පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2016 සැප්තැම්බර් මස 06වන අඟහරුවාදා, එනම් අද දින අපර භාග 3.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2013 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2013 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය සහ ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය සහ ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් නියෝග මම ඉදිරිපත් කරමි.

(i) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) උප වගන්තියේ (ඕ) (ක) සහ (ණ) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1878/11 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1878/12 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iii) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1892/41 සහ 2014 දෙසැම්බර් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iv) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ඌ) වගන්තිය යටතේ ස්වදේශ කටයුතු සහ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1904/10 සහ 2015 මාර්තු 03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(v) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ණඵ), (ණඵ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(vi) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ඕ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(vii) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1924/6 සහ 2015 ජූලි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(viii) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ix) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) (ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන

අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(x) 1996 අංක 2 දරන ඩිවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1)(ත) වගන්තිය යටතේ ඩිවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1945/6 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(xi) 1996 අංක 2 දරන ඩිවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ඩිවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1945/7 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

මම ඉදිරිපත් කරමි.

එම නියෝග තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිධක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2013/2014 වර්ෂය සඳහා සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිධක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු රවීන්ද්‍ර සමරවීර මහතා - පැමිණ නැත.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩුමිකු සුසන්ත පුංචිනිලමේ - පොදු නිර්වාහක මට්‍රුම් මුකාමෙත්තුව පිරති අමෙච්චර්)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ත්‍රිකුණාමලය, බක්මීගම, පුලිකණ්ඩිකුලම යන ලිපිනයෙහි පදිංචි යූ.බී. ජානිකා මල්කාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු ඩුලිප් විජේසේකර මහතා - පැමිණ නැත.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩුමිකු පාලිත තෙවරප්පෙරුම - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දොළහ පිළිගන්වමි.

(1) අතුරුගිරිය, ජය මාවත, අංක 165/3 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එන්. කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කළුතර දකුණ, කොහොලාන, උක්වත්ත යන ලිපිනයෙහි පදිංචි ඩී.ඩී. දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මතුගම, ඉද්දගොඩ, මරම්මුල්ල යන ලිපිනයෙහි පදිංචි ඩී.එච්. ආනන්ද කරුණාසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) බදුරලිය, ගුරුබැද්ද, හැඩිගල්ල යන ලිපිනයෙහි පදිංචි ඩග්ලස් රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) බුලත්සිංහල, දෙල්මැල්ල, කැකිරිහේන යන ලිපිනයෙහි පදිංචි ජී. නන්දාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(6) මොරපිටිය, අත්වැල්තොට, අංක 137/1 ඒ. දරන ස්ථානයෙහි පදිංචි එච්.සී. රොසා රංජනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(7) අයගම, ගවරගිරිය, දෙකන්ද යන ලිපිනයෙහි පදිංචි එම්.එච්. පත්මිණි කාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(8) මතුගම, ඇලදුවත්ත යන ලිපිනයෙහි පදිංචි මුනියන්ඩි ප්‍රේමකුමාර් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) යගිරල, ගම්මන, උදිත ග්‍රයින්ඩින් මිරිස් මෝල යන ලිපිනයෙහි පදිංචි එන්.ඩී. රූපසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(10) බදුරලිය, හැඩිගල්ල ජනපදය, පුවක්දොල යන ලිපිනයෙහි පදිංචි පී.ඩී. ආරියවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(11) පානදුර, අළුත්වත්ත පාර, අංක 8/22 ඒ. දරන ස්ථානයෙහි පදිංචි පී.එම්. සනත් ඉන්ද්‍රජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(12) බෝතලේගම, තිල්ලවල පාර, අංක 35 දරන ස්ථානයෙහි පදිංචි රාමවන්දන් ධම්මිකා මෙනවියගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්ඩුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන ඉදිරිපත් කරමි.

(1) විදුලිපුර, කෙසෙල්ගමුකන්ද, අංක 27 දරන ස්ථානයෙහි පදිංචි බී.කේ.ඒ. සිරියාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) ජයන්තිපුර, පොදු වෙළෙඳ පොළ අසල, අංක 22 දරන ස්ථානයෙහි පදිංචි ජී.ඩබ්ලිව්. ලාල් අමරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පන්නිපිටිය, කොට්ටාව, බංගලාවත්ත, ගැමුණු මාවත, අංක 60 දරන ස්ථානයෙහි පදිංචි එස්.එල්. රණවීර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නුගේගොඩ, සුභද්‍රාරාම පාර, අංක 178 දරන ස්ථානයෙහි පදිංචි ටී. අතුල පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කේ.කේ. පියදාස මහතා
(මාණ්පුමිකු කේ.කේ. පියතාස)
(The Hon. K.K. Piyadasa
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මහනුවර, කුළුගම්මන, අංක 128/8 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ජී. ජයවීර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි - පැමිණ නැත.
ගරු බුද්ධික පතිරණ මහතා - පැමිණ නැත.
ගරු ආනන්ද අලුත්ගමගේ මහතා - පැමිණ නැත.
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා - පැමිණ නැත.

ගරු සුජිත් සංජය පෙරේරා මහතා
(මාණ්පුමිකු සුජිත් සඞ්ජය පෙරේරා)
(The Hon. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යටියන්තොට, වැලිහෙලතැන්න, වීරගල්ල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.ඒ. රණසිංහ පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
සමර්ප්පික්කප්පට්ට මනුක්කළෙප් පොදුමනුක් කුළුවුක්කුච් චාට්ටක් කට්ටළෙයිඩප්පට්ටදු.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 2 - 464/'16- (2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා - දේසිය කොළ්කෙකළ් මට්රුම් පොරුළාදාර අලුවල්කළ් ඉරාජාඞ්ක අමෙච්චර්)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මට්රොරු දිනත්තිට් චමර්ප්පික්කක් කට්ටළෙයිඩප්පට්ටදු.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 - 479/'16- (2), ගරු කනක හේරත් මහතා.

ගරු කනක හේරත් මහතා
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මට්රොරු දිනත්තිට් චමර්ප්පික්කක් කට්ටළෙයිඩප්පට්ටදු.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 4 - 598/'16- (2), ගරු ලකී ජයවර්ධන මහතා.

ගරු ලකී ජයවර්ධන මහතා
(මාණ්පුමිකු ලක්කි ජෂවර්තන)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු වී.එස්. ඉරාතාකිරුෂ්ණන් - කල්වි ඉරාජාඞ්ක අමෙච්චර්)
(The Hon. V. S. Radhakrishnan -State Minister of Education)
Sir, on behalf of the Minister of Education, I ask for one week's time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මට්රොරු දිනත්තිට් චමර්ප්පික්කක් කට්ටළෙයිඩප්පට්ටදු.
Question ordered to stand down.

පලාලි ගුවන් තොටුපළ නවීකරණය : ගිවිසුම
பலாலி விமான நிலைய நவீனமயமாக்கம் : உடன்படிக்கை
MODERNIZATION OF PALALI AIRPORT: AGREEMENT

665/'16

6. ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පලාලි ගුවන් තොටුපළ නවීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දීය රජය හෝ ඉන්දීය සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එම ගිවිසුම සඳහා කැබිනට් මණ්ඩලයේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය හෝ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම කොන්ත්‍රාත්තුව අදාළ සමාගමට ලබා දී ඇත්තේ විවෘත ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීමෙන්ද;

(v) කොන්ත්‍රාත්තුවට අනුව මෙම නවීකරණය සඳහා යන වියදම කොපමණද;

(vi) නවීකරණ කටයුතු අවසන් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பலாலி விமான நிலையத்தை நவீனமயப்படுத்துவதற்கு இலங்கை அரசாங்கம், இந்திய அரசாங்கத்துடனோ அல்லது இந்திய கம்பனியொன்றுடனோ உடன்படிக்கையொன்று கைசாத்திட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி உடன்படிக்கையை இச் சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) மேற்படி உடன்படிக்கைக்கான அமைச்சரவை யினதும் சட்ட மாஅதிபர் திணைக்களத்தினதும் அங்கீகாரம் அல்லது அவதானிப்புகள் அடங்கிய ஆவணங்களைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iv) மேற்படி ஒப்பந்தம் குறிப்பிட்ட கம்பனிக்கு வழங்கப்பட்டிருப்பது பகிரங்க கேள்விப் பத்திர நடைமுறையை பின்பற்றியா என்பதையும்;

(v) ஒப்பந்தத்தின் பிரகாரம் மேற்படி நவீனமயப்படுத்தலுக்கான செலவு எவ்வளவென்பதையும்;

(vi) நவீனமயப்படுத்தும் பணிகளை நிறைவு செய்வதற்கு எடுக்கும் காலம் எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) whether there is an accord or agreement between the Government of Sri Lanka and the Government of India or an Indian Company to modernize the Palali Airport;

(ii) if so, whether that accord or agreement will be presented to this House;

(iii) whether the documents that have the approval and observation of the Cabinet of Ministers and the Department of Attorney-General for the aforesaid accord will be submitted;

(iv) whether this contract has been handed over to the relevant company through an open tender procedure;

(v) the cost needed to modernize the Airport according to the contract; and

the time period that is needed to complete the modernization task?

(b) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, 2016 ජූලි මස 17 වැනි දින "ද සන්ඩේ ටයිම්ස්" පුවත් පතේ "India to develop Palaly as regional airport" යන ලිපි ශීර්ෂය යටතේ පළ වී තිබෙන ප්‍රවෘත්තියක් ගැන ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි. මම එය කියවන්නම්.

> "India is carrying out a feasibility study on the Palaly airport to assess its suitability to be utilized as a regional airport. This airport is now a Sri Lanka Air Force (SLAF)-run facility and is used for military and civilian flights in Sri Lanka.
>
> The Airport Authority of India (AAI) is now carrying out a feasibility study on the Palaly airport to see how it could be developed, Civil Aviation Authority (CAA) Director General H.M.C. Nimalsiri told the Sunday Times. About four months ago, an AAI team visited Palali to ascertain how the airport could be developed as a regional airport, he said."

"ද සන්ඩේ ටයිම්ස්" පුවත් පතේ පළවී තිබෙන ඉහත ප්‍රවෘත්තිය අසත්‍යයක්ද කියා, ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා දැන ගන්නට කැමැතියි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි ආකාරයේ සමීක්ෂණයක් සඳහා ඉන්දියානු කණ්ඩායමක් ඇවිල්ලා තිබෙනවා. ඊට පසුව අපි අවශ්‍යතා හඳුනා ගෙන ඒ අයට දැනුම් දෙන්නට ඕනෑ, කොහොමද එය කරන්නේ කියලා. විශේෂයෙන්ම, මෙය කලාපීය ගුවන් තොටුපොළක් ලෙස නවීකරණය කරනවා නම්, ඒ පළාතේ තිබෙන යම් ඉඩම් ප්‍රමාණයක් අත් පත් කර ගන්නට සිදු වෙනවා. ඒ වාගේම විශාල මුදලක් වැය වෙනවා. අපි තවම ඒ සම්බන්ධයෙන් පිළිතුරක් දීලා නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමා දැන් රාජ්‍ය ප්‍රතිපත්තියක් ප්‍රකාශ

[ගරු බිමල් රත්නායක මහතා]

කරලා තිබෙනවා, ටෙන්ඩර් පටිපාටියකින් තොරව unsolicited proposals විධියට ක්‍රියා කරන්නේ නැහැයි කියලා. එසේ තිබියදී ඔබතුමන්ලා -මම දන්නේ නැහැ, මේකට කැබිනට් අනුමැතියක් තිබෙනවාද කියලා- ඉන්දියාවම තෝරාගෙන, ගිවිසුමකුත් නැතිවම ඉන්දියානු AAI එකට මේ ගැන feasibility study එකක් ලබා දෙන්නේ කුමන පදනමින්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී ප්‍රශ්න දෙකක් තිබෙනවා. ඉන්දියාවේ AAI එකම තෝරා ගන්නේ ඇයි? අපි කියන්නේ නැහැ ඒ වෙනුවට වෙනත් එකක් තෝරා ගන්න කියලා. නමුත් AAIම තෝරා ගන්නේ ඇයි ? දෙවෙනි කාරණය තමයි, මේ විධියට පැවරීමෙන් ඔබතුමන්ලා unsolicited proposalsවලට අනුව ක්‍රියා කිරීමක් සිදු වෙනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එහෙම කිසිම ගිවිසුමක් අත්සන් කරලා නැහැ. ඉන්දියානු කණ්ඩායමක් ඇවිල්ලා පලාලි ගුවන් තොටුපොළ නිරීක්ෂණය කරලා, සමීක්ෂණයක් කරලා කොහොමද ඒක කරන්න පුළුවන් කියන එක ගැන අධ්‍යයනයක් විතරයි කරගෙන ගිහින් තිබෙන්නේ. අපි මේ පිළිබඳව කිසිම ගිවිසුමක් අත්සන් කරලා නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ විධියට ඉන්දියානු කණ්ඩායමකට ඇවිල්ලා නිකම්ම පරීක්ෂණ කරගෙන යන්න බැහැ නේ, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

Airports Authority of India එකට පලාලි Airport එකේ feasibility study එකක් කරන්නට අවසරය ලබාදීලා තිබෙන්නේ කවුද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම අපේ සිවිල් ගුවන්සේවා අධිකාරියත්, අපේ ආරක්ෂක අංශත් දැනුවත් කරලා එතුමන්ලාත් සමඟ තමයි ඒ feasibility study එක කරලා තිබෙන්නේ. එයට පරිබාහිරව අපේ ආරක්ෂාවට තර්ජනයක් වෙන කිසිම දෙයක් රජයක් හැටියට අපි කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු රාජ්‍ය ඇමතිතුමා, මම ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි මතු කරන්නේ.

මම අහන්නේ නීත්‍යානුකූල ප්‍රශ්නයක්. අපේ Sri Lanka Air Force එක භාරයේ තිබෙන Palaly Airport එකේ feasibility study එකක් කරන්න Airports Authority of India එකට අවසර දුන්නේ කවුද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයට -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු මන්ත්‍රීතුමනි, වාර්තාවක් ලබා ගන්න ආණ්ඩුවෙන් අවසරය දුන්නා. එය කරන්න පුළුවන්ද, බැරිද කියලා බලන්න අවසර දුන්නා. [බාධා කිරීමක්] අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිවයි එය කළේ, ගරු මන්ත්‍රීතුමනි. අමාත්‍යාංශය මොකක්ද කියලා මම හරියටම හොයලා ඔබතුමාට කියන්නම්. මේක ආණ්ඩුව දැනගෙන හිටියා; අප දැනගෙන හිටියා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දුන්නාද, ගරු අගමැතිතුමනි?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Feasibility report එකක් ගන්න කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දෙන්න වුවමනා නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා ඒ ලියවිල්ල ඉදිරිපත් කරනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ලියවිල්ලක් නැහැ. මම දැන් කියන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු අගමැතිතුමනි, ඔබතුමා කිව්වා නේ අමාත්‍යාංශයෙන් ලියවිල්ලක්,-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම කරුණු ඔක්කොම ප්‍රකාශ කරන්නම්. අප ඒ වගකීම භාර ගන්නවා. අපි feasibility report එකක් ලබා ගන්න අවසර දුන්නා. එක එක තැන්වලට අප භාර දීලා තිබෙනවා, ඒ ඒ වාර්තා ලබා ගන්න. ඒවාට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය වුවමනා නැහැ.

උඩවලව ජල සම්පාදන ක්‍රමයේ, පනහඩුව ප්‍රධාන නළ මාර්ගයක් එලීම: විස්තර
உடவளவ நீர் வழங்கல் திட்டத்தின்கீழ் பனஹடுவ பிரதான குழாய் இடப்பட்டமை: விபரம்
LAYING OF MAIN PIPELINE IN PANAHADUWA UNDER UDAWALAWA WATER SUPPLY SCHEME: DETAILS

724/'16

8. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උඩවලව ජලසම්පාදන ක්‍රමයේ, පනහඩුව තොග ජල ටැංකියට ආසන්න පනහඩුව ගම්මානයේ අතුරු මාර්ගවලට ජල සැපයුම් ලබා නොදී ඊට ආසන්නව ප්‍රධාන නළ මාර්ගයක් එලීමට රජය වැය කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එමඟින් ජල සැපයුම් ලබා ඇති පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් ජල පාරිභෝගිකයෙකු වෙනුවෙන් රජය දරා ඇති මුදල දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස නොමැති ඉඩම් කට්ටි 03ක් සඳහා මීටර් 850ක් දුරට ජල නළ එලා ඇති බව දන්නේද;

(ii) එම ජල සැපයුම් ලබාගත් පාරිභෝගිකයන් සමඟ රත්නපුර ප්‍රාදේශීය කළමනාකාරවරයාගේ පෞද්ගලික සම්බන්ධතාවයක් තිබෙද;

(iii) තම නිල බලය භාවිතා කරමින් මෙම නිලධාරියා විසින් රාජ්‍ය මුදල් අවභාවිත කර ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

(v) එම මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නගරත් තිට්ටමිටල් මට්‍රුම් නීර් වලඟ්ගල් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) උඩවලව ජල සම්පාදන ක්‍රමයේ පනහඩුව මිරිස්හේන මාර්ගයේ ජල නළ මීටර් 850ක් එලීම සඳහා රුපියල් 834,532.00ක් වැයවී ඇත.

(ii) මෙම ජල නළ මාර්ගයෙන් (මීටර් 850ක් දිගැති) මේ වන විට ජල සැපයුම් 05ක් පමණක් ලබාදී ඇත.

(iii) මෙම නළ මාර්ගයෙන් ජල සම්බන්ධන ලබා ගත් එක් පාරිභෝගිකයෙකු වෙනුවෙන් රජය රුපියල් 168,906.00ක මුදලක් වැය කර ඇත.

(ආ) (i) ඔව්. නිවාස සහිත ඉඩම් කට්ටි 05ක් සඳහා මීටර් 850ක් දිගැති මෙම ජල නළ මාර්ගයේ ජල සැපයුම් ලබා දී ඇත.

(ii) ජල සැපයුම් ලබා ගත් ස්ථාන 02ක් රත්නපුර ප්‍රාදේශීය කළමනාකරුගේ බිරිඳට අයත් ස්ථාන වන අතර, තවත් ස්ථානයක් ප්‍රාදේශීය කළමනාකරුගේ මස්සිනාට අයත් වේ. අනිකුත් ජල සම්බන්ධතා දෙකම ලබා ගත් අය සමඟ ප්‍රාදේශීය කළමනාකරුගේ සම්බන්ධයක් ඇති බව අනාවරණය වී ඇත.

(iii) මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුව ජල නළ මාර්ගයකින් ජල සැපයුමක් ලබා ගැනීමට

නගරත් තිට්ටමිටල් මට්‍රුම් නීර් වලඟ්ගල් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) උඩවලව ජලසම්පාදන ක්‍රමයේ, පනහඩුව තොග ජල ටැංකියට ආසන්න පනහඩුව ගම්මානයේ අතුරු මාර්ගවලට ජල සැපයුම් ලබා නොදී ඊට ආසන්නව ප්‍රධාන නළ මාර්ගයක් එලීමට රජය වැය කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එමඟින් ජල සැපයුම් ලබා ඇති පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් ජල පාරිභෝගිකයෙකු වෙනුවෙන් රජය දරා ඇති මුදල දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස නොමැති ඉඩම් කට්ටි 03ක් සඳහා මීටර් 850ක් දුරට ජල නළ එලා ඇති බව දන්නේද;

(ii) එම ජල සැපයුම් ලබාගත් පාරිභෝගිකයන් සමඟ රත්නපුර ප්‍රාදේශීය කළමනාකාරවරයාගේ පෞද්ගලික සම්බන්ධතාවයක් තිබෙද;

(iii) තම නිල බලය භාවිතා කරමින් මෙම නිලධාරියා විසින් රාජ්‍ය මුදල් අවභාවිත කර ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

(v) එම මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உடவளவ நீர் வழங்கல் திட்டத்தில், பனஹடுவ மொத்த நீர்த்தாங்கிக்கு அண்மிய பனஹடுவ கிராமத்தின் துணை வீதிகளுக்கு நீர் வழங்கலை பெற்றுக்கொடுக்காது, அதற்கு அண்மித்ததாக பிரதான குழாயொன்றை இடுவதற்கு அரசாங்கம் செலவு செய்துள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு;

(ii) இதன் மூலம் நீர் வழங்கலைப் பெற்றுள்ள பாவனையாளர்களின் எண்ணிக்கை யாது;

(iii) ஒரு நீர் பாவனையாளருக்காக அரசாங்கம் ஏற்றுள்ள பணத்தொகை அண்ணளவாக எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வீடுகளில்லாத 03 காணித்துண்டுகளுக்காக 850 மீற்றர் தூரத்துக்கு நீர்க்குழாய் இடப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா;

(ii) இந் நீர் வழங்கலை பெற்றுக்கொண்ட பாவனை யாளர்களுடன் இரத்தினபுரி பிரதேச முகாமை யாளருக்கு ஒரு தனிப்பட்ட தொடர்பு இருக் கின்றதா;

(iii) தனது பதவி அதிகாரத்தைப் பாவித்து இவ் வுத்தியோகத்தர் அரச நிதியை முறையற்றவாறு உபயோகித்துள்ளார் என்பதை ஏற்றுக் கொள்வாரா;

(iv) ஆமெனில், அப்பணத்தொகை யாது;

(v) இத்தொகையை மீள அறவிடுவதற்காக மேற் கொள்ளப்பட்டுள்ள நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) the cost incurred by the Government on laying a main pipeline close to the peripheral villages of Panahaduwa village close to the Panahaduwa wholesale storage tank of the Udawalawa Water Supply Scheme without providing water supplies to those villages;

(ii) the number of consumers who have been benefitted by that; and

(iii) approximately the cost incurred by the government per consumer?

(b) Will he also inform this House-

(i) whether he is aware that pipelines have been laid upto a distance of 850 metres to 3 plots of land without houses;

(ii) whether there is any personal relationship between the Ratnapura Regional Manager and the recipients of those water supplies;

(iii) whether he admits that this officer has misappropriated public funds by using his official status;

(iv) if so, the amount so misappropriated; and

(v) the steps that have been taken to recover that amount?

(c) If not, why?

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)

(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)

(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු රවුෆ් හකීම් මහතා]

මණ්ඩලයේ සේවකයෙකුට හෝ ඥාතියෙකුටද හිමිකම් ඇත. නමුත් මෙම මීටර් 850ක නළ මාර්ගයෙන් මීටර් 600කට පමණක් මූලික සැලැස්මට අනුව අනුමැතිය හිමිව ඇත. ඉතිරි මීටර් 250ක නළ එළීමට සංඝපාල රජමහා විහාරාධිපතිගේ ඉල්ලීම මත සිදු කර ඇති බව අනාවරණය වී ඇත. එසේ වුවත් එම මීටර් 250ක කොටස මූලික සැලැස්මට ඇතුළත් නොවන නිසා එම ජල නළ මීටර් 250 සඳහා ජල සම්බන්ධතා ලබා ගත් නිදෙනාගෙන් වැය වූ මුදල් අයකර ගෙන නොමැත. ඒ සඳහා මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී.

මීට අමතරව තම නිල බලය භාවිත කරමින් රාජ්‍ය මුදල් අවභාවිතයක් මේ සම්බන්ධයෙන් සිදු වී ඇත්ද යන්න තහවුරු කිරීම සඳහා විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර, එය තහවුරු වුවහොත් එම නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියා මාර්ග ගැනීමට පියවර ගනු ඇත. තවද, මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් මේ පිළිබඳව විගණන පරීක්ෂාවක් 2016.03.14 දින සිදු කර වාර්තාවක් ලබා දී ඇති අතර, එම වාර්තාව අනුවද අදාළ නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියා මාර්ගයක් ගැනීමට නිර්දේශ කර ඇත.

(iv) මණ්ඩලයේ නිසි අනුමැතියකින් ලබා නොගත් මෙම අමතර ජල නළ මීටර් 250 සඳහා එක් අයෙකුගෙන් රු.81,816.86ක් අය කරගත යුතුය.

(v) ඉහත (iii) හා (iv) හි සඳහන් කර ඇති පරිදි අදාළ රු.81,816.86ක මුදල පාරිභෝගික ගිණුම් තුනට මුලින් අය කර නොමැති නිසා අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු ඇමතිතුමාට මා පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා, ඉතාම පැහැදිලි හා නිරවුල් පිළිතුරක් ලබා දීම සම්බන්ධව. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, (ආ) (i) පිළිතුර විධියට "නිවාස සහිත ඉඩම් කට්ටි 03ක් නොවෙයි, නිවාස නොමැති ඉඩම් කට්ටි 03ක් සඳහා" යනුවෙන් පිළිතුර නිවැරදි විය යුතුයි කියලා මම සඳහන් කරනවා.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
මම සත්‍ය තත්ත්වය දන්නේ නැහැ. ඒ ගැන සොයා බලලා කියන්නම්.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් විශාල සේවයක් -විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ජනතාගේ ජල සම්පාදන කටයුතු වෙනුවෙන්- කෙරෙනවා. මිනිසුන්ගේ විශාල විශ්වාසයක් තිබෙනවා, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු ජලය කලට වේලාවට ලැබෙනවා කියන එක ගැන.

එවැනි තත්ත්වයක් තිබියදී නිලධාරීන් විසින් මේ ආකාරයෙන් කටයුතු කිරීම නිසා රජය පිළිබඳව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිළිබඳව තිබෙන විශ්වාසය පළුදු වෙනවා. මේ තත්ත්වය වැළැක්වීමට ඉදිරි කාලයේදී ඔබතුමා පියවර ගන්නවා ඇති කියලා බලාපොරොත්තු වෙනවා. මම ඒකට පිළිතුරක් බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ප්‍රශ්න අංක 9 -729/' 16- (1), ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම ප්‍රශ්නය අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සපයන්නම්. නමුත් අතුරු ප්‍රශ්න අහන්න විධියක් නැහැ. ගරු මුදල් ඇමතිතුමා සභාවට තවම පැමිණ නැහැ. පිළිතුර නම් මා ළඟ තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු මුදල් ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්න කිහිපයක් අහන්න තිබෙන නිසා ඒ ප්‍රශ්නය කල් දමලා, මම ඒ වෙනුවට සුවිශේෂී ප්‍රශ්නයක් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ වෙලාවේ වෙනත් ප්‍රශ්න යොමු කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පුළුවන්. මොකද, මේ අහන්න හදන්නේ රටේ මුදල් පිළිබඳ ප්‍රශ්නයක් ගැනයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයට අවශ්‍ය නම් පිළිතුර දෙන්න මට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ වෙලාවේදී වෙනත් ප්‍රශ්න ගැන කථා කරන්න අවස්ථාවක් දෙන්න බැහැ. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා මේ අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුර දෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුර එවලා තිබෙනවා. නමුත්, අතුරු ප්‍රශ්නවලට පිළිතුරු ගරු මුදල් ඇමතිතුමා ඉන්න වෙලාවකයි දැනගන්න වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒකෙන් පැන නඟින අතුරු ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් තිබෙන්න ඕනෑ නිසා, ගරු මුදල් ඇමතිතුමා ඉන්න වෙලාවක ඒ සඳහා අවස්ථාවක් දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා ඉන්න ඕනෑ, අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න. මුදල් ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. නමුත් එතුමා මේ ගැන ප්‍රකාශයක් කරයි. මේ අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුර ගරු මුදල් ඇමතිතුමා විසින් ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාට ලබා දී තිබෙනවා. ඒ ගැන අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ නම්, දැන් අහන්න. මුදල් ඇමතිතුමා ඒ ප්‍රශ්නවලට පසුව උත්තර දෙයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම නම් මම අතුරු ප්‍රශ්න ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාට යොමු කරන්නද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අහන්න. කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, 9 වෙනි ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

මන්දිර බද්දෙන් ඉපැයූ ආදායම: විස්තර
மாளிகை வரியினால் ஈட்டிய வருமானம்: விபரம்
REVENUE EARNED BY MANSION TAX: DETAILS

729/'16

9. ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 අතුරු අය වැය මඟින් `මන්දිර බද්ද' යනුවෙන් නව බද්දක් යෝජනා කර, 2016 අය වැය යෝජනා මඟින් එය තවදුරටත් බල ගැන්වූ බව පිළිගන්නේද;

(ii) එකී මන්දිර බද්ද අය කිරීමේ පඳනම කවරේද;

(iii) 2015 සහ 2016 වර්ෂවලදී මෙම බද්දෙන් රජයට ලැබුණු මුළු බදු ආදායම කොපමණද;

(iv) ඉහත වර්ෂයන්හි දී මන්දිර බද්ද ගෙවනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 இடைக்கால வரவு- செலவுத்திட்டத்தில் "மாளிகை வரி" எனும் புதிய வரி முன்மொழியப்பட்டு, 2016 வரவு - செலவுத்திட்டத்தின் மூலம் இது தொடர்ந்தும் வலுப்படுத்தப்பட்டதென்பதை ஏற்றுக்கொள்வாரா;

(ii) மேற்குறிப்பிட்ட மாளிகை வரியை அறவிடுவதன் அடிப்படை யாது;

(iii) 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் இந்த வரியின் மூலம் அரசாங்கத்துக்கு கிடைத்த மொத்த வரி வருமானம் யாது;

(iv) மேற்படி வருடங்களில் மாளிகை வரியைச் செலுத்தியவர்களின் பெயர் மற்றும் முகவரிகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) whether he admits that a new tax called 'Mansion Tax' was proposed through the Interim Budget of 2015 and that it was further empowered through the budget proposals of 2016;

(ii) the basis on which the said 'Mansion Tax' is levied;

(iii) the total tax revenue received by the Government in the years 2015 and 2016 from this tax; and

(iv) the names and addresses of persons who paid the Mansion Tax in the above years?

(b) If not why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 2000 වර්ෂයේ අප්‍රේල් මස 01 දින හෝ එදිනට පසුව ඉදි කරන ලද, බිම් ප්‍රදේශය වර්ග අඩි දසදහසකට නොඅඩු හෝ යම් අදාළ වර්ෂයක අප්‍රේල් මස පළමුවන දිනට වටිනාකම රුපියල් මිලියන 150කට නොඅඩු නිවාස ගොඩනැඟිල්ලක හිමිකාරීත්වයක් ඇති අයෙකුගෙන් වාර්ෂිකව මෙම බද්ද අය කළ යුතුය.

(iii) ඉහළ ආදායම්ලාභී නිවාස අයිතිකරුවන් සඳහා බදු අය කිරීම රජයේ ප්‍රතිපත්තිය විය. ඒ අනුව, 2015 අතුරු අය වැය මඟින් මෙම "මන්දිර බද්ද" හඳුන්වා දුන් නමුත් සභාධිපත්‍ය දේපල මන්දිර

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

බද්දෙන් නිදහස් කිරීම ඇතුළු යෝජනා මෙම බද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් වූ නිසා එම සංශෝධන සහිතව මුදල් පනත සකස් කර අවසන් නොවීම හේතුවෙන් 2015 සහ 2016 වර්ෂ සඳහා මෙමඟින් බදු අය කිරීමක් සිදු කර නොමැත.

(iv) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ අතුරු ප්‍රශ්න තුන මුදල් අමාත්‍යතුමා වෙත යොමු කරවනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

රාජ්‍ය අය වැය යෝජනා මඟින් ඉදිරිපත් කර ඇති "මන්දිර බද්ද" නැමැති බද්දෙන් කිසිදු ආදායමක් රජයට ලැබී නොමැති නිසා ඒ වර්ෂවල අය වැය ඇස්තමේන්තුවල රාජ්‍ය ආදායම් පිළිබඳ පුරෝකථනයන් වැරැදිසහගත වන බැවින් ප්‍රායෝගික වශයෙන් භාවිත නොවන මෙවැනි බදු මඟින් ඉදිරියට පනවන්නේ කෙසේද කියන ප්‍රශ්නය, පළමු වන අතුරු ප්‍රශ්නයයි.

දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. දැනට මේ බදු අය කිරීම සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශාල අර්බුදයක් ඇති වෙලා එම නිලධාරීන් ඊයේ දිනයේ ලෙඩ නිවාඩු දමා තිබෙනවා. ලෙඩ නිවාඩු දමා තිබෙන්නේ, ආදායම් එකතු කිරීමේ කාර්යය විදේශ සමාගමකට විශාල කොමිස් මුදලකට පැවරීම සම්බන්ධයෙනුයි. මෙවැනි බදු අය කිරීම ලංකා ඉතිහාසය පුරා කරන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වන නිසා එවැනි විදේශ සමාගමකට එම බදු අය කිරීමේ කටයුත්ත පවරන්න බලාපොරොත්තු වනවාද, නැද්ද? මේ අර්බුදය පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති සමඟ ඉතා පැහැදිලි සාකච්ඡාවක් කරන්න කියා අපි මුදල් අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිනවා.

තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි. රජයට බදු රැස් කිරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා රේගු දෙපාර්තමේන්තුව ආදියේ විවිධ වෘත්තීය සමිති හා ක්‍රියාකාරිකයන්ට හඬක් නඟන්න බැරි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. ඒ සඳහා මැදිහත් වන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල - උයර්කල්වි මර්රුම් නෙඩුඤ්චාලෙකළ් අමෛච්චරුම් පාරාළුමන්රච් සපෛ මුතල්වරුම්)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කථාවක් කරනවා නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඇහුවේ, අතුරු ප්‍රශ්න තුනයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා අසන ලද අතුරු ප්‍රශ්න අපි මුදල් අමාත්‍යතුමාට යොමු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නා පරිදි බදු අය කරගැනීම සිදු කරන්නේ, ආදායම් බදු දෙපාර්තමේන්තුව, Sri Lanka Customs සහ Department of Excise විතරයි. වැඩිදුර විස්තර ගරු අමාත්‍යතුමාගෙන් අහමු, ගරු මන්ත්‍රීතුමා.

පුජ්‍ය දලුපොත උපාලි හිමියන්: විශ්‍රාම වැටුප්
வண.தலுபொத்த உபாலி தேரர் : ஓய்வூதியம்
VEN. DALUPOTHA UPALI THERO: PAYMENT OF PENSION

779/'16

10.ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මොරවක අධ්‍යාපන කලාපයේ, පාසල් ගුරු භවතෙකු ලෙස තිස් වසරක් පුරා සේවය කර මීට වසර දෙකකට පෙර විශ්‍රාමගත් පුජ්‍ය දලුපොත උපාලි හිමියන් වෙත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්‍රාම වැටුප් අංකය ලෙස, 02/110/6342 යන අංකය ලබා දී ඇති බවත්;

(ii) පුජ්‍ය දලුපොත උපාලි හිමියන් වෙත හිමිවිය යුතු විශ්‍රාම වැටුප තවමත් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පුජ්‍ය දලුපොත උපාලි හිමියන්ට හිමිවිය යුතු විශ්‍රාම වැටුප තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව උන්වහන්සේ වෙත ගෙවන මෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නියෝග කරන බව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்திலுள்ள மொறவக்க கல்விக் கோட்டத்தில் பாடசாலை ஆசிரியராக முப்பது (30) வருடங்கள் சேவையாற்றி இரண்டு (02) வருடங்களுக்கு முன் ஓய்வுபெற்ற வண. தலுபொத்த உபாலி தேரருக்கு ஓய்வூதியங்கள் பணிப்பாளர் நாயகத்தினால் 02/110/6342 எனும் ஓய்வூதிய இலக்கம் வழங்கப்பட்டிருந்த தென்பதையும்;

(ii) வண. தலுபொத்த உபாலி தேரருக்கு உரிய ஓய்வூதியம் இற்றைவரை செலுத்தப்படவில்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) வண. தலுபொத்த உபாலி தேரருக்குரிய ஓய்வூதியக் கொடுப்பனவுகளை மேலும் காலதாமதமின்றிச் செலுத்துவதற்கு அவர் ஓய்வூதியங்கள் பணிப்பாளர் நாயகத்திற்குப் பணிப்புரை வழங்குவாரா என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management:

(a) Is he aware that-

(i) the Ven. Dalupotha Upali Thero who served as a school teacher for 30 years in Morawaka Educational Division, Matara District retired 2 years ago, has been given the pension number 02/110/6342 by the Director General of Pensions; and

(ii) the Ven. Dalupotha Upali Thero has not been paid the due pension up to now;

(b) Will he inform this House whether he directs the Director General of Pensions to pay Ven. Dalupotha Upali Thero's due pension payments without further delay?

(c) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

පූජ්‍ය දලුපොත උපාලි නිමියන්ගේ විශ්‍රාම වැටුප් අයදුම් පත 2016.02.24 දිනැතිව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර එහි පැවති අඩු පාඩු හේතුවෙන් එය 2016.02.24 දිනම නැවත කලාප කාර්යාලය වෙත යොමු කර ඇත. නැවත 2016.03.21 දිනැතිව එම විශ්‍රාම වැටුප් අයදුම් පත්‍රය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත. අනතුරුව පූජ්‍ය දලුපොත උපාලි නිමියන් වෙත 02-1106342 ලෙස විශ්‍රාම වැටුප් අංකයක් ලබා දී ඇති අතර 2016 ජූලි මස සිට විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කර ඇත.

(ii) මේ වන විට විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ. 2016.07.08 දිනැතිව පූජ්‍ය දලුපොත උපාලි නිමියන් වෙත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හා 2016 ජූලි මස විශ්‍රාම වැටුප් ලෙස රුපියල් 395431.40 (රුපියල් තුන්ලක්ෂ අනූපන්දහස් හාරසිය තිස්එකයි ශත හතළිහක) මුදලක් උන්වහන්සේගේ බැංකු ගිණුම් වෙත බැර කර ඇත.

(ආ) ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ. 2016 අගෝස්තු මස විශ්‍රාම වැටුප ලෙස රුපියල් 30417.80ක (රුපියල් තිස්දහස් හාරසිය දාහතයි ශත අසූවක) මුදල ද 2016.08.10 දින දලුපොත උපාලි නිමියන්ගේ බැංකු ගිණුමට බැර කර ඇත.

(ඇ) ඉහත අ (I), (II) හා (ආ) අනුව පැන නොනඟී.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මල් හා විසිතුරු පත්‍ර ආශ්‍රිත කර්මාන්තය : ගම්පහ දිස්ත්‍රික්කය

பூக்கள் மற்றும் அலங்கார இலைகள் சார்ந்த கைத்தொழில் : கம்பஹா மாவட்டம்
FLOWER AND EXOTIC LEAF-RELATED INDUSTRY: GAMPAHA DISTRICT

784/'16

11. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ගම්පහ දිස්ත්‍රික්කයේ, මල් හා විසිතුරු පත්‍ර ආශ්‍රිත කර්මාන්තයේ නියැලෙන්නන් 5,000ක් පමණ සිටින බවත්, සමිති 28ක් මඟින් ක්‍රියාත්මක මෙම කර්මාන්තයට පසු ගිය රජය දිරිගැන්වීම් ලබා දුන් බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තයේ නියැලෙන්නන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, ඕකිඩ්, ඇන්තූරියම් සහ විසිතුරු පත්‍ර වගාකරුවන්, අලෙවිකරුවන්, සුළු, මධ්‍යම සහ මහා පරිමාණ වගාකරුවන් සහ මල් අපනයනකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 දී හා 2016 මුල් කාර්තුවේදී (අ) හි සඳහන් පුද්ගලයන් දිරිගැන්වීමටත්, ව්‍යාපාරයේ රඳවා ගැනීමටත්, නවකයන් ව්‍යාපාරයට බඳවා ගැනීමටත් ගත් ක්‍රියා මාර්ග, ලබා දුන් සහන, ඊට වෙන් කළ මුදල සහ ප්‍රතිලාභ හිමිවූවන් සංඛ්‍යාව කොපමණද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය රජය විසින් කැලණිය විශ්වවිද්‍යාලය හරහා ගම්පහ උද්භිද උද්‍යානයේ රුපියල් මිලියන 22ක වියදමින් ඉදිකළ පටක රෝපණ මධ්‍යස්ථානයේ සිදුකළ පර්යේෂණ, ජනනය කර ඇති මල් ප්‍රභේද සහ පැළ ලබා දුන් මල් ව්‍යාපාරිකයින් සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கம்பஹா மாவட்டத்தில் பூக்கள் மற்றும் அலங்கார இலைகள் சார்ந்த கைத்தொழிலில் ஈடுபடுகின்ற ஏறக்குறைய 5000 பேர் இருக்கிறார்கள் என்பதையும் ஏறக்குறைய 28 சங்கங்கள் இயங்கிவருகின்ற இக்கைத்தொழிலுக்கு கடந்த அரசாங்கம் ஊக்குவிப்பு களை வழங்கியதென்பதையும் அவர் அறிவாரா?

(ஆ) (i) கைத்தொழிலில் ஈடுபட்டுள்ளவர்கள் தொடர்பில் பிரதேச செயலாளர் பிரிவு வாரியாக தொகை மதிப்பீடொன்று மேற்கொள்ளப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், பிரதேச செயலாளர் பிரிவுக்கிணங்க ஓகிட், அந்தூரியம் மற்றும் அலங்கார இலைகளின் செய்கையாளர்கள், சந்தைப் படுத்துனர்கள், சிறிய, நடுத்தர அளவிலான மற்றும் பாரிய அளவிலான செய்கையாளர்கள் மற்றும் பூக்களின் ஏற்றுமதியாளர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

(iii) 2015 මற்றும் 2016ஆம் ஆண்டுகளின் முதல் காலாண்டில் (அ) இல் குறிப்பிட்ட ஆட்களை ஊக்குவிக்கவும் தொழில்முயற்சியில் தக்கவைத் துக்கொள்ளவும் புதியவர்களை தொழில் முயற்சிகளில் இணைத்துக் கொள்வதற்கும் மேற்கொண்ட நடவடிக்கைகள், வழங்கிய நிவாரணங்கள், அதற்காக ஒதுக்கிய பணத்தொகை மற்றும் நன்மைபெறுனர்களின் எண்ணிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(இ) கடந்த அரசாங்கத்தினால் களனிப் பல்கலை கழகத்தினூடாக கம்பஹா தாவரவியல் பூங்காவில் ரூபாய் 22 மில்லியன் செலவில் நிர்மாணிக்கப்பட்ட இழையச்செய்கை நிலையத்தில் மேற்கொள்ளப்பட்ட ஆராய்ச்சிகள், உருவாக்கப்பட்டுள்ள மலர் வகைகள், நாற்றுகள் வழங்கப்பட்ட மலர் தொழில் முயற்சியாளர்களின் எண்ணிக்கை யாதென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife:

(a) Is he aware that there are nearly 5,000 persons involved in the flower and exotic leaf-related industry in the Gampaha District with nearly 28 societies provided with encouragement by the previous Government?

(b) Will he inform this House-

(i) whether a census has been conducted on Divisional Secretaries' Division level on the persons involved in this industry;

(ii) if so, the number of cultivators and sellers of orchids, anthuriums and exotic leaves and the number of small, medium and large -scale cultivators and exporters of flowers in relation to each Divisional Secretary's Division separately; and

(iii) of the measures taken in 2015 and in the first quarter of 2016 to encourage and retain the persons mentioned in (a) above in the industry and absorb novices into it as well as the concessions granted, amount of money allocated for that and the number of beneficiaries?

(c) Will he also inform this House of the number of researches conducted, species of flowers produced and the number of flower businessmen to whom plants were given by the Tissue Culture Centre established in the Gampaha Botanical Garden through the University of Kelaniya by the previous Government at a cost of Rs. 22 million?

(d) If not, why?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)

(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) ගම්පහ දිස්ත්‍රික්කයේ සුවහස් මල් සමිති 30ක් ඇති අතර සාමාජික, සාමාජිකාවන් 2,195ක් පමණ සිටී. ලියාපදිංචි සාමාජික, සාමාජිකාවෝ ඕකිඩ්, ඇන්තූරියම්, ජර්බෙරා හා විසිතුරු පත්‍රික ශාක මිශ්‍ර වගාවක් ලෙස සිදු කරති.

(ආ) (i) සුවහස් මල් සංගම් සාමාජිකයන් පිළිබඳව පමණක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සංගණනයක් සිදු කර ඇත.

(ii)

	ප්‍රා.ලේ. කොට්ඨාසය	සුවහස් මල් සංගම් ගණන	සාමාජිකයන් සංඛ්‍යාව
01.	ගම්පහ	5	297
02.	මිනුවන්ගොඩ	3	285
03.	අත්තනගල්ල	4	252
04.	දිවුලපිටිය	2	440
05.	මීරිගම	3	192
06.	බියගම	1	60
07.	මහර	4	223
08.	ජා ඇල	3	110
09.	කැලණිය	1	50
10.	දොම්පේ	2	130
11.	මීගමුව	2	156
එකතුව		30	2,195

සුවහස් මල් සංගම්වල ලියාපදිංචි සාමාජික, සාමාජිකාවෝ ඕකිඩ්, ඇන්තූරියම්, ජර්බෙරා හා විසිතුරු පත්‍රික ශාක මිශ්‍ර වගාවක් ලෙස සිදු කරති. මෙම සියලුදෙනා සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන් වේ. අපනයනකරුවන් වෙත ඔවුන්ගේ නිෂ්පාදන ලබා දීම සිදු කරනු ලබයි.

(iii) 2015 වසරේ හා 2016 වසර මුල් කාර්තුවේදී ගම්පහ දිස්ත්‍රික්කය තුළ විශේෂිත පුහුණු වැඩමුළු 50ක් පමණ පවත්වා පුද්ගලයින් 1,815ක් පමණ පුහුණු කර ඇත.

අදාළ කාලය තුළදී ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි සුවහස් මල් සමිති සාමාජික, සාමාජිකාවන්ගේ මල් තවාන් 1,000ක් පරීක්ෂා කළ අතර, අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපදෙස් ලබා දෙන ලදී.

අදාළ කාලය තුළදී ගම්පහ දිස්ත්‍රික්කය තුළ සාමාජික, සාමාජිකාවන් 88ක් අතර පොලිතීන් ගෘහ සැකසීම සඳහා මීටර (100x8) ප්‍රමාණයේ UV ප්‍රතිරෝධී පොලිතීන් රෝල් 7ක් බෙදා දී ඇත. Department of National Botanic Gardens මඟින් පොලිතීන් ලබා දෙනවා; පුහුණු තාක්ෂණය දෙනවා. මේ සඳහා දෙපාර්තමේන්තු අරමුදල් මඟින් රුපියල් 747,600.00ක් වැය කර ඇත.

අදාළ කාලය තුළදී ගම්පහ දිස්ත්‍රික්කය තුළ සාමාජික, සාමාජිකාවන් 403ක් අතර සෙවණ ගෘහ සැකසීම සඳහා මීටර 100x3 ප්‍රමාණයේ සෙවණ දැල් රෝල් 61ක් බෙදා දී ඇත. මේ සඳහා

දෙපාර්තමේන්තු අරමුදල් මඟින් රුපියල් 1,860,000.00ක් වැය කර ඇත.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ නිෂ්පාදිත අළෙවි කිරීමේ මල් ප්‍රදර්ශන පැවැත්වීම සඳහා 10'x10' ප්‍රමාණයේ කැනපි හට් 146ක් ඉහත මල් සංගම් අතර බෙදා දී ඇත. මේ සඳහා දෙපාර්තමේන්තු අරමුදල් මඟින් රුපියල් 4,154,868ක් වැය කර ඇත.

මල් ප්‍රදර්ශන පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම වෙනුවෙන් අදාළ කාලය තුළදී ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රදර්ශන 26ක් සඳහා රුපියල් 530,000.00ක මුදලක් ලබා දී ඇත.

මාසික රැස්වීම්වලට සහභාගි වන නිලධාරීන් සෑම අවස්ථාවකදීම තාක්ෂණික කරුණු පිළිබඳව සාමාජිකයන් දැනුවත් කිරීම සිදු කරයි.

නවකයින් ඉල්ලීම් ඉදිරිපත් කළ පසු අදාළ තවාන් පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් ලබා දී සුවහස් මල් සංගම් සඳහා බඳවා ගැනීම් සිදු කරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණය කියන්න ඕනෑ. මම මේ උද්‍යානවලට ගිහිල්ලා තිබෙනවා. මේ අවුරුද්ද තුළ ඒ උද්‍යානවල නිලධාරීන් සමඟ දිගටම සාකච්ඡා පවත්වලා "ඉදිරි දැක්ම" වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. ඊයේත් දෙහිවල සත්වෝද්‍යානයේ නිලධාරීන් පැමිණියා. ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය අහමින් අපි දැනුවත් කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා.

(ඇ) ගම්පහ උද්භිද උද්‍යානයේ පිහිටුවා ඇති පටක රෝපණ රසායනාගාරයේ පරිපාලන කටයුතු කැලණිය විශ්වවිද්‍යාලය මඟින් සිදු කරනු ලබන අතර, පටක රෝපණ මධ්‍යස්ථානයේ පර්යේෂණ, ව්‍යාප්ත කර ඇති මල් ප්‍රභේද සහ පැළ ලබා දුන් මල් ව්‍යාපාරිකයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු කැලණිය විශ්වවිද්‍යාලය වෙතින් විමසා ඇතත් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත මෙතෙක් ලබා දී නැත.

(ඈ) පැන නොනඟී.

පසු ගිය රජය "දිවි නැහුම" වැඩසටහන යටතේ විශාල මුදලක් වැය කරලා, මේ පර්යේෂණ මධ්‍යස්ථානය ආරම්භ කළා. නමුත් මේ ආයතන අතර සම්බන්ධතාවක් නැති බව මා දැනගත්තේ ඊයේ දිනයේදීයි. ඒ නිසා මේ ප්‍රශ්නය මතු කිරීම සම්බන්ධයෙන් මම ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. මීට අදාළ කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරුන් කැඳවලා, ඔවුන් අතර සම්බන්ධීකරණයක් ඇති කරන්න මම බලාපොරොත්තු වනවා. මොකද, දෙපාර්ශ්වය අතර සම්බන්ධීකරණයක් නැති බව මට පෙනෙනවා. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අදාළව මම මේ කාරණයත් කියන්න කැමතියි. ඔකිඩ්, ඇන්තූරියම් වැනි මල් අපනයනය කිරීම අතින් 2005 අවුරුද්දේ අපි හිටියේ යුරෝපයේ හයවැනි තැනටයි. 2011 අවුරුද්ද විතර වනකොට අපි 60වැනි තැනට - පහළට - පත්වෙලා තිබුණා. ඒ තරම් පහළ මට්ටමට අපේ රට පත්වෙලා තිබුණත්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සංඛ්‍යා ලේඛනවලට අනුව 2014 අවුරුද්දේ අපි මල් අපනයනය කිරීමෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 14ක් ලබාගෙන තිබෙනවා. මම ගම්පහ උද්භිද උද්‍යානයේ පැවති වැඩ මුළුවට සහභාගී වුණා. මේ අංශයේ නිරතවෙලා හිටපු ලංකාවේ මහාචාර්යවරුත් මේ සමුළුවට සහභාගී වුණා. මහාචාර්ය ඒ.වී. ආරියරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි මෙම සමුළුව පැවැත්වුණේ. විවිධ ක්ෂේත්‍ර හා අපනයනකරුවන් එක්ක සම්බන්ධවෙලා, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු රේඛීය අංශ එක්ක වැඩ පිළිවෙළක් ඉදිරියේදී ඇති කරන්න මා බලාපොරොත්තු වනවා. මේ කර්මාන්තය ව්‍යාප්ත කරන්න වාගේම මේ කර්මාන්තයේ නියැළෙන්නන් පුහුණු කරන්න ගරු දයා ගමගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශය ඇතුළු රේඛීය අංශය තුළින් සිදු කරන්න පුළුවන්. මේ අනුව ක්‍රියා කිරීම තුළින් තව අවුරුදු පහකින් අපට විශාල මුදලක් ලබා ගන්න පුළුවන් වෙනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මා ඇසූ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපේ ගරු ඇමතිතුමා දීර්ඝ කථාවක් -දීර්ඝ දේශනයක්- කළා. ඒ සම්බන්ධයෙන් මා එතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මේ පටක රෝපණ මධ්‍යස්ථානය කැලණිය විශ්වවිද්‍යාලයේ උපදේශකත්වය යටතේ පසු ගිය රජය ගොඩනැඟුවේ එම රජයේ අවසාන කාල වකවානුව තුළදීයි. තායිලන්තය, සිංගප්පූරුව වැනි රටවලින් මල් පැළ අපේ රටට ගෙන ඒමේදී විශාල මුදලක් මේ වගාකරුවන්ට ගෙවන්න සිදු වෙනවා. මේවා නැවත අපනයනය කරනකොට මේගොල්ලන්ට ලැබෙන ලාභය අඩු නිසා තමයි, ගම්පහ උද්භිද උද්‍යානයේ මේ පටක රෝපණ මධ්‍යස්ථානය ඉදි කළේ. ඔබතුමන්ලාගේ රජය බලයට පත්වෙලා දැනට වසර එකහමාරක විතර කාලයක් වෙනවා. ඔබතුමා අමාත්‍යාංශය බාර අරගෙනත් මේ වනකොට වසරකට වැඩි කාලයක් වනවා. නමුත් මේ වෙනකල් එහි ප්‍රතිඵල ලැබී නැහැ. ඒ නිසා මේ උද්භිද උද්‍යානයේ තිබෙන පටක රෝපණ මධ්‍යස්ථානය මඟින් සහ රට තුළ එවැනි තවත් ස්ථාන ස්ථාපිත කිරීම මඟින් වගාකරුවන් වැඩි කර ගැනීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක තමයි මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය.

ගරු ගාමිණි ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු සහ මාගේ උපදේශකවරු වන මහාචාර්ය සරත් කොටගම සහ මහාචාර්ය නිමල් ද සිල්වා යන මහත්වරු සමඟ සම්බන්ධ වෙලා අපි කටයුතු කරනවා. කියන්න කනගාටුයි, කැලණිය විශ්වවිද්‍යාලයෙන් හෝ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවෙන් රාජපක්ෂ රජයේ අවසන් කාලයේ බිහි වුණු ඒ tissue culture අංශය ගැන මට දැන ගන්න ලැබුණේ නැහැ. එකල ප්‍රගතිය ගැනවත් දැන ගන්න ලැබුණේ නැහැ. අපේ ඉලක්කය වන්නේ ලංකාවේ හැම ආසනයක්ම නියෝජනය වන පරිදි 35,000කට අධික පිරිසක් මේ වර්ෂයේදී පුහුණු කිරීමයි. මම කිව්වේ 50,000ක් පුහුණු කරන්න කියලායි. ඒ පුහුණු කරන අය මල් අපනයනකරුවන් සමඟ සම්බන්ධ කරනවා. මම මේ ගැන දැන ගත්ත එක බෙහොම හොඳයි. Tissue culture කියන අංශය අපි දියුණු කරන්න ඕනෑ. කැලණිය විශ්වවිද්‍යාලයේ සහ මාගේ අමාත්‍යාංශයේ අදාළ නිලධාරී මහත්වරු සමඟ සාකච්ඡාවක් පවත්වලා, අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නවා. අපි කවුරුන් හෝ කර තිබෙන කිසි හොඳ දෙයක් වහන්නේ නැහැ. වංචාවක්, හොරකමක් වුණා නම් ඒ ගැන පරීක්ෂණ පවත්වනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා කිව්වා වාගේ මහාචාර්යවරුන්ගේ උපදෙස් අර ගෙන, ගම්පහ දිස්ත්‍රික්කයේ -විශේෂයෙන්ම

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

දිවුලපිටිය මැතිවරණ කොට්ඨාසයේ- මල් අපනයන ගම්මානයක් සෑදීම සඳහා පසු ගිය රජයේ වැඩ පිළිවෙළක් තිබුණා. මේ රජය පත්වීමත් සමඟ දැන් එය නැවතිලාද තිබෙන්නේ කියලා මම අහන්න කැමැතියි. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ආසන්න ප්‍රදේශයක් නිසාත්, ඒ වාගේම ගරු ඇමතිතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයට බොහොම ආසන්න ප්‍රදේශයක් නිසාත්, පොල්වතු වැනි විශාල වතු තිබෙන ප්‍රදේශයක් නිසාත්, මල් අපනයනකරුවන් වැඩි කර ගැනීම සඳහා ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යනවාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් මිලියන තිස් ගණනක් වැනි මුදලක් වියදම් කළා කියලා ඊයේ මේ වාර්තාවෙන් තමයි මට දැන ගන්න ලැබුණේ. මම ඒ නිලධාරීන්ටත් දොස් කිව්වා, ඒ සම්බන්ධයෙන් මා දැනුවත් නොකිරීම පිළිබඳව. මම වහාම -[බාධා කිරීමක්] ඉන්න, ඉන්න. මම ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. [බාධා කිරීමක්] හරි, හරි. ඇයි, ඔව්වර පනින්නේ? [බාධා කිරීමක්] ඉන්න කෝ. අනේ! ටිකක් ඉන්න කෝ, මම උත්තර දෙනකල්. මම පරීක්ෂණයක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රුපියල් මිලියන තිස් ගණනක් වියදම් කරලා පටක රෝපණ මධ්‍යස්ථානය ආරම්භ කළා කියන එක ගැන මම පරීක්ෂණයක් කරනවා. ගරු මන්ත්‍රීතුමනි, දිවුලපිටියේ අපනයනකරුවන් එකසිය තිස් ගණනක් ඉන්නවා.

ඒ මහත්වරු මා හමු වුණා. ඒ අය අපේ සාකච්ඡාවලටත් ආවා. එතුමන්ලා විසිඑක්වෙනි දා සිට ප්‍රදර්ශනයක් පවත්වනවා. ඒ ප්‍රදර්ශනයට මාත් සහභාගි වනවා. මම ඒ ප්‍රදර්ශනයට යන්නේ මොකටද? මේ අයට අත දෙන්න.

ඒ සල්ලිවලට වුණු දේ සම්බන්ධයෙන් සොයන්න මම පරීක්ෂණයක් කරනවා. පරීක්ෂණයක් කරලා මැතිවරණය කාලයේ ඒ සල්ලිවලට මොනවාද වුණේ කියලා මම සොයනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ලැබුණේ නැහැ. මම ඇහුවේ මල් අපනයන ගම්මානයක් සෑදීම සඳහා දිවුලපිටිය ප්‍රදේශය තෝරා ගෙන තිබෙන නිසා එම කටයුතු වර්ධනය කරන්න ගරු ඇමතිතුමාගේ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලායි. එහෙම නැතිව පරීක්ෂණයක් පිළිබඳව නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමාට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලායි අහන්නේ. [බාධා කිරීමක්]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)

එතැන වුණේ මනාප වර්ධනයක්ද, මල් වර්ධනයක්ද කියලා මම සොයා බලනවා. අපි දිවුලපිටියේ මල් අපනයන ගම්මානය සෑදීමේ කටයුතු කර ගෙන යනවා. ඒ තුළින් මේ රජයේ ප්‍රතිපත්ති තුළ දුප්පත් කාන්තාවන්ට ස්වයං ආර්ථික වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කර ගෙන යනවා. හැබැයි, මනාප වර්ධනය වුණාද, මල් වර්ධනය වුණාද, මොකක්ද වුණේ කියන එක පිළිබඳවත් මම පරීක්ෂණ කරනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්න තුනම ඇහුවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න දෙකයි ඇහුවේ. මට තව එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

මගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මම අහනවා. අගමැතිතුමා හෝ අපේ විෂයය භාර ඇමතිතුමා මේ ප්‍රශ්නයට උත්තර දෙනවා නම් හොඳයි. මල් පැළ, මල් පෝච්චි, nets, gloves වැනි දේවල් ලබා දීලා පසු ගිය රජයෙන් මේ කර්මාන්තය සඳහා විශාල විධියට ආධාර කළා. ඒ වාගේම මේ කර්මාන්තයේ නියැලෙන අයට සහනදායී පොලියට ණය ලබා දුන්නා. ඒ වාගේම ඔවුන් වෙනුවෙන් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කළා. ඒ වැඩසටහන්වලට රුපියල් ලක්ෂ 50ක මුදලක් වෙන් කරලා තිබුණා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)

අපි ඒ කර්මාන්තයේ නියැලෙන අයට දැල් ලබා දෙනවා; තාක්ෂණ පුහුණුව ලබා දෙනවා. ඒ කර්මාන්තයේ නියැලෙන කාන්තාවන්ට හරි, තරුණයන්ට හරි, ඔබතුමාට වුණත්, ඕනෑ කෙනෙකුට අපි අවශ්‍ය දේවල් ලබා දෙනවා. Gampaha Botanical Garden එක, ගනේවත්ත ඖෂධ පැළෑටි උද්‍යානය, Hambantota Safari Park එක වාගේම නුවරඑළිය වැනි ප්‍රදේශවලත් අපේ උද්‍යාන තිබෙනවා. මේ තැන්වල ඒ ළමයි පුහුණු කරනවා. ඒ, එකක්. අපි ලබා දෙන්නේ තාක්ෂණික පුහුණුව පමණක් නොවෙයි. මල් වර්ධනය කිරීම සම්බන්ධවත් අපි ඒ අය පුහුණු කරනවා. Tissue culture එකත් එක්තරා මට්ටමකට අපි දියුණු කරනවා. අපි ඒ අයට මේ කර්මාන්තයට අවශ්‍ය දැල් ලබා දෙනවා; බෑග් ලබා දෙනවා. ඒ අයට ණයක් දෙන්න බැංකු එක්ක වැඩ පිළිවෙළකුත් අපි ඇති කර තිබෙනවා. අපි ඒවා වර්ධනය කරලා ව්‍යාප්ත කරනවා මීසක් ඒවා කපා හරින්නේ නැහැ. අපේ මල් අපනයනය පහළ බැස්සා. 2005 වර්ෂයේ මල් අපනයනයෙන් අපි සිටියේ යුරෝපයේ හයවෙනි තැනටයි. අවුරුදු 10ක් යද්දි අපි හැටවෙනි තැනට පහළ බැහැලා තිබෙනවා. අගමැතිතුමනි, මේ කර්මාන්තයෙන් අපට විශාල මුදලක් හම්බ කරන්න පුළුවන්. ඒ නිසා මේ වැඩ පිළිවෙළට අපි මුල්තැනක් දෙනවා. අපනයන මණ්ඩලයේ නිලධාරිනුත් සහාය කර ගෙන දයා ගමගේ ඇමතිතුමා එක්ක අපි මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ඔබතුමා මේ කරුණ තේරුම් කරන්න ගොඩක් වෙලාව ගත්තා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
"Development Plan for Floriculture Industry" නමැති මේ වාර්තාව මම **table*** කරනවා.

මේ කමිටුවේ ඉන්නේ මහාචාර්යවරු. මේ අය එක්ක උද්භිද උද්‍යාන නිලධාරීන් තරහයි. ඔවුන් එකිනෙකා හැප්පිලා. මොකක් හරි වංචාවක් වෙලා තිබෙනවා. මම අද උදේ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල් නානායක්කාර මැතිතුමාගෙන් මේ ගැන ඇහුවා. Sir, I also want to mention this.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have taken a lot of time answering this Question.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
Sir, just give me a minute. I will read the names of the Members of the Committee which prepared the Development Plan for Floriculture Industry. Prof. A.R. Ariyaratne, Secretary/ Director, Sri Lanka Council for Agricultural Research Policy; Mr. H.D. Ratnayake, Additional Secretary (Technical), Ministry of Sustainable Development and Wildlife; Mr. Bhathiya Sumithrarachchi, Consultant, Ministry of Sustainable Development and Wildlife; Mr. Ruwantha Samaranayaka, Adviser to the Hon. Minister of Sustainable Development and Wildlife; Prof. Sriyani Peiris, Professor, Horizon Campus, Malabe; Ms. Gayani Wijayathilake, Assistant Director, Export Development Board; Dr. S.M.P. Chandra Padmini, Senior Research Officer, Sri Lanka Council for Agricultural Research Policy යනාදීන්ගෙන් සමන්විත පෞද්ගලික අංශයත් සම්බන්ධ වුණු කමිටුවකින් වාර්තාවක් හදලා තිබෙනවා. මම ඒ වාර්තාව දැන් ගරු අගමැතිතුමාට දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 12-790/'16-(1), ගරු විදුර වික්‍රමනායක මහතා.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරතු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළైයిడప్పట్టత్తు.
Question ordered to stand down.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පරිපාලන සේවා විභාග : උතුරු හා නැඟෙනහිර මධ්‍යස්ථාන

நிருவாக சேவைகளுக்கான பரீட்சைகள்: வடக்கு, கிழக்கில் பரீட்சை நிலையங்கள்

ADMINISTRATIVE SERVICE EXAMINATIONS: CENTERS IN NORTH AND EAST

799/'16

14. ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (SLEAS), ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS) වැනි සේවා සඳහා බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාග පවත්වනු ලබන්නේ කොළඹදී පමණක් බවත්;

(ii) කොළඹ විභාග මධ්‍යස්ථානවලදී පමණක් ඉහත කී විභාග පැවැත්වීම මඟින් දුර බැහැර ප්‍රදේශවල අයදුම්කරුවන්ට ගැටලුවලට මුහුණ දීමට සිදුවන බවත්; එතුමා දන්නෙහිද?

(ආ) අයදුම්කරුවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කර, ඉදිරි කාලයේදී උතුරු හා නැඟෙනහිර පළාත්වල මෙවැනි විභාගයන් පැවැත්වීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கல்வி நிருவாக சேவை (SLEAS), இலங்கை நிருவாக சேவை (SLAS) போன்ற சேவைகளுக்கு ஆட்சேர்ப்புச் செய்வதற்கான திறந்த மற்றும் மட்டுப்படுத்தப்பட்ட போட்டிப் பரீட்சைகள் கொழும்பில் மட்டுமே நடத்தப்படு கின்றன என்பதையும்;

(ii) மேற்படி பரீட்சைகள் கொழும்பிலுள்ள பரீட்சை நிலையங்களில் மாத்திரம் நடத்தப்படுவதன் மூலம் தூரப் பிரதேசங்களிலுள்ள விண்ணப்ப தாரர்களுக்கு சிக்கல்களை எதிர்கொள்ள நேரிடு கின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) விண்ணப்பதாரர்கள் எதிர்நோக்க நேரிடுகின்ற சிக்கல்கள் தொடர்பாக கவனம் செலுத்தி, எதிர்காலத்தில் வடக்கு, கிழக்கு மாகாணங்களில் இவ்வாறான பரீட்சைகளை நடத்த நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) the open and limited examinations for recruitment to Sri Lanka Educational Administrative Service (SLEAS) and Sri Lanka Administrative Service (SLAS) are conducted only in Colombo; and

(ii) the candidates in far away areas face difficulties due to the fact that the aforesaid examinations are conducted only in the examination centres in Colombo?

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

(b) Will he inform this House whether action will be taken to conduct such examinations in the Northern and Eastern Provinces in the future, paying attention to the difficulties faced by the candidates?

(c) If not, why?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தக் கேள்விக் கான பதிலை நான் வழங்குகின்றேன்.

(அ) (i) ஆம்.

(ii) போதியளவு விண்ணப்பதாரர்கள் தூரப் பிரதேசங்களில் இல்லாத காரணத்தினால் கொழும்பில் மட்டும் இப்பரீட்சைகளை நடத்த நேர்ந்துள்ளது. SLAS பரீட்சை மூன்று நாட்கள் நடைபெறும். அதில் சுமார் 1,950 பேர் தோற்றுகிறார்கள். SLEAS பரீட்சை ஒரு நாள்தான் நடைபெறும். அதில் 1,958 பேர் தோற்றுகிறார்கள். இதனால் இப்பரீட்சைகள் கொழும்பில் நடைபெறுகின்றன.

(ஆ) அவசியம் ஏற்படாது.

(இ) இம்மாகாணங்களிலிருந்து தோற்றும் விண்ணப்பதாரி களின் எண்ணிக்கை மிகவும் குறைவாகக் காணப்படு கின்றது. ஒரு சிலருக்காக மாத்திரம் தனிப்பட்ட பரீட்சை நிலையமொன்றை மேலதிகமாக ஏற்படுத்து வதால், தேவையற்ற விதத்தில் பெருந்தொகைப் பணம் செலவாகும். இதனால் இப்பரீட்சைகள் கொழும்பில் மட்டும் நடத்தப்படுகின்றன என்பதைத் தெரிவித்துக்கொள்கின்றேன்.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
வடக்குப் பகுதியிலிருந்து ஒருசிலர் மாத்திரம் இப்பரீட்சை களுக்குத் தோற்றுவதில்லை. ஒரு centre ஐ வைப்பதென்றால் எத்தனை பேர் தேவை?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
Limited examinationக்கு 1,950 பேர்தான் தெரிவு செய்யப்பட்டிருக்கிறார்கள். அதனால்தான் கொழும்பில் மட்டும் நடத்தப்படுகின்றது. அதனைவிட அதிகமானோர் தோற்று கின்ற சந்தர்ப்பம் ஏற்பட்டால் நாங்கள் அதில் கரிசனை எடுப்போம்.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1 - 456/'16- (1), ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 5 - 634/'16- (1), ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 7 -720/'16- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ISIS සංවිධානය: ශ්‍රීලාංකිකයන් සමඟ සබඳතා
ISIS அமைப்பு : இலங்கையருடனான தொடர்பு
ISIS ORGANIZATION: LINKS WITH SRI LANKANS

791/'16

13. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවට)

(මාණ්පුමිකු පන්දුල කුණවර්තන - මාණ්புමිකු டலஸ் அழහப்பெரும சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Dullas Alahapperuma)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලෝක ඉස්ලාම් රාජ්‍යයක් සඳහා ත්‍රස්තවාදය වපුරන ISIS සංවිධානයට ශ්‍රී ලාංකිකයන් බැඳී ඇති බව සත්‍යයක්ද;

(ii) එසේ නම්, මේ වනවිට ISIS ත්‍රස්තවාදය වෙනුවෙන් සටන් කරන බවට හෙළිදරව් වී ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ සටන් කරද්දී මියගිය බවට තොරතුරු අනාවරණ වී ඇති පුද්ගලයන් සිටින්නේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ඔවුන් මියගිය රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ISIS සංවිධානයේ ව්‍යාප්තිය පිළිබඳව සකස් කොට ඇති සැලසුම්වලට අනුව 2020 දී ශ්‍රී ලංකාවද ඔවුන්ගේ සටන් භූමියක් ලෙස තෝරගෙන ඇති බව සත්‍යයක්ද;

(ii) රාජ්‍ය බුද්ධි අංශ විසින් මේ වනවිට ISIS ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ලබා දී ඇති උපදෙස් කවරේද;

(iii) එකී උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා බාධා තිබේද;

(iv) ශ්‍රී ලංකාවේ කිසියම් දේශපාලන පක්ෂයක් හෝ සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් ISIS සංවිධානය සමඟ සම්බන්ධකම් පවත්වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පිරතම අමෙච්චරුම් තේසිය කොළ්කෙකළ් මර්‍රුම් පොරුළාතාර අලුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(அ) (i) உலக இஸ்லாமிய இராச்சியத்திற்காக பயங்கர வாதத்தை விதைக்கின்ற ISIS அமைப்பில் இலங்கையரும் இணைந்துள்ளனர் என்பது உண்மையா என்பதையும்;

(ii) ஆமெனில், தற்போது ISIS பயங்கரவாதத்திற்கு போராடுவதாக வெளிவந்துள்ள இலங்கையர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அவ்வாறு போராடும்போது இறந்ததாக தகவல்கள் வெளியாகியுள்ள ஆட்கள் உள்ளனரா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களது பெயர்கள் மற்றும் அவர்கள் இறந் துள்ள நாடுகள் தனித்தனியாக யாவையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ISIS அமைப்பின் விஸ்தரிப்பு தொடர்பாக தயாரித்துள்ள திட்டங்களின் பிரகாரம் 2020 இல் இலங்கையும் அவர்களின் போர்க்களமாக தேர்ந் தெடுக்கப்பட்டிருப்பது உண்மையா என்ப தையும்;

(ii) அரச புலனாய்வுப் பிரிவினால் தற்போது ISIS பயங்கரவாதம் இலங்கையினுள் பரவுவதைத் தடுப்பதற்காக வழங்கப்பட்டுள்ள ஆலோ சனைகள் யாவையென்பதையும்;

(iii) மேற்படி ஆலோசனைகளைச் செயற்படுத்து வதில் தடைகள் உள்ளனவா என்பதையும்,

(iv) இலங்கையில் ஏதேனும் அரசியல் கட்சி அல்லது அமைப்பு அல்லது அரச சார்பற்ற அமைப்பு ISIS அமைப்புடன் தொடர்பு வைத்திருக்கின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform the House-

(i) whether it is true that Sri Lankans have joined the organization called ISIS, which spreads terrorism for a World Islamic State;

(ii) if so, how many Sri Lankans have been revealed to be fighting for ISIS terrorism at present;

(iii) whether there are persons who have been found to have died fighting in this way; and

(iv) if so, how many have so died, what their names are and within which countries they have died?

(b) Will he also inform the House-

(i) whether it is true that the ISIS has envisaged Sri Lanka as a battleground of theirs for the year 2020, according to the plans prepared on their expansion;

(ii) what instructions have been given by the state intelligence sections to counter the spread of the ISIS terrorism in Sri Lanka;

(iii) whether there exist barriers to the implementation of such instructions; and

(iv) whether any political party, organization or a non-governmental organization in Sri Lanka maintains links with the ISIS?

(c) If not, why?

ගරු නියෝජ්‍ය කථානායකතුමා

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

Hon. Minister, you can table the Answer.

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

Sir, actually, I do not want to table the Answer either. Since this Question has a bearing on the national security and public safety, I would seek your approval to refrain from replying. But, if the Member or any other Member in this House wishes to have more information pertaining to what is in the Question, I am happy to speak to them outside the House.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ අසනු ලබන ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාට එල්ල වූ ප්‍රහාරය
மலேசியாவில் இலங்கை உயர்ஸ்தானிகர் மீதான தாக்குதல்
ATTACK ON SRI LANKAN HIGH COMMISSIONER IN MALAYSIA

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ ගරු අග්‍රාමාත්‍යතුමා වෙත මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ICAPP - International Conference of Asian Political Parties - කියන සංවිධානයේ නවවන සැසිවාරය පසු ගිය සැප්තැම්බර් මස 1වන දින සිට 4වන දින දක්වා මලයාසියාවේ ක්වාලාලම්පූර් නුවරදී පැවත්විණ. එම සම්මේලනයේ විශේෂ දේශනයක් සඳහා ශ්‍රී ලංකාවේ පස්වන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටද, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ඒකාබද්ධ විපක්ෂය, මහජන එක්සත් පෙරමුණ යන පක්ෂවලටද ආරාධනය කර තිබුණු බව ඔබතුමා දන්නවා ඇත.

1. මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා වශයෙන් ඉබ්රහිම් අන්සාර් මහතා - a career Diplomat who is our High Commissioner in Malaysia - කටයුතු කරන බවත්, එතුමාට හා එතුමාගේ නිලධාරීන්ට මැලේසියාවේ ක්වාලාලම්පූර් නුවර ගුවන් තොටුපළේදී අන්තවාදී කොටි හිතවාදීන් පිරිසක් විසින් පහරදී තුවාල සිදු කළ බවත්, එමගින් අප කණ්ඩායමට රාජ්‍යතාන්ත්‍රිකව හිමිවිය යුතු ආරක්ෂාව අහිමිවීම අප රටේ ගෞරවයට හානියක් බවත් ඔබතුමා පිළිගන්නේද? 2016.09.03වන දින අමාත්‍ය දයා ගමගේ, නියෝජ්‍ය අමාත්‍ය අනෝමා ගමගේ, ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක දිනේෂ් ගුණවර්ධන ඇතුළු නියෝජිතයන් ශ්‍රී ලංකාවට පිටත් වීම සඳහා ගුවන් තොටුපළේ අධි ආරක්ෂක කලාපයට පැමිණි අවස්ථාවේ මහ කොමසාරිස්වරයා සහ නිලධාරීන් ඔවුන්ගේ රාජකාරි ඉටු කරදීමට පැමිණ සිටියා. ඒ අවස්ථාවේ වුණු සිදුවීමෙන් හානියට පත්කර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ගෞරවය හා රාජ්‍යතාන්ත්‍රිකභාවය බව පිළිගන්නේද?

   ඒකාබද්ධ විපක්ෂය එම සිදුවීම හෙළා දකින බව ඉතා පැහැදිලිව මුලින්ම ප්‍රකාශ කර සිටියා. පසුව රජය විසින්ද මේ පිළිබඳව ප්‍රකාශයක් නිකුත් කර තිබෙනවා.

2. ශ්‍රී ලංකාවේ 5වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා එම සමුළුවට සහභාගි වීම, සමුළුව ඇමතීම සහ නියෝජිත පිරිස් හමුවීම වැළැක්වීමට උත්සාහ කිරීම, අවහිර කිරීම, තර්ජනය කිරීම හා කොටි කොඩිය පෙන්වමින් ඉතා අමානුෂික ප්‍රකාශ කරමින් කටයුතු කිරීම සිද්ධ වුණේ රාජ්‍ය ආරක්ෂාව මෙහෙයවන වැරදි ක්‍රමය නිසා බවත් පිළිගන්නේද? එය නිවැරදි කිරීමට රජය දැන්වත් අවධානය යොමු කරන්නේද?

   නියෝජිතයකු හැටියට මමත් ඒ සමුළුවට සහභාගි වුණා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එම සැසි වාරය ඇමතීමට පැමිණි අවස්ථාවේ එම සම්මේලනය පැවති ස්ථානයේ දොරකඩ අසල සිට කොටි අන්තවාදීන් සුළු පිරිසක් අශීලාචාර වචන ප්‍රකාශ කරමින් ඇති කළ තත්ත්වය, එම ජාත්‍යන්තර සමුළුවට සහභාගි වූ ආගන්තුක රටක් වූ ශ්‍රී ලංකාවට, අපේ ගෞරවයට මහත් අවමානයක් වුණා.

   පසු ගිය වසර දෙකකට පෙර ICAPP අටවැනි සම්මේලන වාරය පැවැත්වූයේ ශ්‍රී ලංකාවේදී. ඒ අවස්ථාවේදී මෙවැනි කිසිදු තත්ත්වයක් ඇති නොවුණු බව මෙම සමුළුවට සෑම රටකින්ම පැමිණි නියෝජිතයන් සඳහන් කළා.

   ගරු අගමැතිතුමනි, ඒ වාගේම, යම් පිරිසක් සෙන්තුල් විහාරයට ගොස් විහාරාධිපති ස්වාමීන් වහන්සේට පහර දීමේ අමානුෂික ක්‍රියාව ගැන ශ්‍රී ලංකා රජය නිහඬ ඇයි? - [*Interruption.*] Yes, I am just deviating a little from the script. ගරු අගමැතිතුමා මෙවාට පිළිතුරු ලබා දෙයි. ඒ නිසා සභානායකතුමා කලබල වෙන්න එපා. අපේ රට පිළිබඳ ප්‍රශ්නයක් අපි අහන්නේ.

3. මෙවැනි පිළිවෙත් නිවැරැදි කිරීමට රජය කටයුතු කරනවාද සහ ශ්‍රී ලංකාව හා මැලේසියාවේ මිත්‍රත්වයට හානි පමුණුවන ඉහත සියලු සිදුවීම් ගැන රජය ගන්නා වූ ක්‍රියා මාර්ග මොනවාද කියන කරුණු මා ගරු අගමැතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

   ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ සිට ජාත්‍යන්තර හා දේශීය ජන මාධ්‍යවල සිරස්තල ප්‍රවෘත්තිය මෙයයි.

I am not deviating.

The headline of yesterday's “The Island” newspaper states, I quote:

“Lankan HC in Malaysia assaulted.”

2016.09.05වැනි දින "දිවයින" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා.

"මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ඩයස්පෝරා ප්‍රහාරයකින් රෝහලේ".

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Deputy Speaker, just give me a second, because all of us have been party to the ICAPP. I am only pinpointing the extreme group of the LTTE who was behaving like this. Even the Malaysian Government sometimes could be helpless. So, that is the point to which I want to draw the attention of all the Hon. Members and all political parties in this House.

Then, today's "Daily Mirror" newspaper states, I quote:

Attack on Sri Lankan Envoy : Five arrested."

It does not give any information as to who has been arrested.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016 සැප්තැම්බර් මස 06 වැනි දා "දිවයින" පුවත් පතේ ප්‍රධාන සිරස්තලය යටතේ තිබෙනවා, "මැලේසියානු මහ කොමසාරිස්ගෙන් කරුණු විමසයි" කියලා. රජය කරුණු අහලා තිබෙනවා. ඊළඟට, එදිනම "ලක්බිම" පුවත් පත වාර්තා කරනවා, "ලංකාවේ කොමසාරිස්ට අමාත්‍යාංශයෙන් කැඳවීමක්" කියලා. ඒ වාගේම, මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්ට පහර දුන් පින්තූර අද පුවත් පත්වල මුල් පිටුවල පළ වෙනවා. ගරු අගමැතිතුමනි, පහර දුන් ආකාරය ජනමාධ්‍යය පළ කරළා තිබෙනවා. විවෘත ප්‍රදේශයේ නොවෙයි ගුවන් තොටුපොළේ අභ්‍යන්තර ප්‍රදේශයට ඇතුළු වී තමයි මෙය සිදු කර තිබෙන්නේ. මේ විධියට අපේ තානාපතිවරයෙකුට පහර දෙන්නට කොටි ත්‍රස්තවාදීන් - There is an international convention; you would accept that all the diplomatic personnel have to be protected.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජීවිතයට හානි කරන බවට වචන පාවිච්චි කරමින් පැමිණි මේ කණ්ඩායම ඉතා පැහැදිලිව එල්ටීටීඊ කොටි ත්‍රස්තවාදී කණ්ඩායමක අතකොළුවක් බව පෙනී යනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව රජය මෙලෙස අඩුවෙන් කටයුතු කරන්නේ ඇයි කියන ප්‍රශ්නය ඉතාම ඕනෑකමින් මම මේ අවස්ථාවේදී අගමැතිතුමා වෙත යොමු කරනවා.

I do not blame the Malaysian Government. They had done whatever was possible after the incident took place. Their security personnel moved in to give protection to His Excellency Mahinda Rajapaksa. But, what has our Government done? This is what should be answered, Hon. Prime Minister.

Thank you.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කළා. විශේෂයෙන්ම 2016 සැප්තැම්බර් 04වැනි දින මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ඊඛ්‍රාහිම් අන්සාර් මහතාට එල්ල වූ ප්‍රහාරය ශ්‍රී ලංකා රජය තරයේ හෙළා දකින බව අමුතුවෙන් කියන්නට වුවමනා නැහැ. මම ඒ ගැන ක්‍රියා කළා. මම ඒ වෙලාවේම අපේ වැඩ බලන විදේශ ඇමතිතුමාට නියෝග දුන්නා, මෙරට මැලේසියා මහ කොමසාරිස්ව එදින උදේම කැඳවලා මේ සිද්ධිය ගැන අපේ අප්‍රසාදය ප්‍රකාශ කරන්නට කියලා.

අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ රජයේ යුතුකම තමයි අපේ මන්ත්‍රීතුමන්ලාට, ඇමතිතුමන්ලාට සහ අනෙක් අයට විදේශ ගමන්වලදී වුවමනා කරන පහසුකම් සලසා දීම.

මා විශේෂයෙන්ම මන්ත්‍රීවරයකු පිට රටකට යනවා නම්, ඒ අයට සැලකිය යුතු ආකාරය කුමක්ද කියලා සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම ඇමතිවරුන්ට, හිටපු අගමැතිවරුන්ට, හිටපු ජනාධිපතිවරුන්ට, ඒ සියලු දෙනාටම පිට රටකට යනවා නම් සැලකිය යුතු ආකාරය කුමක්ද කියලා සඳහන් කර තිබෙනවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මැලේසියාවට ගිය අවස්ථාවේත්, වෙනත් රටවලට ගිය අවස්ථාවලත් හිටපු ජනාධිපතිතුමකු හැටියට එතුමාට ලබා දිය හැකි සෑම පහසුකමක්ම ලබා දී තිබෙනවා. වාහන ලබා දී තිබෙනවා. එහෙත් ආරක්ෂාව සම්බන්ධයෙන් කියනවා නම්, ඇත්ත වශයෙන්ම මා ගියත්, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගියත්, වෙන කවුරු ගියත් අපි යන විදේශ රටෙන් ආරක්ෂාව ඉල්ලන්න පුළුවන්. අපි යවන අයත් එක්ක අපට පොලීසිය යවන්න බැහැ. අපි එක්ක පොලීසිය ගියත්, අවි ආයුධ ගෙනියන්න බැහැ. එම රටවල ආරක්ෂාව භාර ඒ ඒ රටවලටයි. ඒ අනුවයි අපි ක්‍රියා කළේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ජපානයේ ගියත්, මෙහෙ සිටියත්, කොරියාවේ ගියත්, හිටපු ජනාධිපතිවරයකු හැටියට දිය යුතු හැම ආධාරයක්ම අප ලබා දී තිබෙනවා. ඒක අඩු කරලා නැහැ. එතුමාටත්, චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිතුමියටත් ඒ සැලකිලි සියල්ලම අප ලබා දී තිබෙනවා.

මේ සිද්ධිය පිළිබඳව කියන විට, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා විශේෂයෙන්ම ආසියානු දේශපාලන පක්ෂ සම්මේලනයේ හිටපු සභාපතිවරයෙක්. එම නිසා මෙම සම්මේලනයට සහභාගි වන සියලු දෙනාටම වුවමනා ආධාර ලබා දෙන්නටය කියා අප මහ කොමසාරිස්තුමාට දැනුම් දුන්නා. මහ කොමසාරිස්තුමා ඒක දැන්වුවා. ඒ අවස්ථාවේ විශේෂයෙන්ම ක්වාලාලම්පූර් නගරයේ දී ඒ විහාරස්ථානයේත්, ඒ සම්මන්ත්‍රණය පැවැති ශාලාව ඉදිරිපිටත් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පැමිණීම ගැන විරෝධය ප්‍රකාශ කරමින් සිද්ධින් ගණනාවක් සිදු වුණා. මේ සිද්ධිය ඇති වුණේ, දයා ගමගේ ඇමතිතුමාත්, අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමියත්, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් සමඟ මහ කොමසාරිස්තුමා ගුවන් තොටුපළට ගිය අවස්ථාවේ දීයි. ඒ අවස්ථාවේ දී ඇත්ත වශයෙන්ම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එතැන හිටියේත් නැහැ. ඒ අවස්ථාවේ එතැන සිටියේ මේ අය පමණයි. අපේ මහ කොමසාරිස්තුමාට මුහුණ දෙන්නට සිදු වූ මේ සිද්ධිය සම්බන්ධයෙන් මැලේසියාවේ ආණ්ඩුවටත් වගකීමක් තිබෙනවා. අපේ විදේශ තානාපතීන් ආරක්ෂා කිරීමේ වගකීම ලකාවටත් තිබෙනවා. මැලේසියාවේ ආණ්ඩුවටත් ඒ වගකීම තිබෙනවා. විශේෂයෙන් එම සිද්ධිය ගැන මෙතුමාත්, අපේ දයා ගමගේ ඇමතිතුමාත්, අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමියත් කරුණු දන්නවා.

විශේෂයෙන්ම මේ සම්මේලනය සඳහා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් දයා ගමගේ ඇමතිතුමාත්, අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමියත් සිටියා. මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සිටියා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන්නට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සිටියා. ඒක වැදගත් නිසා තමයි එතුමා කුරුණෑගල සම්මේලනයට යන්නේ නැතිව, එතුමා ක්වාලාලම්පූර්වලට ගිහින් - [බාධා කිරීම] මොකද ඔබතුමන්ලා හිනාවෙන්නේ? [බාධා කිරීම්] එච්චර වැදගත් - [බාධා කිරීම්] මම ඔබතුමන්ලාට කියන්නේ, -[බාධා කිරීම්] ඒකාබද්ධ විපක්ෂය කියන සතෙක් නම් ඔය සම්මේලනය නියෝජනය කරන්නේ නැහැ. අපි දන්නවා, නියෝජනය වන පක්ෂ මොනවාද කියලා. ඒකාබද්ධ විපක්ෂයෙන් කියලා ගියා නම්, යන්න ඉඩ දෙන්නේත් නැහැ. එහෙම නම් එළියේ ඉන්න වෙනවා, කෑ ගහපු මිනිස්සු

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

එක්ක. ඒකාබද්ධ විපක්ෂයක් පිළිගෙන නැහැ. මේ ගියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන්නයි. වැදගත් රැස්වීමක් නිසා ඔබතුමන්ලා සමඟ කුරුණෑගල යන්නේ නැතිව එතුමා ක්වාලාලම්පූර් ගියා. ඒක හොඳයි.

අපි කවුරුවත් ඒක වැරැදියි කියන්නේ නැහැ. ඒක හොඳයි. හිටපු සභාපතිවරයකු හැටියට එතුමා පක්ෂය නියෝජනය කරන්න එහේ ගියා. අපේ ජනාධිපතිතුමාත් ඒ ගැන දොස් කියන්නේ නැහැ; මෙතුමන්ලාත් දොස් කියන්නේ නැහැ. එතුමා එහාට ගියාම එතුමාට ආරක්ෂාව සපයන්න ඕනෑ. එම සිද්ධිය අප සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා. මේ ගැන විභාග කරන්න කියා අප කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට දැනට එන ආරංචිවල හැටියට මේකට සම්බන්ධ වෙලා තිබෙන්නේ, "නාම් තමිලර්" - "We Tamils" - "අපි ද්‍රවිඩ" කියන පක්ෂයයි. ඒ පක්ෂය දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවේ තමයි ක්‍රියාත්මක වන්නේ. "නාම් තමිලර් ඉයක්කම් මැලේසියා" කියලා ඒකේ ශාඛාවක් තිබෙනවා. මැලේසියා ශාඛාවේ ඒකට සම්බන්ධ වුණු අය ගැන දැනට කරන විභාගවලින් හෙළි වෙලා තිබෙනවා, ඒ එක්කෙනෙක්වත් ලාංකිකයන් නොවෙයි කියා. ඒ අය හිටපු ලාංකිකයන්වත් නොවෙයි. ලාංකික දෙමව්පියන්ගෙන් පැවතෙන අයවත් නොවෙයි. ඒ හැම එක්කෙනාම ඉන්දියානු පුරවැසියන්ට සම්බන්ධ මැලේසියානු පුරවැසියන්. ඒ අයගේ දෙමවුපියන්, නැත්නම් ඊට ඉස්සර වෙලා පරම්පරාව විශේෂයෙන්ම ඉන්දියාවෙන් ඇවිත් තිබෙන ද්‍රවිඩ අයයි. ලාංකිකයන් නොවෙයි. ඒ ගැන මම මේ ගරු සභාවේ විශේෂයෙන්ම කියන්නට ඕනෑ. අප විශේෂයෙන්ම මැලේසියාවේ කොටි සංවිධානය ගැන සොයා බලනවා. මොකද, මැලේසියාවේ ඉන්න කොටි සංවිධානයේ ශාඛා හුඟක් සම්බන්ධ වෙලා තිබෙන්නේ වෙන කවුරුවත් එක්ක නොවෙයි. කේපී සමඟයි. ඔබතුමන්ලා එක්ක ගිවිසුම් ගැහුවේ, - [බාධා කිරීම] කේපී සමඟයි සම්බන්ධ වෙලා තිබෙන්නේ. අප දන්නා හැටියට මේ කණ්ඩායම මැලේසියාවේ Democratic Action Party - ප්‍රධාන විරුද්ධ පක්ෂ එක්ක සම්බන්ධකමක් තිබෙනවා. DAP එකේ වෙබ් අඩවිය කියන්නේ, “Malaysia must make its membership in the UN Security Council worthwhile by lobbying to pass a resolution to refer Sri Lanka to the International Criminal Court for War Crimes.” කියායි. අන්න ඒ පදනම උඩයි මේ පක්ෂය ක්‍රියා කරන්නේ. සමහර විට ඒ ඡන්ද ගන්න වුවමනා නිසා වෙන්න ඇති. කෙසේ වෙතත්, තවදුරටත් මේ පක්ෂ එක්ක කථා කරලා කරුණු පැහැදිලි කරන්න අපේ කණ්ඩායමක් යවන්නයි අපි හිතාගෙන ඉන්නේ. "මේක නොවෙයි ලංකාවේ සිදු වන්නේ, යුද අපරාධ සඳහා වූ ජාත්‍යන්තර අධිකරණයකට යන්න වුවමනාවක් නැහැ" කියා කරුණු පැහැදිලි කරලා කියන්න අපි බලාපොරොත්තු වෙනවා.

ලංකාව තුළ දීත්, පිටත දීත් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට ආරක්ෂාව සැපයීම ගැන විශේෂයෙන්ම අවධානය යොමු වෙලා තිබෙනවා. එතුමාට හානියක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. එහෙම කරන්න වුවමනාවකුත් නැහැ. එතුමා මේ රටේ ඉන්න ඕනෑ. දේශපාලනයේත් ඉන්න ඕනෑ. එතුමා සිටියා කියා මට නම් කිසිම ප්‍රශ්නයක් නැහැ.

විශේෂයෙන්ම "දිවයින" පුවත් පත "කොටි" කියා සඳහන් කර තිබුණාම මම ඒක බැලුවා. මොකද, "දිවයින" පුවත් පත කොටින් ගැන හොඳට දන්න නිසා.

කොටි ගැන දන්නවා නම්, "දිවයින" පත්තරේට යුතුකමක් තිබෙනවා, අපේ පොලීසියට වහාම දැනුම් දෙන්න නැත්නම් මැලේසියාවේ පොලීසියට දැනුම් දෙන්න. ඇත්ත වශයෙන්ම මේ තර්ජනය තිබෙන නිසා තමයි එය නැති කර ගන්න ලෝකය හිතන්නේ. අපේ ද්‍රවිඩ ජනතාව බොහෝ දෙනෙක් කිව්වා, මේ අය ලංකාවේ අය වෙන්න බැහැ කියා. මොකද, පන්සලකට ගිහින් පහර දෙන්නේ නැහැ කියා. ඉස්සරහට ගිහින් ඕනෑ දෙයක් කියා කෑ ගැහුවාට පන්සලකට ගිහින් ලංකාවේ ස්වාමීන්වහන්සේ නමකට ගහන්නේ නැහැ කියලා. ඒ වෙලාවේදීම මට කිව්වා. මොකද, ඒ අය දන්නවා, විශේෂයෙන්ම අද මේ ආණ්ඩුව සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා එකතු කරන්න හදන බව. පසුව අපි හොයනකොට මට මේ වාර්තාව ආවේ. මෙවැනි ප්‍රශ්න නැති කරන්න අද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව ක්‍රියා කරනවා. දෙමළ ජනතාව එක්ක කථා කරන්න, දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න, ඒ වාගේම මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්න විසඳන්න කටයුතු කරනවා. ඒවා කරන ගමන් හැම කෙනාම ආරක්ෂා කර ගන්න වැඩ කටයුතු කරනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඒ කාරණය මතු කරපු එක හොඳයි. මොකද, මේ ඇවිල්ලා තිබෙන තර්ජනය නැති කර ගන්න තමයි අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, ඒ කියන්නේ ඔබතුමන්ලාගේ නායකතුමා වැඩ කරන්නේ කියන එක මම කියන්න කැමැතියි.

අද තමයි අපේ එක්සත් ජාතික පක්ෂයේ 70 වෙනි සංවත්සරය. එදා ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා කිව්වා "සිංහල හෝ වේවා; දෙමළ හෝ වේවා; මුස්ලිම් හෝ වේවා; මැලේ හෝ වේවා; මේ අපේ රට, මේ අපේ මව්බිම" කියලා. එහෙම කියලා තමයි එදා එක්සත් ජාතික පක්ෂය ආරම්භ කළේ. ඉතින් එක්සත් ජාතික පක්ෂයේ 70 වෙනි සංවත්සරය වෙලාවේ අපිත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ඒ වාගේම විපක්ෂයේ සිටින ද්‍රවිඩ සන්ධානය, ජනතා විමුක්ති පෙරමුණ, විපක්ෂයේ ඉන්න මහජන එක්සත් පෙරමුණ සහ අනික් පක්ෂත් සමඟ එකට එකතු වෙලා මේ ප්‍රශ්න විසඳා ගැනීමට පියවර ගන්නා බව මම කියන්න කැමැතියි.

පිට රට ඉඳගෙන කෑ ගහන්නේ ශ්‍රී ලාංකිකයන්ට සම්බන්ධ ද්‍රවිඩ අය නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ කාරණය දකුණු ඉන්දියාවේ දේශපාලනයේ කොටසක් වෙලා තිබෙනවා. ඒ නිසා අපි දකුණු ඉන්දියාවටත් යන්නයි ඉන්නේ. දකුණු ඉන්දියාවේ ප්‍රාන්තවලට ගිහින් කියන්න ඕනෑ, අපි මේ ප්‍රශ්නය විසඳාගෙන යන බව. දැන් බලන්න, අපි ඉඩම් ආපසු දෙන්න ක්‍රියාකරගෙන යනවා. අපි ශ්‍රී ලාංකීය අනන්‍යතාව ඇති කරන්න ඕනෑ. ඒ විධියට ශ්‍රී ලාංකීය අනන්‍යතාව ඇති කළාම "යුද අපරාධ" කියන තර්ජනය නැති වෙනවා. ඒ අතර, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මැලේසියාවට ගියාම එතැනදී ඇති වුණු සිද්ධිය ගැන අපි දැන් මැලේසියානු ආණ්ඩුවෙන් වාර්තාවක් ඉල්ලනවා. ඒ එක්කම අපේ මහකොමසාරිස්ට තර්ජනය කරලා ගහන්න ගිය පුද්ගලයන් සම්බන්ධයෙනුත් සම්පූර්ණයෙන් නීතිය ක්‍රියාත්මක කළ යුතුයි කියා අපි මැලේසියාවේ ආණ්ඩුවට කියනවා.

ඒත්, මැලේසියාවේ රාජ්‍ය ආරක්ෂාව සැපයීම අපේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ යුතුකම නොවෙයි. මැලේසියාවේ සාමය ආරක්ෂා කිරීම, අපේ නීතිය හා සාමය අමාත්‍යාංශයේ යුතුකමක් නොවෙයි. ඒ දෙකම කරන්න ඕනෑ, ඒ රජයයි. අපි දන්න කරුණු කාරණා හා සාක්ෂි ඒ අයට වුවමනා නම්, ලබා දෙන්න අපි ලෑස්තියි කියලා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්න අසන වෙලාව. දැන් ඔබතුමාත් කථා කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේක අපි හැමෝටම වැදගත් නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාටත් අවස්ථාව දෙන්න වනවා. මොකද, එතුමාගේ ප්‍රශ්නය නිසා. එතකොට අපට අද දවසේ කාලය?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගෙන් පස්සේ විපක්ෂ නායකතුමාත් කථා කරන්න ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මහ කොමසාරිස්තුමා නියෝජනය කරන්නේ අපේ රට. ඒ නිසා මේ පහර දීම සිදු වී තිබෙන්නේ, අපේ රටේ නියෝජනයට. ඒ නිසා මේ මුළු පාර්ලිමේන්තුව විසින්ම එම පහර දීම හෙළා දැකිය යුතුව තිබෙනවා. මැලේසියානු රජය බැඳී සිටිනවා, අපේ මහ කොමසාරිස්තුමාට ආරක්ෂාව දෙන්න. සියලුම රාජ්‍යයන් නියෝජනය කරන මහ කොමසාරිස්වරුන්ට, තානාපතිවරුන්ට ආරක්ෂාව දෙන්න අප බැඳී සිටිනවා වාගේම, ඒ සෑම රටක්ම අපේ මහ කොමසාරිස්තුමන්ලා, අපේ තානාපතිතුමන්ලා ඇතුළු අපේ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ට ආරක්ෂාව දෙන්න බැඳී සිටිනවා. හැබැයි, මෙතැනදී පැහැදිලි ලෙසම මැලේසියානු රජය තමන්ගේ පාර්ශ්වයෙන් එම පිරිසට ලබා දිය යුතු ආරක්ෂාව ලබා නොදී තිබෙනවා. මොකද, ඒ දින වකවානු තුළ පැවැති තත්ත්වය මාධ්‍ය හරහා අපි දැක්කා. මතු වී තිබුණු එවන් තත්ත්වයක් තුළ මැලේසියානු රාජ්‍ය මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබුණා. ඒ නිසා පැහැදිලිවම පෙනෙන්නේ, ඔවුන් ඒ පිළිබඳව අවධානය යොමු කර නැති බවයි.

ඒ කණ්ඩායම ගත්තොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමා කියූ පරිදිම ඔවුන් ශ්‍රී ලාංකිකයන් නොවෙයි. ඒක නිවැරදියි. ඒ වාගේම ඔවුන් අපේ උතුරේ දේශපාලනය - විශේෂයෙන්ම උතුරේ දෙමළ ජනතාවගේ දේශපාලනය- ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයේ කොටසක් බවට පත් කරගෙන තිබෙනවා. හැම විටම උතුරේ මැතිවරණ ඉලක්ක කර ගනිමින්, උතුරේ දේශපාලනය ඉලක්ක කර ගනිමින්, ලංකාවේ ප්‍රශ්නය ඔවුන් උපයෝගී කරගෙන තිබෙනවා. නමුත්, උතුරේ ජීවත්වන දෙමළ ජනතාව ඔවුන්ව අනුගමනය කරන්නේ නැහැ. අපට මතකයි, පසු ගිය ජනාධිපතිවරණයේදී ඔවුන්ගේ ඉල්ලීම වෙලා තිබුණේ කුමක්ද කියලා. පසු ගිය ජනාධිපතිවරණයේදී ඔවුන්ගේ ඉල්ලීම වෙලා තිබුණේ, ඔවුන් වාගේම ලංකාවෙත් ඔවුන් නියෝජනය කරන කුඩා කණ්ඩායමක් හිටියා. ඒ හැම දෙනාගේම ඉල්ලීම බවට පත් වෙලා තිබුණේ, "උතුරේ ජනතාව ඡන්ද වර්ජනය කළ යුතුයි" කියලා. හැබැයි, ඒ අන්තගාමී හඬට උතුරේ ජනතාව ඇහුම් කන් දුන්නේ නැහැ. ඒ නිසා අපි කිසිසේත්ම මෙම අන්තවාදී පිරිසත්, උතුරේ ජනතාවත් කලවම් කර නොගත යුතුයි. බොහෝදුරට උත්සාහයක් දරමින් තිබෙනවා, මේ ප්‍රශ්නය උතුරේ ජනතාවත් එක්ක කලවම් කර ගැනීමක් කරන්න. එය කිසිසේත්ම යුක්තිසහගත නැහැ; සාධාරණ නැහැ. මොකද, ඇස් ඉදිරිපිට අපි අතර ප්‍රබල සාක්ෂියක් තිබෙනවා. ඒ තමයි, පසු ගිය ජනාධිපතිවරණයේදී ඔවුන්ගේ වුවමනාව නොවෙයි, උතුරේ ජනතාව නියෝජනය කළේ. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තැන තැන පැන නඟිමින් තිබෙන,- එය යුරෝපයේ වෙන්න පුළුවන්; වෙනත් රාජ්‍යයන්වල වෙන්න පුළුවන්; මේ පැන නඟිමින් තිබෙන අන්තගාමී ව්‍යාපාරය කිසිසේත්ම ශ්‍රී ලංකා ජනතාව අනුබල දෙන, ආශීර්වාදය දෙන කණ්ඩායම් බවට අපි පත්වීමට ඉඩ කඩ ලබා නොදිය යුතුයි. ඔවුන්ගේ හඬ උතුරේ නියෝජනය කරන ජනයාගේ හඬ බවට පත් වුණොත් තමයි, ඇත්තටම අපේ රට තුළ ප්‍රශ්නයක් මතුවීමට ඉඩ කඩ තිබෙන්නේ. එසේ නොවන තාක් කල්,- ඒ හඬ නිකම් යුරෝපයේ කෑ ගසමින් හිටියා කියලා; තව කොහේ හරි කෑ ගසමින් හිටියා කියලා, ඒක අපේ රටේ ජනතාවගේ හදවත් එක්ක සම්බන්ධ වුණේ නැත්නම්, ඒවා වා තලයට මුසුවෙන හඬවල් විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා අන්තගාමී කණ්ඩායම් විසින් කළ මෙම ප්‍රහාරය දැඩි ලෙස හෙළා දැකිය යුතු අතර, ශ්‍රී ලංකාව තුළ ජීවත් වෙන සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර ගැටුම් ඇති කරන්න, ඒවා වර්ධනය කරගැනීම සඳහා ලෝකය පුරා දියත් වෙමින් තිබෙන මේ සුළුතර අන්තගාමී කණ්ඩායම් රාජ්‍ය තාන්ත්‍රික ලෙස පරාජයට පත් කිරීම සඳහා ආණ්ඩුව විසින් පියවරක් ගත යුතුයි කියන යෝජනාවත් අපිට තිබෙනවා. මේ කරුණු පිළිබඳව අපේ ස්ථාවරය වන්නේ එයයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම ගරු අගමැතිතුමා වෙත,-

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I am sorry, I think Hon. Leader of the Opposition wants to speak.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, the Hon. Leader of the Opposition.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Hon. Deputy Speaker, I would like to say a few words on this matter.

I wish to unreservedly condemn, Sir, the incident which is now being discussed in this House. Quite apart from everything else, any other circumstances that may be relevant, the incident by itself needs to be condemned and I would urge that stringent action must be taken against the offenders. If they are Sri Lankan citizens - it appears to me from the Hon. Prime Minister's statement that they are not - we might even consider whether they should be extradited to this country and charged in this country.

The country is moving towards stability; the country is moving towards harmony and it is my submission that such incidents are unwarranted. Foolish action on the part of some people, who do not quite realize how harmful the consequences of such foolish actions could be, should not be encouraged; but on the contrary, should be discouraged and terminated.

Such people do not realize that they are playing into the hands of people who do not want stability in Sri Lanka, who want the country to be destabilized and to be in a state of tension, with the possibility of a conflict emerging at any moment. People who have such intentions have such intentions only in their self political interest and not in the interest of this country. I do not think anyone should be so foolish as to play into the hands of these people.

So, we would urge the Government to ensure that stringent action is taken against the offenders and the stability that prevails in this country is not in any way disturbed.

Thank you, Sir.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මෙම සිද්ධිය සම්බන්ධයෙන් පක්ෂ කිහිපයකම නායකයන් මේ ගරු සභාවේදී අදහස් ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම අද අපි ආණ්ඩුවක් හැටියට මේවාට ඉඩ තියන්නේ නැහැ. මම ඉතාම සතුටින් මතක් කරනවා, සියලු ජන කොටස්වලට; සියලු ආගම්වලට; සියලු ජනතාවට එකට ඉන්න පුළුවන් දේශපාලන පක්ෂයක් හදලා අදට අවුරුදු 70ක් වන බව. ඒ අභිමානවත් දේශපාලන පක්ෂය අද බලයේ ඉන්න අවස්ථාවේදී, මෙවැනි දේවල් සිදු වෙන්න ඉදිරියේදී ඉඩ තියන්නේ නැහැයි කියලා මම ප්‍රකාශ කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය රජය පැවැති කාලයේ අපේ මහ කොමසාරිස් ක්‍රිස් නෝනිස් මහතාට නිව්යෝර්ක්වලදී පහර දුන්නා. ඒක දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට මතක ඇති. [බාධා කිරීම්] තමුන්නාන්සේලා මොකක්ද කළේ? [බාධා කිරීම්] මොකක්ද කළේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Dinesh Gunawardena, please.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, this has been raised by the Hon. Dinesh Gunawardena under Standing Order No. 23 (2). So, let him speak.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අගමැතිතුමා වෙත යොමු කළේ ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. ගරු අගමැතිතුමා එවැනි පහත් කථාවන් කියන්නේ නැතිව පිළිතුරු දීම ගැන අපි අගය කරනවා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සජින් ද වාස් ගුණවර්ධන මැතිතුමායි, ක්‍රිස් නෝනිස් මහ කොමසාරිස්තුමායි අතර මෙවැනි ප්‍රශ්නයක් ඇති වුණේ රාත්‍රී භෝජන සංග්‍රහයකදී, ඒ අය විවිධ දේවල් පානය කිරීමෙන් පසුවයි. ඒ සිදුවීම නොදන්නා පාර්ලිමේන්තුවේ සභානායකතුමා ගැන මම කනගාටු වනවා. එහිදී ඇති වූ තත්ත්වයට මේ වැදගත් ICAPP එක සමාන කරන්න බැහැ. එය කොළඹදී මෙහෙයවීමේ වගකීමක් ඔබතුමා යටතේ තිබුණා. - [*Interruption.*] Let me explain. Mr. Sajin De Vass Gunawardena is an SLFP Organizer of the Government today. You are condemning your own people. Perhaps you do not know. මේ වගකීමක් නැති කථා කීම පාරා වළල්ලක් වාගේයි. නමුත්, අපි කථා කරමින් හිටියේ මේකේ බරපතළකමයි.

I do not want to make a long statement. Hon. Leader of the Opposition also condemned this. It was very clear that the attempt was on the former President Mahinda Rajapaksa's life. I was there and I heard what was uttered. I do not want to repeat what was said there in this House. The Hon. Prime Minister is aware of this and the Hon. Lady Deputy Minister is also aware of this. They were chasing after the Hon. Mahinda Rajapaksa when he went to the temple, when he went to the hotel and everywhere he went. So, you should not at all undermine what happened to him in Kuala Lumpur. It is true that the Malaysian authorities gave whatever possible assistance. But, the problem was Hon. Mahinda Rajapaksa's security personnel was not given permission by our country's security establishment to go with him. This is the key issue which should be addressed by the Hon. Prime

Minister. I am not making any reference to any other person. The Hon. Prime Minister should get involved in this because it is for defeating the LTTE, Hon. Mahinda Rajapaksa is being hunted in this manner. I use the word, "hunt", Hon. Leader of the Opposition. All of us today enjoy freedom because the LTTE was defeated and it is up to all of us to defend the Hon. Mahinda Rajapaksa and give him all the security needed irrespective of political views.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ ටික කිව්වේ ඇයි? එහිදී කියපු කතන්දර ඇහුවා නම්, එහිදී කියපු වචන ඇහුවා නම්, ඔවුන්ට යම්කිසි දොරටුවකින් ඇතුළු වන්න ලැබුණා නම් සිදු වන දේවල් අද කවුරුත් සුදු හුණු ගාන්න හදමින් කියන දේවල් නොව, ඊට වඩා බරපතළ දේවල්. ඒ නිසා, ආණ්ඩුවක් හැටියට වගකීමෙන් කටයුතු කළ යුතුයි. හිටපු ජනාධිපතිවරුන් ලෙස කටයුතු කළ අපගේ රාජ්‍ය නායකයන් සියලු දෙනාට පාර්ලිමේන්තු පනතකින් අනුමත කර දී තිබෙන පිළිගැනීම රජයක් හැටියට වගකීමෙන් යුතුව ආරක්ෂා කළ යුතුයි. It is the office of the ex-President that has to be recognized. Give special security to a person who is a target. Please understand, he is a target. That is why, the Hon. Prime Minister should give his attention to provide the necessary security.

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය (බනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (டாக்டர்) (திருமதி) அனோமா கமகே - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Anoma Gamage - Deputy Minister of Petroleum Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ICAPP එකට දයා ගමගේ අමාත්‍යතුමාත්, මමත් සහභාගි වුණා. හිටපු ජනාධිපතිතුමාට විරුද්ධව ඒ උද්ඝෝෂණය ගෙන ගිය වෙලාවේ World Trade Centre එක ඉදිරිපිට විශේෂයෙන් ලොකු ආරක්ෂාවක් දී තිබුණා, හැම කෙනාටම ඇතුළට එන්න බැරි වන විධියට. මා හිතනවා, 100කට වැඩි පිරිසක් ආරක්ෂාවට සිටියා කියා. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා නම් මා දකින්න නැතිව ඇති. මම එළියටත් ගිහින් බැලුවා. 100කට වැඩි පිරිසක් ආරක්ෂාව සඳහා ඒ රජයෙන් දී තිබුණා. දෙවන දවසේත් ඒ වාගේම ආරක්ෂාවක් දී තිබුණා. දෙවන දවසේ හිටපු ජනාධිපතිතුමා පැමිණියේ නැහැ. මහ කොමසාරිස්තුමාගේ නිවසේ රාත්‍රී භෝජන සංග්‍රහයක් තිබුණා. එදාත් ඒ වාගේම ආරක්ෂාවක් දී තිබුණා. හැබැයි මා හිතන විධියට, පසුව දා උදේ ගුවන් තොටු පොළට යද්දී හිටපු ජනාධිපතිතුමා ගියේ නැති නිසාත්, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, මාත්, දයා ගමගේ අමාත්‍යතුමාත් විතරක් යෑම ලොකුවට ගණන් ගත්තේ නැති නිසාත් තමයි මහ කොමසාරිස්තුමා ආරක්ෂාව ඉල්ලුවේ නැත්තේ. ඒ රටින් ආරක්ෂාව දුන්නා කියා මම හිතනවා. අපි හිතුවේ නැහැ ඒ තරම් ලොකුවට දෙයක් වේවි කියා. හිටපු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව නම් බොහෝ දුරට ඒ රටින් දී තිබුණා. මා මේ ගරු සභාවේදී එය කියන්න ඕනෑ. මොකද, ඇත්තටම ඒ රජය ඒ ගැන සැලකිලිමත් වෙලා තිබුණා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමා එන්න කලින් දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන් ඇහුවා, "නෝනිස් මහත්මයාට පහර දුන් වෙලාවේ ආණ්ඩුව මොකක්ද කළේ?" කියා. [බාධා කිරීම්] මහ කොමසාරිස්තුමා. [බාධා කිරීම්] ඒක වුණේ- [බාධා කිරීම්]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා ප්‍රකාශ කළ පරිදි හිටපු ජනාධිපතිතුමාට විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලබා දිය යුතු සියලු සැලකිලි අපි ලබා දෙනවා. එතුමා ඒක හොඳින් දන්නවා. අගමැතිතුමා ඒක පැහැදිලි කළා. අපේ අමාත්‍යාංශය එයට බැඳී ඉන්නවා. මෙතැනදී අපේ මහකොමසාරිස්තුමාට තමයි ඒ අවශ්‍ය ආරක්ෂාව - security එක- ලැබුණේ නැත්තේ. ඒ පිළිබඳව මැලේසියානු මහකොමසාරිස්තුමා අපේ අමාත්‍යාංශයට කැඳවා ඇසල වීරකෝන් ලේකම්තුමා ඔහු සමඟ සාකච්ඡාවක් පැවැත්වුවා. ඔවුන් දැඩි සේ කනගාටුව පළ කළා. ඒ අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න ඔවුන් පොරොන්දු වුණා. ඉදිරියේදී මේ ප්‍රශ්නය ඇති නොවන විධියට මැලේසියානු රජය වග බලා ගන්නවා ඇති කියලා අපි විශ්වාස කරනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක කාරණයක් කියන්න මට අවස්ථාව දෙන්න.

හිටපු ජනාධිපතිතුමා ජපානයට යන කොට තානාපති කාර්යාලයට කියලා තිබුණා කිසිම අවශ්‍ය සත්කාරයක් කරන්න එපායි කියලා. [බාධා කිරීම්] ඒ, ඔබතුමා නොවෙයි. විදේශ කටයුතු අමාත්‍යාංශය. ඒ නිසා මෙතැනදී ඔක්කෝම ඇඳා ගන්නා උත්සාහයක් දරන්නේ නැහැ. නමුත්, හිටපු ජනාධිපතිතුමා මැලේසියාවට යන කොට ඔබතුමන්ලා විදේශ කටයුතු අමාත්‍යාංශය භාරව ඉන්නා අය හැටියට හොඳින් දන්නවා එය බරපතළ තත්ත්වයක් බව. අනෙක් රටවල් වාගේ නොවෙයි. අපි මේවා කථා කරන්න අවශ්‍ය නැහැ. ගරු අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමියනි, මම හිටියා, මෙතුමා හිටියා. ගුවන් තොටුපොළේ තානාපතිතුමාගෙන් ඇවිල්ලා ඇහුවේ අනෝමා ගමගේ ඉන්නවා ද කියලා නොවෙයි, දිනේෂ් ගුණවර්ධන ඉන්නවාද කියලා නොවෙයි. ඒ ගුවන් යානයට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ එන්නේ නැති බව ඒ ගුවන් යානයේ වාර්තාවල තිබියදීත් මහකොමසාරිස්ට තර්ජනය කළේ, "රාජපක්ෂ ඇතුළේ ඉන්නවාද?" කියලා අහලයි. ඒ නිසා නොදන්නා දේවල් හොයා ගන්න ඕනෑ නම් හරියාකාරව පරීක්ෂණයක් කරන්න.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු විපක්ෂ නායකතුමාගේ කථාවට මා සවන් දුන්නා. ඇත්තටම එතුමාට ස්තුතිවන්ත වෙනවා එතුමා කථා කරපු විධිය ගැන. ඒ වාගේම "ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කියපු කටිටිය කියන කථා අපි ඒ තරම් ගණන් ගන්නේ නැහැ. හැබැයි, අපි මේ වෙලාවේ ගරු අගමැතිතුමාගෙන් බලාපොරොත්තු වුණේ දේශපාලන කථාවක් නොවෙයි.

[ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා]

මොකද, මේ තත්ත්වය ඉතාම භයානකයි. දැන් එතුමන්ලාගෙන් අසන්න තිබෙන්නේ, "සතුටුයිද, දැන්?" කියලා තමයි. [බාධා කිරීම්] "සතුටුයිද, දැන්?" කියලා තමයි අහන්න තිබෙන්නේ. මොකද, - [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලබා දුන් අවස්ථාවට ස්තුතියි.

මට කරුණු දෙකක් නිරාකරණය කර ගැනීමට වුවමනායි. පළමුවැනි කරුණ මා යොමු කරන්නේ මෙම විවාදයට අදාළවයි. මෙම විවාදයට අදාළ නොවන ආකාරයට කථා කරන කිරිඇල්ල මැතිතුමා ගැන නොවෙයි, මා මේ කියන්නේ. කොටි සංවිධානයේ කොඩියක් ප්‍රදර්ශනය කරමින් කණ්ඩායමකට උද්ඝෝෂණය කිරීමට මැලේසියාවේ අවසරය තිබෙනවාද? [බාධා කිරීම්] ඉන්න කෝ. එසේ අවසරයක් තිබෙනවාද කියා අපේ විදේශ කටයුතු අංශයෙන් මම අහන්නේ. [බාධා කිරීම්] ඒ ගැන විදේශ කටයුතු අංශයෙන් දැන ගන්න ඕනෑ. එවැනි අවසරයක් තිබෙනවාද? ඒ ගැනයි මම අහන්නේ. [බාධා කිරීම්] එහෙම නොවෙයි නම්, කොටි කොඩිය ප්‍රදර්ශනය කර ගෙන උද්ඝෝෂණය කරපු උද්ඝෝෂකයන් එවෙලාවේ අත් අඩංගුවට ගත්තේ නැත්තේ ඇයි? ඒවා හොයා ගන්න ඕනෑ. [බාධා කිරීම්]ඒවා හොයා ගන්න ඕනෑ.

මට නිරාකරණය කර ගැනීමට තිබෙන දෙවැනි කරුණ මෙයයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Mr. Deputy Speaker -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Prime Minister.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අගමැතිතුමනි, මගේ කරුණු ඉදිරිපත් කර අවසන් වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වාසුදේව මැතිතුමනි, ඔබතුමාගේ අවසන් කරුණත් ඉදිරිපත් කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව එක කරුණක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. මේ ආණ්ඩුවට ලොකු යුතුකමක් තිබෙනවා, මේ වාගේ සිද්ධියක් වුණාම. එහිදී ඉලක්ක කර ගත්තේ හිටපු ජනාධිපතිතුමා වුණාම, මේ සභාවේ මන්ත්‍රීවරයෙකු වුණාම ඒ පිළිබඳව මේ ආණ්ඩුව විශේෂයෙන්ම ගත්තා වූ ක්‍රියාදාමය කුමක්ද කියා සඳහන් කළ යුතුයි. පළමුව ආරක්ෂාව ලබා දීම සම්බන්ධවත්, දෙවනුව සිද්ධියෙන් පසුව ගත් ක්‍රියාදාමය පිළිබඳවත් මේ සභාව ඉදිරියේ කරුණු දක්වා නැහැ. නිකම් හිස්, සාමාන්‍ය, පොදු වචන විතරයි කිව්වේ. ඒ ගත්තා වූ පියවර සම්බන්ධව තීරණාත්මක වශයෙන් විස්තර කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට ප්‍රකාශයක් කරන්න ඕනෑ නම් ඊට පසුව මා කථා කරන්නම්. [සෝෂා කිරීම්]

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
අවශ්‍ය නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
හොඳයි. එතුමා මට මේ කාරණාව ගැන කිව්වා. මම නැවතත් මේ ගරු සභාවේදී කියන්න ඕනෑ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව ගැන ආණ්ඩුව කැප වෙලා සිටිනවාය කියන බව. මොකක් හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. මේ ගරු සභාව නියෝජනය කරන හැම මන්ත්‍රීවරයෙකුටම, හිටපු ජනාධිපතිතුමාට, හිටපු ජනාධිපතිතුමියට අවශ්‍ය කරන ආරක්ෂාව අප සලසා දී තිබෙනවා. ඒවා අපේ යුතුකම්.

අපේ ආරක්ෂක බලවේග යොදවලා අපට ඒ වැඩ කටයුත්ත කරන්න පුළුවන් වන්නේ, ශ්‍රී ලංකා දේශය තුළ පමණයි. ඒකෙන් කියන්නේ ඒ සිදුවීම අමතක කරනවා කියන එක නොවෙයි. වෙනත් රටකට ගියාම ඒ රටෙන් අපි ඉල්ලන්න තිබෙනවා, අදාළ ආරක්ෂාව සලසලා දෙන්න කියලා. මම විදේශයකට ගියත් එහෙමයි. මම මේ සැරේ සිංගප්පූරුවට ගියාම මගේ ආරක්ෂක නිලධාරීන් දෙන්නෙක් ගියා. එහෙත්, ඒ අයට ගිනි අවි ගෙන යන්න බැහැ. ඒ අවස්ථාවේදී එතැන බලාගෙන ඉන්න එක විතරයි කරන්න පුළුවන්. ඒ ඇරෙන්න වෙනත් ආරක්ෂාවක් කරන්න බැහැ. ලංකාවේ ඉඳන් බල ඇණියක් යවන්න බැහැ, ජනාධිපතිතුමා ආරක්ෂා කරන්න; හිටපු ජනාධිපතිතුමාව ආරක්ෂා කරන්න හෝ වෙන කවුරුවත් ආරක්ෂා කරන්න. [බාධා කිරීම්] මම ඔබතුමා කියන දේ අහගෙන හිටියා නේ. විපක්ෂයේ වුණත්, ආණ්ඩු පක්ෂයේ වුණත් මන්ත්‍රීවරයෙක් ගියාම ඒ අයට සලකන්න ඕනෑ. ඒ යුතුකම කරන්න තිබෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ විපක්ෂ නායකතුමා හැටියට මම විදේශ රටවලට ගියාම මට ඒ සැලකීම ඒ තානාපති කාර්යාලවලින් ලබා දුන්නා. ඒ ටික අපි කරන්න ඕනෑ. ඒ ටික අපි කරගෙන යනවා.

එතැනදී වුණු සිද්ධිය මේකයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව එතැන උද්ඝෝෂණයක් ගෙන ගියා. එතැනදී ගත්ත ආරක්ෂක පියවර මොකක්ද? අන්න, ඒක කියන්න පුළුවන් වන්නේ මැලේසියානු ආණ්ඩුවට පමණයි. පන්සලේ සිද්ධියක් ඇති වුණා. තව සිද්ධියක් ගුවන් තොටු පොළේදි වුණා. අපි මැලේසියානු ආණ්ඩුවෙන් මේ ගැන කරුණු ඉල්ලලා තිබෙනවා. කොටි කොඩි දාගෙන යන එක සමහර විට ඒ ආණ්ඩුවට ඒ වෙලාවේම නවත්වන්න බැහැ. ඒ අය එතැන හැප්පීමකට, ලේ වැගිරීමකට යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගොල්ලන් එංගලන්තයේ පාර්ලිමේන්තුව - House of Commons - සුමානයක් වට කරගෙන හිටියා. එතැන කොටි කොඩි ගලවන්න ගියේ නැහැ. එහෙත්, එයින් පිට යන්න ඉඩ දුන්නේත් නැහැ. මම ඒක දැක්කා. ඒ කාලයේ මටත් විශේෂ පොලිස් ආරක්ෂාවක් සලසලා තිබුණා, පාර්ලිමේන්තුවට යන්න.

අනෙක මැලේසියානු දේශපාලනයේ, ''ඩිමොක්‍රටික් ඇක්ෂන්'' පක්ෂයත් මේකට සම්බන්ධ කණ්ඩායමක්. ඒ පක්ෂයේ මතය වන්නේත්, "යුද අපරාධ චෝදනා තිබෙන්න ඕනෑ" කියලා. අපි කාගේවත් ඒ මතය නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශේෂයෙන්ම බලන්න ඕනෑ, එතැනදී මහ කොමසාරිස්තුමා සම්බන්ධ සිද්ධිය මොකක්ද කියා. මම මේ ගැන කරුණු දෙකක් කියන්න කැමැතියි. එකක් මැලේසියානු ආණ්ඩුව කරන ප්‍රකාශය. මම ඒක කියවන්නම්. මොකද, මෙතැනදී බැන්නේ අපේ ආණ්ඩුවට. හැබැයි, මැලේසියානු ආණ්ඩුවට හොඳ කිව්වා.

> "Incident Involving the High Commissioner of Sri Lanka to Malaysia and a group of protestors, 4th September 2016
>
> "The Government of Malaysia regrets the incident involving the High Commissioner of Sri Lanka to Malaysia, His Excellency Ibrahim Ansar, and a group of protestors on 4th September 2016 at the Kuala Lumpur International Airport. The incident caused minor injuries to the High Commissioner.
>
> The Government of Malaysia expresses its sympathies to His Excellency Ibrahim Ansar and gives the assurance that the Malaysian authorities will investigate the incident and bring those responsible to justice.
>
> The Ministry of Foreign Affairs of Malaysia will continue to work closely with the High Commission of Sri Lanka in Kuala Lumpur to ensure that similar incidents will not occur in the future."

ඒ, මැලේසියාවේ විදේශ අමාත්‍යාංශයෙන් කර තිබෙන ප්‍රකාශයයි.

මා තව එක කාරණයක් කියන්න කැමැතියි. අපේ ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිනියක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, අපේ හිටපු ඇමතිතුමෙක්, ඒ වාගේම හිටපු ජනාධිපතිවරයාත් ඒ රටේ ඉන්න අවස්ථාවේදී මෙවැනි සිද්ධියක් ඇති වුණාම ඒ ගැන විවිධ මාධ්‍යවලින් වාර්තා කරනවා. මාධ්‍යයෙන් ඒවා වාර්තා කරන්නට වෙනවා. එහෙම වාර්තා කරන අවස්ථාවලදී සමහරවිට මෙය පෙන්වන්නේ, "කොටියෙක් ගැහුවා, හාමුදුරුවන්ටත් ගැහුවා " කියලායි. ඒ මේක ගිනි තියන්න. බෙරුවල නියෝජනය කරන මන්ත්‍රීතුමා දන්නවා, කොහොමද මීට ඉස්සෙල්ලා ඒ ගොල්ලෝ බෙරුවල ගිනි තිබ්බේ කියන එක. ඒ ගැන අමුතුවෙන් කියන්න වුවමනා නැහැ. ඒ නිසා මම මාධ්‍යයට කියනවා, මීට වඩා වගකීමකින් ක්‍රියා කරන්නය කියා. මේ ගැන අපිත් සොයා බලන්නම්.

අනෙක, මැලේසියාවේ ජනාධිපතිතුමා අපේ හිටපු ජනාධිපතිතුමාගේ හොඳ මිත්‍රයෙක්. හිටපු ජනාධිපතිතුමාට කිසිම හානියක් වෙන්නට ඉඩ දෙන්නේ නැහැ. මේ මැලේසියාවේ සිද්ධිය තවදුරටත් ඇදගෙන යන්න ඉඩ දෙන්න එපා. එය අපේ මිත්‍ර රටක්. එතුමාත් සමඟ ළඟින් ආශ්‍රයක් තියෙනවා. මෙතැන අඩු පාඩුවක් සිදු වුණාද, නැද්ද, මොකක්ද වුණේ කියා සොයා බලා අපි සම්පූර්ණ වාර්තාවක් ලබා දෙමු. මම කියන්නේ ඒකයි. මේ ගැන වාද කරන්න යාමෙන් සිදුවන්නේ මැලේසියාවේ ආණ්ඩුව අපි නිර කරන එකයි. වුවමනා නැහැ, ඒක. මේ ගැන කරුණු සොයා බලා ගරු කථානායකතුමාටත්, සභාවටත් අපි දැනුම් දෙමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

II

වන්නේරිකුලමේ වී ගබඩාවක් සහ වී වියළන ස්ථානයක් පිහිටුවීම
வன்னேரிக்குளத்தில் நெற்களஞ்சியசாலை மற்றும் நெல் உலர்த்தும் தளம் அமைத்தல்
ESTABLISHMENT OF A STORE AND A DRYING PLACE FOR PADDY AT VANNERIKULAM

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர் கௌரவ பீ. ஹரிசன் அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு உங்களுக்கு நன்றி கூறிக்கொள்கின்றேன்.

கிளிநொச்சி மாவட்டத்தில், கரைச்சி பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட வன்னேரிக்குளம் கிராமமானது கிளிநொச்சியிலிருந்து 24 கிலோ மீற்றர் தொலைவில் அமைந்துள்ளது. 1953ஆம் ஆண்டு உருவாக்கப்பட்ட இக்கிராமத்தில் தற்போது 458 குடும்பங்களைச் சேர்ந்த சுமார் 1,658 பேர் வாழ்ந்துவரும் நிலையில், இவர்களது பிரதான வாழ்வாதாரமாக விவசாயம் விளங்குகின்றது. இங்கு பிரதான நீர்மூலமாக விளங்குவது மண்டல்கல் ஆற்றுப்படுகையின்கீழ் உருவாக்கப்பட்ட வன்னேரிக்குளம், தேவன்குளம் ஆகியவற்றை ஒன்றிணைத்துக் கட்டப்பட்ட 1,713 ஏக்கர் அடி நீரைக் கொள்ளளவாகக் கொண்ட வன்னேரிக்குளமாகும். இதன்கீழ் 120 பயனாளிகள் தலா 3 ஏக்கர் வீதம் 360 ஏக்கரில் நெற்பயிர்ச் செய்கையை மேற்கொண்டு வருகின்றனர். மேற்படி வன்னேரிக்குளத்தை மேலும் அபிவிருத்தி செய்து அப்பகுதிக்கான உவர் நீர்த் தடுப்பு அணை ஒன்றையும் நிர்மாணிப்பதன்மூலம் தற்போது உவர் நீர் உட்புகுதல் காரணமாகக் கைவிடப்பட்டுள்ள சுமார் 1,200 ஏக்கரிலும் நெற்பயிர்ச்செய்கையை மேற்கொள்ள முடியுமெனத் தெரிய வருகின்றது.

இந்த நிலையில், போக்குவரத்துப் பிரச்சினை காணப்படும் இப்பகுதியில் உற்பத்தி செய்யப்படும் நெல்லினை உடனடியாக விற்பனை செய்ய முடியாதுள்ளது. எனவே, உற்பத்தி செய்யப்படும் நெல்லைக் களஞ்சியப்படுத்தி

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

වෛප්පතර්කුම් උලර වෛප්පතර්කුම් වසතිකළ් ඉන්මෛ කාරණමාක ඉප්පකුදි විවසාය මක්කළ් පෙරුම් පාදිප්පුක්කළුක්කුළ්ළාකි වරුවදාකත් තෙරිය වරුකින්රදු. ඉක්කිරාමත්තු විවසාය මක්කළුක්කු මේර්පඩි වසතිකළෛච් සෙය්තුකොටුත්තාල්, අවර්කළාල් තංකළදු උර්පත්තියෛ මේලුම් පයනුළ්ළ වකෛයිල් මේර්කොළ්ළක්කූඩිය වාය්ප්පුක්කළ් ඒර්පඩුම්. ඉදනූටාකක් කිරාමියප් පොරුළාදාරම් මේලුම් වළර්ච්චියුර්රු, අදන්මූලම් දේසිය පොරුළාදාරත්තිර්කාන සිරන්තදොරු පංකළිප්පිනෛයුම් වළුංක මුඩියුම්.

වන්නේරික්කුළම් පකුදියිල් උර්පත්ති සෙය්යප්පඩුකින්ර නෙල්ලිනෛක් කළඥ්චියප්පඩුත්ති වෛක්කක්කූඩිය වකෛයිල් පෝදිය වසතිකළෛක් කොණ්ඩ නෙර්කළඥ්චියසාලෛ ඔන්රෛයුම් නෙල්ලිනෛ උලර වෛප්පතර්කාන තළමොන්රෛයුම් අමෛක්ක නඩවඩික්කෛ එඩුක්ක මුඩියුමා?

මේර්පඩි එනදු කේල්වික්කාන පදිලෛයුම් එඩුක්කප් පඩවුළ්ළ නඩවඩික්කෛ තොඩර්පාන විළක්කත්තෛයුම් කෛරව අමෛච්චර් අවර්කළ් වළුංකුවාර් එන එදිර්පාර්ක්කින්රේන්. නන්රි.

ගරු පී. හැරිසන් මහතා (ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Rural Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය සම්බන්ධයෙන් මගේ පිළිතුර මෙයයි.

අප දැනට උතුරු පළාතේ මධ්‍යස්ථාන 19ක වී මිලදී ගැනීමේ කටයුතු සිදු කරනවා. එතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙන් දැනට අප ක්‍රියාත්මක කරන කරුණු මා විශේෂයෙන් මතක් කරන්නට කැමැතියි.

උක්ත කරුණ සම්බන්ධයෙන් එතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයේ සඳහන් වන්නේරිකුලම් ප්‍රදේශයේ වී අස්වැන්න මිලදී ගැනීම සඳහා දැනට පෙරියප්පන් ගබඩාව විවෘත කර ඇත. අපට වන්නේරිකුලම් ප්‍රදේශයේ රජයේ ගබඩා හැටියට තිබෙන්නේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගබඩායි. ඒ ගබඩා සම්බන්ධයෙන් දැනට අප ඉල්ලීම් කර තිබෙනවා. ඒ ගබඩා ලැබෙන තෙක් -වන්නේරිකුලම් සිට පෙරියප්පන්කුලම් ස්ථානයට කිලෝ මීටර් හතක දුරක් තිබෙනවා- අප දැනටත් එතැන ගබඩාවක් විවෘත කර තිබෙනවා. අපට ඒ ගබඩා ලබා දෙන්න ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනට එකඟතාව පළ කර තිබෙනවා. මේ සතිය ඇතුළත ඒවා ලබා දුන්නොත් එතුමාගේ ඉල්ලීම පරිදි එම ස්ථානයේ වී මිලදී ගැනීමට අප බලාපොරොත්තු වෙනවාය කියන එක විශේෂයෙන් මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රදේශයේ නාඩු වී සඳහා විවෘත වෙළෙඳ පොළේ ඉහළ මිලක් තිබෙන හෙයින්, අප දැනට ඉදි කර තිබෙන, ඒ වාගේම දැනට වී මිලදී ගැනීමේ කටයුතු සිදු කරන ගබඩාවට එක නාඩු වී ඇටයක්වත් ලැබී නැහැ. මොකද, විවෘත වෙළඳ පොළේ ඊට වඩා වැඩි මිලකට නාඩු වී අස්වැන්න මිලදී ගැනීමට විශාල පිරිසක් ඉදිරිපත්වී සිටින නිසා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ප්‍රදේශයට ආසන්නව පිහිටි අක්කරායන් ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ගබඩාවක්ද මේ සඳහා අපට ලබා දෙන්නට ගොවිජන සේවා මධ්‍යස්ථානය ඉදිරිපත් වෙලා සිටින බවත් මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

ඒත් එක්කම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත දීර්ඝ කාලීන සැලැස්ම යටතේ ගොවි සංවිධාන උපයෝගී කර ගෙන එම ප්‍රදේශයේ පිහිටි සමූපකාර සමිති සහ කෘෂිකර්ම අමාත්‍යාංශය ඒකාබද්ධව, එතුමා මතක් කර දුන් පරිදි වී ගබඩාවක් සහ වී වියළා ගැනීමට කමතක් පිළියෙල කරන්නට දැනටමත් කෘෂිකර්ම අමාත්‍යාංශය එකඟත්වය පළ කර තිබෙනවාය කියන එකත් මම මතක් කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා.

III

යූබී ෆිනෑන්ස් සමාගමේ තැන්පත්කරුවන්ට මුහුණපෑමට සිදු වී ඇති ගැටලු

யூ.பி. நிதிக் கம்பனி வைப்பாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்

PROBLEMS FACED BY DEPOSITORS OF UB FINANCE COMPANY

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මහ බැංකුවේ අධීක්ෂණය යටතේ තිබූ යූබී ෆිනෑන්ස් සමාගම විසින් සිදු කරන ලද අසාධාරණයක් හේතුවෙන් එහි තැන්පත්කරුවන්ට මුහුණපෑමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

දැනට වසර 08කට පමණ පෙර මුල්‍ය අර්බුදයක් සමඟ සෙලින්කෝ සමූහ ව්‍යාපාරය කඩා වැටෙද්දී ඊට අයත් "ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි" මූල්‍ය සමාගමද අක්‍රිය තත්ත්වයට පත් වුණා. ඒ හේතුවෙන් මෙම සමාගමේ තැන්පත්කරුවන්ට තමන්ගේ තැන්පතු මුදල් ලබාගැනීමට නොහැකි වී විශාල අසාධාරණයක් සිදු වුණා. ඔවුන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද කරුණු දැක්වීමක් අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගමේ කළමනාකරණ කටයුතු පළමුව මර්චන්ට් බැංකුව වෙතටත් අනතුරුව යුනියන් බැංකුව වෙතටත් පවරනු ලැබුවා. අනතුරුව යුනියන් බැංකුව විසින් ෆිනෑන්ස් ඇන්ටි ගැරන්ටි සමාගමේ අයිතිය පවරා ගන්නා ලද අතර, යුනියන් බැංකුවේ අනුබද්ධිත සමාගමක් ලෙස "යූබී ෆිනෑන්ස් කොම්පැනි ලිමිටඩ්" යනුවෙන් සමාගමක් ස්ථාපිත කළා. මහ බැංකුවේ උපදෙස් අනුව එම නව සමාගමේ කොටස් කලින් ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගමේ තැන්පත් කරුවන්ට ලබා දෙන බවට යූබී ෆිනෑන්ස් සමාගම පෙරොන්දු වුණා.

ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගම කඩා වැටුණාට පස්සේ එය ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවට පැවරුවා. ඊට පස්සේ යුනියන්

බැංකුවේ අනුබද්ධිත සමාගමක් ලෙස ගොඩනැඟුවා. සමහර අයට කොටස් සහතික පවා තිබෙනවා. මා මේ කොටස් සහතික කිහිපයක් **සභාගත*** කරනවා.

එහෙත් වසර තුනක කාලයක් ගත වුණද, එම ආයතනය මහ බැංකුවේ උපදෙස් අනුව කටයුතු කිරීමට අසමත් වී තිබෙනවා. තැන්පත්කරුවන් බොහෝ දෙනෙකුගේ එකම ආදායම් මාර්ගය වූයේ, ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගමේ මුදල් තැන්පත් කර එයින් ලැබුණු පොලී ආදායමයි. ආයතනය අක්‍රීය වීමෙන් පසු තමන්ගේ ආදායම අහිමි වීම හේතුවෙන් ඔවුන් දැඩි පීඩනයකට ලක් වුණා. ආදායම අහිමි වීම නිසා ගත වූ කාලය තුළ තැන්පත්කරුවන් 50කට ආසන්න ප්‍රමාණයක් සිය දිවි හානි කරගෙන තිබෙනවා. එසේම තැන්පත්කරුවන්ගෙන් සියයට 80ක් පමණ වන්නේ තමන්ගේ විශ්‍රාම ජීවිතය වෙනුවෙන් පාරිතෝෂික මුදල් එහි තැන්පත් කළ වයෝවෘද්ධ පුරවැසියනුයි. ආදායම් මාර්ග ඇනහිටීම නිසා ඔවුන්ගේ ප්‍රතිකාර කටයුතු වෙනුවෙන් වාගේම දරුවන්ට ඉටු විය යුතු යුතුකම් වෙනුවෙන් මුදල් අහිමි වීම නිසා ඔවුන් දැඩි ලෙස අසරණ වී සිටිනවා. මහ බැංකුවේ අධීක්ෂණය තුළ පොරොන්දු වූ පරිදි යූබී ෆිනෑන්ස් සමාගම විසින් අදාළ තැන්පත්කරුවන්ට තැන්පතු මුදල්, පොලී මුදල් ගෙවීමට හෝ කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීමට පියවර ගෙන නැහැ. අඩුම තරමින් කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කළා නම් මේ කොටස් ඔවුන්ට අළෙවි කරන්න තිබුණා. එහෙම අවස්ථාවක් ලැබුණේත් නැහැ. කොටස් ටිකක් තිබෙන කඩදාසියක් ඔවුන් දැන් අතේ තබාගෙන ඉන්නවා. එයින් ඔවුන්ට පොලියක් ලැබෙන්නේ නැහැ; ඔවුන්ට ලාභාංශයක් ලැබෙන්නේ නැහැ. ඔවුන්ට ඒවා අළෙවි කර ගන්නත් බැහැ. කඩදාසියක් අතේ තියාගෙන ඔවුන් දැන් අවුරුදු ගණනාවක් තිස්සේ ඉන්නවා.

මහ බැංකුව විසින් විවිධ අවස්ථාවල මේ සමාගමට දැනුම් දුන්නා, "මෙය කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත සමාගමක් බවට පත් කරන්න" කියලා. නමුත් මහ බැංකුවේ නිර්දේශවලට අනුව මේ යූබී ෆිනෑන්ස් ආයතනය කටයුතු කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "යූබී ෆිනෑන්ස් සමාගම විශාල ආදායමක් ලබනවා. ඔවුන්ට විශාල ලාභාංශ තිබෙනවා" කියලා පත්තරවල විශාල දැන්වීම් පළ කර තිබෙනවා මා පසු ගිය දිනවල දැක්කා. හැබැයි, ඒ සමාගමේ විශාල මුදල් ප්‍රමාණයක් සමන්විතවෙලා තිබෙන්නේ මේ තැන්පත්කරුවන්ගේ මුදල්වලිනුයි. ඔවුන් ලාභ ලබනවා නම්, ඔවුන්ගේ ආයතනය දියුණුවෙලා තිබෙනවා නම් මේ තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු නොකරන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි මෙතැනදී පැන නඟින්නේ.

මහ බැංකුවේ අධීක්ෂණය තුළ පොරොන්දු වූ පරිදි යූබී ෆිනෑන්ස් සමාගම විසින් අදාළ තැන්පත්කරුවන්ට තැන්පතු මුදල්, පොලී මුදල් ගෙවීමට හෝ කොටස් වෙළෙඳ පොළ ලැයිස්තුගත කිරීමට පියවර ගෙන නැහැ. පොරොන්දු කඩ කිරීම සම්බන්ධයෙන් පියවරක් ගැනීමට මහ බැංකුව ක්‍රියා කර නැහැ. පොරොන්දු කැඩුවාට පස්සේ මහ බැංකුව ඒ වෙනුවෙන් පියවරක් ගන්න ඕනෑ. නමුත් මහ බැංකුව එහෙම පියවරක් අරගෙනත් නැහැ.

විශේෂයෙන් යූබී ෆිනෑන්ස් සමාගම ආරම්භයේදීම කොටස් විශාල ප්‍රමාණයක් අළෙවි කර මුදල් කර ගත් බවටද තැන්පත්කරුවන් චෝදනා කරනවා. ඒවාට සාක්ෂි නැහැ. නමුත් ඔවුන් සාධාරණ චෝදනාවක් නඟනවා, මේ සමාගමේ කොටස් විකුණා තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන්.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අග්‍රාමාත්‍යවරයා විසින් ලබාදෙනු ඇතැයි මා අපේක්ෂා කරනවා. අග්‍රාමාත්‍යතුමා යටතේ තමයි මහ බැංකුව තිබෙන්නේ. ඒ නිසා මේ ගැටලුවලට අග්‍රාමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි කියා මා බලාපොරොත්තු වනවා.

1. අදාළ තැන්පතුකරුවන්ට වසර 08ක් පුරා තැන්පතු මුදල් හෝ පොලී මුදල් නොලැබුණු බව ඔබතුමා දන්නේද?
2. ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගම, යුනියන් බැංකුවට පැවරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මුල් අවස්ථාවේ එළැඹුණු එකඟතා කවරේද? මොකද, ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගම යුනියන් බැංකුවට පවරනකොට මහ බැංකුවත් එක්ක යුනියන් බැංකුව එකඟතාවකට ආවා. ඒ එකඟතාවන් මොනවාද?
3. මහ බැංකුව හා යූබී ෆිනෑන්ස් සමාගම අතර පසුව එළැඹී එකඟතා කවරේද?
4. එළැඹී එකඟතා යූබී ෆිනෑන්ස් සමාගම විසින් කඩකර තිබේද? කඩවී තිබේ නම් ඒ පිළිබඳව ගනු ලබන පියවර කවරේද? එවැනි පියවර තවම ගත්තේ නැත්තේ ඇයි?
5. යුනියන් බැංකුව විසින් ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි සමාගමේ පවරා ගන්නා ලද කොටස් අළෙවි කර තිබේද? ඒ පිළිබඳ පරීක්ෂණයක් කරනු ලැබුවේද?
6. අදාළ තැන්පතුකරුවන්ට ඔවුන්ගේ තැන්පතු මුදල් සහ පොලී මුදල් ගෙවීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද? මොකද, ඔවුන්ට තවදුරටත් මේ කොටස් පිළිබඳ සහතිකයක් නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ කඩදාසියක් අතේ තියාගෙන ඉන්නවා. ඔවුන්ගේ තැන්පතු මුදල් සහ ඊට අදාළ පොලියත් ඔවුන්ට ලැබෙන විධියට කටයුතු කරනවාද, ඒ සඳහා යම් කාල රාමුවක් මහ බැංකුව විසින් සකස් කරලා තිබෙනවාද කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන සම්පූර්ණ වාර්තාවක් මහ බැංකුවෙන් ඉල්ලා තිබෙනවා. මහ බැංකුවෙන් ඒ වාර්තාව ලැබුණාට පස්සේ පාර්ලිමේන්තුවට ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්නම්. වැදගත් කරුණු තිබෙන්නේ. ඒ නිසා මම මහ බැංකුවෙන් සම්පූර්ණ වාර්තාවක් ඉල්ලුවා.

කාර්මික ආරාවුල් පනත: නියෝග
கைத்தொழில் பிணக்குகள் சட்டம்: ஒழுங்குவிதிகள்
INDUSTRIAL DISPUTES ACT: REGULATIONS

[අ.භා. 2.45]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour and Trade Unions Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මා මේ ගරු සභාවට ඉදිරිපත් කළේ, කාර්මික ආරාවුල් පනත යටතේ බේරුම්කරුවන්ට හා කාර්මික අධිකරණ සාමාජිකයන්ට පරීක්ෂණ පැවැත්වීම වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු සංශෝධනය කිරීම පිළිබඳ සංශෝධිත නියෝගයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කම්කරු දෙපාර්තමේන්තුව වෙත පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන සේවකයන් හා වෘත්තිය සමිති මඟින් ඉදිරිපත් කරන ආරාවුල්වල ස්වභාවය අනුව ඒවා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකියි. එකක් තමයි, අදාළ නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙන් අය කර දීම සිදු කළ හැකි ව්‍යවස්ථාපිත හිමිකම් සම්බන්ධ ආරාවුල්. ඒ සඳහා උදාහරණ වශයෙන් සේවක අර්ථ සාධක අරමුදල්, පාරිතෝෂික මුදල්, වැටුප්, අතිකාල ආදිය දැක්විය හැකියි. ඒවා නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙන් අය කර දෙන්න අපට පුළුවන්. එවැනි ප්‍රශ්නයක් තිබෙනවා නම් අපට විසඳා දෙන්න පුළුවන්.

අනෙක් එක තමයි, නෛතික ආවරණයක් නොමැති, එහෙත් කාර්මික ආරාවුල් පනත යටතේ පරීක්ෂණ පවත්වා තීරණ ක්‍රියාත්මක කිරීම මඟින් සහන සලසා දිය හැකි ආරාවුල්. ඒ සඳහා උදාහරණ වශයෙන් උසස්වීම් ලබා නොදීම, තනතුරෙන් පහත හෙළීම, අදාළ වැටුප් පරිමාණය ලබා නොදීම, වැටුප් වර්ධක ලබා නොදීම, අසාධාරණ අයුරින් හෝ විනය නියෝග මඟින් දඬුවම් ලෙස ස්ථාන මාරු කිරීම, තනතුර අහිමි කිරීම, වැටුප් අහිමි කිරීම ආදිය දැක්විය හැකියි.

ඍජු ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම මඟින් බේරුම් කළ නොහැකි කාර්මික ආරාවුල් කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු වූ අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන්, මූලික වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල මඟින් සේවක හා සේවා යෝජක පාර්ශ්ව කැඳවා සාකච්ඡා කොට, දෙපාර්ශ්වයේ එකඟතාව මත එම ආරාවුල් කාර්මික ආරාවුල් පනත යටතේ නිරවුල් කිරීම සඳහා පියවර ගනු ලැබේ. මෙලෙස ආරාවුල් නිරවුල් කිරීම, පනතේ 12(1) වගන්තිය යටතේ සමාදානයෙන් නිරවුල් කිරීම -conciliation- ලෙස හඳුන්වනු ලැබේ. වර්ෂයකට මෙවැනි ආරාවුල් විශාල සංඛ්‍යාවක් -දළ වශයෙන් ආරාවුල් 2000 සිට 3000 දක්වා සංඛ්‍යාවක්- කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින්ම නිරවුල් කරනු ලැබේ. සමාදානයෙන් නිරවුල් කිරීමට නොහැකි කාර්මික ආරාවුල් බේරුම් කිරීම හෝ කාර්මික අධිකරණයක් මඟින් නිරවුල් කිරීම සඳහා යොමු කිරීමට 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 4වන වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයාට බලතල පැවරී ඇත. අද දින ඉදිරිපත් කරන ලද සංශෝධිත නියෝග මේ විෂය පථයට ඇතුළත් වේ.

කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ සුළු ආරාවුලක් බේරුම් කිරීම මඟින් නිරවුල් කිරීම සඳහා යොමු කිරීමටද, පනතේ 4(2) වගන්තිය යටතේ ඕනෑම ආරාවුලක් නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණයක් වෙත යොමු කිරීමටද අමාත්‍යවරයා වෙත බලතල පැවරී ඇත. මෙහිදී බේරුම්කරු හෝ කාර්මික අධිකරණය විසින් අදාළ සේවා හා සේවක පාර්ශ්ව කැඳවා දෙපාර්ශ්වයටම සිය කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී, එකී සියලු කරුණු සලකා බලා යුක්ති සහගත හා සාධාරණ ප්‍රදානයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ. මේ ආකාරයෙන් කාර්මික ආරාවුල් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම, පරීක්ෂණ සකස් කිරීම හා ප්‍රදාන සකස් කිරීම ආදී වශයෙන් ඉතා භාරදූර කාර්යයක් බේරුම්කරුවන් සහ කාර්මික අධිකරණයේ සාමාජිකයන් වෙත පැවරී ඇත. මේ අයුරින් මෙම දෙපිරිසම විනිශ්චය සභා ලෙස කටයුතු කරති.

ඉහත පරිදි කම්කරු අමාත්‍යවරයා විසින් බේරුම් කිරීම මඟින් හෝ කාර්මික අධිකරණය මඟින් කාර්මික ආරාවුල් නිරවුල් කිරීම සඳහා යොමු කර, එම ආරාවුල් නිරවුල් කිරීම සඳහා කටයුතු කිරීම පිණිස බේරුම්කරුවන් වශයෙන් සහ කාර්මික අධිකරණයේ සාමාජිකයන් වශයෙන් කටයුතු කිරීමට කම්කරු අමාත්‍යතුමාගේ නිර්දේශ මත අතිගරු ජනාධිපතිතුමා විසින් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වන මූල මණ්ඩලයක් වසර තුනක කාල සීමාවක් සඳහා පත් කරනු ලබයි. මෙසේ පත් කරනු ලබන මූල මණ්ඩලයේ පුද්ගලයන් බේරුම්කරුවන් වශයෙන් හා කාර්මික අධිකරණයේ සාමාජිකයන් වශයෙන් කටයුතු කරනු ලබයි.

බේරුම්කරුවන් වශයෙන් හා කාර්මික අධිකරණයේ සාමාජිකයන් වශයෙන් පත් කරනු ලබන තැනැත්තන්ගේ කාර්යය වෙනුවෙන් දීමනා ගෙවීම සඳහා කාර්මික ආරාවුල් පනතේ 2වන උපලේඛනය මඟින් විධිවිධාන සලස්වා ඇත. එකී විධිවිධාන පරිදි බේරුම්කරුවන් හා කාර්මික අධිකරණ සාමාජිකයන්ට පරීක්ෂණ සිදු කිරීම වෙනුවෙන්, ප්‍රදාන ලබා දීම වෙනුවෙන් හා ගමන් වියදම් වෙනුවෙන් ගෙවීම සිදු කරයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාර්මික ආරාවුල් පනතේ 39 වගන්තිය යටතේ සාදන ලද නියෝග මඟින් බේරුම්කරුවන්ගේ හා කාර්මික අධිකරණයේ සාමාජිකයන්ට ගෙවන දීමනා අවසන් වරට සංශෝධනය කරනු ලැබ ඇත්තේ 2008 මාර්තු මාසයේදී ය.

බේරුම්කරුවන් හා කාර්මික අධිකරණයේ සාමාජිකයන් සඳහා වන ගෙවීම් 2008 වර්ෂයේදී අවසන් වරට සංශෝධනය කොට වසර 08ක කාලයක් ඉක්ම ගොස් ඇත. මෙම ගෙවීම් ප්‍රමාණවත් නොවීමේ හේතුව මත සාමාජිකයන් කිහිප දෙනෙකුම පසු ගිය කාලය තුළදී ඉල්ලා අස් විය. එබැවින්, කාර්යය කඩිනමින් ඉටු කරවා ගැනීම සඳහා බේරුම්කරුවන් හා කාර්මික අධිකරණයේ සාමාජිකයන් සඳහා වන ගෙවීම් වැඩි කිරීම කාලීන අවශ්‍යතාවක්ව පවතී. එමඟින් පාර්ශ්වයන්ට අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සිය ආරාවුල් සම්බන්ධයෙන් වන බේරුම්කරණ සහ කාර්මික අධිකරණ ප්‍රදාන ලබා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

දැනට ගෙවනු ලබන සහ යෝජිත දීමනා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

(අ) යම් රැස්වීම් වාරයක කාල සීමාව පැය එකක් නොඉක්මවන්නේ නම්, එම රැස්වීම් වාරයක් සඳහා දැනට රුපියල් 600ක් ගෙවනවා. එම මුදල රුපියල් 1,000ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා.

(ආ) යම් රැස්වීම් වාරයක කාල සීමාව පැය එකකට වැඩි නම් සහ පැය තුනක් නොඉක්මවන්නේ නම්, එම රැස්වීම් වාරයක් සඳහා දැනට ගෙවන රුපියල් 800ක මුදල රුපියල් 1,500ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා.

(ඇ) යම් රැස්වීම් වාරයක කාල සීමාව පැය තුනක් ඉක්මවන්නේ නම්, එම රැස්වීම් වාරයක් සඳහා දැනට රුපියල් 1,000ක් ගෙවනවා. එම මුදල රුපියල් 2,000ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා.

(ඈ) යම් කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් වූ ප්‍රදානයක්, එම ආරාවුල විභාග කොට අවසන් කිරීමෙන් පසු සති හයක් ඇතුළත භාර දෙනු ලබන්නේ නම්, ඒ සඳහා දැනට ගෙවනු ලබන අතිරේක ගාස්තුව රුපියල් 3,000ක්. එම මුදල රුපියල් 5,000ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා.

(ඉ) එක් කාර්මික ආරාවුලක් සඳහා ගෙවනු ලබන උපරිම ගාස්තුව දැනට රුපියල් 12,000කට යටත් වනවා. ඒ උපරිම මුදල රුපියල් 25,000ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා.

(ඊ) බෙරුම්කරණ ප්‍රදානය ලිවීමේ දිරි දීමනාව වශයෙන් රුපියල් 5,000ක් ගෙවීමට යෝජනා කරනවා.

ඉහත දැක්වෙන ආකාරයෙන් බෙරුම්කරුවන් හා කාර්මික අධිකරණයේ සාමාජිකයන් සඳහා වන ගෙවීම් සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. කාර්මික ආරවුල් පනතේ නියෝග සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක මඟින් අදාළ නියෝග කෙටුම්පත් කරවා ගැනීමෙන් අනතුරුව, එම නියෝග සංශෝධනය කිරීම සඳහාත්, පාර්ලිමේන්තුවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම සඳහාත් 2016 පෙබරවාරි 10වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත. මෙම නියෝග පිළිබඳව පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී 2016 ජූලි 21 දින සාකච්ඡා කරන ලදී.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බෙරුම්කරුවන් හා කාර්මික අධිකරණ සාමාජිකයන්ගේ දීමනා සංශෝධනය කිරීම වසර 08කට පසුව සිදු කරන අතර, ඔවුන්ගේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කර ගැනීම සඳහා මෙම දීමනා සංශෝධනය කිරීම බෙහෙවින් ඉවහල් වේ. එමෙන්ම, බෙරුම්කරණය සඳහා සහ කාර්මික අධිකරණය වෙත යොමු කෙරෙන කාර්මික ආරාවුල් කඩිනමින් නිරවුල් කිරීම මඟින් වඩාත් කඩිනමින් මහ ජනතාවගේ ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි අප විශ්වාස කරනවා.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන කාලීන අවශ්‍යතාව මත සිදු කෙරෙන මෙම සංශෝධන ඇතුළත් නියෝග අනුමත කරන ලෙස මේ සභාවේ සිටින සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එවුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you very much, Hon. Minister. The next speaker is the Hon. Chandrasiri Gajadeera. You have five minutes.

[අ.භා. 2.55]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද කාර්මික ආරාවුල් පනත යටතේ නියෝග සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වයක් නැහැ. මොකද, එතුමාගේ චේතනාව හොඳයි. මේ ආරාවුල් කඩිනමින් විසඳලා ඒ සම්බන්ධයෙන් තීරණ වහාම කම්කරු පන්තියට දැනුම් දීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තමයි මෙයට පදනම් කර ගෙන තිබෙන්නේ. මට ලබා දුන් විනාඩි පහක කාලය තුළ මම එක කාරණයක් පිළිබඳව ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ විධියට කාර්මික ආරාවුල් පනත යටතේ යම් නියෝග හෝ අණපනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කොට තේ‍ර පාර්ශ්වික ජාතික කම්කරු උපදේශක සභාවට යොමු කරනවා. එහෙම උපදේශක සභාවක් තිබෙනවා. ඒ උපදේශක සභාවට යොමු කරන්නේ කම්කරුවන් සහ වෘත්තීය සමිතිත්, කම්කරු ඇමතිවරයා සහ රජයත් අතර ඇති වන ප්‍රතිවිරෝධතා අවම කර ගැනීම සඳහායි.

ගරු ඇමතිතුමා තේ‍ර පාර්ශ්වික ජාතික කම්කරු උපදේශක සභාවට මෙක යොමු කළාද කියලා මම දැන ගන්න කැමැතියි. එක පැත්තකින් ඔබතුමා තර්කයක් ගෙනෙන්න පුළුවන්, මෙක දීමනා සම්බන්ධයෙන් කාරණාවක් නිසා අපිට ඒක අදාළ වුණේ නැහැයි කියලා. නමුත් එම උපදේශක සභාවට යොමු කිරීමෙන් අලුත් ප්‍රශ්න සහ ඒකට අදාළ විවිධ කරුණු මතු වෙනවා. ඒ නිසා මම දන්නා තරමින් මේ අදාළ කාරණා සම්බන්ධයෙන් තේ‍ර පාර්ශ්වික ජාතික කම්කරු උපදේශක සභාවට යොමු වෙලා නැහැ. එවැනි සම්ප්‍රදායක් ඇති කරන එක හොඳ නැහැ. මොකද, එහෙම තත්ත්වයක් ඇති වුණොත් අපටත් හොරෙන් ඇති කරන මේ නියෝග මොනවාද කියලා සැකයක් ඇති වෙනවා.

විශේෂයෙන්ම කම්කරු පන්තියේ විශ්වාසය දිනා ගන්න නම් අපි විනිවිදභාවය තුළ ක්‍රියා කරන්න ඕනෑ. ඒ නිසා එවැනි ප්‍රමාදයන් ඇති නොවන විධියට කටයුතු කරන්නට වගබලා ගන්නවා නම් ඒක ඔබතුමාට හොඳයි කියා මම හිතනවා. ඔබතුමා මේ ගැන පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

කම්කරු දෙපාර්තමේන්තුව ගන්නා වූ බොහෝ පියවරවල් - අවශ්‍ය පියවරවල්- ජාතික කම්කරු උපදේශක සභාවේ අවධානයට යොමු කරනවා. ඒවා සාකච්ඡා කරනවා. මෑතකදී දවස් දෙක තුනක් තිස්සේ සමහර කරුණු පිළිබඳව සාකච්ඡා කළා. ඇත්තෙන්ම කියන්න ඕනෑ, මේ නීති කෙටුම්පත සකස් කර තිබුණේ මම ඇමතිවරයා වශයෙන් වැඩ භාර ගන්න ඉස්සරවෙලායි කියන එක. ඒ නිසා සැබෑ ලෙසම මෙය එම උපදේශක සභාවට යොමු කළාද කියලා මට කියන්න බැහැ. කෙසේ නමුත් මෙය අර්බුදයකින් තොර දෙයක් නිසා, උපදේශක සභාවට යොමු නොකළා නම් හේතුව ඒක වෙන්න ඇති. නමුත් දැන් අපි හැම කාරණයක්ම ජාතික කම්කරු උපදේශක සභාවට යොමු කරනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ කාරණාව ගැන අපට එච්චර ලොකු ගැටුමක් ඇති වෙන එකක් නැහැ. නමුත් අපි එම තිබෙන සම්ප්‍රදායන් රැක ගෙන කටයුතු කරන්න ඕනෑ. කම්කරු ආරාවුල් අවම කිරීමෙන් කම්කරුවන් අතර විශ්වාසය ගොඩ නඟා ගැනීම රටේ ආර්ථිකයටත් වැදගත් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙවැනි කාරණය මෙකයි. පසු ගිය කාලයේ අපි වැවිලි ක්ෂේත්‍රයේ කම්කරුවන්ටත් රුපියල් 2,500ක දීමනාවක් දෙනවාය කියන තීරණයට ආවා. ඔබතුමා පනතකින්ම ඒ තීරණය ගෙනාවා. නමුත් දැනට රුපියල් 100ක තාවකාලික දීමනාවක් තමයි ගෙවන්නේ. මේ පිළිබඳව වැවිලි ක්ෂේත්‍රය තුළ ලොකු විරෝධයක් තිබෙනවා. මොකද, රුපියල් මිලියන 1000ක ණයකුත් දීලා තමයි ඒ මුදල ගෙවන්නේ. අද රටේ තිබෙන ජීවන බරත් එක්ක - ජීවන වියදමත් එක්ක- ඉතාම දිළිඳු ස්වභාවයේ ඉන්නේ වතු කම්කරු පන්තියයි. එතකොට රජය ගන්නා වූ තීන්දු, ස්වාමී පක්ෂය ක්‍රියාත්මක කරන්නේ නැත්නම් කම්කරු අමාත්‍යාවරයා හැටියට සහ රජයක් හැටියට ඔබතුමන්ලාට තිබෙන වගකීම මොකක්ද? පසු ගිය කාලයේ ව්‍යවස්ථාපිත සමිති ඔබතුමාත් එක්ක දිගින් දිගටම මේ පිළිබඳව සාකච්ඡා කළා. මේක කඩිනමින් ක්‍රියාත්මක කරනවාය කියලා ඔබතුමා පිළිතුරු දීලා තිබුණා. නමුත් අදටත් මේක විසඳිලා නැහැ. අපේ වතුකරයේ කම්කරු පන්ති නායකයෝ මේ පාර්ලිමේන්තුවේ ඇමතිකම් දරනවා. මම ඒ අයට දොස් කියන්නේ නැහැ. රාජ්‍ය ප්‍රතිපත්තියක් එක්ක ගැටගැහිලා කම්කරු පන්තියේ වුවමනාවන් ඉදිරියට ගෙන යන්න ක්‍රියා නොකරන කොට ස්වාමී පක්ෂයට මෙවැනි තීන්දුවලට එන්න පුළුවන්. ඒ නිසා රජයක් හැටියට බැස ගන්නා නිගමන; බැස ගන්නා තීන්දු සක්‍රීය කරන්නත් රජයට වගකීමක් තිබෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම වතු සේවකයන්ට රුපියල් 2,500ක දීමනාව ගෙවිය යුතුයි කියන එක මම පැහැදිලිවම කියන්න ඕනෑ. මේ රුපියල් 2,500ක දීමනාව ගෙවීමේ පරමාර්ථය, එහෙම නැත්නම් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට තමයි රජයේත් අනුග්‍රහය ලබා ගෙන පසු ගිය මාස දෙකේ ගෙවිවේ. අපි බලාපොරොත්තු වුණා, අගෝස්තු මාසය අවසාන වෙන්න කලින් ඒ ව්‍යවස්ථාපිත සමිති සහ සේවා පක්ෂය එකඟ වුණු පරිදි සාමූහික ගිවිසුමකට එයි කියලා. මොකද, දෙපාර්ශ්වය දිගින් දිගටම සාකච්ඡා කළා. ඒ වාගේම ඒ වෙලාවේ යෝජනාවක් ආවා, ඵලදායිතාව පදනම් කර ගෙන කම්කරුවන්ගේ පඩි සකස් වෙන්න ඕනෑ කියා. ඒ සම්බන්ධවත් ඒ අය සාකච්ඡා කළා. නමුත් මම හිතන විධියට ඒකෙන් සාර්ථක ප්‍රතිඵලයක් ගන්න බැරි වුණා. පසු ගිය බ්‍රහස්පතින්දා මමත් මේ සාමූහික ගිවිසුම සකස් කිරීමේ එම සාකච්ඡාවට සහභාගි වුණා. ඒ සහභාගි වුණු අවස්ථාවේ වැවිලි සමාගම් දිගින් දිගටම කියා සිටියේ ඒ මුදල ගෙවන්න අමාරු බවයි. නමුත් ඒක නිදහසට හේතුවක් නොවෙයි.

ඒ අය පෙන්වා දෙන්නේ, "තේ ිල සතුටුදායක ලෙස යම්කිසි ප්‍රමාණයකින් ඉහළ යමින් තිබුණත්, රබර් මිල ඉතාමත් අසතුටුදායක විධියට පහළ බහිනවා. නමුත් ඒ අයටත් ඒ මුදල ගෙවන්න ඕනෑ. ඒක කරන්න අමාරුයි" කියලායි. ඒ අවස්ථාවේ ඒ ගොල්ලෝ යෝජනා කළා, රුපියල් 50ක් ගෙවන්න. මා කිව්වා, "එය නීතිය නොවෙයි. නීතිය අනුව දවසකට අඩු වශයෙන් රුපියල් 100ක් ගෙවන්න ඕනෑ. ඒ නිසා ඒ මුදල ඇතුළත් වන විධියට සාමූහික ගිවිසුමක් අත්සන් කරන්න"යි කියලා. තවමත් මේ සාකච්ඡා පවත්වා ගෙන යනවා. අපි බලාපොරොත්තු වනවා, හෙට හෝ අනිද්දා නැවත වරක් ඒ පාර්ශ්වයන් කැඳවා සාකච්ඡා කර අවසාන තීන්දුවකට එළඹෙන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ රාජ්‍ය වැවිලි සංස්ථාවේ කම්කරුවන්ට මෙතෙක් ඒ මුදල් ගෙවලාත් නැහැ. ඇත්ත වශයෙන්ම අපි මෙවැනි නීති හදලා, නීති ක්‍රියාත්මක කරන්න යන කොට ඒවාට කීකරු වන්නේ නැත්නම්, රජයක් හැටියට ඒ ගැන හිතන්න ඕනෑ. මොකද, අපි අපේ කම්කරු පන්තියේ වුවමනාවන් වෙනුවෙන් පෙනී සිටිනවා නම්, යහ පාලන ප්‍රතිපත්ති උඩ මේ සම්බන්ධයෙන් දැඩි ලෙස මැදිහත් වෙන්න ඔබතුමාට විශාල වග කීමක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

තව එක කාරණාවක් ගැන විතරයි මට කියන්න තිබෙන්නේ. දැන් කම්කරු උසාවි ඔබතුමා යටතේ පාලනය වන්නේ නැහැ. කම්කරු උසාවිවල නිලතල සඳහා පත් කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියා මාර්ග සියල්ලම කරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේයි. හැබැයි ව්‍යවස්ථාපිත සමිතිවලට විශාල ප්‍රශ්නයක් තිබෙනවා, එහි තිබෙන සංස්කෘතික ස්වභාවය ගැන. එහි තිබෙන පරිසරය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාත් දන්නවා ඇති, මීට කලින් කම්කරු ඇමතිවරයා යටතේ කම්කරු උසාවි තිබෙන කොට ව්‍යවස්ථාපිත සමිති නියෝජිතයන් කම්කරු උසාවියේ තිබෙන නඩුවලට පෙනී සිටි බව. මෑතකදී චක්‍රලේඛයක් එවා තිබෙනවා ලු, ව්‍යවස්ථාපිත සමිතිවල සිටින විධායක මට්ටමේ නියෝජිතයන් තමයි කම්කරුවන් වෙනුවෙන් කම්කරු උසාවිවල පෙනී සිටිය යුත්තේ කියලා. තමන්ට විශ්වාසයක් තිබෙන නියෝජිතයකු තමන්ගේ නඩුවක් වෙනුවෙන් ඉදිරිපත් කරන්න බැරි වීම, ඒ අයට තිබෙන බරපතළ ප්‍රශ්නයක්. ව්‍යවස්ථාපිත සමිති ක්ෂේත්‍රය තුළ ඒ ගැන විශාල කනස්සල්ලක් තිබෙනවා විතරක් නොවෙයි, විරෝධයකුත් තිබෙනවා. දැන් ඔබතුමා කියයි, මේ කාරණය ඔබතුමාගේ සීමාවෙන් පිට කියලා. නමුත් එහෙම කරන්න බැහැ. මොකද, තමුන්නාන්සේ ඒ කම්කරු ක්ෂේත්‍රය භාර ඇමතිවරයා හැටියට අදාළ අමාත්‍යාංශ එක්කත් සාකච්ඡා කරලා, විශේෂයෙන්ම ව්‍යවස්ථාපිත සමිති එක්කත් සාකච්ඡා කරලා, ඒ අයට කන් දීලා මේ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගන්නවා නම් හොඳයි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මේ කාරණය ගැන ඔබතුමාත් එක්ක මා එකඟ වනවා. ඇත්ත වශයෙන්ම මෙතෙක් කල් ව්‍යවස්ථාපිත සමිතිවල නිලධාරීන් ඕනෑ කෙනකුට ඔවුන්ගේ සාමාජිකයන් වෙනුවෙන් කම්කරු උසාවියේ පෙනී සිටින්න පුළුවන්කම තිබුණා. දැනුත් ඒ ප්‍රවණතාව තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ, ව්‍යවස්ථාපිත සමිතිවල විධායක මට්ටමේ, එහෙම නැත්නම් ව්‍යවස්ථාපිත සමිතිවල ප්‍රධාන නිලතල දරන අය පමණක් කම්කරු උසාවියේ පෙනී සිටිය යුතුයි කියන නිගමනයට කම්කරු උසාවිවල සභාපතිවරුන්ගේ සංගමය පැමිණ තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමා, අධිකරණ සේවා කොමිෂන් සභාව -JSC එක-, අග්‍ර විනිශ්චයකාරතුමා, ඒ සියලු දෙනා එක්ක සාකච්ඡා කරමින් සිටිනවා. මෙහි තිබෙන බරපතළම දේ තමයි, කම්කරු උසාවියකට පැමිණිල්ලක් ඉදිරිපත් කරන කම්කරුවකුට නියෝජිතයකු මාර්ගයෙන් පෙනී සිටින්න බැරිකමක් තිබෙන එක. අද ලංකාව පුරාම තිබෙන කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරු නඩුවලට නියෝජිතයන් පෙනී සිටීම ප්‍රතික්ෂේප කරනවා. ව්‍යවස්ථාපිත සමිතිවල නිලධාරීන්ට, නීතිඥවරුන්ට නඩුවලට පෙනී

සිටීමේ අවකාශ තවම තිබෙනවා. එය නීතිඥවරුන්ට පමණක් සීමා විය යුතුයි කියන මතයේ සමහර අය ඉන්නවා. නමුත් රැකියාවෙන් දොට්ට දමපු කම්කරුවන්ට තමන්ගේ රැකියාව නැවත ලබා ගැනීම සඳහා පැමිණිල්ලක් ඉදිරිපත් කරලා, පරීක්ෂණයකට භාජන වන කොට, ඔවුන්ට නීතිඥයකුගේ සේවය ලබා ගන්න බැරි වෙන්න පුළුවන්; අපහසු වෙන්න පුළුවන්. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ. මේ නියෝග පැනවීමේ පදනම ඒකයි. කම්කරු උසාවි ස්ථාපනය කරන අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ කරපු කථා බැලුවාම, විශේෂයෙන්ම ඉලංගරත්න මහත්මයාගේ කථාව බැලුවාම පෙනෙනවා, මේ කම්කරු උසාවි ස්ථාපනය කිරීම සේවයෙන් දොට්ට දමන කම්කරුවකුට අඩු වියදමකින් තමන්ට සහනයක් සලස්වා ගැනීම සඳහා වන වැඩ පිළිවෙළක් බව. ඔබතුමාත් නීතිඥයෙක්; මමත් නීතිඥයෙක්. අපි නීතිඥ වෘත්තියේ පළමුවෙන් පෙනී සිටියේ කම්කරු උසාවිවල තමයි. අපි කම්කරු උසාවියේ මෙසය දෙපැත්තේ වාඩි වෙලා, ඒ සම්බන්ධයෙන් කථා කරලා තමයි ඒ කම්කරු ආරවුල් බේරුම් කළේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
බොහොම සරල ප්‍රතිපත්තියක් තිබුණේ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
අද මේවා උසාවි බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසායි මෙතැන ප්‍රශ්නයක් තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් දිගින්-දිගටම සාකච්ඡා කරමින් යනවා. අවශ්‍ය වුණොත් රෙගුලාසි පැනවීමේ අයිතිය ඇමතිවරයාට තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්න බලාපොරොත්තු වනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අදාළ අමාත්‍යාංශයට විතරක් නොවෙයි, කම්කරු පන්තියේ අයිතිය වෙනුවෙන් සියලු ප්‍රශ්නවලට මැදිහත්වීම අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you very much.

The next speaker is the Hon. (Dr.) Harsha De Silva. You have six minutes.

[අ.භා. 3.07]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේ වැදගත් කාරණාවක් මෙම ගරු සභාවට මතක් කරන්නයි මම විනාඩි 5ක කාලයක් ඉල්ලා ගත්තේ.

වැඩ වර්ජනවලට නොයා ප්‍රශ්න ගොඩින් බේරා ගැනීම සඳහා "කාර්මික ආරාවුල් බේරුම්කරණය" ආර්ථිකය පැත්තෙන් කොපමණ වැදගත් වෙනවාද කියන කාරණයයි මම පෙන්වා දෙන්න හදන්නේ. උදාහරණයක් හැටියට, 2014 වර්ෂයට සාපේක්ෂව ගිය අවුරුද්දේ පෞද්ගලික අංශයේ සංවිධානාත්මක සමස්ත වැඩ වර්ජන සංඛ්‍යාව, ඊට සම්බන්ධ වුණු සේවක සංඛ්‍යාව සහ අහිමි වුණු මිනිස් දින ගණන සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව වාර්තා කරනවා. වැඩ වර්ජන නිසා අහිමි වූ මිනිස් දින ගණන් ප්‍රමාණය පිළිබඳව උදාහරණයක් කියනවා නම්, 2012 දී මිනිස් දින 25,043යි, 2013 දී 41,669යි, 2014 දී 29,165යි, 2015 දී 70,697යි. මෙවැනි මිනිස් දින ගණන් ප්‍රමාණයක් ආර්ථිකයෙන් ගිලිහී යනවා නම්, එය අපේ රටේ සංවර්ධන වැඩ පිළිවෙළට කිසිසේත්ම ධනාත්මක ලෙස බලපාන්නේ නැහැ විතරක් නොවෙයි, අතිශයින් ඍණාත්මක ලෙස බලපානවා. ඒ නිසා කාර්මික ආරාවුල් බේරුම්කරණය පිළිබඳව අද ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන නියෝග යටතේ ඒ ගාස්තු වැඩි කිරීම හරහා, ආරාවුල් වැඩ වර්ජන දක්වා නොගොස් එම ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් තත්ත්වයකට පැමිණේවි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ඇත්ත වශයෙන්ම මම කලින් ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන වතු අංශය හා සම්බන්ධ ඒවා පමණයි. වතු අංශය පිළිබඳව මීට කලින් ගරු මන්ත්‍රීවරයෙක් මෙතැනදී කථා කළා. නමුත් අහිමි වූ මිනිස් දින ගණන් ප්‍රමාණයේ සම්පූර්ණ එකතුව බැලුවොත්, 2012 දී මිනිස් දින 35,817යි, 2013 දී 80,423යි, 2014 දී 37,323යි, 2015 දී 82,294යි. ඒ නිසා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් වැඩසටහන් ගණනාවක් ආරම්භ කරලා තිබෙනවා. ඒක හොඳයි. පෞද්ගලික අංශයේ සේවා ස්ථානවල සහයෝගිතාව සහ කාර්මික සාමය වැඩි දියුණු කරන්න අමාත්‍යාංශයෙන් ගන්නා පියවර පිළිබඳව අපට පැහැදීමක් තිබෙනවා. කාර්මික සාමය හොඳින් පවත්වාගෙන ආයතනවලට සම්මාන පිරිනමන වැඩ පිළිවෙළවකුත් ආරම්භ කර තිබෙන බව මහ බැංකු වාර්තාවේ සඳහන් වෙනවා. එවැනි ආකාරයට ඔවුන්ට දිරිගැන්වීම් කරන්න පුළුවන් නම්, යම් කිසි ආරාවුලක් ඇති වුණොත් එම ආරාවුල බේරාගෙන ආර්ථිකයට සහ වැඩ කරන ජනතාවගේ පවුල්වලට කරදරයක් නොවන ආකාරයෙන් එම ආරාවුල් බේරා ගන්න සේවකයන්ටත්, ආයතන අයිතිකරුවන්ටත් හැකියාවක් ලැබෙනවා. ඒ නිසා "සේවකයන්ගේ ජාතික අවම වේතනය" පනත් කෙටුම්පත සහ "සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත් කෙටුම්පත" 2016 මාර්තු මාසයේ පාර්ලිමේන්තුවේදී සම්මත වුණා. ඒ පිළිබඳ වූ ගැටලු කිහිපයක් මේ අවස්ථාවේ සාකච්ඡා වුණා. නමුත්, රුපියල් 40,000ට වඩා අඩු වැටුප් ලබන සියලු පෞද්ගලික අංශයේ සේවකයන් සඳහාත් රුපියල් 2,500 දීමනාව ලැබෙන ක්‍රමය පිළිබඳව පෞද්ගලික අංශයේ ආයතන හිමියන් හා රජය අතර එකඟතාවකට එන්න පුළුවන් කියලා අපි බලාපොරොත්තු වෙනවා. බොහෝ ආයතනවල මේ වැඩි කරන ලද රුපියල් 2,500 දැනටමත් ගෙවා තිබෙන බව අපි කවුරුත් දන්නවා.

මීට ටික වෙලාවකට පෙර මේ සභාවට ඇවිල්ලා හිටියා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා. ඔහු කම්කරු ඇමතිවරයා හැටියට හිටිය කාලයේ, "කම්කරු ප්‍රඥප්තියක්" ගැන දිගින් දිගට කථා කළා අපට මතකයි. එතුමා අවුරුදු 10ක පමණ කාලයක් ජනාධිපති වෙලා හිටියත් ඒක ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. නමුත්, දැන් වන විට ක්‍රියාකාරී කම්කරු ප්‍රතිපත්තියක් සකස් කරන්නට කම්කරු අමාත්‍යාංශය, "ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සේවා නියුක්ති ප්‍රතිපත්තිය පිළිබඳව වන සම්මුතිය" - සී 122 - කියන එක 2016 ජනවාරි මාසයේ අනුමත කරන ලද බවත්, අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ නිසා, මෙවැනි යාවත්කාලීන කිරීමක් සිදු කිරීම සම්බන්ධයෙන් ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඇමතිතුමාට අපි ප්‍රශංසා කරනවා. එය දිරි ගැන්වීමක් හැටියට අප දකිනවා. ඒ හරහා, කම්කරු ආරාවුල් දුර - දිග නොගොස් විසඳා ගන්නට අවස්ථාවක් ලැබෙයි කියා අප බලාපොරොත්තු වනවා. එසේම, කම්කරු වැඩ වර්ජන අවම වෙලා, ඒ හරහා ආර්ථිකයට ඍණාත්මක බලපෑමක් ඇති නොවන විධියට වැඩ කර ගෙන යන්න ලැබෙයි කියා බලාපොරොත්තු වෙමින්, මෙයට අපේ සුභාශිංසන එකතු කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.14]

ගරු විජිත හේරත් මහතා
(*மாண்புமிகு விஜித ஹேரத்*)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කම්කරු ආරාවුල් අවම කිරීම සඳහා බේරුම්කරණ නිලධාරීන්ට යම් දීමනාවක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමා ගෙනෙන සංශෝධනය හොඳයි. නමුත්, ඔබතුමන්ලා පසු ගිය මැතිවරණයේදී ජනතාවට පොරොන්දු වුණා, විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ තිබෙන "කොන්ත්‍රාත් සේවයේ බඳවා ගැනීම" වහාම නතර කරනවාය කියා. ජනාධිපතිවරයාත් ජනාධිපතිවරණයේදී මැතිවරණ පොරොන්දුවක් විධියට මේ ගැන ප්‍රකාශ කළා. ඒ වාගේම, මහ මැතිවරණයේදී ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලත් තිබුණා. ඒ පිළිබඳව තමයි කඩිනම් සංශෝධනයක් ගෙන ආ යුතුව තිබෙන්නේ. ඔබතුමාත් දන්නවා, ඒක දැනට ජාතික කම්කරු උපදේශක සභාවේ අනුමත වුණු යෝජනාවක් බව. ඒකට සේවා පක්ෂයෙන් එකඟතාව ආවා; සේවක පක්ෂයෙන් එකඟතාව ආවා; අමාත්‍යාංශය පැත්තෙන් එකඟතාව ආවා. ඒ නිසා ඔබතුමන්ලාට කිසිදු බාධාවක් නැහැ, ඒ සංශෝධනය ගෙනෙන්න. ඒක දැන් රටේ වැඩ කරන ජනතාව තුළ බරපතළ ප්‍රශ්නයක් වෙලායි තිබෙන්නේ. සේවා පක්ෂය එතැනදී එකඟ වුණාට, මේ සඳහා පසුව විවිධ බාධා කිරීම් කරන බව ඔබතුමන්ලා දන්නවා. නමුත්, ආණ්ඩුවක් විධියට; අමාත්‍යාංශයක් විධියට ඔබතුමන්ලාට ධෛර්යය තිබෙන්නට ඕනෑ, ඒ සංශෝධනය වහාම ගෙනෙන්නට. ඒක තමයි කඩිනමින් ගෙන ආ යුතුව තිබෙන්නේ. ඒක තමයි මැතිවරණයේදී ලබා දුන් පොරොන්දුව.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මේ වන විට රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක සේවා කටයුතු සිද්ධ වෙන්නේ මේ කියන manpower සේවා ආයතන මඟින් බව. දැනට අවුරුදු 10, 15, 20 වැනි කාලයක් manpower ආයතන මඟින් යෙදවූ සේවකයින් වැඩ කරනවා. ප්‍රධාන පෙළේ බැංකුවල, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වැනි ප්‍රධාන රාජ්‍ය ආයතනවල පවා අද සේවය කරන්නේ manpower ආයතන මඟින් යෙදවූ සේවකයන්. සමහර වේලාවට සේවකයන්ට ප්‍රශ්නයක් වුණාම, ඒ සේවකයන්ට යන්න තිබෙන්නේ තමන් වැඩ කරන ආයතනයට නොවෙයි. වැඩ කරන ආයතනයත් එක්ක කිසිදු ගිවිසුමක් නැහැ; වැඩ කරන ආයතනයේ බැඳීමක් නැහැ, ඒ සේවකයන්ගේ සේවක අයිතිවාසිකම් සම්පූර්ණ කරන්න. පෞද්ගලික සමාගමක් ගත්තොත්, "කොකා-කෝලා" වැනි පෞද්ගලික සමාගමක් වෙන්න පුළුවන්; බහු ජාතික සමාගම් වෙන්න පුළුවන්. ඒවායේ වැඩ කරන සියලුම සේවකයන් සම්පාදනය කරන්නේ මේ manpower ආයතනවලින්. සමහර වේලාවට තමන් හිතනවා, තමන් වැඩ කරන්නේ Coca-Cola Company එකේ කියලා. හැබැයි, බලා ගෙන යන කොට තමන් වැඩ කරන්නේ "අප්පුහාමි" කියන manpower ආයතනයේ. "අප්පුහාමි" කියන manpower ආයතනයත් අවුරුදු දෙකෙන්, තුනෙන් තමන්ගේ සේවා ගිවිසුම් වෙනස් කරලා තිබෙනවා. ඒ කියන්නේ, ඒ manpower ආයතනය අතින් අතට මාරු වෙනවා. අවුරුදු 10ක්, 15ක් යන කොට manpower හිමිකාරිත්වයත් මාරු වෙලා තිබෙනවා. සේවකයා දන්නේ නැහැ, තමන්ගේ සේවා පක්ෂය, එහෙම නැත්නම් තමන්ගේ 'හාමිපුතා' කවුද කියලා. එවැනි අවාසනාවන්ත තත්ත්වයක් දැනට තිබෙනවා. ඒ නිසා, ගරු ඇමතිතුමන්ලාගේ පැත්තෙන් වහාම ඒ මැතිවරණ පොරොන්දුව ඉටු කරන්න. මැතිවරණයේදී ඔබතුමන්ලා පුන පුනා කිව්වා, "අපේ රටේ කම්කරුවන් මුහුණ පාන ප්‍රධාන ප්‍රශ්නයක් වන මේ කොන්ත්‍රාත් සේවය, එහෙම නැත්නම් වහල් සේවය නැති කරනවාය කියා. ඒක වැඩ කරන ජනතාව හඳුන්වන්නේ "වහල් සේවය" කියලායි.

රුපියල් 700ක දීමනාවක් දෙනවා නම් ඇත්තටම කම්කරුවාට ලැබෙන්නේ රුපියල් 300ක් හෝ 350ක් පමණයි. ඉතිරි රුපියල් 350ම එහෙම නැත්නම් සියයට 50ම ඒ කොන්ත්‍රාත් සමාගම ගන්නවා. කොන්ත්‍රාත් සමාගම නිකම් ඉඳලා, සේවකයෝ සැපයීම කියන පදනම මත පමණක් වැටුපෙන් අර්ධයක් ලබා ගැනීම කිසිසේත්ම සාධාරණ වෙන්නේ නැහැ. ඒ ක්‍රමය වහාම වෙනස් කළ යුතුව තිබෙනවා.

බැංකු ගත්තොත් ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න ඇමතිතුමනි, පසු ගිය කාලයේ manpower ආයතන හරහා අවුරුදු 10ක්, 15ක් වැඩ කළ සේවකයන්ව මීට අවුරුදු එකහමාරකට, දෙකකට කලින්, -ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පසුව, ඔබතුමන්ලා මේ පොරොන්දුව ඉටු කරනවා කියලා සමහර තැන්වල පෙන්වලා කළා.- කොන්ත්‍රාත් පදනමට හැරෙව්වා. එහිදී කිසිදු වෙනසක් වෙලා නැහැ. Manpower ආයතනයේ වැඩ කළ සේවකයා එම රජයේ හෝ පෞද්ගලික ආයතනයේම කොන්ත්‍රාත් සේවකයෙක් වෙලා ඉන්නවා. නමුත් ස්ථිර කරලා නැහැ. දැන් රාජ්‍ය බැංකුවලට ගියොත්, -ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ලංකා බැංකුව වාගේ ආයතනවලට ගියොත්- පෙනෙනවා විවිධ කොන්දේසි දාලා ඒවායේ notice කරලා තිබෙනවා, අවුරුදු හතක් manpower ආයතනයක වැඩ කරලා තිබෙනවා නම්; තවත් අවුරුදු දෙකක් එකී රාජ්‍ය ආයතනයේ කොන්ත්‍රාත් සේවයේ වැඩ කරලා තිබෙනවා නම් ඔහුට හෝ ඇයට ස්ථිර වෙන්නට පුළුවන් බව. ඔබතුමා දන්නවා මේක කම්කරු නීතියට මූලික වශයෙන් පටහැනි බව ගරු ඇමතිතුමනි. අපේ රටේ කම්කරු නීතියට අනුව, ඔබතුමන්ලාම මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කළ නීතියට අනුව මාස හයකට වැඩි කාලයක් එක දිගට සේවයේ නියුක්ත වුණා නම් එම සේවකයා අනිවාර්යයෙන් ස්ථිර කළ යුතුයි. එහෙම තිබියදී කොහොමද ඒ ආයතනය දැන්වීම් පළ කරන්නේ අවුරුදු දෙකක් කොන්ත්‍රාත් සේවයේ සිටියොත් පමණයි ස්ථිර කරන්නේ කියලා. අවුරුදු හතක් manpower ආයතනයේ සිටි කෙනා තවත් අවුරුදු දෙකක් කොන්ත්‍රාත් සේවයේ සිටියොත් තමයි ස්ථිර කරන්නේ කියලා දැන් රාජ්‍ය ආයතනවල notice කරලා තිබෙනවා. කම්කරු නීතියට පටහැනිව ආණ්ඩුවේම රාජ්‍ය ආයතනවල දැන් මේ වාගේ දැන්වීම් පළ කරලා තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක් විධියට තිබෙනවා. මේවා වෙනස් කරන්නට තමුන්නාන්සේලා තවමත් පැහැදිලි මැදිහත්වීමක් කරලා නැහැ.

ගරු ඇමතිතුමනි, පසු ගිය කාලයේ විදුලිබල මණ්ඩලයේ සහ ටෙලිකොම් ආයතනයේ කොන්ත්‍රාත් සේවකයන් පිළිබඳ ගැටලු මතු වුණා. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ව අනිවාර්යයෙන්ම ස්ථිර කරනවා කියලා ඔබතුමන්ලා පොරොන්දු වුණා. නමුත් මේ වන විට එයින් භාගයක් විතර තමයි ස්ථිර කරලා තිබෙන්නේ. ඉතිරි අය සම්බන්ධයෙන් තවමත් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන නැහැ. ඒ පිළිබඳව ලැබෙන ආරංචි තමයි, ඔවුන්ව ස්ථිර කරන්නේ නැහැ; ඒ වෙනුවට නව තාක්ෂණය භාවිත කරනවා; නව තාක්ෂණය භාවිත කරන විට ඔවුන්ව ස්ථිර කරනවා වෙනුවට ඉන්න අයත් එළියට දමන්නයි සිදු වෙන්නේ කියන එක.

මේක ඔබතුමන්ලා දීපු මැතිවරණ පොරොන්දුවට මුළුමනින්ම පටහැනි දෙයක්. ඒ නිසා ඉතිරි සේවකයන් ස්ථීර කරන්නට, ඒ අයව බඳවා ගැනීමට අවශ්‍ය කරන කඩිනම් මැදිහත්වීමක් අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, රුපියල් 2,500 ප්‍රශ්නය ගැන කථා කරන්නට ඕනෑ. ඔබතුමන්ලා පනත් කෙටුම්පතක් ගෙනැල්ලා පාර්ලිමේන්තුවේදී සම්මත කළා. ඒ වෙලාවේදීත් බරපතළ අඩු පාඩු තිබෙන බව අපි පැහැදිලිව කිව්වා. රුපියල් 2,500ක් ලබා දෙනවා කියලා කිව්වාට පසු ගිය 2015 අවුරුද්දේදී ඔබතුමන්ලා ලබා දුන්නේ රුපියල් 1,500යි. පනතින් නීත්‍යානුකූලව අවසරය දුන්නේ රුපියල් 1,500කට. 2016දී තමයි ඉතිරි රුපියල් 1,000 ලබා දෙන්නේ. ඒකම වැරදියි. ඇත්තටම පනතෙන් කළේ රුපියල් 2,500ම නොගෙවා ඉන්නට පෞද්ගලික අංශයට ඉඩදීමයි. රුපියල් 2,500 ලබාදීම අනිවාර්ය කරලා නීතියක් බවට පත් කරන්න කියලා තමයි අපි කිව්වේ. රුපියල් 2,500 නොගෙවා ඉන්න බැරි වෙන්නයි නීතිය සකස් කළ යුතුව තිබුණේ. නමුත් ඔබතුමන්ලා ඒ නීතිය හැදුවේම දුර්වල විධියට, 2015දී රුපියල් 1,500ක් සහ 2016දී රුපියල් 1,000ක් කියලා. එතැනම වැරැද්දක් තිබෙනවා.

විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, "බොහෝ ආයතන ඒ රුපියල් 2,500 ලබා දීලා තිබෙනවා" කියලා. ලබා නොදීපු ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ ලබා නොදුන් ආයතන විවිධ හේතු දක්වනවා, විවිධ උපක්‍රම පාවිච්චි කරනවා. පනතට අනුව "සේවකයා" යන්න අර්ථ දැක්වීම අනුව යම් යම් සිදුරුවලින් රිංගලා ගිහින් ඔවුන් මේ රුපියල් 2,500 නොගෙවා ඉන්නට පාවිච්චි කරනවා. ඒක අද බොහෝ පෞද්ගලික ආයතනවල තිබෙන දෙයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම වතු අංශයේ ප්‍රශ්නය ගැනත් යමක් ප්‍රකාශ කළ යුතුයි. අවසාන වශයෙන් වතුකරයේ සාමූහික ගිවිසුම 2013දියි අත්සන් කළේ. හරි විධියට නම් 2015 මාර්තු අග වන විට වතු සේවකයන් සහ සේව්‍ය පාර්ශ්වය අතර සාමූහික ගිවිසුම් අත්සන් කළ යුතුව තිබුණා. නමුත්, අද වන තුරු ඒ ගිවිසුම් අත්සන් කර නැහැ. 2015 මාර්තු මාසයේ සිට 2016 සැප්තැම්බර් මාසය දක්වා වූ කාල සීමාව ගෙන බලන්න. දැන් අවුරුදු දෙකකට ආසන්න ගත වෙලා තිබෙනවා. මේ සාමූහික ගිවිසුම් අත්සන් කරන්නේ අවුරුදු දෙකකටයි. හැබැයි, දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක්ම මේ සාමූහික ගිවිසුම් අත්සන් කර නැහැ. කම්කරු අමාත්‍යාංශය විධියට, ආණ්ඩුව විධියට ඔබතුමන්ලා තවම අපොහොසත් වෙලා තිබෙනවා වතු සේවකයන්ගේ ඒ අයිතිවාසිකම ආරක්ෂා කරන්න. සාකච්ඡා වට තිබුණා. පසු ගිය සතියේත් සාකච්ඡා වට පැවැත්වූවා කිව්වා. ලබන සතියේත් තියනවා කිව්වා. අප දන්නා විධියට අට වතාවක් සාකච්ඡා වට පවත්වලා තිබෙනවා. හැබැයි, අට වතාවක් නොවෙයි දහ වතාවක් සාකච්ඡා වට තිබුණත් වතු සේවකයන්ගේ ඒ අයිතිවාසිකම දෙන්න තවම බැරි වුණා.

නියෝජ්‍ය ඇමතිවරු මේ පාර්ලිමේන්තුවේදී පෙට්ටල් වක්කරගෙන ගිනි තියාගන්නත් හැදුවා. පෙට්ටල් දමාගෙන ගිනි තියාගන්න හදපු සන්දර්ශන පැවැත්වූවත්, රුපියල් දෙදහස් පන්සීයේ ඒ දීමනාව වතු සේවකයන්ට ලබාදෙන්න ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලාට තවම බැරි වුණා. එතකොට ඔවුන්ගේ පැත්තෙන් ඔවුන් ඉදිරිපත් කළ තර්කය තමයි, "අප පාර්ලිමේන්තුවේ නීතිවලට බැඳිලා නැහැ, අප සාමූහික ගිවිසුම් අනුව තමයි කටයුතු කරන්නේ, ඒ අනුව තමයි අපේ බැඳීම් තිබෙන්නේ" කියන එක. ඊට පසුව ඔබතුමන්ලා රුපියල් මිලියන 10,000ක සල්ලි වෙන් කළා කිව්වා. ඒ අයට ණය දුන්නාය කිව්වා. ණයවලින් ඒ පඩිය ගෙවන්න කිව්වා. අවසානයේ ඔබතුමන්ලා පල්ලම් බැහැලා කිව්වා, "දවසකට රුපියල් 100 ගණනේ දෙන්න." කියා. එතකොට මාසයකට දවස් 25ක් වැඩ කළොත් පමණයි රුපියල් සියයේ ඒවා 25ක් -2,500ක්- හම්බ වන්නේ. හැබැයි, දැන් කිසිම හාම්පුතෙක්, කිසිදු වතු සමාගමක් කිසිදු වතු සේවකයෙකුට අඛණ්ඩව දින 25ක් වැඩ කරන්න අවස්ථාව ලබාදෙන්නෙත් නැහැ. එහෙම නම්, "අනිවාර්යෙන්ම දවස් 25ක් වැඩ කරන්න දෙන්න." කියන එක අනිවාර්ය කරන්න ඕනෑ. එතකොට තමයි රුපියල් 2,500 ලැබෙන්නේ. දවස් 10ක් වැඩ කළොත් රුපියල් සියයේ ඒවා 10ක් -රුපියල් 1,000ක්- ගන්න පුළුවන්. හැබැයි, බොහෝ වතු කම්කරුවන්ට මාසයකට දවස් 25ක් වැඩ කරන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා රුපියල් 100න් ඔබතුමන්ලා ගැළවෙන්න හැදුවාට ඒක උත්තරයක් වෙලා නැහැ. ඒ නිසා රුපියල් 2,500ක ඒ වැඩි කළ දීමනාව අදත් මේ රටේ ලක්ෂ දෙකකට ආසන්න වුණු වතු කම්කරුවන්ට ලැබිලා නැහැ. වතු කම්කරුවන්ගෙන් ලක්ෂ 12ක විතර සාමාජිකයන් සංඛ්‍යාවක් යැපෙනවා. ඔවුන්ට මේ සහනය ලැබී නැහැ. එහෙම නම් එතැන පැහැදිලි සිදුරක් තිබෙනවා රිංගලා යන්න. සේවකයන්ට මේ සහනය දෙන්න වතු සමාගම්වලට බැරි ඇයි? එයට හේතු මොනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වතු සමාගම් රජය සතුව තියෙද්දි වතු කම්කරුවන්ට මීට වඩා සහන ලැබුණා. ඔවුන්ගේ සෞඛ්‍ය පහසුකම්, ඉස්පිරිතාල ටිකට වෛද්‍යවරු ඇතුළු ඒ අවශ්‍ය කරන බෙත්-හේත් ටික, ඒ උපකරණ ටික ලබාදෙන්න රජය මැදිහත් වුණා. වාර්ෂිකව ඒ නිවාසවල තීන්ත ගා ගන්නත් ඒ වතු සමාගම් රජය සතුව තියෙද්දි මැදිහත් වුණා. ඒ අයගේ සනීපාරක්ෂක කටයුතුවලට, ඒ වාගේම අධ්‍යාපන කටයුතුවලට වතුවල පවත්වාගෙන යන daycare centresවලට, නැත්නම් දරුවන් බලාගන්න පුංචි කාමරවල නඩත්තුව සඳහා පවා එදා වතු සමාගම් මැදිහත් වුණා. හැබැයි, මේවා පෞද්ගලිකකරණය කළාට පසුව ඒ සහන සියල්ල කප්පාදු වෙලායි තිබෙන්නේ. අද වතුවල තත්ත්වය ඒකයි. සෞඛ්‍ය පහසුකම් සැපයීම අඩාළ වෙලා තමයි තිබෙන්නේ. අධ්‍යාපන පහසුකම් ලබාදීම අඩාළ වෙලා තමයි තිබෙන්නේ. අනික් පැත්තෙන් ගත්තොත්, නිවාස සඳහා ලබාදෙන අනිකුත් පහසුකම් සියල්ලත් අඩාළ වෙලා තමයි තිබෙන්නේ. එදා දීපු ඒ සහනවත් මේ පෞද්ගලික සමාගම් වතු සේවකයන්ට ලබාදෙන්නේ නැහැ. ඇත්තටම ඒ වතු සමාගම් පෞද්ගලික අංශයට පැවරුවාට පසුව වතු සේවකයන්ට එදා මාසයකට ලැබුණු පිටි ටික, මාසයකට ලැබුණු ලාම්පුතෙල් ටිකවත් ලැබෙන්නෙත් නැහැ. ඒ නිසා මේ දීමනාව නොගෙවා ඉන්න වතු සමාගම්වලට කිසිදු හේතුවක් නැහැ. මේවාට ලාභ උපයන්න බැරි හේතුව මොකක්ද? ලාභ උපයන්න බැරි වෙලා තිබෙන්නේ මේ වතු සමාගම් රජයේ යම් යම් දේශපාලන වුවමනාවලට පාවිච්චි වන නිසායි.

වොක්ෂෝල් වීදියේ තිබෙන ප්‍රධාන ගොඩනැඟිලි ටිකේ වර්ග අඩියක් අවුරුද්දකට රුපියල් එකයි ශත දෙකටයි බදු දීලා තිබෙන්නේ. අවුරුද්දකට රුපියල් එකයි ශත දෙකයි, වොක්ෂෝල් වීදියේ තිබෙන ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගොඩනැඟිල්ලක වර්ග අඩියක බදු කුලිය. හැබැයි, ජනවසමේ සේවකයන්ට EPF එක ගෙවා ගන්න සල්ලි නැහැ; ETF එක ගෙවන්න සල්ලි නැහැ. අපට මතකයි, පසු ගිය කාලයේ ආණ්ඩුව තීන්දුවක් ගත්තා ඒ වත්තේ තිබෙන ගස් ටික කපලා ලැබෙන ආදායමෙන් EPF එක ගෙවන්න කියා. හැබැයි, ජනවසමට අයිතිම වොක්ෂෝල් වීදියේ තිබෙන ප්‍රධාන ගොඩනැඟිලි හයක් තුට්ටු දෙකට බදු දුන්නා. ගිය ආණ්ඩුව විතරක් නොවෙයි, මේ ආණ්ඩුවත් එහෙම දුන්නා.

2015 ජූනි මාසය අරගෙන බලන්න. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ජනවසම වටිනා ගොඩනැඟිලි -වොක්ෂෝල් වීදියේ ඉඩම්- තුට්ටු දෙකට බදු දීලායි තිබෙන්නේ. සේවකයන්ට EPF එක ගෙවන්න බැරි වෙලා තිබෙන්නේ ඒ හේතුව නිසායි. තමන්ගේ හිතවතුන්ට, දේශපාලන හෙංචයියලාට කොළඹ තිබෙන වටිනා ගොඩනැඟිලි අඩු මුදලට බදු දෙනවා; සේවකයන්ගේ EPF එක ගෙවාගන්න සල්ලි නැහැ කියා අනික් පැත්තෙන් කියනවා.

[ගරු විජිත හේරත් මහතා]

පසු ගිය කාලයේ අගලවත්ත වැවිලි සමාගමට EPF, ETF ගෙවා ගන්න බැරුව ඊට අයිති, අනුබද්ධ වතු 12ක් වැහෙන තත්ත්වයකට පත් වුණා. ඒවා වැහෙන තත්ත්වයට පත්වෙනකොට ඇත්තටම ඒවායේ ආදායම අඩු වෙනවා තමයි. ඇයි, ඒ? මොකද, ඒවා රජයේ සම්පත්. හැබැයි, ඒවා පෞද්ගලික අංශයට පවරලා, කලින් මෙතැන කථා කරපු, ඒ වාගේම මාතෘකාවක් බවට පත් වුණ 'ක්‍රිස් නෝනිස්' තමයි අගලවත්ත වැවිලි සමාගමේ අයිතිකාරයා බවට පත් වුණේ. ආණ්ඩුව එදා වතු සමාගම් ක්‍රිස් නෝනිස්ට දුන්නා. ක්‍රිස් නෝනිස්ට ඕනෑ විධියට රාජ්‍ය ආයතනවලින් බැංකු ණය අරගෙන ආණ්ඩුවට තවත් පාඩු කළා. ඊට පසුව බැංකුවලින් තවත් ණය අරගෙන ඒවා වෙන වෙන අයට විකුණලාත් තිබෙනවා; බදුදීලාත් තිබෙනවා. ඒ වෙන අකටයුතුකම්, අක්‍රමිකතා නතර කරන්න ආණ්ඩුව සමත්වෙලා නැහැ. ඒ නිසා අවසානයේ ඒවායේ ප්‍රතිඵල බුක්ති විඳින්නේ ඒවායේ වැඩ කරන සේවකයන්. ඒ සේවකයන් EPF, ETF ගන්න ගියාම, සල්ලි නැහැ කියා අමාත්‍යාංශය කියනවා. ඒවා විසඳන්න ඔබතුමන්ලා තවමත් සමත්වෙලා නැහැ.

ඒ විතරක් නොවෙයි, වතු කම්කරුවන් මුහුණ දෙන ලොකු ගැටලුවක් තිබෙනවා. එය කාර්මික ආරවුලක් විධියට හැමදාම මතුවෙන කාරණයක්. ඒ තමයි තමන්ගේ EPF, ETF ලබා ගැනීම සඳහා අයදුම් පත්‍ර අත්සන් කිරීමේදී ඇතිවන ගැටලු. තමන්ගේ නොදැනුවත්කම නිසා එක්කෝ හරියට අත්සන් කරලා නැහැ; එක්කෝ හරියට නම ලියැවිලා නැහැ. ඒ නිසා මතුවෙන ගැටලු හේතුවෙන් EPF එක ගන්න ඔවුන්ට බැරි වෙලා තිබෙනවා. ඒවා කාර්මික ආරාවුල් ප්‍රශ්න විධියට බේරුම්කරණයට ගියාම කියනවා, දෙමව්පියන්ගේ උප්පැන්න සහතික සහ හැඳුනුම්පත් ගේන්න කියලා.

අපි දන්නවා, වතුකරයේ කම්කරුවන්ගෙන් බොහෝ අයට උප්පැන්න සහතික හෝ හැඳුනුම්පත් ඉදිරිපත් කිරීමේ හැකියාවක් නැහැ කියා. ඒ නිසාම තමන්ගේ EPF, ETF එක ගන්න විධියක් නැති බොහෝ වතු කම්කරුවන් ඉන්නවා. ඒවා තමයි සැබෑ වශයෙන්ම වතු ක්ෂේත්‍රය අද මුහුණ දීලා තිබෙන ප්‍රශ්න. වතු ක්ෂේත්‍රය නියෝජනය කරන ඇමතිවරු කිහිපදෙනෙක්ම ආණ්ඩුවේ ඉඳලාත් වැඩ කරපු රුපියල් 2,500 දීමනාව සමස්ත වතු කම්කරුවන්ට ලබා දෙන්න තවමත් අසමත් වෙලා තිබෙනවා. ඇමතිවරු ගිහිල්ලා පිටකොටුවේ උපවාස කරනවා; උද්ඝෝෂණ කරනවා; පෙට්‍රල් දාගෙන ගිනි තියා ගන්න හදනවා. ඒ මොන සෙල්ලම් දැම්මත් අවශ්‍ය කරන මැදිහත්වීම් කරන්න තවමත් ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. ඒ සඳහා ඔබතුමන්ලා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? "සාකච්ඡා කරනවා", "ලබන සතියේ සාකච්ඡා කරනවා" කියලා කාලය ගෙවන්න පුළුවන්. හැබැයි, අවුරුදු දෙකක් සාමූහික ගිවිසුම් නැතිව යනවා නම්, එතැනම බරපතළ වැරැද්දක් තිබෙනවා. ඒ වතු පෞද්ගලික අංශයට නඩත්තු කර ගන්න බැරි නම්, ඒවායේ ආදායම කඩාගෙන වැටෙන තත්ත්වයට පත්වෙනවා නම්, ඔබතුමන්ලාට තිබෙන්නේ ඒ වතු රජයට පවරා ගන්නයි; එහෙම නැත්නම් කරන්න පුළුවන් කෙනෙකුට දෙන්නයි. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මහලොකු සද්දෙට කිව්වා "බැරි නම් අපි පවරා ගන්නවා." කියලා. හැබැයි, කරන්නේ නැහැ. ඒවා බොරුවට ජනතාව රවටටන්න කරන ප්‍රකාශ. ඒ නිසා ජනතාව රැවටීම සඳහා කරන ප්‍රකාශ නොවෙයි, පෞද්ගලික අංශයේ සමාගම්වලට බැහැයි කියා කියනවා නම්, ගිවිසුම් අත්සන් කරන්න බැහැයි කියා තවදුරටත් කල් ගන්නවා නම්, ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා කරන්න ඕනෑ ඒ වතු රජයට පවරා ගැනීමයි; ඒ වාගේම ගිවිසුම් අත්සන් කර, ඒ කොන්දේසි උල්ලංඝනය කරපු සමාගම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරලා වහාම මැදිහත් වීමයි; වතු සේවකයන්ගේ අයිතිය ආරක්ෂා කරන්න කටයුතු කිරීමයි. කම්කරු ඇමතිතුමා විධියට ඔබතුමාට එහිදී විශාල වගකීමක් තිබෙනවා. ඒ නිසා ඒ වගකීම ඉටු කළොත් තමයි ඇත්තටම කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සිද්ධ වෙන්නේ. ඒ පිළිබඳව මැදිහත්වීමක් වහා කළ යුතුව තිබෙනවා.

ඔබතුමන්ලා දැන් බොහෝ ආයතනවල කටයුතු පෞද්ගලික අංශයට දෙනවා. වතු දීලා වතුවල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම දැන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීමේ කටයුත්තත් හොංකොංවල පිහිටි බේකර් සහ මැකන්සි සමාගමට පවරන්න කටයුතු කරගෙන යනවා. ඔබතුමන්ලා ඒ සඳහා ගිවිසුම් අත්සන් කර තිබෙනවා. ඒ ගිවිසුම්වලින් මොකක්ද, දැන් කරන්න යන්නේ? බේකර් සහ මැකන්සි සමාගමත් සමඟ අත්සන් කළ ගිවිසුමේ පැහැදිලිව බදු එකතු කිරීමේ කටයුත්ත මේ සමාගමට පවරන්න ලැහැස්තියි. ඔබතුමන්ලා ඒකට කියනවා, "ඒ හරහා බදු ආදායම් වැඩි කරගන්න පුළුවන් වෙයි" කියලා. පසු ගිය කාලය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිය පරිගණක ජාලය ශක්තිමත් කිරීමට විධිමත් ක්‍රියා මාර්ග ගත්තා. එහි පළමු අදියර සියයට 90ක් අවසන් කරලා තිබෙනවා.

දැන් එහි දෙවැනි අදියරත් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව, ආදායම් වැඩි කර ගැනීමේ ක්‍රම දැනටමත් මතු වෙලා තිබෙනවා. පසු ගිය කාලයේ අලුතෙන් නිලධාරීන් 1,500 ගණනක් බදු එකතු කර ගැනීම සඳහා බඳවා ගත්තා. ඒ බඳවා ගැනීම තුළින් දැනටමත් බදු ආදායම එකතු කිරීමේ ක්‍රියාවලිය කලින් තිබුණු තත්ත්වයට වඩා වෙනස් වෙලා තිබෙනවා; වැඩි වෙලා තිබෙනවා. හැබැයි, දැන් ඔබතුමන්ලා බේකර් සහ මැකන්සි සමාගමත් එක්ක අත්සන් කරපු agreement එකෙන් ඒ සමාගමට වාර්ෂිකව මිලියන 23ක් ගෙවන්න පොරොන්දු වනවා. එතකොට දැන් ඔබතුමන්ලා මිලියන 23 ගෙවන්න ඒ සමාගමත් එක්ක ගිවිසුම් ගහන්නෙත් ලංකාවේ ඉන්න සමහර local agentsලා තැරැවිකාරයෝ විධියට අරගෙනයි. සමහර audit companies අරගෙන, ඒවා agentsලා විධියට පාවිච්චි කරලා, බේකර් සහ මැකන්සි සමාගමත් එක්ක ගිවිසුම් ගහලා, බදු එකතු කරන ක්‍රියාවලියක් දැන් පෞද්ගලික අංශයට පවරනවා.

වතු සමාගම් ටික පෞද්ගලික අංශයට පවරලා අවුරුදු ගණනකට පස්සේ මහා දැවැන්ත අර්බුදයක්, කම්කරු අර්බුදයක් රටේ නිර්මාණය වුණාට පස්සේවත් එයින් පාඩමක් ඉගෙන ගන්නේ නැතුව බදු එකතු කිරීමේ ක්‍රියාවලියත් පෞද්ගලික අංශයට පවරනවා. එම ක්‍රියාවලිය පෞද්ගලික අංශයට පවරන්නේ, ඇත්තටම බදු එකතු කිරීමේ ක්‍රියාවලිය දුර්වල වෙලා, කඩාගෙන වැටිලා හෝ කියලා නොවෙයි, කිසිම සාධාරණ හේතුවක් නැතුව. බදු එකතු කිරීමේ ක්‍රියාවලිය මේ මෑතකදී ඇති කරපු වෙනස්කම් එක්ක වැඩි වෙලා තිබෙද්දි, වැඩි කරගන්න පුළුවන් හැකියාව තිබෙද්දි තමයි, ඒකත් පෞද්ගලික අංශයට පවරන්න යන්නේ. ඒක වහාම නතර කළ යුතු දෙයක්. ඒකෙන් අපේ රටේ බදු ආදායම වැඩි වනවා වෙනුවට, පෞද්ගලික සමාගම්වලට අවුරුද්දකට මිලියන 23ක් යනවා. ඒ විතරක් නොවෙයි, අර කියපු ලංකාවේ agentsලාට කොමිස් මුදලක් යනවා. ලංකාවේ agentsලාට කොමිස් දීම පිටු පස්සේ ඉන්නේ කවුද කියලා ඔබතුමන්ලා ආණ්ඩුවෙන් ප්‍රශ්න කර ගන්න. ඒවා නිකම් වෙනවා නොවෙයි. මේ ක්‍රියාවලිය නිකම් වෙනවා නොවෙයි. හිටපු ගමන් බේකර් සහ මැකන්සි සමාගමත් එක්ක ගිවිසුම් අත්සන් කරන්නේ නිකම් නොවෙයි. ඒ ගිවිසුම් අත්සන් කරන කොට ඒවාට මැදිහත් වන local agentsලාට commission එකක් යනවා. ඒ commission එක පිටු පස්සේ ඉන්නේ, මේ තීන්දු ගන්න අය. ඒ තීන්දු ගන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. හැබැයි, මුදල් අමාත්‍යාංශය තීන්දු ගන්න කොට ඒකේ ප්‍රතිඵලවලට මුහුණ දෙන්න වෙන්නේ රටක් විධියට මේ රටේ සියලු ජනතාවට.

අද මේ නියෝග මඟින් ඉදිරිපත් කර තිබෙන, කම්කරු ආරාවුල් නිරාකරණය කිරීමේදී බේරුම්කරන නිලධාරීන්ට ලබා දෙන දීමනා වැඩි කිරීම පිළිබඳව අපේ ප්‍රශ්නයන් නැහැ. ඒක හොඳයි. හැබැයි, ඒකෙන් විතරක් කම්කරු ආරවුල් නිරාකරණය කිරීම වේගවත් වෙන්නේ නැහැ. කම්කරු ආරවුල් නිරාකරණය කිරීම වේගවත් වෙන්න නම් ඔබතුමන්ලා මැතිවරණයේදී දීපු පොරොන්දුව, විශේෂයෙන්ම අපේ රටේ සේවකයාගේ රැකියාවේ ස්ථීරත්වය, ඒ ආරක්ෂාව සහතික කිරීම පිළිබඳව තිබෙන පදනම් ශක්තිමත් කළ යුතුව තිබෙනවා. අන්න ඒකෙදි කොන්ත්‍රාත් සේවය අහෝසි කරන්න, මේ manpower ආයතනවලින් කරන මේ විගඩම, මේ සෙල්ලම නතර කරන්න වහාම පියවර ගත යුතුයි කියන එක අවධාරණය කරමින් මා නතර වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා.

[අ.භා. 3.34]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - திறன் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Skills Development and Vocational Training)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාර්මික ආරාවුල් නිරාකරණය කිරීම සඳහා බේරුම්කරුවන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව වැඩි කිරීමට යෝජනාවක් ගෙන ඒම පිළිබඳව විෂය භාර ගරු අමාත්‍යතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමාටත්, නිලධාරී මණ්ඩලයටත් මාගේ ප්‍රශංසාව පුද කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
I propose that the Hon. Velu Kumar do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.

අතන් පිරකු, මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු වේලු කුමාර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කාර්මික ක්ෂේත්‍රයේ සාමාජිකයන් අතර -හාම්පුතුන් හා සේවකයන් අතර- විවිධ අවස්ථාවල විවිධ ප්‍රශ්න, ගැටලු නිර්මාණය වනවා; පැන නඟිනවා. අපි ඒවා කොතෙකුත් දැක තිබෙනවා. ඒවා පදනම් කරගෙන විරෝධතා ව්‍යාපාර, කර්මාන්තවලට හානි කිරීම්, සේවකයන් අතර ලොකු ඝට්ටන ඇතිවීම්, පොලීසියේ මැදිහත්වීම් වාගේ සිදු වීම් අපට මේ සමාජය තුළ බොහෝ විට දක්නට ලැබුණා. අතීතයේ කර්මාන්ත වැසෙන අවස්ථාවලදී ඒ කර්මාන්තවල සේවකයින් ඊට එරෙහිව යුද පිටියක් බවට කර්මාන්තශාලාව පත් කර ගත්ත අවස්ථාද අපට දකින්නට ලැබුණා. එවැනි අවස්ථා එනකොට ඒ ආරාවුලට මැදිහත්වන උදවිය සමනයට පත් කිරීමට ලිහිල් ක්‍රමවේදයක් අපි නිර්මාණය කළ යුතු වනවා.

අපේ ඉතිහාසයේ ඉඳලා එවන් අවස්ථාවලදී වරින් වර විවිධ අණපනත් ගෙනැල්ලා විශේෂයෙන්ම සේවක මණ්ඩලවලට තමන්ගේ අයිතිවාසිකම් බෙරුම් කර ගැනීම සඳහා රජයන් විසින් අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

අද කාලයත් එක්ක ඇති වෙලා තිබෙන ජීවන වියදම ඉහළ යාමත්, ඒ වාගේම මුදලේ අගය පහළ යාමත් එක්ක බලන කොට, ආරම්භක යුගයේ දුන්න දීමනාවෙන් අද දවසේ යැපෙන්න බැහැ. එහෙම නම්, කාලයත් එක්ක මේ සියලු දේවල් වෙනස් වෙන්න ඕනෑ. එහෙම වෙනස් නොවෙනවා නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. ගරු අමාත්‍යතුමාත්, රාජ්‍ය අමාත්‍යතුමාත්, අදාළ කොමසාරිස්තුමා ඇතුළු නිලධාරි කණ්ඩායම අද යහපත් ක්‍රියාවලියක් සිදු කරලා තිබෙනවා. රුපියල් 600ක දීමනාව රුපියල් 1,000 දක්වා, රුපියල් 400කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම රුපියල් 800 දීමනාව රුපියල් 1,500 දක්වා, රුපියල් 700කින් වැඩි කරලා තිබෙනවා. රුපියල් 1,000ක දීමනාව රුපියල් 2,000 දක්වා, රුපියල් 1,000කින් වැඩි කරලා තිබෙනවා. රුපියල් 12,000ක දීමනාව රුපියල් 25,000 දක්වා, රුපියල් 13,000කින් වැඩි කරලා තිබෙනවා. ඒ කියන්නේ එකට එකකටත් වැඩියි. ඒ වාගේම රුපියල් 3,000ක දීමනාව රුපියල් 5,000 දක්වා, රුපියල් 2,000කින් වැඩි කරලා තිබෙනවා. මේ තුළින් සමථකරුවන්ව - බේරුම්කරුවන්ව- දිරිගැන්වීමට, උනන්දු කරවීමට හොඳ අවකාශයක් හැදෙනවා. මොකද, සොච්චම් මුදලකින් වැඩ කරන කොට ඒ වැඩේ කරන්න එතරම් උනන්දුවක් දක්වන්නේ නැහැ. කල කිරීමෙන් තමයි ඒ කටයුත්ත කරන්නේ. ඒ වාගේම මෙහි නිශ්චිත කාල සීමාවන් දක්වලා තිබෙනවා. ඒ කාල සීමාවන් තුළ ඉතා ඉක්මනින් මේ වැඩ කටයුත්ත හමාර කිරීම සඳහා ඒ වාර්තා ඉදිරිපත් කිරීම කඩිනම්ව සිද්ධ කරනවා නම්, ඒ සඳහාත් අමතර දීමනාවක් -වැඩි දීමනාවක්- ලබා දෙන්නටත් සැලසුම් කරලා තිබෙනවා; යෝජනා කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතා වටිනා යෝජනාවක් කියන එක සිහිපත් කරන්නට ඕනෑ.

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ගරු ඇමතිතුමනි, අද පත්තරේක තිබෙනවා, වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂවරයා තමාට පහර දුන්නා කියලා, පුහුණු නිලධාරියෙක් පොලීසියට කරපු පැමිණිල්ලක් ගැන. වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳව සිදු කරන ලද සාකච්ඡාවකදී තමයි මේ පහරදීම සිද්ධ වෙලා තිබෙන්නේ. මේ වාගේ සිදුවීම් බේරුම්කාර මණ්ඩලයකට යොමු කරනවාද? ඔබතුමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ ප්‍රශ්නයක් නිසායි මම මේ ගැන ඇහුවේ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම සිද්ධිය සිදු වෙලා තිබෙන්නේ පසු ගිය සතියේ බදාදායි. වෘත්තීය පුහුණු අධිකාරියේ පාලන අංශයේ අධ්‍යක්ෂ රණවීර නමැති නිලධාරියා තමයි මේ පහරදීම සිද්ධ කරලා තිබෙන්නේ. මේ නිලධාරියා සමඟ නිදහස් සේවක සංගමයේ සාමාජිකයන් වන ජයකාන්ත ඇතුළු නිලධාරීන් තුන්දෙනෙක් මේ සාකච්ඡාව සඳහා ගිහින් තිබෙනවා. මේ සාකච්ඡාවේදී අධ්‍යක්ෂවරයාට කේන්ති ගිහිල්ලා ජයරත්නත්, ඒ වාගේම සමන් කුලසූරියත්, අධ්‍යක්ෂ ජනරාල් හෙට්ටිආරච්චිත් ඉදිරියේදී පළමුවෙන්ම තර්ජනය කරලා අඩන්තේට්ටම් කරලා තිබෙනවා. ඉන් පසුව යම් පහරදීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ සිදු කළා කියන පහරදීම සම්බන්ධයෙන් මම අද වාර්තාවකුත් සකස් කරගෙන ආවා, ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න. ඒක CCTV කැමරාවලත් සටහන් වෙලා තිබුණා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

නීතිය නවන එක්කෙනෙක් ඉන්නවා නේ. එතුමාට බැරිද මේ සම්බන්ධයෙන් හරියට රාජකාරිය කරන්න?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

නීතිය නැවිය යුතු අවස්ථාවලදී නීතිය නවලා කටයුතු කරන්නත් වෙනවා. මොකද, නීතිය කැඩීම තමයි බරපතළ ප්‍රශ්නය වෙන්නේ. නීතිය නැවීමට නීතියෙන්ම අයිතිවාසිකමක් තිබෙනවා. මේ පිළිබඳව නාරාහේන්පිට පොලිසියට පැමිණිලි කරලා තිබෙනවා. මම අද උදේත් නාරාහේන්පිට පොලිසියෙන් මේ සම්බන්ධයෙන් කරුණු විමසුවා. පහරදීම සිද්ධ වෙලා සතියකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත්, නාරාහේන්පිට පොලීසිය මේ පහරදීම සම්බන්ධයෙන් පරීක්ෂණය අවසන් කරලා නැහැ. මේ සිදුවීම බොහොම සැහැල්ලුවටයි අරගෙන තිබෙන්නේ. මේ සිදුවීම දැනගත්තාට පස්සේ, නාරාහේන්පිට පොලීසියේ වැඩ බලන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධර්මකීර්ති මහත්මයාට මම ඊයේ රාත්‍රියේත් කථා කළා; අද උදේත් කථා කළා. ප්‍රධාන පොලිස් පරීක්ෂක ධර්මකීර්ති මහත්මයා පරීක්ෂා කරලා අද උදේ මට කිව්වේ, CCTV කැමරා සටහන් අරගෙන නැහැ; සාක්ෂි සටහන් කරලා නැහැ කියලායි. ඒ කියන්නේ මේ ප්‍රශ්නය ඉතා සැහැල්ලුවටයි අරගෙන තිබෙන්නේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඒ CCTV දර්ශන මැකිලා ද දන්නේ නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මගේ අතේ CD එක තිබෙනවා. මම අද උදෑසන අමාත්‍යාංශයට ගිහිල්ලා පළමුවෙන්ම කළේ ඒ CD එකේ copy එකක් මගේ අතට ගත්ත එකයි. ඒ නිසා දැන් මැකෙන්න විධියක් නැහැ. දැන් මේ සාක්ෂිය මගේ අතෙත් තිබෙනවා. ඒ නිසා ගැටලුවක් වෙන්නේ නැහැ. භය වෙන්න එපා, ඒවා මැකෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන පොලිස් පරීක්ෂක ධර්මකීර්ති මහතා මට දැනුම් දුන්නේ, යම්කිසි කෙනෙකුගේ බලපෑමක් උඩ මේ පරීක්ෂණය සිදු නොවෙන්න ඇති; නැත්නම් දින තුනක් ඇතුළත මේ පරීක්ෂණය අවසන් වෙනවා කියලායි. කොහොම වුණත්, මේ රණවීර කියන අධ්‍යක්ෂ ජනරාල්වරයා පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. මෙතුමා අද - ඊයේ ඉඳලා නොවෙයි, වසර ගණනාවක් තිස්සේ මේ ආයතනයේ වැඩ කරන කෙනෙක්. මෙතුමා වසර ගණනාවක් වැඩ කරද්දී තර්ජනය, මැරකම දිගටම ක්‍රියාත්මක කර තිබෙනවා. පසු ගිය කාලපරිච්ඡේදයේදී මේ අධිකාරියේ රාජකාරි කටයුතු කරද්දී අධ්‍යක්ෂ ජනරාල් චූලාංගනී මැතිනියට පිහියෙන් අනිනවා කියලා තර්ජනය කරලා තිබෙනවා. ඒ රාජකාරි කටයුත්ත නිසියාකාරයෙන් නීත්‍යානුකූලව, ඵලදායීව කිරීම පිළිබඳව කථාවකට ගියාම එතුමියට පිහියෙන් අනින බවට තර්ජනය කරලා තිබෙනවා. ඒ අවස්ථාවේදී මේ නිලධාරීන්ට අඩන්තේට්ටම් කරලා තිබෙනවා; සාපරාධී බිය ගැන්වීම් කරලා තිබෙනවා; ඒ වාගේම බැණ තර්ජනය කරලා තිබෙනවා. දණ්ඩ නීති සංග්‍රහයේ 486 වගන්තිය යටතේ, දණ්ඩ නීති සංග්‍රහයේ 314 වගන්තිය යටතේ අධිකරණයට ඉදිරිපත් කර දඬුවම් පැමිණ විය හැකි වරදවල් ගණනාවක් මේ නිලධාරියා සිදු කරලා තිබෙනවා.

හැබැයි, ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු මහින්ද යාපා මන්ත්‍රීතුමනි, මේ නිලධාරියා කාලාන්තරයක් තිස්සේ මේ වාගේ වැඩ දිගින් දිගටම කරමින්, කවුරු හරි ඉන්න දේශපාලන බලධාරියෙකුට හේත්තු වෙලා එතුමාව සන්තෝෂ කරමින් ඔහුගේ රැකවරණය -ආරක්ෂාව- ලබනවා. මේ අවස්ථාවේදීත් ඇති වුණේ එවැනි තත්ත්වයක්ද කියලා මම දන්නේ නැහැ. මොකද, කුරුණෑගල දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කය, මහනුවර දිස්ත්‍රික්කය, මාතලේ දිස්ත්‍රික්කය යන දිස්ත්‍රික්ක හතරේ වෘත්තීය පුහුණු අධිකාරියේ සේවකයින්ටත්, ඒ වාගේම පුහුණු වෙන දරුවන්ටත් ඔබතුමන්ලාගේ සම්මේලනයට යාම අනිවාර්යය කරලා තිබුණා. රණවීර නමැති නිලධාරියා තමයි මේ බලපෑම කරන්නේ. ඔහු තමයි මේ කටයුතු මෙහෙයවන්නේ. මෙවැනි දේවල් කරලා, අමාත්‍යවරයාත් එක්ක සමීප වෙලා අමාත්‍යවරයාගේ හොඳම ගෝලයා බවට පත් වෙනවා. ඒ අමාත්‍යවරයාත් එක්ක විවිධ දේවල් කරන පුද්ගලයෙක් බවට පත් වෙනවා. ඔහු එවැනි දේවල් කරලා හැමදාම ඔහුගේ ආරක්ෂාව හදා ගෙන තිබෙනවා. වර්තමානයේ පමණක් නොවෙයි, අතීතයේ ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා එතැන ඉන්න කාලයේදීත් ඒක වෙලා තිබෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

නීතිය නමනවාද නැත්නම් එතුමා කාටහරි නැමෙනවාද?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

නීතිය නමනවාද එතුමා නැමෙනවාද කියලා මම දන්නේ නැහැ. කොහොම හරි ඒ ඉන්න දේශපාලන නායකයාව නමා ගන්නවා. ඒක තමයි වෙලා තිබෙන්නේ. ඔහුට අවශ්‍ය දේ කර ගන්නවා. ඒ තුළ බලය පතුරවා ගන්නවා. ඒ බලය තුළ අනෙක් අයව බය කරගෙන ඉන්නවා. මෙවැනි තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. ඒ නිලධාරියාට විරුද්ධව චෝදනා ගණනාවක් තිබෙනවා.

ගරු මහින්ද යාපා මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා සමහර විට දන්නවාත් ඇති. මීට අවුරුද්දකට කලින් ආණ්ඩු කළේ ඔබතුමන්ලායි. ඒ කාලයේ ඔහු එක පැත්තකින් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් වැටුපක් ලබාගෙන තිබෙනවා; අනෙක් පැත්තෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් වැටුපක් ලබාගෙන තිබෙනවා. ඔහු මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් රුපියල් ලක්ෂ 54ක මුදලක් ලබාගෙන තිබෙනවා. මාසයකට වැටුප් දෙකක්

අරගෙන තිබෙනවා. ඔහු වැටුප් දෙකක් අරගැනීමේ ක්‍රියාවලිය වැරදියි කියලා විගණකාධිපතිවරයා ඔහුගෙන් විමසීම් කරලා තිබෙනවා. ඔහු ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවන්නේ නැහැයි කියලා විගණකාධිපතිවරයා මෑතකදී දැනුම් දී තිබෙනවා. මේ පිළිබඳව අප විමසුවාම අපට තොරතුරු එවන්නේත් නැහැ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත බලාත්මක වුණාම ඒ යටතේ අපට තොරතුරු ලබා ගෙන ඔහුට විරුද්ධව ක්‍රියාත්මක කරන්නයි වෙන්නේ. මෙන්න මේ විධියේ වපසරියක් හදා ගෙන ඔහු වැඩ කටයුතු කරනවා. පසු ගිය දිනවල මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙන් -FCID එකෙන්- ඔහුව කැඳවලා ඔහුට විරුද්ධව විමර්ශනයක් කරලා තිබෙනවා. මට දැනගන්න ලැබුණු විධියට නම්, දැන් එම ගොනුව නීතිපතිවරයාට යොමු කරලා තිබෙනවා. මෙම නිලධාරියා කටයුතු කරන්නේ මේ විධියේ අකටයුතු රාශියක් සිදු කරමිනුයි.

මීට අමතරව, මොහු මේ තනතුරට එන්නත් කටයුතු කරලා තිබෙන්නේ, පසු ගිය රජය තිබෙන අවස්ථාවේ හිටපු අමාත්‍යවරුන්ව සම්බන්ධ කරගෙන ඔහුට නැති සුදුසුකම් පෙන්වා දිලායි. එක පැත්තකින් ඉන්ධන දීමනාව වැඩිපුර අරගෙන තිබෙනවා. තවත් පැත්තකින් මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් වැටුප් අරගෙන තිබෙනවා. තවත් පැත්තකින් ව්‍යාත්තීය පුහුණු අධිකාරියෙන් වැටුප් අරගෙන තිබෙනවා. ඒ අනුව, එක මාසයකට වැටුප් දෙකක් අරගෙන තිබෙනවා. තවත් පැත්තකින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාහන පාවිච්චි කරනවා. අනෙක් පැත්තෙන් ඉන්ධන දීමනාව ගන්නවා. මේ විධියට මොහු මූල්‍ය අපරාධ ගණනාවක් සිදු කරපු ඉතාමත්ම වංචාකාරී පුද්ගලයෙක් කියන එක විගණකාධිපතිවරයාගේ විමර්ශනවලදීත්, ඒ වාගේම FCID එක කරනු ලබන විමර්ශනවලදීත් බොහොම පැහැදිලිවම අනාවරණය වෙලා තිබෙනවා. දැන්, එහෙම අනාවරණය වෙලා තිබියදී ඔහු ඔහුගේ අධිකාරය හදා ගන්නවා; ඔහු බලය හදා ගන්නවා. එක වෙලාවක ඔහු නිදහස් සේවක සංගමයට නායකත්වය ලබා දුන්නා. ඒ නිදහස් සේවක සංගමය මෙහෙය වූයේ ඔහුයි. ඊට පසුව ආණ්ඩුව මාරු වෙලා යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාම ඔහුට යම් ප්‍රශ්න එන කොට ඔහු "පොදු සේවක සංගමය" කියලා සංගමයක් හැදුවා. නිදහස් සේවක සංගමය කඩාකප්පල් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික නියෝජිතයා)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(මාණ්ඩලික නියෝජිතයා)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව සුළු මොහොතකින් මගේ කථාව අවසන් කරනවා. ඔහු පොදු සේවක සංගමය කියලා සංගමයක් හදා ගත්තා. ඔහු පොදු සේවක සංගමය කියලා සංගමයක් හදා ගත්තේ සේවක සංගමයේ සේවකයන්ගේ උන්නතිය සඳහා නොවෙයි. ඔහු එය හැදුවේ ඔහුගේ ආරක්ෂාව සඳහායි. සමස්ත අධිකාරියේ නිලධාරීන්ගෙන් ඔහුගේ ආරක්ෂාව සඳහා වළල්ලක් සාදා ගැනීමට; පවුරක් සාදා ගැනීමට ඔහු කටයුතු කළා. ඔහු ඉතාමත්ම උපක්‍රමශීලීව; වංචාසහගතව; විනයක් නැතිව -අවිනීතව- කටයුතු කරන නිලධාරියෙක්. ඔහු හැමදාම දේශපාලන රැකවරණය ලබනවා. අපේ යහ පාලන රජය යටතේ අදත් ඔහු එම තනතුරේ ඉන්නේත් පැරණි කාලයේ කරපු ඔක්කෝම වැරදි වැඩ තවදුරටත් රැකගෙන ඉදිරියට යන්නේත් මේ වපසරිය තුළයි කියන එක මම සිහිපත් කරන්න කැමැතියි. ඔබතුමන්ලා අපහු ප්‍රශ්න නිසා කාලය ගතවීම නිසා මට වෙනත් කරුණු කථා කරන්නට නොහැකි වීම පිළිබඳව මම කනගාටු වනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.47]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்குப் பேசுவதற்கு சந்தர்ப்பம் தந்ததற்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். வடக்கு, கிழக்குப் பகுதிகளைப் பொறுத்தவரையிலே அங்கு யுத்தத்தின் பின்பு மீள் குடியேற்றம் நடைபெற்று 7 வருடங்கள் நிறைவடைந்திருக் கின்றன. இந்த நிலையிலும் கைத்தொழில் தொடர்பாக ஒரு முறையான, திட்டமிட்ட அபிவிருத்தி வேலைகள் அந்தப் பிரதேசங்களில் நடைபெறாதமை இங்கு சுட்டிக்காட்டத்தக்கது. புதிய கைத்தொழில்களை உருவாக்குவதென்பதற்கு அப்பால், யுத்த காலத்துக்கு முன்பு வட புலத்திலே இயங்கிய கைத்தொழிற்சாலைகள் மீண்டும் இயக்கப்பட வேண்டும். அவை இதுவரை இயக்கப்படாது தொடர்ந்தும் புறக்கணிக்கப் பட்டு வருகின்றமையானது வடக்கு, கிழக்கு மக்களை ஏழ்மை நிலையில் வறியவர்களாகவும் வாழ்க்கைத்தரத்தை உயர்த்த முடியாத நிலைமைக்கும் இட்டுச்செல்கிறது. யுத்த காலத்தின் போது மக்களுக்கு வருமானத்தைப் பெறக்கூடிய பல்வேறு தொழில்கள் காணப்பட்டன. ஆனால், யுத்தத்தின் விளை வினால் தமது அனைத்து சொத்துக்களையும் இழந்த மக்கள் வெறுங்கையோடு மீள்குடியேறினார்கள். அரசினாலும் அரச சார்பற்ற நிறுவனங்களாலும் அபிவிருத்தி என்ற போர்வை யிலே பலகோடி ரூபாய் கொட்டப்பட்டாலும் அந்தப் பணமானது, உரிய முறையிலே திட்டமிடப்பட்டு உரியவர் களைச் சென்றடையாமையால்தான் இன்றும் முல்லைத்தீவு மாவட்டம் ஏழ்மையான மாவட்டமாக காணப்படுகின்றது.

மீள்குடியேற்றத்தின் பின்பு பொருளாதார அபிவிருத்தி அமைச்சினால் விவசாயம், கால்நடை, மீன்பிடி தொடர்பான பல்வேறு வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்பட்டன. ஆனால், அவை பொருத்தமான திட்டமிடலினூடாக முன்னெடுக்கப்படவில்லை. இதற்கு மாறாக இங்கு உற்பத்தி செய்யப்படுகின்ற மூலப்பொருட்களை முடிவுப் பொருளாக்கக் கூடிய கைத்தொழிற்சாலைகளோ, குடிசைக் கைத்தொழில் களோ முறையாக ஆரம்பிக்கப்படவில்லை. உற்பத்தி செய்யப்படுகின்ற மூலப்பொருட்கள் மூலப்பொருட்களாகவே தென்பகுதிக்கு இன்றுவரை கொண்டுசெல்லப்படுகின்ற நிலைமை காணப்படுகின்றது. குறிப்பாக பால், நெல் போன்ற உற்பத்திப் பொருட்களை உதாரணமாகக் கூறமுடியும். இவ்வாறான தொழிற்சாலைகள் ஆரம்பிக்கப்படாமையினால் தொடர்ந்து மீள்குடியேறுகின்ற எமது மக்கள் கூலியாட் களாகவும் மாடு மேய்ப்பவர்களாகவும் வாழ்ந்து வருகின்ற நிலைமையைக் காணக்கூடியதாக இருக்கின்றது. அது மட்டுமல்ல, யுத்தத்தின் பின்பு போக்குவரத்து, மின்சாரம் போன்ற வசதிவாய்ப்புக்களை ஏற்படுத்திக்கொடுப்பதற்கு வாய்ப்புக்கள் இருந்தும் அவற்றில் கவனம் செலுத்தப்படாமை இங்கு ஈண்டு குறிப்பிடத்தக்கது. மேலும், குடிசைக் கைத்தொழிலில் விசேட கவனம் செலுத்தப்படவேண்டிய ஒரு நிலைப்பாடு வடக்கு, கிழக்குப் பகுதிகளில் காணப்படுகின்றது. இங்கு உற்பத்தி செய்யப்படுகின்ற உள்ளூர் உற்பத்திகளை மற்றும் நிரந்தரமாகக் காணப்படுகின்ற பனை, தென்னை போன்ற வளங்களை மையமாகக்கொண்டு சிறுகைத்தொழிற் சாலைகள் ஆரம்பிப்பதன்மூலம் அங்கு வேலைவாய்ப்புக் களை ஏற்படுத்திக்கொடுக்க முடியும். இன்று இயந்திரமய மாக்கல் காரணமாக அங்கு வாழ்கின்ற மக்கள் வேலை வாய்ப்பற்ற ஒரு நிலையில் காணப்படுகின்றார்கள்.

இதனால் எமது மக்கள் வருமானமில்லாமல் தொடர்ந்தும் ஏழைகளாக வாழ்ந்து வருகின்ற நிலையே காணப்படுகின்றது.

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

අවර්කළුට උර්පත්තිකළෙ මෙයමාක වෙත්තු අවර්කළුක්කු වේලෙවාය්ප්පුකළෙ වළංකුකින්ර වකෙයිල් තොළිර්චාලෙකළෙ ආරම්පිත්තු අවර්කළුට වාළ්ක්කෙත් තරත්තෙ උයර්ත්තක්කූටිය වකෙයිල් තිට්ටංකළෙ වකුප්පතර්කු මාරාක, "පනෙයාල් විළුන්තවනෙ මාටේරි මිතික්කින්ර කතෙපෝල" වටපකුතියිලේ වකෙතොකෙයින්රි මතුපානචාලෙකළෙත් තිරප්පතර්කාන අනුමති වළංකප්පටුකිරතු; තෙන්පකුතියිලිරුන්තු වරුකින්රවර්කළ් චට්ටත්තුක්කු මුරාණාන වකෙයිලේ අත්තුමීරි මීන්පිටිත්තොළිලිල් ඊටුපටුවතර්කු අනුමතික්කප්පටුකිරතු; මණ් කටත්තුවතර්කුත් තොටර්න්තු අනුමති වළංකප්පටුකිරතු. ඉව්වාරාන චෙයල්කළිනාල් අංකු වාළුම් මක්කළ් මිකවුම් පාතික්කප්පටුකිරාර්කළ්. උතාරණමාක, උළෛක්කක්කූටිය ඉරණ්ටු පිළ්ළෛකළෙ යුත්තත්තිලේ ඉළන්ත ඔරු තාය් තනක්කුක් කිටෙත්ත වීට්ටුත්තිට්ටත්තුක්කු මණ්ණෙප් පෙට්රුක් කොළ්වතර්කුප් පටුකින්ර කෂ්ටම් චොල්ලිලටංකාතු. ආනාල්, අතර්කු මාරාක වටපකුතියිලිරුන්තු 'ටිප්පර්' කළිලේ අතිකළවාන මණ් කටත්තප්පටුකිරතු එන්පතෙ නාන් ඉංකු කුරිප්පිට වේණ්ටුම්. අත්තුටන්, කලාචාර චීරාළිවුකළෙ ඒර්පටුත්තුකින්ර වකෙයිල් මතුපානචාලෙකළෙත් තිරන්තු අංකුළ්ළ ඉළෛඥර්කළෙච් චමාතානමර්රවර්කළාක, මුරණ් පාටුටෙයවර්කළාක වළර්වතර්කු වළිචමෙත්තුක් කොණ්ටිරුක්කින්ර නිලෙමෙයුම් තොටර්න්තු කොණ්ටිරුක් කින්රතු.

යුත්ත කාලත්තිලේ අංකු වාළ්න්තවර්කළුක්කු, කුරිප්පාක තාය්මාරුක්කු 'ෂෙල්' වන්තු විළලාම්, 'කිපීර්' වන්තු කුණ්ටු පෝටලාම් එන්ර ඉර් අච්චම් මට්ටුම්තාන් ඉරුන්තතු. ආනාල්, ඉන්රු අවර්කළ් කලාචාරත්තෙච් පාතුකාප්පතු, තමතු පිළ්ළෛකළෙ ඔළුක්කමුළ්ළවර්කළාක වළර්ත්තෙටුප්පතු, වේලෙවාය්ප්පෙප් පෙට්රුක්කොළ්වතු, වරුමානත්තෙ ඊට්ටුවතු පෝන්ර පල්වේරුවිතමාන නටවටික්කෛකළෙ මේර්කොළ්වතිල් මිකවුම් කෂ්ටප්පටුකිරාර්කළ්. කුරිප්පාක කණවනෙ ඉළන්ත, කණවනෙප් පරිකොටුත්ත, කණවනෙප් පටෙයිනරින් කෛයිල් කොටුත්තු ඉන්රුවරෙ එංකේයෙන්රු තෙරියාමල් තේටික්කොණ්ටිරුක්කින්ර, නීණ්ටකාලමාක තමතු පිළ්ළෛකළ් චිරෙයිලේ වාටුවතාල් ඔරුනේර චෝර්රුක්කුක් කූට අල්ලර්පටුකින්ර තාය්මාර්, යුත්තත්තිලේ තමතු අංක අවයවංකළෙ ඉළන්තු මාර්රුත්තිරනාළිකළාක ඉරුප්පවර්කළ්, තාය්, තන්තෙයෙ ඉළන්තු අනාතෙකළාක ඉරුක්කින්ර පිළ්ළෛකළ් ඉප්පටියාක යුත්තත්තිලේ නේරටියාකප් පාතික්කප්පට්ටෝරෙ මෙයමාක වෛත්තු අවර්කළුට උටල් ආරෝක්කියම්, උළනලන්කළෙප් පාතුකාක්කින්ර වකෙයිල් තිට්ටංකළ් වකුක්කප්පට වේණ්ටුම්.

අවර්කළ් තංකළුටෙය නිලෙමෙක්කු ඒර්රවකෙයිල්, තොළිල්කළෙච් චෙය්වතර්කු වාය්ප්පුක්කළෙ ඒර්පටුත්තික්කොටුක්ක වේණ්ටුම්. ඉතෙවිටුත්තු, තොටර්න්තුම් අවර්කළුටෙය වාළ්වාතාරත්තෙප් පාතික්කින්ර වකෙයිල් චෙයර්පටක්කූටාතු. කුරිප්පාක මුල්ලෛත්තීවු මාවට්ටත්තින් මීන්පිටිත් තොළිලෙ ඉංකු ඈන්ටු කුරිප්පිටවේණ්ටුම්. අංකු අමෛච්චර් වරුකින්රාර්; චෙයලාළර් වරුකින්රාර්; මාවට්ට මට්ටත්තිලේ උයර් අතිකාරිකළෝටුම් මීනවච් චංකංකළෝටුම් චන්තිප්පුක්කළෙ ඒර්පටුත්තුකින්රාර්; පල තීර්මානංකළ් නිරෛවේර්රප්පටුකින්රන. ආනාල්, නිරෛවේර්රප්පටුකින්ර තීර්මානංකළ් එතුවුම් අංකු චෙයර්පටුත්තප්පටුවතිල්ලෙ. තෙන්පකුතියිලිරුන්තු වරුකින්ර චිංකළ මීනවර්කළ් අංකු චට්ටත්තිර්කු මුරාණාන වකෙයිල් තොටර්න්තු මීන්පිටිත් තොළිලිල් ඊටුපටුවතනාල්, අප්පිරතේචත්තිල් වෙරුංකෛයෝටු මීල්කුටියේරිය මක්කළ් තංකළුටෙය වාළ් වාතාරත්තෛක් කට්ටියෙළුප්ප මුටියාත නිලෙමෙයිල් ඒමාර්රප්පට්ටවර්කළාක වාළ්න්තුවරුකින්රාර්කළ්. ආකවේ, ඉන්ත නිලෙමෙකළෛක් කරුත්තිල්කොණ්ටු වටක්කු, කිළක්කු පකුතිකළිලේ කුටිචෛක් කෛත්තොළිල්කළෙ උරුවාක්කි, තොළිර්චාලෙකළෙ ඉයංකවෛත්තු, අංකු කාණප්පටුකින්ර මූලප්පොරුට්කළෙ මුටිවුප් පොරුට්කළාක මාර්රක්කූටිය වකෙයිල් තිට්ටංකළෙ වකුත්තු, අංකුළ්ළ මක්කළින් වාළ්වාතාරත්තෛ මේම්පටුත්තක්කූටිය වකෙයිලුම් අවර්කළ් නල්ලිණක්කත්තෝටු වාළක්කූටිය වකෙයිලුම් චෙයර්පට වේණ්ටුමෙන්රු කේට්ටු, නිරෛවුචෙය්කින්රේන්. නන්රි!

[අ.භා. 3.57]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම වර්තමාන රජයට, රජයේ හෝ වේවා පෞද්ගලික අංශයේ හෝ වේවා ආයෝජන ගැන විශ්වාසයක් තිබෙනවා. මේ රටේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්න, දළ දේශීය නිෂ්පාදනය වැඩි කරන්න, රාජ්‍ය වාගේම පෞද්ගලික ආදායම් වැඩි කරන්න නම් මේ අවස්ථාව උදා කර ගන්න ඕනෑ. ඒ වාගේම වර්තමාන රජය දැඩි වගකීමකින් බැඳී ඉන්නවා, මේ රටේ ශ්‍රම හමුදාව, එහෙම නැත්නම් සේවකයන් ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කරන්න. අපි දන්නවා, අපේ රටේ ජීවනාලිය, අපේ රටේ ශක්තිය තමයි අපේ රටේ ශ්‍රම හමුදාව බව. මේ රජය විවිධ නීති - රීති, අණපනත් ගෙනැල්ලා, විවිධ පහසුකම් සලසා මේ අයව ආරක්ෂා කර ගැනීමට කටයුතු කරනවා. මේ ආයතන රජයේ ආයතන වන්න පුළුවන්; සමහර විට පෞද්ගලික ආයතන වන්නත් පුළුවන්. ඒ කවරක් වුවත් ඒවායේ විවිධ ගැටලු මතු වෙනවා. සේවකයා සහ ස්වාමියා අතර විවිධ ගැටලු මතු වෙනවා. එම මතු වන ගැටලු වැඩි කාලයක් නොයවා ඉතා ඉක්මනින් විසඳා ගන්න කටයුතු කරන්න සිද්ධ වෙනවා. කොටින්ම කියනවා නම්, නියපොත්තෙන් කඩන්න තිබෙන දේ අවසානයේදී පොරොවෙන් කපන්නත් බැරි තත්ත්වයක් උදා වෙනවා. එසේ වූ අවස්ථා අපි පසු ගිය කාලයේ ඕනෑ තරම් දැක්කා. ඒ නිසා සේවක ගැටලු කල් නොයවා විසඳා ගැනීම සේවකයාටත්, ස්වාමියාටත්, රටේ තිබෙන සම්පත්වලටත් හොඳයි කියලා මා හිතනවා. එමඟින් රාජ්‍ය දේපොළත් ආරක්ෂා වෙනවා; සියලු දේපොළ ආරක්ෂා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන යහ පාලන තත්ත්වය තුළ මේ රටේ සේවකයන්ට දැඩි විශ්වාසයක් තිබෙනවා, මේ රජය ඒ අය ගැන බලනවා, ඒ අයගේ දුග්ගැනවිලි ගැන බලනවා, ඒ අයගේ අයිතිවාසිකම් ලබා දෙනවා කියලා. ඒ වාගේම, ඒ අයට ඇහුම් කන් දෙනවා කියන එක ගැනත් දැඩි විශ්වාසයක් තිබෙනවා. නමුත් පසු ගිය අවුරුදු ගණනාව තුළ අපි දැක්කා, එවැනි විශ්වාසයක් තිබුණේ නැති බව. සේවකයන් රටේ වැඩ කළේ දැඩි පීඩනයකින්. මොකද, වැඩියෙන් කථා කළොත්, එදා සුදු වැන් එකකින් ඇවිත් උස්සාගෙන ගියා. එදා ප්‍රශ්න කිය කියා ඉන්න විධියක් තිබුණේ නැහැ. නමුත් එදා නොලැබුණු ඒ නිදහස මේ රටේ සියලු ජනතාවට අද ලැබී තිබෙනවා. එදා මගේ ප්‍රදේශයේ -වැලිවේරිය ප්‍රදේශයේ- බොන්න වතුර ටික දෙන්න කියලා ජනතාව උද්ඝෝෂණය කළාම ඒ උද්ඝෝෂණය විසඳුවේ බේරුම්කාරයකු මාර්ගයෙන් නොවෙයි, වෙඩි උණ්ඩයෙනුයි. පාසල් යන දරුවන් දෙදෙනෙකුත්, බියගම නිදහස් වෙළෙඳ කලාපයේ වැඩ කරපු කම්කරුවකුත් මරා දමමින් තමයි එදා ඒ ප්‍රශ්නය විසඳුවේ. බේරුම්කරුවන් හරහා නොවෙයි, ඒ ප්‍රශ්නය විසඳුවේ. එදා ඉන්ධන සහනාධාරය ඉල්ලපු හලාවත ඇත්තනී ඇතුළු උද්ඝෝෂකයන්ගේ ප්‍රශ්න විසඳුවේ, වෙඩි උණ්ඩයෙන්.

පොලීසිය ඔහුව මහා දවල් මරා දැමුවා. එහෙමයි එදා ප්‍රශ්න විසඳුවේ. ඒ විතරක් නොවෙයි. ඒකල කර්මාන්ත පුරයේ සේවකයන් ඇවිල්ලා, "අපේ පාරිතෝෂික දීමනාව රජයට පවරාගන්න එපා! ඒවා අපේ සල්ලි!" කියා උද්ඝෝෂණය කරන කොට; විරෝධය ප්‍රකාශ කරන කොට මහ දවල් දෙනෝ දාහක් ඉස්සරහා රොෂේන් චානක මරා දමලායි ඒ උද්ඝෝෂණ ව්‍යාපාරය නැවැත්තුවේ. නමුත් මේ රජය එහෙම කරන්නේ නැහැ. මේ රජය තමන්ගේ ප්‍රතිපත්ති වෙනස් කරලා, ඇහුම් කන් දීලා, බෙරුම්කරුවන් යොදවා අදාළ ප්‍රශ්න ගැන සාකච්ඡා කරලා හැමෝටම කන් දෙන යුගයක් නිර්මාණය කර තිබෙනවා. යහ පාලන ප්‍රතිපත්ති අගය කරමින් මේ රටේ කටයුතු කරනවා. ඒ නිසාම පසු ගිය කාලයේ උද්ඝෝෂණ වැඩි වෙලා තිබෙනවා අපි දැක්කා. මොකද, අවුරුදු ගණනක් තිස්සේ තමන්ගේ අදහස් කියා ගන්න බැරිව, තද කරගෙන, තෙරපාගෙන සිටි සේවකයන්, තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න බැරිව සිටි ජනතාව අදහස් ප්‍රකාශ කරන්න එළියට බැහැලා තිබෙනවා. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති වීමේ, අපේ රටේ පාලනය ක්‍රමවත් වීමේ, එහෙම නැත්නම් යහ පාලනයට පරිවර්තනය වීමේ ප්‍රතිඵලයක් විධියට තමයි අප එය දැක්කේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2006 වර්ෂයේ උද්ඝෝෂණ නිසා, වැඩ වර්ජන නිසා මේ රටට අහිමි වූ මිනිස් දින ගණන 48,95,148ක් වනවා. 2013 වර්ෂයේ වැඩ වර්ජන නිසා මේ රටට අහිමි වූ මිනිස් දින ගණන 80,423ක් වනවා. 2015 වර්ෂය දිහා බැලුවාම, මිනිස් දින 82,294ක් මේ රටට අහිමි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රැකියාවේ යෙදෙනවා කියා පඩි අරගෙන, තමන්ගේ සේවය සපයන්නේ නැතිව විවිධ උද්ඝෝෂණ ව්‍යාපාරවල ඇතැම් සේවකයන් යෙදී සිට තිබෙනවා කියන එකයි. මුළු අවුරුද්ද තුළම පුද්ගලයන් 350ක් වාගේ ප්‍රමාණයක් වැඩ නොකර සිට තිබෙනවා, අදාළ දීමනා සහ වැටුප් අරගෙන. නමුත්, මේක හොඳ ප්‍රවණතාවක් නොවේ. මුලින්ම අපි මේවා විසඳා ගන්න ඕනෑ. ඒ සඳහායි මේ රජය දැඩි ලෙස උත්සාහ කරන්නේ. අපි දන්නවා, මේ රටේ ආර්ථික ප්‍රශ්න තිබෙන බව. නමුත්, ආර්ථික ප්‍රශ්න තිබියදී වුණත් අපි කරන්න ඕනෑ දේ හරියට කරනවා. සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවා. මොකද, සේවක ආරාවුලක් පරක්කු වෙන්න, පරක්කු වෙන්න ස්වාමියාට ඇති වන ප්‍රශ්නයක් නැහැ. ස්වාමියා කැමැතියි, මේක පරක්කු වෙනවාට. ඇදි ඇදී යනවාට කැමැතියි. නමුත්, සේවකයාගේ අයිතිවාසිකම් තමයි ලැබෙන්නේ නැත්තේ. සේවකයාගේ, නැත්නම් කම්කරුවාගේ, එහෙම නැත්නම් සේවය ලබා දෙන පුද්ගලයාගේ ආර්ථිකයයි කඩා ගෙන වැටෙන්නේ. ඒ නිසා මේ ආරවුල් විසඳුණේ නැතත් මේවා ඇදි ඇදී කල් යන කොට ඔහුගෙන් යැපෙන්නන් තමයි අගතියට පත් වෙන්නේ. ඒවා නවත්වන්න තමයි වර්තමාන රජය, විශේෂයෙන් ගරු ඇමතිතුමා මැදිහත් වෙලා; නියෝජ්‍ය ඇමතිතුමා මැදිහත් වෙලා යහපාලන ප්‍රතිපත්ති තුළ මෙවැනි දේවල්වලට මුදල් යොදවා මේ ආරාවුල් බෙරුම්කරුවන්ගේ දීමනාව එකකට එකක්, එහෙම නැත්නම් දෙගුණයකින් වාගේ වැඩි කර ලබා දීම සඳහා අනුමත කර ගන්න අද මේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා බෙරුම්කරුවන් හොයා ගන්න බැරි වුණා. මොකද, ඒ අයට ගෙවන ගණන අඩුයි. ඕනෑ නැති දේවල්වලට පසු ගිය රජය සල්ලි වියදම් කළාට පුද්ගලයන්ගේ ප්‍රශ්න, සේවකයන්ගේ ප්‍රශ්න විසඳන්න මුදල් යොමු කළේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි. එදා බෙරුම්කරුවකුට ගන්න පුළුවන් වුණේ උපරිම රුපියල් දොළොස් දහසයි. අද රුපියල් විසිපන්දහසක් දක්වා ඒක වැඩි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අලුත් ක්‍රමයකුත් ඇතුළත් කර තිබෙනවා. සති පහක් ඇතුළත බෙරුම්කරණය කරලා වාර්තාවක් කම්කරු කොමසාරිස්වරයාට ලබා දෙනවා නම්, - "සියලු දේ කරලා ඉවරයි. මෙන්න වාර්තාව" කියලා ලබා දෙනවා නම් - තවත් රුපියල් පන්දහසක අමතර දීමනාවක් බෙරුම්කරුවාට ගෙවනවා. මේ හැම දේම කරන්නේ ඇයි? මේ හැම දේම කරන්නේ සේවකයාගේ අයිතිවාසිකම ආරක්ෂා කර දෙන්න වාගේම ඔහුගේ ප්‍රශ්නයට ඉතා කඩිනමින් විසඳුමක් ලබා දෙන්නයි.

මා කලින් කිව්වා වාගේ සේවකයාගේ මේ බෙරුම්කරණය පරක්කු වෙන්න, පරක්කු වෙන්න පාඩු සිදු වන්නේ ඒ සේවකයාගෙන් යැපෙන්නන්ට සහ සේවකයාටයි. අපි දැක්කා, සමහර හාම්පුතුන් එහෙම නැත්නම් ස්වාමියන් මේක හිතුමතේ පරක්කු කරවනවා. ඇයි ඒ? ප්‍රශ්නය ඇදි ඇදී යන කොට එපා වේවි කියලා හිතාගෙන. නමුත්, ඒ තත්ත්වය වැළැක්වීම සඳහා අද අඩිතාලම දමා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය අවසානයි. ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

විශේෂයෙන්ම අපි වෘත්තීය සමිති ව්‍යාපාර ශක්තිමත් කළ යුතුව තිබෙනවා. මේ රටේ වැඩ කරන ජනතාවගෙන් සියයට 15ක්වත් වෘත්තීය සමිතිවල සාමාජිකයන් වෙලා නැහැ. වැඩ කරන ජනතාවගෙන් සියයට 85ක් වෘත්තීය සමිතිවලට බැඳිලා නැහැ. නමුත්, ඒ විශ්වාසය ගොඩ නඟමින් මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය දේශපාලන අවස්ථාවාදී ව්‍යාපාරයක් නොකර, රට ආරක්ෂා කරන, ජනතාව ආරක්ෂා කරන, වැඩ කරන සේවකයා ආරක්ෂා කරන ව්‍යාපාරයක් බවට පත් කිරීමට කටයුතු කළ යුතුයි කියන එකත් කියමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා. 4.04]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළමුවෙන්ම ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයක් ගැන කිව යුතුයි. එතුමා කිව්වා, "වැඩ වර්ජන නිසා වැඩ කරන දින ගණන මෙච්චර මෙච්චර අහිමි වෙලා තිබෙනවා, මේ

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

අය පඩි අරගෙනයි වැඩ වර්ජන කරලා තිබෙන්නේ" කියලා. එහෙම නම් එතුමා වැඩ වර්ජන ගැන දන්නේ නැහැ. වැඩ වර්ජනයකින් පසුව, වැඩ වර්ජනය කාලයේ මුදල් පිළිබඳ ප්‍රශ්නය ලොකුම ප්‍රශ්නයක් බවට පත් වන බව එතුමා දන්නේ නැහැ. ඒ අය වර්ජනය කරන කොටම හාමිපුතා කරන දේ තමයි ඒ දිනවල වැටුප් කපා හරින එක. ඊට පස්සේ වැඩ වර්ජනය ඉවර වෙලා යන්න ලැහැස්ති වුණාම මේ ප්‍රශ්නය බරපතළ ආරාවුලක් බවට පත් වෙනවා. ඒ නිසා මේ වැඩ දින ගණන අහිමි වුණේ ඔවුන් වැටුප් අරගෙන නොවෙයි. තමන්ගේ රැකියාව පරදුවට තියලා, තමන්ට ලැබෙන්න තිබෙන වැටුප පරදුවට තියලා තමයි මිනිස්සු වැඩ වර්ජනය කරලා තිබෙන්නේ. ඒක තේරුම් ගත යුතුව තිබෙනවා.

ඊළඟට බේරුම්කාර ප්‍රමාදය ගැන කිව්වොත්, බොහෝ විට සවස් භාගයේ තමයි මේ බේරුම්කාර කටයුතු සිදු වන්නේ. සවස 2.30න් පස්සේ තමයි එන්නේ. නීතිඥවරුනුත් උදේ උසාවි ගිහිල්ලා සවස් කාලයේ තමයි බේරුම්කාර කටයුතුවලට එන්නේ. එහෙම ආවාට පස්සේ ඊට පෙර දවසේ විභාගයේ සටහන්වල හරි වැරදි බලලා ඉවර වෙන කොට සවස 3.30 විතර වෙනවා. එතකොට එම කාර්ය මණ්ඩලවල අය රාජකාරි නිමවෙලා යන්න ලැහැස්ති වන වෙලාව. කාර්ය මණ්ඩලවල අයට කියන්න බැහැ, සවස 4.00න් පස්සේ වැඩ කරන්න කියලා. ඒ නිසා වෙන්නේ බේරුම්කාර නඩු හැමදාම කල් යන එකයි. ඒ නිසා මේ බේරුම්කාර නඩු සඳහා අවුරුද්ද, දෙක, දෙකහමාර ගත වන අවස්ථා තිබෙනවා. ඒ නිසා මේ ව්‍යක්තීය සමිතිවලින් කම්කරු හා ව්‍යක්තීය සබඳතා ඇමතිතුමාට කිව්වා -[බාධා කිරීමක්] කම්කරු හා ව්‍යක්තීය සබඳතා ඇමතිතුමා මේ කාරණයට විතරක් ඇහුම් කන් දුන්නොත් මම ස්තුතිවන්ත වෙනවා. ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න ඇමතිතුමනි, ඔබතුමා මා මේ කියන කාරණයට විතරක් ඇහුම් කන් දුන්නොත්, මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
කියන්න, මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ ව්‍යක්තීය සමිතිවල අය කිව්වා, මේ අයට අතිකාල දීමනාවක් දෙන්නය කියා. කාටද? කාර්ය මණ්ඩලවලට. නැත්නම් ඒ මිනිසුන් පස්වරු 3.30න් පසුව ඉන්න ලැහැස්ති නැහැ. පස්වරු 2.30ට ඇවිල්ලා 3.30 වෙනකොට වැඩ ඉවර කරලා කාර්ය මණ්ඩලය යන්න ලැහැස්ති වෙන නිසා හැම දාම නඩු කල් යනවා. මේකට එක්තරා විසඳුමක් හැටියට තමයි මේ අයට අතිකාල දීමනාවක් දෙන්නය කියා කිව්වේ. මම කියන්නේ මේකයි. බේරුම්කරුවන්ට දීමනා වැඩි කරනවා වාගේම ඔබතුමා මේ කාර්ය මණ්ඩලවලටත් අතිකාල දීමනා දෙන්න යම් තීන්දුවක් ගෙනාවා නම් අවුරුද්දක් ගත වෙන මේ බේරුම්කාර කටයුතු අපට මාස හයකින් ඉවර කර ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් හිත යොමු කරනු ඇතැයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, අය වැය සහන දීමනාව ගැන කථා කරමු. අලුතින් බැඳෙන සේවකයන්ට මේ අය වැය සහන දීමනාව අයිති නැහැ කියා හාමිපුතුන්ගේ සංගමය අර්ථකථනයක් දීලා තිබෙනවා. හාමිපුතුන්ගේ සංගමය ඔබතුමාගේ නීතිය අර්ථකථනය කරලා තිබෙනවා, "අලුතින් බැඳෙන සේවකයින්ට රුපියල් 2,500 දීමනාව අයිති නැහැ" කියා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒ ගොල්ලන් ඒ කාරණය අපටත් දැන්වුවා. අපි කිව්වා මේක කිසිම පදනමක් නැති අර්ථ නිරූපණයක් කියා. එහෙම එකක් මේකේ නැහැ. සේවකයෙක් කොයි අවස්ථාවේ බැඳුණත් ඊට පසුව ඔහුට රුපියල් 2,500 හිමියි. අපි ඒකත් පැහැදිලි කරලා දුන්නා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කොච්චර කිව්වත්, ඔබතුමා ඇමතිවරයා හැටියට කොච්චර අර්ථ නිරූපණ දුන්නත්, ඒ අය දෙන අර්ථ නිරූපණය අනුව තමයි ඒ අය ක්‍රියා කරන්නේ. ඒ නිසා ඒවා සම්බන්ධයෙන් විශේෂ ප්‍රමුඛතාවක් ලබා දීලා ඒවාට වුවමනා කරන නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීමට ඔබතුමා මැදිහත් වෙයි කියා මා විශ්වාස කරනවා. මොකද, මේ කාලයේ හාමිපුතුන්ගේ සංගමයෙන් දීපු අර්ථ නිරූපණය නිසා දැන් හාමිපුතුන්ගේ සංගමයට වේගයෙන් සාමාජිකයන් බැඳෙනවා. නොයෙක් කොම්පැනිකාරයන් ඇවිල්ලා දැන් හාමිපුතුන්ගේ සංගමයට බැඳෙනවා, ඒ අර්ථ නිරූපණයට අනුව රුපියල් 2,500 නොගෙවා සිටීම සඳහා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගේ නෛතික හැකියාව ඔබතුමා ප්‍රයෝජනයට ගන්න. ඔබතුමා රවි කරුණානායක අමාත්‍යතුමා ආදර්ශයට ගත්තොත් හොඳයි. අන්න, එතුමා සුරා බදු දෙපාර්තමේන්තුවට ඔහේ බුදියා ගන්න ඇරලා අමාත්‍යාංශයේ වැටලීම් කාර්ය මණ්ඩලයක් හදා තිබෙනවා. එසේ හදලා එතුමා වැඩ කරනවා. ඒ වාගේම එතුමා අමාත්‍යාංශයේ තවත් ඒ වාගේ වැටලීම් කාර්ය මණ්ඩල හදා ගෙන තිබෙනවා, දෙපාර්තමේන්තු නිලධාරීන්ට කුද ගහ ගන්නය කියා. මේ නීතිය නොතකා ක්‍රියා කරන හාමිපුතුන් ගැන සොයා බලා ඔවුන්ව මේච්චල් කර ගැනීමේ මාර්ගයක් හැටියට ඔබතුමාටත් එහෙම එකක් හදා ගන්න බැරිද කියා මම ඔබතුමාගෙන් විමසන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඊළඟ කරුණ මෙයයි. මේ ආණ්ඩුව බලයට ගෙන ඒමට උදවු කරපු ව්‍යක්තීය සමිති නායකයෙකුම මට කිව්වා, මේ ආණ්ඩුව යටතේ විවෘතවම ව්‍යක්තීය සමිති කඩා දැමීමේ වැඩ පිළිවෙළක් මේ හාමිපුතුන් ගෙන යනවාය කියා. එතුමා මගේ යහළුවෙක්. පසු ගිය ජනාධිපතිවරණය සහ මැතිවරණය පැවැති කාලයේදී අපි වෙනස් මතවල සිටියේ. එතුමා මේ ආණ්ඩුවට උදව් කරපු කෙනෙක්. ඔහු කියනවා මේ ආණ්ඩුව බලයට ආවාට පසුව දැන් විවෘතවම ව්‍යක්තීය සමිති කැඩීමේ ව්‍යාපාරයක් හාමිපුතුන් ගෙන යනවාය කියා. ඒකට ඒ ගොල්ලන් වචනයකුත් හදා ගෙන තිබෙනවාලු, "trade union mafia" කියා. ඒ කියන්නේ ව්‍යක්තීය සමිතියක් හැදෙනකොට ඒකට කියන්නේ, "මාෆියාව" කියායි. ඒ මාෆියාව මෙල්ල කළ යුතුයි කියන පදනමේ ඉඳගෙන තමයි මේ හාමිපුතුන් වැඩ කරගෙන යන්නේ. ඔවුන් පෝස්ටර් පවා ගහනවා. "ව්‍යක්තීය සමිති මාෆියාව හෙළා දකිමු" කියා ඔවුන් පෝස්ටර් පවා ගහනවා. එහෙම පෝස්ටර් ගහන්නේ කවුද? හාමිපුතුන්. දැන් වනවිට තැන් කිහිපයක මේ තත්ත්වය උද්ගත වෙලා තිබෙනවා. ඒ තැන් මොනවාද කියා ගරු ඇමතිතුමාට කියන්න මා කැමැතියි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
නිදහස් වෙළෙඳ කලාපයේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, කටුනායක ප්‍රදේශයේ වෙළෙඳ කලාපයේ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ටී.ජේ. සෙනෙහිරත්න)
(The Hon. W.D.J. Senewiratne)

අපි ඒ හාම්පුතුන්ට පැහැදිලි කරලා දුන්නා, වෘත්තීය සමිතියකට බැඳීම කම්කරුවෙකුට තිබෙන අයිතියක් කියා. ඒ අයිතිය යටපත් කරලා ඒ අයට කටයුතු කරන්න බැහැ. ඒ වාගේම හාම්පුතුන් එහෙම නැත්නම් සේවා පක්ෂයත් බැඳී සිටිනවා, වෘත්තීය සමිති හරහා කම්කරුවන්ගේ දුක්ගැනවිලිවලට ඇහුම් කන් දෙන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ඔබතුමා කියන එක හරි. මම ඒක පිළිගන්නවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ටී.ජේ. සෙනෙහිරත්න)
(The Hon. W.D.J. Senewiratne)

ඒ අනුව ඒ ගොල්ලන් කරපු අර අසාධාරණ වැඩ පිළිවෙළ හුහාක් දුරට පාලනය වෙලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

නැහැ. නැහැ. මට වෘත්තීය සමිති නායකයෙක් ඒ ගැන කිව්වේ. එතුමාම තමයි එහෙම කිව්වේ. ඔබතුමා බොහෝ සේ එම හාම්පුතුන්ට උපදෙස් දුන්නා, එහෙම කරන්න බැහැ කියා.

නමුත් ඒ අය ඔබතුමා කියන දේ නොවෙයි සැලකිල්ලට ලක් කරන්නේ. ඔබතුමාට වඩා ඒ හාම්පුතුන් සලකන්නේ, වෙනත් ඇමතිවරුන් කියන දෙයයි. "ඒ කලාප පිළිබඳ වගකීම් තිබෙන ඇමතිවරු මේ පිළිබඳව දක්වන ආකල්පය ඔක නොවෙයි" කියලායි ඒ හාම්පුතුන් සලකන්නේ. ඔබතුමා කියනවා, "වෘත්තීය සමිති කඩන්න හදන්න එපා. ඒ මිනිසුන්ට අයිතියක් තිබෙනවා, වෘත්තීය සමිතිවලට බැඳෙන්න" කියා. නමුත්, 'වෘත්තීය සමිති කැඩුවත් කමක් නැහැ' කියන ආකල්පයක් තවත් ඇමතිවරුන්ට තිබෙන බවට විශ්වාසයක් ඒ හාම්පුතුන්ට තිබෙනවා කියා ඒ වෘත්තීය සමිති නියෝජිතයා මට කියා සිටියා. දැන් අපි බලමු, ඇත්තටම එහෙම වෙච්ච තැන් තිබෙනවාද කියලා. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය කිව්වත්, එය ගණන් නොගෙන ක්‍රියා කිරීමට බලය අතට ගත් එක් ඇමතිවරයෙකුගේ - මම එතුමාගේ නම කියන්නේ නැහැ. එතුමා ඔබතුමාගේ අමාත්‍ය මණ්ඩලයේ සිටින කෙනෙක්.- නෝනායි, දුවයි තමයි ඒ කර්මාන්තශාලාව පාලනය කරගෙන යන්නේ. ඒ කර්මාන්තශාලාවේ බලධාරින් කෙළින්ම කියා තිබෙනවා, "වෘත්තීය සමිතියෙන් අස් වෙන්න ඕනෑ. අස් නොවුණොත්, ඔය කටිටියට one shot එක දෙනවා" කියා; "One shot එක දෙනවා" කියන්නේ, සේවයෙන් පහ කරන එකටයි. ඒ වෘත්තීය සමිති ක්‍රියාකාරින් කැඳවා, "සමිතියේ වැඩ නැවැත්වූයේ නැත්නම් shot එක දෙනවා." යැයි කියා තිබෙනවා. ඒකයි පාවිච්චි කරන වචනය. "Shot එක දෙනවා" කියන්නේ, සේවයෙන් අයින් කරනවා, එහෙම නැත්නම් ඒ අයට යම් හානියක් පමුණුවනවා, එහෙමත් නැත්නම් ඒ අය යම් පීඩනයකට ලක් කරනවා කියන එකයි. ඇත්තටම, මේවා ක්‍රියාත්මක කරන්නේ කළමනාකරුවෝ බව ඇත්ත. නමුත් මේ තොරතුරු අපට ලබා දෙන්නේ, ඒ කාලයේ තමුන්නාන්සේලාට උදව් කරපු, තමුන්නාන්සේලාගේම හිතවත් පිරිස්. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, "ඒ කාලයේ මැරුවා; අතන මැරුවා; මෙතැන මැරුවා." කියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

මැරූ ඒවා ගැන නොයෙකුත් දේවල් එතුමා කිව්වා. නමුත්, මේකයි කාරණාව. මරපු ඒවායේ ඉතිහාසය දැන් සොයන්න ගියොත්, බටලන්දේ මැරූ ගණන බලන්න තවත් කොතරම් වාර්තා පොත් අවුස්සන්න අපට සිදු වනවාද කියා අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා දැන ගත යුතුයි. ඒ නිසා මැරූ ඒවායේ සංඛ්‍යා ලේඛන පැත්තකින් තියලා අද තිබෙන ප්‍රශ්නය ගැන කථා කරමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කටුනායක තිබෙන ATG Ceylon Private Limited කියන කර්මාන්තශාලාව 365 දවසේම වැඩ කරනවා. එහි සමිතියේ සාමාජිකයන්ට රැස්වීමක් පවත්වන්න බැහැ. ඇයි ඒ? 365 දවසේම වැඩ නේ. දවසේ පැය 24ම වැඩ. එක දවසක් ඒ අය එකතු වෙලා රැස්වීමක් පැවැත්වූවා. රැස්වීම පැවැත්වූවාට පසුව ඉඳලා ඒ පාලකයින් කියනවා, "රැස්වීමට ගිය අය නිසා ඔය අයට overtime payments නැහැ." කියා. ඒ කියන්නේ, "අතිකාල දීමනා නැහැ; අතිකාල වැඩත් නැහැ." කියන එකයි. සමිති ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වීම නිසා ඒ විධියට ඒ අයට වෙනස්කම් කරන්න පටන්ගෙන තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති, ඔබතුමාට පූර්වගාමී කම්කරු ඇමතිවරයකු වූ මහින්ද රාජපක්ෂ මහතාගේ කම්කරු ඇමතිකම නැති වුණේ කොහොමද කියා. එතුමාගේ කම්කරු ඇමතිකම නැති කළේ, චන්ද්‍රිකා මැතිනියයි. ඒ, එතුමා කම්කරුවන්ට වඩාත් හිතවත්ව, වඩාත් පක්ෂපාතීව වැඩ කරනවා කියලායි. ඒකත් මේ යමින් ගමන් කියාගෙන යන්න ඕනෑ. මම ඒ කාලයේ එතුමාගේ කම්කරු අමාත්‍යාංශයේ හිටපු, උපදේශක මන්ත්‍රීවරයායි. ඒ සමහම මමත් අස් වුණා. "කම්කරුවන්ගේ ප්‍රශ්නවලදී බේරුම් කටයුතු කරන්න යාමේදී කම්කරුවන්ගේ පැත්තේ ඉඳන් බලන එක කම්කරු ඇමතිවරයෙකුගේ යුතුකමයි." කියලා තමයි එතුමා කිව්වේ. "මම කම්කරු ඇමති නම්, කම්කරුවන්ගේ පැත්තේ ඉඳන් බලන්නේ නැතුව මා කාගේ පැත්තේ ඉඳන්ද බලන්න ඕනෑ?" කියායි එතුමා ඇහුවේ. චන්ද්‍රිකා මැතිනිය එතුමා ඒ ධුරයෙන් අයින් කරපු වෙලාවේ එතුමාට තිබුණු චෝදනාවත් ඒකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව මම ඉක්මනින්ම අවසන් කරන්නම්. "ලේක් හවුස්" එකේ සේවකයන් සියලු දෙනාම වැටුප් ප්‍රශ්නයක් මුල් කර ගෙන අද එළියට බැහැලා ඉන්නවා. JSS එකයි, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයයි කියන unions දෙක හොර ගිවිසුමක් අත්සන් කරලා, අඩුවෙන් වැටුප් ගන්න එකඟ වෙලා. අද "ලේක් හවුස්" එකේ සියලු දෙනාම එළියට බැහැලා ඉන්නවා. විගහට කැඳවීම් කරලා, ඒ ගැන බේරුම් කිරීමක් කළොත් හොඳයි.

ගරු අමාත්‍යතුමනි, ඒ වාගේම තමුන්නාන්සේ ටිකක් සොයා බලන්න, තේ දලු මිල අඩු වීමේ ප්‍රශ්නය ගැනත්. පොහොර හිහකමේ ප්‍රශ්නය, පොහොර මිල වැඩි වීමේ ප්‍රශ්නය, වල්නාශක

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

නැතිකමේ ප්‍රශ්නය උඩ ජූලි මාසයේ තේ නිෂ්පාදනය සියයට 19කින් අඩු වෙලා තිබෙනවා. තේ නිෂ්පාදනය බහිනවා කියන්නේ, කම්කරු රැකියාවලට එය යම් ප්‍රමාණයකට බලපානවා කියන එකයි. ගරු ඇමතිතුමනි, මේ කාරණය ඔබතුමාට අයිති වුණත්, අයිති නැති වුණත් මේවායේ අන්තර් සම්බන්ධය සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කෞරව වඩිවේල් සුරේෂ්! උංකළුක්කු නාන්කු නිමිඩංකළ් උළ්ළන.

[පි.ප. 4.17]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්‍රෛයතිනම් තොළිල් මට්‍රුම් තොළිර්සංග උරවුකළ් අමෛච්චර් කෞරව ජෝන් සෙනෙවිරත්න අවර්කළාල් කොණ්ඩුවරප්පට්ට කාලත්තින් කට්ටායමාග ඉරුක්කින්‍ර කෛත්තොළිල් පිණක්කුකළ් චට්ටත්තින් කීෆ් ඔළුංකුවිතිකළ් සම්පන්තමාන ඉන්ත මුක්කියමාන විටයත්තිල් නානුම් මලෛයග මක්කළින් පිරතිනිති එන්‍ර වකෛයිලේ කලන්තුකොණ්ඩු ඔරුසිල විටයංකළෛක් කූරලාමෙන නිනෛක්කින්‍රේන්.

මලෛයකත්තිලේ විසේටමාග පෙරුන්තෝට්ටත් තොළිලාළරෛප් පොරුත්තවරෛයිල්, අරසියලුක්කු මුන්නර් තොළිර් සංකත්තින් මූලමාගවේ අවර්කළ් පාතුකාක්කප්පට්ටාර්කළ්. අවර්කළුක්කු ඔරු කාවලරණාග ඉවෛ ඉරුන්තිරුක්කින්‍රන. ආකවේ, තොළිර්සංකංකළින් නන්මෛකළෛත් තෝට්ටත් තොළිලාළර්කළ් පෙරුම් වකෛයිල් ඉන්තච් චට්ටත්තිල් සිල තිරුත්තංකළෛච් චෙය්වතු, අවර්කළෛප් පාතුකාප්පතර්කු සිර්න්‍ත ඔරු තීර්වාග ඉරුක්කුමෙන්‍රේ නාන් කරුතුකින්‍රේන්.

පෙරුන්තෝට්ටත් තොළිලාළර්කළුටෛය සම්පළ උයර්වු, ඉටෛක්කාලක් කොටුප්පනවු, කටන්ත වරවුසෙලවුත් තිට්ටත්තින් පෝතු නාන් නටත්තිය පෝරාට්ටංකළ් සම්පන්තමාග පාරාළු මන්‍ර උරුප්පිනර් ඔරුවර් කොච්චෛප්පටුත්ති සිල විටයංකළෛ ඉංකු පේසිනාර්; නානුම් අවතානිත්තුක් කොණ්ටිරුන්තේන්. මලෛයග මක්කළුටෛය පිරච්සිනෛකළ් සම්පන්තමාග - අවර්කළුටෛය කොටුප්පනවුකළාග ඉරුක්කලාම්, සම්පළ උයර්වුකළාග ඉරුක්කලාම් - මිකවුම් උණර්වුපූර්වමාග නාම් එංකළුටෛය කෝරික්කෛකළෛ මුන්වෛත්තු පෝරාට්ටංකළෛ මේර්කොණ්ටිරුන්තෝම්. එනක්කු මුන් පේසිය උරුප්පිනර්කළ් සිලර් අතර්කාග ඉංකු මුතලෛක්කණ්ණීර් වටිත්තතෛක් කාණක්කූටියතාග ඉරුන්තතු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාර්මික ආරාවුල් පනත යටතේ නියෝග ගෙනැවිත් වෘත්තීය සමිති නායකයන්ට සහ වෘත්තිය සමිතිවලට ගෞරව කිරීම ගැන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමාට මා මේ අවස්ථාවේදී පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කෞරව උරුප්පිනර් අවර්කළේ, උංකළුක්කු ඉන්නුම් ඔරු නිමිඩම් උළ්ළතු.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසු ගිය දවස්වල වතුකරයේ ජනතාවගේ රුපියල් 2,500 දීමනාව වාගේම තවමත් වතු කම්කරු ජනතාවගේ පඩි වැඩි කිරීම සම්බන්ධ සාකච්ඡාවලට මුල් තැන දී එතුමා ලබා දෙන සහයෝගය පිළිබඳවද වතු කම්කරු ජනතාව වෙනුවෙන් මා එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ ගරු සභාවේ කථා වුණා, "පෙට්‍රල් ගෙනාවා. නාඩගම් නැටුවා" කියා. අපි පෙට්‍රල් ගෙනාවේ අපිව පුච්චා ගන්න, වතු කම්කරු ජනතාව වෙනුවෙන්. වතුවල tea factories 1988-1989 කාලයේ පිච්චුවේ කවුද? ඌව පළාතේ factories ඔක්කොම පිච්චුවේ කවුද? Tea factories, rubber factories ඔක්කොම පිච්චුණා. වතුකරයේ තැපැල් කන්තෝරු ඔක්කොම පිච්චුණා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල ටික පිච්චුණා වතු කම්කරුවෝ පාරට ගියා. ඒවාට කෝ උත්තර? අපි ඔක්කොම අහගෙනයි ඉන්නේ. වතු කම්කරු ජනතාව වෙනුවෙන් හඬ දෙන්න, කථා කරන්න තමයි අපව මෙතැනට එවා තිබෙන්නේ. ඒ ජනතාව වෙනුවෙන් විවිධ විධියට අපි ඒ සටන ගෙනියනවා. ඒක වෙන ප්‍රශ්නයක්. වතු කම්කරු ජනතාව පාරට ගේන්න එදා 1988-1989 කාලයේදී ඒ factories ටික ඔක්කොම ගිනි තැබුවා, වතු ලයින් කාමර ටික ඔක්කොම ගිනි තැබුවා. ඌව පළාතේ, ඩයරබා factory එක කෝ? ඩයරබා තේ කර්මාන්ත ශාලාව කවුද ගිනි තිබ්බේ? [බාධා කිරීමක්] ඒ වාගේම කීනකැලේ factory එක කවුද ගිනි තිබ්බේ? නාවින්නවත්ත factory එක කවුද ගිනි තිබ්බේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසන්.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

ඔබතුමා වතුකරය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මේවා ගැන මේ ගරු සභාවේ අප කථා කරන්න ඕනෑ. මේ ආණ්ඩුවේ අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් අද අපට වතු කම්කරුවන්ගේ අයිතීන් ගැන කථා කරන්නට නිදහසක් ලැබී තිබෙනවා. අප ඒ ගැන කථා කරනවා. Collective Agreement එකෙන් අවශ්‍යතාවය අනුව කම්කරු ජනතාවට රුපියල් 2,500ක් ලබා දුන්නා. දැන් ඕනෑ තරම් බයිලා ගහන්න පුළුවන්. එදා අරගෙන දෙන්න කවුරුවත් ආවේ නැහැ. රුපියල් 2,500 මාස දෙකක් ලබා දුන්නා. කම්කරු ඇමතිතුමාත්, වැවිලි කර්මාන්ත ඇමතිතුමාත් එක්ක එකතු වෙලා සාකච්ඡා කර, හැකි ඉක්මනින් වතු කම්කරුවන්ගේ පඩි ප්‍රශ්නයත් අප අවසාන කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසාන කරන්න.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
ආකවේ, ඉන්නත් තෝට්ටත්තොළිලාළර් සම්පන්තමාග අතනෛප් පේසුවතර්කු අරුකතෛයුළ්ළවර්කළ්තාන් පේස වේණ්ටුම්. අතර්කු අරුකතෛයර්‍රවර්කළ් ඉංකු වන්තු

නීලික්කණ්ණීර් වඩික්ක වේණ්ඩිය අවසියම් කිටෙයාතු. අන්ත මක්කළුටෙය 'ලයන්' අරෙකළෙයුම් තොළිර්සාලෙකළෙයුම් තී වෛත්තුක් කොළුත්තියවර්කළ්, අවර්කළතු තේසිය අටෙයාළ අට්ටෛකළෛප් පරිත්තවර්කළ් ඉන්රු අවර්කළ් සම්පන්තමාකප් පේසුම්පෝතු එංකළුක්කු මිකවුම් ආච්චරියමාක ඉරුක්කින්රතු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
கம்கரு ஜனதாவගේ ජාතික හැදුනුම් පත් ගත් කට්ටිය අද කම්කරු ජනතාව ගැන කථා කරනවා. වඩිවේල් සුරේෂ් ඉන්න කොට ඔවා කථා කරන්න එපා. අප දන්නවා, කථා කරන්න. අප කම්කරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ වාගේ නියෝග ගෙනැවිත් වෘත්තිය සමිති ශක්තිමත් කිරීම සම්බන්ධව.

நான் மலையக மக்கள் சார்பாக தொழில் அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன். எனவே, பொறுத்திருங்கள்! வெகுவிரைவில் தோட்டத் தொழிலாளர் களுடைய அடிப்படைச் சம்பளத்திலே உயர்வைப் பெற்றுக் கொடுப்பதற்குரிய நடவடிக்கையை மேற்கொள்வோம் என்று இந்த உயரிய சபையிலே தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

[අ.භා. 4.22]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙරුම්කරුවන්ට, අධිකරණ නියෝජිතයින්ට දීමනාවක් වැඩි කිරීම අපි අගය කරනවා. ගරු ඇමතිතුමනි, මේකටම තව කණ්ඩායමක් ඇතුළත් කරන්න තිබෙනවා. ඒ අය තමයි පඩි පාලක සභාවේ ඉන්න නිලධාරිවරුන්. මේකේ පොඩි අඩුවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියා තිබෙනවා, නඩු විභාගයක් අවසන් වුණාම සතියක් ඇතුළත වාර්තාව භාර දුන්නාම රුපියල් පන්දාහක් දෙනවාය කියා. ඒක නොවෙයි, මේ සඳහා ඕනෑ කරන්නේ. අවුරුද්දක කාලයකින් අවසන් කරන්නයි. ඔබතුමාටත් ලිපිගොනු බලන්න පුළුවන් වෙයි. සමහර පරීක්ෂණ අවුරුදු හත අට ගිහින් තිබෙනවා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ සැන්දෑවටයි මේ පරීක්ෂණ ආරම්භ කරන්නේ. කාර්ය මණ්ඩලයට අතිකාල නැති නිසා සවස 4.00 වෙනකොට ඒ අය යනවා. මේ ගැන තව ටිකක් ගැඹුරින් කල්පනා කර, මේකට කාල සීමාවක් දෙන්න, මේ කාල සීමාව තුළ මේක අවසන් කරන්න කියා. අවසන් කර අඩු ගණනේ සතියක් නැත්නම් දෙකක් ඇතුළත වාර්තාව දෙන්න. සමහර ඒවායේ පරීක්ෂණ ඉවර වෙලාත් අවුරුදු ගණන් වාර්තාව දීලා නැහැ. සමහර ඒවා අවුරුදු දහය දොළහ ගිහින්. එම නිසා ඒ ගැන නැවත කල්පනා කර මේ පනතටත් සංශෝධනයක් හැටියට කාලය නිර්මාණය කරන්න කටයුතු කළොත්-

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
කාල සීමාව නියම කරපු පනතක් තිබෙනවා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධව අසතුට ප්‍රකාශ කර තිබෙනවා. මොකද, අධිකරණ කටයුතුවලදී සියලුම පැති, සියලුම කරුණු සම්බන්ධව විනිශ්චයක් ලබා දිය යුතු නිසා කාල සීමාවක් නියම කිරීම වැරැදියි කියන මතයක් ප්‍රකාශ කරලා තිබෙනවා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒ කාරණය ගැන ඔබතුමා නැවත සලකා බලන්න, ගරු ඇමතිතුමනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාම, ඒ සම්බන්ධයෙන් අධිකරණයට යා යුතු නම් දින හතක් ඇතුළත යන්න කියලා දින නියම කරලා තිබෙනවා; උසාවියට ගියාම ඒ වෙනුවෙන් මාසයක කාල සීමාවක් දීලා තිබෙනවා. අධිකරණයට ගිහිල්ලා කියලා ඒ කටයුත්ත කර ගන්න බැරි වුණොත් සහනයක් ලබා ගන්න arbitration එකට ගියාම ඒ උදව්වට එය සහනයකට වඩා දඩුවමක් බවට පරිවර්තනය වෙනවා. ඒ නිසා ඒ කාරණය පිළිබඳව නැවතත් සලකා බලන්න කියලා මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

අද manpower කණ්ඩායම සම්බන්ධයෙන් ප්‍රශ්න දෙක තුනක් පැන නැඟිලා තිබෙනවා. Manpower සේවය නවත්වන්න බැරි නම් manpower agencies ටික register කරන්න. Manpower agencies ටික register කළොත් එහෙම අඩු ගණනේ තමුන්නාන්සේගේ නිලධාරීන්ට ගිහිල්ලා පරීක්ෂා කරන්න පුළුවන්, මේවායේ සිටින සේවකයින්ට නියම කාලයට EPF එකවත් ගෙවනවාද කියලා. ඔවුන්ට කම්කරු අයිතිවාසිකම් තිබෙනවා. අද ඒ සේවකයින්ට gratuity මුකුත් ලැබෙන්නේ නැහැ. ඒ පිළිබඳව පරීක්ෂා කරලා, ක්‍රියා කරන්න තමුන්නාන්සේලාට ක්‍රමවේදයක් නැහැ.

මේ රටේ තිබෙන security companies ලබන අවුරුද්දට ක්‍රියාත්මක කරන්න නම්, මේ අවුරුද්දේ EPF හරියාකාරව ගෙවලා තිබෙනවාය කියලා තමුන්නාන්සේලාගෙන් දැන් අනුමැතියක් ලබා ගන්න ඕනෑ. ඒ නිසා security companies හරියාකාරව EPF ගෙවනවා. තමුන්නාන්සේලාගේ අනුමැතිය නැත්නම් ඊළඟ අවුරුද්දේ රජයේ ආයතනයකට ඒගොල්ලන්ට ටෙන්ඩර් කරන්න බැහැ. සියලු අර්ථ සාධක අරමුදල් හරියාකාරව ගෙවලා තිබෙනවා නම් තමයි තමුන්නාන්සේලා ඒ අවශ්‍ය අනුමැතිය ලබා දෙන්නේ. Manpower ආයතනවලට එහෙම එකක් නැහැ නේ. උදාහරණයක් කියනවා නම්, අද කේ.ඩී. පෙරේරා කියලා manpower සමාගමේ නම දෙනවා. ඊළඟ මාසයේ ඔහුගේ මල්ලිගේ නම දෙනවා, එහෙම නැත්නම් බාප්පාගේ නම දෙනවා. තමුන්නාන්සේලාගේ නිලධාරියෙකුට ගිහිල්ලා මේ ආයතනය පරීක්ෂා කරලා, EPF ගෙව්වාද නැද්ද කියලා දඩුවම් කරන්න බැහැ. Manpower සේවය නැති වෙන්න ඕනෑය කියන එකයි මගේ මතය. ඒ කටයුත්ත කරනතුරු හෝ ඒවායේ සේවය කරන සේවකයින්ගේ සුරක්ෂිතභාවය ආරක්ෂා වන ක්‍රමයක් හරිගස්සන්න ඕනෑ. එහෙම කරන්න නම් පළමුවෙන්ම ඒ සමාගම් හඳුනාගෙන ලියා පදිංචි කරන්න ඕනෑ. ඒ ලියා පදිංචි කරපු සමාගමෙන් හැර සේවකයෝ ගැනීම තහනම් කරන්න ඕනෑ.

උදාහරණයකට ඇන්සෙල් ලංකා සමාගම ගත්තොත්, ඇන්සෙල් ලංකා සමාගමේ filesවලින් බලා ගන්න පුළුවන් දැන් මේ සේවකයන්ගේ සේවය ලබා ගන්නා සමාගම මොකක්ද කියලා. එහෙම වුණොත් තමුන්නාන්සේගේ නිලධාරීන්ට මාසේ අන්තිමට ගිහිල්ලා බලන්න පුළුවන්, මේකේ ඉන්න සේවකයන්ට සම්පූර්ණ EPF ගෙවලා තිබෙනවාද, අවුරුදු පහක් දිගටම සේවය කරලා කෙනෙක් අස්වෙලා යනවා නම් ඔහුගේ gratuity එක ගෙවනවාද කියලා.

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

අපි පනත්වලින් ඇති කරලා තිබෙන අයිතිවාසිකම් ඒගොල්ලන්ට ලබා ගන්න පුළුවන් වන විධියට ක්‍රමවේදය හරිගස්සන එක තමයි අපේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ යුතුකම වෙන්නේ. තමුන්නාන්සේ ඒ ගැන කල්පනා කරාවි කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ලේකම්වරයා ශ්‍රී ලංකාවට කැඳවනු ලැබුවේ රජය විසිනුයි. රජය වග කිව යුතු ප්‍රකාශයක් කරන්න ඕනෑ. අපේ රට බරපතළ විධියට වර්ග කිරීමකට ලක් කරනවා. Are we going to get categorized into Rwanda and other countries which fell into the genocide category? This is the clear categorization which Ban Ki-moon's statement leads us to. This is the first time Ban Ki-moon has made such a statement. If the relevant organizations pursue this, it is going to be very adverse to Sri Lanka. Therefore, we call upon the Government to make a very clear statement, as we propose, that this should be denounced and rejected. I remember, the present Hon. Minister of Skills Development and Vocational Training once sitting along with the UN Representative who came here, when the relevant Representative went out of the text and made a statement, he was very fast to correct it. That is the how Sri Lanka behaved in the past, but there is a different situation today. We call upon the Government now to make a statement and denounce this. The Secretary-General Ban Ki-moon is not a Head of a State. Heads of States and countries lead the United Nations Organization. He is only the Secretary-General of the United Nations Organization. It is very sad that we have to take up this matter, but the Joint Opposition calls upon the Government to make a clear statement on this.

මෙම කාරණා සඳහන් කරමින්, යෝජනාව ස්ථිර කිරීමට අවස්ථාව සලසා දෙමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම. Hon. Keheliya Rambukwella.

[5.26 p.m.]

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Mr. Presiding Member, thank you for giving me one minute extra.

The topic of the Adjournment Motion today holds a paramount importance for the present and the future of Sri Lanka. The visit of Mr. Ban Ki-moon, the Secretary-General of the UN, last week has raised many questions in the minds of the decision-makers and the general public. To begin with, I would like to draw attention to a few salient remarks made by the Secretary-General.

To start with, in his statement, Mr. Ban Ki-moon has called for, " a reduction of the size of the military in the North and East" and he also pushed for " a speedier return of land to the internally displaced".

After his meeting with the UN Secretary-General, President Sirisena addressing the media also stated that he asked the UN Chief "more time" for reconciliation. In making these remarks and demands, Mr. Ban Ki-moon seems to have momentarily forgotten his mandate as per the UN Charter and has clearly overstepped his boundaries in trying to instruct a Government, or to interfere, as to how to take care of national security and internal affairs.

Secondly, I would like to place a few facts and refresh the memory of the UN Chief who is very critical of the Mahinda Rajapaksa-led Government claiming that "not enough" was done. At the end of the conflict in 2009, over 300,000 people were displaced and were living in camps. In less than two years, 95 per cent of them have been resettled. Over 12,000 known terrorists including child soldiers who surrendered and were captured were rehabilitated and reintegrated into the society. Enormous amount of money was spent on rehabilitation and reconstruction of railway, road network, schools, hospitals, health sector and so on and so forth. The call for an internal investigation was dealt with by the then Government, internally through the Paranagama Commission and the LLRC.

At the press conference held, the UN Secretary-General took questions from only a few selected journalists, and evaded responding to even those questions. He evaded the question when asked about his presumptions that war crimes occurred. When questioned on the involvement of foreign judges, he did not deny it.

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

In fact, he went on to say that the country will have to "work together with the international community and the United Nations on a transitional justice mechanism". Why would the UN or the international community be involved in the justice mechanism in Sri Lanka? Mr. Presiding Member, do we have a failed-justice system that needs international intervention?

When a question was posed on the double standards the UN has, the Secretary-General rejected those claims immediately. I would like to draw attention to one such recent incident on the double standards of the UN and of the international community. On the 3rd of October, 2015, a hospital in the Kunduz Region of Afghanistan was bombed by the American Air Force. It was a trauma centre run by Doctors Without Borders. Of the 42 lives that were lost, many were women, children and the staff of Doctors Without Borders. Where is the UN involvement in this incident? It was a blatant violation of human rights and the UN and the international community has been very quiet about it. Is it because the perpetrator was the US Air Force? I would like to ask the UN Secretary-General, is this not double standards? This is only one such instance whereas you can give hundreds of instances where UN has been totally and blatantly silent about killings.

Setting the record straight on the UN Secretary-General's passing comment on how it was "rather difficult" to get the Mahinda Rajapaksa-led government to listen to "even him" as he put it, I would like to remind him that the Government of Sri Lanka was elected to do right by Sri Lankans and not yield to every whims and fancies of the international community whose suggestions were mostly on par with those of the LTTE diaspora and the separatist groups. At the press conference, Mr. Ban Ki -moon acknowledged that there was a huge difference between his first visit in 2009 and now.

He credited this change and said, "this change was brought about with the active involvement of the international community, particularly the United Nations through the Human Rights Council". I would like to remind the Secretary-General that his first visit was to a country, for two days, coming out of a 30-year long brutal war against terrorism. The change he sees today is not the change brought in by the international community or the UN. It was a hard-earned change brought by peace-loving and hardworking Sri Lankans under the presidency of Mahinda Rajapaksa.

Finally, Sir, I would like to make a reference to the Secretary-General's remarks at the Lakshman Kadirgamar Institute where he drew a comparison between the incidents that took place in Rwanda in 1994, and in Srebrenica - a small village in Bosnia - in 1995, and the Sri Lankan conflict. The situations in Rwanda and Srebrenica were confirmed genocides, where one ethnic group killed the other. I would like to remind the United Nations Secretary-General that the situation in Sri Lanka was a democratically-elected government fighting one of the most ruthless terrorist organizations in the world, an organization that was banned in most of the western nations that you uphold so highly. Unless the definition of the word "genocide" has been redefined, I would like to pose the question as to how these situations were put on par with each other. In fact, it seems as though the UN Secretary-General has added a title to his name as a spokesperson for the LTTE diaspora, as this is exactly what they have been trying to establish for years. Mr. Presiding Member, this is exactly what the LTTE and the LTTE diaspora have been trying to establish saying that there was genocide in Sri Lanka, and he was drawing parallels with Rwanda and Srebrenica.

In fact, it is a shame that we as the Opposition has to be the ones to raise the questions and reject this statement made by the UN Secretary-General. It should be the Government who should be taking him to task on this statement. It also gives rise to questions in my mind as to why the comparison was made. The steps that followed once confirmed genocide was committed in Rwanda and Srebrenica were to establish a UN Security Council tribunal on those situations. Is that where the UN and the international community is leading Sri Lanka towards? I would like to ask this question.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have another two more minutes.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Sir, I will finish before that.

In conclusion, Sir, it baffles me as to why an outgoing Secretary-General with only three months left of his tenure was invited to Sri Lanka. If it was the intension of the Government, the UN and the international community that this visit would assist with the reconciliation effort, it has, in fact, proved the exact opposite. The Secretary-General's statements and remarks during this visit have only given rise to many questions, doubts and has played on the sentiments of extremists.

Sir, give me just another minute, please.

Making reference to mistakes the UN has made in conflict-ridden situations and taking Sri Lanka as an example, he stated, "We made big mistakes. We learnt very hard lessons on the part of the United Nations. I established internal investigations into what happened, into what our people of the UN had been doing at the time."

So, firstly, I would like to ask the UNSG where the reports of the internal investigations held are. It has been

seven years since the conflict ended in Sri Lanka and the world is yet to see a report of the internal investigations conducted by the United Nations on Sri Lanka. I find it quite strange that a person who is skeptical and critical of internal investigations would go ahead and hold only an internal inquiry into what the UN was doing at the height of the conflict in Sri Lanka and have no report or repercussions to show from there onwards.

Mr. Presiding Member, I thank you for giving me time to speak. I think this is a very timely matter. It is not a matter for different political parties to conflict on. It is a matter of our country and its future, and I believe, honestly, that we need to look at it in that perspective, not in the perspective of political alliances.

I would thank you once again, Sir.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Bandula Gunawardane. Before he starts, will an Hon. Member propose the Hon. Bimal Rathnayake to the Chair?

ගරු මහින්ද සමරසිංහ මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Skills Development and Vocational Training)

Sir, I propose that the Hon. Bimal Rathnayake do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் *அக்கிராசனத்திலின்று அகலவே,* மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

[අ.භා. 5.37]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බැන් කී මූන් මහතා ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන්, මේ රට වෙනුවෙන් අප එතුමාට ලිපියක් භාර දෙනු ලැබුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු සහ ලංකා සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, ජාතික නිදහස් පෙරමුණ, පිවිතුරු හෙළ උරුමය, ශ්‍රී ලංකා මහජන පක්ෂය, දේශවිමුක්ති ජනතා පක්ෂය, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ යන පක්ෂවල නායකවරුන්ගේ අත්සනින් යුතුව තමයි ඒ ලිපිය එතුමාට භාර දුන්නේ.

අප එම ලිපියේ සඳහන් කළා, අවුරුදු 2,500කටත් වැඩි ලිඛිත ඉතිහාසයක් තුළ මේ රට ස්වාධීන, ස්වෛරී, නිදහස්, ඒකීය රාජ්‍යයක් ලෙස පැවතුණු බව. මෙහෙම පැවතුණු රාජ්‍යයේ 1948දී අපට නිදහස ලැබුණාට පසුව ප්‍රජාතන්ත්‍රවාදී ලෙස, නිරායුධ, අවිහිංසක ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු රජයට විරුද්ධව, රටට විරුද්ධව, රටේ ජාතික ආරක්ෂාවට විරුද්ධව මුහුදු වෙරළින් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් වෙනම රටක් ලෙස වෙන් කර ගැනීම සඳහා කුරිරු එල්ටීටීඊ ත්‍රස්තවාදය තිස් අවුරුදු කාලයක් තිස්සේ ක්‍රියාත්මක වුණා. ඒ කාලය තුළ මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදී සියලු මිනිසුන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් නැති වුණා. බෞද්ධයන්ටත්, අන්‍ය ආගමිකයන්ටත් ආගම ඇදහීමේ නිදහස නැති වුණා. ශ්‍රී දළ දා මාළිගාව, ශ්‍රී මහා බෝධිය වැනි බෞද්ධයින්ගේ මුදුන් මල්කඩ බඳු ස්ථානවලට ප්‍රහාර එල්ල වුණා. කාත්තන්කුඩි පල්ලියේ යාච්ඤා කරමින් සිටි මුස්ලිම්වරු මරා දැම්මා. හින්දු කෝවිලට පොල් ගහන්න ගිය අපේ මන්ත්‍රීතුමන්ලා කෝවිල තුළදීම මරා දැම්මා. ආගම් ඇදහීමේ නිදහසක් තිබුණේ නැහැ. තර්ජිත ගම්මානවල වැසියන්ට බියෙන් හා සැකයෙන් තොරව ජීවත් වෙන්න ඉඩකඩක් තිබුණේ නැහැ. එල්ටීටීඊ සංවිධානය මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කළේ සිංහල, මුස්ලිම් ජනතාවගේ පමණක් නොවෙයි. ඔවුන් ද්‍රවිඩ දරුවන් පවා බලහත්කාරයෙන් යුද්ධයට කැඳවාගෙන ගොස් ජාත්‍යන්තර මූලික යුද නීති ප්‍රඥප්තිවල සඳහන් වන දරුවන් යුද්ධයට කැඳවාගෙන යාමේ වැරැද්ද පවා ඉතාම නිර්භය ලෙස කරලා, ජාත්‍යන්තර මිනිස් ශීලාචාර බවේ සියලු කොන්දේසි උල්ලංඝනය කරනු ලැබූ දරුණුතම ත්‍රස්තවාදී සංවිධානය බවට පත් වුණා. ඔවුන් මේ රටේ දේපළ විනාශ කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මට තව විනාඩි පහක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමන්ලාගේ පැත්තෙන් තව කථිකයන් දෙදෙනෙක් කථා කරන්න ඉන්නවා. ඒ මන්ත්‍රීතුමන්ලා දෙදෙනාට විනාඩි හතර බැගින් වෙන් කර තිබෙනවා. එහෙම නම් එයින් කථිකයෙක් අයින් කරලා තමයි ඔබතුමාට විනාඩි පහක් දෙන්න වන්නේ. කාවද අයින් කරන්නේ කියන එකත් ඔබතුමා දැනුම් දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අප දැනුම් දෙන්නම්. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා දැනට කථා කරගෙන යන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඉක්මනට දැනුම් දෙන්න. නැත්නම් මට සභාවේ කටයුතු කරගෙන යන්න කාලය මදි වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අප්පාපිල්ලෙයි අමිර්තලිංගම්, ලක්ෂ්මන් කදිර්ගාමර් වැනි දෙමළ නායකයනුත් මරා දමමින් මේ ගෙන ගිය ත්‍රස්තවාදය අවසන් කිරීමට සෑම රාජ්‍ය නායකයෙක්ම උත්සාහ කළා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, ඩිංගිරි බණ්ඩා විජේතුංග මැතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, රනිල් වික්‍රමසිංහ මැතිතුමා යන සියලුදෙනා ආරක්ෂක අංශ සමඟ එකතුව මේ කුරිරු ත්‍රස්තවාදය පරාජය කරන්න උත්සාහ කළත්, ඒ අයට එය කළ නොහැකි වූ අවස්ථාවේදී, අපේ රටේ රණ විරුවන් එකා පිට එකා මැරිලා වැටෙද්දි, ඔවුන් ජීවිත පරිත්‍යාගයෙන් මානුෂික මෙහෙයුමක් තුළින් තමයි මේ රටේ ත්‍රස්තවාදය නිම කරලා සියලුම මිනිසුන්ට අභය දානය ලබාදීමේ පිංකම කළේ. ලංකාවේ හමුදාව මිනිස් සංහාරයක් කරලා මානව අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබෙනවාය කියන යුද අපරාධ චෝදනාව ඒ අවස්ථාවේ නිර්මාණය කරනු ලැබූ එකක් මිසක් සත්‍ය වශයෙන් මේ මහ පොළොවේ සිදු වූ දෙයක් නොවෙයි. ඒ සියලු දේවල් පිළිබඳව සොයා බලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රටේ සේනාධිනායකයා ලෙස මේ මානුෂික මෙහෙයුම තුළින් රට නිදහස් කරගත්තා. බිම් බෝම්බ ඉවත් කරලා, අවතැන් වූ අය නැවත පදිංචි කෙරෙව්වා.

"උතුරු වසන්තය" සහ "නැහෙනහිර උදානය" යටතේ යටිතල පහසුකම් ඇති කරලා ඒ ප්‍රදේශයේ එතෙක් සම්පූර්ණ නොවුණු සියලු අඩු පාඩුකම් එකින් එක සම්පූර්ණ කිරීමේ කාර්ය භාරය මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් ඉෂ්ට කරනු ලැබුවා. ඒ අතර, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසම සහ පරණගම කොමිසම මඟින් බොහෝ කරුණු සොයා ගෙන වැරැදි සිදුවීම් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබුවා. පරණගම කොමිසම කියලා තිබුණේ අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාව 7,000ක් කියලායි. නමුත් මේ මානව හිමිකම් කොමිෂන් වාර්තාවේ එය 40,000 දක්වා කිසිදු සාක්ෂියකින් තොරව වැඩි කරලා තිබෙනවා. ඇසින් දුටු සාක්ෂි නැතිව, නිර්මාණය කරන ලද සාක්ෂි මත, රණ විරුවන් ඇතුළු අනෙක් පිරිස් දඩයම් කිරීම කරන්නට එපා ය කියන එක තමයි අපි ඉල්ලා සිටියේ. අපේ රට බේරාගත් රණ විරුවන් ජාත්‍යන්තර අධිකරණවලට ගෙනිහින් සාධාරණ විභාගවලින් තොරව ඔවුන්ට දඬුවම් කරන්න දරන මේ උත්සාහය අපි හෙළා දකිනවා. අපි කියා සිටියා, මේ රටේ තිබෙන අධිකරණ පද්ධතියට ඒ පිළිබඳ යුක්තිය සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන් බව. මම ඊට උදාහරණයක් කියන්නම්. ඊයේ පෙරේදා මේ රටේ නඩු තීන්දුවක් දුන්නා, එල්ටීටීඊ සැකකරුවෙක් පැන යන අවස්ථාවේදී වෙඩි තැබීම වැරැදි සහගතයි, ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂ 20ක් ගෙවන්න කියලා. ලංකාවේ අධිකරණය විසින් ඒ සොල්දාදුවාට එසේ නියම කරනු ලැබුවා. ලංකාවේ එහෙම අධිකරණ පද්ධතියක් තියෙද්දී, කිසිම ජාත්‍යන්තර අධිකරණයක් මේ රටට ඇඟිලි ගැසීම කරන්න අවශ්‍ය නැති බවත්, ශ්‍රී ලංකාවේ අධිකරණය යුක්තිය සහ සාධාරණය ඉෂ්ට කිරීමට ප්‍රමාණවත් ජාත්‍යන්තරව පිළිගත් අධිකරණයක් බවත්, ඒ නිසා විදේශ විනිසුරුවන් ගෙන ඒම හෙළා දකින බවත් කියන කාරණා ඒකාබද්ධ විපක්ෂයෙන් දුන් ප්‍රකාශයට අපි ඇතුළත් කළා. ඒ වාගේම අපේ රටේ ස්වෛරීභාවය නැති කරන්න එපා, අපේ රටේ අඛණ්ඩභාවය නැති කරන්න එපා, අපේ රටට අහිතකර බලපෑම් ඇති කරන්න එපා, මේ රටේ නිරායුධ අවිහිංසක මිනිස්සු මානුෂික මෙහෙයුමක් කරලා ලබා ගත් ඒ ජයග්‍රහණය පාවා දීලා නැවත මේ රට ලේ විලක් කරන තත්ත්වයට පත් කරන්න මැදිහත් වෙන්න එපා කියන ඉල්ලීමත් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ බැන් කී මූන්ට අප බාර දුන් ඒ ලිපියේ සඳහන් කළා. මගේ කථාවේ කොටසක් ලෙස ඒ ලිපිය හැන්සාඩ් වාර්තාවේ පළ කරන ලෙස ඉල්ලා **සභාගත*** කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 5.46]

ගරු මහින්ද සමරසිංහ මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Skills Development and Vocational Training)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කරපු අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් ඒ වාගේම ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමාත් එතුමන්ලාගේ කථාවට, ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය සංවිධානය කරපු සම්මන්ත්‍රණයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් බැන් කී මූන් මහතා කරපු කථාව සම්බන්ධ කළා. මගේ ළඟ ඒ කථාවේ පිටපතක් තිබෙනවා. මම ඒ එක්කම කියන්න ඕනෑ, බැන් කී මූන් මහතා ඒ කථාව කරපු අවස්ථාවේ මමත් ඒ සභාවේ සිටිය බව. මම එතුමා කරපු කථාව මුල ඉඳලා අග වෙනතුරු අහගෙන හිටපු කෙනෙක්. එතුමාගේ ඒ කථාවේදී ඉස්සෙල්ලාම එතුමා මෙහෙම කියනවා:

"This is my first visit to Sri Lanka since 2009, when I saw great suffering and hardship. Hundreds of thousands of people were displaced and in need of humanitarian aid after the terrible conflict that tore the country apart. I called for fast reconciliation and action to build peace, in the knowledge that conflict can recur in fragile post-war societies." Then he says, "Today, the picture is very different. I congratulate the Government and people of Sri Lanka for the progress you have made. There remains much hard work ahead, but you have moved with determination along a new path with great promise for all the country's people."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා බොහොම පැහැදිලිව කියනවා, එතුමා 2009දී දැක්ක තත්ත්වයත් අද තිබෙන තත්ත්වයත් හාත්පසින්ම වෙනස් කියලා. එතුමා අද විශාල ප්‍රගතියක් දකිනවා කියලා කියනවා. ඒ කථාව අපට බලාපොරොත්තු වෙන්නත් පුළුවන්. මොකද, යුද්ධය ඉවර වුණ හැටියේම නේ එතුමා ලංකාවට ආවේ. යුද්ධය ඉවර වෙලා දවස් තුනකට පස්සේ එතුමා ලංකාවට ආවා. ඒ වන කොට අවතැන් වූ ලක්ෂ තුනක පමණ පිරිසක් අපි භාරගෙනයි තිබුණේ. දවස් තුනකදී ඒ ඔක්කෝටම අවශ්‍ය පහසුකම් සලසන්න අපට කිසිසේත්ම හැකියාවක් තිබුණේ නැහැ. එවැනි ප්‍රශ්න තිබුණා. හැබැයි, එතුමා පසු ගිය දා කිව්වා, "අද වන කොට විශාල ප්‍රගතියක් දකිනවා" කියලා. මේක තමයි හුඟක්ම වැදගත්. මම හිතන හැටියට අපේ රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව එතුමා වාගේ කෙනෙක් කරන විග්‍රහය ශ්‍රී ලාංකිකයන් හැටියට අප සියලු දෙනාම පක්ෂ භේදයෙන් තොරව, "ඒක හොඳ විග්‍රහයක්" කියලා භාර ගන්න ඕනෑ.

එතුමා තවත් දේවල් කිව්වා. ඊළඟට එතුමා කිව්වා, "I congratulate the Government and people of Sri Lanka on passing the Nineteenth Constitutional Amendment and the recent Right to Information Act."

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාවක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කැමැති නම් ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න පුළුවන්.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
කමක් නැහැ.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
In addition to your section, he says that this change was brought about with the active involvement of the international community, particularly the United Nations, through the Human Rights Council. He says that, but that is not the truth. That is what I say.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
But, I can tell you one thing. Hon. Member, I am the one who went to the Human Rights Council. From 2009 till 2014, I led the Sri Lankan delegation. It was only one year that the Hon. (Prof.) G.L. Peiris led the Sri Lankan delegation. Whenever we went there**,** we talked of and we tabled the progress that we had made. But, unfortunately, there were very many more things that they expected us to do. Now, we also had our limitations. You cannot bring about reconciliation overnight. This is something that takes time. I was a part of that Government. You and I, both, were sitting in that Cabinet. We were party to the decisions that were taken. There was work done during that period also. But, what I am saying is, this is an observation that the Secretary-General is making, that he is pleased to see that progress has been achieved. That is good for all of us. Now, he says that he congratulates the Government on the passing of the Nineteenth Amendment to the Constitution and the Right to Information Bill. Then, he says, "I commend your efforts to move forward on a comprehensive transitional justice agenda and on a constitutional reform process"- that Parliament is actually giving attention as we speak today. Then he says, “I also welcome the symbolic steps you have taken, including the decision to sing the national anthem in Sinhala and Tamil on Independence Day last February for the first time since the 1950s. These steps have built confidence and trust, and strengthened transparency and accountability." So, this is what the Secretary-General of the United Nations coming to Sri Lanka and saying as part of his official statement.

Then, he deviated from this official statement and mentioned in the context of what the UN should have done and did not do in various conflict situations. In that context, he brought in Srebrenica and Rwanda. He talked about Rwanda first. We know that in Rwanda there was a genocide, there was a massacre, and about 800,000 civilians were killed. In Srebrenica, we know that there was a massacre of about 7,000 Bosnian Muslims. Now, that situation cannot be compared to Sri Lanka. -[*Interruption.*] That is what is wrong. Can I finish, Hon. Presiding Member? I was in the audience. I was listening very attentively to what he was saying.

මම එතැන හිටපු නිසා මට ඒක කියන්න පුළුවන්. ඔබතුමන්ලා- [බාධා කිරීම්] නැහැ, නැහැ. ඔබතුමන්ලා දෙදෙනාම හිටියේ නැහැ නේ. මේ ප්‍රකාශයට පිටස්තරව එතුමා කියපු කිසිම දෙයක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙබ් අඩවියේවත් නැහැ. අද වන තුරු එහෙම එකක් දාලා නැහැ. එතුමාගේ නිල ප්‍රකාශය විතරයි එහි සඳහන් කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි එතුමා කිව්වේ.

ලෝකයේ තිබෙන විවිධ අරගළ පිළිබඳ, ප්‍රශ්න පිළිබඳ, ත්‍රස්තවාදී ක්‍රියා පිළිබඳ-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You and I, all of us accept - you were present there- that the Secretary-General did make this statement.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
That is what I am trying to say.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Right. So, it is irrelevant whether it has appeared anywhere. All of us are witnesses to what he has said.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
Hon. Member, you must allow me to speak. The reason that I said I was there was to vouch for the fact that he did not compare Rwanda and Srebrenica with Sri Lanka. I was there. -[*Interruption.*] Can I finish, please?

එතුමා කිව්වේ, "1994දී රුවන්ඩාවේ මේ වාගේ සමූහ ඝාතනයක් වුණා. ස්‍රෙබ්‍රෙනිකාවේ 1995දී- [බාධා කිරීම්] "මේ වාගේ" කියන්නේ, "සමූහ ඝාතනයක්" කියන එකයි. ඒ ගැනයි මා මේ කියන්නේ. හරිද? අපේ රටේ එහෙම දෙයක් වුණේ නැහැ නේ. එතුමා ඒක විග්‍රහ කළේ, "Much worse situation than Sri Lanka” කියන වචනය පාවිච්චි කරලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා මොනවා කිව්වත් එතැන හිටපු කෙනෙකු හැටියට මම වග කීමකින් කියනවා, එතුමා රුවන්ඩාවටයි, ස්‍රෙබ්‍රෙනිකාවටයි ශ්‍රී ලංකාව සංසන්දනය කළේ නැහැ කියලා. එතුමා උදාහරණයක් හැටියට පමණයි රුවන්ඩාවයි, ස්‍රෙබ්‍රෙනිකාවයි ගත්තේ. [බාධා කිරීම්] ඔහොම ටිකක් ඉන්න කෝ. එතුමා උදාහරණයක් හැටියට ඒ රාජ්‍යයන් දෙක අරගෙන, එවැනි අර්බුද පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයට හරියට පිළිතුරු නොදීම පිළිබඳ ප්‍රකාශයක් කරලා කිව්වා, "ශ්‍රී ලංකාවට

[ගරු මහින්ද සමරසිංහ මහතා]

වඩා දරුණු තත්ත්වයක් රුවන්ඩාවේ සහ ස්‍රෙබ්‍රෙනිකාවේ තිබුණේ" කියලා. හැබැයි, වුණේ මේකයි. Official statement එකේ ඒක දැම්මේ නැති නිසා එතැන හිටපු සමහර මාධ්‍යවේදීන් ඒකට වැරදි අර්ථ කථනයක් දුන්නා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියවපු ඒ ප්‍රවෘත්තිය මමත් දැක්කා. ඉරිදා පත්තරයක තමයි ඒක පළ කරලා තිබෙන්නේ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒගොල්ලන්ට එහෙම දෙයක් කියන්න බැහැ. [බාධා කිරීම්] මම කියන්නම්. එතුමා කිව්වේ, "Much worse situation occurred in Rwanda and Srebrenica." කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දැන් ඒක කිව්වා. අපට අවශ්‍ය නැති දේවල් හාර ගන්න ඕනෑ නැහැ නේ. අපේ රණ විරුවෝ හදවතින්ම කටයුතු කළ බව අප දන්නවා නේ. අපේ ත්‍රිවිධ හමුදාව පැහැදිලි ප්‍රතිපත්තියක ඉඳලා, සිවිල් ජනතාව ඉලක්ක කර ගන්නේ නැතුව, මේ ලෝකයේ තිබුණු දරුණුම ත්‍රස්තවාදය අපේ රටෙන් ඉවත් කරන්න, අපේ ජනතාවගේ ජීවිත එයින් නිදහස් කරලා දෙන්න ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළේ. එතුමා රුවන්ඩාවයි, ස්‍රෙබ්‍රෙනිකාවයි එක්ක අපේ රට සංසන්දනය කළේ නැහැ. එතුමා රුවන්ඩාවයි, ස්‍රෙබ්‍රෙනිකාවයි උදාහරණයකට ගත්තේ, අපට වඩා දරුණු ප්‍රශ්නයක්, දරුණු තත්ත්වයක්, දරුණු වැඩ පිළිවෙළක් ඒ රටවල ක්‍රියාත්මක වුණා කියන්නයි.

ඒ නිසා genocide එක අපිට අදාළ නැහැ. අපේ රටේ genocide එකක් වුණේ නැහැ. [බාධා කිරීමක්] එතුමා එහෙම කිව්වේ නැහැ. පත්තරවල දමන එක එක දේශපාලන අර්ථකථනවලට ඔබතුමන්ලා රැවටෙන්න එපා. මම පාර්ලිමේන්තුවේ නැඟිටලා මේක වගකීමකින් කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම දෙයක් එතුමා කිව්වේ නැහැ.

අවසාන වශයෙන්, මේ කාරණය ගැනත් මම කියන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා බෑන් කී මූන් මහ ලේකම්තුමාව හමු වුණු අවස්ථාවේදී බොහොම පැහැදිලි ස්ථාවරයක ඉඳගෙන කිව්වා, "මේ රටේ පුළුල් සංහිඳියාවක් ක්‍රියාත්මක කරන්නයි අපට ඕනෑ. හැබැයි, ඒ සංහිඳියාවට යන ගමන අමාරු ගමනක්. ඒක එක රැයකින් කරන්න බැහැ. ඒකට මට කාලයක් ඕනෑ" කියලා. එදාම සවස 7.00ට බෑන් කී මූන් මහ ලේකම්තුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා එතුමාත් කිව්වේ, "එක රැයකින් සංහිඳියාව ලබා ගන්න බැහැ. සංහිඳියාවට යන ගමනට කල් යනවා. ඒකට සම්බන්ධ වෙන්න එකපාරටම බැහැ" කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපේ ජනාධිපතිතුමාත් බොහොම පැහැදිලි ස්ථාවරයක ඉඳගෙන මව්බිම වෙනුවෙන්, රට වෙනුවෙන්, අපේ රණවිරුවන් වෙනුවෙන් හැමවිටම කථා කරලා තිබෙනවා. ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ ඒකමතිකව සම්මත වුණු යෝජනාවේ හයිබ්‍රිඩ් අධිකරණයක් ගැන කිව්වත්, අතිගරු ජනාධිපතිතුමා බොහොම පැහැදිලිව ප්‍රකාශයක් කරලා තිබෙනවා, එතුමා එම පුටුවේ ඉන්න කාලය තුළ කිසිම ජාත්‍යන්තර විනිසුරුවරයකු ලංකාවට ගෙනෙන්න ඉඩ දෙන්නේ නැහැ; හයිබ්‍රිඩ් අධිකරණයකට එතුමා ඉඩ කඩ දෙන්නේ නැහැ කියලා. එතුමා බොහොම පැහැදිලිව ඒක කියලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
ඒ වාගේම එතුමා මෑතකදීත් කියලා තිබෙනවා, රණවිරුවන්ව පාවා දෙන්නේ නැහැ කියලා. මොකද, අපි සියලුදෙනා හදවතින්ම දන්නවා, සිවිල් ජනතාව ඉලක්ක කරගෙන යුද්ධයක් කරන්න කිසිම අවස්ථාවක අපේ හමුදාවේ ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ කියලා. අපි දරුණු ත්‍රස්තවාදයකටයි මුහුණ දුන්නේ. බෙදිලා තිබුණු රටක් අපි එක්සේසත් කළා. දැන් පුළුල් සංහිඳියාවක් මේ රටේ ක්‍රියාත්මක කිරීම තුළින් මෙවැනි දෙයක් ආපසු ඇති නොවෙන තත්ත්වයක් නිර්මාණය කරන්නයි අපි සියලුම දෙනාම උත්සාහ කරන්නේ. ඒ නිසා මේක දේශපාලන සටන් පාඨයක් කරගන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධානීන් මේ රටට එන කොට එක පුද්ගලයෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානයට ගිහිල්ලා, එතැන උපවාසයක් කරපු හැටි මට මතකයි. අන්තිමට හිටපු ජනාධිපතිතුමාට සිද්ධ වුණා, තැඹිලි වතුර පොවලා එතුමාව නැඟිටුවන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය අවසානයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා කථාව අවසන් කළ යුතුයි. මොකද, විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාගේ කාලයෙන් තමයි අඩු වෙන්නේ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

මානව හිමිකම් මහ කොමසාරිස් නවනීදන් පිල්ලේ මහත්මිය ලංකාවට එනකොට එක්තරා හිටපු ඇමතිවරයෙක් කිව්වා, නවනීදන් පිල්ලේ මහත්මිය කසාද බඳින්න එතුමා කැමැතියි කියලා. ගරු මන්ත්‍රීවරුනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයට කොළේ වහලා ගහන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතන්න එපා. ඒ ගොල්ලන් හොඳටම දැනගෙන හිටියා, මේ සියල්ලක්ම සංවිධානය කළේ එවකට හිටපු රජය කියන එක. එතුමන්ලා ඒක දැනගෙන හිටිය නිසා තමයි, අපි කොන් වුණේ. කොන් වෙච්ච රටක් බවට අපි පරිවර්තනය වුණේ. දැන් අපි නැඟිටලා අපේ ස්වාධීනත්වය, අපේ අභිමානය රැකගෙන ලෝක ප්‍රජාවත් එක්ක, ජාත්‍යන්තර ප්‍රජාවත් එක්ක ගනු දෙනු කරන්න පටන් ගෙන තිබෙන අවස්ථාවේදී මේක විනාශ කරන්න කටයුතු කරන්න එපා කියන ඉල්ලීමත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට ගරු විදුර වික්‍රමනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் *தலைமை வகித்தார்கள்.*
Whereupon THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 6.00]

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ලෝකයේ ඉතාමත්ම අකාර්යක්ෂම සංවිධානයක් තිබෙනවා නම්, ඒක එක්සත් ජාතීන්ගේ සංවිධානය විය යුතුයි කියලා මම හිතනවා. දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ මේ ලෝකය කඳවුරු දෙකක් විසින් බෙදා ගත්තා. ඒ අවස්ථාවේදී අසරණ වෙච්ච එකම ආයතනය තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය.

අවාසනාවකට වාගේ, අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙක් හැටියට තවමත් ඉන්නවා. යම් යම් හේතු නිසා අපි ඒ සංවිධානයේ සාමාජිකත්වය දරනවා. හැබැයි, අද මේ ලෝකයේ කුමන හෝ රටක -රුවන්ඩාවේ පමණක් නොවෙයි, සිරියාවේ, එහෙමත් නැත්නම් වෙනත් රටක- ප්‍රශ්නයක් ඇති වුණු වෙලාවක එය පාලනය කර ගන්න අපොහොසත් වුණු සංවිධානයක් තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය. මේක තමයි ඇත්ත. බල කඳවුරු දෙකක් තිබුණු වෙලාවේ මේ ලෝකයේ මීට වැඩිය යම් කිසි පාලනයක් තිබුණා. ඇමෙරිකා එක්සත් ජනපදයත්, සෝවියට් රුසියාවත් ලෝකයේ මහා බලවතුන් හැටියට හඳුන්වා ගත්තා. එහිදී සෝවියට් රුසියාව හෝ ඇමෙරිකා එක්සත් ජනපදය යම් කිසි ආකාරයක වැරැදි වැඩක් කරනවා නම්, අනෙක් පාර්ශ්වය ඊට විරුද්ධ වුණා. අද ඒ තත්ත්වය නැහැ. අද ලෝකයේ එකම පොලිස්කාරයා වෙලා තිබෙන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ දේශපාලනයත් එක්සත් ජාතීන්ගේ සංවිධානයට රිංගනවා. ඒකට තිබෙන හොඳම උදාහරණය තමයි අපේ රටට විරුද්ධව ඉදිරිපත් වුණු යෝජනාව. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇමෙරිකාවට පක්ෂ නම් එවැනි ඕනෑම යෝජනාවක් ඒ ආකාරයට ක්‍රියාත්මක කරන්න පුළුවන් වනවා. ඇමෙරිකාවේ සිතැඟිවලට එකඟ නම්, ඒක තමයි ක්‍රියාත්මක වන්නේ. රටක් ආණ්ඩු විය යුත්තේ මෙහෙම නොවෙයි කියලයි මට හිතෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාට මේ රටේ ඉතිහාසය ගැන මතක ඇති. බරපතළ තීන්දු ගත්තා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා අගමැතිවරයා හැටියට කටුනායක සහ ත්‍රිකුණාමලයේ කඳවුරු අපේ ආණ්ඩුව යටතට පත් කර ගන්න අවශ්‍ය තීන්දු ගත්තා. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තෙල් කොම්පැනි ජන සතු කරපු වෙලාවේ, අපට විවිධ තර්ජනයන්; අභියෝගයන් එල්ල වුණා. අපි රටක් හැටියට ඒවා ඉදිරියේ දණ ගැහුවේ නැහැ. ඔවුන් රාජ්‍ය තාන්ත්‍රිකයන් විධියට කටයුතු කළේ, අපේ රටේ අභිමානය; අපේ ජනතාවගේ අභිමානය ආරක්ෂා කර ගෙනයි. මම හිතන විධියට අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, අද අපේ රටේ රාජ්‍ය තාන්ත්‍රිකයන් නැති වීම. මොකද, අද සිටින්නේ දේශපාලනඥයන්. මේ හැම දෙයක්ම දේශපාලනයට යට වෙනවා. ඒකට ප්‍රධාන හේතුව හැටියට අපි තවත් දෙයක් දකිනවා. ඒ තමයි අපට විදේශ ප්‍රතිපත්තියක් නොමැති වීම. කාලයක් පුරා අපි ගෙන ආපු විදේශ ප්‍රතිපත්තියට; නොබැඳි ප්‍රතිපත්තියට අද අපි බැඳිලා සිටිනවා. ඒ නිසා තමයි එක එක්කෙනා අපේ රටට ඇවිල්ලා අපට පාරම්බාලා යන්නේ. මේ තත්ත්වය වෙනස් විය යුතුයි. අපි නොබැඳි පිළිවෙත අනුගමනය කරන්නේ නැත්නම්, එක් එක් පාර්ශ්වවලට බැඳුණු මිනිසුන් විධියට කටයුතු කරන්න අපට සිදු වනවා. ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. කිවුවාද, නැද්ද, කියන එක නොවෙයි තර්කය විය යුත්තේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනියනි, මට තව විනාඩියක් දෙන්න.

අපේ රටේ අභිමානය අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒකට දේශපාලනය හරස් නොවිය යුතුයි. ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාගේ එම ප්‍රකාශයට අපි එකඟ වනවා. විදේශ ප්‍රතිපත්තිය දේශපාලනයෙන් එහාට ගිය එකක් වෙන්නට ඕනෑ. මොන ආණ්ඩුවක් බලයට ආවත්, මොන පක්ෂය බලයේ සිටියත් විදේශ ප්‍රතිපත්තිය එකක් වෙන්නට ඕනෑ. එහෙම වුණොත් එක එක්කෙනාට ඇවිල්ලා අපේ රට හැල්ලු කරන්න; අපේ රටේ අමාරුවෙන් ගොඩනඟා ගත්ත සාමය නැති කරන්න ඒ අයට බැරි වනවා. ඒ නිසා ඔබතුමන්ලා සියලු දෙනාගෙන්ම මම බොහොම ගෞරවයෙන් ඉල්ලන්නේ, දැන්වත් අප සියලු දෙනාම එකට එකතු වෙලා කාටවත් හොල්ලන්න බැරි විදේශ ප්‍රතිපත්තියක් හදා ගනිමු කියලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.05]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් මම ඉතාමත් කෙටියෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. එක්සත් ජාතීන්ගේ සංවිධානය පැහැදිලිවම ලෝකයට අවශ්‍ය සංවිධානයක්. නමුත්, පසු ගිය අවුරුදු 25කට ආසන්න කාලයක් තිස්සේ එක්සත්

[ගරු බිමල් රත්නායක මහතා]

ජාතීන්ගේ සංවිධානය ඇමෙරිකා එක්සත් ජනපදයේ අණ්ඩක් බවට පත් වෙලා තිබුණා. අද වන විට රාජ්‍යාන්ත්‍රික ක්‍රමයකට යුද්ධය ව්‍යාප්ත කරන ආයතනයක් බවට එම සංවිධානය පත් වෙලා තිබෙනවා.

ලෝක යුද්ධ විශාල ප්‍රමාණයක් නතර කරන්න එම සංවිධානයට බැරි වෙලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පක්ෂපාතිත්වය සම්බන්ධව විවාදයක් නැහැ. එය පැහැදිලිවම ඇමෙරිකානු යුද දේශපාලන ප්‍රතිපත්තියට පක්ෂ ග්‍රාහියි. එයට බිය වී තමයි එය පවතින්නේ. එය ඉන් මුදා ගැනීම ලෝකයේ අනෙක් රටවල වගකීමක් කියා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා මේ කාරණය සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියන්න කැමැතියි, එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා ශ්‍රී ලංකාවට ඇවිත් කරන ලද ප්‍රකාශයේ ලංකාව පිළිබඳ අගය කිරීම් වාගේම ලංකාව වෙනත් රාජ්‍යයන් සමඟ සංසන්දනය කිරීම් ද පැහැදිලිව තිබෙන බව. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිල වෙබ් අඩවියේත්, "විකිපීඩියා" ඇතුළු වෙනත් වෙබ් අඩවිවලත්, ඔහුගේ පැමිණීම පිළිබඳව වාර්තා කරපු පුවත් පත්වලත් -ලංකාවේ නොව පිට රට පුවත් පත්වල- ලංකාව සම්බන්ධව ඔවුන්ගේ ස්ථාවරය සඳහන් කර තිබෙනවා. ඉතා පැහැදිලියි, ලංකාවට දේශපාලන මැදිහත් වීමක් කරගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අවශ්‍ය බව. ඇත්තටම, එක්සත් ජාතීන්ගේ සංවිධානයට නොවෙයි එය අවශ්‍ය වන්නේ. ඇමෙරිකාව, ඉන්දියාව ඇතුළු විවිධ රාජ්‍යයන්ටයි එම සංවිධානය මඟින් එය කරවාගන්න අවශ්‍ය වන්නේ. මේ කාරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය මා කියන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩියක් පමණයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විදේශ මැදිහත් වීම්වලට අපි විරුද්ධයි. නමුත් අප කියන්න ඕනෑ, මෙන්න මේ කාරණයත්. අපේ ස්ථාවරය වන්නේ, 'අධිරාජ්‍යවාදයේ, එහෙම නැත්නම් විදේශවල මැදිහත් වීම් ද එපා; ප්‍රජාතන්ත්‍රවාදය ද එපා.' කියන එක නොවෙයි. අපේ ස්ථාවරය වන්නේ, 'විදේශ මැදිහත් වීම් ද එපා; අපේ රටේ ජනතාවට යුක්තියත් එපා.' කියන එක නොවෙයි. අපේ ස්ථාවරය වන්නේ, 'විදේශ මැදිහත් වීම් ද එපා; මාධ්‍ය නිදහස ද එපා.' කියන එක නොවෙයි. එවැනි ස්ථාවර තිබෙන්න බැහැ. 'ආණ්ඩුව අපියි. අපි අපේ රටේ මිනිසුන් උස්සනවා; මරණවා. අපි මාධ්‍යයට ගහනවා. බැන් කී මූන්ට බලාගන්න දෙයක් නැහැ.' කියා කියන්න බැහැ. බලපෑමක් කිරීමේ අයිතියක් බැන් කී මූන්ට එන්නේම, අප ඒවා කරන නිසායි. අප විසින් කළ යුතු දේවල් නොකිරීම තමයි විදේශ රාජ්‍යයන් අපේ රටට බලපෑම් කරන්න අද පාවිච්චි කරන්නේ. අප දකින විධියට විදේශ මැදිහත් වීම් නතර කරන්න පුළුවන් එකම විධිය තමයි, මේ රටේ ජනතාවට උපරිම ප්‍රජාතන්ත්‍රවාදය ලබා දීම; උපරිම යුක්තිය ලබා දීම; අතුරුදහන් වූවන් පිළිබඳව සෙවීම; මාධ්‍ය නිදහස සහතික කිරීම. ලෝකයේ අධිරාජ්‍යවාදී නොවන සාධාරණ රාජ්‍යයන් සුවිශාල ප්‍රමාණයක් තිබෙනවා. එය දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා දන්නවා. සාධාරණ රාජ්‍යයන් අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. අපට ඔවුන්ට පෙන්වන්න පුළුවන්, 'අපේ රාජ්‍ය සාධාරණ, ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක්. එයටයි මේ ඇඟිලි ගහන්නේ' කියා. එසේ නැතිව, "අධිරාජ්‍යවාදින්" යැයි නම් කරමින්, මේ රටේ සිද්ධ වූ සියලු දේවල් නොසලකා හැරියොත්, රටේ ජනතාවට ලැබෙන අයිතිවාසිකම්වලට පහර ගැහුවොත් එය අනිවාර්යයෙන්ම විදේශ රාජ්‍යයන් අපේ රටට එරෙහිව යොදා ගන්නවා. මා ඉහතින් කී ස්ථාවරය තමයි, මේ සම්බන්ධව අප පක්ෂයක් වශයෙන් දරන්නේ. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමා.

[අ.භා. 6.08]

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සභාව කල් තබන අවස්ථාවේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් ගෙනැවිත් තිබෙන යෝජනාව සම්බන්ධව මට මේ පුංචි වෙලාව තුළ නහන්න ප්‍රශ්න කීපයක් තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බැන් කී මූන් මහතා ශ්‍රී ලංකාවට ඇවිත්, ගාල්ලට ගියා එක දවසක්, උතුරට ගියා එක දවසක්. ගාල්ලට ගිහින් සංහිඳියාව ගැන කථා කළා. හැබැයි, උතුරට ගිහින් සංහිඳියාව ගැන කථා කළාද? උතුරට ගිහින් සංහිඳියාව ගැන කථා කළේ නැහැ. දකුණේදී සංහිඳියාව ගැන කථා කරනවා. මේ රට තුළ අද සිද්ධ වෙමින් තිබෙන දේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බලාපොරොත්තු වූ දේයි. ජනවාරි 8වන දායින් පසු progress එක බලන්න තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් ආවේ. ඒ අය බලාපොරොත්තු වූ දේ සිද්ධ වෙනවා. එය එසේ වන නිසා තමයි ඇඟයුවේ. ඒ වෙනස නිසා තමයි සතුටින් ගියේ. "ඔහොම යං" කියා කියන්නේ, "කාලය ගන්න." කියා කියන්නේ ඒ වැඩේ ඒ විධියටම වන නිසායි. රණ විරුවන් දක්කනවා හිර ගෙදරට. එල්ටීටීඊ සිරකරුවන්ට නිදහස ලබා දෙනවා.

ඒ විතරක් නොවෙයි. යාපනයේ විශ්වවිද්‍යාලයේ සිංහල තරුණයන්ට -සිංහල ශිෂ්‍යයන්ට- සිංහල සංස්කෘතික නැටුමක් කරන්න බැරි වුණා. එතැන තිබිය යුතු සංහිඳියාව ගැන බැන් කී මූන් කථා කරනවාද? ඒ ගැන බැන් කී මූන් කථා කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. එතුමා ඉතා පැහැදිලිව කියනවා, "ගැටලු විසඳන්න රජය දරන තැත අපි අගයනවා. එහෙත් යුද්ධයෙන් බැට කෑ උතුරේ ජනතාවට සැම දා බලා සිටිය නොහැකියි." කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එයින් අපට කියන්නේ මොකක්ද? 'උතුරේ ජනතාව නැවත නැඟිටින්න් ඒකට අපට කරන්න දෙයක් නැහැ.' කියන එකයි ඒ කියන්නේ. ඒ කියන විධියට, යුද්ධයෙන් අවතැන් වෙලා ඉන්නේ උතුරේ ජනතාව විතරයි, යුද්ධයෙන් අසාධාරණය වෙලා තිබෙන්නේ උතුරේ ජනතාවට විතරයි කියන එක බැන් කී මූන් ඒක පාක්ෂිකව පිළිගන්නවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් ලෝකයටම අපක්ෂපාතිව ඉන්න ඕනෑ මොහොතක, මේ රටේ පැවැති අවුරුදු 30කට වැඩි සාපරාධී යුද්ධය ඔස්සේ මුළු රටම ගිනි බත් කරපු ත්‍රස්තවාදී ව්‍යාපාරයට සුදු හුණු ගාන්න තමයි ඔහු ඇවිත් තිබෙන්නේ. ඒ වෙලාවේ තමයි උතුරේ සම්පන්දන් මහත්මයා, විග්නේස්වරන් මහත්මයා ඇතුළු පිරිස ගිහින්, උතුරේ හමුදා කඳවුරු ඉවත් කරන්න, උතුරේ ඉඩම් -භූමිය- අත් පත් කරගන්න කථා කළේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ඒ නිසා ඉතා පැහැදිලියි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් ඇවිල්ලා තිබෙන්නේ එතැනින් නවතින්න නොවෙයි කියන එක. මංගල සමරවීර මහත්මයා උතුරට ගිහිල්ලා කිව්වේ මොකක්ද? එතුමා උතුරට ගිහිල්ලා කිව්වා, "නොවැම්බර් වන කොට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවා" කියලා. ඒක තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විතරක් නොවෙයි, බටහිර අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාව; ඉන්දියාවේ වුවමනාව. ඒ බටහිර හාම්පුතුන්ගේ වුවමනාවටයි මේ ආණ්ඩුව ගොඩ නැඟුණේ. ඒක සම්පූර්ණ කිරීමෙන් තමයි එක්සත් ජාතීන්ගේ ඒ අධිරාජ්‍යවාදී සියලු සංවිධානවල මන දොළ පිනවන රටක් බවට පත් වෙන්නේ. අන්න ඒක තමයි වුවමනාව වුණේ. ඒ කියන්නේ, දැන් බළලා මල්ලෙන් එළියට පැනලයි තිබෙන්නේ. අපි ඉතා පැහැදිලි ප්‍රශ්නයක් අහනවා. මේ රටේ හැටදහසක් කොල්ලෝ මැරෙන කොට බැන් කී මූන්ලා කොහේද හිටියේ? එක්සත් ජාතීන්ගේ සංවිධානය කථා කළා ද? මේ රටේ කළු භීෂණය තිබුණු වෙලාවේ, ඒ අඳුරු යුගය වෙලාවේ, 1988-1989 කාලයේ ඒ භීෂණය හමුවේදී බැන් කී මූන්ලා කොහේද හිටියේ? ඒවාට කථා කළා ද? මේ රටේ ජනතාව අවතැන් වුණු වෙලාවේ, මහා යුද්ධයක් පැවැති වෙලාවේ, අරන්තලාවේ භික්ෂූ ඝාතනය වෙලාවේ කථා කළා ද? නැහැ. ඒ විතරක් නොවෙයි. ශ්‍රී මහා බෝධියට පහර දෙන වෙලාවේ කථා කළාද? දළදා මාළිගාවට ගහද්දී කථා කළාද? මේ රටේ අක්කරෙයිපත්තුව ඇතුළු පොලිස් ස්ථාන පහක යුද භටයින් 600ක් මැරෙද්දී, රණ විරුවන් මැරිලා වැටෙද්දී, ලේ හැලෙද්දී, ඒ ගැන කථා කළාද? නමුත්, එතුමා ඇවිල්ලා කියනවා, ඉතා පැහැදිලිව "ගැටලු විසඳීමට රජය දරන තැත අගයනවා. එහෙත් යුද්ධයෙන් බැට කෑ උතුරේ ජනතාවට සැමදා බලා සිටිය නොහැකියි" කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

බැන් කී මූන් ඇවිල්ලා තිබෙන්නේ නිකම් අත පිහදා ගෙන යන්න නොවෙයි. අත පිහදමන වැඩේ මහින්ද සමරසිංහ මැතිතුමන්ලා කරන බව බැන් කී මූන්ලා දන්නවා; මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි, රනිල් වික්‍රමසිංහ මැතිතුමායි ප්‍රමුඛ ආණ්ඩුව කරන බව දන්නවා. සතුට පළ කරලා ගියේ ඒ නිසයි. ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙනුවෙන් කථා කළාට මට එක වෙලාවකට හිතෙන්නේ ඔබතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා ලෙසයි. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ කථා කරන කොට මට දැනුණු දේ තමයි ඒක. එතුමා වෙනුවෙන් කථා කළාට අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ රටේ ජනතාව බලා ගෙන ඉන්නවා, හෙට දවසේ වෙන්නේ මොනවාද කියලා. අපි ඒකාබද්ධ විපක්ෂය හැටියට ඒ වෙනුවෙන් අරගළ කරනවායි කියන කාරණය මතක් කරමින් මා නිවතිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා.

[6.13 p.m.]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

Madam Chairperson, in spite of the screaming Members of the Opposition, Sri Lanka is a proud member of the United Nations Organization. We joined the United Nations in 1955.

We, as the guardian of the teachings of Gautama Buddha, which is in line with the moral voice that the United Nations seeks to be in this world, should be proud to uphold the values, principles, and norms that the Charter of the United Nations sets out. Sri Lanka should be a leading voice as a promoter of universal values that are set out in the Universal Declaration of Human Rights and in the Charter of the United Nations.

Madam Presiding Member, the Secretary-General of the United Nations, Mr. Ban Ki-moon, honoured this nation and our people undertaking an official visit to Sri Lanka from 31st August to 2nd September 2016. He travelled to Galle, as the Hon. Member just mentioned, where he mingled with youth from all parts of our country. He inspired and encouraged them with his words of wisdom. He urged them to work to become true global citizens. He inspired them to work together with young people from different neighbourhoods, ethnic groups or religions and share their vision for a sustainable and peaceful future, not only for Sri Lanka, but for our planet. I do not understand why the Hon. Member cannot appreciate that position.

The Secretary-General spoke of the "great transition and progress, landmark progress", achieved by Sri Lanka since his last visit in 2009. He also travelled to Jaffna as the Hon. Member mentioned and had meetings with the Governor of the Northern Province, the Leader of the Opposition and the Tamil National Alliance, and met the Chief Minister of the Northern Province. While in Jaffna, he visited the Palai Veemankaman South village resettlement camp.

He held official meetings with the President and the Prime Minister, the Hon. Speaker of Parliament and leaders of political parties. At these meetings, the Secretary-General commended the substantial progress achieved by the National Unity Government in working towards reconciliation and a durable peace, strengthening democracy, human rights, and freedom of expression and good governance under the leadership of the President and the Prime Minister, since January 2015. He also met with representatives of civil society and some of the independent commissions.

Under the leadership of President Sirisena and Prime Minister Wickremesinghe, we have once again restored

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Sri Lanka's image as a responsible and respected nation on the world stage. So much so that we are now hailed as an example to other States. We acknowledge the problems we have. We do not shoot messengers. We work together with dignity and decorum and through discussion and engagement to find solutions that are in the best interest of all our people. Let me repeat "all our people". We do not engage in withholding from our people what is beneficial to them or what is in their best interest in the long-run and this includes strong institutions, an independent judiciary, good governance, rule of law, individual rights, economic prosperity, safety and security and a durable peace, which guarantees the non-recurrence of conflict.

Madam Presiding Member, while thanking the Member of Parliament, Hon. Dinesh Gunawardena for posing a question concerning the visit of the UN Secretary-General, I must inform this House that contrary to what the Hon. Member says, the Secretary-General did not say anything during his visit that defamed our country's image, undermined its unity, sovereignty or territorial integrity.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Madam Presiding Member, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Hon. Deputy Minister, in an Adjournment Motion we expect the answers for the questions that we have posed. The other thing is -[*Interruption*] You are misleading. Out of imaginations, you are speaking.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Instead, his visit and his remarks served to strengthen Sri Lanka's image in the eyes of the world. It enhanced Sri Lanka's profile as a nation, perhaps the only one of its kind in the world at this moment in history, which has forged a consensus among the two main parties in Parliament to work towards addressing pressing issues and challenges faced by the people.

Ours is a country which seeks to heal; which seeks to reconcile; which seeks to understand the pain of the problems of people and find durable solutions with empathy; which seeks to usher in reform to institutionalize good governance practices, strengthen the rule of law and individual rights and works hard at bringing in the necessary economic reform that would result in growth and equitable development that will benefit all.

It is steps like this that will enhance our sovereignty; it is steps like this that will safeguard our sovereignty and our territorial integrity. It is by addressing our problems and by working in engagement with others as a responsible State that we can safeguard our unity, territorial integrity and sovereignty - not by shouting of slogans until we turn hoarse or not by sitting in protest or by burning effigies of visiting dignitaries.

Madam Presiding Member, in this context, I want to specifically mention to those with diabolical intent who try to give various interpretations to the Secretary-General's remarks that the National Unity Government is committed to safeguarding the unity, sovereignty, territorial integrity and welfare of all our people and that includes our security forces who have spared no effort to combat terrorism.

The way we safeguard our motherland and our security forces is not by shouting slogans but through meaningful actions, constructive engagement, dialogue and most importantly by addressing issues, facing challenges and crafting solutions. Amidst efforts to mislead the public and stall action in Parliament through disruption and rioting, the Government with the support of the Members of Parliament from the Opposition, JVP and the TNA saw through the passage of legislation last month to establish an Office on Missing Persons. This was a humanitarian measure aimed at alleviating the pain and anguish of the mothers and fathers of our nation who seek answers to the fate that befell their children, family members who have gone missing.

It is by addressing issues in a responsible manner that we can lift the cloud of allegations that hang over the heads of our security forces and our country. It is by our own accord and our best interest that we decided to co-sponsor the UN Human Rights Council Resolution that incorporated our proposals to set up mechanisms for truth seeking, justice and reparations, and to take steps for non-recurrence aimed at achieving sustainable peace in the country for good of all communities. We believe that the process undertaken by Sri Lanka through truth seeking and accountability will reinforce democracy, freedom, and human rights in the country. Sri Lanka's constructive engagement with Human Rights mechanisms has also paved the way for visits of a number of special rapporteurs to this country, engage with Government officials and people, and see for themselves the actual developments in the country through a candid and open

engagement. This approach has been very much appreciated not only by the local communities but also by the international community.

In this context, the UN Secretary-General's visit and his engagements with all segments of Sri Lankans demonstrates the constructive approach that this country has adopted in achieving progress on multiple fronts and multiple issues. Despite these positive trends, some sections have been attempting to cast the visit of the Secretary-General in a negative light by misinterpreting comments made by him in his speech at the public event at the Lakshman Kadirgamar Institute on 2nd September. These sections have conveniently opted to completely ignore the many positive comments made by the Secretary-General.

The UNSG referred to the ambitious reform programme set by the Government and stated that we have made significant progress in implementing the programme. He congratulated the Government on the many achievements earlier listed by the Hon. Mahinda Samarasinghe and much more. As this House is well aware, there is still much left to do. Therefore, it is only natural that the Secretary-General also pointed this out and encouraged the Government to continue with its efforts for meaningful reconciliation.

The Secretary-General acknowledged that there is no fast route to achieving this. He stated that reconciliation would take many years of political courage and determination. Madam Presiding Member, we believe that the Secretary-General's visit and his two-day engagement with Government leaders and civil society is a very positive development and it demonstrates the goodwill that has been recognized by the international community for Sri Lanka's sincere commitment to re-engaging with the UN system and finding meaningful solutions to reconciliation and peace building.

Further, an open and an honest engagement with international partners is in line with the mandate given by the people of the country to the Unity Government in order to restore the international image of the country. We believe that we have made successful progress in this regard. We are well aware that some sections are attempting to cast the comments made by the Secretary-General negatively for political purposes. Instead it should be noted that the Secretary-General acknowledged that the UN itself has made some mistakes in several cases particularly in Rwanda and Srebrenica and that the work done by the UN was not sufficient including in Sri Lanka.

There was no equating of the situations as mentioned by the speeches in support of this Adjournment Motion. In fact, I have the verbatim of his statement. As the Hon. Mahinda Samarasinghe also mentioned, the Secretary-General says, "Something happened, during my time as Secretary-General, in Sri Lanka. But something more serious, terrible happened in the past." and, he refers to Rwanda. So, if you are unable to comprehend the difference, then that is not my problem. That is your problem. You have a problem in understanding. He says, "Something happened, during my time, in Sri Lanka but something more serious, terrible happened in Rwanda." - [*Interruption.*] So, this is the verbatim. This is exactly what the Secretary-General said. So, if the Hon. Members of the Opposition are unable to comprehend simple English, Madam Presiding Member that is not my problem. This shows your inability to understand the language. You have misconstrued it and then gone before Sinhala press and told lies. Do not do that.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
බැන් කී මූන්ට කට වැරදුණා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
We disagree with the Hon. Dinesh Gunawardena's proposal that Sri Lanka's image has been tarnished and the territorial integrity, unity and sovereignty and respect of the country has been violated by the visit of the Secretary-General of the United Nations. - [*Interruption.*]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීවරුනි, බාධා කරන්න එපා. නිශ්ශබ්ද වෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
On the contrary, I must stress that the previous Government's non-engagement with the international community seriously eroded Sri Lanka's image in the international arena. We are determined to strive on the path of reconciliation in the interest of this nation so that the people of our country can live in safety without fear and progress in unity towards prosperity.

Finally, Madam Presiding Member, I must also state that the Secretary-General's visit has further strengthened the cooperation between the UN and its agencies with Sri Lanka and helped this nation advance its status as a responsible and respected Member-State of the United Nations.

Thank you very much.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.30ට, 2016 සැප්තැම්බර් 07 වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් තියේය.

அதன்படி பி. ப.6.30 மணிக்கு பாராளுமன்றம், 2016 செப்ரெம்பர் 07, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.30 p.m. until 1.00 p.m. on Wednesday, 07th September, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

246 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 246 - இல. 02
Volume 246 - No. 02

2016 සැප්තැම්බර් 07 වන බදාදා
2016 செப்ரெம்பர் 07, புதன்கிழமை
Wednesday, 07th September, 2016

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)
பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
උතුරු පළාතේ වෛද්‍ය මධ්‍යස්ථානවල සුළු සේවකයන් ස්ථිර කිරීම
විශ්වවිද්‍යාල සිසුන් මර්දනය

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත :
පළමුවන වර කියවන ලදි.

මෝටර් වාහන පනත :
නියෝග

කල් තැබීමේ යෝජනාව:
වතු සේවකයන්ට රජයේ ඉඩම් ලබා දීම

பிரதான உள்ளடக்கம்

மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
வட மாகாண மருத்துவ நிலையங்களில் கீழ்நிலைப் பணியாளர்களை நிரந்தரமாக்கல்
பல்கலைக்கழக மாணவர்கள் மீதான அடக்குமுறை

நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

மோட்டார் வாகனச் சட்டம் :
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
தோட்டத் தொழிலாளருக்கு அரச காணி வழங்கல்

PRINCIPAL CONTENTS

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Confirmation of Minor-Grade Employees in Medical Centres of Northern Province
Suppression of University Students

NATION BUILDING TAX (AMENDMENT) BILL:
Read the First time

MOTOR TRAFFIC ACT:
Regulations

ADJOURNMENT MOTION:
Provision of State Land to Estate Workers

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 සැප්තැම්බර් 07වන බදාදා
2016 செப்ரெம்பர் 07, புதன்கிழமை
Wednesday, 07th September, 2016

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 1992 මැයි මස 09වැනි දින නිව්යෝර්ක්හි දී පිළිගන්නා ලද දේශගුණික වෙනස්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය සඳහා වූ පැරිස් ගිවිසුම අපරානුමත කිරීම;

(ii) 2013 සහ 2014 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තා; සහ

(iii) 2013 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව.

එකී ගිවිසුම සහ වාර්තා තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, 2012 වර්ෂය සඳහා ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழுக்களின் அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු කථානායකතුමනි, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "මෝටර් වාහන පනත (203 අධිකාරය) යටතේ නියෝග" යන කරුණ සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු දුමින්ද දිසානායක මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) කහටගස්දිගිලිය, කිරිඉබ්බෑව, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි අහමදු නෙයිනා එහියා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අනුරාධපුර, විජයපුර, අනුලාදේවි මාවත, අංක 932 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජී. සෝමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) අනුරාධපුර, ගුවන් තොටුපොළ හන්දිය අංක 246/24 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. එංගෝනෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) අනුරාධපුර, මයිලගස්හන්දිය, කම්කරු මාවත, අංක 603/36 දරන ස්ථානයෙහි පදිංචි එම්.බී. නිශ්ශංක ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත අලුවිහාරේ මහතා - පැමිණ නැත.

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கிராமிய பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - Deputy Minister of Rural Economic Affairs)

Hon. Speaker, I present a petition from Mr. P. Sivagnanasundaram of No. 28, Thiruchendur, Murugan Temple Road, Kalladi, Batticoloa.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலு வல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

ගරු කථානායකතුමනි, මම පිටකෝට්ටේ, තලවතුගොඩ පාර, රජයේ නිවාස, දෙවන පටුමග, අංක 06 දරන ස්ථානයෙහි පදිංචි ඕ.කේ.ඩී. සුසිත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO HON. PRIME MINISTER

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු අග්‍රාමාත්‍යතුමනි, එක්සත් ජාතික පක්ෂ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ පසු ගිය ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි පොසිල ඉන්ධන භාවිතය අවසන් කර අනාගතයේදී සියයට සියයක් පුනර්ජනනීය බලශක්ති යුගයක් කරා යා හැකි බව අප සඳහන් කර ඇත. නමුත්, විදුලිබල මණ්ඩලයේ ජනන සැලැස්ම මේ හා සැසඳෙන්නේ නැත. ජනතාවට පොරොන්දු වූ පරිදි සියයට සියයක පුනර්ජනනීය බලශක්තිය ලබා දීම සඳහා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම කුමක්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, හැම රටක්ම පුනර්ජනනීය බලශක්ති අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා ක්‍රියා කර ගෙන යනවා. මම දන්නා හැටියට කිසිම ප්‍රධාන රටක් තවම ඒ අරමුණ සියයට 100ක් ඉෂ්ට කර ගෙන නැහැ. දිනෙන් දින ඉහළ යන විදුලිබල ඉල්ලුම අනුව ප්‍රමාණවත් ලෙස විදුලිබලය සැපයීම තහවුරු කිරීම සඳහා රජයේ අවධානය යොමු වී ඇත්තේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය වෙත බව මම පළමුවෙන්ම සඳහන් කරන්න කැමැතියි. "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" නමැති ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේද, "මාස 60කින් අලුත් රටක් හදන පංචවිධ ක්‍රියාවලිය" නමැති මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේද මෙම ප්‍රතිපත්ති රාමුව පිළිබඳව ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා. එම ප්‍රතිපත්තිය අනුව යමින් මෙරටට නව බලශක්ති ප්‍රතිපත්තියක් හඳුන්වා දීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් කටයුතු කර ගෙන යනු ලබනවා. ඒ සඳහා ඔවුන් ජයිකා ආයතනයේද සහාය ඇතිව බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව සම්පූර්ණ අධ්‍යයනයක් සිදු කර ගෙන යනවා. ඒ වාගේම මාගේ ප්‍රධානත්වයෙන් රැස් වන ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව ශ්‍රී ලංකාවට සුදුසු බලශක්ති මූලාශ්‍ර පිළිබඳව, විශේෂයෙන්ම ස්වාභාවික ගෑස් බලාගාර - LNG plants - ඉදි කිරීම පිළිබඳව අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා මහාචාර්ය සිරිමල් අබේරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුත් විශේෂඥ කමිටුවක්ද පත් කර තිබෙනවා. මෙම අධ්‍යයන කටයුතු අවසන් වූ වහාම නව බලශක්ති ප්‍රතිපත්තිය මෙන්ම 2017-2036 දක්වා දීර්ඝ කාලීන බලශක්ති ජනන සැලසුම - Long-term Generation Plan එක - එළි දැක්වීමටද අප රජය බලාපොරොත්තු වෙනවා. මේ අතරතුර රට තුළ පුනර්ජනනීය බලශක්ති ජනනය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය මඟින් පියවර කිහිපයක් ගෙන තිබෙන බව සඳහන් කරන්න කැමැතියි.

දිවයින පුරා නිවාස ඒකක මිලියනයක සූර්ය කෝෂ පද්ධති පිහිටුවීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන "සූර්ය බල සංග්‍රාමය" ව්‍යාපෘතිය ඊයේ ගරු ජනාධිපතිතුමාගේ නිල නිවසින් ආරම්භ කරනු ලැබුවා. මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකකවල ජනනය කරනු ලබන ඉතිරි විදුලිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් මිලදී ගැනීමටත් සැලසුම් කර තිබෙනවා. එසේම විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් මෙගාවොට් 100ක ධාරිතාවයෙන් යුත් කුඩා පරිමාණ සූර්ය තාප බලාගාර පිහිටුවීමටත්, මන්නාරම ප්‍රදේශයේ සුළං බලයෙන් ක්‍රියාත්මක මෙගාවොට් 375ක ධාරිතාවයෙන් යුත් විදුලි බලාගාරයක් පිහිටුවීමටත්, සුළං බලයෙන් ක්‍රියාත්මක කුඩා පරිමාණ බලාගාර පිහිටුවීම දිරිමත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව අවසාන වශයෙන් මා සඳහන් කරන්න කැමතියි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු අග්‍රාමාත්‍යතුමනි, 2018, 2019 වර්ෂවලදී විදුලිබල අවශ්‍යතාව රටේ සංවර්ධනය සමඟ වැඩි වේවි. නමුත් රටේ වැඩි වන විදුලිබල අවශ්‍යතාවන් සඳහා වසර දෙක තුනකදී පිළියම් සෙවීමටත් සිදු වේවි. නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු වෘත්තීය සංගමය LNG බලාගාර ඇති කිරීමට විරුද්ධව කටයුතු කරන බවට පවසා තිබෙනවා. රජයේ මේ ප්‍රතිපත්තියට විරුද්ධව ක්‍රියා කරන, රජයේ නිලධාරීන් සම්බන්ධව අප ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

2018 දී ඇති විය හැකි බලශක්ති හිඟය අපට විශාල ප්‍රශ්නයක්. ඒ ගැන සම්පූර්ණ වාර්තාවක් අපි ළඟදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. ඒ ප්‍රශ්නය අපට තිබෙන නිසා ඒ ප්‍රශ්නයට අපි විසඳුම් සෙවිය යුතුයි. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නම් අපට අලුතින් හිතන්න වෙනවා. LNG බලාගාර ක්‍රියාත්මක කරන්න ආණ්ඩුව තීරණයක් අරගෙන තිබෙනවා. ඒ සඳහා චීන බලශක්ති සමාගමක් සහයෝගය දක්වනවා. හම්බන්තොටත්, ඒ වාගේම කෙරවළපිටියේත් මේ බලාගාර ඉදිකරන්න අපි බලාපොරොත්තු වනවා. මේ කටයුත්තට විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් විරුද්ධයි කියලා මට නම් කවුරුවත් කියලා නැහැ. ඒ ගැන ප්‍රකාශයක් මට නම් ලැබිලා නැහැ; ඇමතිතුමාගෙන් ලැබිලාත් නැහැ. මේ රටේ බලශක්ති ප්‍රශ්නය විසඳන එකට කාටවත් විරුද්ධ වන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහූමාන්)
(The Hon. Mujibur Rahuman)
මෙවැනි බලාගාර සෑදීමට වැඩිය ගල් අඟුරු බලාගාර සෑදීම කෙරෙහි තමයි ඔවුන්ගේ අවධානය තිබෙන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
එක කාලයක් ඔවුන් ගල් අඟුරු බලාගාර සෑදීමේ ස්ථාවරයක තමයි සිටියේ. ඒ රජයේ ස්ථාවරය නොවෙයි. ඒක අපි පැහැදිලි කරලා දුන්නා. "දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම" සම්මත වුණාට පස්සේ අපට ඒවාට යන්න බැරිවනවා. ඒ කාරණා ගැනත් බලන්න වනවා. ගල් අඟුරු බලාගාරවලට අමතරව වෙනත් බලාගාර අපට වුවමනායි. දැනට තිබෙන ගල් අඟුරු බලාගාර අනාගතයේදී ක්‍රියාත්මක කරන්න වන්නේත් පරිසරයට හානි නොවන විධියටයි. ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපි සභාවට ප්‍රකාශයක් කරන්නම්. එහෙම තත්ත්වයක් තිබෙනවා නම්, ඒක මුළු රටම දැන ගන්න ඕනෑ. ඒත් එහෙම එකක් මම නම් දන්නේ නැහැ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහූමාන්)
(The Hon. Mujibur Rahuman)
මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමනි, මේ වනකොට පෞද්ගලික අංශයේ ආයෝජකයන් කුඩා ප්‍රමාණයේ solar power plantsවලින් මෙගාවොට් 1,000ක පමණ විදුලි බලයක් නිෂ්පාදනය කිරීමට ඉල්ලුම් කරලා තිබෙනවා. පෞද්ගලික අංශයේ ආයෝජකයන් විදුලි බලය නිෂ්පාදනය කර ගැනීමට දායක කර ගැනීම සඳහා ඔවුන් දිරිමත් කිරීමට අප ගන්නා ප්‍රතිපත්තිමය තීන්දුවක් තිබෙනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
ඒවා අනුමත කිරීම ගැන ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කල් ගිහිල්ලා තිබෙන ව්‍යාපෘතිවලට ප්‍රථමයෙන්ම අපේ අවධානය යොමු කරන්න ඕනෑ. බලශක්ති හිඟය එනකොට මේ පිළිබඳවත් අලුත් ප්‍රතිපත්ති රාමුවක් ගැන ප්‍රකාශයක් කරන්නම්. මම හිතන විධියට අපට කුඩා ආයෝජකයන් වුවමනායි. අද හැම ගෙදරකම වාගේ බලශක්තිය නිෂ්පාදනය කරන්න පුළුවන් යුගයකයි අපි ඉන්නේ. ඒ ගැන ජනතාව දැනුවත් කරලා අපි ඉදිරියට යමු. ජනතාවගේ මතයේ තමයි අපි ඔක්කෝටම ඉන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කල්)
(The Hon. Speaker)
ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
කෞරව සභානායකර් අවර්කලේ, මාණ්පුමිකු පිරතමර් රණිල් වික්කිරමසිංහ අවර්කලිටම් කේල්වි කේට්ක අනුමතිත් තතර්කු නන්රි. කටන්ත අරසු යුත්තත්තෛ වෙට්රි කොණ්ට පෝතිලුම් තමිෂ් මක්කළින් මනංකළෛප් පෝතියළවු වෙල්ලත් තවරිවිට්ටතු එන්පතෛ උණර්න්තු, තර්පෝතෛය අරසු පල්වේරු සෙයර්පාටුකළෛ මුන්නෙටුත්තු වරුවතු පාරාට්ටත්තක්කතු. අන්ත වකෛයිල් තමිෂ් පේසුම් මක්කළින් උණර්වුපූර්වමාන පිරච්සිනෛකළ් පල ඉන්නමුම් තීර්ක්කප් පටාත නිලෛයිල්, අවර්රෛයුම් ඉනඞ්කණ්ටු ඉන්ත අරසු පටිප්පටියාකත් තීර්ක්කුම් එන්රු නම්පුකින්රේන්.

කුරිප්පාක වේලෛයිල්ලාප් පිරච්සිනෛ එන්පතු වටක්කිල් පාරියතොරු පිරච්සිනෛයාක උරුවෙටුත්තුක් කාණප්පටුකින්රතු. පට්ටතාරිකළ් ඔරුපුරම්, කල්විප් පොතුත් තරාතර උයර් තරත්තිල් සිත්තියටෛන්තු, පල්කලෛක්කළකම් සෙල්ල ඉයලාමල් වේලෛවාය්ප්පින්රි ඉරුප්පෝර් ඉන්නොරුපුරම්, පුනර්වාழ් වළික්කප්පට්ටු උරිය වේලෛවාය්ප්පුකළින්රි ඉරුප්පෝර් මර්රොරුපුරම් එන ඉප්පිරච්සිනෛයානතු එමතු සමූකත්තෛ වාට්ටුකින්ර පාරිය පිරච්සිනෛයාක ඉරුප්පතෛත් තාංකළ් අරිවීර්කළ්. කුරිප්පාක වටක්කින් මුක්කිය නකරංකළිල් ඉළෛඞර් වේලෛවාය්ප්පින්මෛයානතු 60 වීතමාක ඉරුප්පතාක අරස චාර්පර්ර නිරුවනම් ඔන්රු සුට්ටික්කාට්ටියුළ්ළතු.

ඉව්වරුටම් ජනවරි මාතම් 12ආම් තිකති සුවිට්සර්ලාන්තු ටාවෝසිල් ඉටම්පෙර්ර උලකප් පොරුළාතාර මන්ර මානාට්ටිල් තාංකළ් උරෛයාර්ර්යිපෝතු, "ඉලංකෛයිල් මෝතල් නටෛපෙර්ර පකුතිකළිල් පුනර්වාழ්වු, නල්ලිණක්කම් මර්රුම් පුනර්නිර්මාණත්තෛ මුන්නෙටුප්පතේ එනතු මුතල් මුන්නුරිමෛක්කුරිය විටයම්" එනක් කූර්යිරුන්තීර්කළ්. ඉතු උණ්මෛයිලේයේ මිකවුම් පෝර්ර්ත්තක්ක විටයමාකුම්. එමතු නාට්ටිල් ඉනඞ්කළුක්කිටෛයිලාන නල්ලිණක්කම් එන්පතු ඉන්රියමෛයාතතු එන්පතෛ නාම් ජනනායක වළිමුරෛක්කුත් තිරුම්පියිරුන්ත ආරම්පම්තොට්ටේ වලියුරුත්ති වන්තුළ්ළෝම්. තේසිය නල්ලිණක්කත්තිනූටාකවේ එමතු පිරච්සිනෛකළෛත් තීර්ක්ක මුටියුම් එන්ර අසෛයාත නම්පික්කෛයිනෛ මුන්වෛත්තේ එමතු අරසියල් සෙයර්පාටුකළුම් මුන්නෙටුක්කප්පට්ටු වරුකින්රන. එනිනුම්, තේසිය නල්ලිණක්කත්තෛ නාම් පලමික්කතාකක් කට්ටියෙழුප්ප වේණ්ටුමෙන්රාල්, අතර්කු ඉරු තරප්පු මක්කළිටෛයේයුම් උළප්පූර්වමාන එණ්ණක් කරුක්කළෛ නාම් එර්පටුත්ත වේණ්ටුම්. අතේවේළෛ, තමිழ් මක්කළෛ නාම් තයාර්පටුත්ත වේණ්ටුමෙනිල් අවර්කළෛ උණර්වුපූර්වමාක වෙන්රෙටුක්ක වේණ්ටුම්.

තමිழ් මක්කළ් මත්තියිල් තේසිය නල්ලිණක්කත්තිර්කුප් පුරම්පාක උණර්වු රීතියිල් තිණික්කප්පට්ටිරුක්කුම් පල්වේරු එණ්ණප්පාටුකළෛ අකර්රුවතුම් ඇන්ත අරසින් මුක්කිය පණියාක අමෛය වේණ්ටුම්. අන්ත වකෛයිල් ඉලංකෛ ඉරාණුවමානතු ඉන්නුම් එමතු මක්කළිල් පෙරුම්පාලානවර් කළිටෛයේ "සිංකළ ඉරාණුවම්" එන්රේ කරුතප්පටක්කූටිය ඔරු නිලෛප්පාටු කාණප්පටුකින්රතු එන්පතෛත් තාංකළුම් අරිවීර්කළ්. ඉතන් අටිප්පටෛයිල් තාංකළ් ඉන්නමුම් අටිමෛප්පටුත්තප්පට්ටතොරු සමූකමාකවේ වාழ්වතාක එමතු මක්කළ් උණර්කින්රාර්කළ්. ඉතු "නාම් ඉලංකෛයර්" එන්ර උණර්වෛත් තමිழ් මක්කළිටමිරුන්තු අකර්රියුළ්ළතාකවේ තෙරියවරුකින්රතු. ඉලංකෛ මක්කළ් අනෛවරතු උළ්ළങ්කළිලුම් "නාම් ඉලංකෛයර්" එන්ර උණර්වු මේලෝങ්කි යිරුක්ක වේණ්ටුම්. එනවේ, ඉව්වාරාන නිලෛයෛත් තමිழ් මක්කළිටෛයේ මාර්රුම් වකෛයිලුම් තමිழ් ඉළෛඞර්, යුවතිකළුක්කාන වේලෛවාය්ප්පු එන්ර වකෛයිලුම්, පින්වරුම් විනාක්කළෛ විටුක්ක විරුම්පුකින්රේන්.

මුප්පටෛකළිලුම් විකිතාසාර අටිප්පටෛයිල් තමිழ් පේසුම් ඉළෛඞර්, යුවතිකළෛප් පතවිකළිල් ඉණෛත්තුක්කොළ්වතර්කාන වාය්ප්පුක්කළ් කුරිත්තුක් කූරමුටියුමා?

පොලිස් තිණෛක්කළම් මර්රුම් සිරෛච්සාලෛකළ් තිණෛක්කළත්තින් ඌටාක මේලුම් වේලෛවාය්ප්පුක්කළෛත් තමිழ්

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

පේසම් இளைஞர், யுவதிகளுக்கு வழங்கக்கூடிய வாய்ப்புக்கள் உள்ளனவா என்பது பற்றி அறியத்தர முடியுமா?

அவ்வாறான சாத்தியப்பாடுகள் இருப்பின், அவ்வாறு இணைத்துக்கொள்பவர்களை வடக்கு, கிழக்கு உட்பட்ட தமிழ் பேசும் மக்கள் வாழும் பகுதிகளில் கடமைகளில் அமர்த்த முடியுமா என்பது பற்றி அறியத்தர முடியுமா?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களை மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களிடம் எதிர்பார்க்கின்றேன். நன்றி.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඒක ප්‍රධාන ප්‍රශ්නයක්. ඒ තමයි ත්‍රිවිධ හමුදාවේත්, පොලීසියේත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේත් සේවය කරන දෙමළ කථා කරන ජනතාවගේ ප්‍රතිශතය පිළිබඳ ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම ලංකා යුද්ධ හමුදාව ආරම්භ කරද්දීත් අපේ පළමුවැනි ශ්‍රී ලාංකික හමුදාපති වුණේ ද්‍රවිඩ ජාතිකයෙක්. ඒ තමයි මේජර් ජෙනරාල් ඇන්ටන් මුතුකුමරු මැතිතුමා. ඔහු පොලීසියේත් සේවය කළා. නමුත්, විශාල ප්‍රශ්නයක් ඇති වුණේ 1978න් පසුවයි. 1978න් පසු විශේෂයෙන්ම එල්ටීටීඊ සංවිධානය පිළිබඳව පරීක්ෂා කරගෙන ගියේ පොලීසියේ හිටපු ද්‍රවිඩ නිලධාරීන්. ඒ ද්‍රවිඩ නිලධාරීන් සියලු දෙනාම ඝාතනය කරලා දැම්මා. බැස්ටියන් පිල්ලේ වැනි අයව ඝාතනය කළා. ඒ අවස්ථාවේ දෙමළ පොලිස් නිලධාරීන් සිටියේ නැත්නම් ද්‍රවිඩ ප්‍රදේශවල තොරතුරු එන්නේ නැහැ. එතැන සිට තමයි දෙමළ ජනතාව පොලීසියට බැඳෙන එක නවත්වන්න කටයුතු කළේ. දෙමළ ජනතාවට පොලීසියට බැඳෙන්න එපා කියලා විශාල බලපෑමක් ආවා. යුද හමුදාවේත් ද්‍රවිඩ ජනතාව සිටියා. ද්‍රවිඩ නිලධාරීන් සිටියා; සේවය කරන අය සිටියා. එක පැත්තකින් විවිධ බලපෑම් නිසාත්, අනෙක් පැත්තෙන් 1983 කෝලාහලවලින් පසුවත් බැඳෙන සංඛ්‍යාව හුහක් දුරට අඩුවීගෙන ගොස් නැති වෙලා ගියා. යුද්ධය කාලයේ යුද හමුදාවේත්, ගුවන් හමුදාවේත් හොඳ ද්‍රවිඩ නිලධාරීන් සිටියා. එතැන් සිට ද්‍රවිඩ ජනතාවගේ සංඛ්‍යාව සීමා වුණා. එක පැත්තකින් ප්‍රතිපත්තිය වුණේ, ද්‍රවිඩ ජනතාවට හමුදාවේ සේවයට ඒමට ඉඩ නොදීමයි.

අනෙක් පැත්තෙන් එදා පැවැති යුද්ධය ජාතිවාදී යුද්ධයක් හැටියට පෙන්වූ නිසා දෙමළ ජනතාවත් හමුදාවට බැඳුණේ නැහැ. යුද්ධය ගෙනයන අවස්ථාවේදී මිනිස් බලය වැඩිපුර වුවමනා නිසා තමයි රටේ අනෙකුත් ප්‍රදේශවලිනුත් මිනිස් බලය එකතු කර ගැනීම සිදු වුණේ. ඒ තත්ත්වය තමයි, 2009 වසරේ මේ රටේ උතුරු නැඟෙනහිර යුද්ධය අවසන් වෙන විට තිබුණේ. එල්ටීටීඊ එකට විරුද්ධව සටන් කළ කණ්ඩායමක් හිටියා, අපේ ඩග්ලස් දේවානන්දා මැතිතුමාගේ. ඒ අය වෙනම කණ්ඩායමක් විධියටයි සටන් කළේ. ඒ අය හමුදාවට බැඳුණේ නැහැ. සමහරවිට හමුදාවට බැඳෙන්න සුදුසුකම් තිබුණේ නැති වෙන්න පුළුවන්; එහෙම නැත්නම් හමුදාවට බැඳුණොත් අනෙක් අයගෙන් ප්‍රශ්න ඇති වෙයි කියලා වෙන්නත් පුළුවන්. දැන් අපේ අවධානය යොමු වෙලා තිබෙන්නේ එම සංඛ්‍යාව වැඩි කිරීම පිළිබඳවයි.

දෙමළ භාෂා ප්‍රවීණතාව සහිත පොලිස් කොස්තාපල් අයදුම්කරුවන් 216දෙනෙක් බඳවා ගැනීමට නියමිතයි. ඔවුන් අතරින් 151දෙනෙක් අයත් වෙන්නේ උතුරු පළාතටයි. නැඟෙනහිර පළාතට අයත් ගණන 57යි. මේ සංඛ්‍යාව බඳවා ගෙන, මේකට ලැබෙන ප්‍රතිචාරය කොහොමද කියලා අපි බලමු. මේ ගණන ප්‍රමාණවත් වන්නේ නැහැ. මේක ආරම්භයක් විතරයි කියලා මම කියන්න කැමැතියි.

උප පොලිස් පරීක්ෂක, පොලිස් කොස්තාපල්, පොලිස් කොස්තාපල් රියදුරු වැනි තනතුරු සඳහා ඉදිරියේදී උතුරු නැඟෙනහිර පළාත්වල නිලධාරීන් බඳවා ගැනීමට නියමිතයි. ඒ වාගේම, දිවයිනේ සෑම පොලිස් ස්ථානයකටම දෙමළ භාෂාව කථා කළ හැකි නිලධාරීන්, අවම වශයෙන් දෙදෙනෙක් බැගින් හෝ අනුයුක්ත කිරීමට අප විශේෂ උපදෙස් ලබා දී තිබෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ ක්‍රමානුකූලවයි පටන් ගන්න තිබෙන්නේ. යම් කිසි වේලාවක මේ සංඛ්‍යාව වැඩි කර ගන්න පුළුවන්කම ලැබෙයි.

වතුකරය ගත්තාම, වතුකරයේ අයට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් තිබුණේ නැහැ. අධ්‍යාපන සුදුසුකම් තිබුණු අයගේ ප්‍රතිශතය අඩුයි. ඒ අයට පොලීසියට බැඳෙන්නේ නැතිව, වෙනත් රැකියා හොයා ගෙන යන්න අවස්ථාව ලැබුණා. මේ ප්‍රශ්නය තමයි දැනට තිබෙන්නේ.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවට 2015 වසරේ නිලධාරීන් 409දෙනෙක් බඳවා ගත් අතර, එයින් නිලධාරීන් 90ක් දෙමළ භාෂාව කථා කරන නිලධාරීන්. දෙමළ හා මුස්ලිම් ජනතාව. ඒ සංඛ්‍යාවත් වැඩි කර ගත යුතුයි. මම හිතන විධියට අපට මේ සඳහා දීර්ඝ කාලීන සැලැස්මක් තිබිය යුතුයි, විශේෂයෙන්ම ද්‍රවිඩ ජනතාව හමුදාවට බඳවා ගැනීම සඳහා. මුස්ලිම් සහ සිංහල අය බඳවා ගැනීම ගැන ප්‍රශ්නයක් තිබුණේ නැහැ. වතුකර ප්‍රදේශයේ දෙමළ ජනතාව බඳවා ගැනීම පිළිබඳව තිබුණු ප්‍රශ්නය තමයි සුදුසුකම් නොමැතිකම. ඒ ප්‍රදේශවල සුදුසුකම් තිබෙන අය වෙනත් රැකියා බලාපොරොත්තු වුණා. උතුරෙන් බැඳුණේත් නැහැ. ඒ නිසා අපි දැන් ආරක්ෂක අංශවලටත්, පොලීසියට හා බන්ධනාගාරයටත් බඳවා ගැනීමේ ප්‍රමාණය වැඩි කරන්නට කටයුතු කරනවා. දැන් අපි ඒක ආරම්භ කරලා තිබෙනවා. විටින් විට මේ සභාවේදී ඒ ගැන ප්‍රශ්න කරලා දැනගෙන, අදාළ කාරක සභාවෙන් දැනගෙන ඒ වැඩ කටයුතු කරන්නට පුළුවන්.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, වාචිකව පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරන ප්‍රශ්නය මෙයයි.

01. රජය විසින් මෙම වසර තුළ පෞද්ගලීකරණය කිරීමට හෝ රාජ්‍ය හා පෞද්ගලික සමාගම් ඒකාබද්ධ කිරීමට හෝ කළමනාකරණය පෞද්ගලීකරණය කිරීමට හෝ තීරණය කොට තිබෙන රාජ්‍ය ආයතන කවරේද?

02. එම ආයතනයන් සඳහා එම ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට හේතු කවරේද?

03. එම ක්‍රියාවලිය සිදු කිරීමට අපේක්ෂා කරන ක්‍රමවේදය කුමක්ද?

04. රජය විසින් මීට පෙර පෞද්ගලීකරණය කළ ආයතන පිළිබඳව ඇගයීමක් සිදු කර තිබේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේ සියල්ලටම ප්‍රධාන හේතු දෙකක් තිබෙනවා. සංස්ථාවලින් ලාභයක් ලැබෙන්නේ නැහැ. එහෙම නැත්නම් අඩු ලාභයක් ලැබෙන්නේ. දෙවැනි හේතුව තමයි, අද

රටේ තිබෙන ණයබර තත්ත්වය. පරිපාලනය කඩා වැටිලා තිබෙනවා. ව්‍යවසායන් ඇතුළේ ප්‍රශ්න තිබෙනවා.

2016 වසරේ අය වැය ලේඛනය සකස් කරද්දීත් රාජ්‍ය ව්‍යවසායන් ලබාගෙන තිබූ ණය පිළිබඳ නිශ්චිත තොරතුරු වාර්තා වී තිබුණේ නැහැ. පසු ගිය රජය විසින් රාජ්‍ය ව්‍යවසායන් විසින් ලබාගත් ණය ජාතික ණය පද්ධතියට ඇතුළත් කර තිබුණේ නැහැ. දැනට වාර්තා වන අන්දමට ජාතික ණය පද්ධතියට ඇතුළත් කර නැති රාජ්‍ය ව්‍යවසායන් විසින් ගෙවීමට ඇති ණය ප්‍රමාණය රුපියල් බිලියන 1,358ක් වෙනවා. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන 424ක්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් බිලියන 240ක්, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් රුපියල් බිලියන 308ක්, ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 237ක්. මේ වාගේ ඉතා දිග ලැයිස්තුවක් තිබෙනවා. අපේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට, නිවාස සපයන්න, සුබසාධන වැඩ කටයුතුවලට, සංවර්ධනයට යොදවන්න තිබෙන මුදල් තමයි මෙතැන හිර වෙලා තිබෙන්නේ.

අපේ රට දැවැන්ත ණය උගුලකට අසුවී තිබෙන මෙවැනි අවස්ථාවක මේ ණය බර තවදුරටත් ජනතාව මත පැටවීමට අපට හැකියාවක් නැහැ. මොකද, මේවා ජනතාවට ගෙවන්න සිදු වෙනවා. එම නිසා විශාල වශයෙන් ණය වී ඇති පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් විධිමත්ව ප්‍රතිව්‍යුහගත කළ යුතුයි. එම ව්‍යවසායන්වලින් නිසි ප්‍රයෝජන ලැබිය හැක්කේත් එම ආයතනවල සේවය කරන සේවකයන්ගේ රැකියා සුරක්ෂිත කළ හැක්කේත් එවැනි ප්‍රතිව්‍යුහගත කිරීමකින් පමණයි. එම ආයතනය දරනු ලබන පාඩුව අවම කොට රජයට හා ජනතාවට බරක් නොවී ජාතික අය වැයට හා ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් ලබාදීමට හැකි වන්නේ එවිටයි.

මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ ආයතන සඳහා වඩාත්ම ගැළපෙන ක්‍රමවේද අනුගමනය කිරීමට අප බලාපොරොත්තු වෙනවා. මේ සඳහා රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ ක්‍රමවේදය —public-private partnership— ද ඉතා සුදුසු ක්‍රමවේදයක් ලෙස හඳුනාගෙන තිබෙනවා. කෙසේ වෙතත්, මෙම සියලු ක්‍රමවේද ක්‍රියාත්මක කරනු ලබන්නේ රජයට උපරිම වාසි සැලසෙන අයුරින් විවෘත හා විනිවිද පෙනෙන ක්‍රියාවලියක් හරහා පමණක් බවත්, එම ආයතනවල සේවකයන්ගේ රැකියා සුරක්ෂිත වන අන්දමට බවත් අවධාරණය කර සිටීමට කැමැතියි. ඒ වාගේම මීට පෙර පෞද්ගලීකරණය කරන ලද ආයතන සම්බන්ධයෙන් අවස්ථානුකූල තත්ත්වයක් පැන නැඟුණොත් ඒ අනුව ඇගයීම් ක්‍රියාවලියන්ට භාජන කිරීමට අවශ්‍ය තීරණ ගැනීමට පුළුවන්.

රාජ්‍ය ව්‍යවසායන් විවිධාකාරයි. රජයේ ප්‍රතිපත්ති තීරණ අනුව ආරම්භ කරන ලද ව්‍යවසායන් තිබෙනවා. ඒ වාගේම අපට අහම්බෙන් ලැබුණු ව්‍යවසායන් තිබෙනවා. ඒවායින් සමහර ව්‍යවසායන් සංස්ථා; සමහර ව්‍යවසායන් සමාගම් වනවා. රජය තීරණය කරලා ශ්‍රී ලන්කන් ගුවන් සමාගම වැනි ව්‍යවසායන් ආරම්භ කළා. නමුත් හයටි හෝටල් සමාගම ඕනෑ කියා අපි කවුරුවත් කිව්වේ නැහැ. ඇත්ත වශයෙන්ම එය දැන් අපේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට විශාල බරක් වෙලා තිබෙනවා. ඒ වාගේ ව්‍යවසායන් තිබෙනවා. සමහර ඒවා බේරා ගන්න රජය මැදිහත් වෙලා තිබෙනවා. ඒ අනුව, රජය අතර රැඳුණ ඒවාත් තිබෙනවා. අපි මේ ව්‍යවසායන් අංශ තුන හතරකට බෙදා ක්‍රියාත්මක කරන්නයි බලාපොරොත්තු වන්නේ. දැනට අපි ශ්‍රීලන්කන් ගුවන් සමාගම දෙස බලලා රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ඒකාබද්ධ වැඩසටහනක් කරන්නයි බලාපොරොත්තුව. දැනට ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ රුපියල් බිලියන 308ක ණය තිබෙනවා. අපට නැවත ඒවා ගෙවන්න බැහැ. මොකද, අවසානයේ ඒ ණය බර ජනතාවට උහුලන්න සිදු වනවා. A-350 airbuses අරගෙන තිබෙනවා; A-330 airbuses අරගෙන තිබෙනවා. අප සතුව තිබුණ ගුවන් යානා තව දීර්ඝ කරන්නේ නැතිව මේවා අරගෙන තිබෙනවා. අපි ඒවායින් කොටසක් පකිස්තාන් ගුවන් සේවයට දුන්නා. ඒ අනුව රජය සමඟ ඒකාබද්ධව වැඩ කටයුතු කරන්න කැමැති සමාගම්වල යෝජනා අපි ඉල්ලා තිබෙනවා, ඒ ගැන සලකා බැලීම සඳහා. අපට එකට වැඩ කරන්න සිදු වනවා, විශේෂයෙන්ම ශ්‍රීලන්කන් ගුවන් සේවයේ. මීට අමතරව අපට තිබෙනවා, 'හයටි රීජන්සි' හෝටලය හා ලංකා රෝහල් පෞද්ගලික සමාගම. රජය තීරණය කරපු නිසා නොවෙයි, ඒවා එක කාලයකදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මිලදී ගත්තා. ඒ රජයේ පාලනය නොතිබුණු කාලය. 'හයටි රීජන්සි' හෝටලය ගැන අපි මෙතැන දොස් කියලා තිබෙනවා. ඒකට අප මුදල් යොදවලා තිබෙනවා. ඒ මුදල් ටික ආපහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලබා ගෙන, රක්ෂණය කරපු ජනතාවට ඊට වඩා හොඳ සේවයක් ලබා දෙන්න අප බලාපොරොත්තු වනවා.

අපි සංචාරක ව්‍යාපාරයේ ඇදිලා ඉන්න යන්නේත් නැහැ. ඒ නිසා හිල්ටන් හෝටලයේ කොටස් ටික විකිණීමට අප බලාපොරොත්තු වනවා. ඒ හැර රජයේ අනෙක් සමාගම් හා සංස්ථා ගැන තීරණයක් ගන්න වෙලා තිබෙන්නේ, ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරන්නයි. ඒ නිසා රාජ්‍ය වාණිජ ව්‍යවසායන් පිළිබඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනවා. එහි මූල ධර්ම අනුව ක්‍රියා කරන්න. ඒ පනත් කෙටුම්පතින් එතැන මණ්ඩලයක් ඇති කරනවා. ඒ මණ්ඩලය පාර්ලිමේන්තුවටත් වාර්තා කරන්න ඕනෑ. මගේ පෞද්ගලික අදහස තමයි යම්කිසි සංස්ථාවක පාලනයේ වංචා තිබෙනවා නම්, ප්‍රශ්න තිබෙනවා නම්, එහෙම නම් අඩු ගණනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හෝ කණ්ඩායමකට උසාවියට යන්න අයිතිය තිබෙන්න ඕනෑ. ඕනෑම පෞද්ගලික සමාගමක පාලනය අදක්ෂ නම්, ඒක කඩා වැටෙනවා නම්, අද සුළුතරයකට වුණත් උසාවියට යන්න පුළුවන්. ඒත්, රජයට ඒක කරන්න බැහැ. රජයට එලෙස කරන්න පුළුවන් වුණා නම්, අපේ සංස්ථා මෙවැනි තත්ත්වයකට වැටෙන්නේ නැහැ. ඒ කෙටුම්පත ඉදිරිපත් කළාම ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ අදහස් ලබා ගන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අග්‍රාමාත්‍යතුමා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය පැහැදිලි කළා, රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය නැත්නම් ප්‍රතිව්‍යුහගතකරණය කියලා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට තිබුණෙත්, එම රාජ්‍ය ආයතන කවරේද කියන එකයි. SriLankan Airlines, Hyatt Regency, Lanka Hospitals සහ කොළඹ හිල්ටන් හෝටලය කියන ආයතන 4 පිළිබඳව එතුමා සඳහන් කළා. නමුත්, 2016 ජූලි 22වැනිදා ලංකාදීප පුවත් පතේ වාර්තා කරලා තිබෙනවා, "මත්තල ගුවන් තොටුපොළ ඇතුළු රාජ්‍ය ආයතන 7ක් එකවර විකුණයි" කියලා. ඒ ආයතන ප්‍රමාණයත් නම් කරලා තිබෙනවා. ඒ වාගේම පසු ගිය මාර්තු මාසයේ “Ceylon Today” පුවත් පතේ කතුවැකියෙනුත් ගරු රවි කරුණානායක ඇමතිවරයා සඳහන් කළාය කියා යම් ආයතන ප්‍රමාණයක් ගැන සඳහන් කරලා තිබෙනවා. ගරු අගමැතිතුමනි, ඔබතුමා කියපු ආයතන 4ට අමතරව මෙහි ආයතන 7ක් පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. ඒ නිසා මම දැනගන්න කැමැතියි, ඔබතුමා කියපු ආයතන 4ට අමතරව, එසේ රජය විසින් පෞද්ගලිකකරණය කිරීමට දැනට හඳුනා ගෙන තිබෙන රාජ්‍ය ආයතන මොනවාද කියලා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට තිබුණෙත් ඒකයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

හම්බන්තොට වරායත්, මත්තල ගුවන් තොටුපොළ පිළිබඳවත් මම යමක් කියන්න ඕනෑ. මත්තල ගුවන් තොටුපොළ රජයත්, පෞද්ගලික අංශයත් එක්ක එකට ක්‍රියා කරන්නයි බලන්නේ. අපිට මත්තල ගුවන් තොටුපොළේ ණය ගෙවන්න තිබෙනවා. ණය ගෙවන එක අපිට විශාල බරක්. ඒ වාගේම මේ ගුවන් තොටුපොළට අවශ්‍ය කරන මෙහින් ලක්ෂ 10ක් වර්ෂයකට ගේන්නත් අපිට ශක්තියක් නැහැ. මේ දැනුවත් කරන අය එක්ක සම්බන්ධ වෙලා ඇත්ත වශයෙන්ම අපි බලන්නේ මේ ණය ගෙවන එකෙන් අපේ රට බේරාගන්නයි. හම්බන්තොට වරායේත් ඒ වාගේම විශාල ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. දැනට හම්බන්තොට වරායෙන් පමණක් අපිට ආදායමක් ලබා ගන්න බැහැ.

මම හිතන්නේ, දැනට ලංකාවට ගෙන්වන වාහන සියල්ලම හම්බන්තොට වරායෙන් තමයි ගොඩ බාන්නේ. එම වාහන හම්බන්තොට වරායෙන් ගොඩබාලා කොළඹට ගෙනෙනකොට තව රුපියල් 20,000ක, 30,000ක වැඩිපුර ගාස්තුවක් ගෙවන්න සිදු වනවා. ඒ අයුරින් වාහන ගෙන්වීම නතර කළොත් හම්බන්තොට වරාය වහන්න සිදු වනවා. අපට හම්බන්තොට වරාය වහන්න වුවමනා නැහැ. මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරාය වහන්න කියලා කවුරුවත් කියලා නැහැ. එය අපේ රජයත් එක්ක එකට ක්‍රියාත්මක කරලා සාර්ථක කර ගන්න පුළුවන් විධියේ යෝජනා අපි ඉදිරිපත් කරලා තිබෙනවා. මීට ඉස්සර වෙලා හම්බන්තොට කලාපයේ ඉදිවන කර්මාන්ත ගැනත් ප්‍රශ්නයක් ඇහුවා. ඒ ඉදි කිරීමට යෝජිත කර්මාන්ත සංඛ්‍යාව පැමිණෙනවා නම්, හම්බන්තොට කලාපය තුළ වරායකින් ප්‍රයෝජනය ගන්න පුළුවන්. ඔබතුමා ප්‍රශ්නයක්ව මතු කරපු නිසා මම ඒ කාරණා දෙක මතු කරනවා.Volkswagen assembly plant එක හම්බන්තොටින් නොවෙයි පටන්ගන්නේ. ඒක පටන් ගන්නේ කුලියාපිටියෙන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම ගැන ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. ඒක එක් කාලයකදී ජනතාකරණය කියලා හැඳින්වුවා. තවත් කාලයකදී පෞද්ගලීකරණය කියලා හැඳින්වුවා. ඇත්තටම එහි තිබෙන්නේ, රාජ්‍ය අයිතිය අත් හැරීමයි. ගරු කථානායකතුමනි, මීට එක් හේතු සාධකයක් හැටියට ගරු අගමැතිතුමා කිව්වේ, "ණය බර" කියලායි. අපේ ගම්වල ජීවත්වන මිනිසුන් පවා අධික ලෙස ණය වුණාම තමන් සතුව තිබෙන ඉඩම් විකුණනවා; වාහන විකුණනවා; දේපළ විකුණනවා. ආණ්ඩුවත් ඔවුන් අතරත් ලොකු වෙනසක් නැහැ වාගේ තමයි පෙනෙන්නේ. ගරු අගමැතිතුමනි, ඊළඟ කාරණය හැටියට ඔබතුමා කිව්වා, "පරිපාලන ගැටලු" සම්බන්ධව. ඒවා තමුන්නාන්සේලා තමයි විසඳන්න ඕනෑ. මොකද, තමුන්නාන්සේලා අතේ තමයි ආණ්ඩුව තිබෙන්නේ. පරිපාලන ගැටලු විසඳන්න ආණ්ඩුවේ තිබෙන අසමත්කම තමයි මෙයින් පෙන්නුම් කරන්නේ. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා හම්බන්තොට වරාය පිළිබඳව, මත්තල ගුවන් තොටුපොළ පිළිබඳව, හෝටල් කීපයක් පිළිබඳව, ශ්‍රීලන්කන් ගුවන් සමාගම පිළිබඳව කිව්වාට, ඇත්තටම අපේ රටේ වැදගත්ම සම්පතක් තමයි, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණය කියන්නේ.

එම අමාත්‍යාංශයේ නිලධාරි කණ්ඩායමක් විසින් ඒ පිළිබඳව කරන ලද සමීක්ෂණයක වාර්තාවක් ඉදිරිපත් කරලාත් තිබෙනවා, තෙල් සංස්ථාවට උපරිම ලෙස ලාභ ලබා ගැනීමට හැකි වන ආකාරයට එය මෙහෙය විය යුත්තේ කොහොමද කියා සඳහන් කරමින්. ඒ වාගේමයි, වරායත්. වරායේ ශ්‍රී ලංකා රජය සතුව තිබෙන එකම ජැටිය -එකක් පෞද්ගලීකරණය යටතේ වික්කා, පසු ගිය චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව කාලයේ. තවත් එකක් සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ චීන සමාගමක් සමඟ ව්‍යාපෘතියකට ගියා. රජයට ඉතිරි වෙලා තිබෙන්නේ එක කොටසයි. - සම්බන්ධයෙන් පසු ගිය දා කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් යොමු කර තිබෙනවා, එම කොටසත් රජයෙන් අත් හැරීම සඳහා. එහෙම නම්, තමුන්නාන්සේ කිව්වාට වඩා වැඩි ආයතන ගණනාවක් -අපේ රටේ ජාතික ආර්ථිකයේ වැදගත් පදාසයක් නියෝජනය කරන ආයතන ගණනාවක්- රාජ්‍ය අයිතියෙන් බැහැර කරගැනීම සඳහා වන උත්සාහයක් තිබෙනවා. එසේ නැත්නම්, මේවා ඊට අදාළ නොවනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගම ගනිමු. මේ යන විධියට එය වහන්නයි සිදු වන්නේ. අපි ඒක බේරාගන්නයි බලන්නේ. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමට බිලියන 308ක ණයක් තිබෙනවා. ඊට අමතරව, 'ඒ-350' ගුවන් යානා තබාගන්නවා නම් ඊළඟ අවුරුදු 10 තුළ ආදායමක් නොමැති වුණත් තවත් ඩොලර් මිලියන 600ක් ගෙවන්න වෙනවා. මේ ආයතනය පවත්වාගෙන ගියොත්, ඊටත් අමතරව, හැම අවුරුද්දකම අඩු ගණනේ ඩොලර් මිලියන 30ක, 40ක අලාභයක් සිදු වනවා. එහෙම නම්, අපි මොකක්ද ඒ සම්බන්ධයෙන් කරන්නේ? ලේසිම දෙය, මේ ආයතනය වසා දමන එකයි. වසා දමා කියන්න පුළුවන්, "අපි යට වුණේ නැහැ. අපට ගෙවන්න බැහැ" කියා.

දෙවනුව කරන්න තිබෙන්නේ, මේ රටේ ජනතාවගේ බදු වැඩි කරන එකයි. ඒක කරන්නත් බැහැ. තුන්වනුව කරන්න තිබෙන්නේ, එය සාර්ථක කර ගන්න බලන එකයි. එය අපේ තේරීම් කාරක සභාවක් මඟින් ක්‍රියාත්මක කරන්න වුවමනා නම්, ඒ ගැන මගේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔය ප්‍රශ්නයම හම්බන්තොටටත් තිබෙනවා. හම්බන්තොට වරායේ ණයයි, ගුවන් තොටු පොළේ ණයයි ලංකා ආණ්ඩුවට ගෙවන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ලංකා ආණ්ඩුවෙන් ඒ ආයතන ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. හම්බන්තොටින් වෙලා තිබෙන්නේ මොකක්ද? හම්බන්තොට වරාය පවත්වා ගෙන යෑමට කොළඹ වරායේ මුදල් යොදවනවා. අන්තිමට කොළඹ වරාය අලාභ ලබන තත්ත්වයට පත් වී තිබෙනවා. කොළඹ වරාය අපිට තිබෙන හොඳම වරාය. අපි එය බේරා ගන්න ඕනෑ. හම්බන්තොට වරාය පවත්වා ගෙන යන්න කොළඹ වරායේ මුදල් යොදවනවා. කටුනායක ගුවන් තොටුපොළේ මුදල් යොදවා මත්තල ගුවන් තොටුපොළ පවත්වා ගෙන යනවා. ඒ නිසා කටුනායක ගුවන් තොටුපොළේ කටයුතු පවත්වා ගෙන යන්න බැරි වෙලා තිබෙනවා. ඉස්සෙල්ලාම කටුනායක ගුවන් තොටුපොළට සහ කොළඹ වරායට ලැබෙන ආදායම් එතැනටම ලබා දෙන්න ඕනෑ. අන්න ඒකයි ක්‍රියාත්මක කළ යුත්තේ.

හම්බන්තොට වරාය දියුණු කරනවා නම් අපි මෙහෙමයි කරන්න බැලුවේ. අපිත් එහි කොටස් තබා ගන්නවා. ලංකාවේ නාවික හමුදාවත් හම්බන්තොටට යනවා. එහි ආරක්ෂාව හා පාලනය අපේ අතේ තබා ගන්නවා. එහි කටයුතු ක්‍රියාත්මක කිරීමේදී operatorsලා හැටියට අප එකට එකතු වෙලා මේක සාර්ථක කරන එකයි කරන්න තිබෙන්නේ. විශේෂයෙන්ම මේ සමාගම් නිසා එම ප්‍රදේශයට ඊට පසුව කර්මාන්ත ගෙනෙනවා නම්, ඒ තුළින් එම ප්‍රදේශයේ දියුණුවක් ඇති වෙනවා නම් අපේ විකල්පය විය යුත්තේ මොකක්ද? අපේ විකල්පය මේ ණය ගෙවන එකද? ණය ගෙව-ගෙවා එම බර ජනතාව මත පටවන එකද? එහෙම නැත්නම් හම්බන්තොට වරාය වසා දමන එකද? මත්තල ගුවන් තොටු පොළට අදාළවත් ඒ ප්‍රශ්න තිබෙනවා. මත්තල ගුවන් තොටු පොළත් පවත්වා ගෙන යන්න තරම් ශක්තියක් අපට නැහැ. එතැනටත් -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ඔබතුමාගෙන් ඇහුවේ කොළඹ වරාය -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම කියන්නම්.

ඊළඟට, විශේෂයෙන්ම මම එක කරුණක් කියන්න කැමැතියි. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි කවුරුවත් පාවිච්චි කරලා නැහැ. නිලධාරීන් කොපමණ වාර්තා දුන්නත් අපට, ලංකාවට, ඒ තෙල් ටැංකි පාවිච්චි කරන්න බැහැ. මේ නිලධාරීන් මේ සංස්ථාව පවත්වා ගෙන යද්දී තමයි, අපිට බිලියන 424ක ණයක් තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එම නිලධාරීන් -[බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මන්ත්‍රීතුමනි, එම නිලධාරීන් නම් වශයෙන් සඳහන් කරන්න මම කැමැති නැහැ. මෙතැන ඒ අය නැහැ. ඇතුළේ ඉන්නා අයගේ වාර්තා දිහා බැලුවාම, මේවා තවත් කරන්න ගියොත් තවත් බිලියන 424කින් ණය ඉහළ යයි. ඒ ගොල්ලන් කියන විධියට නොවෙයි, අද ලංකාවේත් පිටත් වෙළෙඳ පොළ ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා අපිට මෙය දියුණු කරලා එතැන තෙල් රඳවාගෙන ඒවා ඉන්දියාවටයි, ලංකාවටයි බෙදන්න පුළුවන් කියන්නේ, ත්‍රිකුණාමල වරායෙන් යම් කිසි ප්‍රයෝජනයක් අරගන්න පුළුවන් කියන එකයි.

තුන්වනුව කථා කළේ, කොළඹ වරායේ East Terminal එක ගැනයි. ඒක ආණ්ඩුවටම අයිති එකක් නොවෙයි. එය සකස් කළාට පසුව අපිට ඕනෑ විධියකට ක්‍රියාත්මක කරන්නයි බලන්නේ. ඇත්ත වශයෙන්ම අපි දැන් බලන්නේ, පාලන ආයතනය හැටියට අපේ වරාය අධිකාරිය පවත්වා ගෙන යන්නයි. එතැන කිසි විටෙක වරාය අධිකාරියටම කියා භාර දුන්නේ නැහැ. වරාය අධිකාරිය මේක අවසන් කරන අවස්ථාවේදී East Terminal එක අපට, රජයට, ඕනෑ විධියට තීරණය කරන්න ලබා දුන්නා. ඒ අනුව තවත් අය මෙතැනට බඳවා ගන්න අප තීරණය කළා.

අපේ සංස්ථාවත්, වරාය අධිකාරියත්, අනෙක් අයත් එකට එකතු වෙලා කටයුතු කරලා මේ රටේ වරාය ක්ෂේත්‍රය දියුණු කරලා එන නැව් ප්‍රමාණය වැඩි කර ගැනීමයි අපේ ප්‍රධානම අරමුණ. ඒ එන නැව් සංඛ්‍යාව වැඩි කර ගන්න බැරි නම් එකක්වත් කරලා වැඩක් නැහැ. එන නැව් සංඛ්‍යාව වැඩි කර ගන්න පුළුවන් වෙන්න ඕනෑ. හම්බන්තොටට එන නැව් සංඛ්‍යාව වැඩි කර ගන්න ඕනෑ. කොළඹ වරායට එන නැව් සංඛ්‍යාව වැඩි කර ගන්න ඕනෑ. මේ රටේ තෙල් ටැංකිවල ලංකාවටත්, ඉන්දියාවටත් ඕනෑ තරමට තෙල් රඳා පවතිනවා නම් මේ රටට එන නැව් සංඛ්‍යාව වැඩි වෙනවා. ලංකාව නාවුක කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන එකද, නැත්නම් සංස්ථාවක් යටතේ පාලනය කරලා අලාභ ලබා ගන්න එකද අප කළ යුතු වැඩ කටයුත්ත? අන්න එතැනදී ඔබතුමන්ලායි අපයි අතර වෙනස් මත තිබෙන්න පුළුවන්. අපේ පරමාර්ථය මොකක්ද? සිංගප්පූරුව වාගේම මේ රට විශාල නාවුක කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමයි. ඒ සඳහා වැඩ කටයුතු කරන ගමන් අපේ අත් දැකීම් අනුව අපි බලමු කොහොමද මේ කටයුතු ක්‍රියාත්මක වෙන්නේ කියලා. මේ එකකින්වත් රජයට පාඩුවක් වෙන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට පැහැදිලි කර ගැනීම් දෙකක් සඳහා අවස්ථාව දුන්නා. ගරු අගමැතිතුමනි, මෙතුමාට -[බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
හොඳයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අගමැතිතුමනි, දැන් ඔබතුමා කියනවා ආර්ථිකයේ ඇති වී තිබෙන මේ අර්බුදයත් එක්ක මේ ආයතන කාර්යක්ෂම කරන්නත් ඒ ආයතනවල ප්‍රධානම වගකීම් පුළුල් කර ගැනීම සඳහාත් පෞද්ගලීකරණය කිරීම තමයි හිතකර වෙන්නේ කියලා. හැබැයි, මේක අලුත් වට්ටෝරුවක් නොවෙයි. ඔබතුමන්ලාට මතක ඇති, අපේ රටේ ජේශ කර්මාන්තය පෞද්ගලීකරණය කරන්න මේ විධියටම පාර්ලිමේන්තුවේ යෝජනාව ගෙනාවා. ඒ කියන්නේ, මත්තෙගොඩ, පූගොඩ, තුල්හිරිය රෙදි කම්හල්වලට. හැබැයි, අද රෙදි කම්හල් එකක්වත් ඉතුරු වෙලා නැහැ. ඊට පස්සේ මේ යෝජනාවම ගෙනාවා, කන්තලේ සීනි සමාගම සහ හිඟුරාන සීනි කර්මාන්තශාලාව සඳහා. මොකක්ද ඇති වෙලා තිබෙන ප්‍රතිඵලය? මේ යෝජනාවම තමයි ඇඹිලිපිටිය කඩදාසි කම්හලටත් ගෙනාවේ. මොකක්ද ඇති වෙලා තිබෙන ප්‍රතිඵලය? එහි මැෂින් ටික පරණ යකඩවලට විකුණුවා. ඔරුවල වානේ සංස්ථාවත් එහෙමයි. ඒක දැන් යන්තමින් පවත්වාගෙන යනවා. ඒත්, විකුණලා එහෙට මෙහෙට ගිහිල්ලා ඉවර වෙලා. මේ විධියට අපේ රටේ වැදගත් රාජ්‍ය ආයතන ගණනාවක් ආණ්ඩුවට බරක්ය කියලා කාර්යක්ෂමතාවට ගෙන ඒම සඳහා, වඩාත් වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කියලා පෞද්ගලීකරණය කිරීමෙන් ලැබුණු ප්‍රතිඵල මොනවාද? ඇස් ඉදිරිපිටම පෙනෙන්න තිබෙන දේ තමයි ඒවා අසාර්ථක වීම.

විශේෂයෙන් වතු ක්ෂේත්‍රය අත්හරින කොටත් එහෙම කිව්වා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? වැවිලි කර්මාන්ත ඇමතිතුමා දන්නවා, මොකක්ද වතුවල ඇති වෙලා තිබෙන තත්ත්වය කියලා.

[ගරු අනුර දිසානායක මහතා]

ඒ නිසා අපේ ඇස් ඉදිරිපිට ඕනෑවටත් වඩා වැඩියෙන් සාක්ෂි තිබෙනවා, මේ රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් පෞද්ගලීකරණය කිරීම හරහා ප්‍රතිලාභ ලැබුණා ද, ඒවායේ කාර්යක්ෂමතාව වැඩි වුණාද, එහෙම නැත්නම් රටේ, ජාතික ආර්ථිකයේ විශාල පංගුවක් නියෝජනය කරන ක්ෂේත්‍ර අත් හැරියාද කියන එක සම්බන්ධයෙන්. ඒ නිසා ගරු කථානායකතුමනි, නැවත මේ ක්‍රියාවලිය ආරම්භ කරන්න පෙර අඩුම තරමින් ආණ්ඩුව විසින් මෙතෙක් පෞද්ගලීකරණය කරන ලද ආයතන පිළිබඳව සමීක්ෂණයක් කරලා වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැතිව එකම වට්ටෝරුව, රාජ්‍ය අයිතිය අත්හැරීම කියන සූත්‍රය අසාර්ථක වී තිබෙන බවයි පෙන්නුම් කර තිබෙන්නේ. එම නිසා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, මෙම තීරණ ගනු ලැබුවේ මීට පෙර පෞද්ගලීකරණය කරන ලද ආයතන පිළිබඳව යම් සමීක්ෂණයක් සිදු කරලාද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මම මුලින්ම වරාය ගැන කියන්න කැමැතියි. එතැනත් රුපියල් බිලියන 240ක් ගෙවන්න තිබෙනවා. එහෙම නම් අපට කිසි විටෙක ඒක ගෙවන්න බැරි වෙනවා. ඒ සඳහා යම් කිසි ක්‍රමවේදයක් අවශ්‍යයි. මේ සමහර සංස්ථාවලට කරන්න තිබෙන්නේ ණය ගෙවන එකයි.

දෙවනුව, මේ රටට රෙදි ගෙනෙන එක නවත්වන්න කියලා ඔබතුමා කියනවා නම්, එහෙම නම් අපට පුළුවන්, එය ක්‍රියාත්මක කරන්න. මොකක්ද, මෙතැන සිදු වුණේ? ඇත්ත වශයෙන්ම ඒ සංස්ථාවලට තරග කරන්න බැරි වුණා. ඉස්සර අපි ලංකාවේ සංස්ථාවලට රෙදි ගෙනෙන එක සීමා කළා. විවෘත ආර්ථිකයේදී අපි රෙදි ගෙනෙන්න ඉඩ දුන්නා. ඉස්සර රෙදි ගෙනෙන්න ඉඩ දුන්නේ නැත්තේ ජනතාව සෂ්ටාර මාර්ක් රෙදි ගත්තේ නැති නිසායි. ජනතාව ගත්තේ අනෙක් රෙදි. අපි වෙනත් විධියකට අඳින්න පටන් ගත්තා. ඇත්ත වශයෙන්ම මම කර්මාන්ත ඇමති වශයෙන් සිටි කාලයේදී තුල්හිරිය පේෂකර්මාන්තශාලාව වාගේ ඒවා ක්‍රියාත්මක කළා. ඊට පසුව නැහෙනහිර ආසියාවේ අර්බුදය නිසා ඒවාත් කඩා ගෙන වැටුණා. ඒ වෙනුවට අද අපට තිබෙනවා, ඇඟලුම් කර්මාන්තයක්. ඒ ඇඟලුම් කර්මාන්තයෙන් කී දෙනෙකුට රැකියා ලබා දෙනවාද? කොච්චර විදේශ විනිමය ලබා දෙනවාද? ලෝකයේ හැම තැනම ආර්ථික පරිවර්තනයක් සිදු වෙනවා. සෝවියට් දේශයේ එහෙම කර්මාන්තශාලා ගණනාවක් වසා දමා තිබෙනවා. දැන් ඒ අයගේ අවධානය යොමු වෙලා තිබෙන්නේ බනිජ තෙල්වලට සෞදි අරාබිය සමඟ එකඟත්වයකට ඇවිල්ලා තමන්ගේ මිල පාලනය කරන තත්ත්වයකට එන්නයි.

චීනය දිහා බලන්න. චීනයේ විශාල පෞද්ගලික අංශයක් ඇති වෙලා තිබෙනවා. ආණ්ඩුවේ සමහර අංශ දැන් පෞද්ගලික අංශ සමඟ එකට වැඩ කරනවා. අනෙක් ඒවා වසා දමලා තිබෙනවා. අනෙක් ඒවා සාර්ථකව ගෙන යනවා. ව්‍යාපාර හැටියට රජයේ අංශයෙන් සාර්ථකව පවත්වා ගෙන යන්න පුළුවන් ඒවා අපිත් පවත්වා ගෙන යමු. එහෙත් අපේ මූලික වැඩ කටයුත්ත වන්නේ මේ රටේ ජනතාවගේ ආදායම වැඩි කිරීමයි; අධ්‍යාපනය දියුණු කිරීමයි; සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීමයි; නිවාස ලබා දීමයි. මේ සියල්ලටම ආදායමක් ලබා ගන්න එක තමයි අපේ ප්‍රධාන කාර්යය. අන්න ඒ ක්‍රමවේදය සිදු වෙන එකක් අපට කියන්න. ඉන්දියාවත් දැන් සංස්ථා පවත්වා ගෙන යන්න බැරි තත්ත්වයකයි ඉන්නේ. චීනයේත් දැන් බැංකු ගණනාවකට ණය වෙලා තිබෙනවා. ඒ නිසාම ණය දෙන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. සමහර විශාල ඒවා තිබෙනවා. ඒවා අලුත් ඒවා. State-owned enterprises, China Harbour Engineering Company වාගේ අලුත් ඒවා ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අසාර්ථක වෙන ඒවාත් තිබෙනවා. අපි බලන්නේ අපේ තිබෙන ඒවා සාර්ථක කර ගෙන ඉදිරියට යන්නයි. ඕනෑනම් අපි අලුත් ව්‍යාපාර ආරම්භ කරන්නම්. වැවිලි අංශයේදී රජයට තිබුණු විශාල බරක් නැති වුණා. සමහර වැවිලි සමාගම් සාර්ථකයි. අනික් වැවිලි සමාගම් හරියට වැඩ කටයුතු කරගෙන ගියේ නැහැ. අපි අසාර්ථක වුණු වැවිලි සමාගම් මොනවාද කියලා බලලා, ඒ ගැන ඇගයීමක් කරලා, කරන්න ඕනෑ වෙනස්කම් කරන්නම්. අපි ව්‍යක්තීය සමිති එක්කත් සාකච්ඡා කරගෙන යනවා, ගත යුතු පියවර කුමක්ද කියලා.

සමහර රාජ්‍ය සංස්ථා රජය විසින් පෞද්ගලීකරණය කළා; ජනතාකරණය කළා. සමහර සංස්ථා කළමනාකරණ ප්‍රශ්න හේතුවෙන් පවත්වාගෙන යන්න බැරි නිසා වහලා දැම්මා. අනික් ඒවා ඇත්ත වශයෙන්ම සාර්ථක වුණා. කැලණි ටයර් සංස්ථාව දිහා බලන්න. අද වනකොට කැලණි ටයර් සංස්ථාව පිට රටට ටයර් යවනවා. ඒ තත්ත්වයට කැලණි ටයර් සංස්ථාව පත්වෙලා තිබෙනවා. පෞද්ගලික අංශයේත් විශාල සමාගම් කීපයක් අද වහලා තිබෙනවා. රජයේ අංශයේ වාගේම පෞද්ගලික අංශයේත් අලුත් ව්‍යාපාර ආරම්භ කරලා සමහර ව්‍යාපාර වහන්න සිදුවෙලා තිබෙනවා. අපේ අරමුණ, හොඳ ආදායමක් ලැබෙන ආකාරයේ රැකියා මේ රටේ වැඩි කිරීමයි. හොඳ ආදායමක් ලබා දීලා, ආර්ථික වශයෙන් ශක්තිමත් ජනතාවක් බිහි කර ගැනීම තමයි අපේ අරමුණ. අපි ඒ අරමුණ කරා යන්න ඕනෑ.

මේ මුදල් සියල්ලම අපි ගෙවන්න යනවා නම් නිදහස් අධ්‍යාපනය නවත්වන්න වෙනවා; නිදහස් සෞඛ්‍යය නවත්වන්න වෙනවා; නිවාස දෙන එක නවත්වන්න වෙනවා; ගම්වලට මුදල් දෙන එක නවත්වන්න වෙනවා. මේ ආණ්ඩුවට තිබෙන්නේ ජනතාව දියුණු කරන ආකාරයේ සැලැස්මක් ඉදිරියට ගෙන යෑමයි. ආර්ථිකය දියුණු වෙනවා නම් ජනතාව දියුණු වෙනවා. ජනතාවගේ අතට තමයි අපි මේ අයිතිය ලබා දෙන්න ඕනෑ. අද ජනතාවට නොවෙයි අයිතිය ලබා දීලා තිබෙන්නේ. නිලධාරීන් කීප දෙනෙකු, ඇමතිවරු කීප දෙනෙකු විටින් විට මාරු වෙනවා. ඒ අය තමයි මේවා පාලනය කරන්නේ. ඕක තමයි, යථාර්ථය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මම මෙම ප්‍රශ්නය අහනවා. යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධානයක් හරහා හෝ ජනමත විචාරණයක් හරහා හෝ වර්තමාන පාර්ලිමේන්තුවේ ආයු කාලය හෙවත් කාල සීමාව ව්‍යවස්ථාවෙන් නියම කර ඇති වසර පහ ඉක්මවා දිගු කර ගැනීමට ආණ්ඩුව සැලසුම් කර ඇත්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන්නේ පාර්ලිමේන්තුවෙන් පත් කරපු ව්‍යවස්ථාදායක සම්පාදක මණ්ඩලයයි, සම්බන්ධීකරණ කොමිටියයි. ඒ සඳහා විවිධ අය තෝරාගෙන තිබෙනවා. ආණ්ඩුව නොවෙයි, එතැන වැඩ කටයුතු කරන්නේ. ඒකාබද්ධව වැඩ කටයුතු කරන්න තමයි අපි බලන්නේ.

ආණ්ඩුව මෙතැනට යෝජනා ඉදිරිපත් කරලාත් නැහැ. මොකද, මෙතැන නියෝජනය වෙන්නේ මෙහේ තිබෙන දේශපාලන පක්ෂයි. මේ ආණ්ඩුව එක පක්ෂයක ආණ්ඩුවක් නොවෙයි. ඒ නිසා විවිධ අදහස් අපි යෝජනා කරලා තිබෙනවා. තවම වාර්තාව සකස් කරලා නැහැ. මම දන්නා හැටියට ආණ්ඩුවට අයිති දේශපාලන පක්ෂ නම් ආණ්ඩුවේ -වර්තමාන පාර්ලිමේන්තුවේ- කාල සීමාව වැඩි කරන්න කියලා කිසිම යෝජනාවක් ඉදිරිපත් කරලා නැහැ. එපමණයි මට කියන්න පුළුවන්. ආණ්ඩුව හැටියට අපි එවැනි යෝජනා දීලා නැහැ. ආණ්ඩුවට අයත් පක්ෂවලිනුත් එවැනි යෝජනා දීලා නැහැ.

උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාත් මේ කාරණය පිළිගන්න ඕනෑ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා හැටියට ඇවිල්ලා පූර්ණ විධායක බලතල සහිත ජනාධිපතිවරයකු හැටියට ජයග්‍රහණය කළාට පස්සේ එතුමාම යෝජනා කළා, මේ බලතල ඉවත් කරන්න කියලා. මීටත් වඩා බලතල ඉවත් කරන්න කියලා එතුමා යෝජනා කළා. නමුත්, ඒ සඳහා ජනමත විචාරණයකට යන්න සිදු වෙයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා. එදා ඒ බලතල අඩු කරන එකටත් ගම්මන්පිල මන්ත්‍රීතුමා විරුද්ධ වුණා. ඉතින් දැන් මොනවා කරන්නද? එදා එහෙම විරුද්ධ වුණේ නැත්නම් අපට ජනමත විචාරණයකට යන්න තිබුණා. ජනාධිපතිතුමා කැමැත්තෙන්ම ඒ බලතල අඩු කළා. මේ ආණ්ඩුවත් ඒකට ඉඩ දුන්නා. ඒ වාගේම ස්වායත්ත කොමිෂන් සභා නැති කරලා තිබුණා. අපි ස්වායත්ත කොමිෂන් සභා නැවත පිහිටෙව්වා. ඒවාත් කළේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. නීත්‍යානුකූල අග්‍ර විනිශ්චයකාරතුමිය අපි ආපහු ඒ තනතුරට පත් කළා. ව්‍යවස්ථාදායක සභාවට දැන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුත් සම්බන්ධ වෙලා ඒ බලය ක්‍රියාත්මක කරනවා. මේක බලයට කෑදර පක්ෂවල ලක්ෂණයක් නොවෙයි. අපට ඕනෑ කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් කරන්නයි; බලය තවත් විමධ්‍යගත කරන්නයි; ජනතාව ඒ සඳහා එකතු කර ගන්නයි. ඒ නිසා පාර්ලිමේන්තුවේ කාල සීමාව දිගු කරන්න කියලා යෝජනාවක් අප තුළ නැහැ.

ඒ කාලයේ ජනාධිපතිගේ ධුර කාලය වාර දෙකකට සීමා වුණා. ඔබතුමන්ලා නේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඒකත් වෙනස් කළේ. දැන් අපෙන් අහනවා, පාර්ලිමේන්තුවේ කාලය දිගු කරනවාද කියලා. ජනාධිපතිගේ ධුර කාලය වාර දෙකකට වඩා වැඩි කරන්න ජනතාව ලැස්ති නැහැ. ජනතාවගේ මතය තමයි අපි නියෝජනය කළේ. නමුත්, තුන්වෙනි වතාවටත් ජනාධිපති ධුරයට එන්න තරග කළා. ඔබතුමන්ලා අපෙන් මේ ප්‍රශ්නය අහන්නේ නැතිව අපට කියන්න, ඇයි ජනාධිපතිගේ ධුර කාලය දීර්ඝ කරපු එක ගැන දැන් ජනතාවගෙන් සමාව ඉල්ලන්නේ නැත්තේ කියලා?

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ කිසිම පක්ෂයකින් එවැනි ඉල්ලීමක් නැහැයි කියලා අගමැතිතුමන් ප්‍රකාශ කළා. නමුත්, ආණ්ඩුවේ නිල ප්‍රධානියා වන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වන අතිගරු ජනාධිපතිතුමා අගමැතිතුමා ළඟින් තියාගෙන මාතර පැවැති හවුල් ආණ්ඩුවේ පළමුවැනි සංවත්සරයේදී කිව්වා, "කවුරු අකැමැති වුණත්, මේ ආණ්ඩුව තවත් වසර පහක් පවත්වා ගෙන යනවා" කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ කාලය අවුරුදු පහයි. මේ වනකොට අවුරුද්දක් අවසන් වෙලා තියෙද්දීත්, තවත් අවුරුදු පහක් මේ ආණ්ඩුව පවත්වාගෙන යනවා කියපු නිසායි මම මේ ප්‍රශ්නය ඇහුවේ. [බාධා කිරීම්] අනෙක් මන්ත්‍රීවරුන්ගෙන් නොවෙයි, මම මේ ප්‍රශ්නයට අගමැතිතුමාගෙන් උත්තර බලාපොරොත්තු වෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ සන්ධානයේ නායක, මේ රටේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මාතරදී,- [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයට අයිති නැත්නම් මෙවැනි ප්‍රශ්නයක් මතු කරන්න එතුමාට මේ ගරු සභාවේ ඉන්න බැහැයි කියලා මම කියනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයට අයිති නම්, මම දන්න හැටියට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි. ඉස්සරවෙලා කියන්න කවුද ඔබතුමාගේ නායකයා කියලා. ඔබතුමා කියනවා නම්, "එතුමා මගේ නායකයා නොවෙයි" කියලා, එහෙනම් ඔබතුමා කොහොමද පාර්ලිමේන්තුවේ ඉන්නේ? ඔබතුමා පිළිගන්නවාද, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි කියලා? ඔබතුමා අයිති එක්සත් ජනතා නිදහස් සන්ධානයටද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අමතක කරන්න. මම කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා ගැන නොවෙයි. එදා ඒ වේදිකාවේ හිටියේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අය. ඒ අය එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරග කරලා තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ. එතුන්ලා පාර්ලිමේන්තුවට ආවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. එතුමන්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කරලා පාර්ලිමේන්තුවට ආවේ නැහැ. මේ සන්ධානය කැලි කැලිවලට වෙන් කරන්න හදන්නේ මොකටද? දැන් ඔබතුමා මෙතැන කියන්නේ ඔබතුමාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න අයිතියක් නැහැ කියලාද? ඒක මට කියන්න. ජනාධිපතිතුමා මාතරදී කිව්වේ මොකක්ද කියලා මම කියන්නම්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
කොහෙද යන්නේ, මල්ලෙ පොල්.

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
මල්ලෙ පොල් කියන්නේ ඔබතුමා නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා කිව්වේ, "අපි ඉස්සරවෙලාම ආවේ අවුරුදු දෙකකට, ඊට පස්සේ අපි අවුරුදු පහක් යනවා" කියලා. මැතිවරණයෙන් පස්සේ ඕනෑ නම් තව අවුරුදු පහක් යනවා කිව්වා. ඔබතුමාට මම කියනවා ඕනෑ නම් දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳෙන්න කියලා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු අගමැතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. සෘජු පිළිතුරක් බලාපොරොත්තුවෙන් මම මේ ප්‍රශ්නය අහන්නේ. ඔබතුමන්ලා පාර්ලිමේන්තුව නොවෙයි, "ආණ්ඩුව" කියන එක අර්ථ දක්වන්නේ විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිතුමාගෙන්. පසු ගිය ජනාධිපතිවරණයෙන් පස්සේ අගමැතිතුමා, ඇමතිවරු ඔක්කෝම අලුතින් පත් වුණා. ඔබතුමා දන්නවා ඇති අද සුවිශේෂී දවසක් බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 සහ 31 ව්‍යවස්ථා සමඟ කියැවිය යුතු ජනාධිපතිවරණ පනතේ 2වැනි වගන්තියට අනුව අද සිට හරියටම වසර තුනකින් ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළ යුතු වෙනවා. එවැනි පදනමකදී ආණ්ඩුව වසර පහක් ඉදිරියට ගමන් කරන්නේ කොහොමද කියන එක පැහැදිලි කර දෙන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේක තමයි වෙලා තිබෙන්නේ. තවම පරණ කාලේ. බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් වුණාම, ඔබතුමා ඒකට එකඟ වෙනවාද නැද්ද කියලා කියන්න. එතකොට අපට ඒ ගැන දැන ගන්න පුළුවන්. එතෙක් මට කියන්න දෙයක් නැහැ. මට තිබෙන්නේ සම්බන්ධීකරණ කමිටුවේ වාර්තාව ඉදිරිපත් කරන්නයි. ඊට පස්සේ ඔබතුමන්ලාට ඒ ගැන තීරණය කරන්න පුළුවන්. අපි දන්න හැටියට පාර්ලිමේන්තුවට තමයි බලය එන්න ඕනෑ. ඔබතුමාත් ඒකට කැමැති නම් ඒ අනුව අපි වැඩ කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න මම ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාට භාර දෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කර ගැනීමක් කරන්නයි අවසර ඉල්ලුවේ. ගරු අගමැතිතුමා පිළිතුරු දෙන්න කැමැතිද? කැමැති නම් එතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එතුමාට අවස්ථාව දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මීට කලිනුත් වෙනත් මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවාම, එයට අදාළව තවත් කෙනෙක් අතුරු ප්‍රශ්න ඇහුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, හරි. ඔබතුමා අහන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක ඉවසා ගෙන ඉන්න පුළුවන්. අපි අතුරු ප්‍රශ්න අහන කොට නලියන්නේ මොකද කියලා මට තේරෙන්නේ නැහැ. ඒ මොකක් හෝ අසනීපයක්.

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා උතුරේදී ප්‍රකාශයක් කර තිබෙනවා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොවැම්බර් මාසයේ අය වැය ඉදිරිපත් කිරීමට පෙර මේ පාර්ලිමේන්තුවට ගෙන ඒමට බලාපොරොත්තු වෙනවාය කියලා. අපි ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඔබතුමන්ලා ඉලක්ක කර ගෙන ඉන්නේ නොවැම්බර් මාසයේ අය වැය ඉදිරිපත් කිරීමට පෙර ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට ගෙන එන්නද, එහෙම නැත්නම් ඉන් පසුව කුමන කාල පරිච්ඡේදයකදී ගෙන එන්නද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇත්ත වශයෙන්ම මම ගරු මංගල සමරවීර මැතිතුමාගෙන් ඒ ගැන ඇහුවා. එතුමා කිව්වා එහෙම නොවෙයි ප්‍රකාශ කළේ කියලා. කොහොමත් අපි ඒ ගැන ප්‍රකාශයක් කර තිබෙනවා. ඒක කර ගෙන යන්නේ ආණ්ඩුවෙන් නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයෙන්. අපි උත්සාහ කරන්නේ මේ වසර තුළදී ඒ සම්බන්ධීකරණ කමිටුවේ වාර්තාව ඉදිරිපත් කරන්නයි. ඒ වාර්තාව අය වැයට ඉස්සරවෙලා ඉදිරිපත් කරන්න පුළුවන් නම්, අපි අය වැයට ඉස්සෙල්ලා ඉදිරිපත් කරන්නම්. ඒ වාර්තාවට ලැබෙන ප්‍රතිචාරය අනුව තමයි ඊට වඩා ඉදිරියට යන්න පුළුවන් ඒවා තීරණය කරන්න අපට පුළුවන් වන්නේ. එය ආණ්ඩුව කරන වැඩසටහනක් නොවෙයි. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ගත යුතු ක්‍රියා මාර්ගයක්; තීරණයක්. ඒ නිසා එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට භාර දෙනවා. මංගල සමරවීර ඇමතිතුමා කිව්වා, එතුමා කිව්වේ ඒ විධියට නොවෙයි කියලා. අපි ඉස්සෙල්ලා වාර්තාවක් ලබා ගන්නයි යන්නේ කියලා ප්‍රකාශ කළාම, එතුමා කිව්වා ඒක හරි කියලා. එච්චරයි එතැන සිදු වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. ප්‍රශ්න අංක 1, ගරු එම්.එච්.එම්. සල්මාන් මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මට අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා, ස්ථාවර නියෝග 126 කෙරෙහි. එහි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පිළිබඳ විධිවිධානයක් තිබෙනවා. ඊයේ දිනයේදී -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භ කරන්න පෙර ඒ ගැන කියන්න ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

පේරාදෙණිය - දෙල්තොට - රිකිල්ලගස්කඩ මාර්ගය: සංවර්ධනය
பேராதனை -தெல்தொட்ட- ரிக்கில்லகஸ்கட வீதி : அபிவிருத்தி
PERADENIYA-DELTHOTA-RIKILLAGASKADA ROAD: DEVELOPMENT

458/'16

1. **ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පසු ගිය වකවානුව තුළ මහනුවර දිස්ත්‍රික්කයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළද, පේරාදෙණිය සිට දෙල්තොට දක්වා වූ ප්‍රධාන මාර්ගය සංවර්ධනය නොකිරීම නිසා පොදු මහ ජනතාවගේ ගමනාගමන කටයුතුවලට බාධාවක් වී තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, පේරාදෙණිය නගරයේ සිට දෙල්තොට රිකිල්ලගස්කඩ දක්වාත්, පේරාදෙණිය, ගලහ පාලම හරහා දෙල්තොට දක්වාත් එම ප්‍රධාන මාර්ග කාපට් කර නවීකරණය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த காலங்களில் கண்டி மாவட்டத்தில் பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் நடைமுறைப் படுத்தப்பட்டபோதிலும், பேராதனையிலிருந்து தெல்தொட்ட வரையான பிரதான வீதி அபிவிருத்தி செய்யப்படாமையினால் பொது மக்களின் போக்குவரத்து நடவடிக்கைகளுக்கு இடையூறாக உள்ளதென்பதை அறிவாரா;

(ii) ஆமெனில், பேராதனை நகரிலிருந்து தெல் தொட்ட, ரிக்கில்லகஸ்கட வரையும், பேராதனை கலஹா பாலம் ஊடாக தெல்தொட்ட வரையும் மேற்படி பிரதான வீதிகளுக்கு காப்பட் இட்டு நவீனமயப்படுத்துவதற்கு நடவடிக்கை மேற் கொள்வாரா;

என்பதையும்அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) whether he is aware of the fact that although different development projects were implemented in the Kandy District during the past period, the main road from Peradeniya to Delthota was not developed, thereby posing a hindrance to transportation activities of the public; and

(ii) if so, whether steps will be taken to carpet and renovate the main roads from Peradeniya town to Delthota, Rikillagaskada and from the Galaha bridge of Peradeniya to Delthota?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

සංවර්ධනය කළ යුතු මහාමාර්ගයක් ලෙස හඳුනා ගෙන ඇත.

(ii) පේරාදෙණිය - දෙල්තොට - රිකිල්ලගස්කඩ මාර්ගය (කිලෝමීටර් 0+000 සිට කිලෝමීටර් 52+920 දක්වා) ඉදිරි මාර්ග සංවර්ධන ව්‍යාපෘතියකට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

We are doing it under a bank-funded project.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 - 465/'16- (2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මා 2015 ජනවාරි 13වන දින ඉදිරිපත් කළ ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ප්‍රශ්නය ඉදිරිපත් කළ දිනය මා කිව්වේ, ඒක දැනගෙනයි, ගරු කථානායකතුමනි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඒකේ වැරැද්දක් තිබෙනවාද?

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රබර් පාලන මිල ක්‍රියාත්මක නොවීම: වගාකරුවන්ට සහන

இறப்பர் கட்டுப்பாட்டு விலை அமுலில் இல்லாமை : உற்பத்தியாளருக்கு நிவாரணம்

NON-IMPLEMENTATION OF RUBBER CONTROL PRICE: RELIEF FOR GROWERS

480/'16

3. ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කෑගල්ල හා කළුතර දිස්ත්‍රික්කවල වෙසෙන ජනතාවගෙන් බහුතරයකගේ ජීවන වෘත්තිය රබර් කිරි කැපීම බවත්;

(ii) දැනට මාස ගණනක සිට රබර් කිරි මිල හා වියළි රබර් ෂීට් මිල පහත මට්ටමක පවතින බවත්;

(iii) එයට පිළියමක් වශයෙන් රජය විසින් රබර් කිලෝවකට රු. 350/- ක පාලන මිලක් නියම කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නියම කළ පාලන මිල වෙළඳ පොළ තුළ දැනට ක්‍රියාත්මක නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, රබර් කිරි කැපීම ජීවන වෘත්තිය කරගත් ජනතාව වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ටක් කෛත්තොෆිල් අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) කේකාලෛ මට්‍රුම් කළුත්තුරෛ මාවට්ටංකළිල් වාළුම් මක්කළිල් පෙරුම්පාලානෝරින් වාළ්ක් කෛත් තොළිල් ඉරප්පර් පාල් වෙට්ටුතලාකුම් එන්පතෛයුම්;

(ii) තර්පෝතු පලමාත කාලමාක ඉරප්පර් පාලින් විලෛ මට්‍රුම් උලර්න්ත ඉරප්පර් ෂීට්ටින් විලෛ කීළ් මට්ටත්තිල් නිලවුකින්රතෙන්පතෛයුම්;

(iii) ඉතර්කාන දීර්වාක අරසාංකත්තිනාල් ඔරු කිලෝ ඉරප්පරුක්කු රූපා 350/- කට්ටුප්පාට්ටු විලෛ නිර්ණයික්කප්පට්ටතු එන්පතෛයුම්;

අවර් අරිවාරා?

(ආ) නිර්ණයික්කප්පට්ට කට්ටුප්පාට්ටු විලෛ සන්තෛයිල් තර්පෝතු අමුලිල් ඉල්ලෛ එන්පතෛ අවර් ඒර්ට්‍රුක්කොළ්වාරා?

(ඉ) ආමෙනිල්, ඉරප්පර් පාල් වෙට්ටුවතෛ වාළ්ක්කෛත් තොළිලාකක් කොණ්ට මක්කළුක්කාක මේර් කොළ්ළප්පටුම් නටවටික්කෛකළ් යාවෛ එන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඊ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Plantation Industries:

(a) Is he aware that-

(i) the occupation of the majority of the people, who are living in Kegalle and Kalutara Districts, is rubber tapping;

(ii) the prices of latex and dry sheet rubber are in a lower level since few months; and

(iii) the Government stipulated a control price of Rs. 350/- for a kilogram of rubber, as a remedial measure?

(b) Will he admit that the stipulated control price is not effective in the market by now?

(c) Will he inform this House, if so, of the measures that will be taken on behalf of the people whose livelihood is rubber tapping?

(d) If not, why?

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) ඔව්.

රබර් මිල පහත වැටීම දේශීයව පැන නැඟුණු ගැටලු හේතුවෙන් ඇති වූවක් නොව, ගෝලීය තත්ත්වයකි.

Hon. Speaker, you as a former rubber trader know that global oil prices affect the rubber prices as well. That is what has happened in our country.

ලොව පුරා රබර් වගා කරන සියලුම රටවලට මෙම තත්ත්වය පොදුය. මෙබඳු මිල පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වූයේ කුඩා රබර් වතු හිමියන්ට කෙටි කාලීන සහනයක් සැලසීම වේ. එම සහන කාල සීමාව තුළ ව්‍යාප්ති සේවා විධිමත් කිරීම තුළින් කුඩා රබර් වතු හිමියන්ට ලබා දෙන උපදේශක සේවා වඩාත් කාර්යක්ෂම කිරීමටද, දැනටද කුඩා රබර් වතු හිමියන් වෙත පිරිනැමෙන සහනාධාර ක්‍රම තවදුරටත් ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර ඇත. ඒ අනුව කුඩා රබර් වතු හිමියන්ගේ ඵලදායීතාව ඉහළ නැංවීම මඟින් ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීමට අවශ්‍ය මූලික පියවර එම සහන කාලය තුළ ගනු ලැබ ඇත. මෙබඳු සහතික මිල ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට රජයට මසකට රුපියල් මිලියන 600-700 අතර මුදලක් දැරීමට සිදු වනු ඇති බව ගණන් බලා ඇත. එබඳු පිරිවැයක් දීර්ඝ කාලීනව දරමින් කුඩා රබර් වතු හිමියන්ට සහන සැලසීම ප්‍රායෝගික නොවේ. ලොව රබර් වගා කරන වෙනත් කිසිදු රටකද එබඳු සහතික මිල ක්‍රමයක් අඛණ්ඩව ක්‍රියාත්මක කර නොමැති බව ස්වාභාවික රබර් නිපදවන රටවල සංගමය මඟින් ලබා දී ඇති තොරතුරුවලින් පෙනී ගොස් ඇත. We feel that we cannot sustain a long-term income support system. That is the view of the Government.

(ඇ) 01. දේශීය රබර් මිල ඉහළ නැංවීමේ අරමුණින් අමු රබර් අපනයනයේදී අය කරන සෙස් බදු මුදල කිලෝවකට රුපියල් 15.00 සිට රුපියල් 4.00 දක්වා පහත හෙළීමට කටයුතු කර ඇත.

02. හෙක්ටයාරයකට අඩු ඉඩම් ප්‍රමාණයක් හිමි රබර් වගාකරුවන්ට හෙක්ටයාරයකට රුපියල් 5,000.00ක පොහොර සහනාධාරයක් ලබා දීමට කටයුතු කර ඇත.

03. රබර් වගාකරුවන්ට රජය මඟින් පිරිනමන ව්‍යාප්ති සහ උපදේශක සේවා වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමට පියවර ගෙන ඇත.

04. වගා, නව වගා, අතුරු භෝග වගා, වැඟි ආවරණ යෙදීම සඳහා වන සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

05. ආදායම වැඩි කර ගැනීම සඳහා කෙටිකාලීනව ආදායම් ඉහළ නැංවිය හැකි ක්‍රම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා ඒ වැඩසටහන් පිළිබඳව කිව්වා. විශේෂයෙන්ම රබර් මිල පහළ වැටිලා තිබෙන්නේ ලෝක වෙළෙඳ පොළ තත්ත්වයක් නිසා කියලාත් කිව්වා. ඔබතුමන්ලාගේ රජය රබර්වලට පොරොන්දු වුණු මිල ලබා දෙන්නේ නැති එක තමයි පළමුවැනි කාරණය. එම කාරණා සියල්ලක්ම දිගින් දිගටම පැවතීගෙන ගිහිල්ලා අද පවතින ගැටලු මතු වෙලා තිබෙනවා. අද, මේ රබර් වගාව අපේ රටෙන් නැති වෙලා යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඔබතුමාත් ඒ ගැන දන්නවා ඇති. මගේ මේ ප්‍රශ්නය ඇතුළත මම කෙටියෙන් මේ ගැනත් අහන්න කැමැතියි. ඔබතුමන්ලාගේ රජය පොහොර සහනාධාරය ලබා දෙන්නේ, අක්කර දෙකකට සහ අක්කර දෙකකට වඩා අඩු වැවිලිකරුවන්ට - කුඩා වතුහිමියන්ට- පමණයි. නමුත් අපේ ප්‍රදේශයේ අක්කර දෙකකට වඩා වැඩි, අක්කර දහයකට වඩා අඩුවෙන් වගා කරන කුඩා රබර් වතුහිමියන් සිටිනවා. ඒ නිසා මම මේ කියන කාරණය ඉතාම වැදගත් වෙනවා. දැන් ලබා දෙන්නේත් අක්කරයකට රුපියල් දෙදාහක් පමණයි. ඒ වාගේම අක්කර දෙකහමාරක් වෙද්දී රුපියල් පන්දාහක් ලැබෙනවා. ඒ ප්‍රමාණයත් මදි. කෙසේ වෙතත්, මේ වතුහිමියන් ආරක්ෂා කර ගැනීම සඳහා අක්කර දහයට වඩා වැඩියෙන් වගා කරන වතුහිමියන්ටත් ඒ සහනය ලබා දෙන්න කටයුතු කරන්න බැරිද?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, අපි සති දෙකකට පෙර පොල් හා රබර් වතුහිමියන්ට හෙක්ටෙයාරයකට ලබා දෙන සහනාධාරය හෙක්ටෙයාර දෙකක් දක්වා වැඩි කළා. අක්කර දෙකක් දක්වා වගාකරන අයට අපි රුපියල් පන්දාහක් දෙනවා. විශේෂයෙන්ම අපි මෙම සහනාධාරය දෙන්නේ ඉතාමත් දුප්පත්, ඒ වාගේම අහිංසක කුඩා පොල් හා රබර් ගොවියන්ටයි; තේ ගොවියන්ටයි. ඒක වැඩි කිරීම ප්‍රතිපත්තිමය තීරණයක්. විශේෂයෙන්ම විශාල වශයෙන් තේ වගාකරන වැවිලිකරුවන්ට මේ සහනාධාරය අපි ලබා දෙන්නේ නැහැ. "කුඩා වතුහිමියන්ට" කියන ප්‍රතිපත්තිමය තීරණය උඩයි අපි මේ පොහොර සහනාධාරය ලබා දෙන්නේ. ඒක වෙනස් කරනවාද, නැද්ද කියන එක අපි අනාගතයේ දී සලකා බලන්නම්.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇමතිතුමනි, කුඩා වතුහිමියන් කියන්නේ ඇත්තටම වැවිලිකරුවන් නොවෙයි. ඔවුන්ට අක්කර දහයකට වඩා අඩු වගා ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. අක්කර දෙකහමාරක් වගා කරන අයට පමණක් ඒ සහනාධාරය ලබා දුන්නොත්, ඒ තුළින් මේ කර්මාන්තය නැති වෙලා යන්නට පුළුවන්. අද වෙන කොටත් ගොඩාක් වතුවල රබර් කපන්නේ නැහැ. ඒ තරමට පාඩුයි. ඒ නිසා කුඩා රබර් වතුහිමියන්ට තමන්ගේ ණය ගෙවා ගන්න බැරිව, ඒ වතුවල තිබෙන ගස් ටික කපන්න ආරම්භ කරලා තිබෙනවා. ගස් කපන්න ආරම්භ කරලා තිබෙනවා පමණක් නොවෙයි, නොයෙකුත් ගැටලු නිසා නැවත වගාවන් -නව වගාවන්- කරන එකත් මුළුමනින්ම නවත්වලා තිබෙනවා. ඒ නිසා අපි මේ රබර් වතුහිමියන් ආරක්ෂා කර ගන්න අවශ්‍යයි. එහෙම නැත්නම්, ඉදිරියේ දී රබර් මිල වැඩි වුණත් රබර් වගාව අපේ රටෙන් නැති වෙලා යන්න පුළුවන්. එක පැත්තකින් අපේ පරිසරය ආරක්ෂා කර ගැනීමත් කළ යුතු වෙනවා. මොකද මේ ගස් කැපීම තුළින් පරිසරයට හානි වෙලා තිබෙනවා. අපේ ප්‍රදේශවල තිබෙන ජල මූලාශ්‍ර ටික නැති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ සහනාධාරය අක්කර දහයක් වගා කරන කුඩා වතුහිමියන්ටත් ලබා දෙන්න කටයුතු කළොත් -අඩුම තරමේ අක්කර දහයෙන් පහළ වගා කරන අයටවත් ලබා දෙන්න කටයුතු කළොත්- ඒක ඉතාමත් වැදගත් වෙනවා. ඔබතුමන්ලාගේ රජය එදා පොරොන්දු වුණු දේවත් අඩු ගණනේ ලබා දෙන්න කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලා ඒ සඳහා ගෙන යන ක්‍රියා මාර්ගය මොකක්ද ?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

මේ වතු විවිධාංගීකරණය කිරීමේ තීරණය අපි නොවෙයි අරගෙන තිබුණේ. සමස්තයක් වශයෙන් හෙක්ටෙයාරයකට අඩුව තිබෙන කුඩා තේ හෝ පොල් හෝ රබර් ඉඩම් හිමියෙක් "කුඩා වතුහිමියෙක්" කියලා පිළිගෙන තිබෙනවා. එහෙමයි නම් කරලා තිබුණේ. අපි භාර ගන්න කොටත් තිබුණේ එහෙමයි. ඔබතුමා ඒක පිළිගන්නවා ඇති. නමුත්, ඒ විවිධාංගීකරණය වෙනස් කිරීමට අපි ක්‍රමවේදයක් අනුගමනය කරනවාද නැද්ද කියන එක තවත් ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක්. මම ඒක සම්පූර්ණයෙන්ම භාරගන්නේ නැහැ. නමුත්, අපි භාරගන්න කොටත් තමුන්නාන්සේලා කිව්වේ, තේ ක්ෂේත්‍රය කඩාගෙන වැටෙනවා; තේ ක්ෂේත්‍රය නැති වෙනවා කියලයි. එදා රුපියල් 380ට තිබුණු තේ කිලෝව දැන් රුපියල් 515 දක්වා වැඩිවෙලා තිබෙනවා. මේක market එකත් එක්ක යන ක්ෂේත්‍රයක්. විශේෂයෙන්ම අපට ලෝක ඛනිජ තෙල් මිල පාලනය කරන්න බැහැ. නමුත්, රබර් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා අපට තිබෙන සම්පත්වලින් කරන්න පුළුවන් දේවල් අපි කරනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු ඇමතිතුමනි, කුඩා තේ වතු හිමියන් විශාල පිරිසක් සිටින නිසා ඔවුන් සඳහා ඔබතුමන්ලා පොරොන්දු වුණු මුදල ලබාදෙන්න කටයුතු කරනවාද කියන කාරණය දැනගන්න කැමැතියි. ඒ වාගේම නැවත තේ වගාව ඇතුළු තේ වගාවේ කප්පාදු කිරීම් සියල්ල මේ වන විට නතර වෙලා තිබෙනවා. සෙස් බද්දෙන් ලබාගන්නා මුදල්වලින් නැවත වගාව සඳහා ආධාර ලබා දෙනවාද කියා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

එම B Leaf 60 programme එක යටතේ අපේ ආණ්ඩුවේ දින සියය වැඩ සටහන තුළයි එම ස්ථාවර මිල ලබා දුන්නේ. දින සියය තුළ විතරයි ඒක ලබා දුන්නේ. ඒක දීර්ඝ කරනවාය කියලා අපේ මැතිවරණ ප්‍රකාශයේ සඳහන් කළේ නැහැ. [බාධා කිරීමක්] ඔව්, ඔව්. අපි ඒක ලබා දුන්නා. ඒ සඳහා අපි රුපියල් බිලියන 6ක් වියදම් කළා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

දැන් නිෂ්පාදනය ඉතාම පහළ මට්ටමකට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා ඔබතුමන්ලා ගන්නා වූ ක්‍රියාමාර්ගය මොකක්ද? නැවත වගාව සඳහා ආධාර ලබා දෙන්න කටයුතු කරනවාද?

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ඒ ටික අපි ලබා දෙනවා. නැවත වගාව සඳහා රුපියල් ලක්ෂ 5ක් සහ අලුත් වගාවට රුපියල් ලක්ෂ 4ක් ලබා දෙනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
බොහොම ස්තුතියි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය රෝහල් : වෛද්‍යවරුන්ගේ හිඟය

அநுராதபுர மாவட்டக் கிராமிய வைத்தியசாலைகள் :மருத்துவர் பற்றாக்குறை

RURAL HOSPITALS IN ANURADHAPURA DISTRICT: DEARTH OF DOCTORS

721/'16

4. ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) මේ වනවිට අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ග්‍රාමීය රෝහල්වල වෛද්‍යවරුන්ගේ විශාල හිඟයක් පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් රෝගීන් විශාල දුෂ්කරතාවන්ට පත්වී සිටින බවත්;

(iii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉකිරිගොල්ලාව ග්‍රාමයේ මධ්‍යම බෙහෙත් ශාලාව බොහෝ කාලයක සිට වසා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වෛද්‍ය හිඟයක් පවතින ඉහත අ (i) හි සඳහන් රෝහල්වලට වෛද්‍යවරුන් පත්කරන දිනය කවරේද;

(ii) ඉකිරිගොල්ලාව මධ්‍යම බෙහෙත් ශාලාව ජනතාව සඳහා විවෘත කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது அநுராதபுரம் மாவட்டத்தின், கிராமிய வைத்தியசாலைகளில் மருத்துவர்களுக்கான பெரும் பற்றாக்குறை நிலவுகின்றதென்பதையும்;

(ii) அதன் காரணமாக நோயாளிகள் பெரும் சிரமங் களுக்கு உள்ளாகியுள்ளனர் என்பதையும்;

(iii) அநுராதபுரம் மாவட்டத்தின், மதவாச்சி பிரதேச செயலாளர் பிரிவில், இக்கிரிகொல்லாவ கிராமத் தில் மத்திய மருத்துவ நிலையம் பல காலமாக மூடப்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மருத்துவர் பற்றாக்குறை நிலவுகின்ற மேற்படி (i) இல் குறிப்பிடப்பட்டுள்ள வைத்தியசாலை களுக்கு மருத்துவர்கள் நியமிக்கப்படும் திகதி யாதென்பதையும்;

(ii) இக்கிரிகொல்லாவ மத்திய மருத்துவ நிலையம் மக்களுக்காக திறந்துவைக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware that -

(i) a great dearth of doctors prevail in the rural hospitals in Anuradhapura District;

(ii) the patients are faced with severe difficulties as a result; and

(iii) the central dispensary in the village of Ikirigollawa of the Medawachchiya Divisional Secretary's Division belonging to the Anuradhapura District has remained closed down for a long period of time?

(b) Will he inform this House -

(i) the date on which doctors will be appointed to hospitals mentioned in (a)(i) above where there is a dearth of doctors; and

(ii) the date on which Ikirigollawa Central Dispensary will be opened to the public?

(c) If not, why?

ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)

கௌரவ சபாநாயகர் அவர்களே, இஷாக் ரஹுமான் அவர்களின் கேள்விக்கு கௌரவ அமைச்சரின் சார்பாக நான் பதிலளிக்கின்றேன்.

(අ) (i) இல்லை.

(ii) எழவில்லை.

(iii) இக்கிரிகொல்லாவ கிராமத்தில் மத்திய மருத்துவ நிலையமொன்று இல்லை.

(ஆ) (i) மருத்துவர் வெற்றிடங்கள் நிலவுகின்ற வைத்திய சாலைகளுக்கு எதிர்காலத்தில் புதிய நியமனங் களை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப் பட்டுள்ளது.

(ii) எழவில்லை.

(இ) எழவில்லை.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

இக்கிரிகொல்லாவயில் மத்திய மருத்துவ நிலையத்துக்கான அனைத்து buildings உம் அந்த இடத்தில் இருக்கின்றன. நீங்கள் இல்லையென்று சொல்கிறீர்கள். உங்களால் அங்கு சென்று அதனைப் பார்க்க முடியும்.

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

எங்களுக்குத் தரப்பட்ட தரவுகளின்படி அவ்வாறான மருத்துவ நிலையமொன்று இல்லையென்றுதான் உள்ளது.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

தரவுகளைப் பார்த்து முடிவு சொல்லாமல், ஓர் உயரதி காரியை அங்கு அனுப்பி அதனைப் பார்த்தால் நல்லது என்று நான் நினைக்கின்றேன்.

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

அவ்வாறான நடவடிக்கையை எடுத்துப் பார்க்கலாம்.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

அங்கு hospital க்கான building அப்படியே இருக்கின்றது. நோயாளரும் இல்லை; doctor உம் இல்லை.

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

கௌரவ உறுப்பினர் அவர்களே, அதற்குரிய நடவடிக்கை களை நாங்கள் மேற்கொள்கின்றோம்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, එතුමා හොයලා බලනවා කිව්වා නේ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -732/'16- (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව: මූල්‍ය තොරතුරු

மத்திய வங்கியின் ஊழியர் சேமலாப நிதியத் திணைக்களம் : நிதித் தகவல்கள்

EPF DEPARTMENT OF CENTRAL BANK: FINANCIAL DETAILS

781/'16

7. ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් 31වන් අවසන් මුදල් වර්ෂය සඳහා ප්‍රසිද්ධ කරන ලද වැදගත් මූල්‍ය තොරතුරුවලට අනුව, 2014 සහ 2015 වර්ෂයන්හි;

(i) ශේෂපත්‍රගත දේපළ පිරියත හා උපකරණ වටිනාකම සහ ඇතිවූ වෙනස;

(ii) ශේෂපත්‍රගත සංචිත වටිනාකම සහ ඇතිවූ වෙනස;

(iii) මූල්‍ය වත්කම් හානිකරණය (ව්‍යාපාර කොටස්);

(iv) සාමාජිකයන්ට අනුමත නිවාස ණය පහසුකම් ප්‍රමාණය සහ වෙනස;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ) i, ii, iii සහ iv හි සඳහන් වෙනස කෙරෙහි බලපෑ හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) இலங்கை மத்திய வங்கியின் ஊழியர் சேமலாப நிதியத் திணைக்களம் 2015ஆம் ஆண்டு டிசம்பர் மாதம் 31ஆம் திகதியுடன் நிறைவு பெற்ற நிதி ஆண்டுக்காக வெளியிட்டுள்ள முக்கியமான நிதித் தகவல்களுக்கமைய 2014 மற்றும் 2015ஆம் ஆண்டு களில்,

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(i) ඉන්තොකෙයිල් කුරිප්පිටප්පට්ටුල්ල සොත්තුක් කළ්, පොරිත්තොකුතිකළ් මට්රුම් උපකරණ඙් කළින් පෙරුමති මට්රුම් ඒට්පට්ට මාට්රම්;

(ii) ඉන්තොකෙයිල් කුරිප්පිටප්පට්ටුල්ල ඔදුක්කු කළින් පෙරුමති මට්රුම් ඒට්පට්ට මාට්රම්;

(iii) නිතිච් සොත්තුක්කළ් පෙරුමතික් කුරෙප්පු (වර්ත්තක පඞ්කුකළ්);

(iv) අඞ්කත්තවර්කළුක්කු අඞ්කීකරික්කප්පට්ට වීට මෛප්පු කටන් වසතිකළින් අළවු මට්රුම් මාට්රම්;

එව්වළවෙන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) මේර්කුරිප්පිට්ට (අ) (i), (ii), (iii) මට්රුම් (iv) ඉල් කුරිප්පිටප්පට්ටුල්ල මාට්රත්තුක්කු ඒතුවාන කාරණඞ්කළ් යාවෛ එන්පතෛයුම් අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House, in accordance with the important financial details published for the year ended 31st December 2015 by the Employees' Provident Fund Department of the Central Bank of Sri Lanka-

(i) the value of property, plant and equipment given in the balance sheet and the difference;

(ii) the value of reserves given in the balance sheet and the difference;

(iii) deterioration of financial assets (business shares); and

(iv) amount of housing loans approved to the members and the difference;

in respect of the years 2014 and 2015?

(b) Will he also inform this House the reasons that caused the difference mentioned in the (a) i, ii, iii and iv above?

(c) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2014 වසරේ රුපියල් මිලියන 2,140 හා සසඳන කළ, 2015 වසරේ මෙහි වටිනාකම රුපියල් මිලියන 275ක් විය. මෙය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 1,865ක අඩුවීමකි.

(ii) 2014 වසරේ රුපියල් මිලියන 41,158 හා සසඳන කළ, 2015 වසරේ මෙහි වටිනාකම රුපියල් මිලියන 39,144ක් විය. මෙය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 2,014ක අඩුවීමකි.

(iii) 2015 වසරේදී මෙහි අගය රුපියල් මිලියන 2,957ක් විය.

(iv) 2014 වසරේ රුපියල් මිලියන 8,021 හා සසඳන කළ, 2015 වසරේ මෙහි වටිනාකම රුපියල් මිලියන 5,489කි. මෙය රුපියල් මිලියන 2,532ක අඩුවීමකි.

(ආ) ඉහත, (අ)(i), (ii), (iii) සහ (iv)හි සඳහන් වෙනස්කම් සඳහා බලපෑ හේතු:

(අ) (i)-ශේෂ පත්‍රගත දේපළ පිරියත හා උපකරණ වටිනාකම්:

"මෙහෙවර පියස" ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා සේවක අර්ථ සාධක අරමුදලින් දරන ලද වියදම, දේපළ පිරියත හා උපකරණවලින් ඉවත් කර ලැබිය යුතු ගිණුම යටතේ ගිණුම්ගත කිරීම මීට ප්‍රධාන හේතුවයි. මෙම ව්‍යාපෘති රජයේ ව්‍යාපෘතියක් ලෙස සලකා, මුදල් අමාත්‍යාංශය විසින් අරමුදල මඟින් දරන ලද වියදම ප්‍රතිපූරණය කිරීම එකඟවීම හේතුවෙන් මෙම ගිණුම් තැබීමේ වෙනස සිදු කරන ලදී.

(අ) (ii)- ශේෂ පත්‍රගත සංචිත වටිනාකම :

විකිණීම සඳහා තබා ගෙන ඇති ආයෝජනයන්හි (ලැයිස්තුගත කොටස් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල) සාධාරණ වටිනාකම අඩුවීම සහ මූල්‍ය වත්කම්වල හානිකරණය මෙම වෙනසට හේතු විය.

(අ) (iii) - මූල්‍ය වත්කම් හානිකරණය (ව්‍යාපාර කොටස්):

ඇතැම් සමාගම්හි ව්‍යාපාර කොටස් ආයෝජනවල සාධාරණ අගයේ අඛණ්ඩ පහළ යාම සලකා බලා, ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව රුපියල් බිලියන 2.9ක් 2015 දෙසැම්බර් 31 දිනට හානිකරණය කරන ලදී.

(අ) (iv) - සාමාජිකයන්ට අනුමත නිවාස ණය පහසුකම් ප්‍රමාණය සහ වෙනස:

2014 සහ 2015 වර්ෂයන්හි නිවාස ණය පහසුකම් සඳහා ඇප ආවරණ නිකුත් කිරීම්වල වටිනාකම පිළිවෙළින්, රුපියල් මිලියන 8,021ක් හා රුපියල් මිලියන 5,489ක් වූ අතර, නිකුත් කරන ලද ඇප සහතිකපත් ගණන 2014 වර්ෂයේදී 17,786ක් වූ අතර, එය 2015 වර්ෂයේදී 13,132 දක්වා පහත වැටුණි. මෙම පහත වැටීමට පැහැදිලි හේතුවක් සඳහන් කළ නොහැක.

(ඇ) පැන නොනඟී.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු රාජ්‍ය ඇමතිතුමා පැහැදිලි පිළිතුරක් ලබා දීම ගැන මම ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකම අඩුවීම් මෙහි සටහන් වන

විට, ඒ භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳව රාජ්‍ය ඇමතිතුමා දන්නවා. මේ රටේ විශාලතම ප්‍රශ්නය ඇති වුණේත් මේ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන්. 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී ඒ බැඳුම්කරවල වන අලාභය, රාජ්‍ය ඇමතිතුමා සතුව තිබෙන තොරතුරු අනුව, ඔබතුමාට නිශ්චිත වශයෙන් සඳහන් කරන්නට පුළුවන්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව තොරතුරු මේ අවස්ථාවේ මා සතුව නැහැ. ඔබතුමාට අවශ්‍ය නම්, ඒවා මහ බැංකුවෙන් ලබා ගෙන ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ලංකා ඉතිහාසයේ විශාලතම වංචාව ලෙස සැලකෙන මේ භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ වංචාව ගැන සොයා බලන්න කියලා ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කළා. නමුත් ඒ ගැන සොයා බැලුවේ නැහැ. මේ දක්වා ඒ බැඳුම්කර ගනුදෙනුවේ තත්ත්වය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට ඔබතුමා ඉදිරියේදී කටයුතු කරනවාද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, එතුමා කියනවා නම් සොයා බැලුවේ නැහැයි කියලා, ඒක සම්පූර්ණ අසත්‍යයක්. ඇත්තටම රජයක් වශයෙන් අපි ප්‍රකාශ කරලා තිබෙනවා මේ පිළිබඳව සොයා බලනවා කියලා. විශේෂයෙන්ම COPE එක මේ වන විට ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙමින් යනවා. නමුත් ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාට අපි සඳහන් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මේ ගනු-දෙනුව විතරක් නොවෙයි, ඔබතුමන්ලාගේ රජය යටතේත් ගත්ත සමහර සමාගම්,- විශේෂයෙන්ම සමාගම් කිහිපයක් තිබෙනවා. ඒ වාගේම ශ්‍රීලන්කන් ගුවන් සේවයට රුපියල් මිලියන 500ක්- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. මම කියන්නම්. ඔක්කොම කියන්න ඕනෑනේ. ඔබතුමන්ලා රුපියල් මිලියන 500ක්-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ඔබතුමා මොකක්ද කියන්නේ ගරු රාජ්‍ය ඇමතිතුමා?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

මම පිළිතුරු දෙනවා ගරු කථානායකතුමනි. ඔබතුමන්ලා ශ්‍රීලන්කන් ගුවන් සේවයට සභාපති කෙනෙක් පත් කරලා රුපියල් මිලියන 500ක් ආයෝජනය කළා. ඒ සභාපති ගුවන් සේවිකාවන් සමඟ හැම පඳුරක් ගාණේම පෙම් කෙළලා ආයතනය බංකොලොත් කළා. [බාධා කිරීම්] ඒ ආයතනය බංකොලොත් කරනකම් මෙතුමා කොහේද හිටියේ කියලා තමයි මම අහන්නේ? [බාධා කිරීමක්] දැන් මෙතැන වෙන එකක් කියනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමා, පිළිතුරු දෙන්න. දැන් පිළිතුරු දෙන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, රුපියල් මිලියන 500ක්; ඒක තමයි පිළිතුරු දුන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

Hon. Minister, now you can give the reply. - [*Interruption*.] I am ordering you. Please, give the reply now.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

Sir, I am giving the reply. ගරු කථානායකතුමනි, COPE එක ඉස්සරහා එතුමා අහපු කාරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් යනවා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවට එයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

හරි. That is his reply.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

පරීක්ෂණයක් යන්නේ නැහැ. මොකද, මහින්ද අමරවීර මහතා කැබිනට් අමාත්‍යවරයෙක් වශයෙන් මේ භාණ්ඩාගාර බැඳුම්කර සිද්ධිය පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් භාර දුන්නා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් මේ රටේ ආරක්ෂක ලේකම්වරයාට, ඒ වාගේම නාවික හමුදාවේ හිටපු නාවික හමුදාපතිවරුන් තිදෙනෙකුට නඩු පවරලා තිබෙනවා. නමුත් මේ විශාලම හොරකම පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කටයුතු කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

මේ ගැන පරීක්ෂණයක් පවත්වනවා කියලා COPE එක කියලා තිබෙනවා නේ ගරු මන්ත්‍රීතුමා. So, we will stop that.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

එතුමා අහගෙන හිටියා නම්, මම කිව්වේ COPE එක හරහා මේ පිළිබඳව දැන් පරීක්ෂණයක් පවත්වාගෙන යනවා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා. එතුමාට අහගෙන ඉන්න බැරි නම් මට කරන්නට දෙයක් නැහැ. නමුත් පසුගිය කාලයේ ශ්‍රීලන්කන් ගුවන් සේවය වැනි සමාගම්වල ආයෝජනය කරලා සිදු වුණු විශාල පාඩුවක් ගැන එතුමාට අමතකවීම අපටත් කනගාටුදායක කරුණක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

දෙවන වටය.

ජාතික පාසල් විදුහල්පති තනතුරු : පුරප්පාඩු
தேசியப் பாடசாலை அதிபர் பதவிகள் : வெற்றிடங்கள்
POSTS OF PRINCIPALS IN NATIONAL SCHOOLS: VACANCIES

780/'16

6. ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික පාසල් 150ට අධික සංඛ්‍යාවක් නිසි ලෙස පත් කරන ලද විදුහල්පතිවරුන් නොමැතිව ක්‍රියාත්මක වෙමින් පවතින බව හා එම පාසල්වල පරිපාලනය දරුණු ලෙස අවහිර වී තිබෙන බවත්;

(ii) මෙම ජාතික පාසල්වල විදුහල්පතිවරුන් ලෙස පත්කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සුදුසු ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති බවත්;

(iii) 2015 වර්ෂය අවසානයේදී අමාත්‍යාංශය මෙම කාර්යය සඳහා විභාගයක් පවත්වා ඇති බවත්;

(iv) විභාගයේ ප්‍රතිඵල මත 2016 මාර්තු මසදී අමාත්‍යාංශය සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බවත්;

(v) මෙම පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය විසින් මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිවරුන් පත් කිරීම ප්‍රමාද වීම සඳහා හේතු කවරේද;

(ii) අපේක්ෂකයන් විසින් ලබා ගන්නා ලද ලකුණු මත පදනම් වෙමින් එම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

asked the Minister of Education:

(a) Is he aware that -
(i) over 150 National Schools are functioning without properly appointed principals and the administration of those schools are severely handicapped;
(ii) the Ministry of Education has called for applications from suitable teachers to be selected as principals for those national schools;
(iii) the Ministry has conducted an examination for this purpose at the end of the year 2015;
(iv) the Ministry has held interviews in March 2016 based on the results of the examinations; and
(iv) so far, no action has been taken by the Ministry to fill these vacancies?

(b) Will he inform this House -
(i) reasons for the delay in appointing Principals; and
(ii) whether the necessary steps will be taken to fill those vacancies based on the marks obtained by the candidates?

(c) If not, why?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 150 இற்கும் மேற்பட்ட தேசிய பாடசாலைகள் முறையாக நியமிக்கப்படாத அதிபர்களுடன் தொழிற்படுவதுடன் அப்பாடசாலைகளில் நிர்வாகம் மிகவும் கடுமையாகப் பாதிக்கப் பட்டுள்ளது என்பதையும்;

(ii) அத்தேசிய பாடசாலைகளுக்கு அதிபர்களாகத் தெரிவு செய்யப்படக்கூடிய தகுந்த ஆசிரியர்களி டமிருந்து கல்வியமைச்சு விண்ணப்பங்களைக் கோரியது என்பதையும்;

(iii) 2015 ஆம் ஆண்டு இறுதியில் அமைச்சு இந் நோக்கத்திற்காகப் பரீட்சையொன்றை நடத்தி யது என்பதையும்;

(iv) பரீட்சைப் பெறுபேறுகளின் அடிப்படையில் 2016 மார்ச் மாதம் நேர்முகத் தேர்வுகளை அமைச்சு நடத்தியது என்பதையும்;

(v) இற்றைவரை இவ்வெற்றிடங்களை நிரப்பு வதற்கு அமைச்சினால் நடவடிக் கையெதுவும் மேற்கொள்ளப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அதிபர்களை நியமிப்பதில் ஏற்படும் தாமதத் திற்கான காரணங்கள் யாவையென்பதையும்;

(ii) பரீட்சார்த்திகளால் பெற்றுக்கொள்ளப்பட்ட புள்ளிகளின் அடிப்படையில் அவ்வெற்றிடங் களை நிரப்புவதற்கு அவசியமான நட வடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்ப தையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික පාසල් 150කට (එකසිය පනහ) අධික සංඛ්‍යාවක් නිසි ලෙස පත් කරන ලද විදුහල්පතිවරුන් නොමැතිව ක්‍රියාත්මක වුවද පුරප්පාඩු වී ඇති එම පාසල් සඳහා රාජකාරී ආවරණයට නිලධාරීන් පත් කර ඇති හෙයින් එම පාසල්වල පරිපාලන කටයුතු ගැටලුවකින් තොරව පවත්වා ගෙන යනු ලැබේ.

(ii) ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවා නැත. (ජාතික පාසල්වල විදුහල්පතිවරුන් ලෙස පත් කරනු ලබන්නේ අධ්‍යාපන පරිපාලන සේවයේ I /II/III ශ්‍රේණිවල නිලධාරීන් හා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පමණි.)

(iii) ඔව්.

(iv) ඔව්.

(v) විභාගයේ හා සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත දැනට සුදුසු නිලධාරීන් පත් කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) සම්මුඛ පරීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කර විදුහල්පතිවරුන් පත් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

(ii) විභාගයේදී ලබාගන්නා ලකුණු හා සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලද ලකුණු අනුව මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරගෙන යනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

උතුරු පළාතේ වෛද්‍ය මධ්‍යස්ථානවල සුළු සේවකයන් ස්ථිර කිරීම
வட மாகாண மருத்துவ நிலையங்களில் பணிபுரியும் கீழ்நிலைப் பணியாளர்களை நிரந்தரமாக்கல்
CONFIRMATION OF MINOR-GRADE EMPLOYEES IN MEDICAL CENTRES OF NORTHERN PROVINCE

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி! வடக்கு மாகாணத்தில் கஷ்டமான காலப் பகுதியில் அத்தியாவசியப் பணிகளுக்காக பல்வேறு அரச துறை சார்ந்த பல பணியாளர்கள் இணைத்துக் கொள்ளப் பட்டனர். இவ்வாறு பணிகளில் அமர்த்தப்பட்ட பலர் எதுவித கொடுப்பனவுகளையும் பெறாத நிலையில், தொண்டர் அடிப்படையிலேயே தங்களது பணிகளை மேற்கொண்டு வந்துள்ளனர். இவ்வாறானவர்களில் பலர் கடந்த கால கட்டத்தில் வெவ்வேறு துறைகள் சார்ந்த தற்காலிக, அமைய, குத்தகை மற்றும் நிரந்தர நியமனங்களில் தகைமைக்கு ஏற்ப அமர்த்தப்பட்டுள்ளனர். ஒரு சிலர், அவர்களுக்கான தகைமையினைப் பெறும் வகையில் கால அவகாசம் வழங்கப்பட்டு, மேற்படி பணிகளில் அமர்த்தப்பட்டமையும் குறிப்பிடத்தக்கது.

இந்தவகையில், வடக்கு மாகாணத்தில் மருத்துவ நிலையங்களில் பணிகளில் அமர்த்தப்பட்டுள்ள 820 கீழ்நிலைப் பணியாளர்கள் கஷ்டமான காலத்திலிருந்து இன்றுவரை நிரந்தர நியமனமோ, எதுவிதமான கொடுப்பனவுகளோ இன்றிப் பணியாற்றி வருகின்றனர். அரசாங்க பொது நிர்வாகச் சுற்றறிக்கை இலக்கம் 25/2014இன் பிரகாரம், கருணை அடிப்படையில் தற்காலிக ஊழியர்களுக்கு நிரந்தர நியமனம் வழங்கப்படலாம் எனத் தெளிவாகக் குறிப்பிடப்பட்டுள்ளபோதும், மேற்படி பணியாளர்களுக்கான நிரந்தர நியமனங்கள் இன்னமும் வழங்கப்படவில்லை. ஆனால், வடக்கு மாகாண மருத்துவ நிலையங்களில் வெற்றிடங்கள் காணப்படுகின்றன. இவ்விடயம் தொடர்பில் வடக்கு மாகாண முன்னாள் ஆளுநர் எச்.எம்.ஜி.எஸ். பளிஹக்கார அவர்களால் G/NPC/HG/Appointment எனும் இலக்கத்தையும் 09.02.2016ஆம் திகதியையும் கொண்ட கடித மொன்று சுகாதார அமைச்சுக்கும் திறைசேரிக்கும் அனுப்பி வைக்கப்பட்டுள்ளது என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மேலும், குறித்த 25/2014 இலக்கச் சுற்றறிக்கையின் 7வது பந்தியின் பிரகாரம், "தற்காலிக ஊழியர்களுக்கு நிரந்தர நியமனம் வழங்கும்பொருட்டு முகாமைத்துவ சேவைகள் திணைக்களத்தில் ஆளணிக்கும் அதற்கான நிதி ஒதுக்கீட்டுக்கு மான அனுமதியைப் பெறமுடியும்" எனக் குறிப்பிடப் பட்டுள்ளது. ஆகவே, -

வடக்கு மாகாணத்தில் மருத்துவ நிலையங்களில் கீழ்நிலைப் பணியாளர்களாகப் பணியாற்றி வருகின்ற 820 பேரின் பணிகளை நிரந்தரமாக்குவதற்கு ஆளணி அனுமதியையும் அதற்கான நிதி ஒதுக்கீட்டையும் மேற்கொள்வதற்கு நடவடிக்கை எடுத்து உதவ முடியுமா?

மேற்படி எனது கேள்விக்கான பதிலையும் எடுக்கப்படக் கூடிய நடவடிக்கையையும் கௌரவ நிதி அமைச்சர் அவர்கள் வழங்குவார் என எதிர்பார்க்கின்றேன். நன்றி.

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
ගරු කථානායකතුමනි, මෙම පිළිතුර දෙමළ භාෂාවට පරිවර්තනය කරන නිසා මම සිංහල භාෂාවෙන් කියවන්නම්.

2015 අය වැය යෝජනා අනුව, රාජ්‍ය අංශයේ තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට තීරණය කර ඇත. ඒ අනුව තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට 2014.11.12 දිනැතිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 නිකුත් කර ඇත. (පිටු අංක 3) * මේ සඳහා අංක අමප/14/1775/523/032 හා 2014.12.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ආවරණ අනුමැතියද ලැබී ඇත. (පිටු අංක 9)*

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 හි 02වන ඡේදය පරිදි තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත පහත සේවා ගණයන්ට අයත් තනතුරු දැරූ සේවකයින් සඳහා එකී චක්‍රලේඛ ප්‍රතිපාදනවලට යටත්ව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට හැකි විය.

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන (PL 01)/(U-PL 1)

(ආ) ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ ශිල්පීය (PL 02)/ (U-PL 2)

(ඇ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය (PL 03)/ (U-PL 3)

(ඈ) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන ඛණ්ඩ 02 (MN 01)/(U-MN 1)

(ඉ) කළමනාකරණ සහකාර - තාක්ෂණික ඛණ්ඩ 03 (MT 01)

(ඊ) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන C1 (MA 1-1)

(උ) කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන C2 (MA 1-2)

[ගරු රවි කරුණානායක මහතා]

03. එහෙත් ස්වේච්ඡා පදනම මත බඳවා ගනු ලබන සේවකයන් මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවේ.

04. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැතිව නිකුත් කර ඇති කාර්යපටිපාටික රීතින්හි III වැනි පරිච්ඡේදයේ 32 වගන්තිය අනුව "කිසිම තැනැත්තෙකු නිර්වේතනික පදනම මත හෝ ස්වේච්ඡා පදනම මත හෝ රජයේ සේවයේ තනතුරකට හෝ, රජයේ සේවයේ තනතුරු නාමයක් උපයෝගීකොටගෙන හෝ, රජයේ සේවය සඳහා හෝ පත් නොකළ යුතු වන්නේය." **(පිටු අංක 6)***

05. ස්වේච්ඡා පදනම මත සේවයේ යෙදවූ මෙම සේවකයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 මඟින් ආවරණය නොවන බැවින් ස්ථිර පත්වීම් ප්‍රදානය කළ නොහැක. මේ වන තෙක් කිසිදු අවස්ථාවක ස්වේච්ඡා පදනම මත සේවයේ යෙදවූ සේවකයින් ස්ථිර කර නොමැති අතර, එසේ කළහොත් එය රාජ්‍ය සේවයේ අහිතකර පූර්වාදර්ශයක් විය හැකිය. එසේම, මේ වන විට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014හි විධිවිධාන සපුරන ලද සියලුම සේවකයන්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කර ඇත. තවද, එම චක්‍රලේඛය මඟින් සලසන ලද ප්‍රතිපාදන අවලංගු කරමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014(II) නිකුත් කර ඇත. **(පිටු අංක 5)***

06. ඒ අනුව උතුරු පළාත් රෝහල්වල සුළු සේවකයන් ලෙස ස්වේච්ඡා පදනම මත සේවයේ යොදවා ඇති 820 දෙනා ස්ථිර කළ නොහැක. එබැවින්, මූල්‍ය ප්‍රතිපාදනවල අවශ්‍යතාවයක් ද පැන නොගනී.

But, Hon. Member, their jobs are safe. It will go on the same basis owing to a structural problem that we have.

අමුණා ඇති අංක සඳහන් ලේඛනවල පිටු **සභාගත*** කරමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අනුර කුමාර දිසානායක මහතා.

II

විශ්වවිද්‍යාල සිසුන් මර්දනය
பல்கலைக்கழக மாணவர்கள் மீதான அடக்குமுறை
SUPPRESSION OF UNIVERSITY STUDENTS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

මේ වන විට විශ්වවිද්‍යාල තුළ වර්ධනය වෙමින් යන මර්දනකාරී තත්ත්වය සම්බන්ධයෙන් ශිෂ්‍යයන් තුළ පැනනැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

පසු ගිය කාලය පුරා ලංකාවේ විශ්වවිද්‍යාල ගණනාවක වර්ධනය වෙමින් ආ ශිෂ්‍ය මර්දනකාරී පරිසරය මේ වන විට උත්සන්න තත්ත්වයකට පැමිණ ඇතැයි සරසවි සිසුන් විසින් චෝදනා කරමින් සිටිනවා. එවැනි තත්ත්වයක් දැන් තිබෙනවා. පසු ගිය 31 වැනිදා අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය සහ වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කම්ටුව ඒකාබද්ධව පවත්වන ලද උද්ඝෝෂණ පෙළපාළියට පොලීසිය විසින් කඳුළුගෑස් හා ජල ප්‍රහාර යොදා කරන ලද පහර දීමෙන් සිසුන් සිව්දෙනෙකුට රෝහල් ගතවී ප්‍රතිකාර ලැබීමට සිදුවීම මෙම තත්ත්වයේම තවත් දිගුවක් ලෙස සැලකිය හැකියි. එහිදී එක් ශිෂ්‍යාවකුට ශල්‍ය කර්මයක් පවා සිදු කර තිබුණා. ඒක ඔබතුමා දන්නවා. වත්මන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ශිෂ්‍යයින් මුහුණ දී සිටින කනගාටුදායක මර්දනීය තත්ත්වය මෙසේ සම්පිණ්ඩනය කර කියන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය සාරාංශ කර තමයි කියන්නේ. පත්ති තහනම් කිරීම ගත්තොත්; සබරගමුවේ ශිෂ්‍යයන් 26 දෙනෙක් ද, කොළඹ ශිෂ්‍යයන් 04 දෙනෙක්ද, කැලණියේ ශිෂ්‍යයන් 24ක්ද, මොරටුවේ ශිෂ්‍යයන් 25ක්ද, රජරට ශිෂ්‍යයන් 04 දෙනෙක්ද, පේරාදෙණියේ ශිෂ්‍යයන් 29 දෙනෙක්ද, එච්එන්ඩීඊ ආයතනයේ ශිෂ්‍යයන් 30 ක්ද ආදී වශයෙන් ශිෂ්‍යයන් 107 දෙනෙකුගේ පත්ති තහනම් කර තිබෙනවා. මට මතකයි, මීට කලින් පසු ගිය ආණ්ඩුවේ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා කිව්වා, ඔවුන් ශිෂ්‍යයෝ 1000ක් සිරගෙට යවන්නට ලැහැස්තියි, 2000ක් ගෙදර යවන්නට ලැහැස්තියි කියා. මේ පෙන්නුම් කරන සංඛ්‍යා ලේඛන අනුව දැන් ඒ ව්‍යාපෘතිය තමුන්නාන්සේලා පටන් අර ගෙන වාගෙයි. ඒ වාගේම නඩු පැවරීම් සහ සිරගත කිරීම්. සබරගමුවේ සිසුන් 28 දෙනෙකුට නඩු පවරා තිබෙනවා. එයින් කැලණියේ සිසුන් 24 දෙනෙක්. රුහුණේ සිසුන් 05 දෙනෙක් ආදී වශයෙන් සිදුවීම් 57ක් එක්කෝ නඩු පවරා තිබෙනවා. එක්කෝ සිරගත කර තිබෙනවා. ඔබතුමා දන්නවා, කැලණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවන් ගණනාවක් දින 75කට අධික කාලයක් රිමාන්ඩ් භාරයේ තැබූ බව. කල්පනා කර බලන්න. කෝටි ගණන් සොරකම් කරපු අය අද රිමාන්ඩ් භාරයට යනවා. පසුව දා එළියට එනවා. හැබැයි, ගරු කථානායකතුමනි, මේ සිසුන් දින 75ක් දිගින් දිගටම රිමාන්ඩ් භාරයේ තබා තිබුණා.

ඒ විතරක් නොවෙයි. මීට අමතරව සිසුන් හා ඔවුන්ගේ දෙමව්පියන් බිය වැද්දීමේ බියගුළු මෙහෙයුමක් ද ක්‍රියාත්මක වෙනවා. නිදසුනක් ලෙස සබරගමුව සරසවියේ සිසුන්ගේ නිවෙසට ගොස් තර්ජනය කිරීම් එකක්ද, - නිවෙස්වලට ගොස් තර්ජනය කරන්නට පටන් අරගෙන තිබෙනවා. - නිවෙස්වලට ගොස් තොරතුරු ලබා ගැනීම් දෙකක්ද, -නිවෙස්වලට ගොස් තොරතුරු අසන්නට පටන් ගෙන තිබෙනවා. මේවා අනියත බිය ගැන්වීම්.- ශිෂ්‍ය සංගමයේ නිලධාරීන්ට දුරකථනය මඟින් තර්ජනය කිරීම් 10ක්ද තිබෙනවා. මේ සියල්ල පැමිණිලි කර තිබෙනවා.

කැලණිය සරසවියේ පළමු වසර සහ දෙවන වසර සිසුන්ගේ නිවෙස්වලට කථා කර, දෙමව්පියන් බියවැද්දීම ඇතුළු තවත් සිදුවීම් දෙකක්ද, සියලු සිසුන්ගේ නිවෙස්වලට ලිපි යැවීමද -මේ ළමයින්ගේ ගෙවල්වලට වෙනම භය කරලා ලිපි යවනවා.- මොරටුව සරසවියේ අනතුරු ඇඟවීම් 09ක්ද, රජරට සරසවියේ පොලීසියට කැඳවීම් 01ක්ද, පොලීසිය නිවෙස්වලට ගොස් බියවැද්දීම් 02ක්ද, පේරාදෙණියේ සරසවියේ සිසු ක්‍රියාකාරීන්ගේ නිවාසවලට, දෙමව්පියන්ගේ රැකියා ස්ථානවලට බුද්ධි අංශ සාමාජිකයින් පැමිණීම හා දුරකථනයෙන් තර්ජනය කිරීම් 40කට වැඩි ප්‍රමාණයක්ද, වාර්තා වෙලා තිබෙනවා. ශිෂ්‍යයන්ට තර්ජනය කරනවා. ගෙවල්වලට ගොස් තර්ජනය කරනවා. දෙමව්පියන්ගේ රැකියා ස්ථානවලට ගොස් තර්ජනය කරනවා. තමුන්නාන්සේලා මේ මොකක්ද කරමින් තිබෙන්නේ? [බාධා කිරීමක්] ඔව්. තාත්තා කරපු දේවල් මගෙන් අහගන්න එපා. මහින්දසෝමව මම හොඳට දන්නවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එසේම කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ තුනකට වැඩි ගණනක ශිෂ්‍ය සංගම් පිහිටුවා ඇතත්, මහා ශිෂ්‍ය සංගමය නීත්‍යානුකූලව පිහිටුවීමට විද්‍යාලයීය පරිපාලනය ඉඩදී නැහැ. පරිපාලනය විසින් නීත්‍යානුකූල ශාස්ත්‍රපීඨ ශිෂ්‍ය සංගමය සමග ගනුදෙනු කිරීම ප්‍රතික්ෂේප කර, 2016.08.22 දින එය තහනම් කිරිමට කටයුතු කර තිබෙනවා. පේරාදෙණිය සරසවියේ පශු වෛද්‍ය, සම සෞඛ්‍ය , විද්‍යා යන පීඨවල ශිෂ්‍ය සංගම්වල ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරුන් ඉල්ලා අස්වීම තුළ එම ශිෂ්‍ය සංගම් අකර්මණ්‍ය වී තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි. ශිෂ්‍ය සංගම් අකර්මණ්‍ය කිරීමේ ක්‍රියාවලියකුත් මේ අතර දියත් වෙමින් තිබෙනවා.

විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර ක්‍රියාවලිය මෙසේ වන අතර, පසු ගිය වසරේ මාර්තු 31 වන දින සිට ශිෂ්‍ය උද්ඝෝෂණ සඳහා පොලීසිය යොදවා කරන ලද පහරදීම් සිදුවීම් 07ක් වාර්තා වෙනවා. එම සිදුවීම් පිළිවෙළින් මෙසේයි. 2015 මාර්තු 31 ගාස්තු අඩු කරන ලෙස විවෘත විශ්වවිද්‍යාලයේ සිසුන් කොළඹදී සිදු කරන ලද උද්ඝෝෂණයට පහර දීම. 2015 අප්‍රේල් බදවා ගැනීමේ කප්පාදුවට එරෙහිව අන්තර් විශ්ව විද්‍යාලයී භික්ෂු බල මණ්ඩලයේ උද්ඝෝෂණයට පහර දීම. 2015 ඔක්තෝබර් මාසයේ 29 දින උපාධි සමානකාමය ඉල්ලා එච්එන්ඩීඒ සිසුන් කොළඹ දී සිදු කරන ලද උද්ඝෝෂණයට පහර දීම. සිසුන් 5 දෙනෙක් අත් අඩංගුවට ගත්ත; සිසුන් 08 දෙනෙකු රෝහල් ගත කළා. 2016 නොවැම්බර් මාසයේ එච්එන්ඩීඒ සිසුන්ට පහරදීමට හා සයිටම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කරන ලෙස ඉල්ලා අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය විසින් සිදු කරන ලද උද්ඝෝෂණයට පහර දීම. 2016 අප්‍රේල් මාසයේ 28 මාලබේ සයිටම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කරන ලෙස ඉල්ලා වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව විසින් පවත්වන ලද උද්ඝෝෂණ පා ගමනට පහර දීම. සිසුන් කිහිප දෙනෙකු තුවාල ලබා රෝහල් ගත කිරීම. 2016 ජූනි මාසයේ 23 වනදා මාලබේ සයිටම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කරන ලෙස ඉල්ලා වෛදය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව විසින් පවත්වන ලද උද්ඝෝෂණ පා ගමනට පහර දීම. සිසුන් හත් දෙනෙකු රෝහල්ගත කළා. ආසන්නතම සිදු වීම හැටියට 2016 අගෝස්තු මාසයේ 31 වැනිදා මාලබේ 'සයිටම්' පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කරන ලෙස ඉල්ලා අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය හා වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව ඒකාබද්ධව පවත්වන ලද උද්ඝෝෂණ පා ගමනට පහර දුන්නා.

දැන් තමුන්නාන්සේලා මොකක්ද කරමින් සිටින්නේ? පා ගමන්වලට පහර දෙනවා, ගරු කථානායකතුමනි. සිසුන්ගේ ඔළු පළනවා; රෝහල්ගත කරනවා; අත් අඩංගුවට ගන්නවා; සිරගත කරනවා. මේ කරලා තිබෙන අපරාධවල හැටියට දැන් තමුන්නාන්සේ අධ්‍යාපන ඇමතිද, බන්ධනාගාර ඇමතිද කියලා දැන ගන්න මම කැමැතියි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
නිකම් ඔළු පළා ගන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි මා අපේක්ෂා කරනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
නිකම් ඔළු පළා ගන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ගහන්න ඕනෑ නේ? මේ, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්න ආපු මහත්වරු; යහ පාලනය ගැන කථා කරන්න ආපු මහත්වරු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නයක් අහනවා; ඇමතිවරයා උත්තරයක් ලබා දෙන්න බලාගෙන ඉන්නවා. ගරු ඇමතිතුමාගේ පිටු පසටවෙලා රූපවාහිනියට ඔළුව වැටෙන්න ඉන්න භූතයා කියනවා, "මේ ළමයින්ගේ ඔළු පළන්න ඕනෑ"ය කියලා. මොකක්ද, මේ? එතැනට ගිහිල්ලා වාඩි වෙනවා, රූපවාහිනියේ පෙනෙන්න. ලජ්ජයි! රූපවාහිනියේ පෙනෙන්න ඕනෑ නම් මොකක් හෝ වැඩක් කරන්න. ඇමතිතුමාගේ පිටු පසට ගිහිල්ලා වාඩි වෙන්න එපා, රූපවාහිනියේ පෙනෙන්න. ගිහිල්ලා මොනවා හෝ වැඩක් කර ගන්න. මොකක් හෝ වැදගත් වැඩක් කරලා රූපවාහිනියේ දමා ගන්න. ඇමතිතුමාගේ පිටු පසට ගිහිල්ලා වාඩි වෙනවා, රූපවාහිනියේ පෙනෙන්න. ලජ්ජයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ප්‍රශ්න අහන්න. අද වැඩ කටයුතු රාශියක් කරන්න තිබෙනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)
ඔබතුමා ප්‍රශ්නය අහන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න, ගරු මන්ත්‍රීතුමා. එතුමාට disturb කරන්න එපා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
මම ප්‍රශ්න ටික අහන්නම්.

01. විශ්වවිද්‍යාල අධ්‍යාපන පරිසරය වෙනුවට මර්දනකාරී පරිසරයක් ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින්නේ ඇයි?

එහෙම තත්ත්වයක් තිබෙන බව ඔබතුමා තේරුම් ගන්න, ගරු ඇමතිතුමා.

02. ආණ්ඩුවේ මැතිවරණ ප්‍රකාශයේදී, රටක් ගොඩ නැඟිය හැක්කේ අධ්‍යාපනයෙන් බවත්, ගුණ නැණ බල යන තුනෙන්ම පොහොසත් මානව හිතවාදී හැඟීමෙන් යුතු නිර්මාණාත්මක හා සෞන්දර්යාත්මක චින්තනයෙන් යුතු දරුවෙකු බිහි කිරීම පරමාර්ථය වන බවත් ප්‍රකාශ කළා. දැන් එවැනි තත්ත්වයක්ද මේ ඇති කරමින් තිබෙන්නේ කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

03. සියලු සරසවි සිසුන්ට එරෙහිව පොලීසිය විසින් ඉදිරිපත් කර ඇති නඩු ඉවත් කිරීමට කටයුතු යොදන්නේද?

[ගරු අනුර දිසානායක මහතා]

04. සරසවි සිසුන් සහ ඔවුන්ගේ දෙමව්පියන් බිය වැද්දීම නතර කිරීමට කටයුතු කරන්නේද?

05. සරසවි සිසුන්ට එරෙහිව පනවා ඇති පන්ති තහනම් ඉවත් කරන ලෙස අදාළ බලධාරීන්ට නියෝග කරනු ලබන්නේද?

06. සරසවි පද්ධතිය තුළ සාමකාමී ඉගෙනුම් පරිසරයක් ගොඩ නැඟීමට කටයුතු කරන්නේද?

ඒ වාගේම මා අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔකැන නැඟිටලා කථා කරනකොට අර ඔළු දෙක cover වෙන්නේ නැති වන විධියට කැමරාවට මුහුණ දෙන්න කියලා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම පොඩ්ඩක් පැත්තකට වෙන්නද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔබතුමා නියම ස්ථානයේ ඉඳගෙන පිළිතුරු ලබා දෙන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අපි ඉන්නේ ජ්‍යෙෂ්ඨයන්ගේ ආරක්ෂාවට.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමන්ලා ඉන්නේ අපේ ආරක්ෂාවට.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. සියලුම විශ්වවිද්‍යාලවල අධ්‍යාපන තත්ත්වය, ගුණාත්මක භාවය හා අධ්‍යාපනය ලබන පරිසරය වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් පසු ගිය වසර තුළ විශාල සම්පත් ප්‍රමාණයක් ආයෝජනය කර ඇත. කිසිදු විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් මර්දනය කිරීම පිණිස කිසිදු වැඩ පිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කර නැත. විශ්වවිද්‍යාලවල අධ්‍යාපන පරිසරය වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් සිසුන් කේන්ද්‍ර කර ගත් වැඩ පිළිවෙළක් පසු ගිය වසර තුළ දියත් කර ඇත. ඒ අනුව සියලුම විශ්වවිද්‍යාල සිසුන් සඳහා නව නේවාසිකාගාර ඉදිකිරීම, විශ්වවිද්‍යාල ගොඩනැගිලි, දේශන ශාලා, විද්‍යාගාර, පුස්තකාල ඇතුළු භෞතික පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්හට අධ්‍යාපන කටයුතු පහසු කර ගැනීම සඳහා laptop පරිගණක සඳහා ණය පහසුකම් ලබා දීම මෙන්ම සිසුන් සඳහා ලබා දෙන මහපොළ ශිෂ්‍යත්ව ආධාරය හා රජය මගින් ලබා දෙන ශිෂ්‍යාධාර පිළිවෙළින් රුපියල් 5,000 දක්වා හා රුපියල් 4,000 දක්වා වැඩි කිරීමට ක්‍රියා කර ඇත. එමෙන්ම සිසුන්හට රැකියා අරමුණු කර ගත් නව පාඨමාලා රාශියක් හඳුන්වා දීමටද, මේ වසරේ සිට විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 10කින් පමණ වැඩි කිරීමටද, විශේෂයෙන්ම තාක්ෂණික විෂයය ධාරාවෙන් උපාධි පාඨමාලා සඳහා මේ වසරේදී සිසුන් 1,850ක් පමණ අලුතින් ඇතුළත් කිරීමටද ක්‍රියා කර ඇත. එම වර්තමාන උපාධි පාඨමාලා, විෂයය, අන්තර්ගතයන් නවීකරණය කිරීමටද කටයුතු සැලසුම් කර ඇත. එමෙන්ම විශ්වවිද්‍යාල සිසුන්ට වඩා හොඳ අධ්‍යාපනයක් ලබා දීම පිණිස ආචාර්යවරුන්ටද විශ්වවිද්‍යාල තුළ හිතකර පරිසරයක් පැවතිය යුතුය. ඒ අනුව ආචාර්යවරුන්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීමේ සිට ආචාර්යවරුන්ගේත්, තමන්ගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති අවස්ථාව වැඩි කර දීම දක්වා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

විශ්වවිද්‍යාලය තුළ වඩා හොඳ හා සාමකාමී පරිසරයක් ඇති කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ සේවය කරන අනෙකුත් අනධ්‍යයන සේවකයන් විසින්ද ඉදිරිපත් කර ඇති විවිධ වෘත්තීය ගැටලු නිරාකරණය කිරීමට රජය මඟින් පසු ගිය වසර තුළ ක්‍රියා මාර්ග රාශියක් ගෙන ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල අධ්‍යාපන පරිසරයක් සංවර්ධනය කිරීම සඳහා රජය මඟින් විවිධ ප්‍රගතිශීලී ක්‍රියා මාර්ග ගෙන ඇති බව පැහැදිලි වනු ඇත.

විශේෂයෙන්ම රජය හා විශ්වවිද්‍යාල සිසුන් අතර කිසිදු පෞද්ගලික ගැටලුවක් නොමැති බව සඳහන් කළ යුතු අතර, විශ්වවිද්‍යාල තුළ සිදුවන හුදෙකලා සිද්ධීන් හුවා දැක්වීමෙන් සමස්ථ විශ්වවිද්‍යාල සිසු පරපුරටම සිදු වන මර්දනකාරී පිළිවෙතක් ලෙස අර්ථ කථනය කිරීම වැරදි කරුණකි. මෙයට අමතරව දේශපාලන අරමුණු පදනම් කරගෙන ක්‍රියාකාරකම්වල යෙදෙන සිසුන් අතළොස්සකගේ මෙහෙයවීම මත සිදු වන සමහර ක්‍රියාකාරකම් හේතුවෙන් බහුතරයක් වන අධ්‍යාපනයට ලැදි ශිෂ්‍ය ප්‍රජාවගේ අධ්‍යාපන කටයුතුවලට බාධා පැමිණීමේ අවස්ථාව උදා වී ඇත.

02. මැතිවරණ ප්‍රකාශයෙන් ප්‍රකාශයට පත් කළ පරිදි ගුණ, නැණ, බල යන කරුණුවලින් පොහොසත් මානව හිතවාදී නිර්මාණාත්මක චින්තනයෙන් යුතු සිසු පරපුරක් බිහි කිරීම සඳහා නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි. මෙම අරමුණු කරා ළඟා වීම පිණිස විවිධ පහසුකම් සහ පසු බිම් සකස් කිරීම සඳහා අඛණ්ඩ අයෝජනයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පමණක් නොව, සාමාන්‍ය අධ්‍යාපනය සඳහාද සිදු කිරීමට රජය සැලසුම් කර ඇත. කෙසේ වුවද, මෙවැනි අධ්‍යාපනයට ලැදි මානව හිතවාදී නිර්මාණාත්මක සිසු පරපුරක් බිහි කිරීමයි ගරු මන්ත්‍රීතුමා, අපේ අරමුණ. නිර්මාණාත්මක සිසුන් බිහි කරන්නේ. දැන් විශ්වවිද්‍යාලයේ සරච්චන්ද්‍රලා බිහි වෙන්නේ නැහැ නේ. දැන් සරච්චන්ද්‍රලා බිහි වනවාද? දැන් බිහි වෙන්නේ නැහැ. ඒකයි අපි කියන්නේ, නිර්මාණාත්මක සිසුන් බිහි කරන්න ඕනෑ කියලා, පෙළපාළි යන්නේ නැතිව.

03. පවත්නා නීති - රීතීන්ට එරෙහිව කටයුතු කරනු ලබන්නේ නම් ඕනෑම පුරවැසියකුට විරුද්ධව නීති මාර්ගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියා කිරීම සාමාන්‍ය කරුණකි. මෙය විශ්වවිද්‍යාල සිසුන්ටද පොදුය. ඒ අනුව සිසුන් වරදක් කර නොමැති බව ඔප්පු වුවහොත් අදාළ ආයතනය මඟින් සිසුන් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමා ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා, කුරුණෑගලට බස් 50ක් එව්වේ කවුද කියලා මම කියන්නම්. [බාධා කිරීම්] විපක්ෂයේ කණ්ඩායමක් කුරුණෑගලට බස් 50ක් එව්වා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ඒවා යටිකුට්ටු වැඩ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

05. කිසිදු සරසවි සිසුවකු හෝ දෙමව්පියෙකු බිය වැද්දීම සඳහා රජය මඟින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැති අතර, එවැනි බිය වැද්දීමක් කිරීමට රජයට අවශ්‍යතාවක්ද නොමැත. එසේ වුවද,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න. ඔබතුමන්ලා දිගින් දිගටම බාධා කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එසේ වුවද, සමහර දේශපාලන පක්ෂවලට හිතවත් ශිෂ්‍ය කණ්ඩායම් අනෙකුත් සිසුන් බියවද්දා තම කටයුතුවලට යොමු කර ගැනීමට ක්‍රියා කරන බවට තොරතුරු ලැබී ඇති අතර, එවැනි අවස්ථාවල එවැනි තර්ජනවලට ගොදුරු වූ සිසුන්හට සහන සැලසීමට විශ්වවිද්‍යාල පරිපාලනය ක්‍රියා කරනු ඇත.

05. සිසුන්ට එරෙහිව පනවා ඇති පන්ති තහනම් සම්බන්ධයෙන් කටයුතු කරනුයේ විශ්වවිද්‍යාලවල සනාතන සභා හා පාලක සභාව වන අතර, ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පනත යටතේ ඔවුන්ට බලතල ඇත.

06. සිසුන් අධ්‍යයන හා විෂය සමගාමී කටයුතු සඳහා යොමු කරවීමට උනන්දු කරවීම, අනෙකුත් පහසුකම් සැපයීම හා අධ්‍යයන කටයුතු සාර්ථකව කරගැනීම සඳහා සිසුන් සහ දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා කටයුතු කරනු ඇත. එමෙන්ම විශ්වවිද්‍යාල සිසුන් බාහිර දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සහ තමන්ගේ දේශපාලන මත ප්‍රකාශ කිරීම සඳහා යොදා නොගන්නා ලෙස එවැනි කටයුතුවල යෙදෙන පක්ෂවලින් ඉල්ලා සිටීමට මම කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි, ළමයි විශ්වවිද්‍යාලයට යන්නේ ඉගෙන ගන්නයි. එක්සත් ජාතික පක්ෂයටත් විශ්වවිද්‍යාලයේ සමිති නැහැ. විශ්වවිද්‍යාලයේ එවැනි සමිති හදන්න අපි කැමැත්තක්, රුචියක් දක්වන්නෙත් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් සමිති වැඩිය නැහැ නේ.[බාධා කිරීමක්] ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එවැනි සමිති වැඩිය නැහැ නේ. එක්සත් ජාතික පක්ෂයට එවැනි සමිති අඩුයි. නමුත් වෙලා තිබෙන්නේ, පාර්ලිමේන්තුවටවත් එන්න බැරි සමහර පක්ෂ විශ්වවිද්‍යාලයට ගිහිල්ලා වෘත්තීය සමිති හදා ගන්නවා. ඒ පක්ෂවලට අනුබල දෙනවා, පාර්ලිමේන්තුවේ ඇතුළේ ඉන්න සමහර පක්ෂයි. පසු ගිය දා පැවති විරෝධතා ව්‍යාපාරයට එක්තරා දේශපාලන පක්ෂයක් බස් 50ක් ඇරියා. බස් 50ක්!

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවුද කියන්න කෝ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක අපි හෙළිදරවු කරන්නම්. ඇත්ත වශයෙන්ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ඕනෑ සෑම දෙයක්ම දෙන්න දැන් - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමා නියමිත ස්ථානයේ නොවෙයි දැන් ඉන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට අවශ්‍ය සෑම දෙයක්ම දීලා තිබෙනවා. තවත් දෙන්න දෙයක් නැහැ. අනවශ්‍ය ප්‍රශ්න බදාගෙන තමයි දැන් විරෝධතා ව්‍යාපාර ඇති කරන්නේ. දැන් බලන්න, SAITM එක ගැන. SAITM එක ආපස්සට හරවන්න පුළුවන්ද? ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, දීපු දෙයක් ආපහු ගන්න පුළුවන්ද කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දීලා නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
SAITM උපාධිය පසු ගිය ආණ්ඩුව කාලයේදී පිළිඅරගෙනයි තිබුණේ. ඒක අපිට අවලංගු කරන්න පුළුවන්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජනසතු කළා නම් ඉවරයි නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ පසු ගිය ආණ්ඩුව ඒක පටන් ගත්තේ ජනසතු කරන්නද? ජනසතු කරන්න ඕනෑ නම්, ඒක ආණ්ඩුවෙන්ම පටන් ගන්න තිබුණා නේ. ඇයි ඔබතුමන්ලා පෞද්ගලික විශ්වවිද්‍යාලයක් ආරම්භ කළේ? [බාධා කිරීමක්] නිකම් ඉන්න, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා ආණ්ඩුවේ ඉන්න කොට කරන්නේ එකක්; විපක්ෂයට ගියාම කියන්නේ තවත් එකක්. [බාධා කිරීම්] ලජ්ජා නැතිව තව කියවනවා. ඔබතුමන්ලාට ප්‍රතිපත්තියක් නැහැ; ස්ථාවරයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා පිළිතුර ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම එකක් කියන්නම්. SAITM එක අපට අහෝසි කරන්න බැහැ. ඒක අපි කරන්නෙක් නැහැ. මොකද, ඒක පසු ගිය ආණ්ඩුව කාලයේදීයි පටන් ගත්තේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ පොඩ්ඩක් අහගෙන ඉන්න ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා තමයි ඒක පටන් ගත්තේ. නමුත්, පළමුවෙනි වතාවට අවසාන විභාගයෙන් ශිෂ්‍යයන් pass වුණේ අපේ ආණ්ඩුව කාලයේදීයි. ඉතින්, අපට ඒ SAITM එක අහෝසි කරන්න බැහැ. ඒක අහෝසි කළොත් අපට උසාවි යන්න වෙනවා. උසාවිය කියයි මේක අහෝසි කරන්න බැහැ කියලා. මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, මේ SAITM එකේ ප්‍රශ්නය විසඳන්න අපට උදව් කරන්න කියලායි. Please help us. [බාධා කිරීම්] ඒක තමයි. තමුන්නාන්සේලා කැමැතිද public-private partnership එකකට? [බාධා කිරීම්] නැහැ. නැහැ. ඒක තමයි. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන්නේ, රාජ්‍ය අංශයයි, පෞද්ගලික අංශයයි දෙකම එකතු වී වැඩ කිරීමයි. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා public-private partnership එක ගැන. රජයයි, පෞද්ගලික අංශයයි එකට වැඩ කරන ක්‍රමයකට අපි මෙම විශ්වවිද්‍යාලය පරිවර්තනය කරමු. ඒක තමයි රටට හොඳ. මම විශේෂයෙන්ම, අපේ ගරු අනුර දිසානායක මැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ඇමතිතුමාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා අපට සහයෝගය දෙන්න. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පැහැදිලි කර ගැනීමක්. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් අමාත්‍යතුමා කිව්වානේ, දේශපාලන පළිගැනීම්, දේශපාලන ක්‍රියාකාරකම්, ශිෂ්‍යයන්ගේ නුරුස්නා හැසිරීම් යනාදී දේවල් තමයි මේවාට හේතු සාධකයන් වෙලා තිබෙන්නේ කියලා. මම ඔබතුමාට එක් කරුණක් පෙන්වන්නම්. මේ, එස්. ස්වර්ණ කිත්සිරි, ශිෂ්‍ය අංකය, 2003/බී.ඒ.19424. ඔහුගේ පන්ති තහනම් කරලා තිබෙනවා. මම ඒකට හේතුව කියන්නම්. "ශාස්ත්‍ර පීඨයේ ජ්‍යෙෂ්ඨ සිසුන්හට බදාදා දින පමණක් ශිෂ්‍ය ක්‍රියාකාරකම්වල නිරතවීමට අවසර ලබා දී තිබියදී සිකුරාදා දින රැස්වීමක් පැවැත්වීමෙන් ඉහත නීති රීතින් 2 කොටසේ 4වෙනි වගන්තියට ගැනෙන විෂමාචාරයක් කර ඇති බවට" යනුවෙන් සඳහන් කර තිබෙනවා. මොකක්ද මේ ශිෂ්‍යයෙකුට, ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලට බදාදා දුන්නා, සිකුරාදා යෙදුණා කියලා පන්ති තහනම් කරන සිද්ධිය?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම මේ සිද්ධිය ගැන දන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය ඇහුවා එතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මට ලැබුණු තොරතුරු අනුව, මේ ශිෂ්‍යයා නවක වදය සංවිධානය කරමින් ඉඳලා තිබෙනවා. නවක වදය නීති විරෝධියි. [බාධා කිරීමක්] ඔබතුමා කිවුව ඒ කාරණය ගැන මට තොරතුරු ලැබුණා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අමාත්‍යතුමනි, කොයි විශ්වවිද්‍යාලයේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙය උසාවියක් නොවෙයි, හරස් ප්‍රශ්න අහන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුරු දීම දැන් අවසන් කරන්න. අද දින වැඩ කටයුතු හුඟක් ප්‍රමාද වෙලා තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පසු ගිය දා පැවති විරෝධතා ව්‍යාපාරයට බස් 50ක් යැව්වා. කවුද මේවා කරන්නේ?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
කවුද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
කවුද මේවා කරන්නේ? දැන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ප්‍රශ්න නැහැ. SAITM එක විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට බලපාන්නේ කොහොමද? අධ්‍යාපන ප්‍රතිපත්තිය තීරණය කරන්නේ ආණ්ඩුව.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පාසල් ශිෂ්‍යයන්ට බලපානවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல්ல)
(The Hon. Lakshman Kiriella)
අධ්‍යාපන ප්‍රතිපත්තිය තීරණය කරන්නේ ආණ්ඩුව මිස ශිෂ්‍යයන් නොවෙයි. ඒක මතක තියාගන්න. ආණ්ඩුවයි එය තීරණය කරන්නේ. පසු ගිය ආණ්ඩුව කාලයේ SAITM එක ආරම්භ කරන්න ඕනෑ කියා ඔබතුමන්ලා තීරණය කළා. අපි එය පිළිගන්නවා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එය ජනසතු කරනවාද, නැද්ද කියා කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමන්ලාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ නේ. ඔබතුමන්ලාට එක ප්‍රතිපත්තියක් නැහැ. ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට එක ප්‍රතිපත්තියක්; විපක්ෂයට ගිය විට තවත් එකක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එය ජන සතු කරනවාද, නැද්ද? එච්චරයි අහන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා අවසාන වශයෙන් කියනවා, පාර්ලිමේන්තුවට මෙයට විසඳුමක් දෙන්න බැරි නිසා -[බාධා කිරීමක්] එය පටන්ගත් අයත් දැන් ඒකට විරුද්ධයි නේ. ඉතින් කොහොමද විසඳුමක් දෙන්නේ? පටන්ගත් අයත් දැන් විරුද්ධයි. මෙතුමන්ලාත් විරුද්ධයි. මේ කාරණය දැන් අධිකරණයට ගිහින් තිබෙනවා; this matter is before the court. SAITM එකේ උපාධිය ලබාගත් ශිෂ්‍යයෙක් වෛද්‍ය සභාවේ ලියා පදිංචිය ඉල්ලුවා. වෛද්‍ය සභාව කිව්වා, "ලියා පදිංචිය දෙන්න බැහැ" කියා. දැන් ඒ ශිෂ්‍යයෝ උසාවියට ගිහින් තිබෙනවා. ඔක්තෝබර් මාසයේ ඒ නඩුව අහනවා අවසානයක් දක්වා; it will be a trial to a finish. එහි තීන්දුව දේවි. අපි තීන්දුව දෙන කල් ඉඳිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා කියා කිව්වා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 126 යටතේ කාරක සභා පිළිබඳව දක්වා තිබෙනවා. මා මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. ඊයේ දිනයේදී අපේ මෙස උඩ තබා තිබුණා COPE එකේ වාර්තාව. එම වාර්තාව, "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් අගෝස්තු මස 09වන දින ඉදිරිපත් කරන ලදී" කියලායි සඳහන්ව තිබෙන්නේ. මේ රටත්, අපත්, පාර්ලිමේන්තුවත් - සියලුදෙනා- බලාගෙන සිටියා භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ සිද්ධිය ප්‍රධානම දෙය ලෙස සලකා මේ වාර්තාවේ ඇතුළත් වේවි කියා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
That is not over.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඉස්සර වෙලා මා කියන එක අහගෙන ඉඳලා ඔබතුමාගේ උත්තරය දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
COPE එක දැන් පරීක්ෂණ කරගෙන යනවා. අද දෙවතාවක් ඒ ගැන කියැවුණා, ගරු මන්ත්‍රීතුමා. අග්‍රාමාත්‍යතුමාගෙන් අහපු ප්‍රශ්නයකට ලබා දුන් පිළිතුරකත් COPE එක පරීක්ෂණ කරගෙන යන බව කියා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එතුමා කියපු කාරණයට මා විරුද්ධ වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You raised the question and the reply is, it is under investigation.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමාට විගණකාධිපතිතුමාත් ඒ පිළිබඳ වාර්තාවක් දුන්නාට පසුව මන්ත්‍රීවරුන් ලෙස අපට ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න අයිතියක් තිබෙනවා, "ඒ වාර්තාව සභාපතිතුමාට කියා හැකි ඉක්මනින් මේ ගරු සභාවට ඉදිරිපත් කරවන්න" කියා. නමුත් අපට දැනගන්න ලැබී තිබෙන අන්දමට, සභාපතිතුමාටත් එහි කටයුතු කර ගෙන යන්න බැරි ආකාරයට විවිධ බාධා කිරීම් ඇති වී තිබෙනවා. ඒ වාගේම එම කමිටුවේ සාමාජිකයන් වෙනස් කරලා මේවා යට ගැසීම සඳහා වන උත්සාහයක් දිගින් දිගටම පවතිනවා. ඒ නිසායි, මම මේ ප්‍රශ්නය මතු කරන්නේ. ගරු කථානායකතුමනි, කරුණාකර ඔබතුමා මෙම ප්‍රශ්නයට මැදිහත් වෙන්න. විගණකාධිපතිතුමා වාර්තාවක් දුන්නාට පසුව තව මොනවාද ඒකේ විභාග කරන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. කෝප් කමිටුවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා පිළිතුරු දෙන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ඉදිරිපත් කර තිබෙන මෙම වාර්තාව මාස දෙකක කාලයක් සඳහා වන අතුරු වාර්තාවක්. මෙම අතුරු වාර්තාවේත් 70, 71 සහ 72 පිටුවල බැඳුම්කර ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඒ වනවිට තිබුණු තත්ත්වය පිළිබඳව ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඊට අමතරව නිශ්චිතව බැඳුම්කර ගනු - දෙනුව සම්බන්ධයෙන් ඇති වුණු සියලුම කාරණා, ඇමුණුම් සියල්ල සහිතව මේ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව කාල සටහනක් සකස් කර තිබෙනවා. ඔක්තෝබර් මාසයේ 13වැනි දා වෙනකොට ඒ සම්බන්ධ සම්පූර්ණ වාර්තාව සකස් කරලා අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා වන කාල රාමුවක් සකස් කරලා තිබෙනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගරු කථානායකතුමනි, කිසිදු බාධාවකට හෝ කිසිදු බලපෑමකට යටත් නොවී -එය අදාළ වෙන්නේම නැහැ- කාරක සභාව හැටියට එම වාර්තාව ඉදිරිපත් කරනවා. එම වාර්තාවේ තිබෙන කරුණුවලට එකඟ නොවෙනවා නම්, එකඟ වෙනවා නම් ඒ පිළිබඳව විවාදයක් මේ පාර්ලිමේන්තුවට කරන්න පුළුවන්. එම වාර්තාවේ කාරණා සම්බන්ධයෙන් ගන්නා තීරණය ගැන පාර්ලිමේන්තුව තමයි ඊළඟට තීරණය කළ යුත්තේ. පාර්ලිමේන්තුව තුළින් කෝප් කමිටුවට පැවරෙන බලය අනුව, ව්‍යවස්ථාවෙන් පැවරී තිබෙන බලය අනුව කිසිදු බාධාවකින් තොරව ඒ සම්බන්ධව කටයුතු කරනවා. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමන්ලා නියෝජනය කරන නියෝජිතයනුත් එම කාරක සභාවේ ඉන්නවා. ඒ අයටත් පුළුවන්, සම්පූර්ණ වශයෙන් ඒ සඳහා මැදිහත් වෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, මම එම වාර්තාව සම්බන්ධයෙනුත් මහ බැංකුවේ අධිපතිතුමාගේ අදහස් විමසුවා. එතුමාගේ එකඟත්වය අද මට ලැබුණා. ඒ අනුව මම එය තමුන්නාන්සේට ලබා දීමට කටයුතු කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙහෙම ගියොත් තව කවුරු හරි නැඟිටලා අහන්න පුළුවන්, "වතු වැවිලි සමාගම් ගැන කථාවක් තිබුණා. ඒවා මේකේ නැහැ නේ" කියා. තවත් කවුරු හරි නැඟිටලා අහන්න පුළුවන්, "හෙජින් ගැන තිබුණා. ඒවාත් මේකේ නැහැ නේ" කියා. ඔය විධියට එක එක ඒවා අහන්න පුළුවන්. ඒ නිසා තමයි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂවල නියෝජිතයන්ගෙන් කෝප් සභාව සමන්විත වී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, එම නියෝජිතයන්ගේ වගකීම තමයි සිද්ධ වන්නේ මොකක්ද කියන එක ගැන එම පක්ෂ දැනුවත් කරන එක. අපේ පක්ෂයේත් නියෝජිතයන් ඉන්නවා නම් එම නියෝජිතයන්ගේ වගකීම තමයි, සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක සම්බන්ධව අපේ පක්ෂය දැනුවත් කරන එක. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමන්ලාගේ කණ්ඩායමකුත් එම කාරක සභාවේ ඉන්නවා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීවරයාත් ඒ කාරක සභාවට සභාගී වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, ඒ නිසා ඔබතුමා ඉස්සෙල්ලා එතුමාගෙන් අහන්න. මොකද, ඒ ඔක්කෝම ඉන්න තැන තමයි මේ කාරක සභාව පවත්වාගෙන යන්නේ. මේක හරි වැදගත්. මෙතැන වෙන වෙන "ගේම්" හදන්න සූදානම් වන්න එපා. මොකද, ලබන මාසයේ 13වැනි දා වනවිට එම වාර්තාව සකස් කර අවසන් කිරීම සඳහා සියලු නියෝජිතයන් සිටි සභාවකදී ඉතා පැහැදිලිව කාල සටහනක් හදා ගෙන තිබෙනවා. Road map එකක් හදා ගෙන තිබෙනවා, මහ බැංකු අධිපතිතුමා හෙට ගෙන්වනවා; ඊට පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා; ඊටත් පසුව වාර්තාවක් සකස් කරනවා යනාදී වශයෙන්. එසේ වාර්තාවක් සකස් කර එම අවසන් වාර්තාව ඔක්තෝබර් මාසයේ 13වැනි දා භාර දෙන්න එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. එහෙම ක්‍රියාවලියක් පවතිනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, එම ක්‍රියාවලිය පිළිබඳව ගැටලුවක් තිබෙනවා නම් එම කාරක සභාව නියෝජනය කරන එම පක්ෂවල නියෝජිතයන්ගෙන් ඒ සම්බන්ධව අහන එකයි කළ යුත්තේ. ඔවුන්ගේ වගකීම විය යුත්තේ එයයි. එහෙම නැතුව එක පාරටම උඩින් කඩා පහත් වුණා වාගේ එක එක ඒවා අහන එක සාධාරණ නැහැ. මොකද, මෙම වාර්තාව ඉතා පැහැදිලිව ඉදිරිපත් කර තිබෙනවා. මහ බැංකුව පිළිබඳවත්, ඒ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳවත් ඉදිරිපත් කර තිබෙන නිර්දේශයන් මේ වාර්තාවේ තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි. අපි කෝප් කමිටුවේ සභාපතිතුමාට එම කටයුතු කිරීමට අවස්ථාවක් දෙනවා. ඔක්තෝබර් මාසය දක්වා කල් දෙන්න පුළුවන්.

ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාට මතක් කරන්න කැමැතියි, ආණ්ඩුවට හංගන්න දෙයක් නැහැ කියන එක. ඒකයි අපි විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් ගරු හඳුන්නෙත්ති මැතිතුමා කෝප් සභාවේ සභාපති බවට පත් කළේ. අපට හංගන්න දෙයක් නැහැ. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැවැති කාලයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් තමයි එම කාරක සභාවේ මූලාසනය දැරුවේ. ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පත් කළේ, ඔක්කෝම හංගන්න ඕනෑ නිසායි. අපි විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු පත් කර තිබෙනවා. අපට හංගන්න දෙයක් නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි කෝප් කමිටුවේ සභාපතිතුමාගේ පැහැදිලි කිරීම පිළිගනිමු. ඒක සාධාරණයිනේ. ඔක්තෝබර් මාසය වෙනකොට එම වාර්තාව ඉදිරිපත් කරාවි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය වෙන ප්‍රශ්නයක් වාගේ නොවෙයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, අපි දැන් මෙම කාරණාව අවසන් කරමු. තීරණයක් ලැබුණානේ. ඔබතුමාට තවත් කියන්න දෙයක් තිබෙනවා නම් කියන්න. ඊට පසුව අපි මේ කාරණය අවසාන කරමු.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මැතිවරණයට කලින් ගරු අග්‍රාමාත්‍යතුමා මේ රටට ප්‍රතිඥාවක් දුන්නා මේ බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් ලබා දෙන බව. අපි තේරීම් කාරක සභාව නොඉල්ලා සිටියේ, කෝප් කමිටුව පිළිබඳව විශ්වාසය තියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔක්තෝබර් මාසයේ අවසන් වාර්තාව ලබා දෙනවානේ. අපි ඒක පිළිගනිමු. ඒ නිසා දැන් ඒ ගැන වාද-විවාද කිරීමට අවශ්‍ය වෙන්නේ නැහැ. That is the final decision.

ගරු මුදල් අමාත්‍යතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදී ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා ප්‍රශ්නයක් අසා තිබුණා, කිසිම අදාළත්වයක් නැතුව. එම ප්‍රශ්නය අසා තිබුණේ, ප්‍රශ්නයක් ඇති කරන ආකාරයෙනුයි. ඒ නිසා මම හිතුවා ඒකට උත්තරයක් දිය යුතුයි කියා. එතුමා ඊයේ අහපු අතුරු ප්‍රශ්නයකින් කියා තිබුණා, ආදායම් දෙපාර්තමේන්තුවේ යම් යම් අය ලෙඩ වෙලා තිබෙනවාය කියා. ඒ වාගේ ප්‍රකාශ කරන්න එතුමා ලෙඩ වෙලා ඇති. කවුරුවත් ඒ වාගේ ලෙඩ වෙලා නැහැ. ඒ ගොල්ලන් ලෙඩට වැටුණොත් සදාකල්ම ලෙඩ වෙලා ඉන්න පුළුවන් තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපි මේ අවස්ථාවේදී විතරක් නොවෙයි, මෙතැන පෙන්වලා තිබෙනවා,- [බාධා කිරීමක්] අහගෙන ඉන්න කෝ. කියලා තිබෙනවා, විදේශීය අයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කටයුතු භාර දීලා තිබෙනවා කියලා. මේ වාගේ වැඩ කළේ මහින්ද රාජපක්ෂගේ කාලයේ. විදේශ කටයුතු අමාත්‍යාංශයේ කටයුතු ඒ කාලයේ කළේ සුද්දන්ට භාරදීලා. අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේත් පාලනය යටතේ ඒවා වෙන්නේ නැහැ. බොහොම විනිවිදභාවයෙන් අපි කථා කරලායි ඒ වැඩ කටයුතු කරලා තිබෙන්නේ. අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා, අපේ ආදායම වැඩි කර ගන්නේ කොහොමද කියලා. අද ආදායම සියයට 49කින් වැඩි වෙලා තිබෙන්නේ නිකම් නොවෙයි; පොල් ගාලා නොවෙයි. පිරිසිදු පාලනයක් තිබෙන නිසා තමයි විනිවිදභාවයෙන් කටයුතු කරලා තමයි මෙවැනි වර්ධනයන් ලබා ගෙන තිබෙන්නේ.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்
NATION BUILDING TAX (AMENDMENT) BILL

"Bill to amend the Nation Building Tax Act, No. 9 of 2009."

පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා විසිනි.

2016 සැප්තැම්බර් මස 20 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 செப்ரெம்பர் 20, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Ravi Karunanayake, Minister of Finance;
to be read a Second time upon Tuesday, 20th September, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

මෝටර් වාහන පනත: නියෝග
மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதிகள்
MOTOR TRAFFIC ACT: REGULATIONS

I

[අ.භා. 2.47]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් නියෝගය ඉදිරිපත් කරනවා:

"2016 ජූනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

2015.11.02 දිනැති හා අංක 1939/4 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති 2015 අංක 01 දරන මෝටර් වාහන (රියැදුරු පාසල්, රියැදුරු උපදේශක සහ සහකාර රියැදුරු උපදේශක) නියෝග හඳුන්වා දීමට ප්‍රථම රියැදුරු පාසල් හා රියැදුරු උපදේශකවරුන් නියාමනය 1991.06.05වන දින ප්‍රකාශයට පත් කර තිබූ අංක 665/6 දරන 1990 මෝටර් වාහන (රිය පැදවීමේ පාසල් සහ රිය පැදවීමේ උපදේශක) නියෝගවලට අනුකූලව සිදු විය යුතුව තිබුණා. 2009 අංක 08 දරන මෝටර් වාහන සංශෝධන පනත මඟින් මෝටර් වාහන පනතේ 139 වගන්තිය සංශෝධනය කරමින් රියැදුරු පාසල්, රියැදුරු පුහුණු උපදේශක සහ සහකාර රියැදුරු පුහුණු උපදේශකවරුන් සම්බන්ධ ප්‍රතිපාදන පුළුල් කර ඇත. ශීඝ්‍රයෙන් ඉහළ යන රථ වාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අතුරු ව්‍යවස්ථාවේ 12 ආ 10.1 ඡේදය මඟින් රියැදුරු පාසල් හා රියැදුරු පුහුණුව අධීක්ෂණය හා නියාමනය කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරමින් මෝටර් වාහන (සංශෝධන) පනතෙන් හඳුන්වා දී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව ඒ වන විට ක්‍රියාත්මක වූ 1990 මෝටර් වාහන (රිය පැදවීමේ පාසල් සහ රිය පැදවීමේ උපදේශක) නියෝග අවලංගු කරමින් හා අංක 1939/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති 2015 අංක 01 දරන මෝටර් වාහන (රියැදුරු පාසල්, රියැදුරු පුහුණු උපදේශක සහ සහකාර රියැදුරු පුහුණු උපදේශකවරුන්) නියෝග යොදා ඇත.

එම නියෝගවල 2වන වගන්තිය අනුව සෑම රියැදුරු පාසලක්ම 3වන වගන්තියෙහි දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නිශ්චිත ප්‍රමිතියකට අනුව ඒ, බී හා සී ලෙස ප්‍රභේදනය කර ඇති අතර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කළ යුතුව තිබෙනවා. මෙම රියැදුරු පාසල් වර්ගීකරණයට අනුව ලියාපදිංචි කිරීමේ ගාස්තු නියම කර ඇති අතර වසර දෙකකට වරක් නියමිත ගාස්තුව ගෙවීමෙන් අනතුරුව අලුත් කර ගත යුතුව තිබෙනවා.

රියැදුරු පාසලක තිබිය යුතු ඒ ඒ වාහන වර්ගවලට අයත් වාහනවල අවම සංඛ්‍යාව, රියැදුරු උපදේශකවරුන්ගේ අවම

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සංඛ්‍යාව, සහාය උපදේශකවරුන්ගේ සංඛ්‍යාව විෂය නිර්දේශය හා ක්‍රමවේදය සහ රියැදුරු පාසල්වල ප්‍රමිතිය නියාමනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද මෙම නියෝග මගින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

රියැදුරු පාසලක සේවය කරනු ලබන රියැදුරු උපදේශකවරුන් ඒ, බී හා සී වශයෙන් ඔවුන් සතුව ඇති උපදේශක බලපත්‍රයේ ස්වභාවය අනුව වර්ගීකරණය කර තිබෙනවා. සහකාර රියැදුරු උපදේශකවරුන් සඳහාද වෙන්වූ වර්ගීකරණයක් මෙම නියෝග මගින් හඳුන්වා දී තිබෙනවා.

රියැදුරු උපදේශකවරුන්, සහාය රියැදුරු උපදේශකවරුන් වෙනුවෙන් උපදේශක බලපත්‍ර ලබා දීම සහ විෂයය නිර්දේශ, පැවැත්වෙන විභාගය හා ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර සහ උපදේශක බලපත්‍ර සඳහා අය කරනු ලබන ගාස්තු පිළිබඳව මෙමගින් නියෝග සාදා තිබෙනවා. එමෙන්ම උපදේශක බලපත්‍ර සඳහා ඉල්ලුම් කරනු ලබන ආදර්ශ අයදුම් පත්‍රය ද මෙම නියෝගවලින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

මෙම නියෝග ප්‍රකාශයට පත් කර ඇති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි සිංහල මුද්‍රණයේ 6වැ පිටුවේ II වන කොටසේ 14(ඇ) වගන්තිය නිවැරදි කර හා දෙමළ මුද්‍රණයේ 14(ஈ) වගන්තිය ඇතුළත් කර දෝෂ නිවැරදි කිරීම සඳහා 1963/36 හා 2016 අප්‍රේල් 22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කර තිබෙනවා.

මෙම දෝෂ නිවැරදි කිරීම සහිත ගැසට් පත්‍රය භාෂා ත්‍රිත්වයෙන්ම ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව මත 2016.04.22 දිනැති හා අංක 1963/36 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග අවලංගු කර අදාළ නිවැරදි කිරීම් ඇතුළත් සංශෝධන නියෝග තමයි භාෂා තුනෙන්ම මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියාගෙන ආවේ මේ ගැසට් නිවේදනයේ තිබෙන කාරණා පිළිබඳවයි.

විශේෂයෙන්ම රියැදුරු පාසල් මේ ආකාරයෙන් නියාමනය කිරීම අපේ ගමනාගමන ක්ෂේත්‍රය සඳහා අතිශයින්ම වැදගත්. රටේ ඇති වන රිය අනතුරු ප්‍රමාණය ගැන බැලුවාම අපේ රියැදුරන්ගේ ගුණාත්මකභාවය ඉතාම ඉහළ මට්ටමක තිබිය යුතුයි. රියැදුරන් පුහුණු කරන ආයතන ගුණාත්මක මට්ටමේ නොමැති නම් අපට මේ තත්ත්වය උදා කර ගැනීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වන්නේ මේ ආයතන ඉතා හොඳින් අධීක්ෂණය කරලා මේ රියැදුරු පාසල්වලින් බිහි වන රියැදුරන් ඉතාම නීතිගරුක මෙන්ම රථ ධාවනය කිරීම සඳහා ප්‍රවීණත්වයක් ඇති රියැදුරන් බවට පත් කර ගැනීමයි. ඒ අරමුණින් තමයි මෙම ගැසට් පත්‍රය අප ඉදිරිපත් කර තිබෙන්නේ.

ඊළඟ ගැසට් පත්‍රය, අංක 1946/10 හා 2015.12.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයයි. 2009 අංක 8 දරන මෝටර් වාහන සංශෝධන පනතේ 61වැනි වගන්තිය මඟින් මෝටර් වාහන පනතට ඇතුළත් කරන ලද 213ඇ වගන්තිය මඟින් මෝටර් වාහන ත්‍යාග හා දිරිදීමනා අරමුදලක් පිහිටුවිය යුතු බවට ප්‍රතිපාදන හඳුන්වා දී තිබෙනවා. ඒ අනුව, ප්‍රවාහන අමාත්‍යතුමා විසින් මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ 2011 අංක 04 දරන මෝටර් වාහන ත්‍යාග සහ දිරිදීමනා අරමුදලේ නියෝග 1726/12 හා 2010.10.05 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරමින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

ඒ නියෝගවල 2(1) නියෝගය මඟින් ත්‍යාග සහ දිරිදීමනා අරමුදල් කළමනාකරණ සහ පරිපාලනය සඳහා පාලක මණ්ඩලයක් පත් කර තිබෙනවා.

එම නියෝග ප්‍රකාශයට පත් කරන ලද අවස්ථාවේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කටයුතු භාරව කටයුතු කළ ප්‍රධාන නිලධාරියා වූයේ ප්‍රධාන ගණකාධිකාරිවරයායි. එබැවින්, ඒ නියෝගවල 2(1) නියෝගයේ (ඇ) යටතේ පාලක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීවරයා නම් කර තිබෙනවා.

ඉන් පසු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කටයුතු භාර කිරීම සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරි තනතුර ස්ථාපිත කර ඒ සඳහා නිලධාරියකු පත් කර තිබෙනවා. එබැවින්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙනුවට ප්‍රධාන මූල්‍ය නිලධාරි ත්‍යාග සහ දිරිදීමනා අරමුදලේ පාලක මණ්ඩලයට ඇතුළත් කිරීම සඳහායි මේ සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල සම්බන්ධයෙන් මා කියන්නට කැමැතියි. මේ අරමුදල පාලනය වෙන්නේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් (පරිපාලන), මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රවාහන අමාත්‍යාංශයේ නියෝජිතවරයකු හා භාණ්ඩාගාර නියෝජිතවරයකු යටතේයි.

අරමුදල් ලැබෙන්නේ මෝටර් රථ පනත යටතේ ලැබෙන ආදායමින් සියයට එකක්, පළාත් සභා ආදායමින් සියයට එකක් වාගේම ආයෝජනය කරද්දී ලැබෙන පොලී මුදල් මඟින්.

මුදල් බෙදී යන ආකාරය මෙසේයි. පරිපාලන වියදම් සඳහා ආදායමින් සියයට එකයි. රඳවා ගැනීම් සඳහා ආදායමින් සියයට 5යි. ඒ වාගේම, කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වාර්ෂිකව රුපියල් ලක්ෂයක් වෙන් කර තිබෙනවා. සුබසාධන හා විනෝද කටයුතු සඳහා වාර්ෂිකව රුපියල් පණස්දහසකුත්, ප්‍රශංසනාත්මක ඇගැයීම් සඳහා වාර්ෂිකව රුපියල් පණස්දහසකුත් වෙන් කර තිබෙනවා. ඉතිරිය දිරි දීමනා ගෙවීම් සඳහා වෙන් කර තිබෙනවා.

දිරි දීමනා ගෙවීම සඳහා නිර්ණායක සකස් කර තිබෙනවා. දිරි දීමනා සඳහා වෙන් කළ මුදලේ මුළු වටිනාකමින් සියයට 40ක් සේවකයන්ගේ මූලික වැටුප පදනම් කරගෙන සේවකයන් අතරේ බෙදී යා යුතුයි. දිරි දීමනා සඳහා වෙන් කරන මුදලේ වටිනාකමින් සියයට 60ක් ශාඛාවල වැඩ කටයුතු සඳහා දායක වූ සහ එකී කාර්තුවේ කාර්ය සාධනය සැලකිල්ලට ගෙන ශාඛාවල සේවකයන් අතර සමානව බෙදී යා යුතුයි. දිරිදීමනා ලැබීම සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් කාර්තුවකට දින තිහක්වත් සේවය කළ යුතුයි. එක් කාර්තුවක් සඳහා දින හයක නිවාඩු හිමිකම් අවසරය ලබා දෙනු ලබයි. ඊට අමතරව ලබා ගන්නා නිවාඩු සඳහා සමානුපාතික පදනම මත දිරිදීමනා ගෙවීම්වලින් අඩු කරනු ලබයි.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ත්‍යාග හා දිරි දීමනා වශයෙන් මේ වන විට ගෙවා ඇති මුදල සහ ලැබීම් පිළිබඳව දළ වශයෙන් ගත්තොත්, 2009/2010 වර්ෂවල ලැබීම් රුපියල් මිලියන 57යි. 2009 වසරේ ගෙවීම් රුපියල් මිලියන 13යි. 2010 වසරේ ගෙවීම් රුපියල් මිලියන 30යි. 2011 වසරේ ලැබීම් රුපියල් මිලියන 68යි, ගෙවීම් රුපියල් මිලියන 62යි. 2012 වසරේ ලැබීම් රුපියල් මිලියන 72යි, ගෙවීම් රුපියල් මිලියන 67යි. 2013 වසරේ ලැබීම් රුපියල් මිලියන 73යි, ගෙවීම් රුපියල් මිලියන 68යි. 2014 වසරේ ලැබීම් රුපියල් මිලියන 91යි, ගෙවීම් රුපියල් මිලියන 80යි. 2015 වසරේ ලැබීම් රුපියල් මිලියන 116යි, ගෙවීම් රුපියල් මිලියන 108යි. මේ අරමුදල මඟින් ත්‍යාග හා දිරි දීමනා ලබා දීම සිදු කළ යුතු වුවද, දැනට දිරිදීමනා ලබා දීම පමණක් සිදු කරනවා. අපේ අනාගත බලාපොරොත්තුව අනෙක් අංශයන් සඳහාත් නිසි ආකාරයෙන් යොමු වීමයි. ඇත්ත වශයෙන්ම මේ දිරි දීමනා ලබා දීමෙන් බලාපොරොත්තු වන්නේ වඩාත් කාර්යක්ෂම වූද, අවංක වූද සේවාවක් ඒ අය ඉටු කරයි කියලායි. ඒ පිළිබඳව දැන් නොයෙකුත් මාධ්‍ය වාර්තා තිබෙනවා. කෝප් කමිටුව ඉදිරියේ පරීක්ෂණ පැවැත්වෙනවා. අපේ අමාත්‍යාංශය ඒවා සැලකිල්ලට අර ගෙන ඒවා නිවැරදි කිරීම සඳහා කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම අපේ ක්‍රමවේදයන් විශාල ප්‍රමාණයක් වෙනස් කළ යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම කෝප් කමිටුව මඟින් පෙන්වා දුන්නා, අපේ e-Motoring ව්‍යාපෘතිය ඉතා ඉක්මනින් ආරම්භ කිරීමේ අවශ්‍යතාව පිළිබඳව. ඒ සම්බන්ධයෙන් පාරදෘෂ්‍යභාවයකින් යුතුව කටයුතු කිරීම සඳහා තාක්ෂණික කමිටු පත් කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩලය මඟින් පත් කරනු ලබන කමිටුවක් මඟින් එය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කිරීම සඳහා අපි අවශ්‍ය විධිවිධාන යොදනවා. එවැනි නවීන තාක්ෂණික ක්‍රම තුළින් මෝටර් රථ ලියාපදිංචි කිරීම, මෝටර් රථවල අයිතිය පැවරීම තුළින් තමයි දූෂණය වාගේ කාරණා අවම කර ගන්න අපට පුළුවන් වෙන්නේ. නැත්නම් අපි කොච්චර උත්සාහ දැරුවත් ප්‍රායෝගික වශයෙන් ඒවා අවම කර ගැනීමේ අපහසුකම් රාශියක් තිබෙනවා. ඒ නිසා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ එම ව්‍යාපෘතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් එම කටයුත්ත ඉටු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ආවේණික වූ අඩුපාඩුකම් රාශියක් තිබෙනවා. ලක්ෂ හැටක් පමණ වූ මෝටර් රථ ලියාපදිංචි කිරීම සිදු කරනවා. ඉස්සර එක් එක් මෝටර් රථයට වෙන් වෙන් වශයෙන් ලිපි ගොනු සකස් කරලා ගොඩ ගහලා තිබුණා. ඒ සඳහා ගබඩාවක් තිබුණේ නැහැ. කන්ටෙනර්වල තමයි අපි ඒවා දමලා තිබුණේ. නඩුවකට යම් ලිපි ගොනුවක් ඕනෑ වුණාම මේ කන්ටෙනර් ගලවලා තමයි ගත්තේ. අපි ඒ files ටික හරියට computerize කරනවා. ඒ සඳහා විශේෂ වැඩසටහනක් සකස් කරනවා. එපමණක් නොවෙයි, පරණ files සියල්ලම නැවත නිසි ලෙස ගබඩා කිරීමත් සිදු කරනවා. ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එම ගබඩාවේ රාක්ක ගැසීම ඇතුළු වැඩ කටයුතු ටික දැන් අවසන් වෙමින් තිබෙනවා. මේ අවුරුද්ද අවසන් වීමට පෙර ඒ සියලුම ලිපි ගොනු නිසි ආකාරයෙන් වර්ෂ අනුව, දින අනුව ගබඩා කිරීම සඳහා අපි ඒ අලුත් ස්ථානයට ගෙන යනවා. ඊට පස්සේ ඉදිරියේදී ලියාපදිංචි කරන වාහන සම්බන්ධයෙන් සියලුම තොරතුරු අපි පරිගණකගත කරලා ඒවා සුරක්ෂිතව තබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කරනවා. විශේෂයෙන්ම e-Motoring ව්‍යාපෘතිය ආරම්භ වුණාම අලුතෙන් ලියාපදිංචි වන සියලුම වාහන පිළිබඳ තොරතුරු පරිගණකගත වෙනවා. එතකොට යම් කෙනෙකුට තමන්ගේ වාහනය තව කෙනෙකුට විකුණන්න ඕනෑ නම්, transfer කරන්න ඕනෑ නම්, ඒවා ගෙදර ඉඳලාම කර ගන්න පුළුවන් වෙනවා. e-Motoring ව්‍යාපෘතියෙන් අපි කරන්න උත්සාහ කරන්නේ ඒකයි. ඒ සඳහා තැරැව්කාරයෝ හම්බ වෙන්න ඕනෑ නැහැ, එක එක් කෙනාට මුදල් දෙන්න ඕනෑත් නැහැ. Credit card එකෙන් ඒ කටයුතු කරන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වාගේම ලියා පදිංචි නොකර ධාවනය වන මෙරටදී එකලස් කරන ලද යතුරු පැදි ලියා පදිංචි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීම පිණිස කැබිනට් ප්‍රතිකාවක් ඉදිරිපත් කර තිබෙනවා.

මව් සමාගම නොවන ආනයනකරුවන් විසින් මෙරටට ආනයනය කරනු ලබන අලුත්ම මෝටර් රථ සඳහා අලුත් යනුවෙන් සහතිකයේ සඳහන් කිරීම කරනු ලබනවා. ලිපිගොනු අස්ථානගත වීම හා ලිපිගොනුවල සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලුවක් ඇති වූ බැවින් ලිපිගොනු විධිමත් පරිදි යාන්ත්‍රිකව මිටි බැඳීම - bundle කිරීම - සඳහා යන්ත්‍රයක් මිලට ගෙන ක්‍රියාත්මක කරනවා. වේරහැර කාර්යාල පරිශ්‍රයේ ලිපිගොනු මිලියන 40ක් ගබඩා කළ හැකි අංග සම්පූර්ණ ලේඛනාගාරයක් රුපියල් මිලියන 80ක් වියදම් කර ඉදි කෙරෙමින් පවතිනවා. ආනයනික වාහන සම්බන්ධයෙන් තොරතුරු ඍජුවම මෙම දෙපාර්තමේන්තුවට ලබා ගැනීම සඳහා රේගුව සමඟ ඍජු මාර්ගගත - online - සබඳතාවක් ඇති කිරීමට කටයුතු කරනවා. ව්‍යාජ ලිපිනයන්ට වාහන ලියා පදිංචි කිරීම වැළැක්වීම සඳහා වාහනයේ ලියා පදිංචි සහතිකයට ඇතුළත් කරන ලිපිනය ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනයට වඩා වෙනස් වන අවස්ථාවලදී ග්‍රාම නිලධාරි විසින් නිතුක් කරන පදිංචිය සනාථ කිරීමේ සහතිකයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කරනවා. අංක තහඩු මුද්‍රණය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, ඉදිරියේදී නිකුත් කරන අංක තහඩු සඳහා RFID - Radio Frequency Identification - පහසුකම් සහිතව නිබිය යුතු බවට නිර්ණායකයන් ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම වාහන තම නමට පවරා නොගෙන විවෘත ලියවිලි මත තබා ගෙන සිටීම නිසා දඩ නියම වූ පුද්ගලයන් හට සහනයක් ලබා දීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා ගත් අතර, එය සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වෙනවා. පැවරුම් ලේඛනවල "වාහනයේ සන්තකය වෙනස් වී දින 14ක් ඇතුළත අයිතිය පවරා ගැනීම සඳහා ඉල්ලුම් නොකළහොත් දිනකට රුපියල් 100ක අතිරේක ගාස්තුවකට යටත් වේ" යන්න පැහැදිලිව මුද්‍රණය කිරීම මඟින් ජනතාව දැනුවත් කිරීමට කටයුතු සලසා තිබෙනවා. ඒ වාගේම රියැදුරු පාසල් නියාමනය කිරීම විධිමත් කිරීම තුළින් වඩාත් ගුණාත්මක සේවාවක් ලබා ගන්නට හැකියාව ලැබෙනවා.

වේරහැර හා කළුතර යන ප්‍රදේශවල ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ආදර්ශ ධාවන පථ දෙකක් ඉදි කරනවා. උෂව, වයඹ හා උතුරුමැද යන පළාත්වලද නුදුරේදීම ආදර්ශ ධාවන පථ ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු කර ගෙන යනවා. රියදුරු බලපත් සඳහා වන ලිඛිත පරීක්ෂණයේදී මෙතෙක් නිකුත් කළ ප්‍රශ්න පත්‍ර කට්ටල සංඛ්‍යාව වැඩි කිරීම මඟින් එම විභාගයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට කටයුතු කරනවා. මගී ප්‍රවාහනයේ යෙදෙන

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

බස්රථ රියැදුරන් සඳහා මගී ප්‍රවාහන සේවා බලපත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරනවා. ඒ වාගේම ප්‍රභූ ආරක්ෂක රියැදුරන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ත්‍රිරෝද රථවලින් අද සිදු වන අනතුරු ප්‍රමාණය ඉතාමත්ම වැඩියි. විශේෂ කැබිනට් අනු කමිටුවක් මගින් මෝටර් බයිසිකල්වල ධාරිතාව පිළිබඳව, ත්‍රිරෝද රථවලින් සිදුවන අනතුරු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර, ඒ සඳහා ආරක්ෂිත වැඩ පිළිවෙළවල් සකස් කිරීම හා ත්‍රිරෝද රථවලට රියැදුරු බලපත්‍ර ලබා දීමේදී මීට වඩා ආරක්ෂක විධිවිධාන යෙදීමට බලාපොරොත්තු වෙනවා. ත්‍රිකුණාමලයේ නව කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදි කර ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය එම ගොඩනැඟිල්ල තුළම ස්ථාපිත කර තිබෙනවා. ඒ වාගේම කාර්මික සේවාවන්, මාර්ග ආරක්ෂණ සේවාවන් වාගේ වැඩ කටයුතු රාශියක් සිදු කර තිබෙනවා. මම හිතන විධියට හුහක් මුදල් සංසරණය වන ස්ථානයක් නිසා එයට චෝදනා වැඩියි. නමුත් නිසි ක්‍රමවේදයන් තුළින් පමණයි මේ වැඩ කටයුතු කරන්නට පුළුවන් වන්නේ.

මේ අවස්ථාවේදී මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් මම ගරු සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනවා. මගේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ සිටිනවා. මට ආර්ථික සංවර්ධන කමිටුවට යන්නට තිබෙන නිසා මේ අවස්ථාවේ ගරු සභාවෙන් ඉවත්ව යන්නට අවසර ඉල්ලා සිටිනවා. නමුත් කමිටුවේ රැස්වීම අවසාන වූ වහාම මා මේ ස්ථානයට පැමිණෙන බවත් ප්‍රකාශ කරන්නට කැමතියි. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එදුත්තියම්පප්පෙත්තු.
Question proposed.

[අ.භා. 3.05]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(*மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி*)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෝටර් වාහන පනත යටතේ නියෝග සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ දී එහි තිබෙන කාලීන වැදගත්කම නිසාම මේ පිළිබඳව කරුණු කිහිපයක් මතු කරන්නට බලාපෙරොත්තු වෙනවා. රියැදුරු පාසලක ප්‍රමිතිය, ඒ වාගේම රියැදුරු පාසලක තත්ත්වය නියාමනය කිරීම අත්‍යවශ්‍ය දෙයක්. රටේ ඇති වී තිබෙන මාර්ග අනතුරු, හදිසි අනතුරු සියල්ල සිද්ධ වෙන්නේ ඒ නිසාම නොවෙයි කියන එකත් අපි විශ්වාස කරනවා. ඒකට තවත් බොහෝ හේතු තිබෙනවා වුණත්, රියැදුරෙකුගේ ප්‍රමිතිය සකස් කිරීමේදී රියැදුරු පාසලක ප්‍රමිතිය ඉතා වැදගත් වනවා. ඒක නියාමනය කිරීම ඒ නිසාම වැදගත් වනවා. එහිදී මතු වන්න පුළුවන් ප්‍රායෝගික කරුණු කීපයක් මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි.

ඉන් පළමුවැනි එක තමයි, ඔබතුමන්ලා හඳුන්වා දෙන රියැදුරු උපදේශකවරු සහ සහකාර උපදේශකවරු පමණක් රියැදුරු බලපත්‍ර ලබා දීමේදී බලපත්‍රයක් සහිතව කටයුතු කළ යුතුයි කියන කාරණාව. දැන් මේක එහෙම හදනවා නම්, ඒකට අවශ්‍ය පහසුකම් පද්ධතියකුත් සකස් විය යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට හේතුව මෙයයි. දැනට මෙවැනි licensed රියැදුරන්, ඒ කියන්නේ බලපත්‍රලාභී - licensed - උපදේශකවරු ලංකාවේ ඉන්නේ 1,500ක් පමණක් වීම. ඒ මුළු ප්‍රමාණය.

2015 නොවැම්බර් 02 අංක 1939/4 අති විශේෂ ගැසට් පත්‍රයේ 6(ඊ) වගන්තියේ මෙසේ සඳහන් වනවා:

"(ඊ) වලංගු රියැදුරු උපදේශක බලපත්‍රයක් සන්තකයේ නොමැති පුද්ගලයෙකු කිසිදු රියැදුරු උපදේශකවරයකු වශයෙන් හෝ සහකාර රියැදුරු උපදේශකවරයකු වශයෙන් සේවයේ නොයෙදවිය යුතු ය ;"

ඒ අනුව මෙම ගැසට් නිවේදනයේ මේ කාරණාව විශේෂයෙන් අවධාරණය කරලා තිබෙනවා.

රියැදුරු පුහුණුව ලබා දීලා බලපත්‍රයක් ලබා දෙන සෑම රියැදුරු පාසලකම පුහුණුව පැවැත්වීම සඳහා බලපත්‍ර ලත් රියැදුරු උපදේශකවරු හෝ සහකාර රියැදුරු උපදේශකවරු පමණක් සේවයේ නියුක්ත විය යුතුය කියන කාරණාව පිළිබඳවත් අපි බලන්න ඕනෑ. එහෙම වුණාම ගැටලුවක් තිබෙනවා. බලපත්‍රලාභී උපදේශකවරු දැනට ඉන්නේ 1,500ක් පමණ ප්‍රමාණයක්. එහෙම නම්, දැන් මේකෙදි අනිවාර්යයෙන්ම රියැදුරු පාසල්වල තිබෙන අවශ්‍යතාවට, රටේ තිබෙන රියැදුරු පාසල් ප්‍රමාණයට බලපත්‍රලාභී රියැදුරු උපදේශකවරුන්ව පත් කරන්න ඔබතුමන්ලාට සිද්ධ වනවා. 2016 ජනවාරි පළමුවැනි දා සිට මේ දේවල් ක්‍රියාත්මක වන්න නියමිතයි. මේවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න නම්, සෑම රියැදුරු පාසලකම එවැනි උපදේශකවරු ඉන්න ඕනෑ. එතකොට එවැනි උපදේශකවරු පත් කරන්නේ කොහොමද කියලා ගැටලුවක් එනවා.

ඊළඟට, මේ උපදේශකවරයෙකු සඳහා වන සුදුසුකම් ගත්තොත් එහෙම ඔවුන් විභාගයක් සමත් වන්න ඕනෑ. ඒ විභාගය සාමාන්‍ය විභාගයක් නොවෙයි. ඒක ටිකක් විශේෂ විභාගයක්. ඒ සඳහා අදාළ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරපු ක්‍රමවේදයක්, පාඨමාලාවක් තිබෙනවා. ඒ පාඨමාලාව හදාරන්න ඕනෑ. ඒ වාගේම සෑම රියැදුරු පාසලකම මේ ප්‍රභේදගත කිරීම අනුවත් විශේෂත්වයන් තිබෙනවා. මෙය සංකීර්ණ ක්‍රියාවලියක්. මම කියන්නේ මේ දේවල්වල අවශ්‍යතාවක් නැහැ කියලා නොවෙයි. නමුත්, මේ නිසා සිදුවන්න පුළුවන් දෙයක් තිබෙනවා. දැනට පවත්වා ගෙන යන රියැදුරු පාසල්වලින් මේ ප්‍රමාණය වෙන් කර ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය මෙහිදී මතුවනවා. ඒ මෙහිදී මතුවන එක් ප්‍රායෝගික ගැටලුවක්.

ඊළඟට, දැනට තිබෙන පනත අනුව අවුරුදු 21ට වැඩි රියැදුරු බලපත්‍රයක් තිබෙන ඕනෑම කෙනෙකුට L board එක ගහ ගත්තොත් තව කෙනෙක්ව පුහුණු කරන්න පුළුවන්. එතකොට එවැනි පුහුණු කිරීමක් මේ නිසා කරන්න බැරිද කියන ප්‍රශ්නය ඊළඟට මතු වනවා. මේ තත්ත්වය යටතේ නම්, උපදේශක බලපත්‍රයක් සහිත රියැදුරු පාසලකින් පමණමයි රියැදුරු පුහුණුවක් ලබා රියැදුරු බලපත්‍රයක් අලුතෙන් ගන්න පුළුවන්කම තිබෙන්නේ. අන්න ඒ ප්‍රායෝගික ගැටලුව කොහොමද විසඳන්නේ කියන එක මෙතැනදි මතුවනවා.

ඊළඟට, ඔබතුමන්ලාගේ මේ කාරණාව අනුව රියැදුරු පාසලක් වන්නේ ස්ථිර ගොඩනැඟිල්ලක් තිබෙන ස්ථානයක්. ඒ විතරක් නොවෙයි. මෝටර් වාහනයක ආදර්ශ පද්ධතියක් ප්‍රදර්ශනය කිරීමක් සහිතව දේශන පැවැත්විය හැකි දේශන පහසුකම් තිබෙන, කාර්මික පුහුණුව සඳහා පහසුකම් තිබෙන, වාහන නැවැත්වීමට පහසුකම් තිබෙන, වාහන අංගනයක් තිබෙන ස්ථානයක් තමයි රියැදුරු පාසලක් වන්න ඕනෑ. ඇත්තටම ඒක හොඳයි. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ දැන් තිබෙන රියැදුරු පාසල්වලට මොකද වන්නේ කියන කරුණයි. එතකොට සිදු වන්නේ "රියැදුරු පාසල්" කියන ස්ථාන ඉතා සීමිත පිරිසකගේ දැවැන්ත ව්‍යාපාරයක් බවට පමණක් පත් වන එකයි. මොකද, දැන්

තිබෙන රියැදුරු පාසල් ගත්තොත් පහසුකම් නැහැ කියලා අපි දන්නවා. නගරබද ගත්තොත් එහෙම ලොකු වාහන අංගනයක් සහිත රියැදුරු පාසලක් පවත්වා ගෙන යන්න බැහැ.

බොහෝ වෙලාවට ඒ රියැදුරු පාසල ආසන්නයේ තිබෙන ප්‍රධාන පාර අයිනේ වාහන නවත්වා තිබෙනවා. මේ කටයුත්ත ගත්තොත් ප්‍රායෝගිකව ඒක කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය එනවා. මේ ක්‍රමය නිසා දැනට පවතින - පවත්වා ගෙන යන - රියැදුරු පාසල්වලට ඇති වන තත්ත්වය මොකක්ද? එම කාරණාවත් පැහැදිලි කර ගන්න අවශ්‍යතාව තිබෙනවා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම දැනට ලංකාවේ මේ උපදේශක ලයිසන් එක තිබෙන්නේ 1500ක විතර පිරිසකටයි. එතකොට ඒ අයත් මේ තත්ත්වයට පත් කරනවාද කියන එකත් ප්‍රශ්නයක්. එහෙම නැත්නම් අඩු තරමින් මේ සහායක උපදේශක ලයිසන් එකවත් දෙන්න සුදුසුකම් යම් ප්‍රමාණයකට තියෙන්න ඕනෑ. රියදුරු බලපත්‍රයේ සුදුසුකම් තිබෙන්න ඕනෑ. පුහුණු කරන්න පුළුවන්කම තියෙන්න ඕනෑ. විභාග pass කිරීම පැත්තෙන් ගත්තොත් ඊට වඩා යම් පහසුකමක් ලබා දෙන්න අවශ්‍යතාව ප්‍රායෝගිකව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැනට 2009 අංක 8 දරන පනත අනුව මාස තුනක් රියැදුරු පාසලක පුහුණු වෙන්න ඕනෑ කියලා නීතියක් තිබෙනවා. කාට හරි රියදුරු බලපත්‍රයක් ගන්න අවශ්‍ය නම් රියැදුරු පාසලක මාස තුනක් පුහුණුව ලබන්න ඕනෑ. හැබැයි, තිබෙන ප්‍රශ්නය මෙකයි. ඒ මාස තුන පුහුණු වෙන්න ඕනෑ, කොච්චර කාලයක්ද කියලා කොහේවත් නැහැ. මාස තුනම පුහුණු වෙන්න ඕනෑ. නමුත් දවසට පැය කීයක්ද? එක දිනයකට පැය කීයක් පුහුණු කරන්න ඕනෑද කියන එක ගැන නිශ්චිතභාවයක් නැහැ. දැන් මේ නියෝගවලදීවත් ඒක සකස් වෙනවා නම් හොඳයි කියන එකයි අපි කියන්නේ. මොකද, එහෙම නැති වුණොත් වෙන්න පුළුවන් දේ මෙකයි. කලින් පැය පහක පුහුණුවක් තිබුණා නම් ඇතියි කියලා තිබුණා. ඊට පස්සේ ඒක මාස තුනක් දක්වා දීර්ඝ වුණා. නමුත් කිසිම රියැදුරු පාසලක මාස තුනක් නම් පුහුණු කරන්නේ නැහැ. එහෙම මාස තුනක් පුහුණු කරනවාද කියලා නියාමනය කරන්න ක්‍රමවේදයක් මෝටර් රථ දෙපාර්තමේන්තුවට ඇත්තේත් නැහැ. රියැදුරු පාසලක අනිවාර්යයෙන්ම මාස තුනක් පුහුණු කරනවාද නැද්ද කියලා නියාමනය කිරීමේ ක්‍රමවේදයක් නැහැ.

ඊළඟට, මෝටර් බයිසිකල්වලට බලපත්‍රයක් ගන්නත් මාස තුනක් train වෙන්න ඕනෑ. කොහේවත් ප්‍රායෝගිකව ඒක වෙන්නේ නැහැ. මේ ක්‍රමවේදයට අනුව ගත්තොත් තිබෙන්නේ එහෙමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම විශේෂයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා ප්‍රමීතීන් පවත්වාගෙන යාම ගැන. ඔබතුමන්ලා රියැදුරු පාසල් ඇති කරලා, වාහන අංගන හදලා, පහසුකම් ඇති කරලා, උපදේශක බලපත්‍රයක් හදුන්වා දීලා මේ ක්‍රියාවලිය පටන් ගත්තාට පස්සේ ඊළඟට ඇති වන ගැටලුව තමයි ඒක නියාමනය කරන්නේ කොහොමද කියන එක. ඒ සඳහා සරල, ප්‍රායෝගික උදාහරණයක් මම කියන්නම්. කොළඹින් පිට පළාත්වල අයට නම් තමන්ගේ වාහනය ගෙනිහිල්ලා ඒ වාහනයෙන් බලපත්‍රයක් ගන්න ඉදිරිපත් වෙන්න පුළුවන්. හැබැයි licences ගන්න වෙරහැරට එන අය රියැදුරු පාසලකින් ගන්න වාහනයකින් තමයි trial එක දෙන්න ඕනෑ. වෙරහැර මෝටර් රථ දෙපාර්තමේන්තුව ඉදිරිපිට පාරේ තිබෙන සමහර රියැදුරු පාසල් - ගරු ඇමතිතුමා ඒ ගැන දන්නවා - තිබෙන්නේ රියැදුරු පාසල් හැටියට නොවෙයි, trial එකට වාහනයක් දෙන්න. ඒවා trialsවලට වාහන supply කරන ස්ථාන. එතකොට ඒ බලපත්‍රය ගන්න එන තැනැත්තා පුරුදු කෙනෙක්ද, නැද්ද, එයා ආවේ කොහෙන්ද, කින්ද, මන්ද මොකක්වත් බලන්නේ නැහැ. එතැන වාහනයක් සැපයීමට ආයතන තිබෙනවා. ඒක නියාමනය වෙන්න ඕනෑ නේ. එහෙම නියාමනය නොවුණාම තමයි ප්‍රශ්න එන්නේ. වාහනයක් ගන්න ඕනෑ රියැදුරු පාසලකින්ම නම් ඒ පුරුදු කළ රියැදුරු පාසලෙන්ම වාහනයක් දීලා එවන්න ඕනෑ නේ. එහෙම වෙන්නේ නැහැ. බස් එකෙන් කොළඹට; වේරහැරට ඇවිල්ලා වේරහැර රියැදුරු පාසලකට ගිහිල්ලා පැයකට දෙකකට වාහනයක් ගන්නවා. මොකද, එතැන රියැදුරු පාසල කියලා බෝඩ් එක දමලා තිබුණාට, ඒක තිබෙන්නේම වාහනයක් දෙන්නයි. ඒක ගත්තොත් හරියට cab service එකක් වාගෙයි. ඒක වාහන සපයන ආයතනයක් විතරයි. එවැනි කාරණා බරපතළ ප්‍රශ්න හැටියට තිබෙනවා. ඇත්තටම රියැදුරු පාසලක කාර්යය වන්නේ; රාජකාරිය වන්නේ trial එකට වාහන ලබා දෙන එක නොවෙයි. ඒක පුහුණු කරන ආයතනයක් විය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවිය යුතු ඊළඟ කාරණය මෙකයි. සාමාන්‍ය නීතිය අනුව තිබෙන්නේ licence එකක් ගන්න අවුරුදු 18 සම්පූර්ණ විය යුතුයි කියලායි. අවුරුදු 18 සම්පූර්ණ කෙනකුට තමයි licence එකක් ගන්න පුළුවන්. ඒ වාගේම මෝටර් බයිසිකල් සඳහා අවුරුදු 17 සම්පූර්ණ වුණාම ඒ තැනැත්තාට learner's permit එකක් ගන්න පුළුවන්. ඒ අයට පුහුණු වන බලපත්‍රයක් ලබා දෙනවා. පුහුණු වන බලපත්‍රය අර ගෙන රට පුරාම ඇවිදින්න පුළුවන්. පුහුණු වන බලපත්‍රය අර ගෙන මෝටර් බයිසිකලයෙන් ගියාම ඒ යන එක්කෙනා කවුද කියලා සොයන්නේ නැහැ නේ. ඒකෙන් ගිහිල්ලා අනතුරක් වුණොත් - licence නැතිව ගිහිල්ලා ඕනෑ තරම් අනතුරු වෙනවා. කොහොමත් licence නැතුව මෝටර් බයිසිකල්වල යනවා. නමුත් මා කියන්නේ, බලපත්‍ර දෙන්නේ අවුරුදු 18න් නම්, අවුරුදු 17න් learners' permit එකක් දෙන එකේ තේරුමක් නැහැයි කියලායි. එහෙම නම් ඔබතුමන්ලා වයස අඩු කරලා අවුරුදු 17න්ම licence එක දෙන්න ක්‍රමයක් හදන්න ඕනෑ. ඒක ඊට වඩා ප්‍රායෝගිකයි. මොකද, learners' permit එකත් රියැදුරු බලපත්‍රයක් හැටියට සලකනවා.

ඒ විතරක් නොවෙයි. ලියා පදිංචි වෙන්න අවශ්‍ය නැති බයිසිකල් වර්ගයක් තවමත් තිබෙනවා. ඒ තමයි "මදුරුවා බයිසිකලය" කියන එක. ඒක මෝටර් බයිසිකලයකුත් නොවෙයි. යතුරු පැදියයි, පා පැදියයි අතර මැද බයිසිකලයක් තිබෙනවා නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒකට තවම licence අවශ්‍ය නැහැ. හැබැයි මදුරුවා බයිසිකලයේ ගියත්, හැප්පුණොත් මැරෙනවා. ඊට වඩා වැඩි ධාරිතාවක් තිබෙන බයිසිකලයයි, මදුරුවා බයිසිකලයයි කියලා වෙනසක් නැහැ. අනතුරට කොයි බයිසිකලයත් එකයි. එහෙම නම් මෝටර් බයිසිකල්වලටත් බලපත්‍ර අවශ්‍ය නැති වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මදුරුවා බයිසිකලයටත් බලපත්‍ර තිබෙන්න ඕනෑ. ඒ නිසා මොකක් හෝ ක්‍රමවේදයක් සකස් කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මූලික වශයෙන්ම මතු කළ යුතු කාරණාව මෙයයි. මේ හදන නියාමනය, ප්‍රමීතිය රියැදුරු පාසල්වලට හොඳයි, හැබැයි ටිකයි. මොකක්ද හේතුව? මේ නිසා වෙන්න පුළුවන් දේ, රියැදුරු පාසල් පවත්වා ගෙන යන ඒකාධිකාරය සීමා වන එක. මේ තුළින් ඒ කර්මාන්තයේ යෙදී සිටින විශාල පිරිසකට ඒ කටයුතු සීමා වනවා. දැනට රියැදුරු පාසල් පවත්වා ගෙන යන අයට මේ තුළින් ඇති කරන තත්ත්වය මොකක්ද කියා පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, උපදේශක licence එක නැතුව පවත්වා ගෙන යන රියැදුරු පාසල් දැන් පොලීසියෙන් අල්ලනවා. හැබැයි, උපදේශක

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

licence එකක් ගන්න එකත් ලේසි නැහැ. ලංකාවේම එවැනි උපදේශකවරු 1,500ක් පමණ පිරිසක් තමයි ඉන්නේ. ඔබතුමන්ලා දැන් මේ නීතිය ක්‍රියාත්මක කරන කොට හැම රියැදුරු පාසලකටම උපදේශක licence එකක් අවශ්‍ය වෙනවා. උපදේශක licence එකක් නැති අයට මොකද වෙන්නේ? එවැනි අයට ඇති වන තත්ත්වය මොකක්ද? එහෙම නම් උපදේශකවරු පුහුණු කරලා - පුරුදු කරලා- ඒ විභාග pass කරලා, 2017 ජනවාරි වන කොට මේ තත්ත්වය හදා ගන්න ඕනෑ.

ඊළඟට, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා කියන විධියට "ඒ" ප්‍රභේදයේ බලපත්‍රයක් ලබා ගන්න රුපියල් 20,000ක් ලියා පදිංචි ගාස්තු ගෙවන්න ඕනෑ. අවුරුදු දෙකකට පස්සේ බලපත්‍රය අලුත් කරන්න රුපියල් 10,000ක් ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ, රියැදුරු පාසලක් පවත්වා ගෙන යන කෙනෙක් අනිවාර්යෙන් රුපියල් 30,000ක් ගාස්තු ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ බලපත්‍රය ලබා ගන්න පටන් ගන්න කොට රුපියල් 20,000කුත්, ඊට පස්සේ රුපියල් 10,000කුත් ගාස්තු ගෙවන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. වාහන රියැදුරු පාසලත් පාසලක් නේ. රියැදුරු පාසල් පවත්වා ගෙන යන අයට දෙන පහසුකම් මොනවාද? ඔවුන්ටත් යම්කිසි පහසුකමක් තිබෙන්න ඕනෑ නේ. මොකද, රියැදුරු පාසලක් පවත්වා ගෙන යන කොට ඒ පුද්ගලයා වාහනය පෞද්ගලිකව ගන්න ඕනෑ; පුරුදු කරන උපදේශක පෞද්ගලිකව ගන්න ඕනෑ; බලපත්‍රය ගන්න ඕනෑ; බලපත්‍රය අලුත් කරන්න ඕනෑ; වාහන නඩත්තු කරන්න ඕනෑ. ඊට පස්සේ ඔහුට ගාස්තු අය කර ගන්න වෙන්නේ, licence එකක් ගන්න train වෙන්න එන කෙනාගෙන්. ඔහුට වැය වන සියලුම ගාස්තු එකතු කරලා, ඒක බෙදනවා, මාසයකට train වෙන්න එන ගණනින්. ඒ රියැදුරු පාසලට එන්නේ 10දෙනා නම්, ඒ මුළු වියදම බෙදනවා 10න්. ඔහුගේ පවුලේ ආදායමත් වියදමට එකතු කළාම ඒ සියල්ලම ගෙවන්න වෙන්නේ ඉගෙන ගන්න එන කෙනාටයි. එතකොට licence එකක් ගන්න එකත් ලේසි වැඩක් වෙන්නේ නැහැ.

ඊළඟට, තවත් ප්‍රශ්නයක් ඇති වෙනවා. අනතුරු වළක්වන්න තමයි ඔබතුමන්ලා හොඳ හිතින් මේ නියෝග පනවන්නේ. හැබැයි, ඊට පස්සේ licence නැතුව යන පිරිස වැඩි වනවා. ඇයි? දැන් licence එකක් ගන්න එක ලේසි නැහැ. රියැදුරු පාසලක් සොයා ගෙන යන එකත් අමාරු වෙනවා. මේ නිසා රියැදුරු පාසල් සීමා වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක හොඳ යෝජනාවක්. මොකද, රටේ ප්‍රමිතිකරණයක් ඇති වෙන්න ඕනෑ. Licence නැතුව යන වාහන තිබෙනවා, licence තිබෙන වාහන තිබෙනවා. අපි බස්වල යන කොට සමහර විට අහනවා, කොහෙන්ද licence ගත්තේ කියලා, කවුද licence දුන්නේ කියලා. කොහෙන්ද licence ගත්තේ, කවුද licence දුන්නේ කියලා අහන්නේ, රියැදුරෙකුගේ ප්‍රමිතිය පිළිබඳවයි.

ඊළඟ ප්‍රශ්නය තමයි, දැනට උපදේශක බලපත්‍ර තිබෙන අය අවුරුදු 60 - 70 මට්ටමේ අය වීම. ඔවුන් පරණ driversලා. ඒ ගොල්ලෝ හොඳයි. ඒ ගොල්ලන්ගේ ප්‍රමිතිය හොඳයි; quality එක හොඳයි. හැබැයි, එවැනි අය කීදෙනාද ඉන්නේ? විශේෂයෙන් තරුණ, අලුත්, හැකියාවන් තිබෙන, නව තාක්ෂණය පාවිච්චි කරන එවැනි රියැදුරන් පුහුණු කරන අයට අවම වශයෙන් අවුරුදු 5ක බලපත්‍රයක් තිබෙන්න ඕනෑය කියා ඔබතුමන්ලා මේ නියෝගවල සඳහන් කර තිබෙනවා. ඒක හරි. අවුරුදු 5ක බලපත්‍රයක් තිබෙන අයට උපදේශක තත්ත්වය ගන්න පහසුකමක් හදන්න ඕනෑ. නැත්නම් සිදුවන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. දැනට තිබෙන රියදුරු පාසල් බොහෝ ප්‍රමාණයක් මේ තත්ත්වය යටතේ නම් පවත්වාගෙන යන්න බැහැ.

ඊළඟට, ඔබතුමන්ලා මේකට හොඳ වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ තමයි වාහනය හඳුනාගන්න ක්‍රමයක් තිබෙන්නට ඕනෑ කියන එක. ඒක ඇත්ත. රිය පැදවීම පුරුදුවන අය "L" board එක ගහගෙන යනකොට, ඒ වාහනය රිය පැදවීම train කරන ආයතනයක වාහනයක් කියලා අපි දන්නේ ඒ "L" board එකෙන් විතරයි. සමහර ආයතනවල වාහනවල "Learners" කියලා ගහලා තිබෙනවා. සමහර වාහනවල මොකුත් නැහැ, "L" board එක විතරයි තිබෙන්නේ. නමුත්, "L" board එක තිබෙන වාහනය බලපත්‍රයක් තිබෙන රියදුරු පාසලක වාහනයක්ද, ප්‍රමිතිය සහිත ආයතනයක වාහනයක්ද, නැද්ද කියන එක සොයාගන්න බැහැ. එක්කෝ ඒ වාහන කුමන හෝ එකම වර්ණයකින් යුතුව තිබෙන්නට ඕනෑ. "මෙන්න මේ වර්ණය තිබෙන වාහන, ප්‍රමිතිය සහිත රියදුරු පාසලක වාහනයක් බව" හඳුනාගන්න පුළුවන් ක්‍රමයක් තිබෙන්නට ඕනෑ. එහෙම නැත්නම් අදාළ වාහනය නීත්‍යානුකූල, ප්‍රමිතියකින් යුතු ආයතනයක වාහනයක්ද, ප්‍රමිතියක් නැති ආයතනයක වාහනයක්ද කියලා අපට පාරෙදී තේරෙන්නේ නැහැ, එහෙම නැත්නම් සාමාන්‍ය කෙනෙකුට තේරෙන්නේ නැහැ. මේ වැඩ පිළිවෙළ මීට වඩා විධිමත් ක්‍රියාවලියක් ඇතුළත සකස් විය යුතු තවත් යෝජනා ප්‍රමාණයක් තිබෙනවා.

විශේෂයෙන්ම මේක ප්‍රමිතිකරණයට හා නියාමනයට ලක් කරන එක හොඳයි. ඒ මඟින් රියදුරු පාසල් පවත්වාගෙන යන අයටත් යම් පහසුවක් ඇති වෙන්නට ඕනෑ. ඒ වාගේම එක් සීමිත පිරිසකට පමණක් මේ ව්‍යාපාරය සීමා වුණොත්, එතැනත් බරපතළ තත්ත්වයක් ඇති වෙනවා. මෙන්න මේ කාරණා ටික තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවධාරණය කරන්න තිබෙන්නේ. මේක නරක දෙයක් නොවෙයි. හැබැයි, මේ හොඳ දේ හොඳ විධියට කරන්න නම් මේකට තව සංශෝධන ප්‍රමාණයක් එක්විය යුතුයි. ඒ පිළිබඳව සාකච්ඡාවක් ලබා දෙනවා නම් හොඳයි. අඩු තරමින් මේ විවාදවලින් පසුව ආංශික අධීක්ෂණ කාරක සභාවකදී හෝ පුළුල් විධියට සාකච්ඡා කරලා මෙය ක්‍රියාත්මක කිරීම සුදුසුයි කියන එක තමයි මම අදහස් කරන්නේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දැන් තිබෙන තත්ත්වය කොහොමද කියලා ඇමතිතුමා පිළිගත්තා. ඒ පිළිබඳව විවිධ නිර්දේශයන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරලා වඩා හොඳ ප්‍රවාහන සේවයක් ඇති කරන්න හැකි තත්ත්වයක් ඇති විය යුතුයි කියන අදහස ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ඔබතුමාගේ යෝජනා තිබෙනවා නම් ඒවා ආංශික අධීක්ෂණ කාරක සභාවට ඉදිරිපත් කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

[අ.භා. 3.24]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு பாலித ரங்கே பண்டார - திறன் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி இராஜாங்க அமைச்சர்)

(The Hon. Palitha Range Bandara - State Minister of Skills Development and Vocational Training)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝග පිළිබඳව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත්, ගරු විෂය භාර අමාත්‍යතුමාත් දීර්ඝ ලෙස කරුණු දක්වන්නට කටයුතු කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලැබී තිබෙන්නේ බොහොම කෙටි කාලයක් නිසා මම මෙම පනතේ කරුණු පිළිබඳව නොවෙයි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳවත්, ඒ වාගේම මේ රටට බලපාන සුවිශේෂී කාරණයක් පිළිබඳවත් කථා කිරීමට අදහස් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය වකවානුවේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ අපට දිගින් දිගටම දකින්නට ලැබුණු කාරණයක් තමයි ලිපිගොනු අතුරුදහන් වීම වාගේම එසේ අතුරුදහන් වන්නා වූ ලිපිගොනුව වෙනුවට වෙනත් අනු ලිපිගොනුවක් නිර්මාණය වීම. මේක ඉතාමත්ම නරක තත්ත්වයක්. අපි මේ පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී දිගින් දිගටම සාකච්ඡා කරන කොට අපට දකින්නට ලැබුණු පොදු කාරණයක් තමයි, අදාළ ලිපිගොනු ප්‍රවේශම් සහිතව ගබඩා කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුව සතුව ගබඩා පහසුකම් අඩුවීම. එම ආයතනය තුළ මෙවැනි අක්‍රමිකතා සිදු කරන්න වුවමනාව තිබෙන නිලධාරියෙක් ඉන්නවා නම්, එම දුර්වලතාව නිසා එම නිලධාරියාට එම කාර්ය රිසි සේ කරගැනීමට පුළුවන් අවකාශය ගොඩනැඟෙනවා. එම නිසා ප්‍රවාහන අමාත්‍යාංශය විශේෂ අවධානයක් යොමු කරලා ලිපිගොනු ආරක්ෂා කර ගැනීමට හැකිවන අන්දමට ගබඩා සංකීර්ණයක් කඩිනමින් ඉදිකර දීම ඉතාමත්ම වැදගත් කාරණයක් වෙනවා. මේ පිළිබඳව ප්‍රවාහන අමාත්‍යතුමාගේත්, ඒ වාගේම නියෝජ්‍ය අමාත්‍යතුමාගේත් අවධානය යොමු කරලා වැඩ කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටට විශේෂයෙන්ම බලපාන කාරණයක් තමයි දිවංගත ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් රටේ ප්‍රවාහන පද්ධතිය පුළුල් කිරීම හා මහජන පහසුව ඇති කිරීම සඳහා යොදාගන්නා ලද ක්‍රමවේදය. එකක් තමයි පෞද්ගලික බස්රථ සේවය හඳුන්වා දී එය ක්‍රියාත්මක කිරීම. අනෙක් ක්‍රියාව තමයි ගමේ සිටින පුංචි පුද්ගලයාගේ සිට නගරයේ සිටින පුද්ගලයා දක්වා ප්‍රවාහන කටයුතු පහසු කරගැනීම සඳහාත්, එදිනෙදා වැඩකටයුතු පහසු කරගැනීම සඳහාත් ත්‍රිරෝද රථය හඳුන්වා දීම. එහි අරමුණ වුණේ, ජනතාවගේ ශ්‍රම සිද්ධිය සඳහා වැඩ කටයුතු කිරීමයි. හැබැයි, ඒ අරමුණ සාක්ෂාත් වෙන කොට, අනෙක් පැත්තෙන් තවත් සමාජමය ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ වන විට ලක්ෂ 10 ඉක්ම වූ ත්‍රිරෝද රථ සංඛ්‍යාවක් අපේ රට තුළ තිබෙනවා. එයිනුත් බස්නාහිර පළාත තුළ පමණක් ත්‍රිරෝද රථ ලක්ෂ පහක විතර ප්‍රමාණයක් ලියා පදිංචි වෙලා තිබෙනවා. ඒ කාරණය බස්නාහිර පළාතේ හිටපු මහ ඇමතිතුමාත් දන්නවා ඇති.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ත්‍රිරෝද රථ පදවන්නේ කවුද? පාසල් අධ්‍යාපනය හමාර කරලා, උසස් අධ්‍යාපනයට, වැඩිදුර අධ්‍යාපනයට, නොයන්නා වූ, ඉතාමත්ම ළාබාල වයසේ දරුවන් බහුතරයක් දෙනා පාසල අතහැර නඟින්නේ ත්‍රිරෝද රථයට. ඉතාමත්ම තරුණ වයසේ ඉන්න, හැකියාව තිබෙන, ජවසම්පන්නකම තිබෙන, සෞඛ්‍යය හොඳින් තිබෙන කාල වකවානුවක තමයි මේ තරුණ උදවිය ත්‍රිරෝද රථය තුළ දවස ගත කරන්නේ. ඔවුන්ගේ හැකියාව අනුව, ඒ උදවියට රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වෙන්න පුළුවන්. එහෙම නිෂ්පාදන ක්‍රියාවලියට සක්‍රියව දායක වෙන්න පුළුවන් හැකියාවන් තිබෙන උදවිය ත්‍රිරෝද රථයකට සීමා වෙලා, තමන්ගේ අනාගතයම විනාශ කර ගෙන, තම ජීවිතය එක තැන පල් වීම ඉතාමත්ම බේදජනක තත්ත්වයක්. ත්‍රිරෝද රථ රැකියාව තුළින් අද විශාල ආදායමක් ලබන්න පුළුවන් වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බොහෝ දෙනෙක් ත්‍රිරෝද රථය මිලදී ගන්නේ ණය ක්‍රමය මත සහ ලීසිං ක්‍රමය මත. මේ ණය සහ ලීසිං ගෙවා ගෙන, ගෙදර අවශ්‍යතාත් සම්පූර්ණ කර ගෙන, තමන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නවත් ඔවුන්ට ආදායමක් නැහැ. ඒ ආදායම නැති වෙන කොට මේ අය මොකක්ද කරන්නේ? බොහෝ ත්‍රිරෝද රථ රියැදුරන් තමයි, මේ සමාජයේ තිබෙන සියලු අකටයුතු, සියලු දූෂිත ක්‍රියාවන් සිද්ධ වෙන තැන් දන්නේ. කාන්තාවක් විකුණන තැනක් තිබෙන්නේ කොහේද , ගංජා විකුණන තැනක් තිබෙන්නේ කොහේද, මත් ද්‍රව්‍ය විකුණන තැනක් තිබෙන්නේ කොහේද, මත්පැන් විකුණන තැනක් තිබෙන්නේ කොහේද කියාත්, එහෙම නැත්නම් වෙනත් කුමන හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වෙන තැනක් තිබෙනවා නම්, ඒ සිදු වෙන සෑම තැනක් පිළිබඳවත් ඉතා හොඳින් තොරතුරු ඔවුන් දන්නවා. එවැනි තැන්වලට සමහර අය කැඳවා ගෙන යන පුද්ගලයා බවට බොහෝ ත්‍රිරෝද රථ රියැදුරන් පත් වෙලා තිබෙනවා.

මම මේ කාරණය කිව්වාම, සමහරවිට හෙට ඉඳලා මට දෝෂාරෝපණය කරාවි; සමාජ ජාලා තුළින් මට විවිධ දේවල් කියාවි. ඒකට කමක් නැහැ. කෙටි කාලීනව එවැනි දේකට මුහුණ දුන්නත්, අනාගතයේදී මම අද කියන කාරණය සත්‍යයක් කියා කවුරු හෝ අවබෝධ කර ගනීවි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මෙන්න මේ තත්ත්වයත් එක්ක, අනාගතය පිළිබඳව කල්පනා කරලා ප්‍රවාහන අමාත්‍යාංශයට එක්තරා නිගමනයකට යන්න වෙනවා. මේ තරුණ උදවිය අපි යොදා ගන්න ඕනෑ, ත්‍රිරෝද රථ රියැදුරන් වශයෙන් නොවෙයි. ඔවුන්ට වෘත්තීය පුහුණුවක් ලබා දෙන්නට ඕනෑ. අධ්‍යාපනය කඩා කප්පල් වෙලා සිටියත්, උසස් පෙළ, එහෙම නැත්නම් උසස් අධ්‍යාපනය හදාරන්නට බැරි වුණත්, නීතිඥවරයෙක්, ඉංජිනේරුවරයෙක්, වෛද්‍යවරයෙක් වෙන්න බැරි වුණත්, වෙනත් උපාධිධාරියෙක් වෙන්න බැරි වුණත්, අනෙක් පැත්තෙන් කාර්මික අධ්‍යාපනය තුළින්, ශිල්පීය දැනුම තුළින්, ඔවුන්ගේ ජීවිත අලංකාර කර ගන්නට පුළුවන්කම තිබෙනවා. එසේ ඔවුන්ගේ ජීවිත අලංකාර කර ගැනීමට, ශක්තිමත් කර ගැනීමට නම්, ඔවුන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කරවන්නට ඕනෑ. වෘත්තීය අධ්‍යාපනයට යොමු වීම සඳහා අකැමැති, ටිකක් අලස උදවිය සියලු දෙනා, ඉතාමත් පහසු ක්‍රමවේදය වශයෙන් ත්‍රිරෝද රථය තෝරා ගන්නවා. තරුණ ශ්‍රමය රටේ ජවයයි. මේ ජවය රටක් ගොඩනැඟීමට අත්‍යවශ්‍ය වෙනවා. ඒ ආකාරයට රටක් ගොඩනැඟීමට නම්, ශිල්පීය ඥානය සමඟ මේ උදවියට වැඩ කටයුතු කරන්න පුළුවන් පරිසරය අපි හදන්නට ඕනෑ.

අපේ අමාත්‍යාංශය යටතේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගණනාවක් තිබෙනවා; කාර්මික විද්‍යාල තිබෙනවා; සාගර විශ්වවිද්‍යාලය තිබෙනවා; ජර්මන් ටෙක් ආයතනය තිබෙනවා; NAITA ආයතනය තිබෙනවා. මේ ආදී වශයෙන් ගත්තාම, කාර්මික විද්‍යාල විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඔවුන්ට මේ

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

කාර්මික විද්‍යාලවලට ඇතුළත්වීමට හැකියාව තිබෙනවා. අද මේ රටේ මෙසන්වරු, ඒ වාගේම වඩු කාර්මිකයන්, weldersලා, plumbersලා මේ ආදී වශයෙන් එම වෘත්තීන්වලට එන සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවා. මේ රට තුළ පමණක් නොවෙයි, මේ වෘත්තීන් සඳහා විදේශවල ද දැඩි ඉල්ලුමක් තිබෙනවා. එසේ තිබියදීත්, මේ වෘත්තීන්වලට යන උදවිය අඩු වෙන්නේ මොකද? තරුණ උදවිය දසලක්ෂයක් ත්‍රිරෝද රථ රියැදුරු රැකියාවේ යෙදී ඉන්නවා. ඒ ආකාරයට ත්‍රිරෝද රථ රියැදුරු රැකියාවේ යෙදීමේදී-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

හොඳයි. බොහොම ස්තුතියි.

ත්‍රිරෝද රථවලට සුදුසු රියැදුරන් යෙදීම මෙන්ම මීටර් යෙදීමත් අත්‍යවශ්‍යයි. එහෙම නැතිව මේ ව්‍යාපාරය කරන්නට බැහැ. මේ ව්‍යාපාරය කඩා වැටෙන්න දෙන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සඳහා විකල්පයක් තිබෙනවා. ත්‍රිරෝද රථය ධාවනය කිරීමට රියැදුරු බලපත්‍රයක් දීලා, වයස අවුරුදු 18දී තරුණයා ත්‍රිරෝද රථයට නග්ගන එක නොවෙයි කළ යුත්තේ. අපේ වැඩිමහල් උදවිය ඉන්නවා, මේ සමාජයේ. ඒ වාගේම, තමන් කරන ලද රැකියාවෙන් කල් වේලා ඇතිව -වේලාසනින්- විශ්‍රාම ගත්ත උදවිය ඉන්නවා. මේ විධියට වයස අවුරුදු 40 ඉක්මවූ උදවියට, "මහී ප්‍රවාහන ත්‍රිරෝද රථ ධාවනය" සඳහා රියැදුරු බලපත්‍රයක් ලබා දීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, එසේත් නැතිනම් ප්‍රවාහන අමාත්‍යාංශය යම් පියවරක් ගන්නට ඕනෑ.

මම කියපු පළියට මේක හෙට සිට පටන් ගන්නට බැහැ. දේශපාලන පක්ෂවල, සිවිල් සංවිධානවල වාගේම අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවල මේ පිළිබඳව සාකච්ඡා කරලා මේ රටේ තරුණයාගේ වටිනාකම ප්‍රයෝජනයට ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා. ඒ විධිමත් වැඩ පිළිවෙළ සකස් කළා නම් මේ තරුණ ජවය රටට නවෝදයක්, ප්‍රබෝධයක් ගෙනදීමට පාවිච්චි කරන්නට අපට පුළුවන් වෙනවා. එහෙම නැත්නම් මේ තරුණ ජවය ත්‍රිරෝද රථය ඇතුළේ නිකම්ම ගෙවිලා ඔවුන් මහලු මිනිසුන් බවට පත් වෙනවා. එයින් රටට වැඩක් නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපිට මේ අයගෙන් ප්‍රයෝජනයක් ගැනීම සඳහා විධිමත්ව, සැලසුම්සහගතව කටයුතු කරන්නට වෙනවා. අපි ඒ සැලසුම අනුව අනෙක් අංශවලින් පුහුණුව ලබා දෙන විට ඒ උදවියව තව පැත්තකින් පාලනය කරන්නට අවශ්‍ය වෙනවා. පාලනය කරලා යොමු කිරීමක් කරන්නට උදවු වෙන්නට ඕනෑ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාගේත්, නියෝජ්‍ය අමාත්‍ය ගරු අශෝක් අබේසිංහ මැතිතුමාගේත් අවධානය මේ පිළිබඳව යොමු කරලා, මගේ අදහස් පමණක් නොවෙයි තවත් විද්වත් අදහස් ලබාගෙන විධිමත් වැඩ පිළිවෙළක් සඳහා පියවර ගන්න කියලා ඉල්ලා සිටිමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.32]

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කරන ලද නියෝග සම්බන්ධව කරුණු කිහිපයක් එකතු කරන්නට අවස්ථාව ලබාදීම සම්බන්ධව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නියෝග දෙක පිළිබඳව මාගේ පෞද්ගලික මතය නම් මෙය ඉතාම වැදගත් කාරණාවක් බවයි. පළමුවෙන්ම, මේ රියැදුරු පුහුණු පාසල් නියාමනය කරන්නට, විධිමත් කරන්නට ගන්නා උත්සාහය පිළිබඳව ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමාට මාගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නියාමනය සහ විධිමත් කිරීම ක්‍රියාත්මක කරන විට මුහුණ දෙන ගැටලු පිළිබඳව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේත්, ගරු රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යවරයාගේත් කථාවලදී පැහැදිලිව කිව්වා. මේ නියෝග ක්‍රියාත්මක වන විට නියාමනය කිරීමේ වැඩසටහන අලුත් රියැදුරු පාසල් සම්බන්ධයෙන් නම් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට සහ දැනට ක්‍රියාත්මක වන රියැදුරු පුහුණු පාසල් සඳහා 2017 ජනවාරි 01වෙනි දා සිට ක්‍රියාත්මක වෙනවා කියන කාරණාව තමයි මේ නියෝගවල තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැනදී මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් තිබෙනවා. වර්තමානයේ මේ පුහුණු පාසල්වල පුහුණු කරන උපදේශකවරුන් සෑහෙන කාලයක් මේ ආයතනවල සේවය කරලා තිබෙනවා. ඒ වකවානුවේ මේ අය මේ පුහුණු වීම් පටන් ගන්නා විට මේ අයගේ සුදුසුකම්, අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සොයා බැලීමක් කරලා තිබුණේ නැහැ. මේ නියෝග ක්‍රියාත්මක කරන්නට හදන විට කොහොමද ඒක කරන්නේ කියලා මෙතැනදී පැහැදිලි කරලා කියන්නේ නැහැ. මම දකින විධියට අලුතෙන් පටන් ගන්නා රියැදුරු පුහුණු පාසල්වලට මේ නියෝග අද සිටම ක්‍රියාත්මක කිරීම කිසිම ගැටලුවක් නැහැ. නමුත් දැනට තිබෙන ආයතනවල පුහුණු වීම් කරන උපදේශකවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම් වාගේම ලබා දෙන ප්‍රායෝගික පුහුණුව ලබා දීමේදී - සමහර අයට කියවන්නට බැරිව ඇති, සමහර අයට ලියන්නට බැරිව ඇති. - ඒ අයගේ ප්‍රමිතිය පිළිබඳ සලකා බලා, ඒ අයට ගැළපෙන වැඩ පිළිවෙළක් හදලා ඒ අයටත් ඒ රැකියාවේ නිරත වන්නට පුළුවන් පසුබිමක් නිර්මාණය කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ලියා පදිංචි රියැදුරු පාසල් තිබුණත් බලපත්‍ර ගැනීමේදී බ්‍රෝකර්වරුන් හරහා පෞද්ගලිකව රියැදුරු බලපත්‍ර ලබා ගැනීමට හැකි වාතාවරණයක් අද තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණයත් කිව යුතුව තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත් මගේ දරුවෙකුට licence එකක් ගන්න ඕනෑ නම් අද වන විට පුළුවන්කම තිබෙනවා, ඒ දරුවාගේ පුහුණුවීම මගේ වාහනයකින් මට ලබා දෙන්නට. නමුත් මේ නියෝග ක්‍රියාත්මක වෙන විට මේ රියැදුරු බලපත්‍ර ලබා ගන්න වෙන්නේ රියැදුරු පුහුණු පාසල් හරහාම නම්, ඒ වාගේ අවස්ථාවකදී වියදමක් කරන්නට බැරි කෙනෙකුට ලොකු බර පැනක් දරන්නට සිද්ධ වුණොත් මම හිතනවා, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා වාගේ, වැඩි පිරිසක් රියැදුරු බලපත්‍ර නැතිව වාහන ධාවනය කරන්නට පටන් ගනී කියලා.

ඒ නිසා පෞද්ගලිකව තමන්ට හැකියාවක් තිබෙනවා නම් තමන්ගේ ගෙදර තිබෙන වාහනයක් පාවිච්චි කරලා හෝ ඒ අයට රියැදුරු බලපත්‍රය ලබා ගැනීමට පහසු වන විධියට වැඩ පිළිවෙළකුත් මේ තුළින් සකස් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් රියැදුරු පාසල්වලින් අය කරන මිල ගණන්වල යම් සටහනක්, මිල පාලනයක් ඇති කරන්න වෙනවා. මෙහිදී මාස තුනක පුහුණුවක් ලබාගත යුතුය කිව්වාට, මාස තුනක පුහුණුවකට වඩා ඒක පැය ගණනක පුහුණුවක් ලෙස හඳුන්වා දීලා වුවමනා කෙනෙකුට කෙටි කාලයක් තුළ ඒ බලපත්‍රය ලබාගැනීම සඳහාත් අවශ්‍ය කටයුතු කෙරෙනවා නම් වඩාත් හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ රියැදුරු බලපත්‍රයක් ලබා ගන්න නම් වයස අවුරුදු 18ක් වන තුරු ඉන්න ඕනෑ. නමුත්, සමහර විදේශ රටවලට ගියාම අප දකිනවා පාසල් යන දරුවන් තමන්ගේ පාසලට වාහනයෙන් එන ආකාරය. ඒ අයට අවුරුදු 16දී වාහන බලපත්‍රයක් ලබා ගැනීමට අවස්ථාව හිමි වෙනවා; "P" අකුර ගහලා ඒ වාහනය ධාවනය කරන්න පුළුවන් විධියට ඒ පුහුණුවත් එක්කම permit එකක් නිකුත් වෙනවා. එතකොට ඔවුන් වාහනය ධාවනය කරද්දි වැඩිහිටියෙක් - licence එකක් තිබෙන කෙනෙක් - එක්ක යන්නත් පුළුවන්. එහෙම නැත්නම් permit එක ගහ ගත්තාම ඔහුට යම්කිසි කාල සීමාවක් ඒ permit එක තුළින් වාහනය ධාවනය කිරීමටත් හැකියාව තිබෙනවා. එම නිසා අවුරුදු 18 කියන මේ වයස් සීමාව අවුරුදු 16 දක්වා අඩු කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට, උසස් පෙළ හදාරන්න යන්න ඉස්සර වෙලා තිබෙන කාල සීමාව තුළ මේ පුහුණුව ලබා ගැනීමේ හැකියාව ලැබෙයි කියා මා හිතනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විශාල වශයෙන් මුදල් සංසරණය වන තැනක් නිසා එහි දූෂණ වෙනවා කියා ගරු අමාත්‍යතුමා කිව්වා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න වෙනවා. ප්‍රවාහන සේවයේ වෙනසක් ඇති කිරීමේ අරමුණින් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ආරම්භ කළ පෞද්ගලික බස් රථ සේවාව හා ත්‍රිරෝද රථ පිළිබඳව අද ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා කථා කළා. පෞද්ගලික බස් රථ සේවය ආරම්භ කළේ සද්භාවයෙන්; රටේ ජනතාවට ප්‍රවාහන පහසුකම් ලබාදෙන්නයි. නමුත්, වර්තමානයේදී මේ පෞද්ගලික ප්‍රවාහන සේවාව ඒකාධිකාරයක් බවට පත් වෙලා තිබෙනවා. ගම්වල ලාභ ලබන මාර්ගවල පවා රාත්‍රී නවයෙන් පසුව බස් රථ ධාවනය නොවන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මෙය පසු ගිය යුද්ධ කාලයේ පැවති වාතාවරණය උඩ ඇති වුණු දෙයක්. අද පාඩු ලබන මාර්ගවල බස් රථ ධාවනය කෙරෙන්නේම නැහැ. නමුත්, ඒ කාලයේ CTB බස් රථ ධාවනය වෙන කොට පාඩු ලබන මාර්ගවල පවා රැ වනතුරුම ඒ බස් රථ ධාවනය වුණා. ලාභ ලබන මාර්ගවලින් ලැබූ ආදායමින් තමයි ඒවායේ පාඩුව පියවා ගත්තේ. වර්තමානයේ තනි පුද්ගල බස් රථ තිබෙන නිසා තමයි මේ ප්‍රවාහන සේවාවේ සාර්ථකභාවයක් ලබාගන්න බැරි වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, අද ප්‍රවාහන සේවාවේ යෙදී සිටින පෞද්ගලික බස් හිමියන්ට රජයන්වලට පවා බලපෑම් කරන්න පුළුවන් පසු බිමක් නිර්මාණය වෙලා තිබෙනවා. අද මේ රටේ බහුතරයක් ප්‍රවාහන පහසුකම් ලබාගන්නේ පෞද්ගලික බස් රථ තුළින් වීමයි එයට හේතුව.

ඊළඟට, ත්‍රිරෝද රථ ගැනත් මම කියන්න ඕනෑ. අද මේ රටේ ත්‍රිරෝද රථ ලක්ෂ 10කට අධික සංඛ්‍යාවක් තිබෙනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මාර්ගස්ථ ප්‍රවාහන සේවාවන් අයත් වන්නේ ඒ අදාළ පළාත් සභාවලටයි. ඒ නිසා රජය ගන්නා හැම තීන්දුවක්ම පළාත් සභා සමඟ සාකච්ඡා කරලා ගත යුතුය කියායි මා විශ්වාස කරන්නේ. මොකද, අප මේ පාර්ලිමේන්තුව තුළ ගන්නා නියෝග ක්‍රියාත්මක කරන්න පළාත් සභා බැඳී සිටිනවා වාගේම, පළාත් සභාවල එකඟතාවත් මේ සඳහා ගත යුතු වෙනවා. නීති - රීති හදද්දි ඒ කටයුතු කරන්න වෙනවා. ඒ නිසා ප්‍රවාහන අමාත්‍යවරයා පළාත් ප්‍රවාහන අමාත්‍යවරු සමඟ සාකච්ඡා කරලා ජාතික මට්ටමින් මේ කටයුත්ත කරන්න ඕනෑ. මේ කාර්යය රජයට බරක් කර ගන්න බැහැ. අද පළාත් සභාවල ප්‍රවාහන අධිකාරි පිහිටුවා තිබෙනවා. නමුත්, අද ඒවා පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පෞද්ගලික ප්‍රවාහන සේවාව ආරම්භ කරනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැත් පෞද්ගලික බස් රථ පළාත තුළ ක්‍රියාත්මක වීමේ අයිතිය පිළිබඳව කටයුතු කිරීම පළාත් සභාවලට භාර දෙනවා. පළාත් සභා විසින් මේ සඳහා අධිකාරි පිහිටුවා තිබෙනවා. ආරම්භයේදී සුළු සේවක සංඛ්‍යාවකින් ආරම්භ කරන ලද මෙම ආයතන රැකියා ලබා දෙන තත්ත්වයට පත් වෙලා අද ඒ සෑම අධිකාරියක්ම පාඩු ලබනවා. මේ පාඩුව පියවා ගන්න හදන්නේ පෞද්ගලික බස් රථවලින් ලබාගන්නා ආදායමින්. ඒ නිසා ඒ අයට එන්න එන්නම විශාල බරපැනක් පළාත් සභාවලින් දමනවා. ඒ බරපැන දමන කොට තමයි පෞද්ගලික බස් රථ ව්‍යාපාරයේ යෙදෙන අය බස් ගාස්තු වැඩි කරලා මුදල් ලබා ගන්න කටයුතු කරන්නේ. ඒක වක්‍රාකාරයෙන් ජනතාවට බලපාන නිසා මේ දේවල්වල යම් පාලනයක් ඇති කරන්න ඕනෑ. ඒ පාලනය ඇති කරන්න රියැදුරන් සහ කොන්දොස්තර මහතුන් පුහුණු මධ්‍යස්ථානවලට යොමු කරලා ඒ අයටත් පුහුණුවක් ලබා දෙන්න ඕනෑ. එතකොට වඩා විනීත වූ ප්‍රවාහන සේවාවක් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ත්‍රිරෝද රථ සේවාව ගැන කථා කළොත්, ඒ අය එය ස්වයං රැකියාවක් විධියට කරනවා. රජයට බරක් පටවන්නේ නැහැ. ඒ අය ප්‍රවාහන සේවාව වෙනුවෙන් තමන්ගේ සේවය ලබා දෙන්න කටයුතු කරනවා. ඒ අයටත් විධිමත් පුහුණුවක් ලබාදීම අවශ්‍ය වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ත්‍රිරෝද රථ රියැදුරන්ට පවා පුහුණුවක් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා ඒ අයගෙනුත් වඩා උසස් ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් පසුබිමක් නිර්මාණය වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අරමුණ වන්නේ මහජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීමයි. මීට පෙර වාහන පොතක් සංශෝධනය කර ගන්න ගියාම ඉතා ඉක්මනින් එය කර දීමේ හැකියාවක් තිබුණා. ඒකට හේතුව තමයි අදාළ අංශයේ ප්‍රධානියාට එය අනුමත කළ හැකිවීම. නමුත් දැන් ඒ සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් හා නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් අත්සන් තැබිය යුතුයි කියන නියෝගයක් ක්‍රියාත්මක වෙන නිසා මේ කටයුත්ත ප්‍රමාද වෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තිබෙන ගැටලුව තමයි කෙනෙක් රියැදුරු බලපත්‍රයක් ගන්න වේවා, වාහනයක් ලියා පදිංචි කරන්න වේවා ආවාම ඒ සඳහා ඔහුට ගත කරන්න සිදුවන කාලය විශාල වීම. ඒකට හේතුව නීතිරීති තද කිරීමයි. නීතිරීති තද කරලා හොරකම් අඩු කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් ඒකෙන් වෙන්නේ හොරකම සහ දූෂණය ඊට වඩා එහා යෑමයි. මොකද, එන පුද්ගලයා බලන්නේ කාටහරි සල්ලි දීලා තමන්ගේ අවශ්‍යතාව ඉටු කරගන්නයි. ඒ නිසා

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

මේ නීති-රීති ලිහිල් කරලා හොරකම් හෝ වැරදි වැඩ කරන මිනිසුන්ට දඬුවම් දෙන ක්‍රමවේදයක් හදලා නීතිගරුක අයත් එක්ක කටයුතු කරන්න පුළුවන් පසුබිමක් මෙම දෙපාර්තමේන්තුව තුළ සකස්විය යුතුයි කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. අடுத்து, கௌரவ சி. சிறீதரன் அவர்கள்!

[பி.ப. 3.43]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சாரதிப் பயிற்சிப் பாடசாலைகளூடாக அனுமதிப்பத்திரங்கள் பெறுவது சம்பந்தமாகப் பல்வேறுபட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டாலும் சாரதி அனுமதிப்பத்திரங்களை வைத்திருக்கின்ற எல்லோருக்கும் சரியான முறையில் வேலைவாய்ப்புக்கள் வழங்கப்படுகின்றதா என்பது கேள்விக்குறியே! குறிப்பாக சரணடைந்த முன்னாள் போராளிகளுக்குப் புனர்வாழ்வு முகாம்களில் புனர்வாழ்வளிக்கப்பட்டதுடன் சிலருக்குச் சாரதி அனுமதிப்பத்திரங்களும் வழங்கப்பட்டிருக்கின்றன. அவர்களில் ஏற்கெனவே சாரதி அனுமதிப்பத்திரங்களை வைத்திருந்தவர் களும் புனர்வாழ்வு பெற்று வெளியிலே வந்த பின்னர் சாரதி அனுமதிப்பத்திரங்களைப் பெற்றவர்களும்கூட இருக்கின் றார்கள். ஆனால், அரச நிறுவனங்களில் குறிப்பாக இலங்கைப் போக்குவரத்துச் சபையிலோ அல்லது அரச திணைக் களங்களிலோ அவர்கள் சாரதி வேலை பெற்றுக்கொள்வதற் கான வாய்ப்பு மிகமிக அரிதாகவே காணப்படுகின்றது. அதற்குப் பல்வேறுபட்ட காரணங்கள் சொல்லப்படுகின்றன. அதாவது அவர்கள் வயதில் கூடியவர்களாக இருக்கின்றார்கள் அல்லது அவர்களுக்கு அதற்கான கல்வித்தரம் இல்லை என்று கூறப்பட்டு அந்த வாய்ப்பு வழங்கப்படாமல் பின்னடிக்கப் படுகின்றது. ஆகவே, சாரதி அனுமதிப்பத்திரங்களை வைத்திருக்கும் பல்வேறுபட்ட திறமைகளைக் கொண்ட முன்னாள் போராளிகளுக்கு ஒரு வயது எல்லையை வரைய றுத்து, திணைக்களங்களிலும் இலங்கைப் போக்குவரத்துச் சபை போன்ற நிறுவனங்களிலும் சாரதி பதவிகள் வழங்கப்பட வேண்டும். இதற்கு இலங்கைப் போக்குவரத்துச் சபை நடவடிக்கை எடுக்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் நான் அமைச்சர் அவர்களினூடாக ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன்.

குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே இருக்கின்ற முன்னாள் போராளிகள் இவ்வாறான அனுமதிப்பத்திரங்களை வைத்திருந்தும்கூட அவர்களுக்கு அந்த வேலைவாய்ப்புக்கள் கிடைப்பதில்லை. அங்கேயுள்ள பல்வேறு திணைக்களங் களிலோ அல்லது அங்கிருக்கின்ற மாவட்டங்களான அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை, வவுனியா, மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி, யாழ்ப்பாணம் போன்ற வற்றில் இருக்கின்ற போக்குவரத்துச் சபைச் சாலைகளிலோ அந்தந்த மாவட்டங்களைச் சேர்ந்தவர்களுக்கு இந்த வேலைவாய்ப்புக்கள் வழங்கப்படுவதில்லை. குறிப்பாக, கிளிநொச்சி மாவட்டத்தில் வேலை செய்கின்ற நடத்துநர்கள், சாரதிகளில் அந்த மாவட்டங்களைச் சேர்ந்தவர்கள் மிகமிகக் குறைவு. ஒரு குறிப்பிட்ட எண்ணிக்கையானோர் மட்டுமே அங்கு வேலை செய்கின்றார்கள். இதனால் அந்த மாவட்டங்களில் சரியான போக்குவரத்துப் பணிகளை வழங்க முடிவதில்லை. ஆகவே, அந்த மாவட்டங்களிலே நிரந்தரமாக வசிக்கின்றவர்களிலிருந்து நடத்துநர் நியமனங்களையும் சாரதி அனுமதிப்பத்திரங்கள் வைத்திருப்பவர்களுக்குச் சாரதி நியமனங்களையும் இலங்கைப் போக்குவரத்துச் சபை வழங்குமானால் சிறந்த, காத்திரமான, வினைத்திறனுடைய ஒரு போக்குவரத்துச் சேவையை மக்களுக்கு வழங்கக் கூடியதாக இருக்கும்.

போக்குவரத்துச் சேவையிலே ஈடுபடுகின்ற இலங்கைப் போக்குவரத்துச் சபைக்குச் சொந்தமான பல பேருந்துகள் பாடசாலைப் பிள்ளைகளை ஏற்றுவதில்லை. பாடசாலைப் பிள்ளைகளைத் தெருவிலே நிற்க விட்டுவிட்டு அவை தனியார் பேருந்துகளோடு போட்டிபோட்டு ஓடுகின்ற சூழல்தான் இன்று அதிகரித்திருக்கின்றது. இதனால் ஊழல் நிறைந்த நிலைமை அல்லது யார் கூடுதலான பணம் சேகரிப்பது என்ற ஒரு போட்டித்தன்மைதான் அங்கே உருவாக்கப்படுகின்றது. இது நிறுத்தப்பட வேண்டும். இலங்கைப் போக்குவரத்துச் சபையானது மக்களுடைய தேவைக்காக, மக்களுக்கான வாழ்க்கையில் மாற்றங்களைக் கொண்டுவருவதற்காக 1978ஆம் ஆண்டுவரை ஒரு நல்ல சேவையை வழங்கியிருந்தது. 1978ஆம் ஆண்டுக்குப் பின்னர் தனியார்துறை அபிவிருத்தி செய்யப்பட்டு தனியார்துறையினரின் போக்குவரத்துச் சேவைகள் அதிகரிக்கப்பட்டன. அவ்வாறு அதிகரிக்கப்பட்ட தனியார்துறையினரின் போக்குவரத்துச் சேவைகள் இலாபம் ஈட்டுவதை நோக்கமாகக் கொண்டிருப்பதனால், இலங்கைப் போக்குவரத்துச் சபையானது மக்களுக்கான பணியைச் சரியாக வழங்கவேண்டும். ஆனால், அது அதிலிருந்து விலகிச்செல்கின்றது.

கௌரவ பிரதியமைச்சர் அவர்களே, நீங்கள் குறிப்பாக கிளிநொச்சி போக்குவரத்துச் சாலையை ஒருமுறை வந்து பாருங்கள்! இலங்கையிலே கணனி வசதிகூட இல்லா திருக்கின்ற ஒரேயொரு போக்குவரத்துச் சாலையாக அது இருக்கின்றது. அந்தச் சாலையிலிருந்து பல்வேறுபட்ட இடங்களுக்கு போக்குவரத்துச் சேவைகள் இன்னமும் வழங்கப்படாத நிலை காணப்படுகிறது. ஏனெனில், அங்கே சேவையில் ஈடுபடுத்தக்கூடிய பேருந்துகளோ புதிய பேருந்துகளோ இல்லை. இவ்வாறான சூழல்தான் பல்வேறு மாவட்டங்களில் நிலவுகின்றது. கிளிநொச்சி மாவட்டத்திலே கரைச்சி பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட செல்வா நகர், மலையாளபுரம், பாரதிபுரம், மாயவனூர் போன்ற மிக முக்கியமான கிராமங்களுக்கும் கண்டாவளைப் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட கல்லாறு, சுண்டிக்குளம், புன்னை நீராவி, பிரபந்தனாறு, கண்ணகி நகர் போன்ற முக்கியமான கிராமங்களுக்கும் பூநகரிப் பிரதேச செயலாளர் பிரிவுக்குட் பட்ட தெளிகரை, பள்ளிக்குடா, நாலாங்கட்டை, பூநகரி போன்ற கிராமங்களுக்கும் இதுவரை இலங்கைப் போக்கு வரத்துச் சபையின் சேவை வழங்கப்படவில்லை. இதனால் இந்தக் கிராமங்களிலுள்ள மக்கள் இலங்கைப் போக்குவரத்துச் சபையின் சேவையைப் பெற முடியாதவர்களாக இருக்கின் றார்கள். ஆயிரக்கணக்கான மக்கள் வாழ்கின்ற இந்தப் பிரதேசங்களில் இவ்வாறான ஒரு நிலைமை இருப்பதற்குப் பல்வேறுபட்ட காரணங்கள் சொல்லப்படுகின்றன. அதே நேரம், இலங்கைப் போக்குவரத்துச் சபை இலாபத்தில் இயங்குவதாகக் கூறப்படுகின்றது. அதனை மேலும் அதிகரிப் பதற்கான முயற்சிகளும் மேற்கொள்ளப்படுகின்றன. ஆனால், இந்த மக்கள் இன்றும் போக்குவரத்துச் சேவையை அனுப விக்க முடியாதவர்களாகக் காணப்படுகின்றார்கள்.

අடුත්තු, මික මුක්කියමාක ඉන්තප් පෝක්කුවරත්තුටන් තොටර්පුටෙය වාකනංකළ් තොටර්පාකවුම් පේසවේණ්ටුම්. 2006ආම් ආණ්ටු මට්ටක්කළප්පු මාවට්ටත්තිලේ මේර්කොළ්ළප්පට්ට යුත්තත්තින්පෝතු පලර් ඉටම්පෙයර්න්තු වාකරෙ, වෙරුකල් පෝන්ර ඉටංකළුක්කු අළෛත්තුච් චෙල්ලප්පට්ටාර්කළ්. අවර්කළුටෙය පල්වේරුපට්ට වාකනංකළ් අරස පටෛකළාල් කෛයකප්පටුත්තප්පට්ටන. අතේපෝල් 2009ආම් ආණ්ටු වවුනියා වටක්කු, මන්නාර් මටුප් පිරතේසම්, මර්රුම් කිළිනොච්චි, මුල්ලෛත්තීවු ආකිය මාවට්ටංකළිලුම්, යාழ්ප්පාණත්තිල් වටමරාට්චි කිழක්කු පෝන්ර පකුතිකළිලුම් වාழ්න්ත මක්කළුටෙය වාකනංකළ් - අවර්කළුටෙය චොත්තුක්කළ් - අවර්කළ් යුත්තත්තාල් කලෛක්කප්පටුක් කලෛක්කප්පට්ටු මුள්ළිවාය්ක්කාලිලේ කොණ්ටුපෝය් විටප්පට්ට නිලෙයිල් කෛවිටප්පටවේණ්ටිය නිර්ප්පන්තත්තුක්කුळ්ළායින. ඉන්රුවරෙ අන්ත මක්කළුටෙය වාකනංකළ් අවර්කළුක්කුක් කෛයළික්කප්පටවිල්ලෛ. චිලරුක්කුරිය චිල වාකනංකළ් පළුතටෛන්ත නිලෙයිල්, අழින්තුපෝන නිලෙයිල් කණ්ටෙටුක්කප්පට්ටාලුම්, අන්ත මක්කළිටමිරුන්ත උழවියන්තිරංකළ්, මකිළ්න්තුකළ් පෝන්ර චිල වාකනංකළෛ ඉන්රුම් ඉරාණුවත්තිනර් වෛත්තිරුක්කින්රාර්කළ්. ඉන්නමුම් චරියාන මුරෙයිල් අවෛ මක්කළිටම් කෛයළික්කප්පටවිල්ලෛ. ඉතනෛවිට, යුත්තත්තින්පෝතු අழික්කප්පට්ට වාකනංකළුක්කාන නට්ටෛටු අන්ත මක්කළුක්කු වළංකප්පටවිල්ලෛ. අවර්කළ් කටන්පට්ටු, 'ලීසිංක්' වසතියිල්, පණත්තෛ වට්ටික්කෙටුත්තු මිකක් කටිනමාන චූළලිල් ඉන්ත වාකනංකළෛක් කොළ්වනවු චෙය්තු වෛත්තිරුන්තාර්කළ්. එනවේ, අවර්කළුටෙය අන්ත වාකනංකළුක්කාන ඉழප්පීටුකළ් අරචාංකත්තාල් වළංකප්පටාතු ඉතුවරෙ ඉழුත්තටික්කප්පටුවතු මිකමික වේතනෛයානතු. මික මුක්කියමාක කිළිනොච්චි, මුල්ලෛත්තීවු මාවට්ටංකළි ලිරුක්කින්ර වර්ත්තකර්කළුටෙය චොත්තුක්කළෙල්ලාම් 100 වීතම් අழික්කප්පට්ටන. ඉව්වාරු අழික්කප්පට්ට චොත්තුක්කළුක්කාන විපරංකළුම් අරස චෙයලකංකළිනාල් පෙරප්පට්ටන. ඉව්වාරු විපරංකළ් පෙරප්පට්ටාලුම්කූට අන්තන්ත මාවට්ටංකළිල් අවර්කළුක්කාන compensation - නට්ටෛටුකළ් ඉතුවරෙ වළංකප්පටවිල්ලෛ එන්පතු මිකමිකත් තුර්ප්පාක්කියමානතු. ආකවේ, ඉන්ත විටයංකළ් කවනත්තිලෙටුක්කප්පට්ටු අවර්කළුක්කාන නිවාරණංකළ් කිටෛප්පතර්කාන වළිමුරෛකළ් මේර්කොළ්ළප්පට වේණ්ටු මෙන මුක්කියමාන ඉන්ත විවාතම් නටෛපෙරුකින්ර ඉව්වේළෛයිල් නාන් කුරිප්පිට විරුම්පුකින්රේන්.

නාන් මීණ්ටුම් ඉන්තච් චාරතිකළ් පයිර්චිප් පාටචාලෛ තොටර්පාකක් කුරිප්පිට විරුම්පුකින්රේන්. වටක්කු, කිழක්කිලේ ඉරුක්කින්ර චාරතිකළෛ නීංකළ් අපිවිරුත්ති චෙය්ය විරුම්පිනාල්, ඉලංකෛප් පෝක්කුවරත්තුච් චපෛයිනූටාක චාරතිකළ් පයිර්චිප් පාටචාලෛයොන්ර නීංකළ් උරුවාක් කලාම්. තමිழීழ විටුතලෛප් පුලිකළ් ඉරුන්ත කාලත්තිලේ, තේරාවිල් පකුතියිල් චාරතිකළුක්කාන ඔරු පයිර්චිප් පාටචාලෛයෙය නිරුවියිරුන්තාර්කළ්. අංකේයිරුක්කින්ර චාරති වෙර්රිටංකළෛ නිරප්පුවතර්කාක, ඔරු තකුන්ත විනෛත්තිරනුටෙය නල්ල පයිර්චි පෙර්ර චාරතිකළෛ උරුවාක්කුවතර්කාක තමිழීழ විටුතලෛප් පුලිකළාල් නල්ලතොරු චාරතිකළ් පයිර්චිප් පාටචාලෛයාක අතු උරුවාක්කප්පට්ටිරුන්තතු. ඉන්රු ඔර් ඉරාණුව මුකාමාක අතු ඉරුක්කින්රතු. ඉව්වාරු අවර්කළාල් චෙය්ය මුටින්ත තෙන්රාල්, ඒන් අරචාංකත්තිනාල් චාරතිකළුක්කාන අනුමතිප්පත්තිරත්තෛ වළංකුවතර්කාන චාරතිකළ් පයිර්චිප් පාටචාලෛයොන්ර නල්ල මුරෙයිල් ඉයක්ක මුටියාතු? ඉතු තනියාරිටම්තාන් ඉරුක්කවේණ්ටුමා? අව්වාරු ඉතෛ අරචාංකම් ඉයක්කිනාල්, අන්තප් පයිර්චිප් පාටචාලෛයි ලිරුන්තු වෙළියේයුකින්රවර්කළුක්කු අරස තිණෛක්කළංකළිල් අல්ලතු ඉලංකෛප් පෝක්කුවරත්තුච් චපෛයිල් නේරටියාකවේ වේලෛ වාය්ප්පුක්කළෛ වළංකක්කූටිය නිලෛ උරුවාකුම්. ඉන්ත නිලෛයිල් ඉලංකෛප් පෝක්කුවරත්තුච් චපෛක්කු ඔරු පොරුප්පිරුක්කින්රතු; කටමෛයිරුක්කින්රතු. එනවේ, ඉතනෛච් චරියාකක් කණක්කිලෙටුත්තු, වටපිරාන්තිය චපෛ යිලෝ අல්ලතු කිழක්කුප් පිරාන්තිය චපෛයිලෝ අல්ලතු ඒතෝ ඔර් අටිප්පටෛයිල් ඉණෛන්තවකෛයිලෝ චාරතිකළ් පයිර්චිප් පාටචාලෛයොන්ර උරුවාක්කුවතර්කු මුයර්චික්ක වේණ්ටුමෙන්රු කේට්ටු, නිරෛවුචෙය්කින්රේන්. නන්රි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Ajith Mannapperuma. Before he speaks, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. LUCKY JAYAWARDANA took the Chair.

[අ.භා. 3.51]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ වර්ෂයකට රිය අනතුරු 35,000ක් - 40,000ක් අතර ප්‍රමාණයක් සිදු වනවා. එයින් සියයට 85ක්ම සිදු වෙන්නේ රියැදුරන්ගේ නොසැලකිලිමත්කම නිසායි. ඒ රිය අනතුරු සංඛ්‍යාවෙන් සියයට 45ක්, -ඒ කියන්නේ භාගයකට ආසන්න සංඛ්‍යාවක්- බරපතළ රිය අනතුරු විධියට වාර්තා වනවා. රිය අනතුරු නිසා දවසකට මේ රටේ පුද්ගලයන් 7ක් - 8ක් පමණ මිය යනවා. ඒ අනුව වර්ෂයකට 3,000ක් පමණ රිය අනතුරු නිසා මිය යනවා. මේ මිය යන අයගෙනුත් වැඩි පිරිසක් අවුරුදු 21ත් - 25ත් අතර තරුණ අය. රිය අනතුරු නිසා හදිසියේ තමයි ඒ අය මිය යන්නේ. පවුලක දෙමව්පියන්, දරුවන්, යැපෙන්නන් තමයි මේ රිය අනතුරු නිසා මිය යන්නේ. රටට ඉතා වැදගත්, අත්‍යවශ්‍ය පුද්ගලයන් තමයි මෙසේ මිය යන්නේ. ඒ නිසා අපේ ගරු ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා හා නව රජය රියැදුරන් පුහුණු කිරීමේ ආයතන ගැන අවධානය යොමු කිරීම ඇත්තටම සතුටට කරුණක්. මේ ගැන ගොඩක් හිතන්න ඕනෑ; ගොඩක් බලන්න ඕනෑ. මොකද, මේ රටේ වැඩි පිරිසක් මිය යන්නේ ඩෙංගු නිසාවත්, වෙනත් රෝගයක් නිසාවත් නොවෙයි, රිය අනතුරුවලින් වන නිසා. මේ සම්බන්ධව අවධානය යොමු කිරීම ගැන විශේෂයෙන්ම ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන පද්ධතිය ගැන කථා කළොත්, ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය වීමට සාධක හතරක් අවශ්‍යයි. ඒ සඳහා මාර්ග, වාහන, රියැදුරු මෙන්ම මාර්ග නීතිත් අවශ්‍යයි. මේ සාධකවලින් එකක් තිබූ පමණින් ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය වෙන්නේ නැහැ. මේ හතරම එක් වුණාම තමයි ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය වෙන්නේ. මාර්ගයක් තිබුණු පළියට වාහනයක් නැත්නම්, වාහනයට රියැදුරෙක් නැත්නම්, මාර්ග නීති ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය වෙන්නේ නැහැ. ඒ නිසා අපි රිය අනතුරු වළක්වා ගැනීම සඳහා කටයුතු කිරීමේදී මේ කරුණු හතරේම සම්බන්ධය ගැන සොයා බැලීම ඉතාම වැදගත් වනවා.

අනතුරු අවම කිරීමේ ක්‍රියාවලියේදී පළමුවැනි සාධකය හැටියට මාර්ග කෙරෙහි අපේ අවධානය යොමු කළොත්, මාර්ගවල ක්‍රමවත්භාවයක් නැති නිසා, මාර්ග හොඳ තත්ත්වයෙන් නැති නිසා රිය අනතුරු සිදු වන බව පෙනෙනවා. සමහර විට හැරවුම් ස්ථානයක් නිවැරදි විධියට, අවශ්‍ය විධියට නිර්මාණය වෙලා නැත්නම්, ඒ කියන්නේ ඒ කෝණය - curvature - හරි විධියට නිර්මාණය වෙලා නැත්නම් රිය අනතුරු සිද්ධ වනවා. අපි පාරවල දකිනවා, "රිය අනතුරු බහුල ප්‍රදේශ" කියලා සඳහන් කර තිබෙන බව. මෙන්න මේ ප්‍රදේශයේ, මේ ස්ථානයේ රිය අනතුරු බහුලව සිදු වනවා කියලා දන්වා තිබෙනවා. එතකොට ඒක ඒ මාර්ගයේ තිබෙන ප්‍රශ්නයක්. ඒක වාහනය නිසාවත්, රියැදුරු නිසාවත්, එහෙම නැත්නම් මාර්ග නීති නිසාවත් ඇතිවන ප්‍රශ්නයක් නොවෙයි. උදාහරණයක් කිව්වොත්, ගම්පහ දිස්ත්‍රික්කය හරහා යන නුවර-කොළඹ පාරේ මීරිස්වත්ත මංසන්ධියේ පාර පළලට තිබෙනවා. නමුත් ඊට ආසන්න බෝක්කුව ළඟදී පාර පටු වනවා. ඒ නිසා එතැන රිය අනතුරු සිද්ධ වෙන්න පටන් ගත්තා. නමුත්, පසුව ඒ රිය අනතුරු සිදුවීම අපට වළක්වා ගන්න පුළුවන් වුණා, සංඥා පද්ධතියක් ඇති කරලා. එතකොට රියැදුරාට කල් තියා දැනගන්න පුළුවන් පාරේ ඉදිරියෙන් තිබෙන අවස්ථාව මොකක්ද, ඉදිරියෙන් තිබෙන පසු බිම මොකක්ද කියලා. එසේ දැන ගැනීමට සැලැස්වීමටත්, රියැදුරාට ඒ සඳහා සූදානම් වීමටත් සංඥා අවශ්‍ය වනවා. නමුත් අද බොහෝ විට අපි දන්නවා, colour lights පවා ක්‍රියාත්මක වෙන්නේ නැති බව. ඒක මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩක්. නමුත්, මාර්ග ආරක්ෂාව පිළිබඳව සිතීමේදී safety division කියලා එකක් තිබෙන්න ඕනෑ බව මම හිතනවා. නමුත්, අද එහෙම safety division එකක් නැහැ. මම අහලා තිබෙනවා, safety division එකක කටයුතු කිරීම සඳහා මුළු ලංකාවේම ඉන්නේ ඉංජිනේරු මහත්වරු දෙදෙනෙකු විතරයි කියලා. ඒ නිසා විශේෂයෙන්ම අපට ඒ ගැනත් අවධානය යොමු කරන්න සිද්ධ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වාහන ගෙන්වීමේදී ආරක්ෂාව පිළිබඳව ප්‍රමිතීන් තිබෙනවා. අපේ රටේ තිබෙන වාහනවලින් සියයට 85ක් විතර තිබෙන්නේ, three-wheelers සහ motorcycles. මේවායින් තමයි රිය අනතුරු වැඩියෙන් සිද්ධ වෙන්නේත්. ත්‍රිරෝද රථ තිබෙනවා; මෝටර් සයිකල් තිබෙනවා; තව "බට්ටා" කියලා වාහනයක් තිබෙනවා. එහෙම නැත්නම්, "බට්ටි" කියලා කියයි; "මැස්සා" කියයි; "මැස්සි" කියයි. මේ මොන නම කිව්වත්, එම වාහනවල රියදුරාට හෝ එහි යන මඟීන්ට ආරක්ෂාවක් තියෙනවාද? ආරක්ෂක පද්ධතියක් ගැන අපි සැලකිලිමත් වෙලා තිබෙනවාද? ඉස්සර අපි ජපානයේ පාවිච්චි කරපු reconditioned වාහනයක් ලංකාවට ගෙනාපුවාම, ඒකේ ආරක්ෂාව පිළිබඳව යම් පද්ධතියක් ක්‍රියාත්මක වෙනවා. අපි ගොඩාක් වෙලාවට බලන්නේ වාහනයේ රෝද හතර කැරකෙනවාද කියලා විතරයි. ඒකෙන් යන්න පුළුවන් නම්, වාහනය ආනයනය කරන්න දෙනවා. ඉන්දියන් වාහන වෙන්න පුළුවන්; චීන වාහන වෙන්න පුළුවන්; මේ වාහන අඩු මුදලට අපේ රටට ආනයනය කරනවා. නමුත්, මේ වාහනවලින් ලැබෙන ආරක්ෂාව ගැන අපි තැකීමක් කරන්නේ නැහැ. එහෙම නම්, වාහනයක් ආනයනය කිරීමේදී එහි ගමන් කරන අයගේ ආරක්ෂාව පිළිබඳවත්, එහි ක්‍රියාකාරී තත්ත්වය පිළිබඳවත් අප සැලකිලිමත් විය යුතුයි. ඒ වාගේම එම වාහනය ධාවනය කිරීමේ දී පාරේ යන මඟීන්ගේ ආරක්ෂාව පිළිබඳව, එහෙම නැත්නම් තුන්වන පාර්ශ්වයේ ආරක්ෂාව පිළිබඳවත් ගෙන තිබෙන පියවර පිළිබඳවත් ඉදිරියේදී අපිට සැලකිලිමත් වන්නට සිද්ධ වෙනවා.

ඊළඟට, රියදුරා සම්බන්ධයෙනුත් කිව යුතුයි. රියදුරා ගැන කථා කරන්නට මෙය විශේෂ අවස්ථාවක් කියලා මම හිතනවා. රියදුරන් පුහුණු කරන ආයතන නියාමනය කිරීම සඳහා නීති - රීති සම්මත කර ගැනීම සඳහා තමයි අද මේ නියෝගය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා මෙය විශේෂ අවස්ථාවක්. මොකද, ඒකත් හරි වැදගත් වෙනවා. අපි දන්නවා, පුද්ගලයෙක් රියදුරු බලපත්‍රයක් ගන්න ලැහැස්ති වෙනකොටම ඒක පිටිපස්සේ කප්පම් ගැනීමක් තිබෙන බව. සමහර විට licence එක ගන්න පුහුණු වෙන්න ගියාම රියදුරු පාසලෙන් කියනවා, "පුරුදු කරන්න මෙච්චරයි; මුද්දර ගාස්තු මෙච්චරයි; RMV ගාස්තු මෙච්චරයි; මහත්වරුන්ටත් මෙච්චරක් දෙන්න ඕනෑ" කියලා. එහෙම කියලා තමයි ගාණ අය කරන්නේ. සැහැල්ලු වාහනවලට රුපියල් 1,000ක් නැත්නම් 1,500ක් දෙන්න ඕනෑ. පුද්ගලයෙක් රියදුරු බලපත්‍රයක් ගන්න යනකොටම කප්පම් ගැනීමක් සිද්ධ වෙනවා. ඊට පස්සේ රියදුරු බලපත්‍රය අරගෙන පාරේ වාහනයක් පදවාගෙන යන ඔහුගේ ඔළුවේ තිබෙන්නේ, "මොන වැරැද්ද කළත් කමක් නැහැ, කියක් හරි පොලිස් නිලධාරියාට දීලා බේරෙන්න පුළුවන්" කියන අදහසයි. එහෙම මතයක් දැන් රටේ නිර්මාණය වෙලා තිබෙනවා. අන්න ඒ මතය මේ රටින් නැති කිරීම අපිට විශේෂයෙන්ම වැදගත් වෙනවා. පොලිස් නිලධාරීන් කියක් හෝ ගන්නවා, නොගන්නවා වෙන්න පුළුවන්. හැම පොලිස් නිලධාරි මහත්මයෙක්ම එහෙම මුදල් ගන්නේ නැතිව ඇති. නමුත් රටේ මතයක් තිබෙනවා, මොනවා හරි වුණොත් කියක් හරි පොලිස් නිලධාරීන්ට දීලා බේරෙන්න පුළුවන් කියලා. රියදුරු ක්ෂේත්‍රය තුළ එවැනි මතයක් තිබෙනවා. ඉදිරියේදී සිදු විය හැකි රිය අනතුරු වළක්වා ගැනීමට නම් ඒ මතය නැති කිරීම සඳහා අප කටයුතු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රියදුරු බලපත්‍ර ලබාදෙන පාසලෙන් උගන්වන්නේ වාහනයක් පදවන හැටි විතරයි. නමුත්, බොහෝ විට අනතුරු සිද්ධ වෙන්නේ රිය පදවන හැටි අමතක වෙලා නොවෙයි. රිය අනතුරු සිද්ධ වෙන්නේ නොසැලකිලිමත්කම නිසායි. සියයට 85ක් විතර රිය අනතුරු සිද්ධ වෙන්නේ නොසැලකිලිමත්කම නිසායි. ඒ නිසා රියදුරන් පුහුණු කරන ආයතන නියාමනය කිරීම වාගේම, මේ රිය අනතුරු වළක්වා ගන්නේ කොහොමද කියන එක ගැනත් තවදුරටත් හිතන්න සිද්ධ වෙනවා. රිය අනතුරකට ලක් වෙලා මගේ පාදයක් අහිමි වුණා. පොලීසිය කියනවා, රිය අනතුර සිද්ධ වෙච්ච වැලිපැන්න ප්‍රදේශයේ මේ ස්ථානය රිය අනතුරු බහුලව සිදු වන ප්‍රදේශයක් විධියට දැනුම් දීලා තිබෙනවා කියලා. නමුත් ඒක වෙනස් කරලා නැහැ. පොලීසිවල වාර්තා තිබෙනවා, මෙන්න මේ මාර්ගයේ, මෙන්න මෙතැන රිය අනතුරු බහුලව සිද්ධ වෙනවා කියලා. නමුත් ඒක වෙනස් කරලා නැහැ. ඒ ගැන තැකීමක් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා මොන ප්‍රමිති හැදුවත්, මොන තරම් දඩ මුදල් ගැහුවත්, දඩ මුදල එන්න එන්නම වැඩි වුණත්, රිය අනතුරු සංඛ්‍යාව අවුරුද්දෙන් අවුරුද්ද ඉහළ යන බවයි අපි දකින්නේ. රිය අනතුරු නිසා සිද්ධ වෙන මරන සංඛ්‍යාව අවුරුද්දෙන් අවුරුද්ද ඉහළ යනවා මිසක්, අපිට ඒක අඩු කිරීමේ හැකියාවක් ලැබිලා නැහැ.

ඊළඟට, මේ කරුණ ගැනත් මම විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාගේත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේත් අවධානයට යොමු කරවන්න කැමැතියි. කොළඹ දිස්ත්‍රික්කයට පස්සේ ලංකාවේ වැඩිම රියදුරු බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙන්. නමුත්, ඒ පරීක්ෂණය කිරීම සඳහා සුදුසු තැනක් නැහැ. ඉස්කෝලෙ ඇරිලා ළමයි යන වෙලාවට එක එක පාරවල්වලට ගිහිල්ලා වාහන reverse කරනවා. ළමයි යන පාරේ තමයි examiner ඇවිල්ලා රියදුරන් පරීක්ෂා කරන්නේ. නමුත්, ගම්පහ නගරයේම CTB එකට අයිති අක්කර 12ක භූමි භාගයක් තිබෙනවා; ප්‍රවාහන අමාත්‍යාංශයට අයිති භූමි භාගයක් තිබෙනවා. මේ භූමි භාගයෙන් අක්කර දෙකක තිබෙන්නේ ගම්පහ CTB ඩිපෝවයි. ඉතිරි අක්කර 10 කැළේ. මේ කැළේ එළි කරලා ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අවශ්‍ය අංගෝපාංග වන Medical Centre එක, ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්යාල, ඒ වාගේම පුහුණු කරන මධ්‍යස්ථාන, මේ සියලුම දේ ඒ අක්කර 10 තුළ ඇති කරන්න පුළුවන්. එහෙම කරන්න බැරිකමක් නැහැ නේ. ඉඩම්වල ප්‍රශ්නයක් නැහැ. මෙම පරීක්ෂණ මධ්‍යස්ථානය ඇතුළුව හැමදේම එකම වහළක් යටදී කරගන්න හැකි විධියට එම භූමිය හදන්න පුළුවන්. නැත්නම් අපි මොන නීති දැම්මත්, examiner ඇවිල්ලා පරීක්ෂණය කරන්නේ කොහේද? පාරේ reverse කරන්න පුළුවන් තැනකද? මහා ජනාකීර්ණ තැනක තමයි මේ පරීක්ෂණය සිද්ධ කරන්නේ. ඒ සඳහා අවශ්‍ය මධ්‍යස්ථානයක් හදන්න කටයුතු කරන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, රියදුරු බලපත්‍රයක් ගන්න අවශ්‍ය ගාස්තු ගෙවන්න ගියාම ඒ මිනිස්සු බැංකුවේ පෝලිමේ ඉන්න හැටිත් අපි දකිනවා. අපේ රට ඊට වඩා දියුණුයි. දැන්, නවීන තාක්ෂණය අපේ රටට ඇවිල්ලා තිබෙනවා. Online සල්ලි ගෙවන්න පුළුවන්; Credit card එකකින් ඒ අදාළ ගාස්තු ගෙවන්න පුළුවන්. ඒ ගැනත් අපි හිතන්න වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2009 වසරේදීත් මේ වාගේ නීති ගෙනාපු බව මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි. නමුත්, ඒ නීති අද වනතෙක් ක්‍රියාත්මක වුණේ නැහැ. 2014 වසර වනතෙක් ඒ ආණ්ඩුව තිබුණා. ඒ ඇමතිවරයාත් 2014 වසර වනතෙක් හිටියා. ඒ නීති ක්‍රියාත්මක වුණේ නැහැ. පොදු මගී ප්‍රවාහන බස් රථ සඳහා පොදු මගී ප්‍රවාහන සේවා පුහුණු බලපත්‍රයක් ගන්න ඕනෑ කියලා නීතියක් ගෙනාවා. මේ වන තුරුත් එම නීති ක්‍රියාත්මක වන්නේ නැහැ. එතකොට, ඔහුගේ නොහැකියාව පිළිබඳව ලකුණු ලබා දීලා රියදුරු බලපත්‍රය අහිමි කරන එක - demerit-point system එක - සම්බන්ධයෙන් නීති ආවා මිසක් ඒ නීති ක්‍රියාත්මක වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවනවා. මේ නීති කවුරු ගෙන ආවත් හොඳයි. අපි මේවා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම රියදුරු පාසල් නියාමනය කිරීම සඳහා පුහුණුකරුවන්ව පුහුණු කරන්නේ කවුද? පුහුණු කරවීමක් නැහැ නේ. රියදුරු පාසලේ ඉන්න පුහුණුකරුවාව පුහුණු කරන මධ්‍යස්ථානයක් නැහැ. මෙම රියදුරන් පුහුණු කිරීමේ වෘත්තිය තාත්තාගෙන් පුතාට යන පරම්පරාවෙන් එන වෘත්තියක් වෙලා. එහෙමත් නැත්නම් එතැන රැකියාවක් කරන්න ආව මනුස්සයා තවත් learners එකක් දා ගන්නා පුද්ගලයෙක් බවට පත් වෙනවා මිසක් පුහුණු කරන ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා වෙනත් රටකට ගිහිල්ලා හරි ඔහුට රස්සාව කරලා රටට විදේශ විනිමය ගෙන එන්න පුළුවන් ආකාරයකට ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා පුහුණු මධ්‍යස්ථානයක් මඟින් මේ අයට පුහුණුව ලබා දෙන්න ඕනෑ. එපමණක් නොවෙයි, රියදුරු උපදේශක බලපත්‍රය ලබා ගන්න තිබෙන විභාගය තිබෙන්නේ අවුරුදු 4න් 4ටයි. උපදේශකවරුන් බඳවා ගැනීමේ විභාගය තිබුණේ 2012 වසරේයි. අද වනකනුත් උපදේශකයෙක් බඳවා ගැනීම සඳහා විභාගයක් පවත්වලා නැහැ. ඒ විභාගය ලියන්න අවුරුදු 4ක් ඉන්න ඕනෑ. එදා රියදුරු උපදේශක බලපත්‍රය ලබා දෙන විභාගය සඳහා 1300ක් පමණ පිරිසක් පෙනී සිටියා, pass වුණේ 300 ගණනයි. අනෙක් අය තව දැනුම අරගෙන විභාගය කරන්න බලාගෙන ඉන්නවා. නමුත්, අවුරුදු 4ක කාලයක් ගතවෙලත් තවම විභාගයක් නැහැ. ඉතින්, ඒ ගැනත් අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන්, මේ කාරණය ගැනත් මම කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රවාහන පද්ධතිය අනුගතවීමක් සිදු වෙන්න ඕනෑ. Railway station එකට ආවාම එතැන ඉඳන් මඟී ප්‍රවාහන බස් රථ තිබෙන්න ඕනෑ. නමුත් බස් එක එන්නේ එක වෙලාවක, railway station එකට එන්නේ තවත් වෙලාවක. එම නිසා මෙම පොදු ප්‍රවාහන පද්ධතිය එකිනෙකට සම්බන්ධවීමේ වැඩ පිළිවෙළක් නිර්මාණය කළාම අපට ලොකු වෙනසක් මේ තුළ ඇති කර ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

විශේෂයෙන්ම ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාටත්, අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාටත් මේ සඳහා හොඳ හැකියාවක්, ශක්තියක් තිබෙනවා. එම නිසා ඉදිරි කාලය තුළදී යහ පාලනය යටතේ මේ ප්‍රගතියේ වෙනස පෙන්වන්න අපට පුළුවන් වෙයි කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

[අ.භා. 4.04]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අමාත්‍යතුමා විසින් මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කරන ලද නියෝග පිළිබඳව සාකච්ඡා කරන මෙම මොහොතේ ඊට එකතු වෙන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ මුළු ක්‍රියාවලිය හරහාම නියාමනයේ උපදේශනය සඳහා විධිමත්භාවයකින් යුතු ආයතන පද්ධතියක් ගොඩ නැඟීම; හොඳ ව්‍යූහයක් ගොඩ නැඟීම අපේ රටට අවශ්‍ය දෙයක්. ඒක අපි සියලු දෙනාම පිළිගන්න ඕනෑ කාරණයක්. එය මේ රටේ ජනතාවට, එහෙම නැත්නම් යම් වෘත්තියක නියැලීමට අපේක්ෂා කරන පිරිසට අතිරේක බරක් නොවන ලෙස සිදු කිරීම රටක සහ රජයක යුතුකම වනවා.

[ගරු සිසිර ජයකොඩි මහතා]

විශේෂයෙන්ම මේ නියෝග හරහා මූලික වශයෙන්ම සිදු කරලා තිබෙන්නේ ගාස්තු ඉහළ නැංවීමේ නියාමනය බව අපට පෙනෙනවා. ඒ අනුව නියාමනයේ ප්‍රධාන අංගය වෙලා තිබෙන්නේ ගාස්තු ඉහළ නැංවීමයි. අපට පෙනෙන්නේ මෙය මේ රටේ ජනතාවට තවත් බරක් පැටවීමක් විධියටයි. අපි දන්නවා, රියැදුරු උපදේශන ආයතන අවශ්‍යයි කියලා. ඒ ආයතන විධිමත් කිරීමත් අවශ්‍යයි. හැබැයි, ඒ ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ගාස්තු "ඒ" ශ්‍රේණියේ රියැදුරු පාසල් සඳහා රුපියල් 20,000ක් නිර්දේශ කරනවා. ඒ වාගේම වාර්ෂිකව රුපියල් 10,000ක බලපත්‍ර ගාස්තුවක් මේ උපදේශන ආයතනයට පවරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අතිරේකව ගැසට් පත්‍රයේ පළ කර ඇති නිවේදන පරීක්ෂා කළොත් ඒ හරහා අපට මෙම කාරණය පැහැදිලි කරගත හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 5A පිටුවේ 11.(1) යටතේ මෙසේ සඳහන් වනවා :

"යම් නිශ්චිත ප්‍රභේදයක රියදුරු පාසල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තැනැත්තෙකු විසින් එම රියදුරු පාසල් බලපත්‍රයේ ප්‍රභේදය වෙනස් කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි කාර්යයක් සඳහා රුපියල් 4,000ක සැකසුම් ගාස්තුවක් ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දී ගෙවනු ලැබිය යුතු ය."

එතකොට එය වාර්ෂික බලපත්‍ර ගාස්තුවට අමතරව, ලියාපදිංචි ගාස්තු 20,000ට අමතරව රියැදුරු පාසල් බලපත්‍රයේ ප්‍රභේදය වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී ගෙවිය යුතු අතිරේක ගාස්තුවක් වනවා. එම ගාස්තුව බලපත්‍රය ලබා ගැනීම වෙනුවෙන් නොවෙයි. ප්‍රභේදය වෙනස් කරනවා නම්, එම ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේම රුපියල් 4,000ක් ගෙවන්න ඕනෑ. ඒ නිසා මේ සියලු කාර්යයන්වලින් සිද්ධ වෙන්නේ මේ රටේ සාමාන්‍ය තරුණයෙකුට යම් ආයතනයකට ගිහිල්ලා විධිමත් පුහුණුවක් ලබා ගෙන තමුන්ට වෘත්තියක් ලබා ගැනීම සඳහා අවශ්‍ය වෙන ක්‍රමවේදයට තව තවත් අතිරේක බර පැටවීමක්. ඒ නිසා අපි පරිස්සම් විය යුතුයි. මොකද, මේ රටේ මහජනතාවට එහෙම නැත්නම් රියැදුරු පුහුණුව ලබන තරුණයන්ට තමයි අවසානයේ මේ මුදල බැර වෙන්නේ. ප්‍රධාන ආයතනයට උපදේශන ආයතනය විසින් ගෙවන ගාස්තුව පසුව අය කරනු ලබන්නේ ඒ පුහුණුව ලබන තැනැත්තාගෙන්. ඒ අනුව ඔහුගේ ගාස්තුව තමයි ඉහළ යන්නේ. එතකොට සාමාන්‍ය මනුස්සයෙකුට, එදා වේලවත් හරියට නැතිව ජීවත් වෙන්න බැරි ලක්ෂ 7කට වැඩි සේවා වියුක්තියකින් පෙළෙන මේ රටේ තරුණ පරම්පරාවට මොකක්ද, අපි දෙන මාර්ගෝපදේශනය? මේ වෘත්තියට පැමිණෙන්නට තිබෙන ඉඩකඩට මේ ගාස්තු හරහා බාධාවක් වෙනවා. මේ උපදේශනය හොඳ ක්‍රියාවලියක්; මේ නියාමනය හොඳ ක්‍රියාවලියක්. අපි අගය කරනවා. නමුත් මේවා මහජනතාවට බරක් නොවන පරිදි සිද්ධ කළ යුතු වනවා.

අපි දන්නවා, රජය පසු ගිය වකවානුව තුළ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනාවා. ඒ හරහා භාණ්ඩ සහ සේවා සඳහා "වැට්" එකක් පැනෙව්වා. ඒ වාගේම සේවා අංශය යටතේත් මේවා ගෙන එනවා. ඒ නිසා තව අතිරේක ගාස්තු අය කිරීම් තමයි මේවායින් වෙන්නේ. මම දන්නේ නැහැ මේවා කොහොම බැර වෙයි ද කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත අපි අභියෝගයට ලක් කළා. කැබිනට් මණ්ඩලයේ නිසි අනුමැතියක් නොලබා, නිසි ක්‍රමවේදය අනුගමනය නොකළාය කියන කරුණ පදනම් කරගෙන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත බල ශූන්‍ය පනත් කෙටුම්පතක් බවට තීරණය කළා. එය මේ පාර්ලිමේන්තුවේ විවාදයට ලක් කිරීමට සුදුසු නැති පනත් කෙටුම්පතක් ලෙස තීරණය කළ නිසා ජනතාවට විශාල සහනයක් ලැබුණා. ඒ සහනය ජනතාවට ලබා දෙන්න පුළුවන් වුණ, අත්කර දෙන්න පුළුවන් වුණ ජයග්‍රහණයක් කියා අපි සලකනවා. ඒ නිසා අවසානයේ මේ පනවන අතිරේක බදුත් මේවාට පැටවෙනවා. මේ සියල්ලත් එකට එකතු වෙනවා.මේ නියාමනය තුළ සිදු වන්නේ ජනතාවට බරක් නම්, එය ඉතාම කනගාටුදායක තත්ත්වයක් බව පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අපේ රටේ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හරහා විධිමත් පුහුණු කිරීමේ ක්‍රමවේදයක් තිබුණාය කියා. අද රජය උත්සාහ කරන්නේ කුමකටද? ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පාඩු ලබන්න පුළුවන්. ඒවා විධිමත් කිරීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වන්න පුළුවන්. අපි එය පිළිගන්නවා. නමුත් අද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයිති ආයතන හැකිළීම සඳහා උත්සාහයක් දරනවා. "පාඩු ලබනවා" කියන කාරණය මුවාවෙන් බස් ඩිපෝ විශාල සංඛ්‍යාවක් වසා දැමීමේ ක්‍රියාවලියකට රජය දැන් අවතීර්ණ වෙලා තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ ලක්ෂ 40ක් පමණ වූ ශිෂ්‍යයන්ගෙන් අතිබහුතරයක් season ticket එක භාවිතයෙන් පොදු ප්‍රවාහන සේවාවල ගමන් කරන බව. ඒ වාගේම, රාත්‍රී ගමන් සේවා, දුර බැහැර ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම් ආදි සියල්ල පොදු ප්‍රවාහන මාධ්‍යයෙන් තමයි සැපයෙන්නේ. ඒ නිසා රජයට පුළුවන්කම තිබෙනවා, මේ වාගේ උපදේශන නියාමන ආයතන ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හරහා විධිමත්ව ප්‍රතිසංවිධානය කරන්න. එමඟින් හැකියාව ලැබෙනවා, කඩා වැටුණු ආයතනවලට ශක්තියක් ලබා දීමට සහ බර වාහන පිළිබඳව වඩා හොඳ පුහුණුවක් දරුවන්ට ලබා දීමට. රජය අවතීර්ණ වන්න ඕනෑ එවැනි කාර්යාවලියක් සඳහායි. මේ රටේ පොදු මහ ජනතාවගේ, පීඩාවට පත් වන මිනිසුන්ගේ පොදු ප්‍රවාහන සේවා නැංවීමේ වැඩ පිළිවෙළකට තමයි රජය ගමන් කරන්න ඕනෑ. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළ පරිදි දුම්රිය සේවය යනු, අපේ රටේ ජනගහනයෙන් අතිබහුතරයකට -විශේෂයෙන් රාජ්‍ය සේවයේ නියුක්ත, කාර්යාල සේවයේ නියුක්ත සේවකයන්ට- පොදු ප්‍රවාහන සේවයක් ලෙස ගමන් කිරීම සඳහා ඉතා හොඳ ඉඩ කඩක් සැපයෙන මාර්ගයක්. පසු ගිය කාල පරිච්ඡේදය තුළ සිදුවූ අනතුරු ගැනත් ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ජීවිත කීපයක් විනාශ වන තුරුම රජය දුම්රිය ගේට්ටු කම්කරුවන්ගේ ප්‍රශ්නය විසඳුවේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ජීවිත කීපයක් නැති වුණාට පසුව, "ඔන්න, ඔවුන්ගේ ප්‍රශ්නය විසඳුවා" කියා ගරු ඇමතිතුමා කී බව ජනමාධ්‍යවල සඳහන් වුණා. මේ අනුව බැලුවාම, මේ රටේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න නම් මරණ සිද්ධ වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්රිය මාර්ග පද්ධතිය පුළුල් කිරීමේ ක්‍රමවේදයකට අපි යන්න ඕනෑ. ප්‍රවාහන ක්ෂේත්‍රය නිසා පරිසරයට බරපතළ හානිකර තත්ත්වයක් සිදුව තිබෙන බව අපි දන්නවා. ඒ නිසා රජයක් විසින් අනුගමනය කළ යුත්තේ පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියකට අත හිත දීමේ ක්‍රියාවලියයි. නමුත්, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අය වැය ලේඛනය මඟින් සිදු කර තිබෙන්නේ, පරිසරයට හිතකාමී වාහන සඳහා බදු පැනවීමයි. ඒ

නිසා මෙහි තිබෙනවා බරපතළ පරස්පරතාවක්. මේ පරස්පරතාවෙන් මිදීමෙන් පමණයි අපේ රටේ යහපත් ප්‍රවාහන සේවයක් ඇති කළ හැක්කේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරන ලද මේ උත්සාහය අපි අගය කරනවා. අපි කියා සිටිනවා, 'මහ ජනතාවට බරක් නොවන පරිදි මෙවැනි ක්‍රියා මාර්ග, නියාමන උපදේශනයන් සක්‍රිය කිරීම සඳහා නැවත සාකච්ඡාවක් කරමු' කියා. අවසානයේදී, 'පුහුණුව ලබන තරුණයන්ට අතිරේක බරක් පැටවෙන්නේ නැති ආකාරයේ නියාමනයක් සැකසීම සඳහා අපි එකට එකතු වෙමු.' කියන ආරාධනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි, ඔබතුමාට.

[අ.භා. 4.12]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කාලෝචිත සහ වටිනා නියෝග දෙකක් පිළිබඳව මේ ගරු සභාවේ සාකච්ඡා වන මේ අවස්ථාවේ කථා කරන්න ලැබීම ගැන මා බෙහෙවින් සන්තෝෂයට පත් වෙනවා. විශේෂයෙන්, මෝටර් වාහන පනත යටතේ වන නියෝග දෙකක් ගැනයි අද සාකච්ඡා කරන්නේ. අප මුලින්ම කථා කරන්නේ, රියැදුරු පාසල් නියාමනය කිරීම ගැනයි. මා හිතනවා, රියැදුරු පාසල් නියාමනය කිරීම ඉතාම වැදගත් කාර්යයක් කියා. ඒ ගැන කථා කරන විට සමාජයෙන් ලද අපේ අද්දැකීම් ගැන කියන්න ඕනෑ. රියැදුරු බලපත්‍ර ලබා ගත් අය හැටියට අපි අපේ අද්දැකීම් ගැන කථා කරන්න ඕනෑ. රියැදුරු පුහුණුව ලබන්න කලින්ම අපි පාරට ගියා. රියැදුරු පුහුණුව ගන්නත් කලින් අපි පාරේ තමයි ඉගෙනගත්තේ. එවිට ඇත්තටම සිදු වන්නේ මොකක්ද? තිබෙන බියත් එක්ක සමහර වෙලාවට අප අවධානය යොමු කරන්නේ, හරියාකාරව රියැදුරු පුහුණුව ලබා ගන්න නොව, ඉස්සරහින් එන වාහනයක හෝ පසු පසින් එන වාහනයක නොගැටී යන්නයි. රියැදුරු පුහුණුව සඳහා අප දැන් භාවිත කරන්නේ ඉතාම වැරැදි ක්‍රමවේදයක් කියන එක වටහාගෙන තිබෙන නිසා තමයි අපේ ගරු අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් මේ නියාමනය සිදු කරන්න බලාපොරොත්තු වන්නේ. එය ඉතාම කාලෝචිතයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අඩුම තරමේ එක දිස්ත්‍රික්කයකට එක බැගින්වත් රියැදුරු පුහුණු පාසල් ඇති කරන්න අපට පුළුවන් නම් හොඳයි. මම එය යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න කැමැතියි. එම පාසල ඇතුළේම රියැදුරන්ට පුහුණු වීම සඳහා track එකක් හදන්න පුළුවන්. සාමාන්‍යයෙන් ලෝකයේ භාවිත කරන්නේ ඒ වාගේ ක්‍රමවේදයක් තමයි. අක්කර දෙක-තුනක ඉඩක් තිබෙනවා නම් එක දිස්ත්‍රික්කයකට එක බැගින් වන පරිදි රියැදුරු පුහුණු පාසල් ඇති කරන්න අපට පුළුවන්. එසේ කරනවා නම් හොඳයි. රජයත් එක්ක එකතු වෙලා public-private partnership project එකක් හැටියට එය කරන්න පුළුවන්. ප්‍රවාහන අමාත්‍යාංශයට පුළුවන් මේ සඳහා නායකත්වය ලබා දෙන්න. ඒ යටතේ අලුතින් බිහි වෙන රියැදුරන්ට හැකියාව ලැබෙනවා, වාහනයක් පාරට දමන්න කලින් ඇතුළේ track එකක හරියාකාරව පුහුණු වෙලා පාරට යන්න. එහෙම වුණොත් තමයි හරියාකාරව පුහුණුවක් ලබා ගත හැකි වන්නේ. ලෝකයේ සමහර රටවල් ගත්තොත්, එම රටවල රියැදුරන් පැය තිහක් විතර ඇතුළත මාර්ග පද්ධතියක, track එකක ඉගෙන ගෙන තමයි පාරට යන්නේ. එහෙම වුණොත් විතරයි, හරියාකාරව රියැදුරු පුහුණුව ලැබෙන්නේ. අනාගත ලෝකයේ දියුණුවත් සමඟ අපත් මේ සඳහා යොමු විය යුතුයි කියා මා හිතනවා. එහෙම වුණොත් විතරයි ඉතාම හොඳ ප්‍රමිතියකින් යුත් රියැදුරන් බිහි කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා රියැදුරු බලපත්‍රය ලබා ගැනීමේදී මාස තුනක කාලයක පුහුණුවක් ලබා දෙනවා කියන එක ඇත්තටම මේ යටතේ හරියාකාරව නියාමනය කර ගන්න පුළුවන් වෙනවා. එහෙම වුණොත් එම දිස්ත්‍රික් කාර්යාලය තුළම වෛද්‍ය, ප්‍රායෝගික හා ලිඛිත කියන පරීක්ෂණ තුනම සිදු කර ගන්නත් අපට හැකියාව ලැබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධවත් අවධානය යොමු කළ යුතුයි කියා මා හිතනවා. විශේෂයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවල traffic managementවලට අදාළව වෙනම subcommittee එකක් තිබෙනවා. එහිදීත් මේ ගැන කථා කරනවා. මම ඒ සම්බන්ධවත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රියැදුරු බලපත්‍රවලට අදාළව points system එකක් ගැනත් කථා කරනවා. එම ක්‍රමය මඟින් සිදු වෙන්නේ වැරැද්දක් කළොත් ලකුණු අඩු වෙලා රියැදුරු බලපත්‍රය නැති වෙන එකයි; රියැදුරු බලපත්‍රය අහෝසි වෙන එකයි. මෙවැනි system එකක් ගැන අපි ඉස්සරත් කථා කළා. මේ ගැනත් අපි අවධානය යොමු කළ යුතු වෙනවා. අපි මේ දවස්වල ආංශික අධීක්ෂණ කාරක සභාවේදී Draft Bill එක සම්බන්ධව කථා කරනවා. අපි ඒ සම්බන්ධව උදාහරණයක් ගනිමු. යම් කිසි රියැදුරෙක් වැරැදි කරලා ඔහුගේ ලකුණු මට්ටම ලකුණු 25 දක්වා අඩු කර ගන්නවා නම් ඔහුගේ රියැදුරු බලපත්‍රය ඉබේම අහෝසි වෙනවා. එම රියැදුරා seat belt එක දමන්නේ නැතුව ගියොත් ලකුණු තුනක් විතර අඩු වෙනවා. ඒ වාගේම රිය අනතුරක් වළක්වා ගන්න හැකියාව තිබියදී එය වළක්වා ගත්තේ නැත්නම් ලකුණු දහයක් විතර අඩු වෙනවා. ඒ විධියට එම වැරැදි වර්ගීකරණය කරන්න අපට පුළුවන්. එසේ වර්ගීකරණය කර ලකුණු දීමේ ක්‍රමයක් ඇති කිරීම තුළින් රියැදුරු බලපත්‍රයේ වටිනාකම වැඩිදියුණු කරන්න පුළුවන් වෙනවා. එසේ නියාමනය කිරීම තුළින් අපි points system එකක් හරියාකාරව හදා ගත්තොත්, අපට පුළුවන් මේ ආරක්ෂා පද්ධතියත් හදා ගන්න. ඒ තුළින් මාර්ග පද්ධතිය වැඩිදියුණු කර ගන්නත් හැකි වෙනවා. විශේෂයෙන්ම කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල CCTV කැමරා පද්ධති සවි කිරීම තුළින් වැරැදි කරන්නේ කවුද කියන එක සොයා ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම රියැදුරු බලපත්‍රය නියමිත ප්‍රමිතියකට ලබා දීම තුළින් සහ ඒ පිළිබඳව අධීක්ෂණයක් කිරීම තුළින් රියැදුරන් වර්ගීකරණය කරන්නත් පුළුවන්. ලෝකයේ ඒ වාගේ වර්ගීකරණයන් සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ අත් දැකීමක් උදාහරණයකට කියන්නම්. Gold licence කියා එකක් ජපානයේ තිබෙනවා. අවුරුදු පහක් තුළ කිසිම වරදක් නොකර සිටීමෙන් කිසිම ලකුණක් අඩු නොවුණු අයට gold licence එකක් ලබා දිය හැකියි. ඒ කියන්නේ රියැදුරු බලපත්‍රය ලබා ගෙන අවුරුදු පහක් යනතෙක් කිසිම වරදක් නොකළ කෙනෙකුට එය ලබා ගන්න පුළුවන්. එවැනි ක්‍රමයකට අපේ රක්ෂණ සමාගම් පොලඹවා ගන්නත් අපට පුළුවන්. රියැදුරු බලපත්‍රය හිමි රියැදුරා ඉතාම හොඳ බලපත්‍රලාභියෙක් නම්, වැරැදි කරලා නැති බලපත්‍රලාභියෙක් නම් ඔහු වාහනයට ගෙවන රක්ෂණ මුදල මේ ක්‍රමය යටතේ අඩු කර ගන්න පුළුවන්. ඒ යටතේ අපට රක්ෂණ සමාගම් උපයෝගි කර ගන්න පුළුවන්. මේ හරහා අපට වැඩි වන මුදල අඩු කර ගත හැකි ක්‍රමවේද සොයන්න පුළුවන්. මේක තමයි අලුත් ලෝකයේ අලුත් නාක්ෂණයත් එක්ක යන ක්‍රමවේදය. ඒ වාගේම අවුරුදු පහක කාලය තුළ රියැදුරා වරදක් කරනවා නම් අනිවාර්යෙන්ම අවුරුදු පහකට වතාවක් අලුත් බලපත්‍රයක් ලබා ගත යුතු වෙනවා. එහෙම වුණොත් විතරයි අපට රියැදුරු බලපත්‍රය නියමිත ප්‍රමිතියකින් යුතුව ලබා ගත හැකි වෙන්නේ. දැන් තිබෙන ක්‍රමයට අනුව රියැදුරු බලපත්‍රයක් ලබා ගත් කෙනෙක් අවුරුදු 65ක්, 70ක් වාහනය පදවන්නේ එකම බලපත්‍රය යටතේයි. එවැනි system එකක් තමයි තිබෙන්නේ. එහෙම වෙන්න බැහැ. එය වෙනස් විය යුතුයි.

[ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කාරණයක් මතක් කරන්න මා කැමැතියි. අලුතින් රියැදුරු බලපත්‍රයක් ලබා දුන් පසුව ලෝකයේ බොහෝ රටවල් අවුරුද්දක කාල සීමාවක් "පරිවාස කාල සීමාවක්" ලෙස භාවිත කරනවා. එම කාල සීමාව තුළ එම රියැදුරා වාහනයක් ධාවනය කරනකොට, එම රියැදුරා ආධුනික රියැදුරෙක් කියන එක පිටුපසින් සහ යාබදව එන වාහනවලට දැන ගන්න හැකියාවක් ලැබෙනවා. ඔහු රියැදුරු බලපත්‍රය ලබා ගෙන තවම අවුරුද්දක කාලයක්වත් ගත වෙලා නැහැ කියන එක දැන ගැනීමට හැකියාව ලැබෙනවා. එසේ ආධුනික රියැදුරෙක් කියා හඳුනා ගත්තොත් අනෙකුත් රියැදුරන්ට පොඩ්ඩක් එකී වාහනය ගැන සැලකිලිමත් වෙන්න හැකියාවක් ලැබෙනවා. ඒ වාගේම එම රියැදුරා ආධුනික රියැදුරෙක් කියන එක දැන ගන්නත් හැකියාව ලැබෙනවා.

වැඩිමහල් රියදුරන් -අවුරුදු 65ට, 70ට වැඩි රියදුරන්- පදවන වාහනවල ප්‍රදර්ශනය කිරීම සඳහා ඒ වාගේ ලකුණක් -ස්ටිකර් එකක්- දෙන්න පුළුවන්. එතකොට අපි දන්නවා, "ටිකක් වයසක රියදුරු මහත්මයෙක්. ඒ නිසා අපි බොහොම පරිස්සමෙන් වාහනය ධාවනය කළ යුතුයි" කියලා. මෙවැනි ක්‍රම ලෝකයේ භාවිත වෙනවා. තාක්ෂණයත් එක්ක සම්බන්ධ වෙලා මේ ක්‍රම භාවිත කිරීම තුළින් අපට හැකියාව ලැබෙනවා, රියදුරන්ගේ ප්‍රමිතිය හඳුනා ගන්න. රියදුරන්ගේ ප්‍රමිතිය හඳුනා ගත්තොත් විතරයි අපට පුළුවන් වන්නේ, සංවර්ධනය වන රටක් හැටියට තාක්ෂණයෙන් ඉස්සරහට ගිහිල්ලා, නීති රීති හරියාකාරව ක්‍රියාත්මක කරමින් රිය අනතුරු ප්‍රමාණය වළක්වා ගන්න.

ඔබතුමා දන්නවා, අද ලංකාවේ වැඩියෙන්ම මරණ සංඛ්‍යාවක් වාර්තා වෙන්න, "රිය අනතුරු" එක හේතුවක්ය කියලා. රිය අනතුරු ඇතිවීමට ප්‍රධාන හේතුව තමයි හරියාකාරව රියදුරු බලපත්‍ර ලබා නොගැනීම. හරියාකාරව මාර්ග නීති ගැන දන්නේ නැහැ. උදාහරණයකට අපි දන්නා අත්දැකීමක් ගැන මම කියන්නම්. දුම්රිය හරස් පාරක් හරහාත් වාහන නවත්වලා තිබෙනවා. දුම්රියක් ආවොත් මොකද වෙන්නේ කියන එක ගැන අපි ප්‍රායෝගිකව කල්පනා කරන්නේ නැහැ. අපට මේවා අමතක වෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මා යෝජනා කරනවා, අනාගතයේ අවුරුදු පහකට සැරයක් රියදුරු බලපත්‍රය ලබා ගැනීම review කළ යුතුයි; මේ ගැන සොයා බැලිය යුතුයි කියලා. රියදුරාගේ සෞඛ්‍ය ශක්තිය කොහොමද, ඇස් පෙනීම කොහොමද ආදී සියලු දේවල් ගැන අවුරුදු පහකට සැරයක් බලන්න ඕනෑ. දැනට මේ කටයුතු සඳහා ඊට වඩා වැඩි කාලයක් ගත වෙනවා. ඒ කාලය තුළදී අපට රියදුරන්ගේ තිබෙන ශාරීරික දුර්වලතා හඳුනා ගත නොහැකියි.

ඒ ගැනත් අවධානය යොමු කරන්න. හරියාකාර නියාමනයක් යටතේ පැහැදිලි රියදුරු බලපත්‍ර ක්‍රමයක් හඳුනා ගත හැකියි කියා මා සිතනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 4.21]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் பற்றிய விவாதத்திலே பங்குபற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன். இலங்கையைப் பொறுத்தவரையிலே பொதுப் போக்குவரத்துச் சாதனங்களில் பெண்கள் போக்குவரத்துச் செய்கின்றபோது பல பிரச்சினைகளை எதிர்கொள்கின்றனர். அதனைக் கவனத்திற்கொண்டு இந்த ஒழுங்குவிதிகளில் பல திருத்தங்களைச் செய்யவேண்டுமென்ற எனது கருத்துக்களை முதலில் முன்வைக்க விழைகின்றேன்.

இலங்கைக்கு அந்நியச் செலாவணியை ஈட்டித்தருவதில் பெண்கள் முதுகெலும்பாகக் காணப்படுகின்றார்கள். ஆடை உற்பத்தி நிலையங்களில் வேலை செய்தல், தேயிலைத் தோட்டங்களில் வேலை செய்தல், வெளிநாட்டு வேலை வாய்ப்பைப் பெற்று உழைத்தல் போன்ற பல்வேறு விதமான வேலைகளில் ஈடுபடுகின்ற பெண்கள் இலங்கையின் வருமானத்தில் பெரும்பங்கை ஈட்டும் பணியை ஆற்றுகின்றார்கள். இவ்வாறு பெண்கள் பொருளாதார ரீதியில் முன்னணியை வகித்தபோதும் அவர்கள் பல்வேறு இடங்களில் புறக்கணிக்கப்படுவதும் பல அசௌகரியங்களை எதிர்கொள்வதும் வழமையான ஒரு நிகழ்வாகக் காணப்படுகின்றது. இந்த வகையிலே பொதுப் போக்குவரத்துச் சாதனங்களில் போக்குவரத்தில் ஈடுபடுகின்றபொழுது, அவற்றில் பயணம் செய்கின்ற மிருகத்தனம் பொருந்திய ஆண்களால் மேற்கொள்ளப்படுகின்ற உடலியல் ரீதியான துஷ்பிரயோகங்களைப் பல பெண்கள் சகித்துக்கொண்டும் இன்னல்களை அனுபவித்துக்கொண்டும் செல்வதைக் காணக்கூடியதாக இருக்கின்றது. அவை பற்றிய செய்திகள் பொதுவாக ஊடகங்களில் வெளிவந்தாலும் வெளியிலே கூறமுடியாத எத்தனையோ அசௌகரியங்களைப் பெண்கள் எதிர்கொள்கின்றார்கள். எனவே, முன்பிருந்தது போன்று இந்தப் பொதுப் போக்குவரத்து பஸ்களில் ஒரு பகுதியைப் பெண்களுக்கென ஒதுக்கிக்கொடுக்கின்ற ஒரு நிலையை உருவாக்கவேண்டும்.

அதுமட்டுமல்ல, இலங்கையிலுள்ள பஸ் தரிப்பு நிலையங்கள் அனைத்திலும் போதிய வெளிச்சமூட்டுகின்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும். தமது வேலைகளை முடித்து வீட்டுக்குத் திரும்பும் பெண்கள் பஸ் தரிப்பு நிலையங்களிலே வெளிச்சமற்ற நிலையில் தரித்து நிற்கின்றபோது பல அசௌகரியங்களை எதிர்கொள்கின்றனர். அதுமட்டுமல்ல, இலங்கையிலே பெண்கள் பஸ் நடத்துனர்களாக உள்வாங்கப்பட வேண்டியது ஓர் அவசரத் தேவைப் பாடாகக் காணப்படுகின்றது. சகல தொழில்களிலும் முன்னணி வகிக்கின்ற பெண்களை ஓட்டுநராகவோ நடத்துநராகவோ ஏன், இந்த அரசு உள்வாங்கக்கூடாது? என்ற கேள்வியை நான் இங்கே முன்வைக்க விழைகின்றேன்.

இவற்றுக்கு மேலாக, பொதுப் போக்குவரத்து பஸ்களிலே கர்ப்பிணித் தாய்மார்களுக்கும் மாற்றுவலுவுடையோருக்கும் ஆசனங்கள் ஒதுக்கீடு செய்யப்பட்டாலும், அவற்றை பஸ் நடத்துனர்கள் கண்காணிப்பதில்லை; கவனிப்பதில்லை. அவ்வாறானவர்கள் பயணங்களை மேற்கொள்கின்றபொழுது, அவர்களுக்குரிய வசதிகளை பஸ் நடத்துநர்கள் ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அவ்வாறு தங்களுடைய சேவையை உரியமுறையில் செய்யாதவர்களுக்குத் தண்டனை வழங்கக் கூடிய ஒரு நிலையை உருவாக்கவேண்டியது முக்கியமாகும்.

அடுத்ததாக, வடக்கு, கிழக்கிலே ஏற்பட்ட 30 வருட கால யுத்தம் இறுதியாக முல்லைத்தீவிலே முடிவடைந்தபோது மக்களால் பல்வேறு வகையான வாகனங்கள் அங்கே கைவிடப்பட்டன. ஆனால், அந்த வாகனங்களுக்குரிய உரிமப் பத்திரங்களைப் பலர் இன்றும் தம்வசம் வைத்திருக்கின்றார்கள். இந்த மக்களுக்குரிய ஏனைய இழப்பீடுகள் எவையும் வழங்கப்படாத நிலையில், குறிப்பாக இந்த

வாகனங்களுக்குரிய நட்டஈடுகளைக்கூட வழங்குவதற்கு இந்த அரசு எதுவித நடவடிக்கைகளையும் எடுக்கவில்லை. அவர்கள் அனைத்துச் சொத்துக்களையும் இழந்தாலும் வாகன உரிமப் பத்திரங்களை வைத்திருப்பவர்களுக்கு முன்னுரிமையளித்து, அவர்களுக்கு அதற்கான நட்டஈட்டுக் கொடுப்பனவையாவது வழங்குவதற்கு அரசு நடவடிக்கை எடுக்கவேண்டும்.

இதனைவிட, ஓட்டுநர் அனுமதிப்பத்திரம் வழங்குகின்ற பொழுது, மாற்றுவலுவுள்ளோர் புறக்கணிக்கப்படுவது தொடர்ந்து நடைபெற்றுக்கொண்டிருக்கின்ற ஒரு விடயமாக இருக்கின்றது. வைத்தியர்களால் வழங்கப்படுகின்ற மருத்துவச் சான்றிதழ்களின் பிரகாரம் செவிப்புலனும் பேச்சுத் திறனும் அற்றவர்களுக்கு ஓட்டுநர் அனுமதிப்பத்திரம் வழங்குவது நிராகரிக்கப்படுவதுண்டு. வைத்தியர்கள் சான்றிதழ் வழங்கும்பொழுது, "அவர் கேட்கும் திறன் அற்றவராக இருக்கின்றார். ஆனால், ஏனைய உடல் ரீதியான வல்லமை யுடையவராக இருக்கின்றார்" என்றதொரு சான்றிதழை வழங்கக்கூடிய நிலைமையை உருவாக்கவேண்டும். உதாரண மாக, தற்பொழுது குளிரூட்டப்பட்ட - வளிசீராக்கப்பட்ட வாகனங்களை ஓட்டும்பொழுது, ஓட்டுநர்கள் ஏனைய ஒலிகளைக் கேட்டு வாகனங்களைச் செலுத்துகின்ற நிலைமை காணப்படுவதில்லை. அங்கு பார்வைப் புலன் மட்டும்தான் பயன்படுத்தப்படுகின்றது. இதனை மையமாகக்கொண்டு, கேள்விப் புலன் அற்றவர்களுக்கும் ஓட்டுநர் அனுமதிப் பத்திரங்களை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கவேண்டும்.

அதேபோல், யுத்தத்தின் காரணமாகவோ, பிறப்பினாலோ அல்லது விபத்தினாலோ கால் இயங்காதவர்களுக்கும் இந்த ஓட்டுநர் அனுமதிப்பத்திரம் வழங்குவது அரசாங்கத்தினாலே தடைசெய்யப்பட்டிருக்கின்றது. ஆனாலும், அவர்கள் மாற்று வலுவுள்ளோர் என்பதற்கு அப்பால், சிறப்பாற்றல் உள்ளவர் களாகக் காணப்படுகின்றார்கள். எமது வட பகுதியிலே பலர் இவ்வாறாக, கால் இயங்காதவர்கள் - ஏன், முள்ளந்தண்டு வடம்கூட இயங்காதவர்கள் முச்சக்கர வண்டிகளை ஓட்டுகின் றார்கள். அவர்களது திறமைகளை மையமாக வைத்து கையினாலே செயற்படுத்தக்கூடிய brake போன்றவற்றை அவர்களுக்கேற்றவாறு மாற்றியமைக்கக்கூடிய வசதிகளைச் செய்துகொடுத்து, அவர்களுக்கும் சாரதி அனுமதிப் பத்திரங்களை வழங்கமுடியும். அதனூடாக அந்த மாற்றுவலு வுள்ளோரும் தமது வருமானத்தை ஈட்டக்கூடிய வகையிலே ஒழுங்குகளை மேற்கொள்ளக்கூடியதாக இருக்கும்.

இன்று வடக்கு, கிழக்குப் பகுதிகளிலே பாடசாலை செல்லும் பிள்ளைகளும் அலுவலகம் செல்பவர்களும் பொதுப் போக்குவரத்துச் சேவைகளைப் பெற்றுக்கொள்வதில் பல சிரமங்களை எதிர்கொள்கின்றார்கள். குறிப்பாக, உள்ளூர் களிலே இந்தப் போக்குவரத்துச் சேவை நடைபெறாமை பெரும் குறைபாடாகக் காணப்படுகின்றது. இதனால் பிள்ளைகள் உரிய நேரத்துக்குப் பாடசாலைக்குச் சென்றடைய முடியா மையும் கால்நடையாகச் செல்வதனால் தமது கல்வியினை ஒழுங்காக மேற்கொள்ள முடியாத நிலைமையும் காணப்படு கின்றது. இந்த பஸ் போக்குவரத்து உரிய நேரத்தில் நடத்தப்பட வேண்டுமென்று நாங்கள் உரிய அதிகாரிகளோடு கதைத்தபொழுது, பஸ் பற்றாக்குறை இருப்பதாகவும் அது தனது சேவைக்குரிய வருமானத்தைப் பெறவில்லை என்றும் பல்வேறு விதமான நொண்டிச்சாட்டுக்களைக் கூறுகின் றார்கள். இதன் காரணமாக உள்ளூர் மக்கள் தமக்குரிய மருத்துவச் சேவைகள், பொதுச் சேவைகளைப் பெற்றுக் கொள்வதிலும் தமது பிள்ளைகளுக்குரிய கல்விச் சேவையைப் பெற்றுக்கொள்வதிலும் பெரும் சிரமங்களை எதிர்கொள் கின்றனர். இவ்வாறு உரிய நேரத்தில் இந்த பஸ் சேவை நடைபெறாததனால், பிள்ளைகள் கல்வியில் பின்னடைவைச் சந்திக்கின்றார்கள் என்பதற்கு அப்பால், அவர்கள் நீண்ட நேரத்தை வீதிகளிலே வீணாகக் கழிக்கவேண்டியிருக்கின்றது.

வட பகுதியில் உள்ளூர்களிலே குறிப்பாக பெண் பிள்ளைகள் காட்டுப் பகுதியினூடாக நடந்து செல்கின்ற பொழுது அவர்கள் துஷ்பிரயோகத்துக்குள்ளாவது ஓர் இயல்பான நடவடிக்கையாகக் காணப்படுகின்றது. ஆகவே, இவ்வாறான பல்வேறு இடையூறுகளை, இடைஞ்சல்களை மையமாக வைத்து நீண்டகாலமாக யுத்தத்திலே பாதிக்கப்பட்ட மக்களும் இந்த அரசினாலே வழங்கப்படுகின்ற சேவைகளைச் சமமாகப் பெற்றுக்கொள்ளக்கூடிய வகையிலே இந்த பஸ் போக்குவரத்துச் சேவைகளை ஒழுங்குபடுத்துவதில் முக்கிய கவனம் செலுத்தப்பட வேண்டும்.

இதற்கும் மேலாக, அங்குள்ள வாகன உரிமையாளர்கள் வாகனங்களுக்குரிய வரி அனுமதிப்பத்திரங்களைப் பெறும் பொருட்டு சமர்ப்பிக்க வேண்டிய வாகனப் புகைச் சான்றிதழுக்காக அவற்றின் புகைப் பரிசோதனையைச் செய்துகொள்வதற்கென வெகுதூரம் அலைந்து கஷ்டப்பட வேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமையில் உள்ளார்கள். ஆகவே, பிரதேச செயலக ரீதியாக, ஒரு குறிப்பிட்ட ஒழுங்கில் இந்தப் புகைப் பரிசோதனையைச் செய்வதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும். எனவே, அரசினால் வழங்கப்படுகின்ற சேவைகளை அனைவரும் ஒரே மாதிரியாக-ஒரே விதத்திலே பெற்றுக்கொள்ளக்கூடிய வகையில் நடவடிக்கை எடுக்க வேண்டும். குறிப்பாக வட பகுதியிலே இருக்கின்ற மக்கள் 30 வருட கால யுத்தத்தினாலே இந்தச் சேவைகள் தொடர்ந்தும் மறுக்கப்பட்ட நிலையில் அல்லது கிடைக்காத நிலையில் வாழ்ந்துவந்தார்கள். அவர்களும் ஏனையவர்களுடன் சமமாக வாழக்கூடிய வகையில், சேவைகளைச் சரியாகப் பெற்றுக்கொள்ளக்கூடிய வகையில் நடவடிக்கை எடுக்க வேண்டும். யுத்தத்திலே பாதிக்கப்பட்ட மக்களும் இந்தச் சேவை நீரோட்டத்திலே நன்மை பெற்று வாழக்கூடிய வகையிலே போக்குவரத்துச் சேவைகள் மாற்றியமைக்கப்படுவதற்கு ஏற்ற ஒழுங்குகள் மேற்கொள்ளப்பட வேண்டும் என்று கேட்டு, என்னுடைய உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

[பி.ப. 4.32]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள ஒழுங்குவிதிகள் மீது பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் ஹந்துன்னெத்தி மற்றும் கௌரவ அமைச்சர் ஆகியோர் குறித்த சட்டதிட்டங்களைப் பற்றிப் பேசினாலும் நான் நடைமுறையிலுள்ள சில பிரச்சினைகளைப் பற்றி இந்தச் சபையில் எடுத்துச்சொல்ல விரும்புகின்றேன்.

இவ்வாண்டில் இற்றைவரை அதாவது இவ்வருடம் முடிவடைவதற்கு முன்னர் 11,737 வாகன விபத்துக்கள் இடம் பெற்றுள்ளன. அவற்றில் 970 மரணங்கள் சம்பவித்திருக் கின்றன. கடந்த வருட எண்ணிக்கையை உற்றுநோக்குகின்ற போது 36 ஆயிரம் விபத்துக்கள் இடம்பெற்றிருக்கின்றன. 2,700 மரணங்கள் சம்பவித்திருக்கின்றன. இந்நிகழ்வுகள் எல்லாம் எந்தக் காலப்பகுதியில் இடம்பெறுகின்றன போன்ற விபரங்கள் பொலிஸார் மேற்கொண்ட ஆய்வின்மூலம்

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

තෙරියවන්තුල්ලන. අතාවතු විටියත්කාලෙ 2 මණියිලිරුන්තු 6 මණි වරෙයාන නේරත්තිලුම් පකල් ඔරු මණියිලිරුන්තු 2 මණි වරෙයාන පාටසාලෙකළ් මූටප්පටුකින්ර නේරත්තිලුම් කාරියාලයංකළ් මූටප්පටුකින්ර පිර්පකල් 5 මණියිලිරුන්තු 6 මණි වරෙයාන කාලත්තිලුම් ඉරවු 11 මණික්කුම් නළ්ළිරවු 12 මණික්කුම් ඉටෙයිලාන කාලප්පකුතියිලුම්තාන් වාකන විපත්තින්පෝතු කූටියළවු මරණංකළ් ඒර්පට්ටිරුක්කින්රන. පාටසාලෙ මාණවර්කළුටෙය, අරස උත්තියෝකත්තර් කළුටෙය උයිරුක්කු මිකවුම් පංකම් විළෙවිප්පතාක පොලිස් අතිකාරිකළ් සොල්කින්ර අන්ත නේරංකළෙප් පාර්ක්කින්ර පෝතු අවර්රෙ නාංකළ් විළංකික්කොළ්ළලාම්.

අතුපෝල්, වාකන ඔට්ටුනර්කළ් පුකෙ පිටිත්තුක්කොණ්ටු වාකනංකළෙ ඔට්ටුවතනාලුම් සාතාරණමාක 8 මණිත් තියාලම් වේලෙ සෙය්ය වේණ්ටිය චාරතිකළ් වරුමානත්තෙත් තේටික්කොළ්වතර්කාක 16 -18 මණිත්තියාලම් වරෙ වේලෙ සෙය්කින්රපෝතු තුරිතමාකච් චෙල්ල වේණ්ටුම් එන්ර නෝක්කත්තෝටු වාකනංකළෙ ඔට්ටුවතනාලුම්තාන් කූටුතලාන වීති විපත්තුක්කළ් ඒර්පට්ටිරුක්කින්රන. අණ්මෙයිල් හිල්රන් හෝට්ටලිල් පාන් කී මූන් අවර්කළෙච් චන්තික්කුම් නිකළ්වු ඔන්රිල් පංකුපට්රුමුකමාක නාන් අම්පාරෙයිලිරුන්තු වන්තුකොණ්ටිරුන්තපෝතු වීතියිල් ඔරු පස්සුම් වානුම් මෝතියතිල් ඉවර් උයිරිළන්තතුටන් ඔන්පතු පේර් කායමටෙන්තතෙ නේරිල් කණ්ටේන්. අන්ත වානුක්කුළ් ඉරුන්තවර්කළෙ වෙළියේ එටුප්පතර්කු ඔන්රරෙ මණිත්තියාලම් චෙන්රතු. අතේනේරම් අතර්කු මුන්තිය නාළ් පුත්තළම් වීතියිලේ ඉටම්පෙර්ර ඔරු චම්පවත්තිල් යාළ්ප්පාණත්තිලිරුන්තු වන්තවර්කළ් චිලර් ඉප්පටිප්පට්ට පාරිය ඔර් ඉන්නලුක්කු උළ්ළානාර්කළ්.

පස් පෝක්කුවරත්තෙ එටුත්තුක්කොණ්ටාල්, තනියාර් තුරෙයිනර් අරස පස්කළෙ මුන්තිච්චෙල්ල වේණ්ටුමෙන්පතර්කාක අල්ලතු තංකළුටෙය වරුමානත්තෙක් කූට්ටික්කොළ්ළ වේණ්ටුමෙන්පතර්කාක වේකමාක ඔට්ටුකින්රාර්කළ්. කටන්ත වරුටම් නටෙපෙර්ර 36,000 වීති විපත්තුච් චම්පවංකළිලේ 2,700 මරණංකළ් චම්පවිත්තිරුක්කින්රතු. අප්පටියෙන්රාල් ඉතනෙක් කට්ටුප්පටුත්තවේණ්ටිය, මට්ටුප්පටුත්තවේණ්ටිය පොරුප්පු එංකළුක්කු ඉරුක්කින්රතු. පයිර්චි නිලෙයංකළෙ මාවට්ට මට්ටත්තිලෝ, තොකුති මට්ටත්තිලෝ මට්ටුම් උරුවාක්කි උතවි ආලෝචකර්කළෙ නියමික්කාතු, පිරතේච මට්ටත්තිලේ අවෙ උරුවාක්කප්පට වේණ්ටුම්.

ඔන්රෙ මට්ටුම් නීංකළ් චින්තියුංකළ්! තනියාර් තුරෙයිනර් තංකළුටෙය වාකන අනුමතිප්පත්තිරත්තෙත් වෙත්තුක්කොණ්ටු අරස පස් චේවෙයෙ විටවුම් කූටුතලාකප් පණම් චම්පාතික්ක වේණ්ටුමෙන්පතර්කාක මුරෙකේටාක පස්කළින් වේකත්තෙක් කූට්ටි ඔට්ටුකින්රාර්කළ්. ආට්ටෝ ඔන්රිල් වන්ත ඉළෛඤර්කළ් නාල්වරිල් මූවර් අන්ත ඉටත්තිලේයේ මරණිත්ත ඔරු විපත්තුච් චම්පවම් අණ්මෙයිල් මූතූර් පිරතේචච්චත්තිල් නටෙපෙර්ර්තු. අන්තත් තනියාර් පස් ඔට්ටුනර් අම්පාරෙ, මට්ටක්කළප්පු, පොලන්නරුවෙ, තිරුකෝණමලෙ ආකිය නාන්කු මාවට්ටඞ් කළුටාක වාකනත්තෙච් චෙලුත්තුකින්ර ඔරුවරාවාර්. ඉන්ත මාවට්ටඞ්කළෙ ඌටරුත්තුච් චෙල්ලුම් පෝක්කුවරත්තු පස්කළ්තාන් කූටුතලාන විපත්තුක්කළෙච් චන්තික්කින්රන. අප්පටිප්පට්ට ඔට්ටුනර්කළෙ blacklist පණ්ණ වේණ්ටුම්. කූටුතලාන accidents ඉනෙ උරුවාක්කුකින්ර තනියාර් තුරෙ පස්සුක්කාන අනුමතියෙ ඉරත්තුච් චෙය්ය වේණ්ටුම්. ඉතන්මූලමාක, විපත්තුක්කළෙත් තවිර්ත්තුක්කොළ්ළ මුටියුම්.

මූන්රු මාතඞ්කළුක්කු මුන්නර් මාවට්ට, පිරතේච මට්ටත්තිලිරුක්කින්ර පොලිස් අතිකාරිකළෙයුම් අඞ්කිරුක්කින්ර උතවි අරසාඞ්ක අතිපර්කළෙයුම් පිරතේච චෙයලාළර්කළෙයුම් ඔන්රිණෙත්තු වීතිප් පෝක්කුවරත්තුක්කාන වේකක් කට්ටුප්පාට්ටු අටෙයාළඞ්කළෙයුම් වීති වළෙවුකළිල් අතර්කුරිය අටෙයාළත්තෙයුම් පෝටවේණ්ටුමෙන්රු නාඞ්කළ් කූරියපෝතුම් අතු ඉන්නමුම් නටෙපෙරවිල්ලෙ. ඔව්වොරු මාවට්ටත්තිලුම් ඉත්තකෙය නිකළ්ච්චිකළ් නටෙපෙට්රුක්කොණ්ටිරුක්කින්රන. මේතකු ජනාතිපති අවර්කළුටෙය පාතුකාප්පු උත්තියෝකත්තර්කළින් වාකනමුම් පෝක්කුවරත්තු පස්කළුම් එව්වළවු වේකත්තිල් චෙන්රන? අවෙ එප්පටි accident ක්කු උළ්ළායින? එන්පතර්කාන කාට්චිකළෙ ඔරුමුරෙ නාඞ්කළ් කණ්ටෝම්.

ඉන්රු එඞ්කළාල් වීතිකළිලේ පෝක වුටියාතළවුක්කු තකුතියිර්ර වාකනඞ්කළ් පුකෙයෙක් කක්කික්කොණ්ටු පෝකින්රන. ඉප්පටිප්පට්ට විටයඞ්කළ් තවිර්ක්කප්පට වේණ්ටියතු මුක්කියමාකුම්. මුන්නොරු කාලත්තිලේ පෙරුන්තෙරුක්කළ් අමෙච්චුම් පෝක්කුවරත්තු අමෙච්චුම් අතාවතු Ministry of Highways උම් Ministry of Transport උම් ඉණෙන්ත ඔර් අමෙච්චාකත්තාන් ඉරුන්තතු. ඉප්පොළුතු පෝක්කුවරත්තු වේරාකවුම් පෙරුන්තෙරුක්කළ් වේරාකවුම් පිරික්කප්පට්ටිරුක්කින්රතු. ඉන්ත නිලෙයිල්, ඔරුවර් මර්ර වරුක්කු ඔත්තුළෛප්පු වළඞ්කාමෙයින් කාරණමාක ඉන්රු වීතිකළිලේ ඔළුඞ්කර්ර මුරෙයිලේ පෝක්කුවරත්තුක්කළ් නටෙපෙට්රුක්කොණ්ටිරුක්කින්රන. අතිකාරිකළ් ඉතෙ මට්ටුප්පටුත්තත් තෙරියාතවර්කළාක ඉරුක්කින්රාර්කළ්.

අණ්මෙයිලේ තම්පුළ්ළෙ, කලේවල පකුතියිල් ඉටම් පෙර්ර වීති විපත්තිල් ඉවර් උයිරිළන්තුළ්ළතෝටු එට්ටුප් පේර් කායමටෙන්තනර්. අන්ත විපත්තානතු driver ඔය්වෙටුත්තපෝතු licence ඉල්ලාත ඔරුවර් අන්ත වාකනත්තෙ ඔට්ටිච් චෙන්රතනාල් ඒර්පට්ටිරුක්කිරතු. අඞ්කීකාරම් පෙර්ර චාරතිප් පයිර්චි නිලෙයඞ්කළිල් පයිර්චි පෙරුවතනූටාක කූටුතලාන වීති විපත්තුක්කළෙ එතිර්කාලත්තිලේ තවිර්ත්තුක්කොළ්ළලාම්. තර්පෝතු වාකන ඔට්ටුනර් licence පෙරුවතර්කුම් කූටුතලාන පණත්තෙච් චෙලුත්තවේණ්ටියිරුක්කින්රතු. එනවේ, අතනෙ ඉලකුපටුත්තික් කොටුත්තු, කූටුතලාන ඔට්ටුනර්කළෙ අනුමතික්ක වේණ්ටුමෙන්ර එනතු ආලෝචනෙයෙක් කෙළරව පෝක්කුවරත්තු අමෙච්චර් අවර්කළුක්කු කූරි, විටෙපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 4.39]

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රියැදුරු පුහුණු පාසල්වල තත්ත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒක බොහොම හොඳ කටයුත්තක්. මට ඉස්සර වෙලා කථා කළ මන්ත්‍රීතුමාත් කිව්වා, ගිය අවුරුද්දේ විතරක් රිය අනතුරුවලින් අපේ රටේ 2,700ක් මිය ගියා කියලා. යුද්ධය පැවැති කාලයේ මිය ගිය ප්‍රමාණයට වඩා අද රිය අනතුරුවලින් මිනිසුන් මිය යනවා. හැමදාම මාධ්‍යවලින් දක්නට ලැබෙන තොරතුරු අනුව බලන විට අපට පෙනී යනවා, රිය අනතුරු බහුල වී තිබෙන බවත්, රිය අනතුරුවලින් මිය යන ප්‍රමාණය වැඩි වෙලා තිබෙන බවත්. ඒකට හේතුවක් තමයි වාහන ප්‍රමාණය වැඩි වීම. පසු ගිය ජනවාරි මාසය වන විට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ වාහන සංඛ්‍යාව හැටතුන්ලක්ෂ තිසිහතරදහස් නවසිය හතළිස්දෙකක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, motorcycles තමයි ඉන් වැඩි ප්‍රමාණයක් -නිස්තුන් ලක්ෂයක්- තිබෙන්නේ. ලක්ෂ දහයක් විතර three-wheelers තිබෙනවා. අනතුරුවලට වැඩියෙන්ම භාජන වෙන්නේ මෙන්න මේ three-wheelers සහ motorcycles. ඉස්සර ලංගමයෙන් රියැදුරන් පුහුණු කරලා බර වාහන සඳහා licence එකක් දුන්නා. ඒකෙන් මාස තුනකට වැඩි කාලයක් training එකක් දීලා, වාහනය පදවන්න විතරක් නොවෙයි, වාහනයක් කැඩුණාම ඒක හදා ගන්නේ කොහොමද කියලාත් දැනුවත් කළා. අද රියැදුරෙක් වාහනයක් නැවතුණු ගමන් ඒක එතැන දමලා ගරාජයක් සොයා ගෙන යනවා. අඩුම ගණනේ bonnet එක ඇරලා battery wire එකක් එහා මෙහා කර ගන්නවත් දන්නේ නැහැ. රියැදුරෙකුට හරි පුහුණුවක් ලැබුණේ නැත්නම් පාරේ ඉන්න අහිංසක මිනිසුන්ගේ ජීවිත තමයි නැති වෙන්නේ.

අද වාහන පදවන ගොඩක් දෙනෙක් අනෙක් මිනිසුන් ගැන හිතනවාට වඩා වෙන වෙන දේවල් තමන්ගේ ඔළුවේ තබා ගෙන තමයි යන්නේ. මේ ගැසට් නිවේදනයේ නම් තිබෙන්නේ රියැදුරන්ට තුන් මාසයක පුහුණුවක් දිය යුතුයි කියලායි. නමුත් තුන් මාසයක පුහුණුවක් දෙන්න ගියොත් සමහර අයට රියැදුරු බලපත්‍රයක් ගන්න බැරි වෙයි. බර වාහන සඳහා licence එකක් ගන්න කෙනෙකුට නම් ඒක ප්‍රශ්නයක් නැහැ. Motorcycle එකක්, three-wheeler එකක් පදින කෙනෙක් licence එකක් ගන්න ගියාම එය කරන්න අපහසුයි. මොකද, ඔහු රාජ්‍ය සේවකයෙක් නම්, රැකියාව කරන අතරේ තමයි පුහුණු වෙන්නේ. ඒ අයට හොඳ පුහුණුවක් ලැබෙන කල් බලපත්‍රය නොදුන්නාට කමක් නැහැ. හැබැයි අර වාගේ පුහුණු කාලයක් දුන්නොත් එහෙම යම් ආයතනයක පුහුණු වෙනවාද කියලා අපට හරියටම හොයන්න බැහැ. පුහුණු කරන උපදේශකවරුන් ඉන්නේ 1,500කටත් අඩු ප්‍රමාණයක්. කව්චේරියක් ළඟ විතරයි බෝඩ් එකක් ගහපු, ලියා පදිංචි පුහුණු පාසලක් තිබෙන්නේ. වෙන කොහේ හරි පුරුදු වෙලා, එතැනට ඇවිල්ලා වාහනයක් ඉල්ලා ගෙන, trial එක කරලා තමයි ඕනෑ කෙනෙක් වාහන බලපත්‍රයක් - licence එකක් - ලබා ගන්නේ. හොඳ පුහුණුවක් ලබා දෙනවා වාගේම හොඳ දැනුමකුත් ලබා දෙන්න ඕනෑ, වාහනයක් පාරේ ගෙන යන්නේ කොහොමද කියන එක පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පෙරේදා ය 11.30ට විතර පාරේ එන කොට three-wheeler එකක් එයාගේ වම් පැත්තෙන්ම ගියා. මම බලා ගෙන හිටියේ. මට ඉස්සරහින් ගියේ. එක පාරටම ඒ three-wheeler එක දකුණු පැත්තට දැම්මා. දකුණු පැත්තට දමන කොට ඉස්සරහින් වෑන් එකක් ආවා. ආපසු ඒ එක්කම අනෙක් පැත්තට ගන්න කොටම අර වෑන් එකේ මූණේම three-wheeler එක වැදුණා. ඒ three-wheeler එකේ හිටපු තුන් හතර දෙනෙක් බැහැපු ගමන් මොකද කළේ? අර හොඳට වෑන් රථය පදවා ගෙන ආව රියැදුරා ඇදලා අර ගෙන ගැහුවා. මේක තමයි අද හැටි. ඒ වෑන් එකේ හිටපු කාන්තාවන් ටිකක් කෑ ගැහුවා. බැහැලා එතැනට ගියොත් එහෙම අහක ඉන්න අපිත් රණ්ඩුවලට පැටලෙනවා. එහාට මෙහාට දමලා ආව three-wheeler එක, හොඳට ආපු රියැදුරාගේ වාහනයේ හැප්පුවා. හැබැයි පොලීසියෙන් කරන්නේ මොකක්ද? දෙදෙනාටම නඩු පවරනවා. දැන් අලුත් ක්‍රමයක් තිබෙන්නේ. "අනතුරක් වළක්වා නොගැනීම" කියලා අලුත් නීතියක් හදා ගෙන දෙදෙනාටම නඩු පවරනවා. පාරේ හොඳට ආපු රියැදුරාටත් නඩුවක් පවරනවා. එක පාරට ඇවිල්ලා වාහනයක් පාර හරහා දමපු ගමන්, පාරේ හොඳට ආව වාහනය නවත්වාගන්න කාටවත් පුළුවන්කමක් නැහැ. අපි ඇහුවාම කියනවා, "නැහැ, එයාටත් ඒක නවත්වා ගන්න තිබුණා, එයත් අපරීක්ෂාකාරී ලෙස ආවා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරේ ඉරක් ගහලා තිබෙනවා නම්, ඉරෙන් අනෙක් පැත්තට ගිහිල්ලා වාහනයක් හැප්පුවාම පාරේ හරියට ගිය මනුස්සයාට නඩු පවරලා හරි යනවාද? දැන් පොලීසිය කරන්නේ ඒ පුද්ගලයාටත් නඩු පැවරීමයි. කවුරු හරි ඇහුවාම කියනවා, අපි එයාටත් නඩුවක් පැවරුවා කියලා. අර හොඳට රිය පදවපු මනුස්සයාටත් පොලීසිය කරන්නේ නඩු පැවරීමයි.

ඊළඟට, high speed යන වාහන අල්ලන්න පොලීසිය හැංගි මුත්තම් කෙළිනවා. එක්කෝ කණුවක් ළඟ හැංගිලා ඉන්නවා. එහෙම නැත්නම් ගහක් යට හැංගිලා ඉන්නවා. එහෙම ඉඳලා මොකක් හරි වාහනයක් අල්ලාගෙන high speed ගියා කියනවා. පොලිස් නිලධාරියකුගේ රාජකාරිය ඒක නොවෙයි. අනතුරක් වන එක වළක්වන්න නම් ඒ නිලධාරියා පෙනෙන්න ඉන්න ඕනෑ. පොලිස් නිලධාරියකු පෙනෙන්න ඉන්න කොට වාහනය පදවන එක්කෙනා භයයි. එතකොට පොලිස් නිලධාරියකු සිටින නිසාවත් එයා ප්‍රවේශමකාරී ලෙස වාහනය පදවනවා. මිනිස්සු මරන්න, නඩු දමන්න නොවෙයි පොලීසිය තිබෙන්නේ. පොලිස් නිලධාරියා වාහන පදවන අයට පෙනෙන්න ඉන්න ඕනෑ.

හැංගිමුත්තම් කරලා කරන්නේ දඩ ගහන එක විතරයි. එයින් අනතුරක් වැළැක්වෙන්නේ නැහැ. ඒ නිසා, හරි නම්, අනතුරක් වළක්වන්න කටයුතු කළේ නැහැයි කියලා ඒ පොලිස් නිලධාරින්ට විරුද්ධවයි නඩු දමන්න ඕනෑ. අපි යන කොට වුණත් ඉස්සරහින් එන වාහනයක කවුරු හරි ලයිට් එකක් ගැහුවොත් හෙමින් යන්න කියනවා. ඇයි ඒ? අපි දන්නවා නේ ඉදිරියේ පොලිස් නිලධාරියෙක් ඉන්නවා කියලා. ඒ නිසා ඒ නිලධාරියා පෙනෙන්න ඉන්න ඕනෑ. නමුත් ඒක කරන්නේ නැහැ. මේ රිය අනතුරු වැඩි වෙන්න එක හේතුවක් තමයි පොලීසිය. පොලීසිය හැංගෙන්නේ නැතිව ඒ වැඩේ හරියට කරන්න ඕනෑ. වාහනයට පාරේ ඉරක් යන්තම් කැපුණත් නඩුවක් දමනවා. ඕනෑ නම් ඒ වරදට අවවාදයක් කරන්න පුළුවන්. සමහර වෙලාවට වාහනයකට ඉස්සර කරන්නම බැරි අවස්ථා තිබෙනවා; එක පේළියට වාහන යනවා. එවැනි අවස්ථාවක ඉස්සර කරන්න ගියොත් දැක්ක ගමන්ම ලියනවා. -මම කියන්නේ නැහැ වැරදි වැඩ කරන්න කියලා- හැබැයි දඩ කොළයක් ලිව්වත් ඒ රියැදුරාට කියන්නේ නැහැ, "වැරැද්ද මෙකයි, මේ වැරැද්ද නැවත කරන්න එපා" කියලාවත්. දඩ ගැහුවත් කමක් නැහැ, නැවත නොකරන්න ඒ වැරැද්ද කියලා දෙනවා නම්.

මට කලින් ගරු මන්ත්‍රීතුමෙක් කථා කළා. එතුමාත් කිව්වා driving licenceවලට අදාළ පොතක් තිබෙනවා. ඒ පොතේ රියැදුරා කරන වැරදි ලියන්න පුළුවන්. ඒ වැරදි ලියන්න ඕනෑ. දඩ කොළය දෙන කොටම ඒ වැරැද්දත් ලියලා, දැනට මෙච්චර වැරදි ගණනක් කර තිබෙනවා කියලා පෙන්වා දුන්නාම, අඩු ගණනේ ඒකෙන් බේරෙන්නවත් රියැදුරන් වැරදි නොකර ඉඳියි. හැටතුන් ලක්ෂයකට වඩා වාහන තිබෙන කොට, රියැදුරු බලපත්‍ර තිබෙන අය ලක්ෂ කීයක් ඉන්නවාද? ඒ අය හරි මාර්ගයට ගන්න ඕනෑ. වාහනයක් නැතිව පාරේ අයිනෙන් යන අහිංසක මිනිස්සු තමයි අද වාහනවලට යට වන්නේ. ඒ නිසා අපේ ගරු ඇමතිතුමාගෙනුත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලනවා, මේ කටයුතු පිළිබඳව සොයා බලන්න කියලා.

අපේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හොඳ නිලධාරීන් ඉන්නවා. හුඟක් අය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට දොස් කියනවා. එතැනට ගියාම පගාව දෙන්න ඕනෑය කියනවා. ඒ ඔක්කොම කරන්නේ පාරෙන් එහා පැත්තේ ඉන්න පිරිසක්. ඒ අය තමයි ඒවා කරන්නේ. අද අපේ මිනිස්සුත් ඉගෙන ගෙන තිබෙන්නේ පගාවට වැඩ කරවා ගන්නයි. ලේසියට වැඩ කර ගන්න කාට හරි සල්ලි දීලා කියනවා, "මෙන්න මේක මට කරලා දෙන්න" කියලා. ඒවාට සූදානම් පිරිස් හැදිලා ඉන්නවා. අපේ වාහනයක ප්‍රශ්නයක් තිබෙනවා නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගිහිල්ලා ඒ කටයුත්ත කර ගන්න පුළුවන්. අද සභාවේ කටයුතු ආරම්භ කරන අවස්ථාවේ මම හිටියේ නැහැ.

[ගරු ජානක වක්කුඹුර මහතා]

ඇමතිතුමාගේ කථාව මම රූපවාහිනියෙන් අහගෙන හිටියා. එතුමා කිව්වා, ගෙදර ඉඳන්ම මේ කටයුතු කර ගන්න පුළුවන් ක්‍රමවේදයක් හදනවා කියලා. අපි ඒකට කැමැතියි.

අද මේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ අද බස් රථ ලක්ෂයකට වඩා තිබෙනවා. එයින් කොච්චර ප්‍රමාණයක් පාරේ දුවනවාද කියලා මම දන්නේ නැහැ. ලියා පදිංචි බස් රථ ලක්ෂයකට වඩා තිබෙනවා. පාරේ දුවන්නේ නම් බස් රථ 10,000ක් විතර තමයි. [බාධා කිරීමක්] 25,000ක්. ඔව්. බස් රථ ලක්ෂයක් විතර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩි පිරිසක් ගමන් කරන්නේ බස් රථවලින් තමයි. ඒ නිසා බර වාහන licence දෙනකොට තුන් මාසයක් නොවෙයි, ඊට වැඩි කාලයක් හරි දීලා, ඒ අයට හොඳ පුහුණුවක් ලබා දීලා, අනුන්ගේ ජීවිත තමයි ඒ අය අරගෙන යන්නේ කියන එක උගන්වලා හොඳ පුරවැසියෙක්, හොඳ රියැදුරෙක් බවට පත් කරලා තමයි අපි ඒ බලපත්‍රය දෙන්න ඕනෑ. අඩුම ගණනේ අවුරුද්දක් දෙකක් යන තෙක් අලුත් බලපත්‍රයක් අරගෙන වාහනයක් පදවන කෙනක් හදුනා ගන්න යම්කිසි ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ.

ඉස්සර නම් "L" board එකක් ගහගෙන ගියා. දැන් "L" board ගැහිල්ලක් නැහැ. ඒ නිසා අලුතින් බලපත්‍රයක් ගත් කෙනකුට අඩු ගණනේ හය මාසයක් හරි "L" board එකක් ගහගෙන යන්න කිව්වොත් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මිනිස්සු දන්නවා මේ එන්නේ එච්චර හුරු එක්කෙනෙක් නොවෙයි කියලා. එහෙම වුණාම තවත් ටිකක් පාරෙන් අයින්වෙලා යයි. අපේ රටේ රිය අනතුරුවලින් ජීවිත දහස් ගණනක් නැතිවන නිසා මේ නියෝග ඉදිරිපත් කරනවා වාගේම, රියැදුරන් පුහුණු කිරීම් කටයුතුත් ඉතා හොඳ තත්ත්වයට ගෙනැල්ලා ඒ අනතුරු අවම කරන්න මීට වඩා කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 4.49]

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කරන නියෝග තුළින් ඉතාම වැදගත්, මේ යුගයට අවශ්‍ය සංශෝධන තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ වාගේම රියැදුරු පාසල් නියාමනය කියන එක ඉතා වැදගත් වෙනවා. අද කථා කරපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථාවලින් කියැවුණා වාගේ අද බහුලව සිදු වන අනතුරුවලට අපේ රටේ රියැදුරන්ගේ යම් යම් වැරදි හේතු වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ නිසා අපේ රටේ ජීවිත අහිමි වන අවස්ථා ඇති වනවා.

විශේෂයෙන් රියැදුරු පාසල් නියාමනය කිරීමෙන් ගරු ඇමතිතුමා ඇතුළු අප බලාපොරොත්තු වන්නේ, රියැදුරන් අතින් වන වැරදි අවම කිරීමයි. වාහන විශාල ප්‍රමාණයක් තිබෙන කොට වාගේම, පාරවල්වල යම් යම් ගැටලු සහගත තත්ත්ව තිබෙන කොට අනතුරු බහුල වෙනවා. අපි රියැදුරන්ට නිසි පුහුණුවක් ලබා දෙනවා නම්, රියැදුරන් විනයක් ඇතිව පාරේ වාහන ධාවනය කරනවා නම් අද සිදු වන අනතුරුවලින් සියයට 50කට වඩා අඩු කර ගන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ සඳහා තිබෙන හොඳම දේ තමයි රියැදුරු පාසල් නියමාකාරයෙන් නියාමනය කරන්න අලුත් නීති රීති ඇතුළත් කිරීම. ඒ නිසා දැන් රියදුරු උපදේශකයන් A, B, C වශයෙන් නම් කරලා ඒ අනුව කටයුතු කරන්න අලුත් නීති රීති සකස් කරගෙන යනවා.

විශේෂයෙන් අද ත්‍රි රෝද රියැදුරන් මාර්ග නීති අනුගමනය නොකිරීම සහ කිසිම විනයක් නැති තත්ත්වයෙන් ධාවනය කිරීම තුළ අනතුරු බහුලව සිදු වෙනවා. මේ ත්‍රි රෝද රියැදුරන් විශාල පිරිසක් බලපත්‍ර නැතිවයි ධාවනය කරන්නේ. එවැනි අයට විශේෂ පුහුණුවක් ලබා දීලා, විනයක් ඇතිව වාහනය ධාවනය කරන්න කටයුතු සලස්වනවා නම් අනතුරු විශාල ප්‍රමාණයක් අඩු කර ගන්න පුළුවන්.

පෞද්ගලික බස් රථ සම්බන්ධයෙනුත් කථා කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වයට පිළියම් සෙවීමට මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ ගෙනෙන මේ සංශෝධන ප්‍රමාණවත් නැහැ. විශේෂයෙන් ඒ රියැදුරන් සමහර පාරවල්වල තමන්ට යන්න තිබෙන වේග සීමා ඉක්මවා තරගකාරී තත්ත්වයක් තුළ ධාවනය කිරීම තුළින් අනතුරු විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. මෙන්න මේ කරුණු සියල්ල සලකා බලන්න වෙනවා, රියදුරු බලපත්‍ර ලබා දීමේදී.

නීති-රීති කඩ කරන රියැදුරන්ගේ රියැදුරු බලපත්‍රය සම්බන්ධයෙනුත් මීට වඩා සැලකිලිමත් විය යුතුයි. නීතියක් කඩ කළ ගමන් ඒ අයගේ රියැදුරු බලපත්‍රයේ තිබෙන තත්ත්වය පහළ දමන්න වැඩ පිළිවෙළක් අපි හදලා තිබෙනවා නම්, පොලිසියටත්, ඒ නීති ක්‍රියාත්මක කරන සියලු දෙනාටත් පහසු වෙනවා, ඒ රියැදුරාගේ පෙර වැරදි කොයිතරම් තිබෙනවාද කියන එක දැන ගන්න. ඒ නිසා රියැදුරු බලපත්‍රය තුළින් එහෙම හදුනා ගැනීමේ හැකියාවක් ඇති කරන්න අපි කටයුතු කරන්න ඕනෑ. අපි දන්නා හැටියට දියුණු රටවල්වල රියැදුරන් තුන් වතාවක් වැරදි කළාම බලපත්‍රය අහෝසි කරනවා. ඒ තුළින් විශාල විනයක් ඒ රියැදුරන් තුළ ඇති වෙලා තිබෙනවා.

විශේෂයෙන් දියුණු රටවල රියැදුරන් සහ අපේ රටවල රියැදුරන් අතර ලොකු වෙනසක් අපි දකිනවා. ඒ නිසා අපිත් එවැනි තත්ත්වයක් ඇති කළ යුතුයි. මොකද, ජීවිත කියන්නේ ඉතාම වටිනා දෙයක්. මා ගිය සතියේ දවසක උදේ කුරුණෑගල සාමාන්‍ය මාර්ගයක -ප්‍රධාන මාර්ගයක නොවෙයි- සිදු වුණු අනතුරක් දැක්කා. අම්මා කෙනක් දුව සමඟ පාරේ හුහක් අයින් වෙලා ගමන් කළා. නමුත්, වෑන් රථයක් ඇවිත් ඒ දෙදෙනා යට කරගෙන ගියා. එවැනි තත්ත්ව ඇති වෙන්නේ රියැදුරන්ගේ තිබෙන නොසැලකිලිමත්කම නිසායි. විශේෂයෙන් ඉඩ නැති තැන්වලදී වාහන ඉස්සර කරන්න යනවා. ඒ වාගේම පෞද්ගලික බස් රථ රියැදුරන්ගේ තරගකාරීත්වය තුළ ඇති වන නොසැලකිලිමත්කම නිසා ජීවිත විශාල ගණනක් හානි වෙලා තිබෙනවා.

විශේෂයෙන් රියැදුරු පාසල් නියාමනය කිරීමේදී ඒ කරුණුත් අපි අවධානයට යොමු කළ යුතුයි. විශේෂයෙන් ඒ අය වරින් වර කරන වැරදි වෙනුවෙන් රියැදුරු බලපත්‍රයේ තත්ත්වය බාල කළ යුතුයි. මුලින් "A" grade කියලා බලපත්‍රයක් අපි ලබා දුන්නොත්, රියැදුරා කරන වැරදි අනුව ඒ බලපත්‍රයේ තත්ත්වය අඩු කරලා, වැරදි කිහිපයක් කළාට පස්සේ බලපත්‍රය සම්පූර්ණයෙන් තහනම් කරන තත්ත්වයක වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ.

විශේෂයෙන්ම රියදුරු පාසල් ගැන කථා කරද්දීත්, උපදේශකයන් සම්බන්ධයෙන් කථා කරද්දීත් කියන්නට ඕනෑ, අද තිබෙන රියදුරු පුහුණු පාසල් ප්‍රමාණය අපට කොහොමවත්ම ප්‍රමාණවත් නැති බව. විශාල පිරිසක් රියදුරන් හැටියට අලුතෙන් පුහුණුව ලබනවා. ඒ නිසා මේවා නියාමනය කරලා, මේ සඳහා නීති - රීති අලුතෙන් සකස් කරලා ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි. අද කාලයට -යුගයට- ගැළපෙන ආකාරයෙන් මේවා සකස් කිරීම ඉතාම වැදගත් කියලා මා හිතනවා. ඒ නිසා මේක ඉතාම වැදගත් නියෝගයක්. අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමාත්, එතුමාත් මේ සම්බන්ධයෙන්

අවධානය යොමු කරලා, මේවා ගැන හොඳ අධ්‍යයනයක් කරලා කටයුතු කිරීම වැදගත් කියන එකත් මතක් කරමින්, විශේෂයෙන් මේ කටයුතු කරන්න එතුමාට ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා.

[අ.භා. 4.55]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝග පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමාත් ගරු සභාවේ රැඳී සිටිනවා. මේ ගරු සභාවේ කථා කරපු බොහෝ මන්ත්‍රීතුමන්ලාගෙන් ප්‍රකාශ වුණු ප්‍රධාන කාරණයන් තමයි රිය අනතුරු බහුලවීම සහ රිය අනතුරු වළක්වා ගැනීම. දවසකට අපේ රටේ හත් දෙනෙක්, අට දෙනෙක් රිය අනතුරුවලින් මිය යනවා. මෙය, දවස ගණනේ වර්ධනය වෙන ප්‍රවණතාවක් තිබෙනවා. එය වළක්වා ගැනීම අප කාගේත් පරම යුතුකමක් වෙනවා. ඒ සඳහා කටයුතු කිරීම අපේ වගකීමක්. රියදුරු පාසල් නියාමනය වාගේ කාරණාත් ඒ සඳහා යම් පමණකට වැදගත් වේවි කියලා අපි විශ්වාස කරනවා. නමුත් රිය අනතුරු අවම කර ගැනීම සඳහා ගත යුතු නිසි ක්‍රියා මාර්ගයන් අපි හඳුනා ගන්නවා නම්, ඒ සඳහා නිසි උත්තරයක්, ස්ථිරසාර උත්තරයක් අපි සොයනවා නම්, ලංකාවේ රිය අනතුරු වර්ධනය වුණේ කොහොමද, දවසකට 7-8දෙනෙක් මිය යන තත්ත්වය දක්වා මෙය වර්ධනය වුණේ කොහොමද කියා සොයන්නත් අපි කටයුතු කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රථ වාහන පොලීසියේ අත් දැකීම් අනුව ලංකාවේ රිය අනතුරු බහුලව සිද්ධ වීමට හේතු වන්නේ, අධික වේගය හා අනිසි ඉස්සර කිරීමයි. මේ හේතු දෙක නිසා තමයි වැඩිපුර රිය අනතුරු සිද්ධ වන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ආනන්ද කුමාරසිරි මහතාගේ නම යෝජනා කරන්න.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA left the Chair and THE HON. J.M. ANANDA KUMARASIRI took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

වැඩිම රිය අනතුරු ප්‍රමාණයක් සිද්ධ වන්නේ වෙනත් වාහනයකට ඉස්සර කිරීමට යෑම සහ අධික වේගයෙන් රිය පැදවීම නිසායි. ඒ නිසා දැන් අපට මරු දණ්ඩෙ යනවා වාගේ තමයි පාරවල්වල යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අද මහ පාරේ පයින් ගියත් වාහනයක හැප්පිලා මැරෙන්න වෙයිද කියා දන්නේ නැති අවිනිශ්චිත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහන ඉස්සර කිරීම් සිදු වන්නේ ඇයි? අධික වේගයෙන් රිය පදවන්න පෙලඹෙන්නේ ඇයි? රථ වාහන පොලීසියේ අත් දැකීම් අනුව පෞද්ගලික බස් රථ රියැදුරන්, ත්‍රී වීලර් රථ රියැදුරන් සහ මෝටර් සයිකල් රියැදුරන් තමයි වැඩිපුරම අධික වේගයෙන් රිය පැදවීම සහ ඉස්සර කිරීම් සිදු කරන්නේ. ඒ ඇයි? පෞද්ගලික අංශයේ බස් රථ මඟී ප්‍රවාහනය සඳහා යොදා ගත්තාට පස්සේ ඔවුන් බරපතළ අර්බුදයකට මුහුණ දෙන්න පටන් ගත්තා. ඔවුන්ට දවසේ තමන්ගේ ඉලක්කය සාක්ෂාත් කර ගන්න ඕනෑ. බස් එකක් පාරට දැම්මේ, හිස් අතින් ගෙදර යන්න නොවෙයි; මඟියාට සේවය සපයා නිකම් ගෙදර යන්න නොවෙයි; ලාභයක් ලබන්නයි. ලාභ ලබන්න නම් මොකක්ද කරන්න ඕනෑ? වැඩි මඟීන් ප්‍රමාණයක් පටවන්න ඕනෑ, වැඩි වාර ගණනක් ධාවනය කරන්න ඕනෑ. එහෙම කරන්න නම් මොකක්ද කරන්න ඕනෑ? මාර්ග නීති පැත්තකට දමා, මිනිස් ජීවිත පැත්තකට දමා, අධික වේගයෙන් හැටට හැටේ යන්න ඕනෑ. බල්ලන් මරලා හෝ සල්ලි හම්බ කරන්න ඕනෑ. ඒ තර්කණය ප්‍රවාහනයට ඇතුළු වුණාට පස්සේ තමයි රිය අනතුරු වැඩි වීමේ ප්‍රවණතාවක් ඇති වුණේ. කල්පනා කරලා බලන්න. මේ ගැන ඔබතුමාත් දන්නවා ඇති.

එදා හිටපු පෞද්ගලික අංශයේ බස් රථ හිමියන් අද නැහැ. ඒ බස් රථවල සේවය කළ කොන්දොස්තරවරුන් සහ රියැදුරන් තමයි අද ඒවායේ අයිතිකරුවන් බවට පත් වෙලා ඉන්නේ. දැන් ඒ ගොල්ලන්ට ප්‍රශ්නයක් තිබෙනවා. ලීසිං එකේ මාසික වාරිකයට සරිලන දෛනික ආදායමක් ලබන්න ඕනෑ, වාහනය නඩත්තු කිරීම සඳහා ආදායමක් ලබන්න ඕනෑ, ඒ අය ජීවත් වීම සඳහා අදායමක් ලබන්න ඕනෑ. එතකොට සිල් ගත්තා වාගේ මාර්ග නීති රෑක-රෑක ඉඳලා හරි යන්නේ නැහැ. මාර්ග නීති කඩා ගෙන, බිඳ ගෙන යන්න ඕනෑ; ඉස්සර කරන්න ඕනෑ; අධික වේගයෙන් යන්න ඕනෑ. එතකොට මිනිසුන් හැප්පෙන එක වළක්වන්න බැහැ. ඒ නිසා මේ ප්‍රශ්නයට උත්තරයක් සොයන්නේ නැති තාක් කල්, රියැදුරු පාසල් නියාමනය කිරීමෙන් හෝ ප්‍රමිතිගත කිරීමෙන් පමණක් රිය අනතුරු අවම වෙයි කියා විශ්වාස කරනවා නම් අපි ලොකු මිථ්‍යාවකයි ඉන්නේ කියන එකත් අවධාරණය කරන්න ඕනෑ. ඒකෙන් කියන්නේ නැහැ, රියැදුරු පාසල් නියාමනය කරන එක වැරැදියි කියලා. ඒක කරන්නත් ඕනෑ. හැබැයි බස් රථ තරගය අවම කිරීම සඳහා වුණු නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න

[ගරු ජයන්ත සමරවීර මහතා]

ඕනෑ. මඟී ප්‍රවාහනය සහ ප්‍රවාහනය පිළිබඳ අලුත් කියවීමක් මේ රටට අවශ්‍යයි. දුම්රිය මාර්ග පුළුල් කරලා දියුණු කරන්නේ කොහොමද? දැන් ඒ කාර්යයන් කිරීම අවශ්‍යයි. ගංගා, ඇළ, මුහුදු ප්‍රවාහනය සඳහා පාවිච්චි කරනවා නම් එය කරන්නේ කොහොමද? ඒ සඳහා අලුත් කියවීමක් අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් අපේ පාරවල් හොඳයි. දැන් පාරේ යන කොට හක්ක පනින්නේ නැහැ. දැන් පාරවල්වල මතු පිට හොඳයි, පාර හොඳයි. හැබැයි පාර හැදුවාට වැඩක් නැහැ, පාරේ යන රියැදුරාගේ ඔළුව හැදුවේ නැහැ. ඉස්සර කොට-කොට යන්න සිද්ධ වුණා. ඒ ඇයි? පාර හොඳ නැති නිසා. දැන් කොට-කොට යන්න ඕනෑ නැහැ. වාහනය පාරට දැම්මාම විදලා යන්න පුළුවන්. විදලා යනකොට හැප්පෙනවා. රියදුරාගේ ඔළුව හැදුවේ නැහැ. රියාදුරාගේ ඔළුව හදන්න ඕනෑ රියදුරු පාසල ඇතුළේ දී ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒකට වැදගත්කමක් දෙන්න. ඔළුව හැදුවේ නැත්නම් මේක හරියන්නේ නැහැ. රියදුරු බලපත්‍රය ලබා දීමේදී ඒ අවශ්‍යතාවත් අපි ඔබතුමාට අවධාරණය කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ලංකාවේ වාහන ලක්ෂ 65ක් - මිලියන 6.5ක් - තිබෙනවා. දවසකට මහ පාරවල්වල වාහන මිලියන 5ක් තිබෙනවා කියලා කියනවා. ඒ කියන්නේ ලක්ෂ 50ක්. කොළඹ නගර සභාව ඇතුළේ මාර්ගවල වාහන ලක්ෂ 5ක් තිබෙනවා. එම ලක්ෂ 50 තුළ ධාවනයට නුසුදුසු වාහන කොච්චර නම් තිබෙනවාද? යන්තම් අටෝගෙන දුවන වාහන, කසිකබල් වාහන කොච්චර තිබෙනවාද? එවැනි වාහන පිළිබඳව සොයන්න නිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද? සමහර වාහන බ්‍රේක් ගහනවා, ඒ බ්‍රේක් එක වදින්නේ පදිකයාගේ ඔළුව චප්පවුණාට පස්සේ. මණියා තමයි වාහනයේ අඩකොටය වෙන්නේ. මේවා ගැන බලන්න කෙනෙක් නැහැ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඉන්නවා, මෝටර් රථ කාර්මිකයන්. එම දෙපාර්තමේන්තුවේ 2012 මිනිස්බල ඇස්තමේන්තුව අනුව 148දෙනෙක් අවශ්‍යයි. 2012 දී ලංකාවේ වාහන ලක්ෂ 50ක් තිබුණා. මේ වන විට වාහන ලක්ෂ 65ක් තිබෙනවා. දැන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකයන් - අපි examinersලා කියලා කියනවා - කී දෙනයිද ඉන්නේ? 105දෙනයි ඉන්නේ. ඒ කියන්නේ වාහන 50,000කට එක්කෙනෙක් වශයෙන්වත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් තමයි වැඩිම රිය අනතුරු ප්‍රමාණයක් වාර්තා වෙන්නේ. මම ගරු ඇමතිතුමාට සහ නියෝජ්‍ය ඇමතිතුමාට කියනවා, ඔන්න රක්ෂා දෙන්න අවස්ථාවක් තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමයි වැඩිම රිය අනතුරු සිද්ධ වෙන්නේ. මෝටර් රථ පරීක්ෂකයෝ එක්කෙනයි ඉන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වාහන 50,000ක කාර්මික දෝෂ, ඒ වාගේම එම වාහන පාරේ දුවන්න සුදුසුද, නැද්ද කියලා එක්කෙනෙක් බලන්නේ කොහොමද? 2012 දී 148දෙනෙක් ඕනෑ කියලා තිබුණා. 2012 දී ලංකාවේ වාහන පනස්ලක්ෂයයි තිබුණේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මිනිස්බල ඇස්තමේන්තුව අනුව මෝටර් රථ පරීක්ෂකයන් 148දෙනෙක් සිටිය යුතුයි. නමුත් ඉන්නේ 105දෙනයි. දැන් වාහන ලක්ෂ 65ක් තිබෙනවා, ඒත් මෝටර් රථ පරීක්ෂකයන් ඉන්නේ 105දෙනයි. ඒ කියන්නේ, එක් අයෙකුට වාහන 50,000ක් විතර බලන්න වෙනවා. මාර්ග පරීක්ෂාව තමයි මෝටර් රථ පරීක්ෂකයන්ගේ වගකීම. අද ඔවුන් මාර්ග පරීක්ෂාවට යොදවන්නේ නැහැ. පොලීසියත් එක්ක ඔවුන් එන්නේ නැහැ. වාහනයක් හැප්පුණාම ඒ වාහනය පොලීසියෙන් නිදහස් කර ගැනීම සඳහා examiner ඇවිල්ලා බලනවා, බ්‍රේක් හරියට වැඩ කරලාද තිබෙනවාද කියලා. මේ නිසා මෝටර් රථ පරීක්ෂකයන්ගේ සංඛ්‍යාව වැඩි කරන්න. ඔබතුමාට රක්ෂා දෙන්නත් අවස්ථාවක් තිබෙනවා. ඒ සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ; යාවත්කාලීන කරන්න ඕනෑ. වාහන ලක්ෂ 65 සඳහා අවම වශයෙන් කී දෙනෙක් ඕනෑද කියලා ඔබතුමන්ලා තීරණය කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී පොලීසියටත් කාර්ය භාරයක් තිබෙනවා. අපේ පොලීසිය මැදිහත් වෙන්නේ රිය අනතුරු අවම කිරීම සඳහා වන ප්‍රවේශයක් සඳහා නොවෙයි. එහෙම නම් ඔවුන් හැංගිලා ඉන්නේ නැහැ නේ. ඒ ගොල්ලන් මැදිහත් වන්නේ තමන්ට ලැබෙන දඩ මුදල් ඉලක්කය සම්පූර්ණ කරන්නේ කොහොමද කියන කාරණය සඳහායි. රිය අනතුරු අවම කිරීම සඳහා තමයි ඒ ගොල්ලන් මැදිහත් වන්නට ඕනෑ. ලෝකයේ අනෙක් රටවල රථවාහන පොලීසි එහෙමයි. නමුත් රිය අනතුරු අවම කිරීම සඳහා මැදිහත් වීමක් නොවෙයි අපේ පොලීසියෙන් සිද්ධ වෙන්නේ. ඒ සම්බන්ධයෙනුත් ඔබතුමන්ලාගේ අවධානය යොමු වන්නට ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා අධ්‍යාපනික වග කීමකුත් තිබෙනවා. කනගාටුයි කියන්න, ඇතැම් මාධ්‍ය විසින් රිය අනතුරු වාර්තා කරන්නේ අපටත් රිය අනතුරක් කරන්න ආසා හිතෙන විධියටයි. රිය අනතුරක් කරන්න ආසා හිතෙන විධියට තමයි ඔවුන් රිය අනතුරු වාර්තා කරන්නේ. ඒ සඳහා පෙළඹවීමක් ඇතිවන විධියටයි ඔවුන් එය වාර්තා කරන්නේ. මම දන්න තරමින් රිය අනතුරු බහුලවීම නිසා ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මාධ්‍යයෙන් ඉඩකඩක් ඉල්ලුවා. රියදුරා විතරක් දැනුවත් කරලා හරියන්නේ නැහැ, මණියාත් දැනුවත් කරන්න ඕනෑ නේ. අපි ඉස්කෝලේ යන කාලේ ඉස්කෝලවලට ඇවිල්ලා එවැනි දැනුවත් කිරීමක් කළා. දැන් ඒක කරන්නේත් නැහැ නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මැදිහත් වෙලා සෑම මාධ්‍යයකින්ම ඉඩකඩක් ඉල්ලාගන්න. රිය අනතුරු නිසා දවසකට 7දෙනෙක් මැරෙනවා. අත-පය කඩා ගැනීම්වලට අමතරව දවසකට 7දෙනෙක් රිය අනතුරුවලින් මැරෙනවා. කී දෙනෙක් සදාකාලික ආබාධිතයන් බවට පත්වෙනවාද? ඒවා වාර්තා වෙන්නේ නැහැ. රිය අනතුරු අවම කිරීම සඳහා පොදුවේ සියලුම මහ ජනයා දැනුවත් කරන්න, ඔවුන්ගේ ඔළුව හදන්න මැදිහත් වෙන්න. ඒ සඳහා අවශ්‍ය වැදගත් ගුවන් කාලයක් මධ්‍යයෙන් ඉල්ලාගෙන පළල් ලෙස ජනතාව දැනුවත් කිරීමක් කරන්න.

ඊළඟට, ප්‍රවාහනයේ තිබෙන තරගය අවම කිරීම සඳහා වන රාජ්‍ය මැදිහත්වීම වැඩි කරන්න කියලාත් අපි ඉල්ලනවා. දුම්රිය පාර රට වටේට එළන්න පුළුවන් රටක්, මේ රට. මාගලක් වාගේ දුම්රිය පාර රට වටේට එළන්න පුළුවන්. ඒ නිසා, ඒකට මූලිකත්වය දෙන්න. ඒ වාගේම, මඟී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්න පුළුවන් ගංගා පද්ධතියක් තිබෙනවා. ඒකටත් මූලිකත්වය දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

අවසාන වශයෙන්, මේ කාරණය මතක් කරන්නට ඕනෑ. පසු ගිය කාලයේ, බඩු ප්‍රවාහනය කරන විශාල වාහන සාමාන්‍යයෙන් වාහන තදබදය තිබෙන වේලාවල පාරේ ධාවනය කිරීම තහනම් කරලා තිබුණා. රාත්‍රී දහයේ ඉඳලා උදේ හත වාගේ කාලයක තමයි ඒවා ගමන් කළේ. නමුත්, දැන් ඒ නීතිය වෙනස් වෙලා තිබෙන්නේ. දැන් විශාල කන්ටේනර් පාර මැද්දේ යනවා. මෝටර් සයිකලය ආවා කියලා ඒවාට ප්‍රශ්නයක් නැහැ. ඒකේ රියැදුරුටවත්, කාටවත් මොනවත් වෙන්නේ නැහැ. කන්ටේනර් රථය මෝටර් සයිකලයේ හැප්පුනාම මෝටර් සයිකලය චප්ප වෙනවා, ඒක පැදවූ මිනිහා මැරෙනවා. ඒ නිසා, එවැනි වාහන ධාවනය කිරීමට තිබුණු කාල සීමාව නැවත පනවන්න.

ගරු අශෝක් අබේසිංහ මැතිතුමනි, -ඔබතුමා රථවාහන පොලීසියෙන් අහලා බලන්න.- මේ කන්ටේනර් රථ නිසා තමයි වැඩිම accidents ප්‍රමාණයක් දැන් සිද්ධ වෙන්නේ. ඒ නිසා ඒවා රාත්‍රී දහයේ සිට උදේ හත අතර කාලය තුළ ධාවනය කරවීමට නැවත සලකා බලන්න කියන යෝජනාව කරනවා. ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලනවා, මේ තිබෙන තරගය අවම කිරීම සඳහා රාජ්‍ය ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කරන්නය කියා. ඒ වාගේම, රියැදුරන් පමණක් නොවෙයි, මහී ජනතාවත් ඉලක්ක කර, දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කරන්න. ඒ සඳහා මාධ්‍යයත් යොදා ගන්නා හැටියට අවධාරණය කරමින්, ඔබතුමන්ලා මේ සම්බන්ධව දරන ප්‍රයත්නය ගැන ප්‍රසාදය පළ කරමින් මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි භයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.08]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ස්තුතිවන්ත වනවා, අද ඉතාමත් වැදගත් නියෝග දෙකක් පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. මා හිතන්නේ, මෙය පසු ගිය රජය ගෙන ඒමට තිබුණු නියෝග කියලායි. අවුරුදු දෙකකට ආසන්න කාලයක් තුළ මේ පිළිබඳව විමර්ශනය කර, ගරු අමාත්‍යතුමා විසින් ඉතාමත් වැදගත්, ඒ වාගේම කාලෝචිත කටයුත්තක් හැටියට සලකා බලායි මේ නියෝග ඉදිරිපත් කළේ. මේ අවස්ථාවේදී එයට අදාළ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ සම්බන්ධයෙන් කථා කළ සෑම මන්ත්‍රීවරයෙක්ම මේ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. ශ්‍රී ලංකාවේ වාහන ලියා පදිංචි කිරීම්, ඒ එක්කම රියැදුරු පුහුණු පාසල් ලියා පදිංචි කිරීම් වැනි කාරණා සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් 2012 සිට 2016 දක්වා කරන ලද කාර්යයන් පිළිබඳව අප දන්නවා. ඒ වාගේම, රිය අනතුරු සංඛ්‍යාව බැලීමෙදීත් වර්ධනයක් පෙන්නුම් කරනවාය කියන එක ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාත් ඉතාමත් පැහැදිලිව කිව්වා. එතුමා නම් කථා කරන්නේ, සමහර වේලාවට ඊයේ-පෙරේදා -මේ අවුරුදු දෙකේ- තමයි රිය අනතුරු සිද්ධ වෙලා තිබෙන්නේ කියලා.

අද මාධ්‍යය ඉතාමත් ප්‍රබලව තිබෙනවා. විශේෂයෙන්ම එවැනි තත්ත්වයක් තුළ ලංකාවේ රිය අනතුරු පිළිබඳව මාධ්‍ය තුළ වෙනමම ප්‍රවෘත්තියක් යනවා. පසු ගිය කාලයේ රිය අනතුරකින් මරණයක් වුණාම කවුරුත් දන්නේ නැහැ; සන්නිවේදනය වෙන්නේ නැහැ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට, එහෙම නැත්නම් ගුවන් විදුලි සංස්ථාවට තමයි ඒ ප්‍රවෘත්තිය එන්නේ. පසු ගිය කාලයේත් රටේ රිය අනතුරු සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, අද එවැන්නක් සිද්ධ වෙන කොටම, -විනාඩි ගණනකින්- ලංකාවේ සෑම තැනකටම ඒ ප්‍රවෘත්තිය යනවා. ඒ එක්කම, පුවත්පත්වල, මාධ්‍ය තුළ වෙනම දැක ගන්නට පුළුවන්; දැන ගන්නට පුළුවන් තත්ත්වයක් අද ඇතිවෙලා තිබෙනවා. අද ඉතාමත් කනගාටුදායක, අවාසනාවන්ත තත්ත්වයකින් මෙම අනතුරු සිදු වන බව අපි පැහැදිලිව පිළිගන්නට ඕනෑ. අද සිද්ධ වෙන වාහන අනතුරු දිහා බැලුවාම, මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුව මේ කාරණයේදී මොන විධියට හැසිරෙන්නට ඕනෑද කියන එක සම්බන්ධව විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්නට ඕනෑ. මේ ගැන කලිනුත් මේ සභාවේ සඳහන් කරන්නට ඇති.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන්ගේ සංඛ්‍යාව, ඒ වාගේම රථවාහන පොලිස් පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව වර්තමානයේ ඉතාමත් අඩු තත්ත්වයක තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අපට රියැදුරු බලපත්‍රයක් නිකම් දෙන්නේ නැහැ. අපට බලපත්‍රයක් නිකුත් කරන කොට ආදායමක් ගන්නවා. එහෙම නම්, අවශ්‍ය පහසුකම් තිබෙන්නට ඕනෑ. දිනෙන් දිනම බලපත්‍ර ලබා ගැනීම සඳහා එන පිරිස අද වැඩි වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම, ගාල්ල දිස්ත්‍රික්කය ගත්තොත් රථවාහන පොලිස් පරීක්ෂක නිලධාරීන් දෙතුන් දෙනයි ඉන්නේ. සමහර විට හිනිදුම, නෙළුව වැනි දුෂ්කර ප්‍රදේශයක යම් සිද්ධියක් වුණාම - අනතුරක් වුණාම- ඒ නිලධාරිතුමා බොහෝ විට යන්න ඕනෑ. අනතුරක් වුණාම, පොලීසියේ සමහරු කියනවා, "මේ වාහන ටිකක් වැඩි වෙන්න ඕනෑ. වාහන හතරක්, පහක් වෙන්න ඕනෑ" කියලා. ඒ කියන්නේ, තව අනතුරු ටිකක් සිද්ධ වෙන්න ඕනෑ කියන එකයි. ඊට පස්සේ තමයි පොලීසියේ ඒ අදාළ නිලධාරි මහත්මයා යන්නේ. ඒ වාගේ අනතුරු සංඛ්‍යාව එකතු වන තත්ත්වයක් තුළ කටයුතු කිරීමක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ඉතාමත් කෙටි කාලයක් තුළ යම් යම් පරීක්ෂණ කරලා පොලීසියේ OIC මහත්මයාට, Traffic OIC මහත්මයාට හෝ රථවාහන අංශය භාර නිලධාරියාට ඒ වාහනය නිදහස් කරන්නට පුළුවන් සමහර අවස්ථා තිබෙනවා. නමුත් ලෙහෙසියට අද පොලීසියත් කරන්න බලන්නේ මොකක්ද, අනතුරු සංඛ්‍යාව එකතු වනකල් ඉන්නවා, ගාල්ලෙන් නෙළුවට එන්න ඕනෑ, තවලමට එන්න ඕනෑ කියලා. ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා. මේක වෙනස් කරන්නට ඕනෑ. අපි කාර්යක්ෂම සේවාවක් බලාපොරොත්තු වෙනවා. බොහෝ දෙනෙක් හිතවත්කම්වලට කටයුතු කරන බව පැහැදිලිව පෙනෙනවා. එම නිසා මම ඉල්ලීමක් කරනවා. අද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට රැකියා නැති බොහෝ දෙනෙක් රැකියා ඉල්ලාගෙන යනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ පුහුණුවීම් කළ, - මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ- ඒ තුළින් දැනුම, අවබෝධය ලබා ගත්ත බොහෝ පිරිස් අද ඉන්නවා. කරුණාකරලා නිලධාරීන් කිහිප දෙනෙක් මේ සඳහා ඇතුළත් කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසන් කරන්නම්. ඒ විතරක් නොවෙයි අපි මේ කාරණයත් ඉතාමත්ම පැහැදිලිව කියන්නට ඕනෑ. රටේ රිය අනතුරු සිදුවීම සම්බන්ධයෙන් අපි ඔබතුමන්ලාටම ඒ බර පටවන්නට සූදානම් නැහැ. අපි දන්නවා ප්‍රවාහන පද්ධතිය ගැන විවිධ චෝදනා තිබෙන බව. නමුත් මේ තත්ත්වය තුළ සිදු වන ඉතාමත්ම දරුණු අනතුරුවලදී රියැදුරන්ට ලබා දෙන දඬුවම් ප්‍රමාණවත් නැහැ කියලා මම කියනවා. දඬුවම් ප්‍රමාණවත් නැහැ කියලායි මම කියන්නේ. ඒ නිසා ඒ වැරදි කළ කෙනා නැවත නැවත ඒ වැරදිම කරලා තිබෙනවා. මේ සඳහා විධිමත් නීති පද්ධතියක්, වැඩ පිළිවෙළක් අපි සූදානම් කර ගත යුතු වෙනවා. අපි මේ නීති රීති, අණපනත් නැවත සංශෝධනය කරලා හෝ මේ තත්ත්වයෙන් බේරෙන්නට ඕනෑ කියන ඉල්ලීම මම කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ මේ දෙපාර්තමේන්තුවට මේ රටේ ලොකු වගකීමක් තිබෙනවා. දුක් විඳින අහිංසක මිනිසුන් පාර මාරු වන විට, කහ ඉරේ යන විට සිදු වන අනතුරුවලදී ලබාදෙන දඬුවම් ප්‍රමාණවත් නැහැ. අපි දන්නවා, වාහන අනතුරකින් මරණයක් වුණාට පසුව ඊට පසු දින සැකකාරයාට ඇප දෙන තත්ත්වයට අද පත් වෙලා තිබෙන බව. පැය 24ක් යන්නට පෙර, මරණය ගෙදරට ගේන්නට පෙර සමහර වෙලාවට අධිකරණයෙන් සැකකාරයාට ඇප දෙනවා. මම දන්නේ නැහැ අධිකරණ පද්ධතිය තුළ මේ කාරණය කුමන ආකාරයට යෙදෙනවාද කියලා. නමුත් සමහර වෙලාවට මේ වාගේ තත්ත්වයන් තුළ ඇති වන මානසික තත්ත්වයන් තුළ ඉතාම අවාසනාවන්ත, අකාරුණික තත්ත්වයන්ට මේ රටේ ජනතාව පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන් මේ රටේ ප්‍රතිසංවිධානය විය යුතු ආයතනයක් තමයි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව. වහාම මෙය ප්‍රතිසංවිධානය විය යුතුයි, මෙහි කටයුතු කාර්යක්ෂම විය යුතුයි, මීට වඩා විනිවිද භාවයෙන් කටයුතු කළ යුතුයි. මේ දෙපාර්තමේන්තුව තුළින් ප්‍රාදේශීය මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් ඒ ජනතාවට කාර්යක්ෂමව, කඩිනමින් සේවාවක් ලබා දෙන්නට ඕනෑ. මේ සඳහා අණපනත් තිබෙනවා නම් ගේන්න. අපි ලැහැස්තියි ඒවා වෙනස් කරලා රටේ ජනතාවට සාධාරණ, යුක්ති සහගත වැඩ කටයුත්තක් මේ රජය මඟින් ක්‍රියාත්මක කරන්නට. ඒ සඳහා අපි බැඳී සිටිනවා, වගකීමක් ගන්නට ලැහැස්ති වෙලා ඉන්නවා කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද විශේෂ වූ ආයතනයක් සම්බන්ධ පනතක් යටතේ ගෙන එන ලද නියෝග මඟින් සිදු කරන සංශෝධන තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව කියන්නේ මේ රටේ සමස්ත ජනතාවටම ඉතාමත්ම සමීප සම්බන්ධතා ඇති කර ගන්නට තිබෙන, රටේ ප්‍රවාහන පද්ධතිය නිවැරදි ආකාරයෙන් සකස් කර ගන්නට වගකීම තිබෙන ප්‍රධානම ආයතනය. මේ ආයතනය ගැන කථා කරනවා නම් අපට කරුණු කාරණා රාශියක්ම තිබෙනවා.

නමුත් අද මේ නියෝග මඟින් සංශෝධන ගෙන එන්නේ රියැදුරු පුහුණු පාසල් සම්බන්ධවයි. ප්‍රවාහනය ගැන කථා කරන විට, මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිව්වා, මේ රටේ පාරවල් හදලා තිබෙනවා, වාහන ගෙනැල්ලා තිබෙනවා නමුත් මිනිසුන්ගේ මනස හදලා නැහැ කියලා. ඒ බව කලින් හිටපු ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක්ම කිව්වා. එතුමාට ඒක තේරිලා තිබීම ගැනත් මම සන්තෝෂ වෙනවා. මොකද, කාලයක් තිස්සේ එතුමන්ලාට දැනුණේ නැහැ මිනිසුන්ගේ මනස හැදිලා නැහැ කියලා. අපි ජනතාවගේ මනස හදනවා නම් ප්‍රධාන වශයෙන් මාර්ග නීති සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, ඒවා ක්‍රියාත්මක කරන්නට රූපවාහිනිය තෝරා ගන්න කියලා. රූපවාහිනිය තෝරා ගත්තා කියලා ප්‍රතිඵලයක් වෙන්නේ නැහැ කියලා මම හිතනවා. එයට හේතුව මේකයි. සමහර වෙලාවට එවැනි නීති - රීති සම්බන්ධ වැඩසටහන්, දැන්වීම් දෙස බලාගෙන ඉන්න රූපවාහිනිය නරඹන අපේ ජනතාව ඒ තරම්ම කැමැති වෙයිද කියා අපට ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, පාසල් පද්ධතියත් ඒක රාශි කරගෙන, ප්‍රදේශයේ තිබෙන අනිකුත් ආයතනත් සමඟ එකතු වෙලා, විශේෂයෙන්ම ත්‍රිරෝද රථයේ සිට මේ රටේ තිබෙන මහා පරිමාණ වාහන රියැදුරන් දක්වා වූ සියලුම දෙනා මාර්ග නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කරන්න අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්ග නීති ක්‍රියාත්මක විය යුත්තේ කොහොමද කියා අප දන්නවා. අද ත්‍රීවීලර් එකක රියැදුරෙක් පොඩ්ඩක් ඉස්සර කරන්න ගියාම වාහනයක් බැරි වෙලාවත් එයාගේ පැත්තට පොඩ්ඩක් ගියොත්, ඔරවලා බලනවා විතරක් නොවෙයි, අනික් වාහනයේ සිටින රියැදුරාට පරුෂ වචනයෙන් බණින්න තරම් පහත් තත්ත්වයකට අපේ රියැදුරා වැටිලා තිබෙනවා. ඒ නිසා අප මේ වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරද්දි විශේෂයෙන්ම එක් එක් පාරවල්, මංමාවත් සම්බන්ධවත් විධිමත් වූ වැඩ පිළිවෙළක් අප ළඟ තිබෙන්න ඕනෑ.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව බොහෝ වෙලාවට හිතන්නේ ආදායම් ටික එකතු කරගන්නයි. ආදායම් එකතු කරගන්නා වැඩසටහන් තමයි එම දෙපාර්තමේන්තුවේ බොහොම ක්‍රියාත්මක වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මෙහෙම ප්‍රශ්නයකුත් මතු වෙලා තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියා පදිංචි කිරීම් සම්බන්ධව බොහොම වැරදි සහගත මත සමහර වෙලාවට සමාජයේ තිබෙනවා. අප දන්නේ නැහැ, ඇත්තටම ඒ දෙපාර්තමේන්තුව අස්සේ ඒවා තිබෙනවාද කියා. මෙහි නිලධාරීන්ට වෙන් වූ කුටියේ අද එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉන්නවා මම දැක්කේ නැහැ. අද මෝටර් වාහන පනත යටතේ නියෝග ගෙන එන වෙලාවේ එම දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්වරු කවුරුවත් ඇවිත් නැහැ වාගේ තමයි මට පෙනෙන්නේ.

මෙම දෙපාර්තමේන්තුව විශේෂයෙන්ම ජනතාවගේ මනස හදන ආයතනයකුත් වෙන්න ඕනෑ. ඒ ආයතනයේ එක කොටසක් ඒකට වෙන් වෙන්න ඕනෑ. එහෙම කොටසක් වෙන් වුණොත් තමයි නිවැරදි රියැදුරෙක් මේ රටේ බිහි කරන්න අපට හැකි

වන්නේ කියා මා විශ්වාස කරනවා. මාවතක රියැදුරෙකුට තිබෙන අයිතිය, මාවතක මගියෙකුට තිබෙන අයිතිය, ඒ වාගේම මාවතක වාහනයක් පදවන ආකාරය සම්බන්ධ වැඩ පිළිවෙළක් සකස් කිරීමේ මූලික ආයතනය මෙය විය යුතුයි. මෙම දෙපාර්තමේන්තුවෙන් වාහන ලියා පදිංචි කරලා විතරක් මදි. මම දන්නේ නැහැ, ගරු ඇමතිතුමාගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. වාහනයක් ලියා පදිංචි කරද්දි අඩුම ගණනේ අයිතිකරු පෙනී සිටිය යුතුද? අයිතිකරු නැතිව වාහන ගොඩක් ලියා පදිංචි කරන බව අප දන්නවා. එහෙම නම් අඩු ගණනේ වාහනයක අයිතිකරුවෙක්වත් හඳුනා ගන්නවාද, මේ ලියා පදිංචි කිරීමේ ආයතනය? මේ ආඥායම් එකතු කරනවා හා සමානව මේ සඳහාත් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මා හිතන විධියට දැනට වාහන හැටතුන් ලක්ෂයක් පමණ තිබෙනවා. ඒවායින් එම දෙපාර්තමේන්තුවට විශාල මුදලක් එකතු වෙනවා. මේ වාහනවල ලියා පදිංචිය ඇතුළු අනිකුත් කරුණු, කාරණා ඒක රාශි වෙද්දි විශාල මුදලක් එකතු වෙන්න පුළුවන්. හැබැයි, අප හැමදෙනාම කිව්ව හා සමානවම හොඳ රියැදුරෙක් නිර්මාණය කරන්නේ කොහොමද, ඒ රියැදුරාගේ වගකීම මොකක්ද, ඒ රියැදුරා පරිහරණය කරන වාහනය ඒ මාවත තුළ ගමන් කරන විට මගියාව ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් ඒ රියැදුරා සතුව තිබෙනවාද කියන කාරණා තමයි අප බැලිය යුත්තේ.

විශේෂයෙන්ම අප දන්නවා රියැදුරන් එක් එක් මානසික මට්ටම්වල සිටින බව. සමහර වෙලාවට ගෙදර ප්‍රශ්නයක් වෙන්න පුළුවන්; සමාජයේ ප්‍රශ්නයක් වෙන්න පුළුවන්; වෙනත් ප්‍රශ්නයක් ඔළුවේ තියාගෙන යන්න පුළුවන්. හැබැයි, ඒ රියැදුරා වාහනයට නැග්ගාට පසුව ඒ සියලු ප්‍රශ්න අමතක කරලා වාහනය ධාවනය කරගෙන යන්න පුළුවන් විධියේ වාතාවරණයක් අප සකස් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)
මේ ක්ෂේත්‍රය සම්බන්ධව මා දකින කරුණු, කාරණා ගොඩක් තිබෙනවා කථා කරන්න. හරි නම් ඒ කරුණු එකින් එක අරගෙන කථා කරන්න ඕනෑ. හැබැයි, ඒ සඳහා මේ කාලය කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. මෙම ආයතනය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන් කරද්දි විශේෂයෙන්ම මගියාගේ සුඛසාධනය සඳහාත්, මගියා ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් සකස් කරන්නත් යම් මුදලක් වෙන් කරන්න කියා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. එම වැඩ පිළිවෙළ ග්‍රාමීය වශයෙන්, නැත්නම් නාගරික වශයෙන් අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්. මෙම කටයුතු වෙනුවෙන් කුමන ආයතන සම්බන්ධීකරණය කළ යුතුද, මාවතේ රියැදුරන් හැසිරෙන්නේ කොහොමද, මගීන් හැසිරෙන්නේ කොහොමද කියන මේ සියලු කාරණා ගැන හොඳ සමීක්ෂණයක් කරලා, නිවැරදි වැඩ පිළිවෙළක් සකස් කළොත් පමණයි මේ රටේ අනතුරු වැළකෙන්නේ; විනීත රියැදුරන් බිහි වන්නේ; විනීත මගියන් බිහි වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබාදුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. A. Aravindh Kumar. You have six minutes.

[பி.ப. 5.22]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று மோட்டார்வாகனச் சட்டத்தின் கீழான ஒழுங்கு விதிகளில் திருத்தம் கொண்டுவருவதற்காக இடம்பெறும் இந்த விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் கூறுவதற்கு வாய்ப்புக் கொடுத்ததற்காக உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். இந்த நாட்டிலே அரச திணைக்களங்கள், அதிகாரசபைகள், நியதிச் சபைகள் என்று பல்வேறு அரச துறைகள் மக்களின் நலனுக்காக ஏற்படுத்தப்பட்டிருக்கின்றன. அவற்றில் முன்னணியில் இருக்கும் ஒருசில அரச துறைகளிலே மோட்டார்வாகனப் பதிவாளர் திணைக்களத்தையும் நாங்கள் குறிப்பிட முடியும். இந்தத் திணைக்களமானது அரச துறையிலே ஒரு முக்கிய பங்கை வகிக்கின்றதென்பதை நாங்கள் அனைவரும் அறிவோம். அந்த வகையிலே பார்க்கும்போது இந்தத் திணைக்களத்தின் பல்வேறு சேவைகள் மக்களுக்குப் போய்ச்சேர்ந்தாலும் அதிலே பல்வேறு குறைபாடு களையும் எங்களால் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

எமது நாட்டிலே மோட்டார் வாகனம் தொடர்பான பல்வேறு சட்டங்கள் இயற்றப்பட்டிருக்கின்றன. அவை சரியாக அமுல்படுத்தப்படுகின்றனவா? அவ்வாறான சட்டங்கள் அனைவராலும் மதிக்கப்படுகின்றனவா? மக்கள் சட்டங்களை மதித்துச் செயற்படுகின்றார்களா? என்ற கேள்வியை நாங்கள் எழுப்பும்போது "இல்லை" என்ற பதில்தான் கிடைக்கும். நாங்கள் பல்வேறு நாடுகளுக்குப் போகின்றோம். அங்கிருக்கும் மோட்டார் வாகனச் சட்டங்களையும் போக்குவரத்துச் சட்டங்களையும் நாங்கள் அறிகின்றோம். அங்குள்ள சாரதிகள் மற்றும் பொது மக்கள் எவ்வாறு அச்சட்டங்களை மதித்துச் செயற்படுகின்றார்கள் என்பதையும் நாங்கள் பார்க்கின்றோம். அவ்வாறானதொரு நிலைமை எமது நாட்டிலே இருக்கின்றதா? என்ற கேள்வியை எழுப்பினால் அதற்கும் "இல்லை" என்ற பதிலே எஞ்சிநிற்கும்.

விசேடமாக, இன்று சாரதி அனுமதிப்பத்திரம் வழங்கல் என்பது ஒரு வியாபாரமாக மாறிப் போயிருக்கின்றது. தகுதியுள்ளவர்கள் சாரதி அனுமதிப்பத்திரத்தைப் பெறுகின் றார்கள்; அதில் எவ்வித பிரச்சினைக்கும் இடமில்லை. ஆனால், அதற்குத் தகுதியற்றவர்களும் சாரதி அனுமதிப் பத்திரத்தைப் பெற்றுக்கொள்வதை நாங்கள் பார்க்கின்றோம். கல்வியறிவு இல்லாதவர்களும் சாரதி அனுமதிப்பத்திரத்தைப் பெற்றுக்கொள்கிறார்கள். அவயங்களை இழந்த ஒருசிலர்கூட சாரதி அனுமதிப்பத்திரங்கள் பெற்றிருப்பதாக நாங்கள் அறிகிறோம். அப்படியென்றால் இது எவ்வாறு சாத்திய மானது? என்பதை நாங்கள் மிக ஆழமாக நோக்க வேண்டியிருக்கின்றது. நம் நாட்டில் பின்கதவால் போய், சாரதி அனுமதிப்பத்திரத்தைப் பெற்றுக்கொள்ளக்கூடிய அவலகர மான நிலைமை இருப்பதை நாம் இதனூடாகப் பார்க்கக் கூடியதாக இருக்கின்றது. இவ்வாறு செய்யும்போது - தகுதியற்றவர்கள் அல்லது முறையற்றவர்கள் வாகன சாரதி அனுமதிப் பத்திரங்களைப் பெறுவதன்மூலம் - வீதி விபத்துக்களும் மனித உயிரிழப்புகளும் மனிதர்கள் அவயவங்களை இழப்பதும்தான் இடம்பெறுகின்றன. அதன் பலாபலன்களாக அவர்கள் வாழ்நாள் பூராவும் முடங்கிப்போய் கிடக்கின்ற ஓர் அவலத்தைத்தான் காணமுடிகிறது. ஆகவே, இதனைத் தடுக்கச் சட்டத்தில் மிக ஆழமான, அழுத்தமான திருத்தங்களைக் கொண்டுவர வேண்டும். அவ்வாறு கொண்டுவந்தால்தான் இவ்வாறான மனித இழப்புகளைத் தடுக்க முடியும்.

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

இன்று முச்சக்கரவண்டிகளைச் செலுத்தும் சாரதிகள் பற்றியும் பல்வேறு விமர்சனங்கள் இருக்கின்றன. முச்சக்கர வண்டிகளைச் செலுத்துவோர் பலருக்குச் சாரதி அனுமதிப் பத்திரம் இல்லையென்று சொல்கிறார்கள். இளம் வயதினர் பலர் முச்சக்கரவண்டிகளைச் செலுத்துவதைப் பார்க்கக் கூடியதாக இருக்கின்றது. அவர்களில் பெரும்பாலானோர் சாரதி அனுமதிப்பத்திரம் இல்லாமல் முச்சக்கரவண்டிகளைச் செலுத்துகிறார்கள் என்ற குற்றச்சாட்டு பரவலாக இருக்கின்றது. இவ்வாறான நடவடிக்கைகளை எந்த வகையிலும் ஏற்றுக்கொள்ளவும் முடியாது; அனுமதிக்கவும் முடியாது. ஆகவே, இதிலும் எமது சட்டத்தின் மிக உச்சக்கட்ட அழுத்தத்தைப் பிரயோகிக்க வேண்டும். முச்சக்கரவண்டிச் சாரதிகள் பெரும்பாலும் தமது அன்றாட பிழைப்புக்காகத் தொழிலை மேற்கொள்கிறார்கள். அதில் எவ்வித மாற்றுக் கருத்துக்கும் இடமில்லை. ஆனால், தகுதியற்றவர்கள் இவ்விடயத்தில் இறங்கும்போது அவர்கள் மனித உயிர்களோடு விளையாடுகிறார்கள் என்பதைப் புரிந்து கொள்ளாமல் செயல்படுவதுதான் இங்கு விசனத்துக்குரிய ஒரு விடயமாகவுள்ளது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have one more minute, Hon. Member.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
எனவே, இவ்வாறு செயற்படுபவர்களைத் தெளிவுபடுத்து வதற்காக அவ்வப்போது செயலமர்வுகளை நடத்த வேண்டும். அவ்வாறு செய்வதனூடாக அவர்கள் செய்வது பிழை - தவறு என்பதைச் சுட்டிக்காட்டக்கூடியதாக இருக்கும்.

இன்று மோட்டார் போக்குவரத்துத் திணைக்களத்தில் மோட்டார் வாகனப் பரிசோதகர்கள் - motor vehicle examiners மிகக் குறைவானவர்களே இருக்கிறார்கள். இன்று ஒரு விபத்து நடந்தால் சம்பந்தப்பட்ட வாகனங்களைக் காவல்துறையினர் காவல்நிலையத்துக்குக் கொண்டுபோவதால் அவ்வாகனங்கள் அவர்களின் கட்டுப்பாட்டின்கீழ் கொண்டுவரப்படுகின்றன. அவ்வாறான வாகனங்கள் மோட்டார் வாகனப் பரிசோதகர்கள் வந்து பரிசோதித்த பின்பே விடுவிக்கப்படுகின்றன. இவ்வாறு அப்பரிசோதகர்கள் காவல் நிலையத்துக்கு வந்து வாகனங் களைப் பரிசோதனை செய்வதற்கு மிக நீண்டகாலம் எடுக்கின்றது. இதனால் வாகனச் சொந்தக்காரர்கள் சொல்லொணாத் துன்பங்களுக்கு முகம்கொடுப்பதைப் பார்க்கின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please wind up.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Please give me another minute, Sir.

இன்று பொதுவாக அனைத்து வாகன உரிமையாளர்களும் கடனடிப்படையிலே வாகனங்களைப் பெறுகிறார்கள். இந் நிலைமையில் அவர்களின் வாகனங்கள் காவல் நிலையத்தில் மிக நீண்ட நாட்கள் இருக்கும்போது பல்வேறு கடன் சுமை களுக்கு உள்ளாகிறார்கள். ஆகவே, இதனைத் தடுப்பதற்கு வாகனப் பரிசோதகர்களின் எண்ணிக்கையை அதிகரிக்க வேண்டும். அதன்மூலம், சாரதி அனுமதிப் பத்திரத்திற்கு விண்ணப்பித்தவர்கள் அதனைப் பெறுவதற்கான தாமதத் தையும் நிவர்த்தி செய்ய முடியும்.

கடைசியாக, இந்து சமயத்தில் யமன் எருமை மாட்டின்மீது வந்துதான் மனித உயிரைக் காவு கொள்வதாக ஓர் ஐதீகம் இருக்கின்றது. ஆனால், இந்த நவீன யுகத்தில், விசேடமாக எமது நாட்டிலே யமன் எருமை மாட்டில் வருவதில்லை; பேருந்துகளின் உருவிலே, அதிலும் விசேடமாக தனியார்துறை பேருந்துகளின் உருவிலேதான் வருகிறான். இவ்வாறு வரும் யமன் மனித உயிர்களைக் காவுகொள்கிறான். இதனால் தனியார்துறை பஸ் வண்டிகளில்தான் யமன் அதிகமாகப் பயணிக்கின்றாரோ என்ற சந்தேகம் இந்துக்களாகிய எங்களுக்கு இருக்கின்றது. ஏனெனில், தனியார்துறை பஸ் வண்டிகளால்தான் அதிகமான விபத்துக்களும் அதிகமான மனித உயிர்கள் காவுகொள்ளப்படுதலும் இடம்பெறுகின்றன.

இந்த நேரத்தில் இன்னும் அதிகமான விடயங்களைப் பேச வேண்டியிருக்கின்றது. ஆனால், நேரம் போதாது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களின் கட்டளைக்கு அடிபணிய வேண்டிய கட்டாயமும் இருக்கின்றது. எனவே, இந்த நாட்டிலே கொண்டுவரும் சட்டத்தைச் சரியாக நடைமுறைப்படுத்த வேண்டும். ஒவ்வொரு பிரஜைக்கும் நாட்டின் சட்டத்தை மதிக்க வேண்டுமென்ற தேவையிருக் கின்றது; கட்டுப்பாடு இருக்கின்றது; கடமை இருக்கின்றது. ஆகவே, நாங்கள் சட்டத்தை மதிப்போமாக! என்று கேட்டுக்கொண்டு, சந்தர்ப்பமளித்தமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන්වී තිබෙනවා.

[අ.භා. 5.31]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි.

අද දින මේ ඉදිරිපත් කර තිබෙන 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, රියදුරු පාසල්, රියදුරු උපදේශක සහ සහකාර රියදුරු උපදේශක සම්බන්ධයෙන් වන නියෝගය සහ 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, ත්‍යාග සහ දිරි දීමනා අරමුදල කළමනාකරණය සහ පරිපාලනයට සම්බන්ධ නිලධාරීන්ගේ තනතුරු සංශෝධනය සම්බන්ධයෙන් වූ විවාදයට සහභාගිවීමට ලැබීම සතුටට කරුණක්.

මේ විවාදයේදී මන්ත්‍රීවරු විවිධ අදහස් පළ කළා. විශේෂයෙන්ම අද රියැදුරු පාසල්වල ක්‍රියාත්මක වන අය කිරීම් සම්බන්ධ ගැටලුවක් තිබෙනවා. අද රියැදුරු බලපත්‍රයක් ගන්න ගියාම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අය කරන මුදල වාගේ කිහිප ගුණයක මුදලක් රියැදුරු පාසල්වලින් අය කරනවා. මෙහිදී නිශ්චිත මුදලක් සඳහන් වෙන්නේ නැහැ. ඒ සම්බන්ධව ප්‍රශ්න කළාම, පුහුණුවීමට ලබලා දෙන පහසුකම් මත මෙම අයකිරීම් වෙනස් වෙනවා කියලායි කියන්නේ. එහි අවම මුදල සහ

උපරිම මුදල නියම කරන්න පුළුවන්. ඒ වාගේම වාර කීයක් පුහුණු වෙන්න අවකාශ තිබෙනවාද කියා සඳහන් කරලා මේ සම්බන්ධයෙන් සාධාරණ මුදලක් නියම වෙන්න ඕනෑ කියා මම විශ්වාස කරනවා. මොකද, නැත්නම් රියැදුරු පාසල්වලින් එක එක මිල ගණන් තමයි අය කරන්නේ.

මෝටර් රථ පරීක්ෂකවරුන් ගැන කථා කරනකොට මේ දේ කියන්න ඕනෑ. රියැදුරු බලපත්‍රය ගන්න ගියාම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අය කරන මුදලට සමාන මුදලක් මේ නිලධාරිනුත් අය කරනවා. මේවා අයථා අය කිරීම්. ඒ නිසා මේ අයථා අය කිරීම් සම්බන්ධයෙන් සාධාරණයක් වෙන්න ඕනෑ.

මෙම ගරු සභාවේ විශේෂයෙන්ම සඳහන් වුණා, මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ භිහයක් තිබෙනවා කියලා. භිහයක් තිබෙනවා නම්, ඉදිරියේදී සභායක පරීක්ෂකවරුන් පත් කිරීමේ හැකියාවක් තිබෙනවා. හැබැයි, මේ ගැන කථා කළේ අවුරුදු ගණනාවක් පාර්ලිමේන්තුවේ හිටපු උදවිය. අවුරුදු ගණනක් මේ රට පාලනය කරපු උදවිය දැන් කියනවා, මෙච්චර නිලධාරින් ගණනක් අඩුයි කියලා. ඒ කාලයේ ඒවා දැක්කේ නැද්ද දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිවේගී මාර්ගවල වාහන ධාවනය කිරීම සම්බන්ධයෙන් වූ කාරණා ගැන මේ මෝටර් වාහන පනත යටතේ වූ නියෝගවල කොතැනවත් සඳහන් වී තිබෙනවා මම දැක්කේ නැහැ. අධිවේගී මාර්ග පරිහරණය කරන්න පටන් ගත් මුල් කාලයේ නම් විවිධ දැනුවත් කිරීම් මාධ්‍ය හරහා සිද්ධ වුණා. නමුත් දැන් ඒවා සිද්ධ වෙන්නේ නැහැ. කාර්මික දෝෂ සිද්ධ වුණාම ඒ වෙනුවෙන් ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? හදිසි තදබදයක් ඇති වුණාම ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? හදිසියක් වුණාම එතැනින් ගැලවිලා යන්න තිබෙන මාර්ගයට අපි කියනවා escape zone කියලා. Escape zone පරිහරණය කිරීම සම්බන්ධයෙන් නිර්දේශ මේ නියෝගවල ඇතුළත් වෙලා තිබෙන බවක් මම දැක්කේ නැහැ. අධිවේගී මාර්ගවල යනකොට අපි දකිනවා, එහෙන් මෙහෙන් දාලා ඉස්සර කරගෙන යනවා. මේවා සම්බන්ධයෙන් මීට වැඩිය ක්‍රමවත් පුහුණුවීමක් දෙන්න ඕනෑ. ඒ වාගේම මෙම ගරු සභාවේදී අද විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ඇහුවා, ප්‍රමිතියෙන් ඉහළ රියැදුරු පාසල් පවත්වාගෙන යනකොට අවුරුදු 21ට වැඩි බලපත්‍රලාභියෙකු විසින් "L" board එකක් පාවිච්චි කරලා තවත් කෙනකු පුහුණුකිරීම සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. ඒවා ප්‍රමිතියානුකූල පුහුණුවීම් නොවෙයි. අපි ප්‍රමිතියක් ගැන කථා කරද්දී, "L" board එකක් ගහගෙන තව කෙනෙක් උගන්වනවා නම්, එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මෙහිදී කියන්න ඕනෑ, ප්‍රමිතිය සම්බන්ධව විශාල ගැටලු තිබෙන බව.

මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙනුත් මෙම ගරු සභාවේ කථා කළා. මෝටර් රථ පරීක්ෂකවරුන් භිහ නිසා ඇත්තටම ගෙන්නා ගන්න හරි අමාරුයි. ඒ වාගේම මෙම ගරු සභාවේ කථා වුණා, හොඳ පාරවල් තිබෙනවා; පාරවල් හොඳ නිසා රියැදුරු මහත්වරු අධික වේගයෙන් ධාවනය කරනවා; වාහන හැප්පෙනවා; මිනිසුන් අනතුරට පත් වෙනවා කියලා. ඒක ඇත්ත. හැබැයි, ප්‍රමිතියානුකූලව රියැදුරෙක් බිහි කළොත් තමයි ඒ රියැදුරා ප්‍රමිතියකින් යුතුව වාහන පදවන්නේ. අපි දන්නවා, අපේ රටට වැඩිය හොඳ පාරවල් දියුණු රටවල තිබෙන බව. හැබැයි, ඒ රටවල රියැදුරන් වගකීමකින් තොරව වාහන ධාවනය කරන්නේ නැහැ. ප්‍රමිතිය ගැන කථා කරද්දී, අපේ රටේ රියැදුරු උපදේශකවරුන්ගේ ගැටලුව ගැන විවිධ අදහස් පළ කළා; රියැදුරු පාසල්වල ඉඩකඩ ගැන කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශීය රටවල රියැදුරු පාසල්වලට ආවේණික වුණු ධාවන පථයක් තිබෙනවා.

ඒ ධාවන පථයේ සියලුම මාර්ග සලකුණු තිබෙනවා; traffic lights තිබෙනවා; roundabouts තිබෙනවා. අනිකුත් රටවල රියැදුරන් පුහුණු කිරීමේ පාසල්වල ධාවන පථ පවා තිබෙනවා. හැබැයි, අපේ රටේ එහෙම ඒවා නැහැ. මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් ගැන විවාද කරද්දි විපක්ෂයේ මන්ත්‍රීවරු මේ විධියට අදහස් පළ කරනවා නම්, "රියැදුරු පාසල්වලට ධාවන පථයක් අවශ්‍යයි" කියලා කියන දවසට මෙතුමන්ලා මොනවා කියයිද කියලා මට හිතාගන්න බැහැ. නිවැරැදිව මේ කටයුත්ත කරන්න නම් රියැදුරන් අතින් සිදු වන අනතුරු බොහොම අඩු රටවල් එක්ක අපේ රටත් සංසන්දනය කරන්න වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ඒ සංසන්දනය කිරීම තුළින් තමයි අපට නිවැරැදි මාර්ගයකට අවතීර්ණ වෙන්න පුළුවන් වෙන්නේ. එහෙම නිවැරැදි මාර්ගයකට අවතීර්ණ වීම තුළින් තමයි අපට මේ කටයුත්ත හොඳින් කරන්න හැකියාව ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේදී සමහර මන්ත්‍රීවරුන් කසි කබල් වාහන ගැන කථා කළා. පසු ගිය කාලයේ ගෙනාවේ කසි කබල් වාහන නොවෙයි, බඩ් කරපු වාහනයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තිරු බදු පවා නිසි පරිදි නොගෙවා, හොරට කෑලි කෑලි ගෙනැල්ලා ඇමුණුවා. කෑලි ඇමුණුවාට පස්සේ මේ වාහන ලියා පදිංචි කරන්න බැහැ. ඒ වාහනවලට අංක නැහැ. මේ වාහන ධාවනය කළේ හොර නොම්මර ගහගෙනයි. දැන් මෙතැනට ඇවිල්ලා කසි කබල් වාහන ගැන කථා කරනවා. එතුමන්ලා රෙදි ඇඳගෙනද කථා කරන්නේ කියලා මම අහනවා. මේක තමයි ඇත්ත. පසු ගිය රජය කාලයේ ජාවාරමක් විධියට වාහන හොරට ගෙනැල්ලා, බඩ් කරලා පාරට දැම්මා. විවිධ ක්‍රමවලින් ඒවාට අංකත් ලබා දුන්නා. හැබැයි, ඒ අංක ඔක්කොම හොර අංක. ඒ වාගේ පසු බිමක් තමයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උපදේශකවරුන්ගේ ප්‍රමිතිකරණය ගැන කථා කරනවා නම් අවම සුදුසුකම හැටියට සාමාන්‍ය පෙළ සමත් වෙලා තිබෙන්න ඕනෑ. ඒ වාගේම තමන් සතුව තිබෙන රියැදුරු බලපත්‍රය ලබා ගත් දිනයේ සිට අවුරුදු පහක seniority එකක් තිබෙන්න ඕනෑ. සහකාර උපදේශකවරයෙකුගේ අවම සුදුසුකම තමයි, අට පාස් වෙලා තිබීම. මේ වාගේ ප්‍රමිතිකරණයක් තමයි කරලා තිබෙන්නේ. එවැනි ප්‍රමිතිකරණයෙන් යුක්ත උපදේශකවරුන් අතින් බිහි වන රියැදුරන් විනයානුකූල රියැදුරන් බවට පත් කරන්න හැකි වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ තත්ත්වය තේරුම් ගන්නේ නැතිව නිකම් විවේචනය කිරීම විතරක් ප්‍රමාණවත් වේවි කියලා මා හිතන්නේ නැහැ. උපදේශකවරුන් පත් කිරීමේදී සිදු වන අයථා අඩු පාඩු ආවරණය කරන ක්‍රමවේදයක් මේ නියෝග මඟින් හඳුන්වා දීලා තිබෙනවා. මෙහෙම ගියොත් පොඩි පොඩි රියැදුරු පාසල්වලට මොකද වෙන්නේ කියලා තවත් මන්ත්‍රීවරයෙක් ඇහුවා. ඒ පොඩි පොඩි රියැදුරු පාසල් නිරායාසයෙන්ම මහා පරිමාණයේ රියැදුරු පාසල් බවට පත් වේවි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

රියැදුරන් පුහුණු වීම ක්‍රමවත් වෙන්නේ නැත්නම්, ප්‍රමිතිය ඉහළ යන්නේ නැත්නම්, අපේ රටට විනීත රියැදුරන් බිහි කිරීම සදාකාලික සිහිනයක් පමණයි කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Mylvaganam Thilakarajah. You have six minutes.

[பி.ப. 5.39]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு உங்களுக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன். இந்த ஒழுங்குவிதிகளின் திருத்தத் தினூடாகச் சாரதிப் பயிற்சிப் பாடசாலைகளைப் புனரமைத்தல், சாரதிப் போதனாசிரியர்கள் மற்றும் உதவிப் போதனாசிரியர் களுக்கான ஒழுங்குமுறைகளைப் பிரகடனப்படுத்துதல் என்பன பற்றியும் குறிப்பிடுவது எனது நோக்கமாக இருக்கின்றது. குறிப்பாக, இந்த நாட்டிலுள்ள கல்வி முறை தொடர்பாகப் பல்வேறு விமர்சனங்கள் இருக்கின்றன. இந்தக் கல்வி முறையில் மாற்றத்தை ஏற்படுத்தவேண்டும். அதனூடாகத்தான் உலக ஒழுங்கு சென்றுகொண்டிருக்கின்ற பாதைக்குள் நாம் இணைந்துகொள்ள முடியும் என்ற வாதம் முன்வைக்கப்படுகின்றது. என்றாலும், எமது நாட்டில் இருக்கின்ற கல்வி முறை மிகவும் பழைமையான, புதுப்பிக்கப் படாத ஒரு நிலையில் இருப்பதை நாம் அனைவரும் அறிவோம். அத்துடன், அது ஒரு பாரிய வேலைத்திட்டமுமாகும். அதேபோல்தான், இந்தச் சாரதிக் கல்விகூட, முறைமைப் படுத்தப்பட வேண்டிய ஒரு விடயமாகும். அத்துடன், உலக நடப்புகளை, உலக ஒழுங்குகளை, நவீனங்களை உள்வாங்கவேண்டிய விடயமாகவும் அது இருக்கின்றது.

இன்றைய நாட்களில் ஊடகங்களில் ஒளி, ஒலி பரப்புகின்ற செய்திகளைப் பார்ப்போமாக இருந்தால், தொலைக்காட்சியில் விபத்துச் செய்திகளை அறிவிப்பதற்கென்றே ஒரு தனியான அங்கத்தை வைத்துக்கொண்டு, அவற்றை ஒளிபரப்புகின்ற அளவுக்கு விபத்து என்பது ஒரு நாளாந்த நிகழ்வாக மாறியிருக்கின்றது. தொலைக்காட்சி நிறுவனங்கள் அல்லது வானொலி நிறுவனங்கள் அத்தகைய செய்திகளுக்கான நேரத்தை segment என ஒதுக்கிவைத்துக்கொண்டு, அவற்றை ஒளி, ஒலிபரப்புகின்ற அளவுக்கு மாறியிருக்கின்றன. இதன் அடிப்படையில் அது எங்கே திருத்தப்பட வேண்டுமென்றால், சாரதியொருவர் அதுதொடர்பான கல்வியை முறையாகப் பெற்றுக்கொண்டுள்ளாரா? என்ற நிலையிலிருந்து ஆரம்பிக்க வேண்டும். அந்த வகையில், இன்று இச்சபையில் முன்வைக்கப் பட்டிருக்கின்ற சாரதி பயிற்சிப் பாடசாலைகள் சம்பந்தமான அல்லது சாரதிப் போதனாசிரியர்கள் சம்பந்தமான ஒழுங்கு விதிகளை உள்வாங்கவேண்டியது தவிர்க்க முடியாதது; கட்டாயமானது.

அதேநேரத்தில், நாங்கள் அவதானிக்கவேண்டிய விடயம் என்னவென்றால், வெறுமனே சாரதிப் பாடசாலைகளுக்கான அல்லது போதனாசிரியர்களுக்கான ஒழுங்குவிதிகளை மாற்றி யமைப்பதனூடாக மாத்திரம் முறையான போக்குவரத்துக் கலாசாரம் ஒன்றை இந்த நாட்டுக்குள் கொண்டுவர முடியுமா? என்பதாகும். இந்த ஒழுங்குவிதிகளுடன்கூடவே, போக்குவரத் துப் பொலிஸ் பிரிவினரும் கல்வி அமைச்சோடு தொடர்புடைய இன்னுமொரு பிரிவினரும் நவீன தொழில்நுட்பங்களை உள்வாங்கக்கூடிய விஞ்ஞான, தொழில்நுட்ப அமைச்சோடு இணைந்ததான ஒரு பொது வேலைத்திட்டமொன்றை முன்வைப்பதனூடாக மாத்திரம்தான் எமது நாட்டில் முறையான போக்குவரத்துக் கலாசாரம் ஒன்றைக் கொண்டுவர முடியும் என்று நான் நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் பல வெளிநாடுகளுக்குச் செல்கின்றோம். அங்கு நவீன தொழில்நுட்ப மாற்றங்களோடு இணைந்து எவ்வாறு போக்குவரத்து முறைமை கையாளப்படுகின்றது என்பதைப் பார்க்கின்றோம். நமது நாட்டில் இருப்பதுபோல, போக்குவரத்துப் பொலிஸார் ஒளிந்திருந்து - மறைந்திருந்து, சாரதி தவறு செய்தபின், அந்தத் தவறுக்கான தண்டனையை வழங்குவதற்காகவோ, அல்லது மாத இறுதியில் அவர்களுக்கு வழங்கப்பட்டிருக்கின்ற இலக்குகள் எனப்படுகின்ற targetஐ அடைவதற்காகவோ தண்டப்பணத்தை அறவிட்டு, போக்கு வரத்துக் குற்றங்களை ஒரு வருமான மூலமாக மாற்றுகின்ற நிலைமை காணப்படுகின்றதா? வீதி விபத்துக்களைக் குறைப் பதற்கான முறையான, ஒழுங்கான சாரதிகளை உருவாக்கு வதற்கான திட்டங்கள் வகுக்கப்பட்டிருக்கின்றதா? என்று பார்க்கின்றபோது, அவற்றில் நாங்கள் தலைகீழாகவே இருக்கின்றோம். அதாவது, விபத்துக்களை ஒரு வருமான மூலமாக மாற்றிவிட்டு, அதன்மூலம் வருமானத்தைப் பெற்றுக் கொள்கின்ற முறைமைதான் இங்கு இப்பொழுது ஊக்குவிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இந்தத் தண்டப் பணங்களினூடாக அரசாங்கத்திற்கு நேரடியாக வருமானம் வருகின்ற அதேவேளை, மறைமுகமான வருமானமொன்றைப் பெற்றுக்கொள்கின்ற - கையூட்டல் பெற்றுக்கொள்கின்ற வேறொரு நிலைக்கு அதிகாரிகளை ஊக்குவிக்கின்ற நிலைமை யும் காணப்படுகின்றது. எனவே, இவற்றைக் கருத்தில் கொண்டு நமது நாட்டில் முறையான போக்குவரத்துக் கலாசாரமொன்றைக் கொண்டுவரவேண்டும்.

சாரதிப் போதனாசிரியர்களின் தரத்தை உயர்த்துவதற்கு, அதுதொடர்பில் தனியானதொரு பாடநெறியும் அந்தப் பாடநெறியை வழிப்படுத்தி நடத்துவதற்குத் தனியான பாடசாலை முறைமையொன்றையும் உருவாக்குவதனூடாக மாணவர்களுக்குப் - பயிலுநர்களுக்குப் போக்குவரத்துக் கலாசாரம் பற்றிய அறிவினை வழங்கமுடியும். இது மனித நாகரிகத்தில் மிக முக்கியமானதோர் அம்சமாகும். எனவே, இந்த போக்குவரத்துக் கலாசாரம் பற்றிய முறையான கல்வியைச் சிறு பராயத்திலிருந்தே அளித்து வரவேண்டும். ஆரம்ப காலத்திலிருந்தே 'போக்குவரத்து' என்பதன் முக்கியத் துவத்தை, அதன் பெறுமதியை, அதனால் ஏற்படக்கூடிய விளைவுகளைத் தெளிவுபடுத்துவதன்மூலம் வருங்காலச் சந்ததியினை முறையாக உருவாக்க முடியுமென நான் நினைக்கின்றேன்.

இந்த நாட்டில் உள்நாட்டு யுத்தமொன்று நிகழ்ந்ததென்பது பற்றியும் அந்த யுத்தத்தினூடாகப் பல்லாயிரக்கணக்கான உயிர்கள் இழக்கப்பட்டது பற்றியும் நாம் பேசுகின்றோம். அந்த உள்நாட்டு யுத்தத்தை முடிவுக்கு கொண்டுவந்துவிட்டதாகவும் மார்தட்டிப் பேசிக்கொள்கின்றோம். என்னைப்பொறுத்தவரை, நாங்கள் அந்த யுத்தத்தை முடித்து வைத்துவிட்டு இன்னுமொரு உள்நாட்டு யுத்தத்திற்குள் மூழ்கியிருக்கின்றோம் என்றே நான்

கூறுவேன். அதுதான் இந்த போக்குவரத்தினால் இழக்கப் படுகின்ற உயிரிழப்புக்கள்! அந்த யுத்தத்தினால் எத்தனை உயிர்களை நாங்கள் இழந்தோமோ, அதேயளவான உயிர்களை நாங்கள் தவணை தவணையாக, நாளுக்குநாள் இந்த நாட்டில் இழந்துகொண்டு வருகின்றோம். சாதி, இன, மத பேதங்களுக்கப்பால் பெறுமதியான மனித உயிர்கள் விபத்துக்கள் காரணமாக இந்த நாட்டில் இழக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. வெறுமனே ஒழுங்குவிதிகளை மாற்றியும் சாரதி பயிற்சிப் பாடசாலைகளின் போதனாசிரியர்களில் மாற்றத்தை ஏற்படுத்துவதனாலும் இதனைத் தவிர்க்க முடியாது. அதற்கப்பால் போக்குவரத்துக் கலாசாரம் ஒன்றை முன்னிறுத்தி முறையான பாடத்திட்டத்தினூடாக மனித வாழ்க்கைக்குப் பயன்படக்கூடியவாறு சாரதி பயிற்சிப் பாடசாலையை வழிப்படுத்த வேண்டும். பாடசாலை மட்டத்தி லிருந்தே அதனை உள்வாங்குவதனூடாகத்தான் அந்தக் கலாசாரத்திற்குச் செல்லமுடியுமெனக் கூறிக்கொண்டு வாய்ப் பளித்தமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon.Velu Kumar. You have six minutes.

[பி.ப. 5.45]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று மோட்டார் வாகனச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் மற்றும் கட்டளைகள் தொடர்பாக உரையாற்றுவதற்கு வாய்ப்பைத் தந்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன். குறிப்பாக மோட்டார் வாகனச் சாரதிகளுக்குரிய பயிற்சிப் பாடசாலைகளை ஒழுங்குமுறைப்படுத்துவதற்காக எடுத் திருக்கும் இந்த நடவடிக்கை காலத்தின் தேவையாகும். எனக்கு முன்பு உரையாற்றிய கௌரவ உறுப்பினர் திலகராஜா அவர்கள் கூறியதுபோல இந்த நாட்டின் போக்குவரத்து முறையிலுள்ள குறைபாடுகள் காரணமாக இந்தத் தேசத் தினுடைய பெறுமதிமிக்க உயிர்களை நாங்கள் நாளுக்குநாள் பரிதாபகரமாக இழந்துகொண்டிருக்கின்ற ஒரு காலகட்டத்தில் இருக்கின்றோம். இவ்வாறான ஒரு சூழ்நிலையிலே மோட்டார் வாகனப் போக்குவரத்துத் தொடர்பான விடயங்களைத் தரமிக்கதாகக் கொண்டுவருவதற்கு, ஒரு நியமத்துக்குள் கொண்டுவருவதற்கு, அதனை எங்கே ஆரம்பிக்க வேண்டும்? அதனுடைய ஆரம்பப் புள்ளி எது? என்பது பற்றி நாங்கள் தேடி அறிந்து செயற்பட வேண்டும். அந்த வகையில் மோட்டார் வாகனச் சாரதிகளுக்கான பயிற்சிப் பாடசாலைகளை ஒழுங்குபடுத்தி, அதனுடைய போதனாசிரியர்களை அல்லது பயிற்றுவிப்பாளர்களை ஒரு தரநிலைப்படுத்தி மோட்டார் வாகனச் சாரதிகளை ஒரு தரம்மிக்கவர்களாகக் கொண்டு வருவதற்கு இன்று மேற்கொள்ளப்பட்டிருக்கும் இந்த முயற்சி, மாற்றம் மிக முக்கியமானதொன்றாகும்.

இலங்கையிலே மோட்டார் வாகனப் பாவனை பெருமளவு, மிக வேகமாக அதிகரித்து வருகின்ற ஒரு காலகட்டமாகக் கடந்த ஒரு தசாப்த காலத்தைக் குறிப்பிட முடியும். மோட்டார் வாகனச் சாரதிகளைப் பொறுத்தவரையில் அவர்கள் பொது வாக ஆரம்பப் பயிற்சிக்குச் செல்கின்றபோது மோட்டார் வாகனத்தை ஓட்டுவதற்குரிய அடிப்படைத் தகைமையைப் பெறுவதையே நோக்காகக் கொண்டிருக்கின்றனர். அந்த வகையில் மோட்டார் வாகன ஓட்டுதலில் என்ன வகையான அல்லது என்ன தேவையை அவர்கள் நிறைவேற்றிக் கொள்ளப்போகின்றார்கள் என்பது அடுத்த கட்டத்திற் குரியதாக இருக்கின்றது. குறிப்பாக தன்னுடைய சொந்தப் பயணத்துக்குச் சொந்த வாகனத்தைச் செலுத்துவதற்குரிய ஒரு தேவை கருதியதா? அல்லது அது ஒரு தொழிற்றுறை சார்ந்ததான ஒரு தேவை கருதியதா? என்பது இரண்டாம் கட்டமாகத் தோன்றுகின்றது. அது அவ்வாறு தொழிற்றுறை ரீதியானதாக வருகின்றபோது இந்த அடிப்படைப் பயிற்சிக்கு அப்பால், அந்தத் துறை சார்ந்து அல்லது அவர்கள் எந்த வகையான வாகனங்களை அல்லது என்ன தேவை கருதிய வாகனங்களைச் செலுத்துவதற்கு விரும்புகின்றார்களோ, அந்தத் துறைசார்ந்த ஒரு மேலதிக அறிவினை, மேலதிகப் பயிற்சியினை மோட்டார் வாகனப் பயிற்றுவிப்பாளர்கள் அவர்களுக்குப் பெற்றுக் கொடுக்க வேண்டிய ஒரு தேவை இருக்கின்றது. ஏனென்றால், வாகனம் ஓட்டுவதற்கு மட்டும் தெரியும் என்பதற்காக அவர்கள் பயணிகள் பேருந்தை ஓட்டுவதற்கோ அல்லது பாடசாலைப் பிள்ளைகளைக் கொண்டுசெல்லக்கூடிய பாடசாலை 'வான்'களுக்கு ஓட்டுநராக இருப்பதற்கோ அல்லது வைத்தியசாலைகளில் இருக்கின்ற 'அம்புலன்ஸ்' வண்டிகளைச் செலுத்துவதற்கோ தகுதியானவர்கள் என நாங்கள் முடிவெடுக்க முடியாது. எனவே, இவ்வாறு துறைசார்ந்து வாகன ஓட்டுதலைத் தொழிலாகக் கருதி வருகின்றபோது அதற்கேற்ற வகையிலான சில மேலதிகத் தகைமைகளை அவர்களுக்கு ஏற்படுத்தவேண்டிய தேவையிருக்கின்றது என்பதனையும் நாங்கள் கருத்திலெடுக்க வேண்டியிருக் கின்றது.

அதேபோன்று, இங்கே குறிப்பிட்டதுபோல் மோட்டார் வாகனச் சாரதிகள் மத்தியிலே மனப்பாங்கு ரீதியான ஒரு மாற்றத்தை ஏற்படுத்தவேண்டும். அதாவது, அவர்களுக்கு மோட்டார் வாகனம் செலுத்துகின்ற சூழல் தொடர்பிலும் பல்வேறு விதமான விபத்துக்களைத் தவிர்ப்பது பற்றியும் விபத்துக்களின்போது செயற்படுவது எவ்வாறு என்பது சம்பந்தமாகவும் போதிய அறிவினை வழங்கவேண்டிய தேவையிருக்கின்றது. மேலும், சிறிய ஒரு விபத்து நடைபெற்ற வுடன் இரு சாராரும் தங்களது கலாசாரத்தை, தங்களுடைய அந்தஸ்துக்களை மறந்து அந்தப் பாதையிலே நின்று சண்டை பிடிக்கக்கூடிய நிலைக்கு அவர்கள் மாறுகின்றதை நாங்கள் காண்கின்றோம். ஆகவே, இந்தச் சாரதி பயிற்சிக்குள் இதுபோன்ற அடிப்படையான அம்சங்களை அதாவது ஒரு விபத்தின்போது எவ்வாறு இயங்க வேண்டும்? விபத்துத் தொடர்பில் எடுக்கவேண்டிய நடவடிக்கைகள் என்ன? விபத்துத் தொடர்பில் இருக்கின்ற சட்டரீதியான நடை முறைகள் என்ன? போன்ற மேலதிகமான அறிவினையும் அவர்களுக்குக் கொடுக்கவேண்டிய தேவைப்பாடுள்ளது. நாங்கள் வாகனத்தை ஓட்டும் பயிற்சிக்காகக் காலக்கெடு விதிக்கின்றோம். அந்தக் காலப்பகுதியை இந்தச் சூழல் சார்ந்த, நடைமுறை சார்ந்த, சட்டம் சார்ந்த ஒரு பொது அறிவினைப் பெற்றுக்கொடுக்கக்கூடிய வகையில் மாற்றம் செய்தால், மனோநிலை ரீதியான வித்தியாசத்தை அவர்களுக்குள் ஏற்படுத்த முடியும். அதன்மூலம் ஒரு தரமான போக்குவரத்துச் சூழலை நாங்கள் ஏற்படுத்திக்கொள்ள முடியுமென நம்புவ தோடு, அந்த முன்மொழிவையும் செய்து விடைபெறு கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මහතා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.52]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් ගෙන එන ලද මේ නියෝග පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද දවසේ කරන ලද විවිධ කථා තුළින් ප්‍රවාහන සේවය සම්බන්ධ විවිධ කාරණා ඉස්මතු වුණා. මේ රටේ පවත්නා ප්‍රවාහන සේවය සම්බන්ධ පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා නොයෙකුත් යෝජනා ගරු අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළා. අපි ඒවා අහගෙන හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සතු විශාල ඉඩම් ප්‍රමාණයක් මේ රට පුරා තිබෙනවා. අද ඉදිරිපත් කර තිබෙන නියෝගවලට අදාළව මේ අවස්ථාවේ කථා කළ යුතු වුණත්, ඒ ඉඩම් සම්බන්ධයෙන් යමක් කථා කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

මා නියෝජනය කරන නාවලපිටිය ආසනයේ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. පසු ගිය කාල පරිච්ඡේදය පුරා දුම්රිය අලුත්වැඩියා කිරීමේ ප්‍රධානම අංගනයක් හැටියට නාවලපිටිය අංගනය පාවිච්චි කළා. නාවලපිටිය නගරය ආශ්‍රිතව දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගිය සතියේ මම ඒ ප්‍රදේශයේ සංචාරය කළා. ඒ තිබෙන ගොඩනැඟිලි ඇතුළේ කොස් ගස් පැළවෙලා! ඒ ඉතා වටිනා ගොඩනැඟිලි ඇතුළට කොස් ඇට වැටිලා, පැළ වෙලා, ඒ ගොඩනැඟිලිවල වහල උඩින් ඒ පැළ මතු වෙලා තිබෙන හැටි මම දැක්කා. වාණිජ නගරයක් වන, වටිනාකමින් ඉහළ ඉඩම් ප්‍රමාණයක් තිබෙන නාවලපිටිය නගරය තුළ ඇති මේ ගොඩනැඟිලි හරි විධියට, යහපත් විධියට යොදවා ගන්නවා නම් දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල ආදායමක් ලබන්න පුළුවන්. නමුත් අද මේ ඉඩම් අයාලෙ තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කෙරෙහි ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරන්න. මේ වටිනා ඉඩම් තුළින් දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. නගර මධ්‍යයේ තිබෙන මෙවැනි වටිනා ඉඩම් සහනදායී ක්‍රමයකට ව්‍යාපාර කටයුතු සඳහා දෙනවා නම්, දුම්රිය දෙපාර්තමේන්තුවට ආදායමක් හැටියට විශාල මුදලක් උපයා ගන්න අවස්ථාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වෛද්‍ය පරීක්ෂණ කටයුතු කර ගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ එකම තැනයි තිබෙන්නේ. ඒ පේරාදෙනියේ, ඊරියගම මධ්‍යස්ථානය. ඒ සියලු කටයුතු සිදු කරන්නේ එතැන. රියැදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා විශාල පිරිසක් ඉදිරිපත් වන නිසා, අයදුම් පත්‍ර විශාල ප්‍රමාණයක් එතැනට ලැබෙනවා. මේ ආයතනය තුළින් තමයි අදාළ වෛද්‍ය සහතික නිකුත් කරන්නේ. ගරු අමාත්‍යතුමනි, රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීමේදී අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන වෛද්‍ය මධ්‍යස්ථානයකින් ඒ අවශ්‍ය කරන වෛද්‍ය සහතිකය ලබා ගැනීමට අවස්ථාව ලබා දෙනවා නම් ඉතා හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා මාර්ගවල රථවාහන රාජකාරියේ යෙදී සිටින පොලිස් නිලධාරීන් හැසිරෙන ආකාරය පිළිබඳව අද මේ විවාදයේදී මන්ත්‍රීවරු කීපදෙනෙක් අදහස් දැක්වූවා. අපි හොඳටම දන්නවා, පොලීසියේ සමහර නිලධාරීන් උදේට පාරට එන්නේ නඩු දහයක් අරගෙන යන අදහසින් බව. සමහර වාහන parkingවලින් වැරැද්දක් කළත්, නොකළත් මාසයකට සැරයක් නඩුවක් දෙන්න ඕනෑ. මේක තමයි ඇත්ත කාරණය. වැරදි කරන වෙලාවට අල්ලන්නේ නැහැ. වැරැදි කළත් එකයි; නැතත් එකයි, මාසයකට නඩුවක් දෙන්න ඕනෑ. උදේට පාරට එන පොලීසිය කල්පනා කරන්නේ කෙසේ හෝ නඩු දහයක් අරගෙන යන්නයි. උසාවියට නඩු දහයක් දෙන්න ඕනෑ. ඒක තමයි රාජකාරිය. මම හිතන හැටියට මේක පොලීසියේ වැරැද්දක් නොවෙයි. රජයක් හැටියට මේ තත්ත්වය නිවැරදි කළ යුතුව තිබෙනවා. කාලයක් තිස්සේ කොයි ආණ්ඩුව වුණත් මේ දිහා නිවැරදි විධියට බලලා නැහැ. ඒ නිසායි පොලීසිය මේ වැරැද්ද කරන තැනට යොමු වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණය තමයි, රජයට අයිති වාහන තැන් තැන්වල ගාල් කිරීම නිසා ඒවා දිරා පත් වෙලා තිබීම. ඒ වාහනවලින් විශාල ආදායමක් ලබන්න පුළුවන්. එක්කෝ ඒ වාහන අලුත්වැඩියා කර රජයේ ප්‍රයෝජනයට ගන්න පුළුවන්. නැත්නම්, ඒවා වෙන්දේසි කර රජයට අදායමක් ලබා ගන්න පුළුවන්. මම හිතන හැටියට හැම අමාත්‍යාංශයකම වාගේ එවැනි ඉතාම වටිනා වාහන විශාල තොගයක් තිබෙනවා. ඒවා දිරා පත් වීම නිසා බිමට පාත් වෙලා තිබෙනවා. මේවා යම් විධිමත් ක්‍රමයකට පෞද්ගලික අංශය මඟින් හෝ අලුත්වැඩියා කරගෙන, අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගන්නවා නම් හොඳයි. මේ දෙය සිද්ධ කළ යුතුව තිබෙනවා. රජයේ වාහන මැතිවරණ කටයුතු සඳහා යොදා ගත් ආකාරය ගැනත් අපි දන්නවා. කිසිම ලියකියවිල්ලක් නැතිව ඉතා වටිනා වාහන නිදහස් කරලා, එක එක මැතිවරණ පෝස්ටර් අලවමින් මේ රටේ පාවිච්චියට ගත් අවස්ථා ගැනත් අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය මදි නිසා කෙටියෙන් හෝ කථා කරන්න මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුති කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක් තිබෙනවා.

[අ.භා. 5.58]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කරන ලද මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ දී ගරු සභාව නියෝජනය කරන පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් සියලුදෙනාම වාගේ ඉතා විශා අදහස් ප්‍රමාණයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම වැඩි පිරිසක් -මම හිතන විධියට සියයට අනූවකට වැඩි ප්‍රමාණයක්- අප ඉදිරිපත් කර තිබෙන මේ නියෝග පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් අදහස් දැක්වූවා. ඒ වාගේම අපට යම් යම් යෝජනාත් ඉදිරිපත් කළා. ඒ යෝජනා පිළිබඳව ගරු ඇමතිතුමාව දැනුවත් කරන්න මා බලාපොරොත්තු වනවා. ඒ වගේම ගරු මන්ත්‍රීවරු ඇසූ යම් යම් ප්‍රශ්න සඳහා උත්තර සපයන්නත් මම බලාපොරොත්තු වනවා.

අපේ ගරු ඇමතිතුමා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය ධූරය භාර ගත්තාට පසුව සහ මම නියෝජ්‍ය අමාත්‍ය ධූරය භාර ගත්තාට පසුව, අපේ ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් අප ගත් ප්‍රධාන තීන්දු කීපයක් ගැන විතරක් මේ අවස්ථාවේ දී ගරු සභාව දැනුවත් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

2008 වසරේ සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒ නිසා දෙපාර්තමේන්තුවේ දත්ත පරිගණකගත කරන්න e-Motoring ව්‍යාපෘතියක් ආරම්භ කළා. නමුත්, ඒ ව්‍යාපෘතිය අතර මහ නැවතිලා තිබුණා. ගරු ඇමතිතුමාගේ මූලිකත්වයෙන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන e-Motoring ව්‍යාපෘතිය දැන් -2016 වසරේ- අපි ආරම්භ කරන්න බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විනිවිදභාවය ඇති කිරීම සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන් වෙන කෙනෙකුගෙන් වාහනයක් මිලදී ගෙන දින 14ක් ඇතුළත තමන් සන්තකයට ගන්න -ලියා පදිංචි කරන්න- ඕනෑ කියලා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නීතියක් තිබෙනවා. නමුත්, මේක ක්‍රියාත්මක නොවෙමින් තිබෙන නිසා අපට ඒ සඳහා යම්කිසි දඩ මුදලක් අය කිරීමට සිදු වුණා. දිනකට රුපියල් සියය බැගින් අය කර ගැනීමේ ක්‍රමවේදයක් තමයි ක්‍රියාත්මක වුණේ. තිබුණා. නමුත් ගරු ඇමතිතුමාගේ මැදිහත්වීම යටතේ එයට සහන කාලයක් ලබා දීලා, පළමුවැනිදා ඉඳන් එය නැවත තමන්ගේ සන්තකයට පවරා ගැනීමේ හැකියාව ලබාදීලා තිබෙනවා. ඒ වාගේම ලියා පදිංචි නොකර ධාවනය වන, මෙරට එකලස් කරන ලද යතුරු පැදි ලියා පදිංචි කිරීම සඳහා සහන කාලයක් අපි කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මව් සමාගමෙන් ගෙන්වන ලද අලුත්ම වාහන brand new විධියට ලියා පදිංචි සහතිකයේ සඳහන් කරනවා. සමහර පුද්ගලයන් විසින් වෙනම ගෙන්වන වාහන සඳහාත් එම අවස්ථාව ලබා දීමට අපි වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ එවැනි වැඩ පිළිවෙළවල් කිහිපයක් ගැන විතරයි මම කිව්වේ.

විශේෂයෙන්ම අද මෙම සභාවට නියෝග දෙකක් ඉදිරිපත් වුණා. නමුත්, වැඩියෙන් කථා වුණේ එක නියෝගයක් ගැන පමණයි. විශේෂයෙන්ම රියදුරු පාසල් සහ ඒ උපදේශකයන් නියාමනය කිරීම සඳහා කරපු නියෝගය පිළිබඳව තමයි හුහාක් අය කථා කළේ. නමුත් තවත් එක් නියෝගයක් තිබෙනවා. මෝටර් රථ කොමසාරිස්වරයාගේ අනු දැනුමෙන් තොරව යම් වාහනයක සන්තකය වෙනස් කළොත්, ඒ වාහනයේ යම් යම් වෙනස්කම් සිදු කිරීම තුළින් යම්කිසි වරදක් කළොත්, එවැනි වැරැදි කළ අය සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සඳහා තොරතුරු දෙන පුද්ගලයන්ට ත්‍යාග සහ දිරි දීමනා දීම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ත්‍යාග සහ දිරි දීමනා ලබාදීම පිළිබඳවත් නියෝගයක් තිබෙනවා. නමුත්, අද හුහාක් දෙනෙක් ඒ පිළිබඳව කථා කළේ නැහැ. කෙසේ වෙතත්, අද අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වූ යම් යම් යෝජනා සහ ඔවුන් ඉදිරිපත් කළ ප්‍රශ්නවලට උත්තර කිහිපයක් මම මේ අවස්ථාවේදී ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම මෙම නියෝගය හඳුන්වා දුන්නේ රියදුරු පාසල්, රියදුරු උපදේශක සේවා විධිමත් කිරීම නියාමනය කිරීමටයි. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ප්‍රශ්න නැඟුවා, වයස අවුරුදු 17න් පුහුණු අවසර පත්‍රය ලබා ගැනීමට හැකිවීම, වයස අවුරුදු 18න් රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට හැකිවීම සහ පුහුණු කාලය මාස තුනක් අනිවාර්ය වීම යන කරුණු සම්බන්ධයෙන්. සාමාන්‍යයෙන් මේ කරුණු 2009 අංක 8 දරන මෝටර් වාහන පනත හඳුන්වාදීමේ තිබෙන ප්‍රතිපාදනයි. ඒක අද නියෝගවලට අදාළ වෙන්නේ නැහැ. 2009 අංක 8 දරන මෝටර් රථ පනතේ ඒ කරුණු සියල්ලක්ම තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ප්‍රශ්න කිහිපයක්ම නැඟුවා. ඒ ප්‍රශ්නවලට මම පිළිතුරු දෙන්න බලාපොරොත්තු වෙනවා. රියදුරු උපදේශකයන් 1,500ක් පමණ ප්‍රමාණයක් සිටින්නේ, මේ ප්‍රමාණය මදි නිසා ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා එතුමා ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, රියදුරු උපදේශකයන් සඳහා 2017 ජනවාරි මාසයේදී විභාගය පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව එකඟතාව පළ කරලා තිබෙනවා. ඒ තුළින් මේ උපදේශකයන් ප්‍රමාණය වැඩි කර ගැනීමට අපිට පුළුවන් වෙයි. මම හිතන විධියට අපේ රටේ මෝටර් රථ පරීක්ෂකවරු 140ක් සිටිය යුතුයි. නමුත් දැනට අපේ රටේ සිටින්නේ මෝටර් රථ පරීක්ෂකවරු 105 දෙනෙක් පමණයි. ඉදිරියේදී මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ ප්‍රමාණය තවත් 100කින් පමණ වැඩි කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම රියදුරු පුහුණු පාසල් උපදේශකවරුන්ට රියදුරන් පුහුණු කිරීමට වලංගු බලපත්‍රයක් තිබුණාට, එවැනි පුහුණු පාසලක උපදේශකවරයෙක් යටතේම පුහුණුව ලබන්න අවශ්‍ය නැහැ. තමන්ගේ පවුලේ කෙනෙකුට සැහැල්ලු වාහන සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබෙනවා නම්, එවැනි අයෙකුගෙන් පුහුණුවීමේ හැකියාව තිබෙනවා. එතුමා තවත් ප්‍රශ්නයක් ඇසුවා, රියදුරු පාසල්වල වාහන ගාල් කිරීම සඳහා මේ නියෝගය යටතේ වෙනම ප්‍රතිපාදන ලබාදීලා තිබෙනවාද කියලා. ඒ සඳහා වෙනම ස්ථානයක් තිබිය යුතුයි කියලා එතුමා යෝජනා කළා. ගොඩාක් රියදුරු පාසල්වලට අයිති වාහන රියදුරු පාසල අසල පාරේ තමයි නතර කරලා තිබෙන්නේ. මේ නිසා පාරවල්වල වාහන තදබදයකුත් ඇති වෙනවා. ඒ නිසා තමයි, වෙනම තැනක වාහන ගාල් කළ යුතුයි කියලා යෝජනා කරලා තිබෙන්නේ. ඒ ස්ථානයේම නැති වුණත්, වෙනත් ස්ථානයක හෝ එසේ වාහන ගාල් කිරීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම, රියදුරු පුහුණු කාලය තිබෙන්නේ මාස 3යි. නමුත් මේ පුහුණු කාලය හරියට නිශ්චිත කරගන්නේ කෙසේද කියලා එතුමා අහලා තිබුණා. පනතේ තිබෙන විධියට එම මාස තුන තුළ පැය 20ක් වාහනයේ රියදුරු අසුනේ ප්‍රායෝගික පුහුණුව තිබෙන්න ඕනෑ. මාස තුනක් කියලා තිබුණාට, රියදුරු අසුනේ පැය 20ක ප්‍රායෝගික පුහුණුවක් අනිවාර්යෙන්ම තිබිය යුතුයි. එය මෝටර් වාහන පනතේ සඳහන් වෙනවා. මොකද, මාස තුනක පුහුණුවක් කියලා පනතේ තිබුණාට, පැය 20ක පුහුණුවක් තමයි තිබෙන්න ඕනෑ. ඒ වාගේම, එතුමා අහපු තව ප්‍රශ්නයක් තමයි, මෝටර් බයිසිකල් සඳහා රියැදුරු පුහුණු බලපත්‍රය ලබා ගැනීම සම්බන්ධව. මෝටර් බයිසිකල් සඳහා පුහුණු බලපත්‍රය ලබා ගැනීමේදී අනිවාර්යෙන්ම, මාස තුනක පුහුණු කාලයක් අවශ්‍ය වනවා.

රියැදුරු පාසල් නියාමන ක්‍රමවේදය කුමක්ද කියන එක ගැන 2016.08.24 වෙනිදා සියලුම රියැදුරු පාසල් අපි දැනුවත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව තිබෙන සියලුම කරුණුවල පිටපත් දැනට තිබෙන සියලුම රියැදුරු පාසල් සඳහා අපි යොමු කරලා තිබෙනවා. ඒ වාගේම තමන්ගේ වාහනයෙන් රියැදුරු පරීක්ෂාවට යන්න පුළුවන්ද කියලාත් එතුමා ඇහුවා. බොහෝ දුරට වන්නේ රියැදුරු පාසල්වල තිබෙන වාහන කුලියට අරගෙන රියැදුරු පරීක්ෂාවට යෑමයි. එම නිසා ඒ රියැදුරු පරීක්ෂාවට තමන්ගේ වාහනයෙන් යන්නත් පුළුවන්. හැබැයි, ඒ වාහනය සඳහා පුහුණු රක්ෂණාවරණයක් ලබා ගත යුතුයි. එවැනි පුහුණු රක්ෂණාවරණයක් සහිත වාහනයක් තිබෙනවා නම්, එහෙමත් නැත්නම් තාවකාලිකව හෝ තමන්ගේ වාහනයට පුහුණු රක්ෂණාවරණයක් ලබා ගත්තොත් ඒ වාහනයෙන් තමන්ගේ පරීක්ෂණයට සහභාගි වන්න පුළුවන්.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

මෝටර් වාහන පනත යටතේ එන මෙම නියෝග තුළින් වාහන කුලියට ගැනීමේ තත්ත්වය නතර වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම යම් කෙනෙකුට වයස අවුරුදු 17න් පසු සැහැල්ලු වාහන සඳහා ලිඛිත පරීක්ෂණයට ඉදිරිපත් වන්න පුළුවන්. එම ලිඛිත පරීක්ෂණය සමත්වීමෙන් පසුව රියැදුරු පුහුණු පරීක්ෂණය සමත් වන්න ඕනෑ. ඉන් පසුව රියැදුරු පුහුණු බලපත්‍රය ලබා දෙනවා. රියදුරු බලපත්‍රය ලබා දෙන්නේ වයස අවුරුදු 18න් පසුවයි. ඒ කෙසේ වෙතත් රියැදුරු පුහුණු බලපත්‍රය, රියැදුරු බලපත්‍රයක් ලෙස සලකන්න බැහැ. රියැදුරු බලපත්‍රයක් ලෙස සැලකෙන්නේ, අවුරුදු 18න් පසුව ලබා ගන්නා රියැදුරු බලපත්‍රයයි. ඒ වාගේම සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා පැවැසුවා, "මොපෙඩ් -මදුරුවා- බයිසිකලය ඇතුළු එවැනි බයිසිකල් ලියා පදිංචි කරන්න ඕනෑ නැහැ" කියලා. එහෙම එකක් නැහැ. ඒ සියලුම බයිසිකල් ලියා පදිංචි කළ යුතුයි. මොපෙඩ් බයිසිකලය ඇතුළු එවැනි සියලුම යතුරු පැදි ලියාපදිංචි කළ යුතුයි. ලියාපදිංචි කරලා ඒ යතුරු පැදි සඳහා ද බලපත්‍රයක් ලබා ගත යුතුයි. එය සාමාන්‍ය බයිසිකලයක් වුණත් ඒ බයිසිකල් පදින්නත් රියැදුරු බලපත්‍රයක් අනිවාර්යෙන්ම අවශ්‍ය වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා අහපු ප්‍රශ්න කිහිපයක් තිබුණා. අපි ඒ සම්බන්ධව ක්‍රියාවලියක් දැනටමත් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මොකද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතුව ලිපිගොනු මිලියන 40ක පමණ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගරු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් එම ලිපිගොනු ගබඩා කිරීම සඳහා රුපියල් මිලියන 80ක පමණ වියදමින් යුතුව වේරහැර ප්‍රදේශයේ ලේඛනාගාරයක් අපි ඉදි කරමින් පවතිනවා. ඒ වාගේම, මෙම ලිපිගොනු අතුරුදන්වීම හේතුවෙන් ඇතිවන ගැටලු වැළැක්වීමට ICTA ආයතනය හරහා ලිපිගොනු scan කිරීම සඳහා අපි ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳ සියලු කටයුතු 2017 වසරේදී ආරම්භ කරන්න බලාපොරොත්තු වනවා. ඉන් පසුව ලිපිගොනු අතුරුදන්වීම පිළිබඳ ප්‍රශ්නය විසඳෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම ත්‍රිරෝද රථ ප්‍රවාහනය ගැන එතුමා ඇහුවා. ත්‍රිරෝද රථ මඟින් මගීන් ප්‍රවාහනය කරනවා නම්, passenger transport licence එකක් අනිවාර්යෙන්ම ලබා ගත යුතුයි කියලා අපි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. 2017 ජනවාරි 01 වෙනිදා සිට එය ක්‍රියාත්මක වනවා. ඒ අනුව, ත්‍රිරෝද රථයකින් මගීන් ප්‍රවාහනය කරනවා නම්, අනිවාර්යෙන්ම ඒ සඳහා බලපත්‍රයක් ලබා ගත යුතුයි. ත්‍රිරෝද රථ විශාල ප්‍රමාණයකින් බලපත්‍ර රහිතව මගීන් ප්‍රවාහනය කරන අය සම්බන්ධව තිබෙන ප්‍රශ්නයට යම් කිසි විසඳුමක් ලබා දෙන්න ඊට පසුව අපට පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මන්ත්‍රීතුමිය කිව්වා, "ආබාධිත අයට රියැදුරු බලපත්‍ර ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් හොඳයි" කියලා. අපි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවත් සමඟ සාකච්ඡා කරලා ඉදිරියේදී ඒ පිළිබඳව යම් කිසි වැඩ පිළිවෙළක් ඇති කරන්න බලාපොරොත්තු වනවා. එතකොට, එතුමියගේ ප්‍රශ්නයට පිළිතුරු ලැබෙයි. ඒ වාගේම, ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගේත් ප්‍රශ්න කිහිපයක් තිබුණා. ඉන් එකක් තමයි, "තමන්ගේ පවුලේ දරුවෙකුට තමන්ගේ වාහනයකින් පුහුණුව ලබා ගෙන රියැදුරු බලපත්‍රය ලබා ගන්න පුළුවන්ද" කියලා. එහෙම පුළුවන්. සාමාන්‍යයෙන්, එය මුදල් ලබා නොගෙන කරන කටයුත්තක් නිසා, විශේෂයෙන්ම සැහැල්ලු රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඒ ආකාරයෙන් පුහුණු කිරීමට හැකියාව තිබෙනවා.

දැනට රියැදුරු පුහුණු පාසල්වල පවතින මිල ගණන් මෙම මෝටර් වාහන පනතේ සඳහන් වනවා. එම අය කරන මිල ගණන් කොපමණද කියලා ප්‍රදර්ශනය කළ යුතුයි. ඒ ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම පනතේ ප්‍රතිපාදන සලසා තිබෙනවා. ඒ අනුව, 2017 ජනවාරි මාසයේ සිට සෑම රියදුරු පාසලකම තමන්ගේ මිල ගණන් ජනතාවට දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කළ යුතුයි.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය නිරන්තරයෙන්ම වෙනස්කම්වලට භාජන වන තත්ත්වයක් තිබෙනවා. එම නිසා එක් නිලධාරියෙකුට පමණක් එම database එකට ඇතුළු වීමට හැකිවන පරිදි අපි වැඩ කටයුතු සලසා තිබෙනවා. ඒ නිසා විෂමාචාර අඩු කිරීම සඳහා පියවර ගන්න ඕනෑ. මොකද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ගැන කිව්වාම මේ රටේ ඉතා විශාල විෂමාචාරයන් සිදු වන ස්ථානයක් කියලා හැම වෙලාවේම ජනතාව මැසිවිලි නහනවා. එම විෂමාචාර අඩු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට ඇතුළු වීමට එක් නිලධාරියකුට පමණක් හැකියාව ලැබෙන පරිදි කටයුතු සකස් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත් ප්‍රශ්න කීපයක් නැඟුවා. අපේ අමාත්‍යාංශය තුළ තිබෙනවා, "මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව". මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව තුළින් විශේෂයෙන් මඟීන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කරනවා. මෝටර් වාහන පනත යටතේ ගෙනෙන මෙම නියෝග මඟින් -එහි සඳහන් නියාමනය මඟින්- බලාපොරොත්තු වන්නේත්, එහි මූලික අවශ්‍යතාව වෙලා තිබුණේත් මඟී අනතුරු අවම කිරීමයි; රියැදුරා විනීත රියැදුරකු බවට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමයි. ඒ සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විශාල වැඩ කොටසක් කර තිබෙනවා වාගේම දැනටත් විශාල වැඩ කොටසක් කරගෙන යනවා. රියැදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී අපි නව නීති හඳුන්වා දී තිබෙනවා. මඟී ප්‍රවාහනයට යොදවන බස් රථ සඳහා මඟී ප්‍රවාහන සේවා බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සාර්ථකව පුහුණුව නිම කළ රියැදුරන් හට එකී බලපත්‍ර නිකුත් කිරීමට බලාපොරොත්තු වෙනවා. විශේෂ වැඩ පිළිවෙළක් ඇති කරලා ඒ රියැදුරන්ගේ දැනුම වැඩි කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ලිඛිත පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මාර්ග නීති කඩ කරන්නන් බොහෝ දෙනෙකු පාරවල සිටියදී රියැදුරා නිවැරැදිව වාහනය පදවාගෙන ගියත්, වෙනත් වෙනත් බාහිර බලපෑම් නිසා සිදු වන අනතුරු අවම කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරන්න මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් බලාපොරොත්තු වෙනවා. අප අද ගෙන ආ මේ නියෝගවලින්, රියැදුරු පාසල් නියාමනය මඟින් විශේෂයෙන්ම බලාපොරොත්තු වුණේ අක්‍රමිකතා සිදුවීම වැළැක්වීම, අධික මිල ගණන් අය කිරීම සහ වෙනත් විෂමාචාර අවම කිරීමයි. රියැදුරු පාසල් නියාමනය කිරීම මඟින් අප බලාපොරොත්තු වුණේ ඒවායි. අපි හිතනවා අද අප ඉදිරිපත් කරන ලද නියෝග මඟින් ඒ අවශ්‍යතාව ඉෂ්ට කරගන්න පුළුවන් වේවි කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මුලින්ම කිව්වා අප e-Motoring ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා කියා. අපේ ආශු මාරසිංහ මන්ත්‍රීතුමා කිව්වා, රියැදුරකු යම්කිසි වරදක් කළාම රියැදුරු බලපත්‍රයේ ලකුණු අඩු කිරීම මඟින් රියැදුරු බලපත්‍රය අවලංගු කිරීමට හැකි වැඩ පිළිවෙළක් සකසන්න කියා. එය ඉදිරියේදී -නුදුරේදීම- කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි පුහුණු ධාවන පථ දැනටත් සකස් කර තිබෙනවා. තවත් ඒවා කළුතර, බදුල්ල, කුරුණෑගල, අනුරාධපුරයේ ආරම්භ කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. අපේ ගරු අමාත්‍යතුමාගේ දිස්ත්‍රික්කය, බදුල්ල. මම දැනටමත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 5ක ඉඩම් ප්‍රමාණයක් ගෙන තිබෙනවා, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නව කාර්යාලය සහ ධාවන පථයක්

සකස් කිරීමට. වෙරහැර අලුත්ම ධාවන පථයක් අපි දැන් සකස් කර තිබෙනවා. ඉදිරි වසර කීපය තුළ ඒ ඒ දිස්ත්‍රික්කවල ධාවන පථ අලුතින් ඉදි කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව රියැදුරු බලපත්‍ර ක්‍රමය ගැනත් කියන්න ඕනෑ. අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් කිව්වා, රියැදුරු බලපත්‍ර අලුත් කිරීම පිළිබඳව. 2009 මාර්තු 27වන දා සිට ක්‍රියාත්මක වන පරිදි රියැදුරු බලපත්‍රයක් අලුත් කිරීමේදී, සැහැල්ලු වාහන රියැදුරු බලපත්‍රයක් අවුරුදු 8කිනුත්, බර වාහන රියැදුරු බලපත්‍රයක් අවුරුදු 4කිනුත් අලුත් කිරීම සිදු කරන ක්‍රමවේදයක් දැනටමත් තිබෙනවා. රියැදුරු බලපත්‍රයක් අලුත් කරද්දී අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය තුළින් තමයි පුළුවන් වන්නේ, රියැදුරු බලපත්‍රයක් අලුත් කරන්න. ඒ ආකාරයට කටයුතු නොකළොත් රියැදුරු බලපත්‍රය අලුත් වන්නේ නැහැ. සැහැල්ලු වාහන රියැදුරු බලපත්‍රයක් අවුරුදු 8කිනුත්, බර වාහන රියැදුරු බලපත්‍රයක් අවුරුදු 4කිනුත් අලුත් කළ යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා කිව්වා, "රියැදුරන්ගේ ඔළු හදන්න ඕනෑ" කියා. විශේෂයෙන් බස් රථ රියැදුරන් සඳහා අපි විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. මඟී ප්‍රවාහන සේවයේ රියැදුරන්ට බලපත්‍ර නිකුත් කරද්දී ඔවුන් සඳහා විශේෂ වැඩ පිළිවෙළක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හරහා අපි ක්‍රියාත්මක කරනවා. ඔවුන්ට උපදේශන ලබා දීම, ඔවුන් දැනුවත් කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් අප ක්‍රියාත්මක කරන බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

අපේ දම්ළ මන්ත්‍රීවරයෙක්, දුම් පරීක්ෂාව පිළිබඳවත් කථා කළා. ඒ සඳහා වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපේ ගරු ඇමතිතුමා ඒ ගැන ප්‍රකාශ කර තිබෙනවා. දුම් පරීක්ෂාව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවලට ලබා දීමට -පළමුවෙන්ම ප්‍රාදේශීය මට්ටමින් ලබා දීලා, පසුව දිස්ත්‍රික්ක මට්ටමිනුත් ලබා දීලා, ඊටත් පසුව ඩිපෝ මට්ටමින් ලබා දීමට.- බලාපොරොත්තු වෙනවා. දුම් පරීක්ෂාවත් ඉදිරියේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා.

උතුරු සහ නැඟෙනහිර පළාත්වල රියැදුරු ප්‍රශ්නය ගැනත් මේ ගරු සභාවේදී සඳහන් කළා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියැදුරු පාසලක් උතුර සහ නැඟෙනහිර පළාත්වල ආරම්භ කරන්න කියා යෝජනා කළා. අපි ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා ඉදිරියේදී එම පළාත්වල අයටත් රියැදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා අවශ්‍ය රියැදුරු පුහුණු පාසලක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපේ ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමාත් ප්‍රශ්න කිහිපයක් මතු කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට කථා කිරීමට තව කාලය අවශ්‍යද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔව්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, තව කාරණා එකක්-දෙකක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේදී හැම කෙනෙකුම කථා කළ ප්‍රශ්නවලට අමතරව විශේෂයෙන්ම ත්‍යාග සහ දිරි දීමනා ලබා දීම පිළිබඳවත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ත්‍යාග සහ දිරි දීමනා ලබා දීම සම්බන්ධ නියෝගවලට අදාළව මෙතෙක් කල් මූල්‍ය පාලක සභාවක් තිබුණා. එම පාලක සභාවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා නිල බලයෙන් අයිති වෙනවා. ඒකට අපේ අමාත්‍යාංශයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිවරයා තමයි පරණ පනත අනුව පත් වී සිටියේ. දැන් එහි මූල්‍ය නිලධාරී විධියට එතුමාට ඉදිරියෙන් තව නිලධාරියෙක් සිටිනවා. එම මූල්‍ය නිලධාරී ඇතුළත් කරලා තිබෙනවා. අතිරේක මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයෙක් තමයි මුලින් සිටියේ. ඒ වෙනුවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් - (පරිපාලන) ඇතුළුව එම නිලධාරී මණ්ඩලය ඇතුළත් කර තිබෙනවා. එම මණ්ඩලයෙන් තමයි විශේෂයෙන්ම එම දිරි දීමනා සහ ත්‍යාග ලබා දීම පිළිබඳව තීන්දු ගන්නේ. එයත් අද සංශෝධනය වෙනවා. මෙම නියෝගයන්ට අදාළ ගැසට් පත්‍රයේ සිංහල භාෂාවෙන් තිබුණු කොටසේ මුද්‍රණ දෝෂ කිහිපයක් තිබුණා. එම මුද්‍රණ දෝෂ කිහිපයත් මෙම අලුත් ගැසට් පත්‍රය තුළින් නිවැරදි කිරීමට අප බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ අද දිනයේ ඉදිරිපත් කරන ලද මෙම නියෝග අංක 1 සහ 2 සම්බන්ධයෙන් අපගේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් අදහස් හා යෝජනා ඉදිරිපත් කළා. අපි එම යෝජනා සියල්ලම ගරු ඇමතිතුමා මඟින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරලා පවතින අඩු පාඩු සකස් කිරීමට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තවත් සංශෝධන තිබෙනවා නම් අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවට එම කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. එතකොට අපට ඒවා සම්බන්ධව සාකච්ඡා කරලා මේ තිබෙන අඩු පාඩු හදා ගෙන ඉදිරියට යෑමට හැකි වෙනවා. අපිට අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ ප්‍රවාහන ක්ෂේත්‍රය විධිමත් කිරීමටයි. මොකද, අප රටේ වාහන ගහනය දිනෙන් දින වැඩි වෙන තත්ත්වයක් පවතින නිසා ඒ සම්බන්ධයෙන් අපි වැඩ පිළිවෙළක් දියත් කළ යුතු වෙනවා. මසකට Three-wheelers 5,000ක් පමණ අපේ මාර්ග පද්ධතියට ඇතුළු වෙනවා කියා පුවත් පතක සඳහන් වී තිබුණු පුවතක් මම දැක්කා. එසේ Three-wheelers 5,000 ධාවනයට ඇතුළු වීම තුළ, - දැනටත් අපේ රටේ දසලක්ෂ හැටදහසක් පමණ ත්‍රී-රෝද රථ තිබෙනවා.- තරුණයන් මේ ත්‍රී-රෝද රථ ව්‍යාපාරයට ඇතුළු වීම නිසා අපේ රැකියාවල ප්‍රශ්නයක් මතු වී තිබෙනවා. අපි ඉදිරියේදී රැකියා දස ලක්ෂයක් ලබා දීම සඳහා කර්මාන්තශාලා සියයක් හම්බන්තොට හදන්න බලාපොරොත්තු වෙනවා. මේ ත්‍රී රෝද රථ ව්‍යාපාරය නිසා එම කර්මාන්තශාලාවලට අවශ්‍ය පුහුණු ශ්‍රමය ලබා ගැනීමේ ප්‍රශ්නයක් ඇති වෙයි කියා අප හිතනවා. ඒ නිසා එම ගැටලුව නියාමනය කිරීම සඳහාත් වැඩ පිළිවෙළක් ගරු ඇමතිතුමා හරහා අපි ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කරන්න මා කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් අද දින මෙම විවාදය සඳහා සහභාගි වූ අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ගරු ඇමතිතුමා වෙනුවෙන් මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ඔවුන් ඉදිරිපත් කළ සියලුම කාරණා පිළිබඳව අවධානය යොමු කරමින් ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන බවත් මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Transport and Civil Aviation, I move,

"That the Regulations made by the Minister of Transport and Civil Aviation under Section 237 of the Motor Traffic Act (Chapter 203) read with Section 213D of the Act and published in the Gazette Extraordinary No. 1946/10 of 22nd December 2015, which were presented on 09.03.2016, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු වේලු කුමාර් මහතා. ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
කථානායකතුමාගේ සහතිකය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

කල් තැබීමේ යෝජනාව:
කලා ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති ගැටලු

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ஒத்திவைப்புப் பிரேரணை:
கலைத்துறையில் எழுந்துள்ள பிரச்சினைகள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker’s Certificate

ORAL ANSWERS TO QUESTIONS

ADJOURNMENT MOTION:
Issues arisen in the field of Arts

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 සැප්තැම්බර් 08 වන බ්‍රහස්පතින්දා
2016 செப்ரெம்பர் 08, வியாழக்கிழமை
Thursday, 08th September,2016

පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2016 සැප්තැම්බර් මස 07වැනි දින මට්සින් පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

සත්ව ආහාර (සංශෝධන)

මරණ ලියා පදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)

II

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2016 සැප්තැම්බර් මස 08වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 1.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2015 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධන වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2013 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2013/2014 වර්ෂය සඳහා සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු සන්දිත් සමරසිංහ මහතා
(මාණ්පුමිකු சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම" සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බදුල්ල, කැප්පෙටිපොල පාර, අංක 49/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ.යූ. මනම්පේරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මොණරාගල, ඇතිමලේ වැව, 70 කොටස, අංක 183 දරන ස්ථානයෙහි පදිංචි සී.ටී.එස්. සෙනෙවිරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මොණරාගල, ඇතිමලේ වැව, සිරිපුර වසම, වැවේ පිටිය යන ලිපිනයෙහි පදිංචි එම්.එම්. මුතුබණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු පියංකර ජයරත්න මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු பியங்கர ஜயரத்ன - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - State Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, නල්ලදරන්කට්ටුව, ජය සමරු පුරය, අංක 128/4 දරන ස්ථානයෙහි පදිංචි කේ.එච්. චතුර ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මාතලේ, උඩුපිහිල්ල, අංක 110 දරන ස්ථානයෙහි පදිංචි පී.ජී. නිමල් තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (සූජා) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, I will take up your matter at the end of Question time. I will give you time like yesterday. Otherwise, this will get disrupted.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ශ්‍රී ලංගම සේවක වැටුප් නියමිත දිනට නොගෙවීම : පියවර
இ.போ.ச. ஊழியர் சம்பளத்தை உரிய திகதியில் வழங்காமை : நடவடிக்கை
NON-PAYMENT OF SALARIES TO SLTB EMPLOYEES ON DUE DATE: STEPS TAKEN

705/'16

3. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සමහර ඩිපෝවල 2016 මාර්තු මස වැටුප් 2016 අප්‍රේල් මස 28 දින දක්වාම නොගෙවා සිටි බව දන්නේද;

(ii) සිය සේවකයන් සියලුදෙනාගේ 2016 මාර්තු මස වැටුප් නියමිත දිනට සම්පූර්ණයෙන් ලබා දීමට අසමත් වූ ඩිපෝ කවරේද;

(iii) ඉදිරියේදී නියමිත දිනට වැටුප් ලබා දෙන බව සහතික වීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைப் போக்குவரத்துச் சபையின் சில டிப்போக்களில் 2016 மார்ச் மாதச் சம்பளம் 2016 ஏப்பிரல் மாதம் 28ஆம் திகதி வரையில் செலுத்தப்படாமலிருந்தமை பற்றி அறிவாரா என்பதையும்;

(ii) தமது ஊழியர்கள் அனைவரினதும் 2016 மார்ச் மாதச் சம்பளத்தை குறித்த திகதியில் முழுமை யாகப் பெற்றுக்கொடுக்கத் தவறிய டிப்போக்கள் யாவை என்பதையும்;

(iii) எதிர்வரும் காலத்தில் உரிய திகதியில் சம்பளம் பெற்றுக் கொடுக்கப்படுவதை உறுதிப்படுத்து வதற்காக எடுக்கப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) whether he is aware that the salaries for the month of March, 2016 had not been paid until 28th April, 2016 by some depots of Sri Lanka Transport Board;

(ii) the depots that failed to pay the salaries of all the employees for the month of March, 2016 on the due date; and

(iii) the steps that will be taken to ensure that the salaries will be paid on due date in the future?

(b) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

ශ්‍රී ලංගමයේ කාලයක පටන් පවත්නා මූල්‍ය අර්බුදය හමුවේ සමහර ඩිපෝවල හිඟ වැටුප්, හිඟ සේවක අර්ථසාධක හා හිඟ පාරිතෝෂික මුදල් ගෙවීම් ප්‍රමාදවීම් දක්නට තිබුණි.

මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත සෑම ඩිපෝ සේවකයෙකුටම රුපියල් 16,200ක මුදලක් සෑම මසකම ප්‍රධාන කාර්යාලය විසින් මෙම සේවකයින්ගේ පුද්ගලික ගිණුමට බැර කරන අතර, ශේෂ වැටුප අදාළ ඩිපෝවන් මඟින් උපයා ගත් ආදායමින් ගෙවීම සිදු කරයි. මේ අනුව ඉහළ ආදායම් උපයා ගන්නා ඩිපෝවන් විසින් හිඟ වැටුප් ගෙවාගෙන යනු ලබන අතර, අඩු ආදායම් ලබන ඩිපෝවන් හිඟයක් සහිතව වැටුප් ගෙවාගෙන යනු ලබයි. වර්තමානයේදී මෙම තත්ත්වය සමථයකට පත් කරමින් පවතී.

එසේම රජය විසින් ගන්නා ලද තීරණයක් මත සෑම සේවකයෙකුගේම වැටුප රුපියල් 10,000කින් වැඩි වීමත් සමඟ හා සේවක අතිරික්තයක් පැවතීම මත ශ්‍රී ලංගම වෙත ලැබෙන ආදායම මඟින් වියදම් කළමනාකරණය කිරීම ගැටලු සහගත වී ඇත.

(ii) මීගමුව/ නිවිටඹුව/ කිරිඳිවැල/ කඩවත/ කළුතර/ හොරණ/ අලුත්ගම/ රත්මලාන/ කින්නියා/ කෑගල්ල/ රත්නපුර/ මුතූර්

(iii) ඔව්.

විශේෂයෙන් මා අමාත්‍යාංශයේ වැඩ භාරගත් පසු ශ්‍රී ලංගම තුළ වැටුප් නියමිත දිනට ගෙවීමට නම් සිදු කළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් හඳුනා ගන්නා ලද අතර, විශ්‍රාමික සේවකයින්ට පාරිතෝෂික ගෙවීමේ වැඩ පිළිවෙළක් මෙන්ම ඉදිරියට විශ්‍රාම යන සේවකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ වැඩ පිළිවෙළක්ද දැනට ක්‍රියාවේ යොදවා ඇත.

තවද, මේ වන විට ශ්‍රී ලංගමයේ සේවක සංයුති සැලැස්ම -cadre - හා බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටි -SOR- සකස් කර භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කර ඇති අතර, මා මේ අමාත්‍ය ධුරය භාරගත් පසුව කිසිදු නව සේවකයෙකු බඳවා නොගැනීමටද වග බලා ගන්නා ලදී.

ශ්‍රී ලංගමය තුළ සිටින අතිරික්ත සේවකයන් ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීම -VRS- සඳහා දැනට ක්‍රමවේදයක් සකස් කර ඇති අතර, ඒ යටතේ දැනට සේවකයන් 3,480 දෙනෙකුගේ අයදුම්පත් ලැබී ඇත. මෙම සේවකයන් ඉවත් වන විට ඩිපෝවල වැටුප් ගෙවීමට අතිරේක මුදලක්ද ඉතිරි වේයැයි අපේක්ෂිතව ඇත.

ඉහත දැක්වූ කරුණු හා ශ්‍රී ලංගම තුළ ව්‍යුහාත්මකව දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන් රාශියක ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංගම සේවකයන්ගේ වැටුප් නියමිත දිනට ගෙවීමට අමතරව වෙනත් අයිතිවාසිකම්ද සුරක්ෂිත කිරීමට කටයුතු කරන බව දන්වමි.

(ආ) අදාළ නොවේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)

(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංගම මුහුණ දී ඇති මෙම මූල්‍ය අර්බුදයට විසඳුමක් ලෙස, ලංගම පෞද්ගලීකරණය කිරීමට හෝ පෞද්ගලික අංශය සමඟ හවුල් ව්‍යාපාරයකට යෑමට බලාපොරොත්තු වෙනවාද?

ගරු අශෝක් අබේසිංහ මහතා

(மாண்புமிகு அசோக் அபேசிங்க)

(The Hon. Ashok Abeysinghe)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම කිසිම අදහසක් නැහැ. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ජාතිය සතු වස්තුවක්. ඒ නිසා එය කිසිසේත්ම පෞද්ගලීකරණය කරන්නේ නැහැ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)

(The Hon. Udaya Prabhath Gammanpila)

ඔබතුමාට බොහොම පින්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -782/'16- (1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

උදයංග වීරතුංග මහතාගේ විදේශ ගමන් බලපත්‍ර: විස්තර

திரு. உதயங்க வீரதுங்கவினது கடவுச்சீட்டு : விபரம்
PASSPORTS OF MR. UDAYANGA WEERATHUNGA: DETAILS

783/'16

6. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංග මහතාට හා ඔහුගේ බිරිඳට නිකුත් කර තිබූ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර අවලංගු කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඔහුට හා ඔහුගේ බිරිඳට සාමාන්‍ය ගමන් බලපත්‍ර නිකුත් කර තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) ඒ සඳහා විදේශ අමාත්‍යාංශය විසින් ආගමන හා විගමන පාලක ජනරාල් වෙත යම් නිර්දේශයක් ලබා දී තිබේද;

(vi) එසේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

(vii) ඔවුන් දෙදෙනාට නිකුත් කළ සාමාන්‍ය ගමන් බලපත්‍ර ලබාගැනීමට උදයංග වීරතුංග මහතා ශ්‍රී ලංකාවට පැමිණියේද;

(viii) නොඑසේ නම්, එම ගමන් බලපත්‍ර භාරගන්නා ලද්දේ කවුරුන් විසින්ද;

(ix) එම ගමන් බලපත්‍ර භාරගන්නා ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ரஷ்யாவிற்கான, முன்னாள் இலங்கைத் தூதுவர் திரு. உதயங்க வீரதுங்க மற்றும் அவரது மனைவிக்கு வழங்கப்பட்டிருந்த இராஜதந்திர வெளிநாட்டுக் கடவுச்சீட்டு இரத்துச்செய்யப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், அத்திகதி யாதென்பதையும்;

(iii) இவருக்கும் இவரது மனைவிக்கும் சாதாரண வெளிநாட்டுக் கடவுச்சீட்டு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனின், அத்திகதி யாதென்பதையும்;

(v) இதற்காக வெளிநாட்டலுவல்கள் அமைச்சினால் குடிவரவு, குடியகல்வுக் கட்டுப்பாட்டாளர் நாயகத்திற்கு ஏதேனும் விதப்புரையொன்று வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனின், அக்கடிதத்தைச் சபையில் சமர்ப் பிப்பாரா என்பதையும்;

(vii) இவர்கள் இருவருக்கும் வழங்கப்பட்ட சாதாரண வெளிநாட்டுக் கடவுச்சீட்டுகளைப் பெற்றுக் கொள்வதற்கு திரு. உதயங்க வீரதுங்க இலங்கைக்கு வந்தாரா என்பதையும்;

(viii) இன்றேல், இக்கடவுச்சீட்டுகள் யாரால் கையேற் கப்பட்டன என்பதையும்;

(ix) மேற்படி கடவுச்சீட்டுகள் கையேற்கப்பட்ட திகதி யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether diplomatic passports which had been issued to Mr. Udayanga Weerathunga, former Sri Lankan Ambassador to Russia, and his wife, have been cancelled;

(ii) if so, the aforesaid date;

(iii) whether ordinary passports have been issued to him and his wife;

(iv) if so, the aforesaid date;

(v) whether the Ministry of External Affairs has made any recommendation to the Controller General of Immigration and Emigration;

(vi) if so, whether aforesaid letter will be tabled;

(vii) whether Mr.Udayanga Weerathunga came to Sri lanka to get the ordinary passports that were issued to them;

(viii) if not, who has collected aforesaid passports; and

(ix) the date on which aforesaid passports were collected?

(b) If not, why?

ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පරිගණක පද්ධතිය මඟින් අවලංගු කර ඇත.

(ii) 2015.03.06

(iii) ඔව්.

(iv) 2015.03.06

(v) ඔව්.

(vi) ඔව්. ලිපිය **සභාගත*** කරමි.

(vii) නැත.

(viii) උදයංග වීරතුංග මහතාගේ බිරිඳ යූ.අයි. වීරතුංග මහත්මිය

(ix) 2015.03.09

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මාගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ප්‍රශ්නය තිබෙන්නේ රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංග මහතාගේ ගමන් බලපත්‍රයට අදාළවයි. ඔහුට බරපතළ චෝදනා කිහිපයක් එල්ලවෙලා තිබෙනවා. ඔහු තානාපතිවරයා වෙන්න කලින් යුක්‍රේනයේ කීව් නගරයේ භෝජනාගාරයක අයිතිකරුවකු හැටියට තමයි කටයුතු කළේ. ඒ කාලයේ ඔහු සම්බන්ධ වුණ මීග් යානා ගනු-දෙනුවක් සම්බන්ධයෙන් දැන් පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබෙනවා. ඒ වාගේම යුක්‍රේන ආණ්ඩුවෙනුත් චෝදනා කරලා තිබෙනවා, රාජ්‍ය තාන්ත්‍රික වරප්‍රසාද පාවිච්චි කරලා ඔහු යුක්‍රේනයේ කැරලිකරුවන්ට අවි ආයුධ විකුණා තිබෙනවා කියලා. ඒ වාගේම, උදයංග වීරතුංගට එරෙහිව පරීක්ෂණයක් පැවැත්වෙනවා, රුසියානු තානාපති කාර්යාලයේ වැඩ කරපු තරුණයෙකුගේ හදිසි මරණයක් සම්බන්ධයෙන්. මෙහෙම තත්ත්වයක් තියෙද්දී තමයි, 2015 මාර්තු මාසයේ 06වැනි දා ඔහුගේ රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රය වෙනුවට සාමාන්‍ය ගමන් බලපත්‍රයක් නිකුත් කරන්නේ. එය නිකුත් කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දීලා තිබෙනවා, ආගමන විගමන පාලකවරයාට. ඒ passport එක ගන්නත් ඔහු පැමිණ නැහැ. ඔහුගේ බිරිඳ ලංකාවට ඇවිත් එය අරගෙන ගිහින් තිබෙනවා. ඔබතුමන්ලා මේ රටට කියනවා, "ඔහු සම්බන්ධයෙන් බරපතළ චෝදනා තිබෙනවා, ඔහු හොයනවා" කියලා. හැබැයි, ඔහු ඒ ගමන් බලපත්‍ර පාවිච්චි කරලා හිටපු අධිකරණ ඇමති ජී.එල්. පීරිස් සහ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්තයා තායිලන්තයට ගියාට පස්සේ ඒ රටට ගිහිල්ලා හිටියා. ඒ විධියට මේ ළඟදී ජපානයට හෝ කොරියාවට ගියාද කියන්න අපි දන්නේ නැහැ. මොකද, ඒ ඡායාරූපවල හිටියේ නැති නිසා. එතකොට, මේ ආණ්ඩුවේ ආගමන විගමන පාලක ජනරාල්වරයාගේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවසරය ඇතුව නේ ඒ උදයංග වීරතුංග මේ විධියට කට්ටි පනිමින් ඉන්නේ.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
ගරු මන්ත්‍රීතුමා, මේකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ සිද්ධිය මම මේ අමාත්‍යාංශයට එන්න පෙර වූ එකක්. මම මේ අමාත්‍යාංශය භාර ගත්තේ අගෝස්තු 17 වන දා. දැන් මේ සිද්ධි දිහා බැලුවාම, diplomatic passport එකක් අවලංගු කිරීමේ බලය Controller General of Immigration and Emigrationට තිබෙනවා. ඒ කාර්යය අපේ රජය මඟින් කරලා තිබෙනවා. "උදයංග වීරතුංගට මේ මේ වැරදි සම්බන්ධ චෝදනා තිබෙනවා" කියලා අපේ Controller General of Immigration and Emigration විසින් INTERPOL එකට දන්වලා තිබෙනවා. ඔබතුමා කියන, ඊට වඩා ඇතුළත සිද්ධි සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශය තමයි කටයුතු කළ යුත්තේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මෙම චෝදනා එන්න පටන් ගත්තේ ඔබතුමා ඇමති ධුරය භාරගත්ත දවසේ ඉඳලා නොවෙයි. ඔබතුමන්ලා ආණ්ඩුවක් හදාගෙන බලයට පත් වෙන්න උත්සාහ දරපු ජනාධිපතිවරණ කාලයේ ඉඳලා තමයි මේ චෝදනා එන්න පටන් අරගෙන තිබුණේ. ජනාධිපතිවරණයටත් පෙර ඉඳලායි මේ චෝදනා ආවේ. එතකොට මුළු රටම, ලෝකයම දන්නවා, මොහු වූදිත පුද්ගලයෙක් කියලා. එහෙම තිබියදී ඔහුට සාමාන්‍ය ගමන් බලපත්‍රයක් දෙන්න ආගමන හා විගමන දෙපාර්තමේන්තුව කටයුතු කරලා තිබෙන්නේ ඇයි?

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
සාමාන්‍යයෙන් ඉල්ලුම් කරන ඕනෑම කෙනෙකුට අනිවාර්යෙන්ම passport එකක් දෙනවා. ඒක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඔහුගේ බිරිඳ ලංකාවට ආවාට පස්සේ, ලබාදී තිබුණු diplomatic passport එක සම්පූර්ණයෙන්ම අවලංගු කරලා සාමාන්‍ය passport එකක් තමයි දීලා තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මේ දීලා තිබෙන්නේ diplomatic passport එකක්ද, normal passport එකක්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. ඔහු රටට අවශ්‍ය නම්; ඔහු මීග් යානා ගනු - දෙනු වාගේ රුපියල් බිලියන ගණනක සම්බන්ධ නම්; මිනීමැරුමකට සැකකාරයෙක් නම්; අපේ රටේ කීර්තිය නැති කරපු අවි ආයුධ ගනු - දෙනුවකට සම්බන්ධයි නම්; ඔහුව අත් අඩංගුවට ගැනීමට අධිකරණයෙන් සොයනවා නම්; FCID එකේ පරීක්ෂණ යනවා නම්; ආණ්ඩුවේම ආයතනයක් වෙච්ච විදේශ කටයුතු අමාත්‍යාංශය ලියුමක් දීලා, ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ඔහුට සාමාන්‍ය ගමන් බලපත්‍රයක් දෙන්නේ මොන පදනමින්ද කියලායි මම අහන්නේ?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වුණත් රට ගිහිල්ලා passport එක නැති වුණොත්, entry එකක් දාලා තිබෙනවා නම් අපි නැවත එකක් ලබා දෙනවා. දැන් ඔබතුමාට ප්‍රශ්නය තිබෙන්නේ මේ passport ලබාදීම සම්බන්ධව නේ. ඔහුට පසුගිය කාලයේ දීලා තිබුණේ රාජ්‍ය තාන්ත්‍රික passport එකක්. ඔහුගේ තනතුර අවලංගු වෙනකොට අනිවාර්යෙන්ම ඔහුට normal passport එකක් තමයි දෙන්න වෙන්නේ. ඔහුගේ බිරිඳ ලංකාවට ආවාට පස්සේ ඇයට normal passport එකකුත්, වීරතුංග මහතාට normal passport එකකුත් අපි නිකුත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපට ඊට වඩා විශේෂයෙන් වෙන මොකුත් දෙයක් කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. [බාධා කිරීමක්] ඔබතුමා තුන්වෙනි අතුරු ප්‍රශ්නය ඇහුවා. දැනට අතුරු ප්‍රශ්න තුනක් අසා තිබෙනවා. ඕනෑ නම් යම් පැහැදිලි කිරීමක් කරන්න ඇමතිතුමාට පුළුවන්.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
අධිකරණයෙන් තහනම් නියෝගයක් දීලා තිබුණේ නැහැ. එවැනි දෙයක් දීලා තිබුණා නම් අපි ඒ ගැනත් ක්‍රියාත්මක වනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අධිකරණ නියෝගයක් නොවෙයි. පාස්පෝට් එක නැති වුණාට පසුව තානාපති කාර්යාලයෙන් ලබා දුන්නේ තාවකාලික පාස්පෝට් එකක් පමණයි. ඔය විධියට - [බාධා කිරීමක්] ඊළඟට, ඔබතුමා දැනුවත්ව ඔහුගේ බිරිඳට මෙම පාස්පෝට් එක ගෙන යන්න අවසර ලබා දීලා තිබෙනවා.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
චෝදනාවක් විතරයි නේ තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
චෝදනාවක් තිබෙනවා නම්, චෝදනාවක් විතරයි තිබෙන්නේ කියලා කියන එක වැරැදියි.

ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය: විදේශ සංචාර

ஊவா மாகாண முதலமைச்சரின் பிரத்தியேக பணியாட்டொகுதி :வெளிநாட்டுப் பயணங்கள்

PERSONAL STAFF OF CHIEF MINISTER OF UVA PROVINCE: FOREIGN TOURS

809/'16

10. ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-(1):

(අ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ,

(i) නම්;

(ii) තනතුරු;

(iii) අධ්‍යාපන සුදුසුකම්;

(iv) වැටුප් හා අනෙකුත් දීමනා;

(v) විදේශ සංචාරවල නිරත වී ඇත්නම්, එම සංචාර සඳහා දරන ලද වියදම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සංචාර සඳහා පළාත් සභා අරමුදල් යොදාගෙන තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஊவா மாகாண சபையின் தற்போதைய முதலமைச்சரின் பிரத்தியேக பணியாட்டொகுதி அங்கத்தவர்களின்,

(i) பெயர்கள் ;

(ii) பதவிகள்;

(iii) கல்வித் தகைமைகள்;

(iv) சம்பளம் மற்றும் ஏனைய கொடுப்பனவுகள்;

(v) வெளிநாட்டுப் பிரயாணங்கள் மேற்கொள்ளப் பட்டிருப்பின் அப்பிரயாணங்களுக்காக ஏற்கப்பட்ட செலவு;

வெவ்வேறாக யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி பிரயாணங்களுக்கு மாகாண சபை நிதியம் உபயோகிக்கப்பட்டுள்ளதா என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

Asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House separately-

(i) the names;

(ii) the designations;

(iii) educational qualifications;

(iv) salaries and other allowances; and

(v) if they have participated in any foreign tours, the expenses borne for such tours;

of the personal staff of the present Chief Minister of the Uva Province?

(b) Will he also inform this House whether the funds of the Provincial Council have been used for those tours?

(c) If not, why?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன))
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ පිළිතුරක් තිබෙන නිසා මම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරන්නම්.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයින් වන පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, මාධ්‍ය ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරී, පුද්ගලික සහකාර, කළමනාකරණ සහකාර, රියැදුරු, කාර්යාල කාර්ය සහායක, බංගලා භාරකරු, අරක්කැමි, කම්කරු, සනීපාරක්ෂක කම්කරු, ප්‍රධාන අමාත්‍ය උපදේශක (නීති, අධ්‍යාපන, සංවර්ධන, වාරිමාර්ග, මහජන සම්බන්ධතා, මාධ්‍ය, ඌව පළාත් සභා මුද්‍රණාලය) වරුන්ගේ

(i) නම

(ii) තනතුරු

(iii) අධ්‍යාපන සුදුසුකම්

(iv) වැටුප් හා අනෙකුත් දීමනා

(v) විදේශ සංචාරවල නිරතවී ඇත්නම්, එම සංචාර සඳහා දරන ලද වියදම **ඇමුණුම 01 හි සඳහන් කර ඇත.

(ආ) සංචාර සඳහා පළාත් සභා අරමුදල් යොදාගෙන ඇති අයගේ නම් ඇමුණුම 01 (A තීරුවෙහි) සඳහන් කර ඇත.

2016.01.16 දින සිට 2016.01.24 දින දක්වා නායිලන්ත හා ඉන්දුනීසියානු සංචාරය සඳහා ප්‍රධාන අමාත්‍යතුමා සමඟ සහභාගී වී ඇත. ඒ සඳහා ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ඒ/1/8/1/1 හා 2015.12.14 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී ඇත. (*ඇමුණුම 02 බලන්න)

(ඇ) අදාළ නොවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම ප්‍රශ්නයේ (v) වැනි කොටසට පිළිතුර කියන්න පුළුවන්ද?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ඔව්. කාර්ය මණ්ඩලයේ එක්කෙනෙක් විදේශ සංචාර සඳහා සම්බන්ධ වෙලා තිබෙනවා. සම්බන්ධීකරණ ලේකම්, සුමතිපාල ලියනආරච්චි මහතා, විදේශ සංචාර සඳහා රුපියල් 5,21,892.65ක මුදලක් පළාත් සභාවෙන් වියදම් කරලා තිබෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. සාමාන්‍යයෙන් කැබිනට් අමාත්‍යවරයකු විදේශගත වනවා නම්, රජයේ වියදමෙන් එතුමාගේ පෞද්ගලික ලේකම්වරයාව රැගෙන යන්න අනුමැතිය ලැබෙන බව අපි දන්නවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව විදේශ සංචාරයට සහභාගී වුණේ එක්කෙනෙක් කියලා තමයි සඳහන් වුණේ. නමුත් ජී.ඒ. ආනන්දසිරි මහතා විශ්‍රාමික නිලධාරියෙක්. එතුමාත් 2016.01.15වන දින එම විදේශ සංචාරයට සම්බන්ධ වෙලා තිබෙනවා. එතුමාත් සම්බන්ධීකරණ ලේකම්වරයෙක්. ඒ වාගේම උපුල් රණවීර මැතිතුමාව එතුමාගේ උපදේශකයකු ලෙස පත් කර යවා තිබෙනවා. එතුමාත් පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් කෙනෙක්. ඒ වාගේම ජී.වයි.ඒ.ආර්. පුෂ්පකුමාර මැතිතුමා. එතුමා පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙක්. එතුමාත් පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශකවරයෙක්. මා කලින් සඳහන් කළා, කැබිනට් ඇමතිවරයකුටත් රැගෙන යා හැක්කේ තමන්ගේ පෞද්ගලික ලේකම්වරයා විතරයි කියලා. ඔය කියන පුද්ගලයාටත් පන්ලක්ෂ ගණනක් වියදම් කර තිබෙනවා. තවත් මුදල් දරලා තමයි නීත්‍යානුකූල නොවන විධියට යම් අය විදේශගත වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා නීතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවාද?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, පළාත් සභා අරමුදලින් ගිහින් තිබෙන්නේ සුමතිපාල ලියනආරච්චි කියන නිලධාරියා විතරයි. ඒ සඳහා ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතිය ලැබී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විධියට අනෙක් අය යන්න ඇත්තේ, තමන්ගේ පෞද්ගලික වියදමින් වන්න ඇති. ජනාධිපති ලේකම්ගේ අනුමැතිය ලැබී තිබෙනවා, ඒ අයට විදේශ සංචාරය සඳහා මුදල් වියදම් කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කියන්නේ, 'අනෙක් අය පෞද්ගලික වියදමින් යන්න ඇති' කියන කාරණයයි. නමුත්, ඒ අය පළාත් සභා අරමුදලින් ගිහින් තිබෙනවා කියන එකයි පැහැදිලි වෙලා තිබෙන්නේ. පළාත් සභා අරමුදලින් තමයි ඒ වියදම් දරලා තිබෙන්නේ. පෞද්ගලික මුදලින් ඒ වියදම් දැරුවා නම් මෙම ප්‍රශ්නය ගරු සභාවට මා ගෙන එන්නේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එසේ විදේශගත වීමේ හැකියාවක් තිබෙනවා කියන කාරණය මම දන්නවා. නමුත් පැහැදිලිවම ලේඛන එක්ක, සාක්ෂි ඇතිව අපට ඔප්පු කරන්න පුළුවන්, පළාත් සභා අරමුදලින් තමයි ඉහත කී පිරිස ගොස් තිබෙන්නේ කියන එක.

ජී.වයි.ඒ. පුෂ්පකුමාර මැතිතුමා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරක්. ඌව ප්‍රජා ගුවන් විදුලියේ "සභාපති" කියා තනතුරක් නැහැ. එම තනතුරට පත් කරලා තමයි ව්‍යාජ ලෙස ගෙන ගිහින් තිබෙන්නේ. ඒ වාගේම ජනාධිපතිවරයා අවසරය දීලා තිබෙන්නේ ඌව පළාත් සභාවේ ගරු ඇමතිවරුන්ට සහ මන්ත්‍රීවරුන්ට යෑම සඳහා පමණයි කියන කාරණයම සඳහන් කළ ලිපියකුත් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අද මේ ගරු සභාවට ලබා දී තිබෙන පිළිතුර ටිකත් වැරදි සහගතව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා දීලා තිබෙන අනුමැතියෙන් තොරව කටයුතු සිදු වෙලාත් තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්නේ, ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියායි.

***** පුස්තකාලයේ තබා ඇත.***
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් නැවත විමර්ශනයක් සිදු කර එම තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්. මා වෙත ලැබී තිබෙන ලේඛනවල එම විස්තර සඳහන් වෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, එම විස්තර සොයා ඒවා ඉදිරිපත් කරන එක හොඳයි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මට තව විස්තර ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා නඟපු ප්‍රශ්න සම්බන්ධයෙන් ගරු රාජ්‍ය ඇමතිතුමා නැවත පරීක්ෂා කර බලා එම තොරතුරු ඉදිරිපත් කරනවා කිව්වානේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම පසුගිය අගෝස්තු මාසයේ 11 වැනි බ්‍රහස්පතින්දාත් මෙවැනිම ප්‍රශ්නයක් මතු කළා. එදින මා සඳහන් කළේ කැබිනට් මණ්ඩලය විසින් නිකුත් කරපු වක්‍රලේඛන උල්ලංඝනය කර ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් උපදේශකවරුන් බඳවා ගෙන පඩි-නඩි ගෙවනවාය කියන කාරණයයි. ගරු රාජ්‍ය ඇමතිතුමා එදත් කිව්වේ, "මෙම වාර්තා පිළිබඳව සොයා බලා කියන්නම්" කියායි. නමුත් මේ දක්වා තවම මේ උපදේශකවරුන්ට පඩි-නඩි ගෙවමින් පවතිනවා. එතකොට එම වක්‍රලේඛනය නිකුත් කළ දා සිට මේ දක්වා බැලුවාම, රුපියල් ලක්ෂ තිස්හයක විතර මුදලක් පළාත් සභා අරමුදලින් ගෙවා තිබෙනවා, නීත්‍යානුකූල නොවෙන විධියට. යහ පාලන ආණ්ඩුවේ වැඩ පිළිවෙළ වන්නේ, අයථා ලෙස මුදල් පරිහරණය කරන ආයතන හෝ පුද්ගලයන් සිටිනවා නම් එයට විරුද්ධව කටයුතු කරන එකයි. නමුත් එය දිගින් දිගටම සිද්ධ වෙන්නේ නැහැ.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, වහාම එය අත්හිටුවන්නය කියා ඒ සම්බන්ධයෙන් අපි නියෝගයක් කර තිබෙනවා. අපිට එහෙන් දන්වා තිබෙන්නේ, එය අත්හිටුවා තිබෙනවාය කියායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, එහෙම නම් ඒ පිළිබඳවත් සොයා බලා කටයුතු කරන්න. ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා එම කරුණු දෙක ගැනම සොයා බලා පිළිතුරක් ලබා දෙයි. එම ප්‍රශ්න දෙකම යම් කිසි විධියක වැදගත් ප්‍රශ්න.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉඩම් පැවරීම : විස්තර
வன பரிபாலனத் திணைக்களத்துக்கு காடுகள் ஒப்படைப்பு : விபரம்
TRANSFER OF LAND TO DEPARTMENT OF FOREST CONSERVATION: DETAILS

814/'16

11. ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පාලනය නොකරනු ලබන කැළෑ 2001 වර්ෂයට පෙර ප්‍රාදේශීය ලේකම් / සහකාර ආණ්ඩුවේ ඒජන්ත / ප්‍රාදේශීය ආදායම් නිලධාරි යටතේ පාලනය වූ බවත්;

(ii) අංක 05/2001 චක්‍රලේඛය යටතේ මෙම සියලුම ඉඩම් වන සංරක්ෂක වෙත පැවරූ බවත්;

(iii) රජයේ කඩිනම් අවශ්‍යතාවයන් සඳහා අත්‍යවශ්‍ය ඉඩම් අංක 05/2001 චක්‍රලේඛයෙන් නිදහස් කිරීම සඳහා අංක 02/2006 යටතේ චක්‍රලේඛයක් නිකුත් වූ බවත්;

(iv) රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා ඉඩම් නිදහස් කිරීම, දිසාපතිවරයා දිස්ත්‍රික් ලේකම්වරයාගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද කමිටුවක් මඟින් සිදු කිරීම සඳහා අංක 02/2006 චක්‍රලේඛයෙහි විධිවිධාන සලසා ඇති බවත්;

එතුමා පිළිගන්නේහිද?

(ආ) අංක 05/2001 සහ අංක 02/2006 චක්‍රලේඛ සභාගත කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வன பரிபாலனத் திணைக்களம் அல்லது வன சீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தினால் நிருவகிக்கப்படாத காடுகள் 2001ஆம் ஆண்டின் முன்னர் பிரதேச செயலாளர்/உதவி அரசாங்க அதிபர் / பிரதேச இறைவரி அலுவரின் கீழ் நிருவகிக்கப்பட்டன என்பதையும்;

(ii) 05/2001ஆம் இலக்க சுற்றறிக்கையின் கீழ் இந்த அனைத்துக் காணிகளும் காடு பேணல் அதிபருக்கு ஒப்படைக்கப்பட்டன என்பதையும்;

(iii) அரசாங்கத்தின் அவசர தேவைகளுக்கு அத்தியாவசியமான காணிகளை 05/2001ஆம் இலக்கச் சுற்றறிக்கையிலிருந்து விடுவிப்பதற்காக 02/2006 ஆம் இலக்கத்தின் கீழ் சுற்றறிக்கையொன்று வெளியிடப்பட்டதென்பதையும்;

(iv) அரசாங்கத்தின் அபிவிருத்தித் தேவைகளுக்காக காணிகள் விடுவிக்கப்படுவதை அரச அதிபரின்/ மாவட்ட செயலாளரின் தலைமையில் தாபிக்கப்

பட்ட குழுவினூடாக மேற்கொள்வதற்கு 02/2006ஆம் இலக்கச் சுற்றறிக்கையில் ஏற்பாடு செய்யப்பட்டுள்ளதென்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) 05/2001ஆம் இலக்க மற்றும் 02/2006ஆம் இலக்கச் சுற்றறிக்கைகளைச் சபையில் சமர்ப்பிப்பாரா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he admit that-

(i) the forests which are not coming under the purview of the Department of Forest Conservation and the Department of Wildlife Conservation were administered by Divisional Secretaries/Assistant Government Agents/Divisional Revenue Officers prior to 2001;

(ii) all such lands were transferred to the Forest Conservator under Circular No. 05/2001;

(iii) Circular No. 02/2006 was issued exempting lands essential for emergency needs of the Government from Circular No. 05/2001; and

(iv) Circular No. 02/2006 has provided for the release of lands for development needs of the Government by a committee established under the patronage of Government Agent and District Secretary?

(b) Will he inform this House whether he tables Circular No. 05/2001 and No. 02/2006?

(c) If not, why?

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)

(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2001 වර්ෂයට පෙර වියළි කලාපයේ හෙක්ටෙයාර 80කට අඩු සහ තෙත් කලාපයේ හෙක්ටෙයාර 08ට අඩු අවශේෂ කැලෑවල පාලනය දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී තිබුණි.

(ii) 2001.08.10 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් වෙත පාලන බලය පැවරී තිබූ සියලු අවශේෂ කැලෑවල පාලනය, වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු සහ පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ එකඟතාව ඇතුව නිකුත් කරන ලද 2001.08.10 දින අංක 05/2001 දරන චක්‍ර ලේඛය මඟින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

(iii) 02/2006 චක්‍ර ලේඛය නිකුත් කර ඇත්තේ, 05/2001 චක්‍ර ලේඛය මඟින් කැලෑ කිසිවක් නොපවතින රජයේ ඉඩම් ද වන සංරක්ෂක වෙත පැවරීම නිසා රජයේ කඩිනම් සංවර්ධන අවශ්‍යතාවන් සඳහා අත්‍යවශ්‍ය කැලෑ නොමැති ඉඩම් එම කාර්යයන් සඳහා නිදහස් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් වැළැක්වීමට ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා වේ.

(iv) පිළිනොගනී.

02/2006 චක්‍ර ලේඛයෙන් සිදුකර ඇත්තේ කැලෑ වශයෙන් නොපවතින ඉඩම් නැවත දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කර ගැනීම පිණිස අනුගමනය කළ යුතු ක්‍රමවේදය දැනුම්දීමයි.

(ආ) සභාගත කළ හැකිය.

(ඇ) පැන නොනඟී.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)

(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා අද දිනයේ මේ චක්‍ර ලේඛය සභාගත කරනවාද?

ගරු අනුරාධ ජයරත්න මහතා

(மாண்புமிகு அநுராத ஜயரத்ன)

(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, අද **සභාගත*** කරනවා.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)

(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මොනරාගල දිස්ත්‍රික්කයේ ජීවත්වන අපට අද ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. එක් කාරණයක් තමයි, වනජීවී කලාපවලින් අතිවිශාල ප්‍රදේශයක් ආවරණය වෙලා තිබීම.

ඊට අමතරව, සම්ප්‍රදායානුකූලව හේන් කොටා ගෙන ජීවත් වුණු පිරිසට හේන් කොටන්න තිබුණු ඉඩම් ප්‍රමාණය අහිමි වෙලා තිබෙනවා, මේ හේතුව නිසා. ඒ නිසා මට දැන ගන්න ඕනෑ, ඒ අය විශේෂයෙන්ම තමන්ගේ ජීවිතය ගත කළ ඉතාම දුෂ්කර ප්‍රදේශ වන තණමල්විල, සියඹලාණ්ඩුව, මඩුල්ල වාගේ ලංකාවේම දුප්පත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉන්න ජනතාවට තමන්ගේ කියලා ඉඩමක් නිදහස් කර ගන්න පුළුවන් ක්‍රමවේදයක් ඔබතුමාට හදන්න පුළුවන් වේවිද කියලා. මොකද, සමස්තයක් වශයෙන් මේ කරපු කාරණයෙන් අතිවිශාල පිරිසකට හානියක් වෙලා තිබෙනවා.

ගරු අනුරාධ ජයරත්න මහතා

(மாண்புமிகு அநுராத ஜயரத்ன)

(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, මේ 2006 චක්‍රලේඛනයේ බොහොම පැහැදිලිව තිබෙනවා, ඒ ඉඩම් නිදහස් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු අනුරාධ ජයරත්න මහතා]

මොකද, 2001 චක්‍රලේඛනය මඟින් මේ ඉඩම් නිදහස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම වාගේම එයින් යම් යම් කණ්ඩායම්වලට අපහසුතාවලට ලක් වෙන්න සිදු වුණා. ඒ නිසා තමයි ඒ සියලු දේවල් සංශෝධනය කරලා 2006 චක්‍රලේඛනය නිකුත් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ චක්‍රලේඛනය අද සභාගත කළාම විස්තර බලන්න පුළුවන්. මොන ආකාරයටද මේ ඉඩම් නිදහස් කරන්නේ කියලා ක්‍රමවේදය තිබෙනවා. ඒ අනුමැතීන් ටික ලබා ගත්තොත් දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන කමිටුවේ අනුමැතිය ලබා ගත්තොත් බොහොම පැහැදිලිව ඒ ඉඩම් ලබා දීමේ හැකියාව පවතිනවා.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
අතුරු ප්‍රශ්න එපමණයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කැමැති ද තුන්වැනි අතුරු ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙන්න.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
කැමැතියි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ මඩු රක්ෂිතයේ හෙක්ටෙයාර් 48,000ක් තිබෙනවා. මෙන්න මේකේ විශාල ප්‍රමාණයක, මඩු පල්ලියට යන පාරේ 2කණුව ළඟින් පහළට ගිහිල්ලා මහ වනය මැදින් කිලෝමීටර් 12ක් පමණ ගෙවලා, මීටර් 4ක් පළල පාරක් හදන්න සැලසුම් කරලා තිබෙනවා. දැන් වනජීවී එකෙන් බලාපොරොත්තු වන්නේ මේකේ සංචාරක කලාපයක් ඇති කරලා ඒ තුළින් ආදායම් ලබා ගන්නයි. නමුත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමයි වන අපරාධකරුවන් අල්ලන්නේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන අපරාධකරුවන් අල්ලන්නේ නැහැ. ඒ අය බලා ගන්නේ සතුන් විතරයි.

සංචාරක ව්‍යාපාරය හැමදාම නැහැ. සංචාරක ව්‍යාපාරය තිබුණේ මාස හතරක් නැත්නම් පහක් කියලා අපි හිතමු. මේ කාරණය නිසා සිදු වන්නේ මේ පාරවල් උපයෝගී කර ගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වන අපරාධකරුවන් ඇල්ලූ ක්‍රියාවලිය අහෝසි වෙලා යන එකයි. ඊට පස්සේ වන අපරාධ කරන පුද්ගලයන් මේ පාර උපයෝගී කර ගෙන ට්‍රැක්ටර් මඟින් මහා දැවැන්ත අපරාධයක් කරනවා. මගේ ඇහින්ම මම ඒක නැගෙනහිර පළාතේ සංචාරයක් කළ වෙලාවේ දැක්කා. ඒ නිසා මෙන්න මේ ක්‍රියා මාර්ගය ගැනීම හරිම අපරාධයක් කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වන ජීවීන් ආරක්ෂා කරන්න ඉඩ දෙන්න. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වන අපරාධකරුවන් අල්ලන්න ඉඩ දෙන්න. එහෙම නැතිව මෙන්න මේ අපරාධය කරන්න ඉඩ දෙන්න එපා කියා මා ඉල්ලීමක් කරනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් වෙලා ඉන්නවාද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණය පිළිබඳව ඇත්තටම අපට සොයා බලන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි මේ ඉදි කිරීම් සඳහාත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යම් අනුමැතියක් ලබා දුන්නාය කියලාද කියන්නේ?

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
සංචාරක කර්මාන්තය ඇති කරන්න පාර කපන්න වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති මේ භූමිය ඒගොල්ලන්ට දෙන්න කියලා, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ගැසට් කරලා තමයි මේ ඉල්ලීම කරලා තිබෙන්නේ. එතකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අයට මේ භූමියට ඇතුළු වෙන්න බැහැ.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු කථානායකතුමනි, අපරාධකරුවන් යම් කිසි වැරදි ක්‍රියාවක් කරනවා නම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියන ආයතන දෙකම ඒ කණ්ඩායම් අත් අඩංගුවට ගැනීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම පැත්තෙන් කටයුතු කරනවා. ඒ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විතරක් ක්‍රියාත්මක වන්නේ නැහැ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විතරක් ක්‍රියාත්මක වන්නේත් නැහැ. අපි දෙගොල්ලන්ම ඒකාබද්ධව ඒ කටයුතු කරනවා.

ඊළඟ කාරණාව මෙකයි. මේ භූමිය යම් විධියකින් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දීමක් සිදු වෙනවා නම් ඒ භාර දීම සිදු වන්නේත් අදාළ සියලුම ආයතන ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කමිටුවේ අනුමැතියත්, දිසාපතිතුමා ඇතුළු සියලු කමිටුවල අනුමැතියත් ලබා ගත්තාට පසුවයි. පැවරීමක් කරනවා නම්, අවසාන වශයෙන් අමාත්‍යාංශයේ අන්තර් කමිටුව මඟිනුත් අනුමැතියක් ලබා ගෙන තමයි එය කරන්නේ. ලබා දෙනවා නම්, යම් ක්‍රමවේදයක් තුළ තමයි එය සිදු වෙන්නේ. එහෙම නැතුව ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට යම් ගැටලුවක් ඇති වන විධියට ඒ කටයුතු සිදු වෙන්නේ නැහැ. ඒ පිළිබඳව විශේෂයෙන් සොයා බලන්නත් අපට පුළුවන්කමක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මම හිතන විධියට වනජීවී සංරක්ෂණ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරු සාකච්ඡාවක් පවත්වා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් මැදිහත් වෙලා ඒ ගැන සොයා බලන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න.

ඊළඟට, ප්‍රශ්න අංක 13 - 817/'16 - (1), ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු ඩෙ.ரீ.டபිள්யු. විමලවීර திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිற් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන වටය.

රැකියා විරහිත උපාධිධාරීන්: විස්තර

தொழிலற்ற பட்டதாரிகள்: விபரம்
UNEMPLOYED GRADUATES: DETAILS

487/'16

1. **ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු කනක හේරත් මහතා වෙනුවට)**
(මාණ්පුමිකු பந்துல குணவர்தன - மாண்புமிகு கனக ஹேரத் சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Kanaka Herath)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) 2015 වර්ෂය අවසන් වන විට රට තුළ සිටි රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2016 වර්ෂයේදී එම උපාධිධාරීන්ගෙන් කොපමණ සංඛ්‍යාවකට රජයේ රැකියා ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) ඉතිරි උපාධිධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රැකියා විරහිත උපාධිධාරීන් පෞද්ගලික අංශයෙහි රැකියා අවස්ථාවන් සඳහා යොමු කිරීමට යම් සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එම සැලැස්ම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு இறுதியில் நாட்டிலிருந்த தொழிலற்ற பட்டதாரிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) 2016ஆம் ஆண்டில் மேற்படி பட்டதாரிகளில் எத்தனை பேருக்கு அரச தொழில் வாய்ப்புகளை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படும் என்பதையும்;

(iii) எஞ்சிய பட்டதாரிகள் தொடர்பில் மேற் கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தொழிலற்ற பட்டதாரிகளைத் தனியார் துறையின் தொழில் வாய்ப்புகளுக்கு ஆற்றுப் படுத்துவதற்கான ஏதேனும் திட்டம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்திட்டத்தை இச்சபைக்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of unemployed graduates by the end of 2015 in the country;

(ii) how many of them will be provided with government jobs within the year 2016; and

(iii) what course of action will be taken regarding the rest of the graduates?

(b) Will he also inform this House-

(i) whether there is a plan to channel unemployed graduates to employment opportunities available in the private sector; and

(ii) if so, whether he will table such plan?

(c) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 26,173 (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2015 ශ්‍රමබල සමීක්ෂණය අනුව)

(ii) 2016.05.31 දිනට ලබා දී ඇති උපාධිධාරී පත්වීම් සංඛ්‍යාව - 8,028

(iii) රැකියා දස ලක්ෂයක් ලබා දීමේ වැඩසටහන යටතේ රැකියා ලබා දීම.

දේශීය හා විදේශීය ආයෝජන අවස්ථා ඉදිරියේදී පුළුල් කිරීමට සැලසුම් සකස් කර ඇති බැවින් ඒවායෙහි රැකියා අවස්ථා සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීම.

රාජ්‍ය සේවයේ දැනට පවතින පුරප්පාඩු හා ඉදිරියේදී ඇති වන පුරප්පාඩු සඳහා ඉදිරියේදී පත්වීම් ලබා දීමට කටයුතු කිරීම.

(ආ) (i) ඔව්.

(ii) *ඇමුණුමෙහි දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

මො/අලුපොත මුස්ලිම් මධ්‍ය මහා විදුහල: භෞතික සම්පත්

மொ/அலுபொத்த முஸ்லிம் ஆரம்பப் பாடசாலை :பௌதிக வளங்கள்
MO/ ALUPOTHA MUSLIM PRIMARY SCHOOL: PHYSICAL RESOURCES

643/'16

2. ගරු වාසුදේව නානායක්කාර මහතා (ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා වෙනුවට)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - (மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Vasudeva Nanayakkara on behalf of the Hon. M. H. M. Salman)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) මොණරාගල අධ්‍යාපන කලාපයට අයත්, මෙ/අලුපොත මුස්ලිම් මධ්‍ය මහා විදුහල ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කිරීමේදී, එහි ප්‍රාථමික අංශය වෙන් කරන ලද බවත්;

(ii) වර්ෂ 2013 දී, මෙ/අලුපොත මුස්ලිම් ප්‍රාථමික විදුහල ලෙස නම් කරන ලද එම පාසල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් හෝ අවශ්‍ය භෞතික සම්පත් ඇතුළු සුදුසු ගුරු මණ්ඩලයක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රාථමික පාසල සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට, අවශ්‍ය භෞතික සම්පත් ලබා දීමට සහ සුදුසු ගුරු මණ්ඩලයක් පත් කිරීම සඳහා කඩිනම් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகல கல்வி வலயத்துக்குரிய, மொ/அலுபொத்த முஸ்லிம் மத்திய மகா வித்தியாலயத்தை 1000 இரண்டாம்நிலைப் பாடசாலைகளை அபிவிருத்தி செய்யும் வேலைத்திட்டத்தில் உள்ளடக்குகையில், அதன் ஆரம்பப் பிரிவு பிரிக்கப்பட்டதென்பதையும்;

(ii) 2013ஆம் ஆண்டில், மொ/அலுபொத்த முஸ்லிம் ஆரம்பப் பாடசாலை எனப் பெயரிடப்பட்டுள்ள மேற்படி பாடசாலைக்கு நிரந்தர கட்டிடம் அல்லது தேவையான பௌதிக வளங்கள் உள்ளிட்ட தகுதியான ஆசிரியர்கள் இல்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி ஆரம்பப் பாடசாலைக்கு நிரந்தர கட்டிடமொன்றை நிர்மாணிப்பதற்கும் தேவையான பௌதிக வளங்களை வழங்குவதற்கும் மற்றும் தகைமை வாய்ந்த ஆசிரியர்களை நியமிப்பதற்கும் துரிதமாக நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) the primary section of Mo/Alupotha Muslim Central College in the Monaragala Education Zone was separated when it was included in the programme for the development of 1000 secondary schools; and

(ii) the primary section which was named Mo/Alupotha Muslim Primary School in the year 2013 does not have a permanent building, required physical resources including a suitable teaching staff?

(b) Will he state whether he will take speedy measures to construct a permanent building, provide necessary physical resources and appoint a suitable teaching staff for this primary school?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඌව පළාත් සභාව මඟින් පාලනය වනු ලබන පළාත් පාසලක් වන මොරගල්ලපොත මුස්ලිම් මහා විද්‍යාලය ද්විතියික පාසල් 1,000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කරන ලද අතර, එම වැඩසටහනේ කොන්දේසිවලට අනුව මෙම පාසලේ ප්‍රාථමික අංශය වෙන් කර නව පාසලක් ලෙස මොරගල්ලපොත ප්‍රාථමික විද්‍යාලය 2013.11.25 දින ස්ථාපනය කරන ලදී.

(ආ) මෙම ප්‍රාථමික විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු කර ගෙන යාමේ පහසුව සඳහා මේ වන විට 100x20 ප්‍රමාණයේ ගොඩනැඟිල්ලක් සහ මහා විද්‍යාලයේ කෘෂි ඒකකය ලෙස භාවිත කරන ලද ගොඩනැඟිල්ල ද පන්ති පවත්වා ගෙන යාම සඳහා ලබා ගෙන ඇත.

තවද, වැසිකිළි 04ක් දරුවන්ගේ භාවිතය සඳහා පවතින අතර ඊට අවශ්‍ය ජල පහසුකම්ද සපයා ඇත.

"ළඟම පාසල හොඳම පාසල" ජාතික වැඩසටහනේ ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම පාසල කඩිනමින් සංවර්ධනය කර තවදුරටත් අවශ්‍ය භෞතික සම්පත් ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, අවශ්‍ය ගුරු මණ්ඩලය දැනටමත් ලබා දී ඇත.

(ඇ) අදාළ නොවේ.

සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් සංඛ්‍යාව: කොළඹ දිස්ත්‍රික්කය

ஊழியர் சேமலாப நிதியக் கணக்குகள் : கொழும்பு மாவட்டம்

NUMBER OF EMPLOYEES' PROVIDENT FUND ACCOUNTS: COLOMBO DISTRICT

733/'16

4. ගරු බිමල් රත්නායක මහතා
மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල කොළඹ දිස්ත්‍රික්කය තුළ,

(i) ලියා පදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂි කර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் கொழும்பு மாவட்டத்தில்,

(i) பதிவு செய்திருந்த ஊழியர் சேமலாப நிதியக் (EPF) கணக்குகளின் எண்ணிக்கை;

(ii) புதிதாக பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை;

ஒவ்வொரு ஆண்டின் அடிப்படையில் தனித் தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் புதிதாக பதிவுசெய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை;

(i) அரசாங்கத்துக்கு உரித்தான கம்பனிகள்;

(ii) பகுதியளவிலான அரச நிறுவனங்கள்;

(iii) தனியார் துறை;

(iv) கைத்தொழில்துறை;

(v) விவசாயத்துறை;

(vi) சேவைத் துறை;

இற்கு அமைய ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked theMinister of Labour and Trade Unions Relations:

(a) Will he inform this House separately in relation to years 2013, 2014 and 2015 -

(i) the number of registered Employees' Provident Fund (EPF) accounts; and

(ii) the number of Employees' Provident Fund (EPF) accounts registered anew;

in the District of Colombo?

(b) Will he also inform this House separately in relation to years 2013, 2014 and 2015, the number of Employees' Provident Fund accounts registered anew and by -

(i) State-owned companies;

(ii) semi-government institutions;

(iii) the private sector;

(iv) the industrial sector;

(v) the agricultural sector;

(vi) the service sector?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

වර්ෂය	ලියා පදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	1,105,648
2014	1,157,340
2015	1,177,292

(ii)

වර්ෂය	අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	373,370
2014	384,932
2015	379,545

(ආ) ඉහත පරිදි වර්ගීකරණය කරන ලද පද්ධතියක් දැනට සේවක අර්ථ සාධක අරමුදල සතුව නොමැත.

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව A සිට X දක්වා වූ අක්ෂරයන් අනුව නම් කරනු ලබන කලාපයන්ට අනුකූලව සේවායෝජකයන් ලියා පදිංචි කරන දත්ත පද්ධතියක් පවත්වා ගෙන යනු ලබයි. එලෙස ලියා පදිංචි වූ සේවායෝජකයෙකුගෙන් යම් සාමාජිකයෙකු වෙනුවෙන් දායක මුදලක් ලද විට අදාළ සේවායෝජකයාට හිමි අක්ෂරය හා අංකය යටතේ එම සාමාජිකයා ලියා පදිංචි කෙරේ.

(ඇ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම මෙතැන ඉන්නා නිසා අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවන වටයේදී පිළිතුර සභාගත කිරීම තමයි සාමාන්‍ය චාරිත්‍රය වන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අද සභානායකතුමා පිළිතුරු සභාගත කළ නිසා මට හදිසි ප්‍රශ්නයක් මතු කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ සඳහා අවසානයේදී අවස්ථාව දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

කම්කරු දෙපාර්තමේන්තුවේ ඉහළ සිට පහළට සියලු නිලධාරීන් වැඩ වර්ජනයක් ආරම්භ කර තිබෙනවා. කම්කරු අයිතිවාසිකම් -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට අවස්ථාවක් දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

හදිසි ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හදිසි ප්‍රශ්නයක් කියන්නේ, ගින්නක් ඇති වුණොත් වහාම දෙන්නම්. එහෙම නැත්නම් ප්‍රධාන කටයුතු පටන් ගන්න ඉස්සෙල්ලා අවස්ථාව දෙන්නම්.

ප්‍රශ්න අංක 7 -788/'16- (1), ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -792/'16- (1), ගරු ඩලස් අලහප්පෙරුම මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -800/'16- (1) ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

"පෝෂණ මල්ල" ව්‍යාපෘතිය: සමුපකාරය හරහා ක්‍රියාත්මක කිරීම

"පෝසාක්කුප් පොති" කරුත්තිට්ටම් :කූට්ටුරවුච් සංගම්කළූටාකච් චෙයර්පට්ටුත්තල්
"BAG OF NUTRITIOUS FOOD" PROGRAMME: IMPLEMENTATION THROUGH CO-OPERATIVE SOCIETIES

815/'16

12. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ප්‍රසන්න රණවීර මහතා වෙනුවට)
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන - මාණ්පුමිකු පිරසන්න රණවීර සාර්බාග)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Prasanna Ranaweera)
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) තත්ත්වයෙන් ඉහළ ගුණාත්මක භාණ්ඩ ලබාගත හැකි දීප ව්‍යාප්ත අලෙවි ජාලයක් සහිත රාජ්‍ය ආයතනයක් ලෙස සමුපකාරය ක්‍රියාත්මක වන බවත්;

(ii) ආපදා අවස්ථාවලදී මහ ජනතාව වෙත සහනාධාර ලබා දීම සඳහා සමුපකාරය ප්‍රධානතම ආයතනයක් ලෙස භාවිත කරනු ලබන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ගැබිනි මව්වරුන් සඳහා ක්‍රියාත්මක "පෝෂණ මල්ල" ව්‍යාපෘතිය සමුපකාරය මෙන්ම, වෙනත් ආයතන හරහා ද ක්‍රියාත්මක වන බවත්;

(ii) එම ව්‍යාපෘතිය සමුපකාරය හරහා පමණක් ක්‍රියාත්මක කළේ නම්, මීට වඩා වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා දිය හැකි බවත්;

(iii) එමඟින් සමුපකාරයේ ආදායම ඉහළ නැංවිය හැකි බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) (i) සමුපකාරය සහ වෙනත් ආයතන හරහා ඉහත ව්‍යාපෘතිය යටතේ මේ වනවිට බෙදාහැර ඇති ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(ii) රාජ්‍ය මැදිහත්වීමක් හා විධිමත් අධීක්ෂණයක් යටතේ පවතින සමුපකාර ව්‍යාපාරය හරහා විශාල පිරිසකට ප්‍රතිලාභ ලැබෙන පරිදි පෝෂණ මල්ල ලබා දීමේ වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබියදී, වෙනත් පෞද්ගලික ආයතන හරහා එය ක්‍රියාත්මක කරන්නේ මන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මහලිර් මර්රුම් සිරුවර් විවහාර අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) දරත්තිල් උයර්න්ත සිරන්ත පණ්ටංකළෙ පෙර්රුක් කොළ්ළක්කූටිය නාටළාවිය සන්තෙච්චප්පටුත්තල් වලෙයමෙච්චුපුටන් කූටිය අරස නිරුවනමාක කූට්ටුරවුත්තුරෙ ඉයංකුකින්රතෙන්පතෙයුම්;

(ii) අනර්ත්ත නිලෙමෙකළින්පෝතු පොතු මක්කළුක්කු නිවාරණංකළෙ වළංකුවතර්කාක කූට්ටුරවුච්චංකම් පිරතානමාන නිරුවනමාක පයන්පටුත්තප්පටුකින්රතෙන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) කර්ප්පිණිත් තාය්මාර්කළුක්කාකච් චෙයර්පටුත්තප් පටුකින්ර "පෝසාක්කුප් පොති" කරුත්තිට්ටම් කූට්ටුරවුච් සංගම්කළ් ඌටාකවුම් ඒනෙය නිරුවනංකළ් ඌටාකවුම් චෙයර්පටුත්තප්පටු කින්රතෙන්පතෙයුම්;

(ii) මේර්පටි කරුත්තිට්ටම් කූට්ටුරවුච් සංගම්කළ් ඌටාක මාත්තිරම් චෙයර්පටුත්තප්පට්ටිරුප්පින්, ඉතෙවිට අතිකමානෝරුක්කු අනුකූලංකළෙ වළංක මුටියුමෙන්පතෙයුම්;

(iii) අතන්මූලම් කූට්ටුරවුච් සංගම්කළින් වරුමා නත්තෙ අතිකරික්කච් චෙය්යලාමෙන්පතෙයුම්;

අවර් ඒර්රුක්කොළ්කින්රාරා?

(ආ) (i) කූට්ටුරවුච් සංගම්කළ් මර්රුම් ඒනෙය නිරුවනංකළ් ඌටාක මේර්පටි කරුත් තිට්ටත්තින්කීළ් ඉන්රළවිල් විනියෝකික්කප් පට්ටුළ්ළ උතවිකළින් නිතිසාර් පෙරුමති එව්වළ වෙන්පතෙයුම්;

(ii) අරස තලෛයීටු මර්රුම් මුරෙසාර්න්ත මේර් පාර්වෛයින්කීළ් උළ්ළ කූට්ටුරවු ඉයක්කත්තින් ඌටාක පෙරුම් එණ්ණික්කෙයානෝරුක්කු අනු කූලංකළ් කිටෙක්කුම් වකෙයිල් පෝසාක්කු පොති වළංකුම් වේලෛත්තිට්ටත්තෛ නාටළා විය රීතියාක චෙයර්පටුත්තක්කූටිය ඉයලුමෙ කාණප්පටුකින්රපෝතු, වේරු තනියාර් නිරුවනංකළ් ඌටාක අතනෛ මේර්කොළ්වතර් කාන කාරණංකළ් යාවෙයෙන්පතෙයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

asked the Minister of Women and Child Affairs:

(a) Is she aware that-

(i) the co-operative societies system operates as a public institution with an island-wide network that provides quality goods; and

(ii) the co-operative societies system is used as a key institution to provide aid to the public in disaster situations?

(b) Will she admit that-

(i) the 'bag of nutritious food' programme in operation for pregnant mothers is implemented through co-operative societies as well as other institutions;

(ii) a larger number of people could be provided benefits if the said programme was implemented only through co-operative societies; and

(iii) the revenue of co-operative societies could also be enhanced through that?

(c) Will she inform this House-

(i) the monetary value of assistance distributed by now through co-operative societies and other institutions under the said project; and

(ii) the reason for implementing this programme of providing a bag of nutritious food through other private institutions when it is possible to implement the same island-wide providing benefits to a larger number of people through the co-operative societies system which operates with government involvement and proper supervision?

(d) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදාළ නැත.

(ii) අදාළ නැත.

(ආ) (i) ගැබිනි මවුවරුන් සඳහා ලබා දෙන පෝෂණ දීමනාව වැඩසටහන තුළ ලියා පදිංචි වෙළෙඳ ආයතන තෝරා ගැනීමේදී සමුපකාරය ඉවත් කර නොමැති අතර එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ප්‍රතිලාභීන්ට පහසුවෙන් ළඟාවිය හැකි වෙළෙඳ ආයතන කිහිපයක් තෝරා ගත හැකිය. එහිදී සමුපකාර ආයතනයටද ලියා පදිංචි වීමේ හැකියාව පවතී.

(ii) එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ප්‍රතිලාභීන් කොට්ඨාසය පුරා විසිරී පදිංචි වී සිටින බැවින් ප්‍රතිලාභීන්ට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානවල සමුපකාරය පමණක් ලියා පදිංචි කිරීමට වඩා තවත් ලියා පදිංචි වෙළෙඳ ආයතන පැවතීමෙන් ප්‍රතිලාභීන්ට පහසුවෙන් හා ප්‍රමාදයකින් තොරව අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සමුපකාරයද ඇතුළු කොට්ඨාසය තුළ ඔවුන් කැමැති ලියා පදිංචි වෙළෙඳ සැලකින් ලබා ගැනීමේ හැකියාව පවතී.

(iii) මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ දිවයිනේ අඩු බර දරු උපත් තුරන් කිරීම සහ කායික හා මනෝ සමාජීය වශයෙන් නීරෝගීමත් දරු පරපුරක් බිහි කිරීම වේ. එහිදී සෑම ආකාරයකින්ම ප්‍රතිලාභීන්ට පහසු හා ප්‍රමිතියෙන් ඉහළ ගුණාත්මකබවින් යුතු ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වේ.

(ඇ) (i) පෝෂණ දීමනාව වැඩසටහනට අදාළ 2016 වර්ෂයේ වියදම

මාසය	වියදම
ජනවාරි	රුපියල් 6,888,000.00
පෙබරවාරි	රුපියල් 229,882,623.50
මාර්තු	රුපියල් 507,912,535.50
අප්‍රේල්	රුපියල් 434,581,646.60
මැයි	රුපියල් 367,830,356.50
ජූනි	රුපියල් 324,347,437.44

(ii) මෙම වැඩසටහන 2015 මාර්තු මස සිට ක්‍රියාත්මක වූ අතර වැඩසටහන ආරම්භයේ සිටම ක්‍රියාත්මක කරනු ලැබුවේ සමුපකාරය මඟිනි. නමුත් මෙම වැඩසටහනෙහි සමාරම්භක දිනයේදීම ගිනිගත්හේන විවිධ සේවා සමුපකාරය මඟින් ගුල්ලන් සහිත ආහාරයට නුසුදුසු හාල්මැස්සන් සහ කඩල ලබා දීම සම්බන්ධයෙන් එදිනම (2015.03.21) මාධ්‍ය හරහා ප්‍රචාරය වූ අතර ඒ නිසා වැඩසටහන ආරම්භයේදීම විවේචනයට භාජන විය. එසේම 2015 අගෝස්තු මස 13වන දින ලංකාදීප පුවත් පතෙහි කළුතර විවිධ සේවා සමුපකාරය විසින් ගුල්ලන් ගැසූ හා පණුවන් සහිත පරිප්පු, හාල්මැස්සන්, කරවල සහ සෝයා මීවවල ගුල්ලන් හා පණුවන් ඉවත් කිරීමට විෂ වායුවක් ගසා ඇති බවට පළ විය. මේ අයුරින් වැඩසටහන ආරම්භයේ සිටම විවිධ පුවත් පත්වල මෙම වැඩසටහන මඟින් සමුපකාරය හරහා භාවිතයට නුසුදුසු ආහාර බෙදා හරින බවට විවිධ පුවත් පළ විය. එපමණක් නොව අමාත්‍යාංශය වෙත ලැබෙන දුරකථන ඇමතුම් හරහාද සමුපකාර ආයතන හරහා භාවිතයට නුසුදුසු ආහාර ද්‍රව්‍ය බෙදා හරින බවට පැමිණිලි විශාල වශයෙන් ලැබිණ. තවද නියමිත ප්‍රමාණවලට වඩා අඩුවෙන් ආහාර ද්‍රව්‍ය බෙදා හරින බවටද පැමිණිලි ලැබී ඇත. මෙවැනි විවිධාකාරයෙන් පෝෂණ දීමනාව වැඩසටහන සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු වූ අතර දඩ නියම කිරීම, පරීක්ෂණ පැවැත්වීම ආදිය සිදු විය. මේ සියලු කාරණා පිළිබඳව සැලකිලිමත් වෙමින් ප්‍රතිලාභීන්ට උපරිම පහසුව සහ ගුණාත්මකබවින් ඉහළ ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අප විසින් ලබා දී ඇති ප්‍රමිතීන්ට අනුකූලව තෝරා ගෙන ඇති ලියා පදිංචි කළ පවත්නා ඕනෑම වෙළෙඳ සැලකින් ප්‍රතිලාභියාට ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි පරිදි කටයුතු සම්පාදනය කර ඇත. සමුපකාරය කළ යුත්තේ මහ ජනයා තෘප්තිමත් වන අයුරින් සේවා සැපයීම මඟින් ප්‍රතිලාභීන් තමන් වෙත නැඹුරු කර ගැනීම වේ.

(ඈ) අදාළ නැත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

> "That notwithstanding the provisions of the motion agreed to by Parliament on 08.03.2016, the hours of sitting this day shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m. At 11.30 a.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 84.(x) කෙරෙහි ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරවනවා. එහි මේ විධියට සඳහන් වෙනවා:

"පාර්ලිමේන්තුවේ ඒ පිළිබඳ ප්‍රශ්නයක් සභාගිවුණ කර නොතිබුණ ද, පාර්ලිමේන්තුවේ කැමැත්ත ඇතිව මන්ත්‍රීවරයකුට තමා පිළිබඳ වූ පෞද්ගලික කරුණු පහදා දිය හැකි ය; එහෙත් එවැනි කරුණු විවාදයකට භාජනය කළ නොහැකිය. එමෙන් ම එම කථාව තමාගේ පැවැත්ම දෝෂමුක්ත කිරීමට පමණක් සීමා කළ යුතු ය."

ඒ අනුව ඊයේ දිනයේදී,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, සාමාන්‍යයෙන්, ඔය ඉල්ලීම මට ලිඛිතව ලබා දුන්නොත් අවසර ලබාදෙන්න පුළුවන්. ලිඛිතව ලබා දෙන්න. එතකොට මම ඔබතුමාට හෙට අවස්ථාව ලබාදෙන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල - Standing Ordersවල- එහෙම සඳහන් වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ලිඛිතව ලබා දෙන්න. සාමාන්‍යයෙන් ඒක තමයි කෙරෙන සම්ප්‍රදාය.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල එහෙම සඳහන් වෙන්නේ නැහැ. මොකද, ඊයේ මතු වුණු ප්‍රශ්නයක් පිළිබඳවයි මම සඳහන් කරන්නේ. අපි මේ සභාවේ කටයුතු කිරීමේදී පොදුවේ, පාර්ලිමේන්තුව නොමහ යවන්නේ නැති ආකාරයට මෙම සභාව තුළ කරුණු ඉදිරිපත් කිරීමයි මෙම උත්තරීතර සභාවට වැදගත් වෙන්නේ. ඒ නිසා මම ගරු මුදල් අමාත්‍යතුමා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරන්න නැඟී සිටිය නිසායි මම මේ කියන්නේ. සාමාන්‍ය වාරිත්‍රය තමයි, මෙහෙම ඉල්ලීමක් ඉදිරිපත් කරනවා කියලා උදේ වරුවේ මාව දැනුවත් කරන එක. එහෙම කළා නම් තමයි හොඳ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්. නමුත් සම්ප්‍රදාය ඒ විධියට අනුගමනය කරන්න. ඔබතුමා දැන් කථා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මුදල් ඇමතිතුමා සම්බන්ධයෙන්ද, මේ ප්‍රශ්නය?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමා සම්බන්ධයෙන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කවුද, නොමහ ඇරලා තියෙන්නේ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව තුළ මුදල් පිළිබඳ කටයුතුවලදී ඔබතුමා,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම ඔබතුමා හමුවෙලා මේ කරුණු ඉදිරිපත් කළා. මක් නිසාද යත්, මුදල් කටයුතු පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවට වන නිසා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, කවුද නොමහ ඇරලා තියෙන්නේ කියලා මම අහන්න කැමැතියි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, point of Order එකක් ගත්තාම ඒකට විරුද්ධව තව point of Order එකක් ගන්න බැහැ. ඒක කොහේද තිබෙන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කෙටියෙන් කියන්න කෝ, කවුද නොමඟ ඇරලා තියෙන්නේ කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කෙටියෙන් කියන්න නේන්නම් හදන්නේ. මන්ත්‍රීවරයෙකුට මේ පාර්ලිමේන්තුවේ කථා කිරීමේ නිදහස තිබෙන්නට ඕනෑ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමා කියනවා, නොමඟ යැව්වා කියලා. කවුද නොමඟ යැව්වේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මන්ත්‍රීවරයෙකුට කථා කිරීමේ නිදහස තිබෙන්නට ඕනෑ. ඒ නිසා මගේ කරුණ කියලා ඉවර වෙනකල් ඔබතුමා වාඩිවෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට කථා කරන්න පුළුවන්. නමුත්, කවුද නොමඟ ඇරලා තිබෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
He can refer that matter to me. Then, I will go through it and allow that.- [*Interruption.*] He is the Leader of the House and he has to reply. We must follow the proper procedure.- [*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Member, you are wasting time. - [*Interruption.*]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේ පාර්ලිමේන්තුව සංවාද මණ්ඩපයක් නොවෙයි නේ. අපි ඇවිල්ලා මේකට සහභාගි වෙන්නේ ඇයි? ජාතික වශයෙන් වැදගත් වන මෙවැනි කරුණක් පිළිබඳව ඔබතුමන්ලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට අදහස් ඉදිරිපත් කරන්න දෙන්නේ නැත්නම්, ඇයි අපි මේ සභාවට සහභාගි වෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අවස්ථාව දෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මගේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා සම්ප්‍රදාය අනුගමනය කරන්න. එච්චරයි. ඔබතුමා අද උදේ මට telephone කරලා කියන්න තිබුණා, මෙහෙම එකක් ඉදිරිපත් කරනවා කියලා. එතකොට අපි සූදානම් වෙනවා. එතකොට මට ඒ අය දැනුවත් කරන්න පුළුවන්. එහෙම කළාම මේ සභාවේ වැඩ කටයුතුවලට පහසු වෙනවා. එහෙම නොවුණොත් මේ සභාවේ වැඩ අවුල් වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, කලින් දැනුම් නොදීම පිළිබඳව සමාවෙලා, මට මේ සභාවේ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒක පිළිගන්නවා නම් ඒක වැදගත්. ඒ සම්ප්‍රදාය අපි අනුගමනය කළ යුතුයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, කරුණු මතු කරන්න ඉඩ දෙන්න. මීට කලින් දිනයකදී සභාව කල් තබන අවස්ථාවේදී මම ප්‍රශ්නයක් ගරු මුදල් අමාත්‍යතුමාට යොමු කළා. ඒ අවස්ථාවේදී ඒ ප්‍රශ්නය යොමු කළේ ඉතාම වැදගත් කරුණක් සම්බන්ධයෙන්. මේ රටේ රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන්, "බදු එකතු කිරීම විදේශ සමාගමකට දුන්නොත් වඳ්නිය සමීති ක්‍රියා මාර්ගයක් ගන්නවා" කියලා තිබුණා. ඒ අනුව, ජාතික පුවත් පතක් වන "දිවයින" පුවත් පතේ 2016.09.05 වැනි දින පැහැදිලිව වාර්තා කර තිබුණා, "දේශීය ආදායම් නිලධාරිහු අද ලෙඩ වෙති" කියලා.

ඊට පස්සේ 2016 සැප්තැම්බර් 06 වැනිදා "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "ලෙඩ නිවාඩුවෙන් දේශීය ආදායම් වැඩ අඩාළයි" දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවකයන් ඊයේ අසනීප නිවාඩු දමා සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් එම දෙපාර්තමේන්තුවේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ සහ දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු අඩපණ වී තිබිණි.
>
> බදු ගෙවීමට සහ විවිධ සේවාවන් ඉටුකර ගැනීම සඳහා සාමාන්‍යයෙන් දිනකට තුන්දාහක් පමණ ප්‍රධාන කාර්යාලයට පැමිණෙන නමුත්, ඊයේ එහි පැමිණි කීප දෙනාට ද හැරී යාමට සිදුවී ඇත."

මේ රටේ බදු ආදායම එකතු කරන ආයතනය ලෙඩ වී තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක personal matter එකක් නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then, I cannot allow that.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 84හි තිබෙන්නේ,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, Only a matter of personal nature can be raised.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, it is not a matter of personal nature.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පෞද්ගලික කරුණු නොවෙයි, ගරු කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක පෞද්ගලික කරුණක්-[බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම කියන්නම් ඒකට දීලා තිබෙන උත්තරය. [බාධා කිරීමක්] ගරු සභානායකතුමනි, ඔබතුමා මීට වඩා වගකීමෙන් හැසිරෙන්න. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, he can raise only a matter of personal nature. පෞද්ගලික කරුණු කියන්නේ, එතුමාට බැණලා තිබුණා නම්, එතුමාට අපහාස කරලා තිබුණා නම්, ඒ වාගේ දෙයක්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
84 ස්ථාවර නියෝගය යටතේ මට එය අනුමත කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා උත්තරයක් දෙන කොට, ඒ උත්තරය සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුව නොමඟ යවන උත්තරයක් නම් මොකක්ද, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එතුමාට ඒක තේරෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක වෙනත් දවසක කථා කරමු. මේ අවස්ථාවේදී මට කාලය ලබා දෙන්න අමාරුයි. මන්ත්‍රීතුමාට ඒක ස්ථාවර නියෝග 84 යටතේ බලපවත්වන්නේ නැහැ. [බාධා කිරීමක්] මේ ගැන වෙනම කථා කරන්නට පුළුවන්. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, දැන් මේ සභාව මරණාධාර සමිතියක් වගේ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා නැඟිටලා කථා කරනවා. ඔබතුමාට දැනුම් දීලාත් නැහැ. [බාධා කිරීමක්] I object to it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉල්ලීම නියම විධියට සම්ප්‍රදායානුකූලව ඉදිරිපත් කර නැති නිසා, මට එය අනුමත කරන්න අමාරුයි. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, 84 (x) ස්ථාවර නියෝගයේ දක්වා තිබෙනවා මෙහෙම:

"...මන්ත්‍රීවරයකුට තමා පිළිබඳ වූ පෞද්ගලික කරුණු..."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I know that. So, it is not a matter of personal nature.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, පෞද්ගලික කරුණක් නොවෙයි මා ඉදිරිපත් කරන්නේ, රටේ බදු අය කිරීමක් ගැන-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේක පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්. ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා ඊයේ දිනයේදී උත්තරයක් දුන්නා. මේ බලන්න -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I cannot allow that, ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, කාටද කියන්නේ? නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ වාගේ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා වාඩි වෙන්න. ඒ නියමිත සම්ප්‍රදාය අනුගමනය කරන්න. අපි සාධාරණ වෙන්නම්. ඔබතුමා උදේ ඒ විධියට කිව්වා නම් මට අවස්ථාව ලබා දෙන්න තිබුණා. [බාධා කිරීම්] මෙතැන ඒකාධිපති ක්‍රමයක් නැහැ. ක්‍රමවේදය ඔබතුමාම පිළිගත්තා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ රටේ වැඩ කරන ලක්ෂ 45ක ජනතාව වෙනුවෙන් ගරු සභානායකතුමා වෙත ඉතාම හදිසි ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. අද මුළු කම්කරු දෙපාර්තමේන්තුවම වර්ජනයක් පටන් අරගෙන, පහළට බැහැලා තිබෙනවා. කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සිට සියලු දෙනා අඛණ්ඩ වැඩ වර්ජනයක් අද උදේ සිට ආරම්භ කරලා තිබෙනවා. මේ රටේ වැඩ කරන ජනතාවට කිසිම ප්‍රශ්නයක් එතැනින් විසඳා ගන්න බැරි තත්ත්වයක් අද සිට උදා වෙනවා. EPF, ETF වාගේ කාරණා - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let him give the reply.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේක හදිසි ප්‍රශ්නයක්. අපි උදවු වෙන්නටයි හදන්නේ. මේක වැදගත් ප්‍රශ්නයක්. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, let him raise the question. Thereafter, you can reply.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම දැනගන්නට කැමැතියි මේ වැඩ වර්ජනයට හේතුව මොකක්ද කියලා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හේතුව මොකක්ද කියලා කියන්න දෙන්න කෝ. වැඩ කරන ජනතාව වෙනුවෙන්, මේ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම හා මහජන කම්කරු සම්බන්ධතා අංශ සියල්ලම ප්‍රතිව්‍යුහගත කිරීම නමැති මුවාව යටතේ සිදු කරන්නට යන, වැඩ කරන ජනතාව අවුරුදු 80ක් තිස්සේ මේ දෙපාර්තමේන්තුව භුක්ති විඳින තත්ත්වය නැති කරන්නට යන භයානක වැඩ පිළිවෙළ වහා නවත්වන්නට කියලා තමයි සියලු දෙනාම එළියට බැහැලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, පිළිතුරු දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමෙනුත් පසුව එක පිළිතුරක් දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, කම්කරු දෙපාර්තමේන්තුව තමයි අපේ රටේ සියලු වැඩ කරන සේවක සේවිකාවන් රැක බලා ගන්නට, ආරක්ෂා කරන්නට බැඳී තිබෙන්නේ. දැන් ඒ ආයතනය කඩාකප්පල් කිරීමක්, ඒ ආයතනය කඩා වැටීමක් සිද්ධ වුණාට පසුව කම්කරුවන්ගේ ආරාවුල්වලට බරපතළ තත්ත්වයක් ඇති වෙන බව ඔබතුමාට අමුතුවෙන් කියන්නට ඕනෑ නැහැ.

දැන් ඇතිවෙලා තිබෙන තත්ත්වය තමයි, තමුන්නාන්සේලා මේ හැම එකටම ප්‍රතිව්‍යුහගතකරණය කියා බෝඩ් එකක් ගේන්න පටන්ගෙන තිබීම. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එය ගේන්න පනත් කෙටුම්පතක් හදනවා. රේගු දෙපාර්තමේන්තුවට එය ගේන්න පනත් කෙටුම්පතක් හදනවා. "එයාර්ලංකා" එකට ඒක කරන්න හදනවා. ඒ විධියටම කම්කරු දෙපාර්තමේන්තුවටත් තමුන්නාන්සේලා මේ වැඩේ දෙන්න හදනවා. අන්න ඒකට එරෙහිව තමයි එහි ඉන්න කම්කරුවන් මේ වැඩ වර්ජනයේ නිරත වෙන්න සූදානම් වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, අප තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නේ මේ තත්ත්වය ඇති වෙන්න දෙන්න එපා කියායි. මොකද, මේ රටේ වැඩ කරන ජනතාවට තමන්ගේ ගැටලුවක් විසඳා ගැනීමට තිබෙන තැන එතැනයි. ඒ නිසා එම දෙපාර්තමේන්තුව අඛණ්ඩ වර්ජනයක නිරත වුණොත් විශාල අර්බුදයක් මතු වන බව ඔබතුමා දන්නවා. ගරු සභානායකතුමනි, ඔබතුමාට මේ ගැන අවබෝධයක් නොතිබෙන්න පුළුවන්. ඒ නිසා කම්කරු ඇමතිතුමා අද දවස

ඇතුළත පාර්ලිමේන්තුවේ ඒ පිළිබඳව ප්‍රකාශයක් කළ යුතුය කියා අප හිතනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ නව රජයට ජන වරමක් ලැබුණේ අලුත් රටක්, අලුත් දේශයක් බිහි කරන්නයි. ඒ නිසා අපේ රටේ තිබෙන ප්‍රශ්න දිහා අප අලුත් විධියට බලන්න ඕනෑ. හැබැයි, යහ පාලන ආණ්ඩුව යටතේ වැඩ වර්ජන කිරීමේ අයිතිය දැන් තිබෙනවා. ඒ කාලයේ ඇත්ත වශයෙන්ම වැඩ වර්ජන කිරීමේ අයිතිය තිබුණේ නැහැ නේ. [බාධා කිරීම්] මොකක්ද වුණේ කියා අපි දැක්කා නේ. [බාධා කිරීම්] අද යහ පාලන ආණ්ඩුව යටතේ ඒ අයිතිය තිබෙනවා. [බාධා කිරීම්]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒ කාලයේ නොතිබුණු නිසා තමයි අප අද ඒ කම්කරු අයිතිය ලබා දුන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] ඔබතුමන්ලා කරුණාකර වාඩිවෙන්න. [බාධා කිරීම්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. ගරු සභානායකතුමනි, ඔබතුමා මේ පිළිබඳව කම්කරු ඇමතිතුමාට අද දැනුම් දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් විමසීමක් කළා කියා මම අද කම්කරු ඇමතිතුමාට දැනුම් දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ අවශ්‍ය පියවර ගන්න.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම - ගරු අනුර දිසානායක මහතා.

ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

කලා ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති ගැටලු
கலைத்துறையில் எழுந்துள்ள பிரச்சினைகள்
ISSUES ARISEN IN THE FIELD OF ARTS

[ප.භා. 11.11]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අප රටේ කලා ක්ෂේත්‍රය තුළ පැනනැඟී ඇති ගැටලු ගණනාවක් නිසාවෙන් සාහිත්‍යය, ටෙලි නාට්‍ය, චිත්‍රපට, වේදිකා නාට්‍ය ඇතුළු නිර්මාණයන් බිහිවීමට කලාකරුවා පෙළඹවීම වෙනුවට එකී ක්ෂේත්‍රයන් තුළින් ඔවුන් පිටමන් කිරීමේ තත්ත්වයක් වර්තමානයේ පැනනැඟී ඇත. ආණ්ඩු පත්කිරීමේදී ඔවුන් වෙතද බලාපොරොත්තු ඇති කරවන හා මැතිවරණ ප්‍රකාශනවලට ප්‍රතිපත්ති, පොරොන්දු, වැඩ පිළිවෙළවල් ඇතුළත් කරන පාලකයන් විසින් කර ඇත්තේත්, වර්තමාන පාලනය විසින් සිදු කරන්නේත් නිසි විසඳුම් සඳහා ආණ්ඩුවක කාර්ය භාරය කරනවා වෙනුවට ආණ්ඩුවක් විසින් කළ යුතු අවධානයද යොමු නොකර මගහැර සිටීමයි. මෙම තත්ත්වය නිසා රටක ජනතාවට ලැබිය යුතු කලා රසවින්දනය අහිමි වී ඇති අතර ඒ මඟින් නූතන පරපුර නිර්මාණාත්මක කලා නිර්මාණයක් පරිශීලනයට නොලැබෙන, විශේෂයෙන්ම තම නිවසේ රූපවාහිනියෙන් කැමති වුනත් නැතත් නැරඹීමට සිදුවන බාල වර්ගයේ ටෙලි නාට්‍ය හෝ හඬකවන ලද විදේශීය ටෙලි නාට්‍ය නරඹන අතරමං වූ නරඹන්නන් පිරිසක් බවට පත්ව ඇත.

මෙම තත්ත්වය වෙනස්කොට නිර්මාණකරුවන් ඇතුළු කලා ක්ෂේත්‍රයේ සියලු ශිල්පීන්ගේ, ඔවුන්ගේ නිර්මාණ හා නියැලි භූමිකාව අරක්ෂා කිරීමටත් උසස් රසවින්දනයකට ජනතාවට ඇති අයිතිය තහවුරු කිරීමටත් ආණ්ඩුව විසින් ජාතික වගකීමක් ලෙස සලකා ප්‍රතිපත්ති තීරණ ඇතුළු අවශ්‍ය පියවරයන් ගෙන නිර්මාණකරුවන්ගේ ස්වාධීනත්වයට අවශ්‍ය ඉඩකඩ සලසා දිය යුතු බවට යෝජනා කර සිටී."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අද මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් කරනු ලබන්නේ අපේ රටේ සමාජය යහපත් අතට යොමු කිරීම සඳහා, එහි අධ්‍යාත්මය වර්ධනය කිරීම සඳහා විශේෂයෙන්ම බලපෑම් කරනු ලබන

[ගරු අනුර දිසානායක මහතා]

සාහිත්‍ය කලා ක්ෂේත්‍රය පිළිබඳව සහ එම ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන ගැටලුත්, එම ක්ෂේත්‍රයේ නියැලී සිටින නිර්මාණකරුවන් මුහුණ දී ඇති ගැටලුත්, ප්‍රේක්ෂකයන්ට ඇතිවී තිබෙන තත්ත්වයත් පිළිබඳවයි. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුළු සමාජයක් බිඳ වැටී තිබෙන මොහොතක මේ ක්ෂේත්‍රය පමණක් ආලෝකවත් කුලුනක් ලෙස වැජඹෙන බව අපි විශ්වාස කරන්නේ නැහැ. අප ඉදිරිපිට තිබෙන්නේ නියෝජ්‍ය පොලිස්පතිවරු කප්පමට මිනී මරන සමාජයක් නම්; ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු ඝාතකයන් සොයනවා වෙනුවට ඝාතකයන් ආරක්ෂා කරන සමාජයක් නම්; අලි හොරකම් කරන විනිසුරුවන් සිටින සමාජයක් නම්; ගෙදර මෙහෙකරුවන් දූෂණය කරන විනිසුරුවන් ගොඩනැහෙන සමාජයක් නම්; අවුරුදු 80 මහලු කාන්තාවන් දූෂණය කරන අවුරුදු 17, 18 දරුවන් නිර්මාණය වෙලා සිටින සමාජයක් නම් සියලු මිනිස් සබඳතා බිඳ වැටෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගායකයින් යැයි කියා ගන්නා සමහර අය වේදිකාවට නැගලා "අම්මට" "අම්මට" කියනකොට ඒකට අත්වැල් අල්ලන ප්‍රේක්ෂකයන් සිටින සමාජයක් අද අප ඉදිරිපිට තිබෙනවා නම් අද මේ සමාජය නරුම සමාජයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

මේ සියල්ල බිඳ වැටී තිබෙන තැනක, කලා, සංස්කෘතික ක්ෂේත්‍රය පමණක් ආලෝකමත් කුලුනක් ලෙස ආරක්ෂා වනවාය කියලා අපි කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ. "බුලත් කොක්කනට හෙණ ගැහුවාට පස්සේ කිල්ලෝටය බලන්නේ නැතුවම විසි කරන්න" කියනවා. මේ විධියට මුළු සමාජයම නරුම සමාජයක් බවට පරිවර්තනය වෙලා තිබෙන වෙලාවක එක ක්ෂේත්‍රයක් පමණක් ආරක්ෂා වේවි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒකට අපට ප්‍රතිපත්තිමය අදහසක් තිබෙනවා. 1848දී කොමියුනිට්ස් ප්‍රකාශනය ලියලා කාල් මාක්ස් මෙහෙම කියනවා:

"...ආගමික භක්තියද, ධීර-වීර උනන්දුවද අධි රසිකවාදී අනුරක්තතාවද අරභයා වූ ස්වර්ගමය ආනන්දයත් ආත්මාර්ථකාමී ගණන් බැලීම නැමති අයිස් වතුරේ ගිල්වා දමන ලදී. එය පෞද්ගලික අගය හුවමාරු වටිනාකම බවට පෙරළන ලදී. එමෙන්ම සංඛ්‍යා විරහිත උදුරාගත නොහැකි වර සහිත නිදහස් අයිතීන් වෙනුවට හෘද සාක්ෂියට කොහෙත්ම එකඟ නොවන එකම නිදහස වන වෙළෙඳාම් කිරීමේ නිදහස පිහිටුවාලීය...."

ඒක තමයි තමුන්නාන්සේලා අනුගමනය කරන ප්‍රතිපත්තිය. එකම නිදහස, වෙළෙඳාම් කිරීමේ නිදහස.

ඒ විතරක් නොවෙයි තවදුරටත් මෙහෙම කියනවා:

"නිෂ්පාදනයේ ඇතිවන ස්ථාවර විප්ලවීය වෙනස්වීම් සියලු සාමාජයීය සබඳතාවල ඇති වන නිරන්තර කැලඹීම්, සදාකාලික අවිනිශ්චිතතාව සහ ගාමකත්වය විසින් ධනවාදී යුගය අන් සියලු යුගවලට වඩා වෙනස් වේ. සිය පෞරාණික වූත්, පූජනීය වූත් ප්‍රාග් විනිශ්චයන් සහ මත සහිත පාෂාණීභූත යකඩ සහ මල බැඳුණු සියලු සබඳතා වෙනස් වී යන අතර, අලුතින් ඇති වන සියලු සබඳතා අස්ථිකරණයට භාජන වීමටත් පෙර ඒවා යල් පැන යයි. සන වූ හැම දෙයක්ම උණු වී වාතය බවට පෙරළේ. ශුද්ධ වූ හැම දෙයක්ම කෙළෙසෙන්නේය. අවසානයේදී මිනිසාට තම ජීවිත තත්ත්වය සහ තම වර්ගයා සමඟ ඇති අන්‍යෝන්‍ය සබඳතා දෙස සන්සුන් ඇසින් බැලීමට අවශ්‍යතාවක් ඇති වේ."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඇති වී තිබෙන තත්ත්වය ඒක. පන්සල සහ දායක සභාව අතර සබඳතාව බිඳ වැටී තිබෙනවා නම්, ගුරුවරු සහ දරුවන් අතර සබඳතාව බිඳ වැටී තිබෙනවා නම්, දෙමව්පියන් සහ දරුවන් අතර සබඳතාව බිඳ වැටී තිබෙනවා නම්, සියලු මිනිස් සබඳතා බිඳ වැටී තිබෙනවා නම්, මිනිස් සමාජයටත් තම වර්ගයාටත් බල කර තිබෙනවා, "මේ තත්ත්වය පිළිබඳව සන්සුන් සිතින් බලන්න" කියලා. අද මේ සමාජයේ ඇති වී තිබෙන මේ බෙදවාචකය අප හැම කෙනාටම බල කර සිටිනවා, "මේ ඇති වී තිබෙන බෙදවාචකය දෙස විවෘත, සන්සුන් මනසින් බලන්න" කියලා. ඒ සඳහා අපි තමුන්නාන්සේලාට ආරාධනා කරනවා.

මා දන්නේ නැහැ, තමුන්නාන්සේලා ඒකට සූදානම් වෙයිද කියලා. මොකද, සන්සුන්වීමට හෝ විවෘතවීමට හෝ මොන තරම් සූදානම් ද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. හැබැයි, අපි සන්සුන් මනසින් විවෘතව මේ බෙදවාචකය දෙස බැලිය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මිනිස් ආධ්‍යාත්මය පෝෂණය කිරීමේදී, වඩාත් ගුණවත් සමාජයක් නිර්මාණය කිරීමේදී, අපේ රටේ සාහිත්‍යයට, කලාවට විශාල කාර්ය භාරයක් පැවරී තිබෙනවා. හැබැයි, වෙළෙඳාම පමණක් නිදහස් වූ සමාජයක තමුන්නාන්සේලා ඒකට දීපු අර්ථ කථන මොනවාද? අපට මතකයි, අපේ රටේ පළමු ජනාධිපතිවරයා කිව්වා, "ඔහුට සාහිත්‍ය වැඩක් නැහැ, එය මුදල් හම්බ කිරීමේ මාධ්‍යයක් නොවෙයි" කියලා. අපට මතකයි, අපේ රටේ දෙවැනි ජනාධිපතිවරයා කිව්වා, "ඔහුට ඉංජිනේරුවන් අවශ්‍ය නැහැ. වඩු කාර්මිකයන් -වඩු බාස්ලා- හිටියොත් ඇති. නිර්මාණ ශිල්පීන් වැඩක් නැහැ, මිටියෙන් ගහන්න පුළුවන් මිනිස්සු හිටියොත් ඇති" කියලා. අපට මතකයි, අපේ රටේ හතරවැනි ජනාධිපතිවරිය කිව්වා, "කලා උපාධිය වැඩක් නැහැ" කියලා. ඒ අනුව, රාජ්‍ය මට්ටමින්ම සාහිත්‍ය පිළිබඳව, කලාව පිළිබඳව, මිනිසාගේ ආධ්‍යාත්මික පෝෂණය පිළිබඳව තමුන්නාන්සේලාගේ වටිනාකම්, තමුන්නාන්සේලාගේ ඇගැයීම්, තමුන්නාන්සේලාගේ නායකයන් විසින් ඉදිරිපත් කර තිබෙනවා. ඊට වඩා අලුත් එකක් නොවෙයි මේ ආණ්ඩුව. අපි කිසිසේත්ම මේ ආණ්ඩුවෙන් ඊට වඩා අලුත් දෙයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා අලුත් දෙයක් ඇති කරන්න සූදානම් වෙන බවක් පෙන්නුම් කරන්නේවත් නැහැ.

පළමුකොටම මේ සඳහා වගකියන අමාත්‍යාංශයට මේ ආණ්ඩුවෙන් මොකක්ද කළේ? කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපේ එස්.බී. නාවින්න ඇමතිතුමනි, ඔබතුමා සංස්කෘතික කටයුතු ඇමතිතුමා නේ. දැන් සංස්කෘතික කටයුතු ඇමතිතුමාට ශ්‍රී ලංකා කලා මණ්ඩලය තිබෙනවාද, මධ්‍යම සංස්කෘතික අරමුදල තිබෙනවාද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තිබෙනවාද, ටවර්හෝල් රහඟල පදනම තිබෙනවාද, ගාලු උරුමය තිබෙනවාද? සංස්කෘතියේ වැදගත්ම ක්ෂේත්‍ර වන මේ ආයතන තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ නැහැ. එහෙම නේද ගරු ඇමතිතුමනි? එහෙම නම්, මොකටද සංස්කෘතික ඇමතිකමක්? තමුන්නාන්සේලා යහ පාලන ආණ්ඩුව පිහිටුවන කොට ඒ වෙලාවේ තමුන්නාන්සේලාට සහාය දෙන්න දායකත්වය දක්වපු පුරවැසි බලය සංවිධානය සහ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා අතර ඇති වූ එකඟතා ලියවිල්ල මා ළඟ තිබෙනවා. එහි මොකක්ද කියන්නේ? එම කාර්යයට,- ඒ කියන්නේ මේ ක්ෂේත්‍රයට- සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් ජාතික වශයෙන් ඉටු කළ යුතු කාර්ය භාරය නිශ්චය කොට තහවුරු කරමින්, එමඟින් කලා ක්ෂේත්‍රවල අවශ්‍යතා ඉටු කිරීම පිණිස එම අමාත්‍යාංශය රටේ සංවර්ධනයට උර දෙන ප්‍රධාන අමාත්‍යාංශයක් බවට පත් කරමින්, ඊට ජාතික අය වැයෙන් වාර්ෂිකව ලබා දෙන ප්‍රතිපාදන වැඩි කරනවා කියලා තමයි කිව්වේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය රටේ ප්‍රබල අමාත්‍යාංශයක් බවට පත් කරනවාය කිව්වා. අය වැය ලේඛනයෙන් විශාල මුදල් ප්‍රමාණයක් මේ අමාත්‍යාංශයට යොමු කරනවාය කිව්වා. රටේ සංවර්ධනයේදී සැලකිය යුතු දායකත්වයක් ලබා ගන්නා ක්ෂේත්‍රයක් බවට මේ ක්ෂේත්‍රය පත් කරනවාය කියලා ජනාධිපතිවරණයේදී කිව්වා. හැබැයි, මොකක්ද කළේ? සංස්කෘතික අමාත්‍යාංශයට ඇමතිවරයෙක් පත් කළා. ඇමතිතුමනි, තමුන්නාන්සේ ළඟ තිබෙන්නේ ඒකේ පිට පොත්ත පමණයි. එහි මදය ගලවලා තමන්ගේ හිතවාදී අමාත්‍යවරුන්ට පවරන තත්ත්වයක් නිර්මාණය කරලා තිබෙනවා. ගරු එස්.බී. නාවින්න අමාත්‍යතුමනි, තමුන්නාන්සේගේ අමාත්‍යාංශය මොකක්ද? සංස්කෘතික අමාත්‍යාංශයත්, ආගමන විගමන අමාත්‍යාංශයේ කොටසකුත්, වයඹ සංවර්ධනයත් තමයි තමුන්නාන්සේට දීලා තිබෙන්නේ. ඒක හරියට සිමෙන්ති, ෆැන්ටා, ගස්ලබු එකතු කරලා හදපු "සැලඩ්" එකක් වාගේයි. මොකක්ද තමුන්නාන්සේගේ මේ අමාත්‍යාංශය?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්ෂේත්‍රය පිළිබඳව වැදගත් අවධානයක් යොමු කොට මෙහෙයවීම සඳහා මධ්‍යගත ආයතනයක අවශ්‍යතාව තිබුණා. හැබැයි, මේ ක්ෂේත්‍රය මොන ආකාරයෙන් වර්ධනය කළ යුතුද, මොන ආකාරයෙන් ආරක්ෂා කළ යුතුද කියන එක පිළිබඳව මේ අමාත්‍යාංශ වෙන් කිරීම හරහා තමුන්නාන්සේලාගේ දැක්ම පෙන්නුම් කරලා තිබෙනවා. ඒ අනුව, පරණ නායක කාරකාදීන්ට වඩා අබමල් රේණුවකින්වත් තමුන්නාන්සේලා වෙනස් වෙලා නැති බව තමයි පෙන්නුම් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්ෂේත්‍රය අතිශය වැදගත් බව අපි දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි සංවර්ධනය කියලා කියන්නේ ගොඩනැඟිලි, පාලම්, මහ පාරවල් ගොඩ නැඟීම පමණක් නොවෙයි. මිනිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය කිරීමකින් තොරව, සමාජයේ මානව බැඳීම ශක්තිමත් කිරීමකින් තොරව, ඒ සමාජය යහපත් සමාජයක් බවට පරිවර්තනය කිරීමෙන් තොරව මේ රට ඉදිරියට ගෙන යන්න බැහැ. සමාජය ලාභය හා මුදල් හඹා ගෙන යන අධිපරිභෝජනවාදී සමාජයක් බවට පත් කිරීමෙන් මේ රට ඉදිරියට ගෙන යන්න බැහැ. ඒ නිසා වැදගත් ලෙසම අපේ සමාජයේ මානව බැඳීම් ශක්තිමත් කරන, ආධ්‍යාත්මික බැඳීම් වර්ධනය කරන ප්‍රවේශයකට අප අවතීර්ණ විය යුතුව තිබෙනවා.

අද අපි මහා බෞද්ධාවක දකිනවා. අද කිඹුලන්ට කන්න මාතර ගහට දරුවන් වීසි කරන තාත්තලා හැදෙන්නේ කොහොමද? අවුරුදු 80ක මහලු කාන්තාවන් දූෂණය කරන දරුවන් හැදෙන්නේ කොහොමද? අවුරුදු හතරේ දරුවන් දූෂණය කරන වැඩිහිටියන් හැදෙන්නේ කොහොමද? මේ සියල්ල සිදුවන විධියට නරුමභාවයට පත් වෙච්ච සමාජයක් අපි ඉදිරිපිට තිබෙනවා. මේ සමාජය වෙනස් කිරීමේදී කලාවට, සාහිත්‍යයට කළ හැකි කාර්ය භාරය අතිමහත් කියලා අපි කවුරුත් පිළිගත යුතුව තිබෙනවා. ඒ නිසා සමාජය සුවපත් කිරීමේදී, ආධ්‍යාත්මික වශයෙන් මිනිසා පෝෂණය කිරීමේදී, ආධ්‍යාත්මික වශයෙන් මිනිසා ඉදිරියට ගෙන ඒමේදී අත්නොහළ හැකි වගකීමක් මේ ක්ෂේත්‍රයට පැවැරී තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

නිර්මාණකරුවකු සමාජය වෙත ගෙන යන තමන්ගේ නිර්මාණය පිළිබඳ සංකල්පය නිර්මාණකරුවාගේ මොළයේ ඇති වන්න පුළුවන්කම තිබෙනවා; ඔහුගේ සිත තුළ එය වර්ධනය වන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, එම නිර්මාණ සමාජය වෙත ගෙන යන ප්‍රධාන මාධ්‍යයන් කීපයක් තිබෙනවා. ඒ මාධ්‍ය අතරින් එකක් තමයි චිත්‍රපට මාධ්‍යය. මේ සමාජය වෙත එම නිර්මාණයන් ගෙන යන තව මාධ්‍යයක් තමයි, ටෙලි නාට්‍යය. ඒ වාගේම වේදිකා නාට්‍යය, පත පොත යනාදියත් තවත් මාධ්‍යයන්. ඒ වාගේම වීදි නාට්‍ය වැනි විකල්ප ධාරාවේ අංගෝපාංගද මේ නිර්මාණයන් සමාජය වෙත ගෙන යෑම වෙනුවෙන් උපයෝගි කරගෙන තිබෙනවා. සංගීතය ඇතුළු හැම ක්ෂේත්‍රයක්ම උපයෝගි කර ගන්නවා; විවිධ මාධ්‍යයන් උපයෝගි කර ගන්නවා මේ නිර්මාණ සමාජය වෙත ගෙන යන්න. දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ? චිත්‍රපටයක් වේවා; ටෙලි නාට්‍යයක් වේවා; වේදිකා නාට්‍යයක් වේවා; සංගීත ප්‍රසංගයක් වේවා; විකල්ප ධාරාවේ ක්‍රියා මාර්ග වේවා, ඒ මාධ්‍ය සියල්ල ක්ෂේත්‍රයක් හැටියට අද අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ඒවා ක්ෂේත්‍රයක් හැටියට අර්බුදයකට මුහුණ දී තිබෙනවා පමණක් නොවෙයි, එම ක්ෂේත්‍රයේ නිර්මාපකයන්ද, නිර්මාණකරුවන්ද විශාල අර්බුද ගණනාවකට මුහුණ දී සිටිනවා.

ඒ විතරක් නොවෙයි. නිර්මාණ රස විඳින ප්‍රේක්ෂකයනුත් අද තමන්ට සිදු වන විශාල අසාධාරණයකට, අයුක්තියකට මුහුණ දී සිටිනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රයත්, එහි නිර්මාණකරුවනුත්, ප්‍රේක්ෂකයනුත් ඇති වී තිබෙන මේ බෛදවාවකයෙන් මුදා ගැනීම වෙනුවෙන්, ගොඩ ගැනීම වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කරුණු එකින් එක තමුන්නාන්සේට කියන්නම්. අපේ රටේ එක මාධ්‍යයක් තමයි චිත්‍රපට කර්මාන්තය. එය ඉතා කුඩා එකක් බව අපි දන්නවා. අපේ රටේ දැවැන්ත චිත්‍රපට කර්මාන්තයක් නැහැ. ආසන්න වශයෙන් වසරකට චිත්‍රපට 20ක තරම් ප්‍රමාණයක් තමයි නිෂ්පාදනය වන්නේ. සිනමා හල් 150කට ආසන්න ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. වර්තමානය ගත්තොත්, වසරකට මිලියන 7කට, 7.5කට ආසන්න ප්‍රේක්ෂකයන් ප්‍රමාණයක් තමයි චිත්‍රපට ශාලාවලට ගිහින් චිත්‍රපට බලා තිබෙන්නේ. මෙය ප්‍රේක්ෂකයන් කුඩා ප්‍රමාණයක් සිටින, චිත්‍රපට කුඩා ප්‍රමාණයක් නිෂ්පාදනය කරන, චිත්‍රපට ශාලා කුඩා ප්‍රමාණයක් තිබෙන ක්ෂේත්‍රයක්. ඒ නිසා ලෝකයේ චිත්‍රපට කර්මාන්තයත්, චිත්‍රපට වෙළෙඳ පොළත් එක්ක සංසන්දනය කර බලන විට, අපේ රටේ තිබෙන්නේ කුඩා චිත්‍රපට කර්මාන්තයක්; කුඩා වෙළඳ පොළක්. ඒ වාගේම එය ඇකිළෙන වෙළෙඳ පොළක්.

එක කාලයකදී -80 දශකයේ මැද භාගය පමණ වන විට- අපේ රටේ සිනමා ශාලා විශාල ප්‍රමාණයක් තිබුණා අපට මතකයි. අද ඒ සිනමා ශාලාවලට අත් වෙලා තිබෙන ඉරණම මොකක්ද? මාතර "ක්‍රෝඩ්වේ" සිනමා ශාලාව අද Food City එකක්. තඹුත්තේගම "ඊගල්" සිනමා ශාලාව අද වී ගබඩාවක්. අනුරාධපුරයේ "විජේන්ද්‍රා" සිනමා ශාලාව, අද tuition කඩයක්. අම්බලන්තොට "සාලිය" සිනමා ශාලාව අද පොලීස් ස්ථානයක්. සංවර්ධනය වෙනවා නම්, වෙන්න ඕනෑකම තිබුණේ මොකක්ද? මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? රටක් සංවර්ධනය වෙනවා නම් තව කුඩා කුඩා චිත්‍රපට ශාලා ගොඩනැඟෙමින් සමාජයට එම මතයන්, එම නිර්මාණයන්, එම රස විඳීන්දනය ගෙන යා හැකි ප්‍රජාවක් ගොඩනැඟිය යුතුව තිබුණා. හැබැයි, සිදු වී තිබෙන දෙය වන්නේ ක්‍රමානුකූලව හැකිළෙමින් ක්ෂේත්‍රයක් හැටියට අද මෙය අර්බුදයට ලක් වෙමින් තිබීමයි. එම නිසා මෙම ක්ෂේත්‍රය මෙසේ කුඩාවීම හේතු කොටගෙන -අනිවාර්යයෙන්ම තමුන්නාන්සේලා හැම එකටම ගෙනෙන "ඉල්ලුම-සැපයුම" කියන වෙළෙඳ පොළ තර්කණය මේකට අදාළ නැහැ. මේක ඉතා කුඩා කර්මාන්තයක්; කුඩා වෙළෙඳ පොළක්. කුඩා කර්මාන්තයක්, කුඩා වෙළෙඳ පොළක් අධිකාරී කිහිපයක් යටතට පත් නොවෙන්න නම්, ඒකාධිකාරී නිර්මාණ බිහි නොවෙන්න නම් අනිවාර්යයෙන්ම රාජ්‍ය අංශයේ මැදිහත්වීමක් තුළින් මේ ක්ෂේත්‍රය පවත්වා ගත යුතුව තිබෙනවා. හැබැයි, ක්‍රමානුකූලව සිද්ධ වෙමින් තිබෙන දෙය තමයි, චිත්‍රපට කර්මාන්තය කෙරෙහි රාජ්‍ය දායකත්වය

[ගරු අනුර දිසානායක මහතා]

ක්‍රමානුකූලව හීන කරමින් තිබීම. රාජ්‍ය දායකත්වය එසේ හීන කරමින් චිත්‍රපට කර්මාන්තයේ සුක්කානම රාජ්‍ය අතේ නොතබා ගන්නා ප්‍රමාණයට එහි මෙහෙයවන්නා බවට, එහි හසුරුවන්නා බවට කුඩා ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයන් පත් වෙනවා. එවිට එම ක්ෂේත්‍රය කුඩා ව්‍යාපාරිකයන්ගේ, ව්‍යවසායකයන්ගේ වුවමනාවන් සපුරන ක්ෂේත්‍රයක් බවට පත්වීම වළක්වන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනිවාර්යයෙන්ම යම් ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුගේ ඒකාධිකාරයක් ලෙස චිත්‍රපට කර්මාන්තය නුදුරේදීම ගිල ගනු ලබනවා. ඒ නිසා වහා රාජ්‍ය මැදිහත්වීමක්, රාජ්‍ය හැසිරවීමක් සිදු කර මේ චිත්‍රපට ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

ලෝකයේ හැම ක්ෂේත්‍රයකම තාක්ෂණය වේගයෙන් වර්ධනය වෙනවා වාගේම, චිත්‍රපට කර්මාන්ත ක්ෂේත්‍රයේත් තාක්ෂණය වේගයෙන් වර්ධනය වෙමින් තිබෙනවාය කියන කාරණය අපි දන්නවා. අද මිනිසුන් සිනමා ශාලාවක චිත්‍රපටයක් බැලීමේදී වේවා, රූපවාහිනී නාලිකාවක් තුළින් ටෙලි නාට්‍යයක් බැලීමේදී වේවා, එහි හරය පසෙක තබා පළමුකොට ප්‍රධාන වශයෙන් බලන්නේ, එම නිර්මාණයේ තිබෙන ගුණාත්මකභාවය පිළිබඳවයි. එම නිර්මාණය මොන තරම් සුමට ලෙස තමන්ට බලන්න පුළුවන්ද, මොන තරම් තාක්ෂණයෙන් උඩට ඇවිල්ලා තිබෙනවාද, පින්තූර මොන තරම් පැහැදිලිද, එම නිර්මාණය මොන තරම් ආකර්ෂණයක් ගෙනැවිත් දෙනවාද කියලායි බලන්නේ. ඒක තමයි චිත්‍රපටයක, ටෙලි නාට්‍යයක පළමුවැනි ප්‍රවේශය වන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)

ගරු මන්ත්‍රීතුමා කියන කාරණයේ සත්‍යතාව පිළිබඳව මගෙත් පැහැදීමක් තිබෙනවා. නමුත් දිගින් දිගටම ඔබතුමාත් දකින්න ඇති, චිත්‍රපට ක්ෂේත්‍රය තුළ සිටින ජ්‍යෙෂ්ඨ කලාවේදීන් මාධ්‍ය හරහා නිරන්තරයෙන්ම කරනු ලබන චෝදනාවක් තිබෙනවා. ඒක තමයි ජාතික චිත්‍රපට සංස්ථාව හරහා මේ කටයුතු සිදුකිරීම සහ රාජ්‍ය මැදිහත් වීම නිසා චිත්‍රපට කර්මාන්තය බිඳ වැටෙනවාය කියන චෝදනාව. මෙතැන පරස්පර විරෝධතාවක් තිබෙනවා. ඔබතුමා කියන කාරණය මමත් පිළිගන්නවා. නමුත් ඒ ක්ෂේත්‍රයේ ඉන්න උදවියගේ තිබෙන චෝදනාව තමයි, රාජ්‍ය මැදිහත් වීම තුළ මේ චිත්‍රපට කර්මාන්තය -මේ කලා ක්ෂේත්‍රය- බිඳ වැටෙනවාය කියන එක.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නිර්මාණකරුවන් තුළ ඒ අදහස පැලපදියම් වෙලා තිබෙන එක අසාධාරණ නැහැ. මොකද, රාජ්‍ය මැදිහත් වීම උපයෝගී කර ගත් ආකාරය බැලුවොත් එහෙම හිතෙන්න පුළුවන්. තමන්ට හිතවාදී කණ්ඩායම් නිර්මාණය කර ගන්න, තමන්ට හිතවාදී කණ්ඩායම් ඉදිරියට ගෙන එන්න, තමන්ට හිතවාදී කණ්ඩායම්වලට ණය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ ඉතිහාසය අපි දන්නවා. ඒ නිසා රාජ්‍ය මැදිහත්වීම පිළිබඳව විවේචනයක් ගොඩනැඟිලා තිබෙන්නේ, මැදිහත් වීමේ ආකාරයේ තිබුණු දෝෂය හේතුකොට ගෙනයි. මොකද අපේ රටේ කුඩා කර්මාන්තයක් වුණොත්, එම කර්මාන්තය පිළිබඳව ව්‍යවසායකයන් කිහිප දෙනෙකු අතරේ ඒකාධිකාරීත්වයක් ගොඩනැඟීම වැළැක්විය හැකි වන්නේ අනිවාර්යයෙන්ම රාජ්‍ය මැදිහත්වීමකින් පමණයි. රාජ්‍ය මැදිහත්වීම පිළිබඳව විවේචනයක් තිබෙනවා නම්, එම විවේචනය ගොඩනැඟිලා තිබෙන්නේ මැදිහත්වීම පිළිබඳව නොවෙයි; මැදිහත් වුණු ආකාරය පිළිබඳවයි. එම මැදිහත් වීමේ ආකාරයේ තිබෙනවා, බරපතළ වැරැද්දක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්ෂේත්‍රයට ඇතුළත් වී තිබෙන තාක්ෂණය වේගයෙන් උකහා ගන්න අද අපි අසමත් වෙලා තිබෙනවා. සිනමා ශාලා ඩිජිටල්කරණය පිළිබඳව සාකච්ඡාවන් විශාල ප්‍රමාණයක් අවුරුදු ගණනාවක් තිස්සේ ඇදෙමින් තිබෙනවා. ඇමතිවරු යම් පොරොන්දු දුන්නා. ඒ ගැන මම මේ සභාවේ ප්‍රශ්නයක් ඇහුවා. මට මතකයි, මම ප්‍රශ්නයට අහන්නට නියමිතව තිබුණු දවසට කලින් දවසේ රැස්වීමක් තියලා කෙහෙලිය රඹුක්වැල්ල හිටපු අමාත්‍යවරයා ප්‍රකාශයක් කළා, මේක ලබන සතියේ පටන් ගන්නවා කියලා.

මේ පාර්ලිමේන්තුවේදී මා නැවත මේ ප්‍රශ්නය අහපු වෙලාවක විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යවරයා කිව්වා, ඒ සඳහා තමන්ගේ අමාත්‍යාංශයට මුදල් වෙන් කරලා තිබෙනවා, ඒක පටන් ගන්නවා කියලා. හැබැයි සිනමා ශාලාවක් ඩිජිටල්කරණය සඳහා ගොඩනැඟිලි හදනවා වාගේ, පාරවල් හදනවා වාගේ සැලකිය යුතු කාලයක් ගත වන්නේ නැහැ. මාසයකට ආසන්න කාලයකින් එම කාර්ය අවසන් කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි අපේ කර්මාන්තය පොඩිවීම නිසා එය මුළුමනින්ම චිත්‍රපට ශාලා හිමියෙකුට දරා ගන්න පුළුවන්කමක් නැහැ. එයට යනවා, යම් පිරිවැයක්. ඒ පිරිවැය දරා ගැනීමේ හැකියාවක් චිත්‍රපට කර්මාන්තයට නැහැ. මොකද අපේ චිත්‍රපට කර්මාන්තය දැවැන්ත කර්මාන්තයක් නොවන නිසා. අන්න එතැනදී තමයි ඩිජිටල්කරණ ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීම වෙනුවෙන් එම සිනමා ශාලාවන් සඳහා යම් සහායක් ලබා දිය යුතු වන්නේ.

ඔවුන්ගේ යෝජනාව තිබෙන්නේ ආධාරයක් දෙන්න කියන එක නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔවුන් සමහර අවස්ථාවල යෝජනා කරලා තිබෙනවා, ණය මුදලක් ලබා දෙන්න කියලා. ඒ ලබා දෙන ණය මුදල ප්‍රවේශ පත්‍රවල මිල ගණන් සංශෝධනයක් හරහා නැවත පියවීම සඳහාත් ඔවුන් සූදානම් බව ප්‍රකාශ කර තිබෙනවා. නමුත් ඒ සඳහා රජයක් හැටියට දක්වලා තිබෙන දායකත්වය පිළිබඳව ඉතා විශාල ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟ ගැටලුව තමයි බෙදා හැරීම හා ප්‍රදර්ශනයේ ඇති වී තිබෙන ගැටලුව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඕනෑම නිර්මාණයක් කළාට පස්සේ ඒ නිර්මාණකරුවාගේ අදහස තමයි, තමන්ගේ නිර්මාණය හැකි ඉක්මනින් ප්‍රේක්ෂකයා වෙත ගෙන යෑම.

හැබැයි, අද අපේ නිර්මාණකරුවන්ට තමන් කරන නිර්මාණය කවදා පෙන්වන්න සිද්ධ වේවිද, ඒ නිර්මාණය කවදා එළියට ඒවිද කියලා කිසිදු අදහසක් නැතිව නිර්මාණ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නිර්මාණ කියලා කියන්නේ මේ තිබෙන සමාජයෙන් වියුක්ත වුණු ඒවා නොවෙයි. මේ සමාජයේ සිද්ධ වෙන වලනයන්ම එක් එක් කෝණයන්ගෙන් දැකලා ඔවුන් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, නිර්මාණය සකස් කරන කොට තිබුණු සමාජය නොවෙයි, නිර්මාණය එළියට එන කොට තිබෙන්නේ. ඊට වඩා වෙනස් තත්ත්වයන් නිර්මාණය වෙලා තිබෙනවා. සමහර නිර්මාණ යල් පැනපු තත්ත්වයක් තිබෙනවා. සමාජයේ ඒ තිබුණු අවධිය පහු කරලා, ඒ තිබුණු කලබගෑනිය වෙනස් වෙලා තිබෙනවා. එතකොට තමන්ගේ නිර්මාණය එම පැරණි සමාජයත් එක්ක අනුබද්ධ නොවන නිර්මාණයක් බවට පත් වෙනවා. ඒ නිසා බෙදා හැරීම සහ ප්‍රදර්ශනය පිළිබඳව ගැටලුවක් අද මේ ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙනවා. මේකට ප්‍රධාන මණ්ඩල 05ක් තිබුණාට ඒ මණ්ඩල

ඒකාබද්ධ කරලා මණ්ඩල 03ක් ගොඩ නැඟිලා තිබෙනවා. චිත්‍රපටයක් හැදුවාට පස්සේ ඒ චිත්‍රපටය කවදා ද පෙන්වන්නේ, මොකක්ද පෙන්වන්නේ, මොකක්ද පෙන්වන අනුපිළිවෙළ කියන එක පිළිබඳව හෝ අදහසක් අද නිර්මාණකරුවාට නැහැ. ඒ නිසා මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර චිත්‍රපට රූගත කරමින් තිබෙන කොටම ප්‍රදර්ශනය සඳහා දින දෙන්න නියම වෙලා තිබෙනවා. හැබැයි සමහර චිත්‍රපට පෝලිමේ තිබෙනවා, ප්‍රදර්ශන දිනයක් පිළිබඳව අදහසක්වත් නැහැ.

අපට මතකයි, මීට පෙර රූහුම් පාලක මණ්ඩලයෙන් සහතිකය ලබා දුන් පසු ඒ ලබා දුන් දින වකවානු අනුව තමයි මෙය ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන පටිපාටිය සකස් වුණේ. අද එහෙම නොවෙයි. විශේෂයෙන්ම පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන සමාගම් චිත්‍රපටය දෙස බලන්නේ වාණිජමය ලෙසයි. තමන්ට මේක සාර්ථක කර ගන්න පුළුවන්ද, බැරිද කියන සාධකය තමයි බලන්නේ. එතකොට ඔවුන් වැඩියෙන් පෙළඹෙනවා, වාණිජමය වශයෙන් තමන්ට සාර්ථක කර ගන්න පුළුවන්කම තිබෙන නිර්මාණයකට වැඩි ප්‍රමුඛතාවක් දෙන්න. ඒ නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? අද මේවා ප්‍රදර්ශනය කිරීමේදී, බෙදා හැරීමේදී ඇති වී තිබෙන ගැටලුව බරපතළ වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම රූහුම් පාලක මණ්ඩලය හරහා ලබා දෙන සහතිකයට අනුව, දින වකවානු අනුව ක්‍රමවේදයක් සකස් කරන එක තමයි වඩාත් යෝග්‍ය. ඒකේ නොවුණොත් චිත්‍රපටයක් හැදුවාට, පෙන්වන්නේ කවදා ද කියලා දන්නේ නැහැ. පෙන්වන්න පුළුවන් වෙච්ච කියලා දන්නේ නැතිව චිත්‍රපටයක් හදනවා. ඒක කිසි සේත්ම සාධාරණ තත්ත්වයක් නොවෙයි.

ඊළඟට, මේ චිත්‍රපට ක්ෂේත්‍රයේ නිෂ්පාදකයාට මොකද වෙලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක කුඩු විකුණනවා වාගේ එකක් නොවෙයි. එහෙම නැත්නම් මේක හෝටල් කර්මාන්තය වාගේ එකක් නොවෙයි. චිත්‍රපටය බලන්න ප්‍රේක්ෂකයා එන්න ඕනෑ. ඒ නිසා නිෂ්පාදකයා මෙතැනදී අවදානමක් ගන්නවා. සමහර භාණ්ඩ තිබෙනවා, නිෂ්පාදනය කරපුවාම අනිවාර්යයෙන්ම විකුණන්න පුළුවන්. වත්තේ පොල් තිබෙනවා නම් පොල් කඩපුවාම විකුණන්න පුළුවන්. පොල් කඩන කෙනා දන්නවා පොල් කැඩුවාට ප්‍රශ්නයක් නැහැ, විකුණන්න පුළුවන් කියලා. මුහුදේ මාළු අල්ලන කෙනා දන්නවා මාළු ඇල්ලුවාට කමක් නැහැ, මාළු විකුණන්න පුළුවන් කියලා. හැබැයි, නිර්මාණයක් කරන කොට එම නිර්මාණය මොන තරම් ප්‍රමාණයකට ප්‍රේක්ෂකයා අතරට යාවිද, නැද්ද කියලා කියන්න බැහැ. ඒකේ අවදානමක් තිබෙනවා. නිෂ්පාදකයා මේ ක්ෂේත්‍රයට අවතීර්ණ වන කොට අවදානමක් ගන්නවා. ඒක අපි පිළිගන්න ඕනෑ. හැබැයි, මොකද වෙලා තිබෙන්නේ? නිෂ්පාදකයා ආරක්ෂා කර ගැනීම සඳහා තිබෙන වැඩ පිළිවෙළ ඉතාම දුර්වලයි.

නිෂ්පාදකයා ආරක්ෂා කර ගන්නේ නැතිව මේ කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න බැහැ. අද සිද්ධ වෙලා තිබෙන දේ තමයි, චිත්‍රපටයක් නිෂ්පාදනය කළාට පසුව චිත්‍රපටයේ නිෂ්පාදන වියදම වාගේම, එහි ප්‍රචාරක වියදමත් නිෂ්පාදකයා විසින් දරන්න සිදුවීම. හැබැයි, සිනමාශාලාවකින් ඔවුන්ට ලබා දීම සඳහා ප්‍රමිතිය සකස් කොට තිබෙන්නේ සියයට 45ක්. හැබැයි, සියයට 45ට වඩා අඩුවෙන්, සියයට 35ත් - 45ත් අතර ප්‍රමාණයක් තමයි නිෂ්පාදකයාට ලැබෙන්නේ කියලා අපි දන්නවා. ඕනෑම කෙනෙක් චිත්‍රපටයක් ණයට බලන්න එන්නේ නැහැයි කියලා අපි දන්නවා. යම් කෙනෙක් ප්‍රේක්ෂකාගාරයට ඇතුළු වන්නේ ටිකට් එකක් අරගෙනයි. එතකොට යම් කෙනෙක් ප්‍රේක්ෂකාගාරයට ඇතුළු වනකොටම කවුන්ටරයට සල්ලි ඇවිල්ලා අවසන්. ඒ නිසා ඒක විශාල කාලයක් පමා කරන්න ඕනෑ නැහැ. හැබැයි, දැන් සිද්ධ වෙලා තිබෙන දේ තමයි, සිනමාශාලාවෙන් නිෂ්පාදකයාට මුදල් ලබා දීම මාස හතර-පහ පමා කිරීම. එය කිසිසේත්ම සාධාරණ නැහැ. සමහර විට ඒ නිෂ්පාදකයා මේ චිත්‍රපටය කරලා තිබෙන්නේ බැංකු ණයක් අරගෙන. එහෙම නැත්නම් ඒ මුදල තමන්ගේ වෙන ව්‍යාපෘතියකට දමන්න තිබෙන මුදලක් වන්න පුළුවන්. එහෙම නැත්නම් අධ්‍යක්ෂවරයාගේ හිත හොඳකම නිසා, අධ්‍යක්ෂවරයාත් එක්ක තිබෙන යාළුකම නිසා, පෞද්ගලික සබඳතා නිසා තමයි සමහර අය චිත්‍රපට නිෂ්පාදන ක්ෂේත්‍රයට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා චිත්‍රපට නිෂ්පාදකයා අද මුහුණ දීලා තිබෙන ගැටලුව කෙරෙහි තමුන්නාන්සේලාගේ අවධානය යොමු කිරීමේ ඕනෑකම අද තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට වැදගත්ම දේ නව අධ්‍යක්ෂවරු සම්බන්ධ කරුණයි. මේ ක්ෂේත්‍රය පිළිබඳව නව අත් දැකීම් සහිතව තරුණ පරම්පරාව වර්ධනය වෙමින් ඉදිරියට එමින් තිබෙනවා. ඒක චිත්‍රපට කර්මාන්තය දෙස බැලුවොත් ඉතාමත් හොඳ ලකුණක්. හැබැයි, වැඩක් නැහැ. විවිධ ජාත්‍යන්තර අධ්‍යයන ආයතනවලට ගිහිල්ලා විවිධ හැදෑරීම් කරලා ඔවුන් චිත්‍රපටයක් හදනවා. නමුත්, මේ නව අධ්‍යක්ෂවරුන්ගේ චිත්‍රපටි තමයි අද පෝලිමේ හිර වෙලා තිබෙන්නේ. සමහර චිත්‍රපට පෝලිමේ ඉදිරියට එන්නේ අධ්‍යක්ෂවරයාට තිබෙන වටිනාකම අනුව කියලා මම ඉතා වග කීමෙන් කියනවා. නමුත්, සමහර චිත්‍රපට දේශපාලන මැදිහත් වීම් අනුවත් පෝලිමේ ඉදිරියට ආවා. හැබැයි, නව නිර්මාණ කරන අධ්‍යක්ෂවරුන්ට අද චිත්‍රපටයක් කරලා වසර ගණනාවක් තිස්සේ බලාගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙනවා, ඒ චිත්‍රපටය එළියට දෙන්න. තමන්ගේ පළමු චිත්‍රපටයම අවුරුදු හතරක්, පහක් ප්‍රමාදයට ලක් වනවා නම්, නව චිත්‍රපටයක් හදන්න පෙලඹෙන නව අධ්‍යක්ෂවරයකු ඉන්නවාද? එතකොට ඒ චිත්‍රපටයට ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාර බලා අලුත් චිත්‍රපටයක් නැවත කරන්න කොපමණ කාලයක් පමා වනවාද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා නව අධ්‍යක්ෂවරු මුහුණ දීලා තිබෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්ෂේත්‍රය මේ දූපතට සීමා කරලා තබා ගත යුතුය කියන ස්ථාවරයක අපි කිසිසේත් නැහැ. ඒ නිසා ලෝකයේ චිත්‍රපටි සාහිත්‍යයේ; කලාවේ සිද්ධ වන වර්ධනයන් උකහා ගැනීමේ ඕනෑකම අපට තිබෙනවා. අපේ සිනමාශාලාවක විදේශීය චිත්‍රපටයක් පෙන්වීම පිළිබඳව අපේ විරෝධයක් නැහැ. ඒ විශ්වීය භාෂාවන්. ඒක ලෝකය පුරා පරිහරණය වන්න ඕනෑ. ඒක ලෝකය පුරා ප්‍රේක්ෂකයන්ට එන්න ඕනෑ. ඒ පිළිබඳව විවාදයක් නැහැ. හැබැයි, දැන් සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? පිට රටවලින් අපට ගලාගෙන ආවේ මොනවාද? අපට ඉංග්‍රීසි චිත්‍රපට ආවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රූබි සිනමාශාලාවේ ඇති පෝස්ටරය බල බලා ඒ සිනමාශාලාව ඉදිරිපිටින් අම්මාටයි, තාත්තාටයි, දරුවන්ටයි එකට අත් වැල් බැඳගෙන යන්න බැහැ. අපට විදේශ චිත්‍රපට ගෙනාවා. කොම්පඤ්ඤ වීදියේ රියෝ සිනමාශාලාවේ ප්‍රදර්ශනය වන චිත්‍රපටයේ cut-out එක බල බලා ඒ සිනමාශාලාව ඉදිරිපිටින් අම්මාටයි, තාත්තාටයි, දරුවන්ටයි එකට යන්න බැහැ. මෙන්න ගෙනාපු චිත්‍රපටි. ලෝක සාහිත්‍යයේ චිත්‍රපටවල සිද්ධ වන මහා නැවුම් වර්ධනයන් අපි උකහා ගන්න ඕනෑ. හැබැයි, තමුන්නාන්සේලා ඉතාම බාල වර්ගයේ චිත්‍රපට ගෙනැල්ලා අපේ ප්‍රේක්ෂකයින්ගේ රස විඳීනය මොට්ට කරලා ඔවුන් රස විඳීනයෙන් මොට්ට කරන ලද ජනතාවක් බවට පත් කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ නිසා මේ ජාත්‍යන්තර චිත්‍රපටි ගලා ගෙන ඒම යම් ප්‍රමිතිකරණයකට ලක් කළ යුතුව තිබෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

අපේ අරමුණ විය යුත්තේ මොකක් හරි ඉංග්‍රීසි චිත්‍රපටයක්, නැත්නම් වෙනත් මොකක් හරි විදෙස් චිත්‍රපටයක් පෙන්වීම නොවෙයි. ලෝකයේ ඇති වී තිබෙන නව වර්ධනය අපේ සමාජය වෙත පෝෂණය කරන්න, සමාජය වෙත ගෙන යන්න අවශ්‍ය වන ඉඩකඩ තමයි අප නිර්මාණය කළ යුතු වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කටයුත්ත චිත්‍රපට සංස්ථාව නොකළත්, අපේ රටේ අධ්‍යාක්ෂවරු කළා. ඒ අනුව ඔවුන් මැදිහත් වෙලා වසර දෙකක් තිස්සේ ජාත්‍යන්තර සිනමා උළෙලක් පවත්වා ගෙන ගියා. එය තමයි, "The International Film Festival of Colombo." ඒක කළේ පසුගිය වසරට කලින් වසරේ සහ පසුගිය වසරේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ නව නිර්මාණ කරන අයට; ඒ ක්ෂේත්‍රයේ ඉන්න අයට; ප්‍රේක්ෂක ජනතාවට ලෝකයේ ඉතා ඉහළ ගුණාත්මකභාවයෙන් සකස් කරන ලද චිත්‍රපට බැලීමේ අවස්ථාවක් ඒ තුළින් ලැබුණා. හැබැයි, අධ්‍යාක්ෂවරුන්ගේ පෞද්ගලික වුවමනාව මත තමයි ඒ කටයුත්ත කර ගෙන ගියේ. නමුත්, ඔවුන්ගේ පෞද්ගලික වුවමනාව මත මේ කටයුත්ත කාලයක් තිස්සේ කර ගෙන යන්න බැහැ. ඔවුන් අවස්ථා දෙකකදී මේ කටයුත්ත කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවුරුද්දේ ඔවුන්ට ඒක කරන්න හැකියාවක් නැහැ. එය කළ යුතු වන්නේ චිත්‍රපට සංස්ථාව මැදිහත් වෙලායි. ඒක චිත්‍රපට සංස්ථාවේ වග කීමක්. චිත්‍රපට සංස්ථාව ඒ වගකීම අත් හැරලා තිබෙන්නේ ඇයි? ඒක අධ්‍යාක්ෂවරුන්ගේ පෞද්ගලික කාර්ය භාරයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, ඒ නිසා තමුන්නාන්සේ ඒ පිළිබඳව අවධානය යොමු කරාවි කියලා මම කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට අපේ රට මුහුණ දීලා තිබෙන දැවැන්තම බෙදවාචකය තමයි, "ටෙලි නාට්‍ය". අනෙක් සෑම ක්ෂේත්‍රයකටම වඩා ක්‍රමානුකූලව වර්ධනය වෙමින් තිබෙන ජනමාධ්‍යයට වැඩියෙන්ම බලපෑම් කිරීමේ ක්ෂේත්‍රය බවට අද පත් වෙලා තිබෙන්නේ "ටෙලි නාට්‍ය" කියලා අපි දන්නවා. මොකද, තමන්ගේ ගෙදර සාලයට එනවා, ඒ නිසා කැමති වුණත්, අකමැති වුණත් තමන්ට බැලීම සඳහා පෙලඹවීමක් ඇති කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි මේ ක්ෂේත්‍රයේ ඉන්න නිර්මාණකරුවන් අද විශාල අනතුරකට මුහුණ දී සිටිනවා. අද නිර්මාණකරුවෙකුට සිද්ධ වෙලා තිබෙනවා, කොන්ත්‍රාත් වැඩපළක වැඩ කරන මිනිසුන් බවට පත්වන්නට; පැයකට මෙච්චරයි, පැය දෙකට මෙච්චරයි, දවස් භාගයට මෙච්චරයි යන විධියට මෙහෙවර කරන්න. මේ මොකක්ද සිද්ධවෙලා තිබෙන්නේ? මේවා නිර්මාණද? මේවා නිකම් රොබෝවරු දාලා හදනවා වාගේ වැඩක්. මොකක්ද වෙලා තිබෙන්නේ? දවසටයි ගෙවන්නේ. නිර්මාණයට ගෙවන එකක් නොවෙයි. පැයට ගෙවන්නේ. අපේ ගම්වල තිබෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පැය භාගයක් කුඹුර කපන්න එන්න, මම මෙච්චර දෙන්නම්; පැය දෙකක් කුඹුර කපන්න එන්න, මම මෙච්චරක් දෙන්නම්;. දවස් දෙකක් අත්වැඩ දෙන්න එන්න මම මෙච්චර දෙන්නම්" කියා මෙහෙවර ලබා ගන්නා ක්‍රමයක්. ඒ ජාතියේ වැඩක් මේක. ඒ නිසා සාමාන්‍ය ශ්‍රමිකයාගෙන් මේ නිර්මාණශිලී ශ්‍රමිකයා වෙන් කර ගන්නේ කොහොමද? මෙය වෙන් කර ගන්න ඕනෑකම තිබෙනවා. ඔවුනුත් සාමාන්‍ය ශ්‍රමිකයන් බවට පත් වෙලා තිබෙනවා. ඔවුන් ඊට වඩා යම් නිර්මාණාත්මක දෙයක් තමයි ඇති කරනු ලබන්නේ. එයට අවශ්‍ය සාධාරණ මානසිකත්වයක් ගොඩ නැඟිය යුතුව තිබෙනවා. නමුත් ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද? ඔවුන්ගේ ආදායම බැලුවත්, ඔවුන්ගෙන් මෙහෙය ගන්නා ආකාරය බැලුවත් විශාල බෙදවාචකයකට අද ඔවුන් ලක් කර තිබෙනවා. එයට ප්‍රධාන හේතුවක් බවට මේ කාරණය පත්වී තිබෙනවා.

අප දන්නවා, මේ ක්ෂේත්‍රයේ කට කතා ඕනෑතරම් තිබෙන බව. ඒවා කට කතාම නොවෙයි; ඇත්ත. කල්පනා කර බලන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නිර්මාණ ශිල්පියෙකුට ටෙලි නාට්‍යයක් පෙන්වා ගන්න ඒ ඇමතිවරයාට රුපියල් පණස් දාහක් දෙන්නට සිද්ධ වෙනවා නම් මොකක්ද ඒ රට? නිර්මාණකරුවාට නාට්‍යයක් දාගන්න ඇමතිවරයාට ලිංගික අල්ලස් දෙන්න සිද්ධ වෙනවා නම්, මොකක්ද ඒ රට? මොකක්ද ඒ ඇමතිවරුන්ගේ තත්ත්වය? අපි තමුන්නාන්සේලාගෙන් අහන්නේ මෙයයි. ඇමතිවරයාගේ කාර්ය භාරය මේ දෙය මෙහෙයවා සමාජය පෝෂණය කිරීමයි. හැබැයි සිදු වී තිබෙන දෙය තමයි, ඇමතිවරයාට කප්පම් ගෙවන්නට සිදු වීම.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
ඒවා පරණ කාලයේ. දැන් කාලයේ නොවෙයි. [බාධා කිරීමක්] මේ ආණ්ඩුවේ නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු එස්. බී.නාවින්න ඇමතිතුමා කියනවා, පරණ කාලයේ ඒවා කියා. එතුමාත් හිටපු කාලයේ. මේ ආණ්ඩුවේ නොවෙයි. [බාධා කිරීමක්] මේ ආණ්ඩුවේ ඒවා තවම ආවේ නැතිව ඇති, බලමු. මම මේ කියන ඒවා ගැන කල්පනා කර බලන්න. ඇමතිවරයා ඉන්නේ ඒ ක්ෂේත්‍රය මෙහෙය වන්නටය; ඒ ක්ෂේත්‍රය කළමනාකරණය කරන්නට, ඒකට ප්‍රතිපත්ති හදන්නට, ඒ ක්ෂේත්‍රය වර්ධනය කරන්නට. හැබැයි ඒ අමාත්‍යවරයාම නාට්‍යයක් දමා ගැනීම වෙනුවෙන් රුපියල් පණස් දාහක් ඉල්ලනවා නම්, නාට්‍යයක් දමන්න ලිංගික අල්ලස් ඉල්ලනවා නම් මොකක්ද තත්ත්වය? ටෙලි නාට්‍යයේ එක කොටසකට රුපියල් පණස් දාහක් කප්පම් ඉල්ලනවා නම්, තමුන්නාන්සේලා කල්පනා කර බලන්න, මේ රාජ්‍යයන් මේ ක්ෂේත්‍රයේ ඇති කර තිබෙන විනාශයේ තරම. මම දන්නේ නැහැ, එය දැන් මොන තරම් ප්‍රමාණයකට ලිහිල් වෙමින් යනවාද කියන එක. අපේ රටේ සාමාන්‍යයෙන් ගත්තොත් නරක ආභාෂයන් continue වෙනවා.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
එහෙම වෙන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක එහෙම වෙන්නේ නැත්නම් හොඳයි. සාමාන්‍යයෙන් මම මේ කියන්නේ. පොදුවේ ගත්තොත් අපේ රටේ තිබෙන්නේ නරක ආභාෂයන් continue වෙන සමාජයක් කියන එකයි. හොඳ ආභාෂයක් ආවොත් ඒක ඉතා ඉක්මනින් අයින් වෙනවා.

මා නැවතත් කියනවා, අපි මේ ගෙන එන්නේ විදෙස් ටෙලි නාට්‍ය පිළිබඳව දුපත් සාකච්ඡාවක් කියා. විදේශීය නාක්ෂණයෙන්, නිර්මාණවලින් ඉහළ ටෙලි නාට්‍ය ලෝකයේ නිර්මාණය වෙනවා. ඒවා අපේ රටේ ප්‍රේක්ෂක ජනතාවටත් ලබා ගැනීම සඳහා මේ නාලිකාවලින් ඉඩප්‍රස්ථා ලබා දීම වරදක් නැහැ. හැබැයි අද සිද්ධ වෙලා තිබෙන්නේ ඒක නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නාලිකාවල ප්‍රධාන මාර්ගයක් බවට පත් වී තිබෙනවා, තමන්ට ආදායමක් උපයා ගැනීම. නාලිකාවලට විකුණන්න වෙන දෙයක් නැහැනේ. නාලිකා මුහුණ දෙන අර්බුදයත් අපි දන්නවා. ඔවුන්ට විකුණන්නට පුළුවන් වෙලා තිබෙන්නේ වෙළඳ දැන්වීම් විතරයි. වෙන ව්‍යාපාරයකට

භාණ්ඩයක් සාදා විකුණන්නට පුළුවන්. නාලිකාවකට පුළුවන් වෙලා තිබෙන්නේ වෙළෙඳ දැන්වීම් විකුණන්න විතරයි. ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කර ගන්න ඕනෑ. ඒ සඳහා යන වියදම අඩු කරගන්න ඕනෑ. අනෙක ආදායම උපයා ගැනීම වෙනුවෙන් වෙළෙඳ දැන්වීම් ගන්න ඕනෑ.මේ දෙක මත තමයි මේ සියලු රූපවාහිනී නාලිකා අද රඳා පවතින්නේ.

අප මේ කාරණය තේරුම් ගන්නට ඕනෑකම තිබෙනවා. රූපවාහිනී නාලිකා යොදවන ප්‍රාග්ධනය ඔවුන්ගේ වෙන්නට පුළුවන්. ඒ ආයතනයේ buildings ඔවුන්ගේ වෙන්නට පුළුවන්. ඒ ආයතනයේ කළමනාකරණය ඔවුන්ගේ වෙන්නට පුළුවන්. හැබැයි, ඔවුන් භාණ්ඩයක් නිෂ්පාදනය කරනවා නොවෙයි. ඔවුන් මේ රටේ පොදු ජනතාවට අයිති සංඛ්‍යාන උපයෝගී කර ගනිමින් ජනතාව වෙත මතයක් ගෙන යනවා. වෙන සෑම ව්‍යාපාරයකටම වඩා විශේෂයෙන් රූපවාහිනී නාලිකා ව්‍යාපාරය වෙනස්. ඒක සමාජයත් එක්ක බැඳීමක් තිබෙනවා. "සන්ලයිට්" හදනවා නම් කැමති කෙනා ගන්නවා, අකමැති කෙනා නොගෙන ඉන්නවා. බේකරිය පාන් හදනවා නම් කැමති කෙනා පාන් ගන්නවා, අකමැති කෙනා පාන් නොගෙන ඉන්නවා. මේක එහෙම නොවෙයි. රූපවාහිනී නාලිකා ව්‍යාපාරයේ තිබෙනවා, ජනතාවත් සමඟ අත්හරින්න බැරි අනුල්ලංඝනීය බැඳීමක්. ඒක අත් හරින්න බැහැ. හැබැයි, අද සිද්ධ වෙලා තිබෙන දෙය මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමන්ගේ වෙළෙඳ උපාය මාර්ගික වැඩ පිළිවෙළ අනුව අද හුගක් නාලිකාවල ටෙලි නාට්‍යය තීරණය කරන්නේ, ටෙලි නාට්‍ය පිළිබඳ තිබෙන විද්වත් සභාවක් විසින් නොවෙයි, marketing section එක විසින්. ඒ ආයතනයේ තිබෙන වෙළෙඳ අංශය තමයි නාට්‍ය තීරණය කරන්නේ. ඒ නාට්‍ය විකුණන්න පුළුවන්ද; කොච්චර විකුණන්න පුළුවන්ද; ඒ ටෙලි නාට්‍ය දමනවාද නැද්ද; තෝරනවාද නැද්ද කියන එක marketing section එකේ වැඩක් වෙලා තිබෙනවා. අද එතැනට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා දැන් ඒක තරගයක් බවට පත් වෙලා තිබෙනවා. රූපවාහිනී නාලිකා-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තමයි තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතන්නේ අප මේ විවාදය ටිකක් කලින් පටන් ගත්තා කියලා. පටන් ගන්න තිබුණේ පූර්ව භාග 11.30ටයි. දැනට ගිහිල්ලා තිබෙන්නේ විනාඩි 20යි. ඒ නිසා අපට කාලය ටිකක් ඉතිරි වුණා නේද? ඒ කියන්නේ අපි මේ විවාදය වේලාසනින් තමයි පටන් ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay. You may continue.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්ෂේත්‍රයේ විදෙස් ටෙලි නාට්‍ය පිළිබඳව යම් ප්‍රතිකර්මයකට ලක් කරන්න ඕනෑකම තිබෙනවා. යම් වර්ගීකරණයකට ලක් කළ යුතුයි. මා මේ කියන්නේ තහනම් කිරීමක් පිළිබඳව නොවෙයි. නමුත් වර්ගීකරණයකට ලක් කළ යුතුයි. ඒ වාගේම දේශීය ටෙලි නාට්‍යයත් අපි යම් වර්ගීකරණයකට ලක් කර "මේ නාට්‍ය මේ වර්ගීකරණයට අයත්, මේ නාට්‍ය මේ වර්ගීකරණයට අයත්" කියලා යම් සහතිකයක් ලබා දිය යුතුව තිබෙනවා. මේක මාගේ අදහසක් නොවෙයි. ඒ නිර්මාණ ශිල්පීන්ගෙන් ඇවිල්ලා තිබෙන අදහසක්. ඒ විධියට යම් වර්ගීකරණයකට ලක් කරන්න ඕනෑ කියලා ඔවුන් කියනවා. එහෙම වර්ගීකරණයකට ලක් වන නාට්‍යයකට අවම මිලක් කියන්න ඕනෑ. අද ඒ නිෂ්පාදකයන්ට, අධ්‍යක්ෂවරුන්ට නාට්‍යයක් හදා ගෙන, ඒ නාට්‍ය අර ගෙන නාලිකා පසු පස යන්න සිද්ධ වෙලා තිබෙනවා. එක්කෝ අයිතිකරු හඳුනනවාද කියලා අහනවා. එක්කෝ marketing section එකේ කවුරු හරි හඳුනනවාද කියලා අහනවා. එක්කෝ ඇමති හඳුනනවාද කියලා අහනවා. මොකක්ද, මේ සිද්ධ වෙලා තිබෙන්නේ. අර තෙල් බෙහෙත් වෙළෙන්දෝ වාගේ තමන් හදපු නාට්‍ය අර ගෙන නාලිකා පස්සේ යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ තත්ත්වය මඟ හැරලා හැම නාට්‍යයකටම යම් වෙළෙඳ පොළ වටිනාකමක් ලබා දෙන තත්ත්වයක් හදන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකද, ඒ සඳහා ඔවුන්ට යම් නිෂ්පාදන වියදමක් යනවා. නිෂ්පාදන වියදම තමන්ට උපයා ගන්න බැරි නම් ඔවුන්ගේ නිෂ්පාදනවල වියදම අඩු කරන්න ඕනෑ. මොකක් හරි නිර්මාණයක නිෂ්පාදන වියදම අනිවාර්යෙන්ම එහි ගුණාත්මකභාවයත් එක්ක රඳා පවතිනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රය පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් කලා මණ්ඩලය තිබෙනවා. ඒකට අනුබද්ධව - ඒකට යටත්ව- සාහිත්‍ය අනු මණ්ඩලය තිබෙනවා. එහෙම නැත්නම් නාට්‍ය අනු මණ්ඩලය තිබෙනවා. හැබැයි, ටෙලි නාට්‍ය සඳහා එවැනි අනු මණ්ඩලයක් හෝ මොකක් හෝ මණ්ඩලයක් නැහැ. ඒ නිසා ටෙලි නාට්‍ය නියාමනය සඳහා යම් මණ්ඩලයක් ගොඩ නැඟීම කෙරෙහි තමුන්නාන්සේලා අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ඒ අයගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීම පිළිබඳවත් කියන්න ඕනෑ. එක පැත්තකින් ඔවුන් වෘත්තීය මට්ටමකට ගේන්න ඕනෑ. ඒක රජයේ වගකීමක්. ඒ සඳහා අධ්‍යයන ආයතන ගොඩ නහන එක, ඒ සඳහා අවස්ථා සකස් කරන එක රජයේ වගකීමක්. ඔවුන් වෘත්තීයමය ක්ෂේත්‍රයේ වගකිව යුත්තන් බවට පත් කිරීම සඳහා තමුන්නාන්සේලා අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාමත් ප්‍රබල අපේ නිර්මාණකරුවන්ට අද සිද්ධ වෙලා තිබෙනවා, ඉන්දියානු ටෙලි නාට්‍යවලට හඬ කවන්න. ඒක තමයි බෙදවාවකය. අපට ඔවුන්ගේ කට හඬ ඇහෙන කොට අපි දන්නවා, මේ අසවල් නිළිය නේද, අසවල් නළුවා නේද කියලා. රටේ මහා ප්‍රභාවත් චරිතවලට අද සිද්ධ වෙලා තිබෙනවා, හඬ කවන ශිල්පීන්ගේ වෘත්තියට තල්ලු වෙන්න. රූපවාහිනී නාලිකාවල වැදගත්ම වේලාවට - වැදගත්ම belt එකට- අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ඒක විදෙස් ටෙලි නාට්‍ය විසින් ගිල ගෙන තිබෙනවා. ඒක එකක්. අනික් එක, ලාභය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැද සාලයට එන සමහර නාට්‍ය අපි දකිනවා. නැන්දම්මා ඉන්නවා, අභිංසක ලේලියක් ඉන්නවා, නොතේරෙන පුතා ඉන්නවා. ඒක තමයි නාට්‍යය. නැන්දම්මායි, ලේලියි රණ්ඩු වෙනවා. පුතාට මේක තේරෙන්නේ නැහැ. එක දවසක් සාරිය ඇඳගෙන රණ්ඩු වෙනවා, ඊළඟ දවසේ ගවුමක් ඇඳගෙන රණ්ඩු වෙනවා. අපේ ගෙවල්වල අය ඒක දිහා බලලා කියනවා, "අපේ ගෙදර වාගේම තමයි, රණ්ඩුමයි." කියලා. මොකක්ද, මේ නාට්‍යය? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි නාට්‍යයක් මැද සාලයේ ඉඳගෙන බලන්න අවශ්‍ය නැහැ. රූපවාහිනීය ඕනෑ නැහැ, කාමරයේ ඉඳගෙන නාට්‍යය අහන්න පුළුවන්. රේඩියෝවේ මුවන්පැලැස්ස නාට්‍යය අහනවා වාගේ

[ගරු අනුර දිසානායක මහතා]

කාමරයේ ඉඳගෙන අහන්න පුළුවන්. මෙවැනි තත්ත්වයක් තුළ අපේ රටේ ප්‍රේක්ෂක ජනයා කොතැනටද ගෙන යන්නේ? මේ නාලිකාවලට තමන්ගේ වෙළෙඳාම, තමන්ගේ ආයතනය පවත්වා ගෙන යෑම පිළිබඳව මූල්‍ය වගකීමක් තිබෙනවා. හැබැයි, නාලිකාවල තිබෙන සමාජ වගකීම අත් හරින්න එපාය කියලා අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඔවුන්ට සමාජ කාර්යයක් තිබෙනවා. සමාජ කාර්යය ඔවුන් ඉටු කළ යුතුව තිබෙනවා. මේ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන කඩා වැටීම නිසා අද නිර්මාණකරුවන්, නිර්මාණ ඒ වාගේම ප්‍රේක්ෂක ජනයා විශාල අර්බුද රැසකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්නය කියා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, වේදිකා නාට්‍ය ගැන බලමු. අපේ රටේ එක්තරා කාලයක සමාජ පෝෂණයේදී, සමාජ මත හැසිරවීමේදී වේදිකා නාට්‍ය විසින් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලැබුවා. වේදිකා නාට්‍ය බොහෝ විශ්වවිද්‍යාලවල සෞන්දර්යවේදීන්, රසාස්වාදයක් සහිත මිනිස් ප්‍රජාවක් ගොඩ නැඟීමට ඉවහල් වුණා. හැබැයි, අද අපේ රටේ කොළඹ නගරයේ වේදිකා නාට්‍ය නරඹන ස්ථානයකට ගිහින් බැලුවොත් අපට පෙනෙනවා, ඉතා සීමිත ප්‍රේක්ෂක සංඛ්‍යාවක් තමයි නාට්‍ය බලන්නේ කියලා. බොහෝ ස්ථානවල ශාලාව පිරෙන්න ප්‍රේක්ෂකයෝ ඉන්නවා. හැබැයි, ඒ පැතිරුණු කණ්ඩායමක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද නාට්‍යයක් බලලා, ඊළඟ දවසේ තව නාට්‍යයක් බලන්න ගියොත් අපට පෙනෙනවා, ඊයේ හිටපු ප්‍රේක්ෂක පිරිසගෙන් සියයට 20ක් හෝ සියයට 30ක් පමණයි ඉන්නේ කියලා. පැතිරුණු ප්‍රේක්ෂක පිරිසක් අද අපට නැහැ. අද සිටින ප්‍රේක්ෂක පිරිස කුඩායි. හැබැයි, ඒ ගොල්ලන් නාට්‍ය විශාල ප්‍රමාණයක් බලනවා. ඒකයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා රජයක් හැටියට කරන්න ඕනෑ එක දෙයක් තමයි, ප්‍රේක්ෂක ඝනත්වය වැඩි කිරීම. අද ඉතා සීමිත පිරිසක් තමයි වේදිකා නාට්‍ය බලන්නේ.

විශේෂයෙන් කොළඹ නගරය ගත්තොත් වේදිකා නාට්‍ය නරඹන පිරිස ඉතා සීමිතයි. යම් කෙනෙක් ලයනල් වෙන්ඩ්ට් රඟහලේ නාට්‍යයක් බලනවා අප දකින්නේ නැහැ. මොකද, වේදිකා නාට්‍ය නැරඹීම කුඩා කණ්ඩායමකට සීමා වෙමින් තිබෙනවා. ඒ නිසා පැතිරුණු ප්‍රේක්ෂක පිරිසක් වේදිකා නාට්‍ය නැරඹීම කෙරෙහි ගොඩ නැඟීම පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

ඊළඟට, අද කොළඹ නගරය ගත්තාම නාට්‍යයක් පෙන්වන්න හොඳ රඟහලක් නැති එක වේදිකා නාට්‍යකරුවන් ප්‍රධාන වශයෙන් මුහුණ දීලා තිබෙන ප්‍රශ්නයක්. ලුම්බිණි රඟහල අවුරුද්දකට ආසන්න කාලයක් තිස්සේ අලුත්වැඩියා කරමින් තිබෙනවා. එල්ෆින්ස්ටන් රඟහල කවදා හදලා අවසන් වේවිද දන්නේ නැහැ. අදවත් ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් උත්තරයක් ලබාදෙයිද කියලා මම දන්නේ නැහැ. උත්තරය දෙන්නේ මොන ඇමතිවරයාද කියලාත් මම දන්නේ නැහැ. එල්ෆින්ස්ටන් රඟහල දැන් අවුරුදු හතරකට ආසන්න කාලයක් තිස්සේ වසා දමා තිබෙනවා. ජෝන් ද සිල්වා සමරු රඟහලට මොනවා වේවිද දන්නේ නැහැ. එහෙම නම්, කොතැනකද වේදිකා නාට්‍ය පෙන්වන්නේ?

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ජෝන් ද සිල්වා සමරු රඟහලේ වැඩ සියයට 90ක් පමණ දැන් අවසන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ජෝන් ද සිල්වා සමරු රඟහල, ලුම්බිණි රඟහල, එල්ෆින්ස්ටන් රඟහල, ඊට පස්සේ අපට ඉතිරි වෙලා තිබෙන්නේ පෞද්ගලික අංශයේ තිබෙන ලයනල් වෙන්ඩ්ට් රඟහලක්, ටවර් හෝල් රඟහලක් පමණයි. ඊට පස්සේ mini theatres කීපයක් තිබෙනවා. ඔපමණයි අපට තිබෙන්නේ. කොළඹ නගරය අද ප්‍රමිතියෙන් යුතු රංගශාලා නැති ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. හැබැයි, කොළඹ නගරයට මේ තත්ත්වය නම්, පරිධියේ පිහිටි නගර මුහුණ දීලා තිබෙන තත්ත්වය මීට වඩා භයානකයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ අනුව අනුරාධපුරයේ නාට්‍යයක් පෙන්වන්නේ කොහේද, මොනරාගල නාට්‍යයක් පෙන්වන්නේ කොහේද, මන්නාරමේ නාට්‍යයක් පෙන්වන්නේ කොහේද? මේ හැම ප්‍රදේශයකම වාගේ නාට්‍ය පෙන්වන්නේ ඉස්කෝලයක තිබෙන ප්‍රධාන රඟහලේ. ඉස්කෝලයේ තිබෙන වැසිකිළිය වාගේම තමයි, ඉස්කෝලයේ තිබෙන රඟහලට අනුබද්ධ වැසිකිළියත්. නාට්‍ය ශිල්පීන්ට ගිහිල්ලා තමන්ගේ ඇඳුම මාරු කර ගන්න, තමන්ට නාට්‍යයක් පෙන්වන්න අවශ්‍ය මානසිකත්වය හදා ගන්න, තමන්ට වැසිකිළි කැසිකිළි යන්න සුදුසු තත්ත්වයක් නොමැති තැන්වලට ගිහිල්ලා නාට්‍ය පෙන්වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මේ වෙලා තිබෙන්නේ? නාට්‍යයේ තිබෙන හැම චරිතයම "හිඟන චරිතයක්" නම් ඒ තැන හොඳයි. නාට්‍යයේ තිබෙන හැම චරිතයකින්ම ඉන්දියාවේ වීදිවල සැරිසරන හිඟන්නන් පෙන්වීම නම් කරන්න තිබෙන්නේ ඒ හැම නාට්‍යයක්ම ඔය රඟහලේ පෙන්වන්න පුළුවන්. මොකද, ඔය වැසිකිළියත් ඒකට හොඳයි, ඔය කැසිකිළියත් ඒකට හොඳයි, ඒකට හොඳම පරිසර තත්ත්වය එතැන හදලා තිබෙනවා. හැබැයි, හොඳ නාට්‍යයක් පෙන්වන්න පුළුවන් රඟහලක් නැහැ. අඩුම තරමේ තමුන්නාන්සේලා මේ අවුරුද්දේ අය වැය ලේඛනයෙන්වත් මේ සඳහා මුදල් වෙන් කරන්න. මම කියන්නේ එක පාර හැම දිස්ත්‍රික්කයකම රඟහල් හදන්න කියලා නොවෙයි. ප්‍රධාන නගර කීපයකවත් රඟහල් හත-අටක් හදනවා කියලා තමුන්නාන්සේලා තීරණයක් ගන්න. ඒ සඳහා මුදල් වෙන් කරන්න. තමුන්නාන්සේලා අධිවේගී මාර්ගයක් හදන්න කොපමණ මුදලක් වෙන් කරනවාද? තමුන්නාන්සේලා වරායක් හදන්න කොපමණ මුදලක් වෙන් කරනවාද? සංවර්ධනය කියන්නේ ඒවා පමණක් නොවෙයි. තමුන්නාන්සේලාගේ ඔළුවේ සංවර්ධනය පිළිබඳව ගොඩ නැඟිලා තිබෙන අදහස් වෙනස් කර ගන්න. සංවර්ධනය කියන්නේ ගොඩනැඟිලි විතරක්ම නොවෙයි. සංවර්ධනය මිනිසුන්ගේ ආධ්‍යාත්මයත් එක්ක සම්බන්ධයි. මිනිසුන්ගේ ආධ්‍යාත්මය සංවර්ධනය නොවුණු සංවර්ධනයක් ඒ මිනිසුන්ට වැඩක් නැහැ. අපට එහෙම නේ වෙලා තිබෙන්නේ. අපට ගොඩනැඟිලි ඉතිරි වෙයි. අපට පාලම් ඉතිරි වෙයි. අපට පාරවල් ඉතිරි වෙයි. නමුත්, අපට සමාජයක් ඉතිරි වන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මහනුවර highway එකට කොපමණ මුදලක් වෙන් කළාද කියලා ඔබතුමා දන්නවා. හැබැයි, මහනුවර highway එකට වෙන් කරන මුදලින් සියයට එකක් රඟහල්වලට වෙන් කරන්නේ නැහැ නේ? තමුන්නාන්සේලාගේ ආකල්පය මොකක්ද? සංවර්ධනය කියන්නේ ගොඩනැඟිලිද, පාරවල්ද, මංමාවත්ද? සංවර්ධනය කියන්නේ ඒවා විතරක් නොවෙයි. මිනිස් සමාජය ආධ්‍යාත්මයෙන් පෝෂණය කිරීමකින් තොරව සමාජයක් පවතින්නේ නැහැ. අද සමාජයට ඇති වී තිබෙන බෙදවාචකය මේකයි. විශේෂයෙන්ම 1977න් පස්සේ අපේ සංවර්ධනය පිළිබඳ නිර්ණායක වෙනස් වුණා. ඒ අනුව සංවර්ධනය කියන්නේ ගොඩනැඟිලි බවට, සංවර්ධනය කියන්නේ පාරවල් බවට, සංවර්ධනය කියන්නේ ලයිට්, චතුර බවට ඒ නිර්ණායක වෙනස් වුණා. ඒවා අවශ්‍ය නැහැයි කියලා නොවෙයි මම කියන්නේ.

හැබැයි, ඒ හා සමගාමීව මිනිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහිත් අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඒ සියල්ල අත් හැරපු ගමනකට තමුන්නාන්සේලා යොමු වෙලා තිබෙනවා.

අය වැය ලේඛනය දිහා බැලුවාම පෙනෙනවා, අය වැය ලේඛනයේ මුළු ක්‍රියාවලියේම මොකක්ද තිබෙන්නේ කියලා. මුළු ක්‍රියාවලියෙන්ම වැඩිපුර අවධානය යොමු කරලා අය වැය ලේඛනය ගොඩ නැඟිලා තිබෙන්නේ, පාරවල්, මංමාවත් කෙරෙහියි. හැම ඇමතිවරයාම, හැම ජනාධිපතිවරයාම පුරාජේරු ගහන්නේ මොකක් කියලාද? ඒ අය, "මම පාරවල් හැදුවා. මම පාලම් හැදුවා" කියනවා. හැබැයි, "මම රහඟල් හැදුවා" කියලා කිසි කෙනෙක් කියනවාද? කවුරුවත් එහෙම කියන්නේ නැහැ. හිටපු ජනාධිපතිතුමාට "නෙළුම් පොකුණ රහඟල හැදුවා." කියලා කියන්න පුළුවන්. හැබැයි, ඒකේ නාට්‍යකරුවන්ට නාට්‍යයක් පෙන්වන්න බැහැ. ඒකේ ව්‍යාපාරිකයන්ට functions තියන්න පුළුවන්. රහඟලට පමණක් රුපියල් ලක්ෂ අටක් ඕනෑ. රුපියල් ලක්ෂ අටක් දීලා රහඟල අරගෙන නාට්‍යයක් පෙන්වන්නේ කොහොමද? ඔක්කෝම වියදම් එකතු කළොත් ඒ රහඟලට රුපියල් ලක්ෂ 10ක් පමණ යනවා. එතකොට එතැන නාට්‍යයක් පෙන්වන්න පුළුවන්ද? ඒ නිසා මේ රටේ වේදිකා නාට්‍ය කලාව "රහඟල් ප්‍රශ්නය" ප්‍රධාන ප්‍රශ්නය හැටියට මුහුණ දීලා තිබෙනවා. අඩුම තරමේ අපේ රටේ ප්‍රධාන නගර කීපයක්වත් තෝරා ගෙන රහඟල් ඉදිකිරීම සඳහා මෙවර අය වැය ලේඛනයෙන්වත් මුදල් වෙන් කරන්න කියලා තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලා සිටිනවා.

ගරු එස්.බී. නාවින්න මහතා
(මාණ්පුමිකු එස්.පී. නාවින්න)
(The Hon. S.B. Nawinne)
ලබන අවුරුද්දේ රහඟල් දෙකක් හදන්න මුදල් වෙන් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
දෙකක්. මොකක්ද, අප්පා! මගේ කථාව අහලා මේ සැරේ ඔක්කෝම කරන්නම් කියයි කියලා මම හිතුවා. මේ අනුව වැහිලා තිබෙන රහඟල් ප්‍රමාණය මට තේරෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
"නෙළුම් පොකුණ" වාගේ රහඟල් දෙකක් හදනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
අපි කියන්නේ ඒවා එපා කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙපමණ වෙලා මම කියපු ඒවාට හාත්පසින් වෙනස් දෙයක් කිව්වාම මම මොකටද මේවා කියන්නේ කියලා හිතෙනවා. මම කියන්නේ වේදිකා නාට්‍ය පෙන්වීම සඳහා කොළඹ තිබෙන ලුම්බිණි රහඟලේ, ජෝන් ද සිල්වා සමරු රහඟලේ, එල්ෆින්ස්ටන් රහඟලේ වැඩ කටයුතු ඉක්මනින් අවසන් වනවා නම්, කොළඹ නගරයේ තිබෙන රහඟල් සංඛ්‍යාව අපට කාලයකට ප්‍රමාණවත් කියලායි. හැබැයි, දැන් අපි යන්න ඕනෑ කොහේටද? ගමට. ගමට යන්න ඕනෑ.

ගරු එස්.බී. නාවින්න මහතා
(මාණ්පුමිකු එස්.පී. නාවින්න)
(The Hon. S.B. Nawinne)
කුරුණෑගලට.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඒ පළාත්වලට යන්න තමුන්නාන්සේ අවධානය යොමු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට මතකයි, ඉස්සර එව්.එම්. අෂ්රෝෆ් මැතිතුමා වරාය ඇමති වුණාම එතුමා ඔලුවිල්වල වරායක් හැදුවා. නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සෞඛ්‍ය ඇමති වුණාම සුනාමිය වෙනුවෙන් ලැබුණු ඉස්පිරිතාලයක් බදුල්ලේ හැදුවා. අඩුම තරමින් ඔබතුමා සංස්කෘතික කටයුතු ඇමති වුණු නිසා කුරුණෑගල හෝ වාරියපොල හෝ එක රහඟලක් හදන්නකෝ. ජාතික ප්‍රතිපත්තියක් ඕනෑ නැහැ, අඩුම තරමින් ඒ ප්‍රතිපත්තියට හෝ ගිහිල්ලා කුරුණෑගලවත් එකක්, දෙකක් හදන්න කියන එකයි මම තමුන්නාන්සේට කියන්නේ. ඒ විධියට මේ වැඩ පිළිවෙළ ව්‍යාප්ත කරන්න ඕනෑකම තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. විශේෂයෙන්ම නාට්‍ය ශිල්පීන්ගේ පුහුණුවීම සඳහා ආරම්භයක් වශයෙන් කොළඹට පුහුණු කිරීමේ තැනක් අවශ්‍යයි. විශේෂයෙන්ම බොහෝ නාට්‍ය හැදෙන්නේ කොළඹ කේන්ද්‍ර කරගෙන. ඒ අයට පුහුණු කිරීම් සඳහා විශාල කුලියක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා; පුහුණු කරන ස්ථාන නොමැති වෙලා තිබෙනවා. නාට්‍ය පෙන්වන ස්ථාන වාගේම පුහුණු කිරීමේ ස්ථානත් හදන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේ නාට්‍ය පුහුණු කිරීමේ මධ්‍යස්ථාන ටිකක් ගොඩනඟාවි කියා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නාට්‍ය කලාව ඉදිරියට ගෙන යෑමේදී ප්‍රේක්ෂක සංඛ්‍යාව ගොඩනැඟීම සඳහා පාසල් අධ්‍යාපනය අද අපට අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, අපි මොන නිර්මාණ කළත් වැඩක් නැහැ, රස වින්දනයක් සහිත ප්‍රේක්ෂකයන් හදන්නේ නැත්නම්. ගායකයා වේදිකාවට නැඟලා "අම්මට ..., අම්මට ..." කියන කොට ඉතුරු ටිකට අත් අල්ලන ප්‍රේක්ෂකයන් නම් ඉන්නේ, ඒක මේ රටට මොන ලජ්ජාවක්ද? කල්පනා කරලා බලන්න. අනෙක් පැත්තට හැරිලා ගායකයාට මොකක් හෝ එකක් කියන්න තිබුණා. හැබැයි, මොකක්ද කරන්නේ? අනෙක් අතට කාලය අල්ලනවා. ඔබතුමන්ලා මේ දවස්වල ඒක දකින්න ඇති. සමහර ඒවා මෙතැන කියන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැබැයි ගායකයන් එහෙම කියන එක ගැන මම පුදුම වෙන්නේ නැහැ. මොකද, මේ ඇමතිවරුත් මෙතැනදී ඔය වචනයම කිව්වා. මන්ත්‍රීවරුත් මෙතැනදී ඔය වචනයම කිව්වා. ඉතින්, හැම තැනම කුණුවෙලා තිබෙන අවස්ථාවක ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අවසාන වශයෙන් මෙන්න මේ කාරණයත් කියනවා. දැන් ඇතිවෙලා තිබෙන තත්ත්වය පිළිබඳව තමුන්නාන්සේලා මීට වඩා අවධානය යොමු කරලා මේ ක්ෂේත්‍රය වර්ධනය කිරීමත්, මේ ක්ෂේත්‍රයේ අනාගතය පිළිබඳව කල්පනා කරලා මේ ක්ෂේත්‍රය වඩාත් හොඳ දිශාවකට යොමු කිරීමත් කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා.

1965 දී සාහිත්‍ය සඳහා නොබෙල් ත්‍යාග ලබාගත් සෝවියට් දේශයේ අග්‍ර ගණ්‍ය සාහිත්‍යවේදී මිහායිල් ෂොලොහොව් එම ත්‍යාගය ලබා ගනිද්දී ඉතා වැදගත් ප්‍රකාශයක් කළා. එය මෙසේයි: "මානව වර්ගයාගේ බුද්ධියට හා හදවතට බලපෑම් කිරීමට සමත් විශිෂ්ට හැකියාවක් කලාව සතුව ඇත්තේය. මා අවංකවම අදහන පරිදි යමෙකුට තමා කලාකරුවෙක් යැයි හඳුනා ගැනීම සඳහා පූර්ණ හිමිකමක් ඇත්තේ, ඔහු මෙම ශක්තිය මිනිසුන්ගේ හදවත් තුළ අලංකාර ලෝකයක් නිර්මාණය කිරීම සඳහා යොදාගන්නේ නම් පමණි. මාගේ කෘති මානව වර්ගයාගේ සිත් සතන් වඩාත් නිර්මල කිරීමට, වඩාත් යහපත්වීම සඳහා මහ පෙන්වීමට ඉවහල්වන්නේ නම් මම ඒ පිළිබඳව හුදෙක්ම සතුටු වෙමි. එසේ

[ගරු අනුර දිසානායක මහතා]

මාගේ කෘති මඟින් තම සගයන් වෙත ආදරය දැක්වීමට, මානව වර්ගයාගේ අභිවෘද්ධිය උදෙසා සටන් වැදීමට මිනිසා පොලඹවනු ලබන්නේ නම් මම ඒ පිළිබඳව අවංකවම සතුටු වෙමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මගේ කථාව අවසන් කරන්නේ, "නිර්මාණකරුවන්ගේ නිර්මාණය සහ නිර්මාණකරුවන්ගේ ස්වාධීනත්වය" පිළිබඳ ප්‍රශ්නය අවධානයට යොමු කරමින්. අපි දන්නවා, නිර්මාණකරුවන්ට තමන්ගේම වූ දේශපාලනයක් තිබෙනවා කියලා. ඒ කිසිවෙකු කවර හෝ දේශපාලන වේදිකාවකට නැඟීම විවේචනයට ලක් නොවිය යුතුයි. ඒ, තමන්ගේ දේශපාලන දැක්ම. ඔහු නාට්‍යකරුවෙකු වෙන්න පුළුවන්; චිත්‍රපටකරුවෙක් වෙන්න පුළුවන්; වෙනත් නිර්මාණයක සිටින කෙනෙක් වෙන්න පුළුවන්, ඔහු මේ සමාජයේ පුද්ගලයෙක්. ඒ නිසා ඔහුට අනන්‍ය දේශපාලනයක් කිරීමේ අයිතිය තිබෙනවා. ඒ නිසා කවර හෝ රංගන ශිල්පියෙක් කවර හෝ දේශපාලන වේදිකාවකට නැංගායය කියා අපට ඔවුන් කෙරෙහි කිසිම දේශපාලන විවේචනයක් නැහැ. හැබැයි, අපට විවේචනයක් තිබෙනවා. ඔවුන් තමන්ට ගොඩනැඟී තිබෙන සමාජ වටිනාකම් ඉතා අඩුවට ලංසු තබමින් විකිණීම පිළිබඳව තමයි අපට ගැටලුවක් මතුවෙලා තිබෙන්නේ. දැවැන්ත කලාකරුවන්ට පත් වුණු ඉරණම අපි දැක්කා. ඒ පිළිබඳව අපට විවේචනයක් තිබෙනවා. හැබැයි, කිසිසේත් නිර්මාණකරුවෙකු දේශපාලනයෙන් වියුක්ත වී සිටිය යුතුයි කියා අපි කල්පනා කරන්නේ නැහැ. හැබැයි, අනියමින් ඒ බලපෑම තිබෙනවා. සමහර නාට්‍ය කණ්ඩායම්වල හිටපු අයට සිද්ධ වෙච්ච දේ තමුන්නාන්සේලාට මතක ඇති. ඔවුන් වෙනත් දේශපාලන වේදිකාවකට නඟින්න භයයි, තමන්ගේ නාට්‍ය ජාතික රූපවාහිනියේ විකාශය කරගන්න බැරිවෙයි කියලා. තව වේදිකාවකට නඟින්න භයයි, තමන්ගේ නාට්‍ය ITN එකේ විකාශය කර ගන්න බැරිවෙයි කියලා. මේවා ඉතිහාසයේ තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර නාට්‍යවල රඟපාන රංගන ශිල්පිනිය වෙනත් දේශපාලන වේදිකාවකට නැඟපුවාම ඒ නාට්‍යයෙන් ඇයගේ චරිතය අතුරුදහන් වෙනවා. මෙහෙම නාට්‍ය තිබුණු බව ඔබ දන්නවා. ඒ නිසා ඔවුන්ගේ නිර්මාණත්වයට තිබෙන ස්වාධීනත්වයට හානි කරන්න එපා. ඔවුන්ට දේශපාලනය කිරීමේ අයිතිය තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා ජාතික රූපවාහිනිය, ITN නාලිකාව උපයෝගි කර ගෙන, තමන්ගේ දේශපාලන හිතවාදීන්ට පමණක් ඉඩ කඩ විවෘත කරන තැන් බවට ඒවා පත් කරන්න එපා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
පසුගිය ආණ්ඩුවෙන් එහෙම කළේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඉතිහාසයේ ඒක සිද්ධ වෙලා තිබෙනවා. වර්තමානයේත් අපි ඉඳහිට දැක තිබෙනවා, සමහර ඒවා කැපෙන විධිය. අවශ්‍ය නම් ඒවා ගැන කියන්නම්. අපි දැකලා තිබෙනවා. ඒ නිසා නිර්මාණ ශිල්පියා බයෙන් ඉන්නවා. වෙනත් දේශපාලනයක, -ආණ්ඩුවත් එක්ක එකඟ නොවන දේශපාලනයක- වේදිකාවකට ගොඩ වදින්න බයයි; අදහසක් ඉදිරිපත් කරන්න බයයි. ඒ ඇයි? තමන්ගේ නිර්මාණය ප්‍රේක්ෂකයා වෙත ගෙන යන්න තිබෙන මාධ්‍ය තිබෙන්නේ ආණ්ඩුව අතේ නම්, ආණ්ඩුවේ මාධ්‍ය විසින් නිර්මාණකරුවාගේ ස්වාධීනත්වයට හානි කරනවා. ඒ නිසා නිර්මාණයේ ස්වාධීනත්වය පමණක් නොවෙයි, නිර්මාණකරුවාගේ ස්වාධීනත්වයත් ආරක්ෂා කිරීමට ගරු සංස්කෘතික කටයුතු ඇමතිතුමා කටයුතු කරයි කියා අප කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ සාහිත්‍ය ක්ෂේත්‍රයට පරිවර්තන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කළ සිරිල් සී. පෙරේරා ලේඛකයා ඊයේ-පෙරේදා අපෙන් සදහටම සමු ගත්තා. අපි කාටත් මේ සමාජය පිළිබඳව අලුතින් හිතන්න, සමාජය පිළිබඳ අලුත් දිශාවකින් කල්පනා කරන්න, ඔහු කරන ලද දායකත්වය ඉතාමත් වැදගත් කියා කල්පනා කරනවා. ඒ නිසා, ඔහුට අපේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ කලාකරුවන්ගෙනුත්, රටේ ජනතාවගෙනුත් මේ ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා. විශේෂයෙන්ම, 'ඉසෙර්ගිල් මැහැල්ල" කථාවේ මෙහෙම සඳහන්ව තිබෙනවා.

"අප කල්පනා කළ පමණින් පාරේ තිබෙන කළු ගල් ඉබේ ඉවත් වන්නේ නැහැ. අපි මේ කැලෑව මැදින් ඉදිරියට යමු. කොහේ හෝ මේ ඝන කැලෑවට අවසානයක් තිබෙන්නට ඕනෑ."

සහතිකයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඝන කැලෑවට කොහේ හෝ අවසානයක් තිබෙනවා.

හැබැයි, අපි නිකම් කල්පනා කරමින් හිටියාට, පාරේ තිබෙන කළු ගල් ඉබේ ඉවත් වන්නේ නැහැ. මේ කැලෑව මැදින්ම පීරන්න ඕනෑ. හැබැයි, අපි සහතික වශයෙන් දන්නවා, මේ ඝන කැලෑවට අවසානයක් තිබෙන බව. ඒ අවසානය වෙනුවෙන් සෑම දෙනාටම එකතු වන්නය කියන ආරාධනය කරමින් මම නතර වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කளின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. (Dr.) Nalinda Jayatissa to second the Motion. ඔබතුමන්ට විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
Sir, I will second the Motion now and speak later.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කளின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කளின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. Then, the Hon. S.B. Nawinne, please.

[අ.භා. 12.04]

ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේ සඳහන්, සංස්කෘතික විෂය, ඒ හා බැඳුණු ප්‍රශ්න හා එයට කළ යුතු දෑ සම්බන්ධ යෝජනාව ගැන පිළිතුරු දීමට මම කැමැතියි.

අනුර දිසානායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දක්වා ඇති පරිදි සමාජයේ බොහෝ ගැටලු පවතින බවත්, ඒ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා තිරසාර විසඳුම වන්නේ සංස්කෘතිය හා කලාව තුළින් සම්පූර්ණ මිනිසුන්ගෙන් පිරි ජන සමාජයක් ප්‍රතිනිර්මාණය කිරීම බවත් මා පිළිගන්නවා. ඒ සඳහා මේ වන විට ගෙන ඇති විවිධ ක්‍රියා මාර්ග සඳහන් කිරීමට මම කැමැතියි.

සංස්කෘතිය හා කලා කටයුතු තුළින් ඇති වන්නේ රසවින්දනය පමණක් නොවෙයි. එය රටේ ආර්ථිකයටත්, සමාජ ක්‍රමය වෙනස් කිරීමටත් යොදා ගත හැකි බව අප වටහා ගෙන සිටිනවා. ඒ නිසා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331න් 300කට ආසන්නව සියලුම කලාකරුවන් සම්බන්ධ කර ගනිමින්, ඊට අවස්ථාව සලසා දෙමින්, ප්‍රාදේශීය සංස්කෘතික බල මණ්ඩලයේ දිස්ත්‍රික් 25 තුළ දිස්ත්‍රික් සංස්කෘතික බලමණ්ඩල පිහිටුවමින්, විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනවා. උදාහරණයක් ලෙස ගත් කළ, අවර ගණයේ හරසුන් ගීත ජනගත වීම නිසා ඇති වී තිබෙන ප්‍රශ්න තේරුම් ගෙන, 50, 60, 70 දශකයේ ගායක, ගායිකාවන්ගේ සුභාවිත ගී දිස්ත්‍රික් මට්ටමට ගෙන යාමේ සංදර්ශන මාලාවක් මේ වන විටත් සංවිධානය කර තිබෙනවා. ශාලා පිරී ඉතිරී යන තරමටම ජනතාව මෙම වැඩසටහන් නැරඹීමට පැමිණෙනවා. ඇතැම් දිස්ත්‍රික්කවල රුපියල් ලක්ෂ 5ක, 6ක ආදායමක් ලබා තිබෙනවා. මේවායින් අපට තේරුම් ගත හැකි වන්නේ, යහපත් දේ මිනිසුන්ට ලබා දෙනවා නම්, මහ ජනතාව ඒවා රස විඳිනවා: වැළඳ ගන්නවා කියන එකයි. එකී ආදායම් සංස්කෘතික බලමණ්ඩල ආයෝජන තර කර, එමඟින් ප්‍රාදේශීය මට්ටමින් විවිධ වැඩසටහන් කිරීමට සැලසුම් කර තිබෙනවා. සංස්කෘතික මධ්‍යස්ථාන 185ක් පමණ ප්‍රාදේශීය මට්ටමෙන් ඉදි කර, විවිධ සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා.

ඊට අමතරව නිර්මාණකරුවන්ගේ නිර්මාණ ඇගැයීම සඳහා රාජ්‍ය උත්සව 15ක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පවත්වනවා. අද දවසේත් රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙනවා. ඇත්තම කිව්වොත් රාජ්‍ය සම්මාන උත්සව 11ක් තිබුණා. වියදම් පාලනය තුළ පවත්නා ප්‍රතිපාදනවලින්ම රාජ්‍ය සම්මාන උත්සව 15ක් මේ වසරේ අපි කරනවා. ඒ හැම දේකින්ම-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, -

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
මට තිබෙන්නේ සීමිත කාලයක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, ඔය කාරණයට සම්බන්ධ නිසා අහන්නේ. බාධාවක් කරන්න නොවෙයි. දැන් ඔබතුමා කිව්වානේ රාජ්‍ය උත්සව 15ක් කරනවා කියලා. නමුත් ඔබතුමා දන්නවා මෙවර රාජ්‍ය නාට්‍ය උළෙලට මොකක්ද වුණේ කියලා. ඒ රාජ්‍ය නාට්‍ය උළෙලේ නිර්මාණ ශිල්පීන්ට සිද්ධ වුණේත් නාට්‍යයක් පෙන්වන්නයි. ඔබතුමා දන්නවා ඒකට තිබුණු ගෞරවය, ඒකට තිබුණු අභිමානය සියල්ලම පසෙකලා-

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
ඇත්ත වශයෙන්ම රාජ්‍ය නාට්‍ය උළෙල අයිති මගේ අමාත්‍යාංශයට නොවෙයි. රාජ්‍ය නාට්‍ය උළෙල අයිති කලා මණ්ඩලයටයි. කලා මණ්ඩලය අයිතිව තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට. රාජ්‍ය නාට්‍ය උළෙල විෂය අයිති කලා මණ්ඩලයට.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට නාට්‍ය අයිති නැද්ද?

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
නාට්‍ය අයිතියි. නමුත් ඒ විෂය කලා මණ්ඩලයට ගිහින් තිබෙන්නේ. කලා මණ්ඩලයෙන් තමයි රාජ්‍ය නාට්‍ය උළෙල පැවැත්වූයේ.

රාජ්‍ය සම්මාන උත්සව 15ක් අපි මේ වසරේදී කරනවා. මේ හැම දෙයකින්ම නිර්මාණ ඇගැයෙනවා. පළාත් නවයේම සංස්කෘතික විෂය භාර අධ්‍යක්ෂවරුන් කැඳවා අපි ඔවුන් සමඟ සාකච්ඡා කළා. ඉදිරියේදී සංස්කෘතික විෂය භාර පළාත් අමාත්‍යවරුන් සමඟ ඒකාබද්ධව මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපි උත්සාහ කරනවා. මට දැනට අදාළ වන්නේ සංස්කෘතික විෂය යටතේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවත්, කෞතුකාගාර දෙපාර්තමේන්තුවත් පමණයි.

සංස්කෘතික විෂය වෙනුවෙන් 2016 වසරේ රුපියල් මිලියන 11,000ක පමණ මුදලක් වෙන් කර තිබෙනවා. රජයේ දායකත්වය නැහැයි කියලා කාටවත් කියන්නට බැහැ. නමුත් ප්‍රමාණවත් නොවන බව අපි පිළිගන්නවා. සංස්කෘතිය හා කලාව කියන්නේ ආදායම් උත්පාදනය කළ හැකි විෂයයන්. ඒ ගැනත් අපි මේ වන විට හිතලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ සංස්කෘතිය සම්බන්ධයෙන් දැනුම හා අවබෝධය වැඩි කිරීමට වැඩසටහන් මාලාවක් ඔක්තෝබර් මස 01වෙනි දා සිට 05වෙනි දා දක්වා "අපේ ගම" පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු සලසා තිබෙනවා. ඔබතුමන්ලාටත් මම ඒ සඳහා ආරාධනා කරනවා. එහිදී අපේ උරුමයන්, සූ සැට කලාවන් පාසල් දරුවන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට, පොදු මහ ජනතාවට දැක බලා ගැනීමේ අවස්ථාව ලැබෙනවා. ඇත්තටම මා දකින විශාල ගැටලුවක් වන්නේ අනභිභවනීය වූ අපේ සංස්කෘතික උරුමයන් හා හරයන් පරම්පරාවෙන් පරම්පරාවට නිශ්චිතව හා පැහැදිලිව පවරා දී නොතිබීමයි. මේ සංස්කෘතික හා කලා ප්‍රදර්ශනයෙන් අප බලාපොරොත්තු වන්නේ අපේ සංස්කෘතිය ගැන අවබෝධයක් හා දැනුමක් ජනතාව තුළ ඇති කිරීමයි.

[ගරු එස්.බී. නාවින්න මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාටත් මතක ඇති අපි කුඩා කාලයේදී පෙළ පොතට වඩා ඉගෙන ගත්තේ සමාජය තුළ ජීවත් වීමයි. පුද්ගලයකු ගොඩ නැඟෙන්නේ ඔහු අත්පත් කර ගනු ලබන අත් දැකීම්, පළපුරුදු, කළ පුරුදු, දැක පුරුදු, අහ පුරුදු හා හුරු පුරුදු සමඟයි. අපි වර්තමානයේදී දකින මේ සියලු ප්‍රශ්න විසඳීම සඳහා මෙකී සමාජ පරිවර්තන කාර්ය භාරය මවු කුසේ සිටම සිදු කළ යුතුයි. ඒ නිසාම අපි "අපේ සොඳුරු පවුල" හා "ජීවත් වීමේ කලාව" නමින් විද්‍යානුකූල දැනුමක් ලබා දෙමින් සෞන්දර්යය හා ඒකාත්මිකවීමේ වැඩසටහන් මාලාවක් හඳුනාගෙන ක්‍රියාත්මක කරන්නට මූලික කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, අලුතෙන් විවාහ වන අය, ගැබිනි මවුවරුන්, පෙර පාසල් ගුරුවරුන්, පෙර පාසල් දරුවන්ගේ දෙමවුපියන්, පාසල් ගුරුවරුන්, තනි මා පිය පවුල්, තරුණයන් හා තරුණියන්, දහම් පාසල් ගුරුවරුන්, දරුවන් හා වැඩිහිටියන් සඳහා වැඩසටහන් මාලාවක් අදාළ ඒ ඒ අමාත්‍යාංශ සමඟ එකතු වී ක්‍රියාත්මක කිරීමට මා පෞද්ගලිකව මැදිහත් වී මූලික සාකච්ඡාවක් සිදු කර එහි ව්‍යාපෘති වාර්තාව ගැන අතිගරු ජනාධිපතිතුමා සමඟත් මේ වන විට සාකච්ඡා කොට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්නට උත්සාහ කළේ කලා ක්ෂේත්‍රයට හා කලාකරුවන්ට අවශ්‍ය පහසුකාරකයන් ලෙස කටයුතු කිරීම මෙන්ම ඊට එහා ගිය වපසරියක් තුළ පැහැදිලි දර්ශනයක් තුළ කටයුතු කිරීමට අප මැදිහත් වී තිබෙන බව සඳහන් කිරීමටයි. ඇත්තෙන්ම දශක ගණනාවක සිට සිදු වන සමාජ බාදනය කෙටි කාලයකින් යථා තත්ත්වයට පත් කළ නොහැකියි. ඒ සඳහා සියලු පෞද්ගලික මතිමතාන්තරවලින් බැහැරව සැබෑ වූ හෘදයංගම බවකින් මෙම විෂය හා බද්ධ විය යුතුය. අපගේ අපේක්ෂාව වන්නේ කලාකරුවන්ට හා නිර්මාණකරුවන්ට පහසුකාරකයන් ලෙස පෙනී සිටීම පමණක් නොව ඉහළ යන සමාජයක් බිහි කිරීමයි. ඒ සඳහා මේ වන විටත් බිම් මට්ටමේ, ගම් මට්ටමේ රස වින්දන වැඩසටහන්, ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් මෙන්ම, ගමින් ගමට ගොස් ප්‍රොජෙක්ටර් මඟින් චිත්‍රපට පෙන්වනවා, රූකඩ සන්දර්ශන පවත්වනවා කවි මඩු වැනි වැඩසටහන් පවත්වනවා. ලබන වසරේදී මේ වැඩසටහන් අඛණ්ඩව හා විධිමත්ව ක්‍රියාත්මක කිරීමට අප බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැනට රූපවාහිනී මාධ්‍ය ඔස්සේ විකාශනය වන විදේශීය නාට්‍ය නිර්මාණ අතර අතරමං වුණු නරඹන්නන් පිරිසක් සිටින බව මමද පිළිගන්නවා. ඒ විතරක් නොවෙයි, පොදු ප්‍රවාහන සේවය තුළද රූපවාහිනී තිර භාවිත කරමින් පහත් රස වින්දනය සහිත නිර්මාණ ජනතාවගේ අකැමැත්තෙන් ජනගත වන ආකාරය දැකගන්න තිබෙනවා. අප මෙවන් කරුණු සඳහාද විසඳුම් සොයමින් සිටිනවා. රූපවාහිනී සම්මාන උළෙලවල් මඟින් උසස් රස වින්දනය සහිත වැඩසටහන් තෝරා සම්මාන ලබාදෙන්නේ මෙම ක්ෂේත්‍රයේ නියැලුණු උසස් නිර්මාණකරණයේ නිරත කලාකරුවන් දිරිමත් කිරීමටයි. මේ වසරේ සිට අප සුභාවිත ගීත තැටියක් සකසා පොදු ප්‍රවාහන සේවා සඳහා ලබාදීමට සැලසුම් කර තිබෙනවා. "විනීත රියැදුරු සතිය" නමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අප කළ වැඩසටහනේද මූලික අරමුණ වූයේ උසස් නිර්මාණකරණය හා රස වින්දනය ජනගත කිරීමයි. "දොළොස්මහේ පහන" නමින් අප විසින් කරන මාසික වැඩසටහන් මඟින් විෂය ක්ෂේත්‍ර 12ක් ආවරණය වන පරිදි ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා මෙම වැඩසටහන් අප බිම් මට්ටමටද ගෙන ගොස් තිබෙනවා. මේ අතර ජාත්‍යන්තර දින සැමරුම් උත්සව, කලාකරු ආධාර, ලේඛක ආධාර, කලායතන, විභාග ආදී වශයෙන් වැඩසටහන් රාශියක් පවත්වාගෙන යමින් කලාකරු සුබසාධනය හා කලාවේ උන්නතිය උදෙසාම විශේෂිත වූ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනවා. මේවා ක්‍රියාත්මක කිරීම මඟින් කලාකරුවන්ගේ මෙන්ම කලාවේ සංවර්ධනයත් ඇති වනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංස්කෘතිය යනු කලාව පමණක් නොවන බව මා විශ්වාස කරනවා. මේ අනුව අපගේ සංස්කෘතියට අදාළ තවත් බොහෝ දේ නැවත ජනගත කිරීමටත්, අභාවිතව ඇති එම වටිනා දායාද මතු පරපුරට උරුම කර දීමටත් කටයුතු ක්‍රියාවට නංවා තිබෙනවා. දේශීය ආහාර සංස්කෘතිය යළිදු ජනගත කිරීමේ වැඩසටහන් ඒ සඳහා උදාහරණයක් වශයෙන් සඳහන් කරන්න පුළුවන්. මෙහිදී අභාවිතව ඇති අපේ ආහාර, සංස්කෘතිකමය වශයෙන් වැදගත් ආහාර, පාන වර්ග, රසකැවිලි වර්ග ආදිය ජනගත කිරීමේ වැඩසටහන් පෙන්වා දෙන්න පුළුවන්. මේ යටතේ "කෙතයි බතයි අපේකමයි" නමින් ආරම්භ කළ වැඩසටහන මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා බිම් මට්ටම දක්වා ගමන් කර තිබෙනවා. පසුගිය වසරේදී දේශීය ආහාර සැකසීමේ තරගාවලියක්ද පැවැත්වුවා. මේ ආකාරයට දේශීය ආහාර සංස්කෘතිය, පාරම්පරික ඥානය ආදිය නඟා සිටුවීමේ රාජ්‍ය ජයභූමි හා ජනකලා උපදේශක මණ්ඩලය යනුවෙන් නව උපදේශක මණ්ඩලයක් පිහිටුවා අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් සිටිනවා. මේ වන විට ජන සංගීත ඒකකය මඟින් අපගේ එම උරුමය පිළිබඳ තොරතුරු එක් රැස් කර ඒවා ආරක්ෂා කිරීමේ කටයුතුද ක්‍රියාත්මක කර තිබෙනවා.

රටක් වශයෙන් මුහුණ දීමට සිදුවන යම් යම් ගැටලු සංස්කෘතිය භාවිත කර විසඳීමට හැකියාව පවතිනවා. මා ඊට උදාහරණයක් කියන්නම්. ජාතීන් අතර සාමය හා සහජීවනය ඇති කිරීමට සංස්කෘතික විවිධත්වය හා විචිත්‍රත්වය යොදා ගැනීමට පුළුවන්. අපේ රටේ ජනවර්ග 18ක් වාසය කරනවා. මේ වන විට එම ජන වර්ගවල භාෂාව, සාහිත්‍යය, ජන ගීය, ජන කථා කලාව, ඇඳුම් ආයිත්තම් මෙන්ම පාරම්පරික ඥානය පිළිබඳවත් අප සුවිශේෂ පර්යේෂණයක් කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංස්කෘතියට හා සදාචාරයට දැඩි බලපෑම් එල්ල වන නිර්මාණ බිහිවීම අද සුලබව දක්නට ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ සම්බන්ධව අපේ දෙපාර්තමේන්තුවේ උපදේශක මණ්ඩලය සමඟ සාකච්ඡා කර තිබෙනවා. සදාචාර විරෝධී මෙවන් නිර්මාණ සඳහා නෛතික රාමුවක් සැකසීමට අප සියලු කටයුතු සූදානම් කරමින් සිටිනවා. සංස්කෘතිය හා කලාව කියන ක්ෂේත්‍රයේදී රසවින්දනය මූලික කර ගත්තත්, රටක ආර්ථික සංවර්ධනයට හා මානව සංවර්ධනයට සංස්කෘතිය හා කලාව මඟින් ලබා දිය හැකි දායකත්වය විශාලයි. නිදහස් අරගළයේදී නිදහස දිනා ගැනීම වෙනුවෙන්, කවියන්, සාහිත්‍යධරයන් විශාල සේවාවක් කළ බව මා මේ අවස්ථාවේ සිහිපත් කරනවා. රටකට අවශ්‍ය ආර්ථික සංවර්ධනයට සංස්කෘතිය හා කලාව දායක කරගත් ක්‍රමවේදයක් තිබෙනවා. මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමට පවා අපගේ සංස්කෘතිය හා කලාව භාවිත කිරීමේ හැකියාව තිබෙනවා.

ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා කලාව විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගැනීමේ පහසුම මාර්ගයක් ලෙස යොදා ගැනීමට හැකි බවත් මා දකිනවා. ඒ සඳහා අභාවිතව ඇති ශිල්පීය ඥානය යොදාගත හැකියි. මෙවන් සංස්කෘතිමය වටිනාකම් ආරක්ෂා කර නව පරපුරටත්, ඉදිරි අනාගතයටත් දායාද කර දීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතිනවා.

විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමා මතක් කරපු කාරණා කිහිපයක් සම්බන්ධවත් කියන්න කැමැතියි. පසුගිය කාලයේ ටෙලි නාට්‍ය සම්බන්ධව සිද්ධ වූ, ඔබතුමා කියපු සියලු දේවල් මම පිළිගන්නවා. මොකද, මුදලට තමයි ඒ කටයුතු වුණේ. මුදලක් නැත්නම් තමන්ගේ ටෙලි නාට්‍ය රාජ්‍ය නාලිකා තුළවත් ඉස්සරහට දමා ගන්න පුළුවන්කමක් ඇති වුණේ නැහැ. හැබැයි, මේ ආණ්ඩුව යටතේ එවැනි දේවල් නොවන බව මම ස්ථිරවම ප්‍රකාශ කරනවා. මොකද, කලාව ගැන හොඳ දැනීමක් ඇති කෙනෙක් තමයි අපේ ජනමාධ්‍ය අමාත්‍යතුමා. ජනමාධ්‍ය මගේ අමාත්‍යාංශයේ කොටසක් නොවෙයි. නමුත් එතුමා ඒ කාර්ය හරියාකාරව කරන බව මතක් කරන්න ඕනෑ.

ඔබතුමා කියන චිත්‍රපට කලාව ගත්තොත්, පසුගිය කාලය තුළ බොහෝදුරට අපේ පැතිවල තිබූ චිත්‍රපට ශාලා ක්‍රමානුකූලව අඩු වෙමින් ගියා. ඒකට එක හේතුවක් තමයි හරියාකාර නිර්මාණ නැති වීම. අනෙක් එක තමයි, ලංකාවේ ටෙලි නාට්‍ය වැඩියෙන් ඇති වීම. හුහක්දුරට උදේ සිට රෑ වනතුරු - පැය 24 පුරාම - හැම channel එකේම මොකක් හෝ ටෙලි නාට්‍යයක් පෙන්වනවා. විශේෂයෙන් අපේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ සම්බන්ධව අපට උපදෙස් දීම පිළිබඳව. ඒ වාගේම අඩුපාඩු තිබෙනවා නම්, ඒවා ලබන වසර වෙනකොට නියමාකාරයෙන් සකස් කිරීමටත් මම බලාපොරොත්තු වනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා දීර්ඝ කථාවක් කළා. හවස සාහිත්‍ය උළෙලේදී කරන්න හිටපු කථාව නොවෙයි නේද?

ගරු එස්.බී. නාවින්න මහතා
(මාණ්පුමිකු එස්.පි. නාවින්න)
(The Hon. S.B. Nawinne)
නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
මම හිතුවා, ඒ කථාවද කියලා.

ගරු ඇමතිතුමනි, අපි ඉදිරිපත් කරපු අදහස් ටිකක් තිබෙනවා. ඔබතුමා කැමැති නම්, ඒ නිර්මාණ ශිල්පීන්ට සහ අපට එකතු වෙලා මේ කටයුතු කරන්න පුළුවන්. ගරු ඇමතිතුමා දන්නවා, මේක ආණ්ඩුවක කාර්ය භාරයක් විතරක්ම නොවෙයි, සමාජයේ අපි කාගේත් වගකීමක් බව. ඒ නිසා, ඇතිවී තිබෙන මේ ගැටලු ටික නිරාකරණය කර ගැනීම සඳහා යම් ක්‍රමවේදයක් හදන්න ඔබතුමාගේ පැත්තෙන් එකඟතාවක් තිබෙනවාද? කොහොමද අපි ඒක කරන්නේ?

ගරු එස්.බී. නාවින්න මහතා
(මාණ්පුමිකු එස්.පි. නාවින්න)
(The Hon. S.B. Nawinne)
ඔබතුමන්ලාගේ කාර්යාලයේ ඉන්නවා පුද්ගලයෙක්. මට දැන් එතුමාගේ නම හරියට මතක නැහැ.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට එතුමාගේ නම මතකද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ප්‍රේමරත්න මහත්තයා.

ගරු එස්.බී. නාවින්න මහතා
(මාණ්පුමිකු එස්.පි. නාවින්න)
(The Hon. S.B. Nawinne)
අන්න හරි. ප්‍රේමරත්න මහතා අපිත් එක්ක බොහොම එකතුයි. අපේ අමාත්‍යාංශයෙන් තමයි එතුමාගේ සියලු කටයුතු වෙන්නේ. ඒ අනුව අපට එතුමා සමඟ එක්කාසු වෙලා වැඩ කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
නිශ්චිත ගැටලු තිබෙනවා නේ.

ගරු එස්.බී. නාවින්න මහතා
(මාණ්පුමිකු එස්.පි. නාවින්න)
(The Hon. S.B. Nawinne)
ඒවා අපට විසඳා ගන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
මේ නිශ්චිත ගැටලු ටික විසඳන්න ඕනෑ. ඒ කියන්නේ, ටෙලි නාට්‍ය මුහුණ දීලා තිබෙන ගැටලු, චේදිකා නාට්‍ය මුහුණ දීලා තිබෙන ගැටලු වශයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ලබා දුන් කාලය අවසන්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාර්යයේ අවසානයක් තිබෙන්න ඕනෑ නේ. තව අපේ වෙලාවත් තිබෙනවානේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
අපි 12.30 p.m. Sittings suspend කරන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට වෙන් කර තිබෙන වේලාවෙන් අඩු වුණාට කමක් නැහැ.

මම කියන්නේ මේකයි. මේ ගැටලු ටික තිබෙනවා. අවස්ථා ගණනාවක මේ ගැටලු වෙනුවෙන් සමීති හැදිලා තිබෙනවා; ඇමතිවරු මුණ ගැසී තිබෙනවා; සාකච්ඡා සභා පවත්වා තිබෙනවා; පාර්ලිමේන්තුවේ කියා තිබෙනවා. ඒ වාගේම අපට තවත් ඕනෑ තරම් ඒ ගැන කථා කරන්න පුළුවන්. හැබැයි, අපි අඩුම තරමින්

[ගරු අනුර දිසානායක මහතා]

තෝරා ගත් ප්‍රශ්නවලින්, මේ ප්‍රශ්න ටික අපට ඉක්මනින් විසඳන්න පුළුවන්, මේ ටික අපට තව අධ්‍යයනය කරලා විසඳන්න පුළුවන්, මේ ටික අපට කොහොමත් කරන්න බැහැ කියලා මොකක් හෝ තීරණයක් අරගෙන අපි මේ කටයුත්ත අවසන් කළ යුතුයි. ගරු ඇමතිතුමනි, ඒ සඳහා තිබෙන යාන්ත්‍රණය මොකක්ද?

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. පාර්ලිමේන්තුවේදී වුණත් අපට සාකච්ඡා කරලා විසඳන්න පුළුවන්කම තිබෙනවා. පාර්ලිමේන්තුවෙන් පිට වුණත් විසඳා ගැනීමට පුළුවන්කම තිබෙනවා. ඒ ඕනෑ අවස්ථාවකට මම සූදානම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

මීළඟට, ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 12.21]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Parliamentary Reforms and Mass Media)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳ වූ මේ විවාදයට සම්බන්ධ වීමට ඉඩ ලැබීම ගැන මට සතුටක් තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. මේ යෝජනාවේදී සහ එතුමාගේ කථාවේදී ඉදිරිපත් කරපු බොහෝ කරුණු සම්බන්ධයෙන් අපේ ප්‍රසාදය පළ කරන අතර, ඒ කරුණු ගැන අපේ එකඟත්වයක් තිබෙන බව මුලින්ම සඳහන් කරන්න කැමැතියි.

ගරු මන්ත්‍රීතුමනි, අප ජීවත් වන මේ යුගයේ සමස්ත කලාවම මුහුණ පා තිබෙන අර්බුදය ඇත්තෙන්ම ඔබතුමා යෝජනාවේ ඉදිරිපත් කර තිබෙනවාටත් වඩා බරපතළයි. මට නම් පෙනෙන හැටියට මේ යුගයේ කලාව මුහුණ පා තිබෙන ප්‍රධානම අර්බුදය තමයි, කලාව ඇතුළෙන්ම ප්‍රතිකලාවක් බිහි වීම. අපි ඒකට කියනවා, anti-art කියලා. නාට්‍ය ඇතුළේ නාට්‍ය විරෝධයක්. නාට්‍ය විරෝධයක් කියන්නේ, නාට්‍ය විරෝධී නාට්‍යයක් ඇති වන එකට. ඒක අපි නාට්‍ය කියලා හඳා ගත්ත කලා ශානරයේ මූලික ගුණාංග උල්ලංඝනය කරන දෙයක්. සංගීතය ගත්තොත්, සංගීතය තාක්ෂණ විඥාවක්. නව කථාව ගත්තොත්, එදා නව කථාකරුවෙකුට තමන්ගේ වූ පාඨක ප්‍රජාව 25,000ක් විතර හිටියා නම්, අද ඒක 2,500 දක්වා හැකිළෙනවා. ඒ පාඨක සමාජය හැකිළෙනවා. නාට්‍ය ගත්තොත්, බාල භාෂාව ජනිත කරන විගඩමක් බවට නාට්‍ය පත් වෙමින් තිබෙනවා. මේක ලංකාවේ විතරක් තිබෙන තත්ත්වයක් නොවෙයි, මුළු ලෝකයේම දකින්නට තිබෙන තත්ත්වයක්. ඒ තමයි කලාව ඇතුළේ ප්‍රතිකලාවක් බිහි වීම. මේක සංවේදී කාරණාවක් නිසා හැමෝටම ඒ ගැන විවිධ මත තිබෙන්නට පුළුවන්. නමුත් මේ බැරෑරුමකම අපි අවබෝධ කර ගත්තොත්, කලාව බේරා ගැනීමට අවශ්‍ය නම් සරල දෝෂාරෝපණවලින් එහා ගිය වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා අපට පෙනෙනවා.

අද සමහර අය කල්පනා කරනවා, කලාවේ යුගය අවසානයි, කලාව ඉවරයි කියලා. තව අය කියනවා, කලාව ඉවර වෙලා නැහැ, කලාත්මක ශක්‍යතාව, කලාත්මක කුසලතාව සමාජයෙන් ගිලිහිලා ගිහින් කියලා; සමාජයට කලාව අහිමි වෙලා ගිහින් කියලා. එහෙම නැත්නම්, කලාවක් බිහි කර ගන්න තිබුණු සංස්කෘතික පසු බිම දැන් අපෙන් අයින් වෙලා වෙනත් ආකාරයේ සංස්කෘතියකට මානව සමාජය යමින් තිබෙනවාය කියනවා. කලාව සම්බන්ධයෙන් එවැනි විවිධ මතිමතාන්තර ගොඩක් තිබෙනවා. එම නිසා කලාව සම්බන්ධව මහ බැරෑරුම් අර්බුදයක් අප අතර තිබෙනවාය කියන එක අපි මුලින්ම සඳහන් කරන්න අවශ්‍යයි, අද මේ කථා කරන කරුණුවලට එන්න කලින්. මේ ප්‍රශ්නය බැරෑරුම් වාගේම, උත්තර සෙවීමත් ඉතාම සංකීර්ණ කටයුත්තක් වෙලා තිබෙනවාය කියන එකත් අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අපේ ලාංකික සමාජයේ තිබෙන ගොඩක් ප්‍රශ්න මතක් කළා. ඒ කියපු ගොඩක් දේවල් ඇත්ත. උදාහරණයක් හැටියට නාට්‍ය කලාව ගනිමු. තමුන්නාන්සේ හොඳ නාට්‍ය රසිකයෙක්; ප්‍රේක්ෂකයෙක්. මමත් එහෙමයි. සමහර වෙලාවකට අපි දෙදෙනාම එකම නාට්‍ය ප්‍රේක්ෂකාගාරයේදී හමු වෙලා තිබෙනවා. හැබැයි, නාට්‍ය කලාව අද මුහුණ පා තිබෙන ප්‍රධාන අර්බුදය නාට්‍යශාලා නැතිකම පමණක්ම නොවෙයි. ඒකත් ලොකු ප්‍රශ්නයක්. නමුත් අද ඒ කලාව, කලා ශානරයක් හැටියට ඊට වඩා අභ්‍යන්තරික අර්බුදයකට මුහුණ පා තිබෙනවා. උදාහරණයක් හැටියට රූපවාහිනිය ගනිමු. රූපවාහිනිය ගැන අද ගරු මන්ත්‍රීවරු වැඩි දෙනෙක් කථා කළා. අපි බලන්න ඕනෑ, රූපවාහිනිය කියන මාධ්‍යය කලාවේ ආරක්ෂකයා හැටියට පෙනී සිටිනවාද, ප්‍රතිකලාවේ නියෝජිතයා හැටියට පෙනී සිටිනවාද කියලා. මගේ අදහස අනුව නම් රූපවාහිනිය පෙනී සිටින්නේ ප්‍රතිකලාවේ නියෝජිතයා හැටියටයි. ටෙලි නාට්‍ය කියන කලා ශානරය ගත්තොත්, අද ඒක "වැල් ටෙලිය" කියන පඩංගු නාට්‍ය ගණයට තල්ලු වෙලා ගිහින් තිබෙනවා. අපේ ජාතික රූපවාහිනිය හෝ ස්වාධීන රූපවාහිනිය කියන මේ ආයතන දෙකට පමණයි අඩුම වශයෙන් ඒක සීමා කරන්න පුළුවන් කියන ප්‍රතිපත්තියකට යන්න පුළුවන් වෙලා තිබෙන්නේ. කොටස් 100කින් එහා පෙන්වන්නේ නැහැ කියන තැනට එන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ කොටස් ගණනත් එහාට මෙහාට වුණු අවස්ථා තිබුණා. හැබැයි, අපි ඒ ප්‍රතිපත්තියට ගිහින් තිබෙනවා. නමුත්, මේ "වැල් ටෙලිය"ත් එක්ක මේ ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන ප්‍රශ්න, සූරා කෑම, බාල භාණ්ඩ එළියට ඒම කියන ඒ ඔක්කෝම ටික තිබෙනවා. කලාවේ නියෝජිතයා හැටියට රූපවාහිනිය කියන මාධ්‍යය වැඩ කරන්නේ නැහැ කියන එකයි මගේ අදහස. අන්න ඒක පිළිගෙන අපි මොකක් හෝ උත්තරයක් හොයන්න සූදානම් වෙමු කියන එකයි මගේ අදහස.

"Reality" කලාව ගත්තොත්, අද හැම මාධ්‍යයකටම ඒක වසංගතයක් වාගේ බෝවෙලා තිබෙනවා, ගෝලීය පරිමාණයෙන්. නමුත් "reality" වැඩසටහන්වල වින්දන කර්මාන්තය ගත්තොත්, මෙච්චර කාලයක් - විශේෂයෙන්ම මේ නූතන යුගයේ - අපි බොහෝම මහන්සියෙන් හදා ගත්ත සංස්කෘතික භාණ්ඩාගාර උලා කන සුකර චර්යාවකයි නිරත වෙලා ඉන්නේ. මේක ඇතුළෙන්ම උත්තරයක් සොයා ගන්න පුළුවන්ද කියන ප්‍රශ්නයත් අපට තිබෙනවා. එම නිසා මේවා පිළිබඳව මීට වැඩිය පුළුල් සංවාදයක් එක්ක අපි සියලු දෙනාම වැඩ කරන්න ඕනෑ. මේ හැම කලා අංගයක්ම ආරක්ෂා කරන කලා සංස්කෘතික සමාජ ව්‍යාපාරයක් ඇතුළේ තමයි මේවාට උත්තර සොයා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. රාජ්‍යයට ඒ වෙනුවෙන් තිබෙන වගකීමෙන් ගැලවෙන්න බැහැ. කලාවේ අන්තර්ගතයට රාජ්‍ය මොනම විධියකින්වත් මැදිහත් විය යුතුයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
හොඳයි. මගේ කථාව අවසන් කළ යුතුව තිබෙන නිසා මම කෙටියෙන් සඳහන් කරන්නම්. අපේ චිත්‍රපට කර්මාන්තය අර්බුදයකට මුහුණ පාලා තිබෙනවා, චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන්. චිත්‍රපට සංස්ථාව, අධ්‍යක්ෂවරු, නිෂ්පාදකවරු සහ ක්ෂේත්‍රයේ සියලු දෙනාම එකඟ වෙච්ච වැඩ පිළිවෙළකට දැන් අවතීර්ණ වෙමින් තිබෙනවා. ටෙලි නාට්‍ය විකාශනය කිරීමේදී ඔබතුමන්ලා යෝජනා කරපු ඒ වර්ගීකරණයට අනුව කටයුතු කරන්න අපේ ජාතික නාලිකා දෙක එකඟ වෙලා තිබෙනවා. ඒ වාගේම ජාතික රූපවාහිනිය හෝ ස්වාධීන රූපවාහිනීය ඇතුළේ මේක ක්‍රියාත්මක වුණාට ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ කියන එකත් අපි කියන්න කැමැතියි. තව නාලිකා ගොඩාක් තිබෙනවා. එම නිසා රූපවාහිනී කර්මාන්තයේ සිටින සියලු දෙනාම ඒක රාශි කරගෙන මෙවා සම්බන්ධයෙන් යම් ප්‍රමිතියක් හදාගන්න අපට පුළුවන්ද කියන කාරණය සම්බන්ධයෙන් අපි කටයුතු කරමින් සිටිනවා. ඒ සඳහා නීතිමය වශයෙනුත් අපි මැදිහත් වෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී ජනමාධ්‍ය නියාමන කොමිසමක් බිහි කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අන්න ඒ වාගේ වේලාවකදී මේ වාගේ වැදගත් අදහස් ඒක රාශි කරගෙන පුළුවන් උපරිම ආකාරයෙන් හොඳ, යහපත් සම්මුතීන් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ යෝජනාව ජනමාධ්‍ය අමාත්‍යාංශයට, අධ්‍යාපන අමාත්‍යාංශයට සහ සංස්කෘතික අමාත්‍යාංශයට අදාළ වෙලා තිබෙනවා. ජනමාධ්‍ය අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන් වැඩි වගකීමක් පැවරෙන නිසා, මේ යෝජනාවේ සඳහන් ගොඩක් කරුණු කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය සහ ක්‍රියාමාර්ගික මැදිහත්වීමක් කරන්න අපි සූදානම්ව සිටින බවත් ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப.130 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

[අ.භා. 1.30]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතා වැදගත් යෝජනාවක් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. කලාව, සාහිත්‍යය, නිෂ්පාදනය, වෙළෙඳාම, කෘෂිකර්මය කියන මේ සියලු දේ අයිති වෙන්නේ "සංස්කෘතිය" කියන සන්දර්භය තුළටයි. හැබැයි, අපේ රටේ ඉතිහාසයේ ඉඳලාම "සංස්කෘතිය" අපි නිර්වචනය කරලා තිබෙන්නේ ඉතාම පටු විධියටයි. සංස්කෘතිය කලාවට, සාහිත්‍යයට, එහෙම නැත්නම් චිත්‍රපටයකට, නාට්‍යයකට වාගේ දෙයකට සීමා කරලා තමයි තිබෙන්නේ.

හැබැයි, සංස්කෘතිය යනු මේ සියල්ලේම සමස්තයයි. රටක නිෂ්පාදනය, වෙළෙඳාම, කලාව, නීතිය, කෘෂිකර්මය කියන මේ සියල්ලේ සමස්තයට තමයි සංස්කෘතිය කියලා කියන්නේ. ඒක තමයි, ඊ.බී. ටයිලර්ගේ නිර්වචනය අනුව "සංස්කෘතිය" යන්නට තිබෙන පුළුල්ම නිර්වචනය. හැම ආණ්ඩුවක් කාලයේදීම අපට පෙනෙන්න තිබෙන දෙයක් තමයි, "සංස්කෘතික කටයුතු" කියන එක තුන්වැනි ශ්‍රේණියට පත්වෙලා තිබීම.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙල පැවැත්වෙන දිනය අදයි. හැබැයි, ශ්‍රී ලංකාවේ සාහිත්‍ය සම්බන්ධයෙන් තිබෙන සාහිත්‍ය අනුමණ්ඩලයට මේ සම්මාන උළෙල පවත්වන්න විධියක් නැහැ. අද ඒ සම්මාන උළෙල පවත්වන්නේ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ විශේෂ උපදේශන මණ්ඩලයක් මගිනුයි. සංස්කෘතිය කැලිවලට කඩලා, දෙපැත්තට තුන් පැත්තට බෙදිලා තිබෙනවා. "ඔළුව ජපන්, කඳ ජර්මන්, ඇකුල ඉතාලි" කියලා මා හැම දාම කියන මේ කථාව අනුව සාහිත්‍ය උත්සවය පවත්වන්න සාහිත්‍ය අනුමණ්ඩලයට පුළුවන්කමක් නැහැ. එවන් තත්ත්වයක් තුළ, කොළඹට කොටු වෙච්ච ඇතැම් ඊනියා උගතුන්, බුද්ධිමතුන්, කලාකරුවන් කියන අය මේ රටට විවිධ නිර්වචන දෙමින් තිබෙනවා. මේ රට මොකක් දෝ වෙනසකට භාජනය වුණාය කියලා ඔවුන් කියනවා. හැබැයි, එවැනි තත්ත්වයක් තුළ දරුවන් මැරීම, කුඩු විකිණීම, මත් පැන් පානය කිරීම - මේ සියල්ල - අපේ රටේ වර්ධනය වෙද්දි කොළඹට කොටු වෙච්ච, තමන් ඊනියා බුද්ධිමතුන් යැයි උදන් අනමින් සිටින ඉතාම සීමිත පිරිසක් යම් යම් නිර්වචන දෙමින් සිටිනවා.

පසුගිය රාජ්‍ය නාට්‍ය උත්සවය පවත්වපු වෙලාවේදී එතැන වේදිකාවේ නාට්‍යකරුවන් විරෝධතාවක නිරතවෙලා හිටියා. නාට්‍ය අනුමණ්ඩලයට නාට්‍ය පවත්වන්න අවශ්‍ය මුදල් නැහැ. නාට්‍ය අනුමණ්ඩලයට ශ්‍රී ලංකාවේ රාජ්‍ය නාට්‍ය උළෙල පවත්වන්න මුදල් නැහැ. කලාකරුවන් රාජ්‍ය නාට්‍ය උළෙල පවත්වන තැනට ගිහිල්ලා උද්ඝෝෂණ කරනවා. මේක තමයි, අපේ රටේ සාමාන්‍ය තත්ත්වය.

අපි උදේ ඉඳලා ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියා. එතුමාගේ කථාව බොහොම සාරගර්භයි. එතුමා රෝගයේ ලක්ෂණ ඔක්කොම කිව්වා; රෝගී තත්ත්වය පිළිබඳව කිව්වා. හැබැයි, මේ රෝග නිධානය අපි හොයන්න ඕනෑ. මේ රටේ නැහෙනහිර පළාතේ යම්කිසි කාලයක් අධ්‍යාපන ඇමතිවරයා විධියට හිටපු මට කියන්න තිබෙන්නේ මේ සියල්ල බැඳී තිබෙන්නේ අධ්‍යාපනයෙන් කියලායි. අද රටේ කොහේ හෝ තැනකට ගියොත් - දිය ඇල්ලක් ළඟට ගියොත්, සිහිල් හෙවණක් ළඟට ගියොත්, සුන්දර තැනක් ළඟට ගියොත් - පෙනෙනවා, ඒ තැන්වල බත් කාලා දාලා, අරක්කු බීලා බෝතල් විසි කරලා, පොලිතීන්, ප්ලාස්ටික්වලින් ඒ තැන් පුරවලා තිබෙන බව. අපි කන්න දන්නේ නැති ජාතියක් බවට පත්වෙලා සිටිනවා. මහ පාරේ හැම දාම මිනිස්සු මැරෙනවා. පාරේ යන්න දන්නේ නැති ජාතියක් බවට අපි පත්වෙලා සිටින්නේ. පොදු වැසිකිළියකට ගියොත්, ඒ වැසිකිළියට ආපසු කාටවත් යන්න බැහැ. වැසිකිළි යන්න දන්නේ නැති ජාතියක් තමයි අපි නිර්මාණය කරමින් සිටින්නේ. මේ සියල්ල අධ්‍යාපනය හා බැඳුණු මූලික කාරණයි. නවීන තාක්ෂණයේ මෙවලම් ඔස්සේ, සොඳුරු සෞන්දර්යාත්මක විඳීමක් ඇති, අනුන්ගේ දුක බෙදා ගන්නා, අනුන්ගේ දුකේදී ඇහැට කඳුළක් උනන සෞන්දර්යාත්මක දරුවෙකු බිහි කරන්න අද අපට බැරි වෙලා තිබෙනවා. හැම කෙනාම කල්පනා කරන්නේ අධ්‍යාපනය යනු විභාග සමත් කිරීමේ ක්‍රියාවලියක් කියලායි. විභාග සහතිකයක් අතේ තිබෙනවා. හතරැස් කොළයක්; හතරැස් පන්ති කාමරයක්; හතරැස් අධ්‍යාපනයක්. විභාග සහතිකය අරගෙන ඉන්නවා. "විභාගය සමත්, ජීවිතය අසමත්" දරුවන් තමයි මේ බිහි කරලා සිටින්නේ. ඒ නිසා සංස්කෘතියේ, කලාවේ කඩා වැටීමට

[ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා]

මූලික කාරණය වෙලා තිබෙන්නේ අධ්‍යාපනයයි. හැමෝම මේ ගරු සභාවෙන් එළියේ ඉඳගෙන කථා කරන්නේ විභාග ප්‍රතිඵලයක් ගැන; ඉස්කෝලේ ගොඩනැඟිල්ලක් ගැන; ඩෙස්ක් - පුටු ගැන; ගුරුවරයා ගැන. අද ගුරුවරු කී දෙනෙකුට සෞන්දර්යාත්මක විඳීමක් තිබෙනවාද, කියවීමක් තිබෙනවාද කියලා අපි අහන්න කැමැතියි. ඒ නිසා මේ රටේ පවතින අධ්‍යාපනයේ යම් කිසි වෙනසක් නොකර, කවර හෝ ජාතික මට්ටමේ වැදගත් වෙනස්කමක් කරන්න හැකිවෙයි කියලා මම කල්පනා කරන්නේ නැහැ. එම නිසා අනෙකාගේ දුක්ඛ දෝමනස්සයන්ට අසංවේදී වන, මනු සතුන් කියන දෙපා සතුන් නිර්මාණය කරන මෙම අධ්‍යාපන ක්‍රියාවලිය වෙනස් කරන්නේ නැතිව අපට යහපත් රටක්, සංස්කෘතියක් හදන්න පුළුවන් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කලාකරුවන් ගැන කථා කරනවා; සාහිත්‍යකරුවන් ගැන කථා කරනවා. හැබැයි, මේ රටේ සාහිත්‍යකරුවෙක් යම් ග්‍රන්ථයක් නිර්මාණය කළාට පසුව ඔහුට ලැබෙන්නේ ඒ පොතේ අළෙවියෙන් සියයට 10ක කොටසක්- සියයට 10ක අනුපාතයක්- පමණයි. එතකොට පොත් වෙළෙඳාම් කරන වෙළෙඳ මහත්මයාට; ව්‍යාපාරිකයාට සියයට 40ක මුදලක් ලැබෙනවා. එතකොට නිර්මාණකරුවාට ලැබෙන්නේ, සියයට 10යි, පොත වෙළෙඳාම් කරන පුද්ගලයන්ට සියයට 40යි. එවැනි තත්ත්වයක් තුළදී නිර්මාණකරුවාගේ අයිතිය මොකක්ද? ඒ නිසා කොයි ආණ්ඩුවෙන් හරි, මේ ආණ්ඩුවෙන් හරි- මේ අවස්ථාවේදී ගරු සංස්කෘතික ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ. සංස්කෘතික ඇමතිවරු කිහිප දෙනෙක්ම ඉන්නවා. මොකද, ඒ අමාත්‍යාංශයේ කාර්යයන් බෙදිලා ගිහිල්ලා තිබෙන නිසා. නමුත් දැන් මේ ගරු සභාවේ වගකිවයුත්තෙක් නැහැ. මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරුන්ටයි මම මේ කථා කරමින් ඉන්නේ.- කරුණාකරලා අපි මේ වෙනස්කම කරන්න ඕනෑ. නිර්මාණකරුවාගේ පොතේ අළෙවියෙන් ඔහුට එන ආදායම සියයට 10යි, පොත් විකුණන පුද්ගලයාට සියයට 40යි වුණාම නිර්මාණකරුවෙක් පවතින්නේ කොහොමද? එම නිසා ඔහුගේ අභිමානය, ගෞරවය රැක ගත යුතුයි.

මේ මාසයේ කොළඹ පොත් ප්‍රදර්ශනයක් පවත්වන්න පටන් ගන්නවා. හැබැයි, එතැනට ගියොත් එකිනෙකාගේ ඇඟේ හැප්පෙන තරමටම අති විශාල ජනගහනයක් ඉන්නවා. එතැනට එන වැඩි පිරිසක් පොත් කියවන්නන් නොවෙයි. වැඩි දෙනෙක් එතැනට එන්නේ ඒ පොත්වල මිල ගණන් අහලා, එතැන තිබෙන තෝසේ කඩෙන් තෝසයක් කාලා, කොත්තු රොටි කඩෙන් කොත්තුවක් කාලා යන්නයි. පොත් බලන්න නම් පිරිසක් ඉන්නවා. නමුත්, පොත් කියවීමේ සංස්කෘතියක් ශ්‍රී ලංකාව තුළ නැහැ. ඒකට හේතුව වන්නේ, අපේ රටේ පවතින පාසල් අධ්‍යාපන රටාවයි. සොඳුරු සෞන්දර්ය දර්ශනයක් නැති, විඳීමක් - හැඟීමක් නැති පරපුරක් අපි බිහි කරමින් ඉන්නවා. අපි ඔක්කෝම අධ්‍යාපනය යොමු කරන්න හදන්නේ ව්‍යක්තීය අභිමුඛ පාඨමාලා සඳහායි. අපි කථා කරමින් ඉන්නේ තාක්ෂණික මෙවලම් තුළින් සන්නද්ධ දරුවෙකු හදන්නයි. හැබැයි, මනුස්සකම් ඇති, දෙපා සතෙක් නොවන දරුවෙකු අධ්‍යාපනයෙන් හදන තාක් කල් මේ වෙනස්කම කරන්න අපට පුළුවන්කමක් නැහැ. දැන් සමහර වෙලාවට කියන්නේ, "සල්ලි නැහැ" කියලායි. පසුගිය යුගයේදී අපට එල්ල වුණු චෝදනාවක් තමයි, "එතනෝල්කාරයින්ට උදව් කළා" කියන එක. එතනෝල්කාරයන් කවුද? කුඩු කාරයන් කවුද? "රජපක්ෂ රෙජීමය" කියලායි කිව්වේ. හැබැයි, ශ්‍රී ලංකාවට ගෙන්වන එතනෝල් ලීටරයකට රුපියල් 200ක් අය කරපු බද්ද මේ ආණ්ඩුවෙන් රුපියල් 10 දක්වා අඩු කරලා තිබෙනවා. ආණ්ඩුව එතනෝල් බද්ද අඩු කිරීමෙන් පමණක් රුපියල් කෝටි 1,800ක පාඩු ලබනවා. හැබැයි, නාට්‍ය උළෙල කරන්න සල්ලි නැහැ. සාහිත්‍ය අනුමණ්ඩලයට මැදිහත්වීමක් නැහැ. හැබැයි, එතනොල්කාරයින් ආනයනය කරන එතනෝල් ලීටරයකට රුපියල් 200ක් අය කරපු බද්ද රුපියල් 10 දක්වා අඩු කරන්න පුළුවන් වෙලා තිබෙනවා. රටේ සංස්කෘතියට, කලාවට, එවැනි වැදගත් කාර්යන්වලට වෙන් කරන්න මුදල් නැහැ. ඒක තමයි මේ ආණ්ඩුවේ යථාර්ථය. හැබැයි, ඔවුන් එදා දින 100 වැඩ සටහනින් අලුත් රටක් හදන්න-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු සංස්කෘතික ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ සභාවේ නැති වුණත්, මේ බෙදවාචකය නිවැරදි කරන්න මේ ආණ්ඩුව කටයුතු කරනවා ඇතැයි කියා මම බලාපොරොත්තු වනවා.

අපේ සාලය මැද්දේ තිබෙන රූප පෙට්ටියෙන් හැමදාම පෙන්වමින් තිබෙන්නේ කොහේ තිබෙන ටෙලි නාට්‍යද? ඉන්දියාවේ ටෙලි නාට්‍ය. පසුගිය කාලයේම මේ ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය කොරියන්කරණයට ලක් කරලා තිබුණා. මම දැක්කා, ඒ කාලයේ "සුජාත දියණි" ටෙලි නාට්‍යය පෙන්වන කොට, මේ රටේ

ගැහැනු ළමයි කොණ්ඩේ පීරුවේ සුජාත දියණිය වාගේ බව. ඒ වාගේ ලොකු පොල් කටු හැන්දක් වාගේ එකක් කොණ්ඩේ ගහගෙන ගියා. එතකොට ශ්‍රී ලංකාවේ ඉඳගෙන අපේ දේශීය සංස්කෘතිය ගැන කථා කරන අය අනුකරණය කරමින් තිබෙන්නේ මොකක්ද? අපි හැන්දෑවට රූපවාහිනී ටෙලි නාට්‍ය මාලාව බලන්න ගියොත් සාලය මැද්දේ මොකක්ද, තිබෙන්නේ? ඉන්දියාවේ නැත්නම් කොරියාවේ මධ්‍යම පාන්තික පවුලක ඕපාදූප ටිකක්. මේ ඕපාදූප නරඹලා චින්තනය පළල් වෙයිද? රසඥතා ඥානය දියුණු වෙයිද? එහෙම නැත්නම් සොඳුරු විඳීමක් ඇති කර ගන්න පුළුවන් ජීවන දෘෂ්ටියක් ඇති වෙයිද? ඥාන මණ්ඩලය පුළුල් වේවිද? අපේ ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයෙන් මේ ලාභදායි කොරියානුකරණයත්, ඉන්දියානුකරණයත් ඉවත් කළ යුතුය කියා මම යෝජනා කර සිටිනවා. කවුරුන් හෝ වග කිව යුත්තෙක් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුයි. එහෙම නොකළොත්, ශ්‍රී ලංකාවේ ටෙලි නාට්‍ය නිෂ්පාදන ක්‍රියාවලියත් අඩ පණ වේවි. කොරියානුකරණයයි, ඉන්දියානුකරණයයි නිසා "දඹුබස්නාමානය", "බෝගල සවුදිරිස්", "මහතලා හටන", "රිදී ඉටිටංකරය" ආදි අපූරු නිර්මාණශීලි ගුණාංගයන් සහිත, අපූරු සෞන්දර්යාත්මක ගීත ඥානයක් සම්පාදනය කළ හැකි උත්තුංග කලා නිර්මාණ අද බිහි නොවන තැනට මේ රට පත් වෙලා තිබෙනවා.

අපේ සිනමා ඉතිහාසයේ, 1940 ගණන්වල, 1950 ගණන්වල, 1960 ගණන්වල සිනමාවත් මේ තත්ත්වයට පත් වෙලා තිබුණා. පසුව එය යම් ප්‍රමාණයකින් මිදුණත්, සිනමාශාලාවලට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද සිනමාශාලා දවසින් දවස, පැයෙන් පැය කුඩා වෙමින් තිබෙනවා; කැල්ලෙන් කැල්ල වෙනත් ව්‍යාපාරවලට යමින් තිබෙනවා. පොත් විකුණපු තැන්වල මස් විකුණන්න පටන් ගෙන තිබෙනවා; මත්පැන් විකුණන්න පටන් ගෙන තිබෙනවා. පොත් කඩ, මත්පැන් කඩ වන විට; පොත් කඩ, මස් කඩ වන විට මේ රටේ සෞන්දර්ය ඥානය පුළුල් වන්නේ කොහොමද, විඳීමේ ශක්තිය පුළුල් වන්නේ කොහොමද, කියවීමේ ශක්තිය වැඩි දියුණු වන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගුරුවරයා පවා කියවන්නේ නැහැ. ඔවුන්ට සාහිත්‍ය කෘති කියවීමේ පුරුද්දක් නැහැ. ඒ බෙදවාචකය අද තිබෙනවා. අපි ගීතයක් ගනිමු. අද ගීතයක නිර්මාණශීලි ගුණය ගැන කවුද හිතන්නේ? අද නව තාක්ෂණික මෙවලම් ඔස්සේ, නව තාක්ෂණික ක්‍රියාවලිය ඔස්සේ බොහෝ ගායකයෝ බිහි වෙනවා. හැබැයි, අද අපට මතක හිටින ගීතයක්, කවියක් නැති තරම්. අපි තවමත් මොහිදීන් බෙග්ගේ ගීත, රුක්මණී දේවිගේ ගීත, මිල්ටන් පෙරේරාගේ ගීත, ජෝතිපාලගේ ගීත, එම්.එස්. ප්‍රනාන්දුගේ ගීත කියනවා. අපි එම ගීත අහනවා. අදත් අපි හිමින් හිමින් මුමුණන්නේ ඒ ගීතයි. නමුත්, අද තිබෙන අලුත් ගීත මොනවාද? ඊයේ පෙරේදා අලුත් ගීතයක් මට ඇහුණා. ඒ, "පත්තර පිටුවක ඔතලා තිබුණා..." කියන ගීතයයි. පත්තර පිටුවක ඔතා තිබෙන්නේ පාන් භාගයක්වත්ද කියා මා සිතුවා. බලන කොට, ඒ ප්‍රේමය ලු. ප්‍රේමයයි පත්තර පිටුවක ඔතලා තිබෙන්නේ. මේක තමයි නූතන සාහිත්‍යයේ -ගීත සාහිත්‍යයේ- බිඳීම. මෙය විවේචනය කරලා බැහැ. මෙහි රෝග ලක්ෂණය ගැන කථා කරලා බැහැ. අපි රෝග නිධානයට විසඳුමක් දිය යුතුයි. අද තිබෙන බරපතළම කාරණය මා කියන්නම්. මේ වෙලාවේ අධ්‍යාපන අමාත්‍යතුමා සිටියා නම් හොඳයි. කරුණාකර ගුරු පුහුණුවේ වෙනසක් ඇති කරන්න. මේ ලෝකය වෙනස් කරන්න ඕනෑ නම් අධ්‍යාපනය වෙනස් කරන්න අපි ලෑස්ති වෙමු. එහෙම නැත්නම්, කවදාවත් මේ බෙදවාචකයෙන් ගැලවෙන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේයා සදෙව්මී ළදැරියගේ මරණය අපි ඇති වෙන්න වික්කා. මේ රටේ සියලු මාධ්‍ය ඒ ගැන කථා කළා. උද්ඝෝෂණ පවා පැවැත්වුණා. දැන් දරුවන් මරන්නේ නැද්ද? පසුගිය කාලයේ අපට චෝදනා කළා, මත් ද්‍රව්‍ය, මත් කුඩු, එතනෝල් ගැන කියමින්. ඒ සියලු චෝදනා අප මත දමලායි තිබුණේ. දැන් එතනෝල් නැද්ද? දැන් මත් ද්‍රව්‍ය නැද්ද? දැන් මත් කුඩු අල්ලන්නේ නැද්ද? දැන් කේරළ ගංජා අල්ලන්නේ නැද්ද? ඒ සියල්ල අද එදාටත් වඩා ඉතා පළල් විධියට -ඉතා පුළුල් විධියට- මේ රටේ සිද්ධ වෙනවා. අපි සංස්කෘතිය ගැන කථා කරලා, කලාව ගැන කථා කරලා වැඩක් නැහැ, නාට්‍ය අනුමණ්ඩලයට රාජ්‍ය නාට්‍ය උත්සවය පවත්වන්න බැරි නම්; සාහිත්‍ය අනුමණ්ඩලයට රාජ්‍ය සාහිත්‍ය උත්සවය පවත්වන්න බැරි නම්. එහෙම නම්, සංස්කෘතිය සහ කලාව වෙනුවෙන් මේ ආණ්ඩුව කුමක් කරමින් සිටින්නේද? එදා දින 100 වැඩසටහනට ඉදිරිපත් කරපු යෝජනා සහ පොරොන්දු, කෝ දැන්? අපේ මරික්කාර් මන්ත්‍රීතුමා නම් හයියෙන් හිනා වෙනවා. හැබැයි, මා මේ කියන දේ හොඳින් මතක තියාගන්න. අද දෙමව්පියන්ගෙන් වැඩි දෙනෙකු සාලය මැද්දට ඇවිල්ලා කල්පනා කරන්නේ, අර ස්ටාර්ස්වලට, මේ ස්ටාර්ස්වලට, සුපර් ස්ටාර්ස්වලට දරුවන් යවන්න මිස යහපත් මනුෂ්‍යයන් කරන්න නොවෙයි; යහපත් දර්ශනයක් ඇති, ජීවන දෘෂ්ටියක් ඇති දරුවන් හදන්න නොවෙයි. ස්ටාර්ස්ලා හදන්න තමයි මේ රටේ ජනතාව කල්පනා කරන්නේ. එහෙම වෙන්නේ මොකද? අද මාධ්‍ය ඔස්සේ උදේ ඉඳන් රෑ වන කල්ම 'සුපර් ස්ටාර්ස්ලා වෙන්න ඕනෑ' කියන චින්තනය තමයි ජනතාවට සපයන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාහිත්‍යකරුවන් වෙනුවෙන්, සාහිත්‍ය නිර්මාණකරුවන් වෙනුවෙන් ලබා දෙන සියයට 10 වෙනුවට එය අඩු තරමින් සියයට 25 දක්වා වැඩි කරන්න අපට බැරි නම්, නාට්‍ය අනුමණ්ඩලයට රාජ්‍ය නාට්‍ය උත්සවය පවත්වන්න බැරි නම්, සාහිත්‍ය අනුමණ්ඩලයට රාජ්‍ය සාහිත්‍ය උත්සවය පවත්වන්න බැරි නම් සාහිත්‍ය ගැන කථා කරලා මොකටද? රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙල පවත්වන අද දවසේ මා කියන්න ඕනෑ, රාජ්‍ය සාහිත්‍ය උත්සවය පවත්වන්නේ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ විශේෂ උපදේශක මණ්ඩලයක් මඟින් බව. සාහිත්‍ය අනුමණ්ඩලයට කුමක්ද සිදු වුණේ, නාට්‍ය අනුමණ්ඩලයට කුමක්ද සිදු වුණේ, කලාවට මොකක්ද වෙන්නේ, සංස්කෘතියට මොකක්ද වෙන්නේ කියා අපි සිතා බලමු. එසේ යෝජනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.44]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අනුර දිසානායක මහතා ගෙන ආ යෝජනාවට අදාළව කථා කිරීමට මටත් අවස්ථාවක් ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. කලාව යනු සංවේදනාව හා මනෝභාව ආමන්ත්‍රණය කරන මූලිකාංග දැනුවත්ව, පිළිවෙළකට සකස් කරන ක්‍රමවේදයයි කියන එක අපි ඉස්සෙල්ලාම අවබෝධ කර ගන්න ඕනෑ. මේ වාගේ වැදගත් මාතෘකාවකදීත් සමහර උදවිය දේශපාලන පාට, පක්ෂ කණ්ණාඩිවලින් බලා කථා කිරීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන ගමන් කලාවේ ඉතිහාසය පිළිබඳව යම් කිසි අවබෝධයක් ලබා ගත්තොත් හොඳයි කියා මට හිතෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඈත අතීතයේදී අපේ මහා දා ගැබ්, වෙහෙර-විහාරස්ථාන සැදීම පිණිස කැටයම් කලාව වාගේම චිත්‍ර කලාව යොදා ගෙන තිබෙන ආකාරයෙන්ම අපේ කලාවේ ඉතිහාසය මැනවින් විදහා පෙන්වනවා. ඒ එක්කම සඳකඩ පහණ, ඉසුරුමුණිය, ඇම්බැක්කේ ලී කැටයම්, සීගිරි චිත්‍ර, දඹුලු විහාරයේ සිතුවම් වාගේම තිවංක පිළිම ගෙයි තිබෙන චිත්‍ර දිහා බැලුවාම, කලාව තුළින් ලංකාවේ සංස්කෘතිය පෝෂණය වුණු ආකාරයත් අපට අවබෝධ කර ගන්න පුළුවන්.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පසු කාලීනව 1800 වර්ෂයේදී පමණ පිලිප්පු සිංඤෝ මහත්මයා නාඩගම් කලාව ගෙනැල්ලා අපේ කලාව පෝෂණය කළා. ඒ හරහා කලාව කියන්නේ එකතැන පල් වෙන දෙයක් නොවන බව පෙන්නුවා. ඉන් පසුව ජෝන් ද සිල්වා මහත්මයාගේ මැදිහත්වීමෙන් නූර්ති කලාවක්, වෙදිකා නාට්‍යයක් ගෙනැල්ලා කලාව තවදුරටත් ඉස්සරහට ගෙන ගියා. ඊට පසුව 1870 වර්ෂයේදී පමණ පොඩිසිරිනා ගුරුන්නාන්සේගේ මූලිකත්වයෙන් රූකඩ නාට්‍ය කලාව ලංකාවට ගෙන ඒම නිසා කලාවේ තවත් පැතිකඩක් විවෘත වෙන්න පටන් ගත්තා. ඉන් අනතුරුව 1906 වර්ෂයේදී ග්‍රැමෆෝන් සංගීතය පැමිණීමත් එක්ක අපේ රට තුළ ගීත කලාව ස්ථානගත වෙන්න පටන් ගත්තා. ඊට පසුව 1925 වර්ෂයේදී Radio Ceylon ආයතනය ආරම්භ වුණා. ඒ වාගේම 1947 වර්ෂයේදී නිර්මාණය වුණු "කඩවුණු පොරොන්දුව" නම් පළමුවැනි චිත්‍රපටයත් එක්ක සිනමා කලාව ලංකාව තුළට එන්න පටන් ගත්තා. එහෙම ඇවිල්ලා 1979 වර්ෂයේදී ස්වාධීන රූපවාහිනී සේවය ආරම්භ වුණා. අද මේ ගරු සභාවේ කථා කළ මහත්වරුන් මෙසේ විවේචන එල්ල කළත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් යටතේ තමයි ස්වාධීන රූපවාහිනී සේවය ආරම්භ කළේ. ඊට පසුව 1982 වර්ෂයේදී ජාතික රූපවාහිනී සේවය ආරම්භ කිරීමත් එක්ක "දිමුතු-මුතු" ටෙලි නාට්‍යය විකාශනය වුණා. ඒත් එක්කම ටෙලි නාට්‍ය කලාවේ ආරම්භයත් සිදු වුණා.

මෙන්න මේ ආකාරයට විවිධ පැතිකඩවලින්, විවිධ ආරවලින් ලංකාවේ කලාව ඉස්සරහට දියුණු වී ගෙන ආවා. නමුත් ගරු අනුර දිසානායක මැතිතුමා ගෙන ආ යෝජනාවේ සඳහන් පරිදි සැබෑ ලෙසම අද වෙනකොට අපේ රටේ කලාව ඉස්සරහට ගිහිල්ලා නැහැ කියන එක කවර පක්ෂයක සිටියත් අපත් පිළිගන්න ඕනෑ. කලාවේ අනාගතය පිළිබඳව විශාල අවදානමක් තිබෙනවා. කලාව හිරවීම පිළිබඳව අපට විශාල බලපෑමක් ඇති වෙලා තිබෙනවා. මෙන්න මෙහෙම වුණේ ඇයිද කියන කාරණය සම්බන්ධව අපි විශේෂයෙන්ම බලන්න ඕනෑ. අද පවතින තාක්ෂණයේ දියුණුව ගත්තාම, ඒකට අනුගත වෙන විධියට අපගේ සිනමා කලාව සහ සංගීත කලාව සැකසී තිබෙනවාද කියන එක බලන්න ඕනෑ. ලංකාවේ සංගීත ක්ෂේත්‍රයේ මහා යෝධයෝ තුන්දෙනෙකු සිටියා. ඒ තමයි ආනන්ද සමරකෝන් මහත්මයා, සුනිල් ශාන්ත මහත්මයා සහ පණ්ඩිත් අමරදේව මහත්මයා. ආනන්ද සමරකෝන් මහත්මයා ස්වතන්ත්‍ර ගීත කලාවක් නිර්මාණය කරනකොට, සුනිල් ශාන්ත මහත්මයා එදා වැළලී යන්න ගිය සංගීත කලාව ගොඩ දමන්න උත්සාහ කළා. නමුත් ඔවුන් දෙදෙනාටම ඒ ඌනපූරණය කරන්න බැරි වෙනකොට පණ්ඩිත් අමරදේවයන් ඇවිල්ලා තමයි අපටම අනන්‍යතාවක් සහිත දේශීය සංගීත කලාවක් නිර්මාණය කරලා ඉස්සරහට ගෙන ගියේ. හැබැයි, ඉන් පසුව අපට ඒ ආරෙට සංගීත කලාව දියුණු කරන්න පුළුවන් වුණා ද කියන ගැටලුව තිබෙනවා. අමරදේව මහත්මයාගෙන් පසුව බිහි වුණු ආචාර්ය වික්ටර් රත්නායක, නන්දා මාලිනී, විශාරද සුනිල් එදිරිසිංහ කියන මහත්ම, මහත්මීන් සැලකිය යුතු ප්‍රමාණයකින් ඉදිරියට ගියත්, අද මේ කාලය -වර්තමානය- වෙනකොට එහෙම චරිත සිටිනවාද, එහෙම නිර්මාණ බිහි කරන්න පුළුවන් පුද්ගලයන් සිටිනවාද, එහෙම නිර්මාණ බිහි වෙනවාද කියා ගැටලුවක් තිබෙනවා.

විශේෂයෙන්ම කසුන් කල්හාර කියන ගායකයා යම් ප්‍රමාණයක උත්සාහයක් ගත්තත්, අපේ සංගීත කලාව, විශේෂයෙන්ම සිංහල ගී කෙත මියැදෙන්න පටන් ගත්තේ එවැනි නිර්මාණ බිහි නොවන වකවානුවක් නිර්මාණයවීමත් එක්කයි. ඒ නිසා මේ සඳහා විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කර රාජ්‍ය අනුග්‍රහයක් ලබා දෙන කිසියම් වැඩ පිළිවෙළක අවශ්‍යතාවක් තිබෙනවා කියා මා හිතනවා.

පසුගිය කාලයේ විශේෂයෙන්ම "millennium" කියන සංකල්පයක් එක්ක මුදල් තිබෙන අය සංගීත ක්ෂේත්‍රයට ඇවිල්ලා කොණ්ඩය "ජෙල්" කරලා, ලොකු ඩෙනිමක් ඇඳගෙන තමන්ට කැමැති විධියේ සිංදු ටිකක් ලියාගෙන, එහෙම නැත්නම් මොනවා හෝ කුණුහරුපයක් ලියාගෙන තමන්ට ඕනෑ විධියට music video කරලා ඒවා නිර්මාණ බවට පත් කළා. ඒ නිසා අද වෙනකොට music video සම්මාන උළෙළවල් පවත්වන තත්ත්වයට අපේ රට පත්වීම අපේ රටේ සංගීතයේ විශාල අභාග්‍යයක් කියායි මා නම් හිතන්නේ.

සිනමාව ගැන කථා කරන විට සිනමාශාලා ගැන කියන්නම වෙනවා. 1983 විතර සිනමාශාලා තිබුණා, 279ක් විතර. අද වෙන කොට ඒක 150කට අඩු වෙලා තිබෙනවා. ඒකට හේතුව, අපේ සිනමාශාලා ඩිජිටල්කරණය නොවීමයි. තවම පනතේ තිබෙන්නේ මොකක්ද? පනතේ තිබෙන්නේ, මිලිමීටර් තිස්පහේ Celluloid චිත්‍රපට සම්බන්ධයෙනුයි. පසුගිය අවුරුදු 20 තිස්සේ ආණ්ඩු කරපු කාටවත් මේ පනත වෙනස් කරන්නවත් බැරි වෙලා තිබෙනවා. බොම්බායේ තිබෙන Celluloid සංස්කරණ මධ්‍යස්ථාන නැති වුණොත් ලංකාවේ චිත්‍රපට කර්මාන්තය ඉවරයි; සම්පූර්ණයෙන්ම මියැදෙනවා.

රුපියල් ලක්ෂ 50ක්, 80ක් පමණ වියදම් කරලා සිනමාශාලාවක් ඩිජිටල්කරණය කරන්න පුළුවන්. එහෙම රාජ්‍ය මැදිහත් වීමක්, අනුග්‍රහයක් ලැබිය යුතුයි. රජයට ප්‍රතිපත්තිමය වශයෙන් චිත්‍රපට නිෂ්පාදනය කරන්න මැදිහත් වෙන්න බැරි වුණාට චිත්‍රපට කර්මාන්තයේ පුනරුදය සඳහා මැදිහත් වීමක් ලබා දීමේ හැකියාවක් තිබෙනවා. ඒ කාරණයත් සංස්කෘතික කටයුතු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න අපි කැමැතියි. මොකද, ලංකාවේ ඩිජිටල්කරණය කරපු චිත්‍රපටලශාලා දෙකයි තිබෙන්නේ. ඩිජිටල්කරණයට නොගියොත් ලංකාවේ සිනමා කාර්මාන්තය සම්පූර්ණයෙන්ම අඳුරු යුගයකට යන එක නවත්වන්න බැහැ.

මම තවත් කාරණයත් කියන්න මේක අවස්ථාවක් කර ගන්නවා. මෙවැනි බාධක, ගැටලු ගණනාවක් තිබෙද්දී මේ කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න අන්තිම අවුරුදු පහේදී විතර ලංකාවේ සිනමාකරුවන් විශාල උනන්දුවක් ගත්තා. එහෙම නම් රජයක් හැටියට අපට වග කීමක් තිබෙනවා, ඒ කර්මාන්තකරුවන් ගන්නා වූ උත්සාහයට රාජ්‍ය මැදිහත් වීමක් කරන්න. "මැදිහත් වීම" කියලා කියන්නේ රජයෙන් අවශ්‍ය සහයෝගය ලබා දීලා ඔවුන්ව ඉස්සරහට ගෙන එන එකයි. ගරු විමලවීර දිසානායක මැතිතුමා ඇහුවා, "මේ ආණ්ඩුව මොනවාද කරන්නේ?" කියලා. අපි නොවෙයි මොකුත් කරලා නැත්තේ. මොකුත් කරලා නැත්තේ එතුමන්ලායි.

2013 සැප්තැම්බර් මාසයේ එවකට හිටපු ඇමතිතුමා ප්‍රකාශ කළා, "සිනමාශාලා ඩිජිටල්කරණය කරනවා" කියලා. ඊට පස්සේ 2014 පෙබරවාරි 19වැනි දා අරලියගහ මන්දිරයට කලාකරුවන් සියලු දෙනාම ගෙන්වලා, රාත්‍රී භෝජන සංග්‍රහයක් දීලා, පත්තරේ ලොකු දැන්වීමක් දැම්මා, "ඔන්න, අපි ලබන අවුරුද්දේ ඉඳලා සිනමාශාලා සියල්ලම ඩිජිටල්කරණය කරනවා" කියලා. මේවා තමයි 'රාජපක්ෂ ශෝභන' කියන්නේ. අපිද, සිනමාව වැළලුවේ? සිනමාව දියුණු කරන්න දේශපාලනයට ආපු කට්ටිය ඉන්නවා, කලාව දියුණු කරන්න දේශපාලනයට ආපු කට්ටිය ඉන්නවා. පසුගිය ආණ්ඩුවේ තමයි එහෙම අය ගොඩක් හිටියේ. නමුත් ඔවුන් ඒ කාර්යය සිදු නොකිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා පමණක් නොවෙයි, වර්තමාන රජයටත් අපි යෝජනා කරනවා, මේ කටයුතු අපි කරන්න ඕනෑය කියලා. මොකද හේතුව? කලාව පිළිබඳව, සංස්කෘතිය පිළිබඳව අපට වාගේම අනාගත සමාජයට

වටිනාකමක් තේරෙන්නේ නැත්නම් අපට පැවැත්මකුත් නැහැ. අන්න ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් සංස්කෘතික ඇමතිතුමා දැනුවත් කරනවා. එතුමා විවිධ වැඩ පිළිවෙළවල් ගැන කිව්වා. මම කියන්නේ ඒ වැඩ පිළිවෙළවල්ද, එලදායී වැඩ පිළිවෙළවල් බවට පත් කරන්න ඕනෑ බවයි. මේ නිලධාරීන් හදන වැඩ පිළිවෙළ ඒ හදලා තිබෙන විධියටම අරගෙන වැඩක් නැහැ.

මේ වැඩ පිළිවෙළ මහ පොළොවේ සාක්ෂාත් කර ගන්න නම් ලංකාව පුරා තිබෙන සංස්කෘතික මධ්‍යස්ථාන, performing arts centres බවට පත් කරලා රජයේ අනුග්‍රහය ලබා දෙන්න ඕනෑ, අනාගත තරුණ පරපුරට මේ පිළිබඳව දැනුවත් වෙන්න; දැනුම ලබා ගන්න; පුහුණුව ලබන්න. විෂය ප්‍රගුණ කරගෙන ඉන් පස්සේ එහෙම කණ්ඩායමක් නිර්මාණය කරනවා නම් අපට මේ ක්ෂේත්‍රයට පුහුණුවක් සහ දැනුමක් සහිත පිරිසක් බිහි කරලා මේ කලාව තව ඉස්සහරට ගෙන යන්න පුළුවන් වෙයි.

අපි සංස්කෘතික ඇමතිතුමාට යෝජනා කරනවා. අපේ රජයේ ප්‍රතිපත්තිය අනුව, ගුවන් යානා එන්නේ නැති මත්තල ගුවන් තොටු පොළ පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා පවත්වාගෙන යනවා නම්, නැව් එන්නේ නැති හම්බන්තොට වරාය පවත්වාගෙන යනවා නම් 'රන්මිහිතැන්න' සිනමා ගම්මානයත් එහෙම පවත්වාගෙන යන්න කියලා. මෙම සිනමා ගම්මානය බලන්න තවමත් රසිකයන් එනවා. නමුත් චිත්‍රපට කෙරෙනවා අඩුයි. ඒ නිසා ඒ සිනමා ගම්මානයත් තව දියුණු කළොත්, ඒ ආශ්‍රයෙන් චිත්‍රපට නිෂ්පාදකයන්ට සහනදායී මිලට නූතන පහසුකම් සහිතව තමන්ගේ චිත්‍රපට කර්මාන්තය ඉදිරියට ගෙන යන්න පුළුවන්.

මාතර - හම්බන්තොට අධිවේගී මාර්ගය ඉදිකිරීමේ කටයුතු දැන් කෙරෙනවා. ඒක විවෘත කළාම කොළඹ ඉඳලා පැය එකහමාරකින් විතර එතැනට යන්න පුළුවන්. පෞද්ගලික අංශයත් එකතු වෙලා 'රන්මිහිතැන්න' සිනමා ගම්මානය තවත් දියුණු කරන්න ඕනෑ කියන එක තමයි මගේ ආකල්පය. එහෙම නොවුණොත් මේ කලාව තවදුරටත් වාණිජකරණය වෙනවා; තවදුරටත් මුදල් ඇති සමාජයකටම පමණක් සීමාවන දෙයක් බවට පත් වෙනවා.

පසුගිය කාලයේ ජාතික රූපවාහිනියේ එහෙම නැත්නම් ස්වාධීන රූපවාහිනියේ ටෙලි නාට්‍යයක් දාන්න, එක්කෝ ලක්ෂ 12ක විතර අල්ලසක් දෙන්න ඕනෑ, නැත්නම් ලිංගික අල්ලසක් දෙන්න ඕනෑ . ඉතින් එහෙම තත්ත්වයක් නිර්මාණය වෙලා තිබුණු රටක තමයි අපි පසුගිය අවුරුද්ද ඇතුළත සිදු වෙලා තිබෙන ක්‍රියාකලාපය ගැන කල්පනා කරන්නේ. දැන් තිබෙන තත්ත්වය මාස හයකින් ඇති වෙච්ච දෙයක් නොවෙයි. අවුරුදු 20ක් තිස්සේ ඇති වුණු දෙයක්. මේ චිත්‍රපට බෙදා හැරීම පෞද්ගලික අංශයට ලබා දීම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ කළ සම්පූර්ණ වැරැදි වැඩක් කියලායි මම හිතන්නේ. එය නිසි නියාමනයකට යටත්ව කළා නම් අද සිනමා කර්මාන්තයට මේ තරම් කනගාටුදායක ඉරණමක් අත් වෙන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
කථා කරන්න බොහෝ දේවල් තිබුණත්, කාල වේලාව නැහැ. මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් මා ඉල්ලා සිටිනවා, ලංකාවේ ගීත කලාව සහ සිනමා කලාව ගැනවත් විශේෂ අවධානයක් යොමු කරන්නය කියලා. වේදිකා නාට්‍ය ගැනත් මා කථා කරන්න කැමැතියි. මට මතකයි, මම ජනමාධ්‍ය අංශයේ සේවයේ ඉන්දැද්දී වේදිකා නාට්‍ය උළෙලක් කරන්න එවකට හිටපු ඇමතිතුමියත් එක්ක කථා කළාම, සියලු දේවල් කරලා අන්තිමට එතුමිය දුරකථන ඇමතුම මහ හැරියා. බැලුවාම මොකද වෙලා තිබෙන්නේ? හිටපු ජනාධිපතිතුමා ඒක කරන්න එපා කියලා. මේක තමයි ඇත්ත කථාව. ඒ නිසා වේදිකා නාට්‍ය ගැන මා ඔයිට වැඩිය කථා කරන්න යන්නේ නැහැ. නමුත්, රාජ්‍ය අනුග්‍රහය සිනමාවේ ප්‍රවර්ධනයටත්, ලංකාවේ සිංහල ගීත කලාව බේරා ගැනීමටත් මැදිහත් වීම අත්‍යාවශ්‍ය යුගයකයි අපි දැන් ඉන්නේ. ඒ මැදිහත් වීම ලබා දෙනවා කියන්නේ පරණ, හැම දාම ඉන්න අයත් එක්ක මේ ගමන යෑම පමණක් නොවෙයි. ඔවුන්ට අවශ්‍ය ගරු බුහුමන් ලබා දීලා ඔවුන්ගේ විෂය දැනුම වර්තමාන පරම්පරාවට, අනාගත පරම්පරාවට, අද ලෝකයට ගැළපෙන පරිදි ලබා දීලා ඒ හරහා මේ ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යා යුතුයි. ඒ නිසා විශේෂයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේ මන්ත්‍රීවරයකු හැටියට මේ යෝජනා ටික ඒ අදාළ ආයතනවලට ලබා දීලා මහ පොළොවේ යථාර්ථයක් වන වැඩ පිළිවෙළක් ඔවුන් ලවා ක්‍රියාත්මක කරවා ගනිමින් මෙම ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්න ඕනෑ. ඒ සඳහා ලබන අය වැයෙන් මීට වඩා මුදල් ප්‍රතිපාදන අදාළ ක්ෂේත්‍රවලට ලබා දීලා මේ කටයුතු ඉස්සරහට ගෙන යන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. පාරවල් හදනවා වාගේම අනෙක් දේවල් හදනවා වාගේම, සංවර්ධනය ගෙනෙනවා වාගේම, තාක්ෂණික විප්ලවය ඇති කරනවා වාගේම ඊට සමගාමීව දේශීය අනන්‍යතාව ප්‍රගුණ කිරීම සඳහා ඒ අවශ්‍ය මැදිහත් වීම මේ රජය විසින් ලබා දීලා අවශ්‍ය කටයුතු කරන්න කියන එකයි මගේ ඉල්ලීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

[අ.භා. 1.56]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ කලාව, කලාකරුවන් සහ ජනතාවගේ රස විඳීනය පිළිබඳව ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාවට යම් අදහස් දැක්වීමක් කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

මේ මාතෘකාව අපි එක අමාත්‍යාංශයක් ඉලක්ක කරගෙන විවාද කරන එකක් නොවෙයි. සෘජුවම ගත්තොත්, මෙයට ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය අයිතියි. ඒ අනුව, මේ කථා කරන මාතෘකාවට අදාළ කැබිනට් ඇමතිවරු තුන් දෙනකුත්, නියෝජ්‍ය ඇමතිවරු තුන් දෙනකුත් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංස්කෘත ශ්ලෝකයක් තිබෙනවා මෙහෙම:

"සාහිත්‍ය සංගීත කලා විහීනඃ
ශාක්ෂාත් පශු පුච්ඡවිෂාන හීනඃ
තෘණං න ඛාදන්නපි ජීවමානඃ
තද්භාගදේයං පරමං පශූනම්"

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

එහි තේරුම "සාහිත්‍ය, සංගීතය වැනි කලාවක් නොදන්නා මනුෂ්‍යයා අං තට්ටුවක්, වලිගයක් නැති හරකෙකු වාගේය. ඔහු තණ කොළ නොකනවා පමණි. ඔහු තණ කොළ නොකෑම තණ කොළ කන හරකුන්ගේ වාසනාවක්ය" කියන එකයි. කලාවෙන් කෙනකු විතැන් වුණාට පස්සේ ඔහු අමුම අමු සතෙකු බවට පත් වනවා හැර වෙන දෙයක් වෙන්නේ නැහැ කියන එක තමයි ඒ සංස්කෘතික ශ්ලෝකයේ සඳහන් වෙන්නේ.

අනෙක් සතුන් වාගේම මිනිසුන්ද උපදිනවා; කනවා; බොනවා; දුවනවා; පනිනවා; ලිංගික ජීවිතයක් ගත කරනවා; දරුවන් හදනවා; දරුවන් වඩනවා. නමුත්, ඊට අමතරව මිනිසාට උරුම වුණු සංස්කෘතික ජීවිතයක් තිබෙනවා. ඒ සංස්කෘතික ජීවිතයේ අත්‍යාවශ්‍ය දෙයක් තමයි කලාව. කලාවේ විවිධ අංග පිළිබඳව අපි අද උදෑසන සිට සාකච්ඡා කළා. සංගීතය, වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය, චිත්‍රපට, සාහිත්‍ය ඇතුළත් කලාවේ අංග බොහොමයක් තිබෙනවා.

අපේ රටේ ඉතිහාසය ගත්තොත් අපට පෙනෙනවා, බුත්සරණෙන්, අමාවතුරෙන්, සිදත් සඟරාවෙන්, එහෙම නැත්නම් සද්ධර්ම රත්නාවලියෙන්, සද්ධර්මාලංකාරයෙන් පෝෂණය වුණු වසර දහස් ගණනක සාහිත්‍යයක් අපට තිබෙන බව. ඒ වාගේම සීගිරි කුරුටු ගීවලිනුත් දැක්වෙන ගීතය පිළිබඳ ඉතිහාසයක් ක්‍රිස්තු වර්ෂ පස්වැනි සියවසටත් පෙර සිට අපේ රටේ පැවතිලා තිබෙනවා. චිත්‍රපට කලාව ගත්තොත් 2017 වන කොට වසර 70ක් සම්පූර්ණ වන සිනමා කර්මාන්තයක් අපට තිබෙනවා. එහිම කොටසක් තමයි දැන් වසය අවුරුදු 33ක් පසු කරන අපේ රටේ ටෙලි නාට්‍ය කලාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කලා මාධ්‍යයන්ට වඩා මේ "ටෙලි නාට්‍ය" කියන මාධ්‍යයේ යම් සුවිශේෂත්වයක් තිබෙනවා. චිත්‍රපටයක් හෝ වේදිකා නාට්‍යයක් නැරඹීමේදී අපි තෝරා ගැනීමක් කරනවා. අවශ්‍ය නම් බලන්න පුළුවන්, අවශ්‍ය නම් නොබලා ඉන්න පුළුවන්. ඒ එන චිත්‍රපටයත්, එහෙම නැත්නම් වේදිකා නාට්‍යයත් ප්‍රසිද්ධ රඟහල් පාලක මණ්ඩලයේ අනුමැතිය සහ අවසරය ලබා ගෙනයි එන්නේ. ඒ නිසා එතැනිනුත් පෙරිලා තමයි අපේ ඉස්සරහට එන්නේ. ඒ වාගේම කෙනෙක් චිත්‍රපටයක් හෝ වේදිකා නාට්‍යයක් බලන්න වෙලාවක් වෙන් කර ගන්න ඕනෑ; ඒ ශාලාවට යන්න ඕනෑ; මුදල් ගෙවලා ටිකට් එකක් ගන්න ඕනෑ; ඒ වාගේම පැය එකහමාරක්-දෙකක් එතැන ඉන්න හිත හදා ගන්නත් ඕනෑ. හැබැයි මේ මාධ්‍ය දෙකටම වඩා ටෙලි නාට්‍ය වෙනස්. අපේ ගෙදර සාලයට අනවසරයෙන් කඩා වදින, එසේ කඩා වැදී බලහත්කාරයෙන් අපේ කනේ ඇනෙන, ඇහේ ඇනෙන දෙයක් බවට ටෙලි නාට්‍ය පත් වෙලා තිබෙනවා. එහි ප්‍රමිතිය තීන්දු කිරීම සඳහා කිසිදු පාලක මණ්ඩලයක් නැහැ; රඟහල් පාලක මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් නැහැ. ඒ නිසා හදන හැම ටෙලි නාට්‍යයක්ම අප මත කඩා වැටෙනවා. ඒ වාගේම තෝරා ගැනීමකුත් නැහැ. සවස 6.30 ඉඳලා රාත්‍රී 10.00 දක්වා කවර TV channel එකක් දැම්මත්, අපට ටෙලි නාට්‍ය මුණ ගැහෙනවා. ප්‍රේක්ෂකයාටත් වෙන කරන්න දෙයක් නැහැ. උදේට වැඩට ගිහිල්ලා හවසට ගෙදර එන ගෘහ මූලිකයා යම් ඉසිඹුවක් ලබා ගෙන සාලයේ වාඩි වුණාට පස්සේ, පාසල් හෝ tuition ගිහිල්ලා එන දරුවා නාලා කියලා සාලයේ වාඩි වුණාට පස්සේ, ගෘහණිය කෑම උයන්න පටන් ගත්තාට පස්සේ, මේ ටෙලි නාට්‍ය බලහත්කාරයෙන් ඒ සියලු දෙනාගේම ඇහේ වදිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසාම තමයි මේ වන විට අපේ රටේ වැඩිම පිරිසක් එක විට නරඹන මාධ්‍යය බවට එය පත් වෙලා තිබෙන්නේ.

1979 වසරේදී අපේ රටේ තිබුණේ චිත්‍රපටශාලා 359යි. 2014 වසර වන විට එය 130 දක්වා අඩු වෙලා තිබෙනවා. චිත්‍රපට කර්මාන්තයේ යම් කඩා වැටීමක් තිබෙනවා. 1979 වසරේදී අපේ රටේ ප්‍රේක්ෂකයන් ලක්ෂ 750ක් චිත්‍රපට බලලා තිබෙනවා. 2014 වසර වන විට එය ලක්ෂ 40 දක්වා අඩු වෙලා තිබෙනවා. අපේ රටේ වැඩිම පිරිසක් චිත්‍රපට බලපු අවුරුද්දේ ලක්ෂ 750ක් තමයි චිත්‍රපට බලලා තිබෙන්නේ. නමුත් ටෙලි නාට්‍ය ගත්තොත්, සතියක් ඇතුළත බලන ප්‍රමාණය ඊට සමාන වෙනවා. දවසකට ලක්ෂ 120ක් පමණ බලන මාධ්‍යයක් බවට අද එය පත් වෙලා තිබෙනවා. අනවසරයෙන් ඇවිල්ලා, අප මත කඩා ගෙන වැදිලා, වෙන කරන්න දෙයක් නැතිකමට මොන නාලිකාව දැම්මත් ඒ පැය තුන ඇතුළේ අපට බලන්න ඉඩ සලසන මාධ්‍යයක් බවට ටෙලි නාට්‍ය පත් වෙලා තිබෙනවා. සිනමාශාලා අඩු වුණාට, සිනමාශාලාවලට යන ප්‍රේක්ෂකයන් ප්‍රමාණය අඩු වුණාට, රූපවාහිනීය නැරඹීම වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 වසරේ සංඛ්‍යා ලේඛන අනුව අපේ රටේ පවුල් ඒකක ලක්ෂ 52න් සියයට 78.7කට රූපවාහිනී යන්ත්‍ර තිබුණා. අපේ රටේ ගුවන්විදුලි යන්ත්‍ර තිබිලා තිබෙන්නේ සියයට 69යි. ඒ සියයට 78.7 තිබෙන්නේත් යුද්ධය අවසන් වෙලා මුලතිව් ප්‍රදේශයේ පවුල්වලින් සියයට 25කට රූපවාහිනී යන්ත්‍ර තිබුණු කාලයේදීයි; කිලිනොච්චියේ පවුල්වලින් සියයට 15කට රූපවාහිනී යන්ත්‍ර තිබුණු කාලයේදීයි. ඒ නිසා දැන් මේ සංඛ්‍යාව අනිවාර්යයෙන්ම සියයට 85ක් දක්වාවත් වැඩි වෙන්න ඕනෑ. ඒ කියන්නේ හැම ගෙදරකම වාගේ රූපවාහිනී යන්ත්‍රයක් තිබෙනවා. රාජකාරියට ගිහිල්ලා ආවාට පස්සේ, කාර්යාලීය කටයුතු අවසන් කළාට පස්සේ, ව්‍යාපාරය වැහුවාට පස්සේ, පාසල් ගිහිල්ලා ආවාට පස්සේ, හැම දෙනාටම නරඹන්න තිබෙන, අපේ ඇහේ වදින මාධ්‍යය බවට අද ටෙලි නාට්‍ය පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒවායේ ප්‍රමිතිය අතිශයින් වැදගත් කරුණක් බවට පත් වෙලා තිබෙනවා. ඒවා වැඩිපුර නරඹන්නේ එක්කෝ අපේ රටේ තරුණ මව්වරු. එහෙම නැත්නම් මව්වරු වීමට සිටින තරුණියන්. ඔවුන්ට තමයි ටෙලි නාට්‍යවලින් වැඩිම බලපෑමක් සිදු වන්නේ. ඒ නිසාමයි ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳව අපි වැඩි වැඩියෙන් සැලකිලිමත් විය යුතු වන්නේ.

අපට අද මේ ටෙලි නාට්‍යවල ගුණාත්මකභාවය පිළිබඳව කථා කරන්න සිදු වෙලා තිබෙන්නේ ඇයි? ඉතිහාසයේ ඉඳන් ගත්තොත්, ටෙලි නාට්‍ය ආරම්භයේ සිට ගත්තොත් පූර්වයට පටන් අර ගෙන ක්‍රමානුකූලව වර්ධනය වුණු ටෙලි නාට්‍ය කර්මාන්තයක් නොවෙයි අපට තිබෙන්නේ. 1979 වසරේදී තමයි ඉස්සර වෙලාම අපේ රටේ රූපවාහිනී නාලිකාවක් ආරම්භ වුණේ. ඒ, පෞද්ගලික නාලිකාවක් විධියට පටන් අර ගෙන පසුව රජයට පවරා ගත්, ස්වාධීන රූපවාහිනී සේවය. ඊට පසුව 1982 වසරේදී ජාතික රූපවාහිනීය ආරම්භ කළා. 1951 වසරේදී සැන් ෆ්‍රැන්සිස්කෝ සමුළුවේදී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කළ කථාවට කෘතගුණ සැලකීමක් හැටියට ජපානයෙන් එය දුන්නා කියලා තමයි කියන්නේ. ජපන් රජය ජාතික රූපවාහිනීය ලංකාවට දෙන කොට ඔවුන්ගේ බලාපොරොත්තුව වුණේ, එය අධ්‍යාපන සහ සංස්කෘතික මාධ්‍යයක් ලෙස ප්‍රවර්ධනය වෙයි කියන එකයි. ඒ නිසාම ජාතික රූපවාහිනීය ආරම්භ කරන කොට එහි නාට්‍ය අංශයක් ආරම්භ කළා. ඒ නාට්‍ය අංශයේ ප්‍රධානියා බවට පත් වුණේ අපේ රටේ ප්‍රවීණ කලාකරුවෙක් වුණු ධම්ම ජාගොඩ මහත්මයායි. ඔහු තමයි "television drama" කියන වචන, "teledrama" යනුවෙන් කෙටි කරලා, "ටෙලි නාට්‍ය" කියන වචනය ලංකාවට හඳුන්වා දුන්නේ. මුල් කාලයේදී උපසිරැසි සමඟ විදේශීය ටෙලි නාට්‍ය පෙන්වීම තමයි ජාතික රූපවාහිනීය කළේ. 1983 වසරේදී ඩී.බී. නිහාල්සිංහ මහතා අධ්‍යක්ෂණය කළ "දිමුතු මුතු" ටෙලි නාට්‍යය, "ළා හිරු දහසක්" ටෙලි නාට්‍යය, ධම්ම ජාගොඩ මහතා අධ්‍යක්ෂණය කළ "පළිඟු මැණිකේ" වැනි ටෙලි නාට්‍ය බලපු ප්‍රේක්ෂකයින් ප්‍රමාණයක් අපේ රටේ ඉන්නවා.

ඒ කාලයේ අපේ රටේ කලාව ගුණාත්මකව ඉහළ යන්න බලපෑවේ මොකක්ද? එය ආරම්භ වුණේ, ඒ වෙන කොටත් යම් ආකාරයකින් වර්ධනය වෙලා තිබුණු උල්පත් තුනකින්. එක් පැත්තකින් එදිරිවීර සරච්චන්ද්‍ර, ගුණසේන ගලප්පත්ති, හෙන්රි ජයසේන ආදී චේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් ආභාසය ලත් චේදිකාවේ දක්ෂතම පිරිසක් සිටියා. ඒ වාගේම ඒ වෙනකොටත් සිනමාවට සම්බන්ධ වෙලා වසර තිස්පහක් හතළිහක් තිස්සේ වර්ධනය වූ සිනමා කර්මාන්තයේ පිරිසකුත් ටෙලි නාට්‍ය කලාවට ප්‍රවේශ වුණා. ඒ වාගේම තමයි අපේ සාහිත්‍යයත් ටෙලි නාට්‍යයට දායක වුණා. එම නිසා චේදිකාවත්, සිනමාවත්, සාහිත්‍යයත් කියන ත්‍රිවිධ උල්පත් හරහා තමයි අපේ ටෙලි නාට්‍ය කලාව පෝෂණය වන්නට පටන් ගත්තේ. එම නිසාම ටෙලි නාට්‍ය ආරම්භ වන මොහොතේම, එය යම් ගුණාත්මක තත්ත්වයකින් ඉතාම උසස් තත්ත්වයකින් තමයි ආරම්භ කෙරුණේ. එම නිසාම මුල් කාලයේ -ටෙලි නාට්‍ය ආරම්භ වී පළමුවන දශකයේ, දෙවන දශකයේ- අපට දකින්නට ලැබුණු ටෙලි නාට්‍ය කියා කියන්නේ, හරයක් සහිත දේවල් ඇතුළත් වුණු ටෙලි නාට්‍යයන්. ඒවායේ වස්තු බීජ ඉතාම උසස් මට්ටමක පැවතුණා. සමහර ඒවා ලංකාවේ සමාජ විකාශනය පිළිබඳව පර්යේෂණ කර, ඒ ආශ්‍රයෙන් නිර්මාණය කළ ටෙලි නාට්‍යයන්. උදාහරණ වශයෙන්, ධර්මසේන පතිරාජ මහතාගේ "කඩුල්ල "ටෙලි නාට්‍යය, ජයන්ත චන්ද්‍රසිරි මහතාගේ "දඬුබස්නාමානය" වාගේ ටෙලි නාට්‍ය ගත්තොත් අපේ සමාජ ක්‍රමවල විකාශනය තමයි ඒවායින් නිරූපණය කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම 1978න් පස්සේ වර්ධනය වන මැද පන්තිය, ඒ මැද පන්තියේ ඇති වන ගැටුම, නාගරීකරණය නිසා ඇති වන පීඩාව, ගම සහ නගරය අතර ගැටුම, කුල ගැටුම් ආදි සමාජයේ සිදුවන විවිධ ප්‍රශ්න යථාර්ථයක් බවට ඉස්මතු කරමින් ටෙලි නාට්‍යය ප්‍රමාණයක් බිහිවුණා. පරාක්‍රම නිරිඇල්ලයන් අධ්‍යක්ෂණය කළ " යශෝරාවය," නාලන් මෙන්ඩිස් මහතා අධ්‍යක්ෂණය කළ "නෑදෑයෝ" ටෙලි නාට්‍යය එවැනි තත්ත්වයේ තිබුණු ඒවායි. ඒ වාගේම තමයි වෙනත් සුවිශේෂී පර්යේෂණාත්මක වස්තු බීජ පදනම් කර ගෙනත් අපේ ටෙලි නාට්‍ය කලාව පෝෂණය වුණා. උදාහරණ වශයෙන් ගත්තොත්, ධර්මසේන පතිරාජ මහතාම අධ්‍යක්ෂණය කළ "ඇල්ල ළඟ වලව්ව" වාගේ ටෙලි නාට්‍යයක්, "මායා මන්දිර" වාගේ නාට්‍යයක්, බර්ට්‍රම් නිහාල් මහතා අධ්‍යක්ෂණය කළ " දඬබිම" වාගේ නාට්‍යයක්, ජයන්ත චන්ද්‍රසිරි මහතා අධ්‍යක්ෂණය කළ,"වෙද හාමිනේ" වාගේ ටෙලි නාට්‍යයක් කියා කියන්නේ ඉතාම සුවිශේෂී වස්තු බීජයන් පදනම් කර ගෙන අපේ ටෙලි නාට්‍ය කලාව පෝෂණයට දායක වී තිබෙන ඒවායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, මුල් කාලයේ -පළමුවන දශකයේ, දෙවන දශකයේ මැද වෙනතුරු- අපේ රටේ ටෙලි නාට්‍ය පෝෂණය කරන්න සාහිත්‍ය කෘති විශාල ප්‍රමාණයක් දායක වුණා. ටෙලි නාට්‍යයක් විධියට නිර්මාණය වුණු පළමුවන නවකථාව බවට සෝමවීර සේනානායකයන්ගේ "යශෝරාවය" පත් වුණා. ලෙස්ටර් ජේම්ස් පීරිස් කියන මහා සිනමාවේදියා පුණ්‍යකාන්ති විජේනායක මහත්මියගේ "ගිරය" කෘතිය ටෙලි නාට්‍යයක් බවට පත් කළා. ඒ වාගේම කේ. ජයතිලක මහතාගේ "චරිත තුනක්" කෘතිය තිලක් ගුණවර්ධනයන් විසින් නාට්‍යයක් බවට පත් කළා. මාටින් වික්‍රමසිංහයන්ගේ කෘති ගණනාවක් විවිධ අධ්‍යක්ෂවරුන් විසින් ටෙලි නාට්‍ය බවට පත් කර තිබෙනවා. උදාහරණයක් වශයෙන්, බර්ට්‍රම් නිහාල් මහතා අධ්‍යක්ෂණය කළ "ගම් පෙරළිය" කියන්නට පුළුවන්. ඒ වාගේම සුදත් රෝහණයන් "විකුම්සිහ කතන්දර" කියා තවත් ටෙලි නාට්‍ය මාලාවක් නිර්මාණය කළා. ටී.බී. ඉලංගරත්නයන්ගේ "අඹ යහළුවෝ" කෘතිය ඇසුරෙන් සුදත් දේවප්‍රිය අධ්‍යක්ෂණය කළ "අඹ යහළුවෝ" ටෙලි නාට්‍යය අපි එක කාලයක හුහක් ආශාවෙන් නැරඹූ ටෙලි නාට්‍යයක්. මේ ආදී වශයෙන් දේශීය සාහිත්‍ය කලාව ටෙලි නාට්‍යය සුපෝෂණයට දායක වුණා.

ඒ විතරක් නොවෙයි, විදේශීය සාහිත්‍යයත් අපේ ටෙලි නාට්‍යයේ වස්තු බීජ බවට පත් වෙලා තිබෙනවා. ධර්මසේන පතිරාජයන් එක්වෙලා "සුබ අනාගතයක්" ටෙලි නාට්‍යය නිර්මාණය කළා, චාර්ල්ස් ඩිකන්ස්ගේ "Great Expectations" කියන කෘතිය පදනම් කර ගෙන. ඒ වාගේම පතිරාජයන් එක්වෙලා "දුර්ගාන්තය" කියා ටෙලි නාට්‍යයක් නිර්මාණය කළා, එමිලි බ්‍රොන්ටේගේ "Wuthering Heights" කියන කෘතිය මුල් කර ගෙන. මේ ආකාරයට දේශීය සාහිත්‍ය පමණක් නොවෙයි, විදේශීය සාහිත්‍යයේ තිබෙන රස ගුණයන් අපේ ප්‍රේක්ෂකයාට ගේන්න ඒ අය මහන්සි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තිස්ස අබේසේකරයන් කළ "පිටගම්කාරයෝ" ටෙලි නාට්‍ය, අශෝක හඳගමයන් කළ "දුන්හිඳ අද්දර" ටෙලි නාට්‍යය, අපේ ටෙලි නාට්‍ය කලාවට ඉදිරි පියවර -පිම්- ගණනාවක් පනින්න දායකවෙලා තිබෙනවා. මෙහෙම තිබුණු කලාවක් තමයි අද මේ අර්බුදයට ගිහින් තිබෙන්නේ. මේ ටෙලි නාට්‍ය කලාවේ අර්බුදය ගත්තොත් ගරු ඇමතිතුමනි, දැන් මේක නහයෙන් උඩටත් ගිහින් තිබෙන්නේ. අපි මේ කථා කරන්නේ ඇත්තටම, මේකේ කොතැනින් හෝ කොනක් අල්ලා ගෙන, ආපසු හරවන්න පුළුවන්ද කියා බලන්නයි. ඒ සඳහා දරන ලද උත්සාහයක් තමයි මේ තිබෙන්නේ.

මේ අර්බුදයේ ප්‍රධාන පැති දෙකක් තිබෙනවා. එකක්, දැන් මේ ටෙලි නාට්‍යවල ගුණාත්මකභාවය බිඳවැටීම. දෙවන කාරණය, විදේශීය ටෙලි නාට්‍යවලින් සිදු කරන ආක්‍රමණය. අපේ ටෙලි නාට්‍ය ගුණාත්මකව බිඳ වැටීමට බලපා තිබෙන්නේ, මේ ක්ෂේත්‍රයේ හිටපු -මා කලින් කිව්වා වාගේ, සිනමාවෙන් ආපු, සාහිත්‍යකරණයෙන් ආපු, එසේ නැත්නම් අපේ චේදිකාවෙන් ආපු - දක්ෂයන් මේ ක්ෂේත්‍රයෙන් ඉවත්වෙලා තිබීමයි. එසේ නැත්නම් දක්ෂයන්ගෙන් වැඩ නොගැනීමයි. ඒකට ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ, නිෂ්පාදන වියදමට සාපේක්ෂව මේ නිර්මාණ මිලදී නොගැනීමයි. මේ නිර්මාණ මිලදී ගන්නේ කුණු කොල්ලයට. ටෙලි නාට්‍යයක්ය කියන්නේ අපි තිරයේ දකින රංගන ශිල්පී, ශිල්පිනියන් පමණක් නොවෙයි. ඒ පිටුපස ඉතා විශාල පිරිසක් ඉන්නවා. අධ්‍යක්ෂවරු, සහාය අධ්‍යක්ෂවරු, තිර පිටපත් රචකයන්, කලා අධ්‍යක්ෂවරුන්, පසුතල නිර්මාණකරුවන්, රංගන ශිල්පීන්-ශිල්පිනියන්, කැමරා ශිල්පීන්, කැමරා අධ්‍යක්ෂවරුන්, පටිගත කරන්නන්, ගීත රචකයන් ආදි නිර්මාණකරුවන් සමූහයකගේ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් තමයි ටෙලි නාට්‍ය නිර්මාණයක් කියන්නේ. එහෙම වෙන කොට අද රූපවාහිනී නාලිකාවක් ටෙලි නාට්‍යයක එක කථාංගයක් මිල දී ගන්නේ කීයටද?

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා මේ සභාවට පැමිණි එක හොඳයි. මුලින්ම ජාතික රූපවාහිනීය ඒ episode එකකට රුපියල් 13,500ක් ගෙව්වා. ක්‍රමානුකූලව ඒ මුදල වැඩි වුණා. රුපියල් 16,000ක් වුණා; රුපියල් 20,000 වුණා; රුපියල් 50,000 වුණා. 1992 වන විට ජාතික රූපවාහිනීය සමහර නාට්‍යවල episode එකකට රුපියල් 1,75,000ක් ගෙවලා තිබෙනවා. 1996දී "දඬුබස්නාමානය" ටෙලි නාට්‍ය මිලදී ගන්න කොට episode එකක වටිනාකම රුපියල් 3,15,000යි. හැබැයි, අද වන විට ඒ මිල රුපියල් 1,20,000ට, 1,00,000ට, 80,000ට බැහැලා තිබෙනවා. මේක තමයි තිබෙන බරපතළම කාරණාව. එතකොට මොකද වෙන්නේ? මේ විධියට episode එකකට ගෙවන ගණන අඩු වුණාට පස්සේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේ ගරු එඩ්වඩ් ගුණසේකර මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
Episode එකකට ගෙවන ගණන රුපියල් 80,000ක් 1,00,00ක්, 1,20,000ක් වුණාට පස්සේ කොහොමද නිර්මාණයක් කර ගෙන යන්නේ? යම් කිසි ආකාරයක ප්‍රශස්ත ගෙවීමක් තිබුණ කාලයේ, ඒ කියන්නේ මීට අවුරුදු 10කට, 15කට එහා කාලයේ, ඒ නිර්මාණකරුවන් කියනවා එක කථාංගයක් - episode - කරන්න දින තුනක් ගත වෙනවා කියලා. නමුත් අද මොකක්ද වෙන්නේ? එදා episode එකක් කරන්න දින තුනක් ගත වුණා. අද එක දවසකට episodes තුනක් කරනවා! එහෙම නැතිව බැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
නිබ්බා, ගැහුවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නිබ්බා, ගැහුවා.

එදා ටෙලි නාට්‍යයක් නිර්මාණය කරන කොට අධ්‍යක්ෂවරයා, රංගන ශිල්පීන්, තාක්ෂණ ශිල්පීන් ඇතුළු සියලුදෙනා එකතු වෙලා යම් පූර්ව සූදානමක් කරනවා; වැඩ මුළු තියනවා; සාකච්ඡා කරනවා; පිටපත අධ්‍යයනය කරනවා. එහෙම කරලා තමයි shoot එකට එන්නේ. හැබැයි, අද කොහොමද කරන්නේ? උදේට එන්න කියනවා, ඒ ආපු එක්කෙනා එක්ක shoot කරනවා. බිරිඳගේ සහ සැමියාගේ දර්ශනයක් රූපගත කරන්න ඕනෑ නම්, බිරිඳට රහපාන නිළිය ආවේ නැතත් සැමියාට රහපාන්න ආපු නළුවා ඉන්නවා නම්, ඒ නළුවා එක්ක ඒ කොටස කරනවා. බිරිඳට රහපාන එක්කෙනා හවසට ආවොත් ඇයත් එක්ක ඒ කොටස කරනවා. ඒ තැනට තමයි මේ කර්මාන්තය පත්වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ ස්ථානවල රූගත කිරීම් කළොත් තමයි ටෙලි නාට්‍යයක විචිත්‍ර බව වැඩි දියුණු වන්නේ. හැබැයි, අද මේ මිල ප්‍රශ්නය නිසා බොහෝ අධ්‍යක්ෂවරු පෙළඹිලා තිබෙනවා ඉතාම සීමිත ස්ථාන ප්‍රමාණයක්, කොළඹ අවට තිබෙන සීමිත ස්ථාන ප්‍රමාණයක් locations බවට පත් කරගෙන රූගත කිරීම් කරන්න. එකම තැන තමයි රූගත කිරීම් කරන්නේ.

ඒ විතරක් නොවෙයි, රහපානවා කියන එක කපු කනවා වාගේ වැඩක් නොවෙයි නේ. ඔවුන්ගේ භාවමය ප්‍රකාශන මඟින් අපට සංවේදනා දනවන්න ඕනෑ. දුක, වේදනාව, සතුට, ප්‍රේමය ඒ සියල්ල අපට දනවන්න ඕනෑ. නමුත් දැන් මේ මිල ප්‍රශ්නය නිසා මොකද වෙලා තිබෙන්නේ කියලා ඇමතිතුමා දන්නවා ඇති. උදේ හතරට මේ නළු නිළියන් ගන්නවා. උදේ හතරට ගත්තාම දවසක වැඩ කරලා ඉවර වෙන කොට පාන්දර 2.00යි, 3.00යි. ඔවුන්ට විවේකයක් නැහැ; ඉන්න තැනක් නැහැ. ඉස්සර නම් ඔවුන්ට යම් විවේකයක් සහිතව ඉන්න හිටින්න තැන් දීලා තමයි මේ රූගත කිරීම් කළේ. හැබැයි, අද මේ අය දෛනික කුලීකාරයෝ බවට පත් කරගෙන පාන්දර 4.00 සිට ඇ 2.00 දක්වා ඔවුන්ගේ වැඩ දවස බවට පත් කර ගෙන තිබෙනවා. ඒ කාලයේ සාමාන්‍ය ප්‍රශස්ත මට්ටමේ ගෙවීමක් ඔවුන්ට තිබුණා. ඒ කාලයේ මුළු නාට්‍යයටම තමයි කලාකරුවෝ කොන්ත්‍රාත් අත්සන් කළේ. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? අද අත්සන් කරන්නේ එක්කෝ සතියකට. එහෙම නැත්නම් දවසකට. දැන් ඒක තවත් අඩු වෙලා පැයේ කොන්ත්‍රාත්කරුවන් බවට කලාකරුවන් පත් වෙලා තිබෙනවා. ඒකයි අපි කිව්වේ දැන් මේ කලාකරුවන් "කුලීකරුවන්" බවට පත් වෙලා තිබෙනවා කියලා. කලින් ටෙලි නාට්‍යයක් නිර්මාණය කරන කොට අධ්‍යක්ෂවරයෙක් හිටියා. ඔහු ස්ථිරයි. හැබැයි, දැන් මේ ප්‍රචාරය වන වැල් මෙගා ටෙලි නාට්‍යවල අධ්‍යක්ෂවරයෙක් ඉන්නේ සතියයි, දෙකයි. ඔහු දන්නේ නැහැ, ඊළඟට මොකද වෙන්නේ කියලා. අධ්‍යක්ෂවරු සති දෙකෙන් දෙකට මාරුවෙමින් තමයි පිටපත ලියැවෙන්නේ.

ඒ විතරක් නොවෙයි. දැන් මේ ටෙලි නාට්‍ය episode එකකට රුපියල් 1,75,000ක්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න. කාලය අවසන් වෙලා තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ථ්එන්ඒ එකේ වෙලාව දෙනවා කිව්වා.

ටෙලි නාට්‍යවල පළමුවැනි දෙවැනි දශකවල, ප්ලේන් ටී එකක් ශත 25ට තිබෙන කාලයේ, රුපියල් 250කට 300කට වාහනයක් කුලියට ගන්න තිබුණු කාලයේ, ටෙලි නාට්‍ය episode එකකට රුපියල් 1,75,000ක් රුපියල් 2,00,000ක් ගෙවලා තිබෙනවා. හැබැයි, අද වාහනයකට රුපියල් 5000ක 6000ක කුලියක් ගෙවන්න වෙලා තිබෙන කොට, ප්ලේන් ටී එකකට රුපියල් 15ක් ගෙවන්න තිබෙන කොට ටෙලි නාට්‍ය මිලදී ගන්නා මිල පමණක් අඩු වෙලා තිබෙනවා. නිෂ්පාදන වියදම වැඩි වෙලා, ටෙලි නාට්‍ය episode එකක් ගන්න මිල අඩු වෙලා. ඒ නිසා මොකද වෙන්නේ? ඒ නිසා දැන් සියලුම අධ්‍යක්ෂවරු හා නිෂ්පාදකවරුන් පෙළැඹිලා සිටින්නේ ටෙලි නාට්‍යයක් නිර්මාණය කරනවා වෙනුවට "ටෙලි කොත්තු" හදන්නයි. දැන් ටෙලි නාට්‍ය "හදනවා." ටෙලි "ගහනවා." ටෙලි කොත්තු හදනවා. විශාල ප්‍රේක්ෂක සනුහරයක් සාලයට ගෙනැල්ලා ඇහේ වද්දන ටෙලි නාට්‍යවල ගුණාත්මකභාවය අඩු වෙන්න ඒ කාරණා තමයි බලපා තිබෙන්නේ.

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. අද මේ වෙලි නාට්‍යවල මිල තීරණය කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, මේ වෙලි නාට්‍ය මිලදී ගන්නා රූපවාහිනී නාලිකායි. නමුත් මීට කලින් තිබුණු ක්‍රමය මොකක්ද? කලින් තිබුණු ක්‍රමය අනුව ඒ ගුවන් කාලය යම් තනි අනුග්‍රාහකයෙක් ගත්තා. ඒ කාලය තුළ වෙලි නාට්‍ය විකාශනය කළා. නමුත් අද රූපවාහිනී නාලිකා වෙලි නාට්‍ය මිලදී ගන්නවා. මිලදී අරගෙන ඔවුන් ඒ සඳහා දැන්වීම් හොයනවා. ඔවුන් කොච්චර දැන්වීම් හොයනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය මීට කලිනුත් සාකච්ඡා කළා. වෙලි නාට්‍යයක් දැන් පෙන්වන්නේ පැය භාගයෙන් කොච්චර කාලයක්ද? අපට නාට්‍ය බලන්න පුළුවන් පැය භාගයෙන් විනාඩි 16යි නැත්නම් විනාඩි 17යි. විනාඩි 17ක් බැලුවත් හොඳයි වාගේ තමයි අපට හිතෙන්නේ. ඒ නිසා ජනතාව දැන් කියන්න පුරුදුවෙලා සිටිනවා, "වෙලි නාට්‍යයක් අතර දැන්වීම් බැලුවා නොවෙයි, දැන්වීම් අතර වෙලි නාට්‍යය කැලි කීපයක් බැලුවා"ය කියන්න. විනාඩි 15කට, විනාඩි 16කට අද නාට්‍ය සීමාවෙලා තිබෙනවා. වෙලි නාට්‍යයක් විකාශනය කරනකොට රූපවාහිනී තිරයේ යටින් දැන්වීම් දමන බව ඔබතුමාත් දන්නවා. මුලදී ඒ දැන්වීම් දැම්මේ රූපවාහිනී තිරයේ යටින් විතරයි. දැන් රූපවාහිනී තිරයේ දෙපැත්තෙනුත් දැන්වීම් දමනවා. ආපසු තිරයේ උඩිනුත් දැන්වීම් දානවා. අපි අහල් 24 රූපවාහිනියක් මිලදී ගත්තාට, අපට වෙලි නාට්‍යය බලන්න වෙන්නේ රූපවාහිනියේ පොඩි කෑල්ලක. මේ ගැන හිතන්න. පසු තල නිර්මාණයට රුපියල් ලක්ෂ ගණන් වියදම් කරලා, හොඳින් රූප රචනය කරලා, අධ්‍යක්ෂවරයා රංගන ශිල්පීන් මෙහෙයවාගෙන අපට හොඳ රූපයක් පෙන්වන්න උත්සාහ කරනවා. හැබැයි, වෙලි නාට්‍ය පෙන්වන කොට රූපවාහිනියේ තිරය මැද්දෙනුත් advertisement එකක් දමනවා. තිරයේ මැද්දෙනුත් කකුළුවෙක් හරි, මකුළුවෙක් හරි, පණුවෙක් හරි මොකෙක් හරි එනවා. ඒකත් advertisement එකක්. වෙලි නාට්‍යය පෙන්වන කාලයත් අඩු කරලා, වෙලි නාට්‍යය පෙන්වන තිරයේ ප්‍රමාණයත් අඩු කළාට පස්සේ වෙලි නාට්‍යයට කල දසාවක් යයිද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර තැන්වල ගෘහ භාණ්ඩ ගත්ත කෙනා, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කියන එක ඇත්ත. නමුත් දැන් ඔබතුමාට ලැබී ඇති වේලාව අවසානයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මට තව විනාඩියක් දෙකක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා වැඩිපුරත් කථා කළා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ වේලාව මම ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට කථා කරන්න තිබෙන වේලාව ගැන සඳහන් වෙලා නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
එතුමාගේ නම කථික ලැයිස්තුවේ තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාගේ වේලාවත් ඔබතුමා ගත්තා ලු. කමක් නැහැ, ඔබතුමා කථා කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වෙලි නාට්‍ය සඳහා ගෘහ භාණ්ඩ සපයන, ගෙදර ලබා දෙන, ඇඳුම් ටික ලබා දෙන කෙනාට ස්තුති කරන්නවත් දැන් ඉඩක් නැහැ. දැන් බොහෝ වෙලි නාට්‍ය ආරම්භ කරනකොට නාට්‍යයේ නම දානවා; episode එක දානවා. කලින් වාගේ ස්තුතිය පළ කිරීමක් හෝ නළු නිළියන් ගැන තොරතුරු මොකක්වත් දමන්නේ නැහැ. හෙට අනිද්දා වනකොට නාට්‍යයේ නමත් අයින් කරලා දමන තැනට පත් වේවි. සම්පූර්ණයෙන්ම දැන් වෙලි නාට්‍ය වෙළෙඳාමක් බවට පත් වෙලා තිබෙනවා.

අපි විදේශීය වෙලි නාට්‍ය ගැන කථා කළා. හවස 6.30 ඉඳලා රෑ 10.00 වන තුරු ගත්තොත් මේ belt එකෙන් වැඩි පැය ගණනක් වෙන් වෙන්නේ විදේශීය වෙලි නාට්‍ය - මෙගා වෙලි නාට්‍යය - සඳහායි. අපේ ප්‍රධාන ඉල්ලීම මෙයයි. වෙලි නාට්‍යවල ගුණාත්මක තත්ත්වය වර්ධනය කරන්න, ජනතාවට උසස් රස විඳදනයක් ලබා දෙන්න යම් ව්‍යවස්ථාපිත ආයතනයක් ඇති කළ යුතුයි. ඒ ආයතනය මඟින් වෙලි නාට්‍ය සහ වෙලි නිෂ්පාදන වර්ගීකරණයක් කළ යුතුයි. ඒ වර්ගීකරණය අනුව අවම මිලක් තීරණය කළ යුතුයි. ඒ අවම මිල තීරණය කළාට පස්සේ නාලිකාවලට පුළුවන් තමන්ට කැමැති විධියට ඒ වෙලි නාට්‍ය මිලදී ගන්න. ඒ විතරක් නොවෙයි, වෙලි නාට්‍යයක් විකාශනය කරන්න තිබෙන කාලය පිළිබඳව ඒ මණ්ඩලයට තීන්දු කරන්න පුළුවන්. එවැනි මණ්ඩලයක් නිර්මාණය කර ගැනීමකින් තොරව අපට මෙතැනින් එහාට යන්න බැහැ, ගරු ඇමතිතුමනි. අපි මේ යෝජනා කරන දේවල් ජාතික රූපවාහිනියෙන් වාගේම ස්වාධීන රූපවාහිනියෙන් පටන් ගන්න කියලා ඔබතුමාට කියනවා. දැන් ජාතික රූපවාහිනියත් පෞද්ගලික නාලිකා වාගේම episode එකට ගෙවන ගණන අඩු කරලා තිබෙන්නේ. ජාතික රූපවාහිනිය තමයි මේ රටේ කොරියන්කරණය ආරම්භ කළේ. මේ යෝජනාත් සැලකිල්ලට අරගෙන, කලාකරුවන්ගේත් උදවු අරගෙන, කලාව නහා සිටුවීම වෙනුවෙන් අපි කටයුතු කරන්න ඕනෑ. අපි අද මේ කරන විවාදයෙනුත් යම් ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා යම්කිසි ක්‍රියාමාර්ග ප්‍රමාණයක් අනුගමනය කරමු කියලා මා කියනවා. මට වැඩිපුරත් කාල වේලාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා.

[අ.හා. 2.20]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එතුමාගේ කථාව මම අහගෙන හිටියා. එතුමා ඉතා වැදගත් දෙයක් කිව්වා. විවෘත සහ සන්සුන් මනසකින් මේ සම්බන්ධයෙන් අපි බලන්න ඕනෑ කියලා එතුමා කිව්වා. මම කියනවා, ඒක හොඳ ප්‍රවේශයක් කියලා.

ඒ වාගේම මට පෙර කථා කළ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම කලා මණ්ඩලයක් මඟින් මේ නාට්‍ය පිළිබඳව විනිශ්චයක් ලබා දීම සඳහා - පොලිස්කාර වැඩේ කරන්න නොවෙයි - යම්කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා මා හිතනවා. ඒක ඉතා වැදගත් යෝජනාවක් හැටියට මා අනුමත කරනවා වාගේම පිළිගන්නවා.

කලාව හා සාහිත්‍යය සම්බන්ධයෙන් සංවාදය සංවිධානාත්මකව පටන් ගෙන දැනට අඩු ගණනේ අවුරුදු 2,500කට කිට්ටු වෙනවා. කලාව පිළිබඳව ටෝල්ස්ටෝයි ලියපු විචාරාත්මක කෘතියත්, ඒ වාගේම කලාව පිළිබඳව ඉන්දියාවේ භාරතයේ ලියපු මූලික කෘතිත් අරගෙන බැලුවාම මේ පිළිබඳව ඉතා දීර්ඝ කාලයක පටන් සංවාද ඇති වෙලා තිබෙන බව පෙනෙනවා. මුල් යුගයේ කලාව පිළිබඳව ඇති වුණු මූලික සාකච්ඡාවෙන් ඉදිරිපත් වුණේ, "කලාව තිබෙන්නේ චින්දනය සඳහා, විනෝදය සඳහා හා රසාස්වාදනය සඳහායි" කියන එකයි. ටෝල්ස්ටෝයි සහ බොහෝ ආගමික භාවිතාවන් විසින් කලාව අනවශ්‍ය දෙයක් හැටියට නිර්වචනය කරනු ලැබුවා. විශේෂයෙන්ම ටෝල්ස්ටෝයිගේ මතය පසු කාලීනව ඇරිස්ටෝටල් විසින් වෙනස් කරනු ලැබුවා. කෙසේ වුවත්, මෙහි ඉතාම තීරණාත්මක අවධිය ආවේ මාක්ස්වාදී විචාර කලාව බිහි වුණාට පස්සේයි. කලාව යනු සමාජය සඳහාය, ජනතාවගේ විමුක්තිය සඳහාය කියන මතය ඉතා ශක්තිමත්ව ගොඩ නහනු ලැබුවා. ඒ මතය ලංකා සමාජය ප්‍රමුඛ විශේෂයෙන්ම දකුණු ආසියානු සමාජයේ තවමත් පවතිනවා. අද ලංකාවේ පවා ප්‍රබුද්ධ විචාරකයන් තවමත් සිනමා කෘති, කලා නිර්මාණ නිර්මාණය කරන්නේ වාමාංශික නැඹුරුවක් සහිතවයි.

කෙසේ වෙතත්, කලාවේ මතවාදය කුමක්ද කියන එක සමස්තයක් විධියට කෙටියෙන් කිව්වොත්, කලාව කියන එක නිකම් අපේ ශාරීරික කලාවක්, හුදු ශබ්ද ගොඩක් බවට පත් වෙලා තිබෙනවා. සංගීත ක්ෂේත්‍රය ගත්තොත්, සංයමයක් සහ විචාරයක් නැති, සංවේදිතාවක් නැති, ශරීරයට සංවේදී වන සංගීතයක්, විශේෂයෙන්ම ජනප්‍රිය සංගීතයක් තමයි අද බිහි වෙලා තිබෙන්නේ. ඒ වාගේම සිනමාව තුළින් උසුළු විසුළු සහ පවුල්වල තිබෙන ආරවුල් කිසිම විචාරයකින් තොරව පුනරුපණය කිරීමක් සිදු වනවා.

විශේෂයෙන්ම ඉන්දියානු ටෙලි නාට්‍ය සහ ලංකාවේ බිහි වන බොහෝ ටෙලි නාට්‍ය සමාජයට කිසිම පණිවුඩයක් නොදෙන, නිකම්ම නිකම් කථා පෙළක් බවට පත් වෙලා තිබෙනවා. 1970 සහ 1980 දශකයේ ඉතා ඉහළ සිනමා රසිකයන් අපට සිටියා. ඒ වාගේම පුංචි රටක් හැටියට අපට සිනමා නිර්මාණ විශාල ප්‍රමාණයක් බිහි කරන්නට පුළුවන්කම ලැබුණා. නමුත් අද වන කොට ඒ සිනමා කලාවෙන් බැහැර වුණු යම්කිසි බිඳ වැටීමක් දකින්නට තිබෙනවා.

විශේෂයෙන්ම මා මුලින් කිව්වා, සෝවියට් දේශයේ හොඳම සිනමා කෘති, හොඳම සාහිත්‍ය කෘති බිහි වුණේ සමාජවාදය බිහි වුණාට පස්සේ නොවෙයි; සෝවියට් විප්ලවයට ප්‍රථමයි කියලා. ඇන්ටන් චෙකෝෆ්, මැක්සිම් ගෝර්කි වැනි බොහෝ නවකථාකරුවන්, කෙටිකථාකරුවන් බිහි වුණේ පූර්ව සෝවියට් යුගයේදීයි. ඒ වාගේම දෙවන ලෝක යුද්ධයේ අද්දර සහ ඊට පූර්ව යුගයේ බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් වැනි අය කලාව සම්බන්ධයෙන් ගෙනාපු මතවාද බොහොමයක් සැකසුණේ රාජ්‍ය බලයත් එක්ක නොවෙයි, විකල්ප සමාජ ධාරාවන් එක්කයි. මා මෙහිදී අදහසක් දක්වමින් කියා සිටින්නේ, ප්‍රගතිශීලී දේශපාලන ව්‍යාපාරවලට සහ සමාජ ව්‍යාපාරවලට යම්කිසි දෙයක් කළ හැකිව තිබෙන බවයි. ලංකාව තුළ රාජ්‍ය වාගේම අපි ඒ වගකීම භාර ගත යුතුයි කියන එකයි, මගේ අදහස.

ආධ්‍යාත්මික සංවර්ධනය ගැන අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඒ ගැන මා ඉතාම සතුටු වනවා. අපි ආධ්‍යාත්මික සංවර්ධනය කියා කිව්වාට, ආධ්‍යාත්මික සංවර්ධනය කියන්නේ කුමක්ද කියා නිර්වචනය කර ගෙන නැහැ. ආධ්‍යාත්මික සංවර්ධනය කියන එක එන්නේ කොතැනින්ද? "කුංෆු" කියලා මෙගා ටෙලි මාලාවක් විකාශනය වුණා, මට මතක හැටියට ජාතික රූපවාහිනියෙන්. පසුගිය කාලයේ එහි රඟ පෑ නළුවාත් මිය ගියා.

ආධ්‍යාත්මික ටෙලි නාට්‍ය සම්ප්‍රදාය කොහොමද බිහි කරන්නේ කියන එකට එය ඉතා හොඳ උදාහරණයක්. සෑහෙන තරුණ පිරිස ඒ නාට්‍යය නැරඹුවා. ඒ නාට්‍යයේ හොඳ ප්‍රවේශයක් තිබුණා. ආධ්‍යාත්මික සිනමාව කියන එක, ආධ්‍යාත්මික කලාව කියන එක බිහි වීමේදී බෞද්ධ සංගීතය, බෞද්ධ සිනමා කලාව හා බෞද්ධ විචාර කලාව කියන එක ඉතා වැදගත් වන බව මා කියන්න කැමැතියි. අපේ රට බෞද්ධ රටක් වුණාට, බෞද්ධ කලා විචාරය කුමක්ද කියන එක අපට සමාජගත කර ගන්න බැරි වෙලා තිබෙනවා. මා හිතනවා, බෞද්ධ කලා විචාරයට සමීප කෙනෙක් තමයි බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් කියලා. "හඬන්න හෝ හිනාවෙන්න නොවෙයි ටෙලි නාට්‍යයක් හදන්නේ. නාට්‍යයක් හදන්නේ, සිනමා කෘතියක් හදන්නේ අපි ඒ නාට්‍යයට වශීකෘත නොවී මධ්‍යස්ථ හිතකින් එය නරඹා එහි පණිවුඩය කොහොමද උකහා ගන්නේ කියන එකටයි" කියන එකයි බර්ටෝල්ට් බ්‍රෙෂ්ටිගේ කලා විචාරය තුළ මූලික වශයෙන් තිබුණේ. එය තමයි, බෞද්ධ කලා විචාරයට ගැලපෙන, ඉතාම උචිත, ඉතාම වැදගත් දේ කියලා මා කල්පනා කරනවා.

විශේෂයෙන්ම ආධ්‍යාත්මික මිනිසකු හදද්දී කලාව විකල්ප සමාජ කලාවක් විධියට ඉදිරියට ගෙනෙන්නේ කොහොමද? එක කාලයක හත්තොටුවේගමගේ වීදි නාට්‍ය ආවා. නමුත් ඒවා ඉදිරියට ගියේ නැහැ. මා හිතන හැටියට අද සමාජයේ මිනිසුන් රූපවාහිනී පෙට්ටියෙන් එළියට ගන්න නම් ග්‍රාමීය සංස්කෘතිය ඇතුළේ ජනතාවාදී කලාවක් ඉදිරියට ගන්න සිදු වනවා. අපේ සම්ප්‍රදාය තුළ කොයි වාගේ දේවල්ද තිබුණේ කියලා අපි සාකච්ඡා කළ යුතු වනවා. පසු කාලයකදී මනමේ, සිංහබාහු වැනි නාට්‍ය පෝෂණය වෙන්න විශේෂයෙන් අපේ තොවිල්-පවිල් වාගේ දේවල් බලපෑවා. ඉන්දියාවේ සංගීතය පැත්තෙන් අරගෙන බැලුවොත්, ඉන්දියවේ හින්දු ආගම සහිතව බිහි වන හින්දු සංගීතය, විශේෂයෙන්ම ආගමික සංගීතය කියන එක ඉතාම ප්‍රබල සංගීතයක්. විශාල ජන කණ්ඩායම් අද ඒ සංගීතය අහනවා. ඒකෙන් තමයි ආධ්‍යාත්මික සංගීතය කියන එක බිහි වුණේ. ඒ වාගේම චීනය කියන්නේ ගැඹුරු ආධ්‍යාත්මික සංගීත සම්ප්‍රදායයක් තිබෙන රටක්. අද internet එක අරගෙන බැලුවොත් ආධ්‍යාත්මික සංගීතය කියන්නේ කුමක්ද කියලා අපට බලාගන්න පුළුවන්. මෙන්න මේවා පිළිබඳව අපි අධ්‍යයනය කරන්න ඕනෑ. ඒ අතරින් අපි අධ්‍යයනය කළ යුතු පළමුවෙනි කරුණ වන්නේ අද අපට මේ සම්බන්ධයෙන් ප්‍රබල සහරාවක් නොමැතිකම. ඒ වාගේම අපට මාධ්‍යයක් නැහැ; සාකච්ඡාවක් නැහැ; ලියන්න මිනිස්සු නැහැ. මේ සම්බන්ධයෙන් ලියන්න; ප්‍රකාශ කරන්න අද අපට වග කීමක් පැවරිලා තිබෙනවා කියලා මම හිතනවා.

ආගමික සංගීතය ඉතාම වැදගත් දෙයක් කියලා මම කිව්වා. මිනිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනයක් ඉලක්ක කර ගත් යම් කිසි සංගීතයක් හෝ නාට්‍යය සම්ප්‍රදායක් බිහි වනවා නම් හොඳයි. ජෝන් ද සිල්වාගේ නාට්‍ය සම්ප්‍රදාය මුලින්ම ආවේ අපේ ජාතක කථා සාහිත්‍ය පදනම් කර ගෙන කියලා අපි දන්නවා. අපි ගනිමු මනමේ නාට්‍ය. "මනමේ" බිහි වුණේ ජාතක කථාවක් පදනම් කර ගෙනයි. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ "හුණුවටයේ කථාව" බිහි වුණේ චීන බෞද්ධ කථාවක් පදනම් කර ගෙනයි. ඒ විධියට ආගමික සාහිත්‍ය තුළින් අපට කොතරම් දේවල් ගන්න පුළුවන්ද? අවාසනාවකට වාගේ අද වෙලා තිබෙන්නේ මොකක්ද? ආගමික සාහිත්‍ය, ඉතිහාසය, චිත්‍රපට ආදිය නාට්‍ය කලාවක් බවට පත් කරද්දි කිසිම විචාරයකින් තොරව; ඒ වාගේම එහි තිබෙන ගුණාත්මකභාවය පිළිබඳව කිසිම අදහසකින් තොරව අපි ඒක අතට ගන්නවා.

ලෝකයේ විමුක්තිකාමී සාහිත්‍යයන් දෙකක් තිබෙන බව මා දකිනවා. ඉන් එකක් තමයි, පූර්ව සෝවියට් යුගයේ බිහි වුණු විමුක්තිකාමී සාහිත්‍යය. ඇන්ටන් චෙකොෆ් හරහා, ඒ වාගේම මැක්සිම් ගෝර්කි හරහා ඉදිරියට ආපු සාහිත්‍යය. දෙවෙනි එක තමයි, බෞද්ධ සාහිත්‍යය. බෞද්ධ සාහිත්‍යය තුළ ඉහළ ගුණාත්මකභාවයක්, විමුක්තිකාමී බවක් තිබුණා. අපි ජාතක පොත පිළිබඳව කථා කරනවා නම්, "ජාතක පොත" කියලා කියන්නේ පීඩිතයන්ගේ විමුක්තිය සහ දුක්ඛ වේදනාවන් සමාජගත කිරීමට බිහි වුණු සාහිත්‍යයක්. කාන්තාවන්ගේ මූලික සමාජ ගැටලු සමාජය තුළ සාකච්ඡා කරපු සාහිත්‍යයක්. ජාතක කථා බොහොමයක් අපට තිබෙනවා. ලංකාවේ මේ දේවල් පිළිබඳව ඉතා ගැඹුරු සාකච්ඡාවක් පූර්ව යුගයේ තිබුණා. අවාසනාවකට වාගේ අද විශ්වවිද්‍යාලවල මේ සාකච්ඡාව නැහැ. අපේ විශ්වවිද්‍යාලවලට වෙලා තිබෙන්නේ මොකක්ද කියලා මම දන්නේ නැහැ. අපි විශ්වවිද්‍යාලයේ සිටි කාලයේ "නාට්‍ය වළ" කියලා එකක් තිබුණා; "නාට්‍ය සති" තිබුණා. අද ඒවා තියෙන්නත් වාලේ තිබෙනවා. ඒවායේ ගැඹුරු සාකච්ඡාවක්වත් නැහැ; සිනමා විචාරයක් පිළිබඳ කතිකාවතක්වත් නැහැ. මේකට අපි කරන්න ඕනෑ කුමක්ද?

මට ලැබී තිබෙන මේ කෙටි කාලය තුළ මම යෝජනා කීපයක් කරන්න කැමැතියි. ලංකාවේ සිටින සියලුම පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කලාව හා සාහිත්‍යය ඉගැන්වීමේ වැඩ පිළිවෙළක් අප තුළ තිබෙන්න ඕනෑ. අපි ජපානය ගත්තොත්, ජපානයේ සෑම ශිෂ්‍යයෙකුටම සංගීත භාණ්ඩයක් වාදනය කරන්න පුළුවන්. ඒක තමයි ජපානය හදපු දේ. අපේ සමහර අයට තාලයකට අත්පුඩියක්වත් ගහන්න බැහැ. මොකද, සමහර අයට උපතින්ම ඒ කුසලතාව නැහැ. නමුත්, ජපානයේ හැම දරුවෙකුටම ඔවුන්ගේ පාසල් අධ්‍යාපනය තුළදී කුමන හෝ සංගීත භාණ්ඩයක් වාදනය කිරීමේ හැකියාව ඇති කරනවා. මම හිතන්නේ මෙන්න මේ ක්‍රමය අපි අතට ගන්න ඕනෑ. ඒ වාගේම අපේ පාසල්වල 10, 11 පන්තිවලින් පස්සේ සාහිත්‍ය කලාව හා සම්බන්ධ මොකක්වත්ම නැති වනවා. ඊට පස්සේ අපි විෂය ධාරාව කොටස් තුනකට බෙදා තිබෙනවා. නමුත්, අපේ පාසල්වල 12 පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ඉංජිනේරු පීඨයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කලාව, සංගීතය ඉගෙන ගන්නවා. මම විශ්වවිද්‍යාලයේ සිටි කාලයේ ලැබූ හොඳම අත් දැකීම තමයි, ගණිත විෂයට ඉතාම දක්ෂ ශිෂ්‍යයෝ ළඟ තමයි කලා කුසලතාව තිබෙන්නේ කියන එක. ඉංජිනේරු පීඨවල, වෛද්‍ය පීඨවල විශාල කලා කුසලතා තිබෙන අය ඉන්නවා. හැබැයි, ඔවුන්ට පූර්ව මූලික අධ්‍යාපනයක් නැහැ. ඒ නිසා සියලුම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් පොදුවේ කලාව සහ සාහිත්‍යය හැදෑරිය යුතුයි කියන එක මා මෙහිදී යෝජනා කරන්න කැමැතියි. අද පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ හෝ කුමන විශ්වවිද්‍යාලයක වේවා සෞන්දර්යය පීඨවල තත්ත්වය කුමක්ද?

අද ලංකාවේ තිබෙන විශාකා විද්‍යාලය, ආනන්ද විද්‍යාලය වාගේ ප්‍රමුඛ විද්‍යාල ගත්තොත් ඒවායේ ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් කී දෙනෙක් සංගීතය හදාරනවාද? අතීතයේ මධ්‍යම පන්තික පවුලක් ජීවත් වන ගෙදරක පියානෝවක් තිබුණා. ඒක නිකම් විලාසිතාවක්. අද වනකොට එහෙම විලාසිතාවක් මධ්‍යම පන්තියට නැහැ. අද මධ්‍යම පන්තියේ කලාව හා සාහිත්‍ය වෙලා තිබෙන්නේ nightclub ගිහිල්ලා පිස්සු නටන එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබවහන්සේට තව විනාඩියක් තිබෙනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මේ සම්බන්ධයෙන් අධ්‍යාපනය තුළ අපි කරන ප්‍රතිසංස්කරණය කුමක්ද කියන එක මෙහිදී ඉතාම වැදගත් වනවා කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කරුණු පැහැදිලි කරමින් ඉතා වැදගත් අදහසක් ඉදිරිපත් කළා, මේ සම්බන්ධයෙන් මණ්ඩලයක් තිබෙන්න ඕනෑය කියලා. ටෙලි නාට්‍ය ඇතුළු සෑම දෙයකටම ඒ මණ්ඩලය විසින් යම් කිසි විනිශ්චයක් ලබා දිය යුතුයි කියලා එතුමා කිව්වා. ඒක ඉතා වැදගත් යෝජනාවක්. රජය ඒ යෝජනාව ඉදිරියට ගෙන ගියොත් හොඳයි කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා කිව යුතු දෙයක් තිබෙනවා. කලාකරුවන් පිළිබඳ ඇගැයීම ඉතා වැදගත් වනවා. අපේ රටේ වයසට ගිය කලාකරුවන් ඉන්නවා. ඔවුන්ගේ මුළු ජීවිත කාලයම කලාව වෙනුවෙනුයි ගත වුණේ. නමුත්, ඔවුන්ට කිසිම විශ්‍රාම වැටුපක් නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට පාර්ලිමේන්තුවේ අවුරුදු පහක් හිටියාට පස්සේ අපට විශ්‍රාම වැටුපක් දෙනවා. කලාකරුවෙකු ජීවිත කාලයම කැප කරලා කලාව හදාරා තිබෙනවා. හැබැයි, ඔහුගේ සංරක්ෂණය වෙනුවෙන් අපට වැඩ පිළිවෙළක් නැහැ. විශේෂයෙන්ම ජාතික වශයෙන් වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරපු සියලුම කලාකරුවන්ට සංරක්ෂණ වැඩ පිළිවෙළක් රටක් විධියට අපි ලබා දිය යුතු වනවා. ඔවුන්ට ජීවත් වන්න ගෙයක්ද, ජීවත් වීම සඳහා යැපුම් මාධ්‍යයක්ද ඇතුළුව ඔවුන්ගේ මූලික අවශ්‍යතා අපි සපුරන්න ඕනෑ. වයසට ගිය කලාකරුවෝ අද ඉතාම අන්ත අසරණව ජීවත් වන ආකාරය මා දකිනවා. එදිනෙදා ආහාර වේල පවා සපයා ගන්න බැරි කලාකරුවෝ කීප දෙනෙක්ම මම දන්නවා. අපි ඔවුන්ට පෞද්ගලිකව උදව් කරලා තිබෙනවා. අපි තවමත් අහන්නේ පැරණි ගායක ගායිකාවන්ගේ සින්දු. නමුත් ඒ කලාකරුවන්ට ඉන්න ගෙයක් නැහැ. දරුවෝ ළඟට වෙලා ඉතාම අසරණව ජීවත් වන කලාකරුවෝ ඉන්නවා. ඒ නිසා කලාකරුවන්ට යම් කිසි දීමනාවක්, රැකවරණයක් ලබාදීම රාජ්‍යයක් හැටියට අපේ වග කීමක් කියා මා කල්පනා කරනවා.

විශේෂයෙන්ම අද කථා කළ ඉතා වැදගත් ප්‍රශ්නයක් තමයි, අපි අනුකරණය කරන විදේශීය චිත්‍රපට හා ටෙලි නාට්‍ය. විශේෂයෙන්ම අපි ටෙලි නාට්‍ය ගෙන්වා ගන්න කොට අනිවාර්යයෙන්ම ඒ සඳහා යම් කිසි ප්‍රමිතියක්, ජාතික වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. මොකද හේතුව, අපේ දරුවන්ට, අපේ සමාජයට බලපාන්නේ ඔවුන් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් දකින දේ, බලන දේ. එම නිසා ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි.

අවසාන වශයෙන් මට කිව හැක්කේ, අපේ සමාජයක් මනින මිනුම් දණ්ඩ වන්නේ ගොඩනැඟිලි හා යාන්ත්‍රික වස්තු නොවන බවයි. සමාජයක ගුණාත්මකභාවය පිළිබඳ නිර්ණායකය තමයි,

[ගරු (මූජා) අතුරලියේ රතන හිමි]

සමාජයට කෙතරම් කලාත්මක රසවින්දනයක් කළ හැකිද, ඔවුන්ගේ සාහිත්‍ය කොතරම් ප්‍රබලද, ඒවාට ඇහුම් කන් දීමට ඔවුන් කොතරම් සූදානම්ද කියන එක. ඒ මත තමයි ජාතියක වටිනාකම මනින්නේ. අපි ඉතාම පහළ මට්ටමකට අද වැටිලා තිබෙනවාය කියා මම හිතනවා. අපේ ආර්ථික ඉලක්කම්වලට සාපේක්ෂව ගත්තාම 1970-1980 දශකයේ අපි හුහක් ඉදිරියෙන් සිටියා. අපි ආර්ථිකයෙන් මහා ඉහළට නොගියත්, එදා ඒ තත්ත්වය තිබුණා.

සමහර අය කියනවා, ආර්ථික අතිරික්තයේ ප්‍රතිඵලයක් ලු කලාව හා සාහිත්‍ය. නැහැ, එහෙමම නොවෙයි. ආර්ථික අවපාතය තිබුණු රටවල්වල තමයි කලාව හා සාහිත්‍ය බිහි වුණේ. මම මුලින්ම කිව්වා, හොඳම කලා දියුණුව තිබුණේ පූර්ව සෝවියට් යුගයේ බව. සෝවියට් විප්ලවයෙන් පස්සේ ඇති වුණු කලා දියුණුවක් ගැන අපට කථා කරන්න බැහැ. ඇමෙරිකාවේ විශාල ආර්ථික අතිරික්තයක් තිබුණා කියලා මහා කලා කෘති බිහි වුණාය කියා අපට කියන්න බැහැ. ඒ නිසා අද අපේ වගකීම තමයි, ප්‍රබුද්ධ සමාජ කණ්ඩායම් හැටියට විකල්ප සමාජ ව්‍යාපාර විසින්, විශේෂයෙන්ම ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාර විසින්, දේශපාලන ව්‍යාපාර විසින් අලුත් කථිකාවතක් තුළ, අලුත් වැඩ පිළිවෙළක් තුළ කලාව හා සාහිත්‍ය ඉදිරියට ගෙනයාම. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 2.30]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)
බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විනාඩි කිහිපයක කාලයක් පමණයි මට කථා කරන්න හැකි වෙන්නේ.

මම මූලික වශයෙන්ම කාරණා දෙකක් පිළිබඳව කරුණු දක්වන්න කැමැතියි. එකක් තමයි, බොහෝ දෙනා සාකච්ඡා කළා පැරණි සිනමා කෘති - film archives - දැන් වෙනකොට නාස්තිවෙලා, ඒවා බලන්න ක්‍රමයකුත් නැහැ, ඒවා ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ගැන කිසි කෙනෙක් කථා කරලා නැහැ කියලා. ඒ වාගේම සිනමාශාලා ඩිජිටල්කරණය ගැන සාකච්ඡා වුණා. අපට ගමේ සිනමාශාලා ඩිජිටල්කරණය කරන්න පුළුවන් නම් ඒක ඉතාම වැදගත්. කොළඹ නගරයේ සිනමාශාලා කිහිපයක් පමණයි ඩිජිටල්කරණයට ලක්කර තිබෙන්නේ. මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් මේ ක්ෂේත්‍රය තව දුරටත් දියුණු කරන්න පුළුවන් වෙයි කියා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි මේ පිළිබඳවත් ඔබතුමාව දැනුවත් කරන්න. පළමුවැනි වතාවට තමයි අපි Cannes Film Festival එකට සහභාගි වුණේ. ඇත්ත වශයෙන්ම මමත් ඒකට සම්බන්ධ වුණා; තල්ලු කළා, මේ වැඩේ කළ යුතුයි කියලා. Cannes Film Festival එක කියන්නේ ප්‍රංශයේ පවත්වන ලෝකයේ වැඩිම පිළිගැනීමක් තිබෙන සිනමා උළෙල. Cannes Film Festival එකේදී ලැබෙන සම්මාන තමයි සාමාන්‍යයෙන් ඉහළම සම්මාන හැටියට සලකන්නේ. සිනමා කෘතියකින් මුදල් හම්බ කරනවාට වඩා වැදගත්, එහි ඇති ගුණාත්මකභාවය පිළිබඳව තමන්ගේම සගයෝ විසින් තමන්ට ලබාදෙන සම්මාන. අවුරුදු 69ක් තිස්සේ Cannes සිනමා සන්දර්ශනය පැවතුණත්, ලංකාව නිල වශයෙන් සහභාගි වුණු පළමුවැනි වතාව තමයි මේ අවුරුද්ද. එහිදී අපි මූලික වශයෙන් කාරණා තුනක් සම්බන්ධයෙන් සාකච්ඡා කළා. මම පෞද්ගලිකවම French National Film Corporation එකට,-

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මන්ත්‍රීතුමිය.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
Cannes Film Festival එකට සහභාගි වුණු කෙනෙක් හැටියට මම කියනවා, සුමිත්‍රා පීරිස් මැතිනියගේ "ලොකු දුව" චිත්‍රපටය තමයි නිල වශයෙන් පළමුවරට තේරී පත්වුණු චිත්‍රපටය කියා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමියනි. Cannes සිනමා උළෙලේදී විමුක්ති ජයසුන්දර Golden Camera Award එකකුත් දිනාගත්තා. ඒක ඔබතුමියට මතක ඇති. ඔබතුමිය කියන එක අපි දන්නවා. ලංකාවේ සිනමා කෘති ඉදිරිපත් වෙලා තිබෙනවා. මම කියන්නේ ඒක නොවෙයි. මම කියන්නේ රටක් හැටියට ශ්‍රී ලංකාව Cannes සිනමා සන්දර්ශනයට නිල වශයෙන් ප්‍රථම වතාවට සහභාගී වුණේ 2016 දී කියන එකයි. ඔබතුමිය නොදැනුවත්ව වෙන්න ඇති ඒ කථාව කිව්වේ. මම ඒක නිවැරදි කළා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
2015 වර්ෂයේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
සමාවෙන්න. 2015 මැයි මාසයේ තමයි ඒක කළේ. ගීතා කුමාරසිංහ ගරු මන්ත්‍රීතුමියට ඒ නිවැරදි කිරීම මම කරන්නට ඕනෑ. ඔබතුමිය සම්බන්ධ වුණු සිනමා කෘති අපි පොඩි දවස්වල - පාසල් යන කාලය සිට- film hallsවල පේලිමේ ඉඳලා ගිහින් බලලා තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. අපි ශ්‍රී ලංකාව නිල වශයෙන් නියෝජනය වෙලා තිබුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමිය.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
සුමිත්‍රා පීරිස් මැතිනියගේ "ලොකු දුව" කියන චිත්‍රපටිය Cannes Film Festival එකට ගියා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක හරි.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
නිල වශයෙන් ගියා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක හරි. ඒ විතරක් නොවෙයි, සුමිත්‍රා පීරිස් මැතිනියගෙන් පස්සේ තව බොහෝ දෙනෙකුගේ සිනමා කෘති ඉදිරිපත් වුණා. විමුක්ති ජයසුන්දරගේ එක් සිනමා කෘතියකට "Golden Camera" සම්මානය හම්බ වුණා. ඊට පස්සේ එතුමාට ලංකාවට එන්න හම්බ වුණේත් නැහැ. ඒක වෙනම දේශපාලන කථාවක්. එතැනට යන්න ඕනෑ නැහැ. මම කියන්නේ, පෞද්ගලිකව ඉදිරිපත් කරන සිනමා කෘති ගැන නොවෙයි. ප්‍රථම වතාවට රට නියෝජනය වුණේ 2015 ජුනි මාසයේයි. මට සිනමාව පිළිබඳ වැඩි අවබෝධයක් නැහැ. සමහරවිට මම කියන දේ වැරැදි වෙන්න පුළුවන්; ඔබතුමිය නිවැරැදි වෙන්න පුළුවන්. නමුත්, මට ලබා දීලා තිබෙන දත්තවලට අනුව, පළමු වතාවට තමයි එහෙම සහභාගි වෙලා තිබෙන්නේ. එහෙම නොවෙයි නම්, එය නිවැරැදි කරන්න. එවිට මා එය පිළිගන්නවා. ශ්‍රී ලංකාව නිල වශයෙන් සහභාගි වුණාද, නැද්ද කියලා ඔබතුමිය මට වඩා යමක් දන්නවා.

අපට පුළුවන් වුණා, ශ්‍රී ලංකාව film location එකක් හැටියට ඉදිරිපත් කරන්නට. "Film village" කියලා එකක් තිබෙනවා. ඉන්දියාව, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, ඊශ්‍රායලය වැනි මේ සියලු රටවල් නිල වශයෙන් ඔවුන්ගේ රට ඒ සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා, "මෙන්න අපේ රටේ කෘති, මෙන්න අපේ රටේ හැකියාවන්, මෙන්න අපේ රටේ කළ හැකි සිනමා පටිගත කිරීම්" යනාදී වශයෙන්. ගරු මන්ත්‍රීතුමිය, ශ්‍රී ලංකාව එවැනි ආකාරයකට මීට කලින් ඉදිරිපත් වී තිබුණේ නැහැ කියලායි මම කියන්නේ. ඒක තමයි "නිල වශයෙන්" කියලා මම සඳහන් කළේ. ඒ සාකච්ඡාවල ප්‍රතිඵල දෙකක් පිළිබඳව මම කියන්නම්.

මගේ කථාව ආරම්භයේදීම මම කිව්වා, පරණ කාලයේ චිත්‍රපටි - archives of old movies - බලන්න බැහැ, හරියට සද්දය නැහැ, වර වර ගානවා, තිරය මත සුදු ඉරි යනවා කියලා. ප්‍රංශ රජය සමඟ එකතු වෙලා, මේවා ලේඛනාගාර ගත කිරීම ආදී ක්‍රම මඟින් එම සිනමා කෘති ආරක්ෂා කිරීම පිළිබඳව 70වැනි Cannes Film Festival සමුළුවේදී එකඟත්වයකට එන්නට අප බලාපොරොත්තු වෙනවා.

දෙවැනි කාරණය, සිනමා ශාලා ඩිජිටල්කරණය. සිනමා ශාලා ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතා, බොහෝ වේලාවට National Film Corporation එක වැනි ආයතනවලට ලබා දෙන්න අපට බැරි වෙලා තිබෙනවා. අපේ වාර්ෂික අය වැයෙන් මේ සඳහා මුදල් වෙන් කරන්න අවුරුදු ගණනක් තිස්සේ අපට හැකියාවක් ලැබිලා නැහැ. ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය හොඳටම දන්නවා, ප්‍රංශ සිනමාව කිව්වාම, ඉතාමත්ම ඉහළ ගණයේ සිනමාවක් බව. අපි කවුරුත් ප්‍රංශ සිනමාවේ ගුණාත්මකභාවය ගැන කථා කරනවා. National Film Corporation of France කියන එකත් එක්ක එකතු වෙලා අපට මේ ඩිජිටල්කරණය ගෙන යන්නට පුළුවන් නම්, ඔබතුමියත්, මේ රටේ සියලුම සිනමා ප්‍රේක්ෂක ජනතාවත් සන්තෝෂ වෙයි කියා මා විශ්වාස කරනවා.

තුන්වැනි එක තමයි, සම නිෂ්පාදන අවස්ථා - co-production possibilities. ප්‍රංශ සිනමා නිෂ්පාදකයන් සමඟ යම් කිසි විධියකට එකතු වෙලා චිත්‍රපට නිෂ්පාදනය කරන්න අපට අවස්ථාවක් ලැබෙනවා. අද මේ සභාවේදී බොහෝ දෙනෙක් ලංකාවේ සිනමාව, ටෙලි නාට්‍ය ගැන කථා කළා. අපේ විදේශ අමාත්‍යාංශය මේ කාරණයට මැදිහත් වුණේ මේ නිසායි, ගරු මන්ත්‍රීතුමියනි. අපි විශ්වාස කරනවා ලංකාවේ සිනමාව ලෝකයට ගෙන යන්න පුළුවන් කියලා. ලංකාවේ සිනමාව ගුණාත්මකභාවයෙන් ඉතාම ඉහළ තැනක තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, ගරු මන්ත්‍රීතුමිය.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
"Nobody's Perfect" කියන එකත් අපි කළේ, ප්‍රංශයත් ලංකාවත් අතර collaboration film එකක් හැටියට. කලින්ම ඒක කරලා තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මොකක්ද ඒකේ නම? මට ඒක ඇහුණේ නැහැ.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
"Nobody's Perfect". ගාමිණී ෆොන්සේකා මැතිතුමා සහ මම ඒකේ රඟපෑවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරියට හරි. ඔබතුමිය ඒක ගැන බොහොම ඉහළින් තමයි කථා කරන්නේ. ඒ කියන්නේ ඔබතුමිය පිළිගන්නවා ඇත්ත වශයෙන්ම එවැනි කෘති ගුණාත්මක භාවයෙන් වැඩියි කියලා. ඔබතුමිය පිළිගන්නවානේ? ඔබතුමියට මතක් වෙලා කිව්වේ, " French co-production එකක් හැටියට ඒක කළා" කියලා. මේ හරහා අපි සමහර වෙලාවට ඔබතුමිය වාගේ ඉහළම තැන්වල ඉන්න නළු නිළියන්ටත් වඩා සාමාන්‍යයෙන් නැඟී එන නළු නිළියන්ටත් අවස්ථාව ලබා දෙනවා. ඒක තමයි අපි මේ උත්සාහ කරන්නට යන්නේ. මේ වැරදි දෙයක් කරනවා නොවෙයි. ඔබතුමිය මට වඩා සිය ගුණයක් සිනමාව ගැන දන්නවා. ඔබතුමියගේ දැනුම අපිත් සමඟ share කරන්න, අපට ලබා දෙන්න. මීළඟ සැසිවාරයේදී ඔබතුමියටත් ආරාධනා කරන්නම්. National Film Corporation of Sri Lanka, Sri Lanka Tourism, Embassy of Sri Lanka in France එකත් සමඟ තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ. ඔබතුමියට මම හැකි නම් ආරාධනා කරන්නම් 70වෙනි කැන්ස් සිනමා උළෙලට ශ්‍රී ලංකාවේ නියෝජිතවරියක ලෙස සහභාගි වෙන්න කියලා. විදේශ අමාත්‍යාංශය හරහා අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට පටන් අරගෙන තිබෙනවා. ඒ තමයි පළමුවෙනි දැනුවත් කිරීම වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවෙනි දැනුවත් කිරීම මෙයයි. සංස්කෘතිය ගැන කථා කරන විට අවුරුදු 2,500ක ඉතිහාසයක් තිබෙන අපේ රටේ ස්ථීර අගනුවරවල් හතරක් තිබුණා. අනුරාධපුරය, පොළොන්නරුව, කෝට්ටේ සහ මහනුවර අපට තිබුණා. අපේ පාර්ලිමේන්තුව පිහිටා තිබෙන කෝට්ටේ පැරණි අගනුවර, -1415 සිට 1565දී අන්තිමට අපි මේක දාලා යනතුරු අවුරුදු 150ක් තිබුණු අගනුවර- ගැන කිසි කෙනෙක් කථා කරන්නේ නැහැ. එහි තිබුණු සංස්කෘතිය, එහි තිබුණු පුරාවිද්‍යා වස්තුවල වටිනාකම් ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. අනෙක්

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

අගනුවරවල් තුනම ලෝක උරුම නගර ලෙස යුනෙස්කෝ ආයතනය පිළිගෙන තිබෙනවා. නමුත් කෝට්ටේට ලැබිලා තිබෙන්නේ කුඩම්මාගේ සැලකිලි.

ඇත්ත වශයෙන්ම කාලයක් තිස්සේ මේවා විනාශ වෙලා තිබෙනවා. පෘතුගීසිකාරයෝ මේක විනාශ කළාට පසුව හොරු ඇවිල්ලා මේක විනාශ කරලා තිබෙනවා. මේවායේ ගල් අරගෙන ගිහින් ගෙවල් හදලා තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය සහ කෝට්ටේ මහ නගර සභාව කියන සියලු ආයතන මේවාට වග කියන්නට ඕනෑ. අපි දන්නවා, කෝට්ටේ කොටු බැම්ම -rampart- එක තිබෙන බව. රජ කාලයේ අගනුවර වටේට හදපු කොටු බැම්ම, බැද්දගානේ තිබෙන mounds, ඒ කාලයේ පරණ විහාරස්ථාන, කෝට්ටේ උමග වාගේ පුරාවිද්‍යා වටිනාකම් සහිත ස්ථාන තිබෙනවා. අඩුම තරමින් අපේ දරුවෝ කෝට්ටේ උමග දැකලා තියා ඒ ගැන අහලාවත් නැහැ. ඒ වාගේම, අපේ රජ මහා විහාරය තිබෙනවා; ගල් අම්බලම තිබෙනවා; අලකේශ්වර නටබුන් තිබෙනවා. මේ සියලු දේ තිබෙනවා. නමුත් ඇයි අපි මෙපමණ කාලයක් තිස්සේ කෝට්ටේ සම්පූර්ණයෙන්ම අමතක කරලා තිබෙන්නේ?

1982දී පාර්ලිමේන්තුව මෙතැනට ගෙනාවාට පසුව කැළේට ගිහින් තිබුණු මේ ප්‍රදේශයේ ඉඩම්වල වටිනාකම වැඩි වුණා. ඉස්සර කාලයේ පර්චස් එක රුපියල් 200ට, 300ට විකුණපු කට්ටිය දැන් කාලයේ පර්චස් එක විකුණන්නට කථා කරන්නේ රුපියල් මිලියන 3ට, 4ට. හොර ඔප්පු ලියන මිනිස්සු දේශපාලන හොරුත් සමඟ එකතු වෙලා, ඒ වැඩ කරන නිලධාරීන් එකතු වෙලා හොර ඔප්පු ලියාගෙන බලයෙන් අල්ලාගෙන, කොටු බැම්ම කඩලා ඒ තැන්වල ගෙවල් හදලා තිබෙනවා. මේ විනාශය දිගින් දිගටම සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නට කැමැති කාරණයක් තිබෙනවා. අපි තෝරා ගත්ත ඉතිහාසය ගැන විතරක් කථා කරන්නට එපා. කෝට්ටේට ලැබිය යුතු අවධානය ලැබිය යුතුයි. මම මෙතැනදී ඉස්මතු කරන්නට හදන්නේ "Conservation and Restoration of Kotte - The Ancient Capital City of Sri Lanka" කියලායි. අපි උත්සාහ කරනවා, රජය ඒ ඉල්ලීම කරනවා. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ මන්ත්‍රීවරියන් සියලු දෙනාගේම උදවු උපකාරත් බලාපොරොත්තු වෙනවා. අවුරුදු 600කට කලින් තිබුණු ඒ ගම්මිර අපේ අගනුවර ගැන අපේ අවධානය යොමු විය යුතුයි. කාල වේලාව ඉක්ම ගිහින් තිබෙන නිසා ඒ කාලයේ සංස්කෘතිය ගැන කියන්නට, ඒ කාලයේ කෝට්ටේ ජීවත් වුණු වැදගත් පුද්ගලයෝ මේ රටට කළ සංස්කෘතික දායකත්වය ගැන කියන්නට මේ අවස්ථාවේදී හැකියාවක් නැහැ. නමුත්, මට අවශ්‍ය කළේ මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්නයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අප ඒ ගැන අමතක කරන්න නරකයි. අවුරුදු 150ක් තිස්සේ තිබුණු අපේ ඒ අගනුවර නැවත සංවර්ධනය කිරීම සඳහා අප සියලුදෙනාගේම අවධානය යොමු විය යුතු බව මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.45]

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිශයින්ම වැදගත්, පෞද්ගලිකවම මගේ හිතට සමීප සිනමාව හා කලාව පිළිබඳව අද දින මේ උත්තරීතර සභාවේදී කථා කරන්නට අවස්ථාවක් ලැබීම මගේ වාසනාවක් කොට සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසුන්ගෙන සිටින ඔය කථානායක ආසනය මීට කාලයකට ඉහත හෙළ සිනමාවේ "සක්විති" ලෙස විරුදාවලිය ලත් ගාමිණී ෆොන්සේකා මැතිතුමා විසින් හෙබවූ ආකාරය අප කාටත් මතකයි. සිනමාවේ සියලුදෙනා වෙනුවෙන් කරන ලද විශේෂ උපහාරයක් ලෙස මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ජාතික ලැයිස්තුවෙන් පත් කරන ලද හෙළ සිනමාවේ අග රැජින ලෙස විරුදාවලිය ලත් මාලනී ෆොන්සේකා මැතිනියත් එදා ගාමිණී ෆොන්සේකා මැතිතුමා සේම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අසුනක් හෙබවූ බව ඔබ සියලුදෙනාම දන්නවා ඇති. ඒ වාගේම නොයෙක් කලාකරුවන් මේ පාර්ලිමේන්තුවට පැමිණියා. ජීවන් කුමාරණතුංග මැතිතුමා, වර්තමානයේ මේ පාර්ලිමේන්තුවේ සිටින රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා වාගේම තවත් කලාකරුවන් කීප දෙනෙක්ම මේ පාර්ලිමේන්තුවට ආවා.

හෙළ සිනමාවේ සක්විති ලෙස විරුදාවලිය ලත් ගාමිණී ෆොන්සේකා මැතිතුමා මේ පාර්ලිමේන්තුවට ආ දිනයේ සිට සිනමාව වෙනුවෙන් එතුමා බොහෝ අවස්ථාවලදී කථා කළ හැටි මට මේ මොහොතේ මතක් වෙනවා. එතුමාට අවශ්‍ය වුණා සිනමාවේ ඉදිරි දැක්ම වෙනුවෙන් යම්කිසි කටයුත්තක් කරන්න. මාලනී ෆොන්සේකා මැතිනියත් ඒ අයුරින් කටයුතු කළ බව මගේ හැඟීමයි. නමුත්, කියන්න කනගාටුයි, ලෝක සිනමාව දෙස බලද්දි පුංචි තිතක් වාගේ තිබෙන පුංචිම පුංචි සිනමා කර්මාන්තයකුයි අපට තිබෙන්නේ. ලෝකයේ ඕනෑම කෙනෙක් සමඟ තරග කිරීමට හැකි දක්ෂකම් සහිත ශිල්පීන් අපට සිටියත්, කර්මාන්තයක් ලෙස ගනිද්දි සිංහල සිනමාව බොහොම කෙටි, පොඩි කර්මාන්තයක්. අඩුම තරමින් මේ ශ්‍රී ලංකාව පුරාමවත් අපේ චිත්‍රපට පෙන්වීමේ පහසුකම් අද නැතිවෙලා ගිහින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිනමාව කලාවක්. ගාමිණී ෆොන්සේකා මැතිතුමා සිනමා ශිල්පීන්ගේ වෘත්තීමය තත්ත්වය ඉහළට නංවන්න එදා තිබුණු සියලු සිනමා සමාගම් සමඟ මහා සටනක් කරලා -මීට කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ.- දිනයට, මාසයට කුලියට වැඩ කරපු ශිල්පීන්ට ගෞරවනීය තත්ත්වයක් ලබා දුන්නා. සිනමාව කලාවක් වාගේම ව්‍යාපාරයක්. සිනමාවට මුදල් ආයෝජනය කරන කෙනෙක් ඊළඟ චිත්‍රපටය සඳහා නැවත මුදල් ආයෝජනය නොකළොත් එයට එතැනින් නැවතීමේ ලකුණ වැටෙනවා. අද සිනමාව දිගින් දිගටම ඉදිරියට යන ඒ අවස්ථා සියල්ල හැකිළී යනවා. මේ පාර්ලිමේන්තුවට පැමිණි කලාකරුවන් සියලුදෙනා ඉල්ලූ දෙයක් තිබෙනවා. මම මෙහිදී කරුණු දෙකක් ගැන මතක් කරන්න කැමැතියි. එදා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ පියගැට පෙළ නගිද්දි මම එක දෙයක් තීරණය කළා. ගාල්ල දිස්ත්‍රික්කයෙන් එකම කාන්තාව ලෙස එම ජනතාව මාව මේ පාර්ලිමේන්තුවට තෝරා පත්කර එව්වා. ඔවුන් ගැන කථා කළත්, මට මගේ වරිගයා ගැන, මගේ දෙවැනි උපත සිදු වූ සිනමාව ගැන කථා කිරීමේ අයිතියක් තිබෙන බව මම එදාත් සාක්ෂාත් කර ගත්තා.

එදා මට අවශ්‍ය වුණා, අපේ හිටපු ප්‍රවීණයන් මේ ගරු සභාව හොබවද්දී, කර ගන්න බැරි වුණු දේවල් පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළ හඬක් නගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේවත්, අදවත් කිසිම ආණ්ඩුවකින් නොකෙරුණ දේ තමයි අපට ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම. සිනමාව, සංස්කෘතිය, කලාව, ටෙලි නාට්‍ය යන මේ සියල්ල රැක ගැනීමට නම් හැකි ඉක්මනින් අපි ඒ සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියකට යන්න ඕනෑ. වතුර ටිකට හෝ වෙනත් ඕනෑම දෙයකට ශ්‍රී ලංකාවේ යම්කිසි ප්‍රතිපත්තියක් තිබෙනවා. සිංහල භාෂාවෙන් චිත්‍රපට, ටෙලි නාට්‍ය සහ නාට්‍ය හැදෙන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාවයි. නමුත් එවැනි රටක කලාවට ජාතික

අනන්‍යතාවක් ඇති කර ගැනීමට කවදාවත් රජයේ මැදිහත්වීමක් ලබා දී නැහැ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන්, විශාල මුදලක් වියදම් කරමින් 'රන්මිහිතැන්න' හැදුවා. ජාත්‍යන්තර චිත්‍රපට නිෂ්පාදනයට එහාට ඒවි යැයි එතුමාත්, අපිත් බලාපොරොත්තු වුණා. ඒ වාගේම ආවා. නමුත් අද තත්ත්වය අතිශයින්ම කනගාටුදායකයි. අද එය වසා දමා, නිකම්ම අතහැර දමා, රන්මිහිතැන්නක් තියෙනවාද නැද්ද කියා දැන ගන්නවත් බැරි තත්ත්වයකට පත් කරලා තිබෙනවා. සමහර විට එය හෙට අනිද්දා වී ගබඩාවක් හැටියට පාවිච්චි කිරීමටත් ඉඩකඩ තිබෙනවා.

ඒ කොහොම වුණත් අද කථා කරපු සියලු දෙනා තේරුම් නොගත් එක දෙයක් තිබෙනවා. එනම් ටෙලි නාට්‍ය කියන්නේ වෙනම මාධ්‍යයක්; සිනමාව කියන්නේ වෙනත් මාධ්‍යයක්; වේදිකා නාට්‍ය කියන්නේ තවත් මාධ්‍යයක්. මේ සියල්ල එකතු වන්නේ කලාවට තමයි. නමුත් මේ මාධ්‍ය තුනේ නිරත වන ශිල්පීන් තමන් උපදින කොටම අරගෙන එන හැකියාව, ඒ රංගන ශිල්පීන්ගේ හැකියාව අද තාක්ෂණය ඉදිරියේ යම් යම් අසාධාරණකම්වලට ලක්වෙන්න හේතුවක් වෙලා තිබෙනවා. අපි හැමදාම කෑ ගැහුවා; ඉල්ලුවා; හැම දෙනාටම යාඥා කර කර කිව්වා, අපට රංගන පාසලක් දෙන්න කියලා. ශ්‍රී ලංකාවේ අනාගතය ගැනයි කථා කරන්නේ. හැමෝම දුවනවා, ලෙස්ටර් ජේම්ස් පීරිස් මැතිතුමාගේ උපන්දිනයට. එතුමා සෑම උපන් දිනයකදීම කියන එක දෙයක් තමයි අපේ අනාගත පරපුරට "රේඛාව" වැනි චිත්‍රපටයක් හදන්න, අනාගත පරපුර ඉදිරියට ගෙන යන්න අපට රංගන පාසලක් දෙන්න කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවාද දන්නේ නැහැ, ඉන්දියාවේ ශ්‍රේෂ්ඨතම රංගන ශිල්පීන් බිහිවෙලා තිබෙන්නේ, ෂාරුක් ඛාන් වැනි අග්‍ර ගණයේ නළුවන් බිහිවෙලා තිබෙන්නේ Film and Television Institute of India, - FTII - Pune එකෙන් බව. සිනමාව ගැන හදාරන්න, සිනමාව ගැන දැනුම තියාගන්න ඒ අයට පහසුකම් තිබෙනවා. ඒ වාගේම ඉන්දීය රජය විශේෂ මැදිහත්වීම් වෙමින් ඒ කටයුතු ගැන සොයා බලමින් ඒ සිනමාව ඉදිරියට ගෙනෙන්න කටයුතු කරලා තිබෙනවා.

අපේ (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා බොහොම ලස්සනට කිව්වා, ප්‍රංශ සිනමාව ගැන. එතුමාට මම මේ කාරණය නොකියා හිටියොත් වැරදියි. සුමිත්‍රා පීරිස් මැතිනියගේ 'ලොකු දුව' චිත්‍රපටය නිල වශයෙන් Cannes Film Festival එකට ඉදිරිපත් කරමින් එහි ප්‍රධාන නිළිය හැටියට මාත් එයට සහභාගි වුණා. එතුමා කිව්වා, මට ආරාධනා කරනවා කියලා. මම Cannes Film Festival එකට යනකොට එතුමා ඉපදිලාවත් නැතුව ඇති. ප්‍රංශ සිනමාව ගැන කථා කරන්න ඉස්සෙල්ලා මේ ගරු සභාවේ උදවිය ඉගෙන ගන්න ඕනෑ, ඔයිට වඩා හොඳට සිංහල සිනමාවට ආදරය කරන්න. මොකද, සිංහල සිනමාව ගැන කථා කරන්න ඉන්නේ මේ සිංහල රටේ අපි විතරයි. එකම භාෂාවකින් චිත්‍රපට තිබෙන්නේ මෙහෙ විතරයි. එතුමා කියනවා collaborative චිත්‍රපට කරනවාලු! ඒ කියන්නේ රටවල් දෙකක් එකට එකතු වෙලා චිත්‍රපට කරනවා. අපි මුලින්ම ප්‍රංශ ජාතිකයන් සමඟ එකතු වෙලා "Nobody's Perfect" කියන චිත්‍රපටය කළා. ඒකේ රඟපෑවේ ගාමිණී ෆොන්සේකා මැතිතුමා සහ මම. ඒ වාගේම ඉන්දියාවේ 'පයිලට් ප්‍රේමනාත්' ඒ වාගේ collaborative චිත්‍රපට ඒ කාලයේ පටන් ගත්තා. ඒක නිසා මම ඒ ගැන හොඳාකාරවම දන්නවා. නමුත් 1977 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ආවාට පසු චිත්‍රපට කළ යුතු, නොකළ යුතු හැමෝටම එක දිගට මහජන බැංකුවෙන් ණය දුන්නා. ඒ ණයත් එක්ක චිත්‍රපට පෝලිමක් ඇති වුණා. ඒ හේතුවෙන් අවුරුදු ගණනාවක් යනතෙක් සමහර චිත්‍රපට පෙන්වා ගන්න බැරි වුණා. චිත්‍රපට සඳහා මුදල් ආයෝජනය කළ මිනිසුන්ට කරකියා ගන්න දෙයක් නැතිව ඔවුන් නැවත චිත්‍රපට නිෂ්පාදනයට නොඑන යුගයක් ඇති වුණා. චිත්‍රපටයක් කරලා අවුරුදු 6ක් විතර බලාගෙන හිටියා. පෝස්ටර් ගහන මනුස්සයාටත් දුන්නා චිත්‍රපට කරන්න. තම තමන්ගේ හිතවතුන්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! දැන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair and* DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. (Prof.) Ashu Marasinghe, what is your point of Order?

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ඉක්මන් කරලා අහන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ප්‍රශ්නය, 'රන්මිණිතැන්න' ගැනයි. ඒක හදන්න යෝජනා වෙලා තිබුණේ, බෙන්තොට පැත්තේ දූපතක. ඒ ගැන ඔබතුමිය දන්නවාද කියා මා දන්නේ නැහැ. රවීන්ද්‍ර රන්දෙනිය මහත්මයා තමයි 'රන්මිණිතැන්න' හම්බන්තොටට අරගෙන යන්න ඕනෑ කියලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාව දැනුවත් කරලා - ඇත්තටම මහින්ද රාජපක්ෂ මහත්තයාව අත්දවලා- එහාට අරගෙන ගියේ. බෙන්තොට දූපතේ රන්මිණිතැන්න හැදුවා නම්, මම හිතන හැටියට අද මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order. Hon. (Mrs.) Kumarasingha, you may continue with your speech.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න මම කැමැතියි. 'රන්මිහිතැන්න' හම්බන්තොට හැදුව එක හොඳයි කියා මම අදත් විශ්වාස කරනවා. ඒ සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් තිබුණා. ගුවන් තොටුපොළක්, වරායක් විතරක් නොවෙයි, පිට රටවලින් ජාත්‍යන්තර කීර්තියට පත් වුණු අය ඇවිල්ලා චිත්‍රපට කරන්නටයි ඒ කටයුත්ත ලෑස්ති කළේ. අද හෝ රන්මිහිතැන්නේ රංගන පාසලක් හදන්න ඔබතුමා යෝජනා කළා

[ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය]

නම් ඊට වැඩිය හොඳයි. ගරු ඇමතිතුමාගෙනුත්, අතිගරු ජනාධිපතිතුමාගෙනුත්, ගරු අග්‍රාමාත්‍යතුමාගෙනුත් මම ඉල්ලා සිටිනවා, හෙළ සිනමාව වෙනුවෙන්, ඒ වාගේම අපේ අනාගත පරපුර වෙනුවෙන් හැකි ඉක්මනින් රංගන පාසලක් හදා දෙන්න කියලා. පක්ෂ භේදයක් නැතුව මිනිසුන් චිත්‍රපට බලනවා. පක්ෂ භේදයක් නැතුව මිනිසුන් නාට්‍ය බලනවා. කලාව කියන එකට පක්ෂයක් නැහැ. මම අද මේ හඬ නගන්නේ මේ රටේ සමස්ත කලාකරුවන් වෙනුවෙන්. අපට රංගන පාසලක් දෙන්න.

අපේ චිත්‍රපට සංරක්ෂණය කිරීම ගැන ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා. එතුමා දන්නේ නැතුව ඇති 'ලොකු දුව' කියන චිත්‍රපටය මේ වන කොටත් ප්‍රංශයේ Cannes Film Festival එකෙන් විශාල මුදලක් ගෙවා ලබාගෙන, සංරක්ෂණය කර තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ අවසාන චිත්‍රපටය ධර්මසේන පතිරාජ නමැති ශ්‍රේෂ්ඨ කලාකරුවා ලවා කෙරෙව්වා. ඒ සඳහා මම විශාල මුදලක් වැය කළා. ඒ චිත්‍රපටයේ පිටපත් ගහන්න අපට ඉන්දියාවට යන්න සිදු වුණා. ඉන්දියාවේදි එහි negative පටය නැති වුණා. අපි මේ රටේ චිත්‍රපටයක් නිෂ්පාදනය කළාම එහි පිටපත් ගසා ගැනීමට වාගේ අවශ්‍යතාවලට තවමත් රටින් රට යන්න වෙලා තිබෙනවා. ඒ තමයි අපේ සිනමා කර්මාන්තයේ තිබෙන කනගාටුදායක පැත්ත.

අනෙක් කාරණය, සියලු කලා ශිල්පීන්ට රැකවරණයක්, ආරක්ෂිතභාවයක් ජාතික ප්‍රතිපත්තියක් තුළින් ලබා දිය යුතුයි කියන එක. ඒ අය කලාකරුවන් බව ඇත්ත. දක්ෂතා සපිරි අය බව ඇත්ත. නමුත් ඔවුන්ට ජීවත් වීමට සුදුසු නිවසක් ඒ වාගේම, ඔවුන්ට ජීවත් වීමට මහක් නොමැති වන වෙලාවන් තිබෙනවා. අනෙක් රැකියාවලට වාගේම කලාකරුවන් සඳහාත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කරන්න අවශ්‍යයි. අර ටවර් හෝල් රඟහල පදනම මඟින් දෙන රුපියල් 2,500 වාගේ නොවෙයි. මේ කාලයේ ඒ වාගේ සොච්චම් මුදලකින් ජීවත් වෙන්න බැහැ. මඟින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ අපි කලාකරුවන්ට වාහනයක් ගන්න රුපියල් ලක්ෂ 15ක පොලි රහිත ණයක් ලබා දුන්නා. හැම කලාකරුවකුටම ඒක අවශ්‍ය වුණේ නැහැ. එය ලබා නොගත් කෙනෙක් හැටියටයි අද මම කථා කරන්නේ. නමුත්, එහෙම අවශ්‍යතාවක් තිබෙන අභිංසක කලාකරුවෝ පිරිසක් මේ රටේ ඉන්නවා. අද මම කථා කරන්නේ ඒ අය වෙනුවෙන්. ඒ පිළිබඳව අප ගෞරවයෙන් කථා කළ යුතුයි. ඒ සහනය කපා නොහැර මේ රටේ අභිංසක කලාකරුවන් වෙනුවෙන් ඉදිරියටත් ඒ සහනය ලබා දෙන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

චිත්‍රපට ලෝකය ගැන මම වැඩියෙන් කථා කරන්නේ ටෙලි නාට්‍ය අහකට දාලා නොවෙයි. මේ රටේ ටෙලි නාට්‍යවල තත්ත්වය පිළිබඳව බුද්ධිමත් ප්‍රේක්ෂකයින් දන්නවා. හිතා ගන්න බැරි තරමට අද ටෙලි නාට්‍යවල ප්‍රමිතිය නැත්තටම නැති වෙලා. සමහර ප්‍රේක්ෂකයින් නොමහ ගිහින්. හැබැයි, තවමත් මේ රටේ ප්‍රේක්ෂකයා අපේ ටෙලි නාට්‍යවලට, අපේ සංස්කෘතියට, අපේකමට ආදරය කරනවා. ඒ සඳහා හොඳම උදාහරණය තමයි "සිඳු" ටෙලි නාට්‍යය. ඒ ටෙලි නාට්‍යයේ ශ්‍රී ලාංකික පුංචි හාමුදුරුනමකගේ චරිතයක් තිබෙනවා. ඒ නිසා, එම ටෙලි නාට්‍ය නොබලන කෙනෙක් නැහැ. කිසිම ප්‍රමිතියක් නැතිව, කැමැති කැමැති විධියට භාෂා මතුකරන, නැත්නම් කොරියාවෙන් ගෙන්වන ටෙලි නාට්‍යයකට සිංහල දෙබස් කවලා, එහෙම නැත්නම් ඉන්දියාවෙන් ගෙන්වන ටෙලි නාට්‍යයකට දෙබස් කවලා අපේ රටේ විකාශනය කිරීමෙන් සමස්ත සංස්කෘතිය තුළම සෝදා පාළුවක් ඇති වෙලා ඉවරයි. තවත් වසර ගණනාවක් ගියත් ඒක හරිගස්සා ගන්න කාටවත් බැරි වෙයි. ඉන්දියාවේ ක්‍රමයට අද මහුල් ගෙවල් ගන්න ලංකාවේ අය පුරුදු වුණේ හින්දි විධියට කරන ටෙලි නාට්‍ය නරඹලායි. මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලා බොහොම ලස්සනට කිව්වා, ටෙලි නාට්‍ය සංස්කෘතිය ගැන. "කඩුල්ල" වාගේ අති විශිෂ්ට ටෙලි නාට්‍ය නිෂ්පාදනය කළ මේ රටේ, ඒ සියල්ල අභාවයට යමින් තිබෙනවා. කිසිදු ප්‍රමිතියක් නැතිව, කිසිදු මණ්ඩලයක් නැතිව, කිසිම කෙනෙකුගේ සොයා බැලීමක් නැතිව අද ටෙලි නාට්‍ය පෙන්වන යුගයකට ඇවිල්ලා තිබෙනවා. ටෙලි නාට්‍ය ශිල්පීන් එදිනෙදා වැඩ කරන කම්කරුවන්ගේ තත්ත්වයෙනුයි ඒ වැඩ කටයුතු කරගෙන යන්නේ. මම එක්තරා විධියකින් හිතනවා, අපි වාසනාවන්ත යුගයක කලාවේ, සිනමාවේ හිටපු උදව්ය කියලා. අපේ කාලයේදී අපි ටෙලි නාට්‍ය කරලා නැහැ. නමුත් සිනමාව තුළ මීට වඩා විශිෂ්ටත්වයක් එදා තිබුණා.

අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාත් ඉස්සරහා ඉන්න නිසා මට මේක නොකියාම බැහැ. ගරු ඇමතිතුමනි, සමහරු උදේට නැඟිටලා කල්පනා කරනවා, අද පණ අදින කලාකරුවා කවුද කියලා. කවුද පණ අදින්නේ, කවුද අසනීප වෙලා ඉන්නේ, කවුද ලෙඩවෙලා ඉන්නේ කියලා කල්පනා කරනවා. ඒක හොඳයි, ගරු ඇමතිතුමනි. ලෙඩ වෙච්ච අය ගිහිල්ලා බලන්න ඕනෑ. නමුත් ඒ අය බලන්න යන්න මැරෙනකම් ඉන්න එපා. මැරෙන්න කලින් ඒ අය බලන්න යන්න. කනගාටුදායක අවස්ථාවලදී ඔවුන් ගැන බලන්න. ඔබතුමා රුපියල් 10,000ක් දීලා, රුපියල් කෝටියක publicity එකක් ගන්නවා. හැම TV channel එකකම ඒවා දමනවා. ඒ අසරණ කලාකරුවන්ටත් ආත්ම ගෞරවයක් තිබෙනවා. ඔබතුමාගේ cheque එකට වැඩිය එතුමන්ලා මේ රටේ ජනතාව පිනවපු කලාකරුවන්. ලෙඩ වුණු කලාකරුවන් මැරෙන්න යනවාද, නැද්ද කියලා සොයා බලන්න එපා. අද ඒ වාගේ අසරණ තත්ත්වයකට කවුරු හරි පත් වෙලා ඉන්නවා නම්, ඒ අයට හොඳ විශ්‍රාම වැටුපක් දෙන්න. ඒ විශ්‍රාම වැටුප තුළින් ආත්ම ගෞරවයකින් ජීවත් වෙන කලාකරුවන් පිරිසක් මේ රටට ඇති කරන්න. ඔවුන්ට වාහනයක් ගෙන්වා ගැනීමට පුළුවන් වන විධියට permit එක ආපසු දෙන්න. ඒවා නතර කරන්න එපා. ඒවා අපිට නම් අවශ්‍ය වුණේ නැහැ. නමුත්, ඒවා නැති අභිංසක, පුංචි කලාකරුවන් අපේ රටේ ඉන්නවා. කලාව වෙනුවෙන් තමන්ගේ ජීවිතයම කැප කරලා, ජීවිතයම කලාව කරගත් කලාකරුවන් ඉන්නවා. තමන්ගේ කටහඬින් ජීවත් වෙන කලාකරුවන් ඉන්නවා. ඒ අය වෙනුවෙන් මේවා දෙන්න. ඒක විශිෂ්ට සේවයක් වෙනවා, ගරු ඇමතිතුමනි.

අද ලෝක සිනමාව ගැන කථා කරද්දී ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා අපිට කිව්වා, ඩිජිටල් ක්‍රමය ප්‍රංශ විධියට කරන්න ඉදිරියේදී එතුමන්ලා බලාපොරොත්තු වෙනවා කියලා. අනේ! ගරු ඇමතිතුමා, ප්‍රංශ විධියට නැතත්, ලංකාවේ විධියට හරි කමක් නැහැ කරන්න. ඩිජිටල් කරන්න ප්‍රංශයටම යන්න වුවමනාවකුත් නැහැ. ඩිජිටල් ක්‍රමය කරන්න ඉස්සෙල්ලා සිනමා ශාලාවල ප්‍රමිතිය ගැන සොයා බලන්න. කෙනෙකුට වැදගත් විධියට ගිහිල්ලා චිත්‍රපටියක් නරඹන්න පුළුවන් හොඳ ප්‍රමිතියක් තිබෙන චිත්‍රපටි ශාලා ලංකාවේ කීයෙන් කීයද තිබෙන්නේ? ඒ සිනමාශාලාවලට ගිය සමහර උදව්ය නැවත ඒවාට යන්නේ නැහැ. 1971දී ජාතික චිත්‍රපටි සංස්ථාව ඇති කළා. එදා ඇති කරපු පනත් තවමත් ඒ විධියටම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමිය දැන් කථාව අවසන් කරන්න.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

සමාවෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න. අපිට ආරංචි වුණා, ගරු අග්‍රාමාත්‍යතුමාගේ කාර්යාලයෙන් දැන් අලුතින් පනත් කෙටුම්පතක් හදනවා කියලා. ඒක හදන්න හොඳ සම්මානනීය අධ්‍යක්ෂවරුන් වන ප්‍රසන්න විතානගේ අධ්‍යක්ෂතුමාත්, චන්ද්‍රම් රත්නම් මැතිතුමාත් සම්බන්ධ වෙලා ඉන්නවා. ඒක හංගා ගෙන ඉන්න එපා. ඉක්මනට එළියට දාන්න. ප්‍රවීණයන්ගෙන් උපදෙස් ගන්න. තුන් හතර දෙනෙක් එකතු කරගෙන සිනමාව ගැන පනත් කෙටුම්පත් හදන්න යන්න එපා. මොකද, ඒ හදන ඒවා අරගෙන අන්තිමට ඇනගන්න වෙනවා. ඒක නිසා ඕක හංගා ගෙන ඉන්න එපා. ඔබතුමන්ලා වැටි පනත් කෙටුම්පත වාගේ එක එක පනත් කෙටුම්පත් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ගෙනාවා වාගේ, ඔබතුමන්ලා සියලු දෙනා එකතු වෙලා හැකි ඉක්මනින් ඒ හදන පනත් කෙටුම්පතත් ඉදිරියට ගේන්න. ඒක ජාතික ප්‍රතිපත්තියක් බවට පත් කරන්න. සියලු දෙනාගේ ආරක්ෂාව, කලාවේ උන්නතිය, සිනමා පාසලක්, මේවා අත්‍යවශ්‍ය දේවල්. අද පාසල්වල රංග කලාව විෂයක් හැටියට හදාරන්න පුළුවන්. නමුත් ඒ අය සෞන්දර්ය විශ්වවිද්‍යාලයට ගිහිල්ලා, විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරලා එළියට එනවා. ඒ ගොල්ලන් සිනමාව ගැන ඉගෙන ගෙන තිබෙනවා. නමුත් ප්‍රායෝගිකව ඒ අය දන්න දෙයක් නැහැ. ඒ අය සිනමාවේ වැඩවලට ගන්නේ නැහැ. අද සිනමාව ආදරණීය මායාවක් වෙලා. ඒක ප්‍රයෝගයක් හැටියට ආපස්සට යනවා. ඒ තත්ත්වය හදා ගන්න තවත් වසර ගණනාවකටවත් බැරි වෙයි. මොකද, ඉන්දියාවේ චිත්‍රපටි කොපි කර කර පෙන්වන තත්ත්වයකට අද අපේ රට පත්වෙලා තිබෙනවා. ඒ සඳහා කිසිම ප්‍රතිතියක් නැහැ. එහෙම ප්‍රතිතියක් නැත්තේ ජාතික ප්‍රතිපත්තියක් නැති නිසායි. ඒක නිසා මම යෝජනාවක් හැටියට ඉල්ලා සිටින්නේ, හැකි ඉක්මනින් සිංහල සිනමාව බේරා ගන්නට, නාට්‍ය කලාව, සංස්කෘතිය බේරා ගන්නට ජාතික ප්‍රතිපත්තියක් ගේන්න කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[பி.ப. 3.06]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த ஒத்திவைப்புவேளை விவாதத்திலே கலந்துகொண்டு கலை மற்றும் கலாசாரத் துறைகளில் நிலவுகின்ற பிரச்சினைகள் தொடர்பாகப் பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன்.

எமது பாரம்பரிய கலைகளும், கலாசாரங்களும் பாதுகாக்கப்படவேண்டும். அந்த வகையில் அந்தத் துறையில் இருக்கின்ற படைப்பாளிகளைப் பாதுகாக்கவேண்டியது மிக முக்கிய கடப்பாடாக இருக்கின்றது. கடந்த காலங்களில் எமது கலை, கலாசாரங்கள் - விசேடமாக, தமிழர்களின் கலை, கலாசாரங்கள் - திட்டமிடப்பட்ட முறையிலே முடக்கப்பட்டன; அழிக்கப்பட்டன. இதன்மூலம் எமது கலைஞர்களும் படைப்பாளிகளும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். பலர் துப்பாக்கிச் சூட்டுக்கு இலக்காகி மரணித்துமுள்ளனர். 30 வருட கால யுத்தத்தினால் நாங்கள் சந்தித்த பலதரப்பட்ட இழப்புக்களில் மிகவும் முக்கியமானது, எமது பாரம்பரிய கலை, கலாசாரங்கள் மழுங்கடிக்கப்பட்டுச் சிதறடிக்கப்பட்டதாகும். விசேடமாக, இலைமறைகாயாக இருக்கின்ற படைப்பாளி களையும் கலைஞர்களையும் நாங்கள் பாதுகாக்கவேண்டும். அவர்களுக்குரிய வாய்ப்புக்களைச் சரியான முறையில் வழங்கவேண்டும். கலை, கலாசாரங்களைப் பிரதிபலிக்கின்ற, கலைகளை வளர்க்கின்ற கூடங்களை நீங்கள் வடக்கு, கிழக்கிலே அமைத்துத் தரவேண்டும்.

இன்று எமது கலை, கலாசாரங்களைப் பின்தள்ளுகின்ற, பண்பாடுகளைக் குலைக்கின்ற நடவடிக்கைகளில் சில அரசியல்வாதிகளும் இனவாதிகளும் ஈடுபடுகின்றமை மிகவும் மனவேதனைக்குரிய விடயமாகும். விசேடமாக, 95 சதவீதமான தமிழர்கள் பூர்வீகமாக வாழுகின்ற கல்முனைப் பிரதேசத்தில் அவர்களின் கலை, கலாசாரங்களை மழுங்கடிக்கின்ற - சிதறடிக்கின்ற நடவடிக்கைகளில் அண்மைக்காலங்களில் குறிப்பிட்ட சில அரசியல்வாதிகள், அரசியல் தலைமைகள் ஈடுபடுவது மிகவும் கவலைக்குரிய விடயமாகும். முக்கியமாக, கல்முனைக்குடியை கல்முனையாக மாற்றி, தமிழர்களின் பூர்வீகத்தையும் அவர்களின் பிரதிநிதித்துவத்தையும் குழப்புகின்ற செயற்பாடுகள் அங்கு நடைபெறுகின்றன. கல்முனைக்குடியை கல்முனையாக மாற்றுவதற்காக, அங்கு தமிழர்கள் வாழ்ந்ததற்கான சான்றுகளை இல்லாதொழிக்கின்ற செயற்பாடுகள் நடைபெறுகின்றன. இதன்மூலம் கல்முனையிலே தமிழர்களின் கலைகளும் கலாசாரங்களும் மழுங்கடிக்கப்பட்டு, அவர்கள் அங்கு பெரும்பான்மையாக இருந்தார்கள் என்ற சான்றும் இல்லாதொழிக்கப்படுகின்றது. அதனூடாக கல்முனை யிலுள்ள தமிழ்ப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்துகின்ற நடவடிக்கையை முடக்கி, அந்தப் பிரதேச செயலகத்தின் செயற்பாடுகளை மழுங்கடிப்பதே நோக்கமாகும். நகர அபிவிருத்தித் திட்டத்தை முன்னெடுக்கின்ற செயற்பாடுகளின் ஒரு கட்டமாகத்தான் கல்முனைக்குடியை கல்முனையாக மாற்றுகின்ற நடவடிக்கை இடம்பெறுகிறது. அதாவது, தமிழர்கள் காலாகாலமாக, பரம்பரை பரம்பரையாக வாழ்ந்து வந்த ஓர் ஊரை மாற்றுவதற்கான செயற்பாடு நடைபெறு கின்றது என்பது மிகவும் மனவேதனைக்குரிய விடயமாகும். இலங்கையின் வரைபடம், வாக்காளர் இடாப்பு, தேசிய அடையாள அட்டை, land registry மற்றும் எல்லை நிருணயம் சம்பந்தமான வர்த்தமானி அறிவித்தல் என்பவற்றிலும் கல்முனைக்குடி என்ற பெயர் உள்ளடக்கப்பட்டிருக்கின்றது. அதனைக் கல்முனையாக மாற்றும் செயற்பாடானது மிகவும் பாரதூரமான ஒரு செயற்பாடென்றுதான் நான் கருது கின்றேன். இப்படியான செயற்பாடுகளின்மூலம் அந்த இடத்திலே தமிழர்களின் கலைகளும் கலாசாரங்களும் அழிவடைகின்ற சந்தர்ப்பம் காணப்படுகின்றது.

கடந்த ஆட்சியாளர்களினால் திட்டமிடப்பட்ட முறையிலே எமது கலைகளும் கலாசாரங்களும் அழிக்கப்பட்டன. அதற்கு அத்தாட்சியான ஆவணங்களும் அழிவடைந்திருக்கின்றன. கடந்த காலங்களில் நடந்ததுபோன்ற செயற்பாடுகள் இந்த அரசாங்கத்திலும் நடைபெறக்கூடாதென்று நான் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். இப்படியான செயற்பாடுகளை மேற்கொள்ளுகின்றபொழுது இன முரண் பாடுகள் ஏற்பட்டு அந்த இடத்திலே பாரிய பிரச்சினைகள் ஏற்படுவதற்கும் வாய்ப்பு உண்டாகும். இந்த நல்லாட்சி அரசானது இதனைத் தடுத்து நிறுத்தவேண்டுமென நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், நான் இங்கு குறிப்பிட்டவாறு, 2015ஆம் ஆண்டின் வர்த்தமானி - Gazette - அறிவித்தலின்படி

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

கல்முனைக்குடி என்ற பெயர்தான் அதில் உள்ளடக்கப்பட்டிருக்கின்றது. ஆனால், தற்போது சில அரசியல் தலைவர்கள் தங்களது சுயலாபத்துக்காக அதனைக் கல்முனையாக மாற்றுகின்ற செயற்பாடுகளில் ஈடுபடுகின் றார்கள். கல்முனை என்பது தமிழர்களின் இதயமாகக் கருதப்படுகின்ற ஓரிடம்! அங்கு 95 சதவீதமான தமிழர்கள் வாழ்கின்றார்கள். நிச்சயமாக அவர்களின் கலை, கலாசாரங்கள் பாதுகாக்கப்பட வேண்டும். அழிவடைந்து போகின்ற கலைகளை, இலக்கியங்களை, பண்பாடுகளை, நாட்டுக்கூத்துக்களை முன்னெடுப்பதற்காக, அதற்குரிய கலைஞர்களையும் படைப்பாளிகளையும் உருவாக்குவதற்காக அங்கு ஒரு கலாசார மண்டபம் அமைக்கப்பட வேண்டிய கடப்பாடு இருக்கின்றது.

மேலும், கல்முனை மத்திய வலயம் என்ற ஒரு கல்வி வலயத்தையும் அங்கு உருவாக்க வேண்டும். தற்போது இருக்கின்ற கல்வி வலயத்தில் மொத்தமாக 45 தமிழ்ப் பாடசாலைகள் இருக்கின்றன. இந்தப் பாடசாலைகளுக்கென ஒரு தனியான கல்வி வலயத்தை கல்முனையிலே உருவாக்கு கின்றபொழுது தமிழர்களின் பண்பாடு, கலை, கலாசாரம் என்பன பாதுகாக்கப்படும். தமிழர்களின் கல்வியானது, யுத்த காலத்தில் மழுங்கடிக்கப்பட்டது. அந்த வகையில், நாங்கள் இழந்த கல்வியை மீண்டும் பெற்றுக்கொள்ள வேண்டு மென்றால், சிறந்ததொரு கல்விச் சமூகத்தை உருவாக்க வேண்டுமென்றால், கல்முனைக்கென்று ஒரு தனியான கல்வி வலயம் உருவாக்கப்பட வேண்டும். விசேடமாக, இப்போது இருக்கின்ற கல்வி வலயத்தின் மூலம் தமிழர்கள் பாரிய பிரச்சினையை எதிர்நோக்குகின்றார்கள். அந்தப் பிரச்சினையின்மூலம் எமது எதிர்காலச் சிறார்களின் கல்வி பாதிக்கப்படுகின்றது; அவர்களின் கல்வி மழுங்கடிக் கப்படுகின்றது. ஆகவே, இந்தப் புதிய கல்வி வலயத்தை உருவாக்கினால்தான் எங்கள் பிள்ளைகளின் கல்வியை நாங்கள் சரியான தரத்துக்குக் கொண்டுவந்து எதிர்காலத்தில் வலுவான ஒரு சமூகத்தைக் கட்டியெழுப்ப முடியும் என்ப தனையும் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், இப்போது இருக்கின்ற கல்வி வலயத்தின்மூலம் எங்களது ஆசிரியர்களும் மாணவர்களும் பாதிக்கப்படு கின்றார்கள். உரிய முறையிலே அந்தந்தத் தமிழ்ப் பாடசாலை களுக்கான ஆசிரியர்களை நியமிப்பதில் பாரபட்சம் காட்டப் படுகின்றது. கல்முனைக்குடி, சாய்ந்தமருது போன்ற பிரதேசங்களிலே அதிகளவான ஆசிரியர்கள் உள்வாங்கப் பட்டிருக்கின்றார்கள். பாதிக்கப்பட்ட நாவிதன்வெளி, வீரமுனை, வளத்தாப்பிட்டி போன்ற இடங்களிலே ஆசிரியர்களுக்கான பற்றாக்குறை நிலவிவருகின்றது. தரமற்ற, திறனற்ற ஆசிரியர்களை நியமிப்பதன்மூலமும் வளங்கள் கொடுக்கப்படாமல் விடுவதன்மூலமும் அவர்களின் கல்வி, கலாசாரங்கள் பாதிக்கப்படுகின்றன. அதனால், எமது சமூகம் பின்தள்ளப்படக்கூடிய சந்தர்ப்பம் எற்படுகின்றது. ஆகவே, கல்வி அமைச்சர் அவர்களும் கலாசாரத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்களும் ஒன்றிணைந்து அங்கு சிறந்ததொரு கல்வி வலயத்தை ஏற்படுத்தித்தர வேண்டும். எமது ஜனாதிபதி அவர்களும் பிரதம அமைச்சர் அவர்களும் கல்வி அமைச்சர் அவர்களும் ஒன்றுசேர்ந்து செயற்படுவதன்மூலம் அங்கு "கல்முனை மத்திய கல்வி வலயம்" என்ற ஒன்றை உருவாக்கித் தரமுடியும். அதன்மூலம் எதிர்காலத்திலே சிறந்ததொரு கல்விச் சமூகத்தை உருவாக்குவதோடு, அதனைப் பாதுகாத்து வளப்படுத்தக்கூடிய சந்தர்ப்பம் ஏற்படும் என்பதனையும் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

பொத்துவிலிலே உருவாக்கப்படவிருக்கின்ற கல்வி வலயத்தில் தமிழர்களின் பிரதேசத்திலுள்ள அதாவது திருக் கோயில் பிரதேசக் கல்வி வலயத்திலுள்ள எட்டுப் பாடசாலைகள் உள்ளடங்குவதனால் தமிழ்க் கலாசாரத்தைப் பின்பற்றுகின்ற குறிப்பிட்ட பாடசாலைகள், ஏனைய கலாசாரத்தைப் பின்பற்றக்கூடிய நிலைமை உள்ளது. அதனால் அங்கும் கலாசார அழிவுகள் ஏற்படுவதற்கான வாய்ப்பு இருக்கின்றது. பொத்துவிலிலே ஒரு கல்வி வலயம் உருவாக் கப்படுவது எமக்குச் சந்தோசம்தான். ஆனால், அதற்காகத் தமிழ்ப் பாடசாலைகளை அதிலே உள்ளடக்குவதை மிகவும் பாரதூரமான விடயமாகவே நான் கருதுகின்றேன். அது மட்டுமல்ல, அந்தப் பாடசாலைச் சமூகமும், அதாவது ஆசிரியர்களும் மாணவர்களும் அங்கிருக்கின்ற தமிழ் மக்களும், இந்தத் தமிழ்ப் பாடசாலைகளை பொத்துவில் கல்வி வலயத்தோடு இணைப்பதை விரும்பவில்லை. அப்படி இணைத்தால் அங்கு பாரிய முரண்பாடுகள் ஏற்பட்டு இனக் குரோதங்களைத் தோற்றுவிக்கின்ற நிலைமை உருவாகும்.

இப்படிப்பட்ட நிலையிலே தமிழர்களுக்கான கலை களையும் கலாசாரங்களையும் கல்வியையும் பாதுகாக்க வேண்டும் என்றால், எப்போதும் தமிழர்களின் பூர்வீகம் பாதுகாக்கப்பட வேண்டும் என்றால், கலை, கலாசாரங்களைச் சரியான முறையிலே ஒன்றுசேர்த்து நடத்துகின்ற கட்டுப் பாடான ஒரு சமூக வலையமைப்பு ஏற்படுத்தப்பட வேண்டும். அந்தவகையில், கல்முனை மத்திய கல்வி வலயத்தை உருவாக்குவதற்கும் பொத்துவில் கல்வி வலயத்திலிருந்து திருக்கோயில் கல்வி வலயத்தின் குறிப்பிட்ட எட்டுப் பாடசாலைகளை நீக்குவதற்கும் ஆவன செய்யுமாறு இந்த உயரிய சபையினூடாக இங்கிருக்கின்ற அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களிடம் நான் தயவாக வேண்டிக் கொள்கின்றேன். குறித்த தமிழ்ப் பாடசாலைகள் திருக்கோயில் கல்வி வலயத்தோடு இருக்கின்றபொழுதுதான் அங்கு வாழ்கின்ற தமிழர்களுக்கான கலை, கலாசாரங்களுக்கான, கல்விக்கான பாதுகாப்பைப் பேணமுடியும் என்பதனையும் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்னுமொரு விடயத்தையும் நான் இந்த உயரிய சபையிலே கூறிக்கொள்ள வேண்டும். அதாவது, எமது தம்பிலுவில் மகா வித்தியாலயமானது பிரதமர் அமைச்சர் அவர்களின் ஒத்துழைப்புடன் சிறந்ததொரு தேசிய பாடசாலை யாகத் தரமுயர்த்தப்பட்டது. நான் இந்தக் காரியத்தை முன்னெடுப்பதற்கு உதவிய பிரதம அமைச்சர் அவர்கள், அமைச்சர்கள் ஆகியோருக்கும் விசேடமாக கல்வி இராஜாங்க அமைச்சர் இராதாகிருஷ்ணன் அவர்களுக்கும் மாகாணக் கல்வி அமைச்சர் தண்டாயுதபாணி அவர்களுக்கும் நன்றி சொல்லக் கடமைப்பட்டுள்ளேன். இது சம்பந்தமாக நாங்கள் அவர்களிடம் கேட்கின்றபோதெல்லாம் "இயலாது" என்று சொல்லாமல், குறித்த விடயத்தை முன்னெடுத்து அதற்குரிய வழிவகைகளைச் செய்துதந்தார்கள். எனது இந்த முயற்சிக்கு உறுதுணையாக, பக்கபலமாக நின்று செயற்பட்டதற்காக இவர்கள் அனைவருக்கும் மீண்டும் எனது நன்றியைத் தெரிவித்து, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 3.19]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනයේ සභාව කල් තබන අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාළව සාකච්ඡාවට භාජනය වූ මාතෘකාව අපේ රට තුළ අද කාලයේ කථා කළ යුතු වැදගත් කාරණාවක්. බටහිර රටවල කියමනක් තිබෙනවා, "artistes are unofficial legislators in a country." කියලා. කලාකරුවන් ව්‍යවස්ථා සම්පාදකයන්ට මහ පෙන්වන පෙර ගමන්කරුවන් විධියට සලකන සමාජ තිබෙනවා. දියුණු රටවල ඒ තත්ත්වය බොහොම පැහැදිලියි. මහා බ්‍රිතාන්‍යයේ ඉතිහාසය අරගෙන බැලුවාම, ශේක්ස්පියර් වාගේ විද්වතෙකු කලා නිර්මාණ හරහා ව්‍යවස්ථා සම්පාදකයන්ගේ දෑස් කොතරම් විවර කළාද, මනස පෝෂණය කිරීම සඳහා කොතෙක් දේ ලබා දුන්නාද කියන ඉතිහාස තොරතුරු අප සතුව තිබෙනවා. එක උදාහරණයක් විධියට ගත්තොත්, ශේක්ස්පියර් නමැති මහා පඬිවරයා විසින් රචිත "වැනීසියේ වෙළෙන්දා" කියන නාට්‍යය කලා රසයක් ඇති කිරීමේ අරමුණ පමණක් මුල් කර ගෙන ලියපු නාට්‍යයක් නොවෙයි. එදා සමාජයේ තිබුණු නීතිය, එම නීතියේ තිබුණු මිලේච්ඡත්වය හා එම නීතිය මනුෂ්‍ය සදාචාරයට නොගැළපෙන බව ලියන්න තමයි; පෙන්වන්න තමයි එදා ශේක්ස්පියර් "වැනීසියේ වෙළෙන්දා" නම් නාටකය ලිව්වේ. එම නාට්‍යය හරහා නීතියේ ගිවිසුමක් තුළ තිබෙන අමානුෂික බව, කෲර බව පෙන්වා දුන්නා. ණය මුදලක් ලබා ගත් මනුෂ්‍යයා නියමිත දිනයට ණය මුදල නොගෙවිවොත් හදවතට කිට්ටුම තැනකින් මස් රාත්තලක් කපා ගන්න අයිතිය ලබා දීමේ ක්‍රමවේදයක් එදා නීතියේ තිබුණා. ශේක්ස්පියර්ට ඕනෑකම තිබුණේ, මිනිසුන් ටිකක් ගෙනැල්ලා ප්‍රේක්ෂකාගාරයක හිටුවා ඔවුන් සතුටු කරලා, හිනස්සවා යවන්න නොවෙයි. ශේක්ස්පියර්ට ඕනෑ කර තිබුණේ නීති සම්පාදනය කරන ව්‍යවස්ථාදායකයට දැඩි අතුල් පහරක් ගහලා "ඔබලා කොතරම් මිලේච්ඡද?" කියා පෙන්වන්නයි. ඒකේ ප්‍රතිඵලයක් විධියට බ්‍රිතාන්‍යයේ නීති පොතට, දණ්ඩ නීති සංග්‍රහයට වගන්තියක් ඇතුළත් වෙනවා, කෙනෙකුගේ කැමැත්ත ඇතුව පවා කෙනෙකුගේ ශරීරයකට හෝ අවයවයකට හානි කිරීම දණ්ඩනීය වරදක් කියලා. ඔය නීතිය බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉන්දියාවට ආවා, ඉන්දියාවෙන් ලංකාවට ආවා. ඒ නිසා අපේ රටේ දණ්ඩ නීති සංග්‍රහයේත් දැන් එය තිබෙනවා. ශේක්ස්පියර් වාගේ දාර්ශනිකයකු ඒ වාගේ නාට්‍ය නිර්මාණයක් තුළින් නීති සම්පාදකයන්ට කනේ පහරක් නොගැසුවා නම් සමහර විට අදටත් ඒ වාගේ කොන්දේසි ගිවිසුමකට ඇතුළත් කරන්න හැකියාව ලැබෙන්න ඉඩ තිබුණා. ඒ නිසා තමයි කලාව, සංස්කෘතිය කියන එක ඉතා වැදගත් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ සිංහල කලාව, දෙමළ කලාව ලෝකයේ බොහෝ රටවල පවතින කලාවන්ට වඩා ඉපැරණියි. එය ඓතිහාසික උරුමයක්. ග්‍රීසිය, රෝමය වාගේ රටවල් තුන-හතරක හැරෙන්නට දීර්ඝතම ඉතිහාසයකට උරුමකම් තිබෙන කලාවක් සිංහල, දමිළ භාෂා දෙක තුළ නිර්මාණය වෙලා තිබෙනවා. සීගිරිය ගත්තත්, අනුරාධපුර යුගය ගත්තත්, දඹදෙණිය හා කෝට්ටේ කියන යුගයන් අරගෙන බැලුවත් කලාව ඉතාම ශ්‍රේෂ්ඨ මට්ටමක වැජඹුණු යුගයන් විධියට අපි එම යුග හඳුනා ගෙන තිබෙනවා. අද බොහෝ දෙනෙකු චිත්‍රපට කලාව ගැනත්, ටෙලි නාට්‍ය ගැනත් මේ ගරු සභාවේදී අදහස් දැක්වූවා. ඒ වාගේම කවිය, විරිඳුව, නව කථාව, කෙටි කථාව කියන මේ සියල්ලත් කලාවට ඇතුළත්ව තිබෙනවා.

අද අපේ ගරු මැති-ඇමතිතුමන්ලා ඉදිරිපත් කළ අදහස් අතර ඉතා වටිනා යෝජනාත් ඉදිරිපත් වුණා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අද උදේ වරුවේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින් මෙවා පිළිබඳව හේතු සාධක ඉදිරිපත් කළා. අපිට නෘත්‍ය ශාලාවල තිබෙන මදිකම, චිත්‍රපට ශාලාවල තිබෙන අඩුකම පිළිබඳව එතුමා අදහස් ඉදිරිපත් කළා. ඒ සියල්ල අතරේ මම තව අඩුවක් දකිනවා. අපිට බුද්ධිමත් ප්‍රේක්ෂකාගාරයක් නැහැ. අපිට කලාව ඕනෑ, තේරුම් ගන්න; කලාව ඕනෑ, අත් දැකීම් ගන්න; කලාව ඕනෑ, චින්දනයක් ලබන්න; කලාව ඕනෑ, සතුටු වෙන්න. කලාවෙන් පණිවුඩයක් දෙන්න ඕනෑ. අපේ රටේ හොඳ නිර්මාණකරුවන්, හොඳ නිෂ්පාදකයන්, අධ්‍යක්ෂවරුන්, හොඳ නව කථාකරුවන්, හොඳ කෙටි කථාකරුවන්, කවියන් එම පණිවුඩය ලබා දීම සඳහා රචනා කරන නිර්මාණ තිබෙනවා; ප්‍රදර්ශනය කරන චිත්‍රපට, නාට්‍ය තිබෙනවා. මේවා උකහා ගන්න පුළුවන් සමාජයක් අද අපේ රටේ තිබෙනවාද? එහෙම නැත්නම් බුද්ධියෙන් මේරුවේ නැති මිනිසුන්ට මේ කලාවෙන් ඵලක් තිබෙනවාද? මේ කලාව කියන්නේ මොකක්ද, කියලා තේරුම් ගන්න පුළුවන් සමාජයක් අපි බිහි කරනවාද? මම කාටවත් ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. නමුත්, පසුගිය දශක තුනක, හතරක කාලයක පටන් අපේ අධ්‍යාපන ක්‍රමය තුළ පවා බුද්ධිය ප්‍රසාරණය වන ක්‍රමවේදයක්, පරම්පරාවක් අපි හදලා නැහැ. ඒක අදට කෙරෙන්නෙත් නැහැ. නිදහස් ආර්ථිකයත් එක්ක අපේ බොහෝ දේවල් වෙනස් වුණා. ආර්ථිකය දියුණු කර ගන්න ඒක හොඳයි. හැබැයි, මිනිසුන්ගෙන් සපිරි සමාජයකට අත්‍යවශ්‍ය වන මනුස්සකම, කරුණාව, දයාව, ළෙන්ගතුකම, සෙනෙහස යන මේවා ඔවුන්ගේ හිත් තුළින් ඇත් වෙනවා නම්, අපට මොන කලාවක් තිබුණත් ඇති ඵලක් නැහැ. අපි විශ්වාස කරනවා, අපට හොඳ රස චින්දනයක් තිබෙනවා කියලා. මොකද, අපි අයිති අද යුගයට නොවෙයි. අපි අයිති මීට පෙර පරම්පරාවටයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමාත්, මමත් මීට පෙර පරම්පරාවේ ඉගෙන ගත් අය. අපි සිංහල භාෂාව ඉගෙන ගත්තා. "අමාවතුර", "බුත්සරණ", "සැළලිහිණි සංදේශය" වාගේ ඉතාම වටිනා ග්‍රන්ථ අපි ඉගෙන ගන්නා කාලයේදී සිංහල සාහිත්‍යයේ අනිවාර්ය අංගයක් විධියට තිබුණා. පසු කාලයකදී මේ රටේ විද්වතුන් "මේ සාහිත්‍ය කන්නද" කියලා අපි අහගෙන ඉඳලා තිබෙනවා. ඒක නිසා රැකියාවක් ලබා ගැනීම සඳහා ඊට උචිත පාඨමාලාවකට අනුගත වෙමින් ඒ ඒ අදාළ විෂයන් තෝරා ගත්තා මිසක්, තමන්ගේ හදවත, බුද්ධිය, මොළය දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය චින්දනීය; රස චින්දනීය හැකියාව ලබා ගැනීමේ බුද්ධිය අපේ අද පරම්පරාව දියුණු කරගෙන නැහැ. අපි මේ කියන දේ වැරැදියි කියලා කෙනෙක් විවේචනය කරන්න පුළුවන්. අපේ රසිකත්වයයි, ඒ අයගේ රසිකත්වයයි දෙකක් බව සත්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ චිත්‍රපටි කලාවේ විශාල පසුබෑමක් තිබෙනවා. එයට හේතුව කුමක් වුවත්, මම දකින්නේ අපට හොඳ ප්‍රේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති බවයි. අද නාට්‍ය කලාවත් එහෙමයි. ඉස්සර අපි නාට්‍යයක් එනකන් බලාගෙන ඉන්නවා, ගිහිල්ලා එය රස විඳින්නේ කොහොමද කියලා. නමුත් අද පරම්පරාවට නාට්‍ය එතරම් වැදගත් නැහැ. නාට්‍යයක් රස විඳින්න තේරෙන්නේ නැහැ. අපේ භාෂාවෙන් කියනවා නම්, අද ඔලමොට්ටල සමාජයක් හැදෙනවා කියලායි අපට හිතෙන්නේ. මේක තමයි ජාතියේ බෙදවාචකය. අද, පෞද්ගලික අංශයේ විද්‍යුත් මාධ්‍ය ආයතන අරගෙන බලන්න. ඒ මාධ්‍ය ආයතනවලින් කීයක් නිවැරදිව භාෂාව හසුරවනවාද? හොඳ ගායකයකුගේ, ගායිකාවකගේ හොඳ රසාස්වාදයක් තිබෙන ගීතයක් කනට ඇහෙනවාද? එතැනත් තිබෙන්නේ මාෆියාවක්. එම මාෆියාව ඇතුළේ අද සල්ලි දිලා -මුදල් තිබෙන අය වෙන්න පුළුවන්- ගීතයක් කියලා මොනවා හරි යමක් මුමුණනවා. මේක තමයි අද ප්‍රචාරණය කරන්නේ. ඒක අද මුදලට විකිණෙනවා. ඒ නිසා, අද අපට රසවත් කලාවක් ලැබෙන්නේ නැහැ.

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

අනෙක් පැත්තෙන් ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා කියපු කරුණට මම එකඟ වෙනවා. නාට්‍ය ඕනෑ. නාට්‍ය හොඳයි. නාට්‍ය රස විඳින්න ඕනෑ. නමුත්, අද දරුවෙකුගේ ජීවිතයේ ඉතාම වැදගත් පැය දෙක, තුනක කාලය තමයි හැන්දෑවේ හයේ ඉඳලා නවය අතර කාලය. පාසලේ ඉගෙන ගන්නා ළමයින්ට ගෙදර ඇවිල්ලා තමන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කර ගන්න තිබෙන කාලය වන්නේ මේ පැය තුනක කාලය පමණයි. අද ගෙවල්වල ඉන්න අම්මලා, තාත්තලා එක්තරා ආකාරයකට ඒ පැය තුන තුළ මේ නාට්‍ය නැරඹීමේ රටාවකට පුරුදු වෙලා සිටිනවා. ඒ නිසා අද දරුවන්ට තමන්ගේ ගේ ඇතුළේ ඉගෙන ගන්න තිබෙන පරිසරය නැති වෙලා තිබෙනවා. මම දකින විධියට නම් - කවුරුවත් මෙයට එකඟ වෙන්න වුවමනාවක් නැහැ.- ඉතාමත්ම බාල තෘප්තියක් අම්මලා-තාත්තලාට ලබා දීලා, දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කර දැමීමක් මේ සිද්ධ වන්නේ. ඒ කාලයේ නම් මට මතකයි, "රන් දෙපැය" කියලා කිව්වාම, ඒකට "ගොන් දෙපැය" කියලා කට්ටියක් කිව්වා. ඒ තරමටම එම වචනයත් ගැළපෙනවා. අපත් මේ වෙලි නාට්‍ය බලා තිබෙනවා. මේ වෙලි නාට්‍යානුසාරයෙන් මනුෂ්‍යයෙකුට දෙන පණිවුඩය මොකක්ද, ඉගෙන ගන්න තිබෙන දේ මොකක්ද, තිබෙන රසාස්වාදය මොකක්ද? හුඟක් වෙලි නාට්‍ය අරගෙන බැලුවාම දකින්න තිබෙන දෙය තමයි, අනියම් සබඳතා ඇති වෙනවා; ගහ ගන්නවා; මරා ගන්නවා. ඕක තමයි හුඟක් වෙලි නාට්‍යවලින් අද පෙන්වන්නේ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ එක එක ජාතියේ විවිධවූර්ණ ඇඳුම් ඇඳගෙන එකම දේ නාට්‍ය සියයක පෙන්වනවා. මේකද, කලාව? මට පෙර කථා කරපු බොහෝ මන්ත්‍රීවරුන්ගෙනුත් කියැවුණු ආකාරයට කලාවට ඇත්තටම ජාතික ප්‍රතිපත්තියක් නැහැ. ඒ නිසා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී මෙම කාරණය පිළිබඳව මීට වැඩිය ගැඹුරින් සාකච්ඡාවක් පවත්වලා, යම් ප්‍රතිපත්ති මාලාවක් ඇති කර ගැනීම අප කාගේත් යුතුකමක් කියලා මා හිතනවා. මට කාල වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[අ.භා. 3.30]

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම පිළිබඳව මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නාට්‍ය කලාව සම්බන්ධව මමත් මීට කලින් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා, ඒ සම්බන්ධයෙන් වැඩිපුර කථා කළා. අපේ රටේ නාට්‍ය පමණක් නොවෙයි, සමස්ත කලාව ගැනම තිබෙන තත්ත්වය සහ එය නිදහසේ පාවිච්චි කරන්නට අවශ්‍යයි කියන එකයි ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව යටතේ සඳහන් කරලා තිබෙන්නේ. හැම දෙයක් ගැනම කථා කරන්න දැන් කාලය නැහැ. බොහෝ අය කථා කළේ රූපවාහිනී නාට්‍ය පිළිබඳවයි. ඒකට හේතුව තමයි, මේ රටේ වැඩි බහුතරයක් අද කලාව කියා හිතා ගෙන බලන්නේ මේ teledramas වීම.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කිව්වා වාගේ මේ රටේ ඉන්න හැම කෙනෙකුම බිලී බාගෙන, ඒගොල්ලන්ගේ හිත් දූෂ්‍ය කරමින්, බාල තත්ත්වයේ ප්‍රේක්ෂකයන් බිහි කරන එක තමයි මේ teledramasවලින් කරන්නේ. එතුමාම කිව්ව ආකාරයට, කලාකාරයෝ හැටියට හොඳින් කාලා බීලා, ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් ඒ අයට තිබෙනවාද කියන කාරණය වාගේම ඒ තත්ත්වයෙන්ම මේ රටේ ප්‍රේක්ෂකයිනුත් ඉන්නවාද කියන එකත් ඇත්තටම ප්‍රශ්නයක්.

අපි පාසල් ගිය කාලයේත් හොඳ චිත්‍රපට, හොඳ නාට්‍ය, හොඳ පොත පත, හොඳ ගුවන් විදුලිය - මේ සියල්ලම - තිබුණා. බොහොම පරිණත, ඉතාම දක්ෂ, ප්‍රබුද්ධ කලාකරුවෝ ඒ හැම අංශයක් තුළම හිටියා. අපි ඉස්කෝලෙට ගිහිල්ලා කලා සංගම්, අනිකුත් විද්‍යා සංගම් පවත්වන අතරතුරදී ඉතාම අමාරුවෙන් විදුහල්පතිතුමාගෙන් අවසර අරගෙන තමයි, චිත්‍රපටයක් හෝ පාසල් දර්ශනයක් නැරඹීම සඳහා ගියේ. එදා පාසල් දර්ශන සඳහා දරුවන් අරගෙන ගුරුවරු ගුරුවරියන් ගියා. නමුත් අද පාසල් දර්ශන සඳහා කොහේවත් සිනමා ශාලාවකුත් නැහැ; පෙන්වන එවැනි චිත්‍රපටත් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. නාට්‍ය පිළිබඳ තත්ත්වය ඊටත් එහාට ගිහිල්ලා තිබෙන්නේ. අපි ඉගෙන ගත්ත කාලයේ විෂයයක් හැටියට අපට නාට්‍යය ඉගෙන ගන්න තිබුණා; නාට්‍ය පිළිබඳව අපට ලියන්න තිබුණා. මම එදාත් මේ කාරණය පිළිබඳව කිව්වා. ජෝශප් වාස් විද්‍යාලයේ පෙන්වපු "හුණුවටයේ කථාව" වේදිකා නාට්‍යය මට බලන්න බැරි වුණු නිසා එම නාට්‍යය බලන්න අපේ ගමේ ඉඳලා මා බොහොම දුරට -වෙන්නප්පුවට- ගියා මට මතකයි. ඒ තරමට අපව පොළඹවලා තිබුණා. ඒ කාලයේ කොළඹ නගරයේ වේදිකා නාට්‍ය ප්‍රේක්ෂකයින් හැටියට වැඩියෙන්ම හිටියේ පාසල් දරුවන් බව මට මතකයි. නමුත් ඒවා වැඩි මුදලක් අය කරන දර්ශන බවට පත්වෙලා තිබුණේ නැහැ. නමුත් නාට්‍ය නිෂ්පාදකයින්ට ඒ සඳහා වැඩි ඕනෑකමක් තිබුණා. මොකද, පාසල් දරුවන්ට මේ නාට්‍ය හරියට ඉදිරිපත් කළාම පාසලේ දරුවන් අතර, ගුරුවරු අතර එය කථා බහට ලක්වෙලා, එම නාට්‍යයට ගුණයක් ලැබෙනවාය කියලා ඔවුන් හිතුවා. පොතක් මූලාශ්‍ර කරගෙන නිර්මාණය කර තිබෙන නාට්‍යයක් නම්, එම නාට්‍ය පිළිබඳව තවතවත් විග්‍රහ කරද්දි එය බොහොම සුවඳවත් වන තත්ත්වයට පත් වෙනවාය කියලා ඔවුන් හිතුවා. නමුත් දැන් මෙතැනදී කියවුණා වාගේම හිනස්සන, විහිළු කරන, double meaningවලින් කථා කරන -double meaning නොවෙයි, කෙළින්ම කුණුහරුප කියන තත්ත්වයට පත් වෙච්ච- නාට්‍ය කලාවක් අද තිබෙන්නේ.

මේ රජය පත් වුණේ පසුගිය අවුරුද්දේ අගෝස්තු 17වැනිදායි. අපි නාට්‍ය කලාව ගැන කථා කරනවා. ගරු අගමැතිතුමා මේ පිළිබඳව හොඳට දන්නවා. එතුමාගේ මෑණියන් මේ නාට්‍ය කලාව පිළිබඳව බොහොම උනන්දුවෙන් හිටියා. එතුමිය "සුදර්ශි" රඟහලේ නිර්මාතෘවරිය හැටියට හිටපු බව අපි දන්නවා. අපට ඉදිරියට යන්න දැන් ක්‍රමයක් තිබෙනවා. මේ රටේ ජනාධිපතිතුමා, ගමේ හැදුණු කෙනෙක්. ඒ වාගේම එතුමාත් නාට්‍ය කලාවෙන් ඉස්සරහට යා යුතුයි කියන මානසික මට්ටමේ ඉන්න කෙනෙක්. ඒ නිසා අපට දැන් මේ ක්‍රමය වෙනස් කරන්නට පුළුවන්. හැබැයි මේ රටේ තිබෙන විවිධ මාධ්‍ය මේ සඳහා සහයෝගය දෙන්න ඕනෑ. මෙතැන ඇමතිතුමා කිව්වා වාගේ, අනෙකුත් අය කථා කළා වාගේ ලෝකයේ තිබෙන සුකුරුත්තම දෙයක් ගෙනැත් පෙන්වලා, ඒකට ප්‍රේක්ෂකයෝ රවටලා ගෙන, ප්‍රේක්ෂකයෝ ඒකට ඇදබැඳ ගත්තාම හොඳ දෙයක් අපට පෙන්වන්න බැහැ. බොහොම රාත්‍රී වෙලායි අපත් ගෙදර යන්නේ. මම මේ කාරණය කියන්න ඕනෑ. ජාතික රූපවාහිනීය තුළ පෙන්වනවා "සිහිනයකි රෑ" කියලා ඉතාම හොඳ සංගීතමය වැඩසටහනක්. ඒ වාගේම "Feeling of Youth" කියලා තවත් සංගීත වැඩ සටහනක් තිබෙනවා. ඒකත් ඉතාම ලස්සනයි. ස්වාධීන රූපවාහිනීයේ - ITN එකේ - රාත්‍රී කාලයේ පෙන්වනවා, "වෙනස" කියන වැඩසටහන. අපට කොච්චර වැඩ තිබුණත් අපි රාත්‍රී කාලයේ ඒක බලනවා. ඒ වාගේම "හිරු" නාලිකාවේත් එහෙම වැඩසටහන් විකාශනය වෙනවා. අපි ඒවාත් මහ හරින්නේ නැහැ. "Hiru Unplugged"

කියන වැඩසටහන තිබෙනවා. ඒක හොඳ සංගීතමය වැඩසටහනක්. ඒ වාගේම අපි දකිනවා, "දෙරණ" නාලිකාවේ "මා නොවන මම" කියන වැඩසටහන. ඉතාම ලස්සන සංගීතමය වැඩසටහනක්.

ඒ වැඩසටහන තුළින් අපට පැරණි සින්දු අලුත් ගායක ගායිකාවන්ගේ මුවින් අහන්න පුළුවන්. ඉතාම හොඳ සංගීතයක් තිබෙන වැඩසහටනක්. ඒ වාගේම "දෙරණ" රූපවාහිනියේ "ඩෙල් ස්ටූඩියෝ" කියලා වැඩසටහනක් තිබුණා. ඒකත් ඉතාම හොඳයි. ඒක දැන් පෙන්වන්නේ නැහැ. ඒ වාගේ වැඩසටහන් තිබෙනවා. මේ හැම මාධ්‍ය තුළම ඒ වාගේ වැඩ සටහන් තිබෙනවා. ඒවා බලන්න හැම කෙනෙකුට බැහැ. ඒවා පෙන්වන්නේ රාත්‍රී 9.00න්, 10.00න් පස්සේ. නමුත් මෙතැන කථා වුණා වාගේ, පාසල් දරුවෝ බලන සීමාව තුළ කාටුන්වලින් පස්සේ බලන්න තිබෙන නාට්‍ය දිහා බැලුවාම බුද්ධියට නොගැළපෙන, තමන්ගේ දරුවන්ට නොගැළපෙන තත්ත්වයේ නාට්‍ය කලාවක් තමයි තිබෙන්නේ. ස්වාධීන රූපවාහිනියේ නාට්‍යමය තත්ත්වයේ නාට්‍යයක්, දෙකක් පෙන්වනවා. ඒ ඇරුණු කොට සමස්ත රූපවාහිනී නාලිකාවලම හොඳ නාට්‍ය විකාශනය වෙනවා දකින්න නැහැ. Satellite TV තිබුණාට හැම දාම පෙන්වන දේ තමයි ඒවාවල පෙන්වන්නේ. ඒ නිසා අපේ ලංකාව බාල ප්‍රේක්ෂකයන්ගේ, බාල ප්‍රේක්ෂකාගාරයක් බවට පත් කරලා ඉවරයි.

මට ලැබී තිබෙන කෙටි වෙලාව තුළයි මා මේ කාරණා ටික කියන්නේ. අපි ඉතාම ප්‍රිය කරන දෙයක් තමයි ගීතය. අපි වාහනයට නැග්ග ගමන් රේඩියෝ එක දානවා. ඒක අපේ හිතට, ඔළුවට හරි සැනසිල්ලක්. අද ඒ ගීත රචනාවන් අහගෙන ඉන්න බැහැ. ඒ වෙලාවට මම නම් නොතේරෙන භාෂාවකට හරි channel එක මාරු කර ගන්නවා. ඒ තත්ත්වයටම හිතන්න බැහැ. ඒ සිංදුවල තිබෙන්නේ, "මාව විශ්වාස කරන්න, ඔබ මාව අනාථ කළා" වාගේ වචනයි. අමරදේව මහතා ගැන, වික්ටර් රත්නායක මහතා ගැන, සනත් නන්දසිරි මහතා ගැන, නන්දා මාලනී මහත්මිය ගැන, අඩුම ගණනේ දීපිකා ප්‍රියදර්ශනීල වැනි අය ගැනවත් දන්න ප්‍රේක්ෂකයෝ අද මේ රටේ නැතිවෙලාම ගිහිල්ලා තිබෙනවා. ඇත්තටම අපෙන් ඇහුවොත් මේ අලුත් ගීතය කියන්නේ කවුද කියලා, අපි දන්නේ නැහැ. ඒ තරමට ඒවා අහගෙන ඉන්න අමාරුයි. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කිව්වා වාගේ මොකක් හරි studio එකකට ගිහිල්ලා ගීතයක් පටිගත කරනවා. ඒක සල්ලි දීලා channel එකකට භාර දෙනවා. ඒ ගොල්ලන්ගේ Music Chart එකට දානවා. ඔය විධියට ප්‍රසිද්ධ කරනවා මිසක් කිසිම කලාවක් මේ තුළ ඇත්තේම නැහැ. ඒ නිසා දිනෙන් දින, දිනෙන් දින මේ කලාව කියන පැත්ත ඉතාම පහළටම වැටිලා තිබෙනවා.

මට ලැබී තිබෙන කෙටි කාලය තුළ තවත් එක් දෙයක් කියන්න ඕනෑ. අපේ සාහිත්‍ය ගැන යමක් කියන්න ඕනෑ. අපේ චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාත් මේ අවස්ථාවේ ඉන්නවා. එතුමා හොඳට පොත පත කියවපු කෙනෙක්. අපි තුන්වැනි පන්තියේ හෝ දෙකේ පන්තියේ ඉන්න කොට තමයි, "හීන්සැරය" කියන පොත අපට ඉගැන්වූයේ. ඊට පස්සේ තමයි, අපට "මහුල් කැම" කියන පොත ඉගැන්වූයේ. අද මම හිතන්නේ A/L කරන ළමයෙක්වත් ඒ පොත ගැන දන්නේ නැහැ. ඒක තමයි අපට තිබෙන දුක. සාහිත්‍ය කියන එක බින්දුවටම බැහැලා ඉවරයි. අනුර දිසානායක මන්ත්‍රීතුමා වැඩි කාලයක් අරගෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හැටියට මේ කාරණය ගෙනාවා. මිනිස්සු හිතනවා ඇති, "කලාව කන්නද?" කියලා. හැබැයි අද මේ රටේ මිනිස්සුන්ව නැති වෙන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ මේ "කලාව" කියන එක පිළිබඳව මිනිස්සුන්ගේ සිත් පිත් නැතිකම නිසායි. "කලාවට ගිය සිත කැලෑවට නොයනු ඇත." කියලා සාමාන්‍ය මිනිස්සු අතර සරල කථාවක් තිබෙනවා නේ. ඒක තමයි ඇත්තම කථාව.

අද, "මුදල්, මුදල්, මුදල්" කියන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. චිත්‍ර අඳින අය විහාරමහා දේවි උද්‍යාන පාරේ ඒ චිත්‍ර තියාගෙන රුපියල් දාහකට, රුපියල් පන්සියයකට ඒවා විකුණන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ලෝකයේ විශාලම ආදායමක් ලබන අය චිත්‍ර අඳින අයයි. ලෝකයේ පැරණි චිත්‍ර ශිල්පීන් ගැන අපි කවුරුත් දන්නවා. අපේ රටේ චිත්‍ර අඳින අයට හොඳ නිර්මාණ නොවෙයි අද විකුණන්න වෙලා තිබෙන්නේ. ඒවා බොහොම බාල නිර්මාණ. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හැම ක්ෂේත්‍රයක්ම ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මහාචාර්ය සරච්චන්ද්‍රයන්ලා, හෙන්රි ජයසේනයන්ලා, චන්ද්‍රසේන දසනායකයන්ලා, ගුණසේන ගලප්පත්තිලා, ධම්ම ජාගොඩලා, සෝමලතා සුබසිංහලා, අද ජීවතුන් අතර ඉන්න විජේරත්න වරකාගොඩලා, අයිරාංගනී සේරසිංහලා, සිරිල් වික්‍රමගේලා වාගේ කලාකරුවන් ගත්තාම ඒ හැම කෙනෙක්ම ඉතාම ලොකු කැපවීමක් මේ කලා ක්ෂේත්‍රයට කරලා තිබෙනවා.

ටෝනි රණසිංහලා, උපාලි අත්තනායකලා වුණත් එහෙමයි. ඒ විතරක් නොවෙයි. සරත්චන්ද්‍රයන්ගේ ගෝලයින් වන නිශ්ශංක දිද්දෙනිය, ජයලත් මනෝරත්නලා අදත් ඉන්නවා. ඒ අනුසාරයෙන් ආපු තවත් කලාකරුවන්, කලාකාරිනියන් ඉන්නවා. මේ හැම කෙනකුම හිටියාට ඔවුන්ට දෙන්න ප්‍රේක්ෂකාගාරයක් නැහැ. ඒක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය වන්නේ. එදා පාසල් දර්ශනවලට ගිහිං එළියට එද්දී ඒ ගොල්ලන්ට ලොකු ඉල්ලුමක් තිබුණා. ගෙදර දෙමාපියන් පවා ඔවුන්ගේ නාට්‍යයක් බලන්න, ඔවුන්ගේ සංගීතයක් අහන්න යන තත්ත්වයක් තිබුණා. අද මේ රටේ ඒ තත්ත්වය ඇත්තේම නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මේ යෝජනාව ගෙනෙන වෙලාවේ මා මේ ගරු සභාවේ හිටියේ නැහැ. නමුත්, මා වාහනයේ එන කොට රේඩියෝ එකෙන් අහන්න ලැබුණා, අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු. ඇත්තටම අපට අද නාට්‍යාගාර නැහැ. තිබෙන නාට්‍යාගාරත් වැහිලා. ලක්ෂ 10, 15ක් දීලා නාට්‍යාගාරයක් ගන්නට සාමාන්‍ය කෙනකුට බැහැ. නමුත්, අපට පාසල්වල තිබෙන ශාලා හොඳ නාට්‍යාගාර හැටියට පත් කර ගන්න පුළුවන්. "ළහම පාසල හොඳම පාසල" වැඩ සටහනට ලංකාව පුරා විසිරුණු පාසල්වලින් පාසල් තෝරා ගනිද්දී, හොඳ නාට්‍ය ශාලා ටිකකුත් ඒ අතර ඇති වනවා නම් ඒකෙන් පාසල් අධ්‍යාපනයට සහ ශාස්ත්‍රීය දැනුමට ලොකු රුකුලක් වෙනවා. ඒ නිසා ඒ ක්‍රමය හෝ ගම්වලට ගෙන ගොස් නාට්‍ය කලාව සහ ශාස්ත්‍රීය කලාව ඉදිරියට ගෙන යන්න තිබෙනවා නම් එය ඉතාම යහපත් දෙයක් හැටියට මා මතක් කරනවා.

පොත් ලියන්නන්ට, ගීත රචකයන්ට අවශ්‍ය ශක්තිය අපි ලබා දෙන්න ඕනෑ. අද කිසිම දරුවකු එවැනි දෙයකට පෙළඹෙන්නේ නැහැ. ඒ නිසා ඒවා අගය කිරීමේ තත්ත්වයක් මේ රටේ ඇති වෙන්න ඕනෑයි කියන එක මා මතක් කරනවා. මේ යුගයේ, මේ දේශපාලන යුගයේ මේක කරන්න පුළුවන්. මා කථාව ආරම්භයේදීත් කිව්වේ ඒකයි. කලාව, ශාස්ත්‍රීය දැනුම ගැන හොඳින් දන්නා නායකයින් දෙදෙනකු මේ රටේ ඉන්නා මොහොතේදී ඒ තත්ත්වය ඇති කරන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අපි කවුරුත් සහයෝගය දෙමු කියලා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කාලය අවසන් බව මතක් කරන්න ඔබතුමා සුදානමින් සිටින බව මට පෙනෙනවා. මට කාලය ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි. ඒ

[ගරු එඩ්වඩ් ගුණසේකර මහතා]

වාගේම මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාටත් මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.41]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ සභාව නව තාලයේ අදහස් ප්‍රකාශනයකට යොමු කළා. හුඟක් වෙලාවට ආර්ථික ප්‍රශ්න, සමාජ ප්‍රශ්න, දේශපාලන ප්‍රශ්න ගැන තමයි පාර්ලිමේන්තුව වැඩි බරක් දාලා කථා කරන්නේ. නමුත්, රටට කාලීන වැදගත් මාතෘකාවක් පදනම් කරගෙන අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙන ඒම ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කලාව, සාහිත්‍ය කියන්නේ දියුණු සමාජයක් මනින මිම්මක්. ආර්ථික සමෘද්ධියකින් විතරක්, සාක්ෂරතාවෙන් විතරක් සමාජයක දියුණුව මනින්න බැහැ. යම් කිසි රටක දියුණු කලාවක්, සාහිත්‍යයක්, සංස්කෘතියක් තිබෙනවා නම් ඒක ඒ රටේ මිනිසුන්ගේ ආධ්‍යාත්මය පිළිබිඹු වන එක් කෝණයක්. ඒ නිසා දියුණුව මනින එක් මිම්මක් තමයි සාහිත්‍ය කලාව, සෞන්දර්ය කියන්නේ. අද අපි මුහුණ දෙන මේ සමාජය තුළ මහා ව්‍යසනයක් තිබෙන බව අපට පෙනෙනවා. අනෙක් මනුෂ්‍යයාගේ දුක, වේදනාව තේරුම් ගන්න බැරි අසංවේදී සමාජයකයි අපි ඉන්නේ. අපි නිතරම මේ වාගේ කරුණු අත්දකිනවා.

අද පුවත් පත් අරගෙන බැලුවාම, කොයි තරම් හිත පාරවන දේවල් තිබෙනවා ද කියලා අපි දන්නවා. තමන්ගේ කුසෙන් බිහි වුණු දරුවා වැසිකිළි වළකට, කුණු කූඩයකට දාලා යන්න පුළුවන් අම්මලා ඉන්න සමාජයක් අද තිබෙන්නේ. ඒ වාගේම තමන්ට කිරි පොවාපු අම්මා උස්සාගෙන ගිහිල්ලා හන්දියක තියලා පැනලා යන දරුවන් ඉන්නවා. මේ තරම් සමාජය විකෘතියට යන වෙලාවක, මෙය ප්‍රකෘතිකරණය සඳහා ගෙන යන්න සංවේදී මනුෂ්‍යයකු තනන්න ඕනෑ. ඒ සංවේදී සමාජය ගොඩ නඟන කාර්ය භාරය එක පක්ෂයකට පමණක් අයිති දෙයක් නොවෙයි. ඒක මහා සමාජ ධාරාවක ප්‍රතිඵලයක්. නමුත්, එහිදී රජයක් හැටියට දිය යුතු සහයෝගය දෙන්න ඕනෑ. රජයක් හැටියට දිය යුතු අනුග්‍රහය දෙන්න ඕනෑ. සමාජ වින්දනය දියුණු කරන්න, මිනිසුන්ගේ මනෝභාවය දියුණු කරන්න, මිනිසුන්ගේ ආධ්‍යාත්මය දියුණු කරන්න ඒ පරිසරය හදන්න ඕනෑ.

මා මේ වෙලාවේ කියන්න කැමැතියි, අද පවතින ගීත සාහිත්‍යය ගැන. සමහර ගීත අරගෙන බැලුවාම ආදරය, ප්‍රේමය ගැන කියැවෙන මිනිසුන්ගේ හිත නිවන, මිනිස්සු සංවේදී කරන මාතෘකා යටතේ ලියැවුණු ඒවා. නමුත්, අද තිබෙන සමහර ගීත කොයි තරම් අසංවරද බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය සම්මාන උළෙලවලදී හොඳම ගීත ලෙස තෝරාගත් එක ගීතයක් හෝ රාජ්‍ය මාධ්‍යයකින් අහන්න අද පුළුවන්කමක් නැහැ. මා ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ ගිය වර රාජ්‍ය සංගීත සම්මාන උළෙලේදී සම්මාන ලැබූ "නාගසින්නම් ගීතය" ගැන. නාගසින්නම් ගීතය ශානිකා සුමනසේකර මහත්මියයි ගායනා කරන්නේ. එයින් කියැවෙන්නේ ඓතිහාසික කථාන්තරයක්. ඒ ඓතිහාසික කථාන්තරය මොකක්ද? රාජසිංහ රජ්ජුරුවන් පිටුවහල් කරපු වෙලාවේ ඒ රජතුමාගේ දේවියගේ කන කර ඇදලායි ගලවා ගත්තේ. ඒ වෙලාවේ ඇගේ කනෙන් මතු වුණු ලේ දහරාව ඇගේ හැට්ටයේ තැවරුණා. ඒ හැට්ටය කටු ගෙයි තිබෙනවා. ඒක දැකපු කවියා හොඳ ගීතයක් ලියනවා. ඒ ගීතය තමයි ගිය වර රාජ්‍ය සම්මාන ලැබුවේ. අහන්න ලැබෙනවාද අපට, නාගසින්නම් ගීතය? එය අහන්න ලැබෙන්නේ නැහැ. මේක තමයි රටට වෙලා තිබෙන්නේ. නමුත්, "රුවිරානනී අහන්න.... එක පාර මා මරන්න...." කියන ඒවා නම් ඇහෙනවා. සමහරුන් දැන් ආදරය විග්‍රහ කරන්නේ, "උඹගෙ ආදරය ලැබෙන්නේ නැත්නම්, දැන් ඉතින් මට ගහපන්" කියලායි. ආදරය එහෙම විග්‍රහ කරන කාලයක ගැඹුරු දෙයක් අල්ලාගෙන, ඓතිහාසික දෙයක් මතු කරගෙන කවියකු ලියපු නාගසින්නම් ගීතයට මේ සමාජයේ අපේම මාධ්‍යකින් තැනක් දෙන්නේ නැහැ. ඒ වාගේ උදාහරණ රාශියක් මට කියන්න පුළුවන්. මෑතකදී එවැනි සම්මාන ලත් ගීත ගණනාවක ඉරණම ඒකයි. අපි ඒ ගැන ඇත්ත වශයෙන් කනගාටු වෙනවා. එවැනි ගීතයක් රාජ්‍ය මාධ්‍යකින් හෝ අපට අහන්න පුළුවන්කම නැත්නම් රාජ්‍ය සම්මාන දිනුවාට වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අපට අලුත් ආරකින් හිතන්න වෙලා තිබෙනවා. කලාව කියන එක ඇත්ත වශයෙන් විශ්ව ප්‍රකාශනයක්. ගීතය, නවකථාව, නාට්‍යය කියන ඒවා එක් ජන සමාජයකට විතරක් අයිති ඒවා නොවෙයි. අද අපි සමාජ සංහිඳියාවක් ගැන කථා කරනවා. සමාජ සංහිඳියාව ගැන අලුත් අදහසක් කියන්න, මිනිසුන්ගේ හදවත්වල ආයෙත් සංවේදිත්වය ගොඩ නඟන්න අපට තිබෙන මාධ්‍යක් තමයි, කලාව. එය ගීතයෙන් කරන්න පුළුවන්, නවකථාවෙන් කරන්න පුළුවන්, නාට්‍යයෙන් කරන්න පුළුවන්. ඒ වාගේම, රූපවාහිනී නාලිකා මඟින් පෙන්වන කෙටි චිත්‍රපටි ආදි කලා මාධ්‍යවලින් ඒ සංවේදිත්වය හදන්න පුළුවන්. නමුත්, කවුද ඒකට යොමු වන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනසක් කරලා ව්‍යවස්ථාවේ කොළවල ව්‍යවස්ථා ලිව්වාට වැඩක් නැහැ. ප්‍රායෝගික වැඩ පිළිවෙළකින් මිනිසුන්ට තේරෙන විධියට ඒ පණිවිඩය දෙන්න ඕනෑ. ඒක කරන්න පුළුවන් හොඳම මාධ්‍ය, කලාවයි. කවුද ඒ සඳහා කලාව පාවිච්චි කරන්නේ? කොහේද එවැනි කලාවක් බිහි වන්නේ? ඇත්ත වශයෙන් ගුණාත්මක කලා මාධ්‍යකට අත දිය යුතු මේ වාගේ වකවානුවක තමයි අප ඒ හැඟීම් අමතක කරලා ක්‍රියා කරගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපට ලොකු සමාජ වගකීමක් තිබෙනවා, මේ සමාජය යහපත් පැත්තට හරවන්න. මීට කලින් කථා කරපු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමාත් කිව්වා, අප ඉගෙනුම් ලැබූ කාලයේ කියවපු "අම්මවතුර", "බුත්සරණ", "ලෝකෝපකාරය" ආදිය ගැන. ඒවා විතරක් නොවෙයි. අප පුංචි කාලයේ අපේ මව්පියන් අප සුරතල් කරමින් කියපු ගීතයක්, අපේ ඔළුව අත ගාමින්, දරු සුරතල් බලමින් කියපු දරු නැළවිල්ලක් කියන්න අද නූතන අම්මලා දන්නවාද? නූතන අම්මා කෙනෙකුට ඒවා කියන්න පුළුවන්ද? එදා ඒවායෙන් තමයි දරුවන් සංවේදී වුණේ. ඒවායෙන් තමයි මිනිසුන්ගේ හදවත් පුංචි කාලයේදීම කම්පනය වුණේ. අප පුංචි කාලයේ ඉඳලාම අපේ හදවත්වල අලුත් ජීවය රෝපණය වුණේ වැඩිහිටියන් මේ සමාජ පරිසරයෙන් ලත් තම අද්දැකීම් ඊළඟ පරම්පරාවට සමාජගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසයි. දැන් එවැනි සාහිත්‍යයක් නැහැ; පරිසරය ගැන කියැවෙන දෙයක් නැහැ; දරු නැළවිල්ලක් ඇහෙන්නේ නැහැ; සුරතල් ගීතයක් ඇහෙන්නේ නැහැ; එවැනි දෑ පිළිබඳ සමාජ විග්‍රහයක් නැහැ.

ඉතින් අපි මොන තරම් ආර්ථික සමෘද්ධියක් කරා ගමන් කළත්, ඒ ආර්ථික සමෘද්ධියෙන් ඇති වැඩක් නැහැ, සමාජය

මිලේච්ඡත්වයට යනවා නම්. ඒ සමෘද්ධිය තාවකාලිකයි. ඒ නිසා අපි මේ යුගයේ අවශ්‍යතා ගැන හිතලා, ගීත සාහිත්‍යය, නව කථා ක්ෂේත්‍රය, කෙටි කථා ක්ෂේත්‍රය, ඒ වාගේම රූපවාහිනී මාධ්‍යවලින් දෙන පණිවුඩ සමාජගත කරන්න ඕනෑ. ඒකට රජයට වගකීමක් තිබෙනවා; රජයේ මඟ පෙන්වීමක් තිබෙන්න ඕනෑ; රජයට ජාතික ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම රජයක් හැටියට මෙවැනි කරුණු ගැන අවධානය යොමු කරන්න ඕනෑ. විපක්ෂයෙන් මේවා ඉදිරිපත් කරන එක අපේ වගකීමක්. නමුත් රජයට වගකීමක් තිබෙනවා, මේ සමාජය මිලේච්ඡත්වයෙන් මුදා ගෙන, මේ සමාජයේ ජීවීන් සංවේදීත්වය කරා ගෙන යන සමාජ වටපිටාවක් නිර්මාණය කරන්නේ කොහොමද කියන එක ගැන ජාතික හැඟීමක් ඇති වැඩ පිළිවෙළක් හදන්න. ඒ නිසා උසස් කලාව අගය කරන්න ඕනෑ; උසස් කලාවට අත දෙන්න ඕනෑ; දිරිමත් කරන්න ඕනෑ. දැන් මේ සභාවේදී බොහෝදෙනාගෙන් ඒ ගැන කියැවුණා. ඇත්ත වශයෙන්ම සාර්ථක ඇගයීමක් නැති තැන ඒකට පෙළඹෙන්නේ නැහැ.

අද කලා කෘතියක් නිර්මාණය කරනවාය කියන එක ලෙහෙසි වැඩක් නොවෙයි. සාමාන්‍ය කෙනෙකුට පොතක් මුද්‍රණය කරලා ඒ පොත සමාජයට දෙන්න පුළුවන්කමක් නැහැ. ගීතයක් කොයි තරම් හොඳට ලිව්වත්; කොයි තරම් හොඳට ගායනා කළත්; කොයි තරම් සංවේදී වුණත්, රජයවත් එය අගයන්නේ නැත්නම්, "අපි මේ දරන ප්‍රයත්නය නිස්සාරයි" කියලා ඔවුන්ට කල්පනා වෙන්න පුළුවන්. ඒ නිසා අපි හැම විටම ඒ ගැන හිතන්න ඕනෑ. හොඳ හිතින් කවරෙකු නිර්මාණයක් කළත් එය සමාජය තිරිසන් බවෙන් මුදවන නිර්මාණයක් බවට පත් වෙනවා. එවැනි නිර්මාණශීලීන් මේ සමාජය තුළ ඉන්නවා; ගීත රචකයන් ඉන්නවා; නවකථාකරුවන් ඉන්නවා; චිත්‍රපට නිෂ්පාදකයන් ඉන්නවා. රජයක් හැටියට ඒ අයට අත දෙන්න ඕනෑ. මම "රජය" කිව්වේ පක්ෂ-විපක්ෂ දිහා බලලා නොවෙයි. ඒක සමස්ත සමාජයේ වගකීමක්. රටේ කලින් පාලක පන්තිය මේ ගැන දක්වපු අවධානය මදිය කියලා ඒකට ප්‍රතිඋත්තර දෙන එක නොවෙයි කළ යුත්තේ. ඒවායින් සමාජයට අලුත් දෙයක් දෙන්නේ කොහොමද, මේ සමාජය යහපත් සමාජයක් බවට පරිවර්තනය කරන්නේ කොහොමද, කවර කෝණවලින් මේ ප්‍රශ්න දෙස බැලිය යුතුද කියන එක ගැන අපි ගැඹුරින් හිතන්න ඕනෑ. කලාව කියන්නේ ඒ සඳහා යොදා ගත හැකි ප්‍රබල මාධ්‍යයක්. එහි සංවේදීත්වය ප්‍රබලයි; චින්දනය ප්‍රබලයි. එවැනි චින්දනයක් ඇති සමාජයක් නිර්මාණය කළොත්, එකිනෙකාට බෙදිලා ඇන කොට ගැනීම, ලෙයින් සතුටු වීම, අනෙක් එකා යට කර ගෙන තව එකෙක් ඉස්සරහට යෑම, එක් ජාතියක් පහළට දමලා, තවත් ජාතියක් තුළ ඇතිවන "අපි තමයි ප්‍රබල ජාතිය" කියන හැඟීම යටපත් කරන්න පුළුවන්කම ලැබෙන්නේ එක හා සමාන සංවේදී මානසිකත්වයක් ඇති මිනිසුන් නිර්මාණය කිරීමෙන්. මේ සමාජයට ඕනෑ පළමු දෙය තමයි හොඳ මිනිහෙක් හැදීම; මනුෂ්‍යත්වය නිර්මාණය කිරීම. පක්ෂ, පාට, දේශපාලන අදහස් තිබෙන්න පුළුවන්. ඒ සියල්ලට වඩා මනුෂ්‍යත්වය නිර්මාණය කිරීම අද යුගයේ අපට තිබෙන වගකීමක්.

වෛරයෙන්, ක්‍රෝධයෙන් හා ද්වේෂයෙන් බලන්නේ නැති, යහපත් ගුණාංගවලින් යුක්ත මිනිසෙකු තනනකල් සමාජය හැදෙන්නේ නැහැ. ක්‍රෝධය, වෛරය, අනෙක් එකාගෙන් පළි ගැනීම ආදී සාහසික අදහස් පපුවලින් තුරන් කරන තෙක් අපට මේ සමාජය තුළ අපි බලාපොරොත්තු වන ඉදිරි ගමනකට යන්න බැහැ. ඒ සම්බන්ධයෙන් කලාවට ලොකු වගකීමක් තිබෙනවා. ඒ නිසා විවිධ ක්ෂේත්‍රවලින් කලාව දියුණු කරන්න ඕනෑ. සමාජයේ චින්දන ශක්තිය වැඩි දියුණු කරන්න, පාසල් පද්ධතියේ ඉඳලා අලුත් ආරකට හිතන නව පරපුරක් බිහි කරන්න, කලාව ඉතා වැදගත් වෙනවා. රොබෝවරු නොවෙයි හැදිය යුත්තේ. අද අපි උත්සාහ කරන්නේ, රොබෝවරු හදන්නයි. දැන් ලෝකය පුරාම රොබෝ සංස්කෘතියක් තමයි තිබෙන්නේ. ලෝකය අද උනන්දු වෙන්නේ ඒ වෙනුවෙනුයි. මොකද ලාභය පදනම් කර ගෙන, ශ්‍රමයට දෙන වටිනාකම වෙනුවට යන්ත්‍රයට ඒ වටිනාකම දී, තමන්ගේ ලාභය උපරිම කර ගන්නේ කොහොමද කියා බලන සමාජයක් ඇතුළේ අපි හැම කෙනකුම උත්සාහ කරනවා, රොබෝවරු තනන්න. ඒවා තාවකාලිකයි. කවරක් තැනුවත් වැඩක් නැහැ, ඒවා ක්‍රියාත්මක කරන දැත් මනුෂ්‍යත්වයේ දැත් නොවෙනවා නම්; ඒවා මෙහෙය වන ඔළුව මනුෂ්‍යකමින් පිරුණු ඔළුවක් නොවෙනවා නම්. මනුෂ්‍යකමින් පිරුණු චින්තනයක් ඇති, සදාචාර සම්පන්න ගුණගරුක හැඟීම්වලින් පිරුණු මිනිසකු නිර්මාණය කරන තාක් කල් ඒ සියල්ල තාවකාලිකයි. එම නිසා අපට වගකීමක් තිබෙනවා, සමාජය සංවේදීත්වය කරා ඉස්සරහට ගෙනියන්න; සාහිත්‍ය කලාව ප්‍රධාන කර ගෙන මනුෂ්‍යත්වය ඇති මිනිසුන් සමාජයට ගොඩ නඟන්න.

ඇත්ත වශයෙන්ම, පසුගිය කාලය තුළ මේ සමාජයේ සිදුවුණු අඩුපාඩු, වැරදි විග්‍රහයන් පිළිබඳව ස්වයං විවේචනයක් කර, අපේ අධ්‍යාපනයේ කොතැනද අපිට වැරදිලා තිබෙන්නේ, අපේ අධ්‍යාපනය කොයි ආරයකටද වෙනස් කරන්න ඕනෑ කියන එක ගැන අපිට බලන්නට සිදු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන් කවුරුත් කිව්වා වාගේ, මේ ප්‍රශ්නයේදී අධ්‍යාපන ඇමතිතුමාත් ඉන්න ඕනෑ. මේ සංස්කෘතික ඇමතිතුමාට විතරක් මේකට උත්තර දෙන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා අපි කාටත් පැවරුණු වගකීමක් තිබෙනවා, මේ මුළු මහත් සමාජයටම බලපාන පරිදි යහපත් නිර්මාණකරණයකට රට යොමු කර උසස් චින්දන ශක්තියක් ඇති සමාජයක් මේ මිහිතලයේ නිර්මාණය කරන්න. සමාජ ප්‍රගතිය වෙනුවෙන් ඒ කටයුතු ඉටු කරන්නට රජයේ අනුග්‍රහය මීට වඩා ලැබෙය කියා අපි විශ්වාස කරනවා. ඒ පැත්තට යොමු කරන්න මේ මාතෘකාව අද සභාගතවීම යහපත් ප්‍රවණතාවක්. සම්ප්‍රදායයෙන් මිදුණු අලුත් අදහස් රාශියක් අද මේ ගරු සභාවේ ඉදිරිපත් වුණා. කවුරුත් ධනාත්මක විධියට මේ ප්‍රශ්නය ගැන බලා, ඇගයීමකින් විචාරාත්මකව අදහස් දැක්වුවා. ඒක හොඳ ප්‍රවණතාවක්. ඒ සාමූහිකත්වය තුළ ඇත්තවශයෙන්ම ජාතික ප්‍රතිපත්තිකරණයකට යොමු කරමි අපි බලාපොරොත්තුවන උසස් මානුෂික ගුණාංගවලින් යුතු, දියුණු, සමෘද්ධිමත් සමාජයක් කරා යන්න හැම කෙනකුගේම සහයෝගය ලබා දෙන බවට ප්‍රතිඥා තිබුණා. එය එසේ ඉටු වේවායි! ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

[பி.ப. 3.57]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மிக முக்கியமான விவாதமொன்றில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். ஆங்கிலத்தில் நாங்கள் 'செப்ரெம்பர்' என்று சொல்கின்ற இந்த ஒன்பதாவது மாதத்தைத் தமிழிலே

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

"புரட்டாதி" என்கின்றோம். ஆனால், சிங்களத்தில் இந்த மாதத்திற்கு மிக அழகான ஒரு சொல் இருக்கின்றது. அது 'சாஹித்திய' மாதம் என்பதாகும். சாஹித்தியம் என்றால் அது இலக்கியம் என்று பொருள்படுகின்றது. இந்த இலக்கிய மாதத்திலே 8ஆம் திகதியாகிய இன்று இத்தகைய ஒரு மிக முக்கியமான பிரேரணையை முன்வைத்திருக்கும் கௌரவ உறுப்பினர் அநுர திஸாநாயக்க அவர்களுக்கும் எனது நன்றியைத் தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன். ஓர் எழுத்தாளர், கவிஞர், கலைஞர் என்ற வகையில் எனக்கும் இது மிக முக்கியமான ஒரு பிரேரணையாகும்.

இந்த நாள் குறித்து நான் அவதானம் செலுத்துவதற்குக் காரணமும் உண்டு. அதாவது, இங்கே நாங்கள் கலைஞர்களை வாழ வைக்கவேண்டும்; கலைகளை வலுப்படுத்தவேண்டும்; எழுத்தாளர்களை ஊக்குவிக்கவேண்டும் எனப் பிரேரணை நிறைவேற்றிக்கொண்டிருக்கும் இந்த நாளில் கொழும்பு பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபத்திலே எழுத்தாளர்களுக்கு விருது வழங்கும் விழா இப்பொழுது நடைபெற்றுக்கொண்டிருக்கின்றது. இந்தச் சபையில் பாராளுமன்ற உறுப்பினர்கள் முன்வைக்கும் ஆலோசனைகளைக் கேட்பதற்குக்கூட அவகாசமில்லாமல் இந்தத் துறைக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் இப்பொழுது அங்கே எழுத்தாளர்களுக்கு விருதுகள் வழங்கிக்கொண்டிருப்பார். அந்த வகையில், இன்றைய தினத்தில் விருதுக்காகத் தெரிவுசெய்யப்பட்ட அத்தனை எழுத்தாளர்களும், அதாவது சிங்களமொழிமூலம் படைப்புகளைத் தந்த எழுத்தாளர்களாக இருக்கட்டும், தமிழ்மொழிமூலம் படைப்புக்களைத் தந்த எழுத்தாளர்களாக இருக்கட்டும் அல்லது ஆங்கிலமொழ மூலம் படைப்புக்களைத் தந்த எழுத்தாளர்களாக இருக்கட்டும், மும்மொழிகளையும் சார்ந்த எழுத்தாளர்கள் சரிசமமாக இந்த நாட்டிலே இன்று கௌரவம் பெறுகின்றார்கள். அந்தக் கௌரவத்திற்கு இந்த உச்ச சபையிலிருந்து நானும் எனது வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்வதில் மகிழ்ச்சியடைகின்றேன்.

இருப்பினும், இந்தத் தேசிய சாஹித்திய விருது வழங்கும் விழாக்களிலே பின்பற்றுகின்ற நடவடிக்கைகள் குறித்து நாங்கள் அவதானம் செலுத்தவேண்டிய தேவையிருக் கின்றதென்று நான் நினைக்கின்றேன். உதாரணமாகச் சிறுகதைத் துறையை எடுத்துக்கொள்வோமாக இருந்தால், சிறுகதை எழுதுபவர்களுக்காக வருடந்தோறும் சிறந்த சிறுகதைத் தொகுப்பொன்றைத் தெரிவுசெய்து, அதற்குக் குறிப்பிட்ட தொகைப் பணப் பரிசும் சான்றிதழும் விருதும் வழங்கப்பட்டு வருகின்றது. இந்தப் போட்டிக்காக அல்லது விருதின் தெரிவுக்காகக் குறிப்பிட்ட வருடத்தில் 50 எழுத்தாளர்கள் தங்களது சிறுகதை ஆக்கங்களைப் படைத்து அனுப்பியுள்ளார்கள் என்று வைத்துக்கொள்வோம். இவற்றில் சிறந்ததைத் தெரிவுசெய்யும் அந்தத் தெரிவாளர் குழு எவ்வாறு, எந்தத் தகுதிகொண்டு தெரிவுசெய்யப்படுகின்றது? என்பது தொடர்பாகப் பல்வேறு பிரச்சினைகள் இருக்கின்றன. எனவே, இந்தத் தெரிவுகளைச் செய்கின்றபோது பல்வேறு சிக்கல்கள் நிலவுகின்றன என்பதை நாங்கள் அவதானித்து வந்திருக்கின்றோம்.

அடுத்த பிரச்சினை இந்தத் தெரிவாளர் குழு தெரிவுசெய்து பரிசில்களை வழங்கும்போது இருக்கின்ற நடைமுறையாகும். அதாவது 50 நூல்கள் விருதுக்காக அனுப்பப்பட்டிருக்கின்ற பட்சத்தில், இறுதியில் 3 நூல்களை short-list என்ற அடிப்படையில் பரிசில் வழங்குவதற்காகத் தெரிவுசெய்து வைத்துக்கொள்கின்றார்கள். இந்த மிகுதி 47 எழுத்தாளர்களும் யார் யாரென்ற விபரங்கள் வெளியிடப்படமாட்டாது. ஆனால், இறுதியாகத் தெரிவுசெய்யப்பட்ட அந்த 3 எழுத்தாளர்களின் பெயர் விபரங்களும் ஊடகங்கள் வாயிலாக வெளிப்படுத்தப்படும். Short-listஇல் தெரிவுசெய்யப்பட்ட அந்த 3 படைப்பாளர்களுக்கும் அழைப்பிதழ் வழங்கப்பட்டு அவர்கள் குடும்பத்தோடு வந்து பரிசுக்காகக் காத்திருப்பார்கள். அந்த மூவரில் ஒருவருக்கு மாத்திரம் பரிசு வழங்கப்படும். மிகுதி இருவரின் பெயர்கள் தெரிவு செய்யப்பட்டு வெளியிடப்பட்டிருந்தபோதும் அவர்களுக்கு எவ்விதமான கௌரவமும் அந்த மண்டபத்தில் வழங்கப்படுவதில்லை. இறுதியாக அந்த 47 பேரின் பெயர்கள் உள்ள அதே பெயர்ப் பட்டியலிற்குள் இந்த இருவரின் பெயர்களும் அடங்கிவிடும். எனவே, அந்த இருவரும் குடும்பத்தோடு வந்து மண்டபத்தை நிரப்புகின்ற சாதாரண பொதுமகனாக மாத்திரமே இருந்துவிட்டுச் செல்கின்ற அவலம் நிகழ்ந்துகொண்டிருக் கின்றது. இது அங்கே தெரிவு செய்யப்பட்டு வழங்கப்படுகின்ற ஒவ்வொரு விருதுகளுக்குப் பின்னாலும் நிகழ்ந்து கொண்டிருக்கின்ற அவலமாகும். மூவரில் ஒருவர் பரிசு பெறுகின்றார்; இருவர் பார்வையாளராக வந்து அமர்ந்து, இந்தப் பரிசுக்குத் தகுதியற்றவர்களாகின்றார்கள். அதேநேரம், அந்த 47 எழுத்தாளர்களும் அதே தகுதியைத்தான் பெறுகிறார்கள்; தெரிவாளர் குழுவின் விதப்புரையின் பிரகாரம் அவர்களும் தகுதியற்றவர்கள். எனவே, முதலில் தகுதியுள்ளவர்களாகத் தெரிவுசெய்யப்பட்ட அவர்களைப் பார்வையாளர்களாகத் திருப்பியனுப்புகின்ற ஒரு நடைமுறையே கையாளப்படுகின்றது. ஆகவே, மூவரில் ஒருவரைச் சிறந்த எழுத்தாளராகத் தெரிவுசெய்வதாக இருந்தால், அழைக்கப்பட்ட அந்த மூவரையும் மேடைக்கு அழைத்து, தெரிவுசெய்யப்பட்ட ஒருவருக்கு பரிசையும் விருதினையும் வழங்கிவிட்டு, எஞ்சிய இருவருக்கும் குறைந்தபட்ச கௌரவமாக சான்றிதழையும் மதிப்பீடுகளையும் வழங்கிக் கௌரவிக்கின்ற நிலைமையாவது உருவாக்கப்பட வேண்டும்.

இவ்வாறானவர்கள் முழு இலங்கைத் தீவிலிருந்தும் கொழும்பு நகரை நோக்கி வருகிறார்கள். அவர்களது போக்குவரத்துச் செலவுக்கான பணம்கூட அவர்களுக்குக் கிடைப்பதில்லை. தேசிய மட்ட விருது வழங்கும் விழாவை இப்படியான நிலைமையில் நடத்திக்கொண்டுதான் "கலைஞர்களை ஊக்குவிக்க வேண்டும்; அவர்களின் வருமானத்தை உயர்த்த வேண்டும்; அவர்கள் போற்றப்பட வேண்டும்" எனப் பேசிக்கொண்டிருக்கின்றோம். ஆனால், நடைமுறையில் இருக்கின்ற விருது வழங்கல் அல்லது அவர்களை ஊக்குவிக்கின்ற நடவடிக்கைகள்கூட ஒரு முறையான செயற்றிட்டத்தில் உள்வாங்கப்படாத நிலைமையே காணப்படுகின்றது. இதுகுறித்து நான் தனிப்பட்ட முறையில் அமைச்சர் அவர்களுடன் பேசியிருக்கின்றேன். இருப்பினும், இன்றைய நாளில் கலைஞர்கள் சார்பாக மிகமுக்கியமான பிரேரணை முன்வைக்கப்பட்டிருக்கின்ற இவ்வேளையில், இந்த விபரத்தை எடுத்துக்கூறுவதனூடாக, இருக்கின்ற முறைமையை மாற்றியமைத்து ஒரு சரியான வழிமுறையில் இந்தக் கலைஞர்கள் ஊக்கப்படுத்தப்பட வேண்டுமென்ற கோரிக் கையை இந்தச் சபையினூடாகவும் முன்வைக்கின்றேன்.

இச்சந்தர்ப்பத்தில் இன்னும் ஒன்றை ஞாபகப்படுத்த விரும்புகிறேன், 'திருவிளையாடல்' திரைப்படத்திலே, "சேர்ந்தே இருப்பது: வறுமையும் புலமையும்" என்று ஒரு வசனக் கோர்வை வருகின்றது. அதாவது, "புலமைமிக்க புலவர்களுடன் சேர்ந்தே இருப்பது வறுமை" என்று அதில் சொல்லப்பட்டிருப்பதுபோல, இந்த எழுத்தாளர்கள் வறுமைக்கு மத்தியில் வாழ்பவர்களாகவே இருக்கிறார்கள். எனவே,

இதனைப் போக்குவதற்கு நாம் நடவடிக்கை எடுக்க வேண்டும். அதற்கு அவர்களின் படைப்புகளினூடாக அவர்களை ஊக்குவிக்கின்ற ஒரு முறையான செயற்றிட்டத்தைக் கொண்டுவர வேண்டும். இல்லையேல், மிகமோசமான துயர சம்பவங்கள் இந்த நாட்டில் நடந்துகொண்டேயிருக்கும். குறிப்பாகப் படைப்பாளிகளைப் பாராட்டுதல், வாழ்த்துதல் என்ற போர்வையிலே அவர்களை மேடைக்கு அழைத்துப் பொன்னாடை போர்த்தப்படுகிறது. ஆனால், வீட்டுக்குத் திரும்பிச் செல்வதற்குப் போக்குவரத்துக்கான பணம்கூட இல்லாமல், அந்தப் பொன்னாடையையே விற்றுவிட்டுச் செல்லும் கலைஞர்கள் எத்தனையோ பேர் இந்த நாட்டில் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். எனவே, கலைஞர்கள் கௌரவிக்கப்பட வேண்டுமாக இருந்தால், அவர்களுக்கான உண்மையான கௌரவம் வழங்கப்பட வேண்டும். அதற்கு அவர்களைப் பொருளாதார ரீதியாக மீட்சிபெற வைத்து சமூகத்தில் மற்றவர்களோடு கௌரவமாக வாழுகின்ற ஒரு பிரஜையாக மாற்றவேண்டும். துரதிருஷ்டவசமாக இந்த நாட்டில் கலைஞர்கள் என்போர் வறுமைக்குட்பட்டிருப்பது ஒரு தகுதியாகக் கருதப்படுவது வேதனைக்குரியது. ஆகவே, அவர்களின் பெறுமதிமிக்க எழுத்துக்களும் படைப்புகளும் சிந்தனைகளும் ஆற்றலும் இந்த நாட்டுக்கு வளம் சேர்க்கின்ற சொத்தாகக் கருதப்பட்டு, அவர்களுக்கு உரிய கௌரவம் வழங்குகின்ற வகையில் இந்த நடைமுறைகள் மாற்றியமைக்கப்பட வேண்டுமெனக் கேட்டுக்கொள்வதோடு, இந்த முக்கியமான நாளிலே இந்தப் பிரேரணையை முன்வைத்த கௌரவ உறுப்பினர் அவர்களுக்கும் அதில் எனக்கு உரையாற்ற வாய்ப்பளித்த குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களுக்கும் மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[பி.ப. 4.06]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கலை, கலாசாரம் தொடர்பான ஒத்திவைப்பு பிரேரணை மீதான விவாதத்திலே பங்குகொள்ளக் கிடைத்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொண்டு, அதுசம்பந்தமாக என்னுடைய கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன். மனிதனுடைய ஆழ்மன வெளிப்பாடுகள்தான் 'கலை' என்று சொல்லப்படுகின்றது. கலை, தேசிய இனங்களின் பண்பாட்டு வடிவமாகும். ஒரு நாட்டில் வாழுகின்ற ஒவ்வொரு தேசிய இனத்துக்கும் உரியதான ஒவ்வொரு விதமான கலை வடிவங்கள் காணப்படுகின்றன. அவர்கள் பேசுகின்ற மொழி உலகில் அங்கீகரிக்கப்படாதிருந்தாலும்கூட, அவர்களிடம் ஏதோ ஒரு வகையான கலை வடிவங்கள் இருக்கின்றன. ஆபிரிக்க நாடுகளில் வாழ்பவர்களிடம் ஒரு வித்தியாசமான கலை வடிவம் இருக்கின்றது; காடுகளில் வாழ்கின்ற வேடுவர்களிடம்கூட கலைநயம் பொருந்திய கலை வடிவங்கள் காணப்படுகின்றன. அத்துடன், ஒவ்வொரு நாட்டிலும் வாழுகின்ற தேசிய இனங்கள் தங்களுடைய கலை வடிவங்களைப் பேணிக்கொள்கின்றன. இலங்கையில்கூட வரலாற்று ரீதியாக இரண்டு தேசிய இனங்கள் தங்களுடைய கலை வடிவங்களைப் பேணி வருகின்றன. குறிப்பாக, இந்த மண்ணிலே சிங்கள தேசிய இனத்துக்கு இருக்கின்ற அதே கலை வடிவ அம்சங்கள் தமிழ்த் தேசிய இனத்துக்கும் இருக்கின்றன.

மிக முக்கியமாகத் தாங்கள் பேசுகின்ற மொழி, வரலாற்று ரீதியான தங்களுடைய நிலம் மற்றும் தங்களது கலாசார அம்சங்கள் எல்லாவற்றையும் உள்ளடக்கிய வகையிலே ஒரு தேசிய இனத்துக்கான கலை வடிவம் பரிணாமம் பெறுகின்றது. அத்தகைய பரிணாமத்தோடு இலங்கையிலே வரலாற்று ரீதியாகத் தமிழ்த் தேசிய இனம் வாழ்ந்துவந்திருக்கிறது. போர்த்துக்கேயர், ஒல்லாந்தர், ஆங்கிலேயர் இங்கு வருவதற்கு முன்னர் இந்த நாட்டிலே கண்டி இராச்சியம், யாழ்ப்பாண இராச்சியம். அநுராதபுர இராச்சியம், பொலன்னறுவை இராச்சியம், கோட்டை இராச்சியம் போன்ற இராசதானிகளில் தங்களைத் தனித்தனி அரசுகளாகப் பிரகடனப்படுத்தி வாழ்ந்திருக்கிறார்கள். அவர்களிடம் தனியான வரலாற்று அடையாளங்கள் இருந்திருக்கின்றன. தனியான பிரதேச நிர்வாக அமைப்புகளை அவர்கள் கொண்டிருந்தார்கள். அவர்களுக்கெனத் தனித்துவமான ஒரு கலை வடிவமே இருந்தது. அந்தக் கலை வடிவங்கள் இப்பொழுது இந்த நாட்டிலே சிங்களத் தேசிய இனத்துக்குள் மட்டும் உள்வாங்கப்படுவதாக, அல்லது அதிகார மமதையோடு அது அபகரிக்கப்படுவதாகத் தமிழர்கள் கருதுகின்றார்கள்.

1974ஆம் ஆண்டு யாழ்ப்பாணத்தில் நடைபெற்ற உலகத் தமிழாராய்ச்சி மாநாட்டிலே 9 தமிழர்கள் கொல்லப்பட்டனர். அவர்களது கலை வடிவங்கள் கொண்டாடப்பட்ட அவ்வேளையில் அவர்கள்மீது ஓர் ஆக்கிரமிப்பு நிகழ்த்தப் பட்டதாகத் தமிழர்கள் கருதுகிறார்கள். இந்தக் கலை வடிவங்களெல்லாம் இராசதானிகளுக்கூடாக வந்த கலைவடிவங்கள்தாம்! இலங்கையின் கலை வடிவங் களையெல்லாம் ஆய்வுசெய்த பேராசிரியர் சரத் சந்திர அவர்களுடைய கருத்துக்களை யாரும் இதுவரை மறுபரிசீலனை செய்யவில்லை. அதற்கான எதிர்க் கருத்துக்களையும் யாரும் முன்வைக்கவில்லை. ஏனெனில், இலங்கையின் கலை வடிவங்களைச் சரியான முறையில் ஆய்வு செய்தவர் பேராசிரியர் சரத் சந்திர அவர்களாவார். 'மௌனம்' என்ற படத்தினூடாக இந்த நாட்டிலே பாரிய புரட்சிக்கு அவர் வித்திட்டார். கண்டிய நடனத்தில் இடம்பெறுகின்ற பறை என்ற வாத்தியம்கூடத் தமிழர்களிடமிருந்து தாங்கள் பெற்றுக்கொண்ட ஒன்றென்று சரத் சந்திர அவர்கள் சொல்கின்றார். குறிப்பாக, சிங்களக் கலை இலக்கிய வளர்ச்சியிலே தமிழர்கள் பாரிய பங்கை ஆற்றியிருக்கிறார்களென்று அவர் சொல்கிறார். இவ்வாறு

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

சிங்களப் பேராசிரியர் ஒருவர் மிகத் தெளிவாகக் குறிப்பிடுகிறாரென்றால், தமிழர்கள் இந்த நாட்டிலே கலைக்காகத் தங்களை எவ்வளவுதூரம் அர்ப்பணித்திருக்கிறார்கள் என்பது புரிகின்றது.

பாருங்கள்! சிங்கள மக்களுடைய கலை வடிவங்களை அமைப்பதற்கு கலாஜோதி ஆனந்த குமாரசுவாமி அவர்கள்கூட தன்னுடைய பூரண பங்களிப்பை இந்த நாட்டுக்கு நல்கியிருக்கிறார். கலாஜோதி ஆனந்த குமாரசுவாமி அவர்களுடைய அடிப்படையிலிருந்துதான் இன்று சிங்களக் கலை வடிவங்கள்கூட இந்த நாட்டிலே அரங்குக்குக் கொண்டுவரப்படுகின்றன. இவ்வாறாக சிங்கள கலை வடிவத்துக்கு, சிங்கள கலைகளை வளர்ப்பதற்குத் தங்களுடைய பங்களிப்பைச் செய்த தமிழர்களுடைய கலை வடிவங்கள் இன்று நசுக்கப்படுகின்றன அல்லது இல்லாமற் செய்யப்படுகின்றன. குறிப்பாக 6, 7, 8, 9ஆம் ஆண்டுகளில் படிக்கின்ற தமிழ் மாணவர்களுடைய வரலாற்றுப் பாடப் புத்தகங்களிலிருந்து எல்லாள மன்னனின் வரலாறு இல்லாமற் செய்யப்பட்டிருக்கிறது. இந்த மண்ணிலே அந்நியருக் கெதிராகப் போரிட்ட பண்டார வன்னியனுடைய வரலாறு இல்லாமற் செய்யப்பட்டிருக்கிறது; சங்கிலிய மன்னனுடைய வரலாறு இல்லாமற் செய்யப்பட்டிருக்கிறது. இவர்கள் எல்லோரும் இந்தத் தேசத்தின் விடுதலைக்காக ஆங்கிலேயருடன் போரிட்டவர்கள். பண்டார வன்னியனும் சங்கிலிய மன்னனும் இறுதிவரை போரிட்டவர்கள். ஆனால், இந்த வரலாறுகள் வரலாற்றுப் புத்தகங்களிலிருந்து தூக்கியெறியப்பட்டிருக்கின்றன. இன்று சிங்கள வரலாறுகள் மிகத் தெளிவாகத் தமிழ்ப் பாடநூல்களில் திணிக்கப் பட்டிருக்கின்றன. இதுபற்றிப் பலமுறை இந்த உயர்ந்த சபைக்கூடாகச் சொல்லப்பட்டும்கூட அது கவனத்தில் எடுக்கப்படவில்லை. தமிழ் மன்னர்கள் இந்த மண்ணிலே செய்த ஆட்சி முறைகள் பற்றி வரலாற்றுப் புத்தகங்களில் காண முடியவில்லை. "எல்லாளன் என்ற தமிழ் மன்னன் அநுராதபுரத்தைத் தலைநகராகக்கொண்டு 40 ஆண்டுகள் இலங்கையை ஆட்சிபுரிந்திருக்கிறான்; அவனைத் துட்ட கைமுனு என்ற அரசன் சூழ்ச்சி முறையிலே வெற்றி கொண்டான். வெற்றிபெற்ற பிற்பாடுகூட எல்லாளன் இறந்த இடத்தில் அவனுக்குச் சிலையமைத்து அவனை வணங்கிச் செல்லுமாறு பணித்தான்" என்ற வரலாற்றை நாங்கள் படித்திருக்கிறோம். ஆனால், இப்பொழுது அவற்றைப் பாடப் புத்தகங்களில் காண முடிவதில்லை. முக்கியமாக இதை இந்த இடத்திலே நாங்கள் கருத்திற்கொள்ள வேண்டும்.

இந்த நாட்டிலே நல்லாட்சி, நல்லிணக்கம், நீதித்தன்மை இருக்க வேண்டுமானால், இங்கே இரண்டு தேசிய இனங்களும் ஒற்றுமையாக வாழவேண்டுமானால் இந்த மண்ணின் பூர்வீகக் குடிகளான, வரலாற்று ரீதியாக இந்த மண்ணை வாழ்விடமாகக் கொண்ட தமிழர்களுடைய வரலாறு சரியாக வரலாற்றுப் புத்தகங்களில் இடம்பெறவேண்டும். தயவுசெய்து இது கவனத்திற்கொள்ளப்பட வேண்டும். கௌரவ உறுப்பினர் அநுரகுமார திஸாநாயக்க அவர்களால் கொண்டுவரப் பட்டிருக்கும் இந்த ஒத்திவைப்புப் பிரேரணை வெறுமனே கலை, கலாசாரத்துக்கு மட்டும் உரித்தான ஒன்றாக நோக்கப்படாமல் தேசிய இனங்களுடைய இருப்புக்களை மையப்படுத்தியதாகவும் நோக்கப்பட வேண்டுமென்பதில் நாங்கள் மிகவும் கவனம் செலுத்துகின்றோம்.

அதேபோல, இலங்கையிலுள்ள பாடநெறிகளில் சித்திரப் பாடமும் இருக்கின்றது. ஆனால், சித்திர பாடத்தில் வருகின்ற படங்கள், பூர்வீக கல்வெட்டுக்கள், பூக்கள், பழங்கள் என இவை யாவுமே சிங்களத் தேசியத்தை அடிப்படையாகக் கொண்டதாகவே காட்டப்படுகின்றன. அங்கே தமிழர்களுடைய வரலாற்றுப் பூர்வீக இடங்கள் அல்லது அவர்களுடைய வரலாற்றை அடிப்படையாகக் கொண்ட சித்திர வடிவமைப்புக்கள்கூட இடம்பெறுவதில்லை; அந்தச் சித்திரங்களைக் காணவும் முடிவதில்லை. ஆகவே, இவையெல்லாம் இந்த மண்ணிலே ஒரு திணிப்பாக, ஓர் ஆக்கிரமிப்பாக நடைபெறுகின்றது என்ற உணர்வு தமிழர்களிடம் இருக்கின்றது. 1974ஆம் ஆண்டு நடைபெற்ற தமிழாராய்ச்சி மாநாட்டுக்குப் பிற்பாடு, ஏற்பட்ட "ஆக்கிரமிப்பு" என்ற உணர்வு - தமிழர்கள் மீது திணிக்கப்படுகின்ற "ஆக்கிரமிப்பு" என்ற சிந்தனை - இன்றும் இவர்களால் தொடர்ந்து வளர்த்தெடுக்கப்பட்டு வருவது மிகமிக வேதனையான விடயம் என்பதை நான் இந்த இடத்திலே தெளிவாகச் சொல்லவிரும்புகிறேன்.

போர்த்துக்கேயர் இந்த மண்ணுக்கு வந்தபொழுது, இங்கிருந்த கலாசார மையங்களை, ஆலயங்களை புனித ஸ்தலங்களை எல்லாம் அழித்துவிட்டு, கிறிஸ்தவத் தலங்களை நிர்மாணித்தார்கள். ஓர் இனத்தை அழிப்பதற்கு, ஒரு சுதேசிய இனத்தை இல்லாமல் செய்வதற்கு, ஆக்கிரமிக்கின்ற காலனித்துவவாதிகள் கையாளுகின்ற ஒரு முறையை போர்த்துக்கேயர்கள் மிகத் தெளிவாகச் செய்தார்கள். அவர்களுக்குப் பிற்பாடு வந்த ஒல்லாந்தர்களும் இதே முறையைக் கையாண்டார்கள். அவர்களும் இதே மண்ணிலே மிகுதியாக இருந்த பௌத்த விகாரைகள், இந்துப் புனித ஸ்தலங்களை எல்லாம் அழித்துவிட்டு, கிறிஸ்தவ தேவாலயங்களைக் கடற்கரையோரமாகவும் நாட்டுக்குள்ளும் அமைத்தார்கள். இவர்கள் சுதேசிகளுடைய வரலாற்றையும் அவர்களுடைய தேசிய இன அடையாளங்களையும் அழிப்பதில் கவனம் செலுத்தினார்கள். இதேபோலத்தான் ஆங்கிலேயர்களும் இந்த மண்ணில் வந்து இறங்கியதற்குப் பிற்பாடு - 1800களுக்குப் பிற்பாடு - இங்கிருந்த அனைத்துக் கலை வடிவங்களையும் அழிப்பதில், இங்கிருந்த பொக்கிஷங்களை எடுத்துச்செல்வதில், இந்து ஆலயங்களை அழிப்பதில் கூடிய கவனத்தைச் செலுத்தினார்கள். இதனால், எங்களுடைய வரலாறு இல்லாமல்போனது.

இலங்கையில் ஐந்து ஈஸ்வரங்கள் இருந்தன. அவை இலங்கையின் ஐந்து திசைகளிலும் இருந்திருக்கின்றன. தமிழர்கள் இந்த நாடுபூராவும் வாழ்ந்திருக்கின்றார்கள். ஆனால், இவ்வாறு இருந்த தமிழர்கள் இன்று ஒரு பகுதியில்கூட உரிமையோடு வாழ்வதற்கு முடியாமல் திணறுகிறார்கள். இதற்கெல்லாம் வரலாறு இருக்கிறது. ஆனால், இன்று இந்த வரலாறுகள் வேறுவகையில் திசைதிருப்பப்படுகின்றன.

இவ்வாறான திணிப்புக்கள் இருக்கின்றபொழுது இப்பொழுது, இந்த நாட்டிலே இன்னொரு புதிய வடிவம் எடுக்கப்பட்டிருக்கின்றது. மிக முக்கியமாக, இப்பொழுது எங்களுடைய பிரதேசங்களில் புத்த விகாரைகள் அமைக்கப்படுகின்றன. 2009ஆம் ஆண்டுவரை தமிழர்கள் விடுதலைக்காக ஒரு போராட்டத்தை நடத்தியிருந்தார்கள். அவர்களுடைய போராட்டம் மௌனிக்கப்பட்டதற்குப் பிற்பாடு, அவர்களுடைய மண்ணிலே குடியேறிய இராணுவம், ஆங்காங்கே எந்தெந்த இடங்களில் புத்த விகாரைகளை அமைக்க முடியுமோ, அந்தந்த இடங்களில் எல்லாம் விகாரைகளை அமைக்கின்றார்கள். போர்த்துக்கேயர்கள், ஒல்லாந்தர்கள், ஆங்கிலேயர்கள் செய்த அதேவேலையை, இப்பொழுது இலங்கை அரசும் தொடர்ந்து தன் படைகளை வைத்துக்கொண்டு செய்துவருவதானது, மிகத் தெளிவான ஓர் ஆக்கிரமிப்பு என்பதை நீங்கள் உணர்ந்துகொள்ள வேண்டும்.

மிக முக்கியமாக கிளிநொச்சியிலுள்ள வரலாற்றுச் சிறப்புமிகு ஆலயமான இரணைமடு கனகாம்பிகை அம்பாள் ஆலயத்தின் பூஜைகள் நடைபெறுகின்ற வளவுக்குள்ளே ஒரு பாரிய புத்த விகாரை அமைக்கப்படுகின்றது. இது மிகமிக மோசமான ஓர் ஆக்கிரமிப்பு! அண்மையில்கூட, அந்த மக்கள் ஊர்வலமாகச் சென்று இது தொடர்பான தங்களுடைய ஆட்சேபனைகளைத் தகவல்களாக ஜனாதிபதிக்கு அனுப்பியிருக்கிறார்கள். ஆனால், இதுவரை எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. இலங்கையிலிருந்த சித்தர்கள் பரம்பரையிலுள்ள யோகர் சுவாமிகளால் முதன்முதல் அந்த இடம் அடையாளப்படுத்தப்பட்டமை மிக முக்கியமான விடயமாகும். கிளிநொச்சி மாவட்டத்தின் அனைத்து வயல் நிலங்களுக்கும் நீர் வழங்குகின்ற இரணைமடுத் தாயின் ஆதாரமாக விளங்குகின்ற கனகாம்பிகை அம்பாள் ஆலய வளாகத்துக்குள் இவ்வாறு ஒரு புத்தர் சிலையை வைத்து பெரிய விகாரையொன்று அமைக்கப்படுவது என்பது வெளிப்படையான ஆக்கிரமிப்பு! ஒரு பௌர்ணமி தினத்தை எடுத்துப் பாருங்கள்! ஒரு சித்திரைப் பௌர்ணமி வருகின்றபொழுது, அல்லது ஒரு பௌர்ணமி தினம் வருகின்றபொழுது இந்து மக்கள் தங்களுடைய பிதிர்க்கடன்களை, விரதங்களை மேற்கொள்வதற்காக ஆலயங்களுக்குச் செல்கின்றார்கள். அதேநேரம், அந்தப் பௌர்ணமி தினத்திலோ அல்லது வெசாக் போயா தினத்திலோ அந்த விகாரையில் ஒலிபெருக்கிமூலம் பௌத்த பாராயணங்கள் செய்வது எவ்வளவு முரண்பாடுகளை உருவாக்கும்! முக்கியமாக அங்கு சிங்கள மக்கள் வாழ்கிறார்களா? ஓர் ஆக்கிரமிப்பின் வடிவமாக இராணுவத்தை வைத்துக்கொண்டு இவ்வாறு அரசாங்கம் செய்வது, இந்த மக்களை வெளிப்படையாகவே தொடர்ந்தும் அடிமைகளாக வைத்திருக்கின்ற, அவர்களுடைய கலாசாரச் சின்னங்களை அழிக்கின்ற ஒரு செயற்பாடு என்பதை நான் இந்தச் சபையிலே தெளிவாகக் குறிப்பிட விரும்புகின்றேன். நிச்சயமாக, இது நீக்கப்பட வேண்டும்; இதற்கு நடவடிக்கை எடுக்கப்படவேண்டும். இல்லாவிட்டால், இந்த நாட்டில் நல்லிணக்கமும் சமாதானமும் நீதியும் ஒருபோதும் ஏற்படப்போவதில்லை.

இதேபோல்தான் நயினாதீவிலும் நடைபெறுகிறது. சப்த தீவுகளில் ஒன்றாகப் பேசப்படுகின்ற நயினாதீவிலே இருக்கின்ற நாகபூசணி அம்பாள் ஆலயம் என்பது உலகப் பிரசித்திபெற்ற ஓர் ஆலயம். அவ்வாலயத்தின் தேரைக்கூட ஒரு காலத்திலே கடற்படையினர் கொளுத்தியிருந்தார்கள். கொளுத்திய கடற்படையினரில் ஒருவர்தான் இப்போது உயிரோடு இருப்பதாகப் பேசப்படுகின்றது. அவர்கூட, காவடி எடுத்துத்தான் தன்னைக் காப்பாற்றியதாக அறியக் கிடைக்கின்றது. அவ்வாறான இந்த நாகபூசணி அம்மன் ஆலயத்துக்குப் பக்கத்திலே 60 அடி உயரத்தில் புத்தர் சிலை ஒன்றை அமைப்பதற்கான முயற்சிகள் மேற்கொள்ளப்படுகின்றது. இது மிகமிக வெளிப்படையான ஆக்கிரமிப்பு! குறிகாட்டுவான் துறைமுகத்திலே நின்று பார்க்கின்றபொழுது அங்கிருக்கின்ற நயினாதீவு நாகபூசணி அம்மனைவிட நாகவிகாரையை மையப்படுத்தியதாக இந்தச் சிலை தெரிகின்றது என்று சொல்லப்படுகின்றது. ஆகவே, மிகமிக முக்கியமாக இந்த ஆக்கிரமிப்பு விடயங்கள் நிறுத்தப்பட வேண்டும்.

அதேநேரம் அரசாங்கம் ஒரு புத்த விகாரை அமைப்பதற்காகத் திருக்கேதீஸ்வரம் ஆலயத்துக்கு முன்னால் 10 ஏக்கர் காணியைச் சுவீகரித்து வைத்திருப்பதாகவும் பேசப்படுகின்றது. அங்கு 40 குடும்பங்கள் குடியேறியிருந்தன. இன்று அந்த 40 குடும்பங்களும் அந்த இடத்திலிருந்து துரத்தப்பட்டிருக்கின்றன. அவர்களால் இன்னமும் அந்த இடத்திலே குடியேற முடியவில்லை. அவர்கள் குடியேறி வாழ்ந்த இடம் ஒரு புத்த விகாரை அமைப்பதற்காக ஆக்கிரமிக்கப்பட்டிருக்கின்றது. அவ்வாறே கொக்கிளாய், கருநாட்டுக்கேணியிலே விநாயகர் ஆலயம் இருக்கின்ற தனியாருடைய காணியும் பௌத்த பிக்கு ஒருவரினால் ஆக்கிரமிக்கப்பட்டு அந்த இடத்திலே ஒரு விகாரை அமைக்கப்பட்டிருக்கின்றது. அதேபோல திருகோண மலையிலே திருக்கோணேஸ்வரர் ஆலயம் இருக்கின்ற பகுதிகளின் பூர்வீக வரலாறுகளை யாரும் அறிய முடியாதுள்ளது. அதற்குத் தொல்பொருள் திணைக்களம் தடை விதித்திருக்கின்றது. திருக்கோணேஸ்வரர் ஆலய வளாகத்தைச் சூழவுள்ள பகுதிகளும் ஆக்கிரமிக்கப்பட்டுக் கடைகள் அமைக்கப்படுகின்றன. அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் இதற்கு உதவியாக இருக்கின்றார்கள். இவ்வாறுதான் அண்மையிலே சாம்பல்தீவுச் சந்தியிலும் ஒரு புத்த விகாரை அமைக்கப்பட்டிருக்கின்றது.

போர்த்துக்கேயர்கள், ஒல்லாந்தர்கள், ஆங்கிலேயர்கள் இந்த மண்ணுக்குப் படையெடுத்ததனால் எமது தேசிய இனத்தின் - தமிழர்களின் அடையாளங்கள் ஆக்கிரமிக்கப்பட்டு அழிக்கப்பட்டன. அதேபோல இப்பொழுதும் புத்த விகாரைகளை அமைப்பதன்மூலம் இவ்வாறான அழிவு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றதன. இது இந்த நாட்டிலே ஒரு நல்ல சமாதானத்தைக் கொண்டு வருமென நாங்கள் உணரவில்லை. ஒரு நல்லிணக்கம் வரும்; நீதி நியாயம் கிடைக்கும்; தங்களுக்கு ஒரு சமாதான வாழ்வு கிடைக்கும் என எதிர்பார்த்து இந்த அரசாங்கத்துக்கு வாக்களித்த எமது தமிழ் மக்கள் இன்று ஓர் எதிர்மனப்பாங்கோடு, வேதனையோடு இந்த அரசாங்கத்தைப் பார்க்கின்ற சூழல் உருவாகியிருக்கின்றது.

கலை வடிவங்கள் என்பன மனித வாழ்விலே மிக முக்கியமானவை. கலை அம்சங்களையும் அதன் கலாசார விழுமியங்களையும் பேண வேண்டியது மிகமிக அவசியமானது. இலங்கையிலே எந்தக் கலை வடிவம் கொண்டு வரப்படுகின்றபொழுதும் அதற்கு ஒரு சிங்கள நாமம்தான் சூட்டப்படுகின்றது. தமிழர்களுடைய கலை வடிவத்துக்கான முக்கியத்துவம் எங்கேயும் வழங்கப்படுவதில்லை. இன்று வடக்கு, கிழக்கிலே பெரும்பான்மையாக வாழ்கின்ற தமிழர்கள் தங்களுடைய கலைகளைப் பேணக்கூடிய வரலாற்று இடங்கள் இல்லை. நான் இங்கு குறிப்பிட்டதுபோல, இப்பொழுது நயினாதீவை ஆக்கிரமித்து 60 அடி உயரமான புத்தர் சிலை கட்டப்படுகின்றது. கனகாம்பிகைக்குளத்தை ஆக்கிரமித்து விகாரை கட்டப்படுகின்றது; மாங்குளத்திலே விகாரை கட்டப்படுகின்றது; திருகோணமலையிலே விகாரை கட்டப்படுகின்றது; திருக்கேதீஸ்வரத்திலே விகாரை கட்டப்படுகின்றது. இவ்வாறு தமிழர்களுடைய வரலாற்றுப் பூர்வீக இடங்களில் எல்லாம் விகாரைகள் அமைக்கப்படுகின்றபொழுது தலதா மாளிகையின் வளவுக்குள் அல்லது வளாகத்துக்குள் நாங்கள் ஒரு காளி கோயிலையோ அல்லது சிவன் கோயிலையோ கட்ட முடியுமா? ஏன், இந்த ஆக்கிரமிப்பு?

இன்று நாங்கள் பேச முடியாதவர்களாக இருக்கின்றோம். தமிழர்கள் பலமிழந்தவர்களாக இருக்கின்றார்கள். ஆனால், விடுதலைப் புலிகள் இருக்கின்றபோது அவர்களிடம் ஆயுதம் இருந்தது. அவர்கள் இருந்த காலத்தில் இவ்வாறான ஆக்கிரமிப்பு நடவடிக்கைகள் எதுவும் நடைபெறவேயில்லை. எந்தப் புத்த விகாரைகளும் அங்கே அமைக்கப்படவில்லை.

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

ඒற்கெனவே இருந்த புத்த விகாரைகளைக்கூட அவர்கள் காப்பாற்றியிருந்தார்கள். கிளிநொச்சியிலே இருக்கின்ற லும்பினி விகாரைகூட அப்படியே முழுமையாக இருந்தது. யுத்தம் முடிந்து திரும்ப மீள்கின்றபொழுதும் இந்த விகாரை அவ்வாறே பேணப்பட்டது. ஆகவே, இவற்றை எல்லாம் கவனத்தில் எடுக்காத அரசாங்கம், சமாதானத்தின் ஊடாக எமது மக்களுக்கு நாளை ஒரு நல்ல தீர்வைத் தருமென நம்புவது எவ்வளவுதூரம் சாத்தியமானதாகும் என்பது கேள்விக்குரியது என்பதை நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

இன்று மிகமிக முக்கியமாக எமது வரலாறுகள் திரிபுபடுத்தப்படுகின்றன. மகாவம்சம் என்ற நூலை அடிப்படையாகக்கொண்டு சிங்கத்திலிருந்து ஒருவர் பிறந்தார் என்றும் அதனூடாகச் சிங்கள இனம் உருவாகியது என்றும் சொல்லப்படுகின்றது. இன்று இந்த மகாவம்சம் என்ற நூலை வைத்துக்கொண்டு இலங்கையின் அரச இயந்திரம் இயக்கப்படுகின்றது. மகாவம்சத்தை அடிப்படையாகக் கொண்டு அரசியல் இயந்திரம் இயங்குமானால் ஒருகாலத்திலும் இங்கே இருக்கின்ற ஏனைய இனங்கள் அடையாளப்படுத்தப்படமாட்டா. அவர்கள் அன்னியப்படுத்தப் படுவார்கள். இது மிக முக்கியமானது. இதை நீங்கள் கவனத்தில் எடுக்கத் தவறினால் சமாதானம் என்பது ஒரு கேள்விக்குறியாக அல்லது கானல்நீராக மாறவேண்டிய நிலைமை ஏற்படும் என்பதையும் இந்த இடத்திலே நான் குறிப்பிட விரும்புகின்றேன்.

கடந்தகால வரலாற்றை நாங்கள் பார்க்கின்றபொழுது மிகமிக முக்கியமாக விடுதலைப் புலிகளுடைய தத்துவாசிரியர் அன்ரன் பாலசிங்கம் அவர்கள் "யுத்தமும் சமாதானமும்" என்ற தன்னுடைய புத்தகத்தில் பக்கம் 400-401 இல் "விடுதலைப் புலிகளுடைய ஆயுதப் போராட்டமும் சமாதான முயற்சிகளும்" என்ற தலைப்பிலே ஒரு விடயத்தை மிகத் தெளிவாகக் குறிப்பிட்டிருந்தார். அதாவது, "எமது போராட்டத்தின் நோக்கமானது சுயநிர்ணய உரிமையை அடிப்படையாகக் கொண்டதாகும். சுயநிர்ணய உரிமைக்கான எமது போராட்டத்தில் தொடர்ச்சியாகவே நாம் பற்றுறுதியோடு இருக்கின்றோம். தமிழர் தாயகம், தமிழ்த் தேசியம் மற்றும் தமிழர்களின் சுயநிர்ணய உரிமை என்பன அரசியல் போராட்டத்தின் அடிப்படை விடயங்களாகும். திம்பு முதல் தாய்லாந்து வரை நாம் இவற்றை வலியுறுத்தி வருகின்றோம். இந்த அடிப்படையிலே எமது தேசியப் பிரச்சினை தீர்க்கப்படல் வேண்டும் என்பதே எமது நிலைப்பாடாகும். தனித்துவமான இனம் என்ற அடிப்படையில் தமிழர்கள் சுயநிர்ணய உரிமை உடையவர்களாவர். சுயநிர்ணய உரிமையானது உள்ளக மற்றும் வெளியக சுயநிர்ணய உரிமை என்ற இரு அம்சங்களைக் கொண்டதாகும். உள்ளக சுயநிர்ணய உரிமையானது பிராந்தியச் சுயாட்சியை வழங்குகின்றது. தமிழ் மக்கள் தமது சொந்த நிலங்களில் சுதந்திரமாகவும் கௌரவமாகவும் வாழ வேண்டும். அவர்கள் தமது தாயகத்தில் சுயாட்சி அடிப்படையில் வாழ வேண்டும். இதுவே தமிழர்களின் அரசியல் அபிலாஷையாகும். இது உள்ளக சுயநிர்ணய உரிமைக்கான உண்மையான அர்த்தத்தைக் கொடுக்கின்றது. உள்ளக சுயநிர்ணய அடிப்படையில் எமது தாயகத்தில் பிராந்திய சுயாட்சி மற்றும் சுய அரசாங்கம் என்பவற்றைக் கொண்ட தீர்வுத்திட்டத்தைச் சாதகமாகப் பரிசீலிக்க நாம் தயாராக உள்ளோம்." இவ்வாறு அவர் குறிப்பிட்டிருப்பதைச் சிங்கள சகோதர எழுத்தாளர் காயத்திரி விக்கிரமசிங்க அவர்கள் தன்னுடைய விமர்சனக் கட்டுரையிலே மிகத் தெளிவாகக் கூறியிருக்கின்றார். ஆகவே, யாரும் எந்தக் காலத்திலும் இந்த நாட்டிலே பிரிவினையை வலியுறுத்தவில்லை. இந்த நாட்டின் சமாதானம், இன ஐக்கியம், இன சௌஜன்யம் சரியாக நடைபெற வேண்டுமானால் இதனைப் புரிந்துகொள்ளவேண்டும்.

ஓர் இனத்துக்கு இருக்கின்ற அவர்களுடைய தனித்துவக் கலாசார அம்சங்களை, தனித்துவ அடையாளங்களைப் புரிந்துகொள்ள வேண்டும். இந்தப் பாராளுமன்றத்திலே நாங்கள் எத்தனை பேர் எங்களுடைய கோல உடைகளைத் தரித்து எங்களுக்கான கலாசார உடைகளைப் பேணுகின்றோம்? நாங்கள் எங்களுடைய கலாசாரத்தை விட்டுவிடுகின்றோம். எங்களுடைய கலாசாரத்தை நாங்கள் இழந்துவிடுகின்றோம். எங்களுடைய கலாசாரப் பண்புகள் எங்களைவிட்டுப் போகின்றன. இப்பொழுது மக்கள் 'பீட்சா' போன்ற மேலைத்தேய உணவு வகைகளுக்கு அடிமைகளாக மாறிக்கொண்டிருக்கின்றார்கள். எங்களுடைய பாரம்பரிய உணவு வகைகளை நாங்கள் இழந்துகொண்டிருக்கின்றோம். எங்களுடைய கலாசாரத்தின் மீதும் எங்களுடைய சுயஇருப்பின் மீதும் திணிக்கப்படுகின்ற ஆக்கிரமிப்பு முயற்சிகளாகவே இவற்றை நாம் பார்க்கின்றோம்.

இந்த நாட்டிலே இரண்டு தேசிய இனங்கள் இருக்கின்றன என்பதை நீங்கள் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். தமிழர்கள் தனித்துவமான மொழி அடையாளத்தைக் கொண்டவர்கள். அவர்கள் தனித்துவமான வரலாற்று ரீதியான நில அடையாளத்தைக் கொண்டவர்கள். அவர்களுக்கெனக் கலாசார அடையாளங்கள் இருக்கின்றன. சிங்கள மக்களில் ஆண்கள் அணியும் தேசிய உடையின் மேலாடையின் 'கொலர்' தமிழர்கள் அணியும் தேசிய உடையின் கொலரைப் போன்றில்லாது வித்தியாசமாக உள்ளது. ஒரே வகையான தேசிய உடை அணிந்துகொண்டாலும், அவற்றுக்குள்ளே வித்தியாசமிருக்கின்றது. நாங்கள் ஒரு கலை வடிவத்தைப் பின்பற்றுகின்றோம். நீங்கள் இன்னொரு வகையான கலை வடிவத்தைப் பின்பற்றுகின்றீர்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

ஆகவே, இந்தக் கலை வடிவங்களென்பது ஓர் இனத்தின் தனித்துவ அடையாளங்களை இழக்காத வகையில் இருக்கவேண்டும். இலங்கையிலே இருக்கின்ற கலை வடிவங்களை நாங்கள் பேணுகின்றபோது சிங்கள அடிப்படையான கலை வடிவங்களைத் தவிர்த்துப் பேணிவருகின்றோம். ஆனால், சிங்கள மக்களுடைய கலாசாரத்தை நாங்கள் மதிக்கின்றோம்; அவை அவ்வாறே இருக்கட்டும்!

புத்த பகவான்கூட அறத்திற்காக, நீதிக்காக இந்தப் பூமியிலே அவதரித்தார்; ஞானம் பெற்றார்; யுத்தத்தை வெறுத்தார். இரத்தத்தைக் காணாமல் அவர் ஒதுங்கியிருந்தார். ஒரு மரத்தின் கீழிருந்து ஞானம் பெற்ற புத்த பகவானுடைய போதனையின்படியான பௌத்த மதத்தை இந்த நாடு ஏற்றிருக்கின்றது. அந்தப் பௌத்த கலாசாரத்தை நாங்கள் மதிக்கின்றோம். அதேபோல்தான் தமிழர்களுடைய கலாசாரப் பேணலும் மிகமிக முக்கியமானது. கலாஜோதி ஆனந்தக்குமாரசுவாமி எவ்வாறு சிங்களக் கலைக்கு

முக்கியத்துவம் கொடுத்தாரோ, பேராசிரியர் சரத் சந்திர அவர்கள் எவ்வாறு சிங்களக் கலையிலே தமிழர்களுடைய பங்கு மேலோங்கியிருக்கின்றது என்பதை மிகத் தெளிவாகக் குறிப்பிட்டாரோ, அவற்றை இப்பொழுதிருக்கின்ற புதிய பரம்பரை உணரவேண்டும்; புரிந்துகொள்ளவேண்டும். அவ்வாறு புரிந்துகொள்கின்றபோதுதான் இந்த நாட்டிலே சமாதானமும் நீதியும் ஒற்றுமையும் நிலைநாட்டப்படுவதுடன், பலமும் அதிகரிக்கும். அந்தவகையில் இந்த இரண்டு தேசிய இனங்களையும் தனித்துவமான இனங்களாக, தனித்துவமான கலாசார அடையாளங்களோடு பார்க்கின்றபொழுதுதான் இந்த நாட்டில் சரியான நீதி நியாயம் கிடைக்கும் என்பதைக் குறிப்பிட்டு நிறைவு செய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා

[අ.භා. 4.26]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාළව කලා ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී, කවදත් කලාවට ළැදි, කලාව වෙනුවෙන් මේ ගරු සභාවේත්, හැමතැනකමත් හඬක් නඟන ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවක මටත් වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා.

විශේෂයෙන්ම සංස්කෘතික අමාත්‍යාංශයට සම්බන්ධව කරුණු කියැවුණා මෙන්ම ටෙලි නාට්‍ය ගැනත්, සිංහල සිනමාව ගැනත් අදහස් ගණනාවක් ඉදිරිපත් වුණා. අපේ අමාත්‍යාංශයටත් ඒවා බලපාන හෙයින් ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට මා කල්පනා කරනවා. අද දින මේ ගරු සභාවේ කථා කළ සෑම මන්ත්‍රීවරයකුම කිව්වා වාගේ විශේෂයෙන්ම ටෙලි නාට්‍ය කලාව දැන් දශකයක පමණ කාලයක සිට ලොකු සෝදා පාළුවකට ශීඝ්‍රයෙන් ගමන් කර, අද වෙනකොට ඉතාමත් බරපතළ තත්ත්වයකට පත් වී තිබෙන බව අප කවුරුත් දන්නවා. ටෙලි නාට්‍යවල ප්‍රමිතිය පිළිබඳව ගැටලු මතු වී තිබෙනවා. එම නිසාම අද ටෙලි නාට්‍ය පිළිබඳව හැම පැත්තකින්ම පසු බෑමක් ඇති වී තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, කිසිම ප්‍රමිතියක් නැතිව තමයි දැන් ටෙලි නාට්‍යය නිෂ්පාදනය වන්නේ. සමහර වෙලාවට එක රැයින් ඔක්කොම අවසන් කරනවා. ඒකට කියනවා, "තිබ්බා ගැහුවා වාගෙයි" කියලා. බොහෝ දෙනෙක් දැන් එම කර්මාන්තය ගැන කථා වෙන්නේ එහෙමයි. අපේ රජය බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන්ම රාජ්‍ය මාධ්‍ය වන ජාතික රූපවාහිනීය, ස්වාධීන රූපවාහිනීය වාගේ තැන්වල මේ ටෙලි නාට්‍යවල ප්‍රමිතිය වැඩි කරලා ප්‍රදර්ශනය කිරීම ගැන කල්පනා කළා. ඒ සඳහා කාරණා කිහිපයක් අනුගමනය කරන්න අපි දැනටමත් කල්පනා කර තිබෙනවා.

විශේෂයෙන්ම මේ ටෙලි නාට්‍ය ප්‍රදර්ශනය කිරීමේදී ඇඟිලි ගැසීමක් නැතිව; බලපෑම් කරන්නේ නැතිව; දේශපාලන අතපෙවීම් කරන්නේ නැතිව ස්වාධීන විද්වත් කමිටුවක් පත් කරලා, ලකුණු ක්‍රමයක් ඇති කරලා ඒ ක්‍රමවේදයට අනුව මේක සකස් කරන්න අපි දැනටමත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම අපි බලයට පත් වන විට ජාතික රූපවාහිනීයේ විශේෂයෙන් රාජ්‍ය මාධ්‍යයේ ටෙලි නාට්‍ය ප්‍රදර්ශනය කිරීම ගැන ලොකු විවේචන තිබුණා. අද ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කර තිබුණා. නොයෙක් විධියේ කප්පම් දෙන ඒවා තිබුණා. ඒ වෙනුවෙන් විවිධ අල්ලස් ලබා දෙන්න සිදු වුණු හැටි ප්‍රසිද්ධ කාරණා බවට පත් වෙලා තිබුණා. රුපියල් 50,000 දෙන එක ගැන බොහොම ප්‍රසිද්ධියක් තිබුණා. ඉතින් මම ඇමතිවරයා හැටියට පත් වුණාට පස්සේ ඒ තත්ත්වය නැති කිරීම සඳහා මූලික වශයෙන් වැඩ පිළිවෙළවල් යෙදුවා. දැනටත් එහෙම දේවල් වෙනවා නම් ඕනෑම අවස්ථාවක ඒ ගැන අපව දැනුවත් කරන්න. ඒ ක්‍රම නැති කළා වාගේ දිගටම පිරිසිදු ක්‍රමයකට -ටෙලි නාට්‍යවල ප්‍රමිතිය වැඩි කරන්න පුළුවන් ක්‍රමවේදයකට- මේ වැඩ කටයුතු ඉස්සරහට ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිනමාව ගැනත් අපේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා. නිර්මාණකරුවන්ගේ අඩුවක් ගැන සමහර උදවිය කථා කළා. නමුත් ඉදිරියට චිත්‍රපට පෝලිමක් තිබෙන හැටි දකින කොට නිර්මාණකරුවන්ගේ එහෙම අඩුවක් තිබෙනවාය කියන එක නම් පෙනෙන්න නැහැ. නවක -අලුත්- නිර්මාණකරුවන්ගේ, තරුණ නිර්මාණකරුවන්ගේ වාගේම ප්‍රවීන පළපුරුදු නිර්මාණකරුවන්ගේ නිර්මාණත් නිතර නිතර බිහි වන බව අපට දකින්න ලැබී තිබෙනවා.

විශේෂයෙන්ම චිත්‍රපට පෝලිම් ක්‍රමය ගැන බොහෝ දෙනකුගේ අවධානය යොමු වෙලා තිබුණා. ධාරා ක්‍රමය නිසා චිත්‍රපට තුනක් එක විට මුදා හැරීමට දැන් අපි කටයුතු කරනවා. ඒ හරහා යම් විසඳුමක් ලැබී තිබෙනවාය කියන එක තමයි චිත්‍රපට අධ්‍යක්ෂවරු, නිෂ්පාදකවරු පවා අපිත් එක්ක පවසන්නේ. තව තවත් විවිධ ක්‍රම අනුගමනය කරලා ඒ සියලු දේවල්වලට පුළුවන් තරම් විසඳුම් දෙන්න අපි බලනවා. කාලාන්තරයක් තිස්සේ මේ කර්මාන්තවල ඇති වුණු විනාශය එක රැයකින්, එහෙම නැත්නම් අවුරුද්දක් වාගේ කෙටි කාලයකදී උඩු යටිකුරු කරන්න බැරි වුණත් අපි පුළුවන් තරම් ඉක්මනට ඒවා යථා තත්ත්වයට පත් කරන්න බලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි, නවක නිර්මාණකරුවෙක් අපේ රටේ ප්‍රදර්ශනය කරන්නත් පෙර ජාත්‍යන්තර සම්මානයට පවා පාත්‍ර වුණු චිත්‍රපටයක් නිෂ්පාදනය කළා. ඒක තමයි "මෝටර් බයිසිකලය" චිත්‍රපටය. ඒ ගැන මීට පෙරත් මේ සභාවේදී ඔබතුමන්ලා ඒ ගැන අවධානය යොමු කළා. මම එදාත් කිව්වා ඒ චිත්‍රපටය ඉක්මනින් ප්‍රදර්ශනය කරන්න අවශ්‍ය කටයුතු කරනවාය කියලා. මේ වන විට "මෝටර් බයිසිකලය" චිත්‍රපටය ප්‍රදර්ශනය වෙමින් පවතිනවා. ඒක ඉතාම උසස් චිත්‍රපටයක් හැටියට ප්‍රදර්ශනය වනවාය කියලා තමයි මම කල්පනා කරන්නේ. ඒ වාගේම තවත් නවක නිර්මාණකරුවන්ගේ චිත්‍රපට රැසක්ම ඉදිරියේදී ප්‍රදර්ශනය කරන්න අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතිනවා. "ප්‍රේමය නම්" චිත්‍රපටය, "දැකල පුරුදු කෙනෙක්" චිත්‍රපටය වාගේ ඒවාත් තරුණ නිෂ්පාදකවරුන්ගේ, අධ්‍යක්ෂවරුන්ගේ චිත්‍රපට. ළඟදීම ඒවාත් ප්‍රදර්ශනයට පත් කරන්න කටයුතු සූදානම් කර තිබෙනවා.

සිනමා ශාලා ඩිජිටල්කරණයට ලක් කිරීම ඉතා ප්‍රමුඛ අවශ්‍යතාවක් හැටියට අපි හඳුනා ගෙන තිබෙනවා. පසුගිය කාලයේ මේවා "කරනවා, කරනවා" කියලා නොයෙක් දේවල් කිව්වත් කිසිම ආකාරයකින් කෙරුණේ නැහැ. ඒ පිළිබඳව විවිධ මත තිබෙනවා. මේවාට මේ මේ හේතු බලපෑවා කියනවා. දැන් රට පුරා තිබෙන සිනමා ශාලා 145ක් අතරින් 40ක් විතර ඩිජිටල්කරණය සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අගනුවර

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

තිබෙන ප්‍රධාන සිනමා ශාලා ඇතුළු 40ක් විතර දැන් ඩිජිටල්කරණය වෙලා තිබෙනවා. ඒවා ඒ සිනමා ශාලා හිමියන්ගේ පෞද්ගලික මුදල් යොදලා - ඒ අයට ආර්ථික ශක්තියක් තිබෙන නිසා- ඒ තත්ත්වය ඇති කර ගෙන තිබෙනවා. විශේෂයෙන් ගම්බද ප්‍රදේශවල සිනමා ශාලා ඩිජිටල්කරණය කිරීම ඉතා හෙමින් සිදු වන බවක් තමයි පෙනෙන්නට තිබෙන්නේ. සමහර සිනමා ශාලා හිමිකරුවන්ට පෞද්ගලිකව වියදම් කරලා ඒක කර ගන්න බැරි තත්ත්වයක් අපට දකින්න තිබෙනවා. අපි මේ පිළිබඳව විශේෂ කමිටුවකුත් පත් කළා. ඒ කමිටුවේ වාර්තාව දැන් නිකුත් කර තිබෙනවා. මම ගරු අග්‍රාමාත්‍යතුමාට දැන් ඒක භාර දීලා තිබෙනවා. කොහොම නමුත් ඉතා කෙටි කාලයක් ඇතුළත ලංකාවේ සියලුම සිනමා ශාලා ඩිජිටල්කරණයට ලක් කිරීම අවසන් කළ යුතුව තිබෙනවා. මේ වියදම දැරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අපේ අදහස් කිහිපයක් ඒ කමිටුවෙනුත් නිර්දේශ වෙලා තිබෙනවා. ඒ අදහස් සම්බන්ධයෙන් සිනමාකරුවන් යම් දැනුවත් වීමක් වෙලා තිබෙනවා. ඒ අයත් ඒ ගැන අවධානය යොමු කරලා තිබෙනවා. විශේෂයෙන්ම පෞද්ගලික වියදමින් ඩිජිටල්කරණය කර ගන්න බැරි සිනමා ශාලා හිමියන්ට රජයෙන් යම් සහන ණය ක්‍රමයක් ඇති කරන්න පුළුවන්ද කියන එකත් එක යෝජනාවක් හැටියට ඉදිරිපත් වෙලා තිබෙනවා.

අනික් යෝජනාව තමයි, සිනමා ශාලාවල ප්‍රවේශ පත්‍රයකින් බොහොම සුළු මුදලක් අය කර ගන්නා ක්‍රමයක් ඇති කිරීම. සිනමාශාලා හිමියාටත්, ප්‍රේක්ෂකයාටත් බරක් නොවන විධියට ඒ කටයුත්ත කරන්න පුළුවන්ද කියන යෝජනාවත් ඉදිරිපත් වෙලා තිබෙනවා. කොහොම නමුත් අපි මේ යෝජනාවලින් බලාපොරොත්තු වනවා, "2K" තාක්ෂණය හෝ ඊට ඉහළ තාක්ෂණයක් යටතේ සියලුම සිනමාශාලාවන් ඩිජිටල්කරණයට ලක් කරන්න. කෙටි කාලයක් ඇතුළත ඒ කාර්යය අවසන් කළ යුතුවම තිබෙනවා. එය ප්‍රමුඛ අවශ්‍යතාවක් වශයෙන් අපි තීරණය කර තිබෙනවා.

අපේ හිතවත් ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියත් ඉතා වැදගත් අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. සිනමාව ගැන විශේෂ ඇල්මක්, කැක්කුමක් තිබෙන, සිනමාව ගැන මනා අවබෝධයක් තිබෙන කෙනකු හැටියටත්, ඒ ක්ෂේත්‍රයේ කෙනකු හැටියටත් එතුමිය මේ උත්තරීතර සභාවේ අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. මා ඒ අදහස්වලට ඉතා උනන්දුවෙන් ඇහුම් කන් දුන්නා. සිනමා පාසලක් ඇති කිරීම කොයි තරම් වැදගත්ද කියන එක පිළිබඳව එතුමිය කිව්වා. එතුමිය ඒ අදහස් ඉදිරිපත් කරන කොට මා නැඟිටලා කථා කරන්න ගියේ නැහැ, එතුමියගේ කථාවට බාධාවක් වන නිසා. සංඛ්‍යා ලේඛන තිබුණා නම් මා කථා කරන්න යන්නේ නැහැ. රුපියල් කෝටි ගණන් මුදල් ගැන මා කථා කරන්න යන්නේ නැහැ. මොකද, එතුමිය තරම් මා ඒ ගැන දන්නේ නැති නිසා. නමුත් සිනමා පාසලක් ඇති කිරීම ගැන අපි දැනටම අවධානය යොමු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳට දන්නා ප්‍රදේශයක, දළුගම සරසවි විද්‍යාගාරය පිහිටා තිබෙන තැන ගැන අපි අවධානය යොමු කර තිබෙනවා. එතැන වර්ග අඩි 14,000ක පමණ ඉඩකඩක් තිබෙනවා. විශේෂයෙන්ම ශබ්දාගාරය තිබෙන්නේත් එතැනයි. ඒ වාගේම සියලුම පශ්චාත් සිනමා කටයුතු, ඒ කියන්නේ රූපගත කිරීමෙන් පසුව කෙරෙන සියලුම නිෂ්පාදන කටයුතු ඒ ස්ථානයේදී සිදු වන නිසා ඒ වාගේ තැනක එවැනි සිනමා පාසලක් ඇති කළොත්, ප්‍රායෝගික දැනුම ගැනීමටත් පහසුවක් වනවා. ඒ ගැනත් අපේ අවධානයට යොමු වෙලා තිබෙනවා.

ඉදිරියේදී ඒ සියලු දේවල් ක්‍රමානුකූලව කරලා පෙන්වන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. පසුගිය කාලයේ ටෙලි නාට්‍යවලට තිබුණු තත්ත්වය අපි බලයට ආපු ගමන් නැති කළා වාගේ, රුපියල් 50,000 කථා, වෙන වෙන අල්ලස් කථා අපි නැති කළා වාගේ, අපට මේ සිනමා පාසලත් ඇති කරලා පෙන්වන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කථා කරනකොට විශේෂ, හොඳ අදහස් කීපයක්ම ප්‍රකාශ කළා මට ඇහුණා. ඔබතුමා කවදත් කලාව ගැන බොහොම හැඟීමකින් යුතුව කථා කරන කෙනෙක්. ඔබතුමා කියනවා මට ඇහුණා, ළමා චිත්‍රපට හුඟක් ඉස්සරහට එනවා වාගේ කථාවක්.

ඇත්ත වශයෙන්ම ළමා චිත්‍රපට ගත්තොත් හොඳ නිෂ්පාදන එනවා නම් හොඳයි. මෑත කාලය ගත්තොත් "හෝ ගානා පොකුණ" වාගේ ළමා චිත්‍රපට දින සියය ඉක්මවලා තවමත් හොඳින්, ජනප්‍රිය තත්ත්වයෙන් ප්‍රදර්ශනය වෙනවා. ඒ නිසා එවැනි උසස් ළමා චිත්‍රපටි නිෂ්පාදනය කිරීමටත් උනන්දු කරවන්න පුළුවන් නම් හොඳයි කියලා මා කල්පනා කරනවා.

මා මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. අපේ බන්දුල ගුණවර්ධන ශූරීන් කථා කරන්න බලාගෙන මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාත් සිංහල සිනමාව ගැන විශාල හැඟීමක් තිබෙන, චිත්‍රපට නිෂ්පාදකයෙක්. ඒ නිසා එතුමාත් අදහස් කීපයක් ඉදිරිපත් කරයි කියලා මා හිතනවා. කොහොම නමුත්, -

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ නිර්මාණකරුවන්ගේ ප්‍රධාන ඉල්ලීම වුණේ, වර්ගීකරණය සහ ප්‍රමිතිය පිළිබඳව අධීක්ෂණය සඳහා යම් මණ්ඩලයක් පත් කිරීම සම්බන්ධයෙනුයි. ඔබතුමාගේ කථාවේදී යම් විද්වත් මණ්ඩලයක් පත් කිරීම පිළිබඳව කියැවුණා. ඒක ජාතික රූපවාහිනියට හෝ අයිටීඑන් එකට විතරක් සීමා වන දෙයක් නොවෙයි. එය සියලු නාලිකාවලටම උඩින් තිබෙන මණ්ඩලයක් විය යුතුයි. ඔබතුමා සඳහන් කරපු ඒ විද්වත් මණ්ඩලය කොහොමද හැදෙන්නේ කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමතියි. මොකද, රැහුම් පාලක මණ්ඩලයෙන්වත් ටෙලි නාට්‍ය ආවරණය වෙන්නේ නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ජාතික රූපවාහිනියටයි, අයිටීඑන් එකටයි වෙනම විද්වත් මණ්ඩලයක් යටතේ දැන් සියලුම ටෙලි නාට්‍ය පරීක්ෂා කිරීමක් සිදු වෙනවා. ඒකෙන් දෙන ලකුණු ක්‍රමයට අනුව තමයි ඒවා සිදු වෙන්නේ. සමහරු ඇවිල්ලා විවිධ හේතු කියමින් අපවත් මුණ ගැහෙනවා. නමුත් අපි ඒ කටයුත්තට කිසිම ඇඟිලි ගැහීමක් කරලා නැහැ. ඔබතුමන්ලාට ඒ පිළිබඳව හොයා බලන්න පුළුවන්. අපි ඒ කමිටුවේ ලකුණු ක්‍රමයටම කරගෙන යන්න ඉඩ ලබා දීලා තිබෙනවා.

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, මම ඉස්සෙල්ලා ඔබතුමා කියපු කාරණයක් කොළයක සටහන් කරගෙන, සාක්කුවේ දමා ගත්තා. ඇත්ත වශයෙන්ම ඔබතුමා කිව්වා, "යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ඊට උඩින් පත් කරනවා නම් හොඳයි" කියලා. මට ඒක ඇහෙනකොටම මා එය සටහන් කර ගත්තා. එක පාරට කිසිම දෙයක් ගැන දන්නේ නැතිව කියනවාට වඩා, ඒ ගැන සාකච්ඡා කරලා, ක්‍රමවේදයක් හදන්න තමයි මා හිතාගෙන ඉන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ටෙලි නාට්‍යවලට කලින් තමයි ඒවා ගොඩ නැඟුණේ. ටෙලි නාට්‍ය කියන්නේ රූපවාහිනියත් එක්ක අලුතින් විකාශනය වෙච්ච දෙයක් නේ. ටෙලි නාට්‍ය බිහි වෙන්නට පෙර තමයි අර මණ්ඩල

ටික හදලා තිබෙන්නේ. දැන් ටෙලි නාට්‍ය අලුතින් පුළුල් වීම නිසාම, ඒ ක්ෂේත්‍රය පිළිබඳව නියාමනය කරන්න, යම් පාලනයකට ලක් කරන්න එවැනි මණ්ඩලයක් ගොඩ නැඟීම තමයි වඩාත් යෝග්‍ය වෙන්නේ කියන එකයි මගේ අදහස.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමා ඉදිරිපත් කළේ ඉතා වැදගත් අදහසක් කියලා මට තේරුණා. මා එක පාරටම ඔක්කොම කරනවාය කියලා කීම සම්ප්‍රදායික කථාවක් වෙනවා. ඔබතුමා එක්ක වාගේම අපේ අමාත්‍යාංශයට සම්බන්ධ අයත් කෑඳවලා, පාර්ලිමේන්තුවේදී මේ කාරණය ගැන කථා කරලා, හොඳ අදහස් අරගෙන ඒ කටයුත්තත් කරන්න පුළුවන්ද කියලා අපි බලමු.

විශේෂයෙන්ම ජනතාවගේ රසඥතාව වැඩිදියුණු කිරීමේ කටයුත්ත අපේ අමාත්‍යාංශයට බොහොම සම්බන්ධයි. රූපවාහිනීය වාගේම ගුවන් විදුලි සංස්ථාවේ - අරහෙ මෙහේ - තිබෙන හොඳ වැඩසටහන් ඔක්කොමත් ප්‍රයෝජනයට අරගෙන, ගම් මට්ටමින් ජනතාවගේ රසඥතාව වැඩිදියුණු කරන වැඩ පිළිවෙළවල් ඇති කිරීම ගැනත් අපි දැන් සාකච්ඡා වට කීපයක් පවත්වලා තිබෙනවා. කොහොම නමුත් අපි ඔක්කොම උනන්දුවෙලා, සංස්කෘතික අමාත්‍යාංශයත්, අපේ සියලුම අමාත්‍යාංශත් එකතුවෙලා මේ කටයුත්ත කරමු. කලාවට පක්ෂ පාට බේදයක් නැහැ. රස වින්දනයට එහෙම බේද මුකුත් නැහැ. ඒ නිසා අප සියලු දෙනාගෙන්ම හොඳ අදහස් ලබාගෙන, කාගේ කාගේත් ශක්තිය යොදවලා, උසස් ප්‍රමිතියෙන් යුතු ටෙලි නාට්‍ය සහ හොඳ සිනමාවක් - කලාවක් - ඇති කරන්න අපි කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා. මේ වාගේ කාලෝචිත යෝජනාවක් මේ උත්තරීතර සභාවට අද ඉදිරිපත් කරලා, කාගේත් අදහස් එළියට දමන්න පුළුවන් වන විධියට කටයුතු කිරීම ගැන විශේෂයෙන්ම මා ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. ඒ වාගේම අද දවස පුරාම ඒ යෝජනාව සැලකිල්ලට අරගෙන, සාකච්ඡා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. මට කථා කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වනවා.

[අ.භා. 4.40]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී, මේ ක්ෂේත්‍රය හා සම්බන්ධ වූ අයෙකු ලෙස, එයට දායකත්වය නොසැපයුවොත් මගේ හෘදය සාක්ෂිය පිළිබඳව ප්‍රශ්නයක් මතු වන නිසා, මේ කෙටි වෙලාව හෝ ලබා ගෙන අදහස් කීපයක් එකතු කරන්න මා කැමතියි. අපේ රටේ කලා ක්ෂේත්‍රය ගත්තොත් සිනමාව, ටෙලි නාට්‍ය හා අනිකුත් කලා අංශ පිළිබඳ වගකීම වර්තමානයේ පැවරී තිබෙන්නේ අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමාටයි. එතුමා පසුගිය කාලය තුළදී මේ රටේ දේශපාලන ක්ෂේත්‍රය තුළ කුමන මතවාද දැරුවත්, යහපත් දැක්මක් සහිතව කටයුතු කරන්න උත්සාහ දරන තරුණ ඇමතිවරයෙක්. ඒ නිසා වර්තමානයේ ඇති වෙලා තිබෙන විශාල අර්බුදයට ඵලදායී සක්‍රිය මැදිහත්වීමක් දෙන්න එතුමාට පුළුවන්කම ලැබෙයි කියලා මම හිතනවා. එතුමාට දැන් ඒක කරන්න බැරි වුණොත්, මේ ආණ්ඩු කාලයේදී මේ සඳහා විසඳුමක් ලැබෙයි කියලා මට හිතන්න අමාරුයි. ආඩම්බර විය හැකි ඉහළ ගුණාත්මකභාවයක් තිබුණු දේශීය සිනමාවක් අපට තිබුණා. හෙළ සිනමාවේ නිම් වළලු පුළුල් කිරීම සඳහා අනුපමේය දායකත්වයක් සැපයූ යුග පුරුෂයෝ රාශියක් තවමත් ජීවතුන් අතර සිටිනවා.

ආචාර්ය ලෙස්ටර් ජේමස් පීරිස් ශූරීන් නිෂ්පාදනය කළ සිනමා කෘති අතර විශේෂයෙන් "නිධානය" කියන සිනමා කෘතිය ආසියාවේ ශ්‍රේෂ්ඨතම සිනමා කෘතියක් ලෙස ඉතිහාසයට එකතු වෙලා තිබෙනවා. ඊට පසු කාලයකදී මේ සංසිඳියාව ඇති කිරීම සඳහා ආචාර්ය සුනිල් ආරියරත්න මහතා යාපනය විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස පත් කළා. ඒ වාගේම ධර්මසේන පතිරාජ මහතා ද, මහාචාර්ය සුවරිත ගමලත් මහතා ද කථිකාචාර්යවරු ලෙස පත් කළා. ඒ කාලයේ ධර්මසේන පතිරාජයන් දෙමළ භාෂාවෙන් "පොන්මනි" වාගේ චිත්‍රපටයක් නිෂ්පාදනය කළා. විවිධ ජන වර්ග අතර අපට කථා කළ හැකි භාෂාවක් ලෙසත්, විශ්වීය භාෂාවක් ලෙසත් "සිනමාව" වැදගත් වනවා. කථා නොකළත් සමාජයට විවිධ මතවාදයන් සිනමාවෙන් ගෙන යන්න පුළුවන්කම ලැබෙනවා.

සිනමාවේ විශාල කඩා වැටීමක් තිබුණු අවධියේදී -ඒ කාලයේ මම තරුණ අවධියේ- ප්‍රේක්ෂකයන් ක්‍රමක්‍රමයෙන් සිනමාශාලාවෙන් ඈත් වනකොට සයිමන් නවගත්තේගම ශූරීන්ගේ කථාවක් ඇසුරු කර ගෙන ධර්මසිරි බණ්ඩාරනායකයන් එකතු කර ගෙන මම "සුද්දිලාගේ කථාව" නිෂ්පාදනය කළා. ඒ මඟින් නැවත ප්‍රේක්ෂකයන් සිනමාශාලාවට ගේන්න අපට පුළුවන්කම ලැබුණා.

ඉතා විශාල ආකර්ෂණයක් සහිතව දින 150ක් පමණ නොකඩවා සිනමාශාලා පිරී ඉතිරී යන විධියට එම චිත්‍රපටය සාර්ථකව කරන්න අපට පුළුවන්කම ලැබුණු අතර, ඒ වර්ෂයේ හොඳම චිත්‍රපට නිෂ්පාදකට හිමි සම්මානය ඇතුළු වර්ෂයේ හොඳම චිත්‍රපටයට හිමි "සරසවි සම්මානය" ද එයට හිමි වුණා. ඊට පස්සේ අලුතෙන් සිනමාකරුවෙකු සිනමාවට කැන්දන් එන්න අපට පුළුවන්කම ලැබුණා. පරාක්‍රම නිරිඇල්ල කියන නාට්‍යකරුවා වෘත්තාන්ත සිනමාවට පිවිසිලා, මම "සිරිමැදුර" චිත්‍රපටය නිෂ්පාදනය කළා.

රවීන්ද්‍ර රන්දෙනිය කියන්නේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙකු හා ප්‍රතිභා පූර්ණ කලාකරුවෙක්. මේ චිත්‍රපටයේදී ඔහු එක වචනයක්වත් කථා නොකොට හොඳම නළුවාට හිමි සම්මානය දිනා ගත් අතර, මම ඒ වර්ෂයේත් ලංකාවේ හොඳම චිත්‍රපට නිෂ්පාදකට හිමි සම්මානය ලැබුවා. ඊට පස්සේ දෙනගම සිරිවර්ධන ශූරීන් සමඟ මම "අයෝමා" චිත්‍රපටය හැදුවා. වෙනත් දේශපාලන හේතූන් නිසා මට මේ කර්මාන්තයේ දිගටම නියැලෙන්න බැරි වුණත්, රිවඩ් ද සොයිසාගේ සාතනය සම්බන්ධයෙන් නිලේන්ද්‍ර දේශප්‍රිය සමඟ එකතුව ජාත්‍යන්තර තලයේ අළෙවි කළ හැකි සිනමා කෘතියක් හදන්න මම පසුගිය කාලයේ උත්සාහයක් දැරුවා. මොකද, ලෝකයේ හැම රටකම කලාකරුවෝ මරා දමනවා; මාධ්‍යවේදීන් මරා දමනවා.

අපේ රටේ සිටි රිවඩ් ද සොයිසා කියන කලාකරුවා මරා ගල් ගැට ගහලා හෙලිකොප්ටරයෙන් මුහුදට දැම්මාම මිනිය මෙහාට එනකොට "සිනමාවේ සක්විති" වුණු ගාමිණී ෆොන්සේකා මැතිතුමා තමයි ඒ කාලයේ අපේ නියෝජ්‍ය කථානායකතුමා. ඒ ප්‍රශ්නය මතු වුණු අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ මමත් සිටියා. රිවඩ් ද සොයිසා කියන්නේ බහුවිධ කුසලතා තිබෙන සිනමාකරුවෙක්. එතුමාගේ මැණියන් වූ දොස්තර සරවනමුත්තු මැතිනියගේ මානව දයාවෙන් පිරුණු ජනතා දැනුවත් කිරීම් පිළිබඳ අපි හොඳ තිර රචනයක් කරන්න හැදුවා. නමුත්, අවාසනාවකට මේ රජය බලයට පත් වුණාට පස්සේ ඒ චිත්‍රපටය නිෂ්පාදනය නහනම් කරලා මට ලිපියක් එවා තිබුණා. එය ගයන්ත කරුණාතිලක මැතිතුමාගේ අමාත්‍යාංශය නොවෙයි, ආරක්ෂක අංශ විසින් කළේ.

කලාකරුවන්ට නිර්මාණයක් කරන්න තිබෙන නිදහස පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ වෙළෙඳ පොළ කුඩා

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

වුණත්, හොඳ සිනමා කෘතියක් හැදුවාම මේ තිබෙන අර්බුදයෙන් ගොඩඟන්න පුළුවන්. උදාහරණයක් ලෙස ගත්තොත්, ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ මැණියන් මේ දිනවල ආචාර්ය සුනිල් ආරියරත්නයන් සමඟ "පත්තිනි" චිත්‍රපටය නිෂ්පාදනය කරලා තිබෙනවා. මේ වන විට රුපියල් ලක්ෂ 2,200ක ආදායමක් උපදවලා තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා සඳහන් කළ පරිදි මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ දෝණි නිෂ්පාදනය කළ "හෝ ගානා පොකුණ" චිත්‍රපටය දරුවන් සහ දෙමව්පියන් වඩා ආදර්ශවත්, හොඳ චිත්‍රපටයක් ලෙස වැළඳගත්තා. ජනතාව විසින් වැළඳගන්නා චිත්‍රපට හැදුවොත්, ආර්ථික අලාභයක් නොවන ආකාරයට කර්මාන්තයක් ලෙස පවත්වාගෙන යන්න පුළුවන්කම තිබෙනවා. නමුත්, අධ්‍යයතන සිනමාව පණ අදිමින් පවතින තත්ත්වය තුළ එයට පණ දීමේ ක්ෂණික ක්‍රියාමාර්ගයක් ගතයුතු වෙනවා. මොකද, තාක්ෂණය වෙනස් වෙනවා. තාක්ෂණය වෙනස්වීමත් සමඟ ඒ වෙනස්වන තත්ත්වයට අනුරූපීව අපට හැඩගැහෙන්න බැරි වුණොත් හෙළ සිනමාව මැරෙනවා. දැනට දළ සේයාපට ඉන්දියාවට අරන් යනවා. ඉස්සර නම් ඉන්දියාවේ Prasad Film Lab එක තිබුණා. දැන් ඒක නැහැ. ඒ සියල්ලම වැහිලා. බොම්බායේ තිබෙන lab එකක තමයි අපේ දළ සේයාපට මුද්‍රණය කරන්නේ. අපි canවල දමාගෙන උස්සාගෙන ගොස් ආපසු ගෙනැවිත් ඒක සිනමාශාලාවල පෙන්වනවා. ලෝක බැංකුවෙන් සියයට 3 පොලිය යටතේ ණය ආධාරයක් ලබා ගෙන සිනමාකරුවන්ට සිනමාශාලා ඩිජිටල්කරණය සඳහා මූල්‍යාධාර සපයන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පසුගිය රජය කාලයේ අවසන් තීරණයකට ඇවිල්ලා තිබුණා.

හෙළ සිනමාවේ රැජිණිය ලෙස සලකන මාලනී ෆොන්සේකා මහත්මිය එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් ලෙස කටයුතු කළා. රවීන්ද්‍ර රන්දෙනිය වාගේ මන්ත්‍රීවරු සිටියා. ඩී.බී. නිහාල්සිංහයන් මියයාමට ප්‍රථම මේ කලාකරුවෝ එකතුවෙලා ඩිජිටල්කරණයේ අවශ්‍යතාව පිළිබඳව මහත් උනන්දුවෙන් කථා කළා. ලෝක සිනමාව පිළිබඳව අත් දැකීම් ලැබූ ඩී.බී. නිහාල්සිංහයන් මේ බව පැහැදිලි කර තිබුණා. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, පිරිවැය අතින් ගත්තොත් සිනමාශාලාවක් 2K කියන වර්ගයේ ඩිජිටල්කරණයක් කිරීම සඳහා අපට රුපියල් මිලියන 5යි අවශ්‍ය වෙන්නේ. රුපියල් මිලියන 5 ගණනේ අපට සිනමාශාලා 100ක් ඩිජිටල්කරණය කරන්න වැය වෙන්නේ රුපියල් මිලියන 500යි. අපේ කලාව, සභ්‍යත්වය, සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්නයේදී එවැනි ණය මුදලක් ලබා දීම ඉතාම හොඳයි. ඒ සඳහා රජයට වැය වෙන්නේ ඉතාම සුළු මුදලක්. මම ඊට උදාහරණයක් කියන්නම්. අපි සීනි කිලෝවකට රුපියල් 30ක බද්දක් අය කළා. වහාම ක්‍රියාත්මක වන පරිදි එම බද්ද ක්ෂණිකව ශත 25 දක්වා අඩු කළා. එතකොට සීනි කිලෝවකින් රුපියල් 29.75ක් රජයට අහිමි වෙනවා. ඒ නිසා වර්ෂයකට අහිමි වන මුළු මුදල රුපියල් බිලියන 20ක් වෙනවා. ඉතින්, මේ වාගේ ආදායමක් ගත්තාම රුපියල් මිලියන 500ක් කියන්නේ මොකක්ද?

පිට රටින් බියර් ගෙනැල්ලා විකුණන්න බියගම පිහිටි ලයන් බෲවරි සමාගමට ලබාදී තිබෙන බදු සහනය රුපියල් බිලියන ගණනක් වෙනවා. එම නිසා අමාත්‍යාංශය වශයෙන් ඔබතුමා මැදිහත් වෙලා මිය ඇදෙන සිංහල සිනමාව බේරා ගැනීම වෙනුවෙන් ලංකාවේ සිනමාශාලා ඩිජිටල්කරණය සඳහා දේශීය සිනමාශාලා හිමියන්ට ණය මුදලක් වශයෙන් රුපියල් මිලියන 5 බැගින් දෙන්න මේ නොවැම්බර් මාසයේ පැවැත්වෙන අය වැය සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන්න. මගේ කල්පනාවේ හැටියට එය මෙලොව වශයෙන් කීර්තියක් වාගේම පරලොව වශයෙන් පිංකමක්ද වෙනවා. ඒ ණය මුදල චිත්‍රපට සංස්ථාව හරහා ඉතාම සහනදායී පොලී අනුපාතයක් යටතේ ආපසු අයකර ගන්න. එහෙම නොකළොත් බොම්බේ තිබෙන colour lab එක වහපු ගමන් ලංකාවේ චිත්‍රපටවල දළ සේයාපට අතින් සෝදලා තමයි පෙන්වන්න වෙන්නේ. ඒ නිසා මම ඒ ඉල්ලීම කරනවා. අමාත්‍යාංශයා ලෙස තමුන්නාන්සේට පුළුවන්, මේ රටේ සියලුම සිනමාකරුවන් වෙනුවෙන්, කලාකරුවන් වෙනුවෙන්, මෙම කර්මාන්තය වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ සෘජුවම සාකච්ඡා කරලා මේ සිනමාශාලා සියල්ල ඩිජිටල්කරණය කරන්න. ඒක ආණ්ඩුවටත් හොඳයි. ඒ අනුව එතැන රැකියා අවස්ථා ප්‍රමාණයක් ජනිත වෙනවා; ආදායම් මාර්ග ප්‍රමාණයක් ගමට යනවා; ගමේ කර්මාන්තයක් කරමින් ඒ තුළින් ජීවත් වෙන විශාල පිරිසක් ඇති වෙනවා; ඔවුන්ට හෙට පිළිබඳ බලාපොරොත්තුවක් ඇති වෙනවා. ඒ නිසා, උතුරු, නැහෙනහිර ප්‍රදේශත් ආවරණය වන පරිදි මේ සියලුම සිනමා ශාලා ඩිජිටල්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 5 බැගින් ලබා දීමේ යෝජනාවක් අය වැය ලේඛනයට ඉදිරිපත් කරන්න. එහෙම නොවුණොත් ඊළඟ වර්ෂය වන විට, "සිංහල සිනමා වංශ කථාව නිම වූයේ, ගයන්ත කරුණාතිලක යුගයේ ය" කියලා තමයි අපට ඉතිහාස පොතේ ලියන්නට වෙන්නේ. එහෙම නොලියවෙන්නට, ඔබතුමා මේ කාරණයට මැදිහත් වෙයි කියා මම විශ්වාස කරනවා.

දෙවැනි කාරණය තිර කාලය පිළිබඳවයි. ගරු ඇමතිතුමනි, රටේ බහුතර ජනතාව වෙන්නේ සිංහල ජනතාවයි. ඒ නිසා, සිංහල ජනතාවට වැඩි තිර කාලයක් ලබා දීමෙනුයි ඒ කර්මාන්තය පවත්වා ගෙන යන්න පුළුවන්කම ලැබෙන්නේ. රැජිනිකාන්ත්ගේ film එකක් තිබෙනවා, "කබාලි" කියලා. අද වන විට එහි පිටපත් 50ක් එකවර බෙදා හැරලා තිබෙනවා. ඒ නිසා, විදේශ චිත්‍රපට සඳහා -විදේශවල නිෂ්පාදනය කරන චිත්‍රපටවලට- වැඩි තිර කාලයක් ගත වුණාට පස්සේ, දේශීය සිනමාවට තිබෙන තිර කාලය අඩු වෙනවා.

ව්‍යවහාරික භාෂාවෙන් කියනවා නම්, ටික දවසකින් සිංහල films ටික ගැලවෙනවා, විදේශ චිත්‍රපට පැල් බැඳගෙන දුවනවා. රටකට විදේශ චිත්‍රපටත් අවශ්‍යයි. නමුත්, ඒවාට කිසියම් සීමාවක් පැනවීම අවශ්‍යයි. ඒ සීමාව පැනවීමේ අයිතිය ජාතික චිත්‍රපට සංස්ථාවට - National Film Corporation එකට- තිබෙනවා. ඒ අනුව, තිර කාලය පිරිමසා ගැනීම සඳහා ජාතික චිත්‍රපට සංස්ථාව මැදිහත් වී වැඩ පිළිවෙළක් යොදන්නටය කියා මම ඉල්ලා සිටිනවා. ඒ අනුව, මේ අවස්ථාවේ ඇති වී තිබෙන ක්ෂණික අවශ්‍යතා දෙක ලෙසට, ඩිජිටල්කරණය හා තිර කාලය කළමනාකරණය සඳහා මැදිහත් වන්නටය කියා ඉල්ලා සිටිනවා.

තුන්වන කාරණය වන්නේ මෙයයි. අද අපේ සාලයට ඇවිල්ලා, නොමිලේ පෙන්වන ටෙලි නාට්‍ය තුළින් දේශීය කලාකරුවන්ට විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඉන්දියානු සහ කොරියානු දීර්ඝ ටෙලි නාට්‍ය සඳහා මුළු ගුවන් කාලයම වාගේ අරගෙන තිබෙන නිසා, මේ තුළින් විද්‍යුත් මාධ්‍යවලට විශාල ඇබ්බැහිවීමක් ඇති වී තිබෙන අතර, ඒ හේතුව නිසා අහිතකර ප්‍රතිඵල ද ඇති වෙනවා. මේ සඳහා ගරු ඇමතිතුමාට ක්ෂණිකව කරන්න පුළුවන් දෙයක් තිබෙනවා. කුටිටු දෙකක් ගෙවන ක්‍රමය වෙනුවට අපේ ටෙලි නාට්‍යය වෙනුවෙන් වැඩි මුදලක් ගෙවුවොත්, ආයතන මැදිහත් වෙලා සිංහල, දෙමළ හොඳ ටෙලි නාට්‍ය වැඩි වශයෙන් හදයි.

විදේශීය හඬ කවන ලද ටෙලි නාට්‍යයක්, එහෙම නැත්නම් විදේශ චිත්‍රපටයක් රූපවාහිනී මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීමේදී, විනාඩි 15ක කාලයක් සඳහා රුපියල් ලක්ෂයක සෙස් බද්දක් පනවන්න. ඒ සෙස් බද්ද ඒකාබද්ධ අරමුදලට බැර කරන්නේ

නැතිව, කලා ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් වෙනම අරමුදලකට බැර කරන්න. එවිට තමුන්නාන්සේට සමස්ත කලාවේ, සියලුම කලාකරුවන්ට වඩා ඵලදායී, ජාතික මෙහෙවරක් ස්වායත්තව කරන්නට ඉඩ ප්‍රස්තාව ලැබෙනවා.

විදේශ චිත්‍රපට හෝ ටෙලි නාට්‍ය හෝ මොනවා හෝ පෙන්වනවා නම්, විනාඩි 15ක කාලයකට රුපියල් ලක්ෂයක සෙස් බද්දක් පනවන්න. අන්න, එතකොට ඒ ආයතනවල පිරිවැය වැඩි වෙනවා. පිරිවැය වැඩි වෙන කොට දේශීය අයට කියනවා, "ඔයිට වඩා අඩු මුදලකට සිනමා පට හෝ ටෙලි නාට්‍ය නිෂ්පාදනය කරන්න. අපි ඒවා ගන්නම්; පෙන්වන්නම්" කියලා. මේක ලෙහෙසියෙන් කරන්න පුළුවන් දෙයක්. එය කළොත්, මේ කර්මාන්තයෙන් ජීවත් වන ලක්ෂ ගණනක පිරිසක් ඔබතුමාට පින් දෙයි. ටෙලි කර්මාන්තය මත යැපෙන නළුවෝ, නිළියෝ වැනි පෙනෙන අය හැරුණාම, කාර්මික ශිල්පීන්, කෑම සපයන අය, නවාතැන් සපයන අය, locations දීලා මුදල් උපයා ගන්නා අය වැනි විශාල පිරිසකට එයින් සහනයක් වෙයි. ඒ නිසා, මෙවර අය වැයට මේ යෝජනා දෙක ඉදිරිපත් කරන්න. සමස්ත කලාකරුවන් වෙනුවෙන් ඒ සඳහා නිර්භීතභාවය ඇති කර ගෙන, මා සඳහන් කළ ආකාරයට සෙස් බද්දක් ඇති කරන්න.

මහින්ද රාජපක්ෂ යුගයේදීත් මේ සඳහා බද්දක් පනවා තිබුණා. මේ ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ, දැන් කාලයට ඒ බද්ද ප්‍රමාණවත් නැහැ. ඒ නිසා, විදේශ චිත්‍රපට හෝ විදේශ ටෙලි නාට්‍ය සඳහා විනාඩි 15ක රූපවාහිනී විකාශන කාලයකට රුපියල් ලක්ෂයක සෙස් බද්දක් අය කරන්න. ඒක ගන්නේ බද්දක් ලෙස නොවෙයි කලාවේ දියුණුව සඳහා කලාකරුවන්ටයි. ඒකාබද්ධ අරමුදලට ගත්තොත් තමයි දොස් අහන්නට වෙන්නේ, රජයේ අරමුදලට ගත්තා කියලා. ඒක ගන්නේ කලා ක්ෂේත්‍රයේම උන්නතිය සඳහා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තමයි ඒ 'සෙස්' අරමුදල පවත්වාගෙන යා යුතු වන්නේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි.

දැන් ඉන්දියාවේ සියයට 4ක අධ්‍යාපන 'සෙස්' බද්දක් ගන්නවා. එතකොට කවුරුත් ආණ්ඩුවට බණින්නේ නැහැ. මොකද, දරුවන්ගේ අනාගතය වෙනුවෙන් තමයි මේ සියයට 4ක 'සෙස්' බද්ද ගන්නේ. ඉන්දියාව සමඟ තීරු බදු රහිත ගිවිසුමක් අත්සන් කළත්, -එවිට තීරු බදු නැහැ. බදු නැතිව භාණ්ඩ ගෙන්වන්න, යවන්න පුළුවන්.- සියයට 4ක අධ්‍යාපන 'සෙස්' බද්ද ඕනෑම දෙයකට ගෙවන්නට ඕනෑ. ඒ නිසා අපටත් පුළුවන්, ඒ ආකාරයට කලා ක්ෂේත්‍රය, සංගීත ක්ෂේත්‍රය, නාට්‍යකරණය, රංග කලාව, සිනමාව සහ මාධ්‍යකරණය සඳහා විශාල අරමුදලක් ගොඩ නඟන්නට. ඒ වාගේම එයින් පාලනයකුත් ඇති වෙනවා. විදේශීය නිර්මාණ සඳහා විනාඩි 15ක විකාශන කාලයක් සඳහා රුපියල් ලක්ෂයක සෙස් බද්දක් අය කරන්න. ජනමාධ්‍ය ඇමතිතුමනි, මෙවැනි තත්ත්වයන් පිළිබඳව කථා කරන්නට ඔබතුමාගේ අමාත්‍යාංශයේ ආංශික අධීක්ෂණ කාරක සභාවට අපව කැඳවන්න. මමත් මේ ක්ෂේත්‍රයට සම්බන්ධ අයෙක් ලෙස මේ ගැන විශාල උනන්දුවක් දක්වනවා. අපේ රටේ කලා ක්ෂේත්‍රය, සංස්කෘතික ක්ෂේත්‍රය නඟා සිටුවීමේ විශේෂ වගකීමක් අපි කා වෙතත් පැවරී තිබෙනවා. මක් නිසාද යත්, අද තරුණ දරුවෝ වැඩි දෙනෙක්, හාල්වලට කොටන කුරුල්ලෝ වාගේ, උදේ ඉඳන් අන්තර්ජාලයට කොට කොටා ඉන්නවා. එහෙම හිටියොත් ඒ අය සදාකාලිකව තමන්ගේ ලෝකයක තනි වෙනවා. එම නිසා තාක්ෂණය හරහා අන්තර්ජාලයේ ඇති වෙලා තිබෙන වෙනසත් සමඟ ඇති වෙන තත්ත්වයට මුහුණ දෙන්නට අපි පියවර ගත යුතුයි.

පසුගිය කාල පරිච්ඡේදවල අපි කැමැති වුණත් අකමැති වුණත් අපේ රටේ සංස්කෘතික අපගමනයක්, සාදාචාරාත්මක පිරිහීමක්, මනුෂ්‍යකමේ දරුණු නාය යෑමක් සිද්ධ වෙලා තිබෙනවා. සංවේදී මිනිසුන්, සංවේදී ජාතීන් ඇති වීම සඳහා කලාවට, සාහිත්‍යයට, සංස්කෘතියට කළ හැකි මෙහෙවර විශාලයි. එය කරන්නට හොඳ මැදිහත්වීමක්, සක්‍රිය මැදිහත්වීමක් කරන්නට ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාට අවශ්‍ය ශක්තිය, ධෛර්ය ලැබේවා! කියා පතමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.58]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංස්කෘතිය සහ කලාව ගැන කථා කරන විට, සංස්කෘතිය භූගෝලීය, දේශගුණික, ඓතිහාසික සහ ආගමික සාධක පසු බිම් කරගෙන ගොඩ නැඟෙන ක්ෂේත්‍රයක් බව පෙනෙනවා. 'සංස්කෘතික' කියන වචනයෙන්ම ඒවා එසේ ගොඩ නැඟුණු දෙයක් බව කියැවෙනවා.

සංස්කෘතිය ස්ථිරව එකම විධියකට පවතින්නේ නැහැ; වෙනස් වෙමිනුයි ඉදිරියට යන්නේ. අපේ රටේ සංස්කෘතිය, විජය යුගයෙන් ආරම්භ වූ බව කියන්නට පුළුවන්. මේ රටට බුද්ධාගම පැමිණීමත් සමඟ එය බොහෝ දුරට වෙනස් වුණා. අපේ සංස්කෘතිය තුළ පෙර සිටම ඉන්දියානු සම්භවයක් තිබුණත් වර්තමානයේදී ලංකාවේ සංස්කෘතිය තුළ ඉන්දියානු සම්භවය උලුප්පා දැක්වීමක් සමඟර අවස්ථාවලදී දැකීමට හැකියාව ලැබෙනවා. කෙසේ වුණත් මේ සංස්කෘතික විෂය සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුව රුපියල් මිලියන 11,000ක මුදලක් වෙන් කරලා තිබෙන බව කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලාව සම්බන්ධයෙන් සඳහන් කරන විට, එය මානව වර්ගයාගේ යහපත, අභිවෘද්ධිය උදෙසා කැප වූ සද් ව්‍යාපාරයක් කියලා කියන්නට පුළුවන්. සාහිත්‍යය, සිනමාව, නාට්‍ය, චිත්‍ර, සංගීතය, නර්තනය, ටෙලි නාට්‍යය, චරිත කථා, ආර්ථික හා සමාජ තොරතුරු සහ සංචාරක විත්ති ආදිය මේ කලා ක්ෂේත්‍රයට ඇතුළත් වෙනවා. කලා ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා කලාකරුවන් ඇගැයීම හා රැක ගැනීම, කලා කටයුතු ප්‍රවර්ධනය සහ විශේෂ අවශ්‍යතා ඇති කලාකරුවන් දිරිමත් කිරීම ආදිය කළ යුතු වෙනවා.

අපේ රටේ විශ්වවිද්‍යාල මඟින් උපාධි පාඨමාලා පවත්වලා ඒ ඒ උපාධි හරහා වෘත්තීය වශයෙන් හැකියාව තිබෙන උදවිය සමාජගත කළත්, කලා ක්ෂේත්‍රය වෘත්තියක් වශයෙන් පවත්වාගෙන යාම සඳහා තිබෙන ඉඩ කඩ සීමිතයි. අද වන විට තම හැකියාව සපුරා තිබෙන්නේ එක්කෝ විශේෂිත වූ දක්ෂතාව ඇති පිරිසක් එහෙම නැත්නම් මූල්‍යමය වශයෙන් හැකියාව තිබෙන පිරිසක් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවමත් සංවර්ධනය වන රටක් විධියට ශ්‍රී ලංකාව තුළ විනෝද ආස්වාදය ලබා ගැනීම සඳහා තමන්ගේ ආදායමෙන් වෙන් කරන්නට පුළුවන් මුදල කොපමණද කියන කාරණය ගැන බහුතර පුරවැසියන් සංඛ්‍යාවකට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අප මේ ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන කොට ඒවාට ලබාදෙන පහසුකම් එක්ක ඒ සඳහා අය කරන ගාස්තුවත් ඉදිරියේදී තදින්ම බලපාන්න පුළුවන්. වර්තමාන රජය කලාකරුවන්ගේ අභිවෘද්ධිය සඳහා මේ වන විට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් සිටිනවා. සරස්වතී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කලාකරු විශ්‍රාම රක්ෂණ ක්‍රමය, කලාදේවී රක්ෂණ යෝජනා ක්‍රමය, ජනතා කලාකරු භාරය වැනි ඒවා මඟින් සහ විවිධ උත්සව ආධාර, කලායතන ආධාර ආදී වශයෙන් විශාල මුදලක් වෙන් කළත්, කලාව ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් අද ඇතිවෙලා තිබෙන්නේ ඒ තරම්ම සතුටුදායක තත්ත්වයක් නොවෙයි.

[ගරු වන්දිම ගමගේ මහතා]

අද විවාදයේ විශේෂයෙන්ම අවධානය යොමු වෙලා තිබෙන්නේ මේ ක්ෂේත්‍රයේ චිත්‍රපට කලාව, ටෙලි නාට්‍ය සහ නාට්‍ය සම්බන්ධයෙන් පමණයි. 1950 දශකයේදී ආරම්භ වූ සිනමාව සහ ආරම්භක කාල වකවානුවක් නිශ්චිතව දැනගැනීමට නොහැකි නාට්‍ය කලාවක් යන දෙකම මේ රටේ රූපවාහිනී විකාශනය ආරම්භ වීමත් සමඟ යම්කිසි මට්ටමක පසුගාමී තත්ත්වයකට පත් වුණා. එදා නාට්‍ය සහ චිත්‍රපට බලන්න පෙළඹුණු පිරිස ක්‍රම ක්‍රමයෙන් රූපවාහිනීය වෙත යොමු වුණා. ඒ තුළින් ටෙලි නාට්‍ය ඉදිරියට ගිය බව කියන්න පුළුවන්. හැබැයි, අද ඒ ටෙලි නාට්‍යවලටත් බලපෑම් එල්ල කරන විදේශීය ටෙලි නාට්‍ය - විශේෂයෙන්ම ඉන්දියානු සම්භවයක් ඇති ඒවා- මේ නාලිකා තුළට රිංගලා තිබෙනවා. එම නිසා අද සිනමාව සහ නාට්‍ය කර්මාන්තයේ වෙළෙඳ පොළ සම්බන්ධ සීමාවක් තිබෙනවා. ඉන්දියානු සහ විදේශීය නිෂ්පාදන ලංකාවට ඇතුළත් වීමට සාපේක්ෂව ලංකාවේ නිෂ්පාදන විදේශීය වෙළෙඳ පොළ තුළට ඇතුළත්වීමේ පසුගාමීත්වයක් දකින්න තිබෙනවා. එයට හේතුව, වෙළෙඳ පොළ ජය ගැනීමට හැකි නිෂ්පාදන නිර්මාණය කිරීමට අවශ්‍ය පහසුකම් නොමැතිකම, අනුබල දීම්, සහාය දීම්, ආධාර සහ ඒවා ප්‍රදර්ශනය කිරීමට ඇති ගැටලු වැනි ඒවා බව අප සියලුදෙනා දන්නවා. ඉදිරියේදී ජනමාධ්‍ය කොමිෂන් සභාව පිහිටුවීම තුළින් මේ සඳහා පිළියම් ලැබෙයි කියා අප විශ්වාස කරනවා.

කලා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කථා කරද්දි මම කියන්න ඕනෑ, පසුගිය කාලයේ විවිධ ගැටලු ඇති වුණු බව. කලාකරුවන් අතරිනුත් යම්කිසි පිරිසකට විතරක් ප්‍රතිලාභ ලැබුණු තත්ත්වයක් තිබුණා. විශේෂයෙන්ම පැවතුණු පාලනයට ප්‍රශස්ති ගීත ගායනා කළ, ඒ පාලනය වෙනුවෙන් විවිධ ගැතිකම් කළ උදවියට විතරක් විශේෂ අවස්ථා හිමි වුණා. එහෙම නොවුණු පිරිසට අනිවාර්යයෙන්ම පසුගිය කාලයේ සිද්ධ වුණේ අසාධාරණකම් පමණයි. ඒ වාගේම ඒ රජයට පක්ෂපාතීව සිටි පිරිස්වලට කෝටි ගණනින් මුදල් හරිහම්බ කිරීමේ අවස්ථාව සැලසුණා. නමුත්, යහ පාලන රජය පත්වීමත් එක්ක මේ තත්ත්වය වෙනස් වුණා. ඉදිරියේදී සියලුම කලාකරුවන්ට මේ නව රජය තුළින් සාධාරණයක් ඉටු වෙනවා කියන විශ්වාසය අද ජනතාව තුළ ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී මේ කලාව සාර්ථක කර්මාන්තයක් වශයෙන් මේ රටේ ස්ථාපනය වීමේ ප්‍රවණතාව වැඩියි කියා ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 5.05]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද දින සභාව කල් තබන අවස්ථාවේ කලා ක්ෂේත්‍රය සම්බන්ධව ඉදිරිපත් කරන යෝජනාව ගැන අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. අද හුඟක් මන්ත්‍රීවරු බොහොම අවබෝධයෙන් යුතුව කලාව ගැන කථා කළා. මම එවැනි අවබෝධයක් තිබෙන පුද්ගලයෙක් නොවෙයි කියා මුලින්ම කියන්න ඕනෑ. නමුත්, මට කලාව ගැන කථා කරන්න හේතුවක් තිබෙනවා. විශේෂයෙන්ම මම අද කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. ඒ වාගේම මොරටුව ප්‍රදේශයත් නියෝජනය කරනවා. කලාකරුවන් රාශියක්ම මොරටුව ප්‍රදේශයෙනුත් බිහිවෙලා තිබෙනවා. ඒ නිසා අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මම පළමුවෙන්ම කියන්නට ඕනෑ, කලාව පිළිබඳව ආණ්ඩුවකට වගකීමක් තිබෙන බව. මොකද, කලාව කියන එක වෙළෙඳ පොළ භාණ්ඩයක් හැටියට පමණක් සලකන්න බැහැ. වෙළෙඳ පොළේ යම් ගනු - දෙනු තිබෙනවා. නමුත් කලාව වෙළෙඳ පොළ භාණ්ඩයක් විතරක් නොවෙයි. අද සමහර මන්ත්‍රීවරුන් කිව්වා, කලාව පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ කියලා. නිර්මාණකරුවන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න රජයට විශාල වගකීමක් තිබෙනවා. කලාව වෙළෙඳ පොළ භාණ්ඩයක් නොවන නිසා කලාවට මූල්‍ය වෙන් කරන්න ඕනෑ. කලාව ගැන කථා කරනකොට සමහර වෙලාවට බොහොම පටු ලෙස සාකච්ඡා වෙන්නට පුළුවන්; එක සංස්කෘතියකටම සීමා වෙච්ච දෙයක් හැටියට සාකච්ඡා වෙන්නට පුළුවන්. නමුත් කලාව කියන එක බොහොම පුළුල් දෙයක්. ඒ කියන්නේ කලාව කියන එකට සීමාවක් නැහැ. හැම තිස්සේම අලුත් දෙයක්, නිර්මාණයක් ඉදිරිපත් වෙන ක්ෂේත්‍රයක්. කලාව කියන්නේ "වෙනසකට පෙරගමන්කරුවා" කියලා කියන්න පුළුවන්. සමාජය වෙනස් කරන බලවේගය කලාව හරහා තමයි ඇති වෙන්නේ. "කලාව අපේ" කියන අදහස ගත්තොත්, කලාව ගැන අපි එහෙම හිතුවොත් සමහර විට අනික් අයවළුන්ගේ කලාව අපි වෙන් වෙන්ව දකිනවා. නමුත් ඇත්තටම මේවා එකිනෙකට ගැට ගැහිලායි තිබෙන්නේ. භාරතයේ, ආසියාවේ, පසුගිය අවුරුදු 1,000දී අරාබි ශ්‍රීක, සහ පසුගිය අවුරුදු 500 තුළදී යුරෝපීය කලාවත් සංස්කෘතියත් එක්ක අපේ රටේ කලාවත් ගැට ගැහිලායි තියෙන්නේ. එක්කෝ සමාජයකට ඉස්සරහට යන්න කලාව පාවිච්චි කරන්න පුළුවන්. එහෙම නැත්නම් කලාව හරහා සමාජය පස්සට යන්නත් පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හුඟක් වෙලාවට එක එක චින්තන තිබෙනවා. සමහර ඒවා කලාවට සුදුසුද නැද්ද කියලා අපි හිතන්නට ඕනෑ. පසුගිය කාලයක තේමාවක් ඇති වුණා "අපි වෙනුවෙන් අපි" කියලා. මම හිතන්නේ කලාවට නම් එවැනි චින්තනයක් සුදුසු නැහැ කියලායි. මොකද, හුඟක් වෙලාවට අපි ඒ හරහා, අපි ගැනම සමහර විට වැරැදි අදහසක්, මතයක් ගොඩ නහන්න පුළුවන්. කලාවෙන් සමාජය ඉදිරියට යන්න අවස්ථාවක් තිබෙනවා. කලාව ගැන කථා කිරීමේදී ඒක සාහිත්‍යයෙන් වෙන්නට පුළුවන්; නාට්‍ය හරහා වෙන්නට පුළුවන්; ටෙලි නාට්‍ය හරහා වෙන්නට පුළුවන්; චිත්‍රපට හරහා වෙන්නට පුළුවන්; වේදිකා නාට්‍ය හරහා වෙන්නට පුළුවන්. නමුත් ඒකට ඉඩකඩ සැලසිය යුතුයි. අපේ රටේ හුඟක් වෙලාවට දේශපාලනඥයාට තමයි ඔහුගේ අදහස් ඉදිරිපත් කරන්න ඒ අවස්ථාව තියෙන්නේ. කලාකරුවන්ට ඒ තිබෙන අවස්ථාව බොහොම සීමිතයි. අපට වගකීමක් තිබෙනවා, ඒ අවස්ථාව පුළුල් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද විවාදය තුළ අහන්න ලැබුණා, බාල වර්ගයේ ටෙලි නාට්‍ය තිබෙනවා; බාල වර්ගයේ නාට්‍ය තිබෙනවා; ඒ වාගේම බොහොම ප්‍රමිතියෙන් ඉහළ නාට්‍ය තිබෙනවා කියලා. ඇත්තටම දෙයක් බාල ද, නැත්නම් බොහොම ඉහළ ප්‍රමිතියෙන්ද තිබෙන්නේ කියන එක හරියටම රස විඳින දෙයක් වාගේ තේරුම් ගන්න කෙනෙකුට හැකියාවක් තිබෙන්න ඕනෑ. ඒ රස විඳින්නට නම්, ඒ කියන්නේ බාල දෙයක්, ප්‍රමිතියෙන් ඉහළ උත්තරීතර දෙයකින් වෙන් කරලා දැන ගැනීමේ කලාව පිළිබඳව ඒ අවබෝධය පාසල් කාලයේදීම ලබා ගත යුතුයි. සංගීතයට වැඩිය හුරු නැති අය සමහර වෙලාවට සංගීතය අහනකොට හුඟක් වෙලාවට ඒක හොඳ ද නැත්නම් බාල ද කියලා ඔවුන්ට කියන්න අපහසුයි. නමුත් දරුවෙකු හැටියට ඒ ගැන යම්කිසි අවබෝධයක් ලැබුණා නම්, අපට ඒක තෝරා බේරා ගන්නට පුළුවන්.

අද මේ විවාදයේදී බාල වර්ගයේ නාට්‍ය ගැන කථා කළා. එහිදී විශේෂයෙන්ම සඳහන් කළේ සැපයුම පැත්තෙන්. අපට ඒ නරක දේවල්වල සැපයුම සීමා කරන්න පුළුවන් කොහොමද කියලා තමයි කථා කළේ. හොඳ දේවල්වල ඉල්ලුම පැත්තෙන් බැලුවොත්, ඒක සපුරන්න පුළුවන් වෙන්නේ කුඩා කාලයේදීම දරුවන්ට කලාව රස විඳින්න අවස්ථාව දුන්නොත් පමණයි.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, කලාවයි, කලාවට වෙන් කරන මුදලයි පිළිබඳව. අද මේ ගැන හුඟක් සාකච්ඡා වුණා. අද කලාවට පෞද්ගලික අංශයෙන් එන මුදල් හැරෙන්නට, රජයෙන් වෙන් කරන මුදල් බොහොම සීමිතයි. පෞද්ගලික අංශයෙනුත් මුදල් සීමිත ප්‍රමාණයක් තමයි එන්නේ. අද කථා කළා සිනමාහල් ඩිජිටල්කරණය කිරීම පිළිබඳව. අපේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළා, ඒ වෙනුවෙන් මිලියන 5ක් විතර යනවා කියලා. දැනට තිබෙන සිනමාහල් 145න් 40ක් පමණයි ඩිජිටල්කරණය කර තිබෙන්නේ. ඉතුරු සිනමාහල් 105 අපි කොහොමද ඩිජිටල්කරණය කරන්නේ කියන ප්‍රශ්නය පැන නඟිනවා. ඒ සඳහා වන එක යෝජනාවක් තමයි, ඒ දේ කරගෙන යන්න ණය ක්‍රමයක් හදන්න පුළුවන්ද කියන එක. ඇත්තටම රජයට සීමාසහිත සම්පතක් තිබෙන නිසා, අය වැය හරහා අපි කලාවට මුදල් වෙන් කරනවා නම්, ඒ වෙන් කරන මුදල ඩිජිටල්කරණයට වෙන් කරනවාද, නැත්නම් අද යෝජනා කරපු විධියට කලාකරුවන්ගේ අනෙකුත් අවශ්‍යතාවලට වෙන් කරනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ සඳහා සෙස් බද්දක් පැනවීම ගැනත් අද යෝජනා කළා. ඩිජිටල්කරණය සඳහා අය වැයෙන් මුදල් වෙන් කරන්න අපහසු නම්, සීමිත කාලයකට සෙස් බද්දක් පැනවීම ගැන සලකලා බලන්න පුළුවන් කියන එකයි මගේ මතය. ගරු ඇමතිතුමා, මුදල් ඇමතිතුමා සමඟ මේ ගැන සාකච්ඡා කරලා සීමිත කාලයකට හෝ අපට ඒ බද්ද පනවන්න පුළුවන් වුණොත්, ඒ එකතු කර ගන්නා මුදලින් ඩිජිටල්කරණය විතරක් නොවෙයි, ඊට වැඩිය හුඟක් දේවල් කරන්න පුළුවන් වෙයි.

මම මුලින්ම කිව්වා වාගේ, මොරටුව කියන්නේ කලාකරුවන් හුඟක් බිහි වන නගරයක්. ඉතින්, ඒ නගරය කලා කේන්ද්‍රයක් කරන්න අවශ්‍යයි. මොරටුවෙන් බිහි වුණු දේශපාලනඥයෙකු වන ටිරෝන් ප්‍රානන්දු හිටපු ඇමතිතුමාත් "වීර පුරන්අප්පු" කියලා film එකක් හැදුවා. ඒ වාගේම ජීවන් කුමාරණතුංග හිටපු ඇමතිතුමාත් මොරටුව නියෝජනය කළා. ඒ අනුව බලනකොට දේශපාලනයේ නියැලුණු කලාකරුවනුත් මොරටුවේ ඉඳලා තිබෙනවා. මම ඇමතිතුමාගෙන් කරන ඉල්ලීම තමයි, 'මොරටුව කලා කේන්ද්‍රයක් කරන්න' කියන එක. ඒ වාගේම කොළඹ නගරයෙන් පිට theatres නැති නිසා 1998දී එකක් හදන්න පටන් ගත්තා. ඒක භාගෙට හදලා තිබෙන්නේ. ඒක සම්පූර්ණ කරන්න අපට දැන් අවස්ථාව තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා, ඒ ගැනත් සලකා බලා පුළුවන් නම් මෙවර අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කරන්න කියලා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙන් මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු අ. අරවින්ද් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு எட்வேட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, කථා කරන්න.

[ප.ව. 5.15]

ගරු වේලු කුමාර් මහතා
(මාණ්පුමිකු වේලු කුමාර්)
(The Hon. Velu Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய ஒத்திவைப்புவேளை விவாதத்திலே, இலங்கையில் கலை மற்றும் நாடகத்துறை தற்பொழுது எதிர்நோக்குகின்ற சிக்கலான பிரச்சினைகள் மற்றும் பாரதூரமான நிலைமைகள் என்பவற்றைச் சுட்டிக்காட்டி, அது தொடர்பில் இனிவரும் காலங்களில் முன்னெடுக்கப்படவுள்ள செயற்பாடுகள் பற்றிப் பரிசீலிக்கப்படுகின்றது. எமது நாடானது பல இனங்களையும் பல மொழிகளையும் பல மதங்களையும் கொண்டதாகக் காணப்படுகின்றது. கலை, இலக்கியம் மற்றும் நாடகம் என்பது, ஒவ்வோர் இனத்தினதும் மொழி சார்ந்ததாக, மதம் சார்ந்ததாக இருப்பதோடு, இவை ஒன்றுடனொன்று பின்னிப் பிணைந்திருக்கின்ற அம்சங்களாகக் காணப்படுகின்றன. குறிப்பாக, ஒரு சமூகத்தினது பெறுமானத்தையும் விழுமியத்தையும் எடுத்துக்காட்டுகின்ற அடையாளமாகக் கலைகள் காணப்படுகின்றன. ஒரு சமூகத்தின் தோற்றம், அதன் வளர்ச்சி, அதன் பெறுமானம் என்பன இதனூடாக அடையாளப்படுத்தப்படுகின்றன. நாங்கள் இலங்கையின் வரலாற்றில் இது தொடர்பான பல படிமுறைகளைக் கண்டிருக்கின்றோம்; பல காலகட்டங்களைச் சந்தித்திருக் கின்றோம்.

அந்த வகையிலே, நான் பிரதிநிதித்துவம் செய்கின்ற இலங்கையின் மத்திய பிரதேசத்தை எடுத்துக்கொண்டால், அப்பிரதேசத்துக்கென்றே விசேடமான பல கலை அம்சங்கள் இருப்பதை நாங்கள் அறிவோம். மத்திய மாகாணப் பிரதேசங்களிலே, இந்தியாவிலிருந்து வந்த இந்திய வம்சாவளி சமூகத்தினர் குடியேறி வாழ்கின்றார்கள். இந்தச் சமூகத்துக்கே உரிய அடிப்படையான பல கலை அம்சங்கள் இருக்கின்றன. ஆனால், இன்று அவை வெளிப்படாமல் அருகிவருகின்ற அல்லது இல்லாமல்போகின்ற நிலைமைக்குத் தள்ளப்பட்டிருக்கின்றன. குறிப்பாக, அந்தச் சமூகத்திலே

[ගරු වේලු කුමාර් මහතා]

'கூத்து' எனக்கூறப்படுகின்ற ஒரு விஷேடத்துவமான கலையங்கம் காணப்படுகின்றது. காமன் கூத்து, அர்ஜுன் தபசு, பொன்னர் சங்கம், மயிலாட்டம், குயிலாட்டம், தப்பிசை, காவடி, கரகம், கும்மி, கோலாட்டம் போன்ற பல்வேறு கலையம்சங்கள் இங்கு காணப்படுகின்றன. ஆனால், இந்த நாட்டிலே வாழ்கின்ற ஏனைய சமூகத்தினர் அல்லது ஏனைய பிரதேசங்களைச் சேர்ந்த மக்கள் இவற்றை அறியாதவர்களாகக் காணப்படுகின்றனர்.

எங்களுடைய நாடு பிரதானமாக உல்லாசப் பயணத்துறையை மையப்படுத்தி முன்செல்கின்றது என்பது எங்களுக்குத் தெரியும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கண்டிய நடனம் இங்கு வருகின்ற உல்லாசப் பயணிகளால் விரும்பிப் பார்க்கப்படுகின்ற ஒன்றாக அமைந்திருப்பதை அந்தப் பிரதேசத்தைச் சேர்ந்த தாங்களும் அறிவீர்கள். கண்டிய நடனம் என்பது எங்களுடைய பிரதான கலையம்சமாக வெளிப்படுத்தப்படுவதோடு, எமது நாட்டின் அடையாளத்தையும் பிரதிபலிக்கின்றது. அதேவேளையிலே அது உல்லாசப் பயணிகளைக் கவர்வதனால் வர்த்தக அடிப்படையிலும் அதனை முன்னெடுக்கின்றனர். அந்த வகையில் நாட்டிலே இருக்கின்ற ஒவ்வொரு சமூகத்திலும் சமூக அடையாளங்களாகவும் அங்கங்களாகவும் இருக்கின்ற, அருகி வருகின்ற கலையம்சங்கள் வெளிச்சத்துக்குக் கொண்டுவரப்பட வேண்டும். எனவே, மலையகப் பகுதியிலே இருக்கின்ற நான் குறிப்பிட்ட கூத்துக்கள், கரகம், காவடி, தப்பிசை போன்றவைகளைப் பிரபல்யமடையச் செய்வதன்மூலம் எங்களுடைய நாட்டின் பெறுமானத்தை, தேசத்தின் பெறுமானத்தை வெளிநாடுகளுக்கு, வெளிச் சமூகங்களுக்கு எடுத்துக்காட்ட முடிவதோடு, கலையம்சமுள்ள ஒரு நாடாக எங்களுடைய அந்த ஆடம்பரத்தை வெளிப்படுத்தக் கூடியதாகவும் இருக்கும்.

குறிப்பாக, அருகி வருகின்ற மலையகக் கலைகளை - இந்திய வம்சாவளி மக்களை அல்லது தோட்டத்துறையைச் சார்ந்து இருக்கின்ற கலைகளை - காப்பாற்றுவதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். அவை ஏதேனுமொரு வகையில் எழுத்துருவிலே புத்தகமாக ஆவணப்படுத்தப்பட்டு காப்பகங்களில் பேணப்படுதல் அவசியமானதொன்றாக இருக்கின்றது. அதேபோல் இந்த நாட்டிலிருக்கின்ற ஒவ்வோர் இனத்தினதும் அல்லது சமூகத்தினதும் கலை அம்சங்களைப் பாதுகாத்து அவற்றினை இந்த நவீனத்துவத்துடன் சேர்த்து முன்கொண்டு செல்வதற்குப் பாடசாலை மட்டத்தில் தொடங்கி பல்கலைக்கழகங்கள் வரையிலே தனியான பிரிவுகளை - அங்கங்களை ஏற்படுத்தி அவற்றை விருத்தி செய்யவேண்டிய தேவை காணப்படுகின்றது என்பதையும் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கே உரையாற்றிய பலர் தமது உரைகளிலே பல்வேறு கோணங்களிலே இதுதொடர்பாக முன்னெடுக்க வேண்டிய விடயங்கள் பற்றிக் குறிப்பிட்டிருந்தார்கள். அந்த வகையிலே, இந்தப் பாரம்பரியக் கலைகளைக் கட்டியெழுப்புவதற்கு எமது அரசாங்கமானது எந்த வகையிலே அதனது பங்களிப்பைச் செய்கின்றது? என்ற கேள்வி எழுகின்றது.

இலங்கைத் தமிழர்கள் என்று குறிப்பிடக்கூடியவகையில், வட மாகாணத்தின் வன்னிப் பகுதியிலே வாழுகின்ற மக்களின் பாரம்பரியக் கலை அம்சங்கள் காணப்படுகின்றன; அவற்றில் விசேஷமான அங்கங்கள் இருக்கின்றன. அவ்வாறே கிழக்கை மையமாகக் கொண்டிருக்கின்ற மக்களுடைய பாரம்பரியக் கலைகளில் விசேஷமான அம்சங்கள் இருக்கின்றன. ஒரு நாடு என நோக்கும்போது இவை அனைத்துமே எங்களுக்குப் பெருமை சேர்க்கும் அம்சங்களாகும். ஆகவே, இவை பாதுகாக்கப்பட வேண்டும்; வெளிச்சத்துக்குக் கொண்டுவரப்பட வேண்டும். அதனூடாக நாங்கள் பல்வேறுவிதமான பரிணாமங்களை அடையக்கூடியதாக இருக்கும்.

இன்று இந்த நாட்டிலே சமூகங்களுக்கிடையிலான புரிந்துணர்வு என்பது மிகவும் முக்கிய தேவையான ஒன்றாகக் காணப்படுகின்றது. கடந்த 2-3 தசாப்தங்களாக இங்குள்ள சமூகங்கள் பிரிந்து நின்றதன் காரணமாக இன்று பல்வேறு பொருளாதார, சமூகப் பிரச்சினைகளுக்கு நாம் முகம்கொடுத்துக் கொண்டிருக்கின்றோம். இந்தச் சமூகங்களிடையே புரிந்துணர்வைக் கொண்டுவருவதற்கு மிக எளிமையான - இலகுவான வழியாக இந்தக் கலை அம்சங்கள் காணப்படுகின்றன. அவை கூத்துக்களாக இருக்கலாம், மேடை நாடகங்களாக இருக்கலாம், திரைப்படங்களாக இருக்கலாம். இவ்வாறான பல்வேறு அம்சங்கள் சமூகங்களிடையே இருக்கின்ற வேற்றுமைகளை நீக்கி அவர்களுக்கிடையிலான கருத்துப் பரிமாற்றலை ஏற்படுத்துவதற்கு மிக எளிமையான அம்சமாக - வழிமுறையாகக் காணப்படுகின்றது. எனவே, இதில் நாங்கள் கூடுதல் கவனம் செலுத்தவேண்டியிருக்கின்றது.

நவீனத்துவத்தைப் பற்றிப் பேசுகின்றபோது சினிமாக் கொட்டகைகள் digital மயப்படுத்தப்படவேண்டியதன் தேவை பற்றிப் பேசப்பட்டது; தொலைக்காட்சி நாடகங்களில் இருக்கின்ற நிலைமைகள்பற்றிப் பேசப்பட்டது. இந்தத் தொலைக்காட்சி நாடகங்கள் சின்னத்திரை எனவும் திரையரங்குகளில் உள்ளவை பெரியதிரை எனவும் இரண்டு வகையாகப் பிரிக்கப்படுகின்றன. இங்குள்ள தொலைக்காட்சி அலைவரிசைகளில் இந்தியாவின் தொலைக்காட்சி நாடகங்கள் பாரிய ஆக்கிரமிப்பினைச் செய்திருக்கின்றன என்பது எங்களுக்குத் தெரியும். அதன்மூலம் ஒருவகையில் எங்களுடைய கலைஞர்கள் பாதிப்படைகின்றார்கள். இன்னொரு வகையில் எங்களுடைய கலை, கலாசார அம்சங்கள், பாரம்பரியங்கள், வாழ்க்கை முறைகள் என்பவற்றை நாங்கள் இழக்கின்றோம். இவ்வாறு தொலைக்காட்சியில் ஒளிபரப்பப்படுகின்ற நாடகங்கள் அந்த நாட்டிலிருக்கின்ற சூழ்நிலைகள், அங்குள்ள சமூக நிலைமைகள் என்பவற்றையே சித்தரிப்பதாக இருக்கின்றது. அவை மிக நீண்ட தொடர்களாகப் புகுத்தப்படுகின்றன. வேறு கலாசாரம், வேறு நிலைமைகள் புகுத்தப்படுவதால் நாம் எம்மை மறக்கக்கூடிய, நாம் யாரெனத் தெரியாத ஓர் அபாயகரமான நிலைக்கு இது இட்டுச் செல்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிக இலகுவாக ஒரு விடயத்தை, கருத்தை, எண்ணத்தை மக்களுக்குள் கொண்டுசெல்லக்கூடிய அங்கமாக இந்தக் கலை வடிவங்கள் காணப்படுகின்றன என்று நான் கூறினேன். வேறு கலாசாரங்களை, வேறு அம்சங்களை, வேறு பழக்க வழக்கங்களை எங்களுடைய சாதனங்களூடாக ஒளிபரப்புவதன்மூலம் அவை மிக எளிமையாக மக்களைப் பற்றிக்கொள்கின்றன - தொற்றிக்கொள்கின்றன. இது ஒரு பாரதூரமான விடயம். அதனைத் தடுப்பதற்குரிய நடவடிக்கைகளை நாம் கட்டாயமாக எடுக்கவேண்டும்.

அதேநேரத்திலே மக்களுக்கான பொழுதுபோக்கு அங்கங்களும் தேவை. பொழுதுபோக்கு அங்கங்கள் இல்லாத பட்சத்திலே ஒரு மனிதன் தன்னை மனிதனாக தன்னிலைப்படுத்திக்கொள்வதில் பல்வேறு பிரச்சினைகளை

අල්ලතු අපුත්තංකළෙ එතිර්නෝක්කවේණ්ටි වරුකින්රතු. ආකවේ, පොළුතුපෝක්කෙ ඔළුංකුපටුත්තුකින්රපෝතු අතර්කුරිය පිරතාන අංකමාක තොලෙක්කාට්සියෙක් කාණ්කින්රෝම්. තොලෙක්කාට්සියිලේ එන්ත අලෙවරිසෙයෙ නාංකළ් තිරන්තාලුම් ඉලංකෙත් තේසත්තින් තේසිය අටෙයාලංකළුක්කුරිය අම්සංකළෙක් කාණ මුටිවතිල්ලෙ. වෙළියිලිරුන්තු කොණ්ටුවරප්පට්ට, මොළි මාර්රම් සෙය්යප්පට්ට අම්සංකළෙත්තාන් කාණ මුටිකින්රතු. කුරිප්පාක අවර්රිලේ පේසප්පටුකින්ර මොළිකූට - අතු සිංකළ මොළියාක ඉරුක්කලාම්; තමිළ් මොළියාක ඉරුක්කලාම් - විත්තියාසමාන මුරෙයිල් පේසප්පටුකින්රතු. මොළියාක්කම්කූට ඔරු විතමාකවේ කාණප්පටුකින්රතු. ඉත්තකෙයතොරු තාළ්වුනිලෙක්කු නාංකළ් තළ්ළප් පට්ටිරුක්කිරෝම්. ආකවේ, ඉන්තත් තුරෙකළෙ නාංකළ් කට්ටියෙළුප්ප වේණ්ටියිරුක්කිරතු.

අතේපෝල, තිරෛප්පටත්තුරෙයෙ එටුත්තුක්කොණ්ටාල්, නාන් ඒර්කෙනවේ කුරිප්පිට්ටතුපෝල තිරෙයරංකුකළිල් නවීන තොළිල්නුට්පම් ඉල්ලාතතු මුතල් අම්සම්! ඉරණ්ටාවතාක, අංකේ අටිත්තළ වතිකළ් - කීළ්ක්කට්ටුමාන වතිකළ් මිකවුම් පින්තංකිය ඔරු නිලෙයිලේ කාණප්පටුකින්රන. ආකවේ, සිනිමා කොට්ටකෙකළින් තරත්තෙප් පේණක්කූටිය නියමංකළෙක් කොණ්ටුවරවේණ්ටිය තේවෙ ඉරුක්කින්රතු. අටුත්තු, සිනිමාවුක්කුරිය කට්ටණ අරවීටුකළ්කූට -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු එඩ්වඩ් ගුණසේකර මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
අතන් පිරකු, මාණ්පුමිකු ලක්කි ජූයවර්තන අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු එට්වට් කුණසේකර අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු වේලු කුමාර් මහතා
(මාණ්පුමිකු වේලු කුමාර්)
(The Hon. Velu Kumar)
සිනිමාවුක්කුරිය කට්ටණම් තොටර්පාක එන්ත වරෙයරෙයුම් ඉල්ලෙ. පර්රුච්චීට්ටුකළිල් අච්චිටප් පට්ටිරුක්කින්ර කට්ටණත්තොකෙ ඔන්රාකවුම් අරවිටප්පටුකින්ර කට්ටණත්තොකෙ ඉන්නොන්රාකවුම් ඉරුක්කින්රතු. ඉව්වාරාන මෝසටි නිලෛමෛකළ් සිනිමාක් කොට්ටකෙකළිල් මික අතිකමාකක් කාණප්පටුකින්රන. අංකේ අටිත්තළ වතිකළ් මික මෝසමාන නිලෛයිලේ ඉරුප්පතාල් කුටුම්පත්තෝටු තනතු පොළුතෛක් කළික්කච්චෙල්කින්ර ඔරුවර් චික්කල්කළෛ එතිර්නෝක්කුකින්රාර්. ඉරුක්කෛකළාක ඉරුක්කලාම්, අල්ලතු මලචලකූට වතියාක ඉරුක්කලාම්, අල්ලතු ඒනෛය වතිකළාක ඉරුක්කලාම්, අවෛ එන්තවිතත්තිලුම් උකන්ත නිලෛමෛයිල් ඉල්ලෛ. අවර්රිනතු පරාමරිප්පු මිකමික මෝසමාකවේ ඉරුක්කින්රතු. අන්ත වකෛයිල්, ඉත්තකෙය චෙයර්පාටුකළුම් ඉන්නත් තුරෙයිනතු පාතිප්පුක්කු කාරණමාක ඉරුක්කින්රන.

ආකවේ, ඔරුපුරමාක, එංකළුටෙය තේසත්තිලිරුක්කින්ර පාරම්පරිය කලෛ, කලාචාර අම්සංකළ් පාතුකාක්කප්පට වේණ්ටුම්; අවර්රුක්කාන කාප්පකංකළ් ඒර්පටුත්තප්පට්ටු අවෛ ආවණප්පටුත්තප්පට වේණ්ටුම්; පල්ලෛක් කළකංකළ්වරෙ අවර්රුක්කාන තනිප්පිරිවුකළ් ඒර්පටුත්තප්පට වේණ්ටුම්. මරුපුරමාක, තොලෛක්කාට්චිච් චේවෛකළ් මර්රුම් තිරෛප්පටක්කූටංකළෛක් කට්ටියෙළුප්පි ඉන්නත් තුරෙකළෛ මේම්පටුත්තුවතර්කුරිය නටවටික්කෛකළෛයුම් මේර්කොළ්ළ වේණ්ටුම්. අතර්කාක අරසු අතනතු පෝතිය පංකළිප්පෛප් පෙර්රුක්කොටුක්ක වේණ්ටුම්.

ඉරුතියාක, නාන් පිරතිනිතිත්තුවප්පටුත්තුම් මලෛයක චමූකත්තිනරින් අරිය කලෛකළෛක් කට්ටියෙළුප්පුවතන්මූලම්, අන්තක් කලෛකළෛ මීළාක්කම් චෙය්තු කාප්පාර්රුවතන්මූලම්, අවර්රුක්කාන තනියාන පල්කලෛක්කළක අලකෛ ඒර්පටුත්තුවතන්මූලම් එංකළුටෙය පෙරුමානත්තෛ, අටෙයාලත්තෛ, පෙරුමෛයෛ උලකත්තුක්කු වෙළිප්පටුත්ත මුටිවතෝටු, අවර්රින්මූලම් උල්ලාචප් පිරයාණත්තුරෛ පෝන්ර පල්වේරු වර්ත්තක රීතියාන තුරෙකළෛයුම් පයනටෛයච් චෙය්යලාම්. අන්ත වකෛයිල් ඉන්ත නාට්ටුක්කුප් පයනුටෛයතාක අවර්රිනෛ මාර්රක්කූටිය නිලෛමෛ ඉරුක්කින්රතු එන්පතෛ ඉන්ත චපෛයින් කවනත්තුක්කු කොණ්ටුවන්තු, විටෛපෙරුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළහට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා. 5.30]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාම සතුටු වනවා, අද මේ රටේ ජාතියක් හැටියට අපි සියලු දෙනා එකට එකතු වන අවස්ථාවක්. වසර 2500 ගණනක ඉතිහාසයක් ඇති අපේ රට සංස්කෘතිය හා සභ්‍යත්වය තුළින් ලෝකයේ අද්විතීය තත්ත්වයට පත් වුණේ, විශේෂයෙන්ම මේ රටේ පැවැති කලා ශිල්ප නිසායි. මෙය එවන් වූ, ඉතාම ශ්‍රේෂ්ඨ කලාකරුවන් බිහි වුණු රටක්. එබැවින්, 21 වෙනි ශතවර්ෂය වන විට, මේ රටේ කලාව රැක ගත යුත්තේ මොන ආකාරයකටද යන්නත්, කලාකරුවන් පත් වෙන යම් යම් අකාරුණික තත්ත්වයන් පිළිබඳවත් අප මැනවින් අවබෝධ කර ගත යුතු වනවා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

2004 වසරේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවක් පිහිටුවා, එම ආණ්ඩුවේ සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයෙක් හැටියට ගරු විජිත හේරත් මැතිතුමා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් කටයුතු කළා. මම හිතන්නේ, ඒ කාලය තුළ එතුමා නොයෙක් දේවල් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න ඇති කියලායි. ඒ ඇමති ධුරයෙන් එතුමාට මොන තරම් බලයක් ලැබුණා ද කියලා මම දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් හිටපු සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමාට පුළුවන්කමක් තිබුණා, කලාව මේ වාගේ අගාධයකට යන්න නොදී ඒ සම්බන්ධයෙන් නිර්මාණාත්මක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. අඩුම තරමේ ඒ සඳහා අඩිතාලම දමන්නවත් පුළුවන්කමක් තිබුණා.

විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින්, "අපේ රටේ කලා ක්ෂේත්‍රය තුළ පැන නැඟී ඇති ගැටලු ගණනාවක්...." ආදී වශයෙන් කියලා, මේ තත්ත්වය වෙනස් කොට නිර්මාණකරුවන් හැටියට කලා ක්ෂේත්‍රයේ සියලු ශිල්පීන්ගේ නිර්මාණ හා ඔවුන් නියැලී භූමිකාව ආරක්ෂා කිරීමටත්, උසස් රස වින්දනයකට ජනතාවට ඇති අයිතිය තහවුරු කිරීමටත් ආණ්ඩුව විසින් ජාතික වගකීමක් ලෙස සලකා ප්‍රතිපත්තිමය තීරණ ඇතුළු අවශ්‍ය පියවර ගෙන නිර්මාණකරුවන්ගේ ස්වාධීනත්වයට අවශ්‍ය ඉඩකඩ සලසා දිය යුතු බවට යෝජනා කරනවා. එය තමයි එම යෝජනාවේ ප්‍රස්තුතය බවට පත් වෙලා තිබෙන්නේ.

මේ රටට මහින්දාගමනයත් එක්ක, සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ වැඩමවීමත් එක්ක සූ සැට කලාවන් ආවා. ඒ තුළින් චිත්‍ර කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම් කලාව, නාට්‍ය කලාව වාගේ නොයෙක් නිර්මාණයන් කරන්න අවශ්‍ය පසුබිම සකස් වුණා. ඒ වාගේම සංගීතය, නැටුම යන කලාවන් ආවේ ඉන්දියාවෙන්. පසුගිය කාලයේ මෙතුමන්ලාම කිව්වා, "ඉන්දියානු ආභාෂය තිබෙන ඒවා මෙහේ මොකුත් කරන්න එපා. ඉන්දියාවත් එක්ක කිසිම දෙයක් එපා" කියලා. මේ රටේ කලා ශිල්ප සහ සංස්කෘතික උරුමය ගැන කථා කරන, වසර 2500ක් පැරණි අපේ ඉතිහාසය ගැන කථා කරන බොහෝ දෙනෙකුට අද අමතක වෙලා තිබෙනවා, මේ සියලු කලා නිර්මාණයන් අපට ලැබිලා තිබෙන්නේ ඉන්දියාවෙන්ය කියලා. කුවේණි හිටපු කාලයේත්, විජය හිටපු කාලයේත් තවත් කලාකරුවන් ඉන්න ඇති. ඒ දවස්වල යක්ෂ ගෝත්‍රය, නාග ගෝත්‍රය කියලා කථා කළාට ඒ වාගේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඇති. දේවානම්පියතිස්ස රජ්ජුරුවන් මේ රටේ ඉන්නකොට එවැනි කලා නිර්මාණ තිබෙන්න ඇති. අපට ඒ කටයුතු කරන්න පුළුවන්කමක් තිබුණා. මේ රටේ ඉතිහාසය ගත්තාම එදා-මෙදා තුර අපට ලැබුණු රස වින්දනය කොතෙක්ද කියලා අපි දන්නවා. මේ රටේ අහස උසට දිව යන රුවන්වැලි මහා සෑය වැනි නිර්මාණයන් ඇති කළා. ඒ වාගේම, සීගිරි ගලේ ලියා ඇති කුරුටු ගී දෙස බලනකොට, එදා මිනිසුන් තුළ තිබුණු කලාත්මක හැඟීම්, සිංහල ජාතියේ තිබුණු කලාත්මක හැඟීම් කොපමණද කියලා අපට අවබෝධ වනවා.

චිත්‍ර ශිල්පය ගැන කථා කරන කොට මම හිතනවා, ලෝකයේ අද්විතීය චිත්‍ර කලාවක් අපේ රටේ නිර්මාණය වුණා කියලා. වාරි කර්මාන්තය ගැන කථා කරන කොට, සීගිරියේ ගල පාමුල සිට ගල මුදුන දක්වා ගෙන ගිය ඒ වාරි තාක්ෂණය මොන ආකාරයෙන් නිර්මාණය වුණාද කියලා අදත් අපි අධ්‍යාපන වාරිකා ගිහිල්ලා දරුවන්ට පෙන්වනවා. අද අපි කථා කරන කොළඹ නගරයේ ඇති සුවිසල් මන්දිර නිර්මාණය කරලා තිබෙනවා වාගේ නොවෙයි, ලෝවාමහාප්‍රාසාදය වැනි ඉතාමත්ම කලාත්මක නිර්මාණයන් ගෘහනිර්මාණ ශිල්පයේ දක්ෂතා මතුවන අයුරින් ගොඩ නගන්නට එදා පුළුවන්කම ලැබුණා.

ඒ විතරක් නොවෙයි, නිශ්ශංකමල්ල ලතා මණ්ඩපය ගැන බැලුවොත්, මේ විධියේ නිර්මාණයක් ලෝකයේ තවත් තිබෙනවාද? අපිට හිතෙනවා, අවුකන බුදු පිළිමය කළු ගලින් නිර්මාණය කොට කලා වැව ඉස්මත්තේ ඉදිකරන කොට, ඒ කලාකරුවාට මොන ආකාරයේ දැනුමක්, තාක්ෂණයක් තිබුණාද කියලා. වර්තමානයේදී ගීතයෙන් පවා ඒවා පිළිබඳව අගය කරන්නේ ඒකයි. මේ වාගේ පුදුම හිතෙන කලාකරුවන් අපේ රටේ බිහි වුණා. එහෙම බලද්දී අද ඉන්න කලාකරුවන් මොන ආකාරයෙන්ද කටයුතු කරන්නේ කියලා අපේ හෘදය සාක්ෂියට එකඟව කල්පනා කරලා බලන්න ඕනෑ. අද අපේ කලාකරුවාට මොනවාද වෙලා තිබෙන්නේ? හරියට නාට්‍යයක් නිර්මාණය කරන්න පුළුවන් පසුබිමක් තිබෙනවාද? අඩුම ගණනේ කලාකරුවෙකුට වේදිකා නාට්‍යයක් පෙන්වන්න ඕනෑ කරන ශාලා පහසුකම්වත් හරියාකාරව නැහැ. අගනුවර පහසුකම් තිබෙන ශාලා එකක්-දෙකක් හැදුවාට, නගරයෙන් පිට ගිහිල්ලා වේදිකා නාට්‍යයක් පෙන්වන්න සුදුසු ස්ථානයක් අද නැහැ. බොහෝ නගරවල තවමත් වේදිකා නාට්‍ය පෙන්වන්නේ ඒ කාලයේ වාගේ පරණ පාසල් ගොඩනැගිල්ලක් ඇතුළේම තමයි. අද නගර සභා රුපියල් කෝටි ගණනින් වරිපනම් බදු අය කර ගත්තාට, නාට්‍යයක් පෙන්වන්න ශාලාවක් හදන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, වේදිකා නාට්‍යයක් හරියට පෙන්වන්නට පුළුවන් විධියට එක දිස්ත්‍රික්කයකට අඩුම තරමින් එක ශ්‍රවණාගාරයක්වත් හදන්න කියලා. පාරවල් හදන්න, අධිවේගී මාර්ග හදන්න, නොයෙක් දේවල්වලට අපි කෝටි ගණන් මුදල් වියදම් කරනවා. අපි දන්නවා, හෙට-අනිද්දා වෙනකොට මේ රජය යටතේ නොයෙක් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වන බව. යම් යම් නිෂ්පාදන වෙනුවෙන් අපේ රටේ කර්මාන්තශාලා හදනවා. ඒ දියුණුවට සමගාමීව අපේ සංස්කෘතියත්, අපේ උරුමයත් ආරක්ෂා කර ගනිමින් පවත්වා ගෙන යාමට අවශ්‍යයි. මේ රටේ මිනිස්සුන්ගේ සිත් පහන් කරන්න අපිට අවශ්‍යයි. 70-80 වගා සංග්‍රාම කාලය කියන්නේ මම ඉස්කෝලේ යන කාලය. 1977න් පස්සේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමන්ලා මහවැලිය රජරටට හරවන කොට, ඒ පිළිබඳව ලියවුණු "මහාවැලි" ගීතය අදත් අපේ හදවත් තුළ තිබෙනවා.

පණ්ඩිත් අමරදේවයන් වාගේ කුසලතා තිබෙන ඉතා හොඳ නිර්මාණකරුවන් අදටත් අපි අතර ජීවත්ව ඉන්නවා. එතුමාගේ නිර්මාණයන් අදත් අපි අගය කරනවා. මහාචාර්ය සුනිල් ආරියරත්නයන් වාගේ අය ගීත ලියන කොට, ඒවා නන්දා මාලිනී ගෝකුලයන්ගේ මුවින් ඇහෙන කොට, දැනෙන දේශීයත්වය පිළිබඳව අපට මතකයි. මූලාසනාරූඪ ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කලාකරුවෙක්, ගායකයෙක්. ඔබතුමාත් දන්නවා, ඒ කාලයේ අපි උදේ පාන්දර හයට නැඟිටින කොට ගුවන් විදුලියෙන් අපිට ඇහුණේ දේශාභිමානී ගීත බව. සමහර ගීත තුළින් අලුත් රටක් පිළිබඳ අදහස් මතු වුණා. ඒ වාගේ ගීත තවමත් අපිට දැනෙනවා. මට මතකයි, "මහාවැලි" ගීත අපි මුමුණමින් හිටිය බව. ගොයම් කෙත, ඒකේ කරල පැහෙන ආකාරය පිළිබඳව අපිට ගීතයෙන් අහන්න ලැබුණා. මට ප්‍රශ්නය තිබෙන්නේ, අද ඒ ගීත කොහේටද ගිහිල්ලා තිබෙන්නේ කියලායි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ කුලය මහින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළින් ආරම්භ කරපු මනමේ, සිංහබාහු වැනි නාට්‍ය නිර්මාණයන් තුළින් අපි එදා රසවින්දනයක් ලැබුවා. නමුත්, අද අපි නරඹන්නේ මොනවාද? මනමේ නාට්‍ය, සිංහබාහු නාට්‍ය, දික්තල-කාලගෝල නාට්‍ය බලන්න නගරයේ ශාලාවක පෝලිමේ ඉන්න කොට, අදත් අපිට අමුතුම හැඟීමක් ඇතිවෙනවා. අද අපේ රටේ වේදිකා නාට්‍යයක් බලද්දී ඒ හැඟීම තිබෙනවාද? අද කාගේ හෘද සාක්ෂිය

අනුවද අපි වැඩ කරන්නේ? එතැනින් එහාට චිත්‍රපට කර්මාන්තය දිහා බලන්න. මම ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ ඉගෙන ගන්න කාලයේ අපිට දොළ දුකක් තිබුණා, සිනමා ශාලාවකට අලුතින් එන චිත්‍රපටියක් පළමුවැනි දවසේම බලන්න ඕනෑ කියා. සිනමා ශාලාවේ ගැලරියට ගිහිල්ලා හරි ඒ චිත්‍රපටිය අපිට බලන්න ඕනෑ. පළමුවැනි දවසේ බැලුවේ නැත්නම්, ඒකේ කිසි ජොලියක්, ආතල් එකක් නැතිකමක් තිබුණා. ඒ නිසා අපි චීන කොරටුවේ හිටපු අපේ සහෝදරවරුන්ට කියනවා, ගිහිල්ලා මුල්ම ටිකට් ටික තියාගන්න කියලා.

අපට මතකයි එදා ගැලරියේ ඉඳගෙන චිත්‍රපටි බලන කොට අපි මහා වීරයන් යැයි සිතුණු හැටි. ඇයි, අපි ඉස්සරහින්ම නේ සිටියේ. එවැනි තත්ත්වයක් එදා තිබුණා. ඒ මඟින් එදා අපට ලැබුණු දේ අද ලබන්න අවස්ථාව තිබෙනවාද? නමුත්, අද බොහෝ දෙනෙක් චිත්‍රපටියක් බලන්න යනවාද? පවුලේ, හවුලේ එකට එකතු වෙලා ගිහින් බලන්න පුළුවන් චිත්‍රපටියක් අද මේ රටේ තිබෙනවාද? අපේ ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා සිටියා නම් අපට තවත් ටිකක් කරුණු දැනගන්න තිබුණා. මම දන්නේ නැහැ, එතුමා කලාකරුවකු හැටියට මේ ගැන කථා කරනවාද කියා. අපේ මේ පාර්ලිමේන්තුව තුළ කලාකරුවන් මැති ඇමතිවරුන් වෙලා සිටියා. විශේෂයෙන් රවීන්ද්‍ර රන්දෙනිය මැතිතුමන්ලා සිටියා. අදත් ඉන්නවා, රන්ජන් රාමනායක මැතිතුමා ආදී අය. පසුගිය කාලයේ ජාතික ලැයිස්තුවෙන් ඇවිත් සිටියා ගරු ෆොන්සේකා මන්ත්‍රීතුමිය. ඒ වාගේ ඉතාම හොඳ කලාකරුවන් පාර්ලිමේන්තුවටත් ඇවිත් සිටියා. නමුත් මම දන්නේ නැහැ, පසුගිය කාලයේ ඒ අය මොනවාද කළේ කියා.

මම දැක්කා, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එදා ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ වෙලාවේ නිදහසේ වේදිකාව මත අපේ කලාකරුවන් යම් යම් නිර්මාණ කළා. අද සමහරු කලාකරුවන් ගැන කිඹුල් කඳුළු හෙළනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට මතකයි, එදා ගාල්ල නගරයේ යන විට වීදි නාට්‍යකරුවන්ට එළව එළවා ගහපු හැටි. එහෙම ගහපු අයට අද කථා කරන්න දෙයක් නැහැ. ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක මන්ත්‍රීතුමාට මා පැහැදිලිවම කියනවා, "මේ රටේ කලාකරුවන්ට අප යම් යම් පොරොන්දු දී තිබෙනවා නම්, අපි ඒ පොරොන්දු ඉෂ්ට කරනවා" කියා. අපේ පරමාර්ථය ඒ කටයුතු වෙනුවෙන් ඉදිරියට යෑමයි. අපට හොඳ ඇමතිවරයෙක් පත්ව සිටිනවා. මා මෙය කියන විටම ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා මේ ගරු සභාවට එනවා. මා කියනවා, අපි එතුමන්ලාත් එක්ක එකතු වෙලා විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා කියා. චිත්‍රපටි ගැන, රූපවාහිනී ටෙලි නාට්‍ය ගැන තවත් කථා කරන්න තිබෙන නිසාත්, කාල වේලාව තිබෙන නිසාත් මට තවත් විනාඩි 5ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද රූපවාහිනී කටයුතු අවසන් වන්නේ පස් වරු 6.30ට ද කියා මා දන්නේ නැහැ. දෙන්න, මට තවත් විනාඩි කීපයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තවත් කථිකයන් ඉන්නවා, කථා කරන්න. අද දින රූපවාහිනී කටයුතු පස් වරු 6.30ට තමයි අවසන් වන්න නියමිතව තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
තවත් වෙලාව නැද්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තවත් කථිකයෝ පස්දෙනෙක් ඉන්නවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට තවත් විනාඩි 5ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රෝහල්ගත වෙලා සිටියදීත් තමයි මා ආවේ, මේ කථාව කරන්න ඕනෑ නිසා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තවත් විනාඩි දෙකක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් දෙන්න කියා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝහල්ගත වෙලා ඉඳපු මා "ටිකට්" කපාගෙන ආවේ, මේ කථාව කරන්නයි. ඒ නිසා කලාකරුවකු හැටියට මට අවස්ථාවක් දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අසනීප වෙලා නම්, කථා කරන්න හොඳ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම නම්, නවත්වන්නද?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
එහෙම අමාරුවක් මට නැහැ. සමහරු නම් FCID එක ආදී තැන්වලට යන කොට රෝහල්ගත වෙනවා. එහෙම කෙනෙක් නොවෙයි, මම. මා රෝහලෙන් ආවේ, මේ මාතෘකාව ගැන කථා කරන්න ඕනෑ නිසායි. ඒ නිසා මට අවස්ථාව දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්න හැදුවේ, කරන්න ඕනෑ වැඩ ටික ගැනයි. අපි නගරයක් පාසා -සෑම නගරයකම- ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා. පසුගිය දවස්වල අපි තායිලන්තයට, චීනයට ගියාම ඒ රටවල සංස්කෘතිය අපට කියා දෙන්න අපි රංග ශාලාවලට එක්කරගෙන ගිය බව මට මතකයි. ඒ නාට්‍ය බැලුවාම, ඒ නැටුම් බැලුවාම, ඒ

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ගායනයන් ඇහුවාම 'අපි කොතැනද ඉන්නේ?' කියා සිතෙනවා. අපට එවැනි ශාලාවක් නැහැ. දහස් ගණනකට එක සැරේ එක ශාලාවක සිට නැරඹිය හැකි ශාලා පහසුකම් ඒ ශාලාවල අපට තිබුණා. "නෙළුම් පොකුණ" රහහල ගැන මම සතුටු වෙනවා. කවුරු කළත් ඉතාම වැදගත් දෙයක්, එය. ඒ වාගේ සංස්කෘතික මධ්‍යස්ථාන අපට තිබෙන්න ඕනෑ. මේ වෙලාවේ මම ස්තුතිවන්ත වෙනවා, විපක්ෂය මොන විධියට කථා කළත් මහින්ද රාජපක්ෂ මැතිතුමාට. විවේචනය කිරීම නොව, අපි ඒ වාගේ දේවල් නිර්මාණය කරන්න ඕනෑ. සෑම නගරයකටම අදාළව ඒ වාගේ වැඩ පිළිවෙළක් අපටත් තිබෙනවා. ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමනි, මා ඉල්ලා තිබෙනවා මගේ ආසනය තුළ, දෙතුන්දාහකට ඉඩ පහසුකම් ඇති ශාලාවක් හදන්න අවශ්‍ය කටයුතු කරන්න කියා. සංචාරක සංවර්ධන අමාත්‍යාංශයත්, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයත් එකට එකතු කර ගෙනයි ඒ කටයුතු කරන්නේ. අද අපේ සංස්කෘතිකශාලා තිබෙන්නේ කොහේද? ගමකට ගිහින් පරණ ඉස්කෝලයක වහපු ගොඩනැඟිල්ලක් -80' x 20' ගොඩනැඟිල්ලක්- අරගෙන දැල් ටිකක් ගහලා කියනවා, "මේක තමයි සංස්කෘතික මධ්‍යස්ථානය" කියා. ඒවා තමයි සංස්කෘතිකශාලා හැටියට තිබුණේ. බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා.

රුපියල් එක්කෝටි දසලක්ෂයක් වියදම් කරලා මම සංස්කෘතික මධ්‍යස්ථානයක් හැදුවා. මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕනෑ අපවත් වී වදාළ අපේ අතිපූජ්‍ය මාපලගම විපුලසාර නායක හාමුදුරුවන් වහන්සේ. ඉඩම් කැලි අරගෙන, රුපියල් එක්කෝටි දසලක්ෂයක් වියදම් කරලා එම සංස්කෘතික මධ්‍යස්ථානය හැදුවා. හදලා එය භාර දුන්නා ප්‍රාදේශීය සභාවට. අද එහි හුණු ටික ගාගන්න විධියක් නැහැ. අවුරුදු ගණනකට පසුව වුවත් අද මගේ විමධ්‍යගත මුදල් දෙන්න සිදු වෙලා තිබෙනවා එය හදන්න. මාපලගමයි එය තිබෙන්නේ. එහි පවත්වන උත්සවවලට ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හදන්න ඕනෑ මොනවාද? බොරු කතන්දර වැඩක් නැහැ. අපි කෝටි ගණන් වියදම් කරලා කාපට් පාරවල්, ඇළ මාර්ග, බෝක්කු ආදි නොයෙක් දේවල් හදන්න මුදල් වියදම් කරනවා. කරුණාකර එක දිස්ත්‍රික්කයක එක සංස්කෘතික ශාලාවක් හෝ හදන්න. අපේ රටේ සංචාරක ව්‍යාපාරය තිබෙනවා. අපට උසස් සංස්කෘතික උරුමයක් තිබෙනවා. පිට රටින් එන පුද්ගලයන්ට -සංචාරකයන්ට- අඩු ගණනේ දහඅට සන්නිය පෙන්වන්න හෝ බලිතොවිල් පෙන්වන්න හෝ ශාලාවක් අපට නැහැ. ඒ වාගේ තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අප කියන්නේ, ඒ කටයුතු සඳහාත් මුදල් ටිකක් වියදම් කරන්න ඕනෑ කියායි. දැන් මේ ගරු සභාවේ සංස්කෘතික අමාත්‍යතුමා සිටියා නම් හොඳයි. අපේ අකිල විරාජ් කාරියවසම් අමාත්‍යතුමා ඒ කටයුතු කරන්න, යම්කිසි වැඩ පිළිවෙළකට යන්න ලෑස්ති වෙලායි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න වේදිකා පිළිබඳව. අපි මෑතකදී තායිලන්තයේ සංචාරයකට සහභාගි වුණා. ඒ අවස්ථාවේදී අපි තායිලන්තයේ සංස්කෘතික මන්දිරය නරඹන්නත් ගියා. එම මන්දිරය තුළ තිබෙන විදුලියෙන් ක්‍රියාත්මක වී ඉදිරියට එන වේදිකා දැක්කාම, ජලය ගලා ගෙන ඇවිත් ජලාශ පිරෙන ආකාරය දැක්කාම ඒ වාගේම වේදිකාවේ පසුබිමෙන් තිබෙන තත්ත්වයන් දැක්කාම අපට ඒවා පිළිබඳව හිතා ගන්නත් බැරි වුණා. හැබැයි, මෙවා කරන්න පුළුවන්. ඒ තරම් අමාරු දේවල් නොවෙයි. ඒ කලා ශිල්පීන් ඉන්නවා. ඒ නිසා රූපවාහිනීය හා ගුවන් විදුලිය තුළින් අපටත් යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්.

රූපවාහිනීය පිළිබඳවත් යම් අදහසක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. අද රූපවාහිනීය තුළින් අපි යම් කලා නිර්මාණයක් විකාශනය කරනවා නම් ඒ සඳහා වියදම් දරන්න සිදු වෙනවා. අපිට එය කරන්න අමාරුයි. රූපවාහිනීය තුළින් හොඳ නාට්‍යයක් හෝ චිත්‍රපටයක් පෙන්වනකොට, ඒවායේ අනන්‍යතාව ආරක්ෂා කර ගන්න ඕනෑ. සමහර වේලාවට දේශීයත්වය ආරක්ෂා වෙන චිත්‍රපට බලන්නේ නැහැ. කාලයක් තිබුණා, ඒ කාලයේ මේවායෙන් ප්‍රයෝජනය ගත්තේ කොහොමද කියා අප දන්නවා. ඒ කාලයේ නාට්‍යයක් පෙන්වනවා නම්, නිටපු ඇමතිවරයාට රුපියල් 50,000ක් දෙන්න ඕනෑ. ඒ කාලයේ සමහර නිළියන් ගත්තේ කොහොමද කියාත් අපි දන්නවා. ඒවා ගැන මෙතැනදී යළි යළිත් කථා කරමින් මඩේ දම-දමා සෝදන්න අපි ලැහැස්ති නැහැ. ඒවායෙන් අපි පාඩම් ඉගෙන ගන්න ඕනෑ. මේ අවුරුදු පහ අවසන් වුණාට පසුව අපිත් සංස්කෘතිය වෙනුවෙන් කළේ මොකක්ද කියා ආපසු හැරී බලන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ජාතික වැඩ පිළිවෙළකට යා යුතුයි කියා මා හිතනවා. අපි අද වනවිට රූපවාහිනීය ඉහළ මට්ටමකට ගෙනැවිත් තිබෙනවා. ගුවන් විදුලිය තුළ දේශීයත්වය ඇති කරලා අලුත් නිර්මාණ බිහි කරන්නට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් යන බවත් මා විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. ඒ වාගේම සංස්කෘතික මධ්‍යස්ථානයක් පාසා අවශ්‍ය පහසුකම් ටික ලබා දීලා, ඒවා නවීකරණය කරලා, වායුසමනය කරලා අංග සම්පූර්ණ ශාලා පහසුකම් ලබා දිය හැකි වැඩ පිළිවෙළකට අප යනවා. ඒ නිසා අපිට ඒ සඳහා ටික කලක් ලබා දෙන්න කියා මා ගරු අනුර දිසානායක මැතිතුමාට කියනවා. එතුමන්ලා 2004 කියන ඈත අතීතයේදී දැරූ ඇමතිකමින් කරන්න බැරි වුණු වැඩ කොටස අද වනවිට අපි අවුරුද්දක් තුළ කරමින් පවතිනවා. මම ඒ අයට අභියෝග කරනවා. එතුමන්ලාට කරන්න බැරි වුණු දේවල් අද අප ලවා කරවන්නයි හදන්නේ. බොහොම ස්තුතියි. මොකද, එතුමන්ලාට එහෙම වැඩ පිළිවෙළක්, දර්ශනයක් නැහැ. කථාව විතරයි තිබෙන්නේ. මම හිතන්නේ බලය ලැබුණාට පසුව මොළේ නැති වෙලා. බලය නැති කාලයේ මොළය තිබුණා. ඒ ගැන තමයි අදත් මේ කථා කරන්නේ. ඒ අය උත්තර දෙන්නේ නැහැ. යෝජනාව ඉදිරිපත් කරලා පැත්තකට වෙලා ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන එක මන්ත්‍රීවරයෙකු හෝ දැන් මේ ගරු සභාවේ ඉන්නවාද කියා මම දන්නේ නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අපි ඉන්නවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
අනේ, සමාවෙන්න! ඔබතුමන්ලා ඉන්න බව මම දැක්කේ නැහැ. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත්, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් ඉන්නවා. ඔබතුමන්ලා මේ ගැන දන්නවා. ඔබතුමන්ලා ඇමතිකම්වල සිටියා. මම ඒකයි කියන්නේ. වැරැද්දක් කළේ නැහැ. නිර්මාණ බිහි කරන්න ගත් උත්සාහයන්ට එවකට පැවැති ආණ්ඩුවෙන් අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. මම දන්නවා. ඒ නිසා ඔබතුමන්ලා සහ අපි ඔක්කෝම එකට එකතු වෙලා වැඩ පිළිවෙළකට යමු කියා අප ඉල්ලීමක් කරනවා. ගරු අනුර දිසානායක මහතා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයේත් ඉන්නවා. ඒකත් හොඳ තනතුරක්. ඒ නිසා විවේචනය විතරක් නොවෙයි, වැඩක් කරන්න. ආණ්ඩුවේ හොඳ වැඩවලට උදව් කරන්න තමුන්නාන්සේලාට හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා. එවැනි අවස්ථා හැම දාම ලැබෙන දේවල් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ඔක්කෝම එකට එකතු වෙලා හොඳ වැඩ පිළිවෙළට යමු කියා මා ඉල්ලීමක් කරනවා. සංස්කෘතිය කියන එක ආණ්ඩුවේ සිටියත්, විපක්ෂයේ සිටියත්, ඒකාබද්ධ කල්ලියේ සිටියත්, දෙමළ, මුස්ලිම්, සිංහල කියන මොන ජාතියක සිටියත් කාටත් පොදු දෙයක්. ඒ නිසා අපි ඔක්කෝම එකට එකතු වෙලා මේ රටේ අනන්‍යතාව ආරක්ෂා කර ගෙන සියලු දෙනාටම සතුටු වෙන්න පුළුවන් සංස්කෘතික උරුමයක් අනාගතයට ගොඩ නහන්නට හැකි වැඩ පිළිවෙළකට යමු. ඒ සඳහා ඒ ඇමතිවරුන්ට ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවා! කියාත්, ඔවුන්ගේ සිත් පහන් වේවා! කියාත් ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.47]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වටිනා යෝජනාවක් සාකච්ඡාවට ගන්නා වේලාවේ ඒ වෙනුවෙන් කරුණු කිහිපයක් එකතු කරන්න ලැබුණු අවස්ථාව ගැන ප්‍රථමයෙන්ම ස්තුති කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල, නිවෙස්වල තිබුණු හැම අවශ්‍යතාවකදීම, ඒ හැම තැනකදීම කලාව මතු වුණා. නිවසක මංගල උත්සවයක් තිබුණා නම්, ඒ මංගල උත්සවය කලාවත් එක්ක තමයි හැඩ වුණේ. එම උත්සව සහාව, ඒ වටපිටාව, මහුල් පෝරුව කියන මේ හැම එකක්ම හෙළ සිරිත-විරිතට අනුව කෙරුණු දේවල්. ඒ වාගේම අනෙකුත් ආගම් අදහන විවිධ ජාතීන්ගේ මංගල උත්සව ආදී හැම තැනකදීම කලාව ඉස්මතු වුණා. අවමංගල උත්සවයක් ගත්තත්, ගමක පිරිත් ගෙයක් ගත්තත්, තොවිල් ගෙයක් ගත්තත් මේ හැම සංස්කෘතික වුවමනාවකදීම කලාව මතු වුණා. පල්ලියේ ගීත ගායනා කරපු කණ්ඩායම්වලින් ගායක-ගායිකාවන් ඉස්මතු වුණා වාගේ ගමේ විවිධ නිර්මාණවලින් කලාකරුවන් මතු වෙලා ඉස්සරහට ආවා. ඒ අයගෙන් තමයි ජාතික තලයට යනකම් මේ රටේ විශිෂ්ට නිර්මාණ ශිල්පීන් බිහි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර, ගමේ පාසලේ දරුවන්ට සාහිත්‍ය සංගම් ආදියෙන් තමන්ගේ නිර්මාණ හැකියාවන් දියුණු කරගෙන, තමන්ගේ සහජ කුසලතා දියුණු කරගෙන, ඔප් නංවාගෙන ඉස්සරහට එන්න ලොකු අවස්ථාවක් තිබුණා. නමුත් මේ සභාවේ අද කියවුණා වාගේ අද අපි නව ආරක අලුත් ගමනක් ඇවිල්ලා තිබෙනවා. මේ ආපු ගමන නිසා අද අන්තර් ජාලයත් එක්ක, සමාජ ජාල වෙබ් අඩවි එක්ක අපේ දරුවෝ වැඩිපුර කාලයක් ගත කරන තැනකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද සහජ කුසලතාවන්, දක්ෂතාවන් ඔප් නංවාගෙන ඉස්සරහට එන්න තිබෙන මාර්ගය බොහොම අඩුයි. ඒවා සැහවිලා ගිහිල්ලා; වියැකිලා ගිහිල්ලා. ඒ නිසා මැදි ආදායම් ලබන රටක් හැටියට, සංවර්ධනයේ ඉදිරියට ගමන් කරන්න යන රටක් හැටියට, දියුණු රටක් හැටියට ගමන් කරන්න යන ගමනේදී සංස්කෘතිය, කලාව ඇතුළු මේ සියල්ල සමගාමීව අපේ ජීවිතත් එක්ක එකතු කරගනිමින් තමයි මේ ගමන යා යුත්තේ කියලා අපි දැඩිව විශ්වාස කරනවා. රජයක් හැටියට ඒ වෙනුවෙන් වටිනා පියවර රාශියක් අරගෙන තිබෙනවා. මම සතුටට පත් වෙනවා, අද මෙතැන කථා වුණු බොහෝ කාරණා පිළිබඳව. හුහක් කරුණු කථා කරන්න වෙලාව නැතත් රූපවාහිනීය ගැන මම යමක් කියන්න ඕනෑ.

70 දශකය අග භාගයේ, 80 දශකය මුල් භාගයේ ටෙලි නාට්‍ය කලාව අපට හඳුනා ගන්න ලැබුණා. පසුගිය කාලයේ එක් යුගයක් අපි ගත කළා, රූපවාහිනීය ඉස්සරහට වෙලා ටෙලි නාට්‍යයක් නරඹලා අපේ ජීවිතයට උකහා ගන්න දෙයක් තිබුණාද කියන ලොකු සැකයක් අපට මතු වුණු. ටෙලි නාට්‍ය හැම එකකින්ම එහෙම වෙනවා කියලා මම කියන්නේ නැහැ. බහුතරයක් ටෙලි නාට්‍යවල ඒ සැකය, ප්‍රශ්නය අපට මතු වෙනවා. ඒ වාගේම රජය විසින් නඩත්තු කරනු ලබන ජාතික නාලිකාවල ටෙලි නාට්‍ය ආදිය විකාශනය කර ගන්න යාමේදී ඒ අය විවිධ ප්‍රශ්නවලට, ගැටලුවලට මුහුණ දුන්නු බව අපි අහලා තිබුණා. සමහර වෙලාවට විවිධ අය, විවිධ විධියට සතුටු කරන්න සිදු වුණා; සන්තෝසම් දෙන්න සිදු වුණා. ඒ නිසා ගුණාත්මක ටෙලි නාට්‍යවලට, ගුණාත්මක කලා නිර්මාණවලට තිබුණු ඉඩකඩ බොහොමයක් ඇහුරුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒ තත්ත්වය හුහක් වෙනස් වෙලා තිබෙනවා. අපි සතුටු වෙනවා, වක්මන් ජනමාධ්‍ය අමාත්‍යතුමා - අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා- ගැන. එතුමා ජනමාධ්‍ය සම්බන්ධයෙන් හොඳ ප්‍රවේශයක් -හොඳ ආරම්භයක්- අරගෙන තිබෙනවා. ඕනෑ කෙනෙකුට විවෘත මනසකින් බලන්න පුළුවන් තැනට අද ජාතික නාලිකා එතුමා අරගෙන ඇවිල්ලා තිබෙනවා. අද ප්‍රවෘත්ති ප්‍රකාශයක් ගත්තත් එහි සමබරතාවක් අපට දකින්න ලැබෙනවා. පසුගිය කාලයේ අපි දැක්කා, ජාතික රූපවාහිනීයත්, ස්වාධීන රූපවාහිනීයත් කටයුතු කළේ කොහොමද කියලා. ඒ නම්වලින්ම සඳහන් වුණු විධියට ඒවා පවුලේ නාලිකා බවට පත් වෙලා තිබෙනවා. පවුලේ නාලිකා බවට පත් වෙලා, ඒවා විකාශය පටන් ගත්ත වෙලාවේ ඉඳන් අවසාන වෙන කල් විවිධ අයගේ අඩහැරයන් බවට ජාතික නාලිකාවන් පත් වෙලා තිබුණා.

දේශපාලන ව්‍යාපාරවලින් අපේ ජනමාධ්‍ය ඇමතිතුමාට යම් යම් චෝදනා එල්ල වෙනවා, "මොකද, අපේ රජයක් තිබිලාත් ඔබතුමා අපේ දේශපාලන මතවාදයට ඉඩක් දෙන්නේ නැත්තේ?", "මොකද, වෙනදා තිබුණු විධියට ප්‍රවෘත්ති පටන් ගත්තු වෙලාවේ ඉඳන් අවසාන වන තෙක් ආණ්ඩුවේ දේශපාලනඥයන්ගේ මුහුණු පෙන්වන්නේ නැත්තේ?" කියලා. සමහර වෙලාවට එවැනි චෝදනාවලට එතුමා ලක් වෙලා තිබෙනවා. එතුමාත්, ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, අපේ රජයත් පැහැදිලිවම දැඩි ස්ථාවරයක ඉන්නවා, "මාධ්‍ය විශේෂයෙන්ම ජාතික නාලිකා ස්වාධීන විය යුතුයි, ඕනෑම දේශපාලන මතයක් දරන කෙනෙකුට රූපවාහිනී වැඩසටහන්, ප්‍රවෘත්ති බලන්න පුළුවන් තැනකට රූපවාහිනීය පත් විය යුතුයි" කියලා. අද ඒ තත්ත්වයට ගමන් කරලා තිබෙනවා. ජාතික රූපවාහිනීයේත් ඒ වාගේම ස්වාධීන රූපවාහිනීයේත් අද ගුණාත්මක ටෙලි නාට්‍ය අපට දකින්නට ලැබෙනවා. ඒවා පෙන්වා ලාභ උපයන ඉලක්කය නොවෙයි, ජාතික නාලිකාවකට තිබිය යුත්තේ. මා හිතනවා, ලාභ උපදවන වෙළෙඳ දැන්වීම්වලට වැඩි ඉඩක් දෙන ටෙලි නාට්‍ය හොයා ගෙන යනවාට වඩා රසඥතාව වාගේම හොඳ දැනුමක්, අවබෝධයක් ලබා දෙන ගුණාත්මක ටෙලි නාට්‍ය ප්‍රදර්ශනය කරන තැනට අපේ ජාතික නාලිකා පත් විය යුතුයි කියලා. ඒ ගමන අද ජාතික රූපවාහිනීය හා ස්වාධීන රූපවාහිනීය ආරම්භ කර තිබෙනවා.

අපි දැක්කා, පසුගිය කාලයේ අපේ රටේ කලාකරුවන්ට අත් වුණු බේදනීය ඉරණම. සමහර ජාතික මැතිවරණවලදී කලාකරුවන් ඇවිල්ලා ඇතැම් දේශපාලනඥයන්ගේ ප්‍රතිරූප පුම්බන්න පෙනී හිටපු විධිය අපි දැක්කා. මා එතුමන්ලාට අගරු කරන්න සූදානම් වෙන්නේ නැහැ, මුදලට එහෙම කළායි කියලා. හැබැයි, මේ රටේ ජනතාව අතිශයින් ආදරය කරන, ගරු කරන කලාකරුවන්ට දැන හෝ නොදැන, කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් සමහර දේශපාලන නායකයින්ගේ වන්දි හට්ටියින් බවට පත් වෙන්න සිද්ධ වුණා. මා අහගෙන හිටියා, එක කලාකරුවකු ජාතික රූපවාහිනීයේ වැඩසටහනකට ආපු වෙලාවේ එක්තරා නායකයකු ගැන සඳහන් කළා, එතුමා සුද්ධෝදන රජතුමාට නෑකමක් තිබෙනවා කියලා. එවැනි තැනකට මේ රටේ කලාකරුවන් පත් කරපු යුගයක් අපි අවසන් කරලා තිබෙනවා. එහෙම අවසන් කරලා හොඳ ගමනක් අද ආරම්භ කරලා තිබෙනවා.

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

අපේ ජනමාධ්‍ය ඇමතිතුමා අපි කුඩා කාලයේ ඉඳලා ඉතා හොඳින් දන්නා කෙනෙක්. එතුමාගේ ජීවිතය ගැන, එතුමාගේ වැඩ පිළිවෙළ ගැන අපි හොඳින් දන්නවා. එතුමා බොහොම පිරිසිදු දේශපාලන ගමනක් යන කෙනකු හැටියට අද විශේෂයෙන් රූපවාහිනීය, චිත්‍රපට කලාව ඇතුළු ජනමාධ්‍යයේ අනෙකුත් ක්ෂේත්‍රවල විශාල පරිවර්තනයක් කරන්න අවධානය යොමු කර තිබෙනවා. මා හිතනවා, අපේ ගරු අගමැතිතුමාගේ පූර්ණ ආශීර්වාදය ඒ වෙනුවෙන් ලැබිලා තිබෙනවා කියලා. මා දිගින් දිගටම කථා කරන්නේ නැහැ, කාලය අවසන් වෙලා තිබෙන නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාතෘකාව කලාවට සම්බන්ධ මාතෘකාවක් නිසා මා ඔබතුමාගෙන් අවසර පතනවා, කාලයකට නැතිව කවි දෙක තුනක් කියලා මගේ කථාව අවසන් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය ලැබෙනවා නේද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දන්නවා නේ පාර්ලිමේන්තුවේ රීති ගැන.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මේ සභාවේ ඕනෑ තරම් කාලයක් නොමැතිව කවි කියලා තිබෙනවා. රීතියට අනුව, කාලයක් නැතිව කවි දෙකක් කියලා මම මගේ කථාව මේ විධියට අවසන් කරන්නම්.

"මාටින් විකුම් සිහ, අහුබුදු වැනි සුරුවෝ
බිහි කළ බිමින් ආවෙන් කවිකම දැරුවෝ
සාහිත ගුණය ඇති අය දුසිරිත වැරුවෝ
ඒ මහ යා යුතු ය හෙට බිහි වන දරුවෝ

මහ වැඩ නැතත් කළ වැඩ නිසි වෙලාවට
ඉහළයි කියන හැක මට මේ සභාවට
පැහැපත් හෙට දිනෙක අරුණලු දැකීමට
යහ පාලන රජය අත දෙයි කලාවට

අවි බල බිඳුණු ගුණ බල දෙස නහන්නට
දිවියම සැදුණු යහපත්කම් රකින්නට
පිවිසෙන නව ලොවට මගෙ රට නහන්නට
සවිබල පතමි මම මැති සද ගයන්නට"

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු බිමල් රත්නායක මහතා.

[අ.භා.5 .57]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තැබීමේ අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව ගැන කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

විශේෂයෙන් ජාත්‍යන්තර සාහිත්‍ය දිනය වන අද දවසේම මෙම යෝජනාව ඉදිරිපත් කරන්න ලැබීම මා සතුටක් ලෙස සලකනවා. ජාත්‍යන්තර සාහිත්‍ය දිනය ගොඩ නැඟී තිබෙන්නේ, කොමියුනිස්ට්වාදියකු වශයෙන් කටයුතු කරපු, ජාත්‍යන්තර පුවත්පත් කලාවේදීන්ගේ දිනය නිර්මාණය කරපු ජූලියස් පූජී කියන ශ්‍රේෂ්ඨ ජනමාධ්‍යවේදියාගේ සාතනයත් එක්කයි. ඒ නිසා එම දිනයේදී මේ යෝජනාව ගැන අදහස් දක්වන්න ලැබීම සතුටක් ලෙස සලකනවා.

අද දින ගොඩක් කරුණු කථා වුණා. මේ අවස්ථාවේ ජනමාධ්‍ය ඇමතිතුමා සභාවේ රැඳී සිටීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම දෙමළ ජනතාවට අදාළව ගත්තොත්, දෙමළ මාධ්‍යයෙන් චිත්‍රපට නිර්මාණය, දෙමළ මාධ්‍යයෙන් ටෙලි නාට්‍ය නිර්මාණය, දෙමළ මාධ්‍යයෙන් වේදිකා නාට්‍ය නිර්මාණය වීම අපේ රටේ ඉතා දුර්වල මට්ටමකයි තිබෙන්නේ. මා දන්නා තරමින් දෙමළ මාධ්‍යයෙන් චිත්‍රපට සහ ටෙලි නාට්‍ය නිර්මාණය වෙන්නේම නැති තරම්. කෙටි චිත්‍රපට නිර්මාණය කිරීම පමණක් කරනවා, තරුණ අය විසින්. නමුත්, ප්‍රධාන ධාරාවේ ඒවා නිර්මාණය වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමිල්නාඩුවේ සංස්කෘතික මට්ටම හා අධ්‍යාපන මට්ටම ලංකාවට සාපේක්ෂව ගත්තොත් ඉතා පහළිනුයි තිබෙන්නේ. අද අපේ රටේ දෙමළ ජනතාවට වෙලා තිබෙන්නේ තමිල්නාඩුවට ගැළපෙන සංස්කෘතියක වහලුන් බවට පත් වෙන්නයි. ඒ නිසා රජයක් වශයෙන් මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. කලා ක්ෂේත්‍රයේ දෙමළ කලාකරුවන් සුවිශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම මුස්ලිම් ලේඛක ලේඛිකාවන් -කෙටි කථා ලියන අය- සැලකිය යුතු ප්‍රමාණයක් මේ රටේ ඉඳලා තිබෙනවා; තවමත් ඉන්නවා. විශේෂයෙන්ම ජාතික සමඟිය ගොඩ නඟන්නත් උත්සාහ දැරිය යුතු අවස්ථාවකදී මේ පිළිබඳව කටයුතු කිරීම අත්‍යවශ්‍යයි කියලා අපි රජයට කියා සිටිනවා.

මම කියන්න යන දෙවන කරුණ සම්බන්ධයෙන් ගරු ජනමාධ්‍ය ඇමතිතුමාට අපි මීට කලිනුත් එක්තරා විවාදයකදී කරුණු ඉදිරිපත් කළා. හැම මන්ත්‍රීතුමෙක්ම වාගේ මේ ගැන කිව්වා. පසුගිය කාලයේ ජාතික රූපවාහිනීයේ සහ ITN එකේ ටෙලි නාට්‍ය විකාශය කිරීමට පෙර episode එකකට රුපියල් 30,000 සිට 50,000 දක්වා මුදලක් අදාළ ඇමතිවරයාව සිටි අයගේ සහෝදරයාට අයිති, ඩෙන්සිල් කොඩිබෑකඩුව මාවතේ පිහිටි Havi Restaurant එකට ගෙවිය යුතුව තිබුණා. ගොඩක් අය හිතනවා, ඒ එක ටෙලි නාට්‍යයකට කියලා. නැහැ, ඒ ගෙවිවේ episode එකකට. ඒකෙන් බිල් ගත්ත කලාකරුවන් ඉන්නවා. ගරු ඇමතිතුමනි, මීට මාස ගණනකට කලින් මම ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරලා කිව්වා, අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා මේ පිළිබඳව විමර්ශනයක් කළ යුතුයි කියලා. ඒ වෙලාවේ ඔබතුමා කිව්වා, ඔබතුමාට එවැනි පැමිණිලි ලැබිලා නැහැ කියලා. පැමිණිලි ලැබුණත්, නැතත් ඒක දැන් public knowledge එකක් බවට පත්ව තිබෙන කාරණයක්. මේ පිළිබඳව දැන් කවුරුත් කිව්වා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අමාත්‍යාංශය මට්ටමින් දැන්වත් ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. වැරදි වැහුවොත් ඒවා හදා ගන්න බැරි වෙනවා.

ඊළඟ කාරණය තමයි "ටෙලි නාට්‍ය ප්‍රමිතිකරණය". මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා ඒ පිළිබඳවත් කරුණු ඉදිරිපත් කළා. ඒ ගැන තවත් ගැඹුරින් වචනයක් කියනවා නම්, ජාතික ටෙලි නාට්‍ය ප්‍රමිතිකරණ ආයතනයක් ආරම්භ කළ යුතුයි. දැන් එක එක channelsවලට ප්‍රමිතිකරණ මණ්ඩල තිබෙනවා. ජාතික රූපවාහිනීයෙන් ප්‍රතික්ෂේප කරන යම් යම් ටෙලි නාට්‍ය වෙනත් නාලිකාවක විකාශය කරනවා. ඒකෙන් ප්‍රතික්ෂේප කරන ඒවා ඊට පහළ වෙනත් නාලිකාවක විකාශය කරනවා. ඒ නිසා ඕනෑ කුණු ගොඩක් මොකක් හරි channel එකක පෙන්වන්න පුළුවන්. චිත්‍රපට සඳහා නම් අඩු පාඩු පෙන්වා දෙන්න එක තැනක් තිබෙනවා.

කපන මණ්ඩලය කියයි, මොකක් හරි කියයි, නමුත් එක තැනක් තිබෙනවා. එතැනින් එක්කෝ "බැහැ" කියනවා; නැත්නම් "පුළුවන්" කියනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ටෙලි නාට්‍ය ජාතික ප්‍රමිතිකරණ මණ්ඩලයක් හදන්න. ඒක ඔබතුමාට කරන්න පුළුවන්. ඒ සඳහා මහා ලොකුවට පනත් කෙටුම්පත් හදන්න ඕනෑ නැහැ. එතකොට එතැනින් සමත් වෙන ඒවා channelsවල විකාශය කරන්න පුළුවන්. එහෙම නැතුව channel එකෙන් channel එකට නිර්ණායක ගන්න ගියාම කලාකරුවන්ට හිහන්නත් බවට පත් වෙනවා. ලිංගික අල්ලස් ප්‍රශ්නත්, දේශපාලන ප්‍රශ්නත් ඔක්කෝම එකට ගැට ගැහෙන්නේ ඒකත් එක්කයි. ප්‍රමිතිය බාල වෙන්නේත් ඒ නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට අවුරුදු තුන-හතරකට කලින් episode එකකට රුපියල් ලක්ෂ දෙකහමාරක්-තුනක් ගෙවපු සමහර නාලිකා අද වෙලි නාට්‍යයක එක කොටසකට ගෙවන්නේ රුපියල් එක්ලක්ෂ විසිදහසයි; රුපියල් අනූදහසටත් කරනවා. ඒ නිසා ජනාධිපති සම්මාන වැනි සම්මාන ලබා ගත්ත ඉතා ඉහළ මට්ටමේ අතිශය ප්‍රවීණ නළු නිළියන්ට රුපියල් එක්දහස්පන්සියයට-දෙසියයට රඟපාන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ප්‍රමිතිකරණ මණ්ඩලයක් ආරම්භ කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වන කාරණය තමයි ratings. අද මේක එක්තරා විධියක වංචාවක්, මායාවක්, ව්‍යාපාරික සහ දේශපාලනික වුවමනාව මත සිදු වන දෙයක් බවට පත් වෙලා තිබෙනවා. අද එක එක channelsවලට advertising සඳහා අවස්ථා ලැබී තිබෙන්නේ ඒ මතයි. නාලිකාවල වැඩසටහන් ජනප්‍රියද, නැද්ද කියන එක පිළිබඳව නිරීක්ෂණය කරන එක්තරා ආයතනයක් තිබෙනවා. ඒකේ ප්‍රමිතිය මොකක්ද? ඒක විනිවිද පෙනෙන ආයතනයක්ද? ඒක අද නියාමකයක් බවට පත් වෙලා තිබෙනවා, නමුත් කිසිම ප්‍රමිතියක් තිබෙන එකක් නොවෙයි. ඕනෑ නම් දේශපාලනික වශයෙනුත් ඒක උඩට ගන්න පුළුවන්. ව්‍යාපාරික වශයෙනුත් උඩට ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒක ආණ්ඩුවෙන් කරන්න කියලා නොවෙයි. නමුත් ආණ්ඩුවෙන් නියාමනය කරන්න පුළුවන් ක්‍රමයක් ඇති කරන්න. රූපවාහිනී, ගුවන්විදුලි වාගේ විවිධ ආයතනවලින් සමන්විත, පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය යන දෙකේම සහභාගිත්වයෙන් යුත් කළමනාකරණ මණ්ඩලයක් පත් කරන්න. අවශ්‍ය නම් ඒ මඟින් යම් කිසි ආදායමකුත් ලබා ගන්න. ඒ පරීක්ෂණ නිකම් කරන්න බැහැ නේ. ඒවා තමයි කළ යුතු දේවල්. "නියාමනය" කියන්නේ ඒකයි. තරුණ ඇමතිවරයෙක් විධියට, මේ ගැන තේරෙන කෙනෙක් විධියට ඔබතුමාට එය කළ හැකියි කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශීය ටෙලි නාට්‍ය ගැනත් අද ගොඩක් දෙනෙක් කථා කළා. අද මේ තරම් විදේශීය ටෙලි නාට්‍ය පෙන්වන්න පුළුවන් වෙලා තිබෙන්නේ ඇයි? ඒවා මත කිසිම බද්දක් පනවලා නැති නිසායි. පසුගිය කාලයේදී ඒවා මත පනවා තිබුණු බදු ඉතාම පහළ මට්ටමට අඩු කළා. පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව සියලුම මන්ත්‍රීවරු විදේශීය ටෙලි නාට්‍ය හෙළා දැකලා කථා කළා. හැබැයි, ආණ්ඩුව ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා වැට බදු පනවන ගමන් විදේශීය කුණු කන්දල් මත පනවා තිබෙන බදු අඩු කරනවා. ඒ නිසා අපි යෝජනා කරනවා, එය සීමා කරන්න කියලා. සීමා කිරීමට කළ හැකි එක දෙයක් තමයි, ඒ මත යම් කිසි බද්දක් පැනවීම. ඒකත් ප්‍රමිතිකරණ මණ්ඩලයට දැම්මා නම් විදේශීය ටෙලි නාට්‍යවලටත් එකම ප්‍රමිතියක් හම්බ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ කියන්නේ, ජනතාව ඉල්ලන දෙය දෙනවාය කියලා නේ. එහෙම එකක් නැහැ. ජනතාවට හොඳ දෙය දුන්නොත් ජනතාව හොඳ දෙය ගන්නවා. දැන් රාත්‍රී 7.00 - 9.30 අතර කුණු ජඟ ජරාව පෙන්වනවා වෙනුවට හොඳ දේවල් පෙන්වලා බලන්න කෝ. මිනිස්සු බලන්නේ නැද්ද? මිනිස්සු "ඔෂින්" බැලුවේ නැද්ද? මිනිස්සු "යශෝරාවය" බැලුවේ නැද්ද? මිනිස්සු "කඩුල්ල" බැලුවේ නැද්ද? ඒ වෙලාවට මිනිස්සු television off කළාද? හොඳ දෙය දුන්නොත් මිනිස්සු හොඳ දෙය ගන්නවා. ඒ නිසා "මිනිසුන්ගේ රුචිකත්වය මෙයයි" කියන ලාභ තර්කයට එන්න එපාය කියා අප ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ ළමා අංශය ගැන මා කරුණක් කියන්නට කැමතියි. මේ ගැන ජනමාධ්‍ය අමාත්‍යතුමා මැදිහත් වනවා නම් හොඳයි කියා මම හිතනවා. මොකද, එතුමාටත් මේ ගැන සංවේදීකමක් තිබෙනවා, එතුමාත් තාත්තා කෙනෙක් නිසා. අද ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ ළමයින් සම්බන්ධව කාටූන්, සිංදු ආදී වශයෙන් ළමයින්ට අදාළ කලාව පිළිබඳව කිසිම ආකාරයක කිසිම නාලිකාවක මැදිහත්වීමක් නැහැ. ඒවා අයාලයේ යනවා. මා හැම දාම කියන දෙයක් තමයි කාටූන්. මේවා වංසගතයක්. ඒවායේ තිබෙන්නේ යුද්ධ කරන එක විතරයි. මා නම කියන්න යන්නේ නැහැ. ඉන්දියාවේ නිෂ්පාදනය කරන ලද එක කාටූන් එකක් පෙන්වනවා. ඒක හොඳයි. ඒක අපේ රටේ සංස්කෘතියට කිට්ටු එකක්. මම කාටූන් එකේ නම කියන්න යන්නේ නැහැ. ඒක අපේ රටේ පුරාවෘත්තයට සම්බන්ධ එකක්. අනෙක් කාටූන් ඔක්කොම තිබෙන්නේ මිනිස්සු මරන ඒවා; යුද්ධ කරන ඒවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ළමා නාට්‍ය, ළමා චිත්‍රපට ගැන කියන්න ඕනෑ. ඔබතුමා බලන්න, මම නම කියලාම කියනවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. "හෝ ගාන පොකුණ" කියන චිත්‍රපටය ආවා, දරුවන් වෙනුවෙන්. ඒකෙන් දරුවන් කොපමණ ආශ්වාදයක් විඳිනවාද? කොච්චර හෙළයිද ඒ වාගේ චිත්‍රපට හැදෙන එක? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමා නළුවන්ව අද සුවිශාල වශයෙන් exploit කරනවා. ඇත්තටම ඒගොල්ලන්ට විශාල පීඩනයක් ඇති වෙලා තිබෙනවා. මේ දවස්වල විකාශනය වන ටෙලි නාට්‍යයක ළමා නළුවෙකුත් ඒක පුවත් පත්වලට කියා තිබෙනවා මා දැක්කා. ඒක වෙනම පැත්තක්. මම විශේෂයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. ඔබතුමන්ලානේ බලපත්‍ර දෙන්නේ. ඔබතුමන්ලානේ ඒවා නියාමනය කරන්නේ. විශේෂයෙන් හැම රූපවාහිනී නාලිකාවකටම මේ සම්බන්ධව වග කීමක්, යම් කිසි නිර්දේශ ප්‍රමාණයක් දෙන්න, අනිවාර්යයෙන්ම ළමා අංශයක් සකස් කළ යුතුයි, ඒ සඳහා ළමයින් ගැන තේරුම් තිබෙන කලාකරුවන් සම්බන්ධ කර ගත යුතුයි කියන එක ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද වැඩිපුර කථා කළේ, චිත්‍රපට, ටෙලි නාට්‍ය සහ වේදිකා නාට්‍ය කියන ක්ෂේත්‍ර ගැන. වේදිකා නාට්‍ය ක්ෂේත්‍රය තවම සමාගමිකරණයට ලක් නොවුණු ක්ෂේත්‍රයක්. තවමත් ඒවා ඇහේ ගායට, ඇහේ වුවමනාවට රඟපාන නළු නිළියන් මත රඳා පවතින එකක්. තවම ඒක චිත්‍රපට වාගේ ටෙලි නාට්‍ය වාගේ විශාල කොම්පැනි අතට ගිහින් නැහැ. අද ඇත්තටම කොළඹ කේන්ද්‍රීය කර ගත්තොත්, වේදිකා නාට්‍යවලට ප්‍රවණතාවක්, පොඩි වසන්තයක් කියන්න පුළුවන් වාගේ තත්ත්වයක් තිබෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එකම වේදිකා නාට්‍යයකටවත් දර්ශන වාර දහයක් පහළොවක් කර ගන්නට බැරිවීමයි. මොකද, ඒවායේ ප්‍රමිතියට වඩා, ඒවායේ ගුණාත්මකභාවයේ ප්‍රශ්නයට වඩා -එහෙම ඒවාත් තිබෙනවා- තිබෙන දෙය තමයි, නිෂ්පාදන වියදම දරන්නට අමාරු වීම. ගරු ඇමතිතුමා වශයෙන් ඔබතුමා දන්නවා ඇති, මේ වේදිකා නාට්‍ය ගොඩක් කරන්නේ තරුණ අය බව. ඇහේ ගායට කරන අය ඉන්නේ. මේ වේදිකා නාට්‍ය සම්බන්ධ පුහුණු වීමේ අවස්ථා ගැන ගරු මන්ත්‍රීවරුන් ගණනාවක් කථා කළා. කොළඹ නගරයේ පුහුණු වීමට තිබෙන අවස්ථා ඉතාම අඩුයි. ඔබතුමන්ලා මැදිහත් වෙලා කොළඹ නගරය කේන්ද්‍රීයව තිබෙන -පාදුක්ක, හෝමාගම පැත්තේ නොවෙයි- කොළඹ නගරයේ තිබෙන පාසල්

[ගරු බිමල් රත්නායක මහතා]

කීපයක් පාසල් නිවාඩු කාලයේ හෝ මේ අයට කුඩා මුදලකට අරගෙන දෙන්නට පුළුවන් නම් මේ අයට පුහුණුවීම් කරන්නට අවස්ථාව ලැබෙනවා. වේදිකා නාට්‍යය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඒ කාරණය සඳහන් කරමින් අවසාන වශයෙන් පුංචි ඇගයීමක් කරන්නට ඕනෑ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් කරන්න අවසර දෙන්න. ගරු මන්ත්‍රීතුමාට අපි මේ කාරණය කියන්නට කැමතියි. විශේෂයෙන් ගරු අමතිතුමාගේ මැදිහත් වීමෙන්, ගරු අගමැතිතුමාගේ මූලිකත්වයෙන් පසුගිය කාලයේ පක්කරපු ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය යටතේ නෛතික සහ මාධ්‍ය කටයුතුවලදී තිබ්බු කර තිබෙනවා, ඒකාධිකාරිත්වය බිඳින්න ඔබතුමා කියපු rating ක්‍රමය. ඒ වාගේම ඒවා නියාමනයක් කරන්න, ඉංග්‍රීසි චිත්‍රපට, දෙමළ චිත්‍රපට, ලංකාවේ නිෂ්පාදනය කරන චිත්‍රපට නියාමනය කරන්න තීරණය කළා. දැන් අපි ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලායි තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය වෙලි නාට්‍ය ශිල්පී එකමුතුව විසින් රජයට ඉදිරිපත් කරනු ලබන යෝජනාවලියත්, සංස්කෘතික අවකාශ තුළ උද්ගතව ඇති ගැටලු කෙරෙහි රාජ්‍යයේ අවධානය යොමු කර වීම සඳහා කලාකරුවන් විසින් සකස් කරන ලද ලියවිල්ලත්, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට නිසි තැන ලබා දෙමු කියන සිරස්තලය යටතේ ඇති ලියවිල්ලත් මා සතුව තිබෙනවා.

අද සංස්කෘතික කටයුතු ආයතන තුනකට බෙදීම නිසා මේ ක්ෂේත්‍රය තුළ සුවිශාල බිඳ වැටීමක් වෙලා තිබෙනවාය කියා රජය පිළිගත යුතුයි. ඇත්තටම මේ අංශ කළමනාකරණය කරන්න බැරි තරමට කඩා දමලායි තිබෙන්නේ. ඒ නිසා මේ අංශ සියල්ල එක ඇමතිවරයෙක් යටතට ගත යුතුයි. එහෙම නැතිව මේ ආයතන කරගෙන යන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සම්බන්ධයෙන් කලාකරුවන් සකස් කර තිබෙන දීර්ඝ ලියවිල්ලත්, ජනාධිපතිවරණය ආසන්නයේදී පුරවැසි බලය සංවිධානය විසින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට සහ කලාකරුවන්ට ඉදිරිපත් කරන ලද ලියවිල්ලත් ඇතුළුව මා ඉහත සඳහන් කළ ලියවිලි ඔබතුමාගේ අවසරය මත හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා. එම ලියවිලි මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ පුංචි ඇගයීමකුත් කරන්න ඕනෑය කියලා මම හිතුවා. දේශපාලන පිරිහීම්, පරිපාලන පිරිහීම් සියල්ල එසේ තිබියදීත් ජාතික රූපවාහිනිය පොදුවේ පසුගිය කාලයේ පවත්වා ගෙන ගිය සංගීත වැඩසටහන් පිළිබඳවත් කියන්න ඕනෑ. පසුගිය කාලය පුරාම, ආණ්ඩු වෙනසකින් තොරව - ඒක කියන්න ඕනෑ- සැලකිය යුතු ප්‍රමිතියකට ඔවුන් ඒ වැඩ සටහන් පවත්වා ගෙන ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මේ දිනවල මහේෂ් නිශ්ශංක සහ ජයමිනි කියන දෙදෙනා ඉදිරිපත් කරන "සිහිනයකි ඇ" වැඩ සටහන අගය කිරීමක් කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඇමතිතුමාගෙන් අපි නිශ්චිත වශයෙන් ඉල්ලා සිටි දෙමළ මාධ්‍ය සම්බන්ධව මෙන්ම, විශේෂයෙන්ම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ වෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ කලින් සිදු වුණු වංචා පිළිබඳව සොයා බලන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වාගේම, වෙලි නාට්‍ය ප්‍රමිතිකරණ ජාතික ආයතනයක් පිහිටුවීම පිළිබඳව සහ ratings පිළිබඳව ජාතික නියාමන සභාවක් පිහිටුවන්න කියන යෝජනා ගැන ඔබතුමා ප්‍රායෝගික පියවර ගනීවිය කියා විශ්වාස කරමින් මගේ කථාව අවසන් කරනවා, ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාങ്കුම് උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා.

[ප.ව. 6.11]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු අ. අරවින්ද් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் கொடுத்ததற்காக உங்களுக்கும் கலை, கலாசாரம் தொடர்பான இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை அவைக்குச் சமர்ப்பித்த கௌரவ உறுப்பினர் அநுர திஸாநாயக்க அவர்களுக்கும் எனது நன்றியைக் கூறிக்கொண்டு இவை தொடர்பான ஒரு சில கருத்துக்களை முன்வைக்கலாமென்று நினைக்கின்றேன்.

கலாசாரம் என்பது இன்று உலகிலே நூற்றுக்கணக்கான நாடுகளிலே ஆயிரக்கணக்கான இனங்களுக்கு மத்தியிலே வெவ்வேறு விதமாகக் காணப்படுகின்றது. இந்த இனங்கள் தங்களது தேவைக்கேற்ப கலாசாரத்தைப் பேணிப் பாதுகாத்து வருகின்றன. அந்தவகையிலே இந்த நாட்டிலே வாழும் சிங்கள, தமிழ், முஸ்லிம் இனங்களுக்கிடையில் அவை வேறுபடுகின்றன. ஒவ்வோர் இனமும் தத்தமது சமூகத்திற்கேற்ப கலை, கலாசார விழுமியங்களைக் கடைப்பிடித்து வருகின்றது. ஆனால், எவ்வகையில் பார்த்தாலும் ஒவ்வோர் இனத்தின் கலை, கலாசாரமும் ஈற்றிலே மனித நேயத்தையும் நற்பண்புகளையும் நல்ல வழிகாட்டல்களையுமே எமக்குச் சொல்லிக்கொடுக்கின்றன. ஆனால், தற்போது இந்த நாட்டில் நடைபெறும் சில நிகழ்வுகளைப் பார்க்கின்றபோது எமது கலை, கலாசார விழுமியங்களிலிருந்து நாம் விலகிச் செல்கின்றோமா என்ற சந்தேகம் எழுகின்றது. நாம் எமது பாரம்பரிய கலாசாரத்திலிருந்து விலகி, மேலைத்தேய கலாசாரத்தை நோக்கிச் செல்லுகின்றோமோ என்று எண்ணத் தோன்றுகின்றது. நாங்கள் நாளடைவில் எமது கலை, கலாசார விழுமியங்களை முற்றாக மறந்துவிட்டு, மேலைத்தேய கலை. கலாசாரங்களோடு சங்கமித்து விடுவோமோ என்ற பீதியும் பயமும் கலை. கலாசாரத்தைப் பற்றிச் சிந்திக்கும் அல்லது அவற்றைக் காப்பாற்றவேண்டுமென்று எண்ணும் எம்மைப் போன்றோரின் மனதில் இயல்பாகவே எழுகின்றது.

இன்று நான் பிரதிநிதித்துவம் செய்யும் மலையகத்தில் ஒருவிதமான கலை, கலாசார, விழுமியங்கள் நடைமுறைப்படுத்துகின்ற அதேநேரத்தில், இந்த நாட்டிலே தமிழர்கள் அதிகமாக வாழ்கின்ற வடக்கு, கிழக்குப் பகுதிகளிலே இன்னுமொரு பாணியிலான கலை, கலாசார, விழுமியங்கள் நடைமுறைப்படுத்தப்படுவதை நாங்கள் காண்கின்றோம், மலையகத்தைப் பொறுத்தளவிலே, தற்பொழுது எமது பாரம்பரிய கலைகளான தப்பு, உறுமி,

உடுக்கு, கும்மியடி, கோலாட்டம், காமன்கூத்து போன்ற கலைகளிலிருந்து எமது மக்கள் விலகிப்போவதோடு, இவற்றை அநாகரிகம் என்ற கண்ணோட்டத்தோடு பார்க்கும் ஒரு கலாசாரமும் மிக வேகமாகக் கால்பதித்து வருவதை நாங்கள் விசனத்தோடு பார்க்கவேண்டியுள்ளது. அதேநேரம் இன்று எதற்கு எடுத்தாலும் நாகரிகம் என்ற போர்வையிலே மேலைத்தேய இசைகளைக் கிரகித்துக்கொள்வதும் மேலைத்தேய இசைக் கருவிகளோடு சங்கமித்துப்போவதும் ஒரு புதிய பாணியாக மாறிக்கொண்டு வருவதையும் நாங்கள் விசனத்தோடு பார்க்க வேண்டியுள்ளது.

இன்று தமிழ் சினிமா மற்றும் தமிழ்த் தொலைக்காட்சி நாடகங்கள் போன்றவற்றில் காணப்படும் பாரிய கலாசாரப் பின்னடைவைக் கவலையோடு பார்க்க வேண்டியுள்ளது. ஏனெனில் இன்று எமது நாட்டில் தமிழ் மக்களைப் பொறுத்தவரையில் அவர்கள் தமிழ்நாட்டின் சினிமா தொடர்பாகவே மிக அதிக ஈடுபாட்டோடு செயற்படுவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அந்த வகையில் எமது கலை, கலாசாரம் பேணலுக்கு இன்று தமிழ்நாட்டின் சினிமாவிலேயே நாங்கள் தங்கியிருக்கும் ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஆனால், தமிழ்நாட்டின் தொலைக்காட்சி நாடகங்களைப் பார்க்கும்போது அவை அனைத்தும் போட்டி, பொறாமை மற்றும் குடும்பங்களைப் பிரிக்கும் வகையிலேயே அமைந்துள்ளன. தமிழகத்திலுள்ள எந்தவொரு தொலைக்காட்சி நிறுவனத்தின் நிகழ்ச்சியை எடுத்துக்கொண்டாலும் அது எமது கலாசாரத்துக்கு ஏற்ற வகையிலே இல்லை. ஆனால், பார்ப்பதற்கு மிகவும் இரசிக்கக்கூடியதாக இருக்கின்றது; பொழுதுபோக்கு அம்சங்களைக் கொண்டதாக இருக்கின்றது. நானும் ஒருசில சமயங்களிலே நேரம் கிடைக்கும்போது அவற்றினைப் பார்க்கின்றேன். அவற்றைப் பார்க்கும்போது இந்தியாவிலே இவ்வாறான ஒரு கலாசாரம்தான் நிலவுகின்றதா? இந்தியக் குடும்பங்கள் மத்தியிலே இவ்வாறானதொரு செயற்பாடுதான் நிலவுகின்றதா? என்று என்னுள்ளேயே கேள்விகள் எழுப்பிக்கொண்ட பல சந்தர்ப்பங்கள் இருக்கின்றன. இவ்வாறான நாடகங்களை எமது முழுக் குடும்பத்தவரும் ஆவலோடு பார்த்து இரசித்தாலும் அவற்றிலிருந்து எமது கலை, கலாசாரத்தை உயர்த்தக்கூடிய அல்லது நல்ல விடயங்களை உள்வாங்கக்கூடிய வகையில் எதுவும் இல்லாதது கவலையையும் வேதனையையும் தருகின்றது.

எமது சமூகத்தில் சிறந்த கலைஞர்கள் இலைமறைகாயாக இருக்கின்றார்கள். அவர்களில் சினிமா நடிகர்கள், தொலைக்காட்சி நடிகர்கள், நல்ல மேடை நாடகக் கலைஞர்கள் போன்றோர் இருக்கின்றார்கள்; இயல், இசை, நாடகம் போன்ற முத்தமிழிலே நல்ல பாண்டித்தியம் பெற்ற கலைஞர்களும் படைப்பாளர்களும் இருக்கின்றார்கள். ஆனால், அவர்களை இனங்காணக்கூடிய அல்லது அவர்களை இனம்கண்டு உயர்த்தக்கூடிய வகையிலான சாதகமான செயற்பாடுகள் எதுவும் இல்லை. இந்த விடயத்தில் துரதிருஷ்டவசமான, அவலகரமான ஒரு நிலைமையே இருக்கின்றது. எனவே எமது சமூகத்தில் இலைமறைகாயாக இருக்கும் கலைஞர்களை இனங்கண்டு ஊக்குவிக்க வேண்டும்; அவர்களுக்கு நாம் சரியான களம் அமைத்துக் கொடுக்க வேண்டும்; அவர்களின் திறமை, ஆற்றல், ஆக்கங்கள் மற்றும் முயற்சிகளுக்குக் கைகொடுக்க வேண்டும். ஏனெனில் இவ்வாறானவர்களுக்குக் கைகொடுப்பதற்காக எவருமே முன்வருவதில்லை. அதேநேரம் ஏனையவர்கள் முன்வருகின்றார்கள் இல்லை என்பதற்காக நாங்கள் அவர்களை ஓரம்கட்ட முடியாது; ஒதுக்கிவைக்க முடியாது. ஒவ்வொரு சமூகத்துக்கும் அதனது கலை, கலாசார விழுமியங்களைக் கட்டிக் காப்பாற்ற வேண்டிய பொறுப்பு இருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Sir, please give me two more minutes.

அந்தவகையிலே, அவற்றைக் கட்டிக் காப்பாற்ற வேண்டுமென்றால் அரசாங்கம் உதவி செய்துகொடுத்து அவர்களை ஊக்குவிக்கவேண்டும். எனவே, சகல இனங்களையும் சமமாக மதித்து அனைவருக்கும் சமனான வாய்ப்பு வழங்கப்பட வேண்டும். இதற்கு அரசாங்கமும் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களும் தகுந்த நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டும். இங்கே இவ்வாறான விடயங்களிலே எல்லோரோடும் இணைந்து செயற்படக்கூடிய கௌரவ அமைச்சர் கயந்த கருணாதிலக்க அவர்களது தலைமையில் உள்ள ஓர் அமைச்சை நாங்கள் பெற்றிருப்பது உண்மையிலே எமக்குச் சந்தோசத்தைத் தருகின்றது. அவர் இவ்வாறான கலைஞர்களை ஊக்குவிக்க ஆக்கபூர்வமான நடவடிக்கைகளை மேற்கொள்வாரென்ற நம்பிக்கை எனக்கிருக்கின்றது. எனவே, எமது கலைஞர்களை ஊக்குவிக்க ஆக்கபூர்வமான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென அவரிடம் நான் தாழ்மையாகக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Sir, please give me one more minute.

கலைஞர்களது வாழ்க்கை மிகவும் சோகத்துடன் கூடியதென்று பொதுவான ஒரு கருத்து இருக்கின்றது. அவர்கள் தங்களது திறமையினால் ஏனையவர்களை மகிழ்வித்தாலும், அவர்களின் வாழ்வாதார நிலை மிக அவலகரமானதாகவே உள்ளது. ஏழ்மையிலே துவண்டு, சொந்த வீடு வாசல்கூட இல்லாத ஒரு நிலைமையிலேயே அவர்கள் பலரின் வாழ்க்கை முடிவுக்கு வருகின்றது. இது கலை, கலாசாரங்களின் பேணலுக்குச் சாதகமான ஒரு நிலைமையல்ல! எனவே, தமிழ்க் கலைஞர்களையும் அரவணைத்து, ஏனைய கலைஞர்களுக்குக் கிடைக்கும் வாய்ப்புக்கள் அவர்களுக்கும் கிடைக்கும் வகையிலே ஆக்கபூர்வமான நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டும், முன்பு 'அத்தி பூத்தாற்போல்' ஆங்காங்கே ஒரு சில தமிழ்த் திரைப்படங்கள் இலங்கையிலே தயாரிக்கப்பட்டு வெளியிடப்பட்டன. ஆனால், அவை வந்த வேகத்திலே மறைந்து போயின என்பதை மிகவும் வேதனையுடன் குறிப்பிடவேண்டியுள்ளது. இந்த நிலைமை மாறவேண்டும். எமது நாட்டில் தயாரிக்கப்படும் தொலைக்காட்சி

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

நாடகங்களுக்குக் கை கொடுக்கவேண்டும். மேடை நாடகங்களுக்கு நாங்கள் உரம் சேர்க்கவேண்டும். மறைந்துவரும் மலையகக் கலை, கலாசாரங்களுக்குப் புத்துயிரளிக்க வேண்டும். எமது கலை, கலாசார விழுமியங்கள் பாதுகாக்கப்படும் வகையில் இயல், இசை, நாடகம் ஆகிய துறைகளை மேம்படுத்த அனைத்து நடவடிக்கைகளையும் மேற்கொள்ளவேண்டுமெனக் கேட்டு, நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[6.24p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Hon. Presiding Member, thank you for giving me this opportunity to speak on this Adjournment Motion. As a practicing Muslim, I have not gone to the theatre for a long period nor have I seen many dramas. However, I would like to explain why I speak on this Motion. As you know, today most of the cinemas in our country are closed; we do not come across many dramas today and people do not watch them. We have to find out the reason for this.

My argument is, today, almost in every house we see Dish TV. This Dish TV is ruining not only the chances of films being screened but also plays being staged in the theatres. The reason is, Rupavihini, ITN or any other local channel always wind up their programmes by about 10.00 or 11.00 in the night. But this particular Dish TV goes on for 24 hours. Between 6.00 p.m. and 10.00 p.m. - the time when children are supposed to do their studies and engage in their spiritual activities - today they are not studying or engaging in their spiritual activities and their eyes are glued to the Dish TV. This is how they ruin their lives. Today, our Rupavahini, ITN and the other local channels are showing cricket matches giving commentaries. There are so many companies which are advertising through these channels. But today what has happened to our local channels? Today, even I have Dish TV at home. Unfortunately, we are watching the cricket matches which are played in Sri Lanka through Dish TV. This is what is happening today. All these are illegal. The Government is not at all benefited by this.

Therefore, I request the Hon. Minister to look into this and sensor them. Films are shown through Dish TV throughout the day - all 24 hours. They are all rotten films which are not suitable for youngsters. The young generation is wasting their time by watching these films. They are not studying. Some children watch them even after midnight. Many problems have been created because of this Dish TV. Every religion has a culture; every caste has a culture. As Muslims, we have got so much of cultural events, but today, they are not practiced. Younger generation from all the religions are not at all interested in respecting their culture because of this rotten TV. Earlier, in Sri Lanka, we had good dramas and good films and people have been watching these. But those are not available today. Earlier, the general public after a long hard work, used to go to see a film for three hours which is a good rest for them. But, today, it is not there. That three hours, they spend on watching Dish TV or they are engaged in some other activity by which so many problems have cropped up.

I think to safeguard all these, our Hon. Minister must look into this Dish TV issue and sensor that; and bring that to the attention of the Government. By doing that, not only the film industry will develop and poor artistes will be benefitted, but also the culture of all religions will be saved. If you can control this, I think, in future, like our good old days, we can go back to a system of staging cultural shows. I do not think that we have any cultural shows today. There are no artistes who are prepared to take part in them because they are poorly paid.

So, these things must be taken into consideration. Especially the two factors, the religion and the culture must be maintained by helping the artistes. Then to save the future young generation, they should be encouraged to do their studies properly and not watch these bad films. The Dish TV must be brought under the control of the Ministry and a censorship must be imposed in order to save the people.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you.

එකල්හී වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2016 මාර්තු 08 දින සභා සම්මතිය අනුව, 2016 සැප්තැම්බර් මස 09 වන සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப.6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளு மன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2016 செப்ரெம்பர் 09, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 6.30 p.m., MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

Parliament adjourned accordingly until 10.30 a.m. on Friday, 09th September 2016 pursuant to the Resolution of Parliament of 08th March, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

246 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 246 - இல. 4
Volume 246 - No. 4

2016 සැප්තැම්බර් 09 වන සිකුරාදා
2016 செப்ரெம்பர் 09, வெள்ளிக்கிழமை
Friday, 09th September, 2016

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
මහජන බැංකුවෙහි ඩිජිටල්කරණයට අදාළ දෘඪාංග මිලදී ගැනීම

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය:
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී

පැරිස් ගිවිසුම අපරානුමත කිරීම

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
மக்கள் வங்கியின் டிஜிடல் திட்டத்துக்கான வன்பொருள் கொள்வனவு

தொழில் திணைக்களத் தொழில் அதிகாரிகளினது வேலைநிறுத்தம் :
தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சரினது கூற்று

மருத்துவம் (திருத்தம்) சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

பரிஸ் உடன்படிக்கை ஒப்புதலளித்தல்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Purchase of Hardware for Digitalization of People’s Bank

LABOUR OFFICERS’ STRIKE IN DEPARTMENT OF LABOUR:
Statement by State Minister of Labour and Trade Unions Relations

MEDICAL (AMENDMENT) BILL:
Read the First time

RATIFICATION OF THE PARIS AGREEMENT

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 සැප්තැම්බර් 09 වන සිකුරාදා
2016 செப்ரெம்பர் 09, வெள்ளிக்கிழமை
Friday, 09th September, 2016

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවීම සම්බන්ධයෙන් සාදන ලදුව 2016 ජූනි මස 29 දිනැති අංක 1973/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මම ඉදිරිපත් කරමි.

මෙම නියමය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2015 අංක 16 දරන විසර්ජන පනතේ 6(1) වැනි වගන්තිය යටතේ 2016.08.10 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම-2016 - [මුදල් අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වජිර අබේවර්ධන මහතා - පැමිණ නැත.

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)

Hon. Deputy Speaker, I present -

1. a petition received from Mr. A. Selasteenruban of No.525/8, Trincomalee Road, Batticaloa and
2. a petition received from Mr. M.C.A. Razeed of Kapurady Road, Kattankudi.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීගමුව, 3 කුරණ, මංගල පාර, අංක 30 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඊ.ජේ. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඩුලිප් විජේසේකර මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු තුලිප් විජේසේකර - තපාල්, තපාල් සේවෛකළ් මර්රුම් මුස්ලිම් සමය අලුවල්කළ් පිරති අමෛච්චර්)
(The Hon. Duleep Wijesekera - Deputy Minister of Post, Postal Services and Muslim Religious Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රාගම, තේවත්ත පාර, අංක 629/167 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ජී. ගුණදාස මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගෝනවල (බ.ප.), සපුගස්කන්ද පාර, අංක 612 දරන ස්ථානයෙහි පදිංචි එන්.ඒ. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මින්වලු මර්රුම් පුදුප්පික්කත්තක්ක සක්ති පිරති අමෛච්චර්)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) පානදුර, මහවිල ආදර්ශ මාවත, අංක 127සී දරන ස්ථානයෙහි පදිංචි ඩී.ආර්. දයාවංශ පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) දොඩන්ගොඩ, ගල්කැටමුල්ල, පහන්වත්ත II, අංක 238/24 දරන ස්ථානයෙහි පදිංචි ජේ. මුණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මතුගම, යටදොලවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.කේ. යසවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මතුගම, යටදොලවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.කේ. යසවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) මොරටුව, එගොඩ උයන, මෝදර පාර, අංක 282/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.එස්. ඊබ්‍රාහිම් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු එච්.ආර්. සාරතී තුෂ්මන්ත - නීති පිරති අමෛච්චරුම් පුත්තසාසන පිරති අමෛච්චරුම්)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිතුල්ගල, තැලිගම, තුංකිඳ, ගනේපල්ල පාර, අංක 27 දරන ස්ථානයෙහි පදිංචි බී.වී.සී.පී. සමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොතුවිල් - පී/19, පසරිවිවෙනායි, අකිහාරි පාර යන ලිපිනයෙහි පදිංචි පී. සබුරා උම්මා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වංචාවල, කළහෙ, ශ්‍රී ගුණරතන මාවත, පතිනාවත්ත යන ලිපිනයෙහි පදිංචි චන්ද්‍රසිරි රණධීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නාවලපිටිය, ගම්පොල පාර, අංක 38 දරන ස්ථානයෙහි පදිංචි ඩී.කේ. අළුත්ගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු එඩ්වඩ් ගුණසේකර මහතා - පැමිණ නැත.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනරාගල වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කරන ආර්.එම්.එම්. දිනූස අසංක චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බණ්ඩාරගම, අටුළුගම, අඹගහවත්ත, අංක 52/ඩී දරන ස්ථානයෙහි පදිංචි අබ්දුල් රසිදු ෆාසිමා රාලි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහියංගණ, බ/මහියංගණ ජාතික පාසලේ සේවය කරන සුදන්ත රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු රවීන්තිර සමවීර - තොළිල් මර්රුම් තොළිර්චඞ්ක උරවුකළ් ඉරාජාඞ්ක අමෛච්චර්)
(The Hon. Ravindra Samaraweera - State Minister of Labour and Trade Unions Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල්කිස්ස, ශාන්ත මේරි මාවත, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි රෂීඩ් කපූර් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.
සමර්ප්පික්කප්පට්ට මනුක්කළෙප් පොතුමනුක් කුழුවුක්කුච් චාට්ටක් කට්ටළෛයිටප්පට්ටදු.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 1-490/'16 - (2), ගරු කනක හේරත් මන්ත්‍රීතුමා.

ගරු කනක හේරත් මහතා
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරතු දිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළෙයිඩප්පට්ටදු.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 2-734/'16 - (1), ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරතු දිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළෙයිඩප්පට්ටදු.
Question ordered to stand down.

උතුරු මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය: ප්‍රගතිය
வடக்கு மத்திய அதிவேக நெடுஞ்சாலை நிர்மாணம் : முன்னேற்றம்
CONSTRUCTION OF NORTHERN CENTRAL EXPRESSWAY: PROGRESS

785/'16

3. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පසු ගිය රජය විසින් ආරම්භයේදී මහනුවර දක්වා ඉදිකිරීමට යෝජිතව තිබූ අධිවේගී මාර්ගය, පසුව උතුරු හා නැගෙනහිර දක්වා ව්‍යාප්ත කිරීමේ අරමුණින් "උතුරු මධ්‍යම අධිවේගී මාර්ගය" නමින් වැඩ ආරම්භ කළ බවත්;

(ii) 2015 මාර්තු මාසයේ දී වර්තමාන රජය එහි නම වෙනස් කර කඩවත කොස්හින්න ප්‍රදේශයෙන් වැඩ ආරම්භ කළ බවත්;

(iii) ගම්පහ දිස්ත්‍රික්කය හරහා එඬේරමුල්ල සිට මීරිගම, අඹේපුස්ස දක්වා ඉදිකිරීමට යෝජිත පළමු අදියර ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට සෘජුවම බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගයෙහි නව සැලසුම් හා ගමන් මාර්ගය පිළිබඳව අදාළ ප්‍රදේශවල පදිංචිකරුවන් දැනුවත් කර තිබේද;

(ii) මාර්ගය සඳහා අත්පත් කර ගත යුතු ඉඩම් හඳුනාගෙන ලකුණු කර තිබේද;

(iii) පදිංචි ඉඩම්, ව්‍යාපාරික ස්ථාන, කර්මාන්තශාලා, පොදු ස්ථාන සහ රජයේ ඉඩම් ආදී වශයෙන් වර්ගීකරණය කර ලේඛනගත කර තිබේද;

(iv) හිමිකම් පරීක්ෂා කිරීමේ අභියාචනා පැමිණිලි භාර ගැනීම හා පරීක්ෂා කිරීම් ආරම්භ කර තිබේද;

(v) තක්සේරු කිරීම් හා වන්දි ගෙවීම් ආරම්භ කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මාර්ගය ඉදිකිරීමේ වර්තමාන තත්ත්වය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்கத்தினால் ஆரம்பத்தில் கண்டி வரை நிர்மாணிக்க உத்தேசிக்கப்பட்டிருந்த அதிவேக நெடுஞ்சாலையை பின்னர் வடக்கு கிழக்கு வரை நீடிக்கும் நோக்கத்துடன், "வடக்கு மத்திய அதிவேக நெடுஞ்சாலை" என்ற பெயரில் வேலைகள் ஆரம்பிக்கப்பட்டதென்பதையும்;

(ii) 2015 மார்ச் மாதத்தில் தற்போதைய அரசாங்கம் அதன் பெயரை மாற்றி கடவத்த, கொஸ்ஹின்ன பிரதேசத்தில் இருந்து வேலைகளை ஆரம்பித்ததென்பதையும்;

(iii) கம்பஹா மாவட்டத்தினூடாக என்டேரமுல்ல வில் இருந்து மீரிகம அம்பேபுஸ்ஸ வரை நிர்மாணிக்க உத்தேசித்துள்ள முதலாம் கட்டம் கம்பஹா மாவட்ட மக்களுக்கு நேரடியான தாக்கத்தை ஏற்படுத்துகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இந்த வீதியின் புதிய திட்டம் மற்றும் செல்லும் வழி பற்றி சம்பந்தப்பட்ட பிரதேசத்தின் வதிவாளர்கள் விழிப்புணர்வூட்டப்பட்டுள் ளனரா;

(ii) வீதிக்காகச் சுவீகரிக்கப்பட வேண்டிய காணிகள் இனங்காணப்பட்டு அடையாளமிடப்பட்டுள் ளனவா;

(iii) குடியமர்ந்துள்ள காணிகள், தொழில்முயற்சி நிலையங்கள், தொழிற்சாலைகள், பொது இடங்கள் மற்றும் அரசாங்க காணிகள் என்ற வகையில் வகைப்படுத்தி ஆவணப்படுத்தப்பட் டுள்ளனவா;

(iv) உரித்துக்களை பரிசீலனை செய்வதற்கான மேன்முறையீட்டு முறையீடுகளை ஏற்றுக் கொள்ளலும் பரிசீலனை செய்தலும் ஆரம்பிக்கப் பட்டுள்ளதா;

(v) விலைமதிப்பீடு செய்தலும் நட்டஈடு செலுத்து தலும் ஆரம்பிக்கப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) வீதியை நிர்மாணிப்பதிலான நடப்பு நிலைமை யாதென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

asked the Minister of Higher Education and Highways:

(a) Is he aware that-

(i) the work of the expressway originally proposed to be constructed up to Kandy by the former Government was later commenced under the name "Northern Central Expressway" with the aim of extending it up to the North and the East;

(ii) the present Government changed its name and commenced the work at Koshinna, Kadawatha, in March 2015; and

(iii) phase one of this road proposed to be constructed through Gampaha District from Enderamulla to Mirigama, Ambepussa, directly affects the people of Gampaha District?

(b) Will he inform this House-

(i) whether the residents of the relevant areas have been made aware of the new plans and the route of this road;

(ii) whether the lands to be acquired for the expressway have been identified and marked;

(iii) whether those lands have been documented after classifying as residential lands, business premises, factories, public places, state land et cetera;

(iv) whether accepting complaints of appeals on inspection of titles and conducting inspections have been started; and

(v) whether valuation and payment of compensation have been commenced?

(c) Will he also inform this House of the current situation with regard to the construction of this expressway?

(d) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) පසු ගිය රජය විසින් උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ලෙස නම් කළ ව්‍යාපෘතිය යටතේ, පිටත වටරවුම් මාර්ගයේ යෝජිතව පැවති එඬේරමුල්ල අන්තර් හුවමාරු මධ්‍යස්ථානයේ සිට ගම්පහ, මීරිගම, කුරුණෑගල හරහා දඹුල්ල දක්වාද, පොතුහැර සිට මහනුවර දක්වාද, අධිවේගී මාර්ග පථයක් සඳහා ශක්‍යතා අධ්‍යයන කටයුතු කෙරෙමින් පැවතිණ. පසුව, නව රජය යටතේ ඉහත ව්‍යාපෘතිය මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ලෙස නම් කළ අතර, සිදු කෙරෙමින් පැවතුන ශක්‍යතා අධ්‍යයන කටයුතු නැවත විමර්ශනය කිරීමක් සිදු කරන ලදී. එහිදී සාමාජයීය හා පාරිසරික බලපෑම් හැකිතාක් අවම වන අයුරින්ද, පිටත වටරවුම් මාර්ගයේ කඩවත අන්තර් හුවමාරු මධ්‍යස්ථානයේ සිට ගම්පහ, මීරිගම, කුරුණෑගල හරහා දඹුල්ල දක්වාද, පොතුහැර සිට ගලගෙදර දක්වාද මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී.

(ii) නව රජය යටතේ, 2015 ජූලි මාසයේ පිටත වටරවුම් මාර්ගයේ කඩවත අන්තර් හුවමාරුව ප්‍රදේශයේ සිට ඉහත (අ) (i) යටතේ සඳහන් කරන ලද මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සමාරම්භ කරන ලදී.

(iii) මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු අදියර ලෙස කඩවත සිට ගම්පහ හරහා මීරිගම දක්වා වන කොටස සමාජයීය හා පාරිසරික බලපෑම් හැකිතාක් අවම වන අයුරින්ද, සම්මත ඉංජිනේරු නිර්ණායකවලට අනුකූල වන අයුරින්ද සැලසුම් කර ඇත. එමෙන්ම මෙම යෝජිත මාර්ගයද ගම්පහ දිස්ත්‍රික්කය ආවරණය වන අයුරින් සැලසුම් කර ඇත.

(ආ) (i) මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යටතේ මහ ජනතාව දැනුවත් කිරීමේ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සෘජු අධීක්ෂණය යටතේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේද පූර්ණ සහයෝගය සහිතව සිදු කරන ලදී.

(ii) ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතින අතර, මාර්ගය සඳහා අත්පත් කරගත යුතු ඉඩම් හඳුනාගෙන සලකුණු කර තිබේ.

(iii) ව්‍යාපෘතිය සඳහා ප්‍රතිස්ථාපන සැලසුමක් සකස් කර ඇති අතර, එහිදී අත්පත් කරගැනීමට නියමිත සියලු ඉඩම් වර්ගීකරණය කොට ලේඛනගත කර ඇත.

(iv) ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව, 38 (අ) ගැසට් නිවේදනය නිකුත් කර අවසන් වූ බිම් කොටස් සඳහා හිමිකම් පරීක්ෂා කිරීමේ අභියාචනා පැමිණිලි භාරගැනීම සහ පරීක්ෂා කිරීම් ආරම්භ කර තිබේ.

(v) ඉහත (අ) (iv) හි සඳහන් කළ පරිදි 38 (අ) ගැසට් නිවේදනය නිකුත් කර අවසන් වූ බිම් කොටස් සඳහා තක්සේරු කිරීමේ කටයුතුද ආරම්භ කර පවතින අතර, අභියාචනා පැමිණිලි භාරගැනීම හා පරීක්ෂා කිරීම අවසන් වූ පසුව හා 17 නිවේදනය නිකුත් කිරීමෙන් අනතුරුව වන්දි ගෙවීම ආරම්භ කිරීමට නියමිතය.

(ඇ) (i) කොටස:

කඩවත - මීරිගම

මහජන චීන සමූහාණ්ඩුවේ ණය (Exim Bank Loan) යටතේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇත. ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් වී ඇත. (ණය ගිවිසුම අනුමත වන තුරු කොන්ත්‍රාත්කරු විසින් තම මූලධනය යොදවා මූලික ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.)

(ii) කොටස:

මීරිගම - කුරුණෑගල

ඉදිකිරීම් කටයුතු සඳහා දේශීය කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.

(iii) කොටස:

පොතුහැර - ගලගෙදර

ජපාන තානාපති කාර්යාලයේ සහයෝගය මත ජපාන Tokyo-Mitsubishi බැංකුව මඟින් පිරිනැමීමට යෝජිත ණය මුදලක් යටතේ මධ්‍යම අධිවේගී මාර්ගයේ III වන කොටස ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.

(iv) කොටස:

කුරුණෑගල - දඹුල්ල

රජරට නවෝදය - පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන යටතේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා මූලික කටයුතු සිදුවෙමින් පවතී. මේ සඳහා ණය මුදල් ලබාදීමට මහජන චීන සමූහාණ්ඩුවේ Exim බැංකුව කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර, ඒ සම්බන්ධව අවබෝධතා ගිවිසුමක්ද අත්සන් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වෙන කොට ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම, වඳුරව සිට විල්වත්ත දක්වා කොටසක් - අත් පත් කර ගත්ත කුඹුරු ඉඩම්වල- පස් පුරවා, සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතිනවා. මහා මාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් - ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් - මේ ගම්වලට ඇවිල්ලා පොරොන්දු වෙලා තිබෙනවා, රජයේ තක්සේරුව අනුව, පවතින වටිනාකම වාගේ පස් ගුණයක් මුදල් මේ ඉඩම්වලට ගෙවනවා කියලා. නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගිහිල්ලා බැලුවාම, රුපියල් 35,000ක්, රුපියල් 40,000ක් වාගේ ගණනක ඉඳලා, උපරිම වශයෙන් රුපියල් 75,000ක්, රුපියල් 80,000ක් වාගේ ගණනක් තමයි ගොඩ ඉඩම්වලට ලැබෙන තක්සේරුව වශයෙන් තිබෙන්නේ. ඒ නිසා අද මිනිස්සු පාරට ඇවිල්ලා, කළු කොඩි ඇදලා උද්ඝෝෂණ කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඔබතුමා මේ ගැන දැනුවත්වෙලා තිබෙනවාද? ඒ වාගේම මේ තක්සේරු වටිනාකම වැඩි කරන්නට හෝ මෙතැනින් ඉදිරියට යන්නට ඔබතුමාගේ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉඩම් තක්සේරු කරන්නේ අපි නොවෙයි. ඒ සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව තමයි අපි ඒ ගෙවීම් කරන්නේ. මා ඔබතුමාට කියන්න කැමැතියි, මේ පාර පටන් ගන්නට කලින් විශේෂයෙන්ම කුඹුරු ඉඩම් පර්වසයක් සඳහා තක්සේරුව තිබුණේ රුපියල් 4,500යි. දැන් අපි කුඹුරු ඉඩම් පර්වසයක් සඳහා රුපියල් 11,000ක් ගෙවනවා. මහා මාර්ග දෙපාර්තමේන්තුව මේක තක්සේරු කරන්නේ නැහැ. Valuation Department එකේ තක්සේරුව අනුව අපි ගෙවනවා. ඒ අය තක්සේරුවට අකමැති නම් අභියාචනා කරන්නත් අවස්ථාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ මේ සඳහා සහයෝගය දෙන්න කියලායි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
අපි සහයෝගය දෙනවා ගරු ඇමතිතුමා. ඒ වාගේම දිසාපතිතුමා දැනුම් දෙනවා, රුපියල් 5,000 -7,500ක් පමණයි කුඹුරු ඉඩම් සඳහා ගෙවන්නේ කියලා. නමුත් විරෝධතා මධ්‍යයේ දැන් ඉදි කිරීම් කරගෙන යනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"කුඹුරු ඉඩම් සඳහා" කියලා කියන්නේ, කුඹුරු ඉඩම් පර්වසයක් සඳහාද?

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔව්, පර්වසයක් සඳහා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, ඒක සම්පූර්ණයෙන් වැරදියි. මම කියන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දෙන තොරතුරු. කුඹුරු ඉඩම් පර්වස් එකක් සඳහා රුපියල් 11,000ක් ගෙවනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ වාගේම මේ ව්‍යාපෘතියේ byroad එකක් සඳහන් කරලා තිබෙනවා. වරකාපොළ සිට නුවර පාර සම්බන්ධ වන කොටසේ මීරිගම විල්වත්තේ ඉඳලා මීරිගම නගරයට. මම හිතන විධියට මීරිගම ආසනයේ පමණක් බිම් කට්ටි 570ක් නම් කරලා තිබෙනවා මේ byroad එක සඳහා. නමුත් දැන් ප්‍රචාරයක් යනවා, byroad එක ඉදි වෙන්නේ නැහැ කියලා. තක්සේරුව බලන්න ගියාම මේ කොටස තක්සේරු කරලාත් නැහැ. ඒ නිසා මෙම byroad එක අදාළ වන පුද්ගලයන්ට ඉදිකිරීමක්වත්, වගාවක්වත් කරගන්න කිසිදු ආකාරයක හැකියාවක් නැහැ. ගරු ඇමතිතුමනි, මේ ගැන ඔබතුමා දැනුවත්ද? එම අතුරු මාර්ගය ඉදි කරනවාද, නැද්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, දැනට මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කරන්න තීරණය කර තිබෙනවා. හැබැයි, වෙනසක් වෙනවා නම් මම ඔබතුමාට දන්වන්නම්. අපි සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය විසඳා ගනිමු.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

හොරණ විවිධ සේවා සමුපකාර සමිතිය: දූෂණ හා වංචාකාරී ක්‍රියාකාරකම්

ஹொரண பலநோக்குக் கூட்டுறவுச் சங்கம் : ஊழல் மற்றும் மோசடிகள்

HORANA MULTI PURPOSE CORPORATIVE SOCIETY: CORRUPT AND FRAUDULENT ACTIVITIES

789/'16

4. ගරු විදුර වික්‍රමනායක මහතා
(මාණ්පුමිකු විදුර වික්කිරමනායක්ක)
(The Hon. Vidura Wickramanayaka)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හොරණ විවිධ සේවා සමුපකාර සමිතිය සන්තකව තිබූ රන් භාණ්ඩ, වෙන්දේසි කිරීමකින් තොරව මුළු තොගය එක් ආයතනයකට අළෙවි කර ඇති බවත්;

(ii) ගයාන් තුෂාර නමැති මියගිය පුද්ගලයෙකුගේ අත්සන යොදා චෙක්පත් මාරු කිරීම සම්බන්ධයෙන් පොලිස් වංචා විමර්ශන අංශයට පැමිණිලි කර පරීක්ෂණයක් කිරීමට ගන්නා ලද තීරණය මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බවත්;

(iii) සහල්, කරවල වැනි ද්‍රව්‍යයන් මිලදී ගැනීමේදී කොමිස් ගැනීම, මූණගම ග්‍රාමීය බැංකු ශාඛාව සඳහා බාල සීසීටීවී කැමරා පද්ධතියක් අධික මිලකට මිලදී ගැනීම සහ පෞද්ගලික ආයතනයකින් සමිතියට ලැබෙන මුදලින්, 2%ක මුදලක් ලබා ගැනීම වැනි දූෂණ ක්‍රියා සභාපතිතුමා ඇතුළු කිහිපදෙනෙකු විසින් සිදු කරමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සමුපකාර සමිතියේ සභාපති ඇතුළු කිහිපදෙනෙකු විසින් සිදු කරමින් පවතින මෙවැනි දූෂණ හා වංචාකාරී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කෛත්තොෂිල් මර්රුම් වාණිප අලුවල්කළ් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) ஹொரண பலநோக்குக் கூட்டுறவுச் சங்கத்தின் உடைமையில் இருந்த தங்க நகைகள் ஏல விற்பனையின்றி முழுத் தொகையும் ஒரே நிறுவனத்துக்கு விற்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) கயான் துஷார எனும் மரணித்த ஆளொருவரின் கையொப்பத்தை இட்டு காசோலைகள் மாற்றப்பட்டமை தொடர்பில் பொலிஸ் மோசடிப் புலனாய்வுப் பிரிவுக்கு முறைப்பாடு செய்து விசாரணை மேற்கொள்வதற்காக எடுக்கப்பட்ட தீர்மானம் இதுவரை செயற்படுத்தப்படவில்லை என்பதையும்;

(iii) அரிசி, கருவாடு போன்ற பொருட்களை கொள்வனவு செய்கையில் தரகு பெற்றுக் கொள்ளல், மூனகம கிராமிய வங்கிக் கிளைக்கு தரம் குறைந்த சிசிரிவி கெமராத் தொகுதியை அதிக விலைக்கு கொள்வனவு செய்தல் மற்றும் தனியார் நிறுவனமொன்றிலிருந்து சங்கத்துக்கு கிடைக்கும் பணத்தில் 2% தொகையைப் பெற்றுக்கொள்ளல் போன்ற ஊழல் செயற் பாடுகள் தலைவர் உள்ளிட்ட சிலரினால் மேற்கொள்ளப்பட்டு வருகின்றதென்பதையும்;

அவர் அறிவரா?

(ஆ) கூட்டுறவுச் சங்கத்தின் தலைவர் உள்ளிட்ட சிலரினால் மேற்கொள்ளப்பட்டு வரும் இவ்வாறான ஊழல் மற்றும் மோசடிகள் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Is he aware-

(i) that the jewellery in the possession of the Multi Purpose Corporative Society, Horana has been sold to one institution as a complete stock without conducting an auction;

(ii) of the fact that the decision taken to conduct an investigation after complaining to the Police Fraud Investigation Division in relation to a cheque transaction which had been done by utilizing the signature of a deceased person by the name of Gayan Thushara has not been hitherto implemented; and

(iii) that fraudulent activities such as obtaining commissions when purchasing rice and dried fish, obtaining a substandard CCTV camera system at a high cost for the Rural bank, Moonagama Branch, and obtaining a 2 per cent commission out of the donations granted by a private institution to the society are being committed by several individuals including the Chairman?

(b) Will he inform this house of the measure that will be taken in relation to this type of corrupt and fraudulent activities which are being committed by several persons including the Chairman of the corporative society?

(c) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

(අ) (i) ஹொரண பலநோக்குக் கூட்டுறவுச் சங்கத்தின் உடைமையில் இருந்த தங்க நகைகள் ஏலத்தில் விற்பனை செய்யப்பட்டன. ஏலத்தில் விற்கமுடியாத நகைகள் சங்கத்தின் பணிப்பாளர் சபையினால் எடுக்கப்பட்ட தீர்மானத்தின் பிரகாரம் ஆகக்கூடிய விலையைச் சமர்ப்பித்த தனிநபர் ஒருவருக்கு விற்கப்பட்டது.

(ii) தீர்மானம் செயற்படுத்தப்பட்டுள்ளது. ஹொரண பொலிஸார் ஹொரண நீதிவான் நீதிமன்றத்தில்

இந்த விடயம் தொடர்பாக 99742ஆம் இலக்க வழக்கொன்றினைத் தாக்கல் செய்துள்ளனர்.

(iii) அரிசி, கருவாடு போன்ற பொருட்களைக் கொள்வனவு செய்கையில் தரகு பெற்றுக்கொள்ளுதல் சம்பந்தமாகத் தலைவர் மற்றும் தனிப்பட்ட சிலரின் ஊழல் நடவடிக்கைகள் தொடர்பாக இதுவரை முறைப்பாடுகள் கிடைக்கவில்லை. பொருட்கள் கொள்வனவு செய்யும்போது அவற்றைக் கொள்வனவு செய்வதற்கான நடைமுறை விதிகள் பின்பற்றப்பட்டதாகச் சொல்லப்படுகின்றது.

(ஆ) இந்த விடயம் அதிகாரம் மாற்றப்பட்ட விடயம் ஆகையால் மேல் மாகாண கூட்டுறவு ஆணையாளர் இவ்விடயம் தொடர்பாகத் தற்போது விசாரணைகளை மேற்கொண்டு வருகிறார். இதனை மேல் மாகாண சபையின் அதிகாரத்திற்குட்பட்ட ஆணையாளரே செய்து வருகின்றார்.

(இ) இது எழ இடமில்லை.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සමුපකාරය කියන්නේ නිදාගෙන සිටින යෝධයෙක්. සමුපකාර ව්‍යාපාරය අපට නැඟිටුවන්න පුළුවන් නම්, ලංකාවේ ආර්ථිකයට එයින් විශාල දායකත්වයක් ලබා ගන්නට පුළුවන්. දේශපාලනඥයන්ගේ සහ නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියා නිසා මේ සමුපකාර ව්‍යාපාරය දිනෙන් දින කඩාගෙන වැටෙනවා. ගරු ඇමතිතුමනි, මීට අවුරුදු කිහිපයකට පෙර හොරණ විවිධ සේවා සමුපකාර සමිතිය ලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය වෙලා තිබුණා. වර්තමාන කණ්ඩායම දෙවන වතාවටත් දැන් ඒ කටයුතු කරගෙන යනවා. ඒ විධියට කටයුතු කරගෙන යද්දී තමයි මේ අකටයුතුකම් අපි දැක්කේ. ගරු ඇමතිතුමනි, රන් භාණ්ඩ වෙන්දේසියකදී පළමු දිනයෙන් පසුව දින 14කට පසුව තමයි නැවත වතාවක් එම වෙන්දේසිය කළ යුත්තේ කියා සාමාන්‍ය නීතියක් තිබෙනවා. එසේ කර තිබේද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු මන්ත්‍රීතුමනි, මේ සමුපකාර පාලනය කරන්නේ පළාත් සභාව මඟිනුයි. [බාධා කිරීමක්] මොකද, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව මේ කටයුතු පිළිබඳව අපේ අමාත්‍යාංශයට කිසිදු සම්බන්ධයක් නැහැ. අදාළ කොමසාරිස්තුමා සමඟ තමයි ඒ සම්බන්ධව ගනු-දෙනු කරන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මම line Minister නිසා ඔබතුමා අහපු ප්‍රශ්නය ගැන මම අමාත්‍යාංශයෙන් හා පළාත් සභාවෙන් අහලායි ඒ උත්තරය ලබා දුන්නේ. මම හිතන්නේ මේ කාරණය සම්බන්ධව, පළාත් සභාවේ සමුපකාර ඇමතිවරයාත් එක්ක ඔබතුමා කථා කරලා විසඳුමක් ගත්තොත් තමයි හොඳ කියලා. ඇත්තටම මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරයාට මෙතැන කිසි දෙයක් කරන්න නැහැ. ඒක වැරදියි. ඔබතුමා කියන එක ඇත්ත. මම පිළිගන්නවා. සමුපකාර කීපයක ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. එවැනි ප්‍රශ්න ඇති වන කොට අපි කරන්නේ, අදාළ පළාත් සභාවේ සමුපකාර කොමසාරිස්තුමාට ඉදිරිපත් කරනවා, "මේක ගැන action ගන්න" කියලා. ඒවා සම්බන්ධව action ගන්න අපට කිසිම බලයක් නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ඔබතුමාට බැරිද, පාර්ලිමේන්තුවේදී මේ ප්‍රශ්න පැන නැඟුණා කියලා පළාත් සභාවේ ඒ අදාළ ගරු අමාත්‍යවරයාගෙන් මේ පිළිබඳව විමසීමක් කරන්න?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ඔබතුමා කියනවා නම්, අනිවාර්යෙන්ම ඒ විමසීම කරන්න පුළුවන්. අපි පළාත් සභා අමාත්‍යාංශයට ප්‍රශ්නය යවලායි මේ තොරතුරු ඔක්කෝම ගත්තේ. මේ දුන්නු උත්තරය ඔබතුමා පිළිගන්නේ නැත්නම්, අප දෙදෙනා වෙනම සාකච්ඡා කරලා, ඒ අදාළ ඇමතිවරයා සමඟ, එහෙම නැත්නම් ලේකම්තුමාව හෝ කොමසාරිස්තුමාව ගෙන්වලා අපි කථා කරමු.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන තවදුරටත් කථා කිරීමෙන් ඵලක් නැති බවයි මට තේරෙන්නේ. ඒ නිසා මගේ ඉතුරු අතුරු ප්‍රශ්න අහන්නෙත් නැහැ. මම ඇමතිතුමාත් එක්ක පෞද්ගලිකව කථා කරලා බලන්නම්, මේකට මොකක්ද ගන්න පුළුවන් පියවර කියලා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ ආයතන පිළිබඳව සහ මූල්‍ය පාලනය පිළිබඳව සම්පූර්ණ වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ඒ ගැන අමතක නොකර, ගරු අමාත්‍යවරුන් උත්තර දීලා ඒවා පිළිබඳව සොයා බැලීමක් කළ යුතුයි. අන්න ඒ පිළිබඳව මම ඔබතුමාට සිහිපත් කරනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කියන්න ඕනෑ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව ඒ බලතල මධ්‍යම ආණ්ඩුවට නැහැ. පළාත් සභාවට ඒ බලය දීලායි තිබෙන්නේ. ඒකයි. හොඳයි, අපි සාකච්ඡා කරලා ඒක විසඳමු.

කළුතර, නාගොඩ - නැබඩ ප්‍රධාන මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය : වන්දි

களுத்துறை, நாகொட - நேபட பிரதான வீதி அபிவிருத்திக் கருத்திட்டம் :இழப்பீடு

KALUTARA , NAGODA - NABADA MAIN ROAD DEVELOPMENT PROJECT: COMPENSATION

797/'16

6. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
The Hon. (Dr) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර, නාගොඩ - නැබඩ ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) එම මාර්ගය පළල් කිරීමට අපේක්ෂිත ප්‍රමාණය කොපමණද;

(iii) එම මාර්ගයේ, කටුකුරුන්ද - නාගොඩ කොටස සඳහා දේපළ හානි වූවන්ට වන්දි ගෙවා තිබේද;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iv) එසේ නම්, වන්දි ලැබුවන්ගේ නම් සහ ගෙවූ වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම මාර්ගයේ, නාගොඩ - නැබඩ කොටසේ, බෝම්බුවල මංකඩ ප්‍රදේශය පළල් කිරීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(vi) එහිදී හානිවන නිශ්චල හා චංචල දේපළවලට වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(vii) එසේ නම්, එම වන්දි ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை, நாகொட - நேபட பிரதான வீதியை அபிவிருத்தி செய்கின்ற கருத்திட்டத்துக்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) அந்த வீதியை விஸ்தரிக்க எதிர்பார்த்துள்ள அளவு எவ்வளவு என்பதையும்;

(iii) அந்த வீதியின் கட்டுகுருந்த - நாகொட பகுதிக்காக சொத்துக்கள் சேதமடைந்தவர் களுக்கு இழப்பீடு செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், இழப்பீடுகளைப் பெற்றவர்களின் பெயர்கள் மற்றும் செலுத்திய இழப்பீட்டுத் தொகை ஆகியன வெவ்வேறாக யாவை என்பதையும்;

(v) அந்த வீதியின் நாகொட - நேபட பகுதியில், போம்புவல மங்கட பகுதியை விஸ்தரித்தல் தாமதமடைவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vi) அதன்போது சேதமடையும் அசையும் மற்றும் அசையாத சொத்துக்களுக்கு இழப்பீடு வழங்கப்படுமா என்பதையும்

(vii) ஆமெனில், அந்த இழப்பீடுத் தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) the amount allocated for the project to develop the Kalutara, Nagoda - Neboda main road;

(ii) the length of the section of that road expected to be widened;

(iii) whether compensation has been paid to those whose properties were damaged, with respect to Katukurunda - Nagoda section of that road;

(iv) if so, of the names of the recipients of compensation and the amounts paid, separately;

(v) the reasons for the delay in widening the Bombuwala Mankada area on the Nagoda - Neboda section of that road;

(vi) whether compensation would be paid for the movable and immovable property damaged in the process; and

(vii) if so, the amount of such compensation?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙහි සඳහන් කළුතර, නාගොඩ - නැබඩ මාර්ගය ව්‍යාපෘති දෙකක් යටතේ ක්‍රියාත්මක කර ඇත. එනම්,

1. කටුකුරුන්ද - නාගොඩ මාර්ග ව්‍යාපෘතිය
2. නාගොඩ - නැබඩ මාර්ග ව්‍යාපෘතිය

(ii)

කටුකුරුන්ද - නාගොඩ මාර්ග ව්‍යාපෘතිය	නාගොඩ - නැබඩ මාර්ග ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල් - රු: 212,533,121.95 (රු: මිලියන 212 යි, දශම 5 යි.)	ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල් - රු: 1,506,019,417.25 (රු: මිලියන 1,506 යි.)

(iii) වන්දි ගෙවා ඇත.

කටුකුරුන්ද - නාගොඩ මාර්ග ව්‍යාපෘතිය	නාගොඩ - නැබඩ මාර්ග ව්‍යාපෘතිය
මාර්ගයේ සම්පූර්ණ පළල මීටර් 12 - 16 අතර පවතී.	මාර්ගයේ සම්පූර්ණ පළල මීටර් 10.6 කි.

(iv) ගෙවීම් විස්තර ඇමුණුමේ දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(v) නාගොඩ - නැබඩ මාර්ගය ඉදි කිරීමේදී මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වන ඉඩ කඩ ගනු ලබන්නේ දෙපස ඉඩම් හිමියන්ගේ එකඟතාවෙනි. (වන්දි ගෙවීමකින් තොරව) එම මාර්ගයේ අනෙක් කොටස පළල් කරන ලද ප්‍රමාණයටම මංකඩ ප්‍රදේශයද අදාළ ඉඩම් හිමියන්ගේ එකඟතා මත ඉඩම් ලබා ගෙන පළල් කිරීමට ව්‍යාපෘති සැලසුම්වල යෝජිතව තිබුණි. ඒ සඳහා මාර්ග දෙපස ඉඩ කඩ ලබා ගැනීමට දෙපස කඩ හිමියන් දැනුවත් කිරීමෙන් අනතුරුව සාකච්ඡා වාර කිහිපයක් පැවැත්වූ අතර, කඩ කාමරවල පාරට අසුවන කොටස් කඩා ඉවත් කර ගැනීමට එකඟවන්නේ නම්, එම කඩ කාමරවල ඉතිරි වන ඉදිරිපස කොටස අවශ්‍ය ආකාරයට ප්‍රතිසංස්කරණය කරදීමටද ව්‍යාපෘතිය මඟින් එකඟතාව පළ කරන ලදී. එහෙත්, දෙපස කඩ හිමියන් කිහිපදෙනෙක් ඉඩ කඩ ලබාදීමට දැඩි ලෙස විරෝධතාව දැක්වූ බැවින්, මෙම ව්‍යාපෘතිය

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මහින් මෙම ස්ථානයේ මාර්ගය දැනට තිබෙන පළලට කාපට් අතුරා මේ වන විට වැඩ නිම කර ඇත.

(vi) මෙම නාගොඩ - නැබඩ මාර්ගය ඉඩම් හිමියන්ගේ එකඟතාව මත පළල් කිරීමට යෝජනා කළ ව්‍යාපෘතියක් බැවින්, වන්දි ගෙවීමක් සිදුවී නැත.

(vii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

කටුකුරුන්ද, නාගොඩ කොටසේ වන්දි ගෙවලා තිබෙනවා. නමුත් නාගොඩ - නැබඩ කොටසේ යම් යම් ස්ථානවල වන්දි ගෙවලා නැහැ. මම මේ සාකච්ඡා කරන බෝඹුවල මංකඩ නගරය ආශ්‍රිතව පුංචි කඩ 25ක් විතර තිබෙනවා. පාර පළල් කරන්න, ඒ කඩ ටික ඉවත් කර ගන්න බැහැ. නමුත්, මේ ව්‍යාපෘති දෙකට ණය අරගෙන තිබෙන්නේ ක්‍රම දෙකකට නිසා නාගොඩ - නැබඩ ව්‍යාපෘතියට වන්දි ගෙවන්න අමාරුයි කියලා තමයි කියන්නේ. නමුත්, දේපළ හානි වෙනකොට කාටත් වන්දි ගෙවීම තමයි සාධාරණ ප්‍රතිපත්තිය වන්නේ. එම නිසා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඒ ජනතාවට සාධාරණ වන්දි මුදලක් ගෙවලා මේ මාර්ගය නිසි පරිදි පුළුල් කරන්න ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපේ ප්‍රමාදයක් නැහැ. සමහර අය වන්දි ප්‍රමාණවත් නැහැ කියලා ඇවිටිලි කරනවා. ඉතින්, ඒ අය LARC and Super LARC මණ්ඩලවලට අභියාචනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසායි ප්‍රමාදය තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

නැහැ. මම ඔබතුමාත් එක්කත් අමාත්‍යාංශයේදී කලින් මේ ගැන සාකච්ඡා කළා. මේ ප්‍රශ්නයේ තිබෙන්නේ නාගොඩ-නැබඩ ප්‍රධාන මාර්ගයේ බෝඹුවල කොටසේ කඩ ඉවත් කිරීම සඳහා ඔවුන්ට වන්දි ලබා දීමට මුදල් වෙන් කර නැති නිසා, කඩ ඉවත් වෙන්නෙත් නැහැ. පාර පළල් වෙන්නෙත් නැහැ. කඩ 25යි තිබෙන්නේ. සාමාන්‍යයෙන්, රුපියල් මිලියන 25ක 30ක වන්දියක් තමයි මේ අයට දෙන්න ඕනෑ වන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ ගොල්ලන් කැමැතිද කඩ ඉවත් කරන්න?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

දේපළ තක්සේරු කරලා වන්දි මුදල් ලබා දීමේ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. තවම දේපළ තක්සේරු කරලත් නැහැ. මොකද, පසු ගිය ආණ්ඩුවේ මහාමාර්ග නියෝජ්‍ය ඇමතිවරයා ඔබතුමාට කලින් ඔය ප්‍රදේශයේම හිටියා. මේ ප්‍රශ්නය ඔහුගේ කාලයේ ඉඳලාම තිබෙනවා. ජනතාවට කියලා තිබෙන්නේ-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම මේ ගැන හොයලා බලන්නම්. ගරු මන්ත්‍රීතුමනි, දේපළවලට වන්දි ලබා දීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් නැහැ. ඒ සඳහා මුදල් තිබෙනවා. නමුත්, මේ කොටස අත් හැරියේ ඇයි කියලා මම හොයලා බලන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ වාගේම මම යෝජනා කරන්න කැමැතියි-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

නැහැ. ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදි කිරීමේදී ඉංජිනේරුවන්ගේ උපදෙස්වලට පටහැනිව සමහර ස්ථානවල ප්‍රවේශයන් ඉදි කරලා තිබෙනවා. පළමුවන ප්‍රවේශ මාර්ගය කිලෝමීටර 6න් කහතුඩුවේත්, දෙවන එක කිලෝමීටර 14න් ගැලනිගමත්, තුන්වන එක කිලෝමීටර 34න් දොඩන්ගොඩත් තමයි ඉදි කර තිබෙන්නේ. නමුත්, මුල් සැලැස්මේ හැටියට කිලෝමීටර 28දී බෝඹුවල ප්‍රදේශයේදී තමයි exit එක තිබුණේ. හැබැයි, ඒ වෙලාවේ ඉංජිනේරු උපදෙස් වෙනුවට පැවැති දේශපාලන අධිකාරියේ බලපෑම් නිසා එය දොඩන්ගොඩට අරගෙන ගියා. Exit එක බෝඹුවල දැම්මා නම්, එතැන් සිට නාගොඩ මහ රෝහලට කිලෝමීටර 3යි; ගාලු පාරට කිලෝමීටර 5යි. නමුත්, දොඩන්ගොඩ ඉඳලා නාගොඩ මහ රෝහලට කිලෝමීටර 10ක් තිබෙනවා; ගාලු පාරට කිලෝමීටර 12ක් තිබෙනවා . අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා දක්ෂිණ අධිවේගි මාර්ගයේදී accident වුණාම එතුමා රෝහල්ගත කරන්නත් ඒ දීර්ඝ මාර්ගය පසු කරගෙන යන්න සිද්ධ වුණා.

ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමාට යෝජනා කරන්න කැමැතියි, කලින් සැලැස්මෙහි තිබුණු විධියට බෝඹුවලට නව ප්‍රවේශ මාර්ගයක් ලබා දෙන්න කියා. එහෙම වුණොත්, අර වන්දි ප්‍රශ්නයත් බේරුම් කරගන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාගේ තර්කය පිළිගන්නවා. පසු ගිය ආණ්ඩුව කාලයේ ඒ exit එක දේශපාලන හේතූන් මත වෙනස් කරපු බව මම පිළිගන්නවා. අපි ඔබතුමාගේ යෝජනාව ගැන දැනටමත් සලකා බලමින් යනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාගේ අවසරය ඇතිව මා හට කාරණයක් කියන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමනි, ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න හදනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු අමාත්‍යතුමාගේ අවසර ඇතිව මා ඉතාම කෙටියෙන් ඒ කාරණය කියන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කමක් නැහැ. අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි, දැනට බණ්ඩාරගමත් දොඩන්ගොඩත් අතර පැල්පොළ අලුත් exit එකක් හදනවා. මේ දවස්වල ඒ සඳහා වන මැනුම් කටයුතු සිද්ධ වෙනවා. ඒ නිසා ඔබතුමා කී ප්‍රශ්නය අවම වන බව ඔබතුමාට කියන්න කැමැතියි, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි.

ඌව පළාත් සභා මුදල්: පෞද්ගලික පදනමක් සඳහා යොදා ගැනීම

ஊவா மாகாண சபையின் நிதி : தனிப்பட்ட மன்றமொன்றுக்குப் பயன்படுத்தியமை
FUNDS OF UVA PROVINCIAL COUNCIL: UTILIZATION FOR PRIVATE FOUNDATION

810/'16

9. ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ඌව පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයාගේ නමින් ක්‍රියාත්මක වන පෞද්ගලික පදනමක් සඳහා පළාත් සභා මුදල් යොදවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පළාතේ ජනතාව සතු මුදල් තම පෞද්ගලික පදනමේ කටයුතු සඳහා යොදා ගත හැකිද;

(ii) මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට අපේක්ෂා කරන්නේද;

(iii) පළාත් සභාවට සිදු වී ඇති මූල්‍ය අලාභය, වග කිවයුත්තන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මාකාණ සභෙකළ් මර්‍රුම් උළ්ළූරාට්චි අමෙච්චරෙයි කේට්ට වින්නා:

(අ) ஊவா மாகாண சபையின் தற்போதைய முதலமைச்சரின் பெயரில் இயங்குகின்ற பிரத்தியேக மன்ற மொன்றுக்காக மாகாண சபையின் நிதி பயன்படுத்தப்பட்டுள்ளதை அவர் அறிவாரா என்பதையும்;

(ஆ) (i) மாகாணத்தின் மக்களுக்குச் சொந்தமான நிதியை தமது தனிப்பட்ட மன்றத்தின் பணிகளுக்காகப் பயன்படுத்த முடியுமா என்பதையும்;

(ii) இது சம்பந்தமாக முறைசார்ந்த விசாரணை யொன்றை மேற்கொள்ள எதிர்பார்க்கின்றாரா என்பதையும்;

(iii) மாகாண சபைக்கு ஏற்பட்டுள்ள நிதிசார் நட்டத்தை பொறுப்புக்கூற வேண்டியவர் களிடமிருந்து அறவிட நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Is he aware that the funds of the Provincial Council have been used for a private foundation operating by the name of the present Chief Minister of the Uva Province?

(b) Will he inform this House-

(i) whether the money owned by the people in the area can be used for activities of a private foundation;

(ii) whether a proper investigation will be conducted in this regard; and

(iii) whether action will be taken to charge the financial loss caused to the Provincial Council from the persons responsible for that?

(c) If not, why?

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) නැත. ඌව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ නමින් ක්‍රියාත්මක වන පෞද්ගලික ගිණුමක් සම්බන්ධව අනාවරණය නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පළාත් සභා මුදල් නීති රෙගුලාසි

අනුව යම් ආධාරයක්, මුදලක් හෝ ප්‍රදානයක් ලැබුණාම එම මුදල් තැන්පත් විය යුත්තේ මොන ගිණුමකද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
පළාත් සභාවට අදාළ ගිණුමක.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පෙර පාසැල කියන්නේ මේ රටේ අනාගතය බාර ගන්න ඉන්නා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා මුල් අඩිතාලම දමන මූලික කේන්ද්‍රස්ථානයයි. එම පෙර පාසැල් දරුවන්ට 2015 වර්ෂයේ පෙර පාසැල් බෑග් එකක් ලබා දීම සඳහා කටයුතු කිරීමට පළාත් සභාවේ මුදල් නැහැ කියා ඌව පළාත් ප්‍රධාන ඇමතිතුමා එම ප්‍රදේශයේ රාජ්‍ය බැංකු තුනකට ලිපි යවා තිබෙනවා. ඒ අනුව රුපියල් ලක්ෂ තිස්පහක මුදලක් එම කටයුත්තට ලබා දීලා තිබෙනවා. හැබැයි, මේ සඳහා පළාත් සභා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් රුපියල් ලක්ෂ විසිහතකුත් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවලින් පෙර පාසැල්වලට අවශ්‍ය පොත් බෑග් සඳහා අවශ්‍ය මුදල් වෙන් කරලාත් තිබෙනවා. ඊට අමතරව තමයි මුදල් මදිකමට මේ කියන්නා වූ රාජ්‍ය බැංකුවලින් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා රුපියල් ලක්ෂ තිස්පහක මුදලක් ඉල්ලා තිබෙන්නේ. එම මුදල තැන්පත් වුණේ, "චාමර සම්පත් දසනායක" පදනමට අයත් ගිණුමක. හැබැයි, ගරු ඇමතිතුමා කලින් සඳහන් කළ පරිදි එම මුදල් තැන්පත් විය යුත්තේ පළාත් සභා අරමුදලේයි. "හිරු" රූපවාහිනී නාළිකාව තුළ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා සමඟ පැවැති විවාදයකදී ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා පිළිගත්තා, රුපියල් ලක්ෂ තිස්පහක මුදලක් එතුමාගේ ගිණුමට ලැබුණාය කියා. ගරු ඇමතිතුමනි, එය නීති විරෝධී වරදක් හැටියට ඔබතුමා දකිනවාද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, මේකේ තිබෙන නෛතික තත්ත්වය -දෙන කෙනා දන්නේ පළාත් සභාවටද නැත්නම් පදනමකටද නැත්නම් වෙන පෞද්ගලික අරමුදලකටද කියන එක- තමයි සොයා බලන්න ඕනෑ. ඔබතුමාට තර්ක ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබතුමා දිගින් දිගටම මහ ඇමතිතුමා සම්බන්ධයෙන් ප්‍රශ්නය යොමු කරනවා. එකම බල ප්‍රදේශයේ ඉන්න නිසා ඔබතුමා කථා කරලා මේවා නිරාකරණය කර ගැනීම වඩා සුදුසුයි කියලා හිතනවා. ඊයේත් ඔබතුමා මහ ඇමතිතුමා ගැන ප්‍රශ්නයක් අහලා තිබුණා. දිගින් දිගටම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට -රේඛීය අමාත්‍යාංශයට- පළාත් සභාවෙන් දෙන කරුණු මත තමයි අපි උත්තර දෙන්නේ. හැබැයි, මේක පුද්ගලයෙකු සම්බන්ධයෙන් අහන ප්‍රශ්නයක් නිසා මහ ඇමතිතුමාගේ පෞද්ගලිකත්වයට අපහාස කිරීමක් හැටියට සලකන්න පුළුවන්. ඒ නිසා මෙවැනි ප්‍රශ්න අහන කොට හරියාකාරව දත්ත හොයාගෙන, එවැනි ලිපි තිබෙනවා නම් ඉදිරිපත් කරලා, ප්‍රශ්න ඉදිරිපත් කරන්න කියන එක මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අගමැතිතුමාගේ උපදෙස් පිට මම ඌව පළාතට ගිහිල්ලා පාලමක් විවෘත කිරීමේදී මට දෙදෙනාම කැඳවන්න සිදු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය අහන්නට ඉස්සෙල්ලා මෙතුමාගේ ඒ දීර්ඝ කථාවට පූංචි උත්තරයක් දෙන්නට වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
වග කීමෙන් කිව්වා, "හිරු" නාළිකාව තුළ-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මුලාසනයේ සිටින ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා අසාධාරණයක් කරන්න එපා. මෙතැන ප්‍රශ්න අහපු මන්ත්‍රීවරුන්ට ඔබතුමා දීර්ඝ වෙලාවක් දුන්නා. අපි නවක මන්ත්‍රීවරු හැටියට අපට ඒ අවස්ථාව දෙන්න.

අනෙක, මේක යහ පාලන ආණ්ඩුවක්. යහ පාලන ආණ්ඩුව තුළ ඉන්න හොරු අල්ලන්න කියන එක තමයි මන්ත්‍රීවරයෙකු විධියට මා මතු කරන්නේ. [බාධා කිරීමක්] එතුමා උත්සාහ දරන්නේ මොකක්ද? එතුමා, මහ ඇමතිතුමාගේ පෞද්ගලික නඩුවකට පෙනී ඉඳලා ඒක ආරක්ෂා කරන්න කටයුතු කළා. එහෙම කරන්න එපා, ගරු ඇමතිතුමනි. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. [බාධා කිරීම්]

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මම නීතිඥයෙකු හැටියට එතුමාගේ නඩුවකට පෙනී හිටියා. හැබැයි, ඒ මත එතුමාව ආරක්ෂා කිරීමට මට කිසිම වුවමනාවක් නැහැ. එතුමා මගේ නීතිඥ සහාය ගත්තා. ඒකයි- [බාධා කිරීමක්] ඔව්. ඔබතුමා මේ ප්‍රශ්නයට ඒවා යොමු කිරීම වැරදියි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේක බරපතළ මූල්‍ය වංචාවක්. මේක මුළු පළාත තුළම-[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාට ප්‍රශ්න ඇසීමේ අයිතියක් තිබෙනවා. නමුත්, ඇමතිවරු ගැන චෝදනා කරන එක හරි නැහැ, ඇත්ත වශයෙන්ම සාක්ෂි නැත්නම්. ඒ නිසා බණ්ඩාරවෙලට ඒක සීමා කරගෙන පිළිතුරු දෙන එකයි තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා නේ මේකට සාක්ෂි ඕනෑයි කියලා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඒ කියන්නේ, ඒ බැංකු වෙත මහ ඇමතිවරයාගේ නිල letterhead එක යටතේ තමයි මේ ඉල්ලීම් කර තිබෙන්නේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඔබතුමාත් ඒ-[බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මා දන්නා නිසයි කියන්නේ. එතකොට මේ ඉල්ලීම කරලා තිබෙන්නේ නිකම් ලියුමක් යවලා හෝ මුණ ගැහිලා නොවෙයි. මහ ඇමතිවරයා හැටියට තමයි මේ ඉල්ලීම කර තිබෙන්නේ. එතකොට ඒ රුපියල් ලක්ෂ 35 ලැබුණාට පස්සේ එහෙම නම් ඒක එන්න ඕනෑ පළාත් සභා අරමුදලටයි. හැබැයි, ඒ වෙනුවට එතුමාගේ පෞද්ගලික පදනමකටයි මේ සල්ලි ටික දා ගෙන තිබෙන්නේ. ඒක වැරදියි. ඒ වාගේම ඔබතුමා දැන් ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට කියනවා, එතුමාට ඒක ගෙදර ගිහිල්ලා බෙරා ගන්නය කියලා. එහෙම බෙරා ගන්න නම් කරන්න තිබෙන්නේ මේ රුපියල් ලක්ෂ 35 දෙකට බෙදා ගන්න එකයි. ඔබතුමා කියන විධියට ගමේදී මේක බෙරා ගන්නවා නම් හොරා කාපු මුදල් බෙදා ගැනීමෙන් විතරයි ඒක කරන්න වෙන්නේ. මේ ගරු මන්ත්‍රීවරයා දිගින් දිගටම කියන විධියට මේ පුද්ගලයා මුදල් අවභාවිතයේ යොදවා තිබෙනවා. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගෙන් පාර්ලිමේන්තුවේදී ඒ ගැන ප්‍රශ්න කිරීමේ අයිතියක් තිබෙනවා. ඔබතුමා මේක ආරක්ෂා කිරීම නොවෙයි කිසි සේත්ම කළ යුත්තේ. සත්‍ය තත්ත්වය වාර්තා කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය ඉතා පැහැදිලිව සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමා විසින් දිගින් දිගටම ඉදිරිපත් කළා; පළාත් සභාවේත් ඉදිරිපත් කළා; මාධ්‍යවලටත් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම මෙතුමා -ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා- විසින් අවස්ථා ගණනාවකදී මේ ප්‍රශ්නය මතු කළා. මේකෙන් ලිස්සා යෑම නොවෙයි කළ යුත්තේ. නිශ්චිත වශයෙන් -[බාධා කිරීමක්] මේ මුදල් ඉල්ලා තිබෙන්නේ මහ ඇමතිවරයාගේ letterhead එකෙන්, මහ ඇමතිවරයා ලෙසින්. හැබැයි, සල්ලි දාලා තිබෙන්නේ- [බාධා කිරීමක්] අනික, ගරු ඇමතිතුමනි, ඔබතුමා නඩුවට පෙනී සිටි නිසාම විශේෂයෙන් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් මට පැහැදිලි කිරීමක් කරන්න ඉඩ දෙන්න. එහෙම සිදු වෙලා තිබෙනවා නම් එය වැරදියි. ඒ සම්බන්ධයෙන් මම සොයා බලන්නම්. හැබැයි ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ එහෙම දෙයක් තිබෙනවාද කියලායි. අපට එහෙම දෙයක් අනාවරණ වෙලා නැහැ. මට ලැබුණු දත්ත අනුව තමයි මම උත්තර දෙන්නේ. පළාත් සභා සම්බන්ධයෙන් පළාත් සභාවලින් ලැබෙන උත්තරය මත තමයි රේඛීය අමාත්‍යාංශය උත්තර දෙන්නේ. මම මේ පාර්ලිමේන්තුවට වග කියන්නේ පළාත් සභාවලින් කරුණු අහලායි. ඒ නිසා වගකිව යුතු මන්ත්‍රීවරයෙක් හැටියට මෙතුමා මට මේ ගැන කියනවා නම්, මම ඒ ගැන සොයා බලන්නම්. ඒ ගැන සොයා බැලීමේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි දිගින් දිගටම ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමා සම්බන්ධයෙන් මෙතුමා ප්‍රශ්න කරනවා. හැමදාම ප්‍රශ්නයක් අහනවා. අපේ අමාත්‍යාංශයට වෙන වැඩක් නැහැ, මෙතුමාගේ ප්‍රශ්නවලට උත්තර දෙනවා හැරෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීවරයෙකුගේ ප්‍රශ්න ඇසීමේ අයිතිය නැති කරන්න අපට බැහැ. ඇමතිවරයාට තිබෙන්නේ ඒකට පැහැදිලි උත්තරයක් දෙන්නයි. එකම කාරණයක් සම්බන්ධයෙන් වුණත් දිගටම ප්‍රශ්න ඉදිරිපත් වෙන්න පුළුවන්. ඒ නිසා මහ ඇමතිතුමා සම්බන්ධව දිගින් දිගටම ප්‍රශ්න ඇසීමේ වරදක් නැහැ. ඒක මන්ත්‍රීවරයාට තිබෙන අයිතියක්.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා දිගින් දිගටම එකම පුද්ගලයෙක් ගැන තමයි අහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 11-491/'16-(2), ගරු කනක හේරත් මහතා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම් : මහනුවර දිස්ත්‍රික්කය

ஊ. சே. நிதியக் கணக்குகள்: கண்டி மாவட்டம்
EPF ACCOUNTS: KANDY DISTRICT

735/'16

12. ගරු බිමල් රත්නායක මහතා
மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල මහනුවර දිස්ත්‍රික්කය තුළ,

(i) ලියා පදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂි කර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා (ඉදිරිපත් කිරීම් හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය ගරු (මහාචාර්ය) සන්ත බණ්ඩාර මහතා වෙනුවෙන්)

(The Hon. (Prof.) G.L. Peiris - Minister of Information and Communication Technology on behalf of the Hon. (Prof.) Sarath Bandara - Minister of Implementation and National Policies)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුරු දෙනවා.

(අ) (i)

වර්ෂය	ලියා පදිංචිව තිබූ සේවක අර්ථ සාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	139,342
2014	145,273
2015	144,457

(ii)

වර්ෂය	අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	33,655
2014	35,903
2015	34,533

(ආ) ඉහත පරිදි වර්ගීකරණය කරන ලද පද්ධතියක් දැනට සේවක අර්ථසාධක අරමුදල සතුව නොමැත.

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව A සිට x දක්වා වූ අක්ෂරයන් අනුව නම් කරනු ලබන කලාපයන්ට අනුකූලව සේවායෝජකයන් ලියා පදිංචි කරන දත්ත පද්ධතියක් පවත්වා ගෙන යනු ලබයි. එලෙස ලියා පදිංචි වූ සේවායෝජකයකුගෙන් යම් සාමාජිකයකු වෙනුවෙන් දායක මුදලක් ලද විට අදාළ සේවායෝජකයාට හිමි අක්ෂරය හා අංකය යටතේ එම සාමාජිකයා ලියා පදිංචි කෙරේ.

(ඇ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් අහන්න තිබෙන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ඔබතුමා පිළිතුරු ඉදිරිපත් කරද්දී කිව්වා, ඔබතුමන්ලා සතුව මෙවැනි

(ඈ) ලියා පදිංචි කර ඇති සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் கண்டி மாவட்டத்தில்,

(i) பதிவுசெய்திருந்த ஊழியர் சேமலாப நிதியக் (EPF) கணக்குகளின் எண்ணிக்கை;

(ii) புதிதாக பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை;

ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் புதிதாக பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை,

(i) அரசாங்கத்துக்கு உரித்தான கம்பனிகள்;

(ii) பகுதியளவிலான அரச நிறுவனங்கள்;

(iii) தனியார் துறை;

(iv) கைத்தொழில்துறை;

(v) விவசாயத்துறை;

(vi) சேவைத் துறை;

இற்கு அமைய ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Trade Unions Relations :

(a) Will he inform this House, separately, in relation to years 2013, 2014 and 2015 -

(i) the number of registered Employees' Provident Fund (EPF) accounts; and

(ii) the number of Employees' Provident Fund (EPF) accounts registered anew;

(b) in the District of Kandy?

(i) Will he also inform this House, separately, in relation to years 2013, 2014 and 2015, the number of Employees' Provident Fund accounts registered anew by -

(ii) State-owned companies;

(iii) semi-government institutions;

(iv) the private sector;

(v) the industrial sector;

(vi) the agricultural sector; and the service sector?

(c) If not, why?

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவீந்திர சமவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - State Minister of Labour and Trade Unions Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

වර්ගීකරණයක් නැහැයි කියලා. නමුත් මා දන්නා තරමින් රජයට අයත් සමාගම්, අර්ධ රාජ්‍ය ආයතන පිළිබඳව කෙසේ වුවත්, පෞද්ගලික අංශයට අදාළව විශේෂයෙන්ම කර්මාන්ත, කෘෂි කාර්මික හා සේවා අංශ වශයෙන් වෙන් කිරීමක් තිබෙනවා. ඒ නිසා ඒ ආකාරයේ තොරතුරු ලබා දෙන්න බැරි ඇයි කියන එක මා මුලින්ම දැන ගන්න කැමැතියි.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

ගරු මන්ත්‍රීතුමනි, මෙතැන වාර්තා වෙලා තිබෙන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුවත්, කම්කරු දෙපාර්තමේන්තුවත් A සිට x දක්වා වූ අක්ෂරයන්ට අනුව තමයි කලාපයන්ට වෙන් කරලා මේ මුදල් සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන්නේ කියලායි. එහෙම කරනවාට අමතරව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න ක්‍රමයක් නැහැ. ඒ අක්ෂරයට අනුව, ඒ ගිණුමට අනුව තමයි ඒක බැර වෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, "අක්ෂරය" කියලා කියන්නේ ඇත්තටම දිස්ත්‍රික්කයට බව ඔබතුමා දන්නවා ඇති. කුරුණෑගලට අදාළ අක්ෂරය "Y". මා මේ පිළිබඳව කම්කරු නිලධාරීන්ගෙන් සොයා බැලූ අවස්ථාවේදී, ඔවුන්ගේ පැත්තෙන් නිශ්චිතව මේ කරුණ ඉදිරිපත් කරනු ලැබුවා. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ කාරණය ගැන නැවත සොයා බලන්න කියලා.

දෙවැනි කරුණ මෙයයි. ගරු ඇමතිතුමනි, අපි මහනුවර දිස්ත්‍රික්කය ගත්තොත්, රටේ ප්‍රධානම ආර්ථික පදනමක් තිබෙන දිස්ත්‍රික්ක කීපයෙන් එකක් තමයි මහනුවර දිස්ත්‍රික්කය. ඔබතුමා ඉදිරිපත් කරපු දත්ත අනුව, පසු ගිය අවුරුදු තුන ඇතුළත මේ දිස්ත්‍රික්කවල රැකියා උත්පාදනය ගත්තොත්, වාර්ෂිකව ශ්‍රම බලකායට එකතු වන ප්‍රමාණයේ සැලකිය යුතු අඩු මට්ටමක් පෙනෙන්නට තිබෙනවා. මේ කාරණය සමහර විට ඔබතුමාගේ විෂයයට සෘජුවම සම්බන්ධ නොවෙනවාය කියලා කියන්න පුළුවන්. නමුත් රැකියා උත්පාදනය හා ඔබතුමන්ලා දීලා තිබෙන පොරොන්දු එක්ක ගත්තාට පස්සේ එහි බරපතළ ගැටුමක් තිබෙනවා.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

මා ලබා දීලා තිබෙන තොරතුරුවලට අනුව නම් 2013 සහ 2014 අවුරුදුවලට වඩා 2015 අවුරුද්දේ යම් අඩු වීමක් පෙනෙන්නට තිබෙනවා. නමුත් 2016 දැන් අපි මේ ගැන අලුතින් සොයා බලලා, වෙනම වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. 2016 අවුරුද්දත් එක්ක සාපේක්ෂව බලලා, අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කළොත් මා ඔබතුමාට ඒ විස්තර වෙනම ලබා දෙන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, සාමාන්‍ය සම්මතය - practice එක - වෙලා තිබෙන්නේ යම්කිසි ව්‍යාපාරයක් ලියා පදිංචි කළාට පස්සේ, එදිනම මේ අංක ලබා ගැනීමට කටයුතු කළ යුතුයි කියලායි. රාජ්‍ය ආයතන වාගේම රටේ ප්‍රධාන පෙළේ සමාගම් පවා මෙවැනි ආකාරයට සේවක සේවිකාවන්ට ගිණුම් ලබා නොදී, විශාල වශයෙන් කටයුතු කරගෙන යන බව ඔබතුමාත් දන්නවා ඇති. නමුත් මා වගකීමෙන් යුතුව මේ කාරණය කියනවා. ලංකාවේ ප්‍රධාන supermarkets රාශියක් -ගණනාවක්- තිබෙනවා. ඒවායේ විවිධ සමාගම්වලට අයිති සේවක සේවිකාවන් 20,000කට වැඩි ප්‍රමාණයක් වැඩ කරනවා. ඔවුන්ට අංකයක් ලැබෙන්නේ අවුරුදු දෙකක් වැඩ කළාට පසුවයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගොඩාක් පුංචි තැනක දෙන්නෙක් තුන්දෙනකුගේ ප්‍රශ්නවලට වඩා ප්‍රධාන සමාගම්වලින් පවා සේවක අර්ථසාධක අරමුදලේ ලියා පදිංචි නොකර ඒ සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව සොයා බලන්නය කියා.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

ඒ ගැන සොයා බලා ඔබතුමාට වාර්තාවක් සපයන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේත් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ අදහස් ඉදිරිපත් වුණා. මම දැන ගන්න කැමැතියි -[බාධා කිරීමක්] ඔව්, ඒ කියන්නේ කම්කරු දෙපාර්තමේන්තුවේ වැඩ වර්ජනයක් යනවා. ඒකට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ එම නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව සකස් කිරීම පිළිබඳවයි. ඔබතුමා ඒ ගැන පිළිතුරක් ලබා දෙනවාද?

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

පසුව ඒ ගැන පැහැදිලි කිරීමක් කරනවා. [බාධා කිරීමක්] ඒකට උත්තරය දෙනවා. කලින් කිව්වා නම් ඒකටත් මම උත්තරය දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 13-786/'16-(1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

Sir, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දෙවන වටය.

රට තුළ සිදුව ඇති ඝාතන : විස්තර
நாட்டில் இடம்பெற்ற கொலைகள் : விபரம்
ASSASSINATIONS IN THE COUNTRY: DETAILS

793/'16

5. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு டலஸ் அழஹப்பெரும சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Dullas Alahapperuma)

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.01.01 සිට 2015.12.01 දක්වා සහ 2015.12.01 සිට 2016.08.01 දක්වා කාලසීමාවේදී රට තුළ සහ බස්නාහිර පළාත තුළ සිදු වී ඇති ඝාතන සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015.01.01 සිට 2016.08.01 දක්වා සිදු වූ මුළු ඝාතන සංඛ්‍යාව, එක් එක් පොලිස් බලප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (ii)හි සඳහන් ඝාතන අතරින් අපරාධකරුවන් හෙළිදරව් නොවූ ඝාතන සංඛ්‍යාව කොපමණද;

(iv) වර්ෂ 2013, 2014 සහ 2016 වර්ෂයේ මුල් මාස 08 තුළ සිදු වී ඇති ඝාතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2015.01.01 සිට 2016.08.01 දක්වා කාලසීමාව තුළ සිදු වී ඇති මිනිමැරීමට තැත් කිරීමේ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(vi) 2015.01.01 සිට 2016.08.01 දක්වා කාලසීමාව තුළ සිදු වී ඇති ඝාතන සඳහා සහ මිනිමැරීමට තැත් කරනු ලැබූ අපරාධ සඳහා ගිනි අවි භාවිතා කර ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டம், ஒழுங்கு மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.01.01ஆம் திகதி முதல் 2015.12.01 வரை மற்றும் 2015.12.01ஆம் திகதி முதல் 2016.08.01 வரையிலான காலகட்டத்தினுள் நாட்டிலும் மேற்கு மாகாணத்திலும் நடைபெற்றுள்ள கொலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) 2015.01.01 முதல் 2016.08.01 வரை நடைபெற்றுள்ள மொத்த கொலைகளின் எண்ணிக்கை ஒவ்வொரு பொலிஸ் ஆளுகைப் பிரதேசத்திற் கேற்ப வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி (ii) இல் குறிப்பிடப்பட்டுள்ள கொலைகளில் குற்றவாளிகள் கண்டுபிடிக்கப்படாத கொலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) 2013, 2014 மற்றும் 2016ஆம் ஆண்டுகளின் முதல் 08 மாதங்களுக்குள் இடம்பெற்றுள்ள கொலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(v) 2015.01.01 திகதி முதல் 2016.08.01 வரையிலான காலப்பகுதியில் இடம்பெற்றுள்ள கொலை முயற்சிகளின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(vi) 2015.01.01 திகதி முதல் 2016.08.01 வரையான காலப்பகுதியில் இடம்பெற்றுள்ள கொலைகள் மற்றும் கொலை முயற்சிக் குற்றச்செயல்களுக்கு சுடுபடைக்கலன்கள் பயன்படுத்தப்பட்ட சந்தர்ப் பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Law and Order and Southern Development :

(a) Will he inform this House -

(i) separately, the assassinations that took place in the country and the Western Province during the periods from 01.01.2015 to 01.12.2015 and from 01.12.2015 to 01.08.2016;

(ii) separately, in relation to each Police Division, the total number of assassinations that took place during the period from 01.01.2015 to 01.08.2016;

(iii) out of the assassinations that were stated in aforesaid (ii), the number of assassinations in which the criminals were not uncovered;

(iv) separately, the number of assassinations that took place within the first eight-month period of the years 2013, 2014 and 2016;

(v) the number of attempted murder incidents that took place during the period from 01.01.2015 to 01.08.2016; and

(vi) the number of occasions in which firearms were used for the assassinations and in attempted murder incidents during the period from 01.01.2015 to 01.08.2016?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

කාල සීමාව	රට තුළ සිදු වී ඇති ඝාතන සංඛ්‍යාව	බස්නාහිර පළාත තුළ සිදු වී ඇති ඝාතන සංඛ්‍යාව
2015.01.01 සිට 2015.12.01 දක්වා	443	128
2015.12.01 සිට 2016.08.01 දක්වා	334	90

(ii) ඇමුණුම බලන්න. ඇමුණුම සභාගත* කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) 82කි.

(iv) වර්ෂ 2013, 2014 සහ 2016 මුල් මාස 08 තුළ සිදු වී ඇති ඝාතන සංඛ්‍යාව

වර්ෂය	ඝාතන සංඛ්‍යාව
2013	402
2014	391
2016	301

(v) 267කි.

(vi) 156කි.

(ඇ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 7-801/'16-(1), ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය.

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
Sir, on behalf of the Hon. (Mrs.) Shanthi Sriskandarasa, I ask that Question.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පළමුවැනි ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීම : ජනවාර්ගික අනුපාතය

முதலாம் தரத்திற்கு மாணவர்களை அனுமதித்தல் : இன விகிதாசாரம்
ADMISSION OF STUDENTS TO GRADE ONE: ETHNIC RATIO

804/'16

8. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. M.H.M. Salman)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පළමුවැනි ශ්‍රේණිය සඳහා පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේදී ජනවාර්ගික අනුපාතය පිළිපැදිය යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් නිකුත් කර තිබේද;

(ii) එසේ නම්, එම චක්‍රලේඛයේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பாடசாலைகளில் முதலாம் தரத்திற்கு மாணவர் களை அனுமதிக்கின்றபோது, இன விகிதாசாரம் பேணப்பட வேண்டுமென கல்வி அமைச்சினால் சுற்றறிக்கையொன்று வெளியிடப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், குறித்த சுற்றறிக்கையின் பிரதியை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House -

(i) whether a circular has been issued by the Ministry of Education stipulating that ethnic ratio be followed when admitting students to grade one of schools; and

(ii) if so, whether a copy of the said cicular will be presented?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10-816/'16-(1), ගරු ප්‍රසන්න රණවීර මහතා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උත්තරය සූදානම්. නමුත් එහි පොඩි වෙනස්කම් කිහිපයක් තිබෙනවා. ඒක සංශෝධනයක් කරන්න අවශ්‍ය නිසා මෙම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගංවතුර ඇවිල්ලා මාස පහයි. තවම ඒ දීමනාව ගෙවලා නැහැ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔක්කොම ගෙවලා තිබෙන්නේ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රකාශය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

මහජන බැංකුවෙහි ඩිජිටල්කරණයට අදාළ දෘඪාංග මිලදී ගැනීම
மக்கள் வங்கியின் டிஜிடல் திட்டத்துக்கான வன்பொருள் கொள்வனவு
PURCHASE OF HARDWARE FOR DIGITALIZATION OF PEOPLE'S BANK

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් ස්ථාවර නියෝග 23(2) යටතේ මා මෙම ප්‍රශ්නය යොමු කරනවා.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජාතික බැංකුවක් වන, මහජන බැංකුවෙහි ඩිජිටල්කරණයට අදාළ දෘඪාංග - hardware- මිලදී ගැනීම සඳහා එක්තරා සමාගමක් ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයේ මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 4.5 සිට 5.5 දක්වා විවිධ්‍ය කිරීමේ අරමුණ ඇතිව මෙකී ගනුදෙනුවට අදාළ ලිපි ලේඛන මහජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති බැවින්ද;

රුපියල් කෝටි 70ක පමණ සුවිශාල ගනුදෙනුවට අදාළ ටෙන්ඩර් කැඳවීම දින පහක් වැනි ඉතා කෙටි කාලයක් තුළදී සිදු කළ බවට වාර්තා වී ඇති බැවින්ද;

මෙම ගනුදෙනුවෙන් මහජන බැංකුවට සිදුවිය හැකි අතිවිශාල අලාභය පිළිබඳ ලිඛිත සාක්ෂි අග්‍රාමාත්‍ය කාර්යාලයට අගෝස්තු 29වන දින භාර දෙනු ලැබ ඇති බව වාර්තා වී ඇති බැවින්ද;

මහත් වූ ආන්දෝලනයට තුඩු දී ඇති මෙකී ටෙන්ඩර් මගඩිය පිළිබඳ පූර්ණ විමර්ශනයක් කොට එකී විමර්ශන වාර්තාව කඩිනමින් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

මේ සම්බන්ධයෙන් ඇමතිතුමා උත්තර දෙන්න බලාපොරොත්තු වන නිසා "ලංකාදීප" පුවත් පතේ පළ වූ මේ කොටස මේ අවස්ථාවේදී මම ඉදිරිපත් කරන්න කැමැතියි.

මේ ගනුදෙනුව සම්බන්ධයෙන් 2016 අගෝස්තු 30වන දින "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

"මහජන බැංකුවේ කෝටි 70 ටෙන්ඩරය

අධ්‍යක්ෂවරු දෙදෙනෙක් අගමැති කාර්යාලයට සියලු සාක්කි බාර දෙති

මහජන බැංකුවේ ඩිජිටල්කරණය සඳහා අදාළ දෘඩාංග (hardware) මිලදී ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරුණු රුපියල් කෝටි 70ක (ඇමෙරිකානු ඩොලර් මිලියන 4.5) අධික ගනුදෙනුවට අදාළ සියලු ලිඛිත සාක්ෂි අග්‍රාමාත්‍ය කාර්යාලයට රිය්‍යේ (29) බාර දෙනු ලැබිය.

මෙම ටෙන්ඩරයට අදාළ සියලු ලිඛිත වාර්තා මහජන බැංකුවේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අග්‍රාමාත්‍ය කාර්යාලයට බාරදීම විශේෂත්වයකි...."

මම ඊට වඩා ඒ වාර්තාවේ ඇති දේවල් කියවන්න යන්නේ නැහැ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ළඟත් මේ "ලංකාදීප" පුවත් පත ඇති.

මා මේ අවස්ථාවේදී ඒ සම්බන්ධ ප්‍රකාශයක් කරන්නේ, මහජන බැංකුව මේ රටේ ප්‍රධාන ජාතික බැංකුවක් වන නිසායි. මහජන බැංකුව දීර්ඝ කාලයක් විවිධ ගැටලු, අභියෝග මධ්‍යයේ පැවතගෙන එනවා. මීට ප්‍රථම, මහජන බැංකුව කඩා වැටීමට එවැනි කටයුතු කළ විවිධ අවස්ථාවලදී මමත්, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් මේ පාර්ලිමේන්තුවේදී - 1980 කාල පරිච්ඡේදයේදීත් - මේ විධියට ප්‍රශ්න කරලා ඒ ක්‍රියා මාර්ග නවත්වා ගැනීමට මැදිහත් වුණා. එදා විපක්ෂයේ හිටපු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාටත් ඒ බව මතක ඇති. ඒ නිසා ගරු ඇමතිතුමා මේ පිළිබඳව කරුණු පැහැදිලි කරනවා නම් හොඳයි. මම ප්‍රශ්නය අහලා අවසන් කරන්නම්.

අද මහජන බැංකුව ලක්ෂ ගණනක මුදල් වැය කොට යම් යම් පුවත් පත්වලට විරුද්ධව දැන්වීම් පළ කරනවා. පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙන කොට යම් යම් පුවත් පත්වලට ඒ විධියට පහරදීම සුදුසු නැහැ. මහජන බැංකුව කියන්නේ මහජන ආයතනයක්. එය මහජනතාවගේ බැංකුවක්. එය මූල්‍ය ආයතනවලින් ඉතාම වැදගත් එකක්. ඇමතිතුමාගේ අවසරයක් ඇතිවද බැංකුවෙන් මෙවැනි දැන්වීමක් පළ කරන්නේ? මේ මුදල් වියදම් කරලා ඒ චෝදනාව සහිත දැන්වීම පළ කරලා තිබෙන්නේ "ලංකාදීප" පුවත් පතට ද, ටයිම්ස් ආයතනයට ද, "ඩේලි මිරර්" පුවත් පතට ද? මහජන බැංකුවේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් අග්‍රාමාත්‍ය කාර්යාලයට මේ පිළිබඳ තොරතුරු සහිත ලිපිගොනු යැව්වා නම්, ඒවා පරීක්ෂා කොට හමාර වෙනකල්වත් ඉවසීමෙන් ඉන්න බැරි ඇයි? ඒ නිසා ගරු ඇමතිතුමා මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙනවා නම් මම එය අගය කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාට ලැබුණු සියලු ලියකියවිලි අදාළ අමාත්‍යාංශයට භාර දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කරයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 23(2) යටතේ අද ඉදිරිපත් කළ ඒ ප්‍රශ්නය ගැන සොයා බලා බොහොම විධිමත් ප්‍රකාශයක් කරන්න අපි කල් ඉල්ලනවා. ඇමතිතුමාම ඒ ප්‍රකාශය කරයි.

බැංකුවක් මොකක් හරි ප්‍රකාශයක් කරන කොට අමාත්‍යාංශයේ අවසරයක් ගන්නේ නැහැ. අපි ඒ බැංකුවලට, ආයතනවලට සම්පූර්ණයෙන්ම ස්වාධීනත්වය දීලා තිබෙනවා, ඒවා වාණිජ මට්ටමින් ගෙන යන්න. ඒකයි අලුත් ක්‍රමය. ඒ වාගේම, අපි මහජන බැංකුව කඩා වැටෙන්න කිසිම ඉඩ කඩක් තියන්නේත් නැහැ. ඒ බැංකුව සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරන බවත් මේ සභාවේදී සඳහන් කළ යුතුයි. අපට අවසර දුන්නොත්, පාර්ලිමේන්තුව පැවැත්වෙන ඊළඟ දවසේ අපි මේ ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් ලබා දෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා දීර්ඝ පිළිතුරක් ලබා දෙන නිසාමයි මේ සඳහා අවධානය යොමු කරන්නේ.

දෘඪකාංග පද්ධතියක් සවි කර ගැනීම පිළිබඳ ටෙන්ඩර් පටිපාටියේදී තමයි, රුපියල් මිලියන 700ට ආසන්න මුදල් ප්‍රමාණයක් අවභාවිතයේ යෙදුණය කියන මේ චෝදනාව තිබෙන්නේ. පසු ගිය සති කිහිපය ඇතුළත ලංකාවේ ප්‍රධාන ජාතික පුවත් පත් ගණනාවකම මේ පිළිබඳ සවිස්තරාත්මක වාර්තා පළ වී තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව යම් මන්ත්‍රීවරයෙක් ප්‍රකාශයක් කරන්න පෙර, අමාත්‍යාංශය විසින් මේ පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතුව තිබුණා. හැබැයි, මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්නේ නැතිව, මහජන බැංකුව දැන් පෙළැඹී තිබෙනවා පුවත් පත් වාර්තා පළ කිරීමට. මහජන බැංකුවේ තිබෙන්නේ සභාපතිවරයාගේ හෝ මේ තීරණය ගත්ත අධ්‍යක්ෂවරයාගේ මුදල් නොවෙයි. මහජන බැංකුවේ තිබෙන්නේ මේ රටේ ජනතාවගේ තැන්පත් මුදල්. ඒ තැන්පත් මුදල්වල භාරකාරිත්වය විතරයි ඔවුන්ට තිබෙන්නේ. නමුත් මහ ජනයාගේ තැන්පත් මුදල් උපයෝගි කර ගෙන, මුදල් අවභාවිතයේ යෙදූ කාර්යය වසා ගැනීම වෙනුවෙන් අද මහජන බැංකුව මාධ්‍ය දැන්වීම් පළ කරනවා. ඒක තමයි දැන් සිදු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් ආයතනයක් පිළිබඳව චෝදනාවක් ඉදිරිපත් වුණාම, සෑම ආයතනයක්ම මේ විධියට පත්තර දැන්වීම්වලින් පිළිතුරු දෙන්න ගියොත්, කොතනින්ද කෙළවර වෙන්නේ? අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ ප්‍රශ්නයත් මතු වෙන කොට, ඒ අමාත්‍යාංශය පත්තර දැන්වීමක් දමනවා නම්, පරිසර අමාත්‍යාංශය පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙන කොට, ඒ අමාත්‍යාංශය පත්තර දැන්වීම් දමනවා නම් ඒක හරිද? ඒ ප්‍රශ්න වෙනුවෙන් පත්තර දැන්වීම් දමන එක නොවෙයි ඒ ආයතන කරන්න ඕනෑ.

මහ ජනයාගේ මුදල් තමයි මහජන බැංකුවේ තිබෙන්නේ. ඒ මුදල් උපයෝගි කර ගෙන, වංචා වසා ගැනීම වෙනුවෙන් දැන්වීම් පළකරන තත්ත්වයක් දැන් මතු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] මම කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන එක හරි. වාණිජ මට්ටමින් බැංකුවේ ප්‍රවර්ධනය සඳහා ඒ ආකාරයට දැන්වීම් දැමීම, බැංකුවේ අලුත් ව්‍යාපෘති හඳුන්වා දෙන්න දැන්වීම් දැමීම හරි. ඒක වෙනම කථාවක්. ඒ සඳහා ස්වාධීනත්වය බැංකුව සතුව තිබෙනවා. හැබැයි මෙතැන සිදුවී තිබෙන්නේ, ගනු - දෙනුවක් පිළිබඳ වාර්තා වුණාට පස්සේ, ඒ ගනු - දෙනුව නිරවුල් කර ගැනීම වෙනුවෙන් -ඊට ප්‍රතිපක්ෂ ලෙස- මේ දැන්වීම හරහා පිළිතුරු සැපයීමක් සිදු කර තිබෙන එකයි. එය කිසිසේත්ම යෝග්‍ය නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට අද ඉදිරිපත් කරනවා නම් තමයි වඩාත් යෝග්‍ය. ඇත්තටම ඔබතුමා කළ යුතුව තිබුණේ, මේ ගැන පත්තරවල පළ වෙන කොටම මේ පාර්ලිමේන්තුවේදී කියන එකයි. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය නඟන්න පෙර, අමාත්‍යවරයා විසින් මේ පාර්ලිමේන්තුවේදී මේ ප්‍රශ්නය නිරවුල් කළ යුතුව තිබුණා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉක්මනින්ම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට සුළු වේලාවක් ලබා දෙන්න. මම විනාඩියකින් කියන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, පත්තරවල පළවෙන සියලු දේවල් පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කළ යුතුද නැද්ද කියන එක ඇමතිතුමා තීරණය කළ යුතුයි. ඊයේ පත්තරවල තමයි ඔබතුමා කියපු ඒ දැන්වීම තිබුණේ. ඊයේ ඒ දැන්වීම තිබුණ නිසා මම දැන්ම ඒ ගැන ප්‍රකාශයක් කරනවා. මගේ මතයත් ඒ දැන්වීම සුදුසු නැහැ කියන එකයි. නමුත් ඒ කරුණ පිළිබඳව සොයා බලා සම්පූර්ණ විස්තරයක් පාර්ලිමේන්තුවට ලබා දෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පුවත් පත් දැන්වීම නොවෙයි ප්‍රශ්නය. ඒ දැන්වීමේ මෙලෙසින් පළ කර තිබෙනවා. "මේ වනවිට එක්තරා පුවත් පත් සමාගමක් පමණක්, ද්වේෂ සහගතව, බැංකුව අපකීර්තියට පත් කිරීමේ චේතනාවෙන් පුන පුනා හුවා දක්වන අන්දමේ කිසිදු වංචාවක් සිදුවී නොමැති බව අවධාරණයෙන් සඳහන් කරනු කැමැත්තෙමි."

එහි සඳහන් වෙනවා, "මේ වනවිට එක්තරා පුවත්පත් සමාගමක්" යනුවෙන්. එතකොට, මේක මාධ්‍ය පිළිබඳ ප්‍රශ්නයක්. යම් මාධ්‍යයක් විසින් යම් කිසි වංචාවක්, දූෂණයක්, අක්‍රමිකතාවක් හෙළිදරව් කළාට පස්සේ, ඒ මාධ්‍ය ආයතනවලට දැන්වීම් ලබා දෙන ආයතනයක් සඳහන් කරනවා, "එක්තරා පුවත්පත් ආයතනයකට" තමයි මේ අවශ්‍යතාව තිබෙන්නේ කියලා. ඒක මේ රටේ මහජනයාගේ තොරතුරු දැනගැනීමේ අයිතියට බරපතළ ලෙස එල්ල කළ පහරක් බව තමයි අපි විශ්වාස කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි, පැහැදිලියි.

අපි සියලු දෙනාම කැමැතියි මහජන බැංකුව දියුණු වෙනවාට. පෞද්ගලික අංශයේ බැංකුත් මේ විධියේ පරිගණක පද්ධතියක් සමඟ දියුණු වෙන්න උනන්දුවෙන් ඉන්නවා. ඒ ගැනත් අපි

කල්පනාවෙන් සිටිය යුතුයි කියලායි මම හිතන්නේ. මේ පරිගණක පද්ධතිය දියුණු වුණේ නැත්නම් මහජන බැංකුවේ දියුණුවටත් ඒ කාරණය බලපාන්නට පුළුවන්. ඒ ගැනත් අපි අවධානය යොමු කළ යුතුයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දින අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. අද දින ගරු රවීන්ද්‍ර සමරවීර රාජ්‍ය අමාත්‍යතුමා ඒ සඳහා පිළිතුරු ලබාදීමට සූදානමින් සිටිනවා.

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය: කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

தொழில் திணைக்களத் தொழில் அதிகாரிகளினது வேலைநிறுத்தம் : தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சரினது கூற்று

LABOUR OFFICERS' STRIKE IN DEPARTMENT OF LABOUR: STATEMENT BY STATE MINISTER OF LABOUR AND TRADE UNIONS RELATIONS

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவீந்திர சமவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - State Minister of Labour and Trade Unions Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දිනයේදී, 2016.09.08වෙනි දින ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය පිළිබඳව පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ සඳහා මම කෙටියෙන් පිළිතුරු දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර 93ක් පමණ පැරණි කම්කරු දෙපාර්තමේන්තුව වත්මන් පරිපාලන, සංවර්ධන හා නීති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතා සඳහා ගැළපෙන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා විසින් 2015.09.21වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 14 - A පරිච්ඡේදය යටතේ පැවරී ඇති බලතල අනුව කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට කමිටුවක් පත් කරන ලදී.

කම්කරු අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකු වූ මහින්ද මඩිහඟේවා මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම කමිටුව පත් කරන ලද අතර, ඒ සඳහා හිටපු අමාත්‍යාංශ ලේකම්වරුන්, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් හා කම්කරු විෂය ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති විශ්‍රාමික නිලධාරීන් සාමාජිකත්වය දරයි. මේ වාර්තාව මාස 3ක කාලයක් තුළ නිමා කිරීමට තීරණය කර ඇත. මෙම කමිටුව සඳහා විවිධ අංශවලින් අදහස් හා යෝජනා ලබා ගත් අතර රාජ්‍ය සේවා කම්කරු නිලධාරී සංගමයේ නියෝජිත කණ්ඩායමක්ද ඒ සඳහා අදහස් හා යෝජනා ලබා දී ඇත. දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍යාංශයේ නිලධාරීන් මෙම කමිටුව සඳහා අවශ්‍ය තොරතුරු දත්ත ලබා දෙමින් ඵලදායීව මෙන්ම කඩිනමින් මෙම කටයුතු අවසන් කර ගැනීමට සහාය ලබා දෙයි.

මීට සමගාමීව කම්කරු නිලධාරීන් විසින් කම්කරු සේවා ව්‍යවස්ථාවක අවශ්‍යතාව ඉදිරිපත් කරන ලද අතර, පෙර සකස් කරන ලද "ශ්‍රී ලංකා කම්කරු සබඳතා සේවය" ලෙස සේවා ව්‍යවස්ථාවක කෙටුම්පතක් කොමසාරිස් ජනරාල්ට, අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණි. ඒ යෝජිත ව්‍යවස්ථාව අනුව MN - 5 වැටුප් කාණ්ඩය යටතේ වැටුප් ලබන කම්කරු නිලධාරීන් SL - 01 වැටුප් කාණ්ඩය යටතේ දැනට කම්කරු සහකාර කොමසාරිස්වරුන් ලබන වැටුප් ගණයට තත්ත්වය උසස් කරන ලෙස ඉල්ලා ඇත.

පවත්නා බඳවා ගැනීමේ පටිපාටිය අනුව කම්කරු නිලධාරියකු ලෙස වසර 10ක සාර්ථක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද කම්කරු නිලධාරීන් සඳහා විභාගයක් පවත්වා සුදුසුකම් ලද පසු උසස්වීමක් ලෙස SL - 01 වැටුප් පියවරේ පිහිටුවනු ලබයි. අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව කම්කරු නිලධාරී සංගමයේ නියෝජනය සමඟ පැවැත් වූ සාකච්ඡාවලදී අවධාරණය කරනු ලැබුවේ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු මීට වඩා පුළුල් පරිපාලන ව්‍යුහයක් තුළ සේවා ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීම සුදුසු බවයි.

රජයේ සාමාන්‍ය පරිපාලන ක්‍රියාදාමය වන්නේද රාජ්‍ය ආයතනයක රාජකාරි වගකීම් හා ක්‍රියාවලීන් පුළුල් වීමේදී ආයතනයේ කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ සැලසුමක් හඳුනාගෙන, එම ආයතනයේ ප්‍රධාන රාජකාරි තනතුරු සඳහා සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීම මඟින් සේවක සංඛ්‍යාව යළි හඳුනාගෙන ඒ වගකීම් අනුව සංවිධාන සටහනක් මඟින් තනතුරු විධිමත්ව ස්ථානගත කිරීමයි. නමුත්, රාජ්‍ය සේවා කම්කරු නිලධාරී සංගමය ඇතුළු නියෝජිත කණ්ඩායම කම්කරු දෙපාර්තමේන්තුවෙන් හා අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියේ සේවා ව්‍යවස්ථාව වහාම අනුමත කර, පෙර කී පරිදි සියලුම කම්කරු නිලධාරීන් SL - 01 වැටුප් පියවරේ පිහිටුවීමට කටයුතු කරන ලෙසයි.

ඒ අනුව සංගමය විසින් ඉදිරිපත් කරන ලද සේවා ව්‍යවස්ථා කෙටුම්පත අධ්‍යයනය කර සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ කමිටුවක් පත් කර කටයුතු ක්‍රියාත්මක කරන අතර, සේවා ව්‍යවස්ථාවක් අනුමත කිරීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතා අනුව කළ යුතු කටයුත්තක් බැවින් එය අමාත්‍යාංශයට තනිව කළ නොහැකි කටයුත්තක් බව සාකච්ඡාවලදී සංගමයට අවධාරණය කර තිබුණි.

මෙම තත්ත්වය තිබියදී සංගමය විසින් 2016.09.01 වන දින ලිපියක් එවමින් 2016.09.07 දින සිට අඛණ්ඩ වැඩ වර්ජනයක් කරන බව දන්වා සිටින ලද අතර, ඉල්ලීම් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් මෙතෙක් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව සංගමය දැනුවත් කර ඇත. ඉන් නොනැවතී 2016.09.05 වන දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල් හා සංගමයේ සභාපති ඇතුළු නිලධාරීන් කැඳවා අමාත්‍යාංශයේදී දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර, එහිදී පහත සඳහන් තීරණයන්ට එළඹෙන ලදී:

[ගරු රවීන්ද්‍ර සමරවී මහතා]

1. රාජ්‍ය සේවා කම්කරු නිලධාරි සංගමය විසින් යෝජනා කරන පරිදි එම නිලධාරීන් සඳහා සේවා ව්‍යවස්ථාවක අවශ්‍යතාව සහ සේවා ව්‍යවස්ථාවක් ස්ථාපිත කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගැනීම.

2. සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීම සිදුවිය යුත්තේ කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදිරි අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයට හා නිලධාරීන්ගේ යහපතට හේතු වන ආකාරයෙන් බැවින් කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණය සඳහා පිහිටුවා ඇති කමිටුවේ නිර්දේශ ද සලකා බැලීම.

3. මේ සම්බන්ධයෙන් ඉහත කමිටුවේ නිර්දේශද සලකා බලා කටයුතු කිරීම සඳහා විධිමත් කමිටුවක් මඟින් මාස තුනක (03) කාලයක් තුළදී කටයුතු අවසන් කිරීම සඳහා මූලික එකඟතාව පළ කරන ලදී.

මෙම තීරණ සංගමයේ සභාපතිට ලිඛිතව දැනුම් දෙන ලද අතර, මෙම කරුණු පිළිබඳ එකඟතාවක් නොමැති බව දන්වා 2016.09.06 දින ලිපියෙන් 07 දින සිට අඛණ්ඩව වැඩ වර්ජනයක් කරන බව දන්වා සිටින ලදී.

ඒ අනුව 07 හා 08 දිනවල කම්කරු නිලධාරීන් වැඩ වර්ජනයක යෙදී සිටි. කම්කරු නිලධාරීන්ට පවරා ඇති අධිකරණමය නඩු පිළිබඳ රාජකාරී ගැටලුවක් ඇති නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට පළාත් මට්ටමේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් සහ දිස්ත්‍රික් මට්ටමින් සහකාර කම්කරු කොමසාරිස්වරුන් මෙන්ම දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන්ද දැනුවත් කර රාජකාරී පවරා ඇත.

තවදුරටත් ඕනෑම අවස්ථාවක සාකච්ඡාවකට විවෘතව ඉඩකඩ සලසා ඇති බව සංගමයට ලිපියකින් දන්වා ඇති අතර, අදාළ කමිටු සමඟ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව කඩිනමින් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හා සේවා ව්‍යවස්ථා සකස් කිරීමේ ක්‍රියාවලිය කරගෙන යනු ලබයි.

මෙම ක්‍රියාදාමය වහාම කළ නොහැකි අතර, අවම්ව මාස 3ක කාලයක් අවශ්‍ය බවත්, කම්කරු නිලධාරීන්ගේ ඉල්ලීම සඳහා සුබවාදී ප්‍රතිචාර ලබා දී කඩිනමින් නිශ්චිත කාල රාමුවක් තුළ කටයුතු නිම කිරීම අවශ්‍ය බවටත් සියලුම පාර්ශ්වයන් දැනුවත් කර ඇත. රාජ්‍ය සේවා කම්කරු නිලධාරි සංගමය සමඟ තවදුරටත් සුබවාදීව සාකච්ඡා පවත්වා ගනිමින් ගැටලුව නිරාකරණය කිරීමට අමාත්‍යාංශය කටයුතු කරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංගමයේ සභාපති ඇතුළු නිලධාරීන් කැඳවා අමාත්‍යාංශ නිලධාරීන් සමඟ 05 වෙනිදා අමාත්‍යාංශයේ සාකච්ඡාවක් පැවැත් වුණා. 2016.09.05 වෙනි දින සාකච්ඡාවේ දී මා කලින් සඳහන් කළ තීරණ තුනට මේ අය එකඟ වෙලා ඒ සඳහා මාස 3ක කාලයක් ඉල්ලා සිටියා. 2016.09.05 වෙනි දින එකඟත්වය පළ කරලා ගිහිල්ලා, 06 වෙනිදා ලිපියක් එවනවා, 2016.09.07 වෙනිදා සිට වර්ජනයක් කරනවා කියලා. ඉතින් මේක ටිකක් අසාධාරණයි. ඒ අයට දැනටත් අපි සාකච්ඡාවකට විවෘත කරලායි තිබෙන්නේ. ඒ ගොල්ලන්ට ඕනෑ වේලාවක ඇවිල්ලා ගරු අමාත්‍යතුමාත්, කොමසාරිස්තුමියත් සමඟ සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. SL-01 වර්ගයට අන්තර්ග්‍රහණය කරන්න කියලා කිව්වාම, ඒ කාරණය කම්කරු නිලධාරීන්ට විතරක් අදාළ වන දෙයක් නොවෙයි. එය රාජ්‍ය සේවයේ එම වැටුප් තලයේ සිටින සියලු දෙනාටම අදාළ වෙනවා. දැනට තිබෙන්නේ අවුරුදු 10ක සේවා කාලයකට පසු මේ අයව සහකාර කම්කරු කොමසාරිස් තනතුරට පත් කිරීමයි. නමුත් මේ ගොල්ලන් කියන්නේ අද බඳවා ගන්නා කම්කරු නිලධාරියාත් ඒ වැටුප් තලයට ඇතුළු කරන්න කියලායි. ඒක කරන්න ටිකක් අමාරුයි. මොකද, ඒකට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාශයෙනුත් අවසරයක් දෙන එකක් නැහැ. ඒ නිසා අපි මේ ගැන තවදුරටත් සාකච්ඡා කරලා තීරණයක් ගන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු දෙපාර්තමේන්තුව කියන්නේ දිනපතා දහස් ගණන් කටයුතුවල නිරත වන දෙපාර්තමේන්තුවක්. එහි කටයුතු අඩපණ වීමක් සිදු වන වාතාවරණයක් ඇති නොකොට, මේ පිළිබඳව සුහදතාවයෙන් ක්‍රියා කරන්න කියලායි අපි ඉල්ලා සිටින්නේ.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

අපි දැනටමත් සහකාර කම්කරු කොමසාරිස්වරු සහ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු මේ සඳහා යොදවලා පුළුවන් තරම් මේ ගැන කටයුතු කරගෙන යනවා. ඒ අතරතුර අපි මේ අයට විවෘතව ආරාධනා කරනවා, අපි සමඟ තව දුරටත් සාකච්ඡා කරලා මේ ගැන තීන්දුවක් ගන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාවේ වැඩකටයුතුවල මීළඟට තිබෙන්නේ පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, දැන් නම් හුඟාක් කාලය ගත වෙලායි තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම අහඹරුවාදා ස්ථාවර නියෝග 23(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට ගරු අගමැතිතුමා උත්තරයක් දෙනවා කිව්වා. තවම ලැබුණේ නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේදී පිළිතුර ලබා දෙන්නම්.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත
மருத்துவம் (திருத்தம்) சட்டமூலம்
MEDICAL (AMENDMENT) BILL

"(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි. (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2016 සැප්තැම්බර් 20 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 செப்ரெம்பர் 20, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Health, Nutrition and Indigenous Medicine; to be read a Second time upon Tuesday, 20th September, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the Government Business do have precedence this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the proceedings on Item No. 156 of Public Business appearing on the Order Paper be exempted at this day's sitting from the provisions of the Standing Order No. 23 of the Parliament."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the provisions of the motion agreed to by Parliament on 08.03.2016, the hours of sitting this day shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 4.00 p.m. At 4.00 p.m., Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනට ඇති පැරිස් ගිවිසුම අපරානුමත කිරීමේ යෝජනාව -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී - [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභානායකතුමනි, දිවා ආහාර විවේකය නොගෙන -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We have no objection to continue the Proceedings without a lunch break.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Permission of the House is sought to continue the Proceedings without a lunch break. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, දිවා ආහාරය සඳහා නැවැත්වීමෙන් තොරව රැස්වීම් කටයුතු පවත්වා ගෙන යාමට ගරු සභාවේ එකඟතාව තිබෙනවා.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 156, පැරිස් ගිවිසුම අපරානුමත කිරීම. ගරු අග්‍රාමාත්‍යතුමා.

පැරිස් ගිවිසුම අපරානුමත කිරීම
பரிஸ் உடன்படிக்கை ஒப்புதலளித்தல்
RATIFICATION OF THE PARIS AGREEMENT

[11.35 a.m.]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
I move,

"That the Ratification of the Paris Agreement on the United Nation's Framework Convention on Climate Change adopted in New York on 09th May, 1992, which was presented on 07.09.2016, be approved.

(Cabinet approval signified.)"

Hon. Deputy Speaker, I am happy that the Members of this House are taking a keen interest on this matter and I think it is my duty to explain why we asked for a change at the Committee on Parliamentary Business to bring this forward.

Global climate change has really captured our attention in the last few decades. In 1992, the United Nations adopted the framework on a Convention on Climate Change. But the problem was having agreed to the Convention, countries could not thereafter agree on the steps to be taken. I mean, in 1992, I was the then Minister of Industries and Scientific Affairs. You can just imagine how long it has taken for the countries across the globe to come into an agreement.

The fact is that some of the developed countries did not want any caps on emission or any controls because they felt that their own development will be affected. We are all aware that in the last two centuries the industrial revolution and the rapid developments of the world economies; the World War II; the use of atomic weapons; the testing on nuclear weapons and all those have made a significant impact on the global climate change. Therefore, the climate change, the range we expect of 1.5 °C - 2 °C, is getting exceeded. Even in Sri Lanka, as I mentioned yesterday in my speech, there is a threat that even the waters of Mahaweli can get affected and also our tea industry. It is in this background that there were a number of meetings held, but even the last one in Copenhagen also ended without any agreement despite the efforts that were made. Many countries were looking at their own self-interest. Is it possible for a country to develop fast, have rapid development while controlling its level of emissions? So, it is a question of how powerful the lobbies were in different countries; whether it be in India, China or America and we are happy that Europe and Japan took the lead on these matters. Nevertheless, at the Paris Climate Talks last year, there was an agreement reached. I will not say that we are 100 per cent satisfied with it but it was a great leap forward and now the process of ratification has started.

The ratification requires 55 countries with 55 per cent of the global emissions to agree to ratify the Agreement for it to come into force. While the countries have agreed, these are still issues in some of the Western countries and also in some of the developing Asian economies. Whilst they should agree to these provisions to restrict emissions, these are some of the major issues that are coming up and that will occupy the centre stage in the forthcoming elections in the Western countries this year and next year. In such a background, it gave us all encouragement when the President of the United States and the President of China - President Obma and President Xi - agreed prior to the G20 Meeting that both countries are going to ratify this Climate Change Agreement.

In that background many countries and many Parliaments have now decided to go ahead and ratify the Agreement. As far as Sri Lanka is concerned, President Maithripala Sirisena's election manifesto ensures that we take all necessary measures to protect the environment. That was agreed to by all the parties that supported President Sirisena and the President himself has taken over the Ministry of Mahaweli Development and Environment and taken many measures to go ahead. Therefore, for us it is important that that be clarified. As far as Sri Lanka's development is concerned, we also have an ambition of rapid economic development. It has to be one that is environmentally friendly. If I put it in another way, I do not know whether the Opposition will agree, it is going to be a very "green" development economically. We will talk about the political one later.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You can talk about it tomorrow.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Yes, we will talk on that tomorrow. This country has to move forward being environmental friendly. The Government has already approved the Sri Lanka Sustainable Development Bill. It has been sent to the Provincial Councils. I would like to ask the Minister of Provincial Councils and Local Government also to ask them to expedite it. Then we may be able to debate and pass that Bill also this year. Then we can look at the other measures that are necessary to be taken in accordance with the Sustainable Development Council that has been prepared on the lines of the Canadian Sustainable Development Council. Canada is one of the countries in the forefront of protecting the environment. Once we have the Sustainable Development Council, Hon. Minister of Sustainable Development and Wildlife will then be able to bring before this House the necessary plans.

So, in this background, we want to ratify it quickly in order to ensure that at least by the time the UN General

Assembly meets, there are enough ratifications or commitments to ratify that and the Agreement will come into force before November this year. We discussed this matter with President Maithripala Sirisena and he himself pressed for this Accord. We must also place on record the contributions made by President Hollande of France in putting the Paris Agreement together.

In this background, we felt that we should ask the Parliament to ratify this Agreement immediately because when the President visits New York for the UN General Assembly - that will be the last UN General Assembly meeting with both Secretary-General Ban Ki-moon and the US President Barack Obama who took the initiative in Paris Talks - he should be in a position to announce it.

This week is the last week in which this House is meeting before the President leaves for New York. Therefore, I spoke to the President and he informed the Cabinet to go ahead and pass this on Friday. The President himself could not be available here. He is in Jaffna to participate in two ceremonies there, which are important. That is a part of the reconciliation process. While he is playing a major role, he is unable to be here. But we are moving this and I must thank both Sides of the House for agreeing to support it. We hope that as soon as the Provincial Councils send us their observations on the Sri Lanka Sustainable Development Bill, we will be able to bring the Bill also into the House and then look at the other measures that will be necessary thereafter.

Thank you.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
වීනා එදිත්තියම්පප්පෙරුම්ද.
Question proposed.

[மு.ப. 11.43]

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, காலநிலை மாற்றத்தால் ஏற்படக்கூடிய அனர்த்தங்களிலிருந்து மக்களை எவ்வாறு பாதுகாத்துக்கொள்வது என்ற தொனிப்பொருளின் அடிப்படையில், உலக காலநிலை மாற்றம் தொடர்பாக ஐக்கிய நாடுகள் சபையின் 21ஆவது மகாநாடு பாரிஸ் நகரிலே நடைபெற்றது. அதற்கான உடன்படிக்கையிலே எங்களுடைய நாட்டின் நிலைப்பாடு சம்பந்தமான சில விடயங்களை எடுத்துக்கூறலாம் என்று நினைக்கின்றேன்.

எனக்குமுன் பேசிய பிரதமர் அவர்கள், போரால் உலக நாடுகள் பாதிக்கப்பட்ட விதத்தை மேற்கோள்காட்டியும் உதாரணப்படுத்தியும் தனது உரையை நிகழ்த்தி முடித்தார். உண்மையிலே, எங்களுடைய நாட்டில் போர் நடைபெற்றது. இப்பொழுதும் எங்களுடைய வடக்கு, கிழக்கிலே போர் அனர்த்தத்தின் விளைவுகளை மக்கள் உணர்ந்துகொண்டிருக் கின்றார்கள். அந்த வகையிலே, போரின்போது பயன்படுத்தப் பட்ட கொத்துக்குண்டுகள், தடைசெய்யப்பட்ட குண்டுகள், இரசாயனப் பொருட்கள் என்பவை இன்றும் எங்களுடைய மக்களை மிகத் துன்பப்படுத்திக்கொண்டு இருக்கின்றன. போர் நடைபெற்ற வடக்கு, கிழக்குப் பிரதேசங்களில் அங்கவீனர் களாகவும் குறைமாதத்திலும் குழந்தைகள் பிறக்கின்றமை மிகுந்த வேதனை தருகின்ற விடயமாகும். அந்த வகையிலே, எங்களுடைய நாட்டில் வெப்பநிலையைக் குறைப்பதற்கும் இயற்கை அனர்த்தத்தால் ஏற்படுகின்ற பாதிப்புக்களைத் தடுப்பதற்கும் புதிய அரசாங்கம் என்னென்ன திட்டங்களை வகுத்திருக்கின்றது? என்பதை இச்சபையிலே தெளிவுபடுத்த வேண்டும். ஏனென்றால், எமது வன்னி மாவட்டத்தில் போர் நடந்த பிரதேசங்களிலே இன்னமும் போரின் எச்சங்கள் இருந்துகொண்டிருக்கின்றன. அங்கே மாணவர்கள் கல்வி கற்கின்ற நிலையிலே மயங்கி விழுகின்றார்கள். கடந்த பாராளுமன்ற அமர்விலே எங்களுடைய தமிழ் தேசியக் கூட்டமைப்பின் உறுப்பினர் பேசியதுபோல, போரின்போது மேற்கொள்ளப்பட்ட தாக்குதல்களினால், குண்டு மற்றும் "ஷெல்" துண்டுகளை தமது உடலிலே சுமந்து கொண்டிருக் கின்ற மாணவர்களும் மக்களும் இன்றும் இருந்து கொண்டிருக் கின்றார்கள். ஆகவே, அந்த மக்களைக் காப்பாற்றுவதற்கான ஒரு செயற்றிட்டத்தை இலங்கை அரசாங்கம் வரையறுக்க வேண்டும். போரின் எச்சங்களைக் கண்டுபிடித்து போரினால் பாதிக்கப்பட்ட மக்களை அதிலிருந்து காப்பாற்றுகின்ற முயற்சியை மேற்கொள்ள வேண்டும். காலநிலை மாற்றங்கள் பற்றிய பாரிஸ் உடன்படிக்கையைச் செயற்படுத்துவதற்கான திட்டங்களை மேற்கொள்வதற்கு முன்பதாக அதனைச் செய்ய வேண்டுமென்பது எனது பிரதான கோரிக்கையாகும்.

இலங்கை நான்கு பக்கமும் கடலால் சூழப்பட்ட ஒரு தீவாகக் காணப்படுகின்றது. குறிப்பாக, வன்னித் தேர்தல் மாவட்டத்தின் கரையோரப் பிரதேசங்களில் மக்கள் செறிந்து வாழ்கின்றார்கள். சுனாமியின் தாக்கத்தை எங்களுடைய நாட்டு மக்கள் கண்டிருக்கிறார்கள். இதன்போது முல்லைத்தீவு, மட்டக்களப்பு போன்ற மாவட்டங்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டன. வெப்பநிலை கூடுவதனூடாக இயற்கையின் சீற்றத்தால் மீண்டும் சுனாமி போன்ற அனர்த்தங்கள் எங்கள் நாட்டைத் தாக்கும் ஓர் அபாயநிலை இருந்து கொண்டிருக் கின்றது என்பதை நாங்கள் உணர்ந்திருக்கின்றோம். இந் நிலையில், இந்தப் புதிய அரசாங்கத்தால் கரையோரப் பாதுகாப்பு வலயத்தினூடாகக் கடலரிப்பைத் தடைசெய்கின்ற முறையைக் கையாள்கின்ற செயற்றிட்டத்தைக் கரையோரப் பிரதேசங்களிலே செயற்படுத்துவதற்கு முன்னுரிமை வழங்கப் பட்டிருக்கிறதா? என்ற கேள்வியை இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

வடக்கு, கிழக்கிலே, இன்னும் சொல்லப்போனால் முழு இலங்கை நாட்டிலுமே கடலரிப்பு மிக மோசமாக இருக் கின்றது. அதாவது, இலங்கை நாட்டைக் காவுகொள்கின்ற வகையிலே பல இடங்களிலே கடலரிப்பு ஏற்பட்டுக் கொண்டிருக்கின்றது. முல்லைத்தீவு, மன்னார், யாழ்ப்பாணம் ஆகிய மூன்று மாவட்டங்களும் கூடுதலாக கடலரிப்புக்குள் ளாகின்ற மாவட்டங்களாகக் கருதப்படுகின்றன. கிழக்கிலும் அந்த நிலைமை இருக்கின்றதென நான் நினைக்கின்றேன். உதாரணமாக, மன்னார் மாவட்டத்திலே பேசாலை, அரிப்பு, முசலி போன்ற பிரதேசங்கள் கடலரிப்பால் அழியக்கூடிய ஓர் அபாய நிலையைக் கொண்டிருக்கின்றன.

வெப்பநிலை கூடுகின்றபோது காலநிலையிலும் மாற்றம் ஏற்படுகின்றது. குறிப்பாக, எங்களுடைய நாடு இயற்கை அனர்த்தத்தினால் மிகவும் கூடுதலான பாதிப்புக்குள்ளாகி வரும் சந்தர்ப்பங்களை நாம் காணக்கூடியதாக இருக்கின்றது. கடலால் சூழ்ந்திருக்கின்ற எங்களுடைய நாடு கடலாலேயே

[ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා]

අழிக්කப்பட்டு வருகின்ற சந்தர்ப்பங்கள் கூடுதலாகக் காணப்படுகின்றன. அதை மறந்து யாரும் செயற்பட முடியாது; முக்கியமாக இதனைக் கவனத்திலெடுக்க வேண்டும். எனவே, நாங்கள் இயற்கை வளங்களைப் பாதுகாப்பதனூடாக இயற்கை அனர்த்தங்களிலிருந்து மக்களைக் காப்பாற்றமுடியும் என்பதை உணர்ந்து, அவற்றைப் பாதுகாக்க வேண்டும். எனவே, உலக நாடுகளின் தலைவர்கள் கைச்சாத்திடுகின்ற இந்த ஒப்பந்தத்தினூடாக அனர்த்தங்களிலிருந்து பாதுகாப்புப் பெற்ற பிரதேசமாக எங்களுடைய நாடு மாற வேண்டும்.

கடலில் இருக்கின்ற பவளப் பாறைகள் அழிக்கப்படுகின்ற அல்லது அவை முற்றாக இல்லாதொழிக்கப்படுகின்ற ஒரு சூழ்நிலை இன்றைக்கு எங்களுடைய பிரதேசத்திலே காணப்படுகின்றது. இந்தியாவிலிருந்து வருபவர்கள் தடை செய்யப்பட்ட 'ரோலர்'களை, தடைசெய்யப்பட்ட மடிகளைப் பயன்படுத்துவதால் மீன் உற்பத்தி செய்யப்படுகின்ற இடங்களாகக் கருதப்படுகின்ற அந்த பவளப் பாறைகள் அழிகின்ற சந்தர்ப்பங்களை எங்களால் காணக்கூடியதாக இருக்கின்றது.

இலங்கையைப் பொறுத்தமட்டிலே, புயலாக இருந்தாலும் சுனாமியாக இருந்தாலும் இயற்கை அனர்த்தத்தில் கூடுதலான பாதிப்புக்குள்ளாவது கிழக்கு மாகாணம்தான்! முழு இலங்கை நாட்டையும் எடுத்துக்கொண்டால் புயல் வருகின்றபோது கிழக்கு மாகாண கரையோர பிரதேசங்கள்தான் கூடுதலாகப் பாதிக்கப்படுகின்றன. இவ்வாறு பாதிக்கப்படுகின்ற கிழக்கு மாகாணத்தைப் பாதுகாப்பதற்கு என்ன நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென்பதிலே அரசாங்கம் கவனம் செலுத்தவேண்டும். இயற்கை அனர்த்தத்திலிருந்து மக்களைக் காப்பாற்ற வேண்டுமென்று நினைக்கின்ற அதேநேரத்திலே, இயற்கையை மீறியும் எங்களால் ஒன்றும் செய்யமுடியாது. எங்களுடைய பிரதேசத்திலே உட்புகும் கடல் நீரைத் தடுத்து நிறுத்துவதற்கும் வெள்ளம் வராமல் பாதுகாப்பதற்குமான முயற்சியை நீங்கள் முதலிலே எடுக்கவேண்டுமென்பது என்னுடைய கருத்தாகும். எங்களுடைய நாட்டிலிருக்கின்ற பிரச்சினைகளைக் கையாளாமல், எங்களுடைய நாட்டு மக்களைக் காப்பாற்றுவதற்கான முயற்சியை மேற்கொள்ளாமல், இந்த ஒப்பந்தத்தை நடைமுறைப்படுத்து வதற்கு முயற்சி செய்யாமல் இருந்தோமென்றால் மீண்டும் எங்களுடைய மக்கள் இயற்கை அனர்த்தத்தால் பாதிக்கப்படு கின்ற ஒரு நிலைமை நிச்சயமாக ஏற்படுமென்பது என்னுடைய அபிப்பிராயமாகும். எனவேதான் நான் சொல்கின்றேன், இந்த ஒப்பந்தத்தை எழுத்தளவிலே வைத்துக்கொள்ளாமல் செயலுருப் படுத்துவதற்கு அக்கறை செலுத்தவேண்டும்.

எங்களுடைய மக்களைப் பொறுத்தமட்டிலே அவர்கள் பல பாதிப்புக்களுக்கு உள்ளாக்கப்பட்டு வருகின்றார்க்ள. அதைப் பற்றி அடிக்கடி எங்களுடைய தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் பேசிவருவதை நீங்கள் எல்லோரும் அறிந்திருப்பீர்கள். இந்த நாட்டிலே நல்லிணக்கம் ஏற்பட்டிருப்பதாகச் சொல்லப்பட்டாலும், மக்களுடைய நிலங்களை இராணுவம் தன்னகத்தே வைத்துக்கொண்டிருக் கின்றது; அங்கு புத்த கோயில்கள் அமைக்கப்படுகின்றன; அந்த இடங்களுக்குச் சென்று எங்களுடைய மக்கள் குடியேறுவதற்கான சூழ்நிலை மறுக்கப்படுகின்றது. எங்களுடைய இளைஞர்கள் பலர் பல வருடங்களாகச் சிறையிலே வாடுகின்றார்கள்; பெற்றோர் காணாமற் போனவர்களைத் தேடிக்கொண்டிருக்கின்றார்கள். இப்படியான சூழ்நிலையிலேதான் எங்களுடைய மக்கள் வாழ்ந்துகொண் டிருக்கின்றார்கள். முதலில் எங்களுடைய நாட்டிலே இயற்கை அனர்த்தங்களிலிருந்து மக்களைக் காப்பாற்றுவதற்கான நடைமுறைகள் எவை என்பதை உடனடியாகக் கண்டறிய வேண்டும். அதாவது, சுனாமியிலிருந்து எப்படி மக்களைக் காப்பாற்ற முடியும்? அதேபோல், புயல், மண்சரிவு போன்ற இயற்கை அனர்த்தங்கள் ஏற்படுகின்றபோது எப்படி மக்களைக் காப்பாற்றமுடியும்? என்பதற்கான நடைமுறைகள் கண்டறியப்பட வேண்டும். மழைக் காலங்களில் அநுராதபுரப் பகுதியிலுள்ள குளங்கள் நிறையும்போது, அவற்றின் துருசுகள் திறக்கப்படுகின்றன. அதனால் எங்களுடைய மன்னார் மாவட்டத்துக்குள் நீர் வருகின்றது. இதனால் எங்களுடைய மக்கள் தொடர்ச்சியாக ஒவ்வொரு வருடமும் இடம்பெயர வேண்டியுள்ளது. ஆகவே, இந்த விடயங்களைக் கவனத்தில் எடுக்கவேண்டும்.

இந்த நாட்டிலே ஒவ்வொரு முறையும் ஏதோ ஒரு விதத்தில் மக்கள் இடம்பெயர்கின்றார்கள். இவ்வாறான சூழ்நிலைகள் குறைக்கப்பட வேண்டும். எங்களுடைய மக்கள் இடம் பெயர்கின்ற நிலைமை மாற்றப்பட வேண்டும். அத்துடன், கரையோரப் பிரதேசங்களிலே கடலரிப்பு போன்ற நிலைமைகளைத் தடுப்பதற்கு உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டும் என்றும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! I now wish to welcome the Hon. William Edward Felix Hodgman, the Prime Minister of Tasmania to our Parliament who is being accompanied by the Hon. Matthew Guy Groom, a Minister in the Tasmanian Cabinet, His Excellency Bryce Hutchesson, the High Commissioner of Australia to Sri Lanka and officials from the Tasmanian Government. I welcome you all.

The next speaker is the Hon. Gayantha Karunatileka. You have got ten minutes.

[ප.භ. 11.57]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1992 මැයි මස 09 වැනි දින නිව් යෝර්ක්හිදී පිළිගන්නා ලද, එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය සඳහා වූ "පැරිස් ගිවිසුම" පිළිබඳ යෝජනාව, ගරු අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් සැප්තැම්බර් මස 07 වෙනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලැබුණා. එම ගිවිසුම අපරානුමත කිරීම - ratification - සඳහා වන යෝජනාවක් අද මෙම ගරු සභාවට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ වෙලාවේ විෂය භාර අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමාත් මෙම සභාවේ නැති නිසා, තවදුරටත් ඒ සම්බන්ධයෙන් අදහස් කිහිපයක් එකතු කරන්න පමණයි මම බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි පාර්ශ්වකරුවන්ගේ 21 වෙනි සැසිවාරය 2015 නොවැම්බර් මස ප්‍රංශයේ පැරිස් නුවරදී පැවැත් වුණා. එහිදී, රාජ්‍ය නායකයන් බොහෝ දෙනෙකු සහභාගි වෙලා දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමට එකඟතාව පළ කළා. මෙම ගිවිසුම, අහිතකර දේශගුණික විපර්යාසවලින් වන බලපෑමෙන් මිහිකත මුදවා ගනිමින් කාබන් විමෝචනය අවම තිරසාර අනාගතයක් සඳහා අවශ්‍ය වන්නා වූ ආයෝජන හා ක්‍රියා මාර්ග ශීඝ්‍රයෙන් ගොඩ නැඟීම සඳහා වූ සංධිස්ථානයක් වන අතර, එය ගෝලීය දේශගුණික කටයුතුවක් ගොඩ නැඟීම සඳහා වන නව ප්‍රවේශයක් ලෙස හඳුන්වා දෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගිවිසුමෙහි මූලික අරමුණු, කරුණු දෙකක් ඔස්සේ පෙන්වා දෙන්න පුළුවන්. පූර්ව කාර්මීකරණ යුගයට සාපේක්ෂව ගෝලීය සාමාන්‍ය උෂ්ණත්වය වැඩිවීම සෙන්ට්‍රිග්‍රේඩ අංශක දෙකට වඩා අඩුවෙන් පවත්වා ගෙන යාම එහි පළමුවැන්න වන අතර, එය සෙන්ට්‍රිග්‍රේට් අංශක 1.5 ඉක්මවා නොයෑම සඳහා උත්සාහ කිරීම දෙවැන්න ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. දේශගුණික විපර්යාසවල බලපෑම සහ එහි අවදානම සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමයි, ඒ මාර්ගයෙන් බලාපොරොත්තු වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම අරමුණු පදනම් වූ ඉලක්ක පැරිස් සමුළුවේදී හඳුනා ගෙන තිබෙනවා. දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ගෝලීය ප්‍රජාවගේ හැකියාව ශක්තිමත් කිරීම ඒ අතුරෙන් ප්‍රමුඛ ඉලක්කයක්. ඊට ළඟාවීම සඳහා මූල්‍ය තාක්ෂණය හා ධාරිතා සංවර්ධනය ස්ථාපිත කළ යුතු වනවා. දේශගුණ විපර්යාසවල අවදානමට ලක් වන සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව ඇතුළු රටවල් මෙම ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දිය යුතු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016 වසරේ අප්‍රේල් 22 වැනි දා ශ්‍රී ලංකාව මෙම ගිවිසුමට අත්සන් කළේ සාමාජික රටවල් 178ක් සමඟ. මෙම පැරිස් ගිවිසුම බලාත්මක වීමට අවම වශයෙන් පාර්ශ්ව රාජ්‍යයන් 55ක් අපරානුමත කිරීම අවශ්‍ය වනවා. එසේ අපරානුමත කළ රාජ්‍යයන් හරිතාගාර වායු විමෝචනය සමස්ත ගෝලීය හරිතාගාර වායු විමෝචනයෙන් සියයට 55ක් ද ආවරණය විය යුතුයි. ඒ අනුව සාමාජික රටවල් ඉහත එකඟතාව මත ගෝලීය උණුසුම පාලනය කිරීම සඳහා දේශීයව තීරණය කරන ලද දායකත්වය ප්‍රකාශයට පත් කළ යුතු වනවා. එමෙන්ම අදාළ එකඟතා සපුරා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන උපාය මාර්ගද ක්‍රියාත්මක කළ යුතු වනවා.

ගෝලීය උණුසුම වැඩි වීමට දායක වන හරිතාගාර වායු විමෝචනය සිදු වන ආංශික ක්ෂේත්‍ර අතුරින් බල ශක්තිය, ප්‍රවාහන මාධ්‍ය, පශු සම්පත්, වන සම්පත් සහ අපද්‍රව්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍රවලට හිමි වන්නේ ප්‍රධාන තැනක්. ශ්‍රී ලංකාවේද අපේක්ෂිත ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා දේශීයව තීරණය කරන ලද දායකත්වය ආකාර කීපයකින් සැලසුම් කර අවසන්. පැරිස් ගිවිසුම අප රටේ අපරානුමත කිරීමෙන් වාසි කීපයක් අපේක්ෂා කරන බව මා මේ මොහොතේදී සිහිපත් කරන්න කැමැතියි. ඒ අතුරින් ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම අවම කිරීම හා දේශගුණික විපර්යාසවලට මුහුණ දීම සඳහා වූ ගෝලීය උත්සාහයට දායක වීම මඟින් ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධන මාවතකට යොමු වීම ප්‍රධාන තැනක් ගන්නා බව පෙන්වා දෙන්න පුළුවන්. මීට අමතරව, හරිත දේශගුණ අරමුදල - Green Climate Fund - වැනි අරමුදල් මඟින් සහාය ලබා ගැනීම දේශගුණ විපර්යාසයකදී ජනතාවගේ සෞඛ්‍ය, ආහාර සුරක්ෂිතතාව සහ ජල හා වාරි මාර්ග වැනි ක්ෂේත්‍රවලදී අවශ්‍ය ජාත්‍යන්තර සහාය ලබා දීම ආදිය සාමාජික රටකට හිමි වන සුවිශේෂ වාසි කීපයක් ලෙසත් හඳුන්වා දීමට පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියල්ල පසු පස සැහවුණු යථාර්ථය ලෙස ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම අවම කිරීමේ ඉලක්කය සපුරා ගැනීම මඟින් මෙම සියවස තුළ ප්‍රධාන පාරිසරික අභියෝගය වන දේශගුණ විපර්යාස ජය ගැනීමට අපට හැකියාවක් ලැබෙයි. එමඟින් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා ස්වාභාවික පරිසර පද්ධතිවල ස්ථායීතාව තහවුරු කර ගැනීමටත් හැකියාව ලැබෙනවා. ඒ අනුව මෙම "පැරිස් ගිවිසුම" මඟින් තිරසාර අනාගතයක් ගොඩනැඟීමේ ක්‍රියාවලියට ශ්‍රී ලංකාවට සක්‍රිය දායකත්වයක් ලබාදිය හැකි බව අපට විශ්වාසයි. එය තිරසාර අනාගතයක් සඳහා වූ ක්‍රියාමාර්ග සාර්ථක කර ගැනීමට ශ්‍රී ලංකාවට හිමි වන මහඟු අවස්ථාවක් බව සිහිපත් කරමින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාවක් ලබාදීම ගැන ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්තුතියි.

මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

[අ.භා. 12.03]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෙම පාරිසරික ගිවිසුම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් අපේ ස්ථාවරය ඉදිරිපත් කර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට කැමැතියි.

අප මුලින්ම මෙම 'COP 21' කියන, නැත්නම් 'පැරිස් ගිවිසුම' කියලා හඳුන්වන මෙම ගිවිසුමට ශ්‍රී ලංකා රජය එළඹීම පිළිබඳවත්, එමෙන්ම එම ගිවිසුම මේ පාර්ලිමේන්තුවේදී අනුමත කිරීමටත් අපේ දායකත්වය ලබාදීමට මුලින්ම කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප වැනි රාජ්‍යයන්වලට වඩා බලගතු, විශේෂයෙන්ම පසු ගිය අවුරුදු 200 ඇතුළතදී ලෝකයේ වැඩිම පරිසර දූෂණයට වග කියන්න ඕනෑකම තිබෙන, වායුගෝලයට අහිතකර වායු වැඩිපුරම නිෂ්පාදනය කරන රාජ්‍යයන් වන ඇමෙරිකාව, කැනඩාව හා ජපානයත්, ඒ වාගේම දියුණු වෙමින් පවතින රටවල් වශයෙන් හඳුන්වන චීනය සහ ඉන්දියාවත් මේ ගිවිසුමට එකඟ වෙන්නේ පැහැදිලිවම ලෝකය පුරා පරිසරවේදීන්, සිවිල් සංවිධාන සහ ප්‍රගතිශීලීන් සුවිශාල වශයෙන් බිම් මට්ටමෙන් කරන ලද මැදිහත්වීම් මතයි. එම නිසා මේ මැදිහත්වීම් මත එකඟවීම පිළිබඳව අපි අපේ සතුට ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම අපි දූපත් රාජ්‍යයක් වශයෙන් ගෝලීය උණුසුම ඉහළ යාමේ සෘජු තර්ජනයට ලක්වී තිබෙන රාජ්‍යයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ අවස්ථාවේදී පිළිගනු ලැබූ, ගරු කථානායකතුමාගේ විශේෂ ආරාධනය ලැබ පැමිණ සිටින මෙම ආරාධිතයන් නියෝජනය කරන තස්මේනියානු රාජ්‍යයත්, ඕස්ට්‍රේලියාවට අයත් දූපතක්. එයත්, දූපතක් වශයෙන් මේ ගැටලුවට මුහුණ දෙන රාජ්‍යයක්. ඒ නිසා, මේ කාරණයෙහි විශේෂ වැදගත්කමක් තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටවල් 200ක් එකතු වී අත්සන් කරන ලද ඒ ගිවිසුම සම්බන්ධව අද ලෝකයේ සුවිශාල සාකච්ඡාවක් තිබෙනවා. ඒ ගිවිසුම, toothless - දත් නැති -

[ගරු බිමල් රත්නායක මහතා]

agreement එකක් යැයි කියනවා. ලෝකයේ ප්‍රථම වතාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීම මත පාරිසරික සම්මුතිවලට එළඹීමට 1992 වර්ෂයේදී ලෝකය උත්සාහ කරපු අවස්ථාවේ සිට අද දක්වා අවුරුදු 24ක ගමනක් ඇවිත් තිබෙනවා. මේ අවුරුදු 24 ඇතුළත විශේෂයෙන්, ලෝකයේ බලගතු රාජ්‍යයන් විවිධාකාර පොරොන්දු ලබා දීලා තිබෙනවා.

මට ලැබී තිබෙන කෙටි කාලය තුළ මා එක් උදාහරණයක් කියන්න කැමැතියි. එහි ඊළඟ අදියර වශයෙන් ආ, ජපානයේදී අත්සන් කරන ලද Kyoto Protocol කියන ගිවිසුමේ "Industrialised countries would be legally obliged to cut their greenhouse gas emissions by 5 per cent below 1990 levels by 2008– 2012" යනුවෙන් සඳහන්ව තිබෙනවා. 1990 තිබුණු වායු විමෝචන මට්ටමට වඩා සියයට 5කින් අඩු කරන්න තමයි Kyoto Protocol එකේදී දියුණු වූ රාජ්‍යයන් එකඟ වුණේ. ඔවුන්ට ඒ සම්බන්ධව නීතිමය බැඳීමක් තිබුණා.

විශේෂයෙන් BRICS රටවල් ඇතුළු දියුණු වෙමින් පවතින රාජ්‍යයන්ට නීතිමය වශයෙන් බැඳීමක් තිබුණේ නැති වුණත්, ඔවුන්ටත් බලපෑමක් තිබුණා වායු විමෝචන මට්ටම අඩු කරන්න කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් ඒ නීතිමය බැඳීම් තිබීම නිසා එවකට එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා එය අත්සන් කරපු අවස්ථාවට සහභාගි වුණත්, එක්සත් ජනපද කොංග්‍රස් මණ්ඩලය එම ගිවිසුම 95:0ක් වශයෙන් පැරදවුවා. ඇමෙරිකානු එක්සත් ජනපදයේ Senate එක ඇතුළු කොංග්‍රස් මණ්ඩලයේ එක්කෙනෙක්වත් ඡන්දය දුන්නේ නැහැ, එම පරිසර ගිවිසුමට. ඊට පසුව ජෝර්ජ් බුෂ් හිටපු ජනාධිපතිවරයා ගිවිසුමෙන් තමන්ගේ රාජ්‍යයේ අත්සනත් ඉල්ලා අස් කරගත්තා, 2002 වර්ෂයේදී. ඒ මත පදනම් වෙලා, ඊට පසුව Kyoto Protocol එක ප්‍රායෝගිකව අක්‍රිය වන්න පටන්ගත්තා. Protocol එක අත්සන් කරපු ජපානය පවා 2012දී තමන්ගේ අත්සන ඉල්ලා අස් කරගෙන ඉවත් වුණා. කැනඩාව එයින් ඉවත් වුණා. 1992දී ඒ ගිවිසුම අත්සන් කරද්දී එකඟ වුණා, පරිසරයට අහිතකර, ගෝලීය උණුසුමට දායක වන වායු විමෝචනය 1990 මට්ටමට වඩා සියයට 5කින් අඩු කරනවා කියා. නමුත් 2012 වන කොට 1990දී තිබුණු ප්‍රමාණයට වඩා සියයට 22කින් ඒක වර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා නෛතික වශයෙන් බැඳීමක් තිබුණු ගිවිසුම, කඩවුණු පොරොන්දුවක් වුණා. ඒ ගිවිසුමේ නෛතික බැඳීමක් තිබුණා. ඒ කියන්නේ මේ අදාළ emission rates පවත්වාගෙන ගියේ නැත්නම් රාජ්‍යයන් දඩ ගෙවිය යුතුයි.

අද තිබෙන තත්ත්වය ගැන බලමු. අපි negative විධියට හිතලා නොවෙයි, මේ කාරණය කියන්නේ. රාජ්‍යයන්වලට මේ සම්බන්ධව උනන්දුවක් තිබෙනවා. නමුත් ප්‍රධාන බලගතු රාජ්‍යයන් පැත්තෙන් ගත්තොත් - වැඩිම emmissionsවලට දායකවන රාජ්‍යයන් ගත්තොත්- ඔවුන්ගේ මේ සම්බන්ධයෙන් තිබෙන්නේ ඉතාමත් දුර්වල ප්‍රතිචාරයක්. උදාහරණයක් විධියට මා මේ කාරණය කියන්නම්. ඕලන්දයේ - Hollandවල - PBL Netherlands Environmental Assessment Agency එකෙන් කරපු නිරීක්ෂණ වාර්තාවක ඉදිරිපත් කරලා තිබෙනවා, මේ වෙන කොට 1990දී තිබුණු මට්ටමට වඩා සියයට 65කින් වැඩි වෙලා තිබෙනවා කියා. මම කලින් කිව්වේ 2012දී තිබුණු මට්ටමයි. 1990දී තිබුණාට වඩා සියයට 5කින් අඩු කරන්නයි යෝජනාව තිබුණේ. නමුත් මේ වන විට greenhouse gases කියන ඒවායේ වර්ධනය 1990දී තිබුණු මට්ටමට වඩා සියයට 65කින් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඉතා පැහැදිලියි, කොච්චර සල්ලි වියදම් කරගෙන කොච්චර විශාල සමූළු පැවැත්වුවත් ඒවාට රාජ්‍යයන් ඇප කැප වෙන්නේ නැත්නම්, ඒවාට නීති පනවා ගන්නේ නැතිනම්, පනවාපු නීතිත් කඩනවා නම් මේ ගිවිසුම් තේරුමක් නැහැ කියන එක.

"පැරිස් ගිවිසුම" ගත්තොත්, ඒක ඉතාම දියාරු ගිවිසුමක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පැරිස් ගිවිසුම" සම්බන්ධයෙන් පරිසරවේදීන්ගෙන් තිබෙන ප්‍රධාන චෝදනාවක් තමයි, ජාත්‍යන්තර වශයෙන් මෙයට කිසිම නෛතික බැඳීමක් නැහැ කියන එක. එක් එක් රාජ්‍යයන්ට කියලා තිබෙනවා, ඔයගොල්ලන් කැමැති ඒවා කියන්න කියලා. ලෝකය, අනතුරෙන් ගලවා ගන්න එක නේ අවශ්‍ය වෙන්නේ. ඔබතුමාටයි, මටයි කැමැති දේ නොවෙයි කරන්න වෙන්නේ. මේ විධියට greenhous gas emissions වැඩි වුණොත් ලෝකයේ උණුසුම වැඩි වෙනවා. උණුසුම වැඩි වුණොත් අපි වාගේ දුප්පත් රාජ්‍යයන්වලට බලපෑම් ඇති වෙනවා. අපේ රටට විතරක් නොවෙයි, මුළු ලෝකයේම මිලියන 500කට වඩා ජනතාවකට ඒක බලපානවා. සුවිශාල වශයෙන් කෘෂිකර්මයට බලපානවා. මහා බ්‍රිතාන්‍යයට බලපාන්නේ ඒ රට යටවීම පැත්තෙන් නොවෙයි. ඒ රටවල්, ජනතාව relocate කරන්න සම්පත් තිබෙන රටවල්. නමුත් ඔවුන්ගේ කෘෂි කර්මාන්තයට දැවැන්ත තර්ජනයක් ඇති වෙනවා.

බ්‍රිතාන්‍යයේ විද්‍යාඥයන් පර්යේෂණය කර තිබෙනවා මා දැක්කා, ඔවුන්ට මේක බලපාන්නේ කොහොමද කියන එක ගැන. මේ විධියට ගියොත්, 2050 වෙනකොට ග්ලැසියර් දිය වෙනවා. උතුරු ආර්ටික්වල ග්ලැසියර් දියවුණාම එයින් මහා බ්‍රිතාන්‍යයට ලැබෙන උණුසුම් දියර, ග්ලැසියර් ගලාගෙන යාමත් එක්ක ඒ උණුසුම් දියරවල උෂ්ණත්වය අඩු කරනවා. ඒ උණුසුම් දියරවල් ශීතල දියරවල් බවට පත්වුණාට පස්සේ එය මහා බ්‍රිතාන්‍යයේ කෘෂිකර්මාන්තයට බලපානවා. ලෝකයේ විද්‍යාඥයන්, ලෝකයේ පරිසරවේදීන් තීන්දු කර තිබෙනවා, අනතුරු වළක්වා ගන්නට නම් මේ මට්ටමෙන් උෂ්ණත්වය පවත්වා ගත යුතුය කියා. එතකොට ලෝකයේ රාජ්‍යයන් කටයුතු කළ යුතු වෙන්නේ, අනතුර වළක්වා ගැනීමට අවශ්‍ය කරන මැදිහත් වීමක් සඳහායි. නමුත් "පැරිස් ගිවිසුම" ගත්තාට පස්සේ කවුරුත් සතුටු වෙලා; ඇමෙරිකාවත් සතුටුයි; චීනයත් සතුටුයි; ප්‍රංශයත් සතුටුයි; කවුරුත් සතුටුයි. නමුත් මේ කියන විධියට සෙන්ටිග්‍රේඩ් 1.5ට අඩු කළාට පස්සේත් ලෝකයේ තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බේරා ගත නොහැකි මට්ටමක්. එම නිසා ඇත්තටම ගත්තොත් මෙහි තිබෙන්නේ ලෝකයේ ජනතාව ඉල්ලා සිටින දෙය නොවෙයි. ලෝකයේ මහා පරිමාණ බලශක්ති සමාගම්, මහා පරිමාණ සමාගම් තමයි අවසානයේදී මේ "පැරිස් ගිවිසුම" තීන්දු කර තිබෙන්නේ. අප වාගේ කුඩා රාජ්‍යයකට මේ ගැන චෝදනාවක් නැති වුණත් මේ සම්බන්ධයෙන් විවිධාකාර අදහස් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Please continue with your speech, Hon. Member.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ "පැරිස් ගිවිසුම" සම්බන්ධව අද ලෝකයේ තිබෙන ප්‍රධානම චෝදනාව තමයි මේ සඳහා කිසිම රාජ්‍යයන්ට වග වීමක් නැහැ කියන එක. ඒ වාගේම මේ සම්බන්ධව පුවත් පත් වාර්තා සුවිසාල වශයෙන් පළ වී තිබෙනවා අපි දැක්කා. ඇමෙරිකා එක්සත් ජනපදයේ, මහා බ්‍රිතාන්‍යයේ පළ කරන ප්‍රධාන පෙළේ agenda-setting mediaවල මේ සම්බන්ධයෙන් පළ වී තිබෙනවා.

විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ මැතිවරණයක් මේ දවස්වල තිබෙන නිසා ඔවුන් ඉතා පැහැදිලිව කියා තිබෙනවා, ඔවුන්ට මෙතැනදී කිසිම ආකාරයක බැඳීමක් නැහැ කියා. මා මෙහිදී මේ කාරණයත් කියන්නට ඕනෑ. ඇමෙරිකා එක්සත් ජනපදයේ රිපබ්ලිකන් පාක්ෂික සෙනෙට් සභිකයෙක් වන Jim Inhofe මෙසේ කියනවා; "This agreement is no more binding than any other 'agreement' from any Conference of the Parties over the last 21 years." 'Last 21 years' means, since 1992. "Senate leadership has already been outspoken in its positions that the United States is not legally bound to any agreement setting emissions targets or any financial commitment to it without approval by Congress."

මෙතැන නීතිමය බැඳීමකුත් නැහැ. ඒ නිසා ඔවුන් මුදල් ගෙවන්න ලැස්තිත් නැහැ. මෙහි යෝජනාවක් තිබෙනවා බලගතු රාජ්‍යයන් විසින් ඩොලර් බිලියන 100ක් දියුණු වෙමින් පවතින රාජ්‍යයන්වල clean energy development - green energy development - වලට දෙන්න ඕනෑය කියලා. මේක ඇමෙරිකාවේ ප්‍රධාන පෙළේ සෙනෙට් සභිකයෙකුගේ අදහස. ඒ කෙසේ වෙතත්, මට මෙතැනදී මූලික වශයෙන්ම කියන්න ඕනෑ කාරණය මේකයි. පොදුවේ ගත් කළ ලෝකයේ ජනතාවගේ, දේශපාලන සංවිධානවල, පරිසරවේදීන්ගේ බලපෑම මත පරිසරය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් යම් හොඳ පැත්තකට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේක meaningless Agreement එකක් කියලා අපි කියන්නේ නැහැ. මේක වැදගත් Agreement එකක්, අවශ්‍ය Agreement එකක්. හැබැයි, මේකට අවශ්‍ය බලතල නැහැ. මේ ගිවිසුම දඬුවම් නැති, නියෝග ක්‍රියාත්මක කරන්නේ නැති පනතක් වාගෙයි. ඒකයි මා කලින් කිව්වේ, නීතිමය බැඳීම් තිබුණු, penalties තිබුණු protocols පවා කඩ කරමින් ප්‍රධාන පෙළේ රාජ්‍යයන් කටයුතු කළ ආකාරය. ඔවුන් ඇත්තටම කථා කරන්නේ තෙල් සමාගම්වල භාෂාව. ඒ නිසා ගිවිසුමක් වශයෙන් ගත්තොත් මේකෙන් කිසිදු ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ කියන එකයි පරිසරවේදීන්ගේ අදහස වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තාක්ෂණික ක්‍රමවලට පරිසරය ආරක්ෂා කරන්න පුළුවන් කියන එකයි වර්තමානයේ තිබෙන ප්‍රවණතාව. මේක සම්පූර්ණයෙන්ම වැරදියි. ඔබතුමාට මතක ඇති, ඔය Kyoto Protocol ආපු කාලයේම තමයි "carbon trading" කියලා කථාවක් ආවේ. දියුණු රටවලට ඒකෙන් ඉඩක් දුන්නා, ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න export කරන්න. දියුණු රටවල් පරිසරය දූෂණය කරනවා, ඔවුන් පරිසරය නාස්ති කරනවා. ඒ දියුණු රටවල ඒ වැරදි නිෂ්පාදන ක්‍රම වෙනස් කර ගන්නේ නැතිව carbon trading කරනවා කියලා ක්‍රමයක් හඳුන්වා දුන්නා. ඒ ක්‍රමයෙන් ගෝලීය උණුසුම සෙන්ටිග්‍රේඩ් අංශක දශමයක්වත් අඩුකර ගන්න පුළුවන් වෙලා නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලාභයම පමණක් ඉලක්ක කරගෙන ලෝකය දිහා බලන දේශපාලන ආර්ථික ක්‍රමයකට පරිසරය ආරක්ෂා කර ගන්න බැහැ කියන එක අපි කියන්න කැමැතියි. ප්‍රාග්ධනයටයි, තාක්ෂණයටයි ලෝකයේ ප්‍රශ්න විසඳන්න පුළුවන් වුණා නම්, දැන් මේ ලෝකයේ ප්‍රශ්න විසඳලා ඉවරයි. ඒ සඳහා මම හොඳ උදාහරණයක් කිව්වා. අධි පරිභෝජනවාදී නිෂ්පාදනය, නාස්තිකාර නිෂ්පාදනය, ඒ වාගේම තෙල් සමාගම්වල සහ බලශක්ති සමාගම්වල උවමනාවට -ඒවා තමයි වැඩිම ලාභ ලැබෙන ව්‍යාපාර- කරන නීති - රීති සකස් කිරීම ආදී එකක්වත් වෙනස් කරන්නේ නැතුව මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා අපි හිතන්නේ නැහැ. මේක මා කරන චෝදනාවක් නොවෙයි. 2011දී කැනඩාව Kyoto Protocol එකෙන් ඉවත් වන විට ඒ අගමැතිතුමාට පැහැදිලි චෝදනාවක් තිබුණා, ඔහුගේ පක්ෂයේ ප්‍රධානීන් රාශියක් කැනඩාවේ තෙල් සමාගම්වලට සම්බන්ධ පුද්ගලයන් කියලා. ලෝකයේ තෙල් මිල ඉහළ යෑමත් එක්ක ඔවුන් ඒ ඒ තෙල් සමාගම්වල බලපෑමට ලක් වී තිබුණා. 2001 වසරේදී ජෝර්ජ් බුෂ් ඉවත් වන විට අපි කවුරුත් දැන ගෙන සිටියා, ජෝර්ජ් බුෂ් කියන්නේ කලින් තෙල් සමාගමක කටයුතු කරපු ප්‍රධාන පෙළේ පුද්ගලයෙක් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැහැදිලිවම මෙතැන තිබෙන්නේ "ධනපති" ක්‍රමයත් එක්ක තිබෙන ප්‍රශ්නයක්. ඒ වචනය දරුණු වෙන්න පුළුවන්. නමුත් ඒක තමයි ඇත්ත. පරිසරවේදීන් ගණන් බලා තිබෙන ආකාරයට 1992 වසරේ ඉඳලා පරිසරය සම්බන්ධව පැවැති ප්‍රධාන පෙළේ සාකච්ඡාවලට පමණක් flights 3,000කින් ලෝකයේ රාජ්‍ය නායකයන් ගමන් කරලා තිබෙනවා. ඒ flights 3,000න් සිදු වුණු පරිසර හානියවත් පසු ගිය අවුරුදු විසිහතර තුළදී අඩුවෙලා නැහැ කියලා ඔවුන් කියනවා. පරිසර සමුළුවලටම flights 3,000කින් ගිහිල්ලා තිබෙනවා! අද 21වන සියවස ගැන කථා කළාට, මිනිසුන් ගැන ආදරයක් නැති ක්‍රමයක් තිබෙන්නේ. මෙතැන සම්පූර්ණයෙන්ම තිබෙන්නේ terminology වෙනස් කරන ක්‍රමයක්. 2000 වසරේදී Millennium එකක් ආවා කියලා ලෝකයට ලොකු කථාවක් කියලා අපට දුන්නේ මොනවාද? MDGs -Millennium Development Goals- කියලා අපට දුන්නා කැරට් අලයක්. ඒවා හොඳ යෝජනා. ඒවායේ කිසි වැරැද්දක් නැහැ. යෝජනා වශයෙන් ගත්තොත් ඒවා ඉතා හොඳ දේවල්. 2015 වසර වන විට මේ සහස්‍ර සංවර්ධන ඉලක්ක සම්පූර්ණ කර ගත යුතුයි කිව්වා. නමුත් 2015 වසර වන විට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ ඉලක්කවලින් එකක්වත් සම්පූර්ණ වෙලා නැහැ. ඒවා සම්පූර්ණ කරන්න ලෝකයේ පිළිගත් ලොකු රටවල් එකක්වත් උදව්වු කරලාත් නැහැ. 2015 වසරේ වූ ඒ වැරැද්ද පිළිගන්න වෙනවාට ඊට පස්සේ මොකක්ද කළේ? ඊට පස්සේ ඒ නම වෙනස් කළා. දැන් SDGs-Sustainable Development Goals- කියලා නම වෙනස් කරලා, තව අවුරුදු 15කට ඉලක්ක 17ක් දමලා තිබෙනවා. ඒ ඉලක්ක බලන්න තිබෙන්නේ 2030දී. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරන්නේ තමන්ගේ බැරිකම එක එක smart ක්‍රමවලින් වහගන්න එකයි. ලෝකය උණුසුම් වෙලා පෘථිවිය විනාශ වෙන්න යනවා නම්, කෘෂි කර්මාන්තය, ජන ජීවිත විනාශ වන්න යනවා නම්, ඒ සඳහා කළ යුතු සැබෑ දේ කරන්න ඕනෑය කියන එකයි අපි දකින්නේ. වර්තමාන ආණ්ඩුව මේ පරිසර ප්‍රශ්නයට සෘජුව අහුවෙන්නේ, ඊට ගැළපෙන ආර්ථික ප්‍රතිපත්ති, ඊට ගැළපෙන මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන නිසායි. එහෙම නැතිව, පරිසරය සම්බන්ධ ප්‍රශ්නයේදී මේ ගිවිසුමට අදාළව ආණ්ඩුවට එල්ල කරන්න විශේෂ විවේචනයක් අපට නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මේ ගිවිසුමට විරුද්ධ වන කණ්ඩායම්වල මැදිහත් වීම මත තමයි තමුන්නාන්සේලා මේ ආර්ථිකය සකස් කරන්නේ. දැන් මා

[ගරු බිමල් රත්නායක මහතා]

උදාහරණයක් කියන්නම්. සංචාරක ක්ෂේත්‍රය පැත්තෙන් ගත්තොත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ මන්නාරම දිස්ත්‍රික්කයටත් කිව්වුව, විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ දූපත් රාශියක් තිබෙනවා. වෙල්ලායි, ඉප්පන්තිවු, බත්තලංගුණ්ඩුව, පල්ලියවත්ත, වෙල්ලායි I, II, III, උච්චිමුනේයි, පෙරිය අරිච්චාලයි, සින්න අරිච්චාලයි, ඉරුමුතිව්, සින්න ඉරුමුතිව්, ඉරුමුතිව් බටහිර, කාකතිව් සහ මුතුවල් වශයෙන් දූපත් රාශියක් තිබෙනවා. තමුන්නාන්සේලා මේ දූපත්වලට මොකක්ද කරමින් ඉන්නේ? තමුන්නාන්සේලා කිසිම ප්‍රශ්නයක් නැතුව මේ දූපත්වලින් දූපත් දෙකක් දූපත් විධියටම බදු දීලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ රජයෙන් නොවෙයි ඒක කළේ කියන්න පුළුවන්. නමුත් තමුන්නාන්සේලාත් ඒක අවලංගු කරලා නැහැ නේ.

ඊළඟට, පසු ගිය කාලයේ -තමුන්නාන්සේලාගේ කාලයේ- ලොකුම සිද්ධියක් වුණා. කොකා-කෝලා සමාගමෙන් විෂ සහිත රසායන ද්‍රව්‍ය කැලණි ගඟට එකතු කළා. ඒ නිසා රුපියල් කෝටි ගණනක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පාඩු වුණා. නමුත් තමුන්නාන්සේලා එක රුපියලක්වත් අලාභ හැටියට ඒ සමාගමෙන් අය කර ගත්තේ නැහැ. ලංකාවේ තෙල් කොම්පැනි නැහැ. ලංකාවේ තිබෙන්නේ කොකා-කෝලා වැනි කොම්පැනි. ඇමෙරිකාව වැනි රටවල ලොක්කෝ තෙල් කොම්පැනි ළඟ දණ ගහන කොට, මේ රටේ තමුන්නාන්සේලා කොකා-කෝලා කම්පැනිය ළඟ දණ ගහනවා. අපි මේ රජයෙන් ඉල්ලා සිටිනවා, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, අවසන් කරන්නම්.

අපි ඉතාම වග කීමෙන් මේ ගිවිසුමට සහයෝගය දෙන ගමන් ලාභය පමණක් සොයා ගෙන එළවන ක්‍රමයට නොගොස් ලංකාවේ පරිසරයවත් බේරා ගන්න කියා ඉල්ලා සිටිනවා. වැලි ගොඩ දැමීම නිසා ලංකාවේ ගංගා විනාශ කරනවා. ඒවා කරන්නේ කවුද? ආණ්ඩුවේ, විපක්ෂයේ දෙපර්ශ්වයේම අය ඒක කරනවා. මේ protocols අත්සන් කරන්න කලින් අපේ ගංගා ටික බේරා ගන්න එපා යැ; කැලෑ ටික බේරා ගන්න එපා යැ. ඒවා විනාශ කරන්නේ කවුද? ඒවා විනාශ කරන්නේ දේශපාලනඥයන් පමණක් නොවෙයි. දේශපාලනඥයන්ට උදව් කරන ලොකු ව්‍යාපාරික පැළැන්තියක් ඉන්නවා. ඒ අයත් ඒවාට සම්බන්ධයි.

මේ ගිවිසුමට අත්සන් කරන්න. එයට අපිත් උදව් කරන්නම්. අනාගතය වෙනුවෙන් අපේ රටේ පරිසරය ආරක්ෂා කරන්න ප්‍රායෝගික දෙයක් කරන්න කියලා තමයි අපි අවසාන වශයෙන් ඉල්ලා සිටින්නේ.

[අ.භා. 12.24]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශගුණික විපර්යාස පිළිබඳව පැරිස් සම්මුතිය මේ පාර්ලිමේන්තුවේ සභාගත කරලා සියලුදෙනාගේම එකඟතාව මත අපරානුමතිය ලබා දීම සඳහා අද දින න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මා සතුටු වනවා.

2016 අප්‍රේල් මාසයේ 22වන දා නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී සාමාජික රටවල් 193න් රටවල් 175ක් මේ ගිවිසුමට අත්සන් කළා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නම් කිරීම මත ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එම ගිවිසුමට අත්සන් කිරීම සඳහා හිටපු පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයකු හැටියට මට අවස්ථාව ලැබුණා. මෙය ඓතිහාසික සම්මුතියක්. මෙයට මහ පෑදුණේ, 1990 සිට, මේ රටේ පමණක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් විද්‍යාඥයන් රාශියක් විසින් විවිධ අවස්ථාවල ගෝලීය උෂ්ණත්වය කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙනු ලැබූ නිසායි. ඒ අනුව ජපානයේ කියොතෝ නගරයේදී අත්සන් කරපු Kyoto Protocol එකටත් සමහර ප්‍රබල රටවල් අත්සන් කළේ නැහැ.

ගෝලීය උෂ්ණත්වය කළමනාකරණය කළ යුතුය කියන කාරණය විද්‍යාඥයන් විසින් කොයි තරම් පෙන්වා දෙනු ලැබුවත්, බොහෝ වෙලාවට රටවල දේශපාලන නායකයන් ඒ පිළිබඳව එතරම් අවධානයක් යොමු කළේ නැහැ. සංවර්ධනය, දූප්පත්කම තුරන් කිරීම, ආහාර නිෂ්පාදනය, නිවාස, ශීඝ්‍ර කාර්මිකකරණය ආදී කරුණු ඊට වඩා වැදගත් වුණා. මුල් අවස්ථාවල ඒක කළමනාකරණය කරන ලෙස කළ ඉල්ලීමට ගත් ක්‍රියා මාර්ග ප්‍රමාණවත් නොවුණු නිසා එහි ප්‍රතිඵලයක් විධියට මේ වන විට - 1990 සිට අවුරුදු 25ක් ගත වුණු තැන දී - මේ සියලු දෙනාම එකඟ වන තැනකට එන්න සිද්ධ වුණා. මෙය කළමනාකරණය කර ගැනීම නොවෙයි, කළමනාකරණය කර ගන්න බැරි මට්ටමින් ඉහළට යන කොට ඒක පාලනය කර ගැනීම සඳහා. මුලින්ම අවශ්‍ය වුණේ ගෝලීය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 1.5න් එහාට වැඩි වීම කළමනාකරණය කිරීමයි. හැබැයි, ඒ පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ග නොගැනීමේ හේතුව නිසා මෙය සෙන්ටිග්‍රේඩ් අංශක 4න් එහාට ඉහළ යන බවට වාර්තා වෙන්න පටන් ගත්තා. මේ හේතුව නිසා ලෝක නායකයින්ට ඇති වූ බලපෑමේ ප්‍රතිඵල හැටියට; එය අවබෝධ කර ගැනීමේ ප්‍රතිඵලයක් හැටියට විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමා විසින් 2015 නොවැම්බර් මාසයේ පැරිසියේ දී පැවැත් වූ ලෝක රාජ්‍ය නායකයින්ගේ සමුළුවේදී මේ සඳහා සම්මුතියකට එළඹෙන්න අවශ්‍යයි කියන එකඟතාවකට ආවා. ඒ අනුව තමයි, 2016 අප්‍රේල් 22වැනිදා මේ ගිවිසුම අත්සන් කිරීම උත්සවාකාරයෙන් ආරම්භ කළේ. එදින රටවල් 175ක් මේ ගිවිසුමට අත්සන් තැබුවා.

ඒ රටවල තිබෙන්නා වූ ව්‍යවස්ථාවන් අනුව ඒ රටවල් විසින් මෙය අපරානුමතිය කිරීම කළ යුතු ආකාරයන් තිබෙනවා. මේ අපරානුමතිය දීමේදී වායු ගෝලයට මුදා හරින emissions වලින් සියයට 50කට, 55කට වැඩියෙන් තිබෙන රටවලින් සියයට 55ක් මේ සඳහා අපරානුමතිය ලබා ගත යුතුව තිබෙනවා. ඒ ක්‍රියා දාමය ආරම්භ වෙලා යන ගමනේදී රටවල් ගණනාවක් මේ වන විට අපරානුමතිය ලබා ගෙන තිබෙනවා. පසු ගිය දිනවල චීනයේ පැවැත්වුණු G20 සමුළුවේදී ඇමෙරිකා එක්සත් ජනපදය සහ චීනය ඒ සඳහා අපරානුමතිය දෙන බවට එකඟ වුණා. රාජ්‍ය නායකයින් අතර එකඟතාව ප්‍රකාශ කිරීමත් එක්ක රටවල් ගණනාවක් මේ අපරානුමතිය ලබා දීම සඳහා ඉදිරිපත් වුණා. ඒ නිසා අපේ රටෙත්, විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා පරිසර විෂය භාර අමාත්‍යවරයා හැටියට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සන්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරලා අද සියලුම පාර්ශ්වවල එකඟතාව ඇතිව ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට මේ පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. ඒ අනුව තමයි අද අපි මේ විවාදය පවත්වා ගෙන යන්නේ.

ඊළඟ කාරණය මේකයි. මේ සඳහා පැරිස් දේශගුණික විපර්යාස සම්මුතියට සමගාමීව පසු ගිය 2015 වර්ෂයේ පැවැත්වූ එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේදී තිරසාර සංවර්ධන ඉලක්කයන් - SDGs- 17ක් ප්‍රකාශයට පත් කළා - 17 Goals and 162 Targets. එම 17න් පළමුවැනි එක දුප්පත්කම තුරන් කිරීම. ඒ වාගේම අධ්‍යාපනය, සෞඛ්‍යය මේ ආදී වශයෙන් කරුණු 17ක් තිබෙනවා. 2030 වන විට මේ 17 සාක්ෂාත් කර ගැනීම තමයි ඉලක්කය. ඒ කියන්නේ ඊළඟ circle එක අවුරුදු 15ක්. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ සහශ්‍රක ඉලක්කයන් -MDGs- අටක් තිබෙනවා. හැබැයි, නිශ්චිත කාල සීමාවට පෙර - 2015ට පෙර- අපේ රටේ මේ සහශ්‍රක ඉලක්ක සියල්ලම පාහේ සම්පූර්ණ කර ගන්නට අපට පුළුවන්කම ලැබුණාය කියන එක මම කියන්න ඕනෑ. එයින් එකක් තමයි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය අතර අසමතුලිතතාව - gender inequality - නැති කිරීම. ඒක දැන් අපේ රටේ බොහෝ ක්ෂේත්‍රවල සිදු වෙලා තිබෙනවා.

රැකියා ක්ෂේත්‍රය ගත්තත්, වෛද්‍ය වෘත්තිය, ඉංජිනේරු වෘත්තිය හෝ වෙනත් වෘත්තීන් ගත්තත්, අධ්‍යාපනය ගත්තත් අප්‍රිකාව වැනි බොහෝ රටවල තිබෙන වෙනස අපේ රටේ නැහැ. ඊළඟට, enrolment rate. අපේ රටේ යුද්ධය පැවැති කාල සීමාව හැරුණාම එම ප්‍රදේශවල වයස අවුරුදු පහ සම්පූර්ණ වෙන දරුවන් -පාසල් යා යුතු වයසේ සිටින නමුත් යම් යම් දුර්වලතාවන් තිබෙන දරුවන් හැරුණාම- අධ්‍යාපනය සඳහා අනුගතවීම මේ වනවිට ඉතා හොඳ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා; සියයට සියයේ ඉලක්කය දක්වා ඇවිල්ලා තිබෙනවා.

මට දීර්ඝ වශයෙන් කථා කරන්න වේලාවක් නැහැ. නමුත් මෙම ගිවිසුමේ තිබෙන වැදගත්කම මම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. MDGs ගණනාවක් අපේ රට සාක්ෂාත් කර ගෙන තිබෙනවා. SDGs දහහතෙනුත් බොහෝ ප්‍රමාණයක් මේ වනවිට සාක්ෂාත් කර ගනිමින් පවතිනවා. නිශ්චිත දින වකවානුවලට කලින් ඒක කරන්න පුළුවන්. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා හරිත සංවර්ධනයක් ගැන සඳහන් කළා. හැබැයි, මම කථා කරන්නේ නීල හරිත සංවර්ධනය ගැනයි. "නීල හරිත" කියලා කියන්නේ, ගොඩබිම; හරිත; මුහුදු; නිල් කියන එකයි. ඒ නිසා දූපත් රටක් වන අපට නීල හරිත සංවර්ධනය තමයි පරිසර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක දෙකකට වඩා වැඩිවීම පාලනය කර ගැනීම සඳහාත්, එය සෙන්ටිග්‍රේඩ් අංශක 1.5 මට්ටමේ පවත්වා ගෙන යාම සඳහාත් මෙම සම්මුතියත් එක්ක අප බැඳී සිටිනවා. මෙතැන binding එකක් නැහැ කිව්වාට මෙවැනි සම්මුතීන් එක්ක තමයි ලෝකයේ විවිධ ඉලක්කයන් සපුරා ගෙන තිබෙන්නේ. ජර්මනිය වාගේ රටවල් ඉන්ධන මඟින්, ගල් අඟුරු මඟින් බලශක්ති නිෂ්පාදනය කරනවා වෙනුවට සුළං බලයෙන්, සූර්යාලෝකයෙන් සහ biomass මඟින් එම අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට ඉලක්ක කර තිබෙනවා. ඒ ආකාරයට පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය නිෂ්පාදනය කරලා මේ emissions අඩු කර ගන්න ඔවුන් බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපේ රටෙත් මෙම තත්ත්වය අඩු කර ගැනීමේ ප්‍රධාන ක්‍රියාමාර්ගයක් විධියට බලශක්ති නිෂ්පාදනයේදී අපි පුනර්ජනනීය බලශක්තිවලට ප්‍රමුඛතාවක් ලබා දිය යුතුයි. එසේ සිදු කර ගල් අඟුරු හා ඉන්ධන දහනයෙන් නිෂ්පාදනය කරන බලශක්තිය අවම කර ප්‍රවාහනය සඳහාත් පුනර්ජනනීය බලශක්තිය නිසි ආකාරයෙන් කළමනාකරණය කර ගැනීමට අප කටයුතු කළ යුතුයි.

මම මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. පරිසර විෂය භාර අමාත්‍යවරයා හැටියට එතුමා විශාල උනන්දුවකින් මෙම ගිවිසුම අපරානුමත කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කරලා, සමුළුවලට සහභාගි වෙලා, තව සති දෙකකින් පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සැසියට සහභාගිවීමට පෙරාතුව මේ පාර්ලිමේන්තුව තුළින් මෙම ගිවිසුම අපරානුමත කිරීම අනුමත කිරීමට ඉදිරිපත් කිරීම ගැන මා සතුටු වෙනවා.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය මේ දිනවලත් ජාත්‍යන්තර සමුළුවක් අපේ රටේදී පවත්වනවා. විදේශ රටවල විද්‍යාඥයන් 100කට වඩා වැඩි ප්‍රමාණයක් එයට සහභාගිවෙලා සිටිනවා. අපේ රටෙත් විද්‍යාඥයින් 600කට වැඩි ප්‍රමාණයක් සහභාගිවෙලා සිටිනවා. ඒ, සියලුම තාක්ෂණවේදීන්ගේ හා විද්‍යාඥයන්ගේ සහායත් අප ලබා ගත යුතුයි. අපේ අමාත්‍යාංශය තුළිනුත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න සූදානම් කියලා මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි. මෙම පැරිස් ගිවිසුම අපරානුමත කිරීම, ඒකමතිකව සම්මත කර ගැනීම සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මා, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.34]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට ප්‍රතිලාභ අත්වනවා පමණක් නොව, මේ රටේ අනාගත පරපුරට දායාදයක් වන්නා සේම, මුළුමහත් ලෝකවාසීන්ගේ සුබසිද්ධියට හේතු වන ඓතිහාසික, උදාර කාරණයක් සාකච්ඡා කිරීම සඳහා තමයි අද මෙය රජය වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළේ. පරිසරය සහ එම පරිසරයට අයත් ජීවීන් ආරක්ෂා කිරීම පිළිබඳ අපගේ උදාර වටිනාකම්, මේ රටට සහ මේ රටේ ජනතාවට පරපුරෙන් පරපුරට උරුමවෙලා තිබෙනවා. 2016 අප්‍රේල් මාසයේ 22වැනිදා නිව්යෝර්ක්හිදී පවත්වන ලද ඉහළ පෙළේ අත්සන් කිරීමේ උත්සවයේදී ශ්‍රී ලංකාව ඇතුළු ජාතීන් 177ක් විසින් අත්සන් කරන ලද දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම අනුමත කිරීම සඳහා සම්ප්‍රදායික වශයෙන් ද්විපාර්ශ්වික හා පොදු එකඟත්වයන් සහිත යෝජනාවක් අනුමත කිරීමේ බාරදූර යුතුකම ඉටු කරන ලෙස තමයි, අද මෙම ගරු සභාවෙන් අප ඉල්ලා සිටින්නේ. මේ වන විට රටවල් 24ක් මේ ගිවිසුම අපරානුමත කිරීමේ නෛතික ලේඛන ඉදිරිපත් කර තිබෙන අතර, ඉදිරියේදී පවත්වනු ලබන එක්සත් ජාතීන්ගේ සැසි වාරයේදී තවත් රටවල් 12ක් සිය අපරානුමත කිරීමේ නෛතික ලේඛන එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය වෙත ලබා දෙන බව අපට දැනුම් දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සම්මුතියේ දෙවැනි වගන්තියට අනුව, ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමේ සාමාන්‍ය මට්ටම පූර්ව කාර්මීකරණ අවධියේදී පැවති සෙල්සියස් අංශක 2ක මට්ටමට වඩා අඩුවෙන් පවත්වාගෙන යාමට උත්සාහ දැරීම හා උෂ්ණත්වය ඉහළ යාමේ මට්ටම සෙල්සියස් අංශක 1.5 සීමාවේ තබා ගැනීමෙන් දේශගුණික විපර්යාස තර්ජනයට අදාළ ගෝලීය ප්‍රතිචාර තහවුරු කිරීම පැරිස් ගිවිසුමේ අරමුණ වෙනවා.

මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීවරයෙක් මෙය විවේචනය කරමින් කිව්වා, "මෙය multinational corporationsවල අවශ්‍යතාවක් සඳහා කරපු ගිවිසුමක්. මේකේ නොයෙකුත් අඩුපාඩු තිබෙනවා"ය කියලා. නමුත් ගරු අගමැතිතුමා මෙය ඉදිරිපත් කරපු අවස්ථාවේදී කිව්වා, "මේක සියයට 100ක් අප සියලුම දෙනා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

තෘප්තිමත් කරවන ලේඛනයක් -එකඟතාවක්- නොවෙයි. නමුත් අපට සියලු ජාතීන් සමඟ එකඟ වෙන්න පුළුවන්වෙලා තිබෙන්නේ මේක නිසා"ය කියලා. මොකක්වත් නොකර ඉන්නවාට වඩා, මෙතැනින් මේ වැඩ කටයුත්ත පටන් ගැනීම පිළිබඳව අප සන්තෝෂ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට අමතරව දේශගුණික විපර්යාසවලට මුහුණ දීමේ හැකියාව වැඩිදියුණු කරමින් හා හරිතාගාර වායු විමෝචනයන් අඩු කිරීම මගින් දේශගුණික විපර්යාසවල අයහපත් බලපෑමට අනුවර්තනය වීමේ හැකියාව වර්ධනය කිරීම මෙම ගිවිසුමේ අරමුණක් වෙනවා. කාලගුණික හා දේශගුණික විපර්යාස අවම කිරීම හා ඒවාට අනුවර්තනය වීමේ පියවරයන් මඟින් මෙම රටවල ආහාර නිෂ්පාදනය හා ආහාර සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීම කෙරෙහි මෙම ගිවිසුම මඟින් අවධානය යොමු කරනවා. හරිතාගාර වායු විමෝචනයන් අඩු කිරීම හා දේශගුණික විපර්යාසවලට මුහුණ දීමේ හැකියාව අරමුණු කර ගනිමින් මූල්‍ය ප්‍රවාහ තහවුරු කිරීම පිළිබඳව මෙම ගිවිසුම මඟින් අවධානය යොමු කරනවා. මෙම ගිවිසුම, දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය - UNFCCC , පාර්ශ්ව සමුළුවේ 19වැනි සැසි වාරයේදී - COP19 - හා පාර්ශ්ව සමුළුවේ 20වැනි සැසි වාරයේදී - COP20 - පැවති දීර්ඝ සාකච්ඡාවල ඍජු ප්‍රතිඵලයක් වෙනවා. 19වැනි සැසි වාරයේදී, ශ්‍රී ලංකාව ඇතුළු රටවලට ගෝලීය උණුසුම පාලනය කිරීම සඳහා අපේක්ෂිත, දේශීයව තීරණය කරන ලද දායකත්වය - Intended Nationally Determined Contributions - INDCs - ලබා දෙන ලෙස ආරාධනා කළා.

මම කලින් කිව්වා වාගේ INDCs ප්‍රධාන අංශ හතරකින් සමන්විත වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එයින් එක් අංශයක් තමයි, හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම. වසර 2030 වනවිට මේ ආකාරයට බලශක්ති ක්ෂේත්‍රයෙහි හරිතාගාර වායු විමෝචනය සියයට 20කින් අඩු කරන්න ශ්‍රී ලංකාව බලාපොරොත්තු වනවා. එහිදී කොන්දේසි රහිතව ජාතික ධාරිතාවෙන් සියයට 4ක් සහ කොන්දේසි සහිතව දියුණු රටවල සහයෝගිතාව මත සියයට 16කින් බලශක්ති ක්ෂේත්‍රයෙහි වායු විමෝචනය අඩු කරන්න අපි අපේක්ෂා කරනවා. තවද, ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය හා වනාන්තර යන ක්ෂේත්‍රවල හරිතාගාර වායු විමෝචනය සියයට 10කින් අඩු කරන්නටත් අපි බලාපොරොත්තු වන අතර, එය කොන්දේසි රහිතව සියයට 3කින් හා කොන්දේසි සහිතව සියයට 7කින් අඩු කරන්න බලාපොරොත්තු වනවා.

දෙවැනි කාරණය තමයි, දේශගුණික විපර්යාසවලට අනුරූපී වීම. දේශගුණික විපර්යාස නිසා අවදානමට ලක් වන මිනිස් ප්‍රජාවට සහ පරිසර පද්ධතියට ඒ සඳහා මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම මේ හරහා සිද්ධ වනවා.

තුන්වැනි දේ තමයි, දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන ආපදා, අලාභ හා හානි. ශ්‍රී ලංකාවේ දැනට පවතින ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කර ගැනීම මේ යටතේ සිදු කරන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හතරවැනි එක තමයි, ක්‍රියාත්මක කිරීමේ ආකාරය. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලට ලක්වීමට ප්‍රධාන හේතුවක් ඇත. එනම්, දියුණු වූ හා කාර්මීකරණය වූ රටවල් විසින් අතීතයේ හා වර්තමානයෙහි සිදු කරන අධික හරිතාගාර වායු විමෝචනයයි. මේ නිසා සංවර්ධනය වෙමින් පවතින රටවලට සිදුවන අහිතකර දේශගුණික විපර්යාසවල බලපෑම අවම කරවීම සඳහාත්, හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සඳහාත් ගනු ලබන ක්‍රියා මාර්ග සඳහා අවශ්‍ය වන මූල්‍ය තාක්ෂණ හා ධාරිතා වර්ධනය දියුණු වූ රටවල් විසින් එකඟ වූ සම්මුතිය පරිදි ලබා දිය යුතු වනවා. එබැවින්, මෙය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සඳහා බාහිර සහයෝගය අවශ්‍ය වන්නේ දියුණු හා කාර්මික රටවලින් සිදු කළ හා සිදු කරමින් පවත්නා වූ අසීමිත හරිතාගාර වායු විමෝචනය නිසා සිදු වූ භයානක ප්‍රතිඵල නිසාය යන්න මට මේ අවස්ථාවේදී කියන්න සිද්ධ වනවා. අපි එතැනදී විපක්ෂයේ මන්ත්‍රීවරු කියපු කාරණාව සමඟත් සම්පූර්ණයෙන්ම එකඟ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපගේ සියලුම කාර්යයන් අහිතකර ප්‍රතිවිපාකයන්ගෙන් තොර නොවන බව අපි පිළිගන්න ඕනෑ. එහෙයින් පරිභෝජන රටාවට ඔරොත්තු නොදෙන තත්ත්වය හා එමඟින් පරිසරයට සිදුවන හානිය අපේ ජීවිතවල පැවැත්ම කෙරෙහිත්, මහ පොළොව කෙරෙහිත් දුර්විපාක ගෙන දෙන බව අප ඔක්කෝම දන්නවා. අර්ථ ශූන්‍ය ලෙස ගැටුම් පැවැති අවුරුදු 27ක කාලය තුළ සිදු වූ පාඩුව පිරිමසා ගැනීම සඳහා අපගේ සංවර්ධන කාර්ය භාරය කඩිනම් කර ගෙන ඇති අතර, මෙම උත්සාහයේදී නාගරීකරණ හා සංවර්ධන වැඩසටහන් සිද්ධ වනවා. මෙහිදී අපේ වටිනා සාර ධර්ම හා ජනතාවගේ සුභසාධනය අතර තුලනයක් ඇති කිරීමේ උභතෝකෝටික ප්‍රශ්නයට මුහුණ දෙන්න අපට සිද්ධ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශගුණික විපර්යාස පිළිබඳ ගැටලු ආමන්ත්‍රණය කිරීමේදී ශ්‍රී ලංකාව ජාතික ප්‍රතිපත්ති ක්‍රමෝපාය හා ක්‍රියා මාර්ග අනුගමනය කරමින් පසු ගිය කාලයේදී ධනාත්මක පියවර අරගෙන තිබෙනවා. ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය, 2010 ශ්‍රී ලංකාව සඳහා ජාතික දේශගුණික විපර්යාසයන් අනුවර්තන ක්‍රමෝපාය, දේශගුණික විපර්යාස නිසා අවදානමට ලක් වීමේ ක්ෂේත්‍ර වන ජලය, සෞඛ්‍ය, කෘෂිකර්මය, ධීවර, නාගරික සංවර්ධන, මානව ජනාවාස හා ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය, 2014 තාක්ෂණයට අනුවර්තනය වීම සහ දේශගුණික විපර්යාසවල අනුවර්තනය වීම හා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා තාක්ෂණ ක්‍රියාකාරී සැලසුම්, 2009 "හරිත ලංකා" වැඩසටහන සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම මෙන්ම, 2009 ජාතික ප්‍රවාහන පද්ධතිය පදනම් කර ගනිමින් 2032 නාගරික ප්‍රවාහන ප්‍රධාන සැලසුමත් එසේ ගනු ලබන ධනාත්මක ක්‍රියාමාර්ගවලින් කිහිපයක් වනවා. මේ ක්‍රියා මාර්ග තුළින් ගෝලීය දේශගුණික විපර්යාස තර්ජන ආමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් සහ උෂ්ණත්වය ඉහළ යාම, කලින් අනුමාන කළ නොහැකි දේශගුණික රටා, ස්වාභාවික විපත්, ආහාර සුරක්ෂිතතාව සඳහා වන තර්ජන වැනි එහි බලපෑම් සම්බන්ධයෙන් සංවර්ධිත රටවල් හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ඇති උභතෝකෝටික ගැටලු තව දුරටත් පුළුල් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යම් මාර්ගෝපදේශකත්ව මූල ධර්මවලට අනුකූලව "පැරිස් ගිවිසුම" සකස් කිරීමේදී මෙම කරුණු සැලකිල්ලට ගෙන තිබෙන බව දැන ගැනීමට ලැබීම අපට සතුටට කාරණයක්. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා මෙම ගිවිසුම මඟින් විවිධ ජාතික අවශ්‍යතා සම්බන්ධයෙන් සාධාරණත්වයේ මූල ධර්මය සහ පොදු, එහෙත් වෙන් කොට හඳුනා ගන්නා වගකීම් හා අදාළ හැකියාවන් හඳුනා ගෙන තිබෙනවා. දේශගුණික විපර්යාසවල අයහපත් බලපෑම් අතුරින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම, සාගින්න අවසන් කිරීම සහ ආහාර නිෂ්පාදනයේ අවදානම් සහිත පාර්ශ්වයන්හි මූලික ප්‍රමුඛතාවද මෙම ගිවිසුම් මඟින් හඳුනා ගෙන තිබෙනවා.

දේශගුණික විපර්යාස මානව වර්ගයාගේ පොදු ගැටලුවක් බව පිළිගන්නා අතර, මෙම ගිවිසුමට අනුකූලව දේශගුණික විපර්යාස ආමන්ත්‍රණය කිරීම සඳහා පාර්ශ්ව විසින් ගනු ලබන පියවර මඟින් මානව හිමිකම්, සෞඛ්‍ය සඳහා ඇති අයිතිය, දේශීය මිනිසුන්ගේ, දේශීය ප්‍රජාවන්ගේ, සංක්‍රමණිකයන්ගේ, ළමයින්ගේ හා ආබාධිත පුද්ගලයන්ගේ හිමිකම් පිළිබඳ ඔවුනොවුන්ට ඇති බැඳීම්වලට ගරු කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා සලකා බැලිය යුතු වෙනවා. ශ්‍රී ලංකා ජනතාව පාරිසරික සංරක්ෂණය පිළිබඳව ජනාධිපතිතුමාගේ මැතිවරණ පොරොන්දු අනුමත කරමින්, ජනාධිපතිවරණයේදී අපි පොරොන්දුවක් ලබා දුන්නා. මම එය මෙසේ දක්වන්නම්.

"වනාන්තර හා වන ජීවීන් ආරක්ෂා කර ගැනීම සඳහා වනාන්තර විනාශ කිරීම වැළැක්වීම හා සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා පසු බිම සකසන්නෙමි. කිසිදු නීතියක් අත නොහැර, සියලුම පාරිසරික නීති ක්‍රියාත්මක කරනු ඇත. එසේ කිරීමේදී වැරදිකරුවන්ට ඔවුන්ගේ සමාජයීය තත්ත්ව සැලකිල්ලට නොගනිමින් දඬුවම් ලබා දෙනු ඇත. වනාන්තර වගා කිරීම් පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්තියක් සකසා, ග්‍රාමීය ප්‍රජාවගේ සාම්ප්‍රදායික ජීවනෝපායට අගතිය නොවන පරිදි ක්‍රියාත්මක කරනු ඇත."

මේක තමයි ජනාධිපතිතුමා මැතිවරණයේදී දීපු පොරොන්දුව. මේ ප්‍රතිපත්තිය පදනම් කර ගෙන, පැරිස් ගිවිසුම සාකච්ඡාමය අදියරේදී ශ්‍රී ලංකාව මෙන්න මේ ස්ථාවරය දැරුවා. පැරිසියේ දේශගුණික විපර්යාස ගිවිසුමට අත්සන් තැබීම මානව වර්ගයාට ඉතා වැදගත්ය කියන එක. ඊළඟට, එය සියල්ලටම අදාළ විය යුතුයි කියන එක. දේශගුණික වෙනස්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට අනුකූල විය යුතු සහ ඒ මූල ධර්ම විධිවිධාන මඟින් සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට බාධා නොපැමිණිය යුතු බව. අවදානම්වලට මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, දැඩි වගකීමකින් හා විනිවිදභාවයකින් යුතුව ඇගැයීමේ පියවර ඇතුළත් කළ යුතු බව. සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල මූල්‍යමය, තාක්ෂණික සංවර්ධනය, මාරු කිරීම හා ශක්‍යතා සංවර්ධනය ලබා දීම වැඩිදියුණු කළ යුතු බව සහ ලෝකයේ නායකයන් විසින් විශේෂයෙන් ව්‍යාපාරික හා මූල්‍ය වෙළෙඳ පොළට ඇති බැඳීම් පිළිබඳ ප්‍රබල සංඥාවක් ලබා දිය යුතු බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම ස්ථාවරයන් පැරිස් ගිවිසුමට හොඳින් ඇතුළත් වී තිබෙන බව අපට පෙනෙනවා. ඒ පිළිබඳව කොයි විධියට අපට විවේචන එල්ල වුණත්, අපි තෘප්තිමත් වෙනවා. අපි පැරිස් ගිවිසුම අපරානුමත කිරීමට පෙර පවා, වායු විමෝචන අඩු කිරීම හා අනුවර්ත පියවර ගැනීමට ශ්‍රී ලංකාව දැරූ ප්‍රයත්නවලට පිළිගැනීමක් ලබා තිබෙන බව ඔබතුමන්ලා දන්නවා ඇති. 2016 වසරේදී හරිත දේශගුණික අරමුදල් මණ්ඩලය, -ඒ කියන්නේ Green Climate Fund එක- ගංගා ද්‍රෝණි තුනක ජල කළමනාකරණ කටයුතු සඳහා අරමුදල් සැපයීමට ඇමෙරිකන් ඩොලර් මිලියන 38.1ක් අනුමත කරන ලදී.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, you have three more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Thank you. මෙය, ගෝලීය අරමුදල මඟින් මෙතෙක් අනුමත කරන ලද, තනි රටකට හිමි විශාලතම දේශගුණික විපර්යාස අනුවර්තන ව්‍යාපෘතියක් වේ.

මේ සභාවේ අනුරාධ ජයරත්න නියෝජ්‍ය ඇමතිවරයාත් ඉන්න නිසා මම කියන්න කැමැතියි, ජනාධිපතිතුමාගේ නිර්දේශයකට අනුව, අනුරාධ ජයරත්න නියෝජ්‍ය ඇමතිවරයා සමඟ මමත් ඒ දූත පිරිසට නායකත්වය දුන් බව. අපි කොරියාවට ගිහිල්ලා ලංකාවට ඩොලර් මිලියන 38.1ක ප්‍රදානය ලබා දෙන්න ඕනෑ කුමක් නිසාද කියන එක පිළිබඳව තර්කය ගොඩනැඟුවා. ගොඩනඟපු තර්කය මත තමයි, ලෝකයේ එක රටකට දීලා තිබෙන වැඩිම ප්‍රදානය Green Climate Fund එක හරහා තමයි ලංකාවට ලබා දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගිවිසුම අපරානුමත කිරීම හා පැරිස් ගිවිසුමට අනුකූලව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ අරමුණ වෙන්නේ, කල් ඇතිව අනතුරු හැඟවීම සිදු කිරීම, හදිසි අවස්ථාවලට පෙර සූදානම් වීම, අනපේක්ෂිත සිදුවීම් මන්දගාමී කිරීම, වෙනස් නොකළ හැකි සහ ස්ථිර හානි හා පාඩු මඟ හැරීමේ ක්‍රම යෙදීම, පූර්ණ අවදානම් තක්සේරුව හා කළමනාකරණය, ආපදා සඳහා රක්ෂණ පහසුකම් සැලසීමේ දේශගුණික අවදානම් කොටස්ගත කිරීම හා වෙනත් රක්ෂණ විසඳුම්, ආර්ථික නොවන පාඩු, දේශගුණික විපර්යාස පිළිබඳව ආපදාවලට මුහුණ දීම සඳහා ප්‍රජාවගේ හැකියාව වර්ධනය කිරීම, ජීවන වෘත්තීන් හා පරිසර පද්ධතිය සකස් කිරීම ඇතුළු ව්‍යසන අඩු කිරීම හා ලිහිල් කිරීමේ මාර්ග සලසා දීමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවට සලසන ප්‍රතිලාභ හා ජාත්‍යන්තර ප්‍රජාව කෙරෙහි ඇති කැපවීම සැලකිල්ලට ගනිමින්, 2016 සැප්තැම්බර් 06 වෙනි දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ගිවිසුමේ 21වැනි වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකාව පැරිස් ගිවිසුම අපරානුමත කිරීමට අනුමැතිය පාර්ලිමේන්තුවෙන් ලබා දෙයි කියා අප බලාපොරොත්තු වන බව අවසාන වශයෙන් මම කියන්න කැමැතියි.

කෙසේ වුවද, වැඩි විනිවිදභාවයකින් යුක්ත වීම සඳහා අපගේ ජීවන ක්‍රම, පරිභෝජන රටා සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම අනාගත පරපුරේ ශුභ සිද්ධිය කෙරෙහි බලපාන මෙම තීරණය ජාතික තීරණයක් බවට පත් කිරීමට, මේ යෝජනාව සඳහා මේ ගරු සභාවේ සම්පූර්ණ සහයෝගය අප බලාපොරොත්තු වනවා. ඔබතුමා මට කථා කිරීමට ලබා දුන් කාලය පිළිබඳව ද මම සන්තෝෂ වනවා. මේ පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කරලා තිබෙන වාර්තාව මම **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 දෙසැම්බර් 12වෙනි දින පැරිස් ගිවිසුමට එකඟවීමෙන් පසු ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කරන වැඩසටහන් හා කාර්යයන් පිළිබඳ ඇගැයීමක් කරලා තිබෙනවා. "2015 දෙසැම්බර් 12වෙනි දින පැරිස් ගිවිසුමට එකඟවීමෙන් පසු ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කරන වැඩසටහන් හා කාර්යයන්" යන ශීර්ෂය යටතේ ඇති වාර්තාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරනවා. බොහොම ස්තූතියි.

පුස්තකාලයේ තබා ඇත.
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

2015 දෙසැම්බර් 12 දින පැරිස් ගිවිසුමට එකඟවීමෙන් පසු ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා කාර්යයන්

1. "ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීල හරිත යුගයක්" වැඩසටහන් එළි දැක්වීම

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා නෙක්ස්ට් -නීල හරිත යුගය වැඩසටහන 2016 ජනවාරි මස 6 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී එළි දක්වන ලදී. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාව පරිසර හිතකාමී නිරසාර සංවර්ධන අඩු කාබන් විමෝචන ආර්ථිකයක් කරා යොමු කිරීමයි.

2. ශ්‍රී ලංකාව පැරිස් ගිවිසුම අත්සන කිරීම

2016 අප්‍රේල් මස 22 දින නිව්යෝර්ක්හි පිහිටි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී පැවති පැරිස් ගිවිසුම සඳහා වූ ඉහළ මට්ටමේ අත්සන් තැබීමේ උත්සවයේදී ශ්‍රී ලංකාවද ඇතුළු රටවල් 178ක් පැරිස් ගිවිසුමට අත්සන් තබන ලදී.

3. ශ්‍රී ලංකාවේ අපේක්ෂිත දේශීයව නිර්ණය කරන ලද දායකත්ව ඉදිරිපත් කිරීම

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ රාමුගත සම්මුතියෙහි පාර්ශවකරුවකු වශයෙන් ශ්‍රී ලංකාව ද එම සම්මුතිය මඟින් ගන්නා ලද තීරණ වලට අනුව ක්‍රියා කල යුතුය. ඒ අනුව, ශ්‍රී ලංකාව 2015 ඔක්තෝම්බර් මස එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ රාමුගත සම්මුතියෙහි ලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ අපේක්ෂිත දේශීයව නිර්ණය කරන ලද දායකත්ව වැඩිදියුණු කර 2016 අප්‍රේල් 25 දින නැවත ඉදිරිපත් කරන ලදී.

4. 2016 ජගත් පරිසර දිනය නිමිති කර ගනිමින් පරිසර සභිය ප්‍රකාශයට පත් කිරීම

පරිසර සංරක්ෂණය පිලිබඳ ජනතාව දැනුවත් කිරීම හා විවිධ පරිසර ගැටළු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරවීම අරමුණු කරගත් ජුනි 05 ජගත් පරිසර දින සැමරුම් උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාතලේදී පැවැත්විණි. පරිසර දිනය නිමිති කර ගනිමින් පරිසර සභිය ප්‍රකාශයට පත්කොට දිවයින පුරා පරිසර වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදී.

5. "වන රෝපා" වැඩසටහන - 2016

අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරි වර්ෂ තුනක (03) කාලය තුල රටේ වන ආවරණය 32% ක් දක්වා වැඩි කර ගැනීමේ ඉලක්කය සපුරා ගැනීම පිණිස, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ සක්‍රිය දායකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික වැඩසටහනක් ලෙස "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන හඳුන්වා දෙන ලදී. මේ යටතේ රුක් රෝපණය විධිමත් පරිදි හඳුන්වා දීම පිණිස සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය "වන රෝපා" ජාතික රුක් රෝපණ මාසය ලෙස නම් කර ඇත.

6. නීල හරිත ලස්සන ලංකා ගම්මාන වැඩසටහන

සියලු කෘෂි දේශගුණික කලාප නියෝජනය කරමින් කෝරාගත් ගම්මාන 10,000 ක ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු වන්නේ පරිසර හිතකාමී, දේශගුණික විපර්යාස සඳහා සංවේදී වූ ප්‍රජාවක් සමඟ නිරසාර ආර්ථික සංවර්ධනයක් සහිත ලස්සන ගම්මාන බිහිකිරීමයි. සහභාගිත්ව ක්‍රමවේදය

තුළින් රාජ්‍ය , පෞද්ගලික, රාජ්‍ය නොවන සහ ප්‍රජා මූල සංවිධාන මේ සඳහා දායක කරගැනීමට සැලසුම් කර ඇත.

7. සෑම දිස්ත්‍රික්කයකම පරිසර සමූළු පැවැත්වීම

පරිසර සංරක්ෂණය පිලිබඳ ජනතාව දැනුවත් කිරීම හා එක් එක් දිස්ත්‍රික්කයට සුවිශේෂී වූ විවිධ පරිසර ගැටළු විසඳා ගැනීම පිළිබඳව රාජ්‍ය අවධානය යොමු කිරීම අරමුණු කරගනිමින් සෑම දිස්ත්‍රික්කයකම පරිසර සමූළු පැවැත්වීමට සැලසුම් කර ඇත. එය මේ වන විට රත්නපුර, මාතලේ හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල පවත්වා ඇති අතර ඊළඟ පරිසර සමූළුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පැවැත්වීමට සුදානම් කර ඇත.

8. හරිත දේශගුණ අරමුදල (Green Climate Fund) වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකාවේ විසලි කලාපයෙහි ගොවීන්ගේ දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තුදීමේ හැකියාව නැංවීම සඳහා සකස්කළ ව්‍යාපෘති යෝජනාව හරිත දේශගුණ අරමුදලට ඉදිරිපත් කොට එමඟින් ඇමරිකානු ඩොලර් මිලියන 38.1 ක මූල්‍ය ප්‍රධානයක් ලබා ගැනීම.

9. අපද්‍රව්‍ය කළමනාකරණය

- පොලිතීන් මඟින් ඇතිවී නිබෙන පාරිසරික ගැටළු අවම කිරීම සඳහා "පොලිතීන් භාවිතය නිසි පරිදි කළමනාකරණය කිරීම" මැයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයතන වලින් පොලිතීන් හා ප්ලාස්ටික් අවමකිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහිත චක්‍රලේඛ නිකුත් කරවීමට එක් එක් අමාත්‍යාංශවලට යොමුකර ඇත.
- 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරී පනත අනුව නිකුත් කරන ලද අංක 1571/25 දරණ 2008 ඔක්තෝම්බර් 17 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය සංශෝධනයට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත දන්වා ඇත.
- මහනුවර මහා නගර සභාව හා දිස්ත්‍රික්කයේ පළාත් පාලන බල ප්‍රදේශ තුල එකතු වන නාගරික සන අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස බැහැර කරලීම සඳහා ඒකාබද්ධ නාගරික සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට සුදානම් කර තිබීම.

10. වන භාෂනය හා වන විනාශය පිටුදැකීම තුළින් හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ වැඩසටහන (REDD+)

මෙම වැඩසටහනෙහි මූලික පරමාර්ථය වනුයේ වන භාෂනය හා වන විනාශය පිටුදැකීම තුළින් හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා (REDD+) ශ්‍රී ලංකාව සඳහා උපායමාර්ගික සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලසුමක් සකස් කිරීමයි. සියලුම රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික සහ සිවිල් සංවිධාන වල සහභාගිත්වයෙන් මෙම උපායමාර්ගික සැලැස්ම සකස් කොට ඇත.

11. හරිත ගොඩනැගිලි නිර්මාණය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම

රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි පුළුල් ලෙස පරිසර හිතකාමී වූ හරිත ගොඩනැගිලි ලෙස ඉදිකිරීම හා පවත්වාගෙන යාම සඳහාවූ මාර්ගෝපදේශ හඳුන්වාදීම මෙහි පරමාර්ථයයි. නගර හා ගොඩනැගිලි නිර්මාණයේදී හරිත සංකල්පය ක්‍රියාත්මක කිරීම, බලශක්තිය හා අනෙකුත් සම්පත් සංරක්ෂණය තුළින් හරිතාගාර වායු විමෝචනය අවම කිරීම මෙහි අරමුණයි.

12. සූර්ය බල සංක්‍රාමය වැඩසටහන

රජය සූර්ය බලශක්තිය වැනි පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා මූලිකත්වය දී ඇති අතර ඒ සඳහා සූර්ය බල සංක්‍රාමය වැඩසටහන 2016 සැප්තැම්බර් 06 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් එළිදක්වන ලදී.

13. නීල හරිත නාවොත්සාහක ලේකම් කාර්යාලයක් (Blue Green Initiative Secretariat) ස්ථාපිත කිරීම

නීල හරිත යුගය පිලිබඳ ප්‍රකාශනයේ සඳහන් සංවර්ධන යෝජනා පිළිබඳව ගැඹුරු අධ්‍යනයයන් කිරීම, පර්යේෂණ පැවැත්වීම, සංවර්ධන යෝජනා සකස් කිරීම හා සැලසුම් කිරීම හා ඒ සඳහා දේශීය හා විදේශීය ආයතන සමග සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කිරීම මෙය පිහිටුවීමේ ප්‍රධාන අරමුණයි.

14. ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම එළි දැක්වීම

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක වන ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පාලනය කිරීම සඳහා වන ධාරිතා වර්ධන ව්‍යාපෘතිය මඟින් අදාල සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් ගොඩනැඟුණු ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම එළි දක්වන ලදී. ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ වලින් ආර්ථිකයට, පරිසරයට හා සමාජයට ඇති කරන අවධානම් හඳුනා ගැනීම, එම අවධානම් වළක්වාලීම, ප්‍රතිචාර දැක්වීම, කළමණාකරණය කරන ලද ආයතනික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් හරහා ක්‍රියාත්මක කරනු ලබන යෝග්‍ය නෛතික රාමුවක් සකස් කිරීමට මහ පෙන්වන ජාතික ප්‍රතිපත්තියේ ප්‍රධාන පරමාර්ථය වේ.

15. අපේක්ෂිත දේශීයව නිර්ණය කරන ලද දායකත්වයන් සඳහා පෙර සුදානම් ක්‍රියාත්මක සැලසුම් පිළියෙළ කිරීම

බලශක්තිය, ප්‍රවාහනය, කර්මාන්ත, අපද්‍රව්‍ය හා වන සම්පත් ක්ෂේත්‍රවලින් විමෝචනය වන හරිතාගාර වායු ප්‍රමාණය අවම කිරීම සඳහා වන අපේක්ෂිත දේශීයව නිර්ණය කරන ලද දායකත්වයන් හා දේශගුණ විපර්යාස නිසා දැඩි ලෙස අවධානමට ලක්වූ මානව සෞඛ්‍ය, කෘෂිකර්මය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය, ජල හා වාරිමාර්ග, වෙරළ හා සාගර, ජෛව විවිධත්වය වැනි ක්ෂේත්‍රවල දේශගුණ විපර්යාස වලට මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීමට අදාල දේශීයව නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීම සඳහා වූ පෙර සුදානම් ක්‍රියාකාරී සැලසුම් සකස් කළ අතර එම සැලසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

16. වෙරළ සංරක්ෂණය සඳහා අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය සැමරීම හා ජාතික සමුද්‍රීය සම්පත සුරක්ෂිතේ සතියක් 2016 වර්ෂයේ සැප්තැම්බර් 17 වන දින සිට 23 වන දක්වා ක්‍රියාත්මක කිරීම.

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකාව තුල අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය සැමරීම සඳහා සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 3 වන සතියේ සෙනසුරාදා දිනය යොදා ගැනීමටත්, සැප්තැම්බර් මස 03 වන සතියේ සෙනසුරාදා දින සිට 04 වන සතියේ සෙනසුරාදා දින දක්වා " ජාතික සමුද්‍ර සම්පත් සුරක්ෂිතේ සතිය" ලෙස ප්‍රකාශයට පත් කිරීමටත්, එම සතිය තුලදී රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල දායකත්වයෙන් විශේෂ සමුද්‍ර පරිසර භංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා තිබීම.

17. පරිසර හිතකාමී නොවන ඇස්බැස්ටෝස් ආනයනය හා භාවිතය ශ්‍රී ලංකාව තුළ තහනම් කිරීමට නිර්ණය කිරීම

ජනතාවගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීමේ අරමුණින්, පරිසර හිතකාමී නොවන ඇස්බැස්ටෝස් භාවිතය, ආනයනය හා නිෂ්පාදනය 2018 ජනවාරි 1 වැනිදා සිට සීමා කිරීමටත්, 2024 ජනවාරි 1 වැනිදා සිට භාවිතය තහනම් කිරීමටත් පියවර ගැනීම.

18. "ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීල හරිත යුගයක්" සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය

නීල හරිත ආර්ථික සංකල්ප හරහා නිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2016 ඔක්තෝම්බර් 17 සිට 19 දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී දේශීය හා විදේශීය විශේෂඥයන්ගේ හා විද්වතුන්ගේ සහභාගිත්වයෙන් ඉහත සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය පැවැත්වීමට සැලසුම් කර ඇත.

**** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is Hon. (Dr.) S.Sivamohan.

[12.49 p.m.]

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

First of all, I would like to thank the Hon. Deputy Chairman of Committees for giving me this opportunity to speak in this Debate on the Ratification of Paris Agreement.

Paris Agreement is a global action plan to put the world on track to avoid dangerous climate changes by limiting global warming to well below 2 degrees Centigrade or best below 1.5 degrees Centigrade. The Agreement is due to be effective in 2020.

The Paris Agreement is a bridge between today's policies and carbon-neutrality before the end of the century. Before and during the Paris Conference, countries submitted comprehensive National Climate Action Plans. Even though it is not enough to keep global warming below 2 degrees Centigrade, the Agreement traces the way to achieving this target.

National contribution towards minimizing global temperature, Sri Lanka's INDCs -Intended Nationally Determined Contributions- is comprised of four main areas.

First is mitigation, which means reducing greenhouse gas emissions against the Businesses-As-Usual in the sectors of energy. That means electricity generation, transportation, industry, waste and forestry. The key contributors to greenhouse gas are carbon dioxide, methane and nitrous oxide. Sri Lanka expects to reduce 20 per cent of GHG emission in energy sector by 2030.

Second it is adaptation. INDCs will have focus on human health, food security, water and irrigation, coastal and marine, urban infrastructure and human settlement, tourism and recreation. These are the most vulnerable sectors to adverse effects of climate change in Sri Lanka.

Third it is loss and damage which occurs due to extreme weather conditions such as prolonged droughts and flash floods.

Fourth is implementation. Sri Lanka needs financial support, technical assistance and technology transfers from the developed countries to overcome these types of problems.

Paris Agreement was opened up for signature on 22nd April 2016 at a high-level signature ceremony convened by the Secretary-General in New York. Arrangement for signature will remain opened until 21st of April 2017. As of 3rd September, 2016 there are 180 signatories to the Paris Agreement. Of these, 26 States including China, Cameron, Maldives and Palestine have deposited their instruments of ratification, acceptance and approval. Sri Lanka has not deposited up to now.

Nature is a mysterious phenomenon, not even scientists can explain it. Like the wind or the blowing that embraces one's body, it cannot be explained other than referring to it simply as "nature".

India is regarded as the mind of spiritualism. Indians recognize three particular plants, or trees as being holy. You know the Bo tree. Ascetic Siddhartha sat in deep meditation under the Bo tree until he attained enlightenment and became the Buddha. Scientifically Bo tree is known to have anti-inflammatory and immunomodulatory properties. Hindus believe in Tulsi plant which is a holy plant. They grow Tulsi plants in front of their houses because it has medicinal properties. The third important tree is the bamboo tree which has two varieties. One is the Wild Bamboo tree and the other is Beema Bamboo. The latter has a superior clone which has been identified as eco-friendly and is used to generate bio mass energy. Bio mass is an organic material that is produced from plants and animals. It is a renewable source of energy that can supply energy for 24 hours of the day and 365 days the year. Although it is the best source of energy it is not cost effective to produce.

Finally, I want to tell you about the benefits of signing the Paris Agreement. Firstly, the Paris Agreement can contribute to the global efforts to mitigate global warming, manage climate change and direct Sri Lanka towards a sustainable development path.

Secondly, by way of the Paris Agreement, we can obtain financial assistance from the Green Climate Fund for conditional commitments declared in IDMCs. Developed countries intend to continue the existing collective goal to mobilize US Dollars hundred billion, that means ten thousand billion in Sri Lankan Rupees per year by 2020 and extend this until 2025.

Thirdly, we will be able to obtain finance, technology development and capacity building to build resilient and vulnerable sectors in our country such as human health, food security, water and irrigation, coastal and marine, bio diversity et cetera. Fourthly, we can adopt a new carbon development path way, by which both economic and environmental benefits can be achieved for sustainable development of the country. Fifthly, foreign exchange spent on petroleum imports can be saved by shifting to renewable energy source. Finally, we can achieve improved eco system services such as clean air, clean water and low fluoride soil and lands.

அதேநேரம் வெளிநாடுகளில் இந்த ஒப்பந்தங்களைச் செய்வதன்மூலம் எமது நாட்டை மேம்படுத்த முற்படு கின்றோம். ஆனால், உள்நாட்டில் எமது மக்களின் உரிமைகள் முடக்கப்பட்டிருக்கின்றன. முல்லைத்தீவு மாவட்டத்திலுள்ள நந்திக் கடலானது சுனாமித் தாக்கத்தின் பின் தூர்ந்த நிலையில் காணப்படுகின்றது. எனவே, இது ஆழமாக்கப்பட வேண்டும். அதன்மூலம் சிறந்த ஒரு சூழலை அங்கு ஏற்படுத்தக்கூடியதாக இருக்கும்.

மேலும், வட்டுவாகல் பாலமானது முற்றாக இடிந்த நிலையில் காணப்படுகின்றது. மிக விரைவில் அதனூடான போக்குவரத்துத் துண்டிக்கப்படக்கூடிய நிலையேற்படும். அவ்விடத்தில் ஒரு மேம்பாலம் அமைப்பதற்கு 1000 மில்லியன் ரூபாய் தேவையெனக் குறிப்பிடப்பட்டுள்ளது. ஆனால், இன்றுவரை அதற்கான நிதி ஒதுக்கப்படவில்லை. எனவே,

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

කුරිප්පිට්ට අන්ද නිතියෙ ඔදුක්කිත්තර වේණ්ඩුමෙන ඉන්ද මේලාන සපෙයිල් නාන් කේට්ඩුක්කොළ්ළ විරුම්පුකින්රේන්. අතුමට්ඩුමල්ල, වට්ඩුවාකලිල් එමදු මක්කළ් වාළ්න්ද 600 ඒක්කර් කාණිකළ් national security එන්ර පෝර්වෙයිල් ඉරාණුවත්තුක්කාක ඔදුක්කත් තීර්මානම් එඩුක්කප්පට්ඩිරුන්දදු. අදු ඕර් ආරෝක්කියමාන තීර්මානමල්ල. අම්මුයර්චිකළ් එම්මාල් තඩුක්කප්පට්ඩිරුක්කින්රන. ආනාල්, අදු මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් උල්ලාසප් පයණත්තුරෛක්කුරිය ඔරු මුක්කිය මාන පිරදේසමාකුම්. එනවේ, එමදු මක්කළින් කාණිකළ් අවර්කළුක්කු වළුංකප්පට්ඩු, පඩෙයිනරෛ අංකුළ්ළ වේරු අරස කාණිකළුක්කු මාර්රික්කොළ්ළ වේණ්ඩුමෙන්රු ඉන්ද ඉඩත්තිල් කේට්ඩුක්කොළ්කින්රේන්.

කේප්පාප්පිලවු කිරාමමානදු ඔට්ඩුමොත්තමාක ඉරාණුවත්තාල් අපකරික්කප්පට්ඩිරුක්කින්රදු. ඉදු ඕර් උකන්ද කාරියමල්ල. ඉදනාල් අම්මක්කළින් වාළ්වාදාරංකළ් නීණ්ඩ කාලමාක මුඩක්කප්පට්ඩිරුක්කින්රන. මක්කළෛ විඩුවිප්පදර් කාකප් පෝරාඩියදාකක් කූරුම් ඉරාණුවම්, අවර්කළින් කාණිකළුක්කුළ් ඌට්රුවියිරුප්පදු කවලෛක්කුරිය ඔරු විඩයමාකුම්. අතේපෝල්, පුදුක්කුඩියිරුප්පු නකරින් මත්තියිල් මක්කළ් වසික්කුම් කාණිකළෛ අපකරිත්ත ඉරාණුවම් ඉන්රුවරෛයිල් අංකිරුන්දු වෙළියේරවිල්ලෛ. ඉප්පඩියාක මුල්ලෛත්තීවු මාවට්ටත්තින් ඔට්ඩුමොත්තක් කාණිකළෛ ඉරාණුවත්තිනරුම් කඩර්පඩෙයිනරුම් ආක්කිරමිත්ත් අන්ද මක්කළින් වාළ්වාදාරංකළෛ මුඩක්කික්කොණ්ඩිරුප්පදන් කාරණමාක උළ්ළක රීදියාන අඩක්කුමුරෛයෛ, අදාවදු, ඉන්ද නාට්ටිනුළ්ළේයේ ඕර් අඩක්කුමුරෛයෛ අවර්කළ්මීදු දිණිත්දු වෛත්තිරුප්පදෙන්බදු අනීදියානදු. සර්වදේස රීදියිල් නාම් එව්වළවු සිරන්ද ඔප්පන්දංකළෛක් කෛච්චාත් තිට්ටාලුම් උළ්නාට්ටිල් ඉන්ද මක්කළුක්කාන වාළ්වාදාරංකළුඩන් දොඩර්පුඩෛය ඉන්ද විඩයංකළිල් අරසු මුක්කිය කවනම් එඩුක්ක වේණ්ඩුම්.

ඔරු නල්ලාට්චි අරසෛ අමෛප්පදෙන්රු කූරික් කොඩුත්ත වාක්කුරුදිකළින් අඩිප්පඩෛයිල් පෙරුම්පාන්මෛයාන මක්කළ් ඉන්ද අරසුක්කු ආදරවාක වාක්කළිත්තිරුන්දාර්කළ්. එනවේ, ඉන්ද අරසු, මුක්කියමාක අවර්කළින් කාණිකළෛ විඩුවිත්දල්, කාණාමර්පෝනෝරින් උරවුකළින් පිරච්චිනෛක්කුත් තීර්වු කාණුදල්, චිරෛයිල් වාඩුම් අරචියල් කෛදිකළෛ විඩුවිත්දල් පෝන්ර අනෛත්දු විඩයංකළිලුම් මුන්නින්රු අදර්කාන නඩවඩික්කෛකළෛ මේර්කොළ්ළ වේණ්ඩුමෙනක් කේට්ඩුක් කොළ්කින්රේන්. අත්තුඩන්, ඉරාණුවත්තිනරින් අරික්කෛ කළෛ අර්පඩියේ නම්පි අරසු චෙයර්පඩුවදෛ නිරුත්ත වේණ්ඩුමෙන්පදෛයුම් ඉන්ද ඉඩත්තිල් කේට්ඩුක්කොණ්ඩු, එනදු උරෛයෛ මුඩිත්තුක්කොළ්කින්රේන්. නන්රි. වණක්කම්.

[අ.භා. 1.02]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(මාණ්ඩුමිකු (වණ.) අත්තුරලියේ රතන තේරර්)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉතා වැදගත් යෝජනාවක් සම්මත කිරීමට පාර්ලිමේන්තුව තීරණය කරලා තිබෙනවා. මුලින්ම මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීමක් කරන්නට මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැරිස් නුවර පැවති සම්මේලනයේදී කලින් පැවති සම්මේලනවලදී ගත්ත තීරණ සම්මත කරලා යම්කිසි වැදගත් නිගමනයන්ට එළඹීමට යුරෝපා සංගමය ඇතුළු ප්‍රංශ රජය විශාල උත්සාහයක් දැරුවා. නමුත් පැරිස් සමුළුවේදී පරිසර විද්‍යාඥයන්ගේ ඇතුළු බොහෝ අයගේ අදහස වුණේ, එය අසාර්ථක උත්සාහයක් බවයි. බොහෝ දෙනෙකු විශ්වාස කරනවා, මෙතෙක් පවත්වන ලද පරිසර සමුළුවලින් Kyoto Protocol, නැත්නම් කියතෝ නගරයේදී ඇති කර ගත්ත සම්මුතිය තමයි වැදගත් සම්මුතිය කියලා. මම හිතන හැටියට Kyoto Protocol එකේ බොහෝ සීමා දැන් ඉක්මවා ගිහින් තිබෙනවා. කෝපන්හේගන් සහ Rio+20 සමුළුව පැවැත්වූවාට පසුව Kyoto Protocol එකේදී ගත්ත තීරණ වැඩකට නැහැයි කියන එක දැන් කවුරුත් පිළිගන්නා කාරණයක්. ඒ නිසා Kyoto Protocol එකේ සීමාව දැන් ඇති වෙලා තිබෙන අර්බුදයට කිසිම උත්තරයක් නොවෙයි.

පැරිස් නුවර සාකච්ඡාව වන විට, -20වෙනි සමුළුව වන විට- අපි එකඟ වූ දේවල් දිහා බැලුවාම දැනටමත් අපි හොඳ සම්මුතීන්ට, මූලික සම්මුතීන්ට ඇවිල්ලා තිබෙනවා කියන එක පෙනෙනවා. නමුත් ඒ මූලික සම්මුතීන් එකක්වත් ක්‍රියාවට නඟන්නට රටවල් එකඟ නොවීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මේ තත්ත්වය සැලකිල්ලට අරගෙන අද වන විට රටවල් ගණනාවක් එකඟවෙලා තිබෙනවා, එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය සඳහා වූ පැරිස් ගිවිසුම 2030 වන විට ක්‍රියාවට නඟන්නට. ඒ එකඟතාව සඳහා 2030 වන විට අවම වශයෙන් රටවල් 55ක්වත් එකඟ වෙන්න ඕනෑ කියන කාරණය තමයි මේකේ මූලික දේ. එහෙම වුණොත් විමෝචනයෙන් සියයට 55ක් -දැන් තිබෙන විමෝචනයෙන් සියයට 55ක්- අඩු කරන්නට පුළුවන් කියලා විශ්වාස කරනවා. දැනටම අපේ රටත් සමඟ, -අද අපි ගන්නා තීරණයත් සමඟ- රටවල් 27ක් මෙයට එකඟ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේකේ ඉතා වැදගත් සාධකය මෙයයි. ප්‍රංශ සමුළුව පවත්වන විට පරිසර විද්‍යාඥයන්ගේ සහ බොහෝ අයගේ ප්‍රශ්නය වුණේ චීනය සහ ඇමෙරිකාව සම්මුතියට එළඹෙන්නේ නැහැයි කියන එකයි. උදාහරණයක් විධියට ගත්තොත් දියුණු රටවල ආධිපත්‍යය බොහෝ වෙලාවට එක්සත් ජනපදය විසින් දරනවා. දියුණු වෙමින් පවතින රටවල් අතර මැලේසියාව, සිංගප්පූරුව, චීනය, ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 70 ගණනක් තිබෙනවා. ඒ අතර ශ්‍රී ලංකාවත් ඉන්නවා. ශ්‍රී ලංකාවයි, චීනයයි ආර්ථික සංවර්ධනය අතින් කිසිසේත්ම සමාන කරන්නට බැහැ. නමුත් අපි ඒ ගොඩේ තමයි ඉන්නේ. ඒකෙන් අදහස් වෙන්නේ අපි ඒ ගොඩේ ඉදගෙන ආසියාවේ රටක් විධියට චීනයත් සමඟ තීරණ ගන්න ඕනෑ කියන එකයි. චීනය දියුණු වෙමින් පවතින රටවලට බලපෑම් කරමින් කිසිම තීරණයක් නොගෙන මේ සමුළුව අවසාන තත්ත්වයට එනතෙක්ම හිටියා. මම හිතනවා, මම කියපු කරුණ පැහැදිලි වෙන්නට ඇති කියලා. ඒ කියන්නේ එක පැත්තකින් දියුණු වෙන රටවල් පාලනය කිරීමට චීනය උත්සාහ කරන අතර, දියුණු රටවල හඬ පාලනය කිරීමට එක්සත් ජනපදය උත්සාහ කරමින් සිටියා. නමුත් අද වන විට කාබන් ඩයොක්සයිඩ් වායුව පිටවීම අඩු කර ගැනීමට, ඒ කියන්නේ විමෝචනයෙන් සියයට 55ක්- කාබන් emission එකෙන් සියයට 55ක්- අඩු කර ගැනීමට මේ රටවල් දෙක එකඟ වෙලා තිබෙනවා. ඒ සමඟම දැන් මේ සඳහා රටවල් ගණනාවක් එකඟතාව පළ කරලා තිබෙනවා. ඒ අතර විශේෂයෙන්ම කැනඩාව, බ්‍රසීලය, ජපානය, ඉන්දියාව, රුසියාව, ඕස්ට්‍රේලියාව සිටිනවා. ඒ කියන්නේ, කාබන් emission එක වැඩි ප්‍රමාණයකින් පිට කරන රටවල් හැටියට දැනට තිබෙන මේ රටවල් ඉදිරි කාලය තුළ මේකට එකඟ වෙයි කියා බලාපොරොත්තු වෙනවා. කෙසේ වෙතත්, යුරෝපා සංගමයේ සියලු රටවල් මේ තීරණයට එකඟ වුණොත් -ඇමෙරිකාව සහ චීනය එකඟ වුණාට පසුව- එය ඉතා හොඳ පියවරක් හැටියට, කුමක් හෝ දෙයකින් ලෝකයේ ඉරණම යහපත් දිසාවට හැරීම සඳහා ගත් ඉතා වැදගත් තීන්දුවක් හැටියට අප දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ගරු සභාවේ කළ කථා අරගෙන බැලුවාම මේ ඓතිහාසික වැදගත්කම අප ඒතරම්ම හිතට ගත් බවක් පේන්න නැහැ. එක්සත් ජනපදය සහ චීනය මේ තීරණයට ආවේ ඇයි? අප කවුරුත් දන්නවා ඇමෙරිකාවේ ළඟදි මැතිවරණයක් පැවැත්වෙන බව. ඩොනල්ඩ් ට්‍රම්ප් කියන්නේ මේ තීරණ එයා සම්පූර්ණයෙන් ඉරා දමනවා කියායි. හැබැයි, ඇමෙරිකාව රජයක් හැටියට තමයි මේ තීරණයට ඇවිත් තිබෙන්නේ. ඒකේ වැදගත්කම තමයි, ඇමෙරිකාව තීරණය ගන්න කොට චීනය තීරණය අරගෙන ඉවර වීම. ඒ නිසා ඩොනල්ඩ් ට්‍රම්ප් බලයට ආවත් ලෝකයේ මේ තීරණය වෙනස් කරන්න ඔහුට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මොකද, ඊළඟට යුරෝපා සංගමය මේ තීරණයට එනවා. ලෝක ආධිපත්‍යයේ තිබුණු සීමාව අද අලුත් අදියරකට ඇවිත් තිබෙනවා. ඒ කියන්නේ, මතවාදිමය පැත්තෙන් ලෝකයේ බලවතුන් අද හොඳ තීරණයකට ඇවිත් තිබෙනවා. ඇයි ඒ අය මෙවැනි හොඳ තීරණයකට ආවේ, එහෙම එන්න හේතු වුණු සාධක මොනවාද කියන කාරණා අප සැලකිල්ලට භාජන කරන්න ඕනෑ.

කාබන්ඩයොක්සයිඩ් වායුව පිටවීම පිළිබඳව 1990 දශකයේ සාකච්ඡා කරන කොට කිව්වේ, ලෝකයේ උණුසුම සෙල්සියස් අංශක එකට පහළින් හෝ එකේ තියාගන්න ඕනෑය කියායි. එතකොට ලෝකයේ උණුසුම සෙල්සියස් අංශක එකට වඩා ඉහළට ගියොත් අපට මොකක්ද වෙන්නේ කියා විද්‍යාඥයන් සොයා බැලුවා. එහෙම වුණොත් මෙන්න මෙච්චර දූපත් රටවල් නැති වෙනවා, glaciersවල අයිස් දියවීම මෙපමණ ප්‍රමාණයකින් වෙන්න පුළුවන්කම තිබෙන බව ඔවුන් සොයා ගත්තා. මෙහෙම දෙයක් සිද්ධ වුණොත් ලෝකයට මොන වාගේ ඉරණමක් අත් වෙයිද කියාත් ඔවුන් සොයා බැලුවා. නිතර නිතර සුනාමිය ඇති වීම, විශේෂයෙන්ම ලෝක ජනගහනයෙන් භාගයකටම සාගතයෙන් මිය යන්න සිදුවීම, කාන්තාරකරණය වැඩිවීම, අකාල වැහි, මහා ගංවතුර, එක පැත්තට මහා නියං සායවල් වැනි බරපතළ දේවල් සිදුවිය හැකි බව විද්‍යාත්මක දත්ත මඟින් විද්‍යාඥයන් ඉදිරිපත් කරනු ලැබුවා. අද ලෝක බලවතුන්ට මේකට ඇහුම්කන් දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ විශේෂ වැදගත් තත්ත්වයක් නිසායි. අප මේක සැහැල්ලුවට අරගෙන, "ඇමෙරිකාව කියන්නේ ලෝක බලවතුන්, සමාගම්කාරයෝ තීරණයක් ගන්න දෙන්නේ නැහැ" කියා නිකම් පරණ තාලේ කථාවක් කරලා වැඩක් නැහැ. ඇත්ත තමයි, ඇමෙරිකාව සම්බන්ධයෙන්, චීනය සම්බන්ධයෙන්, ලෝකයේ බලවතුන් සම්බන්ධයෙන් එහෙම මතයක් තමයි තිබුණේ. හැබැයි, ඇත්ත කථාව මොකක්ද? ලෝකයේ බලවතුන්ටත්, පුංචි මිනිසුන්ටත් කියන කාටත් ගෝලීය වශයෙන් එක වාගේ බලපාන ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ කියන්නේ, ලෝකයේ උණුසුම සෙල්සියස් අංශක 2කට ගමන් කළොත් ලෝක ජනගහනයෙන් භාගයක් අනිවාර්යයෙන්ම මැරෙන්න නියමිතයි. මේ කාරණය තමයි මේ තීන්දුව ගන්න එළඹෙන සාධකය. මේ තීරණය ගනිද්දි අප මෙන්න මේ කාරණය ඉතාම හොඳින් සැලකිල්ලට භාජන කළ යුතු වෙනවා. එක්සත් ජනපදය ප්‍රමුඛ රටවල සිටින ඉහළම විද්‍යාඥයෝ, යුරෝපා සංගමයේ ඉන්න විද්‍යාඥයෝ ලබපු අතිවිශිෂ්ට ජයග්‍රහණයක් තමයි, චීනය සහ ඇමෙරිකාව මේ ගැන තමන්ගේ පාර්ලිමේන්තු ඇතුළේ තීරණයක් ගැනීම. ඉන්දියාව තවම ඒ තීරණය අරගෙන නැහැ. විශේෂයෙන්ම ඉන්දියාව එය ගන්න කලින් ශ්‍රී ලංකා රජය මේ තීරණය ගැනීම ඉතාම වැදගත් දෙයක් හැටියටයි මා සලකන්නේ.

ඊළඟට මොකක්ද වෙන්න යන්නේ කියා අපි බලමු. අපි මොකක්ද කරන්න ඕනෑ? අපේ කාබන්ඩයොක්සයිඩ් වායුව පිටවීම කීයද? අප ටොන් එකට පහළින් ඉන්නේ. ඇමෙරිකාව ටොන් කීයක් පිට කරනවාද කියා අපි බලමු. ඇමෙරිකාව කාබන්ඩයොක්සයිඩ් ටොන් 16ක් පිට කරනවා. යුරෝපා සංගමය ටොන් 13ක, 14ක වාගේ පරිමාවක තමයි පසු ගිය වකවානුව තුළ හිටියේ. රුසියාව, ඒ වාගේම ඕස්ට්‍රේලියාවත් මේ සීමාවල තමයි ඉන්නේ. ලෝක ජනගහනයෙන් කාබන්ඩයොක්සයිඩ් වායුව පිට කරන, ඒ කියන්නේ පරිසරයට විෂ වායුව එකතු කරන කණ්ඩායම කවුද? ඒ ප්‍රමාණය ලෝක ජනගහනයෙන් සියයට 20යි. මේ කාබන්ඩයොක්සයිඩ් වායුව පිට කිරීමට වග කිව යුත්තේ ඒ අයයි. ලෝකයේ දියුණු, පොහොසත් යයි සම්මත රටවල සියයට 20ක් තමයි මේ මුළු මහත් ලෝකයේ භූමි භාගයෙන් සියයට 80කටත්, ඊටත් අධික ජනගහනයකටත් බලපෑම් කරන්නේ. ඒ ප්‍රමාණය රටවල් සියයට 20ක් වුණාට, ඒ රටවල් ප්‍රමාණයේ සීමාව ගත්තොත් විශාල භූමි භාගයක් මේකට අයිති වෙනවා. ඒ කියන්නේ, කාබන්ඩයොක්සයිඩ් වායුව පිට කිරීමට, මේ සියයට 20ක කට්ටිය තමයි මුළු ලෝකයටම වග කියන්න ඕනෑ. හැබැයි, දැන් මේ තීරණයත් එක්ක ඒ අයගේ අලුත් තත්ත්වයක් උදා වෙලා තිබෙනවා.

මම ඊළඟට කියන්න හදන්නේ මේ කාරණයයි. කාබන්ඩයොක්සයිඩ් වායුව පිටවීම ටොන් එකකට වඩා අඩු කරන රටවලට කලින් තිබුණු සාකච්ඡාව මේකයි. මේක චීනයත් ගෙනා සාකච්ඡාවක්. අවුරුදු 150ක් විතර මේ කාබන්ඩයොක්සයිඩ් වායුව පිට කිරීමට යුරෝපා රටවල් වග කියන්න ඕනෑ. ඒ නිසා මීට අවුරුදු ගණනකට කලින් චීනය කිව්වා, "ඔබලා මෙච්චර කල් කාබන්ඩයොක්සයිඩ් පිට කර තිබෙන නිසා අපටත් ටිකක් දියුණු වෙන්න ගල් අඟුරු පුච්චන්න ඕනෑ, තෙල් පුච්චන්න ඕනෑ" කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස, ඔබවහන්සේට තව විනාඩි 2ක් තිබෙනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මට විනාඩි 15ක් දීලා තිබුණා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You had only ten minutes.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මට විනාඩි කිහිපයක කාලයක් ලබා දෙනවා නම් හොඳයි. මොකද, මට ලබා දුන් කාලය නම් ප්‍රමාණවත් නැහැ.

මට කියන්න ඕනෑ වෙන්නේ මේ කාරණයයි. මේක තමයි අපට තිබෙන වැදගත් හා ස්වර්ණමය අවස්ථාව. අපි දැන් කොහොමද මේ රට ගෙනියන්නේ? අපි වායුගෝලයට පිට කරන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය ටොන් එකටත් වඩා අඩුයි. චීනය කිව්වේ මොකක්ද? චීනය කිව්වා, "අපිත් කාබන් ඩයොක්සයිඩ් අඩුවෙන් පිට කරන්නේ" කියලා. ඇත්ත වශයෙන්ම ඒ අයත් මූලික මට්ටමට ගිහිල්ලා නැහැ. ඒ කියන්නේ, චීනය ටොන් 4 සීමාවට ගිහිල්ලා නැහැ. ඉන්දියාව ටොන් 2ට පහළින් ඉන්නේ. අපි ඉන්නේ, ටොන් 1ටත් පහළින්. එතකොට කිව්වා, "නැහැ, අපට තව ටිකක් පිට කරගන්න දෙන්න" කියලා. නමුත්, ප්‍රශ්නය වෙන්නේ මේකයි. රටවලින් සියයට 20ක් කාබන් ඩයොක්සයිඩ් පිට කරන විධියට ඉතිරි රටවල් සියයට 80ත් කාබන් ඩයොක්සයිඩ් පිට කළොත්, -තර්කයක් විධියට ගත්තොත්, සියයට 20ක් වන

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

රටවල් කරපු වැඩේ ඉතිරි සියයට 80ක් වන රටවල් විසින් සුළු ප්‍රමාණයක් හෝ කළොත්- සම්පූර්ණ ලෝකයේම උෂ්ණත්වය සෙල්සියස් අංශක 1 සිට සෙල්සියස් අංශක 2න් උඩට යන එක නවත්වන්න බැහැ. උෂ්ණත්වය සෙල්සියස් අංශක 2න් උඩට ගියොත් මොකක්ද, ලෝකයට අත්වන ඉරණම? ජීව පද්ධතියට වන හානිය ආදී සෑම දෙයක්ම අපි සැලකිල්ලට ගන්න ඕනෑ.

අපේ රට දූපත් රටක්. විශේෂයෙන්ම දූපත් රටවල් අතර මේ සම්බන්ධයෙන් වෙනමම සාකච්ඡාවක් තිබෙනවා. අවාසනාවකට වාගේ ලංකාව, දූපත්වාසී රටවල් ආරම්භ කළ ආකාරයේ සටන ආරම්භ කරලා නැහැ. මම දැක්කා, එක්සත් ජාතීන්ගේ සමුළුවට දූපත්වාසී රටවල් කළ ඉල්ලීම අප ඉල්ලා නැහැ. අප රටේ සිටින ජනගහනයෙන් භාගයකට වඩා ජීවත් වෙන්නේ මුහුදුකරය ආසන්නයේ. කිසි දවසක, කිසි වෙලාවක අපේ රට කිසිම සමුළුවකදී ඉල්ලුවේ නැහැ, "අපි දූපත් රටක්, ඒ නිසා 'vulnerable' කියන සටන් පාඨය යටතේ වැඩිම හානිවලට වන්දි ගෙවීමට අපි යටත්" කියන එක. කෙසේ වුවත් මගේ මූලික කථාව මේකයි. කාබන් ඩයොක්සයිඩ් ටොන් එකක් පිට කරන අපි වාගේ රටක් මේ තීරණයට ආවාම තිබෙන වාසිය මොකක්ද? මේකේ වාසිය තමයි, අපි ලෝකයට යම් කිසි හඬක් වන එක.

මාලදිවයින කියන්නේ පුංචි රටක්; සුළු ජනගහනයක් සිටින රටක්. අපේ රටත් එක්ක බැලුවාම ඉතාම පුංචි රටක්. හැබැයි, මාලදිවයිනේ පාර්ලිමේන්තුව නැවක් තුළ පැවැත්වූවා. එහෙම පවත්වලා ලෝකයට පණිවුඩයක් දුන්නා, "උඹලා මේ දේ කළොත් අපි ගිලෙනවා" කියලා. ඒ වාගේ ලංකාවටත් පුළුවන් විශාල පණිවුඩයක් දෙන්න, "ලෝක මානව සංහතිය වෙනුවෙන් අපි මෙන්න වැදගත් තීරණයක් අරන් තිබෙනවා" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දැන් ඉතා වැදගත් කරුණු දෙකක් කියන්න කැමැතියි. මේ රජය යටතේ INDC වාර්තාව කොහොමද හදලා තිබෙන්නේ? ඒ ගොල්ලෝ මෙන්න මෙහෙමයි ලියලා තිබෙන්නේ. "අපි සියයට 4ක කාබන් ඩයොක්සයිඩ් ප්‍රතිශතයක් පිට කරන්න එකඟයි." ඔන්න ඕක තමයි වාර්තාව. ඊළඟට කියන්නේ මොකක්ද? "ලෝකයේ බලවත් රටවල් අපට උදව් කරනවා නම්, ඒ කියන්නේ ණය දෙනවා නම්, සියයට 20ක් දක්වා අඩු කරන්න අපි කැමැතියි." මේකද ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය? මේකද මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය? මේකද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පක්ෂය ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය? මොන තර්ක තිබුණත්, මේ හැම නායකයෙක්ම තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශවලින් පිළිගෙන තිබෙනවා, කාබන් ඩයොක්සයිඩ් වායුව අඩු කළ යුතුයි කියලා. ජනාධිපතිතුමා ජයග්‍රහණය කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය වැඩි ආසන ප්‍රමාණයක් ලබාගෙන තිබෙනවා. අපි ජනතාවගේ කැමැත්ත ලබාගෙන තිබෙන ප්‍රතිපත්තිය, මේ INDC ප්‍රතිපත්තිය නොවෙයි. INDC ප්‍රතිපත්තිය කියන්නේ, අපි කාබන් ඩයොක්සයිඩ් ප්‍රතිශතය සියයට 4කින් අඩු කරනවා කියන එකයි. ඒ කියන්නේ මොකක්ද? ඒ කියන්නේ, ඒක අපි අද ගන්නා තීරණයටත් එකඟ තීරණයක් නොවෙයි.

ඊළඟට, මම මේ කාරණයත් කියන්න කැමැතියි. මට ආරංචි හැටියට, මේ තීරණ සියල්ලම සම්මත කර තිබියදී අද CEB එක අකුරට වැඩ කරන්න පටන් අරන් තිබෙනවා. ඇයි ඒ? ඒ ගොල්ලෝ කියනවා, "ගල් අඟුරු බලාගාර හදන්න ඒ අය සැලසුමක් හදලා තිබෙනවා" කියලා. ඊළඟට ඒ ගොල්ලෝ ගල් අඟුරු බලාගාරවලට - CEB එකට - මොකක්ද දෙන්නේ? Tax එකක් ගහනවා. ඒ ගොල්ලන්ට Tax නැතුව ගල් අඟුරු ගෙන්වන්න අවස්ථාව දෙනවා. අනෙක් කොම්පැනිවලින් සියයට 26.5ක tax එකක් ගහනවා. මේකද රාජ්‍ය ප්‍රතිපත්තිය? CEB එකේ ප්‍රතිපත්තිය මේකද? ප්‍රතිපත්තිමය වශයෙන් මේවා වෙනස් වෙන්නේ නැතුව, පාර්ලිමේන්තුවේ මේක සාකච්ඡා කළාට වැඩක් වෙන්නේ නැහැ. අවාසනාවකට වගේ INDC එක හදපු නිලධාරින්ට ඕනෑ, රටේ ජනතාව ජයග්‍රහණය කරපු ප්‍රතිපත්තියවත්, පරිසරවේදීන්ගේ ප්‍රතිපත්තියවත් නොවෙයි. ඔවුන්ට ඕනෑ තමන්ගේ අත්තනෝමතික ප්‍රතිපත්තිය ජයග්‍රහණය කරන්නයි. රටේ ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභා තීරණය කරලා තිබෙනවා, අපි හදපු "ගල් අඟුරු බලාගාරය" යන සැලැස්ම නොවෙයි අපේ සැලැස්ම, අපි සියයට 100ක් දේශීය පුනර්ජනනීය බලශක්තිය මත පදනම් වන ප්‍රතිපත්තියකට යනවා කියලා. CEB එක ඒ ප්‍රතිපත්තිය ගැන දැන් මොකක්ද කියන්නේ? ඒ ගොල්ලෝ කියනවා, ඒ ගොල්ලෝ හදපු ප්‍රතිපත්තිය රජය අනුමත කරන්නේ නැතිලු. මෙන්න මේ අවාසිසහගත තත්ත්වය අපි සැලකිල්ලට ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට සහ මේ ගරු සභාවට මෙන්න මේ කාරණයත් ප්‍රකාශ කර සිටිනවා. අද වන විට අපේ කඳුකර තේ වගාව වියළී යමින් පවතිනවා; අපේ තේ නිෂ්පාදන ධාරිතාව අඩු වෙමින් පවතිනවා. ඒකට විවිධ කාරණා බලපා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන්වහන්ස, ඔබවහන්සේට ලබාදුන් කාලය දැන් අවසන්.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
තව පොඩි වෙලාවක් මම ගන්නවා.

අවසාන වශයෙන් කියන්න ඕනෑ, අපේ රටේ මිලියනයක් වහළවල්වල solar panels සවි කරන්න අපි තීරණය කරලා තිබෙනවාය කියන කාරණය. ඒක මේ රජය ගත් ඉතා වැදගත් තීරණයක්. ඒ නිසා ඉදිරි කාලය තුළ අපේ රටේ කඳුකර ප්‍රදේශ සැලකිය යුතු ප්‍රමාණයක් වනාන්තර බවට පත්කර ගනිමින් ලෝකයේ ආදර්ශවත් රට බවට ශ්‍රී ලංකාව ගොඩනහන්නට අපට වාසනාවන්ත අවස්ථාවක් තිබෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.17]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් ඉතාම වැදගත් වූ පැරිස් ගිවිසුම අපරානුමත කිරීම සඳහා වූ මේ සාකච්ඡාවට අද දින අපේ පාර්ලිමේන්තුවේදී එක්වීමට ලැබීම අපි අගය කරනවා.

මානව සංහතියේ අනාගත පැවැත්මට අතිවිශාල බලපෑමක් ඇති වෙමින් අපේ පාරිසරික ශුද්ධභාවය දූෂණයට පරිවර්තනය වන වේගය පිළිබඳව ලොව අවදි කරමින්, පරිසරවේදීන්, ආණ්ඩු සහ මහජනතාව අඛණ්ඩව කරන ලද උද්ඝෝෂණ හා බලපෑම

නිසා මේ පැරිස් ගිවිසුම දක්වා ගමන් කරන්න සිදු වුණා. පැරිස් ගිවිසුම ඇති කළත්, එය ක්‍රියාත්මක කිරීම සඳහා 2030 දක්වා දී තිබෙන කාලපරිච්ඡේදය තුළ ඒ තුළ අඩංගු කරුණු සම්පූර්ණ කර ගැනීමේදී විවිධ ගැටලු ඇති විය හැකියි. ඒ නිසා ශ්‍රී ලංකාවේ අපි, මේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අපට නැඟිය හැකි හඬ, කළ හැකි බලපෑම් කිරීම සඳහා කටයුතු කරමු.

මම පරිසරය භාරව අමාත්‍යවරකු හැටියට හිටපු ඒ සුළු කාලය තුළ, ඕසෝන් තලය බේරා ගැනීම සඳහා වූ ජාත්‍යන්තර සමුළුව කොළඹ නගරයේ පැවැත්වූ අවස්ථාවේ, ඒ සමුළුවේ මූලාසනය බාර ගන්න සිදු වූ ඉතාම වැදගත් අවස්ථාවකට සහභාගි වුණා. එය ඕසෝන් ස්ථරය දූෂණය වීම වැළැක්වීම වෙනුවෙන් ශ්‍රී ලංකාව දැවැන්ත පරිත්‍යාගයක් කරපු අවස්ථාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඇති වෙමින් යන තත්ත්වය තුළ අප මුහුණ දෙන මූලික ප්‍රශ්නය වන්නේ, මානව සංහතියේ පැවැත්මට අවශ්‍ය පිරිසිදු වායුව, ජලය දූෂණයට ලක් වීමයි. වායුව සහ ජලය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වනාන්තර, ඇළ, දොළ, ගංගා, මහා මුහුදු යන සියල්ල දූෂණයට ලක් වනවා පමණක් නොවෙයි, ඒවා පාවිච්චි කළ හැකි ප්‍රමාණය වේගයෙන් අඩු කර ගන්නා වූ ආර්ථික ගමන් මාර්ගයක අපි ගමන් කරමින් සිටිනවා. ලෝකයේ සෑම රටක්ම ගොදුරු වුණ මේ විනාශකාරී ගමන නවතා ගැනීම සඳහා අද අපි කැපවිය යුතු බව මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

අද ඇති වී තිබෙන ආදායම් පරතරය ගැන බලනකොට විශේෂයෙන් මම මේ කරුණ සඳහන් කරන්නට කැමැතියි.

Unfortunately, together with the high growth a disparity in income has come. Sixty five families in the world enjoy the income equal to that of 3.5 billion poor people's income. So, you can understand the disparity. Unless action is taken to overcome poverty which lays the foundation not only for future social instability but barriers to growth itself, we shall not be able to create a just society for all our peoples.

Together with the elimination of poverty, there should be increased access by all citizens to their basic needs. One of the fundamental needs on which life depends is water, which is becoming increasingly scarce, and what is available is often poisoned with chemicals. Researchers warn that this climate change in the next thirty years in Asia would lead to one billion more people becoming "water stressed".

The montane rainforests which safeguard the watersheds of Asia have been depleted. That very depletion has contributed to global warming, the retribution for which comes in the form of extended droughts, cyclones, catastrophic floods, super-storms and food shortages, which in turn contribute to the shortage of water.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාවට අපේ ඒකාබද්ධ විපක්ෂයේ එකඟතාව මා මේ මොහොතේ ප්‍රකාශ කරන්න කැමැතියි. අඩු පාඩු කොතෙක් තිබුණත් මේ යෝජනාව සාර්ථක කර ගැනීමේ ඉලක්කයට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ සහ වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව යටතේ මහජන මතයට සවන් දී මෙම ගිවිසුමේ වැදගත්කම ප්‍රකාශයට පත් කරන්න කටයුතු කර තිබෙනවා. අපේ ගෞරවනීය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ මේ ගරු සභාවේ වැඩ සිටින අවස්ථාවේ මම මේ ගැන සඳහන් කරන්නට කැමැතියි, බොදු වචනයෙන්.

දේවෝ වස්සතු කාලේන
සස්ස සම්පජ්ජි හෝතු ච
පීතෝ භවතු ලෝකෝ ච
රාජා භවතු ධම්මිකෝ

අද ඊයේ සිට නොවෙයි, වර්ෂ ගණනාවක්, ශත වර්ෂ ගණනාවක් තිස්සේ අපි කියා පාන්නේ මෙයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේත් සඳහන් කළ පරිදි, අනාගතය දියුණුව සඳහා අපට තිබෙන විශාල සම්පතක් වන අපේ පරිසරය මත ගොඩ නැඟෙන ආර්ථික වැඩ පිළිවෙළකට පිවිස අප ගමන් කළ යුතුයි. සූර්ය තාපයෙන් පිරුණු අපේ දේශය, තවම සූර්ය තාපයේ ප්‍රයෝජනය ලබා ගැනීමට බැරි වුණු දේශයක් බවට පත් වී තිබෙනවා. සුළඟින් පිරුණු අපේ දේශයට තවම සුළං බලය පාවිච්චි කර ගැනීමට බැරිව තිබෙනවා. ඒ වාගේම ජලයේ ප්‍රයෝජනය නිසි ලෙස ලබා ගන්නට බැරි වුණු දේශයක් බවට අප පත් වී තිබෙනවා. මේ සාධක මත තමයි අපේ රටෙත්, ජනතාවගේත් අනාගතය, සරුසාරත්වය හා සංවර්ධනය තීරණය වෙන්නේ. ඒ කරුණු දෙස ඉතා ඕනෑකමින් අපේ අවධානය යොමු කළ යුතු වෙලාවකයි අපි මේ යෝජනාව සම්මත කරන අවස්ථාවත් පැමිණ තිබෙන්නේ.

මට ලැබී තිබෙන වේලාව කෙටි වුණත්, විශිෂ්ටතම ලාංකිකයන් දෙදෙනෙකු ගැන මේ අවස්ථාවේ සඳහන් කිරීම වැදගත්.

One is, Prof. Mohan Munasinghe, Vice Chairman of the Intergovernmental Panel on Climate Change, a co-laureate of the Nobel Prize of 2007. He is a Sri Lankan who contributed much to the environmental changes and the pressures that had to be built. Secondly, the importance of environmental protection was emphasized by Justice Weeramanthri in the case concerning Hungary and Slovakia.

ශ්‍රී ලාංකිකයන් හැටියට ඔවුන් දෙදෙනා ලොවට කළ දායාදයට අපේ රටේ සියලුම ජනතාව වෙනුවෙන් අද පාර්ලිමේන්තුවේදී අපේ ගෞරවය පුද කළ යුතුයි. එසේ කිරීමෙන් බලාපොරොත්තු වන්නේ, අනුකරණවාදී බටහිර ආර්ථික ක්‍රමයෙන් මිදී, අපේ ආර්ථිකය සකස් කර ගැනීමට අපට තිබෙන සම්පත් ප්‍රයෝජනයට ගැනීමට පුළුවන් දිවයිනක් බවට අපේ රට පරිවර්තනය කර ගැනීමයි.

රට වටාම ඇති එකම සමුද්‍ර තීරයකට උරුමකම් කියන රට අපේ ශ්‍රී ලංකාව පමණයි. අපේ රටේ පරිසරය විවිධත්වයෙන් පිරුණු පරිසරයක්. එහි ප්‍රයෝජනය ලබා ගැනීමටත්, ඒ තුළින් සංවර්ධනය ළඟා කර ගැනීමටත්, ඒ වාගේම ලෝක පරිසරය හා මානව සංහතිය ආරක්ෂා කර ගැනීමටත් අවශ්‍ය බලය ක්‍රියාත්මක කිරීම සඳහා වන අපේ එකඟතාව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමැතියි.

[අ.භා. 1.25]

ගරු ගාමිණි ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)

(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ රටවල් 193ක ප්‍රජාවගේ SDGs 17ක් ආරක්ෂා කිරීමේ අරමුණින් අපේ ගරු ජනාධිපතිතුමා පැරිස් ගිවිසුම අත්සන් කරලා විශාල උනන්දුවක් ගන්නවා. මේ මාසයේ පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ සමුළුවටත් එතුමා සහභාගි වෙන්න නියමිතයි. ඒ නිසා අද අපි මේ පාර්ලිමේන්තුවේ අනුමත කරන "පැරිස් ගිවිසුම අපරානුමත කිරීම" ඉතා ඓතිහාසික අවස්ථාවක්. එහි 13වන SDG එකේ තිබෙන්නේ, "Climate Change: Take urgent action to combat climate change and its impacts." මේක ඉතා වැදගත් දෙයක්. මීට පෙර (පූර්ව) අතුරලියේ රතන හාමුදුරුවෝ ප්‍රකාශ කළා, මහනුවර සහ නුවරඑළිය ප්‍රදේශවල කඳුරට තේ වගාව විනාශ වෙනවා කියලා. මීට මාස 4කට පමණ ඉස්සෙල්ලා මම වනජීවී අමාත්‍යවරයා ලෙස දිස්ත්‍රික් මහා සමුළුවේදී ප්‍රකාශ කළා, තව අවුරුදු 20ක් යද්දී, ලෝක ස්වභාව ධර්ම නීතියක් ක්‍රියාත්මක වෙන බව. සෝදාපාළුවීම්, නාය යාම්වලින් කඳුරට විනාශ වන බව. කඳුරට එවැනි දේවල් සිදු වීම නිසා එම ජනතාවට පහත රටට එන්න සිදු වෙලා තිබෙන බව දැන් අපට පෙනෙනවා. එහෙම නම්, ස්වභාව ධර්මය - කැලෑව - රජ කරන යුගය මේ රටේ නැවතත් පටන් ගත යුතුව තිබෙනවා. යුරෝපා සංගමය ඇතුළු ඇමෙරිකාව, චීනය, වාගේ දියුණු රටවල් අද මේ නීතියට ගරු කරන්න පටන් ගෙන තිබෙනවා. පරිසරය විනාශ වීම නිසා ඒ රටවල tornadoes වැනි විශාල කුණාටු, මහා නාය යෑම් ඇති වෙලා, ඔවුන්ට අද ස්වභාව ධර්මය පාලනය කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ අනුව, ස්වභාව ධර්මයේ නීතිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. අපි කාටත් ස්වභාව ධර්මයේ නීතිය පාඩම් උගන්වනවා.

අද තිරසර සමාජයක් බිහි කිරීම සිදු කළ යුතුව තිබෙනවා. තිරසර සංවර්ධනය මගේ අමාත්‍යාංශයට අයත් කටයුත්තක් වුණත්, අපි සෑම දෙනාම එකතුවෙලා මේ කටයුත්ත කළ යුතුව තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාත් ප්‍රකාශ කළ පරිදි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රටවල් අතරින් ලංකාව අද දින තිරසර සමාජයක් උදෙසා පැරිස් ගිවිසුම අපරානුමත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එය අපට ඉතා ගෞරවයක්. අපේ අතිගරු ජනාධිපතිතුමා මේ සඳහා නායකත්වය අරගෙන තිබෙනවා. එහෙම නම්, මෙතැනදී අපි සෑම කෙනෙක්ම මේ කටයුත්ත සඳහා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මා අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලුවා, සෑම අමාත්‍යාංශයකටම මේ ගැන අවබෝධයක් ලබා දෙන්න කියලා. මම Sustainable Development Goals පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවට ගියා. එතැනදීත් ඔවුන් කළ කථාවලින් පැහැදිලි වෙනවා, අපේ ජනාධිපතිතුමා ගැනත්, ලංකාව ගැනත් ඔවුන් තුළ පුදුම ආදරයක්, ගෞරවයක් අද ඇතිවෙලා තිබෙන බව. මම මීට මාස එකහමාරකට ඉස්සෙල්ලා එවැනි සමුළුවකට මා ගිය අවස්ථාවේදී මට අහන්නට ලැබුණා, ලෝකයේ බලවත් රටවල නායකයන් සියලු දෙනාම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව වට කර ගත්තා කියලා. සාමාන්‍යයෙන් ලංකාව වැනි කුඩා රටවල නායකයන් තමයි මහා රටවල නායකයන් පසු පස ගියේ. නමුත් එදා මේ බලවත් රටවල නායකයන් සියලු දෙනාම ලංකාවේ ජනාධිපතිතුමාව වට කර ගත්තා ලු. මම ඇහුවා, "ඒ මොකද?" කියලා. එතුමන්ලා කිව්වා, මේ විධියට ප්‍රබල පක්ෂ දෙකක් එකතු වෙලා රටට හිතකාමී විධියේ ප්‍රතිපත්තියක් ගෙනයන ලංකාව ගැන අපට පුදුම ගෞරවයක් ඇති වෙලා තිබෙනවා කියලා.

එතුමාට අද ලැබී තිබෙන මේ ගෞරවය පිළිබඳව කථා කරන ගමන් මම මේ ගැනත් සඳහන් කරන්න ඕනෑ. දේශගුණික විපර්යාස පිළිබඳ, ගහ කොළ, සතා සිව්පාවා පිළිබඳ, ඒ සෑම දෙයක් ගැනම කථා කරන ඊළඟ CITES Conference එක මේ මාසේ 22වැනිදා සිට ඔක්තෝම්බර් මස 5වැනිදා දක්වා Johannesburgවල පැවැත්වෙනවා. එදා blood ivory විනාශ කරන වෙලාවේ CITES මහලේකම් John Scanlon එම අවස්ථාවට සහභාගී වුණා. ලංකාවට පුදුම විධියේ ආදරයක්, ගෞරවයක් ලෝක ප්‍රජාවගෙන් ලැබිලා තිබෙනවා. ඒ වාගේම රටවල් 183ක් සාමාජිකත්වය දරන, 2,000ක සහභාගීත්වයක් තිබෙන ඊළඟ සමුළුව ලංකාවේ පවත්වන්න කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත අද ඔවුන් තීරණයකට ඇවිල්ලා තිබෙනවා. ගිය සතියේ මම ගරු ජනාධිපතිතුමාටයි, අගමැතිතුමාටයි කිව්වා, මේ ගැන බලවත් කමිටුවක් පත් කරන්න කියලා. අගමැතිතුමා එයට කැමැත්ත පළ කළා. මේ රට අද ලෝක ප්‍රජාවගේ ගෞරවයට පාත්‍රවෙලා තිබෙනවා.

අපි මේ සමුළුව ගැන විතරක් නොවෙයි, අපේ රටට තිබෙන අනෙක් බලවත් ප්‍රශ්න ගැනත් කල්පනා කරන්න ඕනෑ. මම දැන් "සියැටෙල්" කියන රතු ඉන්දියානු නායකයා කියපු කියමනක් කියන්නම්. මේ කියමන තේරුම් අරගෙන ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න මේ පොළොවට හතුරු වෙලා ඉන්නේ කවුද කියලා. මේ පොළොවට හතුරා වෙලා ඉන්නේ අපිමයි. හතුරා වෙලා ඉන්නේ මිනිසාමයි. මිනිසා විසින් පරිසරය විනාශ කිරීම නිසා තමයි අද අපිට මේ විපත්වලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම නම් අපි මේ ක්‍රමය නිවැරදි විධියට හදාගන්න ඕනෑ. "සියැටෙල්" කියන රතු ඉන්දියානු නායකයා කිව්වේ මොකක්ද? "When the last tree is cut down, the last fish eaten, and the last stream poisoned, you will realize that you cannot eat money." අපිට සල්ලි කන්න බැහැ. එහෙම නම්, මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩිය අවස්ථාවේ කල දේශනාව ඒ අයුරින්ම පිළිපදිමින් අපි සෑම කෙනෙක්ම ගහ කොළ, සතා සිව්පාවා ආරක්ෂා කරගන්න ඕනෑ.

අද ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ මොකක්ද? එතුමාගේ තිබෙන ප්‍රතිපත්තිය තමයි සියයට 26ක් පමණ තිබෙන වනගහනය, සියයට 32ක් දක්වා වැඩි කරන එක. එසේ වන ගහනය වැඩි නොකළොත්, අපේ ලංකා භූමියට විශාල විනාශයක් වෙන්න පුළුවන්. මේ සිදු වන විනාශය මිහිතලයටම බලපාන දෙයක්. එහෙම නම්, වනගහනය සියයට 32ක් දක්වා වැඩි කරන්න ඕනෑ කොහොමද? ඒ විධියට වැඩි කරන්නේ, රජයට අලුතින් කැලෑ ඉඩම් පවරාගෙන නොවෙයි. අපේ තිබෙන ඉඩම් ආරක්ෂා කර ගනිමින් සෑම පුරවැසියකුම තමන්ගේ ඉඩමේ ගසක් හිටුවන්න ඕනෑ. පාර දෙපස අලංකාර කරන්න ගස් හිටුවන්න ඕනෑ. තමන්ගේ පාසලේ ගස් හිටුවන්න ඕනෑ. අපි හරිත පරිසරයක් ඇති කරලා ක්‍රියා කරන්න පුළුවන් වැඩ පිළිවෙළකට එන්න වෙනවා. රාජ්‍ය නායකයන්ගේ මූලිකත්වයෙන් විතරක් නොවෙයි, තිරසර සමාජයක් සඳහා මේ ක්‍රමය අරමුණු 169ක් ඔස්සේ ක්‍රියාත්මක වනවා. ඒක ජනාධිපතිතුමාට තනිවම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ පිළිබඳව මම අතිගරු ජනාධිපතිතුමාටත් යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගේ මහපෙන්වීම මත අපි සැලසුම් කරලා තිබෙනවා, ඔක්තෝම්බර් 5වැනිදා සවස දෙකට BMICH එකේදී ජනාධිපතිතුමාගේත්, අගමැතිතුමාගේත් ප්‍රධානත්වයෙන් ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, මන්ත්‍රීවරු, ලේකම්වරු ඇතුළු සියලු දෙනාමත්, පළාත් සභා හා අනෙකුත් රේඛීය අමාත්‍යාංශවල නිලධාරිනුත්, දැනුවත් කිරීමේ

ආරම්භක වැඩසටහනක් පවත්වන්න. එය සෑම ගමකටම ගෙන යන විධියේ වැඩ පිළිවෙළක් ලෙස සකස් කරනවා. ඒ අරමුණු 169 ක්‍රියාත්මක කරන්න නම්, රේඛීය අමාත්‍යාංශයත් මේ වැඩසටහනට සහභාගී වෙලා කටයුතු කරන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, "මේක ජාතික ප්‍රශ්නයක් මිසක්, දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි" කියලා. ඒ ගැන මම සතුටු වෙනවා. ඒ නිසා අපි සෑම දෙනාම මේ කටයුත්ත වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපි කල්පනා කරන්න ඕනෑ, මේ සිද්ධ වෙන විනාශය නවත්වන්න අපි කොහොමද හවුල් වෙන්නේ කියන එක ගැන. ඒකට පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කරගෙන විතරක් බැහැ. මේ පිළිබඳව පාසල් දැනුවත් කරලා, ඒ තුළින් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේකට ජනතාව හවුල් කරගන්න ඕනෑ; විද්‍යුත් මාධ්‍යය මේකට හවුල් කර ගන්න ඕනෑ; මුද්‍රිත මාධ්‍ය - පුවත් පත් - මෙයට හවුල් කර ගන්න ඕනෑ. මේ විනාශය පටන් ගන්නේ මහා ලොකු කම්හල්වලින් විතරක් නොවෙයි; වාහනවලින් විතරක් නොවෙයි; ගමේ පොඩි පොඩි තැන්වලිනුත් මේ විනාශයන් සිද්ධ වෙනවා. පූජ්‍ය අතුරලියේ රතන හාමුදුරුවෝත් කියපු විධියට solar power සහ wind power කියන දෙකට මේ රජය මූලික තැනක් දෙන එක ගැන මම සතුටු වෙනවා. අද හැම නිවසක්ම තමන්ගේ විදුලිය උත්පාදනය කරන විදුලි බලාගාරයක් කළ යුතුයි. මෙන්න මේකයි අවශ්‍ය වෙලා තිබෙන්නේ.

අපි දැක්කා, යම් යම් ඒකාධිකාර තීරණ ගන්නවා. ඉන්ධනවලින් ක්‍රියා කරන මහා generators ගෙනාවා. ඒවා නඩත්තු කරගෙන ඒවායෙන් ලාභ ලබන්න නොවෙයි ක්‍රියා කළේ. නමුත්, එම වැඩ පිළිවෙළ නැති කරන්න රජයේ කැබිනට් මණ්ඩල යන්තම් තීරණයක් ගත්තා. අපට අනාගතයක් තිබෙනවා. අපි හැම ගමකටම, හැම පවුලකටම තමන්ගේ නිවසට energy saving bulbs වැනි පහසුකම් ලබා දෙන්න ඕනෑ. එතකොට, අපේ වායුගෝලයේ තිබෙන උෂ්ණත්වය අඩු කරලා එය සමනය කරන වැඩ පිළිවෙළකට යාමට පුළුවන්කම තිබෙනවා. එම නිසා අපි සෑම කෙනෙක්ම මෙම වැඩ පිළිවෙළට සහාය ලබා දෙනවා. ඒ වාගේම, අපි මේ අවස්ථාවේදී මෙම වැඩ පිළිවෙළට සහාය දීලා මේ අරමුණ ඉෂ්ට කරන්න ක්‍රියා කරන්න ඕනෑ. මෙය පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පසුව මගේ අමාත්‍යාංශයෙනුත් මෙය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියේදී යම් කිසි වැඩ පිළිවෙළක් ගෙනෙනවා. අපි දැනටමත් වැඩමුළු පවත්වා එය ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. අපි ඒ සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. අපි ඒ ගැන සතුටු වනවා. ඒ වාගේම, අතිගරු ජනාධිපතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා.

[අ.භා. 1.35]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சர்)

(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතාමත් වැදගත් විෂයක් සම්බන්ධව පාර්ලිමේන්තු විවාදය පැවැත්වෙන අවස්ථාවක්. දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය සඳහා වූ පැරිස් ගිවිසුම සම්බන්ධව මටත් අදහස් කිහිපයක් දක්වන්නට කාල වේලාව වෙන් කිරීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. ලෝකය දෙස බලන විට පෙනී යන දෙයක් තමයි, අද අපි මේ විඳවන්නේ මනුෂ්‍යයා විසින්ම ඇති කරපු ප්‍රශ්නයක විපාකයන්ය කියන එක. අද ලෝකයේ ජනගහනය වේගයෙන් වැඩිවීමත් සමඟම මෙම ජනගහනයට අවශ්‍ය ඉඩම්, නාගරික පහසුකම් ලබා දීම සඳහා වනාන්තර විනාශ කිරීම තුළින්, මේ වැඩිවන ජනගහනය සඳහා බලශක්ති අර්බුදය විසඳීමට පොසිල් ඉන්ධන දහනය කිරීම තුළින්, වැඩිවන ජනගහනයට අවශ්‍ය කරන ආහාර සැපයීමට කෘෂිකර්මාන්තය සඳහා වන පෙහෙළි එළි කිරීම තුළින්, වැඩිවන ජනගහනයට ප්‍රවාහන පහසුකම් ලබා දීම තුළින් පරිසරය විශාල වශයෙන් හානියට ලක් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම, හරිතාගාර වායු පරිසරයට මුදා හැරීම නිසා අද විශාල පරිසර දූෂණයන් සිදු වෙලා තිබෙනවා. අද ලෝකයේ රටවල් ගත්තාම, හරිතාගාර වායු සියයට 40ක ප්‍රමාණයක් විමෝචනය වීමට බලපාන ප්‍රධාන රටවල් දෙක තමයි ඇමෙරිකාව සහ චීනය. ඒ වාගේම, 1990 ඉඳලා 2015 වන විට හරිතාගාර වායු විමෝචනය සියයට 36කින් වැඩි වෙලා තිබෙනවා කියලා සමීක්ෂණවලින් සොයා ගෙන තිබෙනවා. මෙයින් හරිතාගාර වායුවලින් සියයට 75ක්ම පරිසරයට මුදා හැරලා තිබෙන්නේ, කාබන්ඩයොක්සයිඩ් වායුවයි. ඒ වාගේම මේ කාල පරාසය තුළ කාබන්ඩයොක්සයිඩ් වායුව මුදා හැරීම සියයට 42කින් වැඩි වෙලා තිබෙනවා. එම නිසා අද ලෝකයේ බලවත් රටවල් ඒක රාශි වෙලා මේ සඳහා විසඳුම් සෙවීමට ප්‍රමාද වෙලා හෝ කටයුතු කිරීම පිළිබඳව අපි සන්තෝෂ වනවා. හරිතාගාර වායු සියයට 40ක ප්‍රමාණයකින් විමෝචනය වීමට වගකිවයුතු රටවල් වන චීනය සහ ඇමෙරිකාවේ නායකයන් දෙදෙනා හමුවෙලා කථා කරලා, මේ ලෝකයටම අවශ්‍ය කරන විසඳුම් ලබාදීම සඳහා අද එකඟත්වය පල කරලා තිබෙනවා. අපි ඒ ගැන සන්තෝෂ වනවා. මෙම පැරිස් ගිවිසුම ඉතාමත්ම කාලෝචිත ගිවිසුමක්. මෙය අපේ පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා තබපු වැදගත් පියවරක් හැටියට අපි දකිනවා. එදා, සමුළුවට රටවල් 195ක් සහභාගි වෙලා තිබෙනවා. අද වන විට මෙම ගිවිසුමට රටවල් 178ක් අත්සන් තබා තිබෙනවා. අද, ශ්‍රී ලංකාව තුළ මෙම පැරිස් ගිවිසුම අනුමත කර ගන්න අවශ්‍ය කරන පසු බිම සකසා ගන්නයි ගරු පාර්ලිමේන්තුවට මෙම යෝජනා මාලාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා ලෝකයේ බලවත් රටවල් මෙම ගැටලුවලට විසඳුම් හඳුන්වා දීම පිළිබඳව අපි සන්තෝෂ වනවා. මෙම කාලගුණික විපර්යාසය නිසා පරිසරයේ උෂ්ණත්වය වැඩිවීමෙන් මුහුදු ජල මට්ටම ඉහළ ගිහිල්ලා තිබෙනවා. මෙම මුහුදු ජල මට්ටම ඉහළ යාම තුළ දූපත් රටවලට - ශ්‍රී ලංකාව ඇතුළුව- බලවත් තර්ජනයක් වෙලා තිබෙනවා. මොකද, අද මුහුදු බාදනය වෙමින් තිබෙනවා. ඒ වාගේම මුහුදු මට්ටම ඉහළ යාම තුළ දේශගුණික විපර්යාසයන් සිදු වනවා. එක පැත්තකින් නියඟය ඇතිවීම විශාල ලෙස රටවලට බලපානවා. ගෝලීය උෂ්ණත්වය වැඩි වෙලා තිබෙනවා. අනෙක් අතට එක පාරට සිදුවන ගංවතුර, සුළිසුළං, කුණාටු, නාය යෑම් නිසා ජන ජීවිතයට විශාල තර්ජන එල්ලවෙලා තිබෙනවා. නියඟය නිසාත්, මුහුදු ජල මට්ටම ඉහළ යෑම නිසාත් ජලය සපයන පෝෂිත ස්ථානවලට විශාල ගැටලු මතු වෙලා තිබෙනවා. අද ජල සම්පාදනය සිද්ධ වන්නේ, විශේෂයෙන් ගංගා ආශ්‍රිතවයි. නියඟ කාල තුළ මුහුදු ජලය ගංගා හරහා රට අභ්‍යන්තරයට ඒම නිසා පානීය ජලයට ලුණු මිශ්‍ර වෙලා තිබෙනවා. ඒ නිසා ජල සම්පාදන අමාත්‍යාංශයට අද විශාල පිරිවැයක් දරන්න සිදු වෙලා තිබෙනවා, අවශ්‍ය කරන anicut barriers හදන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ සියයට 12ක ජනගහනයක් තවමත් පානීය ජලය ලබා ගන්නේ ප්‍රජා ජල ව්‍යාපෘති හරහායි. මේ නියඟය නිසාම ප්‍රජා ජල ව්‍යාපෘති රාශියක් අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා ජනතාවට ජලය ලබා දීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ වාගේම, අධික නියඟය නිසා අපේ ආහාර

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

සුරක්ෂිතතාවේ ගැටලු තිබෙනවා; කෘෂි කර්මාන්තය තුළ අස්වනු අඩු වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. උෂ්ණත්වය වැඩි වන විට අප බලාපොරොත්තු වන ඵලදායිතාව, අස්වැන්න අපට ලැබෙන්නේ නැහැ.

හදිසි ගංවතුර තත්ත්වයන් නිසා ද ජන ජීවිත අඩාළ වනවා අපි දැක්කා. හදිසි ගංවතුර තත්ත්වයන් නිසා ජනතාවගේ ජීවිත කඩාකප්පල් වුණා; දේපළවලට විශාල වශයෙන් හානි වුණා; දේපළ නාස්ති වුණා; ලෙඩ රෝග ව්‍යාප්ත වුණා. මේ දේශගුණික විපර්යාසය නිසා, විශාල වශයෙන් සිදු වන වායු දූෂණය නිසා අද ශ්වසන රෝග වැඩි වෙලා තිබෙනවා; ඇදුම වැඩි වෙලා තිබෙනවා; නිදන් ගත රෝග වැඩි වෙලා තිබෙනවා; පිළිකා වැඩි වෙලා තිබෙනවා. අසාත්මිකතාව, මානසික ආතතිය, මානසික රෝග අද විශාල වශයෙන් පැතිරී තිබෙනවා. ඒ නිසා, ජනතාවගේ ජීවිත හරි පාරට ගැනීම ඉතාම වැදගත් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලශක්ති උත්පාදනය සඳහා සූර්ය ශක්තිය ලබා ගැනීමේදී හැම නිවසක්ම සූර්ය ශක්ති බලාගාරයක් හැටියට පරිවර්තනය කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ රජය අද කටයුතු කර තිබෙනවා. අපි ඒ ගැන බෙහෙවින්ම සන්තෝෂ වෙනවා. අතිගරු ජනාධිපතිතුමා පරිසර අමාත්‍යතුමා හැටියට නිවැරැදි නායකත්වය ලබා දෙමින්, පරිසර විනාශය අවම කරන්න අවශ්‍ය කරන මූලික අඩි තාලම අද දමා තිබෙනවා.

අපි දන්නවා, කාබන් ඩයොක්සයිඩ් වැඩි වශයෙන්ම වාතයට මුදා හරින්නේ ඉන්ධන, ගල් අඟුරු, ගෑස් ආදිය මඟින් බල ශක්තිය උත්පාදනය කිරීම තුළ බව. ඉදිරියේදී ගල් අඟුරු බලාගාර හදනවාද කියන කාරණය පිළිබඳව ප්‍රතිපත්තිමය තීන්දු ගැනීම වැදගත් වනවා. පරිසරය ආරක්ෂා කර ගැනීම ඉතාම වැදගත් වන නිසා අපි විකල්ප බලශක්ති උත්පාදනයට යන්න ඕනෑ. ඒ වාගේම, ප්‍රවාහන ක්ෂේත්‍රය ගැනත් කියන්න ඕනෑ. අද වාහන වැඩි වෙලා. වාහනවලින් මෝචනය වන කාබන් ප්‍රමාණය වැඩියි. ඒ නිසා අපි දකිනවා, අද විදුලියෙන් ක්‍රියා කරන වාහන හඳුන්වා දී තිබෙනවා. විදුලියෙන් ක්‍රියා කරන වාහන හඳුන්වා දුන්නාට පරිසර දූෂණය අවම වන්නේ නැහැ. මොකද, විදුලියෙන් ක්‍රියා කරන වාහනය charge කරන්න බලශක්තිය අවශ්‍යයි. අප ඒ බලශක්තිය නිෂ්පාදනය කරන්නේ ඉන්ධන හරහා නම්, ගල් අඟුරු හරහා නම් අපට එයින් ලොකු වාසියක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ ගැනත් අපි හිතන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හරිත වගාව -පැළ සිටුවීම- ඉතාම වැදගත් වනවා. මොකද, අපට දැනගන්න ලැබෙනවා, 1900 ගණන්වල ලංකා භූමියේ සියයට 80ක් තිබුණේ වනාන්තර බව. හැබැයි 2005 වන විට එය සියයට 20 දක්වා අඩු වෙලා. නාගරීකරණයේ ප්‍රතිඵල හැටියට, කෘෂි කර්මාන්තය සඳහා වන එළි පෙහෙළි කිරීම් නිසා අද වනාන්තර අඩු වෙලා තිබෙනවා. 2005 වර්ෂයේ Global Forest Resources Assessment තුළින් පෙන්නුම් කරනවා, 1990 ඉඳලා 2005 දක්වා ලෝකයේ මුල් කැලෑ - primary කැලෑ - විනාශ කරන රටවල් අතුරින් ලංකාව හතරවන තැනෙහි සිටිනවා කියා. ඒ නිසා, අපි මේ සම්බන්ධයෙන් ඉතාම බුද්ධිමත්ව, වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. වැවුණු කැලෑ අක්කරයකින් වසරකට කාබන් ඩයොක්සයිඩ් ටොන් 770ක් උරා ගන්නවා කියා පර්යේෂකයෝ සොයාගෙන තිබෙනවා. එක ගසකින් දිනකට දසදෙනෙකුට හුස්ම ගන්න අවශ්‍ය ඔක්සිජන් ලීටර් 6,400ක් නිදහස් කරන බව සොයාගෙන තිබෙනවා. ඒ නිසා, ඉතාම වැදගත්, පරිසරය ආරක්ෂා කිරීම සඳහා ගස් සිටුවීම. අතීතයේ සිට ගත්තාම, හැම අවස්ථාවකම පාහේ ගස් සිටුවුවා. නමුත්, අපි ගස් සිටුවනවා විතරයි; කිසිදු පසු විපරමක් කර බලන්නේ නැහැ. ඒ නිසා, මේ ගැන ජනතාව, සමාජය පුළුල්ව දැනුවත් කිරීම වැදගත් වනවා. පාසල හරහා දරුවන් දැනුවත් කරලා, දරුවන් ලවා පුංචි කාලයේදීම පැළයක් සිටුවා, ඒ දරුවන් Advanced Level පන්තියට යන කල් ඒ ගස රැක බලාගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කරලා, පුළුල් කථිකාවක් සමාජය තුළ ඇති කරලා, හැමෝම ජීවත් වන මේ මිහි තලය ආරක්ෂිත තැනක් බවට පත් කරලා, නීරෝගිමත්ව ජීවත් වන්න, සන්තෝෂයෙන් ජීවත් වන්න පුළුවන් ශ්‍රී ලංකාවක් නිර්මාණය කරන්න අපි හැමෝම අත් වැල් බැඳගනිමු කියන ආරාධනාව කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.43]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගෝලීය උණුසුම ඉහළ යෑම සමස්ත මිනිස් සංහතියේ ඉතිහාසය තුළ මිනිසා මුහුණ දුන් දැවැන්තම අභියෝගයයි. මෙවැනි අභියෝගයකට, මෙතරම් දැවැන්ත අභියෝගයකට, සමස්ත ජීවී ප්‍රජාවම විනාශ වීමේ අවදානමක් ගෙනෙන අභියෝගයකට මිනිසා මීට පෙර කවදාවත් මුහුණ දීලා නැහැ. අපේ පරිසරයේ තිබෙන කාබන් ඩයොක්සයිඩ්, කාබන් මොනොක්සයිඩ්, මීතේන්, ක්ලෝරෝෆ්ලෝරෝ කාබන් වැනි වායු වාගේම ජල වාෂ්ප ප්‍රමාණය වැඩිවීම වැනි කාරණා නිසා තමයි අද ගෝලීය උණුසුම ඉහළ යමින් පවතින්නේ කියන කාරණය අපි දන්නවා. මීට වසර දෙසියයකට පමණ පෙර මේ ලෝකයේ මෙවැනි දෙයක් අහලා තිබුණේ නැහැ. ගල් අඟුරු භාවිතය ඉහළ යෑම හා පෙට්‍රල්, ඩීසල් යනාදී වශයෙන් අප භාවිත කරන බනිජ තෙල් භාවිතය සුලභ වීම නිසා අද පරිසරයට මුදා හැරෙන වායු ප්‍රමාණය දැවැන්ත ලෙස ඉහළ ගිහින් තිබෙනවා. අද අපිට ගල් අඟුරු, බනිජ තෙල් වැනි බලශක්ති ප්‍රභවයන් නැති ජීවිතයක් ගැන හිතා ගන්න අමාරුයි. විදුලිය නැතිනම්, වාහන නැතිනම්, යන්ත්‍ර-සූත්‍ර නැතිනම් මේ ජීවිතය කුමන ආකාරයකින් ගෙවන්නට වේවි දැයි අපට සිතින් මවා ගැනීමටත් අමාරුයි. හැබැයි, මේ නිසාම වසර ලක්ෂ සංඛ්‍යාතයක් විවිධ ජීවීන් විවිධ ආකාරයට පරිණාමය වෙමින් පැවතුණු මහා පොළොව තවවුරටත් පවතිනවාද, නැද්ද කියන ප්‍රශ්නය ජනතාව ඉදිරියේ තබා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගෝලීය උණුසුම ඉහළ යෑමේ ප්‍රශ්නයට කිසිම රටකට හුදෙකලාව විසඳුම් සොයන්න බැහැ. අපි රටවල් විධියට සීමා මායිම් ඇඳගෙන ඉන්නවා. මේ පැත්තේ ලංකාව තිබෙනවා; එහා පැත්තේ ඉන්දියාව තිබෙනවා; ඊළඟට පාකිස්තානය තිබෙනවා; ඉරානය තිබෙනවා; ඉරාකය තිබෙනවා යනාදී වශයෙන් අපි සීමා මායිම් ඇඳගෙන තිබෙනවා. හැබැයි, සොබා දහම මිනිසා විසින් ඇඳගත් සීමා මායිම් පිළිගන්නේ නැහැ. The nature does not recognize man-made boundaries. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේ කාරණය නිසා තමයි ඇමෙරිකාව වැඩිම ප්‍රමාණයක් වායූන් විමෝචනය කරනවිට, මියන්මාරයට සුළි සුළං ඇති වන්නේ. ඇමෙරිකාවට නොවෙයි, එහි බලපෑම ඇති වෙන්නේ. ජල ගැලීම්වලින් විපතට පත් වෙන්නේ බංග්ලාදේශයයි. සුනාමි එන්නේ ඉන්දුනීසියාවටයි. නියහය එන්නේ සුඩානයටයි. ටොනෑඩෝ තත්ත්වයන් ඇති වෙන්නේ බ්‍රසීලයේයි. ඇමෙරිකාව කරන්නා වූ විනාශයෙන් සැබවින්ම පීඩා විඳින්නේ ලෝකයේ වෙනත් රටවල්. ඇයි? මේ සමස්ත ලෝකයම එකිනෙකට ගැට ගැසුණු, එකිනෙකා මත රැඳෙන, තනි ඒකකයක් විධියටයි පවතින්නේ. එහෙම නැතුව මිනිසා විසින් ඇඳගත් සීමා මායිම් සොබා දහම පිළිගන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පරිසරවේදීන් අතර පිළිගත් ඉතා වැදගත් ප්‍රකාශයක් තිබෙනවා, "ඔබ පරිසරය සුරැකුවොත්, පරිසරය ඔබ රකියි" කියා. එහි අනෙක් පැත්ත ගත්තොත්, "ඔබ පරිසරය විනාශ කළොත්, පරිසරය ඔබව විනාශ කරයි" කියා තමයි කියන්න වෙන්නේ. අද සිදු වෙමින් පවතින්නේ එයයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් වන්නේත්, අනෙක් ජීවීන්ට ජීවත් වෙන්න පුළුවන් වන්නේත්, ගස්-වැල් විසින් මෙහි තිබෙන කාබන් ප්‍රමාණය උරා ගෙන මහ පොළොව යටට අරගෙන ගිහින් තැන්පත් කරන නිසායි. බෝම්බයක් අරගෙන ගිහින් මහ පොළොව යට සඟවා තැබුවා වාගේයි කියා එය හඳුන්වන්න පුළුවන්. අපි අද මහා වෙර වීරියක් දරා මහ පොළොව යට තිබුණු බෝම්බය හාරා ගෙන ගොඩට ගෙනැල්ලා ගල් අඟුරු නමින්, ඛනිජ තෙල් නමින් එකී බෝම්බය පුපුරුවා හරිමින් තිබෙනවා. ඒ නිසා තමයි, අද මේ මහා දැවැන්ත විනාශයට අපි මුහුණ පාමින් ඉන්නේ. ඒ නිසා අද මුළු ලෝකයම එකතු වුණත් එක රටක් එකතු වෙන්නේ නැත්නම් අපිට මේ විනාශය නතර කරන්න බැහැ. ඒ නිසා තමයි එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය බිහි වුණේ. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මේ පාර්ලිමේන්තුවට පැමිණියේ මෙම මැතිවරණයෙන් වුණත්, මීට පෙර 2007, 2010 සහ 2013 කියන වර්ෂවලදී තුන් වතාවක්ම ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එම වාර්ෂික සම්මේලනයට සහභාගිවීමට මට අවස්ථාව ලැබුණා.

ඒ විතරක් නොවෙයි, 2007 සහ 2013 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා වෙනුවෙන් එම සමුළුව අමතන්නත් මට අවස්ථාව ලැබුණා. මේ සමුළුව මීට කලින් Kyoto Protocol යන නමින් ඇති කර ගත්තා. එම "කියෝතෝ සම්මුතිය" මඟින් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ක්‍රියාත්මක වෙන කාබන් විමෝචනය පාලනය කිරීමේ ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ආරම්භ කළා. නමුත් එය සාර්ථක වුණේ නැහැ. ඇයි? ලෝකයේ සමස්ත කාබන් විමෝචනයෙන් සියයට විසිපහකට වඩා වැඩි ප්‍රමාණයකට වග කියන ඇමෙරිකා එක්සත් ජනපදය මෙම සම්මුතියට අත්සන් කරන එක ප්‍රතික්ෂේප කළා. ඕස්ට්‍රේලියාවත් එසේ අත්සන් කිරී**ම** ප්‍රතික්ෂේප කරමින් ඉඳලා 2007 වසරේ බාලි නුවරදී අත්සන් කළා. ඇමෙරිකාව අත්සන් කළේම නැහැ. ලෝකයේ දැවැන්තම පරිසර දූෂකයා, තමන් තුළ ස්වයං විනයක් ඇති කර ගන්න එකම වෙන්නේ නැති තාක්, සොච්චම් ප්‍රමාණවලින් කාබන් විමෝචනය කරන පුංචි, පුංචි රටවල් මොන මොන සම්මුතිවලට එළැඹුණත් ඵලක් වෙන්නේ නැහැ. 2020 ඉඳන් පැරිස් එකඟතාව - Paris Agreement එක- ක්‍රියාත්මක වෙන්නේ. මේ එකඟතාව ඇති කර ගන්න පසු ගිය වසර වෙන කල් ඇදුණේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි, ඇමෙරිකා එක්සත් ජනපදය පාවිච්චි කරපු පරිසරයට සංවේදී නැති, අන් අයගේ ජීවිත පිළිබඳව සංවේදී නැති මුරණ්ඩු ප්‍රතිපත්තිය නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඇමෙරිකා එක්සත් ජනපදය ලෝකයේ අනෙක් රටවලට මානව හිමිකම් කඩකරන බවට ඇඟිල්ල දික් කරනවා. හැබැයි, ඇමෙරිකා එක්සත් ජනපදය මේ Kyoto Protocol එකට එකඟ නොවීමෙන්, පැරිස් එකඟතාව ප්‍රමාද කිරීමෙන් ලෝකයේ දැවැන්තම කාබන් විමෝචකයා බවට පත් වෙමින් මේ ලෝකයට කරලා තිබෙන විනාශය අතිමහත්. එයින්, මිනිසා විතරක් නොවෙයි, සමස්ත ජීවී ප්‍රජාවම අනතුරට ලක් වෙලා තිබෙනවා. අද අපි කථා කරනවා, ස්වාභාවික විපත් සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ලෝකයේ තවදුරටත් ස්වාභාවික විපත් කියලා දෙයක් නැහැ. Sir, there are no natural disasters. All are man-made disasters. ඇයි? මිනිසා කාබන් විමෝචනය කිරීම හරහා ගෝලීය උණුසුම ඉහළ යාමක් ඇති වෙලා තිබෙනවා. ගෝලීය උණුසුම ඉහළ යාම නිසා තමයි, භූමිකම්පා ඇති වෙන්නේ. ගෝලීය උණුසුම ඉහළ යාම නිසා තමයි, සුනාමි ඇති වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

අද මිනිසා මුහුණ දෙන සියලුම ස්වාභාවික විපත්වල මූලය සොයාගෙන ගියොත්, එය ගෝලීය උණුසුම විසින් ඇති කරන ලද තත්ත්වයක්. ඒ නිසා අද ලෝකයේ ස්වාභාවික විපත් නාමයෙන් මිය යන මිනිසුන් පමණක් නොවෙයි, සතුන් පමණක් නොවෙයි, ගස්වැල් ඇතුළු සියලු ජීවීන්ගේ මරණයන්ට, පරිසරයට අධික ලෙස කාබන් විමෝචනය කරන ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ දියුණු යැයි සම්මත රටවල් වගකිව යුතුයි. ඒ නිසා ඇමෙරිකාව මානව හිමිකම් සම්බන්ධයෙන් අපට එක ඇඟිල්ලක් දික් කරද්දී, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇඟිලි හතරක් ඔවුන් දෙසට දික් වී තිබෙන බව අපි ඇමෙරිකාවට සිහිපත් කරලා, පැරිස් එකඟතාව ප්‍රායෝගික තලයට ගෙන එන්න කටයුතු කරන්න ඕනෑ. පරිසරය ගැන සාකච්ඡා කරන ලෝකයේ තිබෙන සමුළු ටික නොතිබුණා නම් හොඳයි කියලා හිතෙනවා. මේ අය සමුළුවලට යද්දී කාබන් ටොන් ලක්ෂ ගණනක් ගුවන් යානාවලින්; private jetsවලින්; නැව්වලින් පරිසරයට මුදා හරින්න ඇති. සමුළුවලට යාමෙන් පරිසරය තවදුරටත් විනාශ වුණා මිසක් පරිසරයට දායකත්වයක් ලැබිලා නැහැ. අද ඕනෑ කරන්නේ, පරිසරය ගැන කථා කරන ප්‍රදර්ශනාත්මක පරිසර රැක ගැනීමක් නොවෙයි. පරිසරය සුරැකීමේ වැඩේට බහින්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය නායකයන් රූපවාහිනී කැමරා ඉදිරියේ පුංචි පැළයක් හිටවලා වතුර දානවා ප්‍රදර්ශනය කරන අතර, ආණ්ඩුවේම ඇමතිවරු 'විල්පත්තුව' වැනි මහා වනාන්තර විනාශ කරනවා නම්, කාබන් විමෝචනය ගැන ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කරලා එයට මහා ප්‍රසිද්ධියක් ලබා දෙන අතරේ කාබන් විමෝචනය වැඩි, රටට ගෙන ඒමට තහනම් වාහන ගෙන එන්න හොර රහසේ බලපත්‍ර දෙනවා නම්, පරිසරය සුරැකීම ප්‍රදර්ශනයක් මිසක් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් නොවෙයි. මට සිහිපත් වෙනවා, 'පරිසර ගීතය' ලියූ අරිසෙන් අහුබුදු මහත්තයායි, මමයි අතර ඇති වුණු සංවාදයක්. මම මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති හැටියට ඉන්න කාලයේ අරිසෙන් අහුබුදු මහත්තයාගෙන් ඒ ගීතය ගැන ඇහුවා. මේ ගීතය අවසන් වෙන්නේ, "මගේ හුස්මෙන් පවා පරිසරය නිවේවා!" කියා. මම අරිසෙන් මහතාගෙන් ඇහුවා, "හුස්ම පිට කරන කොට පිටවෙන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩියි. පිට වෙන හුස්මෙන් ගෝලීය උණුසුම වැඩි වෙනවා. ඉතින්, ඒකෙන් කොහොමද පරිසරය නිවෙන්නේ?" කියලා.

එතකොට එතුමා මට දීපු උත්තරය තමයි, "මට මෙතැන ඕනෑ වුණේ හුස්ම පිට කරන වතාවක්, වතාවක් පාසා පරිසරය නිවේවා! කියන එක සිහිපත් වෙන භාවනාවක් බවට, පරිසරය නිවීමේ වැඩසටහන ජනතාව විසින් පත් කර ගැනීමයි" කියලා. අන්න එහෙම ප්‍රායෝගික වැඩසටහනකට නොගොස් පරිසරය ගැන කථා කිරීමෙන්, මාධ්‍ය සංදර්ශන පැවැත්වීමෙන් අපට මේ විපත නතර කරන්න බැරි වෙනවා. එහෙම වුණොත් අපේ දරුවන්ගේ දරුවෝ මේ මිනිතලය මත ජීවත් වෙන අවසාන පරම්පරාව වෙනවා කියන එක සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you very much. அடுத்ததாக, கௌரவ றவுப் ஹகீம் அவர்கள்.

[1.53p.m.]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Chairman of Committees, how many minutes have I been allotted?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Ten minutes.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Thank you.

Sir, we are gathered today to take up the Debate on the Ratification of the Paris Agreement. Though we were to have a few Votes of Condolences and Private Members' Motions be taken up today, the Party Leaders agreed to give way to this Debate, particularly because of its urgency and importance.

Mr. Deputy Chairman of Committees, the Paris Agreement on Climate Change is a historic achievement after 25 years of diplomatic wrangling. There have been many conferences which failed to reach consensus among the nations in the UN system. Finally, we have been able to seminally achieve something. Though I personally feel that we would want drastic measures to be imposed on the industrialized nations, we have no choice but to finally agree to a consensus of this nature.

The salient point of this Paris Agreement is that only developed countries are expected to slash their emissions in absolute terms. Developing nations are encouraged to do so as their capabilities evolve over time. This has been the basic understanding upon which the Paris Agreement on Climate Change has finally been agreed and signed upon among countries. We were fortunate that our own President Maithripala Sirisena himself was personally there in Paris. Since he is the Minister in charge of the subject, he is in a pivotal position to implement and enforce the national obligations that we have agreed upon after having signed this historic Agreement.

The long-term objective of the Agreement is to make sure global warming stays well below 2 °C and to pursue efforts to limit the temperature rise to 1.5 °C, which I believe, is a very lofty ideal. But, we can make an effort to try and reach those levels. Having known the wrangling that has been going on for several years, countries have agreed to set national targets - five years for reducing greenhouse gas emissions. More than 180 countries have already submitted targets for the first cycle beginning in 2020. Our country, not being a highly industrialized nation, may look at these targets with some cynicism, but yet we have other obligations. Having undergone extreme weather events of late, it is important for us to realize that the unprecedented floods that we have experienced during the past decade or two and the unprecedented extended droughts that we have been facing in this country, have caused immense hardships to many of our rural populations.

Food shortages emanate as a result of these droughts. We had suddenly a bumper harvest and then we face situations where we had to contend with extreme weather events on one side. Monsoons are not experienced during the expected period, resulting in serious difficulties for planners in this country. So, as policy-makers and as a Government, we have had to adjust in order to try to keep to our targets.

The United Nations identified the Millennium Development Goals. Fortunately, Mr. Deputy Chairman of Committees, our country is far ahead of our neighbours in our region in achieving our targets - the Millennium Development Goals. We have virtually achieved all the goals ahead of time than our contemporaries and compatriots in the region. We have been paid the kudos for this even by the UN Secretary-General who was here a few weeks ago. He openly acknowledged the success story of Sri Lanka in achieving the Millennium Development Goals.

Now, there is another set of goals called, "the Sustainable Development Goals" which have now begun to be implemented. There are 17 such Goals and all the Ministries are now being given targets to achieve. My Ministry which has to look after the water supply sector has an important role to play in achieving these 17 Goals. A very important aspect of it is that we need to be conscious about the depletion of the forest cover in this country. When my State Minister was speaking a few minutes ago, she referred to the fact that our forest cover has now come down almost to 20 per cent and it cannot be sustained at that level for too long, unless we take some drastic steps.

His Excellency the President, as the Minister in charge of Environment and under whom the Forest Department comes, has undertaken a very ambitious programme called, "Punarudaya" - "Accelerated National Environment Conservation Programme". Its target period

is from 2016 to 2018, where we wish to set up climate-resilient villages and climate-smart cities. This is a very ambitious programme and I am sure His Excellency the President would be able to reach these targets of setting-up of climate-resilient villages and climate-smart cities, which is a very important step for us to progress in this millennia and then take forward the country.

Then, the Ministries have also been directed to factor in emission reduction in drawing up long-term plans. Now, we as a Ministry, have also looked at our energy consumption. We have almost 330 large water supply schemes all over the country where we appear to spend a lot of money on energy. Our expenses towards energy consumption is almost 25 per cent of our entire spending for a year. So, we are looking at ways and means of going for alternative energy sources rather than to depend on the national grid. This is something that we need to include in the future projects that we embark upon.

In the same manner, we also have to look at very importantly setting-up of an authority to look at river basins and watershed management. Because, river basins and watershed management is a very important area which has now fallen under different clusters of authorities and ministries. Particularly, we have the Mahaweli Authority, the Forest Department and many other agencies which tend to look at the subject of river basins and watershed management issue. Conflicting policies and people going to different agencies to get different accreditations and certifications has resulted in total confusion. Therefore, Mr. Deputy Chairman of Committees, this particular subject of river basins and watershed management is an issue that we have to focus upon.

Since my time is up, may I say a few words in Tamil very briefly, particularly relating to a serious event, the coastal erosion that has affected the coastal communities in the Ampara District.

அம்பாறை மாவட்டத்தில் கடலரிப்புக் காரணமாகப் பாதிக்கப்பட்ட மீனவர்கள் சம்பந்தமாகவும் ஒருசில வார்த்தைகள் பேச வேண்டும். இந்தக் கடலரிப்பினால் தாழ்நிலப் பகுதிகளில் வாழ்கின்ற மீனவர்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். குறிப்பாக ஒலுவில் பிரதேசத்திலே இந்தப் பாதிப்பு மிக அதிகமாக ஏற்பட்டிருக்கின்றது. ஒலுவில் துறைமுகம் அமையப்பெற்ற பின்னர் அந்தத் துறைமுக நிர்மாணத்தில் ஏற்பட்ட ஒரு கோளாறு காரணமாக அந்தப் பிரதேசக் காணிகள் இன்று மிகப் படுமோசமாக இழக்கப்பட்டுவருகின்றன. இது சம்பந்தமான பத்திரமொன்றை அமைச்சரவைக்குச் சமர்ப்பித்ததன்பேரில் அமைச்சரவை இதுகுறித்து ஒரு நிபுணர் குழுவை நியமித்திருக்கின்றது. ஆகவே, கடலரிப்பினால் பாதிக்கப்பட்டு இழந்த காணிகளை மிக விரைவிலே மீளப் பெறுவதற்கும் அந்த மீனவர்களுக்கான நஷ்டஈட்டைப் பெற்றுக் கொடுப்பதற்குமான முயற்சியைத் துரிதப்படுத்துமாறு வலியுறுத்தி, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 2.05]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අද සාකච්ඡා කරන්නේ මානව සංහතියේ ඉරණම පිළිබඳ ප්‍රශ්නය විසඳෙන්නේ කෙසේද කියන බරපතළ කරුණ ගැනයි. ඒ නිසා මෙයට අපට දායක වීමට අවස්ථාව ලැබීම ඉතා වැදගත් කාරණයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, may I know how long do I have?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have ten minutes.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Very well, Sir.

මේ දේශගුණික විපර්යාසය ගැන කථා කරන්නේ 1994 සිටයි. සම්මුතික රාමුව හැදුණේ 1994දියි. එදා සිට 2016 වන තුරු විසි වතාවක් රැස් වෙලා තිබෙනවා. "Earth Summit" කියාවි. එහෙම නැත්නම් "Kyoto Protocol" කියාවි. මේවා මෑත කාලයේ ඒවා. මේ විධියට ආපු විවිධ සමුළු හරහා අසාර්ථක උත්සාහයන් ගෙන තිබෙනවා, මේ ගෝලීය උෂ්ණත්වය පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න.

මේක පරිසරයේ ප්‍රශ්නයක් හැටියට දැමීම වැරදියි. ගෝලීය උෂ්ණත්වය පරිසරයේ කොටසක්. ගෝලීය උෂ්ණත්වය පාලනය කර ගැනීම පරිසරයට අවශ්‍ය සාධකයක්. නමුත් මේක පරිසර ප්‍රශ්නයක් නොවෙයි. මේක ඊට වඩා බරපතළ කාරණයක්. මොකද, මේකේ තිබෙන්නේ ඇත්තටම විමෝචනය වන කාබන් වායුව වැඩිකම නිසා ඇති වෙන්නා වූ -උද්ගත වෙන්නා වූ- තත්ත්වයක්. මේකේ විපාක විඳින්නේ කවුද? මේ මුළු ලෝකයම විපාක විඳිනවා. නමුත්, මේකේ අපරාධකරුවන් කවුද? මේ කාබන් වායුව විමෝචනය වන තත්ත්වයන් පවත්වා ගෙන යන ප්‍රධාන පෙළේ රාජ්‍යයන් ගණනාවක් තිබෙනවා. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මේ අපරාධයට හේතු කාරක වන තත්ත්වයන් ඇති කරන උදවිය නොවෙයි, මේ අපරාධයේ විපාක විඳින්නේ. මේ අපරාධයේ විපාක විඳිනවා ඔක්කෝම. මේ අපරාධයට කිසි සේත්ම දායකත්වයක් නොදෙන අපි වැනි රටවල් පවා මේකෙන් විඳවනවා. අපේ ඒක පුද්ගල විමෝචනය ටොන් බින්දුවයි දශම 6.1යි. මේ කලාපයේ විතරක් නොවෙයි, ලෝකයේම එය අඩුවෙන්ම තිබෙන රටවලින් එකක් අපේ රට. භූතානයටත් වඩා අපේ රටේ අඩුයි. අපේ රටේ එහෙම තිබියදී, අපි එල් නිනෝ නියඟයට මුහුණ දෙනවා. අපි එසේ තිබියදී විපරීත දේශගුණික තත්ත්වයන් නිසා සිදු වන විපත්වලට මුහුණ දෙනවා. It is not our making, but we are the victims. අපි දැන් මේකේ වින්දිතයන්. නමුත්, මේකේ හේතුකාරකයන් අපි නොවෙයි.

ගරු ගම්මන්පිල මන්ත්‍රීතුමා කිව්වා වාගේ මීට වඩා ලොකු මානව විරෝධී අපරාධයක් තිබෙන්න පුළුවන්ද? මීට වඩා ලොකු මානුෂීය විරෝධී අපරාධයක් තිබෙන්න පුළුවන්ද? මුළු මානව සංහතියට විනාශය ගෙන දෙන මීට වඩා ලොකු අපරාධයක් තියෙන්න පුළුවන්ද? එහෙම නම් මේ පිළිබඳව සොයා බලන්නට ජාත්‍යන්තර අධිකරණයක් නැතිකම කොච්චර අඩුවක්ද? ඇයි, එක්සත් ජාතීන්ගේ සංවිධානයට බැරි වුණේ මේකට අධිකරණයක්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

පිහිටුවන්න? මේ වායු විමෝචනය, කාබන් වායු විමෝචනය සීමා කළ යුතුයි. එසේ නැත්නම් මනුෂ්‍ය සංහතිය විනාශ වේවි. කොච්චර කලක් ගියා ද ඇමෙරිකාව මේක පිළිගන්නා තැනට ගෙනෙන්න? ඇමෙරිකාව විද්‍යාඥයින්ට මුදල් දීලා, නොයෙකුත් ශාස්ත්‍රඥයන්ට මුදල් දීලා, කාලයක් තිස්සේ විශාල වෑයමක් ගත්තා, ගල් අඟුරු භාවිතය, පොසිල ඉන්ධන භාවිතය, මේ කාබන් වායු විමෝචනයේ ප්‍රධාන හේතු සාධක නොවෙන බව ඔප්පු කරන්න. නමුත්, අන්තිමට ඔවුන්ට පිළිගන්න සිද්ධ වුණා, මේ කාබන් වායු විමෝචනයේ ප්‍රධාන හේතු කාරක දෙක ගල් අඟුරු භාවිතය හා පොසිල ඉන්ධන භාවිතය බව. මේ වතාවේ ඇමෙරිකාවත් මේ ගිවිසුමට අත්සන් කරන්න එකඟ වෙලා තිබෙනවා. ඒක ඉතා යහපත් දෙයක්. ඇයි, අර Kyoto Protocol එක අත්සන් නොකළේ? ඒකේ තිබෙනවා, ඊට වඩා නිශ්චිත වගකීම් භාර ගැනීමක්. දැන් මේ පැරිස් ගිවිසුමේ නිශ්චිත වගකීම් භාර ගැනීමක් නැහැ. මේවා විභාග කරන්නට ජාත්‍යන්තර අධිකරණයක් ඇත්තේත් නැහැ. මෙන්න මෙවැනි ලෝකයක තමයි අපි ජීවත් වෙන්නේ. ලොකුම අපරාධකාරයින් ගැලවී යනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය හදපු වෙලාවේ එක් රාජ්‍ය තාන්ත්‍රිකයෙක් කිව්වාලු, "The lions are free and the rats are disciplined" කියලා. කුඩා රටවල් විනයකට යටත් කරනවා; නීතියට යටත් කරනවා. නමුත් ප්‍රධාන රටවල් සම්පූර්ණයෙන්ම නිදහසේ තමන්ගේ අභිමතය අනුව ක්‍රියාත්මක වෙනවා. අද මේ පැරිස් ගිවිසුමෙත් there is consensus, but no quantum commitment. There is no enforceable mechanism; it is purely voluntary. If the targets are not met, there is nothing you can do. At least, there should have been some compensatory pecuniary payment to a world fund. If they failed to meet the target, a certain amount of compensation should have been payable to an international fund. But, there is nothing like that in this entire setup.

අපි ලෝකය පුරාම ගියා. ඒ නිසා දැන් අපි වහාම ලංකාවට එමු. අපි දන්නවා, ලංකාවේ මේ මැත කාලීනව ගංවතුරක් ඇති වුණු බව. එයින් වඩාත් හානියට පත් වුණේ දුප්පතුන්. ඒ පිළිබඳව අපට වාර්තා ගණනාවක් ලැබී තිබෙනවා. මේ ලෝකයේ උෂ්ණත්වය වැඩි වීම නිසා මොකක්ද, වෙන්නේ? දේශගුණික විපත් සිද්ධ වෙනවා. ඔන්න, අපට දේශගුණික විපත් සිද්ධ වෙලා තිබෙනවා. ඒ දේශගුණික විපත් නිසා වඩාත්ම දුක් විඳින්නේ කවුද? වඩාත්ම හානියට පත් වන්නේ කවුද? දුප්පත්ම ජනතාව. ඒකත් ඔප්පු වෙලා තිබෙනවා. අප්‍රිකාවේ වාර්තාවකින්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තාවකින් ඒ බව ඔප්පු වෙලා තිබෙනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම එම වාර්තා දෙක **සභාගත*** කරනවා.

එක වාර්තාවක් තමයි අප්‍රිකාව පිළිබඳව වන “Report: Natural Disasters Worsen Poverty” කියන වාර්තාව. අනෙක් එක තමයි “Climate change: the poor will suffer most” නම් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තාව. ලංකාවේත් ඒක නේ වුණේ. ලංකාවේත් දුප්පතුන් තමයි වැඩියෙන්ම දුක් වින්දේ; වින්දිතයන් වුණේ. මොනවාද, ඒ අයට ලැබුණේ? අද වෙනකල් ලැබී තිබෙන්නේ රුපියල් 10,000 විතරයි. නැති වුණු භාණ්ඩවල වටිනාකම දෙනවාය කිව්වා. කැඩුණු ගෙවල් හදා දෙනවාය කිව්වා. නමුත් අද වෙනකල් දීලා තිබෙන්නේ රුපියල් 10,000 විතරයි. ආණ්ඩුව පැරිස් ගිවිසුමට අත්සන ගහලා එනවා. නමුත් මේ රටේ සිදු වූ විපත්වලදී දුප්පත් ජනයා වෙනුවෙන් ලබා දෙන බවට ප්‍රතිඥා දුන් යුතුකම් ඉටු කරන්න මේ ආණ්ඩුවට පුළුවන් වෙලා නැහැ. ඒකට අපි කියනවා, ආත්මවංචාව - hypocrisy - කියලා. එක පැත්තකින් ගිහිල්ලා පැරිස් ගිවිසුම අත්සන් කරනවා. අනෙක් පැත්තෙන් මේ රටේ හානියට පත් වූ මිනිසුන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් පැහැර හැරිනවා.

දැන් අපි බලමු, ස්වාභාවික විපත් නිසා දුප්පත් මිනිසුන් වැඩියෙන් අමාරුවේ වැටෙන්නේ ඇයි කියලා. ලොකු උෂ්ණත්වයක් - heatwave එකක් - ආවා කියමු. ජීවත් වීමට අපහසු වාසස්ථානවල ජීවත් වන මිනිසුන්, එළිමහනේ ජීවත් වන මිනිසුන් තමයි ඒකෙන් විනාශයට පත් වෙන්නේ. එහෙම නැත්නම් ඉතාම අවදානම් සහගත තැන්වල ජීවත් වන මිනිසුන්ට තමයි ඒ ඇති වන්නා වූ විපත් නිසා වඩා බරපතළ හානිය විඳ ගන්න සිද්ධ වෙන්නේ. ඒ නිසා අපේ ආණ්ඩුව අපේ රටේ -ගස් සිටුවීමේ ව්‍යාපාර හොඳයි- අඩු ගණනේ මේ සිදු වන විපත් අවම කරන්න කටයුතු කරන්න ඕනෑ. බංග්ලාදේශය අද අඩු දියුණු රටක්. නෙදර්ලන්තය දියුණු රටක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ රටවල් විවිධ උපක්‍රම මඟින් මිනිසුන්ට සිදු වෙන්න පුළුවන් විපත් අඩු කරලා තිබෙනවා.

මාගේ කථාව අවසන් කිරීමට පෙර මම තවත් දෙයක් කියන්න ඕනෑ. මම "ගංවතුර" ගැන කිව්වා. තමුන්නාන්සේලා මේ රටේ විපතට පත් දුප්පත් මිනිසුන්ට දෙනවාය කියපු වුවමනා නොදුන්නාට, නැති වුණු බඩු මුට්ටුවල අලාභය නොදුන්නාට, ගංවතුරෙන් යට වුණු බෘවරිස් සමාගමේ යන්ත්‍ර සූත්‍ර නැවත හදනතුරු බද්දෙන් තොරව බියර් import කරන්න ඉඩ දීලා තිබෙනවා. බෘවරිස් සමාගමට ඔවුන්ගේ රක්ෂණයෙනුත් මුදල් ලැබුණා. ඊට අමතරව, බදු නොගෙවා මේ රටට බීර ආනයනය කිරීමෙනුත් අතිවිශාල ධනස්කන්ධයක් ලාභ හැටියට ගන්න පුළුවන් වුණා. නමුත් තමුන්නාන්සේලාගේ රජය, දුප්පත් මිනිසුන්ගේ- විපතට පත්වූවන්ගේ- විනාශ වෙච්ච බඩු මුට්ටුවලට දෙනවාය කිව්ව මුදල් ගෙවලාත් නැහැ. ඔවුන්ගේ ගෙවල්වලට වෙච්ච හානියට මුදල් ගෙවලාත් නැහැ. නමුත් තමුන්නාන්සේලා අත්සන් කරන්නේ පැරිස් සමුළුවේ සම්මුතියට!

අවසාන වශයෙන් මා මෙය කියන්න ඕනෑ. දේශගුණික විපර්යාස ඇති වීම වැළැක්වීමට ඉතා පැහැදිලි බන්දනීය වූ තීරණාත්මක ක්‍රියාදාමයක් නැත්නම්, සමහරු කියනවා වාගේ මේ සම්මුතියත් නිකම් වංචාවක් විතරක් වෙයි. ඇත්ත තමයි, මේ ගැන කථා කරන්න කාලයක් ගත වුණා. ඒ කාලය තුළ ලොකු ගැඹුරු කථාබහක් ඇති වුණා. නමුත් අවශ්‍ය ඒ කරුණු නිශ්චිතව ඉටු වන ආකාරයට, උෂ්ණත්වය වැඩි වීමට හේතුවන වායු විමෝචනය අඩු කරන ආකාරයට නිශ්චිතව වග කීම් ඉටු කිරීමට බැඳෙන ක්‍රියාදාමයක් මේ ගිවිසුම තුළ නැහැ. ඒ නිසා අර කිව්වා වාගේ ලොකු රටවලට කැමැති නීතියක් ඔවුන්ට ඕනෑ හැටියට පවත්වා

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගෙන යන්නත්, ඔවුන් අකැමැති නීතියට යටත් නොවී ඉන්නත් තව දුරටත් ලබා දී තිබෙන මේ ඉඩකඩ තුළ, ගල් අඟුරු භාවිතය හා පොසිල ඉන්ධන භාවිතය වැඩි වී ගෙන යනවා. අන්න ඩොනල්ට් ට්‍රම්ප්ට් කියනවා, ඔහු බලයට ආ හැටියේ මේ ගිවිසුම ලිහලා දමනවා කියලා. ඔහු ඇමෙරිකාවේ රිපබ්ලිකන් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා. අපි කවුරුත් දන්නවා. ජනාධිපති ඔබාමා සෙනෙට් සභාවේ අනුමතිය අරගෙනයි ආවේ මේ ගිවිසුමට එකඟත්වය දෙන්න. සෙනෙට් සභාවේ වැඩියෙන් ඉන්නේ රිපබ්ලිකන් පක්ෂයේ අය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up, now.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා කථාව අවසාන කරන්නයි යන්නේ.

ඒ රිපබ්ලිකන් පක්ෂයේ අය පොසිල ඉන්ධන භාවිතයේ වඩාත් හිතමිත්‍රයන් බව කවුරුත් දන්නවා. ඒක ජාත්‍යන්තර වශයෙන්ම කවුරුත් දන්නවා. ඒ නිසා ඇමෙරිකාව අවංකව මේ පිළිබඳව ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියන එක ගැන ලොකු ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. They will have to prove themselves in the future.

Thank you, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු මහින්ද සමරසිංහ මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Skills Development and Vocational Training)

I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[අ.භා. 2.17]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මටත් අවස්ථාවක් ලැබී තිබෙනවා මේ පැරිස් ගිවිසුම අපරානුමත කිරීමට ඉදිරිපත් කර ඇති මොහොතේ ඒ සම්බන්ධයෙන් අදහස් එකතු කරන්න.

අපි දන්නවා, ගෝලීය උණුසුම ඉහළ යෑම මුළු මිනිස් සංහතියටම වන බලපෑමක් කියලා. පළමුවන වතාවට 1982 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා මේ පිළිබඳව රාජ්‍ය නායකයන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ පටන් ගෙන, COP - Conference of Parties -පළමුවන සාකච්ඡාව තිබුණා. ඊට පස්සේ 1992 වර්ෂයේදී Earth Summit එක පැවැත්වුණා. එතැනදී තමයි මේ ගිවිසුමට මූලික වූ යෝජනා ඉදිරිපත් වුණේ. COP 1 සිට COP 20 දක්වා විසි වතාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉන්න රටවල් එකසිය අනූතුනම සහභාගි වුණා. ඊට පස්සේ Kyoto සම්මුතියට ආවා. Kyoto සම්මුතියට එනකොට ඇමෙරිකාව චීනය, ඉන්දියාව යන ප්‍රධාන රටවල් ඒ සම්මුතියට එකඟ වුණේ නැහැ. ඒ විශාල රටවල් ඒක ප්‍රතික්ෂේප කළා. එදා ඇති වුණු එකඟතාව තමයි, 1982 වර්ෂයේ මේ ලෝකයේ තිබුණු උණුසුම සෙන්ටිග්‍රේඩ් එකකින් - plus one - සීමා කරන්නයි. නමුත් ඒ ගෝලීය උණුසුම සීමා කරන්න බැරි වුණා.

2016දී ගෝලීය උණුසුම ඒ සීමාව ඉක්මවා ගිහින් තිබෙනවා. මේ උණුසුමේ ප්‍රශ්නය ඉතා විශාල ප්‍රශ්නයක්. ලෝක ඉතිහාසයේ උණුසුම්ම වසර 2016 වසරයි. ලංකා ඉතිහාසයේ උණුසුම්ම මාස දෙක 2016 අප්‍රේල් මාසය සහ මැයි මාසයයි. මෙය විශාල ප්‍රශ්නයක්, විශාල ගැටලුවක්. මෙය විශේෂයෙන්ම මුළු ලෝකයටම බලපානවා. සාගරයේ වතුර ප්‍රමාණය ඉහළ යෑම නිසා විශේෂයෙන්ම ලංකාව වැනි දූපත්වලට මෙය බලපානවා. ලංකාව වැනි කුඩා රටවලට මේ ප්‍රශ්නයට මුහුණ පාන්න සිදු වෙලා තිබෙනවා. මෙය කාගේ වරදින් සිදු වුණත්, මේ පිළිබඳව ඇමෙරිකාව ඇතුළු විශාල රටවලට වග කීමක් තිබෙනවා.

අලුත් සම්මුතියට කියන්නේ "plus two" කියලායි. 1982 වසරේ උණුසුමට සෙන්ටිග්‍රේට් අංශක 2ක් එකතු කරලා ඒක සීමාවක් කර ගන්න තමයි දැන් අලුතින් ක්‍රියා කර ගෙන යන්නේ. 1992 සිට 2015 දක්වා කාබන් විමෝචනය ගිගා ටොන් 21 සිට ගිගා ටොන් 32 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. තව විධියකට කිව්වොත් කාබන් විමෝචනය සියයට 52කින් වැඩි වෙලා තිබෙනවා. මේ පිළිබඳව බොහෝ සාකච්ඡා තිබුණත්, මේක තමයි යථාර්ථය.

ඒ විතරක් නොවෙයි. ගෝලීය වායු දූෂණය ඉහළ ගිහින් තිබෙනවා, from 250 parts per million to 407 parts per million. තව විධියකට කිව්වොත්, 1992 සිට 2015 දක්වා ගෝලීය වායු දූෂණය සියයට 61කින් ඉහළ ගිහින් තිබෙනවා. COP1 සිට COP20 කියන සමුළු සියල්ල පැවැත්වුණත් ඒ හරහා මේ තත්ත්වය අඩු වෙලා නැහැ. ඒ පසු බිම තුළ තමයි, 2015 දෙසැම්බර් මාසයේ 12වන දා මේ අලුත් පැරිස් සම්මුතිය පිළිබඳව සාකච්ඡා කරලා කරුණු 3ක් පිළිබඳව එකඟතාවකට ආවේ. පළමුවන කාරණය තමයි, මෙය මනුෂ්‍යා විසින්ම ඇති කර ගෙන තිබෙන ප්‍රශ්නයක් කියලා ලෝකයේ හැම රටක්ම පිළිගැනීම.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

දෙවන කාරණය තමයි, මෙය plus twoවලට සීමා කරන්න අපි සියලු දෙනාම එකඟ වීම. තුන්වන කාරණය තමයි, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක ඉෂ්ට කරන්නට මේ සමුළුවේදී හැම රටක්ම එකඟතාවකට පැමිණීම. ඒ නිසා අපට දැන් තිබෙන්නේ, එක්කෝ තිබෙන උණුසුම ඒ මට්ටමින් පවත්වා ගෙන යන්නත්, අපේ කාබන් විමෝචනය ඒ මට්ටමේ තබා ගන්නත්, එහෙම නැත්නම් අනික් රටවල ඒ තත්ත්වය අඩු කරන්නත් කටයුතු කිරීමයි.

ගිය සතියේ G20 සමුළුවේදී ඇමෙරිකාවයි, චීනයයි ප්‍රකාශයක් කළා, ඒ අය මේ සම්මුතිය අනුමත කරලා තිබෙනවාය කියලා, that they have ratified the Paris Agreement. මේ රටවල් දෙක පමණයි, ලෝකයේ කාබන් විමෝචනයෙන් සියයට 35ක් කරන්නේ. ඒ වාගේම 2016 අප්‍රේල් මාසයේදී රටවල් 175ක් එකඟ වුණා, මේ සම්මුතිය අනුමත කරන්නට. ලංකාව මේ සම්මුතිය අනුමත කරන බවට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2016 මැයි මාසයේදී අත්සන් තබා තිබෙනවා. එතකොට, සියයට 39ක් කාබන් විමෝචනය කරන රටවල් 26ක් දැනටම මේ සම්මුතිය අනුමත කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මෙම පැරිස් ගිවිසුම අනුමත කළාට පසුව අපි මොනවාද කරන්න යන්නේ, මේ ගිවිසුම තුළ එකඟ වී තිබෙන ඉලක්ක ඉෂ්ට කරන්න අපි මොනවාද කරන්න යන්නේ කියන එක පිළිබඳව කථා කරන්න ඉතිරි විනාඩි කිහිපය යොදවන්න මා කැමැතියි. හැම රටක්ම මේ සම්මුතිය අනුමත කරනවා විතරක් නොවෙයි, මේ සම්මුතිය යථාර්ථයක් කිරීමට ක්‍රියා දාමයක් සකස් කරන්නට ඕනෑ. ඒ සඳහා ප්‍රතිපත්තියක් අවශ්‍යයි; උපායශීලි ක්‍රමවේදයක් අවශ්‍යයි; සැලසුමක් අවශ්‍යයි. ඒ සැලසුම් එක්සත් ජාතීන්ගේ සංවිධානයට දෙන්න අවශ්‍ය වෙලා තිබෙනවා. බ්‍රසීලය, ඉන්දියාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව මේ සම්මුතිය අනුමත කරලා ඒ අයගේ සැලසුම් ඉදිරිපත් කළා. ඒ අයගේ සැලසුම්වලින් පැහැදිලි වනවා, ගෝලීය උණුසුමට තිබෙන සීමාව, plus two ඉක්මවා යනවා කියලා. එම සැලසුම් ප්‍රතික්ෂේප කරලා අලුතින් සැලසුම් දෙන්නට සිදු වෙලා තිබෙනවා. චීනයේ ජනාධිපතිතුමා ප්‍රකාශයක් කරමින් කිව්වා, "අපි මෙක අත්සන් තබා තිබෙනවා, අපි මේ සීමාවන් ඉෂ්ට කරනවා, ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම අපි ක්‍රියා මාර්ග තුනක් ගන්න යනවා" කියලා. එයින් එකක් විධියට ඔවුන්ගේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය අඩු කරන්න යනවා කියලා ඒ අය කිව්වා. පසු ගිය වසර 20 තුළ සියයට 8ට, 10ට වර්ධනය වුණු චීනයේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය සියයට 4ට, 6ට පමණ අඩු කරන්න ඔවුන් තීරණය කර තිබෙනවා. මොකද, දළ දේශීය නිෂ්පාදන වේගය වැඩියෙන් වර්ධනය වන විට කාබන් විමෝචනය ඉබේටම වැඩි වනවා.

චීනය "New Normal Gowth" කියලා සංකල්පය ඉදිරිපත් කරමින් චීනයේ ආර්ථිකය සියයට 4 - 6 අතර ප්‍රමාණයකින් වර්ධනය කරන්න එකඟ වෙලා තිබෙනවා. ඊට අමතරව "No Roof Left Behind" කියලා, සෑම නිවසකම සෑම වහළයකින්ම සූර්ය බල ශක්තිය නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් චීනය ආරම්භ කර තිබෙනවා. තුන්වෙනුව හරිත ප්‍රාකාරයක් ගොඩනැඟීම. ඒකට "Green Wall Policy" කියලා කියනවා. ඒ කියන්නේ කැලෑවල් ශීඝ්‍රයෙන් වර්ධනය කිරීම. ඔවුන් දැනටමත් හෙක්ටෙයාර් මිලියන 1.5ක් අලුතින් වගා කර තිබෙනවා. ලංකාව දිහා බැලුවොත් - මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීවරුන්ගෙන් අපට අසන්නට ලැබුණා පසු ගිය වසර 20 තුළ පමණක් අපේ රටේ වනාන්තර සියයට 40 ඉඳලා සියයට 18කට පමණ අඩු වෙලා තිබෙන බව. අපි පරිසරය නැති කර ගෙන, නැති කර ගෙන යනවා. අපට ස්වභාව ධර්මයෙන් ලැබුණු මේ දායාදය අපි විනාශ කරමින් පවතිනවා.

මේ රටේ වැවිලි කර්මාන්තය තිබෙන බව අපි දන්නවා. පෞද්ගලික අංශයේත් තිබෙනවා; රාජ්‍ය අංශයේත් තිබෙනවා. ඒවා අලාභ ලබනවා. ඒවා අලාභ ලබන විට සමහර වෙලාවට සේවක අර්ථසාධක අරමුදලට මුදල් එකතු කරන්න බැරි වුණාම, නැත්නම් ලාභය අඩු වුණාම මේ පෞද්ගලික සමාගම් හුහක් වෙලාවට ඒ වතුවල තිබෙන ගස් කපලා, ඒවා විකුණලා එම මුදල්වලින් ඒ අයගේ ව්‍යාපාර කර ගෙන යන්න වෑයම් කරනවා. මම හිතන විධියට මෙවැනි ක්‍රියාවලියන් තහනම් කරන්න දැන් කාලය පැමිණ තිබෙනවා. Ravi Fernando has written an article to a paper published in November 2015 at the European University in Geneva on “Strategy to energize the UN Global Compact: Corporate Signatories to Impact the UN Sustainable Development Goals 2015-2030”. He came up with a business and nation engagement matrix. ලාංකිකයෙක් ළඟදී කර තිබෙන සොයා ගැනීම් අතරින් සඳහන් කර තිබෙනවා, "ව්‍යාපාරයත් රජයත් එක ගමනක යන්න ඕනෑ" කියලා. ඒක කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඔහු ක්‍රමවේදයක් සොයා ගෙන තිබෙනවා. ඒ ක්‍රමවේදය තුළ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 17ක් තිබෙනවා. එම ඉලක්ක 17න් තුනක් තෝරා ගෙන හරියටම ඒ ඉලක්ක තුනට ගියොත් අපට එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සම්පූර්ණ කරන්න විතරක් නොවෙයි, මේ කාලය තුළ පැරිස් සම්මුතිය තුළ තිබෙන ගෝලීය උෂ්ණත්වය පිළිබඳ සීමාව තුළ සිටින්නත් අපට පුළුවන් වෙනවා. ඒ අයගේ හත්වන ඉලක්කය විධියට සඳහන් කරනවා, අපි පුනර්ජනනීය බලශක්තියට යා යුතුය කියලා. මම හිතන විධියට මේ ගිවිසුම අනුමත කළාට පස්සේ අපේ ප්‍රතිපත්ති හදන කොට අපි පුනර්ජනනීය බලශක්තිවලට යන්න ඕනෑ.

සූර්ය බල සංග්‍රාමය කියලා අපේ ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එදා solar power, නැත්නම් සූර්ය බලශක්තිය බෙදා හැරීමේ ක්‍රමවේදයක් ආරම්භ කළා. දැන් අපේ රටේ නිවසක සූර්ය බලශක්තිය නිෂ්පාදනය කරනවා නම්, net metering කියලා ක්‍රමයක් තිබෙනවා. ඒ කියන්නේ, අපි නිවසේ සූර්ය බලයෙන් නිෂ්පාදනය කර භාවිත කරන බලශක්ති ප්‍රමාණය අඩු කරලා තමයි අපට විදුලිබල මණ්ඩලයෙන් බිලක් එවන්නේ. නමුත් සැප්තැම්බර් 6වැනි දා net accounting කියලා අලුත් සංකල්පයකට අපි ගියා. එම සංකල්පය අනුව, අපේ නිවසේ බලශක්තිය නිෂ්පාදනය කරනවා නම්, අපි ඒ grid එකෙන් භාවිත කරන බල ශක්ති ප්‍රමාණය අඩු කරලා අපට විදුලි බිල ලබා දෙන එක පමණක් නොවෙයි, වැඩියෙන් බල ශක්තිය නිෂ්පාදනය කළොත් විදුලිබල මණ්ඩලයෙන් අපට ඒ සඳහා මුදලක් ගෙවන්නත් සූදානම් කියන එකයි. එක kilowatt hour එකකට රුපියල් 22ක් ගෙවන්න ඕනෑ කියන මේ අලුත් සංකල්පය, වැඩ පිළිවෙළක් හැටියට සැප්තැම්බර් මාසයේ 06 වැනිදා ඉඳලා ක්‍රියාත්මක කරන්න අපේ රජය පටන් ගෙන තිබෙනවා.

අප තවත් අදහසකට යනවා. ඒකට කියන්නේ, "net plus" කියලායි. ඒ කියන්නේ කර්මාන්ත ශාලාවක් තිබෙනවා නම්, ඒ කර්මාන්තශාලාව තුළ සූර්ය බලයෙන් පුනර්ජනනීය බලශක්තිය ඇති කරන්නට අපට පුළුවන් නම්, ඒ බලශක්තිය විදුලිබල මණ්ඩලයේ grid එකට විකුණන්න පුළුවන්. 2020දී නිවාසවල වහලවල් හරහා සූර්ය බලයෙන් මෙගාවොට 200ක් නිෂ්පාදනය කරන්න අප සැලැස්මක් සකස් කරලා තිබෙනවා. 2025 වනකොට මෙගාවොට් 1,000ක් දක්වා ඒ සැලැස්ම ඉදිරියට ගෙන යන්න අප යෝජනා කරලා තිබෙනවා.

ඊට අමතරව අපේ රටේ පොදු ප්‍රවාහනය ගත්තොත්, පොදු ප්‍රවාහනයට භාවිත කරන එන්ජින් hybrid හෝ electric වෙන්න ඕනෑ. පෞද්ගලික ප්‍රවාහනයට භාවිත කරන එන්ජින් අනිවාර්යයෙන්ම electric හෝ hybrid වෙන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් පවතින රජයේ බදු ප්‍රතිපත්තිය පිළිබඳව රජය නැවත සිතා බලන්නට ඕනෑ. ඒ වාගේම solar farms ඇති කරන්නට අපේ රජයේ නව අය වැය තුළින් අලුත් අදහස් ඉදිරිපත් වේවි කියලා මා හිතනවා. වාහනවලට තෙල් භාවිත කිරීමේදී සහනාධාර දීම මේ පැරිස් ගිවිසුම හරහා නුසුදුසුයි කියලා මා ප්‍රකාශ කරන්නට ඕනෑ. පැරිස් ගිවිසුම අත්සන් කරපු රටවල් තෙල්වලට සහනාධාර ලබා දෙන්නේ නැහැ. දෙවැනුව ජලය ගැන, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

භයවැනි ඉලක්කය යටතේ ජලය ගැන සඳහන් කරලා තිබෙනවා. අපේ රට, ජලය හිඟ රටක් නොවෙයි. නමුත් ලෝකයේ හුඟක් රටවල ජලය හිඟයි. ඒ අයට බොන්න වතුර නැහැ. නමුත් සමහර රටවලට ඒ අයගේ සංවර්ධන හා ආර්ථික කටයුතු කිරීමට ජලය නැහැ. නමුත් අපට ඒ අවස්ථාව ලැබිලා තිබෙනවා. නමුත් අපට තිබෙන පිරිසිදු ජලය ප්‍රමාණවත් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ රටේ වකුගඩු රෝගය - CKD - පැතිරෙමින් තිබෙනවා. ඒ නිසා ගොවීන්ට රසායනික පොහොර වෙනුවට මුදල් දෙන්න අපේ රජය තීරණය කරලා තිබෙනවා. එතකොට ගොවි මහත්වරුන්ට ඔවුන්ගේ ගොවිතැන් කටයුතු සඳහා පරිසරයට සුදුසු දේ ලබා ගන්නට පුළුවන්. Nanotechnology භාවිතයෙන් මේ රසායනික පොහොර කෙළින්ම ගහක මුලට යවන්නේ කොහොමද කියලා SLINTEC ආයතනයෙන් ක්‍රමවේදයක් හොයාගෙන තිබෙනවා. ඒ, ක්‍රමවේදය හොයාගෙන තිබෙන්නේ ලංකාවේ විද්‍යාඥයන්. මේ ක්‍රමවේදය අප සාර්ථක කර ගත්තොත් මේ ප්‍රශ්නයත් අපට සෑහෙන දුරට අවසන් කර ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මෙම කාරණය ගැනත් මා කියන්නට ඕනෑ. අපේ කැලෑ ප්‍රදේශය අපි වැඩි කර ගන්නට ඕනෑ. කැලෑ ප්‍රදේශය වැඩි කර ගන්නට අපට ක්‍රමවේද අවශ්‍යයි. ගස් කැපීම ගැන නැවතත් අප කල්පනා කරන්නට ඕනෑ. මොනවාද, අපි මේ කරන්නට යන්නේ? අපේ රටේ ගස් කපනවා. නමුත් සමහර රටවල ගස් වැඩිපුර තිබෙනවා. ඒ නිසා මේ රටේ කර්මාන්ත ආරක්ෂා කර ගන්නට නම් සමහර වෙලාවට අපට ඒ රටවල්වලින් ගස් ආනයනය කර ගන්න වේවි. මේ කාරණා ගැන අපට අලුත් විධියට සිතන්නට වෙනවා.

මා අවසාන වශයෙන් මේ කාරණය ගැනත් කියන්නම්. මේ පැරිස් ගිවිසුම අප අනුමත කළා විතරක් නොවෙයි, ඒ ගිවිසුම සාර්ථක කර ගන්නට අවශ්‍ය ප්‍රතිපත්ති දැනටමත් අපේ රජය සකස් කරලා තිබෙනවා. අපේ ගරු අගමැතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමන්ලා පටන් ගෙන තිබෙන මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න හැම දෙනාගේම සහයෝගය අපට අවශ්‍ය වන බවත් සඳහන් කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා.

[අ.භා. 2.34]

ගරු මහින්ද සමරසිංහ මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Skills Development and Vocational Training)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැරිස් ගිවිසුම අපරානුමත කිරීම පිළිබඳ යෝජනාව අද මේ පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම සුවිශේෂ පියවරක් හැටියට අප සියලු දෙනාම දේශපාලන භේදයෙන් තොරව දකින්න ඕනෑ. මේ කටයුත්ත කරන්න අභිගරු ජනාධිපතිතුමා රාජ්‍ය නායකයා හැටියට පමණක් නොවෙයි, පරිසර ඇමතිවරයා හැටියටත් විශාල උනන්දුවක් දක්වලා තිබෙනවා. අප්‍රේල් මාසයේ 22 වැනි දා ශ්‍රී ලංකාව වෙනත් රටවල් 175ක් සමඟ සම්බන්ධ වෙලා නිව්යෝර්ක් නගරයේදී මේ සම්මුතියට අත්සන් කිරීම අප ලැබූ විශාල ජයග්‍රහණයක් හැටියටයි මම දකින්නේ. අද පාර්ලිමේන්තුවෙන් මේ සම්මුතියට අනුමැතිය දීමෙන් අනතුරුව 55-55 කියන ඉලක්කයට යන්න අපට අවස්ථාව ලැබෙනවා. මෙය ක්‍රියාත්මක කරන්න ඉස්සෙල්ලා රටවල් 55ක් අත්සන් කරලා මේ සම්මුතිය භාර ගන්න ඕනෑ. ඒ වාගේම වැඩියෙන්ම පරිසරය දූෂණය කරන රටවල් 55 ඒ සම්මුතිය භාර අරගෙන ඒකට එකඟ වන්න ඕනෑ. ලෝකයේ ආර්ථික වශයෙන් බලවත්ම රටවල් දෙක අතුරින් ඇමෙරිකාව තමයි පළමුවෙනි කැන දිනා ගෙන තිබෙන්නේ. ජපානය ඉක්මවා ගිහිල්ලා දැන් චීනය තමයි දෙවෙනි ස්ථානයේ ඉන්නේ.

ඊයේ-පෙරේදා G20 සමුළුවේදී මේ රටවල් දෙකේ ප්‍රධානීන් - ජනාධිපතිවරු- දෙපළ විසින් මේ "සම්මුතිය භාර ගන්නවා" කියලා නිල ප්‍රකාශයක් කළ ආකාරය අපි දැක්කා. මම හිතන්නේ බොහෝ දුරට දැන් අපට 55-55 කියන ඉලක්කය සම්පූර්ණ කිරීමට ඉඩ අවස්ථා තිබෙනවා. කොහොම වුණත්, 2020 වර්ෂය වනකොට මේ සම්මුතිය ක්‍රියාත්මක වනවා. මේ සම්මුතියට තවම අත්සන් කරලා නැති රටවල් කීපයක් තිබෙනවා. මම කලින් කිව්වා වාගේ රටවල් 175යි දැනට එය අත්සන් කරලා තිබෙන්නේ. අනික් රටවල ප්‍රධානීන්ගේ අත්සනුත් ගන්න ලබන අවුරුද්දේ අප්‍රේල් 22 වන තෙක් කල් තිබෙනවා. දකුණු ආසියාවේ සෑම රටක්ම මේ සම්මුතියට අත්සන් කරලා අවසන්. නමුත්, සම්මුතිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න ඉදිරිපත් වෙලා තිබෙන්නේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකාව. ඒ කටයුත්ත කිරීම පිළිබඳව ඇත්ත වශයෙන්ම අපට ආඩම්බර වන්න පුළුවන්.

මට ලැබී තිබෙන කාලය බොහොම සීමිත නිසා ඉතිරි විනාඩි කීපය තුළදී පරිසර ඇමතිවරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ධුරය හෙබවූ කෙටි කාලය තුළදී පරිසරය ආරක්ෂා කරන්න අරගෙන තිබෙන සුවිශේෂ පියවර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට උපයෝගී කර ගන්න මම කැමැතියි. පළමුවෙන් "ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීලහරිත යුගයක්" කියන ඒ වැඩසටහන එතුමා එළිදැක්වූවා. ඒ වාගේම මේ අවුරුද්දේ ඔක්තෝබර් 17 සිට 19 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාවේදී දේශීය හා විදේශීය විශේෂඥයන්ගේ හා විද්වතුන්ගේ සහභාගිත්වයෙන්

[ගරු මහින්ද සමරසිංහ මහතා]

සම්මන්ත්‍රණයක් හා ප්‍රදර්ශනයක් පවත්වන්නත් දැන් කටයුතු සූදානම් කරලා තිබෙනවා. කලින් අපි කිව්වා, එතුමා "පැරිස් ගිවිසුම" අත්සන් කළා කියලා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ අපේක්ෂිත දේශීයවම තීරණය කරන ලද දායකත්වය ඉදිරිපත් කරන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම 2016 වර්ෂයේ "ජගත් පරිසර දිනය" නියම කර ගනිමින් "පරිසර සතිය" ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ අනුව "වන රෝපා වැඩසටහන 2016" හඳුන්වා දීමෙන් මේ සඳහා තවත් ඉදිරි පියවරක් ගෙන තිබෙනවා. ඉදිරි වර්ෂ තුනක කාලය තුළදී රටේ වන ආවරණය සියයට 32 දක්වා වැඩි කර ගැනීමේ ඉලක්කය සම්පූර්ණ කිරීම තමයි අපේ අදහස තිබෙන්නේ. ඒ වාගේම "නීලහරිත ලස්සන ලංකා" ගම්මාන වැඩසටහන යටතේ ගම්මාන 10,000ක් සම්බන්ධ කර ගෙන පරිසර හිතකාමී දේශගුණික විපර්යාස සඳහා සංවේදී වූ ප්‍රජාවක් සමඟ තිරසාර ආර්ථික සංවර්ධනයක් සහිත ලස්සන ගම්මාන බිහි කිරීම තමයි මේ වැඩ පිළිවෙළ හරහා අපි බලාපොරොත්තු වන්නේ. ඒ වාගේම සෑම දිස්ත්‍රික්කයකම පරිසර සමුළු පැවැත්වීමත් කරනවා. ඊට උදාහරණයක් මම කියන්නම්.

මම කළුතර දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට කටයුතු කරන නිසා මේ පිළිබඳව දන්නවා. අපි සෑම මාසයක් පාසාම රැස් වනකොට පරිසරය පිළිබඳව විශේෂ ඉදිරිපත් කිරීමක් ඒ නිලධාරින්ට කරන්න ඉඩ අවස්ථාව දීලා කළුතර දිස්ත්‍රික්කය තුළ පරිසරය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ සමාලෝචනයට ලක් කරනවා. මේ සියල්ලටම උපදෙස් ලැබිලා තිබෙන්නේ ජනාධිපතිතුමාගෙන්; ජනාධිපති කාර්යාලයෙන්. එතුමාට අපේ නියෝජ්‍ය ඇමති අනුරාධ ජයරත්න තරුණ මහතා ලොකු හයියක් දෙනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

හරිත දේශගුණ අරමුදල - Green Climate Fund - වෙත යෝජනා ඉදිරිපත් කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය හා වන විනාශය පිටුදැකීම තුළින් හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ වැඩසටහන් - REDD-plus - ක්‍රියාත්මක කිරීම, හරිත ගොඩනැඟිලි නිර්මාණය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම, සූර්ය බල සංග්‍රාමය වැඩසටහන, නීලහරිත නවෝත්සාහක ලේකම් කාර්යාලයක් - BlueGreen Initiative Secretariat - ස්ථාපිත කිරීම, ආගන්තුක ආක්‍රමණශීලී ජීව විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්ති උපාය මාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීම, අපේක්ෂිත දේශීයවම තීරණය කරන ලද දායකත්වයන් සඳහා පෙර සූදානම් ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක සැලසුම් පිළියෙළ කිරීම, වෙරළ සංරක්ෂණය සඳහා අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය සැමරීම හා ජාතික සමුද්‍රීය සම්පත සුරැකීමේ සතියක් 2016 වර්ෂයේ සැප්තැම්බර් 17 සිට 23 වෙනි දා දක්වා -ඊ ළඟ සතියේ-ක්‍රියාත්මක කිරීම, ඒ වාගේම පරිසර හිතකාමී නොවන ඇස්බැස්ටොස් ආනයනය හා භාවිතය ශ්‍රී ලංකාව තුළ තහනම් කිරීමට තීරණය කිරීම -ගිය සතියේ රැස්වූ කැබිනට් මණ්ඩලයෙන් ජනාධිපතිතුමාගේ අත්සනින් ඉදිරිපත් කරපු ඒ කැබිනට් පත්‍රිකාවට අනුමැතිය දුන්නා- වැනි වැඩ පිළිවෙළ රාශියක් බොහොම වුවමනාවෙන් අතිගරු ජනාධිපතිතුමා නායකත්වය දීලා අප රට තුළ මේ වනකොටත් ක්‍රියාත්මක කරන්න එතුමා නිරන්තරයෙන්ම සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ කටයුතු සම්බන්ධයෙන් පැහැදිලි නායකත්වයක් දීම පිළිබඳව එතුමාට විශේෂයෙන් අපි ස්තුතිවන්ත වන්න ඕනෑ.

සමහරු අහනවා, "මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මේ තරම් ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබිලා තිබෙන්නේ කොහොමද?" කියලා. මේ වාගේ දේවල් අවංකව, වුවමනාවෙන් හා හදවතින් කරන නිසා තමයි එතුමාට විශාල ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබිලා තිබෙන්නේ. තමන් සතු බලතල ස්වේච්ඡාවෙන්ම දෙන්න ඉදිරිපත් වන වෙන රටක නායකයෙක් අපි මෑත ඉතිහාසයේ දැකලා තිබෙනවාද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමහර ව්‍යවස්ථා ජන මත විචාරණයකින් තොරව වෙනස් කරන්න බැහැයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තමයි කිව්වේ. ඉතින්, මේ වාගේ දේවල් කරන කොට ඇත්ත වශයෙන්ම එතුමාට තිබෙන පිළිගැනීම වැඩි වෙනවා. ඒ වාගේම මම කියන්න ඕනෑ, අපි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු මහින්ද සමරසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද චමරචිංහ)
(The Hon. Mahinda Samarasinghe)
මගේ කථාව මම දැන් අවසන් කරන්නම්.

ඇත්ත වශයෙන්ම "Ceylon Tea" කියන්නේ, අපේ රටේ තිබෙන ප්‍රසිද්ධම නිෂ්පාදනයක්. "Ceylon Tea" කියන නිෂ්පාදනය නිසා ලංකාවේ නිෂ්පාදනය කරන තේවලට "ඕසෝස් හිතකාමී ලාංඡනය" ඇතුළත් කිරීමේ අයිතිය ලැබී තිබෙනවා. නොයෙකුත් රටවල් තේ නිෂ්පාදනය කරනවා. හැබැයි, මෙතෙක් අපේ රටේ නිෂ්පාදනය කරන තේවලට පමණයි "Ozone Friendly Pure Ceylon Tea" logo එක, නැත්නම් "ඕසෝන් හිතකාමී ලාංඡනය" සම්බන්ධ කරන්න අයිතිය ලබා දීලා තිබෙන්නේ. මේක වුණේ, "මීතයිල් බ්‍රෝමයිඩ්" කියන රසායනික ද්‍රව්‍ය ඉවත් කරලා ඒ සඳහා ස්වභාවික විකල්පයක් යොදන්න තේ පර්යේෂණායතනයෙන් පරීක්ෂණ කටයුතු කරලා පියවර ගත් නිසයි. අපි මේ වගේ දේවල් කරලා ජාත්‍යන්තරයේ නමක් දිනාගෙන තිබෙනවා වාගේම රටට කීර්තියක් අත්කර දී තිබෙනවා.

මේ අවුරුද්දේ ඔක්තෝබර් 27වැනි දා NSBM හරිත විශ්වවිද්‍යාලය ජනාධිපතිතුමාගේ අතින් විවෘත කරන්න මම දැන් සියලුම කටයුතු සූදානම් කරලා තිබෙනවා. ආසියාවේම පළමුවැනි හරිත විශ්වවිද්‍යාලය හැටියට අධ්‍යාපනය පැත්තෙනුත් කටයුතු කරන්න, ජනාධිපතිතුමාගේ එම සංකල්පය මේ රට තුළ තව දුරටත් ක්‍රියාත්මක කරන්න, ඒ වාගේම ආදර්ශයක් හැටියට මුළු ලෝකයටම පෙන්වන්න අපි ඉදිරිපත් වෙලා තිබෙනවාය කියන එකත් මේ අවස්ථාවේ මතක් කරමින්, අතිගරු ජනාධිපතිතුමා මෙම විෂය පිළිබඳව ගෙන තිබෙන උනන්දුව සහ ඉදිරියේදී දක්වන උනන්දුව පිළිබඳවත් එතුමාට මගේ ප්‍රණාමය සහ ස්තුතිය පුදකර සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා.

[ප.ව. 2.45]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු අ. අරවින්ද් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்கள் எனக்கு அளித்த இந்த வாய்ப்புக்கு நன்றி கூறுகின்றேன். இன்று சுற்றாடல் தொடர்பான பாரிஸ் ஒப்பந்தம் சம்பந்தப்பட்ட விவாதத்தில் கலந்துகொண்டு பலரும் தமது கருத்துக்களைத் தெரிவித்து வருகின்றார்கள். இந்த

ඔප්පන්තත්තෙප් පොරුත්තළවිලේ, ඉතු උලකළාවිය රීතියිල් මුක්කියත්තුවම් වාය්න්ත ඔර් ඔප්පන්තමාක ඉරුක්කින්රතු. ඒනෙනිල්, ඉක්කිය නාටුකළ් සපෙයිලේ අංකම් වකික්කුම් 193 නාටුකළිල් ඉතුවරෙ 175 නාටුකළ් අවර්ටිනතු ඔප්පුතලෙ අතර්කු අළිත්තිරුක්කින්රන. අන්ත වකෙයිලේ පාර්ක්කුම්පෝතු ඔරු සිල නාටුකළෛත් තවිර අනෛත්තු උලක නාටුකළුම් ඉන්ත ඔප්පන්තත්තිර්කුච් චාර්පාකත් තංකළතු චම්මතත්තෛත් තෙරිවිත්තිරුප්පතෛක් කාණලාම්. අන්ත වකෙයිල් උලක නාටුකළෝටු ඉසෛන්තු නාමුම් ඉන්ත ඔප්පන්තත්තිල් කෛච්චාත්තිටුවතු පොරුත්තමාන නටවටික්කෙයාක ඉරුක්කු මෙන්පතු එනතු නිලෛප්පාටාකුම්.

එමතු නාට්ටිලේ ඉන්රු පල්වේරු වකෙයිල් චූළල් මාචටෛන්තු වරුවතෛක් කාණක්කූටියතාක ඉරුක්කින්රතු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ ගරු ආනන්ද කුමාරසිරි මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු මහින්ද සමරසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ත චමරචිංහ)
(The Hon. Mahinda Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

අතන් පිරකු, මාණ්පුමිකු එට්වට් කුණසේකර අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු ජේ.එම්. ආනන්ත කුමාරචිරි අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, you may continue.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු අ. අරවින්ත් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)
විසේටමාක චූනාමි අනර්ත්තත්තින් පින්නර් එමතු නාට්ටින් කාලනිලෛයිලේ පාරිය මාර්රත්තිනෛ නාංකළ් පාර්ක්කින්රෝම්. චූළලෛප් පොරුත්තළවිලුම් පාරිය මාර්රත්තෛ නාංකළ් පාර්ක්කින්රෝම්. ඉව්වාරු පල්වේරු මාර්රංකළෛ ඉප්පෝතු නාංකළ් චන්දිත්තු වරුකින්රෝම්. අතේනේරත්තිල්, ඉන්ත ඔප්පන්තත්තින් පින්නර් එමතු නාට්ටිලේ නුරෛච්චෝලෛ අනල් මින්නිලෛයම් පෝන්රවර්රෛ අමෛක්ක මුටියාමල් පෝකුම්. ඒනෙනිල්, චූළල් මාචටෛයුම් වකෙයිලේ මේර්කොළ්ළප්පටුම් තිට්ටංකළ්, චුර්රාටටල් තොටර්පාන පාරිස් ඔප්පන්තත්තිර්කු මුරණාක ඉරුක්කුමෙන්ර කාරණත්තිනාල් එංකළාල් අව්වාරු චෙය්ය මුටියාමර් පෝකුම්.

ඉන්රු එමතු නාට්ටිලුළ්ළ වීතිකළිලේ මික අතිකමාන වාකනංකළ් ඔටුකින්රන. වීතිකළ් තාංක මුටියාත අළවුක්කු වාකනංකළින් එණ්ණික්කෛ අතිකමාකිවිට්ටතු. ඉන්ත වාකනප් පෝක්කුවරත්තිනූටාක වෙළියේර්රප්පටුම් මාචටෛන්ත පුකෛයින් කාරණමාකච් චූළල් මික මෝචමාකප් පාතිප්පුක්කුළ්ළාකින්රතු. එනවේ, වළර්න්තුවරුම් ඔරු නාටු එන්ර වකෙයිලේ එමතු නාට්ටිල් වාකනංකළ් අනෛත්තුම් එතිර්කාලත්තිල් ඔන්රිල් මින්චාරම් මූලමාකවෝ අල්ලතු 'හෛපිරිට්' එනප්පටුම් කලප්පු මුරෛයිල් උරුවාක්කප්පට්ට අතාවතු, 'පෙට්රෝල්' මර්රුම් 'පර්රරි' මූලමාකවෝ ඉයංකුම් වාකනංකළාක ඉරුක්ක වේන්টුම්. 'හෛපිරිට්' වාකනංකළෛප් පාවනෛක්කු උට්පටුත්තුවතු එතිර්කාලත්තිලේ නල්ල පයනෛත්තරුම් එන්පතු එනතු කරුත්තාකුම්.

අටුත්තතාක, කාට්ටුත් තී එමතු නාට්ටින් ඉන්නුමොරු මෝචමාන තලෛයෙළුත්තාක මාරිප්පෝයිරුක්කින්රතු. අව්වප්පෝතු විෂමිකළ් කාටුකළෛත් තී වෛත්තුක් කොළුත්තුවතනූටාක එමතු ඉයර්කෛ වළම් වීණ්ටික්කප් පටුකින්රතු; නාචමාක්කප්පටුකින්රතු. ආකවේ, ඉන්තක් කාට්ටුත් තීයිනාල් ඒර්පටුම් අනර්ත්තත්තෛක් කුරෛප්පතර්කුක් කටුමෛයාන නටවටික්කෛ එටුක්ක වේන්টුම් එන්රු නාන් ඉන්ත උයිරිය චපෛයිලේ වලියුරුත්තික් කූර විරුම්පුකින්රේන්. විෂමිකළින් පොළුතුපෝක්කුක්කාක අව්වර්කළිනාල් කාට්ටුත් තී ඒර්පටුත්තප්පටුකින්රතු. අව්වාරු පොළුතුපෝක්කුක්කාකක් කාට්ටුත්තීයෛ ඒර්පටුත්තුපවර්කළ් අතන් අනර්ත්තත්තෛප් පර්රි, තීමෛයෛප්පර්රි යෝචිප්පතිල්ලෛ. තංකළින් චය චන්තෝෂත්තුක්කාක ඉව්වාරු කාට්ටුත්තීයෛ ඒර්පටුත්තිවිට්ටු අතනූටාකක් කුළිර්කායුම් තන්මෛයේ ඉවර්කළිටම් කාණප්පටුකින්රතු. ආකවේ ඉව්වාරාන විෂමිකළෛත් තණ්ටිප්පතර්කුක් කටුමෛයාන වකෙයිලේ චට්ටංකළ් ඉයර්රප්පට වේන්টුම්; චට්ටත්තිලේ කටුමෛයාන චරත්තුක්කළ් උළ්වාංකප්පට වේන්টුම්. අව්වාරු චෙය්තාල් මාත්තිරමේ කාට්ටුත් තීයිලිරුන්තු එමතු නාට්ටෛප් පාතුකාක්කක්කූටියතාක ඉරුක්කුම්.

How many more minutes do I have, Sir?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
You have one more minute.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු අ. අරවින්ත් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)
Sir, I need at least two more minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Okay.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු අ. අරවින්ත් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)
ඉතර්කුප් පුරම්පාකත් තොළිර්චාලෛකළ් පර්රියුම් කුර්රිප්පිට වේන්ටියිරුක්කින්රතු. අතාවතු, එමතු නාටු විවචාය නාටු මාත්තිරමල්ල, ඔරු කෛත්තොළිල් නාටාකවුම් ඉරුක්කින්ර පටියාල් තොළිර්චාලෛකළිලිරුන්තු වෙළියේරුකින්ර අතිකළවාන පුකෛයිනාලුම් එමතු චූළල් මාචටෛකින්රතු.

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

அதேநேரம் எமது நாட்டில் இயற்கைப் பசளையைக் கைவிட்டுச் செயற்கை முறையிலான பசளைகளைப் பாவிப்பதிலேயே இப்பொழுது அதிக முனைப்புக் காட்டப்படுகின்றது. இவ்வாறு செயற்கை முறையிலான பசளைகளை எமது பயிர்ச்செய்கைக்காகப் பாவிக்கும்போது மண் மற்றும் சூழல் மாசடைகின்றது; வளங்கள் குறைவடைகின்றன. அத்துடன் பல்வேறு கிருமிநாசினிகளும் கூட எமது நாட்டின் சூழல் மாசடைவுக்குத் துணை போகின்றன. அதேநேரம் எமது விவசாயப் பயிர்கள் இவ்வாறான செயற்கை முறையிலான கிருமிநாசினிகளுக்கும் செயற்கை முறையிலான உரங்களுக்கும் பழகிப் போயிருக்கின்றன. ஆகவே, இதிலிருந்து விடுபடவேண்டும். இதிலிருந்து விடுபட்டால் மாத்திரமே நாங்கள் சூழல் மாசடைதலைத் தடுக்கக்கூடியதாக இருக்கும்.

இன்று முழு நாட்டிலுமே உஷ்ணத்துடன்கூடிய மாசடைந்த ஒரு சுற்றாடல் நிலைமையை நாங்கள் சதாகாலமும் பார்க்கக்கூடியதாக இருக்கின்றது. வளிமண்டலம் முன்னரை விட மிக அதிகமான வெப்பத்துடன் கூடியதாக இருக்கின்றது. முன்பெல்லாம் இந்தளவுக்கு ஓர் உஷ்ண நிலைமை காணப்படவில்லை என்பதை நாங்கள் உணர்கின்றோம். ஆனால், இதற்கும் காரணம் வளிமண்டலம் உஷ்ணமடைந்திருப்பதுதான். இன்று விண்வெளியில் காணப்படும் 'ஓசோன்' படலம் குறைவடைந்து செல்கின்றதென்றும் அதனால் சூரிய வெளிச்சம் நேரடியாகப் பூமியைத் தாக்குமென்றும் விஞ்ஞானிகள் பயமுறுத்திக்கொண்டிருக்கின்றார்கள். ஆகவே, நாங்கள் இவ்வாறானவற்றிலிருந்து தப்பிக்கவேண்டும்; இவ்வாறு இயற்கை மாற்றமடைவதனூடாக ஏற்படுகின்ற கெடுதல்களிலிருந்து நாங்கள் எம்மைக் காப்பாற்றிக்கொள்ள வேண்டும். எனவே, இதற்குத் தகுந்த நடவடிக்கைகளை எடுப்பதனூடாகவும் இப்படியான ஒப்பந்தத்தை மேற்கொள்வதனூடாகவும் நாங்கள் அந்த இலக்கை நோக்கி ஓரளவுக்கேனும் போகமுடியுமென்று கூறிக்கொண்டு, சந்தர்ப்பமளித்த அவைத் தலைவருக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Mylvaganam Thilakarajah. You have six minutes.

[பி.ப. 2.53]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த உச்ச சபையிலே மிக முக்கியமான ஒரு விவாத விடயம் முன்வைக்கப்பட்டிருப்பது மகிழ்ச்சியளிக்கின்றது. நேற்று முன்தினம் இச்சபைக்குக் கொண்டுவரப்பட்டிருந்த மோட்டார் போக்குவரத்துத் தொடர்பான சட்டத் திருத்த விவாதவேளையில், இந்த உள்நாட்டு யுத்தம் இன்னும் முடிவடையவில்லை என்றும், முறையான வீதிப் போக்குவரத்துக் கலாசாரத்தை நாங்கள் கொண்டுவராத வரை தொடர்ந்தும் தவணை முறையில் உயிர்களைக் காவுகொள்ளும் உள்நாட்டு யுத்தமொன்றை இந்த நாட்டில் நாம் எதிர்கொள்ள வேண்டியிருக்கும் என்றும் குறிப்பிட்டிருந்தேன். அதன் தொடர்ச்சியாகவே இன்றைய எனது உரையைத் தொடரலாமென நினைக்கின்றேன்.

போக்குவரத்து விபத்துக்களினூடாக எவ்வாறு ஓர் உள்நாட்டு யுத்தம் தொடர்ச்சியாகக் கொண்டு நடாத்தப்படுகின்றதோ, அதுபோல் இந்தக் காலநிலை மாற்றமென்கின்ற காரணியூடாக மூன்றாம் உலகப் போரொன்று நிகழக்கூடிய அபாயம் இந்தப் பூகோளத்திற்கே வந்திருக்கின்றது என்பதுதான் உண்மை. ஏற்கெனவே முதலாம் உலகப்போர், இரண்டாம் உலகப்போர் என நேரடியாக நாடுகளுக்கிடையே சண்டை நிகழ்ந்த காலம் போய், தண்ணீருக்காக உலகம் முழுவதுமே ஒரு போரை எதிர்கொள்ளும் அபாயம் இப்பொழுது உருவாகிக் கொண்டிருக்கின்றது. அதனை உணர்ந்துகொண்ட உலக நாடுகள் கடந்த ஆண்டு பாரிஸ் நகரிலே ஒன்றுகூடி, பூகோள ரீதியாக எவ்வாறு இந்தக் காலநிலைப் பாதிப்பிலிருந்து விடுபடுவது என்பது சம்பந்தமாகவும், எதிர்காலச் சந்ததிகளுக்கு இந்த உலகின் வளங்களை மீதம் வைப்பதற்கும் அவர்களது வளமான வாழ்வுக்குமாக எவ்வாறு சூழலைப் பாதுகாப்பது என்பது தொடர்பாகவும் ஆராய்வதற்கான ஒரு மாநாட்டினை நடத்தி, இந்தக் காலநிலைப் பாதுகாப்புத் தொடர்பாக ஒரு மிக முக்கியமான தீர்மானத்தை நிறைவேற்றியிருக்கின்றன.

அந்த மாநாட்டிலே கலந்துகொண்டவரென்ற வகையிலே எமது நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள் மிக முக்கியமான காரியம் ஒன்றைச் செய்திருக்கின்றார். வெறுமனே வெளிநாட்டுக்குச் சென்று அந்த மாநாட்டில் பங்குபற்றி அதனை ஓர் உல்லாசப் பயணமாக மாத்திரம் மாற்றிவிடாமல், எமது நாட்டுக்கு அந்த எண்ணக்கருவைக் கொண்டுவந்து, எல்லோருக்கும் அழைப்பு விடுத்து, பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபத்தில் அதற்கான ஆரம்ப நிகழ்வுகளை ஒழுங்குசெய்து, அந்த நிகழ்ச்சித் திட்டத்தை இலங்கையில் நடைமுறைப்படுத்துவதற்கான ஏற்பாடுகளைச் செய்திருந்தார். அந்த நிகழ்வில் கலந்து கொண்டவனென்ற வகையில், சூழல் பாதுகாப்புத் தொடர்பாக, காலநிலைப் பராமரிப்புத் தொடர்பாக நமது மேதகு ஜனாதிபதி அவர்கள் காட்டுகின்ற ஆர்வமும் அதற்காக உலக நாடுகளோடு ஒன்றிணைந்து எவ்வாறு எமது பங்களிப்பைச் செய்யமுடியும் என்பது சம்பந்தமாக அவர் ஆற்றிய உரையும் அவர் முன்னெடுத்துக்கொண்டிருக்கும் வேலைத்திட்டங்களும் மிக முக்கியமானவை என்பதை நான் நன்கு உணர்ந்திருக்கின்றேன்.

கடந்தவாரம் நாடு முழுவதுமாக solar power எனப்படுகின்ற சூரிய சக்தி மூலம் மின்சாரம் உற்பத்தி செய்கின்ற தொழில்நுட்பத்தில் எவ்வாறு எல்லோரும் பங்கேற்கலாம் என்பது சம்பந்தமாக ஒரு வேலைத்திட்டத்தை மேதகு ஜனாதிபதி அவர்கள் ஆரம்பித்து வைத்திருக்கின்றார். சூரிய சக்தி மூலம் மின்சாரம் உற்பத்தி செய்வது தொடர்பாகப் பாகிஸ்தான் பாராளுமன்றம் ஒரு தீர்மானம் எடுத்து, அந்தப் பாராளுமன்றக் கூரைகளில் சூரிய சக்தி மின்சார உற்பத்திக்கான உபகரணங்களைப் பொருத்தி, மின்சாரத்தை உற்பத்தி செய்து பாராளுமன்றப் பாவனைக்கும் இதர அலுவலகங்களுக்கும் வழங்குகின்ற முறை பற்றி நான் இதற்கு முன்னர் இந்தப் பாராளுமன்றத்தில் உரையாற்றியிருக் கின்றேன். அந்தத் தகவல் கவனத்திலெடுக்கப்பட்டு, நமது பாராளுமன்றக் கூரைகளும் சூரிய சக்தி மூலம் மின்சாரம் உற்பத்தி செய்யும் கூரைகளாக விரைவில் மாறவிருக்கின்றன என்ற செய்தியை பிரதி அமைச்சர் அவர்கள் என்னிடம்

තෙරිවිත්තිරුන්තාර්. இது மிகவும் மகிழ்ச்சிக்குரிய செய்தியாகும். இதுபோன்ற நடைமுறை சார்ந்த, காலநிலை மற்றும் சூழல் பாதுகாப்போடு தொடர்புடைய திட்டங்களை முன்கொண்டு செல்வது இந்த நல்லாட்சி அரசாங்கத்தில் காணப்படும் மிக முக்கியமான ஒரு விடயமாகும். 'நல்லாட்சி' என்றவுடன் வெறுமனே ஊழல் ஒழிப்பு, மற்றும் பொருளாதாரம் சம்பந்தப்பட்ட விடயங்களில் மாத்திரம் எதிர்பார்ப்புக்களைக் கொண்டிருப்போர் இத்தகைய நிலைத்துநிற்கும் அபிவிருத்தி - sustainable development - நோக்கிய இந்த நல்லாட்சி அரசாங்கத்தின் வேலைத்திட்டங்கள் பற்றியும் அவதானம் செலுத்தவேண்டும். இவ்வாறு சர்வதேச நாடுகளின் அரசாங்கங்கள் ஒன்றுசேர்ந்து பல்வேறு எண்ணக்கருக்களை முன்வைக்கின்றவேளையில் இந்த நாட்டு மக்களும் அதனை உள்வாங்கிக்கொண்டு செயற்படுகின்ற மனோபாவம் உருவாக்கப்பட வேண்டும்.

எனக்கு முன்பு பேசிய உறுப்பினர் காட்டுத் தீ பற்றிப் பேசினார். காட்டுத் தீயை ஏற்படுத்தாத வகையிலான மனோபாவத்தை, நமது அன்றாடச் செயற்பாடுகள் காரணமாக நாமே சூழலை மாசடையச் செய்கின்றோமென்ற அறிவூட்டலை மக்களிடம் நாம் ஏற்படுத்த வேண்டும். காலநிலை மாற்றத்தை - சூழல் பாதிப்புக்களை - தடுப்பதற்கான மனோபாவம் மக்களுக்கு ஏற்படுகின்ற வகையில் அதுகுறித்த அறிவு மேம்படுத்தப்பட வேண்டும்.

குறிப்பாக, நான் இந்த உரையினூடாக இன்னுமொரு விடயத்தை முன்வைக்கலாமென்று நினைக்கின்றேன். கழிவுப்பொருட்கள் என்றவுடன் நாங்கள் நாளாந்த வாழ்க்கையில் எதிர்நோக்குகின்ற சாதாரண கழிவுகளைப் பற்றியே யோசிக்கின்றோம். ஆனால், இன்று இந்த உலகை ஆக்கிரமித்துக்கொண்டிருக்கின்ற பிரதான கழிவுப் பொருட்கள் இலத்திரனியல் கழிவுப்பொருட்களாகும். ஒரு கைத்தொலை பேசியையோ, ஒரு தொலைக்காட்சிப் பெட்டியையோ, ஒரு குளிர்சாதனப் பெட்டியையோ பாவித்துவிட்டு நாங்கள் வீசுகின்றபோது அவற்றின்மூலம் வெளியேறும் பல தொன் கணக்கிலான மாசுப்பொருட்களால் சூழல் பாதிக்கப்படுகிறது. எனவே, மக்களின் மனோபாவத்தை மாற்றி, electronic உபகரணங்களைப் பயன்படுத்துவதைக் குறைத்துக் கொள்வதனூடாக - அதன் பாவனையைக் கட்டுப்பாட்டுக்குள் கொண்டுவருவதனூடாக - சூழல் பாதுகாப்பு மற்றும் காலநிலை மாற்றம் என்பவற்றுடன் சம்பந்தப்பட்ட விடயங்களில் நாம் கவனத்தைச் செலுத்தமுடியும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one more minute.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
இறுதியாக, கடந்த அரசாங்கத்தில் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சராக இருந்த கௌரவ மஹிந்த சமரசிங்க அவர்கள் இங்கு உரையாற்றுகின்றபோது, முக்கியமானதொரு விடயத்தை ஞாபகப்படுத்தினார். அதாவது, நமது நாட்டின் தேயிலைக்கு சர்வதேச ரீதியாக "ozone-friendly tea" என்ற நாமத்தைக் குறிப்பதற்கு வாய்ப்புக் கிடைத்துள்ளதாகவும் இதனை இலங்கையில் உற்பத்தி செய்யப்படும் தேயிலைக்கு மாத்திரம்தான் பயன்படுத்தக்கூடிய வாய்ப்பு இருப்பதாகவும் குறிப்பிட்டார். இது மிகவும் வரவேற்கத்தக்கது. ஆனால், அத்தகைய பெருமைபெற்ற தேயிலைக் கைத்தொழிலானது, இப்பொழுது இந்த நாட்டில் எவ்வாறான நிலைமைக்குச் சென்றுகொண்டிருக்கின்றது? நாங்கள் தேயிலைக் கைத் தொழிலைப் பாதுகாப்போமாக இருந்தால், அதனூடாக காலநிலை மாற்றத்தை - இயற்கைச் சூழலைப் பாதுகாக்கக் கூடிய, ரம்மியமான இலங்கையை உருவாக்குவதற்கு வாய்ப்புக் கிடைக்கும். இந்த நாட்டுக்கு வருமானத்தைப் பெற்றுக்கொடுக்கக்கூடிய பிரதான மூலமாக இருந்துவந்த பெருந்தோட்டக் கைத்தொழிலானது, இன்று கைவிடப்பட்ட ஒரு துறையாக மாறிக்கொண்டு வருகின்றது. பல தேயிலைத் தோட்டங்கள் முறையாகப் பராமரிக்கப்படுவதில்லை. இது தொடர்பாக நாங்கள் பல சந்தர்ப்பங்களில் பலவிதமாகப் பேசியிருக்கின்றோம். எனவே, அரசாங்கம் இயற்கையையும் காலநிலையையும் சீராகப் பாதுகாக்கும் அதேநேரம், பொருளாதார ரீதியான வளர்ச்சியை ஏற்படுத்தி வருகின்ற இவ்வேளையில், சர்வதேச ரீதியாக "ozone-friendly tea எனப்படும் நாமத்தினூடாக இலங்கைக்கு நற்பெயரைப் பெற்றுக்கொடுக்கின்ற தேயிலைத் துறையைப் பாது காப்பதையும் காலநிலையோடு சம்பந்தப்பட்ட ஒரு விடயமாகக் கருதிச் செயற்படவேண்டுமென வேண்டுகோள் விடுத்து, வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වනවා. මේ ආකාරයට වැදගත් ගිවිසුමක් ගැන කථා කරන විට, "අද මේ විධියට දේශගුණික විපර්යාසයන් ඇති වෙලා තිබෙන්නේ ඇයි?" කියන කාරණයට සම්බන්ධ අතීතය ගැනත් අපි බලන්නට ඕනෑ.

අපි දන්නවා, අතීතයේ කාර්මික විප්ලවයක් නිසාම පමණක් නොවෙයි, ඒ කාලයේ මනුෂ්‍යයා විසින් කරපු ක්‍රියාදාමයන් නිසා, යුද්ධ, කර්මාන්තශාලා ඇතිවීම්, ජනගහනය වැඩිවීම, වනාන්තර එළිකිරීම වැනි ක්‍රියාකාරකම් නිසාත් කාලගුණික විපර්යාසයන් සිදු වෙලා තිබෙනවා කියලා. අද අපි ගෝලීය උෂ්ණත්වය -global warming - ගැන කථා කරනවා. වර්තමාන ලෝකයේ සෑම තැනම ගෝලීය උෂ්ණත්වය වැඩි වී තිබෙනවා. අද මේ පැරිස් ගිවිසුම හරහා බලාපොරොත්තු වෙන්නේ මේ ගෝලීය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ අංශක 2කට පමණ සීමා කරන්නයි. මේ රට පරිසර හිතකාමී රටක් බවට පත් කරලා වැඩ කටයුතු කර ගෙන යන්න අපේ අගිගරු ජනාධිපතිතුමා පරිසර අමාත්‍යවරයා හැටියට අද විශාල කර්තව්‍යයක් කර ගෙන යනවා. ඒ සඳහා හොඳම උදාහරණය තමයි, "වස විසෙන් තොර" රටක් ඇති කරන්න එතුමාගේ නායකත්වයෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කටයුතු කිරීම. මේ පැරිස් ගිවිසුමටත් එතුමා සහයෝගය ලබා දීලා තිබෙනවා. ඒක අපට ලොකු භයක්.

මේ පැරිස් ගිවිසුම දිහා බලන කොට අපට පෙනෙන දෙයක් තමයි, දියුණු රටවල්, දියුණු වෙමින් පවතින රටවල් වාගේම නොදියුණු සියලුම රටවල්ද අද මේ සඳහා සහයෝගය ලබා දෙන බව. ලෝකයේ රටවල් 195කින් 175ක්ම පරිසරය රැක ගැනීම සඳහා මෙම ගිවිසුමට සහයෝගය ලබා දීලා තිබෙනවා.

[ගරු සන්දිත් සමරසිංහ මහතා]

අද ගෝලීය උෂ්ණත්වය ගැන කථා කරන කොට අපි කියන්නම ඕනෑ, අපේ රටේ පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වගකීමක් සහ යුතුකමක් අපට තිබෙන බව. මොකද, අපේ රටේත් විශාල පාරිසරික, දේශගුණික විපර්යාසයන් සිදු වෙලා තිබෙනවා. එවැනි ආකාරයට දේශගුණික විපර්යාසයන් සිදු වෙන අවස්ථාවල, ඒ වෙනුවෙන් ක්‍රියා කිරීමට රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන තිබෙනවා. ඒ අයගේ වගකීම තමයි, එවැනි විපර්යාසවලදී හරියාකාරව, විනිවිදභාවයෙන් ඒවාට පිළියම් සෙවීම.

විශේෂයෙන්ම ගංගා, ඇළ දොළ ගැන කථා කරන කොට බලන්න ඕනෑ, පසු ගිය වකවානුවේ -පසු ගිය රජය කාලයේ- පරිසරය ගැන කිසිවක් හිතන්නේ නැතිව එදා හිටපු පාලකයෝ මොනවාද කළේ කියන එක. වැලි ගොඩ දැම්මා, ගංගා නිම්න සම්පූර්ණයෙන් විනාශ කර දැම්මා. එහෙම කරපු නිසා ජනතාවට ජලය නැති වුණා. මෙවැනි ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. අදත් ඒ හස්තයන් අප දිස්ත්‍රික්කයේ තවමත් ක්‍රියාත්මක වෙනවා.

මහා ඔයේ වැලි ගොඩ දාන්න පුළුවන් සතියකට දවස් දෙකක් පමණයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දවස් දෙකකට තමයි permit එකකින් වැලි ගොඩ දාන්න පුළුවන් වෙන්නේ. හැබැයි, ඒ විධියට permit එක ලබා ගත්ත අය දවස් පහක් හෝ සතියේ දවස් හතේම වැලි ගොඩ දාන්න කටයුතු කරනවා. මෙවැනි ක්‍රියා සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය හරහා දැඩි ක්‍රියා මාර්ග ගත යුතුයි කියන එක මේ වේලාවේදී කියනවා. මොකද, අපේ අතිගරු ජනාධිපතිතුමා පරිසරය රැක ගැනීමට මේ කරන ක්‍රියාදාමයන්වල ඵල නෙළන්න පුළුවන් වන්නේ, නීතිමය පැත්තෙනුත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා දාමයන් ගත්තොත් පමණක් වන නිසා.

අද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දූෂිතම දෙපාර්තමේන්තුවක් හැටියට අපට හඳුන්වන්න පුළුවන්. එහි සිටින සෑම නිලධාරියෙක්ම දූෂිතයෙක් නොවෙයි. සමහර නිලධාරීන් මොනවාද කරන්නේ? දැව ඉරන ලී මෝල් හිමියන් අල්ලා ගෙන, ඉරූ ලෑලි ගෙන යන්නට රුපියල් 360ට ලබා දෙන බලපත්‍රය රුපියල් 25,000ට විකුණනවා. මොරටුවට දැව කඳන් අරගෙන යන permit නැවත ගෙනැල්ලා, ඒ අය කැමැති ලී මෝල්වල ලේඛනවලට ඇතුළත් කරනවා. එහෙම ඇතුළත් කළාට පස්සේ, එතැනින් ලෑලි ගෙන යන කොට එළියේදී ලෑලිවලට අච්චු ගහනවා. එහෙම අච්චු ගැහුවාම, දික් අඩි 100ක විතර ලෑලි ප්‍රමාණයක් ගෙන යයි. ඒකෙන් පෙන්වන්නේ රුපියල් 40,000ක, 50,000ක විතර ලී එළියට යනවා කියලායි. එහෙම වුණත්, රුපියල් ලක්ෂ හතහමාරක විතර ලී සෑම දාම මේ විධියට එළියට යනවා. ඒ නිසා, මෙවැනි දේවල් අවම කළ යුතුයි. එහෙම කරන්නේ නැතිව, අපේ ගෝලීය උෂ්ණත්වය අඩු කර ගැනීම පමණක් නොවෙයි, මේ විපර්යාසය අපට නැති කරන්නටත් බැරි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩයිනමයිට් දමා මාළු ඇල්ලීම සම්බන්ධව ලොකු මාෆියාවක් අද තිබෙන බව අප දන්නවා. මේක නැහෙනහිර ප්‍රදේශයේ සෑම තැනම සිදු වෙනවා. මේවාටත් දැඩි ක්‍රියා මාර්ග ගන්න ඕනෑ. එහෙම නැති වුණොත්, අපට blue and green කියන ගම්මාන සහිත රටක් ගොඩනහන්න බැරි වෙනවා. අපේ ගම්මාන හරිත ගම්මාන බවට පත්කරන්න විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා පරිසර අමාත්‍යවරයා හැටියට සෑහෙන වැඩ කටයුතු ප්‍රමාණයක් කරගෙන ගිහින් තිබෙන බව අපි දන්නවා. ඒක ඉතාම වැදගත්. මොකද, ගම තුළින් තමයි සෑම දෙයක්ම සිදුවිය යුත්තේ. පරිසරය රැක ගැනීම පිළිබඳව ගමේ ඉන්න ජනතාවට නිවැරදි අධ්‍යාපනය දුන්නා නම්, අනිවාර්යයෙන්ම ඒ අය ඒ දේ කරන බව අපි දන්නවා. විශේෂයෙන්ම දැනුවත් කිරීම් කරලා, නිවැරදිව සහ ඒකාකාරීව පරිසර සංරක්ෂණ කටයුතු කරලා, ඉදිරියට ගෙනයන්න කටයුතු කරන්න නිලධාරීන්ට වග කීමක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අපි දන්නා තවත් දෙයක් තිබෙනවා. අපි ඉදිරියට යන කොට, ඒ වාගේම විදුලිය ගැන කථා කරන කොට පුනර්ජනනීය බලශක්තිය පැත්තට නැඹුරුවීගෙන යනවා. ඒක තමයි ගෝලීය උෂ්ණත්වය නැති කරන්න පුළුවන් එක ඍජුකයක් වෙන්නේ. ඒ තමයි solar energy, windmills සහ ඝන අපද්‍රව්‍ය පාවිච්චි කරලා නිපදවන බලශක්තිය. ඒ හරහා මේ කර්තව්‍ය කරන්න අපි සියලු දෙනාම සැදී පැහැදී ඉන්නවා. හැබැයි, මෙතැනත් ප්‍රශ්නයක් තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය ගත්තාම, එතැන ගල් අඟුරු මාෆියාවක් තිබෙනවා. මේ ගල් අඟුරු මාෆියාවෙන් සිදු කරන්නේ මොනවාද? පරිසර හිතකාමී දේවල් කරන්න, ඒ වාගේම රටේ ජනතාවගේ පමණක් නොවෙයි, අහිංසක දරුවන්ගේ අනාගතය රැකගන්න අවශ්‍ය දේවල් කරන්න ඉඩ දෙන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. අපි මේ සඳහා යම්කිසි ක්‍රමවේදයක් සෑදිය යුතු බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර තිබෙන " කැලෑ ආඥාපනතේ 24 (1) (බී) වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද පළාත් තුළ පිහිටි පුද්ගලික/රජයේ බදු ඉඩම්වලින් දැව ඉවත් කර ගැනීමට දෙන බලපත්‍රය" යන ශීර්ෂය යටතේ ඇති බලපත්‍ර 5ක් මම **සභාගත*** කරනවා.

මේ බලපත්‍රවල සඳහන් වෙනවා ඒ ලොරිවල ප්‍රවාහනය කරලා තිබෙන ලෑලිවල ප්‍රමාණයන්. නමුත් මේවායේ ලොරියක තිබිය යුතු ප්‍රමාණයට වඩා අඩුවෙන් තමයි තිබෙන්නේ. ඒ වාගේම මම නිලධාරීන් හරහා දැඩි පරීක්ෂණයක් ඉල්ලා සිටිනවා, කෑගල්ල දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා සිදු වන දැව transport කිරීම සම්බන්ධයෙන්. මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 3.08]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් වැදගත්, අනාගතයේ උපදින්නට ඉන්න අපේ දරුවන්ටත් වැදගත් වන ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිමය තීරණයකට සහාය පළ කිරීම සඳහා ගෙන එන ලද COP 21 යෝජනාවලිය සඳහා මගේත් දායකත්වය ලබාදීමට හැකියාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම අද මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකු කථා කළා මේ අර්බුදය සඳහා, -වායු ගෝලය උණුසුම් වීමත් සමඟ ලෝකයේ ඇති වන තත්ත්වයන් සඳහා- මොන වාගේ පිළියම්වලටද අපි යන්නට ඕනෑ කියලා. අපේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ එක් කරුණකින් මගේ කථාව පටන් ගන්නට මම කැමැතියි. එතුමා ප්‍රකාශ කළා වායුගෝලය උණුසුම් වෙන්නට බලපා තිබෙන එක් ප්‍රධාන හේතුවක් තමයි ගල් අඟුරු භාවිතය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසුගිය කාලයේ දැක්කා ගල් අඟුරු භාවිතය නිසා පරිසරයට සිදුවන හානිය වාගේම කොතරම් දුරට පරිසරය උණුසුම් වෙනවාද, ඒ හරහා ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා කාබන්ඩයොක්සයිඩ් නිපදවීම වැඩිවීමෙන් ලෝකවාසී ජනතාවට වන අපහසුතාව කොපමණද කියලා. මේ ගැන කථා කරන විට දැන් අපට අවශ්‍ය වන්නේ උපාය මාර්ගිකව පුනර්ජනනීය බලශක්තිය සඳහා මාරුවීමයි.

ගල් අඟුරු ගැන කථා කරන විට අද ලංකාවේ ගල් අඟුරු වැඩියෙන්ම භාවිත වෙන්නේ විදුලිබල උත්පාදනය සඳහායි. මේ තිබෙන වාතාවරණය උඩ විදුලිබල උත්පාදනය සඳහා ගල් අඟුරු භාවිත කිරීමට, -ගල් අඟුරු බලාගාරවලට- රටේ ජනතාවත් කැමැති නැහැ. නමුත් මේ ගැන කටයුතු කරන විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් අතළොස්සක් ජනතා අභිලාෂයට පිටුපාලා ඒවා වළක්වනවා. මේ සඳහා ඉඩ දෙන්නට බැහැ. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සියලු දෙනාම කියන්නේත් ඒකයි. එහෙම නම් මම මේ සභාවට යෝජනා කරනවා, විශේෂයෙන් පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225 දෙනාම එකතු වෙලා ලෝකයටම ප්‍රශ්නයක් වෙලා තිබෙන, කාලගුණ විපර්යාසවලට ඉඩ දෙන ගල් අඟුරු භාවිතය සහ ඩීසල් භාවිතයෙන් විදුලි බලය නිපදවීම වෙනුවට පුනර්ජනනීය බලශක්තිය කරා යොමු වීමට කටයුතු කළ යුතුයි කියලා. ඒ සඳහා අපේ ආණ්ඩුව සූර්ය බල ශක්තිය මුළු ලංකාව පුරාම ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ආකාරය අපි දුටුවා. ගෙවල්වල වහලවල් සූර්ය බල ශක්තිය ලබා ගැනීමට හැකි ආකාරයට හැඩ ගස්වන ආකාරය අපි දැක්කා. ඒ අනුව අපි දැන් ගෙවල් මිලියනයක් සඳහා සූර්ය ශක්තිය හරහා විදුලි බලය ලබා ගන්නට අලුත් වැඩ පිළිවෙළක් පටන් ගත්තා. අපි මහජන නියෝජිතයෝ හැටියට මේ වගකීම භාරගෙන මහ ජනතාව දැනුවත් කරමින් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට, රටට ඒ බලපෑම කරන්නට ඕනෑ.

විශේෂයෙන් විදුලිබල ක්ෂේත්‍රයට සම්බන්ධ සමහර ඉංජිනේරු මහත්වරුන්ගේ ඔළුවේ තිබෙන, "ගල් අඟුරුම ඕනෑ" කියන අදහස මුලින්ම යටපත් කළ යුතුයි, -මේ අවශ්‍යතාව ගැන කථා කළ යුතුයි- කියලා මම හිතනවා. ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීම පිළිබඳව විධිමත් ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තියට ප්‍රධාන පක්ෂ දෙකේම අනුමැතිය ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා ජනාධිපතිවරණය සඳහා ලබා දුන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේත්, එක්සත් ජාතික පක්ෂයේ "මාස 60කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය" තුළත් මේ ගැන අවධානය යොමු කරලා තිබෙනවා. මේ ක්‍රියාවලි දෙකේම අප කථා කරනවා, "සියයට සියයක්ම දේශීය බලශක්තියට යන්න රට සූදානම්" කියලා. එහෙම නම්, ඊට අවශ්‍ය තාක්ෂණික විසඳුම් ලබාදෙන්න වහාම පියවර ගත යුතුයි. ඒ සඳහා අපි පෙළ ගැසෙමින් ඉන්නවා. එහිදී ශක්තිය අපරිමිතැස්මෙන් භාවිත කිරීම, ශක්තිය ගබඩා කිරීම, පුනර්ජනනීය බලශක්තියට ගැළපෙන ලෙස යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වහාම කළ යුතුයි. 2020 වන විට ඒ සියලු යටිතල පහසුකම් හදන්න අවශ්‍යයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියත්, ලංකා විදුලිබල මණ්ඩලයත් මේ සඳහා පෙරට ඇවිත් කටයුතු කළ යුතුයි.

ඉංජිනේරුවන් කියන්නේ රටේ උගත්ම පිරිස. මේ උගත්ම පිරිස තව ටිකක් රට ගැන හිතුවොත් හොඳයි කියලා මා හිතනවා. මම කියන්නේ ඒ සියලුදෙනාම ගැන නොවෙයි, බොහොම සුළු පිරිසක් ගැන විතරයි. සියයට 95ක් ඉන්නවා, මේ රට, ජාතිය ගැන හිතන. නමුත් මේ හොඳ කටයුතුවලට විරුද්ධ, මාෆියාවලට යට වුණු සියයට 5ක පිරිසකුත් ඉන්නවා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ අප කථා කළා ගල් අඟුරු මාෆියාව ගැන, ගල් අඟුරු ටෙන්ඩර්වලින් වන අකටයුතුකම් ගැන. 2009න් පස්සේ සියලුම ගල් අඟුරු ටෙන්ඩර් ගිහින් තිබුණේ එකම එක සමාගමකට. Nobel Prize winnersලා ගැන අපි කථා කළා. ලංකාවේත් Nobel Prize winnersලා team එකක් හිටියා. ලෝකයේ නොබෙල් සම්මාන ගන්න අයගේ කණ්ඩායමටත් වඩා විශාල කණ්ඩායමක් ඒ ගල් අඟුරු මාෆියා කණ්ඩායමේ හිටියා. අපි මෙවැනි දේවල් වැළැක්වීම සඳහා සටන් කළ යුතුයි. මහජන නියෝජිතයන් හැටියට අපට ඒ සඳහා විශාල වග කීමක් තිබෙනවා. පක්ෂ, විපක්ෂ සියලුම මහජන නියෝජිතයන් මේ සඳහා පෙරට පැමිණිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව කියන්නේ නිවර්තන කලාපීය රටක්. අවුරුද්දේ පුරාම හිරු එළිය තිබෙනවා. ඔබතුමා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ආසනය ගැන මම දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති ප්‍රභේදයක් හැටියට සූර්ය බලශක්තිය ලබාගන්න පුළුවන් ලංකාවේ හොඳම තැන, radiation එක වැඩිම තැන තමයි වැල්ලවාය ප්‍රදේශය. වැල්ලවාය ප්‍රදේශයම සූර්ය බලශක්තියෙන් ප්‍රබෝධවත් කරලා, ලංකාවට අවශ්‍ය බලශක්තිය ලබාගැනීමේ ඒ වැඩ පිළිවෙළට ඔබතුමාට නායකත්වය දෙන්න පුළුවන්. අපතේ යන හිරු එළියෙන් අප වහාම ප්‍රයෝජන ගත යුතුයි.

මා කලින් කිව්වා වාගේ, සියලුම පක්ෂ එකතු වෙලා මේ සූර්ය බල සංග්‍රාමයට දායකත්වය ලබාදිය යුතුයි. රටේ හැම වහලකම සූර්ය පැනල සවි කළොත් අපට මේ හිරු එළියෙන් විශාල ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. අලුතින් හදන නිවෙස්වල කෙළින්ම සූර්ය වහලක් හදන්න පුළුවන් නම් අපට ඒ වහලට යන වියදමත් අඩු කරගන්න පුළුවන්. මෙවැනි අලුත් ක්‍රමවේද ගැන අප කල්පනා කළ යුතුයි. එය නිවර්තන කලාපීය රටකට ගැළපෙන අලුත් නිර්මාණයක් වේවි. සූර්ය පැනලවලින් අලුත් වහලක් හදන්නේ කොහොමද කියන එක ගැන හිතන්න කියලා මා විශේෂයෙන්ම ඉංජිනේරුවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. එතකොට අපට උළු සෙවිලි කරලා ඒකට උඩින් සූර්ය පැනල සවි කරන්න අවශ්‍ය නැහැ. කෙළින්ම සූර්ය පැනලවලින් වහලය නිර්මාණය කරගන්න පුළුවන්. අද ලෝකයේ දියුණු රටවල නොයෙකුත් සමාගම් මේ සඳහා පෙළ ගැහිලා ඉන්නවා.

ප්‍රතිපත්ති ප්‍රකාශනවල තිබෙන විධියටම රට පුරාම දර විදුලි බලාගාර හදන්න, ඒ වාගේම දුප්පත් ජනතාවට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබාදෙන්න අපට පුළුවන්. නමුත්, අප හැමදෙනාගේම ඡන්ද දායකයන්ට අලුත් වටිනාකමක් සහිත දෙයක් තමයි දෙන්න ඕනෑ. වහලට වැටෙන හිරු එළිය, වත්තේ වැවෙන ගහ කොළ අපට සල්ලි බවට පත් කරන්න පුළුවන්. ඒවා තමයි අපේ රටේ ආර්ථිකය වර්ධනය වන ප්‍රධානම අනාගත සාධක වන්නේ.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

අද ඉදිරිපත් කර තිබෙන මේ එකඟතාව අප ඒකමතිකව සම්මත කරගත යුතුයි. ඒ සමඟම, 2030දී දේශීය විකල්ප බලශක්තිය සපුරා ගන්නා අපේ ඉලක්කය අපි ලෝකයට ඉදිරිපත් කළ යුතුයි. ඒ මඟින් නව සම්මුති ආණ්ඩුවට තවත් අලුත් පණිවුඩයක් ලෝකයට ලබාදෙන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි, මෙමඟින් අපට එක්සත් ජාතීන්ගේ සමුළුවේදී දැනට වඩා වටිනාකමක් ලැබෙනවා. COP 21 පැරිස් සමුළුවෙන් පස්සේ මේ සඳහා සූදානම් වුණු හොඳ සංවිධානාත්මක කණ්ඩායමක් එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවට සහභාගි වෙනවා. දුප්පත්, පොහොසත් කියා රටවල භේදයක් නැහැ. ලෝකය එක මිටට මේ තිරසාර සංවර්ධනයට යා යුතුයි.

අපේ රට හඳුන්න ලෝක පරිමාණයෙන් තිබෙන හරිත සහන ලබා ගන්න පුළුවන්. ඒ හරහා දිගුකාලීන ණය ලබාගන්න පුළුවන්. මේ සඳහා නිලධාරීන් වේගයෙන් වැඩකටයුතු කළ යුතු වෙනවා. මා හිතන විධියට ඒ මත පදනම් වූ හොඳ ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරි අය වැයත් සමඟ මේ රජය එළිදක්වනවා. මේ කාර්යයන් හරහා සූර්ය බලශක්තිය, අනිකුත් පුනර්ජනනීය බලශක්තිය හරහා මේ රට බලශක්තියෙන් ස්වයංපෝෂිත දේශයක් බවට පත් කරන්න අපට ඉදිරියේදී හැකියාව ලැබෙනවා නොඅනුමානයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්ෂේත්‍රය ගැන හොයද්දී විවිධ රටවල කෙරෙන පර්යේෂණ ගැනත් ඇස යොමු කරන්න මට හැකියාවක් ලැබුණා. මම උදාහරණයක් කියන්නම්. "Europe 2030 Cleaner Buses" කියලා යුරෝපයේ වැඩසටහනක් තිබෙනවා. මේ වැඩ සටහන හරහා යුරෝපයේ ධාවනය වන සියලුම බස් රථ cleaner buses හැටියට ධාවනය කරන්නයි බලාපොරොත්තු වන්නේ. ඒ කියන්නේ, පොසිල ඉන්ධන භාවිත නොකර, සම්පූර්ණයෙන් සූර්ය බලය හා වෙනත් පුනර්ජනීය බලශක්ති මඟින් බස් රථ ධාවනය කිරීමයි. කොළඹ නගරයට ගියොත් ඒ තිබෙන ත්‍රිරෝද රථ ප්‍රමාණයත් එක්ක කොච්චර කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් පරිසරයට මුදා හරිනවාද කියන එක අපට දකින්න පුළුවන්. අපි හුස්ම ගන්නකොට ඒ අපහසුතාව දැනෙනවා. දිගටම මේ විධියට ගියොත් කොළඹ නගරයේ අපටත් දැඩි ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙනවා. අපට හුස්ම ගන්න අවශ්‍ය ඔක්සිජන් වෙනම ලබා ගත යුතු වෙනවා. ඒ වාගේ ප්‍රශ්න උදා වෙන්න පුළුවන්.

2025දී පැරිසියේ භාවිත කරන සියලුම බස් රථ මේ cleaner buses වැඩ සටහන යටතේ භාවිත කරන්න ඔවුන් බලාපොරොත්තු වෙනවා. අපේත් බස්නාහිර පළාත තුළ Megapolis වැඩ සටහනක් තිබෙනවා. ඒ Megapolis වැඩ සටහන හරහා දැන් සිටම කල්පනා කළොත්, තව අවුරුදු 10කින් එන ත්‍රිරෝද රථ සියල්ලම විදුලියෙන් ධාවනය වන ත්‍රිරෝද රථ බවට පත් කරන්න පුළුවන්. දැනට ලක්ෂ 12ක විතර ත්‍රිරෝද රථ ප්‍රමාණයක් අපේ රටේ තිබෙනවා. ඒවා සම්පූර්ණයෙන් cleaner three-wheelers බවට පත් කළොත් විතරයි අපට මේ ජයග්‍රහණ ලබා ගන්න පුළුවන් වෙන්නේ. අපි ඒ සඳහා යොමු විය යුතුයි. බස්නාහිර පළාත සංවර්ධනය කිරීමේ Megapolis වැඩ සටහන යටතේ අපේ අවුරුදු 10ක අනාගත සැලසුම් තිබෙනවා. 2030 වනකොට යුරෝපයේ වාගේම අපේ ප්‍රවාහන සේවය තුළත් cleaner three-wheelers, විදුලියෙන් දුවන බස් රථ, බැටරියෙන් දුවන බස් රථ සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන්න පැහැදිලිවම පුළුවන්. එහෙම වුණොත්, අපට මුළු කොළඹ ප්‍රදේශයම - බස්නාහිර පළාතම - පිරිසිදු වාතාශ්‍රය තිබෙන ප්‍රදේශයක් බවට පත් කරන්න පුළුවන්. එහෙම වුණොත් තමයි, මේ COP 21 බලාපොරොත්තු සපුරාලිය හැකි වන්නේ. මම හිතන විධියට මේ සඳහා පැහැදිලි නායකත්වයක් දැන් අපේ රටට ලැබී තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් මේ සඳහා ප්‍රමුඛත්වය ගන්නවා. මේ සඳහා මම කලින් කී ලෙසම පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මන්ත්‍රීවරු පෙරට ආ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාව යොදා ගන්නවා, මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 23ක විශිෂ්ට සේවා කාලයකින් පසුව අද දින, එනම් 2016.09.09 දින විශ්‍රාම යන ඩබ්ලිව්. ඩොනල්ඩ් ප්‍රනාන්දු මහතාට සුබ විශ්‍රාම දිවියකට සුබ පැතුම් එක් කිරීමට. ඔහු සේවය කළේ පාර්ලිමේන්තුවේ සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ. විශේෂයෙන් මට මතකයි, "සූර්ය බල ශක්තියෙන් මේ පාර්ලිමේන්තුවට සම්පූර්ණයෙන්ම විදුලිය ලබා ගත හැකියි නේද? " කියලා ඔහුත් දවසක් කථා කළා. ඒ නිසායි මේ අවස්ථාවේ මම එතුමා මතක් කළේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට අපේත් සුබ පැතුම් එක් කරනවා.

මීළඟට ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 3.20]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මම ඉතාම සතුටු වෙනවා, අද එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ සම්මුතියේ පාර්ශ්වකරුවන් හැටියට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ ඒ පිළිබඳ විවාද කරන අවස්ථාවේ කථා කරන්න ලැබීම ගැන. රටක් හැටියට, ජාතියක් හැටියට අපි මොන සංවර්ධන කටයුතු කළත් පරිසරය වෙනුවෙන් අපේ යුතුකම සහ අපේ වගකීම ඉෂ්ට කරන්න වර්තමානයේ අපට ලැබුණ මොහොතක් තමයි මේ. මා විශේෂයෙන්ම ඒ ගැන සතුටු වෙනවා.

මේ රටේ ඉතිහාසය පිළිබඳව, ඒ වාගේම කාර්මික විප්ලවය පිළිබඳව කථා කරනකොට අපි එදා පරිසරය පිළිබඳව අනතුරු ඇඟෙව්වා. ඇමෙරිකා එක්සත් ජනපදයේ චිකාගෝ නගරයෙන් මධ්‍යධරනී මුහුදට එකතු වෙන තෙල් සහ වෙනත් අපද්‍රව්‍ය පිළිබඳව, ඒ වාගේම කාබන් විමෝචනය පිළිබඳව මීට දශක හතරකට පහකට ඉස්සෙල්ලා අපි කථා කළා. පාසලේ අධ්‍යාපනය ලබන අපේ දරුවන්ට අපි කියා දුන්නා, ඉතාම දැකුම්කළු පවිත්‍ර වූ අපේ මුහුදු සීමාවත් ඇමෙරිකාවේ චිකාගෝවේ වාගේ කවදා හරි ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙයි කියලා. අපි එදා කථා කළා, ගුවන් මාර්ග, මුහුදු මාර්ග සහ අපේ මාර්ග පද්ධතිය තුළ කාබන් විමෝචනය වීමෙන් ඉදිරියේදී මේ රටේ පරිසරයට ඇති වන තත්ත්වය පිළිබඳව. අද එහි උච්ඡතම අවස්ථාවට පැමිණිලා අවසානයි.

අද ලංකාව ගත්තොත්, පෙණහලු රෝගීන්ගේ ගණන දිනෙන් දින වැඩි වෙලා. පිළිකා සහ වෙනත් රෝගවලට ලක් වූ රෝගීන් ප්‍රමාණයත් වැඩි වෙලා. අද මනුස්සයෙක් මැරුණොත් අපට අහන්න වෙන්නේ හෘදයාබාධයක් - heart attack - හේතුවෙන් හෝ පිළිකා තත්ත්වයක හේතුවෙන් මිය ගිය බවයි. මා හිතනවා, ඒ තත්ත්වය ඉතා දැඩි ලෙස, ඉතා අවාසනාවන්ත ලෙස මේ සමාජයේ ස්ථාපිත වෙලා තිබෙන බව.

ලංකාව හැටියට අපට තනියම මේ සියල්ලටම පිළියම් යෙදීම කරන්න පුළුවන් කටයුත්තක් නොවෙයි. ඒ සඳහා ලෝකයේ

සහාය අද අපට අවශ්‍යයි. ඉන්දියාව ඇතුළු දකුණු ආසියාවේ රටවල් විතරක් නොවෙයි, යුරෝපීය රටවල් ගත්තත්, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය හා චීනය ඇතුළු දියුණු රටවල් ගත්තත් ඉතාමත් අවාසනාවන්ත ලෙස මේ තත්ත්වයට අද මුහුණ දෙමින් සිටිනවා. ලෝකයේ රටවල් සියල්ල එකට එකතු වෙලා නිර්මාණය කරන නොයෙකුත් සම්මුතීන් හරහා මේ රට ගලවා ගන්න පුළුවන්කම තිබෙනවා මිසක්, ලංකාව විතරක් මොනවා කළත් වැඩක් නැහැ. මේ සඳහා අපට ආසන්න රටවල් වන ඉන්දියාව, බංග්ලාදේශය පමණක් නෙවෙයි, මධ්‍යධරණී මුහුදු ආසන්නයේ තිබෙන රටවල්, ඉන්දියන් සාගරය ආසන්නයේ තිබෙන රටවල් ඇතුළු ලෝකයම එකට එකතු වන්න ඕනෑ අවස්ථාවක්. අපට තනි තනි රටවල් හැටියට නැඟිටින්න බැහැ. ඒ නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය අද ඉතාමත් වැදගත් අවස්ථාවකට මුහුණ දීලා තිබෙන බව මා විශ්වාස කරනවා. එදා, 2015 ඔක්තෝබර් මාසයේ ඉදිරිපත් කරන ලද මේ වැඩ පිළිවෙළට අපේ සහයෝගය ලබා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපි සිහිපත් කරන්නට ඕනෑ, ශ්‍රී ලංකාවේ අපේක්ෂිත දේශීයව තීරණය කරන ලද දායකත්වයන් පිළිබඳව. ඒ ගැන කථා කරන කොට විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි, හරිතාගාර වායු විමෝචනය, දේශගුණික විපර්යාසවලට අනුහුරු වීම, දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන ආපදා, පාඩු, අලාභ හානි හා දේශගුණික විපර්යාස නිසා සිදු වන හෝ වඩා තීව්‍ර වන දීර්ඝ නියං තත්ත්වයන්, ක්ෂණික ගංවතුර වැනි ආන්තික දේශගුණික ආපදා හේතුවෙන් ඇති වන පාඩු හා අලාභ හානි පිළිබඳ වෝර්සෝ අන්තර්ජාතික ක්‍රමවේදය තුළත්, පෝලන්තයේ වෝර්සෝ අගනුවර පැවැති 19වන පාර්ශ්වකරුවන්ගේ සමුළුවේදීත් යම් සම්මුතීන් ඇති කර ගත් බව.

අපේ අතිගරු ජනාධිපතිතුමා නුදුරු දිනයකදී -සැප්තැම්බර් මාසයේ 21වැනි දා- පවත්වනු ලබන මෙම එක්සත් ජාතීන්ගේ සමුළුවට සහභාගි වනවා. එදා පරිසර ඇමති හැටියට සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා එම ගිවිසුමට අත්සන් කරලා, අද එය ස්ථිර කරලා, ස්ථාවර කරලා තිබෙන අවස්ථාවක්. එක්සත් ජාතීන්ගේ සමුළුවට අතිගරු ජනාධිපතිතුමා සමඟ සහභාගි වන ඒ නියෝජිත පිරිසට ඇතුළත් වෙන්න මටත් අවස්ථාවක් ලැබීමට තරම් මා වාසනාවන්ත වනවා. ඒ ගැන මම සතුටු වන අතර, එය භාග්‍යයක් කොට මා සලකනවා. මොකද, තව ශත වර්ෂ ගණනාවක් මේ භූතලය තුළ මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් වටා පිටාවක් නිර්මාණය කරන්නට අවශ්‍ය ශක්තිය සඳහා දායකත්වය ලබා දෙන්න අප ජීවතුන් අතර සිටින කාලයේ පුළුවන්කමක් ලැබී තිබෙනවා. විදේශ රටකදීත්, ඒ වාගේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළත් මේ අණ පනත්, ඒ එක්කම මේ සම්මුති පිළිබඳව කථා කරන්නට මට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න බොහෝ දේවල් තිබුණත්, නැඟිටලා කථාව පටන් ගන්න විටම කාලය අවසන් වෙලා. නමුත්, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අලුත් නිපැයුම් පිළිබඳව අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්නට ඕනෑ. අපට අවශ්‍ය කරන අලුත් අලුත් නිපැයුම් අද ඇවිත් තිබෙනවා. උදාහරණක් හැටියට electric cars සහ වෙනත් වාහන. මේවා එන්න එන්නම ප්‍රචලිත කරන්නට ඕනෑ; ආනයනය කරන්නට ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමා මෙරට වොක්ස් වැගන් මෝටර් රථ කර්මාන්ත ශාලාවක් - සමහර විට බොහෝ දෙනෙක් එය සම්චිචලයට ලක් කරනවා ඇති. මේ electric cars ධාවනය සඳහා අද එක රුපියලක්වත් ඉන්ධනවලට වැය වෙන්නේ නැහැ. ඒ වාගේම සූර්ය කෝෂ තුළින් නිවසට අවශ්‍ය විදුලි බලය ලබා ගන්නත් අද අවස්ථාව උදා වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් දෛනිකව නිවසක පරිභෝජනය සඳහා අවශ්‍ය විදුලිය ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා.

අපේ ගරු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමාට කියන්න කැමැතියි, ඉදිරියේදී මේ රටට මෝටර් රථ ආනයනය කරනවා නම්, කරුණාකරලා මේ වාගේ ඉලෙක්ට්‍රික් වාහන ආනයනය කරන්න කියලා. අද electric වාහනයක් රුපියල් ලක්ෂ 36ක් 37ක් පමණ වනවා. අඩු ගණනේ එම වාහනයක් රුපියල් ලක්ෂ 25ක මිලකටවත් ලබා ගන්න අවස්ථාව සලසා දෙන්න පුළුවන් නම් හොඳයි. එහෙම වුණොත් ත්‍රී විලර් රථ හා මෝටර් සයිකල් පාවිච්චිය අඩු වෙයි කියලා මා හිතනවා. ඒ විතරක් නොවෙයි, එමඟින් දෛනිකව සිදුවන කාබන් විමෝචනය අවම කර ගන්නත් අවස්ථාව ලැබෙනවා.

අපි ඉදිරියේදී කොළඹ නගරය තුළ උඩින් යන, එහෙම නැත්නම් ගුවන් පාලම් මත ගමන් කරන දුම්රිය සහ බස් රථ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා. එම වැඩ පිළිවෙළ කොළඹ නගරයේ විතරක් නොවෙයි ක්‍රියාත්මක කරන්නේ. ඒ තුළ විදුලියෙන් ක්‍රියාත්මක වන දුම්රිය සහ බස් රථ ගමන් කර වන්නත් අපි බලාපොරොත්තු වනවා. අපි දන්නවා, චීනයට හෝ වෙනත් රටකට ගියාම උමං දුම්රියෙන් ගමන් කිරීම තුළින් විශේෂයෙන්ම අපේ කාලය ඉතිරි වෙනවා වාගේම, එම දුම්රිය තුළින් පරිසර දූෂණයත් අවම වෙන බව. එවැනි වැඩ පිළිවෙළක් අපේ රට තුළත් ක්‍රියාත්මක කිරීම තුළින් මේ රටේ මිනිස්සුන්ට පිරිසිදුව හුස්ම ගන්න තිබෙන අයිතිය අපි ආරක්ෂා කර දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ලංකාවේ අපි නොයෙක් විධියේ සැලසුම් කරනවා. නමුත් අපි මොන සැලසුම් කළත්, ඒවා ක්‍රියාවට නංවන කොට අපි පරාජය වෙලා අවසානයි. ඒ නිසා රජයක් හැටියටත්, අතිගරු ජනාධිපතිතුමා පරිසර අමාත්‍යවරයා හැටියටත් - මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මැතිතුමා මේ ගරු සභාවේ සිටිනවා. ඔබතුමන්ලාට මේ සම්බන්ධයෙන් විශාල කාර්ය භාරයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්, මට තව විනාඩියක් දෙන්න. අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් සිදු කරන පරිසර වැඩ පිළිවෙළට අදාළව ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරයා හැටියට මම කටයුතු කරනවා. සෑම දිස්ත්‍රික්කයකම ඉන්න මන්ත්‍රීවරුන්ට එම කමිටුවේ කටයුතු කරන්න යම් ශක්තියක් දීලා තිබෙනවා. නමුත්, පරිසර කටයුතු තුළින් ජාතික වැඩ පිළිවෙළට යම් යම් අඩු පාඩු සිද්ධ වෙලා තිබෙනවා. ගරු අනුරාධ ජයරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යන්න මේකට තවත් වැඩියෙන් ශක්තිය දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දිස්ත්‍රික්

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මට්ටමින්, ප්‍රාදේශීය කොට්ඨාස මට්ටමින් ඇවිල්ලා මේ දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීමේ කටයුත්තට අත හිත දෙන්න කියලා ආරාධනය කරනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු හැටියටත්, මහජන නියෝජිතයකු හැටියටත් අත් දෙකම උස්සලා අද දින මේ යෝජනාව සම්මත කිරීමට හදවතින්ම කටයුතු කරනවා කියන එකත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.29]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම අද මේ තිබෙන සංවාදය පරිසරය හා ගෝලීය උෂ්ණත්වය ගැනයි. ඒ සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, පරිසරය ගැන වෙනදාට වඩා ලෝක අවධානය අද යොමු වෙලා තිබෙන බව. විශේෂයෙන්ම ඒ සඳහා ලෝක අවධානය යොමු වෙන්න ප්‍රධාන හේතුවක් තිබෙනවා. පරිසරය මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍යයි. සංවර්ධනයත් එක්ක පරිසරය හා නොයෙකුත් ගැටලු මතුවෙලා තිබෙනවා. ඒ මතු වූ ගැටලුත් එක්ක මිනිසා පරිසරය ගැන වෙනදාටත් වඩා උනන්දුවක් දක්වන්න අද යොමු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මිනිසාගේ දියුණුවත්, වේගවත් සංවර්ධනයත් එක්ක අද විශාල වශයෙන් පාරිසරික තර්ජනවලට, පාරිසරික ගැටලුවලට මුහුණ දෙන්න අපට සිද්ධ වෙලා තිබෙන බව අපි දන්නවා. තාක්ෂණයේ දියුණුවත් එක්ක මිනිසා පරිසරය පාලනය කිරීමට උත්සාහ දැරීම නිසා නොයෙකුත් ආකාරයේ ඵල විපාක හා ප්‍රති විපාකවලට මුහුණ දෙන්නට මිනිස් සංහතියට අද සිද්ධ වෙලා තිබෙන බව ලෝකය දිහා බැලුවාම අපට පෙනෙනවා. අපි සංවර්ධනය ගැන කථා කළත්; ලෝකයේ දියුණුව ගැන කථා කළත්; නොයෙකුත් දියුණු තාක්ෂණික ක්‍රම ගැන කථා කළත්, ස්වභාව ධර්මය පාලනය කරන්න අපට තවමත් බැරිවෙලා තිබෙනවා. පරිසරය පාලනය කරන්න අපි අසමත් වෙලා තිබෙනවා. මිනිසා මොන තරම් දියුණු තත්ත්වයකට පත් වුණත්, මිනිසා මොන තරම් දියුණු දේවල් සොයා ගත්තත්, තාක්ෂණය හා විද්‍යාව මොන තරම් දියුණුවකට ලක් වුණත්, අද ස්වභාව ධර්මය පාලනය කරන්න මිනිසා අසමත් වෙලා තිබෙනවා. එසේ පාලනය කිරීමට යාම තුළින් නොයෙකුත් ඵල විපාකවලට, ප්‍රතිවිපාකවලට අද මිනිස් සංහතියටම මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ගෝලීය උෂ්ණත්වය වැඩිවීම ගැන අපි කථා කරනවා නම්, අද ගෝලීය උෂ්ණත්වය දරුණු නිසා දරුණු කාලගුණික විපර්යාසවලට මිනිස්සුන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම ගෝලීය උෂ්ණත්වය වැඩිවීම නිසා මානව වර්ගයාට නොයෙකුත් ආකාරයේ වසංගත රෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි ලෝක පරිසර සංවිධානයේ සංඛ්‍යා ලේඛන දෙස බැලුවොත්, ඔවුන්ගේ ගණන්වලට අනුව ගෝලීය උෂ්ණත්වය නිසා ඇති වන නොයෙකුත් අතුරු ආබාධ සහ වසංගත රෝග ආදී නොයෙකුත් රෝගවලින් මිනිස්සු එක්ලක්ෂ හැටදහසක් පමණ අවුරුද්දකට මිය යනවා. අද ලෝක පරිසර සංවිධානය මේ බව කියනවා. ඒ විතරක් නොවෙයි, ලෝක පරිසර සංවිධානය කියනවා, ලෝකයේ ගෝලීය උෂ්ණත්වය වෙනස්වීම නිසා මිය යන සංඛ්‍යාව 2020 වන විට දෙගුණයකින් වැඩි වෙන්න පුළුවන් කියලා. 2020 වන විට ගෝලීය උෂ්ණත්වය වෙනස්වීම නිසා අවුරුද්දකට මිනිස්සු තුන්ලක්ෂ විසිදහසකට ආසන්න ප්‍රමාණයක් මිය යන්න පුළුවන්. ඒ නිසා තමයි ලෝකයේ තිබෙන නොයෙකුත් පරිසර සංවිධාන, නොයෙකුත් ලෝක සෞඛ්‍ය සංවිධාන මිනිස්සුන්ට මේ විධියට අනතුරු අඟවන්නේ.

අපිට මතකයි, 1994දී ලෝකයේ පළමුවැනි මිහිකත සමුළුව පැවැත්වුණු බව. ඒ හරහා ලෝකයේ ඉන්න බලවතුන්ට, ලෝක නායකයන්ට පරිසරය පිළිබඳව යම් අවධානයක් ඇති කරන්න ඔවුන් යොමුවුණා. නමුත්, අපි එක දෙයක් දැක්කා. ඉන් පසුව, 1997 වසරේ ජපානයේ කියෝටෝ සමුළුව පැවැත්වුණා. ඒ කියෝටෝ සමුළුව හරහා බලවතුන් නොයෙකුත් එකඟත්වයන්ට පැමිණියත් ඒ එකක්වත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඉන්පසුව, 2011 වසරේ ඩර්බන් සමුළුව පැවැත්වුණා. 2013 වසර වනතෙක් එම සමුළුවල තීන්දු ක්‍රියාත්මක වෙයිද කියලා බලාගෙන සිටියා. නමුත්, එහි තීන්දු ක්‍රියාත්මක වුණේ නැහැ. මෙන්න මේ විධියට ඉතිහාසයේ හැම අවුරුද්දකම ලෝක පරිසර සමුළු එහෙම නැත්නම්, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පිළිබඳ සමුළු පැවැත්වුණා. මේ ආකාරයට සමුළු පැවැත්වුණාට එයින් ගන්නා තීන්දු-තීරණ එකක්වත් ලෝක බලවතුන් ක්‍රියාත්මක කරන්න එකඟ වුණේ නැහැ.

අවසානයේදී, මේ පරිසර සමුළු පවත්වන්න ලෝකයේ රටවල් අතර තරගයක් ඇති වුණා කියලා අපි දන්නවා. හරියට, ඔලිම්පික් තරගය තමන්ගේ රටේ පවත්වන්න අවස්ථාව ගන්න සටන් කරනවා වාගෙයි. එහෙම නැත්නම්, ලෝක පාපන්දු තරගාවලිය පවත්වන්න අවස්ථාව ගන්න සටන් කරනවා වාගෙයි. එහෙමත් නැත්නම්, ලෝක රග්බි තරගාවලිය පවත්වන්න අවස්ථාව ගන්න සටන් කරනවා වාගෙයි. මේ විධියට හුහාක් රටවල් මේ ලෝක පරිසර සමුළුව තමන්ගේ රටේ පවත්වන්න ලොකු තරගයක නිරත වුණා. එවැනි තරගයක නිරත වුණේ, මේවා කෙරෙහි ලෝකයේ අවධානය ඇති වුණ නිසායි. නමුත්, ඒ විධියට ලෝක පරිසර සමුළු පැවැත්වුවාත් කිසිම ආකාරයේ එකඟත්වයකට එන්න බැරි වුණා.

අපි දන්නවා, අද ලෝකයේ දියුණු, සංවර්ධිත රටවල් තමන්ගේ රටේ දියුණුව, තමන්ගේ රටේ සංවර්ධනය වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටින බව. එංගලන්තය වැනි යුරෝපීය රටවල් වෙන්න පුළුවන්, ඇමෙරිකාව වෙන්න පුළුවන්, ඉන්දියාව වෙන්න පුළුවන්, චීනය වෙන්න පුළුවන්; අද ඒ සියලු දෙනාම තමන්ගේ රටේ පැවැත්ම වෙනුවෙන්, තමන්ගේ රටේ පෞද්ගලික න්‍යාය පත්‍ර වෙනුවෙන් තමයි පෙනී සිටින්නේ. එහෙම නැතිව, ලෝක මානව සංහතියේ පැවැත්ම වෙනුවෙන් මේ ලෝකයේ පෙනී සිටීමක් දකින්න ලැබෙන්නේ නැහැ. නමුත්, මේ ඇති වෙලා තිබෙන ලෝක වාතාවරණයත් එක්ක, මේ පරිසර විපර්යාසයත් එක්ක ලෝක බලවතුන්ට පවා පරිසරය ගැන තමන්ගේ අවධානය යොමු කරන්න සිදු වෙලා තිබෙනවා. මොකද, අපි මේ පරිසරයත් එක්ක, පරිසරයට හිතැති සංවර්ධන ක්‍රියා මාර්ගයක මේ ලෝකය ගෙන යනවාද කියලා අද මිනිසුන් හැටියට අපට තීරණය කරන්න වෙලා තිබෙනවා. එහෙමත් නැත්නම්, පරිසරයට විරුද්ධව සංවර්ධන ක්‍රියා මාර්ගයක් තුළින් ගිහිල්ලා මුළු ලෝකයේම ජීවත්වන මිනිස් සංහතියම විනාශයක් කරා අපි ගෙන යනවාද කියන තීන්දුව ලෝක බලවතුන්ට අද ගන්න සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාත්‍යන්තර බලශක්ති අධිකාරිය අනුව ගෝලීය උණුසුමට එරෙහිව කටයුතු කිරීමට අපට තව තිබෙන්නේ වසර පහක් පමණයි. ඒ වසර පහ තුළදී අපි ස්වභාව ධර්මය අනුව කටයුතු කළේ නැත්නම්, අපට ස්වභාව ධර්මයෙන් මීට වඩා දරුණු විධියට ප්‍රතිචාර දක්වනවා කියන එක ජාත්‍යන්තර බලශක්ති අධිකාරිය පවසලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman
මම හිතන හැටියට, අද ලෝකයට හැම පැත්තෙන්ම අනතුරු හැඟවීම් ලැබෙනවා. මේ ලෝකයට ඉදිරි අවුරුදු ගණනාව ඉතාමත්ම තීරණාත්මකයි කියලා ලෝක පරිසර සංවිධාන, ලෝක සෞඛ්‍ය සංවිධානය, ජාත්‍යන්තර බලශක්ති අධිකාරිය යන මේ හැම සංවිධානයක්ම මුළු ලෝකයටම අනතුරු හඟවනවා. මම විශ්වාස කරන්නේ, අපි පරිසර හිතකාමී සංවර්ධනයකට, මානව හිතවාදී සංවර්ධනයකට යා යුතුයි කියලායි. ඒ ගමන යන්න ලෝක බලවතුන් කොයි තරම් කැප කිරීමක් කරන්න ලැහැස්තිද යන්නත්, ඔවුන් තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර අත්හැරලා ලෝකයේ ජීවත්වන මානව වර්ගයා ගැන හිතන්න සූදානම්ද කියන ප්‍රශ්නයත් අප ඉදිරියේ තිබෙනවා. මම හිතන හැටියට, අපට මේ අයුරින් පරිසර හිතකාමී සංවර්ධනයකට යන්න පුළුවන් වන්නේ, ඒ ප්‍රශ්නයට විසඳුමත් එක්කයි. එහෙම නැතිව අපි මේ සමුළුවල ගිවිසුම් අත්සන් කර කොයි තරම් එකඟත්වයකට පැමිණියත් ලෝක බලවතුන් පරිසර හිතකාමී සංවර්ධනයකට යන්න සූදානම් නැත්නම් ප්‍රයෝජනයක් නැහැ. ලෝකය ගැන, මානව වර්ගයා ගැන -මිනිස් සංහතිය ගැන- හිතලා, මේ සංවර්ධනය පරිසර හිතකාමී සංවර්ධනයක් බවට පරිවර්තනය කරන්න ඕනෑ වනවා. මේ තිබෙන අනුන්ව යටපත් කිරීමේ තරගය අත්හරින්න ලෝක බලවතුන් සූදානම් නැත්නම් මේ සමුළුවත් අපි කථා කරපු, කොළවල පමණක් අත්සන් කරපු සමුළුවක් බවට පත් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය යථාර්ථයක් බවට පත් කරන්න නම්, ලෝක බලවතුන්ට අනිවාර්යෙන්ම තමන්ගේ රට ගැන පමණක් නොවෙයි, මුළු ලෝකය ගැන හිතන පරාර්ථකාමී අදහස් පහළ වෙන්න ඕනෑ. අප හිතන පරාර්ථකාමී, අප හිතන පරිසර හිතකාමී සංවර්ධනය යථාර්ථයක් බවට පත්වෙන්නේ එවැනි අදහස් පහළවීම මතයි කියන එක කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. The next speaker is the Hon. Mohamed Navavi. You have five minutes.

[3.37 p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Thank you very much, Mr. Presiding Member.

I think, this Debate on the Ratification of the Paris Agreement is very important. More than 170 countries have already signed this Agreement and our future depends on this.

About a month back, the Hon. Mylvaganam Thilakarajah, Member of Parliament, and myself represented our country at the Asian Parliamentary Assembly in Islamabad. We were very lucky to have visited the Senate which is called, "the Green Parliament". They are completely using solar power and in most of the places we visited, the first preference was given to environment. If a country is to live in peace, if it is to be improved in all aspects, first we have to look at the environmental aspects. I am very happy that this Ministry comes under the perview of His Excellency the President. Under the previous Government he was in charge of the Ministry of Health and I know how he was able to overcome the problems that he had to face with regrard to cigarettes. Then, under this Government, he has taken a decision on drugs and now it is also under control. We are very happy that this Ministry comes under His Excellency the President and we have a dedicated Deputy Minister too.

When we speak of environment, we always forget about the coastal areas. I am from Puttalam and living in the west coast. If you go around the coastal villages from Galle to Mannar, you can see coastal erosion. I can remember that about 20-25 years ago, there was a nice beach from Galle right up to Mannar extending almost up to 1-2 kilometres. But, today, we can see, especially from Wennappuwa to Puttalam, Kalpitiya, that sea is eating up the land. So, we have to look into this. The Hon. Deputy Minister is here and I hope that he will listen to this. So, unless we take a firm action, in the years to come, most of the houses and industrial buildings situated along the west coast will be washed away. So, in order to prevent that happening, we can use not only rocks but we can also encourage the usage of plants and one such variety we are using is *Kadolana*. But, it should be done on a large scale so that the west coast soil can be safeguarded.

The other thing is that His Excellency the President is interested in using compost as fertilizer. As you know, I represent the Puttalam District where we have 16,000 acres of agricultural land in Kalpitiya where the soil is sandy. People have been using other fertilizers and pesticides and because of that the soil has become infertile. So, according to an environmental report, probably in another 10-15 years' time, we will not have pure water in the whole of Kalpitiya. Therefore, I am also struggling to introduce compost as fertilizer to that area and with the help of His Excellency the President, if we can encourage the use of compost, I am sure that we will be able to do something early in order to protect that area.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Please, give me two more minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
No. I am sorry. Please, wind up now.

ගරු මොහොමඩ් නවවි මහතා
(මාණ්පුමිකු මුහමට් නවවි)
(The Hon. Mohamed Navavi)
Okay.

So, I think the ratification of the Paris Agreement is very important to save the country.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Thank you. The next speaker is the Hon. Ameer Ali Shihabdeen. You have five minutes.

[ප.ව. 3.42]

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අමීර් අලි සිහාප්දීන් - කිරාමිය පොරුළාතාර අළුවල්කළ් පිරති අමෛච්සර්)
(The Hon. Ameer Ali Shihabdeen - Deputy Minister of Rural Economic Affairs)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் Paris Agreement தொடர்பான விவாதத்திலே காலநிலை மாற்றம் மற்றும் சுற்றாடல் மாசடைவு சம்பந்தமாகப் பேசுவதற்குச் சந்தர்ப்பம் கொடுத்தமைக்காக நான் முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இலங்கையிலே எதிர்காலத்தில் எமது சந்ததியினரைப் பாதுகாத்துக் கொள்வதற்காக எடுக்கப்படுகின்ற இந்த முயற்சிகள் பலமாக இருக்கவேண்டுமென்பது எனது பிரார்த்தனையாகும்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ දිස්ත්‍රික්කයේ - මඩකලපුව දිස්ත්‍රික්කයේ- ලොකුම ප්‍රශ්නය තමයි, රුපියල් මිලියන 9,000ක ව්‍යාපෘතියක් නවත්වා තිබීම. මා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සම සභාපති හැටියට කටයුතු කරනවා. අපේ දිස්ත්‍රික් ලේකම්තුමිය පෙරේදා මට කථා කර කිව්වා, -මා දැනුවත් කළා-, "වැලි සහ gravel නැති නිසා රුපියල් මිලියන 9,000ක ව්‍යාපෘතියේ වැඩ සියල්ල වහාම නවත්වලායි තිබෙන්නේ." කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මගේ දිස්ත්‍රික්කයේ ඕනෑ තරම් gravel සහ වැලි තිබෙනවා. මම මේ සම්බන්ධව මා හිතවත් නියෝජ්‍ය ඇමතිතුමාත් කලින් දැනුවත් කළා. මා අතිගරු ජනාධිපතිතුමාටත් මේ සම්බන්ධව ලිඛිතව දන්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි සිටින සමහර නිලධාරීන් තමයි එතැන වෙළඳාමක් කරන්නේ. මොන පොලීසිය දැම්මත්, දේශපාලන බලවේග මඟින් නවත්වන්න හැදුවත්, GA හරහා දේශපාලනිකව මැදිහත් වුණත් එය නවත්වන්න බැහැ. මොකද, එතැන එක කල්ලියක් ඉන්නවා. ඒ අය පමණයි ඒ business එක කරන්නේ. ඒවා කියටද ගන්නේ, කොහොමද යන්නේ කියාවත් දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයේ ඉඳලා ඕනෑ තරම් gravel සහ වැලි පිටතට ගෙන යනවා. ඒත් මඩකලපුව දිස්ත්‍රික්කය සංවර්ධනයට බඩු නැති ලු. ඒ හින්දා ඒ ව්‍යාපෘති සම්පූර්ණයෙන් නවත්වා තිබෙනවා. ඒවා අඩ පණ වී තිබෙනවා. රුපියල් මිලියන 9,000ක් කියන්නේ මගේ දිස්ත්‍රික්කයට ලොකුම ගණනක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී වැසි කාලය පටන්ගන්නා විට අපට ඒ ව්‍යාපෘති කරගන්න බැරි වෙනවා. ඒ නිසා මහත් සිත් අමාරුවකින්, වේදනාවකින් තමයි මා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට මේ ගැන -ඒ නිලධාරීන් කරන වැඩ පිළිවෙළ ගැන- දැනුවත් කරන්නේ. මම භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ අදාළ නිලධාරීන්ටත්, සභාපතිතුමාටත් මේ සම්බන්ධව වරින් වර කියා තිබෙනවා. ඒ වුණාට ඒ ගොල්ලෝ එයට ඇහුම් කන් දුන්නේ නැහැ. එහි සිද්ධ වන්නේ මොකක්ද කියා සොයා බැලුවේ නැහැ. නිකම්ම කථා කරනවා මිසක් වෙනත් මොකවත් ඒ අය කළේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(මාණ්පුමිකු අමීර් අලි සිහාප්දීන්)
(The Hon. Ameer Ali Shihabdeen)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ මම අහනවා, 'එකම දිස්ත්‍රික්කයකවත් වැලි සහ gravel නැහැ කියා ලොකුම ව්‍යාපෘතියක් නවත්වන එක, අපේ දිස්ත්‍රික්කයේ තිබෙන වැලි සහ gravel පිට දිස්ත්‍රික්කවලට විකුණන්න යවන එක ලොකුම අපරාධයක් යැයි සිතුවේ නැද්ද?' කියා. ඒක ඒ ජනතාවට කරන මහා අපරාධයක්. මා නම් හිතන්නේ, ලබන මාසය වන විට -වැසි කාලය පටන් ගන්නා විට- ඒ ව්‍යාපෘති කටයුතු ආයෙත් පටන්ගන්න බැරිව යනවා කියායි. මා ඊයේත් මේ සම්බන්ධයෙන් අදාළ සභාපතිතුමා දැනුවත් කළා. අපි දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට අදාළ නිලධාරියා තුන් සැරයක් ගෙන්වා - දේශපාලනඥයෝ මැදිහත් වෙලා, පොලීසිය මැදිහත් වෙලා - කිව්වා, "මෙහේ තිබෙන සංවර්ධන වැඩ පිළිවෙළට ඉස්සර වෙලා මූලිකත්වය දෙන්න." කියා. එතුමා ඇවිල්ලා යනවා. නමුත්, එතුමා ගිහින් කරන්නේ වෙනත් වැඩක්. හිඟයක් තිබෙනවා කියලා, gravel සහ වැලි පිට දිස්ත්‍රික්කවලට දීලා, වෙළඳාමක් කරලා අප දිස්ත්‍රික්කයේ තිබෙන ලොකුම ව්‍යාපෘතිය නවත්වන එක දිස්ත්‍රික්කයේ පමණක් නොව, ඒ පළාතේ සිටින මුළු ජනයාටම කරන ලොකුම අපරාධයක් කියා මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ සිටිනවා. ඉතා උනන්දුවෙන් මේ කාරණයට මැදිහත් වන්න කියා මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම කළේ නැත්නම්, රුපියල් මිලියන 10,000ක් - මේ අවුරුද්දේ අපට වෙන් කරපු මුදල- ආයෙත් භාණ්ඩාගාරයට නිකම්ම දෙන්න අපට සිද්ධ වෙනවා. හේතුව මොකක්ද? Gravel සහ වැලි නැති හින්දායි ඒ මුදල ආපසු යවන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත් වැඩිපුරම gravel සහ වැලි ලංකාවට සපයන එකම දිස්ත්‍රික්කය හැටියට සැලකෙන්නේ මඩකලපුව දිස්ත්‍රික්කයයි. එහෙම වෙලා තිබියදීත් මේ වැඩ පිළිවෙළ නවත්වනවා නම්, එය ඒ දිස්ත්‍රික්කයේ ජනයාට

කරන ලොකු අපරාධයක්. ඉදිරියේදී අදාළ නිලධාරිනුත්, අදාළ නියෝජ්‍ය ඇමතිතුමාත් - එතුමාත් දැන් මේ ගරු සභාවට ඇවිත් ඉන්නවා.-, විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් මේකට මැදිහත් වේවි කියා මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. අපි එතුමාත් දැනුවත් කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා අදාළ ඇමතිවරයාව සිටින වෙලාවේදී, යහ පාලන ආණ්ඩුවෙන් එහෙම වෙනවා නම්, යහ පාලනය ගැන කථා කරන එකේ තේරුමක් නැති වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේ සඳහා ඔක්කෝම ඒකරාශී වෙන්න ඕනෑය; ඔක්කෝම මැදිහත් වෙන්න ඕනෑය කියා මම බලාපොරොත්තු වෙනවා. එහෙම නැත්නම් මෙම වැඩ පිළිවෙළ කරගෙන යන්න බැරි වෙනවා. යහ පාලනයේ නමින් ඔතැන ඉන්නා නිලධාරින් කප්පම් ඉල්ලනවා; යහ පාලනයේ නමින් ඒ සිටින නිලධාරින් වෙන වෙන වැඩ කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, please wind up.

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
Sir, please give me one more minute. එසේ සිදු කරන එක ගැන අදාළ නිලධාරින් බලා ගනියි. නමුත් ඒ පළාතේ ඉන්නා ජනයාගේ ව්‍යාපෘතිය, ඒ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතිය අඩපණ කරන්න එපාය කියා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අනුරාධ ජයරත්න නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 3.48]

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින බොහොම වැදගත්, කාලෝචිත මාතෘකාවක් විවාදයට ගෙන තිබෙන මේ අවස්ථාවේ ඊට අදාළව අවසන් කථාව හැටියට මට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. රටක් විධියට අපි අපේ අනුමැතිය එහෙම නැත්නම් එකඟතාව ලබා දුන් පැරිස් ගිවිසුම සම්බන්ධව අද දිනයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා බහුතරයක් බොහෝ කරුණු-කාරණා ඉදිරිපත් කළා. එසේ කරුණු-කාරණා ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමන්ලා බොහොමයක් මෙම ගිවිසුමේ තිබෙන වටිනාකම පිළිබඳව වාගේම මෙම ගිවිසුමට එසේ සහයෝගය ලබා දීමේ වැදගත්කම පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කළා. ඒ නිසා මම ප්‍රථමයෙන්ම ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා, මෙම ගිවිසුම හරහා රටේ ජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයෙන් කටයුතු කරන්න පුළුවන් වෙන විධියේ වඩාත් ප්‍රායෝගික වුණු, වඩාත් වැදගත් වුණු අදහස් ඉදිරිපත් කිරීම පිළිබඳව. විශේෂයෙන්ම මේ ගිවිසුමත් සමඟ ප්‍රධාන වශයෙන්ම අපට අරමුණු දෙකක් ඉටු කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. එයින් පළමුවැනි කාරණය බවට පත් වන්නේ, ගෝලීය උණුසුම සෙල්සියස් අංශක දෙකකට වඩා ඉහළ යාම වළක්වා ගැනීමයි. දෙවැනි අරමුණ බවට පත් වන්නේ, සෙල්සියස් අංශක 1.5කට අවමයෙන් ගෝලීය උණුසුම පවත්වා ගැනීමයි. මෙන්න මේ කාරණා දෙක ප්‍රධාන කාරණා දෙකක් බවට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේදී මෙම කාරණාව සම්බන්ධයෙන් කථා කළ බොහෝ මන්ත්‍රීවරුන්ගේ අදහස බවට පත් වුණේ, දියුණු වුණු රටවල් එහෙම නැත්නම් කාර්මීකරණය අතින් ඉහළටම ගිය රටවල් බොහෝ විට මේවාට හරියාකාරව සහයෝගය ලබා දෙන්නේ නැතුව අප වාගේ දියුණු වෙමින් පවතින රටවල් විතරක් මේවාට එකතු කර ගන්න උත්සාහ කරනවාය කියන එකයි. හැබැයි, අපි මෙතැනදී කල්පනා කළ යුතු ප්‍රධානම කාරණය තමයි අපි දියුණු වෙමින් පවතින රටක් වුණත්, සමස්ත මානව වර්ගයා වෙනුවෙන් හීන්දු-තීරණ ගත යුතු අවස්ථාවලදී අපි ඒවාට අවශ්‍ය හීන්දු-තීරණ අරගෙන කටයුතු කළ යුතුව තිබෙනවාය කියන එක. මුළු ලෝකයේ තිබෙන හරිත වායු විමෝචනයේ ප්‍රමාණයත් එක්ක සංසන්දනය කරනකොට, ලංකාවේ එම ප්‍රමාණය 0.1ක් වාගේ බොහොම කුඩා ප්‍රමාණයක් බවට පත් වෙන්න පුළුවන්. හැබැයි, අපේ රටේ හරිත වායු විමෝචනයේ ප්‍රමාණය එසේ කුඩා ප්‍රමාණයක් වුණත්, නිවැරදි අරමුණක් වෙනුවෙන් කටයුතු කරනවා නම් අපි ඒවාට අවශ්‍ය හීන්දු-තීරණ අරගෙන කටයුතු යුතුයි කියා අප විශ්වාස කරනවා. අපේ රට කුඩා වෙන්න පුළුවන්. නමුත් පසු ගිය කාලය පුරාවටම අපේ රාජ්‍ය නායකයන් විවිධ කරුණු-කාරණාවලදී ජාත්‍යන්තර වශයෙන් මැදිහත් වෙලා, මේ කියන මහා විශාල දැවැන්තයන් හැටියට හැසිරෙන රටවල අර්බුද පවා සමථයකට පත් කරන්න කටයුතු කළ අවස්ථා අපේ ඉතිහාසයේ ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා මේ කාරණයේදීත් අපි ඒ දියුණු වුණු රටවල් මෙයට සහයෝගය දෙන්නේ කොහොමද කියා බලා ඒ දෙන ආකාරය අනුව අපේ සහයෝගය දෙනවාය කියනවා වෙනුවට ඒ සියලු දෙනාම එකතු කරගෙන අපේ සහයෝගයත් ලබා දෙනවාය කියා සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැරිස් ගිවිසුම අපරානුමත කිරීම අනුමත කරන මේ අවස්ථාවේදී අපේ රටත් එහි පළමුවැනි කණ්ඩායමේ සාමාජිකයන් 55දෙනා අතරට එකතු වීම ඉතාම වැදගත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශගුණික වෙනස්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ වෙබ් අඩවියේ සඳහන් වෙන කරුණු අනුව මේ වෙනකොට පාර්ශ්වයන් 27ක් මෙම ගිවිසුමට අත්සන් තබා එය අපරානුමත -ratify- කර තිබෙනවා. ඒ වාගේම සමස්ත විමෝචන ප්‍රමාණය ප්‍රතිශතයක් හැටියට ගත්තාම, මේ මොහොත වෙනකොට එය සියයට 39.08ක් වෙනවා. මෙම සම්මුතියේ 21 වන වගන්තියේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා, සමස්ත හරිත වායු විමෝචන ප්‍රමාණයෙන් සියයට 55ක් පිරුණාම, පාර්ශ්වයන් 55ක් මෙයට අත්සන් තැබුවාම, දින 30කට පසුව මෙය බලාත්මක වෙනවාය කියන කාරණාව. එතකොට ඒ සාමාජික වුණු රටවලට පමණයි, තීන්දු-තීරණ ගැනීමේ අයිතිය තිබෙන්නේ. අනෙක් සියලු පාර්ශ්වයන් මෙහි නිරීක්ෂකයන් බවට පමණයි පත් වෙන්නේ. ඒ නිසා සාමාජික රටක් බවට පත් වෙලා, පැරිස් ගිවිසුම අත්සන් කරලා, එහි තීන්දු-තීරණ ගන්න, ඊට අවශ්‍ය දායකත්වය ලබා දෙන්න, අපේ අදහස්-උදහස් ඉදිරිපත් කරන රටක් බවට අපේ රට පත්වීමත් ඉතාම වැදගත් වෙනවා. මොකද, මේ 'පැරිස් ගිවිසුම' හරහා ගෝලීය ඉලක්කයකට යන්න අපට පුළුවන්කම ලැබෙන නිසා. ඒ ගෝලීය ඉලක්කය ළඟා කර ගැනීම සඳහා අපේ දායකත්වය ලබා දෙන්න පුළුවන්කම ලැබෙනවා විතරක් නොවෙයි, දේශීය වශයෙනුත් විශාල සංවර්ධනයකට අපට යන්න පුළුවන්කම තිබෙනවා. 'හරිත දේශගුණික අරමුදල' ඇමෙරිකන් ඩොලර් මිලියන 100කට එහා ගිය අරමුදලක් වශයෙන් පිහිටුවා තිබෙනවා.

[ගරු අනුරාධ ජයරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය දිනවල අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව, අපේ අනුගතවීමට අදාළව ව්‍යාපෘතියක් ඉදිරිපත් කරලා ඇමෙරිකන් ඩොලර් මිලියන 38.01ක ප්‍රදානයක් අපේ අමාත්‍යාංශයට ලබා ගන්න පුළුවන්කම ලැබුණා. මම ඒකත් බොහොම සතුටින් මේ අවස්ථාවේදී මතක් කරනවා. පසු ගිය කාලවල රටක් විධියට ලබා ගත්තු ණය ප්‍රමාණයන් පිළිබඳව අපි දන්නවා. ඒ ලබා ගත්තු ණය ප්‍රමාණවලට ගෙවන පොලී ප්‍රමාණය ගැන අපි දන්නවා. හැබැයි, අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීමත් එක්ක ප්‍රදානයක් හැටියට ඇමෙරිකන් ඩොලර් මිලියන 38.01ක් අපට ලබා ගන්නට පුළුවන්කම ලැබුණා. ඒක, එක්තරා විධියකට රටක් විධියට අපි සියලුදෙනා ලබා ගත්තු ජයග්‍රහණයක් හැටියටයි, අපි දකින්නේ.

අපි අද 'පැරිස් ගිවිසුම' ගැන කථා කරන වෙලාවේදී, ඒක අපරානුමත කිරීම සඳහා අපේ එකඟතාව පළ කරන අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු එක් කාරණාවක් තිබෙනවා. එනම් අප විසින් අපේ පාර්ලිමේන්තුව තුළ ඒ වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කරගත යුතු වීම.

මේ වාගේ කරුණු කාරණාවලදී, සමහර වෙලාවට නායකයන් වෙනස් වෙන කොට, සමහර වෙලාවට පක්ෂ පාට වෙනස් වෙන කොට රටේ සම්පූර්ණ තීන්දු තීරණ වෙනස් වෙන තත්ත්වයකට ගියොත් මම හිතන්නේ නැහැ, රටක් විධියට අපට ඉදිරියට යන්න පුළුවන්කම ලැබෙනවා කියලා. අද අපේ සහෝදර මන්ත්‍රීවරුන් සියලුදෙනා එකට එකතු වෙලා මේ රට පාලනය කරනවා. එක්සත් ජාතික පක්ෂය ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සියලුදෙනා එකට එකතු වෙලා මේ රට පාලනය කරන වෙලාවක අපට කළ හැකි විශිෂ්ටම දේ බවට පත් වෙන්නේ, අපි එක්තරා විධියක වූ ජාතික ප්‍රතිපත්තියක් මේ රට තුළ නිර්මාණය කිරීමයි. එහෙම අවුරුදු 20ක, 30ක ජාතික සැලැස්මක අපි කටයුතු කරනකොට ඒක පරිසර අංශය වේවා, එහෙමත් නැත්නම් විදේශීය ප්‍රතිපත්තීන් පිළිබඳව වේවා, එහෙමත් නැත්නම් රටේ සංවර්ධනය පිළිබඳව වේවා සියලුදෙනාටම නිවැරදි අවබෝධයකින් යුතුව කටයුතු කිරීමට හැකියාව ලැබෙනවා. ඒ නිසා, දේශීය ආයෝජකයන්ට වේවා, විදේශීය ආයෝජකයන්ට වේවා, ඒ සියලුදෙනාටම අරමුණක් ඇතුව තම ආයෝජනයන් කරන්න පුළුවන්කම ලැබෙනවා. පරිසර ක්ෂේත්‍රයට අදාළවත් අද ගෝලීය අරමුණක් වෙනුවෙන් අපි සියලුදෙනාම එකට එකතු වෙලා කටයුතු කරන අවස්ථාවක අපි විශ්වාස කරනවා, මේ ක්ෂේත්‍ර වෙනුවෙන් තවදුරටත් දීර්ඝව ක්‍රියාත්මක කරන්නා වූ වැඩ පිළිවෙළකට අප සියලුදෙනා ගමන් කළ යුතුව තිබෙනවා කියලා.

මම කලින් සඳහන් කළා වාගේ, මෙම ගිවිසුම අත්සන් කිරීමත් එක්ක, ගෝලීය උෂ්ණත්වය පාලනය කරන්න, ගෝලීය උෂ්ණත්වය යම් මට්ටමක රඳවා තබා ගන්න අපි සහයෝගය පළ කරනවා විතරක් නොවෙයි, දේශීය වශයෙන් විශාල සංවර්ධන වැඩ කොටසක් මේ හරහා කර ගන්නත් අපට පුළුවන්කම ලැබෙනවා. පොසිල ඉන්ධන මත පදනම් වුණු බලශක්ති ක්‍රමවේදයකුයි, අද අපේ රට තුළ තිබෙන්නේ. විශාල මුදල් ප්‍රමාණයක් පෙට්‍රල් ඇතුළු අනෙකුත් ඉන්ධන ලබා ගැනීම සඳහා අපට වෙනත් රටවලට ගෙවන්න සිදු වෙනවා. හැබැයි, මේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ට අපි මාරුවීම තුළ, රට තුළ අපේ මුදල් ඉතිරි කර ගැනීමට හැකි තත්ත්වයකුත් පැහැදිලිවම ඇති වෙනවා. මේ කොන්දේසිවලට, යම් යම් කරුණු කාරණාවලට අපි දායකත්වය දක්වන කොට ඒ සියලු දේවල් දේශීය මුදල් ආයෝජනය කරලා කරනවා කියන එකඟතාව අපි පළ කරලා නැහැ. ඒක බොහොම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ.

2030 වනකොට සමස්ත හරිත වායු විමෝචනයෙන් සියයට 20ක ප්‍රමාණයක් අවම කිරීමයි, අපේ බලාපොරොත්තු වෙන්නේ. එසේ සියයට 20ක ප්‍රමාණයක් අවම කරන කොට සියයට 4ක කොටසක් විතරයි දේශීය මුදල් දායක කරගෙන අපි අඩු කරන්නේ. ඉතුරු සියයට 16 අඩු කිරීම සඳහා ඒ අවශ්‍ය කරන මූල්‍යමය අනුග්‍රහය, දායකත්වය ඇතුළු සියලු දේවල විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක කරන්නයි අප බලාපොරොත්තු වෙන්නේ. විදේශීය රටවලින්, හරිත දේශගුණික අරමුදල වාගේ අරමුදල්වලින් වැඩි සහයෝගයක්, ශක්තියක් රටක් විධියට අපට අවශ්‍ය කරනවා.

මීට පෙර කියූ කාරණාව සම්බන්ධයෙන් යමක් කියන්න ඕනෑ. "මේ ගිවිසුම්වලට ඇතුළත්වීම තුළ අපට අහිතකර වුවත්, දියුණු රටවල් ගන්නා තීන්දු, තීරණවලට අපට එකඟ වන්න සිදු වෙනවා." කියලා සමහරු විශ්වාස කරනවා. හැබැයි එවැනි තත්ත්වයක් නැහැ.

2030 වනකොට හරිත වායු විමෝචනයෙන් සියයට 20ක් අඩු කරන කොට, සියයට 4ක ප්‍රමාණයක් දේශීය දායකත්වයෙන් අඩු කරනවා කියන එක තීරණය කරලා තිබෙන්නේ වෙනත් කවුරුවත් නොවෙයි; අපට කරපු බලපෑමක් මත නොවෙයි; අපෙන් කරපු ඉල්ලීමක් මත නොවෙයි. මේක, දේශීයව අප තීරණය කරපු සියයට 4ක්. ඒ නිසා අපේ ආර්ථිකයට, අපේ සංවර්ධනයට, මේ කිසිදු දෙයකට හානියක් නොවන ආකාරයෙන් අපට මේ වැඩ කොටස කිරීමේ හැකියාව බොහොම පැහැදිලිව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප මේ වැදගත් මාතෘකාව සාකච්ඡාවට ගන්නා අවස්ථාවේදී අප කල්පනා කර බැලිය යුතුව තිබෙනවා, රට විධියට අපි අද කොතැන ද ඉන්නේ කියන කාරණය පිළිබඳව. පරිසරය පිළිබඳව අපි බොහොම ඉහළින් කථා කරනවා. පරිසරය ආරක්ෂා කරන, පරිසරය රැක ගන්න කණ්ඩායමක් හැටියට, රටක් හැටියට අපි බොහොම හොඳින් පෙනී සිටිනවා. හැබැයි, මා එක උදාහරණයක් ඉදිරිපත් කරනවා. 1956 වන කොට මේ රටේ වන ඝනත්වය සියයට 63යි. හැබැයි, අද වන කොට එය සියයට 29 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, අවුරුදු 60ක් යන කොට දැන් තිබෙන ප්‍රමාණයට වඩා භාගයකටත් අඩු ප්‍රමාණයකට අපේ වන ඝනත්වය අඩු වෙනවා. එහෙම නම් තව අවුරුදු 50ක්, 60ක් යන කොට ලංකාව විධියට අපි කොතැනද ඉන්නේ? අද වන කොට වන ඝනත්වය පාකිස්තානයේ සියයට 2යි; ඉන්දියාවේ සියයට 23යි; බංග්ලාදේශයේ සියයට 11ක වාගේ ප්‍රමාණයක්. එහෙම නම් තවත් අවුරුදු 50ක් යන කොට අපි පාකිස්තානය වාගේ සියයට 2ක වන ඝනත්වයකට යනවාද, එහෙම නැත්නම් අපේ ප්‍රතිපත්තීන් වෙනස් කරගෙන නිවැරදි ගමනක යනවා ද කියන එක ගැන තීන්දු තීරණ අපට ගන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන් ජනාධිපතිවරයෙක් පරිසර අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශයකට නායකත්වය දෙන්නේ ඉතිහාසයේ පළමු වතාවටයි. ඒක එක්තරා විධියක සුවිශේෂී, වැදගත් අවස්ථාවක්. ඒ හරහා එතුමා ගත්ත තීන්දු තීරණ එක්ක හෙට දවසේ වඩා හොඳින් පරිසරය ආරක්ෂා කරන ක්‍රමවේදවලට ගිහිල්ලා පරිසර ආරක්ෂාකාරී කණ්ඩායමක් හැටියට එහෙම නැත්නම් රටක් විධියට ඉදිරියට යන්න අපට පුළුවන්කම ලැබෙනවා. අපේ බොහෝ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ ආකාරයට 'නීල හරිත යුගයක්', 'වන රෝපා' වැඩ සටහන ඇතුළු දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක වන විශාල වැඩ පිළිවෙළවල් රාශියක් අද පරිසර අමාත්‍යාංශයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව එක කාරණාවක් මතක් කරන්න කැමැතියි. අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මතක් කළා, පසු ගිය කාලයේ කොකා-කෝලා සමාගමේ යම් ක්‍රියාවක් හේතුවෙන් කැලණි ගඟේ ජලය අපවිත්‍ර වීම පිළිබඳව. "මේ වෙනුවෙන් කිසිදු මුදලක් පරිසර අමාත්‍යාංශය අය කරගෙන නැහැ. පරිසර අමාත්‍යාංශය මෙහෙම වැඩ කරන කොට පැරිස් ගිවිසුම පිළිබඳව ..." කියලා එතුමා සඳහන් කළා. හැබැයි, මම කැමැතියි, විනාඩියක කාලයක් අරගෙන එතුමාව නිවැරදි කරන්න. මොකද, ඒ ක්‍රියාව නිසා හානි වුණු පොම්පාගාරය හදන්න වැය වුණු සියලු මුදල් ප්‍රමාණය අපි කොකා-කෝලා සමාගම හරහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දීලා තිබෙනවා. ඒක රුපියල් මිලියන 132ක මුදලක්. ඒ වාගේම අපේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වියදම් කරපු රුපියල් මිලියන දෙකක මුදලත් සම්පූර්ණයෙන්ම කොකා-කෝලා සමාගමෙන් අය කර ගන්න අපි කටයුතු කළා. ඒ වාගේම පරිසර අධිකාරියට යම් යම් පරීක්ෂණ සඳහා වියදම් වුණු මුදල රුපියල් මිලියන 1.5යි. ඒ රුපියල් මිලියන 1.5ත් අපි කොකා-කෝලා සමාගමෙන් අය කර ගන්න කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. කැලණි ගඟේ ස්ථාන තුනක වතුර පරීක්ෂා කරන මධ්‍යස්ථාන තුනක් ඉදි කරන්න වැය වුණු සම්පූර්ණ මුදල රුපියල් මිලියන 150යි. එක පරීක්ෂණාගාරයක් ඉදි කරන්න වැය වුණු මුදල රුපියල් මිලියන 50යි. මේ පරීක්ෂණාගාර තුනම ඉදි කරන්නේ කොකා-කෝලා සමාගම විසින්, ඔවුන්ගේ මුදල් යොදා ගෙනයි. මේ කටයුතු අපි මේ ආකාරයට ක්‍රියාත්මක කර තිබෙනවායි කියන එක අපි ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට මතක් කරනවා, එතුමා කළ ප්‍රකාශය නිවැරදි කිරීම සඳහා. පනත අනුව කටයුතු කළා නම් අපට අය කර ගන්න පුළුවන් වෙන්නේ රුපියල් ලක්ෂයක මුදලක් පමණයි. හැබැයි, රුපියල් මිලියන 200කටත් එහා ගිය මුදලක් අපි මේ වන කොට අය කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන් මෙම වැදගත් අවස්ථාවේදී රටක් විධියට ඉදිරියට යන ආකාරය පිළිබඳව ඒ අදහස් ඉදිරිපත් කරපු අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාටම අපි ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් දේශීය දායකත්වය ලබා දීම සඳහා අවශ්‍ය කරුණු කාරණා ක්‍රියාත්මක කිරීම සඳහා, අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සඳහා අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරලා තිබුණා. ඒ කමිටුවේ සියලු දෙනාටත්, ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ අංශයේ අධ්‍යක්ෂ ආචාර්ය සුනිමල් ජයතුංග මැතිතුමන් ඇතුළු සියලු දෙනාටමත්, මෙම කාරණය සාර්ථක කර ගන්න සහයෝගය ලබා දුන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන ඒ නිලධාරීන් සියලු දෙනාටත් අපේ ස්තුතිය පිරිනමමින්, මෙම ගිවිසුම අපරානුමත කිරීම අප අනුමත කරනවා පමණක් නොවෙයි, එය ප්‍රායෝගිකව, හරියාකාරව රට තුළ ක්‍රියාත්මක කරන්න සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන්නයි කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒ බව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 4.00 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 4.04ට 2016 සැප්තැම්බර් 20 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 4.00 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி, பி.ப. 4.04 க்கு பாராளுமன்றம், 2016 செப்ரெம்பர் 20, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 4.00 p.m., THE HON. DEPUTY SPEAKER *adjourned Parliament without Question put.*

Parliament adjourned accordingly at 4.04 p.m. until 1.00 p.m. on Tuesday, 20th September, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

246 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 246 - இல. 5
Volume 246 - No. 5

2016 සැප්තැම්බර් 20 වන අඟහරුවාදා
2016 செப்ரெம்பர் 20, செவ்வாய்க்கிழமை
Tuesday, 20th September, 2016



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත:
ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
පොලිස් අත්අඩංගුවේ සිටි පුද්ගලයකු මිය යෑම
ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

මහජන බැංකුවෙහි ඩිජිටල්කරණයට අදාළ දෘඩකාංග මිලදී ගැනීම:
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

උතුරු සහ නැඟෙනහිර පළාත්වල ආබාධිතවූවන් මුහුණ දෙන ගැටලු:
සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයන් පිරිසකගේ ක්‍රියාකලාපය:
අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී

පරිපූරක මුදල්:
මෙහෙයුම් වියදම්

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත:
නියමය

කල් තැබීමේ යෝජනාව:
කම්කරු නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා පිළිබඳ ගැටලු

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம் :
உயர் நீதிமன்றுக்கு மனு

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
பொலில் காவலிலிருந்த நபரொருவரின் இறப்பு
சர்வதேச உடன்படிக்கைகள் பற்றி மக்களுக்கு அறிவூட்டல்

மக்கள் வங்கியின் டிஜிடல் திட்டத்துக்கான வன்பொருள் கொள்வனவு :
அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சரின் கூற்று

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் மாற்றுவலுவுள்ளோர் முகங்கொடுக்கும் பிரச்சினைகள் :
சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சரினது கூற்று

அரசாங்க வைத்திய அதிகாரிகள் சங்க உறுப்பினர்கள் சிலரது நடவடிக்கை :
கல்வி அமைச்சரினது கூற்று

இலங்கைப் பொறியியற் பேரவைச் சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

குறைநிரப்புத் தொகை :
தொழிற்பாட்டுச் செலவினம்

உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம் :
கட்டளை

ஒத்திவைப்புப் பிரேரணை:
தொழில் அலுவலர்களின் சேவைக் குறிப்பு தொடர்பான பிரச்சினை

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Nation Building Tax (Amendment) Bill: Petition to the Supreme Court

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Death of a Person in Police Custody
Public Awareness on International Agreements

PURCHASE OF HARDWARE FOR DIGITALIZATION OF PEOPLE'S BANK:
Statement by Minister of Public Enterprise Development

PROBLEMS FACED BY THE DISABLED IN NORTHERN AND EASTERN PROVINCES:
Statement by Minister of Social Empowerment and Welfare

CONDUCT OF SOME MEMBERS OF GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION:
Statement by Minister of Education

ENGINEERING COUNCIL, SRI LANKA BILL:
Read the First Time

SUPPLEMENTARY SUM:
Operational Expenditure

EXCISE (SPECIAL PROVISIONS) ACT:
Order

ADJOURNMENT MOTION:
Issues Related to Service Minute of Labour Officers

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 සැප්තැම්බර් 20 වන අඟහරුවාදා
2016 செப்ரெம்பர் 20, செவ்வாய்க்கிழமை
Tuesday, 20th September, 2016

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம் : உயர்நீதிமன்றுக்கு மனு
NATION BUILDING TAX (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ I වැනි කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2014 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තා.

එම වාර්තා තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වගන්තියේ (2) උප වගන්තියේ (ඈ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි මස 15 දිනැති අංක 1971/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழுக்களின் அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "ඉඩම් අත්කරගැනීමේ පනත (460 වන අධිකාරිය) යටතේ නියෝග", "2014 මුදල් වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජෙනරාල්ගේ කාර්ය සාධන වාර්තාව" සහ "2015 මුදල් වර්ෂය සඳහා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව" යන කරුණු සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා වෙනුවෙන් මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද "විසර්ජන (සංශෝධන)" සහ "වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත්, "1978 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14වැනි වගන්තිය යටතේ නියෝග (2016.06.13 දිනැති අංක 1971/5, 2016.06.13 දිනැති අංක 1971/6, 2016.06.28 දිනැති අංක 1973/21 සහ 2016.07.12 දිනැති අංක 1975/40 දරන අති විශේෂ ගැසට් පත්‍රවල පළ කරන ලද)", "1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3වැනි වගන්තිය යටතේ නියමය (2016.05.26 දිනැති අංක 1968/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද)" සහ "ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ 2016 වර්ෂය සඳහා වූ පරිපූරක ඇස්තමේන්තු පිළිබඳ යෝජනාව" යන කාරණා සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)

ගරු කථානායකතුමනි, මම වාරියපොල, සියඹලාකැලේ යන ලිපිනයෙහි පදිංචි ආර්. එම්. පොඩි බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු ටී. බී. ඒකනායක මහතා (ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - காணி இராஜாங்க அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - State Minister of Lands)

ගරු කථානායකතුමනි, මම නෙළුම්දෙණිය, කොණ්ඩගල, සෙන්ට්‍රල් සප්ලයිස් යන ලිපිනයෙහි පදිංචි ජේ.එම්. සුමනාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

ගරු කථානායකතුමනි, මම දොම්පේ, වේල්ගම යන ලිපිනයෙහි පදිංචි පී.එම්. පොඩි අප්පුහාමි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බත්තරමුල්ල, නාගාමුල්ල පාර, අංක 1013 ඊ/1 දරන ස්ථානයෙහි පදිංචි කේ.යූ.ආර්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොළඹ 07, මරීනා ඇවනියු, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි වෛද්‍ය එස්.එච්.කේ. සමරවීර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) සේරුනුවර, ආර්.බී. 02, අංක 158/1 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඩී. ශ්‍රියානි චන්ද්‍රකාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන කේ.ජී. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බලංගොඩ, වැලිගෙපොල, හපුගස්තැන්න යන ලිපිනයෙහි පදිංචි යූ.එම්.යූ.ජී. හසිතා උඩුගම මෙනවියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මහුලාගම, කැකුණගොල්ල යන ලිපිනයෙහි පදිංචි එච්.එම්. උපාලි සමරවීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුරුණෑගල, ජයන්තිපුර, අංක 107/15 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම මොරටුව, වොට්සන් පීරිස් මාවත, අංක 7/2 දරන ස්ථානයෙහි පදිංචි ජේ.පී. සරත් චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, මම කොළඹ - 04, දුම්රියපල පාර, ඕෂන් වීව් ටවර්, අංක 13 ඒ දරන ස්ථානයෙහි පදිංචි නිල්මිණි දුෂාන්ති ෆින්ටෝ (එෆ්. නාඩියා) මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා - පැමිණ නැත.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

Hon. Speaker, I present a petition received from Mrs. Manoharan Santhanayaki of Mamulai, Mulliyawalai, Mullaitivu.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 375/'15 - (4), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Foreign Affairs, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මකු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ශ්‍රී ලංකාවේ කිරි ගව පාලනය: විස්තර
இலங்கையில் கறவைப் பசு வளர்ப்பு: விபரம்
DIARY HUSBANDRY IN SRI LANKA: DETAILS

530/'16

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු බුද්ධික පතිරණ මහතා]

(අ) (i) 2015 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකාව තුළ එළ කිරි නිෂ්පාදනය තම ජීවිකාව කරගත් පිරිස කොපමණද;

(ii) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ එළ කිරි නිෂ්පාදනය ලීටර් කොපමණද;

(iii) 2015 වසර අවසානයේදී ශ්‍රී ලංකාව තුළ සිටි එළ දෙනුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එළ කිරි කර්මාන්තයේ නිරතවන්නන්ට එම කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එළ දෙනුන්ගේ ගහනය වැඩි කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

කිරාමියප් පොරුළාදාර විවකාරඞ්කළ් පට්රිය අමైච් සරైක් කේට්ට විනා:

(அ) (i) 2015ஆம் ஆண்டு முடிவடையும்போது இலங்கையில் பசுப்பால் உற்பத்தியை தமது வாழ்வாதாரமாகக் கொண்டிருந்தவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) 2015ஆம் ஆண்டில் இலங்கையில் பசுப்பால் உற்பத்தி எத்தனை லீற்றர்கள் என்பதையும்;

(iii) 2015ஆம் ஆண்டு இறுதியில் இலங்கையில் இருந்த பசுக்களின் எண்ணிக்கை யாதென் பதையும்; அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பசுப்பால் கைத்தொழிலில் ஈடுபடுபவர்களுக்கு அக்கைத்தொழிலை முன்னேற்றுவதற்குத் தேவையான வசதிகளை அரசாங்கம் பெற்றுக் கொடுத்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வசதிகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) பசு மாடுகளின் தொகையை அதிகரிக்கச் செய்வதற்கு அரசாங்கம் நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Economic Affairs:

(a) Will he state-

(i) the number of persons in Sri Lanka by the end of the year 2015 whose livelihood was dairy farming;

(ii) the milk production of Sri Lanka in litres during the year 2015; and

(iii) the number of milch cows in Sri Lanka at the end of the year 2015?

(b) Will he inform this House-

(i) whether the Government has provided necessary facilities to those engaged in the dairy industry in order to develop that industry; and

(ii) if so, the facilities thus provided?

(c) Will he also inform this House-

(i) whether the Government has taken measures to increase the milch cow population; and

(ii) if so, the measures thus taken?

(d) If not, why?

ගරු පී. හැරිසන් මහතා (ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) කිරි ගොවි පවුල් සංඛ්‍යාව - 2,95,484යි. (දෙලක්ෂ අනූපන්දහස් හාරසිය අසූහතරයි.)

(ii) එළකිරි ලීටර් ප්‍රමාණය - 374,443,200යි. (තුන්සියහැත්තෑහතර මිලියන හාරලක්ෂ හතලිස්තුන්දහස් දෙසීයයි.)

(iii) එළගව දෙනුන් සංඛ්‍යාව - 602,273යි. (හයලක්ෂ දෙදහස්දෙසීය හැත්තෑතුනයි.)

(ආ) (i) ඔව්.

(ii)
- උසස් ආරයේ සතුන් ලබාදීම හෝ ගවගාල් තැනීම හෝ අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා සියයට 50ක සහනාධාර යටතේ මූල්‍යාධාර සැපයීම.
- කිරි ගව පාලනයෙහි නියුතු ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සම්ප්‍රේෂණය කිරීම.
  - නොමිලයේ ව්‍යාප්ති සේවා සහ පුහුණුවීම් ගොවීන් වෙත ලබාදීම.
- වසංගත රෝග මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
  - වාර්ෂිකව නොමිලයේ එන්නත් කටයුතු සිදු කිරීම.
  - කාලීන රෝග විමර්ශන හා සමීක්ෂණ කටයුතු සිදු කිරීම.
- සතුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.

- ගුණාත්මක භාවයෙන් යුතු තෘණ දඬු ලබාදීම සහ දියුණු කරන ලද අනෙකුත් පෝෂ්‍ය තෘණ හඳුන්වාදීම.

- ග්‍රාමීය ප්‍රදේශවල කිරි එකතු කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම.

(ඇ) (i) ඔව්.

(ii) • උසස් ආරයේ සතුන් ලබාදීම සඳහා අභිජනන ගොවිපළ පිහිටුවීම

- ඉහළ කිරි නිෂ්පාදනයක් සහිත කිරි දෙනුන් ආනයනය කිරීම සහ පළමු ප්‍රජනිතය සඳහා ගොවීන්ට ලබාදීම

- කෘත්‍රිම සිංචන කටයුතු ප්‍රචලිත කිරීම මඟින් උසස් ආරයේ සතුන් සංඛ්‍යාව වැඩි කිරීම

- උසස් ආරයේ පුං ගවයින් ගොවීන් වෙත ලබාදීම

(ඈ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංකාවේ එක වකවානුවක් තිබුණා, වතුර බෝතලයට වඩා කිරි ලීටරය මිලෙන් අඩු. ඒ තත්ත්වයේ වෙනසක් කරන්න යනවා නම්, ශ්‍රී ලංකාව දියර කිරිවලින් ස්වයංපෝෂිත කරන්න යනවා නම්, එක පැත්තකින් උසස් කිරි ගවයන් ලබා ගැනීම වාගේම දියුණු තාක්ෂණයත් ලබා ගන්න ඕනෑ. ඒ සඳහා රාජ්‍ය සහ පෞද්ගලික මැදිහත්වීම් අවශ්‍යයි. ඒ වාගේම, විදෙස් ආයෝජකයන් පැමිණෙන්නටත් ඕනෑ. ලංකාවට එහෙම දැක්මක් තිබෙනවාද ගරු ඇමතිතුමා? දියුණු තාක්ෂණය භාවිත කරලා කඩිනමින් කිරි එකතු කර ගන්නත්, ඒවා පාරිභෝගිකයන් වෙත ගෙන යන්නත්, කල්තබා ගන්නත් ක්‍රමවේදයක් හැදීමේ වැදගත්කම හඳුනා ගෙන, ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, දැනටමත් ඕස්ට්‍රේලියානු රජය මඟින් මේ සඳහා අවශ්‍ය සහනදායී වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, ගරු අග්‍රාමාත්‍යතුමා තව දින කිහිපයකින් නවසීලන්තයේ සංචාරය කිරීමට නියමිතයි. මේ තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා අපට අවශ්‍ය වැඩසටහන් ගණනාවක් ඒ රජය මඟින් දැනටමත් යෝජනා කරලා තිබෙනවා. ඒ අනුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය එක්ක සාකච්ඡා කරලා, ඒ අයට අවශ්‍ය පුහුණුව ලබා දෙන්නත්, ඒ වාගේම අපේ ගොවි පවුල්වල දරුවන් පුහුණු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය training centres දෙකක් අපට ලබා දෙන්නත් දැනටම එකඟ වෙලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය වකවානුවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා කිරි දෙනුන් 20,000ක් ගෙන් වීම ගැන කථා කළා. එහිදී දේශපාලනඥයන් විතරක් නොවෙයි සමහර නිලධාරිනුත් අත්තනෝමතික ආකාරයට ක්‍රියා කර තිබුණා. ගරු කථානායකතුමනි, ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම පිළිබඳව ඔබතුමා, අපි කවුරුත් මේ සභාවේදී හරි උනන්දුවකින් කටයුතු කළා. අපි ඒ ගැන තවමත් ඉන්නේ සාධනීය තත්ත්වයක. නමුත් නිලධාරීන් සීමිත ගණනක් දේශපාලනඥයන් පිරිසක් සමඟ එකතු වෙලා ස්වාධීන කොමිෂන් සභා ගිලටීනයට හිර කරගෙන තිබෙනවා. එහෙම නැත්නම් ඒවා උගසට තියලා ඉහළ සිට පහළ දක්වා නිලධාරිවාදයක්, -ග්‍රාම නිලධාරි වසම දක්වා- පැතිරවීමේ කුමන්ත්‍රණයක් දියත් කරලා තිබෙනවා. එහි එක් පියවරක් තමයි, පසු ගිය කාලයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පවතින විට නිලධාරීන් කිහිප දෙනෙකු දේශපාලනඥයන් සමඟ එකතු වෙලා කිරි ගවයන් 20,000ක් ගෙන්වීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම. කිරි ගවයන් 20,000ක් ගෙන්වීමේ එම වැඩ පිළිවෙළ තුළ ඔය එකතු වෙලා ගහපු සූදුවෙන් කකුල් හතරේ කිරි ගවයින් කීදෙනෙක් ගෙන්වුවාද කියලා මම අහන්න කැමැතියි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, පසු ගිය ආණ්ඩුව කාලයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් කිරි ගවයන් 20,000ක් ආනයනය කිරීම සඳහා ඕස්ට්‍රේලියානු රජය සමඟ ගිවිසුමක් ඇති කර ගෙන තිබුණා. නමුත් ඒ අවස්ථාවේදී ගවයින් 20,000ම ගෙන්වූවේ නැහැ. එයින් ගවයින් 6,000කට ආසන්න ප්‍රමාණයක් තමයි දැනට ගෙන්වලා තිබෙන්නේ. ඒ ගෙනාපු ගවයින් දැනට NLDB ගොවිපොළවල ඇති කරනවා. මම හිතන විධියට එසේ කිරි ගවයින් ආනයනය කිරීම ගැන ප්‍රශ්නයක් තිබුණා. ඒ ගවයින් ආනයනය කිරීමේදී කිසිම ටෙන්ඩර් පරිපාටියකින් තොරව තමයි ඒ කටයුත්ත සිදු වෙලා තිබෙන්නේ. ඒ කටයුත්තේදී අක්‍රමිකතා රාශියක් සිදු වෙලා තිබෙනවා කියන කාරණයත් මම තමුන්නාන්සේට කියන්නට කැමැතියි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඒ සිදු වුණු අක්‍රමිකතා සම්බන්ධයෙන් අමාත්‍යාංශය ක්‍රියා මාර්ගයක් ගත්තාද කියලා මා දැනගන්න කැමැතියි. ඒ අතරම, ඔබතුමාගේ අවධානය යොමු විය යුතු තවත් කාරණයක් ගැන මා සඳහන් කරන්න ඕනෑ. දක්ෂිණ සංවර්ධන අධිකාරිය තිබෙන කාලයේ කිරි ගවයන් විධියට -විශේෂයෙන්ම මී කිරි නිෂ්පාදනය සඳහා- මාතර ප්‍රදේශයේ මී හරකුන් බෙදා දුන්නා. මී හරකුන් කියලා යාල කැලයෙන් කුළු හරකුන් අල්ලාගෙන ඇවිත් බෙදලා දෙන්න ගිහින්, ඒ සතුන් ලොරියෙන් එළියට පැනලා හිටපු මහ ඇමති එච්.ජී. සිරිසේන මහත්මයාටත් අනින්න ගිහින් විශාල විජ්ජුම්බරයක් වෙලා තමයි ඒ කටයුත්ත නැවතුණේ. පිට රටින් ගෙන්වනවා වාගේම, ලංකාවේ කුළු හරකුන් අල්ලලා මී හරකුන් කියා බෙදා දුන් යුගයකුත් තිබුණා. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය යම් පරීක්ෂණ ක්‍රියාවලියක නිරත වෙලා ඉන්නවාද, ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, ඒ කාලයේ ආණ්ඩුව මී හරක් වැඩ කෙරුවාට මේ ආණ්ඩුව මී හරක් වැඩ කරන්න යන්නෙත් නැහැ, කුළු හරකුන් ගෙනැත් හොඳ හරක් විධියට දෙන්න අපට වුවමනාවකුත් නැහැ කියන කාරණය මම ඔබතුමාට කියන්න කැමැතියි.

හමුදා සාමාජිකයන්ගේ දරුවන් සඳහා වූ පාසල් : ඇතුළත් කර ගැනීමේ ප්‍රතිපත්තිය

படையினரின் பிள்ளைகளுக்கான பாடசாலைகள்: அனுமதிக் கொள்கை

SCHOOLS FOR CHILDREN OF MEMBERS OF ARMED FORCES: ADMISSION POLICY

608/'16

3. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) හමුදා සාමාජිකයන්ගේ දරුවන් සඳහා වූ පාසල්වලට, නිලධාරීන් නොවන යුද හමුදා සාමාජිකයන්ගේ දරුවන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් පසු ගිය රජය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) இராணுவ அங்கத்தவர்களின் பிள்ளைகளுக்கான பாடசாலைகளுக்கு உத்தியோகத்தர்கள் தரத்தில் அல்லாத இராணுவ அங்கத்தவர்களின் பிள்ளைகளை அனுமதிப் பது தொடர்பாக கடந்த அரசாங்கத்தினால் தயாரிக்கப் பட்ட கொள்கைகள் யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of the policies made by the previous government in regard to admitting the children of Army personnel who are not in officer grades to the schools for the children of members of Armed Forces?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඇති කරගත් එකඟතාවට අනුව ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයන්ගේ දරුවන් පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමේදී ලබා දෙනු ලබන අනුග්‍රහය ප්‍රමාණවත් නොවීම මත එම සාමාජිකයන් මුහුණ දෙන දුෂ්කරතාවන් අවම කරනු වස් ආරක්ෂක සේවා විද්‍යාලය නමින් විද්‍යාලයක් සන්නද්ධ හමුදා සාමාජිකයන්ගේ දරුවන් ඇතුළත් කිරීම සඳහා ආරම්භ කර ඇත. ඇමුණුම 01 බලන්න.

ඒ අනුව පිහිටුවන ලද ආරක්ෂක සේවා විද්‍යාලයට සිසුන් ඇතුළත් කිරීම යුද/නාවික/ගුවන් හමුදා යන ත්‍රිවිධ හමුදාවන්හි සුබසාධන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හා පොලිස් දෙපාර්තමේන්තු සුබසාධන අංශයන් විසින්ද ඉටු කරනු ලැබේ. මේ සඳහා වන නිර්ණායකයන් අදාළ පාර්ශ්වයන් විසින් සකස් කරනු ලැබේ. ඇමුණුම 02 මඟින් අදාළ නිර්ණායක දක්වා ඇත. එසේ සකස් කරනු ලබන නිර්ණායක මත ආරක්ෂක සේවා විද්‍යාලයේ පන්ති සඳහා සිසුන් තෝරා ගැනීම අදාළ සුබ සාධක අංශ විසින් සිදු කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන ළමයින්ගේ නාම ලේඛන ඇතුළත් කිරීම් සඳහා විදුහල්වලට යොමු කිරීමෙන් අනතුරුව ඇතුළත් කර ගැනීම සිදු කරයි. දැනට පවතින ක්‍රමවේදය එයයි.

එසේ ඇතුළත් කිරීමේ දී යුද හමුදා මාණ්ඩලික නිලධාරීන් හා සෙසු නිලධාරීන්ගේ දරුවන් වශයෙන් විශේෂකොට සැලකීමක් සිදු කරනු නොලැබේ. ඒ අනුව ආරක්ෂක සේවා විද්‍යාලය ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා වෙනසක්ව නොමැති බව දන්වමි. මීට අදාළව ආරක්ෂක සේවා විද්‍යාලයේ විදුහල්පති හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් ඉදිරිපත් කර ඇති ලිපිවල පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ විද්‍යාලය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පැවතෙන විද්‍යාලයක් හැටියට ඔබතුමා ඒ පිළිබඳ දරන වගකීමක් තිබේද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් පාසල් වාගේම තමයි මේ පාසලත් ක්‍රියාත්මක වෙන්නේ. මේ පාසලේ විදුහල්පතිවරයා පත් කරන්නේත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින්. නමුත්, ආරක්ෂක අමාත්‍යාංශයත් සම්බන්ධ වුණු මණ්ඩලයක් මඟින් තමයි මෙම පාසල ක්‍රියාත්මක වන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අමාත්‍යතුමනි, මෙම පාසල "ක්‍රියාත්මක වන්නේ" කියන එකෙන් අදහස් වන්නේ පාසල පරිපාලනය වෙන්නේ මණ්ඩලයක් මඟින් කියන එකද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔව්, පරිපාලනය.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම පාසලට ඉල්ලුම්පත් ලැබෙන්නේ මුළු ලංකාවෙන්ම ද? එහෙම නැත්නම් මේ පාසලට ඉල්ලුම්පත් ලැබෙන්නේ එක්තරා භූමි ප්‍රදේශයක් තුළින් පමණක් ද? එම කාරණා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ඇමුණුම්වල ඇති. නමුත්, මම ඒවා දකින්නේ නැතුවයි මේ අහන්නේ. ඒ වාගේම මේ පාසලට ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ සුදුසුකම ලැබෙන්නේ කොහොමද? ත්‍රිවිධ හමුදා සාමාජිකයන් ලක්ෂයක් පමණ සිටිනවා. ලංකාව පුරා ඔවුන් සේවය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කරනවා. ඒ අනුව, කොයි පදනම්ද මේ පාසලට ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම ලැබෙන්නේ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ කාලයේ ක්‍රියාත්මක කළ ඒ පදනම මතම තමයි ළමයින් ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලබන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මීට කලින් ඔබතුමා කිව්වෙත් මේකම තමයි. ඒක මම පිළිගන්නවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. මම උත්තරය දෙන්නම්.

ගරු කථානායකතුමනි, ගුවන්, යුද, නාවික සහ පොලිස් ක්ෂේත්‍රයේ ඉන්න ඕනෑම දෙමව්පියෙකුගේ දරුවෙක් ඇතුළත් කර ගැනීමට ඉල්ලන්න පුළුවන්. මේ වාගේ ආරක්ෂක විද්‍යාලයක් කුරුණෑගලත් තිබෙනවා. මේ සේවාවල ඉන්න ඕනෑම කෙනෙකුට ඉල්ලන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා හදපු ඒ ක්‍රමයම තමයි තවම ක්‍රියාත්මක වෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා අහනවා.

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයෙන් අහපු පරිදි එම පාසල් සඳහා ඉල්ලීම් කරන්න පුළුවන් ආකාරය පිළිබඳ විස්තර ඔබතුමාගේ ඇමුණුමේ තිබෙනවාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඇමුණුමේ තවදුරටත් විස්තර තිබෙනවා. ඒ සේවාවල ඉන්නවා නම් ඕනෑම කෙනෙකුට ඉල්ලන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ ආරක්ෂක සේවා විද්‍යාලයේ නම වෙනස් කිරීමට හා ආරක්ෂක අංශ සාමාජිකයන් නොවන පිරිස්වල දරුවන්ට මේ පාසල විවෘත කරන්න සූදානමක් හෝ සාකච්ඡාවක් දැනට තිබෙනවාද කියා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, "නම් ප්‍රශ්නය" අපේ ආණ්ඩුවට නැහැ. කිසිම නමක් වෙනස් කරන්න අපේ කිසිම සූදානමක් නැහැ. "මහින්දෝදය විද්‍යාගාර" වැනි නම් දාන්න ඕනෑ කියන සංකල්පය තිබුණේ පසු ගිය ආණ්ඩුවේ. අපි, නම් වෙනස් කරන්නෙත් නැහැ; එහෙම කිසිම සූදානමකුත් නැහැ. අපි දැන් නම් දාන්නෙත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 736/'16 - (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මරදගහමුල සහල් ගබඩා සංකීර්ණය : තොග ප්‍රමාණය
மரந்தகஹமுல நெற்களஞ்சியத் தொகுதி : இருப்புத் தொகை
RICE STORAGE COMPLEX AT MARANDAGAHAMULA: AMOUNT OF STOCKS

787/'16

5. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) පසු ගිය රජයේ දිවි නැගුම ව්‍යාපෘතිය මඟින් රුපියල් මිලියන 100ක වියදමින් මරදගහමුල අක්කර 5ක භූමියක රුපියල් කෝටි 100ක පමණ වටිනා වී තොග ගබඩා කළ හැකි සහල් ගබඩා සංකීර්ණයක් ඉදිකළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට එහි ගබඩා කර ඇති වී තොග ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ගබඩාවට සම්බන්ධවී කටයුතු කරන ව්‍යාපාරිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගබඩාවේ සහල් අළෙවි කිරීමේ කටයුතු පිළිබඳව වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කර තිබේද;

(iv) මෙහි අවසන් වරට ගබඩා කර තිබූ වී තොග ප්‍රමාණය කොපමණද;

(v) එම වී තොග අළෙවි කරන ලද්දේ කවුරුන් හට කුමන වකවානුවේද;

(vi) මෙම ගබඩාවෙන් පූර්ණ උපයෝජනයක් ලබා ගැනීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

කිරාමියප් පොරුළාතාර විවකාරණ්කළ් පට්රිය අමෙච් සරෙක් කේට්ට විනා:

(අ) කටන්ත අරසාණ්කත්තින් වාළ්වින් එළුච්චි කරුත් තිට්ටත්තින්මූලම් රූපා 100 මිල්ලියන් සෙලවිල් මරන්තකහමුලවිල් 5 ඒක්කර් කාණියිල් සුමාර් රූපා 100 කෝටි පෙරුමතියාන නෙල්ලෙක් කළඤ්චියප්පටුත්තක් කූටිය නෙට්කළඤ්චියත් තොකුතියොන්රු අමෙක්කප් පට්ටතෙන්පතෙ අවර් අරිවාරා;

(ආ) (i) තට්පෝතු ඉංකු කළඤ්චියප්පටුත්තප්පට්ටුළ්ළ නෙල්ලින් අළවු එව්වළවු;

(ii) ඉක්කළඤ්චියත්තුටන් ඉණෙන්තු සෙයලාට්රු කින්ර වර්ත්තකර්කළින් එණ්ණික්කෙ යාතු;

(iii) කළඤ්චියත්තිල් අරිසි විට්පනෙ නටවටික්කෙකළ් තොටර්පාක වර්ත්තක සංකත්තුටන් කලන් තුරෙයාටප්පට්ටුළ්ළතා;

(iv) ඉංකු ඉරුතියාක කළඤ්චියප්පටුත්තප්පට්ටිරුන්ත නෙල්ලින් අළවු එව්වළවු;

(v) ඉව්වළවු තොකෙයාන නෙල්, යාරුක්කු එන්තක් කාලකට්ටත්තිල් විට්පනෙ සෙය්යප්පට්ටතු;

(vi) ඉක්කළඤ්චියත්තිලිරුන්තු මුළුප් පයනෙප් පෙට්රුක්කොළ්වතට්කාන ඔරු වේලෛත්තිට්ටම් උළ්ළතා

එන්පතෙ අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Rural Economic Affairs:

(a) Is he aware that a rice storing warehouse complex in which stocks of paddy worth 100 crore rupees could be stored was constructed in a five acre plot of land at Marandagahamula at a cost of 100 million rupees by the Divineguma project of the previous government;

(b) Will he inform this House -

(i) the amount of paddy stored in that warehouse at present ;

(ii) the number of businessmen who deal with this warehouse;

(iii) whether discussions have been conducted with the Trade Association in regard to the sale of rice by this warehouse;

(iv) the amount of paddy that had been stored in this warehouse for the last time;

(v) the name of the person to whom the aforesaid amount of paddy was sold along with the day on which it was sold; and

(vi) whether there is a programme to make the fullest utilization of this warehouse ?

(c) If not , why ?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

රුපියල් මිලියන 372.18ක් (තුන්සිය හැත්තෑදෙකයි දශම එකයි අටක්) වැය කොට මෙම ගබඩා සංකීර්ණය ඉදි කර ඇත. මරඳගහමුල ගබඩා සංකීර්ණය දිවි නැහුම වැඩසටහන යටතේ ඉදි කරන ලද අතර, මෙට්‍රික් ටොන් 10,000ක් (දස දහසක්) හා මෙට්‍රික් ටොන් 2,000ක් (දෙදහසක්) ගබඩා කළ හැකි ගබඩා දෙකක් එම සංකීර්ණයේ ඇත.

(ආ) (i) පසු ගිය ජූනි සහ ජූලි මාසවලදී වී අළෙවි කිරීමෙන් පසුව ඉතිරි වී තොග ප්‍රමාණය වන කිලෝග්‍රෑම් 21,860ක් (විසිඑක්දහස් අටසිය හැටක්) ගබඩා කර ඇත.

(ii) මෙම ගබඩා සංකීර්ණය වී අළෙවි මණ්ඩලය දැනට භාවිත කරන බැවින්, මෙම ගබඩාවේ කටයුතු සම්බන්ධයෙන් ව්‍යාපාරිකයන්ගේ කිසිදු සම්බන්ධතාවක් නැත.

(iii) ගබඩාව තුළ වී පමණක් ගබඩා කර ඇති අතර, සහල් ගබඩා කර නොමැත. වී අළෙවි මණ්ඩලය සතු වී තොග බැහැර කිරීමේදී විවෘත වෙළෙඳ පොළේ මිල ගණන් කැඳවා වී බැහැර කිරීම සිදු කරන අතර, මේ සම්බන්ධයෙන් වෙළෙඳ සංගමය සමඟ විශේෂයෙන් සාකච්ඡා කර නොමැත.

(iv) 2016 ජූනි මස වන විට වී කිලෝ ග්‍රෑම් 2,487,430ක් (විසි හතර ලක්ෂ අසූහත්දහස් හාරසිය තිහක්) ගබඩා කර තිබුණි.

(v) මෙම වී තොග ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඉහළම මිල ඉල්ලුම් කර තිබූ ඉල්ලුම්කරුවන් වෙත පසු ගිය ජූනි සහ ජූලි මාස තුළ නිකුත් කර ඇත.

(vi) ඔව්.

ආරක්ෂිත තොගයක් ලෙස තබා ගන්නා වී තොගයෙන් කොටසක් ගබඩා කිරීමට යොදා ගනී.

(ඇ) පැන නොනඟී.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දිවුලපිටිය, මරඳගහමුල ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් සහ යැපෙන්නන් 5000ක් පමණ ඉන්නවා. මෙම ප්‍රදේශයේ මෝල් හිමි ව්‍යාපාරිකයන් 125ක්, 150ක් වාගේ ප්‍රමාණයක් ඉන්නවා. පසු ගිය වකවානුවේදී, මෙම අතරමැදි ගබඩාව ඉදි කළේ ඔවුන් වෙනුවෙනුයි. මේ වන විට ඒ ඉදි කරපු ගබඩාව වී අළෙවි මණ්ඩලයට ලබා ගෙන තිබෙනවා. එම නිසා, ඒ ඉදිරිපිට කරපු කඩ සහ ඒ ගබඩාව මේ වෙද්දී ඒ ව්‍යාපාරිකයින්ට නොලැබෙන තත්ත්වයක් තිබෙනවා. එම නිසා ඉදිරියේදී ඉතිරි වැඩ සඳහා යම් කිසි මුදලක් යොමු කරන්න ඕනෑ වනවා. මොකද, ලංකාවේ හාල් මිල පාලනය වෙන්න මරඳගහමුල ප්‍රදේශයෙන් ලැබෙන සහල් විශාල වශයෙන් පිටිවහලක් වනවා. ඒ මිල පාලනය කරන්න, සුළු ව්‍යාපාරිකයාගේ සහල්වලට තිබෙන මාෆියාව නැති කරන්න මරඳගහමුල ප්‍රදේශයේ සහල් මිල බලපානවා. මෙම සහල් මිල පහත වැටෙන්නේ, සුළු ව්‍යාපාරිකයා මිල අඩුවෙන් පාරිභෝගිකයාට සහල් අළෙවි කිරීම තුළින් බව තමුන්නාන්සේලා දන්නවා. අද වන විට ආයතන දෙක තුනක් එය විශාල වශයෙන් අල්ලාගෙන ඉන්න තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. "සුළු ව්‍යාපාරිකයා, මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා රැකගන්න, ඒ ගබඩාව සම්බන්ධයෙන් ඔබතුමාට කුමන හෝ වැඩ පිළිවෙළක්

තිබෙනවාද?" කියන එක තමයි මගේ පළමුවන අතුරු ප්‍රශ්නය වන්නේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, එම ගබඩා සංකීර්ණය අවුරුදු 2කට වැඩි කාලයක් වසා දමා තිබුණා. ඒ වාගේම, ගබඩා සංකීර්ණය ඉදිරියෙන් කඩ කාමර 100කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒවායේ වැඩ භාගෙට නිම කරලායි තිබෙන්නේ. අපි කැබිනට් පත්‍රිකාවක් මඟින් වී අළෙවි මණ්ඩලයේ ගබඩා දෙක විතරක් වී අළෙවි මණ්ඩලයට පවරාගත්තා. පසු ගිය කාලයේ ඒ ගබඩාව ඉදි කිරීමේදී එම කටයුතු කිසිදු කොන්ත්‍රාත් ගිවිසුමකින් තොරව තමයි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට දී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, "ඒ කඩ ඉදි කරන්න" කියා මේ ගරු මන්ත්‍රීතුමා කිව්වාට, තවත් රුපියල් මිලියන 50කට වඩා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවීමට තිබෙනවා. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ලබන අවුරුද්දේ අය වැය මඟින් එය ආර්ථික මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කරලා ඒ ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ට ඒ කඩ ටික බෙදා දෙන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි, ගරු කථානායකතුමනි. වී මිලදී ගැනීමට ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩ පිළිවෙළක් නැහැ. වී රුපියල් 50ට මිලදී ගන්නවා කියා තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියේ තිබුණත් ගම්පහ දිස්ත්‍රික්කයේත්, එම දිස්ත්‍රික්කයේ පමණක් නොව තවත් සමහර තැන්වලත් ගබඩා නැති ප්‍රශ්නය නිසා වී මිල දී ගන්නේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවීන් යළ කන්නයට වී මෙට්‍රික්ටොන් 5,000ක් විතර තමයි වගා කර තිබෙන්නේ. එම වී මෙට්‍රික්ටොන් 5,000 මිලදී ගන්නවත් වැඩ පිළිවෙළක් නැහැ. "ඒ වී ටික ඒ ගබඩාවලට මිලදී ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදා දෙන්න පුළුවන්ද?" කියන එක තමයි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය වන්නේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, අප මේ වන විට ලංකාව පුරා ගබඩා 156ක් විවෘත කර තිබෙනවා. අපේ රජය මඟින් වී මෙට්‍රික්ටොන් 120,000ක් මිලදී ගන්න සැලසුම් කර තිබෙනවා. ඒ වෙනුවෙන් රජය රුපියල් බිලියන හතරහමාරක් වෙන් කරලාත් තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් පුළුවන්කම තිබෙන අයට කිසිම පැකිළීමකින් තොරව වී ගෙනැවිත් මෙම ගබඩාවලට භාර දෙන්න පුළුවන්. නමුත් මෙවර අස්වැන්න රජයේ මිලට වී ලබා දෙනවාට වඩා පෞද්ගලික වෙළෙඳුන්ට අළෙවි කිරීමට ගොවීන් ඉතාම උත්සුක වෙලා තිබෙනවා. ඒ නිසා රජයේ ගබඩාවලට එන වී ප්‍රමාණය ඉතාම අඩු වී තිබෙනවා. අපි දැන් මාසයකට වැඩි කාලයක් -මාස එකහමාරක්- තිස්සේ වී ගබඩා විවෘත කර තිබුණත්, අපට ලැබී තිබෙන්නේ මෙට්‍රික් ටොන් විසිදහසක වී ප්‍රමාණයක් විතරයි. පෞද්ගලික අංශය ඊට වඩා වැඩි මුදලකට වී මිලදී ගැනීමට මැදිහත් වෙලා තිබෙනවා.

මම මුලින් සඳහන් කළේ, වී අළෙවි මණ්ඩලයේ කාර්ය භාරය සම්බන්ධවයි. වී මිලදී ගැනීම සම්බන්ධයෙන් මේ වනතෙක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් කිසිම පැමිණිල්ලක් ඇවිල්ලා නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ කොතැනක හෝ ස්ථානයකදී වී මිලදී ගැනීමට අවස්ථාවක් ලබා දෙන්න කියා ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මැතිතුමා කියනවා නම්, ඒ ඕනෑම ස්ථානයකදී වී මිලදී ගැනීමේ කටයුතු කරන්න අප සූදානම්.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය වාගේම ඒ තුළින් යෝජනාවක් ඉදිරිපත් කරන්නත් මම කැමැතියි. මෙවැනි ප්‍රශ්නයක් තිබෙන නිසාම මම ඊයේ දිනයේදී දිසාපතිවරයාගෙන් මේ ගැන විමසුවා. ගරු ඇමතිතුමා ඔය විධියට ප්‍රකාශ කළාට, ඒ අවස්ථාවේදී එතුමා කිව්වේ, "වී අළෙවි මණ්ඩලයෙන් ගම්පහ දිස්ත්‍රික්කයට තවම එහෙම වැඩ පිළිවෙළක් හදලා ලබා දී නැහැ. ගබඩාත් තිබෙන නිසා අමාත්‍යවරයා එවැනි වැඩ පිළිවෙළක් සකස් කර දෙනවා නම් වී මිලදී ගන්න පුළුවන්" කියන කථාවයි. ඒ නිසා වී මිලදී ගැනීමට එවැනි අවස්ථාවක් ලබා දෙනවා නම් එම කටයුත්ත දිසාපතිවරයාට යොමු කරන ලෙස මා ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. බොහොම ස්තූතියි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අපි ඒ ගැන සොයා බලා ලැහැස්ති කර දෙන්නම්.

උතුරු පළාතේ ආබාධිත තත්ත්වයට පත් වූ පුද්ගලයන් : මාසික දීමනාව
வட மாகாணத்திலுள்ள வலதுகுறைந்தோர் : மாதாந்தக் கொடுப்பனவு
DISABLED PERSONS IN NORTHERN PROVINCE: MONTHLY ALLOWANCE

802/'16

6. ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පසු ගිය කාලවකවානුවේ උතුරු පළාතෙහි ඇතිවූ යුද්ධය හා අනෙකුත් ආපදා හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු පළාතේ ආබාධිතයන් සඳහා වන මාසික දීමනාව ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ආබාධිත තත්ත්වයට පත්ව සිටියදීත්, කිසිදු දීමනාවක් නොලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආබාධිත පුද්ගලයන් සඳහා ලබා දෙන දීමනාව, සියලුම ආබාධිත පුද්ගලයන්ට ලබා දීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த காலங்களில் வட மாகாணத்தில் ஏற்பட்ட யுத்தம் மற்றும் ஏனைய அனர்த்தங்கள் காரண மாக வலதுகுறைந்த நிலைமைக்கு உள்ளான ஆட்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) வட மாகாணத்தில் வலதுகுறைந்தவர்களுக்கான மாதாந்தக் கொடுப்பனவை பெறுகின்ற ஆட் களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

(iii) வலதுகுறைந்த நிலைக்கு ஆளாகியுள்ள போதிலும், எவ்வித கொடுப்பனவுகளையும் பெறாத ஆட்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) வலதுகுறைந்தவர்களுக்கு வழங்கப்படுகின்ற கொடுப் பனவை, சகல வலதுகுறைந்த ஆட்களுக்கும் வழங்கு வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment and Welfare:

(a) Will he inform this House-

(i) the number of persons who became disabled owing to the war which went on in the Northern Province and other disaster situations during the past period;

(ii) the number of persons who obtain the monthly disability benefit allowance provided for the disabled persons in the Northern Province; and

(iii) the number of persons who do not receive any allowance although being disabled?

(b) Will he also inform this House whether steps will be taken to extend the monthly disability benefit allowance provided for the disabled persons to all the disabled persons?

(c) If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 18,885යි.

(ii) රුපියල් 3,000ක මාසික දීමනාව ලබන ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව 4,163යි.

(iii) ඔව්. ගරු කථානායකතුමනි, අපේ අමාත්‍යාංශයෙන් දීමනා නොලබන සංඛ්‍යාව 11,625යි. හුහාක් පළාත් සභාවලින් මේ අයට පළාත් සභාව මට්ටමෙන් විශේෂ දීමනාවක් ගෙවනවා. මම දන්නා විධියට උතුරේ ඒක කෙරෙන්නේ නැහැ. හැබැයි, උතුරු පළාත් සභාවට ඒක කරන්න පුළුවන්.

(ආ) ඔව්. 2016 වර්ෂය සඳහා 30,094ක ආබාධිත පුද්ගලයන් සඳහා ලබාදෙන ජීවනාධාර ගෙවන අතර, මීට අමතරව මේ වනවිට ජීවනාධාර බලාපොරොත්තුවෙන් පොරොත්තු ලේඛනයේ 39,758ක් ඉන්නවා. 2017 අය වැය ඇස්තමේන්තු සඳහා මේ අයද ඇතුළත් කරලා තිබෙනවා. අපට ප්‍රමාණවත් මුදල් ලබා ගන්න පුළුවන් වුණොත් අපි ඒ සියලුදෙනාටම ගෙවනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
Thank you, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 811/'16 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු පියංකර ජයරත්න මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - State Minister of Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ ප්‍රශ්න ගොඩාක් තිබෙනවා. ඒවා මහ ඇමතිතුමාට විරුද්ධව අහන ප්‍රශ්නයි. එන මාසයේදීත් අහන්න, එවැනි ප්‍රශ්න හතරක් තිබෙනවා. ඔක්කෝම එක පාරටම ඇහුවා නම්, මට උත්තර දෙන්න පුළුවන්. එන මාසයේත් එවැනි ප්‍රශ්න හතරක් තිබෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
වචන 150කට වඩා අහන්න තිබෙනවා නම්, එක පාරටම අහන්න මමත් ආසයි. නමුත් අහන්න තිබෙන්නේ, වචන 150ක් විතරයි.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ඔබතුමා හැම මාසෙම ප්‍රශ්න 05ක් අහනවා, මහ ඇමතිවරයාට විරුද්ධව. එන මාසෙටත් ප්‍රශ්න 04ක් තිබෙනවා. එහෙ ගිහිල්ලා ඔබතුමායි, මහ ඇමතිතුමායි අතට අත දීලා යාළු වෙනවා. මෙහෙ ඇවිල්ලා ප්‍රශ්න අහනවා.

ගරු කථානායකතුමනි, මේක ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා පිළිතුර දෙන්න සති තුනක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 820/'16 - (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මත් ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර HIV ව්‍යාප්තිය : පාලනය
போதைப்பொருள் பயன்படுத்துவோரிடையே HIV பரவுகை: கட்டுப்படுத்தல்
SPREAD OF HIV AMONG DRUG ADDICTS: CONTROL

536/'16

9. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හෙරොයින් ඇතුළු වෙනත් මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් පිළිබඳ සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුද්ගලයන් අතරින් HIV ආසාදිතයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත් ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර HIV ඇතුළු සමාජ රෝග ව්‍යාප්ත වීම පාලනය කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාදාරම், පෝසනෙ මற்றුම් සුදේස මරුත්තුව අමෛච් සරෛක් කේට්ට වින්නා:

(அ) (i) ஹெரோயின் உள்ளிட்ட ஏனைய போதைப் பொருள்களுக்கு அடிமையாகியுள்ளவர்கள் தொடர்பாக தொகை மதிப்பீடொன்று மேற் கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வெண்ணிக்கை எத்தனை யென்பதையும்;

(iii) மேற்படி ஆட்களுக்கு மத்தியிலுள்ள HIV தொற்றுக்கு உள்ளானவர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) போதைப்பொருள் பயன்படுத்துவோர் மற்றும் HIV தொற்று உள்ளிட்ட சமூக நோய்கள் பரவுவதைக் கட்டுப்படுத்துவதற்கு அரசாங்கம் நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில் அந்நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) whether a census has been conducted about the persons who are addicted to drugs including heroin;

(ii) if so, the number of drug addicts; and

(iii) the number of HIV infected persons among the aforesaid persons?

(b) Will he also inform this House -

(i) whether the government has taken steps to control the spread of social diseases including HIV among drug addicts; and

(ii) if so the aforesaid steps?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 17,457 (දහත්දහස් හාරසිය පණස් හත) කි.

(iii) 13 (දහතුන) කි.

(ආ) (i) ඔව්.

(ii)

* ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන මඟින් අන්තරායදායක ඖෂධ පාලන අධිකාරිය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ එක්ව මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් සඳහා අධ්‍යාපන, උපදේශන හා කොන්ඩම් බෙදා හැරීමේ වැඩසටහන් ආරම්භ කර ඇත.

* රට පුරා ව්‍යාප්තව ඇති ලිංගාශ්‍රිත රෝග පිළිබඳ සායනයන් (STD Clinics) මඟින් මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් වෙත ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග හා HIV රෝගය සඳහා ප්‍රතිකාර කරනු ලබන අතර, හෙපටයිටිස් බී (B) හා හෙපටයිටිස් සී (C) පරීක්ෂණ සිදු කිරීම සහ හෙපටයිටිස් (B) එන්නත ලබා දීම ද සිදු කරනු ලබයි.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. ගරු ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා, හෙරොයින් ඇතුළු වෙනත් මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් පිළිබඳව සිදු කළ සංගණනයෙන් 17,000ක පමණ පිරිසක් අපේ රටේ සිටින බව දැන ගන්නට ලැබුණා කියලා. නමුත්, හෙරොයින් හා ඒ හා සමාන අන්තරායකර මත් ද්‍රව්‍ය භාවිත කරපු සංඛ්‍යාව පිළිබඳව මේ සංගණනයෙන් දීලා තිබෙන 17,000 කියන සංඛ්‍යාත්මක අගය පිළිබඳව විශ්වසනීයත්වයක් තබන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි? මේ

[ගරු බුද්ධික පතිරණ මහතා]

සංඛ්‍යාව මීට වඩා දෙගුණයකින් හෝ දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙන්න බැරිද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මේ සංගණන ඔක්කෝම අපි කරන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායක අනුව. ඒ අනුව ඒ ඒ ප්‍රදේශවල ඒ ඒ සංඛ්‍යාව බලා තමයි මේ කටයුතු කරන්නේ. නැත්නම් සෞඛ්‍ය අමාත්‍යාංශයට මුළු ලංකාවේම තොරතුරු අරගෙන සංගණනයක් කරන්න බැහැ. මේ විධියට තමයි සංගණන කරන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය.

හෙරොයින් ඇතුළු වෙනත් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා, රජය සෘජුවම හෝ පළාත් සභා, පළාත් පාලන ආයතන, එහෙම නැත්නම් රාජ්‍ය නොවන සංවිධාන, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රහය ලබන ආයතන සමඟ ඒකාබද්ධව පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි කිරීමේ අවශ්‍යතාවක් ඇති බව මේ සංගණනය අනුව පැහැදිලි වුණාද ? නැත්නම් තිබෙන ආයතනවල ධාරිතාව වර්ධනය කරලා ඉදිරියට යන්න පුළුවන් තත්ත්වයක්ද තිබෙන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

හෙරොයින් භාවිත කිරීම අදාළ වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට නොවෙයි. ඇත්තටම අපේ ප්‍රශ්නය තිබෙන්නේ HIV ආසාදිතයන් පිළිබඳවයි. අපේ රටේ සිටින HIV ආසාදිතයන් ප්‍රමාණය ගත්තාම ඉතාමත්ම අල්පයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, සෘජුවම මගේ ප්‍රශ්නයට මේ කාරණය අදාළ නොවුණත් මම ඔබතුමාගේ අවධානය මේ කරුණ කෙරෙහි යොමු කරවන්න කැමැතියි. ඔබතුමා මේ ප්‍රශ්නයට යම් කිසි පිළිතුරක් ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වනවා. ආයුර්වේද වෛද්‍යවරු 600කට ආසන්න පිරිසක් සඳහා පත්වීම් ලබා දෙනවා කියලා ඔබතුමා මේ සභාවේදී සඳහන් කළා. හැබැයි, මුදල් අමාත්‍යාංශය ආයුර්වේද වෛද්‍යවරුන්ට දන්වා තිබෙනවා, 200-250 අතර පිරිසකට පමණයි පළමුවන වටයේදී පත්වීම් ලබා දෙන්න පුළුවන් වන්නේ කියලා. ආයුර්වේද වෛද්‍යවරුනුත් මේ සමාජය තුළ විශාල කර්තව්‍යයක් ඉෂ්ට කරන නිසා ඒ පිළිබඳව යළිත් මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර, දැනට සංචිතයක් වශයෙන් එකතුවෙලා සිටින 600 දෙනාට සාධාරණයක් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය මොකක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ ප්‍රතිපත්තිය නිසා තමයි අපි සියලුම උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යෝජනා කරලා තිබෙන්නේ. එයින් එකසිය ගණනක් බඳවා ගන්නේ රෝහල්වලට. රෝහල්වලට බඳවා ගන්නා සංඛ්‍යාව ඒ ගොල්ලන් අනුමත කරලා තිබෙනවා. ඉතුරු අය ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන් වශයෙන් බඳවා ගන්නයි අපි යෝජනා කරලා තිබෙන්නේ. ඒ සඳහාත් ඒ ගොල්ලන් එකඟතාව පළ කරලා තිබෙනවා. දැන් ඒ සංඛ්‍යාලේඛන අනුව ඒ අය කුමන විධියට, කුමන ස්ථානවලට අනුයුක්ත කරනවාද කියන එක පිළිබඳව අපේ අමාත්‍යාංශය සමඟ කථා කර ගෙන යනවා. ඒ හැරුණු විට පත්වීම් අඩුවෙන් ලබා දීමක් ගැන කියන්න මම දන්නේ නැහැ.

සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම් : කිලිනොච්චි දිස්ත්‍රික්කය

ஊழியர் சேமலாப நிதியக் கணக்குகள் : கிளிநொச்சி மாவட்டம்
EMPLOYEES' PROVIDENT FUND ACCOUNT : KILINOCHCHI DISTRICT

737/'16

10.ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ,

(i) ලියා පදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் கிளிநொச்சி மாவட்டத்தில்,

(i) பதிவு செய்திருந்த ஊழியர் சேமலாப நிதியக் (EPF) கணக்குகளின் எண்ணிக்கை;

(ii) புதிதாகப் பதிவு செய்துள்ள ஊ. சே. நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை;

ஒவ்வொரு ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் புதிதாகப் பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை,

(i) அரசாங்கத்துக்கு உரித்தான கம்பனிகள்;

(ii) பகுதியளவிலான அரச நிறுவனங்கள்;

(iii) தனியார் துறை;

(iv) கைத்தொழில்துறை;

(v) விவசாயத்துறை;

(vi) சேவைத் துறை;

இற்கு அமைய ஒவ்வொரு ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked theMinister of Labour and Trade Unions Relations:

(a) Will he inform this House, separately, in relation to years 2013, 2014 and 2015 -

(i) the number of registered Employees' Provident Fund (EPF) accounts; and

(ii) the number of Employees' Provident Fund (EPF) accounts registered anew;

(iii) in the District of Kilinochchi?

(b) Will he also inform this House, separately, in relation to years 2013, 2014 and 2015, the number of Employees' Provident Fund accounts registered anew and by -

(i) State-owned companies;

(ii) semi-government institutions;

(iii) the private sector;

(iv) the industrial sector;

(v) the agricultural sector; and

(vi) the service sector?

(c) If not, why?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour and Trade Unions Relations)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) යාපනය හා කිලිනොච්චිය දිස්ත්‍රික්කවල වෙන වෙනම තොරතුරු දැක්වීමට හැකි පද්ධතියක් දැනට සේවක අර්ථසාධක අරමුදල සතුව නොමැත.

දැනට පවතින තොරතුරු පද්ධතියේ යාපනය හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක දෙක කලාප අක්ෂරය වන J මඟින් නිරූපණය කරනු ලැබේ.

වර්ෂය	ලියා පදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	15,694
2014	15,784
2015	20,220

ඒ අනුව, J කලාපයෙහි

වර්ෂය	අලුතින් ලියා පදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	5,919
2014	5,181
2015	7,931

(ii) ඒ අනුව, J කලාපයෙහි

(ආ) ඉහත පරිදි වර්ගීකරණය කරන ලද පද්ධතියක් දැනට සේවක අර්ථසාධක අරමුදල සතුව නොමැත.

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව "A" සිට "X" දක්වා වූ අක්ෂරයන් අනුව නම් කරනු ලබන කලාපයන්ට අනුකූලව සේවායෝජකයන් ලියා පදිංචි කරන දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. එලෙස ලියා පදිංචි වූ සේවායෝජකයකුගෙන් යම් සාමාජිකයකු වෙනුවෙන් දායක මුදලක් ලද විට අදාළ සේවායෝජකයාට හිමි අක්ෂරය හා අංකය යටතේ එම සාමාජිකයා ලියා පදිංචි කෙරේ.

(ඇ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, කිලිනොච්චියේ ප්‍රශ්නය දිග්ගස්සන්නේ නැතුව ඔබතුමාගේ පිළිතුරෙන්ම පැන නඟින පළමුවන ප්‍රශ්නය මා අහනවා. කිලිනොච්චි දිස්ත්‍රික්කය ලංකාවේ පැවති යුද්ධයෙන් විශාල ලෙස පීඩාවට පත් වුණු දිස්ත්‍රික්කයක්. ඒ නිසා එම දිස්ත්‍රික්කය තුළ රැකියා උත්පාදනය කොපමණ සිදු වනවාද කියන එක දැන ගැනීම අත්‍යවශ්‍ය කාරණයක්.

පළමුවන අතුරු ප්‍රශ්නය වශයෙන් ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මින් ඉදිරියට හෝ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දත්ත වෙනම ලබා ගැනීමට හැකි වන පරිදි ඔබතුමා වැඩ පිළිවෙළක් සකස් කරනවාද කියලා. මොකද, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ සාමාන්‍යයෙන් වර්ෂයකට අවම වශයෙන් 1,712ක් රැකියා අපේක්ෂිතයන් බවට පත් වනවා. යාපනය දිස්ත්‍රික්කේ 8,704ක් රැකියා අපේක්ෂිතයන් බවට පත් වනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් මා දැන ගන්න කැමැතියි, ඒ දත්ත වෙන වෙනම හඳුනා ගන්න කටයුතු කරන්න ඔබතුමා ලැහැස්තිද කියලා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

සේවක අර්ථ සාධක අරමුදල් අය කිරීම සටහන් වන්නේ කලාප අනුවයි. දැන් යාපනය දිස්ත්‍රික්කය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කය එක කලාපයක්. ඒ අනුව යාපනය දිස්ත්‍රික්කයයි, කිලිනොච්චි දිස්ත්‍රික්කයයි එකට තමයි ලියා පදිංචි වන්නේ. සේවක අර්ථසාධක අරමුදල් ගෙවන අයගේ නම් ඇතුළත් වන්නේත් ඒ කලාපයේ අක්ෂරය වන "J" යටතේයි. ඒ කාරණය

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

තමයි මේ පිළිතුරෙන් ප්‍රකාශ වන්නේ. ඉදිරියේදී වෙනස් ක්‍රමයකට, වෙනත් ප්‍රතිපත්තියකට අනුව කටයුතු කළොත් කිලිනොච්චි දිස්ත්‍රික්කය වෙනමත්, යාපනය දිස්ත්‍රික්කය වෙනමත් ගන්න අපට පුළුවන්. ඔබතුමා එක්ක මා එකඟ වනවා, කුඩා කර්මාන්ත, හෝටල්, ගරාජයන් ආදිය දැන් වැඩියෙන් බිහි වනවාය කියලා. ඊයේ-පෙරේදා මා ඒ ප්‍රදේශයට ගියාම දැක ගන්නට ලැබුණා, වැඩියෙන් වැඩ පොළවල් බිහි වෙලා තිබෙන බව. ඒ නිසා කම්කරු ක්ෂේත්‍රය තුළ සේවක සංඛ්‍යාව වැඩි කරන්නත්, කාර්යාල වැඩිදියුණු කරන්නත් කම්කරු දෙපාර්තමේන්තුව යටතේ තීන්දු අරගෙන තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. රැකියා ලබා දීම පිළිබඳව බලන කොට රැකියා ලක්ෂ 10ක් පමණ ලබා දෙනවාය කියලා මේ ආණ්ඩුවේ විශාල ප්‍රචාරයක් තිබුණා. නමුත් ඔබතුමා ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛන අනුවත් ගිණුම් ලියා පදිංචි වෙලා තිබෙන ප්‍රමාණයත් ගත්තාම දිස්ත්‍රික්ක දෙකේම 7,000ක් කියලා ඔබතුමා සඳහන් කරනවා. මේ දත්තවලින් පෙනෙනවා යාපනය දිස්ත්‍රික්කයේ පමණක් වාර්ෂිකව රැකියා අපේක්ෂිතයන් 8,604ක් බිහි වන බව. ඒ නිසා විශේෂයෙන්ම යාපනය, කිලිනොච්චිය වාගේ යුද්ධයෙන් පීඩාවට පත් වුණු දිස්ත්‍රික්කවල රැකියා බලාපොරොත්තුවෙන් ඉන්න තරුණ අයට රැකියා ලබා දීම පිළිබඳව අනුගමනය කරන්නේ මොන විධියේ වැඩ පිළිවෙළක්ද කියන එකත් මම දැන ගන්න කැමැතියි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

රැකියා දස ලක්ෂයක් දෙනවාය කියන ප්‍රතිපත්තිය ප්‍රකාශ වුණේ පසු ගිය අවුරුද්දේ. 2015 ඒ ප්‍රකාශය පළ වුණාට පස්සේ මේ කලාපයේ පමණක් 8,000කට කිට්ටු සංඛ්‍යාවකට රැකියා ලැබී තිබෙන බව මේ දත්තයන් අනුව ඔබතුමාට පෙනෙනවා ඇති. ඒ කියන්නේ 15,784ක් වුණු EPF ගෙවන අයගේ සංඛ්‍යාව 20,220කට පමණ වැඩි වෙලා තිබෙනවා. නමුත් මට දැනගන්න තිබෙන විධියට 8,000ක පමණ වැඩි වීමක් තිබෙනවා; 5,000ක පමණ අර්ථ සාධක අරමුදල් ගෙවා තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඇත්තටම මම මේ ප්‍රශ්නය ගරු අග්‍රාමාත්‍යවරයාටත් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් ගරු අමාත්‍යතුමනි, 2013, 2014, 2015 වර්ෂ තුනේ මේ දිස්ත්‍රික්ක දෙකේ එකතු වන රැකියා අපේක්ෂිතයන් ප්‍රමාණය 30,000යි. මේ ප්‍රශ්නයට ගරු අමාත්‍යතුමා දුන් පිළිතුරත් එක්ක බලන විට 2013, 2014, 2015 අවුරුදු තුනටම තිබෙන්නේ 15,000ක්, 17,000ක් පමණ සංඛ්‍යාවක්. දිස්ත්‍රික්ක මට්ටමින් මේ ප්‍රශ්නය අපි ගන්නේත් එක් එක් දිස්ත්‍රික්කයේ රැකියා උත්පාදනය කුමන පැත්තෙන්ද කියන එක සලකා බැලීම නිසා. ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන අනුව ගත්තත් රැකියා අපේක්ෂිතභාවයත් රැකියා ලැබෙන ප්‍රමාණයත් අනුව විශාල ගැටලුවක් තිබෙනවා. මේක අග්‍රාමාත්‍යවරයාටත් අදාළ ප්‍රශ්නයක්. ඒ නිසා කිලිනොච්චි දිස්ත්‍රික්කය වෙනම දිස්ත්‍රික්කයක් වශයෙන් සලකා කටයුතු කරන්න අවශ්‍ය පියවර ගන්නා ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

අපට මේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න වෙයි. මොකද, කලාප අනුව යන්නේ නැතිව දිස්ත්‍රික්ක අනුව යන විධියේ වැඩ පිළිවෙළකට යන්න වෙයි. ඒ ගැන තවම තීන්දුවක් අරගෙන නැහැ. නමුත් කලාප අනුව යාමේදී පසු ගිය අවුරුද්දේ ඒ කලාපයේම රැකියා 8,000ක පමණ වැඩි වීමක් වෙලා තිබෙනවා.

පිළිකා රෝහල් සංවර්ධනය : වෙන්කළ මුදල
புற்றுநோய் வைத்தியசாலைகள் அபிவிருத்தி : ஒதுக்கிய பணம்
DEVELOPMENT OF CANCER HOSPITALS: MONEY ALLOCATED

798/'16

11. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2016 අය වැය මඟින් පිළිකා රෝහල් සංවර්ධනය සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) පිළිකා ඒකක සංවර්ධනය සඳහා මුදල් වෙන්කර ඇති රෝහල් කවරේද;

(iii) දකුණු පළාත සඳහා පිහිටුවන පිළිකා රෝහල සඳහා වෙන්කරන ලද මුදල් ප්‍රතිපාදන, දැනටමත් පිළිකා ඒකකයක් සහිත කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය සංවර්ධනය කිරීමට යොදවන ලෙස Sri Lanka College of Oncologists විසින් ඉල්ලා තිබේද;

(iv) එම ඉල්ලීම සාධාරණ බව පිළිගන්නේද;

(v) එසේ නම්, කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය සංවර්ධනයට යොදවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 வரவு செலவுத் திட்டம் மூலம் புற்றுநோய் வைத்தியசாலைகளின் அபிவிருத்திக்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) புற்றுநோய் அலகுகளின் அபிவிருத்திக்காக பணம் ஒதுக்கப்பட்டுள்ள வைத்தியசாலைகள் யாவை என்பதையும்;

(iii) தென் மாகாணத்துக்காக நிறுவப்படவுள்ள புற்றுநோய் வைத்தியசாலைக்காக ஒதுக்கப் பட்டுள்ள நிதி ஏற்பாடுகளை கராப்பிட்டிய போதனா வைத்தியசாலையில் ஏற்கெனவே இருக்கின்ற புற்றுநோய் அலகினை அபிவிருத்தி செய்வதற்குப் பயன்படுத்துமாறு Sri Lanka College of Oncologists நிறுவனத்தினால் கேட்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அந்த வேண்டுகோள் நியாயமானது என்பதை ஏற்றுக்கொள்கிறாரா என்பதையும்;

(v) ஆமெனில், கராப்பிட்டிய போதனா வைத்திய சாலையின் புற்றுநோய் அலகின் அபிவிருத்திக்கு பயன்படுத்தப்படும் பணத்தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) the amount allocated for the development of cancer hospitals through the Budget 2016;

(ii) the hospitals for which funds have been allocated to develop the cancer units;

(iii) whether Sri Lanka College of Oncologists has made a request to utilize the provisions allocated for the cancer hospital to be established for the Southern Province for the development of the cancer unit of Karapitiya Teaching Hospital that is already there;

(iv) whether he admits that the said request was reasonable; and

(v) if so, the amount that would be utilized for the development of the cancer unit of Karapitiya Teaching Hospital?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රු. 1000,000,000/- (රුපියල් බිලියන දහසයි.)

(ii) 1. කරාපිටිය රෝහල

2. මහනුවර රෝහල

3. තෙලිජ්පලෙයි මූලික රෝහල

(iii) ඔව්.

(iv) ඔව්.

(v) රු. 275,000,000/- (රුපියල් මිලියන දෙසිය හැත්තෑ පහයි.)

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, 2016 අය වැය යෝජනා මඟින් කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය වෙනුවට මාතර පිළිකා ඒකකයක් ආරම්භ කරන්න සාකච්ඡා කරලා තිබුණා. නමුත් වඩා ප්‍රායෝගික මේ තත්ත්වය නිසායි මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ.

ගරු ඇමතිතුමනි, මීට කලිනුත් ආයුර්වේද උපාධිධාරීන්ගේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කළා. ඔබතුමන්ලා ගිය අවුරුද්දේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබුණා, 900කට ආසන්න ප්‍රමාණයකට පත් වීම් ලබා දෙන්න. නමුත් එහි ගැටලුවක් තිබුණා. එය පළාත් සභාවලින් අනුමතවෙලා පැමිණිය යුතුව තිබුණා. මේ වනකොට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ සඳහා ලැබිලා තිබෙනවාද, ඒ අයට රැකියා ලබා දීම පිළිබඳව යම් කාල වකවානුවක් ඔබතුමාට ප්‍රකාශයට පත් කරන්න පුළුවන්ද කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
905කට පත් වීම් ලබා දෙන්න මම කැබිනට් මණ්ඩලයෙන් අවසර ලබා ගත්තා. ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබිලා තිබෙනවා. නමුත් ඉන්නේ 600 ගණනයි. ඒ පත්වීම් ඔක්කොම දීලා තිබෙන්නේ පළාත් සභාවලටයි. පළාත් සභාවලින් අනුමැතිය එවීමේ ප්‍රමාදය නිසායි මේ ආකාරයේ විශාල ප්‍රමාදයක් ඇති වුණේ. ඊට පස්සේ මම සියලුම පළාත් සභා ඇමතිවරු ගෙන්වලා මේ පිළිබඳව සාකච්ඡා කළා. මාසයකට කලින් උතුරු පළාත් සභාවෙනුත් අනුමැතිය ලැබුණා. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පළාත් සභා එක්ක මේ පිළිබඳව සාකච්ඡා කළා. අපි කොහොමත් එකසිය ගණනකට රෝහල්වල පත්වීම් ලබා දෙනවා. ඒ කටයුත්ත හරි. ඉතුරු කට්ටියට තමයි "ප්‍රජා සෞඛ්‍ය නිලධාරී" කියලා පත්වීම් ලබා දෙන්න අපි ලැහැස්ති කරලා තිබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය ගොඩනැඟිලිවලටත් - buildingsවලටත් - අපි මුදල් වෙන් කරලා තිබෙනවා. තව ටික දවසකින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මේ ටික සකස් කරලා අපට දේවි. ඒ ටික සකස් කරලා දුන්නාම අපට මේ පත්වීම් ටික ලබා දෙන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මා මතු කරන්නේත් ආයුර්වේදය සම්බන්ධයෙනුයි, ගරු ඇමතිතුමනි. මේ වනකොටත් ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පැන නැඟිලා තිබෙන අර්බුදය පිළිබඳව ඔබතුමා දන්නවා. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයත්, බෙදා හැරීමත්, අළෙවියත් මේ වනකොට සම්පූර්ණයෙන් අඩාළවෙලා තිබෙනවා. විධායක ශ්‍රේණියේ ඉඳලා පහළ මට්ටමේ සිටින සාමාන්‍ය කම්කරුවා දක්වාම වූ සේවකයින් දැන් වැඩ වර්ජනයක - උද්ඝෝෂණයක - නිරතවෙලායි ඉන්නේ. අදත් ඔවුන් පාර්ලිමේන්තු වට රවුම ළඟ උද්ඝෝෂණයක් පවත්වනවා. විවිධ වෘත්තීය සමිති එකතුවෙලා, බෙදයකින් තොරව ඉල්ලා හිටිනවා, මේ සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ඉවත් කරන්න කියලා. නමුත් ඒ වෙනුවට දැන් සිද්ධවෙලා තිබෙන්නේ රටේ ජනතාවට ආයුර්වේද ඖෂධ මිලදී ගන්න තිබුණු අවස්ථාව අහිමි වීමයි.

ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ගැටලුවට ඔබතුමා දෙන විසඳුම කුමක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අපි එක්සත් ජාතික පක්ෂ වෘත්තීය සමිතිය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වෘත්තීය සමිතිය යන වෘත්තීය සමිති දෙකම එක්ක මේ ගැන සාකච්ඡා කළා. ඒ සියලුම කට්ටිය වර්තමාන තත්ත්වය දැක්කා. "මේ ආයතනයේ ප්‍රගතියක් නැහැ, කඩාගෙන වැටිලා" වාගේ දේවල් තමයි මුලින්ම කියලා තිබුණේ. එහෙම කියපු අයගේම සංඛ්‍යා ලේඛන - Marketing Managerගේ report එක - ගත්තාම, පසු ගිය අවුරුද්දේ මේ ආයතනයේ නිෂ්පාදනයත් වැඩිවෙලා; ලාභයත් වැඩිවෙලා; ආදායමත් වැඩිවෙලා. ගරු සිරිනාල් ද මැල් මන්ත්‍රීතුමාත් මෙතැන ඉන්නවා. එතුමා ඒ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

නියෝජිතයන්ට කිව්වා, "ඔබතුමන්ලා අපට කිව්වේ මේ ආයතනය කඩාගෙන වැටිලා කියලායි. නමුත් මේ ආයතනයේ සම්පූර්ණ ප්‍රගතියක් තමයි තිබෙන්නේ, මොනවාද ඔබතුමන්ලා කථා කරන්නේ? ඔබතුමාමනේ මට කිව්වේ, මේ ආයතනය කඩාගෙන වැටිලා කියලා. නමුත් ඔබතුමාගේම report එක අනුව මේ ආයතනය දියුණුවෙලා තිබෙනවානේ. සභාපතිවරු කී දෙනාද මේ වාගේ වැඩ කරලා තිබෙන්නේ" කියලා. දැන් මේ ආයතනය දියුණු වෙලා තිබෙනවා.

ඊට පස්සේ තිබෙන්නේ ද්විතීයික ප්‍රශ්න. අපට ඒවා සාකච්ඡා මාර්ගයෙන් විසඳාගන්න පුළුවන්. මනුෂ්‍යයෙකුගේ නොයෙකුත් දුර්වලතා තිබෙනවා නම්, තරහා යනවා නම්, ඒවා විසඳා ගන්න පුළුවන්. මතක තබාගන්න මන්ත්‍රීතුමා, මීට ඉස්සෙල්ලාත් එතැන සිටි සභාපතිවරයෙක් ඔය විධියටම බලෙන් දොට්ට දැම්මා. දැන් ඉන්නේ දෙවැනි සභාපතිවරයා. ඒ විධියට බලෙන් දොට්ට දාන්න මේ අවස්ථාවේත් ඉඩ දුන්නොත් මේ වැඩේ ඉවරයක් නැති වෙනවා.

අනෙක් කාරණය මේකයි. මන්ත්‍රීතුමා කිව්වාට සියලුම අය මේ විරෝධතාවට සම්බන්ධ වෙලා ඉන්නවාය කියලා, සියලුම අය සම්බන්ධ වෙලා නැහැ. ඔබතුමා දැක්කානේ, එතැන හිටපු සෙනඟ කොච්චරද කියලා. 300කට ආසන්න පිරිසක් ඉන්වා, එයින් භාගයක් විතර වැඩට යන්න හදනවා. නමුත් ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒකට විරුද්ධ අය ලයිට් කපනවා, නොයෙකුත් ප්‍රචණ්ඩකාරී වැඩවල නිරත වෙනවා. ඒ 8දෙනෙක් පොලීසිය මඟින් උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා. තව එක සිද්ධියක් වුණු ගමන් අත්අඩංගුවට ගන්නවා කියලා ඒ අයට අවවාද කරලා තිබෙනවා. තව 11දෙනෙක් නම් කරලා 21වැනි දා, ඒ කියන්නේ හෙට උසාවියට ඉදිරිපත් කරනවා. මේ වාගේ බොහොම ප්‍රචණ්ඩකාරී විධියට තමයි ඒ ගොල්ලෝ කටයුතු කරන්නේ. වැඩ ආරම්භ කළාම ඒ ගොල්ලෝ ලයිට් කපනවා. සුළු පිරිසක් කරන ප්‍රචණ්ඩත්වයක් තමයි එතැන තිබෙන්නේ. ඒ සේවකයන්ගෙන් භාගයක් විතර කරකියාගන්න දෙයක් නැතුව ඉන්නවා. ඒක තමයි අදට තිබෙන තත්ත්වය. ඒ නිසා මම ඒ ගොල්ලෝ එක්ක සාකච්ඡා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති නායක ලෙස්ලි දේවේන්ද්‍ර මහත්මයා ඒ කට්ටිය එළෙව්වා. මොකද, ඔහු කියන විධියට ඉස්සෙල්ලාම බලන්න ඕනෑ, මේ පාලනාධිකාරිය යටතේ මේ ආයතනය ගොඩනඟලා තිබෙනවාද, කඩාගෙන වැටිලා තිබෙනවාද කියන එකයි. ඒ ගොල්ලන්ගේම වාර්තා අනුව ඒ ආයතනය ගොඩනඟලා තිබෙනවා. ඒ නිසා අනෙක් ප්‍රශ්න ද්විතීයික කරුණු. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීතුමනි, ලෙස්ලි දේවේන්ද්‍ර මැතිතුමා ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා එක්කත් කියලා තිබෙනවා, ඒ නිලධාරීන් ඉවත් කිරීමට විරුද්ධයි කියලා. ඒ අයට මේ වෘත්තීය සමිති දෙකේ පිහිටක් නැතිවුණාම ඔබතුමන්ලාගේ වෘත්තීය සමිති නායකයා පිටිපස්සේත් යයි. සුළු කණ්ඩායමක් තමයි මේ විරෝධතාව කරන්නේ. මේ විරෝධතාවට නායකත්වය දෙන මනුස්සයාට විරුද්ධව ලොකු inquiry එකක් තිබෙනවා, රුපියල් මිලියන ගණනක වයින් බෝතල් ගෙනැල්ලා පාවිච්චි කරන්නේ නැතුව තබාගත්තා කියලා.

අනෙක් එක්කෙනාට විරුද්ධවත් එහෙම චෝදනා තිබෙනවා. මේ වාගේ විශාල චෝදනා තිබෙනවා. ඔබතුමා දන්නේ නැහැ, මම මේ අමාත්‍යාංශයට එන කොට කසාය හදන්න, අරිෂ්ට හදන්න තිබුණු factory එක, වැසිකිළියක තත්ත්වයෙන් තිබුණේ. නමුත් අද ගිහිල්ලා බලන්න. ඒ මුළු factory එකම සකස් කරලා, air conditioned කරලා තිබෙනවා. ඒ වාගේම, අලුතින් නිෂ්පාදන 13කුත් හදලා, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවත්, ලිවර් බ්‍රදර්ස් ආයතනයේ supermarket ජාලයත් හරහා හැම මාසයකම රුපියල් මිලියන 10ක ආදායමක් ලැබුවා. ඒ සමඟම, තිබුණු පැරණි නිෂ්පාදනත් market එකට අවශ්‍ය විධියට දියුණු කරලා තිබෙනවා. අද මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. නමුත් මෙතැන ඉන්නවා වෙනත් කණ්ඩායමක්. පසු ගිය කාලයේත් ඒ ගොල්ලන් වැඩ කරන්න කැමැති වුණේ නැහැ. ඒ ගොල්ලන් කියනවා air conditioned කරපු එකත් වැරැදියි කියලා. පසු ගිය කාලයේ SPC එක යාපනයේ රෙදි කඩයක් අස්සේ තිබුණේ. ඒකට කුලිය රුපියල් 6,000යි කියනවා. ඒත් දැන් ඉතාම ලස්සන, හොඳ තැනක ඒක හදලා තිබෙනවා. නමුත්, ඒවාටත් මේ ගොල්ලන් විරුද්ධයි; මොනවා කළත් විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලියි නේද ගරු මන්ත්‍රීතුමා?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමා කියනවා නම් වෘත්තීය ක්‍රියා මාර්ග ඇතුළේ ඔය දේවල් ජාතික සේවක සංගමයෙන් සිද්ධ වුණාය කියලා, ජාතික සේවක සංගමයේ නායකයෝත්- [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ජාතික සේවක සංගමයේ පමණක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයත් ඉන්නවා. නායකයෝ නොවෙයි. පිරිසක් වැඩ; පිරිසක් විරුද්ධයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම ඔබතුමාගෙන් මීට කලිනුත් ඖෂධ මිල සම්බන්ධයෙන් ඇහුවා. කාලයක් තිස්සේ අපි මේ ගැන සාකච්ඡා කරනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
23වන දා මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමාගේ අනුස්මරණය තිබෙනවා. ඒ ගැන අපි එදාට announce කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මොන විධියකට හරි කමක් නැහැ. අඩු තරමින්-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා ඉදිරිපත් කළා නේ, අත්‍යවශ්‍ය ඖෂධ ලැයිස්තුව. ඒක 2013 වර්ෂයේදී සංශෝධනය කළා. ඒ සම්පූර්ණ ලැයිස්තුවම එදාට අපි ඉදිරිපත් කරනවා, ඒ මිල ඔක්කෝම අඩු කරලා. ඒ ඔක්කෝම සකස් කරලා, ඊයේ අපි Chamber එකටත් කථා කළා. ඒ වාගේම, ආනයනකරුවන්ටත්

කථා කරලා, ඒ ගොල්ලන්ටත් අපි ඒ ගැන දන්වලා 23වැනි දා එතුමාගේ අනුස්මරණ දිනයේදී ඒ ලැයිස්තුව ඉදිරිපත් කරනවා. ඔබතුමාත් එදාට සහභාගි වෙන්න.

ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම්: ප්‍රවේශ පහසුකම්

වලතුකුරෙන්තෝරුක්කාන උරිමෙකළ් : පිරවේස වසතිකළ්

RIGHTS OF THE DISABLED: ACCESS FACILITIES

803/'16

12. ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව, ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ වී සේවා ලබාගත හැකි පරිදි සේවා සැපයීම් කරනු ලබන සියලු රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට අයත් ගොඩනැගිලිවල ආබාධිත පුද්ගලයන් සඳහා විශේෂ ප්‍රවේශ පහසුකම් ඇතිකළ යුතු බවත්;

(ii) උක්ත පනත සම්මත කර වසර අටක කාලසීමාවක් ඇතුළත, රාජ්‍ය හා පෞද්ගලික සේවා සැපයීම් සිදුකරනු ලබන ගොඩනැගිලි සියල්ලෙහිම ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ වී සේවා ලබාගත හැකි පරිදි එම පහසුකම් සලසා තිබිය යුතු බවත්;

(iii) රාජ්‍ය හා පෞද්ගලික සේවා සැපයීමේ ආයතනවල මේ වනවිටද ඉහත සඳහන් පහසුකම් සලසා නොමැති තත්ත්වයක් දක්නට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ආබාධිත පුද්ගලයන්ට පහසුවෙන් ප්‍රවේශ වී සිය අවශ්‍යතා සපුරාගැනීම සඳහා උක්ත පහසුකම් ඇති කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1996ஆம் ஆண்டின் 28ஆம் இலக்க வலது குறைந்தோரின் உரிமைகளைப் பாதுகாக்கும் சட்டத்தின் பிரகாரம், வலதுகுறைந்தோர் பிரவேசித்து சேவைகளைப் பெற்றுக்கொள்ளக் கூடிய விதத்தில், சேவை வழங்கும் சகல அரச மற்றும் தனியார் நிறுவனங்களுக்குச் சொந்த மான கட்டிடங்களில் வலதுகுறைந்தோருக்காக விசேட பிரவேச வசதிகளை ஏற்படுத்த வேண்டு மென்பதையும்;

(ii) குறித்த சட்டம் நிறைவேற்றப்பட்டு எட்டு ஆண்டு களினுள், அரச மற்றும் தனியார் சேவை வழங்கலை மேற்கொள்ளும் சகல கட்டிடங் களிலும் வலதுகுறைந்தோருக்கு பிரவேசித்து சேவைகளைப் பெற்றுக்கொள்ளக்கூடிய விதத்தில் குறித்த வசதிகள் ஏற்பாடு செய்யப் பட்டிருக்க வேண்டுமென்பதையும்;

(iii) அரச மற்றும் தனியார் சேவை வழங்கும் நிறுவனங்களில் இதுவரை மேற்குறிப்பிடப்பட்ட வசதிகள் ஏற்பாடு செய்யப்படாதுள்ள நிலைமை காணப்படுகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) வலதுகுறைந்தோருக்கு இலகுவில் பிரவேசித்து தமது தேவைகளைப் பூர்த்தி செய்துகொள்வதற்காக மேற் குறிப்பிட்ட வசதிகளை ஏற்படுத்துவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment and Welfare:

(a) Is he aware that -

(i) as per the Protection of the Rights of Persons with Disabilities Act, No. 28 of 1996, special facilities should be made available for the disabled in buildings belonging to all public and private institutions providing services so that the disabled are able to access such buildings to obtain services;

(ii) within a period of eight years from the date of passage of the aforesaid Act, arrangements should be made to provide the aforesaid facilities in all buildings from which services are provided by either the public sector or the private sector to ensure that disabled persons can access such buildings and obtain services; and

(iii) State and private sector service providers do not appear to have made the aforesaid facilities available in their institutions as yet?

(b) Will he inform this House whether steps will be taken to provide the aforementioned facilities so that the disabled can access buildings without difficulty and fulfill their requirements?

(c) If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම පිළිබඳව වූ අංක 1467/15 හා 2006.10.17 දින දරන අතිවිශේෂ ගැසට් නිවේදනය හා එම ගැසට් නිවේදනය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරන අතිවිශේෂ ගැසට් නියෝගය නිකුත් කරමින් ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සියලුම ප්‍රසිද්ධ ගොඩනැගිලි හා පොදු සේවා සහිත ස්ථානද සැකසීමට නියෝග ලබා දෙන ලදී.

(ii) 2009.09.18 දින දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ පරිදි 2014.10.16 දිනට ප්‍රථම සියලු ප්‍රසිද්ධ ගොඩනැගිලි ආබාධ සහිත තැනැත්තන්ට

[ගරු එස්.බී. දිසානායක මහතා]

ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කිරීමට පියවර ගන්නා ලෙසත් සියලු අමාත්‍යාංශ, පළාත් සභා හා දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කර ඇත. තවද 2009.04.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අය වැය තුළින් සපයා ගන්නා ලෙසද නියෝග ලබා දී ඇත.

මේ පිළිබඳව පළාත් පාලන ආයතන හා පළාත් සභා මඟින් සොයා බැලීමේ කටයුතු කළ යුතුව ඇත.

(iii) ඔව්.

සියලු පළාත් පාලන ආයතන නව ගොඩනැඟිලි ඉදි කිරීමේදී අදාළ චක්‍ර ලේඛයේ නීති රෙගුලාසිවලට අනුකූල නොවන ඉදි කිරීම් සඳහා අනුමැතිය ලබා නොදෙන අතර, පැරණි ගොඩනැඟිලි සඳහා එම ආයතන මඟින් වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීමේදී මතුව ඇති ගැටලු නිසා ප්‍රවේශ පහසුකම් සහිතව ඉදි කිරීම් සිදු කර නොමැති අවස්ථා දක්නට ලැබෙන අතර ඒ සම්බන්ධයෙන් නිරන්තර දැනුවත් කිරීම් සහ තාක්ෂණික සේවා මෙම අමාත්‍යාංශය මඟින් සැපයීමට කටයුතු කර ඇත.

(ආ) ඔව්.

ප්‍රවේශ පහසුකම් සඳහා වන රෙගුලාසි ආබාධිත පුද්ගලයන්ගේ ප්‍රවේශයට වඩාත් පහසු වන පරිදි පිරිවිතර හා සැකසුම් ඇතුළත් කර සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර, අදාළ චක්‍ර ලේඛයේ නීති හා රෙගුලාසිවලට අනුකූලව ප්‍රසිද්ධ ගොඩනැඟිලි ඉදි කිරීම් සිදු කරනු ඇත. තවද, ප්‍රසිද්ධ ගොඩනැඟිලි ඉදි කිරීම්වලදී අදාළ ගැසට් නිවේදනයට අනුකූල වන පරිදි ප්‍රවේශ පහසුකම් සපුරාලීමට අවශ්‍ය දැනුවත් කිරීම් හා තාක්ෂණික සහාය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ඇත.

(ඇ) අදාළ නොමැත.

ගරු මන්ත්‍රීතුමියනි, ලංකාවේ ඕනෑම ගොඩනැඟිල්ලක් භදන විට අදාළ පළාත් පාලන ආයතනවල අනුමැතිය ලබා ගන්න ඕනෑ. මේ ආයතන සියල්ලට අපි දැනුම්දීලා තිබෙනවා, අබාධිත අයට ප්‍රවේශය නැත්නම් ගොඩනැඟිලි අනුමත කරන්න එපා කියලා. නමුත් තවම ඒ විධියටම ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ පිළිබඳව අවශ්‍ය නීත්‍යානුකූල කටයුතු කිරීමට බලය තිබෙන්නේත් පළාත් සභාවලට. ඒ නිසා අපි පළාත් සභා සමඟ විශේෂ සාකච්ඡාවක් කරලා කිව්වා, පළාත් පාලන ආයතන හරහා ඒ අනුමැතිය කියටවත් දෙන්න එපා කියලා, ඒ ප්‍රවේශය ඇති කරලා නැත්නම්. ඒක තමයි අද තත්ත්වය ගරු කථානායකතුමනි.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
Thank you, Hon. Minister.

ගණකාධිකාරි තනතුරු පුරප්පාඩු : විස්තර
கணக்காளர் பதவி வெற்றிடங்கள் : விபரம்
ACCOUNTANT VACANCIES: DETAILS

832/'16

13. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පවතින ගණකාධිකාරි තනතුරු හා ශ්‍රේණිවලට අදාළව තොරතුරු පද්ධතියක් සකස් කර තිබේද;

(ii) 2015 ජූනි 30 දිනට මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පැවති මුළු ගණකාධිකාරි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් පුරප්පාඩු පවතින ස්ථාන කවරේද;

(iv) 2015 දෙසැම්බර් 31 වනවිට ඉහත පුරප්පාඩුවලින් කොපමණ සංඛ්‍යාවක් පුරවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 දෙසැම්බර් 31 දිනට III වන ශ්‍රේණියේ අනුමත මුළු ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 ජූනි 30 දිනට III වන ශ්‍රේණියේ අනුමත මුළු ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) 2015 දෙසැම්බර් 31 දිනට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නැතත්, පවත්වාගෙන යනු ලබන III වන ශ්‍රේණියේ ගණකාධිකාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய அரசாங்க மற்றும் மாகாண அரசாங்க சேவையின் அமைச்சுக்கள் மற்றும் திணைக் களங்களில் காணப்படுகின்ற கணக்காளர் பதவிகள் மற்றும் தரங்களுக்குரிய தகவல் முறைமையொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) 2015 யூன் மாதம் 30ஆம் திகதி உள்ளவாறு மத்திய அரசு மற்றும் மாகாண சேவையின் அமைச்சுக்கள் மற்றும் திணைக்களங்களில் காணப்பட்ட மொத்த கணக்காளர் வெற்றிடங் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேலே (ii) இல் குறிப்பிடப்பட்டுள்ள வெற்றி டங்கள் காணப்படுகின்ற இடங்கள் யாவை என்பதையும்;

(iv) 2015 டிசம்பர் மாதம் 31ஆம் திகதி உள்ளவாறு மேற்படி வெற்றிடங்களின் எண்ணிக்கையில் எத்தனை நிரப்பப்பட்டுள்ளன என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2015 டிசம்பர் மாதம் 31ஆம் திகதியில் உள்ள வாறு தரம் III ஐச் சேர்ந்த அங்கீகரிக்கப்பட்ட மொத்த கணக்காளர் பதவிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2015 யூன் மாதம் 30ஆம் திகதியில் உள்ளவாறு தரம் III ஐச் சேர்ந்த அங்கீகரிக்கப்பட்ட மொத்த கணக்காளர் பதவிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) 2015 டிசம்பர் மாதம் 31ஆம் திகதியில் உள்ளவாறு முகாமைத்துவ சேவைகள் திணைக் களத்தினால் அங்கீகரிக்கப்பட்டாத போதிலும், பேணிவரப்படுகின்ற தரம் III ஐச் சேர்ந்த கணக்காளர் பதவிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management:

(a) Will he inform this House-

(i) whether there is a database in relation to the posts and grades of Accountants in the Ministries and Departments of the Central Government and Provincial Public Service;

(ii) the total number of vacancies for Accountants in the Ministries and Departments of the Central Government and the Provincial Public Service as at 30th June 2015;

(iii) the places where vacancies mentioned in (ii) above exist; and

(iv) the number of vacancies out of the above number that have been filled by 31st December 2015?

(b) Will he also inform this House-

(i) the total number of approved Posts of Accountants of Grade III as at 31st December 2015;

(ii) the total number of approved Posts of Accountants of Grade III as at 30th June 2015; and

(iii) the number of Posts of Accountants of Grade III being maintained despite being not approved by the Management Services Department as at 31st December 2015?

(c) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 2015.12.31 දිනට,

විශේෂ ශ්‍රේණිය - 18

II/III ශ්‍රේණිය - 184

(iii) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි

(iv) 2016 ජූනි 30 දින දක්වාම ඇති පුරප්පාඩු 220ක් පිරවීම සඳහා සියලු ලේඛන සකස් කර අවසන් කර ඇත. විභාග පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පිණිස යවා ඇත.

(ආ) (i) 1,400

(ii) 2014 වර්ෂයේ පැවති තරග විභාගයෙන් බඳවා ගැනීම් සිදු කරන ලද්දේ 2015 හා 2016 වර්ෂයන්හිදීය. 2015 වර්ෂයේ බඳවා ගැනීම් සඳහා විභාගයක් පැවැත්වීමට අවකාශ නොතිබූ බැවින්, 2015.06.30 දිනට අනුමත තනතුරු සංඛ්‍යාවන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කර නොමැත. එසේ වුවත් ගණකාධිකාරී සේවා අංශයේ පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතිය අනුව 2015.12.31 දිනට III වන ශ්‍රේණියේ අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 1,400කි.

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ගෙන්වා ගන්නා ලද තොරතුරුවලට අනුව 2015 ජූනි 30 දිනට III වන ශ්‍රේණියේ අනුමත මුළු ගණකාධිකාරී තනතුරු සංඛ්‍යාව 1,356කි.

(iii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොමැතිව තනතුරු පවත්වාගෙන යනු නොලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙම ප්‍රශ්නයේ (ආ) (iii) කොටසට පිළිතුර හැටියට කිව්වේ, "කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොමැතිව තනතුරු පවත්වාගෙන යනු නොලැබේ" කියායි. නමුත්, 2015 ජූනි 30වන දින වන විට III වන ශ්‍රේණියේ අනුමත මුළු ගණකාධිකාරී තනතුරු සංඛ්‍යාව 1,356ක් බවත්, 2015 දෙසැම්බර් 31වන දින වන විට III වන ශ්‍රේණියේ අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 1,400ක් බවත් ඔබතුමා (ආ) (ii) කොටසට දුන් පිළිතුරේ සඳහන් වෙනවා. [බාධා කිරීමක්] මගේ අතුරු ප්‍රශ්නය ඒක තමයි. ඒවා එම කාලය තුළ අනුමත කිරීමට ලක් කර තිබෙන තනතුරුද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු මන්ත්‍රීතුමනි, ඒවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කළ තනතුරු.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, පසු ගිය කාලයේ රාජ්‍ය ව්‍යාපාරවල, රාජ්‍ය ආයතනවල සිද්ධ වෙච්ච වංචා, දූෂණ, අක්‍රමිකතාවන් පිළිබඳ විවිධ පරීක්ෂණයන් සිද්ධ වන බව. එම පරීක්ෂණවලදී හෙළි වුණු කාරණයක් තමයි, දේශපාලනඥයන් විසින් මොන තීන්දු තීරණ ගත්තත්, මොන යෝජනා ගෙනාවත් අවසානයේ ගණකාධිකාරිවරුන් තමයි එම වෙක්පත්වලට අත්සන් කර තිබෙන්නේ කියන කාරණය. හුහක් වෙලාවට ඒ අය අපටත් කියා තිබෙනවා "අපි විවිධ බලපෑම් නිසා, විවිධ හේතු නිසා, කට වචනයෙන් කියපු අවස්ථාවල අත්සන් කළා" කියලා. එවැනි තත්ත්වයකට ගණකාධිකාරිවරුන් පත්වෙලා තිබෙනවා නම්,

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

එවැනි බලපෑමකට ලක්වීම නිසා ඔවුන්ට වෙක්පත් අත්සන් කිරීමට සිද්ධ වෙනවා නම්, එවැනි බලපෑම්වලට ලක්වීම වැළැක්වීම සඳහා ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය මොකක්ද? මොකද, ඉදිරියේදීත් ඒ වාගේ තත්ත්වයන් ඇති වෙන්න පුළුවන් නේ. එම නිලධාරීන් භාරව සිටින අමාත්‍යවරයා හැටියට ඔබතුමාට තිබෙන බලතල අනුව සහ හැකියාව අනුව ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ පැත්තෙන් ගත හැකි ක්‍රියා මාර්ගය මොකක්ද? අවසානයේදී මේ සම්බන්ධයෙන් වගකිව යුත්තන් බවට පත්වෙන මේ අය, රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙන්න පුළුවන්; අතිරේක ලේකම්වරුන් වෙන්න පුළුවන්; සහකාර අධ්‍යක්ෂවරු වෙන්න පුළුවන්; එහෙම නැත්නම් ගණකාධිකාරිවරු වෙන්න පුළුවන්. ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔබතුමාගේ වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

දැනටමත් අපේ රජය ස්වාධීන කොමිෂන් සභා පත් කර රජයේ සේවකයන්ට ස්වාධීනව තමන්ගේ කටයුතු කරගෙන යන්න අවස්ථාව දීලා තිබෙනවා. පසු ගිය වකවානුවේ නොයෙක් නොයෙක්, බලපෑම් තිබුණු බව මම පිළිගන්නවා. රජයේ පරිපාලන නිලධාරීන්ට, ගණකාධිකාරිවරුන්ට, ඒ සියලු දෙනාටම නොයෙකුත් බලපෑම් තිබුණා. නමුත් රාජ්‍ය නිලධාරියෙකුගේ වගකීම වන්නේ බලපෑම්වලට යටත්ව කටයුතු කිරීම නොවෙයි. රාජ්‍ය නිලධාරියකුගේ වගකීම වන්නේ නීති-රීති, මුදල් රෙගුලාසි සහ පරිපාලන රෙගුලාසි අනුව තමන්ගේ කටයුතු කිරීමයි. බලපෑම් තිබුණා නම්, ඔවුන් ඒ අවස්ථාවේ වාර්තා කළ යුතුව තිබුණා. සමහර නිලධාරීන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, ගණකාධිකාරිවරුන්, තමන්ට ඒ වාගේ උපදෙස් ලැබුණාම "මට මෙය අනුමත කිරීමට නොහැකියි. මේ සඳහා මට මුදල් ගෙවන්න බැහැ" යනුවෙන් සටහන් දමා තිබෙන අවස්ථා තිබෙනවා. දැනටත් අමාත්‍යාංශ ලේකම්වරුන් කිහිප දෙනෙකු සහ ආයතන ප්‍රධානීන් කිහිපදෙනෙකු මේ සම්බන්ධව චෝදනාවලට ලක්වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කළ යුත්තේ මොකක්ද කියන එක ගැන අපි දැන් සාකච්ඡා කරගෙන යනවා.

නීතිය අනුව නම්, ඒ විධියට කටයුතු කරන්න ඒ ගොල්ලන්ට අවකාශ නැහැ. ඉදිරියේදී ඒ කටයුතු හරියාකාරව සිද්ධ වෙයි කියලා මම හිතනවා. දැන් අපි ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා රජයේ සේවකයන්ට තමන්ගේ කටයුතු ස්වාධීනව කරගෙන යාමට අවස්ථාව ලබා දීලා තිබෙනවා.

එළකිරි කර්මාන්තය දියුණු කිරීම : ක්‍රියා මාර්ග
ஆட்டுப்பால் கைத்தொழிலை முன்னேற்றுதல் : நடவடிக்கை
DEVELOPMENT OF DAIRY GOAT INDUSTRY: MEASURES

531/'16

14. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) 2015 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකාව තුළ එළකිරි නිෂ්පාදනය තම ජීවිකාව කරගත් පිරිස කොපමණද;

(ii) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ එළකිරි නිෂ්පාදනය ලීටර් කොපමණද;

(iii) 2015 වසර අවසානයේදී ශ්‍රී ලංකාව තුළ සිටි එළුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එළකිරි කර්මාන්තයේ නිරතවන්නන්ට එම කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එළු ගහනය වැඩි කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கிராமியப் பொருளாதார விவகாரங்கள் பற்றிய அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முடிவடையும்போது இலங்கையில் ஆட்டுப்பால் உற்பத்தியை தமது வாழ்வாதாரமாகக் கொண்டிருந்தவர்களின் எண்ணிக்கையாதென்பதையும்;

(ii) 2015ஆம் ஆண்டில் இலங்கையின் ஆட்டுப்பால் உற்பத்தி எத்தனை லீற்றர்கள் என்பதையும்;

(iii) 2015ஆம் ஆண்டு முடிவில் இலங்கையிலிருந்த ஆடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஆட்டுப்பால் உற்பத்தியில் ஈடுபடுபவர்களுக்கு அக்கைத்தொழிலை முன்னேற்றுவதற்குத் தேவையான வசதிகள் அரசாங்கத்தினால் பெற்றுக்கொடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வசதிகள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) ஆடுகளின் தொகையை அதிகரிக்கச் செய்வதற்கு அரசாங்கம் நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி நடவடிக்கைகள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Economic Affairs:

(a) Will he state -

(i) the number of persons in Sri Lanka by the end of the year 2015 whose livelihood was dairy goat production;

(ii) the goat milk production of Sri Lanka in litres during the year 2015; and

(iii) the number of goats in Sri Lanka at the end of the year 2015?

(b) Will he inform this House -

(i) whether the Government has provided necessary facilities to those engaged in the dairy goat industry in order to develop that industry; and

(ii) if so, the facilities thus provided?

(c) Will he also inform this House -

(i) whether the Government has taken measures to increase the goat population; and

(ii) if so, the measures thus taken?

(d) If not, why?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ගොවි පවුල් සංඛ්‍යාව - 58,399 (පනස් අට දහස් තුන්සිය අනූ නවයයි)

(ii) ලීටර් ලක්ෂයයි.

ශ්‍රී ලංකාවේ එළු කිරි පරිභෝජනයට වඩා එළු මස් පරිභෝජනයට ඉහළ ඉල්ලුමක් පවතින බැවින් ගොවීන් එළු මස් නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති හෙයින් එළු කිරි නිෂ්පාදනය අවම මට්ටමක පවතී.

(iii) එළුවන් සංඛ්‍යාව - 358,233 (තුන්ලක්ෂ පනස්අටදහස් දෙසීය තිස්තුනයි)

(ආ) (i) ඔව්.

(ii) * සතුන්ගේ ආරය උසස් කිරීම මඟින් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීම.

* කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදන කටයුතු සඳහා 50%ක සහනාධාර යටතේ උපකරණ ලබා දීම.

* ව්‍යාප්ති හා පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීම.

* වසංගත රෝග මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

* නොමිලයේ පශු වෛද්‍ය සේවාව ලබා දීම.

(ඇ) (i) ඔව්.

(ii) * 50% සහනාධාර යටතේ අභිජනන ගොවිපළ පිහිටුවීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

* ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ 50% සහනාධාර මත එක් ප්‍රතිලාභියෙකු වෙත එළුවියන් 04ක් සහ පට්ටි එළුවෙකු ලබා දීම.

* උසස් ආරයේ පට්ටි එළුවන් 50%ක සහනාධාර යටතේ ලබා දීම.

* එළු අභිජනන කටයුතු සඳහා අවශ්‍ය කෘත්‍රිම සිංචන පහසුකම් ලබා දීම.

(ඈ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා සඳහන් කළ විධියට මස් සඳහා එළුවන් ඇති කිරීම පිළිබඳවයි වැඩි අවධානය තිබෙන්නේ. කිරි සඳහා එළුවන් ඇති කිරීම පිළිබඳව තිබෙන අවධානය අඩුයි කියන එකයි ඔබතුමාගේ පිළිතුරේ එක කොටසක සඳහන් වුණේ. ගරු ඇමතිතුමනි, එළු කිරි නිෂ්පාදනය අඩු වීමම එම ඉල්ලුම අඩු වීමට බලපා තිබෙන නිසා, කිරි නිෂ්පාදනය යම් ප්‍රමාණයකින් වැඩි කිරීමක් කළොත් ඔය කියන තත්ත්වයේ වෙනසක් ඇති වනවා නේද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මම මුලින් සඳහන් කළ පරිදි එළු කිරිවලට වැඩිය එළු මස්වලට ඉහළ මිලක් ලැබෙනවා. සාමාන්‍යයෙන් අද මස් කිලෝ එකක් රුපියල් 1,800 - 2,000 අතර මිලකට අළෙවි වන නිසා ගොවීන් කිරි නිෂ්පාදනයට පෙලඹෙන්නේ නැහැ. කිරි ලීටරයක් හෝ භාගයක් අරගෙන ඒක විකුණන්න වැඩි මහන්සියක් ගන්නවාට වැඩිය මස් අළෙවියෙන් එක පාර ලොකු මුදලක් අතට එන නිසා, කිරි නිෂ්පාදනය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැඩි උනන්දුවක් නැති බවයි පෙනෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සමහර රෝග සඳහා වෛද්‍යවරු විශේෂයෙන්ම එළු කිරි නියම කරන නිසා ලංකාවේ එළු ගහනය වර්ධනය කරලා, එළු කිරි නිෂ්පාදනයේ වර්ධනයක් ඇති කරන්න ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට ප්‍රදේශ ඉලක්ක කර ගත්ත වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඔබතුමන්ලා දැන් "එක ගමකට, එක නිෂ්පාදනයක්" කියන වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ ආකාරයේ වැඩ පිළිවෙළක් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය මඟින් සිදු කරන්න අවධානය යොමු කරලා තිබෙනවාද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, දැනටමත් අපි එළු කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා තෙලහැර සහ ඉඹුලන්දණ්ඩ කියන රජයේ ගොවිපොළවල් දෙකේ ඉන්දියාවෙන් ආනයනය කරන ලද උසස් වර්ගයේ එළුවන් ඇති කරනු ලබනවා. බොහෝ වෙලාවට දේශීය වශයෙන් එළිවිය්‍යකගෙන් ලැබෙන්නේ දිනකට කිරි ලීටර් භාගයක් හෝ ලීටරයකට ආසන්න ප්‍රමාණයක්. හැබැයි, විදේශීය රටවලින් ආනයනය කරන ලද එළිවිය්‍යකගෙන් කිරි ලීටර් දෙකත්, තුනත් අතර ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්. දැනට අමාත්‍යාංශය යටතේ පවතින NLDB ගොවිපොළවල් හතරක පමණ මේ වැඩ කටයුත්ත සිද්ධ වෙනවා. මම හිතන විධියට ඒ තුළින් එළු කිරි නිෂ්පාදනය වැඩි කරන්න රජය පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේම කවුරු හරි ගොවි මහතෙක් කැමැත්තක් දක්වනවා නම්, ඒ සඳහා අවශ්‍ය කෘත්‍රිම සිංචන වැඩසටහන් සහ අනෙකුත් සහනාධාර ලබාදීලා ඒ සම්බන්ධයෙන් උනන්දු කරවීමටත් කටයුතු කරගෙන යනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අද දවසේ මගේ දෙවැනි ප්‍රශ්නය තුළින් ඔබතුමාගෙන් ඇසුවේ එළ කිරි නිෂ්පාදනය ගැනයි. දැන් මම මේ ප්‍රශ්නයෙන් ඔබතුමාගෙන් අහන්නේ එළු කිරි නිෂ්පාදනය ගැනයි. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් කථා කරන කොට අපි දන්නවා, ලංකාවේ විශ්වවිද්‍යාලවලින් පිටවන පශු වෛද්‍ය උපාධිධාරී වෛද්‍යවරුන් සංඛ්‍යාව ඉතා සීමිත බව. එක පැත්තකින් අපේ රටේ කුකුළු නිෂ්පාදනය ඉහළ යනවා නම්, එළ හරක්, මී හරක් සහ එළුවන්ගේ වැඩි ගහනයක් බලාපොරොත්තු වෙනවා නම්, අපි පශු කර්මාන්තයට වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. ඒ සඳහා නියත වශයෙන්ම පශු වෛද්‍යවරුන් වැඩි පිරිසක් රටට අවශ්‍ය වෙනවා. ඒ වාගේම මේ ක්ෂේත්‍රය ආශ්‍රිත අනෙකුත් තලයන්හි නිලධාරීන් වැඩි කිරීමත් අවශ්‍ය වෙනවා. ඒ සඳහා ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වුණු වැඩ පිළිවෙළක් පිළිබඳව අවධානය යොමු කළ යුතුව තිබෙනවා. මොකද, එක පැත්තකින් සතුන්ගේ ගහනය වර්ධනය කිරීමත් එක්කම, අනෙක් පැත්තෙන් ඒ සතුන්ට ඇති වන ලෙඩ රෝග අවම කරන්න, මර්දනය කරන්න, ඖෂධ ලබා දෙන්න සහ සතුන්ගේ පෝෂණය සම්බන්ධයෙන් කටයුතු කරන්නත් සිද්ධ වෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයට තිබෙන දැක්ම මොකක්ද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මේ අවුරුද්ද තුළ පශු වෛද්‍යවරුන් 350කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. නමුත් විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, පශු වෛද්‍යවරයාගේ කාර්යයට වැඩිය AIලාගේ කාර්යය මේ සඳහා වැඩියෙන් අවශ්‍ය වන බව. මේ නිෂ්පාදන වැඩ කටයුතු වෙනුවෙන් අප රජය මඟින් නවසීලන්ත රජයේ ආධාර උපකාර ඇතිව ලබන අවුරුද්දේදීත්, ඊළඟ අවුරුද්දේදීත් දහසක කණ්ඩායමක් පුහුණු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ ඒ කටයුත්ත කළොත්, විශේෂයෙන්ම සත්ව පාලනයේදී එළුවන්, ගවයන් සහ කුකුළන් යනාදී සතුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනවා වාගේම ඒ තුළින් වැඩි ගොවීන් ප්‍රමාණයකට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අපට පුළුවන් වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15-738/'16-(1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

පොලිස් අත්අඩංගුවේ සිටි පුද්ගලයකු මිය යෑම
பொலிஸ் காவலில் இருந்த நபரொருவரின் இறப்பு
DEATH OF A PERSON IN POLICE CUSTODY

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය මතු කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

පසු ගිය සෙනසුරාදා (සැප්තැම්බර් 17 දින), නුවරඑළිය දිස්ත්‍රික්කයේ පුස්සැල්ලාව පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන පොලිස් සිර කුඩුවේ රඳවාගෙන සිටි නඩරාජා රාමචන්ද්‍ර තරුණ මහතා එම පොලිස් භාර කුටියේ ජීවිතක්ෂයට පත්ව ඇත. ඒ ගැන අප කාගේත් කනගාටුව පළ කර සිටින අතර, එවැනි දේ සිදු වීමට ඉඩ තැබීම සම්බන්ධයෙන් අපගේ අප්‍රසාදයත්, පිළිකුල්භාවයත් ප්‍රකාශ කරන්න කැමැතියි.

1. පුස්සැල්ලාව රොස්ලන්ඩ් වතුයායේ පදිංචි මේ මහතා 28 හැවිරිදි තරුණයෙක් බව දන්නේද යන්න ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මම පළමුවෙන්ම අසන්නට කැමැතියි. පොලිස් සිර කුඩුවේ, කමිසයක ආධාරයෙන් එම මළ සිරුර එල්ලී තිබූ බව සොයා ගෙන ඇති බව පිළිගන්නේද, නැද්ද?

   මා මිත්‍ර දිගම්බරම් අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ සිටින නිසා මේ කාරණය ඉතාම වැදගත්.

2. වතුකරයේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සහ පොලිස් අත් අඩංගුවට ගන්නා පුද්ගලයකුගේ ජීවිතය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පොලීසිය වග කිව යුතු බැවින්, පොලිස් සිර කුඩුවේදී නඩරාජා රාමචන්ද්‍ර තරුණයාගේ ජීවිතය නැති වීම අපි තරයේ හෙළා දකිනවා. එපමණක් නොව, "ඒ පිළිබඳ වහා විශේෂ පරීක්ෂණයක් සිදු කර, එයට වග කිව යුත්තන්ට එරෙහිව නීති මඟින් කටයුතු කිරීමට රජය පියවර ගන්නවාද?" කියන ප්‍රශ්නය මා පැහැදිලිව අසන්න කැමැතියි.

   Hon. Speaker, I just want to draw your attention to "The Island" newspaper of 19th September, 2016, which gives a front-page coverage of this incident. I quote:

   "Pussellawa tense after police cell death."

   The front page of "Daily Mirror" newspaper of 19th September, 2016 has also reported this incident. I quote:

   "Man dies in police cell:...."

   These are the titles. I do not want to read through. I only want to give reference.

3. දැනට එම ප්‍රදේශයේ උද්ගත වී ඇති තත්ත්වය කුමක්ද? පොලිස් අත් අඩංගුවට පත් නඩරාජා රාමචන්ද්‍ර මහතා මිය ගියා. ඔහු මිය ගිහින් තිබෙන්නේ පොලිස් අත් අඩංගුවේ සිටියදීයි. පොලීසියට ගෙන ආ කෙනෙකු පොලිස් අත් අඩංගුවේදී මිය යන්න බැහැ. දෙමළ වේවා, සිංහල වේවා, මුස්ලිම් වේවා, ඒ ජීවිතය පිළිබඳව පොලීසිය වග කියන්න ඕනෑ. වතු කම්කරුවන් කියන්නේ, ලංකාවේ ජීවත් වන ඉතාම දුක්ඛිත ජනතා කොට්ඨාසයයි. ගෙදර සිටි මනුෂ්‍යයකු පොලීසියට ගෙන ගියාට පස්සේ පොලීසියේදී මිය ගියාම රජය නිශ්ශබ්දව සිටින්නේ ඇයි? එම ප්‍රදේශයේ ජනතාවට ජීවිතාරක්ෂාව ලබා දීමට, - වතු කම්කරුවන් රාශියකගේ ජීවිතවලට ආරක්ෂාව ලබා දීමට- රජය දැන් කටයුතු කරනවාද? මා අහන්නේ නැහැ, "පොලිස් ආරක්ෂාව ලබා දීමට කටයුතු කරනවාද?" කියා. ඔවුන්ට ජීවිතාරක්ෂාව ලබා දීමට රජය කටයුතු කරනවාද? එසේ නම්, ඒ සඳහා ගන්නා පියවර මොනවාද?

ගරු කථානායකතුමනි, මෙය ඉතාම බරපතළ තත්ත්වයක්. පොලීසියට ගෙනා තරුණයකු, පොලීසිය ඇතුළේදී මිය ගිහින් තිබෙනවා. ෂර්ට් එකක් එල්ලා පෙන්නුම් කරන්න හදනවා, ෂර්ට් එකෙන් එල්ලී ඒ තරුණයා මිය ගියා කියා. මා ඒ පිළිබඳව අවසාන කථාවක් කියන්න යන්නේ නැහැ. නමුත්, පොලිස් කූඩුවේදී ඒ තරුණයා මිය ගිහින් -ජීවිතක්ෂයට පත් වෙලා- තිබෙනවා. එය, මිනිස් ජීවිතයක් පිළිබඳ, හුස්ම ගන්නට තිබෙන අයිතිය පිළිබඳ බරපතළ ප්‍රශ්නයක්. පොලිස් කූඩුවට ගෙන ආ, පොලිස් කූඩුව ඇතුළේ හුස්ම ගනිමින් සිටි නඩරාජා තරුණයාගේ මිය යෑම ගැන පිළිතුරක් දෙන්න කියා මා අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා එයට පිළිතුර ලබා දෙනවා ඇති.

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ අද දින ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් අසන ලද ප්‍රශ්නවලට මම පිළිතුර දෙනවා.

> මෙම මිය ගිය තරුණයා පුස්සැල්ලාව, රොස්වයිල් වත්ත, වයිආර්සී කොටසේ පදිංචිකරුවෙකු වන අවුරුදු 30ක් වසසැති කම්කරුවෙකි. බලපත්‍ර නොමැතිව වැඩිපුර මහරා මිලිලීටර් 750 ළඟ තබා ගැනීම පිළිබඳ වරදට අත් අඩංගුවට ගෙන හෙල්බොඩ ම/උ 41889 යටතේ අධිකරණයට ඉදිරිපත් කර ඇත. ඔහුට එරෙහිව ප්‍රජා සේවය කඩකිරීම සම්බන්ධයෙන් වරෙන්තු නිකුත් වී ඇත. වරෙන්තුවේ ඉදිරි දිනය 2016.09.21 වේ.
>
> මෙම වරෙන්තුකරු ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් 2016.09.17 දින පුස්සැල්ලාව නගරයේදී පැය 16.40ට අත් අඩංගුවට ගෙන ඇත.
>
> මෙම සැකකරු පැය 17.15ට සිර මැදිරියේ රඳවා ඇත. ඇඳ සිටි ඇඳුම් ලෙස කොළ පැහැති ටීෂර්ටය සහ නිල් පැහැති ඩෙනිම් කලිසම පමණක් තිබූ බවත්, බාහිර තුවාල නොමැති බවත් සටහන් යොදා ඇත. ඉන් පසු පැය 18.15ට සහ පැය 18.45 ට සිර මැදිරි පරීක්ෂා සටහන් යොදා ඇත. මේ රඳවුම් මැදිරියයි, සිර මැදිරියයි අතර, මීටර් 6.3ක පමණ දුරක් තිබෙනවා. කෙළින්ම ඇතුළත පේන්නේ නැහැ. පොලීසියේ රෙගුලාසියක් තිබෙනවා, පැය බාගයෙන් බාගයට රඳවියන් පරීක්ෂා කළ යුතුය, සටහන් කළ යුතුය කියා. සාමාන්‍යයෙන් රඳවුම් මැදිරියයි, reserve එකයි තිබෙන්නේ, පේන දුරකින්. මේක ඊට වඩා විශේෂ අවස්ථාවක්. මේ පොලීසියේ ඒක එහෙම කෙළින්ම පේන්නේ නැහැ ගරු කථානායකතුමනි. පැය 18.45ට තමයි අවසන් සටහන් තබා තිබුණේ.

පැය 19.40ට පමණ උප සේවා රාජකාරියේ යෙදී සිටි නිලධාරියා හට- ඒ කියන්නේ පැයක වෙනසක් තිබෙනවා. අර පැය භාගයෙන් භාගය වෙන්න ඕනෑ පරීක්ෂණයයි, සටහනයි වෙලා නැහැ. - සිර මැදිරිය තුළින් ශබ්දයක් ඇසී දොර අසළට ගොස් පරීක්ෂා කිරීමේදී සැකකරු ඇඳ සිටි ටීෂර්ට් එක මහින් බිම සිට ඉහළට ඇති කම්බි කූරු වල ගැට ගසා ගෙල වැල ලාගෙන පිට කම්බි කූරුවල ගෑවෙන සේ දහලමින් සිටිනු දර්ශනය වී ඇත. එවිට ස්ථානයේ අනෙක් නිලධාරීන්ගේ සහාය ඇතිව ප්‍රධාන දොර විවෘත කර සැකකරු එල්ලී ඇති ටී ෂර්ටය කම්බි කූරුවලින් සහ ගෙලින් ගලවා ඉවත් කර ඇති අතර, අසාධ්‍ය තත්ත්වය හේතුවෙන් වැඩි දුර ප්‍රතිකාර සඳහා රෝහල් ගත කිරීමට රැගෙන ගොස් රෝහල් ගත කිරීමේදී වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර බලා සැකකරු මිය ගොස් ඇති බව දැනුම් දී ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් 2016.09.18 වන දින ගම්පොල ම/උබී 8442/2016 යටතේ අධිකරණයට කරුණු වාර්තා කර වැඩබලන මහෙස්ත්‍රාත්වරයා විසින් මහෙස්ත්‍රාත් පරීක්ෂණ සිදුකර 2016.09.23 වන දින වැඩිදුර කැඳවීමට නියම කර පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙස රජයේ අධිකරණ වෛද්‍ය නිලධාරී ජේරාදෙණිය රෝහල වෙත නියෝග නිකුත් කර ඇති බවත්, ඒ අනුව ජේරාදෙණිය රෝහලේ පශ්චාත් මරණ පරීක්ෂණය 2016.09.18 වන දින සිදු කර ඇති බව වාර්තා කර ඇත. ඒ පශ්චාත් මරණ පරීක්ෂණයේදී විවෘත තීන්දුවක් ලබා දී තිබෙනවා. ඉන් අනතුරුව ශරීර කොටස් රජයේ රස පරීක්ෂක වෙත යවා තිබෙනවා. මහේස්ත්‍රාත් පරීක්ෂණය අර මා කියූ 2016.09.23 වන දින පැවැත්වීමට නියමිතයි. එදිනට මෙම සිද්ධිය සම්බන්ධව සියලුම සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතයි.

2. සහකාර පොලිස් අධිකාරීවරුන් දෙදෙනෙකු ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම සිදුවීම් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කර ගෙන යනු ලබන අතර, පොලිස් නිලධාරීන් විසින් කිසියම් රාජකාරී පැහැර හැරීමක් හෝ විනය විරෝධී ක්‍රියාවක් සිදු කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් නිසි විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා කටයුතු කරනු ඇත. සිද්ධියට අදාළව කරන ලද මූලික විමර්ශනයෙන් අනතුරුව සිදුවීම වූ දින ස්ථානයේ කාර්ය භාර නිලධාරිවරයාගේ සහ උපසේවා රාජකාරී නියුතු නිලධාරියාගේ වැඩ තහනමකට ලක් කර ඇති අතර, ස්ථානාධිපති වරයා තාවකාලික ලෙස ගම්පොල මූලස්ථාන පොලිස් ස්ථානයට මාරු කර ඇත.

ගරු කථානායකතුමනි, වතුකරයේ පමණක් නොවෙයි, සියලු ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමේ වගකීම පොලීසියට තිබෙනවා. එය පැහැර හරින්න පොලීසිය කටයුතු කරන්නේ නැහැ. එය ආරක්ෂා කරන්න තමයි, අප කටයුතු කරන්නේ. ඒ වාගේම පොලිස් අත්අඩංගුවේ සිටින රඳවියන්ගේ ජීවිත ආරක්ෂාව පිළිබඳවත් විශාල වගකීමක් තිබෙනවා. මම කලින් සඳහන් කළ පරිදි සටහන් තැබීම ආදිය පැය භාගයෙන් භාගයට කළ යුතුව තිබෙනවා. මෙම තත්ත්වයට තව උදව් දීම පිණිස සියලු පොලිස් ස්ථානවල සිර මැදිරිවල CCTV පද්ධති ස්ථාපිත කරන්න අවශ්‍ය නීතිමය පසුබිම බලන්නය; එයට සැලසුම් හදන්නය; ඒ සඳහා මුදල් ඉල්ලන්න කටයුතු කරන්න සූදානම් වෙන්නය කියා මම නියෝග කර තිබෙනවා.

[ගරු සාගල රත්නායක මහතා]

3. 2016.09.19 වන දින පුස්සැල්ලාව පොලිස් වසම තුළ කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැති අතර, ප්‍රදේශවාසී වතු කම්කරුවන් 600කගේ පමණ සහභාගිත්වයෙන් මෘත දේහයේ අවසන් කටයුතු නව මොරපේ පොදු සුසාන භූමියේදී සිදු කර ඇති අතර, අතිරේක නිලධාරීන් යොදවා ප්‍රදේශයේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ක්‍රියා කරන ලද අතර, දැනට නගරයේ ජන ජීවිතය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වෙමින් පවතී.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, ගරු සාගල රත්නායක මැතිතුමා පැහැදිලි කිරීමක් කළා. තවත් පැහැදිලි කිරීම අවශ්‍යද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මට තව එක පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ගරු ඇමතිතුමා පිළිගන්නවා, පොලීසිය මේ මියගිය පුද්ගලයා අත් අඩංගුවට ගත් වේලාව සහ ඔහු පොලිස් සිර කූඩුවට ගෙන ගිය වේලාව. පොලිස් අත්අඩංගුවේ සිටියදී කෙනෙකු මිය යෑම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් මෙතැන මතු වෙන බවත් ගරු ඇමතිතුමා පිළිගන්නවා නම් හොඳයි කියා මා හිතනවා. මොකද, පොලීසිය කවුරු හරි පුද්ගලයෙකු -ජීවිතයේ හුස්ම අදින කෙනෙකු - ගෙනාවා නම් ඒ ජීවිතයට පොලීසිය වග කියන්න ඕනෑ. ප්‍රශ්නය මේකයි. පළමුවැනි ප්‍රශ්නය මේකයි. එහෙම වතුකරයේ ද්‍රවිඩ කම්කරුවන් - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, 23 වැනි දා පරීක්ෂණයක් කරනවා නම් -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේක මිනිස් ජීවිතයක් පිළිබඳ ප්‍රශ්නයක්. හොරකම් කිරීමක් නොවෙයි, මිනිස් ජීවිතයක් පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක හරි. දැන් ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා, 23 වැනි දා ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වනවා කියා. ඊට පසුව මොනවාද වෙන්නේ කියා අපි බලමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ වතු කම්කරුවන්ට සම්බන්ධ දිගම්බරම් ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. නමුත් එතුමාත් නිශ්ශබ්දයි.

ගරු සාගල රත්නායක මහතා
(මාණ්පුමිකු සාකල රත්නායක්ක)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳව අපිත් -රජයත්- බොහෝ සෙයින් කනගාටු වෙනවා. මම ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට හොඳින්ම තේරෙන භාෂාවෙන් කරුණු පැහැදිලි කර දුන්නා, අපි වගකීම ගන්නවාය කියා. [බාධා කිරීමක්] එතැන අඩු පාඩුවක් වෙලා තිබුණා. ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. වැඩිදුර පරීක්ෂණ කරනවා. ඉන් පසුව අවශ්‍ය කටයුතු ඉදිරියටත් කරනවා. මීට වඩා මොනවා කියන්නද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
The Hon. Minister has given an explanation to your Question.

හොඳයි. ඊළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

II

ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
சர்வதேச உடன்படிக்கைகள் பற்றி மக்களுக்கு அறிவூட்டல்
PUBLIC AWARENESS ON INTERNATIONAL AGREEMENTS

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 23 (2)இன் கீழ் இவ்வினாவை அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர் கௌரவ மலிக் சமரவிக்ரம அவர்களிடம் கேட்பதற்கு அனுமதியளித்தமைக்கு முதலில் உங்களுக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன்.

சீனா, இந்தியா மற்றும் சிங்கப்பூர் ஆகிய நாடுகளுடன் இவ்வருட இறுதிக்குள் வர்த்தக உடன்படிக்கைகள் மேற் கொள்ளப்படுமென்று தாங்கள் கூறியதாக ஊடகங்களில் செய்திகள் வெளிவந்திருந்தன. இது வரவேற்கத்தக்க விடய மாகும். எந்தவொரு நாட்டுக்கும் தனித்து அதன் விடயங்களை முன்னெடுக்க முடியாதநிலை இன்று இருப்பதை நாம் ஏற்றுக்கொள்ளவேண்டும். அவ்வாறு இயலுமானதொரு நிலை இருப்பினும், அந்த நாட்டில் நட்டங்கள் அதிகரித்தால், இன்னொரு நாட்டுடன் உடன்படிக்கைகள் செய்துகொண்டு இலாபத்தைப் பெற்றுக்கொள்ளவேண்டிய நிலை ஏற்படுகிறது. இலங்கையைப் பொறுத்தவரையில், எந்தவொரு உடன் படிக்கையையும் ஆளும் கட்சி நல்லது எனக் கூறினால், எதிர்க் கட்சியானது அதனைத் தீமையானது என்றே கூறுவது வழக்கம்.

பொதுவாக எந்தவொரு நாடும் அபிவிருத்தியடைந்த அல்லது அபிவிருத்தியடைந்துவருகின்ற நாடுகளுடன் உடன்படிக்கையொன்றினை மேற்கொள்ளும்போது, அது தொடர்பில் அறிவார்ந்த மதிப்பீடொன்றைச் செய்வதோடு, அதனை மக்களுக்கும் தெளிவுபடுத்த வேண்டும். தகவலறியும் சட்டமூலம் நிறைவேற்றப்பட்டுள்ள நிலையில், எமது நாட்டு மக்கள் இவ்வாறான ஒப்பந்தங்கள் தொடர்பில் அறிந்து கொள்ளக்கூடாது என்ற விதிமுறைகள் ஏதும் இருக் கின்றனவா?

இவ்வாறான உடன்படிக்கைகள் தொடர்பில் எமது மக்கள் மத்தியில் பல்வேறு கருத்துக்கள் நிலவுகின்றன. குறிப்பாக, "எட்கா" ஒப்பந்தம் தொடர்பில் எமது நாட்டு மக்களிடையே அதற்கு முரணான கருத்துக்களே காணப்படுவதாகத் தெரிய வருகிறது. எனவே, இத்தகைய உடன்படிக்கைகள் தொடர்பில் எமது மக்கள் தெளிவாக அறிந்திருக்க வேண்டியது அவசியமாகும். ஏனெனில், இவ்வாறான உடன்படிக்கைகள் மூலம் ஏதேனும் நட்டமேற்பட்டால் அந்த நட்டத்தை ஈடுசெய்ய வேண்டியவர்கள் எமது மக்களே!

இதற்கு முன்பதாக மசகு எண்ணெய் தொடர்பில் உடன்படிக்கையொன்று மேற்கொள்ளப்பட்டு, உலக சந்தை யில் மசகு எண்ணெயின் விலை குறைந்த நிலையிலும் உடன்படிக்கை செய்யப்பட்டிருந்த விலைக்கே மசகு எண்ணெயை இறக்குமதி செய்யவேண்டிய நிலை எமக்கு ஏற்பட்டதாகவும் "ஹெஜின்" ஒப்பந்தம்மூலம் எமது நாட்டுக்குச் சுமார் 7,000 கோடி ரூபாய் நட்டமேற்பட்டதாகவும் ஏற் கெனவே ஊடகங்களின் மூலமாக அறியக்கிடைத்துள்ளன. எனவே, நாங்கள் மேற்கொள்ளப்போகின்ற உடன்படிக்கைகள் எமது நாட்டுக்கும் எமது மக்களுக்கும் எந்தெந்த வழிவகைகளில் நன்மை பயக்கும் என்பதை ஆராய்ந்து, அது தொடர்பில் எமது மக்களுக்கு அறிவுறுத்தப்படல் வேண்டும்.

மேற்படி உடன்படிக்கைகளால் எமக்கு ஏற்படுகின்ற நிதி மற்றும் சேவைகள் மூலமான இலாபங்கள், நாட்டின் தொழில்வாய்ப்பின்மையைக் குறைப்பதற்கான பங்களிப்பு, அபிவிருத்திக்குப் பங்காற்றும் வழிகள், அவை சூழலுக்குப் பாதிப்பினை உருவாக்கும் தன்மைகள் போன்ற விடயங்கள் தொடர்பில் விளக்க முடியுமா?

எதிர்பாராத வகையில், எமது நாட்டுக்கு நட்டம் அல்லது பாதிப்பு ஏற்படுமானால், இந்த உடன்படிக்கைகளிலிருந்து விலக முடியுமா?

ஒப்பந்தங்கள் நடைமுறையாகும்போது ஏற்படக்கூடிய இடைக்காலப் பெறுபேறுகள் குறித்துக் கூறமுடியுமா?

இந்த ஒப்பந்தங்கள் மக்களுக்கு எந்தளவுக்கு நன்மை யானவை என்பது குறித்தும் இவை எமது மக்களுக்குப் பாதிப்பை உண்டுபண்ணக்கூடிய வாய்ப்புகள் உள்ளனவா என்பது குறித்தும் கூறமுடியுமா?

இவை எமது நாட்டின் ஏனைய சேவைகள் மற்றும் பொருட்களின் விலைப்பட்டியலுடன் எந்தளவுக்குப் பாதிப்பினை ஏற்படுத்தும் என்பது பற்றியும் கூறமுடியுமா?

மேற்படி கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப்படக் கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவார் என எதிர்பார்க் கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා ඉන්නවා. ඔබතුමා පිළිතුරු දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
The Hon. Minister will answer that Question tomorrow.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

මහජන බැංකුවෙහි ඩිජිටල්කරණයට අදාළ දෘඪකාංග මිලදී ගැනීම: රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

மக்கள் வங்கியின் டிஜிடல் திட்டத்துக்கான வன்பொருள் கொள்வனவு : அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சரின் கூற்று

PURCHASE OF HARDWARE FOR DIGITALIZATION OF PEOPLE'S BANK: STATEMENT BY MINISTER OF PUBLIC ENTERPRISE DEVELOPMENT

ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

Hon. Speaker, the Ministry of Public Enterprise Development is responsible for ensuring good governance at State-owned institutions. These institutions have independent Boards of Directors. The Directors, along with the management, have the mandate to oversee the day-to-day operations and make commercially-viable decisions. However, as State institutions, those are bound by the Government regulations and processes. Under the guidance of His Excellency Maithripala Sirisena and the Prime Minister, the Hon. Ranil Wickremesinghe, we are committed to transparency and accountability, which are two of the fundamental pillars of Good Governance.

The Question raised with reference to a tender floated for the procurement of hardware as part of the digitalization initiative at the People's Bank is one that is still in process and has not been awarded. The tender has an estimated spend of US Dollars 4.5 to 5.5 million over a period five years. The Hon. Member raised a question about the duration of the tender period. The management at the People's Bank had provided five days for bidders to provide responses to the RFP. Subsequently, this was extended to two weeks, based on a request made by one of the vendors. The Hon. Member of Parliament has also questioned the tendering process and requested an inquiry be held.

[ගරු කබීර් හාෂිම් මහතා]

Furthermore, some media outlets have sensationalized this and cast aspersions on the integrity of the Bank. There has not been any formal complaint to the Ministry or to any authority officially, except allegations made through newspapers. I would like to inform the House that the Board of Directors had decided to call for two expert opinions on the process of selection of the tender. I will also ensure that the Secretary of the Ministry will be engaged with the People's Bank to look into the appointment of the said two experts to get their opinions and will also ask the Secretary to ensure that the due processes have been adhered to.

Thank you.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Speaker this is a question in relation to a tender and the tender procedure had apparently not been followed. That is why I raised the issue. The Hon. Minister also mentioned that the officials of the Ministry were advised to go into the matter. The "Ceylon Today" of Sunday, 11th September, 2016 reported this incident on one whole page under the heading "People's Bank in 'cover-up' mode" - I do not want to go into the matter - stating that three Directors had objected or questioned the relevant decision and complained to higher authorities about the violation of this tender procedure. Now, that is the question before us, which should be addressed and corrected. That is all we are interested in. You should take steps to correct it. In addition to that, let me also tell you -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, time is a problem.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

The Hon. Minister will answer.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay. You just raise the question.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

The People's Bank will also run into difficulty, if we do not allow this problem to be cleared. The Hon. Minister has responded. I am not going to question the Hon. Minister. I am only trying to ask you, Hon. Minister, whether you will hold an inquiry so that the relevant people will be able to come for the inquiry and lay down the facts, because it has not been done so. There is propaganda that is being taken in. Very clearly, three Directors had objected to it and it is in black and white in the Minutes of the Board.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

The reason is, it has been transparent. There are Directors who can object and give their opinions. It was done. Still, the tender has not been awarded. There is no scandal involved because it is still in the process. The Board of the Bank itself has decided to seek two expert opinions to ensure that the process is transparent. So, we will definitely give the opportunity to anybody to make representations to the experts' committee and then, they can lay down the facts.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Have you appointed -

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

No, we have not yet appointed. But, the Board of Directors has already decided to do that. I will ask the Secretary to my Ministry to get involved in the process of getting the two experts'committee set up to get their opinion. It is very simple.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay, that is fine.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

But, Hon. Minister, there was a similar decision taken by this Board on awarding a US Dollars 11 million tender to Silverlake Axis, Malaysia. - [*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කියන මේ ටෙන්ඩරය තවම කාටවත් දීලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

That is what I am saying.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
It has not yet been awarded to anybody.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I know. The Hon. Minister has already replied.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The Central Bank has questioned this decision of the Board on awarding this.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, now you have devoted your attention to this, have you not?

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Speaker, I would like to answer that. If there were any allegations, then there is a process to follow. You can go and make a complaint. You can make a complaint to the Ministry or to the - [*Interruption.*] But, this is all on newspaper hearsay; there is no real fact. So, you have to come up with a complaint. - [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I only hope that the Hon. Minister would appoint a committee to hear any other - [*Interruption.*]

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Yes, certainly. We are open to that.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is fine. We will leave it at that.

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
I will ask the Secretary to work with the Board of the People's Bank to have a committee appointed to get the opinion of anybody who is interested.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is fine. Now, that matter is closed.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
Hon. Speaker, we have to be very careful because this is a tender which has not yet been finalized by the People's Bank. When, the newspapers publish one full-page article, it can put the reputation of the Bank in risk. So, let the tender process take place and then we can look at what happens. Now, the Hon. Minister is having an eye on it. But, when different newspapers run on this, on which the Hon. Minister has had no complaint, sometimes the reputation of the Bank can be at risk.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. මීළඟට, ගරු එස්.බී. දිසානායක මහතා.

උතුරු සහ නැඟෙනහිර පළාත්වල ආබාධිතවූවන් මුහුණ දෙන ගැටලු : සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் மாற்றுவலுவுள்ளோர் முகங்கொடுக்கும் பிரச்சினைகள் : சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சரினது கூற்று

PROBLEMS FACED BY THE DISABLED IN NORTHERN AND EASTERN PROVINCES: STATEMENT BY MINISTER OF SOCIAL EMPOWERMENT AND WELFARE

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා 2016.07.21වන දින ස්ථාවර නියෝග 23(2) යටතේ අහපු මේ ප්‍රශ්නය ටිකක් දිග ප්‍රශ්නයක්. මම බොහොම කෙටියෙන් පිළිතුරු දෙන්නම්, ඊට අවශ්‍ය ලියකියවිලි සියල්ලම මා එතුමාගේ අතට පත් කරන්නම්.

විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා රුපියල් 3,000ක දීමනාවක් ලබාදීම. මේ සඳහා යාපනයේ 6,491දෙනෙක් ඉල්ලුම් කර තිබෙනවා; දැනට 210 දෙනෙකුට තමයි අපි දෙන්නේ. වවුනියාවේ 3,015දෙනෙක් ඉල්ලුම් කරලා තිබෙනවා; 425කට තමයි දැනට දෙන්නේ.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
In Jaffna, out of about 6,000 people, they are giving money only to 2,010 people, not to 210 people.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
We are giving Rs. 3,000.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Yes, Rs. 3,000. But, to 2,010 people, not to 210 people.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
I am talking about the whole district. I will give the figures district by district. යාපනයේ ඉල්ලුම් කරලා තිබෙන්නේ, 6,491දෙනායි; 210දෙනෙකුට දෙනවා. වවුනියාවේ 3,015දෙනෙක් ඉල්ලුම් කරලා තිබෙනවා; 425කට දෙනවා. කිලිනොච්චියේ 2,672දෙනෙක් ඉල්ලුම් කරලා තිබෙනවා; 474දෙනෙකුට දෙනවා. මුලතිව්වල 2,413දෙනෙක් ඉල්ලුම් කරලා තිබෙනවා; 672දෙනෙකුට දෙනවා. මන්නාරමේ 1,622ක් ඉල්ලුම් කරලා තිබෙනවා; අපි 422දෙනෙකුට දෙනවා.

ඊළඟට, සමෘද්ධි සහනාධාරය ලබා දීම. යාපනය දිස්ත්‍රික්කයේ 53,840දෙනෙකුට දැනට දෙනවා; 41,421දෙනෙක් ඉල්ලුම් කරලා තිබෙනවා. දැන් මේ සියලු දෙනා පිළිබඳව සමීක්ෂණ කටයුතු කරලා ඉවරයි. ඒවා පරිගණකගත කරලා තිබෙනවා. ඉදිරි කාලයේදී -ඔක්තෝබර් මාසය අවසන් වනවිට- ඒ තේරීම් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ ලේඛනය table කරන්න පුළුවන් නේද?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
පුළුවන්. ඒ ලේඛනය **table*** කරනවා.

ගරු කථානායකතුමනි, මෙතුමා රුපියල් 3,000 දීමනාව දීම ගැන අහලා තිබෙනවා.

පසු ගිය කාලය තුළ පැවැති යුද්මය වාතාවරණය තුළ උතුරු පළාතේ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බව පිළිගන්නා අතර, ඔවුන් සඳහා රුපියල් 3,000 දීමනාව ලබා දීමට අවශ්‍ය ක්‍රියා මාර්ග අපි ගන්නවා.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයෙන් ගෙවීම් කරනු ලබන උතුරු පළාතේ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා දැනට බලාපොරොත්තුවෙන් සිටින සංඛ්‍යාව ලේඛනගත කර තිබෙනවා. එය මා ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

ඊළඟට උතුරු පළාතේ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ට වැසිකිළි පහසුකම් ලබා දීම සඳහා අපි දැන් සැලැස්මක් හදලා තිබෙනවා. ඒ පිළිබඳ තොරතුරුත් ඔබතුමාට ලබා දෙන්නම්.

එමෙන්ම උතුරු ප්‍රදේශයේ විශේෂ අවශ්‍යතා ඇති විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් ලබා දීම ගැන කථා කර තිබෙනවා. මේ ගැනත් අපි හිතනවා. හැබැයි, මේක අදාළ වෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයටයි. එහෙම නැත්නම් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයටයි. ඒ අවශ්‍ය තොරතුරුත් අපි මෙහි සඳහන් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ආබාධිත පුද්ගලයන්ට දීපු රුපියල් 750 ගමන් වියදම් දීමනාව සඳහා පසු ගිය කාලයේ ප්‍රතිපාදන වෙන් කර තිබුණේ නැහැ. ඒක අපි ඉල්ලා තිබෙනවා. ඒකට ප්‍රතිපාදන දෙන්න මුදල් අමාත්‍යාංශය එකඟ වෙලා තිබෙනවා. ඒ නිසා එය ඉදිරි කාලයේ ලබාදෙන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. අනෙකුත් මාසික දීමනා, වෛද්‍යාධාර, නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර, මාසික වකුගඩු දීමනා, අධ්‍යාපන ආධාර, තනි මාපිය පවුල් දීමනා මේවා පිළිබඳ විස්තරත් තමුන්නාන්සේට දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා ඒ ඔක්කෝම **table*** කරන්න.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඊළඟට, සමෘද්ධි සහනාධාර පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙනවා. ඒ පිළිබඳ සමීක්ෂණ කටයුතු දැන් අවසන්. දැන් අපි ඒවා පරිගණකගත කරගෙන යනවා. ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම්තුමාත්, අතිරේක ප්‍රාදේශීය ලේකම්තුමාත්, එතැන ඉන්න සැලසුම් අධ්‍යක්ෂතුමාත්, මූලස්ථාන සමෘද්ධි කළමනාකාරතුමාත්, සමාජ සේවා නිලධාරිතුමාත් පත් කරලා තිබෙනවා, මේ තේරීම් කටයුතු කරන්න. ඒක ලබන මාසයේ ඉවර කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයින් පිරිසකගේ ක්‍රියාකලාපය : අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

அரசாங்க வைத்திய அதிகாரிகள் சங்க உறுப்பினர் சிலரது நடவடிக்கை : கல்வி அமைச்சரினது கூற்று

CONDUCT OF SOME MEMBERS OF GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION: STATEMENT BY MINISTER OF EDUCATION

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් අහිමි බවට පවසමින් පසු ගිය කාලය පුරා විවිධ සමාජ මතවාද නිර්මාණය කිරීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය උත්සාහ කරන ආකාරය දැකිය හැකි වුණා. එමෙන්ම ඔවුන් විසින්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

උද්ඝෝෂණ කිහිපයක්ද අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට පැවැත්වූ අතර, පෞද්ගලිකව මාගේ කීර්ති නාමයට හානි වන ආකාරයෙන් විවිධ මඩ පෝස්ටර් සහ අවලාද සිදු කරන අයුරු මාධ්‍ය හරහා ද අනාවරණය වුණා. පසු ගිය බදාදා මහජන දිනය දා උදෑසන අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයින් පිරිසක් රාජකාරී කාලයෙන් පසුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය තුළ රැඳී සිටීමින් විශාල මාධ්‍ය සංදර්ශනයක් සිදු කිරීමට උත්සාහ දැරුවා. එමෙන්ම ඔවුන්ගේ දරුවන්ට කිසිදු පාසලක් හෝ ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර නැතැයි පවසමින් ඔවුන්ගේ අරගලය සර්ව සාධාරණ එකක් ලෙස සමාජය ඉදිරියේ හුවා දැක්වීමට කටයුතු කිරීමට ඔවුහු උත්සාහ දැරුවා.

විෂය භාර අමාත්‍යාවරයා ලෙසත්, සමාජ සාධාරණය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමානාත්මතාව අගය කරන යහපාලන ආණ්ඩුවේ ඇමතිවරයකු ලෙසත් පසු ගිය දා සිදු වූ සියලු සිදුවීම් සම්බන්ධයෙනුත්, විශේෂයෙන්ම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලධාරීන් ඉදිරිපත් කරන චෝදනා සම්බන්ධයෙනුත් පැහැදිලි පිළිතුරක් රටේ ජනතාව ඉදිරියේ තැබීම මගේ යුතුකමක් ලෙස සලකනවා. ඒ අනුව තම පටු ආත්මාර්ථකාමී අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් රජයේ වෛද්‍ය නිලධාරීන් සිදු කරන ඉල්ලීම් සහ චෝදනා පිළිබඳ ජනතා පරමාධිපත්‍යයේ මුදුන් මල් කඩ වන "පාර්ලිමේන්තුව" තුළ සිටීමින් කරුණු අනාවරණය කිරීමට මා කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය තුළ බලහත්කාරයෙන් බදාදා දින රාත්‍රියෙහි රැඳී සිටි ඔවුන් සමස්ත ලංකා පාසල් චිත්‍ර තරගයේ ජය සංකේත ප්‍රදානෝත්සවයේ කටයුතු ද කඩාකප්පල් කර දැමුවේ තම දරුවන්ගේ පමණක් අයිතිවාසිකම් වෙනුවෙන් අනෙක් දරුවන්ගේ අයිතීන් උදුරා ගන්නා බව තව දුරටත් පසක් කරමින්. එදින රාත්‍රිය සම්පූර්ණයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය ඇතුළු පරිශ්‍රය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් සිය භාරයට ගෙන තිබුණා. රාජකාරී කටයුතු අවසන් බැවින් අමාත්‍යාංශ සේවකයින් ශ්‍රවණාගාරයේ විදුලිය විසන්ධි කොට නිවෙස් බලා ගොස් තිබුණා. මොවුන් බලහත්කාරයෙන් රැඳී සිටියේ එවැනි පසු බිමකයි. එහිදී අමාත්‍යාංශයේ ආරක්ෂාව සඳහා අනුයුක්ත කර සිටි සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ට ද තර්ජනය කරමින්, පහර දීම් සිදු කරමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නවීන් ද සොයිසා, නලින්ද හේරත් ඇතුළු පිරිසක් කටයුතු කළ ආකාරය පිළිබඳ සාක්ෂි අප සතුව තිබෙනවා. මාධ්‍ය හරහා ද මේ කරුණු අනාවරණය කෙරුණා.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් කොළඹ ජාතික රෝහලට අයත් LW 0752 දරන ගිලන් රථය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත බලහත්කාරයෙන් ඇතුළු කිරීමට කටයුතු කර තිබුණා. මෙම ගිලන් රථය පැමිණියේ රෝගියෙකු ගෙන යාමට බව පැවසුවත්, එම ගිලන් රථය ගෙන ඒමේ සැබෑ අරමුණ රාත්‍රියේ බලහත්කාරයෙන් රැඳී සිටි පිරිසට කෑම-බීම රැගෙන ඒම බව මාධ්‍ය හරහා නිකුත් වූ ඡායාරූප සාක්ෂි දරනවා. ඇමුණුම 1හි මේ සාක්ෂි ඔක්කෝම තිබෙනවා. ඇමුණුම 1 මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයට බලහත්කාරයෙන් ඇතුළු වී එහි රාත්‍රිය ගත කළ මෙම වෛද්‍යවරුන් පිරිස උත්සාහ කළේ මාධ්‍ය සන්දර්ශනයක් සිදු කිරීමටයි. එමෙන්ම අමාත්‍යාංශ ශ්‍රවණාගාරය තුළදී වාතාශ්‍රය නොමැතිවීම හේතුවෙන් එක් තැනැත්තියක් පමණක් විජලනයට ලක් වූ බව පවසන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ පිරිස අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ ඇති විශාල ජනෙල් විවෘත කොට සුව පහසුවෙන් රැය පහන් කරන ආකාරය දැක්වෙන ඡායාරූපද මාධ්‍ය මඟින් අනාවරණය කර තිබුණා. එබැවින් මෙය සම්පූර්ණ නාට්‍ය ජවනිකාවක් බව පැහැදිලියි. යම් පුද්ගලයෙකු රෝගී වූ විට ගිලන් රථයක් රැගෙන ආ යුත්තේ එම සිද්ධියට ආසන්නතම රෝහලෙනි. ඒ අනුව ආසන්නතම රෝහල් වන්නේ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සහ තලංගම රෝහලයි. නමුත්, කලාන්තය හැදුණු රෝගියෙකු රැගෙන යාමට කොළඹ ජාතික රෝහලෙන් ගිලන් රථයක් ගෙන ඒම සම්බන්ධයෙන් අප අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදු කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට දැනුම් දීමට කටයුතු කර තිබෙනවා.

විශේෂයෙන්ම කොළඹ ජාතික රෝහලෙන් ගිලන් රථයක් ගෙන්වන්නේ නම්, එහි ආයතන ප්‍රධානියාගේ අවසරය අවශ්‍ය වනවා. මෙහිදී කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂවරයාගේ නියෝගය ඒ සඳහා ලැබී තිබුණේද යන්න පිළිබඳව ජාතික රෝහල් අධ්‍යක්ෂවරයා පැහැදිලි කළ යුතුයි. රජයේ දේපළ, ජනතාවගේ මුදල් තමතමන්ට අවශ්‍ය විධියට මාධ්‍ය සන්දර්ශන සඳහා යොදා ගැනීමට කිසිවෙකුටත් ඉඩ නොතැබිය යුතුයි.

ගරු කථානායකතුමනි, යම් හදිසි අවස්ථාවකදී නම්, පොලීසිය හරහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ගිලන් රථයක් ඉල්ලා සිටිය යුතුයි. අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ බලය අභිනියෝජනය කරන නියෝජිතයෙකුගේ අවසර ඒ සඳහා තිබිය යුතුයි. මේ සියල්ල බැහැර කරමින් මේ කටයුතු සිදුවී ඇති බවට තොරතුරු වාර්තා වී තිබෙනවා. එමෙන්ම ගරු කථානායකතුමනි, ඒ තරමට අසාධ්‍ය මට්ටමේ රෝගියෙකු සිටියේ නම්, එම රෝගියා රෝහල්ගත කළ යුතුයි. නමුත් එසේ රෝහල්ගත කිරීමක් මේ දක්වා සිදු වී නොමැති බව තහවුරු වී තිබෙනවා.

එමෙන්ම ගරු කථානායකතුමනි, මෙම සිද්ධියේදී මාධ්‍ය ඉදිරියේ තමන් ජාතික රෝහලේ සහකාර අධ්‍යක්ෂවරයෙකු බව පවසමින් හැසිරුණු රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ප්‍රසාද් රණවීර නමැති පුද්ගලයා පිළිබඳව ද අප සෞඛ්‍ය අමාත්‍යාංශයට කරුණු වාර්තා කොට තිබෙනවා. කොළඹ ජාතික රෝහලේ සිටින්නේ අධ්‍යක්ෂවරයෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු පමණක් බව එම රෝහල් සනාථ කර තිබෙනවා. ව්‍යාජ තනතුරු ඉදිරිපත් කරමින් මාධ්‍ය නොමඟ යැවීම සහ රජයේ ආයතනයක කීර්තිනාමය තම වාසියට යොදා ගැනීම පිළිබඳ කරුණු හෙළි වී තිබෙන අතර, මෙවැනි වංචාවන් පිළිබඳව ද අප අනාවරණය කළ යුතුයි.

ආරක්ෂක නිලධාරීන්ගේ රාජකාරියට බාධා කරමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයන් හැසිරෙන අයුරු දැක්වෙන වීඩියෝ පට සහ එම කරුණු සනාථ කරමින් ඔවුන් පළ කළ අදහස්වලට අදාළ හඬපට ද අප සතුව තිබෙනවා. එමෙන්ම අමාත්‍යාංශයේ නිලධාරීන්ට වෙන් වූ රථ ගාල තුළට තම රථ ඇතුළු කරගත් ඔවුන් එම රථවල හුළං ඇර දැමීමට යම් පිරිසක් කටයුතු කර ඇති බව පවසමින් මාධ්‍ය ප්‍රචාරයක් ලබා ගැනීමට කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රයට බලහත්කාරයෙන් ඇතුළු වූ මෙම පිරිස තම රථවාහන නතර කිරීමට අමාත්‍යාංශ නිලධාරීන් සඳහා වෙන් කර ඇති පරිශ්‍රයේ මෙන්ම අමුත්තන් සඳහා වෙන් කොට ඇති පරිශ්‍රය ද යොදා ගෙන තිබුණා. එදින රාත්‍රියේ පොලීසිය සහ ආරක්ෂක නිලධාරීන් හැර වෙනත් කිසිවෙකු අමාත්‍යාංශයේ රැඳී නොසිටි බවට තොරතුරු ලැබී තිබෙනවා. ඒ අනුව ගරු කථානායකතුමනි, තමන්ගේ මෝටර් රථවල හුළං ඇර ඇති බව පැවසීමත් මොවුන්ගේ ගිලන්රථ ජවනිකාව මෙන්ම තවත් මාධ්‍ය සංදර්ශනයක්. අධ්‍යාපන

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

අමාත්‍යාංශයේ හැකි නම් ඒ සඳහා පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කරන ලෙසද මා ඔවුන්ට අභියෝග කරන්නට කැමැතියි. යම් කිසි අමාත්‍යාංශයක නිලධාරියෙකු හෝ එවැනි කඩාකප්පල්කාරී ක්‍රියාවක යෙදී ඇත්නම් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට මා සූදානම්. නමුත් පැහැදිලිවම මෙය නාට්‍ය ජවනිකාවක් බව මා නැවත නැවතත් තහවුරු කරන්නට කැමතියි. රටේ අධ්‍යාපන කේන්ද්‍රස්ථානයට බලහත්කාරයෙන් ඇතුළු වී තම පටු පෞද්ගලික අභිලාෂයන් වෙනුවෙන් කෑ ගසන මොවුන්ගේ සැබෑ නිරුවත සමාජය ඉදිරියේ අනාවරණය කිරීම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් මා විසින් සිදු කළ යුතු ජාතික වැදගත්කමින් යුත් කාර්යයක් ලෙස මම සලකනවා. සියලු ජනතාවට සමාන අයිතීන් ලබා දීම යහපාලන රජයේ වගකීම සහ යුතුකම බව මා නැවත වතාවක් මේ ගරු සභාවට අවධාරණය කිරීමට කැමැතියි.

ගරු කථානායකතුමනි, හොරණ සිට හෝමාගමට මාරු වූ වෛද්‍යවරයෙකු ඉල්ලා සිටිය යුත්තේ හෝමාගම ප්‍රදේශයට සමීප පාසලක් වුවත් එවැනි වෛද්‍යවරයෙකු කොළඹ රාජකීය විද්‍යාලය ඉල්ලා සිටීම කෙතරම් සාධාරණදැයි මම මේ උත්තරීතර සභාවෙන් ප්‍රශ්න කරන්න කැමතියි. මොනරාගල සිට නුවරඑළියට මාරු වූ වෛද්‍යවරයෙකු කොළඹ රාජකීය විද්‍යාලය ඉල්ලා සිටිනවා නම් මාරුව සහ පාසල අතර සම්බන්ධය කුමක්දැයි මා නැවත වතාවක් මේ සභාවෙන් ප්‍රශ්න කරන්න කැමතියි. බලංගොඩ සිට හෝමාගමට මාරු වී කොළඹ රාජකීය විද්‍යාලය ඉල්ලා සිටින වෛද්‍යවරයෙකුගේ ඉල්ලීම සාධාරණද? ගරු කථානායකතුමනි, මේ උදාහරණ කිහිපයක් පමණයි. මීට අදාළ සියලු තොරතුරු සභාගත කිරීමට මා කටයුතු කරනවා.

මව හෝ පියා මාරුවීමක් ලැබූ විට සේවයට යන ස්ථානයේ පාසලක් දරුවාට ලබා දීම සිදු කළ යුතු වුවත්, ඔවුන් දිවයිනේ කවර හෝ ප්‍රදේශයක රෝහලකට මාරුවීමක් ලැබූ විට කොළඹ හෝ ප්‍රධාන නගරවල ඇති ජනප්‍රියතම ජාතික පාසල් 12කටත් වඩා අඩු සංඛ්‍යාවක් සඳහා තම දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා උත්සාහ කිරීම කොතරම් යුක්ති සහගතද?

ගරු කථානායකතුමනි, මගේ මිත්‍රයෙකු මාහට සඳහන් කළ කාරණාවක් මා මතක් කරන්නට කැමතියි. ඔහු වෘත්තියෙන් නීතිඥවරයෙක්. ඔහුගේ පියා වෘත්තීය දුම්රිය සේවකයෙක්. මගේ මිත්‍රයා පාසල් කාලය තුළ අවස්ථා හයකටත් වැඩි සංඛ්‍යාවකදී පියාගේ රාජකාරී ස්ථාන මාරු මත පාසල් 6කට මාරු වී තිබෙනවා. මෙවැනි උදාහරණ ඕනෑ තරම් රාජ්‍ය සේවයේ සොයාගත හැකියි. අපි රාජකාරී ස්ථාන මාරුවීම් මත දරුවන්ට පාසල් ලබා දෙන්නේ ඔවුන්ගේ රාජකාරී පහසු කිරීම වෙනුවෙන් මිසක වෙනම කුලයක් ලෙස මතුවෙමින් අනිසි වරප්‍රසාද හිමි කර දීම වෙනුවෙන් නොවේ.

ගරු කථානායකතුමනි, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මාධ්‍ය ඉදිරියේ තමන්ගේ දරුවන්ට මාස නවයක් ගත වී ඇතත් කිසිදු පාසලක් හෝ ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වී ඇති බව පවසනවා. එබැවින් එහි සත්‍ය තොරතුරු සමාජය ඉදිරියේ අනාවරණය කිරීම වෙනුවෙන් දිවයිනේ අතිජනප්‍රිය පාසල් තම දරුවන්ට ලබා දෙන ලෙස ඉල්ලමින් වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම් නලින්ද හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ලද පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා වූ ලේඛනය මම ඇමුණුම 02 වශයෙන් **සභාගත*** කරන්නට කැමැතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, පාසල් වයස සම්පූර්ණ කළ ඕනෑම දරුවෙකු ගෙදර තබා ගෙන අධ්‍යාපන අයිතිය අහිමි කිරීම වරදක්. මේ වන විට 2016 වසර වෙනුවෙන් අපේ රටේ සියලු දරුවන්ට පාසල් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර තිබෙනවා. ජාතික පාසලක් වේවා, පළාත් පාසලක් වේවා දරුවෙකුගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් පාසලක් ලබා දීම අපේ වගකීමක්. ගරු කථානායකතුමනි, තමන්ගේ පුහු මාන්නය, පන්තිය ආරක්ෂා කිරීම වෙනුවෙන් තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපන අයිතියත් උදුරා ගන්නා මෙවැනි ආත්මාර්ථකාමී කණ්ඩායම් පිළිබඳව සියලුදෙනාගේම අවධානය යොමු විය යුතුයි.

ගරු කථානායකතුමනි, ඊයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සහකාර ලේකම් හරිත අලුත්ගේ සඳහන් කළා, අධ්‍යාපන අමාත්‍යාංශය ඔවුන්ගේ දරුවන්ට පාසල් ලබා දී නැති බව. ඒ වාගේම විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනයේ නිලධාරීන්ගේ, විනිශ්චයකාරවරුන්ගේ සහ විශේෂඥ වෛද්‍යවරුන් යැයි කියා ගන්නා පිරිසකගේ දරුවන්ට පාසල් ලබා දී ඇති බවත් ඔහු පැවසුවා. ගරු කථානායකතුමනි, සාධාරණ ඉල්ලීම් මත අවශ්‍ය ලිපි ලේඛන රැගෙන පැමිණෙන ඕනෑම නිලධාරියෙකුගේ ඉල්ලීමක් සලකා බැලීමේ වගකීම අපට තිබෙනවා. ඒ වාගේම, අපට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කියා විශේෂත්වයක් නැහැ. ගරු කථානායකතුමනි, ඒ අනුව අපි වෛද්‍යවරුන්ගේ දරුවන් 110 දෙනෙකුට පාසල් ලබා දී තිබෙනවා. නමුත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යෝජනා කළ පාසල් ප්‍රතික්ෂේප කරමින් සාකච්ඡාවලින් පවා ඉවත්ව ගිය බව නිලධාරීන් මා හට දැනුම් දුන්නා.

ගරු කථානායකතුමනි, ඊයේ පැවැති රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියෙක් වැදගත් ප්‍රශ්නයක් මතු කළා. ඔහු ඇහුවා, "ඇයි, මේ වෛද්‍යවරුන්ගේ දරුවන්ට සුපිරි පාසල් පමණක් ලබා දෙන ලෙස ඉල්ලන්නේ?" කියලා. එවිට එම සංගමයේ සහකාර ලේකම්වරයා ලබා දුන් පිළිතුරෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිරුවත සියල්ලන්ටම අනාවරණ වුණා. ඔහු පැවසුවා, "මේක වෘත්තිය සමිතියක්. අපේ සාමාජිකයෝ අපෙන් ඉල්ලීම් කරනවා. ඒ ඉල්ලීම් අපි අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කළාම ඔවුන් ඒ සඳහා පිළිතුරු ලබා දීමට බැඳී සිටිනවා." කියලා. ගරු කථානායකතුමනි, ඔවුන්ගේ සාමාජිකයන් ඔවුන්ගෙන් ඉර-හඳ ඉල්ලුවොත්, ඔවුන් ඒ යෝජනාවත් අපට ඉදිරිපත් කරාවි. ඔවුන්ට අනුව අප ඔවුන්ට ඉර-හඳ ලබා දීමටත් බැඳී සිටිය යුතුයි. මේ අසාධාරණ, අයුක්ති සහගත ඉල්ලීම්වලට අපට සාධනීය ප්‍රතිචාර දක්වන්න පුළුවන්කමක් නැහැ.

යහ පාලන රජයේ අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස ප්‍රජාතන්ත්‍රවාදී අධ්‍යාපන රටාවක්, අධ්‍යාපන ක්‍රමවේදයක් මේ රට තුළ බිහි කිරීම වෙනුවෙන් කැප වෙන බව මා නැවත නැවතත් අවධාරණය කරන්න කැමැතියි. අප බිහි කළේ යහ පාලනයක් මිස ආත්මාර්ථකාමී වෛද්‍යවරුන්ගේ අභිමතාර්ථ ඉටු කරන වහල් පාලනයක් නොවන බව මා සිහිපත් කරනවා. ඔවුන්ගේ ඉල්ලීම්වල ඇති හාස්‍යජනක කරුණ වන්නේ ඔවුන්ගේ කැමැත්තේ අනු පිළිවෙළ අනුව පාසල් තුනක් ඉදිරිපත් කර තිබීමයි. කොළඹ රාජකීය විද්‍යාලය තම දරුවාට ලබා දෙන ලෙස ඉල්ලුවේ නැති බව පුන පුනා කියන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලධාරීන්ගේ සැබෑ තත්ත්වය මෙම ලේඛන හරහා හොඳින් හෙළි වෙනවා. මෙම ලේඛනයට අනුව පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා අරගළ කරන නිලධාරීන් 21 දෙනෙකු අයදුම් කර තිබෙන්නේ කොළඹ රාජකීය විද්‍යාලයයි. ඔවුන්ගෙන් 16 දෙනෙකුගේ දෙවන කැමැත්ත තිබෙන්නේ කොළඹ ආනන්ද විද්‍යාලයටයි. කාන්තා පාසල් ගතහොත් 15

දෙනෙකු ඉල්ලා සිටින්නේ කොළඹ විශාකා විද්‍යාලයයි. 12 දෙනෙකු ඉල්ලන්නේ කොළඹ සිරිමාවෝ බාලිකා විද්‍යාලයයි. මේ පළමුවන ශ්‍රේණියට අදාළව පමණයි. කොළඹ රජකීය, ආනන්ද, විශාකා; මහනුවර ධර්මරාජ, කිංස්වුඩ්, මහාමායා, උසස් බාලිකා; කුරුණෑගල මලියදේව පිරිමි, කුරුණෑගල මලියදේව බාලිකා; ගාල්ල රිච්මන්ඩ්, ගාල්ල මහින්ද; මාතර සුජාතා වාගේ පාසල් විතරයි ඔවුන් බලාපොරොත්තු වෙන්නේ. ඊට අදාළව දරුවන් 112 දෙනෙකුගේ තොරතුරු ඇතුළත් ඇමුණුම 03 මම **සභාගත*** කරනවා. මේ පළමුවන ශ්‍රේණියට අදාළව පමණයි.

ගරු කථානායකතුමනි, ඊළඟ සෙල්ලම තිබෙන්නේ අතරමැද ශ්‍රේණි සඳහා දරුවන් ඇතුළත් කිරීමේදීයි. එම තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම 04 ලෙස මම **සභාගත*** කරනවා.

අතරමැද ශ්‍රේණි සඳහා දරුවන් ඇතුළත් කිරීමේදී 5 සහ 6 ශ්‍රේණිවලට දරුවන් ඇතුළත් කිරීමේ හැකියාවක් අපට නැහැ. නමුත් ඔවුන් ඒ සඳහාත් ඉල්ලීම් කර තිබෙනවා. අතරමැද ශ්‍රේණි සඳහා දරුවන් ඇතුළත් කිරීමේදී සිදු වන දූෂණ සහ අක්‍රමිකතා පිළිබඳව මම කරුණු හෙළි කරන්න සූදානම්. කොළඹ රාජකීය විද්‍යාලයට ඉල්ලුම් කළේ නැහැ කියා කිව්වාට ඔවුන් ලබා දුන් ලේඛනයට අනුව 2016 වසරේදී කොළඹ රාජකීය විද්‍යාලයට සිසුන් 12 දෙනෙකු ඇතුළත් කර ගන්නා ලෙස ඔවුන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබෙනවා. ආනන්ද විද්‍යාලයට ළමුන් 4 දෙනෙක්, විශාකා විද්‍යාලයට ළමුන් 8 දෙනෙක් ආදී වශයෙන් ජනප්‍රිය පාසල් 17ක් සඳහා දරුවන් 51 දෙනෙක් ඇතුළත් කරන ලෙස ඔවුන් අපෙන් ඉල්ලා තිබෙනවා. ගරු කථානායකතුමනි, සාධාරණ ඉල්ලීමක් කර තිබේ නම්, ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට හැකි ආකාරයෙන් පිළියම් ලබා දීම අපේ යුතුකමක්. නමුත් පිළිගත හැකි ලේඛන ඉදිරිපත් කරන්නට 2016 අගෝස්තු මස 18 වන දින වන විටත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අපොහොසත් වූ බව මා මෙම උත්තරීතර සභාවට දන්වන්න කැමැතියි.

මේ තිබෙන්නේ පසු ගිය අගෝස්තු මස 18 වැනි බ්‍රහස්පතින්දා දින රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලධාරීන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණ වෙනස් කරන ලද ඔවුන්ගේ තොරතුරු ඇතුළත් පත්‍රිකාවක්. එය ඇමුණුම 05 වශයෙන් මම **සභාගත*** කරනවා.

මා තවත් වැදගත් අනාවරණයක් සිදු කරන්නට සූදානම්. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තමන්ගේ සාමාජිකයන්වත් නොමහ යවමින් එහි නිලධාරීන්ගේ අවශ්‍යතා පමණක් ඉටු කර ගන්නා බවට පැහැදිලි සාක්ෂි අප සතුව තිබෙනවා. ගරු කථානායකතුමනි, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඉල්ලා සිටින්නේ, පාසල්වල ඇති පුරප්පාඩු පිළිබඳව ඔවුන්ට දැනුම් දෙන ලෙසයි. ඔවුන්ගේ සාමාජිකයන් සිය කැමැත්ත මත පාසල් අයදුම් කර තිබුණද, ඉහළ නිලධාරීන්ගේ කැමැත්ත මත අමාත්‍යාංශය විසින් ලබා දෙන පාසල් වෛද්‍යවරුන් අතර බෙදා දීමට හැකි බව ඔවුන් පවසනවා. මේ කවර වෘත්තීය සමිතියක්ද? මේ පිළිබඳ තොරතුරු රැසක් දැන් අනාවරණ වෙමින් තිබෙනවා. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නලින්ද හේරත් මහත්මයා ඉබ්බාගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙක්. නමුත් ඔහු පෞද්ගලික කරුණක් මත මෑතකදී කඩුවෙල ප්‍රදේශයේ පදිංචියට පැමිණ තිබෙනවා. වෛද්‍යවරුන්ගේ දරුවන්ට රාජකාරී ස්ථාන මාරුවීම් මත පාසල් හිමිවිය යුතු බවට අද කෑ ගසන නලින්ද හේරත් තමන්ගේ පුත්‍රයා රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගන්නේ හුදෙක් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම් ධුරය දැරීම උපයෝගි කර ගෙනයි.

ඒ, එම සංගමයේ සාමාජිකයකුට ලැබුණු තවත් අවස්ථාවක් අනිසි ලෙස යොදා ගනිමින් බවට චෝදනාවක් එල්ල වී තිබෙනවා. ඔන්න ඕකයි ගරු කථානායකතුමනි, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඇත්තම තත්ත්වය.

රජයේ වෛද්‍ය නිලධාරීන් ඔවුන්ගේ දරුවන් පමණක් ජනප්‍රියතම ජාතික පාසල්වලට ඇතුළත් කර ගැනීමේ උත්සාහයේදී, වන්දිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය අධ්‍යාපන අමාත්‍ය ධුරය දරන සමයේදී එනම්, 2005 වසරේදී එවකට සෞඛ්‍ය අමාත්‍ය ධුරය දැරූ නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් වෛද්‍යවරුන්ගේ දරුවන් රජයේ පාසල්වලට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ලබා දුන් කැබිනට් තීරණය සම්බන්ධයෙන් මාධ්‍ය සාකච්ඡා ඔස්සේ කරුණු ඉදිරිපත් කරනවා.

එම කැබිනට් පත්‍රිකාව ඇමුණුම 06 ලෙස මා මේ මොහොතේ **සභාගත*** කරන අතර, එහි කිසිදු තැනක ජනප්‍රියතම ජාතික පාසල් වෛද්‍යවරුන්ගේ දරුවන් වෙන ලබා දිය යුතු යැයි අනිවාර්ය කොට දක්වා නැහැ. .

එහි දැක්වෙන්නේ,

* වෛද්‍ය නිලධාරියා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථාන මාරු බලධාරියා විසින් නම් කරන ලද පළාතකට ස්ථාන මාරු ලබා තිබීම
* ඉල්ලුම් කරන ලද ජාතික පාසල සහ වෛද්‍ය නිලධාරියා සේවය කරනු ලබන වෛද්‍ය ආයතනය එකම පරිපාලන පළාත තුළ පිහිටා තිබීම

ආදී කරුණු මත වෛද්‍යවරුන්ගේ දරුවන් සඳහා පාසල් ඉල්ලා සිටීමට ඔවුන්ට හැකියාවක් ඇති බවයි.

මීට අමතරව, දරුවන් ඇතුළත් කිරීම සඳහා ඒ වන විට නිකුත් කර තිබූ 23/2003 නමැති 2003.05.23 දිනැති චක්‍රලේඛය අභිභවා යෑමක් සිදු නොකරන ලෙසද එහි දක්වා තිබෙනවා.

මීට අමතරව අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිරීක්ෂණද එම කැබිනට් පත්‍රිකාවට ඇතුළත් කර ඇති අතර වෛද්‍යවරුන්ට මෙන්ම ස්ථාන මාරුවීම් සහ විදේශගතවී පැමිණීම් මත පාසල් පිළිබඳ ගැටලුව සියලු රාජ්‍ය සේවයේ නිලධාරීන්ට පොදුවේ බලපැවැත්වෙන්නක් බව සඳහන් වනවා.

එමෙන්ම, කිසිදු පාසලක පළමු ශ්‍රේණියේ සිට සියලු ශ්‍රේණි ළමුන්ගෙන් පිරී පවතින අතර, අතරමැදි ශ්‍රේණි සඳහා 40 සීමාව නොඉක්මවා සිසුන් ඇතුළත් නොකළ යුතු බවද එහි දක්වා තිබෙනවා.

එහි දක්වා ඇති අතිශයින්ම වැදගත් කරුණ වන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශය තම ස්ථාන මාරුවීම් ක්‍රමවේදය ජනවාරි මස මුලදී අවසන් කර එම තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දෙන්නේ නම්, ජනප්‍රිය පාසල්වල පුරප්පාඩු ප්‍රමාණයක් පවතින්නේ නම්, ඒ පිළිබඳ ප්‍රමුඛතා අනුපිළිවෙළ මත කටයුතු කළ හැකි බවයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සඳහන් කරන ආකාරයට ඔවුන්ගේ දරුවන් ව්‍යාජ සහ ආත්මාර්ථකාමී වුවමනා පදනම් කර ගනිමින් පාසල්වලට ඇතුළත් කර ගැනීම සඳහා එම කැබිනට් පත්‍රිකාවෙන් කිසිදු අවකාශයක් සලසා නැත. එබැවින්, 2005 වසරේදී ඉදිරිපත් කර ඇති කැබිනට් පත්‍රිකාව පදනම් කර ගනිමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් තම වාසි ප්‍රයෝජන සඳහා කරුණු විකෘති කිරීම්වල යෙදෙන අයුරු පැහැදිලියි.

යම් රාජ්‍ය නිලධාරියකු රාජකාරී අවශ්‍යතා මත විධිමත් ස්ථාන මාරුවීමක් ලැබූ විට ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් සුදුසු පාසලක් ලබා දීම ඔවුන්ගේ රාජකාරී පහසුව සහ කාර්යක්ෂමභාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් සිදු කෙරෙන්නක්. අමාත්‍යවරයා වශයෙන් මම ඒ සම්බන්ධයෙන් එයට කිසිසේත් විරුද්ධ වන්නේ නැහැ. නමුත් මෙහිදී මා විසින් ප්‍රකාශ කළ යුතු වැදගත් කරුණක් තිබෙනවා. එනම්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් අවධාරණය කර පෙන්වන ස්ථාන මාරුවීම්වලට අදාළ පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ ලැයිස්තුවද අතිශයින්ම ප්‍රශ්නකාරී සහ පදනම් විරහිත ලැයිස්තුවක් බවට තහවුරු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2016 වසර සඳහා පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේදී රජයේ සේවයේ ස්ථාන මාරුවීම් ලබා එන නිලධාරීන් සඳහා සියයට 4ක ප්‍රතිශතයක් වෙන් කර තිබෙනවා. එමෙන්ම රාජකාරී අවශ්‍යතා මත විදේශගතවී පැමිණෙන නිලධාරීන්ගේ දරුවන් වෙනුවෙන්ද සියයට එකක ප්‍රතිශතයක් වෙන් කර තිබෙනවා. මීට අමතරව ආදි ශිෂ්‍ය පදනම මත හෝ සහෝදර පදනම මතද වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් සඳහා ඉල්ලුම් කළ හැකියි. නමුත් දැන් මොවුන් මට බලකරන්නේ ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේ ඉල්ලීම් අභිභවමින් නීති විරෝධී ලෙස කටයුතු කරන ලෙසයි.

2016 වසර සඳහා පළමු ශ්‍රේණියට ළමුන් 112දෙනකු ඇතුළත් කර ගන්නා ලෙස රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් ඉල්ලා තිබුණා.

ගරු කථානායකතුමනි, මින් 26 දෙනකු පමණයි, 2014, 2015, 2016 යන වර්ෂවලට අදාළ ස්ථාන මාරුවීම් සහ විදේශගතවී පැමිණීම් සිදුව තිබුණේ. සෙසු සියලු ඉල්ලීම් 2007 වසරේ සිට 2013 වසරට අයත් ඉල්ලීම්. 2007 වසරේදී කොහේ හෝ තැනකින් තවත් තැනකට මාරු වුණු වෛද්‍යවරයකුගේ දරුවකුට අපි පාසලක් ලබා දෙන්නේ මොන පදනමක් යටතේද?

ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ කොන්ද පණ නැතුව, තම තමන්ට ඕනෑ විධියට දේශපාලන බලය ආරක්ෂා කර ගන්න, සමාජ බලපෑම් කණ්ඩායම් කියා ගන්නා මේ වාගේ ආත්මාර්ථකාමී පිරිස් තමන්ට නම්මා ගන්න, ඇතැම් දේශපාලනඥයන් කරපු තකතිරු ක්‍රියාවල ප්‍රතිඵල තමයි ඔවුන් අද පූර්වාදර්ශයක් කර ගෙන තිබෙන්නේ.

2016 අවුරුද්දේ අතරමැදි ශ්‍රේණි සඳහා ළමයින් 168 දෙනෙක් ඇතුළත් කර ගන්න කියලා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අපට බල කරනවා. මා කියන්න කැමැතියි, 2014, 2015 වසර තුළ ඔවුන්ගෙනුත් ස්ථාන මාරු ලබා පැමිණි වෛද්‍යවරුන් සංඛ්‍යාව 27ක් විතරයි කියලා. ඉතුරු 141කම 2007 ඉඳන් 2013 වසර දක්වා මාරු වීම් හෝ විදේශගතව පැමිණීම් සිදු කළ අය.

ගරු කථානායකතුමනි, අපට සලකා බලන්න පුළුවන් වසර දෙකක ස්ථාන මාරුවීම් පමණයි. මේ අයට ඕනෑ ඕනෑ විධියට නටන්න, මේ රටේ සාමාන්‍ය ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය විනාශ කරන්න මම සූදානම් නැහැ.

මොන දේ වුණත් සාධාරණ ඉල්ලීමක් කර තිබෙනවා නම් එම ඉල්ලීම් සලකා බලා හැකි පාසල් ලබා දෙන්න අපි කටයුතු කළා. රාජකීය, ආනන්ද, විශාකා, ඩී.එස්, ධර්මරාජ, කිංස්වුඩ්, කුරුණෑගල මලියදේව, බාලක- බාලිකා පාසල් නැති වුණත් මහානාම, සිරිමාවෝ, පන්නිපිටිය ධර්මපාල, ඉසිපතන, ගාල්ල ධර්මාශෝක, ගාල්ල දේවානන්ද, හොරණ තක්ෂිලා වාගේ පුරප්පාඩු තිබෙන පාසල් ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ අනුව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ වෛද්‍ය සංගමය ඇතුළු වෛද්‍යවරුන් 110 දෙනකුගේ දරුවන්ට පාසල් ලබා දීමට අපි කටයුතු කළා.

නමුත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඔවුන්ට ලබා දුන් පාසල් භාර නොගනිමින් දිගින් දිගටම ජනප්‍රියතම ජාතික පාසල් ටික ඉල්ලුම් කරමින් ඉන්නවා. අප ඔවුන්ට ලබා දුන් පාසල් පිළිබඳ ලේඛනයක් ඇමුණුම 07 ලෙස **සභාගත*** කරනවා. .

ගරු කථානායකතුමනි, සාමාන්‍ය ජනතාවගේ දරුවන්ගේ; ගොවියන්ගේ, කම්කරුවන්ගේ, අනෙක් වෘත්තීන්වල යෙදෙන මව්පියන්ගේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය ආරක්ෂා කිරීම වෙනුවෙන් මා කැප වන එක වළක්වන්න කාටවත් බැහැ. ගරු කථානායකතුමනි, ඒ වාගේම මෙවැනි අසාධාරණ ඉල්ලීම් සිදු කරමින්, අමාත්‍යාංශ වට කර මාධ්‍ය සන්දර්ශන පවත්වමින්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක් තුළ ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙලා; සමාජ ජාලාවලින් බැට කාලා; කහළ ගොඩට විසිවෙලා සිටින මේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් දෙව්වරු වාගේ ඉන්න වෛද්‍යවරුන්ගේත් කීර්ති නාමය කෙළෙසන එක ගැන මා කනගාටු වනවා.

තමන්ගේ සංගමයේ සාමාජිකයන්ට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයෙන් SMS එකක් යවනවා. ගරු කථානායකතුමනි, ඒකේ තියෙනවා, "Minister Akila has launched a well-planned media campaign including FB to tarnish the image of GMOA based on schooling issue. You are expected to counter."

ඒ කියන්නේ "ඇමති අකිල අපේ ප්‍රතිරූපය විනාශ කරන්න මේ පාසල් ප්‍රශ්නය උපකාරී කර ගනිමින් සමාජ ජාල වෙබ් අඩවි හරහා විශාල මාධ්‍ය ව්‍යාපාරයක් ගෙන යනවා, ඒකට විරුද්ධව ප්‍රතිප්‍රහාර එල්ල කරන්න" කියන එකයි.

ගරු කථානායකතුමනි, මට මේ සඳහා කැමිපේන් එකක් කරලා, පහර එල්ල කරන්න අවශ්‍යතාවක් නැහැ. මේ ඇත්ත කරුණු දකින බුද්ධිමත් ජනතාව ඒක දන්නවා. ඔවුන් මේ අසාධාරණකම්වලට එරෙහිව තමන්ගේ මතය ඉදිරිපත් කරන එක සිදු කරනවාමයි.

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී අපේ ආශුබෝධ මාරසිංහ මහතා සමඟ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සිදු කළ සාකච්ඡාවක් අතරවාරයේ දී එහි සභාපති පාදෙනිය මහතා කියල තියෙනවා, " අපි අකිලට පාඩමක් උගන්වනවා, බලාගමුකෝ, අපි ඉස්සරහට කරන දේ" කියලා. මම පාදෙනියට නොවෙයි, පාදෙනිය මහත්තයට කියනවා තමන්ගේ සංගමයේ සාමාජිකයන්ටත් වංගු ගහලා, ඔය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඉහළ නිලධාරීන් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරලා

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

තමන්ගේ දරුවන් සුපිරිම පාසල්වලට ඇතුළත් කරපු ආකාරය ගැන මම හෙළි කරන බව.

ගරු කථානායකතුමනි, මම මේ ලේඛනය ඇමුණුම් අංක 08 ලෙස **සභාගත*** කරනවා.

2011 අවුරුද්දේ තමන්ගේ පුත්‍රයාව කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගන්න බොරු තොරතුරු ඉදිරිපත් කරපු පාදෙනිය, 2012දී දෙවැනි පුතා රාජකීය විද්‍යාලයට දාගන්න නමත් වෙනස් කර ගත්ත ආකාරය පිළිබඳ තොරතුරු මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපතිවරයා 2011 වසරේ දී අංක 75, පයිප් රෝඩ්, කොළඹ 05 ලිපිනයේ පදිංචි වෙලා ඉද ගෙන කොළඹ රාජකීය විද්‍යාලයට තමන්ගේ දරුවා ඇතුළත් කරන්න උත්සාහ කරනවා. නමුත් එම උත්සාහය ව්‍යර්ථ වූ තැන ඔහු තවත් උපක්‍රමයක් යොදා ගෙන දරුවා ආනන්ද විද්‍යාලයට ඇතුළත් කර ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, මහා ලොකුවට පාරම් බාන මේ වෘත්තීය සමිති සභාපතිවරයා 2012 අවුරුද්දේ කොළඹ රාජකීය විද්‍යාලයට තමන්ගේ දෙවැනි දරුවා ඇතුළත් කර ගැනීමට උත්සාහ කරද්දි නමේ අග මුල මාරු කර ගත් බවටත් තොරතුරු තහවුරු වී තිබෙනවා. ඔහුගේ දෙවැනි පුත්‍රයා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගැනීමේදී පාදෙනිය, ඔහුගේ නම ලබා දෙන්නේ "බී.එස්.එම්.එම්.එන්.බී. බණ්ඩාර" ලෙසයි. ගරු කථානායකතුමනි, එහිදී ඔහු ව්‍යාජ ලිපිනයකුත් යොදා ගන්නවා. කොළඹ පහේ පයිප් රෝඩ්වල පදිංචි වෙලා හිටිය පාදෙනිය, හිටි හැටියේම 13/1/ඒ, චාල්ස් වේ, කොළඹ 3 ලිපිනයට මාරු වෙනවා. දැනට දරුවා ඉගෙන ගන්නේ පස්වැනි ශ්‍රේණියේයි. එම දරුවාගේ 2,3,4 ශ්‍රේණිවල තොරතුරු, දෙමව්පිය පදිංචිය ඇතුළු විස්තරද අස්ථානගත කිරීමට කටයුතු කර ඇති බවට අපට තොරතුරු ලැබී තිබෙනවා.

ගරු කථානායකතුමනි, විදේශ පදනම මත තමන්ගේ දරුවා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගන්න අයදුම් කරපු පාදෙනිය, ලකුණු 70 සම්පූර්ණ කරපු ආකාරය සම්පූර්ණයෙන්ම නීති විරෝධී බව හෙළි වී තිබෙනවා. මෙයයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සැබෑ තත්ත්වය. මීට අමතරව පාදෙනිය සිදු කරන ලද ශිෂ්‍යත්ව මුදල් වංචාව, නිසි ආකාරයෙන් විදෙස් පුහුණුව ලබා නොපැමිණ විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස සහතික වීම, ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් දරුවන් පාසල්වලට ඇතුළත් කර ගැනීම ඇතුළු චෝදනා රැසක් මේ වෘත්තීය සමිති සභාපතිවරයාට එල්ල වී තිබෙනවා. ගරු කථානායකතුමනි, වෛද්‍යවරුන්මයි අපට මේ තොරතුරු ලබා දෙන්නේ. දැන් මේ සංගමය අපට අපහාස කරන්න පටන් අරගෙන තිබෙනවා. තමන්ගේ නම සඳහන් කරලා, ඒ වගකීම අරගෙන පෝස්ටරයක්වත් ගහන්න බැරි මේ කණ්ඩායම අදත් ස්ථාන කීපයක මඩ පෝස්ටර් ව්‍යාපාරයක් දියත් කරලා තිබුණා. නමවත් දමන්න තරම් ඔවුන්ට කොන්දක් නැහැ, ගරු කථානායකතුමනි.

දිනක් ඔවුන් අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිටට ඇවිත් "මුදලට ගිජු අධ්‍යාපන ඇමති ගෙදර යවනු" කියලා සටන් පාඨයක් ඉදිරිපත් කළා, තවත් සටන් පාඨ එක්ක. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ මොහොතේ විමසා තිබෙනවා, "ඇයි, මෙසේ පදනම් විරහිත අපහාස සිදු කරන්නේ?" කියලා. එවිට එහි ලේකම් නලින්ද හේරත් මහතා ලබා දුන් පිළිතුර මම මේ ගරු සභාවට කියන්න කැමතියි, ගරු කථානායකතුමනි. "අපි වෘත්තීය සමිතියක් නේ ලේකම්තුමා. අපි ඉතින් වෘත්තීය අරගළය තුළ විවිධ සටන් පාඨ කියනවා. ඒවාට එච්චර කලබල වෙන්න ඕනෑ නැහැ." ඔන්න ඕකයි ඔහු ලබා දී තිබුණු පිළිතුර.

ගරු කථානායකතුමනි, මම දේශපාලනඥයකු ලෙස කොමිස් ගහන, දූෂණ, අක්‍රමිකතාවලට සම්බන්ධ පුද්ගලයකු නොවන බව මේ ගරු සභාවට සිහිපත් කරන්න කැමතියි. ඒ නිසා තමයි විවිධ පාර්ශ්ව විසින් කෝටි ගණන් ගසා කාපු නිල ඇඳුම් රෙදි බෙදා දීමේ ක්‍රමය පවා අපි නතර කළේ. ඒ නිසාම තමයි මුදලට දරුවන් පාසල්වලට දැමීමේ ක්‍රමවේදයට තිත තබමින් දූෂණ, අක්‍රමිකතාවලට සම්බන්ධ වුණු විදුහල්පතිවරු අපි ගෙදර ඇරියේ, ගරු කථානායකතුමනි. කාටවත් අත තියන්න බැහැ කිය කියා හිටපු සමහර විදුහල්පතිවරු අපි මාරු කළා. ඒ, මේ රටේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය ආරක්ෂා කිරීම වෙනුවෙනුයි. හොරට අමතර පන්ති පවත්වාගෙන ඕනෑ ඕනෑ විධියට ළමයි ඇතුළත් කරපු, ශිෂ්‍යත්වය සමත් දරුවන්ගේ අයිතිය අහිමි කරපු අයට එරෙහිව අපි හඬ නඟනවා. මට දූෂණ, අක්‍රමිකතා චෝදනා නැහැ, ගරු කථානායකතුමනි. අපි කරන්නේ පිරිසිදු දේශපාලනයක්.

ඊයේ පැවති මාධ්‍ය සාකච්ඡාවේදී ඔවුන් මට අභියෝගයක් කළා, "පසු ගිය මාර්තු මාසයේ ඉඳලා මේ වන තුරු ජනප්‍රිය පාසල්වලට ළමුන් ඇතුළත් කරපු තොරතුරු ලබා දෙන්න" කියලා. ගරු කථානායකතුමනි, මා අධ්‍යාපන අමාත්‍ය ධුරයට පත් වී වසර දෙකකට ආසන්න කාලයක් ගත වුණත්, 1, 5, 6 ශ්‍රේණිවලට දේශපාලන වශයෙන් හෝ කිසිදු ආකාරයකින් කිසිම දරුවෙකු ඇතුළත් කරලා නැහැ. ගරු කථානායකතුමනි, අතරමැදි පන්තිවලටත් සිසුන් ඇතුළත් කරන්න කියලා අභියාචනා ආවොත් ජාතික පාසල් අධ්‍යක්ෂවරයා, අතිරේක ලේකම්වරු ඇතුළු විධිමත් කමිටුවක් මඟින් එය විමර්ශනයට භාජන කරනවා පමණක් නොව, අවසානයේ අමාත්‍යාංශ ලේකම්වරයා විසිනුත් එය විමර්ශනයට භාජන කරනවා. සාධාරණ හේතුවක් නම් පමණයි ඔවුන් එම පාසල්වලට ඇතුළත් කරගෙන තිබෙන්නේ. ඒවාත් පුරප්පාඩු මත තමයි ලබා දීලා තිබෙන්නේ. මෙන්න මේකයි, අපේ ප්‍රතිපත්තිය. ගරු කථානායකතුමනි, අපි අයථා විධියට මේ කටයුතු කරලා තිබෙනවා නම් අපට මෙහෙම කෙළින් හිටගෙන කථා කරන්න බැහැ.

මාර්තු 31 ඉඳලා නොවෙයි, මම අධ්‍යාපන අමාත්‍ය ධුරය දරන වසර දෙකටම අදාළ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙනවා. යම්කිසි පුද්ගලයකු සාධාරණ අභියාචනාවක් ඉදිරිපත් කර තිබෙනවා නම්, ඒ පිළිබඳව සලකා බලා කටයුතු කිරීම සඳහා අතිරේක ලේකම්වරයෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් අභියාචනා මණ්ඩලයක් ලෙස මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඉන් සාධාරණ ලෙස තහවුරු වූ අතළොස්සක් තරම් අවස්ථා ප්‍රමාණයක් පමණයි අමාත්‍යාංශය හරහා ලබා දීලා තිබෙන්නේ. ඒ, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අත්සන යටතේයි. කිසිදු මොහොතක අපි හිතුණු හිතුණු විධියට ළමයි ඇතුළත් කිරීම සිදු කරලා නැහැ කියන එකත් මා කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. විනිවිදභාවයකින් යුක්තවයි අපි සියලුම දේවල් සිදු කරන්නේ.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මට චෝදනා කරනවා, දේශපාලනිකව පසු ගිය මැතිවරණයේදී ඔවුන්ට සහයෝගය නොදැක්වීම නිසා මා ඔවුන්ගේ දරුවන්ට පාසල් ලබා නොදෙන බව ප්‍රකාශ කළාය කියලා.

ගරු කථානායකතුමනි, මෙවැනි අසත්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔවුන් ලජ්ජා විය යුතුයි. මම ඔවුන් එක්ක පැවැත්වූවේ රහස් සාකච්ඡාවක් නොවෙයි. එතැන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක්, ජාතික පාසල් අධ්‍යක්ෂවරයා ඇතුළු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

නිලධාරීන් පිරිසක් සිටි නිසා මා විසින් එවැනි ප්‍රකාශයක් සිදු නොකළ බව සාක්ෂි සහිතව ඔප්පු කළ හැකියි. මට කිසිදු පුද්ගලයෙකුගෙන් දේශපාලනිකව පළිගැනීමට අවශ්‍යතාවක් නැහැ. ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන අමිපාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරලා තිබුණා, තමා පාර්ලිමේන්තුවට පැමිණීමත් සමඟ තම දරුවාට කොළඹ ප්‍රදේශයෙන් පාසලක් ලබාදෙන්න කියලා. මන්ත්‍රීවරියක් විධියට රාජකාරි කිරීම හේතුවෙන් ඇයට දරුවා සමඟ ගතකරන්න තිබෙන කාලය අඩුවන බවට ඇය මානුෂික හේතු දක්වලා තිබුණා.

ගරු කථානායකතුමනි, අපි එම ඉල්ලීම පවා අභියාචනා මණ්ඩලයට යොමු කර, ඉන් අනතුරුවයි සුදුසු පාසලක් ලබාදී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අපේ දින 100 ආණ්ඩුව කාලයේ සුසන්තිකා ජයසිංහ මහත්මියත් අභියාචනයක් ඉදිරිපත් කළා. එතුමිය පසු ගිය ආණ්ඩුවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ වේදිකාවල හිටපු කෙනෙක්. අපි එම අභියාචනය වහාම අභියාචනා කමිටුවට ඉදිරිපත් කළා. එම අභියාචනා කමිටුව තීරණය කරනු ලැබුවා, එතුමිය වගේ රටට කීර්තියක් ගෙනදුන් කෙනෙකුට අවස්ථාවක් ලබාදෙන්න ඕනෑ කියලා. එතුමියත් එතුමියගේ interview එකකදී කියලා තිබුණා, ගිය ආණ්ඩුවෙන් නොවෙයි, මේ ආණ්ඩුවෙනුයි මගේ දරුවාට පාසලක් ලැබුණේ කියලා. ඒ අවස්ථාව ලබාදුන්නේත් කමිටුවේ නිර්දේශයක් මතයි. ඒ වාගේම ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන තවත් මන්ත්‍රීවරුන්ගේ දරුවන්ද පාසල්වලට ඇතුළත් කිරීමට සාධාරණ හේතු ඉදිරිපත් කර තිබුණා නම්, ඔවුන්ටත් ඒ අවස්ථාව ලබාදී තිබෙනවා. ඒ වාගේම පසු ගිය කාලයේ එක්සත් ජාතික පක්ෂය සහ වත්මන් රජය දැඩි ලෙස විවේචනය කළ පුද්ගලයන්ට පවා සාධාරණ හේතු ඉදිරිපත් කළොත් එම අවස්ථා වළක්වන්න තරම් කුහකත්වයක් මා තුළ නැහැ.

ඒ වාගේම සේනානායක කියලා නමක් කිව්වා. ඊයේ මාධ්‍ය සන්දර්ශනයකදී ඒ ගැන කියනවා මම දැක්කා. පුරප්පාඩු මත සහ විදුහල්පතිවරයාගේ නිර්දේශ මත ඒ ඉල්ලීම ඉදිරිපත් කර තිබූ නිසයි ඒ අවස්ථාව ලබාදී තිබෙන්නේ. ඔහු, අපිවත්, පක්ෂයේ නායකත්වයත් වැඩියෙන්ම විවේචනය කරපු කෙනෙක්. නමුත් අපි ඒක නැවැත්තුවේත් නැහැ. සාධාරණ හේතු තිබෙන නිසා ඒ අවස්ථාව දිය යුතුයි කියලා කමිටුව තීරණය කරලා තිබුණා. මෙන්න මේකයි අපි විනිවිද පෙනෙන විධියට කටයුතු කරනවා කියන්නේ.

තමන්ගේ ආත්මාර්ථකාමී අභිලාෂයන් වෙනුවෙන් අසරණ රෝගීන්ගෙන් පළිගන්නා, රෝගීන් බිලිගන්නා මේ මජර සංස්කෘතිය අපි වෙනස් කළ යුතුයි. මේ, බුද්ධදාස රජතුමා අනුව යන වෛද්‍යවරුන් හෝ හිපොක්‍රටීස් අනුව යන වෛද්‍යවරුන් නොවන බව පැහැදිලියි. ඔවුන්ට තිබෙන්නේ පටු ආත්මාර්ථකාමී අභිලාෂයන් පමණයි. ගරු පාදෙනිය මැතිතුමනි, මට මඩ ගැහුවාට, බොරු චෝදනා එල්ල කළාට, මේ රටේ ජනතාවගේ විරෝධයෙන් ඔබතුමන්ලාට ගැලවෙන්න බැරි බව මතක තියාගන්න. හරිනම් විය යුත්තේ සැබෑ ලෙසම ස්ථාන මාරු ලබා ඇති වෛද්‍යවරුන්ගේ ලැයිස්තුවක් ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සකස් කර ඉදිරිපත් කිරීමයි. මේ ක්‍රමවේදයට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට එකඟ වෙන්න බැරි ඇයි? මම සියලුම වෛද්‍යවරුන්ගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාජ ලේඛන නිසා ඊට සම්බන්ධ වුණු සාධාරණ හේතු සහිත වෛද්‍යවරුන්ටත් අපහසුතාවලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. ඇත්තටම මේක මාෆියාවක්. මේ සම්බන්ධයෙන් වෛද්‍යවරුන්ට සිදුවන අපහසුතා පිළිබඳව මා කනගාටුවට පත් වෙනවා. මොකද, මගේත් මිත්‍රයින් බොහොමයක් වෛද්‍යවරුන් විධියට කටයුතු කරනවා. මෙම ලැයිස්තුව සකස් කිරීමේදී බොහෝ අක්‍රමිකතා සිදුව ඇති බවට වෛද්‍ය වෘත්තිකයින් විසින්ම චෝදනා කිරීමෙන් එය හොඳින් තහවුරු වෙනවා.

අප විසින් නැඟිය යුතු ප්‍රශ්නය වන්නේ, විනිවිදභාවයකින් තොර, නිවැරදි කරුණු මත පදනම් නොවූ මෙවැනි ලැයිස්තුවක් සකස් කිරීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට ඇති බලය කුමක්ද යන්නයි. නිවැරදි, විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයක් මත පදනම් වෙමින් පාසල්වලට ළමුන් ඇතුළත් කරගැනීම සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ප්‍රමුඛතා ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අකමැති ඇයි? එවැනි නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ඔවුන් පැකිළෙන්නේ ඇයි? ගරු කථානායකතුමනි, ඒ වාගේම පසු ගිය කාලයේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දුන් පාසල් එම සාමාජිකයන් අතර බෙදා ගැනීමේදී රුපියල් දසදහසක මුදලක් අයකළ බවටත් අපට පැහැදිලි සාක්ෂි සහිත තොරතුරු වාර්තා වී තිබෙනවා. මෙවැනි දෙබිඩි පිළිවෙතකින් යුත් නිලධාරීන්ගෙන් සමන්විත වෘත්තීය සමිතියකට ඔබගේ දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ අයිතිවාසිකම යටපත් කිරීමට ඉඩ නොදී සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ලබා ගන්නා නිවැරදි තොරතුරු මත පදනම් වූ සැබෑ ස්ථාන මාරුවීම් ලද ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කරගැනීම වෙනුවෙන් ඉදිරියට එන ලෙස මා මෙරට සිටින යහපත්, අවංක වෛද්‍ය වෘත්තිකයන්ගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි.

වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් ලබාදීමේ ක්‍රමවේදය හැකිතාක් පාරදෘශ්‍ය ආකාරයෙන් සිදු කිරීමට මමත්, මගේ නිලධාරිනුත් මේ දක්වා ක්‍රියා කර තිබෙනවා. එහි යම් දුර්වලතාවක් තිබෙනවා නම්, එය සංවාදයකට විවෘතයි. සුභද ලෙස ගැටලු සාකච්ඡා කර විසඳීම මගේ රාජකාරි පිළිවෙත බව යහපත් අවංක වෛද්‍ය වෘත්තිකයන්ට ප්‍රකාශ කරන්න කැමැතියි. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය හිතාගෙන ඉන්නේ අපව ගොනාට අන්දගෙන, බිත්තිවලට හිර කරගෙන ඔවුන්ගේ වංචාවන් සාධාරණීකරණය කර ගන්නයි. කලින් ආණ්ඩුව කාලයේ ඒවා කළාට, මේ ආණ්ඩුව යටතේ ඒවා කරන්න බැරි බව මම අවධාරණය කරන්න කැමැතියි. දේශපාලනඥයින් මෝඩයින් යැයි සිතන බවක් ඔවුන්ගේ ප්‍රකාශවලින් තහවුරු වෙනවා. මා මෙම පිළිතුර දෙන්නේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නියෝජනය කරන මෙම උඩඟු ප්‍රකාශ කරන පුද්ගලයන්ට මිස, සමස්ත වෛද්‍ය ප්‍රජාවට නොවේ කියන එකත් ගරු කථානායකතුමනි, සඳහන් කරනවා.

මෙහි ඇතැම් වෛද්‍යවරුන්ට මනුෂ්‍ය ශරීරය නමැති ස්වාභාවික විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුමක් මිස, සමාජ විද්‍යාවන් හෝ දේශපාලන විද්‍යාවන් ගැන අවබෝධයක් නැහැ. මේ පිළිබඳ ඕනෑතරම් උදාහරණ ලබා දිය හැකියි. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම්වරයා කට අරින වාරයක් වාරයක් පාසා ඒ බව තහවුරු වෙනවා. මොහු මේ ප්‍රකාශ සිදු කරන්නේ ස්වාභාවික විද්‍යා මූල ධර්ම, සමාජ විද්‍යාවන්ටත් අදාළ වේ යැයි සිතා විය යුතුයි.

තමන්ගේ දරුවන්ට පමණක් සුපිරිතම, ජනප්‍රිය පාසල් ලබා දෙන ලෙස ඉල්ලමින්, ප්‍රජාතන්ත්‍ර විරෝධී අසමානතා මූල ධර්ම පදනම් කර ගනිමින් මෙම පිරිස අපගේ රජයට මඩ ගසමින් සිටිනවා.

අවසාන වශයෙන් මට කිව හැක්කේ, වෛද්‍ය වෘත්තිකයින් යනු කුලයක් නොවන බවයි. මේ අය හැසිරෙන්නේ කුලවාදී මානසිකත්වයකින් මිස, වෘත්තීය ආචාර ධර්මවලට ගැළපෙන

මානසිකත්වයකින් නොවෙයි. මේ පවතින්නේ වැඩවසම් හෝ ගෝත්‍රවාදී පාලන තන්ත්‍රයක් ද නොවෙයි; නැතිනම් ඒකාධිපති හෝ ෆැසිස්ට් පාලන ක්‍රමයක් ද නොවෙයි. නිදහස් අධ්‍යාපනයේ පිහිටෙන් වෛද්‍යවරුන් බවට පත් වූ මේ 'කුලය', සමාජ වරප්‍රසාද නමැති කඩතුරාවෙන් හිස වසාගෙන, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ෆැසිස්ට් නියෝග යොමු කරමින් සිටීම සමස්ත වෛද්‍ය වෘත්තිකයින්ගේ ගෞරවය ද කෙළෙසා දැමීමක්. ප්‍රජාතන්ත්‍රවාදියෙකු වන මා, මොවුන්ගේ ෆැසිස්ට්වාදයට කිසිදා යටත් වන්නේ නැහැ.

එමෙන්ම යහපාලනය අගයන වත්මන් රජයේ කිසිදු සාමාජිකයෙකු මේ අසාධාරණ ඉල්ලීම්වලට අවනත නොවනු ඇති.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත
இலங்கை பொறியியற் பேரவைச் சட்டமூலம்
ENGINEERING COUNCIL, SRI LANKA BILL

"Bill to provide for the establishment of the Engineering Council, Sri Lanka which shall be responsible for the maintenance of professional standards and conduct of engineering practitioners; registration of different categories of engineering practitioners; and to provide for matters connected therewith or incidental thereto."

පිළිගන්වන ලද්දේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා විසිනි.

2016 ඔක්තෝබර් 04වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர் சார்பாக மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 ஒக்ரோபர் 04, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Lakshman Kiriella on behalf of the Minister of Power and Renewable Energy; to be read a Second time upon Tuesday, 04th October, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු; පරිපූරක මුදල - ශීර්ෂය 147- වැඩසටහන 1- ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය; විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවන වර කියවීම;

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, only Item No. 1 will be moved now.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. පරිපූරක මුදල - ශීර්ෂය 147- වැඩසටහන 1.

පරිපූරක මුදල: මෙහෙයුම් වියදම්
குறைநிரப்புத் தொகை: தொழிற்பாட்டுச் செலவினம்
SUPPLEMENTARY SUM: OPERATIONAL EXPENDITURE

[අ.භා. 3.13]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Regional Development)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"ශීර්ෂය 147-වැඩසටහන 1,- 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට" මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු.592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

උපලේඛනය

ශීර්ෂය	147	-	ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
	වැඩ සටහන 1	-	මෙහෙයුම් වැඩසටහන
	පුනරාවර්තන වියදම්	-	රු. 469,425,000
	මූලධන වියදම්	-	රු. 123,500,000
	මුළු වියදම	=	රු. 592,925,000

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම

[ගරු සරත් ෆොන්සේකා මහතා]

උපරිම වියදම් සීමාව	- රු. 2,000,000
අවම ලැබීම් සීමාව	- රු. 150,000
උපරිම හර ශේෂ සීමාව	- රු. 3,500,000

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.) "

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 3.15]

ගරු රවී කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු කථානායකතුමනි, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් මම ඉදිරිපත් කරනවා. "2016 මැයි 26 දිනැති අංක 1968/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය" කියා මම කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] තලෛමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Ravi Karunanayake.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Thank you, Hon. Deputy Chairman of Committees. I am privileged to speak when you are in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නේ අපි ඉදිරිපත් කරලා තිබෙන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය පාර්ලිමේන්තුවේදී අනුමත කරගෙන, එය රටේ ආදායම හරියාකාරව ගණනය කිරීමට උපක්‍රමයක් ලෙස පාවිච්චි කිරීමටයි. මේ තත්ත්වය උද්ගත වෙලා තිබෙන්නේ මීට අවුරුදු ගණනාවකට පෙර සිටයි. ඉතාමත්ම විකෘති වුණු ආදායම් බදු ප්‍රතිපත්තියක් කාර් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙනවා. බලතල අනිසි විධියට පාවිච්චි කරලා සමහර රජයේ නිලධාරීන් මෙහි ප්‍රයෝජන අරගෙන තිබෙනවා කියන එක අපට චෝදනා වෙලා තිබෙනවා. ඒ හේතුව නිසා සමහර අය දේශපාලනඥයන්ට බැණ බැණ ඉන්නවා. රජයේ නිලධාරීන් ඒ ක්‍රමය තුළ සිර වෙලා, ඒවා ක්‍රියාත්මක කරමින් යනවා. මේ ප්‍රශ්න දෙකටම විසඳුමක් ලෙස තමයි අපි මෙවැනි උපක්‍රමයක් ඇති කළේ. මෙතෙක් දුරට රටේ බදු ප්‍රතිපත්තිය වුණේ කාර් එකක මිල අනුව ඒ සඳහා බදු ක්‍රියාත්මක කිරීමයි. ඒ තුළින් discretionary power -තමන්ට අභිමත පරිදි කටයුතු කරන්නට- ක්‍රියාත්මක කරන්නට ඒ පුද්ගලයාට අවස්ථාවක් ලැබෙනවා. එම නිසා ඒ කොටස අයින් කරලා අපිට හරියාකාර ආදායමක් ගන්න පුළුවන් ක්‍රමයක් තමයි ඇති කළේ. මීට පෙර තිබුණු ක්‍රමය වෙනුවට, "CC" එකට, -Cylinder Capacity එකට- මෙපමණ ප්‍රමාණයක් අවම බදු ගෙවන්න ඕනෑ කියන එක තුළින් නිෂ්පාදනකරුවන් සමඟ එකතු වෙලා ඒජන්තවරුන් උපක්‍රමශීලීව කරගෙන ගිය ඒ undervaluation එක සම්පූර්ණයෙන්ම නැති කරන්න දරන උත්සාහයක් මේක. අපි තවම සතුටුදායක තත්ත්වයකට ඇවිල්ලා නැහැ. නමුත් එදා සියයට 80ක් undervalue කරලා එන ආනයන දැන් සියයට 20කට පමණ අඩු වෙලා තිබෙනවා.

මම ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ කරුණාකරලා මේ ගැන දන්නා කරුණු තිබෙනවා නම් අපට ඉදිරිපත් කරන්න කියලායි. අපට අවශ්‍ය වන්නේ සියයට 100ක් foolproof විධියට, ඒ කියන්නේ කිසිම වංචාවක් ඇති නොවන විධියට කටයුතු කරන්නයි. ඒ විතරක් නොවෙයි discretionary power, ඒ කියන්නේ අභිමත පරිදි කටයුතු කරන්නට පුළුවන් ස්වරූපය වෙනුවට කෙළින්ම කළු සහ සුදු වශයෙන් තිබෙනවා, මෙන්න මෙහෙම තමයි අය කරන්නට ඕනෑ කියලා. අපි සියලු දෙනාම දන්නවා ඒ වාගේ ඍජු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හොඳ කාරණයක් බව.

මේ තක්සේරුව අනුව අපට පෙනෙනවා, නොයෙක් නොයෙක් ක්‍රම උපයෝගී කරගෙන තිබෙන බව. World Trade Organization එක යටතේ මේවා තක්සේරු කරන ආකාරය අපට කෙටුම්පත් කරලා දීලා තිබෙනවා. නමුත් ඒවා අබ්බවා ගිහින් කටයුතු කරන අවස්ථා ගණනාවක් තිබෙනවා. එම නිසා මේ වාගේ දේවල් රටේ නීතිගත කරන විට අපි හිතන්නට ඕනෑ ඒ නීති ඇති කරන්නේ පවුකාරයන්ට මිස ශාන්තුවරුන්ට නොවෙයි කියන එක.

ඒ සඳහා හොඳම උදාහරණය තමයි, මීට අවුරුදු තුන හතරකට පෙර තිබුණු පාලනය තුළින් රථ වාහන 1,500ක් පමණ කිසිම Customs Clearance එකක් නැතිව ගෙනැල්ලා තිබෙනවා. ඒ වාහන එන්නේ ජනාධිපතිගේ අනුදැනුම තුළින්. ඊට පසුව ඒ රථ වාහන අදාළ බදු ගෙවන්නේ නැතිව කෙළින්ම එළියට ගිහින් තිබෙනවා. මේක අපට තිබෙන ලොකුම ප්‍රශ්නයක්. ඒක ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් විතරක් නොවෙයි, රාජ්‍ය ආදායම අඩුවීමට හේතු වන ප්‍රශ්නයක් ලෙසත් බලපාලා තිබෙනවා. එම නිසා විධිමත්ව කරගෙන යන මේ කටයුත්තට සහයෝගය ලබා දෙන සියලුම නිලධාරීන්ට අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප ඉදිරිපත් කළ මේ අලුත් ආකාරය සංශෝධනයට ලක් විය යුතුය කියන කාරණයත් මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්නේ බොහොම ඕනෑකමින්. අප මෙය ඉදිරිපත් කරන අවස්ථාවේ සියයට සියයක්ම හරියි කියා හිතුවේ නැති වුණාට, සියයට 95ක්, 96ක් විතර වැරැද්ද නිවැරදි කර තිබෙනවා. මට අවශ්‍ය වන්නේ එවැනි සුළු වෙනස්කම් ටිකක් ඇති කරන්නයි. අප වෙළෙඳ පොළට කිව්වා, "මෙම මිල ගණන් වැඩි කරනවා නම් ඒ අය දැනුවත් කිරීම තුළින් තමයි කරන්නේ" කියා. මා හිතන විධියට සුබෝපභෝගී රථ වාහන මිල ගණන්වල යම් හිඳැසක් තිබෙනවා. හිඳැස තිබීම නිසා රට තුළට වාහන අනවශ්‍ය ප්‍රමාණයක් එනවා. එක තැනක යුරෝපයේ කාර් එකක් ජපානයේ

කාර් එකකට වඩා රුපියල් ලක්ෂ 150ක විතර අඩුවක් තිබෙනවා. ඒ හිදැස පුරවන්න අවශ්‍ය නීති රීති අප වැඩිකල් යන්න පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව මම මතක් කරන්න කැමැතියි. අප මෙය කරන්නේ කිසි හිරිහැරයක් කිරීමට නොවෙයි. මේ හිදැස පිරවීමත්, ඒ තුළින් යම් ආදායමක් ලබාගන්න පුළුවන් මාර්ගයක් ඇති කිරීමත් තමයි අප බලාපොරොත්තු වන්නේ.

තක්සේරු ක්‍රමය යටතේ අප දැනට කොටස් තුනක් පාවිච්චි කරනවා. ඉන් එකක් තමයි නිෂ්පාදනකරු, ඒ කියන්නේ ඒ කාර් එක, වාහනය හදන කොම්පැනියේ තිබෙන අගය. සියයට සියයක් තිබෙන බදු ප්‍රමාණය එයට උපයෝගි කර ගන්නවා. දෙවැනි කාරණය මෙකයි. යම් තැන්වල පාවිච්චි කළ කාර් එනවා. ඒ පාවිච්චි කළ කාර්වල තමයි ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ. අවුරුදු දෙකක් පාවිච්චි කළ කාර් තමයි අප ගෙන්වන්නේ. එසේ ගෙන්වන කොට අප එය ගණනය කරන්නේ අලුත් කාර් එකක් ලෙසයි. ඒ ඇයි? සමහර විට දවස් දහයක් පාවිච්චි කර තිබෙන කාර් එකක් පවා එන්නෙත් පාවිච්චි කළ කාර් එකක් විධියටයි. ඒ නිසා අප මෙය අගය ක්ෂය වීමේ -depreciate වීමේ - පදනම තුළින් කරන්න ගියොත් ලොකු බාධාවක් ඇති වෙනවා; ආදායම හුඟක් අඩුවෙනවා. ඒ නිසායි මේ අනුගමනය කර තිබෙන උපක්‍රමය තුළින් අවතක්සේරු -undervalue- කිරීම නිසා ගෙනෙන කාර් ප්‍රමාණය ශීඝ්‍රයෙන් අඩු වෙලා තිබෙන්නේ. මම මේ අවස්ථාවේ මේ පාර්ලිමේන්තුවේ සිටින ඔබ සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මෙයයි. ශීඝ්‍රයෙන් නැති වුණු මේ ආදායම යථා තත්ත්වයට ගෙන ඒමට කරුණාකර අපට උදව් කරන්න. අප කළ වැඩි කිරීම තුළින් අද මේ රටට එන කාර්වලින් යම් ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා. අප එය පිළිගන්නේ ඕනෑකමින්. අප කර තිබෙන්නේ මේකයි. අද රටේ පාරවල තිබෙන වාහන තදබදය දැක්කාම අපට හිතෙනවා කාර් මේ තරම් විශාල සංඛ්‍යාවක් අපේ රටට එන එක අහිතකර ක්‍රියාවක් බව. ඒ නිසා අපේ ආණ්ඩුව තුළින් මෙවැනි නීතියක් ක්‍රියාත්මක කරන්න පටන්ගෙන තිබෙනවා. මේ කාර්යයට අවුරුදු එකහමාරක් දෙකක් ගත වේවි. ඒ යන තාක් කල් මේ ප්‍රමාණය අඩු කිරීම අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කරනවා. We are discouraging imports until we have our infrastructure in proper order.

ගෙන්වන කාර් ප්‍රමාණය අඩු වුණත් අපේ ආදායම අපට අවශ්‍ය ප්‍රමාණයටම ලැබී තිබෙන බව මම සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි. සමහර අය මේ ගැන නොයෙක් නොයෙක් ඊර්ෂ්‍යා සහගත ප්‍රකාශ පතුරුවා තිබෙනවා. එවැනි කාරණා දෙක තුනක් මතක් කරන්න මේ අවස්ථාව මා උපයෝගි කර ගන්නවා. මා අගය කරනවා, අද අපේ අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා වෛද්‍යවරුන්ගේ ඒ ප්‍රශ්නයට බොහොම නිර්භීතව උත්තර දීලා අපේ ආණ්ඩුවේ තිබෙන අවංකභාවය පෙන්වීම. අපේ ආණ්ඩුවේ ඉන්න අනික් සියලුම ඇමතිවරුත් ඒ වාගේමයි. එකක් කියලා තව එකක් කරන ප්‍රතිපත්තිය 2015 ජනවාරි මාසයේ 8වැනි දා සිට නැවතුණා. නැවතීම තුළින් පිරිසිදු පාලනයක් ගෙන යාම තමයි අපට අවශ්‍ය වන්නේ. මහින්ද රාජපක්ෂ 2015 ජනවාරි 8වැනි දා භාරදුන්න ආර්ථිකය - [බාධා කිරීමක්] ප්‍රාදේශීය සභාවේ හිටපු කෙනෙක් පාර්ලිමේන්තුවට ආවාම ඔන්න ඕක තමයි වන්නේ.

මහින්ද රාජපක්ෂගේ පාලනය යටතේ සියයට 10.4කට අඩු කරපු ආර්ථිකයේ ආදායම අද සියයට 13.8කට වැඩිවෙලා තිබෙනවා. මෙතෙක් කල් ඒ සල්ලි ටික ගියේ කොහේටද? ඒ කාලයේ සුරාබදුවලින් අවුරුද්දකට රුපියල් බිලියන 40යි හෙව්වේ. ඒ තුළින් අද අප රුපියල් බිලියන 150ක් හොයනවා. රුපියල් බිලියන 110ක් මෙතෙක් කල් කොහේද ගියේ? මෙන්න මේ වාගේ පාලනයකට යට වෙලා සිටි පිරිසක්, කුඩා කල්ලියක් අද නිකම් කෑ ගහනවා. තමන්ගේ ආදායම් මාර්ගය නැති වුණු එක තමයි ඒ අයට තිබෙන ප්‍රශ්නය වන්නේ. ඒ ආදායම ඇති කරන්න යන කොට නොයෙක් නොයෙක් බාධා මතු වෙනවා. මොකද, මේ රටේ හොරකම නැති කිරීම හරිම අමාරු දෙයක්. එය නැති කරන අයට තමයි මේ ප්‍රශ්න ඇති වන්නේ. හොරු ටික ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. ඒවා නැති කරන්න යන කොටයි ප්‍රශ්න මතු වන්නේ. ආදායම රජයට එන කොට ඒක බාධාවක්. මේවා පුවත් වෙන්න පුළුවන්; කාර් වෙන්න පුළුවන්; ඒ අය කරපු ක්‍රියාවලිය වෙන්න පුළුවන්. අද ඒවා හෙළිදරවු වෙලා තිබෙනවා. වැඩිදුර යන්න ඕනෑ නැහැ. ආනයනය කිරීමේ හැකියාවක් නැති engine capacity එකක කාර් එකක් මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාගේම මන්ත්‍රීවරයෙක් ගෙන්නුවා. ඊට පසුව අපෙන් අහනවා, "මෙය මන්ත්‍රීවරයෙක් සඳහා ගෙන්වන කාර් එකක් නේ. ඇයි, ඒක ආනයනය කරන්න බැරි?" කියලා. එහෙම ගෙන්වන්න පුළුවන් නම්, මන්ත්‍රීවරු සියලුදෙනාම ගෙන්වන්නේ ඒ වාගේ සුඛෝපභෝගී කාර් නේ. බදු ගෙවන්නේ නැතුව තමයි ඒ කාරය ගෙන්වලා තිබෙන්නේ. ඒ ගැන ප්‍රශ්න කරන්න යනකොට කියනවා, "දේශපාලන හිරිහැර කිරීම් කරනවා" කියලා. මෙන්න මේවා තමයි අද තිබෙන ප්‍රශ්න. මේවා ගැන තමයි උත්තර දෙන්න තිබෙන්නේ. [බාධා කිරීම්] මේ ගරු සභාවේ නිකම් කෑගහන්න එපා. මේ වාගේ දේවල් හෙළිදරවු කිරීම තමයි තිබෙන ප්‍රශ්නය. මේවා පෞද්ගලික මට්ටමට ගෙන යාමේ අවශ්‍යතාවක් අපට නැහැ. නමුත් ඉල්ලන් කනවා නම් මොනවාද, අපට කරන්න පුළුවන් වන්නේ? හංගලා තිබෙන මේ කාරණා හෙළිදරව් වුණාම ඒක දේශපාලන පළිගැනීම් ලෙසයි සලකන්නේ.

ඒ වාගේම තමයි JVP එකේ ඉන්නා අයත්. ඒ ගොල්ලන් එක වෙලාවකට එකක් කියනවා; තව වේලාවක තවත් එකක් කියනවා. දූෂණය තිබෙනවා කියලා, අපි වාගේ පුද්ගලයන් ඉලක්ක කරන්න ඒ අය හදනවා. නමුත් ඒ ගොල්ලන්ගේ වාගේ හැසිරීම් අපි ළඟ නැහැ. ඒ වාගේ තුච්ඡ දේශපාලනය අපි ළඟ නැහැ. ඒ ගොල්ලන් වනාන්තරයේ කරපු දේශපාලනය මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා පිරිසිදු දේශපාලනය කිලිටි කරන්න හදනවා නම්, අපි පෙන්වන්න හදන්නේ- [බාධා කිරීම්] වසන්ත සමරසිංහ කියනවා, ට්‍රැක්ටර් permits වලින් බෙන්ස් කාර් ගෙනැල්ලා තිබෙනවා කියලා. මේ වාගේ පට්ටපල් බොරු කියන වසන්ත සමරසිංහලා වැනි අය අද පාර්ලිමේන්තුවේ නැත්තේ ඒ නිසායි. ඒ වාගේ බොරු කියූ නිසා ජනතාව ඒ අයට පාඩමක් උගන්වලා තිබෙනවා. ඒ නිසා තමයි ඒ අය අද මේ ගරු සභාව නියෝජනය කරන්නේ නැත්තේ. අපි අභියෝග කරනවා. ඒ විධියට බොරු කරන්න අපි දේශපාලනයට එන්න ඕනෑ නැහැ.

අවුරුදු 24ක කාලයක් අපි දේශපාලනය කරන්නේ කකුල් දෙකෙන් හිටගෙන අපි දේශපාලනය කරපු නිසායි. ආදායම් සොයාගන්න පුළුවන් මාර්ග අපට තිබෙනවා. මේ වාගේ හොර කරලා ගන්න ඒවා නොවෙයි, අපට අවශ්‍ය වන්නේ. [බාධා කිරීම්] මේවා එකින් එක අපි හෙළිදරවු කරනවා. අපි පෙන්වනවා, මහින්ද රාජපක්ෂ කාලය තුළ කොහොමද, මේ හොරු ටික පාලනය කළේ කියලා. [බාධා කිරීම්] ඒක තමයි අපට කරන්න තිබෙන ලොකුම දේ. [බාධා කිරීම්] මහින්ද රාජපක්ෂත් ඉන්නේ ඒ 40දෙනාගේ හොරු කල්ලියේ. ඔය හැම එකේම 'කේස්' එකක් තිබෙනවා. [බාධා කිරීම්] මොනවා හෝ දූෂණයක් තිබෙනවා. එහෙම නැත්නම් අඩු ගණනේ රත්තරන් ටික හෝ හොරකම් කරලා තිබෙන පුද්ගලයෙක්. ඒ විධියට තමයි මේ අය දේශපාලනය කරන්නේ. ඕවාට බයෙන් නොවෙයි අපි දේශපාලනය කරන්නේ. අභිංසක ජනතාව අපට වරමක් දීලා තිබෙන්නේ මෙහි වෙනසක් කරන්නයි. එදා තිබුණ බදු මුදල් තමන්ගේ සාක්කුවලට දාගෙන,- Entrust Securities එකේ මොනවාද වුණේ කියා දැක්කා නේද? මිලියන 4,500 කොහාටද ගිහිල්ලා තිබෙන්නේ? අද උත්තර දෙන්න තමයි ඔතැන-විපක්ෂයේ- ඉන්නේ. ඔන්න ඔය වාගේ කට්ටිය තමයි ඔතැන ඉන්නේ. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන්ට ඔය ආකාරයට කටයුතු කරන්න පුළුවන් නම්, තව

[ගරු රවි කරුණානායක මහතා]

මොනවාද කරන්නේ? තාත්තා කියන දේ පුතා දන්නේ නැහැලු! පුතා කියන එක තාත්තා කරන්නේ නැහැලු! මොකක්ද, මේ තත්ත්වය? අපි ඔය වාගේ තුච්ඡ දේශපාලනයට වැටිලා නැති නිසා, නම් කියන්නේ නැහැ. නමුත් හිතන්න එපා, එය අපේ දුර්වලතාවක් කියලා. [බාධා කිරීම්] මොනවාද, warehouse කියන්නේ? ඔබතුමන්ලා දන්නවා, warehouse එකට අවුරුදු 25කට ඉස්සෙල්ලා චන්ද්‍රිකා කුමාරතුංග තමයි අනුමැතිය දීලා තිබෙන්නේ කියන එක. ඒ කාරණා ගැන නොදන්නා, ඔබතුමන්ලා අපට ඇඟිල්ල දික් කරන්න හදනවා. තමුන්නාන්සේලා ඊර්ෂ්‍යාවෙන් පෙළෙනවා. ගරු සරත් අමුණුගම ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (විශේෂ කාර්යභාර අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம - விசேட பணிப் பொறுப்புகளுக்கான அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of Special Assignment)
මුදල් ඇමති හැටියට මමයි එය විවෘත කළේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි විපක්ෂයේ ඉන්නකොට, මුදල් ඇමතිතුමා හැටියට, ගරු සරත් අමුණුගම ඇමතිතුමා තමයි එය විවෘත කළේ. තමුන්නාන්සේලා වාගේ licence පාවිච්චි කරලා ව්‍යාපාර කරන පුද්ගලයෝ නොවෙයි අපි. ඒ නිසා මේවා ඉගෙන ගන්න අවශ්‍යයි. මේක Entrust Securities වෙන්න පුළුවන්; cars import කිරීමක් කරනවා වෙන්න පුළුවන්. [බාධා කිරීම්] අපට අවශ්‍ය වන්නේ හැම තඹ ශතයක්ම ආණ්ඩුවට ලබා ගැනීමට හැකි වැඩ පිළිවෙළක් සකස් කිරීමටයි. ඒ නිසා තමයි මේ වාගේ උපක්‍රමශීලී වැඩ පිළිවෙළවල් ඇති කරලා තිබෙන්නේ. [බාධා කිරීම්]

ලැම්බෝගිනි ගැනත් කියන්න ඕනෑ. කෝ, මේ ලැම්බෝගිනි? [බාධා කිරීම්] ඇයි, අපි ඒවා රජය සන්තක කරලා තිබෙන්නේ? [බාධා කිරීම්] ඔබතුමන්ලා නොදන්නවා වුණාට, අපට කියන්න තිබෙන්නේ ඒවා රජය සන්තක කර තිබෙන බවයි. මිලියන 30කට ගෙනාව කාර් ටික කවුද, ආනයනය කරලා තිබෙන්නේ? ඒ දේවල් අද පිළිගෙන තිබෙනවා. මේවා ගෙනාවේ හිටපු ජනාධිපතිතුමාගේ අනුදැනුම ඇතිව කියලා අද හෙළිදරවු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා නොදැන ශබ්ද කළාට, වෙච්ච දේවල් තමයි අද හෙළිදරවු වෙලා තිබෙන්නේ. ගෙනාවේ Carnet permit එකෙන්. අවුරුද්දක කාලයකට පසුව නැවත අපනයනය කරනවා කිව්වත්, මේ රටේ අවුරුදු 3ක් තිබුණා. අපි පත් වුණාට පසුව අපනයනය කරන්න ගිහිල්ලා, වුණ දේ තමයි එතැනදී හෙළිදරවු වෙලා තිබෙන්නේ. ඒ නිසා වංගු දාලා කරපු දේශපාලනය සම්පූර්ණයෙන් අතුගාලා තිබෙනවා. අපේ පිරිසිදු පාලනය නිසා තමයි ඔබතුමන්ලාට ඇඟිල්ල දික් කරලා හොරු ටික මෙතැන තමයි ඉන්නේ කියලා අපි කියන්නේ. නමුත් ඒ දේවල් කියන්නට තරම් අපේ කොන්ද ශක්තිමත් වන්නේ නැහැ, ඒ වාගේ වැරැදි වැඩ කරමින් අපි කටයුතු කරනවා නම්. [බාධා කිරීම්] ඒ නිසා තමුන්නාන්සේලාගේ ඔය 45 කල්ලියේ හොරු සියලුදෙනාම එකතු වෙලා, ඒ හොරු කණ්ඩායම නියෝජනය කරන නායකයෙක් තමයි පත් කරලා තිබෙන්නේ.

ජනාධිපති ලෙස අද රටට නායකත්වය දෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කොතරම් හිරිහැර කරන්න හදනවාද? ජනතාව වෙනුවෙන් අවංකව සේවය කරන්න එතුමා පත් කරලා තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද දායකයෝයි. ඒ නිසා ඔවුන් මේ ආණ්ඩුවට අභියෝග කරනවා. පැරදුණු එක්කෙනෙක් කියනවා, "කොහොමද ඒක වුණේ, කොහොමද මේක වුණේ?" කියලා. අපට මතකයි, 65වන සංවත්සරයට කුරුණෑගලට ආවා කියලා පෙන්වපු කට්ටිය. ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ 70වන සංවත්සරයට Campbell Park එකට ආපු කට්ටිය දැකලා දැන් මේගොල්ලන්ගේ කට වැහිලා තිබෙනවා කියන එක තමයි කියන්න තිබෙන්නේ. ඒ නිසා අපි ඔබතුමන්ලාට අභියෝග කරනවා, පුළුවන් නම් එක තැනකට 5,000ක් එකතු කරලා පෙන්වන්න කියලා. අන්න එදාට පෙන්වන්න පුළුවන්, මහින්ද රාජපක්ෂට කොන්දක් තිබෙනවා කියන එක.

දැන් බලන්න, හිටපු ජනාධිපති මෙන්ම මුදල් ඇමති වන මහින්ද රාජපක්ෂ අදහසක් ඉදිරිපත් කරනවා, "වැට් එක අඩු කරන්න" කියලා. මේ රටේ ආර්ථිකය කාලා දාලා, රටේ ආදායම අඩු කරලා, ආදායම හා වියදම අතර පරතරයක් අපට ලබා දීලා දැන් එතුමා කියනවා, "ඒ ණය ටික ගෙවන්න ආදායමක් උපයන්න එපා" කියලා. අද එතුමා අපට අදහසක් ඉදිරිපත් කරනවා, "කරුණාකරලා ජනතාව වෙනුවෙන් 'වැට්' එක වැඩි කරන්න එපා" කියලා. එතුමාගේ කාලයේ මේ රට පාලනය කළ ආකාරය නිසා තමයි, මේ වාගේ තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙන්නේ.

අද බලන්න, Sooriyawewa Cricket Stadium එක. ඒකට රුපියල් මිලියන 4,600ක් වියදම් කර තිබෙනවා. ඒකේ සැබෑ ඇස්තමේන්තුව රුපියල් මිලියන 860යි. ඉතුරු සල්ලි කොහේද ගිහින් තිබෙන්නේ? නොරොච්චෝලේ විදුලි බලාගාරයේ වියදමත් ඒ වාගේම වැඩි වෙලා තිබෙනවා. එදා අධිවේගී මාර්ග හදන්න ගිය වියදමෙන් සියයට 21ක් අඩු කර හදන්න පුළුවන් හැකියාව අද ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් ඇති වෙලා තිබෙනවා. එහෙම තමයි අද මේ වෙනස ඇති කරලා තිබෙන්නේ. " 'මේ රටේ සල්ලි නැහැ.' කියලා එක පැත්තකින් කියනවා, නමුත් මේ රට සංවර්ධනය වෙන්නේ කොහොමද?" කියලා ඔබතුමන්ලාට දරා ගන්න බැරි වෙලා තිබෙනවා. රට සංවර්ධනය කිරීම තමයි අපි කර ගෙන යන්නේ. [බාධා කිරීම්] සද්ද කළා කියලා අපි භය වෙන්නේ නැහැ. ඔබතුමන්ලා තව සද්ද කරන්න. ඒක තමයි අපට තිබෙන ලොකුම අභියෝගය. ඒ අභියෝග මත අපි යහ පාලනය තුළින් උත්සාහ ගන්නේ මීට වැඩිය සංවර්ධනයක් රටේ ඇති කරන්නයි. ඒක නොවැම්බර් මාසයේ 10වැනිදා ඉදිරිපත් කරන අය වැය තුළින් අපි පෙන්වා දෙනවා. එදාට තමයි මේ අය හොල්මන් වෙන්නේ, බංකොලොත් වෙලා තිබෙනවා කියන මේ රට අපි කොහොමද ඉදිරියට ගෙන යන්නේ කියලා. [බාධා කිරීම්] ඒ නිසා අප මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නේ, ඔබතුමන්ලා කරපු අපරාධ දැන ගෙන, මේ වාගේ සද්ද කරන්නේ නැතුව, ඔබතුමන්ලා ඒ ඇති කරපු ප්‍රශ්න නැති කරලා, පිරිසිදු කරලා, දුකෙන් පෙළෙන අහිංසක ජනතාවට සෙතක් ලබා දෙන්න කටයුතු කරන්න අපට කාලයක් ලබා දෙන්න කියලායි.

අපි ජාතික ප්‍රතිපත්තියක් ඇතිව රට හදන්න ඕනෑ. ජාතික ප්‍රතිපත්තිය ඇති කිරීමේ පළමුවැනි සාධකය තමයි, ආදායම. අපට ආදායම් අවශ්‍යයි. ආදායම හරියාකාරව ලබා ගන්න පුළුවන් නම්, ඒකට සරිලන වියදමක් ඇති කරන්න ඕනෑ. අසීමිත ඉල්ලීම් ඉටු කිරීමට සීමිත සම්පත් ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ සීමිත සම්පත අසීමිත ඉල්ලීම් තුළින් බෙදා හරින කොට අවශ්‍යතාවලට ප්‍රමුඛත්වයක් දිය යුතුයි. ඒ ප්‍රමුඛත්වය දෙන එක තමයි අපි කරමින් යන්නේ. ඔබතුමන්ලා මෙතැනට ඇවිල්ලා සද්ද කිරීම නොවෙයි කළ යුත්තේ. කිසිම හරයක් නැතුව සද්ද කරන එක තමයි හාස්‍යයට කරුණක් වන්නේ. අප මේ අවස්ථාව උපයෝගි කර ගන්නේ, සමබරතාවකින් රටේ සංවර්ධනය ඇති කරන්නයි. අපි මෙවැනි ආදායමක් උපයන්නේ එක දිස්ත්‍රික්කයක town එකක් සංවර්ධනය කරන්න නොවෙයි. අපි කොළඹ ඉඳන්

මඩකලපුවටත්, පේදුරුතුඩුවේ සිට දෙවුන්දරතුඩුවටත් සමබරතාවෙන් සංවර්ධනය ඇති කරනවා කියන එක මේ අවස්ථාවේ පෙන්වා තිබෙනවා. ඒ පෙන්වීම තමයි අද ප්‍රශ්න කරන්නේ. කොහේද අරක වෙන්නේ, කොහේද මේක වෙන්නේ, ඒ ප්‍රශ්න අහන එක තමයි ඔබතුමන්ලාට කරන්න පුළුවන් එකම දේ. ඊට වඩා හරයක් ඇතිව කටයුතු කරන්න පුළුවන්ද? ඔබේ හිටපු මුදල් ඇමතිට අපි නොයෙක් අවස්ථාවල කියලා තිබෙනවා, "කරුණාකරලා ඇවිත් කොහොමද ඒවා වුණේ කියලා තර්ක කරන්න; අපිත් එක්ක විවාද කරන්න" කියලා. නමුත් තවම භයයි ඇවිල්ලා කථා කරන්න. එන්නේ පස්ස දොරෙන්. යන්නේ පන්සලකට. නැත්නම් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා, "මෙන්න යෝජනා" කියලා. එන්න, පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරන්න. පාර්ලිමේන්තුව නියෝජනය කරන්නයි පත් කරලා තිබෙන්නේ.

ජනාධිපතිකමෙන් පැරදුණාට පස්සේ මන්ත්‍රී කෙනෙක් වෙනවා. ඒක එතුමාගේ අදහස. ඒත් ඇවිල්ලා මෙතැන කියන්න පුළුවන් නම්, "මෙහෙම තමයි වුණේ" කියලා මම හිතන්නේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. පස්ස දොරෙන් කරපු දේශපාලනය ඒ අයගේ කාලාන්තරය තුළ වෙන්න පුළුවන්. නමුත්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් අද මේ පාලනය තුළින් වෙනසක් ඇති කර තිබෙනවා කියන එක අපි නෙවෙයි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කලින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have another three more minutes.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
Sir, can I take another two minutes more? The entertainment that comes from them compels me to go a little longer and say what is going on.

අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, අපේ ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් මේ ගෙන යන අලුත් සම්මුතිවාදී දේශපාලන ගමන වෙනුවෙන් අද ලෝක නායකයන් අපට උදව් කරන්න පටන් අරගෙන තිබෙනවා. ජපානයෙන් වෙන්න පුළුවන්; චීනයෙන් වෙන්න පුළුවන්; ඇමෙරිකාවෙන් වෙන්න පුළුවන්; ඔවුන් අපට උදව් කරන්න පටන් අරගෙන තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා 21වැනි දා United Nationsවල 71වැනි මහා මණ්ඩල සැසිය අමතන්න සූදානමින් ඉන්නවා. මේවා තුළින් අද අපේ රට ගැන විශේෂ සැලකිල්ලක් ඇතිවෙලා තිබෙනවා. පසු ගිය ආණ්ඩුව එදා ණය ගත්තේ සියයට භයක, හතක පොලියකටයි.

අද අපි සියයට එකහමාරක, දෙකක පොලියට ණය ලබා ගන්න කොට ඉරිසියාවක් ඇතිවෙලා තමයි මේ විධියට කෑ ගහන්න පටන් අරගෙන තිබෙන්නේ. ගරු බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා කියනවා, අපි ගිය අවුරුද්දේ වැඩියෙන් ණය අරගෙන තිබෙනවා කියලා. මහින්ද රාජපක්ෂ මහතාගේ පසු ගිය ආණ්ඩුවෙන් ගත්ත ණය ටික තමයි අපට ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියලා එතුමන්ලා දන්නේ නැද්ද? අපි දැන් ගන්න ණය ගෙවන්නේ තව අවුරුදු භයකින්, හතකින්. අද අධිවේගී මාර්ග හැදෙනවා; ගෙවල් හැදෙනවා; රැකී රක්ෂා ලබා දෙනවා. මේ සියල්ල දෙස බලාගෙන තමයි තමුන්නාන්සේලා අපෙන් ප්‍රශ්න කරන්නේ, කොහෙන්ද මේවා එන්නේ, අරක මොනවාද වෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට නියමිත කාලය අවසන් වෙලා තිබෙන නිසා මම මීට වඩා වේලාව ගන්නේ නැහැ. රටේ ආර්ථිකය වර්ධනය කරමින් ශක්තිමත් කරමින් අපි ඉදිරියටත් කටයුතු කර ගෙන යනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරු රටේ ආදායම අඩු වුණත් උසාවි යනවා. එතුමන්ලා දැන් හැම දේකටම උසාවි යනවා; VAT එකට උසාවි යනවා; අපි අරක්කු මිල වැඩි කළත් උසාවි යනවා. මේ වාගේ සංකල්ප තුළින් අපේ ආදායම ඇස්තමේන්තු ආදායමට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය කර ගැනීමට හැකියාව ඇතිවෙලා තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ සිටින සියලුම නිලධාරීන්ට මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. මොකද, වැඩ කරන අය මහන්සියෙන් වැඩ කරනවා. වැඩ කරන්නේ නැති හොරු ටිකකුත් ඉන්නවා. මේ වෙනස ඇති කරගෙන සියලු දෙනාගේම එකමුතුභාවය තුළින් ඉදිරියට කටයුතු කිරීම තමයි අපි කරන්නේ. නොවැම්බර් මාසයේ 10වැනි දාට මේ රට හොල්මන් වන විධියේ අය වැයක් අපි ඉදිරිපත් කරලා පෙන්වනවා කියන එකත් මේ අවස්ථාවේදී මා මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කලින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
අධ්‍යාපන කෞරව වෛද්‍ය කලානිති සිවමෝහන් අවර්කළ්! උංකළුක්කු ඔන්පතු නිමිඩංකළ් උළ්ළන. ඉන්ත විවාතම් තාමතමාකත් තොටංකියතාල් උංකළුටෙය නේරම් කුරෙක්කප්පට්ටිරුක්කින්රතු.

[ප.ව. 3.37]

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) සි. සිවමෝහන්)
(The Hon. (Dr.) S. Sivamohan)
කෞරව කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළේ, ඉන්රෙය විවාතත්තිල් කලන්තුකොළ්ළ එනක්කුච් සන්තර්ප්පම් තන්තතර්කාක උංකළුක්කු එනතු නන්රියෙත් තෙරිවිත්තුක් කොළ්කිරේන්. මුල්ලෛත්තීවු නකරානතු මූන්රු පක්කමුම් නීරාල් සූළප්පට්ටතාකුම්. ඔරු පක්කම් පෙරුංකටලාලුම් මර්රෙය ඉරු පක්කංකළුම් නන්තික් කටලාලුම් සූළප්පට්ටිරුප්පතු අතන් විසේටමාන ඕර් ඉයල්පු. අංකු වට්ටුවාකල් පිරතේසමානතු නන්තික්කටල් කළප්පුටන් සේර්න්තතාක ඉරුප්පතාල් අතු ඔරු විසේට ඉටත්තෛප් පිටිත්තිරුක්කින්රතු. මළෛක් කාලත්තිල් කාට්ටිලිරුන්තු තිරණ්ටුවරුම් වෙළ්ළම් නන්තික් කටලිලේ කලන්තු, ඉන්ත වට්ටුවාකල් කළප්පෛ උටෛත්තු අතනූටාකප් පෙරුංකටලෛ අටෛකින්රතු. ඉන්තක් කාලත්තිල් ඉන්තක් කළප්පිලේ නණ්ටු, ඉරාල්, මීන් පෝන්රවෛ මුට්ටෛයිට්ටුප් පෙරුකුවතර්කාන ඔරු සූළලුම් කාණප්පටුකින්රතු. එනවේ ඉතු එමතු මක්කළින් වාළ්වාතාරත්තුටන් ඉණෛන්තුළ්ළ ඔරු විටයම්. ඉන්තක් කළප්පු උටෛක්කුම්පොළුතු මළෛ නින්රුවිටුම් එන්රු එමතු මක්කළ් නම්පි වරුකින්රාර්කළ්. අතුතාන් උණ්මෛයුමාකුම්. අතාවතු, ඉරුති මළෛ කොට්ටුම් පොළුතු ඉන්තක් කළප්පෛ උටෛත්තුවිටුවතුටන්, මළෛයුම් නින්රුවිටුම්. අප්පටියාන ඕර් ඉටත්තිල් ඉන්රු චට්ටත්තුක්කුප් පුරම්පාක කෝත්තාපය කටර්පටෛ මුකාම් විස්තරික්කප්පට්ටු වරුකින්රමෛ කවලෛක්කුරිය ඔරු විටයම්.

ඉතු එමතු මක්කළින් ඉයර්කෛ වාළ්වුටන් සේර්න්ත ඔරු පිරතේසම්. මුල්ලෛ නකරමානතු ඉයර්කෛ මීන්පිටිත් තුරෛ මුකත්තුටන් සේර්න්ත ඕර් ඉටම්. අංකු ඉවර්කළාල් ආක්කිරමික්කප්පට්ට පිරතේසම් එමතු කටල් වළත්තුටන් සේර්න්ත ඕර් ඉටම්. අතු මට්ටුමල්ල, ඉන්ත නන්තික් කටලානතු නණ්ටුකළෛ උර්පත්ති සෙය්තු කොළුම්පුක්කු අනුප්පුවතිල් ඉන්රුම් පෙයර්පෙර්ර ඔරු පිරතේසම්. ඉංකුතාන් ඉන්තප්

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

பிரச்சினையே உள்ளது. கடற்படையினர் இதை ஆக்கிர மித்துக்கொண்டு இது தங்களுக்கு முக்கியத்துவமான பிரதேசம் என்று கூறுகின்றார்கள். ஆனால் இது மக்களுக்கு முக்கியத்துவமான ஒரு பிரதேசம் என்பதற்குத்தான் இங்கு நாங்கள் முன்னுரிமை கொடுக்க வேண்டும். இந்த இடத்தில் ஓர் இயற்கை வட்டம் சுற்றிவருகின்றது. நான் சொல்ல வருவது, அது மழை காலத்தில் உடைப்பெடுத்த பின்னர் அந்த உடைப்பு அடைக்கப்பட்டு மீண்டும் ஒரு மழை வரும்பொழுது உடைப்பெடுக்கும். இவ்வாறு இங்கு ஓர் இயற்கை வட்டம் சுற்றி வருகின்றது. மக்களின் வாழ்வுடன் சேர்ந்த இந்தப் பிரதேசத்தை உருக்குலைப்பதற்குக் கடற்படையினர் முயன்று வருகின்றார்கள் என்பதே கவலைக்குரிய ஒரு விடயமாகும்.

அதுமட்டுமல்ல, எமது முல்லை மாவட்டத்தில் இந்தப் பிரதேசமானது உல்லாசப் பயணத்துறைக்குரியது என்பதுதான் எமது வாதம். எமது பிரதேச அபிவிருத்தி இணைப்புக் குழுவில் நாங்கள் ஒரு தீர்மானம் எடுத்திருந்தோம், இந்தப் பிரதேசம் எமது கடற்றொழில் பல்கலைக்கழகத்துக்காக ஒதுக்கப்பட வேண்டும் என்று. எனவே, அங்குள்ள 600 ஏக்கர் வரையான பொதுமக்களின் காணிகள் அவர்களுக்கு விடுவித்துக் கொடுக்கப்பட வேண்டும்; மிகுதியான அரச காணிகளை ஒரு கடற்றொழில் பல்கலைக்கழகத்துக்காகப் பிரயோசனப்படுத்து வதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதுதான் எமது கோரிக்கையாக இருக்கின்றது. அதற்காகவேதான் இந்தத் தீர்மானத்தை நாங்கள் எடுத்திருந்தோம். ஆனால் துரதிருஷ்டவசமாக முன்னைய அரசின் இராணுவ ஆட்சிக் காலத்தில் - இராணுவ ஆட்சி அரங்கேறிய காலத்தில் இடம் பெற்ற நகர்வுகள் இதற்குத் தடையாக இருந்தன. தவறான ஒரு காணி சுவீகரிப்புக்காக இங்கு ஒரு gazette notification வெளியிடப்பட்டிருக்கின்றது. எனவே, முன்னைய அரசு செய்த மக்கள் விரோதச் செயல்களையே இந்த அரசும் தொடரப்போகின்றதா? என நான் கேட்க விரும்புகின்றேன். உங்களது ஆட்சி மக்களாட்சியா அல்லது இராணுவ ஆட்சியா? என்ற ஒரு கேள்வி இங்கு தொக்கிநிற்கின்றது. ஏனெனில், இன்று நடைபெறும் நிகழ்வுகள் கவலைக்குரிய வைகளாகத்தான் இருக்கின்றன.

அண்மையில் முல்லைத்தீவு மாவட்டத்தில் படையினர் எந்தவித அறிவித்தலுமின்றித் திடீரென மேய்ச்சல் தரையாகப் பாவித்த பிரதேசத்தைச் சுற்றிவளைத்து வேலி போட்டதால் அங்கு சென்ற மக்களின் கால்நடைகள் அவர்களின் அடைப் புக்குள் சிக்கிக்கொண்டன. அவ்வாறு 600க்கும் மேற்பட்ட கால்நடைகள் சிக்கிக்கொண்டதாக மக்கள் தெரிவிக் கின்றார்கள். எனவே, இன்று அவர்கள் அந்தக் கால்நடைகள் மூலம் கிடைக்கும் வருமானத்தைக்கூட இழந்து நிற்கின்றார்கள். ஆனால், இதைப்பற்றிப் பேசுவதற்கு அங்கு யாரும் முன்வரவில்லை என்பது கவலைக்குரிய விடயம். ஆனால், இந்தக் காணி சுவீகரிக்கின்ற நடவடிக்கை இடைநிறுத்தப்பட்டிருக்கின்றபொழுதிலும் படையினர் அவர்களது நடவடிக்கைகளைத் தொடர்ந்து வருகின்றார்கள். இது மக்களுடனான அந்நியோன்னியத்திற்கு ஒரு பங்கமான நிகழ்வு என்றுதான் நான் கூறுவேன். காஷ்மீரில் இருக்கின்ற இராணுவத்தினர் காட்டிலே கொடூரப் பனிப் பிரதேசத்தில் அந்த நாட்டைக் காத்துக்கொண்டிருக்கின்றார்கள். ஆனால், இவர்கள் நகரிலே சொகுசாக வாழ்வதற்காக மக்களின் வாழ்வாதாரங்களைக் குலைத்து அங்கு நிலைகொள்ளப் பார்க்கின்றார்கள். இது சரியா? என்றுதான் நான் கேட்கின்றேன். பாதுகாப்புப் படையினருக்காகப் பயன்படுத்தக் கூடிய பல அரச காணிகள் காட்டுப் பிரதேசங்களில் தாராளமாக இருக்கின்றன. ஏன், நகர்ப் பிரதேசங்களில் வந்து எமது மக்களின் வாழ்வாதாரங்களை இவர்கள் உருக் குலைக்கிறார்கள்? என்பதுதான் எனது கேள்வி. எனவே, அரசாங்கம் இந்த விடயத்தைக் கவனத்திலெடுத்து வட்டுவாகல் கடற்படை முகாமை அங்கிருந்து அகற்ற வேண்டும். அந்த முகாமை கடற்பிரதேசத்தை அண்டி அவர்களுக்குப் பொருத்தமான இடத்தில் அமைத்தால், இந்தக் களப்புப் பிரதேசத்தை எமது மக்களின் வாழ்வாதாரத்திற்குப் பயன்படுத்தக்கூடியதாக இருக்கும்.

ஆனால், இப்படி மக்களின் வாழ்வாதாரத்தைக் குழப்பும் ஒரு விடயத்தை உங்களால் தென்பகுதியில் செய்ய முடியாது. சிங்கள மக்கள் உங்களை அவர்களது வாழ்வாதாரத்தைக் குலைக்க விடமாட்டார்கள். எப்படியாவது நீங்கள் அங்கு வந்து இராணுவ ஆட்சியை நிலைப்படுத்தப் பார்க்கிறீர்களா? என்று நான் கேட்க விரும்புகிறேன். எனவே, இந்த விடயத்தில் அரசாங்கம் கரிசனையெடுத்து இன்னும் ஒரு மாத காலத்திற் குள்ளாக அல்லது இனிவரப்போகின்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்துக்கு முன்பாக அந்தக் கடற்படை முகாமை விலக்கிக்கொண்டால், நான் மிகவும் நன்றியுடையவனாக இருப்பேன்.

மேலும், நஞ்சுண்டான்குளம் என்றொரு குளம் விஸ்வமடு வில் உள்ளது. இது அபிவிருத்தி செய்யப்படாமல் அப்படியே இருக்கின்றது. இந்தக் குளமானது பண்டாரவன்னியன் வாழ்ந்த காலத்தில் கட்டப்பட்டதாகும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்கள் உரையை முடித்துக்கொள்ளுங்கள்.

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
இங்கே வீட்டுத் திட்டம் சம்பந்தமாகவும் கூற வேண்டியிருக்கிறது. எமது முல்லைத்தீவு மாவட்ட மக்களுக்கு 17,000 வீடுகள் தேவைப்படுகின்றன. யுத்தத்தால் உருக் குலைக்கப்பட்ட குடும்பங்கள் இன்றும் அநாதரவாக விடப் பட்டிருக்கின்றன. கோர யுத்தம் எங்களுடைய மக்களை முள்ளிவாய்க்காலில் பலியெடுத்ததென்பது உங்களுக்குத் தெரியும். எனவே, இந்த 65,000 வீட்டுத் திட்டத்தை உடனடி யாக நடைமுறைப்படுத்தி இந்த மக்களின் கஷ்டங்களை நீக்குவதற்கு அரசாங்கம் முன்வரவேண்டும் என்பது என்னுடைய கோரிக்கையாகும்.

நான் இங்கு பேசுவதற்குப் 15 நிமிடங்கள் கோரி யிருந்தேன். ஆனால், குறைவான நேரமே தரப்பட்டது. நான் நிறைய விடயங்களைச் சொல்ல எண்ணியிருந்தாலும் நேரம் போதாமையால் இன்னுமொரு விடயத்தையும் கூறி எனது உரையை முடிக்கலாமென நினைக்கின்றேன்.

அரச மருத்துவ அதிகாரிகள் சங்கத்தைப் பற்றிப் பல பிரச்சினைகள் இங்கு முன்வைக்கப்பட்டன. தயவுசெய்து இந்த அரசு ஒரு விடயத்தைக் கவனத்திலெடுக்க வேண்டும். நீங்கள் சொல்வதுபோல் வைத்தியர்கள் file களை எடுத்துவைத்துக் கணக்குப் பார்க்கும் வேலையைச் செய்வதில்லை. அவர்கள் நோய்களுடன் போராடி உயிர்களைக் காப்பாற்றும் வேலையைத்தான் செய்கிறார்கள். எனவே, அவர்களின் குழந்தைகளுக்காக நீங்கள் சில சலுகைகளைச் செய்ய

වේණ්ඩියතු මුක්කියමානතාකුම්. අවර්කළ් තංකළතු කුළන්තෛකළුක්කාකත්තාන් කේට්කින්රාර්කළ්. වෛත්තියර්කළින් කුළන්තෛකළ්තාන් ඉන්ත නාට්ටිලේ අතිකම් පාවම් සෙය්තවර්කළ්. ඒනෙනිල්, මට්රවර්කළුක්කු ඔරු වරුටත්තිල් අතික නාට්කළ් leave එටුක්කක්කූටිය සන්තර්ප්පම් කිටෛක්කින්රතු. ආනාල්, වරුටම් මුළුවතුම් 24 මණි නේරමුම් සේවෛ සෙය්යුම් වෛත්තියර්කළෛ නීංකළ් කණ්ටිරුප්පීර්කළ්. එනවේ, අවර්කළින් කුළන්තෛකළුක්කාක ඉන්ත අරසු මේලතික සලුකෛකළෛච් සෙය්ය මුන්වරවේණ්ටුම්. අතෛවිටුත්තු, අවර්කළුටන් පෝරාට මුට්පටක්කූටාතු එන්පතෛයුම් කේට්ටුක් කොණ්ටු විටෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 3.47]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (විශේෂ කාර්යභාර අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம- விசேட பணிப் பொறுப்புகளுக்கான அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of Special Assignment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වෙනි වගන්තිය යටතේ, 2016 මැයි 26 දිනැති අංක 1968/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, වාහන බදු සම්බන්ධයෙන් අද දින කෙරෙන විවාදයට සහභාගි වෙන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වනවා.

දීර්ඝ කාලයක් තිස්සේ මේ රටට වාහන ආනයනය කිරීමේදී නොයෙක් විධියේ දූෂණ පවතින බවට අප සියලුදෙනාම -ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්, විරුද්ධ පක්ෂය වෙන්න පුළුවන්- එකඟ වනවා. එවැනි දූෂණ පසු ගිය රජය කාලයේත් තිබුණා; වර්තමානයේත් තිබෙනවා. එම නිසා මේ යෝජනාවලින් බලාපොරොත්තු වන්නේ, රජයට හිමි මුදල් ප්‍රමාණය ලබා ගැනීමේදී වාහන ආනයනය කිරීමේදී ලැබෙන කොටස පිළිබඳවත් සලකා බලන්නයි.

ඇත්ත වශයෙන්ම මේ රටට පරණ කාර් ගෙන ඒම තුළ නොයෙක් විධියේ දූෂණ තිබෙනවා. අපේ රටේ විදේශ විනිමය ප්‍රශ්නයක් තිබුණ නිසා තමයි, අලුත් කාර් ගෙන්වන්නේ නැතිව පරණ කාර් ගෙන්වන්න සිද්ධ වුණේ. මුදල් තිබෙන වෙනත් රටවලට පරණ කාර් ගෙන්වන්නේ නැහැ. නමුත්, අපට තිබුණු ආර්ථික දුෂ්කරතා නිසා අතීතයේ සිට මෙම ලාභ කාර් ගෙන්වන්න සිද්ධ වුණා. වාහන ගෙන්වීමේදී මේ දූෂණ පැවැතුණේ ශ්‍රී ලංකා රේගුවේ විතරක් නොවෙයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව කියන මේ සෑම අංශයකම මේ දූෂණ ඔඩු දුවන ප්‍රශ්නයක් බවට පත් වුණා; පත් වෙලා තිබෙනවා. රජයට අවශ්‍ය ආදායම ලබා ගැනීමේ ඒ මාර්ග වඩාත් කාර්යක්ෂම කිරීම සහ දූෂණයෙන් තොර කිරීම රජයේ යුතුකමක් වනවා. ඒ අරමුණින් තමයි මේ සංශෝධනය ගෙනැත් තිබෙන්නේ.

ඉතිහාසයේ විශාලම හොරකම පසු ගිය දවස්වල සිද්ධ වුණේ රේගු දෙපාර්තමේන්තුව හරහා බව අපි දන්නවා. CTB එකට අවශ්‍ය අමතර කොටස් කියලා පුද්ගලික වෙළෙන්දන් - ඔබතුමන්ලාටත්, ඒකාබද්ධ විපක්ෂයටත් සම්බන්ධ අය- කෝටි ප්‍රකෝටි ගණන් වටිනා වාහන කොටස් මේ රටට ගෙන්වලා පුද්ගලික අංශයට දුන්නා, විශාල ලාභ ගන්න. ඒ විතරක් නොවෙයි, රේගු දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් ඒ කටයුත්තට සම්බන්ධ කරගෙන තිබෙනවා. අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ඍතුකිවන්න වන්න ඕනෑ. මොකද, ඒ දෙන්න ඕනෑ පගාවෙන් තුනෙන් පංගුවක් ගෙවලා, ඉතිරි ටික ගෙවන්න හෝටලයකට ගියාම බඩුත් එක්ක අතටම ඒ වංචාකරුවන් අල්ලා ගත්ත නිසා. ඉතින්, මේ වාගේ විශාල දූෂණ රේගු අංශයේ, ආදායම් බදු අංශයේ, සුරාබදු අංශයේ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තිබෙනවා. ඒ තුළින් රජයට ලැබිය යුතු ආදායම් අඩු වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තුව තමයි මුදල් පිළිබඳ වගකියන ආයතනය. ඒ නිසා අපි ආණ්ඩු පක්ෂයේ, විරුද්ධ පක්ෂයේ කියලා භේදාගෙන කටයුතු කරන්න හොඳ නැහැ. මේ නීති - රීති නැවත සකස් කරලා රජයට ලැබිය යුතු ආදායම ලබා ගන්න අප සියලු දෙනාම එකතු වී කටයුතු කරන්න ඕනෑ. මේ වෙනස කරනකොට යම් යම් ප්‍රතිකර්ම යොදන්නත් අපට සිද්ධ වෙනවා.

දැන් බලන්න, අපේ හිතවත් ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා තමයි, මුදල් පිළිබඳ අනුකාරක සභාවේ සභාපති. එතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන ඒ කොමිටියේ වාර්තාවේ අංක එකේ යෝජනාව ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. මොකක්ද ඒ අංක එකේ යෝජනාව? ඒ Report එක බලන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොන කමිටුවේද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Subcommittee on Finance. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා තමයි ඒ කමිටුවේ සභාපති. එතුමාගේ -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
It is appointed by the Constitutional Assembly.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක Constitutional Assembly එකට අනුබද්ධ Subcommittee එක නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමාගේ යෝජනා පිළිබඳව -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ. මම ඒ පළමුවැනි යෝජනාව ගැන විතරයි කියන්නේ. මොකද, ඒක බොහොම වැදගත් එකක්. මම හිතන හැටියට ඒක විවාදාත්මක එකක් නොවෙයි. "Head of State or Government should not hold the portfolio of Finance in the Cabinet of Ministers." මේක අපි ඔක්කෝටම එකඟ වෙන්න පුළුවන් යෝජනාවක්.

මගේ හිතවත් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ ගැන දන්නවා. රාජ්‍ය නායකයා මුදල් ඇමති වුණාම, සම්පූර්ණ පාලන තන්ත්‍රයම විකෘති වෙනවා. මම පුද්ගලයන් ගැන නොවෙයි මේ කියන්නේ. සමහර කාලවල රාජ්‍ය නායකයා මුදල් ඇමති වශයෙනුත් සිටියදී මොකද වුණේ? මගේ හිතවත් ගරු දිනේෂ්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇමතිවරයෙකු වශයෙන් සිටියදී මොකද වුණේ? කොන්ත්‍රාත් එකක් ගැන සාකච්ඡා කරනකොටම, ඔබතුමාගේ බලතල අයින් කළා. එහෙම වුණා. සමහර අවස්ථාවට ඇමතිතුමාට කරදර කරලා නවතින්නේ නැතුව, එතුමාගේ අමාත්‍යාංශයේ ප්‍රධානියාත් මාරු කරලා දැම්මා. හැබැයි, ඒකෙන් ඒ නිලධාරියාට හොඳක් වුණා. අද එතුමා ජනාධිපතිතුමාගේ ලේකම් බවට පත් වෙලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි, අපේ ජනාධිපතිතුමා එදා මොරගහකන්ද ගිවිසුම අත්සන් කළාට පස්සේ, ඔන්න බොලේ පහුවදාම මහවැලි අමාත්‍යාංශයට වෙන ඇමති කෙනෙකු පත් කළා! ඇයි, ඒ බලතල එහෙම ලබා දෙන්නේ? ඒ නිසා මේ රට පිරිසිදු කරන්න නම් රාජ්‍ය නායකයා මුදල් ඇමති හැටියට පත් කරන්න හොඳ නැහැ. ඒකට අපි එකඟ වෙන්න ඕනෑ.

අපි අවුරුදු දහයක්-පහළොවක් කැබිනට් ඇමතිවරුන් වශයෙන් හිටපු අය. මම අවුරුදු විස්සක් ඇමතිවරයකු විධියට ඉඳලා තිබෙනවා. හැම වෙලාවෙම අපට පෙනෙන දෙයක් තමයි, රාජ්‍ය නායකයා ඇඟිලි ගැසුවොත්, අනිවාර්යයෙන් රටේ මුදල්-හදල් පිළිබඳ තත්ත්වය විකෘති වෙලා යන බව. අපේ කැබිනට් ඇමතිවරුන් ඔක්කෝම මේ ගැන දන්නවා. ඒ නිසා අපි ඔක්කෝටම මේ යෝජනාවට එකඟ වෙන්න පුළුවන්. ඒක තමයි, ඒකමතිකවම මේ කොමිටිය මේ යෝජනාව නිර්දේශ කරන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
එහෙම නම් ඒක හොඳයි නේද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම*)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඉතා හොඳයි. අපි එකඟයි. අපි ඒකට ගෞරව කරන්න ඕනෑ මගේ මිත්‍රයාට; ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට. එතුමා තමයි, මේ නිර්දේශයට ඉස්සෙල්ලාම අත්සන් කරන්නේ. [බාධා කිරීමක්] ඒකනේ. දැන් රාජ්‍ය නායකයා නොවෙයි, මුදල් ඇමතිතුමා. ඒකට වෙනම කෙනෙකු පත් කරලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල*)
(The Hon. Lakshman Kiriella)
He has set an example.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම*)
(The Hon. (Dr.) Sarath Amunugama)
Yes, he has set an exmple.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ලොකු rocket science එකක් නොවෙයි කියලා අපි කවුරුත් පිළිගන්නවා. අපි රටක ආදායම සහ වියදම කළමනාකරණය කරන්න ඕනෑ. දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටේ ආදායම් පැත්ත ශීඝ්‍ර ලෙස අර්බුදයට ලක් වෙලා තිබෙන වේලාවක, විවිධ හේතු නිසා -සමහර විට අදූරදර්ශී විධියට කටයුතු කරපු නිසා- අපේ වියදම් වැඩි වෙනවා. දවසින් දවස මේ පරතරය වැඩි වුණොත්, ලෝකය මේ රට දිහා බලන්නේ තමන්ගේ මුදල් කළමනාකරණය කරන්න බැරි රටක් හැටියටයි. ලෝක බැංකුව කිව්වත්, අපේ මහ බැංකුව කිව්වත්, විරුද්ධ පක්ෂයේ අය කිව්වත්, කවුරු කිව්වත් අපට පිළිගන්න සිද්ධ වෙනවා, අපේ මේ අය වැය පරතරය කළමනාකරණය කිරීම අත්‍යාවශ්‍යයි කියන එක. එක පැත්තකින් අපි හොඳට සොයා බලා අනවශ්‍ය වියදම් කපා හැරලා, මේ රටට ප්‍රයෝජනවත් විධියට වියදම් කරන්න දැන ගන්න ඕනෑ. අනෙක් අතට අපට හිමි විය යුතු ආදායම අපි අනිවාර්යයෙන් ලබා ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අපේ දළ දේශීය නිෂ්පාදිතය -GDP- අනුව සංඛ්‍යා ලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්නම්. මේ අවුරුද්දේ දැනට ක්‍රියාත්මක වන අය වැය යෝජනා අනුව අපේ රටේ ආදායම - VAT, NBT ආදි සියල්ලම ගත් විට- අපේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13.2යි. අපේ වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19යි. එයින් අපේ පුනරාවර්තන වියදම්, සියයට 14යි; ප්‍රාග්ධන වියදම් සියයට 5යි. එහෙම නම් මේ තුළින් අපට පෙනෙන්නේ, මේ අය සහ වැය වඩාත් කළමනාකරණය කළ යුතුය කියන කාරණයයි. මුදල් අමාත්‍යතුමාගේ යෝජනා අනුවත්, වර්ෂය අවසන් වන විට එම පරතරය සමහර විට සියයට 5.9ක් පමණ වෙන්න ඉඩ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජය ආදායම ලබාගන්නා ක්‍රම දෙකක් තිබෙනවා. අපේ දේශීය බදු එක්කාසු කිරීමේ විශාල වර්ධනයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අය බදු හෙවත් ආදායම් බදු, රේගු බදු, සුරා බදු කියන මාර්ග තුනෙන් තමයි රජයට ආදායම ලැබෙන්නේ. ඒ හැම එකකම සැලකිය යුතු වර්ධනයක් තිබෙනවා. මට ආරංචි හැටියට අපේ රටේ ආදායම් බදු තමයි ඉතාම සුළු වශයෙන් ඉහළට යන්නේ. විශේෂයෙන්ම රේගු බදුවල-

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු අමාත්‍යතුමා, මා ප්‍රශ්නයක් ඇහුවාට කමක් නැද්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම*)
(The Hon. (Dr.) Sarath Amunugama)
අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු අමාත්‍යතුමනි, රජයට එවැනි ආදායමක් ලැබෙද්දීත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැවරී තිබෙන බදු මුදල් එකතු කිරීමේ කාර්ය වෙනත් විදේශීය පෞද්ගලික සමාගමකට දෙන්න යනවාය කියන එක -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම*)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
පැහැදිලි කරගන්නයි මා එය ඇහුවේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(*මාණ්පුමිකු (කලානිති) සරත් අමුණුකම*)
(The Hon. (Dr.) Sarath Amunugama)
පැහැදිලි කිරීමක් තමයි ඔබතුමා ඉල්ලන්නේ. එය මුදල් අමාත්‍යතුමා තේරුම් කරලා දෙයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය කිසිම විධියකින් වෙනස් වන්නේ නැහැ; කොහෙත්ම වෙනස් වන්නේ නැහැ. මගෙ හිතේ, එතුමන්ලා මුදල් අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරලා දැන් සාර්ථකව ඉදිරියට යනවා. නමුත්, අලුත් ක්‍රම සොයන්න අපට

සිද්ධ වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එකඟ වනවා ඇති, අද නව තාක්ෂණය මඟින් වඩාත් හොඳ බදු එකතු කිරීමක් කරන්න පුළුවන් කියන කාරණයට. අද හුඟක් රටවල එසේ සිදු වනවා. මුදල් අමාත්‍යතුමනි, ඔබතුමා ඇහුම්කන් දෙනවාද? මා ඔබතුමා ගැන හොඳක් කියන්නයි මේ යන්නේ. ඉස්සරත් BOI එක තිබුණා. නමුත් BOI එකත්, ආදායම් බදු දෙපාර්තමේන්තුවත් අතර කිසි සම්බන්ධයක් තිබුණේ නැහැ. ආදායම් බදු දෙපාර්තමේන්තුවත් රේගුවත් අතර කිසි සම්බන්ධයක් තිබුණේ නැහැ. නමුත්, රජයේ ආදායම් පිළිබඳව ඒ ආයතන තුනෙන්ම නොයෙක් විධියේ ගනුදෙනු සිදු වෙනවා. අද "ආසිකුඩා වර්ල්ඩ්" ක්‍රමය භාවිත කරමින් නව තාක්ෂණය හරහා ඒ ආයතන අතර සම්බන්ධකම් ඇති කර තිබෙනවා. අපි ඒ ගැන මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ හින්දා තමයි මේ විධියට ආදායමේ විශාල වැඩි වීමක් ඇති කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදු ක්‍රමය මේ රටේ ඇති කරන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි කියන එක ගැන ඇත්ත වශයෙන්ම අප කල්පනා කර බලන්න ඕනෑ. එය වෙන කොටසක තිබෙන අර්බුදයක්. පිට රටවලට විකුණන අපේ භාණ්ඩ සම්බන්ධයෙන් වෙළෙඳ ක්ෂේත්‍රයේ විශාල පසු බෑමක් අද ඇති වෙලා තිබෙනවා. එහෙම නම් මෙය තනිකරම බදු එකතු කිරීමේ අර්බුදයක් නොවෙයි. මා ඔබතුමා සමඟත් මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. පිට රට වෙළඳාම පිළිබඳ ප්‍රශ්නයක් තමයි මෙතැන වැඩිවශයෙන් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "Economics Digest" - January - June 2015 සඟරාවෙන් මේ කාරණය මා උපුටා දක්වන්න කැමැතියි. අපේ අර්ථ ශාස්ත්‍රඥවරියක වන දුෂ්නී වීරකෝන් මහත්මිය පසු ගිය කාලය ගැන විවේචනයක් කරමින් මෙසේ කියනවා:

> "This is despite inherent structual weaknesses underpinning that high growth; it relied almost entirely on infrastructure development that skewed growth heavily towards non-tradables, with a deferred cost of an external debt overhang. "

ඒ කියන්නේ, "ආර්ථික උපාය මාර්ගය තුළ ගොඩක් මුදල් වැය කළේ යටිතල පහසුකම් - infrastructure- ඇති කරන්නයි" කියන එකයි. එහි වරදක් කියනවා නොවෙයි. නමුත් එහි සමබරතාවක් නැහැ. ඒ ක්ෂේත්‍රයේ සියල්ල non-tradable කියන කොටසට තමයි වැටෙන්නේ. ඒ කාලය තුළ අපේ වෙළෙඳ ක්ෂේත්‍රය කඩාගෙන වැටුණා. කොටසක්, අපේම හේතු නිසා නොවෙන්න පුළුවන්. මේ වාර්තාවේම කියලා තිබෙනවා, ජාත්‍යන්තර ප්‍රශ්න ගැන. ජාත්‍යන්තර වශයෙනුත් ලෝක ආර්ථිකයේ විශාල පසුබෑමක් සිදු වෙලා තිබෙනවා නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මුළු ලෝකයටම බලපෑවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්, ඔව්. මේ සඟරාවෙන් ඒ පිළිබඳව මා උපුටා දක්වන්නම්. එහි මේ විධියට සඳහන්ව තිබෙනවා:

> "Global economic conditions are very different today from what prevailed before the financial and economic meltdown of 2008. Even the most competitive of economies in East and Southeast Asia are struggling to keep economic growth above 6 per cent post-crisis."

චීනය වාගේ රටවල්, වියට්නාමය වාගේ රටවල් අද අර්බුදයකට මුහුණ පානවා. මොකද, ඒ ඉල්ලුම අඩුවෙලා තිබෙන නිසා. අද ඇමෙරිකාවේ ඩොනල්ඩ් ට්‍රම්ප් ජනප්‍රිය වෙලා තිබෙන්නේ ඇයි? ඇමෙරිකාව චීනයෙන් බඩු ගෙනාවා; වියට්නාමයෙන් බඩු ගෙනාවා; ආසියාවෙන් ලාභ බඩු ගෙනාවා. ඒ නිසා ඇමෙරිකාවේ factories වහන්න පටන් ගත්තා. කම්කරුවන්ට රැකියා නැති වුණා. ඒ මිනිස්සු තමයි අද ඩොනල්ඩ් ට්‍රම්ප් වාගේ නායකයකු පස්සේ දුවන්නේ. අද හිතා ගන්න බැරි දෙයක් සිදු වෙලා තිබෙනවා. රිපබ්ලිකන් පක්ෂයට කම්කරුවන් තමයි වැඩියෙන්ම සහයෝගය දෙන්නේ. ඇමෙරිකාවේ නිෂ්පාදන වියදම් වැඩියි. චීනයේ නිෂ්පාදනය වියදම, වියට්නාමයේ unit cost එකට වඩා ඇමෙරිකාවේ නිෂ්පාදන වියදම වැඩියි. ඒ ගොල්ලන් එක වාහනයක් ගන්න යන වියදමෙන් චීන කාර් දෙකක් ගන්න පුළුවන්; ජපන් කාර් දෙකක් ගන්න පුළුවන්. ඒ නිසා ඒ ආර්ථිකය ශීඝ්‍රයෙන් සීමාවෙන්න පටන් ගත්තා. නමුත් ඒ ගොල්ලන්ට බේරෙන්න පුළුවන් වුණා. මොකද ඒ ගොල්ලන් ළඟ, reserve currency තිබෙන නිසා. ලෝකයේම සල්ලි එහාට ගිහිල්ලා දානවා. ඊට පස්සේ ඒ ගොල්ලන් ඒවා පාවිච්චි කරලා, ඒ ගොල්ලන්ගේ ආර්ථිකය ව්‍යාජ විධියට ඉදිරියට පෙන්වනවා. ඉතින් මේ ප්‍රශ්න තුළ, අපේ ආදායම ලබා ගන්න අපි මහන්සි වෙන්න ඕනෑ. මුදල් ඇමතිතුමා කියලා තිබෙන විධියට අපේ වෙළෙඳ ක්ෂේත්‍රය වැඩි වෙනවා නම්, පිට රටවලට අපේ භාණ්ඩ විකුණන්න පුළුවන් නම්, මේ බදු ප්‍රමාණයන් එන්න එන්නම අපට අඩු කරන්න පුළුවන්. මේ දෙක අතර සම්බන්ධයක් තිබෙනවා. ඒ නිසා එම සමබරතාව අපි ඇති කර ගන්න ඕනෑ. මේ බදු තාවකාලිකයි.

අවසාන වශයෙන්, මේ කාරණය ගැනත් මා කියන්න ඕනෑ. මේ වෙළෙඳ ගිවිසුම්වලට හැමෝම විරුද්ධත්වය දක්වන්න හදනවා. අපි ඉදිරියේදී, ඉන්දියානු වෙළෙඳ ගිවිසුම; චීන වෙළෙඳ ගිවිසුම; සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම අත්සන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ඔක්කෝම එකට එන්නේ. එතකොට තමුන්නාන්සේලාට බලන්න පුළුවන්, එක පැත්තකට අදිනවාද, නැද්ද කියලා. ඔක්කෝම එකට දෙනවා. අද ලෝකයේ තිබෙන වෙළෙඳ පොළවල් හඹායන්න ඕනෑ. දේශීය වෙළෙඳ පොළ සීමා වුණාම මොකද වෙන්නේ? ඒ නිෂ්පාදිත භාණ්ඩයේ මිල වැඩියි. අර්ථ ශාස්ත්‍රයේ නීතියක් තිබෙනවා, "economies of scale" කියලා. ඒ භාණ්ඩය වැඩි වැඩියෙන් නිෂ්පාදනය කරන්න ඒ ඒකකයේ මිල බහිනවා. වෙළෙඳ පොළ සීමාවෙන්න, සීමාවෙන්න ඒකකයේ මිල වැඩියි. ඒ නිසා පාරිභෝජකයා සහ නිෂ්පාදකයා යන දෙදෙනාවම අපි සතුටු කරන්න ඕනෑ. අද ලංකාවට හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ලෝකයේම තිබෙන ලොකුම වෙළෙඳ පොළවල් දෙක -ඉන්දියාව සහ චීනය- අපේ අත ළඟට ඇවිල්ලා තිබෙනවා. මේ වෙළෙඳ ගිවිසුම් ගැන අපි පස්සේ වාද විවාද කරමු. අපි රජයක් වශයෙන් මේ රටට පොරොන්දුවක් දෙනවා, මේ වෙළෙඳ ගිවිසුම් තුළින් එන අවුරුද්ද, ඊළඟ අවුරුද්ද සහ ඊටත් පසු අවුරුද්ද වෙන කොට ආර්ථිකයේ ශීඝ්‍ර වර්ධනයක් සිදු වෙන බවට. ඒ මොකක් නිසාද? හම්බන්තොට චීන කර්මාන්තශාලා 150ක් හදනවා. දැන් අපි සාකච්ඡා කරලායි තිබෙන්නේ. ඉන්දියානු කලාපවල ඉන්දියානු කර්මාන්ත එනවා. මේ ආර්ථිකය වඩා හොඳ පැත්තකට ගිහිල්ලා, මේ රටේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්න අපට පුළුවන්කම ලැබෙනවා. රැකී රක්ෂා ප්‍රශ්නය තමයි අනාගතයේ එන ලොකුම ප්‍රශ්නය. [බාධා කිරීමක්] කවදාවත් බනින්නේ නැහැ. අපේ පක්ෂය -ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - චීනයත් එක්ක මිත්‍රත්වයකින් ඉන්න පක්ෂයක්. ඇත්ත වශයෙන්ම අපේ රට චීනයත් එක්ක මිත්‍රත්වයක් තිබෙන රටක්. තමුන්නාන්සේලා බොහොම මහන්සි වුණා නේ, චීනයෙන් ආරාධනාවක් ගන්න. ඒ ගොල්ලන් එවන්නේ නැහැ නේ. ඒ ගොල්ලන් එවන්නේ නැහැ.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

මේ අලුත් ආර්ථික ක්‍රමය හරහා මේ රටේ නිෂ්පාදනය වැඩි කරලා ජාත්‍යන්තරව සහ කලාපීය වෙළෙඳ පොළට ඒ භාණ්ඩ යැවීම සම්බන්ධයෙන් අපේ රජයට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්ඩලික කටයුතු පිළිබඳ නියෝජ්‍ය සභාපති අවර්කල්)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Eran Wickramaratne. Before that, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(මාණ්ඩලික නිමල් සිරිපාල ද සිල්වා - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 4.07]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡාවට ගැනෙන අයිතමයන් අතරින් මා කැමැතියි, එකතු කළ අගය මත බද්ද ගැන කථා කරන්න. ඇත්තටම VAT එක ගැන දැන් විශාල බිල්ලෙක් මවා තිබෙනවා. මේ බිල්ලා මැව්වේ කවුද කියන එකයි දැන් හොයා ගන්න වෙලා තිබෙන්නේ. අද අපි මේ බිල්ලාගේ වෙස් මුහුණ ගලවන්නයි ලැහැස්ති වෙලා ඉන්නේ.

1964 ඉඳලා නිෂ්පාදන සහ නිෂ්පාදන නොවන ව්‍යාපාර ආවරණය වන ආකාරයට බද්දක් පැනෙව්වා. එය 1963 අංක 11 දරන පනතින් පිරිවැටුම් බද්ද - Turnover Tax - TT - කියලායි පැනෙව්වේ. මේක 1964 ඉඳලාම පැවත එන එකක්. මේ පිරිවැටුම් බද්දෙන් උද්ධමනය වැඩි වෙනවා. මොකද, එය බද්දක් මත පනවන බද්දක්. ඒ නිසා ඒකෙන් බඩු මිල ඉහළට යනවා; උද්ධමනය ඉහළට යනවා.

1950 ඉඳලා 1960 ගණන්වල මැද වනතුරු උද්ධමනය සියයට 3ක විතර අගයකයි තිබුණේ. 1980 ගණන්වල මැද භාගය වන කොට එය සියයට 25කට විතර ඉහළ ගියා. එහිදී එදා තිබුණු රජයන් කල්පනා කරලා මේ පිරිවැටුම් බද්ද අහෝසි කළා, 1998දී. ඉන් පසු 1998 අප්‍රේල් මාසයේ 01වැනිදා ඉඳලා භාණ්ඩ හා සේවා බද්දක් - Goods and Services Tax - GST - දැම්මා, Turnover Tax එක වෙනුවට. මේක 1998 අප්‍රේල් 01 වැනිදා සිට ක්‍රියාත්මක වුණා. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත මඟින්නුයි මේ GST එක නැත්නම් භාණ්ඩ හා සේවා බද්ද හඳුන්වා දුන්නේ. මේ බදු දෙකේ වෙනස මොකක්ද? එහෙම නැත්නම් පිරිවැටුම් බද්දේ - TT එකේ - හා භාණ්ඩ හා සේවා බද්දේ - GST එකේ - වෙනස මොකක්ද? පිරිවැටුම් බද්දට මුළු අලෙවියේ වටිනාකම ගන්නවා. භාණ්ඩ හා සේවා බද්දට එකතු කළ අගයේ වටිනාකම පමණයි ගන්නේ. එතකොට පිරිවැටුම් බද්ද බද්දක් මත පනවන බද්දක් වෙනවා. නමුත්, භාණ්ඩ හා සේවා බද්ද දායකත්වය මත පැනවෙන බද්දක් පමණයි.

පිරිවැටුම් බද්ද අය කරන කොට අනුපාත ගණනාවක්ම තිබුණා. නමුත්, භාණ්ඩ හා සේවා බද්දට තිබුණේ එක අනුපාතයයි. එනම්, සියයට 12.5ක අනුපාතයක් පමණයි තිබුණේ. පිරිවැටුම් බද්දෙන් රජයකට පහසුයි. එය පහසුවෙන් එකතු කර ගන්නත් පුළුවන්. ඒ තුළින් විශාල ආදායමක් රජයට ලබා ගන්නත් පුළුවන් වුණා. එදා රටේ මුළු ආදායමින් සියයට 25ක් පමණ ලබා ගත්තේ පිරිවැටුම් බද්දෙනුයි. නමුත්, භාණ්ඩ හා සේවා බද්දෙන් ඊට වඩා අඩු ආදායමකුයි රජය ලබා ගන්නේ. ඒ නිසා 1998 තිබුණු රජය නැවතත් කල්පනා කළා, මොනවාද කළ යුත්තේ කියලා. එහිදී, GST එක දායක්තවය අනුව එකතු කරන බද්දක් හැටියට යෙදෙව්වාට, ජාතික ආරක්ෂක බද්දකුත් - National Defence Tax - එකතු කළා. එතකොට පිරිවැටුම් බද්දෙන් භාණ්ඩ හා සේවා බද්දට ගියාට, ජාතික ආරක්ෂක බද්ද පිරිවැටුම් බද්දක් හැටියට දිගටම පවත්වාගෙන ගියා.

1998දී ඔවුන් කළේ, GST එක සහ ජාතික ආරක්ෂක බද්ද එකතු කරලා VAT එක ඇති කළා. ඒ කියන්නේ, මුලින් පිරිවැටුම් බද්දෙන් GST එකට ගියා. නමුත්, ජාතික ආරක්ෂක බද්දක් තිබුණු නිසා -ඒකත් පිරිවැටුම් බද්දක්- ඒ දෙක එකතු කරලා VAT එක ඇති කළා. ඒක "එකතු කළ අගය මත බද්ද" වනවා. 2002 අගෝස්තු මාසයේ පළමුවැනි දා සිට මේ බද්ද ක්‍රියාත්මක කළා. "ඔන්න බබෝ බිල්ලෝ එනවා" ඇත්තටම මේ "VAT" කියන බිල්ලාව හඳුන්වා දුන්නේ කවුද? මේ VAT එක හඳුන්වා දුන්නේ 2002 වර්ෂයේ තිබුණු රජයයි.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(මාණ්ඩලික லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
2002 හිටියේ කවුද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්ඩලික இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

2002 හිටියේ කවුද? මගේ නෑදෑයෙකු නම් නොවෙයි කියලා මට පැහැදිලිව කියන්න පුළුවන්. 2002 හිටියේ කොයි රජයද කියලා ඔබතුමන්ලා දන්නවා නේ? VAT එකේ මූලික ලක්ෂණ වන්නේ, දේශීය පරිභෝජනයට හා ආනයනයට යටත් වීමයි. මේ බද්දෙන් නිදහස් වන්නේ අපනයනය පමණයි. මේ VAT එක දැන් රටවල් 140ක පමණ ක්‍රියාත්මක වනවා. මෙය එකතු කළ අගයන්වල දායකත්වය මත රඳා පවතින බද්දක්. මේ VAT එක පිරිවැටුම් බදුවලට වැඩිය ප්‍රගතිශීලී බද්දක් කියලා කියන්න පුළුවන්. මොකද, ආර්ථික ක්‍රියාදාමයක් තුළ එක එක සන්ධිස්ථානවල අගය එකතු වනකොට ඒ එකතු වන අගයට පමණයි මේ බද්ද ගෙවන්නේ.

සියයට 10ක් අත්‍යවශ්‍ය බඩු සඳහාත්, සියයට 20ක් අනිකුත් බඩු සඳහාත් වශයෙන් අපේ රටේ බදු අනුපාත දෙකක් තිබුණා. අපනයනයට VAT එක බින්දුවයි. මුල්ම කාලයේදී විදුලි බලය, ඉඳිකිරීම්, පෙට්‍රල්, ඩීසල්, ලාම්පු තෙල්වලටත් VAT එක තිබුණා. මේ දේවල්වලට VAT එක තිබුණා කියලා ඒ කාලයේ නම් මිනිස්සු උද්ඝෝෂණය කළේ නැහැ. නමුත්, මේ VAT එකේ ප්‍රතිශතය කලින් කලට වෙනස් වුණා. 2004 දී සියයට 15යි. 2005 දී සාමාන්‍ය භාණ්ඩවලට සියයට 15යි, සුඛෝපභෝගී භාණ්ඩවලට සියයට 18යි. සුඛෝපභෝගී භාණ්ඩවලට VAT එක සියයට 18ක් කළාම 2005 දී කොයි රජයද තිබුණේ කියලා අපට පොඩ්ඩක් කල්පනා කරලා බලන්න පුළුවන්. ඊට පස්සේ 2006 දී මේ VAT එක සියයට 20ක් කළා. අද VAT එක සියයට 15යි.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
වැඩි කලේ කවුද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
වැඩි කළේ කවුද කියන එක අපිත් අහන්න ඕනෑ. [බාධා කිරීම්] අද හොඳ යෝජනාවක් පාර්ලිමේන්තුවේ ඉදිරිපත් වුණා. ඒ යෝජනාව වන්නේ කවදාවත් "රාජ්‍ය නායකයා මුදල් ඇමතිතුමා නොවිය යුතුයි" කියන එකයි. අද පාර්ලිමේන්තුවේදී ඒ යෝජනාව සාකච්ඡා වුණා. මම හිතන්නේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සිටින අයත්, ආණ්ඩුවේ සිටින අයත් කියන සියලු දෙනාම ඒ යෝජනාවට එකඟයි. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් ඒකට සම්පූර්ණයෙන් එකඟයි කියලා එතුමාගේ මුහුණෙන්ම පෙනෙනවා. ඒ කියන්නේ "රාජ්‍ය නායකයා මුදල් ඇමතිතුමා නොවිය යුතුයි" කියන එක.

2006 දී VAT එක සියයට 20කට ඉහළ යැව්වා. ඊට පස්සේ 2007 දී ඒ බද්ද ආයෙත් සියයට 15ට අඩු කළා. 2009 දී නැවත ඒ බද්ද සියයට 12ට අඩු කළා. [බාධා කිරීමක්] මහජන බැංකුව සම්බන්ධයෙන් මම මොහොතකින් කථා කරන්නම්. 2014 වනකොට ඒ බද්ද සියයට 12ට අඩු කළා. අපේ රජය 2015දී බලයට ඇවිල්ලා සියයට 12කට තිබුණු ඒ බද්ද සියයට 11කට අඩු කළා. ඒක අඩු කළේ ඇයි? මැතිවරණයක් එනකොට මැතිවරණ පොරොන්දු දෙනවා. ඒ මැතිවරණ පොරොන්දු ඉෂ්ට කිරීමට බදු අඩු කරන්න සිදු වුණා. සහනාධාර ලබා දීමට රජයට ආදායමක් අවශ්‍යයි. ඒ නිසා 2016 දී ඒ බද්ද සියයට 15ට වැඩි කරලා තිබෙනවා. ඒ අනුව මේ VAT එකේ ප්‍රතිශතය කලින් කලට ඉහළ ගිහිල්ලා තිබෙනවා, පහළ බැහැලා තිබෙනවා. නමුත්, උද්ඝෝෂණ ඇති වුණා. බොහෝ වෙලාවට මේ උද්ඝෝෂණ ඇති වුණේ කළමනාකරණයේ ගැටලු නිසාය කියලා මම විශ්වාස කරනවා. රජය බදු අය කරන්නේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යෑමටයි. රජය බදු අය කරන්නේ අත්‍යවශ්‍ය සේවාවන් වන හමුදාවන්- ත්‍රිවිධ හමුදාව- පොලීසිය, සෞඛ්‍ය සේවාවන්, අධ්‍යාපනය, සමාජ සේවාව වැනි දේවලට වියදම් කිරීමටයි. 1978 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 24.2ක් රජයේ ආදායම වුණා. අවුරුදු විස්සකට පස්සේ 1998 වර්ෂය වෙනකොට එය සියයට 14.5යි. 2015 වර්ෂය වෙනකොට එය සියයට 12ක් පමණ වුණා. ඒ කියන්නේ, 1978 වර්ෂයේ සිට 2015 වර්ෂය වෙනකොට අර්ධයකින් නැත්නම් සියයට 50කින් රජයේ ආදායම අඩු වෙලා තිබෙනවා.

අද මුදල් අමාත්‍යතුමා සඳහන් කළා, 2016 වර්ෂයේ අද වෙනකොට රජයේ ආදායම සියයට 12 සිට සියයට 13.8කට ඉහළ ගොස් තිබෙනවාය කියා. මා හිතන්නේ එය හොඳ සලකුණක්. ඒ කියන්නේ, අත්‍යවශ්‍ය සේවාවන් ජනතාවට ලබා දීමට ඒ ආදායම යෙදවෙනවා. රජයේ වියදම ඊට සාපේක්ෂව අඩු වෙලා නැහැ. ඒ අවුරුදු විස්සක කාලයේදී ආදායම අඩු වෙලා තිබෙනවා. වියදම අඩු වෙලා නැහැ. එතකොට ඕනෑම ආර්ථිකයක වෙන්නේ; ආදායමයි, වියදමයි අතර පරතරය වැඩි වෙනවා. අය වැය පරතරය වැඩි වෙලා තියෙනවා. ඒ පරතරය පියවන්නට රජයන්ට ණය ගන්නට සිදු වෙලා තිබෙනවා. නමුත් පසු ගිය රජය විශාල ලෙස ණය ගත්තා. ණය අර ගෙන ඒ ණය වාරික ගෙවන්න -වසරකට ණය මුදලයි ,පොලියයි ගෙවන්න- වසරකට රජයට ලැබෙන මුළු ආදායමෙන් සියයට සියයම වාගේ නැත්නම් මුළු ආදායම වාගේ යනවා. එතකොට හිතා බලන්න පුළුවන් කොපමණ විශාල ප්‍රශ්නයකට අද රජය මුහුණ දෙනවාද කියා. රජයේ ආදායම වක්‍ර බදු සියයට 75ක් විතර වෙනවා. මුළු බදු ප්‍රමාණයෙන් ඍජු බදු නැත්නම් ආදායම් බදු සියයට 18ක් විතර වෙනවා. බදු නොවන ආදායම ඒ කියන්නේ, ගාස්තු අය කිරීම් සියයට 3ක් විතර වෙනවා. ලාභාංශ සියයට 2ක් විතර වෙනවා. පොලීවලින් ලැබෙන ආදායම සියයට 1ක් විතර වෙනවා. වෙනත් ආදායම් සියයට 1ක් විතර වෙනවා. ඒ විධියට බදු නොවන ආදායම සියයට 7ක් විතර වෙනවා. එතකොට ඍජු ආදායම බොහොම අඩුයි.

අපේ ගරු අගමැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කළා, 2020 වෙනකොට මේ රටේ තිබෙන වක්‍ර බදු ප්‍රතිශතය සියයට 60කුත්, ඍජු බදු ප්‍රතිශතය සියයට 40 දක්වාත් අඩු කරනවාය කියා. අද තිබෙන වක්‍ර බදු සියයට 80, සියයට 60ට අඩු කර, අද තිබෙන ඍජු බදු සියයට 18, සියයට 40ට වැඩි කරනවාය කියා. ඇත්තටම මේකෙන් සාධාරණත්වයක් ඇති වෙනවා. අපේ රජයේ ප්‍රතිපත්තිය සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් ඇති කිරීමයි. අපේ නායකයන්ට රකින්න ව්‍යාපාර නැහැ. අපේ නායකයින්ට රකින්න පවුල් සමාගම් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අපේ නායකයෝ මහා මානා ඩී.එස්. සේනානායක මැතිතුමා, හිටපු අගමැති ඩඩ්ලි සේනානායක මැතිතුමා, සර් ජෝන් කොතලාවල මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා. අපේ නායකයන්ට ආරක්ෂා කරන්න පවුල් නැහැ. අපේ නායකයන්ට පවුල් සමාගම් ඇති කරන්නට අවශ්‍යතාවක් නැහැ. අපේ නායකයෝ ඔවුන්ට තියෙන දේපළ පරිත්‍යාග කළා. රත්මලානේ ආරක්ෂක විශ්වවිද්‍යාලයක් හදන්න ඔවුන්ගේ වතු දුන්නා. කොළඹ හතේ ජේ.ආර්. ජයවර්ධන කේන්ද්‍රස්ථානයක් අධ්‍යාපනික සහ පුහුණු කටයුතු සඳහා හදා දී තිබෙනවා. මම නම් කළ අපේ ඒ නායකයන්ගෙන් එක් කෙනෙකුවත් ශතයක්වත් හොරකම් කර, ඒ වාගේ පුද්ගලික සමාගම් හදා නැහැ. ඒක අපි ආඩම්බරයෙන් කියන්න ඕනෑ.

VAT ගෙවන්නේ පාරිභෝගිකයන්. ව්‍යාපාරිකයන් නොවෙයි. ව්‍යාපාරිකයන්ට තිබෙන්නේ ලියා පදිංචි වෙන්න පමණයි. රටක් සංවර්ධනය කරනකොට ආදායම් බදු ගන්නේ දේශීය ආයෝජනයට. ආදායම් බදුවලින් ඒක කරන්න බැරි නම්, විදේශීය ආයෝජන බලාපොරොත්තු වෙනවා. විදේශීය ආයෝජන සඳහා හුහක් වෙලාවට බදු සහන දෙන්න සිදු වෙනවා. නැත්නම් ණය ගන්න සිදු වෙනවා. එක්කෝ ආදායම් බදු හරහා, නැත්නම් විදේශීය ආයෝජන හෝ ණය මඟින් ආදායම් ලබා ගන්න සිදු වෙනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

පසු ගිය රජය රට විකුණුවා. අපට ඒ ණයත් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවාව සඳහා සියයට තිහක් වැනි අධික පොලියක් යටතේ අලුත් ගුවන් යානා ණයට ලබා ගෙන තිබෙනවා. අද ඒ ණය ගෙවන්න සිදු වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
හොඳයි, මම කථාව අවසන් කරනවා.

අපි තොග හා සිල්ලර වෙළෙඳාම සඳහා එකතු කළ අගය මත බද්ද, ලියා පදිංචිය සඳහා වාර්ෂික මුළු පිරිවැය රුපියල් මිලියන 50ක් ලෙස සංශෝධනය කරනවා. බද්දට යටත් භාණ්ඩ සඳහා පමණක් බදු අය කරනවා. එකතු කළ අගය මත බද්ද සඳහා ලියා පදිංචි වී නැති තැනැත්තන්ගෙන්, කරනු ලබන මිලදී ගැනීම් සඳහා යෙදවුම් බදු බැර ලබා දීමේ ක්‍රමයක් -deemed input tax credit system එකක්- අපි හඳුන්වා දෙනවා. ඒකෙන් කුඩා ව්‍යාපාරිකයන්ට, කුඩා වෙළෙඳ සැල්වලට සහනයක් ලැබෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Charles Nirmalanathan. You have nine minutes.

[පි.ප. 4.24]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. நான் முதலில் தங்களிடம் ஒரு பணிவான வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். அதாவது, சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர் மாண்புமிகு சுவாமிநாதன் அவர்கள் இன்று சபையில் இல்லாததால் எனது கோரிக்கையை நீங்கள் அவரிடம் தெரிவிக்கவேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அநுராதபுரம் சிறைச்சாலையிலுள்ள தமிழ் அரசியல் கைதிகள் நாளை முதல் ஓர் உண்ணாவிரதப் போராட்டத்தை ஆரம்பிக்க இருக்கின்றார்கள். அதேநேரத்தில் தங்களுடைய கோரிக்கை அடங்கிய மனுக்களை அநுராதபுரம் சிறைச்சாலை அதிகாரியிடம் ஒப்படைத்திருக்கின்றார்கள். அந்த மனுக்கள் உண்மையில் மேதகு ஜனாதிபதி, மாண்புமிகு பிரதமர், மாண்புமிகு எதிர்க்கட்சித் தலைவர், மாண்புமிகு நீதியமைச்சர், வட மாகாண முதலமைச்சர், பிரதம நீதியரசர், சட்டம் ஒழுங்கு ஆணைக்குழுவின் தலைவர் ஆகியோருக்கு அனுப்பிவைக்கப்பட வேண்டும். இந்த அரசாங்கத்தினால் அவர்களுக்கு வழங்கப்பட்ட வாக்குறுதிகள் நிறைவேற்றப்படாத நிலையில் அவர்களால் அனுப்பப்பட்ட இந்தக் கடிதங்கள் தற்போது அநுராதபுரம் சிறைச்சாலை அதிகாரியிடம் இருக்கின்றன. அந்தக் கடிதங்களைக் குறிப்பிட்ட 7 பேருக்கும் அனுப்ப வேண்டிய பொறுப்பை அந்த அதிகாரி ஏற்றுக்கொள்ள வில்லை. எனவே, மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அதனை மாண்புமிகு அமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவந்து அந்தக் கடிதங்கள் உரியவர் களுக்குச் சென்றடைவதற்கான நடவடிக்கை எடுக்கவேண்டு மெனக் கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரத்தில், இன்று பிராந்தியங்களின் அபிவிருத்தி தொடர்பாகச் சில விடயங்களைக் குறிப்பிடவேண்டும். எங்களு டைய வட பிராந்தியத்தில் தற்போது புதிதாக மாவட்டச் செயலகங்கள் அமைக்கப்படுகின்றன; வீதிகள் புனரமைக் கப்படுகின்றன. மாவட்டச் செயலகங்கள் புதிதாக அமைக்கப் படுவதன் மூலமோ அல்லது வீதிகள் புனரமைக்கப்படுவதன் மூலமோ பிராந்தியங்களை அபிவிருத்தி செய்ய முடியாது. உண்மையில் வடக்கை அபிவிருத்தி செய்யவேண்டுமானால், அங்குள்ள இளைஞர் யுவதிகளுக்கு வேலை வாய்ப்புக்களை உருவாக்கிக் கொடுக்கவேண்டும். குறிப்பாக, தற்பொழுது வடக்கில் அரச சேவை நியமனங்களின்போது, மூன்றிலொரு பங்குக்கு மேலாக வேறு மாகாணங்களைச் சேர்ந்தவர்கள்தான் உள்வாங்கப் படுகின்றார்கள். அந்த நியமனங்களின்போது தகுதியான ஆட்களை உள்வாங்கவேண்டும். தகுதிகள் இருந்தும் வட மாகாணத்தில் நீண்ட காலமாக வேலைவாய்ப்பு இல்லாமல் இருக்கின்றவர்களை முதற்கட்டமாக உள்வாங்க வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன். அதேநேரத்தில், அரச நியமனங்கள் வழங்குகின்றபோது, அது அரசியல் ரீதியான நியமனங்களாக அல்லாமல், தகுதி ரீதியான நியமனங்களாக இருந்தால்தான் அந்தப் பிராந்தியம் அபிவிருத்தியடையும். ஒவ்வொரு கிராமங்களிலும் அரச சேவையில் ஈடுபடுகின்ற இளைஞர், யுவதிகள் இருந்தால் அங்கு விழிப்புணர்வு ஏற்படும். அந்த விழிப்புணர்வின்மூலம் பிராந்தியங்கள் ஒன்றுபடும். எனவே, அரச நியமனங்களில் எங்களுடைய இளைஞர், யுவதிகளும் உள்வாங்கப்பட வேண்டும். நான் மீண்டும் கூறுகின்றேன், எங்களுடைய பிரதேசங்களில் மாவட்டச் செயலகங்களைத் திறந்து வைப்பதால், வீதிகளை அமைப்பதால் மாத்திரம் ஒரு காலமும் எமது பிராந்தியம் அபிவிருத்தியடையாது என்று.

அண்மையில் எங்களுடைய நாட்டின் ஜனாதிபதி அவர்கள் மது, drugs, alchohol பாவனை தொடர்பில் புள்ளிவிபர மொன்றைக் குறிப்பிட்டிருந்தார். மதுப் பாவனையில் யாழ். மாவட்டம் முதலாவது இடத்திலும் மட்டக்களப்பு மாவட்டம் இரண்டாவது இடத்திலும் நுவரெலியா மாவட்டம் மூன்றாவது இடத்திலும் இருப்பதாகச் சொன்னார். இதனைச் சற்று கடந்தகால நிகழ்வுகளுடன் நோக்குவோமானால், முன்னைய அரசாங்கத்தின் ஒரு திட்டமிட்ட செயலாகத்தான் வடக்கில் குறிப்பாக யாழ்ப்பாணத்தில் alchohol - மதுப்பாவனை அதிகரிக்கப்பட்டது. 1990களில் நுவரெலியாவில் இந்தத் திட்டம் ஆரம்பிக்கப்பட்டது. அதன் பின்பு மட்டக்களப்புக்கு அந்த திட்டம் அறிமுகப்படுத்தப்பட்டு, தற்பொழுது யாழ்ப் பாணத்தில் அதை வெற்றிகரமாக நடத்திக்கொண்டிருக் கின்றார்கள். இதற்கு உண்மையான காரணம் என்ன வென்றால், அந்த மாவட்ட மக்களைத் தங்களுடைய கைகளுக்குள் கொண்டுவரவேண்டிய ஒரு தேவை முன்னைய அரசாங்கத்திற்கு இருந்தது. அதை ஊக்குவிக்கின்ற விதமாகத் தற்பொழுது இந்த அரசாங்கமும் செயற்பட்டுக் கொண்டிருக்கின்றது. குறிப்பாக, 2013ஆம் ஆண்டு முன்னாள் பாதுகாப்புச் செயலாளர் கோட்டாபய ராஜபக்ஷ அவர்கள் 'ஜெய்க்கா' கூட்டத்தில் கலந்துகொள்வதற்காக யாழ்ப் பாணத்திற்கு வந்திருந்தார். அப்போது அங்குள்ள சுகாதாரத் திணைக்கள அதிகாரிகளிடம், தாங்கள் யாழ்ப்பாணத்தில்

மதுபான விற்பனையை அதிகரிக்கின்ற நடவடிக்கையில் ஈடுபட்டிருப்பதாகவும் உரிய வைத்திய நடவடிக்கைகளைப் பார்த்துக்கொள்ளுமாறும் அவர் கூறியிருந்தார். அதன் உள்நோக்கம் எங்களுடைய மக்களை வசப்படுத்துவதாகத்தான் இருந்திருக்கிறது. மூன்று மாவட்டங்களின் புள்ளிவிபரங்களைக் கூறிய இந்த அரசாங்கம், மற்றைய மாவட்டங்களின் புள்ளிவிபரங்களை இன்னமும் வெளியிடவில்லை என்பதையும் சொல்லிக்கொள்கின்றேன்.

குறிப்பாக, யாழ்ப்பாணத்தில் குடியுரிமை பெற்ற மக்கள் மட்டும் மதுபானம் வாங்குவதில்லை என்பதைக் கவனத்திற் கொள்ள வேண்டும். யாழ்ப்பாணத்தில் சுமார் நாற்பதாயிரம் இராணுவத்தினரும் ஐயாயிரம் பொலிஸாரும் இருக்கின்றார்கள். அத்தோடு, நாளாந்தம் தென்பகுதி சுற்றுலாப் பயணிகளும் மிக அதிகமாக அங்கு வந்துசெல்கின்றார்கள். அதேநேரத்தில் வெளிநாட்டு பிரஜைகளும் யாழ்ப்பாணத்துக்கு சுற்றுலாப் பயணிகளாக வருவது வழக்கமாக இருக்கின்றது. அவர்கள் எல்லோரும் சேர்ந்துதான் மதுபானக் கொள்வனவில் ஈடுபடுகின்றார்கள். அப்படியிருக்கும்போது யாழ்ப்பாணத்தில் மதுபான விற்பனை அதிகரித்துக் காணப்படுவதாகச் சொல்வதனை உண்மையில் அங்குள்ள மக்களுடைய மனங்களை நோகடிக்கச் செய்கின்ற ஒரு செயலாகத்தான் நான் பார்க்கின்றேன்.

ஒருசில வருடங்களுக்கு முன்னர் மல்லாகம் மகா வித்தியாலயத்தில் நடைபெற்ற பொலிஸாருடைய carnival நிகழ்வைப் பார்க்க வருகைதந்திருந்த அனைவருக்கும் beer tin கொடுக்கப்பட்டது. யாழ்ப்பாணத்தில் பொலிஸ் பிரிவே இப்படியான ஒரு நடவடிக்கையில் ஈடுபட்டுக் கொண்டிருக் கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one more minute.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Sir, please give me two more minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
இரு வருடங்களுக்கு முன்னர் நடைபெற்ற இராணுவத் தினருடைய carnival நிகழ்வினை நான் வெளியில் நின்று பார்த்துக்கொண்டிருந்தேன். அப்போது ஏதோ ஒரு போட்டிக்கு முதற் பரிசாக வெளிநாட்டு alchohol போத்தலும் இரண்டாவது பரிசாக இலங்கையின் சாராயப் போத்தலும் கொடுக்கப் பட்டதை நான் அவதானித்தேன். உண்மையில் இராணுவத் தினரும் பொலிஸாரும்தான் வடக்கில் alchohol விற்பனை செய்கின்ற முகவர்களாக, அதை மக்கள் மத்தியில் கொண்டுசெல்கின்ற தரகர்களாகச் செயற்பட்டுக்கொண்டிருக் கின்றார்கள். இது வன்மையாகக் கண்டிக்கத்தக்கது. கடந்த ஆட்சியில் செய்த அதே நிகழ்வு இந்த ஆட்சியிலும் தொடர்ந்து கொண்டிருக்கின்றது.

மதுபான விற்பனை வடக்கில் மென்மேலும் அதிகரித்துச் செல்வதற்கு என்ன காரணமென்று மது வரித் திணைக்கள அதிகாரிகளிடம் நான் கேட்டேன். அரசாங்கம் மதுபானம் விற்பனை அளவின் வீதத்தை வருடாவருடம் அதிகரித்துச் செல்வதாக அவர்கள் கூறுகின்றார்கள். இராணுவம் மற்றும் பொலிஸாரினது உதவியுடன் எங்களுடைய மக்கள் மத்தியில் அவர்கள் வில்லங்கமாக alchohol ஐயும் drugs ஐயும் திணிக்கின்றார்கள். அப்படியான ஒரு சூழ்நிலையைத் தாங்களே உருவாக்கிவிட்டு, public ஆக - பகிரங்கமாக யாழ்ப்பாணம், மட்டக்களப்பு, நுவரெலியா ஆகிய மூன்று மாவட்டங்களும்தான் அதிகளவு மதுபானம் விற்பனை செய்யப் படுகின்ற இடங்களாகக் கருதப்படுவதாகச் சொல்கின்றார்கள். இது அந்த மக்களுடைய மனங்களை வேதனையடையச் செய்கின்றது. அதேநேரம், மற்றைய மாவட்டங்களுடைய தரவுகளையும் சொல்ல வேண்டும்.

மேதகு ஜனாதிபதி அவர்கள் உலகத் தலைவர்களுடைய மனதை வென்றிருக்கலாம்; ஆனால், ஒன்றரை வருடங்களுக்கு மேலாகியும் அவர் தமிழ் மக்களுடைய மனங்களை இன்னமும் வெல்லவில்லையே! என்று சொல்லி, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 4.34]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பிரதேச அபிவிருத்தி அமைச்சர் பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா அவர்களுடைய அமைச்சின் குறைநிரப்பு மதிப்பீடு தொடர்பாகவும் நிதி அமைச்சு சம்பந்தப்பட்ட சில விடயங்கள் தொடர்பாகவும் இடம்பெறும் இன்றைய விவாதத்திலே கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகின்றேன்.

குறிப்பாக, பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா அவர்கள் ஓர் இராணுவ வீரனாக, இராணுவத் தளபதியாக இருந்து இந்த நாட்டுக்குப் பாரிய சேவையாற்றியிருக்கிறார். இந்த நாட்டிலே புரையோடிப்போயிருந்த பயங்கர வாதத்தையும் அதனால் மக்களுக்கிடையேயிருந்த பயத்தையும் நாட்டிலே இருந்த அச்ச சூழ்நிலையையும் இல்லாமற் செய்வதற்காக அவர் தனது உயிரையும் அர்ப்பணிக்கத் தயாராக இருந்தார். அந்தவகையில் அவர் பெரியதோர் ஆபத்திலிருந்து மீண்டு, நேர்மையாகத் தன்னுடைய பணியை ஆற்றிய ஒரு பெருமகனாவார். கடந்த பாராளுமன்றத் தேர்தலிலே போட்டியிட்டு அவரால் வெற்றிபெற முடியா விட்டாலும் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் ஐக்கிய தேசியக் கட்சியின் தேசியப் பட்டியல்மூலம் அவரை நியமித்து, பிரதேச அபிவிருத்தி அமைச்சர் பதவியை வழங்கியிருப்பது சாலப் பொருத்தமானதாகும். அதற்காக ஐக்கிய தேசியக் கட்சியின் தலைவர் அவர்களுக்கு எனது கட்சி சார்பாகப் பாராட்டுக்களைத் தெரிவித்துக்கொள்கின்றேன்.

பொதுவாக பிரதேச அபிவிருத்தி என்று பார்க்கின்றபோது இந்த நாட்டிலிருக்கின்ற பல விடயங்களை அந்த அமைச்சின் கட்டுப்பாட்டின்கீழ் அல்லது அதன் செலவுத் தலைப்பின்கீழ் கொண்டுவரக்கூடிய வாய்ப்புக்கள் உள்ளன. நேற்று நான்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

முல்லைத்தீவிலுள்ள புதுக்குடியிருப்பு, கரைதுறைப்பற்று, ஒட்டுசுட்டான் ஆகிய பிரதேச செயலகங்களுக்கான பிரதேச அபிவிருத்தி ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களில் கலந்து கொள்வதற்குச் சென்றிருந்தேன். என்னோடு பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ வைத்திய கலாநிதி சிவமோகன், கௌரவ காதர் மஸ்தான், கௌரவ (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா, சிவசக்தி ஆனந்தன் ஆகியோரும் மாகாண சபை உறுப்பினர்கள் பலரும் கலந்துகொண்டார்கள். அங்கு வயோதிபத் தாய்மார், பிள்ளைகளை இழந்த பெற்றோர், உறவுகளை இழந்தவர்கள், பெற்றோரை இழந்த பிள்ளைகள் என்றவகையில் பலர் தங்களுடைய கைகளிலே பதாகைகளை ஏந்திக்கொண்டு, "எங்களுக்கு வீடு வேண்டும்; நாங்கள் இருக்கின்ற கொட்டில்களிலே இனியும் வாழமுடியாது; மழைக்காலம் வருவதற்கு முன்னர் சொந்த வீட்டைக் கட்டக் கூடிய ஏற்பாட்டை கௌரவ மீள்குடியேற்ற அமைச்சரிடம் பெற்றுத்தர வேண்டும்; வீட்டுப் பிரச்சினை சம்பந்தமாக மாகாண சபையும் மத்திய அரசும் ஒன்றுசேர்ந்து செயற்பட வேண்டும்" என்றவாறான பல கோஷங்களை எழுப்பிக் கொண்டிருந்தார்கள். அத்துடன், அந்த துக்ககரமான, வேதனையான வேண்டுகோளை அவர்கள் எழுத்துமூலமாகவும் கையளித்தார்கள்.

இன்று நான் மாண்புமிகு அமைச்சர் சுவாமிநாதன் அவர்களை அவருடைய அமைச்சுக்கு சென்று சந்தித்து இந்த மக்களுடைய வேதனையை, துன்பத்தை எடுத்துச் சொல்லியுள்ளேன். நாளை சம்பந்தப்பட்ட பாராளுமன்ற உறுப்பினர்களுடன் அமைச்சர் அவர்களைச் சந்தித்து ஒரு விசேட கூட்டத்தைக் கூட்ட எண்ணியிருக்கின்றேன். இந்த நாட்டின் மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதமர் அவர்களும் மாண்புமிகு மீள்குடியேற்ற அமைச்சர் அவர்களும் சேர்ந்து அந்த மக்களுடைய வீடில்லாப் பிரச்சினைக்குரிய நல்லதொரு தீர்வை மழைக்காலம் வருவதற்கு முன்னர் எடுப்பார்கள் என நான் நம்புகின்றேன். அதேபோல் மன்னார், வவுனியா, கிளிநொச்சி, யாழ்ப்பாணம் ஆகிய மாவட்டங்களிலும் முல்லைத்தீவின் ஏனைய பகுதிகளிலும் கிழக்கு மாகாணத்திலும், இதேபோல் எங்கெல்லாம் வீடுகளில்லாமல் கஷ்டப்படுகின்றார்களோ, அங்கெல்லாம் அந்த மக்களுக்கு அவசரமாக வீட்டுத் திட்டத்தை வழங்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அந்தப் பிரதேசங்களிலே பாரிய கட்டமைப்பு வசதிகள் செய்யப்பட்டிருந்தாலும் இன்னும் பல அபிவிருத்திகளை அவர்கள் எதிர்பார்த்த வண்ணமிருக்கிறார்கள். அவற்றை யெல்லாம் ஒன்றன்பின் ஒன்றாக இங்கு எடுத்துக்கூறுவதற்குச் சந்தர்ப்பம் இல்லாவிட்டாலும் ஒரு முக்கியமான விடயத்தை இங்கு சொல்லிவைக்க விரும்புகின்றேன். குறிப்பாக, புத்தளம் மாவட்டத்தில் புத்தளம் தேர்தல் தொகுதியானது ஒரு முக்கியமான பிரதேசமாகும். இந்த நாட்டின் வரலாற்றிலே ஒரு சமூகம் 24 மணித்தியால அவகாசத்திலே ஒரு மாகாணத்திலிருந்து ஒட்டுமொத்தமாக வெளியேற்றப்பட்ட தென்றால், அது வட மாகாண முஸ்லிம் சமூகம்தான். அவ்வாறு வெளியேற்றப்பட்ட மக்கள் கடல் மார்க்கமாகக் கற்பிட்டிக் கரைக்கு வந்தபோது, கற்பிட்டி மக்கள் அரவணைத்து அவர்கள் தங்குவதற்குத் தங்களுடைய வீடுகளை, பாடசாலைகளை, மத்ரஸாக்களை, தோட்டங்களை வழங்கிச் சமைத்த உணவுகளையும் கொடுத்தார்கள். அவ்வாறு ஒன்றிரண்டு வருடங்களல்ல, 20 - 25 வருடங்களாகப் பல்லாயிரக்கணக்கான மக்களைப் பாதுகாத்து வந்த ஒரு தொகுதிதான் புத்தளம் தேர்தல் தொகுதி. அந்த வகையில் கடந்த இரண்டு தசாப்தங்களாகத் தங்களுடைய வளங்களைப் பங்கிடுவதனூ டாகக் கல்வித்துறை, சுகாதாரத்துறை, பொருளாதாரத்துறை எனப் பல துறைகளிலும் அந்த மக்கள் நஷ்டங்களைச் சந்தித்திருக்கின்றார்கள். இடம்பெயர்ந்த இந்தச் சமூகம் அந்தப் பிரதேசத்திற்கு வந்ததைத் தொடர்ந்து அவர்களுக்கு அடைக்கலம் கொடுத்ததனால் புத்தளம் தொகுதி மக்கள் தங்க ளுடைய எத்தனையோ விடயங்களை இழந்திருக்கின்றார்கள். ஆனால், இதுவரைக்கும் ஒருநாள்கூட இந்த மக்களுடைய மனதைப் புண்படுத்தக்கூடிய முறையில் நடந்துகொள்ள வில்லை; அவர்களை இந்த மண்ணிலிருந்து வெளியேறும்படி சொல்லவுமில்லை என்பதை அந்த மக்களோடு இடம்பெயர்ந்து வந்தவனென்ற வகையிலே கௌரவத்தோடும் நன்றியுணர் வோடும் தெரிவிக்க விரும்புகின்றேன். அன்று அங்கிருந்த உலமாக்கள், அரசியல்வாதிகள், பெருந்தலைவர்கள் என எத்தனையோ பேர் இன்று மரணித்துவிட்டார்கள். அத்தனைபேருக்கும் நான் எனது மனமார்ந்த நன்றியைத் தெரிவிக்கின்றேன்.

இந்தப் புத்தளம் தொகுதியைக் கடந்த 26 வருடங்களாக நான் பார்க்கின்றேன். அந்தத் தொகுதியிலே இரண்டு பெரிய கட்சிகளிலே முஸ்லிம்கள் போட்டியிட்டபோதும் பாராளுமன்ற உறுப்பினராக வருவதற்கு ஒருவருக்குக்கூட வாய்ப்புக் கிடைக்கவில்லை. கடந்த 2 தசாப்தங்களுக்கு மேலாக ஓர் அரசியல் தலைமைத்துவம் இல்லாத மக்கள் வாழ்கின்ற அந்தத் தொகுதியிலே, இவ்வாறு ஓர் இலட்சம் மக்கள் வந்தபோது அவர்கள் அடைக்கலம் கொடுத்தார்கள், அதன்மூலம் பல துன்பங்களையும் கஷ்டங்களையும் தாங்கிக்கொண்ட அந்த மக்களின்மீது கருணை காட்டாமல், அங்கு பல்லாயிரக் கணக்கான விவசாயிகளின் காணிகள் இருக்கின்ற நுரைச்சோலையிலே அனல் மின் நிலையம் - coal power plant- ஒன்றினை நிறுவினார்கள், இதற்கு எதிராக அந்த மக்கள் பாதையிலே இறங்கிப் போராடினார்கள்; அதனைத் தடுக்க முயற்சித்தார்கள். அதற்காக எத்தனையோ அரசியல்வாதி களைச் சந்தித்தார்கள். எனினும், அங்கு அனல் மின் நிலையம் அமைக்கப்பட்டது. இதனால், இன்று அந்த மக்களுடைய விவசாயம் நாசமாக்கப்பட்டிருக்கின்றது, அதேபோல, சம்பூரிலும் இவ்வாறான ஓர் அனல் மின் நிலையத்தை அமைப்பதற்கு ஒப்பந்தம் செய்யப்பட்டது தொடர்பில் கடந்த காலங்களில் பேசப்பட்டு வந்தது உங்களுக்குத் தெரியும். இதற்கு எதிராக அங்கிருக்கின்ற மக்கள் - மூதூர், சம்பூர் மக்கள் - உட்பட அரசியல் தலைமைகள் ஒன்றிணைந்து தொடர்ந்து பேசிவந்த வரலாறும் இருக்கிறது. அண்மையிலே இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள் இந்தியாவுக்குச் சென்று, அந்த நாட்டுப் பிரதமரைச் சந்தித்து, அனல் மின் நிலையத்தினால் ஏற்படுகின்ற தாக்கத்தை எடுத்துச்சொன்னதன்பேரில் இரு நாட்டு அரசுகளின் ஒத்திசைவுடன் அதனை நிறுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டமையானது எங்களுக்குப் பெரிய சந்தோசத்தை ஏற்படுத்தியிருக்கின்றது. இது அந்த மக்களுக்குக் கிடைத்த வெற்றியாகவே நான் பார்க்கின்றேன். இவ்வாறான ஒரு நல்ல பணியை இந்த அரசு செய்திருக்கின்றது.

கடந்த அரசாங்கத்தினால் புத்தளத்திலே அனல் மின் நிலையம் திணிக்கப்பட்டது. இதன் தாக்கத்தை இன்றும் அந்த மக்கள் அனுபவிக்கின்றார்கள். இதன்மூலம் இந்த நாட்டுக்கு மின்சாரம் கிடைத்தாலும், புத்தளம் தொகுதி மக்கள் தங்களுடைய பொருளாதாரத்திலே ஏற்பட்டிருக்கின்ற நட்டத்தை ஈடுசெய்ய முடியாமல் இன்றும் துடித்துக் கொண்டிருக்கின்றார்கள். இவ்வாறானதொரு நிலையில், கொழும்பு மாவட்டத்திலே இருக்கின்ற அத்தனை குப்பைகூளங்களையும் புத்தளத்துக்குக் கொண்டுசெல்கின்ற திட்டத்தை எங்களுடைய இந்த அரசாங்கம் மேற்கொண்டு

වරුකින්රතු. இதுபற்றிக் கூறுவதற்காக நேற்று மாலை புத்தளத்தைச் சேர்ந்த பல இளைஞர்கள் என்னை நேரடியாகச் சந்தித்தார்கள். அந்த நேரத்தில், அங்கு கௌரவ பாராளுமன்ற உறுப்பினர் நவவி அவர்களும் என்னுடைய கட்சியின் அமைப்பாளர் அலி சப்ரி அவர்களும் சகோதரர் முஹ்ஸி அவர்களும் இருந்தார்கள். அப்போது, அந்த இளைஞர்கள் என்னிடம், "ஏன், எங்களுடைய புத்தளம் தொகுதிக்கு இந்த அரசாங்கமோ அல்லது நீங்களோ இந்த அநியாயத்தைச் செய்கின்றீர்கள்? கடந்த தேர்தல்களை எடுத்துக்கொண்டால், - அது ஜனாதிபதித் தேர்தலாக இருக்கலாம் அல்லது பாராளு மன்றத் தேர்தலாக இருக்கலாம்- இரண்டு தேர்தல்களிலும் நாடளாவிய ரீதியில் அதிகபட்ச வாக்குகளை அளித்த தொகுதியாக புத்தளம் தேர்தல் தொகுதியே காணப்பட்டது; அந்த மாவட்டத்தில் எங்களுடைய கட்சி வெல்லுவதற்கு அந்தத் தொகுதியின் ஒட்டுமொத்த வாக்குகள்தான் காரணமாக இருந்தது. இரண்டு தேர்தல்களிலும் 50,000க்கும் மேற்பட்ட வாக்குகளை உங்களுக்குப் பெற்றுத் தந்ததற்கு நன்றிக் கடனாகவா நீங்கள் - இந்த அரசாங்கம் - இந்த அநியாயத்தைச் செய்கின்றீர்கள்?" என்று கேட்டார்கள். இந்த நாட்டிலே எத்தனையோ பிரதேசங்கள் இருக்கின்றன. எத்தனையோ மாவட்டங்களைத் தாண்டித்தான் புத்தளம் தொகுதி இருக்கின்றது. கடந்த அரசு அங்கு அனல் மின் நிலையத்தை அமைத்து அங்குள்ள மக்களுக்கு அநியாயம் செய்ததுபோல புத்தளம் தொகுதியில் மாத்திரம் இவ்வாறான துன்பியலான விடயங்களை, அங்கு குப்பைகூளங்களைக் கொண்டுசென்று கொட்டுதல் போன்ற அந்த மக்களுக்கு ஆபத்துக்களை விளைவிக்கக்கூடிய விடயங்களை அமுல்படுத்துவதை இந்த அரசும் இனி வருகின்ற எந்த அரசும் நினைத்துப் பார்க்கவே கூடாது என்று நான் மிகவும் கௌரவமாகவும் அன்புடனும் வேண்டுகோள் விடுக்கின்றேன்.

மேலும், "Silent Volunteers" என்ற அமைப்பில் இருக்கின்ற மிகவும் இளம் வயதினையுடைய வாலிபர்கள் கடந்த இரண்டு - மூன்று தசாப்தங்களாக புத்தளத்தில் முஸ்லிம்களுக்கான பாராளுமன்றப் பிரதிநிதித்துவம் அல்லது அரசியல் தலைமைத் துவம் இல்லாத காரணத்தினால், அத்தொகுதி அடைந்திருக் கின்ற துன்பங்களைக் கண்கூடாக உணர்ந்திருக்கிறார்கள். இப்பிரதேசம் யுத்தத்திலே நேரடியாகச் சம்பந்தப்படா விட்டாலும், வடக்கு, கிழக்கில் நடந்த யுத்தத்தின்போது வெளியேற்றப்பட்ட ஓரிலட்சம் அகதிகளைத் தாங்கிய ஒரு பிரதேசமாக இருக்கின்றது. யுத்தத்தின் பின்னர், அபிவிருத்தி விடயமாக இருந்தாலென்ன, வீடமைப்பு விடயமாக இருந்தா லென்ன அல்லது வாழ்வாதார விடயங்களாக இருந்தாலென்ன எந்த விடயத்திலும் இந்தப் புத்தளம் தொகுதியானது எவ்வித இலாபத்தையும் அடையவில்லை என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இப்பிரதேசத்திலுள்ள மக்கள் அனல் மின் நிலையத்தினால் ஏற்படுகின்ற தாக்கத்தைத் தாங்க முடியாமல் இன்னமும் தவித்துக்கொண்டிருக்கின்றனர். இந்த நிலையில், அப்பிரதேசத்தில் குப்பைகூளங்கள் கொட்டப் படுமாக இருந்தால், அங்கு மீன்பிடித் தொழில் செய்கின்ற - சிறுகடல் தொழில் செய்கின்ற – 20,000 மீனவர்களுடைய வாழ்வாதாரம் பாதிக்கப்படும். இந்தப் பிரதேசத்திலே நான்கு உப்பளங்கள் இருக்கின்றன. இந்த நாட்டுக்குத் தேவையான உப்பில் 40 வீதத்தை இந்த உப்பளங்களே உற்பத்தி செய்கின்றன என்ற விடயத்தை நான் இங்கு சொல்லிவைக்க வேண்டும். அதுமாத்திரமல்லாமல், ஆயிரக்கணக்கான மக்கள் இத்தொழிலிலே தங்கியிருக் கின்றார்கள். இதனால், அவர்களுடைய வாழ்வாதாரம் பாதிக்கப்படவிருக்கின்றது. அதேபோல், கற்பிட்டி முதல் அனல் மின் நிலையம் அமைந்திருக்கின்ற நுரைச்சோலை வரையிலுள்ள 16,000 ஏக்கர் விவசாய நிலமும் பாதிக்கப் படவிருக்கின்றது.

அது மாத்திரமல்லாமல், அந்த பிரதேசத்தில் 600 ஏக்கர் பரப்பில் இறால் பண்ணையும் இருக்கின்றது. பல பில்லியன் ரூபாய்களை அந்தப் பிரதேச மக்கள் அதில் முதலீடு செய்திருக்கின்றார்கள். அதுவும் பாதிக்கப்படப்போகின்றது. இப்படியாக பாதிப்புக்களை இங்கே நாங்கள் அடுக்கிக் கொண்டு செல்லலாம். "Silent Volunteers" என்ற அமைப்பு இதனால் ஏற்படக்கூடிய தாக்கம் சம்பந்தமாக - EIA report - ஓர் அறிக்கையைத் தயாரித்திருக்கிறது. என்னிடத்தில் ஒப்படைக்கப்பட்டிருக்கின்ற அந்த *அறிக்கையை ஹன்சாட்டில் இணைத்துக்கொள்ளுமாறு உங்களிடம் நான் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்ததாக, பிரதேச அபிவிருத்தி அமைச்சின் குறைநிரப்புத் தொகை மீதான இந்த விவாதத்திலே சில விடயங்களை முன்வைக்கலாமென்று நினைக்கின்றேன். குறிப்பாக, மீள்குடியேற்ற விடயங்கள் அங்கு நடைபெற்றுக் கொண்டிருந்தாலும் வட மாகாண சபைக்கும் மத்திய அரசுக்கு மிடையில் நல்லதோர் உறவை நாங்கள் காணவில்லை. மத்திய அரசின் பல்வேறுபட்ட விடயங்களிலே வட மாகாண சபையிடம் கருத்து முரண்பாடுகள் காணப்படுகின்றன. அதன் காரணமாகப் பல அபிவிருத்திகள் பின்தள்ளப் பட்டிருக் கின்றன. எனவே, நல்ல விடயங்களிலே இரண்டு தரப்பும் - மத்திய அரசும் வட மாகாண சபையும் - இணைந்து செயற்பட வேண்டும்; யுத்தப் பாதிப்பிலிருக்கின்ற அந்த மக்களுடைய கண்ணீரைத் துடைப்பதற்கு ஒன்றுபட வேண்டுமென்று வேண்டிக்கொள்கின்றேன்.

நிதி அமைச்சு சம்பந்தமான கட்டளையொன்றும் இங்கு சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. கௌரவ ரவி கருணாநாயக்க அவர்கள் மிகவும் கெட்டித்தனமாக, பொருளாதார மேம் பாட்டை நோக்கி அந்த அமைச்சை இன்று முன்னெடுத்துச் செல்கின்றார். BOI ஆக இருக்கலாம், அதேபோல Commerce Department ஆக இருக்கலாம், அல்லது Sri Lanka Customs ஆக இருக்கலாம், அல்லது Registrar of Companies ஆக இருக்கலாம், இவை எல்லாவற்றையும் ஒருமுகப்படுத்தி single-window setup க்குக் கீழே அவற்றைக் கொண்டுவந்து இந்த அமைச்சை அவர் முன்னெடுத்துச் செல்கின்றார். அதுமாத்திர மல்லாமல், எங்களுடைய அமைச்சின் திட்டங்களை நாங்கள் முன்வைக்கின்றபொழுது அவற்றை முன்னெடுத்துச் செல்வதற்கு எங்களுக்கு உதவி செய்கின்றார். அதேபோல, ஏனைய அமைச்சுக்களுடைய நடவடிக்கைகளையும் சிறந்த முறையில் முன்னெடுத்துச் செல்வதற்கான ஆலோசனை களைக் கூறி, அதற்கான ஏற்பாடுகளையும் அவர் செய்து வருவதை நன்றி உணர்வுடன் நினைவுகூருவதோடு, அதற்காக அவருக்கு இந்த இடத்திலே நன்றி கூறி, பிரதேச அபிவிருத்தி அமைச்சர் பீல்ட் மார்ஷல் சரத் பொன்சேகா அவர்களுக்கும் என்னுடைய வாழ்த்துக்களைக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 4.49]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන යෝජනා තුළින් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට රුපියල් ලක්ෂ 5,930කට ආසන්න පරිපූරක මුදලක් ඉල්ලා තිබෙනවා. මම ඒ පිළිබඳව තමයි අද කථා කරන්න යන්නේ. ඉදිරි මාස තුනට තමයි මේ අමාත්‍යාංශයට රුපියල් ලක්ෂ 5,930ක් ඉල්ලන්නේ. එයින් රුපියල් ලක්ෂ 4,694ක් පුනරාවර්තන වියදම්වලට තමයි යන්නේ. උදාහරණයක් හැටියට ගත්තොත් රාජගිරිය,

[ගරු ප්‍රසන්න රණවීර මහතා]

ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 1090, සිනෝ ලංකා කුලුනේ ආරම්භ කරන මෙම අමාත්‍යාංශයේ මාසික කුලිය රුපියල් ලක්ෂ 90ක්. ඒ අනුව, මේ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට ප්‍රාග්ධන වියදම් හැටියට ඉතිරි වන්නේ රුපියල් ලක්ෂ 1,235ක්.

අද ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331ක් තිබෙනවා. මේ මුදල 331න් බෙදුවොත්, ඉදිරි මාස කිහිපයට එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් වියදම් කරන්න පුළුවන් වන්නේ රුපියල් 3,73,111යි.

ලංකාවේ ග්‍රාම නිලධාරි වසම් 14,022ක් තිබෙනවා. මේ මුදල ග්‍රාම නිලධාරි වසම් මට්ටමට ගියොත්, ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ග්‍රාම නිලධාරි වසමකට වියදම් කරන්න වෙන්නේ රුපියල් 8,000ක විතර මුදලක්. ඒ අනුව, රුපියල් 8,000ක් වැනි විශාල මුදලක් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ග්‍රාම නිලධාරි වසමකට වියදම් කරන්න පුළුවන්කම තිබෙනවා.

අද මේ රටේ ජනතාව මත විශාල ලෙස බදු පනවනවා. වැට් එක ගහනවා. මේ සියලු දේවල් කරමින් එක එක අමාත්‍යවරු සනසන්න, තෘප්තිමත් කරන්න මේ තරම් විශාල මුදලක් පරිපූරක ඇස්තමේන්තු මඟින් මේ පාර්ලිමේන්තුවේ අනුමත කර ගන්න හදනවා. මේ රටේ ජනතාවට දුක දෙන ගමන්, ජනතාවගේ බඩට ගහන ගමන්, ආර්ථිකය කඩා වට්ටවන ගමන් මේ අමාත්‍යවරුන්ගේ සුඛ විහරණය සඳහා අද රුපියල් කෝටි පන්දහස්, හයදහස් ගණන් වෙන් කර ගන්නවා. මේකද ආණ්ඩුවේ යහ පාලනය?

නින්දෙන් නැඟිටලා වාගේ අද අපේ ඇමතිවරු කථා කළා. පසු ගිය ආණ්ඩුව කාලයේ ණය ගත්තාලු. රට ණය උගුලකලු. රාජපක්ෂලු ණය ගත්තේ. හැබැයි, ඒ අවුරුදු දහයටම අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 14,200ක් තමයි ණය අරගෙන තිබෙන්නේ. එයින් ප්‍රාග්ධන වියදම් වශයෙන් සංවර්ධන කටයුතුවලට විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 12,396ක් වියදම් කර තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය හදන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 526යි. නොරොච්චෝලේ ගල් අඟුරු ව්‍යාපෘතියට ඇමෙරිකානු ඩොලර් මිලියන 1,340යි. කොළඹ-මාතර අධිවේගී මාර්ගය හදන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 630යි. කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය හදන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 248යි. කොත්මලේ ජලාශ ව්‍යාපෘතියට ඇමෙරිකානු ඩොලර් මිලියන 300යි. මත්තල මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපොළට ඇමෙරිකානු ඩොලර් මිලියන 190යි. ග්‍රාමීය මාර්ග සංවර්ධනට ඇමෙරිකානු ඩොලර් මිලියන 2,020යි. කොළඹ වරාය සංවර්ධනයට ඇමෙරිකානු ඩොලර් මිලියන 426යි. බලශක්ති සංවර්ධන ව්‍යාපෘතිවලට ඇමෙරිකානු ඩොලර් මිලියන 326යි. අම්පාර වාගේ ප්‍රදේශවල ඇත පිටිසර ගම්මානවලට ජලය ලබා දීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 468යි. උතුර - නැගෙනහිර ප්‍රදේශවල ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 145යි. කටුනායක ගුවන් තොටුපොළ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 80යි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට වෙන් කළ කාලය විනාඩි 11ක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා. කථා කරන්න ඒවිද දන්නේ නැහැ.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
නැහැ, නැහැ. ඒ වෙලාවත් මට දීලායි තිබෙන්නේ. ඔබතුමා කලබල වෙන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කලබලයක් නොවෙයි, ඒ බව අපට දන්වලා නැහැ. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න සංවිධායකතුමා ඒ බව අපට දන්වලා නැහැ.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ලේකම්තුමාට දැන්වුවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සංවිධායකතුමා හැටියට ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමා අපට දන්වලා නැහැ.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
අපි ලේකම්තුමාට දැන්වුවා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ලේකම්තුමාට දැනුම් දීලා ගියේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. තව විනාඩි දෙකකින් කථාව අවසන් කරන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
කථා කරන්න වෙලාව දෙන්න. බාධා කරන්න එපා. මේවා හොඳට අහගන්න. හරි අමාරු ඇති, අහගෙන ඉන්නකොට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒකට වෙලාව වැඩියෙන් අරගන්න. වෙලාව වැඩියෙන් අරගෙන කථා කරන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මේ ආණ්ඩුව පසු ගිය කාලයේ කිව්වේ මොනවාද? හොරකම් කළ, කොමිස් ගත්ත මුදල්වලින් මේ රටේ දුක් විඳින ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන්න පුළුවන් කියා කිව්වා; අපට ආර්ථික සැලසුමක් තිබෙනවා කියා කිව්වා; ආර්ථික කළමනාකරණය කිරීමේ හැකියාවක් තිබෙනවා කියා කිව්වා; තරුණයන් දස ලක්ෂයකට රැකියා දෙනවා කියා කිව්වා; Volkswagen company එක එනවා කියා කිව්වා; ආයෝජකයන් එනවා කියා කිව්වා. අද තරුණයන් දසලක්ෂයකට රැකිරක්ෂා ලබා දෙන ව්‍යාපෘතියේ සභාපති හැටියට මහ බැංකුවේ රුපියල් බිලියන 145ක් හොරකම්

කරපු අර්ජුන් මහේන්ද්‍රන් පත් කරලා තිබෙනවා. මහ බැංකුවට සිදු වුණු දෙයම තමයි මේ රටේ තරුණයන්ටත් වෙන්නේ කියන එක බොහොම පැහැදිලියි. මේ වාගේ අකාර්යක්ෂම නිලධාරීන් මේ රටේ තරුණයන් වෙනුවෙන් යෙදෙව්වාම මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා වාගේ හෙට අනිද්දා වන විට තරුණ පරපුරත් විනාශ කරලා දමයි. ඒ ගැන කිසිදු සැකයක් නැහැ.

අද මේ මැති ඇමතිවරුන්ගේ අමාත්‍යාංශවලට කෝටි ගණන් සල්ලි වෙන් කරන ගමන් හෙට අනිද්දා VAT එකත් ගෙනෙන්න යනවා. මේ කරන්නේ මොකක්ද? දුරකථන බිලෙන් විතරක් නොවෙයි, මේ රටේ දුප්පත් අහිංසක මිනිසුන්ගේ බෙහෙත් පෙත්තේ ඉඳලා බදු අය කරනවා. නංගිලා-මල්ලිලාට සැපට ඉන්න Wi-Fi දෙනවා කියා කිව්වා. Wi-Fiවලින් විතරක් නොවෙයි, බෙහෙත් පෙත්තෙනුත් බදු අය කරන්නයි මේ ලැහැස්ති වෙන්නේ. ප්‍රාදේශීය සංවර්ධන ඇමතිගේ පුනරාවර්ථන වියදම රුපියල් ලක්ෂ 5,930යි. ඡන්ද 5,000යි. මෙන්න, රටේ තත්ත්වය. ඉදිරි මාස තුන සඳහා ප්‍රාදේශීය සංවර්ධන ඇමතිගේ පුනරාවර්තන වියදම රුපියල් ලක්ෂ 5,930යි. මේ 2017 වර්ෂය සඳහා වියදම නොවෙයි. අද මේ කරන්නේ රාජ්‍ය මුදල් අවභාවිත කිරීම. ඒක නීත්‍යානුකූලව කරන්න Cabinet Paper එක ඉදිරිපත් කරන වැඩේ තමයි මේ කරන්නේ. අපේ ගෙදරක වුණත් කන්න බොන්න දීලා සුරතල් බල්ලෙක් හැදුවාම ඌ බුරනවා. බුරන්නේ කන්න දෙන නිසයි; මස් කට්ටක් දෙන නිසයි. මේ ඉන්න සමහර ඇමතිවරුන්ටත් අපේ රටේ රාජ්‍ය නායකයන්ට වඳින්න, ඔවුන් වෙනුවෙන් බුරන්න තමයි මේ වාගේ මස් කටු දෙන්නේ; රුපියල් ලක්ෂ පන්දහස් ගණන් දෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න. ඔබතුමාගේ කාලය අවසානයි. විනාඩි හතරක් වැඩියෙන් දුන්නා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ විනාඩි 8ක් තිබෙනවා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මූලාසනයට වෙලාව සම්බන්ධයෙන් කිසිවක් කියලා නැහැ.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
කිව්වා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ. ඔබතුමා කිව්වා. එතුමා කියලා නැහැ. ඒ නිසා ඔබතුමා කථාව අවසන් කරන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
කථා කරන්න තව කරුණු තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ඔබතුමා මූලාසනයේ සිටිමින් පක්ෂපාතිව කටයුතු කරන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
කථාව අවසන් කරන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මේ රටේ සැබෑ ඇත්ත කියන කොට කාට කාටත් අමාරුයි. නාස්තිය, දූෂණය, නීෂණය නැති කරනවාය කියා බලයට පැමිණි මේ යහ පාලන ආණ්ඩුව අද මේ මොකක්ද කරන්නේ? මහජන බැංකුවේ ඩොලර් මිලියන 44 සම්බන්ධයෙන් ගත්ත නීත්‍යානුකූල පියවර කෝ? අර්ජුන මහේන්ද්‍රන්ට විරුද්ධව ගත්ත පියවර කෝ?

අදත් ඇවිල්ලා ණය ගැන කථා කරනවා. අපි රුපියල් කෝටි ගණන් ණය කළා ලු. ණය කරලා කරපු සංවර්ධන ව්‍යාපෘති ටික පෙන්වා තිබෙනවා. පසු ගිය අවුරුදු දෙකට කරපු එක සංවර්ධනයක් කියන්න. හැබැයි ඇමතිවරු සංවර්ධනය කළා. ග්‍රාම සේවා වසමකට රුපියල් 8,000ක් බෙදන්න යන වාහනයේ වටිනාකම රුපියල් ලක්ෂ 400යි, රුපියල් ලක්ෂ 500යි. ඉදිරියේදී තව මොනවා ඉල්ලයිද දන්නේ නැහැ. එතකොට ඒවාට තව පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්න වෙනවා. අපි කියන්නේ මේ රටේ ජනතාවට බොරු කරන්න එපාය කියලායි. මේ රටේ ජනතාව එදා වැටුණු වළේ ආයෙත් වැටෙන්නේ නැහැ, මේ තරුණයා ආයෙත් ඒ වළේ වැටෙන්නේ නැහැ. ප්‍රායෝගිකව කටයුතු නොකර, වචන ටිකකට විතරක් සීමා වෙලා කටයුතු කිරීමෙන් අද මේ රට එන්න-එන්නම බංකොලොත් කරලා තිබෙනවා. බදු, මේ රටේ ජනතාවට පීඩාවක් බවට පත් කරලායි තිබෙන්නේ. බදු බර තමයි ජනතාවට පටවා තිබෙන්නේ. සමහර ඇමතිවරු ට්‍රැක්ටර් ගෙනෙනවාය කියලා ප්‍රාඩෝ ගෙනාවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කරනවා, ආදායම වියදම ගැන. යකඩෝ! පසු ගිය කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 2.6යි. අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් කථා කළා. මේ රටේ යුද්ධයකුත් නිබියදී, 2008 ලෝක ආර්ථික අර්බුදයත් හමුවේ අපට ආර්ථික වර්ධන වේගය සියයට 6.5කට ගෙනෙන්න හැකියාව තිබුණා. අපට එවැනි ආර්ථික සැලසුම්කරණයක් තිබුණා. අද තමයි සැලසුම්කරණයක් නැත්තේ. සැලසුමක් නැති නිසා තමයි මේ රටට ආයෝජකයන් එන්නේ නැත්තේ. අද වී නිෂ්පාදනය බැහැලා තිබෙනවා. පොහොර ටිකට කෙළියා.

අද "දිවයින" පත්‍රයේ තිබෙනවා, වී අස්වැන්න අඩුයි කියලා. ගොවියා වගා කරන්න යන්නේ නැහැ. මේ සැලසුම් හදන්නේ සියලුම ආයතන විකුණා ගෙන කන්නයි. පාඩුයි-පාඩුයි කියලා

[ගරු ප්‍රසන්න රණවීර මහතා]

රාජ්‍ය ආයතනවල මූල්‍ය කළමනාකරණය කරන්න ඕනෑය කියනවා. යකඩෝ! මූල්‍ය කළමනාකරණය කරන්න නම් ආයතන ටික විකුණා ගෙන කාලා හරි යනවා යැ. ඒ සඳහා දක්ෂ මන්ත්‍රීවරුන් පත් කරන්න එපා යැ. SriLankan Airlines එකට සභාපති කෙනකු පත් කළා, තවත් පාඩු කරන්න. පසු ගිය ආණ්ඩුව ගෙව්වාට වඩා තුන් ගුණයක් අද ගෙවනවා. දක්ෂයකුට ඒ ආයතන දෙන්න ඕනෑ. මනා නිපුණතාවක් තිබෙනවා නම්, ඒ සම්පත් පිළිබඳව දැනුමක් තිබෙනවා නම්, උපදේශකයන් ගන්නේ ඒ ආයතන ගොඩ ගන්නයි. මේ සැලසුම් හදන්නේ ආයතන ටික විකුණා ගෙන කන්නයි. සියයට 20ක් කොමිෂන් ගන්නවා. මෙවැනි තත්ත්වයක් තුළයි අද මේ රට ගෙන යන්නේ.

ඒ විතරක් නොවෙයි. ජනාධිපතිවරයකුට මුදල් ඇමති වෙන්න බැහැයි කියා හොඳ පනතක් සම්මත කර ගත්තාය කියනවා. හැබැයි එක්සත් ජාතික පක්ෂ නායක රණසිංහ ප්‍රේමදාස නිටපු ජනාධිපතිතුමා තමයි මුදල් ඇමති ධුරය දරමින් මුලින්ම ඒ පූර්වාදර්ශය සැපයුවේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් විනාඩි 12ක් ගත වුණා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
බොහොම ස්තුතියි. මා අවසන් කරනවා.

මෙවැනි පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරලා රට සංවර්ධනය කරන්න යනවා නම් මේ රටට බුදු සරණයි! දෙවියන්ගේම පිහිටයි! කියමින් මා නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට, අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා.

[ප.ව. 5.01]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්තුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, இப்பொழுது பேசிவிட்டு அமர்ந்த கௌரவ உறுப்பினர் பிரசன்ன ரணவீர அவர்கள் பிரதேச அபிවිරුත්தி அமைச்சுக் காக ஐம்பத்தொன்பது கோடியே முப்பது இலட்சம் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பதாகவும் முன்னைய 'மஹிந்த' அரசிலே 12,396 மில்லியன் அமெரிக்க டொலர்களே அவ்வமைச்சுக்கு ஒதுக்கப்பட்டதாகவும் கூறினார். அவர் அதனை டொலராகச் சுருக்கிக் கூறி, தற்போதைய ஒதுக்கீட்டை ரூபாயிலே விரித்துக் கூறினாலும் அவர்களுடைய எந்தக் குற்றத்தையும் மறைக்க முடியாது. 180 இலட்சம் டொலர்களைக் கடனாகப் பெற்று இந்த நாட்டிலே வருமானத்தைக் கூட்டுவதற்காக - *[இடையீடு]*

ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ප්‍රාග්ධන වියදම් වශයෙන් සංවර්ධන කටයුතුවලට විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 12,396ක් වියදම් කර තිබෙනවාය කියලා ඔබතුමා කිව්වා. අමාත්‍යාංශයෙන් කියනවා, ඒ මුදල තිබෙන්නේ ලක්ෂවලින් කියලා. ඔබතුමා මෙහෙමයි mention කළේ. ඉස්සෙල්ලා ඩොලර් කියලා කිව්වා නම් අනික් තැන්වලදීත් ඔබතුමා ඩොලර් කියලා කියන්න ඕනෑ. [බාධා කිරීමක්] චුට්ටක් ඉන්න.

'வற்' வரி சம்பந்தமாகவும் நாங்கள் பேச வேண்டும். முன்னைய 'மஹிந்த' அரசாங்கம் 9 இலட்சம் கோடி ரூபாயை இந்த நாட்டு மக்களுடைய தலைகளிலே கடனாகச் சுமத்தியிருக்கிறது. அதாவது, 9 இலட்சம் கோடி ரூபாய் கடனை இன்று நாங்கள் எமது தலைகளில் சுமந்து கொண்டிருக்கின்றோம். கௌரவ அமைச்சர் சரத் அமுனுகம அவர்கள் உரையாற்றியபோது, எந்தவொரு அரச தலைவரும் நிதி அமைச்சராக வரக்கூடாதென்று சொன்னார். அவர் அமைச்சராக இருந்தபோது அந்தத் தலைவரின் தொல்லையை அனுபவித்தவரென்பதால் அதுபற்றி இங்கு தெளிவாக எடுத்துக்கூறியிருக்கிறார். ஏன், நான் இதை உங்களுக்குக் கூறுகின்றேனென்றால் தற்போதைய நிதி அமைச்சருக்கு மோசடி செய்யவேண்டிய எந்த அவசியமும் இல்லை யென்பதைச் சுட்டிக்காட்டத்தான். தகுதியான நிதி அமைச்சர் ஒருவரை மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் தெரிவுசெய்திருக்கிறார்.

இங்கு மகேந்திரன் அவர்களைப் பற்றிக் கூறப்பட்டது. சிங்கப்பூரின் அபிவிருத்தியிலே கனிசமான பங்களிப்பைச் செய்தவர் அவர். முன்னைய அரசில் நிதி அமைச்சின் செயலாளராக பீ.பி. ஜயசுந்தர அவர்கள் இருந்தபோது இறக்குமதி செய்யப்பட்ட 'பிராடோ' ஜீப் வாகனங்கள் பறிமுதல் செய்யப்பட்டன. எங்களுடைய முதலாளிமாருக்கு வாகனங்களை இறக்குமதி செய்ய முடியாத நிலைமை உருவாக்கப்பட்டது. அவ்வாறு பறிமுதல் செய்யப்பட்ட 'பிராடோ', 'மொன்ரறோ' போன்ற நூற்றுக்கணக்கான 'ஜீப்' வாகனங்கள் அன்றைய ஜனாதிபதியின் பிள்ளைகளுக்கும் அன்றிருந்த நிதி முகாமைத்துவத்தில் இருந்தவர்களுக்கும் அவர்களுடைய சுகபோகங்களுக்காக வழங்கப்பட்டது. இன்னமும் அவற்றுக்குரிய சரியான கணக்கு வழக்குகள் இல்லாமல் இருக்கிறது. இப்படியான மோசடிகளை வெளிக் கொணர்வதற்காக இன்று ஆராய்ந்து கொண்டிருக்கின்றார்கள். இன்று இவ்வாறான பல மோசடிகள் வெளிவந்து கொண்டிருக் கின்றன.

கடந்த ஆட்சியிலே ஒன்பது இலட்சம் கோடி ரூபாய் வரையில் இந்த நாட்டைக் கடனாக்கி விட்டிருக்கிறார்கள். அந்தக் கடனை அடைப்பதற்குத்தான் இன்று 'வற்' வரி கொண்டுவரப்பட்டிருக்கிறது. இந்த வரியை எமது அரசாங்கம் கொண்டுவரவில்லை. இது 1964ஆம் ஆண்டு அப்போதைய ஸ்ரீலங்கா சுதந்திரக்கட்சியின் தலைவி சிறிமாவோ பண்டாரநாயக்க அம்மையாரின் ஆட்சியில்தான் முதன்முதல் கொண்டுவரப்பட்டது. 1947 முதல் 1964ஆம் ஆண்டு வரைக்கும் உற்பத்தி வரியைத் தவிர வேறு எந்த வரியும் இருக்கவில்லையென்பது உங்களுக்குத் தெரியும். பிறழ்வு வரி என்று ஒன்று இருந்தது. பிறழ்வு வரியென்றால், இறக்குமதி செய்கின்ற பொருட்களுக்கான வரி. அதற்கு மேலாக இறக்குமதி செய்யப்பட்ட பொருட்களுக்கு மேலும் வரியை விதித்து அன்று நுகர்வோருக்கு கஷ்டத்தைக் கொடுத்தார்கள். 1964ஆம் ஆண்டு உருவாக்கப்பட்ட 'வற்' வரிதான் 2014ஆம் ஆண்டு வரைக்கும் 10 வீதத்திலிருந்து 20 வீதம் வரை உயர்ந்துகொண்டு போனது. ஆனால் இன்று அதனை 15 வீதத்திற்குக் கொண்டுவந்திருக்கிறார்கள்; மேதகு ஜனாதிபதி அவர்களினதும் மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களினதும்

ஆலோசனையின் பேரில் சாதாரண பாமர மக்கள் பாதிக்காத வகையில் அத்தியாவசியப் பொருட்களுக்கு வரியை இல்லாமல் ஆக்கியிருக்கிறார்கள். அதாவது, மக்கள் அன்றாடம் நுகர்கின்ற பொருட்களுக்கு எந்த வரியும் விதிக்கவில்லை.

எமது அரசாங்கம் இந்த நாட்டின் தேசிய உற்பத்தியை அதிகரிக்கச் செய்வதற்கும் அந்நியச் செலாவணியை அதிகரிப் பதற்கும் பல திட்டங்களைக் கொண்டுவந்திருக்கின்றது. பத்து இலட்சம் பேருக்கு வேலைவாய்ப்பு என்ற விடயத்தில் அமைச்சர் றிஸாட் பதியுதீன் அவர்கள் தன்னுடைய அமைச் சுக்குக் கீழ் இன்று 35 - 45 வயதுக்குட்பட்டவர்களுக்குத் தொழில் வாய்ப்புகளை வழங்கக்கூடிய வகையில் தொழிற் பேட்டைகளை அமைப்பதற்குத் தீர்மானித்துள்ளார். இந்த நாட்டில் வேலையற்றிருக்கின்ற இளைஞர் யுவதிகளுக்கு வேலை வாய்ப்பைக் கொடுப்பதன்மூலம் உற்பத்திகளை அதிகரித்து அதன்மூலமாக வருமானத்தை அதிகரிக்கலாம்.

2004ஆம் ஆண்டு காலப்பகுதியிலே பாராளுமன்ற உறுப்பினர்களான நாங்கள் Middle-East Countries க்குச் சென்றிருந்தபோது அந்த அரபு நாடுகளிலே பல தேவைகள் இருப்பதை அறிந்தோம். அங்கு Doctors மற்றும் male nurses - ஆண் தாதியர், பெண் தாதியர்களுக்கான வேலைவாய்ப்புகள் இருக்கின்றன. எமது நாடடில் ஒரு வருடத்திலே இரண்டு இலட்சத்துக்கு மேற்பட்டவர்கள் A/L பரீட்சையில் சித்தியடைந்தாலும் 20,000 – 24,000 மாணவர்கள்தான் பல்கலைக்கழகங்களுக்குச் சென்று உயர் கல்வி கற்கிறார்கள். ஏனையோரில் தகுதியானவர்களைச் சுகாதார அமைச்சின்கீழ் இப்படிப்பட்ட தொழில்களைப் பயிற்றுவித்து அவர்களை வெளிநாடுகளுக்கு அனுப்புவதன்மூலம் அந்நியச் செலா வணியைச் சம்பாதிக்க முடியும். அதேபோன்று, O/L சித்தியடைந்தவர்களுக்கு carpenters, electricians போன்ற தொழில்களைப் பயிற்றுவிப்பதன்மூலம் வெளிநாடுகளிலே அவர்களுக்குக் கணிசமான வேலைவாய்ப்பைப் பெறக் கூடியதாக இருக்கும். அத்துடன், இன்று Arab countries களில் மீனவர்களின் தேவையும் இருக்கின்றது. இங்குள்ள மீனவர்களுக்கு நவீன தொழில்நுட்பப் பயிற்சிகளை வழங்குவதன்மூலம் அங்குள்ள அந்த வேலைவாய்ப்பை பெற்றுக்கொடுத்து அதன்மூலம் அந்நியச் செலாவணியை அதிகரிக்க முடியும்.

மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களும் தமது சொந்தத் தேவைக்காக அரசாங்க நிதியைப் பயன்படுத்தாதவர்கள். அன்றைய அரசாங்கத்தில் இருந்தவர்கள் தங்களுடைய குடும்பத்தின் தேவைகளுக்காக Treasury க்கு அப்பால் தங்களுடைய சொந்தக் கணக்கில் கோடிக்கணக்கான ரூபாயை வைப்பிலிட்டுச் செலவு செய்திருக்கிறார்கள். இவைபற்றி எந்தவித கணக்குவழக்கும் இல்லை. ஆனால், சாதாரண அதிகாரி ஒருவரின் கணக்கில் ஓர் 200 ரூபாய் மாற்றம் ஏற்படுகின்றபோது அவர் dismiss பண்ணப்படுகின்றார். இவ்வாறு பல்லாயிரம் கோடி ரூபாய் கொள்ளையிடப்பட்டுள்ளதாகக் கூறப்படுகின்றது. அதனை வெளிக்கொணர்கின்ற திட்டத்தை முன்வைத்து எமது அரசு விசாரணைகளை மேற்கொண்டிருக்கின்றது. மறைக்கப்பட்ட பல கோடி ரூபாய் பணம் வெளிவருகின்றபோது இந்த நாட்டிலுள்ள சாதாரண மக்களின் சுமைகள் எல்லாம் குறையும்.

திருகோணமலை மாவட்டத்திலே அனல் மின்நிலையம் அமைக்கப்படுவது தொடர்பாக சம்பூர் மக்கள் சொல்லொணாத் துன்பத்தில் இருந்தார்கள். இன்று அங்கு BOI projects இலிருந்து இரத்துச் செய்து 818 ஏக்கரும் கடற்படை முகாமை அகற்றி 237 ஏக்கருமாக மொத்தம் 1,055 ஏக்கர் விடுவிக்கப்பட்டுள்ளது. இதற்காக மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களுக்கு நன்றி சொல்லக் கடமைப் பட்டுள்ளோம். 2 - 3 நாட்களுக்கு முன்னர் அந்த அனல் மின் நிலையம் அமைப்பதையே இரத்துச் செய்து மீண்டும் 500 ஏக்கர் நிலத்தை விடுவித்ததன்மூலம் எங்களுடைய சுற்றா டலின் நலனைப் பேணுவதற்கு முயற்சி செய்திருக்கின்றார்கள். இதற்காக மேதகு ஜனாதிபதி அவர்களுக்கும் மாண்புமிகு பிரதம மந்திரி அவர்களுக்கும் நன்றி கூறக் கடமைப் பட்டுள்ளேன்.

மாண்புமிகு பிரதம மந்திரி அவர்கள் இந்த நாட்டுக்குப் பொருத்தமான, ஆளுமை மிக்க நிதியமைச்சரை நியமித்ததன் மூலம் அவர் சகல அமைச்சுக்களுக்கும் சம பங்கீடு செய்கின்ற வராகத் தன்னுடைய கடமையைச் செய்துகொண்டிருக் கின்றார். மாண்புமிகு பிரதம மந்திரி அவர்கள் தென்கிழக் காசியாவிலுள்ள ஏனைய நாடுகளைவிட 2020ஆம் ஆண்டு எமது நாட்டிலுள்ள ஒவ்வொருவரதும் தனிநபர் வருமானத்தை அதிகரிக்கச் செய்வார்; கடந்த அரசாங்கத்தினால் ஏற்படுத்தப் பட்ட கடன் சுமையான ஒன்பது இலட்சம் கோடி ரூபாயை அடியோடு இல்லாமல் செய்து இந்த நாட்டை அனைவரும் திரும்பிப் பார்க்க வைப்பாரென்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 5.10]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று பிரதேச அபிவிருத்தி அமைச்சுக்கான குறைநிரப்புப் பிரேரணை சமர்ப்பிக்கப்பட்டு விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கிறது. சரியான முறையிலே திட்டமிடுவதன்மூலம் பிராந்திய அபிவிருத்தியை மேற்கொள்ளக்கூடியதாக இருக்கும். இன்று இந்த நல்லாட்சியிலே ஒரு வருடம் கடந்தும் கூட அபிவிருத்தியானது மிக மந்த கதியிலே நடந்தாலும், எதிர்காலத்திலே சிறந்த திட்டமிடுதலுக்கான ஓர் அத்திவார மாக இதனை நான் கருதுகின்றேன். ஆகவே, இந்த நல்லாட்சி அரசாங்கமானது சரியான முறையிலே திட்டங் களைத் தயாரித்து அபிவிருத்திகளை மேற்கொள்ளவேண்டும்.

கடந்த அரசாங்கத்தினால் அம்பாறை மாவட்டத்திலே ஒலுவில் துறைமுகம் அமைக்கப்பட்டதன் காரணமாக எமது கடலோர வளங்கள் சின்னாபின்னமாக்கப்பட்டிருக்கின்றன. கடலோரப் பகுதிகளிலே பல ஆக்கிரமிப்புக்கள் இடம்பெற் றுள்ளன. அங்கே கடலரிப்பினால் மக்களின் வாழ்விடங்களும் வாழ்வாதாரங்களும் விவசாய நிலங்களும் பாதிப்புக்குள்ளாகி யிருக்கின்றன. விசேடமாக திருக்கோவில், கல்முனை, ஒலுவில், பொத்துவில் போன்ற பிரதேசங்களில் கடலரிப்பு நிகழ்ந்துகொண்டே இருக்கிறது. இதனால் விவசாய நிலங்கள் சூறையாடப்படுவதும் எமது வளமிக்க நிலங்கள் சின்னா பின்னமாக்கப்படுவதும் முக்கியமாகக் கூறவேண்டிய விடயமாகும். இந்தக் குறைநிரப்புப் பிரேரணையிலே அந்த இடங்களுக்குத் தேவையான நிதிகளை ஒதுக்கீடு செய்வதன் மூலம் கடலோர வளங்கள் பாதுகாக்கப்பட வேண்டுமென இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும் தோணிக்கல், பொத்தானை, டிப்போ மடு, கஞ்சிக்குடிச்சாறு, தங்கவேலாயுதபுரம் போன்ற பகுதிகளில் காலாகாலமாகப் பயிர் செய்துவந்த வளமிக்க விவசாயக் காணிகள் Forest Department இனால் சுவீகரிக்கப்பட்டு அத்துமீறி ஆக்கிரமிக்கப்படுகின்ற ஒரு சூழ்நிலை

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

காணப்படுகின்றது. இதனால் எமது விவசாயம் பாதிக்கப் படுகின்றது. இந்தச் செயற்பாட்டை இந்த நல்லாட்சி அரசாங்கமானது தடுத்து நிறுத்தவேண்டும். ஏனென்றால், இந்த நாட்டின் முதுகெலும்பாக இருக்கின்ற விவசாயத்தை இந்த அரசு முன்னேற்றவேண்டும். மேதகு ஜனாதிபதி அவர்கள் ஒரு விவசாயியின் மகனாக இருப்பதனால் விவசாயத்தைப் பற்றி அவர் நன்கு தெரிந்தவராக இருக்கின்றார். அவரது காலத்திலே எமது தமிழ் மக்களின் விவசாய நிலங்கள் சூறையாடப்படுவது மிகவும் மனவேதனைக்குரிய காரியமாகும். ஆகவே, இந்த நல்லாட்சி அரசானது இந்த ஏழை விவசாயிகளின் காணிகளை விடுவித்துக் கொடுக்கவேண்டும்.

முன்னாள் ஜனாதிபதி சந்திரிகா அம்மையார் அவர்களி னால் அத்தாட்சிப்பத்திரம், உறுதி மற்றும் அளிப்புக்கள் வழங்கப்பட்ட நிலையிலுள்ள 2587 ஏக்கர் காணிகள் சுவீகரிக் கப்படுகின்றன. இதனை உடனே தடுத்து நிறுத்தவேண்டும். திருக்கோவில், ஆலையடிவேம்பு, பொத்துவில் ஆகிய பிரதேசங்களுக்குட்பட்ட காணிகள் சுவீகரிக்கப்படுகின்ற அதேநேரம் லஹுகல, வக்குமுட்டியா போன்ற பிரதேசங்களில் உள்ள காணிகள் சுவீகரிக்கப்படாமல் அதிலே இனவேறுபாடு காட்டப்படுவது இந்த நல்லாட்சி அரசாங்கத்திற்குக் குந்த கத்தை விளைவிக்கின்ற ஒரு செயலாகுமென நான் கருதுகின்றேன். ஆகவே, இந்த நல்லாட்சி அரசாங்கமானது தமிழ் மக்களையும் அவர்களின் வளமிக்க விவசாய நிலங் களையும் கருத்திற்கொண்டு அவர்களுக்குரிய ஒரு தீர்வைச் சரியான முறையிலே வழங்கவேண்டுமெனக் கூறி, எனது உரையை முடிக்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.14]

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම වැය ශීර්ෂය පිළිබඳව යම් කිසි අදහසක් ඉදිරිපත් කිරීම සඳහා මට විනාඩි 8ක කාලයක් ලබාදීම පිළිබඳව මුලින්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මට තිබෙන කාලය විනාඩි 8ක් කියලා පැහැදිලි කිරීම පිළිබඳවත් මම ඔබතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඇත්ත වශයෙන්ම මෙම වියදම් දෙස බලනකොට අපට ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඕනෑම යහපාලන ආණ්ඩුවකට සාදාචාරාත්මකභාවයකුත්, ඒ වාගේම විනිවිදභාවයකුත් තිබිය යුතුයි කියා මා විශ්වාස කරනවා. නමුත්, මේ වියදම් දෙස බලනකොට ඇත්ත වශයෙන්ම මෙහි විනිවිදභාවයක් තිබෙනවාද, නැත්නම් සදාචාරාත්මකභාවයක් තිබෙනවාද කියන එක ගැන අපට ප්‍රශ්න කරන්න වෙනවා. තමුන්නාන්සේලා දන්නවා, ජනතාවට විශාල පීඩනයක් දීලා මේ ආණ්ඩුව බදු අය කරන බව. Belt එක තද්කරගන්න කියලා කියනවා, VAT එක වැඩි කරනවා කියලා කියනවා. මෙහෙම කරනකොට අපේ ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකාගේ පුනරාවර්තන වියදම්වලින් - recurrent expenditureවලින්- සියයට 93ක්ම යන්නේ එතුමාගේ වාහනය සඳහායි. VAT එක වැඩි කරන්න කියලා එක පැත්තකින් කියනවා. හැබැයි, රුපියල් මිලියන 70ක්, ඒ කියන්නේ පුනරාවර්තන වියදම්වලින් සියයට 93ක් යන්නේ එතුමාගේ වාහනය ගෙන්වීම සඳහායි. ඒක සාධාරණයිද, ඒක සදාචාරාත්මකද කියන එක අපි මේ යහපාලන ආණ්ඩුවෙන් ප්‍රශ්න කරන්න ඕනෑ.

තවත් මෙවැනි ප්‍රශ්නයක් තිබනෙවා. අපි මේ ආණ්ඩුවේ ඉතිහාසය දෙස බලමු. ගරු රවි කරුණානායක ඇමතිතුමාත් අද කථා කළා. හැබැයි, රවි කරුණානායක ඇමතිතුමාත් මෙහිදී යම් කිසි record එකක් තියලා තිබෙනවා. ඉතිහාසයට ගිහිල්ලා අය කරන බදු - එහෙම නැත්නම් retrospective taxes - ජනතාවගෙන් වැඩියෙන්ම අය කළ මුදල් ඇමති කියන record එක. ලංකාවේ නොවෙයි, ලෝක ඉතිහාසයේවත් ඒ විධියේ මුදල් ඇමති කෙනෙක් ඉඳලා නැහැ.

තමුන්නාන්සේලා දන්නවා, Super Gain Tax එක කියලා Tax එකක් දැම්ම බව. ඒ බද්දෙන් මොකක්ද කළේ? ඉතිහාසයට ගිහිල්ලා තමයි මේ උදව්ය බදු වැඩි කරන්නේ. ඒ වාගේම දැන් VAT එකත් ගේන්න හදනවා. VAT එක ගේන්න හදන්නේත් අද ඉඳලා ක්‍රියාත්මක විධියට නොවෙයි; හෙට ඉඳලා ක්‍රියාත්මක වන විධියට නොවෙයි. ඒක ගේන්න හදන්නේ ඉතිහාසයේ ඉඳලා ක්‍රියාත්මක වන විධියටයි. මේක යහ පාලනයක්ද, මෙහි සාදාචාරාත්මකභාවයක් තිබෙනවාද, මෙහි විනිවිදභාවයක් තිබෙනවාද කියලා අපි ඇත්ත වශයෙන්ම මෙතැනදී ප්‍රශ්න කරන්න ඕනෑ. වෙනත් රටක නම්, මුදල් ඇමතිවරයෙක් මේ විධියට හැසිරුණොත් ඒ මුදල් ඇමතිවරයා අස්වෙනවා. යහ පාලනයක් තිබෙන ආණ්ඩුවක මුදල් ඇමතිවරයෙක් නම් අස්වෙනවා. නමුත්, ඒ වගේ සම්ප්‍රදායක් ලංකාවේ නැහැ. මේ ආණ්ඩුවෙන් නම් අපට ඒ වගේ සම්ප්‍රදායක් බලාපොරොත්තු වෙන්න බැහැ කියලා මම විශ්වාස කරනවා.

ඉන් පසු ගරු සරත් අමුණුගම ඇමතිතුමාත් මේ වැය ශීර්ෂයට ඇතුළත් කළ යම් කිසි ඡේදයක් පිළිබඳව කථා කළා. ඇත්ත වශයෙන්ම ඒ යෝජනාව ඉදිරිපත් කළේ මමයි. ඒ යෝජනාව විතරක් නොවෙයි අපි ඉදිරිපත් කළේ. අපි තවත් යෝජනාවක් ඉදිරිපත් කළා. මුදල් ඇමතිවරයෙක් පත්කරනවා නම්, ඒ මුදල් ඇමතිවරයාගේ පිරිසිදුභාවයක්, නැත්නම් විශ්වාසවන්තභාවයක්, integrity එකක් තිබිය යුතුයි. මෙතැනදී නිකම් පිරිසිදුභාවයක් විතරක් නොවෙයි, perceived integrity භාවයක් තිබෙන්නට ඕනෑ. නිකම් විශ්වාසය විතරක් තිබ්ලා මදි, නිකම් අවංකභාවය විතරක් තිබ්ලා මදි, මුදල් ඇමතිතුමා කිසිම හොරකමක් කරන්නේ නැතුව කටයුතු කරනවාය කියලා ජනතාව යම් කිසි විධියකට විශ්වාස කරන්න ඕනෑ. නමුත්, මේ දවස්වල අපට TV එකෙන් දකින්න ලැබෙන්නේ මොකක්ද? මුදල් ඇමතිතුමා ගිහිල්ලා "හැරීට සල්ලි හම්බකරන්න පුළුවන් නම්, ධම්මිකට සල්ලි හම්බ කරන්න පුළුවන් නම්" වාගේ ප්‍රකාශ කරන කොට අපට යම් කිසි සාධාරණ සැකයක් ඇති වෙනවා කියන එක අපි කියන්න ඕනෑ. මෙතැනදී සමහර මන්ත්‍රීවරු bonded warehouse එකක් ගැන කිව්වා. මේ වගේ ප්‍රශ්න තිබෙන කොට ඇත්ත වශයෙන්ම විනිවිදභාවයකින් යුතුව කටයුතු කරනවාද කියන එක ගැන අපට ගැටලුවක් ඇතිවෙනවා.

මෙතැනදී තවත් ගැටලුවක් මතුවෙනවා. ඒ තමයි මේ රජයේ බදු ප්‍රතිපත්තිය පිළිබඳ ගැටලුව. අගමැතිතුමා අවුරුදු 5ක ආර්ථික ප්‍රතිපත්තිය ගැන පැය ගණනක් කථා කළා. ඒ ප්‍රතිපත්තියේ මොකක්ද තිබෙන්නේ? සෘජු බදුවලට යන්න ඕනෑ කියන එකයි එහි තිබෙන්නේ. බටහිර යුරෝපයේ සමහර රටවල් අරගෙන බැලුවොත්, ඔවුන් සෘජු බදුවලින් පොඩ්ඩක් ඉවත් වෙලා වක්‍ර බදුවලටයි යන්නේ. ඩෙන්මාර්කය, බෙල්ජියම වගේ රටවල සාමාන්‍යයෙන් වක්‍ර බදු සියයට 40කින්, 50කින් වැඩිවෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ගැටලුව, එක පැත්තකින් අගමැතිතුමා එක දෙයක් කියනවා;

හැබැයි මුදල් ඇමතිතුමා කරන්නේ තවත් දෙයක්. මේක යහපාලන ආණ්ඩුවක් කියලා මට නම් විශ්වාස කරන්න බැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැනත් අපි කථා කළ නිසා මා කියන්න කැමතියි, තවත් නාඩගමක් අපට ඉදිරියේදී බලා ගන්න පුළුවන් වෙනවාය කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙකු හැටියට මා, මගේ යෝජනා ටික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කළා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් යෝජනා ඉදිරිපත් කළා. සමහර යෝජනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුවෙන් ලබා ගැනීම පිළිබඳව මා සතුටු වෙනවා. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. Meetings අටකට විතර අපි සහභාගී වුණා. සාමාන්‍යයෙන් පැය දෙක හමාරක වාගේ කාලයක් තමයි එක meeting එකක් තිබෙන්නේ. මේ වාගේ සීමිත කාලයක් තුළ අපට ඇත්ත වශයෙන්ම හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න පුළුවන් කියලා මා විශ්වාස කරන්නේ නැහැ.

2013 අවුරුද්දේ වාගේ අයිස්ලන්තය අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනාවා. ඒකට "Crowdsourced Constitution" කියලායි කියන්නේ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මොකක්ද කරන්නේ? ජනතාවගේ අදහස් අරගෙන තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන්නේ. හැබැයි, සියලුම ජනතාවගේ අදහස් ලබාගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හදන්නත් බැහැ. "සෝලෝන්" කියන පුද්ගලයා තමයි ග්‍රීසියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදුවාය කියලා කියන්නේ. ඇමෙරිකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදනකොට තෝමස් ජෙෆර්සන්, හැමිල්ටන් වාගේ කීප දෙනායි එයට දායක වුණේ. අපිව ගොනාට අන්දලා, සුමන්තිරන් මන්ත්‍රීතුමායි, තවත් කීප දෙනෙකුයි එක්කාසුවෙලා, වෙනම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවාද කියලාත් ඉන් පස්සේ අපට ප්‍රශ්න කරන්න සිදු වෙනවා. ඒ, කෙසේ වෙතත් මේ රටේ ජනතාව රවටිටන එක නවත්වන්න. රටට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි. ඒ, කාරණය අපි පිළිගන්නවා. ඒ වෙනුවෙන් අපි අපේ අදහස් ලබා දෙන්න කැමැතියි. හැබැයි, සුමාන අටකින්, මාස දෙකකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න නොව, අවශ්‍ය කාලය අරගෙන ඉන් පස්සේ අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න ඕනෑ. මෙහෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන්න අපට හදිසියක් නැහැ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණු වැරදි නිසා තමයි අපට තවත් ප්‍රශ්න මතුවෙලා තිබෙන්නේ කියලා තමුන්නාන්සේලා දන්නවා. නොවැම්බර් මාසයට ඉස්සෙල්ලා draft එකක් දෙන්න ඕනෑ කියලා අපේ විදේශ කටයුතු ඇමතිතුමා කියනවා. සමහර උදවිය තවත් දේවල් කියනවා. ඇයි, මේ ඉක්මන? විදේශ රටවල අවශ්‍යතාවට අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදුවොත්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට වුණු දේම තමයි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු වෙන්නේත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා ආර්ථික විශ්ලේෂණයක් කරලා, වර්තමානයේ රට මොන පැත්තටද ගමන් කරන්නේ කියන එක කිව්වා. අපි හැම දාම එකම මොඩලය පාවිච්චි කරමින්, බටහිර රටවල් වාගේම World Bank එක, IMF එක කියන දේ කළොත් ඒකෙන් අපේ රටට විශාල සෙතක් වෙන්නේ නැහැ කියලා මා විශ්වාස කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
මට තව විනාඩියක් ලබා දෙන්න පුළුවන්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථා කරන්න.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ස්තුතියි. World Bank එක මොකක්ද කියන්නේ? World Bank එක කියනවා, "Privatize State-owned enterprises; maintain low inflation; reduce government bureaucracy; balance the budget; liberalize trade; deregulate foreign investment; deregulate capital markets; make the currency convertible; reduce corruptions and privatize pensions" කියා. මෙන්න මේ points 10 තමයි IMF එකයි, World Bank එකයි හැම දුප්පත් රටවලටම කියන්නේ. හැබැයි, ඒ රටවල් සංවර්ධනයවෙලා තිබෙන්නේ කොහොමද කියලා බැලුවොත්, ඒ රටවලට හරි සැලැස්මක් තිබුණු බව අපට පෙනෙනවා. එංගලන්තය සංවර්ධනය වනකොටත්, ඇමෙරිකාව සංවර්ධනය වන කොටත් විවෘත ආර්ථිකයක් ඔවුන් ගෙන ගියේ නැහැ. ජර්මනියත්, ජපානයත්, මෑතකදී සංවර්ධනය වුණු ආසියානු රටවලුත් සංවර්ධනය වනකොට මේ ආණ්ඩුව ගෙන යනවා වාගේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ගෙන ගියේ නැහැ. ඉතිහාසය කියවලා බැලුවොත් එහෙම අපට එම කාරණය පැහැදිලි වෙනවා.

ඇත්ත වශයෙන්ම මෙතැන තිබෙන්නේ වෙනත් කරුණක්. දැන් තිබෙන්නේ අපේ රටේ ජනතාවගේ අවශ්‍යතාවට හදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොවෙයි. අයිස්ලන්තය වාගේ රටේ ජනතාවගේ අවශ්‍යතාවට හදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කියලායි මෙතැනදී ඔවුන් පෙන්වන්න හදන්නේ. නමුත් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන්නේ බලය බෙදා දීමේ අරමුණයි. රටේ අවශ්‍යතාවට බලය බෙදා දෙනවාද එහෙම නැත්නම් බටහිර රටවල අවශ්‍යතාවට බලය බෙදා දෙනවාද කියන කාරණය තමයි අපට මෙතැනදී ප්‍රශ්න කරන්න සිදු වෙන්නේ. ඇත්ත වශයෙන්ම අවංකභාවයෙන් යුතුව මේ කටයුතු කළොත් මේ රටට හොඳ අනාගතයක් උදා වෙනවාය කියලා මා හිතනවා. නමුත් මේක bulldoze කරලා, ජනතාවට එක මතයක් ඉදිරිපත් කරලා, ඊට පස්සේ යටින් හංගලා ගහනවා නම් ඉන් විශාල ප්‍රශ්නයක් ඇති වෙනවාය කියලා මා හිතනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කෙසේ වෙතත් අපි ආර්ථිකය ගැන කථා කළොත්, අපේ රටේ ආර්ථික තත්ත්වය මොකක්ද කියලා අද ජනතාව හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා අපි මෙතැනට ඇවිල්ලා කොච්චර විවාද කළත් වැඩක් නැහැ. රුපියල් 1,000ක් අරගෙන පොළට ගියාම ඒ මුදලින් කොච්චර මුදලක් ඉතුරු වෙනවාද කියලා අද අපේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා මේ බොරුව හැමදාම කරන්න බැහැ. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" කියන එක අවුරුදු පහකට, අවුරුදු දහයකට හදන ව්‍යවස්ථාවක් නොවෙයි. මේක අවුරුදු තිහකට විතර හදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. සමහර වෙලාවට අවුරුදු තිහකින්, අවුරුදු හතළිහකින් නැවත අපට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමේ අවශ්‍යතාවක් ඇති වෙන්න පුළුවන්. මේ වේලාවේ අවුරුදු තිහක්, අවුරුදු හතළිහක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා නම්, අවංකව, විනිවිදභාවයකින් යුතුව, හැම කෙනාටම සාධාරණයක් වන ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සාදන ලෙස ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය නිම කරනවා.

[ප.ව. 5.25]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
කෞරව තලෙමිතාතුමා උරුප්පිනර් අවර්කළේ, පිරතේස අපිවිරුත්ති අමෙච්චින් කුරෙනිරප්පු මතිප්පීටු පත්‍රිය

[ගරු මඩිල්වාගමේ කිලකරාජා මහතා]

විවාදත්තිල් උරෙයාට්රුවතට්රකු වාය්ප්රලිත්තමෙක්කාක උංකළුක්කු නන්රි තෙරිවිත්තුක්කොළ්කින්රේන්. කුරිප්පාක ඉන්තප් පිරේරණෙ මීතාන විවාතම් ඉන්රු පාරාළුමන්රත්තිල් එටුත්තුක්කොළ්ළප්පටුවතේ ඔරු සිරප්පාන අම්සමෙන්රු නාන් නිනෙක්කින්රේන්. කාරණම්, ඒර්කෙනවේ ඉන්ත අමෙච්සුක්කු ඒර්පට්ට පල්වේරු සෙලවිනංකළ් මේතකු ජනාතිපති අවර්කළින් සෙලවිනත් තොකෙයිලිරුන්තේ මේර්කොළ්ළප් පට්ටිරුක්කින්රතු. ඉන්ත නිලෙයිල්, අතනෙ නිතියීට්ටම් සෙය්කින්ර වකෙයිල් පාරාළුමන්රත්තිල් අතර්කාන අනුමතියෙක් කෝරුකින්ර ඔරු පිරේරණෙයාක ඉන්තප් පිරේරණෙ අමෙන්තිරුක්කින්රතු. ඉන්තච් චන්තර්ප්පත්තිල් ඉංකේ එතිර්ක්කට්චි උරුප්පිනර්කළිනාල් ආර්රප්පට්රුකින්ර උරෙකළෙප් පාර්ක්කින්රවෝතු, කටන්ත කාලංකළිල් ඉත්තකෙය සෙලවිනංකළ් එව්වාරු මේර්කොළ්ළප්පට්ටන එන්පතෙ මීළ්පරීසීලනෙ සෙය්තු පාර්ක්කවේන්ටිය ඔරු කටප්පාටු කාණප්පටුකින්රතු. කටන්ත කාලංකළිලුම් ඉව්වාරාන පිරතේස අපිවිරුත්ති අමෙච්සුක්කළ් ඉරුන්තන. අන්ත අමෙච්සුක්කළුක්කාන නිතිකළ් එව්වාරු කෙයාළප් පට්ටන? අත්තකෙය මුරෙකළෝතු ඔප්පිට්ටුප් පාර්ක්කුම් පොළුතු ඉන්ත නල්ලාට්චියිලේ ඉව්වාරාන නටෙමුරෙකළ් පාරාළුමන්රත්තිර්කුච් චමර්ප්පික්කප්පට්ටු, විවාතික්කප්පට්ටු පාරාළුමන්රත්තින් අනුමති පෙරප්පට්ටු සෙලවිනංකළ් මේර්කොළ්ළප්පට වේන්ටුමෙන්ර එත්තනිප්පුක්කළ් වරවේර් කත් තක්කතාකක් කාණප්පටුකින්රතු.

1994ආම් ආන්ටු කාලප්පකුතියිල් අප්පෝතෙය ජනාතිපතියාක ඉරුන්ත චන්තිරිකා අම්මෙයාර් අවර්කළ්, තෝට්ටප්පකුතිකළිල් වීටමෙප්පතර්කෙන, අමරරාකිවිට්ට මලෙයක මක්කළ් මුන්නණියින් මුන්නාළ් තලෙවර් චන්තිරචේකරන් අවර්කළින් තලෙමෙයිලේ ඔර් අමෙච්චිනෙ උරුවාක්කිනාර්. අන්ත අමෙච්සු පින්නර් තෝට්ට උට්කට්ට මෙප්පු අමෙච්සු එනප් පෙයර් මාර්රම් චෙය්යප්පට්ටතු. ඉව්වාරු චෙයර්පට්ටුක්කොණ්ටිරුන්ත අව්වමෙච්සු 2005ආම් ආන්ටු මහින්ත රාජපක්ෂ අවර්කළ් ජනාතිපතියාකත් තෙරිවුචෙය්යප්පට්ටතන් පින්නර් පොතුවාක, තේස නිරුමාණ අමෙච්සු එන්ර අමෙච්චින් කීළ් ඔරු පකුතියාකක් කොණ්ටුවරප් පට්ටතු. පෙරුන්තෝට්ටප් පකුතිකළෙ අපිවිරුත්তි චෙය්වතර්කෙන, අංකේ වීටමෙප්පෙ උරුවාක්කුවතර්කෙන, අංකේ උට්කට්ටමෙප්පු වේලෙකළෙ මේර්කොළ්වතර්කෙන උරුවාක්කප්පට්ටිරුන්ත අන්ත අමෙච්සු පිටිප්පිටියාක මාර්රම් චෙය්යප්පට්ටු, ඉරුතියාක 2009ආම් ආන්ටු අත්තකෙය ඔර් අමෙච්චෙයේ ඉල්ලාමලාක්කිය ඔරු චූළ්නිලෙතාන් ඉන්ත නාට්ටිල් ඉරුන්තතු. පින්තങ්කිය මක්කළුක්කු අපිවිරුත්তි නටවටික්කෙකළෙ මේර්කොළ්වතර්කු අවචියමානතාක ඉරුන්ත ඔර් අමෙච්සු ඉල්ලාමල් චෙය්යප්පට්ට වරලාරුතාන් අන්තක් කාලත්තිලේ ඉරුන්තතු. අතර්කුප් පතිලාක, 'වටක්කින් වචන්තම්' එන්ර තිට්ටත්තෙ උරුවාක්කුකිරෝම්; 'කිළක්කින් උතයම්' එන්ර තිට්ටත්තෙ උරුවාක්කුකිරෝම්; 'පුපුතු වෙල්ලස්ස' එන්ර තිට්ටත්තෙ උරුවාක්කි ඌවාවෙ වළර්ච්චියටෙයච් චෙය්කිරෝම්; 'කන්තුරට්ට උතාන' එන්ර තිට්ටත්තෙ උරුවාක්කි මලෙනාට්ටෙ අපිවිරුත්ති චෙය්කිරෝමෙනක් කූරිනාර්කළ්. 'කන්තුරට්ට උතාන' එන්ර තිට්ටත්තින්කීළ් පෙරුන්තෝට්ට චමූකම් මේම්පටුත්තප්පටුමෙන්ර වාතත්තෙ මුන්වෙත්තු, අන්ත මක්කළුක්කාක උරුවාක්කප්පට්ටිරුන්ත අමෙච්චෙයේ ඉල්ලාමලාක්කියවර්කළ්තාන් ඉන්රු පිරතේස අපිවිරුත්ති අමෙච්සු චම්පන්තමාක පේසුකින්රාර්කළ්. අත්තකෙය අපිවිරුත්තිත් තිට්ටංකළින්කීළ්, වටක්කින් වචන්තත්තෙයෝ කිළක්කින් උතයත්තෙයෝ එංකළුක්කුක් කාණක්කිටෙක්ක විල්ලෙ; අතේපෝල මලෙනාට්ටිලුම් එන්ත එළුච්චියෙයුම් කාණක්කිටෙක්කවිල්ලෙ.

ආනාල්, අව්වාරු ඉල්ලාමල් චෙය්යප්පට්ට පෙරුන් තෝට්ට උට්කට්ටමෙප්පු අමෙච්චානතු ඉන්රු නල්ලාට්චි අරචාංකත්තින් කීළ් අන්ත මක්කළුක්කුප් පුතිය කිරාමංකළෙ උරුවාක්කුකින්ර අමෙච්චාක, මලෙනාට්ටු පුතිය කිරාමංකළ්, උට්කට්ටමෙප්පු වචතිකළ් මර්රුම් චමූතාය අපිවිරුත්ති අමෙච්සු එන්රු මේන්මෙප්පටුත්තප්පට්ට ඔරු තොලෙ නෝක්කුත් තිට්ටත්තෙ මුන්වෙක්කින්ර ඕර් අමෙච්චාක පුතිය වටිවත්තෝතු ඉයංකුකින්රතු; අතුවුම් ඔරු පිරතේස අපිවිරුත්ති අමෙච්සුතාන්. තෙර්කු අපිවිරුත්ති අමෙච්සු පෝන්රු වෙව්වේරු අමෙච්සුකළ් ඉප්පෝතු උරුවාක්කප් පට්ටිරුක්කින්රන. එනවේ, ඉන්ත පිරතේස අපිවිරුත්ති අමෙච්චින් වේලෙත්තිට්ටත්තිර්කාක ඉප්පොළුතු මුන්වෙක් කප්පට්ටිරුක්කින්ර චෙලවිනත්තුක්කාන තොකෙ විමර්චනත්තුක් කුට්පට්ටාලුම්කූට, අතර්කාන අංකීකාරත්තෙප් පෙරුවතර්කු අතුපර්රිප් පාරාළුමන්රත්තිල් විවාතික්කප්පට්ටු මුටිවෙටුප්ප තර්කාන ඔරු කලාචාරම් උරුවාක්කප්පට්ටිරුක්කින්රතු.

ඉතර්කු මුන්තිය අරචිල් පොරුළාතාර අපිවිරුත්ති අමෙච්සු ඔන්රෙ උරුවාක්කි වෛත්තුක්කොණ්ටු පාරාළු මන්ර උරුප්පිනර්කළුක්කු වළංකප්පටුකින්ර පන්මුකප්පටුත්තප් පට්ට නිතියිනෙක්කූට අතනූටාක මේර්කොළ්ළප්පට වේන්ටුමෙන්ර නිපන්තනෙ විතික්කප්පට්ටිරුන්ත කාලම්තාන් ඉරුන්තතු. අන්තක් කාලම් මාර්රප්පට්ටු ඉප්පොළුතු පාරාළුමන්ර උරුප්පිනර්කළුක්කු වළංකප්පටුකින්ර පන්මුකප්පටුත්තප්පට්ට වරවු චෙලවුත්තිට්ට නිතියිනෙක්කූට tender අරිවිත්තල් මූලමාක චෙලවිටප්පට වේන්ටුම් එන්ර නිති කෙයාළුකෙ මුරෙමෙයොන්රු කොණ්ටුවරප් පට්ටිරුක්කින්රතු. අන්තවකෙයිල් ඉතුපෝන්ර කුරෙනිරප්පුප් පිරේරණෙකළ් පාරාළුමන්රත්තිනූටාක නිරෙවේර්රප් පටුවතෙ නාංකළ් වරවේර්කින්රෝම්. අතේපෝල ඉන්තප් පිරතේස අපිවිරුත්ති අමෙච්සුම් අතනතු එතිර්කාල වේලෙත්තිට්ටංකළිලුම් එල්ලාප් පිරතේසංකළිලුම් අපිවිරුත්ති නටවටික්කෙකළෙ මුන්නෙටුප්පතර්කු නටවටික්කෙකළෙ මේර් කොළ්ළ වේන්ටුමෙන්රු කේට්ටුක්කොණ්ටු, ඉන්ත උරෙ යිනෙ ආර්රුවතර්කු වාය්ප්පළිත්තමෙක්කු මීන්ටුම් නන්රි කූරි, විටෙපෙරුකින්රේන්.

[අ.භා. 5.30]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කාරණා දෙකක් අද විවාදයට ලක් කෙරෙනවා. ප්‍රධාන වශයෙන්ම, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමාගේ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් මුදල් වෙන් කිරීම සඳහා විවාද කෙරෙනවා. ඒ වාගේම, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය පිළිබඳව සාකච්ඡා කරනවා.

මම මුලින්ම කියන්නට ඕනෑ, ප්‍රමාද වෙලා හෝ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට -අපේ ගරු අමාත්‍යතුමාට- ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කිරීම එක පැත්තකින් අගය කරන බව. මොකද, එහෙම නැත්නම්, මේ අවුරුද්ද එතුමාට ගත කරන්න සිද්ධ වෙන්නේ, ප්‍රතිපාදන නැති - ඇමතිකම ඇති අමාත්‍යාංශයක ඇමතිවරයෙක් හැටියටයි. වර්ෂය අවසාන වෙන්න කලින් හෝ එතුමාට ප්‍රතිපාදන වෙන් කිරීම වටින්නේ ඒක නිසායි.

එතුමාගේ අමාත්‍යාංශය ගැසට් කරන්නේ මේ අවුරුද්දේ මාර්තු මාසයේ 18 වැනිදා. හැබැයි, එතුමාට ඒ අමාත්‍යාංශය සඳහා ප්‍රතිපාදන ලබා ගන්න අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් වෙලා ඒක අනුමත වෙන්නේ මේ අවුරුද්දේ ජූලි මාසයේ 12

වැනිදා. අමාත්‍යාංශයක් ස්ථාපිත කරලා, ඒ අමාත්‍යාංශය සඳහා අවශ්‍ය පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ලබා දෙන්න මාස හතරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. ඒක අද තමයි පාර්ලිමේන්තුවේදී විවාදයට ගන්නේ. ඇමතිවරයෙක් හැටියට, - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යවරයා හැටියට- එතුමා මොකක්ද කරන්නේ? ඊළඟට බරපතළ ප්‍රශ්නය වෙන්නේ, අමාත්‍යවරයෙක් හැටියට එතුමාගේ තිබෙන වගකීමයි. මේ අවුරුද්ද අවසාන වෙන්න තව තිබෙන්නේ මාස තුනක් පමණයි. අද අපි මේ කාරණය ගැන කථා කරනවා, තව මාස දෙකකින් ඊළඟ අය වැය ඉදිරිපත් කරනවා. ඒ අය වැයෙන් එතුමාගේ අමාත්‍යාංශයට විධිමත් පරිදි මුදල් වෙන් කිරීමක් කෙරෙයි කියා මම විශ්වාස කරනවා. නමුත්, ඇමතිකම් හැදීමේ, ඇමතිකම් ක්‍රියාත්මක කිරීමේ විද්‍යාත්මක පදනමක් නොවෙයි, ඉතාමත්ම අවිධිමත් පදනමකුයි මෙහි තිබෙන්නේ. මම ඒකට සරල උදාහරණයක් කියන්නම්. මගේ මතකය නිවැරැදි නම්, තව කොටසක් අඩු වෙලා තමයි, මෙතුමාගේ මේ අමාත්‍යාංශය "ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය" බවට පත් වුණේ. "මධ්‍යම" කියලා හෝ මේකට එකතු වෙලා තව කොටසක් තිබුණා. [බාධා කිරීමක්] පස්සේ නැවත එකතු වුණාද?

පසු ගිය කාලයේ මේ රජයේ ඉඩම් අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු එම්.කේ.ඒ.බී.එස්. ගුණවර්ධන අමාත්‍යතුමා අභාවප්‍රාප්ත වුණා. ඒ ගැන අප කනගාටු වුණා. එතුමා වෙනුවෙන් ශෝක යෝජනා මේ සභාවේදී සිද්ධ වුණා. එතුමා කටයුතු කළ ඉඩම් විෂයත්, ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වාගේ රට පුරාම පැතිරුණු දැවැන්ත විෂයක්. දැන් ඒ ඉඩම් සම්බන්ධ විෂය ඉටු කරන්නේ කවුද? ඒ, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය සහ ඉඩම් අමාත්‍යතුමා හැටියට ජෝන් අමරතුංග ඇමතිතුමායි. රටේ දැවැන්ත විෂයන් ප්‍රමාණයක් වෙනුවෙන් එක ඇමතිතුමෙක් කටයුතු කරනවා.

මම මේ පැහැදිලි කරන්නේ මෙහි තිබෙන වෙනස්කම ගැනයි. මම දන්නේ නැහැ, සරත් ෆොන්සේකා මැතිතුමාගේ අමාත්‍යාංශය විෂයන් හැටියට කොයි ආකාරයට බෙදිලා තිබෙනවාද කියලා. නමුත්, අවුරුද්දකට ආසන්න කාලයක් යනතුරු එතුමාට ප්‍රතිපාදන වෙන් වෙන්නේ නැහැ. විෂයන් බෙදීමේ විද්‍යාත්මක ක්‍රමවේදයක් නොවෙයි මෙහි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිතුමා ඉන්නවා. එතුමා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා හැටියට කටයුතු කරනවා. විශ්වවිද්‍යාලයයි මහාමාර්ගයි ගත්තාම, "ෆැන්ටා සහ මඩගාර්ඩ්" වාගේ. එකම සම්බන්ධයයි මේ ක්ෂේත්‍ර දෙක අතර තිබෙන්නේ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ පාර අවහිර කරලා picket කරන කොට චිතරයි, මහාමාර්ග සහ විශ්වවිද්‍යාල සම්බන්ධ වෙන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශවල සම්බන්ධය තිබෙන්නේ ඔය කාරණයේදී චිතරයි. මහාමාර්ග - විශ්වවිද්‍යාල. පාරේ picket කළොත් චිතරයි ඒ අමාත්‍යාංශ දෙක සම්බන්ධ වෙන්නේ. ක්‍රිස්තියානි ආගමික කටයුතුයි, ඉඩම් අමාත්‍යාංශයයි, සංචාරක අමාත්‍යාංශයයි එක අමාත්‍යවරයකුට තිබෙනවා. එහෙම තිබෙන විට ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට ඉර පායන්නේ අද තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් පාර්ලිමේන්තු ඉතිහාසයේ අපි දැකපු ක්‍රියාවලියත් මේකම තමයි. අපි මීට කලින් මේ පාර්ලිමේන්තුවේදී දැක්කා කාර්ය භාරයක් නොමැති ඇමතිවරු. තේරෙන භාෂාවෙන් කියනවා නම් "වැඩක් නැති ඇමති" කියන එකනේ. අමාත්‍යාංශ නැති ඇමතිවරු, විෂයක් නැති ඇමතිවරු හිටියා. මට මතකයි මර්වින් සිල්වා මැතිතුමාත් මේ පාර්ලිමේන්තුවේ විෂයක් නැති ඇමතිවරයෙක් හැටියට හිටියා. ඒ නිසා එතුමා හිතා ගත්තා එතුමාට ඕනෑම තැනකට පනින්න පුළුවන්; ඕනෑම තැනක යන්න පුළුවන්; ඕනෑම අමාත්‍යාංශයක ඕනෑ දෙයක් කරන්න පුළුවන් කියලා. විෂයක් නැති ඇමතිකම තමයි විෂය. අදටත් ඒක එහෙමමනේ. මම කියන්නේ ඒකයි. මේක ඔබතුමන්ලාගේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. අමාත්‍යාංශ බෙදන විට මොකක් හරි විද්‍යාත්මක පදනමක් තිබිය යුතුයි. සම්බන්ධයක් නැති අමාත්‍යාංශ දුන්නාම ඒක ඒ අමාත්‍යවරුන්ටත් බරක්. පෞද්ගලිකවත් අපි ඒක දන්නවා.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වාගේ තැන්වල විමසුම් කරන විට සමහර අමාත්‍යවරුන්ගේ මැදිහත්වීම අවශ්‍යයි, විෂයක් හැටියට. එක ඇමතිවරයෙකුට ඒ විෂයය අධ්‍යයනය කරලා, තිබෙන ආයතන බලලා, ආයතනවල කටයුතු බලලා සොයා බලන්න තියා ඒ ආයතනවලට යන්නවත් වෙලාවක් නැහැ. මොකද, ඒවා ඒ තරමට පැතිරුණු ඒවායි. ගොඩක් ආයතන එක තැනක දෙකක ගොඩ ගැහිලා තිබෙනවා. මේක තමයි තිබෙන ගැටලුව. මොන පදනමකින්ද ඒ අමාත්‍යාංශවලට විෂයයන් වෙන් කිරීම, නම් කිරීම කර තිබෙන්නේ? ඒවාට එක ක්‍රියාවලියක් තිබිය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර රටවල අමාත්‍යාංශවල ඇමතිවරු මාරු වෙනවා, ඇමතිවරු පත් වෙනවා. නමුත් ඒ අමාත්‍යාංශය ස්ථිරයි. ඒ අමාත්‍යාංශවල නම් හැදිලා තිබෙන්නේම, විෂයයන් හැදිලා තිබෙන්නේම, ආයතන හැදිලා තිබෙන්නේම, මුදල් ප්‍රතිපාදන වෙන් වෙන්නේම යම්කිසි විද්‍යාත්මක පදනමක් අනුවයි. එතකොට ජනතාව ඒ ආයතනය දන්නවා; ඒ අමාත්‍යාංශය දන්නවා.

උදාහරණයක් විධියට අද අපි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සතොස ආයතනයේ විමසුම් කළා. ඒ ආයතනයේ සමහර ගනු - දෙනු ගැන අහන විට කිව්වා, ඒවා මීට කලින් සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට අයිතිව තිබුණේ, දැන් ඒ files සොයා ගන්න නැහැ කියලා. මොකද, ඒවා අස්ථානගත වෙලා. අමාත්‍යාංශ මාරු වෙන විට filesත් මාරු වෙනවා; නිලධාරිනුත් මාරු වෙනවා. එතකොට වෙන්නේ රාජ්‍ය ආයතනවල, රජයේ දෙපාර්තමේන්තුවල අඛණ්ඩතාව බිඳෙන එකයි. අඛණ්ඩතාව බිඳුණාම වගකීමත් බිඳෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක බරපතළ ප්‍රශ්නයක්.

ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමනි, මම ඔබතුමාගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් නොවෙයි කියන්නේ. පොදුවේම තිබෙන ගැටලුව ගැනයි මම කියන්නේ. ඒ විෂයයන් බෙදීමේදී සහ විෂයයන්වලට වගකීම බෙදීමේදී විද්‍යාත්මක බවක් තිබිය යුතුයි. මම පෞද්ගලිකවත් දන්නවා ගරු සරත් ෆොන්සේකා අමාත්‍යවරයා වාගේ කෙනෙක් විශාල කාර්ය භාරයක් කරන්නට පුළුවන් කෙනෙක් කියලා. නමුත් එතුමා වාගේ කෙනෙකුගේ කාර්ය භාරය අද සීමා වුණු ස්වභාවයක් තිබෙනවා. අද තමයි එතුමා පත්වීම ලබලා ප්‍රතිපාදන ලබන්නේ. ඒකෙන් පේන්නේ මෙහි තිබෙන අවිද්‍යාත්මක භාවය සහ සැලැස්මක් නැතිකමයි. සැලැස්මක් නැතිකමෙන් තමයි මේ අවුරුද්ද අවසාන වනතුරු ඔබතුමාගේ අමාත්‍යාංශයට ප්‍රතිපාදන වෙන් කරන්නට නොහැකි වුණේ. ප්‍රායෝගිකව අපි දන්නවා, අමාත්‍යාංශයක් හැදෙන්නේ අය වැයට පසුව නම් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරන්නේ මෙහෙම තමයි කියලා. ඒක නොවෙයි ගැටලුව. මේ ප්‍රතිපාදන වෙන් කරන්නට යන කාලය සම්බන්ධයෙනුයි ගැටලුව තිබෙන්නේ. මම මේ ප්‍රතිපාදනවල ස්වභාවය ගැන ටිකක් බැලුවා. ඒවායින් මොනවාවත් කරන්න පුළුවන් දෙයක් නම් නැහැයි කියලායි පේන්නේ. මේ වෙන් කිරීම් කරලා තිබෙන ආකාරය දිහා බැලුවාම අමාත්‍යාංශයකට තියා රජයේ දෙපාර්තමේන්තුවකට, රජයේ සාමාන්‍ය සංස්ථාවකට, මණ්ඩලයකටවත් කරන්න පුළුවන් දේවල් මේ අමාත්‍යාංශයට කරන්න පුළුවන් මට්ටමක් තියෙයිද කියලා මට හිතෙන්නේ නැහැ. ඒක ඔබතුමාට භාරයි. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, අවුරුද්දටම මෙවැනි තත්ත්වයක් නම් තිබෙන්නේ ඒකෙන් පේන්නේ නොහැකියාව වීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක සාමාන්‍යයෙන් අමතක වෙන්නට පුළුවන්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

දෙයක් නොවෙයි නේ. වෙන දෙයක් නම් අමතක වුණා කියන්න පුළුවන්. නමුත්, විෂයක් සහිත ඇමතිවරයෙක් නම් කරලා, ඒ අමාත්‍යාවරයාට අවශ්‍ය කරන ප්‍රතිපාදන වෙන් කරන්න මාස හතරක් ප්‍රමාද වෙලා තිබෙනවා නම් එය අමතක වීමක් කියා කියන්න බැහැ.

ගරු සරත් ෆොන්සේකා අමාත්‍යතුමනි, දැන් අපට අහන්න තිබෙන ප්‍රශ්නය තමයි ඔබතුමා ඇමතිවරයා හැටියට මේ මාස හතරේ මොනවාද කළේ කියන එක. ප්‍රතිපාදන වෙන් වන්නේ අද නම් ඔබතුමාට මේ මාස හතරේ කරන්න පුළුවන් වුණේ මොනවාද? ඇත්තටම ආණ්ඩුවක් හැටියට ඒ ගැන ඔබතුමන්ලා ලජ්ජාවට පත් වෙන්න ඕනෑ. මේකයි ඇත්ත කාරණාව. මම මේ ගැන වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ ප්‍රතිපාදන වෙන් වුණේ නැත්නම්, "විෂයක් ඇති, මුදල් නැති, අවුරුද්දක් සම්පූර්ණ වුණු ඇමති" කියා ඔබතුමා තව පොඩ්ඩෙන් වාර්තාවක් තියනවා. අද මේ ප්‍රතිපාදන වෙන්වීම නිසා ඔබතුමා ඒකෙන් බේරුණා. ඒක තමයි මට මේ ගැන කියන්න තිබෙන්නේ. මේ දුර්වලතාවෙන් පෙන්වන්නේ ආණ්ඩුවේ නොහැකියාව සහ නොසැලකිල්ලේ තරමයි. ඇමතිවරයෙකුට සලකන්නේ මෙහෙම නම්, අමාත්‍යාංශවලට සලකන්නේ මෙහෙම නම්, නිවාස දස ලක්ෂය, රැකියා දස ලක්ෂය, නිවාස පන්ලක්ෂය වැනි වැඩ පිළිවෙළවල් ගැන මොන කථාද? ඒවා අමාත්‍යාංශවලින් පල්ලෙහාට යන කටයුතු නේ.

අප දන්නවා, එක්සත් ජාතික පක්ෂයේ බොහෝ ඇමතිවරු, මන්ත්‍රීවරු පසු ගිය කාලයේ ඡන්ද ව්‍යාපාරය -මහ මැතිවරණය, ජනාධිපතිවරණය කියන සියල්ල- කළේ රැකියා දස ලක්ෂය පෙන්වලා බව. ඒ නිසා අද ඔබතුමන්ලාට ගමට යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. ඒ මොකද? "රැකියා දස ලක්ෂය කෝ?" කියා ජනතාව අහනවා. විශේෂයෙන් තරුණ තරුණියන් අහනවා, "අර අප කොඩි දමපු, රැස්වීම් තියපු, සාකච්ඡා කළ, කැන්වසින් ගිය රැකියා දස ලක්ෂයේ වැඩ පිළිවෙළ කෝ?" කියා. මොකද, ඒවා එහෙම වැඩ පිළිවෙළක් නැතිව, නිකම් උඩින් පෙන්වපු සටන් පාඨ. මේ විෂයයක් තිබෙන ඇමතිවරයෙකුට මුදල් වෙන් වෙන්නෙත් අද නිසා ඒවාට වැඩ පිළිවෙළක් නැති බව හොඳටම පෙනෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, අද මේ සාකච්ඡාවට ලක් වෙලා තිබෙන VAT එක සම්බන්ධයෙන් මම විශේෂයෙන් යමක් කියන්න ඕනෑ. ඔබතුමන්ලා VAT එක පනවලා යම් මුදලක් බලාපොරොත්තු වෙනවා නේ. නමුත්, ඔබතුමන්ලාට මා කියන්නේ VAT එක පනවන්නේ නැතිව, ඒ මුදල හොයන්න පුළුවන් ක්‍රම ඕනෑ තරම් තිබෙනවා කියායි. ඔබතුමන්ලා ඒ ක්‍රම ඔක්කොම අතහැරලා, ඒවා වෙනම විකුණලායි තිබෙන්නේ. මම උදාහරණයක් කියන්නම්. වාහන ලියා පදිංචි කරන කොට, වාහනයක වාර්ෂික බලපත්‍රය - ආදායම් බලපත්‍රය- ගන්න යන කොට වායු විමෝචන පරීක්ෂණය - දුම් test එක- කරන්න ඕනෑ. මේ විධියට බලපත්‍රය ගන්න, ගිය අවුරුද්දේ වාහන 568,000ක් පමණ ලියා පදිංචි කර තිබෙනවා. මේ පරීක්ෂණයෙන් එන ප්‍රතිපාදන ප්‍රමාණයෙන් ආණ්ඩුවට අහිමි වෙලා තිබෙන ප්‍රමාණය රුපියල් බිලියන 2.3ක් -මිලියන 2,300ක්- වෙනවා. මොකද, මේ කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන්නේ සියයට 10යි. ඒ කියන්නේ, ආණ්ඩුවට ලැබෙන ආදායම ලක්ෂ 202යි. ඉතිරි ටික ඔක්කොම යන්නේ කාටද? ඉතිරි සියලු මුදල් යන්නේ පෞද්ගලික සමාගමකටයි. ඒ වාගේම ඒ දුම් පරීක්ෂාව නිවැරදිව කෙරුවාද, නැද්ද කියා දන්නෙත් නැහැ. තැන් තැන්වල දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවලා තිබෙනවා. වාහනයක ආදායම් බලපත්‍රය ගන්න නම් අනිවාර්යයෙන්ම දුම් පරීක්ෂාව කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයෙක් කියලා ඔබතුමාගේ වාහනයටවත්, ඇමතිවරයෙකුගේ වාහනයටවත් නිකම් ආදායම් බලපත්‍රය ගන්න බැහැ. "ආදායම් බලපත්‍රය ගන්න නම් දුම් පරීක්ෂාව කර ගෙන එන්න" කියා කියනවා. දුම් පරීක්ෂාව කිරීම අනිවාර්යයි. පොඩි මැෂින් එකක් හයි කරලා මේ දුම් පරීක්ෂාව රජයෙන් කරනවා නම් අවුරුද්දකට රජයට රුපියල් මිලියන 2,300ක -බිලියන 2.3ක- ආදායමක් ලබා ගන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැන් මේ දුම් පරීක්ෂාවෙන් රජයට හම්බ වන්නේ රුපියල් ලක්ෂ 202යි. ඒ ඇයි? ලැබෙන මුදලින් සියයට දහයයි නේ, හම්බ වන්නේ. ඒ මුළු මුදලින් සියයට 90ක් පෞද්ගලික සමාගමකට යනවා. මේ කටයුත්ත දෙන්නෙක් දමලා රජයට කරන්න පුළුවන් වැඩක්. ඇයි ඒක නොකරන්නේ? මොකක්ද තිබෙන ප්‍රශ්නය? රජයට එන්න තිබෙන ආදායම එළියට යන්නයි, ජනතාවගෙන් ගන්න තිබෙන දේ බෙල්ල මිරිකලා ගන්නයි නේ, තමුන්නාන්සේලා පාරවල් හදා තිබෙන්නේ. ඒ නිසා මම කියන්නේ VAT එක ජනතාවගේ පිට පටවන්නේ නැතිව ඕනෑ නම් ආදායම් හොයන්න පුළුවන් ක්‍රම ඔබතුමන්ලාට තිබෙන බවයි. මොකද, මේ දුම් පරීක්ෂාව අනිවාර්යයෙන්ම කරන්න වෙනවා නේ. තමන්ට වාහනයක් තිබෙනවා නම්, ඒ වාහනයේ ආදායම් බලපත්‍රය ගන්න දුම් පරීක්ෂාව කර ගන්නම වෙනවා. ඇයි ඒක රජයෙන් නොකරන්නේ? ඒ මාර්ග ලිහා දමලායි තිබෙන්නේ. මම මේ කිව්වේ එක උදාහරණයක් විතරයි.

ඔබතුමන්ලා මැද පෙරදිග යන අභිංසක ජනතාවගෙනුත් නැවත වතාවක් මේ VAT එක එකතු කරන තත්ත්වයක් උදා කර තිබෙනවා. ඒ ගැන විවාද කරන කොට අපට ඒ ගැන තව සාකච්ඡා කරන්න පුළුවන්; සංශෝධන කරන්න පුළුවන්. මේ VAT එක දමලා ජනතාවගේ බෙල්ල මිරිකන්න එපා, රජයට ආදායම් ලබා ගන්න පුළුවන් ක්‍රම තිබෙනවා, ඒවා අතහැර තිබෙනවා කියන කාරණයයි මට අවධාරණය කළ යුතුව තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.45]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න විනාඩි 5ක පමණ කාලයක් තමයි තිබෙන්නේ, මන්ත්‍රීවරු වේලාව වැඩියෙන් පාවිච්චි කළ නිසා.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ -සරත් පොන්සේකා ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ- පරිපූරක ඇස්තමේන්තුවකටත් අනුමැතිය ලබා ගන්න තමයි අද මේ යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ. සාමාන්‍යයෙන් මේ විධියේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නේ ප්‍රායෝගිකව ඇතිවන ගැටලු නිසා. ඒවා නිරාකරණය කර ගෙන, ලබන අවුරුද්ද වෙන කොට සැලකිය යුතු වැඩ ප්‍රමාණයක් කරන්න පුළුවන් අමාත්‍යාංශයක් බවට මේ අමාත්‍යාංශය පත් කර ගැනීමේ හැකියාව අපට තිබෙනවා.

තව කාරණා කිහිපයක් පිළිබඳව අද කථා වුණා. රාජ්‍ය ආදායම පිළිබඳව, ඒ වාගේම ජීවන වියදම පිළිබඳවත් කථා වුණා. ජීවන වියදම පිළිබඳව සොයා බලන්න කමිටුවක් පිහිටුවා තිබෙනවා. එහි සාමාජිකයකු විධියට මම මේ කරුණ කියන්න කැමැතියි. බඩු මිල අඩුයි කියලා කවදාවත් මේ රටේ ජනතාව කියලාත් නැහැ. ඒ වාගේම විරුද්ධ පක්ෂයේ දේශපාලනඥයන් කියලාත් නැහැ. ඒක තමයි අපි විරුද්ධ පක්ෂයේ සිටිද්දීත් තිබුණු තත්ත්වය. මේ අවුරුද්දේ පසු ගිය මාස කිහිපය, පසු ගිය අවුරුද්ද සහ ඊට පෙර අවුරුද්දේ මේ මාස කිහිපය සමඟ සංසන්දනය කරන විට, ජීවන වියදමේ අඩුවීමක් තිබෙන බව පෙනෙනවා. අවශ්‍ය නම්, සාධක සහිතව ඒ කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව මට තිබෙනවා. නමුත් මට ඒ ගැන කියන්න වෙලාව නැහැ. අද මිල වැඩි වෙලා තිබෙන්නේ කුකුළු මස්වල පමණයි. අනෙක් බොහොමයක් ඒවායේ මිල අඩු වෙලා තිබෙනවා. ඒ අනුව, ජීවන වියදමේ අඩුවීමක් තමයි තිබෙන්නේ. අපි ඒක පිළිගත යුතු වෙනවා. මුදල් ඇමතිතුමා මේ වාර්තාව සියලු දෙනාට ලබා දෙනවා නම් වඩා හොඳයි කියලා මා හිතනවා. ඒ පිළිබඳව රජයට වගකීමක් තිබෙනවා. මොකද, මේ පිළිබඳව දැනුවත් කිරීමේ අඩු බවක් ජනමාධ්‍ය තුළත් තිබෙනවා. ඒ නිසා තමයි අපට මේ විධියට උත්තර දෙන්න වෙන්නේ. ඇත්තටම ජීවන වියදමේ වැඩිවීමක් නැහැ; අඩුවීමක් තිබෙන්නේ. සංඛ්‍යාලේඛන අනුව ලබා ගත් තොරතුරු අනුව තමයි මම ඒ කරුණු පැහැදිලි කළේ. ඒ වාගේම සංවර්ධනයේ නතරවීමකුත් නැහැ. මම ඒකත් පැහැදිලිව කියන්න ඕනෑ.

රජයක් බලයට පත් වුණාම සංවර්ධන වැඩ ක්‍රියාත්මක කරන්න සාමාන්‍යයෙන් අවුරුදු දෙකක්, තුනක් යනවා. දැන් මේ රජය නතර වෙලා තිබුණ සංවර්ධන වැඩ සියල්ලම පාහේ ආරම්භ කරලා තිබෙනවා. අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, ඒ වාගේම අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සියල්ලේම වැඩ නැවත ආරම්භ කරලා තිබෙනවා විතරක් නොවෙයි, අලුතින් සංවර්ධන වැඩ පටන් ගෙන තිබෙනවා. මාර්ග සංවර්ධනය ආසන මට්ටමින් නැවත ආරම්භ කිරීමක් තිබෙනවා. සෑම වසමකටම රුපියල් ලක්ෂ 10 බැගින් ලබා දීලා, විශාල සංවර්ධන ව්‍යාපෘතියක් රට තුළ ක්‍රියාත්මක වෙනවා.

ඒත් එක්කම මම කියන්න කැමැතියි, අධ්‍යාපනයටත් විශාල මුදලක් මේ වර්ෂය තුළ ලබා දීලා තිබෙන බව. අපි අධ්‍යාපනය වෙනුවෙන් ලොකු ආයෝජනයක් කරනවා. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයකු විධියට මම ඒ ගැන සතුටු වෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, දකුණු පළාත් සභාවේ ප්‍රාග්ධන වියදම් සඳහා වාර්ෂිකව රුපියල් මිලියන එක්දහස් තුන්සියයක් හෝ හාරසියයක් තමයි දිගින් දිගටම වෙන් වෙලා ආවේ. නමුත් මේ අවුරුද්දේ ඒ ප්‍රමාණය රුපියල් මිලියන 5,700 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒක ඉහළම තත්ත්වයක්. මේවා ගැන අපි කථා කරන්නේ නැහැ. ඒ නිසා හැම වේලාවේම "වැඩ කරන්නේ නැහැ, වැඩ කරන්නේ නැහැ" කියන්නේ නැතුව අපි ඇත්ත තත්ත්වය කථා කරන්න ඕනෑ. ඒ සියලුම වැඩ ආපසු පටන් ගෙන තිබෙනවා. ගම් මට්ටමින් ඇවිදිනකොට අපට පෙනෙනවා, නැවතත් පාරවල් හැදෙන්න පටන් ගන්නවා; වැව් ටික හැදෙන්න පටන් ගන්නවා; ඇළවල් ටික හැදෙන්න පටන් ගන්නවා. ආණ්ඩුවක් වෙනස් වුණාම කරුණු සමාලෝචනය කරන්න ටික දවසක් යනවා. ඒ වාගේම කරපු වැඩවල අඩු පාඩු සොයා බලන්න කාලයක් ගත වෙනවා. ඒ ගත වුණ කාලය තමයි ඒ තිබෙන්නේ. 1970, 1977, 1994, 2005 අවුරුදුවල සිදු වුණ හැම ආණ්ඩු වෙනසකදීම ඒ ප්‍රමාදය ඇති වුණා. හැබැයි, අනෙක් සියලු ආණ්ඩුවලට වඩා කලින් මේ රජය නැවතත් ඒ සංවර්ධන ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවාය කියන එක මා ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ එක්කම ආදායම් වැඩි කර ගැනීම සඳහා කටයුතු කර තිබෙනවා. සුරා බදු ආදායම විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒක අපට අහිමි වෙච්ච ආදායමක්. ඒක පසු ගිය ආණ්ඩුව කාලයේ අපට එකතු කර ගන්න බැරි වෙච්ච ආදායමක්. අද ඒවා එකතු කරගෙන තිබෙනවා. එහෙම නැතුව, මත්පැන් බොන එක අවුරුද්දක් ඇතුළත විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා නොවෙයි, මේ ආදායම වැඩි වුණේ. ඒ ආදායම ලබා ගැනීම සඳහා මුදල් ඇමතිතුමාත්, අමාත්‍යාංශයේ නිලධාරිනුත් ගත් ක්‍රියාමාර්ග අපි අගය කරන්න ඕනෑ. ඒ වාගේම තවත් විවිධ ක්ෂේත්‍රවලින් ආදායම් වැඩි කර ගෙන තිබෙනවා.

ජනතාවගේ පැත්තෙන් බැලුවත්, සහන කන්දරාවක් දීලා තිබෙනවා. ඒකත් අපි අමතක කරන්න හොඳ නැහැ. රුපියල් 10,000ක වැටුප් වැඩිවීමකින් පටන්ගෙන, විශ්‍රාම වැටුපේ වැඩිවීම, සමෘද්ධි සහනාධාරය දෙගුණයකට වඩා වැඩිවීම සිදුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඉන්ධන මිල විශාල වශයෙන් අඩු කරලා, කිරි පිටි මිල අඩු කරලා ලබා දුන් සහනයත් අපි සැලකිය යුතුයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. ඒ වාගේම, මේ රජය විශාල ආයෝජන රාශියක් රට තුළ ඇති කළා.

අද VAT සම්බන්ධව යෝජනාවක් තිබෙනවා. අපේ තාරක බාලසූරිය මන්ත්‍රීතුමා කිව්වා, ලෝකයේ බොහෝ රටවල් අවධානය යොමු කරන්නේ වක්‍ර බදු කෙරෙහි කියලා. නමුත්, සාමාන්‍ය මනුස්සයාගෙන් නැතුව, අය කළ යුතු නියම මනුස්සයාගෙන් බදු ගන්නවා නම්, අපි ඍජු බදුවලට තමයි යන්න ඕනෑ කියන එක මේ පාර්ලිමේන්තුවේදී අපි අනන්තවත් කථා කරලා තිබෙනවා. හිටපු ඇමතිවරයෙකු වන ඩිව් ගුණසේකර මහතා හැම දාම කියපු කථාවක් ඒක. වාසුදේව නානායක්කාර හිටපු ඇමතිතුමා හැම දාම කියපු කථාවක් තමයි, "ඍජු බදු අය කර ගන්න, ඒක තමයි රජයේ ප්‍රතිපත්තිය වෙන්න ඕනෑ" කියන එක. අද VAT බද්දට සංශෝධනයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒකට අපිත් යම් යම් යෝජනා ඉදිරිපත් කළා. අපිත් ඒකට සංශෝධන ඉදිරිපත් කළා. ඒ නිසා ඒ යෝජනාව ගෙනාපු ආකාරයෙන්ම නොවෙයි, ජනතාවට අවම බරක් දැනෙන ආකාරයට සංශෝධන සහිතව ක්‍රියාත්මක කරන්න, VAT බදු අය කරන්න අද තීන්දු කරලා තිබෙනවා.

බද්දක් පැනවීම හොඳයි කියන්න බැහැ. බද්දක් පැනෙව්වාම කාට හෝ අමාරුයි. ඒක අපි පිළිගන්නවා. හැබැයි, රාජ්‍ය ආදායම වැඩි කර ගන්න, අධ්‍යාපනයට වැඩියෙන් මුදල් වෙන් කරන්න බදු

[ගරු මහින්ද අමරවීර මහතා]

එකතු කර ගන්න වෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම ඉතිහාසයේ වැඩිම මුදලක් ඒ ක්ෂේත්‍රයට මේ කාලය තුළ වෙන් වෙලා තිබෙනවා. මේ කටයුතු කරන්න මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍යයි. ඒ සඳහා තිබෙන මනුස්සයාගෙන් අරගෙන, නැති මනුස්සයාට දීමේ වැඩ පිළිවෙළ තමයි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒක රජයක් විධියට ක්‍රියාත්මක කරනවාය කියන එකත් අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ.

අපට දැන් මහා ණය කන්දරාවක් ඉතුරු වෙලා තිබෙනවා. මෙච්චර කල් අපි දෙගොල්ලක් ආණ්ඩු කළා. අපි මාරුවෙන් මාරුවට ආණ්ඩු කළා. දැන් අපි දෙගොල්ල එකතු වෙලා ආණ්ඩු කරන්න පටන් ගෙන තිබෙනවා. මේ ජාතික ආණ්ඩු සංකල්පය අලුත් දෙයක්. මේ සංකල්පය පිළිබඳව ජනතාව තුළ පැහැදිලි වීමක් නැති බව අපි දන්නවා. මිනිසුන්ට "මොකක්ද මේ වුණේ" කියලා තවම හොයා ගන්න බැරි වෙලා. මේ සංකල්පය පිළිබඳව විවිධ මත, වැරදි මත ප්‍රචාරය කරලා. හැබැයි, ටික දවසක් යද්දී මිනිසුන්ට තේරෙයි, මේ ගෙන යන වැඩ පිළිවෙළ නිසා හොඳ ප්‍රතිඵලයක් තමයි රටට එන්නේ කියලා.

අපි වරින් වර, මාරුවෙන් මාරුවට අවුරුදු ගණනාවක් ආණ්ඩු කරලා තිබෙනවා. නමුත් අද වන විට අපට ඉතුරු වෙලා තිබෙන්නේ කෝටි නවලක්ෂ අනූදාහක ණය කන්දරාවක් පමණයි. එතකොට, අපි මේ රටේ දකින සුන්දර සංවර්ධනය, මේ ඇති වුණු සංවර්ධන ව්‍යාපෘතිවල අයිතිකාරයෝ වෙලා තිබෙන්නේ විදේශීය රටවල්. අපි විදේශීය රටවලට ණය වෙලා තමයි මේ සංවර්ධනය ගෙනැල්ලා තිබෙන්නේ. එහෙම නම් අපි මේ ණය ප්‍රමාණය අඩු කර ගෙන, වැඩි සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි කියන එක තමයි මා විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය සීමා වෙලා තිබෙන නිසා මා මීට වැඩිය කථා කරන්නේ නැහැ. මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩපමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Gnanamuthu Srineshan. You have six minutes.

[பி.ப. 5.52]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் பிரதேச அபிவிருத்தி அமைச்சுக்கான குறை நிரப்புத் தொகை தொடர்பான பிரேரணை மீது மிகக் குறைந்த நேரத்தில் உரையாற்ற வேண்டிய நிர்ப்பந்தத்தில் இருக்கிறேன். நல்லாட்சி அரசாங்கத்தின் ஒரு வருட பூர்த்தி கொண்டாடப் பட்ட நிலையில் வடக்கு, கிழக்கில் எந்தளவுக்கு அபிவிருத்தி செய்யப்பட்டிருக்கின்றது? அதிலும் குறிப்பாக நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்தில் அபிவிருத்தி எந்தளவில் இருக்கின்றது? என்பது பற்றி மிகக் குறுகிய உரையொன்றினை வழங்கலாமென்று நினைக் கின்றேன்.

கடந்த 2015ஆம் ஆண்டில் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத் திட்டத்தின்போது கௌரவ நிதி அமைச்சர் அவர்கள் சில வாக்குறுதிகளை அளித்திருந்தார். அதனை நான் நினைவுபடுத்த விரும்புகின்றேன். வடக்கு, கிழக்கு மாகாணங் களைப் பொறுத்தமட்டில் யுத்தத்துக்கு முற்பட்ட காலத்திலும் யுத்த காலத்திலும் இயங்கி வந்த தொழிற்சாலைகள் தற்போது பூச்சிய நிலையில் இருக்கின்ற ஒரு நிலைமை காணப்படு கின்றது. அதுமட்டுமல்லாமல், நிலங்கள் துண்டுபட்டு இணைக்கப்படாத நிலையில் நீர்நிலைகளால் பிரிக்கப் பட்டிருக்கின்ற நிலைமையும் காணப்பட்டன. இதுதொடர்பாக நாங்கள் சில விடயங்களைப் பிரஸ்தாபித்தபோது கடந்த வரவு செலவுத் திட்டத்தின்போது உரையாற்றிய கௌரவ நிதி அமைச்சர் அவர்கள் நான்கு பாலங்களை அமைத்துத் தருவதாகவும் இரண்டு தொழிற்சாலைகளை இயங்கவைத்துத் தருவதாகவும் உத்தரவாதமளித்திருந்தார்.

அவர் குறிப்பிட்ட இரண்டு தொழிற்சாலைகளில் ஒன்று வாழைச்சேனையில் அமைந்திருக்கின்ற காகிதத் தொழிற் சாலையாகும், இந்தத் தொழிற்சாலை நீண்ட காலமாக இயங்கிவந்தது, இதில் ஆயிரக்கணக்கான தொழிலாளர்கள் தொழில்புரிந்தார்கள், இதன்மூலமாக 10,000க்கு மேற்பட்ட பயனாளிகள் பயனடையக்கூடிய விதத்தில் இது அமைந் திருந்தது, ஆனால், இன்று இந்தத் தொழிற்சாலையை மீள ஆரம்பிப்பதற்கான ஆரம்ப செயற்பாடுகள் - ஆரம்ப முன்னெடுப்புகள் எதுவும் செய்யப்படாத நிலையில், அதன் அமைவிடத்தை வேறு தேவைக்காகப் பயன்படுத்துகின்ற ஒரு போக்கினையும் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இது அந்தப் பிரதேச மக்கள் மத்தியில் மிகவும் வேதனையான ஒரு நிகழ்வாகப் பதிவு செய்யப்பட்டிருக்கின்றது. எனவே, இந்த அரசாங்கத்தின் ஒருவருட காலம் பூர்த்தியடைந்த இவ்வேளை யிலாவது அந்தத் தொழிற்சாலையை மீண்டும் உயிர்ப்பூட்டி அதனை இயங்கச்செய்து அதில் அங்குள்ள மக்கள் பணியாற்றக்கூடிய வாய்ப்பினை ஏற்படுத்திக் கொடுக்க வேண்டும் என்பதை மீள்பார்வையினூடாக அமைச்சர் அவர்களுக்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன். குறிப்பாக, கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர் கௌரவ றிஸாட் பதியுதீன் அவர்கள் இந்த விடயத்தில் கூடுதலான கவனம் செலுத்தவேண்டும். மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்கள் என்றவகையில், நாங்கள் மூவரும் சென்று அவரிடம் இதுபற்றிக் கூறியிருந்தோம். எனினும், இதற்கான ஆரம்ப வேலைகள்கூட ஆரம்பிக்கப்படாத நிலையில் காணப்படுவது எங்களுக்கு ஒரு வகையில் வேதனை அளிக்கின்ற சம்பவமாக அமைந்திருக் கின்றது. அதுமட்டுமல்லாமல், மண்டூரில் இயங்கிவந்த ஓட்டுத் தொழிற்சாலை இன்று நிர்மூலமாக்கப்பட்ட நிலையில் காணப்படுகின்றது. அதனையும் இயங்கவைத்துத் தருவதாக உத்தரவாதம் அளிக்கப்பட்டது. எனினும், அதுவும் அப்படியே இருக்கின்றது.

உண்மையிலே கௌரவ அமைச்சர் லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள் முற்போக்கான ஒரு செயற்பாட்டில் ஈடுபட்டிருக் கின்றார். அதாவது, வீதிகள் அமைக்கின்ற விடயத்தில் ஆளும் கட்சி, எதிர்க்கட்சி என்ற பேதமில்லாமல், எதிர்க்கட்சிகளைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களுக்கும் 60 மில்லியன் ரூபாயை ஒதுக்கித் தந்திருக்கிறார், இதையும்விட, roads with interlock paving blocks க்கு 5 மில்லியன் ரூபாயை ஒதுக்கித் தந்திருக்கிறார். ஆகவே, பேதமில்லாமல் மற்றவர்களுக்கு உதவி செய்கின்ற இவருடைய மனப்பாங்கினை நான் பாராட்டுகின்றேன். நல்ல விடயங்களைப் பாராட்டுவதும் நல்லவையல்லாத விடயங்களைச் சுட்டிக்காட்டுவதன்மூலமாக அவற்றை நிறைவேற்றுவதற்குரிய வழி வகையினைச் செய்வதும் எமது கடமையாகும். கௌரவ லக்ஷ்மன் கிரிஎல்ல அவர்கள், வீதி அபிவிருத்தி மற்றும் தொழில்வாய்ப்பு

තොටර්පිල් එංගලුටෙය කරුත්තුක්කලුක්කුම් සෙවිසාය්ත්තු කෙළරවමාන මුරෙයිල් අණුකිච් සෙයර්පට්ටමෙයෙයිට්ටු අවරුක්කු මීණ්ටුම් පාරාට්ටුක්කළෛත් තෙරිවිත්තුක්කොළ් කින්රේන්. අතේවේළෛ, ඉන්ත ආණ්ටිල් ඔරු පාලත්තෛ අමෛත්තුත් තරුවතාක අවර් එංගළුක්කු උත්තරවාතම් අළිත්තිරුක්කින්රාර්. නිච්චයමාක, අවර් අන්තප් පාලත්තිනෛ අමෛප්පතර්කුරිය සෙයර්පාට්ටිනෛ මුන්නෙටුප්පාර් එන්රු නාන් නිනෛක්කින්රේන්.

අතේවේළෛ, එනක්කුරිය මිකක් කුරෛන්ත නේරත්තිල් නාන් ඉන්නුමොරු මුක්කිය විටයත්තෛයුම් කූරියාක වේණ්ටුම්. අතාවතු, කිළිනොච්චියිල් ඔරු සන්තෛක් කට්ටිටත්තොකුති එරින්ත නිලෛයිල්, 120ක්කුම් මේර්පට්ට කටෛකළ් තීක්කිරෛ යාක්කප්පට්ටිරුක්කින්රන. අවර්රෛයුම් මික විරෛවාකප් පුනරමෛත්තුක් කොටුක්කවේණ්ටිය පොරුප්පු ඉන්ත නල්ලාට්චි අරචාංකත්තුක්කු ඉරුක්කින්රතු එන්පතෛත් තෙරිවිත් තුක්කොළ්කින්රේන්. තර්පෝතෛය නිලෛයිල් පිරාන්තිය අපිවිරුත්ති, මේර්කු අපිවිරුත්ති, තෙර්කු අපිවිරුත්ති, වටමේල් අපිවිරුත්ති එන්රෙල්ලාම් අමෛච්චුකළ් ඉරුක්කින්ර පෝතු, යුත්තත්තිනාල් පාතික්කප්පට්ට වටක්කු, කිළක්කු මාකාණංකළින් අපිවිරුත්තික්කාක ඒන් ඕර් අමෛච්චිනෛ ඒර්පටුත්තමුටියාතු? එන්ර කේල්වියෛයුම් නාන් ඉන්ත ඉටත්තිල් කේට්ටුක්කොළ්කින්රේන්. ආකවේ, එංගළතු පිරතේච අපිවිරුත්ති පර්රිය විටයත්තිල් කාණප්පටුකින්ර පින්නටෛ විනෛ ඉන්ත නල්ලාට්චි අරචාංකත්තින් මූලමාකත් තුරිතමාකච් චීර්චෙය්තු, පාතික්කප්පට්ට මක්කළුක්කුත් තෙම්පූට්ටුමාරු කූරි, අමර්කින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
තීළහට, ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.58]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උතයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ මට විනාඩි 8ක කාලයක් තිබුණා කියලායි. නමුත් දැන් මට කාලය හරස් වෙලා තිබෙනවා. අද දවසේ දී ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගේ පරිපූරක ඇස්තමේන්තු ගැනත්, ඒ වාගේම විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත්, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය පිළිබඳවත් සාකච්ඡා කරන මේ අවස්ථාවේදී වැදගත්ම කාරණා කිහිපයක් පිළිබඳව සඳහන් කරන්න කැමැතියි. මෙහි කරුණුවල සංඛ්‍යාත්මක අගය පිළිබඳ සාකච්ඡාවකට වඩා, මේ ඇති වෙලා තිබෙන දේශපාලන තත්ත්වය පිළිබඳව මේ පාර්ලිමේන්තුවට මගේ පෞද්ගලික අදහස ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මම 2004 සිට 2010 දක්වා පාර්ලිමේන්තුවේ ඉන්න කාලයේදී ජනරල් සරත් ෆොන්සේකා මැතිතුමා ගැන මගේ හිතේ තිබුණු චිත්‍රය නොවෙයි, අද මම මේ පාර්ලිමේන්තුවේදී කථා කරන කොට ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා සම්බන්ධයෙන් තිබෙන්නේ. එතුමා එක වෙලාවක යුද සෙන්පතියෙක්, යුද වීරයෙක්. යුද්ධ කරපු නායකයෙක්. යුද්ධය මෙහෙයවපු නායකයෙක්. හිටපු යුද හමුදාපති මේජර් ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා පිළිබඳව මුළු රටේම ජනතාවගේ ඉතා ඉහළ අගයක් තිබුණා. මම ඊයේ රාත්‍රී විකාශනය වූ "දෙරණ 360" වැඩසටහන බැලුවා. එහිදී විශ්‍රාමික මේජර් ජනරාල් කමල් ගුණරත්න මහත්මයා ඒ වැඩසටහනට ඇවිල්ලා තමන් නායකත්වය දුන්න 53වැනි සේනාංකය නන්දිකඩාල් කලපුවෙන් යුද්ධය අවසන් කරපු හැටි පිළිබඳව ඉතා මනරම් විග්‍රහයක් කළා. නමුත් ඒ යුද්ධයට නායකත්වය දුන් කෙනෙක් හැටියට සරත් ෆොන්සේකා මැතිතුමා අද ඉන්න තැන ගැන හරිම දුකක් හදවතේ තිබෙනවා. මම එකක් කියන්නට ඕනෑ. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාට අද අවශ්‍ය වෙලා තිබෙන්නේ කුමක්ද? එතුමා හීලෑ පක්ෂයක් හදාගෙන තිබෙනවා. අද හීලෑ විපක්ෂයකුත් හදාගෙන තිබෙනවා. අද මොකක්ද තිබෙන්නේ? හීලෑ පක්ෂයේ හඬ තිබෙනවාද? නැහැ. හීලෑ පක්ෂයේ පාටක් තිබෙනවාද, වර්ණයක් තිබෙනවාද? නැහැ. මහින්ද අමරවීර ඇමතිතුමා කථා කරන කොට හඬ නැහැ; වර්ණයක් නැහැ; හැඩයක් නැහැ; හඬ බාලයි. හීලෑ විපක්ෂයේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරන කොට හඬක් නැහැ; පාලනය අඩුයි; සැර නැහැ; සද්දේ මදි. ඇයි එහෙම වෙලා තිබෙන්නේ? හීලෑ පක්ෂයකුයි, හීලෑ විපක්ෂයකුයි තිබෙන නිසා. හැබැයි, හීලෑ නොවන සැබෑ විපක්ෂය කථා කරන එක නවත්වන්න තමුන්නාන්සේලාට කරන්න පුළුවන් සෑම දෙයක්ම කරලායි තිබෙන්නේ.

FCID, අර CID, මේ CID එකට අරගෙන ගිහිල්ලා විපක්ෂයේ ඔක්කෝම හඬවල් නිහඬ කරන්න සැලසුම් කරලා තිබෙනවා. ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා ඇමතිතුමනි, තමුන්නාන්සේගේ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය දිහා බලන්න කෝ. මොකක්ද මේ තිබෙන්නේ? හීලෑ පක්ෂයටයි, හීලෑ විපක්ෂයටයි වරප්‍රසාද. හීලෑ විපක්ෂයට තනතුරු වරප්‍රසාද. හීලා පක්ෂයේ ඉන්න තමුන්නාන්සේලාට ඇමතිකම්, වරප්‍රසාද. තමුන්නාන්සේගේ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය දිහා බලන්න කෝ. අය වැය ඉදිරිපත් කරන්න මාස කීපයකට කලින් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට දීලා තිබෙන වරප්‍රසාද ටික බලන්න. ලක්ෂ 5,000යි. තමුන්නාන්සේ අරගෙන තිබුණෙත් ඡන්ද 5,000යි. ලක්ෂ 5,000යි; ඡන්ද 5,000යි. ඡන්ද 5,000ට මාස තුනට ලක්ෂ 5,000යි. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් කීයද? ලක්ෂ 4,694යි. තමුන්නාන්සේගේ මූලධන වියදම් කීයද? ලක්ෂ 1,235යි. මේකේ එකතුව ලක්ෂ 5,929යි. මෙයින් ලක්ෂ 90ක්ම තමුන්නාන්සේගේ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ කුලිය වශයෙන් ඉතිරි මාස කිහිපය සඳහා වෙන් වෙනවා. තමුන්නාන්සේගේ වාහනයට ඒකෙන් ලක්ෂ 700ක් වෙන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට මේකේ තත්ත්වය පේනවා නේද? වරප්‍රසාද දීලා, අල්ලස් දීලා අරගෙන යන ආණ්ඩුවක් එක පැත්තකින් තිබෙනවා. අනෙක් පැත්තෙන් හීලෑ වෙච්ච විපක්ෂයක් ඉන්නවා. ආර්. සම්පන්දන් විපක්ෂ නායකතුමා අද කථා කරන්නේ මොනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පත්ම උතයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ජනතා විමුක්ති පෙරමුණ අද කථා කරන්නේ මොනවාද? අද ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරද්දී මොනවාද කිව්වේ? "සරත් ෆොන්සේකා මැතිතුමාට විශාල කාර්යයක් කරන්න පුළුවන්" කියලා එතුමා කිව්වා. නමුත්, මේක ඇතුළෙන් කප්පම් දීලා, වරප්‍රසාද දීලා ගොඩනඟන ආණ්ඩුවේ ඉදිරි අනාගත පැවැත්ම පිළිබඳව එතුමන්ලාට කිසිම විශ්වාසයක් නැහැ. එක පැත්තකින් බෙදුම්වාදීන්ට කප්පම් දෙන, අපේ රණවිරුවන් දඩයම් කරන ගමනක් යනවා. සරත් ෆොන්සේකා මැතිතුමනි, මෙතැනදී ඔබතුමාගේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරෙන්නේ නැද්ද? අපේ

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

රණවිරුවන් දං ගෙඩියට දක්කන කොට තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරෙන්නේ නැද්ද? අපේ බුද්ධි අංශ නිලධාරින් දං ගෙඩියට දක්කන කොට තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරෙන්නේ නැද්ද? උතුරු - නැඟෙනහිර තිබෙන හමුදා කඳවුරු ඉවත් කරලා, ඒ ඉඩම් ටික අල්ලා ගන්න කොට තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරෙන්නේ නැද්ද? තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරෙන්නේ නැහැ. හැබැයි, එදා හිටිය යුද හමුදාපති සරත් ෆොන්සේකාගේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරුණා. මෙදා තමුන්නාන්සේ මියැදිලා. මියැදිච්ච නිසා ඇමතිකම්, වරප්‍රසාදවලට තමුන්නාන්සේ යට වෙලා. වරදානවලට යට වෙලා. ඒ නිසා තමුන්නාන්සේගේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරෙන්නේ නැහැ. ජාතියට වෙන විපත ගැන, රටට වෙන විපත ගැන හීලෑ විපක්ෂයේ හෘදය සාක්ෂිය ප්‍රශ්න කෙරෙන්නේ නැහැ. මේ ආණ්ඩුව අපේ රණවිරුවන් දං ගෙඩියට දක්කන, එල්ටීටීඊ සිරකරුවන් නිදහස් කරන, බෙදුම්වාදීන්ට කප්පම් දෙන ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. මංගල සමරවීර මැතිතුමා ඒ නිසා තමයි උතුරට ගිහිල්ලා කිව්වේ, ළඟදීම අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් එනවා කියලා. බෑන් කී මූන් ලංකාවට ඇවිල්ලා කියන්නේ ඒකයි. රට බෙදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනැල්ලා සිංහල, දෙමළ, මුස්ලිම් ජනවර්ග හැටියටත්, ආගම් හැටියටත් රට බෙදන ක්‍රියාවලියකට මේ ආණ්ඩුව රැගෙන යමිනුයි තිබෙන්නේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට අවශ්‍යයි, සන්තෝසම්, වරදාන, වරප්‍රසාද දීලා හරි ඔබතුමන්ලා මෙතැන නියාගන්න. ඔබතුමාගේ මේ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ඇත්තම නාමය මට නම් හිතෙන්නේ "වෛරය, ක්‍රෝධය, පළිගැනීම වැපිරීමේ අමාත්‍යාංශය" කියලායි. ගරු සරත් ෆොන්සේකා මැතිතුමනි, ඔබතුමාට දුන්නේ ඒ අමාත්‍යාංශයේ ඇමතිකමයි. ඒ නිසා ඔබතුමා ඇමතිකම කරන්න. මහින්ද රාජපක්ෂ මැතිතුමාට පුළුවන් තරම් ගහන්න. සඳුන් ගසක් කපන්න, කපන්න සුවඳ හමනවා වාගේ, මහින්ද රාජපක්ෂ මහත්මයාට ගහන්න ගහන්න එතුමා ශක්තිමත් වෙනවා. අපි එතුමා එක්ක ඉදිරියටත් මේ රටේ දේශපාලනය කරනවා කියන එකත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමා කථා කරන්න.

[අ.භා. 6.04]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Regional Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා කෑ ගහපු හැටියට මම හිතුවා, නැවත ඉස්පිරිතාලයට ගිහින් තව bypass සැත්කමක් කරන්න වෙයි කියලා. එතුමා අනුනවයෙන් බේරුණා. අපිට තව පොඩ්ඩෙන් මෙතැනට ambulance එකක් ගෙනෙන්න වෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නැහැ, අවශ්‍ය නැහැ.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
දැන් ඔබතුමා වාඩි වෙලා මේ කියන ටිකත් අහගන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අහගෙන ඉන්නේ.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
අංක ඉලක්කම් තේරෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අමාත්‍යාංශයට කාර්ය මණ්ඩලය ඔක්කෝම 459ක් යෝජනා වෙලා තිබෙනවා. ඒකෙන් සියයට 50ක් දැනටමත් අනුමත වෙලා තිබෙනවා. ඉදිරි කාලයේදී ඉතිරි කොටසත් අනුමත කරගන්න අපි උත්සාහ ගන්න නිසා ඒකට අවශ්‍ය ඉඩ කඩ, යාන වාහන, ගොඩනැඟිලි ආදිය වෙන් කර ගැනීමට අපි මේ දිනවල ක්‍රියා කරමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් හා ගණන් ගැන අවබෝධයක් නැතුව මන්ත්‍රීවරු කීප දෙනෙකු අද නොයෙක් කථා කිව්වා. ඒ කථා මම අහගෙන හිටියා. ඒ කථා කළ සමහර මන්ත්‍රීවරු ප්‍රාදේශීය සභාවෙන් තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ප්‍රාදේශීය සභාවේ තුට්ටු දෙකේ මුදල් අත ගගා ඉඳලා, රුපියල් 10 - 15 පගා ගාලා, මෙතැන රුපියල් මිලියන 400, 500 ගැන කථා කරන කොට ඒවා ටිකක් අවබෝධ කර ගැනීමේ දුෂ්කරතාවක් ඒ අයට තිබෙනවා.

ඊළඟට මගේ හිතවතා, මගේ සුවජාත මිත්‍රයා වන සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කළා. එතුමා හැම දාමත් ඇත්ත කථා කරන කෙනෙක්. එතුමා කිව්ව හුඟක් දේවල් ඇත්ත. එතුමා හෘදය සාක්ෂියට එකඟව කථා කළා. නමුත්, එතුමා කියපු දේවල්වලට මම යමක් එකතු කරන්න කැමැතියි.

අපි ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට පරිපූරක ඇස්තමේන්තුවෙන් රුපියල් 592,925,000ක මුදලක් ඉල්ලා තිබෙනවා. ඇත්තටම මේක අමාත්‍යාංශයේ වැඩ කිරීම සඳහා වෙන් වන මුදලක් නොවෙයි. මෙම අමාත්‍යාංශය යටතේ දැනට ආයතනයක් හැටියට පවතින්නේ, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ තිබිලා අපට පවරපු "හදබිම අධිකාරිය" පමණයි. එතකොට මෙම අමාත්‍යාංශයට මේ කාලය තුළ වැඩ කිරීමට හැකියාවක් ලැබුණේ සහ මේ වසරේ ඉතුරු කොටසෙත් අපට වැඩ කරන්න ඉතුරු වෙලා තිබෙන්නේත් හදබිම අධිකාරියට වෙන් කරපු රුපියල් මිලියන 70 පමණයි. ඒක මම පැහැදිලි කරන්න කැමැතියි. ඒ හැරෙන්න පරිපූරක ඇස්තමේන්තුවෙන් රුපියල් මිලියන 592ක් ඉල්ලා තිබෙන්නේ, ඇත්ත වශයෙන්ම ගොඩනැඟිලි සපයා ගැනීමට, ගොඩනැඟිලිවලට අවශ්‍ය උපකරණ සහ වෙනත් අභ්‍යන්තර පහසුකම් ගොඩනැඟීමට සහ කාර්ය මණ්ඩලවල වැටුප් ගෙවීම කියන දේවල්වලට අදාළවයි.

මගේ මිත්‍රයා, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කියපු ආකාරයට මේ මුදල පරක්කුවෙලා වෙන් වුණේ අමාත්‍යාංශයේ වැඩ කිරීමට නොවෙයි. මම ඇමති කෙනෙක් වුණේ පෙබරවාරි මාසයේ. මගේ අමාත්‍යාංශය පිහිටුවන්න ගොඩනැඟිල්ල ලැබුණේ මම ඇමති ධුරය භාර ගෙන මාස හතරකට පසුවයි. රජයේ තිබෙන පිළිවෙත් අනුව අපට ගමන් කරන්න සිදු වුණා. අතීතයේ වාගේ අල්ලස් අරගෙන, කප්පම් අරගෙන කෙටි මාර්ගවලින් ඒකාධිපතියෙකුගේ අවශ්‍යතාව පරිදි ඒවා කරන්නේ නැහැ. එම

නිසා ගොඩනැඟිල්ලක් ලබා ගන්න මාස 4ක් ගත වුණා. තට්ටු 6ක ගොඩනැඟිල්ලේ ඇතුළත තට්ටු 2ක් හදා ගන්න අපට මාස තුනක් ගත වුණා. එම ගොඩනැඟිල්ලට ගෙවදිනකොට මාස 7ක් ගත වෙලා තිබුණා. අලුත් අමාත්‍යාංශයක් හදනකොට ක්‍රියාදාමය වන්නේ එයයි. ඒකාධිපතියන් වාගේ රුපියල් කෝටි ගණනින්, රුපියල් මිලියන ගණනින් ණය අරගෙන ඒකෙන් භාගයක් හොරකම් කළේ නැහැ. එහෙමත් නැත්නම්, තමන්ගේ හොඳ මිත්‍රයෙක්ගේ ගොඩනැඟිල්ලක් එහි වටිනාකමට වඩා 10 ගුණයක් සල්ලි දීලා ගන්නවා වාගේ වැඩ අපි කළේ නැති නිසා මේවාට කාලයක් ගියා. මේ වන විට මගේ අමාත්‍යාංශයට අවශ්‍ය කාර්ය මණ්ඩලය තුනෙන් එකක ප්‍රමාණයක් පමණයි සපයා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

රජයේ සේවකයින් ලබා ගැනීම ඉතාම දුෂ්කරයි. මම හිතනවා ප්‍රවීණ, පරණ දේශපාලනඥයින් හැටියට ඒක තමුන්නාන්සේලාට තේරුම් ගන්න පුළුවන්ය කියලා. මේ දවස්වල අපි advertisements දාලා interviewsවලට call කරලා කාර්ය මණ්ඩලයේ ඉතිරි කොටස සපයා ගන්න උපරිම ශ්‍රමයක් දරනවා. ඒ කටයුතු සම්පූර්ණ වන විට මේ වසර අවසන් වෙලා තිබේවි. අනිවාර්යෙන්ම, මේ අමාත්‍යාංශ කටයුතු ක්‍රියාත්මක වන විට ලබන වසරේ මුල් භාගය වෙලා තිබේවි. එය කිසි කෙනෙකුගේ දුර්වලකමක්වත්, මන්දගාමීබවක්වත්, රජයේ අකාර්යක්ෂමතාවක් නිසාවත් සිදු වන දෙයක් නොවෙයි. අප නිවැරදි පිළිවෙත් අනුගමනය කරන නිසා - පටිපාටි අනුගමනය කරන නිසා - ඒ කාලය ගත වීම වළක්වන්න බැහැ.

කැලණිය පැත්තේ එක මන්ත්‍රී කෙනෙක් මේ මුදල් ගැන කිය කියා කෑ ගහලා තිබුණා, ඡන්ද 5000ට, ලක්ෂ 5000යි කියලා. ගණන් හදන්න ඉගෙන ගත්තේ කොහෙන්ද දන්නේ නැහැ. පහ වසර පන්තියට ගිහිල්ලා නැති නිසාත්, රුපියල් 10ට කැලණිය පැත්තේ බූරුවා ගහ ගහා හිටපු නිසාත්, නොයෙක් ආකාරයෙන් එක එක මැර වැඩ කරපු නිසාත් කොහෙන් හරි ඡන්ද ටිකක් සොයා ගෙන පාර්ලිමේන්තුවට ආවා. ඒ ආවාට අපි රටට කරපු සේවය ගැන අදහසක්වත්, අවබෝධයක්වත් ඒ පුද්ගලයාට නැහැ. අපි කොච්චර කැපවීමකින් වැඩ කළාද, අපේ ඉතිහාසය මොකක්ද කියලා දන්නේ නැහැ. පිහියක් ඉණේ ගහගෙන රස්තියාදු වැඩ කර කර, බූරුවා ගහමින්, හොරපොල් කඩ කඩා හිටපු පුද්ගලයෙකුට මේ පාර්ලිමේන්තුවට එන්න පුළුවන් නම්, මම වාගේ පුද්ගලයෙකුට එහෙම කථා කරන්න පුළුවන් නම්, මගේ අමාත්‍යාංශය සඳහා මෙවැනි මුදලක් වෙන් කිරීමේ කිසිම අපරාධයක්වත්, වරදක්වත් නැහැ. මම හිතනවා, ඒක සියලු දෙනාම පිළිගනියි කියා. [බාධා කිරීමක්] මට ඇහෙනවා, ඒ පුද්ගලයා කළායැයි කියන තව එක එක රාජකාරි මේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරු කියනවා. මී හරකුන් පවා බැලුවාලු. තව එක එක දේවල් මේ පැත්තෙන් කියනවා. ඒ පුද්ගලයාට මෙම රුපියල් මිලියන ගණන් ගැන අවබෝධයක් නැහැ. ඒ පුද්ගලයාට මේ රටේ සංවර්ධනයේ මහා පරිමාණ දේවල් ගැන අවබෝධයක් නැහැ. හිටපු ගමන් කැලණිය පැත්තට ගිහිල්ලා අනවසරයෙන් මුඩුක්කුවක් හදනවා. ඒ වාගේ දේවල් තමයි ඔහු කර කර හිටියේ. ඒ වාගේ අයට උත්තර දෙන්න මම වැඩිය කාලය ගන්න අවශ්‍ය නැහැ.

මේ මුදල් අවශ්‍යතා ගැන මම ඉතා කෙටියෙන් පැහැදිලි කරන්න කැමැතියි. රජයේ රෙගුලාසි අනුව, කාර්ය මණ්ඩලය 494ක් පමණ වන විට වර්ග අඩි 100ක් එක්කෙනෙකුට අයිති වෙනවා. ඒ අනුව, මෙම ගොඩනැඟිල්ලේ වර්ග අඩි 4900ක් පමණ කාර්ය මණ්ඩලයට පමණක් අවශ්‍යයි. ඊට අමතරව, විවිධ උසස් ශ්‍රේණිවල නිලධාරීන්ට අවශ්‍ය කාමර - කුටි -, සේවකයින් ආහාර පාන ගන්න ශාලාවන්, මහජනයාට ගැවසෙන ස්ථාන යනාදී මේ සියල්ල එකතු වී මෙම ගොඩනැඟිල්ල සැකසෙන විට වර්ග අඩි 50000ක් කියන එක අත්‍යවශ්‍ය කාරණාවක් වුණා. ඒ අනුව, මේ ගොඩනැඟිල්ලේ පිහිටුවන කාර්යාලයේ ඉඩ කඩ සඳහා මාසික කුලිය රුපියල් 7,717,667.20ක් වනවා. එය ගණන් හදන්නේ, වර්ග අඩියකට රුපියල් 160 ගණනේ වර්ග අඩි 48000කට. ඊළඟට වර්ග අඩි 57000කට- ඒ කියන්නේ, පොදු ප්‍රදේශයත් එක්ක වර්ග අඩියට රු. 30.00 ගණනේ ගණන් හැදුවාම රුපියල් මිලියන එකයි හත්ලක්ෂ විසිඑක්දාහක් එනවා. එතකොට, වර්ග අඩියකට රුපියල් 160ක් පමණ එකතුව එනවා. ඒ එකතුව අනුව සම්පූර්ණ මාසික කුලිය රුපියල් මිලියන නවයයි හාරලක්ෂ තිස්නවදාහක් වනවා. වර්ග අඩියක් රුපියල් 160ක් පමණ වනවා. මගේ අමාත්‍යාංශය "සෙත්සිරිපාය"හි පවත්වා ගෙන යන්න කටයුතු කළා නම්, වර්ග අඩියකට රුපියල් 300 ගණනේ මාසික කුලිය ගෙවන්න ඕනෑ.

කෘෂිකර්ම අමාත්‍යාංශයට ගත් ගොඩනැඟිල්ල වෙනුවෙන් වර්ග අඩියකට කුලිය වශයෙන් වැය වුණා රුපියල් 240ක්. අපි අමාත්‍යාංශය සඳහා ඉතාම අඩු මුදලකට ඒ ගොඩනැඟිල්ල ලබාගෙන රජයට විශාල ඉතිරියක් කළා. අප ටෙන්ඩර් කැඳවුවාම ඒ ගොඩනැඟිල්ලේ හිමිකරු පමණයි එකම ඉල්ලුම්කරු හැටියට ඉදිරිපත් වුණේ. ඒ වුණත් ඉතාම අඩු මුදලකට ඒ ගොඩනැඟිල්ල ලබා ගැනීමට අපට හැකියාවක් ලැබුණා. ඒ මාසික කුලිය හැදුණේ ඒ ආකාරයටයි. ඒ අනුව, අපට ගෙවන්න සිද්ධ වුණා මාස 24ක අත්තිකාරම් මුදලක්. එයට රුපියල් මිලියන දෙසියහැටපහකුත් අටලක්ෂ පනස්දහසක්, මාස 6ක ආරක්ෂක තැන්පතුවක් සඳහා රුපියල් මිලියන 46ක් සහ 2016 වර්ෂයේ මාස හතක කුලිය රුපියල් මිලියන 77ක් ඇතුළත් වනවා. මුළු මුදල රුපියල් මිලියන 389ක් වනවා. පුද්ගලික පඩි නඩි, ගමන් වියදම් සැපයීම් හා නඩත්තු වියදම් සඳහා රුපියල් මිලියන 79.7ක් ගෙවන්න වුණා. එවිට සම්පූර්ණ මුදල රුපියල් මිලියන 469.4ක් වුණා. ඊට අමතරව, තිබෙනවා ප්‍රාග්ධන වියදම්. අපි ඒවා නාස්ති කළේ නැහැ. මෙහි සඳහන්ව තිබෙනවා අමාත්‍යතුමාගේ නිල වාහන සඳහා රුපියල් මිලියන 70යි කියා. ඒ සඳහා රුපියල් මිලියන 70ක් රජයෙන් වෙන් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! ගරු කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ලක්ෂ්මී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* MR. SPEAKER *took the Chair.*

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

ගරු කථානායකතුමනි, මා කියමින් සිටියේ වාහන ගන්න වෙන් කළ රුපියල් මිලියන 70 ගැනයි. එහා පැත්තේ සිටින අර කල්ලියේ මන්ත්‍රීවරයෙක් ඒ රුපියල් මිලියන 70 ගැනත් කථා කරමින් කියා තිබුණා, රුපියල් මිලියන 70කට වාහනයක් ගන්නවා කියා. එයා මගේ වාහනවල ගණන් බලනවා. එයා දන්නේ නැහැ එයාගේ නායකයා -අර සාටකයෙන් බෙල්ලේ වැල දාගෙන ඉන්නේ- වාහන 1,200ක් පාවිච්චි කළ බව. එයින් වාහන 300ක් අද වන විටත් ආ ගිය අතක් නැහැ. එයාගේ කල්ලියේ ඉන්නවා passports හොරකම් කරන මන්ත්‍රී. එයා එයාගේ අමාත්‍යාංශයේ ආරක්ෂක අංශයෙන් වාහන 42ක් වංචා කළා. එහි

[ෆීල්ඩ මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

සිටි ආරක්ෂක නිලධාරියෙක් මගේ අමාත්‍යාංශයේ දැන් වැඩ කරනවා. ඔහු දැනට FCID එකට බඩගානවා. ඒ, වාහන 42 ආ ගිය අතක් නැහැ. ඒවා ගැන නොදන්නවාද දන්නේ නැහැ, අර වාගේ මැත දොඩවන, තම කල්ලිය කරන ඕනෑම දෙයකට, ඕනෑම වැඩකට නමස්කාර කරන, සද්භාවයෙන් වැඩක් කරන්න හැදුවාම ඒවායේ වැරැදි දකින ඒ පුද්ගලයා. රුපියල් මිලියන 70ක් ඇමතිවරයකුට වෙන් කළා වාහන සඳහා. ඒවා රජයේ වාහනයි. නමුත් මා ඒ රුපියල් මිලියන 70 වෙන් කළා, වාහන තුනකට. ආරක්ෂක වාහනය, ජීප් එක, කාර් එක කියන තුනටම මා වෙන් කළේ රුපියල් මිලියන 63යි. රුපියල් මිලියන 63ක් වියදම් කරලා මම වාහන තුනක් ලබා ගත්තා. මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, තමුන්නාන්සේලාගේ මිම්මෙන් අපව මනින්න එපා කියා. තමුන්නාන්සේලා කරපු හොරකම්, මැරකම්, ජරා වැඩ, දූෂිත වැඩ අපත් කරනවා කියා හිතලා ඒ මිම්මෙන් අපව මනින්න එපා. තමුන්නාන්සේලාගේ ඥානවල ඒවා පිහිටා තිබෙනවා. තමුන්නාන්සේලාට ඒවා පුරුදු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ නායකයා ඒවා කළා. නායකයා මුළු රටම විනාශ කළා. නමුත් මේ පැත්තේ සිටින මේ ආණ්ඩුවේ අය ඒවා කරන්නේ නැහැ. ඒවා කළොත් අපට මේ ආණ්ඩුවේ රැඳෙන්න බැහැ; ඇමති ධුර හොබවන්න හම්බ වන්නේ නැහැ. එය තේරුම්ගන්න කියා මා තමුන්නාන්සේලාට මතක් කර දෙනවා.

ගරු කථානායකතුමනි, රුපියල් මිලියන 592ක පරිපූරක ඇස්තමේන්තුව අපි ඉතා සද්භාවයෙන් අද ඉදිරිපත් කර තිබෙනවා. මම හිතනවා ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ කියා. අඩු ගණනේ ඉස්කෝලේ ගියා නම්, අට පාස් වෙලා තිබෙනවා නම්, යමක් කමක් එකතු කර ගන්න පුළුවන් නම්; තිබෙන ප්‍රවණතාව මොකක්ද, ක්‍රමවේද මොනවාද, ටෙන්ඩර් පටිපාටි මොනවාද, අමාත්‍යාංශයක් වැඩ කරන්නේ කොහොමද, ඒවායේ කාර්ය මණ්ඩලය ඉන්නවාද, එහෙම නැත්නම් ඉන්නේ ඒකාධිපතියෙක්ද, කාර්ය මණ්ඩලයක් නැතිව එක් අයෙක් හොරකම් කරනවාද, එක් අයෙක් තීන්දු තීරණ ගන්නවාද ආදිය ගැන අවබෝධයක් තිබෙනවා නම් මම හිතන්නේ නැහැ, ප්‍රශ්නයක් තිබේවි කියා.

ගරු කථානායකතුමනි, ගුණසේකර මන්ත්‍රීතුමා මගේ අතීතය ගැන කියනවා මම අහගෙන සිටියා. ඔහු මෙතැන ඉන්නේත්, චණ්ඩියා වාගේ කථා කරන්නේත් ඒ අතීතය පුරාවට අප ලේ, ඩහදිය, රුධිරය හෙළා මේ රටට සාමය ගෙන ආ හින්දායි. ඒ සාමය ගෙනාවේ බෙල්ලේ වැල ලෙස ලාගෙන තිබෙන අර සාටකයේ පිහිටෙන් නොවෙයි. රණ විරුවන් ලේ ඩහදිය හෙළා තමයි, අප කැපවීමෙන් වැඩ කරලා තමයි, අපේ ජීවිත අනතුරේ තබා තමයි, අප මැරිලා ඉපදිලා තමයි ඒ සාමය ගෙනාවේ. එක් පුද්ගලයකු ලියපු පොතක් ගැනත් කථා කළා. මේ කාලයේ මේ අය රණ විරුවන් දඩයම් කිරීම ගැන කියනවා; ඒ පොත ලියපු කෙනාට නමස්කාර කරනවා. ඒ පිහිටෙන් හෝ එල්ලෙන්න හදනවා. මගේ යටතේ සිටියා සේනාංකාධිපතිවරු විසිදෙනෙක්. ඒ විසිදෙනාගෙන් එක්කෙනෙකු තමයි ඔය පොත ලියා තිබෙන්නේ. ඉදිරියේදී තවත් දහනවදෙනෙක් ලියන්න ඉන්නවා. ලක්ෂ දෙකක් කරපු යුද්ධයෙන් විස්සෙන් කොටසකට සම්බන්ධ වූ මිනිහෙකු ලියූ පොතක් ගැන තමයි ඔය වර්ණනා කළේ. එතුමා එයා ගැන බොහෝ දුකින් කථා කළා. නමුත් ඒ මන්ත්‍රීතුමාට මම කියනවා, "ඉවසාගෙන ඉන්න. ලක්ෂ දෙකම ක්‍රියා කරපු ආකාරය ගැන ලියැවුණු පොත අපි නුදුරේදීම එළියට දමනවා" කියා. සාටකය යුද්ධ කළාද, යුද්ධ කළේ කවුද, රණ විරුවන් ඇත්තටම සටන් බිමට ගියේ කොහොමද, එම සේනාංක විස්සටම අණ දුන්නේ කවුද, සේනාංක විස්සම සැලසුම් කළේ කවුද, සේනාංක විස්සටම සටන් සංකල්ප කියා දුන්නේ කවුද කියන එක ගැන ඔය කථා කළ මන්ත්‍රීවරයාට එදාට දැන ගන්න පුළුවන්.

ඊළඟට, රණ විරුවන් දඩයම් කරනවාය කියාත් කිව්වා. රණ විරුවන් දඩයම් කරනවාය කියා කෑ ගහන ඔය "ඒකාබද්ධ-මලබද්ධ කල්ලිය" දැන ගන්න ඕනෑ - දැන් හමුදාවේ මේජර් කෙනෙකු ගැන ඉතා දුකින් කථා කළා. ඊළඟට, "හමුදාපති මේජර් ජනරාල් ෆොන්සේකා" කියාත් සඳහන් කළා. මේජර් ජනරාල්වරු හමුදාපතිවරුන් වෙන්නේ නැහැ. මම හමුදාවට බැඳෙනකොට නම් හමුදාවේ සිටියේ දහදාහයි. එතකොට හමුදාපති මේජර් ජනරාල්. දැන් හමුදාවේ ඉන්නේ ජනරාල්වරු. තරු හතේ ජනරාල්වරු. හමුදාව ලක්ෂ දෙකක් ඉන්නවා. ඒවා ගැන ඉගෙන ගෙන ඇවිත් තමයි රණ විරුවන් ගැන කථා කළ යුත්තේ.

ඊළඟට, මේජර්වරයෙකු ගැන ඉතාම කැක්කුමකින් කථා කළා. හමුදාපති ඇදගෙන ගිහිල්ලා හිරේ දමනකොට ඔය කථා කරපු මන්ත්‍රීතුමා සිටියේ කොහේද දන්නේ නැහැ. ඒ මන්ත්‍රීවරයා ඒ කාලයේ ඇස-කට වහගෙන නිදාගෙන තමයි සිටියේ. එතකොට කිරිබත් කෑවා. ඔය කියන රණ විරුවා වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළනා ඔය පැත්තේ ඉන්නා හතළිස්දෙනාම ඒ වේලාවේ කිරිබත් කෑවා. දැන් හමුදාවේ අයට පහර දෙනවාය කියා අමුතු දුකක්, කනගාටුවක් ඇවිල්ලා. නමුත් මම මතක් කරන්න ඕනෑ, ඔය කියන මේජර්වරයා දඬුවම් ලැබුවේ රණ විරුවෙක් නිසා නොවෙයි කියන වග. ඔහු දඬුවම් ලැබුවේ, මිනී මැරුමක් සම්බන්ධයි. එම මිනී මැරුමට ඔහුට විරුද්ධව නඩු දැම්මේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේයි. එසේ නඩු දැම්මේ ජී.එල්. පීරිස්ලායි. ඒ කාලයේ නඩු දමපු නිසායි, මේ කාලයේ දඬුවම් ලැබුණේ. අපි අධිකරණයට ඇඟිලි ගහන්නේ නැහැ. අපි අධිකරණය හසුරුවන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ වාගේ අධිකරණයට ගැන්තෝ දමා ගන්නේ නැහැ. අපිට ඕනෑ විධියට තීන්දු දෙන්න කියා අපි අධිකරණයට කියන්නේ නැහැ. අපි අධිකරණයට නිදහස දීලා තිබෙනවා. අධිකරණයේ නඩුවක් ඇසුවා; ඒ අනුව නඩුවට තීන්දුවක් දීලා දඬුවමක් දුන්නා. අපිට ඒවාට ඇඟිලි ගහන්න බැහැ. රටේ නීතිය අනුව, නීත්‍යානුකූල පටිපාටිය අනුව අවශ්‍ය උසාවියකට ගිහිල්ලා ඇපෑලක් -අභියාචනයක්- කරලා ඔහුගේ නිවැරදිතාව ඔප්පු කරන්න ඔහුට පුළුවන්.

දැන් කල්ලියම කැටයක් අරගෙන කොහේද ගිහිල්ලා සල්ලි එකතු කරනවා. ඔය කැටයට එකතු කරන හැම ශතයක්ම ඕකූන් bank accountsවලට දමා ගන්නවා. අනිවාර්යෙන්ම එහෙම කරනවා. [සෝෂා කිරීම්] අර ගම්මන්පිල කියන මන්ත්‍රීතුමා එක වතාවක් රුපියල් සියය ගණනේ දුප්පත් මිනිසුන්ගෙන් එකතු කළා. එකතු කරලා ඒක bank account එකේ දමා ගත්තා. හිහන්නෙක් වාගේයි. හිහන කොටෙක් වාගේයි. දැන් ආපසු කැටයක් අරගෙන කල්ලියම වටේ යනවා. අපි මේ රටේ ජනතාවට මතක් කරන්න කැමැතියි, ශත පහක්වත් ඔය කැටයට නම් දමන්න එපා කියා. අනිවාර්යෙන්ම ඔය කල්ලියේ එවුන් කන්න-බොන්න, සම්භාෂණ දමන්න, පරණ ජීවිතය ගත කරන්න ඔය සල්ලි ඔක්කෝම වියදම් කරනවා. ඔවුන් රටෙන් හොරකම් කරපු සල්ලි තිබෙනවා. මේ දවස්වල එසේ මිලියන හයසියය-අටසියය හොරකම් කරපු ඒවාට විරුද්ධව නඩු දමනවා. අර රණ විරුවා වෙනුවෙන් ඔය තරම් කැක්කුමක් තිබෙනවා නම් එයින් මිලියන දෙකක් දෙන්න බැරිද? මිලියන දෙකක් දීලා එම රණ විරුවා බේරා ගන්න බැරිද? ඒකත් අභිංසක මිනිසුන් ලවා තමයි කරන්න හදන්නේ. ඕකයි යථාර්ථය. ඔය කල්ලියේ සිටින තමුන්නාන්සේලා වීදුරු ගෙවල්වල ඉඳගෙන අනෙක් අයට ගල් ගහන්න එපා. මීට පසුව ඔය කල්ලිය බොරු ඇද බෑවාට, මඩ ගැසුවාට, අපේ චරිත ඝාතනය කළාට ඔය කල්ලියට කවදාවත් ඔළුව උස්සන්න හම්බවෙන්නේ නැහැ. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත : නියමය
உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம் : கட்டளை
EXCISE (SPECIAL PROVISIONS) ACT: ORDER

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 26 දිනැති අංක 1968/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු විජිත හේරත් මහතා.

කම්කරු නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා පිළිබඳ ගැටලු
தொழில் அலுவலர்களின் சேவைக் குறிப்புத் தொடர்பான பிரச்சினை
ISSUES RELATED TO SERVICE MINUTE OF LABOUR OFFICERS

[අ.භා. 6.20]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"මේ වනවිට කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනයක් දියත් වෙමින් තිබීම නිසා දෙපාර්තමේන්තුව තුළ බරපතළ ගැටලුසහගත තත්ත්වයක් මතු වී තිබේ. මෙහි බලපෑම දෙපාර්තමේන්තුවට පමණක් සීමා වී නැති අතර ව්‍යක්තිය ක්‍රියාමාර්ග නිසා කම්කරුවන්ගේ ප්‍රතිලාභ වෙනුවෙන් හාම්පුතුන්ට එරෙහිව අධිකරණයේ පවරන ලද නඩු 23,000කට බාධා වී ඇතැයි ජනමාධ්‍ය වාර්තා කරයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ කාලීනව සිදු විය යුතු ප්‍රතිසංවිධානයන් සිදු නොවීම තුළ වර්ධනය වූ කම්කරු නිලධාරීන්ගේ ගැටලුකාරී තත්වය මෙම වැඩ වර්ජනයට තුඩු දී තිබේ. එම නිලධාරීන්ගේ ගැටලු විසඳීම ඉලක්ක කරගත් සේවා ව්‍යවස්ථාවක් ක්‍රියාවේ යෙදවීම කෙරෙහි බලධාරීන්ගේ අවධානය මෙතෙක් යොමු වී නැත. මෙම අත්‍යවශ්‍යතාකාරී සේවා තත්වය තුළ අසරණ වන්නේ, එම නිලධාරීන්ගේ සේවා ලබන ලංකාවේ පෞද්ගලික අංශයේ ලක්ෂ සංඛ්‍යාත වැඩකරන ජනතාවය. එබැවින් මෙම ගැටලු කඩිනමින් විසඳිය යුතුව තිබේ.

ආණ්ඩුව විසින් කඩිනමින් මැදිහත්ව විසඳිය යුතු දෙපාර්තමේන්තු පරිපාලන ගැටලුවක් ජාතික වශයෙන් බලපෑමක් වනතුරු වර්ධනය වීමට ඉඩ හැරීම කනගාටුදායක කරුණකි. මේ තත්ත්වය තුළ කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා පිළිබඳ ගැටලුව කඩිනමින් විසඳීම සඳහා මැදිහත් වන ලෙස රජයට යෝජනා කරමි."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේ, ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "මේ අවස්ථාවේ, ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටතු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු එට්වට් කුණසේකර අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පෞද්ගලික අංශයේ ඒ වාගේම අර්ධ රාජ්‍ය අංශයේ වැඩ කරන කම්කරු ජනතාව, ලක්ෂ 80ක් පමණ වෙනවා. ලක්ෂ 80ක් පමණ වන වැඩ කරන ජනතාවගේ දෛනික කම්කරු ප්‍රශ්න විසඳීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවක් තිබෙනවා. ඒ කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ නිලධාරීන් සේවයේ නියුක්ත වෙලා ඉන්නවා. වසර ගණනාවක් තිස්සේ කම්කරු නිලධාරීන්ගේ සේවාවන් පිළිබඳව තිබෙන ගැටලු සේවකයන් විසින් ඉදිරිපත් කරනු ලැබුවා.

[ගරු විජිත හේරත් මහතා]

වර්තමානයේ පමණක් නොවෙයි, මීට ඉහත පැවතුණු ආණ්ඩුවලටත් තමන් වෘත්තීය වශයෙන් මුහුණ දෙන ගැටලු ඉදිරිපත් කළා. ඉදිරිපත් කිරීමත් එක්ක මීට වසර ගණනාවකට පෙර කම්කරු නිලධාරීන් සඳහා වෙන් වූ සේවා ව්‍යවස්ථාවක් හදනවාය කියන පොරොන්දුව විවිධ ඇමතිවරු දීලා තිබෙනවා. මේක අද ඊයේ හදිසියේ මතු වෙච්ච තත්ත්වයක් නොවෙයි.

මීට අවුරුදු 10කට කලින් ඒ වැටුප් කොමිෂමෙන් 2006/06 වැටුප් චක්‍ර ලේඛයට අනුව ඉතා පැහැදිලිව නිර්දේශ කරලා තිබෙනවා, විවිධ ක්ෂේත්‍ර සඳහා විවිධ වෘත්තීන්වලට වෙන් වූ සේවා ව්‍යවස්ථාවක් හදන්න කියලා. මීට අවුරුදු 10කට කලින් කරපු නිර්දේශයක් ඉතා පැහැදිලිව තිබෙනවා. ඊයේ, පෙරේදා වැඩ වර්ජනයකට හදිසියේ ආවා නොවෙයි. පසු ගිය ආණ්ඩු මේ සේවා ව්‍යවස්ථාව හදන්න මැදිහත් වුණේත් නැහැ. මේ ආණ්ඩුව මේ සේවා ව්‍යවස්ථාව හදන්න මැදිහත් වෙලාත් නැහැ. අවසානයේදී, මේක ජාතික වැඩ වර්ජනයක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍ය හරහා ඇමතිවරුන්ගේ ප්‍රකාශ සහ සමහර බලධාරීන්ගේ ප්‍රකාශ තුළින් ජනතාවට ඒත්තු ගන්වන්න උත්සාහ කරනවා, කම්කරු නිලධාරීන් වැඩ වර්ජනයකට ඇවිල්ලා තිබෙන්නේ තමන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නයක් නිසාය කියා. ඒක කිව්වාම හරි ලේසියි, මේ නිලධාරීන්ගේ වැඩ වර්ජනය මර්දනය කරන්න. ඇත්ත ප්‍රශ්නය යට ගහලා වැටුප් ප්‍රශ්නයක් උඩට දැම්මාම වැඩ කරන ජනතාවට වැරැදි අදහසක් එනවා, "මේ නිලධාරීන් තමන් වෙනුවෙන් නොවෙයි, ඔවුන්ගේ වැටුප් වෙනුවෙන් වර්ජනය කරන්නේ" කියලා. ඒක ඉතාම වැරැදි සහගත ක්‍රියාවක්.

කම්කරු නිලධාරීන් වාගේම සහකාර කම්කරු කොමසාරිස්වරු අවුරුදු ගණනාවක ඉඳලා කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳව තමන්ගේ අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. ජාත්‍යන්තර කම්කරු සංවිධානය - ILO එක - පිළිගෙන තිබෙනවා, මේ රටේ කම්කරු බලධාරීන් පිළිගෙන තිබෙනවා, "කම්කරු දෙපාර්තමේන්තුව යල් පැනගිය ආයතනයක්. ආයතනික ව්‍යුහය යල් පැන ගිය එකක්. ඒ නිසා මේක අලුත් වෙන්න ඕනෑ; නවීකරණය වෙන්න ඕනෑ; විමධ්‍යගත කරණයකට ලක් වෙන්න ඕනෑ" කියලා. ඒ නිසා තමයි, ප්‍රතිව්‍යුගතකරණය පිළිබඳ සැලැස්මක් ක්‍රියාවට නහන්න යෝජනාවක් මීට ඉහතදී මතු වුණේ. ඒ අනුව තමයි යම් කමිටුවක් පත් කරලා -මඩිහළුවා කමිටුව පත් කරලා- කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ යම් වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙන්නේ. නමුත් ඒ ප්‍රතිව්‍යුහගතකරණයත් එක්ක ඊට ගැළපෙන ආකාරයට ඒ නිලධාරීන්ගේ සේවාවත් අලුත් වෙන්න ඕනෑ; නවීකරණය වෙන්න ඕනෑ. මේ දෙක වෙන වෙනම නොවෙයි, මේ දෙක එකක්. එක පැත්තකින් කම්කරු දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය අලුත් වෙන්න ඕනෑ. අලුත් වෙන ආයතන ව්‍යුහයට ගැළපෙන ආකාරයට නිලධාරීන්ගේ සේවාවනුත් නවීකරණය වෙන්න ඕනෑ.

ඇත්තටම, මේ දෙකම පැවරිය යුත්තේ එකම කමිටුවකට. නමුත් කැබිනට් මණ්ඩලය ගත්තු තීන්දුවෙන් මඩිහළුවා කමිටුවට බලය පැවරිලා තිබෙන්නේ, මේ ආයතනය ප්‍රතිව්‍යුහගතකරණයට පමණයි. ඇමතිතුමා මාධ්‍යවලට කියලා තිබෙනවා, "මඩිහළුවා කමිටුව පත් කරලා තිබෙනවා. දැන් මේකෙන් සේවා ව්‍යවස්ථා හදන්න පුළුවන්" කියලා. නැහැ. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. ඉතාම පැහැදිලිව මඩිහළුවා කමිටුවෙන් කරුණු සඳහන් කරනවා, "අපට බලය පැවරිලා තිබෙන්නේ ආයතනය ප්‍රතිව්‍යුහගතකරණයට පමණයි" කියලා. ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය හොඳයි. ඒක කරන්න ඕනෑ. පළාත් මට්ටමට, දිස්ත්‍රික් මට්ටමට, ප්‍රාදේශීය මට්ටමට කම්කරු දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය විමධ්‍යගතකරණය වෙන්න ඕනෑ. සේවකයන්ට, තමන්ගේ අර්ථ සාධක අරමුදල ලබා ගන්න, තමන්ගේ වෘත්තීමය ගැටලුවක් පිළිබඳව නීතිමය කරුණක් විසඳා ගන්න යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මඩකලපුව, හම්බන්තොට, අම්පාර වාගේ ඈත ප්‍රදේශවල ඉඳලායි කොළඹට එන්න සිදු වෙලා තිබෙන්නේ.

කොළඹ, නාරාහේන්පිට කම්කරු අමාත්‍යාංශයේ මූලස්ථානයෙන් ඒ සියල්ල විසඳා ගන්නා තත්ත්වය වෙනස් වෙන්න ඕනෑ. ඒක තවත් විමධ්‍යගතකරණය කරන්න, එහි පරිපාලනය තවත් කම්කරු ජනතාවට සමීප කරවන්න ව්‍යූහාත්මක වෙනසක් විය යුතුයි. හැබැයි, ඒ ව්‍යූහාත්මක වෙනසට සාපේක්ෂව මේ සේවකයින්ගේ සේවා ව්‍යවස්ථාව හැදෙන්න ඕනෑ. නමුත්, අදටත් ඒක හැදිලා නැහැ. ඒකයි මේ ප්‍රශ්නය. සේවා ව්‍යවස්ථාවක් හදන්න අමාත්‍යාංශය පැත්තෙන් මැදිහත් වෙන්නේ නැති නිසා කම්කරු නිලධාරීන්ගේ පැත්තෙන්, වෘත්තිය සමිති පැත්තෙන් සේවා ව්‍යවස්ථාවක් හදලා ඉදිරිපත් කර තිබෙනවා. එතකොට ඒ සේවා ව්‍යවස්ථාව ඉදිරිපත් කරපු එක මත පදනම් වෙලා දැන් මේකට කඩිනම් විසඳුමක් ලබා දෙන්න පුළුවන්.

ඇත්තටම අද කම්කරු අමාත්‍යාංශය පැත්තෙන් හා කම්කරු දෙපාර්තමේන්තුව පැත්තෙන් ගත්තොත්, ඒවායේ ඉහළම තනතුරු වන අමාත්‍යාංශ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල්, අතිරේක කොමසාරිස් ජනරාල් තනතුරු සඳහා අද රාජ්‍ය පරිපාලන සේවයේ අයයි බඳවා ගන්නේ. ඒ නිසාම 2005 ඉඳලා මේ වනතුරු නීති පිළිබඳ අතිරේක කම්කරු අධ්‍යක්ෂ ජනරාල් ධුරය හිස්ව තිබෙනවා. මොකද, ඒ තනතුර පුරවන්නේ කම්කරු නිලධාරියාගේ මට්ටමේ ඉඳලා සේවා කාලය, වාගේම අනෙකුත් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් මතයි. නමුත්, ඒ තනතුර පුරවා නැහැ. ඉතින් ඉහළ තනතුරු දෙක තුනක් පරිපාලන නිලධාරීන්ගෙන් පිරුණාම ඒ අයට නීතිය පිළිබඳ, කම්කරු නීති පිළිබඳ දැනුමක් නැහැ; අත්දැකීමක් නැහැ. ඒ වාගේම කම්කරු නීති පිළිබඳව මැදිහත් වෙන්න ඒ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය දෙන්න හැකියාවක් නැහැ. එහෙම නම් පරිපාලනමය දැනුම තිබීමෙන් පමණක් ඔය කියන ප්‍රතිව්‍යුහගතකරණය කරන්න බැහැ.

අද මඩිහළුවා කමිටුව ගත්තොත්, එහි පස් දෙනාගෙන් තුන් දෙනෙක් ඉන්නවා එහෙම අත්දැකීම් තිබෙන අය; අනෙක් දෙදෙනා පරිපාලන නිලධාරීන්. එතුමන්ලා දෙදෙනා මේ වැඩ වර්ජනය පටන් ගන්න දවසේ දිස්ත්‍රික් කාර්යාලයකට යන්නයි හිටියේ බලන්න. දැන් තමයි ඉගෙන ගන්නේ. ඉතින් එවැනි අයගෙන් ආයතන ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ සැලැසුම් හදන්න බැහැ. ඔබතුමන්ලා දීපු පොරොන්දුවකුයි මේ ඉෂ්ට කරලා නැතුව තිබෙන්නේ. ඒ තීන්දු තීරණ ගන්නා තැනට, මේ ආයතන ප්‍රතිව්‍යුහගතකරණය සහ සේවා ව්‍යවස්ථාව හැදීම පිළිබඳ තීන්දු තීරණ ගන්නා තැනට එවැනි අයට එන්න පුළුවන් ආකාරයේ ව්‍යූහයක් හදන්න ඕනෑ. නමුත්, ඒක තවම හැදිලා නැහැ. එහි ප්‍රතිවිපාක බුක්ති විඳින්නේ මේ රටේ පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය ආයතනවල වැඩ කරන ලක්ෂ සංඛ්‍යාත ජනතාවයි. මොකද, EPF එක එහෙම නැත්නම් අර්ථ සාධක අරමුදල කියන්නේ රුපියල් කෝටි ගණනක් සල්ලි තිබෙන තැනක්. EPF එක පිළිබඳව නීතිමය ගැටලු තවම තිබෙනවා. ඒ නිසා තමයි පසු ගිය කාලයේ අපි දැක්කේ, EPF එකේ සල්ලි ටික අරගෙන කොටස් වෙළෙඳ පොළේ බිස්නස් කර තිබෙන අන්දම. ඒ බිස්නස් කරපු සල්ලි අද පාඩු ලබා තිබෙනවා. ඒ මුදල් ඒ කම්කරුවන්ට නැති වෙලා තිබෙනවා. ඒවා පිළිබඳ තීන්දු තීරණ ගන්න, ඒවා කළමනාකරණය කරන්න, ඒ EPF එක පිළිබඳව කටයුතු කරන්න තිබෙන දෙපාර්තමේන්තුව තමයි කම්කරු දෙපාර්තමේන්තුව කියන්නේ. නමුත්, එතැන අකර්මණ්‍ය වුණොත්, එතැන රැකියාව

කරන අයට රැකියාවේ තෘප්තිමත්භාවය නැති වුණොත් එතැනින් එහාට ඒක ආරක්ෂා වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සම්බන්ධයෙන් බොහෝ නඩු තිබෙනවා. අපි දන්නවා, අර්ථ සාධක අරමුදලට සියයට 20ක් දමන්න ඕනෑ කියන කාරණය. එයට සියයට 8ක් සේවකයාගෙන් දමනවා, සියයට 12ක් ව්‍යාපාරිකයා දමන්න ඕනෑ. නමුත්, ඒවා හරියට නොගෙවීම නිසා බොහෝ නඩු ඇති වෙලා තිබෙනවා. අවසානයේදී මොකද වෙන්නේ? EPF නොගෙවීම නිසා සේවායා හිරේට යනවා. මාස 6ක්, අවුරුද්දක් හිරේ ඉඳලා එළියට එනවා. හැබැයි, ඒකෙන් සේවකයාගේ EPF එක ලැබෙන්නේ නැහැ. ඒක ඔහු ගෙවන්නේ නැහැ. මාස 6ක් හිරේ ගිහිල්ලා ගෙවන්නේ නැතිව ඉන්නවා. ඒවා වෙනස් කරන්න නීති කෝ? ඒවා හදන්න ඕනෑ. ඒවා හදන්න තමයි නීති පිළිබඳ කම්කරු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට එවැනි සුදුසුකම් තිබෙන කෙනකු බඳවා ගන්නේ. හැබැයි, ඒ තනතුර තවම පුරප්පාඩුව තිබෙනවා. ඉතින් ලක්ෂ ගණනක් සල්ලි ආණ්ඩුවට ලැබෙන්නෙත් නැහැ, කම්කරුවන්ගේ ඒ අයිතිය ලැබෙන්නෙත් නැහැ. අද අක්‍රිය නඩු තිබෙනවා, 3,680කට වැඩි සංඛ්‍යාවක්. ඒකෙන් විතරක් රුපියල් කෝටි 180ක් ආණ්ඩුවට ලැබෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් වරෙන්තු නඩු 2,461ක් තිබෙනවා. ඒ නිසා රුපියල් කෝටි 81ක් ආණ්ඩුවට ලැබෙන්නේ නැහැ. මෙතැන එකතුව ගත්තොත් රුපියල් කෝටි 261ක්. මේ යන්ත්‍රණය හරියට ක්‍රියාත්මක නොවීම නිසා ඒ මුදල අහිමි වෙලා තිබෙනවා. අද මේ කම්කරු නිලධාරීන් වැඩ වර්ජනය කරන්නේ මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න කියලා. මේ රටේ වැඩ කරන ජනතාවගේ EPF සල්ලි ගෙවන්නේ නැතිව ඒ පිළිබඳව නඩු දමා තිබෙනවා. එම නිසා රුපියල් කෝටි 261ක මුදලක් ආණ්ඩුවට ලැබෙන්නේ නැහැ. ඒ සම්බන්ධ ප්‍රශ්නත්, කම්කරුවන්ට මුදල් නොලැබෙන ප්‍රශ්නත් විසඳන්න යන්ත්‍රණයක් හදන්න. ඒ වෙනුවෙන් තමයි මේ නිලධාරීන් වැඩ වර්ජනය කරන්නේ. ඒක හුදු වැටුප් අරගළයකට හරවාගෙන තමන්ගේ රස්සාවේ වැටුප වැඩි කර ගන්න මේ නිලධාරීන් strike කරනවාය කියනවා. ඔබතුමන්ලා මේ වැඩ වර්ජනය ඒකට ලඝු කරලා අවසානයේ මර්දනයෙන් මේකට උත්තර හොයනවා. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? ඔබතුමන්ලා ඉස්සෙල්ලා කිව්වා, "අනිවාර්යයෙන්ම සේවයට එන්න ඕනෑ, එහෙම නැත්නම් සේවයෙන් ඉවත් කරනවා" කියලා. එක එක තැන්වල එක එක් කෙනා එක එක ඒවා කිව්වා. වැඩ වර්ජනයට සහභාගි වුණු අයට වැටුප් ගෙවන්නේ නැහැයි කියලා අද හදිසියේම තීන්දුවක් අරගෙන තිබෙනවා. වැඩ වර්ජනයට සහභාගි වුණු අයට වැටුප් ගෙවන්නේ නැහැ කියලා තීරණයක් ගන්නේ කොහොමද? ඒක යහ පාලනයද? ඔබතුමන්ලා බලයට ආවේ කම්කරුවන් ඒ විධියට මර්දනය කරන්නද? යහ පාලනය කියන්නේ මේකද? වැඩ වර්ජනය කිරීම වෘත්තීය අයිතිවාසිකමක්.

මේ අය වැඩ වර්ජනය නිකම් පටන් ගත්තේ නැහැ. හත්වන දා වැඩ වර්ජනයක් ආරම්භ කරනවා කියලා පළමුවන දා ලිඛිතව දැනුම් දුන්නා. ඒ අනුව පස්වන දා සාකච්ඡාවක් දුන්නා. ඒ සාකච්ඡාවේදී යම් යම් කරුණු කථා කළා. හැබැයි, ඒ සාකච්ඡාවේදී එකඟ වුණු දේවල් ඔබතුමන්ලාගේ පැත්තෙන් හරියාකාරව ඉෂ්ට කළේ නැහැ. ඔබතුමන්ලා පසුව මාධ්‍යවලට කිව්වා, "වෘත්තීය සමිති එකඟ වුණා, එකඟ වෙලා ගිය ඒවා පස්සේ කැඩුවා" කියලා. නැහැ, "එකඟ වුණා" කියලා Minute එක ඔබතුමන්ලා හදා ගත්තා. හැබැයි, එතැනදී ඉතා පැහැදිලිව කිව්වේ මොකක්ද? එතැනදී කිව්වේ මේ පිළිබඳව වහාම කැබිනට් අනු කමිටුවක් පත් කරන්න කියලායි. ඒ කැබිනට් අනු කමිටුව පත් කරලා මේ සේවා ව්‍යවස්ථාව හදනවාද නැද්ද, හැදිය යුත්තේ කෙසේද කියලා තීන්දුවක් දෙන්න කිව්වා. ඔවුන් ඉල්ලන්නේ එපමණයි. ඔබතුමන්ලා දැන් මේක අත්තනෝමතික විධියට මර්දනය කරනවා. අදත් ඔවුන් කියන්නේ වෙන මොකක්වත් නොවෙයි. අද ඔවුන් වැඩ වර්ජනය කරන්නේ ඔබතුමන්ලා එක එක් කෙනා එක එක ඒවා කියපු නිසායි. ඇමතිතුමනි, දහතුන්වන දා සාකච්ඡාවක් යොදා තිබුණු බව ඔබතුමා දන්නවා. හැබැයි, ඒ සාකච්ඡාවට ඔබතුමා ආවේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා සාකච්ඡාවට සම්බන්ධ වුණා. ඒ සාකච්ඡාවේ නිලධාරිනුත් සිටියා. මේ සේවා ව්‍යවස්ථාව හදන්න විසිවන දා -ඒ කියන්නේ අද- කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරන්න නියෝජ්‍ය ඇමතිතුමා එකඟ වනවා. එතකොට වෘත්තීය සමිති කියනවා, "අද කැබිනට් මණ්ඩලයට ඒ යෝජනාව දමනවා නම්, විසිඑක්වන දා සිට වැඩ වර්ජනය අත් හරිනවා" කියලා.

පස්සේ මොකද වන්නේ? ලේකම්තුමා ඒ යෝජනාවත් එක්ක, ඒ එකඟතාවත් එක්ක නිලධාරීන් සමඟ ඇමතිතුමාව හම්බ වනවා. ඔබතුමාගේ පෞද්ගලික ලේකම්, මාධ්‍ය ලේකම්, ඒ වාගේම අමාත්‍යාංශයේ නිලධාරි කීප දෙනෙක් එතැන ඉන්නවා. ඒ නිල නොවන සාකච්ඡාවේදී ඔබතුමාගේ උත්තරය වෙලා තිබුණේ මොකක්ද? "මම ඇමතිකමෙන් ඉවත් වුණත්, මේක කරන්නේ නැහැ" කියලා ඔබතුමා කිව්වා. දහතුන්වන දා පැවැති සාකච්ඡාවේදී නියෝජ්‍ය ඇමතිතුමා එකඟ වුණු දේට ඔබතුමා කියනවා, "එකඟ වන්නේ නැහැ" යි කියලා. කම්කරු රාජ්‍ය අමාත්‍යතුමා එකඟ වුණු දේ කැබිනට් අමාත්‍යතුමා කරන්නේ නැහැයි කියනවා. මේකට හේතුව මොකක්ද? හරිනම්, තමන්ගේ අමාත්‍යාංශයේ සිටින කම්කරු නිලධාරීන්ගේ අයිතිය වෙනුවෙන් පෙනී ඉන්න ඕනෑ ඇමතිවරයායි. සල්ලි නැහැ කියලා මුදල් ඇමතිවරයාත් ඒක කරන්න බැහැ කියනවා. මුදල් ඇමතිවරයා හෝ, ප්‍රතිපත්ති සැලසුම් සම්පාදක මණ්ඩලයේ කොහේ හෝ කියනවා නම්, මේ රැකියාවල ප්‍රශ්නයක්; වෙන ගැටලුවක් තිබෙනවා කියලා ඒක වෙනම කථාවක්. අඩුම ගණනේ කැබිනට් මණ්ඩලය පත් කරන කොට අනු කමිටුවෙන් මේක ප්‍රතික්ෂේප කරනවා නම්, ඒත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අයිතිය වෙනුවෙන් ඔබතුමා පෙනී ඉන්නේ නැහැ. එතැනයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒ වුණාට ඔබතුමා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේදී තමයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දේශීය ආදායම් නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව හැදුවේ. එතකොට ජයසුන්දර මහත්තයා මැදිහත් වෙලා ඒක හැදුවා.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විධියට ඔබතුමා ඒකට අනුමැතිය දුන්නා. අද ඔබතුමාගේම අමාත්‍යාංශයේ නිලධාරීන් උදාහරණයට ගන්නේත් එදා ඔබතුමා කළ දේමයි. දේශීය ආදායම් නිලධාරීන්ට හදපු සේවා ව්‍යවස්ථාවට සමාන වුණු සේවා ව්‍යවස්ථාවක් අපටත් හදන්න කියලායි ඔවුන් ඉල්ලන්නේ. මොකද, රැකියාව ගත්තොත් එතැන ඉන්නේත් උපාධිධාරීන්, මෙතැන ඉන්නේත් උපාධිධාරීන්. මේ උපාධිධාරීන්ට ඔවුන්ගේ උපාධියට සරිලන විධියට තමන්ගේ රැකියාව කරන්න පුළුවන් ආකාරයට සේවා ව්‍යවස්ථාවක් හදන්න. ගරු ඇමතිතුමනි, ඒ සේවා ව්‍යවස්ථාව හදන්න බැහැයි කියලා ඔබතුමාම barrier එක දමා දැන් විවිධ මර්දනවලින් මේක යටපත් කරන්න හදනවා. ඒක කිසිසේත්ම සාධාරණ වන්නේ නැහැ.

මෙතැන ඇත්තටම ගත්තොත්, දැන් ඔබතුමන්ලා මේකට මැදිහත් වුණු ආකාරය බැලුවොත්, සති දෙකකට පස්සේ හදිසියේ -පසු ගිය ඉරිදා- ඔබතුමා ඇමතිවරයා විධියට ලිපියක් යවනවා. Fax යවන්න බැහැ. අන්තිමට ඉරිදා නිවාඩු දවසේ, වෘත්තීය සමිති කාර්යාලයේ දොර යටින් ලියුම දාලා ගිහින් තිබෙනවා, සඳුදා -ඊයේ- සාකච්ඡාවට. අද ඔබතුමා ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. එතකොට කලබල වෙලා, ඉරිදා ලියුමක් ගෙන ගිහින් දොර යටින් ඇතුළු කළා. මෙහෙමද ප්‍රශ්න විසඳන්නේ? ඇමතිවරයා විධියට ඔබතුමාට මීට වඩා වගකීමක් තිබෙනවා, මේ

[ගරු විජිත හේරත් මහතා]

ප්‍රශ්නයට මැදිහත් වන්න. ඒ වගකීම ඔබතුමා පැහැර හැර තිබෙනවා. ඔබතුමන්ලා මාධ්‍යවලට කියා තිබෙන්නේ, "දැන් කමිටුවක් පත් කර තිබෙනවා. මේ ප්‍රශ්නය දැන් විසඳනවා. මාස තුනක් ඇතුළත මේක හදනවා" කියා. නැහැ. මාස තුනක් ඇතුළත හදනවාය කියා සහතිකයක් දී නැහැ. එතැනදී ඔබතුමන්ලා කියන්නේ මඩිහළුවා කමිටුවේ වාර්තාව ආවාට පස්සේ මේකට මැදිහත් වීමක් කරනවා කියායි. ඒක නොවෙයි උත්තරය වෙන්න ඕනෑ. හරි පැහැදිලිව කියනවා නම්, මඩිහළුවා කමිටුවේ වාර්තාව දැන් ඇත්තටම කෙරෙන්නේ නැති එකක්. ඒක පත් කරලාත් දැනට අවුරුද්දකට කිට්ටුයි. මාස තුනෙන් වාර්තාව දෙනවාය කියා කිව්වේ. මාර්තු මාසයේ වාර්තාව දෙනවාය කිව්වා. තවමත් නැහැ. ජූනි මාසය ගියා. හය මාසයයි. දැන් නවවන මාසය. මාස නවයක් ගියා. මාස තුනෙන් මඩිහළුවා කමිටුවේ වාර්තාව දෙන්නම් කිව්වා. අද වෙන තුරු වාර්තාව නැහැ. දැන් ඔබතුමා මාධ්‍යයට කියනවා, තව මාස තුනකින් ඒක දෙනවාය කියා. මේක කොහොමද පිළිගන්නේ? මේක පිළිගන්නට පුළුවන්ද? බැහැ. එම නිසා තමයි කම්කරු නිලධාරීන් කියන්නේ, "මඩිහළුවා කමිටුව අපට වැඩක් නැහැ. ඒකට Cabinet එකෙන් බලය පවරා තිබෙන්නේ වෙන වැඩකට. සේවා ව්‍යවස්ථාවක් හදන්න එතැනට බලය පවරා නැහැ" කියා. ඒ කමිටුවේ අයම එහෙම කියනවා. එම නිසා මේක නොවෙයි කළ යුත්තේ.

සේවා ව්‍යවස්ථාවක් හදන්න Cabinet එකේ අනුකමිටුවක් පත් කරන්න. එච්චරයි. මේක හරි සරල වැඩක්. ඔබතුමාට තිබෙන්නේ, කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරන්නයි. මේ නිලධාරීන්ගේ පැත්තෙන් ඉදිරිපත් කරන යෝජනා ටිකත්, එයට අමතරව ඔබතුමන්ලාට අමාත්‍යාංශය විධියට තව යෝජනා තිබෙනවා නම් ඒ ටිකත් ඒ සියල්ල සැලකිල්ලට අරගෙන කැබිනට් මණ්ඩලයෙන් පත්කරන අනුකමිටුවට සේවා ව්‍යවස්ථාවක් හදන්න බලය පවරන්න. අනුකමිටුව කියනවා නම් අපට කම්කරු නිලධාරීන් සඳහා සේවා ව්‍යවස්ථාවක් හදන්න බැහැ කියා, ඒක වෙනම කථාවක්. එතකොට ඒකට උත්තර වෙනම සොයන්න වෙනවා. මේ සරල වැඩය ඇයි කරන්නේ නැත්තේ?

මේ ප්‍රශ්නය දැන් ජාතික ප්‍රශ්නයක් කරලායි තිබෙන්නේ. ජාතික ප්‍රශ්නයක් කරලා එක පැත්තකින් අනිවාර්ය සේවා කරන්න නියෝග කරනවා. අනෙක් පැත්තෙන් වැටුප් නතර කරනවා. මේ මර්දනය කළාම සහකාර කම්කරු කොමසාරිස්වරුනුත් වැඩ වර්ජනයට සම්බන්ධ වුණා. ඊයේ ඉඳලා එතුමන්ලාත් වර්ජනයට ආවා. මේක සරලව නියපොත්තෙන් කඩලා බේරා ගන්න තිබුණු වැඩක්. දැන් පොරවෙන් කපා බේරන්නට බැරි තත්ත්වයට වර්ධනය වෙලා තිබෙනවා. සහකාර කම්කරු කොමසාරිස්වරුනුත් වැඩ වර්ජනයට කැඳවා ගත්තා, ඔබතුමන්ලා හරියාකාරව මේකට මැදිහත් වුණේ නැති නිසා. මේ ප්‍රශ්නය දුර දිග ගෙනියන්න ඕනෑ එකක් නොවෙයි. හරි පැහැදිලිව, මේ කම්කරු නිලධාරීන්, කම්කරු කොමසාරිස්වරු, කම්කරු දෙපාර්තමේන්තුවේ සමස්ත නිලධාරීන් ඉල්ලා සිටින්නේ තමන්ගේ වෘත්තියට සේවා ව්‍යවස්ථාවක් හදා දෙන්නය කියායි. ඒ සේවා ව්‍යවස්ථාව හදන්න අඩුම ගණනේ මැදිහත්වීමක් තිබෙනවාය කියන එක කැබිනට් අනුකමිටුවක් පත් කර ප්‍රායෝගිකව ඔප්පු කර පෙන්වන්න. එච්චරයි. අද ඔබතුමා තීන්දුවක් ගන්න. අද ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරන්න. "සේවා ව්‍යවස්ථාව පිළිගන්න මම ප්‍රතිපත්තියක් විධියට එකඟයි" කියා ලිඛිතව තිබෙනවා. ප්‍රතිපත්තියක් විධියට එකඟ වුණාට වැඩක් නැහැ. Practically ඒක අවුරුදු දහයක් තිස්සේ සිද්ධවෙලා නැහැ. 2006 වැටුප් චක්‍රලේඛයේ නිර්දේශ කරපු දෙය අවුරුදු දහයක් තිස්සේ සිද්ධවෙලා නැහැ.

ඇමතිතුමනි, ඔබතුමාත් කම්කරු ඇමතිවරයා විධියට කාලයක් හිටියා. ඇත්තටම අවංක වුවමනාවක් තිබෙනවා නම් මෙය කරන්න පුළුවන්. වුවමනාවක් නැහැයි කියන එක තමයි මේ පේන්නේ. ඒකයි මම කිව්වේ. ඒක කරන්න ඕනෑය කියා එතැන කමිටුවේදී නියෝජ්‍ය ඇමතිවරයා පිළිගත් දෙය ඔබතුමා පිළිගන්නේ නැතිවෙනකොට එතැන පරස්පරයක් තිබෙනවා. ඔබතුමන්ලා දෙන්නා අතර වෙන ප්‍රශ්නයක් තිබෙනවාද කියා අපට තේරෙන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ එක ප්‍රතිපත්තියක්, ඔබතුමා නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය තව එකක් නිසාද මේ ප්‍රශ්නය ආවේ? සාමාන්‍යයෙන් වෙන්න ඕනෑ එහි අනෙක් පැත්තයි. යුඇන්පිය තමයි විරුද්ධ වෙන්න ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැමැති වෙන්න ඕනෑ. දැන් වෙලා තිබෙන්නේ ඒකේ අනෙක් පැත්ත. යුඇන්පී රාජ්‍ය ඇමතිතුමා එකඟ වුණාය කියා කියනවා. සිරසේ voice-cut එක යනවා. රාජ්‍ය ඇමතිතුමා හරි පැහැදිලිව කියනවා, සේවා ව්‍යවස්ථාව සඳහා කැබිනට් අනුකමිටුවක් පත්කරනවා කියා. ඒක මාධ්‍යවලට කිව්වා. ඒක 17වන දා "සිරස" රාත්‍රී ප්‍රවෘත්ති විකාශනයේ පළ වුණා. ඒක නැහැ කියන්න බැහැ, Minutesවලට මොන බොරු දැම්මත්. ඒකේ, Minutes තවම දුන්නේ නැහැ. එතැන වෙන ප්‍රශ්නයක් තිබෙනවාද කියා අපට තේරෙන්නේ නැහැ.

හැබැයි, මේ ප්‍රශ්නයෙන් තැළෙන්නේ කම්කරු නිලධාරීන්. කම්කරු නිලධාරීන් විතරක් නොවෙයි. රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ වැඩ කරන සේවකයන් ලක්ෂ 80ක් මෙහි ප්‍රතිඵලය බුක්ති විඳිනවා. මේ ප්‍රශ්නය ජාත්‍යන්තරවත් බලපානවා. මේ ප්‍රශ්නය ILO එකට යනවා. ලංකාවේ කම්කරු නීතිය පිළිබඳව ILO එක සඳහන් කරලා තිබෙන්නේ මොකක්ද? ILO එක පිළිගත් එක කරුණක් තමයි කම්කරු දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ සේවා ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නය. ඒක පැහැදිලිව තිබෙනවා. මේවා නොකර හිටියාම ඊළඟට එනවා, GSP Plus ප්‍රශ්නය. පසු ගිය කාලයේ GSP Plus බදු සහනය අපට අහිමි වුණා. ඒක අහිමි වෙන්න එක හේතුවක් තමයි මේ රටේ වෘත්තීය කම්කරුවන්ගේ කම්කරු අයිතිවාසිකම් පිළිබඳව නිසි ගරුත්වයක්, නිසි ආකාරයේ සැලකීමක් නොමැති වීම. ඒ නිසා නැවත මෙය ජාත්‍යන්තර ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය සරල නැහැ. තුන්සිය ගණනක් කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනයක් කියලා මේක සරලව සලකන්න එපා. මේක ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ජාත්‍යන්තර ප්‍රශ්නයක් වීම අත ළඟයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානය දැනටමත් මේ ප්‍රශ්නය භාර ගෙනයි තිබෙන්නේ. එතකොට මේ ප්‍රශ්නය අනිවාර්යයෙන්ම ජාත්‍යන්තරය තුළ සාකච්ඡා වෙනවා. ජනාධිපතිවරයා "නිව්යෝර්ක්" ගිහිල්ලා ලස්සනට මොන කථා පැවැත්වුවත් වැඩක් නැහැ. මොකද, කම්කරු නීතිය පිළිබඳව, කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව අපේ රට හරියට ක්‍රියාත්මක වුණාද, නැද්ද කියන එක එතැනදී අනිවාර්යයෙන් සලකනවා. ඒ නිසා මේක එහෙම සරලව ලඝු කරලා සලකන්න එපා. මේක බරපතළ ප්‍රශ්නයක්. ඔබතුමන්ලා අත්තනෝමතික තීන්දු තීරණ අරගෙන බලහත්කාරී විධියට වැටුප් ගෙවන එක නතර කරලා ප්‍රශ්නයෙන් ලිස්සලා යන්න, ප්‍රශ්නය යට ගහන්න ලැහැස්ති වෙන්න එපා. මේ ප්‍රශ්නයට වහාම මැදිහත් වෙන්න. මේ ප්‍රශ්නය විසඳන්න. මේ ප්‍රශ්නය විසඳන්න කරන්න තිබෙන්නේ එකම එක දෙයයි. ඒ වෙන මොකක්වත් නොවෙයි. කඩිනමින්, දවසින් -පැය 24න්- විසඳුමක් ගෙනෙන්න බැරි බව මම පිළිගන්නවා. හැබැයි, ඔබතුමන්ලාට කරන්න පුළුවන් සරල දෙයක් තිබෙනවා.

මේ යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න. කැබිනට් මණ්ඩල අනු කමිටුවක් පත් කරන්න. ඒ අනු කමිටුවට මේ සියලු යෝජනා ඉදිරිපත් කරන්න. ඒ අනු කමිටුවට යම් කාලයක් දෙන්න. මාස තුනක් ඇතුළත ඒ අනු කමිටුවට පුළුවන්, සේවා ව්‍යවස්ථාව හදනවාද, නැද්ද, හදන්නේ කොහොමද කියන එක පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කරන්න. එතැනට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. එතැනට ඉදිරිපත් කර වහාම මේ ප්‍රශ්නය

විසඳන්න. මේ ප්‍රශ්නය ජාත්‍යන්තර ප්‍රශ්නයක් බවට පත් කර ගන්න එපා. මේ කම්කරු නිලධාරීන්ගේ ප්‍රශ්නය, අපේ රටේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ වැඩ කරන සමස්ත ජනතාවගේ ජීවිත පිළිබඳ ප්‍රශ්නයක්. කම්කරු නිලධාරීන්ගේ වැටුප් නොගෙවා ඉඳලා මේ ප්‍රශ්නය සරලව මර්දනය කරන්න ලැහැස්ති වෙන්න එපා. මේ ප්‍රශ්නයට වහාම කඩිනම් විසඳුමක් ලබා දෙන්න. කඩිනමින් කැබිනට් අනු කමිටුවක් පත් කරන්න. පත් කරලා මේ ප්‍රශ්නයට විසඳුමක් දීලා, මේ සේවා ව්‍යවස්ථාව කඩිනමින් හදන්න කියන ඉල්ලීම ආණ්ඩුවෙන් කරමින් මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 6.45]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ 80ක් පමණ වන රාජ්‍ය, පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ වැඩ කරන සමස්ත ජනතාවගේ අයිතිවාසිකම් ලබා දීම සඳහා විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් වශයෙන් සලකමින් මා එය ස්ථිර කරනවා. ඒ වාගේම මම ඒ ගැන වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම හිතන හැටියට තමුන්නාන්සේ දෙතාවකදී පමණ කම්කරුවන් පිළිබඳව වගකීම් දරන අමාත්‍යවරයා වශයෙන් පත් වෙලා තිබෙනවා. නමුත් මේ වාගේ ප්‍රශ්නවලට මැදිහත් වෙලා ඒවා නිරාකරණය කර ගන්න පුළුවන් විධියේ ප්‍රායෝගික වැඩ පිළිවෙළක් තවමත් නැති බව තමුන්නාන්සේ දන්නවා. මේ පත් වෙලා තිබෙන ආණ්ඩුවත් දෙබිඩි - hybrid - ආණ්ඩුවක්. ඇමතිවරයා එක පක්ෂයක. රාජ්‍ය ඇමතිවරයා තවත් පක්ෂයක. ඒ නිසා තමුන්නාන්සේලා දෙදෙනා කඹ අදින්නේ නැතුව, පරස්පරතා ඇති කර ගන්නේ නැතුව එකට එකතු වෙලා, එක අදහසකට ඇවිල්ලා, වැඩ කරන ජනතාව වෙනුවෙන් මේ කැකෑරෙන ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න. තමුන්නාන්සේලා විවිධ පැති නියෝජනය කරමින් එහේ මෙහේ යන්නේ නැතුව, නිවැරදිව තර්කානුකූලව බිමේ ක්‍රියාත්මක කරන්න පුළුවන් ප්‍රායෝගික විසඳුමක් ලබා දීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 6.47]

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour and Trade Unions Relations)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පවතින කම්කරු නිලධාරීන්ගේ වැඩ වර්ජනය සම්බන්ධව සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාවක් ඉදිරිපත් කරමින්, ඒ සම්බන්ධයෙන් විවාදයට ලක් කිරීමට මා මිත්‍ර ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කටයුතු කිරීම ගැන මා සතුටු වනවා. මොකද, මේ අවස්ථාව, අපි මේ ප්‍රශ්නය පිළිබඳව දින කිහිපයක් තිස්සේ සාකච්ඡා කරමින්, මේ ප්‍රශ්නය විසඳීමට පියවර ගනිමින් සිටින අවස්ථාවක් නිසා. එතුමාගේ කථාවේ සත්‍යයට වඩා අසත්‍ය ගැබ් වුණා. කරුණු බොහෝ දුරට විකෘති වෙලා තමයි ප්‍රකාශ වුණේ. මා හිතනවා, එසේ වන්නට ඇත්තේ, එතුමාට දීපු ආරංචි අනුව වෙන්නට ඇති කියලා. අපි මුල සිටම බොහොම වග කීමක් ඇතිව මේ ප්‍රශ්නයට ප්‍රවේශ වුණා.

කම්කරු නිලධාරීන් අපේ දෙපාර්තමේන්තුවේ වැදගත් කර්තව්‍යයක් කරන නිලධාරි කණ්ඩායමක් බව මා පිළිගන්නවා. ඒක තමයි මගේ අදහස. ඒ නිසා මේ කම්කරු නිලධාරීන්ට අවාසියක් හෝ අසාධාරණයක් වන විධියට කටයුතු කරන්න මා කෙසේවත් බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, මා අද විතරක් නොවෙයි, මීට පෙරත් 1997 සිට 2000 දක්වා කම්කරු ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. එදා මා කම්කරු ඇමතිවරයා වශයෙන් කටයුතු කළ අවුරුදු 3ක හෝ අවුරුදු 4ක පමණ කාලය තුළ මේ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කරලා මෙහි ගුණාත්මක තත්ත්වය වැඩි කරන්න කටයුතු කළා. ඊට පස්සේ වර්තමාන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිවරයා වශයෙන් නැවත පත් කළාට පස්සේ කම්කරු නිලධාරීන් වරක් හෝ දෙකක් ඇවිල්ලා කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ තිබෙන වැදගත්කම ගැන සාකච්ඡා කළා.

ඇත්ත වශයෙන්ම මා ඒ වන කොට තේරුම් ගෙන තිබුණා, කම්කරු දෙපාර්තමේන්තුවේ ගුණාත්මක තත්ත්වය වර්ධනය කරන්න නම් ප්‍රතිව්‍යුහගත කිරීමකට යන්න ඕනෑය කියලා. මොකද, කඩා වැටීම්වලට සහ පසු බෑම්වලට ලක් වුණු බොහෝ අංශ එහි තිබෙන බව මා දැක්කා. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කියපු, සේවක අර්ථසාධක අරමුදල් එකතු කිරීම විශාල වශයෙන් පසු බෑමට ලක් වුණා. සේවක අර්ථ සාධක අරමුදල් ලැබිය යුතු බොහෝ අයට සේවක අර්ථ සාධක අරමුදල් ලැබෙන්නේ නැහැ. සේවක අර්ථ සාධක අරමුදල් ගෙවිය යුතු බොහෝ හාම්පුතුන් සේවක අර්ථසාධක අරමුදල් ගෙවන්නේ නැහැ. ඒ ගැන සොයන්න, ඒවා එකතු කරන්න, ඒ අයට විරුද්ධව නඩු පවරන්න, ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්න හරියාකාරව කටයුතු කෙරෙන්නේ නැහැ. ඊට සම්බන්ධ කරුණු අපට තේරුම් ගියා. වෘත්තීය සමිති ගණනාවකුත් මේ කාරණා මා වෙත ඉදිරිපත් කළා. ඊට පස්සේ අපි තීන්දු කළා, මේ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑය කියලා. ඒ අනුව මහින්ද මඩිහේවා කමිටුව පත් කළා. මහින්ද මඩිහේවා කියන්නේ, කම්කරු නිලධාරියකු වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ඇතුළු වෙලා, ඊට පසුව කම්කරු කොමසාරිස් ජනරාල් වශයෙන් පත් වෙලා, අවසානයේ අමාත්‍යාංශයේ ලේකම් ධුරයට පත් වුණු මේ රටේ කම්කරු ක්ෂේත්‍රයේ, කාර්මික ක්ෂේත්‍රයේ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්. ඒ නිසා කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ඔහුගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කළා. මේ කටයුත්ත කම්කරු නිලධාරීන්ගේ සංගමය පිළිගත්තා. ඒ අය සතුටු වෙලා කිව්වා, "කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කර එහි සේවාවල කාර්යක්ෂමභාවය හා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ උසස් වීම් අවස්ථා පුළුල් විය යුතුයි යන අපගේ මතය ක්‍රියාත්මක කිරීම සඳහා මහින්ද මඩිහේවා කමිටුව පත් කර ගැනීමට ලැබීම අප ලැබූ ජයග්‍රහණයකි" කියලා.

කම්කරු නිලධාරීන් විසින්ම ඔවුන්ගේ මාසික සඟරාවේ පළ කළා, "ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටුව පත් කර ගැනීමත්, මහින්ද මඩිහේවා මහත්මයා ඒ කමිටුවේ සභාපති වශයෙන් පත් වීමත් අපි ලැබූ ජයග්‍රහණයක්" කියලා. එදා ඒ විධියට අගය කරලා, ඊට පස්සේ ඒ අයම ගිහින් ඒ කමිටුව ඉදිරියේ කරුණු ඉදිරිපත් කළා. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, ඒ කමිටුව පත් කළේ ජනවාරි මාසයේය, දැනට මාස 6කටත් වැඩි කාලයක් ගතවෙලා තිබෙනවාය කියලා. නැහැ, ඒක වැරදියි. ඒ කමිටුව පත් කළේ මාර්තු මාසයේයි. මාර්තු මාසයේ සිට මාස 3ක් ගත වුණාට පස්සේ ඒ අය අපට කරුණු ඉදිරිපත් කිරීමක් කළා; presentation එකක් කළා. ඒ වන තෙක් කරපු වැඩ කටයුතු සම්බන්ධව අප දැනුවත් කරලා ඒ අය කිව්වා, "සියලු අංශවල අදහස් විමසන්න ඕනෑ. එම නිසා තව මාස 3ක් කල් දෙන්න"යි කියලා. කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, වෘත්තිය සමිති, විශ්‍රාමලත්

[ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා]

නිලධාරීන්, භාණ්ඩාගාරයේ නොයෙක් අංශ, පිටස්තර වෘත්තීය සමිති ආදී සියලුදෙනාම කැඳවා ඒ සම්බන්ධයෙන් කරුණු විමසා අංග සම්පූර්ණ වාර්තාවක් ලබා දෙන්න තිබුණු වුවමනාව නිසා තව මාස 3ක් කල් දෙන්න කියා ඉල්ලා සිටියා. ඒ අනුව තමයි සැප්තැම්බර් 30 දක්වා ඒ කමිටුවට කල් දුන්නේ. මා පැහැදිලිව කියන්නට ඕනෑ, සැප්තැම්බර් 30 දිනට පෙර මහින්ද මඩිහළුවා වාර්තාව අපට ලබා දෙනවාය කියන පොරොන්දුව එතැන තිබෙන බව. මේ ප්‍රතිව්‍යුහගත කිරීම කාලයක් තිස්සේ අවශ්‍ය වෙලා තිබුණා. කාලයක් තිස්සේ ඉල්ලපු ඒ කාරණය ඉෂ්ට වන වෙලාවේ, දැන් ඒක හකුළා ගන්න කියන එක වැරැදියි. එහෙම කරන්න බැහැ. ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍යාංශයෙන් කමිටුවක් පත් කළේ විශාල ඉලක්කයක් ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන්.

ඒ නිසා ඒක නැවත අවලංගු කරන්න පුළුවන්කමක් නැහැ. අපට ඒ වාර්තාව තවම ලැබුණේත් නැහැ. ඒ වාර්තාව ලැබෙන්නත් ඉස්සරවෙලා කම්කරු නිලධාරී මහත්වරුන්ගේ සංගමය කියන්නේ, "ඒක අවලංගු කරන්න, ඒක හකුලා ගන්න" කියලායි. ඒ වාගේම පළමුවෙන් කිව්වා, මහින්ද මඩිහළුවා මහත්මයා ඉවත් කරන්න කියලා. ඒ ගැන අපි ඇහුවා. මටත් වඩා අපේ රාජ්‍ය ඇමතිතුමා අහලා තිබෙනවා, "මහින්ද මඩිහළුවා මහත්මයා ඉවත් කරන්නේ ඇයි, එයාට විරුද්ධද" කියලා. "නැහැ, අපි එයාට විරුද්ධ නැහැ" කියා තිබෙනවා. එහෙම කියලා නැවතත් ගිහිල්ලා "මහින්ද මඩිහළුවා වාර්තාව හකුලා ගනිමු" කියලා හැම තැනම පෝස්ටර්ස් ගහලා තිබුණා. මේ විධියට පරස්පර විරෝධී ස්ථාවර ගන්නා වෘත්තීය සමිතියක් බවට මේ නිලධාරීන් පත් වී තිබීම ගැන මම කනගාටු වෙනවා. මොකද, යම් කිසි කාරණයක අවසානයක් ළඟා කර ගන්න නම් ඔවුන් පැහැදිලි ස්ථාවරයක ඉන්න ඕනෑ.

මේ නිලධාරීන්ගේ වෘත්තීය සමිතිය සමඟ සාකච්ඡා ගණනාවක් පැවැත්වුවා. පළමුවෙන්ම පසු ගිය සැප්තැම්බර් 5වැනි දා මා සමඟ සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවේදී ඒගොල්ලෝ කරුණු කිහිපයක් ඉදිරිපත් කළා. එකක් තමයි, ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පත් කර තිබෙන කමිටුව අහෝසි කරන්නය කියන එක. ඉතින් අපි පැහැදිලි කරලා කිව්වා, "ඒක කරන්න බැහැ, ඒක කරන්න බැරි දැන් ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටුවේ වැඩ කටයුතු අවසාන වෙලා ඒ වාර්තාව ලබා දීමට ආසන්න වෙලායි තිබෙන්නේ, අනිවාර්යයෙන්ම අපි ඒ වාර්තාව ලබා ගන්න ඕනෑ. අමාත්‍යාංශය විසින් විශාල බලාපොරොත්තු ඇතිවයි මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටුව පත් කළේ. මේ නිලධාරීන්ගේත් දෙපාර්තමේන්තුවේත් උන්නතිය වෙනුවෙන් ඒ කමිටු වාර්තාව අපි ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා"ය කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ඒ අය සේවා ව්‍යවස්ථාවක් ඉදිරිපත් කළා. ඒක ඒ අය විසින් හදපු සේවා ව්‍යවස්ථාවක්. මම කිව්වා, "මම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා හැටියට අවුරුදු හතරහමාරක් සිටියා, එහෙම සේවා ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරන්න බැහැ, සේවා ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරනවා නම් ඒ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවල අයගේත් අදහස් ගන්න ඕනෑ. දෙපාර්තමේන්තුවේම අදහස් ගන්න ඕනෑ" කියලා. මේ සියලුම අංශ ගැන සලකා බැලීමෙන් පසුව, සියලු දෙනාගේම කැමැත්ත අනුව තමයි සේවා ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ සේවා ව්‍යවස්ථාවට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ, වැටුප් වැඩිවීම් සම්බන්ධයෙන් තිබෙන වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ඕනෑ. එහෙම නැතිව සේවා ව්‍යවස්ථාවක් අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න බැහැ. මම හිතන විධියට ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාට මේ ගැන අවබෝධයක් නැතිව ඇති. සේවා ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරනවා නම් ඇමතිවරයා වගකියන්න ඕනෑ. එහෙම නැතිව වෙනත් කවුරු හරි හදපු එකක් අරගෙන කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා "මේක පිළිගන්න, මේ ගැන කටයුතු කරන්න කැබිනට් අනු කමිටුවක් පත් කරන්න" කියලා කියන්න ඇමතිවරයාට බැහැ. එහෙම සිරිතක් ඇත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැනත් එතුමා කිව්වා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කළේ ඉතාම වැරදි ක්‍රියාවක් බව අපි දන්නවා. මම මෙතැනදී ඒ ගැන දිගින් දිගට කථා කරන්න යන්නේ නැහැ. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ ඇමතිවරයා වශයෙන්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වශයෙන් අපි ඒ පිළිබඳව විරුද්ධ වුණා. මේක අනාගතයේදී ප්‍රශ්න රැසකට තුඩු දෙන කාරණයක් කියලා අපි පෙන්වා දුන්නා. නමුත් ඒ වෙලාවේ බදු නිලධාරීන් කොමසාරිස්වරුන් බවට පත් කරලා, තනතුරු නාමය වෙනස් කරලා ඒ අය "SL 1" පඩි ක්‍රමයේ තිබ්බා. ඒ නිසා අද වන විට මේ ප්‍රශ්න පැන නඟින්න පටන් ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අද ඒ දෙපාර්තමේන්තුවම අධිකරණයට ගිහින් තිබෙනවා. නඩු ගණනාවක් අධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ නඩු කිහිපයක් අධිකරණයේ ඇහෙනවා. ඒ අතරතුර, හිටපු තක්සේරුකරුවන් -assessors- වැනි අයත් අධිකරණයට ගිහිල්ලා තිබෙනවා. අද මෙවැනි ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මේ ගැටලු නිරාකරණය කර ගෙන, පඩි වැඩිවීම් සම්බන්ධ යෝජනා ඇතුළත් කරලා, සේවා ව්‍යවස්ථාවත් අරගෙන තමයි කැබිනට් එකට යන්න ඕනෑ. මොකද, ඇමතිවරයෙක් වශයෙන් ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න මට බැහැ. මම ඒ ගැන සැලකිලිමත් වෙන්න ඕනෑ. ඒ අය "SL 1" වැටුප් ක්‍රමය යටතේ තියන්න කිව්වාම, එක පාරටම මට ඒක අරගෙන ගිහිල්ලා කැබිනට් එකට දමන්න බැහැ. මේ "SL 1" වැටුප් ක්‍රමයේ පිහිටුවන්න කියලා ඒ අය කියනවා නම්, එයින් ඇති වන විපාක ගැනත් මම කැබිනට් එක දැනුවත් කරන්න ඕනෑ. ඒ හා සමාන නිලධාරීන්ගෙන්, අනෙක් දෙපාර්තමේන්තුවලින් මේකට කොයි විධියේ ප්‍රතිචාරයක් ලැබෙයිද, ඒ නිලධාරිනුත් මේ වැටුප් ක්‍රමය ඉල්ලයිද කියන එකත් බලන්න ඕනෑ. "SL 1" කියන්නේ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ගේ ආරම්භක වැටුප. කම්කරු නිලධාරීන් ඒ ආරම්භක වැටුපේ තිබ්බාම, දැනට "SL 1" වැටුප ලබන නිලධාරීන්ගේ ප්‍රතිචාරය කුමක් වෙයි ද? ටික කාලයක් ගිහිල්ලා ඒ අයත් ඉල්ලයි, "අපට "SL 1" වැටුප් ක්‍රමයේ ඉන්න බැහැ, අපට ඊට වඩා ඉහළ මට්ටමට යන්න ඕනෑ" කියලා. ඉතින් මම මේ කරුණු අධ්‍යයනය කරන්න ඕනෑ.

මම නිලධාරීන් ලවා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගෙන, ඒ අනුව තමයි කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුවේ වාර්තාවත් ඒ කරුණු සමඟ සසඳන්න ඕනෑ. ඒ කරුණු අතර පරස්පර විරෝධතාවක් තිබෙනවා නම් ඒක කරන්න බැහැ. මෙන්න, මේ නිසා තමයි මෙම කටයුත්ත සඳහා මාස තුනක කාලයක් මට දෙන්න කියලා මා කිව්වේ. එහෙම නැතිව මා කිසිම දවසක සේවා ව්‍යවස්ථාවක් අවශ්‍ය නැහැ කියන පදනමේ හිටියේ නැහැ. මා හැම වෙලාවේදීම සේවා ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියන මතයේ තමයි හිටියේ. මා අසනීපවෙලා හිටපු නිසා මට ඒ සාකච්ඡාවට සහභාගී වෙන්න බැරි වුණා. ඒ, අවස්ථාවේදී රාජ්‍ය ඇමතිතුමා මේ සාකච්ඡාව පැවැත්වුවා. ඇත්ත වශයෙන්ම එතුමා පැහැදිලි කර දුන්නේත් "සේවා ව්‍යවස්ථාව හදන්න අපි එකඟයි. ඒ සඳහා දැනටමත් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවට කම්කරු නිලධාරීන්ගේ නියෝජිතයිනුත් කීප දෙනෙකු පත් කරන්න" කියලායි. ඒ අනුව කම්කරු නිලධාරීන් තුන් දෙනෙකු එම කමිටුවට පත් කළා. ඊට පස්සේ එතුමා කිව්වා, "සේවා ව්‍යවස්ථාව ඉතා ඉක්මනින් සකස් කරන්න. මා ඇමතිතුමාට කියලා මේක

යවන්නම්" කියලා. නමුත් එම සේවා ව්‍යවස්ථාව සකස් කරන්න කම්කරු සමිතිය වෙනුවෙන් පත් කරපු නිලධාරීන් සහභාගී වුණේ නැහැ. ඒගොල්ලන් කියනවා, "අපි සහයෝගය ලබා දෙනවා" කියලා. සේවා ව්‍යවස්ථාව හදන කමිටුවේ සාකච්ඡාවටවත් සහභාගී වෙන්නේ නැතිව, ඔවුන් සහයෝගය ලබා දෙන්නේ කොහොමද? මීට ඉස්සෙල්ලා ඒ අය විසින්ම සකස් කරපු වාර්තාව, කිසිම ප්‍රශ්නයක් නැතිව - කිසිම සංශෝධනයක් නැතිව- ගෙන යෑම තමයි ඒගොල්ලන්ගේ බලාපොරොත්තුව. නමුත් ඒ කටයුත්ත කරන්න අමාරුයි කියන එකයි මා මේ කියන්නේ. මමත්, රාජ්‍ය ඇමතිතුමාත් අතර විරසක භාවයක් ඇති කරන්න ඒ අය හදනවා. නමුත් එහෙම විරසකභාවයක් ඇති වන්නේ නැහැ. මම පැහැදිලිව කියන්න ඕනෑ, අද තිබෙන අමාත්‍යාංශවලින් ඇමතිවරයාත්, රාජ්‍ය ඇමතිවරයාත්, - [බාධා කිරීමක්] ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. ඇමතිවරයාත්, රාජ්‍ය ඇමතිතුමාත් ඉතාමත් සහයෝගයෙන් යුතුව වැඩ කරන අමාත්‍යාංශයක් තමයි, අපේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය. එතුමාත්, මමත් අතර කිසිම කාරණයක් නිසා විරසක භාවයක් පැන නැඟිලාත් නැහැ; පැන නැහෙන්නෙත් නැහැ කියන කාරණය මා පැහැදිලිව කියනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඒ ගොල්ලන් කියන්නේ නැහැ, ඒ ගොල්ලන් හදපු සේවා ව්‍යවස්ථාවම ක්‍රියාත්මක කරන්න කියලා. ඒක වැරැදියි ඇමතිතුමනි. ඒ ගොල්ලන් කියන්නේ, එම සේවා ව්‍යවස්ථාවත් අරගෙන, ඔබතුමන්ලාගේ අදහසුත් ඉදිරිපත් කරලා, සියලු දෙනාගේම අදහස් මත ක්‍රියා කරන්න කියලායි. ඒකම ක්‍රියාත්මක කරන්න කියලා ඒ ගොල්ලන් කියන්නේ නැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

හරි, හරි. ඔබතුමා ඒ කටයුත්තට මැදිහත් වෙන්න. මා කියන්නේ ඒක නොවෙයි. ඒගොල්ලන් සේවා ව්‍යවස්ථාව ගෙනාවා. සේවා ව්‍යවස්ථාව ගෙනාවාට පස්සේ අපි කිව්වා, "මේ සේවා ව්‍යවස්ථාව ගෙනි යන්න බැහැ. අපි මේ සේවා ව්‍යවස්ථාව අධ්‍යයනය කරලා, යම් යම් සංශෝධනයන් කරලා, දෙපාර්තමේන්තුව පැත්තෙනුත් අදහස් ඉදිරිපත් කරලා, අංගසම්පූර්ණ සේවා ව්‍යවස්ථාවක් හදලා ඉදිරිපත් කරමු" කියලා. එම කටයුත්තට සහයෝගය ලබා දෙන්නේ නැති එකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. අනෙක් නිලධාරීන් ඊයේත් මේ සාකච්ඡාවට සහභාගී වුණා. අද දවසේත් ඒගොල්ලන් සාකච්ඡාවට සහභාගී වෙනවා. නමුත් කම්කරු නිලධාරීන්ගේ වෘත්තීය සමිතිය නියෝජනය කරන නිලධාරීන් කවුරුවත් ඊට සහභාගී වෙන්නේ නැහැ. රාජ්‍ය ඇමතිතුමාගේ සහභාගීත්වයෙන් පැවැත්වූ රැස්වීමේදී නිලධාරීන් තුන් දෙනෙකු ඒ සමිතිය නියෝජනය කරන්න පත් කළා. නමුත් එම නිලධාරීන් කවුරුවත් මීට සහභාගී වෙන්නේ නැහැ. "සේවා ව්‍යවස්ථාව හදන්න අපි අපේ සහයෝගය ලබා දෙනවා. අපේ අඩුපාඩුකම් තිබෙනවා නම් අපට දන්වන්න. අපි ලිඛිතව නොරතුරු එවනවා" වාගේ දේවල් තමයි ඒගොල්ලන් කියන්නේ. කමිටුවක් සේවා ව්‍යවස්ථාවක් හදනකොට එම කමිටුව එකට වාඩි වෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන් වැටුප් වැඩි වීමක් කරන්න කියලා ඉල්ලනවා. වැටුප් වැඩි වීමේ තිබෙන ආනිසංස ගැන කථා කරන්න ඔවුන් එතැන ඉන්න ඕනෑ. ඔවුන් ඒ කිසිම දෙයක් කරන්නේ නැහැ. තමුන්නාන්සේ මෙයට මැදිහත් වෙනවා නම් හොඳයි කියලා මා හිතනවා, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. වෘත්තීය සමිතිය අද එක දෙයක් කියනවා; හෙට තවත් දෙයක් කියනවා. "මාස තුනක කාලයක් අවශ්‍යයි" කියලා පස් වැනි දා කිව්වාම ඔවුන් ඒකට එකඟ වුණා. එකඟ වෙලා කියපු එකම දේ තමයි, "එහෙම නම් සතියක් ගණනේ අපට මේ ප්‍රගතිය වාර්තා කරන්න" කියන එක. අපේ කම්කරු කොමසාරිස් ජනරාල්තුමිය එයට එකඟ වුණා. නමුත් ඊට පහුවදාම "මාස තුනක කාලයක් ලබා දුන්නු එකට අපි එකඟ වෙන්නේ නැහැ" කියලා ලියලා එව්වා.

මා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ධුරයට පත් වූ දවසේ ඉඳලාම කියපු දෙයක් තමයි, මේ කම්කරු නිලධාරීන්ගේ සංඛ්‍යාව මදියි කියන එ . විශාල වශයෙන් කම්කරු නිලධාරීන්ගේ හිඟයක් තිබෙනවා. ඒ නිසා වැඩ කරන්න බැහැ. කම්කරු නිලධාරීන්ගේ හිඟය ඇත්ත වශයෙන්ම පෙනෙන්න තිබුණු දෙයක්. දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන්ගේ හිඟයක් තිබුණා. පසුව අපි කැබිනට් මණ්ඩලයට මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. ඒ අනුව කම්කරු නිලධාරීන් 200ක් බඳවා ගන්න දැන් අවසර ලැබිලා තිබෙනවා. ඊයේ ඇවිල්ලා කියනවා, "කම්කරු නිලධාරීන් බඳවා ගන්න එපා" කියලා. මෙහෙම දෙපාර්තමේන්තුවක් ගෙන යන්න අමාරුයි. අපි කවුරුත් එකට වාඩිවෙලා, සහයෝගයෙන් යුතුව සාකච්ඡා කරලා මේ කටයුතු කරන්න ඕනෑ. ඔය හැම කෙනෙකු එක්කම මා සාකච්ඡා පවත්වලා තිබෙනවා. මේ කම්කරු නිලධාරීන් එක්කත් මා සාකච්ඡා කරලා තිබෙනවා. ඔවුන් අද කියන දේ නොවෙයි හෙට කියන්නේ; උදේ කියන දේ නොවෙයි හවසට කියන්නේ. කම්කරු නිලධාරීන්ගේ වෘත්තීය සමිතිය ඉතාමත් අස්ථාවරභාවයක් පෙන්වනවා.

වැඩ වර්ජන කියන එක මට අලුත් දෙයක් නොවෙයි. මම හිටපු දෙපාර්තමේන්තුවල පැවති වැඩ වර්ජන නිරවුල් කරන්න මා සහභාගී වෙලා තිබෙනවා. වැඩ වර්ජන පවතින අවස්ථාවලදී වෘත්තීය සමිති පෙන්වන විශේෂ ලක්ෂණයක් තිබෙනවා. එනම්, වැඩ වර්ජනයක් ආරම්භ කරන්න වාගේම, වැඩ වර්ජනයක් අවසාන කරන්නත් වගකීමක් ඇතිව ඒ අය කටයුතු කරනවාය කියන එක. මොකද, වැඩ වර්ජනයක් දිගට ගෙනි යන්න කිසිම වෘත්තීය සමිතියක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් මේ කම්කරු නිලධාරීන්ගේ වෘත්තීය සමිතියේ එකම බලාපොරොත්තුව, වැඩ වර්ජනය අවසාන කරනවාට වඩා වැඩ වර්ජනය ඉදිරියට ගෙන යෑමයි. මේක තමයි අද සිද්ධ වෙලා තිබෙන තත්ත්වය. මේක ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක්. මොකද, අපට එකඟ වෙන්න බැරි ඉල්ලීම් කිහිපයක් මෙතැන තිබෙනවා. ඒවා සාකච්ඡා කරලා, සැහැල්ලු තත්ත්වයට පත් කරලා කැබිනට් මණ්ඩලයට ගෙනියන්න ඕනෑ. ඒ වාගේම වැටුප් වැඩිවීම සම්බන්ධවත් අදාළ අංශ එක්ක සාකච්ඡා කරන්න ඕනෑ. එසේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව තමයි සේවා ව්‍යවස්ථාවට ඇතුළු කරන්න ඕනෑ. එහෙම නැතුව කැබිනට් ඇමතිවරයෙක් වශයෙන් හිතුමතේට ඒවා සේවා ව්‍යවස්ථාව තුළට ඇතුළත් කරන්න බැහැ. මම ගිහිල්ලා ඒක සාධාරණීකරණය කරන්න ඕනෑ. එහෙම නැතිව නිකම්ම කඩදාසි අරගෙන යන්න පුළුවන්කමක් නැහැ. ඒ සඳහා තමයි කමිටුවක් පත් කළේ. අපි කිසිම අවස්ථාවක වග කීමෙන් පැනලා යන්න හදන්නේ නැහැ කියන එක මම ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාට විශේෂයෙන් කියන්න ඕනෑ. මෙම දෙපාර්තමේන්තුව කාර්යක්ෂම දෙපාර්තමේන්තුවක් කරන්නයි අපට වුවමනා කරන්නේ. ඒක නිසා තමයි අපි ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කළේ. ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කිරීමටත්, ඒ වාගේම මෙම දෙපාර්තමේන්තුවේ සේවකයන් සඳහා බලපාන සේවා ව්‍යවස්ථාවක් ඇති කිරීමටත් කටයුතු කරලා, අපි ඒ සියලු දෙනාගේම උන්නතිය සහ සුබසාධනය වෙනුවෙන්, අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරනවාය කියන එකත් ප්‍රකාශ කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමා.

[අ.භා. 7.03]

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කම්කරු නිලධාරීන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් වන වැඩ වර්ජනය අවසන් කිරීම සඳහා යම් කාර්ය භාරයක්, වග කීමක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයටත් තිබෙන නිසා මම මේ ගැන වචනයක් කථා කරන්න කැමැතියි.

නව ප්‍රතිව්‍යුහගත කිරීමක්, වැටුප් වැඩිවීමක්, නව සේවා ව්‍යවස්ථාවක් ඇති කිරීමක් යන කාරණා තුන ගැන තමයි ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කථා කළේ. නව සේවා ව්‍යවස්ථාවක් පිළිබඳව එතුමා දිගින් දිගටම කිව්වා. මේ රටේ තිබෙන කම්කරු දෙපාර්තමේන්තුව අවුරුදු 100කට වඩා පැරණි දෙපාර්තමේන්තුවක් විධියට, කාලීන ප්‍රශ්න, කාලීන අවශ්‍යතාත් එක්ක ප්‍රතිව්‍යුහගත කළ යුතුයි කියන එක අපේ රජයත් පිළිගන්නවා. ඒක නිසා තමයි ගරු ඇමතිතුමා මේ සඳහා කමිටුවක් පත් කරලා කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරන්නේ. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමට සමගාමීව තමයි නව සේවා ව්‍යවස්ථාවක් හදන්න ඕනෑකම තිබෙන්නේ. අපි නව සේවා ව්‍යවස්ථාවක් හදන කොට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හැටියට අපටත් එහි වග කීමක් තිබෙනවා. නව සේවා ව්‍යවස්ථාවක් හදන්නේ ඇයි? නව ව්‍යවස්ථාවක් හදන්නේ සේවකයන්ගේ වැටුප් තලයේ වෙනසක් ඇති කිරීම සඳහා යන්න තමයි තමුන්නාන්සේලාගේ එකම තර්කය. ඔක තමයි තිබෙන රහස ගරු මන්ත්‍රීතුමනි. ඒ වැටුප් තලය වෙනස් කරන්නේ කොහොමද?

කම්කරු නිලධාරීන්, කම්කරු සබඳතා ක්ෂේත්‍රයේ කාර්මික සාමය පවත්වාගෙන යන්න හොඳින් වැඩ කරන නිලධාරීන් පිරිසක් බව අපි දන්නවා. ඒ අය මේ රටේ කම්කරු නීති ක්‍රියාවට නංවලා, කම්කරුවන්ගේ - වැඩ කරන ජනතාවගේ - අයිතිවාසිකම් වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරනවා. අපි රජයක් වශයෙන් එම නිලධාරීන්ගේ ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ඔවුන්ගේ වැටුප් තලය පිළිබඳව අපි බලන්න ඕනෑ. SL - I වැටුප් තලයේ පිහිටුවන්න කියලා තමයි ඒ ගොල්ලෝ ඉල්ලන්නේ. ඒක, ඒ ගොල්ලන්ගේ වැඩ වර්ජනයේදී පැහැදිලිව කියන කාරණයක්. "දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරීන් SL - I වැටුප් තලයේ පිහිටුවපු නිසා අපිත් පිහිටුවන්න" කියලා ඒ අය කියනවා. එකක් වරද්ද ගත්තා කියලා තව වරද්දාගන්න හොඳ නැහැ. ඇමතිතුමාම කිව්වා, එදා රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා හැටියට මේකට එතුමා විරුද්ධත්වය ප්‍රකාශ කළා කියලා. කම්කරු නිලධාරීන් දැනට ලබන වැටුප් තලය වන්නේ MN - 5 වැටුප් තලයයි. රජයේ සේවයේ කාර්යාලගත, ක්ෂේත්‍රගත තනතුරු වාගේම උපාධිය මූලික සුදුසුකම ලෙස සලකා බඳවා ගන්නා තනතුරු සඳහා MN - 5 සහ MN - 6 වැටුප් ක්‍රම ලබා දී තිබෙනවා. එය, 2006 වසරේ කරන ලද වැටුප් ප්‍රතිශෝධනයට අනුව ඉහත සඳහන් තනතුරු සඳහා ලබාදුන් වැටුප් තලයයි. ඒ කියන්නේ, කම්කරු නිලධාරීන් MN - 5 වැටුප් තලයේ තමයි පිහිටුවන්නේ. MN - 6ත් පහුකරලා SL - I එක ලබා දෙන්න කියලායි ඒ ගොල්ලන් ඉල්ලන්නේ. එහෙම කළොත් විශාල ප්‍රශ්නයක් ඇති වෙනවා. මේක නිසා සමස්ත රාජ්‍ය සේවයේ ඇති වන අර්බුද මොනවාද කියලා අපි බලන්න ඕනෑ. එක ප්‍රශ්නයකට උත්තර දීලා තව ප්‍රශ්න කීයක් එයිද කියලා අපි බලන්න ඕනෑ. උපාධිය මූලික සුදුසුකම වන විධායක නිලධාරීන්ට SL - I වැටුප් ක්‍රමය ලබාදී තිබෙනවා. අනිත් එක, මේ සෑම තනතුරක් සඳහාම බඳවා ගන්නේ තරග විභාගයකින්. SL - I වැටුප් ක්‍රමයෙන් වැටුප ආරම්භ වන හැම නිලධාරියෙක්ම තරග විභාගයකින් බඳවා ගන්නේ උපාධිය මූලික සුදුසුකම කරගෙනයි. උපාධිය මූලික සුදුසුකම කර ගත් කම්කරු නිලධාරියාගේ වැටුප් තලය MN - 5. අපිත් පිළිගන්නවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරීන් පිහිටු වූ වැටුප් තලය වැරැදියි කියලා. කම්කරු නිලධාරීන්ටත් SL - 1 වැටුප් ක්‍රමය ලබා දුන්නොත්, MN - 5 සහ MN - 6 හිමි සියලු වෙනත් සේවකයන්ද මේ වැටුප ඉල්ලා නඩු මහට බහිනවා. ඒකේ දෙකක් නැහැ. එතකොට රජයක් විධියට අපි කොහොමද මේ කටයුත්ත කරන්නේ?

උදාහරණයක් විධියට, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරීන් ඉන්නවා. ඒ වාගේම උපාධිය මූලික සුදුසුකමක් ලෙස සලකා බඳවා ගත් ආර්ථික සංවර්ධන සංවර්ධන නිලධාරීන් ඉන්නවා. එම වැටුප් තලය දුන්නොත් ඒ ගොල්ලන්ටත් ඒ වැටුප ඉල්ලන්න පුළුවන්. අපි අහන්නේ, ඇයි අපි මේ කාරණය ගැන පුළුල්ව කල්පනා නොකර කටයුතු කරන්නේ කියලායි. MN - 5 වැටුප් ක්‍රමයේ සිටින නිලධාරීන් එක්වර SL - 1 වැටුප් ක්‍රමයට අන්තර්ග්‍රහණය කළොත්, සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන අනුරූප වැටුප් පියවරේ තැබිය යුතුයි යන්න සමඟ ද ක්‍රියාත්මක කළ නොහැකි බව නිරීක්ෂණය වෙනවා.

අපි 2016 වැටුප් සංශෝධනයක් ගෙන ආවා. 2020 වන විට රජයේ හැම නිලධාරියෙකුගේම මූලික වැටුප දෙගුණයකින් වැඩි වෙනවා. 2020 වෙන කොට MN - 5 වැටුප් ක්‍රමයේ තුන්වැනි ශ්‍රේණියේ ආරම්භක වැටුප රුපියල් 34,605යි. SL - 1 තුන්වැනි ශ්‍රේණියේ ආරම්භක වැටුප රුපියල් 47,625යි. කොහොමද මේක කරන්නේ?

එතැනදී තවත් ප්‍රශ්නයක් පැන නඟිනවා. සහකාර කම්කරු කොමසාරිස්වරු ඉන්නේ SL - 1 වැටුප් පරිමාණයේයි. කම්කරු නිලධාරීන් ඒ අදාළ වැටුප් පියවරට ගෙනාවොත්, සහකාර කම්කරු කොමසාරිස්වරු කියයි, "අපට මේ වැටුප් තලයේ ඉන්න බැහැ, අපි ඉහළ වැටුප් තලයකට යන්න ඕනෑ" කියලා.

අපි මේවා විසඳන කොට මුළු රාජ්‍ය සේවයම ගැන අපට කල්පනා කරන්න වෙනවා. අද මේ අර්බුදයක් ඇති කරන්නේ. සමහර වෘත්තීය සමිති නොයෙක් ඉල්ලීම් කරනවා. නමුත් රජයක් විධියට අපට වගකීමක් තිබෙනවා, අනෙක් සේවාවල අර්බුදයක් නොවන විධියට මේ කටයුත්ත කරන්න. මම හිතන්නේ මෙතුමන්ලා කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කරන්න කමිටුවක් පත් කරලා තිබෙනවා. විජිත හේරත් මන්ත්‍රීතුමා සේවා ව්‍යවස්ථාව ගැන කිව්වේ නැහැ. තමුන්නාන්සේ සේවා ව්‍යවස්ථාවේ වැටුප් වැඩි වෙන එක ගැන නොකියා ඒක හැංගුවා. සේවා ව්‍යවස්ථාව ඉල්ලන්නේ වැටුප් වැඩි කරන්නයි. මෙයින් අපේ රාජ්‍ය සේවයේම ප්‍රශ්නයක් ඇති වෙනවා.

දැනටමත් වැටුප් කොමිසම නව වැටුප් ක්‍රමයක් සම්බන්ධව සාකච්ඡා කර ගෙන යනවා. මුළු රාජ්‍ය සේවාවේම අලුතින් වැටුප් ක්‍රමයක් ප්‍රතිව්‍යුහගත කරන්න දැනට අපි සාකච්ඡා කර ගෙන යනවා. එතැනදී මෙවැනි ප්‍රශ්නවලට යම් උත්තරයක් දෙන්න අපට පුළුවන් වෙයි. රාජ්‍ය සේවයේ සිටින එක එක්කෙනා ඉල්ලන විධියට එක එක ආකාරයට වැටුප් ලබා දුන්නොත්, තව අර්බුද විශාල ප්‍රමාණයක් පැන නඟිනවා. අපේ රජය දැනට ඒ සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යනවා. කම්කරු ඇමතිතුමාත්, අපේ රාජ්‍ය ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර තිබෙනවා. නව සේවා ව්‍යවස්ථාවක් හදද්දී මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වාර්තාවත් අවශ්‍ය වෙනවා. මේ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා, වැටුප් කොමිසම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මේ සියල්ල එක්කාසු කරලා තමයි මේ කටයුත්ත කරන්න වෙන්නේ. මේ අයට වැඩ වර්ජනයෙන් එළියට එන්න කියලායි අපි කියන්නේ.

රජයේ සේවය වෙනුවෙන් කරන්න පුළුවන් ලොකුම වැටුප් වැඩිවීම කරලා තිබෙන්නේ අපේ ආණ්ඩුවයි. ඉතිහාසයේ කවදාවත් හිතුවේ නැහැ රජයේ සේවකයෙකුගේ වැටුප රුපියල් දසදහසකින් වැඩි වෙයි කියලා. අපේ ආණ්ඩුව අවුරුද්දකට මේ වෙනුවෙන් රුපියල් බිලියන 165ක් වැඩිපුර වැය කරනවා. ඒක 1:4 අනුපාතයට නැවත ගැළපුවාම, 2020 වර්ෂය වෙන කොට මේ සියල්ල මූලික වැටුපට එක්කාසු වුණාම රුපියල් බිලියන 300කට වැඩි මුදලක් අපට වැය වෙනවා. මේ ආකාරයට රජයේ සේවකයා වෙනුවෙන් විශාල වැඩ කොටසක් අපි කරලා තිබෙනවා. අපි තවත් ඒ සම්බන්ධව කටයුතු කර ගෙන යනවා. විජිත හේරත් මන්ත්‍රීතුමා සහ අපි ඉල්ලන්නේ මේ වේලාවේ ඒකට- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඔබතුමාගේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයත්, කම්කරු අමාත්‍යාංශයත් මැදිහත්වෙලා ඒ සියලු දෙනාටම පැහැදිලි කරන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
"Cabinet Subcommittees" කියලා අපි තුන්දෙනාම කථා කරන්නේ ඒකයි ගරු මන්ත්‍රීතුමා. මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වාර්තාව ආවාට පස්සේ ඒ ගැන කටයුතු කරනවා. ඒ කියන්නේ, යමක් කරන පිළිවෙළක් තිබෙනවා. [බාධා කිරීමක්]

භය වෙන්න එපා. අපේ ආණ්ඩුව කෙරෙහි රජයේ සේවකයාගේ විශ්වාසය තහවුරු වුණු නිසා තමයි පසුගිය මැතිවරණයේදී සියයට 60ක් පමණ රජයේ සේවකයින් අපට ඡන්දය දුන්නේ. තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලන්නේ මේවාගේ ව්‍යාත්තීය ක්‍රියා මාර්ග ගැනීමේදී මීට වඩා සාධාරණව කල්පනා කරන්න කියලායි. මේ අය වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කමිටු වාර්තාව ආවාම සාකච්ඡා කරලා අපි කරනවා. අද වැඩ වර්ජනයක් කළාම හවසට අපට කියන්නට පුළුවන්ද, "අපි මේකයි කරන්නේ" කියලා. ගරු අමාත්‍යතුමා කිව්වා 30වෙනි දා වන විට කමිටු වාර්තාව එනවා කියලා. ඉන් පසුව අවශ්‍ය කටයුතු කරනවා. [බාධා කිරීමක්] ඉල්ලන සියල්ල දෙන්න බැහැ. රජය කල්පනා කරලා ඒ සම්බන්ධව-

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒ ටික කරන්න යාන්ත්‍රණයක් හදන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රන්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නමුත් ගරු මන්ත්‍රීතුමා ඒවා නිවැරදි කරන විට රාජ්‍ය සේවාවේ අර්බුදයක් නොවන විධියට අපි ඒ කටයුතු කරන්නට ඕනෑ. බොහොම ස්තුතියි.

[අ.භා. 7.13]

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා ව්‍යාත්තීය සමීති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவீந்திர சமவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - State Minister of Labour and Trade Unions Relations)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා අද දින ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න අමාත්‍යතුමා පැහැදිලි පිළිතුරක් ලබා දුන්නා. මේ ප්‍රශ්නයට අදාළව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාත් එතුමාගේ අමාත්‍යාංශය පැත්තෙන් මේ සභාවට කරුණු ඉදිරිපත් කළා.

මට මෙතැනදී විශේෂයෙන් ප්‍රකාශ කරන්නට තිබෙන්නේ මෙයයි. පසු ගිය 13වෙනි දා අපේ ගරු අමාත්‍යතුමා හදිසියේ අසනීප වූ නිසා එතුමාගේ ඉල්ලීම පරිදි මම රාජ්‍ය සේවා කම්කරු නිලධාරීන්ගේ සංගමය සමඟ සාකච්ඡාවක් කළා. මේ සාකච්ඡාවට මැදිහත්කරුවෙකු හැටියට කම්කරු කොමසාරිස්වරුන්, අපේ කොමසාරිස් ජෙනරාල්තුමියටත්, ලේකම්තුමියටත් දන්වලා ඒ අයත් සමඟ ඇවිල්ලා තමයි සාකච්ඡා කළේ. මේ සාකච්ඡාවේදී ඒ අය කියපු දේ මම අහගෙන හිටියා. අහගෙන ඉන්නා විට මට තේරුණා, මේ අය ලොකු සැකයකින් තමයි මේ කථා කරන්නේ කියලා. මම අහපු පළමුවෙනි ප්‍රශ්නය තමයි, "ඔබතුමන්ලා දැන් ඇමතිතුමා විසින් පත් කරලා තිබෙන මඩිහඳේවා කමිටුව ගැන මොකක්ද කියන්නේ?" කියලා. "නැහැ, ඒ ගැන අපේ විශ්වාසයක් නැහැ" කිව්වා. මම ඇහුවා, "පුද්ගලයෝ ගැනද ප්‍රශ්නය තිබෙන්නේ?" කියලා. ඒ සියලු වාර්තා අපි ළඟ තිබෙනවා. මම ඇහුවා, "පුද්ගලයෝ ගැනද ප්‍රශ්නය තිබෙන්නේ, මඩිහඳේවා මහත්මයා ගැනද ප්‍රශ්නය තිබෙන්නේ?" කියලා. මම නම කියලාම ඇහුවා. "නැහැ, කිසි ප්‍රශ්නයක් නැහැ. කමිටුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව තමයි අපට තිබෙන ප්‍රශ්නය" කිව්වා. ඉන් පසුව මම ඇහුවා එහෙම නම් මොකක්ද යෝජනා කරන්නේ කියලා. ඒ අය කිව්වා, "අපට වෙන කිසි දෙයක් එපා. කැබිනට මණ්ඩලයෙන් පත් කළ කමිටුවක් පත් කරලා දෙන්න. එච්චරයි අපි ඉල්ලන්නේ. ඒ කමිටුව පත් කළ දවසට වැඩ වර්ජනය අවසන් කරනවා" කියලා. ඒ වාර්තා අපි ළඟ තිබෙනවා. එහෙමයි කිව්වේ. එතැනින් නතර වුණේත් නැහැ. තව කිව්වා, "ඒ කමිටුව කුමන නිර්දේශය දුන්නත් අපි පිළිගන්නවා. ඒ කමිටුව කොපමණ කාලයක් ගත්තත් අපට ප්‍රශ්නයක් නැහැ" කියලා.

මේක අහගෙන හිටියාම අපට පේනවා මේ කරන්නේ සද්භාවයෙන් කරන වැඩ වර්ජනයක් නොවෙයි, ඉල්ලීමක් නොවෙයි කියලා. මෙහෙම කියලා යෝජනාවක් එව්වා. මම කිව්වා, "හොඳයි, මම මේක ඇමතිතුමාට ඉදිරිපත් කරන්නම්" කියලා. මොකද, කැබිනට් මණ්ඩලයට මට යන්නට බැහැ නේ. කැබිනට් මණ්ඩලයට යන්නට ඕනෑ ඇමතිතුමා. මේගොල්ල පෙන්වන්නට හැදුවා, -දැන් අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාත් කිව්වේ- ඇමතිතුමායි මමයි අතර ප්‍රශ්නයක් තිබෙනවා. අපි මත දෙකක් දරනවා කියලා. එහෙම එකක් අපේ නැහැ. මේක මම මේ සභාවට පැහැදිලිවම කියන්නට ඕනෑ. මම කිව්වා, "හොඳයි, මම ඇමතිතුමාට ඉල්ලීම කරන්නම්, මේක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නට" කියලා.

ඒගොල්ල වැටුප් ප්‍රශ්නයක් ගැනත් කිව්වා. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා වැටුප් ප්‍රශ්නයක් නැහැ කියලා. නමුත් වැටුප් ප්‍රශ්නය තමයි ඒ අයගේ මූලික ප්‍රශ්නය. ප්‍රතිව්‍යුහගත කිරීම හා සේවා ව්‍යවස්ථාවක් හැදීම ගැන කිව්වා. මම කිව්වා, එහෙම කරන්න බැහැ කියලා. මම කිව්වා, සම්පූර්ණයෙන් මේක එක package එකක් වෙන්න ඕනෑ කියලා. එහෙම නැතිව අපේ ඇමතිතුමාට බැහැනේ කැබිනට අනු කමිටුවක් පත් කරන්නට කියන්නට, වැටුප් වැඩි කරන්න විතරක්. ඒක කරන්න බැහැ. මම කිව්වා, "එහෙම කරන්න බැහැ, මේ සියලු දේ එකට අන්තර්ග්‍රහණය වෙන්න ඕනෑ" කියලා. "කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න නම් අප මේ යෝජනා මාලාව හදන්න ඕනෑ" කියා මම කිව්වා. අපේ ගරු ඇමතිතුමා කියපු විධියට ඒ අයගේ නිලධාරීන් තුන්දෙනෙක් ඒ වෙනුවෙන් පත් කළා. ඒ ගොල්ලෝ අපට ඒ නිලධාරීන් තුන්දෙනා නම් කරලාම දුන්නා. අපත් අමාත්‍යාංශය පැත්තෙන් නිලධාරීන් තුන්දෙනෙක් නම් කළා. "ඒ

[ගරු රවීන්ද්‍ර සමරවීර මහතා]

නිලධාරීන් තුන්දෙනා එවලා හෙට ඉඳලා අපේ යෝජනා ඉදිරිපත් කරනවා" කියා ඒ අය කිව්වා. ඒකයි එකඟතාව. එහෙමයි එදා සාකච්ඡාව අවසාන වුණේ.

මම කිව්වා, "දැන් තමුන්නාන්සේලා සද්භාවයෙන් කටයුතු කරන්න, ඒක පෙන්වන්න." කියා. "එහෙම කරන්න බැහැ" කියා එයාලා කිව්වා. "එහෙම කියන්න එපා. යම්කිසි ප්‍රශ්නයක් විසඳන්න යනකොට දෙපාර්ශ්වයම ඒ ගැන සද්භාවයෙන් කටයුතු කරන්න ඕනෑ" කියා මම කිව්වා. "අප සඳුදා උදේට ප්‍රකාශයක් කරනවා, මේ අනුකම්පාව පත් කරන්න කියා. අහඹරුවාදා කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලීමක් කළොත් අප වැඩ වර්ජනය අවසාන කරනවා" කියා එතකොට ඒ අය කිව්වා. එහෙම කියලා එළියට ගිය මිනිස්සු මොනවාද කළේ? සවස හයහමාරෙන් පසුව අමාත්‍යාංශයට හොරෙන් ඇතුළු වෙලා ඇතුළේ පෝස්ටර් ගහන්න පටන් ගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, තව විනාඩි දෙකකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අන්න ඒකයි ඒ අය කළේ.

දැන් අපේ පැත්තේ වැඩකටයුත්ත අප කරගෙන යනවා. අප දැන් යෝජනා මාලාව හදනවා. කම්ටුවේ තුන්දෙනෙක් එනවා කිව්වා නේ. ඒ අයට ලියුම් යැව්වා. නමුත්, අද වන තුරු ඒ එක නිලධාරියෙකුවත් සහභාගි වෙලා නැහැ. මේ අය කරන්න හදන දේ මොකක්ද කියා මම දන්නවා. අපට මේක තේරෙනවා. මේ කරන්න හදන්නේ මොකක්ද? අපේ ඇමතිතුමා කැබිනට් මණ්ඩලයට ගිහින්, "මෙන්න මෙහෙම යෝජනාවක් තිබෙනවා." කියා කිව්වොත්, "අපෙන් කරුණු ඇහුවේ නැහැ. අප මේකට යෝජනා ඉදිරිපත් කළේ නැහැ. අප මේකට විරුද්ධයි" කියා එදාට ඒ අය කියයි. එතැනටයි මේ එන්න හදන්නේ. මෙහෙම ව්‍යක්තීය සමිතියක් එක්ක අප සාකච්ඡාවක් කරන්නේ කොහොමද, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි? 13වැනි දා තමයි අපේ රැස්වීම තිබුණේ. අද 20වැනි දායි. දැන් සතියක් ගත වෙලා තිබෙනවා. මේ අය එක දවසක්වත් ඇවිත් තවම එක වචනයක්වත් කියා නැහැ. ඊයේ අපේ ඇමතිතුමා මේ අය කැඳෙව්වා. ඊයේ මොකද කිව්වේ? මේ කතන්දර නොවෙයි එයාලා කියන්නේ. ඒ පාර කියනවා, "අලුතින් නිලධාරීන් බඳවා ගන්න එකට අප විරුද්ධයි" කියා. අද තමුන්නාන්සේලාම කිව්වා කෝටි ගණන් මුදල් අය වෙන්න තිබෙන බව. ඒ වෙනුවෙන් නඩු පවරා තිබෙනවා. ඇයි මෙහෙම වෙන්නේ? මේ රාජකාරියේ කොටසක් හරියාකාරව ඉෂ්ට වන්නේ නැති නිසායි. අපත් පිළිගන්නවා ලොකු මුදලක් අය වෙන්න තිබෙන බව. අන්තිමට නඩු මාර්ගයට අවතීර්ණ වෙන්න ඕනෑ. මේ රාජකාරිය හරියට වෙනවා නම් මෙහෙම දෙයක් වන්නේ නැහැ නේ.

අපට නිලධාරීන්ගේ ලොකු භිඟයක් තිබෙනවා. අපේ ඇමතිතුමා කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලීමක් කරලා නිලධාරීන් 200ක් බඳවා ගන්න අපට බොහොම අමාරුවෙන් දැන් අනුමැතිය ලැබී තිබෙනවා. මේ අය ඊයේ ඇවිත් ඇමතිතුමාට කියනවා, "එක්කෙනෙක්වත් බඳවා ගන්න බැහැ" කියා. මොකක්ද මේ කරන්නේ? ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා කරුණාකර මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න. මේක ආණ්ඩුවකට එල්ල කරන ප්‍රහාරයක් නොවෙයි. මේ වර්ජනය නිසා අහිංසක මිනිස්සු තමයි අන්තිමට බැට කන්නේ; අහිංසක කම්කරුවන් තමයි දුක් විඳින්නේ. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, අප ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සඳහා සද්භාවයෙන් ඉදිරිපත් වෙන්න, කරුණු තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න කියා කරුණාකර මේ ව්‍යක්තීය සමිතියට කියන්න. අපේ වැඩ කොටස අප කරගෙන යනවා.

අද කැබිනට් මණ්ඩල රැස්වීම පවත්වන්න තිබුණු දිනයයි. නමුත්, අතිගරු ජනාධිපතිතුමා රටින් බැහැරව සිටින නිසා අද ඒ කටයුත්ත කෙරුණේ නැහැ. අපේ ගරු ඇමතිතුමා ඊළඟ දිනයේදී මේ ගැන කැබිනට් මණ්ඩලයට දැනුම් දීමක් කරාවි. කැබිනට් මණ්ඩලයට දැනුම් දෙනකොට අපේ යෝජනා විතරයි නේ යන්නේ. ඇයි, එයාලා අදහස් ඉදිරිපත් කළේ නැහැ; සාකච්ඡාවට එන්නේ නැහැ. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, වැටුප් කපන්න අප තීරණය කර තිබෙනවාය කියා කිව්වා. අප එහෙම ප්‍රකාශයක් කර නැහැ. ඒ අය මේවා කියනවා. ඒ අය අපෙන් ඒක කරගන්නයි හදන්නේ, මේ වැඩේ අවුල් කර ගන්න.

කම්කරු නිලධාරීන් පන්සිය ගණනක් ඉන්න ඕනෑ තැන අද නිලධාරීන් 360කින් තමයි වැඩ කරන්නේ. අප උතුරු නැගෙනහිර පළාත්වලට ගියා. ගරු ඇමතිතුමායි මමයි මුලතිව් දිස්ත්‍රික්කයට ගියා. මුළු දිස්ත්‍රික්කයටම එක කම්කරු නිලධාරියායි ඉන්නේ. ඉතින්, කොහොමද වැඩ කටයුතු කෙරෙන්නේ? අපට නිලධාරීන් හදිසියේ බඳවාගන්න වෙනවා.

ඊයේ සාකච්ඡාවට ඇවිත් කියනවා, "එක්කෙනෙක්වත් බඳවා ගන්න බැහැ, අප විරුද්ධයි" කියා. එයාලා තව පියවරකට යන්නයි හදන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ ව්‍යක්තීය සමිතියට දැනුම් දෙන්න, මේ ප්‍රශ්නයට සද්භාවයෙන් මුහුණ දෙන්න කියා; ඒ අයගේ ඉල්ලීම් තිබෙනවා නම්, අපෙන් අඩු පාඩුවක් වෙලා තිබෙනවා නම් ඇවිත් ඒවා ඉදිරිපත් කරන්න කියන්න. අපේ ඇමතිතුමා ඒවා අන්තර්ගතය කරලා කැබිනට් මණ්ඩලයට දැනුම් දේවි. එහෙම නැතිව අප මේ යෝජනා හදාගෙන ගිහින් කැබිනට් මණ්ඩලයට දැනුම් දුන්නොත් කියාවි, "අපෙන් අහන්නේ නැතිව, අපේ අදහස් නැතිවයි මේ යෝජනා දුන්නේ, ඒ නිසා අපට වැඩ වර්ජනය අවසාන කරන්න බැහැ" කියා. එතකොට අප මොකක්ද කරන්නේ? ඒ නිසා මේ ප්‍රශ්නයේදී හැම පැත්තකම සාධාරණත්වයක් තිබෙන්න ඕනෑ. එසේ නොවෙනවා නම් ඒකේ වගකීම ඒ අයට තමයි භාර ගන්න වන්නේ, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි. ඒ කාරණය මම පැහැදිලිවම ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වේලාව අවසන්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙම යෝජනාව ඉදිරිපත් කළ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා. මේ ගරු සභාවේ කථා කළ කාරණා හරියාකාරව මාධ්‍යයට යයි කියා අපි බලාපොරොත්තු වනවා. මොකද, අපි කථා කරන කාරණය නොවෙයි, මාධ්‍යයෙන් පිට වෙන්නේ. ඔබතුමා දැන් ඒක ප්‍රකාශ කළා. මාධ්‍යයෙන් කථා

කරලා මගෙන් අහනවා, ඔබතුමා සහ ඇමතිතුමා මේකට පරස්පරවයි ඉන්නේ කියලා. මම කිව්වා, නැහැ. එහෙම දෙයක් නැහැ කියලා. එදා ඒ සංගමය ආපු වේලාවේ මම පැහැදිලිවම ඒක කිව්වා. ඒ ගොල්ලෝ කිව්වා, "ඇමතිතුමා, මේ ගැන හරියට කටයුතු කළේ නැහැ" කියලා. මම ඇහුවා, ඇමතිතුමා කටයුතු කළේ නැත්තේ ඇයි? කියලා. මොකද, මෙච්චර කල් මේ ඇමතිතුමා තමයි ඒ ගොල්ලන් සමඟ සාකච්ඡා කෙරුවේ. මේ ඇමතිතුමා තමයි මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටුව පත් කෙරුවේ. එතුමා මේ සඳහා ගන්න පුළුවන් හැම ප්‍රයත්නයක්ම ගත්තා. ඒ සාකච්ඡාවේදී ඒ ගොල්ලන්ගෙන් මම ඇහුවා, බැරිවෙලාවත් කැබිනට් අනුකාරක සභාවක් පත් කරලා එහි දී මහින්ද මඩිහහේවා මහතා පත් කළොත් මොකද වෙන්නේ කියලා. එතකොට කිව්වා, "අපිට ඒකට කමක් නැහැ" කියලා. අපි ළඟ ඒවාට සාක්ෂි තිබෙනවා. ඒ ගොල්ලන්ට "නැහැ" කියන්න බැහැ. නමුත් ඒ ගොල්ලන් සිරසට ගිහිල්ලා මොකක්ද, කිව්වේ? "අපි මහින්ද මඩිහහේවාට විරුද්ධයි." කිව්වා. ඉතින්, මේ වාගේ පිළිවෙළක් තියාගෙන මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ නිසා ඔබතුමන්ලාගෙන් අපි කරුණාවෙන් ඉල්ලනවා, සද්භාවයෙන්; විශ්වාසයක් ඇතිව කටයුතු කරලා මේ සඳහා ඉක්මනින් විසඳුමක් ලබා ගන්න පුළුවන් විධියට කටයුතු කරන්න කියා මේ වෘත්තීය සමිතියට දැනුම් දෙන්න කියන කාරණය. මොකද, මේකෙන් තැලෙන්නේ ආණ්ඩුවවත්, ඒ ගොල්ලන්වත් නොවෙයි, අසරණ වැඩ කරන ජනතාව බව මතක තබා ගන්න කියන කාරණය මතක් කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විවාදයකින් තොරව ඒකමතිකව පිළිගනු ලැබිණි.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 7.23 ට, 2016 සැප්තැම්බර් 21වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

අතුරු නියෝගය පරිදි පා.ව. 7.23 මණිකු පාරාලුමන්‍රම්, 2016 සැප්‍රැම්බර් 21, පුතන්කිළමෙ පා.ව. 1.00 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටදු.

Parliament adjourned accordingly at 7.23 p.m. until 1.00 p.m. on Wednesday, 21st September, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

246 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 246 - இல. 6
Volume 246 - No. 6

2016 සැප්තැම්බර් 21 වන බදාදා
2016 செப்ரெம்பர் 21, புதன்கிழமை
Wednesday, 21st September, 2016

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අර්බුදය

දෙමළ අධ්‍යාපන කලාප පිහිටුවීම

විශ්වවිද්‍යාලවල බාහිර උපාධි පාඨමාලාවලට සිසුන් ලියාපදිංචි කර ගැනීම සීමා කිරීම

එළාර රජුගේ සොහොන ප්‍රතිසංස්කරණය කිරීම :
අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ඔලුවිල් වරාය ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්න:
වැඩ බලන වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු එස්.එම්. මරික්කාර් මහතා] - පළමුවන වර කියවන ලදි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්:
වැටුප හා දීමනා

ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරුන් හා සාමාජිකයන්:
පාරිශ්‍රමික හා වෙනත් දීමනා

பிரதான உள்ளடக்கம்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

இலங்கை ஆயுர்வேத மருந்துக் கூட்டுத்தாபன நெருக்கடி

தமிழ்க் கல்வி வலயங்களைத் தாபித்தல்

பல்கலைக்கழகங்களில் வெளிவாரிப் பட்டப் பாடநெறி களுக்கான மாணவர் பதிவினை மட்டுப்படுத்தல்

எல்லாள மன்னனின் சமாதி புனரமைப்பு :
கல்வி அமைச்சரின் கூற்று

ஒலுவில் துறைமுகப் பிரதேச மக்கள் எதிர்நோக்கும் பாரிய பிரச்சினைகள்:
துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பதில் அமைச்சரின் கூற்று

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
ஆலோகா சமூக சேவை மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு எஸ்.எம். மரிக்கார்] - முதன்முறை மதிப்பிடப்பட்டது

இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய குற்றப் புலனாய்வு ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகம்:
சம்பளம் மற்றும் கொடுப்பனவுகள்

சுயாதீன ஆணைக்குழுக்களின் தலைவர்கள் மற்றும் உறுப்பினர்கள் :
ஊதியங்கள் மற்றும் ஏனைய படிகள்

PRINCIPAL CONTENTS

PUBLIC FINANCE COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Crisis in Sri Lanka Ayurvedic Corporation
Establishment of Tamil Education Zones
Limitation of Registration of Students for External Degree Courses in Universities

RESTORATION OF TOMB OF KING ELARA:
Statement by Minister of Education

SERIOUS PROBLEMS FACED BY PEOPLE IN OLUVIL PORT AREA:
Statement by Acting Minister of Ports and Shipping Affairs

PRIVATE MEMBERS' BILLS:
Aloka Social Service Foundation (Incorporation) – [The Hon. S.M. Marikkar] – Read the First time

DIRECTOR-GENERAL OF COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION:
Salary and Allowances

CHAIRMEN AND MEMBERS OF INDEPENDENT COMMISSIONS:
Emoluments and Other Allowances

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 සැප්තැම්බර් 21 වන බදාදා
2016 செப்ரெம்பர் 21, புதன்கிழமை
Wednesday, 21st September, 2016

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 සහ 2013 වර්ෂ සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු වජීර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, මම 2015 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Hon. Speaker, I present the Annual Report and Accounts of the Co-operative Wholesale Establishment for the year 2011 and move that this Report be referred to the Sectoral Oversight Committee on Business and Commerce.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழுக்களின் அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "2012 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව", "2015 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව", "2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව", "2012 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව", "2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව" සහ "2014 වර්ෂය සඳහා සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව" යන කාරණා සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education and Human Resources Development on the matters related to the Bill entitled "The Universities (Amendment)", "Order made under Section 25A of the Universities Act, No. 16 of 1978" and "Order made under Section 27(1) of the Universities Act, No. 16 of 1978" referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තා
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORTS

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the Resolutions related to, "Revision of Salary and Allowances of the Director-General of the Commission to Investigate Allegations of Bribery or Corruption" and "Emoluments and Other Allowances being paid to Chairmen and Members of Independent Commissions" referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

47(5) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව
நிலைக்கட்டளை இல. 47(5)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORT PRESENTED UNDER STANDING ORDER NO. 47(5)

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சிறுவர் புனர்வாழ்வு மையம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
CHILD REHABILITATION CENTRE (INCORPORATION) BILL

"ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව". - [ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය]

පනත් කෙටුම්පත 2016 ඔක්තෝබර් මස 04 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.

சட்டமூலம் 2016 ஒக்ரோபர் 04, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.

Bill ordered to be read a Second time upon Tuesday, 04th October, 2016.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් එකොළහ පිළිගන්වමි.

(1) බත්තරමුල්ල, ජයවඩනගම, අංක 2බී/41 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එල්.පී.එස්. අබේදීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පිටිගල, පත්තිනිගොඩ යන ලිපිනයෙහි පදිංචි සිරිල් ජයසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ගාල්ල, ආයුර්වේද රෝහලේ සේවය කරන වෛද්‍ය කේ.ඒ.කේ. නානායක්කාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ගාල්ල, ශ්‍රී ගුණරතන මාවත, අංක 38 ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. රත්නසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) කටුනේරිය, "සියපත" යන ලිපිනයෙහි පදිංචි එල්.ඒ.එන්. වසන්ත ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) ගාල්ල, තලාපිටිය, බණ්ඩාරනායක පෙදෙස, අංක 30/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්.එච්. රිෆායා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(7) ගාල්ල, චීන කොරටුව, ශ්‍රී දේවමිත්ත පාර, අංක 77 දරන ස්ථානයෙහි පදිංචි පී.කේ. අතුල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) නාවලපිටිය, හපුගස්තලාව, හල්ගොල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි එස්.එම්.එල්.එස්. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) ගාල්ල, තල්පේ, කන්දෙවත්ත, හීනටිගල දකුණ යන ලිපිනයෙහි පදිංචි යූ.කේ. විජේසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(10) ගාල්ල, බෝපේ, වැකුණුගොඩ පටුමහ, "නිෂාධි", අංක 13 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජී.එස්. හරිස්චන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(11) හික්කඩුව, වැවල, "දීපා" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්.ඒ.එස්.එස්.පී. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු පාඨලී චම්පික රණවක මහතා - පැමිණ නැත.

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(මාණ්ඩලික මහින්ද අමරවීර - කඩතොලිල් මත්ස්‍ය හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, අම්බලන්තොට, ඕලුවිල, රොටවල පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එල්.පී. සනත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු රංජිත් සියඹලාපිටිය මහතා - පැමිණ නැත.
ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික නිෂාන්ත මුත්තුහෙට්ටිගමගේ - වරාය සහ නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය)
(The Hon. Nishantha Muthuhettigamage - Deputy Minister of Ports and Shipping Affairs)
ගරු කථානායකතුමනි, අක්මීමන, ඉහළගොඩ, ඉහළවත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. සමරපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු මනුෂ නානායක්කාර මහතා (විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික මනුෂ නාණායක්කාර - විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය)
(The Hon. Manusha Nanayakkara - Deputy Minister of Foreign Employment)
ගරු කථානායකතුමනි, ඇල්පිටිය, කුරුඳුගහහැතැක්ම, එල්.එම්.පී. මාවත, "පිරිස් විලා" යන ලිපිනයෙහි පදිංචි ඒ.කේ.ජී. ආනන්ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු එඩිවඩ් ගුණසේකර මහතා - පැමිණ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්ඩලික බුද්ධික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) දෙවිනුවර, කපුගම - බටහිර, "සරසවි" යන ලිපිනයෙහි පදිංචි ඒ.ජී.ආර්. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හබරාදුව, "අමරවාස" යන ලිපිනයෙහි පදිංචි ජී.පී. අමරසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතර, නූපේ, විල්මට් බාලසූරිය මාවත, අංක 13 දරන ස්ථානයෙහි පිහිටි කම්කරු විනිශ්චය සභාව - අංක 16හි සේවය කරන එම්.අයි.එම්. සාහීර් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාතර, සුල්තානාගොඩ, කැකිල්ල යන ලිපිනයෙහි පදිංචි එම්.එම්.ඒ. රුවන් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) වැලිගම, පැනෑටියන, මාරගහහේන යන ලිපිනයෙහි පදිංචි මහගමගේ සෝමා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්ඩලික (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, පුබ්බිලිය, මාරගමුව, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි පී.ජී. සුදන්ත පොඩිබණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

HIV ආසාදිත පුද්ගලයන්: විස්තර
HIV தொற்றுக்கு உள்ளானோர் : விபரம்
HIV INFECTED PERSONS: DETAILS

543/'16

1. ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්ඩලික බුද්ධික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) දැනට ශ්‍රී ලංකාවේ සිටින HIV ආසාදිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පිරිසෙන් ඒඩ්ස් රෝගීන් ලෙස හඳුනාගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒඩ්ස් රෝගය හේතුවෙන් පසු ගිය වසර පහ තුළ මියගිය පුද්ගලයන් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) HIV හේතුවෙන් මෙතෙක් මියගිය මුළු පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) HIV ආසාදිත පුද්ගලයන්ගේ ආයු කාලය දීර්ඝ කිරීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) HIV පැතිරීම පාලනයට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාදාරම්, පෝසණෙ මර්‍රුම් සුදේස මරුත්තුව අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) තර්පෝදු ඉලංකෛයිල් HIV තොර්‍රුක්කු උළ්ළාකියුළ්ළ ආට්කළින් එණ්ණික්කෛ එත්තනෛයෙන්පතෛයුම්;

(ii) ඉවර්කළිල් එයිට්ස් නෝයාළර්කළෙන අටෛයාළඞ් කාණප්පට්ටුළ්ළ ආට්කළින් එණ්ණික්කෛ එත්තනෛයෙන්පතෛයුම්;

(iii) එයිට්ස් නෝයින් කාරණමාක කටන්ත ඉන්දු වරුට කාලප්පකුදියිල් මරණිත්ත ආට්කළින් එණ්ණික්කෛ වරුට අඩිප්පටෛයිල් වෙව්වේරාක එත්තනෛයෙන්පතෛයුම්;

(iv) HIV කාරණමාක ඉදුවරෛ මරණිත්තුළ්ළවර් කළින් මොත්ත එණ්ණික්කෛ එත්තනෛයෙන් පතෛයුම්;

අවර් ඉච්සපෛක්කු අර්‍රිවිප්පාරා?

(ආ) (i) HIV තොර්‍රුක්කු උළ්ළාකියුළ්ළ ආට්කළින් ආයුට්කාලත්තෛ අතිකරික්කච් චෙය්වතර්කාක අරසාඞ්කම් නටවටික්කෛ එටුත්තුළ්ළතා එන්පතෛයුම්;

(ii) ආමෙනිල්, අන්නටවටික්කෛකළ් යාවෛයෙන්පතෛයුම්;

(iii) HIV පරවුවතෛක් කට්ටුප්පටුත්තුවතර්කාක අරසාඞ්කම් මේර්කොණ්ටුළ්ළ නටවටික්කෛකළ් යාවෛයෙන්පතෛයුම්;

අවර් ඉච්සපෛක්කු අර්‍රිවිප්පාරා?

(ඉ) ඉන්ර්‍රෙල්, ඒන්?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) the number of HIV infected persons living in Sri Lanka at present;

(ii) the number of persons who have been identified as AIDS patients out of the aforesaid number of persons;

(iii) the number of persons who died of AIDS disease in each year during the last five years separately; and

(iv) the total number of persons who have died due to HIV by now?

(b) Will he also inform this House-

(i) whether the Government has taken action to extend the life span of HIV infected persons;

(ii) if so, the aforesaid action; and

(iii) the steps taken by the Government to control the spread of HIV?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2,436කි. (දෙදහස් හාරසිය තිස්හය)

(ii) 631කි. (හයසිය තිස්එක)

(iii)

වර්ෂය	මිය ගිය සංඛ්‍යාව
2011	32
2012	30
2013	27
2014	26
2015	31
එකතුව	146

(iv) 394කි. (තුන්සිය අනූහතර)

(ආ) (i) ඔව්.

(ii) අවස්ථානුකූල ආසාදන සඳහා ප්‍රතිකාර කිරීම.

2004 සිට ප්‍රතිවෛරස් ඖෂධ ලබා දීම ආරම්භ කිරීම.

රසායනාගාර පරීක්ෂණ පහසුකම් ලබා දීම.

සත්කාර සේවා සපයන්නන් පුහුණු කිරීම.

(iii) 1988 වර්ෂයේ සිට පරිත්‍යාග කරනු ලබන රුධිර සාම්පලවල HIV ආසාදනය පරීක්ෂා කිරීම.

HIV ආසාදිත ගර්භිණී මව්වරුන් හට විශේෂ ප්‍රතිකාර ආරම්භ කර ඇත.

වාණිජ ලිංගික සේවා සපයන්නන් සඳහා සහ අවදානම් කණ්ඩායම් සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ (STD) සායනවලට පැමිණෙන සියලුම පුද්ගලයන්, ක්ෂය රෝගීන් මෙන්ම පූර්ව ප්‍රසව සායන සඳහා පැමිණෙන ගර්භිනී මව්වරුන්ගේ ද HIV පරීක්ෂණ සිදු කිරීම.

රට පුරා සිටින බන්ධනාගාර රැඳවියන් සඳහා ද HIV සේවා සපයනු ලබයි.

HIV ආසාදිත සියලුම පුද්ගලයන් සඳහා හෙපටයිටිස් B එන්නත ලබා දෙනු ලබයි.

ලිංගාශ්‍රිත රෝග සහ HIV/AIDS රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් පුහුණු කිරීම සඳහා රජය පියවර ගෙන ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇමතිතුමාගේ පිළිතුර අනුව දැනට ශ්‍රී ලංකාවේ ඉන්න HIV ආසාදිත සංඛ්‍යාව 2,436ක්. ඒ පිරිසෙන් ඒඩිස් රෝගීන් ලෙස 631ක්, දළ වශයෙන් ආසාදිත පිරිසෙන් හතරෙන් එකකට තරමක් වැඩි සංඛ්‍යාවක් හඳුනාගෙන තිබෙනවා. ඒ අතරේ, ඒඩිස් රෝගය නිසා පසු ගිය අවුරුදු පහේ 146 දෙනෙක් මිය ගිහින් තිබෙනවා. HIV හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව 394 දෙනෙක්. මේ සංඛ්‍යාව, කලාපයේ සහ ලෝකයේ අනෙක් රටවල් එක්ක බලන කොට, විශේෂයෙන්ම දකුණු ආසියානු කලාපය සැලකුවොත් ගරු ඇමතිතුමනි, ඔබතුමාට තිබෙන දැනීම අනුව අපේ රට දකුණු ආසියානු කලාපය තුළ කුමන ස්ථානයකද තිබෙන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
දකුණු ආසියානික කලාපය බැලුවාම අපේ රට තමයි අඩුම, අවම මට්ටමේ තිබෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මා මේ කාරණය ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. බන්ධනාගාරය තුළදී රුධිර පරීක්ෂණ කරන්නේ සිර දඬුවම් ලබන අයගේ විතරක්ද, නැත්නම් ඊට අමතරව, රිමාන්ඩ් බන්ධනාගාර ගත වෙන අයගේත් රුධිරය පරීක්ෂාවට ලක් කරනවාද? ඉදිරියේදී මේ දෙපිරිස පිළිබඳවම අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවාද, එහෙම නැත්නම් එක කොටසකගේ පමණක් රුධිර පරීක්ෂණ කරනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අපි බන්ධනාගාරය තුළදී රුධිර පරීක්ෂණ පවත්වන්නේ, "සිරකරුවන්" කියන අයගේයි. රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්න අයගේ නොවෙයි, "සිරකරුවන්" කියන අයගේ පමණයි රුධිර පරීක්ෂණ සිදු කරන්නේ. ඒ කියන්නේ, වැරදිවලට ලක් වෙලා දඬුවම් ලබපු අය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මීට වසර කිහිපයකට පෙර කාල සීමාවේත්, දැනට මාස කිහිපයකට පෙරත්, වරින්වර අන්තර්ජාලය තුළින් සහ මාධ්‍ය තුළින් පළ වුණා, රාජ්‍ය සේවයට ඇතුළත් කර ගැනීමේදී ලබා ගන්නා වෛද්‍ය වාර්තාවේ ලිංගාශ්‍රිත රෝග පිළිබඳ පරීක්ෂණය සිදු කර තිබීම අනිවාර්ය තත්ත්වයකට පත් කරනවා කියලා. ගැබිනි මවුවරුන්ට එවැනි පරීක්ෂණයක් සිදු කිරීම අනිවාර්ය තත්ත්වයට පත් කර තිබෙනවා කියලා දැන් ඔබතුමා සඳහන් කළා. රාජ්‍ය සේවයට ඇතුළත් කර ගැනීමේදී එවැනි පරීක්ෂණයක් සිදු කිරීම අනිවාර්ය කිරීමක් දැනට කර තිබෙනවාද? එහෙම නැත්නම් කරන්න බලාපොරොත්තු වනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අපි ඉදිරියේදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් එවැනි පරීක්ෂණයකට ලක් කිරීමටත්, ඒ වාගේම රාජ්‍ය සේවය සඳහා ඇතුළත් කර ගන්නා අයව එවැනි පරීක්ෂණයකට ලක් කරන්නටත් බලාපොරොත්තු වනවා. මොකද, කවුරු හෝ නොදැන එවැනි රෝගී තත්ත්වයන්ට ගොදුරු වී තිබෙනවා නම් මේ පරීක්ෂණය කර ගැනීමෙන් ඔවුන්ට සෙතක් සැලසෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 3 - 611/'16 - (2), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
Sir, I ask for two weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 739/'16 - (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 812/'16 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Provincial Councils and Local Government, I ask for three weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රජයේ ඉඩම්වල ඉදිකර ඇති සුනාමි නිවාස : ඔප්පු ලබා දීම

அரச காணிகளில் அமைத்துள்ள சுனாமி வீடுகள் : உறுதிகள் வழங்கல்

TSUNAMI HOUSES CONSTRUCTED IN STATE LANDS: PROVISION OF TITLE DEEDS

821/'16

7. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා රජයේ ඉඩම්වල ඉදිකර ඇති සුනාමි නිවාස සඳහා ඔප්පු ලබා දී නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මාතර දිස්ත්‍රික්කයේ සිටින එවැනි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් පවුල් සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ ඔප්පු ලබා දීමේදී සම්පූර්ණ කර තිබිය යුතු සුදුසුකම් කවරේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ යටතේ මේ වන විට ඔප්පු ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) ඔප්පු ලබා දී නොමැති නිවාස හිමියන් වෙත, ඔප්පු ලබා දීම සඳහා ගතවිය හැකි කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

වීඩමෙප්පු මත්‍රුම් නිර්මාණත්‍රුරෙ අමෙච්චරෛක් කේට්ට විනා:

(அ) (i) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையினூடாக அரச காணிகளில் அமைக்கப்பட்டுள்ள சுனாமி வீடுகளுக்கு உறுதிகள் வழங்கப்படாத குடும்பங்களின் எண்ணிக்கை எத்தனை;

(ii) மாத்தறை மாவட்டத்திலுள்ள அவ்வாறான குடும்பங்களின் எண்ணிக்கை எத்தனை;

(iii) மேலே (i) இல் குறிப்பிடப்பட்ட குடும்பங்களுக்கு உறுதிகள் வழங்குவதற்கான வேலைத்திட்டம் ஒன்று உள்ளதா;

(iv) அவ்வாறு உறுதிகள் வழங்கப்படும்போது நிறைவு செய்திருக்க வேண்டிய தகைமைகள் யாவை;

(v) அவ்வாறாயின், அவ்வேலைத்திட்டத்தின்கீழ் இதுவரை உறுதிகள் வழங்கப்பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாது ;

(vi) உறுதிகள் வழங்கப்பட்டாத வீட்டுரிமையாளர்களுக்கு உறுதிகளை வழங்குவதற்கு எவ்வளவு காலம் எடுக்கும்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House-

(i) the number of families that have not been provided title deeds for the Tsunami houses constructed in State lands through the National Housing Development Authority;

(ii) the number of such families in Matara District;

(iii) whether there is a programme to provide title deeds to the families mentioned in (i) above;

(iv) the qualifications to be met in providing the title deeds in the said manner;

(v) if so, the number of families that have been provided title deeds under that programme by now; and

(vi) the time it may take to provide title deeds to the owners of houses who have not been provided title deeds?

(b) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 89යි. (මෙතෙක් කිසිවෙකුට ඔප්පු ලබා දී නොමැත.)

(ii) නිවාස 89 යි.

නුපේවෙල නිවාස ව්‍යාපෘතියේ නිවාස 64ක් හා කම්මල්වත්ත ව්‍යාපෘතියේ නිවාස 25ක් වන පරිදි නිවාස 89ක් වේ.

අධිකාරිය මැදිහත් වී ඉදි කළ නිවාසවලට අමතරව ගාල්ලගෙවත්ත සහාධිපත්‍ය නිවාස 20ක් සහ පොල්ඇතුමෝදර සහාධිපත්‍ය නිවාස 28ක් මෙම අධිකාරියට පවරා ගෙන ඔප්පු ලබා දීමට කටයුතු කරමින් පවතී.

තවද, අධිකාරිය මැදිහත් නොවී ඉදි කළ නිවාස 246 සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ඔප්පු ලබා දීමට කටයුතු කරනු ඇත.

(iii) ඔව්.

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ද සම්බන්ධ වී ඔප්පු ලබා දීමට කටයුතු ආරම්භ කර ඇත.

(iv) i. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉඩම පවරා ගැනීම.

ii. ගොඩනැඟිලි සැලසුම් අනුමත කර ගැනීම.

iii. සහාධිපත්‍ය දේපළවලට අදාළ සේවා සැලැස්ම අදාළ ආයතන වෙතින් අනුමත කර ගැනීම.

iv. සහාධිපත්‍ය පිඹුර සකස් කිරීම.

v. අනුකූලතා සහතිකය ලබා ගැනීම.

vi. සහාධිපත්‍ය ප්‍රකාශන සකස් කිරීම.

vii. සහාධිපත්‍ය සහතික ලබා ගැනීම.

viii. ඔප්පු නිකුත් කිරීම.

(v) මෙතෙක් කිසිදු අයකුට ඔප්පු ලබා දී නොමැත.

(vi) කම්මල්වත්ත ඉඩම මෙතෙක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පැවරී නොමැත. ඒ සඳහා වන්දි හා පොලී ගෙවා ඇත. එම ඉඩම හා නූපේවෙල නිවාස යෝජනා ක්‍රමය සඳහා නිදහස් දීමනා පත්‍රය රජයෙන් (ප්‍රාදේශීය ලේකම් මඟින්) ලැබිය යුතුය. මෙම ගම්මාන දෙකෙහි ගොඩනැඟිලි සැලසුම් අනුමැතිය ලබා ගැනීමට මුදල් ගෙවා නගර සභාව වෙත ඉදිරිපත් කර ඇත. සභාධිපත්‍ය පිඹුර සකස් කර දීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත මුදල් ගෙවා ඇත. දැනට මෙම කටයුතු කරගෙන යනු ලැබේ. සභාධිපත්‍ය සහතිකය ලබා ගෙන සභාධිපත්‍ය ප්‍රකාශන ලියාපදංචි කිරීමෙන් පසු මාස 03ක් ඇතුළත ඔප්පු ලබා දීමට කටයුතු කළ හැකිය.

(ආ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු ලබා දීම ගැන මම මුලින්ම එතුමාට ස්තුතිවන්ත වනවා.

සුනාමි විපත සිදුවෙලා දැනට වසර 12ක් ගතවී තිබෙනවා. එතුමා කියන ආකාරයට මේ ඔප්පු ලබා නොදීමට එම ජනතාව කරපු වරදක් නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා තිබෙනවා නම්, නගර සභාවට අවශ්‍ය ගෙවීම් කරලා තිබෙනවා නම්, ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය ගෙවීම් කරලා තිබෙනවා නම්, මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගෙවීම් කරලා තිබෙනවා නම්, පවරා ගැනීමේ කටයුතු කරලා ඔප්පු ලබා දීමයි කළ යුත්තේ. නමුත් තවම එක නිවාසයකටවත් ඔප්පු ලබා දීලා නැහැ.

ගරු ඇමතිතුමනි, මාගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මාතර විතරක් නොවෙයි, හම්බන්තොට ආදී සුනාමි ව්‍යසනයට ලක් වුණු සෑම ප්‍රදේශයකම මේ ප්‍රශ්නය තිබෙනවා. මේ නිසා ළමයෙක් පාසලකට ඇතුළත් කර ගැනීමට නොහැකි තරම් අර්බුදයකට ඔවුන් පත් වී සිටිනවා. ඒ නිසා ඔප්පු ලබා ගැනීම සඳහා ඒ ජනතාව තවදුරටත් කළ යුත්තේ මොකක්ද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, රජයෙන් ඔප්පුවක් ලබා දීම සඳහා පැහැදිලිවම යම් කාල පරිච්ඡේදයක් ගත වෙනවා. මොකද, නිදහස් දීමනා පත්‍රයක් ලබා දීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ඉඳලාම අනුමැතිය අවශ්‍ය වෙන නිසා. ඉතින් ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යනවා. ඒ සඳහා ඇත්තටම යම් කාලයක් ගත වෙනවා. ඒ පිළිබඳව අපිත් සොයා බලනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම හිතන විධියට සොයා බැලීමේ ප්‍රමාදයකුත් තිබෙනවා. මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ඒ මොහොතේ සමහර නිවාසවලින් පදිංචිකරුවන් ඉවත් කළා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙයියන්ගේ වත්ත කියන මුහුදු අයිනේ තිබෙන ඉඩමේ සිටි අය ඉවත් කරලා ඒ අයට නිවාස ලබා දුන්නා. ඊට පසුව ඒ මිනිස්සු පදිංචි වෙලා හිටපු තැනයි, ඒ මිනිසුන් කර්මාන්ත -ධීවර කර්මාන්තය, උම්බලකඩ කර්මාන්තය- කරගෙන ගිය පරිසරයයි සම්පූර්ණයෙන් වෙනස් වුණා. නමුත් ඒ මිනිසුන් ඉවත් කරලා ගත්ත ඉඩම දැන් රජයේ වෙනත් කටයුතුවලට පවරා ගෙන පෞද්ගලික ව්‍යාපාරිකයින්ට පවරා දෙන්න, හෝටල් ඉදි කරන්න ආදී වශයෙන් වෙනත් කටයුතුවලට යොදා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එතැන පදිංචියට සුදුසු නැත්නම් හෝටලයක් හදන්නත් සුදුසු නැහැ නේ. එහෙම නම් කළ යුතුව තිබෙන්නේ ඒ මිනිසුන්ට ඒ ඉඩම ලබා දීමයි. මොකද, ඒ මිනිසුන්ගේ ජීවන වෘත්තිය තිබෙන්නේ එතැන නිසා. ඒ මිනිසුන්ගේ වරදකින් නොවෙයි ඒ මිනිසුන්ට එතැනින් ඉවත් වෙන්න සිදු වුණේ. එවැනි ගැටලුත් මේ තුළ තිබෙනවා. ඒ නිස් කරපු ඉඩම් සම්බන්ධයෙන් මතු වී තිබෙන එවැනි ගැටලු ඔබතුමන්ලා හඳුනා ගෙන තිබෙනවාද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන්නේ නූපේවෙල සහ කම්මල්වත්ත නිවාස ව්‍යාපෘති දෙක පමණයි. ඒ නිසා අනික් ඉඩම් පිළිබඳව අපට වග කියන්න බැහැ. ඒවා අපේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ව්‍යාපෘති නොවෙයි. අපේ අමාත්‍යාංශයට අදාළ වන්නේ මේ ව්‍යාපෘති දෙක පමණයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. සභාධිපත්‍ය දේපොළ යටතේ, බද්ධ නිවාස යෝජනා ක්‍රමය යටතේ හදපු බද්ධ නිවාස තනි බිත්තියෙන් බැඳිලා තිබෙන නිසාත්, එක වහළක් යටතේ තිබෙන නිසාත් ඒ මිනිසුන්ට ඔප්පු ලබා ගැනීමේ අර්බුදයක් තිබෙනවා. නමුත් ගැටලුව තිබෙන්නේ, ඒ අයගේ ඊළඟ පරම්පරාවට, දරුවන්ට යන්න වෙන තැනක් නැති එකයි, ගරු කථානායකතුමනි. දරුවන්ට හෝ ඒ නිවාස භාර දෙන්න නම්, සභාධිපත්‍ය ක්‍රමයට හෝ ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. මා හිතන හැටියට ඒ වැඩ පිළිවෙළ හදන්න හැකියාවක් තිබෙන්නේ ඔබතුමන්ලාටයි. ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් අහන කොට කියන්නේ, ඒක අයිති ජාතික නිවාස සංවර්ධන අධිකාරියට කියලායි. ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් අහන කොට කියන්නේ, ඒක අයිති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කියලායි. මේ දෙගොල්ලන්ම වගකීම භාර ගන්නේ නැති එකේ බරපතළ ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එක තැනකින් හෝ මැදිහත් වෙලා සම්බන්ධීකරණයක් කළ යුතුයි කියා ඔබතුමා පිළිගන්නවාද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ඒ ඉඩම පැවරුණාට පස්සේ තමයි ඒ වැඩ කටයුතු කර ගෙන යන්නේ. මෙහි විශාල කාර්ය භාරයක් ප්‍රාදේශීය ලේකම්ටත් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්ලා තවම අපට -ජාතික නිවාස සංවර්ධන අධිකාරියට- එක ඉඩමක් නීත්‍යානුකූලව පවරලාත් නැහැ. මොකද, පසු ගිය කාලයේ එක ඉඩමක් හරහා මේ අධිවේගී මාර්ගය - Expressway එක - ගමන් කිරීම තුළින් ඒ ඉඩම්වලත් යම් ගැටලු මතු වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, පුළුවන් තරම් ඉක්මනට මේ නිවාසවලට ඔප්පු ලබා දෙන්න අපි උත්සාහ කරනවා. අපටත් අවශ්‍ය වන්නේ, ඉක්මනට ඒ ජනතාවට ඔප්පු ලබා දෙන්නයි.

ගරු වජීර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවාද?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණයේ සත්‍යතාවක් තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තාම, සුනාමියෙන් පස්සේ ගාල්ල දිස්ත්‍රික්කයේ කිලෝ මීටර් 68ක සීමාවක් තුළ නිවාස ඉදිකර තිබෙනවා. මේ සමහර නිවාස ඉදි කළ ඉඩම්, උදාහරණයක් විධියට ගත්තොත් අහංගම ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම් අක්කර හත, අට දීලා තිබෙනවා. හැබැයි, ඒ ඉඩම ප්‍රාදේශීය ලේකම්ට දීලා තිබෙනවා. සමහර වෙලාවට, සමහර ස්ථානවල ඒ ඉඩම ලිඛිතව භාර දීම සිදු වෙලා නැහැ. උදාහරණයක් හැටියට දඩල්ලේ ඉඩම්වල ඔප්පු දෙන්න විධියක් නැතිව තිබෙනවා. ඒකට හේතුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරලා වෙනත් කාරණයක් සම්බන්ධයෙන් ගැටලු පැන නැඟී තිබීමයි. දැනට අපි දිසාපතිවරු සියලු දෙනාටම උපදෙස් දීලා තිබෙනවා සුනාමි ව්‍යසනයෙන් පසු ඉදි කළ නිවාස සම්බන්ධයෙන් තිබෙන ගැටලුවලට; පෞද්ගලික ඉඩම් සහ රජයේ ඉඩම් සම්බන්ධයෙන් මතු වෙලා තිබෙන ගැටලු සියල්ලම ඒකරාශී කරලා වාර්තා කරන්නය කියලා. දැනට දිසාපතිවරුන්ගෙන් අපට විශාල ප්‍රමාණයක් වාර්තා වෙලා තිබෙනවා. ඒ ගැන දැනට අපි කටයුතු කර ගෙන යනවා. පුළුවන් තරම් ඉක්මනින් ඒ ප්‍රශ්නය නිරාකරණය කරන්න අවශ්‍ය කටයුතු කරනවා. හම්බන්තොටත් අපි ඒකට අර ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් කරන්න කැමැතිද?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කැමැතිද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ඔබතුමා කියන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මාතර දිස්ත්‍රික්කයේ තිබෙන ඉතාම බරපතළ ප්‍රශ්නයක් මෙම ගරු සභාවට යොමු කිරීම ගැන.

ගරු කථානායකතුමනි, මේ ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් අපේ ස්වදේශ කටයුතු ඇමතිතුමා කියන සියලුම නිලධාරීන් මධ්‍යයේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවත් මීට අවුරුදු හයකට පෙර තීන්දු කර තිබෙනවා. ඒ වාගේම ඔබතුමා පැහැදිලි කළ එක කාරණාවක් නම්, ඉඩමේ අයිතිය නිල වශයෙන් භාර දීලා නැත්තේ කම්මල් වත්තේ විතරයි. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්ව නූපේවෙල ඉඩම ගැන කිසි ගැටලුවක් නැහැ. ඒවා නීත්‍යානුකූලව භාර දීලා, නිවාස ණය දීලා ඒ සියල්ලම සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මමත් ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එක්ක එකතු වෙමින්ම යෝජනා කරන්නේ මේක තවදුරටත් ප්‍රමාද කරන්නේ නැතිව ඔබතුමන්ලා සියලු පාර්ශ්ව එකතු වෙලා මේ සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන්න කියලායි. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සඳහා ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්න.

පොල් පැණි ආශ්‍රිත නිෂ්පාදන : රැකියා අවස්ථා
தென்னம்பாணி மூலமான உற்பத்திகள் : தொழில் வாய்ப்புக்கள்
COCONUT TREACLE RELATED PRODUCTS: EMPLOYMENT OPPORTUNITIES

545/'16

8. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1)

(අ) (i) පොල් පැණි ආශ්‍රිතව නිෂ්පාදන රාශියක් සිදු කළ හැකි බවත්;

(ii) එය සීනි වෙනුවට භාවිත කළ හැකි සෞඛ්‍යාරක්ෂිත විකල්පයක් බවත්;

(iii) මෙම කර්මාන්ත හරහා රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් ජනිත කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පොල් පැණි හා හකුරු කර්මාන්ත ජීවනෝපාය කරගත් පිරිස පිළිබඳව සංගණනයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පොල් පැණි හා හකුරු කර්මාන්තය නගා සිටුවීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தென்னம்பாணியின் மூலம் பல உற்பத்திகளை மேற்கொள்ள முடியும் என்பதையும்;

(ii) இது சீனிக்குப் பதிலாக பயன்படுத்தக்கூடிய சுகாதாரப் பாதுகாப்பான ஒரு மாற்றமாகும் என்பதையும்;

(iii) இந்த கைத்தொழில் மூலம் பெருமளவிலான தொழில் வாய்ப்புக்களை ஏற்படுத்த முடியும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) தென்னம்பாணி மற்றும் கருப்பட்டி உற்பத்தியை வாழ்வாதாரமாகக் கொண்ட எவ்வளவு பேர் இருக்கின்றார்கள் என்பது தொடர்பாக கணிப் பீடொன்று செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின் அந்த எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) தென்னம்பாணி மற்றும் கருப்பட்டி உற்பத்தித் தொழிலை மேம்படுத்த அரசு நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின், அந்த நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he admit that -

(i) a number of products can be made using coconut treacle;

(ii) it is a healthy option for sugar; and

(iii) a large number of employment opportunities can be generated through these industries?

(b) Will he inform this House -

(i) whether a census has been conducted in regard to the number of persons who have made their living in coconut treacle and jaggery industries; and

(ii) if so, the aforesaid number of persons?

(c) Will he also inform this House -

(i) whether steps have been taken by the government for the upliftment of coconut treacle and jaggery industry; and

(ii) if so, the aforesaid steps?

(d) If not, why?

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) මූලිකව පොල් පැණි, පොල් හකුරු හා ගෝල්ඩන් සිරප් නිෂ්පාදනය කෙරේ.

(ii) හකුරු, සීනිවලට විකල්පයක් ලෙස භාවිතයට ගැනේ. එහෙත් සීනි සඳහා පූර්ණ විකල්පයක් නොවේ.

(iii) දැනටමත් මෙම කර්මාන්තයේ අදාළ ප්‍රදේශවල ශ්‍රමිකයන් රැසක් සේවයේ යෙදේ.

(ආ) (i) අමාත්‍යාංශය විසින් පූර්ණ සංගණනයක් සිදු කර නොමැත.

(ii) අදාළ නොවේ.

(ඇ) (i) පොල් පැණි නිෂ්පාදනය සහ මී රා නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත. එලෙසම ඉදිරියේදී පොල් හකුරු හා පැණි නිෂ්පාදනය කිරීමට අවධානය යොමුකොට ශ්‍රමිකයින් පුහුණු කිරීමටත්, කර්මාන්තය පුළුල් කිරීමටත් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කිරීමට අමාත්‍යාංශය අදහස් කරයි.

(ii) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා විෂයය භාර කැබිනට් අමාත්‍යතුමාගෙන් මේ කාරණය දැනගන්නට කැමැතියි. පොල් පැණි සහ හකුරු කර්මාන්තය මාතර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රික්කය වාගේම තවත් බොහෝ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන කර්මාන්තයක්. රටට වැඩියෙන් විදේශ ආදායමක් ලබන්න පුළුවන් කර්මාන්තයක් වාගේම ඵලදායී නිෂ්පාදන ක්ෂේත්‍රයක් විධියට මේ කර්මාන්තය දියුණු කරන්න අමාත්‍යාංශයට දැන් වුවමනාවක් තිබෙන බව සඳහන් වෙනවා. නමුත් මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් කරලා නැති නිසා මුලින්ම රට පුරා සමීක්ෂණයක් සිදු කරලා, නිෂ්පාදකයින් හඳුනාගෙන, එම නිෂ්පාදකයින් ලියා පදිංචි කරලා, ඔවුන්ගේ නිෂ්පාදන සඳහා එක පැත්තකින් දිරිදීමනා ලබා දෙමින්, ඔවුන්ගේ නිෂ්පාදනවල ප්‍රමිතිය පිළිබඳව අධ්‍යයනයකට යෑම වඩා උචිතයි නේද?

විශ්වවිද්‍යාල පද්ධතියේ මේ ක්ෂේත්‍රය හා බැඳෙන පශ්චාත් උපාධිය හදාරන ශිෂ්‍යයින් සහ විශ්වවිද්‍යාල මට්ටමේ සිටින විශේෂඥයන්ගෙනුත්, ඒ වාගේම ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය සහ මේ හා බැඳි අනෙකුත් ක්ෂේත්‍රවල අයගේත් සහයෝගය ලබාගෙන අදාළ සමීක්ෂණ වැඩ පිළිවෙළ දියත් කරන්න අමාත්‍යාංශය ප්‍රමාද කරන්නේ ඇයි?

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම එය හොඳ ප්‍රශ්නයක්. දැනටමත් මේ අමාත්‍යාංශය ඔබතුමා සඳහන් කළ ක්ෂේත්‍රයට යොමු කර තිබෙන අවධානය මදියි කියා මම පිළිගන්නවා. විශේෂයෙන්ම පොල් කර්මාන්තය හා සම්බන්ධ අනෙකුත් අතුරු බෝගවලට තමයි අපි අවධානය යොමු කරලා තිබෙන්නේ. මම ඔබතුමාට පැහැදිලිව වචනයක් දෙනවා. අපි මේ සමීක්ෂණය පුළුවන් තරම් ඉක්මනට කරනවා. ඒ අනුව අපි ඉදිරියේදී ඉතාමත් සවිස්තරාත්මක වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා පොල් වගාව පිළිබඳව සඳහන් කළා. මාතර දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල පොල් ආශ්‍රිතව ඇති වෙලා තිබෙන රෝගයක් නිසා, පොල් ගස් ඉවත් කිරීම, අනෙක් පැත්තෙන් පොල් පැළ ප්‍රවාහනය පවා නතර කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා පොල් ගස් විශාල වශයෙන් කපනවා. එක ගසකට ගෙවන්නේ රුපියල් 2,000යි. මීට අවුරුදු 6කට කලින් ගෙව්වේත් රුපියල් 2,000යි, අද ගෙවන්නේත් රුපියල් 2,000යි. එම නිසා පොල් වගාකරුවන්

[ගරු බුද්ධික පතිරණ මහතා]

මන්දෝත්සාහී වෙලා තිබෙනවා. පොල් පැළ ගෙනියන්නත් බැහැ. මේකත් මගේ ප්‍රශ්නයට අදාළ කර්මාන්තයට බලපාන කාරණයක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් වන අමාත්‍යාංශයේ මැදිහත්වීම මොකක්ද?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

අපි ඔබතුමාට සෑම විටම උදව් කරන නිසාත්, විශේෂයෙන්ම මීට සති දෙක තුනකට පෙර ඔබතුමාත් එක්ක අත්වැල් බැඳගෙන අපගේ කුඩා තේ වතු හිමියන්ට අදාළ පොහොර සහනාධාරය ලබා දීමට කටයුතු කළ නිසාත්, ඔබතුමා ඉදිරිපත් කරන ඕනෑම යෝජනාවක් ක්‍රියාත්මක කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඒ ගැන ඔබතුමා මාත් එක්ක සාකච්ඡා කරන්න. විශේෂයෙන්ම අපේ පක්ෂයේ නායකතුමාගේ අවධානයත් ඔබතුමා ගැන යොමු වෙලා තිබෙන නිසා, ඔබතුමාට අපගේ සහයෝගය ලබා දෙන්න කැමැතියි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමා උත්තර දෙන්නේ මූලාසනයෙන් එහා පැත්තේ නෑදෑයෝ වට කර ගෙන. ඒක නිසා හරි සන්තෝෂයෙන් ඇමතිතුමා ඉන්නේ.

ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය විධියට මම මේ කාරණය දැනගන්න කැමැතියි. පොල් පැණි ආශ්‍රිතව සිදු කරන නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේදී තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, ඒ අයට නූතන තාක්ෂණය සහ ඇසුරුම්කරණය පිළිබඳවත්, ඒ කර්මාන්තය දියුණු කර ගැනීමට ණය සහ තාක්ෂණික ආධාර ලබා ගැනීම පිළිබඳවත් පවතින ගැටලුව. උදාහරණයක් විධියට ගත්තාම, තවමත් හකුරු මුල ඔතන්නේ පරණ -ඒ කියන්නේ දවස් කිහිපයක් වේළුණු- කෙසෙල් කොළවල. සමහර වේලාවට කෙසෙල් කොළ පුස් කාලා තිබෙනවා. සමහර වේලාවට ඒවායින් අප්‍රසන්න දුර්ගන්ධයක් එනවා. එහෙම වුණාම අපනයනයේදී ගැටලුවක් වෙනවා.

විශේෂයෙන්ම, පොල් පැණි සහ හකුරු කර්මාන්තය ආශ්‍රිතව යැපෙන්නන්; ඒ ආශ්‍රිතව ජීවත් වන පුද්ගලයින් වෙනුවෙන් ඒ අයට අවශ්‍ය තාක්ෂණයත්, ප්‍රාග්ධනයත් ලබා දෙන්නට අමාත්‍යාංශයට තිබෙන දැක්ම මොකක්ද ?

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, අපේ පොල් නිෂ්පාදන ප්‍රමාණයයි දැනට අපට තිබෙන විශාලම ප්‍රශ්නය වන්නේ. දැනට මේ රටේ මිලියන 3,000ක පමණ ප්‍රමාණයකුයි පොල් නිෂ්පාදනය කරන්නේ. එයින් මිලියන 2,800ක් පාවිච්චි වෙන්නේ දේශීය පරිභරණයට. නිෂ්පාදනය වැඩි කිරීමට අපි දැන් දෙවැනි පොල් ත්‍රිකෝණයත් උතුරු, නැගෙනහිර ප්‍රදේශවල පටන් අරගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙන්නේ ඔබතුමාගේ අවධානයත් මේ ගැන යොමු කරලා, ඔබතුමාත් අපට ඉදිරිපත් කළ පරිදි, විශේෂයෙන්ම අලුතින් නිෂ්පාදනය වන, දැනට තිබෙන සාම්ප්‍රදායික නිෂ්පාදනත් එකතු කර ගෙන අපගේ අපනයනය ශක්තිමත් කිරීමටයි. ඒ සඳහා දැන් පොල් සංවර්ධන මණ්ඩලය සහ අනෙකුත් ආයතන ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළකට මම යොමු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -740/'16 - (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලි තර්ජනය: විදුලි වැට දිගු කිරීම
தம்புள்ள பிரதேச செயலாளர் பிரிவில் யானை அச்சுறுத்தல் : மின்சார வேலியை நீடித்தல்
THREAT OF WILD ELEPHANTS IN DAMBULLA DS DIVISION: EXTENSION OF ELECTRIC FENCE

776/'16

10.ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිකවටවන ග්‍රාම නිලධාරී වසමට අයත්, දමනයාය, සීගිරිමුල්ල, හුඹස්ගැටේ හා අරුණෝදය යන ගම්මාන ප්‍රබල වන අලි තර්ජනයකට මුහුණ දී ඇති බවත්;

(ii) මේ හේතුවෙන් මෙම ගම්මානවල පවුල් 4,500කගේ ජීවිත හා ඔවුන්ගේ ගොවිතැන් තර්ජනයට ලක්ව ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වැවල සිට දෙහිගහ ඇළ, දියකැපිල්ල දක්වා වනය මැදින් ඉදි කර ඇති විදුලි වැට මොරගොඩගම, සීගිරිමුල්ල, අළුත්යාය, මයිලත්තෑව, කලාපුරය, පොල්ලත්තෑව හා සීගිරිය යන ගම්මානයන් දක්වා දිගු කිරීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) මේ සඳහා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்புள்ள பிரதேச செயலாளர் பிரிவில், நிக்கவட்டவன கிராம அலுவலர் பிரிவுக்குரிய தமனயாய, சீகிரிமுல்ல, ஹும்பஸ்கட்டே மற்றும் அருணோதய ஆகிய கிராமங்கள் யானைகளின் பாரிய அச்சுறுத்தலுக்கு உள்ளாகியுள்ளன என்பதையும்;

(ii) இதன் காரணமாக மேற்படி கிராமங்களில் சுமார் 4500 குடும்பங்களைச் சேர்ந்த மக்களின் உயிர்கள் மற்றும் அவர்களது விவசாயம் என்பன அச்சுறுத்தலுக்கு உள்ளாகியுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) வேவல தொடக்கம் தெஹிகஹ எல, தியகெபில்ல வரை காட்டின் ஊடாக நிர்மாணிக்கப்பட்டுள்ள மின்சார வேலியை மொறகொடகம, சீகிரிமுல்ல, அளுத்யாய, மைலத்தாவ, கலாபுரய, பொல்லத்தாவ மற்றும் சீகிரிய ஆகிய கிராமங்கள் வரை நீடிப்பதற்கு நடவடிக்கை எடுக்காதிருப்பது ஏனென்பதையும்;

(ii) இதற்காக தம்புள்ள பிரதேச செயலகத்திற்கு நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், அத்தொகை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife:

(a) Is he aware that -

(i) the villages of Damanayaya, Sigirimulla, Humbasgete and Arunodaya situated in the Nikawatawana Grama Niladhari Division belonging to the Dambulla Divisional Secretary's Division are faced with a grave threat from wild elephants; and

(ii) that the lives and cultivations of 4500 families living in these villages are at risk as a result of this?

(b) Will he inform this House -

(i) the reason why the electric fence established across the wilderness from Wewala to Dehigaha Ela, Diyakeppilla is not extended to cover the villages of Moragodagama, Sigirimulla, Aluthyaya, Mayilaththewa, Kalapuraya, Pollaththewa and Sigiriya;

(ii) whether financial provisions for this purpose have been allocated to the Dambulla Divisional Secretariat; and

(iii) if so, the amount thus allocated?

(c) If not, why?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය)

(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் பிரதி அமைச்சர்)

(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Deputy Minister of Sustainable Development and Wildlife)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

දැන් හඳුනාගෙන තිබෙනවා.

(ආ) (i) වෑවල සිට දෙහිගහ ඇළ දක්වා ඇති කොටස කිලෝ මීටර් 05 කැලය මැදින් ඉදි වී ඇති අතර, මෙම විදුලි වැට ගම්මාන මායිමට ගත යුතුව ඇත. මෙය මහජන විරෝධය මත කැලය මැදින් ඉදි කිරීමට සිදු වීම නිසා වන අලින් මෙම වැට කඩා දැමීමේ ප්‍රවණතාව වැඩි වී ඇත. ඒ අනුව මෙහිදී කළ යුතුව ඇත්තේ විදුලි වැට දීර්ඝ කිරීම නොව එය ගම්මාන මායිමට ගෙන ඒමය. එසේ කිරීමේදී කිලෝ මීටර් 05ක් ඉදි කර ඇති කොටස කිලෝ මීටර් 10 දක්වා දීර්ඝ වනු ඇත. නැවත ගම්වාසීන් සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ එකඟතාවකින් පසුව මෙම විදුලි වැට ගම්මාන මායිමට ගෙන ඉදි කිරීමට කටයුතු කරන බව විශේෂයෙන් සඳහන් කරමි.

(ii) ඉහත ගැටලුව නිරවුල් කිරීමෙන් අනතුරුව මුදල් ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන බව විශේෂයෙන් දැනුම් දෙනවා.

(iii) නැත.

(ඇ) විදුලි වැට මාර්ගය නිවැරදිව හඳුනා ගැනීමෙන් තොරව මෙම විදුලි වැට සඳහා වැය වන මුදල නිවැරදිව ගණනය කිරීම අපහසුය.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, මම ඇහුවේ මෙයයි. දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෑවල සිට දෙහිගහ ඇල, දියකැපිල්ල දක්වා වනය මැදින් ඉදි කර ඇති විදුලි වැට මොරගොඩගම, සීගිරිමුල්ල, අළුත්යාය, මයිලත්තෑව, කලාපුරය, පොල්ලත්තෑව හා සීගිරිය යන ගම්මාන දක්වා දිගු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ කොයි කාලයේද?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)

(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

දැනට ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර නැහැ. මෙම විදුලි වැට කැලය මැදින් ඉදි කර ඇති නිසා තමයි වැඩි වශයෙන් වන අලින් මේක විනාශ කර දමන්නේ. එහෙම වුණාම වන අලි ගම් වදිනවා. ඒ නිසා ගම්මානය වට කරලා තමයි අප මේ වැට දැන් අලුතින් ඉදි කිරීමේ කටයුතු කරන්න යන්නේ. ඊට පසුව ගමේ වනජීවී කමිටු සකස් කරලා, සිවිල් ආරක්ෂක බලකාය සහ ගමේ පිහිටුවන කමිටු මඟින් මෙම වැටේ ආරක්ෂාව සඳහා කටයුතු කරන්න අප බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මෙහි වෙනසක් කරන්න සිද්ධ වෙනවා. දැනට කැලය මැදින් හිටවපු වැට නැවත

[ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය]

ගම්මාන මායිමට ගන්න කටයුතු කරන්න ඕනෑ. එහෙම කරන කොට නැවත වතාවක් මේ සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් සකස් කරන්න වෙනවා. ඒ ඇස්තමේන්තුව සකස් කළාට පසුව තමයි මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න පුළුවන් වන්නේ. අපේ අමාත්‍යාංශයේ මුදල් තිබෙනවා. ඒ නිසා ඒ සඳහා මුදල් වෙන් කරන්න පුළුවන්. මේ පිළිබඳව ඉතා ඉක්මනින් කටයුතු කරන්න අප බලාපොරොත්තු වෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමියනි, එම විදුලි වැට ඉතාම ඉක්මනින් ඉදි වෙයි කියා අප බලාපොරොත්තු වෙනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විදුලි වැටවල් ඉදි කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පසු ගිය අය වැයෙන් විශාල මුදලක් -මම දන්නා තරමට රුපියල් මිලියන 100ක් වාගේ මුදලක්- වෙන් කර තිබෙනවා. නමුත් අලි-මිනිස් ගැටුම වැළැක්වීම සඳහා දැන් තිබෙන ප්‍රධානතම උපක්‍රමයක් තමයි, අලි මංකඩවල් විවෘත කිරීම. ඒ සඳහා අමාත්‍යාංශය විසින් අරගෙන තිබෙන පියවර මොනවාද?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

අලි මංකඩවල් විවෘත කිරීම සඳහා කැබිනට් අනුමැතිය අපි ලබා ගෙන තිබෙනවා. දැනටමත් අලි මංකඩවල් විවෘත කිරීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරලායි තිබෙන්නේ. නමුත්, එතැන ගැටලුත් රාශියක් තිබෙනවා. මොකද, අලි මංකඩවල් විවෘත කරන මාර්ගවල මිනිසුන් ගෙවල් ඉදි කරගෙන පදිංචි වෙලා ඉන්නවා. ඒ නිවාස එතැනින් ඉවත් කිරීමේදී ඒ අයට වන්දි මුදලක් හෝ නිවාස ලබා දිය යුතුයි. ඒ අයට නිවාස ඉදි කර දීලා තමයි ඒ අලි මංකඩවල් විවෘත කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකට ටික කාලයක් ගත වෙනවා. ඒ කටයුත්ත කරන්නත් අපට දැනට කැබිනට් අනුමැතිය ලැබිලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

හොඳයි. ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙනම අංශයක් තිබෙනවා, සමාජ සේවා කටයුතු සඳහා. නමුත්, දැන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වෙන් කරලා තිබෙන මුදල්වලින් රුපියල් මිලියන 15ක් පමණ වනජීවී භාරයට ගන්න කටයුතු කර තිබෙනවා. අමාත්‍යාංශයේ සමාජ සේවා කටයුතු සඳහා වෙනම ඒකකයක් තිබෙනවා නම්, මුදල් ප්‍රතිපාදන වෙන් වීමක් තිබෙනවා නම් සහ නිලධාරීන් ඉන්නවා නම් වනජීවී භාරයට මෙතරම් මුදලක් අමාත්‍යාංශයෙන් අරගෙන තිබෙන්නේ ඇයි?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

දැන් වනජීවී භාරය හරහාත් අලි-මිනිස් ගැටුම් සම්බන්ධව වැඩ කටයුතු ගොඩක් කරගෙන යනවා. අපට පහසු වන ආකාරයට තමයි වනජීවී භාරය හරහා මුදල් ලබාගෙන සුහසාධන කටයුතු කරගෙන යන්නේ. දැනටමත් ඒ කටයුතු කරගෙන යනවා.

දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු : මාතර දිස්ත්‍රික්කය
தமிழ் மொழிமூல ஆசிரியர் வெற்றிடங்கள்: மாத்தறை மாவட்டம்
TAMIL-MEDIUM TEACHER VACANCIES: MATARA DISTRICT

823/'16

11. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වල සහ පළාත් සභා පාසල්වල පවතින දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා ගුරුවරුන් බඳවා ගන්නා දිනය කවරේද;

(iii) බඳවා ගැනීමේදී ස්වේච්ඡා ගුරුවරුන් සඳහා ප්‍රමුඛතාවක් ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தில் தேசிய பாடசாலைகளில் மற்றும் மாகாண சபை பாடசாலைகளில் நிலவுகின்ற தமிழ் மொழிமூல ஆசிரியர்களுக்கான வெற்றிடங் களின் எண்ணிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக எடுக் கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென் பதையும்;

(ii) இதற்காக ஆசிரியர்கள் ஆட்சேர்க்கப்படும் திகதி யாதென்பதையும்;

(iii) ஆட்சேர்ப்பின்போது தொண்டர் ஆசிரியர் களுக்கு முன்னுரிமை வழங்கப்படுமா என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House the number of vacancies existing in National and Provincial Schools in the Matara District for Tamil-medium teachers?

(b) Will he also inform the House -

(i) what measures have been taken to fill those vacancies;

(ii) the date on which teachers will be recruited for this purpose; and

(iii) whether priority will be given to volunteer teachers in making recruitment?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු 57කි.

(ආ) (i) 6 සිට 11 වසර දක්වා ඇති ගුරු පුරප්පාඩු ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන්ගෙන් පිරවීමට කටයුතු සැලසුම් කර ඇති අතර, අපොස (උසස් පෙළ) විෂයයන් සඳහා පැවති පුරප්පාඩු අභ්‍යාසලාභී උපාධිධාරීන්, තාක්ෂණවේදය උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන්ගෙන් සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත.

(ii) අභ්‍යාසලාභී උපාධිධාරීන්, තාක්ෂණවේදය උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් හට 2016.08.26 දින ගුරු පත්වීම් ලබා දුන් අතර, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් හට සැප්තැම්බර් මාසයේදී පත්වීම් ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත.

(iii) නැත. ස්වේච්ඡා ගුරුවරුන් ගුරු සහායකයින් ලෙස බඳවා ගැනීම සඳහා 2007 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද තීරණය අනුව, ඉදිරියේදී ස්වේච්ඡා ගුරුවරුන් කිසිවෙක් පත් කළ නොහැක.

(ඇ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මෙම පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍යයෙන් උගන්වන ගුරුවරු 57දෙනෙකුගේ පුරප්පාඩු දැනටමත් තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ තිබෙන පාසල් ප්‍රමාණයට සාපේක්ෂව ගත්තොත්, ඒක ඇත්තටම බරපතළ තත්ත්වයක්. ඒක නිසා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ඔබතුමා කියන 6 වසර සිට 11 වසර දක්වා සහ උසස් පෙළ කියන මේ කොටස් දෙක වෙනුවෙන් කරන බඳවා ගැනීමේ කටයුතුවලින් මේ පුරප්පාඩු 57 පිරවීමට හැකියාවක් තිබෙනවාද කියලා. ඒ බඳවා ගැනීම් තුළින් මේ පුරප්පාඩු සම්පූර්ණ වෙනවාද? ඔබතුමා දැන් මේ පුරප්පාඩු පුරවන ආකාර දෙකක් යෝජනා කළා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

එකක් පුරවලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා මේ ප්‍රශ්නය අහන විට පුරප්පාඩු ගණන 57යි. ඒක දැන් මේ වන විට පුරවන්න කටයුතු කරලා තිබෙනවා. ඒක සැප්තැම්බර් මාසයේ පුරවන්න සැලසුම් කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අනෙක් කාරණය තමයි, ගුරු ව්‍යාවස්ථාවට අනුව ගුරුවරුන් බඳවා ගැනීමට ගැසට් කළාම දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම් කරන ප්‍රමාණය හරිම අඩුයි. ඒ නිසා තමයි මේ ගැටලුව තිබෙන්නේ. නමුත් අපි මේකට දැන් විකල්පයක් සොයා ගෙන ඉදිරියේදී ඒකට අවශ්‍ය පියවර ගන්නවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

පිළිතුර සම්පූර්ණ වුණේ නැහැ, ගරු ඇමතිතුමනි. සැප්තැම්බර් මාසය වන විට මුළු පුරප්පාඩු ප්‍රමාණයම පිරවෙනවා කියලා ඔබතුමා විශ්වාස කරනවා නම්, ඒක මම අගය කරනවා. විශේෂයෙන්ම සියනෑ විද්‍යා පීඨය වාගේ තැනක ගුරුවරුන්ව බඳවා ගැනීමේ කටයුතුත්, ඒ වාගේම පුහුණු කිරීමේ කටයුතුත් මීට වඩා විධිමත් කරනවා නම් හොඳයි. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙත් අපි ඉල්ලීම් කළා, මේ ප්‍රශ්නය නිසාම විශේෂයක් කරන්න කියලා. ගරු ඇමතිතුමනි, මූලික ප්‍රශ්නය වෙන්නේ බදුල්ලෙන්, යාපනයෙන් වාගේ ප්‍රදේශවලින් එන ගුරුවරු මාතර, දෙනියාය වාගේ ප්‍රදේශවල රැඳෙන්නේ නැති එකයි. ඒ අය පත්වීම ලැබිලා ආපු ගමන්ම -කෙටි කාලයක් තුළ- මොනවා හරි ක්‍රමයකින් මාරුවීමක් හදාගෙන යන්න බලනවා. ඒ නිසා ඒ පාසල්වල දරුවන්ට ඒක බරපතළම ගැටලුවක් වෙලා තිබෙනවා. මොකක් හරි විශේෂ වැඩ පිළිවෙළක් ඒ ගොල්ලන් වෙනුවෙන් හදන්න පුළුවන් නම් හොඳයි. අපි යෝජනා කළේ අඩුම තරමින් LRC එකේ තිබෙන ඉඩම්වලින් ස්ථාවර ඉඩම් කොටසක් හරි ලබා දෙනවා කියන සහතිකයක් ඒගොල්ලන්ට දෙන්න කියලායි. එහෙම නම් ඒ ගොල්ලන් එහි පදිංචි වෙනවා. නමුත්, දැන් මේ යන ක්‍රමයට එහෙම පදිංචිවීමක් වෙන්නේ නැහැ. ඒ නිසා ගුරුවරු ස්ථාවරව ඒ පාසල්වල රැඳෙන්නේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රධානම ප්‍රශ්නය.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රදේශයෙන් සහ පළාතෙන් සුදුසුකම් තිබෙන ගුරුවරු සොයා ගන්න තිබෙන අපහසුකම නිසා තමයි, පිට පළාත්වලින් ගුරුවරු ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. අයදුම්පත් කැඳවන විට ඒ ප්‍රදේශවල සුදුසුකම් තිබෙන අය ඉල්ලුම් කරන්නේ නැහැ. ඒක තමයි පිට පළාත්වලින් ගුරුවරු ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙන්නේ. හැබැයි, අපි ඉදිරියේදී බඳවා ගැනීමේ ක්‍රමවේදය වෙනස් කරන්න ගරු අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් තිබෙන කමිටුවකින් මේ සියල්ල පිළිබඳ තීන්දු තීරණ ගන්නවා. ඉදිරියේදී ඒ මාර්ගයෙන් පාසල පාදක කරගෙන school-based system එකකට යන නිසා මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. මොකද, ඊට පස්සේ එන ගුරුවරයා මේ ගැන දන්නා නිසා එතැන ඉන්න බලාගෙනමයි එන්නේ. ඊට පස්සේ කලින් වාගේ ගුරුවරු මාරුවීම් ප්‍රශ්නයක් එන්නේ නැති වෙයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු ඇමතිතුමනි, දකුණු පළාතේ දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගන්නා දරුවන්ට සුවිශාල ප්‍රශ්නයක් තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ දරුවන්ටත් එය සුවිශාල ගැටලුවක්ව පවතිනවා. ඔබතුමා හොඳින් දන්නවා, දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගන්නා දරුවන් නුවරඑළියට යන්න පෙලඹීමට එක් හේතුවක් වන්නේ ගුරුවරුන්ගේ හිඟකම බව. දකුණු පළාත් සභාව සමඟ යම් කිසි මැදිහත්වීමක් කරලා මෙය විසඳන්න ගරු අධ්‍යාපන ඇමතිතුමාට පුළුවන්. ඒ නිසායි මම මෙම ප්‍රශ්නය තුන්වැනි අතුරු ප්‍රශ්නය වශයෙන් ඉදිරිපත් කරන්නේ. බදුල්ල සහ මඩකලපුව වැනි ප්‍රදේශවලින් එන දෙමළ මාධ්‍යය ගුරුවරුන්ගෙන් යම් පිරිසක් සූදානමින් ඉන්නවා, ඒ ප්‍රදේශවලම පදිංචිවෙලා ජීවත්වෙමින් ගුරුවරු වශයෙන් සේවය කරන්න. ඒ පළාතේ ගුරුවරුන් නැත්නම්, රටේ කොහෙන් හරි ගුරුවරුන් ගන්න වෙනවා නේ. ගරු ඇමතිතුමනි, මෙය ඔබතුමාගේ විෂයටම අදාළ දෙයක් නොවෙයි. ගරු අගමැතිතුමා වාගේ අය මේ සඳහා මැදිහත් විය යුතුයි. ගරු ඇමතිතුමනි, දකුණු පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිතුමාත්, ඉඩම් ඇමතිවරයාත්, ඒ පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත්, එම ගුරුවරුනුත් සම්බන්ධ කර ගෙන පාර්ලිමේන්තුවේදී සාකච්ඡාවක් කරන්න ඔබතුමාට පුළුවන් නම් හොඳයි. ගරු කථානායකතුමනි, ඔය ප්‍රශ්නය සම්බන්ධයෙන් එක යෝජනාවක් තිබෙනවා. දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගන්නා

[ගරු බිමල් රත්නායක මහතා]

දරුවන්ගේ ප්‍රශ්නය විශේෂයෙන් සැලකිල්ලට අරගෙන පිටින් එන ගුරුවරුන්ට එහි පදිංචිවීමට යම් කිසි ණය මුදලක් ලබා දුන්නොත් -ඔවුන් නිකම් මොකුත් ඉල්ලන්නේ නැහැ- ඒ ගුරුවරුන් ඒ ප්‍රදේශයේ රැඳී සිටිමින් එම දරුවන්ට උගන්වනවා. ඒ සම්බන්ධයෙන් පළමුවෙන් සාකච්ඡාවකට මැදිහත් වෙන්න කියන ඉල්ලීම තමයි මම ගරු ඇමතිතුමාගෙන් කරන්නේ, තුන්වන අතුරු ප්‍රශ්නය වශයෙන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, පාසල් පාදක කර ගෙන බඳවා ගැනීමේ ක්‍රමවේදයෙනුත් මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබුණේ නැත්නම් අපි සාකච්ඡා කර ඒ ක්‍රමයට යමු කියලා මම යෝජනා කරනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් මටත් පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තුනක් අසා තිබෙනවා. දැන් අපට කාල වේලාව නැහැ. ඇමතිතුමා පිළිතුරු ලබා දෙන්න කැමති නම් ඔබතුමාට පැහැදිලි කර ගැනීමකට අවස්ථාව ලබා දෙන්නම්. අපට ඊයේ දිනයේදීත් පැය එකහමාරක ප්‍රමාදයක් වුණා. ඇමතිතුමා කැමතිද පිළිතුරු ලබා දෙන්න?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම කැමැතියි, ගරු කථානායකතුමනි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, මාතර, ගාල්ල, හම්බන්තොට සිටින දෙමළ මාධ්‍ය මුස්ලිම් උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා නොදෙන්නේ ඇයි? මොකද, පළාත් සභා අධ්‍යාපන අමාත්‍යවරයා කරන ප්‍රධානම දේ තමයි පිට ප්‍රදේශයකින් ගෙනැවිත් හෝ කොහොම හරි ගුරු පත්වීම් ලබා දීම. නමුත්, මේ දිස්ත්‍රික්ක තුනේම ඉන්න මුස්ලිම් උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබා දෙන්නේ නැහැ. ඇයි ඒ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, උපාධිධාරීන්ව බඳවා ගන්න පළාත් සභාවට පුළුවන්කම තිබෙනවා. දැන් ඔබතුමා කියන්නේ, බඳවා ගන්නේ නැහැ කියන එකද?

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
නැහැ. දෙමළ මාධ්‍ය මුස්ලිම් උපාධිධාරීන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය හදාරන දෙමළ අයත් ඉන්නවා; මුස්ලිම් අයත් ඉන්නවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාවේ එවැනි ක්‍රියා පිළිවෙතක් තිබෙනවාද කියලා මම සොයා බලන්නම්. හැබැයි, අප නම් කිසි විටෙකත් දෙමළ, මුස්ලිම් කියලා කිසිම භේදයකින් තොරවයි කටයුතු කරන්නේ. ඒ පුරප්පාඩු මත පමණයි අප කටයුතු කරන්නේ. ගරු කථානායකතුමනි, අපි සම්පත් බෙදා හැරීමේදී උතුර, නැඟෙනහිර, දකුණ, බටහිර යන සියලු පළාත්වලට සමානවයි සම්පත් බෙදන්නේ. මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණ සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවෙන් විමසන්නම්.

කිතුල් පැණි හා හකුරු කර්මාන්ත නගා සිටුවීම : පියවර

கித்துள்பாணி மற்றும் கருப்பட்டித் தொழிலை மேம்படுத்தல் : நடவடிக்கை

PROMOTION OF KITHUL TREACLE AND JAGGERY INDUSTRIES: MEASURES TAKEN

546/'16

12.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිතුල් පැණි ආශ්‍රිතව නිෂ්පාදන රාශියක් සිදු කළ හැකි බවත්;

(ii) ඒවා සීනි වෙනුවට භාවිත කළ හැකි සෞඛ්‍යාරක්ෂිත විකල්පයක් බවත්;

(iii) මෙම කර්මාන්ත හරහා රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් ජනිත කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කිතුල් පැණි හා හකුරු කර්මාන්ත ජීවනෝපාය කරගත් පිරිස පිළිබඳව සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කිතුල් පැණි හා හකුරු කර්මාන්ත නගා සිටුවීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கிராமியப் பொருளாதார விவகாரங்கள் பற்றிய அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கித்துள் பாணியின் மூலம் பல உற்பத்திகளை மேற்கொள்ள முடியும் என்பதையும்;

(ii) இது சீனிக்குப் பதிலாக பயன்படுத்தக்கூடிய சுகாதாரப் பாதுகாப்பான ஓர் மாற்றீடாகும் என்பதையும்;

(iii) இந்தக் கைத்தொழில் மூலம் பெருமளவிலான தொழில் வாய்ப்புக்களை ஏற்படுத்த முடியும் என்பதையும்;

அவர் ஏற்றுக் கொள்வாரா?

(ஆ) (i) கித்துள் பாணி மற்றும் கருப்பட்டி உற்பத்தியை வாழ்வாதாரமாகக் கொண்டவர்கள் எவ்வளவு பேர் இருக்கின்றார்கள் என்பது தொடர்பாக கணிப்பீடொன்று செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த எண்ணிக்கை எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) கித்துள் பாணி மற்றும் கருப்பட்டி உற்பத்தித் தொழிலை மேம்படுத்த அரசு நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த நடவடிக்கை யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Economic Affairs:

(a) Will he admit that -

(i) a number of products can be produced using kithul treacle;

(ii) such products can be used as healthy alternatives for sugar; and

(iii) that a large number of employment opportunities can be generated through kithul industry;

(b) Will he inform this House -

(i) whether a census has been carried out in order to find out the number of those who are engaged in producing kithul treacle and jaggery as their livelihood; and

(ii) if so, the number of such persons?

(c) Will he also inform this House -

(i) whether the Government has taken measures to promote kithul treacle and jaggery industries; and

(ii) if so, of the nature of such measures?

(d) If not, why?

ගරු පී. හැරිසන් මහතා (ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

(மாண்புமிகு பீ. ஹரிசன் - கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர்)

(The Hon. P. Harrison - Minister of Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

(අ) (i) ඔව්. කිතුල් පැණි ආශ්‍රිතව නිෂ්පාදන රාශියක් සිදු කළ හැක.

(ii) ඔව්. කිතුල් පැණි සීනි වෙනුවට භාවිත කළ හැකි සෞඛ්‍යාරක්ෂිත විකල්පයකි.

(iii) ඔව්. පිළිගනිමි.

(ආ) (i) සංගණනයක් සිදු කර නොමැත.

(ii) කිතුල් කර්මාන්තය සෘජු හා වක්‍රව ජීවනෝපාය කරගත් විශාල පිරිසක් සිටිති.

(ඇ) (i) ඔව්.

(ii) කිතුල් කර්මාන්තය සංවර්ධනය පිණිස ඒ ආශ්‍රිත දිස්ත්‍රික්ක 12ක් සඳහා පහත සඳහන් පරිදි 2016 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන කැස්පර් තාක්ෂණය ලබාදීම, නවීන තාක්ෂණය, මල් මැදීම පුහුණු කිරීම, ව්‍යවසායකත්ව පුහුණුව සඳහා මෙන්ම කිතුල් මදින පිහි ලබාදීම, බඳ පටි ලබාදීම, පැණි උණු කිරීම සඳහා තාච්චි සහ ආරක්ෂිත හා පිරිමැසුම්දායි උදුන් ලබාදීම සඳහා යොමු කර ඇත.

අදාළ දිස්ත්‍රික්කයන්හි සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති වාර්තා අනුව අදාළ ප්‍රතිපාදන ලබා දී ඇත.

කිතුල් කර්මාන්තකරුවන් ලියා පදිංචි කොට හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ට බලය පවරා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MREA/5/8/4/ kithul හා 2016.08.02 දිනැතිව උපදෙස් මාලාවක් නිකුත් කර ඇති අතර එකී ලියා පදිංචියෙන් පසුව කර්මාන්තයේ නිරත කිතුල් කාර්මිකයන් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා අවධානය යොමු කර ඇත.

2016 වර්ෂය		
දිස්ත්‍රික්කය		වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන (රු.)
1	කළුතර	1,701,540.00
2	කෑගල්ල	2,510,540.00
3	ගාල්ල	2,436,150.00
4	බදුල්ල	7,077,960.00
5	මහනුවර	3,309,280.00
6	මාතර	525,200.00
7	මාතලේ	1,158,300.00
8	රත්නපුරය	3,449,470.00
9	හම්බන්තොට	1,495,200.00
10	නුවරඑළිය	1,742,090.00
11	කුරුණෑගල	700,100.00
12	අම්පාර	137,750.00
එකතුව		**26,243,580.00**

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමනි, ඔබතුමාත් එකඟ වනවා ඇති, ඔබතුමාගේ අමාත්‍යාංශයට සෘජුව අයිති නොවුණත් පොල් පැණි ආශ්‍රිතව සිදු කරන හකුරු නිෂ්පාදනයත්, කිතුල් පැණි ආශ්‍රිතව සිදු කරන හකුරු නිෂ්පාදනය

[ගරු බුද්ධික පතිරණ මහතා]

සහ පැණි නිෂ්පාදනයත්, හම්බන්තොට දිස්ත්‍රික්කය, මාතර දිස්ත්‍රික්කය ද ඇතුළුව බොහෝ දිස්ත්‍රික්කවල ජනතාවගේ අතිරේක ආදායම් මාර්ගයක්ය කියන කාරණයට. ඒ වාගේම, මෙය අපේ රටේ සංස්කෘතීන් එක්ක බැඳී තිබෙන කාරණයක්. ජනතාව තම ගමේ ආර්ථිකය තනිකරම මේ නිෂ්පාදනත් එක්ක ගොඩ නහාගෙන ඇති සමහර ප්‍රදේශ, සමහර ගම්මාන තිබෙනවා. හැබැයි ඒ ජනතාවට ඒ නිෂ්පාදන ඉදිරියට ගෙන යන්න, ජාත්‍යන්තරයට ගෙන යන්න තිබෙන ඉඩ ප්‍රස්ථා අඩුයි. පොල් පැණි වේවා, කිතුල් පැණි වේවා, ඒ ආශ්‍රිතව සිදු කරන නිෂ්පාදන වේවා, විශේෂයෙන් යාපනය වාගේ ප්‍රදේශවල කෙරෙන තල් ආශ්‍රිත නිෂ්පාදන වේවා, එවැනි නිෂ්පාදන කරන ගම්මාන හඳුනාගෙන ඒ ගම්මානවලට ඒ නිෂ්පාදන වැඩිදියුණු කරගන්න තාක්ෂණික උපදෙස් ලබා දෙන්න, ප්‍රාග්ධනය ලබා දෙන්න 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ සහ 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. ஹரிசன්)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, එතුමා කියූ පරිදි දැනටමත් ඒ ගම්මාන හඳුනාගෙන තිබෙනවා. අපට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ අපනයන වෙළෙඳාමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. ඒ සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශයත්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයත් එකතු වෙලා යෝජනා ගණනාවක් ක්‍රියාත්මත කරන්න ලැහැස්ති කර තිබෙනවා. මා හිතන හැටියට, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේත් ගම්මාන කීපයක් අපි ඒ සඳහා තෝරාගෙන තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මාතර දිස්ත්‍රික්කයේත් ගම්මාන කීපයක් ඒ සඳහා තෝරාගැනීම පිළිබඳව මා ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා. ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් කාරණයක් දැනගන්න කැමැතියි. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා හරහා ලංකා සතොස සහ ඒ ආශ්‍රිත අළෙවි ජාලය පාවිච්චි කරන්න පුළුවන්.

ඒ වාගේම අද රට තුළ සුපිරි වෙළෙඳ සැල් ඇති වී තිබෙනවා. හැබැයි, මේවාට "සුපිරි" කියලා කිව්වාට, අද මධ්‍යම පාන්තිකයන්, පහළ මධ්‍යම පාන්තිකයන් සහ ඉහළ මධ්‍යම පාන්තිකයන් මෙම වෙළෙඳ සැල් පාවිච්චි කරනවා. එක පැත්තකින් සුපිරි වෙළෙඳ සැල් ජාලාවක් තිබෙනවා. ඒ වාගේම හුදෙකලාව ඇති කරපු සුපිරි වෙළෙඳ සැලුත් තිබෙනවා. මේ සුපිරි වෙළෙඳ සැල්වල තිබෙන පැණි සහ හකුරු නිෂ්පාදන අරගෙන බැලුවොත්, ඒවායෙන් බොහෝ ඒවා සීනි දිය කරලා හදපු ඒවා බව අපි දන්නවා. ප්‍රමිතියෙන් තොර පැණි ආශ්‍රිත නිෂ්පාදන තමයි තිබෙන්නේ. ඒ නිසා සැබෑ නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන මෙම අළෙවි ජාලයට ඇතුළු කිරීම සඳහා පෞද්ගලික ව්‍යවසායකයන් සමඟ සාකච්ඡා කරලා විශේෂ වැඩ පිළිවෙළක් යොදන්න අමාත්‍යාංශයට බැරිද?

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. ஹரிசன්)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, අමාත්‍යාංශය මේ කටයුත්තට ඍජුවම අත ගැසුවොත් කරන්න අමාරු වෙයි කියා මා හිතනවා. දැනට කිතුල් පැණි ආශ්‍රිත නිෂ්පාදන කරන පෞද්ගලික ආයෝජකයන් විශාල පිරිසක් මෙතුමා කියන ඔය සුපිරි වෙළෙඳ සැල්වල ඒ නිෂ්පාදන අළෙවි කිරීමට විශාල උනන්දුවක් දක්වනවා. අපේ අමාත්‍යාංශය හරහා ඒ අය දිරිමත් කරලා දේශීය වශයෙන් එම නිෂ්පාදන වැඩිදියුණු කිරීමටත්, විදේශීය වශයෙන් අපනයන වෙළෙඳාමට අවශ්‍ය පුහුණුවීම් ඒ අයට ලබා දෙන්නත්, ඒ වාගේම ඒ අයට අවශ්‍ය ණය පහසුකම් ලබා දෙන්නත්, අනෙකුත් යටිතල පහසුකම් සැපයීමටත් කටයුතු කරගෙන යනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයේදීත් මා සංක්ෂිප්තව මේ ගැන යමක් සඳහන් කළා. පොල් ආශ්‍රිත නිෂ්පාදන වේවා, තල් ආශ්‍රිත නිෂ්පාදන වේවා, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන වේවා මෙම නිෂ්පාදන සම්බන්ධව තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි, මේවායේ ප්‍රමිතිය පිළිබඳ කාරණය. මෙය ජනතාවගේ සෞඛ්‍යයටත් ඍජුවම බලපා තිබෙනවා. ඒවායේ නියාමන කටයුතු අයිති වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට බව මම දන්නවා. හැබැයි, නිෂ්පාදකයා එකවර වැඩි මුදලක් උත්පාදනය කර ගැනීම සඳහා මෙසේ ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන කරන එක නතර කරන්නත් යම් මැදිහත්වීමක් කරන්න අමාත්‍යාංශයට පුළුවන්ද?

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. ஹரிசன්)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඍජුවම සම්බන්ධ වෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයටයි. නමුත් අපිත් ඒ ගැන බලනවා. දේශීය වශයෙන් සිදුවන නිෂ්පාදනයේදීත්, විදේශීය වශයෙන් එම නිෂ්පාදන අපනයනය කිරීමේදීත් එම ප්‍රමිතිය හරියාකාරව නොතිබුණොත් පාරිභෝගිකයන් ඒවා ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා අපි ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි එම නිෂ්පාදනවල ප්‍රමිතිය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා කටයුතු කිරීමට පුළුවන් තරම් උත්සාහ කරනවා.

සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම්: මුලතිවු දිස්ත්‍රික්කය

ஊழியர் சேமலாப நிதியக் கணக்குகள் : முல்லைத்தீவு மாவட்டம்

EMPLOYEES' PROVIDENT FUND ACCOUNTS: MULLAITIVU DISTRICT

741/'16

13. ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பිමல් ரத්නாயக்க)
(The Hon. Bimal Rathnayake)

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල මුලතිවු දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

තොழිල් මற්றුම් තොழිற්சங්ක உறவுகள් அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013, 2014 மற்றும் 2015 ஆம் ஆண்டுகளில் முல்லைத்தீவு மாவட்டத்தில்,

(i) பதிவு செய்திருந்த ஊழியர் சேமலாப நிதியக் (EPF) கணக்குகளின் எண்ணிக்கை;

(ii) புதிதாக பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை;

ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் புதிதாக பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை,

(i) அரசாங்கத்துக்கு உரித்தான கம்பனிகள்;

(ii) பகுதியளவிலான அரச நிறுவனங்கள்;

(iii) தனியார் துறை;

(iv) கைத்தொழில்துறை;

(v) விவசாயத்துறை;

(vi) சேவைத் துறை;

இதற்கு அமைய ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked theMinister of Labour and Trade Unions Relations:

(a) Will he inform this House separately in relation to years 2013, 2014 and 2015 -

(i) the number of registered Employees' Provident Fund (EPF) accounts; and

(ii) the number of Employees' Provident Fund (EPF) accounts registered anew;

in the District of Mullaitivu?

(b) Will he also inform this House separately in relation to years 2013, 2014 and 2015, the number of Employees' Provident Fund (EPF) accounts registered anew by -

(i) state owned companies;

(ii) semi government institutions;

(iii) the private sector;

(iv) the industrial sector;

(v) the agricultural sector;

(vi) the service sector?

(c) If not, why?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour and Trade Unions Relations)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

වර්ෂය	ලියාපදිංචි තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	645
2014	654
2015	1833

(ii)

වර්ෂය	අලුතින් ලියාපදිංචි තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව
2013	382
2014	292
2015	1342

(ආ) (i) රජයට අයත් සමාගම්

(ii) අර්ධ රාජ්‍ය ආයතන

(iii) පෞද්ගලික අංශය

(iv) කර්මාන්ත අංශය

(v) කෘෂිකර්මාන්ත අංශය

(vi) සේවා අංශය

වශයෙන් වර්ගීකරණය කරන ලද පද්ධතියක් දැනට සේවක අර්ථසාධක අරමුදල සතුව නොමැත.

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව A සිට X දක්වා වූ අක්ෂර අනුව නම් කරනු ලබන කලාපවලට අනුකූලව සේවා යෝජකයන් ලියාපදිංචි කරන දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. එලෙස ලියාපදිංචි වූ සේවා යෝජකයෙකුගෙන් යම් සාමාජිකයෙකු වෙනුවෙන් දායක මුදලක් ලද විට අදාළ සේවා යෝජකයාට හිමි අක්ෂරය හා අංකය යටතේ එම සාමාජිකයා ලියාපදිංචි වේ.

(ඇ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්න වෙනවා. සේවක අර්ථසාධක අරමුදලත් ඒ වාගේම ETF එකත් එකම අංකයකින් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ගරු ඇමතිතුමනි එයට අනුව, මම මේ ඉදිරිපත් කරලා තිබෙන රැකියා ක්ෂේත්‍ර අනුව වර්ගීකරණයක් ඔවුන් සතුව තිබෙනවා. ඔබතුමාගේ කම්කරු අමාත්‍යාංශය සතුව නැතත්, ETF එක යටතේ ඒ විස්තර තිබෙනවා. ඒ දෙකම, එකම අංකයකින් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා දැන් බැරි වුණත් ඉදිරියේදී හෝ මට පිළිතුරක් ලබා දෙන්න. මොකද මම ප්‍රශ්න කිහිපයක් අහලා තිබෙන නිසා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ඊයේ ඔබතුමා මෙවැනිම ප්‍රශ්නයක් අහලා තිබුණා. ඒ ප්‍රශ්නයට පිළිතුරු දීලා, අමාත්‍යාංශයට ගිහිල්ලා, මම දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ සාකච්ඡා කළා. ඔබතුමාගේ ඒ යෝජනාවේ තිබෙන සාධනීය තත්ත්වය ඇත්ත වශයෙන්ම මම තේරුම් ගත්තා. මම ඒ ගැන කටයුතු කරන්න බලනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මම මේ අහලා තිබෙන ප්‍රශ්නයට අදාළ දත්ත ETF එක සතුව තිබෙන නිසා ඒවා ඔබතුමාගේ අමාත්‍යාංශයටත් ලබා ගන්න කියලා. අනෙක් දිස්ත්‍රික්ක සම්බන්ධ ප්‍රශ්නවලදී ඒ කොටසත් එකතු කරලා උත්තර දෙන්න උත්සාහ කරන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මීට පසුව අපි ඒ තත්ත්වය හදන්න බලමු.

Sir, with all due respect to the Chair, these Answers cannot be understood in the proper perspective, unless they are linked with the Question. I can reply, but the thing is, it is not understood in the proper perspective unless they are linked with the Question. The Hon. Member who raised the Question may understand, but as far as the other Members are concerned, they will not understand. They may not be able to raise Supplementary Questions because they are in the dark.

This is for your consideration Sir, with all due respect.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

Hon.Speaker, it is not clear. I could not hear him properly.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමා කියනවා ඔබතුමා සඳහන් කළ කාරණය පැහැදිලි නැහැ කියලා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ගරු කථානායකතුමාට කියපු කරුණ මට හරියටම ඇහුණේ නැහැ. ඒ නිසා පැහැදිලි වුණේ නැහැ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මා කථානායකතුමාගේ අවධානයට යොමු කළේ, පිළිතුරු දෙනකොට ප්‍රශ්නයත් සඳහන් කරලා පිළිතුර දුන්නේ නැත්නම් තේරුම් ගන්න අමාරු වෙනවා කියන එකයි. ප්‍රශ්නයත් සඳහන් කරලා උත්තරය දුන්නොත්, මා හිතනවා අනෙක් ගරු මන්ත්‍රීවරුන්ටත් අවබෝධ කර ගන්න පහසුයි කියලා. නමුත්, ගරු කථානායකතුමනි, වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන බව මා දන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, වෙලාව පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ. එහෙම නම් අපට වේලාව දීර්ඝ කර ගන්න වෙනවා. ඊයේ දිනයේත් පැයක් පරක්කු වෙලායි අනෙකුත් කටයුතුවලට ගියේ.

දැන් දෙවන වටය.

අමාත්‍යවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාර: විස්තර

அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் வெளிநாட்டு விஜயங்கள்: விபரம்

FOREIGN TOURS OF MINISTERS AND MEMBERS OF PARLIAMENT : DETAILS

606/'16

2. ගරු එස්. සී. මුතුකුමාරණ මහතා (ගරු ටී. රංජිත් ද සොයිසා මහතා වෙනුවට)
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண - மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா சார்பாக)
(The Hon. S.C. Mutukumarana on behalf of the Hon. T. Ranjith De Zoysa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා,

(i) රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගි වී ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) අග්‍රාමාත්‍යවරයාද ඇතුළත්ව එම සංචාර සඳහා සහභාගි වී ඇති මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් කවුරුන්ද;

(iii) සංචාරය කරන ලද රටවල් කවරේද;

(iv) එම විදේශ සංචාරවලින් රාජකාරී හා පෞද්ගලික සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ (i) හි සඳහන් සංචාර සඳහා රජයේ නිලධාරීන් සහභාගි වී තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත කාලසීමාව තුළ රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගි වී ඇති විදේශ සංචාරවලට වැය වී ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පිරතම අමෙච්චරුම් තේසිය කොළ්කෙකළ් මර්රුම් පොරුළාතාර අලුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(අ) 2015 චනවරි තොටක්කම් ටිසම්පර් වරෙ,

(i) අරචාංකත්තින් පාරාළුමන්ර උරුප්පිනර්කළුම් අමෙච්චර්කළුම් කලන්තුකොණ්ටුළ්ළ වෙළි නාට්ටු විජයංකළින් එණ්ණික්කෙ යාතු;

(ii) පිරතම අමෙච්චරෙයුම් උළ්ළටංකලාක මේර්පට්ටි විජයංකළිල් කලන්තුකොණ්ටුළ්ළ පාරාළු මන්ර උරුප්පිනර්කළුම් අමෙච්චර්කළුම් යාවර්;

(iii) විජයම්චෙය්ත නාටුකළ් යාවෙ;

(iv) මේර්පට්ටි වෙළිනාට්ටු විජයංකළිල් කටමෙ මර්රුම් පිරත්තියේක විජයංකළ් තනිත්තනියාක යාවෙ;

එන්පතෙ අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ආ) (i) අ (i) ඉල් කුරිප්පිටප්පට්ට විජයංකළිල් අරචාංක අලුවලර්කළ් පංකේර්රුළ්ළනරා;

(ii) ආමෙනිල් මේර්පට්ටි අලුවලර්කළින් එණ්ණික්කෙ යාතු;

(iii) මේර්පට්ටි කාලප්පකුතික්කුළ් අරචාංකත්තින් පාරාළුමන්ර උරුප්පිනර්කළුම් අමෙච්චර්කළුම් කලන්තුකොණ්ටුළ්ළ වෙළිනාට්ටු විජයංකළුක් කාකච් චෙලවාකියුළ්ළ මොත්තප් පණත්තොකෙ යාතු;

එන්පතෙ අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of foreign tours in which the Members of Parliament in the Government and Ministers have participated;

(ii) the names of the Members of Parliament and Ministers including the Prime Minister who have participated in the aforesaid tours;

(iii) the countries which they visited; and

(iv) out of the aforesaid foreign tours, separately the official and personal tours taken;

during the period from January to December in the year 2015?

(b) Will he also inform this House-

(i) whether public officers have participated in the tours mentioned in (a) (i);

(ii) if so, the number of aforesaid officers; and

(iii) the total expenditure borne for the foreign tours in which Members of Parliament representing the Government and Ministers have participated during the above period?

(c) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රජයේ මන්ත්‍රීවරුන් සහභාගි වූ විදේශ සංචාර සංඛ්‍යාව - 16

රජයේ අමාත්‍යවරුන් සහභාගි වූ විදේශ සංචාර සංඛ්‍යාව - 86

(ii) ඇමුණුමෙහි* දක්වා ඇත.

(iii) ඇමුණුමෙහි* දක්වා ඇත.

(iv)

	රාජකාරී සංචාර	පෞද්ගලික සංචාර
අමාත්‍යවරුන්	58	28
මන්ත්‍රීවරුන්	16	09

(ආ) (i) ඔව්.

(ii) පණස්තුනයි (53)

(iii) * අමාත්‍යවරුන් සඳහා - රුපියල් අසූඑක් මිලියන අටසියපණස් දෙදහස් හයසිය පණස්හතරයි ශත දහයයි. (රු.81,852,654.10)

* මන්ත්‍රීවරුන් සඳහා - රුපියල් විසිහත්මිලියන එකසියහතළිස් හයදහස් හයසිය තිස්හතරයි ශත පණස් තුනයි. (27,146,634.53)

(ඇ) අදාළ නොවේ.

නොරොච්චෝලේ සුනාමි නිවාස : බෙදා නොදීම
நுரைச்சோலை சுனாமி வீடுகள் : பகிர்ந்தளிக்காமை
NOROCHCHOLAI TSUNAMI HOUSES: NON-DISTRIBUTION

819/'16

6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. M.H.M. Salman)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ, සුනාමියෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් සෞදි අරාබියේ රාජ්‍ය නොවන සංවිධානයක අරමුදල් යටතේ අක්කරපත්තුව, නොරොච්චෝලේ ගම්මානයේ ඉදිකරන ලද නිවාස ව්‍යාපෘතියක් ප්‍රතිලාභීන්ට බෙදා දීමට පෙර අංක 178/2008 දරන ශ්‍රේෂ්ඨාධිකරණය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බුද්ධික පතිරණ මහතා]

ලබා දුන් නඩු නියෝගයක් මත නිවාස බෙදාදීම් අත්හිටුවන ලද අතර, 2009.12.02 දින ලබා දුන් ඉහත නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත්කර වසර 6කට වැඩි කාලයක් ගත වී ඇතත්, එම තීන්දුවට අනුව නිවාස බෙදා දීම සිදුකර නොමැති වීමෙන් එම දේපළ පරිහරණයට නුසුදුසු අන්දමින් පරිහානියට පත් වී ඇති බැවින් එම නඩු තීන්දුව අනුව කටයුතු කිරීමට අම්පාර දිස්ත්‍රික් ලේකම්/අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அம்பாறை மாவட்டத்தில் சுனாமியால் பாதிக்கப்பட்ட மக்களுக்காக சவூதி அரேபியாவின் அரச சார்பற்ற அமைப்பொன்றின் உதவியின்கீழ் அக்கரைப்பற்று-நுரைச்சோலை கிராமத்தில் நிர்மாணிக்கப்பட்ட வீட மைப்புக் கருத்திட்டம் நன்மை பெறுனர்களுக்கு பகிர்ந்தளிக்கப்பட முன்னர் 178/2008ஆம் இலக்க முடைய உயர்நீதிமன்றத்தினால் வழங்கப்பட்ட வழக் குக் கட்டளையின் பேரில் வீடுகளைப் பகிர்ந்தளித்தல் இடைநிறுத்தப்பட்டதோடு, 2009.12.02ஆந் திகதி வழங்கிய மேற்படி வழக்குத் தீர்ப்பு அறிவிக்கப்பட்டு 06 வருடங்களுக்கு மேற்பட்ட காலம் கழிந்துள்ள போதிலும் அத்தீர்ப்பின்படி வீடுகளைப் பகிர்ந் தளித்தல் இடம்பெறாமையால் மேற்படி ஆதனங்கள் பாவனைக்குப் பொருத்தமற்ற வகையில் சீரழிந்துள்ள மையால் அவ்வழக்குத் தீர்ப்பின் பிரகாரம் செயலாற்ற அம்பாறை மாவட்டச் செயலாளர், அக்கரைப்பற்று பிரதேச செயலாளருக்கு ஆலோசனை வழங்குவாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) A housing project funded by a non-governmental organization in Saudi Arabia for the Tsunami affected people in the Ampara District constructed at the Norochcholai village in Akkaraipattu was suspended on a Court Order bearing Number 178/2008 delivered by the Supreme Court prior to houses being distributed amongst beneficiaries and though more than six years have lapsed since the delivery of the above judgment on 02.12.2009, the houses have not been distributed in accordance with the said court order resulting in the entire property becoming uninhabitable and therefore will he inform this House whether he instructs the Ampara District Secretary/ Akkarapattu Divisional Secretary to act in accordance with the said court order?

(b) If not, why?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අදාළ පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ සුනාමියෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් සෞදි අරාබියේ රාජ්‍ය නොවන සංවිධානයක අරමුදල් යටතේ අක්කරපත්තුව, නොරොච්චෝලේ ගම්මානයේ නිවාස 500ක් ප්‍රතිලාභීන්ට බෙදා දීම සඳහා ඉදි කර ඇත.

මෙම නොරොච්චෝල නිවාස යෝජනා ක්‍රමය තුළ අන්‍යාගාමිකයන් පදිංචි වුවහොත් දීඝවාපී ගම්මානයේ ජීවත්වන සිංහල බෞද්ධ ජනතාවගේ මූලික අයිතිවාසිකම් දැඩි ලෙස කඩවන බව පෙන්නුම් කරමින් මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 178/2008 දරන නඩුව ගොනු කර තිබුණි.

එම නඩුව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුවට අනුව නිවාස බෙදා දීම අත්හිටුවනු ලැබිය.

කෙසේ වෙතත්, මෙම නිවාස කඩිනමින් ප්‍රතිලාභීන්ට බෙදා දීම පිළිබඳව රජයේ අවධානය යොමු වී ඇති අතර ඒ අනුව ජනාධිපති කාර්යාලය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් මේ වන විට පරීක්ෂණයක් පවත්වන අතර එම පරීක්ෂණ කටයුතු නිම වූ පසු පිළිතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

කාල වේලාව ඉතිරි කර ගැනීම සඳහා ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය මා වෙත ලබා දී තිබෙන සටහන අනුව ඉදිරිපත් කරන්න කියා මා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අර්බුදය
இலங்கை ஆயுர்வேத மருந்துக் கூட்டுத்தாபன நெருக்கடி
CRISIS IN SRI LANKA AYURVEDIC CORPORATION

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවසර දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට ආයුර්වේද බෙහෙත් නිෂ්පාදනය සම්බන්ධ කේන්ද්‍රීය රාජ්‍ය සංස්ථාවයි. මෙම රාජ්‍ය සංස්ථාව,

01. එහි සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් පත්වීම් 302කට ඉඩ තිබියදී නීති විරෝධී පත්වීම් 359ක් කිරීම, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව කටයුතු කරමින් අමාත්‍යාංශයෙන් එවන ලද අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ කියන දෙදෙනාම ටෙන්ඩර් කොමිටියෙන් ඉවත් කිරීම වැනි අක්‍රමික පරිපාලනය හේතුවෙන් ආයතනය සම්පූර්ණයෙන්ම අඩ පණ වී ඇති බව ගරු ඇමතිතුමා පිළිගන්නේද?

මේ අනුව ඇති වූ වෘත්තීය සමිති උද්ඝෝෂණයේදී ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, විධායක නිලධාරි සංගමය, ස්ථාන භාර නිලධාරි සංගමය, කළමනාකරණ සහකාර සංගමය ගෙන ගිය වැඩ පිළිවෙළට අනුව හදිසියේ සැප්තැම්බර් 15වන දා කර්මාන්ත ශාලාව වසා දැමුවා. මෙම කර්මාන්ත ශාලාව නැවත ඊයේ විවෘත වුණු බව ප්‍රකාශ කළද, මේ දිනවල එම කර්මාන්තශාලාවේ පාඩුව රුපියල් ලක්ෂ 80ක් පමණ වනවා.

02. එහි සේවක හා වෘත්තීය සංගම් අඛණ්ඩව ගෙන යන උද්ඝෝෂණයෙන් ඉල්ලා සිටින පරිදි යහපත් කාර්යක්ෂම පාලනයක් ඇති කිරීම සඳහා වර්තමාන පාලකයන් ඉවත් කිරීමට කටයුතු කොට සංස්ථාව සුරැකීමට ගරු ඇමතිතුමා කටයුතු කරන්නේද?

මොකද, භාණ්ඩාගාරයේ නියෝජිතයන් අධ්‍යක්ෂ මණ්ඩලයට එන්නේ නැහැ. කලින් සඳහන් කළ නිලධාරි දෙදෙනාම අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් කරලා තිබෙනවා.

අවසාන වශයෙන් මේ කරුණ ගැනත් මම සඳහන් කරන්න කැමැතියි. උසස් නිලතල පිළිබඳ කාරක සභාව ද මේ ආයතනයේ ප්‍රධානියාගේ පත්වීම අනුමත කරලා නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා ගරු ඇමතිතුමාගේ අවධානය මේ සඳහා යොමු කර මේ රටේ වෛද්‍යවරු දහස් ගණනක් බෙහෙත් ගන්නා මෙම ආයතනය ආරක්ෂා කිරීමට අදාළ වෙනස්කම් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු කරලා නිවැරදි පාලන තන්ත්‍රයක් ඇති කිරීමට කටයුතු කරන්නේද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට මම බොහොම ස්තුතිවන්ත වනවා. මේ සම්බන්ධයෙන් ටිකක් කථා කරන්න තිබුණා නම්, මීටත් වඩා හොඳට මේ ගරු සභාවට සත්‍ය තත්ත්වය පැහැදිලි කරන්න තිබුණා.

කෙසේ වෙතත් මම එතුමාගේ ප්‍රශ්නයට උත්තරය දෙන්නම්.

01. නැත.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ කටයුතු සම්පූර්ණයෙන් අඩ පණ වී නොමැති අතර, 2016.09.20 දින සිට ආයතනය නැවත නිෂ්පාදන කටයුතු සඳහා විවෘත කළ අතර, නිෂ්පාදන කටයුතු සිදු කරමින් පවතී. අතිගරු ජනාධිපතිතුමා විසින් 2015.12.28 වන දින විවෘත කරන ලද නව ශාකසාර නිෂ්පාදනාගාරයේ සේවය සඳහා සේවයේ අත්‍යවශ්‍යතාව මත කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීම සිදු කර ඇත.

ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොමැති අතර, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2016.02.10 දිනැතිව පත් කරන ලද ප්‍රසම්පාදන මණ්ඩලයක් මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලැබේ.

මම මෙහිදී කියන්න ඕනෑ, සියලුම දේවල් කරලා තිබෙන්නේ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලය මඟිනුයි. ඒ විතරක් නොවෙයි, රුපියල් ලක්ෂ දෙකහමාරක් දක්වා භාණ්ඩ මිලදී ගැනීම සඳහා සභාපතිවරයාට බලය තිබෙනවා. නමුත් අද වනතුරුත් සභාපතිවරයා තමාගේ බලතල පාවිච්චි කරලා නැහැ. රුපියල් ලක්ෂ දෙකහමාර දක්වා වූ භාණ්ඩ මිලදී ගෙන තිබෙන්නේ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලය මඟින්. ඒ නිසා එම කාරණය අසත්‍යයයි.

02. නිලධාරීන් ඉවත් කිරීමක් සිදු නොකෙරේ.

වර්තමාන පාලකයන් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු ආයතනයේ සංවර්ධනය වන පරිදි කරගෙන යන නිලධාරීන් වන අතර, ඔවුන් ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් චෝදනා ඉදිරිපත් වී නොමැති බැවින් කිසිදු අයෙකු ඉවත් කිරීමට කටයුතු කර නොමැත. වර්තමාන පාලන අධිකාරිය සේවයට පැමිණීමෙන් පසු නිෂ්පාදනයේ සහ අලෙවියේ ප්‍රගතිය පහත පරිදි සිදුවේ.

ගරු කථානායකතුමනි, 2014 වසරේ නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 270.21ක් තිබෙනවා.

2013 වර්ෂයේ නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 282.32ක් තිබිලා තිබෙනවා. ඒ අනුව, 2014 වර්ෂයේදී මේ නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 12.11කින් අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම 2015දී නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 291.08 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව, 2013 වර්ෂයේදී තිබූ ප්‍රමාණයටත් වඩා වැඩි ප්‍රමාණයකින් නිෂ්පාදන පිරිවැය වැඩි වෙලා තිබෙනවා. එතකොට 2015 වර්ෂයේ නිෂ්පාදනයේ වැඩිවීම රුපියල් මිලියන 20.87ක් වනවා.

2015 වර්ෂයේ මුල් මාස පහේදී නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 104.70යි. නමුත් 2016 වර්ෂයේ මුල් මාස 5දී නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 141.57ක් වනවා. ඒ කියන්නේ රුපියල් මිලියන 36.87කින් වැඩිවී තිබෙනවා. ඒ අනුව සියයට 35කට වැඩි ප්‍රමාණයක නිෂ්පාදන ප්‍රගතියක් ලබා ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, අරිෂ්ට, ආසව, ක්වාත,තෛල, සිරප් වාගේ ඒවා මෙහි තිබෙනවා. 2013 වර්ෂයේදී එකී ඖෂධ 513,719ක් නිෂ්පාදනය කර තිබෙනවා. 2014 වර්ෂය වන විට ඒ ප්‍රමාණය 435,096කට අඩු වෙලා තිබෙනවා. නමුත් නව පාලන අධිකාරිය යටතේ 2015 වර්ෂයේදී 530,839ක් දක්වා ඖෂධ නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම චූර්ණ, කල්ක, ලේප,රස,වතික්කා,ගුගුල් කියන ඖෂධ 2013 වර්ෂයේදී කිලෝග්‍රෑම් 70,914ක් නිෂ්පාදනය කරලා තිබෙනවා. නමුත් 2014 වර්ෂයේදී ඒ ප්‍රමාණය කිලෝග්‍රෑම් 59,948කට කඩා වැටී තිබෙනවා. 2015 වර්ෂයේ දී කිලෝග්‍රෑම් 65,670 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ හැම පැත්තෙන්ම බැලුවොත් වර්ධනයක් තිබෙනවා. ඒ ඇරුණුකොට 2014 වර්ෂයේ රාජ්‍ය හා පෞද්ගලික අංශය යන දෙකටම කරන ලද අලෙවි ප්‍රගතිය රුපියල් මිලියන 444.94ක් වනවා.

2015 වර්ෂයේදී එම ප්‍රමාණය මිලියන 527. 22ක් වෙන තුරු වැඩි වෙලා තිබෙනවා. අලෙවියේ වැඩිවීම මිලියන 82.28 යි. මේ මාස හතරේ ප්‍රගතිය ගත්තොත්, 2015 ජනවාරි සිට අප්‍රියෙල් දක්වා අලෙවියෙන් ලැබූ ආදායම රුපියල් මිලියන 153.37යි. එය 2016 අප්‍රියෙල් මාසය වනවිට රුපියල් මිලියන 193.44 දක්වා වැඩි වී තිබෙනවා. විවෘත වෙළෙඳපොළ ඉලක්ක කර ගත් නව ශාකසාර නිෂ්පාදනාගාරයක් 28.12.2015 දින විවෘත කළා. නිෂ්පාදන ඖෂධ අලෙවිය සඳහා අලුතෙන් යාපනය, මාතර, බොරැල්ල ආයුර්වේද රෝහල් පරිශ්‍රයේ නව වෙළෙඳසැල් විවෘත කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මෙහි තිබෙන වෘත්තීය සමිති ගැන මම කියන්න ඕනෑ. පළමුවන වරට නොවෙයි මෙහෙම සභාපතිවරුන්ව අයින් කරන්න හැදුවේ. තිස්ස කරල්ලියැද්ද මැතිතුමා මෙම අමාත්‍යාංශය භාරව සිටි කාලයේ එතුමා පරිපාලන නිලධාරියකු සභාපතිවරයා ලෙස පත්කළා. ඒ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

වෙලාවේ එතුමාට පහර දී පන්නා දැමුවා. ඊළඟට, සායක්කාර ජයවර්ධන කියලා General Manager කෙනෙක් හිටියා. එතුමාත් පරිපාලන නිලධාරියෙක්. එතුමාට ගහලා, පහරදීලා, තුවාල කරලා පළවා හැරියා. ගංගොඩවිල උසාවියේ තවම ඒ නඩුව තිබෙනවා. තුන්වන වරට ලංකා වරකාගොඩ මෙනෙවිය කියන HR Manager කෙනෙක් හිටියා. මේ HR Managerව ගත්තේ සාලින්ද දිසානායක මැතිතුමා. රෝහිත අබේගුණවර්ධන මැතිතුමා කියලා තමයි ගත්තේ. ඒවා ගැන කල්පනා කරලා මටත් තිබුණා, මේ අයව දොට්ට දමන්න. මම මැදිහත් වෙලා කිව්වා, "අභිංසක මිනිසුන්ට කරදර කරන්න එපා "කියලා. මම ඇහුවා, "රාජකාරියේ වැරදි තිබෙනවාද?" කියලා. රාජකාරියේ වැරැදි නැහැ, දේශපාලන වැරැද්දක් තිබුණේ. මේ අලුතෙන් ආපු ආණ්ඩුවක් කිව්වා. මම කිව්වා, අලුත් ආණ්ඩුවක් ආවාය කියලා එහෙම මිනිසුන්ව දොට්ට දමන්න බැහැ, ඒකට නොවෙයි අපි යහ පාලනයක් හැදුවේ, වහාම ඇතුළට ගන්න කියලා. අපි ඒ වාගේ තුට්ටු දෙකේ දේශපාලනය කරන්නේ නැහැ. එහෙම නම් අපිටත් තිබුණා, රෝහිත කියලා ගත්තේ, හිටපු සාලින්ද ඇමතිතුමා රැකියාව දුන්නේ කියලා මේ අයව අල්ලලා දොට්ට දාන්න. අපි එහෙම කළේ නැහැ, නැවත රක්ෂාව දුන්නා.

මේ ගොල්ලන් පරිපාලනය අතට අරගෙන කටයුතු කරන්න හදනවා. දැන් ඇවිත් මාත් එක්ක කථා කළා, කිසිම වෘත්තීය ඉල්ලීමක් නැහැ. සිරිනාල් ද මැල් මැතිතුමාත් සාකච්ඡාවට ආවා. එතුමා අන්තිමට ඇහුවා, "ප්‍රගතියක් නැහැ, කඩාගෙන වැටිලාය කියලා තමුන්නාන්සේලා කිව්වා නේද?" කියලා. "දැන් බලනකොට සෑම දෙයකම ප්‍රගතියක් නේ තිබෙන්නේ" කියලා එතුමා කිව්වා. මේ තිබෙන්නේ Marketing Report එක, මේ Marketing Report එක අනුව බැලුවාමත් තිබෙන්නේ ප්‍රගතියක් කියලා සිරිනාල් ද මැල් මැතිතුමා කිව්වා, "අද සභාපතිවරුන් කී දෙනාටද ප්‍රගතියක් ලබා දෙන්නට පුළුවන්? වෙන තැන්වල තත්ත්වයත් අපි දැක තිබෙනවා. වෙනත් ප්‍රශ්න තිබෙනවා නම් මේ ඇමතිතුමාත් එක්ක කථා කරන්න" කියලා කිව්වා. ලෙස්ලි දේවේන්ද්‍ර මැතිතුමා ළඟට ගියා. එතුමා කථා කරලා අන්තිමට පන්නා ගත්තා. මොනවාද මේ කථා කරන්නේ කියලා ඇහුවා. ඊට පස්සේ ගියා, ජනතා විමුක්ති පෙරමුණ හමු වෙන්න. ගිහින් එතැන හිටියා. දැන් පොදු විපක්ෂය හමු වෙන්න ගිහින් තිබෙනවා. මේක එක්තරා දේශපාලන කුමන්ත්‍රණයක්. අනෙක් එක, මේවා ප්‍රගතිය නුරුස්සන කට්ටිය ගෙන යන වැඩ පිළිවෙළවල්. මේකෙ ඇත්ත තත්ත්වය ගැන මට තව හුගක් දේවල් කියන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, මේ තමුන්නාන්සේගේ පියා හදපු සංස්ථාව. තමුන්නාන්සේගේ පියා හදපු ධීවර සංස්ථාව එදා අපි රැකබලා ගත්තා. මතක තියා ගන්න. අද මේකත් මට භාර දීලා තිබෙනවා. අපි ඉතා හොඳ දියුණු තත්ත්වයකට පත් කරනවා. නවීන තාලේ සංවර්ධන වැඩ පිළිවෙළක් ඇති කරනවා. තමුන්නාන්සේගේ පියා මේවා හැදුවේ යූ.ඇන්.පී ආණ්ඩුවක් යටතේ බවත් මතක තියා ගන්න. එම නිසා මෙය එක්සත් ජාතික පක්ෂය තුළ හදපු සංස්ථාවක්. මෙය අපි ඉතාමත්ම හොඳ තත්ත්වයකට ගෙනෙනවා. කඩාකප්පල්කාරීන් කිහිප දෙනෙක් තමයි මේවා කරන්නේ. අද සේවකයන්ගෙන් භාගයයි වැඩ. භාගයයි ඉතිරි වෙලා තිබෙන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ ගැන ඊයේත් විවාද කළා. ඊයේත් මේ ගැන කථා කළා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඊයේත් හුගක් වෙලා මේ ගැන කථා කළා මට මතකයි. මේ ගැන දැන් විවාදයක් කරන්න ඉඩ දෙන්න බැහැ. සභාවේ වැඩ කටයුතු පැය එකහමාරක් ප්‍රමාද වෙලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, we have to move on to the Public Business.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේත් අපි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වෙලාව ගත කළා. [බාධා කිරීම්] Hon. Minister, please pay your attention to this. So, shall we move on to next Item?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවේ විධායක නිලධාරීන්ගේ සංගමයේ සභාපතිතුමා ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව පිළිබඳව කෝප් කමිටුවේ සභාපති, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා අමතන ලද ලිපිය මම **සභාගත*** කරනවා. ඒ ගැන ගරු ඇමතිතුමාත්, කෝප් කමිටුවත් කටයුතු කරයි කියා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, Hon. Douglas Devananda.

Before you start, I would like to draw your attention to the fact that a matter like this can be raised under Oral Answers to Questions, rather than raising it under Standing Order 23 (2). So, I would like to request you to look at that in the future.

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

II

දෙමළ අධ්‍යාපන කලාප පිහිටුවීම
தமிழ்க் கல்வி வலயங்களைத் தாபித்தல்
ESTABLISHMENT OF TAMIL EDUCATION ZONES

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களிடம் எனது வினாவைக் கேட்க அனுமதித்ததற்கு உங்களுக்கு நன்றி கூறுகிறேன். கௌரவ கல்வி அமைச்சர் அவர்களிடம் தமிழில் கேள்விகளை எழுப்புகின்றபொழுது, அவர் அதற்கான பதிலை தன்னுடைய இராஜாங்க அமைச்சருக்கூடாக தமிழில் வழங்க முற்படுவதை வரவேற்பதுடன், அவருக்கும் நான் நன்றி தெரிவித்துக்கொள்கின்றேன்.

நுவரெலியா மாவட்டத்தில் நுவரெலியா, ஹற்றன், ஹங்குராங்கெத்த, கொத்மலை, வலப்பனை ஆகிய ஐந்து கல்வி வலயங்கள் உள்ளன. இந்த மாவட்டத்திலுள்ள தமிழ்ப் பாடசாலைகளைப் பொறுத்தவரையில் நுவரெலியாவில் 116, ஹட்டனில் 106, வலப்பனையில் 26, கொத்மலையில் 37, ஹங்குராங்கெத்தவில் 11 என்ற வகையில் மொத்தமாக 296 பாடசாலைகள் உள்ளன. நுவரெலியா மற்றும் ஹற்றனைப் பொறுத்தவரையில் 222 தமிழ் மொழிமூலப் பாடசாலைகள் உள்ளன. இவ்விரு வலயங்களிலும் சிங்கள மொழிமூலப் பாடசாலைகள் சுமார் 75 வரையிலேயே உள்ளன. இந்த நிலையில் நுவரெலியா கல்வி வலயத்தில் சிங்கள மொழிமூலமான கல்விப் பணிப்பாளரின் கீழான நிர்வாகம் நடைபெறுவதாகவும் ஹற்றன் கல்வி வலயத்தில் தமிழரல்லாத ஒருவரே அப்பதவியை வகித்து வருவதாகவும் அங்குள்ள மக்கள் தெரிவிக்கின்றனர். மேற்படி மாவட்டத்தில் அனைத்து கல்விசார் விடயங்களும் சிங்கள மொழிமூலமே இடம்பெறுவதாகவும் தமிழ் மொழிமூலப் பாடசாலைகளுக்குச் சிங்கள மொழிமூலமான பணிப்பாளர்களும் ஆசிரிய ஆலோசகர்களும் சென்று மேற்பார்வை செய்கின்ற நிலை உருவாகியிருப்பதாகவும் மேலும் தெரியவருகிறது. இவ்வாறு மொழி புரியாத அதிகாரிகள் செயற்படுகின்ற நிலையில் அப்பகுதியில் தமிழ் மொழிமூல மாணவர்களின் கல்வி நிலையை மேம்படுத்த இயலாதிருப்பதாக அப்பகுதி கல்விசார் சமூகத்தினர் எடுத்துக்காட்டுகின்றனர்.

குறித்த ஒரு மொழிமூலப் பாடசாலைகள் அதிகம் காணப்படுகின்ற கல்வி வலயத்தில் அந்த மொழிமூலமாக நிருவாகக் கடமைகளை ஆற்றக்கூடிய ஏற்பாடுகள் மேற்கொள்ளப்படுவதனூடாகவே அப்பாடசாலைகளின் மூலமான நோக்கங்களை முழுமையாக அடைய முடியும். எமது நாட்டின் இலவசக் கல்விக் கொள்கையை எமது மாணாக்கர் அனைவரும் பெற்றுக்கொள்ளக்கூடிய வகையில் ஏற்பாடுகள் மேற்கொள்ளப்படுவது அவசியமாகும். அந்த வகையில், -

நுவரெலியா மற்றும் ஹற்றன் பகுதிகளில் தமிழ்க் கல்வி வலயங்களை ஏற்படுத்த நடவடிக்கை எடுக்கமுடியுமா?

மேற்படி எனது கேள்விக்கான பதிலையும், எடுக்கப்படக் கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கத்தையும் கௌரவ அமைச்சர் அவர்கள் தருவாரென எதிர்பார்க்கிறேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, are you going to reply now?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් දැන් ගැසට් නිවේදනයක් පළ කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු ලබා දෙයි.

ගරු වී. එස්. රාධාකෘෂ්ණන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

விசேடமாக, கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள் நாங்கள் கேட்கவேண்டியதைக் கேட்கின்றார். மிகவும் சந்தோசம்! எது எப்படியிருந்தாலும், நுவரெலியா மாவட்டத்தில் தற்போது 5 கல்வி வலயங்கள் இருக்கின்றன. ஹங்குராங்கெத்தை வலயத்தில் 57 சிங்கள மொழிமூலமான பாடசாலைகளும், 12 தமிழ் மொழிமூலமான பாடசாலைகளும் இருக்கின்றன. ஹற்றன் வலயத்தில் 36 சிங்கள மொழிமூலமான பாடசாலைகளும், 113 தமிழ் மொழிமூலமான பாடசாலைகளும் இருக்கின்றன. கொத்மலை வலயத்தில் 43 சிங்கள மொழிமூலமான பாடசாலைகளும் 42 தமிழ் மொழிமூலமான பாடசாலைகளும் இருக்கின்றன. நுவரெலியா வலயத்தில் 32 சிங்கள மொழிமூலமான பாடசாலைகளும் 124 தமிழ் மொழிமூலமான பாடசாலைகளும் இருக்கின்றன. வலப்பனை வலயத்தில் 60 சிங்கள மொழிமூலமான பாடசாலைகளும் 29 தமிழ் மொழிமூலமான பாடசாலைகளும் இருக்கின்றன. இப்படியாக அங்கு மொத்தம் 228 சிங்கள மொழிமூல பாடசாலைகளும் 320 தமிழ் மொழிமூல பாடசாலைகளும் இருக்கின்றன.

அரச கல்வி மீளமைப்பு நடவடிக்கையினுள் கல்வி முகாமைத்துவத்தைப் புதிய அணுகுமுறையுடன் மேற்கொள்ள வேண்டுமென்பது உறுதிப்படுத்தப்பட்டுள்ளது. அதன்படி, மாகாண கல்விக் கட்டமைப்பை விமர்சித்து எதிர்காலத்தில் கல்வி வலயங்களின் எண்ணிக்கையை விரிவுபடுத்தக்கூடிய நடவடிக்கைகளை மேற்கொள்வதற்குத் திட்டமிடப்பட்டுள்ளது. இப்பொழுது முழு இலங்கையிலும் 98 கல்வி வலயங்கள் இருக்கின்றன. புதிய மீளமைப்பின் மூலமாக 150 வரைக்கும் அதன் எண்ணிக்கை அதிகரித்துச் செல்வதற்கான நடவடிக்கை எடுக்கப்பட்டு வருகின்றது. அப்போது இந்த வலயங்களினுடைய எண்ணிக்கையும் அதிகரிக்குமென்பதை நான் இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோல, நுவரெலியா மாவட்டத்திற்குத் தேவையான கல்வி வலயங்களை பூகோள அமைவின்படி மீண்டும் அமைக்க முடியும். ஹற்றன் மற்றும் நுவரெலியா வலயங்களில் அதிக எண்ணிகையிலான தமிழ் மொழிமூலப் பாடசாலைகள் இருப்பதால் மீளமைக்கும் தருணத்தில் அவ்வலயங்கள் மேலும் பிரிக்கப்பட்டு கூடுதலான கல்வி வலயங்களை அமைக்க இடமுண்டு. கல்வி மீளமைப்புத் திட்டத்தை எதிர்வரும் ஆண்டு முதல் தொடங்குவதற்கு ஏற்பாடு செய்யப்பட்டிருக்கின்றது.

கடந்த வருடங்களில் வருடந்தோறும் கல்வி நிர்வாக சேவை உத்தியோகத்தர்களுக்கான ஆட்சேர்ப்புப் பரீட்சைகள் நடத்தப்படவில்லை. SLEAS பரீட்சைகள் நடத்தப்படாததுதான் அங்கு கல்வி அதிகாரிகள் இல்லாததற்குக் காரணமாகும். இலங்கை கல்வி நிர்வாக சேவையில் தமிழ் மொழிமூல உத்தியோகத்தர்களுக்கான குறைபாடு காணப்படுகின்றது என்ற உங்களுடைய கோரிக்கையை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம். தற்போதுள்ள 850 பதவி

[ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා]

වෙත්‍රිටඩංගුළුක්කාකත් තිරන්ත මත්‍රුම් මට්ටුප්පටුත්තප්පට්ට පෝට්ටිප් පරීට්සෙකළෙ නටවටික්කෙ එටුක්කප්පට්ටු වරුකින්‍රතු. අන්ත 850 පේරිල් තමිල් මොළිමූල අතිකාරිකළෙ ඉණෙත්තුක්කොළ්ළවුම් එතිර්පාර්ක්කප්පටුකින්‍රතු. එතිර්කාලත්තිල් අව්වුත්තියෝකත්තර්කළෙ වලයක් කල්විප් පණිමනෙකළුක්කුච් චේර්ත්තුක්කොළ්ළුම් චන්දර්ප්පම් ඒර්පටුම්පෝතු තමිල් මොළිමූල උත්තියෝකත්තර්කළුක්කාන කුරෙපාට්ටුක්කුත් තීර්වු කිටෙක්කුම්. ඒර්ක්කෙනවේ නාන් අන්ත මාකාණත්තින් කල්වි අමෙච්චරාක ඉරුන්ත කාරණත්තිනාල් ඉන්ත විටයංකළ් එල්ලාමේ එනක්කුත් තෙරියුම්.

අතේනේරත්තිල් SLEAS උත්තියෝකත්තර්කළ් ඉල්ලාත කාරණත්තිනාල් SLPS - 1 අතාවතු අතිපර් චේවෙ තරම් 1 ඉල් උළ්ළවර්කළ්තාන් පතිල් කටමෙයාට්රුම් උත්තියෝකත්තර්කළාක නියමික්කප්පට්ටාර්කළ්. ඉප්පොළුතු අවර්කළ් මූලමාකවේ චේවෙ වළංකප්පට්ටු වරුකින්‍රතු. ආනාල්, තොටර්න්තුම් ඉතනෙච් චෙය්‍රය මුටියාතු. එතිර්කාලත්තිලේ කට්ටායමාකත් තමිල් උත්තියෝකත්තර්කළ් නියමික්කප්පට්ටු, චිරන්ත කල්වි වලයංකළෙ උරුවාක්කි අතන්මූලමාකච් චේවෙ චෙය්වතර්කු නටවටික්කෙ එටුක්කප්පටුම් එන්පතෙත් තෙරිවිත්තුක්කොළ්කින්‍රේන්.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ළස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)

උංකළුටෙය පතිල්කළුක්කු නන්‍රියෙක් කූරික්කොළ් කින්‍රේන්. අත්තුටන්, උරියවර්කළෙ නියමික්කුම්වරෙ - අන්තක් කාල අවකාචත්තුක්කුළ් තමිල් මොළිමූලප් පතිලීට්ටු උත්තියෝකත්තර්කළෙ නියමිප්පතු නල්ලතු.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(මාණ්පුමිකු වී.එස්. ඉරාතාකිරුෂ්ණන්)
(The Hon. V.S. Radhakrishnan)

SLPS - 1 අතාවතු අතිපර් තරම් 1 ඉල් උළ්ළවර්කළ් ඉන්තච් චේවෙයෙච් චෙය්තු වරුකින්‍රාර්කළ්. තමිල් මොළිමූලමාන කල්වි වලයංකළිලේ චිංකළ අතිකාරිකළ්තාන් ඉරුක්කින්‍රාර්කළ් එන්පතෙ නාන් අරියක්කූටියතාක ඉරුක්කින්‍රතු. ඉට්රන් කල්වි වලයත්තිල් මට්ටුම් චිනීතරන් එන්පවර් තමිල් කල්විප් පණිප්පාළරාකච් චෙයර්පටුකින්‍රාර්.

III

විශ්වවිද්‍යාලවල බාහිර උපාධි පාඨමාලාවලට සිසුන් ලියාපදිංචි කරගැනීම සීමා කිරීම

பல்கலைக்கழகங்களில் வெளிவாரிப் பட்டப் பாடநெறிகளுக்கான மாணவர் பதிவினை மட்டுப்படுத்தல்

LIMITATION OF REGISTRATION OF STUDENTS FOR EXTERNAL DEGREE COURSES IN UNIVERSITIES

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශ්වවිද්‍යාලවල බාහිර උපාධි පාඨමාලාවලට සිසුන් ලියා පදිංචි කර ගැනීම සීමා කිරීම හේතුවෙන් ඊට ඇතුළත් වීමට අපේක්ෂාවෙන් සිටින විශාල සිසු පිරිසකට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවීමට මම බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල විසින් බාහිර උපාධි පාඨමාලා දිගු කලක සිට පවත්වා ගෙන එනු ලැබුවා. අපොස උසස් පෙළ සමත්, එහෙත් ඉඩකඩ නොමැති වීම නිසා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකිව අසාධාරණයට ලක් වූ විශාල සිසු සිසුවියන් ප්‍රමාණයකට එමඟින් විශාල සහනයක් සැලසුණා. එහෙත් පසු ගිය ආණ්ඩුව උපාධිධාරීන්ගේ රැකියා ගැටලුව හේතුවක් කර ගනිමින් බාහිර උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම සම්පූර්ණයෙන් අත් හිටුවුවා. ඒ පිළිබඳව අපි පාර්ලිමේන්තුවේ හඬ නැඟුවා; එම සිසුන් විරෝධතා දැක්වුවා. එහෙත් අතිශය අසාධාරණ ලෙස එම අත් හිටුවීම 2014 දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක වුණත්, 2014 වසරේදී නැවත බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට තීරණය කළා. එහෙත් ඒ සඳහා දැඩි කොන්දේසි පැනෙව්වා. එම කොන්දේසි හේතුවෙන් පෞද්ගලික ආයතනවලින් උපාධි ලබා ගැනීමට මුදල් නොමැති විශාල සිසු සිසුවියන් සංඛ්‍යාවකට උපාධියක් ලබා ගැනීමට තිබුණු සීමිත අපේක්ෂාව බිඳ වැටුණා. ගරු කථානායකතුමනි, ගාස්තු පවා වැඩි කළ බව ඔබතුමාට මතක ඇති. නමුත් දැන් තත්ත්වය ඊටත් වඩා බරපතළයි.

2014 සහ 2015 අධ්‍යයන වර්ෂ දෙකට අදාළව බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියා පදිංචි කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කැලණිය විශ්වවිද්‍යාලය වෙත විශේෂ උපදෙස් මාලාවක් නිකුත් කර තිබෙනවා. මොකද, බාහිර උපාධිධාරීන්ගෙන් විශාල සංඛ්‍යාවක් ලියා පදිංචි වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ නිසා. ඒ අනුව එම පාඨමාලාවලට සිසුන් ඇතුළත් කර ගැනීම බරපතළ ලෙස කප්පාදු වී තිබෙනවා. එම නියෝගවල ඇතැයි ප්‍රකාශ කෙරෙන්නේ එක් අධ්‍යයන වර්ෂයක් සඳහා බඳවා ගන්නා අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව මෙන් දෙගුණයක් පමණක් බාහිර උපාධි සඳහා බඳවා ගත යුතු බවයි. ඒ කියන්නේ අභ්‍යන්තරව බඳවා ගන්නේ 1,000යි නම්, බාහිරව 2,000ක් බඳවා ගත යුතුයි කියන එකයි. හැබැයි එම සීමාව පනවා ඇත්තේ, යම් විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව මෙන් දෙගුණයක් බාහිර උපාධිධාරීන් බිහි කිරීමේ අරමුණෙන් යුතුව බවයි පවසන්නේ. එතකොට අභ්‍යන්තරව 1,000ක් ආවොත් බාහිරව 2,000ක් එනවා. එහෙත් මෙම නව තීරණය පසු ගිය කාලයේ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාවට අදාළව බිහි වූ උපාධිධාරීන් සංඛ්‍යාව පිළිබඳව කිසිදු වැටහීමක් නොමැතිව ගන්නා ලද්දක් බව ඊට අදාළ සංඛ්‍යා ලේඛනවලින් පෙනී යනවා. උදාහරණයක් වශයෙන් කියනවා නම්, 2006 වසරේ සිසුන් 11,082ක් ලියාපදිංචි වූ අතර උපාධි සම්පූර්ණ කරන ලද්දේ සිසුන් 1,158යි. ලියා පදිංචි වූවන්ගෙන් සියයට 10ක් පමණ ප්‍රමාණයක් තමයි උපාධිය සම්පූර්ණ කරලා තිබෙන්නේ. පිළිවෙළින් 2007 වසරේ සිසුන් 13,956ක් ලියා පදිංචි වන විට සිසුන් 2,057ක් තමයි උපාධිය ලබා ගෙන තිබෙන්නේ. 2008 වසරේ සිසුන් 12,656ක් ලියා පදිංචි වන විට සිසුන් 3,518ක් තමයි උපාධිය ලබා ගෙන තිබෙන්නේ. 2009 වසරේ සිසුන් 16,704ක් - විශාල සංඛ්‍යාවක් කියා හිතන්න පුළුවන්.- ලියා පදිංචි වන විට උපාධිය ලබා ගන්නේ සිසුන් 2,100ක් පමණයි. 2010 වසරේ සිසුන් 15,400ක් ලියා පදිංචි වන විට උපාධිය ලබා ගන්නේ සිසුන් 1,994ක් පමණයි. ඇත්ත වශයෙන්ම උපාධිය ලබා තිබෙන්නේ මුල් ලියා පදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 10කටත් වඩා අඩු ප්‍රමාණයක්. ලියා පදිංචි වුණාට සියලුදෙනාම උපාධිය සම්පූර්ණ

කරන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලා සිසුන් ලියා පදිංචි කරන ප්‍රමාණය සීමා කරලා තිබෙනවා.

මෙවැනි තත්ත්වයක් තිබියදී 2014 වර්ෂය වෙනුවෙන් අයදුම් පත් 14,000ක් ඉදිරිපත්ව තිබුණද, නව ප්‍රතිපාදන කොන්දේසි යටතේ කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි අංශයට බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත්තේ සිසුන් 2,160කට විතරයි. මේ සිසුන් 2,160දෙනාම උපාධිය ලබා ගන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, පරණ ලේඛන අවුස්සා බැලුවොත් ඔබතුමාට දැක ගන්න පුළුවන්, සියයට 10ක ප්‍රමාණයක් තමයි උපාධිය ලබා ගෙන තිබෙන්නේ කියලා. හැබැයි, දැන් ලියා පදිංචි කරන්නේම 2,160ක ශිෂ්‍ය සංඛ්‍යාවක් පමණයි. මුදල් ගෙවා අයදුම් පත් ලබා ගත් අතිවිශාල ශිෂ්‍ය සංඛ්‍යාවකට පාඨමාලාව සඳහා ලියා පදිංචි වීමේ දොරටු වැසී ගොස් තිබෙනවා. මොකද, පත්‍ර දැන්වීම පළ කරනකොට දෙදහස් ගණනක් පමණයි බඳවා ගන්නේ කියලා තමුන්නාන්සේලා එවැනි සීමාසහිතභාවයක් සඳහන් කළේ නැහැ. පොදු දැන්වීම තමයි පළ කළේ. සෙසු විශ්වවිද්‍යාලවල මේ හා සමාන්තර බඳවා ගැනීම්වලදී මෙම කොන්දේසිය මෙම වසරට අදාළව ක්‍රියාත්මක වී තිබුණේත් නැහැ. අනික් විශ්වවිද්‍යාලවල මේ කොන්දේසිය අදාළ වසරට ක්‍රියාත්මක වන්නේත් නැහැ. කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට අපේක්ෂාවෙන් සිටි සිසුන් දැන් බලවත් අපේක්ෂා භංගත්වයට පත් වී තිබෙනවා. ඒ වාගේම මොවුන් විශාල ලෙස පෞද්ගලික බාහිර පන්තිවලට යනවා. දැන් ඒ සිසුන් පන්තිවලටත් යනවා. හැබැයි, තමුන්නාන්සේලා ලියා පදිංචිය දෙන්නේ නැහැ. ලියා පදිංචි වුණු සියලුම සිසුන් උපාධිධාරීන් වන්නේත් නැහැ.

ගරු කථානායකතුමනි, බාහිර උපාධි පාඨමාලාව හදාරන විශාල ප්‍රමාණයක් යම් රැකියාවක නිරත වන අයයි. අපි දන්නවා, පොලීසියේ නිලධාරීන් බාහිර උපාධි පාඨමාලාව හදාරනවාය කියලා. තවත් ආයතනයක වැඩ කරන නිලධාරීන් අමතර සුදුසුකමක් ලෙස බාහිර උපාධි පාඨමාලාව හදාරනවා. මේ උපාධි පාඨමාලාව කරන අයගෙන් විශාල ප්‍රමාණයක් දැනටමත් විවිධ රැකියාවල නිරත වන අයයි. ඒ ගොල්ලෝ වැඩිදුර අධ්‍යාපනය සඳහා තමයි මේ උපාධි පාඨමාලාව හදාරන්න පෙළඹෙන්නේ. හැබැයි, තමුන්නාන්සේලා විශාල ලෙස එය කප්පාදු කිරීමට භාජන කරලා තිබෙනවා. බාහිර උපාධි සඳහා බඳවා ගැනීම කප්පාදු කර ඇත්තේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ වගකීම ආණ්ඩුවට ගැනීමට සිදු වේ යැයි පවතින බිය නිසාද, නැතහොත් උසස් පෙළ සමත්, එහෙත් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට නොහැකි වූ තරුණ තරුණියන් පෞද්ගලික අධ්‍යාපනයට, බාහිර උපාධි සඳහා ඇතුළත් වන්නේ නැතිව ඊට වඩා අතිවිශාල මුදලක් ගෙවන, සමහරවිට පාඨමාලාවල කිසිදු ගුණාත්මකභාවයක් නැති තැන්වලට පෙළඹීමටද කියන සැකයත් මේ තුළ මතු වෙනවා.

මෙම තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට ගරු ඇමතිතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

1. විශ්වවිද්‍යාල බාහිර උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම සීමා කර ඇත්තේ ඇයි? මෙවැනි සීමාවක් ගෙනාවේ ඇයි?
2. ඒ සඳහා පාදක කර ඇති යෝජනා සකස් කරන ලද්දේ කවුද? ඇයි එහෙම කළේ? මොකද, ලියා පදිංචි වන ඔක්කොම අය උපාධිය ගන්නේ නැහැ. ලියා පදිංචි වන අයගෙන් සියයට 10ක් තමයි උපාධිය ගන්නේ. ඒ කප්පාදුව කළේ ඇයි?
3. බාහිර උපාධියක් ලබා ගැනීමේ අයිතිය අහිමි කරන ලද අයට අසාධාරණයක් නොවන්නේද?
4. විශේෂයෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ 2014 සහ 2015 බාහිර උපාධි සඳහා බඳවා ගැනීම්වලට අදාළ නව කොන්දේසි හේතුවෙන් අයදුම්පත් ලබා ගත් විශාල සංඛ්‍යාවකට ලියා පදිංචිවීමට නොහැකි වී ඇති බව දන්නවාද?
5. ඒ හේතුවෙන් අසාධාරණයකට ලක් වූ ශිෂ්‍යයන්ට සහනයක් සැලසීමට කටයුතු කරන්නේද?
6. බාහිර උපාධිවලට අදාළව මතු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව ආණ්ඩුව කවර ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්නේද කියලා දැන ගන්න කැමැතියි. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පිළිතුර මෙසේයි.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල 14ක බාහිර උපාධි අංශ ඇති කර ඇති අතර, එම විශ්වවිද්‍යාල මඟින් බාහිර උපාධිය සඳහා වාර්ෂිකව සිසුන් ලියා පදිංචි කරනු ලබයි. එසේ බාහිර උපාධිය සඳහා වැඩිම සිසුන් ප්‍රමාණයක් ලියා පදිංචි වනුයේ කලා උපාධි පාඨමාලා සඳහා වන අතර කළමනාකරණ උපාධි පාඨමාලා සඳහා සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවක් වාර්ෂිකව ලියා පදිංචි කරනු ලබයි. බාහිර උපාධිය සඳහා වැඩිම සිසුන් සංඛ්‍යාවක් ලියා පදිංචි කරනු ලබන්නේ කැලණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයන්ය. ඒ අනුව 2014 වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් 90,068ක ප්‍රමාණයක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 70,073ක්ද ලියා පදිංචි වී ඇති බව වාර්තා වී ඇත.

ඒ විධියට ලියා පදිංචි වෙලා ඉන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මුළු කාලයටමද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්. දැන් ලියා පදිංචිවෙලා ඉන්න සම්පූර්ණ ගණන.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ එක වසරකට නොවෙයි. බාහිර උපාධි පාඨමාලාව පටන් ගත් දවසේ සිට.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
They are registered. ඒ ගොල්ලෝ ලියා පදිංචි වෙලා ඉන්නවා. මේකේ බරපතළකම තිබෙන්නේ එතැනයි. මොකද, ඒ ලියා පදිංචි වෙලා ඉන්න අය වෙනුවෙන් විභාග ප්‍රශ්න පත්‍ර හදන්න ඕනෑ. මොකද, ඒ ගොල්ලෝ පළමුවැනි විභාගය pass වෙනවා. දෙවැනි විභාගය fail වෙනවා. ඒ බර තිබෙනවා. ඒකයි මම කියන්නේ. 2014 වන විට කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් 90,068ක් ලියා පදිංචි වෙලා තිබෙනවා. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් 70,073ක් ලියා පදිංචි වෙලා තිබෙනවා.

බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියා පදිංචිය සහ ලියා පදිංචි වීම සඳහා විභාග පැවැත්වීමේ ක්‍රියාවලියට පමණක් විශ්වවිද්‍යාල කටයුතු කරනු ලබයි. ලියා පදිංචි වනු ලබන සිසුන් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා පෞද්ගලික උපකාරක පන්තිවලට

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

මුදල් ගෙවා ඇතුළත් විය යුතුයි. මෙම උපකාරක පන්ති හුදෙක් මහා පරිමාණයෙන් පවත්වාගෙන යන දේශන ක්‍රියාවලියක් පමණයි. එමෙන්ම සමස්ත බාහිර උපාධි අධ්‍යාපන ක්‍රියාවලියම මෙසේ දේශන මත පමණක් පදනම් වූ අධ්‍යාපන ක්‍රියාවලියකි. බාහිර උපාධි පාඨමාලාවලට සහභාගී වන සිසුන්හට, කිසිදු විෂය බාහිර ක්‍රියාකාරකමකට හෝ අනිකුත් මෘදු කුසලතාවන් හෝ සමාජමය කුසලතා වර්ධනය කර ගැනීමට එම අධ්‍යාපන ක්‍රමය තුළ අවස්ථාවක් නොලැබේ. කිසිම කුසලතා වර්ධනයක් සිදු වෙන්නේ නැහැ. පෞද්ගලික උපකාරක පන්තිවලට යනවා. ඒ, කාරණයයි මා මේ කියන්නේ.

> බාහිර උපාධි පාඨමාලාවලින් මතු වී ඇති ගැටලුව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නයේ හැඳින්වීම තුළින්ම පිළිබිඹු වෙනවා. ඔබතුමා අහපු ප්‍රශ්නයේම මේ කාරණය සඳහන්වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීවරයා ඉදිරිපත් කරන ලද සංඛ්‍යා ලේඛන අනුවම බාහිර උපාධිය සමත් වන ප්‍රමාණය මුල් ලියා පදිංචියෙන් සියයට 10ක ප්‍රමාණයක් පමණි. ඒ අනුව සියයට 90ක් වන ලියා පදිංචි සිසුන්ට දීර්ඝ කාලීන පාඨමාලා හැදෑරීමකින් පසුව උපාධිය නොමැතිව පසුතැවිලි වීමට සිදු වනු ඇත. මෙය කාලය මෙන්ම තරුණ ශ්‍රමය අපතේ යැවීමකි. ඒ අනුව මෙම ක්‍රමයේ දැඩි දුර්වලතාවක් පවතින බවද, මෙය වෙනස් කළ යුතු බවද ගරු මන්ත්‍රීතුමා පිළිගන්නවා ඇත.
>
> එමෙන්ම බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන්හට රැකියා වෙළෙඳ පොළ තුළ පවතින ශ්‍රම ඉල්ලුම සඳහා අපේක්ෂිත නිපුණතාවන්ට අදාළ අධ්‍යාපනයක් නොලැබෙන බැවින් සහ එම සිසුන්හට බාහිර කුසලතා අත් කර ගැනීමට අවස්ථා නොමැති වීම මත පවත්නා රැකියා වෙළෙඳ පොළ තුළ රැකියා ලබා ගැනීම අපහසු කරුණක් වී ඇත. ඒ අනුව මෙසේ බිහි වන උපාධිධරයන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීමද රජයේ වගකීමක් වී ඇති බව පිළිගත යුතු කරුණකි.
>
> බාහිර උපාධිය සඳහා විශාල සංඛ්‍යාවක් වාර්ෂිකව ලියා පදිංචි වීමත්, මේ තරුණ තරුණියන් උපාධිය අපේක්ෂාවෙන් කටයුතු කිරීමත් හේතුවෙන් වර්තමාන ශ්‍රම වෙළෙඳ පොළ තුළ රැකියා බහුල වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට සහ වෘත්තීන්ට යොමු වීමේ අඩු ප්‍රවණතාවක් ඇති වී තිබෙනවා. විශේෂයෙන්ම උපාධියක් අපේක්ෂා කරනු ලබන තරුණ තරුණියන්හට ඒ හා සමාන සුදුසුකම් ලබා ගැනීමට වෘත්තීය අධ්‍යාපනය තුළින්ද අවස්ථාව ලැබෙනවා.

2. ඉහත කරුණු පදනම් කරගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.

3. ඉදිරිපත් වී ඇති වැඩ පිළිවෙළ තුළින් බාහිර උපාධිය සඳහා ලියා පදිංචි වන සිසුන් සියයට 100ක් සඳහාම උපාධියක් ලබා ගැනීමට අවස්ථාව සැලසීම සඳහා ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ පරිදි, ලියා පදිංචි වන සිසුන්ගෙන් උපාධිය ලබන්නේ සියයට 10යි. ඒ අනුව තරුණ තරුණියන් මිරිඟුවක් පසුපසයි යන්නේ. ලියා පදිංචි අයගෙන් සියයට 10යි උපාධිය ලබන්නේ. සියයට 90ක්ම මිරිඟුවක් පසුපස යන්නේ. ඒ අයගේ වටිනා කාලය තමයි නාස්ති වෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ.

   අනුර දිසානායක මන්ත්‍රීතුමා කැලණිය විශ්වවිද්‍යාලය ගැන ඇහුවා නේ.

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු දත්ත අනුව 2014 වසර දක්වා කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා සඳහා ලියා පදිංචි වී තවමත් උපාධිය සම්පූර්ණ කර නැති සිසුන් සංඛ්‍යාව 90,068ක් වෙනවා. Ninety thousand students have registered only at the University of Kelaniya.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවුරුදු කීයකටද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ සම්පූර්ණ ගණන. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. 90,000ක් ලියා පදිංචි වුණාම විභාගවලට වාඩිවීමේදී ඒ අයට අවශ්‍ය පහසුකම් සලසන්න ඕනෑ. [බාධා කිරීමක්] එහෙම කියන්න බැහැ නේ. ඒක ඔබතුමාගේ ප්‍රශ්නයෙන් කියලා නැහැ නේ. කී දෙනෙක් විභාගයට වාඩිවෙනවාද කියලා ඔබතුමා කියලා නැහැ නේ. ගරු කථානායකතුමනි, කැලණිය විශ්වවිද්‍යාලයේ විතරක් බාහිර උපාධි පාඨමාලා සඳහා 90,000ක්දෙනා ලියා පදිංචි වෙලා ඉන්නවා. ඒ අයගෙන් සියයට 10යි උපාධිය සම්පූර්ණ කරන තෙක් පන්තිවලට සහභාගි වෙන්නේ. සියයට 90ක් අතරමඟ අතරමං වෙනවා. කෙසේ වුවද, මෙම සිසුන් අතරින් සක්‍රිය ලෙස වාර්ෂිකව විභාගවලට සම්බන්ධ වන සිසුන් සංඛ්‍යාව 79,025ක් බව සඳහන් වෙනවා. 90,000න් 79,000යි විභාගවලට ඉදගන්නේ. හැබැයි, ලියා පදිංචි වෙලා ඉන්න සියලුම දෙනාට පහසුකම් දෙන්න ඕනෑ.

ඒ අනුව ඉදිරි වර්ෂ 4 ඇතුළත කැලණිය විශ්වවිද්‍යාලයට බාහිර සිසුන් සම්බන්ධව පැවරී ඇති වගකීම පැහැදිලි වනු ඇත. මෙවැනි තත්ත්වයක් පවතිද්දී තව දුරටත් විශාල සිසුන් සංඛ්‍යාවක් ලියා පදිංචි කර ගැනීම සාධාරණ වන්නේදැයි ගරු මන්ත්‍රීවරයා සිතා බැලිය යුතුව ඇත. නොඑසේ නම්, එසේ ලියා පදිංචිය අපේක්ෂා කරන සිසුන් - දැන් 90,000ක් ලියා පදිංචි වෙලා ඉන්නවා.- වෙනත් රැකියාවක් බලාපොරොත්තු වෙන්නේත් නැහැ නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] වෙලා තිබෙනවා.

නොඑසේ නම් ඒ ලියා පදිංචිය අපේක්ෂා කරන සිසුන් අනෙකුත් රැකියා අපේක්ෂිත පාඨමාලා සඳහා යොමු කිරීම වඩා වැදගත් වන බව සිතා බැලිය යුතුව ඇත. ඒ අනුව චක්‍රලේඛ අංක 13/2016 මඟින් දී ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීම මඟින් කැලණිය විශ්වවිද්‍යාලයට මෙම ප්‍රශ්නය විසඳා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ගරු කථානායකතුමනි, කාලය නොමැති නිසා 5වන සහ 6වන ප්‍රශ්නවලට පිළිතුරු හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:
Rest of the Answer tabled:

5. නව රජයේ ප්‍රතිපත්තිය අනුව උසස් අධ්‍යාපන අවස්ථා සීමා කිරීමට අදහසක් නොමැති අතර, සිසු දරුවන් රැකියා වෙළෙඳ පොළට උචිත පාඨමාලාවලට යොමු කිරීම සඳහා කටයුතු සිදු කරයි. මේ අනුව විශ්වවිද්‍යාල අභ්‍යන්තර පාඨමාලා නවීකරණය කරමින් හා අලුත් පාඨමාලා අරඹමින් බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට දැනටමත් ක්‍රියා කර ඇත.

   එමෙන්ම දැනටමත් රැකියා අවස්ථාවක් සම්බන්ධයෙන් ගැටලුවක් නැති පාඨමාලාවලටද වැඩියෙන් සිසුන් බඳවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට උපදෙස් දී ඇත.

   උදා. ඉංජිනේරු/ප්‍රමාණ සමීක්ෂණ/වෛද්‍ය විද්‍යා/කළමනාකරණ

   මීට අමතරව සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල අවස්ථාව හිමි නොවන සිසුන් සඳහා වැඩි අවස්ථාවක් හිමි කිරීමට විවෘත විශ්වවිද්‍යාලයේ දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ ඉඩ ප්‍රස්තාව වැඩි කර ඇත. එමෙන්ම වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියා අභිමුඛ පාඨමාලා සඳහා තරුණ තරුණියන් යොමු කිරීමටද, එම ක්ෂේත්‍රයේ අධ්‍යාපන අවස්ථා වැඩි කිරීමටද රජය මඟින් කටයුතු කර ඇත.

6. විවෘත විශ්වවිද්‍යාලය මඟින් වඩා ක්‍රමවත්ව සහ ශිෂ්‍ය කේන්ද්‍රීය වූ අධ්‍යාපන ක්‍රමවේදයක් මඟින් වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට උපාධි ලබා ගැනීමට අවස්ථාව උදා කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ. මෙම පාඨමාලා තුළින් දැනුම මෙන්ම සේවා නියුක්තියට අවශ්‍ය මෘදු කුසලතාවන්ද (භාෂා/පරිගණක සාක්ෂරතා/වෘත්තීය නිපුණතාවන්) සංවර්ධනය කිරීම. එමෙන්ම සිසුන් සහ ආචාර්යවරුන් අතර වැඩි සම්බන්ධයක් ඇති කිරීම සහ උපකාරක පන්ති ක්‍රමයේ (Tuition Education) උපාධි පාඨමාලා පැවැත්වීමේ ක්‍රමය අධෛර්යවත් කිරීමටද රජය කටයුතු කරනු ඇත.

ගරු කථානායකතුමනි, මම එක කාරණයක් පැහැදිලි කරන්නට කැමැතියි. නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. වෙන පක්ෂයක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂය තමයි නිදහස් අධ්‍යාපනය ආරම්භ කළේ. නිදහස් අධ්‍යාපනය අපි ආරක්ෂා කර ගන්නා අතර, නව ලෝකයට ගැළපෙන විධියට අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්නටත් ඕනෑ. සමහර උපාධිවලින් රැකියාවක් ලබා ගන්න බැහැ. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ සේවය කරන අයට, බොහෝ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා ගෙන ඒ අයට ගැළපෙන රැකියාවක් සොයා ගන්න බැහැ. ඇත්තවශයෙන්ම නිදහස් අධ්‍යාපනය විනාශ කරන්නට අපේ බලාපොරොත්තුවක් නැහැ. කැලණිය විශ්වවිද්‍යාලය තමයි හොඳම උදාහරණය. එහි 90,000ක්දෙනා ලියාපදිංචි වෙලා ඉන්නවා; 70,000යි විභාගයට පෙනී සිටින්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
79,000යි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
79,000යි. එතකොට -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, කථාව අවසාන කරන්න. ගරු අනුර කුමාර මන්ත්‍රීතුමා, දැන් මේ ගැන විවාදයකට යන්න අමාරුයි. දැනටමත් පැය භාගයක් ප්‍රමාද වෙලා තිබෙනවා. මේ ගැන පැහැදිලි කිරීමක් කරලා, අපි ඊළඟ කරුණට යමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය වෙනස් කරන්න අපට උදවු කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැනට 90,000ක්දෙනා ලියා පදිංචි වෙලා තිබෙනවා කිව්වාම හිතෙනවා, උසස් පෙළ කළ සියලුමදෙනා ලියාපදිංචි වෙලා කියලා. එහෙම තත්ත්වයක් නොවෙයි මේ. 90,000ක් කියන්නේ, කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පටන් ගත්ත දවසේ සිට ලියා පදිංචි වුණු මුළු සංඛ්‍යාව.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
90,000න් 79,000ක් විභාගයට ඉඳ ගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොඩ්ඩක් ඉන්න.

90,000න් 79,000ක් විභාගය ලියනවා කියන්නේ ගරු කථානායකතුමනි, හොඳ, ප්‍රශස්ත මට්ටමක්. 90,000න් 79,000ක් කිව්වාම, ආසන්න වශයෙන් ගත්තොත්, සියයට 90 ඉක්මවනවා. අභ්‍යන්තර විභාගයකවත් සියයට 90ක පිරිසක් විභාගයට වාඩි වෙන්නේ නැහැ. ඒ නිසා ඒක හොඳ මට්ටමක්. හැබැයි ගරු කථානායකතුමනි, මේ අයගේ තිබෙන ප්‍රශ්නය මෙයයි. මේ අයගෙන් වැඩි පිරිසක් රැකියා කරන අය. ඒ අතර මාධ්‍යවේදීනුත් ඉන්නවා.

පරිපාලන විභාගය ගත්තොත් ගරු කථානායකතුමනි, පරිපාලන විභාගයට අභ්‍යන්තර සහ බාහිර වශයෙන් විභාගයක් තිබෙනවා. විශේෂයෙන්ම clerk කෙනෙක් බාහිර උපාධිය කරලා අභ්‍යන්තර විභාගයෙන් පරිපාලන සේවයට ඇවිල්ලා තිබෙනවා. මොකද, ඔවුන්ට ඒ අවස්ථාව ලැබෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ගැන වෙනම විවාදයක් කළොත් හොඳයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේකට වෙන මොකක් හරි විකල්පයක් ගෙනැල්ලා කටයුතු කරන එක හොඳයි. මෙතැන කරලා තිබෙන්නේ ඒ උපාධිය ගැනීමට තිබෙන අවස්ථාව මුළුමනින්ම කප්පාදු කරලා තිබීමක්. [බාධා කිරීමක්] 14,000ක් ලියා පදිංචි වෙන කොට 14,000ම එළියට එන්නේ නැහැ. ඒක ඇත්ත. මේගොල්ලන් රැකියා කරනවා, සමහර අය මහදී ඒ අධ්‍යාපනය අත් හරිනවා. නමුත් ඒ අවස්ථාව දෙන්නට ඕනෑ. එදා 11,000ක් අරගත්තාම එළියට එන්නේ 1,100 නම්, තමුන්නාන්සේලා 2,000ක් ගත්තොත් 150ක්වත් එළියට එන්නේ නැහැ. එම නිසා තමුන්නාන්සේට මම කියන්නේ-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි කප්පාදු කරලා නැහැ. අපි උසස් අධ්‍යාපනය වෙනුවෙන් මෙවර සියයට 30ක් මුදල් වැඩි කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයකට ඉඩ දෙන්නට බැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි වෙන් කරන මුදල් ප්‍රමාණය සියයට 30ක් වැඩි කරලා තිබෙනවා, කප්පාදු කරලා නැහැ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, අපි ඉදිරි වැඩ කටයුතුවලට යමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්නේ මෙයයි. දැන් කැලණිය විශ්වවිද්‍යාලයේ බාහිර උපාධිය සඳහා 90,000ක්දෙනා ලියා පදිංචි වෙලා ඉන්නවා. නමුත් විභාගයට ඉඳ ගත්තේ 79,000යි. ඒ 79,000න් pass වෙන්නේ සියයට 10යි. ඒ අනුව තව 80,000ක් පමණ තමන්ගේ වටිනා කාලය නිපුණතාවක් නැති උපාධික් සඳහා යොදවනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ළමයින්ට නැති අමාරුවක් ඔබතුමාට තිබෙන්නේ කොහොමද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපිට වගකීමක් තිබෙනවා. අපි ආණ්ඩුවේ, ඒ නිසා අපිට වගකීමක් තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා වාඩි වෙන්න. අපි ඊළඟ කටයුතුවලට යමු. අමාත්‍යාංශ නිවේදන, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

එළාර රජුගේ සොහොන ප්‍රතිසංස්කරණය කිරීම : අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
எல்லாள மன்னனின் சமாதி புனரமைப்பு: கல்வி அமைச்சரின் கூற்று
RESTORATION OF TOMB OF KING ELARA: STATEMENT BY MINISTER OF EDUCATION

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා විසින් 2016.07.22 වෙනි දින ස්ථාවර නියෝග 23 (2) යටතේ අසනු ලැබූ ප්‍රශ්නය වෙනුවෙන් මා පිළිතුරු ලබා දෙනවා.

1. එළාර සමාධිය, මේ තාක් නිශ්චිත ලෙස හඳුනා ගෙන නොමැත.

එළාර රජතුමාගේ සමාධිය පිහිටා ඇතැයි අනුමාන කරනු ලබන අනුරාධපුර දකුණු දොරටුවට පිටතින් ඒ ආසන්නයේ මධ්‍යම සංස්කෘතික අරමුදල හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව අවශ්‍ය ගවේෂණ හා කැණීම් කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව එළාර රජතුමාගේ සත්‍ය සමාධිය හඳුනා ගතහොත් එය ප්‍රතිසංස්කරණය කර ඉදිරි කටයුතු සිදු කිරීමට හැකිය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Are you satisfied with the Answer, Hon. Douglas Devananada?

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
உரிய ஆவணங்களோடு இது சம்பந்தமாகக் கலந்துரையாடுவதற்கு எனக்கு நேரம் ஒதுக்கித் தருமாறு கேட்டுக்கொள்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. මීළඟට, ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ නියෝජ්‍ය අමාත්‍යතුමා.

ඔලුවිල් වරාය ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්න : වැඩබලන වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
ஒலுவில் துறைமுகப் பிரதேச மக்கள் எதிர்நோக்கும் பாரிய பிரச்சினைகள்: துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பதில் அமைச்சரின் கூற்று
SERIOUS PROBLEMS FACED BY PEOPLE IN OLUVIL PORT AREA: STATEMENT BY ACTING MINISTER OF PORTS AND SHIPPING AFFAIRS

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Muthuhettigamage - Deputy Minister of Ports and Shipping Affairs)
ගරු කථානායකතුමනි, 2016.08.23 වන දින ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා විසින් 23(2) ස්ථාවර නියෝගය යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. ඔව්.

මේ පිළිබඳව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ 2016.08.08 දිනැති 16/1588/714/029 අංක දරන අමාත්‍ය මණ්ඩල සන්දේශයේ දක්වා ඇති නිර්දේශ කෙරෙහි අවධානය යොමු කර, පවත්නා ගැටලු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියට දන්වා ඇත. පිටපතක් අමුණා ඇත. එය **සභාගත*** කරමි.

මෙම කාර්යය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු කරනු ලැබේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සිදු කරන ලද සාකච්ඡාවට අනුව ක්ෂණිකව ගත යුතු තාවකාලික පියවරක් ලෙස මීටර් 550ක වෙරළ ප්‍රදේශයට ගල් වැටි දැමීමට තීරණය කරන ලදී.

ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් සැපයීමේ නියෝජිත ආයතනය වන ඩෙන්මාර්ක් විදේශ කටයුතු අමාත්‍යාංශය පුළුල් ඉංජිනේරු අධ්‍යයනයක් සිදු කර, වෙරළ බාදනය සඳහා පිළියම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග සැකසීම සඳහා මූල්‍ය සහාය ලබාදීමට එකඟ වී ඇත.

අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර මේ වන විට කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. ටෙන්ඩර් මණ්ඩලය හා කොන්ත්‍රාත්කරු අතර එකඟතාව සඳහා වන සාකච්ඡා අවසන් කර ඇත.

02. මත්ස්‍ය අපනයන කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඔලුවිල් වරාය ආශ්‍රිතව දැනටමත් ස්ථාපනය කර ඇත. කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නැත.

03. මේ වන විට අම්පාර දිස්ත්‍රික් ලේකම් පත්කළ කමිටුව විසින් ඉඩම් අයිතිය තහවුරු කළ ඉඩම් හිමියන් 19දෙනෙකු සඳහා පර්චසයට රුපියල් 30,000 බැගින් වන්දි ලබාදී ඇත. ඉතිරි ඉඩම් හිමියන් සඳහා වන්දි ගෙවීමට අදාළ තක්සේරු වාර්තා අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් අයිතිය තහවුරු කර ගැනීම සහ වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වී ඇත.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஆலோகா சமூக சேவை மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
ALOKA SOCIAL SERVICE FOUNDATION (INCORPORATION) BILL

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආලෝකා සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of National Policies and Economic Affairs for report.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, දැනටමත් කාල වේලාව බොහෝසෙයින් ඉක්ම ගිහිනුයි තිබෙන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම වේලාව ගන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේ කාරණය කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ස්වාධීන කොමිෂන් සභා ඇති කළ පසු, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඛ.(1), (2) සහ (3) අනු ව්‍යවස්ථා යටතේ ඒවායේ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස වරකදී අප ඉල්ලා සිටියා. දැන් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. නමුත්, එක් එක් කොමිෂන් සභාවල වාර්තා තවම හරියාකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා නැහැ. ඔබතුමා තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිතුමා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුවයි මේ කටයුතු කෙරෙන්න ඕනෑ. මම ඔබතුමාගේ අවධානයට ගෙනෙන්නේ, කොමිෂන් සභා සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රීති මාලාව පිළිබඳවත් 41 ව්‍යවස්ථාවේ සඳහන් කර තිබෙන බවයි. ඒ රීති මාලාව අනුව හරියාකාර වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර තමයි කොමිෂන් සභා කටයුතු කරගෙන යන්නේ. මෙය ඉතාම බරපතළයි. ගරු කථානායකතුමනි, ඒ නිසා කොමිෂන් සභා මේ ආකාරයෙන් කටයුතු කරගෙන යෑම හරිද, නැද්ද කියන කාරණාව පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න පුළුවන් නම් හොඳයි. ඒ සම්බන්ධයෙන් එම අදාළ කොමිෂන් සභා සියල්ලටම නියෝගයක් නිකුත් කිරීමට ඔබතුමා කටයුතු කරනවා නම් හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දැනට එම වාර්තා සකස් වෙමින් පවතිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම මෙතුමාට මතක් කරන්න කැමැතියි පසු ගිය ආණ්ඩුව කාලයේ -අවුරුදු 10ක්- ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක වුණේ නැති බව. නීති - රීති හදන්න ඔබතුමන්ලාට අවුරුදු 10ක් තිබුණා. මොනවාද මේ කථා කරන්නේ? [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අවුරුදු 10ක් - [බාධා කිරීම්] මුලදී ස්වාධීන කොමිෂන් සභා අක්‍රිය කළා. ඊට පස්සේ -[බාධා කිරීම්] ඒ අවුරුදු 10න් අවුරුදු 05ක් අක්‍රිය කළා. [බාධා කිරීම්] අවුරුදු 10ක් තිබුණා, නීති - රීති හදන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, අපි ප්‍රධාන කටයුතුවලට යමු.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම අනුමත කිරීම සහ ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා අනුමත කිරීම. ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්: වැටුප හා දීමනා

இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய குற்றப் புலனாய்வு ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகம் : சம்பளம் மற்றும் கொடுப்பனவுகள்

DIRECTOR-GENERAL OF COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION: SALARY AND ALLOWANCES

[අ. භා. 2.38]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාව මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධුරයේ රාජකාරි කළ ජනාධිපති නීතීඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:-

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතීඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, -[බාධා කිරීම්] මේ සභාවේ බැටළුවෝ ඉන්නවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමා අවස්ථාව ලබා දෙනවා නම්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමාගේ කථාවට බාධා කරන්න එපා. මම ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන දෙපාර්ශ්වයටම කථා කිරීමේ නිදහස ලබා දීලා තිබෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේ රටේ ව්‍යවස්ථාවට අනුකූලව ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයන්ටත්, සභාපතිවරුන්ටත්, නිලධාරීන්ටත් වේතන හා දීමනා අනුමත කරන්න තිබෙන්නේ පාර්ලිමේන්තුවෙන්. මේ අය දැන් අහනවා, කොමිෂන් සභාවල වාර්තා ගැන. මම දොස් කියන්නේ නැහැ. මොකද, මෙතුමන්ලා තමයි ස්වාධීන කොමිෂන් සභා නැති කළේ. දැන් මේ රටේ ස්වාධීන කොමිෂන් සභාවල වැඩකටයුතු කෙරෙනවා කියලා හිතන්න මේ අය අකැමතියි. [බාධා කිරීම්] ඇත්ත වශයෙන්ම විශාල කැක්කුමක් තිබෙනවා, තමන්ට මේවා ක්‍රියාත්මක කරන්න බැරි වීම ගැන. මෙච්චර ප්‍රශ්නයක් තිබෙන්නේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ මේවා ක්‍රියාත්මක කිරීම ගැන නේ.

මේ රටේ තිබුණු දූෂණය නැති කරන්න, දේශපාලන ඇඟිලි ගැසීම් නතර කරන්න අකැමැති වුණ නිසා තමයි අද මෙතැන කෑ ගහන්නේ. ඒවා ඔබතුමන්ලාට නැති කරන්න බැරි වුණා නේ. [බාධා කිරීම්] ඔබතුමන්ලාට ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක

කරන්නත් බැරි වුණා නේ. අපේ මන්ත්‍රීවරයෙක් තමයි ඉස්සෙල්ලාම ගිහින් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිවරියට බල කළේ. මේ විරුද්ධ පක්ෂයෙන් එදා සකස් කරපු දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න කියලා චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිවරියට ගිහින් බල කළා. එහෙම බල කරලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කළායින් පස්සේ, අද මේ අයට විශාල කැක්කුමක් තිබෙනවා, අප ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක කිරීම ගැන. 2001දී අපි ඇවිල්ලා මේ සභාවේ දෙපැත්තේම කැමැත්ත ඇතිව දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කළා. ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක වන ලෝකයේ වෙනත් රටවල් දිහා බැලුවා. ඒ අනුව අපි යෝජනා ඉදිරිපත් කරලා මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති කළා. අවුරුදු දෙක තුනක් ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක කළා. අපි අවුරුදු දෙක, තුනක් ක්‍රියාත්මක කළායින් පස්සේ ඊළඟ අවුරුදු දෙක, තුනේදී ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක කරන එක අක්‍රිය කළා. අක්‍රිය කළායින් පස්සේ මොකක්ද ඊළඟට සිද්ධ වුණේ? 2010 ඇවිල්ලා, මේ ගරු සභාවේ හැම පක්ෂයක්ම එකට එකතු වෙලා 223දෙනෙක් අනුමත කරපු ස්වාධීන කොමිෂන් සභා අහෝසි කළා. ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරපු නිසා ඊට විරුද්ධව විශාල ජනමතයක් මේ රටේ ඇති වුණා.

මම හිතන්නේ, පළමුවැනි වතාවට විරුද්ධ පක්ෂයේ ඉන්න කණ්ඩායම් සියල්ලමයි, සිවිල් සමාජයයි, ආගමික නායකයින් සියලු දෙනාමයි එකට එකතු වුණේ මේ ස්වාධීන කොමිෂන් සභා ඇති කරන්න කියලායි. ඒ සඳහා විශාල බලවේගයක් ඇති වුණා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න, මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති කරන්න කියලා ඒ බලවේගය විසින් පොදු අපේක්ෂකයෙක් තෝරා ගත්තා. ඒ පොදු අපේක්ෂකයා තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. [බාධා කිරීමක්] තමන්ගේ පක්ෂයේ නායකයාට විරුද්ධව නේ ඔබතුමන්ලා මේ කථා කරන්නේ. ඉතින්, මේ අය කොහාටද යන්නේ? තමන්ගේ පක්ෂයේ නායකයාට විරුද්ධයි නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ඉරුවர්)
(An Hon. Member)
ඔවුන් පක්ෂයෙන් එළවලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)

ඔව්. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" කියන මැතිවරණ ප්‍රකාශනය ක්‍රියාත්මක කරන්න අපි සියලු දෙනාමත්, මේ රටේ ජනතාවත් කැපවෙලා එතුමාව ජනාධිපති කර ගත්තා. ඇත්ත වශයෙන්ම මෙතැන කෑ ගහන අයට මම දොස් කියන්නේ නැහැ. ඔබතුමන්ලා දැන් කනගාටු වෙනවා ඇති, අපි මේ ස්වාධීන කොමිෂන් සභා අහෝසි කළේ නැත්නම් තවමත් අපි ආණ්ඩුව පැත්තේ වාඩි වෙලා ඉන්නවා කියලා. ඔබතුමන්ලා දැන් ආණ්ඩුව පැත්තේ වාඩි වෙලාත් නැහැ; විපක්ෂයේ ප්‍රධාන තනතුරේ වාඩි වෙලත් නැහැ. ඒ පැත්තේ කොනේම තමයි ඔබතුමන්ලා දැන් ඉන්නේ. මේ රටේ ජනතාව ඉල්ලපු දෙයක් තිබුණා. ඒ ජනතාවගේ ඉල්ලීම අනුව අලුත් බලවේගයක් ඇති වුණා. ඒ බලවේගයෙන් දේශපාලන පෙරළියක් මේ රටේ ඇති වුණා. අවසානයේදී අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ එක්සත් ජාතික පක්ෂයේ, ජනතා විමුක්ති පෙරමුණේ, ද්‍රවිඩ සන්ධානයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ විවිධ මත තිබුණා. ඒත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වශයෙන් පත්වුණාට පස්සේ මේ සභාවේ සාකච්ඡා කරලා, අපි එකඟ වෙලා, ඒක සම්මත කළා. අපි සියලු දෙනාම එකතු වෙලායි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගත්තේ. ඒක සම්මත කරගෙන අපි ඡන්දයට ගියාට පස්සේ මේ රටේ ජාතික ආණ්ඩුවක් ඇති කරන්න වාතාවරණය ඇති වුණා. 2010දී දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මේ ස්වාධීන කොමිෂන් සභා අහෝසි කළා. එම නිසා මේ රටේ විශාල දේශපාලන පෙරළියක් ඇති වෙලා, මේ ස්වාධීන කොමිෂන් සභා නැවතත් පිහිටුවලා පළමුවැනි වතාවට මේ රටේ ජාතික ආණ්ඩුවක් ඇති වෙලා තිබෙනවා. මේ රටේ ජාතික ආණ්ඩුවක් තිබෙන එකට සමහර අය අකැමැතියි. මේ රටේ ප්‍රශ්න විසඳෙන එකට සමහර අය අකැමැතියි. ඒ ගැන විශාල තරහක් තිබෙනවා; කැක්කුමක් තිබෙනවා. මොකක්ද ඔය තිබෙන අමාරුකම? මොකක්ද තිබෙන ප්‍රශ්නය?

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ඉරුවர්)
(An Hon. Member)
හොරකම් කරන්න බැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)

එක එක හේතු අපේ ගරු මන්ත්‍රීවරු කියනවා. එක පැත්තකින් හොරකම් කරන්න බැහැ. අනෙක් පැත්තෙන් දේශපාලන වශයෙන් බලපෑම් කරන්න බැහැ. මෙතැන මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? පළමුවැනි වතාවට මේ රටේ පරිපාලනයේ පත්වීම්වලට ඇඟිලි ගහන්න බැහැ. දේශපාලන වශයෙන් බලපෑම් ඇති කරන්න බැහැ. පොලිසියේ පත්වීම්වලට, පොලිසියේ නිලධාරීන්ට බලපෑම් කරන්න බැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ඉරුවர්)
(An Hon. Member)
එතකොට පොලිස්පති පත් කළේ කොහොමද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)

ගරු ජනාධිපතිතුමා ව්‍යවස්ථාදායක මණ්ඩලයට අවස්ථාවක් දුන්නා, පොලිස්පතිතුමාව තෝරන්න කියලා. වෙන කොහෙන්ද ඒ පත් කිරීම සිද්ධ වුණේ? මේ රටේ ව්‍යවස්ථාදායක මණ්ඩලයට ජනාධිපතිතුමා ඒ කටයුත්ත බාර දුන්නා. මේවා ගැන දන්නේ නැතිව නිකම් කෑ ගහන එකෙන් වැඩක් නැහැනේ. අද තිබෙන්නේ හොඳ අවස්ථාවක්, මේ කොමිෂන් සභා ක්‍රියාත්මක වෙනවාද, ඒවායේ අඩු පාඩුකම් තිබෙනවාද, නැද්ද කියලා බලන්න. මෙතැනදීම ජේනවා, අද කිසිම අරමුණක් නැතිව ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රණය කඩාකප්පල් කරන්න එක කණ්ඩායමක් ඉන්නවා කියලා. කොච්චර කෑ ගැහුවත් අපි යන මේ ගමන නවතින්නේ නැහැ. පාද යාත්‍රාව අවසන් කරන කොට අපි කැම්බල්පිටිය දුන්නා ජනතාවගෙන් පුරවන්න කියලා. කැම්බල් පිටිය ජනතාවගෙන් පුරවන්න බැරි නිසා කොහේටද ගියේ? [බාධා කිරීම්] කොහේටද ගියේ? [බාධා කිරීම්] තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නේ තමුන්නාන්සේලා තමයි නියම ශ්‍රී ලංකාකාරයන් කියලා. තමුන්නාන්සේලාගේ රැස්වීමට වඩා තුන් හතර ගුණයක් විතර සෙනග කුරුණෑගල හිටියා. කැම්බල් පිටිය පුරවන්නේ කොහොමද කියලා අපි සැප්තැම්බර් මාසයේ පෙන්නුවා. ඒ විධියට වැඩ කර ගන්නේ නැතිව නිකම් කෑ ගහලා වැඩක් නැහැ නේ. තමුන්නාන්සේලා ජනතාව එක්ක ඉන්න; නැත්නම් හැදෙන්න. ඒ දෙකෙන් එකක් කර ගන්න. තමුන්නාන්සේලා ජනතාව එක්ක

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඉන්නේත් නැහැ; හැදෙන්නේත් නැහැ. ඉතින්, වැටෙන්න ඕනෑ. [බාධා කිරීම්] මෙයින් පෙන්නුම් කරන්නේ, රට ප්‍රතික්ෂේප කරපු, කුණු වුණු, පල් වුණු දේශපාලනයක් තමයි තවමත් ගෙන යන්නේ කියන එකයි. වෙන දෙයක් නැහැ. [බාධා කිරීම්] ඒ නිසායි කෑ ගහන්නේ. මොකක්ද තිබෙන තරහ?

දැන්, මැතිවරණයට බලපෑමක් කරන්න බැහැ. අවුරුදු පහක් හයක් මෙම ක්‍රමවේදය යනවා නම්, කාටවත් ඒක වෙනස් කරන්න බැහැ. තමුන්නාන්සේලා ඊළඟට මැතිවරණයට ගිහිල්ලා කියනවාද ස්වාධීන කොමිෂන් සභා නැති කරනවා කියලා?

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
ඉතින්, පළාත් පාලන මැතිවරණය තියන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මට කියන්න, තමුන්නාන්සේලා ස්වාධීන කොමිෂන් සභා නැති කරනවා කියලා ඊළඟ මැතිවරණයට ගිහිල්ලා කියනවාද? ස්වාධීන කොමිෂන් සභා නැතිව ප්‍රාදේශීය සභා මැතිවරණයට යන්න තමුන්නාන්සේලා ලෑස්තිද?

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
මැතිවරණය තියන්න. ඇයි මැතිවරණයට බයද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මැතිවරණය තියන්නේ ස්වාධීන කොමිෂන් සභා එක්කද, නැතිවද? තමුන්නාන්සේලා මට එකක් කියන්න. ස්වාධීන කොමිෂන් අහෝසි කරනවා කියලා ඊළඟ මැතිවරණයේදී කියන්න ඔබතුමන්ලා ලෑස්තිද?

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ලෑස්තිද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
දැන් නැඟිටලා කියන්න, අපි ඒවා අහෝසි කරනවා කියලා. [බාධා කිරීම්] එහෙම නම්, මම කියන්නේ එක දෙයයි. ඔබතුමන්ලා ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරන්න අකැමැතියි. එහෙම නම් මොකද මේ තරහ? අපට කියන්න ඒ හේතුව මොකක්ද කියලා. [බාධා කිරීම්] මේ තරහ මොකක්ද? ඇයි ඊර්ෂ්‍යාව? ඇයි රිදෙන්නේ?

මේ කොමිෂන් සභා එකකටවත් අධිකරණ බලය නැහැ. මේ සභාවලින් නඩු දැම්මොත් අධිකරණයට යන්න පුළුවන්. ඒ තීරණ ගන්නේ අධිකරණයෙන්. දැන්, දුරකථනය අරගෙන ජනාධිපතිතුමා නැන්නම් මම අග්‍රවිනිශ්චයකාරතුමාටවත් කාටවත් කථා කරන්නේ නැහැ. මම දැකලාවත් නැහැ -[බාධා කිරීම්] කවුද? ඔබතුමන්ලා කියන්න කවුද එහෙම කළේ කියලා? මම කිව්වේ අපි කරන්නේ නැහැ කියලායි. මම කිව්වේ නැහැ වෙන කෙනෙක් කරනවා කියලා! [බාධා කිරීම්] මම කියන්නේ, මම කථා කරලා නැහැ කියලායි. ජනාධිපතිතුමාත් කථා කරලා නැහැ. වෙන අය කථා කරන්න ඇති. මම නම් ඒවා දන්නේ නැහැ. ඉතින්, ඒ කවුද කියලා ඔබතුමන්ලා දන්නවා නම් කියන්න. [බාධා කිරීම්] මම නම් ඒවා දන්නේ නැහැ.

අද පළමුවෙනි වතාවට මේ රටේ අධිකරණය කෙරෙහි විශ්වාසයක් තිබෙනවා. අද මේ රටේ පොලීසිය කෙරෙහි විශ්වාසයක් තිබෙනවා.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
තිබෙනවා! තිබෙනවා!! අපි දන්නවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අධිකරණය කෙරෙහි විශ්වාසයක් නැහැ කියලා තමුන්නාන්සේ කියනවාද? [බාධා කිරීම්] ඔබතුමා කියන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණය ගැන විශ්වාසයක් නැහැ කියලාද?

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
කඩුවෙල ඉන්න විනිශ්චයකාරවරයා -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද? ගරු මන්ත්‍රීතුමනි, නඩුකාරවරුන්ගේ තීන්දුවලට කැමැති නැත්නම් මේ ගරු සභාවට ඇවිල්ලා බණින්න එපා. මේ අධිකරණය තමයි වැටි පනත් කෙටුම්පත අහෝසි කළේ; වැටි අය කරන එක අහෝසි කළේ. එක මහේස්ත්‍රාත්වරයෙකුගේ- නඩුකාරයෙකුගේ- තීන්දුව වැරදි නම් කරුණාකරලා ඊළඟ උසාවියට යන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අධිකරණය විවේචනය කිරීම සුදුසු නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
තමුන්නාන්සේලා කියන විධියට, විනිශ්චයකාරවරු තමුන්නාන්සේලා ඉදිරියේ දණ ගහන්න ලෑස්ති නැහැ. දුරකථනයෙන් කිව්වාම ඒ අනුව තීන්දු දෙන්නත් අද ලෑස්ති නැහැ. ඒවා අපටවත් වෙනස් කරන්න බැහැ. අපි සියලු දෙනාම උසාවියට යටත්. මහ රජතුමාට එක නීතියක්, ජනතාවට තවත් නීතියක් නැහැ. වැරැද්ද කළා නම්, කළා. අද දඬුවම් විඳින අපේ සංවිධායකවරුත් ඉන්නවා. ඒ දඬුවම් නවත්වන්න කියලා අපි ගිහිල්ලා කියන්නේ නැහැ. ඔබතුමන්ලා දැන් ඇවිල්ලා ඉන්නේ, නඩුකාරයෙකුට දෙන්නෙකුට බණින්න. ඇයි නඩුකාරවරුන්ට බණින්නේ?

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හිරේ දාන නිසා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මොකක්ද, බණින්න හේතුව? ඒ ගැන මොකුත් කියන්නේ නැහැ. වටේ යනවා! වටේ යනවා!! වටේ යනවා!!! කේන්තියක් තිබෙනවා නම්, ඒ කේන්තියට හේතුව මොකක්ද කියලා අපට කියන්න.

ගරුමන්ත්‍රීවරයෙක්
(மாண்புமிகுஉறுப்பினர்ஒருவர்)
(An Hon. Member)
පඩිය කීයද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகுரணில்விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මම දන්නේ නැහැ, මහෙස්ත්‍රාත්වරුන්ගේ පඩිය කීයද කියලා. මම මහෙස්ත්‍රාත්වරයෙක් නොවෙයි. ඒක ඔබතුමන්ලා පාර්ලිමේන්තුවෙන් තීරණය කරන්නේ.

මට මෙතැනදී තමුන්නාන්සේලා සියලු දෙනාට කියන්න ඕනෑ වුණේ, ඒ කොමිෂන් සභාවලට සාමාජිකයන් තෝරාගන්න, නිලධාරින් තෝරාගන්න හොඳ දීමනාවක් දෙන්න වුවමනායි කියන එක. අද ඒවායේ සේවය කරන්න හොඳ මිනිසුන් එනවා නම්, හොඳ පුද්ගලයන් එනවා නම් ඒ අයට හොඳ වැටුපක් දෙන්න ඕනෑ. ඒ චේතන තමයි මෙහිදී යෝජනා කරන්නේ. මේ යෝජනාව කළාට පස්සේ, ඇත්ත වශයෙන් හොඳ වැටුපක් නැතිව ඉන්නේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විතරයි. අපි ඊළඟට ඒ ගැනත් කථා කරන්න ඕනෑ. එහෙත් දැන් ඒ ගැන කථා කරන්න මගේ බලාපොරොත්තුවක් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අපි -අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව- ඒ සියලු දෙනා තෝරාගත් බව. අප එකතු වෙලා ඒ අය තෝරාගෙනයි තිබෙන්නේ. ඒ නිසා අපි මෙසේ යෝජනා කරනවා.

"(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;"

ඒ, නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙක් අයටයි.

ගරු කථානායකතුමනි, එහි අනෙක් යෝජනා මෙසේයි:

"(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු.8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් 3/4ක විශේෂ දීමනාවක් ද."

යනුවෙන් අපි යෝජනා කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව, 1වන යෝජනාවේ සඳහන් වනවා,

"1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;...." යනුවෙන්.

ගරු කථානායකතුමනි, මා මේ සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී එක් කාරණයක් කියන්න කැමැතියි. පසු ගිය අවුරුද්දෙන් පසුව තමයි ඒ නිලධාරින් හරියට බඳවාගන්න පටන් ගත්තේ. ඒ අයට පුහුණුවක් දීලා තිබුණේ නැහැ. ඒ අය පුහුණු කරන්න පටන්ගෙන තිබෙනවා ගිය අවුරුද්දේයි, මේ අවුරුද්දේයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය වෙනුවෙන් 2015.02.12වන දින සිට වැටුප් හා දීමනා ගෙවීමටයි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබෙන්නේ. ඒ අනුව, අපි අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ වැටුප අතිරේක සොලිසිටර් ජනරාල්වරයකුගේ මාසික වැටුපට සමාන කර තිබෙනවා. ඒ අනුව අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර) අධ්‍යක්ෂ ජනරාල්තුමියට ලබා දෙනවා. ඊට අමතරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබා දී නොමැති නම් නිවාස කුලී දීමනාවද ලබා දෙන්න තමයි මෙතැන යෝජනා කරන්නේ.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මම මේ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වුණේ නැහැ. මම නැඟිට්ටේ මෙම යෝජනාව ඉදිරිපත් කරන්න විතරයි. නමුත් විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා කරපු සද්ද ගැන මම පුදුම වුණා. ඒ නිසා ටිකක් කල් අරගෙන මේ ගැන සාකච්ඡා කරන්න මට සිදු වුණා.

ගරු කථානායකතුමනි, මම මෙම යෝජනා දෙකම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, the Committee on Public Finance considered this yesterday. We made one observation. Some of the commissions have slightly different functions. I appreciate that with regard to the Election Commission; from the date of the declaration, you have made a specific proposal. But, with regard to a commission like the Human Rights Commission, they might need to travel much more than the other commission members. So, would the Government consider slightly different formula for travel allowance and so on?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

We could do that, but I think we will have to pass this and bring in some amendments. We can certainly go into the matter. We can ask the Hon. Speaker to take up whatever that has been decided. Thereafter, we can make suitable amendments for those commissions.

ගරු කථානායකතුමනි, සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ සභා ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ, ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයෙන් පසුවයි. ඒ අනුව දැන් එම සභාවලට වර්ෂයක් පිරෙන නිසා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කියපු විධියට එම සභාවලට ඒ අයගේ වාර්තා ඉදිරිපත් කරන්න කියා අපිත් මතක් කරන්න ඕනෑ. මෙම කොමිෂන් සභා විසින් මාස තුනකට වතාවක් තමන්ගේ වාර්තා ජනාධිපතිතුමාට ඉදිරිපත් කරයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි දැනට ඒ ගැන අවධානය යොමු කර තිබෙනවා. ඉදිරියේදී ඒ සඳහා අවස්ථාවක් ලැබෙයි. The next speaker is, the Hon. S. Shritharan. Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

[பி.ப. 2.58]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய குற்றப் புலனாய்வு ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் கொடுப்பனவுகளை மறுசீரமைத்தல் தொடர்பான பிரேரணைமீது உரையாற்ற வாய்ப்புக் கொடுத்தமைக்கு நன்றி. இந்தச் சந்தர்ப்பத்தில், கடந்த 16.09.2016 அன்று கிளிநொச்சி சந்தைத் தொகுதியில் ஏற்பட்ட பாரிய தீ விபத்து தொடர்பான விடயங்களை இச்சபையின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

1983ஆம் ஆண்டுக்கு முன் இலங்கையில் ஒரு பிரதானமான பொதுச் சந்தையாக கிளிநொச்சி பொதுச் சந்தை விளங்கியது. தென்னிலங்கையிலிருந்தும் வடபகுதியின் கிழக்குப் பகுதியிலிருந்தும் வருகின்ற மக்கள், மத்தியாக அமைந்திருக்கும் இந்தப் பெரிய சந்தையில் பலதரப்பட்ட பொருட்களையும் கொள்வனவு செய்கின்ற நிலைமை காணப்பட்டது. 1983ஆம் ஆண்டுக்குப் பிறகு இலங்கையில் ஏற்பட்ட யுத்தத்தைத் தொடர்ந்து அந்தச் சந்தை அமைப்பு சீர்குலைந்துபோனதன் காரணமாகத் தம்புள்ள சந்தை அந்த இடத்தைப் பெற்றுக்கொண்டது.

யுத்தம் காரணமாக கிளிநொச்சி மாவட்டத்தில் பல தடவைகள் ஏற்பட்ட இடம்பெயர்வுகளினால் அந்த மக்கள் முழுமையாக பின்நகர்த்தப்பட்டபோதிலும், அவற்றையும் தாண்டி வியாபாரப் பொருட்களையும் தங்களுடைய உற்பத்திப் பொருட்களையும் அந்தச் சந்தையிலே விற்பனை செய்து சிறியளவில் தங்களுடைய பொருளாதாரத்தை மேம்படுத்திக்கொண்டிருந்தார்கள். இந்நிலையில், 2008ஆம் ஆண்டு தமிழர்கள்மீது திணிக்கப்பட்ட பாரிய யுத்தத்தினால் மக்கள் இடம்பெயர்ந்து முள்ளிவாய்க்கால்வரை சென்று அங்கிருந்து வவுனியாவிலுள்ள முகாம்களுக்குள் வாழ்ந்து, பின்னர் தமது இடங்களில் மீண்டும் குடியேறி வாழ்கின்றார்கள். அவர்கள் மீள்குடியேறிய காலத்திலே அம்பாள்குளம் பகுதியில் இந்தச் சந்தை அமைப்பு அப்போதைய அரசினால் தற்காலிகமாக மேற்கொள்ளப்பட்டது.

அதற்குப் பிற்பாடு அந்தச் சந்தை கிளிநொச்சி நகரப் பகுதியிலிருக்கின்ற டிப்போ சந்தியில் ஏற்கெனவே இருந்த இடத்தில் மீன் சந்தைக்கான ஒரேயொரு கட்டிடத்தோடும் வெற்றிலை, மரக்கறி போன்ற வியாபாரங்களுக்கான ஒரு கட்டிட அமைப்போடும் கிட்டத்தட்ட 220க்கு மேற்பட்ட ஏனைய கடைகள் தற்காலிக கொட்டகைகளாக - தற்காலிக கடை அமைப்புகளைக் கொண்டதாக பூரணமாக அமைக்கப்பட்டது. அந்த நேரத்திலிருந்து அங்குள்ள மக்கள் அவசர அவசரமாக அந்தக் கடைகளில் வியாபாரத்தை ஆரம்பித்தார்கள்; அது அந்தக் காலத்தில் ஏற்பட்ட தேவையாகவும் இருந்தது. ஆனால், அந்தக் கடைகள் அமைக்கப்படுகின்றபோது அக்காலத்தில் இருந்த அரசும் அரசோடு இருந்த அரசின் காட்டுச் சட்டங்களைக் கையில் வைத்திருந்தவர்களும் கடைகளின் சரியான அமைப்பு முறைக்கேற்ப தற்காலிகக் கடைகளை அமைக்கவில்லை. அத்துடன், மக்களால் தெரிவுசெய்யப்பட்ட ஒரு பிரதேச சபை இருந்தும் அந்தச் சபையை மீறி அரசுடன் இருந்தவர்களுக்கு கட்டாயப்படுத்தி அவற்றை வழங்கியதாலும் அவை சரியாகப் பேணப்படவில்லை என்பதுதான் உண்மையானது.

அதனை வடக்கு மாகாண சபை பொறுப்பெடுத்த பின்னர் 70 மில்லியன் ரூபாய் செலவிலே 60 கடைகள் கொண்ட ஒரு தொகுதி இப்பொழுது அந்தப் பகுதிக்குள் அமைக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இந்தச் சூழ்நிலையில்தான் கடந்த 2016.09.16ஆம் திகதி இரவு 9.30 மணியளவில் அந்தச் சந்தையில் தீ விபத்து ஏற்பட்டுள்ளது. அத்தீயானது கிட்டத்தட்ட 5 மணித்தியாலங்கள் பெரும் சுவாலையாக எரிந்தது. இதனால் 124க்கு மேற்பட்ட கடைகள் முற்றாக எரிந்து நாசமாகியுள்ளன. அங்கு பழக்கடைகள் 22, புடவைக் கடைகள் 55, தையல் வியாபாரத்தில் ஈடுபடுகின்ற கடைகள் 2, அழகுசாதன - fancy பொருட்கள் விற்பனை செய்கின்ற கடைகள் 44, தேநீர்க் கடை 1 என மொத்தம் 124 கடைகள் முற்றுமுழுதாக எரிந்து நாசமாகியுள்ளன. இவற்றின் மொத்தப் பெறுமதி 22,17,97,200 ரூபாய் என கரைச்சி பிரதேச

சபையினால் மதிப்பீடு செய்யப்பட்டிருக்கின்றது. கிட்டத்தட்ட 230 மில்லியன் ரூபாய் பெறுமதியான சொத்துக்களை அந்த மக்கள் இழந்திருக்கிறார்கள். அவர்கள் கடுமையான யுத்தத்தால் பாதிக்கப்பட்டவர்கள். யுத்தத்தின்போது உடுத்த உடுப்போடு அகதிகளாகச் சென்று மீண்டும் குடியேறி மெல்ல மெல்லத் தங்கள் வியாபாரத்தினை ஆரம்பிக்கின்றபொழுது இந்த எதிர்பாராத அனர்த்தம் அவர்களை மீண்டும் ஒரு பாரிய படுகுழிக்குள் தள்ளியிருக்கின்றது.

இதுதொடர்பாக நான் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் மாண்புமிகு பிரதமர், மாண்புமிகு புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்ற அமைச்சர், மாண்புமிகு உள்நாட்டலுவல்கள் அமைச்சர், மாண்புமிகு நிதி அமைச்சர் ஆகியோருக்கும் எழுத்துமூலமான கடிதங்களை அனுப்பியிருக்கின்றேன். தயவுசெய்து அனைவரும் இரக்கத்தோடும் மிக வேகமாகச் செயற்படுத்தக்கூடிய வகையிலும் இதனை அணுகவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அவர்களுக்கான ஒரு நிவாரண உதவி உடனடியாக வழங்கப்பட வேண்டும். அவர்கள் அந்தக் கடைகளை ஆரம்பித்துத் தங்களுடைய வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கான முயற்சிகளை மேற்கொள்ள வேண்டும்.

நேற்றைய தினம் நான் நிதியமைச்சரைச் சந்தித்துப் பேசியபொழுது இது சம்பந்தமாகக் குறிப்பிட்டேன். அவர்கள் வங்கிகளிலே கடன் பெற்றிருக்கின்றார்கள். இலங்கை வங்கி, மக்கள் வங்கி, தேசிய சேமிப்பு வங்கி, கொமர்ஷல் வங்கி, ஹற்றன் நஷனல் வங்கி இதனைவிட கொமர்ஷல் கிறடிற், ஏசியா கிறடிற் போன்றவற்றிலே கடன்களைப் பெற்று இந்தக் கடைகளை நடத்தியிருக்கின்றார்கள். இவ்வாறு பாதிக்கப் பட்டவர்களுக்கு அங்கு காப்புறுதி கிடைக்கவில்லை. அவர்களுடைய கடைகள் தற்காலிகக் கடைகள் என்ற காரணத்தால் அவர்களுக்குக் காப்புறுதிகள் எதுவும் வழங்கப்படவில்லை. வங்கிகள் தற்காலிகக் கடைகளுக்குக் கடன் வழங்கியிருக்கின்றன. ஆனால், காப்புறுதி நிறுவனம் தற்காலிகக் கடை எனக் கூறி அவர்களுக்குக் காப்புறுதியைச் செய்ய முன்வரவில்லை. இதனால் அவர்கள் காப்புறுதிகூட இல்லாத நிலைமைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். இது ஒரு மனிதாபிமானப் பிரச்சினை.

அனர்த்தம் காரணமாக இந்த நாட்டிலே பல இடங்களில் பலவிதமான பிரச்சினைகள்! மலையகத்திலே ஏற்பட்ட மண் சரிவுகள், சாலாவயில் ஏற்பட்ட வெடிகுண்டுப் பிரச்சினைகள்போல கிளிநொச்சியிலே ஏற்பட்ட இந்த 124 கடைகளுக்குமான அழிவு ஒரு பயங்கர அனர்த்தமாக இந்த நாட்டிலே பார்க்கப்பட வேண்டும். அதனால்தான் இவர்களுக்குரிய உதவிக்கான வேண்டுகோளை இந்த உயர்ந்த சபையினூடாக நான் முன்வைக்கின்றேன். இங்கே இப்பொழுது மீள்குடியேற்றம் மற்றும் புனர்வாழ்வுக்குப் பொறுப்பான அமைச்சர் அவர்களும் இருக்கின்றார். அவரும் இதில் கூடுதலான கவனமெடுப்பார் என்று நான் கருதுகின்றேன். இதனைவிட நாட்டினுடைய இந்த உயர்ந்த சபையின் ஊடாக ஒவ்வோர் அமைச்சரும் மற்றும் இந்தத் துறைசார்ந்தவர்களும் இதனோடு தொடர்புடையவர்களும் இதற்கு வேகமாக உதவ வேண்டும் என்பதுதான் என்னுடைய மிக முக்கியமான வேண்டுகோள்.

இந்த இடத்திலே இன்னுமொரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அதாவது, கிளிநொச்சி ஒரு தனி மாவட்டமாக இருந்தும் அந்த மாவட்டத்திலே ஒரு நகர சபையோ மாநகர சபையோ இல்லை என்ற காரணத்தினால் அங்கு ஒரு fire brigade - தீயணைப்புப் படைப் பிரிவு இல்லை. இந்தத் தீயினால் ஏற்பட்ட அழிவுக்கு இது ஒரு மிக முக்கியமான காரணமாகக் கொள்ளப்படுகின்றது. அங்கு ஒரு தீயணைப்புப் படை இருந்திருந்தால் இந்த அழிவைப் பெருமளவில் தடுத்திருக்க முடியும். யாழ்ப்பாணத்திலே இருக்கின்ற யாழ்ப்பாணம் மாநகர சபைக்குச் சொந்தமான தீயணைப்பு இயந்திரங்கள் அந்த ஊழியர்களோடு அங்கு வருகைதந்து அந்தத் தீயை அணைக்கும்வரை அங்குள்ள நீர் வழங்கல் வடிகாலமைப்புச் சபை, பிரதேச சபை போன்றவற்றின் சாதாரண 'பவுசர்'கள் மூலமாகவே தண்ணீர் பீய்ச்சித் தீயை அணைப்பதற்கான முயற்சி மேற்கொள்ளப்பட்டது. ஆனால் அது பெரிய அளவிலே வெற்றியைக் கொடுக்கவில்லை. அந்த இடத்திலே ஒரு தீயணைப்புப் படை இருந்திருந்தால் தீயை வெகுவேகமாக அணைத்திருக்க முடியும். இனியாவது காலம் தாழ்த்தாமல் இதனை அங்கு ஏற்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

கிளிநொச்சியிலுள்ள கரைச்சி பிரதேச சபையை கிளிநொச்சி நகர சபையாகத் தரமுயர்த்துவதற்கான வேண்டுகோள் 2013ஆம் ஆண்டிலேயே தமிழ்த் தேசியக் கூட்டமைப்பினரால் அரசிடம் முன்வைக்கப்பட்டது. இது கிளிநொச்சிக்கு மிக முக்கியமான தேவையும்கூட. ஆகவே, இந்த அனர்த்தத்தைத் தொடர்ந்தாவது கிளிநொச்சிக்கான ஒரு தீயணைப்புப் படைப் பிரிவு உடனடியாக ஏற்படுத்தப்பட வேண்டும் என்பது எங்களுடைய மிக முக்கியமான கோரிக்கையாகும்.

இதனைவிட, இங்கே நான் குறிப்பிட்டதுபோல, பாதிக்கப்பட்ட இந்த 124 கடை உரிமையாளர்களும் வங்கிகளிலே கடனைப் பெற்றிருக்கின்றார்கள். Credit அடிப்படையிலே - கடன் அடிப்படையிலே மட்டுமல்லாமல் நாள் வட்டிக்குக்கூட அவர்கள் கடனைப் பெற்றிருக் கின்றார்கள். இந்த வங்கிகளோடு அரசாங்கம் இது சம்பந்தமாகப் பேசவேண்டும். நிதியமைச்சர், மீள்குடியேற்ற அமைச்சர் ஆகியோர் இந்த வங்கிகளோடு தொடர்பை ஏற்படுத்தி, 6 மாத காலத்திற்கு இவர்களது கடன்களுக்கு வட்டியை இல்லாமற் செய்வதற்கும் கடன் அறவீடுகளை நிறுத்துவதற்கும் இவர்கள் தங்களது தொழிலை ஆரம்பித்து இயங்கத் தொடங்கிய பிற்பாடு 6 மாத கால இடைவெளியை வழங்குவதற்கும் உதவி செய்யவேண்டும் என்று இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அதனைவிட அவர்கள் அந்தச் சந்தையிலே தங்களது கடைகளுக்கு மின்சாரக் கட்டணம் கட்டியிருக்கின்றார்கள்; மின்சார ஒழுக்குக்கூட இதற்குக் காரணமாக இருக்குமா என்று ஆராயப்படுகின்றது. நாளாந்தம் அவர்கள் பிரதேச சபைக்கு வரி கட்டியிருக்கின்றார்கள். இவர்கள் இவ்வாறெல்லாம் செய்தும்கூட ஒரு காப்புறுதியையோ அதற்கான ஒரு compensation - நட்டஈட்டையோ பெறமுடியாமல் இருக்கிறார் களென்றால், இது ஒரு பாரிய இழப்பாகவே பார்க்கப்படுகின்றது. ஆகவே, கடந்த 16ஆம் திகதி கிளிநொச்சியிலே ஏற்பட்ட அனர்த்தம் ஒட்டுமொத்தத்திலே பல பேருடைய இதயங்களைப் பிழிந்த ஒரு விடயம். யுத்தத்திலே அவர்கள் தங்களுடைய சொத்துக்களை இழந்திருக்கின்றார்கள்; தங்களுடைய குடும்ப அங்கத்தவர்களை இழந்திருக் கின்றார்கள். அவர்கள் தங்களுடைய முழுச் சொத்துக்களையும் வியாபாரப் பொருட்களையும் இழந்துதான் மீண்டும் வந்து குடியேறி இந்த இடத்திலே அவர்கள் வியாபாரத்தை ஆரம்பித்தார்கள். நான் அந்த இரவு நேரம் அந்த இடத்திற்குச் சென்றபோது பல பெண்கள் கண்ணீர்விட்டுக் கதறி அழுதார்கள். பலர் அந்த எரிகின்ற கடைகளுக்குள் விழுந்து தற்கொலை செய்வதற்குக்கூட முயற்சித்தார்கள். அவ்வாறு

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

மிகவும் பாதிக்கப்பட்டவர்களுடைய நிலையைக் கருத்திலெடுத்து உடனடியாக அவர்களுக்கு உதவ வேண்டும் என்பதை என்னுடைய அவசர வேண்டுகோளாக இன்றைய தினத்திலே இந்த உயர்ந்த சபையினூடாக நான் முன்வைக்கின்றேன். எனக்கு ஒதுக்கிய மிகுதி நேரத்தை எனக்குப் பின்னால் பேச இருக்கின்ற என்னுடைய கட்சி சார்ந்தவர்களுக்கு வழங்குமாறு கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 3.07]

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කරලා තිබෙන්නේ, වැදගත් යෝජනාවක්. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට සහ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට අදාළව වැටුප් සහ අනෙකුත් දීමනා ගෙවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව සාකච්ඡා කරන මේ මොහොතේ මීට වැඩිය මන්ත්‍රීවරු ප්‍රමාණයක් මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ හිටියා නම් ඉතාම වැදගත් වෙනවා කියා මා සිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අගමැතිතුමාගේ කථාව පටන් ගන්නත් කලින් මම දැක්කා, එළු හඬවල්, බැටළු හඬවල්, නොයෙකුත් සත්වයන්ගේ හඬවල් මේ වටිනා සභා ගැබෙන් නිකුත් වෙනවා. මම කථා කරන්න ඉස්සෙල්ලා ගොනෙකුගේ හඬකුත් ආවා. ගොන්නුත් හඬ නිකුත් කරලා ඉවරයි. තව සත්තු හතර, පස් දෙනායි ඉන්නේ. ඒ හතර, පස් දෙනා ඇතුළට ආවොත් ඒ හඬවලුත් නිකුත් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය කොමිෂන් සභා ටික ගෙනෙන්න අපි විශාල මහන්සියක් ගත්තා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ඒ ගැන සන්තෝෂ වෙනවා. ඒවා ගෙනෙද්දී, එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියලා බැලුවේ නැහැ.

1948 ඉඳලා හොඳ දේවල් කළා නම්, ඒ හැම දේටම එක්සත් ජාතික පක්ෂයේ අපි සහයෝගය දීලා තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත අපි ආණ්ඩු පක්ෂයේ ඉන්දෙද්දී ගෙනාවා; අපි විපක්ෂයේ ඉන්දෙද්දී ගෙනාවා. හැබැයි, මේ පිරිස රටට වැඩදායීවන යම් දෙයක් තිබෙනවා නම් ඒකට සහයෝගයක් දුන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අගය කරනවා, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමන්ලා වාගේ මන්ත්‍රීවරු. ඔවුන් විපක්ෂයේ හිටියත් යම් හඬක් නහන මන්ත්‍රීවරු; යම් යම් අවස්ථාවල හරි දේවල් කරන්න යොමු වෙන මන්ත්‍රීවරු. එතුමා අවුරුදු ගණනක් මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව යටතේ හිටියා. හැබැයි, අපි එතුමාගෙන් බලාපොරොත්තු වුණු ඒ කාර්යභාරයවත් ඒ අවස්ථාවේදී ඉටු වෙනවා අපි දැක්කේ නැහැ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අමු අමුවේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය විනාශ කරන සංශෝධනයක්. මොන මොන හේතු නින්දා හරි මේ උදවියට ඒ සංශෝධනයට අත ඔසවන්න සිදු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපට ඉතාම සන්තෝෂ වෙන්න පුළුවන් කාරණයක් තිබෙනවා. මේ රටේ යහ පාලනය වෙනුවෙන් අපි විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. සමහර ඒවා දේශපාලන වශයෙන් අපට අවාසි වෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ හිටියත් රට ගැන හිතලා අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් කෙළින් කථා කරන්න පුළුවන්, කෙළින් වැඩ කරන්න පුළුවන් හැකියාවක් තිබෙන හින්දා බය නැතුව මේ කොමිෂන් සභා ටික ස්ථාපනය කළා.

ඒ දවස්වල මම රාජපක්ෂවරුන්ට එරෙහිව කථා කරන කාලයේදී මට විරුද්ධව නඩු කිහිපයක්ම ගෙනෙන්න තැත් කළා. හැබැයි අපි බය වුණේ නැහැ. අපේ හඬ නැවැත්වූයේ නැහැ. අපි දෝෂාරෝපණය කළේත් නැහැ, මේ කොමිෂන් සභාවලටත්; නඩුකාරයන්ටත්. ඒ අවස්ථාවල අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. නැත්නම් වෙනත් අධිකරණයකට ගියා. කරුණු දැක්වුවා; අපට අවශ්‍ය තීන්දු ලබා ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටෙන් බිලියන ගණනක් හොරකම් කරලා තිබෙනවා. ඇමෙරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුව සඳහන් කරනවා, පසු ගිය අවුරුදු 10 තුළ ඩොලර් බිලියන 19ක් -US Dollars 19 billion- රටින් පිටමං වෙලා තිබෙනවා කියලා අපට මේ රට ගොඩ ගන්න තිබුණා, මේ මුදල් ටික හොරකම් කළේ නැත්නම්; මේ රටින් පිටමං වුණේ නැත්නම්.

දිල්රුක්ෂි වික්‍රමසිංහ මැතිතුමිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පත් කළාට පස්සේ, කාන්තාවක් වශයෙන් එතුමිය නිර්භීතව ඒ තනතුර භාරගත්තා. එතුමිය නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කරන කාලයේ එතුමියගේ කාර්ය භාරය ඉතා පිරිසිදුව කළා. අපිත් නීතිඥවරු. ගරු වාසුදේව නානායක්කාර මහත්මයාත් නීතිඥවරයෙක්. මටත්, නීතිඥ වෘත්තිය සම්බන්ධව අවුරුදු 17ක, 18ක අත්දැකීම් තිබෙනවා. ස්වාමිනාදන් අමාත්‍යතුමා වැනි අය නීතිඥ වෘත්තියේ දීර්ඝ කාලීන අත් දැකීම් සහිත අය. අපි එතුමියගේ කල්ක්‍රියාව ගැන හොඳට දන්නවා. එතුමියට මඩ ගැහුවා; චෝදනා කළා. නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කළ කාලය තුළ එතුමිය ගැන - එතුමියට විරුද්ධව- එක චෝදනාවක් හෝ තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා හිතට එකඟව දන්නවා, එහෙම නැහැ කියලා. එතුමිය නිර්භීතව, පිරිසිදුව වැඩ කරපු කාන්තාවක් වශයෙන් මේ වගකීම භාර ගත්තා. ඒක ලෙහෙසි පහසු කාර්ය භාරයක් නොවෙයි. දේශපාලනඥයින්ට විරුද්ධව නඩු පවරන්න සිදු වනවා; බලවත් පුද්ගලයින්ට විරුද්ධව නඩු පවරන්න සිදු වනවා. හැබැයි, එතුමිය ඒ තනතුර භාර ගත්තා.

සමහර මන්ත්‍රීවරු යම් යම් කථා ඉදිරිපත් කරනවා මා අහගෙන හිටියා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට එක නිදසුනක් ඉදිරිපත් කරන්නම්. මොහාන් පීරිස් මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරු වශයෙන් හිටපු, ඒ වාගේම බාලපටබැඳිගේ මැතිතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපති ධුරය දැරූ පසු ගිය කාලයේ දුරකථන වාර්තා පුළුවන් නම් අරගෙන බලන්න. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ office එකේ දුරකථන වාර්තා ටිකත් ගන්න. මොහාන් පීරිස් මහත්මයාගේ දුරකථන අංක පරීක්ෂා කර බලන්න. බාලපටබැඳිගේ මහත්මයාගේ දුරකථන අංක ටික පරීක්ෂා කර බලන්න. පුළුවන් නම් ඔබතුමන්ලා, අපි ඒවා පරීක්ෂා කර බලමු.

ඒ විතරක් නොවෙයි. මේ අවස්ථාවේදී දිල්රුක්ෂි වික්‍රමසිංහ මැතිතුමියගේ, ශ්‍රීපවන් මහත්මයාගේ, ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ දුරකථන අංක පරීක්ෂා කර බලන්න. අගමැතිතුමා හෝ ජනාධිපතිතුමා එක හෝ දුරකථන පණිවිඩයක් දීලා තිබෙනවා නම් අපට ඉදිරිපත් කරන්න. එහෙම දුරකථන පණිවිඩයක් දීලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාව, ශ්‍රේෂ්ඨාධිකරණය එහෙම නැත්නම් අධිකරණය හසුරුවන්න තැත් කළ බවට කාරණා තිබෙනවා නම් අපට පෙන්වන්න. අපි ඔබතුමන්ලාට ඒ වගකීම භාර දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටේ යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, විනිවිදභාවය, නීතියේ ආධිපත්‍ය -මේ සියල්ල- මේ රටේ අනාගතය වෙනුවෙන් බිහි කළා. ඒකට අපි පොඩි කාලයක් ගත්තේ. සුළුතර ආණ්ඩුවක් තියාගෙන ජනවාරි 8වැනිදා ඉඳලා අපි ඒ කාර්ය භාරය ඉටු කළා. අද මේ කාරණය විපක්ෂයටවත්, ආණ්ඩු පක්ෂයටවත් අදාළ දෙයක් නොවෙයි. හොරෙක් නම්, අල්ලස් අරගෙන තිබෙනවා නම්, දූෂණයට පාත්‍ර වෙලා තිබෙනවා නම් තමන්ගේ කාලය තුළ, ඒ වෙනුවෙන් රටේ නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒක අපි සැම දෙනාටම එක ලෙස ක්‍රියාත්මක වෙන්න ඕනෑ. යම් කිසි ආකාරයකින් වැරදි ලෙස චෝදනා ඉදිරිපත් වෙනවා නම් අපි ඒවාට විරුද්ධවත් කථා කරන්න ලෑස්තියි. අපි කියන්නේ නැහැ, "අපි අංග සම්පූර්ණ ආණ්ඩුවක්, අපි අංග සම්පූර්ණ රටක් බිහි කළා" කියලා. හැබැයි, සාපේක්ෂ වශයෙන් බලන කොට සියයට 98ක්, 99ක් අපි පිරිසිදු මාර්ගයේ ගිහිල්ලා තිබෙනවා කියන එක මේ රටේ ජනතාවට පෙනෙනවා. අපේ වැරදි සියයට 1ක්, 2ක් වාගේ තිබෙන්න පුළුවන්. හැබැයි, ඔබතුමන්ලා ඒ වැරදි පෙන්වා දුන්නොත්, ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න අපි කැමැතියි. මට ජනාධිපතිතුමා සම්බන්ධයෙන් විශ්වාසයි. මට අගමැතිතුමා සම්බන්ධයෙන් විශ්වාසයි. විශේෂයෙන් අගමැතිතුමා එක්ක අවුරුදු ගණනක් තිස්සේ වැඩ කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් මට එතුමා ගැන විශ්වාසයක් තිබෙනවා. එතුමා එක්ක සටන් කළා, එතුමා වෙනුවෙන් වැඩ කළා. ඒ නිසා එතුමා ගැන මා හොඳට දන්නවා. නීතිය සම්බන්ධයෙන් කියද්දී, මට එතුමා ගැන එක සහතිකයක් දෙන්න පුළුවන්. එනම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ඇතුළු අනෙකුත් කොමිෂන් සභාවල වැඩ කටයුතුවලට ඒ වාගේම අධිකරණයේ වැඩකටයුතුවලට අත ගහන්න එතුමා කිසි විටෙක එතුමාගේ බලතල පාවිච්චි කරන්නේ නැහැ කියන එක.

මා තව නිදසුනක් දෙන්නම්. මා පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වූ අවස්ථාවේදී මට විරුද්ධව අභූත චෝදනාවක් ඉදිරිපත් කළා, හිටපු පොලිස්පතිතුමා සහ යම් නිලධාරීන් පිරිසක් විසින්. මා SSP මහත්මයෙකුට කථා කරලා කිව්වා, "මෙතැන පොලිස් සැරයන්වරයකු බීලා ඉන්නවා. මේ පොලිස්සැරයන්වරයාට විරුද්ධව ක්‍රියාත්මක වෙන්න" කියලා. "අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් අපි කටයුතු කරනවා මන්ත්‍රීතුමා, අපි ASP ටයි, SSP ටයි දැනුම් දීලා තිබෙනවා. ඔබතුමා ඔබතුමාගේ වැඩ ටික කරගෙන යන්න, අපි දැන් පරීක්ෂණයක් කරනවා" කියලා මට සඳහන් කරලා, ඊට පස්සේ දවසේ මට විරුද්ධව B Report එකක් උසාවියට ඉදිරිපත් කළා. මගේ මැතිවරණ ව්‍යාපාරය විශාල ලෙස කඩාකප්පල් කළා. හැබැයි, අද වනතුරු ඒ නඩුව තිබෙනවා. නඩුව ඉවත් කර ගෙන නැහැ. ජනාධිපතිතුමා කාටවත් කථා කළේත් නැහැ. අගමැතිතුමා කාටවත් කථා කළේත් නැහැ. ඒ නඩුව තවමත් ක්‍රියාත්මක වනවා. මා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තහනම් නියෝගයක් ගත්තා, හිටපු පොලිස්පතිතුමාට විරුද්ධවත්, ඒ අදාළ පොලිස් නිලධාරීන්ට විරුද්ධවත්. අද රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ එහෙමයි. හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිතුමියට විරුද්ධව තිබෙන ඉතා සුළු චෝදනාවකට අද අධිචෝදනා පත්‍ර ඉදිරිපත් කරලා තිබෙනවා. ජනාධිපතිතුමා ඒවාට අත ගැහුවාද? අගමැතිතුමා ඒවාට අත ගැහුවාද? නැහැ.

අද වාසුදේව නානායක්කාර මහත්තයාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ එක චෝදනාවක්වත් තිබෙනවාද? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විරුද්ධව චෝදනා ඉදිරිපත් වන්නේත් නැහැ. ඒ ඔබතුමා හොරෙකු නොවන නිසායි. ඔබතුමායි, මමයි දේශපාලන වශයෙන් හැප්පෙනවා. හැබැයි, ඔබතුමා හොරකම් කරලා තිබෙනවාය කියලා කවුරු හරි කිව්වොත්, මම ඒක විශ්වාස කරන්නේත් නැහැ. එහෙම වුණොත්, ඔබතුමා වෙනුවෙන් මම පෙනී සිටිනවා. එහෙම නම්, ඔබතුමාට විරුද්ධව ඔබතුමාම විශාල හඬක් නඟන්නේ ඇයි? ඔබතුමාට විරුද්ධව මේ ස්ථානවල චෝදනා නැත්තේ ඇයි? ඇත්තටම අපට ඔබතුමා විශාල කරදරයක්. හැබැයි, ඔබතුමාට විරුද්ධව කොහේවත් චෝදනාවක් ඉදිරිපත් කරලා නැහැ; චෝදනාවක් ඉදිරිපත් වන්නේත් නැහැ. ඔබතුමාගේ හෘදය සාක්ෂියට එකඟව ඔබතුමා උත්තර දුන්නොත් ඔබතුමා දන්නවා, ඔබතුමාට විරුද්ධව චෝදනාවක් එල්ල වන්නේ නැහැ කියලා. ඒක ඔබතුමාට විශ්වාසයි.

ඒ කාලයේ අධිකරණය ක්‍රියාත්මක වුණු හැටි අපි දන්නවා. සරත් ෆොන්සේකා මහත්තයා කියන්නේ මේ රටේ යුද්ධය අවසන් කළ නායකයායි. එතුමා විරුද්ධ පක්ෂයට ගිහිල්ලා ඡන්දය ඉල්ලුවා කියලා එතුමාට විරුද්ධව චෝදනා හතරක් ගොනු කරලා බෙල්ලෙන් අල්ලා ගෙන ගිහිල්ලා හිරගෙදරට දැම්මා. ජම්පර් ගහගෙන එතුමා අවුරුදු හතරක් හිරගෙදර සිටියා. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ හෘදය සාක්ෂියට එකඟව බැලුවොත් ඔබතුමාත් මේ පිළිබඳව දන්නවා. සරත් ෆොන්සේකා මහතාට විරුද්ධව එල්ල කළ චෝදනා හතර මොනවාද කියලා එක මන්ත්‍රීවරයෙකුගෙන් ඇහුවත් කාටවත් කියා ගන්න බැහැ. මේ අය අද රට ජාතිය ගැන කථා කරනවා. රණ විරුවන් ගැන කථා කරනවා. සරත් ෆොන්සේකා මහතාව බලන්න මම පස්-හය වතාවක් හිරගෙදරට ගියා. එහෙම රටකයි අපි ජීවත් වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ක්‍රියාත්මක වූ ත්‍රස්තවාදය සහ රාජපක්ෂවරු මේ රටේ ක්‍රියාත්මක කළ ත්‍රස්තවාදය ගැන අප සියලු දෙනාම දන්නවා. ඊට විරුද්ධව අපි සටන් කළා. හොරකම, ජඩකම, මැරකම මේ රටේ රජ කළා. අද අපි ඒ සියල්ල අවසන් කරලා තිබෙනවා. ඒ හින්දා ඉදිරි අනාගතය වෙනුවෙන් මේ කොමිෂන් සභා අපි ශක්තිමත් කරනවා. අපි හැම දාම ආණ්ඩු පක්ෂයේ නොසිටින්න පුළුවන්. හැබැයි, අපි භය නැහැ. කොමිෂන් සභා, අධිකරණය කියන සියල්ලටම රට තුළ ස්වාධීනව කටයුතු කරන්න අවශ්‍ය කරන හැම දේම අපි කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාසුදේව නානායක්කාර මැතිතුමනි, සුළු සුළු අඩු පාඩු තිබෙන්න පුළුවන්. එහෙම තිබෙනවා නම්, අපට ඒවා ඉදිරිපත් කරන්න. අනිවාර්යයෙන්ම අපි ඒ සම්බන්ධයෙන් කථා කරනවා.

විශේෂයෙන්ම ඔබතුමාට අපැහැදිලි, ඒ වාගේම ඔබතුමන්ලා සෑහීමට පත් නොවන අධිකරණ තීන්දු තිබෙනවා නම්, ඔබතුමන්ලා ඒවා විවේචනය කරන්න. ඒවා විවේචනය කිරීමේ අයිතිය දැන් තිබෙනවා. කලින් එස්.බී. දිසානායක මහත්තයාට කළා වාගේ ගිහිල්ලා ඇදලා දමන්න බැහැ. අධිකරණයට අපහාස කරන්න බැහැ. හැබැයි, අධිකරණයේ තීන්දු විවේචනය කරන්න පුළුවන්. අද අපි මේක ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒක ඔබතුමා පටන් ගන්න. යම් තීන්දුවක් තිබෙනවා. ඔබතුමා හිතනවා නම්, ඒ තීන්දුව වැරදියි කියලා ඒ සම්බන්ධයෙන් කරුණු දක්වා ඒක ඔබතුමා විවේචනය කරන්න. ඒ සම්බන්ධයෙන් මමත් ඔබතුමාට සහාය දෙනවා. අධිකරණයට අපහාස කළා කියලා ඊට එරෙහිව අධිකරණයට කටයුතු කරන්න බැහැ. ඒවා මේ රටේ කවුරුවත් දන්නේ නැහැ. අධිකරණය ගැන කථා කරන්න භයයි. හැබැයි, එහෙම දෙයක් තිබෙනවා නම්, ඔබතුමන්ලාට කථා කරන්න අයිතිවාසිකම් තිබෙනවා.

[ගරු සුජීව සේනසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිල්රුක්ෂි වික්‍රමසිංහ මැතිතුමිය සම්බන්ධයෙන් මම සහතිකයක් දෙනවා. එතුමිය නිර්භීත වාගේම, පිරිසිදු කාන්තාවක්. කවුද කිව්වා, "එතුමිය අගමැතිතුමාගේ නෑයෙක්" කියලා. එතුමියට "වික්‍රමසිංහ" කියලා වාසගම තිබුණාට එතුමිය අගමැතිතුමාගේ නෑයෙක් නොවෙයි. හැබැයි, අගමැතිතුමා එතුමිය හඳුනනවා. එතුමා මේ රටේ සිටින සියලුම නීතිඥවරු වාගේ හඳුනනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා සම්බන්ධයෙන්, ඒ වාගේම අගමැතිතුමා සම්බන්ධයෙන් අපි දන්නවා. එතුමන්ලා නීතිය, යහ පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, විනිවිදභාවය අගය කරන නායකයෝ දෙදෙනෙක්. කිසිම අවස්ථාවක කිසි කෙනෙකුගෙන් පළි ගන්න, කවුරුවත් අමාරුවේ දමන්න, ඒ වාගේම කවුරුවත් බේරන්න නීති අංශවලට හෝ අනෙකුත් අංශවලට එතුමන්ලා කථා කරන්නේ නැහැ කියන සහතිකය මම එතුමන්ලා දෙදෙනා වෙනුවෙන් දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන මීට වඩා පිරිසක් සිටියා නම් මම සන්තෝෂ වනවා. මොකද, මේ කොමිෂන් සභා ටික අපි ඇති කර ගත්තේ ඉතාමත් අමාරුවෙන්. අද රටේ රාජ්‍ය නිලධාරීන්, පොලීසියේ නිලධාරීන් කියන ඒ සියලු දෙනාට කොන්ද කෙළින් තියාගෙන දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව නිදහසේ කටයුතු කරන්න පුළුවන් වාතාවරණයක් අපි ඉදිරි අනාගතය වෙනුවෙන් ඇති කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි.

[අ.භා. 3.21]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම අද ඉදිරිපත් වී තිබෙන යෝජනාවට පරිබාහිරව, නමුත් අදාළව යම් කරුණු කීපයක් සඳහන් කරන්න මම කැමැතියි.

දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළා වාගේම, දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න අවශ්‍ය තුනෙන් දෙකේ බලය දුන්නේ අපයි කියන එක සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා පිළිගත යුතුයි. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන ඔබතුමන්ලාගේ පැත්තෙන් ආ යෝජනාව තුනෙන් දෙකේ බලයකින් සම්මත කරන්නට සහාය වූ "අපි" ඒකේ අයිතිකාරයෝ හැටියටයි අපි සලකන්නේ. නමුත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි අදහස් කරපු ස්වාධීන කොමිෂන් සභාවල තිබෙන්නේ පිට කවරය විතරයි. ඇතුළත ස්වාධීනත්වයක් නැහැ. මම මේ කියන්නේ සිවිල් සමාජයෙන් පත් කරනු ලැබූ තුන්දෙනා ගැන නොවෙයි. සිවිල් සමාජයෙන් පත් කරනු ලැබූ පුද්ගලයන් තුන්දෙනා පසෙක තිබියදී, මේ ආණ්ඩුවේ ඇමතිවරුන් විධායක බලය තබාගෙන පත් වෙලා ඉන්නවා. මේක කරන්න එපා කියා අපි කිව්වා. මොකද, විධායක බලය හසුරුවන කෙනෙකු ව්‍යවස්ථා මණ්ඩලයට පත් වෙනකොට ව්‍යවස්ථා මණ්ඩලයේ යම් යම් තීරණවලට බලපෑ හැකි සම්බන්ධතාවක් ඒ තුළින් හට ගන්නවා. නමුත් ඒ කියපු දේවල් ඇහුවේ නැහැ. සංශෝධනයේ තිබෙන්නේ "මන්ත්‍රීවරු" කියලායි. නමුත් ආණ්ඩුවේ තිබෙන බහුතර බලය බලහත්කාරය හැටියට පාවිච්චි කරලා "ඇමතිවරුන්ටත් පුළුවන්" කියා ඒක අර්ථකථනය කර ගත්තා. ප්‍රතිඵලය වුණේ මොකක්ද?

රණවක ඇමතිතුමා හදිසි අනතුරක් පිළිබඳව වන සිද්ධියක් සම්බන්ධයෙන් සැකයට භාජන වී සිටියා. ඒ සිද්ධිය තුළින් මම ඒ ගැන කියන්නම්. ඒ වේලාවේ ඒ සම්බන්ධ පරීක්ෂණය භාරව තිබුණේ, පොලීසියේ ඉහළම තලවලටයි. ඒ ඉහළම තලවල උදවිය අතරේ පොලිස්පති ධුරය සඳහා තරගයක් තිබුණා. පොලිස්පති ධුරයට පැමිණිය යුත්තේ කවුද කියා තීන්දු කළේ, මේ සැකකරුවාත් ඇතුළත් මණ්ඩලයයි. ඒ නිසායි මම කියන්නේ ස්වාධීනත්වය පිට කවරය විතරයි කියා. ඇතුළත ස්වභාවය මොකක්ද? ඇමතිවරුන්ගේ විධායක බලය ව්‍යවස්ථා මණ්ඩලය කෙරෙහි බලපෑමක් ඇති කරනවා.

ඊළඟට, මේ පැත්තේ විපක්ෂයන් දෙකක් තිබෙනවා. ඒවා හදා ගත් විපක්ෂයන් දෙකක්. දෙමළ ජාතික සන්ධානයයි, ජනතා විමුක්ති පෙරමුණයි. මේ දේශපාලන සන්දර්භය බෙදී තිබෙනවා, දෙකට. ඒක එන්නේ පසු ගිය ජනාධිපතිවරණයේ සිටයි. ආණ්ඩුවයි, එක්සත් ජාතික පක්ෂයයි, දෙමළ සන්ධානයයි, ජනතා විමුක්ති පෙරමුණයි එක රංවුවක් හැටියට තමයි මේ දේශපාලන බිමේ අද පොර බදන්නේ. ඒ නිසා මේ විධායක මට්ටමේ බලයයි, මේ නිර්මාණය කර ගත් විපක්ෂයයි එකට එකතු කරපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය අද අපට පෙන්වන්නේ, ස්වාධීන කොමිෂන් සභා පත් කරන මණ්ඩලය හැටියටයි. ඒ නිසායි මම මගේ කරුණුවලට එන්න ඉස්සර වෙලා මේ කාරණා ටික කියන්න හිතුවේ. නැත්නම් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ උපාරුව දිගටම කථා කරනවා. මොකද, මේ ව්‍යවස්ථා මණ්ඩලය ඇත්තටම ක්‍රියාත්මක වන ආකාරයත්, එය ක්‍රියාත්මක වන ආකාරය අනුව පත්වෙන කොමිෂන් සභාද ඒ අනුවම ඒ ස්වාධීනත්වයේ ඒ සීමාවන්ට යටත්. මේ ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය මේ සියල්ලම ගැන අපට කථා කරන්න පුළුවන්. නමුත් අන්තර්ගතය ඇත්තටම කොහොමද කියා විභාග කර බලනකොට, ඒක ආණ්ඩුවේ වුවමනාව ඉටු කරන අතකොළුවක් කියලා අපට පෙනී යනවා නම්, අපට ඒවායේ තිබෙන ස්වාධීනත්වයේ සළුපිළි ගලවා පෙන්වන්නත් පුළුවන්.

ඊළඟට මම කැමැතියි, අද ඉදිරිපත් කර තිබෙන යෝජනාවට එන්න. ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා 2016.04.06 වෙනිදා සභාව කල් තැබීමේ යෝජනාව ගැන කථා කරමින් දිග ලැයිස්තුවක් දුන්නා: මෙන්න ලිපි ගොනු අංකය, මෙන්න පුද්ගලයාගේ නම, මේ ගොල්ලන්ට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පැමිණිලි තිබෙනවා, මේවාට තවම විභාගයක් වෙලා නැහැ කියලා. එතකොට ආණ්ඩුවෙන් අපට ලැබුණ උත්තරය මොකක්ද? ආණ්ඩුවෙන් අපට ලැබුණ උත්තරය තමයි, "මේවා පරණ පැමිණිලි, තමුන්නාන්සේලා අවුරුදු 10ක් ආණ්ඩු පාලනයේ හිටියා, ඇයි, මේවා ගැන තමුන්නාන්සේලා මොකුත් කළේ නැත්තේ?" කියන එක. හොඳයි, ඒ වරද අපි බාරගන්නම්. ඒ තමයි මේවා පිළිබඳ කිසිවක් නොකිරීමේ වරද. තමුන්නාන්සේලාගේ ආචාර්ය විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කිව්වා, මේ අවුරුද්දේ මේ ආණ්ඩුව ආවාට පස්සේ චිතරක් අල්ලස් හෝ දූෂණ සම්බන්ධයෙන් පැමිණිලි එක්දහස් ගණනක් තිබෙනවා කියලා. ඊට පෙර පැමිණිලි නවදහස් ගණනක් තිබුණා. ඒ ලැයිස්තුවෙන්, "මෙන්න මන්ත්‍රීවරු, මෙන්න ඇමතිවරු, මෙන්න ආණ්ඩු පක්ෂයේ ඉන්න අය, මෙන්න විපක්ෂයේ ඉන්න අය, මෙන්න ඒගොල්ලන්ගේ නම් ටික" කියන කාරණා අපි හෙළිදරව් කර ගත්තා. අඩු ගණනේ එතැනින් පටන් ගනිමු.

ගරු වි.ජ.මු ලොකුබණ්ඩාර හිටපු කථානායකතුමා මූලාසනයේ හිටපු කාලයේ 'කෝප්' එකේ ඉල්ලීමක් හා යෝජනාවක් අනුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට එතුමා නියම කළා, විටින් විට ප්‍රගති වාර්තාවක් දෙන්න කියලා. මම හිතන්නේ ඒ මාස තුනකට වරක්. නමුත් ඒ ප්‍රගති වාර්තාව ආවේ නැහැ. හොඳයි, ඒ එදා. මෙදා අඩු ගණනේ මේ කියන්නා වූ ශුද්ධවන්තභාවයේ ඇත්තක් තිබෙනවා නම්, මේ දේශපාලන දඩයම් තලාව හරියාකාර කොමිෂන් සභාවක් බවට හරවන්න. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු ගණනාවක් අද චෝදනාවන්ට ලක්වෙලා ඉන්නවා. ඒ අය ගැන ගත්තු පරීක්ෂණ

මොනවාද? අර්ජුන් මහේන්ද්‍රන්ට විරුද්ධව කළ පරීක්ෂණ මොනවාද? ඒ වාගේම මමත් පැමිණිල්ලක් කර තිබෙනවා, "මේ අගමැතිතුමා ඒ විශාල බැංකු මගඩියේ උදවුකාරයෙක්" කියලා. ඒ ගැන පරීක්ෂණයක් කිරීම සඳහා උපදෙස් ගැනීමට නීතිපතිතුමාට යොමු කර තිබෙන බව පොලිසිය කිව්වා. නමුත් තවම ඒ උපදෙස් ලැබුණෙත් නැහැ; ඒ පරීක්ෂණය කෙරුණෙත් නැහැ. මෙන්න තමුන්නාන්සේලාගේ ශුද්ධවන්තභාවය. හොඳයි, අපි වැරැදියි; අපි කිලිටි මිනිස්සු; අපි ඔක්කෝම හොරු; අපි ඔක්කෝම තමුන්නාන්සේලා කියන චෝදනාවලට සුදුසු අය! දැන්, ශුද්ධවන්ත තමුන්නාන්සේලාගේ ඇත්ත ක්‍රියා මාර්ගය අපට හෙළි කරන්න. ඒකයි, අපි මේ කරුණු ඉදිරිපත් කළේ. කරුණාකරලා මේවාට උත්තර දෙන්න කියලා.

ඊළඟට, දූෂණ ගැන සොයන්න මේ ළඟදී තමුන්නාන්සේලා කමිටුවක් පත් කරලා තිබුණා. ඒ කමිටුවේ ඉන්නවා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය. දූෂණ ගැන සොයන කමිටුවේ එතුමිය ඉන්නවා. එතුමියට චෝදනා රැසක් තිබෙනවා, දූෂණ සම්බන්ධයෙන්. දූෂණ පිළිබඳව සොයන කමිටුවට තමුන්නාන්සේලා පත් කරන්නේ දූෂණ සම්බන්ධයෙන් චෝදනාවලට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නම් කරපු අයද? මම මේ ටික ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නම්. Water's Edge Case SC (FR) No.352/2007 : She - ඒ කියන්නේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය- was found guilty by the Supreme Court and ordered to pay Rs.3 million to the State as compensation stating that this was a token payment of the real loss to the State of several hundreds of millions. Her personal friend Ronnie Peiris from London was ordered to pay Rs.2 million. The Supreme Court directed the respondent Director-General, Commission to Investigate Allegations of Bribery or Corruption to immediately investigate the entire transaction under the relevant laws.

එහෙම කළාද? දැන් ඉතින් මේ යකඩ ගැහැනිය ආවා. රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමාගේ යකඩ ගැහැනියයි දැන් ඉන්නේ. ඊට පස්සේ මේ යකඩ ගැහැනිය මේ පැමිණිල්ල සම්බන්ධයෙන් මොකක්ද කළේ කියලා මේ සභාවට කියනවාද?

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment and Welfare)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, what is your point of Order?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ හිතාදර, මා ගරු කරන වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට කිසිම අල්ලස් චෝදනාවක් නැහැ, ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ. එතුමාට, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට විරුද්ධව කිසිම අල්ලස් චෝදනාවක් නැහැ. ඔබතුමා කියපු list එකේ ඉන්න අනෙක් අය ගැනත් ඒ යකඩ ගැහැනිය ලවා සොයා බලනවා කියලා පොරොන්දු වෙනවා ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බොහොම ස්තුතියි, ඔබතුමාට. ඔබතුමා අගමැතිවරයා හැටියට ක්‍රියා කරන්න පටන් ගන්නා දවසේදී මට ඔය කථාව භාර ගන්න පුළුවන්.

"අගමැතිවරයාගේ ප්‍රාර්ථනාව මාගේ යුතුකමයි" කියලා හිතන යකඩ ගැහැනියෙක් තමයි මේ වෙලාවේ ඒ කොමිෂන් සභාවේ ඉන්නේ. "Your wish is my duty," කියලා හිතන යකඩ ගැහැනියෙක් තමයි ඉන්නේ. ඒ අය අතරේ තිබෙන හිතවත්කම්, යාළු මිත්‍රකම්, ඒ ගෙවල් දොරවල්වලට යන එන ඒවා, ඒ ගොල්ලන්ගේ කෑම බීම ගැන නොවෙයි මම කථා කරන්නේ. ඒවා ගැන කථා කරන්න තරම් මම පහළට වැටෙන්නේ නැහැ. මම කථා කරන්නේ ක්‍රියා කලාපය ගැනයි.

චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය සම්බන්ධයෙන් තිබෙන ඊළඟ කාරණය බලන්න. ඒ, Lanka Marine Services Limited case එක. ඒකේ මම තමයි පෙත්සම්කරු. The case number is SC (FR) No. 209/2007.

As the President of the Republic, she had signed a Deed of Grant for 8 ½ acres of land within the Port of Colombo and sold for Rs.1,200 million to Lanka Marine Services Limited after it had been taken over by John Keells Holdings Limited. It is stated on the Deed under her signature - I have a photocopy of it - that this money has been received by the Treasury. Receipt of this Rs.1,200 million has been denied by the Treasury in the course of investigations by the Parliamentary Committee on Public Enterprises. Here, too, the Supreme Court had directed the respondent, Chairman of the Bribery Commission, to conduct investigations and prosecutions. The Bribery Commission had subsequently reported to the Supreme Court that they are proceeding with the investigations. They filed the Interim Report with the Supreme Court and the Supreme Court trusted that the proceedings would continue. But, up to date we have heard nothing.

මේ වෙනකල් ඒ ගැන කිසිවක් අපට අහන්න ලැබී නැහැ. අරයාගේ මෙයාගේ පැමිණිලි ගැන නොවෙයි, සුප්‍රීම් උසාවියේ නඩු තීන්දු දෙකක් ගැනයි මම මේ කියන්නේ. සුප්‍රීම් උසාවියේ නඩු තීන්දු දෙකකින් කියා තිබෙනවා, මේ ගැන විභාග කරන්නය කියලා. මම මේ කථා කරන්නේ දිල්රුක්ෂි වික්‍රමසිංහ ගැන නොවෙයි. මම මේ කථා කරන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරිය ගැනයි. කාලය කුමක් වුණත් කාලය අනුව නොවෙයි වගකීම තිබෙන්නේ. වගකීම තිබෙන්නේ රාජකාරිය අනුවයි. මෙතුමියගේ රාජකාරිය නොවෙයිද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට දෙන ලද වාර්තා අනුව, සිදු කරන බව කියූ පරීක්ෂණ කෙළවරකට ගෙන යාම? මෙතුමියද, මේ දූෂණ පිළිබඳ සොයන කමිටුවේ සාමාජිකත්වයට පත් කරලා තිබෙන්නේ? මේක නේද, ක්‍රියා කලාපය? මම ඒකයි කිව්වේ, අපි කථා කරන්නේ කන බොන ඒවා ගැන නොවෙයි, යාළු මිත්‍රකම් ගැන නොවෙයි කියලා. අපි කථා කරන්නේ ක්‍රියා කලාපය ගැනයි. මේ වන විට සියලුම හොරකම්වලට, චෝදනාවලට, අල්ලස් චෝදනාවලට අරගෙන යමින් ඉන්නේ මේ අය.

රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමනි, රාජිත සේනාරත්න ඇමතිතුමාට විරුද්ධව ඔබතුමා පැමිණිල්ලක් දැම්මා.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ඒ ගැන ඔබතුමා එදා ප්‍රකාශයකුත් කළා. ඒ පිළිබඳව ඔබතුමා ගිහිල්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේදීත් ප්‍රකාශයක් කළා. ඒ සම්බන්ධයෙන් එතැනින් එහාට සිදු වුණු දෙයක් ගැන අපි දන්නේ නැහැ. කැඳවීම් කිහිපයක් කළත් රාජීත සේනාරත්න ඇමතිතුමා කොමිසමට ගියේ නැති බව පමණයි අපි දන්නේ. ඒක වැරදි නම්, ඒක එසේ නොවෙයි නම්, එතුමා කොමිසමට ගියා නම් ඒ බව කියන්න. මම එය නිවැරදි කරන්නම්.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳව මම පැමිණිල්ලක් කළා. හඬ පටයකුත් ලබා දුන්නා, රුපියල් ලක්ෂ 50ක් ලබා ගත් බවට, ඔහුගේ ලේකම්වරයා. ඒ ගැන විමර්ශනය කෙරෙමින් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් අවබෝධ කර ගන්න. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඇතුළු වෙන්න ගේට්ටු දෙකක් තිබෙනවා. මාධ්‍යවේදීන් ආවරණය කරන්නේ ඉදිරිපස තිබෙන ගේට්ටුව පමණයි. අපේ ආණ්ඩුවේ ඇමතිවරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඇවිල්ලා, පිටුපස ගේට්ටුවෙන් පැනලා යනවා. ජනතාව ඒක දකින්නේ නැහැ. මා මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා, පිටුපස ගේට්ටුව ළඟත් පොඩ්ඩක් ඉන්නය කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මට ඔය කථාව කියලා වැඩක් නැහැ. ඒක මාධ්‍යවේදින්ට කියන්න. [බාධා කිරීම්] නැහැ, නැහැ. දැන් ඔය කරනවාය කියන විමර්ශනය ගැන මා තමුන්නාන්සේට කියන්නම්. තමුන්නාන්සේ කියන කථාව ඔතැන ඉඳගෙන තමුන්නාන්සේට නොකියා බැහැ. නමුත් ඇත්ත කථාව මොකක්ද? දඩයම් තලාවක් තිබෙනවා. හොඳයි, අපි වැරැදි කළාය කියමු. වැරැදි නොකරපු අයද ඔය පැත්තේ ඔක්කොම ඉන්නේ? අපිත් එක්ක ඉඳලා ඔය පැත්තට ගිය අයගේ නාම ලේඛනය නැද්ද? ඒ වාගේම මේ පරීක්ෂණය, මේ චෝදනාව, මේ සොයා යෑම, මේ කැඳවීම් ඒ අය සම්බන්ධයෙනුත් ඒ වාගේ කෙරෙනවාද? අවංකව කියන්න පුළුවන්ද? ඔබතුමාට අවංකව කියන්න පුළුවන්ද, අමාත්‍යතුමනි? අද වන කොට ඒකාබද්ධ විපක්ෂයේ අපේ උදවියට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන චෝදනාවලට, කැඳවීම්වලට, නඩු දැමීම්වලට සාපේක්ෂව ආණ්ඩු පක්ෂයේ ඉන්න කාටද, චෝදනා එල්ල කරලා, නඩු දමලා, ඒ විධියට ක්‍රියා කරලා තිබෙන්නේ? ඒකයි මගේ අභියෝගය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මා අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මා ඉස්සෙල්ලා කිව්වා වාගේ, අපේ කාලයේ කළේ නැහැ, ඒ නිසා මේ කාලයේ කරන්නේ නැහැයි කියලා මේ රජයට බේරෙන්න බැහැ. තමුන්නාන්සේලා බලයට පැමිණියේ දූෂණය පිටුදකින්නයි; මේ රටේ යහ පාලනය ක්‍රියාත්මක කරන්නයි. එතකොට අර coal tender එක ගැන මොකක්ද කියන්නේ? විගණකාධිපති කියනවා, රුපියල් බිලියන 1.8ක් ඒ ටෙන්ඩර් එකෙන් පාඩුයි කියලා. විගණකාධිපති කියනවා, ශ්‍රී ලංකා මහ බැංකුවේ මගඩියෙන් රුපියල් බිලියන 1.6ක් පාඩුයි කියලා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා විගණකාධිපතිට අභියෝග කරන්න පටන් ගත්තා. විගණකාධිපතිතුමා ඔක්කොම ගණන් මිනුම් බලා තමයි අපට ඉලක්කමක් වුණත් කියන්නේ. එතුමා කියන ඉලක්කම අපට භාර ගන්න වෙනවා නේද? විගණකාධිපතිතුමාගේ විගණනය අපි භාර ගන්නේ නැත්නම් අපි කොහොමද අද Public Accounts Committee එක කරන්නේ? නමුත් COPE එකේ මොකක්ද වුණේ? විගණකාධිපතිතුමාගේ නිගමනයට විරුද්ධව එක්තරා විධියකට විගණකාධිපතිතුමා අඩස්සියට අරගෙන එතුමාව අසීරුතාවට පත් කරන්න උත්සාහ කළා. ඒකයි කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමියට අපි කියනවා, ඒ කොමිසම හරහා මේ පාර්ලිමේන්තුවටයි වග කියන්නේ; මේ පාර්ලිමේන්තුවෙන් තමයි පඩි වැඩි කරන්නේ කියලා. මේ සභාවට නාම ලේඛනයක් දීලා තිබෙනවා; file numbers දීලා තිබෙනවා. අද මා කිව්වා, උසාවියේ නඩු නොමිමර. මේවා ගැන අධ්‍යක්ෂ ජනරාල්තුමිය මොකක්ද කළේ කියා කරුණාකරලා මේ සභාවට කියන්න වෙයි. එසේ කියන තුරු අපට අයිතියක් තිබෙනවා, චෝදනා කරන්න. කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරියට ඉහළින් 3දෙනකු ඉන්නවා. නමුත් ක්‍රියාත්මක වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරියයි. ඒ අධ්‍යක්ෂ ජනරාල්වරිය මේ ආණ්ඩුවේ වුවමනාව අනුව අද දේශපාලන දඩයමක නිරත වනවාය කියන අපේ චෝදනාව නිෂ්ප්‍රභ කරන්න නම්, මා ඉදිරිපත් කළ ඒ ලැයිස්තුව ගැන ගත්ත පියවර පිළිබඳවත්, ඒ සම්බන්ධයෙන් කළ පරීක්ෂණය් ප්‍රගතිය පිළිබඳවත් මේ සභාවට දැන්විය යුතුයි කියා මතක් කරමින්, එසේ වන තුරු එතුමියගේ වැටුප අනුමත කිරීම සඳහා අපේ ඡන්දය දෙන්න බැහැයි කියමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඊළඟට, ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමා.

[අ.භා. 3.39]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Regional Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියට ගෙවිය යුතු වැටුප හා දීමනා අනුමත කිරීමට හා ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරුන්ට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන යෝජනා වෙනුවෙන් මම ද පෙනී සිටිනවා.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණක් ගැන කියන්නට මා මොහොතක් ගන්නවා. එතුමා සඳහන් කළා, දූෂණ ගැන සෙවීම සඳහා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර තිබෙනවා කියලා. ඒක ඔබතුමා වැරදි අවබෝධයකින් කළ ප්‍රකාශයක්. අපේ දැනුමේ හැටියට නම් එවැනි කමිටුවක් පත් කර නැහැ. ඔබතුමාට ඒ ගැන නිවැරදි තොරතුරු තිබෙනවා නම් කරුණාකරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

1994 වර්ෂයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට උපරිම බලතල අනුමත වූවාට පසුව එම කොමිසම නිසියාකාරව ක්‍රියාත්මක වනවා අපි දකින්නේ, 2015 ජනවාරි 08වැනි දායින් පසුවයි. ඊට ඉහත අවුරුදු දහයකදී මෙම කොමිසම තිබුණ වගක්වත් රටවැසියාට තේරුණේ නැහැ. යහපාලනයේ ජවයත් සමඟ එම කොමිසම නිසි ක්‍රියාශීලිත්වයෙන් ක්‍රියාත්මක වනවා අපට පෙනෙනවා.

වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරිය උපරිම කැප වීමෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ වගකීම ක්‍රියාවට නැංවීම නිසා එම කොමිසමේ අවශ්‍යතාව හා වැදගත් බව අපට හා රටට මේ වන විට වැටහී තිබෙනවා. අප රටේ පසු ගිය සමයේ සිදු වූ අප්‍රමාණ දූෂිත ක්‍රියා දාමයන් හා අල්ලස් සංස්කෘතිය නිසා රටට සිදු වුණු පාඩුව ඉතා විශාලයි. [බාධා කිරීම්] මේ පාඩු යථා තත්ත්වයට පත් කරනවා යැයි අපි 2015 ජනවාරි 08වැනි දාට පෙර රටේ ජනතාවට පොරොන්දු වුණා. දැන් ඒ පොරොන්දු ඉෂ්ට කිරීමට කාලය එළඹී තිබෙනවා. රටේ තිබුණු ඒකාධිපති පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වීම, නීතිය අවනීතිය වීම, රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම යන පසු බිම මත ඒවා නිවැරදි කොට රටේ ජීවත් වන සියලුම ජනතාවට සාධාරණය ඉෂ්ට කොට ලොව පිළිගත් ප්‍රජාතන්ත්‍රවාදය හා මානුෂීය අයිතිවාසිකම් ආරක්ෂා වන රටක් බිහි කරන බවට අපි ජනතාවට පොරොන්දු වුණා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර කැලේ සිද්ධ වන සමහර දේවල් ස්වභාව ධර්මයට සම්බන්ධයි. [බාධා කිරීම්] ස්වභාව ධර්මයට සම්බන්ධ ඒ සිද්ධි අතර තිබෙනවා, කැලේට සිංහයා එන කොට කැලේ ඉන්න වඳුරෝ ටික කුලප්පු වන අවස්ථා. [බාධා කිරීම්] කුලප්පු වුණාම වඳුරෝ ටික ගස්වලින් පනිනවා; බිමට වැටෙනවා. රිලවි එහාට මෙහාට දුවනවා. සිංහයාගේ ආක්‍රමණයට භය නිසා වඳුරෝ එහෙම හැසිරුණාට සිංහයාගේ ඇහට ඒක දැනෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උறුප්පිනර්කள්)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப්පට්ටුள්ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කள්)
(The Hon. Deputy Speaker)
Order, please!

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

රට පුරා මුල් බැස ගෙන තිබුණු දූෂණය හරහා රාජ්‍ය මුදල් විශාල වශයෙන් අවභාවිත කිරීම හා වංචා කිරීම පසු ගිය සමයේ රටේ පාලකයා, ඔහුගේ පවුලේ උදව්ය හා ගෝල බාලයින් විසින් නිදහසේ කර ගෙන ගියා. මෙම අගාධයෙන් රට ගොඩ ගැනීමට වර්තමාන රජයට ජනතා වරමක් ලැබී ඇති නිසා ඊට අදාළ පසු බිම සකසා ගෙන අදාළ පරිසරය ගොඩ නහා ගෙන අදාළ රෙගුලාසි හා චක්‍රලේඛ හරහා අපි ඉදිරියට ගමනක් යමින් සිටිනවා. [බාධා කිරීම්] මෙම කරුණ ඉටු කර ගැනීමට මුළු රටේම සේවකයන් වන රාජ්‍ය තන්ත්‍රය -අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, මැති ඇමතිවරුන් හා අයථා පීඩනයෙන් පෙළුණු රාජ්‍ය සේවකයන්- දැන් ක්‍රියා කරමින් සිටිනවා. අගාධයකට ගිය රටක්, සියලුම දේ වැරදි මාර්ගයේ ගිය රටක්, දූෂණය ගැන ජනතාව මුනිවත රැකීමට පුරුදු වූ රටක් නැවත පණ ගන්වා කෙළින් කර ගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක සිට නොයෙක් ආකාරයේ රෙගුලාසි හා නීති - රීති ආදිය සූදානම් කොට ගැනීමට සිදු වුණා. [බාධා කිරීම්] ඒ සඳහා අවශ්‍ය පුද්ගලයන්, කොමිෂන් සභා, කමිටු ආදිය ස්ථාපිත කිරීමට රජයට සිදු වුණා. ඒවා සියල්ල සිදු වන්නේ නීත්‍යානුකූලවයි. නීතිය අතට ගත් ඒකාධිපතියාගෙන් බේරා ගත් රටේ සියල්ල නිවැරදිව, විනිවිදභාවයෙන් සිදු කිරීමට වග බලා ගත යුතුව තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මාර කඩේ යාමක් නේ, මේක.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

අතීතයේ දූෂණයෙන් පිරුණු රටේ අයුතු ප්‍රතිලාභ ලැබූ පාලකයා හා ඔහුගේ හෙංචයියන් නැවත රට අතීතයට ගෙන යෑමට උත්සාහ කරන්නේ ජනතාව නොමඟ යවමින්, රට පුරාම සෑම දේශපාලන මට්ටමකම දූෂිත ගනු-දෙනු කරමින්, බඩ ගෝස්තරය ලබා ගනිමින්, පරණ පුරුදු සුඛ විහරණයෙන් සමහර කොටස් පමණක් හා පවුල් පමණක් සැප විඳීමේ හා රටට සිදු වන හානිය ගැන තඹ දොයිතුවකට මායිම් නොකිරීමේ පුරුද්දට අනුව ජීවිත ගොඩ නහා ගැනීමටයි. [බාධා කිරීම්] මෙම ඛේදවාචකයෙන් රට බේරා ගැනීමට නම් රජය අනුගමනය කරන ස්වාධීන කොමිෂන් සභා ශක්තිමත් කිරීම අපට අවශ්‍ය වනවා.

මා කථා කරනකොට අල්ලස් කාක්කන්ට රිදෙනවා; පගා ගහපු අයට රිදෙනවා; හොරකම් කරපු අයට රිදෙනවා; ඒ අය මර හඬ දෙනවා; ඒ අය සත්තු වාගේ හැසිරෙනවා. [බාධා කිරීම්] ස්වාධීන කොමිෂන් සභාවල සියලුම සාමාජිකයන් -විශේෂයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරිය- වෘත්තීය නිපුණත්වයෙන් හෙබි, වෘත්තීමය වශයෙන් විශාල පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පමණක් නොව සමාජයට ආදර්ශයක් වන, වගකීම් දැරිය හැකි මානුෂිකත්වයෙන් යුත් පුද්ගලයන් වීම රටේ වාසනාවක්.

ඔවුන් දූෂිත ඒකාබද්ධ කල්ලියේ - අල්ලස් කල්ලියේ - සාමාජිකයන් මෙන් රටට හානිකර ගති පැවැතුම් ඇති හා රටට අහිතකර දූෂිත මුදල් ගනු-දෙනුවල නිරතවූවන් නොවේ. රාජකාරියේ ගෞරවය රැක ගැනීමේදී ඔවුන්ට යම්කිසි සමාජ මට්ටමක රැඳෙමින් සේවය කිරීමට සිදු වේ. නොයෙක් පුද්ගලයන්ගේ සරණ පතමින් හෝ යමෙකුගෙන් යැපෙමින් ඔවුන්ගේ වෘත්තීය වගකීම ඉෂ්ට කළ නොහැක. ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට පවා නොයෙක් සමාජ සීමාවල සිට ජීවිතය ගෙවීමට සිදු වේ. රැකියාවක් තෝරා ගැනීමේදී පවා ඔවුන් නොයෙක් සීමා ගැන අවධානයෙන් සිටිය යුතුය. මේ කරුණු අපි සුළුවට නොතැකිය යුතුය. [බාධා කිරීම්]

රණ විරුවන් ගැන කථා කරනවා; රණ විරුවන්ගේ ගෞරවය ගැන කථා කරනවා. හමුදාවේ නිලතලවලට ගරු කරන්නවත් දන්නේ නැති, මේ වාගේ තුට්ටු දෙකේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப්පට්ටුள්ளது]
[Expunged on the order of the Chair.]

[ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

බිරිඳට මිලියන 306ක ඉඩමක් තෑගි දුන්නු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

- මෙතැන බෙල්ල මිරිකලා වාගේ කෑ ගහනවා. [බාධා කිරීම්] අර

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

බෙල්ල මිරිකලා වාගේ මෙතැන කෑ ගහනවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please!

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු චරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)

ඉහත කරුණු ගැන සැලකිල්ලට ගැනීමේදී කොමිෂන් සභාවල සාමාජිකයන් ස්ථාවර ආර්ථික මට්ටමක තැබීම රජයේ වගකීම වනු ඇත. සමාජයේ වගකීම් දරන නොයෙකුත් පුද්ගලයන්ගේ ජීවන මට්ටම ගැනද, පෞද්ගලික අංශයේ නොයෙක් මට්ටමේ තනතුරු දරන්නන්ගේ ජීවන මට්ටම ගැනද සලකා බලා, ඉහත සාමාජිකයන්ට සාධාරණ වැටුප් හා දීමනා ගෙවීම අත්‍යවශ්‍යය. මෙම ක්‍රියාදාමය හරහා ඔවුන්ගේ වගකීම් වඩා ක්‍රියාශීලීව හා සාර්ථකව ඉෂ්ට කිරීමට අවශ්‍ය වාතාවරණය ඔවුන්ට සැලසෙන බැවින් ඉහත වැටුප් හා දීමනා ගෙවීම ගරු පාර්ලිමේන්තුව ගෞරවාන්විතව අනුමත කිරීම යෙහෙකි යැයි මා මෙහිදී ප්‍රකාශ කිරීමට කැමැතියි.

පැවතුණු දූෂිත පරිසරයට නැවතත් රට ගෙන යෑමට ඉඩ දිය නොහැකිය. [බාධා කිරීමක්] මේ වනවිට රටේ දේශපාලන වපසරියේත්, පාර්ලිමේන්තුව තුළත් අප දකින්නේ දූෂිත පාලනය හා ගෝල බාලයන් බල ලෝභයෙන් නැවත හිස එසැවීමට දරන උත්සාහයකි. තණ්හාව උතුරා යයි. තණ්හාව උතුරා යනවා යැයි කිව්වාම මට අමරදේවගේ සින්දුවක් මතක් වෙනවා. [බාධා කිරීම්] ඒ, සින්දුව අහගන්න. [බාධා කිරීම්] ඒ සින්දුවේ මෙහෙම කියනවා.

"තණ්හා ආශා ඔලගු කරේ ලා
මහ තොට නොබලා වගතුග නොසොයා
එළිය දකින්නද මේ යන්නේ
සැපත සොයන්නද මේ යන්නේ
කතරේ ..... ගිනිගත් වැලි කතරේ"

හොඳට අහගන්න. [බාධා කිරීම්]

ඔවුන් රට පුරාම ගෙන ගිය දූෂිත සංකල්පනාවලින් රට මුදවා ගත් අපි, දැන් රට හරි මාර්ගයට ගෙන යෑමට මහා ශක්තියක් ලෙස ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා ගත්තෙමු. ඒ අමිහිරි අතීතයට නැවත හිස එසවීමට නොදී ස්ථාවර රටක් ඉදිරියට ගෙන යෑමට අත්‍යවශ්‍ය අංශයක් වන්නේ ස්වාධීන කොමිෂන් සභාවල පැවැත්මයි. සතුරා අවතක්සේරු නොකළ යුතුය. සතුරාගේ අතීතයේ හැසිරීම අමතක නොකළ යුතුය. කොටියාට ලේ රහ වැටුණු පසු මිනී මස් කෑම අත් නොහරී. එමෙන් රාජපක්ෂ පාලනය පවුල් පිටින් එකතු වී ඒ දූෂිත ගනු-දෙනුවලින් විශාල ධනස්කන්ධයක් උපයා ගත්තේය.

සමහර විට ඒවායේ බරපතළකම විශ්වාස කිරීම පවා දුෂ්කරය. හොරකම් කරපු අය මේ දවස්වල උසාවියට බඩගානවා. හොරකම් කරපු අය දැන් මාංචු දමාගෙන ඉන්නවා. සමහර අයගේ මල්ලිලා උසාවියේ, සමහර අයගේ ඥාතීන් උසාවියේ. නායකයාත් උසාවියේ. මේ දවස්වල හිරේට බඩගානවා හැර මේ කල්ලියට වෙන කිසිම වග කීමක් නැහැ. රටේ ජනතාව වෙනුවෙන් කිසිම දෙයක් කරන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී පොදුවේ අපි කාට-කාටත් චෝදනා කර ගන්න පුළුවන්. නමුත්, මේ සභාවේ ගරු මන්ත්‍රීවරයකු ඉලක්ක කරලා හොරකමක් ගැන චෝදනාවක් කරන්න පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව අවසරයක් නැහැ. එහෙම නම් ඒ සඳහා Motion එකක් ගෙනෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නමක් සඳහන් කළේ නැහැ නේ. ඔබතුමා ගැන කිව්වාද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
"රාජපක්ෂවරු" කියලා කිව්වා. "රාජපක්ෂවරු" කියලා කියමින් මේ පැත්තට ඇඟිල්ල දිගු කරන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
එතුමා මේ වෙලාවේ මේ ස්ථානයේ නැහැ නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මන්ත්‍රීවරුන්ගේ නම් කියලා චෝදනා නොකර, පොදුවේ චෝදනා කරන්න අයිතිය තිබෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු චරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
මේ අයට විරුද්ධව නඩු තිබෙනවා කියන එකයි අපි කියන්නේ. නඩු තිබෙනවා කියන එක යථාර්ථයක්. රටේ සිදු වන දෙයක් ගැන කියන්න අපට අවකාශ තිබෙනවා. [බාධා කිරීම්] රාජපක්ෂ පවුලේ ප්‍රධානියා ඉතා සූක්ෂ්මව දූෂිත ගනු - දෙනු ගෙන ගියත්, මෙතෙක් ඔහුගේ දූෂිත ගනු - දෙනුවලට ඇති සම්බන්ධය කෙළින්ම හෙළිවී නැතත්, ඒවා පසු පසු අනිවාර්යයෙන්ම ඔහු සිටියේය. නැත්නම් ඔහුගේ බිරිඳ, දරුවන්, සහෝදරයන්, ළඟම හිතවතුන්, ඔහුගේ කාර්ය මණ්ඩලය, මේ හෙන්චයියන් රුපියල් කෝටි ගණන් හොරකම් කරන විට, මිනී මරන විට, මුදල් අවභාවිත කරන විට ඔහු නිදාගෙන සිටියාද?

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද ලසන්ත මැරුවේ?

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ட් மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගෝඨාභය රාජපක්ෂ. වෙන කවුද? ගෝඨාභය තමයි මැරුවේ. ඒක අනිවාර්යයයි. [බාධා කිරීම්] දැනට හෙළි වී තිබෙන සියයට 30ක් පමණවත් නොවූ පහත සඳහන් දූෂිත ගනු - දෙනු රාජපක්ෂ සමාගමේ හා හෙන්චයියන්ගේ දූෂිත ගනු - දෙනුවලින් කොටසකි. [බාධා කිරීම්] ගෝඨාභය රාජපක්ෂ. "අපි වෙනුවෙන් අපි" ගිණුමේ රුපියල් ලක්ෂ 45,000ක් යොදා කළ වැඩක් නැත. ගිණුම් පරීක්ෂණ පවත්වා නැත. ඔහු UDA එකේ හා නාවික හමුදාවේ මුදල් රුපියල් ලක්ෂ 910ක් දෙමවුපියන්ගේ සොහොන සෑදීමට වංචනික ලෙස යෙදවීය. ලංකා හොස්පිටල් ව්‍යාපාරයේ සභාපතිවරයා ලෙස ගෝලයන් සමඟ එක්වී රුපියල් ලක්ෂ 6,000ක් වංචා කළේය. ඇවන්ට් ගාර්ඩ් සමාගම හා එක්ව රුපියල් 111,000ක් රටට අහිමි කළේය. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමා, දැන් කථාව අවසන් කරන්න.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ட් மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඇවන්ට් ගාර්ඩ් සමාගම එක්ක ගනු - දෙනු කළ කෙනෙක් මේ පැත්තේත් ඉන්නවා. එයාට මම කියන්නේ "නාට්ටාමියා" කියලා. ඔහුගේ අන්තිම පින්තූරයත් මට ලැබිලා තිබෙනවා. ඔහු ඇවන්ට් ගාර්ඩ් සභාපතිවරයා එක්ක ඇමෙරිකාවෙදී ගත් පින්තූර මම ගිය සැරේ පෙන්නුවා. මෙවර මම පෙන්වනවා, ඔහු ඇවන්ට් ගාර්ඩ් සභාපති සමඟ ලංකාවේදී ගත් පින්තූරයක්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කෝ, පෙනෙන්නේ නැහැ නේ.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ட් மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
මෙතුමා මොකටද කෑ ගහන්නේ?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ ගරු මන්ත්‍රීවරයෙකුට, ඒ කියන්නේ අධිකරණ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා ඉලක්ක කොටගෙන මෙතුමා "නාට්ටාමි" කියලා කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා නමක් සඳහන් කළේ නැහැ නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මහත්මයාට එහෙම කියන එක වැරැදියි. එතුමාට එහෙම කියන එක වැරැදියි. එතුමාට නොවෙයිද කිව්වේ? එතුමාට නොවෙයිද කිව්වේ?

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ட් மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
තමුන්නාන්සේ තමයි නම පාවිච්චි කළේ. තමුන්නාන්සේ අනෙක් කොණෙන් කථා කරනවා. වාඩි වෙන්න, වාඩි වෙන්න. [බාධා කිරීම්]

පහත සඳහන් දූෂිත ගනු - දෙනු දැනට හෙළි වී තිබෙනවා. ඇවන්ට් ගාර්ඩ් එක්ක රුපියල් 111,000ක් රටට අහිමි කළේය. ඔහු සහ ඇවන්ට් ගාර්ඩ් හොරා ආරක්ෂා කිරීමට ඉදිරිපත් වූ ඇවන්ට් ගාර්ඩ් හෙන්චයියන් ලංකාවේදී ගත් පින්තූරයක් මම ඉදිරිපත් කළේය. යුද සමයේදී හමුදාවට ගත් අවි ආයුධවල මිල හතර ගුණයකින් පමණ වැඩි කරමින් බිල් ගෙවා විශාල මුදලක් වංචා කළේය. මිග් ගුවන් යානා ගනු - දෙනුවේදී ගුවන් යානා 4කින් ඇමෙරිකානු ඩොලර් මිලියන 7 බැගින් ඩොලර් මිලියන 28ක් - රුපියල් ලක්ෂ 42,000ක් - වංචා කළේය. මෙම පරීක්ෂණ දැනට සිදුවෙමින් පවතිනවා. දැනට සිදු වෙමින් පවතින පරීක්ෂණ ගැන අපට කථා කරන්න පුළුවන්.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
අංකය කියන්න. ස්ථාවර නියෝගයේ අංකය කියන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
එතුමා මේ සභාවට පින්තූරයක් ඉදිරිපත් කළා. එය සභාගත කරන්න කියලා කියනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ட් மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ඒක කරනවා. භය වෙන්න එපා. [බාධා කිරීම්] මරහඬ දෙන්න එපා, ඒක කරනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
අනිවාර්යයෙන්ම කරන්න. භය වෙන්න එපා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ඡායාරූපය **සභාගත*** කරනවා. [බාධා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

යෝෂිත රාජපක්ෂගේ මිත්තණිය සහ ශිරන්ති රාජපක්ෂගේ මව වන ඩෙසි ආච්චිත් එක්ක එකතු වෙලා ගල්කිස්සේ ඉඩම් ගනු - දෙනුවකින් - [බාධා කිරීමක්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා point of Order එකක් ඉදිරිපත් කරනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාගේ කථාවේ දී නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ නම සඳහන් කරමින් කිසි යම් වංචාකාරී ගනු - දෙනුවක් ගැන මේ ගරු සභාවට කිව්වා. [බාධා කිරීමක්] ඉන්න, කියන්නම්. ඒවා ගරු අධිකරණය ඉදිරියේ දැනටත් විභාගයට ලක් වෙමින් තිබෙන කාරණා. මෙතැන මෙතුමාට නඩු අහලා තීරණ දෙන්න බැහැ. මේ කොහේ ඉන්න වෙල්විදානේ කෙනෙක්ද? මේක හමුදාව නොවෙයි, මේක පාර්ලිමේන්තුව. අධිකරණයේ විභාගයට ලක් වෙන - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සරත් ෆොන්සේකා මැතිතුමනි, මේ වේලාවේ ඔබතුමා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ නම සඳහන් කරමින් යම් ප්‍රකාශයක් කළා. එතුමා මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයෙක්. ඔහු පිළිබඳව පරීක්ෂණයට ලක් වෙලා තිබෙන කාරණාවක් සම්බන්ධයෙන් යම් කිසිවක් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් දෙන්න බැහැ. ඒ වාගේම එය - [බාධා කිරීම්]

Order, please! ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරපු කරුණු හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මා නියෝග කරනවා. [බාධා කිරීම්] ගරු ඇමතිතුමාට ලබා දී ඇති කාලය අවසානයි. [බාධා කිරීම්]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ ගැන අදහස් ප්‍රකාශ කළේ නැහැ. අපි කිව්වේ දැනට තිබෙන තත්ත්වය ගැනයි. ඒ අයට එම තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇත්ත කිව්වාම, ඔබතුමා ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න එපා. [බාධා කිරීම්] යෝෂිත රාජපක්ෂගේ මිත්තණිය හා ශිරන්ති රාජපක්ෂගේ මව වන ඩෙසි නමැත්තිය ගල්කිස්සේ ඉඩම් ගනු - දෙනුවකින් - [බාධා කිරීමක්] මගේ වෙලාව කනවා. ඒ නිසා ඔබතුමා මට වෙලාව ලබා දෙන්න. මගේ වෙලාව ගන්නවා නම්, මට එම වෙලාව ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට ලබා දුන් කාලයට අමතරව තව විනාඩි තුනහමාරක් කථා කරලා තිබෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
යෝෂිත රාජපක්ෂගේ මිත්තණිය වන ශිරන්ති රාජපක්ෂගේ මව ගල්කිස්සේ ඉඩම් ගනු - දෙනුවකින් රුපියල් ලක්ෂ 500ක් වංචා කොට අත් අඩංගුවට පත්වුණා.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Sir, the Hon. Member is misleading the House by stating that he was jailed, but he was in remand prison. Sir, he must understand the difference between the jail sentence and the remand prison. හිරේ ගියා කියන එකෙයි, රිමාන්ඩ් භාරයේ සිටියා කියන එකෙයි වෙනස තේරුම් ගන්න බැහැ.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රකාශ කළේ අත් අඩංගුවට පත් වුණා කියලායි. අත් අඩංගුවට පත් වුණා කියන්නේ, සිර දඬුවම් විඳිනවා නොවෙයි. [බාධා කිරීම්] සිංහල දන්නේත් නැහැ; ඉංග්‍රීසි දන්නේත් නැහැ.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
අත් අඩංගුවට පත් වුණා කියලායි කිව්වේ. [බාධා කිරීම්]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
සිංහල දන්නේත් නැහැ. අර බැල්කනියට ගිහිල්ලා පනිනවා. [බාධා කිරීම්]

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්තිම කමකේ)
(The Hon. Chandima Gamage)
අත් අඩංගුවට පත් වුණා කියලායි කිව්වේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමාට ලබා දුන් කාලය දැන් අවසාන වෙලා තිබෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
මට තව විනාඩි පහක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ නාස්ති කරන වෙලාව වෙනුවෙන් මට වෙලාව ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Okay. You may go ahead.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
මම කිව්වේ, අත් අඩංගුවට පත් වුණා කියලා මිසක්, සිරගත කළා කියලා නොවෙයි. සිංහල දන්නේත් නැහැ; ඉංග්‍රීසි දන්නේත් නැහැ. [බාධා කිරීම්] යෝෂිත රාජපක්ෂගේ මිත්තණිය වන ශිරන්ති රාජපක්ෂගේ මව අත් අඩංගුවට පත් වුණා. [බාධා කිරීම්] ශිරන්ති රාජපක්ෂ රුපියල් ලක්ෂ 500කට අධික වටිනාකමක් ඇති රජයේ ඉඩමක් කාල්ටන් පෙර පාසල් ව්‍යාපෘතිය සඳහා වංචනිකව ලබා ගෙන තිබෙනවා. ඒවාට චෝදනා එල්ල වී තිබෙනවා.

බැසිල් රාජපක්ෂ තරගයේ වීරයා. ඔහු "දිවි නැහුම" මුදල්වලින් වංචා කොට ඇති මුදල රුපියල් ලක්ෂ 29,920යි. ඔහුත් අත් අඩංගුවට පත්වුණා. බැසිල් රාජපක්ෂගේ මල්වානේ සහ මාතර ඉඩම් ගනු - දෙනු රුපියල් ලක්ෂ 1,000 ඉක්මවා ගොස් තිබෙනවා. මොහුගේ බිරිඳට විරුද්ධවත් දූෂිත ගනු - දෙනු චෝදනා එල්ල වී තිබෙනවා.

ඊළඟට, විමල් වීරවංශ මන්ත්‍රීතුමා ඉතා හොඳින් ක්‍රීඩා කොට තිබෙනවා. ඔහුගේ බිරිඳට රුපියල් ලක්ෂ 300කට අධික වටිනාකමින් යුත් ඉඩමක් අයථා ලෙස ත්‍යාග වශයෙන් ලබා දී තිබෙනවා. කෝටිපතියා. ඒ කාලයේ ආ ගිය අතක් නැතිව හිටියා. කොහෙන් සල්ලි ආවාද? මෙතුමා කොහෙන් ආවාද? ආතක්-පාතක් නැහැ. බිරිඳට රුපියල් මිලියන 300ක ඉඩමක් තෑගි හම්බ වෙලා තිබෙනවා. [බාධා කිරීම්] මීළඟට, ඉතා දක්ෂ ලෙස වැඩ පෙන්වයි, ජොන්ස්ටන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා - [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරමින් අසත්‍ය ප්‍රකාශයක් කළා; අවලාදයක් කළා. කරුණාකරලා ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ එක්කම මම මේ වෙල් විදානේට කියනවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකර්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කියලා. [බාධා කිරීම්]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
ඒ මොකක්ද ඒ? [බාධා කිරීම්] ඒවා තේරෙන්නේ එතුමාටම විතරයි. [බාධා කිරීම්] ඒ කියපුවා තේරෙන්නේ එතුමාට විතරයි. මම කිව්වේ ඒ අයට චෝදනා තිබෙනවා, පරීක්ෂණ පැවැත්වෙනවා කියලායි. [බාධා කිරීම්]

මීළඟට, ඉතා දක්ෂ ලෙස වැඩ පෙන්වා ඇති- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි ඔබතුමාට විරුද්ධව යමක් කිව්වාම ඒක ප්‍රතික්ෂේප කරලා ප්‍රකාශයක් කිරීමේ අයිතිය ඔබතුමාට තිබෙනවා. ඊට පසුව එතුමා කියපු කාරණයට පිළිතුරු දීමේ අයිතිය ඔබතුමාට තිබෙනවා. ඉස්සෙල්ලාම ඒක ප්‍රකාශ කරන්න. මට එතුමා කළ ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නට පුළුවන් වන්නේ එතුමා කළ ප්‍රකාශයේ වැරැදි, නිවැරදි භාවය සලකා බැලීමෙන් පසුවයි. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට හිතෙන්නේ -

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඔරුවර්)
(An Hon. Member)
"පාස්පෝට්".

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(පීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)
"පාස්පෝට්" කිව්වාම වචන හිර වෙනවා. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකර්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

තේරෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටවත් මගේ බිරිඳටවත් ඔය කියන විධියේ පරීක්ෂණයක් නැහැ. මේ කියන්නේ පට්ට පල් බොරුවක්. මේ අවලාද නඟන්නට කියන කථා. ඒ නිසා කරුණාකරලා මේ සභාවේ අසත්‍ය දේවල් වපුරන්නට එපා. හයිකොප් නඩුව ගැන අපි කථා කළේ නැහැ.

[ගරු විමල් වීරවංශ මහතා]

ධනුන තිලකරත්න ගහපු ගැහිල්ල ගැන අපි කථා කළේ නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේ යුද්ධය පාවා දීම ගැන අපි කථා කළේ නැහැ. [බාධා කිරීම්] මේ රටම පාවා දුන්නා. "සුදු කොඩි ඉස්සුවා" කියලා මුළු රටම, හමුදාවම පාවා දීලා රනිල්ගෙන් හම්බ වුණු ඇමති කට්ට අරගෙන මෙච්චර කඩේ යන්නේ මොකද මනුස්සයෝ? [බාධා කිරීම්]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)

අපි රට පාවා දුන්නේ නැහැ, අපි රට බේරා ගත්තා. තමුන්නාන්සේ ගල්කටස් එකක් රෙද්ද අස්සේ දමා ගෙන පඳුරු අස්සේ රිංග රිංගා ඉන්න කොට අපි නිල ඇඳුමක් ඇඳගෙන ගෞරවාන්විතව රට බේරා ගත්තා. [බාධා කිරීම්] මෙයා ගල්කටස්කාරයා. [බාධා කිරීම්] මෙවුන්ට කෙළෙහි ගුණ නැහැ. [බාධා කිරීම්] කෙළෙහි ගුණ දන්නෙත් නැහැ; රටට මොනවාද වුණේ දන්නෙත් නැහැ; හමුදාවක් තිබුණාද දන්නෙත් නැහැ. මේ වාගේ ආතක් පාතක් නැති මිනිස්සු කවදාවත් රටට සේවයක් කළේ නැහැ.

තවත්, මුදල් හිහාකන දේශප්‍රේමියකු ලක්ෂ 1,000කට අධික මුදල් වංචාවකට සිරගත වුණා. එම දේශප්‍රේමියා පසු ගිය කාලයේ රුපියල් 100 ගණනේ හිහා කෑවා. ඔහුවත් ලක්ෂ 1,000කට අධික මුදල් වංචාවකට පසු ගිය දවස්වල අත් අඩංගුවට ගත්තා.

තවත්, ඒකාබද්ධ කල්ලියේ පුද්ගලයකු වූ අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ වන විට මාංචු දමාගෙන, බකන්නිලාගෙන සිටිනවා. [බාධා කිරීම්] එම කල්ලියේම පුද්ගලයකු වන රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාද පෝලිමේ සිටිනවා. [බාධා කිරීම්] මේ සියලු දෙනාට ඒකාබද්ධ අල්ලස් කල්ලියේ - [බාධා කිරීම්]

මේ ආකාරයට බැලූ විට ස්වාධීන කොමිෂන් සභාවලටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් ඉදිරියේදී විශාල කාර්ය භාරයක් කිරීමට සිදු වෙන බව මැනවින් පෙනී යයි. මෙම තත්ත්වය තවත් උග්‍ර වන්නේ තවමත් නීති ක්ෂේත්‍රයේ දූෂිතයන් රාජපක්ෂ චින්තනයට අනුව ක්‍රියා කිරීමට වෙර දරන නිසායි. රාජපක්ෂ පාලනයේ දූෂිත ගැත්තන් නීති ක්ෂේත්‍රයේ ඉහළ තැන්වල බලපතියන් කළා. දුමින්ද සිල්වාගේ නඩු තීන්දුවේදී එක් විනිසුරුවරයෙක්-

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(මාණ්පුමිකු මොහාන් පිරියතර්ෂන ත සිල්වා)
(The Hon. Mohan Priyadarshana De Silva)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(මාණ්පුමිකු මොහාන් පිරියතර්ෂන ත සිල්වා)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු සරත් ෆොන්සේකා අමාත්‍යතුමා කථා කරන සියලුම දේවල් මේ වන විට ගරු අධිකරණය ඉදිරියේ විනිශ්චයට භාජනය වන කාරණා. ඒ එක කාරණයක් ගැනවත් ස්ථාවර නියෝග අනුව මේ ගරු සභාවේදී කථා කරන්නට බැහැ. ඒ නිසා කරුණාකරලා මේ කරන තුච්ච වැඩේ නවත්වන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකක්ද මේ කරන වැඩේ? මේ ගරු සභාවේ මේ විධියට කථා කරන්නට බැහැ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

Order, please! ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමනි, දිගින් දිගටම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරමින් උසාවියේ විනිශ්චයට භාජනය වෙලා තිබෙන කාරණා පිළිබඳව සාකච්ඡා කිරීමෙන් ඒ නඩු නිමිතිවලට යම්කිසි බලපෑමක් සිද්ධ වෙන්නට පුළුවන්. එම නිසා ඔබතුමා යම් මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරමින් මේ වන විට අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් තිබෙන කාරණා පිළිබඳව ප්‍රකාශ කර තිබෙනවා නම් අපට එම ප්‍රකාශයන් ඉවත් කරන්නට සිදු වෙනවා. ඊට අමතරව, පරිබාහිරව ඔබතුමා ප්‍රකාශ කර තිබෙන දේවල්වලට උත්තර දීමේ අයිතිය අනික් අයට තිබෙනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප කියන්නේ මේ අවස්ථාවේ මේ මේ පරීක්ෂණ පැවැත්වෙනවා කියායි. ඒ ඇරෙන්න අප ඒ අය වැරදිකාරයෝ කියා කිව්වේ නැහැ. ඒ කියන දේවල් අසත්‍ය නම් පමණක් ඔබතුමා ඒ දේවල් හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න. මම කියන දේවල් සත්‍ය නම් ඒවා අයින් කරන්න එපා. ඒ පරීක්ෂණ පැවැත්වෙනවා නම් ඔබතුමා ඒවා අයින් කරන්න එපා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අහන්න තිබෙන්නේ මේකයි. තෙමෙන්නේ නැතිව නාන්න බැහැ නේ. දූෂණ, වංචා, අක්‍රමිකතා ගැන කථා කරනවා නම් මේවා ගැනත් කියන්න වෙනවා. විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ සහෝදරයා මේ වන විට බන්ධනාගාරගත වෙලා ඉන්නවා. මේ දේවල් ගැන කථා කරන්න එපා නම්, හැන්සාඩ් වාර්තාවෙන් ඒ දේවල් ඉවත් කරනවා නම් වැඩක් නැහැ. තෙමෙන්නේ නැතිව අපට නාන්න බැහැ. නානකොට තෙමෙනවා. හොරු ගැන කථා කරන්නේ නැතිව මේ දේවල් කථා කරන්න බැහැ. භූමිතෙල් ගෑවුණු ගැරඩි වාගේ මෙතුමන්ලා දහලනවා. කරුණාකරලා එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ගරු සරත් ෆොන්සේකා අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(ෆීල්ට් මාර්ෂල් මාණ්පුමිකු සරත් පොන්සේකා)
(Field Marshal Hon. Sarath Fonseka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප නැවත නැවතත් ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙපමණයි. රටේ නීති ක්ෂේත්‍රයේ සිද්ධ වන දේවල් ගැන මෙතැනදී අප කථා කරනවා. මේ

පාර්ලිමේන්තුවේදී අපට ඒවා ගැන කථා කරන්න පුළුවන්. අප තීන්දු තීරණ දෙන්නේ නැහැ. ඔබතුමා ඒ කරුණු හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරලා අපට අසාධාරණයක් කරන්න එපා.

දූෂිතයන්ට නියම දඬුවම් ලබාදීමට නම් අධිකරණ ක්ෂේත්‍රය තවත් ශක්තිමත් කළ යුතුය. දැනට පවතින ක්‍රමවේදවලට අනුව ඉතා භයානක තත්ත්වයේ චෝදනාවලට තීන්දු දීමට දීර්ඝ කාලයක් ගත වන බව පෙනී යයි. මේ කට්ටියට විරුද්ධව තිබෙන අල්ලස් චෝදනා ගැනයි මම මේ කියන්නේ. මේ සඳහා විශේෂ අධිකරණවල අවශ්‍යතාව දැන් දැන් ජනතාවට පෙනී යයි. [බාධා කිරීම] ඒවාට බයයි; heart attacks හැදෙනවා. [බාධා කිරීම] මෙය දඩයමක් ලෙස කියා පෑමට උත්සාහ කළත්, ජනතාව දැන් සැබෑ තත්ත්වය තේරුම් ගනිමින් සිටී.

මෙම කොමිෂන් සභාවල ක්‍රියාකාරිත්වය වෙනුවෙන් යෙදෙවෙන්නේ රාජ්‍ය මුදල්ය. එබැවින් ඒවා ප්‍රයෝජනවත් ලෙස යොදවා ගැනීමට රජය හා මහජනයා තේරුම් ගත යුතුය. එබැවින්, මෙම කොමිෂන් සභාවල ප්‍රගතිය ගැන පාර්ලිමේන්තුව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් තිබිය යුතුය. - පණ බයේ කෑ ගහන කොට එහෙම දැනුවත් කරන්නේ කොහොමද? - [බාධා කිරීම] ඒ මාර්ගයෙන් මෙම ආයතනවල ආධිපත්‍යය රැකීමටත්, ඒවායේ පැවැත්ම තහවුරු කර ගැනීමටත් රජයට හා පාර්ලිමේන්තුවට හැකිවනු ඇත.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මුහුණ පා සිටින තවත් ප්‍රශ්නයක් වනුයේ, ඔවුන්ට -දූෂිතයන්ට- නඩු පැවරීමට හැකි වනුයේ මහාධිකරණයේ නොව මහෙස්ත්‍රාත් අධිකරණයේ වීමය. මේ නිසාම දූෂිතයන්ට - ඒ කියන්නේ මේ වාගේ අයට - තෙවරක් අභියාචනා ඉදිරිපත් කරමින් නඩුව ඇදගෙන යාමටත්, කල් මැරීමටත් හැකියාව ලැබී ඇත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට කෙළින්ම චෝදනා මහාධිකරණයට ගොනු කිරීමට අවස්ථාව ලැබෙන්නේ නම් එය වඩා තාත්වික වනු ඇත. තවද, පවතින නීතියට අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම හා පොලිස් පරීක්ෂණ පවත්වන්නන්ට තොරතුරු හුවමාරු කරගැනීමට නොහැකි වීම පරීක්ෂණවල ප්‍රගතිය මන්දගාමී වීමට බලපායි. මෙයට අදාළ නීතිමය ප්‍රතිපාදන ගෙන ඒමෙන් කොමිසමට තවත් ක්‍රියාශීලීව ක්‍රියා කිරීමට ඉඩ සාදා දිය හැකිය.

ඡන්ද සමයේ දේශපාලන වාසි ගැනීමට ජනතා මුදලින් රුපියල් ලක්ෂ 6,000ක සිල් රෙදි බෙදා දී මුදල් අවභාවිත කිරීම සහ රාඩා ආයතනය හරහා ත්‍රස්තවාදීන්ට ජනතාවගේ මුදල් රුපියල් ලක්ෂ 6,000ක් ලබාදීමේ ක්‍රියාදාමයෙනුත් හිටපු පාලකයාට හා ගෝලයින්ට දඬුවම් නොලැබ ගැලවියාමට නොහැකි විය යුතුය. සිල් රෙදි මුදල් ලක්ෂ 6,000න් හතරෙන් තුනක් වංචා කර ඇත්තේ හතර ගුණයකින් වැඩි කර බිල්පත් ඉදිරිපත් කිරීමෙනි. වූදිතයන් නිදැල්ලේය. රට බෙරා ගත්තා යැයි පම්පෝරි ගහන රාජපක්ෂලා රටට කළ හානිය ඉතා බරපතළය. ඔවුන්ගේ ගෝල බාලයන් කළ හානිය ඊටත් වඩා බරපතළයි. [බාධා කිරීම] වට්ටක්කයත් කෑ ගහනවා. බොරුවට කෑ ගැහුවාට රටට කරපු හානිය වැඩියි. මේ "දේශ ප්‍රේමියෝ" යයි කියා ගන්නා අල්ලස් කාක්කෝ ටික රටට කරපු හානිය ඉතා බරපතළයි. දේශ ප්‍රේමී හම පොරවාගෙන රට විනාශ කිරීමේ ක්‍රියාවක ඔවුන් යෙදී සිටිනවා. රට බෙරා ගත්තා යයි පම්පෝරි ගහන රාජපක්ෂලා කළ හානිය ඉතා බරපතළය. ප්‍රභාකරන් කළාට වඩා හානියක් රාජපක්ෂලා රටට කළේය.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ස්වාධීන ආයතන ශක්තිමත් කිරීම ජාතික අවශ්‍යතාවකි. ඒ සඳහා සුදුසු පුද්ගලයන් පත් කර ගැනීමත්, ඔවුන් නඩත්තු කිරීමත් රජයට කිරීමට සිදුවනු ඇත. ඒ සඳහා සාධාරණ මුදලක් යට කිරීම ඉතා ප්‍රයෝජනවත් ආයෝජනයක් මිස මුදල් නාස්තියක් නොවේ. එබැවින් ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ගැන සාධාරණ ලෙස සිතිය යුතුය.

දැන් "සත්තු වත්තේ ජවනිකාව" අවසානයි. සියලු දෙනාටම ස්තුතියි. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එක කරුණක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමාගේ කථාවේදී මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් රාශියකගේ නම් කියැවුණා. ඒ අධිකරණයේ විනිශ්චයට ලක්වන නඩු සම්බන්ධයෙන්. ඒ වාගේම එතුමා අවසාන වශයෙන් "සත්තු වත්තේ" කියලා කිව්වා. කවුරුත් එක "වත්තේ" නිසා ප්‍රශ්නයක් නැහැ. නමුත්,- [බාධා කිරීම්] මම - [බාධා කිරීම්] ඒක හැන්සාඩ් - [බාධා කිරීම්]

මම කිව්වේ, "වත්තේ" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සඳහන් කළ මන්ත්‍රීවරුන්ගේ නම් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. අධිකරණයේ විනිශ්චයට ලක්වන -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Vasudeva Nanayakkara, do you want to speak?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සරත් ෆොන්සේකා මැතිතුමා "සත්තු වත්තේ" කිව්වේ පාර්ලිමේන්තුවට නොවෙයි නම්, එතුමා ඒක කියන්න ඕනෑ. "දැන් සත්තු වත්තේ ජවනිකාව අවසානයි" කියා එතුමා කිව්වාම, එක අර්ථයයි තිබෙන්නේ. ඒ මේ පාර්ලිමේන්තුව සත්තු වත්තක් හැටියට- [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සත්තු වත්තේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම කියන්නේ, එසේ මේ පාර්ලිමේන්තුවට පරිභව කිරීමට- [බාධා කිරීම්] එතුමා ප්‍රකාශයක් කළ යුතුයි.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිව්වේ මේගොල්ලෝ රඟ පෑ ජවනිකාව ගැන. ඒ ජවනිකාව, "සත්තු වත්තේ ජවනිකාවක්".

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරන්න.

[අ.භා. 4.10]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1978 සම්මත වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒකාධිපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දුන්නේ ඒ 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. එදා සිට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ඒක මරු පහරක් වුණා. ඒ නිසා තමයි ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පසු කාලීනව ඇති වුණු සාකච්ඡාවේදී දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගනු ලැබුවේ. ලංකාවේ පළමුවැනි වතාවට විධායක ජනාධිපතිවරයා සතු බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පවරමින් ප්‍රජාතන්ත්‍රවාදයේ යම් ප්‍රතිසංස්කරණයක් සිද්ධ වුණා. නමුත්, රටේ අවාසනාවකට නැවත රාජපක්ෂ පාලන යුගයේදී දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්, නැවත ප්‍රජාතන්ත්‍රවාදය හකුළා දැම්මා; ස්වාධීන කොමිෂන් සභා සම්පූර්ණයෙන්ම අක්‍රිය කළා. එය නැවත වෙනස් කරමින් තමයි අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුවේ සම්මත කළේ.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න ලැබීම ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් තබපු විශාල ඉදිරි පියවරක්. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව තමයි, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම ආරම්භ කළේ. ස්වාධීන කොමිෂන් සභා පිහිටුවන්න නම් ඒ සඳහා මූලික වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවත් මුළුමනින්ම ස්වාධීන වෙන්න ඕනෑ. ඒ නිසා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටු වීමේදී එහි සාමාජිකත්වය ස්වාධීන විද්වතුන්ගෙන් සමන්විත විය යුතුයි කියන ස්ථාවරයේ අපි හිටියේ. එදා ඉතා පැහැදිලිව තිබුණු කණිකාව තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජික සංඛ්‍යාව 10දෙනායි; එහි සමාජිකත්වය කිසිදු දේශපාලන පක්ෂයකට සෘජුව සම්බන්ධ නැති ස්වාධීන විද්වතුන්ගෙන් සම්පූර්ණ වෙන්න ඕනෑ කියන එක. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා ඉදිරිපත් වුණු කෙටුම්පතෙත් තිබුණේ එහෙම. නමුත්, මේ පාර්ලිමේන්තුවේදි විශේෂයෙන්ම දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයා ඇතුළු කණ්ඩායම එදා කිව්වේ, "නැහැ. මේක සමන්විත වෙන්න ඕනෑ ස්වාධීන පුද්ගලයන්ගෙන් නොවෙයි. මන්ත්‍රීවරුන්ගෙන් මේක සමන්විත වෙන්න ඕනෑ. මේකට මන්ත්‍රීවරුන් ඇතුළත් වෙන්න ඕනෑ" කියලා.

වාසුදේව නානායක්කාර ගරු මන්ත්‍රීතුමා අද කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ස්වාධීනත්වය පිළිබඳව. එතුමා කිව්වා, "මෙයට ඇමතිවරු පත් වෙලා තිබෙනවා. විවිධ පක්ෂවල නියෝජිතයෝ පත් වෙලා තිබෙනවා" කියලා. ඒක සිද්ධ වුණේ ඔබතුමන්ලාගේ වැරැද්දෙන්. ස්වාධීන පුද්ගලයන්ගෙන් ඒක පත් වෙන්න ඕනෑ කියන ස්ථාවරයේ අපි හිටියේ. ඔබතුමන්ලා තමයි එදා ඒකට විරුද්ධ වුණේ. එදා ඉදිරිපත් වුණු කෙටුම්පතේ තිබුණේ එහෙමයි. කවුද ඒකට විරුද්ධ වුණේ? ඒකට විරුද්ධ වුණේ ඔබතුමන්ලා. ඔබතුමන්ලා කිව්වේ, "නැහැ, මේක සම්පූර්ණයෙන් ස්වාධීන වෙන්න බැහැ. ඒකට පාර්ලිමේන්තු නියෝජනයක් තිබෙන්න ඕනෑ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පත් වෙන්න ඕනෑ" කියලා. ඒ අනුව තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මේකට සම්බන්ධ වුණේ. ඒ නිසා අද ඒ ව්‍යවස්ථා සභාවේ සංයුතියට යම් යම් දේශපාලන මතයන් දරන දේශපාලන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු පත් වෙලා ඉන්නවා නම්, ඇමතිවරු පත් වෙලා ඉන්නවා නම්, ඒකේ සම්පූර්ණ වගකීම ඔබතුමන්ලා ගන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලා එදා ඒකට විරුද්ධවීම නිසා එවැනි දෙයක් සිද්ධ වුණේ. එදා විරුද්ධ නොවුණා නම්, මේ තත්ත්වය වෙනස් කරන්න තිබුණා. අද ඒ ව්‍යවස්ථා සභාවට ඇමතිවරු පත්වෙලා තිබෙනවා නම්, ඒ ඇමතිවරු කියන කෙනා මන්ත්‍රී කෙනෙක්. ව්‍යවස්ථා සභාවට මන්ත්‍රී කෙනෙක් පත්වීමට ඉඩ හැදුවේ ඔබතුමන්ලායි. ඒ නිසා තමයි අපි කිව්වේ, "මේකට ඇමතිවරු, මන්ත්‍රීවරු පත් කරන්න එපා; ස්වාධීන පුද්ගලයන් කියන්නේ මේ පාර්ලිමේන්තුවේ පක්ෂවලට අයිති මන්ත්‍රීවරු නොවෙයි" කියලා. නමුත්, ඒ වැරැද්ද දැන් සිද්ධ වෙලා ඉවරයි.

දැන් ව්‍යවස්ථා සභාවේ සංයුතිය තිබෙන්නේ මෙන්න මේ විධියටයි. එහි සභාපති ගරු කථානායකතුමායි. ඊට අමතරව අගමැතිතුමා ඉන්නවා. විපක්ෂ නායකවරයා ඉන්නවා. විපක්ෂ නායකවරයා විසින් නම් කරන නියෝජිතයෙක් ඉන්නවා. ජනාධිපතිවරයා විසින් පත් කරන නියෝජිතයෙක් ඉන්නවා. ඒ වාගේම අගමැතිවරයා විසින් පත් කරන නියෝජිතයෙක් සහ අගමැතිවරයා සහ විපක්ෂ නායකවරයා අයත් නොවන දේශපාලන පක්ෂ නියෝජිතයෙක් ඉන්නවා. කවුද ඒ නියෝජිතයා? ගරු ජෝන් සෙනෙවිරත්න ඇමතිවරයා. මොකක්ද නියෝජනය? එක්සත් ජනතා නිදහස් සන්ධානය. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඒ ඔබතුමා නියෝජනය කරන පක්ෂයයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජිතයා විධියට ජෝන් සෙනෙවිරත්න ඇමතිවරයා පත් වෙන්නේ, ඒ ඔබතුමන්ලාගේ පක්ෂයේ නියෝජිතයා නිසායි. ඒ නිසා මේක සිද්ධවීම වැරැදියි. මේ පක්ෂ නියෝජනය සිද්ධ වෙච්ච එක වැරැදියි. ඔබතුමන්ලා තමයි ඒ නියෝජනය ඇතිවීමට ඉඩ හැදුවේ. ඒක අද තේරුම් ගන්න ඕනෑ. දැන් කියලා වැඩක් නැහැ, ව්‍යවස්ථා

සභාව පත් කිරීමේදී දේශපාලන දෘෂ්ටි කෝණයන් බලපානවා කියලා. ඒක ඉතා පැහැදිලියි. කවුරු හරි කියනවා නම් දැන් ව්‍යවස්ථා සභාව සම්පූර්ණයෙන්ම ස්වාධීනයි කියලා, එහෙම වෙන්නේ නැහැ. ඒක බොරු කථාවක්. ඇයි? එතැන ඉන්නේ දේශපාලන පක්ෂ නියෝජිතයන්. දේශපාලන පක්ෂ නියෝජිතයන් ඉන්න කොට දේශපාලන දෘෂ්ටි කෝණයක් ඒකට අනිවාර්යෙන්ම බලපානවා. ඒක වළක්වන්න බැහැ. ඒ නිසා ඔබතුමන්ලා ඉතිහාසයේ කරපු වැරැද්ද නැවත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය වෙන අවස්ථාවකදීවත් නිවැරැදි කරන්න මැදිහත් වෙන්න. දැන් ඒක වෙලා ඉවරයි. නැවත ඒක වෙන්න ඉඩ තියන්න එපා. ඒ නිසා ප්‍රමද වෙලා හරි ඒක තේරුම් ගත්තොත් හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ස්වාධීන කොමිෂන් සභාවලින් එකක් තමයි, දැන් ආන්දෝලනයට ලක් වෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කළ යුතුයි. ඒ ගැන කථා දෙකක් නැහැ. මොකද, 1994දී අපි රටක් විධියට අල්ලස් හෝ දූෂණ වළක්වා ගැනීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට අත්සන් කළා. අපි ඒ සම්මුතියට අත්සන් කළාට පස්සේ තමයි, 1994දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත මේ පාර්ලිමේන්තුවේ සම්මත වුණේ. 1994දී ඒක සම්මත වුණාම එවකට හිටපු ජනාධිපතිවරිය ඇතුළු ආණ්ඩුව කිව්වේ, "එක්සත් ජාතික පක්ෂයේ පරණ දූෂිතයන්, වංචාකරුවන් ගෝල්ෆේස් පිට්ටනියට ගෙනැල්ලා උල තියනවා" කියලායි. හැබැයි, ඒ පනත පාවිච්චි කරලා හොරුන්ට ඒ විධියට දඬුවම් දුන්නේ නැහැ. අවසානයේදී ඒක තමන්ගේ දේශපාලන තුරුම්පුවක් කරගත්තා විතරයි. ඊට පස්සේ දිගටම වුණේ මොකක්ද? මේ පනත පාර්ලිමේන්තුවේ තිබුණාට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම දිගින් දිගටම අඩපණ කළා, බලරහිත කළා. බලරහිත කිරීමත් එක්ක පසු ගිය කාලයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමක් රටේ තිබෙනවාද, නැද්ද කියලාවත් ජනතාවට දැනුණේ නැහැ. මොකද, කිසි කෙනෙකුට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් හරියට, පැහැදිලිව චෝදනා ඔප්පු කරලා දඬුවම් දුන්නේ නැහැ.

මීට කලින් 2012දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ වැටුප් වැඩි කිරීම පිළිබඳ යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ආවා. ඒ වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරු අදහස් දැක්වුවා. එතුමන්ලා ඇහුවා, "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිවරු නිදි; එහෙම නිදාගෙන ඉන්න වැටුප් වැඩි කරන්නේ, ඉන්ධන දීමනා වැඩි කරන්නේ මොකටද?" කියලා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ඇඳකුයි, කොට්ටයකුයි, කාමරයකුයි දෙන එක තමයි දැන් වඩාත් උචිත කියලා සමහර මන්ත්‍රීවරු කිව්වා. එදා තිබුණු තත්ත්වය ඒකයි. එදා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හිටපු සභාපති බාලපටබැඳි මහත්මයාට විරුද්ධව චෝදනා තිබුණා.

අපි 2014 ජනවාරි පළමුවැනි දා ඒ කොමිෂන් සභාවේ සභාපතිවරයා වැරදි ආකාරයෙන් වාහනයක් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් චෝදනාවක් ඉදිරිපත් කළා. නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් පැවැත්වුණේ නැහැ. හරි නම්, "පරීක්ෂණයක් පවත්වන තෙක් සදාචාරසම්පන්නව ඒ කොමිසමේ සභාපති ධුරයෙන් ඉල්ලා අස්වෙන්න." කියලා ඔබතුමන්ලාට තිබුණා, එතුමාගෙන් ඉල්ලා සිටින්න. පරීක්ෂණය අවසානයේදී එතුමා නිවැරැදි යැයි තීරණය වුණා නම්, එතුමාට පුළුවන් නැවත තනතුරේ වැඩ භාරගන්න. කරන්න තිබුණේ එහෙමයි. නමුත්, එහෙම කළේ නැහැ. එදා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පාවිච්චි කළේ තමන්ගේ දේශපාලන අත කොළුවක් විධියටයි. තමන්ගේ ආණ්ඩුවේ උදවිය නිදහස් කරන්න, ඒ අයට තිබෙන චෝදනාවලින් නිදහස් කරගන්න එදා ඒක පාවිච්චි කළා. එම නිසා, ඒක වෙනස් වෙන්න ඕනෑ. ඒක වෙනස් වෙන්න ඕනෑ කියන එක වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම වෙනස් වන්න ඕනෑ. රටේ ජනතාවට ප්‍රශ්නයක් තිබෙනවා. අදත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ ක්‍රියාකාරීත්වය ඒ විධියටම අපක්ෂපාතීව සිදු වෙනවාද කියන ප්‍රශ්නාර්ථය තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "ආණ්ඩුවේ ඇමතිවරුන්ට තිබෙන චෝදනා පිළිබඳව විභාග කෙරෙනවා. හැබැයි, මෙහි ගේට්ටු දෙකක් තිබෙනවා. ඉස්සරහා දොරෙන් යනකොට මාධ්‍යවේදීන් ඒවා කැමරා කරනවා. අපේ ආණ්ඩුවේ අය එළියට යන්නේත්, ඇතුල් වෙන්නේත් පිටුපස දොරෙන්" කියලා. මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, පිටුපස දොරෙන් ගියේ කවුද? කියා. මම ඔබතුමන්ගෙන් දැන ගන්න කැමැතියි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පිටුපස දොරෙන් හැංගිලා හොරෙන් ගිය ආණ්ඩුවේ ඇමතිවරු කවුද කියලා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරු ලබා දෙනවාද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළිතුරක් ලබා දෙනවා. එතුමාගේ පක්ෂය ඉතාම භාරදුර ප්‍රශංසනීය කාර්ය භාරයක් කරනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙනුවෙන් වසන්ත සමරසිංහ මහතාට විශේෂ ස්තුතියක් පුද කරන්න ඕනෑ. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට මම එතුමාට නිරන්තරයෙන්ම ගරු කරනවා.

ප්‍රශ්නය ඇහුවේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ තිබෙන ගේට්ටු දෙක ගැනයි. ඇත්තෙන්ම, ගේට්ටු දෙකක් තිබෙනවා. මාධ්‍ය වේදීන් යන්නේ ඉස්සරහා ගේට්ටුවෙන් පමණයි. පිටුපස ගේට්ටුවෙන් ගිය අපේ ආණ්ඩුවේ ඇමතිවරුන් ඉන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක තමයි මේ නම අහන්නේ. ඒ කවුද කියලායි අහන්නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඇහුවා නම මොකක්ද කියලා. පොන්නි සම්බා සහල් මෙට්‍රික් ටොන් ගණනක ප්‍රශ්නයක් වෙනුවෙන් ගරු රිසාඩ් බදියුදීන් ඇමතිවරයාව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගෙන්නූ අවස්ථාවන් තිබුණාය කියලා මම මේ අවස්ථාවේ දී කියනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඉතින්, එතුමා පිටුපස දොරෙන් ද ගියේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැවතත් නියෝජ්‍ය ඇමතිතුමා කරන්නේ මේ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරමින් මේ අයට අවස්ථාවක් දෙන්නේ නැතිව-

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මේකට වැරදි අර්ථ කථනයක් දෙන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දිගටම කර ගෙන යනවා නම් හොඳයි. [බාධා කිරීමක්]

Order, please! මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මේ අවස්ථාවේදී ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் *தலைமை வகித்தார்கள்.*
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මහතා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක ඇමතිවරයෙක් පිටුපස දොරෙන් ගියා කියලා එතුමා ඉතා පැහැදිලිව කිව්වා. දැන් අපට තිබෙන ප්‍රශ්නය තමයි, ඉතිරි ඇමතිවරු පිටුපස දොරෙන් නිදහස් වුණාද කියන එක. ඉතිරි ඇමතිවරු කවුද? ආණ්ඩුවේ බොහෝ ඇමතිවරුන්ට චෝදනා තිබෙනවා නේ? එක් ඇමති කෙනෙක්ගේ නමක් ඔබතුමා කිව්වා. එතුමා පිටුපස දොරෙන්ද ගියේ කියලා මම දන්නේ නැහැ. ඒක එතුමාගෙන් තමයි අහන්න ඕනෑ. දැන්, මාධ්‍යවේදීන් දැන ගන්න ඕනෑ, ඔන්න! මාධ්‍යවේදීන්ට හොරෙන් පිටුපස දොරෙන් එක ඇමතිවරයෙක් පැනලා ගිහිල්ලා තිබෙනවා කියලා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ දෙකෙන්ම නොගියපු අයත් ඉන්නවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
අන්න ඒක තමයි ප්‍රශ්නය. ඒ නිසා ජනතාව තුළ දැනට අවිශ්වාසයක් තිබෙනවා -විශ්වාසය බිඳ වැටීමක් තිබෙනවා.- ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු සම්බන්ධයෙන් තිබෙන චෝදනා විභාග කෙරෙන්නේ නැහැ, ඒවා පසුවට ගන්න දාලා කල් යවනවා කියලා. මෙම ආණ්ඩුවේ දැනට ඉන්න ඇමතිවරු කිහිප දෙනෙකුටම චෝදනා තිබෙනවා. ඒ චෝදනාත් විභාග වෙන්න ඕනෑ. එවැනි පරීක්ෂණයක් ගියොත් පමණයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ ක්‍රියාකාරීත්වය සාධාරණයි කියලා, අපක්ෂපාතීයි කියලා ජනතාවට තහවුරු වන්නේ. එම නිසා රජයේ ඇමතිවරුන් පිටුපස ගේට්ටුවෙන් එළියට යන්නත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හෝ වෙනත් අය ඉස්සරහා ගේට්ටුවෙන් එළියට යන්නත් තිබෙන සාම්ප්‍රදාය වෙනස් වෙන්න ඕනෑ. එහෙමනම්, අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් ඉල්ලීමක් කරන්න ඕනෑ කරුණාකරලා පිටුපස ගේට්ටුව වහන්න කියලා. මොකද, මාධ්‍යවේදීන්ට-.[බාධා කිරීමක්] ඉතින්, එක ගේට්ටුවක් තියන්න. පිටුපස දොරෙන් හොරෙන් එන්න ගේට්ටුවක් ඕනෑ නැහැ නේ.[බාධා කිරීමක්] පිටුපස ගේට්ටුව වහලා එක ගේට්ටුවක් තියන්න. එතකොට ආණ්ඩු පක්ෂයේ අයටයි, විපක්ෂයේ අයටයි පිටුපස දොරෙන් රිංගලා යන්න ලැබෙන්නේ නැහැ. ඉස්සර පිටුපස දොරෙන් රිංගලා ගිය ක්‍රමය, පසුව-

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
ඒ පැත්තටත් මාධ්‍යකරුවන්ට යන්න කියන්න.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
එක දොරක් තියන්න. එතකොට වැඩේ ලෙහෙසියි නේ. කැමරා දෙකක් තියන්න ඕනෑ නැහැ නේ. ආයේ ඒකට එච්චර වියදම් කරන්නේ මොකටද? එක ගේට්ටුවක් වහන්න. ඒ ගේට්ටුවෙන් ඇතුළු වෙන්න පුළුවන්, ඒ ගේට්ටුවෙන්ම එළියට එන්න පුළුවන්. එතකොට කාටවත් හැංගෙන්නත් බැහැ, තදබදයකුත් නැහැ නේ. එම නිසා අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් ඉල්ලීමක් කරනවා, මේ අයුරින් වැටුප් වැඩි කරලා පහසුකම් සපයලා ශක්තිමත් කරද්දී ඒ ගේට්ටුව වහලා, ඕනෑ නම් ඉදිරිපස ගේට්ටුව පොඩ්ඩක් පළල් කරන්න කියලා. දැන්, කට්ටිය වැඩියි නේ. කට්ටිය එන ප්‍රමාණය වැඩි නම්, ගේට්ටුවට දරා ගන්න බැරි තරමට තදබදය නම් ඒ ගේට්ටුව අයින් කරලා තාප්පය කඩලා ලොකු ගේට්ටුවක් දාලා මාධ්‍යවේදීන්ට ඒ හැමෝම ඡායාරූපගත කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න. හැබැයි, දැනට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. ආණ්ඩුවේ ඇමතිවරුන් සම්බන්ධ පරීක්ෂණ හෝ ඒ සම්බන්ධ විභාගයන් හරියාකාරව සිදු වන්නේ නැහැ. ඒවා පසුවට ගන්න තබනවා. පසුවට ගැනීම තුළින් අපක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රශ්නයක් අපට මතු වෙනවා. ඒක වෙනස් කළ යුතුයි. ඒක වෙනස් කරමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මීට වඩා ශක්තිමත් කරන්න ඕනෑ. එම පනතේ යම් යම් දුර්වලතා, අඩු පාඩුකම්, යල් පැන ගිය වගන්ති තිබෙනවා. ඒවා වෙනස් විය යුතුයි. ඒවා නැවත ශක්තිමත් තැනකට ගෙන ආ යුතුයි. කිසිදු තර්කයක් නැහැ, එහි පහසුකම් වැඩි කරන්න ඕනෑ. පසු ගිය කාලයේ typewriters වලින් තමයි එතැන අවශ්‍ය ලේඛන කටයුතු සිද්ධ වුණේ. දැන් ඒ තත්ත්වය ටිකක් වෙනස් වෙලා තිබෙනවා. නමුත් තවමත් පහසුකම් නැහැ. ඒ නිසා පහසුකම් වැඩි කරන්න ඕනෑ. එහිදී අධ්‍යක්ෂ ජනරාල්වරිය පමණක් නොව සමස්ත ආයතනයම

ශක්තිමත් කරන්න ඕනෑ. එහි නිලධාරින්ට විශේෂ පුණුවක් ලබා දෙන්න ඕනෑ. එහි විමර්ශන නිලධාරින් වඩාත් ශක්තිමත් කිරීම සඳහා විශේෂ පුහුණු ලබා දීමේ පාඨමාලා ආදි දේවල් හදුන්වා දෙන්න ඕනෑ. ඒවාට මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න ඕනෑ. ඒ වාගේම, ඒ නිලධාරින්ගේ සේවා ඇගයීමේ ක්‍රමයක් තිබෙන්න ඕනෑ. පරීක්ෂණ හොඳින් මෙහෙයවා ඒ අය යම් යම් දේවල් සොයාගෙන නඩු කටයුතුවලට මැදිහත් වන කොට ඒ නිලධාරින් ඇගයීමට ලක් කිරීමේ ක්‍රමයක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා වන අමතර දීමනා, අමතර පහසුකම්, දීමනා ලබා දෙන්න ඕනෑ. එවිට තමයි නිලධාරින් ධෛර්යවත් වන්නේ; උනන්දු වන්නේ. එය අනතුරුදායක රැකියාවක්. ඒ අනතුරු බිඳගෙන, ඒ අභියෝග ජයගෙන වඩාත් සාර්ථකව පරීක්ෂණ කරන්නේ නිසි ඇගයීමේ ක්‍රියාවලියක් තිබුණොත්, ඒ අයට යම් සහතික ලබා දීමක් කළොත්, සේවය ඇගයීමට ලක් කළොත් පමණයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ශක්තිමත් කරනවා කිව්වාම, අධ්‍යක්ෂ ජනරාල්ගේ වැටුප් වැඩි කිරීම පමණක් සිදු විය යුතු නැහැ. සමස්ත ආයතනයම ශක්තිමත් විය යුතුයි. 1වන යෝජනාව මඟින් ඔබතුමන්ලා ඉදිරිපත් කර තිබෙනවා, අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ නමින්ම වැටුප් හා දීමනා වැඩි කිරීමක්. මා හිතනවා, එය වෙන්න ඕනෑ එහෙම නොවෙයි කියා. පනතේ තිබෙන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරන්න ඕනෑ කියලායි. ඒ මිස, "දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ" කියන අධ්‍යක්ෂ ජනරාල්වරියගේ නමට නොව "අධ්‍යක්ෂ ජනරාල්" කියන තනතුරෙහි වැටුප හා දීමනා වැඩි වීම තමයි විය යුතු වන්නේ. නමුත් ඔබතුමන්ලා ගෙනැවිත් තිබෙන යෝජනාව තිබෙන්නේ නිශ්චිතව එම නමටයි. එහෙම නොවෙයි කරන්න ඕනෑ. කවුරු ඒ ධුරයට පත් වුණත්, ඒ පත් වන ඕනෑම පුරුෂයකුට හෝ කාන්තාවකට ඒ ලැබීම් ලැබිය යුතුයි; ඒ ශක්තිය ලැබිය යුතුයි. ඒ තනතුර විතරක්ම නොව, ඒ තනතුරටත්, ඒ හා සමානව අනෙකුත් සියලු තනතුරුවලටත් ශක්තිමත් වීමේ දීමනා ලබා දීමක් සිද්ධ විය යුතුයි. සමස්ත වශයෙන් මුළු ආයතනයම ශක්තිමත් විය යුතුය කියන කාරණය මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ස්වාධීන කොමිෂන් සභා අතර තිබෙන තවත් ප්‍රධාන වැදගත්ම එකක් තමයි, විගණන සේවා කොමිෂන් සභාව. එම කොමිසම ක්‍රියාත්මක වන්න නම් ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත වන්න ඕනෑ. ජාතික විගණන පනත් කෙටුම්පත පසු ගිය දවස්වල සම්පාදනය වුණා. එය ඉතාම ශක්තිමත් පනත් කෙටුම්පතක්. රජයේ යම්කිසි නිලධාරියෙකු යම්කිසි නාස්තියක්, වංචාවක් කළාම ඒ විගණන පනත අනුව ඒ නිලධාරියාගෙන් පෞද්ගලිකව එය අය කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. අද ඒ පනත් කෙටුම්පතට මොකක්ද වෙලා තිබෙන්නේ? අද එය පස්සට යනවා. හැබැයි ඔබතුමන්ලා පොරොන්දු වුණා, දින 100 වැඩසටහනේදීත් පොරොන්දු වුණා, ජාතික විගණන පනත් කෙටුම්පත දින 100 ඇතුළත ගෙනෙනවා කියා. නමුත් අද වන විට අවුරුද්දකුත් මාස නවයක් ගිහින් තිබුණත්, අද වන කල් එය සම්මත කර නැහැ. ජාතික විගණන පනත් කෙටුම්පත පරක්කු වන්නේ ඇයි? ඉතා පැහැදිලිව අපි දන්නවා, රජයේ සමහර ඇමතිවරුන් එයට කැමැති නැති බව. හැමෝම නොවෙයි, නිලධාරින්ගෙන් යම් කණ්ඩායමක් එයට කැමැති නැහැ. ඇයි ඒ? විගණනය කිරීමෙන් පසුව දඬුවම් ලබා දීමේ බලයකුත් එයට ලැබෙනවා. විගණකාධිපතිවරයාගේ සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ, විගණන සේවා කොමිෂන් සභාවේ බලය ශක්තිමත් වනවා. නමුත් ඔබතුමන්ලා එය සම්මත කරන්නේ නැහැ. එය පස්සට දාලා තිබෙනවා. අද විගණන නිලධාරින්ට සිද්ධ වෙලා තිබෙනවා පාරවල් ගානේ ගිහින් උද්ඝෝෂණය කරන්න. ඇයි එසේ උද්ඝෝෂණය කරන්නේ? ඒ, ජාතික විගණන පනත ශක්තිමත් කරන්නයි. දැන් විගණන සේවා කොමිෂන් සභාව තිබෙනවා. ඒ කොමිසම පත් කරලා තිබෙනවා. අපි අද එහි වැටුප් ද වැඩි කරනවා; දීමනා සහ වැටුප් ද දෙනවා. හැබැයි, ඒ කොමිසම ක්‍රියාත්මක නැහැ. කොමිසම ක්‍රියාත්මක වන්න නීතියක් නැහැ. පනත් කෙටුම්පත සම්මත වෙලා නැහැ. ඒ කොමිසමට නිලධාරින් පත් කරලා, සාමාජිකයන් පත් කරලා ඒ අයට අපරාදේ වැටුප් දෙනවා; දීමනා දෙනවා; වාහන දෙනවා. හැබැයි ඒ අයට ක්‍රියාත්මක වන්න නීතියක් නැහැ. ඒ කොමිසමට නිසි පරිදි ක්‍රියාත්මක වන්න නම් වහාම ඒ පනත ක්‍රියාත්මක වන්න ඕනෑ. එහෙම නැත්නම්, ඉස්සර වෙලාම විගණනය වන්න පුළුවන් කොතැනද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවට නියමිත කාලය අවසානයි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඉස්සර වෙලාම, එම කොමිසමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයක් ඉල්ලන්න පුළුවන්. ඇයි ඒ? ඒ, කොමිසමේ අයට වැටුප් දීලා තිබුණත්; දීමනා දීලා තිබුණත් කරපු දෙයක් නැති නිසායි. නීතියක් නැහැ, පනතක් නැහැ. ඒ නිසා පළමුවන විගණන වාර්තාව කොමිසම සම්බන්ධයෙන් එනවා. එය වළක්වන්න නම් ඒ පනත් කෙටුම්පත වහාම සම්මත කරගත යුතු වනවා. සම්මත කරලා එය ක්‍රියාත්මක කළ යුතු වනවා. ඒ අර්ථයෙන් ගත්තාම, ඒ ස්වාධීන කොමිෂන් සභා ශක්තිමත් කිරීමට ඔබතුමන්ලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළාට විතරක් මදි. එයට අවශ්‍ය කරන ප්‍රායෝගික මැදිහත් වීම කරන්නත් ඕනෑ. විශේෂයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ විගණන සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක කරන්න, බලාත්මක කරන්න වහාම පියවර ගත යුතුයි කියන ස්ථාවරය සඳහන් කරමින් මා නතර වනවා.

[අ.භා. 4.29]

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment and Welfare)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප් සහ දීමනා ප්‍රතිශෝධනය කිරීම හා සම්බන්ධ යෝජනාව වෙනුවෙන් කථා කිරීම, ඒ විෂයය ගැන කථා කිරීම මගේ යුතුකමක්ය කියා මා සිතනවා.

2015 ජනවාරි 08වන දා ලක්ෂ හැටදෙකහමාරක් පමණ වන ජනතාවගෙන් ලැබුණු ඒ ඓතිහාසික ජයග්‍රහණයේදී අපේ මූලික තේමාව වුණේ, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරියක් පත් කිරීම, මේ ස්වාධීන කොමිෂන් සභා සඳහා නව සභාපතිවරු පත් කරලා, ඒවා ශක්තිමත් කිරීම සහ මේ රට විනාශ කරපු හොරු ටික, මං කොල්ලකරුවන් ටික, අපරාධකරුවන් ටික අල්ලා එම දේපළ ජනසතු කරනවාය කියන කාරණයි. අපේ ප්‍රධාන සටන් පාඨය වුණේ ඒකයි. ඒ නිසා අපි ඒකට බැඳී සිටිනවා. මේක කිසිම දඩයමක්, පළිගැනීමක් නොව තනිකරම ඡන්ද පොරොන්දුවක් ඉෂ්ට කිරීමක් විතරයි කියන එකත් මුලින්ම මතක් කරන්න කැමැතියි.

[ගරු රන්ජන් රාමනායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය රජයන් බලයට ආවේ දූෂණය පිටු දකිනවා කියායි. පසු ගිය රජයන් චේදිකාවලදී කියා සිටියේ, පොළොවේ අත තබා දිවුරමින් කියා සිටියේ, අනිවාර්යයෙන්ම මේ දූෂිතයන් ගෝල්ෆේස් පිටිටනියට ගෙනැවිත් එල්ලා ගහනවා; සියලුම නඩු හරියට කරනවා; මේ මුදල් ජනසතු කරනවා; ඒවාට අදාළ ඉඩම් හා සියලු දේපළ රාජ සන්තක කරනවා කියායි. ඒ විධියට තමයි ඔවුන් පොරොන්දු වුණේ.

නමුත් මට මතකයි, ගරු චම්පික රණවක ඇමතිවරයා එක් අවස්ථාවක කියපු කථාවක්. පසු ගිය රජයන් මේ දූෂිතයන් අල්ලනවා කියා කළේ කුමක්ද කියන එක ගැන එතුමා බොහොම පැහැදිලිව කිව්වා. අනුලා විද්‍යාලයට තම දරුවන් ඇතුළත් කර ගැනීමට ගිය මව්පියන්ගෙන් එම විදුහලේ විදුහල්පතිනිය වරක් තේ බොන පීරිසි කෝප්ප කට්ටලයක් ලබා ගත්තාය කියා ඇයව අත් අඩංගුවට ගැනීම හැර පෙනෙන, දැනෙන හොරෙකුව අල්ලසක් ගත්තාය කියා අත්අඩංගුවට ගන්න පසු ගිය රජයන්වලට බැරි වුණා. මේක තමයි, ඉතිහාසයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ කාර්ය භාරය වෙලා තිබුණේ.

අපේ ජවිපෙ පක්ෂයට මේ අවස්ථාවේ credit එක යන්නම ඕනෑ. වසන්ත සමරසිංහ, අනුර දිසානායක, සුනිල් හඳුන්නෙත්ති සහ විජිත හේරත් කියන මේ අය තමයි වැඩිපුරම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා ඇවන්ට් ගාර්ඩ් සිද්ධිය ගැන, ලෝක හොරු ගැන කරුණු ඉදිරිපත් කළේ. කෝටි ගණන් වත්කම්-බැරකම් තිබෙන ෆයිල් හංගලා තිබුණා. මේ පාර්ලිමේන්තුවට සමහර විට කුලී රථවලින් පැමිණි අය අද නැව් අරගෙන තිබෙනවා; chopper අරගෙන තිබෙනවා; ගුවන් යානා පුහුණු කරන පාසල්වල අයිතිකාරයන් වෙලා තිබෙනවා. ඔවුන්ට ඩුබායිවල ගෙවල් තිබෙනවා; ඕස්ට්‍රේලියාවේ ඇපල් වතු තිබෙනවා. සාමාන්‍ය රැකියාවල නියුතු වෙලා මේ පාර්ලිමේන්තුවට පැමිණි පිරිසක් තමයි අද ඒ විධියට ධනවත් වුණු පිරිසක් බවට පත් වෙලා තිබෙන්නේ. අද තිබෙන තත්ත්වය ඒකයි. මේවා ගැන සොයන්න තමයි අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මේ වාගේ බලවත් කළේ. මේක ජනතාවගේ අභිලාෂයක් කියායි මම කියන්නේ. ජනතාව බලාගෙන සිටියේ මෙවැනි ශක්තිමත් ජනරාල්වරියක් මෙම කොමිසමට පත් වෙයි කියායි. මම දිල්රුක්ෂි වික්‍රමසිංහට 'යකඩ ගැහැනිය' කිව්වාය කියා අර වාසුදේව මහත්මයා මට චෝදනා කළා. මම තවම ඒ කථාව කියනවා. මම ඒ කථාව ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මෙවැනි අධ්‍යක්ෂ ජනරාල්වරියක් ඉතිහාසයේ කවදාවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විධියට පත් වෙලා තිබුණේ නැහැ. අර ඇවන්ට් ගාර්ඩ් සිද්ධියට සම්බන්ධ සභාපතිවරුන්ව, හිටපු නීතිපති පාලිත ප්‍රනාන්දු වැනි අය අත්අඩංගුවට ගන්න කොන්ද පණ තිබුණේ එතුමියට විතරයි. මහා ලොකු කැබිනට් ඇමතිවරුන් අත්අඩංගුවට ගන්නට කොන්ද පණ තිබුණේ එතුමියට විතරයි. ගැහැනියක් වෙලාත් ඇයට ඒ ශක්තිය තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසු ගිය කාලයේ හිල්ටන් හෝටලයේ තිබුණු බෑන් කී මූන් මහත්මයාගේ meeting එකට සම්බන්ධ වුණා. එතුමා බොහොම පැහැදිලිව කිව්වා, "ලංකාවේ දේශපාලනයේ කාන්තා සහභාගිත්වය ඉතාම අඩු වී තිබෙනවා. කාන්තාවන් ඉදිරියට එන්න ඕනෑ. කාන්තාවන් නායකත්වයට පත් වෙන්න ඕනෑ"ය කියා. ඇත්තෙන්ම කාන්තාවන් වීරත්වයට පත් වී තිබෙන මේ කාලයේ මෙම කාන්තාව වීරවරියක් හැටියට ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම අනෙක් කාන්තාවන් ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. ඉතාම හොඳ, සෘජු ඒ වාගේම කොන්ද පණ නැති විනිසුරුවරයන්ට නැති ශක්තිමත් කොන්දක් තිබුණු පද්මිණී එන්. රණවක ගුණතිලක විනිසුරුවරියටත් මම මේ අවස්ථාවේදී මගේ ගෞරවය පුද කරන්න කැමැතියි. ඒ වාගේම ලංකා ජයරත්න කියන විනිසුරුවරියටත් මම මගේ හිස නමා ආචාර කරන්න කැමැතියි. නමුත් මේ ජනරාල්වරිය මෙච්චර මහන්සි වෙලා හොරුන්ව අල්ලා නීතිය ඉදිරියට ගෙනිච්චාම ඉන්න සමහර විනිසුරුවරු මොකද කරන්නේ? ඒ අයට ඇප දෙනවා; මහ රෑ ඇප දෙනවා; සමහරවිට පෝය දවස්වලට ඇප දෙනවා. මහ රෑ ගිහින් chamber එකේදි හමු වුණාම ඇප දුන් අවස්ථා තිබෙනවා. මේවා තමයි ලංකාවේ ජනතාව දැනගන්න ඕනෑ. මේක අහගෙන ඉන්න ලංකාවේ ජනතාවට මා කියා සිටිනවා, මේ හොරුන්ට විරුද්ධව අපි සටන් කරන්න යද්දී වැඩියෙන්ම කෑ ගහන්නේ, වැඩියෙන්ම කේන්ති යන්නේ මොකක් හෝ හොරකමකට සම්බන්ධ අය බව. මට ඉස්සෙල්ලා කථා කළ සමහර මන්ත්‍රීවරු කථා කරද්දී, හොරු ටික ඒ ගැන බොහොම කේන්තියෙන් කෑ ගහනවා මම දැක්කා.

අපේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මෙතැන සිටියේ නැති වුණත් මා එතුමාට මේ අවස්ථාවේදී බොහොම ප්‍රශංසා කරන්නට කැමතියි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට එතුමා පිළිබඳව චෝදනාවක් ආවා. එතකොට මොකක්ද එතුමා කළේ? සෘජු -බොහොම කෙලින්- මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහින් කිව්වා, " මෙන්න මට විරුද්ධව චෝදනාවක් තිබෙනවා. මගේ පරීක්ෂණය ඉක්මන් කරන්න. මගේ පරීක්ෂණය ඉදිරියට ගෙනියන්නට මගේ පූර්ණ සහයෝගය දෙනවා. මම කවදාද එන්න ඕනෑ? මට ඉක්මන් දින දෙන්න. මගෙන් ඕනෑ ලිපි ලේඛන මොනවාද?" කියා. එතුමාගේ පරීක්ෂණය ඉක්මන් කර පවත්වාගෙන යන්න කියා දිල්රුක්ෂි වික්‍රමසිංහ මැතිනියට වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට එතුමාගේ පූර්ණ සහයෝගය දෙන්න එතුමා ඉදිරිපත් වුණා. එහෙම තමයි එතුමා වැඩ කළේ. නමුත් අනෙක් අය මොනවාද කළේ? තමන්ට චෝදනා එද්දී එතැන උද්ඝෝෂණ පැවැත්වුවා; එතැන කෑ ගැහුවා. එතකොට පොදු විපක්ෂය යයි කියා ගන්නා අයගේ මත දෙකක් තිබෙනවා. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කියනවා, "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම තිබෙන මගේ පරීක්ෂණය ඉක්මන් කරන්නය" කියා. නවත් සමහරු කියනවා, "අපට පරීක්ෂණ තිබ්බොත් එහෙම අපි මේක ඉස්සරහ ජවුෂන් නටනවා; උද්ඝෝෂණ තියනවා" කියා.

පසු ගිය කාලයේ බාලපටබැඳි මහත්මයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති වෙලා සිටියා. බාලපටබැඳි මහත්මයා සභාපති වෙලා සිටියදී මොකද වුණේ? මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයකුට විරුද්ධව චෝදනාවක් ආවා. ඒ මන්ත්‍රීවරයා දැන් මේ සභාවේ නැහැ. මොකක්ද ඒ මන්ත්‍රීවරයාට විරුද්ධව තිබුණු චෝදනාව? 2002-2006 කාලය ඇතුළත තමන්ගේ වත්කම් බැරකම් ඉදිරිපත් කළේ නැහැ කියන චෝදනාව. එතකොට මොකක්ද වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එතුමාට කොමිසමෙන් එන්න කියන දවසේ හරියටම එතුමාට නයෙක් ගහනවා. එතුමා medical certificate එකක් එවනවා, "මට නයෙක් ගැහුවා" කියා. ඊට පස්සේ, එන්න කියන අනෙක් දවසේ එතුමාට පලා පොළඟෙක් ගහනවා. එදාට එතුමා කියනවා, "මට පලා පොළඟෙක් ගැහුවා. මෙන්න medical certificate එක" කියා. ඊට පස්සේ අනෙක් දවසේ එන්න කිව්වාම එදාට එතුමාට කුණකටුවෙක් ගහනවා. මෙහෙම තමයි ඒ කාලයේ බාලපටබැඳි මහත්මයා යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම කටයුතු සිද්ධ වුණේ.

අපේ ආණ්ඩුව කාලයේ එහෙම වුණේ නැහැ. අපේ ආණ්ඩුව කාලයේ පොදු විපක්ෂය චෝදනා කරන්නේ හොරුන්ව වැඩියෙන් අල්ලනවාය කියායි. පොදු විපක්ෂයේ මන්ත්‍රීවරු කියන දෙයක් තමයි, "ඔන්විල්ලාව ඒ පැත්තට යැව්වාම ආයෙත් මේ පැත්තටත් එනවා" කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවදාවත්

බලයෙන් ඔළුව උදුම්මවා ගන්නේ නැහැ. බලය සදාකාලික නැහැ. මීට වඩා බලසම්පන්න, යුද්ධය නිමා කළාය කිව්ව ඒ මහා විරුවාවත් අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ලංකාවේ ජනතාව ගෙදර යැව්වා, ඔහු සහ ඔහු වටේ ඉන්න අය සොරකම් කළාය කියා. එම නිසා අප පව් කළොත් -අප සොරකම් කළොත්- මේවා අසාගෙන ඉන්න ජනතාව අපිව ගෙදර යවන දවසත් වැඩි ඈතක නැහැ. එම නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ජනරාල්වරිය කවදාවත් ගෙදර යවන්න එපා; මේ කොමිසම අකර්මණ්‍ය කරන්න එපාය කියන ඉල්ලීමයි මම පොදු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ. මොකද, මේ කොමිසම ශක්තිමත් කරන්න, ශක්තිමත් කරන්න සොරකම් කරන්න බලාගෙන ඉන්න අය -දැන් මේ set වෙලා ඉන්නවා නේ සොරකම් කරන්න- පවා භය වෙනවා. ඒ අය භය වෙනවා, "අප සොරකම් කළොත් අපටත් මේ වාගේම හැම දාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යන්න වෙයි; අපට FCID යන්න වෙයි; විජය කුමාරතුංග මහත්මයා 'ජය අපටයි' චිත්‍රපටයේ රහ පෑවා වාගේ අපට මාංචු දාගෙන යන්න වෙයි" කියා. එම නිසා ඒ අයව අධෛර්යවත් කරන්නට මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ශක්තිමත් කරන්න, මේ සභාපතිතුමියගේ වැටුප් වැඩි කරන්න, මේ අයට දැඩි ආරක්ෂාවක් දෙන්න කටයුතු කරන්න ඕනෑ. ඒ කොමිෂන් සභාව ශක්තිමත් කරන්න අවශ්‍ය ප්‍රතිපාදන දීලා, recording facilities දීලා, දීමනා දීලා, මෙම ගොඩනැඟිල්ල තවත් ලොකු කර ඉඩ පහසුකම් දීලා ශක්තිමත් කරන්න කියා මම කියනවා.

මේ රට බෙරා ගන්න නම්, ඉස්සරහට හොරකම් කරන්න ඉන්න අයව අධෛර්යවත් වෙන්න මේ ආයතන ශක්තිමත් කරන්න ඕනෑ. පසු ගිය කාලයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හිටපු සභාපතිවරයාටත් ජේවීපී එකෙන් පැමිණිල්ලක් දැම්මා, "ටොයොටා කොරොල්ලා" වාහනයක් ලබා ගත්තා කියලා. මෙහෙමයි, ඒ කොමිෂන් සභාවේ හිටපු සභාපතිවරුන්ට චෝදනා නැහුණේ. දැන් මේ අය කියනවා, අපි අනෙක් අයව දඩයම් කරනවාලු; පොදු විපක්ෂයේ අයව දඩයම් කරනවාලු. ඒකට කියන්න තිබෙන බොහොම පැහැදිලි උත්තරය මෙයයි.

මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ගේට්ටු දෙකක් තිබෙනවා. පළමුවැනි ගේට්ටුව ළඟ මුරකාවල් දාගෙන මාධ්‍යවේදීන් ඉන්නවා. මේ අවස්ථාවේදී මාධ්‍යවේදිනුත් මෙතැන ඉන්න හින්දායි මම මේ කාරණය කියන්නේ. එතැන ගේට්ටු දෙක, තුනක් තිබෙනවා. මේ ගේට්ටු දෙක, තුනෙන් අපේ ඇමතිවරුත්, අපේ මන්ත්‍රීවරුත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගෙන්වනවා. ඒ අය කටඋත්තර දෙනවා. අපි නම් ඒ කොමිසමට යන්නේ, පැමිණිලි දාන්නයි. මම මේ පැමිණිලි දාද්දී, "කාටවත් වෙනසක් ඇති කරන්නේ නැහැ" කියලා ලංකාවේ ජනතාව දන්නවා. මම නම් කියන්නේ නැහැ, මම කියන කථා හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න කියලා. කවදාවත් මම එහෙම කියන්නේ නැහැ. ඒ කථා හැන්සාඩ් වාර්තාවෙන් අයින් කෙරුවා කියලා වැඩක් වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඒ කථා PEO TV හරහා ලෝකය වටේ විකාශනය වෙලා ඉවරයි. ඕනෑ නම් මගේ මුළු කථාවම හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න. මම නම්, දූෂිතයන්ගේ නම් කියනවා. මගේ කථාවම අයින් කළත් කමක් නැහැ. මොකද, PEO TV හරහා සියලුදෙනාම ගෙවල්වල ඉඳන් බලලා, CDගත වෙලා ලෝකයේ හැම තැනම ප්‍රචාරය වෙලා එය සමාජගත වෙලා ඉවරයි. මම කියන්නේ මේ හොරුන්ව ජනතාවට අනාවරණය කළ යුතුයි කියලායි. අපි කවදාවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට මගේ මිත්‍ර වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම දැම්මේ නැහැ. මම පසු ගිය දවස්වල නම් list එකක් ගිහින් දුන්නා. ඒ නම් list එකේ විපක්ෂයේ අයගේ නම් මෙන්ම අපේ පක්ෂයේ අයගේත් නම් තිබෙනවා. මම එහෙම කරනවා කියලා විරුද්ධ පක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාම දන්නවා. මට මේ දේශපාලනයේ යාළු මිත්‍රයන් නැහැ. මම කඩේ යන්නේ ශ්‍රී ලංකාවේ මට ඡන්දය දුන්නු ජනතාවට පමණයි. එච්චරයි මගේ කථාව. ඒ නිසා මම කියන්නේ මෙතැන කිසිම දඩයමක් නැහැ කියන එකයි.

ජනතා මුදල් හොරකම් කළාය කියලා අහු වුණොත් මගේ හොඳම යාළුවා වුණත් කරන්න දෙයක් නැහැ, ඔහුට විරුද්ධව මට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යන්න සිද්ධ වෙනවා. ඒක මම ජනතාවට දුන්නු පොරොන්දුවක්. අපි අල්පේච්ඡ ජීවිතයක් ගත කරනවා. ඒ, මේ හොරු අල්ලන්න යන හින්දා. අපි ගැන හොඳට හොයලා බලන්න පුළුවන්. මගේ වත්කම් බැරකම් file එක මම අදාළ තැන්වලට යවලා ඉවරයි. නමුත් අපි හොඳටම දන්නවා, තමුන්ගේ ජීවිතය ඉතාම සුළුවෙන් පටන් ගත්තු අය, අද කොහොමද කෝටිපතියෝ වෙලා; ප්‍රකෝටිපතියෝ වෙලා ඉන්නේ කියලා. ඒවා ගැන කථා කරන එක හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න තරම් දඩුවමක් වෙන්නට බැහැ. මොකද, ඔහු ඇසුරු කරපු, ඔහුගේ ගම් ප්‍රදේශයේ, දිස්ත්‍රික්කයේ, ආසනයේ කට්ටිය දන්නවා, මේ පුද්ගලයා ජීවිතය පටන් ගත්තේ කොහොමද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයකුයි තිබෙන්නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

යෝෂිත රාජපක්ෂගේ ජීවිතය ගැන බලන්න. මැදමුලනේ කට්ටියගේ ජීවිත ගැන බලන්න. හඬසන් සමරසිංහ මහත්මයාගේ radio programme එකකදී මහාචාර්ය සරත් විජේසූරිය මහත්මයා කියලා තිබෙනවා, "ඩී.ඒ. රාජපක්ෂ මහත්මයා මිය ගිහිල්ලා තුන් මාසයේ දානය දෙන්න බැසිල් රාජපක්ෂ මහත්මයාගේ මවට වත්තේ තිබුණු පොල් ගස් 10ක් විකුණන්න සිද්ධ වුණා" කියලා. එවැනි ආර්ථික තත්ත්වයක් තිබුණු පවුලකට ඩෙසි ආච්චිගේ මැණික් මල්ල හරහා කොළඹ ඉඩම් 16ක් තිබෙන්නේ කොහොමද? එහෙම වෙන්න බැහැ. එහෙම වෙන්න නම්, "ඇලඩින්ගේ මැජික් පහන" පහළ වෙන්න ඕනෑ. නිර්දෝෂී පුද්ගලයෙකුට, අවංක පුද්ගලයෙකුට මම "හොරෙක්" කියලා අපහාස කළොත්, අසත්‍ය කියනවාට රන්ජන් රාමනායකට මෙතැනදීම හෙණයක් වදින්න ඕනෑ. අපි, හොරාට "හොරා" කියන්න බය නැතුවා වාගේම නිර්දෝෂී මිනිහාට, "නිර්දෝෂී අවංක ධාර්මිෂ්ඨ මිනිහෙක්" කියන්න පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අපට කොන්දක් තිබෙන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහත්මයාට අපේ කිසිම චෝදනාවක් නැහැ. ඇයි ඒ? ගරු වාසුදේව නානායක්කාර මහත්මයාට අපේ කිසිම චෝදනාවක් නැහැ. ගරු විදුර වික්‍රමනායක මන්ත්‍රීතුමා විපක්ෂය පැත්තේ ඉඳගෙන බලාගෙන ඉන්නවා. එතුමාට කිසිම චෝදනාවක් නැහැ. කවදාවත් මම එතුමාට attack කරන්නේ නැහැ. එතුමා හොරෙක් නොවෙයි. මම හොඳට හොයලා බලලායි කියන්නේ. අපෙන් ඒ සහතිකය ගන්න තමුන්නාන්සේලා ඒ විධියට ජීවත් වෙන්න ඕනෑ. අපේ කිසිම පළිගැනීමක්, දඩයමක්, වෛරයක්, තරහක් නැහැ. අපි හැම දෙයක්ම කියලා තිබෙන්නේ සාක්ෂි සහිතවයි. ඒ හින්දා කවදාවත් මෙතැන පළිගැනීමක් වෙන්නේ නැහැය කියන එක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. ඒ හින්දා කවදාවත් වැරැදි මතයක් ඇති කර ගන්න හදන්න එපා. මේ අවස්ථාවේදී මම නැවත නැවතත් කියනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තවත් ශක්තිමත්

[ගරු රන්ජන් රාමනායක මහතා]

කරන්න කියලා. ඒක අපේ රටේ අනාගතයට හොඳයි. පසු ගිය ටිකේ ඒක වුණේ නැහැ. නමුත්, අද වන කොට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ වැඩ පිළිවෙළ ලස්සණට කරගෙන යනවා. ඒ නිසා මා හිතනවා, ඒ අයගේ පඩි නඩි ඇතුළු සියලු දේවල් තවත් වැඩි කරලා ඒ කොමිෂන් සභා තවත් ශක්තිමත් කරන්න ඕනෑය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍යවේදිනුත් මේ හොරු අල්ලන්න මහා කාර්ය භාරයක් කළා. මා මාධ්‍යවේදීන්ටත් කියනවා, මේ ගේට්ටු දෙක තුන ගැනම විමර්ශනයෙන් ඉන්න, හැම තැනම කැමරා අටවා ගෙන ඉන්න කියලා. ඒකට අද කැමරා සහිත ෆෝන් පවා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මේවා ගැන විමර්ශනයෙන් ඉඳලා, අවදියෙන් ඉඳලා, alert එකේ ඉඳලා මේ සියලු දෙනාගේම හොර මැරකම් අල්ලා ගන්න උදව් වෙන්න. හරියට අධ්‍යයනය කරලා මේ වත්කම් ටික අල්ලා ගත්තොත් අපට ආයෙත් බදු පනවන්න ඕනෑ නැහැ. අර මාතර බ්‍රවුන්ස්හිල් ඉඩම, මල්වානේ ඉඩම, නිහාරියේ ඉඩම ජනසතු කළා වාගේ, මේ මුදල් එකතු කරලා ජනසතු කළොත් හොඳ අය වැයක්, ජනතාවට හොඳින් ජීවත් වෙන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කරන්න අපට පුළුවන්. මහා සල්ලි ප්‍රමාණයක් මේ අය කොල්ල කාලා තිබෙනවා. ඒවා නැවත ලබා ගන්නට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම තවත් ශක්තිමත් කරලා, FCID එක තවත් ශක්තිමත් කරලා, ඒ ආයතනවල සියලු නිලධාරීන්ට තවත් ශක්තිය, ධෛර්ය දෙමු කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.45]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉංග්‍රීසි කියමනක් තිබෙනවා, "Caesar's wife must be above suspicion." කියලා. මොකක්ද මේ කියමනේ පසු බිම කථාව? ක්‍රිස්තු පූර්ව 62දී රෝමයේ රාජ්‍ය ආගමේ ප්‍රධාන පූජකයා බවට ජූලියස් සීසර් පත් වුණා. ඒ ආගමේ සම්ප්‍රදාය අනුව ජූලියස් සීසර්ගේ බිරිඳ, පොම්පියා නිවසේ පවත්වන්න ඕනෑ, "Good Goddess Festival" හෙවත් යහපත් දෙවඟනගේ වන්දනාව. එයට සහභාගි විය හැක්කේ කාන්තාවන්ට පමණයි. හැබැයි, පොම්පියාට වහ වැටුණු ක්ලෝඩියස් කියන තරුණයා කාන්තාවක් වාගේ වෙස් වලාගෙන ගෙට රිංගා ගත්තා. මේක සීසර්ට හසු වෙනවා. අනාචාරයේ යෙදුණා කියලා ක්ලෝඩියස්ටයි, පොම්පියාටයි චෝදනා නඟනවා. ඒ චෝදනාවෙන් පොම්පියා නිදහස් වෙනවා. හැබැයි, සීසර් පොම්පියා දික්කසාද කරනවා. හැමෝම මේ ගැන සීසර්ගෙන් විමසනවා. පොම්පියා නිර්දෝෂීයි. "නිර්දෝෂී පොම්පියා ඇයි ඔබ දික්කසාද කරන්නේ? " කියලා අහනවා. මොකක්ද සීසර් දුන්නු උත්තරය? "මගේ බිරිඳ ගැන සමාජයේ සැකයක් ඇති වුණා. ඒ නිසා මා ඇය දික්කසාද කරනවා" කියලා සීසර් කිව්වා. සීසර්ගේ බිරිඳ වරදක් කිරීම නොවෙයි, වරදක් කිරීම පිළිබඳ සැකයකටවත් භාජන වෙන්න බැහැ කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සීසර්ගේ බිරිඳ වාගේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරියත්, වරදක් කිරීම නොව, වරදක් කිරීම පිළිබඳ, දූෂණයක් පිළිබඳ සැකයකටවත් භාජන වෙන්න බැහැ. ඇයි අපි එහෙම කියන්නේ? රාජ්‍ය යාන්ත්‍රණයේ ඉන්න කවුරු හෝ නිලධාරියකු කුමක් හෝ දූෂණයක් කළාය කියලා, අල්ලසක් ගත්තාය කියලා දැන ගන්න ලැබුණාම ඒ පිළිබඳ පැමිණිලි කරන්න යන්න තිබෙන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමටයි. එතකොට, එතැන ඉන්න අධ්‍යක්ෂ ජනරාල්වරිය ගැන කිසියම් හෝ සැකයක් සමාජයේ තිබෙනවා නම්, ඇය ගැන විශ්වාසනීයත්වය බිඳ වැටී තිබෙනවා නම් ජනතාවට හිතන්න තිබෙන්නේ, "වැටත් නියරත් ගොයම් කයි නම් කාට කියන්නද ඒ අමාරුව" කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේදී අගමැතිතුමා ප්‍රකාශ කළා අධ්‍යක්ෂ ජනරාල්තුමිය එතුමාගේ සමීපතම මිතුරියක් කියලා. සමීපතම මිතුරියක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් කිරීම වරදක් විධියටයි මා දකින්නේ. හැබැයි, එය බරපතළ වරදක් වුණත්, එතුමිය පත් වුණාට පස්සේ ස්වාධීනව කටයුතු කරගෙන යනවා නම් කමක් නැහැ. අපට මතකයි, 1978දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා තමන්ගේ සමීපතම මිතුරෙකු වුණු නෙවිල් සමරකෝන් මැතිතුමා රටේ අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කළා. හැබැයි, අගවිනිසුරු ධුරයට පත් වුණාට පස්සේ මිත්‍රකම් පැත්තකින් තියලා තනතුරේ ගෞරවය රැකගෙන ස්වාධීනව කටයුතු කරන්නට එතුමා සමත් වුණා. හැබැයි, දිල්රුක්ෂි මැතිනිය මේ තනතුරට පත් වුණාට පස්සේ, එතුමියගේ පැවැත්ම තුළ, එතුමියගේ ක්‍රියාකාරිත්වය තුළ, පක්ෂග්‍රාහීත්වයේ සැකය, පක්ෂග්‍රාහීත්වය තුළින් මතු කරන අවිශ්වාසය අද මේ සමාජයට කාන්දු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව මර්දනය පිළිබඳ විශේෂඥයෝ. කලින් ආණ්ඩු නම් මර්දනය කිරීමේදී කළේ, පහර දෙන එකයි, ගිනි තියන එකයි, පැහැරගෙන ගිහිල්ලා අතුරුදහන් කරන එකයි. හැබැයි, මේ ආණ්ඩුව ඊට වඩා වෘත්තීය මට්ටමින් තමයි ඒක කරන්නේ. රාජ්‍ය යාන්ත්‍රණයේ මර්දන ත්‍රිත්වය බවට අද පත් වෙලා තිබෙන්නේ පොලීසිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නීතිපති දෙපාර්තමේන්තුවත් "සහායට ඩැනී" චරිතය රඟපාමින් මේ සඳහා බරපතළ සහයෝගයක් ලබා දෙනවා. ව්‍යවස්ථාදායක සභාව, පවතින නීතිය නොසලකා හරිමින් නීතිපතිවරයා හා පොලිස්පතිවරයා පත් කිරීම නිසා, තමන්ට ඕනෑ ආකාරයට මර්දනයේ හස්තය බවට රාජ්‍ය යාන්ත්‍රණය පත් කර ගන්න අද පුළුවන් වෙලා තිබෙනවා. වෑල්ඩින් බාස් කෙනෙකුට පොලිස්පති ධුරය දීලා, එතුමා නම් දැන් අපූරුවට නීතිය නමමින් වැඩ පෙන්වමින් සිටිනවා. මෙන්න මේ පසු බිම තුළ තමයි අපි මේ ආයතනය ක්‍රියාත්මක වන ආකාරය ගැන බලන්න ඕනෑ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේ වනකොට රාජ්‍ය මර්දන යාන්ත්‍රණයේ පෙරටු යාන්ත්‍රණය බවට, පෙරටු එන්ජිම බවට පත් වෙලා අවසන්.

මා මිත්‍ර රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා සිහිපත් කළා, 2015 අප්‍රේල් මාසයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් කැඳවීමක් කළ බව. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ අණ පනත් අනුව ජනාධිපතිවරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධිකාරී විෂය පථයට වැටෙන්නේ නැහැ. අපි ඒ බව පෙන්වා දුන්නත්, එය පිළිගන්න

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන මැතිනිය සූදානම් වුණේ නැහැ. ඊට පස්සේ අපි ඒ සඳහා අපූරු උපක්‍රමයක් පාවිච්චි කළා. 2015 මැයි මාසයේ 12වෙනි දා අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා වර්තමාන ජනාධිපතිතුමාට සහ අගමැතිතුමාට එරෙහිව පැමිණිල්ලක් භාර දුන්නා. එම පැමිණිල්ලෙන් අපි මේ දේවල් කිව්වා. 2014 නොවැම්බර් මාසයේ 21වෙනි දා වර්තමාන ජනාධිපතිතුමා මාධ්‍ය හමුවක් පවත්වා කිව්වා, "මම ජනාධිපතිවරණයට එනවා. මම ජනාධිපති වුණොත්, ජනාධිපති වුණු වහාම අගමැති ධුරයට රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් කරනවා"ය කියලා. ඊට පස්සේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රකාශයට පත් කළා, "මම ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමේ අදහස ඉවත් කර ගන්නවා, අපේ සහයෝගය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ලබා දෙනවා"ය කියලා. ඒ තීරණයත් එක්ක ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කරනවා. එතුමා ජයග්‍රහණය කරලා විනාඩි දෙකක් ඇතුළත රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් කරනවා. 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත අනුව, ජනාධිපතිවරණ අපේක්ෂකයකුට සහාය ලබා ගැනීම සඳහා යම් පුද්ගලයකුට තනතුරක් ලබා දීමට පොරොන්දු වීම, තනතුරක් ලබා දීම, තනතුරක් භාර ගැනීම අල්ලස් වැරදි බවට පත් වනවා. අපි මේක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා කිව්වා. [බාධා කිරීම්] අල්ලස් දෙන්න පොරොන්දු වන්නේ ජනාධිපතිතුමා, අල්ලස ගන්නේ අගමැතිතුමා, අල්ලසට දෙන්නේ රටේ දෙවෙනි පුරවැසිකම වන අගමැති ධුරය. ලංකා ඉතිහාසයේ ලොකුම අල්ලස මෙයයි. මෙන්න පැමිණිල්ල, මෙන්න සාක්ෂි, මෙන්න ඇමුණුම් ලේඛන, මේ ගැන විමර්ශන කරන්න කියලා අපි කිව්වා. ඒ පැමිණිල්ල භාර දීලා අද වන කොට මාස 16ක් ගත වෙලා අවසන්. නමුත්, අද වන තුරු කිසිම විමර්ශනයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙය හුදෙක් විපක්ෂය පමණක් ඉලක්ක කර ගත් ආයතනයක් විධියටයි කටයුතු කරන්නේ.

දැන් බලන්න, අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ දවස්වල ඉන්නේ බන්ධනාගාරයේ. මැතිවරණ කාලයේ කැරම් බෝර්ඩ් බෙදුවා කියලා එතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් චෝදනාවක් ගොනු කරලා තිබෙනවා. මොකක්ද මේ සිදුවීමේ පසුබිම් කථාව. 2016 නොවැම්බර් මාසයේ 7වෙනි දා අමාත්‍යාංශ ලේකම්වරයා ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයාට කථා කරලා කියනවා, කැරම් බෝඩ් වගයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා, මේ කාරණය සඳහා-

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා මේ කතන්දර කිව්වාට තවම රුපියල් සියයේ ගිණුම් ටික පෙන්වූයේ නැහැ. මෙතුමා ජනතාවට කිව්වා, එකතු කරපු රුපියල් සියයේ ගිණුම් දෙනවා කියලා. මෙතුමා දැන් රුපියල් සියයේ ගිණුම් දෙන්නේ නැතිව මේ වෙන වෙන විකාර කියනවා. සුරංගනා කථා කියනවා වාගේ මොනවාද ඔය කියවන්නේ? අර ඕස්ට්‍රේලියන්කාරයා ඇවිල්ලා අරහෙ බලාගෙන ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා කථා කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටියේ මෙයයි. අමාත්‍යාංශ ලේකම්වරයා ඉල්ලීමක් කරනවා, මෙන්න කෙටුම්පත, මේ ආකාරයට මට ලිපියක් හදා දෙන්න, මම ඇමතිතුමා එක්ක කථා කරලා තිබෙන්නේ කියලා. ඒ අනුව 2014 නොවැම්බර් මාසයේ 07 වෙනිදා අමාත්‍යාවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් යවමින් කියනවා, පාසල් සහ ක්‍රීඩා සමාජ අතර බෙදා හැරීම සඳහා කැරම් බෝඩ් 14,000ක් සතොස මඟින් ආනයනය කරන්න කියලා. ඒ ලිපිය මත එදිනම ලේකම්වරයා සතොස සභාපතිට ලිපියක් යවනවා, අපට මේ කැරම් බෝඩ් ආනයනය කරලා දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 නොවැම්බර් මාසයේ 7 වෙනිදා සතොසට ඒ ලිපිය ලැබෙන විටත් මේ කැරම් බෝඩ් ආනයනය කරලා ඉවරයි. එය ව්‍යාජ ලිපි හුවමාරුවක්. හැබැයි, ඇමතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලිපියක් දුන්නා නම්, ඇමතිවරයා එයට වගකියන්න ඕනෑ නේද කියලා කවුරු හරි ප්‍රශ්න කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණය නිසා තමයි අමාත්‍යාවරයා 2011 ජූලි මාසයේ 07 වෙනිදා සියලුම ආයතන ප්‍රධානීන්ට, අමාත්‍යාංශ ප්‍රධාන නිලධාරීන්ට ලිපියක් යවා තිබෙන්නේ, "මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයෙන් ලිපියක් ආවත් කිසිම බඳවා ගැනීමක්, කිසිම මිලදී ගැනීමක් මගෙන් විමසීමකින් තොරව කරන්න එපා" කියලා. ඒ අනුව, දූෂණ චෝදනාවක් එල්ල කරනවා නම්, එල්ල කරන්න ඕනෑ අර සම්බන්ධීකරණ ලේකම්වරයාට සහ අමාත්‍යාංශ ලේකම්වරයාට නේද? නමුත් එහෙම සිද්ධ වෙන්නේ නැහැ. ඒ වෙනුවට සිද්ධ වෙන්නේ මොකක්ද? අමාත්‍යාංශ ලේකම්වරයාටවත්, සම්බන්ධීකරණ ලේකම්වරයාටවත් නොවෙයි, මේ කාරණය පිළිබඳ කිසිම අවබෝධයක් නොතිබුණු ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාටයි චෝදනා එල්ල වන්නේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා පුදුම උනන්දුවකින් තමන්ගේ පාර්ශ්වයක් බෙරාගන්න කථා කරනවා. මම කියන්න කැමැතියි, ගල්ලෙන බිඳලා තමයි මෙතුමන්ලා මෙහාට ආවේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
එය point of Order එකක් නොවෙයි. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මන්ත්‍රීවරුන්ට මගේ කාලය නාස්ති කරන්න ඉඩ දෙනවා. එතුමා දන්නේ නැහැ, point of Order එකක් කියන්නේ මොකක්ද කියලා. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට මේ චෝදනාව නැගීමේ පදනම මොකක්ද? එතුමා වරදක් කර තිබෙනවාද? ඔව්. බරපතළ වරදක් කර තිබෙනවා. ඒ තමයි ලංකා ඉතිහාසයේ දැවැන්තම පා ගමන වන "ජන සටන පා ගමන" සංවිධාන කමිටුවේ සභාපති ධුරය දරමින් ඒ ආණ්ඩු විරෝධී සටනට ජනතාව පෙළගැස්වීමට නායකත්වය ලබා දීම. මේ ආකාරයට තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අද රාජ්‍ය මර්දන යන්ත්‍රණයේ කොටස්කරුවන් බවට පත් වෙලා තිබෙන්නේ. අද ආණ්ඩුව විසින් නිහඬ කරන්න ඕනෑ චරිත, පීඩාවට පත් කරන්න ඕනෑ චරිත හඳුනාගෙන, ඒ අයට දඬුවම් කරන්නයි මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම භාවිත කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂය පැත්තේත්, විපක්ෂය පැත්තේත් දෙපැත්තේම සිටින මන්ත්‍රීවරුන්ට අල්ලස් චෝදනා තිබෙනවා; දූෂණ චෝදනා තබෙනවා. ඒවා පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විමර්ශන සිදුකරමින් පවතිනවා. [බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි අවස්ථාවක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප් වැඩි කිරීමට මේ සභාව යෝජනාවක් සම්මත කිරීමත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියට ලබා දෙන අල්ලසක් බවට පත් වෙනවා. ඒ නිසා මේ විවාදය පැවැත්විය යුතුව තිබුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් සිද්ධ වන විමර්ශන අවසන් වුණාට පසුවයි. [බාධා කිරීම්] හැබැයි, දැන් විවාදය පටන් අරගෙන ඉවරයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අඩුම ගණනේ මේ පිළිබඳව ඡන්ද විමසීමවත් මන්ත්‍රීවරුන්ට එරෙහිව තිබෙන දූෂණ චෝදනා අවසන් වනතුරු නොකළ යුතුයි කියලා මා යෝජනා කරනවා. අවසාන වශයෙන් කියන්න කැමැතියි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය කරන මේ සේවය දෙස බලද්දී, මේ වැටුප් වැඩිවීම හොඳටම මදී. එතුමියට දස ගුණයක වැටුප් වැඩිවීමක් කරලා, වසා දමා තිබෙන ජනාධිපති නිල නිවස ඇගේ නිල නිවස බවට පත් කරන්නැයි කියා යෝජනා කරනවා. ඒ වාගේම එතුමිය මේ කරන සේවය හේතුවෙන් අනාගතයේ දිනක ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ පාර්ලිමේන්තුවට පැමිණීමට වරම් ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් වෙන් කර තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා,-

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
දැන් මොකක් ගැනද රීති ප්‍රශ්නය?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාගේ කථාව අතරතුර යම් මන්ත්‍රීවරයකු නැඟී සිට කිව්වා. මම රුපියල් සියය ගණනේ එකතු කරලා බැංකු ගිණුම් ලබා දීලා නැහැ කියලා. ඒක පට්ටපල් බොරුවක්. මේ ලංකා ඉතිහාසයේ තමන්ගේ සියලුම ගිණුම්, invoice, ලදුපත්, බැංකු ප්‍රකාශන සමඟින් ප්‍රසිද්ධ කර ඇති එකම මන්ත්‍රීවරයා මා පමණයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.00]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාට විශේෂයෙන්ම මේ කාරණය පිළිබඳව කියන්න කැමැතියි. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මැතිනියට ඉල්ලා අස් වෙන්න කියලා

එතුමා චෝදනාවක් නැඟුවා කිව්වා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ඉදිරියට ගිහිල්ලා උද්ඝෝෂණ කරන කොට මේ ජාති හිතෙෂි උදය ගම්මන්පිලට සිංහ කොඩිය අමතක වුණා. සිංහ කොඩිය කියලා වෙන කොඩියක් වනලා, අන්තිමට ජාතියෙන් සමාව ගත්තා. උදය ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමා එදා ඉල්ලා අස් වෙයි කියලා අපි හිතුවා. කොන්ද කෙළින් තිබෙන මන්ත්‍රීවරයෙක් නම් එදා ඉල්ලා අස් වෙනවා, ජාතියෙන් සමාව ගන්නේ නැතුව. සිංහ කොඩිය හඳුනන්නේ නැති මන්ත්‍රීතුමා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස, දූෂණය අනිසි ආකාරයෙන් ධනය ඉපයීම වැනි කාරණා තුළින් කිසි විටෙක රටකට ඉදිරියට යන්න බැහැ. පසු ගිය දවස්වල සිල් රෙදි බෙදුවා, කැලැන්ඩර බෙදුවා, දිනපොත් බෙදුවා, යකඩ බම්බු බෙදුවා, ගෑස් කුකර් බෙදුවා, පැළ වෙන්නේ නැති ඇට බෙදුවා කියලා අපි දන්නවා. ඒ ඔක්කෝම කළේ මේ විධියට හම්බ කර ගත්ත සල්ලිවලින්. පසු ගිය කාලයේ SriLankan Airlines එක අවුරුද්දකට රුපියල් කෝටි 3,136ක් පාඩු ලැබුවා. ඒවා ගෙව්වේ අහිංසක මිනිසුන්. එහෙම පාඩු විදිද්දී දවසකට රුපියල් ලක්ෂ 70ක් බදු දීලා ගුවන් යානා කුලියට ගත්තා. මත්තල ගුවන් තොටුපොළ හැදුවා, ඒකෙන් රටට ආදායමක් නැහැ; රටට වාසියක් නැහැ; යහපතක් නැහැ. නමුත් මත්තල ගුවන් තොටුපොළ වෙනුවෙන් පොලිය වශයෙන් පමණක් දවසකට රුපියල් ලක්ෂ 65ක් ගෙව්වා. හම්බන්තොට වරාය හැදුවා, දවසකට රුපියල් ලක්ෂ 70ක් පොලිය ගෙව්වා, රටට වුණු සෙතක් නැහැ. අවුරුදු ගණනක් සුදු අලියෙක් විධියට ඒවා තිබුණා. මේ රටේ අහිංසක ජනතාවගේ බදු මුදල්වලින් ඒ වාගේ කටයුතු කළා. නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදුවා. කැඩුණු මැෂින් ගෙනැල්ලා හැදුවා. අන්තිමට දවසකට රුපියල් ලක්ෂ 600කට ආසන්න මුදලක් ණය පොලී ගෙවන තත්ත්වයට ලංකා විදුලිබල මණ්ඩලය පත් වුණා. ටෙන්ඩර් කැඳවන්නේ නැතුව වටරවුම් පාර හැදීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගමකට භාර දුන්නා. රුපියල් කෝටි 66,600කට කොන්ත්‍රාත්තුවක් භාර දුන්නා, ටෙන්ඩරයක් නැතුව. අහිංසක මිනිසුන් ඒවාට වන්දි ගෙවනවා. තමන්ගේ තාත්තාගේ සොහොන් ගෙය හැදුවා. ජනතා සල්ලි වියදම් කරලා. රුපියල් කෝටි 100ක් විතර වියදම් කරලා සොහොන් ගෙවල් හැදුවා. ඒ වාගේම වී විකුණා ගන්න බැහැ කියලා ගොවීන් කෑ ගහද්දී, 2014 අවුරුද්දේ සහල් ටොන් ලක්ෂ හයක් ආනයනය කළා. සමහර මන්ත්‍රීතුමන්ලාගේ ආච්චිලාට මැණික් මලු හම්බ වුණා. ආණ්ඩුව මාරු වුණාට පසුව සමහර හිටපු ඇමතිවරුන්ට තමන්ගේ වත්කම් පෙන්වා ගන්න බැරුව ගලේ පහරපු බළල්ලු වාගේ දහලන්න පටන් ගෙන තිබෙනවා. මොකක්ද, මේ රටට වුණේ?

මේ රටේ ජනතාවගේ සල්ලි ඒ විධියට නාස්ති කළ නිසා රට දුප්පත් රටක් බවට පත් වුණා. රටේ ආර්ථිකය පරිහානියට පත් වුණා. ඒ විතරක් නොවෙයි, ඒකාධිපති ක්‍රමයක් යටතේ ධනය, බලය තිබෙන අයට වැඩ කර ගන්න පුළුවන් සමාජයක් නිර්මාණය වුණා. සුදුස්සාට සුදුසු තැන ලැබුණේ නැති නිසා මේ රටේ හිටපු ඉගෙන ගත්ත බුද්ධිමත් මිනිසුන් රට ගැන කලකිරිලා රට හැර දමා යන කාලයක් උදා වුණා. මේවා හංගන්න බැහැ. රටේ ආර්ථිකය කඩා වැටුණා විතරක් නොවෙයි, ලෝකය ඉදිරියේ අපේ රට නීති විරෝධී වැඩ කරන රටක් බවට පත් වුණා. මහජන මුදල් විනාශ කරන රටක් බවට අපේ රට පත් වුණා. මේවා හංගන්න බැහැ. Transparency International වාගේ ආයතන ලෝකයට හඬ නඟා කියනවා, මෙන්න ලංකාවේ තත්ත්වය; මේකයි මේ රටේ තත්ත්වය කියලා.

"මමයි රජා" කියලා කෑ ගැහුවාට ලෝකය ඉදිරියේ මේවායින් වසන් වෙන්න බැරි වුණා. අපේ රට ලෝකය ඉදිරියේ අපකීර්තියට පත් වන විට අපට ලැබී තිබුණු GSP සහනය පවා අපට නැති වුණා. GSP සහනය අහිමි වීම නිසා රැකි රක්ෂා උත්පාදනය කිරීමට තිබුණු කර්මාන්තශාලා අපට නැති වුණා. අපේ ජාත්‍යන්තර මත්ස්‍ය වෙළෙඳාම කඩා වැටුණා. රාජ්‍ය මුදල් අවභාවිත කරන රටක්, ඒකාධිපති පාලනයක් තිබෙන රටක් වීම නිසා අපට ඒවා නැති වුණා. අපේ රටට රුපියල් කෝටි 3,000ක පමණ විදේශ විනිමය ලැබෙන එක නතර වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Transparency International ආයතනයේ records අනුව අල්ලස, දූෂණය නැති ලෝකයේ තිබෙන හොඳම රටවල් වන්නේ ඩෙන්මාර්කය, පින්ලන්තය, ස්වීඩනය, නවසීලන්තය, නෙදර්ලන්තය වැනි රටවලුයි. ඒ ගොල්ලෝ ඒ රටවලට ලකුණු 90ක් දීලා තිබෙනවා. ඒ වාගේම corruption වැඩිම රටවල් විධියට ලිබියාව, ඉරාකය, වෙනිසියුලාව, හයිටි රාජ්‍යය, යේමනය වැනි රටවල් නම් කරලා තිබෙනවා. ඒ රටවලට ලකුණු 20කට වඩා අඩු ප්‍රමාණයක් තමයි ලැබී තිබෙන්නේ. ඒ රටවල තමයි මෙවැනි සිදු වීම් සිදු වන්නේ. ඒ රටවල් දුප්පත් රටවල්. ඒ රටවලට කවදාවත් ගොඩ එන්න බැහැ. ලංකාවත් ඒ තත්ත්වයට පත් වෙලායි තිබුණේ. අපේ රටට අත්වුණු ඉරණම තමයි, අපි ලෝකයේ 83වන ස්ථානයට පත්වීම. ඒ විතරක් නොවෙයි. ඒ ශ්‍රේණිගත කිරීම තුළ අපට ලකුණු 40ක්වත් ගැනීමට හැකියාව ලැබුණේ නැහැ. එම නිසා මා විශේෂයෙන් කියනවා, මහජන මුදල් දූෂණය හා අල්ලස විනාශ කරන තෙක් මේ රටේ අනාගතය හදන්න අපට නොහැකි වන බව.

අපි දැක්කා, එක්කෝ මුදල් අල්ලස් දීලා, එක්කෝ ලිංගික අල්ලස් දීලා, විවිධ වරප්‍රසාද දීලා හෝ කමක් නැහැ, තමන්ගේ වැඩය කර ගන්න පුළුවන් හැකියාව තිබෙන සමාජයක් නිර්මාණය වෙලා තිබුණු බව. ඒ අය තමයි බලවත් වෙලා තිබෙන්නේ. මේ රටේ ජනතාවට විශ්වාසයක් තිබුණේ නැහැ. පොලීසියට ගියොත් අල්ලස් දෙන කෙනා දිනනවා. එහෙම නැත්නම් වෙනත් අල්ලස් ක්‍රමයකින් දිනනවා මිසක් සාධාරණය ඉෂ්ට වන්නේ නැහැයි කියන හැඟීම මේ රටේ ජනතාවට තිබුණා. අධිකරණයට ගියත් වැඩක් නැහැ. අධිකරණයට ගියත් බලපුළුවන්කාර මනුෂ්‍යයා දිනනවා මිසක් අහිංසක මනුෂ්‍යයාට තැනක් නැහැයි කියන හැඟීම ජනතාවට තිබුණා. උසාවි භූමියට ගිහින් බැලුවාම අපට පෙනෙනවා, සල්ලි තිබෙන මිනිසුන්, බලය තිබෙන මිනිසුන් උසාවි භූමියේ නැහැයි කියලා; දුප්පත්, අහිංසක මිනිසුන් තමයි උසාවි භූමියේ නඩුවලට පැටලිලා තිබෙන්නේ කියලා. එසේ වන්නේ අල්ලස්වල ප්‍රතිඵලයක් වශයෙන් කියන එක මේ රටේ හැමදෙනාම විශ්වාස කරනවා. රාජකාරි කටයුත්තක් කර ගන්න රජයේ කාර්යාලයකට ගියත්, අල්ලස් දීලා ඒ කටයුත්ත කර ගන්නවා හැරෙන්නට වෙන ක්‍රමවේදයක් නැහැ. මේ රටේ මතයක් තිබුණා, සල්ලි දීලා වැඩක් කර ගන්නවා මිසක් එයට වෙන විධියක් නැහැයි කියලා. අල්ලසක් දීලා වැඩක් කර ගන්නවා මිසක් එයට වෙන විධියක් නැහැයි කියන එක හිතට විතරක් නොවෙයි, තමන්ගේ ශරීරයේ තිබෙන ඇට මිදුලුවලට පවා කාවැදිලා තිබුණා. හැබැයි මේ ක්‍රමය තුළින් අතළොස්සක් බලවත් වුණා, අතළොස්සක් ශක්තිමත් වුණා. ඒ බලවත් අයගේ හඬ තමයි රට තුළ ක්‍රියාත්මක වන්න පටන් ගත්තේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
කථාව තවම පටන් ගත්තේවත් නැහැ. මට විනාඩි කීයක්ද තිබුණේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 8යි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
තවම විනාඩි 8ක් ගතවුණේ නැහැ. මට තව විනාඩි 2ක්වත් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ. කාලය මදියි. කථික මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඉන්නවා. ඔබතුමාගේ කථාව විනාඩියකින් අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාව පටන් ගන්න ලැබුණේත් නැහැ, කාලය අවසාන වෙලා.

මා කියනවා, විශේෂයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් දිල්රුක්ෂි වික්‍රමසිංහ මැතිනිය ඉතාමත් සාර්ථකව මේ කටයුත්ත නිම කරනවාය කියලා. නමුත් දැනට තිබෙන්නේ එදා තිබුණු අධිකරණ පද්ධතියයි. අල්ලස් දූෂණයට, වංචාවට ලක් වුණු පුද්ගලයන් අධිකරණයට යොමු වුණාට, අධිකරණ පද්ධතිය ශක්තිමත් කරන්නේ නැතුව තීන්දු තීරණ ඉක්මනට දෙන්න බැහැ. වෙනම අධිකරණයක් නැතුව අපට මේ තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්න බැහැ.

අවසාන වශයෙන් මා කියනවා, රජය බලාපොරොත්තු වන්නේ යහ පාලනයයි; රජය බලාපොරොත්තු වන්නේ මේ රටේ මහජන මුදල් හැම ශතයක්ම වැඩදායී ආකාරයට ආයෝජනය වනවා දකින්නයි කියලා. අපේ හෘදය වස්තුව ශක්තිමත් වුණාට වැඩක් නැහැ, රුධිර නාළයක block එකක් අති වුණොත් paralyse වනවා. අපට වෙනම අධිකරණයක් ඕනෑ. FCID එකේ ප්‍රශ්න විසඳන්න අධිකරණයක් ඕනෑ. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් දෙන නිර්දේශ මත ඒ සඳහා නඩු පැවරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට වෙනම අධිකරණයක් අවශ්‍යයි. කුමන ආකාරයෙන් හොරුන් අල්ලා දුන්නත්, තීන්දුවක් දෙන්නේ නැති නිසා, "තවමත් හොරු ඇල්ලුවේ නැහැ. තවමත් දඬුවම් දුන්නේ නැහැ"යි කියා ජනතාව බලා ගෙන ඉන්නවා. ඒ නිසා අවසාන වශයෙන්, FCID එකට වාගේම මෙම ආයතනයටත් වෙනම අධිකරණයක් පිහිටුවා නඩු ඇසීම ක්‍රියාත්මක කළ යුතුයි කියන කාරණය අධිකරණ ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

[ප.ප. 5.09]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் இலஞ்சம் அல்லது ஊழல் பற்றிய புலனாய்வு ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் கொடுப்பனவுகளை மறுசீரமைத்தல், சுயாதீன ஆணைக்குழுக் களின் தலைவர்கள் மற்றும் உறுப்பினர்களுக்குச் செலுத்தப்படும் ஊதியங்கள் மற்றும் ஏனைய படிகள் பற்றியதான விவாதம் காரசாரமாக நடைபெற்றுக் கொண்டிருக்கின்ற இவ்வேளையில், எனது கருத்தினையும் பதிவுசெய்யலாம் என்று நினைக்கின்றேன்.

எமது நாட்டை எடுத்துக்கொண்டால், இங்கு இரண்டு வகையானவர்கள் காணப்படுகின்றார்கள். கடமை, கண்ணியம், கட்டுப்பாடு உடையவர்கள் ஒரு வகையினர். கடமை, கண்ணியம், தட்டுப்பாடு உடையவர்கள் இன்னுமொரு வகையினர். நாங்கள் இவை இரண்டையும் நன்றாக வேறுபடுத்திக்கொள்ள வேண்டும். எமது நாட்டின் ஆட்சியானது கடமை, கண்ணியம், கட்டுப்பாட்டுடன் இருக்கின்றவர்களின் கைகளில் கிடைத்திருந்தால், சுவர்க்க பூமியாக மிளிர்ந்திருக்கும். அதேபோன்று அதிகாரிகளும் சரி, அரச உத்தியோகத்தர்களும் சரி, கடமை, கண்ணியம் கட்டுப் பாடுடன் செயற்படக்கூடிவர்களாக இருந்திருந்தால், இந்த நாடு என்றோ அபிவிருத்தியைக் கண்டிருக்கும். ஆனால், கடமை, கண்ணியத்தில் தட்டுப்பாடுடையவர்களின் கைகளுக்கு அடிக்கடி இந்த நாட்டின் ஆட்சி அதிகாரம் சென்றிருக்கின்ற காரணத்தினால், இந்த நாட்டினைக் கட்டியெழுப்பக்கூடிய நிலைமை பின்னோக்கியதாக அமைந்திருக்கின்றது.

கடமை, கண்ணியம் கட்டுப்பாட்டுடன் பணியாற்று கின்றவர்கள் சம்பளத்தைத் தவிர, வேறு எதனையும் மற்றவர் களிடம் எதிர்பார்க்கமாட்டார்கள். அவ்வாறு எதிர்பார்க்காமல் நியாயமான முறையில், நேரிய பாதையில் பணியாற்றுகின்ற, கடமை, கண்ணியம் கட்டுப்பாட்டுடன் செயற்படுகின்ற பணிப்பாளர் நாயகத்துக்குச் சம்பளத்தை அதிகரித்துக் கொடுக்கவேண்டிய தேவை இருக்கின்றது. ஆனால், இலஞ்சம் அல்லது ஊழல் மோசடிகள் தலைவிரித்தாடக்கூடிய விதத்தில் நாட்டின் நிலைமை காணப்படுமாக இருந்தால், இலஞ்சம் அல்லது ஊழல் ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்துக்குச் சம்பளத்தை அதிகரித்துக்கொடுப்பதில் எந்தவித அர்த்தமு மில்லை. நியாயமாக, நேரிய பாதையில் செயல்பட்டு நாட்டில் இலஞ்சம் அல்லது ஊழல் மோசடிகளை ஒழிக்கக்கூடிய தலைவர்கள் இருப்பார்களாக இருந்தால், அவர்களுக்கு - கண்ணியமாக இருக்கின்றவர்களுக்கு, நல்லவர்களாக இருக்கின்றவர்களுக்கு, வல்லவராக இருக்கின்றவர்களுக்கு - சம்பளத்தை அதிகரித்துக்கொடுப்பதில் எந்தவிதமான ஆட்சேபனையும் இருக்க முடியாது.

இந்தியா எமது நாட்டுக்குப் பக்கத்திலுள்ள ஒரு நாடு என்பது எங்களுக்குத் தெரியும். இப்பொழுது, டில்லியில் ஆம்ஆத்மி கட்சியைச் சேர்ந்த அரவிந்த் கெஜ்ரிவால் என்பவர் முதலமைச்சராக இருக்கின்றார். இவர் பண பலமோ, அதிகார பலமோ, படை பலமோ இல்லாத ஒரு சாதாரண அரசியல்வாதியாக இருந்தார். அவர் நேர்மை, உண்மை, கடமை, கண்ணியம், கட்டுப்பாடு போன்றவற்றைத் தன்னுடைய நெறிகளாகக் கொண்டு தேர்தலில் போட்டியிட்ட போது, சட்ட சபையில் மொத்தமாகவுள்ள 67 ஆசனங்களில் 64 ஆசனங்களைக் கைப்பற்றினார். இது நேர்மை, உண்மை, கடமை, கண்ணியம், கட்டுப்பாடுடைய ஒரு தலைவருக்கு மக்கள் வழங்கிய ஒரு தீர்ப்பாக அமைந்தது. எனவே, எப்போதும் மக்கள் சரியான தலைவர்களை, நேர்மையான தலைவர்களை, கண்ணியமான தலைவர்களைத் தெரிவு செய்வதன்மூலம் இலஞ்சம் அல்லது ஊழல் மோசடிகளை ஒழித்துக்கட்ட முடியும்.

இந்தச் சந்தர்ப்பத்தில் ஒரு சினிமாப் பாடலொன்றிலுள்ள, "திட்டம் போட்டுத் திருடுற கூட்டம் திருடிக் கொண்டேயிருக்குது, அதைச் சட்டம் போட்டுத் தடுக்கின்ற கூட்டம் தடுத்துக்கொண்டேயிருக்குது" என்ற வரிகள் என் ஞாபகத்திற்கு வருகிறது. எனவே, மக்களிடமிருந்து பெறப்படுகின்ற இந்த வரிப்பணங்கள் சரியான முறையில் மக்களுக்காக, நாட்டுக்காகச் செலவு செய்யப்படுகின்றனவா என்பதைப் பற்றி நாங்கள் பார்க்க வேண்டும். தற்போது பாரிய நிதிமோசடி சம்பந்தமாக விசாரணை செய்யும் குழுவின்

முன்னிலையில் ஆஜர்படுத்தப்படுகின்றவர்களின் எண்ணிக்கையைப் பார்க்கின்றபோது, எவ்வாறு இந்த நாடு சென்றிருக்கின்றது என்பதை நாங்கள் அறிந்துகொள்ளக் கூடியதாக இருக்கின்றது. எனவே, எமது நாடு ஒரு சட்டவாட்சியை நோக்கி, நல்லாட்சியை நோக்கி, ஒரு பரிபூரணமான ஜனநாயகத்தை நோக்கிச் செல்லவேண்டுமாக இருந்தால், இலஞ்ச ஊழல்கள் பற்றிப் புலனாய்வு செய்கின்ற, ஆணைக்குழுக்கள் வீரியமுள்ளதாகவும் விவேகமாகவும் வேக மாகவும் செயற்படவேண்டிய தேவையிருக்கின்றது. அவ்வாறு செயற்படுகின்றபோதுதான் இந்த நாட்டிலுள்ள அதிகாரிகள் மீது, நிர்வாகிகள்மீது மக்கள் நம்பிக்கை கொள்ளக் கூடியவர்களாக இருப்பார்கள்.

உண்மையில் சில தலைவர்கள் மிகவும் புனிதமாகவும் மனிதத்துவமாகவும் நடந்து தங்களுடைய பணிகளைச் செவ்வனே நிறைவேற்றிக் காட்டியிருக்கின்றார்கள். நான் ஒரு பத்திரிகையில் அரசியல்வாதி ஒருவரின் விடயம் பற்றி வாசித்தேன். அது இடதுசாரி உறுப்பினரான, நீண்டகால அனுபவமுடைய வாசுதேவ நாணாயக்கார அவர்கள் பற்றியதாகும். அவர் ஒருமுறை வெளிநாடொன்றுக்குச் சென்று விட்டு நாடு திரும்பியதன் பின்னர் தனக்குக் கொடுக்கப்பட்ட 2,50,000 ரூபாய் பணத்தில் மிகுதியாக இருந்த 60,000 ரூபாயை நேரடியாக அரசாங்கத்திடமே ஒப்படைத்ததாக அந்தப் பத்திரிகை குறிப்பிட்டிருந்தது. இவ்வாறாக நேர்மையாகப் பணியாற்றுகின்ற உண்மையான அரசியல் தலைவர்களும் இருக்கத்தான் செய்கின்றார்கள். நிதி மோசடிகள் இல்லாமல், நிதியைத் தவறான முறையில் கையாளாமல் சரியான முறையில் கையாள்கின்ற தலைவர்களை எப்போதும் மக்கள் பாராட்டுகின்றார்கள். சற்று முன் உரையாற்றிய சக உறுப்பினர், நிதி மோசடிகள் இல்லாமல் செயற்பட்ட தலைவர்களைப் பற்றிப் பட்டியலிட்டுக் கூறியிருந்தார். இதன்படி பார்க்கின்றபோது எமது நாட்டிலும் கடமை, கண்ணியம், கட்டுப்பாட்டுடன் செயற்படுகின்ற அரசியல் வாதிகள் இருக்கின்றார்கள் என்பதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது.

எனவே, இன்றைய நிலையில் இலஞ்சம், ஊழல் மோசடிகள் என்பவற்றுக்கெதிராக அதற்குரிய விசாரணைகளை மேற் கொண்டு சரியான நடவடிக்கை எடுக்கக்கூடியவர்களுக்கு, நேர்மையாகச் செயற்படுகின்றவர்களுக்கு, ஒரு சுத்தமான விசாரணையை மேற்கொள்கின்றவர்களுக்கு, எந்த ஓர் அதிகார பலத்திற்கும் அல்லது பணபலத்திற்கும் அடிமையாகாமல் செயற்படக்கூடிய அத்தகைய ஆணையாளர்களுக்குச் சம்பளங்களை அதிகரித்துக் கொடுப்பதென்பது உண்மையில் வரவேற்கத்தக்கதொரு விடயமாகும். ஆனால், இதற்குரிய அதிகாரிகள், ஆணையாளர்கள் செயற்பட்டுக் கொண்டிருக்கின்றபோதும் நாட்டில் இலஞ்சம், ஊழல், மோசடிகள் அதிகரித்துக்கொண்டு செல்லுமாக இருந்தால், அந்த ஆணையாளர்களுக்கு வழங்கப்படுகின்ற சம்பளங்கள் அர்த்தமற்றவையாக மாறிவிடும். ஆகவே, இலஞ்சம், ஊழல் மோசடிகள் போன்றவற்றால் கபடத்தனமாக நாட்டையும் மக்களையும் சூறையாடுகின்ற நிலைமைகளிலிருந்து பாதுகாக்கக்கூடிய விதத்தில் ஆணையாளர்கள், அதிகாரிகள் செயற்படவேண்டிய தேவையிருக்கின்றது. அவ்வாறு செயற்படுகின்றபோதுதான் உண்மையில் 'நல்லாட்சி' என்பது அர்த்தமுள்ள ஓர் ஆட்சியாக அமையும். இல்லாதுவிட்டால், 'நல்லாட்சி' என்பது வெறும் சொல்லாட்சியாகத்தான் இருக்குமேயொழிய, உண்மையான நல்லாட்சியாக இருப்பதற்கு வாய்ப்பு இல்லை. அந்த வகையில் இன்று இங்கு கொண்டுவரப்பட்டிருக்கின்ற ஆணைக்குழுக்களின் அதிகாரிகளுக்குச் சம்பளங்களை அதிகரித்துக் கொடுக்கின்ற இந்தப் பிரேரணையைப் பொறுத்தமட்டில் அப்படியான அதிகாரிகள் நியாயமாக, நிதானமாக, சரியாகச் செயற்படு வதற்கு அந்தச் சம்பள அதிகரிப்பு என்பது அவர்களுக்கு ஒரு பலமாக இருக்க முடியும்.

உண்மையில் கஷ்டப்பட்டுத் தங்களுடைய கடமைகளை நேர்மையுடன் நியாயமாகச் செய்யக்கூடிய உண்மையான அதிகாரிகளின் வீட்டில் எப்போதும் வறுமைதான் வரவேற்றுக் கொண்டிருக்கின்றது. ஒரு மனிதனைப் பற்றி அறிவதாக இருந்தால் அவனிடம் இரண்டு விடயங்களைக் கொடுத்து விட்டுப் பார்க்க வேண்டும் என்று சொல்வார்கள். ஒன்று பணத்தைக் கொடுத்துவிட்டுப் பார்ப்பது. இரண்டாவது அதிகாரத்தைக் கொடுத்துவிட்டுப் பார்ப்பது. பணத்தையும் அதிகாரத்தையும் கொடுக்கின்றபோது ஒருவன் தன்னுடைய நிலையிலிருந்து தளம்பாமல் நியாயமாகச் செயற்படுவானாக இருந்தால் அவன் உண்மையில் கடமை, கண்ணியம், கட்டுப்பாடுடைய மனிதனாக மதிக்கப்படுகின்றான். இப்படிப்பட்ட மனிதர்களை மக்கள் எப்போதும் மதிக்கின்றார்கள்; துதிக்கின்றார்கள்; நேசிக்கின்றார்கள்; பூசிக்கின்றார்கள். அந்த வகையில் இந்த நாட்டில் 'நல்லாட்சி' என்கின்ற ஒரு பொறிமுறையினை நல்ல திசையை நோக்கி நகர்த்துவதற்கு உண்மையான அதிகாரிகள் மற்றும் உண்மையான ஆணையாளர்கள் தேவைப்படுகின்றார்கள். அரசியல்வாதிகளுக்கு அடங்கிப் போகின்ற, பணத்துக்கு அடங்கிப்போகின்ற அதிகாரிகள், அரசியல்வாதிகள் இருப்பார்களாக இருந்தால் இந்த நாட்டில் 'நல்லாட்சி' என்பது பொய்த்துப் போவதற்கு வாய்ப்பு இருக்கின்றது. அவ்வாறு இல்லாமல் நல்லாட்சி நல்ல திசையை நோக்கி நகர வேண்டும்; நாட்டில் நல்லவை நடக்க வேண்டும். அப்படியான ஒரு சூழ்நிலை உருவாக வேண்டுமாகவிருந்தால் இந்த அதிகாரிகள் எப்போதும் நல்ல பண்புள்ளவர்களாக, கடமை, கண்ணியம், கட்டுப்பாடு உள்ளவர்களாக, கடமை, கண்ணியத்தில் தட்டுப்பாடு அற்றவர்களாக இருக்கவேண்டிய தேவையிருக் கின்றது. எனவே, எதிர்காலத்தில் இந்த ஆணைக்குழுக்கள் அவர்களால் ஆளுகை செய்யப்படுகின்றபோது எந்தவிதத் திலாவது நாட்டில் இலஞ்சம், ஊழல்கள் ஒழிக்கப்படுமாக விருந்தால் இப்படியான இந்தப் பிரேரணைமூலம் அவர்களுக்குச் சம்பளங்களை அதிகரித்துக் கொடுப்பதில் எந்தக் குறையுமில்லை என்பதைச் சுட்டிக்காட்டி, அமைகின்றேன். நன்றி.

[අ.භා. 5.20]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීමත්, ඒ වාගේම ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරුන් හා සාමාජිකයන් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා දීමනා ගැනත් සාකච්ඡා කරන මේ අවස්ථාවේ මුලින්ම සඳහන් කරන්නට ඕනෑ, අද මේ රටේ ලොකු වෙනසක් ඇති වෙලා තිබෙන බව. ඒ වෙනස තමයි ස්වාධීනව අධිකරණය ක්‍රියාත්මක වීම වාගේම ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක වීම. එක කාලයක මේ කොමිෂන් සභා ස්වාධීනව ක්‍රියාත්මක කරන්න වෑයම් කරන කොට, හුඟක් වෙලාවට එදා තිබුණු රජයන් ඒවාට හරස් කැපුවා. උදාහරණයක් කිව්වොත් ඒවා නිරීක්ෂණය කරන්න අවශ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන් නොදුන්න කාලයකුත් තිබුණා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ඇත්තටම අද ඒක වෙනස් වෙලායි තිබෙන්නේ. ඕනෑම රාජ්‍ය සේවකයෙක් ස්වාධීන වෙන්න නම් ඒ රාජ්‍ය සේවකයාට නිසි වැටුපක් හා දීමනා දිය යුතුයි. පුද්ගලයෙක් මූල්‍ය වශයෙන් ස්වාධීන නැත්නම් ඇත්තටම ඒ පුද්ගලයා ස්වාධීන නැහැ. මම මෙතැනදී පොදුවේ රාජ්‍ය සේවය ගැනයි කථා කරන්නේ. මම හිතන විධියට රාජ්‍ය සේවකයන්ට; විශේෂයෙන්ම ඉහළ නිල තල දරන රාජ්‍ය සේවකයන්ට නිසි පඩිපත්, දීමනා ගෙවන්න අවශ්‍යයි. පුරවැසියන් හැටියට ඒක කරන්න අපට වගකීමක් තිබෙනවා. එහෙම කළේ නැත්නම් අපි ඔවුන්ට වෙනත් ආකාරයෙන් මුදල් සොයා ගන්න මාර්ගයක් සලසා දෙනවා. මෙතැනදී අපි සමාජයක් හැටියට යම් කිසි තීරණයක් ගත යුතුයි. විශේෂයෙන්ම අපේ රාජ්‍ය සේවය ගැන කථා කරන කොට හුඟක් වෙලාවට දේශපාලනඥයන්ට තිබෙන පීඩනය තමයි, රාජ්‍ය සේවාවේ සංඛ්‍යාව වැඩි කිරීම. නමුත් අපට ඊට වඩා වගකීමක් තිබෙනවා, රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩි කිරීමට. ඒ නිසා ඔවුන්ගේ දීමනා පඩිපත වැඩි කිරීම සඳහා පුරවැසියන් හැටියට අපි වගකීමක් ගත යුතුයි.

මම ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ කථාව අහ ගෙන හිටියා. දැන් එතුමා මෙතැන නැහැ. මේ අවස්ථාවේ මෙවැනි සාකච්ඡාවක් පවත්වන එක රජය මේ සභාපතිවරුන්ට අල්ලසක් දෙනවා වාගේ කියන අදහස එතුමා ඉදිරිපත් කළා. මම කියන්නේ ඒ අදහස සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්න ඕනෑ කියලායි. නමුත් ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්න නම් මම හිතන විධියට මේ කොමිෂන් සභාවල සභාපති ධුරය දරන; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන අයගේ පඩිපත තීරණය කරන කොට වසරින් වසර ඒක තීරණය වෙන්න ඕනෑ නැහැ. ඒ නිසා ඒ පඩිපත සහ අනෙක් දීමනා ඒ තනතුරුවලට සම්බන්ධ කළොත් හැමදාම ඒ තනතුරුවලට සමානව ඒවා තීරණය වෙයි කියලා අපි දන්නවා. මේ වතාවේ ඒ යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමියට දෙන මාසික වැටුප හා දීමනා, අතිරේක සොලිසිටර් ජනරාල් - Additional Solicitor-General - තනතුරට අදාළ මාසික වැටුප සහ සියලු දීමනාවලට සම කරන්නය කියන අදහස ඇතුළත් කර තිබෙනවා. මම හිතන විධියට ඒක හුඟක් හොඳ අදහසක්. එතකොට කවදාවත් සැකයක්වත් තියා ගන්න බැහැ රජය ඒ පුද්ගලයාගේ මුහුණ දිහා බලලා එක එක වැඩිවීම් සිදු කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දෙවනුව කියන්න අවශ්‍ය කරුණක් තිබෙනවා. ඒක තමයි රාජ්‍ය සේවකයන්ට යම් කිසි දීමනාවක් දෙන එක. පසු ගිය පාර්ලිමේන්තුවේත් නොයෙකුත් අවස්ථාවල ඒ අදහස ඉදිරිපත් කළා. ඒ දීමනා දිය යුත්තේ මුදලින් කියන එක තමයි මගේ අදහස වන්නේ. බොහෝ විට අපි මුදල් දීලා ඊට පස්සේ කියනවා, "කාර් එකට බලපත්‍රයක් - car permit එකක්- දෙමු"යි කියලා. එහෙම සඳහන් කළාම රට තුළ සැකයක් ඇති වනවා, සහවලා විශාල දීමනාවක් දෙනවාය කියලා. නමුත් ඇත්ත කථාව ඒක නොවෙයි. මා හිතන හැටියට මන්ත්‍රීවරුන් විතරක් නොව රාජ්‍ය සේවකයන්, රජයේ ඉහළ නිලධාරීන්, ඉහළ වෛද්‍ය නිලධාරීන් ඇතුළුව මේ permit එක ලැබෙන අය දන්නවා, එයට යම්කිසි වටිනාකමක් තිබෙනවාය කියලා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට රුපියල් 54,000ක දීමනාවක් ලැබෙනවා. මට මතකයි, ඒ permit එකේ වටිනාකම රුපියල් මිලියන 10ක් පමණ වනවාය කියලා පසු ගිය පාර්ලිමේන්තුවේදීත් සඳහන් කළ බව.

ඒ මුදල මාස 60කින් බෙදුවොත් මාසයකට රුපියල් 1,66,000ක් වෙනවා. ඒ මන්ත්‍රීතුමාට leasing company එකකින් අරගෙන වාහනයක් දුන්නා නම් අඩුම වශයෙන් එය රුපියල් ලක්ෂයක් ඒ වෙනුවෙන් ගෙවන්න වෙනවා. ඇත්තටම ඉතිරි මුදල වන රුපියල් 66,000ට, රුපියල් 54,000 එකතු කළොත් මාසයකට ගෙවිය යුතු මුළු ගෙවීමම වෙන්නේ රුපියල් 1,20,000ක් පමණයි. මා ඒ කාරණය පැහැදිලි කළේ මෙන්න මේ නිසයි. නැත්නම් රට තුළ මතයක් ඇති වෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විශාල පඩිපතක් ලබනවාය කියලා. ඒක නොවෙයි, ඇත්ත කථාව. මේ කාරණය අදාළ වෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි. වෛද්‍යවරුන්ටත්, රජයේ ඉහළ නිලධාරීන්ටත් මේ කාරණය අදාළ වෙනවා. ඒ නිසා මේ සැකය නැති කරන්න අවශ්‍යයි. රාජ්‍ය දීමනා පාරදෘශ්‍ය වෙන්න නම් මුදලින්ම මේ දීමනා දෙන එක වැදගත් වනවා. මේක රජයේ යෝජනාවක් වෙන්න ඕනෑ නැහැ. රජයයි, විපක්ෂයයි එකතුවෙලා, රට ගැන හිතලා, ඉදිරිය ගැන හිතලා, මේ වාගේ දේවල් වෙනස් කරන්න අපි යම්කිසි පොදු ප්‍රතිපත්තියකට එන්න ඕනෑ. මුදල් ඇමතිතුමා පසු ගිය අය වැයේදී මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කළාම විශාල විරෝධයක් ඇති වුණා. නමුත් අපි කළ යුත්තේ සාකච්ඡාවක් ඇති කරලා, රාජ්‍ය සේවකයන්ට මීට වැඩිය ඔබින සුදුසු පඩි පතක් ගෙවන්නට කටයුතු කිරීමයි. එතකොට පාරදෘශ්‍යභාවය වැඩි වෙනවා.

ද්‍රව්‍යමය වශයෙන් නොදී ඒ සහනාධාර මුදලින් දෙන එකේ යහපත්කම මෙන්න මේ නිසයි. පොහොර සහනාධාරය ගැන හිතුවොත් පසු ගිය කාලයේදී පොහොර සහනාධාරය දුන්නේ ද්‍රව්‍යමය වශයෙන් පොහොර ලෙසයි. අද අප මුදලක් හැටියටයි ඒ සහනාධාරය ලබා දෙන්නේ. රාජ්‍ය ගිණුමකින් රුපියල් 100ක් බැර කළා නම්, කෙළින්ම ඒ රුපියල් 100ම ගොවි මහත්තයාට යනවා. අතරමැදියන්ට ඒකෙන් කිසිවක් ලැබෙන්නේ නැහැ. ද්‍රව්‍යමය දෙයක් දෙනකොට අතරමැදියන් ඒකෙන් කොටසක් ලබා ගන්නවා. නමුත් ද්‍රව්‍යමය වශයෙන් නොදී ඒක කෙළින්ම මුදලින් දුන්නොත්, රුපියල් සියයක් දෙනවා නම් රුපියල් සියයම ගොවි මහත්තයාගේ ගිණුමට කෙළින්ම බැර කරන්න පුළුවන්. මුදලින් දීමේ තිබෙන වාසිය මේකයි. වාහන permit එකක් දුන්නාම හුඟක් වෙලාවට ඒ වාහනයම ගන්න සිදු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
විනාඩි නවයක් ගත වුණේ නැහැ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි නවය අවසානයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එහෙනම් මම මගේ කථාව ඉක්මනට අවසන් කරන්නම්. මම කියමින් හිටපු කරුණ අමතක කරලා අවසාන කරුණ ගැන කියන්නම්.

මේ රටේ ජනතාව බොහොම කලකිරීමකින් සිටිනවා, අධිකරණයේ පවතින නඩු විශාල වශයෙන් ප්‍රමාද වීම සම්බන්ධයෙන්. අල්ලස, දූෂණය සම්බන්ධයෙන් අධිකරණයේ පවතින නඩු කටයුතු ප්‍රමාද වීම නිසා ජනතාව තවතවත් කලකිරෙනවා. පාර්ලිමේන්තුවේ හුඟක් ඉන්නේ වංචාකාරයින්,

හොරුන් කියලා ජනතාව අතර මතයක් තිබෙනවා. මේක ඇත්ත කියලා මා නම් පිළිගන්නේ නැහැ. හොරු, වංචාකාරයින් ඕනෑම තැනක ඉන්නවා. පාර්ලිමේන්තුවේත් ඉන්නවා වෙන්න පුළුවන්. ඒ නිසා මා යෝජනා කරනවා, අල්ලස, දූෂණය සම්බන්ධයෙන් පමණක් කටයුතු කරන්න විශේෂ අධිකරණයක් ඇති කරන්න කියලා. රජයේ තනතුරු දරන නිලධාරීන් වෙන්න පුළුවන්, මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, ඇමතිවරු වෙන්න පුළුවන්, කවුරු වුණත් කමක් නැහැ, විශේෂ අධිකරණයක් ඇති කරලා, ප්‍රමාදයක් නොමැතිව මේ අයව අධිකරණයට ඉදිරිපත් කරලා, වැරැදිකරුවන් නම් ඔවුන්ට දඬුවම් ලබා දෙන්න කියලා ඉල්ලමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා - වෙළිනාට්ටලුවල්කළ් පිරති අමෛච්චර්)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)
විනාඩි හතරක් මට ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු එඩ්වඩ් ගුණසේකර මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

අතන් පිරකු, මාණ්පුමිකු ලක්කි ජූයවර්තන අවර්කළ් *අක්කිරාසනත්තිනින්රු අකලවේ,* මාණ්පුමිකු එට්වට් කුණසේකර අවර්කළ් *තලෛමෛ වකිත්තාර්කළ්.*

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබී තිබෙනවා.

[අ.භා. 5.29]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මා ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමා කියපු කථාවත් එක්ක එකඟ වෙනවා. "හොරු" කියන ජාතිය පක්ෂ, පාට, ආගම් සහ ජාති බේදයකින් තොරව තමයි ඉන්නේ. නිල් හොරු ඉන්නවා, කහ හොරු ඉන්නවා, රතු හොරු ඉන්නවා, කොළ හොරු ඉන්නවා. නොයෙකුත් ජාතියේ හොරු ඉන්නවා. හොරකම පිළිකාවක් වාගේ අපේ සමාජයේ පැතිරිලා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත කථාව. දැන් පොඩ්ඩකට කලින් අපි COPE එකේ හිටියා. "Permit එකක් ගන්න රුපියල් ලක්ෂ හයක් දුන්නා, නමුත් ඒ රුපියල් ලක්ෂ හය මදි. තවත් රුපියල් ලක්ෂ තුනක් ඉල්ලුවා, රුපියල් ලක්ෂ නවයක් දීලා තමයි permit එක ගත්තේ" කියලා එතැනදී කථා වුණා. එය එහෙම සිදු වුණු එක permit එකක් සම්බන්ධයෙන් කථාවක් පමණක් නොවෙයි. මේ රටේ හැම තැනම පගාවට තමයි වැඩ කරන්නේ. කවුද, එහෙම නැහැ කියලා කියන්නේ? පොඩි මිනිහාගේ ඉඳලා ලොකු මිනිහා දක්වා පගා ගහනවා. කාලයක් තිස්සේ මේක තමයි මේ රටේ සිදු වුණේ. මේ ක්‍රමය ඇත්තටම වෙනස් කරන්න ඕනෑ නම්, එක් කෙනෙකුගේ පඩිය වැඩි කරලා, එක් කෙනෙකුට තනතුරක් ලබා දීලා මදි. ඒ සඳහා අපි සියලුම දෙනාම එකතු වෙලා වැඩ කරන්න ඕනෑ; ඕනෑකමින් වැඩ කරන්න ඕනෑ.

මට කථා කරන්න තිබෙන අවසාන විනාඩියේදී මේ දෙයත් කියන්න ඕනෑ. දූෂණය සහ වංචාව කියන්නේ පිළිකාවක්. පක්ෂ භේදයකින් තොරව අපි මේ පිළිකාව නැති කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

දැනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පත් කර සිටින අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප වැඩි කර ඇයට අවශ්‍ය පහසුකම් ලබාදීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. මට මතකයි, එතුමිය එම තනතුරට පත්වෙන්න කලින් මම එතැනට ගිය වෙලාවේ එතැන හිටපු පුද්ගලයා මට කිව්වා, "අපේ ආයතනයට අවශ්‍ය computers නැහැ; වාහන නැහැ; මිනිස්සු නැහැ. ඒ නිසා අපට මේ වැඩේ කරගන්න බැහැ" කියලා. ඒ අවශ්‍ය පහසුකම් අපි ලබා දිය යුතුයි.

හොරා නිල්ද, කොළද, රතුද, කහද කියලා බලන්න එපා. හොරකම් කළොත් පක්ෂ භේදයකින් තොරව අල්ලලා දඬුවම් දෙන්න ඕනෑ කියන එක මම ඉතාමත්ම වග කීමෙන් කියනවා. අපි සියලු දෙනාම ජනතාවට වග කියන්න ඕනෑ. දූෂණය, වංචාව නැති කරනවා කියලා ජනතාවට පොරොන්දුවක් දීලායි අපි ආවේ. දූෂණය හා වංචාව නැති කරන්න අපි මේ පාර්ලිමේන්තුව පක්ෂ භේදයකින් තොරව ඉදිරිපත් විය යුතුයි කියන මතය ප්‍රකාශ කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 5.31]

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(මාණ්පුමිකු ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉලඤ්චම් මට්රුම් ඌழல් පට්රිය පුලනාය්වු ආණෛක්කුழුවින් පණිප්පාළර් නායකත්තින් චම්පළම් මට්රුම් කොටුප්පනවුකළෛ මරුසීරමෛත්තල් මට්රුම් සුයාතීන ආණෛක්කුழුක්කළින් තවිසාළර් මට්රුම් උරුප්පිනර්කළුක්කුච් චෙලුත්තප්පටුම් ඌතියංකළ් පට්රිය ඉන්රෛය පිරේරණෛකළ් තොටර්පාකප් පේසුවතර්කුච් චන්තර්ප්පම් කොටුත්තමෛක්කාක උංකළුක්කු නන්රියෛක් කූර්ක්කොළ්කින්රේන්, උණ්මෛයිලේ ඉන්ත ඉලඤ්චම්, ඌழல් පෝන්ර ඉන්නෝරන්න විටයංකළ්

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

தலையெடுப்பதற்குச் சம்பளம் தொடர்பான விடயம் மிக முக்கியமான ஒரு காரணமாக அமைந்திருக்கின்றது,

இலஞ்சம் மற்றும் ஊழல் என்பது ஒரு புற்றுநோய் போன்றது. மனித உடலிலே புற்றுநோய் 3 கட்டங்களை அடைகின்றது. முதலாவது கட்டம் அல்லது இரண்டாவது கட்டங்களில் அந்தப் புற்றுநோய் கண்டுபிடிக்கப்பட்டால் மருத்துவத்தினால் ஓரளவு குணமாக்க முடியும். ஆனால், அது மூன்றாம் கட்டத்தை அடையுமானால் மருத்துவத்தினால் குணமாக்குவதென்பது இலகுவான விடயமல்ல. அதுபோன்றுதான் இலஞ்சம் மற்றும் ஊழல் என்கின்ற புற்றுநோய் முதலாவது கட்டத்தில் அல்லது இரண்டாவது கட்டத்திலே கண்டுபிடிக்கப்பட்டால் இந்த நாட்டை அழிவிலிருந்து பாதுகாத்துக்கொள்ளலாம். ஆனால், இன்று இது ஆரம்பத்திலிருந்து படிப்படியாக வளர்ச்சியடைந்து ஒரு பாரிய கட்டத்தை, அடைவை அடைந்திருக்கின்றது. ஆகவே, இந்த இலஞ்சம் மற்றும் ஊழல் என்ற விடயம் எனக்கு முன் பேசிய கௌரவ உறுப்பினர் அவர்கள் கூறியதுபோல் அடிமட்டத்திலிருந்து ஆரம்பிக்கின்றது. சாதாரண அரச அலுவலகங்களிலிருந்து, தனியார் துறைகளிலிருந்து மட்டுமல்லாது பாடசாலைகளிலிருந்துகூட இது ஆரம்பிக்கின்றது. தரம் ஒன்றுக்கு மாணவர்களை அனுமதிப்பதில் ஆரம்பித்து, இன்று அரசாங்க மட்டத்திலே உயரதிகாரிகள் தொடக்கம் அரசியல்வாதிகள் வரை பரவிநிற்கின்றது. ஆகவே, மாறிமாறி வருகின்ற அரசாங்கங்கள் இந்த இலஞ்சம் மற்றும் ஊழல் என்ற புற்றுநோயை ஆரம்பத்திலேயே கண்டறிந்து குணப்படுத்துவதற்குச் சரியான திட்டங்களை வகுத்து நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டும்.

இன்று உலகிலே அபிவிருத்தியடைந்த நாடுகள் பட்டியலை எடுத்துப் பார்த்து, அவை அபிவிருத்தியடைந்திருப்பதற்கான காரணம் என்ன என்பதை நாம் ஆய்வு செய்யவேண்டும். அபிவிருத்தியடைந்த நாடுகளிலே நிச்சயமாக அரச துறை வேலைவாய்ப்புக்களாக இருந்தாலும் சரி, தனியார் துறை வேலைவாய்ப்புக்களாக இருந்தாலும் சரி, அங்கு வேலை செய்பவர்களுக்கான வேதனங்கள் - சம்பளங்கள் அவர்களுடைய வேலைக்கேற்ப, அவர்களுடைய வாழ்வை நடத்துவதற்கேற்பச் சரியான முறையிலே வழங்கப்படுவதால் அந்த நாடுகளிலே இலஞ்சம் மற்றும் ஊழல் என்பன மிகமிகக் குறைவாக இடம்பெறுகின்றன. அதேநேரம் அந்த நாடுகள் அபிவிருத்தியை நோக்கி வளர்ச்சியடைந்து கொண்டிருக்கின்றன. ஆனால், இந்த நாட்டை எடுத்துக்கொண்டால் இங்கு உடலை வருத்தி மிகவும் கஷ்டப்பட்டு வேலை செய்கின்றவர்களுக்கான சம்பளம் அல்லது வேதனக் கொடுப்பனவுகள் மிகவும் அடிமட்டத்தில் இருக்கின்றன. அதேநேரம் இன்று பல துறைகளிலும் தொழில் புரிகின்றவர்களுக்கான கொடுப்பனவுகள் குறைவாக இருப்பதனால்தான் இலஞ்சம் மற்றும் ஊழல்கள் ஏற்படுவதற்கான வாய்ப்புக்கள் ஏற்படுகின்றன.

இன்று இந்த நாட்டில், உண்மையிலே இலஞ்சம் அல்லது கையூட்டு மற்றும் ஊழல் என்பவற்றால் கூடுதலாகப் பாதிக்கப்படுகின்றவர்கள் யார்? குறிப்பாக கிராமங்களைச் சேர்ந்த படிப்பறிவில்லாத, அன்றாடம் தங்களுடைய வாழ்க்கையைக் கொண்டுநடத்துவதற்குக் கஷ்டப்படுகின்ற அந்தப் பாமர மக்கள்தான் இன்று இலஞ்சம் மற்றும் ஊழலால் கூடுதலாகப் பாதிக்கப்படுகின்றவர்களாகக் காணப்படுகின்றார்கள். சாதாரணமாக ஓர் அலுவலகத்தை எடுத்துக்கொண்டால் - அது ஓர் அரச அலுவலகமாக இருக்கலாம், தனியார்துறை அலுவலகமாக இருக்கலாம் - அங்கு செல்கின்றவர்கள் தங்களுடைய தேவைகளை உரிய நேரத்தில் நிவர்த்திசெய்து கொள்ள முடியாமல் மணித்தியாலக் கணக்காக, நாள் கணக்காக, மாதக் கணக்காக அலைய வேண்டியிருக்கின்றது. சில அலுவலகங்களைப் பொறுத்தவரையில் அந்த அலுவலகங்களுக்கு வெளியில் நிற்கின்றவர்களுக்கு அல்லது அந்த அலுவலகங்களில் வேலை செய்பவர்களுக்கு ஏதாவது கையூட்டு அல்லது இலஞ்சம் கொடுத்துத்தான் அந்த அலுவலகங்களில் காரியங்களைச் செய்துமுடிக்க வேண்டியிருக்கின்றது. இந்த நாட்டிலே இவ்வாறு அனைத்துத் துறைகளிலுமே ஏதோ ஓர் அடிப்படையில் இலஞ்சம் மற்றும் ஊழல் இடம்பெற்றுக்கொண்டுதான் இருக்கின்றது.

இன்று பலர் பாரிய குற்றச் செயல்களில் ஈடுபடுவதற்கு பொலிஸாரும் ஒரு காரணமாக அமைந்துவிடுகின்றார்கள். சட்டவிரோதமான மண் அகழ்வுகள், சட்ட விரோதமான கனியப்பொருள் அகழ்வுகள் போன்றவற்றைத் தடுத்துநிறுத்த வேண்டியவர்கள் பொலிஸார். ஆனால், அந்தச் சட்டவிரோதச் செயல்களில் ஈடுபடுகின்றவர்கள் அவர்களுக்கு ஒரு சிறு தொகைப் பணத்தை இலஞ்சமாகக் கொடுத்துவிட்டு அதனைச் செய்கின்றார்கள். சட்டவிரோதமாக அகழப்பட்ட மண்ணை ஏற்றிச் செல்லும்போதும் போக்குவரத்துப் பொலிசாருக்கு இலஞ்சம் கொடுக்கிறார்கள். அந்த வகையில் இன்று இலஞ்சம் மற்றும் ஊழல் என்பன சாதாரண ஓர் அரச அலுவலக மட்டத்திலும் சாதாரண தனியார்துறை மட்டத்திலும் மிகப் பெரிய அளவில் வளர்ந்திருக்கின்றன. ஆகவே, இலஞ்சம் மற்றும் ஊழல் என்கின்ற புற்றுநோய் எங்கு ஆரம்பிக்கின்றதோ, அங்கிருந்து அவற்றை நிறுத்துவதற்கு இந்த நல்லாட்சி அரசாங்கம் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அது வளர்ந்ததற்குப் பின்பு, அதற்கான பரிகாரங்களைத் தேடியலைவதைவிட, அது வளர்வதற்கான சூழல் எங்கு உருவாகின்றதோ, அந்தச் சூழலை - இடத்தைக் - கண்டுபிடித்து, அதற்குரிய நடவடிக்கைகளை மேற்கொண்டால், நிச்சயமாக இந்த நாட்டை இலஞ்சம் மற்றும் ஊழல் அற்ற மிகச் சிறந்த நாடாக மாற்றலாம்; அபிவிருத்தியடைந்த மேற்குலக நாடுகளின் தரத்துக்கும் கொண்டுவரலாம்.

இன்று நாங்கள் உலகத்தில் இருக்கின்ற பணக்காரர்களைப் பட்டியல்படுத்தினால், அதிகளவான பணக்காரர்கள் வாழுகின்ற நாடாக இந்தியா இருப்பதைக் காணலாம். எனினும், இன்று இந்தியா அபிவிருத்தியடைந்து வருகின்ற நாடாகத்தான் இருக்கின்றது. அதாவது, முழுமையான அபிவிருத்தி அடையாத நாடாக இருக்கின்றது. அதிகளவான பணக்காரர்கள் இருக்கின்ற இந்தியாவிலே, ஒருவேளை உணவுக்குக்கூட கஷ்டப்படுகின்ற மக்கள் அதிகமானோர் இருக்கின்றார்கள். இன்று உலகத்திலே அதிகளவான பணக்காரர்களைக் கொண்டிருக்கின்ற இந்தியா, ஏன் அபிவிருத்தியடைந்த நாடுகளின் பட்டியலில் சேர்க்கப்படவில்லை என்றால், அங்கிருக்கின்ற மிகப்பெரிய வர்த்தகர்கள் அதிகளவான இலஞ்சம், ஊழல் என்பவற்றில் ஈடுபடுகின்றார்கள். அத்துடன், இன்று இந்தியாவில் எல்லாத்துறைகளிலும் இலஞ்சம், ஊழல், கறுப்புப் பணம் போன்ற மோசடிகள்தான் மலிந்து காணப்படுகின்றன. இதன் காரணமாக அந்த நாடு அபிவிருத்தியடையாமல் இருக்கின்றது. அது போன்றுதான் தென்னாசியாவில் இருக்கின்ற எமது இலங்கை போன்ற நாடுகளும் இன்று அபிவிருத்தி என்ற பாதைக்குள் முழுமையாகச் செல்லாமல் இருப்பதற்குக் காரணம், இந்த இலஞ்சம் மற்றும் ஊழல்தான். இதன் காரணமாக, குறிப்பிட்ட ஒரு சிலரிடமே அதிகளவான பணம் -

கறுப்புப் பணம் தேங்கி நிற்கின்றது. ஆகவே, இந்த விடயத்தில் அரசு மிகவும் கவனம் செலுத்தவேண்டும்.

அந்தவகையில், இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய குற்றப் புலனாய்வு ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் அதிகரிக்கப்படுவதை நாங்கள் வரவேற்கின்றோம். நிச்சயமாக, அவர் தனது செயற்பாட்டைச் சுதந்திரமாக முன்னெடுப்பதற்குரிய வழிவகைகளைச் செய்துகொடுப்பதோடு, அவருடைய சம்பளத்தையும் அதிகரிக்க வேண்டும். இது வரவேற்கத்தக்க விடயம். எதிர்காலத்தில் இலஞ்சம் மற்றும் ஊழல் அற்ற நாட்டை உருவாக்குவதற்கு நாம் எடுக்கும் சிறந்த முதற்கட்ட முயற்சியாக - நடவடிக்கையாக இது இருக்குமென்று நான் நினைக்கின்றேன்.

அதுமாத்திரமல்ல, இந்த உயரிய சபையிலே நான் இன்னொரு விடயத்தை முன்வைக்க விரும்புகின்றேன். இந்தப் பாராளுமன்ற வளாகத்துக்குள் கிட்டத்தட்ட 850 ஊழியர்கள் பணிபுரிகின்றார்கள். குறிப்பாக, அவர்களுடைய சம்பளத்திலே பாராளுமன்ற அமர்வு இடம்பெறுகின்ற நாட்களுக்கான கொடுப்பனவாக அடிப்படைச் சம்பளத்தின் 40 வீதம் வழங்கப்படுகின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
Sir, please, give me one more minute.

Budget காலத்தில் இக்கொடுப்பனவானது அடிப்படைச் சம்பளத்தின் 50 வீதமாகும். அவர்களுடைய சம்பளத்தை அதிகரிக்க இருக்கின்ற செயற்பாட்டின்போது அடிப்படைச் சம்பளம் அதிகரிக்கப்பட்டாலும் அவர்களுக்குரிய அந்த 40 வீத மற்றும் 50 வீத கொடுப்பனவுகள் நிச்சயமாக வழங்கப்பட வேண்டும். இது தொடர்பாகக் குறிப்பிடுகின்ற 03/2016 இலக்க அரசாங்க நிருவாகச் சுற்றறிக்கையின் 6.1 என்ற பிரிவை நீக்கவேண்டுமென்று கேட்டுக்கொள்வதோடு, அவர்களுடைய கொடுப்பனவுகள் தொடர்பில் இந்த உயரிய சபை கவனம் செலுத்தவேண்டும் என்றும் வலியுறுத்தி, வாய்ப்புக்கு நன்றிகூறி விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. The Hon. Seyed Ali Zahir Moulana, please.

[பி.ப. 5.40]

ගරු සෙයිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய புலனாய்வு ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் கொடுப்பனவுகளை மறுசீரமைத்தல், பொலிஸ் ஆணைக்குழு உட்படச் சுயாதீன ஆணைக்குழுக்களின் தலைவர்கள் மற்றும் உறுப்பினர்களுக்குச் செலுத்தப்படும் ஊதியங்கள் மற்றும் ஏனைய படிகள் பற்றியதான முக்கிய விவாதம் நடைபெறுகின்ற இச்சந்தர்ப்பத்திலே, நான் ஒரு முக்கிய விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன்.

கடந்த 10.09.2016ஆம் திகதி ஏறாவூர் பொலிஸ் பிரிவுக்குட்பட்ட முகாந்திரம் வீதி, ஏறாவூர் - 06 என்னும் முகவரியில் வசித்த, மிகவும் ஒழுக்கமுள்ள குடும்பத்தைச் சேர்ந்த 56 வயது தாயும் 32 வயது மகளும் வீட்டில் உறங்கிக்கொண்டிருந்த நிலையில், மிகவும் கொடூரமாக அடித்துக் கொலை செய்யப்பட்டுள்ளனர். மறுநாள் காலை 11.00 மணியளவில்தான் கொலைச் சம்பவம் தொடர்பான தகவல்கள் மக்களுக்குத் தெரியவந்தன. அன்றைய தினம் கௌரவ அமைச்சர் வஜிர அபேவர்தன, கௌரவ பிரதி அமைச்சர் அமீர் அலி, முதலமைச்சர் நஸீர் அஹமட், மாவட்டச் செயலாளர் திருமதி சார்ள்ஸ் ஆகியோருடன் மாவட்டத்தில் நடைபெற்ற பல தொடர் நிகழ்ச்சிகளில் நான் பங்குபற்றிக்கொண்டிருந்த வேளையில், இச்சோக நிகழ்வைக் கேள்வியுற்று அதிர்ச்சியுற்றவனாக, சம்பவ இடத்துக்கு நேரில் விஜயஞ்செய்து, பொலிஸ் மேலதிகாரிகளையும் விசாரணைக் குழுவினரையும் அங்கிருந்த பாதிக்கப்பட்ட குடும்ப அங்கத்தினர்களையும் சந்தித்து இந்த விசாரணைகள் துரிதமாகவும் விவேகமாகவும் நடைபெறுவதற்கான ஏற்பாடுகளை ஆரம்பித்தேன்.

கடந்த 13.09.2016ஆம் திகதி சட்டவைத்திய அதிகாரியின் பிரேதப் பரிசோதனையின் பின்னர், இரவு 10.00 மணியளவில் ஏறாவூர் மஸ்ஜிதுன் நூர் காட்டுப் பள்ளிவாசலில் பல்லாயிரக்கணக்கான மக்கள் மத்தியில் ஜனாஸாக்கள் நல்லடக்கம் செய்யப்பட்டன. அதன் பின்னர், அங்கு கூடியிருந்த பொது அமைப்புக்களால் கொலையாளிகளைக் கண்டித்தும் குற்றவாளிகள் தொடர்பான பொலிஸாரின் நடவடிக்கைகளைத் துரிதப்படுத்துமாறும் கோரி, கவனயீர்ப்புப் போராட்டங்கள் நடத்தப்பட்டன. இக்கொலையையடுத்து ஏறாவூர் மக்கள் மிகவும் அச்சத்துடனும் அதிர்ச்சியுடனும் காணப்படுகின்றனர். மக்களின் பாதுகாப்பு கேள்விக்குட்படுத்தப்பட்டுள்ளது. கொலையாளிகள் கண்டுபிடிக்கப்பட்டுத் தண்டிக்கப் படவேண்டுமென்ற ஆத்திரத்துடனும் ஆதங்கத்துடனும் அம்மக்கள் காணப்படுகிறார்கள்.

ஆரம்பத்தில் கொலை செய்யப்பட்டவர்களின் உறவினர் ஒருவர் மாத்திரம் சந்தேகத்தின் பேரில் ஏறாவூர் பொலிசாரால் கைதுசெய்யப்பட்டிருந்த நிலையில், அந்தப்பகுதியிலுள்ள வீதிகளில் பொருத்தப்பட்டிருந்த CCTV camera களின் பதிவுகள் வெளிப்படுத்தப்பட்டன. அதனையடுத்து சந்தேகத்திற்குரிய மோட்டார் சைக்கிள் நபர் மக்களால் இனங்காணப்பட்ட நிலையில் 18.09.2016 அன்று அவர் பொலிசாரிடம் சரணடைந்து கொலை தொடர்பான பல தகவல்களை வெளியிட்டுள்ளார். அதைத் தொடர்ந்து மேலும் இருவர் கைது செய்யப்பட்டனர். அத்துடன், மறைத்துவைக்கப்பட்டிருந்த மோட்டார் சைக்கிள் உட்பட களவாடப்பட்ட நகைகள், கொலையாளியின் இரத்தக்கறை படிந்த ஆடைகள் என்பனவும் பொலிசாரால் கைப்பற்றப்பட்டன.

அன்றைய தினம் கொலைச் சந்தேக நபர்களைக் கண்டித்தும் கொலையாளிகளுக்கு உயர் தண்டனைகளைப் பெற்றுக்கொடுக்கக் கோரியும் ஆயிரக்கணக்கான பொதுமக்கள் ஏறாவூர் பொலிஸ் நிலையத்திற்கு முன்பாக ஒன்றுதிரண்டு தங்களது ஆதங்கத்தை வெளிப்படுத்தினர். அவ்வேளை, ஏறாவூர் பள்ளிவாசல்களைச் சேர்ந்தவர்கள், முஸ்லிம் நிறுவனங்களின் சம்மேளனத்தைச் சேர்ந்தவர்கள் மற்றும் ஊர்ப் பிரமுகர்கள் ஒன்றுகூடி அம்மக்களை

[ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා]

ஆறுதல்படுத்தி அங்கிருந்து அவர்களைக் கலைந்துசெல்ல வைத்தனர்.

அதன்பின்னர் கடந்த 20ஆம் திகதி மேலும் இரண்டு சந்தேக நபர்கள் கைது செய்யப்பட்டுள்ளனர். இவர்கள் கைதானதைத் தொடர்ந்து மக்கள் பெரும் எதிர்பார்ப்புடன் இருந்தனர். அதேவேளையில், இக்கொலைச் சம்பவம் தொடர்பான விசாரணை நடவடிக்கைகளில் எவ்வித முன்னேற்றங்களோ, திருப்பங்களோ இல்லாமல் தொய்வுநிலை காணப்படுவதையிட்டு பொலிசாரின் நடவடிக்கைகளில் மக்களுக்கு சந்தேகங்கள் ஏற்பட்டுள்ளன. இந்த நல்லாட்சி அரசாங்கத்திலும் இலஞ்சமும் ஊழலும் தலைவிரித்தாடுகின்றதா? உயர் பொலிஸ் அதிகாரிகள் கொலையாளிகளைத் தப்பிக்க வைக்க முயற்சிக்கின்றார்களா? என்று அப்பகுதி மக்கள் என்னிடம் வினவுகின்றனர். முக்கிய கொலைச் சூத்திரதாரிகளைக் கண்டுபிடிப்பதில் மிகவும் சிறப்பாக இயங்கும் இலங்கை பொலிஸ் திணைக்களத்திற்கு இவ்வாறான ஓர் அவப்பெயர் ஏற்படக்கூடாதென்று நான் கவலைப்படுகின்றேன். எனவே, இச்சந்தேகநபர்களை முறையாக விசாரணைகளுக்குட்படுத்தி கொலையாளிகளைக் கண்டுபிடிக்க பொலிஸ் திணைக்கள உத்தியோகத்தர்களும் பொலிஸ் மாஅதிபர் அவர்களும் உடனடி நடவடிக்கையெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

While debating on the revision of salary and allowances of the Director-General of the Commission to Investigate Allegations of Bribery or Corruption and emoluments and other allowances being paid to the Chairmen and Members of Independent Commissions, including that and with special mention to the Police Commission, I would like to bring the attention of this House on a very important matter.

In the light of the recent tragic events ongoing around the country, I wish to highlight one such event that took place in my home town, Eravur. In the eve of the Haji festival, in the early morning hours of September 11th, five alleged assailants broke into a home in which two innocent women were sleeping in. The mother, a 56-year old widow and her daughter, a 32-year old married woman, whose husband was employed overseas, were due to wake up in a few hours to commence a voluntary fast in lieu of the forthcoming festival. It is alleged that these five assailants molested both women and then clubbed them to death.

Sir, this heinous crime is possibly the most brutal breach of law to occur in the Batticaloa District since the end of war. In the immediate aftermath of this occurrence, the community and the populace of Eravur - young and old - came together. The usual festive celebrations of Id-Ul-Alha this year were a solemn, somber affair. There was an air of agitation amongst women, afraid for their safety and well-being while they sleep in their homes at night, and amongst men, a fear of safeguarding their wives, mothers and daughters. This could have happened to anybody.

However, as savage and inhuman was this crime, I wish to take this opportunity to commend the efficiency and the high competence displayed by the Sri Lanka Police, specifically in upholding the rule of law and investigating this crime with foolproof precision. In a mere matter of days - the investigation was so thorough and was effectively carried out - the alleged suspects, all members of the same community, were taken into custody. With the investigation ongoing, I do not wish to comment further, but would like to express my sincere gratitude on behalf of my people to the Sri Lanka Police and bring to the attention of this House, particularly to the attention of the Hon. Prime Minister and the Hon. Minister of Law and Order and Southern Development, their admirable conduct, especially its leadership in the Batticaloa District and in the Eastern Province and their steadfast determination in bringing a closure to the suffering of the families of the affected and for bringing about a sense of peace and security among the community.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Finally, Sir, let me conclude with this. In these difficult times, when the rule of law is challenged, breached or debated, it is important to take note of and express gratitude to those who enforce it, without question, just as a mere sense of duty. I pray to the Almighty to grant the Highest Heaven to those who have left us through such unthinkable crimes and to keep our children and families, the community and the country safe.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා.

[අ.භා. 5.46]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරියට අල්ලසක් දෙන්න ගරු අග්‍රාමාත්‍යතුමා ගෙන ආ මේ පිළිකුල් සහගත යෝජනාව ගැන ඉතාම පිළිකුලෙන් වචන කිහිපයක් කථා කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල පාර්ලිමේන්තුව එක එක අයට අල්ලස් දෙන එක තමයි කරන්නේ. ඊයේ වැඩක් නැති ඇමතිතුමාට රුපියල් මිලියන 990ක අල්ලසක් දුන්නා. අද එතුමා ඒ රුපියල් මිලියන 990 ලබාදීමේ යුතුකම ඉටු කළා, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් ගණනාවකට අපහාස කරමින්. අද තමන්ගේ සහචරයන්ට, තමන්ගේ අයට අල්ලස් දීම සඳහා මේ පාර්ලිමේන්තුව යොදාගෙන තිබෙනවා, ඉතාම පිළිකුල් සහගතව.

ඇයි අපි කියන්නේ මේක අල්ලසක් කියලා? ගරු අග්‍රාමාත්‍යතුමාම කිව්වා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය, දිල්රුක්ෂි ඩයස් චික්‍රමසිංහ එතුමාගේ ගජ මිතුරියක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මෙන්න මේ කාරණය අහනවා. 2000 ඉඳලා 2013 වෙනකල් අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි 83ක් ඉදිරිපත් කළා. ඒ පැමිණිලි 83 තුළ අග්‍රාමාත්‍යතුමාට විරුද්ධව පැමිණිල්ලක් තිබෙනවා, ජනාධිපතිතුමාට විරුද්ධව පැමිණිල්ලක් තිබෙනවා කබීර් හාෂිම් අමාත්‍යතුමාට විරුද්ධව පැමිණිල්ලක් තිබෙනවා, රාජිත සේනාරත්න ඇමතිතුමාට විරුද්ධව පැමිණිල්ලක් තිබෙනවා, චම්පික රණවකට විරුද්ධව පැමිණිල්ලක් තිබෙනවා. ඒ පැමිණිලිවලට මොකද කළේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පැමිණිලිවලට මොකද කළේ? ඒ පැමිණිලි විභාග කරලා, 2015 වාර්ෂික වාර්තාව මෙතැනට ඉදිරිපත් කරලා, තමන්ගේ කාර්ය සාධනය හරියට පෙන්නුවා නම්, අල්ලස් සහ වංචා නවත්වන්න තමයි දිල්රුක්ෂි ඩයස් කැපවෙන්නේ කියලා පෙන්නුවා නම්, මේ විධියට නොවෙයි, සියදහස් ගුණයකින් පඩිය වැඩි කළත් අපි අත උස්සනවා. අපටත් ඕනෑ හොරු අල්ලන්නයි. කොයි පාට හොරු හිටියත් කමක් නැහැ, ඒ අය අල්ලනවා නම් අපි ඒකට පක්ෂව අත උස්සන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 2015 මාර්තු මාසයේ 3වැනි දා රාජිත සේනාරත්න අමාත්‍යවරයාට විරුද්ධව "බිලූ මවුන්ට්" කියන ආයතනය හදලා ධීවර අමාත්‍යාංශය කරපු මහා පරිමාණ හොරකමක් පිළිබඳව - වංචාවක් පිළිබඳව - ලිඛිත සාක්ෂිත් එක්ක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා පැමිණිල්ලක් දැම්මා. කෝ, අද වෙනකල් ඒක විභාග කළාද? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගෙන් අපි අහනවා, රාජිත සේනාරත්න අමාත්‍යතුමාට විරුද්ධව අපි ඉදිරිපත් කරපු පැමිණිල්ලේ ප්‍රගතිය මොකක්ද කියලා ඊළඟ දවසේ පාර්ලිමේන්තුවට වාර්තා කරන්න පුළුවන්ද කියලා. අපි විතරක් නොවෙයි, රන්ජන් රාමනායක මහත්මයාත් පැමිණිල්ලක් ඉදිරිපත් කළා. කෝ, ඒවා? ඒ විතරක් නොවෙයි, ඇවන්ට් ගාර්ඩ් සමාගමේ සභාපති නිශ්ශංක සේනාධිපති ගිහිල්ලා හඬ පටයකුත් එක්ක, රාජිත සේනාරත්න මහත්මයාට දීපු සල්ලිවලට අදාළ චෙක්පතේ කොපියකුත් එක්ක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් දැම්මා. ඒවා කෝ?

ඒ විතරක් නොවෙයි, ජනාධිපතිතුමාගේ දකුණු අතද, වම් අතද කියා ගන්නා මහින්ද අමරවීර ඇමතිතුමා, -එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමා- 21වැනි සියවසේ මේ රටේ සිද්ධ වෙච්ච ඓතිහාසිකම හොරකම වූ බැඳුම්කර වංචාව පිළිබඳව දිල්රුක්ෂි ඩයස් චික්‍රමසිංහ නෝනාගේ දෙපතුල ළඟට ගිහිල්ලා පැමිණිල්ලක් කළා නේ. හත් දෙයියනේ! කෝ, ඒවාට විභාග? කෝ, ඒවාට පරීක්ෂණ? ඒවා විභාග නොකරපු ලොක්කිට නේ මේ විධියට පඩි දෙන්න යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි කොහොමද පඩි දෙන්න යන්නේ? එතුමිය පත් වෙච්ච දවසේ ඉඳලා, 2015.09.02 ඉඳලා මෙයාට පුද්ගලික වන සේ arrears එක්ක දෙන්නයි යන්නේ. කොහොමද වැඩේ? නොම්මර එකයි නේද යහ පාලනේ? පංකාදුයි නේද යහ පාලනේ? මේක අල්ලසක් නොවෙයිද ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමනි? මේක අල්ලසක් නොවෙයිද හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමනි? මේක අල්ලසක් නොවෙයිද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

මේ රට බෙදන ආණ්ඩුවට, රට කන ආණ්ඩුවට, රට විනාශ කරන ආණ්ඩුවට විරුද්ධව මතවාදයක් ගෙන යන ඒකාබද්ධ විපක්ෂයේ මිනිස්සු අල්ල අල්ලා කූඩුවට දමන්න තමයි අද චික්‍රමසිංහ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පාවිච්චි කරන්නේ. පසු ගිය කාලයේ එහෙම කරන්න බටලන්ද පාවිච්චි කළා. අද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා මේ යෝජනාවට පවන් ගහනවා වාගේ කථා කළා. විජිත හේරත් මන්ත්‍රීතුමාගේ ප්‍රධාන විවාදය, ප්‍රධාන ප්‍රශ්නය වුණේ ඉස්සරහ දොරයි, පස්ස දොරයි ගැන. එදා මේ රට කෑලිවලට කඩන්න හදන කොට, ඒකට විරුද්ධව කටයුතු කරපු තරුණ තරුණියෝ දහස් ගණනක් වධ දීදී මරා දාන්න බටලන්ද වධකාගාරය චික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා පවත්වා ගෙන ගියා වාගේ, අද නූතන බටලන්ද තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ FCID එක. මේ මහත්තුරු අද ඒක තියා ගෙන ඉන්නේ මොකටද? ඇත්තටම රටේ සිද්ධ වෙන හොරකම, වංචාව නවත්වන්න ඕනෑ නම්, එහෙම සැබෑ වුවමනාවක් තිබෙනවා නම්, මේ ආයතන කැප වෙන්නේ ඒකට නම්, ඒ ආයතන පවත්වා ගෙන යන්න ඕනෑ නම්, ජනාධිපතිතුමාගේ වම් අත කියන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමා, -අමාත්‍ය මහින්ද අමරවීර මහත්තයා- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා පැමිණිලි කරපු, 21වැනි සියවසේ විශාලතම, මහ පොළොව නුහුලන මහා අපරාධය, පැටවු ගහන අපරාධය බවට පත් වෙච්ච බැඳුම්කර වංචාවට විරුද්ධව වහාම පරීක්ෂණ ආරම්භ කරන්න කියලා අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගෙන් ඉල්ලනවා. පළමුව ඒක කරලා එන්න නෝනා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමියට දුරකථන ඇමතුමක් දීලා තමයි මම කිව්වේ, "මට පැමිණිල්ලක් දාන්න තිබෙනවා. ඒ file එකේ තිබෙන්නේ සිත්තර පත්තරේ නොවෙයි, හිස් කඩදාසි නොවෙයි. ඒකේ රාජිත සේනාරත්න ඇමතිතුමාට විරුද්ධව ලිඛිත සාක්ෂි තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමියට යන්න තිබෙන්නේ ආයතන තුනකටයි. එකක්, ධීවර අමාත්‍යාංශය. අනෙක් එක ධීවර සංස්ථාව. අනෙක් එක සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලය" කියලා. එහෙම ගියා නම් මේකේ ඇත්ත නැත්ත හොයා ගන්න පුළුවන්. ඒ පරීක්ෂණය කරලා සතියකින් ඉවර කරන්න පුළුවන්. එහෙම කළා නම්, "ජයන්ත සමරවීර හරිද, රාජිත සේනාරත්න හරිද?" කියලා ඔප්පු කරන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කෝ, ඒක විභාග කළාද? රාජිත සේනාරත්න ඇමතිතුමා කී සැරයක් ආවාද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මේ කරන්නේ වෙන මොකක්වත් නොවෙයි. මේ රට වෙනුවෙන් හඬ නඟන ඒකාබද්ධ විපක්ෂයේ මහජන නියෝජිතයන්, ජන නායකයන් දඩයම් කරන්න පාවිච්චි කරන බටලන්දක් බවට මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අද පාවිච්චි කරගෙන තිබෙනවා.

[ගරු ජයන්ත සමරවීර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනය දේශපාලනීකරණය කරලා ඉවරයි. තමන්ගේ ගෙදර හුරතලයට හදන බල්ලන්ට මස් ගෙනෙන්නත් අග්‍රාමාත්‍යතුමා හෙට අනිද්දා වන විට මේ පාර්ලිමේන්තුවට පනත් ගෙනෙයි. හුරතලයට හදන බලු පැටවුන්ට කන්න - බොන්න දෙන්නත් හෙට දවසේ පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ගන්න එයි. මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

සල්ලි වියදම් කරන්න, තමන්ගේ අශික්ෂිත වුවමනා, පිළිකුල් සහගත වුවමනා, දුෂ්ට වුවමනා ඉෂ්ට කර ගැනීම සඳහා මේ ගෙන ආ යෝජනාව දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. මේ රටේ අල්ලස, දූෂණය මඩින්න අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සැබෑවටම ක්‍රියාත්මක වෙනවා නම්, ඒ සඳහා මේ රටේ පාර්ලිමේන්තුවට පිළිගන්න පුළුවන් අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කරලා, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව නැවත වතාවක් නිසි පරිදි, ශක්තිමත්ව ගොඩනඟන්න කියන ඉල්ලීම කරමින්, මේ පිළිකුල් සහගත යෝජනාව ඉතාම පිළිකුලෙන් හෙළා දකිමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.54]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දිනවල BMICH එකේ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පැවැත්වෙනවා. මේ පොත් ප්‍රදර්ශනයේ මේ දවස්වල උණු කැවුම් වාගේ විකිණෙන පොතක් තිබෙනවා. මමත් ගියා මොකක්ද මේ උණු කැවුම් වාගේ විකිණෙන පොත කියලා බලන්න. මේ පොත තමයි ලසන්න රුහුණගේ මහත්මයා ලියපු "රාජපක්ෂ සමාගම" කියන පොත. [බාධා කිරීම] මම මේ පොත ගැන එතැනින් එහා කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ පොත ගැන කථා කරන්න අපිට දැන් වාතාවරණයක් හැදිලා තිබෙනවා. අතීතයේ මෙහෙම පොත් ලිව්වා නම් අද අපිට කථා කරන්නට වෙන්නෙත් නැහැ. [බාධා කිරීම්] දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් සඳහා වන ගමනේදී මේ වාගේ පොත් ලියලා, මේ වාගේ වැඩ කරලා තමයි අපිට මේ රට බේරා ගන්න වෙන්නේ. දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් ගැන කථා කරන විට ප්‍රධාන දේ තමයි, "විමසිලිමත් වෙමු, අල්ල ගමු" කියන එක. ඒ වාගේම "පිළිවෙළ දැනගෙන නිසි ලෙස පෙන්වමු" කියන එක. "වෙනස් කරමු; ගොඩ නඟමු; මතු පරම්පරාව දැනුවත් කරමු" කියන එක. ඊළඟට, "සඟමුලින් පිටුදැකීමට හඬ නඟමු" කියන එක. මේ තමයි අපේ හඬ; ජනතාවගේ හඬ. මේ ජනතාවගේ හඬ කාටවත් යටපත් කරන්නට බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි අපි මේ ක්‍රියාවෙන් පෙන්වන්නේ. ඒ වාගේම තමයි පෙර ගමන්කාරයෙක් හැටියට ක්‍රියාවෙන් පෙන්වන්නේ. මේ සඳහා පරිපූර්ණත්වය අනිවාර්යයෙන් අවශ්‍ය වෙනවා. මේ පරිපූර්ණත්වය ලබා ගැනීමේ අවශ්‍යතාව නිසා තමයි අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට බලතල හදලා දෙන්නේ. මේ බලතල හදා දෙන විට - [බාධා කිරීම්] මේ රැළ කෑ ගැහුවාට කිසි කෙනෙක් භය වෙන්නේ නැහැ. අද නිදහස ලැබිලා තිබෙනවා; මේ රටට ප්‍රජාතන්ත්‍රවාදය ලැබිලා තිබෙනවා. ඒ හරහා තමයි අපි අල්ලස් සහ දූෂණවලින් තොර ශ්‍රී ලංකාවක් සඳහා යන්නේ. මේ අවශ්‍යතාව සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධුරයේ රාජකාරි කළ ජනාධිපති නීතීඥවරියක් වන ඒ.පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මැතිනියට මේ බලතල අපි ලබාදීලා තිබෙනවා. ඒ වාගේම මේ කොමිෂන් සභා ක්‍රමය යටතේ මේ රටේ වන සියලුම දූෂණ වංචා සොයන්න ඒ කොමිසමට බලතල ලැබෙනවා. මේ බලතල ලැබීම හරහා කිසිම පාටක් නැතිව මේ වංචා දූෂණ සොයන්නට පුළුවන්. වංචා දූෂණ සොයන්නට ශක්තිය ලබා දීමට බලගැන්වීම සඳහා තමයි අපි මේ කථා කරන්නේ. මේ කථා කරන ඒවා කටවත් යටපත් කරන්නට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

රටේ සියලුම මහ ජනතාව "රාජපක්ෂ සමාගම" කියන මේ පොත කියෙවිවොත් කවුද හොරු, කවුද කම්බා හොරු, කවුද පරම්පරාගත හොරු, ඒ හොරකම් කළ විධියවල් ආදී සියලු දේවල් දැන ගන්නට පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන විට මට මතක් වෙන කාරණයක් තිබෙනවා. මේ පොතේ තිබෙනවා, නීතියේ ආධිපත්‍ය ගැන. ඒ වාගේම ආණ්ඩුවේ පෞද්ගලික සමාගම්වල තිබුණු සූදුව කොහොමද? "9564 සූදු වැන් භීතිකාව", "නිතට මත මහ පාරේ". ඒ වාගේම "night race විනෝද බද්දෙන් නිදහස් වුණේ කොහොමද?", "මහජන මුදලින් ඓශ්වර්යාට තරු හෝටල්", "රාජ සන්තක කළ ස්වර්ණාභරණ ජනපති නියමයෙන් නිදහස්", "වැය ශීර්ෂයේ වැඩි පංගුව ආරක්ෂාවට හා රාජපක්ෂවරුන්ට" - [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් අවසන් කරන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ඒ වාගේම "පුතාගේ car raceවලට ජනපතිගෙන් බලපත්‍ර සහන". ඊළඟට, "මිහිදුසෙත් පුරයෙන් ආරම්භ වන අලුත්ම සෙල්ලම" මේ ආදී වශයෙන් සියලුම දේවල් මේ පොතේ අඩංගු වෙනවා. ඒ නිසා ඉදිරියේ දීත් අපි මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවැරී ඇති කාර්යයන් ඉටු කරලීම සඳහා සහාය දක්වන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 5.57]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலஞ்சம் அல்லது ஊழல் பற்றிய குற்றப் புலனாய்வு ஆணைக் குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் கொடுப்பனவுகளை மறுசீரமைத்தல் தொடர்பான இன்றைய விவாதத்திலே எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்று நடைபெறுகின்ற இந்த விவாதத்திலே இந்த அதியுயர் சபையின் உறுப்பினர்களில் பலர், சபையின் சில உறுப்பினர்களது இலஞ்சம், களவு, குற்றங்கள், அவற்றுக்கான தண்டனைகள் பற்றியே கதைத்துக்கொண்டிருந்தார்கள். தவிர, இந்த இலஞ்ச ஊழலால் எமது மக்கள் படுகின்ற துன்பத்தைப்பற்றி நினைத்துப் பார்க்கவில்லை. அந்த மக்கள் அவர்களுக்குத் தேவையான சேவைகளைப் பெற்றுக்கொள்வதற்கு, தமது அன்றாட வாழ்க்கையைக் கொண்டுசெல்வதற்கு எவ்வாறு இந்த இலஞ்ச ஊழலால் இன்னல்படுகின்றார்கள் என்பதை எவரும் சிந்தித்துப் பார்க்கவில்லை. எனவே, தயவுசெய்து வெறுமனே இங்கு கூக்குரல் இடுவதை நிறுத்திவிட்டு, தமிழ் தெரியாதவர்கள் செவிப்புலன் கருவியைக் காதில் மாட்டி, இந்த 30 வருட யுத்தத்தினால் பாதிக்கப்பட்ட எமது மக்கள் இன்று

தமது அன்றாட வாழ்வைக் கொண்டுநடத்துவதற்கு எவ்வாறான ஓர் அசௌகரிய சூழலை எதிர்கொள்கின்றார்கள் என்பதைப் பற்றியெல்லாம் நாங்கள் கூறுவதை நீங்கள் இதயசுத்தியோடு, மனச்சாட்சியோடு கிரகித்துக்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்ளுகின்றேன்.

யுத்த காலத்திலே வடக்கு, கிழக்குப் பகுதிகளிலே எமது மக்கள் மிகவும் கௌரவமாக வாழ்ந்தார்கள். அன்று பொருளாதாரத் தடையிருந்தது; A-9 வீதி மூடப்பட்டிருந்தது. ஆனால், அவர்கள் வறுமையிலும் செம்மையாக வாழ்ந்தார்கள். அங்கு குற்றங்கள் நடைபெறவில்லை. இலஞ்ச ஊழலுக்கு இடமிருக்கவில்லை. இறுதி யுத்தத்தின்போது சகல சொத்துக்களையும் சுகங்களையும் இழந்து வெறுங்கையோடு மீள்குடியேறிய எமது மக்கள் இன்று யுத்தம் முடிவுக்குக் கொண்டு வரப்பட்டு 7 வருடங்கள் பூர்த்தியான பின்னரும் மிகவும் மோசமான நிலையை எதிர்கொள்கின்றார்கள். இந்த யுத்தத்திலே தமது பிள்ளைகளையும் கணவன்மாரையும் இழந்திருக்கின்ற நிலையில் ஒரு வீட்டுத்திட்டம் கிடைத்தாலும் அந்த வீட்டைக் கட்டுவதில், அதற்குரிய மரத்துண்டுகளைப் பெற்றுக்கொள்வதில் தாய்மார் படுகின்ற இன்னல் சொல்லி லடங்காது. ஆனால், அங்கு மரங்கள் அரியப்பட்டு 'ரிப்பர்'களில் கடத்தப்படுகின்றன. அதுபோல், ஒரு 'லோட்' மண்ணைப் பெறுவதற்கு அந்தத் தாய் படுகின்ற துன்பம் எங்களுக்குத்தான் தெரியும். ஆனால், மண் அகழ்ந்து செல்லப்படுவது புலப்படாமலே எமது பிரதேசத்தைவிட்டு எப்படியோ மண் செல்கின்றது. கடந்த வாரம் நடைபெற்ற பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலே இதைப் பற்றிப் பிரஸ்தாபித்தபோது, இது எவ்வாறு செல்கின்றதென்பது தங்களுக்குத் தெரியாதென்றும் தாங்கள் அதற்கு அனுமதி வழங்கவில்லையென்றும் மேலிடத்திலிருந்து அதற்கு அனுமதி பெறப்படுகின்றதென்றும் கூறி, அங்கிருக்கின்ற அதிகாரிகள் கையை விரிக்கின்றார்கள். இந்த நிலை மாற வேண்டும்.

அதுபோல், வெறுங்கையோடு குடியேறிய எமது மக்கள் அன்றாடம் மீன் பிடித்து தங்களுடைய வயிற்றை வளர்க்கின்ற நேரத்திலே, தென்பகுதியிலிருந்து வருபவர்களால் அனுமதியற்ற முறையிலே, சட்ட விரோதமான முறையிலே மீன்கள் வாரிச்செல்லப்படுகின்றன. இதுதொடர்பாக அதிகாரிகளிடம் கேட்டபொழுது, உரிய முறையிலே மாவட்ட மட்டத்திலே அதற்கான அனுமதி பெறப்படவில்லையென்றும் தாம் அதற்கெதிராக குரல் கொடுத்தால் தம்மைக் குற்றவாளிகளாக்க முயல்கின்றார்களென்றும் அவர்கள் கூறுகின்றார்கள். இந்த நிலையை நீங்கள் சற்றுச் சிந்தித்துப் பாருங்கள்!

சிவில் நிருவாகம் வந்த பின்புதான் எமது வடக்கு, கிழக்குப் பகுதியிலே துஷ்பிரயோகங்கள், பாலியல் துஷ்பிரயோகங்கள், பிள்ளைகள் மீதான வன்முறைகள் போன்றவை அதிகரித்துச் செல்கின்றன. மதுபான சாலைகளுக்கு எவ்வாறு அனுமதி வழங்கப்படுகின்றதென்பது எவருக்கும் தெரியாது. அந்த அனுமதி மேலிடத்திலிருந்து - உயர் மட்டங்களிலிருந்து - கிடைக்கின்றது. திட்டமிட்டு எமது மாவட்டங்களிலே மதுபான சாலைகளைத் திறக்கின்றார்கள். அதனால் எமது பிள்ளைகளின் எதிர்காலம் குட்டிச்சுவராகின்றது. அதுமட்டுமல்ல, சட்டவிரோதமான முறையிலே அங்கு கசிப்பு காய்ச்சப்படுகின்றது. அதைப் பிடிப்பதற்காக பொலிஸார் சென்றாலும், கசிப்பு காய்ச்சுபவர்களுக்கும் பொலிஸாருக்கும் இடையில் சிநேகிதம் இருப்பதால் மேற்கொண்டு எதுவும் நடைபெறுவதில்லை. பாதிக்கப்பட்ட மக்கள் தொடர்ந்தும் பாதிக்கப்பட்டவர்களாகவே இருந்துவருவதை நான் மிகவும் வேதனையோடு முன்வைக்க விரும்புகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
Please, give me one more minute.

அதுமட்டுமல்ல, இன்றைய இந்த விவாதத்திலே அரசியலமைப்பின்கீழ் நிறுவப்பட்ட சுயாதீன ஆணைக்குழுக்களின் உறுப்பினர்களுக்கு ஊதியம் வழங்குவது தொடர்பான பிரேரணையும் இங்கு முன்வைக்கப்பட்டிருக்கின்றது. இதை நாம் வரவேற்கின்ற அதேநேரம், எமது நாட்டின் எதிர்க்கட்சித் தலைவரும் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவருமாகிய மதிப்புக்குரிய இரா. சம்பந்தன் ஐயா அவர்களுக்கு இதுவரை உத்தியோகபூர்வ வாசஸ்தலம் வழங்கப்படவில்லை என்பதையும் அதற்கான எந்தவித நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதையும் தெரிவித்துக் கொள்ள விரும்புகிறேன். இப்படியான நிலைமையிலே எமது பிரதம மந்திரி அவர்கள் சுயாதீன ஆணைக்குழுக்களைப் பற்றிக் கதைத்துக் கொண்டிருக்கின்றார். ஆகவே, எமது மக்கள் நல்லிணக்கத்தோடு வாழ்வதற்கேற்ற திட்டங்களைச் செயற்படுத்த வேண்டுமென்று இந்தவேளையில், கேட்டு, நிறைவு செய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි තුනක් නම් මදි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මම විනාඩි පහක් දෙනවා. එතකොට එතුමියට විනාඩි අටක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair and* DEPUTY SPEAKER *took the Chair.*

[අ.භා. 6.03]

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය පත් කිරීමේදී මේ රටේ මත දෙකක් පැවතුණා. "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට අලුත් අධ්‍යක්ෂ ජනරාල් කෙනෙක් පත් කරන්න ඕනෑ, ඉතාම ස්වාධීනව, ක්‍රියාශීලීව එය මෙහෙයවන්න පුළුවන් අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් රටට අවශ්‍යයි" කියන මතය ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් වුණා. "මේ පත් කරන්න යන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ හිතවතියක්; මිතුරියක්; මේ පත් කරන්න යන්නේ ආණ්ඩුවට බොහොම හිතවත්, විශ්වාසවන්ත කෙනෙක්, ඒ නිසා විපක්ෂය මර්දනය කරන්න තමයි මේ අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරිය පත් කරන්නේ" කියන මතය අනික් පැත්තෙන් රටේ මතු වුණා. හැබැයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇය එතුමාගේ පුද්ගලික මිතුරියක්ය කියන කාරණය -ඒ මිත්‍රභාවය - කොයි වෙලාවකවත් ප්‍රතික්ෂේප කළේ නැහැ. නමුත්, "විපක්ෂය මර්දනය කරන්නයි මේ අධ්‍යක්ෂ ජනරාල්වරිය පත් කරන්නේ" කියන මතයත්, "නැහැ, රටේ අල්ලස් හා දූෂණ නැති කර, ක්‍රියාශීලීව ස්වාධීනව කටයුතු කරන්නයි එම අධ්‍යක්ෂ ජනරාල්වරිය පත් කරන්නේ" කියන මතයත් යන දෙකෙන් නිවැරදි කොයි එකද කියන එක අපට තහවුරු කර ගන්න වන්නේ මේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය පත් කළාට පසුව එතුමිය ගෙන යන ක්‍රියා කලාපයත්, එතුමිය සම්බන්ධයෙන් ආණ්ඩුව ගන්නා ක්‍රියා කලාපයත් අනුවයි. අපට පේනවා, අද දිගින් දිගටම සමාජගත වෙමින් තිබෙන්නේ මේ දෙවැනි මතය බව. මොකද, මේ ක්‍රියාශීලීත්වය සහ ක්‍රියා කලාපය දිහා බැලුවාම, විපක්ෂය මර්දනය කරන්නත්, රජයේ අවශ්‍යතා ඉටු කරන්නත් අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරිය කටයුතු කරනවාය කියන එක පත්වීමෙන් පසුව එතුමිය අනුගමනය කළ ක්‍රියා කලාපය දිහා බැලුවාම අද සමාජය පිළිගන්නා කාරණයක්.

මීට කලින් කථාවලදීත් කියැවුණු විධියට, මේ ආණ්ඩුවේ ප්‍රබල කැබිනට් ඇමතිවරයෙකුට එකොළොස් වතාවක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට එන්න කියපු බව අප දන්නවා. හැබැයි, එතුමා ඒ පළාතේවත් ගියේ නැහැ. එතුමා එම කොමිසම පළාතේවත් නොගියා කියා අධ්‍යක්ෂ ජනරාල්වරිය ගත්ත කිසිම ක්‍රියා මාර්ගයකුත් නැහැ. ඒ විතරක් නොවෙයි, යම්කිසි විධියකට මේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නේ නැතිව, ආණ්ඩුවට ගිහින් ඇමතිකමක් ගත්තා නම් ඒ file එක පැත්තකින් තියනවා. මේ විධියේ නොයෙකුත් කාරණා තිබෙනවා. පසු ගිය කථාවලදීත් මතු වුණු ආකාරයට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමා මහ දවල් මහ බැංකුවේ සිදු වුණු මුදල් මං කොල්ලය ගැන අර්ජුන මහේන්ද්‍රන්ට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. හැබැයි, මේ වන තුරු මෙම අධ්‍යක්ෂ ජනරාල්වරිය එතුමාගෙන් කට උත්තරයක්වත් ගත්තේ නැහැ. එතකොට මෙම කොමිසමේ තිබෙන ස්වාධීනභාවය ගැන අපට සැකයක් මතු වෙනවා. මේක විපක්ෂය මර්දනය කරන්න එතුමියට දෙන දිරි දීමනාවක්ද, එකොළොස් වතාවක් කැඳවලාත් ආවේ නැති අය -ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරු- අත් අඩංගුවට නොගත් එකට දෙන දිරි දීමනාවක්ද, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහින් දමන පැමිණිලිවලට කිසිම ක්‍රියා මාර්ගයක් නොගැනීම නිසා එතුමියට ආණ්ඩුව පැත්තෙන් දෙන දිරි දීමනාවක්ද කියන කාරණය අපට තේරුම් ගන්න පුළුවන්.

විශේෂයෙන්ම අද මේ කොමිෂන් දිහා බලන කොට අපට පෙනෙනවා ඒවා වර්තමානයේ සිද්ධ වන දූෂණවලට කිසිම ක්‍රියාමාර්ගයක් නොගන්නා, පුස්සක් බවට පත් වෙලා තිබෙන කොමිෂන් බව. ජනතාවගේ සල්ලිවලින් කොමිසම් හදනවා. ඒ කොමිසම්වල කටයුතු කෙරෙනවා ලු. ඒ වුණාට, අපට මතකයි පසු ගිය කාලයේ කෘෂිකර්ම අමාත්‍යාංශයට වෙන ගොඩනැගිල්ලක් ගත්ත බව. හැබැයි, මේ කොමිෂන්වලින් කිසි දෙයක් වන්නේ නැහැ. අවසානයේදී සිද්ධ වෙන්නේ මේ රටේ ජනතාවගේ සල්ලි නාස්තිවීමත්, විපක්ෂයේ මර්දනයත් පමණයි කියන කාරණය මතක් කරමින්, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පුස්සක් බව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.09]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරී මහත්ම මහත්මීන්ගේ දීමනා පිළිබඳව විවාදයට ගන්නා මේ අවස්ථාවේදී මම දකින විශේෂ කාරණාවක් තිබෙනවා. ඒ තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය කෙරෙහි කථා කරන්නට පමණක් මේ විවාදයේ වැඩිම වෙලාවක් ගත්තා. මෙම කොමිෂන් සභාවේ සාමාජික සාමාජිකයින් සියලු දෙනාට ස්වාධීනව තමන්ගේ රාජකාරිය සිදු කරන්න නම් ඒ අයට අවශ්‍ය දීමනා සහ අවශ්‍ය පහසුකම් සැලසීම වගකීමක් ඇති රජයක වැදගත් කාර්යයක් වෙනවා. එදා වෙච්ච වැරැද්ද අද නිවැරදි කිරීමක් හැටියට මම මේ යෝජනා දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැදගත්ම සංශෝධනයක් වුණා. ඒ තමයි, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මොකද, ජනාධිපති බලතල අඩු කරන්න ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම ගැන වසර ගණනාවක් කථා බහට ලක් වුණත් එය යථාර්ථයක් බවට පත් වුණේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. නමුත්, රටේ අවාසනාවට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැල්ලා, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විනාශ කළා. ඒ නිසා කොමිෂන් සභාවල බලය එක පුද්ගලයකුට සීමා වෙන්න පටන් ගත්තා. පසු ගිය කාලයේදී අප දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. විශේෂයෙන්ම ජනවාරි 08වැනිදා මේ රටේ ජනතාවට ලබා දුන්නු පොරොන්දුවක් හැටියට, ඒ වාගේම මේ රටේ බහුතරයකගේ කැමැත්ත ක්‍රියාත්මක කිරීමක් හැටියට තමයි අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් නැවතත් ස්වාධීන කොමිෂන් සභා පිහිටුවලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළින් එම නියෝජිතයන් ඉතා ස්වාධීනව පත් කරලා, මේ රටට අවශ්‍ය වැදගත් තීන්දුවක්, තීරණයක් අප අරගෙන තිබෙනවා. හැබැයි, අපි මෙතැනදි එක අඩු පාඩුවක් දකිනවා. ඒ තමයි නීති රීති වෙනස් නොවීම. මොකද, ස්වාධීන කමිටු වග කියන්න අවශ්‍යයි. වග කියන්න අවශ්‍ය වෙන්නේ, පාර්ලිමේන්තුවට. එහෙම නම්, මේ කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වග කියන්න අපේ පාර්ලිමේන්තුවේ නීති රීති වෙනස් කරන්න අවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරයි කියන විශ්වාසය අපේ තිබෙනවා. අපි රජයක් හැටියට ඉදිරියේදී ඒ කටයුතු සිදු කරන්න බලාපොරොත්තු වනවා.

ස්වාධීන කොමිෂන් සභා නැවත ඇති කිරීම මේ රටේ ගත්ත වැදගත් තීන්දුවක්. ඔබතුමන්ලා දන්නවා, අද රජයේ සේවකයින්ට කොන්දක් ඇතිව සේවය කරන්න පුළුවන් වෙලා තිබෙන බව. අද මැතිවරණ පිළිබඳව තීන්දු තීරණ ගන්න, මැතිවරණ මෙහෙය වන්න මැතිවරණ කොමිසමට බලය තිබෙනවා. අද පොලිස් සේවයේ ඒ ඒ පත්වීම්, ඒ ඒ මාරු කිරීම් පිළිබඳව තීන්දු තීරණ ගන්න ජාතික පොලිස් කොමිසමට පුළුවන් වෙලා තිබෙනවා.

පසු ගිය කාලයේ මැතිවරණයක් අවසන් වෙලා නව රජයක් පත් වන කොට අපි ඉස්සෙල්ලාම දකින්නේ, පොලිස් ස්ථානාධිපතිවරුන් මාරු කිරීම්. අද ඒවා දකින්න නැහැ. අද රජයේ සේවකයින්ට වැදගත් විධියට තමන්ගේ රාජකාරිය කරන්න පුළුවන් වාතාවරණයක් ඇති වෙලා තිබෙනවා. අන්න ඒ අවස්ථාව ලැබුණේ කොමිෂන් සභා පත් කිරීමෙන්. ස්වාධීන කොමිෂන් සභා පත් කිරීම තුළින් තමයි, මේ රට අද ඉදිරියට ගෙන යන්න හැකි වෙලා තිබෙන්නේ.

ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම ගැන විරුද්ධ කොටසක් ඉන්න බවත් අපි දකිනවා. ඒ කොටස මේකට විරුද්ධ ඇත්තටම මේ කොමිෂන් සභාවලට තිබෙන විරෝධතාවද, එහෙම නැත්නම් මේ කොමිෂන් සභාවලින් රටේ ඇති වෙලා තිබෙන තත්ත්වයට තමන්ගේ පෞද්ගලික හේතූන් මත, තමන්ගේ පෞද්ගලික අවශ්‍යතාවන් මත විරෝධතාවක් පළ කරනවාද කියන එක මම හිතන්නේ රටේ ජනතාව හොඳට තේරුම් අරගෙන තිබෙනවා. මේ කොමිෂන් සභාවල සාමාජිකයන්ට ලබා දෙන දීමනා පමණක් නොව, ඒ අයට අවශ්‍ය සම්පත් හා දැනුම යන සියල්ලම ලබා දීලා, මේ කොමිෂන් සභා ඉදිරියේදී තවත් ශක්තිමත් කළ යුතුයි. ඒ මඟින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් කරමින්, මේ රජය ඉදිරියට යා යුතු බව ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.13]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ දීමනා සහ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් අද දින ගෙනා යෝජනාව සම්බන්ධයෙන් කථා කරද්දී විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ ටික එකතු වෙලා එද්දි "ලංකා ඉතිහාසයේ වැඩිම වැටුප් ගන්න නිලධාරිනිය" ලෙස එතුමියට ගිනස් වාර්තාව තියන්න පුළුවන් වේවි. විශේෂයෙන්ම මේ යෝජනාවෙන් එතුමියට පෞද්ගලික වන සේ මේ දීමනා ටික ලබා දීමට කටයුතු කරන බවත් කියන්නට ඕනෑ.

හරි ආදරයක්, කරුණාවක්, ළෙන්ගතුකමක් දක්වන බව මේ යෝජනාව ඉදිරිපත් කරද්දී අපට පේනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියන්න ඕනෑ, ආණ්ඩුව මේ වෙද්දී ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව. හැබැයි, ආණ්ඩුව අල්ලස් දෙන එක ගැන කිසිම කෙනෙක්, කිසිම වෙලාවක කථා කරන්නේ නැහැ. එක එක ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු බොහොම වීරත්වයෙන් කථා කළා. හැබැයි, පැමිණිල්ලක් නැතිව, පැමිණිල්ලක් දමන්නේ නැතිව ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න උදවිය අල්ලාගෙන කුදලාගෙන අල්ලස් කොමිසමට ගෙනියන්න කටයුතු කරනවා. අද අපේ ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා කථා කරලා කියනවා, "මේ කොමිෂන් සභා ශක්තිමත් කරන්න ඕනෑ" කියලා. මේ කොමිෂන් සභා ශක්තිමත් කරන්න ඕනෑ බව අපි පිළිගන්නවා. හැබැයි, මේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියට මෙච්චර ශක්තිමත්භාවයක් දෙන්න, මෙච්චර දීමනාවක් ලබා දෙන්න මොකක්ද තිබෙන වුවමනාව, හදිස්සිය කියන එක පාර්ලිමේන්තුවේ විපක්ෂයේ අයටත් දැනෙන්න ඕනෑ. විපක්ෂයේ කියලා හිතාගෙන කථා කරන ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරුන්ට, ටීඑන්ඒ එකේ මන්ත්‍රීවරුන්ට ලබාදීලා තිබෙන අල්ලස් ගැන අද අපි දන්නවා.

අපි දන්නවා, විපක්ෂ නායකතුමාගේ ප්‍රධාන විපක්ෂයට මාර්ග ව්‍යාපෘති කිරීම සඳහා රුපියල් මිලියන 60 ගණනේ අද බෙදා දීලා තිබෙන බව. එහෙම අපිට ලබා දීලා තිබෙනවාද? ඒ වාගේම අද ආණ්ඩුවේ ඇමතිකමක් නොදරන මන්ත්‍රීවරුන්ටත්, ඒකාබද්ධ විපක්ෂයේ නොවන අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් එක එක විධියට ලක්ෂ ගණනින් මුදල් දෙන්න කටයුතු කරලා තිබෙනවා. මේවාට තමයි අල්ලස් කියන්නේ. ඒ වාගේම අපි ඊයේ දැක්කා, එක අමාත්‍යාවරයෙක් බොහොම තදට උඩු බුරනවා. එතුමා බොහොම තදට උඩු බිරුවා. මොකටද උඩු බිරුවේ? උඩු බිරුවේ වෙන දේකට නොවෙයි. දිපු කට්ටේ රහ වැටිලා තමයි එතුමා උඩු බිරුවේ.

මහ මැතිවරණයේදී ඡන්ද 5,000යි ගත්තේ. ඡන්ද 5,000ක් අරගෙන ඇවිල්ලා උඩු බිරුවා, ලක්ෂ 5,000ක් අනුමත කරගන්න. තනි පුද්ගලයෙක් විධියට ගත්තම මනාප 2,000ක් නැහැ. මේවා ලජ්ජයි. ඒ නිසා අපි කියනවා, මේ අල්ලස් දීම අගමැතිවරයා නවත්වන්න ඕනෑ කියලා. ඒ වාගේම මම අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තුවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ට වැදගත් විධියට කථා කරන්න කියලා. ඊයේ කථාවලදී එක එක අයගේ චරිත හුවා දක්වපු විධිය අපි දැක්කා. හමුදාවේ ඉන්න කාලයේ කටයුතු කරපු විධියට පාර්ලිමේන්තුවේදී කටයුතු කරන්න එපා. නීතිගරුකව පාර්ලිමේන්තුවේ කටයුතු කරන්න. ඔබ තමුන්නාන්සේලා ඒක තීරණය කරන්න ඕනෑ. ඒ වාගේම තවත් අමාත්‍යාවරයෙක් කිව්වා, අල්ලස් කොමිසමට ආණ්ඩුවේ ඉන්න අය යන්නේ පස්සේ දොරෙන් කියලා. ඒක යකාගේ නීතියක් නේ. අල්ලස් කොමිසමට ආණ්ඩුවේ ඉන්න අය මොකටද පස්සේ දොරෙන් යන්නේ? අපේ ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා අල්ලස් කොමිසමට ආවේ පස්සේ දොරෙන් කිව්වා. අපි නම් දැක්කේ නැහැ, එතුමා පස්සේ දොරෙන් එනවා. එතුමා බොහෝම ලස්සනට ඇවිල්ලා පරීක්ෂණයට මුහුණදීලා, රූපවාහිනියටත් මුහුණ දීලා ගියා. අපේ අයත් ගියා. අපේ මහින්දානන්ද මන්ත්‍රීතුමාට නැති චෝදනා දාලා එක්කගෙන ගියා. අපේ විමල් වීරවංශ මන්ත්‍රීතුමාට, ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාට චෝදනා නැහැ; චෝදනා දාපු කෙනෙක් නැහැ. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට චෝදනාවක් දාපු කෙනෙක් නැහැ. අවුරුදු 19ක් පරණ සිද්ධියකට අපේ උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාට චෝදනාවක් දැම්මා. ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න අය එකතු කරලා ඒ අය තමයි හොරු කියලා කියනවා. නැහැ, නියම අල්ලස් ගත්ත පුද්ගලයන් තමයි අද ආණ්ඩුව කරන්නේ කියලා කියන්න ඕනෑ. ඒක අපි ඊයේ දවසේදී දැක්කා. ඊයේ ආණ්ඩුවේ අමාත්‍යාවරයෙකුට දුන්න අල්ලස අපි දැක්කා. අපි ඒ අල්ලසේ සද්දෙත් ඇහුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පොලිස් කොමිසම හදනවා; මැතිවරණ කොමිසම හදනවා වාගේම අල්ලස් කොමිසම හදනවා. ඒකට තමුන්ගේ හිතවතුන් පත් කර ගන්නවා. අද ඡන්දෙත් නැහැ. පොලීසියෙන් සාධාරණයක් වෙන්නෙත් නැහැ. අල්ලස් කොමිසම කටයුතු කරන්නේ ඒ ගොල්ලන්ට ඕනෑ, ඕනෑ අයට විතරයි. මේ ආණ්ඩුව පැහැදිලිවම අපේ ඒකාබද්ධ විපක්ෂය දඩයම් කිරීම අපිට ගැටලුවක් නැහැ. මොකද අපි දන්නවා, මේවාට නඩු දාලා උසාවි ගෙන ගියාට අපේ නිර්දෝෂීභාවය උසාවිය පිළිගෙන අපට ඇප දෙනවා කියලා. අද ඒවාට විරුද්ධවත් මේ

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

ආණ්ඩුව කටයුතු කරනවා. ඒ නිසා මේ හුරතලීව හුරතල් කරලා, මේ හුරතලීට දීමනා දීලා, මේ හුරතලීව නඩත්තු කරලා ඕනෑ තැනකට ගෙනියන්න ඒකාබද්ධ විපක්ෂය ශක්තිමත්ව කටයුතු කරනවා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්තුතියි.

මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 6.19]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කතාව පටන් ගත්තේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අල්ලස් දෙනවා කියමිනුයි. පසු ගිය ආණ්ඩුව ආණ්ඩු පක්ෂයේ හිටපු හැම මන්ත්‍රීවරයෙකුටම වාහන, පෙට්‍රල් ආදී නොයෙකුත් දීමනා ලබා දීපු බව අද එතුමාට අමතක වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් හොරු පොලීසියට කැමැති නැහැ. හොරු පොලීසියට විරුද්ධයි. හොරු පොලීසියට විරුද්ධයි වාගේම, අල්ලස් ගත්ත උදවිය; අල්ලස් දූෂණවලට සම්බන්ධ උදවිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට විරුද්ධයි; ඒ ගොල්ලන් බයයි; ඒ අදාළ නීති ස්ථාපිත කරලා, නීතිය ක්‍රියාත්මක කරනවාට ඒ අය විරුද්ධයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මෙම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම ස්වාධීන කරලා, එහි නීති ක්‍රියාත්මක කරන්න කටයුතු සලසනවා. ඒ වාගේම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ වැඩ කරන නිලධාරීන්ගේ ආරක්ෂාව ගැන අපි කථා කරන්න ඕනෑ. අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් අල්ලන්න යන්නේ මේ රටේ ඉන්න ග්‍රාම නිලධාරීන් නොවෙයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ කරන රජයේ නිලධාරීන් නොවෙයි. අද ඔවුන් අල්ලන්න යන්නේ, මේ රට පාලනය කරපු; ඒ රාජ්‍ය තන්ත්‍රයේ හිටපු; ඒ රජ පවුලට සම්බන්ධ වුණු අයයි. ඒ රජයේ නිලධාරීන්ගේ පිටුපසයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම දුවන්නේ. එම නිසා, ඒ නිලධාරීන්ගේ ආරක්ෂාව රජයක් හැටියට අපි සහතික කළ යුතුයි. මොකද, මේක එසේ මෙසේ වගකීමක් නොවෙයි. මේ අල්ලන්න යන්නේ, හාල්මැස්සන් නොවෙයි. මේ අල්ලන්න යන්නේ, පොඩි මිනිසුන් නොවෙයි. මේ රට පාලනය කරපු, මේ රට දූෂණය කරපු, මේ රටේ ජනතාවගේ මුදල් හොරා කාපු, ඒ රාජ්‍ය තන්ත්‍රයේ හිටපු උදවිය තමයි මේ අල්ලන්න යන්නේ. අද මේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු කෑ ගහන්නේ එකට විරුද්ධවයි. අද මේ අය බය වෙන්නේ ඒකට විරුද්ධවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. තවත් අයව අත්අඩංගුවට ගන්න තිබෙනවා. 2014 වසරේ ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත් මහත්මයා ජනාධිපති මන්දිරයේ සිටියදී, එතුමාගේ යටතේ ඒ.එම්.බී. අබේසිංහ නමැති පරිපාලන නිලධාරී මහත්මයෙක් වැඩ කළා. එතුමා 2014 දෙසැම්බර් මාසයේ පමණක් චෙක්පත් මඟින් රුපියල් මිලියන 217ක් මුදල් කරගෙන තිබෙනවා. ඒ චෙක්පත් මුදල් කරන්න කොහෙන්ද ආවේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හැම චෙක්පතක්ම ආවේ ජනාධිපති මන්දිරයට කෑම සපයපු, construction කරපු, රජයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරපු සමාගම්වලින්. ගාමිණී සෙනරත් මහත්මයාගේ යටතේ හිටපු ඒ.එම්.බී. අබේසිංහ කියන පරිපාලන නිලධාරියා 2014 දෙසැම්බර් මාසයේ පමණක් සියලුම චෙක්පත්වලින් රුපියල් මිලියන 217ක මුදලක් ලබා ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට කියන්නේ, මේවා ගැනත් සොයන්න කියලායි. එපමණක් නොවෙයි, මේ අය කථා කරනකොට මට තව එක සිද්ධියක් මතක් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දාපු නඩුත් ඉල්ලා අස් කර ගත්තා.

175 අංක දරන ලිපිනයේ පදිංචි තොග වෙළෙඳාම් කරන රොෂාන්ග පත්බේරිය කියලා කෙනෙක් මහරගම නැඟෙනහිර කාර්යාලයේ ඉන්න ආදායම් බදු නිලධාරිතුමාට -සමරසිංහ දිසානායක මහතා- විරුද්ධව 2013 වසරේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පැමිණිල්ලක් දැම්මා. පැමිණිල්ලක් දැම්මේ, රුපියල් ලක්ෂ 4ක පගාවක් ඉල්ලුවා කියලායි. රුපියල් ලක්ෂ 4ක පගාව ගන්නකොට අල්ලස් කොමිසමෙන් ඔහුව අල්ලලා මහෙස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කරලා රිමාන්ඩ් කළා. ඊට පසු, ඔහු ඇප පිට නිදහස් වුණා. නිදහස් වුණාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිතුමා එදා ගිහින් මොකක්ද කළේ? 2014.06.14 වෙනිදා උසාවියට ගිහිල්ලා ඒ නඩුව ඉල්ලා අස් කර ගත්තා. හේතුව මොකක්ද? සමරසිංහ දිසානායක මහත්මයා රාජ පරම්පරාවට ඥාති සම්බන්ධතාව තිබෙනවා. එතුමා රජ පවුලේ ඥාතිවරයෙක්. එම නිසා ඒ නඩුව ඉල්ලා අස් කර ගත්තා. මම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිතුමියට කියන්නේ, නැවත එම නඩුව කැඳවන්න; නැවත නඩුව ගෙනියන්න; නැවත නඩුව හොයන්න කියලායි. මෙන්න, මේවා තමයි පසු ගිය කාලයේ වුණේ. මෙන්න, මේ වාගේ ඒවා තමයි යට ගැහුවේ. යට ගහපු මිනිසුන් තමයි අද ඇවිල්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට විරුද්ධව කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ රට යම් තැනකට ගෙනැල්ලා තිබෙනවා. මේ රටේ අල්ලස හා දූෂණය තුරන් කරන්න මෙම ආණ්ඩුවට වුවමනා වෙලා තිබෙනවා. එය, මේ ආණ්ඩුවේ අභිප්‍රාය, චේතනාව වෙලා තිබෙනවා. ඒ හින්දා අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන කළා. අපි FCID එක හැදුවා; ජනාධිපති විමර්ශන කොමිසම ක්‍රියාත්මක කළා. ඒ හැම එකක්ම කළේ මේ රටින් අල්ලස, දූෂණය තුරන් කරන්නයි. අපි කනගාටු වෙනවා, විරුද්ධ පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් මෙයට විරුද්ධ වෙලා, එය නවත්වන්න මේ යෝජනාවට විරුද්ධව අද කථා කිරීම ගැන. සාමාන්‍යයෙන් හොරු පොලීසියට විරුද්ධයි. හොරු පොලීසියට විරුද්ධයි වාගේම, දූෂණවලට සම්බන්ධ උදවියත්, අල්ලස් ගත් උදවියත්, ඒවාට අදාළව නඩු තිබෙන උදවියත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට විරුද්ධයි. ඒ විරුද්ධත්වය ඔවුන් ප්‍රකාශ කළා. නමුත්, අද මේ යහ පාලන ආණ්ඩුව නිසි මාර්ගයේම, නියමිත මාර්ගයේම යන ගමන අපි නවත්වන්නේ නැහැ. අපි පසු ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ 8වන දා මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා, යහ පාලනය වෙනුවෙන්. ඒ පොරොන්දුව මොකක්ද? අල්ලසට සම්බන්ධ අය, මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිත කරපු අය, හොරකම් කරපු අය -ඒ සියලුදෙනා- නීතිය ඉදිරියට ගෙනෙනවා කියන පොරොන්දුවයි. අපි අද ඒ පොරොන්දුව ඉෂ්ට කරමින් එක්කෙනා, එක්කෙනා නීතිය ඉදිරියට ගෙන එමින් පවතිනවා. අපි අල්ලසට ඉඩක් දෙන්නේ නැහැ. ඒ වංචාවලට සම්බන්ධ වූ අය නීතියෙන් ගැලවෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් අප ඔබතුමාට කියන්නේ මේකයි. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් නායකත්වය යටතේ අප මේ ගොඩ නහාගත් යහ පාලනය ආරක්ෂා කර ගනිමින් අප ඉදිරියට යනවා. අද සමහරු කුමන විරුද්ධ දේ කළත්, කුමන දේවල් කථා කළත්, නුවර ඉඳන් කොළඹට පා ගමන් ආවත්, කොළඹ ඉඳන් නුවරට පා ගමන් ගියත්

මේ ආණ්ඩුව ගත් ඒ තීන්දු තිරණ, අප එදා ඒ ජනතාවට දීපු පොරොන්දු එකක්වත් ආපස්සට හරවන්නේ නැහැයි කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1ට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයන්: පාරිශ්‍රමික හා වෙනත් දීමනා
சுயாதீன ஆணைக்குழுக்களின் தலைவர்கள் மற்றும் உறுப்பினர்கள்: ஊதியங்கள் மற்றும் ஏனைய படிகள்
CHAIRMEN AND MEMBERS OF THE INDEPENDENT COMMISSIONS: EMOLUMENTS AND OTHER ALLOWANCES

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරී ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:-

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් 3/4ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 2ට සභාව එකඟද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Aye.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Divide!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනා අංක 2 සම්බන්ධවද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මොකද, පළමුවන එකට- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, නැහැ. 2වන යෝජනාවට විතරයි ඉල්ලීම කළේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
1වන එකට විරුද්ධ වුණේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
1වන යෝජනාවට තමයි ඉල්ලීම කළේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, නැහැ. දැන් බැහැ. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
1වන යෝජනාවටයි ඉල්ලුවේ. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
නැහිටින්නම ඕනෑ නැහැ නේ. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
1වන යෝජනාවටයි "Divide" කිව්වේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [ඝෝෂා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා පළමුවන යෝජනාව ඡන්දය සඳහා ඉදිරිපත් කළා. එයට "Aye" කිව්වා. ඊට පසුව එය සම්මත වුණා. දෙවන සැරේ "Aye" කිව්වාට පසුව "Divide" කියා කිව්වා. එහෙම නම්, Division එක එන්නේ 2වන යෝජනාවටයි. [ඝෝෂා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. You called for a Division for Item No. 2.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. Item No.1

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
Item No.1 සඳහා කවුරුවත් "Divide" කිව්වේ නැහැ. එයට ඡන්දයක් ඉල්ලුවේ නැහැ. ඕනෑ නම් 2වන එකට ඡන්දයක් ගන්න. අපට ප්‍රශ්නයක් නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
I called for a Division for Item No.1

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
Item No.1 සඳහා ඔබතුමන්ලා ඉල්ලුවේ නැහැ. You missed the bus. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද මේ කරන්නේ? [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
පාර්ලිමේන්තුවේ වරප්‍රසාද අනුව, ඕනෑ නම් 2වන යෝජනාවට ඡන්දයක් ගන්න. Item No. 2 සඳහා 'Divide' කිව්වා. අපි සියල්ලෝම එකඟයි, එයට. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! අපි අද දින න්‍යාය පත්‍රයේ යෝජනා අංක 1 සභාව හමුවේ තැබුවාම, සභානායකතුමා ඒ සඳහා සභාවෙන් අනුමැතියක් ගත්තා. ඒ සම්බන්ධයෙන් කිසිකෙනෙක් ඉල්ලීමක් කළේ නැහැ, Division එකකට. [ඝෝෂා කිරීම්] Order, please! [ඝෝෂා කිරීම්] Order, please! ඊට පසුව මම අංක 2 යෝජනාව සභාව හමුවේ තැබුවාම නැඟී සිටියා, බෙදීමක් ඉල්ලා. මේ වන කොට 1වන යෝජනාව සභාවේ අනුමත වෙලායි තිබෙන්නේ. [ඝෝෂා කිරීම්] දෙවැනි යෝජනාවට Division එකක් ඉල්ලා තිබෙනවා. ඒ නිසා අපි දෙවැනි යෝජනාව ඡන්දයකට ඉදිරිපත් කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යෝජනා අංක 1 සම්මත වුණා. [බාධා කිරීම්] ඒ අවස්ථාවේදී මේ අය අවදියෙන් සිටියේ නැහැ. මේ අය නිදි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is clear. Now we are on Item No.2.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ අය නිදා ගෙන සිටියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ තීරණය දෙන්න. [බාධා කිරීම්] මොකද, මේ අවස්ථාවේදී රීති ප්‍රශ්නයක් ගන්න බැහැ. You cannot raise a point of Order during a vote.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විපක්ෂයේ අය බෙදීමක් ඉල්ලා සිටින නිසා දෙවැනි යෝජනාව සඳහා ඡන්දය ගැනීමට සීනුව නාද කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දෙවැනි යෝජනාවට බෙදීමක් ඉල්ලුවේ නැහැ. [ඝෝෂා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
යෝජනා දෙකටම ඉල්ලුවේ නැහැ. එහෙම නම් වැඩේ ඉවරයි. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! දැන් සීනුව නාද වෙනවා. කරුණාකර ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ ආසනවලට යන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි යෝජනාවට -[ඝෝෂා කිරීම්] මයික් එක දෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න මයික් එක දෙන්නේ නැහැ. [ඝෝෂා කිරීම්]

[මේ අවස්ථාවේදී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සභා ගර්භයෙන් පිටව ගියහ.]

[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்திலிருந்து வெளியேறினர்.]

[At this stage, some Members of the Opposition walked out of the Chamber.]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීවරුන් කරුණාකර තමන්ගේ ආසනවල ඉඳගන්න. දැන් ඡන්ද විමසීම සිදු කරන වේලාවයි.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විනා විධුක්කප්පට්ටது.

குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.

Question put.

THE HON. DEPUTY SPEAKER, having collected the Voices, declared that the " Ayes " had it.

පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ පක්ෂව 68 : විරුද්ධව 0 යනුවෙන් බෙදුණේය.

பாராளுமன்றம் 43ஆம் நிலைக் கட்டளைப்படி பிரிந்தது: சார்பாக 68; எதிராக 0.

The Parliament divided under Standing Order No. 43: Ayes 68; Noes 0 .

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ අනුව යෝජනාව සම්මත වූ බව මම ප්‍රකාශ කරමි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Parliament do now adjourn."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සිසිර ජයකොඩි මහතා. එතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ නැති බවයි පෙනෙන්නේ.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.37ට, 2016 මාර්තු 08 දින සභා සම්මතිය අනුව, 2016 සැප්තැම්බර් 22වන බ්‍රහස්පතින්දා ප. භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.37மணிக்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2016 செப்ரெம்பர் 22, வியாழக்கிழமை மு. ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.37 p.m. until 10.30 a.m. on Thursday, 22nd September, 2016, pursuant to the Resolution of Parliament of 08th March, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

246 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 246 - இல. 7
Volume 246 - No. 7

2016 සැප්තැම්බර් 22 වන බ්‍රහස්පතින්දා
2016 செப்ரெம்பர் 22, வியாழக்கிழமை
Thursday, 22nd September, 2016

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
පාර්ලිමේන්තුව ස්ථාවර නියෝගවලට අනුව කටයුතු නොකිරීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
වතු කම්කරුවන්ට නිවාස ලබා දීම
දිවි නැගුම සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සඳහා වූ තරග විභාගයේදී අපේක්ෂකයන්ට සිදු වූ අසාධාරණය

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත :
දෙවන වර සහ තුන් වන වර කියවා සම්මත කරන ලදි.

කල්තැබීමේ යෝජනාව :
සිරියානු අර්බුදයට සාමකාමී විසඳුමක්

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு
பாராளுமன்ற நிலையியற் கட்டளைகளுக்கு அமைந்தொழுகாமை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
தோட்டத் தொழிலாளர்களுக்கு வீடுகள் வழங்குதல்
திவிநெகும அபிவிருத்தி உத்தியோகத்தர் ஆட்சேர்ப்புக்கான திறந்த போட்டிப் பரீட்சையில் அபேட்சகர்களுக்கு ஏற்பட்ட அநீதி

பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
சிரியா பிரச்சினைக்குச் சமாதானத் தீர்வு

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Nation Building Tax (Amendment) Bill: Determination of the Supreme Court
Non-compliance with Standing Orders of Parliament

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Provision of Houses for Estate Workers
Injustice Caused to Candidates at the Competitive Examination for Recruitment of Divineguma Development Officers

UNIVERSITIES (AMENDMENT) BILL:
Read a Second, and the Third time and passed

ADJOURNMENT MOTION:
Peaceful Resolution to the Syrian Conflict

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 සැප්තැම්බර් 22 වන බ්‍රහස්පතින්දා
2016 செப்ரெம்பர் 22, வியாழக்கிழமை
Thursday, 22nd September, 2016

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
NATION BUILDING TAX (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේදී අභියෝගයට ලක් කරන ලද "ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

එකී පනත් කෙටුම්පත, සමස්තයක් වශයෙන් හෝ එහි විධිවිධාන කිසිවක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :
உயர் நீதிமன்றத் தீர்ப்பு:
Determination of the Supreme Court:

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

A BILL TITLED, "NATION BUILDING TAX (AMENDMENT)"

In the matter of an application under and in terms of Article 121 read with Article 120 and Article 83 of the Constitution to determine whether the above Bill is inconsistent with the Constitution of the Democratic Socialist Republic of Sri Lanka

BEFORE

K. Sripavan	-	Chief Justice
Anil Gooneratne,	-	Judge of the Supreme Court
Prasanna S. Jayawardena, P.C.	-	Judge of the Supreme Court

S.C.(S.D.) No.34/2016

Petitioner	P. Liyanaarachchi, Attorney-at-Law, "Saketha", Midellawita Road, Galahitiyawa, Ganemulla.
Counsel	Dharshana Weraduwage
Respondent	Hon. Attorney General, Attorney-General's Department, Colombo12.
Counsel	Mrs. Farzana Jameel P.C., Additional Solicitor General with Yuresha de Silva, Senior State Counsel

Court assembled for hearing on 20th September 2016.

The Bill titled "Nation Building Tax (Amendment)" which seeks to amend certain provisions of the Nation Building Tax Act No. 9 of 2009 was challenged by the Petitioner as to its constitutionality.

The Petitioner alleges that Clauses I, 2(2)(a)(iii), 2(2)(b), 4(2)(b) and 5 violate Articles 03,04,12(1), 13(6), 27(1), 27(2)(a),111(c) of the Constitution. The main argument of the Petitioner is that the aforesaid Clauses, purporting to have retrospective operation violate Articles 03, 04 and 12(1) of the Constitution.

Article 75 of the Constitution empowers the Parliament to make laws including laws having retrospective effect. Thus, it is well recognized that the power to legislate includes the power to legislate prospectively as well as retrospectively. This Court expressing its view in respect of a Special Determination on the Bill titled "Code of Criminal Procedure (Special Provisions)" S.C. S.D. 16/2012 and S.C. S.D. 17/2012 noted as follows with regard to the enactment of retrospective legislation.

> *"Retrospective legislation would in most instances validate or invalidate the rights of parties and therefore the mere fact that in this instance Clause 8 validates the acts referred to therein with retrospective effect does not necessarily mean that it constitutes a usurpation of judicial power by the legislature".*

Further, in relation to the **Inland Revenue (Amendment) Bill** S.C.S.D. 3/1980, this Court made the following observations:-

> *".....This is however, fiscal legislation and it is a matter for the legislature to decide what consideration relating to the amelioration of hardship or to the interests of the economic progress of the people should be given effect to. Presumably this provision is sought to be enacted on the basis of economic consideration in respect of which the decision must* ***largely be left to the legislature in view of the inherent complexity of fiscal adjustment of diverse elements that requires to be made."*** (emphasis added)

[ගරු කථානායකතුමා]

Thus, once the legislature decides to give retrospective operation to the Nation Building Tax (Amendment) Bill with effect from 1st January 2016, the Court should not substitute its own opinion for the opinion of the legislature. As Warrington L.J. in ***Short*** *Vs.* ***Poole Corp*** **(1926) C.H. Division 60(91)** stated that *"with the question whether a particular policy is wise or foolish the Court is not concerned; it can only interfere if to pursue it is beyond the powers of the authority."* Accordingly, the power to tax retrospectively is an incident of sovereignty and is co-extensive with the subjects to which the sovereignty extends. It is unlimited in its range acknowledging in its very nature no limits so that security against its abuse, if any, is to be found only in the responsibility of the legislature which imposes the tax on the people who are to pay it.

Learned Counsel for the Petitioner submitted that Clause 4(2)(b) of the Bill introduces Nations Building Tax in addition to the existing tax on telecommunication levy. In the case of *Ananthakrishnan* Vs. *Madras* AIR (1952) 395 at 408 the Court observed as follows :-

> *"The Law undoubtedly is that the sovereign power of taxation is absolute, that it could be exercised up to any limit, that the determination of that limit is for the legislature and that it knows no limitations except what are prescribed by the Constitution. The laws fixing taxes cannot be questioned on the ground that the tax is heavy and oppressive ...."*

Thus, it is well established in taxing matters, the legislature has the greatest freedom in selecting persons or objects it will tax and such steps taken by the legislature is not open to attack on the basis that the legislature taxes some persons or objects and not others. Once the legislature decides the limit within which the law applies, the law cannot operate unequally within the limit so decided by the legislature.

This Court in S.C. Special Determination No. 17/1997 (Bill to Amend the Inland Revenue Act No. 28 of 1979) referred to the approach that should be followed by Court with regard to taxing Statutes as follows:-

> *"The principles that govern the approach of the court to taxing statute, where the basis of classification is challenged, were lucidly set out by Hedge J. in the following terms:*
>
> *It is not in dispute that taxation laws must also pass the test of article 14. That has been laid down by this court in Moopil Nair v. State of Kerala (1961 3 SCR 77). But as observed by this court in East India Tobacco Co. vs. State of Andhar Pradesh (1963 1 SCR 404, 409), in deciding whether the taxation law is discriminatory or not it is necessary to bear in mind that the State has a wide discretion in selecting persons or objects it will tax, and that a statute is not open to attack on the ground that it taxes some persons or objects and not others; it is only when within the range of its selection, the law operates unequally, and that cannot be justified on the basis of any valid classification, that it would be violative of article 14. It is well settled that a State does not have to tax everything in order to tax something. It is allowed to pick and choose districts, objects, persons, methods and even rates for taxation if it does so reasonably.*

Mr. Goonewardena cited the decision of the Supreme Court of India, Kerala Hotel Restaurant Association vs. State of Kerala and others, 1990 S.C. cases (Tax 309) where Verma J. stated "The extent to which the revenue is required from a particular source is a matter of fiscal policy and if the legislature chooses to be satisfied with the raising of that amount alone which can be recovered from the affluent, it cannot be faulted for not dragging the impecunious also in the tax net. Even otherwise the play in the joints permitted to the legislature for making classification in a taxing provision is greater....." In the course of his judgment Verma J. cited the following passage from the judgment of Venkarachaliah J. in the case of P.M. Ashwathanarayana Setty vs. State of IKarnataka (1989) Supp (1) SCC 696) : "Though other legislative measures dealing with economic regulations are not outside article 14, it is well recognized that the State enjoys the widest latitude where measures of economic regulations are concerned. These measures for fiscal and economic regulations involve an evaluation of diverse and quite often conflicting economic criteria and adjustment and balancing of various conflicting social and economic values and interests. It is for the State to decide what economic and social policy it should pursue and what discriminations advance those social and economic policies. In view of the inherent complexity of these fiscal adjustments, courts give a larger discretion to the legislature in the matter of its preferences of economic and social policies and effectuate the chosen system in all possible and reasonable way."

The Court therefore does not see any violation of the provisions of the Constitution by imposing Nation Building Tax in addition to the telecommunication levy.

Counsel further argued that the validation Clause, namely, Clause 5, violates Articles 3, 4, 12(1) and 27(1) of the Constitution. The legal effect of the said Clause is to validate certain taxes calculated and collected by the Commissioner-General of Inland Revenue and the Director General of Customs under Sections 4 and 5 respectively of the principal enactment from persons to whom the Act applies and further to provide that such provisions shall not affect any decision or order made by any Court or any proceedings pending before any Court in respect of any such tax collected.

உயர் கல்வி அமைச்சினால் அறிமுகப்படுத்தப்பட்டுள்ள பல்கலைக்கழகப் பிரதேசங்களை நகரமயமாக்கல் மூலம் பல்கலைக்கழகங்களுக்கும் பொதுமக்களுக்குமிடையிலான நல்லுறவை வளர்ப்பதனூடாக அபிவிருத்தித் திட்டங்களை முன்னெடுப்பதற்கான செயற்றிட்ட முன்மொழிவுகள் வவுனியா வளாகத்தினால் ஏற்கெனவே சமர்ப்பிக்கப்பட்டுள்ளன. இவற்றுக்குப் பல்வேறு சிறிய மற்றும் நடுத்தர செயற்றிட்ட முன்மொழிவுகளினூடாக 4,500 மில்லியன் ரூபாய் கோரிக்கையாக முன்வைக்கப்பட்டுள்ளன. அத்துடன், வவுனியா வளாகத்தின் 25ஆவது வருட பூர்த்தியை இவ்வருடம் நவம்பர் மாதம் கொண்டாடுவதற்கான ஏற்பாடுகளைச் செய்து வருகின்ற அதேவேளையில், மனிதவள மற்றும் பௌதிக வளங்களின் பற்றாக்குறை காரணமாக உயர் கல்வி நிறுவகம் எனும் அந்தஸ்தினைப் பேணிவருவதில் பல சிரமங்களை எதிர்நோக்கி வருகின்றது என்பதையும் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

உலகமயமாக்கல் மற்றும் பல்வேறு துறைகளினதும் துரித அபிவிருத்தி வளர்ச்சிப் பாதையில் பயணிப்பதற்கும் வன்னி மாவட்ட மக்களின் அபிலாசைகளைப் பூர்த்தி செய்யவுமென வவுனியா வளாகத்தினைப் பல்கலைக்கழகமாகத் தரமுயர்த்த வேண்மென வலியுறுத்துகின்றேன். வவுனியா வளாகம் 25ஆவது வருட பூர்த்தியைக் கொண்டாடும் இச்சந்தர்ப்பத்தில் இவ்வருடத்தில் அதனை வன்னிப் பல்கலைக்கழகமாக தரமுயர்த்துவதன்மூலம் வன்னி மாவட்ட மக்களின் நீண்டகால அபிலாசைகளைப் பூர்த்திசெய்து, நல்லாட்சி அரசாங்கத்தின் அதிகாரப் பரவலாக்கலின் நன்மையை வன்னி மாவட்ட மூவின மக்களும் பெற்றுக்கொள்வதற்கு இச்சந்தர்ப்பத்தினைப் பயன்படுத்திக்கொள்ளுமாறு அரசாங்கத்திடம் கேட்டுக்கொள் கிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீண்டகாலமாக மூவின மக்களும் வாழ்கின்ற எங்களுடைய மாவட்டத்தில் இந்தக் கோரிக்கை விடுக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இதனை நீங்கள் கவனத்தில் எடுத்து இதனை வன்னிப் பல்கலைக் கழகமாகத் தரமுயர்த்துவதற்குத் தேவையான சகல நிதி ஆதாரங்களையும் ஏனைய விடயங்களையும் செய்து தரும்படி அங்கு பாதிக்கப்பட்டிருக்கின்ற மக்கள், புத்திஜீவிகள், அரசியல் பிரமுகர்கள் சார்பாக உங்களிடம் கோரிக்கை விடுக்கின்றேன்.

இவற்றுக்கு அப்பால், இன்னும் சில முக்கியமான விடயங்களையும் இச்சந்தர்ப்பத்தில் குறிப்பிட நினைக் கின்றேன். அநுராதபுரம் சிறைச்சாலையிலே அரசியல் கைதிகள் 2வது நாளாக உண்ணாவிரதமிருந்து வருகிறார்கள். அவர்கள் தங்களுடைய விடுதலை தொடர்பாகப் பல தடவைகள் இந்த உண்ணாவிரதத்தை மேற்கொண்டிருந் தார்கள். இவர்களுக்கு வாக்குறுதிகள் கொடுக்கப்படுவதும் மீண்டும் அவை மீறப்படுகின்ற நிலைமையும்தான் தொடர்ந்து கொண்டிருக்கின்றது. இந்த விடயம் தொடர்பாக அரசாங்கத்தால் உரிய நடவடிக்கைகள் எடுக்கப்படவில்லை. அவர்கள் ஒரு வழக்கிலிருந்து நீதிமன்றத்தால் விடுவிக்கப் பட்டாலும் இன்னுமொரு நீதிமன்றத்தில் மீண்டும் வழக்குத் தொடரப்படுகின்றது. மேலும், இந்த வழக்குகள் வட மாகாணம் தவிர்ந்த ஏனைய மாட்டங்களில் நடைபெறுவதால் மொழி ரீதியான பிரச்சினைகள் இருக்கின்றன.

இப்படிப் பல்வேறுபட்ட பிரச்சினைகளைப் பற்றிய கோரிக்கைகளை முன்வைத்து அவர்கள் உண்ணாவிரதம் இருக்கிறார்கள். நீண்டகாலம் சிறையிலே வாடுகின்ற இந்த அரசியல் கைதிகளின் உண்ணாவிரதத்தை நீங்கள் ஒரு முடிவுக்குக் கொண்டுவரவேண்டும். இந்த அரசாங்கம் ஓர் உண்மையான நல்லிணக்கத்தை அல்லது நம்பிக்கையைக் கட்டியெழுப்ப நினைத்தால் இந்த அரசியல் கைதிகள் எல்லோருக்கும் நிபந்தனையின்றிப் பொதுமன்னிப்பு வழங்கி விடுதலை செய்யவேண்டும் என்பதைத் தொடர்ச்சியாக நாங்கள் வலியுறுத்தி வருகின்றோம். நல்லிணக்கமும் நம்பிக்கையும் அரசாங்கத்தின் தரப்பிலிருந்து வரவேண்டும். அதைச் செய்வதனூடாகத்தான் இந்த நம்பிக்கையையும் நல்லிணக்கத்தையும் கட்டியெழுப்ப முடியும். வெறுமனே ஒரு தரப்பால் மட்டும் இதனை ஏற்படுத்த முடியாது. இதேபோன்று இன்னும் பல்வேறுபட்ட பிரச்சினைகள்!

நாங்கள் கடந்த வாரம் முல்லைத்தீவு மாவட்டத்தில் புதுக்குடியிருப்பு, ஒட்டுசுட்டான், கரைதுறைப்பற்று போன்ற பிரதேசங்களின் ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களுக்குச் சென்றிருந்தபோது, பிரதேசச் செயலகத்துக்கு முன்பாக நூற்றுக்கணக்கான பொதுமக்கள் கூடி, எதிர்வுகின்ற பருவ மழைக்கு முன்பாகத் தங்களுக்கான வீட்டுத் திட்டங்களைத் தந்துதவும்படி உருக்கமான வேண்டுகோளை விடுத்திருந்தார்கள். யுத்தம் முடிவடைந்து இன்றைக்கு ஏழு வருடங்கள் கடந்திருக்கின்றன. இந்த ஏழு வருட காலத்திற்குள் போரினால் பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்கான ஒரு வீட்டுத் திட்டத்தைக்கூட வழங்க முடியவில்லை. அதுமட்டுமல்ல, அவர்களுக்கான ஒரு தற்காலிகமான வீட்டுத்

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

திட்டத்தையாவது வழங்க முடியவில்லை. ஆகவே, இந்த வீட்டுத்திட்டம் தொடர்பாகவேனும் மீள்குடியேற்றம் மற்றும் சிறைச்சாலைகளுக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ சுவாமிநாதன் அவர்கள் கவனம் செலுத்த வேண்டும்.

ஆரம்பத்திலே 65 ஆயிரம் வீட்டுத்திட்டம் பற்றிப் பேசப்பட்டது. அந்தப் பொருத்துவீடு எங்களுடைய பிரதேசத்துக்குப் பொருத்தமில்லை; அவை நிரந்தரமான கல் வீடுகளாக மாற்றப்பட வேண்டும்; அந்த 65 ஆயிரம் வீட்டுத்திட்டம் ஓர் இலட்சத்து முப்பதாயிரமாக அதிகரிக்கப்பட வேண்டும் என்பதைக்கூட நாங்கள் பாராளுமன்றத்தில் பேசியிருக்கின்றோம்; ஜனாதிபதி மற்றும் பிரதமருடனும்கூடப் பேசப்பட்டிருக்கின்றது. எழுத்துமூலமாகவும் தெரிவித்திருக் கின்றோம். ஆனால், இந்த 65 ஆயிரம் பொருத்து வீட்டுத்திட்டம் மாற்றியமைக்கப்பட்டிருக்கின்றதா? அல்லது அது வழங்கப்படுமா, இல்லையா? அது பொருத்து வீட்டுத்திட்டமாக வழங்கப்படுமா? அல்லது நிரந்தரமான கல்வீடாக வழங்கப்படுமா? என்பது பற்றி இற்றைவரைக்கும் எங்கள் யாருக்குமே தெரியாது.

அரசியல் கைதிகளுடைய விடுதலையில் அரசாங்கம் அக்கறை இல்லாமல் இருக்கின்றது; மீள்குடியேற்ற விடயங்களிலே எந்தவிதமான முடிவில்லாமல் இருக்கின்றது; காணாமற்போனவர்கள் தொடர்பாகவும் எதுவுமில்லை. ஆகவே, இப்படியான சூழ்நிலையிலே எப்படி ஒரு நல்லிணக்கத்தை, நம்பிக்கையைக் கட்டியெழுப்ப முடியும்? என்பதை அரசாங்கம் உணர்ந்துகொள்ள வேண்டும். உண்மையிலே இந்த நல்லிணக்கத்தை ஏற்படுத்துவதற்குப் பதிலாக இன்றைக்கும் நீங்கள் என்ன செய்கின்றீர்கள்? ஏற்கெனவே முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷவினுடைய ஆட்சிக் காலத்திலே - அந்த அரசாங்கத்திலே பின்பற்றப்பட்ட நிகழ்ச்சிநிரலின்படிதான் இன்றைய அரசாங்கமும் அதாவது நீங்களும் செல்வதாகத் தெரிகின்றது. எங்களுடைய மக்கள் பல வருட காலமாகச் சொந்தக் காணிகளிலே மீளக்குடியேற முடியாத நிலைமை தொடர்ந்தும் நீடிக்கின்றது. கால் நூற்றாண்டு கடந்தும் யாழ்ப்பாணத்தைச் சேர்ந்த மக்கள் அல்லது கிழக்கு மாகாணத்தைச் சேர்ந்த மக்கள் தங்களுடைய நிலங்களைப் பெற்றுக்கொள்ள முடியவில்லை. இராணுவம் தன்னுடைய கட்டுப்பாட்டின்கீழ்தான் இந்தக் காணிகளை வைத்துக் கொண்டிருக்கின்றது. ஜனாதிபதி அங்குபோய் அந்தக் காணிகள் விடுவிக்கப்படும் என்று வாக்குறுதி வழங்குகின்றார். ஆனால், இராணுவத் தளபதி சொல்கின்றார், இராணுவத்தின் பாதுகாப்புத் தேவை கருதி இந்த நிலங்களை விடுவிக்க முடியாதென்று. ஆகவே, இந்த நாட்டிலே ஜனாதிபதிக்குக் கீழே பாதுகாப்புப் படை இருக்கின்றதா? அல்லது பாதுகாப்புப் படைக்குக் கீழே ஜனாதிபதி இருக்கின்றாரா? என்ற கேள்விகள் எழுகின்றன.

நாங்கள் திரும்பத்திரும்பச் சொல்கின்றோம், "சிங்கள மக்கள் - பௌத்த மக்கள் இருக்கின்ற இடங்களிலே பௌத்த கோயில்களை அமைப்பதற்கு நாங்கள் எதிரானவர்கள் இல்லை" என்று. நாங்கள் அந்த மதத்திற்கு எதிரானவர்களும் இல்லை; அதேநேரம் இனத்துக்கு எதிரானவர்களும் இல்லை. ஆனால், வடக்கு மாகாணத்திலே நீங்கள் ஒன்றரை இலட்சம் இராணுவத்தை வைத்துக்கொண்டு அங்கு சகல இடங்களிலும் பௌத்த சிலைகளை நிறுவிக்கொண்டிருக்கிறீர்கள். இவற்றைக் குறைக்கும்படி நாம் பல தடவைகள் கேட்டிருந்தோம். ஆனால், எதுவுமே நடைபெறவில்லை. அதற்கு இராணுவம் பாதுகாப்பாக இருக்கின்றது. தென் பகுதியிலிருந்து வருகின்றவர்களுக்கான குடியேற்றத்துக்கும் இராணுவம் பாதுகாப்பு வழங்குகின்றது. அந்தவகையில், வடக்கிலே இருக்கின்ற இராணுவம் மீள்குடியேற்றத்துக்கும் இன நல்லிணக்கத்தைக் கட்டியெழுப்புவதற்கும் இப்படித் தொடர்ச்சியாக முட்டுக்கட்டையாக இருக்கின்றது.

இன்றைக்கு புதிய அரசியலமைப்புக்கு ஊடாக எங்களுடைய பிரச்சினைக்குத் தீர்வு காணப்போவதாக ஜனாதிபதி கூறுகின்றார்; பிரதமர் கூறுகின்றார். இன்னொரு பக்கத்திலே ஒற்றையாட்சிக்குள்தான் தீர்வு என்றும் கூறப்படுகிறது. ஆகவே சர்வதேச சமூகத்தை ஏமாற்றுவதற் காக நீங்கள் பல்வேறு கதைகளைச் சொல்கின்றீர்கள்! ஜனாதிபதி மற்றும் பிரதமர் உள்நாட்டில் - தெற்கிலே ஒரு பேச்சு! சர்வதேசத்துக்குச் சென்றால் இன்னொரு பேச்சு! வடக்கே சென்றால் அங்கு ஒரு கதையையும் தெற்கிலே சிங்கள மக்களுக்கு ஒரு கதையையும்தான் சொல்லிக்கொண்டிருக் கின்றார்கள். ஆகவே, உண்மையான நல்லிணக்கம் இந்த நாட்டிலே ஏற்படவேண்டுமாக இருந்தால், தமிழ் மக்களுக்கு நாங்கள் வழங்கிய வாக்குறுதிகள் நிறைவேற்றப்பட வேண்டும். எங்களுடைய தேர்தல் விஞ்ஞாபனங்களிலே - அது மாகாண சபைத் தேர்தலாக இருக்கலாம் அல்லது பாராளுமன்றத் தேர்தலாக இருக்கலாம்- நாங்கள் பல வாக்குறுதிகளை முன்வைத்தோம். "நாங்கள் இந்த நல்லாட்சி அரசாங்கத்தோடு பேசி அரசியல் கைதிகளை விடுவிப்போம்; காணாமற் போனவர்கள் தொடர்பில் நாங்கள் நல்லதொரு முடிவை எடுத்துத் தருவோம்; மீள்குடியேற்றம் நடைபெறச் செய்வோம்; எங்களுடைய பிரச்சினைக்கு நிரந்தரமான ஓர் அரசியல் தீர்வை நாங்கள் பெற்றுத்தருவோம்" போன்ற வாக்குறுதிகளை முன்வைத்ததால்தான் மக்கள் எங்களைத் தெரிவுசெய்தார்கள். ஆனால், மக்களிடமிருந்து பெற்ற ஆணையின்மூலம் பதவிக்குவந்த நாங்கள், இன்றைக்கு அந்த வாக்குறுதிகளை நிறைவேற்றிக்கொள்ள முடியாத நிலையிலிருக்கின்றோம்.

தமிழ் மக்களால் ஏற்படுத்தப்பட்ட இந்த ஆட்சி மாற்றத்தில் இந்த அரசாங்கமானது தமிழ் மக்களுடைய கோரிக்கைகளை நிறைவேற்றவேண்டும். ஆனால், அதற்குப்பதிலாக இன்றைக்கு அவற்றுக்கெதிரான செயற்பாடுகளை இராணுவமும் இந்த அரசாங்கமும் தொடர்ச்சியாகச் செய்து கொண்டுவருகின்றன. இதனுடைய ஒரு வெளிப்பாடுதான் எதிர்வரும் 24ஆம் திகதி சனிக்கிழமை யாழ்ப்பாணம் முற்றவெளியிலே நடைபெற இருக்கும் 'எழுக தமிழ்' என்ற மக்கள் பேரணி. பல்லாயிரக்கணக்கான இளைஞர்கள், பொதுமக்கள், பல்கலைக்கழக மாணவர்கள், மாகாண சபை உறுப்பினர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் எனப் பெருந்தொகையானோர் கலந்துகொண்டு, ஜனநாயக வழியிலே, நான் ஏற்கெனவே குறிப்பிட்ட இந்தக் கோரிக்கைகளை முன்வைத்து, அதாவது தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய தேர்தல் விஞ்ஞாபனத்திற்கமைவான இந்தக் கோரிக்கைகளை நிறைவேற்றும்படி இலங்கை அரசாங்கத்திற்கும் சர்வதேச சமூகத்திற்கும் வலியுறுத்து வதற்காக இந்த மக்கள் பேரணி ஓர் அமைதியான முறையில் நடைபெற இருக்கின்றது. ஆகவே, ஜனநாயக ரீதியாக நடைபெற இருக்கின்ற இந்த மக்கள் பேரணியை இராணுவத்தினரோ அல்லது புலனாய்வுத் துறையினரோ அடக்க முற்பட்டால் அல்லது இதை நசுக்க முற்பட்டால் அது ஓர் ஆபத்தான நிலைமைக்குத்தான் இட்டுச்செல்லும். ஏனென்றால், ஆரம்ப காலத்திலே எங்களுடைய மிதவாதத் தலைவர்கள் எங்களுடைய உரிமைகளுக்காக ஜனநாயக

රීතියාන, සාත්වීක රීතියාන පෝරාට්ටංකළ නටත්තියපෝතු ඉරුම්පුක් කරංකළ් කොණ්ටු අටක්කප්පට්ටතන් විළෙවු, 30 වරුට කාලම් ඉන්ත නාට්ටිලේ ඉටම්පෙට්ර විටුතලෛප් පෝරාට්ටමුම් තොටර්න්තු ඉටම්පෙට්ර කොටිය යුත්තමුමාකුම්. ආකවේ, අප්පටියොරු නිලෛමෛක්කු මීණ්ටුම් එමතු මක්කළෛත් තළ්ළාතීර්කළ්!

ඉන්රු ආයුතප්පෝරාට්ටම් මුටිවුක්කුක් කොණ්ටුවරප් පට්ටිරුක්කින්රතු. යුත්තම් මුටිවතෛන්තු 7 වරුටංකළ් කටන්තිරුක්කින්රන. ඉන්ත 7 වරුට කාලත්තිර්කුළ්ළේ එංකළුටෛය මක්කළින් අන්රාට වාළ්වාතාරප් පිරච්චිනෛකළ් උට්පට මීළ්කුටියේර්රම් චෙය්යප්පට මුටියාත නිලෛමෛකළ් එනප් පල්වේරුපට්ට පිරච්චිනෛකළ් කාණප්පටුකින්රන. චාතාරණමාක එංකළුටෛය පිරතේචංකළිල් මක්කළුක්කුත් තේවෛයාන චින්නඤ්චිරු කාරියංකළෛක්කූට ඉන්රෛක්කු එංකළාල් චෙය්යමුටියාත නිලෛමෛ ඉරුක්කින්රතු. ආකවේ, ඉන්ත නිලෛමෛකළ් මාරවේණ්ටුම් එන්පතෛයුම් වලියුරුත්තිත්තාන් එතිර්වරුම් චනික්කිළමෛ 'එළුක තමිල්' එන්ර මක්කළ් පේරණි ඉටම්පෙර ඉරුක්කින්රතු. ආයිරක්කණක්කාන මක්කළ් කලන්තුකොළ්කින්ර අන්තප් පේරණියිලේ අන්ත මක්කළුටෛය ජනනායක රීතියාන කෝරික්කෛකළ් එන්න? තේවෛකළ් එන්න? අවර්කළින් පිරච්චිනෛකළ් එන්න? එන්පතෛ ඉන්ත අරචාංකම් කවනත්තිලෙටුත්තු අවර්රෛත් තීර්ප්පතර්කාන උරිය නටවටික්කෛකළෛ එටුක්කවේණ්ටු මෙන්පතු එංකළුටෛය කෝරික්කෛයාකුම්.

අන්ත මක්කළුටෛය ජනනායක රීතියාන කෝරික්කෛකළ් මරුතලික්කප්පටුමාක ඉරුන්තාල් අටුත්තකට්ටම් ඕර් ආපත්තාන නිලෛමෛයෛ නෝක්කි ඉන්ත නාටු චෙල්ලවේණ්ටිය ඔරු නිලෛමෛ වරුම්. ඒනෙන්රාල්, කටන්තකාල වරලාරුම් පටිප්පිනෛයුම් අතෛත්තාන් තන්තිරුක්කින්රන. තන්තෛ චෙල්වනායකම් අවර්කළ් ආයුතම් තූක්කිප් පෝරාටාත ඔරු ජනනායකවාති. චාත්වීක රීතියාක 30 වරුටංකළ් තමිල් මක්කළින් උරිමෛක්කාකක් කුරල් කොටුත්තාර්. ආනාල්, අතු මරුක්කප්පට්ටතන් විළෙවු කටන්ත 30 වරුට කාල ආයුතප් පෝරාට්ටම් ඕර් උච්චක්කට්ටත්තිර්කුච් චෙන්රමෛයාකුම්. මීණ්ටුම් නාංකළ් එංකළුටෛය කෝරික්කෛකළෛ නිරෛ වේර්රුවතර්කු ජනනායක රීතියාකප් පෝරාටුවතෛත් තවිර වේරු වලියිල්ලෛ. ඉන්ත නල්ලාට්චි අරචාංකත්තෛක් කොණ්ටුවන්තතිල් තමිල් මක්කළුක්කු ඔරු පෙරිය පංකිරුන්තතු; පෙරිය පොරුප්පිරුන්තතු. එනවේ, අන්ත මක්කළුටෛය කෝරික්කෛකළෛ අරචාංකම් පරිචීලිත්තු උරිය තීර්වෛක්කාණ මුන්වරවේණ්ටුමෙන්රු මීණ්ටුම් කේට්ටු, විටෛපෙරු කින්රේන්. නන්රි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, his request to make the Vavuniya Campus a university will be granted in future.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you, Hon. Minister.

ඊළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා. 12.03]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතනවා, මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවය කරන 13,207ක් පමණ වන අනධ්‍යාපන සේවකයන්ට අද සුවිශේෂී දවසක් වනවා කියලා. මොකද , මේ අයට මෙතෙක් කාලයක් තිබුණේ, අවුරුදු 57න් විශ්‍රාම ගිහිල්ලා, ඊට පස්සේ අවුරුදු 60 වන තුරු අවුරුද්දෙන් අවුරුද්ද එකිනෙක්කෙනාගේ මුහුණ දිහා බලලා සේවා කාලය දිගු කරපු අතීතයක්. අපේ යහ පාලන ආණ්ඩුව මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ, මේ 13,207දෙනාගේම වුවමනාව හා අවශ්‍යතාව පරිදි කිසිම බාධාවක් නැතිව අවුරුදු 60 දක්වා සේවය කිරීම සඳහා ඔවුන්ට අවස්ථාව ලබාදීලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, අද ඒ සේවකයන්ට සුවිශේෂී දවසක් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වර්තමානයේදී වසරකට අපේ රටේ දරුවන් ලක්ෂ 3ක් පමණ දිවයිනේ විවිධ පාසල්වල පළමුවන ශ්‍රේණියට ඇතුළත් වෙනවා. නමුත් මේ පිරිසෙන් A/L විභාගය සමත් වෙන්නේ 1,49,572ක් වාගේ සංඛ්‍යාවක්. එතරම් සංඛ්‍යාවක් පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වුණාට, එයින් සියයට 50ක්වත් A/L විභාගය සමත් වෙන්නේ නැහැ. සමහර ළමයි පහ වසර ශිෂ්‍යත්වයෙන් පහළට වැටෙනවා. සමහර ළමයි O/L විභාගයට පෙනී සිටින්නේ නැහැ. සමහර ළමයි O/L විභාගය කරලා නැවත උසස් අධ්‍යාපනය කරන්නේ නැහැ. සමහර ළමයි A/L පන්තියේ ටික කාලයක් ඉගෙන ගෙන අයින් වෙනවා. සමහර ළමයි A/L කරලා විෂයන් තුනම අසමත් වෙනවා. මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. නමුත්, නව රජය විශේෂයෙන්ම තීන්දුවක් ගත්තා, මේ රටට ඕනෑ උගතුන්, මේ රටට ඕනෑ දැනුම තිබෙන පුද්ගලයන් කියලා. ඒ නිසා සියලු දෙනාම 13වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හැදෑරිය යුතුයි කියන තීන්දුව ගත්තා.

අපේ රටේ කොන්ක්‍රීට් ගොඩනැඟිලි හදලා, කොන්ක්‍රීට් වනාන්තර හදලා, පාරවල් කාපට් කළා කියලා රට දියුණු වුණේ නැහැ. අපි දැක්කා, පසු ගිය දවස්වල වෙච්ච දේවල්. නමුත්, වර්තමානය වන විට අපේ රටේ දැනුමෙන් පිරි මිනිස් සම්පතක් නිර්මාණය කිරීම සඳහා මේ රජය ගත්ත තීන්දු තීරණ සුවිශේෂී වෙනවා කියලා මම හිතනවා. ඒ වාගේම අපි පැහැබර ශ්‍රී ලංකාවක් බලාපොරොත්තු වෙනවා. සියලු ළමයින් 13වන ශ්‍රේණිය දක්වා ඉගෙන ගන්නවා කියන්නේ, මේ රටේ හොඳ උගතුන් පිරිසක් බිහි වෙනවා කියන එකයි. මේ රටේ සියලු ළමයින්ට ඒ අවස්ථාව නොමිලයේ ලබා දීලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන්නා වාගේම, බලයට ආව හැම විටම නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කළා. දරුවාට අවශ්‍ය පෙළ පොත් ටික නොමිලේ ලබා දුන්නා. දෙමව්පියන්ට තිබුණු ආර්ථික ප්‍රශ්න නිසා, පෙළ පොත් ටික ගන්න බැරිව දරුවන් පාසල් යවා ගන්න බැරි අවස්ථා අනන්ත අප්‍රමාණ තිබුණා. නමුත්, අපේ ආණ්ඩුවෙන් පෙළ පොත් ටික නොමිලේ ලබා දුන්නා විතරක් නොවෙයි, දරුවාට අවශ්‍ය නිල ඇඳුම් රෙදි දෙන්නත් කටයුතු කළා.

ඒ කාලයේ අපි පාසලකට ගියාම දකින්නට ලැබුණු තත්ත්වය තමයි, දරුවන් විවිධ ඇඳුම් ඇඳගෙන පාසලට පැමිණීම. සමහර දරුවන්, ඉරුණු ඇඳුම් ඇඳගෙන එනවා. සමහර දරුවන්ගේ ඇඳුම් කහ ගැහිලා දුර්වර්ණ වෙලා. තවත් සමහර දරුවන් පාසලට ගැළපෙන්නේ නැති ඇඳුම් ඇඳගෙන එනවා. ඒ විධියට ඇවිල්ලා, සමාජයේ විෂමතාව එම දරුවන් තුළින් පෙනෙන්න පටන් ගත්තා.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

නමුත්, එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සියලු දරුවන්ට එක වාගේ පාසලට එන්න පුළුවන් විධියට නිල ඇඳුම් සපයා දීමට කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. පාසල් දරුවන්ට දිවා ආහාරය ලබා දීම තුළින්, දරුවන් තවත් ශක්තිමත් කළා.

"මහපොළ" වාගේ ශිෂ්‍යාධාර ක්‍රම නිර්මාණය කරලා විශ්වවිද්‍යාල අධ්‍යාපනය පවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළින් තමයි ශක්තිමත් කළේ. එදා දෙමව්පියන්ට උද්ගත වුණු ප්‍රශ්නයක් තමයි, දරුවා විශ්වවිද්‍යාලයට තේරී තිබුණත්, වියදම් කරන්න සල්ලි නැතිකම. Boarding fees ගෙවා ගන්න විධියක් නැහැ. අවශ්‍ය පොත් පත් හා උපකරණ අරගන්න විධියක් නැහැ. නමුත්, තමන්ගේ දරුවා විශ්වවිද්‍යාලයට යවා උගන්වන්න ආසයි. මොකද, තමන්ගේ පරම්පරාවේ කිසිම කෙනෙක් විශ්වවිද්‍යාලයට ගිහින් නැහැ. අන්තිමට තමුන්ගේ ගේ උගස් කරලා, ඒ දරුවාට උගන්වනවා. ඒ ඉගැන්වීමේ ශාපය නිසාම ගමේ ඉන්න පොලී මුදලාලිට තමුන්ගේ ගේ සින්න වෙලා යන අවස්ථා අනන්ත අප්‍රමාණ තිබුණා. නමුත් එදා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ සංකල්පයක් මත, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩු කාලය තුළ ඒ යුගය අවසන් කරමින් "මහපොළ" ශිෂ්‍යාධාර ක්‍රමය නිර්මාණය වුණා. මම පවා "මහපොළ" විශේෂ කුසලතා ශිෂ්‍යත්වය ලබා ගත් කෙනෙක්.

එදා, අපි දැක්කා මේ සමාජයේ පරිවර්තනය. මහපොළ ශිෂ්‍යත්වය බිහිවීමත් සමඟම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවන්ගේ විප්ලවයක් සිදු වුණා. මහපොළ ශිෂ්‍යත්වය කිසිම කෙනෙකුට නැති කරන්න බැරි වුණා. ලලිත් ඇතුලත්මුදලි මහත්මයා මරා දැමුවත් -ඝාතනය කළත්-, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නැතිව ගියත්, මහපොළ ශිෂ්‍යත්වය ඉතාමත්ම ශක්තිමත් වෙමින්, ශක්තිමත් වෙමින් මේ රටේ විශ්වවිද්‍යාල දරුවන් සඳහා, ආර්ථික ප්‍රශ්න තිබෙන දෙමව්පියන් සඳහා විශාල පිටිවහලක් බවට පත් වුණා.

ආණ්ඩු වෙනස් වීමත් සමඟම "ජන සවිය" වැඩසටහනේ නම වෙනස් කරලා "සමෘද්ධිය" යනුවෙන් නම් කළා. මේ අයුරින් එම වැඩසටහන්වල නම් වෙනස් වුණා. රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ "උදාගම් සංකල්පය" එතුමාගේ අභාවයත් එක්කම, ආණ්ඩු වෙනස්වීමත් එක්කම නැති වෙලා ගියා. සජිත් ප්‍රේමදාස මැතිතුමා දැන් නැවතත් උදාගම් සංකල්පය පටන්ගෙන තිබෙනවා.

මේ රජය අවුරුදු එකහමාරක් වැනි සුළු කාලයක් තුළ උසස් අධ්‍යාපනය සඳහා සුවිශේෂ වැඩ කොටසක් කර තිබෙන බව අපි දන්නවා. ගරු මුදල් ඇමතිතුමා 2016 වසරේ අය වැය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළා, "2018 වසර වන විට සියලුම විශ්වවිද්‍යාල සිසුන්ට සිය මුළු විශ්වවිද්‍යාල අධ්‍යාපන කාලය සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දෙනවා" කියලා. අපි ඒ ගැන ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා සමඟ සාකච්ඡා කළාට පසුව, එතුමා මේ අවුරුද්ද තුළ යම් කිසි ප්‍රමාණයකින් එය සාර්ථක කර ගන්න දක්ෂ ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කරලා තිබෙනවා. මේ වනවිට, නේවාසිකාගාර 24ක් නිර්මාණය කර දීලා විශ්වවිද්‍යාල දරුවන්ගේ නේවාසිකාගාර ප්‍රශ්නය විසඳීමට කටයුතු කර තිබෙනවා. 2017 වසර වන විට පුද්ගලික හා රාජ්‍ය ආයෝජනය තුළින් විශ්වවිද්‍යාලවල ඉතුරු දරුවන් වෙනුවෙන් නේවාසිකාගාර නිර්මාණය කිරීමට කටයුතු කිරීම ප්‍රශංසනීය කටයුත්තක් වනවා. අපි දන්නවා, මේ දරුවන් ඉගෙන ගන්න ගියාම බෝඩිම් හොයනවා. අපි පවා විශ්වවිද්‍යාලවලට යන කාලයේ ගෙවල් ගණනේ ගිහිල්ලා බෝඩිම් හොයන කාලයක් තිබුණා. බෝඩිමටත් ලොකු ගණනක් ගෙවන්න ඕනෑ. එපමණ මුදල් ගෙවිවත් එහි නීතිරීති පද්ධතියක් තිබෙනවා. ඒ නීතිරීතිවලට යටත් වෙලා අපට ඉගෙන ගන්න සිදු වුණා. නමුත්, උසස් අධ්‍යාපනය හදාරන කාලයේ තිබුණු ඒ අමිහිරි යුගය ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයාගේ කාලයේ නිමා කරලා, තමුන්ට රිසිසේ නිදහසේ අධ්‍යාපනය ලබා ගන්න පුළුවන් විධියේ නේවාසිකාගාර පද්ධතිය හැදීමට මේ රජය කටයුතු කරලා තිබෙනවා.

විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් විතරක් නොවෙයි -විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් විතරක් නොවෙයි- විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයන් වෙනුවෙනුත් මේ රජය වැඩ කටයුතු කරලා තිබෙනවා. විශ්වවිද්‍යාලවල සේවය කරන සේවකයන්ගේ විශ්‍රාම කාලය තමුන්ගේ අභිමතය පරිදි අවුරුදු 60 දක්වා දීර්ඝ කර ගන්න අවස්ථාව දුන්නා. ඒ වාගේම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය නිවාස සෑදීම සඳහා රුපියල් මිලියන 3,000ක් මේ රජය ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මීට කලින් මහපොළ ශිෂ්‍යත්වය තිබුණේ රුපියල් 2,500යි. එය රුපියල් 5,000 දක්වා වැඩි කළා. ශිෂ්‍යාධාරය තිබුණේ රුපියල් 2,500යි. එය රුපියල් 4,000 දක්වා වැඩි කළා. මෙවැනි කටයුතු කිරීම තුළින් මේ රජය උසස් අධ්‍යාපනය අගය කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ රටේ සිටින අපේ සියලු වැසියන් උසස් අධ්‍යාපනය ලැබිය යුතුයි කියා. ඊට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. තමාට අවශ්‍ය කරන ලැප්ටොප් පරිගණක ගන්න, ලෝකයට විවෘත වෙන්න, ලෝකයත් එක්ක වැඩ කරන්න පුළුවන් අවකාශය විශ්වවිද්‍යාල දරුවන්ට ලබා දෙන්න පොලී රහිතව මාස 36කින් වටිනාකම ගෙවන්න පුළුවන් වන විධියට පරිගණක ලබා දීමේ ක්‍රමයක් අපි ආරම්භ කර තිබෙනවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවකුට ලංකා බැංකුව, මහජන බැංකුව ආදි බැංකුවකට ගිහින් එම පරිගණක ලබා ගැනීමට හැකියාව නිර්මාණය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය කියන විශ්වවිද්‍යාල පහෙහිම තාක්ෂණ පීඨ ආරම්භ කරලා අලුත් පෙරළියක් මේ රටේ ඇති කරන්න අපි උත්සාහ කරනවා. මොකද, අපි දන්නවා, දරුවන් විශාල සංඛ්‍යාවක් කලා මාධ්‍යයෙන් උපාධි ලබා ගැනීමට යෑම නිසා ඒ දරුවන් අතර මං වෙලා ඉන්නවා කියා. කුමන හෝ උපාධියක් ලෙහෙසියෙන්ම ලබාගෙන ඒම සඳහා කලා විෂයය තෝරාගෙන අධ්‍යාපනය ලැබීම නිසා කලා මාධ්‍යයෙන් මේ රටට අවශ්‍ය ප්‍රමාණයට වඩා උපාධිධාරීන් බිහිවී ඉන්නවා. නමුත් තාක්ෂණ විෂයයන් යටතේ අධ්‍යාපනය ලබා දීමට ඉඩ ප්‍රස්තාව ඇති කර දී, තාක්ෂණ උපාධියක් ලබාගෙන මේ රටේ විතරක් නොව ලෝකයේම තිබෙන ශ්‍රම අවශ්‍යතාව පිරිමැසීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා කටයුතු කර, අලුත් පීඨ නිර්මාණය කිරීම වෙනුවෙන් මේ වන කොට රුපියල් මිලියන 3,000ක් වැය කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මහා නගර සභා සැලැස්ම යටතේ කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයක්ද, තාක්ෂණ විද්‍යා පීඨයක්ද, ඒ වාගේම මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයක්ද පිහිටුවන්න පිටිපන ප්‍රදේශයේ අක්කර 60ක් අද ලබා ගන්නවා. මා හිතන විධියට ගරු අග්‍රාමාත්‍යතුමා, එය ලබා ගැනීමේ අවස්ථාව සඳහා අද සභාගි වී සිටිනවා. එතුමා ඒ අක්කර 60 ලබා ගෙන විශ්වවිද්‍යාල පුළුල් කිරීමේ වැඩ කටයුත්ත සිදු කරනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාගේ අධීක්ෂණය යටතේ, මෙහෙය වීම යටතේ මේ ටික කාලය තුළ විශ්වවිද්‍යාලවලට බඳවාගත් සිසුන් සංඛ්‍යාව සියයට 10කට වඩා වැඩි කර තිබෙනවා. නමුත් ඉදිරියේදී මේ

සැලැස්ම ක්‍රියාත්මක වන කොට, තවත් අවුරුදු දෙකතුනක් යන විට එම ප්‍රමාණය සියයට සියයක් දක්වා -විශාල ප්‍රමාණයකින්- වැඩි වේවි. මොකද, අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාවගේ උගත්කම, දැනුම වැඩි කරලා මේ රට විශ්වයටම උගතුන් නිර්මාණය කරන කේන්ද්‍රස්ථානය කරන්න පුළුවන් වේවි කියා. ඒ විතරක් නොවෙයි. මේ රජය මේ චූටි කාලය තුළ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවල යටිතල පහසුකම් හදන්න, වැඩි කරන්න විතරක් රුපියල් මිලියන 33,170ක් ලබා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නව රජය විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් සුවිශේෂ කාර්යයක් ඉටු කර තිබෙනවා. ඒ වෙනුවෙන් අපි ගරු අමාත්‍යතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මා මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිය ලබාගත් කාලයේ පවා උපාධි පාඨමාලාව හදාරන අයගේත් තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හදාරන අයගේත් ප්‍රශ්නය තිබුණා. ඒක "නයි - මුගටි ගෝරිය" වාගේ හැම දාම තිබුණා. නමුත් ITUM කියලා ආයතනයක් නව වසරේ විවෘත කිරීමට කටයුතු කරලා, මොරටුව විශ්වවිද්‍යාලයේ ළමයින් අතර තිබුණු "නයි - මුගටි රණ්ඩුව" නැති කරන්නත්, සියලු දරුවන්ට හොඳට ඉගෙන ගන්න පුළුවන් වාතාවරණයක් නිර්මාණය කරන්නත් මේ කෙටි කාලය තුළදී මේ රජය කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපිට පොඩි අඩුවක් තිබෙනවා.

අපි උගතුන් නිර්මාණය කරනවා. මේ උගතුන්ගෙන් සියයට පනහක්වත් ලංකාවේ රැඳෙන්නේ නැහැ. මේ උගතුන් හැසිරෙන ආකාරය ගැන නම් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ පාසල් අධ්‍යාපනය තුළ උගතුන් බිහි කිරීමට ක්‍රමවේදයක් නැහැ. දැනුම තිබෙන අය විතරක් බිහි කරන ක්‍රමය තමයි අපේ රටේ පාසල් අධ්‍යාපනයේ තිබෙන්නේ. විශ්වවිද්‍යාලය යනු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිබිම්බයක්. අද අපි විශ්වවිද්‍යාලය තුළින් දකින්නේ සමස්ත අධ්‍යාපන ක්‍රමයේ තිබෙන තත්ත්වයයි. ඒ නිසා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවන්ට තමන්ගේ ආකල්ප සහ කුසලතා ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය සෞන්දර්ය වටපිටාවක් නිර්මාණය කර දීලා, ආගමික වටපිටාවකට නැඹුරු වෙන්න පුළුවන් විධියට විශ්වවිද්‍යාල පද්ධතිය සකස් කළ යුතුයි කියා මම යෝජනා කරනවා. එය එසේ සිදුවිය යුතුයි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ශ්‍රමිකයන් හැම විටම තම ශ්‍රමය උදෙසා වැඩි වැටුපක් හා පහසුකම් අපේක්ෂා කරන බව. මේ තත්ත්වය මත ලංකාවේ බිහි වන කුසලතා පූර්ණ ශ්‍රමික පිරිස් රටින් පිට වී යනවා. වර්ෂයකට දෙලක්ෂ අසූදහසක් පමණ ශ්‍රමික පිරිසක් පිටරට රැකියා සඳහා පිටවී යනවා. නමුත් රටේ ශ්‍රම බලකායට ඇතුළු වන ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව එක්ලක්ෂ තිස්දහසයි. ඒ කියන්නේ දෙගුණයකට වැඩි ප්‍රමාණයක් රට හැරදා යනවා. මෙසේ පිටවී යන උගත් -දැනුම තිබෙන- අය ඒ සල්ලි අරගෙනවත් ආපසු මේ රටට එන්නේ නැහැ. ඔවුන් පවුල් පිටින්ම ඒ රටවල්වල පදිංචි වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මොන බාධක මැද්දේ වුණත්, මේ උගත් ශ්‍රමිකයන් මේ රටේ රඳවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම සිදු කළ යුතුයි. ඒ නිසා වෙළෙඳ ගිවිසුම් සහ විවිධ ගිවිසුම් මධ්‍යයේ ඔවුන් රැක ගැනීම සඳහාත් කටයුතු කරමුය කියා අවසාන වශයෙන් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Akila Viraj Kariyawasam. You have six minutes.

[අ.භා. 12.15]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මටත් මේ අවස්ථාවේදී කථා කිරීමට කෙටි කාලයක් හෝ ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ උසස් අධ්‍යාපන ඇමතිතුමාටත්, අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් මටත් අපේ රටේ අධ්‍යාපනයේ හා උසස් අධ්‍යාපනයේ මෙම වෙනස්කම් ටික ඇති කරන්නට විශාල වුවමනාවක් තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා අලුත් වෙනස්කම් රාශියක් අපි කළ යුතුව තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාගේ මහ පෙන්වීම යටතේ, වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනයක් ලබා දීමට සූදානම් වෙමින්, කාලයට ගැළපෙන, නවීන ලෝකයට ගැළපෙන පාඨමාලා හඳුන්වා දෙමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන එන අවස්ථාවකයි අප සිටින්නේ. එවැනි අවස්ථාවක අපේ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේත්, උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේත් මැදිහත්වීමෙන් උසස් අධ්‍යාපනය තුළත්, විශ්වවිද්‍යාල තුළත් මේ වෙනස්කම් ටික කඩිනමින් සිදුවෙයි කියා අප බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ විශ්වවිද්‍යාල අනෙකුත් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ සංසන්දනය කෙරෙන මට්ටමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ සංසන්දය කිරීම තුළ තමයි අපේ ප්‍රමිතිය, අපේ තත්ත්වය ආරක්ෂා වෙන්නේ. මම එහෙම කියන්නේ අපි international benchmarkingවලට යන්න ඕනෑ නිසායි. එහෙම ගියාම තමයි අපේ තත්ත්වය ආරක්ෂා කරන්න පුළුවන්. මේ සඳහා අපි සපුරාලිය යුතු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සඳහා විශේෂයෙන්ම පර්යේෂණවලට - researches - අපි යා යුතුව තිබෙනවා. අපේ රටේ විශ්වවිද්‍යාලවල එතරම්ම නොවෙන්නේත් ඒ දේ තමයි. එය ඉතාම නරක තත්ත්වයක්. අපි වැඩි වැඩියෙන් research කරන්න ඕනෑ. ඒ වාගේම අපේ කථිකාචාර්යවරුන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන් international journals වලට ලියන්න ඕනෑ; ලිපි ඉදිරිපත් කරන්න ඕනෑ

මේ තත්ත්වය බොහොම අවම මට්ටමකයි තිබෙන්නේ. ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා කාර්ය සාධනය මත - performance - වැටුප් වැඩිවීම්, දිරිගැන්වීම් වාගේ දේවල් අපි ඉදිරියේදී හඳුන්වා දෙන්න ඕනෑ. මේ තත්ත්වය තිබුණොත් තමයි, මේ අය දිරිගන්වන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම අපේ රටේ විශ්වවිද්‍යාලවලට ජාත්‍යන්තර තත්ත්වය - ranks - ගන්න නම්, අපේ රටේ විශ්වවිද්‍යාලත් ඒ තැනට ඇතුළත් කරන්න නම්, ජාත්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන් අපේ විශ්වවිද්‍යාලවලට එන්න ඕනෑ. ඒ සඳහා පහසුකම් අපි ඇති කරන්න ඕනෑ. දැන් ගරු අමාත්‍යතුමන්ලාත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා ඇතුළු ඒ කණ්ඩායමත් එයට අවශ්‍ය පියවර අරගෙන

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

යනවා. ඒ බව සතුටින් කියන්න ඕනෑ. මේ තත්ත්වය ආරක්ෂා කරන්න ඉතාම විගස අපි කටයුතු කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම, අපි වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනයක් ලබාදෙන කොට, ඒ විභාගවල ප්‍රතිඵල ඉක්මනින් ලබා දෙන්න ඕනෑ. මම මේ වෙන කොට විභාග කොමසාරිස්වරයාට උපදෙස් දීලා තිබෙනවා, අපොස උසස් පෙළ වෙන්න පුළුවන්, අපොස සාමාන්‍ය පෙළ වෙන්න පුළුවන් ඒ විභාගවල ප්‍රතිඵල ඉතාම ඉක්මනින් නිකුත් කරන්න ඕනෑ කියලා. ඒ ප්‍රතිඵල නිකුත් වූ විගස අපේ විශ්වවිද්‍යාලවලට අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගෙන, ඒ උපාධිය හැකි ඉක්මනින් අවසන් කරන්නත්, ඊට පස්සේ පශ්චාත් උපාධිවලට -Master's - යන්න පුළුවන් අවස්ථාව උදා කළ යුතුයි. ජාත්‍යන්තර මට්ටමින් පිළිගත් විශ්වවිද්‍යාලවලින් ලබා දෙනවා වාගේ අපේ රටේ ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි පවා අඩු වයසක් ලබා ගැනීමට හැකි අපි අවස්ථාව ලබා දෙන්න ඕනෑ. අපේ රටත් මෙයට සූදානම් විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. අපි රජයක් විධියට ඒකට අවශ්‍ය පියවර ගනිමින් යනවා. අපි ඉතාම ඉක්මනින් එය කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ UGC එක ක්‍රියාත්මක වෙන පනත් දැන් ගොඩක් යල් පැන ගිහිල්ලා. ඒවා වෙනස් කරන්න ඕනෑ. ඒ වාගේම, විශ්වවිද්‍යාලවලට ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. දියුණු රටවල විශ්වවිද්‍යාලවල කරනවා වාගේ අපේ විශ්වවිද්‍යාලවලටත් ඒ සමහර නීති - රීති, අණපනත් ගෙනැල්ලා වෙනම බඳවා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කරන්න පුළුවන් නම් හොඳයි. අපේ විශ්වවිද්‍යාලවලටත් ස්වාධීනව දියුණු වෙන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම්, අපි විශ්වාස කරනවා ඒ විශ්වවිද්‍යාලවලින් අපට හොඳ තත්ත්වයක් උදා කර දෙයි කියලා.

මට ඉතා කෙටි කාලයක් තිබෙන නිසා මම මේ කාරණය ඉතාම කෙටියෙන් කියන්නම්.

අපි universities, Green Cities බවට පත් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල Green Cities බවට පත් කරන්න ඕනෑ. ඒ විශ්වවිද්‍යාලවල විදුලිය ඉතුරු කිරීම පිළිබඳව වාගේම පරිසර හිතකාමී වටපිටාවක් ඇති කිරීම පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. අධ්‍යාපන මධ්‍යස්ථාන සැකසීමේදී ඒ වටපිටාව -ඒ පරිසරය- ඊට ගැළපෙන, ඊට සරිලන ආකාරයට සිදු වෙන්න ඕනෑ. මම දැක්කා, පසු ගිය කාලයේ ගොඩනැඟිලි හදනවා. ඒවායේ කිසිම ප්‍රමිතියක් නැහැ. නිකිම්ම නිකම් ගොඩනැඟිලි විතරයි. එවැනි තත්ත්වයක් උදා නොකරන්න ඕනෑ කියලා හිතනවා. ඒ වාගේම university villages ඇති කරන්න ඕනෑ. University villages ඇති කළාම ඒ විශ්වවිද්‍යාලය තුළ පාසල්, shopping complex, රෝහල් නිර්මාණය වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මා මේ කාරණය කියන්න කැමැතියි. මෙවැනි සංකල්ප තුළින්, අධ්‍යාපනයේ ප්‍රගතිය කරා ඉක්මනින් ගමන් කරන්න අපේ නව රජය සූදානම්. ඒ වාගේම ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාටත්, අපේ රාජ්‍ය ඇමතිතුමාටත් මා ස්තුති කරන්න ඕනෑ. කුලියාපිටිය ආසනයේ මේ 12වැනි දා වෛද්‍ය පීඨය - medical faculty එක- සඳහා මුල්ගල තියනවා. අපි වෛද්‍ය පීඨ වැඩියෙන් ඇති කිරීම තුළින් මේ විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරන්න අපේ රජය දැන් කටයුතු කරමින් යනවා. ඒ සඳහා බිලියන තුනක් පමණ -මිලියන 3,000ක් පමණ- ගරු අමාත්‍යතුමා වෙන් කරලා තිබෙනවා. ඒ තුළින් අපේ රටට වෛද්‍යවරු අලුතින් බිහි කිරීමට ඉඩ සැලැස්වීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.21]

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත 2016 යටතේ, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 75වන වගන්තිය සංශෝධනය කිරීම පිළිබඳව ඇති වන මේ කථිකාවතේදී වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මා විශේෂයෙන් සතුටු වෙනවා.

ඇත්තටම විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දීර්ඝ කාලීන ඉල්ලීමක් වාගේම, ඔවුන් මෑත කාලයේ වෘත්තීය ක්‍රියා මාර්ගවලට අවතීර්ණ වීමට පවා මූලික හේතුවක් වුණා, ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නවලට අමතරව, ඔවුන් විශ්‍රාම ගැන්වීමේ වයස අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ මට්ටමට, අවුරුදු 60 දක්වා ගෙන එන්නය කියන එක.

මේ ඉල්ලීමට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ප්‍රධාන අපේ අමාත්‍යාංශයේ සියලු දෙනා ඉතා ඉහළින් ඇහුම්කන් දුන්නා, විශේෂයෙන් අපේ රජය ශ්‍රමිකයන් කෙරෙහි දක්වන විශේෂ උනන්දුවත් එක්ක. අපි හැකි ඉක්මනින් මෙයට කැබිනට් අනුමැතිය අරගෙන, වයස 57 දක්වා තිබුණු විශ්‍රාම යෑමේ කාලය වයස 60 දක්වා එහෙම නැත්නම් දැනට රජයේ නිලධාරීන්ට පවතින කාලය දක්වා දීර්ඝ කිරීම සඳහා මේ පනත සංශෝධනය කරනවා.

මේ සංශෝධනයත් එක්ක අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ලැබෙන වරප්‍රසාද වයස 60 දක්වා සීමා වෙන්නේ නැහැ. අනාගතයේ රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වයස් සීමාව සංශෝධනය වන්නේ යම් සේද, ඒ අනුව විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේත් විශ්‍රාම යෑමේ වයස් සීමාව ස්වයංක්‍රීයව සංශෝධනය වනවා, මේ පනතේ අලුත් සංශෝධනයට අනුව. ඒක තමයි මේ සංශෝධනයේ තිබෙන සුවිශේෂී වටිනාකම. මේ දක්වා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අයට සිද්ධ වුණා, තමුන්ගේ ආයතනයේ ප්‍රධානියාගෙන් මේ වයස් සීමාව වැඩි කර ගැනීම අවුරුද්දෙන් අවුරුද්ද ලබා ගන්න. අද මේ සංශෝධනය හරහා ඒ සේවකයාගේ ස්වාධීනත්වය ආරක්ෂා වෙලා තිබෙනවා, ඔහුට රජයේ අනෙකුත් නිලධාරීන්ට ලැබෙන වරප්‍රසාදය ලබා දීම හරහා. ඒ නිසා මා හිතනවා, මේ යෝජනාව මේ උගත් සභාව විශේෂයෙන් සතුටින් යුක්තව අනුමත කරන පනත් සංශෝධනයක් වේවි කියලා.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා විශ්වවිද්‍යාල පිළිබඳ ප්‍රඥප්ති ඉතාම කැලඹිලිකාරී බව අපි දන්නවා. ඒ කැලඹිලිකාරී ප්‍රශ්න අතීතයේ සිට නොකඩවා පැවතුණු, අපේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය තුළ සංස්කෘතියක් බවට පත් වෙලා තිබුණු ඒවා බවත් අපි දන්නවා. මේ වාතාවරණය තුළ වූ ශිෂ්‍යයන්ගේ විවිධ යෝජනා හා ඔවුන්ගේ විවිධ තර්ක විතර්ක, සටන්වල ගත යුතු දේවල් තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත්, මමත් ඔවුන්ගේ ඉල්ලීම් ඉතා සාවධානව විශ්ලේෂණය කර බලනවා. අපට පුළුවන් හැම දෙයක්ම අපි කරනවා. ඔවුන්ගේ මූලික ඉල්ලීමක් වුණා, විශ්වවිද්‍යාලවල ප්‍රවේශය වැඩි කළ යුතුයි කියලා. මේ ප්‍රවේශය වැඩි කරන්න මේ වසර මුල සිටම අපි ලොකු වැඩ පිළිවෙළක් ගෙනාවා. අපි විභාග දෙපාර්තමේන්තුව එක්ක සාකච්ඡා කළා, අපට උසස් පෙළ විභාග ප්‍රතිඵල ඉක්මනින් ලබා ගන්න පුළුවන්ද කියලා. විභාග ප්‍රතිඵල ඉක්මන් කිරීම හරහා පමණක් නොවෙයි, අපි පුළුවන් තරම්

උනන්දු කළා, විභාග ප්‍රතිඵල ලැබුණු අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත්‍ර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කිරීම online ක්‍රමයෙන් කර ගන්න. එතකොට මේ දත්ත පරිගණකගත කිරීමේ කාලය ඉතිරි වෙනවා. ඒ ඉතිරි වීම හරහා අපට පුළුවන් cut -off marks පුළුවන් ඉක්මනට දෙන්නත්, ඒ හරහා විශ්වවිද්‍යාලයට දරුවන් ඇතුළත් කර ගැනීමේ කාලපරිච්ඡේදය අඩු කර ගන්නත්.

ඇත්ත වශයෙන්ම යම් වසරක අගෝස්තු මාසයේ අපොස උසස් පෙළ විභාගයට වාඩි වෙන දරුවෙකුට ඊළඟ වසරේ අන්තිම දක්වා, දෙසැම්බර් පසු වන තුරු, අවුරුද්දකුත් මාස 4කට වැඩි කාලයක් නිකරුණේ ගත කරන්න වෙනවා. ඔහුගේ වටිනා කාලය නාස්ති වෙනවා, විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්න ගතවන මේ කාලපරිච්ඡේදය නිසා. අපි මේ කාලය මාස 6කින් අඩු කරන්න සැලසුම් කරලා තිබෙනවා. විශේෂයෙන් ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ මහ පෙන්වීම යටතේ, වසරකට මාස දෙක බැගින් මේ කාලය ඉස්සරහට ගන්න අපි වැඩ කර ගෙන ආවා. ඒ වාගේම, ඇතුළත්වන ප්‍රමාණය වසරකට සියයට 10කින් වැඩි කිරීමටත් කටයුතු කළා. වසරකට සියයට 10කින් වැඩි වීම තුළ මේ අවුරුද්දේ දරුවන් 2208ක් වැඩියෙන් ප්‍රවේශ කර ගන්නවා. අලුතින් ආරම්භ කරන ලද විවිධ පාඨමාලා හරහාත් මේ සියයට 10ක පමණ වැඩි ප්‍රවේශය වර්ධනය කර ගන්න අපට පුළුවන් වුණා. ඒක ඉතාම ඵලදායී කටයුත්තක්. ඒ තුළින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අපි දීපු පොරොන්දුව ඉටු කර ගන්න පුළුවන් වුණා.

ඒ විතරක් නොවෙයි. අපි මේ රටාව ඊළඟ වර්ෂයේත්, ඊළඟ වර්ෂයේත් පවත්වා ගෙන යන්න බලාපොරොත්තු වනවා. මේ වසරේ විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමේ cut-off marks ඉදිරිපත් කිරීම පසු ගිය දින දෙකකට පෙර සිදු වුණු බව අපි හැමෝම දන්නවා. මේක ඇත්තටම පසු ගිය වසරට වඩා මාස එක හමාරක පමණ ඉක්මනින් සිදු වුණා. මේක නිකුත් කිරීම මේ මාසයේ 20වැනි දා දක්වා කල් ගියා. ඇත්තටම අපි හිතාගෙන හිටියේ මේ මාසයේ මුල මේ cut-off marks නිකුත් කරන්නයි. මේ දින 20ක ප්‍රමාදයට හේතු වුණේත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වර්ජනයයි. ඒක නොවුණා නම්, සැප්තැම්බර් මාසයේ මුල වෙනකොට cut-off marks දෙන්න තිබුණා. 20 වෙනි දා මේක දුන්නාට පසුව අපට අවස්ථාව ලැබෙනවා, නොවැම්බර් මාසයේ මුල ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට. අපි මේ වසරේ මුල සිටම ඒ සඳහා සම්මන්ත්‍රණ තියලා, රැස්වීම් තියලා ගරු ඇමතිතුමා සහ මම පීඨාධිපතිවරුන්ටත්, උපකුලපතිවරුන්ටත් දැනුම් දුන්නා, ඊළඟ අවුරුද්දේ පාඨමාලාව නොවැම්බර් මාසයේ මුල පටන් ගැනීමට ලැහැස්ති වෙන්න කියලා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අමාත්‍යාංශය පැත්තෙන් කළ යුතු කාර්ය භාරය අපි ඉෂ්ට කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ අනුව මේ වසරේ ප්‍රතිඵල මත ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම නොවැම්බර් මාසයේ මුල සිට කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එය මාස දෙකක ඉක්මන් කිරීමක්. මොකද, ගිය වසරේ ප්‍රතිඵල අනුව අපට මේක කරන්න පුළුවන් වුණේ මේ අවුරුද්දේ ජනවාරි මාසයේදියි. නමුත් මේ නොවැම්බර් මාසයේ මූලදී අනිවාර්යයෙන්ම වෛද්‍ය පීඨ හා ඉංජිනේරු පීඨ ආරම්භ කරන්න අපට පුළුවන් වනවා. ඒ අනුව, පේරාදෙණිය සහ මොරටුව විශ්වවිද්‍යාලවල ඉංජිනේරු පීඨ දෙකත්, වෛද්‍ය පීඨ ගණනාවකුත් නොවැම්බර් මාසයේ ආරම්භ කිරීමේ හැකියාව ලැබෙනවා. පීඨාධිපතිවරුන් හා කුලපතිවරුන් ඔවුන් පොරොන්දු වුණු විධියට මේ කටයුත්ත කරන්න සූදානම් නම්, අපි වේලාසනින් දැනුම් දුන් විධියට නොවැම්බර් මාසය වනකොට අනෙකුත් පාඨමාලාත් පටන් ගන්න අපට පුළුවන් වනවා.

විශ්වවිද්‍යාලවලට 68,000ක පමණ ශිෂ්‍ය පිරිසක් ඉල්ලුම් කරනවා. ඒ ඉල්ලුම් කිරීම ලබන වසරේ සිට අනිවාර්යයෙන් online කළ යුතුයි කියන පදනමට යාමට අපි කටයුතු කර ගෙන යනවා. එහෙම වුණොත්, අපට මේ කාලපරිච්ඡේද හුඟක් අඩු කර ගන්න පුළුවන්. ඒ අනුව අපි ලබන වසරේ සිට තවත් මාස දෙකකින් විශ්වවිද්‍යාල ප්‍රවේශය ඉක්මන් කර ගැනීමට බලාපොරොත්තු වනවා. මේ විධියට අවුරුදු තුනක් පමණ යනකොට අපට මේ විශ්වවිද්‍යාල ප්‍රවේශය මාස 6කින් ඉස්සරහට ගන්න පුළුවන් වනවා. එතකොට විශ්වවිද්‍යාලයට ඇතුළත්වන උසස් පෙළ සමත් දරුවන් මුහුණපාන ප්‍රශ්න ගණනාවක් විසඳන්න අපට පුළුවන්කම ලැබෙනවා. ප්‍රවේශය, ගුණාත්මකභාවය වැඩි කිරීම, රැකියා වෙළඳ පොළට ඇති අදාළත්වය වැඩි කිරීම යන බොහෝ දේවල් මේ සුළු කාලය තුළ අපි කරලා තිබෙනවා.

විශේෂයෙන් ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා පියවර ගෙන තිබෙනවා. ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කිරීම, තත්ත්ව පාලනය කිරීම හා ප්‍රතීතනය කිරීම සඳහා ස්වාධීන කොමිසමක් පිහිටුවීම සඳහා සියලු පනත් කෙටුම්පත් මේ වන විට සකස් කර ගෙන යනවා. මේ ස්වාධීන කොමිසම පිහිටුවීමෙන් පසු ඇත්ත වශයෙන්ම අපේ රටේ පෞද්ගලික අධ්‍යාපන ආයතන මෙන්ම රාජ්‍ය අංශයේ සියලුම උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව පාලනය සඳහාත්, ප්‍රතීතනය සඳහාත් මේ ස්වාධීන කොමිසමට යන්න වෙනවා. ඒ අනුව අපට සියලුම විශ්වවිද්‍යාල තුළ ඉතා හොඳ තත්ත්වයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව බොහෝ දේවල් කථා කරන්න තිබුණත්, කාලය සීමිත බැවින් මට ලබා දුන් කාලය පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත් නිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා]ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப.1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமைவகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *in the Chair..*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

[අ.භා. 1.30]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව යම් අදහස් දැක්වීමක් කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

විශ්වවිද්‍යාලවල අනධ්‍යයන සේවකයන් 13,000ක් පමණ නියෝජනය වන අතරේ, ඔවුන් පසු ගිය කාලය පුරාවටම වෘත්තීය ඉල්ලීම් කිහිපයක් සම්බන්ධයෙන් වැඩ වර්ජනයක නිරත වෙලා සිටියා. ඒ ඉල්ලීම් අතර ප්‍රධාන කාරණා තුනක් තිබෙනවා. ඒ තමයි, ඔවුන්ගේ මාසික හිලව් දීමනාව වැඩි කර ගැනීම, ඔවුන්ගේ මූලික

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

වැටුප සහ දීමනා සියල්ල EPF එකට, ETF එකට එකතු කර ගැනීම සහ මේ කියන විශ්‍රාම වයස දීර්ඝ කර ගැනීම. අද සංශෝධනය ඉදිරිපත් වෙන්නේ ඒ අතරින් විශ්‍රාම යන වයස වැඩි කිරීම සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොයි කාලයෙත් අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සමාජයේ බලවත් උනන්දුවක් තිබෙනවා. දෙමව්පියන් සිතනවා, -ඒ සිතීම සාධාරණයි.- තමන්ගේ දරුවාට උරුම කරන්න පුළුවන් ඉහළම දායාදය අධ්‍යාපනය කියලා. මොකද, අපේ රටේ දෙමව්පියන්ට පරම්පරාවෙන් එන ඉඩම් අක්කර ගණන්, මහා යානවාහන, මහා පරිමාණ කර්මාන්තශාලා දරුවන්ට උරුම කරන්න බැරි නිසා ඔවුන් කෙසේ හෝ දුක් මහන්සි වෙලා අධ්‍යාපන හිණිමහේ ඉහළටම දරුවන් එගොඩ කරන්න මහන්සි වෙනවා. ඒ නිසා තමයි සමහර ජාවාරම්කරුවන් දෙමව්පියන්ගේ ඒ අභිලාෂය ප්‍රයෝජනයට ගන්නේ.

පසු ගිය දවස්වල අපොස (සාමාන්‍ය පෙළ) අසමත් වුණු දරුවන් පිරිසක් හන්තානේ කඳවුරකට අරගෙන ගිහිල්ලා "සාමාන්‍ය පෙළ සමත් කරවන්නම්" කියලා ඔවුන්ට ලිංගික අතවර කරපු සිදුවීමක් වාර්තා වුණා. ඔබතුමාත් එය මාධ්‍ය තුළින් දකින්න ඇති. දරුවෝ කියලා කියන්නේ දෙමව්පියන් මල් වාගේ බලාගත්, ඇහේ තියාගෙන හදපු දරුවෝ. ඒ දරුවෝ එක දවසක්වත් ගෙදරින් පිට මං කරන්න දෙමව්පියෝ සූදානම් නැහැ. නමුත්, සාමාන්‍ය පෙළ කඩ ඉම කෙසේ හෝ පහු කර ගන්න දෙමව්පියන්ටත් බලවත් වුවමනාවක් තිබෙන නිසා ඒ දරුවෝ ටික එතැනට යොමු කළා. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් පුද්ගලයෝ කීප දෙනෙක් ඒ දරුවන් අපයෝජනයට ලක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිනවල මහත් ආන්දෝලනයකට තුඩු දීලා තිබෙන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර තිබෙන ප්‍රශ්නය බලන්න. ඒ දරුවන්ට පාසල් ලබා ගැනීම සඳහා දෙමව්පියන් දරන මහන්සිය, උත්සාහය පිළිබඳව අපි අගය කිරීමක් කරනවා. නමුත්, ඒ ලැයිස්තුව කිසිදු සාධාරණ බවකින් තොරයි කියලාත් පෙනෙනවා. ඒ නිසා මෙහි තිබෙන සාධාරණ ඉල්ලීම් ද ප්‍රතික්ෂේප වෙලා යනවා. නමුත්, අපි එක කරුණක් සලකන්න ඕනෑ. මීට මාස කිහිපයකට පෙර වාර්තා වුණු මීගහතැන්නේ ප්‍රාථමික විද්‍යාලයට දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා කරපු උද්ඝෝෂණයට සහභාගි වුණු දෙමව්පියන් පිළිබඳව බලන්න. ඒ පැත්තේ රබර් කිරි කපන, වැලි ගොඩ දමන සාමාන්‍ය කම්කරුවෝ තමයි ඒ දරුවන්ගේ දෙමව්පියන්. ඔවුන්ටත් තිබුණු එකම ඉල්ලීම තමයි, කෙසේ හෝ තමන්ගේ දරුවා රජයේ පාසලකට දමා ගැනීම. මේ සියලු වෘත්තීන්වල, තරාතිරම්වල දෙමව්පියන් අරගළය කරන්න, උද්ඝෝෂණය කරන්නේ, විවිධ දේවල් කරන්නේ රජයේ පාසලකට -රජයේ අධ්‍යාපනයට- දරුවන් ඇතුළත් කරවීම සඳහායි. ඒ උත්සාහය පිළිබඳව අපි හැම දෙනාම සතුටු වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල සඳහා කඩ ඉම් ලකුණු නිකුත් කර තිබෙනවා. කෙසේ හෝ තමන්ගේ දරුවන් විශ්වවිද්‍යාලයකට ඇතුළත් කරලා උසස් අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑම දෙමව්පියෙකුට බලාපොරොත්තුවක් තිබෙනවා. හැබැයි, අපේ රටේ තිබෙන සීමිත විශ්වවිද්‍යාල ප්‍රමාණය නිසා ඒ සඳහා තිබෙන්නේ ඉතාම පටු දොරටුවක්. ඒ නිසා උසස් පෙළ සමතුන්ගෙන් සියයට 17ක් විශ්වවිද්‍යාලයට යනකොට සියයට 83ක් එළියේ. ඒ නිසා සමහර ව්‍යාපාරිකයින්, ජාවාරම්කරුවන්, ඔවුන්ගේ ව්‍යාපාර, එහෙම නැත්නම් ලාභ ලබන ව්‍යාපාර බවට මේවා පත් කර ගන්න මෙන්න මේ අවස්ථාව පාවිච්චි කර ගන්නවා.

ලෝකයේ රාජ්‍ය විශ්වවිද්‍යාල - State universities - වාගේම, රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලත් - non-State universities - තිබෙනවා. එහෙම නැත්නම්, රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල කියලා කියන්නේ හුදෙක් පෞද්ගලික විශ්වවිද්‍යාලම නොවෙයි. පෞද්ගලික විශ්වවිද්‍යාල විලාසිතා සහ යථාර්ථය සම්බන්ධයෙන් අපේ ගරු චම්පික රණවක ඇමතිතුමාගේත් හිතවතකු වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුරුද්ධ ප්‍රදීප් මහතා ලියපු පොතක් දැන් මා ළඟ තිබෙනවා.

එම පොතේ සඳහන් වනවා, "බ්‍රිතාන්‍යයේ ඇත්තේ එක් පෞද්ගලික විශ්වවිද්‍යාලයක් පමණි. ඒ බකින්හැම් විශ්වවිද්‍යාලයයි" කියලා. එහි රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල තිබෙනවා. නමුත්, ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන්න තිබෙන විශ්වවිද්‍යාල සංඛ්‍යාව එකයි. ඒ වාගේම තවත් එහි සඳහන් වනවා, "ඕස්ට්‍රේලියාවේ ඇත්තේ ද දෙකකි. එනම්, 1987දී ආරම්භ කළ "Bond University" සහ 1989දී ආරම්භ කළ "The University of Notre Dame Australia" විශ්වවිද්‍යාලයයි" යනුවෙන්.

ඊළඟට, කියනවා, "සිංගප්පූරුවේ පවතින්නේ එවැනි විශ්වවිද්‍යාල දෙකකි. Singapore Management University and SIM University. මෙයින් පළමුවැන්න වන Singapore Management University, රජය විසින් මුදල් ආයෝජනය කරන ලද්දකි" කියලා.

සමහර තැන්වල ඒ ආකාරයට යම් නියාමනයක් සහිතව රජය මැදිහත් වෙලා තමයි රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ආරම්භ කරලා තිබෙන්නේ.

එම පොතේ තව දුරටත් මෙසේ ද සඳහන් වනවා:

"නිව්යෝර්ක් ප්‍රාන්තයේ පෞද්ගලික විශ්වවිද්‍යාල 188ක් පිහිටා ඇති අතර, එයින් ලාභ ලැබීමේ පරමාර්ථය ඇත්තේ පෞද්ගලික විශ්වවිද්‍යාල 18කට පමණි. එපරිද්දෙන් පෙන්සිල්වේනියාවේ ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල 128න්, ලාභ ලැබීමේ පරමාර්ථය ඇත්තේ පෞද්ගලික විශ්වවිද්‍යාල 9කටද, මැසචුසෙට්හි ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල 88න්, ලාභ ලැබීමේ පරමාර්ථය ඇත්තේ පෞද්ගලික විශ්වවිද්‍යාල 4කටද යනුවෙන් ඉතාමත් අඩු සංඛ්‍යාවක් වේ. සමස්තයක් වශයෙන් ගත්තාම ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි මේ ප්‍රාන්ත තුනේම පෞද්ගලික විශ්වවිද්‍යාල 404ක් පිහිටා ඇතත්, ඒවායෙන් ලාභ අපේක්ෂිත ඒවා ඇත්තේ 31ක් පමණි."

අපේ රටෙත් දෙමවුපියන්ට තමන්ගේ දරුවන්ට ඉහළ අධ්‍යාපනයක් ලබා දීම සඳහා තිබෙන කැමැත්ත -අපේක්ෂාව- සමහර උදවිය මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් යොදා ගෙන තිබෙනවා. මේ වෙනකොට අපේ රටේ වෛද්‍ය පීඨවල සිසුන් දින 200කට වැඩි කාලයක් සත්‍යාග්‍රහවල නිරත වෙලා සිටින බව ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා දන්නවා. කොහේ ගිහිල්ලා බැලුවත් ඔවුන්ගේ වෛද්‍ය පීඨ ඉදිරිපිට අට්ටාල ගහගෙන සත්‍යාග්‍රහ පවත්වන බව පෙනෙනවා. ඇයි මේ? ඔවුන් කියනවා, මාලඹේ තිබෙන SAITM කියන පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කරන්න කියලා. අපි පෞද්ගලික විශ්වවිද්‍යාල පිළිබඳ සාකච්ඡාව පැත්තකින් තබමු.

අපි දන්නවා, එක්සත් ජාතික පක්ෂය 1977 විවෘත ආර්ථිකය ආරම්භ කළ දිනයේ සිට ඔවුන් පෞද්ගලික විශ්වවිද්‍යාල වෙනුවෙන් පෙනී සිටි බව. 1980දී උතුරු ලංකා පෞද්ගලික

විශ්වවිද්‍යාලය ආරම්භ කළා. 1982වන කොට උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළා. මේ ආකාරයට එක්සත් ජාතික පක්ෂය තමන්ගේ ප්‍රතිපත්තියක් විධියට පෞද්ගලික විශ්වවිද්‍යාල වෙනුවෙන් පෙනී සිටිනවා. එය අරුමයක් නොවෙයි. ඊට ප්‍රතිපක්ෂව අපි හිතනවා, අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය ලබා දීම රජය සතු විය යුතුයි කියලා. කොයි එක හොඳද, කොයි එක හොඳ නැද්ද කියලා මේ පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව දීර්ඝ සංවාදයක්, සාකච්ඡාවක්, විවාදයක් අපට කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලය පුරාම අපේ රටේ මතයක් ගොඩ නඟා තිබෙනවා, ලෝකයේ රටක් ඉදිරියට යන කොට, ආර්ථිකය ප්‍රසාරණය වන කොට, ඒක පුද්ගල ආදායම වැඩි වන කොට ඒ රටේ නොමිලයේ දෙන අධ්‍යාපනය නැවතිලා, පෞද්ගලික අධ්‍යාපනයට වැඩි ඉඩකඩක් විවෘත වනවාය කියලා. ඒක පට්ටපල් බොරුවක්. ලෝකය ගත්තාම නොමිලයේ අධ්‍යාපනය තිබෙන්නේ කියුබාව වැනි සමාජවාදී රටවල පමණක් නොවෙයි. ලෝකයේ හොඳම අධ්‍යාපනය තිබෙනවාය කියා දැනුත් විශ්වාස කරන පින්ලන්තය වැනි ස්කැන්ඩිනේවියානු රටවල් ගත්තොත්, පින්ලන්තයේ පෙර පාසලේ සිට මූලික උපාධිය දක්වා නොවෙයි, පශ්චාත් උපාධිය දක්වා තවමත් නොමිලයේ අධ්‍යාපනය ලබා දෙනවා. යුරෝපයේ ආර්ථික අර්බුදයක් හමා ගෙන යනවා. මේ ආර්ථික අර්බුදය හමුවේ ඒ ආණ්ඩුව අමාරුවෙන් තීන්දුවක් අරගෙන තිබෙනවා, දේශීය ශිෂ්‍යයින්ගෙන් නොවෙයි, විදේශීය ශිෂ්‍යයින්ගෙන් පමණක් යම් මුදලක් අය කරන්න. එයටත් විරෝධයක් තිබෙනවා. එවැනි රටවල් පෞද්ගලික අධ්‍යාපනයේ සිට නොමිලයේ රාජ්‍ය අධ්‍යාපනය දක්වා ගමන් කරලායි තිබෙන්නේ. චීනය ගත්තත් එහෙමයි. චීනයේ පෞද්ගලික අධ්‍යාපනය තිබෙනවා. හැබැයි ඔවුන්ගේ 2006 - 2011 පස් අවුරුදු සැලැස්මේ චීන මහජන සමූහාණ්ඩුව යෝජනා කරලා, ක්‍රියාත්මක කර ගෙන යනවා, චීනයේ බටහිර පැත්තේ සිට නැඟෙනහිර පැත්තට, දුප්පත්කම වැඩි පැත්තේ සිට අඩු පැත්තට, එහෙම නැත්නම් යුනාන්වල සිට බීජිං පැත්තට නොමිලයේ සහ අනිවාර්ය අධ්‍යාපනය ලබා දීම. ඒ නිසා ලෝකයේ ආර්ථිකය, රටක ආර්ථිකය ප්‍රසාරණය වන කොට, දළ ජාතික නිෂ්පාදනය වැඩි වන රටවල් ගමන් කරන්නේ, අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමට තිබෙන අයිතිය තහවුරු කරන්න රජය අධ්‍යාපනයේ අයිතිය අතට ගැනීමටයි. හැබැයි අපට මතයක් හදමින් යනවා, රටක් දියුණු වන කොට පෞද්ගලික අධ්‍යාපනය තමයි ප්‍රමුඛ වන්නේ කියලා. නැහැ, ඒක වැරැදියි. මේ ඉඩකඩ ඇතුළේ අපේ රටේ වෙලා තිබෙන්නේ මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ SAITM එකේ කාරණාව සම්බන්ධයෙන් පසු ගිය දවස්වල අපි සාකච්ඡා වුණා. උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට කිව්වා, ඒක අහෝසි කරන්නේ නැහැ, වහන්නේ නැහැයි කියලා. ඒක ඒ පැත්තට විශාල ධෛර්යයක් වුණා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේක පසු ගිය ආණ්ඩුව කාලයේ පටන් ගත් දෙයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට ඒක ආපස්සට හරවන්න බැහැ. අපි ඒක වැහුවොත් ඒ ගොල්ලෝ උසාවි යයි. උසාවි ගියාට පස්සේ අපට මේක විවෘත කරන්න වනවා. මා කිව්වේ ඒකයි. පසු ගිය ආණ්ඩුව කාලයේ තමයි මේක පටන් ගත්තේ, අපේ ආණ්ඩුව කාලයේ තමයි පළමුවන කණ්ඩායම - first batch එක - එළියට ආවේ කියලා. අපි මේකට විසඳුමක් දෙන්න ඕනෑ. මා ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. රජයයි, පෞද්ගලික අංශයයි මැදිහත් වෙලා මේක කරනවා නම් ඔබතුමා කැමැතිද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මගේ කථාවේදී මා කියන්නම් කෝ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රජයයි, පෞද්ගලික අංශයයි දෙගොල්ලන්ම එකතු වෙලා SAITM එක Public-Private Partnership එකකට run කරන එකට ඔබතුමා කැමැතිද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒක කරන්න බැරි කාරණය මා කියන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රජයේ නියාමනය යටතේ Public-Private Partnership එකකට SAITM එක ගෙන යන්න ඔබතුමා කැමැතිද? මොකද, මේක හරවන්න බැහැ. මේක ආපස්සට හරවන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හැමදෙනාම උනන්දු වන්නේ විසඳුමක් සොයන්නයි. තමුන්නාන්සේලාටත් විසඳුමක් සොයන්නයි කියන්නේ. නමුත් ඒ විසඳුම සාධාරණ වන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අපිත් මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා විසඳුමක් සොයන්න තමයි සාකච්ඡා කරමින් ඉන්නේ. මුදල් පොලියට දෙන ආයතන මේ රටේ තිබෙනවා නේ. සමහර ආයතන මහා පරිමාණයෙන් පවත්වා ගෙන යනවා. හැබැයි ඒ ආයතන සියල්ලම ආණ්ඩුවෙන් වටලන්නේ නැහැ නේ. සමහර ආයතන බලපත් ලබා ගෙන මුදල් පොලියට දෙනවා. නමුත් සක්විති රණසිංහ අල්ලා ගත්තා නේ. සක්විති රණසිංහ එවැනි මුදල් ජාවාරමක නිරත වෙලා සිටියදී ඔහුව අල්ලා ගෙන හිරේ දැම්මා. ඇයි, ඒ? එය වංචනික ජාවාරමක් නිසා. ඒ වාගේම තමයි, දැන් මේ SAITM ආයතනයත්. 2008 මාර්තු 31වන දා ශ්‍රී ලංකා ආයෝජනය මණ්ඩලය සහ නෙවිල් ප්‍රනාන්දු මහතා අතර අත්සන් කරපු ගිවිසුමකින් තමයි මේ ආයතනය ආරම්භ කළේ. මේ ගිවිසුම අත්සන් කරන කොට තිබුණු කොන්දේසි මොනවාද?

ඒ වෙලාවේ තිබුණු South Asian Institute of Technology and Management (Pvt.) Limited කියන ඔහුගේ සමාගම විසින් BOI එකෙන් අවසර ඉල්ලනවා, Information Technology, Management and Finance, Engineering, Vocational Studies, Nursing, Languages, Health Science කියන පාඨමාලා ආරම්භ කරන්න.

මේක ඇතුළත "Medicine" කියලා කොහේවත් නැහැ. සෞඛ්‍ය සම්බන්ධයෙන් තිබෙන්නේ "Nursing සහ Health Science" විතරයි. ඒ වාගේම BOI එක මේ පාඨමාලා සඳහා අනුමැතිය දෙන කොටත් කොන්දේසි දෙකක් දමනවා. එකක්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තමයි "This approval was granted subject to the condition that the approval from Ministry of Health and Nutrition be obtained prior to providing training in Health Science" කියන එක. සෞඛ්‍ය විද්‍යාව සම්බන්ධ පුහුණුවක් දීමට කලින් සෞඛ්‍ය, පෝෂණ අමාත්‍යාංශයේ අනුමැතිය -අවසරය- ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවක් වෙලා තිබුණා.

මගේ අතේ තිබෙනවා, 2010.08.09වැනිදා එවකට Sri Lanka Medical Council එකේ සභාපතිනිය වුණු ලලිතා මෙන්ඩිස් මැතිනිය BOI එකේ සභාපතිවරයාගෙන් අහන ප්‍රශ්නවලට එවකට BOI එකේ සභාපති සහ Director General වන ජේ.ඩී. බණ්ඩාරනායක මහතා දෙන පිළිතුර. එතුමිය අහනවා, "Did the application include a proposal to set up a Medical School?" කියා. වෛද්‍ය විද්‍යාලයක් සෑදීම සඳහා ඉල්ලීමක් මෙහි තිබුණාද? නැත. එහෙම නැත්නම් රුසියාවේ Nizhny Novgorod රාජ්‍ය විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ වෙලා විශ්වවිද්‍යාලයක් හදන්න අවසර අරගෙන තිබුණාද? නැත. ඒ කියන්නේ BOI එකේ අනුමැතිය තිබෙන්නේ Nursing සහ Health Science කියන උපාධි දෙක දෙනවා නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුයි කියලායි.

ඊට පස්සේ නෙවිල් ප්‍රනාන්දු මහතා පත්‍රවල දිගින් දිගටම දැන්වීම් දැම්මා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය තිබෙනවා කියලා. 2013.04.05වැනිදා එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් Dr. Nihal Jayathilake *නීතිපති* දෙපාර්තමේන්තුවට ලියනවා, "I was instructed by the Hon. Minister ...."

එවකට මේ "Hon. Minister" අද ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා.

> " ... to inform you that he did not issue any letter in writing or otherwise or grant any approval to the effect of carrying out a Medical Faculty at SAITM and to award Medical Degrees in Sri Lanka."

එවකට සෞඛ්‍ය ඇමතිවරයාගේ උපදෙස් මත නිහාල් ජයතිලක ලේකම්වරයා ලියනවා, මේ SAITM එකට වෛද්‍ය උපාධියක් ප්‍රදානය කිරීම සඳහා කිසිදු ආකාරයක අවසරයක් ලබා දුන්නේ නැහැයි කියලා. මේක ඇත්තද බොරුද කියලා දැන් ජනාධිපතිතුමාගෙන් අහන්න පුළුවන්. හැබැයි, මෙහෙම තිබෙද්දී South Asian Institute of Technology and Management කියන ආයතනයේ නෙවිල් ප්‍රනාන්දු දොස්තර මහත්තයා කඩුවෙල දිසා අධිකරණයට දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරනවා, "මා ප්‍රකාශ කර සිටින්නේ චිත්තිකරුගේ වෛද්‍ය විද්‍යාලය සම්බන්ධව රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගෙන් ලිඛිතව අනුමැතිය ලබා ගෙන ඇති බවයි" කියා.

මේ තිබෙන්නේ කඩුවෙල උසාවියට ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශයයි. ඔහු අවසරය ගත්තේ කොහෙන්ද? සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අවසර අරගෙන නැහැ. ඒක තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා කියන්නේ. හැබැයි, ඔහු අවසරයක් අර ගෙන තිබෙනවා. කාගෙන්ද, ඒ කාලයේ පෞද්ගලික සෞඛ්‍ය අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙක් හිටියා. ඔහු තමයි වෛද්‍ය හර්ෂ අමල් ද සිල්වා. ඔහුගෙන් එකඟතාවක්, අනුමැතියක් අර ගෙන තිබෙනවා, මාලබේ ප්‍රදේශයේ පෞද්ගලික රෝහලක් ඇති කරන්න. අන්න ඒ ලියුම තමයි Dr. Neville Fernando සාවද්‍ය ලෙස පාවිච්චි කරලා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණායි කියලා රටට ඉදිරිපත් කරන්නේ. ඔහු දිගින් දිගටම ප්‍රකාශ කරනවා, "මේ ආයතනය රුසියාවේ Nizhny Novgorod රාජ්‍ය විශ්වවිද්‍යාලයත් එක්ක අනුබද්ධයි, ඒ නිසා ළමයි එවන්න" කියලා. මේ තිබෙන්නේ 2012.12.19 දින Alexey Postnikow, Director of Nizhny Novgorod State Medical Academy ලංකාවෙන් කළ විමසීමක් ගැන කළ ප්‍රකාශයක්.

ඔහු කියනවා, "In response to your previous email inquiry with regard to the status of the Sri Lankan Campus of Nizhny Novgorod State Medical Academy, I would like to inform you that the Database of accredited Higher Education Institutions in the Russian Federation maintained by the National Accreditation Agency does not contain any information about the Sri Lankan Campus of Nizhny Novgorod State Medical Academy." කියා. රුසියාවේ විදේශ විශ්වවිද්‍යාල සම්බන්ධ රාජ්‍ය ආයතනයෙන් කියා තිබෙනවා, මෙහෙම විශ්වවිද්‍යාලයකට අනුබද්ධ ආයතනයක් ලංකාවේ කොහේවත් නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
කාටද, ඒ උත්තරය එවා තිබෙන්නේ?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒ උත්තරය එවා තිබෙන්නේ Dr. Chanaka De Silvaට.

ඊළඟට මම කියන්නම්, මේ කාරණයටම සම්බන්ධ අනෙක් කාරණය ගැන. මේ තිබෙන්නේ ආන්දෝලනයට තුඩු දීලා තිබෙන කරුණ සම්බන්ධයෙන් එවකට රුසියාවේ ශ්‍රී ලංකා තානාපති වශයෙන් කටයුතු කළ උදයංග වීරතුංග එවපු 2012.11.07 දිනැති ලිපිය. ඔහු කියනවා,"…the Russian Federation have informed in December 2011, that the Russian Federation has not established a branch of any educational institute in the territory of Sri Lanka" කියලා. ඔහු වෙන වෙන අයථා ගනුදෙනුවලට සම්බන්ධයි කියන එක වෙනත් කාරණයක්. හැබැයි නිල වශයෙන් අපේ රට නියෝජනය කළ රාජ්‍ය තාන්ත්‍රිකයා අපේ රටට දැනුම් දීලා තිබෙනවා, SAITM එක රුසියාවේ එවැනි විශ්වවිද්‍යාලයකට අනුබද්ධ නැහැ කියලා. හැබැයි, SAITM එක දිගටම දැන්වීම් පළ කරන්නේ එය රුසියාවේ Nizhny Novgorod විශ්වවිද්‍යාලයට අනුබද්ධයි කියලායි. ඒ විතරක් නොවෙයි, ලංකාවේ දරුවන්ගෙන් එකතු කරන මුදල්වලින් සියයට 22ක් ඒ ආයතනයට යවනවා කියලාත් ඔවුන් දැන්වීම් පළ කරනවා.

"Asian Institute of Technology and Management" කියන නම තමයි ආරම්භක අවස්ථාවේදී තිබුණේ. ඊට පසුව ඒ ගොල්ලන් ඒක ටිකක් වෙනස් කළා, "South Asian Institute of Technology and Management - SAITM"- කියලා. එහෙම කරලා තමයි BOI එකෙන් අනුමැතිය ගත්තේ. හැබැයි, SAITM කියන එක හොරාට වෙනස් කළා, "South Asian Institute of Technology and Medicine" කියලා. "M" අකුරෙන් අදහස් වුණු "Management" කියන එක "Medicine" කියලා කාගෙන්වත් අවසරයක් ගත්තේ නැතුව හොරාට වෙනස් කළා. එහෙමයි වෙනස් කළේ. ඇයි? ඔහුගේ එකම අරමුණ වුණේ ලාභය පමණක් නිසායි. එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාව සිටි රවින්ද්‍ර රුබෙරු ඇතුළුව පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළා. Dr. Ravindra Ruberu, Chairman, Dr. H.R.U. Indrasiri, Prof. Jayantha Jayawardana, Dr. Palitha Abeykoon and Mrs. A.R. Ahamed යන අය 2012.02.28 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයට

ඉදිරිපත් කළ ඒ කමිටු වාර්තාවේ ඒ කාරණා සියල්ල තිබෙනවා. BOI එකෙන් අවසර අරගෙන තිබෙන්නේ වෙනත් නමකින් කියලා තිබෙනවා. Nursing සහ Health Science Degree එකක් ලබා දෙනකොට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගන්න ඕනෑ, එවැනි අනුමැතියක් ලබා ගෙන නැහැ කියලා තිබෙනවා. අනුමැතියක් අරගෙන තිබෙන්නේ 2009.01.07 වන දින Dr. Amal Harsha De Silvaගෙන්, ඒක වලංගු නැහැ කියලා තිබෙනවා. මේ තමයි මේ ආයතනය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා නිකුත් කළ වාර්තාව.

ඊළඟට, තවත් වාර්තාවක් තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගිහිල්ලා මෙය පරීක්ෂා කළා. ඒ සඳහා ගියේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වත්මන් සභාපති Prof. Mohan de Silva ඇතුළු පස් දෙනෙක්. අපොස උසස් පෙළ සඳහා ජීව විද්‍යා විෂය ධාරාව හදාරා නැති, අපොස උසස් පෙළ විභාගයෙන් "S" pass තුනක්වත් ලබා ගෙන නැති සිසුන් SAITM එකේ පළමු කණ්ඩායම් හතර තුළ සිටි බව ඔවුන් සොයා ගත්තා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මොකක්ද, ඒ වාර්තාව?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
2013 පෙබරවාරි 26 දිනැති, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්තාව. ඒ Team එකේ ඉඳලා තිබෙනවා, Prof. Mohan de Silva, Prof. Jayantha Jayawardana, Prof. Thilak Weerasooriya, Prof. Colin Peiris, Prof. Malik Goonewardene and Dr. Sunil de Alwis යන අය. ඔවුන්ගේ වාර්තාවේ හතර දෙනෙක් පිළිබඳව පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, "මේ හතර දෙනා විතරයි සොයා ගන්න පුළුවන් වුණේ, ඔවුන් අවශ්‍ය සුදුසුකම් සපුරා නැහැ" කියලා.

ඊළඟට, SAITM එක Sri Lanka Medical Council එකට ආරාධනා කළා, ඔවුන්ගේ ආයතනය පරීක්ෂා කරන්න team එකක් එවන්න කියලා. Sri Lanka Medical Council එක එය පරීක්ෂා කරලා, "The Degree awarded by SAITM should not be recognized for the purpose of registration under the Medical Ordinance." යනුවෙන් වාර්තාවක් නිකුත් කරලා තිබෙනවා. Prof. Carlo Fonseka සභාපතිත්වය දරන Sri Lanka Medical Council එක නිකුත් කළ වාර්තාවේ සඳහන් වෙනවා, "මේ දෙන උපාධිය වෛද්‍ය ආඥා පනත යටතේ පිළිගන්න බැහැ" කියලා. Sri Lanka Medical Council එක කියන්නේ

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය නොවන සංවිධානයක් නොවෙයි; ස්වේච්ඡා සංවිධානයක් නොවෙයි; එය ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක්. එහි සභාපතිවරයා පත් කරන්නේ ජනාධිපතිවරයා. සභිකයන් පත් කරන්නේ අදාළ ඇමතිවරයා. ඇත්තටම ගත්තොත් ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් ජනතාවට වග කියන්න තිබෙන, රජයට උදව් කරන්න තිබෙන ආයතනය තමයි Sri Lanka Medical Council එක. ඔවුන් කියනවා, "ඒ උපාධිය පිළිගන්න බැහැ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ කවදාද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
2015 සැප්තැම්බර් 04 වන දා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සියලු ලිපි ලේඛන **සභාගත*** කරනවා.

මේ අතරේ තමයි මෙහි ඉන්න ශිෂ්‍යයින් කීප දෙනෙකු එකතුවෙලා අධිකරණයට යන්නේ. අධිකරණයට ගිහිල්ලා ඔවුන් ඉල්ලා සිටිනවා, "ඔවුනට සායනික පුහුණුව ලබා දීම සඳහා රජයේ රෝහල් ලබා දෙන්න" කියලා. එහෙම නඩුව යනකොට සෞඛ්‍ය අමාත්‍යාංශය අධිකරණයෙන් පිටතදී එකඟතාවකට එනවා, "අපි මේ සායනික පුහුණුව දෙන්නම්" කියලා. හැබැයි, ඒ දෙන්නේ කාටද? ඒ දෙන්නේ මෙහෙමයි. 2014.09.17 එවකට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් හිටපු සුධර්මා කරුණාරත්න විසින් නීතිපතිවරයාට යවපු ලියුම මා ළඟ තිබෙනවා. ඔවුන් එයින් පැහැදිලිව මෙහෙම කියනවා:

"Ultimately, with regard to the facilities required in this case, in principle, Hon. Minister is agreeable to cooperate with the SAITM in order to facilitate the required clinical training at designated state hospital in respect of the petitioners and the batches registrable under the Medical Ordinance."

වෛද්‍ය ආඥාපනත යටතේ ලියා පදිංචි වුණු කණ්ඩායම්වලට පමණක් එහෙම සායනික පුහුණුව දෙන්න අධිකරණයෙන් පිට එකඟතාවකට එනවා. හැබැයි, වෛද්‍ය ආඥාපනත යටතේ recognized එක batch එකක්වත් මේක ඇතුළේ නැහැ. උසාවියෙන් පිටත ආපු මේ එකඟතාව පෙන්නුම් කරලා තමයි, අවිස්සාවේල්ල රෝහලත්, කඩුවෙල MOH එකත් මේ අයට සායනික පුහුණුව සඳහා ලබා දුන්නේ. මේක කොච්චර හොරා ගැහිල්ලක්ද කියලා කියනවා නම්, කඩුවෙල MOH එක සහ අවිස්සාවේල්ල වෛද්‍ය අධිකාරිවරයාට යවපු ලියුම තමයි මේ තිබෙන්නේ. ඒ ලියුමට උසාවියේ වාර්තාවත් අමුණනවා, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්. ඇයි, ඒ? තමන්ගේ තීන්දුව හරියි කියලා කියන්න සෞඛ්‍ය අමාත්‍යාංශය බය නැත්නම් ඔවුන්ට මේ උසාවි නියෝගය අමුණන්න ඕනෑ නැහැ. හැබැයි, මේ උසාවි නියෝගය අමුණන්නේ මොකද? මේ සඳහා අවසරය නොදුන්නොත් උසාවි නියෝගයක් කඩ කරනවා කියලා වෛද්‍ය අධිකාරිවරයා සහ MOH බය කරනවා. උසාවි නියෝගයේ තිබෙන්නේ එහෙම නොවෙයි.

මේක මුල ඉඳලාම බොරුවක්. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල විවෘත කිරීම සඳහා එවපු ආරාධනා පත්‍රය තමයි මේ තිබෙන්නේ. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල විවෘත කරන්න කවුද ගියේ? එවකට අගමැති දි.මු. ජයරත්න මැතිතුමා, එවකට සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, එවකට උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා සහ රුසියාවේ තානාපතිවරයා තමයි මේ රෝහල විවෘත කරන්න ගියේ. මේ එන්න කියන්නේ මොකටද? එහි සඳහන් වෙනවා, මේ විධියට: "To the opening of Dr Neville Fernando Sri Lanka - Russia Friendship proposed Teaching Hospital."

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සියල්ලෝම ගිහිල්ලා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
සියල්ලෝම ගිහිල්ලා. ඒක තමයි මා අහන්නේ. ජනාධිපතිතුමා පවා ගිහිල්ලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
එම ප්‍රශ්නය නිවැරැදි කරන්න තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් බලයට පත් කළේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ ආණ්ඩුව ආවේ ඊට අවුරුදු හතරකට පස්සේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අවුරුදු අටක්, දහයක් නොවෙයි, කවදා කළත් එම වැරැද්ද හදන්න තමයි ලක්ෂ 62ක් ඡන්දය දීලා තිබෙන්නේ. නැත්නම් මොකටද ඡන්දය ලබා දෙන්නේ? ගිය කෙනාටත් ඡන්දය දුන්නා නේ. පෞද්ගලික අංශයට Teaching Hospital එකක් ආරම්භ කරන්න පුළුවන්ද? බැහැ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය ඇමතිවරයා විධියට සිටියදී පාර්ලිමේන්තුවේදී කිව්වා, "එහෙම ශික්ෂණ රෝහලක් ආරම්භ කරලා නැහැ. එහෙම ආරම්භ කරන්න බැහැ" කියලා. හැබැයි, Teaching Hospital එකක් -ශික්ෂණ රෝහලක්- කියලා තමයි invitation එක ගහලා එවලා තිබෙන්නේ. ශික්ෂණ රෝහලක් එහෙම ආරම්භ කරන්න පුළුවන් වෙන්නේ කොහොමද? එහෙම කරන්න බැහැ. බලන්න, දැන් නමත් වෙනස් කරලා තිබෙන්නේ. නමත් හොරාට ගහලායි තිබෙන්නේ. බඳවාගෙන තිබෙන්නේත් හොරාට. ශික්ෂණ රෝහල ආරම්භ කරලා තිබෙන්නේත් හොරාට. සියල්ල හොරාට කරලා, BOI එකත් නොමඟ යවලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයත් නොමඟ යවලා විතරක් නොවෙයි, මේ රටේ දරුවන් 1,200ක් ද රැවටීමටත් ලක් කරලා තිබෙනවා. ඇයි, මේ? ඒ, ඔහුගේ එකම අරමුණ ලාභයම පමණක් නිසයි. යුරෝපයේ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ආරම්භ කරන්නේ ආයතන විසිනුයි

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, නෙවිල් ප්‍රනාන්දු මේ ශික්ෂණ රෝහල ආරම්භ කරනකොට මෙහෙම වෙනසක් කරනවා. BOI එකට ඔහු දැනුම් දෙනවා, Dr. Neville Investment Company (Pvt.) Limited එකෙන් ආරම්භ කරපු ආයතනය, ආයතනයක් විධියට නොවෙයි, Dr. Neville Fernando නමින්ම විතරක් පවත්වාගෙන යන්න කියලා. තනි පුද්ගලයෙකු ආයෝජනයක් කරලා, මෙහෙම වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරලා තිබෙනවා. ඒ, මොකටද? තමුන්නාන්සේලා කියනවා, "උසස් පෙළ සමත් වූ දරුවන්ගෙන් සියයට 83කට විශ්වවිද්‍යාලවලට යන්න බැහැ. ඒ අයට අවස්ථාව දෙන්න තමයි මේ වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළේ" කියලා. නැහැ. ඒ, ලාභය වෙනුවෙනුයි. මෙයින් රුපියල් බිලියන 5ක් පසු ගිය කාලයේ ලාභය විතරක් හොයලා තිබුණා. රුපියල් මිලියන 5000ක්! මේ ලාභ ලබනකොට කොහොමද වෙලා තිබෙන්නේ?

අද පුවත් පත්වල මෙහෙම වාර්තා කරලා තිබෙනවා. මේ සියල්ල හොරෙන් කරගෙන තිබෙන්නේ. "තාජුඩීන්ගේ නැති වුණු අස්ථි කොටස් SAITM එකට ගෙනි යන්න නියෝග දුන්නේ කවුද?" එහි උපකුලපතිවරයා හැටියට ඉන්නේ විශේෂඥ වෛද්‍ය ආනන්ද සමරසේකර මැතිතුමායි. හැබැයි, ඊයේ තාජුඩීන්ගේ නඩුවේදී හෙළිදරවු වෙනවා, කොළඹ ජාතික රෝහලේ තිබුණු අස්ථි කොටස්, මෘත ශරීර කොටස් බෑග් 15ක, 20ක පටවලා, ලොරිවලින් SAITM එකට අරගෙන ගියාය කියලා. මේ ශිෂ්‍යයින් කාය ව්‍යවච්ඡේදන සඳහා පාවිච්චි කරපු සමහර මෘත ශරීර, මිනිසුන් මරලා ගෙනාපුවාද කියලා හොයා බලන්න වෙනවා. ඇයි? ආන්දෝලනයට තුඩු දුන් මෙවැනි ඝාතනයක ශරීර කොටස් පොහොර මලුවල දමාගෙන SAITM එකට අරගෙන ගියා නම් - අද පුවත් පත් තමයි මේක වාර්තා කරන්නේ. - මෙවැනි ආයතනයක් නීත්‍යානුකූල කරන්න තමුන්නාන්සේලා කටයුතු කරන්නේ කොහොමද?

පෞද්ගලික විශ්වවිද්‍යාල ගැන, පෞද්ගලික අධ්‍යාපනය ගැන අපි වෙනම විවාදයක් කරමු. හැබැයි මම අහන්නේ මේ SAITM ආයතනය වංචනික විධියට ආරම්භ කරලා, වංචනික විධියට පවත්වාගෙන ගිහිල්ලා, දරුවන් අතරමං කරලා මේ ආකාරයට පවත්වාගෙන යන්න තමුන්නාන්සේලා ඉඩ දෙනවාද කියලායි. ඔබතුමන්ලා අහලා ඇති, මහරගම ප්‍රදේශයේ දරුවෙක් පසු ගිය දවස්වල ඩෙංගු රෝගය නිසා මිය ගියා කියලා. ඔහු ජයවර්ධනපුර රෝහලට ඇතුළත් කරලා ඉඳලා, පසුව ඔය කියන ශික්ෂණ රෝහලට ඇතුළත් කරලා තිබුණා. ඒ දරුවා මියගියාට පස්සේ ඒ දරුවාගේ අම්මා කියනවා, "නිලමැස්සෝ වහනවා වාගේ, එහෙම නැත්නම් කපුටෝ රැළක් වහනවා වාගේ තමයි ඒ දරුවා පරීක්ෂා කළේ" කියලා. මියයන්න ඔන්න මෙන්න සිටි දරුවා ඒ රෝහලේ සිටි වෛද්‍ය සිසුන් ඔක්කෝම ඇවිල්ලා ඔබ-ඔබා පරීක්ෂා කළේ කපුටෝ රැළක් වහනවා වාගේ කියලා ඒ අම්මා කියනවා. තමන්ගේ දරුවා මියගියේ ඒ රෝහලට ඇතුළත් කළ නිසා කියලා ඒ අම්මා චෝදනා කරනවා. ඔන්න තත්ත්වය. Teaching Hospital කියලා ගහගෙන බොරුවක් කරනවා කියලා ඇස් පනාපිටම පෙනෙනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පුන පුනා පත්තරේ දැන්වීම් දාලා කියනවා, "වෛද්‍ය සභාව මෙය පිළිගෙන නැහැ, මේකට දරුවන් ඇතුළත් කරන්න එපා" කියලා. හැබැයි, ඊට පහුවෙනිදා ඔවුන් පත්තරේ පිටු ගණන් දැන්වීම් දානවා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය තිබෙනවා කියලා. මොකක්ද මේ කරන්නේ? තමුන්නාන්සේලා අනාථ කරන්නේ අපේ රටේ දරුවන් නේ. කෙසේ හෝ උසස් අධ්‍යාපනය ලබා ගන්න ඒ දරුවන් තුළ කැමැත්තක් තිබෙනවා. ඔය ක්‍රමය වෙනුවට අපි යෝජනා කරන්නේ මොකක්ද? ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි, අපේ රටේ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ ආරම්භ කරන්න තවමත් ඉඩකඩ තිබෙනවා. ආණ්ඩුව කවදාද ඒ වාගේ දෙයක් කළේ?

පසු ගිය ආණ්ඩුව 2008 යෝජනා කරලා නතර කරපු වැඩසටහනක් තිබෙනවා. සබරගමුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීම සඳහා 2008දී යෝජනාවක් ආවා. ඔවුන්ගේ 2010-2015 පස් අවුරුදු සැලැස්මේ ඒක තිබුණා. ඒ අනුව 2013 වෙනකොට පළමුවැනි කණ්ඩායම බඳවාගන්න තමයි ඔවුන් යෝජනා කරලා තිබුණේ. නමුත් ඒක කළේ නැහැ. රත්නපුර මහ රෝහල ආසන්නයේ වෙරළුපේ කියලා ප්‍රදේශයක් තිබෙනවා. 2012 දී නාගරික සංවර්ධන අධිකාරියට අයත් එම ප්‍රදේශයේ අක්කර 22ක ඉඩමක් වෛද්‍ය පීඨය හදන්න සබරගමුව විශ්වවිද්‍යාලයට භාරදීලා තිබෙනවා. හැබැයි, අද වන තුරා එහි මුල්ගලක්වත් තියලා නැහැ නේ. ඔවුන්ගේ ඊළඟ පස් අවුරුදු සැලැස්මටත් ඒක ඇතුළත් කළා. 2016දී මේ Faculty එක ආරම්භ

කරන්න ඔවුන් බලාපොරොත්තුවෙන් සිටියා. Syllabus එක යවලා තිබෙන්නේ UGC එකට. ඉඩම තිබෙනවා. තමුන්නාන්සේලාට විශ්වවිද්‍යාල වරම් නොලබන දරුවන් ගැන ඔයතරම් අනුකම්පාවක් තිබෙනවා නම්, සිසුන් 150ක් දාන්න පුළුවන් රාජ්‍ය වෛද්‍ය විද්‍යාලයක් රත්නපුරේ ආරම්භ කරන්න. රත්නපුර මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කරලා ඒක පාවිච්චි කරන්න පුළුවන් නේ.

අද කිව්වා, වයඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වෛද්‍ය විද්‍යාලයක් පටන් ගන්නවා කියලා. පෞද්ගලිකව මම කියන්නේ මේකයි. ඒක කුලියාපිටියේ පටන් ගන්න සුදුසුයි කියලා වාර්තාව දුන්නේ කවුද කියලා මම දන්නේ නැහැ. මහ රෝහල තිබෙන්නේ කුරුණෑගල නම්, ඇත්තටම වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළ යුත්තේ කුරුණෑගලයි. අධ්‍යාපන ඇමතිතුමා කුලියාපිටිය ආසනයේ කියලා ඒක එහේ පටන් ගන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කළ නිසා තමයි දැන් ඇනිලා තිබෙන්නේ. නැහෙනහිර ප්‍රදේශයේ ඇමතිවරයෙක් වරාය ඇමති හැටියට පත්වෙන කොට ඔලුවිල්වල වරාය හදනවා. එහෙම කරන්න පුළුවන්ද? එහෙම කරලා තමයි රට අනාථ කරලා තිබෙන්නේ. හම්බන්තොට්ටින් ජනාධිපති එනකොට, එහේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණ හදනවා. එහෙම නොවෙයි, කුරුණෑගල නගරය ආශ්‍රිතව ඒ වෛද්‍ය විද්‍යාලය හැදුවා නම් ප්‍රශ්න අඩුයි. අග්නිදිග විශ්වවිද්‍යාලය හදලා ප්‍රශ්න ඇතිවෙලා තිබෙන්නේ ඒකයි. තමුන්නාන්සේලාට පුළුවන් ඒවා නිවැරදිව පටන් ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි.

ඊළඟට මොරටුව විශ්වවිද්‍යාලය තිබෙනවා. මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරන්න පුළුවන්. කළුතර, නාගොඩ මහ රෝහල ශික්ෂණ රෝහලක් විධියට හදන්න. රෝගීන් ඉන්නවා, විශේෂඥ වෛද්‍යවරු ඉන්නවා. එතැන වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරන්න පුළුවන්. බදුල්ල මහ රෝහල පාවිච්චි කරලා ඌව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරන්න තමුන්නාන්සේලාට පුළුවන්. එම වෛද්‍ය විද්‍යාල 4ත් ආරම්භ කළාට පසුවත් දොස්තරලා මදියි කියලා කියනවා නම්, ඊට පස්සේ තමුන්නාන්සේලාට මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි, තමුන්නාන්සේලා ඒ එකකටවත් අත තියන්නේ නැතුව, රත්නපුරේ ඉඩම වේළෙනවා; ඒවාට අත තියන්නේ නැතුව SAITM එක බදාගෙන නහිනවා. එස්.බී. දිසානායක ඇමතිතුමා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලයේ ඒ වෙනුවෙන් නැහුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011 සැප්තැම්බර් මාසයේ තමුන්නාන්සේගේ 'ලක්බිම' පත්තරේ තිබෙනවා, "රජයේ පිළිවෙතට පටහැනි තීරණයක් දුන්නොත් -ඒ කියන්නේ SAITM එකට අවසරය දුන්නොත්- වෛද්‍ය සභාව විසුරුවා හරිනවා" කියලා. එතුමා එදා එහෙම කිව්වා. ඔන්න ඔහොමයි කියන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මමද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නැහැ, හිටපු අමාත්‍යතුමා. තමුන්නාන්සේත් දැන් ඒ පාරේ යන බව තමයි පෙනෙන්නේ. ඒ නිසා දැන් කරන්න ඕනෑකම තිබෙන්නේ වෙන දෙයක්. අපේ රටේ දරුවන්ට උගන්වන්න දෙමව්පියන්ට තිබෙන කැමැත්ත, ඒ අභිලාෂය හොඳයි. එය අපේ රටේ සංවර්ධනයට පාවිච්චි කරමින් රාජ්‍ය වෛද්‍ය විද්‍යාල, රාජ්‍ය විශ්වවිද්‍යාල හදන්න. ඒ නිසා මේ වගේ වංචනික ආයතනවලට ඉඩ දෙන්න එපා කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, SAITM එක පටන් ගත්ත කාලයේ කවුරුවත් විරුද්ධ වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා කිව්ව විධියට පටන් අරන් තිබෙන්නේ Management -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
SAITM එක පටන් ගත්ත කාලයේ කිසි කෙනෙක් විරෝධතා ව්‍යාපාර ගෙන ගියේ නැහැ; පාර්ලිමේන්තුව විරුද්ධ වුණේත් නැහැ; විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු විරුද්ධ වුණේත් නැහැ. ඒ වාගේම, මේ ආයතනය අපි පටන් ගත්ත එකක් නොවෙයි; පසු ගිය ආණ්ඩුව කාලයේයි පටන් ගත්තේ. පසු ගිය ආණ්ඩුව කාලයේ Kotelawala Defence Academy එකේත් -ආරක්ෂක පීඨයේත්- වෛද්‍ය පීඨයක් ආරම්භ කළා. ඒ වේලාවේ කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. මොකද, ඒ කාලයේ එහෙම විරුද්ධ වෙන්න ශක්තියක් තිබුණේ නැහැ. SAITM එකේ ළමයි අපේ ආණ්ඩුව කාලයේ තමයි අවසාන විභාගයට පෙනී ඉඳලා තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ මේකට විසඳුමක් දෙන්න ඕනෑ කියලායි. දෙගොල්ලෝම එක්කාසු වෙලා Public-Private Partnership එකකට මේ ආයතනය පරිවර්තනය කරමු. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඇයි, ඒ කාලයේ විරුද්ධ වුණේ නැත්තේ? [බාධා කිරීමක්] කවුද විරුද්ධ වුණේ? [බාධා කිරීමක්] ඒ කාලයේ කිසි කෙනෙක් විරුද්ධ වුණේ නැහැ. ඒක පටන් ගත්ත කාලයේ භයයි; කට අරින්න භයයි. ඒ නිසා කවුරුවත් විරුද්ධ වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. අපි දැන් විවාදයට යන්න ඕනෑ. [බාධා කිරීමක්] ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා කථා කරන්න. [බාධා කිරීමක්] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
SAITM එක සම්බන්ධ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර විවාද කරන විට අපිත් හිටියා. එහිදී පැහැදිලිව කිව්වා ඒක ඒ

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ආණ්ඩුවේ රාජ්‍ය ප්‍රතිපත්තියක් කියලා. ඒකට කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. ඒ කාලයේ භය නිසා කවුරුවත් කට ඇරියේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා.

[අ.භා. 2.01]

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සඳහා විශ්‍රාම වයස වෙනස් කිරීම සම්බන්ධයෙන් තමයි අද අපි සාකච්ඡා කරන්නේ. මෙය එක්තරා ආකාරයකට රටේ ජනගහන ප්‍රවණතාවක්. මොකද, 1960 ගණන්වල අපේ රටේ ජනගහනයේ ශීඝ්‍ර වර්ධනයක් සිදු වුණා. නමුත්, 1980න් පස්සේ ඒ ජනගහන වර්ධන වේගය ශීඝ්‍රයෙන් අඩු වෙලා, සමස්තයක් හැටියට අද වන විට සියයට එකකටත් වඩා අඩු ජනගහන වර්ධනයක් තමයි පවතින්නේ. 2012 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව, එය සියයට දශම 7.4ක් වුණා. ඒ නිසා කරුණු දෙකක් සිද්ධ වෙලා තිබෙනවා. එකක් තමයි, වියපත් ජනගහනය ශීඝ්‍රයෙන් වැඩිවීම. දැනට අවුරුදු 65ට වැඩි ජනගහනය සියයට 14ක් වනවා. 2030 වන විට මේ ප්‍රමාණය සියයට 25ත් ඉක්මවා යන තත්ත්වයක් ඇති වෙනවා. ඒ අනුව වියපත් ජනගහනයේ වර්ධනයක් තිබෙනවා.

මේ අතරේ ජනගහන සෞභාග්‍යය - demographic dividend එක - අරගෙන බැලුවාම අපට පෙනෙනවා, 1992 ඉඳලා ශ්‍රම බලකායේ ජනගහන වර්ධනය උපත් අනුපාතයට වඩා වැඩි වෙලා තිබෙන බව. මෙන්න මේ කාලය 2030 වර්ෂය වනතුරු පවතිනවා. මේ කාලය ඇතුළත තමයි, ලෝකයේ සෑම රටක්ම දුගී තත්ත්වයේ ඉඳලා, මේ ශ්‍රම බළ කායේ වේගවත් වර්ධනය පාවිච්චි කරමින් සෞභාග්‍යමත් රටක් බවට පරිවර්තනය වුණේ. අපට තව ඉතාම සුළු කාලයයි තිබෙන්නේ. 1992 ඉඳලා අපි සැලකිය යුතු කාලයක් -දශක දෙකකට අධික කාලයක්- නාස්ති කරලා තිබෙනවා. ඊළඟ දශක එකහමාර ඇතුළත විධිමත් ජනගහන ප්‍රතිපත්තියක් එක්ක අප කටයුතු කළ යුතුයි. ඒ වාගේම, මනුෂ්‍යයෙකුගේ ආයු කාලය දැන් අවුරුදු 79 දක්වා වැඩි වෙලා තිබෙන තත්ත්වය තුළ, අපේ රටේ විශ්‍රාම යන වයස පිළිබඳ තීරණයක් ගැනීමේ අවස්ථාව එළඹිලා තිබෙනවා. ඒ අනුව ඒකට අපේ පක්ෂපාතිත්වය පළ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාලවල පොදුවේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන අපි ඉතාමත් සංවේදී වෙන්නට ඕනෑ. මේ රටේ අතීතයේ ඇති වුණු බොහෝ තරුණ කැරලිවල - 1971, 1988 - 1989 සිදුවීම්වල- ආරම්භය සිද්ධ වුණේත්, උතුරේ ඇති වුණු ත්‍රස්තවාදී ක්‍රියාවලියේ ආරම්භය ඇති වුණේත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළින්ය කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. ඒ නිසා මේ විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රශ්නය පිළිබඳව මතුපිටින් පමණක් සාකච්ඡා නොකර, ගැඹුරින් සාකච්ඡා කරලා, ව්‍යුහාත්මක විසඳුම්වලියක් ලබා දීමේ අවස්ථාවට දැන් රට එළඹිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශාල පිරිසක් අවධාරණය කරන දේ තමයි, විශ්වවිද්‍යාල ප්‍රවේශයට තේරුණු 150,000කට අධික පිරිසෙන්, 125,000කට පමණ විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න අවස්ථාව නොලැබෙනවාය කියන තර්කය. ඒ නිසා පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කිරීමට, එහෙම නැත්නම් වෙනත් ආයතන හරහා කටයුතු කිරීමට නොයෙකුත් යෝජනා ලබා දීලා තිබෙනවා. මේ විශ්වවිද්‍යාල ප්‍රවේශයේ අවම කොන්දේසි මොනවාද? අවුරුදු 40ක් තිස්සේ මේ අවම කොන්දේසිය වෙනස් වෙලා නැහැ. ඒක තමයි, සාමාන්‍ය සාමර්ථ තුනක් ලබා ගැනීම. කොටින්ම කිව්වොත් "S" තුන ලබා ගැනීම. "S" තුන ලබා ගන්නවා කියන්නේ ලකුණු 35ට වැඩියෙන් විෂයයන් තුනටම ලබා ගැනීම.1992දී මේ රටේ උසස් පෙළ විභාගයෙන් "A" හතර ලබා ගත්තේ 93 දෙනායි. නමුත් 2015 උසස් පෙළ විභාගයේදී 6,329කට "A" තුන ලැබිලා තිබෙනවා. මෙයින් 140කට අධික පිරිසකට "A" තුන ලබා ගෙනත් විශ්වවිද්‍යාලයට යන්නට බැරි වෙලා තිබෙනවා. පසු ගිය අවුරුද්දට පෙර අවුරුද්දේ වාණිජ අංශයෙන් පමණක් 2,000කට අධික පිරිසකට "A" තුන ලබා ගෙනත් විශ්වවිද්‍යාලයට යන්නට බැරි වුණා. මේ උසස් ප්‍රතිඵල අපට ලැබිලා තිබෙන්නේ සමහරවිට ශිෂ්‍යයින්ගේ දක්ෂතාව නිසා වෙන්නට පුළුවන්; සමහර විට ටියුෂන් ගුරුවරුන්ගේ දක්ෂතාව නිසා වෙන්නට පුළුවන්; සමහර විට මේ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමේ කුසලතාවන් වර්ධනය වීම නිසා වෙන්නට පුළුවන්; සමහර විට අක්‍රමිකතා නිසා වෙන්නට පුළුවන්.

මම උදාහරණයක් කියන්නම්. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල සමීක්ෂණය කරන කිහිප දෙනෙකු සමඟ මම කථා කළා. බහුවරණ ප්‍රශ්න පත්‍රයට සියයට 75ක් ගන්නා ළමයින්ගෙන් විශාල පිරිසක් රචනා ප්‍රශ්න පත්‍රයට අරන් තිබෙන්නේ බින්දුවයි. එහෙම නම් එතැන පැහැදිලි ප්‍රශ්නයක්, අක්‍රමිකතාව පිළිබඳ ගැටලුවක් තිබෙනවා. ඒවා වාර්තා කිරීම සඳහා උත්තර පත්‍ර පරීක්ෂකයින් හෝ විභාග පරීක්ෂකයින් ඉදිරිපත් වෙන්නේ නැහැ. මොකද, ඉතාම සංකීර්ණ අධිකරණ ක්‍රියාදාමයක් තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මේ කාරණය ගැන මගේ යෝජනාව මෙන්න මේකයි. මේක ආණ්ඩුවේ යෝජනාවක් නොවෙයි. මගේ යෝජනාව තමයි, අපි මේක වහාම වෙනස් කරන්නට ඕනෑ කියන එක. මේ ලකුණු 35න් විශ්වවිද්‍යාලයට යන ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ. මේ අධ්‍යාපන මට්ටම අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශයට වාඩිවෙන ශිෂ්‍යයින්ගෙන් සියයට 25කට "A" සාමාර්ථ ලැබෙන අවස්ථාවක අපි තවත් "S" තුන සංකල්පයේ සිටිය යුතු නැහැ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් තිබෙන කඩ ඉම් ලකුණු ප්‍රමාණය අනිවාර්යයෙන්ම ඉහළ නංවන්නට ඕනෑ. උසස් පෙළ විභාගය සමත්වීමේ කඩ ඉම දැන් තිබෙන විධියටම පවත්වාගෙන විශ්වවිද්‍යාලයට ඇතුළුවීමේ කඩ ඉම් ලකුණු ප්‍රමාණය වැඩි කරන්නට ඕනෑ. ඒක තමයි ජාත්‍යන්තර සම්මතයත්. අඩුම ගණනේ තමන්ගේ විෂයය පද්ධතියට සාමාන්‍යයක් හැටියට ලකුණු 50ක්වත් ගන්නා අයට පමණක් විශ්වවිද්‍යාල ප්‍රවේශ තත්ත්වය ඇති කරන්නට ඕනෑ. මේක රැඩිකල් වෙනසක්. නමුත් මෙය අත්‍යවශ්‍යයෙන්ම කළ යුතුයි කියන එක මම යෝජනා කරනවා.

ඊළඟට, අවුරුදු 40ක් තිස්සේ තවමත් විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා ක්‍රියා මාර්ගයේ වෙනසක් සිද්ධ වෙලා නැහැ. මට මතකයි, අපි විශ්වවිද්‍යාලයේ ඉන්නා අවස්ථාවේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කිංස්ලි ද සිල්වා වාර්තාවක් ඉදිරිපත් කළා මේ විශ්වවිද්‍යාලවලට ගන්නා ප්‍රවේශ තත්ත්වය වෙනස් කරන්නට. ඇත්තටම කුසලතා පදනම වෙනුවට භාෂාව මත පදනම් වෙන ප්‍රමිතිකරණයක් මුලින් ආවා. එහි ඇති වුණු ප්‍රශ්න නිසා එය අවුරුදු 2යි ක්‍රියාත්මක වුණේ. ඒක නිසා තමයි දිස්ත්‍රික් පදනම යෝජනා වුණේ. 1976 සිට ඒක ක්‍රියාත්මකයි. දැන් අවුරුදු 40ක්, මොකක්ද තත්ත්වය? කුසලතා පදනමින් සියයට 40යි. දිස්ත්‍රික් පදනමින් සියයට 60යි. ඒකෙනුත් දුෂ්කර දිස්ත්‍රික් පදනම

සියයට 5යි. උදාහරණයක් හැටියට හම්බන්තොට දිස්ත්‍රික්කය දුෂ්කර දිස්ත්‍රික්කයක්. නමුත් පසු ගිය වසරේ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට යන Z-score එක ගම්පහට වඩා හම්බන්තොට වැඩියි. එහෙම නම් මේ දිස්ත්‍රික්ක තවදුරටත් දුෂ්කර දිස්ත්‍රික්ක ලෙස හඳුන්වා දෙමින් මේ quota ක්‍රමය පවත්වාගෙන යාමේ තේරුමක් නැහැ.

අවුරුදු 40ක් තුළ අපේ අධ්‍යාපනයේ විශාල වෙනසක් සිද්ධ වෙලා තිබෙනවා. අධ්‍යාපන මධ්‍යස්ථාන හැම තැනකම ඇති වෙලා තිබෙනවා. ඒක පාසල් අධ්‍යාපනයේ දියුණුව නිසා පමණක් නොවෙයි, ට්‍යුෂන් අධ්‍යාපනයේ දියුණුව නිසා. එම නිසා අනිවාර්යයෙන්ම මේ කුසලතා පදනමේ ප්‍රමාණය අපි වැඩි කරන්නට ඕනෑ. ප්‍රධාන වශයෙන් ඒක 50ට 50 තත්ත්වයටවත් ගේන්නට ඕනෑ. අනාගතයේ 70යි 30 තත්ත්වයට එන විධියට අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණයක් සිදු කළ යුතුයි. මොකද, මේ තුළ තමයි -කුසලතා පදනමේ සහ දිස්ත්‍රික් පදනමේ තිබෙන අනුපාතයේ ගැටලුව නිසා- විශාල පිරිසක් අසාධාරණයට ලක් වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කුසලතා පදනමේ සියයට 40, 70 දක්වා වැඩි කරන්නට ඕනෑ.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මුලින් 50 කරන්නට ඕනෑ. ඉන් පසුව ක්‍රමයෙන් වසර ගණනාවක් ඇතුළත 70 දක්වා වැඩි කරන්නට ඕනෑ. ඒ වාගේම මෙතැනදී ඇති වෙලා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් කථා කළා SAITM ප්‍රශ්නය ගැන. මීට දශක තුනකට කලින් අපි විශ්වවිද්‍යාලයේ ඉන්න විට මීට සමානම ප්‍රශ්නයක් පැන නැඟුණා. ඒ, උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ ගැටලුව. ඒ අවස්ථාවේදී ඒ වෛද්‍ය විද්‍යාල අරගළය සම්බන්ධ ප්‍රශ්නයේ ප්‍රධාන පාර්ශ්වකාරයෙක් හැටියට සිටි කෙනෙක් හැටියටත්, එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා සහ ස්ටැන්ලි කල්පගේ මහාචාර්යතුමා සමඟ සාකච්ඡා මාර්ගයෙන් ඒ ප්‍රශ්නය විසඳීම සඳහා සහභාගි වුණු කෙනෙක් හැටියටත් මම ඉතාම කනගාටු වෙනවා, අවුරුදු 30කට පසුව අපේ දරුවන්ටත් ඒ විධියටම ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවීම ගැන. ඇත්තටම මේ ගැටලුව මේ සමාජය විසින් නැවත ප්‍රශ්න කළ යුතු දෙයක්. අවුරුදු 30කට පසුවත් පැරණි ප්‍රශ්නය ආයෙත් ඒ විධියටම අපේ ඉස්සරහට ඇවිත්, අර විධියටම පෙළපාළි යමින්, අර විධියටම උපවාස කරමින්, අර විධියටම ගැටුම්කාරී තත්ත්වයකට ගමන් කරමින් තිබෙනවා.

මේ ප්‍රශ්නය විසඳන්න මම ඉදිරිපත් කරන යෝජනාව මෙකයි. අපි නිදහස් අධ්‍යාපනයේ වරම් ලබාගෙන මෙතැනට පැමිණි අයයි. එය මේ රටේ සිදු වුණු විප්ලවකාරී පරිවර්තනයක්. නමුත්, අද අපේ රට මැදි ආදායම් ලබන රටක් බවට පත් වෙලා තිබෙන තත්ත්වයත්, විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යයන් බඳවා ගැනීමේ දිස්ත්‍රික් පදනම නිසා කුසලතාව තිබෙන විශාල පිරිසකට අවස්ථා අහිමිවී තිබෙන තත්ත්වයත් ගැන අප සලකා බලන්න ඕනෑ.

විශේෂයෙන්ම වෛද්‍ය පීඨය සම්බන්ධයෙන් බැලුවොත්, පසු ගිය වසරේ කුසලතා පදනම මත "Z" ලකුණු ප්‍රමාණය වැඩි, විශ්වවිද්‍යාලයට යෑමට නොහැකි වුණු දහසකට ආසන්න පිරිසක් හිටියා. ඒ අයගේ ලකුණු වැඩියි විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට තේරුණු, අවසාන ලකුණ තිබෙන එක්කෙනාට වඩා. එතකොට මේ දහසක පිරිසකගේ ප්‍රශ්නයට විසඳුම මොකක්ද? ඒක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා මගේ හැඟීම නම්, දිස්ත්‍රික් පදනම නිසා මේ "Z" ලකුණු ප්‍රමාණය අහිමි වන දරුවන්ට මුදල් ගෙවා රජයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළම අධ්‍යාපනය ලබන්න වහාම ඉඩකඩ සලසා දිය යුතුය කියන එකයි. වෛද්‍ය, ඉංජිනේරු ක්ෂේත්‍රවලට තමයි මේ ප්‍රශ්නය තදින් බලපාන්නේ. වෛද්‍ය පීඨයෙන් වෛද්‍යවරයෙක් බිහි කරන්න අද අවුරුදු පහටම ලක්ෂ 30කට ආසන්න මුදලක් තමයි වැය වන්නේ. හැබැයි, පෞද්ගලික විශ්වවිද්‍යාලයකට ඒ සඳහා රුපියල් ලක්ෂ 120ක් ගෙවන්න ඕනෑ. එහෙම නම්, අපි දරුවන්ට අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒ අනුව, ඒ වෛද්‍ය පීඨය තුළටම තවත් අමතර පිරිසක් බඳවා ගන්න ඕනෑ. ඒ අයට රජයේ රැකියා දෙනවා කියා ස්ථිරතාවක් නැහැ. ඒ අයට මුදල් ගෙවා වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාව ලබාදිය යුතුයි කියා මා යෝජනා කරනවා. මේ අලුත් තත්ත්වය මත එහෙම දෙයක් කරන්න වෙනවා. ඒ හරහා උසස් අධ්‍යාපනයට කිසිම බාධාවක් වන්නේ නැහැ. මොකද, මේ විධියට බඳවා ගන්නා පිරිස අනිවාර්යයෙන්ම විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨයට යා යුතු පිරිසක්. නමුත් දිස්ත්‍රික් පදනම නිසා ඒ අයට ඒ අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. අපට මේ ප්‍රශ්නය මඟ ඇරලා යන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනයේ පරමාර්ථය මොකක්ද කියන එකත් මේ අවස්ථාවේදී මා කියන්න ඕනෑ. අධ්‍යාපනය නොමිලේ ආචාර්ය උපාධිය දක්වා ලබාදිය යුතුයි කියන අදහස, මතය තමයි නිදහස් අධ්‍යාපනය නමින් ස්ථාපිත වෙලා තිබෙන්නේ. එය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඇතුළු ඒ ප්‍රගතිශීලී පිරිස් විසින් මේ රට ඇතුළේ ගත්ත විප්ලවකාරී පියවරක්. හැබැයි, මධ්‍ය ආදායම් ලබන රටක් බවට අප පරිවර්තනය වෙනවාත් එක්ක, ලෝකයේ ඇති වෙලා තිබෙන අලුත් අධ්‍යාපනික ප්‍රවණතා, විශේෂයෙන්ම නවෝත්පාදනය ඇතුළු ක්‍රියාවලියත් එක්ක, අධ්‍යාපනය ඊට වඩා පුළුල් තාක්ෂණික ක්ෂේත්‍රයකට ගෙන යෑම ගැන අපට දැන් සිතන්න සිද්ධ වෙලා තිබෙනවා. එතැන මූලික ප්‍රතිපත්තිය විය යුත්තේ අධ්‍යාපනය - විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය- ලාභ උපයන ව්‍යාපාරයක් විය යුතු නැහැ කියන එකයි.

ලෝකයේ සියලුම විශ්වවිද්‍යාලවල ප්‍රධාන මට්ටමේ ranking ඊයේ පළ වුණා. එහි පළමුවන ස්ථානයට පත් වෙලා තිබෙන්නේ බ්‍රිතාන්‍යයේ Oxford විශ්වවිද්‍යාලය. එම ලැයිස්තුවේ පළමුවැනි විශ්වවිද්‍යාල විස්ස ගත්තාම, ඒ විස්සම රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලත් එක්ක බැලුවාම ලාභ උපයන විශ්වවිද්‍යාල නොවෙයි. ඒ පළමුවැනි විශ්වවිද්‍යාල විස්සම ලාභ උපයන්නේ නැති, එක්කෝ සමූහ විසින්, නැත්නම් Trust විසින් පවත්වා ගෙන යන ඒවා. ඒ විශ්වවිද්‍යාල විස්සම තිබෙන්නේ බටහිර රටවල. එහෙම නම් අපිත් මේ ආදර්ශය ගන්න ඕනෑ. ලාභ ඉපැයීම සඳහා උසස් අධ්‍යාපනය කැප කළොත් මොකද වන්නේ? එහි ගුණාත්මකභාවය විනාශ වෙනවා විතරක් නොවෙයි, ආර්ථික උපාය මාර්ගයකට අනුකූලව අපට විශ්වවිද්‍යාල පද්ධතිය හැසිරවීමට තිබෙන හැකියාවත් නතර වෙනවා.

ඊළඟ කාරණය, මේ SAITM එකේ ප්‍රශ්නයයි. දැන් මේ ප්‍රශ්නයට තව තවත් දිගු වෙමින් ඉදිරියට යන්න දෙන්න බැහැ. මෙය ශිෂ්‍ය ජීවිත එකක් දෙකක්, තුනක්, හතරක් හෝ ඊට වැඩි ගණනක් බිලිගෙන ඉදිරියට යෑමට ඉඩ දෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේ විධියේ ප්‍රශ්නයක් පිළිබඳව අපේ සමාජයේ මීට අවුරුදු 30කට කලිනුත් කතිකාවතක් තිබුණා; දැනුත් කතිකාවතක් ඇති වෙලා තිබෙනවා. මේ විශ්වවිද්‍යාලයේ තවත් පීඨ ගණනාවක් තිබෙනවා. නමුත්, ඒවා පිළිබඳ ප්‍රශ්න පැන නැඟිලා නැහැ. මේ වෛද්‍ය පීඨයේ ප්‍රශ්නයට තමයි වෛද්‍ය සභාව තරයේ විරුද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මෙම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට සිසුන් බඳවා ගැනීම අපි වහාම නතර කළ යුතුයි. එයයි මගේ යෝජනාව. දැනුත් මෙම පීඨයේ සිසුන් 1,200ක් ඉන්නවා.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

අවුරුද්දක් පතා 100, 150 ගණනින් වැඩි කර කර, ඒ දරුවන්ගේ අනාගතයත් අවුල් කරමින්, මේ ප්‍රශ්නය තවත් සංකීර්ණ කළ යුතු නැහැ. ඒ නිසා අපි මෙම පීඨයට සිසුන් බඳවා ගැනීම වහාම නතර කළ යුතුයි.

දෙවනුව, අපි කිසියම් ආකාරයකට නිශ්චිත විශේෂඥ කණ්ඩායමක්, වෛද්‍ය මණ්ඩලයක් පාවිච්චි කරලා, මේ ඇතුළු වෙලා ඉන්න 1,200ක පිරිස අතරේ සුදුසුකම් විරහිතව ඇතුළු වෙලා ඉන්න පිරිසක් ඉන්නවා නම් -එහෙම චෝදනා තිබෙනවා - ඒ පිරිස් ඉවත් කරන්න ඕනෑ. විදේශ විශ්වවිද්‍යාලවල ඉගෙන ගත්ත අයට ලංකාවේ වෛද්‍යවරයෙකු ලෙස ලියා පදිංචි වීම සඳහා වෛද්‍ය සභාව විසින් අනුමත කර ඇති Act 16 විභාගයට මුහුණ දෙන්න වනවා. -දැන් ඒ විභාගයේ නම වෙනස් කර තිබෙනවා- මේ ශිෂ්‍යයන්ටත් ඒ විභාගයට ඉදිරිපත් වෙන්න සලස්වලා, මේ රටේ වෛද්‍යවරු හැටියට පුහුණුව ලබාගෙන ඉදිරියට යන්න අවස්ථාව ලබා දිය යුතුයි.

සයිටම් ආයතනය මොරටුව විශ්වවිද්‍යාලයට භාර දෙනවාද, එහෙම නැත්නම් ස්වායත්තව කරගෙන යනවාද කියන එක නොවෙයි වැදගත්. අනිවාර්යයෙන්ම මේ ආයතනය රජයේ නියාමනයට යටත් විය යුතුයි. වෛද්‍ය සභාවක් පිහිටුවලා තිබෙන්නේ, වෛද්‍ය ක්ෂේත්‍රයේ නියාමනය සඳහායි. ඒ නියාමනයට අනිවාර්යයෙන්ම මේ ආයතනය යටත් විය යුතුයි. මෙය පමණක් නොවෙයි. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයත් ඒකට අනිවාර්යයෙන්ම නතු විය යුතුයි. එසේ නැතුව සමාජ සාධාරණත්වය විශ්වාසය, මේ සමාජය තුළ අපට ඇති කරන්න බැහැ. අප දන්නවා, කවුරු කැමැති වුණත්, අකැමැති වුණත් අද අධ්‍යාපනයේ පරමාර්ථය, එක්කෝ වෛද්‍යවරයෙක් වීම. නැත්නම් ඉංජිනේරුවෙක් වීම බව. අපට තිබෙන අත්දැකීම ඒකයි. ඒ නිසා මේ ප්‍රශ්නය ඔඩු දුවන්න නොදී වහාම විසඳිය යුතුයි. ඒ සඳහා දිගු කාලීන විසඳුමක් විධියට මා යෝජනා කරනවා, ඒ අවස්ථා අහිමි වන කුසලතා සහිත ශිෂ්‍යයන්ට රාජ්‍ය විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවලට මුදල් ගෙවා අධ්‍යාපන කටයුතු කර ගැනීමට දිස්ත්‍රික් පදනමින් අවස්ථාව දෙන ගමන් මේ ආයතනය සම්බන්ධයෙන් නිශ්චිත තීන්දුවක් අරගෙන මේ ප්‍රශ්නය විසඳීමට කටයුතු කළ යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය එක්ක ඇදිවිච්ච තවත් ප්‍රශ්නයක් තමයි, ජාත්‍යන්තර පාසල් කියන එක. ඇත්තටම ලෝකයේ ජාත්‍යන්තර පාසල් කියලා දෙයක් තිබෙන එකම රට, මේ රට. ජාත්‍යන්තර පාඨමාලාවක් ඉගෙන ගන්න මේ රටේ දේශීය දරුවෙකුට කිසිම අවශ්‍යතාවක් නැහැ. අපේ 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතට අනුව මේ රටේ පෞද්ගලික පාසල් පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා තමයි සමාගම් පනත යටතේ මේ ජාත්‍යන්තර පාසල් පිහිටුවලා තිබෙන්නේ. අපි වහාම මේ පිළිබඳව කටයුතු කරලා, පළමුව ඒ දරුවන්ට අවස්ථාව දෙන්න ඕනෑ දේශීය විෂය ධාරාව ඉගෙන ගන්න. මොකද, 2014දී මේ සම්බන්ධ ප්‍රශ්නයක් පැන නැඟුණා. ජාත්‍යන්තර පාසල්වලට ඇතුළු කරන දරුවන් විභාග ලියන්න ආණ්ඩුවේ පාසලට ගන්න එපා කියලා, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් නිකුත් කළා. ඒ ගැන අධ්‍යාපන අමාත්‍යාංශයට දොස් කියන්න බැහැ. මොකද, ඒ පනත යටතේ උපකෘත පාසල් අපේ විෂය මාලා හදාරලා නැති නිසා. ඒකෙන් සෑහෙන දරුවන් පිරිසක් අපහසුතාවට පත් වුණා. මේ ජාත්‍යන්තර පාසල් කියන්නේ ළමයින් 4 - 5දෙනෙකු හෝ දෙතුන් සියයක් යන ඒවා නොවෙයි.

අද අපේ පාසල් පද්ධතියේ ළමුන් හතළිස්ලක්ෂයක් ඉන්නකොට, කිසිම ප්‍රමිතියකින් තොර ජාත්‍යන්තර පාසල් පද්ධතියේ ළමුන් හාරලක්ෂයක් ඉන්නවා. ඒ නිසා පළමුව මේ පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයට අරගෙන නියාමනය කරලා, ප්‍රමිතිය උසස් කරලා පෞද්ගලික පාසල් හැටියට පවත්වාගෙන ගියාට ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම, කවුරු හෝ එංගලන්තයේ විෂය මාලාව ඉගෙන ගන්නවා නම්, Cambridge curriculum එක කරගෙන යන අය ඉන්නවා නම්, ඒ අය ඒ අනතුර භාරගෙන කටයුතු කළ යුතුයි. ඒ අයට රටේ පාසල්වලට ඇතුළු වෙන්න හෝ රටේ විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න අවස්ථාවක් ලබා දිය යුතු නැහැ. ඒ නිසා ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් විධිමත් නියාමනයක් කරලා, ඒවා පෞද්ගලික පාසල් හැටියට අපේ පාසල් පද්ධතියට ඇතුළු කර ගන්න විප්ලවකාරී පරිවර්තනයක් කළ යුතු අවස්ථාව දැන් එළඹිලා තිබෙන බවත් කියන්න ඕනෑ.

ඊළඟට රාජ්‍ය විශ්වවිද්‍යාලවල මුදල් අය කර ඉගැන්වීමේ ක්‍රියාදාමයත් ඇති කරලා, ඒවාට මේ පෞද්ගලික පාසල්වල දරුවන්ටත්, විදේශීය සිසුන්ටත් ඇතුළු වන්න අවස්ථාව ලබා දිය යුතුයි. මේ රටේ පිහිටීම සහ අවස්ථා අනුව අපට තිබෙන විශාල වෙළෙඳ පොළක් තමයි, අධ්‍යාපනය. ඒ වෙළෙඳ පොළ අපි විවෘත කරන්න ඕනෑ. විශේෂයෙන්ම අප්‍රිකාව වාගේම නැගෙනහිර ආසියානු රටවල් අතරේ ලංකාවේ අධ්‍යාපනය ගැන, එහි තත්ත්වය ගැන විශාල පිළිගැනීමක් තිබෙනවා. ඒ නිසා ඒ අයට ඒ අවස්ථාව ලබා දිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන විශ්ලේෂණයක් කරපු විද්වතකු වන අපේ අනුරුද්ධ ප්‍රදීප් මැතිතුමාගේ ගණන් හැදීමකට අනුව ශිෂ්‍ය ප්‍රමාණයෙන් සියයට 17ක් පමණක් මුදල් ගෙවා ඇතුළු කළොත්, ඒ මුදලින් මුළු උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේම ප්‍රාග්ධන වියදම පියවා ගැනීමට හැකියාව ලැබෙනවා. ඒ තුළින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අලුත් පරිවර්තනයක් ඇති කර ගැනීමටත් අපට හැකියාව ලැබෙනවා. ඒ නිසා අපේ පාඨමාලා වෙනස් විය යුතුයි. විශේෂයෙන්ම කලා පාඨමාලාවට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණයේ අඩු කිරීමක් කරලා, ඒවා රැකියා උපදවා ගත හැකි ක්ෂේත්‍ර කරා යොමු කරවිය යුතුයි. කළමනාකරණ විෂයට, ඒ වාගේම තාක්ෂණ විෂයන් වෙතට යොමු කිරීමක් කරලා අධ්‍යාපනයේ පූර්ණ වෙනසක් අපි ඇති කළ යුතුයි. එහෙම නැත්නම්, එදා අවුරුදු 18, 20 තරුණ තරුණියන් අතින් සිදු වුණා වාගේ කැරලිකාරී තත්ත්වයක් නැවත මේ රටේ ඇති වෙලා, නැවත වතාවක් ලේ වැගිරීම්වලට පාර කැපෙන එක විතරයි වෙන්නේ. ඒ නිසා ඒ වියරු, බිහිසුණු අත් දැකීම් සහිත සමාජය යළිත් ඇති නොවෙන්න උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේත්, පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේත් විප්ලවකාරී වෙනසකට අප සියලුම දෙනාම පක්ෂ, පාට භේදයෙන් තොරව එකඟ විය යුතු යුගය එළඹිලා තිබෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

[අ.භා. 2.21]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර ගණනාවක් තිස්සේ අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය කළ ඉල්ලීමක් ඉෂ්ට කරන්නට ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ගෙන එමින් දක්වන ලද උත්සාහය අපි

අගය කරනවා. විශේෂයෙන්ම ඔවුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව දීර්ඝ කිරීම සඳහා දරන උත්සාහය ගැන. ගරු චම්පික රණවක ඇමතිතුමාත් ප්‍රකාශ කළ පරිදිම අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියම සමස්ත දියුණුවක් කරා ගමන් කරන්න අවශ්‍ය ක්‍රමවේදයකට පිවිසීමේ අවශ්‍යතාව වඩ වඩාත් දැනෙනවා. මීට වසර කීපයකට ඉස්සෙල්ලා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අලුත් පෙරළියක් ඇති කරමින් උසස් පෙළ විෂය ධාරාවට තාක්ෂණවේදය විෂය හඳුන්වා දුන්නා. දැනට වසර 500කට පෙර අධ්‍යාපනයේ පුනරුදය පිළිබඳව ෆ්‍රැන්සිස් බේකන් කරපු ප්‍රකාශයට ශාස්ත්‍රීය සහ ශිල්පීය සම්ප්‍රදායන් එකතු කරමින් අධ්‍යාපනය අලුත් සංවර්ධනයක් කරා ගමන් ගන්න ඕනෑ කියන චින්තනය ක්‍රියාත්මක කරන්න අපේ රටේ අවුරුදු 500ක් ගතවුණා. ඒ නිසා තමයි තාක්ෂණවේදය හඳුන්වා දුන්නේ. තාක්ෂණවේදය හඳුන්වා දෙද්දී පොරොන්දු වුණා, තාක්ෂණික පීඨ දිස්ත්‍රික්ක මට්ටමින් ඇති කරනවා කියලා. අද අපේ ගරු ඇමතිතුමා වාගේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත් ඒකට නිහඬයි. අද දිස්ත්‍රික්ක මට්ටමින් එවැනි තාක්ෂණික පීඨ සඳහා සිසුන් ඇතුළත් කර ගන්නේ නැහැ. ඒ වාගේම විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ප්‍රමාණය ඔබතුමන්ලා භෞතික වශයෙන් වැඩි කරලා තිබෙන බව අපි දන්නවා. ඔබතුමන්ලා ගිය වසරට සාපේක්ෂව මේ වසරේදී විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා වූ සිසුන් ප්‍රමාණය 2,208කින් වැඩි කරලා තිබෙන බව අපි පිළිගන්නවා. නමුත් මේ වැඩි කරපු ප්‍රමාණය සැලකිල්ලට ගත්තොත්, තාක්ෂණවේදය සඳහා අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අලුත් පුනරුදයක් ඇති කිරීම සඳහා හඳුන්වා දුන් ක්‍රමවේදයට සැලකිය යුතු ප්‍රතිශතයක් වැඩි කරලා නැහැයි කියන එකයි ප්‍රකාශ කරන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේ අවුරුද්දේ තාක්ෂණික පීඨ 5ක් ආරම්භ කරලා අපි ළමයින් 1,800ක් බඳවා ගන්නවා, ගරු මන්ත්‍රීතුමා. අපි පළමුවැනි වතාවට මේ අවුරුද්දේ තාක්ෂණික පීඨ 5ක් ආරම්භ කරලා, ළමයින් 1,800ක් බඳවා ගන්නවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

තාක්ෂණික පීඨ 24ක් ගොඩනැගීම සඳහා ක්‍රමවේදයක් පසු ගිය රජය ආරම්භ කළා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

තාක්ෂණික පීඨ 5ක් ආරම්භ කරලා අපි ඒක ඉස්සරහට කරගෙන යනවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

හොඳයි. ඒ සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. බොහෝම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ-පෙරේදා ගරු අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශ කළා, සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල උසස් පෙළ අධ්‍යයනය සඳහා අවශ්‍ය වෙන්නේ නැහැ කියලා. මේක අපේ රටේ විශාල අවිනිශ්චිතතාවක් ඇති කරන ප්‍රශ්නයක්. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උසස් පෙළ සාමාර්ථය වාගේම සාමාන්‍ය පෙළ ප්‍රතිඵලත් අත්‍යවශ්‍යයි. ඒ නිසා මේ නිර්දේශයත් එක්ක එක පැත්තකින් උසස් පෙළ විභාගයට මුහුණ දෙන ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ඉල්ලුම්කරණය සම්බන්ධයෙන් ගැටලු මතු වෙනවා. ඒක පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය, විශේෂයෙන්ම රජයේ රැකියා සම්බන්ධයෙන් චක්‍රලේඛයක් තිබෙන බව අපි දන්නවා. රජයේ රැකියාවන් ලබා දීමේදී අපොස සාමාන්‍ය පෙළ සමත්වීම අවශ්‍යයි කියලා නියම කරලා තිබෙනවා. ඒ අනුව සාමාන්‍ය පෙළ විභාගය සමත් නොවී උසස් පෙළ අධ්‍යයනය කරන බොහෝ පිරිසකට මතු ආත්මෙකටවත් රජයේ රැකියාවක් ලබාගැනීමේ අවස්ථාව අහිමි කරනවා. එක පැත්තකින් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප කප්පාදු කරනවා. තව පැත්තකින් සාමාන්‍ය පෙළ අධ්‍යාපනය ලබන දරුවාගේ මනසට වෙන දෙයක් යොමු කරලා, ඔවුන්ව රාජ්‍ය සේවයට එක්වීම සඳහා තිබෙන පහසුකම අවම කරනවා. ඉදිරි කාලයේ දී රාජ්‍ය සේවයේ කරන්න හදන කප්පාදුව සඳහා ගෙන යන්නා වූ වැඩ පිළිවෙළෙහි එක් අංගයක් විධියටයි අපි එය දකින්නේ. ඉන්දියාවේ ගුණාත්මකභාවයෙන් තොර උපාධි ලබා ගත් ඕනෑ තරම් පිරිස් ඉන්නවා. නමුත් අපේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබපු පිරිස් ගුණාත්මකභාවයකින් යුතු උපාධි ලබා ගත්, ඒ වාගේම අධ්‍යායන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ කාර්යක් ඉෂ්ට කරන අය බව අප දන්නවා. ඒ නිසා ගුණාත්මකභාවයෙන් තොර කණ්ඩායමක් බිහි කිරීමේ කටයුත්ත තමයි මේ සිදු කරන්න යන්නේ කියන කාරණය අපට ඉතාම හොඳින් පැහැදිලි වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු කෙරෙහි මගේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් බිහිවන වෛද්‍යවරුන් වැනි අය රට හැර යාම පිළිබඳව එතුමා සඳහන් කළා. ඒ වාගේම, ගරු අධ්‍යාපන ඇමතිතුමා පසු ගිය දවස් දෙක තුළ ඉතා දැඩි ලෙස රජයේ වෛද්‍යවරුන්ගේ සංගමයට බරපතළ ලෙස නින්දා-අපහාස කළා. පෞද්ගලිකවම එම සංගමයේ සාමාජිකයන්ව අපහාසයට-උපහාසයට ලක් කළා. ගෞරවාන්විතව විවිධ වාත්තීන්වල යෙදෙන අය ඉන්න බව අප දන්නවා. විනිශ්චයකාරවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, එහෙමත් නැත්නම් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ආචාර්ය, මහාචාර්ය, කථිකාචාර්යවරුන්ට විශේෂ ක්‍රමවේදයක් සකසා තිබෙන්නේ, ඔවුන්ගේ දරුවා උසස් යැයි සම්මත පාසලකට දැමීම පමණක්ම අරමුණු කරගෙන නොවෙයි.

විශේෂයෙන්ම ඒ අය පිට රටවල රැකියාවලට යන එක වැළැක්වීමේ පියවරක් විධියට තමයි මේ කටයුත්ත සිදු කරන්නේ. එම නිසා වෛද්‍යවරුන්ගේ දරුවන්ට නිසි පාසලක් ලැබුණේ නැත්නම්, "අපට හොඳ රස්සාවක් තිබෙනවා. පිට රට රැකියාවකට ගියොත් මීටත් වඩා වැටුප් ලැබෙනවා. ඒ නිසා පවුල පිටින්ම පිට රට යමු" කියන අදහසක් මනසෙහි ඇති වෙනවා. ඒ නිසා අධ්‍යාපන ඇමතිවරයා මේ විධියට පෞද්ගලික වශයෙන් ඔවුන්ට බැණ වැදීම වෛද්‍යවරුන්ට බරපතළ ගැටලුවක්. තව පැත්තකින්, ඉන්දියාව සමඟ අත්සන් කරන්නට යන ETCA ගිවිසුමට විරුද්ධව රජයේ වෛද්‍යවරු අරගළයක් ගෙන යන බව අපි දන්නවා. මාලබේ වෛද්‍ය විද්‍යාලය සම්බන්ධයෙනුත් ඔවුන්ගේ උද්ඝෝෂණයක් තිබෙනවා. ඉතින්, මෙවැනි ප්‍රශ්න තිබියදී තමයි අධ්‍යාපන ඇමතිවරයා වෛද්‍යවරුන් එක්ක පැටලෙන්න උත්සාහ කරන්නේ. එම නිසා අපේ විශ්වවිද්‍යාල පද්ධතියෙන් ගුණාත්මක උසස් අධ්‍යාපනයක් ලබපු පුද්ගලයන්ට මෙවැනි ආකාරයෙන් මඩ ගැසීම පිළිබඳව අපි බරපතළ ලෙස කනගාටුවට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මතු කරන්නට ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. මෑත කාලයේ දී අපේ රටේ නොයෙකුත් ක්ෂේත්‍රවල අධ්‍යාපනය ලබපු, ගෞරවාන්විතව ජීවත් වුණු බොහෝ පිරිසක් අද හොරු, මංකොල්ලකාරයන් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. එම නිසා අද අපේ විශ්වවිද්‍යාලවලින් ගුණාත්මක අධ්‍යාපනයක් ලබන තැනැත්තකු ඉදිරි කාල පරිච්ඡේදයේ දී රජයේ තනතුරක් හෝ රජයේ පරිපාලන සේවයේ තනතුරක් හෝ ලබා ගනියි කියලා මම හිතන්නේ නැහැ. අද අපේ රට ඒ තත්ත්වයට පරිවර්තනය වෙලා තිබෙනවා.

[ගරු සිසිර ජයකොඩි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිව යුතුම කාරණයක් තිබෙනවා. සෑම වෘත්තියකම ගැටලු ඇති කරලා තිබෙන්නේ, වෘත්තීය වශයෙන් සුදුසුකම්ලාභී නැනැත්තන්. මේ කාරණය පිළිබඳව ඊයේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයට ගැනීමට නියමිතව තිබුණා. රේගු නිලධාරීන්, පරිපාලන විභාගය කරපු අය සිටිනවා. බොහෝ දෙනෙක් උපාධිධාරීන්. අද ඒ සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මුදල් ඇමතිවරයාගේ ඇතැම් අත්තනෝමතික ක්‍රියාමාර්ග නිසා අද දේශීය ආදායම් බදු නිලධාරීන්, විගණන නිලධාරීන් උද්ඝෝෂණය කරන්න පටන් ගෙන තිබෙනවා. ඉංජිනේරු ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ලැබූ අයට පනවන්නට යන ආචාර්ය ධර්ම යැයි කියා ගන්නා ඇතැම් දේවල්, මෙවැනි තත්ත්වයන් නිසා මේ රටේ වෘත්තිකයන් බරපතළ අපහසුතාවකට පත් කරපු අවස්ථාවක් බවට පත් වෙලා තිබෙනවා.

අපේ විශ්වවිද්‍යාල පද්ධතිය අපේ රටට ලබා දුන් දායාදයි. විශ්වවිද්‍යාල පද්ධතිය ලබා දුන් ඒ දායාදවලට අද කර තිබෙන දේ බලන්න. විගණකවරුන් වේවා, ඉංජිනේරුවන් වේවා, වෛද්‍යවරුන් වේවා, ඒ සියලු වෘත්තිකයෝ -ඒ සියලු ක්ෂේත්‍රවල අය- අද රජයත් එක්ක පඹ ගාලක පැටලිලායි ඉන්නේ. ඇතැම් විට, මුදල් ඇමතිවරයා ගන්නා අත්තනෝමතික ක්‍රියා මාර්ගවලට විරුද්ධව ඒ සෑම ක්ෂේත්‍රයකම පිරිස් උද්ඝෝෂණ ව්‍යාපාරවල පැටලිලායි ඉන්නේ. ඒ නිසා අවුල් ජාලයක් රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ තිබෙන මේ ප්‍රශ්න සම්බන්ධයෙන් මධ්‍යස්ථ මතයක් දරන්න විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මැදිහත් වන්න ඕනෑ කියන කාරණය අපි මේ ගරු සභාවේ අවධානයට යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා බොහොම අකමැති කාරණයක් තිබෙනවා. අකමැති වුණත් එය කිව යුතු කාරණයක්ය කියා මම විශ්වාස කරනවා. ඒ තමයි, විශ්වවිද්‍යාල පරිපාලකයන් ප්‍රදේශ වශයෙන්, ගෝත්‍ර වශයෙන් වෙනස්ව කටයුතු කිරීම. ඒ ගැන බොහොම කනගාටුයි. නවක වදය හා සම්බන්ධ සිද්ධියක් කැලණිය විශ්වවිද්‍යාලයේ සිදු වුණු බව අපි දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහිදී නවක වදය තහනම් කිරීමට අදාළ පනත යටතේ ගොනු කරපු නඩුවෙහි ශිෂ්‍යයන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයකු විධියට මා ඉතා වගකීමෙනුයි මේ කාරණය කියන්නේ.

නවක වදය තහනම් කිරීමට අදාළ පනත යටතේ ශිෂ්‍යාවන් දෙදෙනෙකු අත් අඩංගුවට ගෙන තිබුණා, තවත් ශිෂ්‍යයන් ගණනාවක් එක්ක. "නංගි, ඔය ඇඳුම ඇඳගෙන එන්න එපා" කියා දුරකථන ඇමතුමක් දුන්න එක විතරයි ඒ අය කරලා තිබෙන්නේ. ඒ අය මාස තුනක් මහර රිමාන්ඩ් බන්ධනාගාරගතව සිට තිබුණා. එය, දුරකථන ඇමතුමක් නිසා වූ දෙයක්. ඒ විශ්වවිද්‍යාල පරිපාලනය පොලීසියට සෘජු බලපෑම් කළා. විශ්වවිද්‍යාල පරිපාලනය ඒ ශිෂ්‍යයන් සම්බන්ධයෙන් කටයුතු කරපු විධිය එහෙමයි. නමුත් යාපනය විශ්වවිද්‍යාලයේදී සංස්කෘතික අංගයක් නිරූපණය කරපු ශිෂ්‍යයන්ට එහි දෙමළ ශිෂ්‍යයන් විසින් පහර දීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පරිපාලනය කටයුතු කළේ කොහොමද කියා අපි දන්නවා. ඒ නිසා විශ්වවිද්‍යාල පරිපාලනය ශිෂ්‍යයන් සමඟ කරන ගනුදෙනුවලදී -ශිෂ්‍යයන් සම්බන්ධ ප්‍රශ්නවලදී- ඊට වඩා ප්‍රවේසම් වන්න ඕනෑ, බොහොම මධ්‍යස්ථව මැදිහත් වන්න ඕනෑ කියන කාරණය පෙන්වා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විශ්වවිද්‍යාල වරම් නොලබන ශිෂ්‍යයන් අතිවිශාල ප්‍රමාණයක් ඉන්නවා. එසේ වුවත්, අද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව චක්‍රලේඛනයක් නිකුත් කර තිබෙනවා, බාහිර උපාධි සඳහා බඳවාගන්නා ශිෂ්‍ය ප්‍රමාණය අඩු කරන්න කියා. මේ තිබෙන්නේ ඒ චක්‍රලේඛනයයි. එක් පැත්තකින් පෙන්වනවා, විශ්වවිද්‍යාලවලට ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය 2,000කින් වැඩි කරනවා කියා. එසේ කියන ගමන්, බාහිර උපාධිවලට ලියා පදිංචි වන ශිෂ්‍ය ප්‍රමාණය අඩු කිරීම සඳහා වූ චක්‍ර ලේඛනයක් නිකුත් කරනවා. ඒ නිසා අපොස (උසස් පෙළ) සමත් වන, උපාධි සිහිනයක් තිබෙන, රජයේ රැකියාවකට -යම් වෘත්තියකට- පිවිසීමේ ඉලක්කයක් තිබෙන විශාල පිරිසකට - අතිමහත් පිරිසකට- මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් වන්න බැරි වෙනවා, ඒ සඳහා වූ බලාපොරොත්තු අහිමි වනවා. ඒ නිසා මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරන්න ඕනෑ. ඒ සඳහා ප්‍රායෝගික ගැටලු තිබෙන බව අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් අලුත් ක්‍රමවේදයක් ගොඩ නඟන්න ඕනෑ. 'ඒ ඔස්සේ අපේ රටේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා කැප වෙමු.' කියන ආයාචනය මා කරනවා. ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

[අ.භා. 2.35]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සාකච්ඡාව පැවැත්වෙන අද දිනය ඉතාම වැදගත්. විශ්වවිද්‍යාලවල වැඩ කරන උදවියට වයස අවුරුදු 60 දක්වා-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර නිශ්ශබ්ද වන්න. කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදය සිදු කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ඒ යටතේ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින්ගේ සේවා කාලය වසර 60 දක්වා දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව, ඉතාම වැදගත් යෝජනාවක් කියා මා සඳහන් කරනවා. ඒ සම්බන්ධයෙන් අපි ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. මොකද, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල සේවකයන්ගේ වයස අවුරුදු පනස්පහ වුණාම වසරෙන්, වසර ඒ අයගේ සේවා කාලය දිගු කිරීමේ අවශ්‍යතාවක් මේ වනතෙක් තිබුණා. නමුත් ඔවුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාවත් අවුරුදු හැට දක්වා කෙළින්ම දිගු කිරීම තුළින් එම සේවකයන්ට තිබුණු එම අපහසුතාව මඟ හැරී යාම ඉතාම හොඳ දෙයක් කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙනකොට අපේ රටේ ජනතාවගේ ආයු කාලය වසර හැත්තෑනවය දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා සේවකයෙකුට, විශේෂයෙන්ම විශ්වවිද්‍යාලයක් වාගේ ආයතනයක සේවය කරන සේවකයෙකුට වයස අවුරුදු හැටක් වනතෙක් තම සේවාව ඉටු කිරීම එතරම් අපහසු කාර්යයක් නොවන බව විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල ගැන කථා කිරීමේදී අපට කරුණු-කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. අද වනවිට උසස් පෙළ විභාගය සඳහා වසරකට ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දෙලක්ෂ ගණනක් ඉදිරිපත් වෙනවා. එයින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා එක්ලක්ෂ පනස්දහසකට ආසන්න ප්‍රමාණයක් සුදුසුකම් ලබනවා. නමුත් අපේ රටේ තිබෙන විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත්වීමට අවස්ථාව ලැබෙන්නේ එයින් විසිපන්දහසක් වාගේ ප්‍රමාණයකටයි. ප්‍රතිශතයක් වශයෙන් බැලුවොත්, සියයට පහළොවකට වඩා පොඩ්ඩක් වැඩි ප්‍රමාණයක් තමයි ඒ අවස්ථාව උදා කර ගන්නේ. මෙතැනදී අපි කල්පනා කළ යුතු දෙයක් තිබෙනවා. අද වනවිට එසේ සුදුසුකම් ලබා විශ්වවිද්‍යාලයකට ඇතුළත් වෙන්න බැරුව, එම බලාපොරොත්තු තබා ගෙන සිටින සියයට අසූවකට වැඩි ප්‍රමාණයක් වන දරුවන් - ශිෂ්‍යයන්- එතැනින් එහාට යන මාර්ගය මොකක්ද කියන එක ගැන අපි විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ.

අද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ගණනාවක් ඇති වෙලා තිබෙන බව අපි දන්නවා. පෞද්ගලික අංශය එසේ කටයුතු කිරීම වරදක් හැටියට අපි සලකන්නේ නැහැ. නමුත් මෙම ආයතන නියමානුකූල ප්‍රමිතියකින් යුතුව කටයුතු කරනවාද කියන එක ගැන සොයා බලන්න ඕනෑ. මොකද, එවැනි ආයතන ගණනාවක් විශාල වශයෙන් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා එම ආයතන නියම ප්‍රමිතියකට අනුව එම කටයුතු ඉටු කරනවාද කියා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉතාම උනන්දුවෙන් සොයා බැලිය යුතු කාලය හොඳටම ඇවිත් තිබෙනවා කියන එක මම මතක් කරන්න ඕනෑ. අද රජයේ විශ්වවිද්‍යාලවලට යන්න බැරි වෙන ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සිටින බව අප දන්නවා. ඒ වාගේම පෞද්ගලික අංශයෙන් නොයෙක් ආයතන ගණනාවක් උපාධි ලබා දීම සඳහා ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් වෛද්‍ය විද්‍යාලයට ඇතුළත්වීමට නොහැකි වෙන දරුවන්ට තමයි විශාල අසාධාරණයක් සිදු වෙලා තිබෙන්නේ කියා මා හිතනවා. මෙහිදී SAITM එකද එහෙම නැත්නම් වෙනත් ආයතනයක්ද කියන එක නොවෙයි, ප්‍රශ්නය වන්නේ. අපි ඒ අයටත් අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ. මොකද, අද එවැනි දරුවන් විශාල ප්‍රමාණයක් හා එම දරුවන්ගේ දෙමව්පියන් අසරණභාවයට පත් වෙලා තිබෙනවා. එසේ සුදුසුකම් ලබා ගෙන තිබෙන උදවිය අපේ අල්ලපු රට වන ඉන්දියාව වාගේ රටවලට ගිහිල්ලා වෛද්‍ය උපාධිය ගන්නවා; චීනය වාගේ රටවලට ගිහිල්ලා වෛද්‍ය උපාධිය ගන්නවා; බංග්ලාදේශය වාගේ රටවලට ගිහිල්ලා සමහර අය අපහසුතා ගණනාවකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම අපේ රට තුළ රජයේ වෛද්‍ය විද්‍යාලවලට බඳවා ගන්නා ප්‍රමාණය වැඩි කර ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්නත්, ඒ වාගේම පෞද්ගලික අංශයට එවැනි අවස්ථාවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නත් කටයුතු කරනවා නම් එය ඉතාම වැදගත් වෙනවා කියා මා හිතනවා. මොකද, අපේ දරුවන් එසේ විදේශ රටකට ගිහිල්ලා අධ්‍යාපනය ලබනකොට, අපේ රටේ මුදල්- අපේ විදේශ විනිමය- ඒ සඳහා යොදවන්න අපට සිදු වෙනවා.

මෙවැනි කරුණු-කාරණා දිහා බැලුවාම, අපේ රටේ පවතින උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ඉස්සරහට ගෙනැල්ලා විශේෂයෙන්ම අපේ රටට හොඳ ලාභයක් ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හැටියට එම විශ්වවිද්‍යාල පද්ධතිය ක්‍රියාත්මක කරනවා නම් එය ඉතාම වැදගත් දෙයක් ලෙස මා සලකනවා. ඒ වාගේම මම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් මතක් කළා වාගේ රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට සුදුසුකම් තිබෙන දරුවන්ට මුදල් ගෙවා එසේ ඇතුළු වීමේ අවස්ථාව අපි සියයට ප්‍රමාණයකින් හෝ ලබා දුන්නොත්, ඒක ඉතාම වැදගත් වෙනවා කියා මා හිතනවා. රජයේ විශ්වවිද්‍යාල පවත්වා ගෙන යෑමේදී බලපාන මුදල් ප්‍රශ්න එහෙම නැත්නම් ආර්ථික ප්‍රශ්නවලටත් ඒකෙන් විසඳුම් ලැබෙනවා කියන එකත් මම ඉතාම ඕනෑකමින් මේ අවස්ථාවේදී මතක් කරනවා.

වයඹ පළාතට වෛද්‍ය විද්‍යාලයක් ලබා ගැනීම සම්බන්ධ කාරණයත් අපි මේ අවස්ථාවේදී උසස් අධ්‍යාපන ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ. දැනට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා මම පළාත් සභා නියෝජනය කරන කාලයේදීත් මෙම ඉල්ලීම කර තිබෙනවා. විශේෂයෙන්ම ඒක ඉතාමත් සුදුසු දෙයක්. වයඹ පළාත කියන්නේ, අධ්‍යාපනය අතින් අද ඉතාම ඉහළට ඇවිල්ලා තිබෙන ප්‍රදේශයක්. මේ වෙලාව, වෛද්‍ය විද්‍යාලයක අවශ්‍යතාව වයඹට දැනෙන වෙලාවක්. පේරාදෙණිය වෛද්‍ය විද්‍යාලයේ ඉඳලා මහාචාර්යවරුන් ඇතුළු ඒ සියලු දෙනාට කුරුණෑගලට පහසුවෙන් පැමිණෙන්න පුළුවන්. කුරුණෑගල ශික්ෂණ රෝහල තිබෙනවා. ඔවුන්ට, එන්න ගත වෙන්නේ විනාඩි 45ක්, පැයක් වාගේ කෙටි කාලයක්. සමහර පළාත්වල වෛද්‍ය විද්‍යාල ඇති කරලා තිබුණත්, ඒවාට අවශ්‍ය මහාචාර්යවරුන්ගේ, ආචාර්යවරුන්ගේ අඩුපාඩුකම් අපි දැකලා තිබෙනවා. නමුත් වයඹ පළාතේ, කුරුණෑගල ප්‍රදේශයට මෙවැනි අවස්ථාවක් ලබා දුන්නොත්, එවැනි ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. මොකද, ඒ හැම දෙයකටම අවශ්‍ය වටාපිටාව ඒ ප්‍රදේශයේ තිබෙන නිසා. විශේෂයෙන්ම පේරාදෙණියේ ඉඳලා එන්න යන වෙලාවත් එක්ක, ඒ මහාචාර්යවරුන්ට කුරුණෑගල වෛද්‍ය විද්‍යාලයේ ඉගැන්වීම් කරන්න ඉතාමත් පහසු වෙනවා කියන එක මා මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

මීට කලින් ගරු චම්පික රණවක ඇමතිතුමා කථා කළා. මම හිතනවා, මේක චම්පික රණවක ඇමතිතුමාගේ පෞද්ගලික මතය වෙන්න ඇති කියලා. මේක රජයේ මතය නොවිය යුතුයි. මොකද, එවැනි ළමයින් නැවත බලලා මේ බඳවා ගැනීම නවත්වන්න කියලා දෙයක් අපිට කරන්න බැහැ. විශ්වවිද්‍යාලයක එහෙම දෙයක් කොහොමද කරන්නේ? මේ විශ්වවිද්‍යාලය පසු ගිය රජයෙන් අනුමත කරලා තිබෙනවා. පසු ගිය රජයෙන් අනුමත කරපු විශ්වවිද්‍යාල ආයතනයක් -institute එකක්- අපිට බැහැ නවත්වන්න.

පසු ගිය රජයේ වැරැද්දක් තිබෙනවා නම්, ඒ වැරැද්ද හදන එකයි අපි කරන්නේ. උසස් අධ්‍යාපන ගරු ඇමතිතුමනි, මම හිතන විධියට ඒක තමයි අපි කළ යුත්තේ. ඔබතුමා කිව්වා වාගේ අපි SAITM ආයතනය දිගටම පවත්වා ගන්න නම්, Public-Private Partnership විධියට, PPP model එකක් විධියට මේක මේ රටේ හරියාකාරව ස්ථාපිත කළ යුතුයි. හැබැයි මතක තියාගන්න, අපි සියලු දෙනාම quality එක වෙනුවෙන් පෙනී සිටින බව. Quality education එක මේ ආයතනයේ නැත්නම්, අපි ඒක ලබා දිය යුතුයි. ඒක තමයි අපි මේ වන විට අධ්‍යයනය කරමින් ඉන්නේ. අපි SAITM ආයතනයේ ශිෂ්‍යයන් හමුවුණා. ඒ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් හමුවුණා. SAITM ආයතනය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට අපි කැඳෙව්වා. ඒ ගොල්ලොත් එක්ක අපි මේ ගැන කථා කළා. අපි ඇත්ත තත්ත්වය දැක්කා. ඒ නිසා මේ ගැන හරියාකාරව දැනුවත් වී කථා කළ යුතු වෙනවා. විශේෂයෙන්ම මේ රටට පෞද්ගලික විශ්වවිද්‍යාල අවශ්‍යයි. හේතුව, අපේ Z-score එකට අනුව විශ්වවිද්‍යාලයට වරම් ලබපු ශිෂ්‍යයන්ගෙන් සියයට 18යි විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්නේ. එතකොට සියයට 82ක පිරිසක් එළියේ ඉන්නේ. මේ සියයට 82ට අපි මොකක්ද කරන්නේ? ඒ ළමයි උසස් අධ්‍යාපන වරම් නැති අයද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ ප්‍රශ්නය විසඳීම සඳහා ක්‍රමවේදයක් අවශ්‍යයි. විශේෂයෙන්ම ඇති වී තිබෙන වෛද්‍ය විද්‍යාල ප්‍රශ්නය දෙස බැලුවොත්, GMOA එකේ ඉන්න වෛද්‍යවරුන්ගෙන් සියයට එකක විතර වෛද්‍යවරුන්ගේ කුහකකම නිසා තමයි, අද ගොඩාක් අයට වෛද්‍ය වෘත්තියට එන්න තිබෙන ඉඩ ඇහිරිලා තිබෙන්නේ. පසු ගිය වර්ෂයේ වෛද්‍ය පීඨවලට ඇතුළත් වුණේ 1,255දෙනෙක් විතරයි. මට දැනගන්න ලැබුණු ආකාරයට අලුත් ප්‍රතිඵල අනුව තවත් 16දෙනෙක් වැඩි වෙලා තිබෙනවා. ඒක ඉතාමත් හොඳ තත්ත්වයක්. එතකොට මේ රටට වර්ෂයකට වෛද්‍යවරු ඕනෑ 1,255ක් විතරද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට මේ ඉන්න වෛද්‍යවරු පිළිබඳව කොහේවත් දත්ත නැහැ. අදටත් ඇහුවොත් කොළඹ මහ රෝහලේ වෛද්‍යවරු කී දෙනෙක් ඉන්නවාද කියලා, කාටවත් උත්තරයක් දෙන්න බැහැ. ඇත්ත කථාව මේකයි. වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පුළුවන් තරම් ඒ ගොල්ලන්ගේ අය එතැනට පුරවලා මේ දත්ත හංගලායි තිබෙන්නේ. ලංකාවේ දැනට දළ වශයෙන් ඉන්නේ වෛද්‍යවරු 17,000ක් විතරයි. 17,000ක් කියලා ගණන් හැදුවොත් මේ රටේ ජනගහනයෙන් 1,386 දෙනෙකුට එක වෛද්‍යවරයයි ඉන්නේ. මේ වෛද්‍යවරුන් ගණන ප්‍රමාණවත්ද? ඒ වාගේම, අපි ලෝකයේ අනෙක් රටවල් දිහා බලමු. ලිතුවේනියාව වාගේ රටක ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 4 දෙනෙකු ඉන්නවා. ලැට්වියාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 4.6ක් ඉන්නවා, රුසියාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 4.1ක් ඉන්නවා, කසකස්තානයේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.4ක් ඉන්නවා, ඊශ්‍රායලයේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.2ක් ඉන්නවා. ඒ වාගේම ග්‍රීසියේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.4ක් ඉන්නවා. ප්‍රංශයේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.1ක් ඉන්නවා. කියුබාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.6ක් ඉන්නවා. බල්ගේරියාවේ ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.1ක් ඉන්නවා. Czech Republicවල ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3.6ක් ඉන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, අපේ ආර්ථිකයට සමාන රටවල ජනගහනයෙන් 1,000කට වෛද්‍යවරුන් 3 දෙනෙකු ඉන්නවා. ඒ කියන්නේ ජනගහනයෙන් 300කට එක වෛද්‍යවරයෙක් ඉන්නවා. අපිත් මේ ගණනට වෛද්‍යවරුන් හදන්නේ නැද්ද? මේ 17,000 තියාගෙනම ඉන්නවාද?

ඔබ දන්නවාද අද වන විට ලංකාවේ රෝහල් 37ක් වැහිලා තිබෙන බව. මේක කියන්නේ සෞඛ්‍ය ඇමතිවරයා. වැහිලා තිබෙන රෝහල් 37 ගැන කථා කරන්නේ නැද්ද? ඇයි අපි වහගෙන ඉන්නේ? අර රෝහල් 1,255 විතරමද තිබෙන්නට ඕනෑ?

ඒ වාගේම අද වෛද්‍යවරුන් කණ්ඩායම එකතු වෙලා ඉන්න ප්‍රදේශය දිහා බලමු. කොළඹ ප්‍රදේශයේම පෞද්ගලික රෝහල් 12ක් පමණ තිබෙනවා. මේ රෝහල්වල ඇඳන් ගණන 4,500ක් පමණ වෙනවා. ඒ අනුව දින ගණනත් සමඟ බැලුවාම මසකට මුදල් ගෙවන නේවාසික රෝගීන් ගණන 135,000ක් වෙනවා. විශේෂඥ වෛද්‍යවරුන් 2,000ක් පමණ මේ ප්‍රදේශය තුළ ඒකරාශී වෙලා ඉන්නවා. අනුරාධපුරයෙන්, පුත්තලමින්, මොනරාගල වාගේ පළාත්වලින් උදේ පාන්දර මේ විශේෂඥ වෛද්‍යවරුන් channel කර ගන්නට රෝගීන් එනවා. මේ ක්‍රමය වෙනස් කළ යුතුයි. අර වැහිලා ගිය රෝහල් 37 සඳහාත් අපි දොස්තරවරුන් නිර්මාණය කළ යුතුයි. මම හිතනවා, අපිට මේ සඳහා වැඩිපුර වෛද්‍ය විද්‍යාල අවශ්‍යයි කියලා.

අපි ලෝකයේ තිබෙන වෛද්‍ය විද්‍යාල ගැන බලමු. වෛද්‍ය විද්‍යාල ඉන්දියාවේ 219ක් තිබෙනවා, ඇමෙරිකාවේ 147ක් තිබෙනවා, චීනයේ 130ක් තිබෙනවා, බ්‍රසීලයේ 84ක් තිබෙනවා, ජපානයේ 80ක් තිබෙනවා, මෙක්සිකෝවේ 65ක් තිබෙනවා, රුසියාවේ 60ක් තිබෙනවා, අපි වාගේ දෙගුණයක් පමණ ඉන්න දකුණු කොරියාවේ 52ක් තිබෙනවා. ඒ වාගේම, ඉරානයේ 48ක් තිබෙනවා, පාකිස්තානයේ 34ක් තිබෙනවා, පිලිපීනයේ 34ක් තිබෙනවා. මේ ආදී වශයෙන් වෛද්‍ය විද්‍යාල තිබෙනවා. නමුත් පෞද්ගලික වෛද්‍ය පීඨ දෙකත් ඇතුළත්ව අපේ රටේ තිබෙන්නේ 10යි. අපි විශ්වාස කරනවා අඩුම තරමින් 24ක්වත්,-දකුණු කොරියාවේ වාගේ භාගයක්වත්- අපේ රටට වෛද්‍ය විද්‍යාල අවශ්‍යයි කියලා.

රජයේ සියලුම වෛද්‍ය පීඨවල පීඨාධිපතිවරු ඇතුළු සියලු දෙනා සමඟ රජයේ වෛද්‍ය පීඨවල තිබෙන ප්‍රශ්න ගැන අපි පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කථා කළා. එතැනදී අපි දැක්කා සමහර වෛද්‍ය පීඨවල තිබෙන ප්‍රශ්න. විශේෂයෙන්ම නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ඉන්න සම්පූර්ණ ආචාර්ය මණ්ඩලය 27ක වාගේ ප්‍රමාණයක්. ඒ ratio එක අනුව ළමයින් 13 දෙනෙකුට එක ආචාර්යවරයයි. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්ය මණ්ඩලය 110ක් ඉන්නවා. මේකේ ratio එක ළමයි 9 දෙනෙකුට එක ආචාර්යවරයෙක් වෙනවා. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර්යවරුන් 116ක් ඉන්නවා. Ratio එක ළමයින් 9.5කට එක ආචාර්යවරයායි. ඒ වාගේම රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ තත්ත්වය දිහා බැලුවොත් නියමිත ප්‍රමාණයෙන් සියයට 40යි ආචාර්යවරුන් ඉන්නේ. මේක තමයි ප්‍රශ්නය

වන්නේ. හිටපු අධ්‍යාපන ඇමති ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාට සහ ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාට මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, විපක්ෂයේ හිටියත් හොඳ යෝජනාවක් ගෙනැල්ලා මේ ප්‍රශ්න පිළිබඳව කථා කිරීම ගැන. මෙතුමන්ලා බොහොම හොඳ යෝජනා ඉදිරිපත් කළා. අපි බොහොම සාදරයෙන් එවැනි යෝජනා පිළිගන්නවා. අපි විශේෂයෙන් රජරට විශ්වවිද්‍යාලයේ සහ නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨවලට විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා. අපිට නැඟෙනහිර විශ්වවිද්‍යාලය ගැන ඉල්ලීම් කිහිපයකුත් ලැබුණා. ඒ ඉල්ලීම්වල තිබෙන්නේ, මේ වෛද්‍ය පීඨ සඳහා ආචාර්යවරුන් හැටියට විශේෂඥ වෛද්‍යවරුන් තෝරාගෙන තිබෙන බවයි. නමුත් ඒ අයව release කරන්නේ නැති ප්‍රශ්න තිබෙනවා. මේ ආදී වශයෙන් අපිට ඉතාම සරල ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. අපිට එවැනි ප්‍රශ්න විසඳා ගැනීමට සෞඛ්‍ය ඇමතිතුමා මැදිහත් වෙනවා නම් හොඳයි. එහෙම වුණොත්, අපට නැඟෙනහිර විශ්වවිද්‍යාලයෙත්, රජරට විශ්වවිද්‍යාලයෙත් තිබෙන ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාවේදී මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ -Medical Faculty එකේ - Dean ඉතාමත් හොඳ යෝජනාවක් කළා. විශේෂයෙන්ම එවැනි යෝජනා අගය කරන්න ඕනෑ. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය කියන්නේ, ලෝකයේ ප්‍රධාන පෙළේ තිබෙන Medical Faculty එකක්. පේරාදෙණියේ වෛද්‍ය පීඨයත් ඒ වාගේයි. මොකද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා ගන්න විදේශීය සිසුන්ගෙන් -foreign studentsලාගෙන්- ලොකු ඉල්ලීමක් තිබෙනවා. එතුමිය අපට යෝජනා කළා, කොළඹ විශ්වවිද්‍යාලයේ වෙනම අංශයක්, International Medical School එකක් හදන්න. උදාහරණයක් හැටියට කියනවා නම්, "University of Colombo, International School of Medicine" කියලා එකක් අපට හදන්න පුළුවන්. ඒ හරහා foreign studentsලා 100කට මුදල් ගෙවලා ඉගෙන ගන්න අවස්ථාව හදනවා වාගේම, තව local ළමයි 100 දෙනෙකුට නොමිලේ අධ්‍යාපනය ලබා දිය හැකියි. මෙවැනි යෝජනා ආවා. මේවා බොහොම සාධනීය, සාධාරණ යෝජනා. අපට එවැනි අංශයක් Peradeniya Medical Faculty එකෙත් හදන්න පුළුවන්. ඒත් එක්කම අපි යෝජනා කරලා තිබෙන, ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා පවා කථා කරන, විශ්වවිද්‍යාලවලට ස්වාධීනත්වය මේ හරහා ලැබිය යුතුයි.

අපි විශ්වවිද්‍යාලවල ranking ගැන කථා කරනවා. දැන් කිහිප දෙනෙක්ම ඒ ගැන කථා කළා. ලෝකයේ පළමු පෙළේ විශ්වවිද්‍යාල 20ම තිබෙන්නේ යුරෝපා රටවල. හැබැයි, මේ විශ්වවිද්‍යාල 20ම Public-Private Partnerships එහෙම නැත්නම් private universities. මේ පෞද්ගලික විශ්වවිද්‍යාල Public-Private Partnership එහෙමත් නැත්නම් සමූහ මඟින් පාලනය වන විශ්වවිද්‍යාල ඉදිරියට ආවේ ඇයි? ඒ, එම විශ්වවිද්‍යාලවල ඇති මේ ස්වාධීනත්වය නිසායි. මේ අවස්ථාවේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් මෙතැන නිලධාරි කුටියේ ඉන්නවා. අපි ඔවුන්ව විවිධ කමිටුවලදී හමුවුණා.

අපේ විශ්වවිද්‍යාල පද්ධතියට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, අලුතෙන් පාඨමාලා පටන් ගන්නා විට, Management Services Department -MSD- එකෙන් cadre approval එකක් ගන්න තිබෙන අමාරුව. මොකද, ඒ ගොල්ලන්ට අපේ තිබෙන මෙම ක්‍රමවේදය සමහර වෙලාවට තේරෙන්නේ නැහැ. අපි ඊයේ-පෙරේදා සෞන්දර්ය විශ්වවිද්‍යාලයත් එක්ක කථා කළා. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ඩිජිටල් සිනමාකරණය ගැන උපාධි පාඨමාලාවක් අලුතෙන් යෝජනා වුණා. ඉතාමත් හොඳයි. මේ රටට එවැනි අලුත් පාඨමාලාවන් අවශ්‍යයි. ඩිජිටල් සිනමාකරණය ගැන පාඨමාලාව ආරම්භ කරන්න අවශ්‍යයි. නමුත්, cadre approve කරන Management Services Department එක හිතන්නේ, "තවම පාඨමාලා ආරම්භ කරන්න බැහැ. මොකද, approve කරන්න තව කල් යනවා. ඒ නිසා විශ්වවිද්‍යාල පාඨමාලා පටන් ගන්න approve කරනතෙක් ඉන්න" කියලායි. මේ සංකල්ප වෙනස් විය යුතුයි. අපි මේ රාජ්‍ය පද්ධතිය තුළ තිබෙන සමහර නීති රීති එක්ක ක්‍රියා කරද්දී සමහර විට කාලයක් ගත වෙනවා ඇති. එහෙමනම්, විශ්වවිද්‍යාල ස්වාධීන කළ යුතුයි. අද, ලෝකයේ පවතින විශ්වවිද්‍යාල එහෙමයි ගමන් කරන්නේ. විශ්වවිද්‍යාල ස්වාධීන වුණොත් පමණයි එම විශ්වවිද්‍යාලවලට හැකි වන්නේ, තමන්ම උපයා ගෙන තමන්ටම වියදම් කරන්නට. එහෙම කළොත් මෙම විශ්වවිද්‍යාල පද්ධතිය ඉහළ ස්ථානයකට ගෙන යන්න අපට පුළුවන් වනවා. එතකොට, ලෝකයේ අනෙක් විශ්වවිද්‍යාල පද්ධති සමඟ යම් තරඟකාරී තත්ත්වයකට පත් වෙනවා. මෙයින් කියන්නේ, දැනට ලබා දෙන නොමිලේ අධ්‍යාපනය නවත්වන්න කියලා නොවෙයි. වැරැදි අර්ථ නිරූපණයක් කර ගන්න එපා. දැනට ලබා දෙන නොමිලේ අධ්‍යාපනය, විශ්වවිද්‍යාල මේ සියල්ල අපි රැක ගත යුතුයි. අප සියලු දෙනාම නොමිලේ අධ්‍යාපනය තුළින් බිහි වුණු අය. හැබැයි, නොමිලේ අධ්‍යාපනයයි, නිදහස් අධ්‍යාපනයයි කියන්නේ දෙකක්. විශ්වවිද්‍යාල තුළ නිදහස් අධ්‍යාපනය ඇති කළ යුතුයි; නිදහස් පාඨමාලා ඇති කළ යුතුයි.

සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ යෝජනා කරන ඩිජිටල් සිනමාකරණ පාඨමාලාව delay වෙන්නේ ඇයි? එම පාඨමාලාව පටන් ගන්න ඒ අයට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. දැන්, විශ්වවිද්‍යාල වරම් ලබන ශිෂ්‍යයන්ට වඩා ඩිජිටල් සිනමාකරණය ඉගෙන ගන්න විශාල ශිෂ්‍යයන් පිරිසක් ඉන්නවා. ඒ අනුව, මෙම ඩිජිටල් සිනමාකරණය ඉගෙන ගන්න අවශ්‍යතාව ඇති වෙලා තිබෙන්නේ, සිනමාකරණය තුළ ඉන්න කැමැති පිරිසකට. එහෙමනම්, මෙවැනි අයට පාඨමාලා හදන්නේ කොහොමද? ඒ සඳහා විශ්වවිද්‍යාලවලට ස්වාධීනත්වය ලබා දිය යුතුයි. ඒ විශ්වවිද්‍යාල තනියම හිතලා, තනියම පාඨමාලා හදලා උපයා ගන්නා ආදායම විශ්වවිද්‍යාල දියුණු කරන්න යොදා ගත්තොත්, විශ්වවිද්‍යාලවල තත්ත්වය තවත් ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් වෙයි කියා මම හිතනවා.

මෙවැනි අලුත් අලුත් දේවල් අපි හිතන්න ඕනෑ. ඒ වාගේම, මේ රටකට පෞද්ගලික විශ්වවිද්‍යාලත් පැහැදිලිවම අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නැවත එන්නම්, අප SAITM එකේ ප්‍රශ්නයට විසඳුම ලබා දිය යුත්තේ කොහොමද කියන කාරණයට. අපි හිතනවා, SAITM එකේ ප්‍රශ්නයට විසඳුම ලබා දිය යුත්තේ Public-Private Partnership model එකකින්ය කියා. SAITM එකේ ප්‍රශ්නය තිබෙන්නේ සායනික පුහුණුවෙහි නම් -clinical training එකේ නම්- සායනික පුහුණුව නියමිත ප්‍රමිතියට අනුව ලබා දුන්නොත් අපට පුළුවන්, ඒ ප්‍රමිතිය හදා දෙන්න. Medical Council එක පැහැදිලිවම කියනවා, "සායනික පුහුණුව හරියාකාරව දෙනවා නම්, එහි තත්ත්වය හදා දෙනවා නම් අපට මෙහි ප්‍රශ්නයක් නැහැ" කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කරන්න තිබෙන හොඳම දේ තමයි රජය යම් කොටසක් අරගෙන පෞද්ගලික හා රජයේ ආයතනයක් විධියට ඒ රෝහල පවත්වාගෙන යමින් මේ අවස්ථාව අපට සාදා ගැනීම. රෝහලේ සේවාව නොමිලේ ලබා ගැනීමට එන රෝගීන් වෙනුවෙන් වෙනම section එකක් හදන්න, ඒත් එක්කම professorial wards ආදී ඒවා හදා දෙන්න පුළුවන්, SAITM එකට තියා ගන්න. ඒවායේ අයිතිය සියයට 50: 50 ද, එහෙමත් නැත්නම් වෙනත් ප්‍රමාණයකින්ද කියන එක ගැන පසුව කථා කරන්න අපට පුළුවන්. අපි එවැනි තැනක ඉඳගෙන මේ ගැන කල්පනා කළ යුතුයි.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා කිව්වා, "එයට ළමයි ඇතුළත් කරන එක වහාම නතර කළ යුතුයි" කියා. මා නැවතත් කියනවා, ඒ කථාව වැරැදියි කියා. එහෙම කොහොමද කියන්නේ? රජයක් හැටියට කියන්නේ කොහොමද, "ළමයින් ඇතුළත් කරන එක වහාම නවත්වන්න" කියා. එහෙම ප්‍රතිපත්තිමය තීරණ ගන්න අපට බැහැ. මොකද, එය පසු ගිය රජය හෝ අනුමත කරපු උසස් අධ්‍යාපන ආයතනයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මතක තබාගත යුතු තවත් කාරණයක් තිබෙනවා. අපි පසු ගිය දවස්වල දැක්කා, උසස් අධ්‍යාපන ආයතන අනුමත කිරීමේ ප්‍රශ්නත් තිබෙන බව. පසු ගිය දවස්වල gazette එකක් ආවා, KAATSU නම් වූ ආයතනයේ උපාධි පාඨමාලා අනුමත කරන්න. ඒ KAATSU කියන ආයතනය ගෙන බැලුවාම, එහිත් තිබෙන්නේ Bachelor of Science Honours Medical Science, Psychology, Human Resources, Marketing, Accounting ආදියයි. අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් එතැන තිබෙනවා. කොහොමද ඒ දේවල් කළේ කියන එක අපි පැහැදිලිව සොයා බැලිය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි, ඒ විශ්වවිද්‍යාල ආයතනයේ උපාධි පාඨමාලා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන්නේ 2015 ජනවාරි 07වන දායි. 2015 ජනවාරි 07වන දා කියන්නේ, ජනාධිපතිවරණයට දිනකට කලිනුයි. මා බැලුවා KAATSU කියන ආයතනයේ ඉන්නේ කවුද කියා. එහි පාලක සභාවේ -University Court එකේ- Chairman හැටියට ඉන්නේ, හිටපු ජනාධිපතිවරයාගේ ලේකම් ලලිත් වීරතුංග මහත්මයායි. එහෙම නම්, ඒ ආකාරයට කඩි මුඩියේ පෞද්ගලික විශ්වවිද්‍යාල අනුමත කිරීම දැඩි ප්‍රශ්නයක්. මේ සම්බන්ධව නිවැරැදි නියාමනයක් මේ රටට අවශ්‍යයි. නිවැරැදි නියාමනයක් තිබුණොත් විතරයි, ලෝකයේ තරගකාරිත්වයෙන් ඉහළ තැනක තිබෙන ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල ලංකාවට එන්නේ. එහෙම නැති වුණොත් වෙන්නේ, දේශපාලන අවශ්‍යතා නිසා ජනාධිපතිවරණයට කලින් දවසේ 'ටක්' ගාලා approval එක ගත් ඒවා වාගේ විශ්වවිද්‍යාල ආවොත් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. එහෙම වුණොත් ඒක වැරැදියි. අපි ඒ ගැන සොයා බැලිය යුතුයි. නමුත් රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කරන්න අපට බැහැ. යම් රජයකින් එවැන්නක් අනුමත කළා නම් අපේ රජයට බැහැ, ඒක නවත්වන්න. රජයක් ගැසට් එකක් නිකුත් කරලා පාර්ලිමේන්තුවේ අනුමත කරවා ගත්තා නම්, එය ක්‍රියාත්මක කරගෙන යන්න අපි - මේ රජය - බැඳී සිටිනවා. මෙන්න මේ වාගේ කාරණා ගැන අපි බොහොම සාවධානව සොයා බැලිය යුතුයි. ඒ සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක්, නියාමනයක් අවශ්‍ය වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා යෝජනා කළා, තේරීම් කාරක සභාවකින් මෙය කළ යුතුයි කියා. දැනටමත් ආංශික අධීක්ෂණ කාරක සභා හරහා මෙය සිදු වනවා. අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යටතේ, උසස් අධ්‍යාපනය සඳහා වූ අනුකාරක සභාවක් තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සියල්ල කැඳවා අප මේ සම්බන්ධයෙන් දැනටමත් සාකච්ඡා කර තිබෙනවා. එහිදී අපි ඒ අයගේ ප්‍රශ්න ගැනත් කථා කළා. ඒ වාගේම පසු ගිය දවස්වල වෛද්‍ය, සෞන්දර්ය ආදි පීඨ සමහත් අපි කථා කළා. මේ වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන නියාමනය කරන්නේ කොහොමද කියන එක ගැන පළමුවන draft එක වෙනුවෙන් කථා කරනවා. ඒවායෙහි හරියාකාර නියාමනයක් මේ රටට අවශ්‍යයි. එහෙම වුණොත් විතරයි, තරගකාරිත්වයෙන් වැඩි උසස් අධ්‍යාපන ආයතන ලංකාවට එන්නේ. ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ සඳහා දැඩි මහන්සියක් දරන බව අප දන්නවා. අපේ රජයේ ප්‍රතිපත්තිය හැටියට ලෝකයේ තිබෙන ප්‍රධාන විශ්වවිද්‍යාලවලට අපේ රටට එන්නය කියා අපි ආරාධනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවුරුදු දහයක් විතර ජපානයේ විශ්වවිද්‍යාලයක මහාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කළා. මම දැක්කා, ලංකාවෙන් යන අපේ දරුවන් තමයි එම විශ්වවිද්‍යාලවලදී පළමුවැනි තැන ලබා ගන්නේ. අපේ විශ්වවිද්‍යාලවල ඉන්නා දරුවන්ගේ දැනුම ලෝකයේ ඉහළම තැනක, ඉහළම ප්‍රමිතියක තිබෙනවා. ඒ නිසා ඔවුන්ට මෙවැනි අවස්ථා වැඩි වැඩියෙන් ලබා දිය යුතුයි. ඒ සඳහා දැන් වයඹ විශ්වවිද්‍යාලයට අලුතින් වෛද්‍ය පීඨයක් හැදෙනවා; මොරටුව විශ්වවිද්‍යාලයටත් අලුතින් වෛද්‍ය පීඨයක් යෝජනා කරනවා. ඊළඟට, සබරගමුව විශ්වවිද්‍යාලයටත් වෛද්‍ය පීඨයක් යෝජනා කර තිබෙනවා. ඒ සඳහා ඉඩමකුත් බලා තිබෙනවා. මේ විධියට රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබෙන විශ්වවිද්‍යාලවලින් වෛද්‍ය පීඨ නැති තැන්වලට වෛද්‍ය පීඨත්, ඉංජිනේරු පීඨ නැති තැන්වලට ඉංජිනේරු පීඨත් ලබා දිය යුතුයි. එසේ ලබා දීම තුළින් තමයි විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමට වරම් නොමැතිව අතරමං වන සියයට අසූදෙකක් පමණ වන පිරිසකට වැඩි වැඩියෙන් අවස්ථාව -වරම්- ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, රාජ්‍ය මැදිහත්වීම තුළින් විතරක් මේ ප්‍රශ්න විසඳා ගන්නා බැහැ. එහෙම නම් පෞද්ගලික විශ්වවිද්‍යාල සඳහා ආයතන ලබාදීම සඳහා යම් උනන්දු කිරීමක්, ප්‍රමුඛතාවක් ලබා දිය යුතුයි. [බාධා කිරීමක්] ඉන්න, මම එතැනට එන්නම්. ආචාර්යවරුන් සොයා ගන්නා එකට හොඳ විසඳුමක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මෙම ආචාර්යවරුන් සොයා ගන්නා කාරණයට මමත් මැදිහත් වෙලා සිටිනවා. අපි ජපානයේ විශ්වවිද්‍යාල දහහතක සංසදයක් එක්ක විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීමට කටයුතු කරනවා. අපිට ඒ සඳහා Cabinet approval එකත් ලැබී තිබෙනවා. ජපානයේ විශ්වවිද්‍යාල සංසදයක් එක්ක "Asian Institute of Science and Technology" කියා විශ්වවිද්‍යාලයක් අපි ආරම්භ කරනවා. ඇත්තටම අපි අතීතය ගත්තොත්, AIT එක ලංකාවට ලැබෙන්නයි නියමිතව තිබුණේ. නමුත් ඒ වේලාවේ ගත් තීරණ නිසා ඒක ලංකාවට ලැබුණේ නැහැ. ලෝකයේ ප්‍රමුඛතාවක් තිබෙන මෙවැනි විශ්වවිද්‍යාලත් එක්ක අපි විශ්වවිද්‍යාල පටන් ගන්නා කොට, ආචාර්ය උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් බිහි කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, ජපානයේ විශ්වවිද්‍යාල සංසදය එක්ක එකතු වෙලා අපි අද වනවිට ආචාර්ය උපාධිධාරීන් හැත්තෑතුන්දෙනෙකු බිහි කරමින් ඉන්නවා. එය 2011 වර්ෂයේ සිට පටන් ගත් project එකක්. [බාධා කිරීමක්] ජපානයේ ආචාර්යවරුන් තුනෙන් එකක් එනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ජපන් ජාතිකයන්ද?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඔව්, ජපන් ජාතිකයන්. මෙවැනි විශ්වවිද්‍යාල ලෝකයේ හැදුවා; මැලේසියාවේ හැදුවා; ඊජිප්තුවේ හැදුවා. ඔවුන්ට වැටුප් ලබා දෙන්නේ ජපානයෙන්. මේක තමයි මේ වෙනස. විශ්වවිද්‍යාල සංසදයෙන් තමයි වැටුප් ලබා දෙන්නේ. විශ්වවිද්‍යාල දහහත හරහා අපේ විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමට ආචාර්යවරුන් එවනවා. එහෙම සහයෝගය ලබා දෙන රටවල් ලෝකයේ තිබෙනවා. ජපානය එහෙම රටක්. මමත් ඒ projects දෙකේම සිටියා. මට

මතකයි, Malaysia-Japan International Institute of Technology - MJIIT - කියා එකක් හැදුවා. ඊළඟට, Egypt-Japan University of Science and Technology - EJUST - කියා ඊජිප්තුවේ එකක් හැදුවා. මේ දෙකටම ජපානයේ මහාචාර්යවරුන් ගිහිල්ලා උගන්වනවා. අපි මේ වාගේ අවස්ථා පුළුල් කළොත් තමයි ලෝකයේ තිබෙන දැනුමත් අපට එන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මෙගා පොලිස්" සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ කොළඹ, මාලබේ ප්‍රදේශයේ Science City එකක් ආරම්භ කිරීම ගැන අපි කථා කරනවා. ඒ වාගේම ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ මූලිකත්වයෙන් අපට නුවර ප්‍රදේශයේත් Kandy Science City එකක් හදන්න පුළුවන් කියා මම යෝජනා කරනවා. පේරාදෙණිය ආශ්‍රිතව විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතන ගොඩාක් තිබෙනවා. පේරාදෙණිය, කුණ්ඩසාලේ හා පාතදුම්බර වාගේ මැතිවරණ කොට්ඨාස ටිකක් සම්බන්ධ කරගෙන, ඒවායේ තිබෙන සම්පත් ටික ලබා ගත්තොත් Kandy Science City එකක් පටන් ගන්න අපට හැකියාවක් ලැබෙනවා. මේ සඳහා රජයේ විශ්වවිද්‍යාල වාගේම පෞද්ගලික විශ්වවිද්‍යාලත් සම්බන්ධ කර ගන්න අපට පුළුවන්. ලෝකයේ අනෙක් රටවල තිබෙන විශ්වවිද්‍යාලවලටත් ආරාධනා කළ හැකි වෙනවා. විශේෂයෙන්ම ජපානයේ විශ්වවිද්‍යාල සංසදය වාගේ ලෝකයේ මේ සඳහා කැමැත්තක් තිබෙන විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ වෙලා Public-Private Partnership modelsවලට යන්න අපට පුළුවන්කම ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් වශයෙන් ගත්තොත් දැනට ලංකාවේ teaching hospitals හැටියට convert කරන්න පුළුවන් hospitals 45ක් තිබෙනවා. මේ රෝහල් 45 teaching hospitals විධියට convert කරන්න අපිට පුළුවන් වුණොත්, වෛද්‍ය පීඨ සිසුන්ට වැඩි වැඩියෙන් අවස්ථාව ලබා දෙන්නත් අපට හැකියාව ලැබෙනවා. ඒ වාගේම රුහුණ විශ්වවිද්‍යාලයෙන් තව යෝජනාවක් ඇවිල්ලා තිබුණා, ළමයින් සඳහා වන teaching hospital එකක් හදන්න කියලා. ළමයින් සඳහා වන teaching hospital එකක් හැදීම තුළින් වෛද්‍ය සිසුන්ට තව තවත් අවස්ථාව ලබා දෙන්න පුළුවන්. මේ ආදී වශයෙන් අපේ ආණ්ඩුව උසස් අධ්‍යාපන කටයුතුවල පැහැදිලි වෙනසක් කරන්න, පැහැදිලි ප්‍රතිපත්තියක් ඇතුව පැහැදිලි දැක්මකින් යුතුව කටයුතු කරනවා. අද අපි අනුමත කරන මේ පනත් කෙටුම්පත මඟින් අපේ ශිෂ්‍යයන් වැඩි ප්‍රමාණයකට විශ්වවිද්‍යාල වරම් ලැබෙනවා.

අවසාන වශයෙන් තව එක් කාරණයක් මතක් කරන්න ඕනෑ. අපේ විශ්වවිද්‍යාල ස්වාධීන වුණොත් ඒ විශ්වවිද්‍යාලවලට හැකියාවක් ලැබෙනවා, පැය 24 පුරා වැඩ කරන විශ්වවිද්‍යාල බවට පරිවර්තනය වෙන්න. පැය 24 පුරා වැඩ කරන විශ්වවිද්‍යාලයි අද ලෝකයේ තිබෙන්නේ. අපට පුළුවන්, රාත්‍රී පාඨමාලා පටන් ගන්න; පර්යේෂණ පටන් ගන්න. පර්යේෂණ සංස්කෘතියක් අපේ විශ්වවිද්‍යාල තුළට ඇතුළත් විය යුතුයි. එහෙම වුණොත් තමයි රටේ අනාගතයට ගැළපෙන පර්යේෂකයන් -නවෝත්පාදන ආර්ථිකයට යන පර්යේෂකයන්- නිර්මාණය කර ගත හැකි වෙන්නේ. ඔබට ස්තූතියි.

[අ.භා. 5.05]

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත විවාදයට ගන්න වෙලාවේ මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව තමුන්නාන්සේට මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා. ගරු අමාත්‍යතුමනි, මට කථාව පටන් ගන්න ප්‍රස්තුත කාරණාව හැදුවේ අපේ මහාචාර්යතුමා කථා කරද්දී කියපු කාරණයක්. එතුමා බිම බලාගෙන කිව්වේ, "එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පැමිණි හැම වෙලාවකම අපි උසස් අධ්‍යාපනය වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම දේ කළා" කියලා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

බිම බලාගෙන නොවෙයි, උඩ බලා ගෙනයි කිව්වේ.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

බිම බලාගෙන නොවෙයි ලු, උඩ බලාගෙන ලු කිව්වේ. මම තමුන්නාන්සේට ඒ ගැන එක් කාරණයක් විතරක් මතක් කරනවා. මම ඒ ගැන වැඩිය කථා කරන්නේ නැහැ. මම අතීතයට ගරහන මිනිහෙක් නොවෙයි. මාතර, එළියකන්දේ තිබෙනවා, සරසවි ශිෂ්‍යයෝ ගෙනැල්ලා පතුරු ගහපු තැන; ත්‍රිමාලා ගෙනැල්ලා පතුරු ගහපු තැන. ශරීරය ඇතුළට බට දාලා කටු කම්බිවලින් ඇදපු තැන, මාතර, එළියකන්දේ -අපේ විශ්වවිද්‍යාලයේ hostel එක තිබුණු තැනට එහා පැත්තේ- තිබෙනවා. අපි තවමත් ඒ පැත්ත බල බලා යනවා. ඒ, එක තැනක් විතරයි.

ගරු ඇමතිතුමනි, මම අතිශය සතුටට පත් වෙනවා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශයක් ගැන විවාද කෙරෙන වෙලාවේ මුළු පාර්ලිමේන්තුවම ඔළු ගෙඩිවලින් පිරිලා තිබීම ගැන. මම අතිශය සතුටට පත් වෙනවා, තමුන්නාන්සේගේ අමාත්‍යාංශය ගැන විවාද කරන වෙලාවේ මුළු පාර්ලිමේන්තුවම පිරිලා සිටීම ගැන. මේ රටේ මාධ්‍යයත් මම හිතන්නේ-

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ඒකාබද්ධ විපක්ෂයේ අය කෝ?

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

මම කියන්නේ කවුරුත් ගැනයි. තමුන්නාන්සේලා හැමදාම -[බාධා කිරීමක්] එක පැත්තකට බරව කථා කරන්න ඕනෑ නම්, තමුන්නාන්සේලා කැමැති නම් ඒ පැත්තට බරව මට කථා කරන්න පුළුවන්. මධ්‍යස්ථව ඉඳන් කථා කරන්න ඕනෑ නම්, මම මධ්‍යස්ථව ඉඳන් කථා කරන්නම්. මම තමුන්නාන්සේට ඒ ගැන මතක් කරනවා, ගරු අමාත්‍යතුමනි. ගරු අමාත්‍යතුමනි, වෛද්‍යවරයා මේ රටේ ජාතිය සුවපත් කරනවා. ගොවියා ජාතියට බත සපයනවා. කසළ ශෝධකයාගේ ඉඳලා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන්නන් මේ රටට දායකත්වය ලබා දෙනවා. ඒ හැම මිනිහෙකුගේම පපුවට තට්ටු කරලා ඇහුවොත්, "උඹේ පුතා, උඹේ දුව කවුරු වෙනවාටද කැමති?" කියලා, අතිබහුතරයක් දෙනා කියාවි, "මගේ දරුවා මෙන්න මෙතැනට එනවාටයි මම කැමැති. මගේ දරුවා ගෙන යන්න කැමැති මෙතැනටයි" කියලා. හැබැයි, දෙමව්පියන්ගේ තිබෙන අසීමිත බලාපොරොත්තුවලට පණ දෙන්නේ, ඒ දෙමව්පියන්ගේ අරමුණුවලට දරුවන් මෙහෙයවන්න මහ පාදන්න උදව් කරන්නේ, කුමන පක්ෂයක හෝ බලපැවැත්වෙන ආණ්ඩුවක්. ඒ ආණ්ඩුවට තමයි ඒ බලය තිබෙන්නේ. ඒ මිනිසුන්ගේ අරමුණු වෙනුවෙන් අධ්‍යාපනය මෙහෙයවලා රට ඉදිරියට ගෙන යාමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවකටයි.

ගරු අමාත්‍යතුමනි, මම මුලින්ම මේ කාරණය මතක් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල අනධ්‍යාන සේවකයන් සඳහා විශ්‍රාම යන වයස

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

මේ සංශෝධනයෙන් අවුරුදු තුනක් වැඩි කරලා තිබෙනවා. මේක කාලයක් තිස්සේ තිබුණු ඉල්ලීමක්. අවුරුද්දකට සැරයක් ආයතන ප්‍රධානියා ඉදිරියට ගිහිල්ලා ඔහුට විවිධාකාරයෙන් සැලකිලි දක්වලා නැත්නම් විවිධ විධියට පිංසෙණ්ඩු වෙලා තමන්ගේ සේවා දිගුව අවුරුද්ද, අවුරුද්ද වැඩි කර ගන්න පුළුවන්කම ලැබුණා. අවුරුදු 60 දක්වා විශ්‍රාම යාමේ වයස දික් කරලා, තමුන්නාන්සේලා ඒකට නීත්‍යානුකූල වටිනාකමක් දුන්නා.

ගරු අමාත්‍යතුමනි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා, මේ පාර්ලිමේන්තුවේ හිටපු කීර්තිමත්ම දේශපාලනඥයෙක් වන රොනී ද මැල් මැතිතුමාට. එතුමා රුහුණ විශ්වවිද්‍යාලය ආරම්භ කරන කොට හුහක් දෙනෙක් ඒකට විරුද්ධ වුණා. පරණ හැන්සාඩ් කියෙව්වොතින් ඒක තේරුම් ගන්න පුළුවන්. අති බහුතරයක් දෙනා රුහුණ විශ්වවිද්‍යාලය හදනවාට විරුද්ධ වුණා. ඒක හරියට, මහින්ද රාජපක්ෂ මහත්තයා හම්බන්තොට වරාය හදන්න යන කොට විරුද්ධ වුණා වාගෙයි. අද වන කොට රුහුණු විශ්වවිද්‍යාලය කීර්තිමත් තැනක තිබෙනවා. හම්බන්තොට වරායත් එහෙමයි. "මෙන්න, අපි පුළුල් වරායක් හදලා තිබෙනවා, නැව් මාර්ගයට ආසන්නයේ වරායක් හදලා තිබෙනවා" කියලා චීනයට පෙන්වන්න පුළුවන්කම තිබෙන්නේත්, "අපේ රටට ආයෝජන කරන්න එන්න" කියන ආරාධනය කරන්න පුළුවන්කම ලැබුණේත් හම්බන්තොට වරායක් හදාපු නිසායි.

ගරු අමාත්‍යතුමනි, මගේ මුල්ම පාර්ලිමේන්තු කථාවේදීත් මා කිව්වා රටක් විධියට අපි බලන්න ඕනෑ සීමා ටික. ගරු අමාත්‍යතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශ හරහා තමයි රටක් ගොඩ නඟන මිනිස්සු බිහි වෙන්නේ. රට හදන මිනිස්සු බිහි වෙන්නේ එතැනින්, රටට දැනුම දෙන මනුෂ්‍යයා බිහි වෙන්නේ එතැනින්, රටට වීරත්වය ගොඩ නඟන පොලිස්පතිවරයා බිහි වෙන්නේ එතැනින්, හමුදාපතිවරයා බිහි වෙන්නේ එතැනින්. හැබැයි, ගරු අමාත්‍යතුමනි, විදේශීය සමාගමක් ඇවිල්ලා මේ රටේ යම් සමාගමක් ආරම්භ කරන්න බදු සහන දීපන්, ඉඩම් ටික දීපන්, යටිතල පහසුකම් දීපන් කිව්වාම, අපි ඒ සමාගම ආරම්භ කරන්න, ඒ factory එක ආරම්භ කරන්න අපට දෙන්න පුළුවන් උපරිම දේවල් ටික දීලා ඒ සමාගම පටන් ගන්න ඉඩ දෙනවා. හැබැයි, අපට අමතක වෙනවා, අපේ රටේ තිබෙන ලොකුම දායාදය, ලොකුම අනාගත ආයෝජනය හතළිස්හතර ලක්ෂයක් වන මේ රටේ මහා ශිෂ්‍ය පරම්පරාවයි කියන එක. ඒ නිසා තමයි ගරු අමාත්‍යතුමනි, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ ඉල්ලීම් කරමින්, "මට hostel එකක් දෙන්න, දේශන ශාලාවට අවශ්‍ය පහසුකම් ටික දෙන්න" කියලා ඉල්ලීම් කරගෙන පාර දිගේ එනකොට, අධිආරක්ෂක කලාපය ළං වෙන කොට පොලීසියේ නිලධාරින් ටික එකතු වෙලා රබර් උණ්ඩ ටිකයි, කඳුළු ගෑස් ප්‍රහාරයි එල්ල කරන්නේ. එතකොට අපි කාටත් අමතක වෙනවා, මේ රටේ අනාගත නායකත්වය ගන්න මිනිස්සු ටික, මේ රට ගොඩ නඟන මිනිස්සු ටික ඉන්නේ එතැනයි කියන එක.

ගරු අමාත්‍යතුමනි, රුහුණු විශ්වවිද්‍යාලයේ තිබෙනවා, "කැටපත් පවුර" කියලා එකක්. කැටපත් පවුරේ ලියන්නේ කුරුටු ගී. එක සහෝදරයෙක් ලියලා තිබුණු කුරුටු ගීයක් මට මතක් වෙනවා. මට මතක නැහැ, ඒ සහෝදරයා ඒ කුරුටු ගීය කොයි කාලයේද ලියලා තිබුණේ කියලා. එහි සඳහන් වුණේ මෙහෙමයි.

"ආදරණීය ලොකු මල්ලි,

විශ්වවිද්‍යාලයට ඇවිල්ලා අවුරුදු තුනක් ඉවරයි

Degree එක පෙනෙන තෙක් මානයකවත් නැහැ

උඹ විශ්වවිද්‍යාලයට එන්න එපා

මට ඇවිල්ලා කොටන්න

උකස් තියන්නේ නැතිව අන්තිම ලියද්ද ඉතිරි කරපන්"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඹුර උකස් තියලා විශ්වවිද්‍යාලයට ආපු දරුවන් තමයි විශ්වවිද්‍යාලයේ වැඩිපුරම ඉන්නේ. මට මතකයි, මා විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේ මිත්‍රයෙක් හිටියා. ඔහුට රුපියල් 2,500ක මහපොළ ශිෂ්‍යාධාරය හම්බ වුණා. ඒ 2,500න් රුපියල් 2,000කින් මුළු මාසයක්ම ජීවත් වෙලා රුපියල් 500ක් ගෙදරට යැව්වා. සමහර ශිෂ්‍යයෝ මහපොළ හම්බ වෙන දවසට තමයි එළියට ගිහිල්ලා fried rice එකක් කාලා ආවේ. මමත් රුහුණු විශ්වවිද්‍යාලයේ උඩ කැන්ටීමේ රුපියල් තුනට "අඩුව" කාපු දරුවෙක්. වෙන ශිෂ්‍යයකු කාලා පිහාන පැත්තකින් තිබ්බාට පස්සේ, රුපියල් 3ක් දුන්නාම කැන්ටීමෙන් ඒ "අඩුවට" බත් භාගයක් දෙනවා. මමත් රුහුණු විශ්වවිද්‍යාලයේ ඒ අඩුව කාපු දරුවෙක්.

ගරු අමාත්‍යතුමනි, අපට තිබෙන ප්‍රශ්නය මේ වාගේ අමාත්‍යාංශයක් අපි කොයි දිශාවකට ද යොමු කරන්න ඕනෑ කියන ප්‍රශ්නයයි. අහස කඩා ගෙන වැටුණත් කමක් නැහැ වාගේ තමුන්නාන්සේ ඕනෑම දෙයකට හිතා වෙලා බොහොම සැහැල්ලුවෙන් ඉන්න අමාත්‍යවරයෙක්. හැබැයි, මේ අමාත්‍යාංශයේ තිබෙන බර මේ රටටවත් දැනිලා තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. එක පැත්තකින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට මහ ලොකු අසාධාරණයක් වෙනවා. අනෙක් පැත්තෙන් ආචාර්යවරයාට අසාධාරණයක් වෙනවා. ඒ වාගේම, විශ්වවිද්‍යාල පද්ධතියේ, අධ්‍යාපන ක්‍රමයේ යාවත්කාලීන නොවීම, විෂයයන් සංශෝධනය නොවීම මහා ගැටලුවක් වෙලා තිබෙනවා.

තමුන්නාන්සේට අමාත්‍යාංශ දෙකක් භාර දීලා තිබෙනවා. ඒ මහාමාර්ග සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශ දෙක අතරවත්, මහාමාර්ග අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය අතරේවත් අඩුම තරමින් අවබෝධතා ගිවිසුමක් හැදිලා තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, විශ්වවිද්‍යාලයෙන් ගන්න පුළුවන් විශේෂඥ සහාය. එක පැත්තකින් විශ්වවිද්‍යාලයෙන් විශේෂඥ සහාය ගන්න MoU එකක් අත්සන් කරන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අමාත්‍යාංශයට අවශ්‍ය සහාය ශිෂ්‍යයන්ගෙන් සහ දේශකයන්ගෙන්, ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් ලබා ගන්න පුළුවන්. අද ඒ අවස්ථාව කොයි තරම් දුරට ලබා ගෙන තිබෙනවාද කියලා මා දන්නේ නැහැ.

අද තිබෙන පළමුවැනි බෙදවාචකය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයෝ එනවා; ශිෂ්‍යයෝ පුරවනවා. අද මේ සභාවේත් කියැවුණා, ගිය අවුරුද්දට වඩා දරුවන් දෙදහස් ගණනක් වැඩිපුර ඇතුළත් කරගන්න කටයුතු කර තිබෙනවා කියලා. මා අහනවා, නිදහස් අධ්‍යාපනය කියලා කියන්නේ මේකටද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශිෂ්‍යයෙකුට hostel එකක් දෙන්නේ පළමුවැනි අවුරුද්දේයි, අන්තිම අවුරුද්දේයි විතරයි. අනෙක් අවුරුදු දෙකේ ඒ ළමයා ලගින්නේ පාරේද? කැබිතිගොල්ලෑවෙන්, මොනරාගලින්, බණ්ඩාරවෙලින්, හල්දුම්මුල්ලෙන් එන ශිෂ්‍යයා පාරේද ලගින්නේ? නිදහස් අධ්‍යාපනය කියලා මහ ලොකුවට වර්ණ කරලා, හැඩ කරලා, උඹලාගේ ආණ්ඩුවට වඩා මෙන්න අපේ ආණ්ඩුව කරනවායි කියලා අපි කියන්නේ මේකටද? නමුත් අපි බලාපොරොත්තු වන්නේ මේක නොවෙයි.

ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමන්ලාට මතක් කරනවා ඊළඟ ප්‍රශ්නය. පාරේ එන විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට බැටන් පොලු ප්‍රහාර

එල්ල කරන පොලිස් නිලධාරින්ට අමතක වෙනවා, එල්ලය බලා ගෑස් උණ්ඩය එල්ල කරන පොලිස් නිලධාරියාට අමතක වනවා, මේ රටේ අනාගත නායකත්වය ගන්න ඉන්නේ මේ දරුවන් බව. කුඩු ගහලා, මිනිහෙක් මරලා, පාරේ පැනලා යන හොරාට උණ්ඩය කෙළින් එල්ල වෙන්නේ නැති පොලිස් නිලධාරියාගේ බැටන් පොලු ප්‍රහාරය එල්ල වෙනවා විශ්වවිද්‍යාල ශිෂ්‍යයා වෙනුවෙන්. හැබැයි, මට තිබෙන කනගාටුව මේකයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාගෙන් එක් කෙනෙකුගේවත් දරුවෝ ඒ විශ්වවිද්‍යාල ඇතුළේ නැහැ. ඒ බැටන් පොලු ප්‍රහාර කන්නේ අපේ දරුවෝ නොවෙයි; අපි - තමුන්නාන්සේලාගේ දරුවෝ නොවෙයි. ඒ බැටන් පොලු ප්‍රහාර එල්ලවන දරුවන් අතරේ තමුන්නාන්සේලාගේ දරුවන් හිටියා නම්, තමුන්නාන්සේලා පොලීසියට කථා කරලා කියනවා ගහන්න එපා කියලා. එහෙම වුණා නම්, පූජිත් ජයසුන්දර මහත්තයාගේ උඩ අග්ගිස්සේ ඉඳලා මුලටම නැව්ලා, ආයෙත් මැදිනුත් පුළුවන් නම් නවා ගන්න හදනවා. ඒකයි ඇත්ත. හැබැයි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත් පූජිත් ජයසුන්දර මහත්තයා පොලිස්පති විධියට කටයුතු කරන මේ කාලයත් දරුවන්ගේ ඔළු පළා අමු කුණුහරුපයෙන් බැනලා එළවන කාලයක් බවට පත් වෙලා තිබීම පිළිබඳව මම කනගාටුවට පත් වනවා. මම ජනාධිපතිවරයා, මේ පාර්ලිමේන්තුවේ අගමැතිවරයා හෝ මූලාසනයේ ඉන්න මන්ත්‍රීවරයා සිටින පුටුවට තව අවුරුදු 30ක් පමණ යනකොට දැන් අධ්‍යාපනය ලබන හතළිස් ලක්ෂයෙන් කෙනෙක් නේද එන්නේ කියලා මම තමුන්නාන්සේලාගෙන් අහනවා. ඒක තමයි ඇත්ත. ඒක තමයි අපි හිතන්න ඕනෑ දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මන්ත්‍රීවරු කීප දෙනෙක් කළ කථා මම අහගෙන සිටියා. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, "අපි ඉදිරි දිනයකදී අපේ ඉල්ලීම් දිනා ගන්න පාරට බහිනවා. එහේ ඉන්න වෘත්තිකයෝ, බුද්ධිමතුන් සියලු දෙනා එක්ක පාරට බහිනවා, පුළුවන් නම් නවත්වා පෙන්වන්න, නවත්වා බලමු" කියලා. මට තිබෙන ප්‍රශ්නය මේකයි. මම තෘෂ්ණාව තිබෙන මිනිහෙක් නොවයි. මේ රට කැඩෙනවා, මේ අපේ කැල්ල, ඒ නිසා මේක නවත්වා ගන්න ඕනෑය කියන හැඟීමක් නොවෙයි මට තිබෙන්නේ. මම කියන්නේ සිංහල, මුස්ලිම්, දෙමළ කියන ජන වර්ග තුනටම එකට අත්වැල් බැඳගෙන, කරට අත දමාගෙන ඉන්න පුළුවන් කියලායි. ඒ විධියට මේ පාර්ලිමේන්තුවේ අපට ඉන්න පුළුවන් නම්, මේ රටේත් එහෙම ඉන්න පුළුවන් වන්න ඕනෑ. ඒක පමණයි ප්‍රශ්නයක් විධියට මට තිබෙන්නේ.

අද උතුරෙන් ආපු බහුතර දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ කථා කළේ උතුරේ ප්‍රශ්න ටික පමණයි. ප්‍රධාන විපක්ෂයේ ප්‍රශ්නය වුණේ උතුර පමණයි. සම්පන්දන් මැතිතුමාගේ ප්‍රධාන විපක්ෂයේ පළවෙනි කාරණය වුණේ උතුරේ ප්‍රශ්න විතරයි. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීතුමා විනාඩි 30ක් කථා කළා. ඒ විනාඩි 30 ඇතුළේම කථා කළේ SAITM ප්‍රශ්නය පමණයි. මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් මම අහනවා, අතීතයේ විශ්වවිද්‍යාලයේ සිටි මේ රටේ බුද්ධිමතුන්ගෙන් මම අහනවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පාරට බැස්සේ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් විතරද කියලා. නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමාජයේ ප්‍රශ්න එනකොට, සමාජයේ විකෘතිභාව එනකොට, රට අනික් පැත්තට යනකොට විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ පෙරමුණ ගත්තා. නමුත්, අද එක්තරා දේශපාලන කණ්ඩායම් විසින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයා කොහේ හෝ කණුවක බැඳ තබා සීමාවක් ඇතුළේ පමණක් ඔවුන් හසුරුවමින් ඉන්නවා. හැබැයි, මට තිබෙන ප්‍රශ්නය මෙයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ විශ්වවිද්‍යාලවල ඉන්න දහස් ගණනක් වන සහෝදර ශිෂ්‍යයින්ගෙන් මම මෙහෙම අහනවා.

"නුඹලා නිදහස් අධ්‍යාපනය රැක ගෙන, උපාධි ලෝගුව දමා ගෙන, උපාධි සහතිකය අරගෙන පාරට බහින කොට කෝ නුඹලාට රටක්." නුඹලාට රටක් නැහැ. නුඹලා නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් පාරට බැහැ බැහැ හිටපල්ලා. නුඹලා පාරට බැස්සාට නුඹලාට රටක් නැහැ. අර කිරිබණ්ඩාගේ පුතා කුරුටු ගීය ලිව්වා වාගේ ආපහු සැරයක් කුඹුර කොටන්න විතරයි නුඹලාට ඉතිරි වෙලා තිබෙන්නේ. හැබැයි, මේ වෙනකොට අපේ රටේ කෘෂිකර්මයත් විනාශ කරලා අවසන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ අපේ තාත්තලා කුඹුරට බහින කොට උදැල්ලට වැන්දා, ගරු ඇමතිතුමනි. වී ටික කුරුණියට දමන කොට කුරුණියට වැන්දා. වී ටික ගෝනියට දමනකොට ගෝනියට වැන්දා. වී ටික කොටා ගෙන හාල් ටික ගෙදරට ගෙනැල්ලා ළිපේ තියන කොට අපේ අම්මා ළිපටත් වැන්දා. ඒවා අපට මතකයි. එදා කෘෂිකර්මයට එහෙමයි ආදරය කළේ. හැබැයි, අද අපේ රටේ ගොවියෝ කුඹුරට ගිනි තියනවා. ගොවියා කුඹුරට ගිනි තියද්දී අනික් පැත්තෙන් රුපියල් කෝටි දෙකකට ආසන්න මුදලක් කෘෂිකර්ම අමාත්‍යාංශ ගොඩනැඟිල්ලට වෙන් කර ගන්නවා. ගරු අමාත්‍යතුමනි, මේකද යහ පාලනය? තමුන්නාන්සේගේ හෘදය සාක්ෂියට කථා කරන්න. මේකද යහ පාලනය?

මගේ වයස අවුරුදු 35යි. ඕනෑ නම්, මිනිසෙකු විධියට මම තව අවුරුදු 30ක් මේ රටේ ජීවත් වෙයි. තව අවුරුදු 30කින් හෝ ඊට කලින් මම මැරිලා යයි. වෙසක් පෝය හැටියට ගත්තොත් මට තිබෙන්නේ තව වෙසක් පෝය 30යි. හැම වෙසක් පෝයටම සිල් ගත්තොත්, මට වෙසක් පෝය 30යි -දවස් 30යි- සිල් ගන්න පුළුවන්කම තිබෙන්නේ. අපි මේ රටට ඉතිරි කරලා යන්න ඕනෑ මොනවාද? අපි මේ රටට අතහැරලා යන්න ඕනෑ මොනවාද? ගරු ඇමතිතුමනි, මේ දේවල් මම තමුන්නාන්සේ කෙරෙහි ද්වේශසහගතව කියනවා නොවෙයි. මේ පාර්ලිමේන්තුවේදී මම තමුන්නාන්සේගෙන් ගෞරවනීය ඉල්ලීමක් කරන්න කැමැතියි. තමුන්නාන්සේ යටතේ අමාත්‍යාංශ දෙකක් තිබෙනවා. මම තමුන්නාන්සේගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, තමුන්නාන්සේ එක අමාත්‍යාංශයක වැඩ කරන්න කියලා. තමුන්නාන්සේට අමාත්‍යාංශ හයක්-හතක් තිබුණා කියලා තමුන්නාන්සේගේ ගෞරවය වැඩි වන්නේ නැහැ. තමුන්නාන්සේගේ කාර්ය සාධනය වැඩි වීම මත තමයි තමුන්නාන්සේට මේ රටේ ගෞරවයක් නිමිවන්නේ. උසස් අධ්‍යාපනය කියන්නේ මහා බලගතු අමාත්‍යාංශයක්. මේ රටේ හැඩය තීරණය කරන අමාත්‍යාංශය, "උසස් අධ්‍යාපන අමාත්‍යාංශය"යි.

ගරු ඇමතිතුමනි, මම මේ වෙලාවේ තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. අපි විශ්වවිද්‍යාලය තුළ සිටින ශිෂ්‍යයන්ගේ භෞතික පහසුකම් පමණක් නොවෙයි සම්පූර්ණ කරන්න ඕනෑ. මම ගියේ රුහුණු විශ්වවිද්‍යාලයට. මම මේ කරුණ නොබියව කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ආචාර්යවරු ඇවිල්ලා උගන්වද්දී මෙ ලෝ දෙයක් තේරෙන්නේ නැහැ. මේ ලෝ හසරක් තේරෙන්නේ නැහැ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගෙන් තමුන්නාන්සේ අහන්න. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලයෙන් අහන්න. UGC එකෙන් අහන්න. සමහර කථිකාචාර්යවරු, ආචාර්යවරු ඇවිල්ලා උගන්වනවා, මෙලෝ හසරක් තේරේනේ නැහැ. ආචාර්යතුමා උගන්වනවා, අර කොළයේ අත්සන තියන්න ඕනෑ නිසා ශිෂ්‍යයන් ගිහිල්ලා වාඩි වෙලා ඉන්නවා. ඇයි? ඒකට ආචාර්යවරයාට බැණලා හරි යන්නේ නැහැ, ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි. ආචාර්යවරයකු විධියට තෝරා ගන්නකොට ඒ විශ්වවිද්‍යාලය ඇතුළේ හොඳම ප්‍රතිඵලය ගත්තු මිනිහා විතරක් ඒකට අරගන්න ඕනෑ කියන නිර්ණායකය විතරක් හරි යන්නේ නැහැ. Interview එකේ අන්තිම විනාඩි 10 තුළ presentation එකක් කරලා, ඒ presentation එක හොඳට කළා කියන නිර්ණායකය ආචාර්යවරයෙක් විධියට කටයුතු කිරීම සඳහා සුදුසුකමක් වන්නේ නැහැ.

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

ගරු ඇමතිතුමනි, මම එක දෙයක් තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. ආචාර්යවරයකු විධියට කෙනෙකු බඳවා ගන්නවා නම්, ඒ කෙනාට ආයතනික පරිසරයක් ඇතුළත පුහුණුව ලබා දෙන්න. ඒකයි පළමු වැනි කාරණය. ආචාර්යවරයෙක් ඇවිල්ලා, කළමනාකරණය ගැන උගන්වනවා. හැබැයි, ආයතනයක් තුළ කළමනාකරණය වෙන්නේ කොහොමද කියන කාරණය ගැන දන්නේ නැහැ. ආයතනයක් ඇතුළේ කළමනාකරණය වෙන ආකාරය ගැන දැන ගත්තොත් තමයි විශ්වවිද්‍යාලයට ඇවිල්ලා ප්‍රායෝගිකව උගන්වන්න පුළුවන්කම ලැබන්නේ. ඒ දැනුම නැහැ. ඒ නිසා ඔවුන් නිකම්ම නිකම් දරුවන්ට උගන්වනවා. දරුවෝ කුප්පියක් දා ගන්න එක තමයි කරන්නේ. ගරු ඇමතිතුමනි, කුප්පියක් දා ගන්නවා කියන්නේ subject එක දන්නා ශිෂ්‍යයකුගෙන් අනෙක් ශිෂ්‍යයන් ඉගෙන ගැනීමයි. ඒකට කියන්නේ "කුප්පිය" කියලා. ඉතින් ඒ කුප්පිය නැති වුණා නම් විශ්වවිද්‍යාලවල results ගන්න දරුවන් නැහැ. ඒක තමයි ඇත්ත. මේ අධ්‍යාපන ක්‍රමය මහා බොරුවක් ගරු ඇමතිතුමනි. මහා බොරුවක්. තමුන්නාන්සේ බලන්න. මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා, මේ අවුරුදු හතර ඇතුළත තමුන්නාන්සේට පුළුවන්, මේ රටේ උසස් අධ්‍යාපනය ඉහළම තත්ත්වයකට ගෙනැල්ලා කීර්තිමත්ම උසස් අධ්‍යාපන ඇමතිතුමා වෙන්න. ගරු ඇමතිතුමනි, මිනිහෙක් මැරෙනකොට ඉතුරු වෙන්න ඕනෑ එච්චරයි කියලායි මම කියන්නේ. මැරෙනකොට ඉතුරු වෙන්නේ මම කවුද, මම මොනවාද කළේ කියන එක විතරයි. තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේද, විපක්ෂයේද කියන එක නොවෙයි අදාළ වන්නේ. ඉන්නා තැන ඉඳගෙන මට කරන්න පුළුවන් මොනවාද කියන එක විතරයි ඕනෑ. කවුරුවත් නැති මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේ වාඩිවෙලා ඉන්න එක ගැන මම සතුටට පත් වෙනවා.

ගරු ඇමතිතුමනි, දැන් විෂයයක් ගෙනැල්ලා තිබෙනවා, විශ්වවිද්‍යාලය ඇතුළේ ක්‍රමවේදයක් "Eco-concept" එක කියලා. මේක ගැන ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාත් කිව්වා. ඉතින් මේ විවේචන නොවෙයි, මේවා නොකරත් බැහැ; කරලාත් බැහැ; කළාට වැඩකුත් නැහැ. මේවා හරියට "බීරි අලින්ට විණා වයනවා වාගේයි" කියලා මට හිතෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පිරිසක් ඇවිල්ලා අමාත්‍යාංශයත් එක්ක, UGC එකත් එක්ක කථා කළාට වැඩක් වෙයිද කියලා මම තමුන්නාන්සේගෙන් අහනවා. වැඩක් නැහැ. ඇයි? උත්තරය හම්බවෙන්නේ මෙතැනින්. තමුන්නාන්සේලාගේ ආයතන තුළ තමුන්නාන්සේලා නිකම්ම නිකම් නිකමුන් විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ඇත්ත. Eco සංකල්පය ඇවිල්ලා තිබෙනවා. Eco සංකල්පය තුළින් වියදම අවම කරන එකයි මේ කරන්න යන්නේ. විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා තමුන්නාන්සේ අහන්න. Roneo කරලා දුන්නා, කොළ ටිකක්. Handout එක දුන්නේ කොළ ටිකක්. දැන් ඒක e-mail එකට එවන්න විධියක් හදලා තිබෙනවා. ගරු ඇමතිතුමා, මම විශ්වවිද්‍යාලයට යනකොට මට පරිගණකයක් තියා පළමු දවසේ බස් එකේ යන්න සල්ලි තිබුණේත් නැහැ. පරිගණකයක් තියා පළමු දවසේ විශ්වවිද්‍යාලයට යන්න - මාතරට යන්න -සල්ලි තිබුණේ නැහැ. තමුන්නාන්සේලා concepts හදනවා. තමුන්නාන්සේලා concept එක හදන්නේ "ලක්ෂ 10ක් රැකියා" කියලා යි. උඩ හදනවා concept එක, යට ඒක ක්‍රියාත්මක කරනවා. මඟුලක්වත් වෙන්නේ නැහැ. ඕක තමයි ඇත්ත. මම කියනවා, තමුන්නාන්සේ බහින්න එළියට. ඔය වීරත්වයෙන් එළියට බහින්න. "මම ඇමති කෙනෙක්" කියන මානසිකත්වයෙන් එළියට බහින්න. මේ රටේ සාමාන්‍ය මිනිහෙක් විධියට තමුන්නාන්සේ හිතන්න. මේ රටේ සාමාන්‍ය මිනිහෙක් විධියට තමුන්නාන්සේ අගමැතිතුමාටත් උපදෙස් දෙන්න. තමුන්නාන්සේට තවත් අගමැතිවරයාගෙන් සුදු හුණු ගාගන්න දෙයක් නැහැ. තමුන්නාන්සේට අගමැතිවරයාගේ හිතෙෂියෙකු වෙන්න, අප්‍රමාණව එතුමාට ළංවෙන්න තවත් වුවමනාවක් නැහැ. හැබැයි, අපේ රටේ නායකයන්ට තිබෙන ප්‍රශ්න මේවාද, ගරු ඇමතිතුමනි? අපේ රටේ නායකයා වන ජනාධිපතිවරයාට තිබෙන ප්‍රශ්නය, කොහොමද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මගේ පක්ෂය කර ගන්නේ කියන එකයි. ආවේ, අවුරුදු 5කට කියලායි. නිර්පාක්ෂිකයි කියලායි ආවේ. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මගේ කර ගන්නේ කොහොමද කියන එකයි දැන් එතුමාට තිබෙන ප්‍රශ්නය. එතැනින් එහාට දෙයක් තිබෙනවාද? නැහැ. එතැනින් එහාට තමුන්නාන්සේ දන්නවාද? නැහැ.

ඊළඟට, එක්සත් ජාතික පක්ෂයට තිබෙන ප්‍රශ්නය මොකක්ද? එක්සත් ජාතික පක්ෂයට තිබෙන ප්‍රශ්නය ගැන මම කියන්න යන්නේ නැහැ. මම මේ දේශපාලන ක්ෂේත්‍රයට නවකයෙක්. හැබැයි, සමහර දේවල් අපි දන්නවා; දකිනවා. ඒ දේවල් මේ රටට කියන්න ඕනෑ නැහැ. ගරු අමාත්‍යතුමනි, මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සහෝදරත්වයෙන් සිටිය බව මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, නවක වදයට අති බහුතරයක් බණිනවා නේ. "නවක වදය" කියන එකේ තේරුම දැන ගෙනද ඔය කථා කරන්නේ?

නවක කාලය තරම් අත්දැකීම් ලැබෙන කාලයක් කොහේවත් නැහැ, ගරු ඇමතිතුමනි. මම එන්නේ කැබතිගොල්ලාවේ ඉඳලා නම්, මේ කැබිතිගොල්ලාවේ කොල්ලෙක් කියා හඳුනාගැනීමටයි කැබිල්ලා කියලා කාඩ් එක දමන්නේ. මෙන්න කැබිල්ලා. පාරේ වැටිලා හිටියත් දන්නවා, මෙන්න "කැබිල්ලා" කියලා. මාස තුනක් එක පේළියට ගමන් කරනකොට අපි මුහුණු ටික හඳුනා ගන්නවා. මෙන්න "කැබිල්ලා" කියලා කවුරුත් හඳුනා ගන්නවා. සිංදුවක් කියන්න කිව්වාම, ඔහුට තිබෙන හැකියාව අපි හඳුනා ගන්නවා. හැබැයි ගරු ඇමතිතුමනි, ඒක විකෘති කරලා ඉවරයි. දේශපාලන හස්තය විසින් ඒ උප සංස්කෘතිය විනාශ කළා. මා විශ්වවිද්‍යාලය ඇතුළේ හිටපු මිනිහෙකු විධියට, නවක වදය කියන එක හරි ආදරණීය විධියට වින්ද මිනිහෙක්. Hostel එකේදී කලිසම ගලවන්න කිව්වාම කොල්ලෝ ඉන්න තැන කලිසම ගලවන එක ප්‍රශ්නයක් නොවෙයි, ගරු ඇමතිතුමා. හැබැයි විශ්වවිද්‍යාලයෙන් පිටත සිටින අය කිව්වේ කොහොමද? "හෙලුවෙන් ඉන්න ඉඩ සලස්සනවා" කියලායි. ගරු ඇමතිතුමනි, හැබැයි ඇඳුම් ඇඳගෙන හිටියාට මේ ආණ්ඩුවේ කී දෙනෙක් නම් සමාජය ඉදිරියේ හෙලුවෙන් ඉන්නවාද? අන්න, සමාජ ජාලා වෙබ් අඩවිවල අපේ ඇමතිවරුන් නිරුවත් කරලා තිබෙනවා. ඒ ඇමතිවරුන්ට ගිහිල්ලා බලන්න කියන්න, තම තමන්ගේ රූපය දිහා. අන්න, නිවැරදි රූපය සමාජ ජාලා වෙබ් අඩවිවල තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, මේ අවුරුදු පහ ඇතුළත මේ රටේ අධ්‍යාපනය කෙරෙහි වැඩි ඕනෑකමකින් කටයුතු කරලා, මේ රටේ අධ්‍යාපනය නිසි තැනට ගෙන යන්න තමුන්නාන්සේට හැකියාව ලැබේවි කියලා මම විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, මම විශ්වාස කරන ආකාරයට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය බද්ද විය යුත්තේ මහාමාර්ග අමාත්‍යාංශය සමඟ නොවෙයි, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟයි. අපේ දරුවන්ගේ අම්මලා පහ වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් එල්ලා ගෙන පන්තිවලට යනවා. O/L Exam එක කරන කොට ටිකක් අත් හැරලා දමනවා. ඊළඟට, මොනවා හරි දෙයක් උකස් තියලා උසස් පෙළ පන්තිවලට යවනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ විශ්වාස කරන්න, අපේ ගම්වල සමහර අම්මලා දලු කඩන එක නවත්වලා රට වී කොටන්න ගිය අවස්ථා තිබෙනවා. අල්ලපු ගෙදර වී කොටන්න ගියා. ඇයි? මෝල් ගස් දෙකෙන් වී කෙටුවොත් විතරයි හාල් සේරුවක් හම්බ වුණේ. එහෙමයි ඔවුන් තමන්ගේ දරුවන් විශ්වවිද්‍යාලයට යැව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුප්පත් පවුලකින් පාර්ලිමේන්තුවට ආපු තරුණයකු විධියට මම දන්නවා,

හාල් නැතුව ගෙදර හිටපු දවසට තමයි දුප්පත්කමේ තරම දැනෙන්නේ කියලා. අණ්ඩ දමපු කලිසම ඇඳගෙන ගිය නිසා තමයි මට දුප්පත්ම පවුලක සිටින දරුවකුගේත් හැඟීම් තේරෙන්නේ. මාගේ ආසනය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණු එක මන්ත්‍රීවරයෙක් මේ වන විට හැම තැනම කිය කියා යනවා, ජීවිතේට පාර්ලිමේන්තුවට එන්න බැරි එවුන්ටත් "මහින්ද සුළඟ" නිසා පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම ලැබුණාය කියලා. දේශපාලනඥයා කියන මිනිහා හැමදාම මිනිසුන් ඉදිරියට ගිහිල්ලා කියන්නේ, "මම තමුන්නාන්සේලා වෙනුවෙන් පෙනී ඉන්නවා, අපි දුප්පත් තමුන්නාන්සේලා වෙනුවෙන් පෙනී ඉන්නවා" කියලායි. හැබැයි දුප්පත් මිනිහෙකුට කවදාවත් උඩට එන්න දෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒක තමයි ඇත්ත කථාව. කවදාවත් උඩට එන්න දෙන්නේ නැහැ. හැබැයි දුප්පත් මිනිහෙකුගෙන් අහන්න, "ඔබ රටට කොයි තරම් ආදරේද? ඔබ මේ රටේ මිනිසුන්ට කොයි තරම් ආදරේද?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, මේ ලෝකයේ තිබෙන්නේ තරගකාරී අධ්‍යාපන රටාවක් බව. Hostel එකක් නැති දරුවෝ අපේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගනිද්දී තව දරුවෙක් ඉගෙන ගන්න ඇමෙරිකාවට යනවා. මාතර රුහුණු විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්ත දරුවාත්, ඇමෙරිකාවේ ඉගෙන ගත්ත දරුවාත්, දෙදෙනාම අවසානයේදී job එකක් ගන්න එක තැනකට එනවා. ඒ දෙදෙනා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට ආවොත් පිට රට ඉගෙන ගත්ත මිනිහාටද, රුහුණු විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්ත මිනිහාටද job එක දෙන්නේ කියලා මම තමුන්නාන්සේගෙන් අහනවා, ගරු ඇමතිතුමනි. කාටද, job එක දෙන්නේ? Job එක දෙන්නේ අර පිට රට ඉගෙන ගත්ත මිනිහාට. ඇයි? ඌට තමයි ඔළුව තිබෙන්නේ; දැනුම තිබෙන්නේ කියලා තමුන්නාන්සේලා තීරණය කරන නිසා. හැබැයි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගමන් කළ යුතු දිශාව මොකක්ද කියන එක පිළිබඳව කාටවත් තේරුමක් නැහැ. කාටවත් හැඟීමක් නැහැ. ඒක සිංහල වෙන්න පුළුවන්; දෙමළ වෙන්න පුළුවන්; මුස්ලිම් වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි උතුරේ ඇති වුණු සිද්ධිය. සිංහල ශිෂ්‍යයකුට එළුව එළවා ගහන කොට ඒක බෙදා ගත්ත විධිය හරිද කියලා දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ගෙන් මම අහනවා අපි ඒක බෙදා ගත්තා. අපි ඒක බෙදා ගන්න විධියක් තිබුණා නේ. සංහිඳියාව ඇතුළේ ඒක බෙදා ගත්ත විධියක් තිබුණා. හැබැයි බෙදා ගන්න ඕනෑ එහෙමද, ගරු ඇමතිතුමනි? ඒක බෙදා ගන්න තිබුණේ එහෙම නොවෙයි. දෙදෙනාම ශිෂ්‍යයෝ කියන ගණයට දමලායි ඒක බෙදා ගන්න තිබුණේ. දෙමළද, මුස්ලිමිද, සිංහලද කියලා නොවෙයි, "මේ අපේ ශිෂ්‍යයෙක්" කියන හැඟීමෙනුයි ඒක බෙදා ගන්න තිබුණේ. හැබැයි ඒ පසුතැවීම කවදාවත් තමුන්නාන්සේලාට හඳුන්න බැහැ. ඒ ගුටි කාපු ශිෂ්‍යයා සත්‍යය දන්නවා. ඒ ගුටි කාපු ශිෂ්‍යයාගේ හෘදය සාක්ෂිය සත්‍යය දන්නවා. අපි අතර තිබෙන්නේ ජාති භේදයක්, ආගම් භේදයක් නොවෙයි. මේ රටට සත්‍ය වපුරන්නයි අපට වුවමනා කරන්නේ, ගරු ඇමතිතුමනි. ඒකයි අපේ වුවමනාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල පරිසරය තුළ නවකයන් අතර ගොඩ නැඟී තිබුණු සහෝදරත්වය මේ වන විට සම්පූර්ණයෙන්ම අවසන්. ඒ කාලයේ විශ්වවිද්‍යාල පරිසරය තුළ නවකයන් අතර සහෝදරත්වයක් ගොඩනැඟිලා තිබුණා. දුප්පත් පවුලකින් ඇවිල්ලා ඉන්නේ කවුද, එයා කොයි තරම් දුප්පත්ද, එයාට උදව් කරන්න ඕනෑ කොහොමද කියලා ඉස්සර අපි දන්නවා. හැබැයි දැන් එහෙම හඳුනා ගැනීමක් සිදු වන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් තමුන්නාන්සේ මේ ගැන අහලා බලන්න. දැන් assignment එකක් කරන්න දුන්නාම මුලින්ම කරන්නේ නම් ටික දමන එකයි. රුවන්, තරංග, චාමික ආදී වශයෙන් නම් ටික දමනවා. ඊට පසුව එක එක් කෙනා ඒ assignment එක කරන්න දායක වුණු ප්‍රමාණය කොච්චරද කියලා සටහන් කරනවා. එක් කෙනෙක් සියයට 85යි; අනෙක් කෙනා සියයට 20යි; අනෙක් කෙනා සියයට 10යි කියලා group එකේ නායකයා ගිහිල්ලා lecturerට වාර්තාවක් දෙනවා. හැබැයි එදා එහෙම එකක් තිබුණේ නැහැ. මගේ සහෝදරයකුට මේ assignment එකට සම්බන්ධ වෙන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, එදා මම ඒක දැනගෙන සිටියා. නවකයන් කාලයේ දී සිදු වූ හඳුනා ගැනීමත් සමඟ ඔහුගේ ගෙදර ප්‍රශ්න තිබෙනවා, අම්මාට අසනීපයි, ඒ නිසා අපේ සහෝදරයාට එන්න වෙන්නේ නැහැ කියලා මම දැන ගෙන හිටියා. අනෙක් කෙනා මෙසන් වැඩපොළක බදාම අනන්න යනවා කියලා අපි දැන ගෙන හිටියා. ඒ නිසා assignment එකට ඔහුගේ දායකත්වය සියයට 10යි කියලා මම දැම්මේ නැහැ. විශ්වවිද්‍යාල තුළින්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් තුළින් අද ඒ සහෝදරත්වය සම්පූර්ණයෙන්ම ඇතට ඇදගෙන ගිහිල්ලා ඉවරයි. ගරු ඇමතිතුමනි, යහපත් මිනිසුන් හදන්න, ඒ වාගේම මේ රට ඉදිරියට ගොඩ නඟන්න විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ගන්න පුළුවන් කාර්ය භාරය අති විශාලයි කියලා මම විශ්වාස කරනවා. මා විශ්වාස කරනවා, නිලධාරීන් හැටියට වාඩි වෙලා ඉන්න අය කවදා හෝ දවසක විශ්වවිද්‍යාලයක හිටපු අයයි කියලා.

ගරු ඇමතිතුමනි, මට මතකයි, එක අවස්ථාවකදී මගේ විශ්වවිද්‍යාලය මාරු කරන්න වුවමනාවක් තිබුණු බව. එතකොට මා ස්වාධීන රූපවාහිනියේ වැඩ කරනවා. මට එහි වැඩ කරන්න විධියක් නැති නිසා මට විශ්වවිද්‍යාලය මාරු කරන්න අවශ්‍ය වුණා. මා හත් වතාවක් UGC එකට ගියා. UGC එකේ එක් කෙනෙක්වත් මාව ඇතුළට ගත්තේ නැහැ. ඔන්න වුණු දේ. UGC එකට හත් වතාවක් ගියා. එක වතාවක්වත් මාව ඇතුළට ගත්තේ නැහැ. මගේ ප්‍රශ්නයට ඇහුම් කන් දුන්නේ නැහැ, ලියුමක් දීලා යන්න කිව්වා. මා විශ්වාස කරනවා, දිරලා නැත්නම් ඒ ලියුම කොහෝ හෝ තැනක ඇති කියලා. තමුන්නාන්සේලා කියනවා, ශිෂ්‍යයන් පාරට බහිනවා වැඩියි කියලා. හැබැයි අද ශිෂ්‍යයකුගේ ප්‍රශ්නයක් පිළිබඳව පෞද්ගලිකව හෝ ගිහින් කථා කර ගන්න තැනක් නැහැ. ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න පිළිබඳව කථා කර ගන්න තැනක් නැහැ. ඒක තමයි ඇත්ත.

මේ පාර්ලිමේන්තුවේදී මා තමුන්නාන්සේලාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන, මේ රට හදන්න, මේ රට ගොඩ නඟන්න දායක වන අය විධියට තමුන්නාන්සේලාගෙන් මා එකම එක ඉල්ලීමයි කරන්නේ. මේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එකට එකතු කරලා එක අමාත්‍යාංශයක් කරන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ දරුවෝ, ගුරුවරු වේගයෙන් ඉදිරියට යනවා; උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක තැන නතර වෙලා තිබෙනවා. මේක හරියටම එකම දුම්රිය මාර්ගයේ ශීඝ්‍රගාමී දුම්රියයි, මන්දගාමී දුම්රියයි යනවා වාගෙයි. මන්දගාමී දුම්රිය හෙමිහිට ඉදිරියෙන් යනවා. ශීඝ්‍රගාමී දුම්රිය පිටුපසින් යනවා. එතකොට දුම්රිය දෙකම මන්දගාමීයි. ගරු ඇමතිතුමනි, දැන් වෙලා තිබෙන්නේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මන්දගාමී ගමනක යනවා, අධ්‍යාපන අමාත්‍යාංශය ශීඝ්‍රගාමී දුම්රියක් විධියට යනවා. දෙක එක තැනකදී පැටලෙන බව මතක තබා ගන්න. දෙක එකට හැප්පෙනවා. තමුන්නාන්සේලාට හැප්පෙන එක දැන් තේරෙනවා. හැබැයි තමුන්නාන්සේලාට කරන්න දෙයක් නැහැ. හේතුව, කරන්න දෙයක් නැතිකම නොවෙයි. එයට හේතුව වෙලා තිබෙන්නේ ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳ දැක්මක් - vision එකක් - නැතිකම විතරයි.

ජීවත් වන කාලය තුළ පක්ෂය රැක ගන්න අසත්‍ය ප්‍රකාශ කරනවා. එහෙම තමයි දේශපාලනඥයන්ගේ විධිය. ඒ අසත්‍ය

[ගරු එස්. ශ්‍රේමරත්න මහතා]

දේවල් කියන්න. හැබැයි රට හදන්න මේ පාර්ලිමේන්තුවට ආපු අය විධියට, මේ මාතෘ භූමියේ ඉපදුණු සුජාත දරුවන් විධියට රට වෙනුවෙන් තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියත් එක්ක වැඩ කරන්නය කියන ඉල්ලීම මා කරනවා. ඒ ඉල්ලීම කරමින්, මේ රටේ නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත් දරුවකු විධියට, නිදහස් අධ්‍යාපනයේ පුතකු විධියට මා ප්‍රාර්ථනා කරනවා, මේ ගෞරවනීය මාතෘ භූමියේ නිදහස් අධ්‍යාපනය තව තවත් රැකේවා, මේ රට හදන මිනිසුන් නිදහස් අධ්‍යාපනයෙන් තව තවත් බිහි වේවා, කවුරුන් පත් වුණත් මේ රටේ ආණ්ඩුවලට, ඇමතිවරුන්ට ඒ වෙනුවෙන් උදව් කරන්නට හැකියාව ලැබේවා!යි කියා. එසේ ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි! ස්තුතියි.

[ප.ප. 5.35]

ගරු ඊ. සරවනපවන් මහතා
(මාණ්පුමිකු ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

The Hon. Presiding Member, I have some issues to bring to the attention of the Minister of Higher Education and Highways and the Chairman of the University Grants Commission. But, I am going to speak in Tamil.

இந்தவேளையிலே, பரவலான முறையில் பலரதும் நாட்டினதும் கவனத்திற்கு வராத விடயத்தை இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன். அதன்மீது பல்கலைக்கழக மாணியங்கள் ஆணைக்குழுவும் உயர் கல்வி அமைச்சரும் உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டும் என்றும் எதிர்பார்க்கிறேன்.

யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் கல்வி நடவடிக்கைகளுக்காகத் தெரிவுசெய்யப்பட்ட மகாதேவன் விஜயகுமார் என்ற மாணவன் தனது கற்றல் நடவடிக்கைகளை நிறுத்தி விட்டார். பகிடிவதை - "ராக்கிங்" -என்ற பெயரில் அவர் வதைக்கப்பட்டதே இதற்கான காரணம். இந்த விடயம் தமிழ்ப் பத்திரிகைகளில் செய்தியாக வெளிவந்தபோதும் அந்த மாணவன் தனது கல்வியைத் தொடர்வதற்கு வேண்டிய நடவடிக்கை எதனையும் யாழ். பல்கலைக்கழகத் துணைவேந்தர் வசந்தி அரசரட்ணமோ பல்கலைக்கழக நிர்வாகமோ மேற்கொள்ளவில்லை. மாணவன் வரப்பிரகாஷின் கொலையின் பின்னர், பல்கலைக்கழகங்களிலிருந்து பகிடிவதை முற்றாக அகற்றப்பட்டதாகச் சொல்லப்படுகிறது. ஆனாலும், பல்கலைக்கழகங்களில் அவை தொடரத்தான் செய்கின்றன. அதிலும், போரால் அதிகம் பாதிக்கப்பட்டு துன்பம், சித்திரவதை என்பவற்றில் அனுபவங்களைக் கொண்டிருக்கக்கூடிய யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் இத்தகைய கொடூரம் நடப்பதையும் அதனைத் துணைவேந்தரும் நிர்வாகமும் கண்டுகொள்ளாமல் இருப்பதையும் ஏற்றுக்கொள்ள முடியவில்லை. சமூகத்துக்கு முன்மாதிரியாக இருக்கவேண்டிய ஒரு பகுதியினர் இவ்வாறு கீழ்த்தரமான நடவடிக்கைகளைத் தங்கள் கல்வி நிறுவனத்தில் அனுமதித்திருப்பது கவலையளிக்கிறது. மாணவன் விஜயகுமார் மிகவும் பின்தங்கிய ஒரு கிராமத்தைச் சேர்ந்தவன். பின்தங்கிய அவனது சமூகத்திலிருந்து படித்துப் பல்கலைக்கழகத்திற்குத் தெரிவாகிய அவனை ஊக்குவித்து ஆதரவளித்திருக்க வேண்டும். அதுவே பல்கலைக்கழகம் போன்ற உயர் நிறுவனங்கள் ஆற்றியிருக்கக்கூடிய மிகச் சிறந்த பணி. ஆனால், அவ்வாறு நடக்கவில்லை.

2016ஆம் ஆண்டு வர்த்தகப் பிரிவில் இணைந்த விஜயகுமார் வெறும் 3 மாதங்களிலேயே தனது படிப்பைக் கைவிட்டார். சக மாணவர்களின் பகிடிவதை கட்டுக் கடங்காமல் சென்றமையே அதற்குக் காரணம். பகிடிவதை என்ற பெயரில் தினமும் கொடுமைப்படுத்தப்பட்ட அம்மாணவன், மன அழுத்தத்தினால் தனது படிப்பை நிறுத்திவிட்டு, தற்போது தந்தையுடன் சேர்ந்து கூலிவேலை செய்து வருகின்றான். பட்டதாரியாக ஓர் அரச வேலையில் அமரவேண்டும் என்ற அவரது கனவு சிதைக்கப்பட்டுள்ளது. உயர் கல்வி அமைச்சரும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவும் இவ்விடயத்தில் அதிக கவனம் செலுத்தி, அந்த மாணவன் வேறு பல்கலைக்கழகம் எதிலாவது கல்வியைத் தொடர்வதற்கு ஆவன செய்யவேண்டும். ஏற் கெனவே, மிக மோசமான நிர்வாகத்தைக் கொண்டுநடத்தும் யாழ்ப்பாணப் பல்கலைக்கழகத் துணைவேந்தர் இந்த விடயத்தில் நேர்மையாக நடந்து, அந்த மாணவனுக்கு நீதி வழங்குவார் என்று எதிர்பார்க்கமுடியாது. அந்த மாணவன் இதுதொடர்பில் தன்னிடம் முறைப்பாடு செய்யவில்லை என்ற ஒரு காரணத்தை மட்டும் முன்வைத்து இந்த விடயத்தைக் கைகழுவி விடுவார். எனவேதான் உயர் கல்வி அமைச்சரும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவும் இவ் விடயத்தில் தலையிட்டு நடவடிக்கை எடுக்கவேண்டும் என்று வலியுறுத்துகின்றேன். இந்த மாணவன் தனது பல்கலைக்கழகக் கல்வியை நிறுத்துவதற்குக் காரணமாக இருந்த மூத்த மாணவர்கள் தொடர்பில் பக்கச்சார்பற்ற விசாரணை ஒன்றை நடத்தி, குற்றவாளிகளைத் தண்டிக்கவும் நடவடிக்கை எடுக்கவேண்டும். அப்போதுதான் இனிவரும் காலங்களில் இத்தகைய சம்பவங்கள் இடம்பெறாது தடுக்கலாம்.

ගරු කථානායකතුමනි, එය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. අදාළ ප්‍රශ්නයට ආවාම මම ගරු මන්ත්‍රීතුමාට පිළිතුරක් දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ අවස්ථාවේ දී ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර සභාගත කරන්න.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මා එම පිළිතුර සභාගත කළා, ගරු කථානායකතුමනි.

ශ්‍රී ලංකා පරිපාලන සේවය: ස්ථාන මාරුවීම්
இலங்கை நிர்வாக சேவை: இடமாற்றங்கள்
SRI LANKA ADMINISTRATIVE SERVICE: TRANSFTERS

831/'16

11.ගරු බිමල් රත්නායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Bimal Rathnayake on behalf of the the Hon. Sunil Handunnetti)
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට තමන් කැමැති සේවා ස්ථානයක රැඳී සිටිය හැකි උපරිම කාල සීමාව කොපමණද;

(ii) ඔවුන්ගේ ස්ථාන මාරුවීම් පටිපාටිය විධිමත් ලෙස ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, සරත් රූපසිරි මහතා (ශ්‍රී.ල.ප.සේ. I) අවුරුදු 22 ක්ද, නිහාල් රණසිංහ මහතා (ශ්‍රී.ල.ප.සේ. - විශේෂ ශ්‍රේණිය) අවුරුදු 14ක්ද, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ, සේවයේ යෙදී සිටින්නේ කෙසේද;

(iv) මෙම නිලධාරීන් ආගමන විගමන දෙපාර්තමේන්තුවේ දීර්ඝ කාලයක් රැඳී සිටීමෙන් ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් ලෙස පැමිණි නිලධාරීන්ට අසාධාරණයක් සිදු වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை நிர்வாக சேவை உத்தியோகத்தர்கள் தாம் விரும்பும் சேவை நிலையத்தில் தொடர்ந்து கடமையாற்றுவதற்குரிய உச்ச கால வரையறை எவ்வளவென்பதையும்;

(ii) இவர்களுடைய இடமாற்ற நடைமுறை முறைசார்ந்த விதத்தில் நடைமுறைப்படுத்தப் படுகின்றதா என்பதையும்;

(iii) ஆமெனின், திரு. சரத் ரூபசிறி (இ.நி.சே. I) 22 ஆண்டுகளும், திரு. நிஹால் ரணசிங்க (இ.நி.சே. - விசேட தரம்) 14 ஆண்டுகளும், குடிவரவு, குடியகல்வுத் திணைக்களத்தில் கடமையாற் றுவது எவ்வாறு என்பதையும்;

(iv) மேற்படி உத்தியோகத்தர்கள் குடிவரவு, குடிய கல்வுத் திணைக்களத்தில் நீண்டகாலம் தொடர்ந்து கடமையாற்றுவதால் இவர்களுக்கு பதிலாக கடமையேற்க வந்துள்ள உத்தியோகத் தர்களுக்கு அநீதி ஏற்படுமென்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management:

(a) Will he inform this House-

(i) the maximum period the officers of the Sri Lanka Administrative Service can remain at a place of their choice;

(ii) whether their transfer procedure is functioning properly;

(iii) if so, as to how Mr. Sarath Rupasiri (S.L.A.S. - 1) and Mr. Nihal Ranasinghe (S.L.A.S. Special Grade) have been serving in the Department of Immigration and Emigration for 22 years and 14 years respectively; and

(iv) whether he admits that the officers who have joined the department as their successors have faced an injustice owing to them remaining in the Department of Immigration and Emigration for a long period?

(b) If not, why?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වාර්ෂික ස්ථාන මාරු පරිපාටියට අනුව එක් සේවා ස්ථානයක වසර 6ක් හා එක් දිස්ත්‍රික්කයක වසර 12කි.

(කොළඹ හැර)

ඊට අමතරව ප්‍රියමනාප සේවා ස්ථානවල පහත පරිදි උපරිම සේවා කාලයක් සේවය කළ හැක.

- රේගු දෙපාර්තමේන්තුව - අවුරුදු 3යි
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - අවුරුදු 5යි
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - අවුරුදු 5යි
- සුරාබදු දෙපාර්තමේන්තුව - අවුරුදු 5යි
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - අවුරුදු 3යි

(ii) ඔව්.

(iii) ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණියේ යූ.වී.එස්. රූපසිරි මහතා මේ වන විට වසර 19කට ආසන්න කාලයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති අතර, (සක්‍රිය සේවා කාලය) ඔහුට 2016.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවීම් ලබාදී ඇත.

ශ්‍රී ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ එම්.එන්. රණසිංහ මහතා මේ වන විට වසර 14ක් මෙම දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති අතර, ඔහුට 2014.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවීම් ලබාදී ඇතත්, 2014.10.14 දින සිට අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ආගමන හා විගමන පාලක ජනරාල් තනතුරට පත් කර ඇත.

(iv) ඔව්.

ඉදිරියේදී වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධව තදින් ක්‍රියා කිරීමට සටහන් කරගෙන ඇත.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, 23(2) ස්ථාවර නියෝගය යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

රේගු නිලධාරීන්ගේ අකුරට වැඩ කිරීමේ ක්‍රියා මාර්ගය
சுங்க அதிகாரிகளின் சட்டப்படி வேலை நடவடிக்கை
WORK-TO-RULE CAMPAIGN BY CUSTOMS OFFICERS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මා මෙම ප්‍රශ්නය යොමු කරනු ලබන්නේ මුදල් අමාත්‍ය, ගරු රවි කරුණානායක මැතිතුමා වෙතයි. එතුමා දැන් මෙම ගරු සභාවේ නැති වුණත්, මෙහි අතිබරපතළ හා හදිසි තත්ත්වය නිසා එතුමා පැමිණෙයි කියා බලාපොරොත්තුවෙන් මා ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවා නියුක්තිකයන් අකුරට වැඩ කිරීමේ වෘත්තිමය ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීම කරණකොට ගෙන ජාතික ආර්ථිකයට සුවිශාල අහිතකර බලපෑමක් දැනට ඇතිවී තිබෙන බැවින්ද; රහසිගතව, රේගු ආඥාපනතක් සැකසීමට පත් කොට ඇති කම්ටුව විසුරුවා හැර, රේගු දෙපාර්තමේන්තුව සම්බන්ධ වෘත්තීය සමිති සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයෙහි අදාළ පාර්ශ්වයන් සමඟ ඵලදායී සාකච්ඡාවක් මඟින් රේගු ආඥාපනත සංශෝධනය කිරීමට රජය එකඟ වීමෙන් මෙම ආරවුල පහසුවෙන් විසඳාගත හැකි බවද, රේගු දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික නිලධාරීන් සේවයට කැඳවීම වැනි තර්ජන, මර්දන ක්‍රියා මාර්ග තුළින් තවදුරටත් රේගු අර්බුදය උග්‍රවීමට හේතුවන යහ පාලන විරෝධී වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොකරන ලෙසද, අපේ රටේ ආර්ථිකයේ කේන්ද්‍රීය උල්පතක් මේ ආකාරයෙන් අවුල් වියවුල් ජාලාවකට පත් නොකර එයට වහාම මැදිහත් වන ලෙසද මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ කාරණාවලට පිළිතුරක් ලබා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, දැනටමත් රේගු දෙපාර්තමේන්තුව අකුරට වැඩ කිරීම නිසා එහි කටයුතු ඇන හිටින තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. රේගු දෙපාර්තමේන්තුව කියන්නේ, රටේ ප්‍රධාන ආදායම් මාර්ග සොයන තැනක්. මෙම ප්‍රශ්නයට අගමැතිතුමා උත්තර දෙනවා නම් වඩා හොඳයි. මම ඊට වඩා කාල වේලාව ගන්නේ නැහැ. මේ අර්බුදයේ උත්සන්නභාවය ගරු අගමැතිතුමා දන්නවා ඇති.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

මුදල් ඇමතිතුමා පැමිණ මේ සම්බන්ධයෙන් පිළිතුරක් දෙයි. එහෙත් මම මේ ගරු සභාවට එක කාරණයක් කියන්න කැමැතියි. රහසිගතව රේගු ආදායම් පනත් කෙටුම්පතක් සකස් කරන්න රජයේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. ඉදිරිපත් කර තිබෙන ලියවිල්ල සාකච්ඡාවට භාජනය කරන එකක්. රේගු ආඥාපනත පැරණි එකක්. විශේෂයෙන්ම අපි අලුතින් බලනවා නම්, internet තාක්ෂණය ඔය කියන ආඥාපනතට ඇතුළත් කරන්න බැහැ. ඒ නිසා මේක සංශෝධනය කරලා, තිබෙන ආඥාපනතේ හුහක් වගන්ති ඒ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න පුළුවන්.

අලුත් කොටසකුත් මෙයට ඇතුළත් කරන්න තිබෙනවා. ඒවා ගැන සාකච්ඡා කරනවා. කවුරු සකස් කළත් අන්තිමට මෙය පාර්ලිමේන්තුවේ කාරක සභාවට ඉදිරිපත් කළ යුතුයි. ගරු ඇමතිතුමා මේ ගැන පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රේගු වෘත්තීය සමිති රාශියක් තිබෙනවා. මේ රටේ ප්‍රධාන ආදායම උපයන තැනක්. අවුල් සහගත තත්ත්වයක් ඇති නොකරගෙන මේ සම්බන්ධයෙන් සාකච්ඡා මාර්ගයට පිවිසෙන්නය කියන එක තමයි අපේ ඉල්ලීම.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

කොහොමත් මේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡාවට ගන්නවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
That is your view. But, what is happening in the Ministry is a different thing.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Member, this is the Government's view. රේගු නිලධාරීන්ගේ අදහස් ගන්න තිබෙනවා; මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අදහස් ගන්න තිබෙනවා. පෞද්ගලික අංශයේත් අදහස් ලබා ගන්න තිබෙනවා. අපට Chambersවලට විතරක් යන්න බැහැ. මොකද, Chambersවලට අයිති නැති අයත් ඉන්නවා. Wharf කට්ටිය ඔක්කෝම එක්කත් සාකච්ඡා කරලා, අන්තිමට මේ සභාවට ඉදිරිපත් කරලා, අපේ කාරක සභාවටත් ඉදිරිපත් කරන්න තිබෙනවා. එතැනදිත් සාකච්ඡා කරන්න පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I agree. But, there is a go-slow.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
I can assure you that we will consult all stakeholders.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Okay. But, you should ensure that the go-slow stops and the work continues. That is the main thing right now.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
I know that the work has to continue. I think, there is a discussion going on now. But, I can assure you that all the stakeholders will be consulted. We will have to upgrade this law because it does make provision for IT and all the other things to come in.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, දැනට කටයුතු නිමා වෙලා තිබෙන මේ පනත් කෙටුම්පත ගැන විශේෂිත සමිති එක්ක සාකච්ඡා කිරීම සඳහා ගරු ඇමතිතුමා අවස්ථාවක් නොදීම පිළිබඳ ගැටලුවයි මෙතැන තිබෙන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කරයි. මට ඒ ගැන කියන්න බැහැ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔබතුමා ආණ්ඩුවේ නායකයා විධියට ඇමතිතුමාට ඒක දැනුම් දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු ඇමතිතුමා ඒ ගැන සියලු දෙයක්ම පැහැදිලි කරයි. අපේ ප්‍රතිපත්තිය මේකයි. ගරු ඇමතිතුමාත්, අපත් ඔක්කෝම එකඟයි. දවස් කීපයකට ඉස්සෙල්ලා මටත් කිහිප දෙනෙක් හම්බ වුණා. ඔවුන්ට මම කිව්වා, "නැහැ, මේක Sri Lanka Customs එකේ ඒ කණ්ඩායම එක්ක පමණක් නොවෙයි, හැම කෙනා එක්කම කථා කරලා කරන්න තිබෙන දෙයක්" කියලා. Department of Export Agriculture එකේ කණ්ඩායමකුත් මට අලුතෙන් හම්බ වුණා. ඒ ගොල්ලන් කියන්නේ ඒ ගොල්ලන්ට ප්‍රශ්න තිබෙනවා කියලායි.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මේ ප්‍රශ්නය නිසා දවසකට පාඩුව ගණනය කර තිබෙනවා, රුපියල් බිලියනයක් පමණ වනවා කියලා. ආණ්ඩුව වශයෙන් ගත්තොත් ඒක විශාල හානියක්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි ඒක කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේ ප්‍රශ්නය ගැන විවාදයක් කරන්න අමාරුයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේක විවාදයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න අදාළ ඇමතිතුමා පසුව එනවා කිව්වා. එතෙක් මම මේ කරුණ පැහැදිලි කළා පමණයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අපි එතැනදි පැහැදිලි කර ගනිමු. නැත්නම් මේ ප්‍රශ්නය දිගටම යනවා. අපි මේ ප්‍රශ්නය පිළිබඳ කථාව මෙතැනින් නවත්වමු.

මීළඟට තිබෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනා. පළමුවෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ඩී.එම්. ගුණසේකර මැතිතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව.

ශෝක ප්‍රකාශය :
ගරු ඩී.එම්. ගුණසේකර මහතා
அனுதாபத் தீர்மானம் :
மாண்புமிகு டி.எம். குணசேகர
VOTE OF CONDOLENCE :
HON. D.M. GUNASEKERE

[පූ.භා. 10.48]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ආසනය නියෝජනය කරමින් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පස්වන පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කළ ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේදී ගරු සභාවට මම ඉදිරිපත් කරමි.

ගම්මුලාදෑනි සහ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් සේවය කළ ඩී.එම්. උක්කුබණ්ඩා මහතාට සහ ඩබ්ලිව්.එම්. මුතුමැණිකා මහත්මියට දාව දරුවන් 11 දෙනෙකුගෙන් සමන්විත එම පවුලේ වැඩිමහල් පුත්‍ර රත්නය ලෙස 1934 වර්ෂයේ මැයි මස 21ක් වන දින අරවාකුඹුර, ලුණුගලදී ගුණසේකර මහතා ජන්ම ලාභය ලැබුවේය.

කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් අධ්‍යාපන කටයුතු හැදෑරූ මෙතුමා පාසලේ දීප්තිමත් ශිෂ්‍යයකු විය. එසේම එතුමා දක්ෂ වොලිබෝල් ක්‍රීඩකයකු ලෙස පාසල් කණ්ඩායම ද නියෝජනය කර ඇත. පසු කලෙක ඉංග්‍රීසි ගුරුවරියක වූ ඉන්ද්‍රාණි ගුණසේකර මෙනවිය සමඟ යුග දිවි ගමනට පිවිසි මෙතුමා පුතුන් පස් දෙනෙකු හා දියණියන් දෙදෙනෙකු මෙලොවට දායාද කළේය. ඔවුන් මේ වන විට රජයේ හා පෞද්ගලික ආයතනවල උසස් නිලතල දරමින් රටට වැඩදායී පුද්ගලයන් ලෙස සේවයේ යෙදී සිටී.

1960 වර්ෂයේ බිබිල ආසනයේ පොදු ජනතාව නියෝජනය කරමින් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පස්වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වී එම පළාතේ ජනතාවට සුවිශාල මෙහෙවරක් ඉටු කරමින් කටයුතු කළේය. එසේම 1970-1971 කාල වකවානුවේ කඩා වැටී විනාශ වී තිබුණ පහළ ඌව සමුපකාර ව්‍යාපාරය නැවත යථා තත්ත්වයට පත් කිරීමට එහි ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස මෙතුමා මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. 1972 -1976 කාලයේදී එවකට වෙළඳ අමාත්‍ය ලෙස කටයුතු කළ ටී.බී. ඉලංගරත්න මැතිතුමාගේ ඉල්ලීම පරිදි සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ දියුණුව සඳහා විශාල කැපවීමකින් කටයුතු කළ මෙතුමා බිබිල මැතිවරණ කොට්ඨාසය හා මොනරාගල දිස්ත්‍රික්කයේ දේශපාලන හා ආගමික කටයුතුවලට විශාල සේවාවක් කළ අතර, මුස්ලිම් ජනතාවගේද අවශ්‍යතා සපුරාලීමට මහත් කැපවීමකින් කටයුතු කළ උදාර නායකයකු ලෙස හඳුන්වා දිය හැකිය.

ප්‍රදේශයේ සුවහසක් දූ දරුවන්ගේ දෙනෙත් පැදීම සඳහා බිබිල කනිෂ්ඨ විද්‍යාලය, කණුවේගල්ල විද්‍යාලය, ඉලුක්කැපුතැන්න විද්‍යාලය, රත්මල්ගහඇල්ල විද්‍යාලය, බඹරගස්රොද විද්‍යාලය, රිටිගහවත්ත විද්‍යාලය ආදී පාසල් ගණනාවක් ඉදි කරමින් එම පළාතේ දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම පිණිස පෙරමුණ ගෙන කටයුතු කර ඇත. එමෙන්ම බිබිල, බකිණිගහවෙල, බුද්දගම, තන්නපුරාව ආදී නගරයන්හි සංවර්ධන කටයුතු සිදු කරමින් ඒවා උසස් තත්ත්වයට ගෙන ඒමට එතුමාගෙන් ලැබුණු දායකත්වය අප මෙහිදී ඉතා කෘතවේදීව සිහිපත් කළ යුතුය. එපමණක් නොව, බිබිල-අම්පාර නව මාර්ගය ආරම්භ කිරීමට පුරෝගාමීව කටයුතු කිරීම, දඹගල්ල-මැදගම මාර්ගය ඉදිකර දීම, දොඩම්ගොල වැව ඇතුළු වැව් කිහිපයක්ම ප්‍රතිසංස්කරණය කරදීම, බිබිල නගරයට විදුලිය ලබා දීම හා මහජන බැංකු ශාඛාවක් ලබා ගැනීමට දායක වීම වැනි පොදු කටයුතු සිදු වූයේද එතුමාගේ උනන්දුව හා දැඩි උත්සාහය නිසාය.

එසේම, තන්නපුරාව බෙහෙත් ශාලාව ආරම්භ කිරීම, දඹගල්ල හා වෙනත් රෝහල් නහා සිටුවීම, සමුපකාර රාශියක්ම ආරම්භ කරදීම, මුස්ලිම් ජනතාවට විශාල අඩු පාඩුවක්ව පැවැති සුසාන භූමිය ලබා ගැනීමට දායක වීම, කොටබෝව පූජා භූමියක් ලෙස ආරම්භ කිරීමට දැඩි උත්සාහයක් ගෙන කටයුතු කිරීම, පොතුබන්දන රජමහා විහාරයට බැතිමතුන්ට යාමට පාලමක් ඉදිකර දීම වැනි සද්ක්‍රියා සිදු කළේ බිබිල පොදු මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම උදෙසාය. රුසියාව, ජර්මනිය ආදී රටවල සංචාරය කර ඇති එතුමා ඒවායින් ලද අත් දැකීම් සමුදාය යොදා ගත්තේද තම ජනතාව වෙනුවෙන් සේවය කිරීමේ අරමුණ පෙරදැරි කරගෙනය. මෙසේ මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ආසනයේ ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කළ එතුමා අවුරුදු 82ක් ආයු වළඳා 2016 ජනවාරි මස 23 වන දින මෙලොවින් සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, 1960 වර්ෂයේ සිට 1964 වර්ෂයේ අග දක්වා අවුරුදු 05කට ආසන්න කාලයක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පස්වන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ අභාවප්‍රාප්ත ඩී.එම්. ගුණසේකර මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

[පූ.භා. 10.54]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගැමි ජනතාව නියෝජනය කිරීමට අප පාර්ලිමේන්තුවට තේරී පත් වුණු මන්ත්‍රීවරයකු වශයෙන් ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ වියෝව පිළිබඳව ගෙනා ශෝක යෝජනාවට එක්වන මේ අවස්ථාවේදී, ඒකාබද්ධ විපක්ෂයේ සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ශෝකය සටහන් කරන්නට මා කැමැතියි. ගුණසේකර මැතිතුමා අප රට දේශපාලන නිදහස් සටනේ උරුමය වූ ඌව-වෙල්ලස්සේ ගම් නියම්ගම්වල සැබෑ හැඟීමක් ඇති හඬ පාර්ලිමේන්තුවට ගෙනැවිත් පාර්ලිමේන්තුව තුළ හා ඒ වාගේම බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් පැවති පාලන ආණ්ඩුවල එම ජනතාවට දිනා දීමට කිබෙන ජයග්‍රහණ රාශියකට මුල පුරන්න ක්‍රියා කළ ඌවේ නායකයකුය කියන එක ගෞරවයෙන් සඳහන් කරනවා.

එතුමාගේ දේශපාලන ක්‍රියා මාර්ගයන් තුළින් විශේෂයෙන් මේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරයටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක් වූ අප රට ප්‍රගතිශීලී ජනතාවගේ ක්‍රියා මාර්ගයන් ඉදිරියට ගෙන යන්න, ඒවා ජයග්‍රහණය කරවන්න පාර්ලිමේන්තුව තුළත්, පාර්ලිමේන්තුවෙන් පිටතත් ගැටුම්, තර්ජන, ගර්ජන මධ්‍යයේ තම යුතුකම් සම්භාරය ඉටු කළ මහජන සේවකයෙක් ලෙස එතුමාට අපේ ගෞරවය පුද කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ඌව - වෙල්ලස්ස කියන්නේ සුදු අධිරාජ්‍යවාදීන්ගේ මිලේච්ඡ බව ලෝක ඉතිහාසයට එකතු කළ බ්‍රිතාන්‍යයේ කළු ලපය ලෙස සලකන්න පුළුවන්. අප රටේ ගමින් ගමට මෙතරම් පිරිසක් ඝාතනය වුණු වෙනත් ප්‍රදේශයක් නැහැ. එතුමා අපේ රටින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව පළවා හැරීමට නැඟී සිටි කෙනෙක්. ඌව - වෙල්ලස්ස ජනතාවට එල්ල වුණු ඒ සංහාරය පිළිබඳව අදටත් බ්‍රිතාන්‍ය කට උත්තර දීලා නැහැ. අප රටේ තරුණ වයසේ සිටින සියලු දෙනාගේ පටන් ඝාතනය කළ යුතුය කියන කනගාටුදායක නිවේදනය ක්‍රියාත්මක කරමින්, බ්‍රිතාන්‍යයන් ඒ මිනිස් සංහාරය සිදු කළ ගම් බිම්වල උපන් ඩී.එම්. ගුණසේකර මැතිතුමා සැබැවින්ම ඌවේ කැරැල්ලේදී ජීවිතය පූජා කළ පවුලකට; ජීවිතය පූජා කළ පවුලක උරුමයට අයිති වීම නිසා එතුමාගේ අවසන් හුස්ම හෙළන තුරුම - අප රට නිදහස සම්පූර්ණ කරන ගන්නා තුරුම- ඒ හැඟීම ප්‍රකාශ වුණා.

මා විශේෂයෙන්ම මේ බව සඳහන් කරන්නේ එතුමා සමඟ කළ නිසංසල සාකච්ඡාවලදී බොහෝ කරුණු අලුතින් එකතු කරන්න පුළුවන් වීම නිසයි. ඒ නිසා මා මේ අවස්ථාවේදී එතුමාට විශේෂ ගෞරවය පුද කරන්න ඕනෑ. අධිරාජ්‍යවාදීන් අපේ රටට කළ හානිය නිසා ඌව - වෙල්ලස්සේ අසරණ ජනතාව දුක් වින්දා. ඔවුන් අපේ රටට කළ හානිය වෙනස් කිරීමේ නව උත්සාහයට එතුමා තම ජීවිතයේ විශාල කාල පරිච්ඡේදයක් කැප කළා. එය මුළු ජාතියේම පිනට සිදු වුණු දෙයක් බව ගෞරවයෙන් මා මේ අවස්ථාවේදී සිහිපත් කරන්නට ඕනෑ.

එතුමාගේම ආදායමින් එතුමා ගම් නියම් ගම්වල ජාතික, ආගමික, ශාසනික සහ පොදු වැඩ කටයුතු රාශියක් සිදු කළා. ඌව කියනකොට ඔබතුමන්ලා දන්නවා, එවකට ඈත එපිට ගමකින් අනික් ගමට යන්න පාරක් තිබුණේ නැති බව. වන සතුන්ගෙන් පිරුණු භූමි තමයි, බිබිලේ සහ මොනරාගල තිබුණේ. එවන් ආසනයක මන්ත්‍රීවරයකු හැටියට - අද යුගයේදී නොවෙයි, ඒ යුගයේ - වැඩ කිරීමේදී එතුමා දැක්වූ පරාර්ථකාමී මිනිස් ගුණාංග මා විශේෂයෙන්ම අද දිනයේ මේ පාර්ලිමේන්තුවේදී සිහිපත් කරන්න කැමැතියි.

අපේ රට රජමහා විහාර ප්‍රධාන උතුම් පුණ්‍ය භූමියක් බව අපි දන්නවා. දුටුගැමුණු රජතුමා ලංකාවේ දකුණු ප්‍රදේශයෙන් - මාගම්පුරයෙන් - පිටත්වෙලා, මහවැලි ගඟෙන් එගොඩ වෙන්න ගියේ මේ මහ පොළොවට පය තබමිනුයි. එහි තිබුණු යටපත් වුණු විහාරස්ථාන යළි ප්‍රතිසංස්කරණය කරන්න; අලුත්වැඩියා කරන්න, රජමහා විහාර ආරක්ෂා කරන්න, ඒවායේ තිබුණු සුවිශේෂී අංගයන් ජාතියට දායාද කරන්න, එම ප්‍රදේශ ප්‍රකාශයට පත් කරන්න එතුමා මැදිහත් වී කටයුතු කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ ඉතා කිට්ටුවෙන් වැඩ කරන්න පුළුවන් විධියේ පසු බිමක් එතුමා ඇති කර ගෙන සිටියා. අපි දන්නවා, එතුමා හැම මැතිවරණයකදීම ප්‍රගතිශීලී කඳවුරට දිය හැකි හැම සහයෝගයක්ම ලබා දීමෙන් ගොවි ජනතාව වෙනුවෙන් වූ ඒ ජනසටන ශක්තිමත් කළා කියාත්.

ගරු කථානායකතුමනි, එතුමා හමුවුණු හැම අවස්ථාවකම ඇළ, දොළ, ගංගා, වැව්, පොකුණු සිඳී යෑම පිළිබඳව, පරිසරය ආරක්ෂා කර ගැනීම පිළිබඳව දැක්වූ සුවිශේෂ අදහස්, හැඟීම් සහ ඒවාට තමන්ම මැදිහත් වෙමින් දුන් සහයෝගය පිළිබඳව මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. එය ඌවේ ජනතාවට වාගේම බිබිල වැනි ගම්බද ජනතාවගේ දියුණුවට සහ ආරක්ෂාවට ලොකු හයියක් වුණා.

අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කළොත්, ඒ කාලයේ එම ප්‍රදේශවල තිබුණේ පාසල් බොහොම ටිකයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය පාසල් ජනසතු කරන අවස්ථාවේදී එයට සහයෝගය දෙමින්, අධ්‍යාපනය ගමට ගෙන යාමේ අලුත් වැඩ පිළිවෙළට ගුණසේකර මහතා සහයෝගය දුන්නා. සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙනුත් එතුමා ක්‍රියාකාරී උනන්දුවකින් වැඩ කළා. අන්‍යොන්‍ය සහයෝගය හා ශක්තිය එකතු කර ගෙන සමුපකාර ව්‍යාපාරය විවිධ ප්‍රදේශවලට ගෙන යන්න කටයුතු කළා. 1956 වසරේ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ කෘෂිකර්ම හා ආහාර ඇමතිව සිටි මගේ දිවංගත පියා සමඟ, සමුපකාර ව්‍යාපාරය නහාසිටුවීම පිණිස එම දිස්ත්‍රික්කවල ඉටු කළ මෙහෙය සහ එයින් ලැබුණු ශක්තිය එතුමා මා හමු වුණු කිහිප වතාවකදීම ඉතාම ගෞරවයෙන් සිහිපත් කළා.

එතුමාගේ ජීවිතයේ අවසාන කාලයේ, එතුමාගේ බිරිඳ ඇතුළු පවුලේ අය තමන්ගේ ඥාතීන් සමඟ මහරගම ආසනයේ ජීවත්වීම නිසා අපට නිතර දෙවේලේ පැරණි විත්ති කථා කරන්නට හැකි වුණා. ඒ කළ සියලු කටයුතු වෙනුවෙන් ඩී.එම්. ගුණසේකර මැතිතුමාට අපගේ ගෞරවය පුද කරනවා.

එතුමාගේ එක පුතෙක් රණ විරුවෙක්; අපේ හමුදා සේනාංකවල සටන් පෙරමුණේ ඉදිරියෙන් කටයුතු කළ රණ විරුවෙක්. ඒ ගැනත් ඒ ආදරණීය පියාට සතුටක් තිබුණා, "මගේ පුතාත් මේ රට බේරා ගන්න ඉදිරියට ගියා. එම කාර්ය භාරය ඉෂ්ට කළා" කියා. ඒ ගැන එතුමා තුළ තිබුණේ නිහතමානී සතුටක්ය කියන කාරණය, අපේ රටට ආදරයක් තිබුණු ඩී.එම්. ගුණසේකර මැතිතුමාට ගෞරවය පිණිස සඳහන් කරමින්, එතුමාගේ ආදරණීය බිරිඳ සහ දරුවන් සමඟ එතුමාගේ අභාවය පිළිබඳ ශෝකයට එකතු වෙමින් මම ඩී.එම්. ගුණසේකර මැතිතුමාට නිවන් සුව පතනවා!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා.

[පූ.භා. 11.03]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ඌව - වෙල්ලස්ස ප්‍රදේශය නියෝජනය කරමින් 1960 වර්ෂයේදී බිබිල ආසනයේ පොදු ජනතාවගේ ඡන්දයෙන් මෙම උත්තරීතර සභාවට පත්ව එය ශෝභාවත් කළ දිවංගත ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවේදී වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා.

හිටපු අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කියූ පරිදි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය සමයේ ඌව පළාතේ බිබිල වැනි ඉතාම දුෂ්කර ආසනයක් නියෝජනය කරමින්, -ඒ කාලයේ මනාප ඡන්ද ක්‍රමය තිබුණේ නැහැ. තමන්ගේ ආසනයට තමයි ඒ මන්ත්‍රීවරයා බැඳිලා තිබුණේ.- ගමනා ගමන පහසුකම්, දුරකථන පහසුකම් සහ අධ්‍යාපන පහසුකම් ඉතාම අල්පව පැවති ඉතාම දුෂ්කර කාල පරිච්ඡේදයක තමන්ගේ ආසනයේ ජනතාවට පමණක් නොවෙයි මොනරාගල දිස්ත්‍රික්කයේම ජනතාවට එකී පහසුකම් ලබා දීලා ඔවුන්ගේ ජීවිත වඩාත් වර්ණවත් කිරීම සඳහා ඩී.එම්. ගුණසේකර මැතිතුමා අනුපමේය කැපවීමක් කළා. ඒ වාගේම එතුමා, ඒ දුෂ්කර කාල පරිච්ඡේදය තුළ විනාශ වෙලා තිබුණු ඌව සමුපකාර ව්‍යාපාරය

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ගොඩ නැඟීමේ පුරෝගාමියෙකු වශයෙන් එවකට වෙළෙඳ අමාත්‍යවරයා ලෙස කටයුතු කළ ටී.බී. ඉලංගරත්න මැතිතුමා සමඟ ඉතාම ළඟින් කටයුතු කරමින් තමන්ගේ සේවාව ලබා දුන්නා.

ඌව වෙල්ලස්සේ 1960 දශකයේ බිහිවුණු දෙවන පෙළ දේශපාලන නායකයන් අතරින් ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ ක්‍රියා කලාපය, ඔහුගේ කැපවීම, ඔහු විසින් කරන ලද සේවාව ඌව වෙල්ලස්ස ජනතාවගේ හදවත් තුළ තවමත් රැඳී තිබෙන බව මම ප්‍රකාශ කරන්නට කැමැතියි. එතුමා පූජනීයස්ථාන දියුණු කිරීම වැනි විවිධ ආගමික වැඩ කටයුතු කළා පමණක් නොවෙයි, බිබිල-අම්පාර නව මාර්ගය ආරම්භ කිරීමේදී පුරෝගාමීත්වය ගෙන, එතුමාගේම ව්‍යාපාරයක් හැටියට හිතට ගෙන අවශ්‍ය අය ඒ කටයුත්තට තල්ලු කර, ඒ සඳහා ආරම්භයක් ලබා දුන්නා.

මා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යවරයාව සිටි කාලයේදී එතුමා වයෝවෘද්ධව සිටියත්, මොනරාගල දිස්ත්‍රික්කයේ අප විසින් එවකට කර ගෙන ගිය පහළ ඌව වැව් සංවර්ධන වැඩ පිළිවෙළ පිළිබඳව, ඒවායේ අඩු පාඩු පිළිබඳව නිතර කථා කළා මට මතකයි. "ඇමතිතුමා මෙන්න මෙහෙම පැමිණිල්ලක් තිබෙනවා, මේක පොඩ්ඩක් සොයා බලන්න. නිලධාරීන්ගේ මෙන්න මේ අඩු පාඩුකම් තිබෙනවා" යයි මට කියා තිබෙනවා. ඒ කියන්නේ, එතුමා දේශපාලනයෙන් විශ්‍රාම ගියත්, ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ ජනතාවට කරන සේවයෙන් විශ්‍රාම ගියේ නැහැ කියන එක මම පැහැදිලිවම ප්‍රකාශ කරන්නට ඕනෑ. එම නිසා මෙවැනි දැවැන්ත සේවාවක් කළ, ජනතා හිතවාදී දේශපාලනඥයකු වූ ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ වියෝව ඌව වෙල්ලස්ස ජනතාවට විශාල පාඩුවක් බව මා ප්‍රකාශ කරන අතර, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් මේ උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස කරන ලද යෝජනාවට මා එකඟ වෙන බව ප්‍රකාශ කරමින්, ඌව වෙල්ලස්ස ජනතාවට අනූපමේය සේවයක් කළ ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ ජනතා හිතවාදී වැඩ පිළිවෙළ අපේ මේ උත්තරීතර සභාවේ මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් වෙන බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව සමාප්ත කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.08]

ගරු විජිත බෙරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

ගරු කථානායකතුමනි, ඌව වෙල්ලස්සේ, -විශේෂයෙන්ම පහළ ඌවේ- මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල මැතිවරණ කොට්ඨාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මුල්ම මහජන මන්ත්‍රීවරයා ලෙස ඩී.එම්. ගුණසේකර මැතිතුමාව 1960 ජූලි මැතිවරණයෙන් බිබිල ආසනයේ ජනතාව වැඩි ඡන්ද ප්‍රමාණයකින් තෝරා ගත්තා. එතුමා ඒ වන කොට පසු වුණේ, හදු යෞවන කාලයේයි. ඌව වෙල්ලස්සේ වැදගත් පෙළපතකින් පැවත ආ ඩී.එම්. ගුණසේකර මැතිතුමා, හොඳ අධ්‍යාපනයක් ලැබූ, ඉතා කාර්ය ශූර හා නිර්භීත තරුණ දේශපාලනඥයෙක් විධියට අපට හඳුන්වන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් ගමේ කෙනෙක් විධියට බිබිල මැතිවරණ කොට්ඨාසයෙන් බිහි වුණු ප්‍රථම මහජන නියෝජිතයා ඩී.එම්. ගුණසේකර මහතායි. එතුමා කාගෙත් හිත් දිනාගෙන කටයුතු කරපු කෙනෙක්.

එවකට බිබිල මැතිවරණ කොට්ඨාසය බොහොම දුෂ්කර, ඒ වාගේම අධ්‍යාපන, සමාජයීය, සංස්කෘතික සහ යටිතල පහසුකම් අතින් බොහොම පහත් තත්ත්වයක තිබුණු ප්‍රදේශයක්. එම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා හඳුනාගෙන, ඉටු කළ යුතු මූලික දේවල්, අත්‍යවශ්‍යම දේවල් තෝරා බේරාගෙන ඉටු කළ මහජන නියෝජිතයෙක් වශයෙන් එතුමා හඳුන්වන්න පුළුවන්.

එතුමා විවාහ වුණේ, එච්.ඒ. ඉන්ද්‍රානි ගුණසේකර මෙනවිය සමඟයි. එතුමිය ගුරු මාතාවක්. එතුමිය ඒ ප්‍රදේශයේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්, දරුවන්ගේ නැණ නුවණ පාදන්නට වෙහෙස මහන්සි වෙලා දුෂ්කර ව්‍යායාමයක යෙදුණු ගුරු මාතාවක්. ඩී.එම්. ගුණසේකර මැතිතුමා මෙතුමිය විවාහ කරගෙන, දරුවන් හත් දෙනෙක් මේ රටට, සමාජයට දායාද කළා. ඒ දරුවන් හත් දෙනාගෙන් පස් දෙනෙක් පිරිමි දරුවන්; දෙදෙනෙක් ගැහැනු දරුවන්. ඒ දරුවන් අතර ගුරුවරියන් සහ මේ රට දැය ආරක්ෂා කර ගත්ත රණ විරුවන් ඉන්නවා. ඒ දරුවනුත් හොඳට ඉගෙන ගෙන තම පියතුමා වාගේ රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් විවිධ තලවල, විවිධ වෘත්තීන්වල හිඳිමින් විශාල මෙහෙවරක් කරන බව විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

එතුමාගේ දයාබර බිරිඳ වන ඉන්ද්‍රානි ගුණසේකර මැතිනිය ගුරුවරියක් වශයෙන් ඌව වෙල්ලස්සේ දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කරන්න අපමණ වෙහෙසක් ගත්තා. දැන් එතුමිය විශ්‍රාම සුවයෙන් පසුවෙනවා. ඩී.එම්. ගුණසේකර මැතිතුමා අවුරුදු 5කට වඩා අඩු කාලයක් තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට කටයුතු කළේ. එතුමා ඒ ප්‍රදේශයේ හොඳට ඉගෙන ගෙන පසු කාලීනව ආනන්ද ශාස්ත්‍රාලයෙන් ඉගෙන ගෙන හොඳ දැනුමක්, අවබෝධයක් ලබපු කෙනෙක්. එතුමා පාසල් අවධියේ දක්ෂ ක්‍රීඩකයෙක් විධියට නමක් දිනාගෙන ක්‍රීඩා ක්ෂේත්‍රයෙන්, ක්‍රීඩා කෞශල්‍යයෙන් ඉස්සරහට ගිය කෙනෙක්. එතුමා මහජන නියෝජිතයෙක් විධියට බිබිල මැතිවරණ කොට්ඨාසය පුරා ගමින් ගමට යමින්, ජනතාව සමඟ සමීපව සම්බන්ධ වෙමින් ඒ ප්‍රදේශයේ තිබුණු මූලික අවශ්‍යතා හඳුනාගෙන ප්‍රමුඛතාව අනුව ඒවා දියුණු කිරීමට මහත් වෙහෙසක් ගත්ත බව අපි දන්නවා. අපි කවුරුත් කථා කරන බිබිල - ඉඹිනියාගල හරහා අම්පාර දක්වා යන මාර්ගය ආරම්භ කරන්න ඒ අවධියේ එතුමා තමයි මූලික වුණේ. ඒ කාලය ග්‍රාම නිලධාරි වසම් 4ක ජනතාවට ප්‍රධාන නගරයට ඒමටත්, ගමන් බිමන් සඳහාත් දුෂ්කරම අවධියක්ව පැවතුණා. මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ආසනයේ එක්තරා කොටසක ජනතාව අම්පාරත් එක්ක සම්බන්ධකම් පවත්වන කොට, ඒ මාර්ගය ගැන විශේෂ උනන්දුවක් දක්වලා එතුමා එවකට සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය නායකත්වය දැරූ රජයේ ඇමතිවරුන් සම්බන්ධ කරගෙන ඒ මාර්ගය මහජනතාවට ගමන් කරන්න පුළුවන් මට්ටමකට සංවර්ධනය කළා. අද වන විට ඒ ප්‍රදේශයට යටිතල පහසුකම් ලැබිලා, විශාල සංවර්ධනයක් වෙලා, ඒ ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ මට්ටමකට ගිහිල්ලා තිබෙනවා. ඒකට අඩිතාලම දැමුවේ ඩී.එම්. ගුණසේකර මැතිතුමා. අපි දන්නවා, එතුමා ඒ කාලයේ අනාගතය දිහා බලලා වැඩ කළ බව.

අධ්‍යාපනය වෙනුවෙන් එතුමා පාසල් ගණනාවක් ආරම්භ කළා. ඒවාට අවශ්‍ය මානව සහ භෞතික පහසුකම් දීලා ඒ පාසල් හැකි පමණින් දියුණු කරන්නට එතුමා උත්සාහ කළා. එපමණක් නොවෙයි, ග්‍රාමීය මාර්ග, සෞඛ්‍ය මධ්‍යස්ථාන යනාදිය දියුණු කරන්න එතුමාට පුළුවන් විධියට උදව් කරලා කටයුතු කළා.

ආගමික හා ශාසනික පැත්තෙන් ගත්තාමත් එතුමා ඒ ප්‍රදේශයේ විහාරස්ථාන සමඟ බොහොම කිට්ටුවෙන් සම්බන්ධ වෙලා, ඒ නායක හාමුදුරුවන්ගේ උපදෙස්, අනුශාසනා හා මගපෙන්වීම් අනුව ඒ විහාරස්ථාන දියුණු කිරීමටත් කටයුතු කළා.

එතුමා අසාධාරණයට විරුද්ධව, අයුක්තියට විරුද්ධව කෙළින් හිටගත්ත නායකයෙක්. අදත් විවිධ මැතිවරණ කොට්ඨාසවල ජීවත්

වෙන එතුමාගේ සමකාලීනයන් ඒ පිළිබඳව කථා කරනවා. ඒ වාගේ නායකයන් අපට වඩ වඩාත් අවශ්‍ය වූ යුගයක තමයි එතුමා අප අතරින් සදහටම සමු ගත්තේ. එතුමාගේ දේශපාලන ජීවිතයේදී මන්ත්‍රීවරයකු විධියට කාලය ගත කළේ අවුරුදු 5කටත් වඩා අඩු කාලයක් වුණත්, ඒ කාලය තුළ එතුමා ප්‍රදේශයට, ජනතාවට, රටට, සමාජයට මතක හිටින, කාටත් කථා කළ හැකි මට්ටමේ සේවාවක් කළා. එතුමා ක්‍රියාකාරී දේශපාලනයෙන් ඈත් වුණත්, සමාජයට කරන්න තිබෙන මෙහෙවර සහ සේවය වෙනුවෙන් විවිධ මැතිවරණ කාලවලදී ඒ ප්‍රදේශයට වැඩක් කළ හැකි නායකයන් සමඟ එකතු වෙමින් දේශපාලන ගමනෙහි නිරත වුණා. එතුමා මේ වසරේ මුල් කාලයේදීම ජීවිතයෙන් සමුගනියි කියලා අපි කවුරුත් බලාපොරොත්තු වුණේ නැහැ. මොකද, එතුමා හොඳ නීරෝගී සෞඛ්‍ය සම්පන්න විධියට ජීවිතය ගත කළ නිසා. එතුමාට අවුරුදු 80කට ආසන්න කාලයක් වුණත් ගම් පියසට ආ වෙලාවක, යහළුවන්, හිතවතුන් හමුවන්නට පා පැදියකින් ගමන් කළ හැටි අපි නිතර දැකලා තිබෙනවා.

මහජන නියෝජිතයකු විධියට කාලයක් දේශපාලන ක්ෂේත්‍රයේ තමන්ගේ හඬ පතුරාගෙන සිටියත්, එතුමා බොහොම සරල, මානව හිතවාදී ගුණයක් තිබුණු, සාමාන්‍ය මිනිසුන් අතරේ හැදුණු වැඩුණු කෙනෙක්. එතුමාගේ පසු කාලීන ජීවිතයේදීත් එතුමා බිබිල ප්‍රදේශයේ සාමාන්‍ය මිනිසුන් සමඟ ගත කළ බව එතුමාගේ දින චර්යාව තුළින් අපි දැක්කා. එතුමාගේ පවුලේ සහෝදරයන් බොහෝ දෙනෙකු තවමත් ඒ ප්‍රදේශයේ ජීවත් වෙනවා. ඒ අයත් තමන්ගේ සහෝදරයා වාගේම සමාජ මෙහෙවරෙහි යෙදෙනවා. එතුමාගේ සහෝදරයකුගේ පුතෙක් ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයකු ලෙස මෑතක් වන තෙක් කටයුතු කළා. එතුමාත් තමන්ගේ ලොකු තාත්තා ගිය අඩි පාරේ ගමන් කරමින් සමාජ මෙහෙවරෙහි යෙදෙනවා.

ගරු කථානායකතුමනි, ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමා ආදර්ශයට ගත හැකි පැරණි දේශපාලනඥයෙක්. වර්තමාන දේශපාලනය තුළ දේශපාලනඥයන් පිළිබඳව විවිධ කථා, විවිධ මත, විවිධ විවේචන තිබෙනවා. මුදල් පසු පස නොගොස් සමාජ මෙහෙවර වෙනුවෙන්, හොඳ අනාගත පරපුරක් ගොඩ නැඟීම වෙනුවෙන් දේශපාලනයේ නිරත වුණු කෙනකු වූ එතුමා පිළිබඳව අපට බොහොම ආඩම්බරයෙන්, ගෞරවයෙන් කථා කිරීමට හැකියාව තිබෙනවා.

ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමාට දේශපාලන ක්ෂේත්‍රයෙන් සමුගන්න සිද්ධ වුණේ ඒ කාලයේ එතුමාට විරුද්ධව පදනම් විරහිත චෝදනා නභා තිබූ නිසායි. ඒ කාලයේ ඒ සමාජයේ තිබුණු පිළිගත් මත සහ පිළිගත් විශ්වාස අනුව දේශපාලන ක්ෂේත්‍රයේ කෙනකුට සුළු හෝ චෝදනාවක් එල්ල වී තිබුණා නම් ඔහු දේශපාලන ක්ෂේත්‍රයට ආවේ නැහැ. මා දන්නා විධියට ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමා දේශපාලන ක්ෂේත්‍රයේ බොහොම නිවැරැදිව කටයුතු කළා; නිවැරැදි ගමනක් ආරම්භ කළා. නමුත් දේශපාලන ක්ෂේත්‍රයේ හොඳ ගමනක් යන, හොඳ අනාගතයක් තිබෙන ඕනෑම දේශපාලනඥයකුට එන විරෝධතා, ප්‍රතිවිරෝධතා එතුමාටත් එල්ල වුණා. නමුත් එතුමා ඒවායෙන් කම්පාවට පත් වුණේ නැහැ. එතුමා හැම දෙයක්ම මධ්‍යස්ථ සිතින් දරාගෙන මැතිවරණයට ඉදිරිපත් නොවී සිටියත්, හැම මැතිවරණයකදීම සමාජයට මෙහෙවරක් කරන්න පුළුවන් අයට සහයෝගය දීලා දේශපාලනයේ යෙදුණා. ඌව වෙල්ලස්සට ආලෝකයක් ලබා දෙමින්, ඌව වෙල්ලස්ස ජනතාවගේ ජන ජීවිතය ඉදිරියට ගෙන ඒමට කටයුතු කරමින්, දේශපාලන ක්ෂේත්‍රයේ නොමැකෙන මතක සටහන් මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ආසනයේ ජනතාව තුළ ඉතිරි කරමින් එතුමා සදහටම සමුගත්තා.

එසේ සදහටම සමුගත්තත්, එතුමා ඒ කාලය තුළ කළ කී දේ අදත් ජනතාව බොහොම භක්තියෙන්, ආදරයෙන්, ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ නිසා එතුමාගේ දයාබර බිරිඳ වන ඉන්ද්‍රාණි ගුණසේකර මැතිනියටත්, දරුවන් හත් දෙනාටත්, පවුලේ ඥාති පිරිසටත් ස්වාමි පුරුෂයෙකු, පියෙකු, ඥාතිවරයෙකු වශයෙන් එතුමා පිළිබඳව බොහොම ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන් වෙයි. එම ගෞරවය ඒ පවුලේ සියලු දෙනාටත් ඒ ප්‍රදේශයේ ජනතාව නිතර පිරිනමනවා. ඒ ගෞරවය අඩු වෙන එකක් නැහැ. තමන්ගේ දිස්ත්‍රික්කයට, තමන්ගේ ආසනයට විශාල මෙහෙවරක් කරමින් සිටි එතුමා තමන්ගේ දිස්ත්‍රික්කයෙන්, තමන්ගේ ආසනයෙන් විතරක් නොවෙයි සියලු දෙනාගෙන්ම සමු ගත්තා. එතුමාගේ අභාවයෙන් ශෝකයට පත් වී සිටින එතුමාගේ දයාබර බිරිඳටත්, දරුවන්ටත්, එතුමාගේ පවුලේ සියලු ඥාතීන්ටත් ඒ වාගේම එතුමා පිළිබඳව බොහොම සුබවාදීව හිතන එතුමාගේ හිතවත් සියලු දෙනාටත්, විශේෂයෙන්ම බිබිල මැතිවරණ කොට්ඨාසයේ සියලුම ප්‍රගතිශීලී, කෘතවේදී ජනතාවගේත්, මොණරාගල දිස්ත්‍රික්කයේ කෘතවේදී ජනතාවගේත්, මගේත් ශෝකය මේ අවස්ථාවේදී පුද කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු රවුෆ් හකීම් මැතිතුමා.

[11.21a.m.]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Hon. Speaker, I am pleased to say a few words on this occasion when this House is paying tribute to one of the former Members, the late Hon. D.M. Gunasekere, who served this House for a period of four years, from 1960 to 1964. Several Hon. Members who spoke before me referred to the rare personality that the Hon. D.M. Gunasekere was.

Sir, the Votes of Condolence in this House are certainly not mere rituals where we pay empty tributes in this Assembly to Members who have passed away. What is more important for us to look at is the Member's entry to Parliament and the period in which he served the country as a representative of the people. All of us know that 1960 was a turbulent period where this House had to face two elections in the same year, in March and later in July - we now have here Field Marshal Hon. Sarath Fonseka also with us - and that was a year where the country faced an attempt at a coup to topple a democratically-elected Government. Such was the period in which the Hon. D.M. Gunasekere entered this House and served his people. What is important for us to bear in mind is it is because of such people and their commitment to democracy that democracy thrives today in this country.

I am not someone who had closely associated with him, but I have heard from the people, particularly the

[ගරු රවුෆ් හකීම් මහතා]

Muslims of villages like Bakinigahawela, Kotabowa, which are ancient villages where Muslims have settled down since the glorious good old days of the Uva-Wellassa *Rajadhani*. The Hon. D.M. Gunasekere had been responsible to look at issues concerning the miniscule minority like the Muslims and has even been responsible to ensure that they were allocated a separate land for their burial purposes. All of us know that Muslim burial rites have to be concluded within a day, within 24 hours, and they are not in the habit of cremating the remains of the dead. Therefore, they need proper burial grounds to allow the departed to have a final resting place. In this case, the Muslims of Kotabowa have always been keeping the late Hon. D.M. Gunasekere in their thoughts for this yeoman service that he rendered those people. That was also a period - especially after 1956 - in which there was this wave of Sinhala-Buddhist nationalism sweeping across the country, a period in which there was a massive revival towards nationalist feelings. In balancing the interests of the majority and the minorities, the service of people of the calibre of the late Hon. D. M. Gunasekere have to be always remembered. We need to pay a glowing tribute to the way in which such people conducted their public life.

It is also important for us to remember here - because I as a Party Leader who has to travel past Bibile - the days in which we had to face the horrendous war against terrorism in the country, there were times when we could not go through the normal route through Mahiyangana and Mahaoya to reach Ampara. We had to take the circuitous route towards Bibile and go through Bibile to Ampara passing Namaloya and other areas. It was the late Hon. D. M. Gunasekere who had been the pioneer in making sure that that road became a reality and that road is an important bypass road for the purposes of reaching Ampara in case there are difficulties to go through the usual route of passing through Mahiyangana and Mahaoya towards Ampara. Therefore, that again is a matter that is always remembered when the late Hon. D. M. Gunasekere's name is mentioned.

I do not want to take much time in paying tribute to him, but I must also remember here that the late Hon. Gunasekere had among his offspring whom he left for the country, the boys and girls - seven of them - a son whom he allowed to join the armed forces and serve the armed forces. Therefore, he should be among those parents who have that satisfaction of having contributed towards safeguarding the territorial integrity of this country bequeathing one of their children towards the horrendous war that we had to face. Therefore, that again is another important aspect of his glorious life.

He had lived until the ripe old age of 82 years and had served his people well by having been involved in the revival of the co-operative movement, having served the co-operative movement, having been involved in setting up the co-operative welfare establishment in many parts of the Moneragala District during the period of the late Trade Minister, Hon. T. B. Illangaratne. These are all important milestones in his glorious political career.

It is my pleasure once again, Mr. Speaker, to be involved in paying tribute to one of those parted Members who had rendered a yeomen service to his people.

May I convey my condolences to his wife and children and to the people of Moneragala on this occasion.

Thank you.

[පූ.භා. 11.30]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මේ උත්තරීතර සභාව නියෝජනය කළ, මේ රටේ ජනතාව ඉතාම නිවැරැදිව නියෝජනය කළ සහ මේ රටේ නිවැරැදි දේශපාලන මතවාදයක් වෙනුවෙන් සෘජුව පෙනී හිටපු ජනතා නියෝජිතයකුගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාවක් ගෙනැවිත් තිබෙන අවස්ථාවක්, මේ. වෙල්ලස්ස ඓතිහාසික බිම්කඩ නියෝජනය කළ එම ජනතා නියෝජිතයා වන ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියටත්, ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරමිනුත් අපේ සංවේගය, ඒ වාගේම ඒ පවුල වෙත තිබෙන අපේ හෘදයංගමභාවය ඉතාම හැඟීම් බරව ප්‍රකාශ කරන්නට මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා.

අද දවසේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ නැති වුණත්, ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා අද පෙරවරුවේත් දුරකථනයෙන් කථා කර එතුමාගේ ගෞරවය සහ සංවේගය ගුණසේකර පවුල වෙත ප්‍රදානය කරන්නටය කියන ඉල්ලීම අපෙන් කරනු ලැබුවා. එය මේ ගරු සභාව හරහා, ගුණසේකර මහතාගේ පවුල වෙතත්, එතුමාගේ හිතවතුන් වෙතත් සන්නිවේදනය කරන්නට මම මේ අවස්ථාව පාවිච්චි කරන්න ඔබතුමාගේ අවසරය ඉල්ලනවා.

ගරු කථානායකතුමනි, මම පෞද්ගලිකව කියනවා නම්, ගුණසේකර මැතිතුමා මේ රටේ ජනතා නියෝජිතයකු විධියට පත් වෙන්නේ මා ළඳරුවකු විධියට බහතෝරන අවධියටත් පෙර සිටියි. ඒ නිසා පෞද්ගලිකව එතුමාගේ දේශපාලන පරමාදර්ශයන් පිළිබඳව මට තිබෙන්නේ දැකලා පුරුදු, අත්විඳපු දේවල් නොවෙයි, සමාජය විසින්, සමාජයේ කථිකාවන් හරහා දැන උගත් දේවල් පමණයි. නමුත්, දැන් මේ ගරු සභාවේ සාකච්ඡා වුණු ආකාරයට එතුමා පිළිබඳ පෙර කියැවීම් සියල්ලම ඉතා නිවැරදිව සඳහන් කරන්නේ එතුමා පරමාදර්ශී දේශපාලනඥයකු විධියටයි.

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ ඔබතුමාගේ දකුණු අත පැත්තෙන් සහ වම් අත පැත්තෙන් අසුන් ගෙන ඉන්න අපි සියලු දෙනාම පිළිගන්නට ඕනෑ, "දේශපාලනඥයා" කියන වචනයට අද ලැබෙන නිර්වචන සමාජයේ සෞඛ්‍ය සම්පන්න නිර්වචන නොවෙයි කියන එක. ඒවා නිරෝගී නිර්වචන

නොවෙයි; ප්‍රසන්න නිර්වචන නොවෙයි. "දේශපාලනඥයා" කියලා කිව්වාම සමාජයේ ගොඩ නැහෙන්නේ "තක්කඩියෙක්" කියන හැඟීමයි. උදේ පාන්දරට මොන පුවත් පත ගත්තත් කාටුන් ශිල්පියා දේශපාලනඥයා සිතුවම් කර තිබෙන්නේ, එක්කෝ මදාවියෙක් විධියට, එහෙම නැත්නම් කපටියෙක් විධියට, එහෙමත් නැත්නම් සල්ලාලයෙක්, වංචනිකයෙක් විධියට. මේක තමයි ඔබතුමා ඇතුළු අපි සියලු දෙනා පිළිබඳවම මේ රටේ මාධ්‍යවේදීන් දකින විධිය. ඒ, අපේ මේ ඉන්න 225දෙනා හෝ අපේ පූර්වගාමීන් සියලු දෙනාම එකතු වෙලා කළ වංචනික ක්‍රියාවන් නිසා නොවේ. අපි නියෝජනය කරන පක්ෂයේ පාට නිල් ද කොළ ද, රතු ද කියලා වෙන් කර නොවෙයි, ඒ මතය ගොඩ නැඟී තිබෙන්නේ. අපි නියෝජනය කරන තීරුවල ඉන්න ඉතා කුඩා කණ්ඩායම් විසින් සමාජයට දීපු වැරදි ආදර්ශ නිසයි මේ මතය ගොඩ නැඟී තිබෙන්නේ. තුවක්කුවක්, පිස්තෝලයක් එල්ලා ගත්ත කෙනකු තමයි දේශපාලනඥයකු කියලා අද පුංචි දරුවා හිතන්නේ.

ගරු කථානායකතුමනි, අපට ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමා වැනි චරිත වැදගත් වෙන්නේ, අද මේ සමාජගත වෙලා තිබෙන ජනප්‍රිය, සම්මත නිර්වචනයට බාහිරව ගිහිල්ලා සැබවින්ම ජනතාව වෙනුවෙන් පෙනී සිටි ජනතා නායකයන් විධියටයි. ඒ නිසා එතුමා ගැන අපට ආඩම්බර වෙන්න පුළුවන්. එතුමාගේ පවුලේ සියලුම දෙනාටමත් ආඩම්බර වෙන්න පුළුවන්. ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමා නියෝජනය කළේ වෙල්ලස්ස; රටේ ඓතිහාසික උරුමයන් වෙනුවෙන් පෙරමුණ ගත්තු වෙල්ලස්ස. එතුමා නියෝජනය කළේ අපේ පක්ෂය; ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. ඒ විතරක් නොවෙයි. එතුමා නියෝජනය කළේ මේ රටේ වරප්‍රසාද රහිත ජන තීරුව. මේ සියලුම සාධක එක්ක එතුමා එතුමාගේ එකම පුත්රුවන මේ රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් කැප කරන්න තීන්දු කළ නායකයෙක්. ඒ නිසා එම මැතිනියටත්, පවුලේ සියලු දෙනාටමත් තමන්ගේ ස්වාමි පුරුෂයාගේ, තමන්ගේ පියාගේ අභාවයෙන් දශක ගණනාවකට පස්සේ වුණත් සතුටු වෙන්න පුළුවන්, තමන් ඉතිහාසයට යමක් එකතු කළ නායකයකුගේ, ස්වාමියෙකුගේ, පියෙකුගේ පරම්පරාවක් නියෝජනය කරනවාය කියලා.

මේ පාර්ලිමේන්තුව විධියටත්, ජනතා නියෝජිතයන් විධියටත් අපි ප්‍රාර්ථනා කරන්නේ එතුමා දීපු ආදර්ශය, පරමාදර්ශය තවත් කාලාන්තරයක් යන තුරා මේ රටේ ජනතා නියෝජිතයන්ට මහ පෙන්වන මාවතක් බවට පත් වේවා! කියායි. මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපි අදහන ආගම්වල හැටියට එතුමාගේ ආත්මයට නිදහස, සාමය ලැබේවා! ඒ වාගේම එතුමාට නිවන් සුව අත්වේවා! කියන ප්‍රාර්ථනාව කරමින් එතුමාගේ අභාවය වෙනුවෙන් අපි සියලු දෙනාගේම කනගාටුව සහ සංවේගය ඔබතුමා හරහා රට වෙත මුදාහැරීමටත් මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. බොහොමත්ම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණි විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමා.

[පූ.භා. 11.38]

ගරු ගාමිණි විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)

ගරු කථානායකතුමනි, 1960 සිට 1965 දක්වා අපේ ගමේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වූයේ ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමායි. අපි එතුමා දකින්නේ දේශපාලන පක්ෂයක් නියෝජනය කළ නියෝජිතයෙකුට එහා ගිය ඉතාමත් සුභදශීලී, ඉතාමත් එඩිතර, අවංක නායකයෙක් විධියටයි; හේනේ පැලේ, කුඹුරේ, ඇළේ-දොළේ නාලා සාමාන්‍ය මිනිහාත් එක්ක ජීවත් වුණු ඉතාම නිර්ව්‍යාජ දේශපාලනඥයෙක් හැටියටයි.

මේ පාර්ලිමේන්තුවේ කවුරු කොහොම කථා කළත් මම මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. එතුමා පසු ගිය 27 වෙනිදා පන්නිපිටිය සුසාන භූමියේදී අවසන් ගමන් ගියා. එදින මම එතුමා ගැන ගුණකථනයක් කළා. අද එතුමා ගැන මම මේ කරන්නේ දෙවන ගුණකථනයයි. එතුමාගේ අවසන් කටයුතුවලට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් සහභාගි වුණු, මේ පාර්ලිමේන්තුවේ එකම මහජන නියෝජිතයා මමයි. ඒකට හේතුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. අපට මේ නායකයා පිළිබඳව කථා කරනකොට විවිධ ගුණ කථන කරන්නට පුළුවන්. නමුත් අපේ හැම චරිතයකටම විවිධ චෝදනා එල්ල වෙනවා. අපේ ආනන්දාරාමයේ නායක හාමුදුරුවෝ ආර්.එම්. ගුණසේකර මැතිතුමාත්, ඒ වාගේම ඩී.එම්. ගුණසේකර මැතිතුමාත් කොළඹ ආනන්ද ශාස්ත්‍රාලයට ඇතුළත් කරලා අධ්‍යාපනය ලබන්න ඉඩකඩ සැලසුවා.

ආර්.එම්. ගුණසේකර මහතා තැපැල් ස්ථානාධිපතිවරයෙක් හැටියට මුල් පත් වීම ලැබුවා. ඩී.එම්. ගුණසේකර මහතා සමුපකාර ව්‍යාපාරයේ කටයුතු කරනු ලැබුවා. මේ දේශපාලන පක්ෂ දෙකේම නායකයන් දෙදෙනා පන්සල මැදිහත් වෙලා බිහි කළ නායකයන් දෙදෙනෙක්. කෙසේ නමුත් දෙදෙනා දෙපැත්තට ගියා. අවසානයේදී දේශපාලනයේ තිබෙන කුරිරුකම, අනුවේදනීයකම මතු වෙලා, මොන ආකාරයකින් හෝ ආර්.එම්. ගුණසේකර මැතිතුමාගේ මරණය පිළිබඳ චෝදනාව ඩී.එම්. ගුණසේකර මහතාට එල්ල වුණා. උසාවිය ඒ චෝදනාවෙන් මෙතුමා නිදොස් කොට නිදහස් කළා. නමුත් ඒ ප්‍රදේශයේ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ හදවත් තුළින් ඒ චෝදනාව ඉවත් වුණේ නැහැ. අපේ සමාජය ගම්බද -ගැමි- සමාජයක්. බොරු ආරංචි, බොරු වැරදි, බොරු චෝදනා හේතුවෙන් බොහෝ විට නායකයන් ප්‍රතික්ෂේප වෙනවා. ඒක එදත්, අදත් එක සේ සිදු වන දෙයක්, ගරු කථානායකතුමනි. දේශපාලන වශයෙන් ඉතාම දක්ෂ නායකයෙක් වුණත්, මොන ක්‍රියාකාරකම්වල නිරත වුවත් එතුමාට ඒ අභියෝගය ජයග්‍රහණය කිරීමට නොහැකි වුණා. නමුත් එතුමා දේශපාලනය අත් හැරියේ නැහැ. පසු ගිය මහ මැතිවරණයේදීත් එතුමා මට වැඩ කළා.

ගරු කථානායකතුමනි, අපි එතුමාගේ පරපුර ගැන කථා කරන්න ඕනෑ. 2018 වසරේදී 1818 කැරැල්ලට අවුරුදු 200ක් පිරෙනවා. 2018 වසරේදී අවුරුදු 200ක් පිරෙන ඒ අපේ රටේ පළමුවන නිදහස් අරගළය, හිරු නොබසින අධිරාජ්‍යය සසල කරවපු ඒ අරගළය ජයග්‍රහණය කරා ගමන් කළත්, අපේ අයගේම පාවාදීම් නිසා අවසානයේදී එය විනාශය කරා ගමන් කළා. ඒක ලෙහෙසි පහසු විනාශයක් නොවෙයි. ඌව වෙල්ලස්සේ බරපතළ විනාශයක් සිදු වුණා. දකින දකින හැම මිනිහාම ඝාතනය කරලා, වැව් අමුණු කඩා දමලා, අටු කොටු ගිනි තියලා, ජනතාව පලවා හැරලා, හරක බාන පවා විනාශ කරලා මහා දැවැන්ත විනාශයක් සිදු කළා, ගරු කථානායකතුමනි. එයට අභිතව මුහුණ දීපු නායකයෙක් තමයි එතුමාගේ මී මුත්තා වන කොහුකුඹුරේ රටේරාල. ඒ වාගේම එතුමාගේ පියා වන කොහුකුඹුරේ ආරච්චි මහත්මයා ගැනත් මම ආඩම්බරයෙන් මතක් කරනවා. කොහුකුඹුරේ ආරච්චි මහත්මයා මගේ පවුලේ ඉතාම හොඳ හිතවතෙක්. එතුමා කාලයක් මගේ නිවසේත් රැඳී සිටියා. මට "පුතා" කියලා තමයි කථා කළේ. ඒ නිසා ඒ පවුලත්, මාත් අතර ලොකු සම්බන්ධතාවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ එක්කම ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ දයාබර බිරිඳ වන

[ගරු ගාමිණී විජිත් විජයමුණි මහතා]

ඉන්ද්‍රාණි ගුණසේකර මහත්මිය ගැනත් කියන්න ඕනෑ. එතුමිය මගෙත් ඥාතිවරියක්. එතුමිය ගුරුතුමියක්. එතුමිය විවිධ දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා. එතුමිය විවිධ ස්ථානවලට මාරු කළා. මම ප්‍රධාන ඇමතිවරයා හැටියට සිටියදී එතුමියට යම් සාධාරණයක් ඉෂ්ට කරන්න මට අවස්ථාව ලැබුණා. ඒ වාගේම ඔවුන්ට දරුවන් හත් දෙනෙක් ඉන්නවා. පිරිමි දරුවන් පස් දෙනෙක් ඉන්නවා, ගරු කථානායකතුමනි. ඒ පස් දෙනාගෙන් එක පුතෙක් හමුදා සේවයේ ඉන්නවා. මේ රටට, සමාජයට, ජාතියට යම්කිසි මෙහෙවරක් කරන්න පුළුවන් ඉතා වටිනා දූ පුතුන් රාශියක් එතුමා දායාද කළා.

1982දී හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා ජනාධිපති අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වූ ජනාධිපතිවරණය ගැන මතක් කරන්න ඕනෑ. එදා ඒ මැතිවරණ කටයුතු එතුමා තනියම මෙහෙයවුවා. එතුමා හුදකලා වුණා. එතුමා හුදකලා සටනක් කළා. එහිදී විජය කුමාරණතුංග, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වැනි නායකයන් ගෙන්වා මහා දැවැන්ත රැස්වීම් පවත්වන්න එතුමාට පුළුවන්කම ලැබුණා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගෙන්වා රැස්වීම් පවත්වන්න එතුමාට පුළුවන්කම තිබුණා. ගරු කථානායකතුමනි, ඒ වෙලාවේ එතුමාගේ සෙවණැල්ලක් වාගේ එතුමා පිටුපස ඉන්න මට අවස්ථාවක් ලැබීම මගේ භාග්‍යයක් කොට මා සලකනවා. අපි එතුමාට උදව් කළා. එතුමා ආරක්ෂා කරන්න බැලුවා. එතුමා මනා පෞරුෂයක් ඇති, ආරෝහ පරිණාහ දේහයක් තිබෙන, අපේ වචනවලින් කියනවා නම් ටිකක් නහට අහන්නේ නැති එක විධියක කෙනෙක්. එතුමා පක්ෂ නායකත්වයත් එක්ක අරගළ ඇති කර ගන්නවා; පක්ෂයත් එක්ක අරගළ ඇති කර ගන්නවා. හැබැයි එතුමා ඉතා නිවැරැදි මතයි දැරුවේ. ඒවා අපි අනුමත කරපු මත.

දේශපාලන හැළ හැප්පීම්වලදී එතුමා නියෝජනය කරන මතය වෙනුවෙන් එතුමා කැප වීමෙන් කටයුතු කළා. එතුමා ජනතාවට කරුණු පැහැදිලි කරමින් ගම් නියම් ගම්වලට ගියා. එකල මේ වාගේ පාරවල් තිබුණේ නැහැ. වාහනවලින් යන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ. සැතපුම් ගණන් පයින් ගිහින්, පාක්ෂිකයන් එක් රැස් කරන මහා දේශපාලන ව්‍යාපාරයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ඌව-වෙල්ලස්සේ ගෙන ගිය එකම නායකයා එතුමාය කියලා අපට කියන්න පුළුවන්. ගරු කථානායකතුමනි, අද සමහර දේශපාලනයින් කරනවා වාගේ, උඩින් පහත් වෙලා, එහෙම නැත්නම් පැරෂුට් එකෙන් ඇවිල්ලා තමන්ගේ බලය පෙන්වා කරන දේශපාලනයක් නොවෙයි, එකල තිබුණේ. මෙතුමා ලබා ගත් ඡන්ද ගණන මට මතකයි. ඡන්ද පන්දහස් ගණනක් වැනි සුළු ඡන්ද ප්‍රමාණයක් තමයි එතුමාට ලැබී තිබුණේ. කේවල මැතිවරණ ක්‍රමය තුළ තමන්ගේ ආසනයේ හැම කෙනකුම හමු වෙලා කථා බහ කර, පෞද්ගලිකව දැන හැඳින ගෙන, ඒ හැම කෙනෙකුගේම හිත දිනා ගැනීමේ හැකියාවක් එතුමාට තිබුණා. අපි දන්නවා, අද මැතිවරණ ක්‍රමය සංකීර්ණයි කියලා. ඒ නිසා එවැනි අයට අද පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව නැවත සිතා බැලිය යුතුයි කියා මා විශ්වාස කරනවා.

එදා එතුමාගේ අවසන් කටයුතු සිදු වුණු පන්නිපිටියේ සුසාන භූමියට බිබිල ආසනයේ අපේ පැරණි පාක්ෂිකයන් සියලු දෙනාම එකතු වෙලා සිටියා. ඒ පාක්ෂිකයන් ගුණසේකර මැතිතුමා ගැන කථා කළේ බොහොම ගෞරවයෙන්, ආදරයෙන්. අද මොන පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වුණත් තමන්ගේ ආසනවල පාක්ෂිකයන් එහෙම කථා කරනවාය කියලා මා නම් හිතන්නේ නැහැ. එහෙම කථා කරන්න තරම් ජනතාවට ළෙන්ගතුකමක්, ආදරයක් ගෞරවයක් ඇති වන තත්ත්වයට ක්‍රියා කරන්න මන්ත්‍රීවරයකුට පුළුවන්කමක් නැහැ, ගරු කථානායකතුමනි.

මම තවත් කාරණාවක් මතක් කරන්න ඕනෑ. එතුමා බිබිල - නාමල් ඔය පාර නිර්මාණය කළා. එම පාර බුලුපිටිය දක්වා එහා පැත්තෙන් තවත් කඩඉමකට නාමල් ඔය දක්වා නිර්මාණය වෙලා තිබුණා. මැද කොටස සම්බන්ධ වෙලා තිබුණේ නැහැ. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, ඩී.එම්. ගුණසේකර මැතිතුමා ආරම්භ කළ ඒ පාර ෆවුසි ඇමතිතුමා එක්ක ගෙන ගිහිල්ලා සම්බන්ධ කරන්න පුළුවන්කම ලැබුණ බව. ඒක මට ලැබුණ තවත් වාසනාවක්. ඒ වාගේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්න කාලයේ ඒ රජයේ ඇමතිවරයෙක් හැටියට රුපියල් මිලියන 4,660ක් වියදම් කරලා ඒ පාර කාපට් කරලා අද ඉතා සුන්දර පාරක් හැටියට තිබෙනවා. ඉතාම කෙටි කාලයක් තුළ නිර්මාණය කළ බුලුපිටිය, හමනව, නිල්ගල පාර වනෝද්‍යානයක් මැදින් යන ඉතාම සුන්දර පාරක්, ගරු කථානායකතුමනි. එවැනි ඉතාම සුන්දර පාරක් නිර්මාණය කරන්න අපට පුළුවන්කම ලැබුණා. එහි නිර්මාතෘවරයා ඩී.එම්. ගුණසේකර මැතිතුමායි. එතුමා ආරම්භ කළ ඒ වැඩ කොටස මට අවසන් කරන්න ලැබීම ඩී.එම්. ගුණසේකර මැතිතුමාට මා විසින් දක්වන ලද ගෞරවයක් කියා මා හිතනවා. පසු ගිය කාලයේ අපේ රජය යටතේ මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එතුමාට කළ ගෞරවයක් හැටියට මා කල්පනා කරනවා, ගරු කථානායකතුමනි,

එතුමාගේ මැතිනියගේ පැත්තෙන් සී.පී. ද සිල්වා මැතිතුමා සමඟත් එතුමාට ඥාති සම්බන්ධකමක් තිබෙනවා. ඒ සම්බන්ධකම ගොඩ නැඟෙමින් පවතිද්දී තමයි අභූත චෝදනාවක් යටතේ එතුමාට සිරගත වෙන්න සිදු වුණේ. එතුමා මන්ත්‍රීවරයකු හැටියට සිටි කාලයෙන් වැඩි කොටසක් ඒ නඩුවට මුහුණ දුන්නා. එතුමා සිරගත වෙලා සිටියා. ඊට පස්සේ එතුමාට පාර්ලිමේන්තුවට එන්න බැරි වුණත් හැම අවස්ථාවකම එතුමා දැවැන්ත දේශපාලන මෙහෙවරක් කළා. මට මතකයි, ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ පුතා ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා පළාත් සභා මැතිවරණයට ඉල්ලූ අවස්ථාවේ ඩී.එම්. ගුණසේකර මැතිතුමා ඒ මැතිවරණ ව්‍යාපාරයෙන් කොටසක් අතට අර ගෙන වැඩ කළ බව. ඔබතුමා ඒක දන්නවා ඇති.

මෙහිදී අපට පෙනෙන දේ තමයි, දේශපාලන මතය වෙනුවෙන්, තමන්ගේ පක්ෂය වෙනුවෙන් නොසැලී අවංකව කටයුතු කරන මෙවැනි නායකයන් අද නැහැයි කියන එක. ඒ නිසා අපට ඩී.එම්. ගුණසේකර මැතිතුමාගෙන් ගත හැකි අතිමහත් ආදර්ශයන් තිබෙනවා. එතුමා අපි ගෞරව කරන නායකයෙක්; අපි ආදරය කරන නායකයෙක්; අපට සිටිය යුතු නායකයෙක්. හැබැයි, අභාවප්‍රාප්ත වෙන්න කලිනුත් මම නම් කිහිප වතාවක් එතුමා හමු වුණා. එතුමාට ශරීර සෞඛ්‍ය පිළිබඳව ගැටලුවක් තිබුණේ නැහැ. මොකක් හෝ කුඩා රෝගයකට කුඩා ශල්‍ය කර්මයක් කරන්න තිබුණා. එතුමා ඒකට ගියේ නැහැ, ආරාණ්‍ය සේනාසනයකට දානයක් දෙන්න ගියා. ඒ දානය දීලා යන්නම් කියලා තමයි එතුමා කල්පනා කළේ. නමුත් එතුමා දානය දීලා ආවා. අභාග්‍යයකට වාගේ එතුමා අප අතරින් සදහටම වෙන් වුණා.

එතුමාගේ අභාවය වෙනුවෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන වෙල්ලස්සේ ජනතාවගේත් ගෞරවනීය උත්තමාචාරය සහ ශෝකය අපි ඒ පවුල වෙත පිරිනමනවා. ගරු කථානායකතුමනි, එතුමාට දෙවි මිනිස් සැප කෙළවර අමා මහ නිවන් සුව අත් වේවා; එතුමා නැවත අප අතරේ ඉපදේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

[පූ.භා. 11.48]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, 60 දශකයේ මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් මගේ ශෝකය මා පුද කරන්න කැමැතියි.

ඇත්ත වශයෙන්ම මම ඩී.එම්. ගුණසේකර මැතිතුමාව ළඟින් ඇසුරු කළ කෙනෙක් නොවෙයි. එතුමාගේ දේශපාලන ඉතිහාසය පිළිබඳව කවුරුත් කථා කළා. එතුමා ගමින් බිහිවෙලා, ගැමි සුවදින් ජනතාව අතර මිත්‍රත්වය ගොඩ නහාගෙන, පාර්ලිමේන්තුව නියෝජනය කරපු ගැමි නායකයෙක්; ඇත්ත වශයෙන්ම අධිරාජ්‍යවාදයට විරුද්ධව තමන්ගේ මුතුන් මිත්තන් ගෙන ගිය අරගළය හැඟීම්වලින් පෝෂණය කළ කෙනෙක්.

බොහෝ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේදී එතුමා ගැන හුඟක් කරුණු කිව්වා. එතුමා, සුදු අධිරාජ්‍යවාදයට විරුද්ධව එතුමාගේ පරම්පරාව ගෙන ගිය අරගළවලින් ඇත්ත වශයෙන්ම පෝෂණය ලබලා, අධිරාජ්‍ය විරෝධී හැඟීම් නිසාම දේශපාලනය තෝරා ගත් කෙනෙක්. එතුමා අපේ පක්ෂයේ කෙනෙකු නොවුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින්, මේ රටේ ධනේශ්වර ක්‍රමයට එරෙහිව අවලව, ප්‍රතිපත්තිගරුකව කටයුතු කළ දේශපාලනඥයෙක් හැටියට එතුමා ජනතාවගේ ගෞරවාදරයට පත් වී සිටිනවා. ප්‍රතිපත්තිගරුක දේශපාලනඥයන් මේ සමාජයේ දුර්ලභ අවධියක, ගමින් බිහිවෙලා, ගමේ ජනතාව අතර මිත්‍රශීලී බැඳීම් ඇතිව ගමට සේවය කළ, ගමේ ජනතාවගේ ගුණ සුවඳට ප්‍රතිචාර දක්වමින් ගෞරව කළ දේශපාලනඥයෙකු තමයි ඩී.එම්. ගුණසේකර මැතිතුමා කියන්නේ. එවැනි දේශපාලනඥයෙකු මේ යුගයේ අහිමි වීම බරපතළ කනගාටුවට කරුණක්.

එතුමාගේ ඉතිහාසයෙන් අපට ලබා ගන්න පුළුවන් අත්දැකීම් තිබෙනවා. එතුමාට අධිරාජ්‍ය විරෝධී අරගළ ව්‍යාපාරයේ මුතුන් මිත්තන්ගේ ආභාසය තිබෙනවා. ඒ කාරණා සියල්ල ගැන සලකලා, එතුමා ගෙන ගිය ඒ අවල දේශපාලන ප්‍රතිපත්තියට ගරු කරමින්, එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ බිරිඳ ඇතුළු දරුවන්ට අපේ පක්ෂයේ ශෝකය මේ අවස්ථාවේදී පුද කරනවා. එතුමා පැතූ යම් සුවයක් තිබෙනවාද ඒ සුවය ලැබේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම බෞද්ධයෙක් හැටියට මා එතුමාට නිවන් සුව අත් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් ශෝකය පළ කිරීම අවසන් කරනවා.

[පූ.භා. 11.52]

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, ඩී.එම්. ගුණසේකර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශය කරන මේ අවස්ථාවේදී එයට සම්බන්ධ වීමට මා ද කැමැතියි. එතුමාගේ දේශපාලන ජීවිතය, ඒ වාගේම එතුමාගේ පරම්පරාව පිළිබඳව මේ ගරු සභාවේදී ප්‍රමාණවත් අදහස් ප්‍රකාශ කළා.

ඩී.එම්. ගුණසේකර මැතිතුමා 1960 මාර්තු මාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් බිබිල ආසනයට තරග කළා. ඒ අවස්ථාවේ ඔහුට ජය ගන්න බැරි වුණත්, එම වර්ෂයේම ජූලි මාසයේ පැවැත්වූ මැතිවරණයෙන් එතුමා ජයග්‍රහණය කළා. ඒ කාලයේ එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන කොට, මගේ පියාත් බෙලිඅත්ත ආසනයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ අවස්ථාවේදී පාසල් ශිෂ්‍යයන් හැටියට ශ්‍රාවස්තියේදී පළමුවෙන්ම මෙතුමා දැන හඳුනා ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඊට පසුව මම 1965 මොණරාගල පොලීසියේ සේවය කරන කාලයේ ඉඳලා මෙතුමා හමුවීමටත්, යම් යම් අවස්ථාවලදී කටයුතු කිරීමටත් පුළුවන්කම ලැබුණා.

අපේ විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා කිව්ව පරිදි, 2009 ඌව පළාත් සභා මැතිවරණය පවත්වපු අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන්, ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමාගේ ජයග්‍රහණය උදෙසා ඉතාම ඕනෑකමින්; කැප වීමෙන්; මහන්සි වෙලා එතුමා වැඩ කළා. ඒ අවස්ථාවේදී එතුමා සමඟ බිබිල ආසනයේ විවිධ තැන්වලට -ගම්මාන රාශියකට- යන්න අපටත් පුළුවන්කම ලැබුණා. එතුමා හැම කෙනෙක්ම හඳුනනවා. බිබිලේ ජනතාව එක්ක හොඳ සම්බන්ධකමක්, මිත්‍රකමක් තියා ගෙන සිටි බව ඒ අවස්ථාවේ අපි දැක්කා.

ඉන් පසුව 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී එතුමා තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාසයට ඇවිල්ලා, මා වෙනුවෙන් විශාල කැපවීමක් කර වැඩ කළා. එතුමාගේ පිරිසත් එකතු කර ගෙන ඇවිල්ලා, මාස ගණනක් තිස්සමහාරාමයේ නැවතිලා ඉඳගෙන ඒ මැතිවරණ කටයුතුවලදී වැඩ කළා.

එතුමාට යම් කාර්යයක් භාර දුන්නාම ඒ කාර්යය ඉතාමත් අවංකව හා කැපවීමෙන් ඉටු කරන බව මේ අවස්ථාවේදී එතුමාට ගෞරවයක් හැටියට මම සඳහන් කරන්නට කැමැතියි.

බිබිල මැතිවරණ කොට්ඨාසය කියන්නේ ඉතාමත් ප්‍රසිද්ධ මැතිවරණ කොට්ඨාසයක්. මට මතකයි, ඉස්සර බිබිල මැතිවරණ කොට්ඨාසයට අපේ රටේ හිටපු අගමැතිවරයෙක් වන ඩඩ්ලිව්. දහනායක මැතිතුමාත් තරග කළා. ඉන් පසුව මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ, අවුරුදු 11ක් පමණ මුදල් අමාත්‍ය ධුරය දැරූ රොනී ද මැල් මහත්මයාත් තරග කර තිබෙනවා.

ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ අවසන් කටයුතු සිදු කරන අවස්ථාවේදී එතුමාට අවසන් ගෞරවය දැක්වීමට, එතුමා කළ සේවය ඇගයීමට පන්නිපිටිය ප්‍රදේශයේ පිහිටි එතුමාගේ නිවසට බිබිල සහ මොනරාගල වාගේ ප්‍රදේශවලින් විශාල ජනකායක් පැමිණි බව මට මතකයි. එතුමා කොතරම් දුරට ප්‍රදේශයේ ජනතාවත් සමඟ කිට්ටුවෙන් සිටියාද, ලෙන්ගතුව සිටියාද කියන එක අපට එදා දැක ගන්නට පුළුවන් වුණා. එතුමා ඒ කාලයේ හැටියට ඒ ප්‍රදේශයට විශාල සේවාවක් කරලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මම එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමාගේ දයාබර බිරිඳටත්, දරුවන්ටත් අපගේ ශෝකය ප්‍රකාශ කරන අතර, ඩී.එම්. ගුණසේකර මැතිතුමාට නිවන් සුව අත්වේවා! යි ප්‍රාර්ථනය කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දිවංගත ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් මමත් ඒ සමඟ එක්වීමට කැමැත්තෙමි. රැස්වීමට අදාළ නිල වාර්තාවේ - හැන්සාඩ් - පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි.

The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අභාවප්‍රාප්ත, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා පිළිබඳ ශෝක යෝජනාව ඉදිරිපත් කිරීම. ගරු සභානායකතුමා

ශෝක ප්‍රකාශය : ගරු ඉන්දික ගුණවර්ධන මහතා
அனுதாபத் தீர்மானம்: மாண்புமிகு இந்திக குணவர்தன
VOTE OF CONDOLENCE: HON. INDIKA GUNAWARDENA

[අ.භා. 1.30]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ පොදු ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ කෘතහස්ත දේශපාලනඥයකු වූ ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරමි.

"බොරළුගොඩ සිංහයා" ලෙස විරුදාවලිය ලත් මහජන එක්සත් පෙරමුණේ හිටපු නායක සහ හිටපු අවිස්සාවේල්ල පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පිලිප් ගුණවර්ධන මැතිතුමාට සහ කිරිඇල්ල හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී, ගරු කුසුම්සිරි ගුණවර්ධන මැතිනියට දාව 1943 පෙබරවාරි මස 08වන දින බොම්බායේ මතුංගා හින්දු ජනාවාසයේ පායි දොස්තර මහතාගේ රෝහලේදී මෙතුමා ජන්ම ලාභය ලැබුවේය.

කොල්ලුපිටිය මෙතෝදිස්ත විදුහලෙන් මූලික අධ්‍යාපනය හදාරා පසුව කොළඹ තර්ස්ටන් විදුහලෙන්ද, 5 ශ්‍රේණියේ විභාගය සමත් වීමෙන් පසු කොළඹ රාජකීය විදුහලෙන්ද ද්විතීයික අධ්‍යාපනය ලද මෙතුමා පාසලේ සාහිත්‍ය සංගමයේ හා විවාද කණ්ඩායමේ සාමාජිකයකු ලෙස එම කටයුතුවලට සම්බන්ධ වීම මෙන්ම පෙරදිග සංගීත වාදක කණ්ඩායමේ කැපී පෙනෙන සාමාජිකයෙකු ලෙස කටයුතු කරමින් විදුහලට ඉමහත් කීර්තියක් ගෙන දුන් සිසුවෙකු ලෙස පෙන්වා දිය හැකිය.

මට මතකයි, අප රාජකීය විද්‍යාලයේ ඉන්න කාලයේ මුළු පාසලෙන්ම එතුමා තමයි ජාතික ඇඳුම ඇඳගෙන ආවේ. අපට වඩා ජ්‍යෙෂ්ඨ පන්තිවලයි එතුමා හිටියේ. මා හිතන විධියට එතුමා තමයි රාජකීය විද්‍යාලයේ මුළු ඉතිහාසයේම පළමුවැනි වතාවට ජාතික ඇඳුමින් සැරසී එම පාසලට ආවේ.

තවද, සංස්කෘතික අමාත්‍යාංශය විසින් සංවිධානය කළ කොළඹ දිස්ත්‍රික් පාසල් සිංහල සාහිත්‍ය සංගම් සම්මේලනයේ සභාපති වශයෙන්ද මෙතුමා කටයුතු කර ඇත.

රාජකීය විදුහලෙන් අධ්‍යාපන කටයුතු නිම කළ මෙතුමා පසුව ජර්මනියට පිටත් වූ අතර, එරට ලයිප්සිග් විශ්වවිද්‍යාලයෙන් පස් අවුරුදු කෘෂිකර්ම ගෞරව උපාධිය ජර්මන් භාෂාවෙන්ම හැදෑරීමට සමත් විය.

කොළඹ හිටපු නගරාධිපති, ප්‍රසන්න ගුණවර්ධන මහතා, හිටපු අමාත්‍ය මෙන්ම කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිනේෂ් ගුණවර්ධන මහතා, හිටපු අමාත්‍ය ගරු ගීතාංජන ගුණවර්ධන මහතා සහ ලක්මාලි ගුණවර්ධන මහත්මිය යන අයගේ සහෝදරයෙකු වූ ඉන්දික ගුණවර්ධන මැතිතුමා 1973 මැයි මස 17වන දින වෛද්‍ය පද්මිණී ගුණවර්ධන මහත්මිය සමඟ විවාහ දිවියට පිවිස, දියත් ගාමින්ද ගුණවර්ධන සහ යසිත් චතුර ගුණවර්ධන යන පුතුන් දෙදෙනා මෙලොවට දායාද කළේය.

1968 මහ බැංකුවේ පර්යේෂණ අංශයේ ග්‍රාමීය ණය අංශයේ පර්යේෂණ නිලධාරි වශයෙන් සේවය කළ ඉන්දික ගුණවර්ධන මැතිතුමා පසුව අගලවත්ත රබර් පර්යේෂණ ආයතනයේ ප්‍රථම කෘෂි ආර්ථික අර්ථශාස්ත්‍රඥ තනතුර දරමින් සේවය කළ අතර, එම කාල වකවානුව තුළ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය ගෙන එම පක්ෂයේ කටයුතුවල නිරත විය. පසුව පක්ෂයේ ඉල්ලීම පරිදි රැකියාවෙන් ඉවත් වී පූර්ණ කාලීන දේශපාලනයට පිවිසි එතුමා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සමිති සම්මේලනයේ උප සභාපති, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ලංකා රාජ්‍ය සංස්ථා සේවක සමිතියේ ලේකම් හා පක්ෂයේ මධ්‍යම කාරක සභික, පක්ෂ සංවිධායක, දිස්ත්‍රික් ලේකම්, නියෝජ්‍ය සභාපති යන තනතුරු දැරුවේය. මෙතුමා 1980 වසරේ මානව අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස ජනතාවගේ මානව අයිතිවාසිකම් වෙනුවෙන් සෘජුව පෙනී සිටි දේශපාලනඥයෙකු ලෙසද සැලකිය හැකිය.

1993 පැවැති බස්නාහිර පළාත් සභා මැතිවරණයෙන් ජයගෙන පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වූ ඉන්දික ගුණවර්ධන මැතිතුමා 1994 වර්ෂයේ පැවැති මහ මැතිවරණයෙන් ජයගෙන පාර්ලිමේන්තුවට තේරී පත්ව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ලෙස කටයුතු කළේය. එම කාලයේ ධීවර කර්මාන්තය නහා සිටුවීම සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමත්, නව ධීවර හා ජලජ සම්පත් පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයද නැවත ව්‍යාප්ත කිරීමට කටයුතු කරන ලදී.

1997 ජුනි මස සිට 2000 වර්ෂය දක්වා නාගරික සංවර්ධන නිවාස හා ඉඩිකිරීම් අමාත්‍යවරයා වශයෙන්ද, නැවත 2000 වර්ෂයේ මැතිවරණයෙන් ජයගත් මෙතුමා 2000 සිට 2001 සැප්තැම්බර් දක්වා උසස් අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ සංවර්ධන අමාත්‍යවරයා වශයෙන්ද, ඉන් පසුව 2001 සැප්තැම්බර් මස සිට 2001 දෙසැම්බර් මස දක්වා තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යවරයා වශයෙන්ද කටයුතු කළේය. එසේම කැලණි මිටියාවත පොදුජන උදානයෙහි සභාපති වශයෙන් 1996 වසරේ සිට මිය යන තුරුම කටයුතු කළේය.

මාලදිවයින, ප්‍රංශය, චීනය, නෙදර්ලන්තය, කියුබාව, රුසියාව, ජර්මනිය ඇතුළු රටවල් ගණනාවක සංචාරය කළ මෙතුමා එයින් ලද අත් දැකීම් සමුදායද ජනතා මෙහෙවර වෙනුවෙන් ඉවහල් කර ගත්තේය. මෙසේ තම ජීවිතයෙන් වැඩි කාලයක් ජනතා යහපත වෙනුවෙන් කැප කළ ඉන්දික ගුණවර්ධන මැතිතුමා අවුරුදු 73ක් ආයු වළඳා, 2015 සැප්තැම්බර් මස 14 වන දින මොලොවින් සමු ගත්තේය. ගරු කථානායකතුමනි,1994 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වාත්, නැවත 2000 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වාත් අවුරුදු හතකට වැඩි කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් කොළඹ දිස්ත්‍රික් ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කළ ඉන්දික ගුණවර්ධන මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කරමි.

[අ.භා. 1.37]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)

(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා සහෝදර කැබිනට් අමාත්‍යවරයෙකු වශයෙන් අප සමඟ සේවය කරන ලද ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේ එතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මම සතුටු වෙනවා.

මම එතුමාව හඳුනා ගත්තේ මේ රටේ වාමාංශික ව්‍යාපාරයේ ක්‍රියාකාරිකයෙකු වශයෙන් - එතුමා විශේෂයෙන් ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ පූර්ණකාලීන සාමාජිකයෙකු වශයෙන් - කටයුතු කරන අවධියේදියි. විශේෂයෙන්ම 1983 සිට කොළඹ මහ නගර සභාවේ මා විපක්ෂ නායකයා වශයෙන් කටයුතු කරන කාලයේ සිටම කොටාරෝඩ් හි පිහිටි "ඇන්ත" පුවත් පත් කාර්යාලයට අප නිතරම ගියා. නිරතුරුව සාකච්ඡා පැවැත්වූවා. කේ.පී. ද සිල්වා මැතිතුමා, ඉන්දික ගුණවර්ධන මැතිතුමා යන මේ අය අපේ වාමාංශික දේශපාලන ව්‍යාපාරයේ පන්නරය මුවහත් කළ දේශපාලනඥයන් බවට පත් වුණා. එතුමා ඉතාමත් කීර්තිමත් ශ්‍රී ලාංකීය දේශපාලන පවුලක සාමාජිකයෙක්. මවත්, පියාත්, සහෝදරයිනුත් ශ්‍රී ලාංකීය දේශපාලනය සඳහා අනුපමේය සේවයක් කළා. එතුමාත් ඒ අඩි පාරේම යමින් අනෙක් අයටත් වඩා- පාර්ලිමේන්තු දේශපාලනයටත් වඩා- වෘත්තීය සමිති, ජනතා අයිතිවාසිකම්, කොමියුනිෂ්ට පක්ෂය ගොඩ නැංවීම වැනි පරාසයන් තුළ කටයුතු කරමින් පාර්ලිමේන්තු දේශපාලනයට එන්නට පෙර මේ රටේ දේශපාලනයට පිවිසි හා දේශපාලන වැඩ කටයුතු කරන ලද පුද්ගලයෙක්.

විශේෂයෙන්ම එතුමා මෙම අවධීන්හිදී තරුණ සංවිධාන සමඟ, වෘත්තීය සමිති සමඟ, වෘත්තීය අරගලයන් සමඟ සුවිශේෂ කැප කිරීමකින් කටයුතු කළා පමණක් නොව, එතුමාගේ අප්‍රතිහත ධෛර්යය, නොපසු බස්නා උත්සාහය, ඒ වාගේම යම් කාර්යයක් නිම වන තුරු -එය නිම කර ගැනීම සඳහා- කරනු ලබන කැප කිරීම, ශක්තිය සහ ධෛර්යය අපට ඉතාම හොඳින් පැහැදිලි වුණා. ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කැබිනට් මණ්ඩලය තුළ එතුමා වෘත්තීය සමිති අයිතිවාසිකම් වෙනුවෙන්, විවිධ කාරණා පිළිබඳව තමන්ගේ අදහස් නොබියව ප්‍රකාශ කරමින්, අප ගන්නා ලද විවිධ තීරණයන් සඳහා අමාත්‍යවරයෙකු වශයෙන් එතුමාගේ නොමසුරු දායකත්වය ලබා දුන් බව මම ප්‍රකාශ කරන්නට ඕනෑ.

1994 පැවැති මහ මැතිවරණයේදී මාත් සමඟ කොළඹ දිස්ත්‍රික්කයෙන් මැතිවරණයට ඉදිරිපත් වුණා. අප සහෝදරත්වයෙන් මේ මැතිවරණ ව්‍යාපාර යනාදියේදී එකට වැඩ කටයුතු කළා. එතුමා පාර්ලිමේන්තුවට පත් වුණා. පත් වුණායින් පස්සේ මා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ කටයුතු භාර ගන්නා අවස්ථාවේදී, මා දැරූ නාගරික සංවර්ධන හා නිවාස ඉදිකිරීම් අමාත්‍ය ධුරය එතුමාට ලබා දුන්නා. මා විසින් ආරම්භ කරන ලද "ජන උදාන" ගම්මාන සංකල්පයේ සිය වැනි ජන උදාන ගම්මානය - මගේ ඒ අමාත්‍ය ධුර කාලසීමාව අවසාන වීමෙන් පසුත් - අපි හම්බන්තොට දිස්ත්‍රික්කයේ පැවැත්වූ අවස්ථාවේදී එතුමායි ඒ ජන උදාන ගම්මානය මාත් සමඟ විවෘත කළේ. එය මගේ දේශපාලන ජීවිතයේත්, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා වශයෙන් මා කරන ලද වැඩ කටයුතුවලදීත් ඉතාම ස්වර්ණමය අවස්ථාවක් ලෙස මගේ හදවතේ රැඳී තිබෙනවා. එතුමා පිළිබඳව ඉතාම සුන්දර වූ එවැනි මතක සටහන් මා සතුව තිබෙනවා.

එපමණක් නොවෙයි, ගරු කථානායකතුමනි, බදුලු දිස්ත්‍රික්කයේ ජනතාවට, උෟව වෙල්ලස්සේ ජනතාවට සිදු වූ බලවත් සමාජ අසාධාරණයක් තිබුණා. හැම පළාතකටම විශ්වවිද්‍යාල තිබුණත්, උෟව වෙල්ලස්සට විශ්වවිද්‍යාලයක් තිබුණේ නැහැ. එම නිසා ඒ අවස්ථාවේ උෟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම සඳහා මා විශාල සටනක් ගෙන ගියා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා තමයි 2000 සිට 2001 සැප්තැම්බර් දක්වා උසස් අධ්‍යාපන හා කොරතුරු තාක්ෂණ සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේ. ඒ අවස්ථාවේ මා එතුමා හමුවෙලා උෟව වෙල්ලස්සට විශ්වවිද්‍යාලයක ඇති අවශ්‍යතාව ගැන කියලා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ගෙන්වලා දීර්ඝ වශයෙන් සාකච්ඡා පවත්වලා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට දන්වලා මුදල් වෙන්කරවා ගත්තා. ඒ විධියට තමයි අද ලංකාවේ අග්‍ර ගණ්‍ය විශ්වවිද්‍යාලයක් වන උෟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය අපි ආරම්භ කළේ. එතුමාත්, මමත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් තමයි එයට මුල්ගල් තැබුවේ. එතුමා මට එම සහයෝගය නොදෙන්නට, කවදාවත් උෟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය බිහිවෙන්නේ නැහැ. එතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයට, උෟව වෙල්ලස්ස ජනතාවට කරන ලද සේවාව, කරන ලද පිළිගැනීම නිසා සමාජ අසාධාරණයට ලක් වූ, කොන්කර තිබූ උෟව වෙල්ලස්සට එම විශ්වවිද්‍යාලය ලබා ගැනීමට හැකියාව ලැබුණා. ඒ වෙනුවෙන් ඉන්දික ගුණවර්ධන මැතිතුමා ගන්නා ලද මහඟු ප්‍රයත්නය මම මේ අවස්ථාවේදී සිහිපත් කරන්නට කැමැතියි.

මා සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අවස්ථාවේදී එතුමාගේ ආදරණීය බිරිඳ වන පද්මිණී ගුණවර්ධන මැතිනිය ලාඳුරු මර්දන ව්‍යාපාරයේ අධ්‍යක්ෂිකාව වශයෙන් මහඟු මෙහෙයක් ඉටු කළා. ඇය ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් විශාල සේවාවක් කළ අතර, ඉන්දික ගුණවර්ධන මැතිතුමා දේශපාලනයේ යෙදුණත් ඒ හැම විටම ඇයට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලබා දුන්නා. විශේෂයෙන්ම එතුමිය සෞඛ්‍ය කටයුතුවලදී විශාල සේවාවක් කළේ තම සැමියාගෙන් ලැබුණු දැවැන්ත සහයෝගය නිසයි. එම නිසා එතුමාගේ අභාවයත් සමඟම වාමාංශික දේශපාලන ව්‍යාපාරයෙන් පන්නරය ලැබූ හසළ අත් දැකීම් ඇති දේශපාලනඥයෙක් අපට අහිමි වුණා.

එතුමා ඉතාම අවංක දේශපාලනඥයෙක්. එතුමා හැම විටම, සෑම කටයුත්තකදීම ප්‍රතිපත්ති ගරුකව වැඩ කටයුතු කළා. එතුමා ප්‍රගතිශීලී දේශපාලනය වෙනුවෙන්, වාමාංශික දේශපාලනය වෙනුවෙන් නිරතුරුව ක්‍රියාකාරීව කටයුතු කළා. නාගරික සංවර්ධන, නිවාස හා ඉදි කිරීම් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරද්දි එතුමා මේ රටේ නාගරික සංවර්ධනය වෙනුවෙන්, ජල සම්පාදනය වෙනුවෙන් වැඩ කටයුතු රාශියක් ඉටු කළා. එතුමාගේ අභාවය නිසා ඇති වූ හිදැස පිරවීම අපට අමාරුයි. එතුමා දර්ශනයට පමණක් සීමා වුණු කෙනෙක් නොවෙයි. ඒ දර්ශනය, පොදු ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සිය සම්පූර්ණ සහයෝගය, වෙහෙස, කැපවීම හා දායකත්වය ලබා දුන්න දේශපාලනඥයෙක් හැටියට ඉතිහාසයට එකතු වනු ඇත.

ගරු කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ දයාබර බිරිඳ හා දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙතද, එතුමාගේ සහෝදරයන් හා සහෝදරිය වෙතද අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.45]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ අමාත්‍ය ධුර රාශියක් හොබවමින් අපේ රටට අමිල සේවාවක් ඉටු කළ ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට පමණක් නොවෙයි, අපේ පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙකු හැටියට විවිධ පෙරමුණු ගණනාවක නායකත්වය දරමින් ක්‍රියා කළ දේශ ප්‍රේමී, ජාත්‍යන්තරවාදියෙකු හැටියට එතුමාව දකින මා, එතුමාගේ අභාවය වෙනුවෙන් අපේ පක්ෂයේ ශෝකය එක්තැන් කරන්න කැමැතියි.

ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා ගැන අපට ඕනෑ තරම් කථා කරන්න පුළුවන්. එතුමා සෘජු, ප්‍රතිපත්තිගරුක හා නිර්මාණශීලී දැක්මක් ඇති නායකයකු විධියට අපට හඳුන්වන්න පුළුවන්. එදා නිදහස් සටන ආසියාව පුරා හඹා යන අවස්ථාවේ ලංකා සමසමාජ පක්ෂය සුදු ආධිරාජ්‍යවාදීන්ට විරුද්ධව ගෙන ගිය අරගළය නිසා, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ලංකා සමසමාජ පක්ෂයේ නායකයන්ව හිර භාරයට ගත්තා.

ඇත්ත වශයෙන්ම එතුමාගේ පීතෘවරයා වන පිලිප් ගුණවර්ධන මැතිතුමාත් ඒ අරගළයේ නායකත්වය දැරූ කෙනෙක්. පිලිප් ගුණවර්ධන මැතිතුමාවත් ඒ අවස්ථාවේම බන්ධනාගාරගත කළා. පිලිප් ගුණවර්ධන මැතිතුමා ඇතුළු ආසියාවේ නිදහස් සටනට ශක්තිය ලබා දීම නිසා සිරගත කළ වමේ නායකයන් එදා බන්ධනාගාරයේ දොරගුළු කඩාගෙන රටින් පැන ගියා. එහෙම ගියේ ඉන්දියාවට. අපේ සභානායකතුමා කිව්වා වාගේ, ඉන්දියාවේ බොම්බායට ගිහින්, බොම්බායේ මතුංගා කඳුකරයේ හින්දු ගම්මානයක සැහැවිලා සිටියා. එහිදී පිල්ප් ගුණවර්ධන මැතිතුමා ජෝශප් ගුරුස්වාමි හා කුසුම්සිරි ගුණවර්ධන මැතිනිය මෙබල් ගුරුස්වාමි යන අන්වර්ථ නාමයකින් ඉන්දියාවේ නිදහස් සටනටත් සහයෝග දැක්වූවා. ඒ අවස්ථාවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඔවුන් බොම්බායේ සිරගත කළා. ඒ ජෝශප් ගුරුස්වාමිට සහ මේබල් ගුරුස්වාමිට දාව උපන් දරුවා තමයි, ඉන්දික. ඉන්දිකගේ මුල් නිවහන වුණේ, ඉන්දියාවේ බන්ධනාගාරය. ඒ ආදරණීය අම්මාත් සමඟ බන්ධනාගාර ගත වෙලා හිටපු ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඊට පස්සේ ලංකාවට ආවා.

අපේ සභානායකතුමා කිව්වා වාගේ, එතුමා ලංකාවට ඇවිත්, කොල්ලුපිටිය මෙතෝදිස්ත විදුහලෙන් මූලික අධ්‍යාපනය හදාරා, පසුව කොළඹ තර්ස්ටන් විදුහලෙන්ද, 5 ශ්‍රේණිය සමත්වීමෙන් පසුව කොළඹ රාජකීය විද්‍යාලයෙන් ද තම අධ්‍යාපනය හදාරලා, ඉන් පසුව කෘෂි ආර්ථික විද්‍යාව හදාරන්න ජර්මනියේ ලයිප්සිග් සරසවියට ගියා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා කිව්ව විධියට ඒ සරසවියේදී කෘෂි අධ්‍යාපනය පමණක් නොවෙයි, මාක්ස්වාදී මූල් පොත පතත් හොඳින් පරිශීලනය කරන්න එතුමාට පුළුවන් වෙලා තිබෙනවා. ඒ බවත් මම මෙතැනදී මතක් කරන්න කැමැතියි. ඒ නිසා එතුමා මාක්ස්වාදී දෘෂ්ටියකින් යුක්ත දැක්මක් ඇති, මේ සමාජ පරිවර්තනය සඳහා නිර්මාණශීලී ප්‍රවේශයකින් ප්‍රශ්න දෙස බලන්න පුළුවන් නායකයෙකු හැටියට අපේ රටට ඇවිත් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ පූර්ණ කාලීනයෙකු විධියට දීර්ඝ කාලයක් ඒ වගකීම් දැරුවා.

මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, එතුමා තුළ තිබුණ දක්ෂතාව නිසා පක්ෂය තුළ විවිධ වගකීම් සම්භාරයක් එතුමාට පැවරුණු බව. ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ එවකට නායකත්වය දරපු එම්.ජී. මෙන්ඩිස් මැතිතුමාත්, ඒ වාගේම එල්.ඩබ්ලිව්. පණ්ඩිත මැතිතුමාත්, රාජ්‍ය සංස්ථා වෘත්තීය සමිතියේ සභාපතිත්වය ඉන්දික ගුණවර්ධන මැතිතුමාට පිරිනැමුවා. එතුමා කම්කරු නායකයෙකු විධියට කම්කරු පන්තියේ ප්‍රශ්න සෘජුව අරගෙන කම්කරු පන්තියේ පෙරමුණ ශක්තිමත් කරමින් කටයුතු කළා වාගේම ගොවි පෙරමුණෙත් නායකත්වය ගත්තා; තරුණ පෙරමුණේත් නායකත්වය ගෙන ක්‍රියා කළා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සම්මේලනයේ සභාපතිවරයා හැටියට සරත් මුත්තෙට්ටුවේගම මැතිතුමා ක්‍රියා කරන අවධියේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා තමයි උප සභාපතිවරයා හැටියට හිටියේ. ගරු කථානායකතුමනි, මට එතුමා වඩාත් සමීප වෙන්නේ ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ හිටපු කාලයේදීයි. ලංකා ජාතික ශිෂ්‍ය සංගමය ගොඩ නැඟීමේ ප්‍රධාන වගකීම බාරදීලා තිබුණේ එතුමාටයි. අපි එතකොට විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ. එතුමා තමයි පූර්ණ කාලීනව විශ්වවිද්‍යාල ව්‍යාපාරය ඇතුළේ ඒ වගකීම්, න්‍යාය හා දෘෂ්ටිය දරාගෙන ඒ කටයුතු ඉදිරියට ගෙනියන්න කටයුතු කළේ.

අපි අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩලය ගැන කථා කරනවා. ලංකා ජාතික ශිෂ්‍ය සංගමය හැටියට එදා අපට පුළුවන්කම ලැබුණා, සියලුම සරසවිවල බලය අපේ අතට ගන්න. එහි ප්‍රධාන වගකීම දැරුවේ, මහපෙන්වීමක් කළේ ඉන්දික ගුණවර්ධන මැතිතුමායි. ඒ ජාතික ශිෂ්‍ය සංගමය තමයි අද 'අන්තරේ' වෙලා තිබෙන්නේ. සෑම ක්ෂේත්‍රයක් තුළම කැපවී වගකීම් දරාගෙන ක්‍රියා කළ ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තරවාදියෙකු ලෙස ප්‍රශ්න දෙස බැලූ ආකාරය එතුමාගේ ජීවිතය පුරා දැරූ විවිධ වගකීම්වලින් පැහැදිලිව අපට තේරුම් ගන්න පුළුවන්.

ඉන්දික ගුණවර්ධන මැතිතුමා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගරු කළා වාගේම පාර්ලිමේන්තුවෙන් බැහැර වූ අරගළය ශක්තිමත් කරන්නත් ක්‍රියා කළා. එතුමා මානව හිමිකම් සංවිධානවල, ජාතීන් අතර මිත්‍රත්වය ගොඩ නඟන සංවිධානවල වගකීම් දරාගෙන කටයුතු කළා. එක්සත් ජාතික පක්ෂයේ රජය ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ එක් අවස්ථාවකදී ඉන්දික ගුණවර්ධන මැතිතුමා අත් අඩංගුවට ගෙන එතුමාට නඩු පැවරුවා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා එවකට ආණ්ඩුව පෙරළන්න ක්‍රියා කළ කෙනෙක් හැටියට හංවඩු ගහලා තමයි එතුමා සිරභාරයට ගත්තේ. එතුමා ජාතිවාදියෙක් නොවෙයි. නමුත්, 1983 ජූලි කලබල සමයේ සිදු වූ සිදුවීම්වලින් ද්‍රවිඩ ජාතිය සිංහල ජාතියෙන් වෙන්වීමේ ප්‍රවණතාවකට ලක්වුණා කියන අදහස මත සිටි නිසා, සෘජු මත දැරීමේ හේතුව මතයි, එතුමාට සිරගත වෙන්න සිද්ධ වුණේ. ඒ අවස්ථාවේ කුමාර් පොන්නම්බලම් මැතිතුමා, නීලන් තිරුවෙල්වම් මැතිතුමා වැනි අය සමඟ එතුමා ජාතික වශයෙන් සංහිඳියාව ගොඩ නඟන්න කැපවී ක්‍රියා කළා. ඒ උත්තුංග පරමාර්ථ වැරදි විධියට හඳුනා ගත් එදා රජය එතුමා සිරගත කළත්, එතුමාගේ චින්තනය වෙනස් කරන්න කාටවත් පුළුවන්කමක් තිබුණේ නැහැ. අපි කවුරුත් දන්නවා, පසු කාලයේ ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම යටතේ පළාත් සභා සංකල්පය ආපු බව. පළාත් සභාවලදී අපි බැලුවේ නැහැ, මේ පළාත් සභාව එන්නේ කාගේ බලයක් යටතේද කියලා. පළාත් සභා සංකල්පය ආවේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සමයේදීයි. සුළු ජාතික ප්‍රශ්නවලට අවම විසඳුමක් හෝ මෙයින් සිදු වෙනවා නම්, උතුරේ සන්නද්ධ කොටස් අවි බිම තියන්න සූදානම් වෙනවා නම් අපි මේකට උදව් කළ යුතුයි කියලා අපේ පක්ෂය තීන්දු කළා. අපි පළාත් සභාවලට සටන් කළේ ඒ මතයේ සිටියි.

ගරු කථානායකතුමනි, එදා ජනතා විමුක්ති පෙරමුණේ හිටපු අපේ මිත්‍රයන්ගේ අදහස් ඒ මතවලින් බොහෝ වෙනස්. එදා දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් අප එකා පිට එකා මරනු ලැබුවා. එකා පිට එකා මරද්දීත්, ඒ අවස්ථාවේ අපට අපේ ප්‍රතිපත්තිය මත ඉන්න පුළුවන්කම ලැබුණා. එලෙස තම වගකීම දරාගෙන, කැප වෙලා කටයුතු කළ නායකයෙක් තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමා. ඒ නිසා එතුමා කවදාවත් ජාතිවාදියෙක් වුණේ නැහැ. එතුමා ජාත්‍යන්තරවාදී විධියටයි ප්‍රශ්න දෙස බැලුවේ.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්නට කැමැතියි, 2000 වසරේදී පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ගෙනා අවස්ථාව ගැන. එදා, සිරිමාවෝ බණ්ඩාරණායක රජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන අවස්ථාවේ දී, විපක්ෂයේ මන්ත්‍රීවරුන් එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට ගිනි තියනවා අපි දැක්කා. ඒකට විවිධ කරුණු තිබෙන්නට පුළුවන්. ගරු කථානායකතුමනි, එදා ඉන්දික ගුණවර්ධන මැතිතුමා මේ ගරු සභාවේදී කළ කථාවෙන් කොටසක් එතුමාට ගෞරවයක් වශයෙන් එදින හැන්සාඩ් වාර්තාවෙන් උපුටා දක්වන්න කැමැතියි. ගරු කථානායකතුමනි, ඔබතුමා මට ඒ සඳහා අවසර ලබා දෙයි කියලා මම හිතනවා.

2000 අගෝස්තු මස 07 වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 932 හි මෙසේ සඳහන් වනවා:

"නවසිය අසූ ගණන් හා පසුගිය දශක දෙකකට වැඩි කාලයක්, මගේ දේශපාලන ජීවිතයෙන් වැඩි කාලයක් යොදවා ඇත්තේ ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සෙවීම සඳහාත් ජාතික සමඟිය ගොඩ නැඟීම සඳහාත්ය. 1983 සමාජවාදී ජනතා ව්‍යාපාරය සමඟ එක්ව එම ගැටලුවට න්‍යායික පිළිතුරක් ලබා දීමට "ජාතීන් අතර ප්‍රශ්නයට ප්‍රජාතාන්ත්‍රික විසඳුමක්" යනුවෙන් ලියවිල්ලක් 1983දී සකස් කරන ලදි. 1984දී මම, ජාතීන් අතර යුක්තිය හා සමානාත්මතාවය සඳහා වූ ව්‍යාපාරයේ ප්‍රධාන ලේකම් ධුරය දැරුවෙමි.

1985දී "ද්‍රවිඩ දේශපාලන ක්‍රියාකාරීන් සමඟ ආණ්ඩු පෙරළීමට කුමන්ත්‍රණය කිරීමේ" අභූත චෝදනාව ලැබ අත් අඩංගුවට පත්ව නව මැගසින් බන්ධනාගාරයේ සිරගත වී සිටියෙමි. ඉන්දු-ලංකා ගිවිසුම අනුව ද්‍රවිඩ දේශපාලන නායකයින් නිදහස් කරන අවස්ථාවේදී මා ද නිදහස් කරන ලදි. මේ රටේ සමාජවාදී ව්‍යාපාරය, මේ රටේ මාක්ස්වාදී ව්‍යාපාරය ජාතීන් අතර පවතින මෙම ප්‍රශ්නය පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ අරගල කර තිබෙනවා. අප පක්ෂයේ නායකයන්ව සිටි දොස්තර එස්.ඒ.වික්‍රමසිංහ, පී. කන්දයියා, පීටර් කේනමන්, රාජා කොල්ලුරේ, සරත් මුත්තෙට්ටුවේගම, ඩියූ ගුණසේකර යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙම පාර්ලිමේන්තුව තුළදීත් ඉන් පිටතදීත් මේ රටේ ජාතීන් අතර සමානාත්මතාව ඇති කිරීම සඳහා කටයුතු කර තිබෙනවා..."

තීරු අංක 933හි වැඩිදුරටත් මෙසේත් සඳහන් වනවා:

" එහෙත් වමේ ව්‍යාපාරය එදා සිට ගෙන ගිය අරගලය අදත් නොකඩවා ඉදිරියට ගෙන යනවා; මේ ජාතික ප්‍රශ්නයට, මේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සෙවීමට දරන්නා වූ උත්සාහය අත්හැර නැහැ..."

තවද, තීරු අංක 934හි මෙසේ සඳහන් වනවා:

"... මේ යුද්ධයෙන් ජනතාව බේරා ගත හැකි එකම මාර්ගය මාර්ගය එක්සත් ශ්‍රී ලංකාවක් පිළිබඳ දේශපාලන විසඳුමකි..."

තවද, තීරු අංක 934 සහ 935හි මෙසේ සඳහන් වනවා:

"...අද කම්කරු පන්තියට යුද ක්‍රියාදාමයේ විශාල බරක් දැරීමට සිදු වී තිබෙනවා. මෙම ක්‍රියාදාමය අවසන් කිරීමට පොදුජන එක්සත් පෙරමුණ දේශපාලන විසඳුම ඉදිරිපත් කර තිබෙනවා. මෙම දේශපාලන යෝජනාවලියට මානව හිමිකම් පිළිබඳ යෝජනා රාශියක්ද, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමටද, මනාප ඡන්ද ක්‍රමය වෙනුවට ආසන ඡන්ද ක්‍රමයක් යෝජනා කිරීමද සමඟ ගත් කළ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීමක් අනිවාර්යෙන්ම නව ව්‍යවස්ථාවෙන් සිදු වනු ඇත. දේශපාලන කටයුතුවලදී වමේ ව්‍යාපාරයට, කම්කරු පන්තියට, ඉදිරියට යා හැක්කේ මෙවැනි ප්‍රජතන්ත්‍රවාදී රාමුවක් තුළ පමණයි. අද මේ රටට සාමය උදා කිරීමට උත්සාහ දරන සියලුම බලවේග සමඟ කටයුතු කරමින් එයට මඟ අහුරන සියලුම බලවේගයන්ට අතීතව මුහුණ දීම වැඩ කරන ජනතාවගේ ප්‍රධාන යුතුකම වේ. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය මෙම ව්‍යවස්ථාවට සහයෝගය දෙන අතර, ඒ පිළිබඳව අරගලය මෙම ව්‍යවස්ථාවෙන් අවසන් නොවන බව අවබෝධ කර ගනිමින් රටේ ජාතීන් අතර -සිංහල, දෙමළ, මුස්ලිම් ජාතීන් අතර- සමඟිය ගොඩ නැඟීමේ දීර්ඝ අරගලයක් අප ඉදිරියේ ඇති බව අවධාරණය කරමින් සාමයට ලැදි සියලුම ජනතාවට මෙයට ආරාධනා කරමින් මගේ කථාව මින් අවසන් කරමි..."

එතුමා පාර්ලිමේන්තුවේදී එදින කළ කථාවෙන් කොටසක් පමණයි හැන්සාඩ් වාර්තාවෙන් මම උපුටා ගත්තේ. මම මේ අවස්ථාවේදී කියන්නේ, අද වාගේ දවසක එතුමා හිටියා නම් හොඳයි කියලායි. මොකද, තිස් අවුරුදු යුද්ධයකට මුහුණ දීලා, ජාතීන් අතර සංහිඳියාව ගොඩ නඟන්න උත්සාහ ගන්නා යුගයකයි අපි මේ ඉන්නේ. ඉන්දික ගුණවර්ධන මැතිතුමා වැනි නායකයන් අවශ්‍ය වූ මෙවැනි යුගයකයි අපට එතුමා අහිමිව ගියේ. එසේ වුවත්, මා මේ අවස්ථාවේ කියන්න කැමැතියි, "අපි එතුමාගේ ප්‍රාර්ථනා අත් හරින්නේ නැහැ" කියා. ගරු කථානායකතුමනි, එය අපේ පක්ෂයේ චින්තනයයි. එතුමා පක්ෂයේ චින්තනය නොබියව ඉස්සරහට ගෙන ගියා; මරණයේ සෙවණැල්ල මත ඉඳගෙන ඒ වෙනුවෙන් පෙනී සිටියා. එතුමා මේ සමාජයට යම් පණිවුඩයක් දුන්නා; තමාගේ පක්ෂයේ ඊළඟ පරම්පරාවට පණිවුඩයක් දුන්නා. ඒ තමයි, පටු, අවස්ථාවාදී දේශපාලනයෙන් මිදී, ජාතිවාදයෙන් තොරව, මේ රටේ සියලු ජාතීන්ට සමානව ජීවත් වීමේ අයිතිය ලබා දෙන සමාජයක් නිර්මාණය කරන්න කැප වෙන්න කියන පණිවුඩය. මෙය තමයි, මාක්ස්වාදියෙකු වූ ඔහු තුළ තිබුණු චින්තනය.

ගරු කථානායකතුමනි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා ළඟ විවිධ නිර්මාණශීලි හැකියාවන් තිබුණා. එතුමා අමාත්‍යාංශ ගණනාවක වැඩ කරද්දී දැක්වූ නිර්මාණශීලිත්වය ගැන අපේ සභානායකතුමා කිව්වා. ඒ සියල්ල වාගේම එතුමා තුළ තිබුණු දේශපාලන චින්තනය වඩාත් ඔප් නැංවෙන යුගයක්, මේ යුගය. එවන් යුගයක අපි ඉන්දික ගුණවර්ධන මැතිතුමා යළි යළිත් සිහිපත් කරනවා. යම් කෙනෙකු සමාජයට දෙන යහපත් පණිවුඩය භාවිතයක් බවට පත් කිරීම තමයි ඇත්ත වශයෙන්ම ඔහුට දක්වන ගෞරවය. අප පාර්ලිමේන්තුවේ මෙවැනි ගුණ කථන කරන්නේ, ඒ ජීවිතවලින් ආභාසයන් උකහාගන්නයි. යහපත් චරිත හිඟ යුගයක ඉන්දික ගුණවර්ධන මැතිතුමා වැනි අය වඩා වටිනා බව මා ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ සහෝදර දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අද මේ පාර්ලිමේන්තුව තුළ අපේ නායකත්වය දරමින් ක්‍රියා කරනවා. ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ පවුලේ සහෝදර සහෝදරියන්, බිරිඳ, දරුවන් අද මේ ස්ථානයේ ඉන්නවා. එතුමාගේ අභාවය වෙනුවෙන් ඒ සියලු දෙනා සමඟ අපේ පක්ෂයේ ශෝකය මේ අවස්ථාවේ බෙදා හදා ගනිමින්, ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ බලාපොරොත්තු ඉදිරියට ගෙන යන බවට ප්‍රතිඥාව ලබා දෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 2.02]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, මා ඉන්දික ගුණවර්ධන මැතිතුමාව පළමුවෙන්ම දැනගත්තේ අපේ රාජකීය විද්‍යාලයේ ඉගෙනුම ලැබූ මට වඩා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයකු හැටියටයි; ඒ වාගේම, මගේ මිතු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ වැඩිමහල් සහෝදරයා හැටියටයි. අප සියලු දෙනාට වඩා ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඒ කාලයේදීම තමන් වෙනස් කියා පෙන්නුවා. තමා විප්ලවකාරියකු බව එතුමා එදා පාසලේදී අපට පෙන්නුවා. ඒ කාලයේ රාජකීය විද්‍යාලයට පළමුවන වතාවට ජාතික ඇඳුමින් ගිය ශිෂ්‍යා හැටියට ඉන්දික ගුණවර්ධන මැතිතුමාව සැලකුණා. අන්න එවැනි විප්ලවකාරී අදහස්, ප්‍රගතිශීලි අදහස් එතුමා ඉදිරියට ගෙන ගියා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

එතුමාට හැම විටම දේශපාලනය ගැන ඇල්මක් තිබුණා. මට මතක පරිදි පාසලේදී එතුමා සංගීතයට -පෙරදිග සංගීතයට- විශේෂ ළැදියාවක් දැක්වූවා.

ගරු කථානායකතුමනි, ඉන්දික ගුණවර්ධන කියන්නේ, තම මාර්ගය හදාගෙන ගිය පුද්ගලයෙක්. පිලිප් ගුණවර්ධන මැතිතුමා කොමියුනිස්ට් පක්ෂයේ නොවෙයි. එතුමා දේශපාලනය පටන්ගත්තේ ට්‍රොට්ස්කිවාදියකු හැටියටයි. ට්‍රොට්ස්කිවාදයෙන් තම මහජන එක්සත් පෙරමුණ සංවිධානය කරන්න ගියා. සමහර අය කොමියුනිස්ට්වාදය දර්ශනයක් හැටියට එදා ප්‍රතික්ෂේප කළා. එහෙත් ඉන්දික ගුණවර්ධන මැතිතුමා පියාගේ දර්ශනයෙන් වෙනස් වෙලා කොමියුනිස්ට්වාදය පිළිගෙන කොමියුනිස්ට් පක්ෂයෙනුයි තම දේශපාලන ගමන ආරම්භ කළේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම කිව යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා පළමුවෙන්ම දේශපාලනයට පැමිණියේ නැහැ. එතුමා කාලයක්ම වැඩ කටයුතු කළේ පක්ෂයේ ක්‍රියාකාරිකයකු හැටියටයි. පසුව තමයි මැතිවරණයට ඉදිරිපත් වෙලා තරග කිරීම ආරම්භ කළේ. අන්න ඒ නිසා එතුමා තමාටම යන්න පුළුවන් මාර්ගයක් හැදුවා. අපි බොහෝ දෙනෙක් දේශපාලනයට ඇවිත් වැඩි කල් යන්න ඉස්සර වෙලා මැතිවරණවලට තරග කරන්න පටන්ගත්තා. නමුත් එතුමා තුළ ඒ පක්ෂයේම වැඩ කටයුතුවලට කැපවීමක් තිබුණා. එතුමාගේ දර්ශනය වෙන්න පුළුවන්, එතුමාගේ පක්ෂය වෙන්න පුළුවන්. ඒ සඳහා කැපවෙලා එතුමා කටයුතු කළා. එම කාල සීමාව තුළදී කොමියුනිස්ට් පක්ෂය ශක්තිමත් කරන්න එනවා කියන හැම කෙනා තුළම එම කැපවීම තිබුණේ නැහැ. එතුමා එම කැපවීම ඇතිව තමයි ඉදිරියට ගියේ. ඉන්දික ගුණවර්ධන මැතිතුමා එම වැඩ කටයුත්ත කරන්න රජයේ සේවයෙන් ඉවත් වුණා. එතුමා එම කැපවීම කළා. රජයේ සේවයෙන් ඉවත් වෙලා පූර්ණ කාලීන දේශපාලනයේ යෙදුණු පුද්ගලයෙකු හැටියට තමයි අපි ඉන්දික ගුණවර්ධන මැතිතුමා දකින්නේ.

එක කාලයකදී මටත් එතුමා එක්ක වැඩ කටයුතු කරන්න අවස්ථාවක් ලැබුණා. 1987 වර්ෂයේ දහතුන්වන සංශෝධනය ඉදිරිපත් කරද්දී, රට වටේම ගිහින් ඒ පිළිබඳව ප්‍රචාරයක් කරන්න; ජනතාව දැනුවත් කරන්න අපට සිදු වුණා. එක්සත් ජාතික පක්ෂය පමණක් නොවෙයි, වමේ පක්ෂ සියල්ලමත් -සියලු පක්ෂ- එකතු වෙලා, විජය කුමාරණතුංග මැතිතුමා ඇතුළු ඒ සියලු දෙනා එකතු වෙලා තමයි, එම වැඩ කටයුතු කළේ. ඒ නිසාම චන්ද්‍රිකා කුමාරණතුංග හිටපු ජනාධිපතිතුමියත්, ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඇතුළු කොමියුනිස්ට් පක්ෂයේ සියලු දෙනාත් එකට එකතු වෙලා එම ක්‍රමවේදය ඉදිරියට ගෙන ගියා. ඒ අතින් බලනකොට, ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඇතුළු එම පිරිස මාක්ස්වාදී පක්ෂය වෙන්න පුළුවන්, කොමියුනිස්ට් පක්ෂය වෙන්න පුළුවන්, ලංකා සමසමාජ පක්ෂය වෙන්න පුළුවන් මේ රටේ පාර්ලිමේන්තු ක්‍රමවේදයට එකතු කරන්න ක්‍රියා කළ අය හැටියට, මහ පෙන්වූ අය හැටියට හඳුන්වන්න පුළුවන්. එතුමාගේ පියාත්, එන්.එම්. පෙරේරා මැතිතුමාත් තමයි 1936 වර්ෂයේදී එය ආරම්භ කළේ. ඔවුන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඇතුළු වී තමන්ගේ දර්ශනය පාර්ලිමේන්තුව මාර්ගයෙන් ඉදිරියට ගෙන යන්නට ක්‍රියා කළ පුද්ගලයන් කියා මම විශේෂයෙන්ම මෙතැනදී කියන්න ඕනෑ. ඉන්දික ගුණවර්ධන මැතිතුමාත් ඒ මාර්ගයේ තමයි ආවේ. කොමියුනිස්ට් දර්ශනය ඉදිරියට ගෙන යෑම සඳහා සමහර වේලාවට එතුමා ඉතා වේගවත්ව ක්‍රියා කළා. එය එතුමාගේ චරිතයේ කොටසක්. එතුමා වේගවත්ව ක්‍රියා කරලා එම වැඩ කටයුතු ඉදිරියට ගෙන ගියා.

ඇත්ත වශයෙන්ම කොමියුනිස්ට්වාදී-මාක්ස්වාදී දේශපාලනය මහජන ඡන්දයට, මහජන ජනවරමට ඇතුළු කර ගැනීමේදී හැම රටකම ඒක සාර්ථකව සිදු වුණේ නැහැ. නමුත් ලංකාවේ ඒක කරන්න අවස්ථාව ලැබුණා. නමුත් හැම න්‍යාය ධර්මයකටම කාලයක් තිබෙනවා. ඒ අනුව කාලය වෙනස් වෙනකොට කාලයක් කොමියුනිස්ට් පක්ෂයට දේශපාලනයේ තිබුණු ඒ ප්‍රධානම තැන එක එක හේතු නිසා අඩු වෙලා ගියා. මම මෙතැනදී ඒවා ගැන විශේෂ විමර්ශනයක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් ඉන්දික ගුණවර්ධන මැතිතුමා පෙන්නුවේ, තමන්ගේ දේශපාලන දර්ශනයත් එක්ක ඉදිරියට යන්න පුළුවන් කියායි. එතුමාගේ පියා වාගේම එතුමාත් දැන ගත්තා ග්‍රාමීය කොටස් පවා වැදගත් බව. කම්කරු කොටස් වාගේම ග්‍රාමීය කොටස් වැදගත් බව එතුමා දැන ගත්තා. එම ග්‍රාමීය අංශ දියුණු කිරීමට ඒ කාලයේ එතුමා ක්‍රියා කළා. නමුත් ඇත්ත වශයෙන්ම එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙත් අවධානය යොමු වී තිබුණේ, ග්‍රාමීය කොටස් දියුණු කරන්නේ කොහොමද කියන එක ගැනයි. ඒ නිසා කොමියුනිස්ට් පක්ෂයට එම තරගයට මුහුණ දෙන්න බැරි වුණා කියා මා හිතනවා. එතුමා එකක් පිළිගත්තා. ග්‍රාමීය අංශය වැදගත්; ඒ නිසා ග්‍රාමීය අංශය තුළ ක්‍රියා කරන්න වුවමනායි කියා එතුමා පිළිගත්තා.

එතුමා ඇමතිවරයකු හැටියට මේ පාර්ලිමේන්තුවේදී බොහෝ අවස්ථාවල මට මුණ ගැසුණා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, බටහිර කලාපීය සංවර්ධන සැලැස්ම ඇති කරන්නත් එතුමා බොහෝ දුරට ක්‍රියා කළ බව. මුළු බටහිර කලාපයටම -Western Region එකටම- ඇති කරපු ඒ යෝජනාවලියෙන් අපට ප්‍රයෝජනයක් ඇති වුණා. මොකද, ඒ බටහිර කලාපීය සංවර්ධන යෝජනාවෙන් බස්නාහිර පළාතේ තිබෙන ලක්ෂණ දිහා බලා සමහර ප්‍රදේශ නාගරික ප්‍රදේශ බවට පත් කරන්න හා සමහර ප්‍රදේශ ග්‍රාමීය වශයෙන් තබා ගන්න තමයි එතුමා මූලික සැලැස්ම ආරම්භ කළේ. ඒකෙන් අපට වුවමනා කරන මූලික දත්ත ඔක්කෝම ලැබුණා. විපක්ෂයේ ඉන්නා කාලයේ ඒ දත්ත සියල්ලම එකතු කර ගෙන බටහිර කලාපීය සංවර්ධන සැලැස්ම කියවන්න මට අවස්ථාව ලැබුණා. අපි ආණ්ඩුවක් වශයෙන් පත් වුණාට පසුව, බස්නාහිර පළාත එක මහානගරයක් බවට පත් කිරීමට අවශ්‍ය අදහස් අපට ලැබුණේ, ඒකෙන් තමයි. අපි ඒ ගැන සාකච්ඡා කරද්දී එය ලංකාවටත් වුවමනා බව අපට වැටහුණා. බස්නාහිර පළාත විශාල ප්‍රදේශයක්. ඒ සඳහා අපි වැඩ කටයුතු කරමු කියා අප සාකච්ඡා කළා. ඒ අනුව සිංගප්පූරුවේ Surbana-Jurong Private Limited එක කැඳෙව්වාම, එම සමාගම පදනම් කර ගත්තේ බටහිර කලාපීය සංවර්ධන සැලැස්ම කියා මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. ඒ ඇති වුණු සැලැස්ම තමයි යළිත් 2015 වර්ෂයේදී Surbana-Jurong Private Limited සමඟ සාකච්ඡා කරලා, සංශෝධනය කර, බස්නාහිර පළාත මහානගරයක් බවට පත් කරන්න අලුත් කෙටුම්පතක් වශයෙන් මේ අවුරුද්ද අවසානයේ, ලබන අවුරුද්දේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වන්නේ. ඉන්දික ගුණවර්ධන මැතිතුමා පෙන්වූ දූරදර්ශී වැඩසටහන් නිසා තමයි අපට මේ කාරණය කරන්න පුළුවන් වුණේ කියන එක මම මෙතැනදී කියන්න ඕනෑ. එදා ආරම්භ කරපු ඒවායේ පොත් ටික මගේ ළඟ තවම තිබෙනවා. ඒවා වැදගත් පොත්. අපේ ඉතිහාසයේ කොටසක් හැටියට අපි ඒවා සලකන්න ඕනෑ.ඒ නිසා එතුමා කළ ඒ සේවය විශේෂයෙන්ම මේ අවස්ථාවේ මා මතක් කරනවා.

අපේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා එක්ක වැඩ කටයුතු කළ බොහෝ දෙනෙක් මේ ගරු සභාවේ ඉන්නවා. විශේෂයෙන්ම එතුමා ප්‍රචාරයට ගියේ නැහැ. ඒත් වැඩ කටයුතුවලට දක්ෂයි. එහෙම පුද්ගලයන් අපට ලේසියෙන් සොයා ගන්න බැහැ. එතුමා තමන්ගේ පක්ෂය වෙනුවෙන්, තමන්ගේ දර්ශනය වෙනුවෙන්, රට වෙනුවෙන් කළ සේවය අපි අගය කරන්න ඕනෑ. අපේ මතවාද

අනුව අපි එතුමා එක්ක එකඟ වුණු අවස්ථාත් තිබෙනවා; එකඟ නොවුණු අවස්ථාත් තිබෙනවා. කෙසේ වෙතත්, ඒ පරපුර ආරම්භ කළ ඒ සේවය එතුමා ඉදිරියට ගෙන ගියා. අපි එතුමා කළ ඒ සේවය අගය කරනවා. එතුමාගේ අභාවය පිළිබඳව ඒ පවුලේ සියලු දෙනාටම අපේ කනගාටුව ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[2.11p.m.]

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Thank you, Mr. Speaker, for this opportunity to say a few words on the Vote of Condolence of the Hon. Indika Gunawardena, a former Member and a former Minister of this country. It was not my good fortune, Sir, to know Hon. Indika Gunawardena in my younger days, or for us to meet each other in our younger days. I came to know him when we were both in Parliament together at the same time. And, during that time, I developed a very close relationship with him. We often talked at length. I found him to be a very liberal person with very progressive views. He struck me as being a genuine Sri Lankan who wanted all the people in this country - irrespective of whether they were Sinhalese, Tamils, Muslims, Burghers, whatever - to be Sri Lankans and to be one nation belonging to one country on a basis of equality and justice. I was so impressed with his very liberal and progressive views that I once suggested to him that he should become the President of this country. In fact, I proposed to him, "Indika, you should stand for presidency in this country, because I do not think anyone else is more qualified than you to be the President of this country and if you become the President of this country, I am sure you can guide this country on proper lines." Of course, I think, Sir, humility and simplicity were the hallmarks of the character and personality of Hon. Indika Guanwardena and he smiled at my proposal and would not take it too seriously.

We are sorry, Sir, genuinely sorry, that this country is today missing a person like him. We are today engaged in a very important exercise as far as this country is concerned. We are trying to frame a Constitution for the people of this country on the basis of consensus, not merely amongst political parties, but on the basis of consensus amongst the different peoples who live in this country. I think it is fundamental that the supreme law of this country should be framed on such consensus. It is in countries where Constitutions have been framed on consensus that there has been peace, harmony, goodwill and prosperity amongst all peoples. You have several examples the world over. I think if a person like the Hon. Indika Gunawardena was with us today, he would have played a very important role in accomplishing this sacred task that we are all engaged in, because he was one who believed genuinely and sincerely that all Sri Lankans can live together only on the basis of equality and justice. He came from a distinguished political family in this country, Sir. His father, the late Hon. Philip Gunawardena was a leader of a political party, a Member of Parliament and a Minister in several Governments. His mother, the late Hon. (Mrs.) Kusuma Gunawardena, was also a Member of Parliament. Several of his brothers are in politics. They are, Mr. Prasanna Gunawardena, former Mayor of Colombo, the Hon Dinesh Gunawardena who is the Leader of the Mahajana Eksath Peramuna and a one-time Minister who is with us in Parliament today and the Hon. Geethanjana Gunawardena, a former Member of Parliament who was also a Minister. I believe, the Hon. Indika Gunawardena had one sister.

We convey to the spouse of the Hon. Indika Gunawardena, Dr. (Mrs.) Pathmini Gunawardena, his children and grandchildren our extremely sincere condolences on the passing away of a great man, a person whom we can, without any reservation or hesitation, describe as a great Sri Lankan. We are all sorry that he has passed away. His demise is not merely a loss to his family; his demise is a great loss to this whole country. I am personally extremely sorry that for unavoidable reasons I was not able to pay my respects in person to him when he passed away. I am genuinely sorry about that, that I failed in my duty to pay my respects to a great individual for whom I had developed a great deal of affection.

But I want to convey Sir, to the members of his family and all others close to him, our deepest condolences and assure them that the Hon. Indika Gunawardena will always be remembered by us as a genuine, good friend.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා.

[අ.භා. 2.18]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (විශේෂ කාර්යභාර අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம- விசேட பணிப் பொறுப்புகளுக்கான அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of Special Assignment)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ ඉතාම වැදගත් මන්ත්‍රීවරයකු මෙන්ම අපි සමඟ කැබිනට් සහයෙක්ව සිටි, මේ රටට විශේෂ සේවයක් සහ ආදර්ශයක් සැපයූ ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය ගැන අපේ සංවේගය ප්‍රකාශ කරන්න මා කැමැතියි. මගේ අදහස හැටියට මේ ලංකාවේ පරම්පරා තුනක් තිබෙනවා. ඒ පරම්පරා තුන තමයි, ගුණවර්ධන පරම්පරාව, බණ්ඩාරනායක පරම්පරාව සහ සේනානායක පරම්පරාව. මේ පරම්පරා තුනේම අය ගැන කවුරු මොන මත දැරුවත් - සමහර විට විරුද්ධත්වය දක්වන මත දැරුවත්- මේ පරම්පරාවේ කිසිම

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

කෙනෙකුගේ වැරැද්දක් ගැන, දූෂණයක් ගැන, වැරැදි හැසිරීමක් ගැන අඛමල් රේණුවකවත් චෝදනාවක් ඇවිල්ලා නැහැ කියන එක අපට ගෞරව සහිතව පිළිගන්නට සිදු වෙනවා. මෙය අපේ ඉතිහාසයේ ඉතාමත්ම වැදගත්ව, ගෞරවනීය වශයෙන් අපි සැලකිය යුතු දෙයක්. ගුණවර්ධන පරම්පරාව බොරළුගොඩ රාළහාමිගේ -ජකෝලිස් ගුණවර්ධන මැතිතුමාගේ- කාලයේ පටන් එතුමාගේ දරුවන්, මුනුපුරන් මේ රටේ දේශපාලන ඉතිහාසය විචිත්‍රවත් කර තිබෙනවා. එපමණක් නොවෙයි, අනාගතයේදී එතුමාගේ මීමුනුපුරන් පවා මේ රටේ දේශපාලනය විචිත්‍රවත් කරයි කියලා අපි විශ්වාස කරනවා.

පිලිප් ගුණවර්ධණ මැතිතුමා, එම මැතිනිය වන කුසුම්සිරි ගුණවර්ධන මැතිනිය, රොබට් ගුණවර්ධන මැතිතුමා, ඉන්දික ගුණවර්ධන මැතිතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා මේ දේශපාලන ක්ෂේත්‍රයේ කටයුතු කළ අය. මට හරියටම මතක නැහැ, රූපා ගුණවර්ධන මැතිනියත් මේ ගරු සභාවේ හිටියාද කියලා. මම හිතන විධියට එතුමිය මේ ගරු සභාවේ හිටියේ නැහැ. මොන මොන මතභේද තිබුණත්, ඒ සියලු දෙනාම ඔවුන්ගේ ආදර්ශවත් හැසිරීම, බුද්ධිය, අවංකභාවය අතින් මේ පාර්ලිමේන්තුවේ හිටපු කිසිම කෙනෙකුට නොදෙවැනි ඉතිහාසයක් සහ ගෞරවයක් තිබෙනවා කියලා අපට කියන්න පුළුවන්. මම කියපු ගුණවර්ධන පරම්පරාව, බණ්ඩාරනායක පරම්පරාව, සේනානායක පරම්පරාව යන තුන්ගොල්ලන්ම මුලින් දේශපාලනයට ආපු විධියටමයි අදත් ඉන්නේ. පිට රටවල ගෙවල් හදලා නැහැ; ලොකු මන්දිර හදලා නැහැ; ලොකු යාන වාහන අරගෙන නැහැ.

ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අවමංගල්‍යය සඳහා අපට යන්න වුණා, බොරළුගොඩට. අපි මේ රටේ සදාචාරය ගැන කථා කරන කොට; මේ රටේ දේශපාලනය සම්බන්ධයෙන් කැපවීම ගැන කථා කරන කොට අනිවාර්යයෙන් ගුණවර්ධන පවුල සහ අද අපි සාකච්ඡා කරන ඉන්දික ගුණවර්ධන මැතිතුමා ගැනත් ඉතාම විස්මිතව, ආදරයෙන් අපට මතක් කරන්න සිදු වෙනවා. ඇත්ත වශයෙන්ම ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ ජීවිතය අපේ නිදහස් සටනේ එක් පැතිකඩක් හැටියට අපට කියන්න පුළුවන්. මම එහෙම කියන්නේ මොකද? සමසමාජ පක්ෂය, ත්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය විසින් තහනම් කළ කාලයක පිලිප් ගුණවර්ධන මැතිතුමාටත්, එම මැතිනියටත් ඉන්දියාවට ගිහිල්ලා තමන්ගේ දේශපාලන කටයුතු කරන්න සිදු වුණා, ඉන්දියාවේ බොල්ෂෙවික් පක්ෂය සහ සමාජවාදී පක්ෂයත් එක්ක. මට මතක හැටියට ඒක මතක් කරගෙන තමයි එතුමාට "ඉන්දික" කියන නම දීලා තිබෙන්නේ. ඒ විප්ලවකාරී, ඒ වාගේම දේශහිතෛෂී ඒ ඉතිහාසය දිනෙන් දිනම තමන්ගේ චරිතයේ කොටසක් බවට පත් කරගත් පවුලක් තමයි, මේ ගුණවර්ධන පවුල.

ගරු කථානායකතුමනි, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා Royal College එකේ ඉගෙන ගත් කාලය අපට මතකයි. ඉස්සර වෙලාම ඒ පාසලට එතුමා තමයි ජාතික ඇඳුමක් ඇඳගෙන ආවේ. ළමයි කොලොප්පම් පවා කළා, "මොකද මෙයා රෙද්දක් ඇඳගෙන එන්නේ?" කියලා. නමුත්, එතුමා ඒවාට සැලුණේ නැහැ. කිසිම අවස්ථාවක පියා සැලුණෙත් නැහැ; පුතා සැලුණෙත් නැහැ. කවුරු මොන මොන විවේචන කළත්, එතුමා තමන්ගේ වැඩ කටයුතු ඒ විධියටම කරගෙන ගියා.

Royal College එකේ අධ්‍යාපන කටයුතු නිම කළ එතුමා නැඟෙනහිර ජර්මනියේ ලයිප්සිග් විශ්වවිද්‍යාලයට ගිහින් ජර්මන් භාෂාව හොඳින් ඉගෙන ගෙන එම විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්ම ගෞරව උපාධියත් ලබා ගත්තා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මා හිතන විධියට එතුමාට ඒ කාලයේ තමයි පද්මිණී මැතිනිය හමු වුණේ. මගෙත් ඒ අයට පොඩි සම්බන්ධයක් තිබුණා. මොකද, මගේ පියතුමායි, පද්මිණී මැතිනියගේ පියතුමායි ඒ කාලයේ මහනුවර සිටි හොඳ යාළුවෝ. ඒ වාගේම ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ මස්සිනා වන ගාමිණී ගුණවර්ධන මහත්මයා පොලීසියේ නියෝජ්‍ය ප්‍රධානියා හැටියට හිටියා. අප පොඩි කාලයේ සිටම යාළුවෝ. අප විශ්වවිද්‍යාලයේ එකට හිටියා. ඒ වාගේම හාවර්ඩ් විශ්වවිද්‍යාලයට යන කොටත් අපි එකට හිටියා. එවැනි හොඳ ඉතිහාසයක් අපට තිබෙනවා. ඒ කාලයේ තරුණ පෙළ අතර හැම දාම එක පැත්තකින් හිටියේ සරත් මුත්තෙට්ටුවේගම මැතිතුමායි, අනෙක් පැත්තෙන් ඉන්දික ගුණවර්ධන මැතිතුමායි. මේ දෙදෙනා කොමියුනිස්ට් පක්ෂයේ අනාගතය හැටියට කල්පනා කරලා තමයි සියලු දෙනාම ඉදිරියට කටයුතු කළේ.

ගරු කථානායකතුමනි, අපේ ඩිව් ගුණසේකර මැතිතුමාගේ පොතක් ළඟදි පිටවෙලා තිබෙනවා. ඒක කියවන කොට අපට හොඳට අවබෝධ වෙනවා, ඒ කාලයේ කොයි තරම් බලාපොරොත්තු ඇතිව, කොයි තරම් පරිත්‍යාගශීලීව මේ රටේ වාමාංශික ව්‍යාපාරය දියුණු වුණාද කියලා. මට මතකයි, ඒ දවස්වල නිමල් කරුණාතිලක මැතිතුමාත් සිටියේ කොමියුනිස්ට් පක්ෂයේ. එතුමා කේතලෙන් මල්ලක් විවාහ කරගෙන, පසුව නියෝජ්‍ය ඇමති කෙනෙකුත් වුණා. නමුත් ඒ කාලයේ කොයි තරම් දරිද්‍රතාවෙන් පෙළෙමින් දේශපාලන වැඩ කළාද කියලා එතුමා මට කියා තිබෙනවා. දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ එනතුරු ඒ කාලයේ බලාගෙන ඉන්නවා ලු, කොස් ගොඩියක් ගෙනැත් පළලා තම්බාගෙන කන්න. ඒ තරම් අමාරුවෙන්, කැපවීමෙන් තමන්ගේ දේශපාලන දර්ශනය වෙනුවෙන් ඒ අය වැඩ කරලා තිබෙනවා. ඡන්ද දිනන්නත් පුළුවන්; පරදින්නත් පුළුවන්. ඒවා ඒ තරම් ලොකු දේවල් නොවෙයි. නමුත්, තමන් තෝරාගත් ධර්මය අනුව, තමන්ගේ විනිශ්චය අනුව අවසානය දක්වා සටන් කරනවා නම් ඒ අය වීර පුරුෂයන් හැටියට අපට සලකන්න සිද්ධ වෙනවා.

එතුමා අපේ කැබිනට් මණ්ඩලයේ සිටි කාලය ගැන මතක් කරනවා නම්, ඇත්ත වශයෙන්ම ඒකත් යම් වාර්තාවක් තැබීමක් කියලා මා හිතනවා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මහජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කැබිනට් මණ්ඩලයේ හිටියා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරමින් කැබිනට් මණ්ඩලයේ සිටියා. අපි ඔක්කොම එකට, එක කැබිනට් මණ්ඩලයක සිටියා. ඒකත් වාර්තාවක් තැබීමක් කියලායි මා හිතන්නේ. එතුමා නිවාස ප්‍රශ්න, නාගරික සංවර්ධන ප්‍රශ්න ගැන හැම වෙලාවේම ඉතාම උනන්දුවෙන් කටයුතු කළා මට මතකයි.

විශේෂයෙන්ම ඒ කාලයේ දුප්පත් ජන කොටස් තමයි කොමියුනිස්ට් පක්ෂයත් එක්ක හිටියේ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට මතක ඇති, ඒ දවස්වල කොළඹ නගර සභාව කියන්නේ පොඩි පාර්ලිමේන්තුවක් වාගෙයි. එන්.එම්. පෙරේරා මැතිතුමා හිටියා; බර්නාඩ් සොයිසා මැතිතුමා හිටියා; විවියන් ගුණවර්ධන මැතිනිය හිටියා; පීටර් කෙනමන් මැතිතුමා හිටියා; එල්.ඩබ්ලිව්. පණ්ඩිත මහත්මයා හිටියා. අපි ජර්මනියේ එතුමා හිටපු බර්ලින් නුවරට ගියා. බර්ලින් නුවර එක එක කොටස් තිබුණා රතු බර්ලිනය කියලා. ඒක ඇතුළට වෙන අයට එන්න දුන්නේ නැහැ . ඒ ගොල්ලන් හිටලර්ට එන්න දුන්නෙත් නැහැ. අන්න ඒ වාගේ විශාල ආදරයක් සහ ගෞරවයක් ඇතිව තමයි කොමියුනිස්ට් පක්ෂය ඉදිරියට ආවේ. මා දකින විධියට සරත් මුත්තෙට්ටුවගම මහත්මයාට, ඉන්දික ගුණවර්ධන මහත්මයාට තවදුරටත් ඉදිරියට යාම ප්‍රශ්නයක් වුණේ, ලෝක කොමියුනිස්ට් පක්ෂයේ තිබුණු ප්‍රශ්න නිසයි; ලෝක සමාජවාදී කඳවුරේ තිබුණු ප්‍රශ්න නිසයි. ඉස්සෙල්ලාම සෝවියට් චීන අරගළයෙන් කොමියුනිස්ට් පක්ෂයේ භේද ඇති වුණා. ඔබතුමන්ලා ඒ ගැන හොඳට දන්නවා ඇති. වෘත්තිය සමිති එක පැත්තකට ගියා, ඡන්මුගදාසන් එක්ක. මෙහේ හුඟ දෙනෙක් ඒ ගැන දන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම රෝහණ විජේවීර පටන් ගත්තේත් ෂන්මුගදාසන්ගේ පක්ෂයෙන්; එයාගේ තරුණ සමිතියේ නායකයාගෙන්. ඊට පසුව ෂන්මුගදාසන්ට කැපිල්ල දැම්මා. ඒවා වාර්තාගත වෙලා තිබෙනවා. එහෙම නැහැ කියලා කාටවත් කියන්න බැහැ. මා කියන්නේ අසත්‍යක්ද, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි? ෂන්මුගදාසන් පොතක් ලියලා තිබෙනවා. ඒකේ පැහැදිලිවම කියලා තිබෙනවා, මේ පුද්ගලයා මාව පාවිච්චි කරලා පක්ෂය ඇතුළත ජාතිවාදය ඇති කරලා කටයුතු කළායි කියලා. මේක දැනුත් ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කියන දෙයක්. මේ විධියට පක්ෂය ඇතුළත ජාතිවාදය ඇති කරලා තමතමන්ගේ පෞද්ගලික අභිමතාර්ථයන් ඉෂ්ට කර ගන්න එදා ඒ අය කටයුතු කළා. ජාතිවාදය ඇති කරන්නේ මොකටද? පක්ෂය ඇතුළත තැනක් ගන්නයි. දැන් ජනතා විමුක්ති පෙරමුණ කිඩාරම් මලෙන්ද, මොකකින්ද ලකුණකින් එන්න හදනවා. ඒකෙදිත් තැනක් ගන්න තමයි ජාතිවාදය පතුරවන්න හදන්නේ. ඒකම තමයි විජේවීර කළෙත්. පක්ෂය ඇතුළට රිංගලා ඒ පක්ෂයට ජාතිවාදය කවන්න හැදුවා. ඒකෙනුයි ජනතා විමුක්ති පෙරමුණ ආරම්භ වුණේ. කෙසේ නමුත්, සමාජවාදී කඳවුර ජාත්‍යන්තර හේතු නිසා ගැටුම් ඇති කර ගත්තා. ඉස්සෙල්ලාම සෝවියට් දේශයයි, චීනයයි අතර ගැටුම් ඇති වුණා.

ගරු කථානායකතුමනි, ඒ කාලයේ වූ සිදුවීමක් ගැන මා කියන්න කැමැතියි. මා එවකට රත්නපුරේ අතිරේක දිසාපති හැටියටයි හිටියේ. සරත් මුත්තෙට්ටුවගම මහත්මයා තමයි මගේ හොඳම යහළුවා. මා ගෙදර ඉන්න දවසක චීන තානාපති කාර්යාලයේ බොහෝ දෙනෙකු ආවා මගේ නිවසට. ඒ ගොල්ලන් දන්නේ නැහැ, මම සරත් මුත්තෙට්ටුවගම නොවෙයි, සරත් අමුණුගම කියලා. ඒ අය මට පැයක විතර දේශනයක් දුන්නා, "ඔබතුමා රුසියන් පිලේ ඉන්න එපා, කොහොම හරි චීන පිලට එන්න" කියලා. අහගෙන ඉඳලා මම කිව්වා, "මම සරත් මුත්තෙට්ටුවගම නොවෙයි. එතුමා ඉන්නේ පාරෙන් එහා පැත්තේ ගෙදර. ගිහිල්ලා එතුමාට මේ දේශනය කරන්න" කියලා. ඒ විධියට ඒ කාලයේ සමාජවාදී පිලෙත් නොයෙක් ගැටුම්, මතභේද තිබුණා. ඒ වෙනස්වීම් හුහක් දුරට අද වාමාංශික ව්‍යාපාරයට බලපා තිබෙනවා, අපට නැහැ කියන්න බැහැ.

ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාට මේ රටේ දේශපාලනයේ මීට වඩා කටයුතු කරන්න ඉඩ තිබුණා කියලා මා විශ්වාස කරනවා. නමුත්, සමාජවාදී ලෝකයේ තිබුණු ඒ සුළි සුළං අප සියලු දෙනා කෙරෙහිම බලපෑවා. ඒ මොනවා වුණත් එතුමා අපට ලොකු ආදර්ශයක් දුන්නා. එතුමා කවදාවත් වැරැදි වැඩක් කළේ නැහැ. කවදාවත් දූෂණයට ඉඩ දුන්නේ නැහැ. කවදාවත් දූෂණය සාධාරණීකරණය කළේ නැහැ. සමහර විට එතුමාට ඒකෙන් පාඩු සිදු වෙන්නත් ඇති. ඊට පසුව පත් වුණු කැබිනට් එකේ ඉන්න එතුමාට ඉඩ කඩ අහිමි වෙන්නත් ඇති. නමුත්, එතුමා මේ රටේ දේශපාලනයට ආදර්ශයක් දුන්, දූෂණය ගැන, වැරදි වැඩ ගැන පුංචි සුළඟක්වත් වැදුණේ නැති පවුලක නියෝජිතයකු බව අපි මතක තියා ගන්න ඕනෑ. මා මුලින් කියාපු විධියට මේ රටේ ගුණවර්ධන පවුල, බණ්ඩාරනායක පවුල, සේනානායක පවුල ඉතා වාසනාවන්තයි. ඒ ගොල්ලන් අතර මොන මතභේද තිබුණත්, ඒ අය ආදර්ශවත් දේශපාලනයක් කළ අයයි. ඒ නිසා දූෂිත ලෝකයේ ජීවත් වන අප සියලු දෙනාටම යහ මහ යන්න අනුබල දුන් චරිතයක් හැටියට ඉන්දික ගුණවර්ධන මැතිතුමාට අපි ගෞරව කරනවා. ඒ වාගේම එතුමාට "නිවන් සැප ලැබේවා!" යි මම ප්‍රාර්ථනය කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

[අ.භා. 2.32]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ස්තුතියි, ගරු කථානායකතුමනි.

අභාවයට පත් අපගේ හිතමිත්‍ර සහෝදර ඉන්දික ගුණවර්ධනයන් ගැන ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් මගේ සංවේගය පළ කරන්න මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතියි. ඇත්තටම සංවේගය පළ කරන මෙවැනි යෝජනාවලදී චාරිත්‍රානුකූල කථා රටාවක් අනුගමනය කරනවාට වඩා පිටතින් ගලා ගිය කථාවක් අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා කරන්න යෙදුණා. සමහර විට මේ ගරු සභාවේ ඉන්න ගරු මන්ත්‍රීවරු ඉලක්ක කර ගෙන ඒ කථාවේ යම් ප්‍රකාශයන් කෙරුණා. ඒ නිසාම පමණයි මම මේ කරුණ කියන්නේ. එතුමා පවුල් තුනක් ගැන කිව්වා. ඒ පවුල් තුනේ තිබෙන ශ්‍රේෂ්ඨත්වය ගැන, දූෂණයෙන් තොර බව ගැන කිව්වා. සංවේග ප්‍රකාශයක මෙවැනි කථා බහ වෙන්නේ නැහැ කියන කරුණ මම අමුණුගම මැතිතුමාට මතක් කරන්න ඕනෑ. නමුත්, මට මේ දේ නොකියා බැහැ. බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිවාසිකම් අහෝසි කරන්න ගෙනා යෝජනාවේ අඩංගු වුණු චෝදනා පිළිබඳව ඔබතුමාට මතක් කර දෙන්න මම කැමැතියි. එදා එක්සත් ජාතික පක්ෂය බණ්ඩාරනායක පවුලට කළ විශාල අපවාද අපි අමතක කරන්නේ නැහැ. ඔබතුමා අද ඔය පැත්තේ ඉඳගෙන මොන පැත්තක් හරි නියෝජනය කරමින්, ඔබතුමා කියන ඔය කථාවලට වඩා වෙනස් දේවල් වෙලා තිබෙනවා. ඒ වාගේම ඩඩ්ලි සේනානායක මහත්මයා අගමැති වුණු වෙලාවේ ඒ පිළිබඳවත් පවුල්වාදී කථාවක් තිබුණා, ඩඩ්ලි සේනානායක අගමැති කරන්න ආණ්ඩුකාරයාට කියලා තිබුණාය කියලා. මේවා ඔක්කෝම දේශපාලනයේ තිබෙන එක්තරා විධියක අපට නොවැළැක්විය හැකි සමාන්තර කතාන්තර. ඒවා පැත්තකින් තියලා අපි මර්දනයට යමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ශෝක ප්‍රකාශ යෝජනාවට යමු.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මර්දනයට මුහුණ දුන් පවුලක් ගැනයි මම මේ කියන්නේ. ගුණවර්ධන පවුල පරම්පරා තුනක් මර්දනයට මුහුණ දුන්නා.

ගරු කථානායකතුමනි, ඇත්තටම ඔබතුමා ඒ යොමු කිරීම ගරු සරත් අමුණුගම මැතිතුමාට කළා නම් හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සරත් අමුණුගම මැතිතුමාත් මේ දේවල් කිව්වා, ඔබතුමාත් කියනවා. සීමාවක් ඇතිව මෙම ශෝක ප්‍රකාශ යෝජනාව කරගෙන යන්න ඕනෑ කියලා මම හිතුවා. ඒ ගැන අමනාප වන්න එපා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ දේවල් ඔබතුමා කිව යුතුව තිබුණේ එතුමාටයි. මට දෙවනුව මේක කියන්න සිද්ධ වුණේ එතුමා ඒ දේවල් කිව්ව නිසායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, දැන් ඒ කථාව අවසන් කරමු.

පරම්පරා තුනක් මර්දනයට ලක් වුණු පවුල් දෙකක් තිබෙනවා. ජනතාවගේ ඡන්දයෙන් තේරී පත් වෙලා ඇවිල්ලා ජනතාවගේ නියෝජිතයන් හැටියට, මේ රටේ පොදු ජනතාවගේ -පීඩිත ජනතාවගේ; මේ රටේ වැඩ කරන ජනතාවගේ- වුවමනාවන් වෙනුවෙන් පෙනී සිටිමින් ගුණවර්ධන පවුල පරම්පරා තුනක් මර්දනයට ලක්වී තිබෙනවා. ඒ, එක්කෝ අධිරාජ්‍යවාදීන් අතින්, එක්කෝ යූඑන්පී ආණ්ඩුව අතින්.

ගුණවර්ධන පවුලේ බොරලුගොඩ රාළහාමි ඒ කාලයේ සිරගත කරනු ලැබුවා. ඒවා කවුරුත් දන්නවා. ඒ අධිරාජ්‍යවාදීන්ගේ රජය විසින්. ඊළඟට, පිලිප් ගුණවර්ධන මැතිතුමා එදා සිටි අධිරාජ්‍යවාදීන් විසින් සිරගත කළා. ඊට පසුව එතුමා යූඑන්පී ආණ්ඩුව කාලයේත් නැවත සිරගත කරනු ලැබුවා. ඉන් පසුව තුන්වෙනි පරම්පරාවේ ඉන්දික ගුණවර්ධනත් යූඑන්පී ආණ්ඩුව විසින් සිරගත කරනු ලැබුවා. ඒ, මර්දනකාරීව එදා තිබුණා වූ ආණ්ඩුවට විරුද්ධව ඒ අය ගෙන ගිය දේශපාලන ක්‍රියාකාරිත්වය නිසායි. ඒ වාගේම රාජපක්ෂ පවුලේ ඩී.එම්. රාජපක්ෂ, ලක්ෂ්මන් රාජපක්ෂ, ඊළඟ පරම්පරාවේ මහින්ද රාජපක්ෂ යන අයත් සිරගත කරනු ලැබුවා. ඒත් යූඑන්පී ආණ්ඩු කාලයන් තුළ. එතකොට මර්දනයට ලක් වීමේ මූලික අත්දැකීම් ලැබූ, මර්දනයට මුහුණ දුන් අයෙකු හැටියට ඉන්දික ගුණවර්ධනයන් හඳුන්වන්න පුළුවන්. මේ පරම්පරා දෙකම ගැන කථා කරන්න මාව පෙලඹෙව්වේ මීට පෙර සිද්ධ වූ කථාවක් නිසායි.

ඉන්දික ගුණවර්ධන මට හමුවෙන්නේ නැහෙනහිර ජර්මනියේදීයි. ඒ, දහවෙනි තරුණ උළෙලට නැහෙනහිර ජර්මනියට මා ගිය අවස්ථාව. ඒ, බර්ලින් තාප්පය බිඳ වැටීමේ ජයග්‍රාහී පම්පෝරිය ඇති වෙන්න පෙර අවස්ථාවක්. එකී තරුණ උළෙලට යන්නේ අපි 100 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක්. ඒ ගිය වෙලාවේ ඉන්දික ගුණවර්ධන එහේ ඉගෙන ගන්නවා. ඒ වාගේම චන්ද්‍රා ගුණසේකර මැතිතුමාගේ පුත් ප්‍රීතිත් එහි ඉගෙන ගන්නවා. මේ අය ඔක්කෝම වමේ දේශපාලනයේ හිටපු අය. අපි ඒ රටට ආගන්තුකයන් වුණා. ඔවුන් එහි සිටීම නිසා අපට ලොකු ශක්තියක් ලැබුණා. මේ දෙන්නා කළ මහපෙන්වීම නිසා අපට ලොකු ධෛර්යයක් ලැබුණා. ඒ අයගෙන් අපේ කණ්ඩායමට, ඒ මුළු තරුණ උළෙල පුරාම විශාල වැඩ කොටසක් ඉටු කරන්න ලොකු අනුග්‍රහයක් ලැබුණා; ඒ වාගේම අවකාශයක් ලබා දුන්නා.

ඉන්දික ගුණවර්ධනගේ නම ඔහුට ලැබුණේ කෙසේද කියා ගරු සරත් අමුණුගම මැතිතුමා කිව්වා. එදා ඉන්දියාවේ හිරගෙදරක අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව කළ අරගළය නිසා ඔවුන්ට මුහුණ දෙන්න වූ තත්ත්වයන් යටතේ දකුණු ආසියානු නිදහස් අරගළයේ සංකේතයක් හැටියට ඔවුන් නම් කරනු ලැබුවා. ඉන්පසුව 1979දී ඉන්දික ගුණවර්ධන මහතා ආපසු ලංකාවට ආවා. ලංකාවට එනකොට ලංකාවේ තිබුණේ මර්දනකාරී පරිසරයක්. ඒ වෘත්තීය සමිතිවලට පහරදෙන කාලයක්; වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වය මර්දනය කරන කාලයක්. ඒ වාගේම අවසානයේදී වෘත්තීය සමිති මහා අරගළයක් -මහා වැඩ වර්ජනයක්- කරලා, සේවකයන් දස දහස් ගණනක් සේවයෙන් නෙරපා දැමුවා. ඒ නිසා ඒ වකවානුව වෘත්තීය සමිතිවල පැවැත්ම පොඩි පට්ටම් කරනු ලැබූ කාලයක්. මේ කාලයේ තමයි ඉන්දික ගුණවර්ධන නැවතත් ලංකාවට ඇවිත් ඒවාට මුහුණ දෙන්නේ. ඒ කාලයේ වෘත්තීය සමිති අංශයේ විශාල වගකීමක් ඔහුට බාර වුණා. වෘත්තීය සමිති තුළ ඔහු විශාල මෙහෙවරක් ඉටු කළා. ඒ කාලය තුළදී තමයි 1980 මහා වැඩ වර්ජනය එන්නේ.

1980 මහා වැඩ වර්ජනයෙන් ඇතිවූ බරපතළ තත්ත්වයට මුහුණ දෙන්න ඔහුට සිදු වුණා. ඉන්පසු ඉන්දික ගුණවර්ධන මැතිතුමාට ඔහු වැඩ කරපු වෘත්තීය සමිතිවල නායකත්වය ගනිමින්, වර්ජනයෙන් ඇති වුණ තුවාලවලට වුවමනා කරන සුවපත් කිරීම්, සත්කාර කිරීමේ කටයුතු බාර වුණා. එතුමා දේශීයත්වය නියෝජනය කරපු කෙනෙක්. දේශ හිතෛෂීභාවය, දේශප්‍රේමීභාවය යන මේ ඕනෑ නමකින් දක්වන්නේ එකයි. එතුමා තමන්ගේ රටේ නිදහස ගැන, ස්වාධීනත්වය ගැන උනන්දු වුණ කෙනෙක්. ඒ වාගේම ජාතික එක්සත්කම ගැන උනන්දු වුණ කෙනෙක්.

වාමාංශිකයන් හැටියට අපට කාර්යයන් හතරක් තිබෙනවා. පළමු කාර්ය ජාතික නිදහස. දෙවැනි කාර්යය ප්‍රජාතන්ත්‍රවාදය, තුන්වෙනි කාර්යය ජාතික එක්සත්කම. හතරවෙනි කාර්ය ජනතාවගේ සුබ සාධනය. මේවායින් ජාතික එක්සත්කමත්, ජාතික නිදහසත් යන දෙකම එකට එකතු කර ගෙන සටන් කළ අය තමයි වාමාංශික අය; සම සමාජ පක්ෂය සහ කොමියුනිස්ට් පක්ෂය. නමුත් මේ රටේ එක්තරා අවධියක දේශපාලනය සම්පූර්ණයෙන්ම දෙපැත්තකට තීරු ගැහුණා. ඒ තමයි දෙමළ ජාතික වාදය හා සිංහල ජාතික වාදය. මේ දෙක අතර, භාෂා ප්‍රශ්නය ඔස්සේ මුළු සමාජයම ද්‍රුවීකරණය වුණා. ඒ ද්‍රුවීකරණය තුළ වාමාංශික ව්‍යාපාරය බොහොම දුෂ්කර තත්ත්වයකට මුහුණ දුන්නා. වාමාංශික ව්‍යාපාරයට එක පැත්තකින් ජාතික එක්සත්කම සඳහා කොඩියත්, අනෙක් පැත්තෙන් ජාතික නිදහස සඳහා කොඩියත් එකට ගන්නට වුණා. නමුත් ඉන්දික ගුණවර්ධන සහෝදරයා එදා ලංකාවට ආපු වෙලාවේ අවසානයේදී ඔහුට මුහුණ දෙන්නට වුණේ අධිරාජ්‍යවාදයක් එක්කලා අපට තිබෙන්නා වූ සටනේදී "අපි කුමන මාවතක් ගන්නවාද?" කියන කාරණයයි.

එදා පිලිප් ගුණවර්ධන මැතිතුමා ගිය මාවතේම අඩිය තබන්න තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමාටත්, අපටත් සිදු වුණේ. අධිරාජ්‍යවාදය සමඟ තිබෙන ප්‍රතිවිරෝධය, ප්‍රධාන ප්‍රතිවිරෝධය හැටියට සලකමින් අපට මැද මාවත් බලවේග සමඟ එකතු වෙලා ගමන් කරන්න සිදු වුණා. ඒ මැද මාවත් බලවේග සිංහල ජාතිකවාදයත් එක්ක ගමන් කරපු බලවේග වුණත්, අනෙක් අතට ජාතික එක්සත්කම සඳහා සියලුම ජාතීන් එකතු කළ හැකි මාවතක් සොයන්නට සිදු වී තිබුණත්, අපට ආසන්න වශයෙන්ම අධිරාජ්‍යවාදයත් එක්ක ගැටෙන ප්‍රධාන බලවේගවලට එකතු වී ගමන් කිරීමට අවශ්‍ය වීමේ හේතුව ඉන්දික ගුණවර්ධන මැතිතුමාටත් පිළිගන්න සිදු වීම නිසා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක වමේ පක්ෂ එකතු වී ගමන් කරන මාවතක එතුමාත් ගමන් කළේ.

මම දැන් මගේ කථාව ඉවර කරන්නයි සූදානම් වන්නේ. අද අපි නැවතත් එවැනි කරුණකට, එවැනි අවස්ථාවකට මුහුණ දී තිබෙනවා. ඒ සඳහා අපට ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අත්දැකීම් ප්‍රයෝජනයට ගන්න පුළුවන්. එක පැත්තකින් අධිරාජ්‍යවාදය උත්සාහ කරනවා, මේ රටේ සුළු ජනවර්ග තමන්ගේ අනුග්‍රාහකත්වයේ තබා ගන්න. අධිරාජ්‍යවාදය මැදිහත් වෙනවා, සුළු ජන කණ්ඩායම්වල ආරක්ෂකයා හැටියට ක්‍රියා කරන්න. ඒ අතරම අධිරාජ්‍යවාදය උනන්දු වෙනවා, මේ රටේ අද තිබෙන මේ දක්ෂිණාංශික රජය ආරක්ෂා කරන්න. ඒ කාර්යයන්හි නිරත වන අධිරාජ්‍යවාදයත් එක්ක අපට තිබෙන ගැටුමේදී ගත යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව ඉන්දික ගුණවර්ධන මැතිතුමා එදා අනුගමනය කළ වැඩ පිළිවෙළහි අත්දැකීම් අසුරෙන් අපට ඉගෙන ගන්න සිදු වෙලා තිබෙනවා.

එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම නිසා හෝ කුමන හේතුවක් නිසා හෝ එතුමාගේ ජීවිත කාලයෙන් විශාල පංගුවක් අපේ වාමාංශික ව්‍යාපාරයට එකතු කරන්න එතුමාට බැරි වුණා. පූර්ණ කාලීනයෙක් හැටියට කොමියුනිස්ට් පක්ෂයට එකතු වුණු එතුමා ලොකු පියවරක්, තීන්දුවක් ගත්තා. පූර්ණ කාලීනයෙක් වන විට ඒකේ තිබෙන සීමා මොනවාද කියලා එතුමා දැන ගෙන සිටියා. එතුමා ඒ කැප කිරීම් කළ අතර, එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම නිසා -වෙනත් කරුණු කාරණා කුමක් වුණත්- එතුමාගේ ජීවිතයේ වැඩි කාලයක ප්‍රයෝජනය මේ රටට ලබා දෙන්න බැරි වුණා. ඒ නිසා ඉන්දික ගුණවර්ධන මැතිතුමා කළ මෙහෙවර පිළිබඳව මේ අවස්ථාවේදී මෙනෙහි කරමින්, එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ බිරිඳ වන වෛද්‍ය පද්මිණී ගුණවර්ධන මහත්මියටත්, පුතුන් දෙපළටත් අපගේ සංවේගය පළ කරමින්, මා මේ අවස්ථාවේදී නිහඬ වෙනවා.

[2.46p.m.]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Bismillahir Rahmanir Raheem.

Hon. Speaker, I had the privilege of being in the same Cabinet of President Chandrika Bandaranaike Kumaratunga where the late Hon. Indika Gunawardena too was a member. Before I became the Leader of the Sri Lanka Muslim Congress, the late Hon. Indika Gunawardena served in the same Cabinet under President Kumaratunga along with my late Leader, the Hon. M.H.M. Ashraff.

To me, the Hon. Indika Gunawardena coming from a dynastic family exuded the important qualities of not only a matured politician but also a very humane person and a person with a sense of humility. His humaneness and humility is a matter that everybody agrees upon. But for someone who had foregone his job and the profession for the sake of the Party, for the ideology to which he had taken to, it is an extraordinary trait.

His involvement with the Communist Party of Sri Lanka since 1970s resulted in him entering the Provincial Council only in 1993. Along with the former President Chandrika Bandaranaike Kumaratunga, he entered the Western Provincial Council and along with her, when she led the then People's Alliance to victory over the United National Party, after a long rule of repression as they said, there began his Parliamentary career. Within that short career, he held several portfolios. I must very gratefully acknowledge the assistance he gave my late Leader, the Hon. M.H.M. Ashraff, to implement the drinking water scheme for the coastal areas of the Ampara District, which was begun by him as the then Cabinet Minister in charge of Urban Development, Housing and Construction.

In a Condolence Motion, sometimes, it may not be correct to digress and talk about or criticize the ideologies to which Members committed themselves. There was a minor battle a while ago over a comment made by the Hon. (Dr.) Sarath Amunugama about the ideology of certain Members of Parliament and the political path they have chosen, which was frowned upon by the Hon. Vasudeva Nanayakkara. True enough but the fact is that left of centre politics in this country has had its own challenges when it came to standing up for the rights of minorities in this country. We have had a galaxy of leaders who had led the Left movement in the pre-independence and post-independence history of his country and who had steadfastly stood for justice, equality and autonomy of the minority communities in this country.

The late Hon. Indika Gunawardena was someone who, in this House and outside, steadfastly supported his Party's ideology in taking forward the efforts to grant more power to the regions in this country. After the Indo-Lanka Accord, when the Thirteenth Amendment was introduced and the Provincial Council elections were called upon, the Communist Party and all the left of centre parties came together under the banner of United Socialist Alliance to contest the Provincial Council election held in 1988. When the Sri Lanka Freedom Party boycotted the elections, they became the official Opposition. The Party my late leader led - the Sri Lanka Muslim Congress - became the Opposition in the temporarily-merged North-Eastern Provincial Council.

There were many battles, both in this House as well as in the Provincial Councils, to try and convince the then UNP administration, which had by then become somewhat arrogant and inflexible when it came to devolving power in the provinces in which they were not ruling and we had several incidents where matters went to courts to find resolutions to the problems. Therefore, this issue of devolution of power and the left of centre parties and their commitment and midway through we also found the radicalization of youth, who also professed the same Marxist ideology, which unfortunately got mixed up sometimes with the nationalist ideology. Some critics would have even called them somewhat "racists" in their attitude. But then people of late Hon. Indika Gunawardena's caliber were there to steadfastly stand up and speak up for greater justice for minorities in this country.

The Hon. (Dr.) Sarath Amunugama referred to the three dynastic families and the manner in which they had committed themselves to public service without any allegation of corruption, which I would wholeheartedly endorse. I had the good fortune of associating with all his siblings, including the Hon. Dinesh Gunawardena, Prasanna Gunawardena, the former Mayor of Colombo and my former Colleague in this Chamber, the Hon. Geetanjana Gunawardena. It is only their sister Lakmali with whom I have not had much acquaintance, but all of them, whatever ideology they professed, have brought honour and esteem to whatever the office they held.

[ගරු රවුෆ් හකීම් මහතා]

Therefore, it has always been a pleasure of knowing them and when it comes to Indika, I must once again say that he was a rare human being. With such humility and with very forthright views, he was committed to his ideology and lived a simple life throughout and had been a wonderful example for anyone who would take to pubic life.

Therefore, it is with a heavy heart that we associate ourselves in this Vote of Condolence and I would extend my condolence to his dear wife, Dr. Padmini Gunawardena and his two sons as well as his siblings, who are present today both in this Chamber and in the Gallery.

I thank you.

[අ.භා. 2.57]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, අද අපි රැස්ව සිටින්නේ, ශ්‍රී ලංකාවේ බිහි වුණු විශිෂ්ට සටන්කාමී නායකයකු සිහිපත් කරමින් එතුමාගේ අභාවය ගැන අපේ ශෝකය එක් කරන්නයි. ඉන්දික ගුණවර්ධන මැතිතුමා තමන්ගේ වාර්තා ගොන්නට පළමු වාර්තාව තබන්නේ ලංකා ඉතිහාසයේ බිහි වුණු ළා බාලතම සිරකරුවකු විධියටයි. අපේ ශ්‍රී ලංකා නිදහස් අරගළයේ දැවැන්ත සේවයක් කිරීම වෙනුවෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව දෙන තෑග්ගක් විධියට පිලිප් ගුණවර්ධන මැතිතුමාත්, -ඉන්දික ගුණවර්ධන මහතාගේ පියා - කුසුමා ගුණවර්ධන මැතිනියත් -ආදරණීය මෑණියන්- අත් අඩංගුවට ගැනීමට සුදු අධිරාජ්‍යවාදීන් නියෝග කරනවා. මේ වන විට ඉන්දික ගුණවර්ධන මැතිතුමා මාස කිහිපයක් වයසැති ළදරුවෙක්. අම්මායි, තාත්තායි සැඟ වී සිටින සමයේ තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමා උපත ලබන්නේ. මේ පුංචි දරුවායි, අම්මායි, තාත්තායි ඉන්දියාවේ සිටින අතරේ තමයි ඔවුන් පොලිස් අත් අඩංගුවට පත් වන්නේ. මේ පුංචි දරුවා තමන්ගේ ආච්චි-සීයා, නැන්දලා-මාමාලා කවුරුන්වත් හඳුනන්නේ නැහැ. එම නිසා මේ පුංචි දරුවාටත් සිද්ධ වනවා, තමන්ගේ අම්මායි, තාත්තායි එක්ක සිරගත වන්න. වසරකට ආසන්න කාලයක් සිරගත වෙලා ඉන්න කොට තැළෙන, පෑගෙන, පොඩි වන පුංචි ජනතාවගේ දුක මේ පුංචි දරුවාගේ සෙල්ලම් ලෝකයට එකතු වනවා. ඒ වාගේම මේ අම්මා, තාත්තා මේ අසාධාරණ ලෝකයට එරෙහිව කරන මහා අරගළය මේ පුංචි දරුවා දකිනවා. මේ සියල්ල ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ වාමාංශික දේශපාලන නැඹුරුවට අනිවාර්යයෙන්ම හේතු වන්න ඇති.

ගරු කථානායකතුමනි, එතුමා තමන්ගේ දේශපාලනය සඳහා තෝරා ගන්නේ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයයි. පාසල් ශිෂ්‍යයකු විධියට මා මගේ දේශපාලනය ආරම්භ කරන්නේ ලංකා ජාතික ශිෂ්‍ය සංගමයෙන්. ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ තේරීම වුණේත් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයයි. එතුමා වාමාංශික දේශපාලනයේදී කළ කාර්ය භාරය ගැන මේ පාර්ලිමේන්තුවේ ඉන්න වාමාංශික නායකයන් සිහිපත් කළ නිසා ඉන්දික ගුණවර්ධන මැතිතුමා තුළ සිටි පරිසරවේදියා ගැන, ඉන්දික ගුණවර්ධන මැතිතුමා තුළ සිටි මානව හිතවාදියා ගැන කථා කරන්න මා කැමැතියි.

ගරු කථානායකතුමනි, බොහෝ දේශපාලකයන් මහජන සේවය සිදු කරන්නේ මනාප එකතු කරන්නයි; මහ ජනතාවගේ ප්‍රශ්න කථා කරන්නේ මනාප එකතු කරන්නයි. නමුත් ඉන්දික ගුණවර්ධන මැතිතුමා එහෙම කළේ නැහැ. අසනීප තත්ත්වය නිසා ක්‍රියාකාරී දේශපාලනයෙන් ඈත් වුණත්, මහ ජනතාවට සේවය කිරීම එතුමා නතර කළේ නැහැ. 2007 වසරේ මම මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරද්දී එතුමා මා හමු වෙන්න ඇවිත්, "කැලණිය මිටියාවතේ කැලණි ගඟේ ඉවුරු කඩා හැළෙමින් පවතිනවා. මෙයට අපි වහාම පියවරක් ගත යුතුයි" කියලා මට යෝජනා කළා. එතුමා මට ආරාධනා කළා, ඇවිල්ලා මෙය ඇස් දෙකෙන්ම බලන්න කියලා. එතුමා කිව්ව පරිදි මා එය බලන්න ගිහින්, පවිත්‍ර ගංගා ව්‍යාපෘතියෙන් අරමුදල් වෙන් කළා. එතුමා ප්‍රධාන අමුත්තා කර ගෙන අපි ඉවුරු සංරක්ෂණ වැඩ පිළිවෙළක් පටන් ගත්තා. එතුමා තමන්ගේ අසනීප තත්ත්වයන් පැත්තක තබා, තමන්ගේ ප්‍රදේශයේ ජනතාව මුහුණ දී තිබුණ පරිසර ප්‍රශ්නයට උත්තර සොයන්න ක්‍රියාකාරිව මැදිහත් වුණා.

ඒ විතරක් නොවෙයි, මා බස්නාහිර පළාත් කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් ඉන්න කොට අවිස්සාවේල්ල ආසනයේ ප්‍රශ්න කථා කරන්න ගොවීන් හමු වෙන්න යද්දී ඉන්දික ගුණවර්ධන මැතිතුමා අසනීප තත්ත්වයෙන් සිටියත්, ගොවි ජනතාව එක්ක ඇවිත්, ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කළ බව මට මතකයි.

මේ අවස්ථාවේදී එතුමාගේ සහෝදරයකු වන ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා ගැනත් මතක් කරන්න ඕනෑ. එතුමා ඉතා අපහසුවෙන් සැරයටියකින් පැමිණ ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න කටයුතු කළා. එතුමන්ලා පරිසරයට ආදරය කළේ, මිනිසුන්ට ආදරය කළේ හුදෙක් දේශපාලනය වෙනුවෙන් නොවෙයි; මනාප එකතු කරන්න නොවෙයි. දේශපාලනයේදී මනාප උපයනවාට වඩා ජනතාවට සේවය කර සතුට උපයා ගැනීම ජීවිතයේ සැදෑ සමය තෘප්තිමත්ව ගත කරන්න වටිනවාය කියන කාරණය එතුමන්ලා අවබෝධ කර ගෙන සිටියා. එතුමා පාර්ලිමේන්තුවේ සිටියේ වසර 7ක් වැනි කෙටි කාලයක් වුණත්, ඒ කෙටි කාලය තුළදී එතුමා අවිස්සාවේල්ල ජනතාවට, කඩුවෙල ජනතාවට, සමස්තයක් හැටියට කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල සේවයක් ඉටු කළා. ඒ නිසා තමයි එතුමා අභාවප්‍රාප්ත වුණාට පස්සේ එතුමාගේ මළ ගෙදරට පැමිණි ජනතාව, "අපට වතුර දුන්නේ ඉන්දික මහත්තයා. අපට රක්ෂාවක් දුන්නේ ඉන්දික මහත්තයා. අද අපි කාලා ඇඳලා ඉන්නේ ඉන්දික මහත්මයා නිසා"යි කියලා ඇඹූ කඳුළින් අපත් එක්ක පැවසුවේ.

ගරු කථානායකතුමනි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා අධිරාජ්‍ය විරෝධී සටන්කාමියෙක්. අද එතුමා සිටියා නම් අසනීප තත්ත්වය පැත්තකින් තියලා මේ රටේ සිදු වන දේවල් ගැන ඉතාම කනස්සල්ලෙන් බලාවි; ඇමෙරිකානු අධිරාජ්‍යවාදයේ ග්‍රහණයට අපේ ආදරණීය මව්බිම ලක් වෙන ආකාරය ගැන කනස්සල්ලෙන් බලාවි; ඉන්දියානු ව්‍යාප්තවාදයට අපේ මව්බිම ගොදුරු වන ආකාරය ගැන කනස්සල්ලෙන් බලාවි; කනස්සල්ලෙන් බලලා, සුසුමක් හෙළලා නිහඬ වෙනවා වෙනුවට, තමන්ගේ අසනීප තත්ත්වය පැත්තකින් තියලා මේ මව්බිමේ නිදහස් අරගළයට ක්‍රියාකාරිව අපිත් එක්ක එකතු වේවි. ගරු කථානායකතුමනි, වාසනාවට එතුමාගේ ආදරණීය සොයුරු ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අද අපිට ඒ අරගළයට නායකත්වය දෙනවා.

ගීතාංජන ගුණවර්ධන මැතිතුමා එතුමාගේ තවත් සහෝදරයෙක්. එතුමා අද අපේ මේ අරගළය තුළ නිහඬ සේවයක් කරනවා. ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ දේශපාලන පක්ෂය වුණේ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයයි. එම පක්ෂයත් මේ අරගළයේදී ක්‍රියාකාරිව අපිත් එක්ක ඉන්නවා.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මෙවැනි ශෝක ප්‍රකාශ යෝජනාවකදී අපේ සම්ප්‍රදාය තමයි ඒ මිය ගිය සටන් සගයාට නිවන් සුව අත්වේවා! කියා ප්‍රාර්ථනා කිරීම. නමුත් ඒ සම්ප්‍රදායට

අනුකූලව කථාව අවසන් කරන්න මගේ හිත ඉඩ දෙන්නේ නැහැ. එතුමා වැනි සටන්කාමීන් වැඩි වැඩියෙන් ඕනෑ කරන සමයකයි එතුමා අපෙන් සමු ගෙන තිබෙන්නේ. ඒ නිසා නොනිමි වූ අධිරාජ්‍ය විරෝධී අරගළය ජයග්‍රහණයෙන් කෙළවර කරන්නට ඉන්දික ගුණවර්ධන මැතිතුමා යළි අප අතර ඉපදේවා! කියා ප්‍රාර්ථනා කරමින් අපේ ශෝකය පවුලේ සැමට යොමු කරමින් මා නිහඬ වෙනවා. තෙරුවන් සරණයි!

[අ.භා. 3.04]

ගරු තිලංග සුමතිපාල මහතා (නියෝජ්‍ය කථානායකතුමා)
(மாண்புமிகு திலங்க சுமதிபால - பிரதிச் சபாநாயகர்)
(The Hon. Thilanga Sumathipala -Deputy Speaker)

ගරු කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් දේශපාලනයේ නියැලී සිටි ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ගෙනා ශෝක ප්‍රකාශ යෝජනාව සම්බන්ධයෙන් වචන ස්වල්පයක් එක් කරන්න අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙවැනි අවස්ථාවක ඒ සඳහා වචන ස්වල්පයක් එක් කරන්න ලැබීම මා වැදගත් කොට සලකනවා.

එතුමා දේශපාලනඥයකු වශයෙන් පාර්ලිමේන්තුවේ සිටි යුගයේ මා නොසිටියත්, මට එතුමා එක්ක වැඩ කරන්න, එතුමාව දැන හඳින ගන්න අවස්ථා කිහිපයක් ලැබුණා. එතුමා නියෝජනය කළ පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවුණත් මේ අවස්ථාවේ එතුමාව සිහිපත් කරමින් එතුමාගේ අභාවය වෙනුවෙන්, කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන අපගේ ශෝකය ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම එතුමාගේ අභාවය වෙනුවෙන්, කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ශෝකයත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

එතුමා කොමියුනිස්ට් පක්ෂයේ නායකයකු හැටියටත් වාම දේශපාලනයේ නායකයකු හැටියටත් කොළඹ දිසාවට විශාල සේවාවක් කළ කෙනෙක්. ඒ සියල්ලටම වඩා මේ රටේ අඩු ආදායම් ඇති දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් එතුමා කළ සේවය මට මතක් වෙනවා. "පැල්පත්වාසීන්" කියා නම් කළ කොළඹ නගරයේ ඉන්න 60,000කට වැඩි ජනතාව පිළිබඳව අධ්‍යයනය කරමින් ඒ අය නැවත පදිංචි කරවීමේ වැඩ පිළිවෙළක් මුලින්ම ආරම්භ කළේ අපේ හිටපු අමාත්‍ය ඉන්දික ගුණවර්ධන මැතිතුමායි. ඒ සඳහා සැලැස්මක් හදලා "සහස්පුර" කියන ගොඩනැඟිල්ල හදන්න සංකල්පය හැදුවේ එතුමායි. ඒ අය සිටින නිවාසවල තිබුණේ ඉතාම අඩු පහසුකම්. තමන්ටම කියලා වතුර ටිකක් ගන්න තැනක් නැතිව පොදු පයිප්පයෙන් වතුර බීපු, පොදු වැසිකිළිවලට ගිය ඒ දුගී ජනතාව වෙනුවෙන් මහල් නිවාස සංකීර්ණ හදලා ඒ අය නැවත පදිංචි කරවන්නටත්, තාවකාලික පදනම්න් ඒ අය ඒ තැන්වලින් ඉවත් කරන්නටත් ඉතාම පැහැදිලි වැඩසටහනක් ඉදිරිපත් කළ නායකයෙක් හැටියට තමයි අපට එතුමාව මතක් වන්නේ. නැති බැරිකම; දුප්පත්කම; දිළිඳුකම තුරන් කරන්න අවශ්‍යයි කියන අවංක චේතනාව ඇතිව ඒ ජනතාවට තමන්ටම කියා නිවාස ලබා දීමේ වැඩසටහනට නායකත්වය දුන්න, එම සැලැස්ම කොළඹ නගරය තුළ ක්‍රියාත්මක කළ නායකයා එතුමායි.

බොරැල්ල වනාතමුල්ල ප්‍රදේශයේ "සහස්පුර" කියන නිවාස සංකීර්ණය ඉදි කිරීමේ සංකල්පය ක්‍රියාත්මක කළේ එතුමායි. ඒ හා සමගාමී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළක් පිළිබඳව අදටත් අපට හිතන්න බැහැ. සියලු දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් වාගේම නිවාස හිමි වුණු, නිවාස ලබා ගන්න බලාපොරොත්තු වන අය වෙනුවෙනුත් මා මේ අවස්ථාවේදී එතුමාව මතක් කරනවා. එතුමා ගැන නොයෙකුත් දේවල් මේ ගරු සභාවේදී කියැවුණා. ඒ නිසා නැවත මා ඒ කාරණා පිළිබඳව සිහිපත් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. නමුත් මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ දයාබර භාර්යාව වන පද්මිණී ගුණවර්ධන මහත්මියටත්, දියත් ගාමින්ද ගුණවර්ධන සහ යසිත් වතුර ගුණවර්ධන කියන පුතණුවන් දෙදෙනාටත් අපගේ ශෝකය පුද කර සිටිනවා.

ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ සහෝදරයන් වන මේ පාර්ලිමේන්තුවේ අපත් එක්ක සිටින දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත්, හිටපු අමාත්‍ය අපගේ හිතවත් ගීතාංජන ගුණවර්ධන මැතිතුමාත්, කොළඹ නගරයේ නගරාධිපති වශයෙන් හිටපු අප හිතවත් ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාත්, එතුමාගේ දයාබර සහෝදරිය වන ලක්මාලි ගුණවර්ධන මැතිනියත් මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ සියලු දෙනා ඇතුළු මේ පවුලෙන් මේ රටේ සමාජ පරිවර්තනයට විශාල සේවාවක් සිදු වුණා. ඔවුන්ට මේ ආභාසය ලැබුණේ දයාබර දෙමව්පියන් වන පිලිප් ගුණවර්ධන මැතිතුමාගෙන් සහ එම මැතිනියගෙන් බව අප හැමෝම දන්නවා.

ඉන්දික ගුණවර්ධන මැතිතුමා 1993 පැවති බස්නාහිර පළාත් සභා මැතිවරණයෙන් ජයගෙන කොළඹ දිසාවේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙසත්, 1994 වර්ෂයේ පැවති මහ මැතිවරණයෙන් ජයගෙන පාර්ලිමේන්තුවටත් පත් වුණා. එතුමා අවංකව, ජනතා සේවය සඳහා වැඩ කළා. අපගේ හිතවත් මානව හිතවාදී ඉන්දික ගුණවර්ධන මැතිතුමාව අප මේ අවස්ථාවේදී සිහිපත් කරන්නේ, එය මේ පාර්ලිමේන්තුවේ වගකීමක් සහ යුතුකමක් හැටියට සලකායි. මට අවස්ථා කිහිපයකදීම ඉන්දික ගුණවර්ධන මැතිතුමාව මුණ ගැහෙන්න ලැබුණා. ඉතාම ප්‍රායෝගිකව, පැහැදිලි අදහසක්, අරමුණක් ඇතිව යමක් විග්‍රහ කරන්න පුළුවන්, ඒ වෙනුවෙන් කථා කරන්න පුළුවන් අවබෝධයක් එතුමාට තිබුණා. බොහොම ඕනෑකමින් යම්කිසි දෙයකට ඇඟුම් කන් දීලා, සමාජයේ අවශ්‍යතාව හඳුනාගෙන, පෞද්ගලික අංශයේ සේවකයනුත්, රජයේ සේවකයනුත්, ග්‍රාමීය ජනතාවත් අතර සම්පූර්ණ සංකලනයක් ඇති කිරීම සඳහා වැඩ කටයුතු කිරීමේ හැකියාව තිබුණු නායකයෙක් තමයි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත්, කොළඹ දිස්ත්‍රික්කයේ වාම දේශපාලනයත් එක්ක වැඩ කරපු කල්‍යාණ මිත්‍රයෙක්, හිතවතෙක් හැටියට එතුමාව හඳුන්වන්න පුළුවන්.

සමාජ පරිවර්තනයක් කරලා දියුණු රටක් සඳහා සිහින මවපු, අහිංසක ජනතාව ගැන හැම දාම අවංකව සිතපු එතුමා ගම් මට්ටමින්, බිම් මට්ටමින් වාගේම වතුකරයේ ජනතාව වෙනුවෙනුත් වැඩ කටයුතු කළා. ඉස්ලාම් හෝ වේවා හින්දු භක්තිකයන් හෝ වේවා ඕනෑම ජාතියක් සමඟ එතුමා කටයුතු කළා. අවිස්සාවේල්ල ප්‍රදේශයේ වතු කිහිපයක් තිබෙනවා. එම ප්‍රදේශයේ දහසකුත් දෙමළ ජනතාව ඉන්නවා; මුස්ලිම් ජනතාවත් ඉන්නවා. මිශ්‍ර ජාතීන් ජීවත් වුණු එම ප්‍රදේශය තුළ එතුමා හුඟක් වැඩ කටයුතු කළා. ජාතිවාදයකින් තොරව සියලු දෙනාටම එක විධියට සලකමින්, හැමෝගේම ප්‍රශ්නවලට ඇඟුම් කන් දෙමින්, බොහොම ඕනෑකමින් නායකත්වය දීපු නායකයෙක් හැටියට මා නැවත නැවතත් එතුමාව මේ අවස්ථාවේදී මතක් කරනවා. එතුමාගේ පවුලේ අයට අපගේ කනගාටුව ප්‍රකාශ කරන අතර, එතුමාට නිවන් සුව ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

[අ.භා. 3.11]

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු කථානායකතුමනි, "බොරළුගොඩ සිංහයා" නමින් විරුදාවලිය ලත් පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳවත්, ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ මෑණියන් වන කුසුම්සිරි ගුණවර්ධන මැතිනියගේ සහ රොබට් ගුණවර්ධන

[ගරු වමල් රාජපක්ෂ මහතා]

මැතිතුමාගේ අභාවයන් පිළිබඳවත් පාර්ලිමේන්තුව මීට පෙර අවස්ථා කීපයකදී ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කළා. අද දවස ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළකිරීමේ යෝජනාව ඉදිරිපත් වන දවසයි. ඒ සියලු දෙනාගේම අභාවයන් පිළිබඳව පාර්ලිමේන්තුවේදී ශෝක ප්‍රකාශ කළ සෑම අවස්ථාවකටම මේ ගරු සභාව නියෝජනය කළ රාජපක්ෂවරයෙකුත් සම්බන්ධ වෙලා තිබෙනවා. අභාවප්‍රාප්ත ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන අද, මට ඒ අවස්ථාව ලැබුණා, අපේ ශෝකය ප්‍රකාශ කරන්න.

විශේෂයෙන්ම ගුණවර්ධන පවුල 1920 දශකයේ අග භාගයේදීත්, 1930 දශකයේ මුල් භාගයේදීත් එදා අපේ රටේ තිබුණු ඉංග්‍රීසි පාලනයට විරුද්ධව, එදා තිබුණු ඒ පීඩනයට විරුද්ධව, මේ රටට නිදහස ලබා ගැනීම සඳහා මූලිකව කටයුතු කළ පවුලක්. එවැනි පවුලක නායකයෙකුගේ පුතෙකු ගැන තමයි අද අපි කථා කරන්නේ.

එදා තිබුණු දේශපාලන වාතාවරණය තුළ ඉංග්‍රීසි පාලනයට විරුද්ධව කථා කිරීම ඉතාම අපහසු කාර්යයක්. ඒ වාගේම තමයි එදා ජනතාවට තිබුණු පීඩනයත්. ඒ හැම අවස්ථාවකදීම ඒවාට විරුද්ධව නායකත්වයක් අරගෙන කටයුතු කළ පවුලක් තමයි ගුණවර්ධන පවුල.

ලංකා සමසමාජ පක්ෂයේ - වාමාංශික ව්‍යාපාරයේ - නිර්මාතෘවරයා සිටියේත් ගුණවර්ධන පවුලේයි. පිලිප් ගුණවර්ධන මැතිතුමා, ඒ වාගේම එන්.එම්. පෙරේරා මැතිතුමා, ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා, කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා වැනි වාමාංශික ව්‍යාපාරය තුළ සිටි නායකයන්, වාමාංශික ව්‍යාපාරය හරහා රටටත්, ජනතාවටත් සේවය කළ ආකාරය වර්තමාන දේශපාලනඥයන් වන අපටත් ලොකු ආදර්ශයක්. ඒ අය රට වෙනුවෙන් කටයුතු කර හිරබත් කාපු අය.

1940දී පමණ වාමාංශික ව්‍යාපාරයේ යෙදුණු සියලු දෙනාම අත් අඩංගුවට ගන්න එදා ඉංග්‍රීසි ආණ්ඩුව නියෝග කළා. මට මතකයි, අපි අහලා තිබෙනවා, මේ සියලු දෙනාම වැලිකඩ බන්ධනාගාරයෙන් පැනලා ගිහිල්ලා සැඟවිලා සිටියේ ගිරුවාපත්තුවේ. වීරකැටියේ කොන්දගල කියන නිවසේත්, මැදමුලන අපේ නිවසේත් ඒ විධියට කාලයක් සැඟවී සිටියා. එතැනින් තමයි ඉන්දියාවට පැනලා ගියේ. ඒ නායකයන් ඉන්දියාවේ ඉන්න කාලයේ තමයි ඉන්දික ගුණවර්ධන මැතිතුමා උත්පත්තිය ලැබුවේ. ඒ නිසා තමයි "ඉන්දික" කියන නමත් එතුමාට ලැබුණේ. ඉන්දික ගුණවර්ධන මැතිතුමාත් පියාගේ, බාප්පලාගේ අඩිපාරේ යමින් වාමාංශික ව්‍යාපාරය ඉදිරියටම ගෙනගියා. එතුමා කොමියුනිස්ට් පක්ෂයේ හොඳ ක්‍රියාකාරී සාමාජිකයෙක්. ඒ වාගේම අවංකව, කැපවීමෙන් කටයුතු කළ කෙනෙක්. කොමියුනිස්ට් පක්ෂයේ වෘත්තීය සම්මිවලත්, තරුණ සංවිධානයේත් එතුමා ක්‍රියාකාරීව කටයුතු කළා. කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්ති රැකගනිමින් එතුමාගේ අවසානය දක්වාම එතුමා ඒ කටයුත්ත කළා.

1993දී එතුමා බස්නාහිර පළාත් සභාවට තේරී පත්වුණා. ඉන් පසු 1994 සිට 2001 දක්වා පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා අමාත්‍යාධුර රාශියක් දරලා තිබෙනවා. පිලිප් ගුණවර්ධන මැතිතුමා අමාත්‍යාධුර දරලා තිබෙනවා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා අමාත්‍යාධුරයක් දරලා තිබෙනවා. එතුමාගේ සහෝදරයා වන දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් අමාත්‍යාධුර දරලා තිබෙනවා. ගීතාංජන ගුණවර්ධන මැතිතුමා නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියටත්, අමාත්‍යවරයකු හැටියටත්, නියෝජ්‍ය කථානායකවරයකු හැටියටත් මේ සභාව නියෝජනය කර තිබෙනවා. ඉන්දික ගුණවර්ධන මැතිතුමා මොනම ආකාරයකින්වත් එතුමාගේ දැක්ම, දර්ශනය, ප්‍රතිපත්තිය වෙනස් කළේ නැහැ. ඒ ප්‍රතිපත්තියේ ඉඳගෙන රට වෙනුවෙන් තනතුරු දරමින් සේවයක් කළා.

අද පාර්ලිමේන්තුව නියෝජනය කරන දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒකාබද්ධ විපක්ෂයේ නායකවරයා හැටියට, පිලිප් ගුණවර්ධන මහත්මයා ආරම්භ කළ වාමාංශික ව්‍යාපාරයේ වැඩ පිළිවෙළ ඊට වඩා මධ්‍යස්ථව කර ගෙන යෑම ගැන අපි ආඩම්බර වෙනවා. ඒ පවුලේ සියලුදෙනාගෙන්ම මේ රටට විශාල සේවාවක් සිදු වෙලා තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා ඇතුළු බොහෝ අය ප්‍රකාශ කළා, ඉන්දික ගුණවර්ධන මැතිතුමා අමාත්‍ය ධුරය දරපු කාලයේ මොන තරම් නම්‍යශීලිව රටේ ප්‍රශ්න, ජනතාවගේ ප්‍රශ්න තේරුම් අරගෙන කටයුතු කළාද කියලා. ඒ පවුලේ සියලුදෙනාම ජනතාව වෙනුවෙන්, ජනතාවගේ හඬට ඇහුම් කන් දීපු අය.

ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා කොළඹ මහනගර සභාවේ නගරාධිපති ධුරය දැරුවා මට මතකයි. එතුමාත් එතුමාගේ අංශයෙන් විශාල වැඩ කොටසක් කළා. නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යවරයා හැටියට ඉන්දික ගුණවර්ධන මැතිතුමා කොළඹ විතරක් නොවෙයි, ලංකාව පුරාම කටයුතු කළා. පසුව, දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් නාගරික සංවර්ධන ඇමතිතුමා හැටියට කටයුතු කළා. ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා ඒ අවස්ථාවල ඒ අමාත්‍යාංශවල කටයුතු කරන්න එතුමන්ලාට විශාල හයියක්, ශක්තියක් දුන්නා. පීටර් කේනමන් මැතිතුමා නිවාස ඇමතිවරයා හැටියට මේ රටට යම් සේවාවක් කළා. ඒ සේවාව තවත් ඉදිරියට ගෙන යන්න ඉන්දික ගුණවර්ධන මැතිතුමාට පුළුවන්කම ලැබුණා.

ගිරුවාපත්තුවේ ජනතාවත්, ගුණවර්ධන පවුලේ අයත් අතර බොහොම කිට්ටු සම්බන්ධතාවක් තිබෙනවා. ඉන්දික ගුණවර්ධන, දිනේෂ් ගුණවර්ධන, ප්‍රසන්න ගුණවර්ධන, ගීතාංජන ගුණවර්ධන මැතිතුමන්ලාගේ මෑණියන් වන කුසුමා ගුණවර්ධන මැතිනිය තංගල්ල ප්‍රදේශයේ කෙනෙක්. වාමාංශික ව්‍යාපාරය හරහා, සූරියමල් ව්‍යාපාරය හරහා ඒ අය තව තවත් කිට්ටු වුණා. විශේෂයෙන්ම රාජපක්ෂවරුත් එදා ඉඳලා, -එක්දහස්නවසිය තිස්ගණන්වල ඉඳලා- ඩී.එම්. රාජපක්ෂ, ඩී.ඒ. රාජපක්ෂ, ජෝර්ජ් රාජපක්ෂ, ලක්ෂ්මන් රාජපක්ෂ මේ හැම කෙනෙක් එක්කම බොහොම කිට්ටු සම්බන්ධයක් තිබුණා. ලක්ෂ්මන් රාජපක්ෂ මැතිතුමා නම් අවසානය දක්වාම පිලිප් ගුණවර්ධන මැතිතුමාත් එක්කයි දේශපාලනයේ නිරත වෙලා හිටියේ.

ඉන්දික ගුණවර්ධන මැතිතුමාගෙන් අපේ රටේ දේශපාලනයට, වාමාංශික ව්‍යාපාරයට සිදු වූ සේවාවත්, ඒ වාගේම, මන්ත්‍රීවරයකු හැටියට, අමාත්‍යවරයකු හැටියට සිදු වූ සේවාවත් මේ වේලාවේ අගය කරනවා.

මෙතුමා අසනීප වෙලා හිටිය කාලයේ බොරලුගොඩ නිවසේ තමයි හිටියේ. එතුමා බලන්න මමත් එක අවස්ථාවක ගියා. එතුමා හැම විටම කථා කළේ ලෙඩේ ගැන නොවෙයි, රටේ ප්‍රශ්න ගැන; ජනතාවගේ ප්‍රශ්න ගැන. මම හිතන හැටියට මෙවැනි අවංක අයට ජනතාවට වැඩි වැඩියෙන් සේවය කරන්න ලැබෙන අවස්ථාව අඩුයි. අද තිබෙන ක්‍රමවේදය අනුව එවැනි දේ ජනතාව තේරුම් ගැනීමත් බොහොම අඩුයි.

ඩිලාන් පෙරේරා ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගේ පියා -මාර්ෂල් පෙරේරා මැතිතුමා- බදුල්ලේ. එතුමාත් වාමාංශික ව්‍යාපාරයේ කෙනෙක්. එතුමාත් ඉන්දික ගුණවර්ධන

මැතිතුමාට බොහොම සමීප කෙනෙක්. මම බදුල්ලේ ඉන්න කාලයේ මටත් අවස්ථාව ලැබුණා, ඒ දෙගොල්ලන් එක්කම යම් යම් අවස්ථාවලට සම්බන්ධ වෙන්න. අපට මේ වාගේ දේශපාලන නායකයන් නැතිවීම විශාල පාඩුවක්.

අවසාන වශයෙන්, ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ දයාබර බිරිඳ වන විශේෂඥ වෛද්‍ය පත්මිණී ගුණවර්ධන මැතිනියටත්, දරුවන් දෙදෙනා ඇතුළු අනෙකුත් සහෝදර සහෝදරියන් සියලු දෙනාටටම ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු රාජපක්ෂවරුන්ගේ ශෝකය මේ අවස්ථාවේ දී පුද කර සිටිනවා. අපේ හිතවත් ඉන්දික ගුණවර්ධන මැතිතුමාට නිවන් සුව අත් වේවා! යි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.23]

ගරු ඩිලාන් පෙරේරා මහතා (මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - நெடுஞ்சாலைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilan Perera - State Minister of Highways)

ගරු කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව ගෙනා ශෝක ප්‍රකාශ යෝජනාව සම්බන්ධව සාකච්ඡා කරන විට, ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ දේශපාලනයේ විවිධ ඉසවු, විවිධ ලක්ෂණ අරගෙන තව කෙනෙකුගේ දේශපාලනයට පහර ගහන්නත්, සමහර අය තමන් අද ඉන්න තත්ත්වයේ ඉන්නේ ඇයි කියලා පැහැදිලි කරන්නත් මේ ශෝක ප්‍රකාශ යෝජනාව පාවිච්චි කළ බව මට දැණුනා. ඒ හරහා අපට පෙනෙන්නේ මේ ගරු සභාවේ පක්ෂ විපක්ෂ සියලු දෙනා ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ මුළු දේශපාලන දර්ශනයම නොවුණත්, යම් යම් දේවල් අගය කරන බවයි. මේ පැත්තෙන් ගරු සරත් අමුණුගම ඇමතිතුමා කියන විට අද යුගයේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා හිටියා නම් හොඳයි කියලා, අනෙක් පැත්තෙන් විපක්ෂ නායක ගරු ආර්. සම්පන්දන් මැතිතුමා මේ රටේ ජනාධිපතිකමටත් ඉන්දික ගුණවර්ධන මැතිතුමා හිටියා නම් හොඳයි කිව්වා.

ඊළඟට, ගරු උදය ගම්මන්පිල මැතිතුමාත් කිව්වා ඉන්දික ගුණවර්ධන මැතිතුමා අද හිටියා නම් හොඳයි කියලා. නමුත් මේ තුන්දෙනාගේම දේශපාලන ධාරාවන් සහ දර්ශන වෙනස් බව අපි දන්නවා. නමුත් ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ යම් දේශපාලන ලක්ෂණයක් ඒගොල්ලන්ගේ දේශපාලනයට අනුව හොඳයි කියලා ඒ තුන්දෙනාම දැකලා තිබෙනවා.

මම අද දේශපාලනයේ ඉන්නේ 1988 පළාත් සභා මැතිවරණයෙන් දේශපාලනයට ආපු නිසායි. ඒ වෙලාවේ ජැක් කොතලාවල මැතිතුමා ශ්‍රී ලංකා මහජන පක්ෂයේ සභාපතිතුමා හැටියට මගේ පියා මෘදුල් පෙරේරා මැතිතුමාට තමයි මුලින්ම ආරාධනා කළේ, එක්සත් සමාජවාදී පෙරමුණෙන් පළාත් සභාවට තරග කරන්න කියලා. මගේ පියා ඒ වෙලාවේ ඒක ප්‍රතික්ෂේප කළ නිසා ඩිවි ගුණසේකර මැතිතුමාටයි, ඉන්දික ගුණවර්ධන මැතිතුමාටයි භාර වුණා, බදුල්ලට ගිහින් මගේ පියා හමු වෙලා මාව දේශපාලනයට යොමු කර වන්නට මගේ පියාගේ කැමැත්ත ගන්න. ඒ කාලයේ මම නවක නීතිඥවරයෙක්. ඒ ගමන යන්න දෙන්නම සහභාගි වෙන්න හිටියත් අවසානයේ ඉන්දික ගුණවර්ධන මැතිතුමාට එන්න බැරි වුණා. ඩිවි ගුණසේකර මැතිතුමා තමයි ගියේ. නමුත් ඉන්දික ගුණවර්ධන මැතිතුමා දුරකථනයෙන් මගේ පියාට කථා කරලා කිව්වා, "මෘදුල් සහෝදරයා ඔබතුමාට බැරි නම් පුතාව හරි දේශපාලනයට එවන්න. මේක හොඳ වෙලාවක්" කියලා. ඒ වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පක්ෂය ඒ පළාත් සභා මැතිවරණය වර්ජනය කළා. වර්තමාන මගේ පක්ෂයේ එදා නායිකාව වුණේ බණ්ඩාරනායක මැතිනිය. එතුමිය එදා පළාත් සභා ක්‍රමයට විරුද්ධව කොටුවේ බෝධිය ළඟ වාඩි වුණා. ඒ කාලයේ පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණු අයට ආණ්ඩුවෙන් සහ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය හරහාත් දෙපැත්තකින් තුවක්කු පත්තු වුණා.

මගේ මව ගෙදර අඩන කොට තමයි මම 1988දී පළාත් සභා මැතිවරණයට නාම යෝජනා භාර දුන්නේ. එදාම තමයි විදේශ සේවා විභාගය pass වෙලා interview එකට එන්න කියලා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වර්තමාන ලේකම් ඇසල වීරකෝන් මැතිතුමාටයි, මටයි ලියුම් ආවේ. නමුත් මම තෝරා ගත්තේ තානාපති සේවය නොවෙයි දේශපාලනය. ඒක හොඳයි. මොකද, මම තානාපති සේවයට ගියා නම් ලංකාව වෙනුවෙන් කීර්ති නාමය ආරක්ෂා කරන්නට බැරි වෙන්න තිබුණා. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, එදා මගේ පියා හමුවෙලා ඒ කරපු ඉල්ලීම මත තමයි මම දේශපාලනයට අවතීර්ණ වුණේ. ඒ වෙලාවේ මම දේශපාලනයට එන්න තෝරා ගත්තේ ශ්‍රී ලංකා මහජන පක්ෂයයි.

හැබැයි, ඉන්දික ගුණවර්ධන මැතිතුමාව මට හමුවුණේ, මා කැලණිය විශ්ව විද්‍යාලයේ අන්තර් ශිෂ්‍ය බලමණ්ඩලයේ සාමාජිකයකු හැටියට සිටි කාලයේදීයි. ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ උපාලි ජයවීර සහෝදරයාත් එක්ක අපි එතුමා හමු වෙන්න යනවා.

"ඉන්දික සහෝදරයා" කියලායි අපි එතුමාට කියන්නේ. ඒ දවස්වල කොළඹ ටවුන් හෝල් එකේ තිබුණා, ජලබදු විරෝධී සංවිධානයේ රැස්වීමක්. මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවෝ තමයි ඒ රැස්වීමේ මූලාසනය ගත්තේ. එදා කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් කථා කරන්නට හිටියේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා. එදා අපේ ශිෂ්‍ය ප්‍රශ්නය ගැන කථා කරන්න අවස්ථාවක් ඉල්ලා ගෙන අපි එහි ගියා. එවකට සිටි අධ්‍යාපන ඇමතිවරයා රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමා එදා ගෙනාපු අධ්‍යාපන පනතට විරුද්ධව කථා කරන්න න්‍යාය පත්‍රයේ අපට නිල වශයෙන් අවස්ථාවක් තිබුණේ නැහැ. අවස්ථාවක් දෙන්න කියලා එතුමා හරහා අවසර ගන්නයි අපි ගියේ. එතුමා ඒ වෙලාවේ කිව්වා, "මම තමයි යන්න ඉන්නේ, හැබැයි, අපි වෙනුවෙන් එදාට යන්නේ නන්දා සිල්වා සහෝදරියයි. එම නිසා මම නන්දා සිල්වා සහෝදරියට කියන්නම්" කියලා. අවසානයේ එම ජලබදු විරෝධී සංවිධානයේ රැස්වීමට උපාලි ජයවීර සහෝදරයාත් එක්ක ගිහින් නිල නොවන හැටියට ශිෂ්‍ය ප්‍රශ්න කථා කළේ මම. උපාලි ජයවීර සහෝදරයා ජනතා විමුක්ති පෙරමුණේ හිටපු සහෝදරයෙක්. රැස්වීම ඉවර වෙනකොට මාව අත් අඩංගුවට ගන්න පොලීසිය ඇවිත් සිටියා. මම නන්දා සිල්වා මැතිනියත් එක්ක ගිහින් කාලෝ ෆොන්සේකා මැතිතුමාට තිබුණු ෆොක්ස්වැගන් රථයේ පිටුපස බිම හාන්සිවෙලා ගිහින් තමයි යාන්තම් පොලීසියෙන් බේරිලා එදා එළියට ආවේ. ඉන්දික ගුණවර්ධන මැතිතුමා නැවත වරක් මට හමුවුණේ මොනරාගලදීයි. මා ශිෂ්‍යයකු කාලයේ මගේ පියාත් එක්ක එතුමා ඉතාමත් කවිටු සම්බන්ධතාවක් තිබුණා. විශේෂයෙන්ම මොනරාගල පැල්වත්තේ ඉඩම් සමාගම්වලට දෙන සටනේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා පුරෝගාමියකුව සිටියා. එතුමා ඒ දවස්වල මොනරාගල ගිහින් පදිංචි වෙලා සිටියා.

මම පාර්ලිමේන්තුවට ආවාට පස්සේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා මාත් එක්ක ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කළා. මාත්, නාලන්ද එල්ලාවල මැතිතුමාත් සමහර වෙලාවට එතුමාගේ කාර්යාලයට ගිහින් පැය ගණන් දේශපාලනය ඉගෙන ගත්තා. නාලන්ද එල්ලාවල මැතිතුමා මේ ගරු සභාවේ මේ පැත්තේ ඉඳගෙන කථාවක් කරද්දී කිව්වා, " අපි සිංහල භාෂාවෙන් 'ශ්‍රී ලංකා මාතා' ගීය ගයනකොට, දෙමළ ජනතාවත් ඒ විධියට දෙමළ භාෂාවෙන් ජාතික ගීය ගයන දිනය කවදාද කියන එක

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

මගේ සිහිනයක්" කියලා. ඒක අහගෙන හිටපු ඉන්දික ගුණවර්ධන මැතිතුමා අපට කාමරයට එන්න කියලා නාලන්දට කිව්වා, "ඔයා සැබැවින්ම නන්දගේ පුතා"යි කියලා. "නන්දගෙ ප්‍රාර්ථනාව තිබුණේත් ඕකම තමයි" කියලා කිව්වා.

වරක් පාර්ලිමේන්තු සංචාරයක් තිබුණා. ඒ සංචාරයේදී ජර්මනියට යන්න නායකත්වය දුන්නේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා. මමයි, නාලන්දයි, එක්සත් ජාතික පක්ෂයේ හෙන්රි ජයමහ මහත්මයායි, දේවරාජ් මහත්මයායි අපි පස් දෙනා තමයි ගියේ. හෙන්රි ජයමහ මහත්මයායි, දේවරාජ් මහත්මයායි ටිකක් වයසක තලත්තැනි අය. මායි, නාලන්දයි එදා බොහොම තරුණයෝ. ඉන්දික ගුණවර්ධන මැතිතුමා ජර්මනිය ගැන ටිකක් දන්නවා. ඒ සංචාරයේදී නිදහස් වෙලාවන් ලැබුණාම ඉන්දික ගුණවර්ධන මැතිතුමා අපි දෙන්නාට කියනවා, "ඔය දෙන්නා මේ පාරෙන් දකුණු පැත්තට යන්න. වම් පැත්තට යන එක අපිට හොඳයි, දකුණු පැත්ත තමයි ඕගොල්ලන්ට හොඳ" කියලා. එතුමා අපට නායකත්වය දුන්නත්, සංචාරවලට සහභාගි වුණාම බොහොම නිදහසේ අපට කටයුතු කරන්න අවස්ථාව සලසා දුන්නා.

එතුමා හැම අවස්ථාවකදීම - පාර්ලිමේන්තුවේ කථා කරන අවස්ථාවලත් - මේ රටේ ජාතික සමගිය වෙනුවෙන් කථා කළා. 1988 පළාත් සභා මැතිවරණයට අපි ඉදිරිපත් වූ අවස්ථාවේ දී එතුමා ඉදිරිපත් නොවුණත්, පසුව එතුමා 1993 වර්ෂයේදී පළාත් සභා මැතිවරණයට තරග කළා. ඒ විතරක් නොවෙයි, කොළඹ දිස්ත්‍රික්කයේ පොදු ජන එක්සත් පෙරමුණු කණ්ඩායමට එතුමා විශාල ශක්තියක් වුණා. ඒ මැතිවරණය වෙනකොට දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ලා මහජන එක්සත් පෙරමුණෙන් වෙනම තරග කළා. එහෙම නේද? [බාධා කිරීමක්] 1994? Did you contest?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

No. we boycotted.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

එතුමන්ලා මැතිවරණය වර්ජනය කළා. එම නිසා දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ලාට ඡන්ද පදනමක් තිබෙනවා, මහරගමින් එහාට. ඒ ඡන්ද ටික පොදුජන එක්සත් පෙරමුණට ආවේ ඉන්දික ගුණවර්ධන මැතිතුමා අපේ ලැයිස්තුවෙන් තරග කළ නිසායි. මේ පාර්ලිමේන්තුවට 2000 වසරේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් ගෙනා අවස්ථාව මට මතකයි. එතුමා ඊට ඉස්සරින් දවසේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට ගිහින් කිව්වා, "ඔබතුමිය කළු සිංහල කාන්තාවක්. හැබැයි මේ රටේ සිංහල ජනතාවයි, දෙමළ ජනතාවයි, මුස්ලිම් ජනතාවයි ඔක්කොම එකතු වෙලා ජාතික ප්‍රශ්නයට විසඳුමක් සොයන්න මේක තමයි වාරය කියලා ඔබතුමිය කථාව පටන් ගන්න" කියලා.

ඒ යෝජිත ව්‍යවස්ථාව 2000දී පාර්ලිමේන්තුවට ගෙනා වෙලාවේ, එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුව ඇතුළේදී ඒක ගිනි තැබුවා. සියලු පක්ෂ සාකච්ඡා කරලායි ඒ ව්‍යවස්ථාව ගෙනාවේ. එදා ඒ ව්‍යවස්ථාව සම්මත කර ගත්තා නම් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, මටයි ඔබතුමාටයි අද උදේ, ඊයේ උදේ, පෙරේදා උදේ පාර්ලිමේන්තුවේ හතරවැනි තට්ටුවේ පැවති කමිටුවේදී වාද විවාද කර ගන්න වෙන්නේ නැහැ. එදා -2000දී- පැවැති විවාදයේදී ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඉතාම මැනවින් පැහැදිලි කළා, ඒ ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට තිබෙන අවශ්‍යතාව. අද චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා එදා එතුමා කළ කථාවෙන් උපුටා දක්වමින් කිව්වා, "එක්සත් ශ්‍රී ලංකාවක් තුළ මේ රටේ සියලු ජාතීන්ට ජීවත් වන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කර ගන්න ඕනෑ" කියා එතුමා කිව්ව බව. එතුමා, වචන එක්ක පැටලෙන්න ගියේ නැහැ; වචන එක්ක හරඹ කරන්න ගියේ නැහැ. මේ රටේ සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාවට එකට වැඩ කරන්න පුළුවන් පරිසරයක් හදන්න ඕනෑ කියා තමයි, හැම දාම පෙනී හිටියේ. එතුමා තම ප්‍රතිපත්තිවලින් බැහැර වුණා නම්, භාගදා එතුමාට දේශපාලනයෙන් මීට වඩා ඉස්සරහට යන්න තිබුණා.

ගරු සම්පන්දන් මැතිතුමාගේ වචනවලින්ම කිව්වා, "ජනාධිපතිවරණයට - Presidential Election එකට - තරග කරන්න එතුමාට ආරාධනා කළා" කියලා ගරු කථානායකතුමනි. ඒ කියන්නේ මේ රටේ දෙමළ ජනතාවගේ ප්‍රධාන බලවේගය විශ්වාස කළා, "ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වෙන්න සුදුස්සෙක්" කියලා. එක්සත් ජාතික පක්ෂයේ නොවන කෙනෙකුට "ජනාධිපතිකමට සුදුසුයි" කියලා එහෙම ලේසියෙන් ඒ අයගේ විශ්වාසය දිනා ගන්න පුළුවන් වෙන්නේ නැහැ. මෑත ඉතිහාසයේ ඒ විශ්වාසය දිනා ගත්තේ චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිතුමිය. ඊට පස්සේ ඒකත් නැති වුණා. [බාධා කිරීමක්] මම කියන්නේ, එක්සත් ජාතික පක්ෂයේ නොවන කෙනෙක්. මම කියන්න ගියේ ගරු කථානායකතුමනි, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ දේශපාලනය තුළ එතුමා හැම දාම ජාතික නිදහස හා ජාතික සමගිය වෙනුවෙනුත් පෙනී හිටියා, කෙළින් හිටගෙන.

ගරු කථානායකතුමනි, මේ රටේ දේශපාලන පරම්පරා ගැන කථා කරන කොට අපට ගුණවර්ධන පරපුර, සේනානායක පරපුර, බණ්ඩාරනායක පරපුර වාගේම සරත් අමුණුගම මැතිතුමාට අමතක වුණු රාජපක්ෂ පරපුරත් අමතක කරන්න බැහැ. ඒක අමතක වුණාද, හිතාමතා අමතක කළාද කියා මම දන්නේ නැහැ. නමුත්, රාජපක්ෂ පරපුරත් අමතක කරන්න බැහැ. ඒක තමයි ඇත්ත කතන්දරය. ඒ පරපුරවල් හතරම අපට දේශපාලන වශයෙන් පිළිගන්න පුළුවන් තත්ත්වයන් තිබුණත්, පිළිගන්න බැරි තත්ත්වයන් තිබුණත් මේ රටේ ඉතිහාසය පුරාම, මේ රටට විශාල සේවයක් කරපු පරපුරවල් හතරක්. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒක පිළිගත්තේ නැත්නම් ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ දේශපාලනයට ගරු කළා වෙන්නේ නැහැ.

ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා හැම දාම කෙළින් කථා කරපු කෙනෙක්. ඒ නිසා මේ වෙලාවේ ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය ගැන අපි ඇත්තටම ශෝක වනවා නම් ගරු කථානායකතුමනි, එතුමාගේ දේශපාලනය ඉගෙන ගන්නවා නම්, අපට ඉගෙන ගන්න තිබෙන්නේ, අධිරාජ්‍යවාදීන්ට මේ රටට ඇඟිලි ගහන්න තිබෙන ප්‍රධානතම ආයුධය තමයි ජාතීන් හැටියට, ආගම් හැටියට අපව බෙදන එක. ජාතිවාදය, ආගම්වාදය අපේ ඔළුවලට දාලා මේ රට බෙදීම තමයි, අධිරාජ්‍යවාදීන්ට පහසුම ක්‍රමය මේ රටට ඒගොල්ලන්ගේ අත පෙවීම් කරන්න. ඒ නිසා ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා ප්‍රාර්ථනා කරපු විධියටම සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාව අතර ජාතික සහජීවනය යම් ආකාරයක බලය බෙදා හදා ගැනීම තුළිනුත් -එතුමාගේ දේශපාලන දර්ශනය වුණෙත් ඒක.- අපට ඇති කරන්න පුළුවන් නම්, මම හිතන්නේ අද ඇත්තටම කටින් පමණක් නොවෙයි, ක්‍රියාවෙනුත් ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා වෙනුවෙන් ශෝක වුණා කියලා අපට කියන්න පුළුවන්.

පදනම් ආයතනයේදී පැවැති ගරු ඩිවි ගුණසේකර මැතිතුමාගේ පොත දොරට වැඩීමේ උත්සවයට මම ගියා. ඒ පොතේ තිබෙන

බොහෝ කරුණු දිහා බලන කොට අපට ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමන්ලා වැනි දේශපාලනඥයන්ගේ අවශ්‍යතාව මතු වනවා. අද අපි අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණ කරන මොහොතක පක්ෂ දේශපාලන කණ්ණාඩි පැත්තකට දාලා වැඩ කරන්න ඕනෑ යුගයක් කියන එක තව තවත් පසක් වෙනවා.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මා අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. පාර්ලිමේන්තුවේ අපි ආණ්ඩු පක්ෂයේ ඉන්න කොටත්, විරුද්ධ පක්ෂයේ ඉන්න කොටත් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදියෙක් හැටියට විශාල කාර්ය භාරයක් කළා, ඒ වාගේම කරමින් ඉන්නවා. එතුමාට අද ලැබිලා තිබෙන කාර්ය භාරයක් ලේසි පහසු නැහැ. මොකද, ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සියයට සියයක්ම පිළිනොගන්නා වූ සමහර අයත් ඉන්න බව හැසිරීම් විලාසයෙන් පෙනී යනවා. නමුත්, එතුමාට පුළුවන්කම ලැබිලා තිබෙනවා, හිටපු ජනාධිපතිතුමාත් සාමාජිකයකුව ඉන්න, හිටපු ගරු කථානායකතුමාත් සාමාජිකයකුව ඉන්න ඒකාබද්ධ විපක්ෂයේ නායකයා වෙන්න. එතුමා ඒකාබද්ධ විපක්ෂයේ නායකයා හැටියට, අද මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත් නායකයා මේ පාර්ලිමේන්තුව ඇතුළේ; හිටපු ගරු කථානායකතුමාගේත් නායකයා මේ පාර්ලිමේන්තුව ඇතුළේ. නිසා එතුමාටත් හැකියාව ලැබිලා තිබෙනවා, ඒකාබද්ධ විපක්ෂයේ අයගේත් හිත දිනාගෙන, ගරු අගමැතිතුමා ඇතුළු සම්මුතිවාදී ආණ්ඩුවේ ඉන්න අපි සියලු දෙනාගේත් සිත් දිනාගෙන කටයුතු කරන්න. ඒ නිසා ගුණවර්ධන පරපුරේ ශක්තියක් තිබුණා, කාගේත් සිත් දිනාගෙන කටයුතු කිරීමට.

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදියෙකු විධියට කටයුතු කිරීමට එතුමාටත් අවස්ථාව ලැබුණා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පියා වන පිලිප් ගුණවර්ධන මැතිතුමා, වැඩිමහල් සොහොයුරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා, ඒ වාගේම මේ ගරු සභාවේ ගරු කථානායකතුමාගේ ගැලරියේ අසුන් ගෙන සිටින ගීතාංජන ගුණවර්ධන මැතිතුමා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අපේ රට යුද්ධය ජයග්‍රහණය කළාට පස්සේ ජාත්‍යන්තරයෙන් විශාල ප්‍රශ්න ගණනාවක්ම ආවා. ඒ වේලාවේදී විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා හැටියට ගීතාංජන ගුණවර්ධන මැතිතුමා අපේ රටට මානව හිමිකම් කොමිසමෙන් ආපු සමහර චෝදනාවලට විරුද්ධව විශාල කාර්ය භාරයක් කළා. ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා කොළඹ නගර සභාවේ නගරාධිපති වුණේ එක්සත් ජාතික පක්ෂයෙන්. පිලිප් ගුණවර්ධන මැතිතුමා UNP ආණ්ඩුවේ හිටියා කියලා, එතුමා UNP ප්‍රතිපත්ති පිළිගත්තේ නැහැ. හැබැයි, එතුමා ඒ ආණ්ඩුව තුළ ඉඳගෙන මහජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති මත යම් සේවයක් කළා.

අපි දේශපාලන වශයෙන් එකිනෙකාගේ චරිතවලට මඩ ගහනවා වෙනුවට, අපි සැබවින්ම ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය ගැන ශෝක වෙනවා නම් කළ යුතු වන්නේ, එතුමා පිළිගත්තා වූ ජාතික නිදහස, ජාතික සහජීවනය කියන කාරණා පෙරදැරි කරගෙන කටයුතු කරන එකයි. අද ගරු කථානායකතුමාගේ ගැලරියේ එතුමාගේ ආදරණීය භාර්යාව ඉන්නවා. ඒ වාගේම එතුමාගේ පුත්‍ර රත්නයන් දෙදෙනෙක් ඉන්නවා. එක්කෙනෙක් මාත් එක්ක බොහොම හොඳින් විවිධ අවස්ථාවලදී කතා කරලත් තිබෙනවා. එතුමා ඉතා දක්ෂ තරුණයෙක්. එතුමාගේ අභාවය වෙනුවෙන්, ඒ දරුවන් දෙදෙනාටත්, ඒ වාගේම දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු පවුලේ සියලුම අයටත් මගේත්, මගේ පවුලේ ශෝකයත් ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම උසස් අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ ඌව පළාතට විශ්වවිද්‍යාලයක් ලබාදීමේ මූලික පුරෝගාමියා වුණේ එතුමා බව විශේෂයෙන්ම කියන්න ඕනෑ. අද එතුමා හිටියා නම්, වතුකරයේ ජනතාවටත් විශ්වවිද්‍යාලයක් ලබා දෙන්න අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. ඒ නිසා එතුමාගේ අභාවය වෙනුවෙන් ඌවේ ජනතාවගේ ශෝකයත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුවය ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්තුතියි.

මීළඟට, ගරු ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමා කථා කරන්න.

[අ.භා. 3.39]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ, සමසමාජ පක්ෂයේ අපට ඉන්දික ගුණවර්ධන සහෝදරයාගේ මරණය පිළිබඳ ශෝක ප්‍රකාශ කරන අවස්ථාවේදී ලංකා සමසමාජ පක්ෂයේ බහුතර කණ්ඩායම වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම ඉතාමත්ම සතුටු වෙනවා.

අප පක්ෂයේ නිර්මාතෘවරයෙකු වූ පිලිප් ගුණවර්ධන සහෝදරයාගේ වැඩිමහල් පුත් ඉන්දික ගුණවර්ධන සහෝදරයා ඉපදුණේ 1943 පෙබරවාරි 8වැනිදායි. ලංකා සමසමාජ පක්ෂයේ නායකයන් අධිරාජ්‍ය විරෝධී අරගලයට සම්බන්ධවීම හේතු කොටගෙන ඔවුන්ව සිර බාරයට ගනු ලැබුවා. පසු කාලයක බෝගම්බර සිර ගෙදර කඩාගෙන පිලිප් ගුණවර්ධන, ඇන්.ඇම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා, සහ එඩ්මන් සමරක්කොඩි යන සමසමාජ නායකයන් එළියට ගිහිල්ලා, ලංකාවේ තිබුණු තත්ත්වය ආරක්ෂිත නොවන නිසා පසු කාලයක නායකයන් බොහෝ දෙනෙක් ඉන්දියාවට ගියා. ඒ අවස්ථාවේදී, 1942දී පිලිප් ගුණවර්ධන මැතිතුමා සහ එතුමාගේ බිරිඳ වූ කුසුමසිරි ගුණවර්ධන මැතිනිය ද ඉන්දියාවට ගියා. බොම්බායේ ඔවුන් දෙදෙනා නොයෙකුත් අන්වර්ථ නම්වලින් පෙනී සිටිමින් ඉන්දියාවේ නිදහස් අරගලයට ද සම්බන්ධ වුණා. එහෙම ඉන්න කාලයේ වර්තමාන මහාරාෂ්ට්‍ර ප්‍රදේශයේ බොම්බායේ, මතුංගා කඳුකරයේ හින්දු ජනාවාසයක පිහිටි පායි නමැති දොස්තර මහත්මයාගේ රෝහලේදී තමයි, අමර ඉන්දික ගුණවර්ධන උපත ලැබුවේ. එතුමා ඉන්දියාවේ උපත ලබපු නිසා ඉන්දික කියන නම එතුමාගේ දෙමව්පියන් තැබුවා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී බර්නාඩ් සොයිසා සහෝදරයා මට දවසක් කිව්වා, කුඩා දරුවන් එක්තරා වයසකට ආවාම පළමුවැනි වරට ඉර පෙන්වන සම්ප්‍රදායයක් බොම්බායේ මහාරාෂ්ට්‍ර ප්‍රදේශයේ තිබෙනවා කියලා. ඒ සම්ප්‍රදායට අනුව, එතුමා කුඩා අවධියේදී වඩාගෙන ගිහිල්ලා ඉර පෙන්වලා තිබෙන්නේ බර්නාඩ් සොයිසා මැතිතුමායි. 1943 ජූලි 15 වෙනිදා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ගුණවර්ධන යුවල අත් අඩංගුවට ගෙන බොම්බායේ සිරගත කළා. නැවත ලංකාවට එන තුරු, අනෙකුත් දේශපාලන නායකයන් සහ සිය මව සමඟ මාස ගණනක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ සිර මැදිරියේ ගත කිරීමට ඉන්දික ගුණවර්ධන ළඳරුවාට ද සිදු වුණා.

ඉන්දික ගුණවර්ධන මැතිතුමා කුඩා අවධියේ සිටම දේශපාලනයට සම්බන්ධව සිටියා. ඔහු කුඩා දරුවෙක් හැටියට ඔහුගේ මුල්ම අවධියේ දී දේශපාලනය ඉගෙන ගත්තේ, අධිරාජ්‍යවාදී හිර ගෙදරක ඉඳගෙනයි. පසු කලෙකදී, ඔහුගේ මවට පමණක් සිර භාරයෙන් නිදහස් වෙලා ලංකාවට එන්න පුළුවන්කම

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

ලැබුණා. ඉන්පසු, අපට නිදහස ලැබෙන්න ඉස්සරවෙලා -ලෝක යුද්ධය අවසන් වුණාට පසුව- පිලිප් ගුණවර්ධන මැතිතුමා ලංකාවට ඇවිල්ලා 1947දී පැවැති මැතිවරණයෙන් අවිස්සාවේල්ල ආසනය ජය ගත්තා. එහෙත්, බස් වර්ජනයකට සම්බන්ධ සිද්ධියක් හේතුකොටගෙන මාස 3ක් වැනි කෙටි කාලයක සිර දඬුවමක් එතුමාට විඳීමට සිදු වුණා. ඒ හේතුවෙන්, ඒ කාලයේ තිබුණු නීතිය අනුව පාර්ලිමේන්තුවේ අසුන එතුමාට අහිමි වුණා. ඒ සඳහා පැවැති පාර්ලිමේන්තු අතුරු මැතිවරණයට පෙර ඉන්දික ගුණවර්ධනගේ මව වන කුසුමා ගුණවර්ධන මැතිනිය පත් වුණේ නිතරගයෙන්. ඒ නිසා අතුරු මැතිවරණයක් තිබුණේ නැහැ. ඉන්පසු, එතුමිය 1960 වර්ෂය වනතෙක් අවිස්සාවේල්ල සහ කිරිඇල්ල ආසන දිගටම නියෝජනය කළා. පිලිප් ගුණවර්ධන මැතිතුමා, 1970 වර්ෂය වනතෙක් එම අවිස්සාවේල්ල ආසනයම නියෝජනය කළා. ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ මව්පියන් දෙදෙනාම ලංකා සම සමාජ පක්ෂයේ ක්‍රියාකාරී දේශපාලනයේ නිරතවූවන්. ඒ අනුව, ඉන්දික ගුණවර්ධන මැතිතුමා ද නිරායාසයෙන්ම සම සමාජ දේශපාලනයට ඇදී ගියා.

ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ මුල්ම පාසල වුණේ කොල්ලුපිටිය මෙතෝදිස්ත විද්‍යාලය. ඒ කාලයේ සම සමාජ කාර්යාලය පිහිටා තිබුණේ, ඒ පාසලට බොහොම සමීපයි. එම නිසා, පාසල ඇරිලා සම සමාජ කාර්යාලයට කුඩා දරුවෙක් හැටියට එදා දිව ගිය ඉන්දික ගුණවර්ධන සිය පියා සමඟ පියාගේ දේශපාලන කටයුතුවලට සහයෝගය දෙමින් කටයුතු කළා. එතුමා සම සමාජ ලාංඡනය පැලඳ, පෙළපාළි සහ රැස්වීම්වලට සහභාගී වුණා. ඒ වාගේම, ජාත්‍යන්තර කම්කරු ගීතය උස් හා රළු හඬින් ගායනා කිරීමට පුරුදු වුණේ, එතුමාගේ කුඩා කාලයේ සිටයි. මෙතෝදිස්ත විද්‍යාලයෙන් පසුව තර්ස්ටන් විද්‍යාලයට කෙටි කාලයකට ගිය ඉන්දික පස්වන ශ්‍රේණියේ විභාගයෙන් සමත් වී රාජකීය විද්‍යාලයට ඇතුළත්ව එහි වැඩි දුර අධ්‍යාපනය හැදෑරුවා. එහිදී එතුමා දේශපාලනය පමණක් නොවෙයි, විවිධ කාරණා පිළිබඳව හැදෑරුවා. සාහිත්‍ය කණ්ඩායම්වල කටයුතු කළා, පෙරදිග සංගීත කණ්ඩායම්වල කටයුතු කළා. ගුවන් විදුලි වැඩ සටහන්වලට සම්බන්ධ වුණා. සිංහල සාහිත්‍ය සංගමයට සම්බන්ධ වී පාසල් විවාද කණ්ඩායමේ කටයුතු කළා. පාසල් වේදිකාවේ විවිධ චරිත රඟපෑවා. පසු කාලෙක සර්වෝදය ව්‍යාපාරයේ නායකයන් සමඟ ශ්‍රමදාන කඳවුරුවලට ද එතුමා සහභාගී වුණා.

1956 වර්ෂයේ සිදු වූ ආණ්ඩු පෙරළිය තරුණ ඉන්දික ගුණවර්ධනයන්ට බලපෑවා. පසුව, එතුමා ජාතික ඇදුම ඇඳගෙන රාජකීය විද්‍යාලයේ ඉගෙන ගත්ත ප්‍රථම ශිෂ්‍යයා බවට පත් වුණා; ශිෂ්‍ය නායකයෙක් බවටත් පත් වුණා. එතුමා ඒ කාලයේ සිටම දේශපාලන කටයුතුවල යෙදී සිටියා. පසු කාලෙක වැඩි දුර අධ්‍යාපනය සඳහා ඉන්දික ගුණවර්ධන නැහෙනහිර ජර්මනියට ගියා. ඒ කාලයේ තිබුණ ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් ජනරජයට ගිහිල්ලා ලයිප්සිග් නුවර විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්තා. ඔහුගේ උපාධියේ නිබන්ධනයට අදාළ කර ගත්තේ, "රාජ්‍ය ගොවිපොළවල ලාභය"යන මාතෘකාවයි. එහිදී ලාභය පිළිබඳ මාක්ස්වාදී ආර්ථික විද්‍යාවේ මූලධර්ම ගැඹුරින් හදාරන්නට ඉන්දික ගුණවර්ධනයන්ට අවස්ථාව ලැබුණා. එතුමා ලයිප්සිග් විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ, එම විශ්වවිද්‍යාලයේම වෛද්‍ය ශිෂ්‍යාවක් වන පද්මිණී ගුණවර්ධන මැතිනියව මුණ ගැසුණා. ගරු කථානායකතුමනි, පෞද්ගලික කාරණාවක් සම්බන්ධව කියන්න ඔබතුමා මට අවසර දෙනවා නම්, මම කියන්න කැමැතියි පද්මිණී ගුණවර්ධන මැතිනිය මගේ ඥාතිවරියක් බව.

මහනුවර උඩිස්පත්තුව තමයි මගේ උපන් ගම; මා හැදී වැඩුණු ගම. උඩිස්පත්තුවේ තමයි පද්මිණී ගුණවර්ධන මැතිතුමියගේ පරම්පරාවත් ජීවත් වුණේ. ඒ සියලු දෙනා දකුණ ප්‍රදේශයෙන් ගිය අයයි. දකුණින් ගිය අයයි එහේ ජීවත් වුණේ. පසු කාලයක ඔවුන් මහනුවරට ගිහින් මා පසුව ඉගෙනගත්, කටුගස්තොට පාරේ පිහිටි ශාන්ත අන්තෝනි විද්‍යාලයට බොහොම සමීපව නිවසක් හදාගෙන එහි පදිංචි වුණා. ලංකාවට ආවාට පසුව තරුණ ඉන්දික ගුණවර්ධන, පද්මිණී ගුණවර්ධන මැතිනිය සමඟ විවාහ වුණා. ඒ උත්සවය තිබුණේ කටුගස්තොට පාරේ නිවසේයි. මගේ දෙමව්පියන් ඒ විවාහ උත්සවයට ගිහින් ඇවිත් කිව්වා මට අද වාගේ මතකයි, "විවියනුත් ඇවිල්ලා සිටියා" කියා. "විවියන් ගුණවර්ධන" කියන්නේ නැන්දායි. "විවියනුත් මහුල් ගෙදර ඇවිත් සිටියා" කියා බොහොම ආඩම්බරයෙන් වාගේ මගේ දෙමව්පියන් මට කිව්වා මතකයි. ඉන්දික ගුණවර්ධන මැතිතුමා ලංකාවට ඇවිත් මහ බැංකුවේ පර්යේෂණ අංශයේ ග්‍රාමීය ණය පර්යේෂණ නිලධාරියකු ලෙස කටයුතු කළා. ඒ අතරතුර වුණත් එතුමා දේශපාලනය අත් හැරියේ නැහැ. "අජිත්" කියන අන්වර්ථ නාමයෙන් "නවලෝක" සඟරාවට ලිව්වා. ලාංකික ධනපති පන්තිය, ඉඩම් හිඟයෙන් පෙළුණු ගොවි ජනතාව අධිරාජ්‍යවාදී ව්‍යාපාරයට එක් වීම වළක්වා තමා වෙත නැඹුරු කර ගැනීමට ඉදිරිපත් කළ නිදහස් ගොවි පරපුරක් බිහි කිරීමේ න්‍යායෙහි සදොස් බව ඔහු හෙළිදරවු කළා.

ගරු කථානායකතුමනි, ඉන්දික ගුණවර්ධන තමන්ගේ දේශපාලනය පටුලේ දෙමව්පියන්ගේ දේශපාලනයෙන් ස්වාධීනවයි කළේ. එම නිසාම තම පියාගේ දේශපාලනයට විරුද්ධව 1960 ගණන්වල අන්තිම භාගයේදී එතුමා කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ වුණා. ඒ කාලයේ පිලිප් ගුණවර්ධන මැතිතුමා එදා තිබුණු ජාතික රජයේ ඇමතිවරයෙක්. එහෙත් ඉන්දික ගුණවර්ධන ඒ මඟ ගියේ නැහැ. එතුමා කොමියුනිස්ට් ව්‍යාපාරයට, කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ වුණා. 1970 මැතිවරණයේදී සමඟි පෙරමුණ රජය පිහිටුවපු වෙලාවේ එතුමා රැකියාවෙන් අස් වෙලා කොමියුනිස්ට් පක්ෂයේ පූර්ණ කාලීන දේශපාලනඥයකු හැටියට කටයුතු කළා. 1970 අප්‍රේල් 02වන දා "ඇත්න" පත්‍රයේ මුල් පිටුවේ ප්‍රධාන සිරස්තලය වුණේ, "පිලිප්ගේ පුතා අපේ පැත්තට. රක්ෂාවත් දමා එයි." කියන එකයි. කොමියුනිස්ට් පක්ෂයට බැඳීම සම්බන්ධයෙන් ඉන්දික ගුණවර්ධන මැතිතුමා ප්‍රකාශයක් කර කිව්වා, ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයකු වශයෙන් මේ රටේ අධිරාජ්‍ය විරෝධී හා සමාජවාදී ව්‍යාපාරය සඳහා සම්පූර්ණ කාලය යෙදවීමට තීරණය කළ බව. එදායින් පසුව ඔහු කිසිම දවසක රැකියාවක් කළේ නැහැ, ඉහළ සුදුසුකම් තිබුණත්. සමඟි පෙරමුණේ රට පුරා පැවැති රැස්වීම්වල ප්‍රධාන කථිකයකු වූයේ ඉන්දික ගුණවර්ධනයි. පිලිප් ගුණවර්ධන මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ සහාය ඇතිව මහජන එක්සත් පෙරමුණෙන් මැතිවරණයට ඉදිරිපත් වූ නිසා තරුණ ඉන්දික ගුණවර්ධන අවිස්සාවේල්ලේ ගිහින් පියාට විරුද්ධව campaign කළේ නැති බව මට හොඳින්ම මතකයි. එහෙත් අනෙක් පළාත්වලදී එතුමා අපේ මැතිවරණ ව්‍යාපාරයට සම්බන්ධ වුණා. පිලිප් ගුණවර්ධනගේ පුතා වූ නිසාම ඔහුට විශාල ආකර්ෂණයක් තිබුණා. ඊට පසුව කොමියුනිස්ට් පක්ෂයත් ඒ ආණ්ඩුවට සම්බන්ධ වුණා.

ගරු කථානායකතුමනි, 1971 කැරැල්ලෙන් පසුව ඇති වූ තත්ත්වයන් පිළිබඳව ඉන්දික ගුණවර්ධන මැතිතුමා බෙහෙවින් කනගාටුවට පත් වුණා. එය මර්දනය කළ ආකාරය පිළිබඳව, එහිදී ඇති වූ මානව හිමිකම් ප්‍රශ්න පිළිබඳව ඔහු වෙනස් මතයක් දැරුවා. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු ප්‍රකට නීතිවේදීන්, විද්වතුන් සහ ආගමික නායකයන් සමඟ එකතු වී මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටියා. ඒ තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීමට, ඔවුන් නිදහස් කරගැනීමට ඔහු කැපවුණා.

ගරු කථානායකතුමනි, එතුමා වෘත්තීය සමිති ක්ෂේත්‍රයේත් - විශේෂයෙන් සංස්ථා අංශයේ- කටයුතු කළා. සංස්ථා අංශයේ එවකට ප්‍රබල වෘත්තීය සමිතියක්ව තිබූ "ලංකා රාජ්‍ය සංස්ථා සේවක සමිතියේ" පළමුවන නායකයා වුණා. 1977 මැතිවරණයෙන් පසුව එතුමා මානව හිමිකම් පිළිබඳ කාරණාවලදී කැපී පෙනුණා; මානව හිමිකම් සුරැකීමේ සංවිධානවලට සම්බන්ධ වුණා. රෙජී සිරිවර්ධන, ලයනල් බෝපගේ, සුනිලා අබේසේකර, නීලම් තිරුවෙල්වම් ආදි අයත් එක්ක මානව හිමිකම් කටයුතුවලදී වැඩ කළා. 1980 මහා වැඩ වර්ජනයෙන් පසු, එහි ප්‍රතිඵලයක් ලෙස කෙරුණු කම්කරු අයිතීන් සහ මානව අයිතීන් පාගා දැමීමට විරුද්ධව, හිංසනයට සහ ජාතිවාදයට විරුද්ධව ඉන්දික පෙරමුණ ගෙන කටයුතු කළා.

ජාතීන් අතර යුක්තිය හා සමානාත්මතාව සඳහා වූ ව්‍යාපාරයේ මුල් කාලයේ -1984 වර්ෂයේ- ලේකම් වුණේ ඉන්දික ගුණවර්ධන මහතායි. එතුමා රටේ නොයෙක් පළාත්වලට ගිහින් ජාතිවාදයට විරුද්ධව කථා කළා; සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර සමඟිය පිළිබඳව කථා කළා. එතුමා ඒ වෙනුවෙන් පෙනී සිටියා. ඉන් පසුව 1985 වර්ෂයේදී ජේ.ආර්. ජයවර්ධන රජය විසින් එතුමා අත් අඩංගුවට ගනු ලැබුවා. එතුමා කොමියුනිස්ට් පක්ෂයෙන් වෙන් වෙලා ජයතිලක ද සිල්වා වැනි අයත් එක්ක වෙනම කණ්ඩායමක සිටියා. ඒ කාලයේ එතුමා මාස කිහිපයක් රෝහල්ගත කරලාත් සිටියා; ඒ වාගේම නිවාස සිර අඩස්සියේත් සිටියා. හදිසි නීතිය යටතේ අවුරුදු එකහමාරක පමණ කාලයක් එසේ සිටි එතුමාට විරුද්ධව නඩු පැවරුවා. නමුත් ඉන්දු-ලංකා ගිවිසුම ඇතිවීමත්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කිරීමත් සමඟම ඒ සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කරන්නට එවකට පැවැති රජය තීරණය කළ නිසා එතුමාට එළියට එන්නට පුළුවන් වුණා. එතුමා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, බලය බෙදා හැරීමට, ප්‍රතිපත්තියක් හැටියට සහයෝගය දීලා පසුව නැවත ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සමඟ සම්බන්ධ වුණා.

1993 වර්ෂයේ පැවැති පළාත් සභා මැතිවරණයේදී බස්නාහිර පළාත් සභාවට එතුමා කොළඹ දිස්ත්‍රික්කයෙන් පත් වුණේ, හැත්තැනවදහස් නවසිය දහයක් වැනි විශාල මනාප සංඛ්‍යාවක් ලබමිනුයි. බර්නාඩ් සොයිසා මහතා පළමුවැනි තැන ලබා සිටියා. එතුමාගෙන් පසුව වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා ගනිමින් දෙවැනි ස්ථානයට පැමිණ සිටියේ ඉන්දික ගුණවර්ධන මැතිතුමායි. 1994 වර්ෂයේ පැවැති මහ මැතිවරණයේදී ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයා ලෙස කොළඹ දිස්ත්‍රික්කයෙන් පත් වුණු ඉන්දික ගුණවර්ධන මහතා මනාප පනස්අටදහස් හත්සිය පනස්තුනක් ලබමින් පාර්ලිමේන්තුවට ඇතුළු වී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග රජයේ ධීවර සහ ජලජ සම්පත් ඇමතිවරයා හැටියට කටයුතු කර විශාල සේවයක් ඉටු කළා. පසුව 1997 වර්ෂයේදී නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ ඇමතිවරයා හැටියට කටයුතු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමා කිව්වා වාගේ එතුමා වනාතමුල්ලේ තට්ටු නිවාස හැදීම පිළිබඳව විශාල සේවයක් සිදු කළා. එක්තරා විධියකට ලංකා සමසමාජ පක්ෂයට අයිතියක් තිබෙනවා, ඒ සම්බන්ධයෙන් කථා කරන්න. මොකද, ඒ කාලයේ ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා බොරැල්ල ආසනය නියෝජනය කළා. මම හිතන්නේ ඒ කාලයේ බොරැල්ල තිබුණේ, එක් මැතිවරණ කොට්ඨාසයක් හැටියටයි. වනාතමුල්ලේ තිබුණු නිවාස ප්‍රශ්නය විසඳන්න ඒ කාලයේ ඇන්. එම්. පෙරේරා මහතා උත්සාහ කළා. මෙවැනි තට්ටු නිවාස හදන්න ඕනෑය කියා මුල් කාලයේ එතුමා යෝජනා කළාම, ඇත්තටම එම පැල්පත්වල සිටි ජනතාවගෙන් පවා එතුමාට සහයෝගයක් ලැබුණේ නැහැ. ඔවුන් විරුද්ධ වුණා. පසු කාලයක එම ජනතාවගේ කැමැත්ත ඇතුව එම කාරණය සම්පූර්ණ කරන්න ඉන්දික ගුණවර්ධන මැතිතුමාට පුළුවන්කම ලැබුණා. 2000 වර්ෂයේදී එතුමා උසස් අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ සංවර්ධන ඇමතිවරයා හැටියට කටයුතු කළා. පසුව, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිවරයා හැටියටත් කෙටි කාලයක් කටයුතු කළා.

ගරු කථානායකතුමනි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඉපදුණේ, සාම්ප්‍රදායික මතවලට එරෙහිව යමින් යටත්විජිත වැඩවසම් ක්‍රමයට එරෙහිව අරගළ සිදු වුණු වකවානුවකයි. සාම්ප්‍රදායික ආගම්, කුල, පවුල්, පක්ෂවලට සීමා නොවී, කොටු නොවී කටයුතු කරන්නත් එතුමාට පුළුවන් වුණා. එම සීමා අභිභවා ගිය දේශපාලනයක් සහ සමාජ පැවැත්මක් එතුමාට තිබුණා. එතුමා සැබෑ ජාත්‍යන්තරවාදියෙකු වුණා. කුල භේදය කුඩා කල සිටම නොඉවසූ එතුමා පොදුජන සමඟිය හා මානව අයිතිවාසිකම් සුරැකීමට නිතරම ඉදිරිපත් වුණා. සීමාවන් තුළ කොටු නොවූ එතුමාගේ දේශපාලන දිවිය ඉදිරියට රැගෙන ගියේ, විවිධ බාධක සහ ගැටුම් මැදයි. නමුත් එම බාධක අභිභවා යන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. එක්සත් ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම එතුමාගේ එකම අභිප්‍රාය වුණා.

මට මතකයි, 2000 වර්ෂයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු කිරීමට කටයුතු කළ කාලය. 1995 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා ඇති වුණු බලය බෙදා හැරීම පිළිබඳ සුප්‍රසිද්ධ කතිකාවේදී, "The Devolution Debate" එකේදී, එතුමා ඉතාම ක්‍රියාකාරිව එයට සම්බන්ධ වුණා. අපිට 2002 වර්ෂයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න බැරි වුණා. මට අද වාගේ මතකයි, 2002 වර්ෂයේ ජූලි මාසයේදී එතුමා අපේ නිවසට පැමිණියා. ඒ ආවේ මගේ බිරිඳගේ අවමඟුලට සහභාගි වෙන්නයි. එතකොට අප විපක්ෂයට ගිහින්. "ජයම්පති, අපට දෙදාහේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරගන්න බැරි වුණා, දැන් තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂ රජයක්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපතිනියයි. ජාතික ගැටලුව විසඳා ගන්න මේ වාගේ හොඳ අවස්ථාවක් නැවත එන්නේ නැහැ. එම නිසා අපි දේශපාලන භේදයෙන් තොරව මෙයට විසඳුමක් සෙවීමට සහයෝගය දිය යුතුයි" කියා එදා එතුමා මට කිව්වා. එතුමා කියපු දෙය මට අද වාගේ මතකයි. එතුමා කිසිම දවසක ජාතිවාදයට යට වුණේ නැහැ. අද එතුමා සිටියා නම් අප මේ ඉදිරියට රැගෙන යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට ඉතාම ධනාත්මකව සම්බන්ධ වෙනවාට කිසිම සැකයක් නැහැ. එතුමා සාමාජිකත්වය දැරූ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය අද මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුත්තට ධනාත්මකව සම්බන්ධ වන ආකාරය පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා. තමන් ඊනියා වාමාංශිකයි කියා ගන්නා සමහරු ඉතාම ජාතිවාදී කොටස් සමඟ එකතු වෙලා වැඩ කරන වෙලාවක, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා දේශපාලනය කළ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ඊට වඩා වෙනස් මඟක් ගනිමින්, අද මේ රටේ ධනාත්මක ව්‍යවස්ථා වෙනසකට සම්බන්ධ වන බවට ලකුණු පෙනෙන්න තිබෙනවා. එය ඉතාම හොඳ ලකුණක්. මා හිතන විධියට ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාට කළ හැකි ලොකුම ගෞරවයද එයයි.

අවසාන වශයෙන්, එතුමාගේ අභාවය පිළිබඳව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ සහෝදරවරු සියලු දෙනාටමත්, අප සමඟ සිටින දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට, ඒ වාගේම ගීතාංජන ගුණවර්ධන මැතිතුමාට, එතුමාගේ මස්සිනා වන මා මිත්‍ර, හිටපු නියෝජ්‍ය පොලිස්පති ගාමිණී ගුණවර්ධන මැතිතුමා ඇතුළු ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ දරුවන් දෙදෙනා සහ ඒ පවුලේ සියලු දෙනාට, ලංකා සම සමාජ පක්ෂයේ බහුතර කණ්ඩායමේත්, පෞද්ගලිකව මගේත් ශෝකය පිරිනමමින්, ගරු ඉන්දික ගුණවර්ධන සහෝදරයාගේ නාමයට අපේ විප්ලවීය ආචාරය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.59]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, හිටපු අමාත්‍ය ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේ මට මෙන්න මේ සිද්ධිය සිහිපත් වෙනවා. 1991දී මම ප්‍රථම වතාවට දේශපාලනයට ප්‍රවේශ වෙමින් ප්‍රාදේශීය සභා මැතිවරණයකට ඉදිරිපත් වුණා. ඒ අවස්ථාවේ එම ප්‍රාදේශීය සභා කණ්ඩායම දිනවන රැස්වීමක් තිබුණා. ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා එතැනට ඇවිත් ඉතාම ඉහළ ගණයේ කථාවක් කළා. ඒ වාගේම අපේ කණ්ඩායමට ශක්තියක් ලබා දුන්නා. එදා තමයි එතුමා සජීවීව දැක ගන්න මට පුළුවන්කම ලැබුණේ. ඊට පසුව වරින් වර එතුමා පිළිබඳව පළ වූ පුවත් පත් වාර්තා, එතුමාගේ දේශපාලන කථා අසන්නට දකින්නට ලැබුණා. ඒ වාගේම ඒ පවුල පිළිබඳවත් අප තුළ දිගින් දිගටම විශාල අවධානයක් තිබුණා; අවබෝධයක් තිබුණා. විශේෂයෙන්ම කුසුමා ගුණවර්ධන මැතිනියගේ උපන් ගම අපේ මැතිවරණ කොට්ඨාසයේ, තංගල්ල ප්‍රදේශයයි. ඒ වාගේම එතුමාගේ ඥාතීන් විශාල සංඛ්‍යාවක් හම්බන්තොට දිස්ත්‍රික්කය පුරා නියෝජනය වෙනවා. ඒ නිසාම මේ පවුල පිළිබඳව අපට විශේෂ ඇල්මක් තිබුණා.

ගරු කථානායකතුමනි, ඊට පසුව එතුමා මට නැවත වතාවක් මුණ ගැහෙන්නේ මම පළමු වතාවට පාර්ලිමේන්තුවට ප්‍රවේශ වන කොට, 1994දියි. එවිට එතුමා ඉතාම පරිණත දේශපාලනඥයෙක් විධියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ කාලය පුරාවට එතුමා ඉතාම හරවත් කථා කළ පාර්ලිමේන්තුවේ විශේෂ කථිකයෙක් බව මා පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාටත්, අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට වාගේම ඉතාම වේගවත්, ඉතාම ගැඹුරු කට හඬක් තිබුණා. එතුමා පාර්ලිමේන්තුවේ කථා කරන කොට අප හැමෝම ළං වෙලා එතුමාගේ කථා අහගෙන හිටියා. ආධුනිකයෝ විධියට මේ පාර්ලිමේන්තුවට පළමුවෙන්ම එන කොට මේ ජාතික ප්‍රශ්නය වැනි දේවල් පිළිබඳව ඇත්තටම අපට ලොකු අවබෝධයක් තිබුණේ නැහැ. නමුත්, එතුමා කළ පළමුවැනි කථාවේ ඉඳලාම ජාතික ප්‍රශ්නය පිළිබඳව විශාල අවබෝධයකින් කථා කළා විතරක් නොවෙයි, පාර්ලිමේන්තු කථාවෙන් ඔබ්බට ගිහින් මුණගැහුණු හැම වෙලාවේම කළ සාකච්ඡාවලදීත් අපට පෙනී ගියා, මේ රටේ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාවට එක හා සමානව ජීවත් වීමේ අයිතිවාසිකම් ලැබෙන්න ඕනෑය කියන මතයේ එතුමා හිටිය බව. හැම වෙලාවේම එතුමාගේ තිබුණේ යුද මානසිකත්වයක් නොවෙයි. සියලු ජන කොටස් සමඟ සහයෝගයෙන් සිටිය යුතුයි කියන මානසිකත්වයක් තමයි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා තුළ තිබුණේ. ඒ පවුලේ දේශපාලන වටපිටාව පිළිබඳව මට පෙර කථා කළ කථික මහත්වරුන් අදහස් ඉදිරිපත් කරන්න ඇති.

විශේෂයෙන්ම හිටපු කථානායකතුමා කථා කළ බව මට දැන ගන්න ලැබුණා. රාජපක්ෂ පවුල පිළිබඳවත්, රාජපක්ෂ පවුලේ කටයුතු පිළිබඳවත් විශාල සම්බන්ධයක් ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඇතුළු ඒ ගුණවර්ධන පවුලේ තිබුණු බව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉපදුණු කෙනෙක් විධියට මා හොඳටම දන්නවා. සෑම වැදගත් අවස්ථාවකදීම ඒ පවුලේ නියෝජනයක් අනිවාර්යයෙන්ම තිබුණා.

ඉන්දික ගුණවර්ධන මැතිතුමා දේශපාලන කාර්යයන් ඉතා විශිෂ්ටව සිදු කළා වාගේම එතුමා 1994 ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා විධියට -අද මා නියෝජනය කරන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විධියට- විශාල කාර්ය භාරයක් මුළු ධීවර ප්‍රජාවටම කළ බව මා ඉතාමත් පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. එතුමා, ඉතාමත් අවංක දේශපාලනඥයෙක්. කවදාවත් එතුමාට විරුද්ධව වංචාවක්, දූෂණයක් පිළිබඳව අහන්න ලැබුණේ නැහැ. මේ අමාත්‍යාංශය නියෝජනය කරන අමාත්‍යවරයා විධියට මට අදත් බය නැතුව ඒ බව කියන්න පුළුවන්. එතුමා ඇමති ධුරයේ හිටපු කාලයේ ඉඳපු සේවකයන් -බොහෝ පැරණි සේවකයන්- අපේ අමාත්‍යාංශය තුළ තවමත් කටයුතු කරනවා. ඉතාමත් පිරිසිදු දේශපාලනඥයෙක් වාගේම ඉතාමත් පිරිසිදු අමාත්‍යවරයෙක් විධියට ඒ අය ඉන්දික ගුණවර්ධන මැතිතුමා පිළිබඳව ඉතාමත් ගෞරවයෙන් අදත් සිහිපත් කරනවා. එතුමා ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යයන්වලදී, ඒ ජනතාව සිටින ප්‍රදේශවලට ගිහිල්ලා ඒ කටයුතු පිළිබඳව ප්‍රායෝගික සොයා බලමින් කටයුතු කළා.

එතුමා ධීවරයෙක් නොවෙයි. ධීවර පවුලක සාමාජිකයෙක් නොවෙයි. එතුමා ඒ අමාත්‍යාංශයේ කටයුතු කරමින් පෙන්වූවා, තමන්ට භාර දෙන ඕනෑම කටයුත්තක් කිරීමේ හැකියාව තමන්ට තිබෙනවා කියලා. ඒක තමයි විශේෂත්වය. එතුමා ඒ පිළිබඳව විශාල අවබෝධයක් ලබා ගත්තා. ධීවර ක්ෂේත්‍රයටම ආවේණික වුණු, ඒ පරම්පරාගත අයගේ දැනීම වාගේම ඒ ක්ෂේත්‍රයේ ඉඳපු විශේෂඥයන්ගේ දැනුම අරගෙන කටයුතු කරන්නත් එතුමා අමතක කළේ නැහැ. ඒ නිසා තමයි ධීවරයන් තුළත්, ඒ සේවකයන් තුළත් එතුමා පිළිබඳව අදටත් ඒ ගෞරවය ඇති වෙලා තිබෙන්නේ.

ඉන් පසුව, එතුමා නිවාස, නාගරික සංවර්ධන ඒ වාගේම ජලසම්පාදන කියන විෂයයන්හි අමාත්‍යවරයා විධියට කටයුතු කළා. ඒ කාලය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිවාස ප්‍රශ්නය විසඳන්න ඒ වාගේම ජල ප්‍රශ්නය විසඳන්න විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා වාගේම රට පුරාම ඒ වැඩ පිළිවෙළ දියත් කරන්න එතුමා අමතක කළේ නැහැයි කියන එක ඉතාමත් පැහැදිලිව අපි දන්නවා. කොළඹ නගරයේ නාගරික සංවර්ධන කටයුතු වාගේම අනෙකුත් නගර සංවර්ධනය කරන්න එතුමා විශාල කැපවීමක් කළා. භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව කියලා විහාරස්ථානවලට උදවු කරන අංශයක් ඒ අමාත්‍යාංශය යටතේ තිබුණා. ඒ හරහා ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම් ලබන විහාරස්ථානවල තිබෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කරලා ඒ ගැටලුවලට විසඳුම් ලබා දෙන්න එතුමා කටයුතු කළා. ඉතාමත් පැරණි ඒ වාගේම රජමහා විහාරස්ථානවල ඒ අත්‍යාවශ්‍ය කටයුතු වාගේම පෞරාණික දේවල් ආරක්ෂා කර ගැනීම සඳහා එතුමා විශාල වැඩ පිළිවෙළක් සකස් කළ බව මා සඳහන් කරන්න කැමැතියි.

අපි අහලා තිබෙන විධියට එතුමා පාසල් අවධියේ ඉඳලාම ජාතික ඇදුමට ඇලුම් කළ පුද්ගලයෙක්. තරුණයෙක් විධියටත්, ශිෂ්‍යයෙක් විධියටත් ජාතික ඇඳුමට ගරු කළා විතරක් නොවෙයි, ඒ ඇඳුමට සරිලන ආකාරයෙන් හැසිරෙන්න ඒ වාගේම කටයුතු කරන්න අමතක කළේ නැති නායකයෙක් විධියට අපි අහලා තිබෙනවා. රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය ලැබුවත් එතුමා ඒ පාසලට යන කොටත් ජාතික ඇඳුමෙන් තමයි පාසල් අධ්‍යාපනයට ප්‍රවේශ වෙලා තිබෙන්නේ. එතුමා මේ රටේ විතරක් නොවෙයි, විදේශ රටවලදී පවා තමන්ගේ ජාතිකත්වය ප්‍රදර්ශනය කරන්න, විභිදුවන්න කටයුතු කළ බව අපි ඉතාමත් හොඳින් දන්නවා.

1994 "පොදුජන එක්සත් පෙරමුණ" රජය බිහිවෙන කොට එහි ප්‍රධාන ක්‍රියාකාරිකයෙක් බවට පත් වෙන්නේ ඉන්දික ගුණවර්ධන මැතිතුමායි. ඒ වෙලාවේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය එහි ප්‍රධානත්වය -නායකත්වය- ගෙන කටයුතු කරන අවස්ථාවේ එතුමියත් සමඟ සමීපව සිටිමින්, ඒ රජය බිහි කරන්න ප්‍රධාන

ක්‍රියාකාරිකයෙක් විධියට එතුමා කටයුතු කළා. ඒ රජය ඉදිරියට පවත්වාගෙන යාමේදී ජාතිවාදී නොවන පෙරමුණක් බවට පත් කරන්න වාගේම ජාතිවාදී නොවන ආණ්ඩුවක් කියන එක ප්‍රදර්ශනය කරන්න එතුමා ඉතාමත් ඉහළ කාර්ය භාරයක් ඉටු කළා කියන එක මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

එතුමා කටයුතු කළ අමාත්‍යාංශ සම්බන්ධයෙන් බැලුවොත්, චෝදනා එල්ල විය හැකි අමාත්‍යාංශ භාරව තමයි එතුමා කටයුතු කළේ. විශේෂයෙන් නාගරික සංවර්ධන කටයුතු, නිවාස කටයුතු, ජලසම්පාදන කටයුතු වැනි ප්‍රබල අමාත්‍යාංශවල ඉන්න කොට රිසි සේ කටයුතු කිරීමේ හැකියාවන් බොහෝ අවස්ථාවල තිබෙන්න ඇති. නමුත්, සෑම අවස්ථාවකම තම පියාගේ, මවගේ ගෞරවය ආරක්ෂා කර ගනිමින්, තම පවුලේ ගෞරවය ආරක්ෂා කර ගනිමින් කටයුතු කරන්න ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා අමතක කළේ නැහැයි කියන එක සම්බන්ධයෙන් අප සියලු දෙනා සාක්ෂි දරනවා.

ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මිය ගියාම පාර්ලිමේන්තුවේ මේ විධියට ශෝක ප්‍රකාශ පළ කරනවා; විවිධ කථා කරනවා. ඒ සමහර කථා හිතට එකඟව කරනවා වාගේම හිතට එකඟ නොවෙන වර්ණනා කරන බවත් අපි දන්නවා. නමුත්, මා පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා පිළිබඳව හිතට එකඟව ඕනෑම කෙනෙකුට කථා කරන්න පුළුවන් විධියට විශාල කාර්ය භාරයක් එතුමා කරලා තිබෙන බව. සියලුම පක්ෂවලට, සියලුම ජාතීන්ට එතුමා පිළිබඳව කථා කරන්න පුළුවන්.

මා ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා කළ කථාව අහගෙන හිටියා. එතුමා සඳහන් කළ පරිදි, TNA එකේ නායකයා විධියට, උතුරේ ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන නායකයකු විධියට විපක්ෂ නායකතුමාත් එතුමා පිළිබඳ අගය කිරීමකින් කථා කළා. මා කොහොමටත් දන්නවා, එතුමා ඒ දෙමළ මන්ත්‍රීවරුන් සමඟ පාර්ලිමේන්තුවේදී සෑම අවස්ථාවකදීම බොහොම සුහදව කටයුතු කළ බව. ඉන් පරිබාහිරවත් ඒ ජනතාව සමඟ ඉතා සුහදව කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා කිව්වා වාගේ එතුමා ගම්මන්පිල මැතිතුමාගේත් ගෞරවය දිනා ගත්තා. මේ සෑම පාර්ශ්වයකම, සෑම කෙනකුගේම ඇගයීමකට ලක් වීම ලෙහෙසි පහසු වෙන්නේ නැහැ. ඒ වාගේම මන්ත්‍රීවරුන්ගේ අභාවයන් වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ ශෝකය පළ කිරීමේදී වුණත්, ඒ බොහෝ දෙනෙකු කැමැත්තෙන් කථා කරන්නේ නැහැ. සමහර වෙලාවට තමන්ගේ හිතට එකඟව කථා කරන්නේ නැහැ. නමුත්, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා පිළිබඳව හිතට එකඟව කථා කළා. ඒක මා හොඳටම දන්නවා. ඒ පවුලම දේශපාලන කටයුතුවල නිරත වුණු පවුලක්. රොබට් ගුණවර්ධන මැතිතුමා, කුසුමා ගුණවර්ධන මැනිනිය, ඉන්දික ගුණවර්ධන මැතිතුමා වාගේම ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ඉහළ පෙළේ, දේශපාලනඥයෙක්. මා කලක් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කළා. ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමාත් ඉතා පිරිසිදු දේශපාලනඥයකු විධියට ගුණවර්ධන පවුලේ ඒ ආභාෂය ඒ ආකාරයෙන්ම ගෙන යන්න කටයුතු කළ බව අපි හොඳටම දන්නවා.

ඒ විතරක් නොවෙයි. ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විධියට කටයුතු කළා. මගේ මතකයේ හැටියට සුනාමිය ආව කාලයේ එතුමා ඒ අංශවල බොහෝ කාර්ය භාරයන්ට මැදිහත් වුණා. ඒ සෑම අවස්ථාවකදීම තමන්ගේ පවුලේ ගෞරවය ආරක්ෂා කර ගනිමින් මේ රට වෙනුවෙන් කරන්න ඕනෑ යුතුකම් හරියාකාරව ඉෂ්ට කළා.

ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමාත් මේ පාර්ලිමේන්තුවේ අමාත්‍යවරයකු විධියට කටයුතු කළා. දේශපාලනඥයකු විධියට පාර්ලිමේන්තුවට එන්නට පෙර සිටම අපි එතුමා ගැන දැන සිටියා, රාජපක්ෂ පවුල සමඟ තිබුණු සම්බන්ධතා නිසා. ඒ සියලුම දෙනා තමන්ගේ පියාගේ, මවගේ, පවුලේ ගෞරවය ආරක්ෂා කළා විතරක් නොවෙයි, රට වෙනුවෙන් විශාල යුතුකම් ප්‍රමාණයක් ඉෂ්ට කළ නායකයින්. ගුණවර්ධන පවුලේ වැඩිමලා විධියට ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා ලබා දුන් නායකත්වය පවුලේ අනෙක් අයටත් තිබෙන්නට ඇති කියලා මා විශ්වාස කරනවා. ඒ පවුලේ අනෙක් සහෝදරියන් ඇතුළු සාමාජිකයන් අපට විටින් විට මුණ ගැහෙනවා. ඒ පවුල මේ රටට විශාල ආදරයක් තිබෙන උදවිය ඉන්න පවුලක්. ඒ වාගේම එවැනි නායකයන් ඒ පවුල තුළ සිටීම පිළිබඳව අපට තිබෙන්නේ ඉමහත් ආඩම්බරයක්.

ගරු කථානායකතුමනි, ගරු ඉන්දික ගුණවර්ධන මැතිතුමා පිළිබඳ අපට තව බොහෝ කරුණු කියන්න පුළුවන්. නමුත්, මා ඒකට කාලය ගන්න සූදානම් වෙන්නේ නැහැ, ගොඩක් කථික මහත්වරු ඒ පිළිබඳව කථා කළ නිසා. අපට ආදර්ශයක් දුන්නු දේශපාලන නායකයකු විධියට, රටට විශාල සේවයක් කළ දේශපාලන නායකයකු විධියට එතුමා අභාවප්‍රාප්ත වීම අප සියලුම දෙනාටම පාඩුවක්.

එතුමාගේ අභාවය වෙනුවෙන් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු එතුමාගේ පවුලේ සියලුම සහෝදරයන්ටත්, ඒ වාගේම එම මැතිනිය, දරුවන් ඇතුළු සියලුම දෙනාටත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රධාන ලේකම්වරයා විධියට මම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ශෝකය පළ කරනවා. එතුමා අද ජීවතුන් අතර සිටියා නම්, අනිවාර්යයෙන්ම එක්සත් ජනතා නිදහස් සන්ධානය ශක්තිමත් කරන වැඩ පිළිවෙළේ පතාක යෝධයෙකු කියන එකත් මා මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. අවසාන වශයෙන් එතුමාට නිවන් සුව අත්වේවා! යි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

[අ.භා. 4.12]

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා)

(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சர்)

(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ විශේෂ ස්තුතිය පිරිනමන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා හිටපු විප්ලවවාදියෙක්; හිටපු මාක්ස්වාදී නායකයෙක්; හිටපු අමාත්‍යවරයෙක්. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ හැටියට හිටපු කාලයේ අප දේශපාලනයට ඇදලා දැමූ ප්‍රධාන පුද්ගලයා කවුද කියලා ඇහුවොත්, අපට එක පාරටම මතක් වන්නේ ඉන්දික ගුණවර්ධන මැතිතුමායි. 1970 සමඟි පෙරමුණු රජය පිහිටුවීම සඳහා විශාල කැප වීමක් කරපු ඉන්දික ගුණවර්ධන මැතිතුමා, 1970 අග භාගය වන විට මේ රටේ බිහි වුණු සන්නද්ධ අරගළ 'වලිප්පුවට' විරුද්ධව, විශ්වවිද්‍යාලය ඇතුළට ගිහිල්ලා දේශපාලන මතවාදී හා න්‍යායාත්මක අරගළයක් කරපු නායකයන් කිහිප දෙනා අතර ඉදිරියෙන්ම හිටපු එඩිතර තරුණ නායකයායි. 71 අරගළය එන්න කලින් සිට නොකඩවාම මේ සන්නද්ධ වියරුවට පහර දෙමින් න්‍යායාත්මක යුද්ධයක් කරපු ඉන්දික ගුණවර්ධන මැතිතුමා, 71

[ගරු එස්.බී. දිසානායක මහතා]

අරගළයෙන් පස්සේ, එදා රජය පිහිටුවපු අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවට එරෙහිව ආණ්ඩුවෙන් එළියට බැස්සා. දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමා, ඊලියන් නානායක්කාර මැතිතුමා, සරත් මුත්තෙට්ටුවගම මැතිතුමා එක්ක ඉන්දික ගුණවර්ධන මැතිතුමාත් එදා තරුණ නායකයෙකු හැටියට ආණ්ඩුවෙන් එළියට බැස්සා.

ගරු කථානායකතුමනි, එදා අපේ විශ්වවිද්‍යාල සිර කඳවුරු කරලා, අපි ලුම්බිණියේ, තර්ස්ටන් එකේ, රෝයල් එකේ තැන් තැන්වල පන්තිවලට යනකොට, අප පාරට ඇදලා අරගෙන විශ්වවිද්‍යාල දිනා ගැනීමේ සටන මෙහෙයවන්න අ දිරි ගැන්වූයේ ඉන්දික ගුණවර්ධන මැතිතුමායි. අපට දේශපාලනය ඉගැන්වූයේ අපේ ආදරණීය නායකයා වූ ඉන්දික ගුණවර්ධන මැතිතුමායි.

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා කිව්වා වාගේ පොදුජන එක්සත් පෙරමුණු රජය පිහිටුවන්න නොවෙයි, පොදුජන එක්සත් පෙරමුණ හදන්න මූලික වුණු ප්‍රධාන කීප දෙනාගේත් ප්‍රධානියෙකු තමයි අපේ ආදරණීය ඉන්දික ගුණවර්ධන මැතිතුමා. අමාත්‍යාවරයකු හැටියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට කරපු මහා සේවයට වඩා එතුමා ඉතාම විද්‍යාත්මකව, ඉතාම ගැඹුරින් හදාරා තිබුණු මාක්ස්වාදී දර්ශනය, ලෙනින්වාදී දර්ශනය පිළිබඳව මේ රට පුරා විශාල ජන මතයක් ගොඩ නැඟුවා. මම හිතන හැටියට 70 දශකයේ තිබුණු ට්‍රොස්කිවාදී මතවාදයට එරෙහිව තදින් පහර දුන්, එය විවේචනය කරපු ප්‍රධාන න්‍යායාත්මක දේශපාලන තරුණයා අපේ ඉන්දික ගුණවර්ධන මැතිතුමායි.

ගරු කථානායකතුමනි, ඉන්දික ගුණවර්ධන මැතිතුමා එක්ක තමයි මම ලංකා ජාතික ශිෂ්‍ය සම්මේලනයට බැඳුණේ. එතුමා තමයි මා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ -එදා විද්‍යෝදයේ - සභාපති කළේ. ඒ වාගේම අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩලයේ සභාපති තනතුරට මා ඔසවා තබන්නට පේරාදෙනියේ හිටපු මහාචාර්ය නවරත්න බණ්ඩාර වාගේ පුද්ගලයෝ උදවු කළා. අප ශිෂ්‍ය නායකයෝ කරන්න ඉදිරියට තල්ලු කරපු ප්‍රධාන තරුණ නායකයා, මාක්ස්වාදියා, විප්ලවවාදියා වන්නේත් අපේ ආදරණීය ඉන්දික ගුණවර්ධන මැතිතුමායි.

එතුමාගේ ආදරණීය පියා, එතුමාගේ ආදරණීය මව, එතුමාගේ ආදරණීය සහෝදරයන් වන දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහ ගීතාංජන ගුණවර්ධන මැතිතුමා යන මේ සියලු දෙනා එක්ක බලනකොට එතුමා සුවිශේෂයි. එතුමා තම ආදරණීය පියාගේ සහ මවගේ ගෞරවය රකිමින්, පවුලේ අනෙක් සහෝදරවරුත් වමේ දේශපාලනයට ඇද බැඳ තබා ගැනීමට කටයුතු කළා. තරුණයකු හැටියට ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට එතුමා දුන් නායකත්වය අපට කවදාවත් අමතක කරන්න බැහැ. ඒ වාගේම, එදා පොදු ජන එක්සත් පෙරමුණ ආණ්ඩුව හදන්න එතුමා කරන ලද මෙහෙයවීම කිසි දවසක අපට අමතක වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, විද්‍යාත්මක ලෙස, ඉතාම ගැඹුරින් මාක්ස්වාදය හදාරපු දේශපාලනඥයන් අතර ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඉදිරියෙන්ම සිටියා. ඒ නිසා එතුමාට ඕනෑම ට්‍රොස්කිවාදී මතධාරීන් සමඟ වාද කිරීමේ ශක්තිය තිබුණා. 1970 දශකයේ අග භාගයේ තිබුණු ජේවීපී දේශපාලන මතවාදයත් එක්ක බොහොම ලේසියෙන් තර්ක විතර්ක කරලා, කරුණු පෙන්වාදීලා, ඒ කරුණු කියා දීලා, ඒ මතවාද කඩා දමන්න එතුමා මේ රටේ තරුණ පරපුරට -අපට- මහ පෙන්නුවා. තරුණ මාක්ස්වාදියකු හැටියට, විප්ලවවාදියකු හැටියට, කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සම්මේලනයේ, දේශපාලන මණ්ඩලයේ හිටපු සභිකයකු හැටියට සහ මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ඇමතිවරයකු හැටියට එතුමා කළ සේවය මා අගය කරනවා.

ගරු කථානායකතුමනි, ජාතිවාදී නොවන, අන්ත ආගමිවාදී නොවන තාර්කික ප්‍රගතිශීලි දේශපාලනයක් තුළින් මේ රට ගොඩනැඟීම සඳහා අප මෙහෙයවූ ඒ ආදරණීය නායකයාට, අපේ රට වෙනුවෙන්, රටේ ප්‍රගතිශීලි ජනතාව වෙනුවෙන්, වමේ ව්‍යාපාරය වෙනුවෙන් බෞද්ධයකු හැටියට මම නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ අභාවය වෙනුවෙන් මාගේ ශෝකය ඒ පවුලේ සියලු දෙනා වෙතද පුද කරන්න කැමැතියි. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.19]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළමුකොට ගරු කථානායකතුමාටත්, ඒ වාගේම මේ ශෝක යෝජනාව ගෙනෙන ලද ගරු සභානායකතුමාටත්, ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ බාල සහෝදරයකු හැටියට මාගේ කෘතවේදීත්වය පළ කරන්න ඕනෑ.

බොරලුගොඩ, ගුණවර්ධන පවුලෙන් මෑත කාලයේ දේශපාලනයට පිවිස, දේශපාලන අරගළය ඉදිරියට ගෙන යන්නට තම ජීවිතය කැප කළ කෙනකු හැටියට ඉන්දික ගුණවර්ධන අපේ සහෝදරයා හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම වමේ ව්‍යාපාරයේ සහෝදරයකු හැටියට එතුමාට අප කාගේත් ගෞරවය පුද කළ මේ අවස්ථාවේ මා ද ඊට එක්වීම යුතුකමක්. ඉන්දික ගුණවර්ධන අපේ වැඩිමහල් සහෝදරයායි. ප්‍රසන්න, ලක්මලී, මම සහ ගීතාංජන එකම පවුලේ සහෝදර සහෝදරියන් හැටියට හැදුණු වැඩුණු බාල කාලයත්, තරුණ කාලයත් මේ මොහොතේ සිහිපත් වෙනවා. පුරවැසියන් හැටියට අපේ සමාජයට, අපේ රටට, යුක්තිය හා සාධාරණය වෙනුවෙන් කළ හැකි කාර්ය භාරය ඉටු කිරීමට ගත් ක්‍රියා මාර්ගවලදී අප අතර විවිධත්වයක් තිබුණද, එකඟතාවකින් හා මානව දයාවෙන් යුතුව ජනතාවගේ අයිතිය වෙනුවෙන් කටයුතු කරන්න අපට පුළුවන් වුණා. කොමියුනිස්ට් පක්ෂයට බැඳුණාද නැද්ද යන ප්‍රශ්නයෙන් තොරව, අපේ වැඩිමහල් සහෝදරයා වන ඉන්දික ගුණවර්ධන මැතිතුමා සමඟ දේශපාලනය හා සමාජය පිළිබඳව ඉතාම කිට්ටුවෙන් සාකච්ඡා කිරීමට පුළුවන්වීම අප ලැබූ සුවිශේෂ භාග්‍යයක්.

මම කාල වේලාව වැඩි වශයෙන් ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මම කියන්නට ඕනෑ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නට පෙර සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමෙන් පසුවත් ඉන්දික ගුණවර්ධන මැතිතුමා රටට එක් කළ දේ පිළිබඳව කෙරුණු විග්‍රහයන් ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ බිරිඳ වන වෛද්‍ය පද්මිණී ගුණවර්ධන සහෝදරියටත්, ඒ වාගේම දරුවන් දෙපොළ වන දියත්, යසිත් සහ යසිත්ගේ බිරිඳ ඇතුළු සියලු දෙනාටත් එක්තරා විධියක ධෛර්යයක් හා ආඩම්බරයක් වනවාට කිසිදු සැකයක් නැති බව.

රාජකීය විද්‍යාලයෙන් ලද අධ්‍යාපනය ඉන්දිකගේ විශිෂ්ටත්වයට හේතු වුණු බව සභානායකතුමා ඉදිරිපත් කළ ශෝක යෝජනාවේ සඳහන් වුණා. අප දෙපොළම රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන් හැටියට දන්නවා, එවකට තිබුණු සම්ප්‍රදාය වෙනස් කරමින් ජාතික ඇඳුම ඇඳ ඉන්දික රාජකීය විද්‍යාලයට පැමිණි අවස්ථාව ගැන. එදා පාසල බඹර වදයක් ඇවිස්සුණු තත්ත්වයට පත් වුණා. රාජකීය විද්‍යාලයේ සම්ප්‍රදාය

සම්පූර්ණයෙන් කඩා වැටී බඹරු සතර දික් භාගයේ ගමන් කළ දවසක් හැටියට මම ඒ දවස දැක්කා. නමුත් ඉන්දික ඒ අභියෝගය පිළිගත්තා. කුමන බාධාවන්, විවේචන පැමිණියත් ඔහු ජාතික ඇදුම අත් හැරියේ නැහැ. එතුමා රාජකීය විද්‍යාලයේ ශිෂ්‍ය නායකයකු හැටියට පත්වී සිටි නිසාම ඉතා වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරන්නට එතුමාට හැකි වුණා.

විවාද තරගවලදී එතුමා කළ කථාවලට සවන් දෙන්න අපි ගියා. අපි ඒවාට සවන් දුන්නා; ඉගෙන ගත්තා. කොළඹ දිස්ත්‍රික්කයේම සාහිත්‍ය සංගම්, විවාද කණ්ඩායම් එකතු කොට නිර්මාණශීලීව මහා සංවිධානයක් ඇති කිරීම සඳහා ඉන්දිකගේ නායකත්වය ආරම්භක මුහුණුවරක් පෙන්නුම් කළාය කියලා මා හිතනවා. ඒ වාගේම එතුමා සංගීතය වැනි විවිධ විෂයයන් හැදෑරුවා. ඒ වාගේම රාජකීය විද්‍යාලයේ බෞද්ධ ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා ලෙසත් කටයුතු කළා.

මා දන්නා විධියට එතුමා හොකී ක්‍රීඩාවටත් එකතු වුණා. ඒ වාගේම රාජකීය විද්‍යාලයේ සිටි කාලයේදී ශිෂ්‍ය ව්‍යාපාරයන්වත් එතුමා එක් වුණා. ශිෂ්‍යයන්ගෙන් ගාස්තු අය කිරීමට එරෙහිව කොළඹ නගරයේ පැවැති මහා ශිෂ්‍ය උද්ඝෝෂණයට පළමු වරට එතුමා සහභාගි වුණු දිනය අපට මතකයි. ඒ අවස්ථාවේදී ධර්මසිරි සේනානායක, රාජා කොල්ලුරේ සහ ආනන්ද ගුණතිලක වැනි නායකයන් සමඟ එකම ශිෂ්‍ය පෙළපාළිය ගමන් කරවමින් අසාධාරණ, අයුක්ති සහගත ප්‍රතිපත්තිවලට එරෙහිව නැඟී සිටියා. එවැනි සංවිධානාත්මක ක්‍රියාදාමයන්වලට ඉදිරිපත් වීම දීර්ඝ කාලීනව එතුමාගේ මුළු ජීවිත කාලය පුරාම එලෙසම සිදු වුණා.

අපේ ආදරණීය පියා වන පිලිප් ගුණවර්ධන මැතිතුමාත්, ආදරණීය මව වන කුසුමා ගුණවර්ධන මැනිනියත්, ඒ වාගේම රොබට් ගුණවර්ධන මැතිතුමාත් දීර්ඝ කාලයක් තිස්සේ පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රීවරුන් හැටියට කටයුතු කරමින් ලබා දුන් ආදර්ශය වාගේම, ඉන්දික ගුණවර්ධන මැතිතුමාත් සුවිශේෂී ආදර්ශයක් ලබා දුන්නා කියලා මා හිතනවා. එතුමා පළමු වරට පාර්ලිමේන්තුවට තේරී පත් වීමෙන් පසුව මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කිරීම පමණක් නොවෙයි, අමාත්‍ය ධුරයක්ද හිමි වීම නිසා මහා වගකීමක් එතුමාගේ කර මත පැටවුණා. සභානායකතුමාත්, මාගේ මිත්‍ර එස්.බී. දිසානායක ඇමතිතුමාත් මේ කාරණය සම්බන්ධයෙන් මා සමඟ එකඟ වනවා ඇති කියලා මා හිතනවා. ඉතාම කෙටි කාලයකදී අමාත්‍ය ධුර රාශියක කටයුතු කිරීමට එතුමාට සිදු වුණත්, විෂය කරුණු ගණනාවක් පිළිබඳව එතුමා තුළ තිබුණු ගැඹුරු දැනුම, අවබෝධය හා අධිෂ්ඨානය නිසා එම හැම අමාත්‍යාංශයක්ම හැසිරවීමට එතුමාට හැකියාව තිබුණා. විශේෂයෙන්ම පසු ගිය දශක අටක -අවුරුදු අසූවක- කාල පරිච්ඡේදය තුළ අපේ රටේ පීඩිත පන්ති ව්‍යාපාරයට අලුත් විශ්වාසයක් දුන් වමේ නොනැවතෙන සමාජවාදී ව්‍යාපාරයට ඉන්දික එකතු වුණේ, අපේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳිය හැකි එකම මඟ ධනවාදය නොව, සමාජවාදය පමණයි කියන ගැඹුරු අවබෝධය මාක්ස්වාදියකු හැටියට ලබා ගත් නිසයි. ඒ තුළ ඔහු දැරූ සමාජවාදී අදහස් කිසිදු වෙනසක් නොකොට, අවසාන හුස්ම හෙළන තුරු සමාජවාදී දර්ශනය තවත් අයට අවබෝධ කර දෙමින්, සමාජවාදී දර්ශනයේ ඇති වැදගත්කමේ පන්නරයෙන් තව ඉදිරියට ගමන් කළ හැකි අනාගතයක් පිළිබඳ විශ්වාසය ස්ථාපිත කළා.

එතුමා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට බැඳුණු බව කලින් සඳහන් කළා. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට බැඳෙන්න පෙරාතුව එතුමා ඒ කාලයේ නැඟෙනහිර ජර්මනියේ, ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් ජනරජයේ -GDR-, ලයිප්සිග් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ විශිෂ්ට සම්මානයක් හිමි කර ගත් කාලය තුළ මාක්ස්වාදය හැදෑරුවා. එතුමා සමාජවාදී ධර්මතාවන් පිළිබඳව ගැඹුරින් අවබෝධ කර ගත්තා. එක අවස්ථාවකදී තරුණ ව්‍යාපාරයේ රැළියකට මා ගිය වෙලාවේ, ඉන්දික සමාජවාදී රටවල ශිෂ්‍ය සංවිධානයේ මහා සම්මේලනය ගොඩ නැඟීමේ කටයුතුවල නිරත වෙලා, එම සම්මේලන වාරය ඇමතුවා මට මතකයි. ලංකාවේ වාමාංශික හා දේශපාලන ව්‍යාපාරවල හිටපු හා සිටින නායකයන් රාශියක් ඒ අවස්ථාවේදී එම රටවලින් පැමිණ එම සමුළුවට සහභාගි වුණා. එතුමා ජාත්‍යන්තරව ලබා ගත් ඒ අත් දැකීම් සම්භාරය, තරුණ ව්‍යාපාරය තුළින් ලබා ගත් ඇත් දැකීම් සම්භාරය වාගේමයි.

එතුමා දවසක් ගත් එඩිතර තීරණයක් තමයි ගරු කථානායකතුමනි, සර්වෝදය ශ්‍රමදාන කඳවුරට ගමන් කරන්න තීරණය කිරීම. ආචාර්ය ඒ.ටී. ආරියරත්න මහතාත් සමඟ ඒ ගමන යද්දී අපේ පියාගෙන් අවසර ඉල්ලන කොට අපේ මව තුළ තිබුණු දැඩි ආදරය නිසා ඇය කිව්වා, "පුතා කොහේද මේ යන්නේ කඳවුරකට, කොහේ යනවාද දන්නේ නැහැ"යි කියලා. මා ඒ සිදු වීම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ අවස්ථාවේදී අපේ ආදරණීය පියාගේ ආශීර්වාදය ලැබුණා. "ඔහු ගෙන තිබෙන තීරණය යම්කිසි පරාර්ථකාමී තීරණයක්. ඔහු ශ්‍රමය දානය කිරීමේ හොඳ වැඩකට යන්නේ, අපි ඉන්දිකට ආශීර්වාදය කරන්න ඕනෑ"යි කියලා කිව්වා. මා හිතන හැටියට අවුරුදු 60කට විතර ඉස්සෙල්ලා සිදු වුණු අවස්ථාවක් තමයි මා සිහිපත් කළේ. ඉන්දික ගත් ඒ එඩිතර තීරණය නිසා පරාර්ථකාමී සමාජ යුතුකම් සඳහා ඔහුගේ ජීවිතය සකස් කර ගැනීමට පුළුවන්කම ලැබුණා. එතුමා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට එකතු වුණා, 1970දී මහා පෙරළියකට කර දුන්නා. එවැනි දේ සිදු වුණද, තම පියා හා මවත්, අපේ සහෝදරකම ගැනත් කිසිදු මතභේදයකින් තොරව කටයුතු කරන්නට පුළුවන් වීම, මා හිතන හැටියට අද ජීවත් වන දේශපාලනඥයන් සැම දෙනාටම ආදර්ශයක්. දේශපාලන මතිමතාන්දර ඇති වන්නට පුළුවන්. සදාකාලික දෙයක් ලොව නැති බව බුදුන් වදාළ ධර්මයයි. සදාකාලික නොවන දෙයක් පිළිබඳව අප අතර ඇති වන මතභේද, සදාකාලික මතභේද බවට පත් විය යුතු නැති බවයි මා හිතන්නේ. එතකොට අපට අවබෝධයෙන් වැඩ කරන්න පුළුවන්කම ඇති වනවා.

ගරු කථානායකතුමනි, මා තවත් අවස්ථාවක් සිහිපත් කරන්න කැමැතියි. 1983දී මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට සිටියදී ඉන්දික අත් අඩංගුවට ගත්තා. එතකොට මේ සභාවේ විපක්ෂයේ සිටියේ 8දෙනායි. ඒ 8දෙනාගෙන් එක් කෙනෙක් තමයි, මම. කොයි තරම් අමාරු වෙන්න ඇතිද කියලා කල්පනා කරන්න පුළුවන්. මගේ සහෝදරයා ආණ්ඩුව පෙරළීම සඳහා කටයුතු කළා යැයි අත් අඩංගුවට ගත් බව අමාත්‍යවරු ගණනාවක් ඇවිත් මට කිව්වා. ඒ අවස්ථාවේදී තිබුණු දැඩි සටන මගේ වැඩිමහල් අනික් සහෝදර ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා, බාල සහෝදරයා ගීතාංජන ගුණවර්ධන මැතිතුමා, ඒ වාගේම ඒ දරුවන් දෙපොළ දන්නවා. අපේ සමාජයේ අද හෝ හෙට, එහෙම නැත්නම් ඉදිරි දිනකත් එවැනිම ආකාරයට මර්දනකාරීව කොයි තරම් අය අත් අඩංගුවට පත් වනවාද කියලා අපට කල්පනා කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, එතුමාව බලන්න යන්න මටත් බිරිඳ පද්මිණීටත් විශේෂ අවසරයක් දීලා තිබුණා. එතුමා වැලිකඩ හිර ගෙදරට ගෙන යන්නට පෙර රඳවා ගෙන සිටියේ අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයට අල්ලා තිබෙන බොහොම භයානක ගොඩනැඟිල්ලේ. මා එතුමාට පිදෙන ගෞරවයක් ලෙස මේ කථාව කියන්න ඕනෑ. අද වන තුරු මම මේක ප්‍රසිද්ධියේ කියලා නැහැ. එක දවසක් සවසක මා ඉන්දික බලන්න යන කොට එතුමා සිටි කාමරයට අල්ලපු කාමරයේ දොරවල් විවෘත කොට, ප්‍රසිද්ධියේ කකුල් දෙකෙන් එල්ලා තිබුණ මනුස්සයෙක් පණ අදිනවා. එතුමා මගෙන් ඇහුවා "මෙතැනට එන කොට උඹේ ඇස් දෙක පෙනුණාද?" කියලා. "ඔව් මගේ ඇස් දෙක

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

පෙනුනා" කියලා මම කිව්වා. අර මිනිසා කකුල් දෙකෙන් එල්ලා පණ අදින තත්ත්වය දැක්කාම එතැන තිබුණ තත්ත්වයත් මිනිස්සු විඳින දුකත් කොයි තරම් ද කියලා තේරුම් කර ගත හැකි වුණා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක මෘගකම ගැනත්, ඒ අවදියේදී හැසිරුණු ආකාරය ගැනත් තමයි මම කිව්වේ. තරුණයන් මුහුණ දුන් එවැනි තත්ත්වයන් ගැන එස්.බී. දිසානායක මැතිතුමා, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා, ඩිලාන් පෙරේරා මැතිතුමාන්ලාත් කිව්වා. ඒ නිසා ඒ හරහා ගමන් කිරීමට, ඒ අයිතිවාසිකම් සඳහා වූ උත්සාහයට එතුමා කැප වුණා. එවැනි තත්ත්වයන් හමුවේ නොසැලී සිටින්න පුළුවන්කම තිබුණු නිසා ඉන්දික නොසැලී තම දේශපාලන මතය දිගටම දැරුවා. මරණයද, නැද්ද, මරණය පෙන්වනවාද, නැද්ද ඒ කිසිවකට බියක් නොදක්වා තම ජීවිතයේ මුහුණ දිය යුතු අවස්ථාවන්ට මුහුණ දෙන්න පුළුවන් එඩිතරකම ඔහුගේ ජීවිතය තුළ තිබුණු ඉතාම වටිනා ලක්ෂණය වුණා. ඒ නිසා මා මේ කාරණය සඳහන් කිරීම වටිනවා. මොකද, මිනිස්සුන්ගේ මානව අයිතිය, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය හා මිනිස් අයිතිය වෙනුවෙන් පෙනී සිටි විවිධ වේදිකාවලට, සමාජ සංවිධානවලට එතුමා එකතු වුණා. ඒ නිසාම එතුමාට 1970 පාර්ලිමේන්තු මැතිවරණයටත් පක්ෂයෙන් ඉදිරිපත් වෙන්න අවකාශය නොලැබුණා වාගේම, මේ හේතුව නිසාම 1977 මැතිවරණයටත් ඉදිරිපත් වීමේ අවකාශය ලැබුණේ නැහැ. එතුමාට කොමියුනිස්ට් පක්ෂයෙන් අපේක්ෂකත්වය ලබා දුන්නේ නැහැ. එම කරුණත් සඳහන් කිරීම මම ඉන්දික වෙනුවෙන් කරන යුතුකමක්.

එදා 1977 මැතිවරණයේදී මම මහජන එක්සත් පෙරමුණෙන් තනිවම අව්ස්සවෙල්ල ආසනයට තරග කළා. සීමිත පිරිසකගේ ආධාරය ඇතිව ඉන්දික ස්වාධීනව කඩුවෙල ආසනයට තරග කළා. එයින් බොහෝ දුරට ඉන්දිකගේ දේශපාලන චින්තනය යළි අවදි කරන්න පුළුවන් වුණා. ඒ වාගේම එතුමාගේ එඩිතරකම නිසා එයට මුහුණ දුන්නා. ඒ තුළින් ඇති වුණු ක්‍රියා මාර්ගයන් නිසා පසුව අපේ රටේ සටන්කාමී ව්‍යාපාර සමඟ එක්වීමත්, ඒ වෙනුවෙන් නිදහස් අයිතිවාසිකම් සඳහා වූ සංවිධාන සමඟ එක්වීමත් නිසා තමයි එතුමා අත් අඩංගුවට පත් වුණේ. පසුව එතුමා නිදහස් කරනු ලැබුවා. නමුත් එතුමාට දීර්ඝ කාල පරිච්ඡේදයක් අත් අඩංගුවේ රැඳී සිටීමට හා අධිකරණ ක්‍රියා මාර්ගවලට මුහුණ දෙන්න සිදු වුණා. එතුමා අමාත්‍යවරයෙක් හැටියට විශාල වැඩ කොටසක් ඉෂ්ට කිරීම ගැන මෙතැන සඳහන් වුණා.

විශේෂයෙන්ම අධිරාජ්‍යවාදයට එරෙහිව නැඟී සිටීම නිසා එතුමා නියෝජනය කළ හේවාගම් කෝරළයේ සීතාවකට උරුමයක් තිබෙනවා. අපේ රටට පළමුවැනි අධිරාජ්‍යවාදීන්ගේ පැමිණීමට විරුද්ධව කළ සටනේදී ජීවිත පූජා කරමින් ගම් නියංගම් ලෙයින් තෙත් වුණු ප්‍රදේශයක් තමයි සීතාවක. පරංගීන්ට විරුද්ධව කළ සටනේ උරුමය ඉදිරියට ගෙන යන අරගළයට හවුල් වුණු වමේ ව්‍යාපාරයේ තේතැන්න විය. ඒ වාගේම අලුත් රටක් බිහි කිරීමට, මේ සමාජය වෙනස් කිරීම සඳහා වූ සමාජවාදී ව්‍යාපාරයේ උරුමයට හා ගමනට ඉන්දික එකතු වුණා.

ගරු කථානායකතුමනි, එතුමාගේ ජීවිතය ගැන බලන කොට එතුමා මුහුණ දුන් කිසිම තත්ත්වයක් ගැන කිසිම අවස්ථාවක ශෝකයට පත් වුණාය කියලා මා හිතන්නේ නැහැ. කලිනුත් සඳහන් කළා වාගේ එතුමා ඉපදුනේත් ඉන්දියාවේ. "දුටු තැන වෙඩි තබනු" කියන නියෝගය බ්‍රිතාන්‍ය පාලනය පනවා තිබුණු නිසා අපේ පියාටත්, මවටත් වමේ නායකයන් සමඟ ඉන්දියාවට පැන යන්න සිද්ධ වුණා. ඒ වෙලාවේ තිබුණේ හදිසි නීතියකුත් නොවෙයි, martial law එක. "දුටු තැන වෙඩි තබනු" කියන නියෝගය බ්‍රිතාන්‍ය පාලනය පනවා, ලංකා සමසමාජ පක්ෂයේ 41 දෙනෙකුගේ නම් සඳහන්වෙලා තිබුණා. ඒ අවස්ථාවේදී මගේ පියාත්, මගේ මවත්, (ආචාර්ය) එන්.එම්. පෙරේරා මැතිතුමාත්, බර්නාඩ් සොයිසා මැතිතුමාත්, ඇන්තනි පිල්ලේ මැතිතුමාත්, රොබට් ගුණවර්ධන මැතිතුමාත්, කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමාත් නිදහස් සටන් ව්‍යාපාරයේ සගයන් සමඟ එක් වී කටයුතු කළා. අපි අහලා තිබෙන කථාවට අනුව - අපට කියපු කථාව අනුව - උදේ පාන්දර ගෙදර වට කරලා, පියායි, මවයි, මේ උපන් දරුවායි අත් අඩංගුවට ගත්තා. නිදහස් වන තුරු බොම්බායේ හිර ගෙදර ගත කරපු ජීවිතය මා හිතන්නේ කුඩා දරුවෙකුට නම් මතක නැහැ. නමුත් එතුමා ජීවිතය ගත කළ හිර ගෙදර බලන්න ගියා.

එතුමා ඉපදුණේ බොම්බායේ මතුංගා හින්දු ජනාවාසයේ පායි වෛද්‍යාචාර්යතුමාගේ රෝහලේදීයි. ඉන්දික ගුණවර්ධන මැතිතුමා ඇමතිවරයෙකු හැටියට පත් වුණාට පස්සේ එම වෛද්‍යාචාර්යතුමා ලංකාවට පැමිණියා. එම අවස්ථාවේදී වෛද්‍යාචාර්යතුමා හමු වී කථා බස් කරන්න තරම් අවස්ථාවක් ඉන්දික ගුණවර්ධන මැතිතුමාට ලැබුණා. එම අවස්ථාව, ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ ජීවිතයට සතුට එක් වුණු අවස්ථාවක් වුණා. පවුලේ සියලු දෙනාම අද දින මේ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාවට එක් වී සිටිනවා. වැඩ කරන ජනතාව, ගොවි ජනතාව, තරුණ ජනතාව වෙනුවෙන් වාගේම බුද්ධිමතුන් හා නිර්මාණශීලී අනාගතයක් වෙනුවෙන් එතුමා ඉටු කළ සේවය උදෙසා, මගේ සහෝදර ඉන්දික ගුණවර්ධන මැතිතුමාට පාර්ලිමේන්තුව තුළ ගෞරවයක් හිමි කර දීම මන්ත්‍රීවරු හැටියට මහජන එක්සත් පෙරමුණේත්, ඒකාබද්ධ විපක්ෂය වන අපේත් යුතුකමක් වනවා. ඒ වෙනුවෙන් එක් වචනයක් හෝ කථා කළ සියලු දෙනාටම මේ ගරු සභාවේ ගෞරවය මා පුද කරනවා. එය එතුමාගේ දරුවන් දෙදෙනාටත් අභිමානයක් වනවා. තම ආදරණීය පියාගෙන් රටටත්, සමාජයටත් ඉටු වුණු සේවාව ගැන මතක සටහන් ඇති වේවා! කියා ප්‍රාර්ථනා කරමින්, ඉන්දික ගුණවර්ධන මැතිතුමාට මා යළිත් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, දිවංගත අමාත්‍ය ඉන්දික ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේදී දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මමද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි. මේ අවස්ථාවේදී ඉන්දික ගුණවර්ධන මැතිතුමා ගෞරවයෙන් මවිසින්ද සිහිපත් කරනවා. කොළඹ නගරාධිපතිවරයා වශයෙන් මා කටයුතු කරන කාලයේදී අපි දේශපාලන මත දෙකක් දැරුවත්, කොළඹ නගරයේ ඉදිරි සැලැස්ම නිම කිරීමට එතුමා විශාල ශක්තියක් ලබා දුන්නා. එම අවස්ථාවේදී අපට සුහදව, කැප වීමෙන් යුතුව කටයුතු කිරීමට හැකි වුණා. මේ කටයුතු අවසාන වන තුරුම නිතරම අපි හමු වී කථා කළා. ඒ අවස්ථාවේදී එතුමා මට විශාල ශක්තියක් ලබා දුන්නා. එතුමා ගැන ගරු මන්ත්‍රීවරුන් බොහෝ අදහස් ප්‍රකාශ කළ නිසා, මා දීර්ඝ ලෙස ඒ සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. දේශපාලන ක්ෂේත්‍රයේ මා දුටු දැක පිරිසිදු, දුර්ලභ ගණයේ මහත්මයෙකු වශයෙන් මා එතුමාව හඳුන්වන්න කැමැතියි.

රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මා නියෝග කරනවා.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of the motion agreed to by Parliament on 08.03.2016, the hours of sitting this day shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m.. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

රජිත කොඩිතුවක්කු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ரஜித கொடிதுவக்கு மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
RAJITHA KODITHUWAKKU FOUNDATION (INCORPORATION) BILL

ගරු මලිත් ජයතිලක මහතා
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රජිත කොඩිතුවක්කු පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப் படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப் படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare for report.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.42ට, 2016 ඔක්තෝබර් මස 04 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තියේය.

அதன்படி பி.ப. 4.42 மணிக்கு பாராளுமன்றம், 2016 ஒக்ரோபர் 04, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament Adjourned accordingly at 4.42 p.m. until 1.00 p.m. on Tuesday, 04th October, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.